පූජ්‍යාචාර්ය ජයබාහු ධර්මකීර්ති මහා ස්ථවිර පාදයන්
විසින් විරචිත

සද්ධර්මාලංකාරය

ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ
සංස්කරණය

Non-Commercial Distribution

පටුන

	පිටුව
පෙරවදන	vii
සංඥාපනය	ix
ප්‍රස්තාවනා	xvii
ධම්සඞ්ග්‍රහ වර්ගය	01
නිදන වර්ගය	32
අභිනීහාර වර්ගය	59
ධර්මසොණ්ඩක වර්ගය	
ධර්මසොණ්ඩක වස්තුව	84
වෙස්සාමිත්‍රා වස්තුව	98
මිගලුද්දක වස්තුව	106
සරණ සංවීර වස්තුව	113
බුධවම්ම වස්තුව	120
මහා මන්ධාතු වර්ගය	
මහාමන්ධාතු වස්තුව	126
චෝරඝාතක වස්තුව	137
සීවලී වස්තුව	142
සඛේය්‍ය වස්තුව	150
පද්මාවතී වස්තුව	156
නන්දි රාජ වර්ගය	
නන්දිරාජ වස්තුව	171
උත්තර සාමණේර වස්තුව	184
සාබමාල වස්තුව	191
කපණා වස්තුව	199
කඤ්ඤුනදේවී වස්තුව	203
යක්ඛ වඤ්චිත වර්ගය	
යක්ඛවඤ්චිත වස්තුව	207
මිථ්‍යාදෘෂ්ටික වස්තුව	211
අහිගුණ්ඨික වස්තුව	216
පාදපීඨිකා වස්තුව	219
කාවීරපට්ටන වස්තුව	225
තුන් යහළු වර්ගය	
තුන් යහළු වස්තුව	229
ව්‍යාඝ්‍ර වස්තුව	236
ඵලක බණ්ඩදින්න වස්තුව	239
චෞර මිත්‍ර වස්තුව	243
පානීය වස්තුව	250
බ්‍රාහ්මණ වර්ගය	
මරුතක බ්‍රාහ්මණ වස්තුව	254
සොම බ්‍රාහ්මණ වස්තුව	256
මෞරිය බ්‍රාහ්මණ වස්තුව	260
දුග්ගත වස්තුව	264
දෙවසංවීර වස්තුව	267

Non-Commercial Distribution

	පිටුව
මහාසෙන වර්ගය	
මහාසෙන වස්තුව	272
අන්‍යතර මනුෂ්‍ය වස්තුව	275
රූප දෙවි වස්තුව	277
විෂමලොම වස්තුව	284
ඉන්දගුත්ත වස්තුව	289
තෙභාතික වර්ගය	
තෙභාතික වස්තුව	301
පුත්‍ර වස්තුව	340
සවර්ණතිලකා වස්තුව	344
බුඩෙති වස්තුව	353
කුණ්ඩලී වස්තුව	358
බොධි රාජ වර්ගය	
බොධිරාජ වස්තුව	362
ලංකා ශාසන ප්‍රතිෂ්ඨාපන කථා	368
ශුද්ධාසුමනා වස්තුව	380
ධම්මසවණොපාසිකා වස්තුව	384
කුඩ්ඩරජ්ජ වස්තුව	387
මිගපොතක වස්තුව	390
ආරඤ්ඤක වර්ගය	
ආරඤ්ඤක අභය ස්ථවිර වස්තුව	393
සමණගාම වස්තුව	396
නාගා වස්තුව	403
උත්තරොලිය වස්තුව	410
පුවපබ්බතවාසී තිස්ස ස්ථවිර වස්තුව	414
කාකවණ්ණ වර්ගය	
කාකවර්ණතිස්ස රාජ වස්තුව	418
දුෂ්ට ගාමණී වස්තුව	428
නන්දිමිත්‍ර වස්තුව	460
සුරනිමිල වස්තුව	465
මහාසොණ වස්තුව	470
ගොඨඉම්බර වර්ගය	
ගොඨඉම්බර වස්තුව	473
ථෙරපුත්තාභය වස්තුව	483
මහාභරණ වස්තුව	488
වෙළු සුමන වස්තුව	490
ඛඤ්ජදෙව වස්තුව	492
ඵුස්සදෙව වර්ගය	
ඵුස්සදෙව වස්තුව	494
ලභියසභ වස්තුව	497
දඨාසෙන වස්තුව	500
මහනෙල වස්තුව...	511
චූළතිස්ස වස්තුව...	516
සාලිරාජ වර්ගය	
සාලිරාජ වස්තුව...	520
නකුලං වස්තුව	531

Non-Commercial Distribution

	පිටුව
ශුඬාතිස්ස අමාත්‍ය වස්තුව	534
තිස්සා වස්තුව	536
චූලනාගථෙර වස්තුව	540
තම්බසුමන වර්ගය	
තම්බසුමන වස්තුව	544
චන්දුල පබ්බත වස්තුව	547
මෙසවණ්ණ වස්තුව	550
කාක වස්තුව	555
රියහල් වස්තුව	557
අභයථෙර වර්ගය	
අභයථෙර වස්තුව	570
ධම්මදින්නථෙර වස්තුව	574
ගාමිදරිකා වස්තුව	577
ධම්මාය වස්තුව	580
තිස්ථි සඩිකා වස්තුව	584
සංඝදත්ත වර්ගය	
සංඝදත්ත වස්තුව	590
රටපීක පූජක වස්තුව	594
නෙසාද වස්තුව	596
සිලුත්ත වස්තුව	601
හේමා වස්තුව	603
සිරිනාග වස්තුව	608
අම්බ අමාත්‍ය වස්තුව	612
කාණසිහාල වස්තුව	615
වානර වස්තුව	617
ජයම්පතිකා වස්තුව	620
නන්දිවාණිජ වස්තුව	631
දුතිය ජයම්පතිකා වස්තුව	639
රුක්ඛ දෙවතා වස්තුව	645
පණ්ඩරඞ්ග වස්තුව	648
දුබ්බිට්ඨි මහාතිස්ස වස්තුව	651
චූළගෙලල වස්තුව	654
තිස්සසාමණේර වස්තුව	670
ගොළ උපාසක වස්තුව	675
පුටභත්ත දයිකා වස්තුව	680
අඤ්ඤතර කුමාරිකා වස්තුව	683
තිස්ස නාග වස්තුව	687
මහල්ලිකා වස්තුව	691
පඤ්චසත භික්ඛු වස්තුව	693
දත්ත කුටුම්බික වස්තුව	696
මෙත්තෙය්‍ය වස්තුව	700
අනාගතවංශ දේශනාව	731
ගැටපදය	734

Non-Commercial Distribution

පෙරවදන

සද්ධර්මාලංකාරයේ මෙම සංස්කරණය සම්පාදනය කරන ලද්දේ ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂොපකාර සමාගම මගිනි. එම සමාගම මගින් දියත් කෙරෙන සම්භාව්‍ය ග්‍රන්ථ සංස්කරණය පිළිබඳ ව්‍යාපෘතිය යටතේ පළවන දෙවන ග්‍රන්ථය මෙය වේ.

ගිහි පැවිදි විද්වතුන්ගෙන් සැදුම්ලත් මණ්ඩලයක සහභාගිත්වයෙන් සැකසුණු මෙම කෘතිය ශාස්ත්‍රීය වශයෙන් බලන කල සංස්කරණ අඩු ලුහුඩුකම් මග හැරෙන ලෙස සම්පාදනය වූ අගනා කෘතියක් ලෙස සැලකිය හැකිය. එබැවින් උසස් අධ්‍යාපනය සඳහා සිංහල භාෂාව හා සාහිත්‍යය හදාරන සැමට බෙහෙවින් ප්‍රයෝජනවත් කෘතියක් බව සඳහන් කරනු කැමැත්තෙමි.

එම සමාගමේ ඉල්ලීම පරිදි මේ සද්කාර්යයට දයක වී මෙම මාහැඟි ග්‍රන්ථය මුද්‍රණය කිරීමට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට හැකිවීම අගය කොට සලකමි.

එම්. කේ. ජේ. ජ්. අල්විස්
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් හා
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්‍ෂ ජනරාල්.

1996. 02. 20 වන දින
බත්තරමුල්ල
ඉසුරුපාය
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ දීය.

Non-Commercial Distribution

සංඥාපනය

සද්ධර්මාලංකාරයෙහි මෙම සංස්කරණය සම්පාදනය වී ඇත්තේ ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂොපකාර සමාගමේ සම්භාව්‍ය ග්‍රන්ථ සංස්කරණ ව්‍යාපෘතිය යටතේ ය. සම්භාව්‍ය සාහිත්‍ය කෘතිවල ප්‍රාමාණික වූත් සමරූපතාවෙන් යුක්ත වූත් සංස්කරණ මාලාවක් ප්‍රකාශයට පත් කිරීමේ අවශ්‍යතාව සැලකූ මෙම සමාගම දැනට වසර කීපයකට උඩදී මෙම සම්භාව්‍ය ග්‍රන්ථ ව්‍යාපෘතිය ආරම්භ කළේය. මෙම ව්‍යාපෘතියේ පළමුවන පියවර වශයෙන් සද්ධර්මරත්නාවලිය සංස්කරණය කොට ප්‍රකාශයට පත් කරන ලදී. මෙම සද්ධර්මාලංකාර සංස්කරණය එම ව්‍යාපෘතියේ දෙවන පියවරයි. මෙම ග්‍රන්ථයේ දැනට දක්නට ලැබෙන සංස්කරණ බොහොමයක ශාස්ත්‍රීය විධි නියමයන් නොපිරිහෙලා අනුගමනය නොකරන ලද බවක් පෙනෙන්නට තිබීමත් දැනට මුද්‍රණය වී ඇති සංස්කරණවල පිටපත් ලබා ගැනීම අපහසු වීමත් නිසා මෙම ග්‍රන්ථය සංස්කරණය කිරීමට සමාගම විසින් තීරණය කරන ලදී. හැකිතාක් පුස්කොළ පිටපත් ලබාගෙන මුද්‍රිත සංස්කරණ ද පරිශීලනය කරමින් සම්මත ශාස්ත්‍රීය විධි නියමයන්ට අනුකූල වූ සංස්කරණයක් මුද්‍රණය කිරීම සමාගමේ අභිලාෂය විය. මෙම සංස්කරණය සම්පාදනය කිරීම සඳහා ප්‍රාචීන භාෂොපකාර සමාගමේ ගිහි පැවිදි පඬිවරුන්ගෙන් හා කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහලාංශයේ ආචාර්ය මණ්ඩලයෙන් ද සැදුම්ලත් සංස්කාරක මණ්ඩලයක් පත් කර ගන්නා ලදී. මෙම මණ්ඩලයේ අධ්‍යක්ෂ ධුරය දරන ලද්දේ මහාචාර්ය ඇම්. බී. ආරියපාල මහතා විසිනි. සංස්කරණ කාර්යයට සහභාගි වූ ගිහි පැවිදි භවතුන්ගේ නාම ලේඛනය මෙහි පහත දැක්වේ.

රාජකීය පණ්ඩිත පූජ්‍ය හොරණ වජිරඤාණ නාහිමිපාණන්වහන්සේ
රාජකීය පණ්ඩිත පූජ්‍ය බෙලිදෙණියේ සිරිධම්ම නාහිමිපාණන්වහන්සේ
රාජකීය පණ්ඩිත පූජ්‍ය රත්කැරව්වේ විමලධම්ම නාහිමිපාණන්වහන්සේ
රාජකීය පණ්ඩිත පූජ්‍ය රත්ගම සුමනනන්ද නාහිමිපාණන්වහන්සේ
රාජකීය පණ්ඩිත පූජ්‍ය පත්බේරියේ විමලඤාන නාහිමිපාණන්වහන්සේ
ශාස්ත්‍රපති පූජ්‍ය විගමුවේ විමලජෝති හිමිපාණන් වහන්සේ
මහාචාර්ය ඇම්. බී. ආරියපාල මහතා
මහාචාර්ය ජී. හේමපාල විජයවර්ධන මහතා

Non-Commercial Distribution

මහාචාර්ය ජේ. බී. දිසානායක මහතා
මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මිය
මහාචාර්ය තිස්ස ජයවර්ධන මහතා
මහාචාර්ය ඒ. බී. දිසානායක මහතා
මහාචාර්ය රෝහිණී පරණවිතාන මහත්මිය
මහාචාර්ය අනුර වික්‍රමසිංහ මහතා
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සරත් විජේසූරිය මහතා
රාජකීය පණ්ඩිත ආචාර්ය ආනන්ද තිස්සකුමාර මහතා
කථිකාචාර්ය ප්‍රේමසිරි නාගසිංහ මහතා
රාජකීය පණ්ඩිත රාජා දිසානායක මහතා
රාජකීය පණ්ඩිත ඩී. එම්. කරපුටුගල මහතා
ප්‍රේමදාස රණසිංහ මහතා
නන්දන ජයකොඩි මහතා
ජනහිත විජයබණ්ඩාර මහතා
ලයනල් ද සිල්වා මහතා
පියසිරි නාගහවත්ත මහතා

මෙම සද්ධර්මාලංකාර සංස්කරණය සඳහා විවිධ ප්‍රදේශවලින් ලබා ගත් පුස්කොළ පිටපත් 12 ක් ද මුද්‍රිත සංස්කරණ 06 ක් ද උපයෝගී කොට ගන්නා ලදී. එම පුස්කොළ පිටපත් හා මුද්‍රිත සංස්කරණ පිළිබඳ විස්තර ද අධෝ ලිපිවල එම පොත් හැඳින්වීම සඳහා යොදා ඇති සංකේත ද පහත දැක්වේ.

පුස්කොළ පිටපත් : -

A - බලපිටියේ වැලිතර අම්බරුක්ඛාරාම විහාරයට අයත් පුස්කොළ පිටපත. මෙය අසම්පූර්ණ පිටපතකි. මහාහරණ වස්තුවේ සිට චූලගල්ල වස්තුවේ අවසානය තෙක් කොටස අඩු ය.

B - හඟුරන්කෙත පොත්ගුල් විහාරයට අයිති පිටපතකි. අසම්පූර්ණ පිටපතකි. සිරිනාග වර්ගය හා නන්දිරාජ වර්ගය යන කොටස් දෙක මෙහි දක්නට නැත.

C - මිරිස්සේ සිරි සුනන්ද පිරිවෙන සතු පිටපතකි. මෙය සම්පූර්ණ පිටපතකි.

D - ගෙලිඔය, තෙළඹුගල නිග්‍රොධඛෙත්ත පිරිවෙනෙන් ලබා ගත් පිටපතකි. මෙය සම්පූර්ණ පිටපතකි.

Non-Commercial Distribution

E - ගම්පොල බෝවල රජමහා විහාරය සතු පිටපතකි. සම්පූර්ණ පිටපතකි. මැනවින් ආරක්ෂා වී ඇත.

F - මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන සතු පිටපතකි. අසම්පූර්ණ පිටපතකි. අගින් විශාල කොටසක ඌනතාවක් ඇත. නෙහාතික වර්ගයෙහි පළමුවන නෙහාතික වස්තුවෙන් පිටපත අවසන් වේ.

G - හාතාගල සුමංගල පිරිවෙනෙන් ලබා ගත් පිටපතකි. මෙය ද අසම්පූර්ණ පිටපතකි. අගින් සුළු කොටසක ඌනතාවක් ඇත. ග්‍රන්ථයේ අවසාන කථා වස්තුව වන තිස්සනාග වර්ගයේ මෛත්‍රෙය වස්තුවේ මැද භාගයෙන් පිටපත අවසන් වේ.

H - අඟුනුකොළ පැළැස්ස අලුත්වැව පුරාණ විහාරය සතු පිටපතකි. මෙය සම්පූර්ණ පිටපතකි.

I - දොඩන්දූවේ, පටුවත, මොරකොළ සිරි ගංගාරාම මහා විහාරය සතු පිටපතකි. මෙය ද අසම්පූර්ණයි. ග්‍රන්ථාරම්භයෙහි පත් ඉරුවක ඌනතාවක් පෙනේ. අගින් ද විශාල කොටසක ඌනතාවක් පෙනේ. පිටපත අවසාන වන්නේ මහාමණ්ඩාතු වර්ගයේ පළමුවන මහාමණ්ඩාතු වස්තුවෙනි.

J - බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලයේ හියු නෙවිල් පුස්කොළ පොත් සංචිතයෙන් ලබා ගත් පිටපතකි. එහි මෙම පිටපතේ අංකය වන්නේ Or. 6603 (38) ය. සංස්කරණය සඳහා භාවිත කරන ලද්දේ පුස්කොළ පිටපතින් ලබා ගන්නා ලද ඡායා පිටපතකි. මෙය ද අසම්පූර්ණ පිටපතකි. එහෙත් අඩු වී ඇත්තේ ග්‍රන්ථාවසානයේ පත් ඉරු කීපයක් පමණි. එනම්, මෛත්‍රෙය වස්තුවේ මැද භාගයේ පටන් ග්‍රන්ථාවසානය දක්වා කොටස ය. ලිපි දෝෂ සහ අක්ෂර වින්‍යාසය පිළිබඳ දෝෂ බෙහෙවින් අඩු මෙම පිටපත සංස්කරණයේ දී වඩාත් ප්‍රාමාණික සේ සලකන ලදී.

K - බම්බලපිටියේ වජිරාරාමයෙන් ලබා ගන්නා ලද පිටපතකි. මෙය ද අසම්පූර්ණ ය. නෙහාතික වර්ගයේ දෙවන පුත්‍ර වස්තුව අවසානයේ සිට සාකවර්ණ වර්ගයේ පුරනිමල වස්තුවේ මැද කොටස දක්වා වූ කොටස නැත. බෙහෙවින් දිරා යාම හා කාවුන් විසින් කා දමනු ලැබීම නිසා මෙම පිටපත කියවීම පවා ඉතා දුෂ්කර විය. L පිටපත හා මෙය ද එක ම මුල් පිටපතකින් පිටපත් කර ගන්නා ලද බවක් පෙනේ. මෙහි අක්ෂර වින්‍යාසය සතුටුදායක ව පැවතිණ.

Non-Commercial Distribution

L - බම්බලපිටියේ වජිරාරාමයෙන් ලබා ගන්නා ලද සම්පූර්ණ පිටපතකි. අග කොටසේ පත් ඉරුවල දිරා ගිය ස්වභාවයක් දක්නට ලැබිණ. අන්තිම පත් ඉරුව කළු මැද නොමැත. මෙහි අක්ෂර වින්‍යාසය දුර්වලයි. පිටපත් කිරීමේදී තැන් තැන්වලින් වචන, වාක්‍ය කොටස් හා වාක්‍ය අත්හැර දමා තිබේ. මෙය පැලෑනේ වජිරඥාන නාහිමියන්ට ගාල්ලේ පෙට්ටිගල වත්තේ ඒ. සී. එස්. ගුණරත්න මුහන්දිරම් රාළහාමි විසින් 1914.11.08 දින පූජා කරන ලද බවක් කම්බයේ සඳහන් ව ඇත.

මුද්‍රිත සංස්කරණ

ක - සද්ධර්මාලංකාරය, කළුතර සාරානන්ද හිමියන්ගේ සංස්කරණය, කොළඹ - 1928.

කි - සද්ධර්මාලංකාරය, කිරිඇල්ලේ ඥාණවිමල හිමියන්ගේ සංස්කරණය, කොළඹ - 1954.

ඥා - සද්ධර්මාලංකාරය, ඥානේශ්වර හිමියන්ගේ සංස්කරණය, කොළඹ - 1914.

බෙ - සද්ධර්මාලංකාරය, බෙන්තර ශ්‍රද්ධාතිෂ්‍ය හිමියන්ගේ සංස්කරණය, කොළඹ - 1935.

ම - සද්ධර්මාලංකාරය, මකුළුදූවේ පියරතන හිමියන්ගේ සංස්කරණය, කොළඹ - 1971.

මෙම මුද්‍රිත සංස්කරණ හැරුණු විට මහාචාර්ය පුංචිබණ්ඩාර සන්නස්ගල මහතා විසින් ආචාර්ය උපාධිය සඳහා සංස්කරණය කරන ලද මෙතෙක් අමුද්‍රිත සද්ධර්මාලංකාර සංස්කරණය (ස) ද පරිශීලනය කරන ලදී.

කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහලාංශයේදී රැස්වූ සංස්කාරක මණ්ඩලය විසින් පුස්කොළ පිටපත් හා මුද්‍රිත සංස්කරණ සියල්ල කියවා බලා පාඨාන්තර සංසන්දනය කොට සාකච්ඡා කිරීමෙන් පසු පෙළට තෝරා ගන්නා පාඨය නිශ්චය කර ගන්නා ලදී. මේ සඳහා අවශ්‍ය අවස්ථාහිදී පාලි රසවාහිනිය, ජාතකට්ඨ කථාව, සහස්සවත්ථුප්පකරණය හා මහාවංශය ද පරිශීලනය කරන ලද්දේය.

මෙම සංස්කරණයේදී ද හැම විට ම ප්‍රමුඛත්වයෙන් සලකන ලද්දේ පුස්කොළ පිටපත් ය. මුද්‍රිත පොත්වල සංස්කාරකවරුන් පිටපත්වල ප්‍රතිෂ්ඨාව නොමැති ව පාඨ සංශෝධනය කර ඇති බව පෙනී ගිය ස්ථානවලදී පුස්කොළ පිටපත්වලින්

Non-Commercial Distribution

ලැබෙන ප්‍රතිෂ්ඨාව මත පෙළ තෝරා ගන්නා ලදී. පැහැදිලි වශයෙන් ම ලිපි දෝෂ බව පෙනී ගිය පිටපත්වල එන පාඨාන්තර අධෝලිපි වශයෙන් දක්වා ඇත. කිසියම් පාඨයක් ඇතැම් පිටපත්වල නොමැති බව දැක්වීම සඳහා අධෝ ලිපිවල එම පාඨය ඉදිරියෙන් (නැත) යන්න වරහන් තුළ දක්වා ඉන් පසු එයේ නොමැති පිටපත් ආදිය සංකේත මගින් සටහන් කොට ඇත. කිසියම් ප්‍රබල හේතුවක් නිසා කිසිදු පුස්කොළ පිටපතක නොපෙනෙන අක්ෂරයක් හෝ පාඨයක් පෙළට තෝරා ගනු ලැබූ විට එම අක්ෂරය හෝ පාඨය පෙළෙහි හතරැස් වරහන් තුළ දක්වා ඇත. බොහෝ විට මෙම ක්‍රමය අනුගමනය කර ඇත්තේ පුස්කොළ පිටපත් බෙහෙවින් දූෂිත ව ඇති බව පෙනී ගිය විටදී ය. මෙබඳු තන්හිදී මුද්‍රිත සංස්කරණවල එන පාඨ විශේෂ අවධානයට ලක්විය. රසවාහිනිය, සහස්සවත්ථුප්පකරණය, මහාවංශය, ජාතකට්ඨකථාවේ නිධාන කථා කොටස යන මෙකී පාලි ග්‍රන්ථ ද අවස්ථානුරූප පරිදි පාඨ ශෝධනය සඳහා උපකාර කොට ගන්නා ලදී.

අප විසින් භාවිත කරන ලද පිටපත් අතුරින් වඩාත් ම විශ්වසනීය පිටපත හැටියට පෙනී ගියේ J පිටපතයි. මෙහි ලිපි දෝෂ බෙහෙවින් අඩු බව පෙනී ගිය අතර පෙළට තෝරා ගැනීම වඩාත් ම යෝග්‍ය සේ පෙනී ගියේ ද මෙහි ඇතුළත් පාඨයි. A පිටපත ද මෙයට බෙහෙවින් සමාන බවක් දක්නට ලැබේ. මෙම පිටපත් දෙකේ ඇතුළත් පාඨ බොහෝ සෙයින් බෙන්තර ශ්‍රද්ධාතිෂ්‍ය සංස්කරණය සමග ද සමාන බවක් පෙනී ගොස් ඇත. ඉතිරි පිටපත් අතුරින් B, G, H යන පිටපත් තුනේ පාඨ බොහෝ සෙයින් සැසඳෙන අතර එම පිටපත් තුන එක මුල් පිටපතකින් පිටපත් කර ගත් සේ අනුමාන කළ හැකිය. ඇතැම් තැනක දී C, D, හා E පිටපත් ද පූර්වෝක්ත පිටපත් තුන හා සමග සැසඳෙන බවක් පෙනේ. K හා L යන පිටපත් දෙක බෙහෙවින් සමානකමක් දරන අතර මේ දෙක එක මුල් පිටපතකින් පිටපත් කරන ලද බව පැහැදිලි ය. අනෙක් පිටපත් හා සසඳන විට මේ දෙකෙහි විසදෘශ පාඨ දක්නට ඇතත් ලිපි දෝෂවලින් ගහන බැවින් ප්‍රාමාණික සේ සැලකිය නොහැකි ය. මේ පිටපත් දෙක බෙහෙවින් දිරා ගොස් තිබීම නිසා කියවා ගැනීම ද අපහසු විය. මුද්‍රිත සංස්කරණ අතුරින් වඩාත් ම ප්‍රාමාණික සේ පෙනී ගියේ බෙන්තර ශ්‍රද්ධාතිෂ්‍ය හිමියන්ගේ සංස්කරණයයි. අපගේ මෙම සංස්කරණයෙහි පද බෙදීමේ දී සද්ධර්මරත්නාවලිය සංස්කරණයේ දී තීරණය කර ගනු ලැබූ ක්‍රමය ම මෙහි දී ද අනුගමනය කරන ලදී. මෙහි දී අර්ථයේ පැහැදිලි බව හා ඒකීයතාව කෙරෙහි විශේෂ අවධානය යොමු විය.

සංස්කරණය සඳහා භාවිත කරන ලද පුස්කොළ පිටපත් සපයා දීමෙන් ද එම පිටපත් සංස්කරණ කාර්යය අවසන් වන තෙක් තබා ගැනීමට අවකාශ ලබා දීමෙන් ද මෙම ශාස්ත්‍රීය කර්තව්‍යයට උපකාර කළ ඉහත සඳහන් පුස්කොළ පිටපත් අයිති ඒ ඒ විහාරස්ථානාධිපතීන් වහන්සේලා වෙත සමාගමේ විශේෂ කෘතඥතාව පළ කළ යුතුය. දුර්ලභ මුද්‍රිත පිටපතක් ලබා දීමෙන් ද පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේ ඇති ග්‍රන්ථ පරිශීලනය කිරීමට අවශ්‍ය සහාය ලබා දීමෙන් ද පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිංහලාංශයේ මහාචාර්ය පී. බී. මීගස්කුඹුර මහතා

Non-Commercial Distribution

මෙම සංස්කරණ කාර්යයට විශේෂ අනුග්‍රහය දැක්විය. කොළඹ විශ්වවිද්‍යාලයීය පුස්තකාලයෙන් අවශ්‍ය පොත් පත් ලබා ගැනීමට එහි පුස්තකාලයාධිපතිනි සුමනා ජයසූරිය මහත්මිය විශේෂයෙන් උපකාරී වූවාය. කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහලාංශයේ මහාචාර්ය රෝහිණී පරණවිතාන මහත්මිය විසින් ද දුර්ලභ මුද්‍රිත සංස්කරණයක් සපයා දෙන ලදී. බ්‍රිතාන්‍ය කෞතුකාගාර පුස්තකාලයේ සංචිතයට අයත් පුස්කොල පිටපතේ ඡායා පිටපත ලබාදෙන ලද්දේ එහි සේවයේ නියුක්ත කේ.ඩී. සෝමදස මහතා විසිනි ඒ සියලු මහත්ම මහත්මීන්ට ප්‍රාචීන භාෂොපකාර සමාගමේ විශේෂ ස්තුතිය හිමි වේ.

ප්‍රස්තාවනාවේ මුල් කොටස එනම් ලංකාදීපොත්පත්ති දක්වා වූ කොටස සම්පාදනය කරන ලද්දේ මහාචාර්ය රෝහිණී පරණවිතාන මහත්මිය විසිනි. එහි අපර කොටස එනම්, ලංකාද්වීපෝත්පත්ති කථාවේ සිට ඉදිරියට පූජ්‍යපාද රාජකීය පණ්ඩිත ආචාර්ය හොරණ වජිරඤාණ නායක ස්ථවිරපාදයන් වහන්සේ විසින් සම්පාදිතයි. අවසානයෙහි යොදා ඇති ගැටපදය මහාචාර්ය ජී. හේමපාල මහතා සහ ප්‍රේමසිරි නාගසිංහ මහතා විසින් පිළියෙල කෙරිණි.

පුස්කොළ පිටපත්වලින් පාඨාන්තර සටහන් කර ගැනීමෙන් අනතුරු ව පෙළ සකස් කිරීම සඳහා ප්‍රාමාණික පාඨ නිශ්චය කිරීමේ කාර්යය මහාචාර්ය ඇම්. බී. ආරියපාල මහතා ප්‍රමුඛ මණ්ඩලයක් විසින් සිදු කරන ලදී. එම මණ්ඩලයට පූජ්‍යපාද බෙලිදෙණියේ සිරිධම්ම නායක ස්වාමීන්වහන්සේ, මහාචාර්ය ජී. හේමපාල විජයවර්ධන මහතා, මහාචාර්ය රෝහිණී පරණවිතාන මහත්මිය සහ ප්‍රේමසිරි නාගසිංහ මහතා ද අයත් වූහ. එම භවතුන්ට ද සමාගමේ කෘතඥතාව හිමි වේ.

මෙම සංස්කරණ කාර්යය කොළඹ විශ්වවිද්‍යාලයේ සිංහලාංශයේදී පැවැත්වීමට පරිපාලන කටයුතු සංවිධානය කරන ලද්දේ එවකට අංශාධිපති ව සිටි මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මිය විසිනි. ඒ මහත්මියගේ බලවත් පරිශ්‍රමය මේ කටයුතු සාර්ථක කර ගැනීමට බෙහෙවින් උපකාරී විය. එසේ ම ප්‍රේමසිරි නාගසිංහ මහතා අඛණ්ඩ ව මෙම සංස්කරණ කටයුතු සංවිධානයෙහි ලා දැක්වූ උද්‍යොගය බෙහෙවින් අගය කටයුතුය.

අප සමාගමේ සියලු කටයුතුවලදී මෙන් ම මෙම ග්‍රන්ථ සංස්කරණ ව්‍යාපෘතිය ද අගයමින් නිරන්තර ව අපට සහයෝගය දක්වන අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය රිචර්ඩ් පතිරණ මැති තුමන්ට ද අපගේ කෘතඥතාව හිමිවෙයි.

මෙම සංස්කරණයෙහි කටයුතු ආරම්භ වූයේ එම්.ඩී.ඩී. පීරිස් මහතා අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සහ ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂොපකාර සමාගමේ සභාපති ව සිටි අවදියෙහිදී ය. මෙහි ලා එතුමන් දුන් සහාය අගය කළ යුතුය. ඒ සමග ම මෙම කාර්යයෙහි ලා අනුග්‍රහ දක්වූ අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරුන් සහ සමාගමේ සභාපතිවරුන් ව සිටි එන්.වී.කේ.කේ. වේරගොඩ, ඒ. ඇන්ඩෘ ද සිල්වා යන මහත්වරුන්ට ද අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ වර්තමාන ලේකම් හා අප සමාගමේ සභාපති ආර්.පී. ගුණවර්ධ මහතාට ද අපගේ ස්තුතිය හිමි වෙයි.

Non-Commercial Distribution

ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ ලේකම් ධුරය දරන බස්නාහිර පළාත් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යංශයේ අතිරේක ලේකම් සිරිසේන විතානගේ මහතා මෙම කාර්යය හුදෙක් නිල කටයුත්තක් පමණක් සේ නොසලකා එය සඵල කර ගැනීමට මහත් උනන්දුවෙන් හා කැපවීමෙන් නන් අයුරින් සහයෝගය දැක්වූ බව මෙහි ලා විශේෂයෙන් ස්තුති පූර්වක ව සඳහන් කළ මනා ය.

ප්‍රමාණයෙන් විශාල වූ මෙම ග්‍රන්ථය මුද්‍රණය කිරීම සඳහා ඉදිරිපත් වීම පිළිබඳ ව අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් හා නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් එම්. කේ. ජේ. ඒ. අල්විස් මහතා ප්‍රධාන එම දෙපාර්තමේන්තුවට අපගේ ස්තුතිය හිමි වෙයි.

මෙම සංස්කරණයේ මුද්‍රණ කටයුතු ඉතා ශෝභන ලෙස පරීක්ෂාකාරී ව නිම කර දුන් කොළඹ 10, සමයවර්ධන මුද්‍රණ ආයතනයේ අධිපති ආරියදස වීරමන් මහතා ප්‍රමුඛ සියලු ම නිලධාරී මහතුන්ට හා සේවක මහතුන්ට ද විශේෂ ස්තුතිය පිරිනැමේ.

මහාචාර්ය ඇම්. බී. ආරියපාල
මහාචාර්ය ඒ. හේමපාල විජයවර්ධන

Non-Commercial Distribution

සද්ධර්මාලංකාරය ලියන ලද්දේ පාලිභාෂාවෙන් තිබූ සද්ධර්මය ඒ බස නොහදාළ සාධු ජනයන්ට ද කියවන්ට සලස්වා ඔවුන් තුළ ශ්‍රද්ධාබුද්ධි වර්ධනය කිරීමේ ප්‍රයත්නයක් ලෙස ය.

'ලෝවැඩ පිණිස බුදුන් විසින් වදාරණ ලද්දාවූ සද්ධර්මය මාගධික භාෂාවෙහි නොහසළ සිංහල ද්වීපවාසීන්ට නොදැනෙන හෙයින් හෙළු බසින් පෙරළා ලඞ්කාද්වීපවාසී වූ සාධුජනයන්ගේ සිත් පහදවමින් ලෝවැඩ වඩා බොහෝ කාලයක් පවත්නා පරිද්දෙන් ධර්මව්‍යාඛ්‍යානයක් කළ මැනවැ යි මෙසේ කරුණා පුරස්සර නිශ්ශරණාධ්‍යාශයෙන් යෙදී පරවැඩෙහි තත්පර ව සියස බ්‍රහ්මචාරී වූ ප්‍රියදර්ශී නම් බුද්ධපුත්‍රයාණන් විසින් කරන ලද ආරාධනාව හා

භාසයෙ ජෝතයෙ ධම්මං - පග්ගණ්හෙ ඉසිනං ධජං
සුභාසිතං ධජා ඉසයො - ධම්මොහි ඉසිනං ධජො

යන මේ බුද්ධානුශාසනාව පිළිගෙන සාධුජනයන්ගේ සිත් පහදවා ශ්‍රද්ධා බුද්ධි වර්ධනය කෙරෙමින් ඔවුන්ට ත්‍රිවිධ සම්පත් සාදා දෙන පිණිස එක්සිය පණසක් පමණ වස්තු කථාවෙන් අලංකෘත කොට සරහා සද්ධර්මාලංකාර නම් ධර්මව්‍යාඛ්‍යානයක් දක්වමි.'

ජනයාගේ සිත් යහමගට යොමු කරවන අවියෙන් කථා කී පැරණි ගත්කතුවරයන්ගේ සම්ප්‍රදායට මේ කතුවරයා ද අනුකූල වූ බව පැහැදිලි කරුණකි. මේ ග්‍රන්ථය ගඩලාදෙණි නම් විහාරයෙහි විසූ දේවරක්ෂිත විජයබාහු ධර්මකීර්ති නම් සංඝරාජතුමකු විසින් රචනා කරන ලද බව ග්‍රන්ථාවසානයේ දැක්වෙන ගාථා පඞ්ක්තියෙහි සඳහන් වේ.

සද්ධම්මදාන ධම්මසවණො ධම්මෙන ඤත්වා ඵලං
ධම්මෙ වත්තික ධම්ම කිත්තික මහා සංඝස්ස රාජා සදා
සාධෙතුං සහිතං තථා පරහිතං ආබුද්ධභාවා මහා
සද්ධම්මාදිපදෙන යුත්ත රචයී ලංකාර ධම්මං ඉමං

කතෘ හිමියන් ගම්පොළ රාජධානි කාලයේ මුල් අවධියේ ගඩලාදෙණියේ වැඩ සිටි ප්‍රථම සංඝරාජ වූ ශීලවංශ ධර්මකීර්ති හිමියන්ගේ ශිෂ්‍යයෙක් විය. ශීලවංශ ධර්මකීර්ති හිමියන් විසින් ද පාරමී සතකය හා ජනානුරාගචරිතය නමින් ග්‍රන්ථ ද්වයයක් රචනා කරනු ලැබිණ. ශීලවංශ ධර්මකීර්ති සංඝරාජ හිමි ධර්මකීර්ති පරපුරේ මහාසාමියා ලෙස ද ප්‍රසිද්ධ ය. කලක් දඹදිව වැඩ සිටි එතුමා අමරාවතියේ ධාන්‍යකටකයෙහි විහාරයක් කරවූ බව ඓතිහාසික මූලාශ්‍රවලින් පැහැදිලි වේ. පසුව ලංකාවට වැඩි එතුමන් පළමු ව අලව්තුරේ විහාරයක වැඩ විසූ බවත් ගම්පොළ මාලතීමාල නම් ගල් අතළ මහා ආශ්‍රමයක් කරවා එහි වැඩ සිටි බවත් අවසාන කාලයේදී ගඩලාදෙණි විහාරය කරවා අවුරුදු එකසිය දහයක් ආයු වළඳමින් එහි ද වැඩ සිටි බවත් සද්ධර්මරත්නාකරයේ සඳහන් වේ. එතුමන් අලව්තුරේ වැඩ සිටි

Non-Commercial Distribution

කාලයේදී පාරමී සතකයත් මාලතීමාලා ආශ්‍රමයෙහි වැඩ සිටියදී ජනානුරාගචරිතයත් කළ බව මූලාශ්‍රයන්හි සඳහන් වේ. මේ සටහන්වලින් පැහැදිලි වන්නේ සද්ධර්මාලංකාරය ලියූ ධර්මකීර්ති මාහිමියන්ගේ ආචාර්යවරයා විශාල ශාසන සේවයක් මෙන් ම සාහිත්‍ය සේවාවක් ද ඉටු කළ භික්ෂුවක බවයි.

සද්ධර්මාලංකාරය රචනා කළ ධර්මකීර්ති හිමි ද සිය ආචාර්යවරයාගේ පිය සටහන් අනුව යමින් ශාසනයෙහි ද භාෂා ශාස්ත්‍රයෙහි ද දියුණුවට කැප වී කටයුතු කළේය. මේ හිමියන් පිළිබඳ තොරතුරු සද්ධර්මාලංකාරයෙන් ද සද්ධර්මරත්නාකරයෙන් ද හෙළිදරව් වේ. එතුමා නිකායසංග්‍රහය, බාලාවතාර ගඩලාදෙණි සන්නය, සද්ධර්මාලංකාරය හා ජිනබෝධාවලිය යන ග්‍රන්ථවල කතුවරයා වේ. එහිමියන් විසින් රචිත වෙනත් කෘති ගැන නිකාය සංග්‍රහයේ සඳහන් නොවන බැවින් එය එතුමන්ගේ ප්‍රථම කෘතිය ලෙස සැලකිය යුතු වේ. සද්ධර්මාලංකාරයේ අවසානයේ දැක්වෙන ගාථාවන්හි සියලු ම පොත්වල නම් සඳහන් වන බැවින් එතුමන් විසින් ලියන ලද ග්‍රන්ථමාලාවේ අවසාන කෘතිය එය විය යුතු ය. ප්‍රියදර්ශී නම් සථවිර කෙනෙකුගේ ඇරයුම පරිදි පොදු ජනයාගේ හිත සුව පිණිස මෙය ලියූ එතුමෝ ඒ ලිවීමේ පුණ්‍ය මහිමයෙන් ලොවුතුරා බුද්ධත්වය ද ප්‍රාර්ථනා කළෝ ය. ධර්මකීර්ති පරපුරේ භික්ෂූන් වහන්සේලා විසින් ගම්පොළ කාලයේ ඇති කරන ලද ශාසනික හා ශාස්ත්‍රීය දියුණුව කෝට්ටේ රාජධානි අවධිය දක්වා ම පැතිරී පැවතියේය. සද්ධර්මරත්නාකර කර්තෘ සද්ධර්ම විමලකීර්ති හිමි ද්විතීය ධර්මකීර්ති හිමිපාණන්ගේ ශිෂ්‍යයෙකි. සද්ධර්මරත්නාකරය ද සද්ධර්මාලංකාරය අනුව යමින් ශ්‍රද්ධාවෙන් ආර්ද්‍ර වූ සිතැති ශ්‍රාවක ජනතාව වෙනුවෙන් රචනා කරන ලද ධර්ම ග්‍රන්ථයකි.

සද්ධර්මාලංකාරය සූවිසි වර්ගයකට අයත් කථා සමුච්චයකි. මේ කෘතියෙන් තමා කථා 155 ක් ඉදිරිපත් කරන බව ග්‍රන්ථයේ මුල් කොටසේදී කතුවරයා සඳහනක් කර ඇතත් පොතේ අවසානයේ සඳහන් කර ඇත්තේ මේ කෘතියෙහි කථා එක්සියසූසාලිසක් දක්වන බවයි. මුලින් කථා 155 ක් ගැන පවසන ලද්දේ මුල් තුන් වර්ගයේ අන්තර්ගත කුඩා කථා ද එක් කර ගැනීමෙන් විය යුතු ය. කර්තෘසන්දර්ශිත ගාථාවල කතුතුමන් සංඝරාජවරයකු බව සඳහන් වන බැවින් සද්ධර්මාලංකාරය රචනා කරන ලද්දේ ගත්කතුහිමියන් සංඝරාජ පදවියෙන් පිදුම් ලැබුවාට පසුව බව පැහැදිලි වේ. එතුමන් රචනා කළ අවසාන ග්‍රන්ථය ද මෙය වේ. මේ හිමියන් ම ලියූ නිකාය සංග්‍රහයෙහි බුද්ධ වර්ෂ 1941 දී තමන්වහන්සේගේ ප්‍රධානත්වයෙන් කරන ලද ශාසන ශුද්ධියක් ගැන සඳහන් වේ. ඒ අනුව සද්ධර්මාලංකාරය නිසැකයෙන් ම බුද්ධ වර්ෂ 1941 ට පසු ලියන ලද්දක් බව තීරණය කළ හැකිය. ස්ථිර වශයෙන් එක් වර්ෂයක් සඳහන් කළ නොහැකි වුවත් ගම්පළ රාජධානි සමයේ අවසාන භාගයේ මෙය රචනා වූ බව පිළිගත හැකිය.

සද්ධර්මාලංකාරය ලියන ලද්දේ පාළි භාෂාවේ නොහසළ දනන් අරමුණු කරගෙන ය. මාගධික භාෂාවේ නොහසළ අයට තමන් මේ ග්‍රන්ථය කරන බව සඳහන් කර ඇති හෙයින් නිසැක ව ම මාගධික භාෂාවෙන් මුලින් ලියන ලද යම්

Non-Commercial Distribution

කෘතියක් කතුවරයාට ආශ්‍රය වූ බව පැහැදිලි වෙතත් ඊට ආශ්‍රය වූයේ කිනම් මාගධික ග්‍රන්ථයක ඇතුළත් කවර ධර්මකථාවක් ද යන්න සඳහන් වී නැත. බුදුන් විසින් වදාරන ලද මාගධික භාෂාවෙන් පවත්නා සද්ධර්මය ආශ්‍රය කළ බව කතුවරයා පවසා ඇත. කථාවල දැක්වෙන ගාථාවලට පූර්වයෙන් සැමවිට "බුදුන් විසින් වදාරන ලදි". "එහෙයින් කියන ලදී." යන යෙදුම් සඳහන් වී ඇති නිසා ඒ පාළි ගාථා, කථා ලබාගත් මූලාශ්‍රයට අමතර ග්‍රන්ථයකින් ලබා ගත් බව අවබෝධ වේ.

සද්ධර්මාලංකාර කතුවරයා වැඩි වශයෙන් ආශ්‍රය කළේ පාලියෙන් රචිත රසවාහිනියයි. මෙය කවර කලක රචනා කරන ලද්දක් දැ යි තීරණය කිරීම අපහසු ය. පොතේ ද එය රචනා වූ වකවානුවක් ගැන සඳහන් නොවන බැවිනි. පොතේ කතුවරයා අරඤ්ඤායතන ආනන්ද නම් හිමි කෙනෙකුන්ගේ ශිෂ්‍ය වේදේහ නමැති පැවිදිවරයකු බව පොතේ සඳහන් වේ. සීහල සද්දලක්ඛණ නම් ග්‍රන්ථය ද, සමන්තකූට වර්ණනාව ද මේ හිමියන් විසින් ලියන ලද අනෙක් ග්‍රන්ථ වේ. රසවාහිනී කතුවරයා දඹදිව සිදු වූ කථා හා ලංකාවේ සිදු වූ කථා මගින් දන් දීම්, සිල් රැකීම්, බණ ඇසීම් ආදී සත්ක්‍රියාවන්හි අනුසස් ඉදිරිපත් කෙරෙන බැවින් පොදු ජනයාගේ ජීවිතය යහපත් මාවතකට යොමු කිරීම සඳහා එවැනි කථා සිංහලෙන් යළි කීමෙන් විපුල ඵල අත්වනු ඇතැයි කතුවරයා බලාපොරොත්තු වීයැ යි සිතිය හැකිය. රසවාහිනියේ කථා 103 කි. ඉන් 40 ක් දඹදිව පසුබිම් කරගත් කථා ය. 63 ක් ලංකා කථා ය. වර්ගයක කථා 10 බැගින් අඩංගු වන සේ වර්ග 4 ක් දඹදිව කථා ද එසේ ම වර්ග 10 ක් ලංකා කථා ද අවසාන කථා 3 ක් වෙන ම ද දක්වා ඇත. මේ දඹදිව කථා වැඩි කොටසක් බුදුන් පිරිනිවීමෙන් පසු සිද්ධ වීම විශේෂ කරුණක් ලෙස සැලකිය හැකිය.

රසවාහිනී ග්‍රන්ථයේ එන බොහෝ කථා කෙටියෙන් අඩංගු වූ සහස්සවත්ථු නම් පාළි ග්‍රන්ථයක් වේ. රසවාහිනිය ලිවීමේදී ඒ කතුවරයා මේ ග්‍රන්ථය ඇසුරු කරන්ට ඇත. සහස්සවත්ථු යන්නෙහි අදහස කථා දහසක් යන්න නොවේ. සහස්ස කථා යනු සතුට සහිත කථා යන්නයි. මෙහි කථා 101 ක් ඇත. මෙහි කථා වර්ග දහයකට බෙදා දක්වා අටවන වර්ගයේ කථා එකොළොසක් ද අනෙක් වර්ගවල කථා දහය බැගින් ද දක්වා ඇත. රසවාහිනියේ මෙන් මෙහි ලංකා කථා හා දඹදිව කථා වෙන් වෙන් ව දක්වා නැත. මේ පොත් දෙක ම සද්ධර්මාලංකාර කතුවරයා ආශ්‍රය කර ඇති බව පැහැදිලි කරුණකි. එහෙත් වඩා සමීප වී ඇත්තේ රසවාහිනී ග්‍රන්ථයට යි. රසවාහිනියේ කථා දක්වන අනු පිළිවෙළ සද්ධර්මාලංකාරයේ නොඑයි. සද්ධර්මාලංකාර කතුවරයා කථා සංග්‍රහ කළේ එතුමාගේ රුචියට අනුකූලවයි. කථා සංග්‍රහ කිරීමේදී කථාවල අන්තර්ගත කරුණු ගැන අවධානය යොමු කළ බව පෙනේ. උදාහරණ වශයෙන් දුදනගති කියවෙන කථා එකට ම දක්වා ඇත. සද්ධර්මාලංකාරය රසවාහිනියේ පරිවර්තනයක් නොවේ. වෙනත්

Non-Commercial Distribution

මූලාශ්‍රවලින් ද කථා තෝරාගත් සද්ධර්මාලංකාරය කතුවරයා කථා සංග්‍රහ කිරීමේ දී ද කථා ගෙතීමේ දී ද සිය අභිමතාර්ථයට අනුරූප වී ඇත.

පළමුවෙන් ම දැක්වෙන ධර්මසංග්‍රහ වර්ගය වෙසෙසින් සකස් කර ඇත්තේ ධර්මයට හා සංඝයාට ගෞරව කිරීමෙන් ලැබෙන ආනිසංස හුවා දැක්වීමේ පරමාර්ථයෙනි. ශීලවන්තයන්ට දෙන දානය මහත්ඵල මහානිසංස ගෙන දෙන බවත් ඒ දානයටත් වඩා නොකොඳුරා නොකතනා අනාවිහිත නොවී ධර්මශ්‍රවණය කිරීම වඩාත් ආනිසංසකර බවත් පෙන්වා දීම සඳහා කතුවරයා ධම්මපදට්ඨ කථා වැනි පාලි ග්‍රන්ථවලින් කථා තෝරාගෙන ඇත. මීට පසුව දැක්වෙන්නේ නිදාන වර්ගයයි. කල්පාසංඛ්‍යකාලයක් මුළුල්ලේ පාරමිතා පූරණය කරමින් බුද්ධත්වය ප්‍රාර්ථනා කළ බෝධිසත්වයන්ගේ පූර්වචරිතාපදානය එයින් කියවේ. මෙහි අසංඛ්‍ය විභාගය හා කල්ප විභාගය පිළිබඳ කරුණු ද නිදන කථාව හා දෙවන නිදාන කථාවේ දැක්වෙන තොරතුරු ද යම් කිසි පාලි ග්‍රන්ථයකින් ලබා ගත්ට ඇතැයි අනුමාන කළ හැකිය. අභිනීහාර වර්ගයෙහි එන සුවිසි විවරණ කථා සඳහා බුද්ධවංසට්ඨ කථා ඇසුරු කළ බව පෙනේ. සුවිසි විවරණ කථා අවසානයෙහි කතුහිමි ද ගෞතම බුදුන් පාරමිදම් පුරා උතුම් බුදු බව ලැබ ගත් පරිද්දෙන් තමන්වහන්සේ ද ලොවුතුරා බුද්ධත්වයට පත් වන ලෙස ප්‍රාර්ථනා කරයි. හතරවන පරිච්ඡේදයේ සිට 24 වන පරිච්ඡේදය දක්වා ඇති වර්ගයන්හි දැක්වෙන කථාවලින් 103 ක් ම පාළි රසවාහිනියේ කථා මය. පස්වන වර්ගයේ පද්මාවතී කථාව හා විසිහතරවන වර්ගයේ අවසානයේ එන මෛත්‍රෙයය වස්තුව රසවාහිනියේ නැත. පද්මාවතී වස්තුව අවදන කල්පලතාවෙහි ද මෛත්‍රෙයය වස්තුව අනාගත වංශයෙහි ද සඳහන් වන බැවින් කතුවරයා ඒ කථා එකී මූලාශ්‍රයන්ගෙන් ලබා ගත්ට ඇතැයි අනුමාන කළ හැකිය.

සද්ධර්මාලංකාරයේ ඇතුළත් කථා බොහොමයක දක්නට ලැබෙන්නේ රසවාහිනී කථා සමඟ පවත්නා සමීප සම්බන්ධයයි. එහෙත් සමහර කථා රසවාහිනියට වඩා විස්තරාත්මක ව දැක්වේ. රසවාහිනියේ ගාථා හැමවිට ම සද්ධර්මාලංකාරයේ දැක්වෙන්නේ නැත. සද්ධර්මාලංකාර කතුවරයා මහාවංසයෙන් ද ගාථා උපුටා දැක්වී ය. විශේෂයෙන් ලංකා කථා කීමේදී කතුවරයා මහාවංසය ද ආශ්‍රය කරන්ට ඇතැයි එයින් පෙනී යයි. රසවාහිනියේ දැක්වෙන කථා අනුපිළිවෙළ ම සද්ධර්මාලංකාරයේ නැත. සද්ධර්මාලංකාර කතුවරයා කථාවල අන්තර්ගත කරුණු අනු ව කථා වර්ග කොට දැක්වීම කෙරේ වැඩි අවධානයක් යොමු කිරීම මේ ග්‍රන්ථද්වයයෙහි දැක්වෙන කථාවන්හි අනුපිළිවෙළෙහි අසමානත්වයක් ඇතිවීමට හේතුවන්ට ඇත. කථාවන්ට නම් දීමේ දී ද මුල් පාළි ග්‍රන්ථයට අනුව යාමට සද්ධර්මාලංකාර කතුවරයා හැමවිට ම යොමු වී නැත. රසවාහිනියේ කපණ්ණස වත්‍ථු යන්න සද්ධර්මාලංකාරයේ දැක්වෙන්නේ දුග්ගතවත්‍ථුව යනුවෙනි. මේ ග්‍රන්ථද්වයෙහි පවත්නා මෙකී වෙනස්කම් නිසා සද්ධර්මාලංකාර කතුවරයා

Non-Commercial Distribution

රසවාහිනියේ පරිවර්තනයක් කිරීමට නොසිතූ බව පෙනී යයි. තමා රසවාහිනිය ඇසුරු කළ බව කතුවරයා තම රචනාවේ කොතැනකවත් සඳහන් කරන්නේ ද නැත.

මාගධික භාෂාව නොදන්නා සිංහල ද්වීපවාසී සාධුජනයන්ගේ සිත් පහදවනු පිණිස පාලියෙන් පැවති ධර්මය සිංහල බසින් පෙරළා කී ජයබාහු ධර්මකීර්ති හිමියෝ මෙහිදී පාලියෙන් පැවති කථා වස්තු පදයෙන් පදය පරිවර්තනය කොට නොදක්වති. පාලි කථාව බුද්ධ ධර්මය ලෙස සලකා කතුවරයා එය සවිස්තර ව ඉදිරිපත් කරයි. පාලියෙන් එක් වැකියකින් දක්වන විස්තරය පේළි ගණනාවකින් හෝ ඊටත් වැඩි ප්‍රමාණයකින් විස්තර කර දැක්වීම කතුවරයාගේ වර්ණනා ක්‍රමය යි. පාලි කථා සිංහලයට පෙරළීමේදී ඒ කාලයේ ව්‍යවහාරයේ පැවති වචන යෙදීමට කතුවරයා වෙසෙසින් උනන්දු වී ඇත.

උදරවාතො සමුට්ඨහිත්වා පීළෙති	-	බඩරුජාවෙක් පහරන්ට පටන්ගත.
ධොතවත්ථං	-	අපුලා තිබූ ඉණකඩ
ගාළ්හං නිවාසෙත්වා	-	කත්තිය මිරිකා හැඳ
මිස්සක කණ්ඩුලෙන	-	පලාමාලුවක්
පූටභත්තං	-	බත්මුලක්
වග්ගුලියො	-	කිරිවවුලෝ

පාලි වාක්‍යවලින් කියවෙන දේ සිංහල හුරුවට අනුව යොද ගත් තැන් ඇත.

දුබ්භගො මනුස්සො	-	පින්මඳ කාලකණ්ණි පුරුෂයෙක
නීලවල්ලිං තක්කම්බිලෙන මද්දිත්වා	-	ගෝනිල් වැලක් ගෙන ඉස්ම මිරිකා
	-	ඇඹුල් මෝරු හා මිශ්‍ර කොට
ගිලානා විය	-	ලෙඩ ව උණ සීගතු එකක මෙන්
මධුං පරියෙසිත්වා	-	මී බමර සළා.

පාලි වාක්‍යයේ එන අදහස් උපමාවකින් වඩාත් විචිත්‍රවත් ව පැහැදිලි ලෙස කී අවස්ථා ද සද්ධර්මාලංකාරයේ බොහෝ සෙයින් දක්නට ලැබේ.

"නාගො පාදතො පට්ඨාය යාව සකල සරීරං භොගෙන වෙඨෙත්වා" - නා රජ්ජුරුවෝ නැවත ඒ කුමාරිකාවන්ගේ දෙපත්ලෙහි පටන් සියලු ශරීරය එක් දාගැබෙක සමන් මල්දමක් සිසාරන්නා සේ දරණ වැලයෙන් වෙළා ගෙන-

(කාඤ්චන දේවී වස්තුව)

පාලියෙන් තිබූ කථා සිංහල බසට නැගීමේදී සිංහලදේශවාසීන්ට මැනවින් පැහැදිලි වන පරිදි මෙහි ව්‍යවහාරානුගත ව ඒවා විස්තර කර දැක්වීමට කතුවරයා බෙහෙවින් රුචි කළේ ය.

Non-Commercial Distribution

"එකං ගිලානං භික්ඛුං දිස්වා" - එක්තරා රෝගයකින් ආතුර වූ පඬුවන් ව දුර්වල වූ ශරීර ඇති ව ආන ආනා නතනමින් සැතපුණාවූ එක් තෙරකෙනෙකුන් වහන්සේ දැක (රූපදේවී වස්තුව)

"හත්ථපාදගීවූපගතෙසු ආභරණෙසු ලොභං උප්පාදෙත්වා" - අත කර ආදියෙහි පැළඳි පාමුදු පාඩගම් මිණිවළලු මිණිවඩම් කාදු කාප්පු පමුතිලිංගම් පට්ටකාර ආදී වූ ආභරණයෙහි ලොභ උපදවා

ඒ පාලි වචනවලින් කියවෙන අදහස් ලාංකික ජනව්‍යවහාරයේ පැවති ආකාරය කතුතුමා වඩවඩාත් විස්තර කර දක්වන්නේ පාඨක ජනතාව කථාව කෙරේ ආකර්ෂණය කරවමිනි. මේ නිසා එකල ජනතාව අතර පැවතුණු සිරිත්විරිත් ද අපට එළිදරව් වේ.

"රඤ්ඤො සන්තිකං ගන්ත්වා වන්දිත්වා" - යන්නෙන් කියවෙන රාජවන්දනය සද්ධර්මාලංකාර කතුවරයා විස්තර කරන්නේ මෙසේය. - රජ්ජුරුවන් දැක බැස හෙව වැඳ

වෙනත් තැනක භික්‍ෂුවක වෙත ගොස් වැඳි ආකාරය එතුමා මෙසේ විස්තර කරයි.

"තිස්ස ථෙරස්ස සන්තිකං ගන්ත්වා වන්දිත්වා" - තිස්ස මහතෙරුන්වහන්සේ සමීපයට ගොස් පත්කඩ තබා වැඳ.

රජ්ජුන්ට දණ්ඩනමස්කාරයෙන් වැඳීම ද, භික්‍ෂූන්ට පත්කඩ එළා වැඳීම ද එකල පැවති සිරිත බව අපට ඉන් පැහැදිලි වේ.

සිවුරු පෙරවීමේදී සිවුරු ගැටවටු ගන්වාගෙන ගිය බව සද්ධර්මාලංකාර කතුවරයා බොහෝ තැන්හි පවසා ඇත. මෙවැනි යෙදීම්වලින් පැහැදිලි වන්නේ පාලියෙන් පැවති කථා මෙරට ජනතාවගේ සිතට පහසුවෙන් පිවිසෙන පරිදි විචිත්‍ර ලෙස පැවසීමට කතුවරයාට තිබූ අවශ්‍යතාව හා ඒ කාර්යයෙහි එතුමන් තුළ පැවති මනා හැකියාවයි. මේ නිසා සද්ධර්මාලංකාරයේ තත්කාලීන භාෂා ව්‍යවහාරයේ පැවති වචන රාශියක් දක්නට ලැබේ.

අවබාල (තරුණ) අවිෂය කාලය (අමාරු කාලය) උගාරිනිය කොට (වමාරා) උප්පත (බුලත් කොළය) මක්කල් සිනා (ශබ්ද නගා සිනාසීම) කන්ථකඩ (පරණ වූ රෙද්ද) කම්මල් සම (මයිනාහම), පිටබිත්ත බඩබින්න (පිට සහෝදරිය සහ එක්කුස උපන් සහෝදරිය) රාවුතයා (අස්පැටියා) සබලපෙති රුකයා වැනි වචන උදාහරණ සේ දැක්විය හැකිය.

Non-Commercial Distribution

කාලීන ව්‍යවහාරයේ පැවති වචන රාශියක් මෙහි හමුවන අතර සමහර විටක කතුවරයා අනුරාධපුර අවධියට අයත් පැරණි යෙදුම් ද භාවිත කරනු දක්නට ලැබේ. අතුරුධන් කෙරෙමින්, ධම්සභා මණ්ඩපයෙහි, ධම්සෙනෙවි පැරියුත්, පෙම් ධරා ගත තොහී වැනි යෙදුම් මෙහි සුලභ ව දැක්වේ. සද්ධර්මාලංකාරය මුළුමනින් ම ගෙන සලකා බැලූ විට වැඩි වශයෙන් ප්‍රකට වන්නේ සංස්කෘත භාෂාවේ දැඩි බලපෑමයි. කතුවරයා හැකි හැම අවස්ථාවකදී ම භාවිත කරන්නේ සංස්කෘත මිශ්‍ර භාෂා ශෛලියකි. ගම්පොළ අවධිය වන විට සිංහල ජනයාගේ බස්වහර පාලි සංස්කෘත පමණක් නොව, දෙමළ භාෂාවේ බලපෑමට ද හසු වී තිබුණි. මේ කාලයේ සිංහල සමාජය දේශපාලනික, සාමාජීක, ආගමික යන හැම අංශයකින් ම දකුණු ඉන්දියානු බලපෑම්වලට ගොදුරු වූයේය. දෙමළ වචන රාශියක් සිංහලයන් අතර බහුල ව භාවිත වෙමින් පැවතිණ. ආභරණ ගැන සඳහන් කිරීමේදී කාදුකාප්පු, පාඩගම්, මිණි කෙවඩම්, පමුතිලිංගම් වැනි දෙමළ වචන යෙදී ඇත.

යහපත් ජීවනමාර්ගයක් සකසා ගැනීම සඳහා හේතු වන බණකථා ඇසීමෙහි අතිශයින් ලොල් වූ ජනකායක් උදෙසා පාළි කථා සිංහලෙන් ලියූ අපේ බණකථාකරුවෝ සිය පාඨක ශ්‍රාවක ජනතාවට ගැළපෙන අන්දමේ බස්වහරක් ඒ සඳහා යොදා ගත්හ. ඒ ඒ අවධිවල ජනයා අතර පැවතුණු උපමා, උපදේශ, ප්‍රස්තාවපිරුළු ඒ ඒ කතුවරුන් විසින් අඩුවැඩි වශයෙන් යොදා ගන්නා ලදී.

ගින්නේ හුණු ලුණු පුපුරන්නා සේ
නාටකජනයන් විසිළු පාන්ට ලා ගත් විකට ජරා රූපයක් සේ
මිරිඟු ජලයෙන් ස්නානපාන කරන්ට උත්සාහ කරන්නා සේ
යුද්ධයෙහි බිඳී වල්වන්නවුන් රණමැස්සන්ගේ හඬට භය වන්නා සේ
සඬුකුඹුරක යාලක් වපුට පැලක් ලබන්නක්හු මෙන්
සොයා ගිය බෙහෙත් පෙරමග තුබුවා සේ
කේසර සිංහරාජයකු දුටු මුවරළක් බුන්නා සේ
යහපත් බිම් බලා ගොයම් කොට බොහෝ ශස්‍යඵල ලබන්නාවූ ගොවීන් මෙන්
හිරු දුටු කදෝපැණියන් ලෙසින්
පූරණ කාශ්‍යප නම් නිගණ්ඨයා පැන දිව්වා සේ

සද්ධර්මාලංකාරය ලිවීමෙන් සම්මා සම්බුද්ධත්වය පැතූ ජයබාහු ධර්මකීර්ති හිමිපාණන්ගේ පරමාභිලාෂය වූයේ දනන් දන් දීමෙහි හා ධර්මශ්‍රවණයෙහි යොමු කරවමින් ඔවුන් යහපත් මාර්ගයකට යොමු කරවීමයි. දන් දීම, සිල් රැකීම, බණ ඇසීම වැනි සැදැහැවත් බෞද්ධයකු පුරුදු පුහුණු කළ යුතු යහගුණ පිළිබඳ මේ කථාවලින් අඩු නැති ව කියවේ. මෙහි සඳහන් කථා කියවීමෙන් ධර්මඥානයක් ද, කථා රසයක් ද ව්‍යක්ත භාෂා භාවිතයෙහි පරිචයක් ද ලබාගත හැකිය. බුද්ධ කාලයට පසු කලෙක දඹදිව හා ලංකාවේ සිද්ධි මුලින් පාලියෙන් තිබී ජයබාහු

Non-Commercial Distribution

ධර්මකීර්ති හිමියන් විසින් සිංහල ජනතාවට උචිත බසින් කියන ලද බැවින් ඒ කථාවලට පසුබිම්වී යැ යි සැලකෙන අනුරාධපුර කාලයේ සමාජය ද ඒ හිමියන් විසූ ගම්පළ රාජධානි සමයේ සමාජය ද පිළිබඳ බොහෝ තොරතුරු එහි නිරායාසයෙන් ම පටහන් විය. එහෙයින් මධ්‍යකාලීන සමාජ ඉතිහාසය හදාරන්නකුට මේ කෘතියෙන් ලබා ගත හැකි ප්‍රයෝජන අනල්ප ය.

සද්ධර්මාලංකාරය ආගමික ජනකථා සමුච්චයකි. ජනකතාවක් යනු ඓතිහාසික වශයෙන් සත්‍ය වූ කථාවක් ම නොවේ. මනඃකල්පිත වූ අසත්‍ය කථාවක් ද නොවේ. යම්කිසි ජන සමාජයක කලකට පෙර සිදු වූ දෙයක් ජනයාගේ සිතුම් පැතුම්වලින් පරිපූර්ණ ව ඔපවත් වී නිර්මාණය වන්නකි. සද්ධර්මාලංකාරයේ දඹදිව කථා මගින් බුද්ධ කාලයේ හා ඊට පසුව දඹදිව වූ යම් යම් සිදුවීම් ද, ලක්දිව කථා මගින් අනුරාධපුර අවධිය පසුබිම් කොටගත් සිදුවීම් ද ගම්පොළ රාජධානි අවධිය දක්වා ලංකාවේ ජීවත් වූ ජනයාගේ රුචිඅරුචිකම්, සිතුම්පැතුම් සමග මිශ්‍ර වී සද්ධර්මාලංකාර කතුවරයාගේ අභිමතාර්ථ සාධනයට ද යොමු වන පරිදි සැකසී ඉදිරිපත් වී ඇත. කලක් මුළුල්ලේ ජනයා අතර පැවති කථා පුරාතනයන් විසින් දීප භාෂාවෙන් තැබූ බවත් ඒ කථා රට්ඨපාල හිමියන් විසින් පාලියට නගා තිබූ බවත් රසවාහිනියේ සඳහන් වේ. වේදේහ හිමියන් විසින් පාලි භාෂාවෙන් නැවත සකස් කොට රසවාහිනියෙන් ඉදිරිපත් කරන ලද්දේ ඒ කථා ය. සද්ධර්මාලංකාර කතුහිමියන් ලංකාද්වීපවාසී සාධුජනයාගේ සිත් පහදවා ඔවුන්ගේ දෙලෝ අභිවෘද්ධිය සලසනු පිණිස අලංකාර කොට සරසා ඉදිරිපත් කරන ලද්දේ රසවාහිනියේ අන්තර්ගත ඒ කථා සම්භාරය යි. එහිමියන් මේ කථා සිංහල භාෂාවෙන් කියා පැවේ ලාංකික ජනතාවගේ සිත් තුළ ශ්‍රද්ධා භක්ති ජනනය කොට ඔවුන් ධර්මශ්‍රවණය, දන්දීම වැනි සත්කාර්‍යයන්හි ලෝලී කරවනු පිණිස ය.

ත්‍රිවිධ රත්නයෙහි භක්තිවන්ත ව විසීම දෙලොව වැඩ සාධන බව ද අන්‍ය අරමුණෙහි විහිත නොවී ධර්ම ශ්‍රවණයෙහි ලොල් වීම මේ අත්බවයේ ඊසි සැප සාධන බව ද මරණින් මතු දිව සැපත්, මොක් සැපත් ලබන බව ද පාඨකයන්ට පැහැදිලි කිරීමට සද්ධර්මාලංකාර කතු හිමියෝ බොහෝ උත්සාහ ගත්හ. ශීලවන්ත භික්ෂූන් වහන්සේලාට හෝ දුකට පත් වූ අසරණ අයට පමණක් නොව තිරිසන් සතුන්ට දෙන දානය පවා මහත්ඵල මහානිසංස ලබා දෙන බව තහවුරු කිරීමට එතුමෝ කථා ආශ්‍රය කර ගත්හ. විපස්සී බුදුන් ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලාට මහමෑ පුහක් දන් දීමේ කුශලයෙන් තුනාදරුවකු සක්විති රජ සැපත් ලැබූ පුවතක් මහමන්ධාතු වර්ගයේ මහමන්ධාතු වස්තුවේ වේ.

මහමන්ධාතු රජු ලැබූවාවූ සැපත කතුවරයා මහත් උත්කර්ෂයෙන් විස්තර කරන්නේ පාඨක ජනයා විස්මයෙන් අලළවමිනි. දානය නම් මනුෂ්‍යයන්ට රක්ෂා ස්ථානයක් බවත්, සියලු දුගති භය වළක්වා දෙව්ලොවට නංවන්නාවූ හිණක් බඳු, රිසිරිසි සැපත් සිද්ධ කරන චින්තමාණික්‍ය රත්නයක් හෝ කල්ප වෘක්ෂයක් හෝ

Non-Commercial Distribution

හද්‍ද සටයක් හා සදෘශ වන බවත් පැවසූ සද්ධර්මාලංකාර කතුතුමා සිය කථා ගොතා දැක්වූයේ සාමාන්‍ය පොදු ජනතාවගේ සිතුම්පැතුම්වලට ගැළපෙන ලෙසිනි. භික්ෂූන් වහන්සේලාට උක් සකුරු දන්දීම හකුරු කඳු ලාභයට හේතුවන බව ද පෙර අත්බවයෙක ගිතෙල් දන් දීමේ හේතුවෙන් සමුදුර මැදකදී පවා ගිලන් වී ගිතෙල් අවශ්‍ය අවස්ථාවකදී කරදිය ගිතෙල් බවට පත් වූ බව ද කියවෙන මහා විස්මයාවහ සිද්ධි සඳෙධයා වස්තුවෙහි වේ. පූර්වාත්මභාවයකදී අලුත් දී හා කැටි මී දන් දීමෙන් සීවලී හිමියන් බුද්ධ ශාසනයේ සිවුපස ලාභීන් අතර අග්‍රස්ථානයට පත් වූ ආකාරය සීවලී වස්තුවෙන් දැක්වේ. රෝගාතුර භික්ෂුවකට උක් සකුරු දන්දීම නිසා බැලූ බැලූ තන්හි හකුරු කඳු ඇතිවීම, බල්ලකුට බත් පිඩක් දන්දීම නිසා පසු අත්බවයක සුලභ ව අන්නපාන ලැබීම, දුප්පත් මිනිසකුට රන් කහවණුවක් දීම නිසා ධන සම්පත් ලැබීම, භික්ෂුවකට වස්ත්‍රයක් දන් දීමේ හේතුවෙන් සිතූ සිතූ විට වස්ත්‍ර ලැබීම වැනි මහා ආශ්චර්යජනක ආනිසංස ලැබෙන ආකාරය පුන පුනා කීමට සද්ධර්මාලංකාර කතුවරයා මහත් උද්‍යෝගයක් දැක්වූයේ වෙසෙසින් ම මේ ආකාරයෙන් හෝ ජනයා ධර්මානුකූල දිවි පෙවෙතකට මෙහෙයවීම අවශ්‍ය නිසා ය. සද්ධර්මාලංකාරය තර්කානුකූල ව සිතන විචාරවත් පාඨක පිරිසක් විශේෂ කොට ගෙන ලියන ලද කථා සමුච්චයක් ම නොවේ. මේ කථා සංග්‍රහයෙන් හෙළි වන්නේ එකල, ධර්මානුකූල ජීවිත රටාවකට හුරු වූ සත්‍යාසත්‍යගවේෂණයෙහි තත්පර වූ විබුධ ජනයා හීන වූ බැවින් ගුණධර්ම අතින් මෙන් ම බුද්ධිප්‍රභාවෙන් ද හීන වූ ජනයා ආමිෂ දානය කෙරේ යොමු කරවීම අත්‍යවශ්‍ය ව පැවැති බව ය. සුළු වශයෙන් හෝ භික්ෂූන්ට සිවුපසය සැපයීම මහත්ඵල මහානිසංස ගෙන දෙන බව අවධාරණය කිරීමට කතුහිමියන් නිරතුරු ව ම උනන්දු වූයේ එකල භික්ෂු සමාජය බෙහෙවින් සිවුපසයෙන් පිරිහී සිටි බැවින් විය යුතුය. එසේ නැතහොත් දානාදී ආගමික කටයුතුවල අගය පිළිබඳ අවබෝධයක් සමාජයේ වඩා තහවුරු ව නොපැවතුණු බැවින් විය යුතු ය.

කර්මය යනු ලෝකය පවත්වන්නාවූ න්‍යාම ධර්ම පසෙන් එකකි. එහෙත් නූගත් පොදු ජනයාගේ ජීවන පැවැත්ම යහපත් කරලීම සඳහා කර්මවාදය ඉස්මතු කර දැක්වීම වඩාත් අවශ්‍ය වේ. අකුසල් මග අවුරා වැට කඩොලු බැඳ කුසල් මගට යොමු කරනු සඳහා කුශලාකුශල කර්මයන්හි විපාක පැහැදිලි කළ යුතු වේ. දන්දීම, ධර්මශ්‍රවණය, යමකුට උපකාර කිරීම වැනි කුශල කර්ම සඳහා ඊට අනුරූප ප්‍රතිඵල ලැබීමත් අකුසල කර්ම හේතුවෙන් ඊට ගැළපෙන දුකකට පත් වීමත් අනිවාර්ය බව අවධාරණය කෙරෙන කථාවලින් සද්ධර්මාලංකාරය පිරී පවතී.

ගම්පළ රාජධානි සමය වන විට නොයෙකුත් භාරත ලංකා සම්බන්ධතා හේතු කොට ගෙන හින්දු ආගම මෙහි දැඩි ව මුල් බැස ගෙන තිබිණි. ශතවර්ෂ ගණනාවක් මුළුල්ලේ වරින්වර බුද්ධාගම අබිබවා ගෙන ආ හින්දු බලවේගය බෞද්ධ නරපතීන්ගේ ද බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ ද පොත පත ලියූ ලේඛක පර්ෂදයේ ද අප්‍රතිහත ධෛර්යය නිසා යටපත් වෙමින් පැවතියේය. එහෙත් ජනයාගේ සිත්සතන්

තුළ මුල් බැස ගෙන රෝපණය වූ සමහර හින්දු විශ්වාස සම්පූර්ණයෙන් සෝදා හැරීම පහසු නොවීය. ගම්පොළ රාජධානි සමය ඉන්දියාවේ විජයනගර අධිරාජ්‍යයේ බලපෑම දැඩි ව දැනුණු සමයකි. හින්දු දේව සංකල්ප නිසරු ප්‍රලාප සේ බැහැර කිරීමේ අවශ්‍යතා පැන නැගිණි. ඊශ්වර දෘෂ්ටිකයකු හා බෞද්ධාගමික උපාසකයකු අතර ඇති වූ අදහස් ගැටීමක් ගැන කියවෙන යක්‍ෂබවක්‍ෂවිත වගීයේ පාදපීඨිකා වස්තුවෙන් එකල පොදු ජනයා අතර ඇති වූ ආගම් වාදවිවාදවල ස්වරූපය පැහැදිලි වේ. බුදුන් වහන්සේගේ පා පහස ලත් පාදපීඨිකාව පෑ පෙළහර දැක විස්මය පත්වූ ඊශ්වර භක්තිකයන් සිය මිථ්‍යා දෘෂ්ටිය හැර තුනුරුවන් සරණගිය අයුරු ඒ කථාවෙන් දැන ගැනීමට ලැබේ.

බුදුන් වහන්සේ නොයෙක් අවස්ථාවල පෑ පෙළහර කථා මගින් පාඨක ශ්‍රාවක ජනයාගේ සිත් තුළ භක්තිමය හැඟීම් ජනිත කරවනු සඳහා සිය පන්හිඳ මෙහෙයවූ විද්‍යාචක්‍රවර්ති ගිය මග ම සද්ධර්මාලංකාර කතු හිමියන් තෝරා ගත්ත ද එතුමන් මේවා ඉදිරිපත් කර ඇති ආකාරය, ගම්පළ සමයේ සමාජ ව්‍යුහයේ පරිහානි ලක්‍ෂණ පැහැදිලි කරයි. භික්‍ෂූන් වහන්සේ කෙනෙකුට සිවුරට නුවා දැම්ම සඳහා වස්ත්‍රයක් පූජා කොට ඒ පිනෙන් අසිරිමත් සක්විති සැපත ලැබුවකු පිළිබඳ නන්දිරාජ වස්තුවෙන් කියවේ. පද්මාවතී කථාවේ පද්මාවතී කුමරිය අප්‍රමාණ රූප ශෝභාවකින් බැබලුණේ පසේ බුදුවරයකුට විලඳ හා නෙලුම් මලක් පිදීමෙනි. ඒ දනෙහි අනුහසින් ඇ පැතූ පරිදි ඇගේ ශරීරය රන් පැහැ ගත්තේය. සිරුරින් සඳුන් සුවඳ වහනය විය. මුඛයෙන් මහනෙල් සුවඳ හැමීය. එබු එබු පත්ලෙහි නෙලුම් මල් පිපිණ. එපමණක් නොව රජ බිසෝ සම්පත් ද පසේබුදු සැපත් ලබන පන්සියයක් පින්වත් පුතුන් ද ලැබුවාය. පද්මාවතිය පිළිබඳ කථාව කතුවරයා ලබාගෙන ඇත්තේ රසවාහිනියට පරිබාහිර මූලාශ්‍රයකිනි. රසවාහිනියේ ද සඳහන් නොවන මේ විස්මයාවහ කථාව විශේෂයෙන් ම ඉදිරිපත් කරන ලද්දේ නිසැකයෙන් ම ස්ත්‍රී ජනයා දන් දීමෙහි යොමු කරවනු පිණිස ය. ඔවුන් ලවා රූ සැපත් ද දෙව් සැපත් ද ප්‍රාර්ථනා කරවනු පිණිස ය. භික්‍ෂූන්වහන්සේලාගේ සිවුපසය සැපයීම කෙරෙහි පොදු ජනයා යොමු කරවීම ද සද්ධර්මාලංකාර කතු හිමියන්ගේ එක්තරා අභිමතාර්ථයක් විය. තෙළෙස්වන සියවස වන විට ලාංකික ජන සමාජය බෞද්ධාගමික පරමාර්ථවලින් පණ පෙවීමේ අවශ්‍යතාවක් පැන නැඟී තිබුණේය. ජනයා දනට පිනට යොමු වූ දැහැමි දිවිපෙවෙතින් ඈත් ව වීසීම නිසා ධර්මානුයෝගී ශීලවන්ත භික්‍ෂූන් වහන්සේලා ගිහි ජනයාගෙන් ලැබිය යුතු සිවුපසයෙන් පිරිහීම වැළැක්වීම ද කතුවරයාගේ අභිමතාර්ථයක් වන්ට ඇතැයි අනුමාන කළ හැකිය. පෙර දඹදිව කාවේරි පටුනේ විසූ ඊශ්වර භක්තිකයෝ ඊශ්වර දෙවියන්ට බුදුන් නමදිනු දැක්වෙන රූපයක් පුවරු කඩෙක ඇන්දාහ. එය බෞද්ධ ජනයාගේ බලවත් ශෝකයට හේතු විය. ඔවුහු මහත් සේ කැලඹුණු සිත් ඇති ව ඒ බව රජුට සැළ කළහ. මෙහිදී සද්ධර්මාලංකාර කතු හිමියෝ උපමා මාලාවක් උපාසකවරුන්ගේ මුවට නංවා ඔවුන් ලවා බුදු ගුණ වර්ණනා කරවති. ඒ රජතුමා ලවා ඒ පුවරුකඩ සුදු වස්ත්‍රයකින් වස්වා, අස් තබ්බවා රැකවල් සලස්වා ගත් උපාසකවරු නොයෙක් පින්කම්හි

Non-Commercial Distribution

යෙදෙමින් මේ රූපය බුදුන් වහන්සේට ගර්හා නොවන ආකාරයෙන් වෙනස් ස්වරූපයක් ගන්නා ලෙස පතමින් සත්‍යක්‍රියා කළහ. උපාසකවරුන්ගේ පින් මහිමයෙන් ශක්‍රයා මිනිස් ලොවට පැමිණ ඒ ඊශ්වර රුව බුදුන් නමදින අයුරින් වෙනස් කළේය. එසේ විපරීත වූ පුවරුකඩ දුටු සියලු මිථ්‍යාදෘෂ්ටිකයෝ සිය දෘෂ්ටිය අත්හැර දමා බුදුන් සරණ ගියහ.

මෙසේ ජනයා සිවුපස දානය ධර්මශ්‍රවණය ආදී සත්ක්‍රියාවන්හි යොමු කිරීම සඳහා ද තුනුරුවන්හි ගුණ හුවා දැක්වීම සඳහා ද කථා කියූ සද්ධර්මාලංකාර කතුවරයා විටෙක සත්පුරුෂ ලක්ෂණ විවරණය කර දක්වමින් ජීවන මං පෙතෙහි වරින්වර හමුවන නොයෙක් කම්කටොලුවලින් මිදීමට උපකාර වන උපදේශ දානයෙහි ද යෙදුණේය. සමහර මිනිසුන්ගේ අසත්පුරුෂ දුර්ගුණ නිසා විටෙක තිරිසනුන් පවා මිනිසුන්ට වඩා අගය කටයුතු බවත් කෘතෝපකාර සිහි කිරීම හා මිත්‍ර ධර්මය ආරක්ෂා කිරීම සමාජයේ යහ පැවැත්මට අතිශයෝපකාර වන බවත් මිනිසුන්ගේ සිත්සතන් තුළ තහවුරු කෙරෙන කථා ද සද්ධර්මාලංකාරයේ දුලබ නොවේ. විවිධාකාර සංකීර්ණ ගතිගුණවලින් හෙබි ජනයා සමග ගැටෙන්ට මිනිසාට සිදුවේ. එකිනෙකාගේ යහගුණ මෙන් ම දුර්ගුණ ද වටහාගෙන ඊට වහල් නොවී ඉන් පීඩනයට පත් නොවී ජීවත්වීමට ශක්තිය ලබා ගැනීම අප ජීවන තක්සලාවෙන් ලබන උසස් ම ඉගෙනීම වේ. ජීවිත පරිත්‍යාගයෙන් වුවත් තවෙකකුගේ යහපත පතා කටයුතු කළ ද ඉන් හැමවිට ම ඊට සමාන්තර ප්‍රතිචාර ලැබෙන්නේ නැත. සද්ධර්මාලංකාරයේ කථා පාඨක ජනතාවගේ ජීවන මං පෙත පුරා පැතිර පවත්නා කටු අකුල් ඉවත ලා එය නිරවුල් කර ගැනීම සඳහා උපකාර වන උපදෙස්වලින් ගහණ ය. තුන් යහලු වර්ගයේ ව්‍යාඝ්‍ර වස්තුව මිනිසුන් තුළ පවත්නා කුරිරු අධම හැසිරීම් නිසා සමාජයට වන්නාවූ අයහපත පැහැදිලි කරන කථාවකි. එක් නියං සමයක දිය පිපාසයෙන් පීඩිත වූ ගිරවෙක්, නාගයෙක් හා මිනිසෙක් වනමධ්‍යයේ වූ බොහෝ ගැඹුරු නරාවළක වැටුණහ. වනය හරහා ගමන් කළ එක් මිනිසෙක් මොවුන්ගේ හැඬුම අසා ඔවුන් මේ විපතින් මුදවා ගත්තේය. පසු කලෙක තමන්ට උදව් කළ ඒ මිනිසා දුක්ඛිත තත්වයකට පත්වූ අවස්ථාවේ කෘතෝපකාර සැලකූ ගිරවා රජුගේ මුතුහර සොරා ගෙනැවිත් දී ඉන් සැපවත් වන ලෙස මිනිසාට කීවේය. ඒ මිනිසා එය ආරක්ෂා කොට තබා ගන්නා ලෙස තමා පෙර වනයේදී උදව් කළ මිනිසාට භාර දුන්නේය. සත්පුරුෂ මිනිසා මිත්‍ර ධර්මය සිහි නොකොට ස්වකීය ලාභය තකා තමාගේ දිවි ගැලවූ මිත්‍රයා රජුට ඉදිරිපත් කළේය. මුතුහර සොරා ගැනීම සම්බන්ධ ව රාජ උදහසට ලක්වූ මිනිසා කෘතෝපකාර දත් නාගයාගේ ප්‍රත්‍යුපකාරය නිසා ජීවිතය ගලවා ගත්තේය. අඥාන වූ අසත්පුරුෂයන් හා ආශ්‍රය දුරින් ම දුරු කටයුතු බව කතුවරයා මේ කථාවෙන් පාඨකයන් වෙත ගෙනහැර පා ඇත්තේ සමාජ විෂමතා ගැන මනා අවබෝධයක් ඇත්තකු පරිද්දෙනි.

කොපමණ මී, සකුරු, පැණි, කිරි යොදා වැඩුව ද කොහොඹ ගස කිසිසේත් මධුර බවට නොපැමිණේ. නිරන්තර ප්‍රේම සහිත ව කිරිපොවා වැඩුවත් සජීයා

විෂය ම එළවයි. ගින්නෙන් කිසිදා සිසිලසක් ලබා ගත නොහැකිය. එමෙන් කොපමණ ගුණ කළත් අසත්පුරුෂයෝ ද කිසිදා කෘතෝපකාර නොසලකති. මිත්‍රයකු හා ආශ්‍රය ඇති කර ගැනීමේදී මිතුරන්ට හිතවත් වීම, කළ උපකාර මෙනෙහි කොට ඊට නිසි ප්‍රතිඋපකාර කිරීම සමාජයේ යහ පැවැත්මට අතිශයින් ම හේතු වේ. පාලියෙන් තිබූ ඒ කථා දඹදිව පසුබිම් කොට ගෙන යෙදුණු කථා වුව ද සද්ධර්මාලංකාර කතුවරයා දිවිය එකලු කර ගැනීමට ආලෝකයක් ලැබෙන පරිද්දෙන් රසවත් ව ඉදිරිපත් කර ඇත.

බෞද්ධ සාරධර්මවලට අනුකූල ව ජීවත්වීම මෙලොව ජීවිතය සාමකාමී ව හා සන්සුන් ව ගත කිරීම සඳහා හේතු වේ. අසත්පුරුෂයන් වෙතින් දුරු ව සත්පුරුෂ ආශ්‍රය ලැබීම, දෙමාපියන්ට සැලකීම, භික්ෂූන් වහන්සේලාට සිවුපසය සැලසීම, ධර්මශ්‍රවණය හා ධර්මයෙහි හැසිරීම, ධර්මදේශනා කිරීම, කෘතගුණ සැලකීම, මිත්‍රධර්මය ආරක්ෂා කිරීම එවැනි සාරධර්ම යි. පාඨකයා වෙත ඒ ගුණධර්ම සන්නිවේදනය කෙරෙන්නේ කථා මගිනි. එමගින් කියන උපදෙස් වඩාත් හොඳින් සිත්හි කාවදින ලෙස ඉදිරිපත් කළ හැකිය. විසිතුරු වර්ණනා, විස්මයාවහ සිද්ධි, අතාර්කික සිදුවීම් ඒවාට එකතු වන්නේ ඒ ඒ පාඨක ජනයාගේ මානසික ස්වභාවයට අනුරූපව ය. අකුරු ශාස්ත්‍රයෙහි මනා පරිචයක් නොලත් ජනයාට තුනුරුවන්ගේ අගය වටහා දී හොඳ නරක තෝරා ගැනීමට හැකි ඥානාලෝකයක් ලබා දී ගුණ ධර්ම වර්ධනය කරනු සඳහා සද්ධර්මාලංකාර කවියා විචිත්‍ර කථා කලාවක් යොදා ගෙන ඇත. සාහිත්‍යයක් බිහිවන්නේ ඒ ඒ කාලවලට අයත් සමාජ චලනයට අනුරූපව ය. එසේ නොවූවොත් ඒ කථා කිසිදා පාඨක හද බැඳ ගන්නේ නැත.

පාඨකයන්ට විචිත්‍ර ආස්වාදයක් ලබා නොදෙන ඔවුන්ගේ දිවි මග ආලෝකමත් නොකරවන සාහිත්‍යය ජනප්‍රිය වන්නේ නැත. සද්ධර්මාලංකාර කථා ඇසුවෝ ධර්මානුකූල දිවිපෙවෙතකට අනිවාර්යයෙන් ම යොමු වෙති. පොදු ජනතාවගේ අභ්‍යන්තර මානසික ස්වභාවය මැනවින් වටහාගෙන ඔවුන්ට ගෝචර වන ආකාරයට පාළියෙහි ආ කථා විසිතුරු ව කීමට සද්ධර්මාලංකාර කතුවරයා සමත් වී ඇත. මෙහි මුල් වර්ගවල කථා දඹදිව ආශ්‍රය කරගත් කථා වුව ද එවැනි දේශ භේදයක් පාඨකයාට ඒ කථාවලින් අවබෝධ වන්නේ නැත. විශිෂ්ට සාහිත්‍යය එක් දේශයකට, කාලයකට සීමා වන්නේ නැත. ජනයාගේ හිත සුව පිණිස ජනයා පිළිබඳ ව කියවෙන මේ ජනකථා සමුච්චය බෞද්ධාගමික ජීවන රටාවේ මං පෙත් එළි කරවන කථා සම්භාරයකි. එහි සමාජයේ හැම තරාතිරමකට ම අයත් ජනයාගේ ජීවන තොරතුරු සඳහන් වේ. එහෙයින් එය සිංහලයන්ගේ දේශපාලන, ආර්ථික, සමාජ ජීවිතය ගැන අධ්‍යයනය කිරීමේදී අතිශයින් ආධාරවන සාහිත්‍යික මූලාශ්‍රයක් වෙයි.

ධර්මකීර්ති පරම්පරාවේ ලියැවුණු අනගි බණ පොත සද්ධර්මාලංකාරයයි. දේශීය පරිසරයේ සිදු වූ කථා සිංහල පාඨකයන්ට කියවන්ට ලැබුණු පළමු අවස්ථාව

Non-Commercial Distribution

ද මෙය සේ සැලකිය හැකිය. එහෙයින් නොඅනුමාන ව එය ලියැවුණු කාලයේදීත් ඊට පසුවත් මෙය මහත් සේ ජනප්‍රිය වන්නට ඇත. කෝට්ටේ අවධියේදී මෙහිමියන්ගේ ශිෂ්‍යයකු විසින් සද්ධර්මරත්නාකරය ලියන ලද්දේ සද්ධර්මාලංකාරයට කරන ලද ගෞරවයක් ලෙසිනි. සීතාවක කාලයේදී දහම්සොඬ ජාතක කාව්‍යය රචනා කරන ලද්දේ සද්ධර්මාලංකාරයේ දහම්සොඬ කථාව මුල් කර ගෙන ය. මහනුවර කාලයේ ලියැවුණු ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහයටත් සර්වඥගුණාලංකාරයටත් මෙහි බලපෑම ලැබිණි. ජාතක කථා පොත මෙන් ම සද්ධර්මාලංකාරය ද සිංහල කවීන්ට කථාවස්තු සැපයූ වස්තු කෝෂ්ඨාගාරයක් විය. පද්මාවතී කථාව, කාඤ්චන දේවී වත, නන්දිය වෙළඳ වත එසේ කවියට නැගුණු සද්ධර්මාලංකාර කථා වේ.

කතුහිමියන් ප්‍රාර්ථනය කළ පරිද්දෙන් ම සකලජන සුබෝධ කොට ස්වභාෂාවෙන් දක්වන ලද සද්ධර්මාලංකාරය නම් කථාග්‍රන්ථය, එය ලියැවුණු දා පටන් ම සකල ජනානන්දය කෙරෙමින් බහුමානයට භාජන වූ අගනා ගද්‍ය කාව්‍යයකි.

ලංකාද්වීපෝත්පන්න කථා

සාහිත්‍ය පක්ෂයෙන් මෙන් ම ඓතිහාසික පක්ෂයෙන් ද වැදගත් විශේෂතා ප්‍රකට කෙරෙන සද්ධර්මාලංකාරය ජම්බුද්වීපෝත්පන්න කථා, ලංකාද්වීපෝත්පන්න කථා යනුවෙන් ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත ය. සද්ධර්මාලංකාරයට මූලාශ්‍රය වූ රසවාහිනී නම් පාලි කථා සංග්‍රහයෙහි ද මේ ආකාරයෙන් ම කොටස් දෙකක් දක්නට ලැබේ.

> "තත්ථ තෙසං වත්ථූනමුප්පත්තියො ද්විධා භවන්ති, ජම්බුදීපෙ සීහලදීපෙචාති. තත්ථ ජම්බුදීපෙ තාළීස සීහලදීපෙ තෙසට්ඨී"
>
> (රසවාහිනී 2 පි.)

යන පාඨයෙන් ඒ බව පැවසේ. සද්ධර්මාලංකාරයෙහි දෙවන කථා පරිච්ඡේදය, ලංකාද්වීපෝත්පන්න කථා පිළිබඳ කරුණු විමසා බැලීමේදී ලක්දිව දකුණු පෙදෙසට අයත් රෝහණය හෙවත් රුහුණු ජනපදය අමතක කළ නොහැකිය. මෙහි කථා වස්තු බොහොමයක් රුහුණ හා බැඳී පවත්නා බැවිනි. පඬුවස්දෙව් රජුගේ බිසොව භද්දකච්චානා දේවියගේ සොහොයුරන් සය දෙනකු ලක්දිව පැමිණ ඒ ඒ තැන්හි නුවර කරවා විසූ බවත් ඔවුන් අතරින් රෝහණ ශාක්‍ය පුත්‍රයා වාසය කළ පෙදෙස 'රුහුණු' නම් වූ බවත්, දිගා නම් ශාක්‍යපුත්‍රයා වාසය කළ පෙදෙස 'දිගාමඩුල්ල' නම් වූ බවත් ඓතිහාසික මූලාශ්‍රයන්හි සඳහන් වේ. (මහාවංස 9 පරි. 10, 11 ගාථා, මහාවංස ටීකා. 206 පි., සද්ධර්මාලංකාරය 387 පි.).

අනුරාධපුර මහමෙවුනා උයනෙහි මහා බෝධිය පිහිටුවන අවස්ථාවෙහි මහා බෝධියෙන් ගිලිහුණු පලයකින් පැන නැගුණු බෝධි අංකුර අටෙන් එකක් රුහුණ

Non-Commercial Distribution

ජනපදයේ කාජරගාමයෙහි (කතරගම) ද එකක් චන්දන ගාමයෙහි (සඳුන් ගම) ද රෝපණය කළ බව මහාවංසය පවසයි. (මහාවංස 19 පරි. 62 ගාථා) එමෙන් ම මහාබෝධිය ලක්දිවට වැඩමවන අවස්ථාවෙහි පැවති මහා උත්සවයට කාජරගාමයෙහි හා චන්දන ගාමයෙහි ක්ෂත්‍රියයන් සහභාගි වූ බව ද සඳහන් වේ. (මහාවංස. 19 පරි. 54, 55 ගාථා).

මෙම ඓතිහාසික වාර්තා අනුව රෝහණ ජනපදය දේවානම්පියතිස්ස රාජ්‍ය සමයෙහි ක්ෂත්‍රියයන්ගේ වාසභූමියක් ව පැවති බව පැහැදිලි වේ.

දේවානම්පියතිස්ස රජුගේ සොහොයුරු මහානාග නම් යුවරජු, මහරජ බිසොවට බියෙන් අඹුදරුවන් සමග බල වාහන ද ගෙන රුහුණට පලා ගොස් මාගම රාජධානිය කොටගෙන රෝහණ දේශය පාලනය කළ බව ද ඔහුගෙන් පසු මහානාග රජුගේ පුත් යටාලතිස්ස ද යටාලතිස්සගෙන් පසු ඔහුගේ පුත් ගෝඨාභය ද, ඉන්පසු ගෝඨාභයගේ පුත් කාකවණ්ණතිස්ස රජු ද රෝහණයේ රාජ්‍යය කළ බව මහාවංසය පවසයි. (මහාවංස 22 පරි. 6 සිට 11 ගාථා, සද්ධර්මාලංකාරය 438 පි.)

පැරණි ලක්දිව රුහුණු මායා පිහිටි යනුවෙන් රටවල් තුනකට වෙන් ව තිබුණු බව ද අනුරාධපුරය පිහිටි රට රාජධානිය ලෙස ද මාගම රුහුණේ රාජධානිය ලෙස ද පැවති බව ද ඓතිහාසික වාර්තාවන්ගෙන් අනාවරණය වේ. මෙයින් අනුරාධපුර රාජධානිය සම්බන්ධ ඉතිහාසය මහාවංසය සවිස්තර ව ඉදිරිපත් කර ඇතත් මාගම රාජධානිය සම්බන්ධයෙන් එපමණ දීර්ඝ විස්තරයක් මහාවංසයෙහි දක්නට නොලැබේ. එබැවින් මාගම රාජධානිය හා රුහුණු දේශය පිළිබඳ ඓතිහාසික කරුණු අනාවරණය කර ගැනීම පිණිස සහස්ස වත්ථුප්පකරණය, ධාතුවංසය, රසවාහිනිය, සද්ධර්මාලංකාරය යන ග්‍රන්ථ සහ අභිලේඛන බෙහෙවින් ප්‍රයෝජනවත් වී ඇත.

පිහිටි රට, අනුරාධපුර රාජධානියේ ප්‍රධාන බෞද්ධ ආගමික මධ්‍යස්ථානය ලෙස මහා විහාරයත් රුහුණු රට, මාගම රාජධානියේ ප්‍රධාන බෞද්ධ ආගමික මධ්‍යස්ථානය ලෙස තිස්සමහාරාම විහාරස්ථානයත් පැවති බව පෙනේ. මෙම රාජ්‍ය දෙක අතර මායිම ලෙස සලකන ලද්දේ මහවැලි ගඟයි. "සුමංගල විලාසිනී" දීඝනිකාය අට්ඨකථාවෙහි එන විස්තරයක් මෙහි ලා විශේෂයෙන් දැක්විය හැකිය.

බුද්ධකාලයේ භික්ෂූන් වහන්සේලා වස් එළඹීමට පළමු කමටහන් ගැනීමට ද වස් අවසානයෙහි තමතමන් කමටහන් භාවනා කිරීමෙන් ලබා ගත් විශේෂතා සැලකිරීම පිණිස ද එක් තැනකට රැස් වන බවත් එමෙන් ලක්දිව භික්ෂූන් වහන්සේ ද රැස් වන බවත් දැන්වීම සඳහා එම අට්ඨකථාවෙහි මෙසේ සඳහන් වේ.

Non-Commercial Distribution

"තම්බපණ්ණි දීපෙපි අපාරගංගාය ලොහපාසාදෙ සන්නිපතිංසු. පාර ගංගාය භික්ඛූ තිස්ස මහාවිහාරෙ. තෙසු අපාරගංගාය භික්ඛූ සංකාර ඡඩ්ඩක සම්මජ්ජනියො ගහෙත්වා මහා විහාරෙ සන්නිපතිත්වා චෙතියෙ සුධාකම්මං කත්වා වුත්ථවස්සා ආගන්ත්වා ලොහපාසාදෙ පංචනිකාය මණ්ඩලෙ යෙසං පාලි පගුණා තෙ පාලිං සජ්ඣායන්ති. යෙසං අට්ඨකථා පගුණා තෙ අට්ඨකථං සජ්ඣායන්ති. යො පාලි වා අට්ඨකථං වා විරොධෙති, තං තස්ස සන්තිකෙ ඨයා ගහිතන්ති විචාරෙත්වා උජුං කත්වා ගාහාපෙන්ති. පාරගංගා වාසිනොපි තිස්ස මහා විහාරෙ එවමෙව කරොන්ති"

(සුමංගල විලාසිනී. 406 පි.)

මහවැලි ගඟින් මෙතෙර විහාරස්ථානවල භික්ෂූන් වහන්සේ අවුරුද්දකට දෙවරක් එනම් වස් විසීමට පළමු හා වස් අවසානයෙහි අනුරාධපුරයේ ලෝහප්‍රාසාදයට රැස්වූ අතර මහවැලි ගඟින් එතෙර භික්ෂූන් වහන්සේ රුහුණු ජනපදයේ තිස්ස මහා විහාරයට රැස්වූ බව ඉහත දැක්වුණු අටුවා පාඨයෙන් පැවසේ.

"මෙසේ මේ සද්ධර්මාලංකාරයෙහි ධම්මසොණ්ඩක වස්තුවෙහි පටන් බෝධිරාජ වස්තුව අවසන් කොට ජම්බුද්වීපෝත්පන්න එක්සාළිසක් පමණ කථා වස්තූන් වෙන වෙන ම දක්වා මෙයින් මතු ලංකාද්වීපෝත්පන්න කථාවස්තූන් දක්වන්නාවූ මම වනාහි මතු කියන ඒ කථාවස්තූන්ට උත්පත්තිස්ථාන වූ මේ ශ්‍රී ලංකාද්වීපය අබුද්ධෝත්පාද කාලයෙහි යක්ෂයන්ට නිවාස ව බුද්ධෝත්පාදයෙහි මනුෂ්‍යයන්ට වාස වන බව ද......."

(සද්ධර්මාලං. 379 පි.)

යනාදී පාඨයෙන් ලංකාද්වීපෝත්පන්න කථා දැක්වීමට පළමුවෙන්, ලක්දිව සම්බුදු සසුන පිහිටුවීම හා සම්බන්ධ විස්තරයක් ඉදිරිපත් කරමින් මෙම විස්තරය මුලින් දක්වන ලද දෙවනපෑතිස් කථාවට මූලාරම්භයෙහි දැක්විය යුතු වුවත් ග්‍රන්ථය විශාල වෙයි සිතා නොදැක්වූ බව පවසා ඉන්පසු පළමුවෙන් "ශ්‍රද්ධා සුමනා වස්තුව" පවසන බව ද කතුවරයා කියයි.

අතිරේක වශයෙන් දක්වන ලද එම විස්තරයෙහි බුදුරජාණන් වහන්සේගේ ලංකාගමනය, විජයාගමනය, පණ්ඩුවාසදේව, පණ්ඩුකාභය, ගණතිස්ස ආදී රජවරුන් පිළිබඳ විස්තර, ලක්දිව සම්බුද්ධ ශාසන ප්‍රතිෂ්ඨාපනය, ආදී ඓතිහාසික වශයෙන් වැදගත් තොරතුරු ඉදිරිපත්කොට ඇත. ඉන්පසු ශ්‍රද්ධාසුමනා කථා වස්තුවට මුල් වූ අනුරාධපුර නගරය ගැන විස්තරයක් දක්වයි. මෙම විස්තරයෙහි එන කාව්‍යමය ලක්ෂණ බැහැර කොට අන්තර්ගත අතික් කරුණු විමසා බැලීමේදී අනුරාධපුරය පිළිබඳ ඓතිහාසික වශයෙන් අගනා තොරතුරු රැසක් අනාවරණය වේ. එවක අනුරාධපුර නගරය රහතන් වහන්සේගේ නිරන්තර සංචාරයෙන් යුක්ත විය. දාගැබ් මහබෝ සුළුපා මහපා සක්මන් මණ්ඩප රන්පත් පන්ති ආදියෙන් ගැවසී

Non-Commercial Distribution

ගත් අතිපරිශුද්ධ භූමියක් විය. සුණුවමින් ධවල වූ උස් වූ ප්‍රාකාරවලින් යුක්ත ය. විසිතුරු ලෙස සරහන ලද වහළල් දොරටු අට්ටාල වටවෙට්ටම් ආදියෙන් ප්‍රතිමණ්ඩිත විය. සැදැහැවතුන් විසින් නිරතුරු පූජා පවත්වන උස් වූ දාගැබ් සමූහයකින් යුක්ත විය. සියදහස් ගණන් විහාර ආරාම බෝධි වෘක්ෂ ආදියෙන් යුක්ත ය. දෙමහල් තුන්මහල් ප්‍රාසාද නව ලක්ෂයක් පමණ ද බිම් මහල් අනූලක්ෂයක් ද විය. දහස් ගණන් ප්‍රදීප, මනහර තොරණ, ධජපතාක, හස්ති අශ්ව සේනා, ආදියෙන් ද භේරිතූර්ය වාදන නෘත්‍යමණ්ඩල ආදියෙන් ද යුක්ත වූ මෙම නගරය චන්ද්‍රවංක වීථිය, මහවැලි වීථිය, සිහුරු වක් වීථිය ආදී වීථි පන්තියෙන් ද යුක්ත විය.

මෙසේ අනුරාධපුර නගර වර්ණනය කොට එම නගරයේ මහවැලි වීථියෙහි වාසය කරන සුමනා නම් කාන්තාව හෙවත් ශ්‍රද්ධා සුමනාව පිළිබඳ පුවත ගෙනහැර දක්වා ඇත. මෙම අනුරාධපුර නගර වර්ණනය ශ්‍රී ලංකාවේ අතීත සෞභාග්‍යය කෙබඳු වී දැයි අවබෝධ කර ගැනුමට උපකාරවත් වේ.

මීළඟට අපගේ විමැසුම යොමු විය යුත්තේ රසවාහිනී කතුවරයා ලංකා දීපුප්පත්ති කථා පරිච්ඡේදයෙහි ප්‍රථම කථා වස්තුව හැටියට මිගපෝතක කථාව ඉදිරිපත් කිරීමත් සද්ධර්මාලංකාර කතුවරයා ශ්‍රද්ධා සුමනා කථා වස්තුව ඉදිරිපත් කිරීමත් පිළිබඳව ය.

අනුරාධපුර නගරය හා බැඳුණු සද්ධා සුමනා කථාවස්තුව උපයෝගී කොටගෙන අනුරාධපුරය ගැන සද්ධර්මාලංකාර කතුවරයා වර්ණනයක් කිරීමෙන් අනතුරු ව රුහුණේ අගනුවර ලෙස සැලකූ මහාගාම හෙවත් මාගම වර්ණනය කිරීම පිණිස ඒ හා බැඳුණු කථා වස්තුවක් වන ධම්මසවණෝපාසිකා කථාවස්තුව ඉදිරිපත් කරන්නට ඇතැයි සිතිය හැකිය. එහිදී මාගම ගැන ද කතුවරයා උත්කර්ෂවත් අන්දමින් වර්ණනය කරයි. සියදහස් ගණන් භික්ෂු භික්ෂුණීන් විසින් ගැවසී ගත් සියදහස් ගණන් විහාර ආරාම, ඉසුරුමත් මහජනයා, දෙමහල් තුන්මහල් ආදී නොයෙක් මහලින් සැදි ගෙවල් තිස්ලක්ෂයක් පමණ වූ සියගණන් වීථි, නැටුම් ගැයුම් ආදියෙන් නිරතුරු මහජනයා සතුටු කරවන පරිත්‍යාගශීලී ජනතාව, සැදැහැවත් ජනතාව විසින් නිරතුරු ව පවත්වන පුදපූජා යන මේ ආදී කරුණු මාගම පිළිබඳ වර්ණනයෙහි දැක්වේ.

ජම්බුදීපුප්පත්ති කථා අවසන රසවාහිනිය "අථ ලංකාදීපුප්පත්ති කථා කථයන්ති" යනුවෙන් ඉක්බිති ලංකාදීපෝත්පන්න කථා කියනු ලැබේ යැයි කෙටියෙන් පවසා දෙවෙනි කථා පරිච්ඡේදය ආරම්භ කරයි. සද්ධර්මාලංකාර කතුවරයා මෙහි ඉහත දක්වන ලද පරිදි සවිස්තර දීර්ඝ පාඨයකින් කරුණු ඉදිරිපත් කොට දෙවෙනි කථා පරිච්ඡේදය ආරම්භ කරයි. ශ්‍රී ලංකාවත් ලාංකික ජන ජීවිතයත් පිළිබඳ සද්ධර්මාලංකාර කතුවරයා තුළ පැවැති පෘථුල අවබෝධ ඥානය කෙබඳුදැයි මෙයින් වටහා ගත හැකිය. තවද සද්ධර්මාලංකාරයෙහි දෙවෙනි පරිච්ඡේදයේ

Non-Commercial Distribution

ප්‍රථමයෙන් දැක්වෙන ශ්‍රද්ධා සුමනා වස්තුව රසවාහිනියෙහි දැක්වෙනුයේ විසිවන කථාවස්තුව හැටියට ය. සද්ධර්මාලංකාර කතුවරයා මෙම විසිවන කථාවස්තුව මුල් කථාව සඳහා ගත්තේ කවර හේතු නිසාදැයි විමසා බැලිය යුතු ය. සද්ධර්මාලංකාරයෙහි මිගපෝතක කථා වස්තුව දැක්වෙනුයේ පනරවන කථාව හැටියට ය. මිගපෝතක කථාවෙන් පැවසෙනුයේ මුව පොව්වකු බුදුබණ ශබ්දමාත්‍රයෙන් ශ්‍රවණය කිරීමෙන් ප්‍රතිඵල ලැබූ ආකාරයයි. චරිත නිරූපණයෙන් කථාකලාවෙන් හා පරමාර්ථයෙන් අගය කළ හැකි විශේෂත්වයක් මෙම කථාවෙහි නැත. එහෙත් ශ්‍රද්ධාසුමනා වස්තුව මෙයට වඩා සැලකිය යුතු විශේෂ ලක්ෂණයන්ගෙන් යුත් ජනජීවිතයට බෙහෙවින් සමීප සම්බන්ධත්වයක් දක්නට ලැබෙන කථාවකි. එපමණක් නොව අනුරාධපුර නගරයෙහි විසූ සුමනාව කථා නායිකාව ලෙස නිරූපණය කොට රුහුණු ජනපදයෙහි මාගම විසූ එක්තරා පුරුෂයකු දෙවන කථා නායකයා ලෙස ගෙන ගොඩ නැගුණු කථාවකි. ප්‍රථමයෙන් අනුරාධපුර නගරය පිළිබඳ වර්ණනයක් කිරීම ද කතුවරයාගේ පරමාර්ථය වීයැ යි සිතිය හැකිය. අනුරාධපුර නගරය හා බැඳුණු සද්ධා සුමනා කථාවස්තුව උපයෝගී කොටගෙන අනුරාධපුරය ගැන සද්ධර්මාලංකාර කතුවරයා වර්ණනයක් කිරීමෙන් අනතුරු ව රුහුණේ අගනුවර ලෙස සැලකූ මහාගාම හෙවත් මාගම වර්ණනය කිරීම පිණිස ඒ හා බැඳුණු කථාවස්තුවක් වන ධම්ම සවණෝපාසිකා කථා වස්තුව ඉදිරිපත් කරන්නට ඇතැයි සිතිය හැකිය. එහිදී මාගම ගැන ද කතුවරයා උත්කර්ෂවත් අන්දමින් වර්ණනය කරයි. සියදහස් ගණන් භික්ෂුභික්ෂුණීන් විසින් ගැවසී ගත් සියදහස් ගණන් විහාර ආරාම, ඉසුරුමත් මහජනයා, දෙමහල් තුන්මහල් ආදී නොයෙක් මහලින් සැදි ගෙවල් තිස්ලක්ෂයක් පමණ, සියගණන් වීථි, නැටුම් ගැයුම් වැයුම් ආදියෙන් නිරතුරු මහජනයා සතුටු කරවන පරිත්‍යාගශීලී ජනතාව, සැදැහැවත් ජනතාව විසින් නිරතුරු ව පවත්වන පුද පූජා යන මේ ආදී කරුණු මාගම පිළිබඳ කරන වර්ණනයෙහි දැක්වේ.

මෙබඳු කථා සංග්‍රහයෙකින් පැරණි ගත්කතුවරයන් බලාපොරොත්තු වූ පරිදි පොදු ජන ජීවිතයට අවශ්‍ය උපදේශ කථනයට ද ශ්‍රද්ධා සුමනා කථාව උපයෝගී කර ගැනීමට හැකිවීම සැලකිය යුතු විශේෂ කරුණකි.

අකීකරු ව හැසිරෙන සුමනාව ඇයගේ ස්වාමිපුරුෂයා විසින් නිවසින් පලවා හැරීම නිසා අසරණ තත්ත්වයට පැමිණීම කීකරුකමක් නැති අන් අයට ආදර්ශයක් වන අයුරු උපදේශාත්මක ස්වරූපයෙන් කතුවරයා මෙසේ පවසයි.

"අහෝ ඛේදයක් ඇසුව මැනවි. නොකීකරු ව සිත් සේ ඇවිදිනවුන්ට මෙපරිද්දෙන් ම පිරිහීම වන්නේය. ඒ එසේ මැයි. කුඩා වූ හෝ මහත් වූ ඉෂ්ටානිෂ්ට වූ යම්කිසි කාර්යක් මවුපියන් ආදී වූ වැඩිමහල්ලන් විචාරා ඔවුන්ගේ අදහස් දැන කටයුත්තේය. දෙමවුපියන්ගේ අභිප්‍රාය නැති ව ඉදින් රාජ්‍යසම්පත්තියක් ලැබෙන්නේ වී නුමුත් (ඒ ලාභය) සුවච කීකරු ව දෙමවුපියන් අනුව පවත්නා උත්තම පුත්‍රයන් විසින් එබඳු රාජ්‍ය සම්පත්තියෙහිදු ආලය නොකට යුත්තේය." (සද්ධර්මාලං. 392 පි.)

Non-Commercial Distribution

කථා හා චරිත මගින් උපදෙස් දීමේ පැරණි ගත්කතුවරයන්ගේ සම්ප්‍රදාය සද්ධර්මාලංකාර කතුවරයා ද අනුගමනය කළ අයුරු මෙහි මෙබඳු වෙනත් තැන්වලින් ද පැහැදිලි වේ.

පොදු ජනතාවට පමණක් නොව රජදරුවන්ට ද රාජ්‍යපාලන විධි ගැන සුදුසු උපදෙස් දීමට වුව ද පැරණි සිංහල ගත්කතුවරයන් පසුබට නොවූ අයුරු සද්ධර්මාලංකාරයෙහි එන කැලණිතිස්ස රජුගේ කතා පුවතින් ද ප්‍රකට වේ. කැලණිතිස් රජු කැලණි තෙරුන් වහන්සේට කළ දරුණු අපරාධය නිසා අමාත්‍ය මණ්ඩලය රැස්වී රජුට අවවාද කරන ආකාරය සද්ධර්මාලංකාරයෙහි මෙසේ දැක්වේ.

"රජදරුවන් විසින් යම් සේ කටයුත්තක් පරීක්ෂාකාරී ව කටයුතුය. අපරීක්ෂාකාරී නොවිය යුත්තේය. තමතමන් විසින් කළමනා කටයුතු නුවණින් සලකා කරන්නාවූ රජදරුවන්ගේ යශෝකීර්තිය........ නිරන්තරයෙන් දසදිග පැතිර වඩනේය...... තව ද ඉතා භය එලවන්නාවූ ද ඉතා මොලොක් වූ ද ධනධාන්‍ය නැති ව ඉතා දිළිඳු වූ ද කළමනා කටයුත්තෙහි මන්දෝත්සාහී ව කල් යවන්නාවූ ද කාමයෙහි ඉතා ගිජු වූ ද යන මේ දෝෂයෙන් යුක්ත රජදරුවන්ට හැමදෙන ම නින්දා කරන්නාහ." (සද්ධර්මාලං. 440 පි.)

මෙම අවවාදමාලාවෙහි නපුරු වචන කීම, ප්‍රමාදවීම, වංචාව, කුසීතබව, මහජනයාට භයජනක දර්ශනයක් වීම ආදිය ද රජුන්ගේ පරිහානියට හේතුවන බව විස්තර වශයෙන් දැක්වේ.

රජයට අයත් වස්තුව අයුතු අන්දමින් පැහැර ගැනීමේ හා පරිහරණය කිරීමේ ආදීනව ගැන ගැමි කාන්තාවක් පවසන අවවාදාත්මක කථාවක් සද්ධර්මාලංකාරයෙහි උත්තරෝලිය කථා වස්තුවෙහි දක්නට ලැබේ. වර්තමාන සමාජයට වුව ද ප්‍රයෝජනවත් එම අවවාදය මෙසේය:

"ලෝකවාසී වූ අඥාන සත්වයෝ විෂ නොවන දෙය විෂයැයි කියති. සැබෑ විෂයක් නම් රජ දරුවන් සන්තක වස්තුව මය. කාරණා කිමද යත්? විෂය කෑ තැනැත්තහු විනා අනිකකු නැසිය නොහෙයි. රජ දරුවන් සන්තක වස්තුව සොරා සහවා ගත් කෙනෙක් ඇත්නම් උන් තබා උන්ගේ දරු මුනුබුරු පරම්පරාව දක්වාත් සියල්ලවුන් ම නසයි. එම්බා වනාන්තරයෙහි ලැවු ගිනි ගත් කල පවා අතරතුරේ තෝරි සිටින වෘක්ෂයෝ ඇත් මය. රජ දරුවන්ගේ කෝප නමැති ගිනි ගත්තාවූ මනුෂ්‍ය නමැති වනාන්තරයෙහි තෝරි සිටිනා මනුෂ්‍ය කෙනෙක් නැති මය. දරු මුනුබුරන් දක්වාත් මරවාපියති. රජ දරුවන්ට වඩා බලී මාරයා දෝ හෝ නොහොත් මාරයාට වඩා බලී මාර රජ දරුවෝ දෝ හෝ යි මෙසේ තොප සිතට සැක වූ නම් ඊට කිසි සැකයක් නොසිතව. මාරයා කල් යවා බොහෝ කලකින් මරා ගන්නේය. රජ දරුවෝ කෝප වූ ඇසිල්ලෙහි ම මරවාපියති. එසේ හෙයින් මාරයාටත් වඩා රජදරුවන් බලී බව නොදනු දැයි මෙසේ ඒ ගැහැණිය භය ගන්වා බිණුව.........."

Non-Commercial Distribution

සද්ධර්මාලංකාරය වේදේහ හිමියන් විසින් සම්පාදිත රසවාහිනී පාලි ග්‍රන්ථය ආශ්‍රයෙන් සම්පාදනය කරන ලද බව පළමුවෙන් ප්‍රකාශ කෙළෙමු. රසවාහිනී කතු හිමියන් ග්‍රන්ථාරම්භයෙහි :

තහිං තහිමුප්පන්නානි වත්ථූනි අරහා පුරෙ
අභාසුං දීපභාසාය තං ඨපෙසුං පුරාතනා
මහාවිහාරෙ තංගුත්තවංක පරිවෙණවාසිකො
රට්ඨපාලොති නාමෙන සීලාචාරගුණාකරො
හිතාය පරිවත්තෙසි පජානං පාළිභාසතො

ඒ ඒ තැන්වල පහළ වූ කථාප්‍රවෘත්ති පෙර විසූ රහතන් වහන්සේ දීප භාෂාවෙන් (හෙළ බසින්) ප්‍රකාශ කොට තැබූහ. මහා විහාරයෙහි එම කථා වස්තු ආරක්ෂා කොට තබන ලදී. වංක පිරිවෙන් වැසි රට්ඨපාල නම් තෙරුන් වහන්සේ මහජනයාට හිත පිණිස එම කථා පාලි භාෂාවට නැගූහ.

රට්ඨපාල තෙරුන්ගේ එම කථා වස්තු පුනරුක්ත දෝෂ ආදියෙන් යුක්ත නිසා වේදේහ හිමියන් ආකුල තැන් නිරාකුල කොට රසවාහිනිය කළ බව මෙම ගාථාවන්ගෙන් පැවසේ.

ඉහත දැක්වුණ පාලි ගාථාවෙහි 'මහා විහාරෙ තංගුත්තවංක පරිවෙණ වාසිකො' යනු මහා විහාරයෙහි "ගුත්තවංක" පිරිවෙන් වැසි රට්ඨපාල තෙරුන්යැයි පොල්වත්තේ බුද්ධදත්ත හිමියන්ගේ "සහස්ස වත්ථුප්පකරණ" ප්‍රස්තාවනාවෙහි හා වෙනත් උගතුන් කිහිප දෙනෙකුගේ ම ලිපි ලේඛනවල දක්නට ලැබේ. රසවාහිනී ටීකා කතුවරයාගේ විග්‍රහය අනුව "ගුත්තවංක" පිරිවෙණයැ යි අදහස ගැනීම වැරදි ය.

"මහා විහාරෙ තං වත්ථුං ගුත්තං ගොපිතං රක්ඛිතංති අත්ථො. වංක පරිවේණවාසිකො ති එවන්නාමකෙ පරිවෙණෙ වාසිකො" (3 පි.) යනුවෙන් පිරිවෙනේ නම "වංක"යැ යි රසවාහිනී ටීකාව දක්වා ඇත.

සද්ධර්මාලංකාරය කතු හිමියන් විසින් ම තම ග්‍රන්ථය හඳුන්වනු ලබනුයේ ධර්ම ව්‍යාඛ්‍යානයක් ලෙස ය. බුදුරජාණන් වහන්සේගේ ධර්මය විස්තර කිරීම පිණිස මෙම ග්‍රන්ථය සම්පාදනය කළ බව ඉන් පැවසේ. එහෙත් මෙහි ඇතුළත් යෝධයන්ගේ උත්පත්ති කථා, දුටුගැමුණු එළාර අතර පැවැති යුද්ධය, විජිතපුර සටන ආදී ඓතිහාසික පක්ෂයෙන් වැදගත් තොරතුරු විමසා බලන කල පැරණි සිංහල ගත් කතුවරයන් ග්‍රන්ථ සම්පාදනයෙහිදී අනුගමනය කළ සාම්ප්‍රදායික මාර්ගය මෙම කතුවරයා විසින් ද නොඉක්මවූ බව පෙනේ. මහාවංශය ආදී ඓතිහාසික ග්‍රන්ථයන්ගෙන් ද මෙම කරුණු තහවුරු වේ.

Non-Commercial Distribution

ස්වාර්ථ පරාර්ථ සංසිද්ධිය, සියලු දෙනාට ම ආනන්දය ගෙනදීම, ලෝක බහුමානයට භාජන වීම, සාධු ජනයන්ගේ සිත් පහදවා සගමොක් සැපත් සාධා දීම ආදිය මෙම ග්‍රන්ථයෙන් කතුවරයා බලාපොරොත්තු වන පරමාර්ථ හැටියට ප්‍රකාශ කරයි. (756 පි.)

සද්ධර්මාලංකාර කතුවරයා රසවාහිනී පාලි ග්‍රන්ථයෙහි කථා සිංහලයට නගා දැක්වීමේදී පාලි පොතට ම වහල් නොවී අවශ්‍ය අතිරේක විස්තර ආදිය ද ඇතුළු කොට කථා ඉදිරිපත් කිරීමට උනන්දු වූ බව පෙනේ. එමගින් සිංහල පාඨකයන්ට විශේෂයෙන් පැරණි ඓතිහාසික තොරතුරු පිළිබඳ අවබෝධයක් ලබා දීම කතුවරයාගේ පරමාර්ථය වූ බව සිතිය හැකිය. නිදසුන් වශයෙන් සහස්ස වත්ථුප්පකරණය, රසවාහිනිය, සද්ධර්මාලංකාරය යන ග්‍රන්ථත්‍රයෙහි ම එන 'නාග වත්ථුව' මෙහිලා විමසා බලමු.

සහස්සවත්ථුප්පකරණය මෙම කථාවස්තුව ආරම්භ කරනුයේ මෙසේය :

'සට්ඨිමත්තා භික්ඛූ නාගදීපෙ රාජායතන චෙතියං වන්දිතුකාමා හුත්වා නාගදීපං ගන්ත්වා රාජායතන චෙතියං වන්දිත්වා අත්තනො භික්ඛාචාරකාලෙ නාග ගාමං භික්ඛාය පවිසිත්වා සකල ගාමම්හි භික්ඛාය චරිත්වා කිංචි අලභිත්වා යථා ධොතෙනෙව පත්තෙන නික්ඛමිංසු'

(සහස්සවත්ථු 32 පි.)

(භික්ෂූන් වහන්සේ සැට නමක් පමණ නාගදීපයෙහි රාජායතන චෛත්‍ය වන්දනාව සඳහා එහි ගොස් වන්දනා කොට පිඬු සිඟා වැඩ කිසිවක් නොලැබ ආපසු පැමිණියහ.)

මෙම පුවත 'රසවාහිනිය' දක්වනුයේ මෙසේ ය :

භගවති ධරමානෙ ලංකායං නාගදීපෙ චූලොදරො මහොදරොති ද්වෙ මාතුල භාගිනෙය්‍යා මණිපල්ලංකස්ස කාරණා මහා සංගාමං පච්චුපට්ඨාපෙසුං (බුද්ධකාලයේ ලක්දිව නාගදීපයෙහි චූලෝදර මහෝදර දෙමයිල් නාරජුන් අතර මිණි පලඟක් නිසා මහත් වූ සංග්‍රාමයක් ඇතිවිය) ආදී වශයෙන් රාජායතන චෛත්‍ය සම්බන්ධ ඓතිහාසික ප්‍රවෘත්තිය සවිස්තර ව ඉදිරිපත් කොට අනතුරු ව,

එකස්මිං කිර සමයෙ ලංකාදීපෙ සට්ඨිමත්තා භික්ඛූ සමන්තකූට කල්‍යාණිකාදයො මහා විහාරෙ වන්දන්තා පූජෙන්තා ආහිණ්ඩන්ති. තතො තෙ නාගදීපෙ රාජායතන චෙතියං වන්දිතුකාමා හුත්වා අනුපුබ්බෙන තත්ථ ගන්ත්වා රාජායතන චෙතියං වන්දිත්වා පූජෙත්වා පභාතාය රත්තියා තෙ සුනිවත්ථා සුපාරුතා ගාමං පිණ්ඩාය පවිසිත්වා සකලගාමෙ චරන්තා කිංචි අලභිත්වා යථා ධොතපත්තෙනෙව නික්ඛමිංසු (රසවාහිනී 17 පි.)

Non-Commercial Distribution

රසවාහිනී පාලි පාඨයෙහි අදහස සහස්සවත්ථුප්පකරණ පාඨයේ අදහසට බෙහෙවින් සමාන ය. සද්ධර්මාලංකාර කතුවරයා මෙම කථා ප්‍රවෘත්තිය මෙසේ ආරම්භ කරයි:

'මෙම ලංකාද්වීපයෙහි දිව සත්රුවනින් විසිතුරු වූ පවුරුපදනමින් හා උද්‍යානවිමානාදියෙන් සශ්‍රීක ව එක මහල් ගෙයක් සේ සශ්‍රීක දිව්‍යනාගයන්ට වාසස්ථාන වූ නාගභවන තුනෙක් විය. එයින් වඩුන්නාගල නාගභවනයෙහි තිස් කෙළක් නයින්ට නායක වූ චූලෝදර නම් නා රජෙක් වෙසෙයි. කැලණි ගංගා නාග භවනයෙහි විසි කෙළක් නයින්ට නායක වූ මණිඅක්ඛික නම් නාරජෙක් වෙසෙයි. මණිනාග දිවයින සමුද්‍ර නාගභවනයෙහි තිස් කෙළක් නයින්ට නායක වූ මහෝදර නම් නා රජෙක් වෙසෙයි' (සද්ධර්මාලං. 415 පි.)

මෙම නාගයන් අතර ඇති වූ කලහය හා රාජායතන චෛත්‍යයේ උත්පත්ති කථාව සවිස්තර ව දක්වා ඉන්පසු සද්ධර්මාලංකාරය කථා ප්‍රවෘත්තිය මෙසේ ඉදිරිපත් කරයි.

"එක් සමයෙක්හි ලංකාදීප වාසී වූ සඟ සැට දෙනකුන් වහන්සේ සමනළ කැලණිය ආදී වූ සිද්ධස්ථාන වැඳ පුදා ඇවිදිනාසේක් මණිනාග දිවයින ඒ රාජායතන නම් වූ දාගැබ වඳනා කැමති ව අතරමග විහාර වඩිමින් නාග දිවයිනට වැඩ එතැන්හි ම සැතපී දෙවන දවස් උදාසන්හි සිරුරු පිළිදැග කළමනා වත් සපයා වැඳ පුදා ඉක්බිති ගැටවටු ගන්වා ගමට සිහා වැඩ එක් ගෙයකිනුත් අහරක් නොලත් හෙයින් පාත්‍රය සේදූ වන ම ඇරගෙන ගමින් පිටත් වූ සේක."
(සද්ධර්මාලං. 419 පි.)

සද්ධර්මාලංකාරයෙහි එන මෙම විස්තරයෙන් ලක්දිව පිහිටි දිව්‍යනාග භවන තුනක් ගැන පැවසේ. වඩුන්නාගල, කැලණි ගඟ සහ මණිනාග දිවයින යන තුනයි. මේ නාග ගෝත්‍රිකයන් ඔවුනොවුන්ට ඥාතිත්වයක් ඇති ව සිටි බව ද සඳහන් වේ. වඩුන්නාගල නාග භවනයට අධිපති චූලෝදර නාරජු හා මණිනාග දිවයිනට අධිපති මහෝදර නාරජු ද අතර මිණිපලඟක් නිසා සටනක් ඇති වූ අවස්ථාවෙහි ඔවුනොවුන් සටනට සැරසී වහසිබස් කී අයුරු මෙහි විස්තර වශයෙන් දැක්වේ. එම විස්තරයෙන් ප්‍රකට වනුයේ මොවුන් හැම දෙන ම මනුෂ්‍ය කොට්ඨාසයක් බව ය. "කඩු පලිහ පලඟ පත්තිරම් ආදී වූ නානාප්‍රකාර ආයුධ පන්ති රැගෙන ඔවුහු සටනට වන්හ, මෙම වර්ණනය අනුව විමසා බලන කල නාග යනු මනුෂ්‍ය කොට්ඨාසයක් බව නිසැක ව ම පැවසිය හැකිය. බුදුරජාණන් වහන්සේගේ ද්විතීය ලංකාගමනය හා සම්බන්ධ මෙම සිද්ධිය මහාවංශය ආදී ඓතිහාසික ග්‍රන්ථයන්හි ද දක්නට ලැබෙතත් නාග භවන තුන ගැන කරන විස්තරය හා උභය පක්ෂයේ සටන් අවස්ථාව පිළිබඳ මෙහි එන විස්තරය ද එම ග්‍රන්ථයන්හි දක්නට නොලැබේ. කාව්‍යමය රචනාවක ලක්ෂණ නිරූපණය කෙරෙන මෙම යුද්ධ වර්ණනය

Non-Commercial Distribution

සද්ධර්මාලංකාර කතුවරයා විසින් එක් කරනලද විශේෂ වර්ණනයෙකැ යි සිතිය හැකිය.

ආගමික වශයෙන් රෝහණයේ පැවති දියුණු තත්ත්වය සද්ධර්මාලංකාරයේ කථාවස්තු හා සම්බන්ධ බෞද්ධ වෙහෙර විහාර හා මහතෙරුන්වහන්සේලා ගැන කරන විස්තරවලින් අනාවරණය වේ. එපමණක් නොව අනුරාධපුරයේ හා උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි බෞද්ධ සිද්ධස්ථාන ගැන විස්තර ද සද්ධර්මාලංකාරයෙහි දක්නට ලැබේ. තිස්ස මහා විහාරය, මියුගුණු සෑය, සිතුල්පව්ව, සඳගිරි වෙහෙර, උතුරුදිග මහා නාග විහාරය, දේවගිරි විහාරය, සෑගිරි වෙහෙර, මිහින්තලා විහාරය, මිරිසවැටිය, දකුණුගිරි විහාරය, මහා විහාරය (පංච මහා ආවාස) ඇත්නඳ විහාරය, ථූපාරාම විහාරය, මණිනාග දිවයින මහ සෑය, පියංගල විහාරය, සුලුගුලු වෙහෙර ආදී ප්‍රකට විහාරස්ථාන සමූහයක් ගැන මෙන් ම අප්‍රකට විහාරස්ථාන සිය ගණනක් සම්බන්ධ පුවත් ද සද්ධර්මාලංකාරයෙහි දක්නට ලැබේ. මෙහි ලා විශේෂයෙන් සඳහන් කළයුතු කරුණක් නම් ඇතැම් විහාරස්ථාන ගැන කතුවරයා කරන විස්තර වර්ණනා ය.

මිහින්තලා විහාර වර්ණනයෙහි තුන් සිය සැටක් පමණ ධාතුගර්භ, විසිතුරු සිතියමින් හොබනා පිළිමගෙවල්, සිය ගණන් පොකුණු පනැස්, එක් දහස් සාරසිය පනළිස් හයක් පිරිවෙන් ගෙවල් ගැන ද එම විහාරස්ථානයෙහි දොළොස් දහසක් සංඝයා වැඩසිටි බව ද පැවසේ. (413 පි.)

රුහුණු රට සප්පදුරු ගං සමීපයෙහි (කප්පකන්දර නදී?) "චතුරු" නම් විහාරයක් ගැන ද කෙටි විස්තරයක් ඉදිරිපත් කොට තිබේ. එම විහාරය සුළුපා මහපා සක්මන් මණ්ඩප ආදියෙන් යුක්ත බවත් සිය ගණන් සංඝයා වහන්සේගෙන් ආකීර්ණ ව පැවති බවත් කියයි. (528 පි.)

ගෞතම බුදුරජාණන් වහන්සේගේ දකුණු අකුධාතුව නිදන් කොට දෙවනපෑතිස් රජු විසින් අනුරාධපුරයෙහි කරවන ලද ථූපාරාමය ගැන විස්තරයක් කරන සද්ධර්මාලංකාරය එය තිස් රියන් උස ආශ්චර්යවත් දාගැබක් බවත් විහාරය වටේ උළින් උස් කොට සුණු කර්මාන්තයෙන් විසිතුරු කරනලද පවුරු පදනම් දොරටු අටලු පිරිවෙන් ආදියෙන් සමලංකෘත බවත් දෙමහල් තුන් මහල් ප්‍රාසාද පන්ති හා සිය ගණන් භික්ෂූන්ගෙන් ගැවසී ගත් තැනක් බවත් පවසයි.

මහණුදුරු විහාරය (මහා නිජ්ඣර විහාර) ගැන සද්ධර්මාලංකාරයෙහි එන විස්තරය අනුව එක ම විහාරයෙහි රුක්ඛමූලිකාංගය, අබ්භෝකාසිකාංගය, පංසුකූලිකාංගය, සෝසානිකාංගය, පිණ්ඩපාතිකාංගය, නේසජ්ජිකාංගය, ඒකාසනිකාංගය ආදී විවිධ ධුතාංග පුරමින් භාවනානුයෝගී ව මහණදම් පුරන භික්ෂූන් වහන්සේ වාසය කළ බව පෙනේ. (533 පි.)

Non-Commercial Distribution

දාඨාසේන යෝධයා පිළිබඳ කථාවස්තුවෙහි එන 'තක්ක' නුවර අභිවත්තිය නම් මහා විහාරය ගැන කෙරෙන වර්ණනය ද මෙහිලා විශේෂයෙන් දැක්විය යුතු ව ඇත. මෙම විහාරස්ථානය දඹදිව පිහිටි බව සඳහන් වේ. දාඨාසේනයන් එහි ගිය ගමන් මඟ අනුව නාග දිවයිනට ගොස් පණස් යොදුන් පමණ මුහුදෙහි පීනා සොළී රට කාවීර පටුන් තොටින් ගොඩ බැස එතැන් සිට දොළොස් යොදුන් මඟ ගෙවා තක්ක නුවරට පිවිසියේය. එහිදී රහතන් වහන්සේලා වැඩ සිටින විහාරස්ථානයක් ගැන මහජනයාගෙන් විමසූ කල ඔවුන් අභිවත්තිය මහා විහාරය ගැන කළ විස්තරයයි සද්ධර්මාලංකාරයෙහි දැක්වෙනුයේ.

අභිවත්තිය විහාරස්ථානය ගැන කෙරෙන මෙම විස්තරය රසවාහිනියෙහි ද කාව්‍ය රසයෙන් යුත් ගාථා පන්තියෙකින් පවසා ඇත. එම ගාථාවන් සිංහලයට නගා සද්ධර්මාලංකාර කතුවරයා ඉදිරිපත් කර ඇත.

වරුණ නම් මහරහතන් වහන්සේ අභිවත්තිය විහාරයෙහි අධිපති වූ සේක. මොනර කරක් සේ නිල් වූ සිත්කළු වූ මහා පර්වතප්‍රාන්තයක පිහිටි වනෝද්‍යානය ගැන අති උත්කර්ෂවත් අන්දමින් කෙරෙන වර්ණනයෙන් අනතුරු ව විහාර පරිසරය හා විහාරස්ථානය ගැන වර්ණනය කර ඇත. පහත දැක්වෙනුයේ එම වර්ණනයේ එක් ඡේදයකි.

> "සුපුෂ්පිත පද්මෝත්පලපුණ්ඩරීකාදීන් ප්‍රතිමණ්ඩිත වූ සීතලජලභරිත වූ පුෂ්කරණීහු ඒ ඒ තැන්හි පිහිටියහ. මෙසේ නොයෙක් පලුපල්ලවකුසුමයෙන් සශ්‍රීක වූ විසිතුරු තුරු පෙළින් හා මනහර විල්පොකුණු වැලිතලා ගල්තලා ඇලදොළ ආදීන් මනෝඥ වූ පර්වතප්‍රාන්තයෙහි පවුරු පදනමින් හා රන්වන් සුලුපා මහපා සක්මන් මණ්ඩප ලේනපබ්භාරාදීන් ප්‍රතිමණ්ඩිත වූ අති ධවල වැලි මළු පෙළින් ගැවසී නිරන්තරයෙන් නරසුර අසුර ගරුඩගන්ධර්වාදීන් විසින් භජනය කරන ලද අභිවත්තිය නම් වූ මහත් විහාරයෙක් විය."
>
> (524 පි.)

මෙම විස්තර වර්නණයෙන් ප්‍රකට වන්නේ අභිවත්තිය විහාරස්ථානය අරණ්‍ය සේනාසනයක් බවත් එදා ලක්දිව පමණක් නොව දඹදිව ද බෞද්ධ වෙහෙර විහාර ඉතා දියුණු තත්ත්වයක පැවති බවත් ය.

සද්ධර්මාලංකාරයෙහි සඳහන් වන ඓතිහාසික වාර්තා අනුව විශේෂත්වයක් ගන්නා ශ්‍රේෂ්ඨ සංඝපිතෘවරයන් වහන්සේලා ගැන ද මෙහි දී අපගේ අවධානය යොමු විය යුතු ව ඇත. උන්වහන්සේලා අතර කිහිපදෙනකුන් වහන්සේ පිළිබඳ තොරතුරු සැකෙවින් දක්වමු.

"දුටුගැමුණු රජුට පළමු ශික්ෂාපද දුන් ගෝතම හිමි, දීගාමඬුල්ලේ විසූ ගෝධගත්තතිස්ස හිමි, සප්පදුරු විහාරයේ ථෙරපුත්තාභය හිමි, තලගුරු වෙහෙර

Non-Commercial Distribution

ධම්මදින්න හිමි, මහා සමුද්‍ර විහාරයේ සංඝරක්ඛිත හිමි, ථූපාරාමයේ අසිග්ගාහක පිරිවෙනේ චූලනාග හිමි, උදුම්බරගිරි පර්වතයේ චන්ද්‍රමුඛ ලෙන විසූ මලියදේව හිමි, යෝනක බුද්ධරක්ඛිත හිමි, තිස් මහ වෙහෙර ධම්මදින්න හිමි, ධටක්‍ෂු නම් භාවනා ගෙහි විසූ චූල පිණ්ඩපාතිකනාග හිමි, දක්ෂිණාරාම විහාරයේ තම්බසුමන හිමි, තිස් මහ වෙහෙර චූලපිණ්ඩපාතික තිස්ස හිමි ආදී ථෙරවාදී භික්ෂු පරම්පරාවට අයත් මෙම හිමිවරුන් අතර රහත් මහපල ලබා ගත් උතුමෝ ද වෙති. නගරබද මෙන් ම ගම්බද පෙදෙස්වල විහාරස්ථානයන්හි ද වෙසෙමින් මුන්වහන්සේලා විසින් ඉටු කරන ලද සාසනික සේවාව කෙබඳු දැයි සද්ධර්මාලංකාරයෙහි එන කථා ප්‍රවෘත්තිවලින් මනාව ප්‍රකට වේ.

වට්ටගාමිණී අභය රාජ සමයෙහි (ක්‍රි. පූ. 89-77) ලක්දිව ඇති වූ බැමිණිටියා සාගතය සම්බන්ධ විස්තර ද ඒ හා බැඳුණු විවිධ ප්‍රවෘත්ති ද සද්ධර්මාලංකාරයෙහි අන්තර්ගත වේ. පාලි අට්ඨකතා හා ටීකා ග්‍රන්ථයන්හි දැක්වෙන පරිදි මෙම සාගතය සම්බන්ධ දීර්ඝ විස්තරයක් සද්ධර්මාලංකාරයේ 20 වන පිටුවේ සඳහන් වේ. තම්බසුමන වස්තුව (565 පි.) චන්ද්‍රලපබ්බත වස්තුව (568 පි.) සංඝදත්ත වස්තුව (612 පි.) ජයම්පතිකා වස්තුව (642 පි.) රුක්ඛදේවතා වස්තුව (667 පි.) ආදී කථාවස්තු සම්බන්ධ වී ඇත්තේ බැමිණිටියා සාගත සමයට ය. එම කාල පරිච්ඡේදයේ ලක්දිව පැවති දුර්භික්ෂය හා පීඩාකාරී ජන ජීවිතය ද විශේෂයෙන් භික්ෂූන් වහන්සේට මුහුණපෑමට සිදු වූ සම්බාධක ද මෙම කථාවස්තුවලින් අනාවරණය වේ.

මාගම්පුර රාජධානිය හා රෝහණයේ ඉතිහාසය හා සම්බන්ධ මහානාග, යටාලතිස්ස, ගෝඨාභය, කාකවණ්ණතිස්ස, කැලණිතිස්ස, දුට්ඨගාමිණී, සද්ධාතිස්ස, ලජ්ජිතිස්ස ආදී රාජ්‍ය පාලකයන්ගේ පාලන අවධි ගැන තොරතුරු සද්ධර්මාලංකාරයෙහි ඇතුළත් ලංකාදීප උප්පත්ති කථා පරීක්ෂා කර බැලීමෙන් දැනගත හැකිවේ.

දුට්ඨගාමිණී අභය රජුගේ යුද්ධකාර්යය ජයග්‍රහණය කරා මෙහෙයවීමට උපකාරවත් වූ නන්දිමිත්ත, ඵුස්සදේව, ලභියවසභ ආදී දසමහ යෝධයන් පිළිබඳ සම්පූර්ණ විස්තර කථා මෙම ග්‍රන්ථයෙහි ඇතුළත් වී තිබේ. වීර චරිත කථා වශයෙන් මෙම කථාවස්තු අගය කළහැකිය.

පැරණි ලක්දිව පැවති සිරිත් විරිත් ආදිය ගැන අගනා තොරතුරු ද සද්ධර්මාලංකාරයෙහි ඇතුළත් කථාවස්තු විමසා බැලීමේදී පැහැදිලි වේ. දුටුගැමුණු රජුගේ පුත් සාලි කුමරු උපන් දිනයේ ලංකාද්වීපයේ පුවඳ රත්හැල් වර්ෂා කළ බවත් තණවරා ආදි කටුසර පිරි කොටගුළු පුවඳ හැලින් පිරුණ බවත් හිස් කොටගුළු ද එසේ පිරුණ බවත් කියයි. මෙම විස්තරයෙහි එන ඉතා වැදගත් කරුණු නම් දරුවකුගේ බත් කැවීමේ මංගල්‍යය, කන් විදීමේ මංගල්‍යය හා තුන් මසින් සත් මසින් නව මසින් මංගල්‍ය කළ බව ද එම පුවතෙහි සඳහන් වීමයි. (538 පි.) කුඩා දරුවන්ට

Non-Commercial Distribution

අකුරු ඉගැන්වීම සම්බන්ධ පුවතක් උත්තරෝලිය කථාවස්තුවෙහි ද දක්නට ලැබේ. එය මෙසේය. :

> "ඒ කුමාරයන් මවුකුසින් බිහි ව ක්‍රමයෙන් වැඩී ශික්ෂාග්‍රහණ කාලය සම්ප්‍රාප්ත විය. එකල මේ ලංකාද්වීපයෙහි මනුෂ්‍යයෝ පස් හැවිරිදි කුමාරවරුන් තම තමන් විභවානුරූප ව නොයෙක් ආභරණයෙන් සරහා මහත් වූ මඟුලෙන් ශික්ෂා ග්‍රහණය කරවති." (425 පි.)

පස් හැවිරිදි වයස සම්පූර්ණ වන විට දරුවන්ට අකුරු කියවීමේ චාරිත්‍රයක් එදා ලක්දිව පැවති බව මින් පැහැදිලි වේ. රසවාහිනියෙහි මෙම පුවත මෙයට බෙහෙවින් සමාන ව දක්නට ලැබේ :

> "තදා කිර දීපවාසිනො පංචවස්සිනං කුමාරං විභවානුරූපාභරණෙහි අලංකරිත්වා මංගලෙන සික්ඛාපදං ගණ්හාපෙන්ති. තදා පි තස්ස මාතා සික්ඛාගහණ මංගල නාමගහණ මංගලෙසු පුත්තං පසාධෙන්ති. හිටිකුමහතො තදා ඉත්ථියා පක්ඛිත්ත වත්ථං ගහෙත්වා නිවාසෙසි" (රසවාහිනී, ලංකාදීපුප්පත්ති කථා 23 පි.)

කැලණිතිස්ස රජුගේ සමයෙහි මුහුද ගොඩ ගැලීමෙන් සිදු වූ විනාශය සම්බන්ධයෙන් රසවාහිනියෙහි මෙන් ම සද්ධර්මාලංකාරයෙහි ද සඳහන් කරුණු අනුව ලක්දිවට පිරිවර වූ කුඩා දිවයින් නවයක් පැවති බව පැවසේ. එම දිවයින් නවය සමග මහ පටුනුගම් තිස් පන් දහස් පන්සිය හතරක් ද වැව් කෙත්වතු ආදිය ද මුහුදුබත් වූ බව කියැවේ. එදා කැලණියට මුහුද සත් ගවු පමණ දුර විය. ඉන් එක් ගව් පමණ දුර ඉතිරි ව අන් සියල්ල මුහුදු බත් වී ඇත. (442 පි.)

පෙර ලක්දිව පැවති ජාතික උත්සව අතර 'වප් මඟුල' ද වැදගත් තැනක් ගෙන ඇත. එබඳු වප් මඟුල් උත්සවයක් ගැන විස්තර දුබ්බිට්ඨි මහා තිස්ස කථා වස්තුවෙහි දක්නට ලැබේ. ඒ මෙසේය:

> 'මැත භාගයෙහි උන්ගේ මහත් වූ වප් මඟුලෙක් විය. නොයෙක් සිය ගණන් මනුෂ්‍යයෝ කර්මාන්තයෙහි නියුක්ත වූවාහු සර්වාංගයෙන් ධවල වූ සුදු ගොනුන් කසා නාවා කරබොලු ආභරණ පළඳවා අංවල රන් රිදී කුප්පි බහා පය රන් රසු බැඳ සර්වාලංකාරයෙන් සරහා නඟුල් වියදඬු ආදියෙහි යොදා සියලු මනුෂ්‍යයෝ තම තමන්ගේ විභවානුරූප පරිද්දෙන් නොයෙක් කනබොන දෑ සපයා කමින් බොමින් සර්වාභරණයෙන් සැරහී සමහරෙක් සාති. සමහරෙක් වපුරති. ගෙවල ස්ත්‍රී ජනයෝ ද එපරිද්දෙන් ම වස්ත්‍රාභරණාලංකාරයෙන් ම සැරහී මහත් වූ උත්සවයෙන් ම වපුරති.'
>
> (674 පි.)

Non-Commercial Distribution

එදා වප් මඟුල් උත්සවය කොතරම් උත්කර්ෂවත් ලෙස පැවැත්වූයේ ද යනු මෙම වර්ණනයෙන් ප්‍රකට වේ.

චූලගල්ල කථා වස්තුවෙහි මනුෂ්‍ය ගන්ධර්වයන්ගේ වීණා වාදන ශිල්පය ගැන කෙරෙන දීර්ඝ විස්තරය ද සද්ධර්මාලංකාරයෙහි එන වීමංසනයට භාජන විය යුතු තවත් වැදගත් කොටසකි.

'මනුෂ්‍ය ගාන්ධර්වයෝ වීණා වයන කල උසභය ධෛවතය ෂඩ්ජය ගන්ධාරය මධ්‍යමය පංචමය නිෂාදය යි මෙසේ සර සතක් හා ෂඩ්ජ ග්‍රාමය මධ්‍යම ග්‍රාමය සාධාරණ ග්‍රාමය සංඛ්‍යාත සර සමූහ තුනක් හා උසභාදී වූ සප්තස්වරයන් අතුරෙන් එකි එකී ස්වරයකට තුන් තුන් මූසන බැගින් එක්විසි මූසනක් හා එකි එකී සරයට සත් සත් ස්ථාන මන්දාඛ්‍යාවස්ථාව පවත්නා එකුන් පණස් ස්ථාන විශේෂයක් හා ශ්‍රැතිභේද වශයෙන් පළමුවන ස්වරයෙහි ශ්‍රැති තුනෙක දෙවන ස්වරයෙහි ශ්‍රැති දෙකෙක තුන්වන ස්වරයෙහි ශ්‍රැති සතරෙක සතරවන ස්වරයෙහි ශ්‍රැති සතරෙක පස් වන ස්වරයෙහි ශ්‍රැති තුනෙක සවන ස්වරයෙහි ශ්‍රැති දෙකෙක සත්වන ස්වරයෙහි ශ්‍රැති සතරෙකැ යි මෙසේ සප්තස්වරයෙහි ශ්‍රැතිභේද දෙවිස්සක් හා මෙකී සකල ප්‍රයෝගයට යෝග්‍ය වන සේ වීණා සදා වාද්‍ය විධි විශේෂාදී වූ ගායනා කෙරෙති'
(680 පි.)

මෙම විස්තරයට අනතුරු ව දිව්‍ය ගාන්ධර්වයන්ගේ වීණා වාදනයෙහි ද විශේෂ ලක්ෂණ දක්වා ඇත. සද්ධර්මාලංකාරයෙහි විද්‍යමාන ඉහත කී වීණා වාදන ශිල්ප විස්තරය රසවාහිනියෙහි මේ අයුරින් සවිස්තර ව ඉදිරිපත් කර නැත. එහෙත් රසවාහිනී ටීකාවෙහි:

සරා සත්ත තයො ගාමා චෙකවීසති මුච්ඡනා
ඨානානෙකූන පඤ්ඤාස ඉච්චෙතං සර මණ්ඩලං
උසභො ධෙවතොචෙව සජ්ජ ගන්ධාර මජ්ඣිමා
පංචමො ච නිසාදොති සත්තෙතෙ ගදිතා සරා (රසවාහිනී ටීකා 79 පි.)

යනාදී ගාථාවන්ගෙන් ඉහත දැක්වුණු විස්තරය ටීකා කතුවරයා සංක්ෂිප්ත ව ඉදිරිපත් කර ඇත. පැරණි සිංහල සාහිත්‍ය ග්‍රන්ථ හුදෙක් බුදු දහම ප්‍රචාරය සඳහා ම ලියන ලදැ යි පවසන ඇතැම් නූතන විචාරකයන් මෙබඳු විස්තර වර්ණනායන් ගැන මැදහත් නුවණින් විමසා බැලිය යුතු ව ඇත.

යුද්ධ සඳහා අවශ්‍ය ආයුධ තනන කර්මාන්ත ශාලා පැවති බවත් රජතුමා විසින් ම ඒවායේ කටයුතු පරීක්ෂා කර බැලූ බවත් සඳහන් වේ. පහත දැක්වෙන පාඨ විමසා බැලීමෙන් මේ බව තහවුරු කර ගත හැකිය.

Non-Commercial Distribution

'එකල නිර්මලයෝ තමන් ලත් ඒ සියල්ල දෙමවුපියන්ට දී එදවස් මාගමට අවුත් රජ්ජුරුවන් දුටහ. එදවස් රජ්ජුරුවෝ බොහෝ නැවැමියන් රැස් කරවා කර්මාන්තශාලාවෙහි නොයෙක් ආයුධ කරවති.' (සද්ධර්මාලංකාරය. 486 පි.)

"එකල්හි රජ්ජුරුවෝ (කාවන්තිස්ස) පන් සියයක් පමණ කර්මකාරයන් ගෙන්වා ශගන නොයෙක් නොයෙක් ආයුධ කරවා සලස්වති..............රජ්ජුරුවෝ සෙසු ආයුධ කර්මාන්ත බලමින් ශාලාව ඇත කෙළවරට ගියහ' (සද්ධර්මාලංකාරය. 518 පි.)

දෙමාපියන් ගැහැණු දරුවන් සූපශාස්ත්‍රයෙහි ප්‍රගුණ කරවීමේ සිරිතක් පැවති බව සද්ධර්මාලංකාරයේ 'කිංචි සංසා' කථාවස්තුවෙන් අනාවරණය වේ.

'උන්ගේ දෙමවුපියෝ ඒ කුමාරිකාවන් සූප ශාස්ත්‍රයෙහි අභ්‍යාස කරවා පිසින සේ ඉගැන්වූහ. එකල ඒ කුමාරිකාවන් පළමු කොට පිසූ උපකරණ සංඝයා වහන්සේට දුන්හ.' (සද්ධර්මාලංකාරය 605 පි.)

ආහාර පිසීමේ කාර්යය හා සම්බන්ධ 'සූප ශාස්ත්‍රයන්' පෙර ලක්දිව පැවති බව මෙයින් පැහැදිලි වේ.

පැරණි ලක්දිව සමාජ ජීවිතය හා සිරිත් විරිත් පිළිබඳ සද්ධර්මාලංකාරයෙන් අනාවරණය වන මෙබඳු වැදගත් තොරතුරු බෙහෙවින් ප්‍රයෝජනවත් ය.

සද්ධර්මාලංකාර කතුවරයා ශ්‍රී ලංකාව හැඳින්වීමේදී ලංකාදීප, සීහලදීප, තම්බපණ්ණි දීප යන නම් තුන ම භාවිත කළ බව පෙනේ. මෙසේ නම් තුන වරින් වර කථාවස්තුවල යොදා ඇත්තේ කවර හේතු නිසා දැයි විමසා බැලිය යුතුයැ යි සිතමි.

පැරණි සිංහල ගද්‍ය සාහිත්‍ය ග්‍රන්ථ අතර සද්ධර්මාලංකාරය විශේෂතා සමූහයකින් යුත් ගද්‍ය ග්‍රන්ථයක් බව මෙතෙක් අප ඉදිරිපත් කළ කරුණු අනුව වටහා ගත හැකිය. රෝහණ ප්‍රදේශයේ පැරණි ජන ජීවිතය හා ඉතිහාසය දෙසට මෙම ග්‍රන්ථයෙන් විහිදී ඇති ආලෝකය වෙනත් කිසිදු පැරණි ග්‍රන්ථයෙකින් නොලැබෙන බව ඉදුරා කිව හැකිය.

Non-Commercial Distribution

සද්ධර්මාලංකාරය

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස

1. පරිච්ඡේදය

1. ධම්මසඞ්ගහ වග්ගය

සත්ථුප්පසත්ථවරණං සරණං ජනානං
බ්‍රහ්මාදිමොලිමණි රංසි සමාවහන්තං,
පඞ්කෙරුහාභමුදුකොමලචාරුවණ්ණං
වන්දාමි චක්කවරලක්ඛණමාදධානං.

යන මේ ගාථාව සකලලක්ෂණ[1] ගුණගණාධාර ජගදීශ්වර[2] ශාස්තෘ වූ[3] සර්වඥයන් වහන්සේගේ ශ්‍රීපාදයුග්මයට නමස්කාර පිණිස දක්වන ලදී.[4]

මෙහි අභිප්‍රාය[5] නම් ස්වර්ගමර්ත්‍යපාතාලසඞ්ඛ්‍යාත භුවනත්‍රයවාසී වූ සමස්තසත්ත්වයන්ගේ ප්‍රසාදනෙත්‍රයට විෂය වෙමින් පාදතලයෙහි පටන් කෙශාන්තය දක්වා සකලශරීරය එකපැහැර සරහා සිටගත්තා වූ සුප්‍රතිෂ්ඨිතපාදදී දෙතිස් මහාපුරුෂ ලක්ෂණයෙන්[6] හා එම දෙතිස් මහාපුරුෂලක්ෂණයන් අනුව පවත්නා[7] තම්බතුඞ්ගනඛාදී වූ අසූ අනුව්‍යඤ්ජන[8]ලක්ෂණ ශ්‍රී ශොභාවන් හේතු කොටගෙන විකසිත පද්මොත්පල පුණ්ඩරීකාදීන් ප්‍රතිමණ්ඩිත වූ ජලතලාවක් සේ ද තාරකානිකරයන්ගේ රශ්මි සමූහස්පර්ශයෙන් විස්ඵුරිත වූ ගගනතලයක් සේ ද සර්වාලි ඵුල්ලිත[9] වූ කුසුමස්තවකයෙන්[10] හොබනා[11] පාරිච්ඡත්‍රක නම් වෘක්ෂරාජයා සේ ද අතිශයින් සශ්‍රීක ව බබළන්නා වූ[12] උභයාඞ්ගයන් අතුරෙන්[13] අධඃශරීරය වසා සර්වඥවෙශානුරූප කොට ත්‍රිමණ්ඩල ප්‍රතිච්ඡාදනාකාරයෙන්[14] අඳනා ලද ලාක්ෂාරසරාශියක් සේ අතිරක්ත වූ දෙපට අඳනා සිවුරෙකින් හා මත්තෙහි බඳනා ලද ස්වර්ණ විද්‍යුල්ලතාවක්[15] හා සමාන මනහර පටිධාතුවෙකින් හා එසේ ම ඌර්ධ්වශරීරය වසා එකාංස කොට වළඳනා ලද සන්ධ්‍යාවලාපටලයක් වැනි සුරක්තවරපාංශුකූලචීවරයෙකින්[16] හා සිරොධාතුව මැදින්

1. ලක්ෂණ සම්පන්න - ක. කි. සද. ස.
2. ජගදෙස්වර - BCDEGHJKL; ජගදේශ්වර වූ A
3. වූ (නැත) - BD
4. ලදී (නැත) - ACEGH
5. අභිප්‍රාව - JKL
6. ලක්ෂණයන්- AGJ
7. පැවැත්තා වූ- B; පවත්නා වූ -CDF, මුද්‍රිත හැම ස.
8. අනුව්‍යඤ්ජන - DEJKL
9. සර්වසර්වාලිඵුල්ලිත - කි.ස.
10. ස්තබකයෙන් - C; තම්බකයෙන්- ABD
11. හොබනා ලද - C, මුද්‍රිත හැම,
12. බබළන - GHKL
13. දෙදෙනා අතුරෙන් - ACDF
    දෙඅතුරෙන් - J
14. පුච්ඡාදනාකාරයෙන් - DEJ
15. විද්‍යුල්ලතා - පිටපත් හැම
16. චීවරයෙන් -ACFJ

Non-Commercial Distribution

රතන[1] ප්‍රමාණයක් නැගී ජෝතිමත් ව[2] බබළන කෙතුමාලාලඞ්කාරයෙකින් හා සියලඟින් නික්ම සක්වළගබ පුරමින් දසදිග දුවන්නාවූ[3] නීලපීතලෝහිතාවදාතමාඤ්ජිෂ්ඨ ප්‍රභාස්වර ය යි කියන ලද සවනක් ඝනබුද්ධරශ්මිමාලා සමූහයෙකින් භින්නවර්ණව හාත්පස්හි වටා[4] සිටගත්තා වූ බ්‍යාම[5]ප්‍රභාමණ්ඩලය කරණකොට ගෙන සන්ධ්‍යාවලාපටලයෙන් හා දෙව්දුන්නෙන් හා විදුලිය කැලයෙන් වලඳනා ලද ස්වර්ණගිරිශිඛරයන්ගේ[6] ද උත්කෘෂ්ට වශයෙන් දක්වන ලද නිසර්ගශොභාවිශෙෂයෙන් විචිත්‍රවක්‍රරත්නාදී වූ අනෙකප්‍රකාර රත්නජාතයන්ගේ[7] ද සියලු දිව්‍යබ්‍රහ්මගරුඩ[8] ගන්ධර්ව[9] සිද්ධවිද්‍යාධරාදීන්ගේ ද සකලශ්‍රී ශොභාවන් එකපැහැර නිශ්ශොභ[10] කෙරෙමින් උපමාවිෂයාතික්‍රාන්ත වූ අතිශය සහිත[11] විලාසශ්‍රීන් දසදික් හොබවා බබළන්නා වූ අෂ්ටාදශ හස්තප්‍රමාණ රූපකායසම්පත්තියක් හා තවද ප්‍රඥාසම්පන්න ජනයන්ගේ නුවණ[12] නෙත්‍රයට විෂය වෙමින් මනඃප්‍රසාද[13] උපදවා තුන්ලෙව්හි[14] පැතිර පවත්නා වූ 'ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධො' යනාදී[15] නවපෙදෙහි සඞ්ගෘහීත ව සිටි ෂට්අසාධාරණඥානය, අෂ්ටවිද්‍යා, පසළොස්චරණධර්මය, අෂ්ටාදශආවෙණිකධර්මය, චුද්දසබුද්ධඥානය[16], ෂට්අභිඥය, දශබලය, සතරවෛශාරද්‍යය, සිව්පිළිසිඹියාය යනාදී වූ අනන්තාපරිමාණ කලණගුණ[17] සමූහ නමැති ධර්මකායසම්පත්තියක් ඇත්තා වූ තමන්වහන්සේගේ රූපශබ්දගුණවිශෙෂ තාක් දුටුදුටුවන් ඇසුඇසුවන් සිතූසිතූවන් ඇස් නිවමින්[18] කන් නිවමින්[18] සිත් නිවමින්[18] වැඳිවැන්දන්ට පිදූපිදූවන්ට එකහෙලා දෙව්[19] මිනිස්සැපත් හා නිවන්සැපත් සාධා දීම් වශයෙන් සියල් ලෝවැසියන් ජාති කාන්තාරාදීන් තරණය කොට අමාමහනිවන් නමැති ශාන්තිපුරයට පමුණුවන හෙයින් ශාස්තෘ නම් වූ සර්වඥයන්වහන්සේගේ ශ්‍රීපාදයුග්මයට[20] නමස්කාර කෙරෙමි.[21]

කෙසේ වූ ද යත්,

"සමුන්නතහසොසහ[22] හංසසීහ, සමාන ලීලාය යහිං පයාති,
නිත්තුන්නතා හෙරිතලාව භූමි, හොතාථ පුප්ඵාදිසුමණ්ඩිතා ච,
අපෙන්ති මග්ගා සයමෙව ඛාණු, සකණ්ටමූලා කඨලා ච සබ්බෙ,
ගම්භීරනීරාපගපඩ්ක...ගගා, හිත්වා සභාවං රමණීයමෙන්ති.

1. රත්න - ABEGHJKL, ම. බෙ.
2. ද්‍යුතිමත් ව - ABCE කි. ම. ක. ඤ. බෙ. ස
3. දිවන්නා වූ - ACDGHJKL, බෙ. ස.
4. වට - GHL
5. ව්‍යාම - G
6. ශිඛරයක් සේ ද - H
7. රත්නජාතීන්ගේ - ABCDFJK
8. ගරුඩ - BCHJ
9. ගාන්ධර්ව - පිටපත් හැම
10. නිශ්ශෝභා - AEGHJK, ඤ.ස. බෙ; නිස්සෝභා -BCDFL
11. සාතිශය සහිත - ACDGHJKL
12. නුවණ නැමැති - F, කි. බෙ. ඤ. ක. ම,
13. මනො - පිටපත් හැම
14. ලොවුහි - AGH
15. යනාදී -H, කි.
16. චතුද්දස - බෙ. ස.
17. සකලගුණ - BHL
18. නිමමින් -DFIJ ; නිමවමින් - KL
19. දෙව් - පිටපත් හැම
20. ද්වන්ද්වයට BIKL; ද්වයට - බෙ.
21. ගුණ වර්ණණ කෙරෙමි - GH
නමස්කාර කෙරෙමි - ස.
22. හසුසහ - බෙ.

Non-Commercial Distribution

වජ්ජන්ති භූමිං ගිරයො පුරත්ථ,[1] පසාරිතෙ පාදවරෙ ජිනස්ස,
නිබ්බාති අග්ගි නරකොදරේ'පි, ගණ්හන්ති පාදෙ පදුමාදයො ච."

යනාදීන් දක්වන ලද මහත් වූ ආනුභාවසම්පත්තීන් යුක්ත වූ කාමලොකය රූපලොකය අරූපලොකය යි කියන ලද තුන් ලෝවාසීන්ට පරමප්‍රතිෂ්ඨාධාර වූ,[2] තවද ජගත්‍රයවාසී වූ සකලජනයන්ගේ වන්දනමානනාදී බහුමානභාජන ව ලොකාධිපති වූ සහම්පතී නම් මහාබ්‍රහ්මයා ආදි කොට ඇති බ්‍රහ්මරාජයන්ගේ ද අමරපුරාධිපති වූ ශක්‍රදෙවේන්ද්‍රයා ප්‍රධාන කොට ඇති මහානුභාවසම්පන්න වූ දිව්‍යරාජයන්ගේ ද, අසුරපුරාධීශ්වර වූ වෙපචිත්ති නම් අසුරේන්ද්‍රයා ප්‍රධාන කොට ඇති ශෞර්‍යවීර්‍යාන්විත අසුරරාජයන්ගේ ද, උරගපුරේශ්වර වූ මහාකාල නම් නාගෙන්ද්‍රයා ආදි කොට ඇති දීර්ඝායුෂ්ක වූ නාගරාජයන්ගේ ද, මනුජලොකනායක වූ කාසි කොසලාදි නරේන්ද්‍රයන්ගේ ද යනාදී වූ රාජාධිරාජප්‍රශස්ත උත්තමරාජයන්ගේ මස්තකාලඞ්කාර වූ මකුටමණිමයූඛමාලාවන් උද්වහනය කරන්නාවූ හෙවත් නිරන්තරයෙන් වැඳ පුදන ලද නෛකබ්‍රහ්ම සුරාසුරොරගගරුඩගන්ධර්ව[3] සිද්ධවිද්‍යාධරාදී වූ රාජාධිරාජයන්ගේ සකලමස්තකාලඞ්කාර වූ මෞලිමාණික්‍ය රශ්මිසමූහ නමැති හංසසහස්‍රයන් උද්වහනය කරන්නාවූ සුමට වට[4] දීර්ඝාඞ්ගුලී පඞ්ක්ති නමැති පෙතිපතරින් හොබනා සර්වාකාර[5]පරිපූර්ණ වූ නාභි නිම්වළලු සහිත දහස්ගණන් දැවි නමැති කෙසරපන්තීන් ශොභමාන වූ චක්‍රලක්ෂණ නැමැති කර්ණිකා දෙකක් හා තව ද,

"තමෙව චක්කං පරිවාරයිත්වා, සිරිවච්ඡසොවත්ථිවතංසකා ච,
පාසාදභද්දාසනපුණ්ණපාතී,[6] සිතාතපත්තා ච මයූරහත්ථා
නීලාදිභෙද කමලුප්පලා ච, සමෙරුසත්තද්දිමහාසමුද්දා,
සත්තාපගා සත්තමහාසරා ච, හිමාලයො චක්කවාළද්දිකො ච
චන්දක්කතාරා ච ඡදෙවලොකා, පිතාමහාවාස මනුස්සලොකං[7]
සුවණ්ණනාවා සිවිකා ච සඞ්ඛං, කෙලාසසෙලං[8] ධජතොරණං ච[9].

---

1. පුරත්ථා - බෙ. ස.
2. වූ (නැත) - ACDEFJ
3. ගාන්ධර්ව - ABCDEFIJ
4. සුමට වටසිලුටු -කි. ම; සුමට මටසිලුටු - බෙ. ස.
5. සර්වාලංකාර -A සර්වප්‍රකාර - B
6. පුණ්ණපාති - IJ, බෙ.
7. මනුස්සලොකා - BEGH, කි.ම.ක.ඤ, බෙ.
8. කෙලාසසෙලා - කි. බෙ. ක. ඤ, ස.
9. තොරණාව - ABGH කි. ම. ක. ඤ

Non-Commercial Distribution

විජාහාමණුණ්ණීස සවච්ඡධෙනු, මීනද්වයං චක්කවත්ති සසෙනො[1]
සීහසසමාතඞ්ගවියග්ඝා[2] රාජා හංසොසභො කිම්පුරිසො මයූරො
කොඤ්චා ච[3] එරාවණහත්ථිරාජා, සචක්කවාකා මකරාදයො ච
නානාමහාමඞ්ගලලක්ඛණානි[4] විරොචමානා විලසන්ති නිච්චං

යනාදීන් දක්වන ලද එම චක්‍රලක්ෂණකර්ණිකා දෙක පිරිවරා සිටි සිරිවස සවස්තිකාදි වූ දෙසියසොළසක් පමණ අනන්‍යසාධාරණොත්තම මඞ්ගලලක්ෂණ[5] නමැති මුවරද සමූහයන් ධරන්නාවූ[6] රක්තපද්මයුගලයක්[7] හා සමාන[8] අරුණතරවර්ණසම්පත්තීන් යුක්ත වූ මෘදු[9] කොමල මනොඥ වූ සියලු ජනයන් විසින් පසස්නා ලද එබඳු ශ්‍රීපාදයුග්මය එහි ජනිත[10] මේ යථොක්ත ප්‍රකාර ඇති සකලජන[11] මනොප්‍රසාදජනක වූ තථාගතොචිත ලක්ෂණගුණචින්තනාදිවශයෙන්[12] මනොද්වාරයෙහි පැවැත්තා වූ භක්තිප්‍රෙමාතිබහුමානොපචාර- භාරාවනතොත්තමාඞ්ගය කරණ කොට ගෙන හෙවත් මනොද්වාරයෙන් ප්‍රෙෂිත ව[13] කායද්වාරයෙන් ප්‍රණීත ව වාග්[14]ද්වාරයෙන් සතුති කෙරෙමින් ආයු වර්ණ සැප බල බුද්ධිවර්ධනාදී වූ සියලු අභිමතාර්ථසිද්ධිය පිණිස නමස්කාර කෙරෙමි වඳිමි යි කී නියා ය.

එසේ හෙයින් මේ ලොකයෙහි තමතමන් භජනය කළා වූ සත්ත්වයන්ට කැමති කැමති වස්තු සිද්ධ කොට දෙමින් තුන් ලෙව්හි[15] පූජ්‍ය ව සිටි මහානුභාවසම්පත් ඇති චක්‍රරත්නාදි වූ උත්තමවස්තූන් විසිනුදු ලක්ෂණ ව්‍යාජයෙන්[16] භජනය කරන ලද එබඳු ශ්‍රීපාදයුග්මයට නමස්කාර කිරීමෙන් සිද්ධ වන්නා වූ[17] විපාකවිශෙෂය සලකාගත නොහී යම් කිසි කෙනෙක් බුදුන්ට කළ නමස්කාර පමණෙකින් ආයුවර්ණවර්ධනාදී වූ අභිමතප්‍රාර්ථනාව කෙසේ සිද්ධ වේ දෝ හෝ යි සැක සිතන්නාහු වී[18] නමුදු ඔවුන්ගේ කාංසා දුරු කරන පිණිස මෙතැන්හි දැක්විය යුතු බොහෝ කථාවස්තූන් අතුරෙන් එක්තරා උදහරණයක් ගෙනහැර දක්වමි. තමහට වැඩ කැමති සත්පුරුෂයන් විසින් සාවධාන ව ඇසිය යුතු.

හේ කෙසේද යත්, එක් සමයෙක[19] අප මහාගෞතම සම්මා සම්බුදුරජාණන්[20] වහන්සේ මගධරට වෙදිය[21] නම් පර්වතයක් මුදුනෙහි

---

1. ච සෙනො - I
2. විහඞ්ග - I, කි. බෙ. ක. සැ.
   විහග්ඝ - ACDFJ
3. කොඤ්ජො - ADEFJ
4. ලක්ඛණා න - DEGH ම. බෙ.
5. මංගල්‍ය -ACDEFGHIJKL, ක. සැ.
6. ධරන්නා වූ - ABCDEFGJ, බෙ.
7. යුග්මයක් - කි.ම.ක.සැ.
8. සමාන මනහර - I
9. මුදු - IJ
10. ජනිතය - BGH
11. මනො - පිටපත් හැම,
    මනඃ - කි. ම. බෙ. ක. සැ. ස.
12. චින්තනාදියෙන් -C, ම
13. ප්‍රේමසිතව - FI
    ප්‍රේරිතව - E; ප්‍රේරිසිතව; H
    ප්‍රේමසහිතව - කි. ම. බෙ. ක. සැ.
14. වාක් - පිටපත් හැම
15. ලෙවු - ABCDFGH
16. ව්‍යාජයෙන් - CJ; ව්‍යඤ්ජනයෙන්-DEI
    ව්‍යඤ්ජනයෙන් - B; ව්‍යඤ්ජනයෙන් -KL කි.ම.සැ.ක.
17. සිද්ධ කරන්නා වූ - ස
18. වූ -C ක. සැ. ම
19. සමයෙක්හි -E
20. ගොතම බුදුරජාණන් -ACDEFIJ
21. වෙදියක - ABDEH, ම

Non-Commercial Distribution

පවුරුපදනමින්[1] හා හිස්ති[2] දෙරකවුළු ආදියෙන් හෙබියා වූ ඉන්‍ද්‍රශාල[3] නම් ගල්ගුහාවෙක[4] වැඩවසනසේක. එකල ශක්‍රයෝ මනුෂ්‍යගණනාවෙන් තුන්කෙළ සැටලක්‍ෂයක් අවුරුදු ශක්‍රසම්පත් විඳ තමන්ගේ ආයු ගෙවුණු හෙයින් මරණ හයින් වෙවුළා තව්තිසා වැසි දෙවියන් රැස් කරවා මහත් වූ දිව්‍යසෙනාව හා සමඟ බුදුන් දක්නා කැමැති ව වෙදිය පර්වතයට ගොස් තමන් ආ නියාව පඤ්චශිඛයා ලවා බුදුන්ට දන්වා ඔහු ගෙනදුන් අවසරයෙන් ඉන්‍ද්‍රශාල නම් ගුහාවට[5] වැද[6] බුදුන් වැඳගෙන ඔත්හ.

එකල බුදුහු සක්දෙව් රජහුගේ පූර්වචරිතය බලා, ශක්‍රය, ආයු බොහෝ ව, යි[7] වදළ සේක. ඒ බස හා සමඟ ශක්‍රයෝ තුන්කෙළ සැටලක්‍ෂයක් අවුරුද්දට[8] ආයු ලදින් තුන්ගව් උස දිව්‍යශරීර ඇති ව ගව් උස මිණි ඔටුනු ධරා සැටගැලක් පුරාලන[9] දිව්‍යාහරණයෙන් සැරහී රන්ගිරිකුළු දෙකක් බඳු වූ දිවමිණිකොඩොල් දෙකක් දෙකන පැළඳ යෙළයාලක් සුවඳ විලවුන් ගෙන රන්ගිරි අතලක් මුදුනෙන්[10] හුණු ගඟුල්හැල්ලක් හා සමාන වූ මනහර මුත්හරක් කර ලා විදුලියකැල වැළඳි රන්පර්වතයක් මෙන් ශොභාමත් ව නොයෙක් දහස් සුවහස් ගණින් හිරසඳ එකවිට පහළ වූ කලක්[11] පරිද්දෙන් සියලහින් දිවන්නාවූ[12] රශ්මිසමූහයෙන් දසදික් හොබවා මහත් වූ දිව්‍යානුභාවයෙන් දිලිහි දිලිහී වැඳ වැඳ නැඟී සිට[13] බුදුන්ගේ මහිම සිතසිතා වැඳ වැඳ නැමිනැමී එකත්පස් ව සිටියහ.

එසේ හෙයින්[14] කියන ලදී:

"යං වන්‍දමානො තිදසාධිපො සො
යසසානුභාවෙන ගතායුකො'පි,
සකීයඨානෙසු පුනාසි තෙසං
පාදම්බුජං ධීර මහානුභාවං"යී

මෙසේ මහසොම්නසින් ඔදවැඩ සිටියාවූ ශක්‍රයෝ බුදුන්ට දන්වන්නාහු ස්වාමීනි පෙර මම මේ බුද්ධොත්පාදයෙහි ම 'සදිව්‍යලෝකය පිරෙයි, සතර අපාය සිස් වෙයි" යනු අනුන් අතින් ඇසීම්, දැන් මම ඒ ප්‍රත්‍යක්‍ෂයෙන්[15] ම දිටිමි. නුඹවහන්සේගේ මේ බුද්ධොත්පාදයෙහි කිඹුල්වත්නුවර ගොපිකා නම් රාජකන්‍යාවක් තුනුරුවන් කෙරෙහි පැහැද පඤ්චශීලය අඛණ්ඩ කොට රක්‍ෂා කරන්නී "ස්ත්‍රීභාවයෙහි

1. පදනම් - GH; පදන් - B
2. හිත්ති - CI
3. ඉන්‍ද්‍රසාලා - CDGHKL
4. ගල්ගුහායෙක - BGH, කි.ම.ක.ඤ.
   ගල්ගුහාවක - I
5. ගල්ගුහාවට - CF, ස
6. වැඩ - GH
7. බොහෝ වේවයි - B, ම.
8. අවුරුද්දට - පිටපත් හැම; අවුරුද්දකට - මුද්‍රිත හැම
9. පුරාලන පමණ - ADEJ
   පුරාලන ලද - GH
10. මැදින් - I
11. කලක් (නැත), BGHKL
12. දුවන්නාවූ - GH, කි.
13. වැද නැඟී සිට - BEGHIKL
    වැඩ හිඳ වැඳ නැඟී සිට - F
14. එසේ හෙයින් (නැත) -BGHIKL
15. ප්‍රත්‍යක්ෂ කොට - I

Non-Commercial Distribution

සිට බුදු විය නොහැක්ක, පසේබුදු විය නොහැක්ක, සක්විති රජ විය නොහැක්ක, සක්දෙව් රජ විය නොහැක්ක, මාර සම්පත් ලද නොහැක්ක, බ්‍රහ්ම සම්පත් ලද නොහැක්ක යනාදීන් මෙසේ[1] ස්ත්‍රීභාවයෙහි [සව] ප්‍රධානත්වයක්[2] නැති පවත් අසා ස්ත්‍රීභාවයෙහි කළකිරී පිරිමි ව උපදිමියි ප්‍රාර්ථනා කොට විහාරයක් කරවා සඟ තුන්දෙනකු[න්] වහන්සේට[3] පිළිගන්වා නිරන්තරයෙන් ම සිව්පස දනයෙන් උපස්ථාන කළා ය. බණ අසන වේලෙහි පවිත්‍රශීලී ව එක් තෙනෙක[4] වැද හිඳ හයලජ්ජා ඇති ව ආදර සහිත ව දෙහොත් මුදුනෙහි[5] තබාගෙන දසත නොබලා කිසිකෙනකුන් හා කථා[6] නොකොට බුලත් පමණකුත් නොකා නොනිදා එකඟ වූ සිතින් බණ අසා නොයෙක් පින්කම් කොට ස්ත්‍රීභාවයෙන් මිදී තව්තිසා දෙව්ලොව නොයෙක් ලක්‍ෂ ගණන් දිව්‍යනළුවන් හා සමඟ දහස් සුවහස් ගණන් දෙවඟනන් පිරිවරා දෙදෙව්ලොවට අධිපති වූ මට ම පුත් ව ඉපද ගොපික[7] දිව්‍යපුත්‍ර යයි ප්‍රසිද්ධ ව මා හා සමාන වූ සම්පත් ලද්දී ය. ඒ රාජකන්‍යාවට අනුශාසනා කොට දන් වැළඳූ භික්‍ෂූහු තුන්දෙන අත්‍යන්තනිර්මල වූ ශීලය රක්‍ෂා කොට ධ්‍යානලාභී ව වසන්නාහු පවා බණ අසන වේලෙහි දසත බල බලා වික්‍ෂිප්ත වූ සිතින් නිඳ නිඳ සරු නැති ව හුන්නා වූ අකුශලයෙන් බ්‍රහ්මලොකොත්පත්තියෙන් පිරිහී යට[8] තරු පෙනෙන දෙව්ලොව හීන වූ ගන්ධර්ව නිකායෙහි ඉපද පෙර තමන් රැක්කාවූ ශීලයෙහි අනුසසින් ප්‍රභාසම්පන්න ව දිව්‍යසැපත් ලදහ. මෙසේ දිව්‍යසැපත් ලදින් රූපශ්‍රීන් දිලිහි දිලිහී බොහෝ දෙවතාවන් පිරිවරා[9] දිව්‍යසැපත් විඳින්නාවූ ඒ ගන්ධර්ව පුත්‍රයෝ තුන්දෙන තුන්ගව් දිග මහබෙර කර ලා දහස් ගණන් දිව්‍යනළුවන්[10] පිරිවරනා ලදුව එක් දවසෙක මට සේවය පිණිස සුදම් දෙව්සබයට අවුත් පනස් පනස් යොදුන් තැන[11] රඟමඬුලු බැඳ සිටගත්හ. අඛණ්ඩ වූ ශීලය රක්‍ෂා කොට දෙව්ලොව උපන් දිව්‍යපුත්‍රයන් හෙයින් ඔවුන් තුන්දෙනාගේ ශරීරාලොකය හා ගායනා ඉතා මනොඥ වී ය, හැම දෙවියන්ට ප්‍රීතිකර වී ය. එවේලෙහි ගොපික දිව්‍යපුත්‍රයා මට නුදුරු වූ මලස්නෙක හුන්නේ ඒ දිව්‍යපුත්‍රයන් තුන්දෙනා දැක "මොවුහු ඉතා ප්‍රභා සම්පන්නයහ. අතිශයින් ම රූපත්හ. කවර කුශලයක් කොට කොයින් අවුත් මෙහි උපන්නාහු දෝ හෝ" යි පරීක්‍ෂා කරනුයේ පෙර ඔවුන් තුන්දෙනා මහණ ව ඉඳුරා සිල් රැක ධ්‍යානලාභී ව තමහට කුලුපග ව සිව්පසය වළඳා අනුශාසනා කළ මහණුන් බව දැන සිතනුයේ "පිරිසුදුකොට සිල් රැක්කාහු[12] දිව්‍යලොකයෙන් කැමැති දිව්‍යලොකයෙක දිව්‍යරාජන් ව උපදනාහු මය. ධ්‍යානලාභී වූවාහු වී නම් බඹලොව උපදනාහු මය. මොහු තුන්දෙන ධ්‍යානලාභී වී පවා බ්‍රහ්මලොකයෙහි ඉපදගත නුහුණු [වූ]වාහ[13]. සිල්

1. ස්ත්‍රීභාවයෙහි සිට......මෙසේ - JKL
2. සප්‍රධානත්වයක් - IJK
   සප්‍රධානත්වය - GH
   සප්‍රධානත්වයෙක් - ABCEF
   ප්‍රධානත්වයෙක් - D
   සවප්‍රධානත්වයෙක් ක.කැ.ම.බෙ.ස
3. තුන්දෙනකු වහන්සේට -පිටපත් හැම
4. තැනෙක DL; - පසෙක - I
5. මුදුනෙහි - ABCDFGI; ක. කැ. බෙ
6. කථා පමණකුත් - D
7. ගොපක - D, ම.
8. යට - BEHIKL
9. දිව්‍යසැපත්.... පිරිවරා (නැත)-ක.කි.කැ.ම.ස.
10. දිව්‍යනළුවන් විසින් - EGH
11. තන්හි - J
12. රක්ෂා කළාහු - I
13. නුහුණුවාහ - පිටපත් හැම

Non-Commercial Distribution

රක්ෂා කොට පවා මත්තෙහි දිව්‍යලෝකයෙකත් ඉපදගත නුහුණු [වූ]වාහ.[1] සියල්ලෙන් පාත දෙව්ලොව හීන වූ ගන්ධර්වයන් කෙරෙහි[2] උපන්හ. මම මොවුන්ගෙන් අවවාද ලදින් සත්‍රී ව සිට පවා මා කළා වූ කුශලයෙන් දැන් දෙදෙව්ලොවට අධිපති වූ සක්දෙව්රජහට පුත් ව උපන්මි. එබැවින් මුන් ලජ්ජා වන සේ දෙඩුව මැනවැයි සිතා ඔවුන් තුන්දෙනා මුහුණු බලා නිපියා සේ හහවා "එම්බල කොල, තෙපි තුන්දෙන පෙර මිනිස්ලොව ඉපිද මහණ ව පවා බුදුන් බණ වදරන වේලෙහි දසත[3] බල බලා අතරතුර කථා කොට කොට වික්ෂිප්ත සිතින් නිද නිද[4] බණ ඇසුවා වේ ද්[5] මම එකල සත්‍රී ව සිට පවා ශ්‍රද්ධාවෙන් ආදර සහිත ව බණ අසා නොයෙක් පින්[6] කොට දැන් මේ දෙව්ලොව සියල්ලෙන් ම උතුම් ව දිව්‍යරාජන් ව උපන්මි. තෙපි තුන්දෙන එකල අපට අවවාද දී මහණදම් පුරා ධ්‍යානලාභී ව පවා හීන වූ ගන්ධර්වනිකායෙහි ඉපද දැන් අපට බෙර ගසා සේවය කරන්නට අවු ද? තෙපි තමා ලජ්ජා නැතියා දැ' යි බිණී ය.[7]

එකල ඔවුන් තුන්දෙනා අතුරෙන් දෙදෙනෙක් සිතන්නාහු "කෙළිනළු පානා වූ නාටකජනයෝ බලන්නවුන්ගෙන් බොහෝ ප්‍රසාද ලැබෙති.[8] එසේ දෙන්නාවූ ප්‍රසාද තබා මේ දිව්‍යපුත්‍රයා අප දුටු වේලෙහි පටන් ගින්නට දැමූ ලුණු පුපුරන්නා සේ තතනමින් පිටිතොල[9] දත්කමින්[10] පැහැසෙයි. මීට කාරණ කිම් දෝ හෝ" යි පරීක්ෂා කරන්නාහු පෙර තමන් මහණදම් පිරූ බව ද ධ්‍යානලාභී වූ බව ද ඕහට කුලූපග වූ බව ද එකල සරු නැතිව නිද බණ ඇසූ බව ද යන සියල්ල ම දැක මහත් වූ ලජ්ජාවට පැමිණ කර තුබූ බෙර බා තබා එතැන්හි ම සිට භාවනා කරන්නාහු පෙර තමන් බොහෝ දවසක් වශීභූත කළා වූ භාවනා හෙයින් මඳ විගසෙකින් ධ්‍යාන උපදවා අනාගාමී ව එම ඇසිල්ලෙහි එයින් ගොස් බ්‍රහ්මපුරෝහිත නම් බඹතෙලෙහි ඉපද දෙළොස් යොදුන් බ්‍රහ්මශරීර ලදින් ධ්‍යානක්‍රීඩාවට පටන්ගත්හ. එයින් එක් දිව්‍යපුත්‍රයෙක් පඤ්චකාමසමපත්තීන් මිදී යා නොහී එහි ම රඳ අද දක්වා දිවසැපත් විඳිනේය, යනාදීන් ශක්‍රයෝ මේ කථාප්‍රබන්ධය බුදුන්ට දන්වා[11] "ස්වාමීනි අපිත් ඔවුන් සේ ම නුඹවහන්සේගේ සස්නෙහි[12] නිවන් දහම් පසක් කරනු සඳහා ආම්හ. එබැවින් දැන් අවසරයක් ලදුමෝ නම් ප්‍රශ්න විචාරනු කැමැත්තම්හ"යි දන්වා බුදුන්ගෙන් අවසර ගෙන[13] තුදුස් පැනයක් විචාරා ඒ තුදුස් පැනය බුදුන් විසඳ වදළ ඇසිල්ලෙහි අසූදහසක් දෙවියන් හා සමග සෝවාන්ඵලයට පැමිණියහ. මෙසේ සෝවාන්ඵලයට පැමිණියාවූ ශක්‍රදෙවේන්ද්‍රයෝ එතැන් පටන් තුන්කෙළ සැටලක්ෂයක් අවුරුදු මුළුල්ලෙහි වටින් සතිස්ලක්ෂ දසදහස් තුන්සිය පනස් යොදුන් චක්‍රවාට පර්වතයෙහි බාහිර පාර්ශ්වය දක්වා විචිත්‍රාකාරයෙන් සැදී සිට

1. නුහුණුවාහ - පිටපත් හැම
2. ගාන්ධර්ව නිකායෙහි - I
3. දස - ABCDEFGJL
4. නිඳ නිදා නිද -ABFJ, ස
5. ඇසුවා වේද - පිටපත් හැම
   ඇසුවාහු වෙද්ද - මුද්‍රිත හැම
6. පින්කම් - ACEGI
7. නියා බිණිය - I; නැති නියාදැයි බිණිය-ස
8. ලබති - I, බෙ. කි. ක. කැ
9. පිටිතොල -ABEFJ
10 දත් කකා - BDEHK
11. දක්වා - ABGHJ
12. සාසනයෙහි - I
13. ඉල්ලාගෙන - I

Non-Commercial Distribution

ගත්තාවූ කනක රජත මාණික්‍යමය විමානමාලාවෙන් හා උයන් පොකුණු ගලතළ කල්පවෘක්‍ෂ පඞ්ක්තීන් සශ්‍රීක වූ දිව සත්රුවනින් විසිතුරු වහසල් පවුරු පදනමින් හෙබියාවූ දහසක් රුවන් දොරටුවෙන් සැදුම් ලද[1] විජයොත් මහපාය ඇතුළු[2] අනෙකප්‍රකාර දිව්‍යසම්පත්තීන් සමෘඬ වූ දෙදෙව්ලොව දිව්‍යරාජ්‍යය කෙරෙමින් දෙකෙළ පනස්ලක්‍ෂයක් දෙවඟනන් හා දෙදෙව්ලොව දෙවියන්[3] පිරිවරා සූවිසි කෙළලක්‍ෂයක් දිව්‍යනාටකයන්ගේ නෘත්‍ය ගීත වාදයෙන් සනතුෂ්ට වෙමින් අනොපමෙය[4] වූ ශක්‍ර සම්පත් විඳ එයින් අවුත් දඹදිව සත් වාරයෙක ද්වීපචක්‍රවර්ති ව මනුෂ්‍ය සම්පත් විඳ නැවත එයින් ගොස් චාතුර්මහාරාජික ය තාවතිංස ය[5] යාම ය තුසිත ය නිර්මාණරතී ය පරනිර්මිත වශවර්ති ය යන සදිව්‍යලොකයෙහි පිළිවෙළින් එක් ව[6] එක් දහස් දෙසිය අටවිසිකෙළ පනස්ලක්‍ෂයක් අවුරුදු මුළුල්ලෙහි ප්‍රමාණාතික්‍රාන්ත වූ පඤ්චකාම සම්පත් අනුභව කොට එහිදී කාමවිරාගය කොට ධ්‍යාන උපදවා එයින් ගොස් බ්‍රහ්මපාරිසද්‍ය ය බ්‍රහ්මපුරොහිත ය මහාබ්‍රහ්ම ය පරිත්තාභ ය අප්පමාණාභ ය ආභස්සර ය පරිත්තශුභ ය අප්‍රමාණශුභ ය ශුභකීර්ණක ය වෙහප්ඵල ය[7] යන දස මහ බඹතෙලෙහි පිළිවෙළින් එක් ව සසිය විසි කපක් මුළුල්ලෙහි නිරාමිෂ වූ ප්‍රීති සැප අනුභව කොට එහිදී මාර්ග භාවනා කොට අනාගාමී ව එයින් ගොස් අවිහ ය අතප්ප ය සුදස්ස ය සුදස්සී ය අකනිෂ්ඨ ය යන පඤ්ච ශුද්ධාවාසයෙහි ද පිළිවෙළින් ම එක්තිස් දහසක් කප් මුළුල්ලෙහි ධ්‍යානක්‍රීඩාවෙන් දවස් යවා මෙසේ හැම එක් ව[8] එක් දහස් දෙසිය අටවිසිකෙළ පනස්ලක්‍ෂයක් අවුරුදු උතුරු කොට ඇති එක්තිස් දහස් සසියවිසි කපක් ගිය කල එයින් මතු අනාගතයෙහි රහත් ව අමාමහනිවන් දක්නාහ. මෙසේ දක්වන ලද ආයු වර්ණ වර්ධනාදි වූ මේ සියලු සම්පත් ම ශක්‍රයෝ එදවස් බුදුන්ට කළ නමස්කාරයෙන් ම ලදහ. තව ද යම් කිසි ශ්‍රද්ධාවන්ත කෙනෙක් බැතිපෙම් සහිත ව එම බුදුන් විසින් වදරන ලද ධර්මරත්නයට ද ඒ ධර්මය වූ පරිද්දෙන් පිළිපදනා සඞ්ඝරත්නයට ද පහන් සිතින් නමස්කාර කළාහු වී නම් ඒ නමස්කාර පමණකින් ජනිත වූ කුශලසම්භාර නමැති මහාමේඝය ද අනවරතයෙන් ඔවුන්ගේ සිත්හි ඇවිළ නැඟෙන්නා වූ භවදුඃඛ නමැති මහ ගිනිකඳ නිවා එම සිත්සතන් නමැති කල්පවෘක්‍ෂයෙහි මාර්ගඵල නමැති අමෘතඵල ගන්වාලන්ට ද සමර්ථ වන්නේ මය. වදරනලද මැයි:-

බුද්ධෙ ධම්මෙ ච සඞ්ඝෙ වා - කතො එකො'පි අඤ්ජලී,
පහොති භව දුක්ඛග්ගිං[9] - නිබ්බාපෙතු මසෙසකං යි

මෙසේ පහන් සිතින් තමන්ට ද තමන් දෙසූ ධර්මයට ද ඒ දහම් නොවරදවා පිළිපදනා සඞ්ඝයාට ද නමස්කාර පමණක් කළාවූ[10] ශ්‍රද්ධාවන්තයන්ට පවා සියලු සැපත් සාධා දීලන්ට සමර්ථ වූ ඉතා ආශ්චර්යය සහිත එබඳු මහානුභාවසම්පත් ඇති[11]

---

1. සැදුම් ලද්දවූ - ACFJ
2. ඇතුළු වූ - CDGHIJKL
3. දිව්‍යසේනාව - ACDEJ
4. අනොපමෙය්‍ය - ABCDEFGIJKL
5. එක්ව (නැත) - BDHIKL
6. ඇතුළුව - CDF
7. වෘහත්ඵලය - බෙ. ස.
8. එක්ව (නැත) - BDHI
9. දුක්ඛග්ගිං - බෙ.ස.
10. කළා වූ කුශලයෙන් - AC
11. ලබන - I

Non-Commercial Distribution

සර්වඥභාවයක් හා කිසි කෙනකුන් හා අසාධාරණ වූ ලක්‍ෂණානුව්‍යඤ්ජනයෙන් ප්‍රතිමණ්ඩිත රූපසම්පත් ලබන සර්වඥවරයෝ ද පූර්වජන්මවල බුඩ ප්‍රත්‍යෙකබුඩ ආයර්‍ය්‍යශ්‍රාවකාදීන් උදෙසා පහන් සිතින් රැස්කරන ලද දනාදි වූ කුශලධර්මයෙන් ම ලදහ. එද වනාහි,

දනං සීලංච භාවනා පත්තිදනං
වෙය්‍යාවච්චං දෙසනා චානුමොදෙ
දිට්ඨිජ්ජුකං සංසුති චාපචායො
ඤෙදයො එවං පුඤ්ඤවත්‍ථුප්පභෙදෙ

යනු හෙයින් දන්දීමය සිල්රැකීමය භාවනාකිරීමය පින්දීමය පින්ගැනීමය බණ කීමය බණ ඇසීමය සාමීචි වශයෙන් පූජාකිරීමය වතාවත් කිරීමය දෘෂ්ටිය සෘජු කිරීමය යි සර්වසඞ්ග්‍රාහික වශයෙන් දසවැදෑරුම් වෙයි. ඒ දශවිධ කුශලයෙහි විභාග වෙන වෙන[1] කියත් ඉතා බෙහෙව. එයින් දනය නම්: සතර සඞ්ග්‍රහ වස්තුවෙන් පළමුවන සඞ්ග්‍රහ වස්තුව ය. දශරාජධර්මයෙන් පළමුවන රාජධර්මය ය. දශපුණ්‍ය ක්‍රියා වස්තුවෙන් පළමුවන පුණ්‍යක්‍රියා වස්තුව ය. දසපාරමිතාවෙන් පළමුවන පාරමිතාව ය. බුදු පසේ බුදු මහසව් ආදීන්ගේ ප්‍රවේණි ධර්මයෙක. එයින් සිඩ නොවන්නා වූ යම්කිසි සම්පත්තියකුදු නැත් මය. චක්‍රවර්ත්ති සම්පත් ආදී වූ මනුෂ්‍ය සම්පත් ය ශක්‍රසම්පත් ආදි වූ දිව්‍යසම්පත් ය සම්‍යක් සම්බොධිසමධිගමාදි වූ[2] නිර්වාණ සම්පත් ය යන සියලු සම්පත් ම දනය මුල් කොට ඇති කුශලධර්මයෙන් ම සිඩවන්නේ ය. තව ද දන් දෙන්නා වූ ශ්‍රඩාවන්තයෝ නම් සිතූ සිතූ වස්තු දෙන හෙයින් සිතුමිණි රුවනක් වැනියහ. ඉච්ඡානුරූප වූ වස්ත්‍රාභරණ දෙන හෙයින් කප්රුකක් වැනියහ. කැමති නැමති සම්පත් එක මුඛයෙන් දෙන හෙයින් සුරභිධෙනුවක් වැනියහ. කයට සිතට[3] කිසි අසැපයක් නොවිය දී යහපතක් ම[4] කරන හෙයින් භද්‍රඝටයක්[5] වැනියහ.

තව ද දන් දෙන්නාහු මතු ලබන ස්වර්ග මොක්‍ෂ සම්පත් තබා මෙම ජාතියෙහි අපමණ වූ ප්‍රීතිසැප අනුභව කෙරෙති. සියල්ලවුන් විසින් ආදර කටයුතු වෙති. බොහෝදෙනාහට ප්‍රිය වෙති. සත්පුරුෂයන් හා සමාගම ලැබෙති. දශදිග පතළ කීර්ති ඇති වෙති. සියල්ලවුන් විසින් විශ්වාස කටයුතු වෙත්. එයින් කීහ:

පීතිමුදරං වින්දති දතා - ගාරවමස්මිං ගච්ඡති ලොකෙ,
ඛ්‍යාතිමනන්තං[6] යාති ච දතා - විස්සසනීයො හොති ච දතා යි.

---

1. වෙන වෙනම - DI
2. සම්බොධ්‍යධිගමාදිවූ - බෙ. ම.
3. කයට සිතට (නැත) - කි.ක.ම.ඤ
4. සැපයක් - I
5. හද්‍ර ඝටකයක් - BCDIJ
6. මහන්තං - BH

Non-Commercial Distribution

මෙසේ උභයලොක හිත සිද්ධියට කාරණ ව සිටි[1] දනය දෙන්නා වූ ශ්‍රද්ධාවන්තයන් විසින් ආදි කොට ත්‍රිවිධ චෙතනාවන් ශුද්ධ කොට සිල්වතුන් හැඳින පින්කෙත් පරීක්ෂා කොට දන් දෙන ලද්දේ වීනම් ඒ[2] දනය මහාඵල[3] මහානිසංස වෙයි. එහි විභාග මෙසේ දතයුතු. කෙසේද යත්[4]

අප බුදුහු බුදු වූ සත් වන අවුරුදු යමක නම් මහ පෙළහරක්[5] දක්වා තීර්ථකමර්ථනය කොට තුන් පියවරින් තව්තිසා දෙව්ලොවට නැඟී සක්දෙව්රජහුගේ පාණ්ඩුකම්බල ශෛලාසනය මස්තකයෙහි[6] විජම් දෙශනාවට වැඩහුන්සේක. එකල අඞකුරය ඉන්දකය යන දිව්‍යරාජයෝ දෙදෙනෙක් ඔවුනොවුන් හා මන්ත්‍රණය කරන්නාහු "අප බුදුන් දැන් විජමැයි යන බණක් දෙසනු සඳහා මේ දෙව්ලොවට වැඩ පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි වැඩහුන් සේක. නොබෝ ඇසිල්ලකින් බොහෝ දෙවියෝ රැස් වෙති. එකල අප ඇමට අවසර නොලැබෙයි. අපි දෙදෙන පළමු ගොස් බුදුන් ළඟ ඉඳුම්හ"යි මන්ත්‍රණය කොට අතින් අත් බඳ කථා කෙරෙමින් ගොස් බුදුන් දැක වැඳ ඉන්දක නම් දිව්‍යරාජයා බුදුන්ගේ දකුණු දණමඩලට නුදුරු ව හිඳගත. අඞකුර නම් දිව්‍යරාජයා වම් දණමඩලට නුදුරු ව හිඳගත. එකල බුදුන් විජම් දෙශනාවට වැඩි පවත් ඇසුවාවූ දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මසෙනාව ඇසිල්ලකින් දිව අවුත් ශක්‍රපුරයෙහි ම රැස්වන්ට පටන් ගත්හ. මහානුභාවසම්පන්න වූ දිව්‍යසෙනාව එත් එත් අවශෙෂ දෙවතාවෝ පසු බැස බැස ගොස් සමහරු සක්වළගල මුදුනෙහි ගැහැටි ගැහැටී[7] සිටිති. සමහරු පසු බැස බැස ගොස් යුගන්ධරාදි වූ සප්තකුල පර්වතයන් කරා පැමිණ එහිදු ගැහැටී ගැහැටී සිටිති. සමහර බලවත් දෙවතාවෝ පසු බැස බැස ගොස් ලක්ෂයක් දහසක් සියයක් යොදුන් තැන ගැහැටි ගැහැටී සිටිති. එකල ඒ දිව්‍යරාජයන් දෙදෙනා අතුරෙන් අඞකුර නම් දිව්‍යරාජයා බුදුන්ගේ වම් දණමඩල සමීපයෙන්[7] පසු බස්නේ තමා[8] මහත් වූ පින්බල ඇති හෙයින් සෙසු දෙවතාවන් සේ බොහෝ තැනක් නොගොස් පෙර තමා[9] දන් දෙන සමයෙහි ඒ දන් පිසන පිණිස මිනිස්ලොව ලිප් බැඳවූ දෙළොස් යොදුන් ප්‍රමාණය නම් මෙ[10] පමණ දිගුපුළුලු ඇත්තේ යයි දසදහසක් සක්වළ දිව්‍යසෙනාව මධ්‍යයෙහි ප්‍රකාශකොට දක්වන්නට ගියා සේ දෙළොස් යොදුනක්[11] තැන් පසු බැස[12] යම්තම් අවකාශයක් ලදින් හුන්නේ ය. ඉන්දක නම් දිව්‍යරාජයා වනාහී තමා හුන් තැනින් අඟලක් පමණ තැනුත් නොගොස් බුදුන්ගේ දකුණු දණමඩල[13] සමීපයෙහි[14] ම සිනාසිසී කිසි භයක් නැති ව හුන්නේ ය. එකල බුදුහු ඒ දිව්‍යරාජයන් දෙදෙනාගේ පූර්වකුශල විභාගය දිව්‍යසෙනාවට[15] හඟවා පළමු කොට සර්වයන් දනයෙහි පිහිටුවා

1. කාරණ වූ සිටි - GH
   කාරණ වූ - I
2. එම - GH
3. මහත්ඵල - BFIKL
4. හේ කෙසේද යත් - ACJ
5. පෙළහර - BGHKL
6. මත්තෙහි - DFJ, ස. බෙ.
7. ලක්ෂයක් දහසක් සියක් යොදුන් ගැහැටී ගැහැටී - EGHIKL
8. ස්වමීපයෙන් - පිටපත් හැම
9. තමාත් - ACDEFJ
10. බැදි - I
11. යොදුනක් - BDGHK
    යොදනක් - ACEFJ
    යොදුන් - I, කි. බෙ. ම. ක. කු.
12. බැස බැස - බෙ. ස.
13. දණ- ABCFGH
14. ස්වමීපයෙහි - පිටපත් හැම.
15. සේනාව මධ්‍යයෙහි - I

Non-Commercial Distribution

පසු ව විජම් දෙසම් සිතා වදරා අඩකුර නම් දිව්‍යරාජයා මුහුණ බලා සියලු දිව්‍යසෙනාවට ඇසෙන සේ වදරනසේක්,

මහාදනං තයා දින්නං - අඩකුර දීඝමන්තරෙ,
සුවිදූරෙ[1] නිසින්නොසි - ආගච්ඡ මම සන්තිකං

යනාදීන් "එම්බල අඩකුරය, තෝ පෙර දසදහසක් අවුරුදු මුළුල්ලෙහි මුළු දඹදිව යාචකයන්ට මහදන් දුන්නෙහි වේ ද, දැන් මේ සමාගමයට පැමිණ කුමක් පිණිස දුර හිඳී දැයි[2] තෙල ඉන්‍දකයා සේ ම මා සමීපයේ[3] හිඳ බණ අස[4]. මෙසේ පලා වරැ"යි වදළසේක. එකල අඩකුර නම් දිව්‍යරාජයා හුනස්නෙන් පැන නැඟී බුදුන් වැඳ දන්වනුයේ,

අයං සො ඉන්‍දකො යක්ඛා - දජ්ජා දනං පරිත්තකං,
අතිරොචති අම්හෙහි - චන්‍දෙ තාරාගණෙ යථා

යනාදීන් "ස්වාමීනි, පෙර මම අබුධොත්පාදකාලයෙහි අඩකුර නම් රජ ව මිනිස්ලොව දෙළොස් යොදනෙක ලිප් බඳවා දසදහසක් අවුරුදු මුළුල්ලෙහි මුළු දඹදිව් වැසියන්ට මහදන් දෙන්නෙම් සිල්වතුන් නො ලදින් අවශෙෂ යාචකයන්ට ම ඒ දනය පරිත්‍යාග කෙළෙම්. දැන් එම අඩුව නිසා සඩු[5] කුඹුරෙක යාලක් වපුට පැලක් ලබන්නාක්හු මෙන් නොසිල්වතුන් විෂයෙහි බොහෝ පින් කොට දෙව්ලොව දිව්‍යරාජන් ව ඉපද පවා මෙබඳු ස්වල්ප වූ ආනුභාව ලදිම්. තෙල ඉන්‍දක නම් දිව්‍යරාජයාණෝ සරු කුඹුරෙක පැලක් වපුට යාලක් ලබන්නා සේ සිල්වත් එක් භික්‍ෂුකෙනෙකුන් වහන්සේට දවසෙක ස්වල්පමාත්‍ර වූ දනක් දී අපමණ වූ ආනුභාව සම්පත් ලදින් තාරකාවන් මැද දිලිහෙන්නාවූ පූර්‍ණචන්‍ද්‍රයා සේ දැන් අප හැම අභිභවා දිලිහි දිලිහී හිඳිනාහු වේ දැ"යි දැන්වීය. එකල බුදුහු ළඟ හුන් ඉන්‍දකයා බණවා "එම්බල ඉන්‍දකය, තොයිත් තා කළ පින් කියා බලගැ"යි වදළසේක. ඒ තෙපුල් අසමින් ම හෙද හුනස්නෙන් පැන නැඟී දෙහොත් මුදුන් දී සිට තමා කළ පින් බුදුන්ට දන්වනුයේ "ස්වාමීනි, පෙර මම ඉන්‍දක නම් දුඃඛිතයෙකිම්. දෙරින් දෙර භික්‍ෂාටනය කොට ඇවිදුනෙම් එක් දෙරෙක[6] සිහා සිටියෙම්. ඒ ගෙයි මනුෂ්‍යයෝ මා දැක උපන් මහාකරුණාවෙන් බත් සැන්දක් ගෙනාහ. එකල නුඹවහන්සේගේ මල් වූ අනුරුද්ධ[7] මහතෙරුන්වහන්සේ පසු ව එම දෙරට සිහා වැඩිසේක. මම එකල උන්වහන්සේ දැක සිතනුයෙම් "පෙර පිනක් නොකළ හෙයින් දැන් දුඃඛිත වීම්.[8] එබැවින් දැන් පිනක් පුරාගන්මි"යි සිතා සැදැහැයෙන් ඒ බත් සැන්ද ඔබගේ පාත්‍රයට පිළිගන්වා

1. අවිදූරෙ - ACDEFIJ
2. හිඳී ද - ADEF බෙ. ස.
3. ස්වාමීපයට අවුත් - C
4. අසව - CDHI
5. සඩු - ABDI
6. වීදිදෙරෙක - KL, ක.පද.ම.
7. අනුරුත් - බෙ. ස.
8. දුඃඛිතයෙම් - බෙ.ස.

Non-Commercial Distribution

ලීමි. එපමණ පිනින් දැන් මෙපමණ දිවසැපත් ලදිමි, මාගේ ශරීරයෙන් නික්මෙන්නා වූ ප්‍රභාසමූහය හැම දෙවියන්ගේ ශරීරප්‍රභා[1] නිෂ්ප්‍රභ[2] කෙරෙමින් පවත්නා ලෙස ද මා ඉදිරියේ ඉඳහෙන්නාවූ දෙවතාවකු නැති නියාව ද මාගේ මහත් දිව්‍යතේජස් හා පරිවාර සම්පත්තිය ද යන සියල්ල ම බලා වදළ මැනවැ"යි දැන්වීය. එකල මෙසේ ඉන්ද්‍රකයා කී තෙපුල් අසා බුදුහු "අඞ්කුරය, තෝ සම්ප්‍රාප්ත යාචකයන්ට දන් දුන් බව මිස[3] සිල්වත් කෙනකුන් නිශ්චය කොට ගෙන දන් දුන්නෙහි නොවෙයි. එසේ හෙයින් තා දෙළොස් යොදනෙක ලිප් බඳවා දසදහසක් හවුරුදු මුළුල්លෙහි මුළු දඹදිව යාචකයන්ට[4] ඒ සා මහත් දනයට වඩා අනුරුත්[5] මහ තෙරුන්ට ඉන්ද්‍රකයා දුන් එක බත්කෙණෙස්සෙහි විපාක ම[6] බොහෝ වී" යයි වදරා දසදහසක් සක්වළින් රැස්වූ දිව්‍යසෙනාව මධ්‍යයෙහි දනවිභාග දක්වනසේක්:-

විචෙය්‍ය දනං සුගතප්පසත්ථං
යෙ දක්ඛිණෙය්‍යා ඉධ ජීවලොකෙ,
එතෙසු දින්නානි මහප්ඵලානි
වුත්තානි බීජානි යථා සුඛෙත්තෙ

යනාදීන් "එම්බා, දනඵල විඳුනා කැමති ශ්‍රද්ධාවන්තයන් විසින් සිල්වතුන් සොයාගෙන[7] දන් දිය යුත්තේ" ය යනාදීන් දනඵල විභාග දක්වා බණ වදළසේක. එහි විභාග මෙසේ දතයුතු.

මේ ලොකයෙහි යම් කිසිවෙක් බත් ආලොපයක් පමණකින් හෝ එයින් භාගයක් පමණකින් හෝ දුන්නාවූ දනය ද ගුණ වශයෙන් හෝ උපකාර වශයෙන් හෝ පොෂ්‍ය කරනු පිණිස හෝ දෙන ලද්දවූ දනය නොගෙන උෟරු බලු කුකුළු ආදි වූ තිරිසනුන් අතුරෙන් තමා සමීපයට පැමිණියා වූ යම්කිසි තිරිසනක්හට කම්පල අදහා ඔහු කුසගන්නා පමණ බඩපුරා ආහාරයක් දුන්නේ වී නම් ඒ දුන්නා වූ දනය ඕහට එකී එකී ආත්මභාවයෙක ආයුෂ ය රූප ය බල ය සැප ය නුවණ ය යන පස් අනුසස් දීම් වශයෙන් පසක් පසක් කොට සියක් ජාතියෙහි උපදවා පන්සියයක්[8] විපාක දෙයි. වැදි කෙවුළු ආදී වූ පරපීඩාවෙහි නියුක්ත වූ දුශ්ශීල මනුෂ්‍යයක්හට[9] දුන්නාවූ දනය කියන ලද ක්‍රමයෙන් ම දහසක් ජාතියෙහි උපදවා පන්දහසක් විපාක දෙයි. දැහැමින් දවස් යවා ගොශීලාදිය රක්නාවූ මනුෂ්‍යයක්හට දුන්නාවූ දනය ලක්ෂයක් ජාතියෙහි උපදවා පස්ලක්ෂයක් විපාක දෙයි. අෂට සමාපත්තිලාභී වූ බාහිර තාපසයක්හට දුන්නාවූ දනය කෙළලක්ෂයක් ජාතියෙහි උපදවා පස්කෙළ ලක්ෂයක් විපාක දෙයි. ඒ සියක් දෙනාහට දුන් දනයට වඩා මේ සස්නෙහි තිසරණ පිහිටියාවූ ද, එයට වඩා පන්සිල් පිහිටියාවූ ද, අටසිල්

1. ශාරීරික ප්‍රභා - ස.
2. නිෂ්ප්‍රභා- HIJ, බෙ. ස.
3. මුත් - B
4. දුන් - DGH සි. බෙ. ස.
5. අනුරුද්ධ - I
6. විපාක - BHI
   විපාකය - GKL
7. නැඳින පින්කෙත් පරීක්ෂා කොට - I
8. පන්සියක් ADEFIJKL
9. මනුෂ්‍යයන්හටGH

Non-Commercial Distribution

පිහිටියාවූ ද, දසසිල් පිහිටියාවූ ද උපාසක ජනයක්හට දුන්නාවූ දනය පිළිවෙළින් ම එකිනෙකට වැඩි වැඩි අසඞ්ඛ්‍යය වූ අප්‍රමෙය වූ විපාක දෙයි. එයට[1] වඩා මේ ශාසනයෙහි සාමණේරය සාමාන්‍ය උපසම්පන්නය වුතසාර උපසම්පන්නය විදර්ශකය ආරබ්ධ විදර්ශකය මාර්ගසමඞ්ගීය ශ්‍රොතාපන්නය සකෘදාගාමිය අනාගාමිය අර්හත්නය ප්‍රත්‍යෙකබුඩය යන දක්ෂිණීය පුද්ගලයන්ට දුන් දන ද පිළිවෙළින් ම සියක් දහසක් ගුණෙන් එකිනෙකට වැඩි වැඩි අසංඛ්‍යය වූ අප්‍රමෙය වූ විපාක දෙයි. එයින් වැඩිතරම් ව සිටි පසේබුදුන් සියක් දහසක් දෙනාට දුන් දානයට වඩා එක ලොවුතුරා බුදුකෙනකුන්ට දුන්නා වූ දනය ම අසඞ්ඛ්‍යය වූ අප්‍රමෙය වූ විපාක දෙයි. හේ එසේ මය. මේ ලෝකයෙහි ලොවුතුරා බුදුන්ට වඩනා අග්‍රදක්ෂිණෙය්‍ය[2] කෙනෙක් නැත්තාහු ම ය. ඉදින් යම් කිසි සෘඩිවන්ත කෙනෙක් සක්වළගබ සා බිමෙක සත්රුවන් මණ්ඩපයක් කරවා එහි අතුරු නොදී පසේබුදුන් රහතුන් දණින් දණ ගස්වා පිළිවෙළින් වඩා හිඳුවා චතුමධුරයෙන් දන් දුන්නාහු වී නම් ඒ සා මහත් වූ දනයෙහි විපාක[3] ලොවුතුරා බුදුන්ට එක දවසක් දුන්නාවූ දනයෙහි බත් කෙණෙස්සක විපාකයෙන් සොළොස්වන භාගයක් නො අගනේ මය. එසේ වූ ලොවුතුරා බුදුන්ට දුන්[4] දනයට වඩා බුදුපාමොක් මහසඞ්ඝයාට දුන්නාවූ සාඞ්ඝික දනය ම අග්‍ර වූ විපාක දෙයි. නව ද ඒ දානයටත් වඩා යමෙක් නිරන්තරයෙන් ධම්මය පවත්නාවූ තුන්බෝධි පිහිටි විහාරයෙක දෙර කවුළු ඇති කරවා කෙස්සෙන් දෙර හැර[6] සතරදිගින් එළඹෙන මහ සඞ්ඝයා සුව සේ සැතපෙන පරිද්දෙන් ආවාසයක්[7] කරවා දුන්නේ වී නම් එහි විපාකය ම[8] අසඞ්ඛ්‍යය වෙයි. අප්‍රමාණ වෙයි. එයට වඩා කිරි සිඳක් දෝනා ඇසිල්ලකුදු සියලු සතුන් කෙරෙහි මෙත් සිත් පතුරුවා මෛත්‍රීභාවනා කෙළේ වී නම් අප්‍රමෙය්‍ය වූ[9] විපාක දෙයි. එයට වඩා අනිත්‍ය ය දුඃඛ ය අනාත්ම යයි තිලකුණු මෙනෙහි කෙළේ වී නම් අප්‍රමෙය්‍ය වූ විපාක දෙයි. ඒ සියල්ලට ම වඩා යමෙක් ධම්දනය දුන්නේ වී නම් දෙවුයේ වී නම් එහි පින් මහාඵල මහානිසංස වේ මය[10]. එයින් වදළහ සක්දෙව්රජහට,

> සබ්බදනං ධම්මදනං ජිනාති
> සබ්බං රසං ධම්මරසො ජිනාති
> සබ්බං රතිං ධම්මරතී ජිනාති
> තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාති යි

---

1. ඒ සියල්ලට - I
2. දක්ෂිණීය - බෙ. ම. ස
   දක්ෂිණෙය්‍ය - පිටපත් හැම
3. විපාකය - AEFIJ
4. දුන්නාව - DGH
5. මේ - BGHIKL
6. ඇර - I, කි. ක. කු. ම.
7. ආවාස දනයක් - පිටපත් හැම
   ආවාසයක් - මුද්‍රිත හැම
8. විපාක - BDI
9. අප්‍රමෙය්‍ය - පිටපත් හැම
   අප්‍රමෙය - මුද්‍රිත හැම, ස
10. වේ මැයි - GHKL; වේ මයි, BF;
    වෙයි - CI, කි. ම.කු.

හේ එසේ මැයි. මේ ලෝකයෙහි ශ්‍රද්ධාවන්‍ත වූ යම් කිසි සෘද්ධිවන්ත[1] කෙනෙක් තමන්ගේ සෘද්ධ්‍යනුභාවයෙන් සුවාසූදහසක් යොදුන් ගැඹුර ඇති මහා සාගරයෙහි ජලස්කන්ධය සක්වළගලින් පිටත ඉස වටින් සතිස්ලක්‍ෂ දසදහස් තුන්සිය පනස් යොදුන් චක්‍රවාට පර්‍වතය ඇතුළත මහපොළොව හෙරිතලයක් මෙන්[2] තනා පොළෝතෙලෙහි පටන් මුදුනෙන් අකනිටා බඹලොව අවසන් ව වටින් සක්වළගල හිමි කොට දහසක් මහලින් හොබවා කිංකිණිකිංකිණි දැලින් තෙවුනාවූ සර්‍වරත්නමය ධ්වජමාලාවෙන් සැදුම් ලත් සත්රුවන් මණ්ඩපයක් නිමවා රත්රිදී තරු පෙළින් විසිතුරු වියන් බඳවා නා සපු දුනුකේ දෑසමන්[3] දෙයිද්ද පරසතු මදරාදි වූ නානාවර්‍ණ සුවඳ මල්දම් ඒ ඒ තන්හි අලඞ්කෘත කොට එල්වා ලක්‍ෂ සුවහස් වටනා මනහර අසුන් පනවා බුදුපාමොක් මහසඟ පිරිසට පිළිගන්වා එහි අතුරු නොදී පෙළ පෙළ සැදී උන්නාවූ බුදු පසේබුදු මහසවුවන්ට චතුමධුරයෙන් යුක්ත මහදන් දී එම[4] බඹලොව උසට තුන්සිවුරු පාත්‍ර වෙන වෙන ම රැස්කොට හැම දෙනා වහන්සේට නොවරදවා අටපිරිකර දී එසේ ම ගිතෙල් මී වෙඩරු තෙල් සකුරුය යන බෙහෙත් පසය ද[5] හැම දෙනා වහන්සේට පාත්‍ර පුරා පිළිගන්වා කපුරු තකුල් ආදි වූ පස්පලවතින් බුලත් ද පිළිගන්වා මෙසේ සිව්පසයෙන් උපස්ථාන කළාහු වී නම් ඉතා අවිෂය වූ ඒ සියලු දනය එම සමාගමයෙහි යටත් පිරිසෙයින් සතරපදයකින් යුක්ත ගාථා මාත්‍රයෙකින් අනුමෙවුනි[6] වසයෙන් පවත්වන ලද්දවූ ධර්‍මදනයාගේ කුශලයෙහි සොළොස් වන කලාවත්[7] නොඅගනේ මය. කාරණ කිම යත්, බුදුන් උදෙසා සිවු පනස් කෙළක් ධන වියදම් කොට දෙවුරම් වෙහෙර කරවා සපිරිවර[8] බුදුන්ට පිළිගන්වා බුදුන් ප්‍රධානකොට ඇති නිත්‍ය පරිවාර පන්සියයක් දෙනාවහන්සේ හා සෙසු බොහෝ භික්‍ෂු භික්‍ෂුණීන් වහන්සේට[9] සිවුපසයෙන් උපස්ථාන කළ අනේපිඩු මහසිටාණන් හා නව කෙළ ලක්‍ෂයක් වස්තු වියදම් කොට දහසක් ගබඩාවෙන් යුක්ත වූ පූර්‍වාරාම නම් විහාරය කරවා පිරිවර සහිත වූ බුදුන්ට පිළිගන්වා එම ලෙස[10] උපස්ථාන කළ විශාඛා මහා උපාසිකාවන් වැනි* ශ්‍රද්ධාවන්තයෝ පවා බුදුන්ගෙන් බණ අසා සෝවාන් ව අචල ශ්‍රද්ධාවෙහි පිහිටා

1. සෘද්ධිමත් - බෙ.ස.
2. සේ - IL
3. සමන් - I
4. එසේ ම - මුද්‍රිත හැම. ස
5. පස ද - G මුද්‍රිත හැම
6. අනුමෙවෙනි - ABCDGHI කි.
7. කලාවටත් - ADI
8. පිරිවර සහිත - I
9. භික්ෂුනීන්ට - ACDEFJ
10. ලෙස (නැත) - ACDFJ

* තවද විශාඛා මහා උපාසිකාවන් වැනි ශ්‍රද්ධාවන්තයින් පවා පූර්වාරාම විහාර පූජාව සාරමසක් මුළුල්ලෙහි කළාහුය. විහාර බිම ගත්තා වූ නව කෙළක් ධනය විහාර කර්මාන්තයට නව කෙළක් ධනය දන පූජාවට නව කෙළක් ධනයයි මෙසේ සත්විසි කෙළක් ධන ඒ එක පූර්වාරාම විහාරයට වියදම් කොට වෙහෙර කරවා සපිරිවර බුදුන්ට පිළිගන්වා බුදුන් ප්‍රධාන කොට ඇති නිත්‍ය පරිවාර පන්සියයක් දෙනා වහන්සේ හා සෙසු බොහෝ භික්‍ෂු භික්‍ෂුණීන් වහන්සේට සිවුපසයෙන් උපස්ථාන කළ විශාඛා මහා උපාසිකාවන් වැනි (මේ කොටස B පිටපතේ පමණක් මෙතැන්හි පෙනේ.)

Non-Commercial Distribution

වරෙ චාරු රූපෙ විහාරෙ උදාරෙ
නරො කාරයෙ වාසයෙ තත්‍ථ භික්ඛූ,
දදෙය්‍යන්නපානඤ්ච වත්‍ථඤ්ච තෙසං
පසන්නෙන චිත්තෙන සක්කච්ච නිච්චං

යනාදීන් දක්වනලද විහාරදානයෙහි අනුසස් බණින් අසා ම එබඳු පින්කම් කළහ. තව ද චණ්ඩාවෙන් ලොකවාසීන් පොළොඹාගෙන බඩ වඩා ඇවිද ඒ පවින් මතු අවීචි මහා නරකයෙහි ඉපද නරකාග්නියෙන්[1] ද අළුවන බවට පූර්වනිමිත්ත පානා සේ සියලඟ අළු තවරා මුහුකළ අළුපුසුල් සේ විරූප රූපයෙන් ඇවිදුනා නිරුවල[2] හුණු නිවට පාෂාණ්ඩයන්ගේ බස් ගෙන අපායමාර්ගයට පැමිණ සිටි අශෝක මහරජහු වැනි මිථ්‍යාදෘෂ්ටි ගත් රජදරුවෝ පවා නිග්‍රොධ[3] සාමණේරයන් වහන්සේ වදළ බණ අසා බුද්ධශාසනයෙහි පැහැද තුනුරුවන් උදෙසා දාගැබ් මහබෝ ප්‍රතිමාගෘහ ධර්මශාලා සක්මන් මණ්ඩප රත්වන්[4] සුළුපා මහපා ආදීන් ප්‍රතිමණ්ඩිත සුවාසූදහසක් විහාර කරවා තෙසැට දහසක් භික්ෂූන් වහන්සේට නිරන්තරයෙන් මහදන් පවත්වා අපමණ වූ කුශලධර්ම පිරීමෙන් එම ජාතියෙහි ධර්මාශොක මහරජය යන නමින් ප්‍රසිද්ධ ව දසදහසක් යොදුන් ජම්බුද්වීපයෙහි එකච්ඡත්‍ර නංවා රාජ්‍යාභිෂේක ප්‍රාප්ත ව මවුනු[5] පළන් සුවාසූ දහසත් මහරජුන් හා අපමණ වූ මහසෙනඟ පිරිවරා අහසින් යොත්නෙක පොළොවින් යොත්නෙක වටින් සාගරජලය පර්යන්ත ව යශොතෙජස්[6] පතුරුවා ද්වීපචක්‍රවර්ති ව එබඳු පින් රැස්කරන්නාහු[7] ද එහි විපාක බණින් අසා ම රැස් කළහ. තව ද එකුන්විසි කෙළක් වස්තු වියදම්කොට මිරිසවැටි[8] විහාරය කරවා එක් පෙළෙක සතලිසක් වැම් බැගින් සතලිස් පෙළෙක එක්දහස් සසියයක් වැම් පිහිටුවා,

අනෙකලඞ්කාරවිභාසුරාය - සම්පීතාමොද මනොහරාය,
සයින්දකානෙකමුදාකරාය - නිරන්තරං මඞ්ගලමන්දිරාය

යනාදීන් වර්ණනා කරන ලද සුධර්මා නම් දිව්‍යසභාව මෙන් ශෝභාමත් ව බබළන්නාවූ එක්සියවිසි රියන් දිග පුළුල ඇති නව මහලකින් හා දහසක්[9] කන්කුළින් යුක්ත වූ ලෝවාමහපාය තිස් කෙළක් වස්තු වියදම් කොට කරවා නොයෙක් කෙළගණන් රහතන් වහන්සේට චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍යය යන සිව්පසයෙන් උපස්ථාන කොට අනර්ඝ වස්තු සූවිස්සක් හා කෙළ දහසක් වස්තු වියදම් කොට එක්සිය විසි රියන් රුවන්වැලි මහසෑය බඳවා තව ද නවානුවක් විහාර

1. නරකාග්නීන් - C
2. නිරාවල - I, ස
3. න්‍යග්‍රොධ - බෙ, H
4. රත්වන් - AC
   රම්වත් - සි. ක.ඤ
   රත්පත් - ම.
5. සහ මවුනු - ABCDGHIJKL
   ධනවොවුනු - E
6. යශොතේජස් - ABCDEFIKLJ
   යශස්තේජස් - මුද්‍රිත හැම
7. කළාහු ද - I
8. මිරිසවිටි - ABDEIJKL
9. දසසහසක් - ම. බෙ. ස.
   දසදහසක් - සි.ක.ඤ.

Non-Commercial Distribution

හා දූපිස්සක් දගැබ් බන්දවා එබඳු කුශල රාශියක් කළාවූ දුටුගැමුණු රජ්ජුරුවෝ පවා "ඒ සියලු කුශලයට වඩා ධර්මදානයෙහි විපාක බෙහෙව"[1] යි යනු අසා බණ කියම් යි ධර්මාසන නැඟී හිඳ දෙළොස් දහසක් රහතන් වහන්සේ දැක උපන්නාවූ ආසථානභයින් බණ කිය නොහී අස්නෙන් බැස එතැන් පටන් ලංකාද්වීපයෙහි සියලු විහාරවල තමන් නමින් බණ පවත්නා ලෙස ධර්මකථිකයන්ට නොයෙක් සත්කාර කොට එකි එකී ධර්මකථිකයක්හට නැලියක් නැලියක් පමණ ගිතෙල් මී උක්සකුරු ද සතරඟුලක් දිග මහ වැල්මී ගැටයක් ද වස්[2] සාරපෝයෙහි එකි එකී පිළිසහලක් ද භාණ්ඩාගාරයෙන් ම දී තමන් රාජ්‍යය කරන සූවිසි අවුරුද්ද මුළුල්ලෙහි එපරිද්දෙන් ම බණ කියවා ධර්මදානය දී එබඳු කුශලසම්භාරයන් රැස් කරන්නාහු ද එහි විපාක බණින් අසා ම කළහ. එසේ හෙයින් සත්වයෝ බණ නොඇසූවාහු වී නම් සෙසු දෑ තබා සරළුවක්[3] පමණ බතක්[4] ද කෙණෙස්සක් පමණ කැඳිත්තක්[5] ද රියනක් පමණ කඩරෙද්දක් ද පවා නොදෙන්නාහ. එසේ කල්හි සතලිස් කෙළක් වස්තු ඇති වත් පරලොවට පිහිට වන කිසි පිනක් නො කොට අවීචි මහානරකයෙහි උපන් අපුත්‍රක[6] සිටාණන් මෙන් මතු නරකාදි වූ සතර අපායෙහි ඉපද මහ දුක් අනුභව කොට ඉදින් මනුෂ්‍යාත්මභාවයක් ලද්දාහු නම්[7] ඉතා දිළිඳු ව කුණුරෙදි ගොතා හැඳ අනුන් සේවනය පිණිස රහමඩලෙක පුරමාට්ටු පානා කෙනකුන් සේ කබල් ගත් අත් ඇති ව රක්නා තපසක් නැතත් උදරපොෂ්‍යය නිසා දෙර දෙර සිට සිඟාත් කුස යපෙන පමණ අහර නොලදින් වෙවුලුම් ගත් දුර්වල ශරීර ඇති ව සැරයටිය ගසා ඇවිදුනාහු[8] පෙර කුසල් කළවුන් කා බී හැඳ පැළඳ කෙළිනළුයෙහි යෙදී ඇවිදුනා[9] දැක තමන් පෙර කුසල් නොකොට විඳුනා දුක් සිත සිතා සුසුම් ලලා දෙඇසින් වැහෙන[10] කඳුළු ධාරා නියහින් ඉස ඉස මෙසේ ජීවිතාන්තය දක්වා මහ දුක් විඳ නැවත නිජ්ඣාමතණ්හික නම් ප්‍රේතනිකායෙහි ඉපද කපක් මුළුල්ලෙහිදු පෙම් සොටු පමණ ආහාරයක් නො ලැබ ඇතුළ ගිනි ගත් සිඳුරු ගසක් සේ ක්ෂුධාදුඃඛයෙන් පීඩිත ව මහදුක් අනුභව කරන්නාහු ම ය. මෙසේ සසර දුක් ඇති බව බණින් අසා එසේ වූ දුකට නොපැමිණිය මැනවැයි සිතා[11] ලෝකවාසීන් කුසල් කොට සැපත් ලබන හෙයින් සියලු දානයට වඩා ධර්මදානය ම උතුම් වන්නේ ය. තව ද මේ ලොකයෙහි විද්‍යමාන වූ මූලරසය ඛන්ධරසය තව[12] රසය පත්‍රරසය ඵලරසය[13] පුෂ්පරසය යනාදී[14] රසජාති ද උත්කෘෂ්ට වශයෙන් දක්වන ලද දෙවියන්ගේ සුධාභොජන රසය ද අනුභව කළ සත්වයන් යළිදු සතර අපායෙහි ඉපද මහදුක් විඳුනා[15] හෙයින් ඒ සියලු රසය ම නැවත සසරදුක් විඳීමට කාරණ වන්නේ ය. මේ සත්තිස් බොධිපාක්ෂික ධර්ම

1. බොහෝ ව - I
2. වස් - ACJ
3. සාළුවක් - ACDEFJ
4. කැඳිත්තක් - *CDGHJK*
   කැඳ ද - I
5. බතක් ද - ABCDEFGHJK
   කැඳ ද - I
6. ආගන්තුක - පිටපත් හැම, ක.ඤ.ම.
7. වී නම් - ABCDIJKH; වී නම් - L
8. ඇවිදිනාහු - BCDHL
   ඇවිදිනොම් - I
9. ඇවිදුනාවුන් - I
   ඇවිදුනාහු - කි. බෙ. ක. ඤ
10. වැගිරෙන - BGHIKL
11. *මැනවැයි සිතා - පිටපත් හැම*
    මැනවැයි - කි. ම. බේ. ක. ඤ, ස.
12. ත්වච - CK , තොච - L
13. පත්‍රරසය ලියරසය - L
14. යනාදි වූ - BCIK
15. විඳිනා - CDI කි.

Non-Commercial Distribution

[සහිත ව][1] නවලොකොත්තර සද්ධර්ම නමැති රසය ඇදහිලි ඇති ව ඇසීම් වශයෙන් අනුභව කළා වූ සත්වයෝ එනාහි මණ්ඩූක ව ඉපද බුදුන්ගෙන්[2] බණ අසා හොත් කුසල් පමණකින් දෙව්ලොව ඉපද මහත් වූ දිව්‍යසැපත් ලදින් සෝවාන් ව පළමුවන මඟින් නිවන් දැක සැනහුණු මණ්ඩූක දිව්‍යපුත්‍රයා මෙන් නොයෙක් සියදහස් ගණන් ජාතියෙහි දිව්‍යමනුෂ්‍ය සම්පත් විඳ කෙළවර අමෘත මහා නිර්වාණයටත් පැමිණෙන්නාහු මය. තව ද අගසව් බව පතා එකාසංඛ්‍ය කප් ලක්ෂයක් පිරූ පාරමිතා ඇති ව කපක් දවස් වට වැස්සෙහි දියබිඳු ගණනට සමත් වූ මහ නුවණ ලදින්,

ගඞ්ගාය වාලුකා ඛීයෙ - උදකං ඛීයෙ මහණ්ණවෙ,
මහියා මත්තිකා ඛීයෙ - ලක්ඛෙණ මම බුද්ධියා

යනාදීන් ඥනගර්ජනා කොට තුන්ලෙව්හි කීර්ති පතුරුවාපු සැරියුත් මහතෙරුන්වහන්සේ වැනි මහාශ්‍රාවකයෝ පවා තමන්ගේ නුවණින් නිවන් දහම් පසක් කොට[3] නොහී අස්සජි මහතෙරුන් වහන්සේ වදළ ගාථාර්ධයක් අසා සෝවාන් ව බුදුන් වදළ සද්ධර්මරසය අනුභව කිරීමෙන් ම නිවන් දහම් පසක් කෙරෙමින් ශ්‍රාවකබොධිය සිද්ධ කළහ. එසේ හෙයින් යට කියන ලද මූලරසාදි සියලු රසයට වඩා ධර්මරසය ම උතුම් වන්නේ ය. තව ද ස්ත්‍රීරතිය වස්ත්‍රරතිය පුත්‍රරතිය ධීතෘරතිය නෘත්‍යරතිය[4] ගීතරති ය යනාදී වූ අනෙකප්‍රකාර රති එනාහි හෙවත් මුතු මැණික් වස්ත්‍රාභරණ ස්ත්‍රී ආදීන් විෂයකොට පවත්නාවූ ප්‍රීතිය එනාහී අනිෂ්ටාලම්බනික[5] වූ ඒ ඒ වස්තු ආදියෙහි ලොභ වශයෙන් ම පවත්නා හෙයින් මතු නරක තිර්යක් ප්‍රේත අසුරකාය යන සතර අපායෙහි නොයෙක් දුක් විඳීමට ඒකාන්ත කාරණ වන්නේය. මේ සද්ධර්මය කියන්නවුන්ට ද අසන්නවුන්ට ද සතුටු කඳුළු වඩමින් සියලඟ ලොමුදහ ගන්වමින් සාධුකාර දෙවමින් සිත ඇතුළෙහි උපන්නා වූ ධර්මප්‍රීතිය එනාහී දරු දෙමව්පිය බෑබුන් ආදීන් කෙරෙහි කළ ශොකයෙන් දෙඅත ගෙන[6] හිස තබා හඬමින් වලපමින් වැනි වැනී හන් කඩ ඉරා කර ලා වියරු වෙස් ගෙන උපන්වන ම අවුත් බණපිරිස් මැදට වැද බුදුන්ගේ වචන මාත්‍රයක් අසා හිරි ඔතප් ලදින් බණ අසා රහත් වූ පටාචාරාව මෙන් සියලු සසර දුක් ගෙවා රහත් බවටත් පමුණුවා ලන්නේ මය. තව ද ධර්මාලම්බන ප්‍රීතීන් මත් ව එපරිද්දෙන් සාධුකාර දිදී බණ ඇසුවාහු උපනුපන් ජාතියෙහි උත්පලගන්ධ මහතෙරුන් වහන්සේ මෙන් මහනෙල්මල් සුවඳ වහනය වන මුව ලබන්නාහ. වදරන ලද මැයි,

---

1. සංඛ්‍යාත - පිටපත් හැම
   සහිත - මුද්‍රිත හැම,
2. බුදුන්ගේ - EF
3. කොටගත- IKL
   කර - C
4. නච්චරතිය - KL
5. අනිෂ්ටාලම්බනික - පිටපත් හැම
   ඉෂ්ටාලම්බනීය - මුද්‍රිත හැම. ස
6. අත ගෙන - ABGHKL

Non-Commercial Distribution

සද්ධම්මදෙසනාකාලෙ - සාධු සාධූ'ති භාසතො
මුඛතො වායතී[1] තස්ස - ආමොදුප්පලසම්භවා යි.

එසේ හෙයින් වස්තුරති ආදී වූ සියලු රතියට වඩා ධර්මරතිය ම උතුම් වන්නේ ය. තව ද සත්වයෝ තෘෂ්ණාව නිසා ම මහදුක් විඳුනාහ. හේ එසේ මැයි. ගිය දවස කාමතෘෂ්ණා වසඟී ව ස්ත්‍රියක කෙරෙහි පෙම් බැඳ වසන පුරුෂයෙක් එම ස්ත්‍රිය විසින් මරවන[2]ලදුව ඇය[3] කෙරෙහි සෙනහයෙන් එම ගෙයි ගරඬි ව ඉපද වසනුයේ ඒ ස්ත්‍රිය උන් සිටි යම් ම තැනක් බලා දිවගෙන ගොස් සෙනහයෙන් වෙරෙහි වැලඳ ගන්නේ ය. එකල ඕ තොමෝ "මේ වූ කලී අනිකෙක් නොවෙයි. පළමු ගෙහිමියා[4] ම ය" යි දැන එකල්හිදු ඔහු මරවාපුව. නැවතත් හෙතෙම ඇය[3] කෙරෙහි සෙනහයෙන් එම ගෙයි බලු ව ඉපද මඳක් පයින් ඇවිදුනා අවස්ථාවෙහි පටන් ඒ ගැහැනිය යන එන යම් ම තෙනෙක පසුපස්සෙහි ඇවිදුනේය. දර පලා ආදිය පිණිස වලට යන වේලෙහි ද කැට්ව ම නික්මෙයි. ඒ බව දැක[5] මිනුෂ්‍යයෝ "එම්බල කොල, බලුවැදි[6] බල්ලන් ගෙන[7] දඩයමට නික්මිණ. අද කවර දසාවක දඩයමට යේ දෝහෝ, සතුන් මැරූ කල අපටත් මස් සුහක් දේ දේහෝ[8] යනාදීන් නොයෙක් කවට කියා වෙහෙසන්ට පටන් ගත්හ. ඉක්බිති එම ස්ත්‍රී තොමෝ එබසට ළජ්ජා ව එකල්හිදු ඔහු මරවාපුව. නැවත ඒ තෙමේ ඇය[3] කෙරෙහි ම සෙනහ බලවත් හෙයින් එම ගෙයි දෙනක කුස පිළිසිඳ ගොන් ව ඉපද පළමු පරිද්දෙන් ම ඒ ගැහැණිය පසුපස්සෙහි ඇවිදුනේය. එපවත් දැක මිනුෂ්‍යයෝ "එම්බල කොල, ගොපල්ලාණෝ ගෙරීන් ගෙන නික්මුණහ. අද ගෙරීන් කවර තණබිම කරා නමද්දෝ[9] හෝ, කොතෙනෙක තණ ඇද්දෝ හෝ"යනාදීන් වෙහෙසන්ට පටන්ගත්හ: එතෙපුල් අසා ඒ කල්හිදු එම ස්ත්‍රී ඔහු මරවාපුව. හෙතෙම තව ද ඇය[3] කෙරෙහි පැවැත්තා වූ සෙනහතෘෂ්ණාව හැරපිය නොහී,

පුත්තො පිතා භවති මාතුපතීහ පුත්තො
නාරී කදචි ජනනී ච පිතා ච පුත්තො
එවං සද විපරිවත්තති ජීවලොකො
චිත්තෙන සද්'ති චපලෙ බලු ජාතිරඩ්ග

යනු හෙයින් සතරවන වාරයෙහි එම ගැහැණිය කුස පිළිසිඳ පුත් ව උපන. එකල ඕහට ජාතිස්මරණ නුවණ පහළ වි ය. එතෙම තමාගේ ජාතිස්මරණ නුවණින් අතීතජාති බලනුයේ පිට පිට සතර ජාතියෙක එම ස්ත්‍රිය විසින් තමා ජීවිතක්ෂයට පමුණුවාපු[10] බව දැක "අහෝ ළෙහි ගුණයක් නැති ඉතා තද සැතිරියක කුස ඉපද[11] ගියෙමි" යි කණස්සලු ව එතැන් පටන් ඈ අතින් තමා ඇඟ ඇල්විය නොදේ. ඉදින්

1. වායතී ගන්ධො - A
   වායතී ගන්ධො තස්ස - J
2. මරන - IKL
3. ඈ - පිටපත් හැම
4. ගෙයි හිමියා - ABDF
5. දැන - BGHI
6. බලුවැදිව ඇවිදිව - I
   බලුවැදිව - කී. ක. සැ. බෙ. ස.
7. ගෙන්නාගෙන - F
   ගෙන්වාගෙන - D, මුද්‍රිත හැම, ස.
8. දේ දෝහෝ නොදෙත්හෝ - L, ස.
9. නමද්දෝ - ACDEFIJKL, කී. ක. සැ.
   නමන්දෝ - H
   නමත්දෝ - BG
   රඳවද්දෝ - බෙ. ස.
10. පමුණුවාලු - E, බෙ. ස.
    පමුණුවන - I
11. පිළිසඳ ඉපද - BGHI

Non-Commercial Distribution

මදක් ඇඟ ඇල්වී[1] නම් මහ හඬින් හඬයි. එසේ හෙයින් ඔහු මුත්තණුවෝ ම[2] වැඩූහ. මෑතභාගයෙහි ඒ කුමරු වැඩී මහත් වූ කල දවසෙක මුත්තණුවෝ විචාරන්නාහු "කිමෙක්ද පුත, තෙපි තොප මෑණියන් අතින් ඇඟ ඇල්විය නොදෙව, ඉදින් ඇල්වූ නම් මහ හඬින් හඬව. ඊට කාරණ කිම් දැ"යි විචාළහ. එකල කුමාරයෝ කියන්නාහු "තමන් බඩ පිළිසුන් හෙයින් වැදූ පමණක් මිය ඌ[3] මාගේ මෑණි කෙනෙක් නොවෙයි, නොයෙක් වර බොහෝ අනර්‍ථ කළාවූ සැතිරියක් මය. එබැවින් උන්ගේ[4] පූර්‍වචරිතය අසනු කැමැතහොත් ඇසුව මැනවැ" යි කියා මේ කථා ප්‍රබන්ධය මුත්තණුවන්ට කීහ. එකල මුත්තණුවෝ කුමාරයන් ළංකොට දෙඅතින් වඩා ළෙහි හොවාගෙන පිඹ සනහා[5] අඬා වැලප තෘෂ්ණාවෙහි ආදීනව සලකා පසර කළකිරී ගිහිගෙන් නික්ම එක්තරා විහාරයකට ගොස් දෙදෙන ම සසුන් වැද මහණ ව නොබෝ කලකින් ම සියලු දුකට කාරණ ව සිටියා වූ තෘෂ්ණාව ක්‍ෂය කොට රහත් ව සියලු දුක් දනා[6] නිවන් සැප ලදහ.

තව ද බුදු බව පතා දසපැරුම් පුරමින් ආවාවූ අප මහබෝසතාණෝ කුසරජ ව උපන් සමයෙහි ,මමය සිංහස්වර කුසරජ්'යි බැණ නැගි ශබ්දමාත්‍රයකින් සිංහනාද ඇසූ මුවරළක් බුන්නා සේ සත්රජකු හා සත්සතුරු සෙනඟක් බිඳ ජයගන්ට සමර්‍ථ වූ ආඥබල තේජස් ඇති ව පවා,

> තෙජවාපි හි නරො විචක්ඛණො
> සක්කතො බහුජනස්ස පූජිතො
> නාරී වසංගතො[7] න භාසති
> රාහුනා උපගතොව චන්දිමා

යනාදීන් තමන් මතු බුදු ව දෙසන ධර්‍මයට නය තබා තබන්නා සේ එම ජාතියෙහි ප්‍රිය භාර්‍යා වූ ප්‍රභාවතීන් නිසා රාජ්‍යශ්‍රීන් හැර නිශ්ශ්‍රීක දරිද්‍ර වෙශොපගත ව දර පැන් ඇද බඳුන් ශොධා වඩුන් පිස කරින් ඇද නීච ක්‍රියායෙහි යෙදී තෘෂ්ණා බලයෙන් ම මහදුක් අනුභව කළාහු එම තෘෂ්ණාව ක්‍ෂය කිරීමෙන් ම ලොවුතුරා බුදු ව සියලු දුක් ද නසා[8] මුළුලෝ දුකින් ගැළවූහ.

මෙසේ එම ජන්මයෙහි අනයව්‍යසනයට[9] පමුණුවා මතු ජාතියෙන් ජාතියෙහි ගව බලු ගරඬි[10] මැඩි හූරු ආදි වූ හීන තිරිසන් යොනියෙහි උපදවමින් අපමණ දුකට පමුණුවන්නාවූ ක්‍ෂෙත්‍රවස්තුන් හා පුත්‍රදාරාදීන් කෙරෙහි ද මුතු මැණික් ආදි වූ දශවිධ රත්නායෙහි ද ලොභ වශයෙන් පවත්නාවූ තෘෂ්ණාව ක්‍ෂය කළ කල්හි හෙවත්

---

1. ඇල්වූ - ACDEGHJ කි. ස.
   ඇල්යු - B
2. මුත්තණියෝ - ABCDEFGHIJKL
3. ඈ -බෙ. ස.
4. ඈගේ - බෙ.ස.
5. සනහා - පිටපත් හැම - සනසා - මුද්‍රිත හැම
6. නසා - CDEFHIK, කි.ම
7. නාරී තං වසගතො - බෙ.
   නාරීනං වසගතො - කි. ක. කැ. ම. ස.
   නාරී වසංගතො - පිටපත් හැම
8. දනා - GE, ස
9. අනන්ත වූ ව්‍යසනයට - L
10. ගැරඬි - BCI

Non-Commercial Distribution

තෘෂ්ණාවගේ ක්ෂයාන්තයෙහි ම බුදු පසේබුදු මහරහත්බව සිද්ධ කෙරෙමින් අභීත්ඵලය ඉපද සසර දුක් නසන හෙයින් තෘෂ්ණාව ක්ෂය කිරීම සියලු දුක් ම[1] නසන්නේ ය.[2] මෙසේ අවිද්‍යා තෘෂ්ණාදීන්ගේ ආදීනව හා කුශලාකුශල කර්ම්මයන්ගේ ඉෂ්ටානිෂ්ට විපාක ධර්ම්මයෙන් ම අසා ලෝකවාසීන් කුසල් කොට දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳ නිවන් දක්නා හෙයින් අන්නදනය පානදනය යානදනය වස්ත්‍රදනය මාලදනය ගන්ධදනය විලෙපන[3]දනය ආවාසදනය ශයනදනය[4] දීපදනය ධූපදනය යනාදී වූ සියලු දනයට වඩා ලාභසත්කාරයෙහි නිරපෙක්ෂ ව නිශ්ශරණාධ්‍යාසයෙන් යෙදී අනුන්ට බණ කීම් වශයෙන් දෙන්නා වූ ධර්ම්මදනය ම උතුම් වන්නේ ය. මෙසේ සියලු දනයට උතුම් ව හැම කුශලයට මුල් ව[5] මුළු ලොවට පිහිට ව ගගනගඞ්ගා ප්‍රවාහයක් සේ නිෂ්කලඞ්ක ව පවත්නා වූ මේ සද්ධර්ම්මයෙහි විශෙෂ විභාග සලකාගත නොහී යම්කිසි කෙනෙක් ස්වාඛ්‍යාතාදී ගුණොපෙත වූ සපර්ය්‍යාප්තික නව ලොකොත්තර සද්ධර්ම්මයෙහි විමති උපදවා දෘෂ්ටිවිපර්ය්‍යාසයට පැමිණියාහු නම් ඔහු වාවකාල නම් උපාසකයා මෙන් මතු අපායෙහි[6] උපදනාහ. හේ කෙසේද යත්,

මෙම ලඞ්කාද්වීපයෙහි මහවැලි ගං අස එක්තරා ගමෙක වාවකාල නම් උපාසකයෙක් තමා ඉතා භවරාගී හෙයින් බොහෝකලක් සැප විඳිනා කැමැති ව සෝවාන් වුව මැනවැයි සිතා ද්වාත්‍රිංශාකාර කර්ම්මස්ථානය ඉගෙන තිස් අවුරුද්දක් මුළුල්ලෙහි කමසේ 'ම'[7] පිරිවහා බොහෝ උත්සාහ කරනුයේ විශෙෂාධිගමයක් නො ලැබ තමාගේ නුවණ නුමුහුකළ හෙයින් අධිගම නොලත් බව සිතාගත නොහී වරදවා සිතනුයේ 'මම මෙතෙක් කල් මුළුල්ලෙහි මෙසේ කමසේ ම ද්වාත්‍රිංශාකාර කර්ම්මස්ථානය පිරිවහා බොහෝ වීර්ය්‍ය කරනුයෙම් පවා ආලොකමාත්‍රයකුදු උපදවාගත නුහුණුයෙම්. මේ බුද්ධශාසනය නෛර්ය්‍යාණික නොවන වනැ'යි මෙසේ නිෂ්කාරණයෙහි දෘෂ්ටි වරදවාගෙන එම අකුශල බලයෙන්[8] එයින් මිය මහවැලිගහ එක් දහස් දෙසිය සැටරියන් දිග ශරීර ඇති මහ කිඹුල් ව ඉපද ක්ෂුධාදුඃඛයෙන් පීඩිත ව මහදුක් විඳ වෙසෙයි[9]. එකල ගල්ටැම් පිරූ ගැල්සැටක් ඇදගෙන නික්මුණු දෙසිය සතලියක් පමණ ගොන් හැම කසාතොටින් එතෙර වනු සඳහා ගහදියට බටහ. එකෙණෙහි ඒ කිඹුල් තෙම ගැල් ගල් ගොන් ආදී වූ සියල්ල ම ඇසිල්ලෙක භක්ෂණය කෙළේය. එතකුදු වුවත් ඒ හැම ඔහු කුස යපෙන පමණෙක් ම විය. එසේ හෙයින් බුද්ධශාසනයෙහි විමති විරුද්ධ පිළිබහා බහුමාන පෙරදැරි ව ආදර කටයුත්තේ මය.

අප බුදුන්ගේ ශාසනික ධර්ම්මය නම් පර්ය්‍යාප්ති ධර්ම්මය ප්‍රතිපත්ති ධර්ම්මය ප්‍රතිවෙධ ධර්ම්මය යි තුන් වැදෑරුම් වෙයි. එම ත්‍රිවිධශාසන නමුත් වෙයි. එයින් තුන්පිටකයෙහි සඞ්ගෘහිත වූ සියලු බුද්ධවචනය පර්ය්‍යාප්ති ධර්ම්ම නම. තෙරස ධූතගුණය

---

1. දුක් ද - ACDEFGHJ
2. නසන්නේමය - ADEFGHK
3. විලෙප - GIJ
4. ශබ්දදානය - BDHIKL
5. හැම කුශලයට මුල්ව (නැත), I මුද්‍රිත හැම
6. අපායෙහි ම - BDGH
7. නොකමසේම - GH
   නොකඩ කොට සේම - I
8. අකුශලයෙන් - ACDFGHIJKL
9. වෙහෙසෙයි - D

Non-Commercial Distribution

චුද්දස ඛන්ධකව්‍රතය දෙයාසූ මහාව්‍රතය ශීලය සමාධිය විදර්ශනාය යන මේ ප්‍රතිපත්ති ධර්ම්ම නම. තව ද ශ්‍රොතආපත්‍යාදි සතර මාර්ගය ද සතර ඵලය ද නිර්වාණය ද යන මෙ ලොකොත්තර ධර්ම්ම නවය ප්‍රතිවෙධ ධර්ම්ම නම. එම අධිගම සද්ධර්ම නමුදු වෙයි. තව ද ඒ තුන් වැදෑරුම් වූ ධර්ම්මයන් අතුරෙන් පර්‍ය්‍යාප්ති ධර්ම්මය ම සර්වඥශාසනයට මුල් වෙයි. ඊට කාරණ පෙර මහාස්ථවිරයන් විසින් ම දක්වන ලදී. කෙසේ ද යත්,

මෙම ලක්දිව බැමිණිටියාසාය සමයෙහි ශක්‍රයෝ මහත් වූ පසුරක් මවා මේ සියක් යොදුන් ලඞ්කාද්වීපයෙහි හැම භික්‍ෂුසඞ්ඝයාට ඇසෙන සේ කියන්නාහු "ස්වාමීනි, හැමදෙනා වහන්සේ ම මා කියන්නක් ඇසුව මැනව. මතු මහත් වූ දුර්භික්‍ෂ භයෙක් වෙයි. දෙළොස් අවුරුද්දක් මුළුල්ලෙහි වැසි නොවස්සී[1]. භික්‍ෂූන් වහන්සේ ද ප්‍රත්‍යය නිසා මිරිකෙන හෙයින් බුදුන් වදළ පාළි ධර්ම්මය ඉදුරා සම්පූර්ණ කොට ධරාගත නොහෙනසේක. එබැවින් ඇස් ඇතියවුන්ට ලොව සියලු වස්තූන් ප්‍රකාශ කොට දක්වන හිරුමඩල[2] සේ නුවණ නමැති ඇස් ඇත්තාවූ පින්වත් සත්වයන් සියලු සම්පතට පැමිණෙන්නාවූ ප්‍රතිපත්තිවිභාග දක්වන පාළිධර්ම්මය නොපිරිහෙළා පවත්වා රක්‍ෂාකොට මතු ඇතිවන සත්වවර්ගයාට කුශලමාර්ගය දක්වා සංසාර කාන්තාරයෙන් එතෙර කොට අමාමහ නිවන් නමැති අභයපුරයට පමුණුවාලන පරිද්දෙන් කරුණා පෙරදැරි ව මේ පසුරට නැඟී මුහුදින් එතෙර වැඩ හැමදෙනා වහන්සේ ම ජීවිතය රැකගෙන බුදුන්ගේ පාළිධර්ම්මය නොපිරිහෙළා පවත්වා වදළ මැනව. යම් කිසි[3] කෙනකුන් වහන්සේට මේ පසුරෙහි අවකාශ නොසෑහේ නම් ඒ හැමදෙනා වහන්සේ ද තෙල පුවරුකඩවල ළය තබාගෙන වැඩිය මැනව කිසිකෙනකුන් වහන්සේටත් භයෙක් නොවෙයි"[4] කීහ. එතෙපුල් අසා මුහුදුවැල්ලෙහි රැස් වූ භික්‍ෂූන් අතුරෙන් සැට දෙනකුන්[5] වහන්සේ "අපට මෙතැන්හි ගමකින් ප්‍රයෝජන කිම් ද, අපි හැම මෙහි ම රඳ තෙවළා බුදුවදන් රක්‍ෂා කරම්හ"යි කතිකා කොට එතෙනින් නික්ම දකුණුදිග ගල්වල් ජනපදයට ගොස් වනමුල් පලා කොළ ආදියෙන් දිවි රකිමින් දවස් යවනසේක්[6] කායබල ඇති වේලෙහි ඉඳගෙන ධර්ම්මය පිරිවහනසේක. කාය අශක්ති වේලෙහි වැලි ගොඩ කොට එහි වටින් හිස් තබා ඔවුනොවුන් වහන්සේගේ කනට ඇසෙන පමණෙක[7] පාළිධර්ම්මය පිරිවහනසේක. මෙම ක්‍රමයෙන් දෙළොස් අවුරුද්දක් මුළුල්ලෙහි අර්ථකථා සහිත වූ ත්‍රිපිටක ධර්ම්මය හදරා පිරිවහා සම්පූර්ණ කොට රක්‍ෂා කළසේක. පරදෙසට[8] වැඩි සත්සියයක් දෙනා වහන්සේ ද අර්ථකථා සහිත වූ ත්‍රිපිටක ධර්ම්මය එක අකුරකුත් නොපිරිහෙළා පරිහරණය කොට දුර්භික්‍ෂභය සන්හුන්[9] කල්හි මෙම ලක්දිවට අවුත් කලලග්‍රාම[10] ජනපදයෙහි මණ්ඩලාරාම නම් විහාරයට වන්සේක. එකල මේ ලක්දිව රැඳුණු සැටදෙනා වහන්සේ එපවත් අසා මණ්ඩලාරාම විහාරයට ගොස් ඔවුනොවුන්

1. නොවසියි - I
2. ළහිරුමඩල - A
3. කිසි (නැත) - BEGI
4. නොවෙවයි - GHIKL
5. දෙනකු - ACDEGHIJK
6. යවනසේක - CI
7. සේ පමණක් - EIJ
8. පරදේශයට - ACDFJKL
9. සන්හිඳි - L
10. කල්ලරාග්‍රාම - ACIJ
    කල්ලග්‍රාම - GHI

Non-Commercial Distribution

වහන්සේ දැක වැඳ දුක්සැප කථාකොට ඉක්බිති ත්‍රිපිටකධර්මය වනපොත් පිරිවා පරීක්ෂා කරනසේක් මේ [1] දෙපක්ෂයෙහි එක අකුරක් පමණකුත් වෙනසක් වැරැද්දක් නුදුටුසේක. ඉක්බිති දෙපක්ෂයෙහි භික්ෂූන් වහන්සේ එක් ව සාකච්ඡා කරනසේක් මේ සර්වඥශාසනයට මුල් පර්යාප්ති ධර්මය ද නොහොත් ප්‍රතිපත්ති ධර්මය ද යන කථාවක් ඉපදවූසේක. එකල පාංශුකූලික ස්ථවිර ශාසනයට මුල් නම් ප්‍රතිපත්ති ධර්මයි කීහ. ධර්මකථික ස්ථවිරවරයෝ පර්යාප්ති ධර්මය ශාසනයට මුලැයි කීහ. ඉක්බිති සෙසු භික්ෂූන් වහන්සේ එපවත් අසා "තමන් දෙපක්ෂයෙහි වචන ම[2] මෙපමණකින් නොගිවිසුම්හ. බුදුන් වදළ පාළිධර්මයකින් උදහරණයක් ගෙනහැර දක්වාලව" යි වදළසේක. එතෙපුල් අසා පාංශුකූලික ස්ථවිරයෝ උදහරණයක් දක්වන්නාහු "ඉමෙ ච[3] සුභද්ද භික්ඛූ සම්මා විහරෙය්‍යුං අසුඤ්ඤො ලොකො අරහන්තෙහි අස්ස" යන මේ පාලි වචනය දක්වා "සර්වඥශාසනය[4] ප්‍රතිපත්තිය ම මුල් කොට ඇත්තේ ය. ප්‍රතිපත්තිධර්මය පවත්නා තෙක් ම ශාසනය පවත්නේය" යි කීහ. ඉක්බිති ධර්මකථික ස්ථවිරවරයෝ තමන්ගේ වාදය පිහිටුවනු පිණිස[5]

යාව තිට්ඨන්ති සුත්තන්තා - විනයො යාව දිප්පති,
තාව දක්ඛින්ති ආලොකං සූරියෙ[6] අබ්භුට්ඨිතෙ යථා.

සුත්තන්තෙසු අසන්තෙසු - පම්මුට්ඨෙ විනයම්හි ච,
තමො භවිස්සති ලොකො[7] - සූරියෙ අත්ථංගතෙ යථා.

සුත්තන්තෙ රක්ඛිතෙ සන්තෙ - පටිපත්ති හොති රක්ඛිතා
පටිපත්තියං ඨිතො ධීරො - යොගක්ඛෙමා න ධංසති.

යන මේ ගාථා තුන ගෙනහැර දක්වා "යම් තාක් මේ ලෝකයෙහි සූත්‍රාන්ත විනය දෙක දීප්තිමත් ව පවතී ද ඒ තාක් කල් මුළුල්ලෙහි ලොව පතළ ගණඳුරු විදහා දශදිග ආලොක කෙරෙමින්[8] අහස හිරු නැගි කල්හි ඇස් ඇත්තවුන් ලොව විද්‍යමාන වස්තූන් දක්නා සේ නුවණ නමැති ඇස් ඇත්තාවූ[9] පින්වත් සත්වයෝ ඒ සූත්‍රාන්ත විනය සඞ්ඛ්‍යාත වූ ධර්මාලොකයෙන් සියලු සම්පතට පැමිණෙන්නාවූ ප්‍රතිපත්තිමාර්ගය දක්නාහ. සූත්‍රාන්ත ධර්මය නැති කල්හි භික්ෂූහු විනය ක්‍රමයෙහි අදක්ෂ වෙති. එකල සූර්‍ය්‍යමණ්ඩලය අස්ත පර්වතයට ගිය කල මුළු ලොව[10] අඳුරු වන්නා සේ සත්වයන්ගේ චිත්තසන්තානය මොහ නමැති අන්ධකාරයෙන් එකාන්ධකාර වන්නේය. පර්යාප්ති ධර්මය රක්ෂා කළ කල්හි ප්‍රතිපත්ති ධර්මය රක්නා ලද්දේ ම වෙයි; එපරිද්දෙන් ප්‍රතිපත්ති ධර්මයෙහි පිහිටියාවූ නුවණැති යොගාවචර භික්ෂූහු භාවනානුයොගයේ යෙදී මාර්ගඵල සඞ්ඛ්‍යාත වූ ප්‍රතිවෙධ ධර්මයෙන් නොපිරිහෙති. හෙවත් මාර්ගඵල උපදවා අමාමහ නිවන් දක්නාහ. එබැවින්[11] සර්වඥශාසනයට මුල්

1. මේ (නැත), ABCDHJ
2. වචනය, ACDEGHIJKL,
3. ච (නැත), ADEFGHIJ සි.ක.ස.
4. සර්වඥශාසනයට - BCGHI
5. ඉක්බිති..... පිණිස (නැත), GHI
6. ලොකෙ - BCDEH
7. ලොකෙ - I
8. කිරීමෙන් - ABGHI
9. ලද්ද වූ - I මුද්‍රිත නැම
10. මුළු ලොවට - KL
11. එබැවින් මේ - මුද්‍රිත නැම - CGHK

Non-Commercial Distribution

නම් පාලි ධර්මය ම වේදැ" යි කීහ. එකල පාංශුකූලික[1] ස්ථවිරවරයෝ අන් කිසි උත්තරයක් කිය නොහී තුෂ්ණීම්භූත වූහ. ධර්මකථික ස්ථවිරවරයන්ගේ වචනය ම ඉදිරි ව මුදුන්පත් විය. මෙසේ සර්වඥශාසනයට මූලප්‍රතිෂ්ඨා වූ අමෘත මහාමේඝයක් සේ මුළුලෝ සනසමින් පස්වාදහසක් පවත්නා අර්ථකථා සහිත[2] සියලු මේ[3] පාළිධර්මය විනයපිටකය අභිධර්ම පිටකය සූත්‍රපිටකය යන තුන්පිටකයෙහි සඞ්ගෘහිත විය. එයින් භික්ෂූන්ට අනුශාසනා පිණිස වදරන ලද විනය පිටකයෙහි පාරිජිය පාචිත්තිය චූළවග්ගය මහාවග්ගය පරිවාරය යන පඤ්චප්‍රකාර වූ විනය පාලියෙහි ග්‍රන්ථ සඞ්ඛ්‍යාව දෙසාලිස්දහස් දෙසියපනසෙක; ඊට සමන්තපාසාදිකා නම් වූ විනය අටුවාව[4] සත් විසිදහසෙකැයි මෙසේ විනයපිටකය ශ්‍රීමුඛ පාළි හා අර්ථකථා වශයෙන් එකුන්සැත්තෑදහස් දෙසියපනස් ග්‍රන්ථ සඞ්ඛ්‍යාවෙකින් සම්පූර්ණ විය[5]. තව ද බුදුන්[6] තමන්ගේ ප්‍රඥාසාරය දක්වා දිව්‍යබ්‍රහ්මයන්ට වදළා වූ අභිධර්මපිටකයෙහි,

> ධම්මසඞ්ගණී විභඞ්ගං ච - කථාවත්ථු[7] ච පුග්ගලං,
> ධාතු යමක පට්ඨානං-අභිධම්මොති වුච්චති.[8]

යනු හෙයින් ප්‍රකරණ වශයෙන් සතක් වුව ද ධර්මසඞ්ගණිය විභඞ්ගය කථාවස්තුය පුද්ගල ප්‍රඥප්තිය ධාතුකථාය මූල යමකය ඉන්ද්‍රිය යමකය දුකපට්ඨානය තිකපට්ඨානය[9] දුකතිකපට්ඨානය යි නවප්‍රකාර වූ විජම් පාළියෙහි ග්‍රන්ථසඞ්ඛ්‍යාව සයානූදහස් දෙසියපනසෙක. ඊට පිළිවෙළින් ම අට්ඨසාලිනීය සම්මෝහවිනෝදනීය සන්නකය විජම් අටුවා තුන් පොතෙහි[10] ග්‍රන්ථසඞ්ඛ්‍යාව තිස් දහසෙකැයි මෙසේ විජම් පිටකය ශ්‍රීමුඛපාළි හා අර්ථකථා වශයෙන් එක්ලක්ෂ සවිසිදහස් දෙසියපනස් ග්‍රන්ථසඞ්ඛ්‍යාවෙකින් සම්පූර්ණ වි ය. තව ද බුදු වන මහාපුරුෂයන් බොධිසම්භාර පුරන්නාවූ ප්‍රකාර දක්වා වදළ පන්සිය පනස් ජාතක දෙශනාවෝය සාමාන්‍යයෙන් බුඩකාරක පිළිවෙත්හි විභාග දක්වා වදළ බුඩවංශ චර්‍යාපිටක දෙශනාවෝය මෙවෙනි කුශලයක් කළ කල මෙනම් මහාපුරුෂලක්ෂණය පහළ වෙයි යනාදි විභාග හා සර්වඥවරයන්ගේ ආනුභාව ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මවිභාග දක්වා වදළ සතළොස් දහස් පන්සිය පන්සැත්තෑවක් පමණ සූත්‍රදෙශනාවෝය ප්‍රශ්නාවාගත[11] වස්තූන් නිමිතිකොට ගෙන කුශලාකුශල දෙක්හි විභාග දක්වා වදළ දෙසිය නවානුවක්[12] වස්තුකථා දෙශනාවෝය යනාදි වශයෙන් මෙසේ විනෙයජනයන්[13] නිසා වදාරන ලද සූත්‍රපිටකයෙහි,

> දීඝ මජ්ඣිම සංයුත්තා - අඞ්ගුත්තරික ඛුද්දකා,
> නිකායා පඤ්ච ගම්භීරා - ධම්මතො අත්ථතො විමෙ

1. පංසුකූලික - ABF පංසුකුල - GHKL
2. සහිත වූ - GHJK
3. ඒ සියලු ම - ABCDEFJ
4. අටුවා - පිටපත් හැම
5. පයීරජ්ති ධර්මය.... සම්පූර්ණ විය (නැත) - I
6. බුදුන් විසින් - I
7. වත්ථුං - පිටපත් හැම
8. පවුච්චති - AFJ
9. සංඛ්‍යාව වැරදි වුවද තිකපට්ඨානය යන්න හැම පිටපතක ම පැනෙන බැවින් ඇතුළු කරන ලදී.
10. පොත්හි - මුද්‍රිත හැම, ස.
11. ප්‍රශ්නාගත - ADFGHIJ
12. නවානු දහයක් - හි. ක. හැ, ම.
13. වෛශනය ජනයන් - පිටපත් හැම

Non-Commercial Distribution

යනු හෙයින් දික්සඟිය මැදුම්සඟිය සංයුත්සඟිය අඞ්ගුත්තර සඟිය කුදුගත්[1] සඟියයි පස් මහ සඟියෙක් වෙයි. එයින් පළමුවන දික්සඟිය තෙමේ[2] ශීලස්කන්ධවර්ගීය මහාවර්ගීය පාටිකවර්ගීයයි තුන් වර්ගයකින් හා සොළොස් දහසක් පමණ ග්‍රන්ථසඞ්ඛ්‍යාවෙකින් හා බ්‍රහ්මජාලසූත්‍රය ආදිකොට ඇති දීඝ ප්‍රමාණ වූ සූතිස් මහා සූත්‍රයකින් ශොභාමත් විය. එයින් කීහ,

චතුත්තිංසෙව සුත්තන්තා - තිවග්ගො යස්ස සඞ්ගහො,
එස දීඝනිකායොති - පඨමො අනුලොමිකො යි.

තව ද දෙවන මැදුම්සඟිය තෙමේ මූලපණ්ණාසය මජ්ඣිමපණ්ණාසය උපරිපණ්ණාසය යි තුන් පණ්ණාසයකින් හා පසළොස් වර්ගයකින් සඞ්ගෘහිත ව එක්විසිදහස් සත්සිය පනස් ග්‍රන්ථ සඞ්ඛ්‍යාවකින් පරිච්ඡින්න ව මූලපරියාය සූත්‍රය ආදි කොට ඇති මධ්‍යම ප්‍රමාණ වූ එක්සිය දෙපනස් සූත්‍රයකින් සමෘද්ධ විය. එයින් කීහ,

දියඩ්ඪසත සුත්තන්තා - ද්වෙ ච සුත්තානි යත්ථ සො
නිකායො මජ්ඣිමො පඤ්ච - දසවග්ග පරිග්ගහො යි.

තව ද තුන්වන සංයුත්සඟිය තෙමේ සගාථාවර්ගීය[3] නිදානවර්ගීය ස්කන්ධවර්ගීය සළායතනවර්ගීය මහාවර්ගීය යි පස්වර්ගයකින් හා[4] පස්විසිදහසක් පමණ ග්‍රන්ථසඞ්ඛ්‍යාවකින් හා[3] දෙවතා සංයුක්තාදී වශයෙන් සිටියා වූ ඔඝතරණ සූත්‍රය ආදි කොට ඇති සත්දහස් සත්සිය දෙසැට සූත්‍රයකින් සමෘද්ධ විය. එයින් කීහ,

සත්ත සුත්ත සහස්සානි - සත්ත සුත්ත සතානි ච,
ද්වාසට්ඨී චෙව සුත්තන්තා - එසො සංයුත්ත සඞ්ගහො යි.

තව ද සතරවන අඞ්ගුත්තරසඟිය තෙමේ [එකක දුක][5] තිකනිපාතය චතුෂ්ක නිපාතය පඤ්චක නිපාතය ෂ සත්තක නිපාතය අට්ඨක නවක නිපාතය දසෛකාදසක නිපාතය යි ෂට්ප්‍රකාරයකින් හා එකුන්තිස්දහස් සත්සියපනස් ග්‍රන්ථසංඛ්‍යාවකින් හා එකි එකී අඞ්ගාතිරේක වශයෙන් සිටියා වූ චිත්තපරියාදන සූත්‍රය ආදි කොට ඇති නවදහස් පන්සිය සත්පනස් සූත්‍රයකින් සමෘද්ධ විය. එයින් කීහ:-

නව සුත්ත සහස්සානි - පඤ්ච සුත්ත සතානි ච,
සත්තපඤ්ඤාසද සුත්තානි - සඞ්ඛා අඞ්ගුත්තරෙ අයං යි

තව ද පස් වන කුදුගත්සඟිය තෙමේ මෙසේ මෙකී දික්සඟිය ආදි කොට ඇති ග්‍රන්ථසඞ්ඛ්‍යා සහිත සතර මහසඟිය හැර චූලනිද්දේශය

1. කුදුගොත් - ABCDEFGHJKL
2. දික් (නැත) - BGHIJKL
3. සකවර්ගීය - CDEFGHIJ
   සතරවර්ගීය - BK
   සත් වර්ගීය - AL
4. හෝ - I
5. එකක දුක (නැත) - පිටපත් හැම

Non-Commercial Distribution

මහානිද්දේශය[1] ප්‍රතිසම්භිදය මහාවග්ගීය නෙත්තිප්පකරණය ජාතකපාඨය යි සර්වසඞ්ග්‍රාහික වශයෙන් ෂට් ප්‍රකාරයෙකින් හා යථෝක්ත වූ විනයාභිධර්ම දෙක්හි ග්‍රන්ථසඞ්ඛ්‍යාව හැර සූසාලිස්දහස් දෙසියපනස් ග්‍රන්ථසඞ්ඛ්‍යාවකින් හා[2] ඛුද්දකපාඨය ධම්මපදය උදානය ඉතිවුත්තකය සුත්තනිපාතය විමානවත්ථුය ප්‍රේතවත්ථුය ථෙරගාථාය ථෙරීගාථාය ජාතකය නිද්දේශය ප්‍රතිසම්භිදය අපදානය බුද්ධවංශය චර්‍ය්‍යාපිටකයයි විභාග වශයෙන් මෙසේ පසළොස් ප්‍රකාරයකින් සමෘද්ධ ව සිටියේය. එයින්[3] කීහ,

ඨපෙත්වා චතුරොපෙතෙ - නිකායෙ දීඝ ආදිකෙ,
තදඤ්ඤං බුද්ධවචනං - නිකායො ඛුද්දකො මතො යි.

මෙසේ දක්වන ලද පස් මහ සඟියෙහි ශ්‍රීමුඛපාඨ එක්ලක්ෂ දෙසාලිස්දහස් දෙසියපනස් ග්‍රන්ථසඞ්ඛ්‍යාවක් හා ඊට පිළිවෙළින් ම සුමඞ්ගලවිලාසිනී නම් අටුවාය ප්‍රපඤ්චසූදනී නම් අටුවාය මනෝරථපූරණී නම් අටුවාය සාරාර්ථප්‍රකාශිනී නම් අටුවාය පරමාර්ථජෝතිකා නම් අටුවාය සද්ධර්මජෝතිකා නම් අටුවාය උදාන නම් අටුවාය ඉතිවුත්තක නම් අටුවාය සුත්තනිපාත නම් අටුවාය විමානවත්ථු නම් අටුවාය ප්‍රේතවත්ථු නම් අටුවාය ථෙරගාථා නම් අටුවාය ථෙරීගාථා නම් අටුවාය ජාතක නම් අටුවාය ප්‍රතිසම්භිද නම් අටුවාය අපදාන නම් අටුවාය බුද්ධවංශ නම් අටුවාය චර්යාපිටක නම් අටුවාය විශුද්ධිමාර්ග නම් අටුවාය නෙත්තිප්පකරණ නම් අටුවාය යි මෙසේ සූත්‍ර අටුවා දෙලක්ෂ සූපනස්දහස් දෙසියපනස් ග්‍රන්ථසඞ්ඛ්‍යාවක් ඇතුළු ව සූත්‍රපිටකය ශ්‍රීමුඛපාළි හා අර්ථකථා වශයෙන් තුන් ලක්ෂ සයානූදහස් පන්සියපනස් ග්‍රන්ථසඞ්ඛ්‍යාවකින් සම්පූර්ණ විය.

මේ සියලු ධම්ම[4] සඞ්ඛ්‍යා වශයෙන් එකෙක් වෙයි. ධම්ම විනය වශයෙන් දෙකෙක් වෙයි. ආදි මධ්‍යාවසාන[5] වශයෙන් තුනෙක් වෙයි, පිටක වශයෙන් තුනෙක් වෙයි. නිකාය වශයෙන් පසෙක් වෙයි. අඞ්ග වශයෙන් නවයෙක් වෙයි. ස්කන්ධ වශයෙන් සුවාසූදහසෙක් වෙයි. ශ්‍රීමුඛපාළි වශයෙන් දෙලක්ෂ පන්සැත්තෑදහස් දෙසිය පනස් ග්‍රන්ථයෙක් වෙයි. උක්තානුක්ත අර්ථකථා වශයෙන් තුන්ලක්ෂ එක්සැටදහස් සත්සිය පනස්[6] ග්‍රන්ථසඞ්ඛ්‍යාවෙක් වෙයි. ඒ සියලු ම පිටකත්‍රයෙහි ශ්‍රී මුඛපාළි හා අර්ථකථාවෝ බණවර[7] සඞ්ඛ්‍යා වශයෙන් දෙදහස් පන්සිය සත්සාලිසක් පමණ වෙති. ග්‍රන්ථ සඞ්ඛ්‍යා වශයෙන් සලක්ෂ සත්තිස් දහස් පමණ වෙති. අක්ෂර සඞ්ඛ්‍යා වශයෙන් දෙකෙළ තෙයානූලක්ෂ අටසැට දහසක් පමණ අක්ෂරයෙන් පිරුණාහ. නය වශයෙන් අසඞ්ඛ්‍යය ගණන් නය ඇතියාහ. ඉදින් මේ ලෝකයෙහි යම් කිසි ප්‍රඥාවන්ත කෙනෙක් මේ සියලු ම ධර්මය අසා පිරිවහා බහුශ්‍රැත ව කුශලාකුශල

---

1. මහානිර්දේශය (නැත) - BGHIKL
2. මෙතැන විනය පිටකය, අභිධර්ම පිටකය යන්නක් හැම පිටපත්හි පෙනේ.
3. එසේ හෙයින් - BGHIKLI.
4. ධර්මස්කන්ධය - I
5. මධ්‍යාන්ත වචන - B
   මධ්‍යාන වචන - GH
6. සත්සිය පමණ - GH
7. භාණවාර - DEFJ

Non-Commercial Distribution

දෙක්හි විභාග දක්වා බණ කියන්නාහු වී නම් ඔහු බොහෝ දෙනාගෙන් ප්‍රශංසා ලැබෙති. සියල්ලවුන් විසින් පිදිය යුත්තාහු ද[1] වෙත්. හේ එසේ මැයි:

දවසෙක බමුණෙක් බුදුන් කරා එළඹ විචාරනුයේ "ස්වාමීනි, රූපී ව සිටි හෙයින් බුද්ධරත්නය සඞ්ඝරත්නය යන දෙරත්නයට පූජා සත්කාර කරම්හ. අරූපී වූ ධර්මරත්නයට කෙසේ පූජා කරමෝ දැ"යි විචාළේ ය. එකල බුදුහු ත්‍රිපිටකධාරී වූ ප්‍රඥාවන්ත සෙසු මහාශ්‍රාවකයන් ඇත ද සියලු ධර්මය නිශ්ශේෂ කොට ධරා සිටි අනඳ මහතෙරුන් වහන්සේ පිදුව සියලු ධර්මයට පූජා කළා නම් වන හෙයින්[2] ඔබ උදෙසා ධර්මයට පූජා කරවනු කැමති ව දහම් දන්නවුන් පිදුව ධර්මයට පූජා කළා නම් වෙ"යි වදරා "ධර්මය දන්නෝ කවුරු දැ"යි විචාළ කල්හි "බුදුහු තමන්ට අත්පා මෙහෙ[3] කරන්නා වූ තමන් මලණුවන්ට පූජා කරවනු කැමති ව කීහ" යි අවඥා කොට පෘථග්ජනයන්[4] අපායෙහි උපදනා[5] හෙයින් අසුවල්හු යයි නොවදරා "සඞ්ඝයා අතින් විචාරව" යි වදාළසේක. එකල බමුණු සඞ්ඝයා කරා එළඹ "ස්වාමීනි, මේ, ශාසනයෙහි ධර්මරාශියක් සේ සිටියෝ කවුරු දැ"යි විචාළේය. එවේලෙහි සඞ්ඝයා වහන්සේ "එම්බල බමුණ, මේ ශාසනයෙහි සුවාසූදහසක් ධර්මස්කන්ධය නිරවශෙෂ වශයෙන්[6] ධරා ගෙන,

ද්වාසීතිං බුද්ධතො ගණ්හිං - ද්වෙ සහස්සානි භික්ඛුතො,
චතුරාසීති සහස්සානි - යෙමෙ ධම්මා පවත්තිනො

යනාදීන් සිංහනාද කළාහු නමුදු අනඳ මහ තෙරහු මය. "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං බහුස්සුතානං සතිමන්තානං ගතිමන්තානං ධිතිමන්තානං උපට්ඨකානං යදිදං ආනන්දෙ" යනාදීන් බුදුන් විසින් පඤ්චස්ථානයෙක්හි අග්‍රස්ථානයට පමුණුවනු ලද්දහු නමුදු අනඳ මහතෙරහු මය. "ආයස්මා ආනන්දෙ අත්ථකුසලො ධම්මකුසලො ව්‍යඤ්ජනකුසලො නිරුත්තිකුසලො පුබ්බාපරකුසලො" යනාදීන් ධර්මසෙනෙවි සැරියුත් මහතෙරුන් වහන්සේ විසින් ධර්මමූර්ති ස්වරූපයෙන්[7] දක්වන ලද්දහු නමුදු අනඳ මහතෙරහු මය. එබැවින් ධර්මරාශියක් සේ සිටි කෙනෙක් නම් අනඳ මහතෙරහු මය" යි කියා මහතෙරුන් වහන්සේ දැක්වූසේක. එකල්හි බමුණු තෙමේ "ධර්මරත්නයට පූජා කෙරෙමි"යි මහත් වූ ආදර බහුමානයෙන් අනඳ මහතෙරුන් වහන්සේට උදරතර පූජා කෙළේය.

තව ද මේ ලොකයෙහි යම් කිසි ප්‍රඥාවන්ත කෙනෙක් යම්තම් ශ්‍රීමුඛපාඨයක් දක්වා ස්ථානොචිත වශයෙන් අනෙකප්‍රකාර වූ[8] උපමා හා නොයෙක් දෘෂ්ටාන්ත දක්වා විසිතුරු කොට විදහා චිත්‍රකථී ව[9] බණ කියන්නාහු වී නම් ඔවුන් විසින්

1. යුත්තාහු නම් - I
2. වෙයි. එසේ හෙයින් - I
   වන්නේය එසේ හෙයින් - H
3. මෙහෙවර - B
4. පුථුජ්ජනයන් - ACDEFJ
5. උපදවන - KL
6 නිරවශෙෂයෙන් - ABDEGHIJKL
7. ස්වභාවයෙන් - BGHIKL
8. අනෙකප්‍රකාරයෙන් - K
9. චිත්‍රකථික - KL, බෙ.ස.

Non-Commercial Distribution

කියන්නාවූ ඒ ධර්මය පඤ්චෝපක්ලේශයෙන් විනිර්මුක්ත වූ චන්ද්‍රමණ්ඩලය සේ ද දසදිග අඳුරු විදහා දහසක් රසින් දිලියෙන්නාවූ බාලාර්කමණ්ඩලය සේ ද අතිශයින් ප්‍රකාශ ව බබළන්නේය. අසන්නවුන්ට ද ඉතා ප්‍රිය වන්නේ මය. විස්තර වශයෙන් දැනෙන්නේ මය. එයින් වදාළහ අඞ්ගුත්තර නිකායෙහි,

"තීනිමානි භික්ඛවෙ විවටානි විරොචන්ති නො පටිච්ඡන්නානි. කතමානි තීනි? චන්දමණ්ඩලං භික්ඛවෙ විවටං විරොචති, නො පටිච්ඡන්නං. සූරියමණ්ඩලං භික්ඛවෙ විවටං විරොචති, නො පටිච්ඡන්නං. තථාගතප්පවෙදිතො ධම්මවිනයො භික්ඛවෙ විවටො විරොචති නො පටිච්ඡන්නො. ඉමානි ඛො භික්ඛවෙ තීනි විවටානි විරොචන්ති නො පටිච්ඡන්නානි" යි. හේ එසේ මැයි.

අඤ්ඤාකොණ්ඩඤ්ඤ මහා ස්ථවිර ආදි වූ අසූ මහසව්වන් කෙරෙහි අන්තර්ගත ව[1] සිටි කුමාරකාශ්‍යප නම් මහතෙරුන් වහන්සේ තමන් වහන්සේ ඉතා චිත්‍රකථී හෙයින් බුදුන් වදාළ ධර්මයන් අතුරෙන් සතර පදයෙන් යුක්ත එක ගාථාමාත්‍රයක් දක්වා නොයෙක් උපමා හා අනේකප්‍රකාර උදාහරණ දක්ව දක්වා[2] පළමු ව කී ගාථාවෙහි අර්ථ හා එක් ව ගළප ගළපා ශීතල ජලභරිත මහවිලෙක පඤ්ච වර්ණ පද්මයන් සුපුෂ්පිත කරවන්නාක්හු මෙන් ද හෙවත් පස්පියුමෙන් සදන්නාක්හු මෙන් ද මහමෙර මුදුනෙහි නොයෙක් දහස් ගණන් පහන් දල්වන්නාක්හු[3] මෙන් ද හිමවත් පර්වතයෙන් නික්මෙන්නාවූ එකොළොස් දහස් පන්සියයක්[4] පමණ මහා ගඞ්ගාවෙහි ජලස්කන්ධය උකා ගෙනවුත් එක් තෙනෙක්හි සලන්නාක්හු[5] මෙන් ද සතර මහාද්වීපයෙහි එකහෙළා වස්නාවූ චාතුර්ද්වීපික මහාමේඝයක් එක දිවයිනෙක වස්නාක්[6] මෙන් ද ත්‍රිපිටක ධර්මය යටි උඩු කෙරෙමින් ඒ ඒ ස්ථානයෙහි නොයෙක් උදාහරණ ගෙනහැර දක්ව දක්වා විසිතුරු කොට විදහා චිත්‍රකථී ව[7] බණ කියන සේක. එසේ හෙයින් ම බුදුහු ධර්මකථිකයන් කෙරෙහි අගතැන්පත් ව සිටි පූර්ණ මහතෙරුන් වහන්සේ වැනි මහා ශ්‍රාවකයන් ඇත ද "එතදග්ගං භික්ඛවෙ මම සාවකානං භික්ඛූනං චිත්තකථිකානං යදිදං කුමාරකස්සපො" යනාදීන් කුමාර කසුප් මහතෙරුන් වහන්සේ ම චිත්‍රකථික භික්ෂූන් කෙරෙහි එතදග්‍ර පාළියෙහි තබා වදාළ සේක. එසේ හෙයින් බණ කීම නම් එවැනි චිත්‍ර කථීන්ට ම හොබනේය.

තව ද මෙම ලක්දිව ශ්‍රද්ධාසම්පන්න වූ භාතිය නම් රජ්ජුරු කෙනෙක් දවසෙක මහත් වූ පූජාවක් කරවා බණ කියන සේ ධර්මශාලාවක් සරහා[8] එහි මනහර ධර්මාසනයක් පනවා ධර්මකීර්ති[9] පණ්ඩිතයන් බණ කියන සේ නියෝග කොට තුමූ

1. අන්තර්ගත ව - B
2. උදාහරණ දක්වා - KL
3. ලවන්නාක්හු - IL
   අවුලුවන්නාක්හු - GHK
4. පන්සිය පන් සැත්තෑවක් - I
5. සලාලන්නාක්හු - I
6. වස්වන්නාක්හු -E
   වස්නාක්හු - FGHJ
7. චිත්‍ර කථිකව KL බෙ.ස.
8. කරවා - DGH
9. අකීර්ති - KL, බෙ.ස.

Non-Commercial Distribution

එකත්පස් ව උන්නාහු "තුනුරුවන් ගුණයෙන් යුක්ත වූ ජයමඞ්ගල ගාථාවෙකින් බණ කියව" යි කීහ. එකල ධර්මාසනයට නැඟී විජිනිපත්‍රය අතින් ගෙන හුන්නාවූ [ධර්ම]කීර්ති[1] පණ්ඩිතයෝ රජු මුහුණ බලා "අද මේ රජහු සිත් ගෙන කවර නම් ගාථාවෙකින්[2] බණ කියම් දෝ හෝ" යි සිතා තුන් පිටකය නුවණින් අළලා බලන්නාහු ධර්මපදයෙහි බ්‍රාහ්මණ වග,

දිවා තපති ආදිච්චො - රත්තිං ආභාති චන්දිමා
සන්නද්ධො ඛත්තියො තපති - ඣායී තපති බ්‍රාහ්මණො,
අථ සබ්බමහොරත්තං[3] - බුද්ධො තපති තෙජසා යි,

යන මේ ගාථාව දැක "දිවා තපති ආදිච්චො" යන පදය කියා අස්තපර්වතයට යන්නා වූ සූර්යමණ්ඩලයට නමස්කාර කළහ. "රත්තිං ආභාති චන්දිමා" යන පදය කියා උදය පර්වතයෙන් උදවෙමින් සිටියාවූ[4] චන්ද්‍රබිම්බයට නමස්කාර කළහ. "සන්නද්ධො ඛත්තියො තපති" යන පදය කියා සැරහී සිටි රජ්ජුරුවන්ට නමස්කාර කළහ; "ඣායී තපති බ්‍රාහ්මණො" යන පදය කියා භික්ෂුසඞ්ඝයාට නමස්කාර කළහ. "අථ සබ්බමහොරත්තං බුද්ධො තපති තෙජසා" යන පදය කියා රුවන්මැලි මහසෑයට නමස්කාර කළහ. එකල රජ්ජුරුවෝ පණ්ඩිතයන් කෙරෙහි පැහැද "ප්‍රස්තාවට පැමිණ සිටි වස්තුන් ම[5] දක්වා ස්ථානෝචිත කොට බණ කී නියා යහපතැ"යි ප්‍රශංසා කොට හුනස්නෙන් නැඟී[6] "පණ්ඩිතයෙනි, අත දික්කරව"යි කියා දික් කළ අත්ලෙහි[7] දහසින් බැඳි පියල්ලක් තුබූහ. එතැන් පටන් මේ ගාථාව ද සර්වමඞ්ගල ගාථාව යයි[8] ප්‍රසිද්ධ විය. එබැවින් මෙසේ බණ අසන්නවුන් කී කී පරිද්දෙන් ඔවුන්ගේ අභිප්‍රාය[9] නොපිරිහෙළා ස්ථානෝචිත වස්තුන් දක්වමින් ප්‍රසාද උපදවා බණ කීම වනාහි නෙවළා බුදුවදන් දිවග ලෙලවාපු එබඳු මහාපුරුෂයන්ට මිස සෙස්සවුන්ට නො පිළිවන් ම ය. තව ද මෙම ලඞ්කාද්වීපයෙහි තලගුරු වෙහෙර වසන ධම්මදින්න නම් මහතෙරුන්වහන්සේ තිස්ස මහවෙහෙර දගප් මළුවේ වැඩහිඳ ,තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අපණ්ණකපටිපදං පටිපන්නො හොති" යනාදීන් දක්වන ලද අපණ්ණකසූත්‍රයෙන් බණ කියනසේක. එකල බණපිරිස[10] බොහෝ දෙන නානාච්ඡන්දික ව දසදික් බල බලා වික්ෂිප්ත ව බණ අසති. ඒ බව දැන මහතෙරුන් වහන්සේ අත තුබූ විජිනිපත්‍රය භූමිය දසාවට නමා පෑසේක. එකෙණෙහි මුදුන පටන් අවීචි මහනරකය දක්වා එක්සිය සතිස් නරකය වෙන වෙන වසුන් හැර තුබූ වළන් වස්නක් සේ එකාඞ්ගන ව පෙනෙන්ට වන. එකල බණපිරිස[11] නරකයෙහි අනෙකප්‍රකාර දුක් විඳිනා සත්ව සමූහයා දැක එම විට නරකයෙහි හුණුවා සේ නරක භයින්

1. කීර්ති - DGH ස.
අකීර්ති - BCGHIKL
2. කවර කථාවෙකින් - CJ
කවර නම් කථාවෙකින් - BGI
කවර කථාවෙන් - A
3. රත්තිං - පිටපත් හැම
4. උදවෙන්නාවූ- BGHKL
5. වස්තුව ම - BGHKL
වස්තුම - I
6. පැන නැඟී - L
7. අත්ලෙහි ම - ABEFGGHIJKL කි.ම.ක.ස.
අත්ලෙහි මැද - D
8. ගාථායයි - CGHIKL
9. අභිප්‍රාව - පිටපත් හැම
10. බණපිරිස් -ABGHIKL
11. බණ (නැත) KL

Non-Commercial Distribution

නැතිගෙන වෙවුලන්ට පටන්ගත්හ. නැවත තෙරුන්වහන්සේ විජිනිපත්‍රය අහසට ඔසවා මුදුන් කළසේක, එක්ෂණයෙහි බ්‍රහ්මාණ්ඩය දක්වා සදිව්‍යලොකය එකාඩගන ව පෙනෙන්ට වන. එකල බණපිරිස[1] සදිව්‍යලොකයෙහි වෙන වෙන ම අනෙකප්‍රකාර වූ දිව්‍යසම්පත් විඳුනා දෙවසත්‍රීන් දැක එම විට දෙව්ලොවට නැඟෙන්ට උත්සාහ කරන්නවුන් සේ එසෙව් එසෙව්[2] උඩ බල බලා අක්පල්ලෙන්[3] සිට සිට සාධුකාර දිදී විටින්විට මහතෙරුන්වහන්සේ වැඳ වැඳ මහ කුල්මතින් බණ ඇසූහ. මෙසේ තෙරුන් වහන්සේ බණපිරිස නරක භයින් නැති ගන්වා දිව්‍යලොකසම්පත්තියෙහි ලොභ කරවා බණ කී කල්හි එයින් සමහරෙක් සෝවාන් වූහ. සමහරෙක් සකෘදගාමී වූහ. සමහරෙක් අනාගාමී වූහ. සමහරෙක් රහත් වූහ. එබැවින් මෙසේ නරක භයින් නැති ගන්වා ස්වර්ගසම්පත්තීන්[4] සත්වයන් පොළඹා බණ කීම රහතන් වහන්සේට මිස අවශෙෂ සත්වයන්ට විෂය නොවන්නේ මය.

තව ද එක් සමයෙක්හි අතුල නම් උපාසකයකු[5] ඇතුළු වූ පන්සියයක් උපාසකවරුහු රෙවත මහතෙරුන් වහන්සේ කරා එළඹ පසහ පිහිටුවා වැඳ එකත්පස් ව සිටියාහු "ස්වාමීනි බණ අසනු කැමැත්තම්හ. එබැවින් බණ වදාළ මැනවැ"යි ආරාධනා කළහ.

එකල රෙවත මහතෙරුන්වහන්සේ ධ්‍යානයට සමවැද වැඩහුන් හෙයින් මුවෙන් නොබිණූසේක. එවේලෙහි උපාසකවරුහු "කිමෙක්ද මේ වහන්සේ අප හැම්[6] හා පෙර වැඩිතරම් උරණක්[7] ඇතියා සේ මුවෙන් නොබණන දැ ය,[8] මෙතෙන සිට ප්‍රයෝජන කිම් දැ"යි රැහැණි ව එතෙනින් නික්ම සැරියුත් මහතෙරුන් වහන්සේ සමීපයට එළඹ පළමු පරිද්දෙන් ම බණට ආරාධනා කළහ. එකල ඔබ තමන්වහන්සේ[9] මහත් වූ සෘඩිඥන ඇත ද ඔවුන්ගේ අදහස් නොබලා ම විස්තර වශයෙන් බොහෝ කොට විජම් පිටකයෙන් බණ වදාළසේක. ඒ අසා උපාසකවරුහු "කිමෙක්ද මේ වහන්සේ වැව් පොකුණු කුඹුරු ආදියෙහි මියර බිඳුවා වැස සලා පියන විෂම වර්‍ෂාවක් සේ ප්‍රමාණයක් නොබලා ම බොහෝ කොට බණ කියනසේකැ"යි ඔබ කෙරෙහි නොසතුටු ව එතැනින් නික්ම අනද මහතෙරුන් වහන්සේ කරා එළඹ පළමු පරිද්දෙන් ම බණ වදාළ මැනවැයි ආරාධනා කළහ. එ කල ඔබ තමන්වහන්සේ සුවාසූදහසක් ධර්මස්කන්ධය දිවග ලෙලවා බහුශ්‍රැත ව බණ කියන සේ දැන දැන ද පවා[10] මෙපමණෙක් ම මොවුන්ට පමණැයි සිතා දෝහෝ යම්තම් බණක් වදාළසේක. එකල ඔහු "කිමෙක් ද මුන්වහන්සේ කල්පාන්තකාලයෙහි මෙඝය පතන්නා වූ[11] ඇල්ගොවියන් සතුටු කරවා මහා ගර්ජනා කොට පොද ගණනක් ගසා එපමණෙකින් ම වැසි සිටුවා පියන්නා සේ බණ කියම්යි

1. බණපිරිස් - ABGHIKL
2. එසවි එසවී - ACDEFGHIJK
3. අක්පත්ලෙන් - DL
   අක් පතුලෙන් - AI
   අග්පත්ලෙන් - CGH
   අගපත්ලෙන් - AF
4. දිව්‍යසම්පත්තීන් - ස.
5. උපාසකයෙකු - AGHJ
   උපාසකයා - I
6. ඇම - ACDEJ, හැම (නැත) - L
7. උරණයක් - KL
8. නොබිණූදැය - B
   නොබැන උත්දැය - I
9. ඔබ තමන්වහන්සේ - ABCDEIJL
   ඔබ වහන්සේ - අන් හැම
10. දැන දැන පවා - ABCDFIJ
11. පවත්නා වූ - F

Non-Commercial Distribution

පටන්ගෙන මෙම ඇසිල්ලෙහි නිමවාපුසේක.[1] ඉඳුරා අප ඇම් අසා පියන සේ බණ නොවදළසේකැ"යි මෙසේ ඔබ කෙරෙහි නොසතුටු ව "යම්හ සබඳිනි, පලා එව"යි එතැනින් නික්ම බුදුන් සම්පයට එළඹියාහු අනුපමේය[2] වූ ශ්‍රී විලාසයෙන් වැඩහුන් බුදුන් දැක සිත හටගත්තාවූ භක්තිප්‍රේමයෙන් නැමී නැමී ළං ව පසඟ පිහිටුවා වැඳ බුදුන්ගේ ශ්‍රී මුඛය බල බලා දෙහොත් මුදුන් දිදී එකත්පස් ව සිටියාහ. එසඳ බුදුහු උපාසකවරුන්ගේ අදහස් බලා ඉතා බොහෝ නොකොට ඉතා ස්වල්ප නොකොට ඔවුන් සිත් පහදනා පමණක් බණ වදළසේක. එකල අතුල නම් උපාසකයා ඇතුළු වූ පන්සියයක් උපාසකවරු සිටි පියෙහි සිට සෝවාන් ව පළමුවන මඟින් අමාමහ නිවන් දුටහ. එබැවින් මෙසේ අනුන් සිත් හැඳින[3] බණ කීම සර්වඥවරයන්ට මිස සෙසු මහාශ්‍රාවකයන්ට ද නොපිළිවන් මය.

එතකුදු වුවත් ලෝවැඩ පිණිස බුදුන් විසින් වදරන ලද්දා වූ සද්ධර්මය මාගධික භාෂාවෙහි නොහසළ සිංහලද්වීපවාසීන්ට නොදැනෙන හෙයින් හෙළුබසින් පෙරළා ලඞ්කාද්වීපවාසී වූ සාධුජනයන්ගේ සිත් පහදවමින් ලෝවැඩ වඩා බොහෝ කාලයක් පවත්නා පරිද්දෙන් ධම්මව්‍යාඛ්‍යානයක් කළ මැනවැයි මෙසේ කරුණාපුරස්සර නිශ්ශරණාධ්‍යාශයෙන් යෙදී පරවැඩෙහි තත්පර ව ප්‍රිය සබ්‍රහමචාරී වූ ප්‍රියදර්ශී නම් බුද්ධපුත්‍රයාණන් විසින් කරනලද ආරාධනාව හා තව ද බුදුන් විසින් ම වදරනලද,

භාසයෙ ජෝතයෙ ධම්මං - පග්ගණ්හෙ ඉසිනං ධජං,
සුභාසිත ධජා ඉසයො - ධම්මො හි ඉසිනං ධජො

යන මේ බුද්ධානුශාසනාව පිළිගෙන සාධුජනයන්ගේ සිත් පහදවා ශ්‍රද්ධා බුද්ධිවර්ධනය කෙරෙමින් ඔවුන්ට ත්‍රිවිධ සම්පත් සාධාදෙන පිණිස හා "මතු බුදුවන බුදුන්[4] දැක අෂ්ටධර්ම සමොධානයෙන් යෙදී විවරණ ශ්‍රී ලදින් බුද්ධකාරක ධර්මයන් මුහුකුරුවා ලොවුතුරා බුදු ව මුළුලොවට අභිවෘද්ධියක වෙම්ව"යි යන මාගේ අභිමත ප්‍රාර්ථනාව සාධා ගන්නා පිණිස මෙතැන්හි ධර්මසංග්‍රහ වර්ගය, නිදන වර්ගය, අභිනීහාර වර්ගය, ධර්මසොණ්ඩක වර්ගය, මහාමන්ධාතු වර්ගය, නන්දිරාජ වර්ගය, තුන් යහළු වර්ගය, සොම බ්‍රාහමණ වර්ගය, පාදපීඨිකා වර්ගය, මහාසෙන වර්ගය, තෙභාතික වර්ගය, බොධිරාජ වර්ගය, ආරක්ෂාදක වර්ගය, කාකවර්ණ වර්ගය, ගොඨඉම්බර වර්ගය, චූළසිව දෙව වර්ගය, නකුල වර්ගය, තම්බසුමන වර්ගය, අභය වර්ගය, සඞ්ඝදත්ත වර්ගය, සිරිනාග වර්ගය, නන්දිවාණිජ වර්ගය, චූලගල්ල වර්ගය, තිස්සනාග වර්ගය යි. මෙසේ සුවිසි වර්ගයකින් හා සඞ්ක්ෂෙප කථාවන් හා සමඟ අමෘත රසධාරාවක් සේ සිටියාවූ එක්සිය පස් පනසක් පමණ වස්තුකථාවෙන් අලඞ්කෘත කොට සරහා සද්ධර්මාලංකාර නම් වූ

---

1. බණ නිමවාපු සේක. KL
2. අනොපමෙය්‍ය - පිටපත් හැම
3. සිත්ගෙන - ACJ
4. මතු බුදුන් - ACIJ, මෛත්‍රී බුදුන් - ස.

Non-Commercial Distribution

ධර්මව්‍යාඛ්‍යානයක්[1] දක්වමි. එද වනාහි භාෂාව වෙනස් වුව ද පාලිධර්මය ම හෙයින් සියල්ලවුන් විසින් ආදර සහිත ව ඇසිය යුත්තේ මය.[2]

අප බුදුන්ගේ ධර්මය නම් රාගවිෂ විනාශයට දිව්‍යමන්ත්‍රයක් වැන්න. ද්වේෂරෝග විගමනයට[3] දිව්‍යෞෂධයක් වැන්න. මෝහාන්ධකාර විධමනයට මහාප්‍රදීපයක් වැන්න. මදමාන භුජංග ගණ සමාකීර්ණ ජාති ජරා මරණ තෘෂ්ණ ගහන විනාශයට කල්පාන්ත වහ්නියක් වැන්න. මාත්සර්‍ය්‍ය මළ වියළීමට සරාහිරු මඬලක් වැන්න. කෙලශසම් නිර්වාපණයට මහාමෙඝයක් වැන්න. අපාය ගමන නිවාරණයට මහඅකුලක් වැන්න. සසර සයුරෙන් එතෙර වීමට මහ නැවක් වැන්න. දුලීබ්ධි පටල විනාශයට දිව බෙහෙදක්[4] වැන්න. සාධුජන නමැති කෞමදවන ප්‍රබෝධයට සරාසඳ මඬලක් වැන්න. සංසාර නමැති කාන්තාර තරණයට තන්හි තන්හි අමෘතඵලභරිත කල්පපාදප පඞ්කතියක් වැන්න. දෙව්ලොවට නැගෙන හිණිපෙති පෙළක් වැන්න. තුන්තරා බෝධි සමධිගමයට සෘජු රාජපථයක් වැන්න. අමෘතමහානිර්වාණ පුරප්‍රවෙශයට මහදෙරක් වැන්න. එබැවින් ධර්මය නම් මේ ජාතියෙහි පටන් නිවන් දක්නා ජාති දක්වා උපනුපන් ජාතියෙහි දිව්‍යමනුෂ්‍ය සම්පත් ආදි වූ කැමති කැමති වස්තු සිධකොට දෙන සිතුමිණිරුවනක් හා සදෘශ වූ තුන්ලෝවාසීන්ට ප්‍රතිෂ්ඨාධාරයෙක. මුළු තුන්ලොව විද්‍යමාන ව සිටි හැම රසයන්ට වඩා උතුම් වූ රසයෙක. මුක්තාමාණික්‍යාදි සියලු රත්නයන්ට වඩනා මාහැඟි රත්නයෙක. භුවනත්‍රයවාසී වූ සමස්ත සත්වයන්ගේ සියලු දුක් දුරුකිරීමට ඒකාන්ත කාරණයෙකැයි මෙසේ මේ ධර්මයෙහි බහුමාන උපදවා නොකොඳුරා නොතතනා අනන්‍යවිහිත නොව බණ අසා රෑ දෙවෙහි[6] නොපමාව දශවිධ කුශලධර්මයෙහි යෙදී එයින් ජනිත වූ ඉෂ්ටවිපාකයෙන් මතු දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳ අමාමහනිවන් දකින්ට උත්සාහ කළ මැනවි. දක්වන ලද මැයි:

ධම්මො තිලොකසරණො පරමො රසානං
ධම්මො මහග්ඝරතනො රතනෙසු ලොකෙ,
ධම්මො භවෙ තිභවදුක්ඛ විනාසහෙතු
ධම්මං සමාචරථ ජාගරිකානුයුත්තා යි.

මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි

ධර්මසඞ්ග්‍රහ වර්ග නම් වූ

පලමුවන පරිච්ඡේදය නිමි.

---

1. ව්‍යාඛ්‍යාන කතාවක් - D
2. යුක්තේය - ACDEFGHIJK
3. විධමනයට - G, කි. බෙ. ක. කැ. ස.
4. බෙහෙතක් - DHIK, කි. ස.
5. සිනා මෙසේ - ස.
6. රෑ දෙවේලෙහි - ADFL
   දිවා රෑ දෙක්හි - ම. ක. බෙ. කි. කැ.

Non-Commercial Distribution

නව ද මේ සද්ධර්මාලංකාරයෙහි දෙවන නිදන වර්ගය නම් කවර[1] යත්?

මෙසේ යට කී පරිද්දෙන් නොයෙක් වර කරනලද සද්ධර්මාරාධනාව පිළිගෙන මේ ධර්මව්‍යාඛ්‍යානය උපදවන්නාවූ මම වනාහි මතු කියන ධර්මසොණ්ඩක වස්තුවෙහි සද්ධර්මය පතා ජීවිතප්‍රදානය කළ විශුද්ධ බුද්ධාඞ්කුර වූ මහාපුරුෂයාණන්[2] විසින් කල්ප ශතසහස්‍රාධික විංශත්‍යසඞ්ඛ්‍ය පරිමිත කල්ප කාලයක් මුළුල්ලෙහි බුද්ධත්වය පිණිස මනො වචී ප්‍රණිධාන වශයෙන් පූර්වයෙහිදු කරන ලද විවිධ විශෙෂ දුෂ්කර වීර්‍ය්‍යාදි විභාග යශොධරාපදානයෙහිදු පෙනෙන හෙයින් තත්ප්‍රකාශක වූ භවාන්තරගත බාහිර නිදනය මහා නිදනය අවිදූරෙ නිදනය දූරෙ නිදනය අවිදූරෙ නිදනය සන්තිකෙ නිදනය යි මෙසේ සොදස්සක නිදනයෙහි දක්වන ලද සවැදෑරුම් වූ නිදනයන් අතුරෙන් අවසානයෙහි දක්වන ලද නිදනත්‍රය පිළිවෙළින් ම මතු කියන අභිනීහාර වර්ගයෙහි සඞ්ගෘහිත වන බැවින් මෙ තැන්හි ප්‍රස්තාවාගත[3] මාත්‍රයක් ගෙන සංඛ්‍යා[4] විභාගය කල්ප විභාගය යන මොවුන් හා සමඟ එඅප මහබෝසතාණන්ගේ පූර්වචරිතාපදනය, මූලප්‍රණිධාන වූ මනොප්‍රණිධියෙහි පටන් එකදෙශමාත්‍රයක් ගෙනහැර දක්වමි. එයින් ප්‍රකාශ වන්නේ නම් බුදුබැව්හි ලා ආශ්චර්‍ය්‍යයක් ම හෙයින් මා විසින් දක්වන ලද ඒ විස්මය සහිත වූ බොධිසත්ව චරිතය තමහට වැඩ කැමති සත්පුරුෂයන් විසින් ආදර සහිත ව සිත හෙළා ඇසියයුතු. හේ කෙසේද යත්.

අප මහබෝසතාණන් වහන්සේ ප්‍රථමයෙන් සම්‍යක් සම්බොධි සමධිගමයට ප්‍රාරම්භ කෙරෙමින් මනොප්‍රණිධානය පටන්ගත් තැන් පටන් ධර්මසොණ්ඩක වස්තුයෙහි සද්ධර්ම ප්‍රතිලාභය දක්වා මේ දෙඅතුරෙහි විසි අසඞ්ඛ්‍යයක් හා කප් ලක්‍ෂයක් අතික්‍රාන්ත විය. එයින් පළමුවන අසඞ්ඛ්‍යය නන්ද[5] නම් වෙයි. දෙවන අසඞ්ඛ්‍යය සුනන්ද[6] නම් වෙයි. තුන්වන අසඞ්ඛ්‍යය පෘථිවි නම් වෙයි. සතරවන අසඞ්ඛ්‍යය මණ්ඩ නම් වෙයි. පස්වන අසඞ්ඛ්‍යය ධරණී නම් වෙයි. සවන අසඞ්ඛ්‍යය සාගර නම් වෙයි. සත්වන අසඞ්ඛ්‍යය පුණ්ඩරීක නම් වෙයි. අටවන අසඞ්ඛ්‍යය සර්වභද්‍ර නම් වෙයි. නවවන අසඞ්ඛ්‍යය සර්වඵුල්ල නම් වෙයි. දශවන අසඞ්ඛ්‍යය සර්වරත්න නම් වෙයි. *එකොළොස්වන අසඞ්ඛ්‍යය උසභක්ඛන්ධ[7] නම් වෙයි. දෙළොස්වන අසඞ්ඛ්‍යය මාණිභද්‍ද නම් වෙයි. තෙළෙස්වන අසඞ්ඛ්‍යය පදුම නම් වෙයි. තුදුස්වන අසඞ්ඛ්‍යය උසභ නම් වෙයි. පසළොස් වන අසඞ්ඛ්‍යය ඛන්ධත්ව නම් වෙයි. සොළොස්වන අසඞ්ඛ්‍යය සර්වශෛල[8] නම් වෙයි. සතළොස් වන අසඞ්ඛ්‍යය සෙල නම් වෙයි. අටළොස්වන අසඞ්ඛ්‍යය භාස නම් වෙයි. එකුන්විසි වන අසඞ්ඛ්‍යය වය නම් වෙයි. විසිවන අසඞ්ඛ්‍යය රුචි නම් වෙයි.

---

1. කවරහ - AGHIJ
2. මහාපුරුෂයාණන් වහන්සේ - BGHIKL
3. ප්‍රස්තාගත - ABCDEFGIJKL
4. අසඞ්ඛ්‍යා - G. බෙ. ස.
5. නන්ද - ABCDFGHJKL
6. සුනන්ද - ABCDFGHIKL
7. සර්වඋසභක්ඛන්ධ - BGHIKL; උසභස්කන්ධ - බෙ.ස
8. සබ්බසෙල - J
   සර්වසෙල - KL

* මෙතැන් සිට 34 වන පිටුවේ 'දසවන සර්වරත්න නම් අසංඛ්‍යය ද' දක්වා කොටස I පිටපතෙහි නැත.

එයින් එක් අසඞ්ඛ්‍යයෙක් නමුදු නම් යුද්‍ධ කොට කියන බව මිස තෙමේ වූ කලි ඉතා දීර්ඝ කාලයෙක. දවස් මස් අවුරුදු කල්පාදී වශයෙන් මෙතෙකැයි යන සඞ්ඛ්‍යාවක් නැති හෙයින් අසඞ්ඛ්‍යය නම් වෙයි. හේ එසේ මැයි. එකෙක දෙකෙක යනාදී වශයෙන් ක්‍රමයෙන් ගොස් ප්‍රමාණවත් ව සඞ්ඛ්‍යාපථයට පැමිණ සිටියේ සඞ්ඛ්‍යය නම් වෙයි. එයින් මත්තෙහි සඞ්ඛ්‍යාපථයට[1] පැමිණ අන්‍ය නාමාන්තරයකින්[2] ව්‍යවහාර කටයුතු ප්‍රමාණවත් වූ සඞ්ඛ්‍යාවක් නැති හෙයින් අසඞ්ඛ්‍යය නම් වෙයි. හේ කෙසේද යත්?

දශ දශයෙක් නම් සියයෙක, දශ සියයෙක් නම් දහසෙක, සියක් දහසෙක් නම් ලක්‍ෂයෙක, ලක්‍ෂ සියයෙක් නම් කෝටියෙක, කෝටි සියයෙක් නම්[3] ප්‍රකෝටියෙක, ප්‍රකෝටි සියයෙක්[3] නම් කෝටිප්‍රකෝටියෙක, කෝටිප්‍රකෝටි සියයෙක් නම්[4] නහුතයෙක, නහුත සියයෙක් නම් නින්නහුතයෙක, නින්නහුත සියයෙක්[3] නම් හුතනහුතයෙක, හුතනහුත සියයෙක්[3] නම් ඛම්භයෙක, ඛම්භ සියයෙක්[3] නම් විෂ්කම්භයෙක, විෂ්කම්භ සියයෙක්[3] නම් අක්‍ෂෞහිණියෙක අක්‍ෂෞහිණි සියයෙක්[3] නම් බින්දුවෙක, බින්දු සියයෙක්[3] නම් අද්බුදයෙක, අද්බුද සියයෙක්[3] නම් නිරබ්බුදයෙක, නිරබ්බුද සියයෙක්[3] නම් අබබයෙක, අබබ සියයෙක්[3] නම් අටටයෙක, අටට සියයෙක්[3] නම් අහහයෙක, අහහ සියයෙක්[3] නම් කුමුදයෙක, කුමුද සියයෙක්[3] නම්[3] සෞගන්ධියෙක, සෞගන්ධි සියයෙක්[3] නම් උත්පලයෙක, උත්පල සියයෙක්[3] නම් පදුමයෙක, පදුම සියයෙක්[3] නම් කථා(න)යෙක,[4] කථාන[5] සියයෙක්[3] නම් මහා කථා[න]යෙක[4] මහා කථාන[5] සියයෙක්[3], නම් අසඞ්ඛ්‍යයෙක් නම්.

මෙසේ දැක්වූ මේ අසඞ්ඛ්‍යය සඞ්ඛ්‍යාවට ලක් නබන තරම් මහත් වූ විශාල වස්තුවෙක් කිසි තැනෙකත්[6] නැත් මය[7]. ඊට කාරණ කිම් ද යත්? ඉදින් යම්කිසි කෙනෙක් සතර මහාසාගරය මහපොළොව මහාමෙරු පර්වතය ආකාශය යන මේ වස්තු සතරින් එකක් එකක්ම මහත් ව අති විශාල වන බැවින් අසඞ්ඛ්‍යය සඞ්ඛ්‍යාවට ලක් නබන්ට සෑහෙයි සිතන්නාහු වී නමුදු සනරියන්[8] පමණ සිව්රැස් අවකාශයෙක්හි[9] පැන් සතරමුණක් ගන්නා හෙයින් සුවාසූදහසක් යොදුන් ගැඹුර ඇති සතර මහාසාගරයෙහි ජලස්කන්ධය පවා අසඞ්ඛ්‍යයක් උලක්කුවට නොසෑහෙන්නේ ය. එසේම සන රියන් පමණ සිව්රැස් වළෙක පස් දසපැලක් ගන්නා හෙයින් දෙලක්‍ෂ සතලිස් දහසක් යොදුන් ඝනකඩ බොල් මහපොළොවෙහි පස් පවා උඳු මුං ඇට පමණ කඩ කඩකොට කැපුව ද අසඞ්ඛ්‍යයක් කැටියට නොසෑහෙන්නේ ය. තව ද රියනක් පමණ සමසිව්රැස්[10] අවකාශයෙක්හි අබ දැමුණක් ගන්නා හෙයින් හා කුළුදුල්ලෙක් නම් අබඇට ලක්‍ෂයක් හෙයින් එක්ලක්‍ෂ අටසැටදහසක් යොදුන් උස

1. අසම්ඛ්‍යපථයට - L
2. නාමමාත්‍රයකින් - මුද්‍රිත හැම
   නාමමාත්‍රයකින් - AJ
3. ලක්‍ෂයෙක් නම් - ABCDEFJ
4. කථාවෙක - BCDEFGHKL
   කථායෙක - AJ
5. කථා - පිටපත් හැම
6. තෙනකත් - ACDFJ
   තැනකත් - GH
7. නැත්තේම - BGHKL
8. නවරියන් - A
9. අවකාශයෙහි - ACDEFGHJKL
10. සිව්රැස් - ACDEFJ

Non-Commercial Distribution

ඇති මහාමෙරු පර්‍වතය පවා අබබිජු පමණ බිඳු කරත් අසඞ්ඛ්‍යයක් බිඳුවට නො සෑහෙන්නේය. එසේ ම අනන්ත වූ ආකාශයෙහි පෙනෙන තාරකාවෝ ද පවා අසඞ්ඛ්‍යයට ලක් තබන්ට නොසෑහෙන්නාහ. මෙසේ මේ කාරණයෙන් අසඞ්ඛ්‍යයට පුඩු තබන්ට තිසි මහත් වස්තුවෙක් කිසි තැනෙකත්[1] නැත් මය. එසේ හෙයින් අසඞ්ඛ්‍යයෙක් නම් බොහෝ සඞ්ඛ්‍යාවෙකැයි දතයුතු. මෙතැන්හි මේ අසඞ්ඛ්‍යය විභාග[2] වනාහි,

පුඤ්ඤාපුඤ්ඤ විභාගා ච - අසඞ්ඛෙය්‍යා පකාසිතා,
අපුඤ්ඤා ච අසඞ්ඛෙය්‍යා - බුද්ධුප්පාදෙහි මණ්ඩිතා.
බුද්ධ පච්චෙකබුද්ධා ච - සාවකා චක්කවත්තිනො,
අපුඤ්ඤසඞ්ඛෙ අසඞ්ඛෙය්‍යෙ - උප්පජ්ජන්ති මහිද්ධිකා.

යනාදීන් ශූන්‍යාශූන්‍ය වශයෙන් ද්විප්‍රකාර කොට දැක්වූ හෙයින් බුද්ධාදීන් නූපදනා අසඞ්ඛ්‍යය ලෞකික ලොකොත්තර කිසි ගුණසාර ජනකයක්හු නැති හෙයින් ශූන්‍ය අසඞ්ඛ්‍යය නම් වෙයි. හැම ලෙසින් ගුණසාරජනක ව සිටි බුදු පසේබුදු මහසව්වන් හා මහානුභාව සම්පන්න මහෙශාක්‍ය වූ සක්විති රජුන්[3] උපදනා අසංඛ්‍යය අශූන්‍ය අසඞ්ඛ්‍යය නම් වෙයි. එබැවින් මෙතැන්හි ප්‍රස්තුත වූ මේ[4] විසි අසඞ්ඛ්‍යයයෙන් පළමුවන නන්ද නම් අසඞ්ඛ්‍යය ද දෙවන සුනන්ද නම් අසඞ්ඛ්‍යය ද තුන්වන පෘථිවි නම් අසඞ්ඛ්‍යය ද සතරවන මණ්ඩ නම් අසඞ්ඛ්‍යය ද පස්වන ධරණී නම් අසඞ්ඛ්‍යය ද සවන සාගර නම් අසඞ්ඛ්‍යය ද සත්වන පුණ්ඩරීක නම් අසඞ්ඛ්‍යය ද යන මේ සත් අසඞ්ඛ්‍යය හා එසේ ම අටවන වූ සර්‍වභද්‍ර නම් අසඞ්ඛ්‍යය ද නවවන සර්‍වඵුල්ල නම් අසඞ්ඛ්‍යය ද දසවන සර්‍වරත්න නම් අසඞ්ඛ්‍යය ද එකොළොස්වන උසභක්ඛන්ධ නම් අසඞ්ඛ්‍යය ද දොළොස්වන මාණිභද්ද නම් අසඞ්ඛ්‍යය ද තෙළෙස්වන පදුම නම් අසඞ්ඛ්‍යය ද තුදුස්වන උසභ නම් අසඞ්ඛ්‍යය ද පසළොස්වන ඛන්ධත්ථ නම් අසඞ්ඛ්‍යය ද සොළොස්වන සර්‍වශෛල[5] නම් අසඞ්ඛ්‍යය ද යන මේ සොළොසාසඞ්ඛ්‍යය ම අනන්ත වූ බුද්ධගුණරත්නයෙන් ප්‍රතිමණ්ඩිත හෙයින් ශොභමාන හෙයින් අශූන්‍යාසඞ්ඛ්‍යය නම් වෙයි. ඊට ඉක්බිති සෙල නම් අසඞ්ඛ්‍යය ඊට ඉක්බිති හාස නම් අසඞ්ඛ්‍යය ඊට ඉක්බිති වය නම් අසඞ්ඛ්‍යය ඊට ඉක්බිති රුචි නම් අසඞ්ඛ්‍යය යන මේ[6] සතර අසඞ්ඛ්‍යයෙහි ම බුදුකෙනකුන්වහන්සේ ලෝකයෙහි නූපන් හෙයින් ශූන්‍යාසඞ්ඛ්‍යය නම් වෙයි. එබැවින් මේ අසඞ්ඛ්‍යයයෝ ශූන්‍යාශූන්‍ය වශයෙන් ද්විප්‍රකාර වන්නාහ. නන්දදි වූ මේ[7] නමනමන්ගේ ස්වකීය නාම වශයෙන් විංශති ප්‍රකාර වන්නාහයි දතයුතු. මේ මෙහි සංක්‍ෂෙපයෙන් අසඞ්ඛ්‍යය විභාග ය.

---

1. තෙනකත් - AEJ
   තෙනෙකත් - CDF
   තැනකත් - B
2. විභාගයට - AJ
3. රජුන් හා - ACFJ
4. මේ (නැත) - KL හැර අන් පිටපත් හැම
5. සර්‍වසෙල - පිටපත් හැම
6. මේ (නැත) - AGHIJ

Non-Commercial Distribution

ඉක්බිති කල්ප විභාග නම් කවර යත් ඒ වනාහි මහාකල්පය, අසඞ්ඛ්‍යෙය කල්පය, අන්තඃකල්පය යි තුනෙක් වෙයි. එහි විභාග වෙන වෙන දක්වත් ඉතා බෙහෙව. එක් මහාකල්පයෙක් නම් අසඞ්ඛ්‍යෙය කල්ප සතරෙක. එනම් සංවර්තය සංවර්තස්ථායිය විවර්තය විවර්තස්ථායිය යන සතර ය. එයින් එක් අසඞ්ඛ්‍යෙය කල්පයෙක් නම් සූසැට අන්තඃකල්පයෙක්[1] පමණ වෙයි[2]. ඒ අසඞ්ඛ්‍යෙය කල්ප සතරින් සංවර්ත නම් නස්නා කල්ප ය. සංවර්තස්ථායි නම් නැසී සිටි කල්ප ය. විවර්ත නම් හටගන්නා කල්ප ය. විවර්තස්ථායි නම් හටගෙන සිටි කල්ප ය. එම සතරින් පළමු වන සංවර්ත කල්පයෙහි තෙජො සංවර්තය, ආපො සංවර්තය, වායො සංවර්තය යි සංවර්ත තුනෙක් වෙයි. සතරවන විවර්තස්ථායි කල්පයෙහි රොගාන්තඃකල්පය, ශස්ත්‍රාන්තඃකල්පය, දුර්භික්ෂාන්තඃකල්පය යි අන්තඃකල්ප තුනෙක් වෙයි. එයින් තෙජොසංවර්තාදි වූ තුන් සංවර්තයෙන් මහාකල්ප විනාශය වන කල[3] විවර්තස්ථායි කල්පයෙහි උපන් සත්වයන්ගේ සිත්හි උපදනා වූ රාග දේෂ මොහ ය යන තුන් වැදෑරුම් වූ අකුශල ධර්මයන් අතුරෙන් එක්තරා අකුශල ධර්මයක්[4] හේතුකොට ගෙන ඒ ඒ කර්මයට අනුරූප වූ පරිද්දෙන් ගින්නෙන් හෝ දියෙන් හෝ සුළඟින් හෝ හාත්පසින් කෙළලක්ෂයක් සක්වළ මුළුල්ලෙහි විද්‍යමාන ව සිටි සත්වසංස්කාර සියල්ල ම එකහෙළා විනාශයට පමුණුවා යට අජටාකාශයෙහි පටන් මුදුනෙන් තුන් සංවර්තයට එකාන්ත පරිච්ඡෙද ව සිටියා වූ ආභස්සරය ශුභකීර්ණය වෙහප්ඵල ය යන තුන් තලයෙන් එකී එකී තලයක් දක්වා ම නොසද[5] තුබු හෙරි කුහරයක් සේ අතුර සිස් කොට සංවර්ත කල්පයාගේ අවසානයෙහි සංහිදෙයි. රොගාදි වූ තුන් අන්තරායෙන් අතුරු කප නස්නා කල තෙජොසංවර්තාදියෙහි කී පරිද්දෙන් ම විවර්තස්ථායි කල්පයෙහි උපන් සත්වයන්ගේ සිත්හි උපදනා රාග දේෂ මොහාදි වූ අකුශල ධර්මයන් හෙතුකොට ගෙන ඒ ඒ කර්මයට අනුකූල වූ පරිද්දෙන් රොගයෙන් හෝ ශස්ත්‍රයෙන් හෝ දුර්භික්ෂයෙන් හෝ සත්වයන් පමණක් ම බොහෝ විනාශයට පමුණුවා එම විවර්තස්ථායි කල්පයෙහි ම උපශාන්ත ව එයින් රැකුණාවූ සත්වයන් මත්තෙහි කුසල් කොට ගන්නා පරිද්දෙන් අවසර හරනේ ය. එයින් එක් අන්තඃකල්පයෙක් නමුදු බොහෝ කාලාන්තරයෙක. ඉදින් යම්කිසි ඍද්ධිවන්ත[6] කෙනෙක් තමන්ගේ ඍද්ධ්‍යනුභාවයෙන් සතරගව්වක් උස ඇති සමසිව්රැස් කොටුවෙක අබ පුරා අවුරුදු සියයක් ගිය කල්හි එයින් එක් අබඇටක්[7] ගරනාහු වී නමුදු එබඳු දිග පුළුල ඇති මහ කොටුවෙහි[8] පුරා තුබු අබ රාශිය හැම නිමාවට[9] යෙයි, අතුරු කපෙක අවුරුදු නොනිමන්නේ මය. තව ද එසේ ම සතර ගව්වක් උස ඇති සමසිව්රැස් පර්වත මුදුනෙකින්[10] සියක් අවුරුද්දෙන් දවසෙක අහසට නැඟී යන සිධයකුගේ සළුකොන ගැවීමෙන්[11] ඒ පර්වතය කලකින් ගෙවී උදැටක් සා[12] වේ නමුදු අතුරුකපෙක අවුරුදු නොගෙවෙන්නේ ම ය. එතකුදු වුවත් ප්‍රමාණ වශයෙන් වනාහි

1. කල්පයකට - AFJ
2. නම් වෙයි - L
3. කල්හි - ACDFJ
4. කර්මයක් - ADEFJ
5. දක්වාම් නොද - I, දක්වා සම නොද - බෙ. ස. දක්වාම් නොසොද - සඳ
6. ඍද්ධිමත් - බෙ.ස
7. ඇටක් බැගින් - J .
8. එහි - මුද්‍රිත හැම කොටුවෙහි - ස. මහ කොටුවෙක - ACJ
9. නිමාමට - CDEHIJKL
10. පර්වතයෙකින් - I
11. සළුකන ගැවීමෙන් - ABCDHJK
සළුවක් ගැවීමෙන් - I
සළුව කොන ගැවීමෙන් -L
12. සා පමණ - IL

Non-Commercial Distribution

වස්සානං දසතො පට්ඨා - අසංඛෙය්‍ය සමුග්ගතො[1]
දසවස්සෙ පුනප්පත්තෙ - අන්තකප්පොති ඊරිතො

තස්මිං වස්සසහස්සෙන - වඩ්ඪනඞ්ගුලකං මහිං,
ඤෙය්‍යං වඩ්ඪනකාලන්ති - යොජනඤ්ච තිගාවුතං

යනු හෙයින් එක් අන්තඃකල්පයක් නම් සත්වයන්ගේ පරමායු[2] දස අවුරුද්දට පැමිණි කල්හි යට කියන ලද්ද වූ ක්‍රමයෙන් ම රොගයෙන් හෝ ශස්ත්‍රයෙන් හෝ දුර්භික්ෂයෙන් හෝ බොහෝ ජනයන් විනාශයට පැමිණි කල්හි රැකුණාවූ සත්වයන්ගේ කුශල සමාදනය හෙතුකොටගෙන මනුෂ්‍යයන්ගේ ආයුෂය දස අවුරුද්දෙහි පටන් ක්‍රමයෙන් වැඩී අසංඛ්‍යයට පැමිණ නැවත සත්වයන්ගේ අකුශල සමාදනය හෙතුකොටගෙන අසංඛ්‍යයෙහි පටන් ක්‍රමයෙන් පිරිහී දස අවුරුද්දට පැමිණ පළමු කී පරිද්දෙන් ම රොගාදි වූ තුනින් එක්තරා කාරණයක් මුල්කොට බොහෝ සත්වයන් විනාශයට යන තැන් දක්වා මේ අතුර එක් අන්තඃකල්පයෙක් නම් වෙයි. ඒ වනාහී දහසක් අවුරුද්දෙන් අඟලක්[3] වඩනා පොළොව එක් යොදුන් තුන් ගවුවක් උස වඩනා පමණ කල් වන්නේය. එසේ වූ එක් අන්තඃකල්පයෙක් නම් අටයුගයෙක් වෙයි. එයින් උත්සර්පිණී සතර යුගයෙක: අපසර්පිණී සතර යුගයෙක. උත්සර්පිණී නම් උර්ධ්වමුඛ යුගය: අපසර්පිණී නම් අධොමුඛ යුගය.[4] එද වනාහී යට කී පරිද්දෙන් ම දසඅවුරුද්දෙහි පටන් අසඞ්ඛ්‍යයායු වන තැන් දක්වා වඩනේ උර්ධ්වමුඛ යුගය නම් වෙයි. අසඞ්ඛ්‍යයෙහි පටන් දස අවුරුද්දට ආයු වන තැන් දක්වා බස්නේ අධොමුඛ යුගය නම් වෙයි. උත්සර්පිණී සතර යුගය නම්. කලියුගය ද්වාපරයුගය ත්‍රෙතායුගය කෘතයුගය යන සතරය. අපසර්පිණී සතර යුග නම්. කෘතයුගය ත්‍රෙතායුගය වාපරයුගය කලියුගය යන සතර ය. කෘතයුගය සතරක් කොට බෙදූ කල සතර භාගයෙහි ම ධර්මය[5] වෙයි.[6] ත්‍රෙතා යුගය සතරක් කොට බෙද බැලූ කල තුන් භාගයෙක ධර්මය වෙයි. එක් භාගයෙක අධර්මය. වෙයි: ද්වාපරයුගය සතරක් කොට බෙදූ කල දෙභාගයෙක ධර්මය[5] වෙයි, දෙභාගයෙක අධර්මය වෙයි. කලියුගය සතරක් කොට බෙදූ කල එක් භාගයෙක ධර්මය[5] වෙයි, තුන්භාගයෙක අධර්මය[5] වෙයි. එසේ හෙයින් කලියුගයෙහි බුදුකෙනෙකුන් වහන්සේ ලොව පහළවීම නම්[7] නරකාග්නි[8] මධ්‍යයෙහි දසදිග සුවඳ විහිදුනා මුවරඳ කෙසුරුසළා ඇති පැහැපත් වූ මහ පියුමක් නැංගා සේ ඉතා ආශ්චර්‍ය්‍ය වන්නේය. කියන ලදුයේ මැයි,

කප්පකසායෙ කලියුගෙ - බුද්ධුප්පාදො අහො මහච්ඡරියං,
හුතවහමජ්ඣෙ ජාතං - සමුදිත මකරන්දමරවින්දං-යි.

1. සමුග්ගතො - CDEFJ
2. පරමායුෂ - F
3. අඟලක් උස - I
4. එද වනාහි..... කෘත යුගය යන සතරය යන කොටස C හි නැත.
5. ධර්ම, අධර්ම - ABEFGHI
6. ත්‍රෙතා යුගය...... අධර්මය වෙයි යන කොටස B හි නැත.
7. නම් (නැත) - BEFGH
8. නරකග්නි - KL

Non-Commercial Distribution

මෙකී ක්‍රමයෙන් එක් මහා කල්පයෙක් නම් අසඞ්ඛ්‍යෙය කල්ප ගණනාවෙන් සතරෙක් වෙයි. එයින් එකි එකී අසඞ්ඛ්‍යෙය කල්පයට සිව්සැටක් සිව්සැටක් අන්තඃකල්ප බැගින්[1] අතුරු කප් ගණනාවෙන්[2] දෙසිය සපනසෙක් වෙයි. එයින් එකි එකී අන්තඃකල්පයට අට අට යුගයක් බැගින් යුග ගණනාවෙන් දෙදහස් අටසාලිස් යුගයෙක් වෙයි. මෙසේ ඉතා දීර්ඝප්‍රමාණ වූ මහාකල්පයාගේ සතර භාගයෙන් සංවර්තය සංවර්තස්ථායිය විවර්තය යන තුන් භාගයෙහි සියලු සත්වයෝ ම අපරාපර්‍යවෙද්‍ය වූ කුශලකර්මයාගේ බලයෙන් ඒකාන්ත[3] සුව විඳුනාහ. විවර්තස්ථායී නම් වූ සතරවන භාගයෙහි සුවදුක් දෙක ම විඳුනාහු සුගතියට වඩා දුගතිය ම[4] ආයු බොහෝ වන බැවින් බොහෝ කොට දුක් ම විඳුනාහ. එසේ හෙයින් සසර වසන සත්වයන්ට මහාකල්පයාගේ අට භාගයෙන් සත් භාගයෙක ඒකාන්ත සුව විඳීම වෙයි: සුරු වූ එක් භාගයෙක ඒකාන්ත දුක් විඳීම වන්නේ යයි දතයුතු. මෙසේ දක්වන ලද මේ කල්ප විභාගය ද වනාහී,

සුඤ්ඤඤ්ච අසුඤ්ඤඤ්ච දුවිධා - කප්පානං නාමධෙය්‍යකා,
අසුඤ්ඤඤ්ච පඤ්චවධා[5] කප්පා - සෙසා සුඤ්ඤාති නාමකා

යනාදීන් ශූන්‍යාශූන්‍ය වශයෙන් ද්විප්‍රකාර කොට දැක්වූ හෙයින් බුද්ධාදීන් නූපදනා කල්පය ශූන්‍යකල්ප නම් වෙයි. බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ ආර්‍යශ්‍රාවකාදී වූ ගුණාධික මහාත්මයන්ගේ[6] උත්පත්තියෙන් ප්‍රතිමණ්ඩිත වූ කල්පය අශූන්‍යකල්ප නම් වෙයි. ශූන්‍යකල්පය ද පඤ්චප්‍රකාර වන හෙයින් ප්‍රථමයෙන් දැක්වූ අශූන්‍ය අසඞ්ඛ්‍යෙය විභාග හා සමහ මිශ්‍රක වශයෙන් වනාහී,

සාරො මණ්ඩො වරො චෙව - සාරමණ්ඩො ච භද්දකො,
අසුඤ්ඤස්මිං අසඞ්ඛෙය්‍යෙ පඤ්ච කප්පා විභාවිතා
එකො බුද්ධො සාරකප්පෙ - මණ්ඩකප්පෙ ජිනා දුවෙ,
වරකප්පෙ තයො බුද්ධා - චතුරො සාරමණ්ඩකෙ
පඤ්ච බුද්ධා භද්දකප්පෙ - තතො නත්ථිකා[7] ජිනා

යනු හෙයින් සාරකල්පය මණ්ඩකල්පය වරකල්පය සාරමණ්ඩ කල්පය භද්‍රකල්ප යයි මෙසේ අශූන්‍ය අසඞ්ඛ්‍යෙයයෙහි කල්පයෝ පස්දෙනෙක් වෙති. එයින් යම් කල්පයෙක එක ම බුදුකෙනෙකුන් වහන්සේ උපදනාසේක් වී නම් ඒ කල්පය සෙසු කල්පයන්ට වඩා සාරගුණජනක වන බැවින් සාරකල්ප නම් වෙයි. යම් කල්පයෙක දෙදෙනෙකු[න්] වහන්සේ උපදනාසේක් වී නම් ඒ කල්පය කර්ණාභරණ යුග්මයක් සේ භූෂණ ව මණ්ඩිත වන හෙයින් ද පළමුව උපන් ගුණ පහදවා දෙවන

1. බැවින් - BGHI
2. දෙසිය සපනසෙක්...... සතර භාගයෙන් මේ කොටස GHI හි නැත.
3. ඒකාන්ත වූ - I
4. දුගතියෙහි ම - CDFJ
5. පඤ්චවිධා - DHIKL
6. මහෝත්තමයන්ගේ - B බෙ. කි. ක. ස.
7. නත්ථාධිකා - CDEF ස.
   නත්ථයිකා - BG

Non-Commercial Distribution

බුදුන් උපදනා හෙයින් ද මණ්ඩකල්ප නම් වෙයි. යම් කල්පයෙක තුන්දෙනෙකු[න්] වහන්සේ උපදනාසේක් වීනම් එයින් පළමු ව බුදු වූ බුදුහු දෙවනු ව උපදනා බුදුන් ප්‍රකාශ කොට දක්වනසේක. දෙවනු ව උපන් බුදුහු තුන්වැනි ව උපදනා[1] බුදුන්ගේ මහිම දක්වා වදරනසේක. එකල සත්ත්වයන් අතිශයින් ප්‍රමුදිත වූ සිත් ඇති ව තම තමන් විසින් කරන ලද්ද වූ ප්‍රාර්ථනා වශයෙන් උත්තමභාවයට පැමිණෙන හෙයින් ද මතු උපදනා බුදුන් දකුම්හ යි ප්‍රාර්ථනා වශයෙන් කැමති වන හෙයින් ද ඒ කල්පය වරකල්ප නම් වෙයි. යම් කල්පයෙක සතර දෙනෙකුන් වහන්සේ උපදනාසේක් වී නම් ඒ කල්පය පළමුවන කල්පයට වඩා විශිෂ්ට හෙයින් ද සාරභාවය හා ප්‍රසන්නභාවය ඇති හෙයින් ද සාරමණ්ඩ කල්ප නම් වෙයි. යම් කල්පයෙක පස්දෙනෙකුන් වහන්සේ උපදනා සේක් වී නම් ඒ කල්පය බොහෝ දෙනාට අභිවෘද්ධි කරන හෙයින් ද වැඩකරු හෙයින් ද භද්‍රකල්ප නම් වෙයි. එසේ වූ භද්‍රකල්පයෙක් නම් ලොකයෙහි ඉතා දුර්ලභ වන්නේය. බොහෝ සේ ඒ භද්‍රකල්පයෙහි උපන්නා වූ සත්ත්වයෝ බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ ආර්‍ය්‍යශ්‍රාවකාදි වූ කල්‍යාණ මිත්‍රොපසෙවනයෙන් ලබනලද සැපය ම බහුලකොට ඇත්තාහු වෙති. බොහෝ සේ ත්‍රිහෙතුක[2] සත්ත්වයෝ ලොභ ද්වෙෂාදි වූ කෙලශයන් ක්ෂය කොට නිවන් දක්නාහු වෙති.[3] ද්විහෙතුක සත්ත්වයෝ සප්තවිධ කාමස්වර්ගයෙහි ම උපදනාහ. අහෙතුක සත්ත්වයෝ හෙතු සම්පත් ලබන්නාහ. එසේ හෙයින් ඒ කල්පය හැමදෙනාහට අභිවෘද්ධිකර කාරණයෙන්[4] භද්‍ර වන හෙයින් භද්‍රකල්ප නම් විය. ඒ කල්පයට වඩා සර්වඥවරයන්ගෙන් භද්‍ර වන අනික් කල්පයෙක් නැත්නුයි කියා හෝ භද්‍රකල්ප නම් විය. එසේ හෙයින් මේ කල්පයෝ ද ශූන්‍යාශූන්‍ය වශයෙන් ද්විප්‍රකාර වන්නාහ. තම තමන්ගේ සාරමණ්ඩාදි ස්වකීය නාම වශයෙන් පඤ්චප්‍රකාර වන්නාහයි දතයුතු. මේ මෙහි කල්ප විභාග ය.

ඉක්බිති බාහිර නිදානය නම් කවර යත්, මෙසේ මේ සියලු ම සත්ත්වලොකයෙහි බුද්ධ ප්‍රත්‍යෙක බුද්ධ ආර්‍ය්‍යශ්‍රාවකාදි වූ උත්තමයන්ගේ[5] උත්පත්තිය පිණිස හීන මධ්‍යමොත්කෘෂ්ටාදී වූ හැම සත්ත්වයන්ට වියයුතු සියලු අභිවෘද්ධියට එකාන්තනිමිත්ත ව අනන්තාපර්‍ය්‍යන්ත කල්ප කාලයකින් අතරතුර පහළවන සකලජනහිතසිද්ධ සඞ්කල්පිත වූ ඒ ඒ කල්පයෙහි සත්ත්වසන්තානවර්ති වූ අශෙෂ දෙෂාන්ධකාර ප්‍රබන්ධ විධ්වංසනයට එකාන්තකාරණ ව ලොකොද්භූත වන සර්වඥදිවාකරයන්ගේ එකක ද්විකාදි වූ පඤ්චමාවසාන සඞ්ඛ්‍යා වශයෙන් ම ක්‍රමයෙන් කල්පයන්ගේ සාරාලඞ්කෘත වරසාර භූෂණ භද්‍රාදී බව හෙතුකොටගෙන යථොක්ත ක්‍රමයෙන් ලබන ලද නම්

---

1. උපදනා (නැත) - KL බෙ.
2. තිහෙතුක - ABCEFGJKL
3. දක්නාහ - ACJ
4. අභිවෘද්ධි කාරණයෙන් - ACFGHJKL
   අභිවෘද්ධි කාරණා හෙයින් - I
5. උත්තම සත්වයන්ගේ - ACDEFJ

Non-Commercial Distribution

ඇති සාරකල්පය මණ්ඩකල්පය වරකල්පය සාරමණ්ඩකල්පය භද්‍රකල්පය යි මෙසේ පඤ්චප්‍රකාර වූ කල්පයන් අතුරෙහි කකුසඳ කෝණාගම[1] කාශ්‍යප ගෞතම මෛත්‍රෙය යන පස් බුදුකෙනකුන් වහන්සේගෙන් ප්‍රතිමණ්ඩිත හෙයින් උතුම් හෙයින් භද්‍ර වන හෙයින් භද්‍රකල්පයයි නම් ලද මේ මහා භද්‍රකල්පයට යට විසතාසඞ්ඛ්‍යය කප් ලක්‍ෂයෙකින් ඔබ්බෙහි [කල්ප][2] අසඞ්ඛ්‍යයක් යන තුරු අතුරෙ[3] බුදුකෙනෙකුන් වහන්සේ ලොකයෙහි නූපන්සේක. එකල පූර්ව ස්වීඥවරයන් සමයෙහි අනාගාමී ව ශුද්ධාවාස බඹලොව ඉපද රහත් බවට පැමිණියා වූ බ්‍රහ්මරාජයන් හා එහි ම සිටියා වූ අනාගාමී බ්‍රහ්මරාජයෝ ද එයින් පාත දසමහ බඹතෙලෙහි සතරමග සතරඵලයට පැමිණ සිටියා වූ බ්‍රහ්මරාජයන් හා සදෙව්ලොව සිටියා වූ සකෘදගාමීහු ද යන හැම ආර්‍ය්‍යපුද්ගලයෝ ක්‍රමයෙන් ගොස් අමාමහනිවන් පුර පිරූහ. එකල සියලු දිව්‍යලොකවල සිටියා වූ සෝවාන්හු තමන්ගේ භවනිකාන්තිය බලවත් හෙයින් අනුලොම ප්‍රතිලොම වශයෙන් සදෙව්ලොව සැරිසරා ඉසුරු[4] විඳ වරින් වර සත්වරෙක එයින් බැස මිනිස්ලොව සැපත් විඳ එයින් ගොස් චාතුම්හාරාජික දිව්‍යලොකයෙහි ඉපද අනූලක්‍ෂයක් අවුරුදු එහි දිවසැපත් විඳ එයින් ගොස් තව්තිසා දිව්‍යලොකයෙහි ඉපද තුන්කෙළ සැටලක්‍ෂයක් අවුරුදු දිවඉසුරු[5] විඳ එයින් ගොස් යාම නම් දිව්‍යලොකයෙහි ඉපද තුදුස්කෙළ සතලිස්ලක්‍ෂයක් අවුරුදු දිවසිරි විඳ එයින් ගොස් තුසීපුර දිව්‍යලොකයෙහි ඉපද සත්පනස්කෙළ සැට ලක්‍ෂයක් අවුරුදු දිවසැපත් වළඳ එයින් ගොස් නිර්මාණරතී නම් දිව්‍යලොකයෙහි ඉපද දෙසිය තිස්කෙළ සතලිස්ලක්‍ෂයක් අවුරුදු දිවසැපත් වළඳ එයින් ගොස් පරනිම්මිත වසවර්තී නම් දිව්‍යලොකයෙහි ඉපද නවසිය එක්විසිකෙළ සැටලක්‍ෂයක් අවුරුදු පරම රමණීය වූ දිවඉසුරු විඳ මෙසේ අනුලොම ක්‍රමයෙන් එක්දහස් දෙසිය අටවිසිකෙළ පනස්ලක්‍ෂයක් අවුරුදු මුළුල්ලෙහි අනොපමෙය[6] වූ පඤ්චකාම සම්පත්තීන් සතුණට වෙමින් මහත් වූ දිවසැපත් විඳ එහි සිට කාම විරාග භාවනා කොට ධ්‍යාන උපදවා එයින් ගොස් අසංඛ්‍යෙය කල්පයාගේ තුන්භාගයෙන් එක් භාගයකට ආයුෂය ඇති බ්‍රහ්මපාරිසද නම් බඹලොව ඉපද එහි ආයුපමණින් සිට එයින් ගොස් අසංඛ්‍යෙය කල්පයෙන් භාගයකට ආයුෂය[7] ඇති බ්‍රහ්මපුරොහිත නම් බඹලොව ඉපද එහි ආයු පමණින් ධ්‍යානසුව විඳ එයින් ගොස් අනූනාධික වූ අසංඛ්‍යෙයක් කපට ආයුෂය ඇති මහාබ්‍රහ්ම නම් බඹලොව ඉපද එහි ආයු පමණින් ධ්‍යානක්‍රීඩා කොට එයින් ගොස් මහාකල්ප යුගමයකට ආයුෂය ඇති පරිත්තාභ නම් බඹලොව ඉපද එහි ආයු පමණින් ප්‍රීතිසැප විඳ එයින් ගොස් සතර මහාකල්පයකට ආයුෂය ඇති අප්පමාණාභ නම් බඹලොව ඉපද එහි ආයු පමණින් ධ්‍යානයෙන් දවස් යවා එයින් ගොස් ආභස්සර නම් බඹලොව ඉපද එහි අට මහාකල්පයක් ධ්‍යාන කෙළි කෙළ, එයින් ගොස් පරිත්තසුභ නම් බඹලොව

---

1. කෝණාගමන - ABCDJKL
2. කල්ප (නැත) - පිටපත් හැම
3. අතුරතුර - ABCEFGH
4. ඉසුරුඉසුරු - I
   සුර ඉසුරු - මුද්‍රිත හැම
   දිවඉසුරු - ස
5. දිවසිරි - BCEFG
6. අනොපමෙය්‍ය - පිටපත් හැම
7. ආයුෂ - DHF
   ආයු - EIL ස.

Non-Commercial Distribution

ඉපද එහි සොළොස් කපක් ධ්‍යාන[1] සුව විඳ එයින් ගොස් අප්පමාණසුභ නම් බඹලොව ඉපද එහි දෙතිස් කපක් ප්‍රීති සුව[2] විඳ එයින් ගොස් සුභකිණ්ණ නම් බඹලොව ඉපද එහි සුසැට කපක් ධ්‍යාන සුව විඳ එයින් ගොස් වෙහප්ඵල නම් බඹලොව ඉපද එහි[3] පන්සියක් කප් ධ්‍යානයෙන්[4] දවස් යවා මෙසේ මේ දසමහ බඹතෙලෙහි උදර්තර වූ ප්‍රීති සැප අනුභව කොට එම වෙහප්ඵල නම් බඹතෙලෙහි සිට මාර්ග භාවනා කොට ක්‍රමයෙන් රහත්බවට නොපැමිණියා වූ අනාගාමීහු පඤ්චශුද්ධාවාසයෙන් පළමු වන අවිහ නම් බඹලොව ඉපද එහි දහසක් කප් පිරෙන තුරු ප්‍රීති සැප අනුභව කොට එයින් ගොස් දෙදහසක් කල්පයට ආයුෂය ඇති අතප්ප නම් බඹලොව ඉපද එහි ආයු පමණින් ධ්‍යාන සුව විඳ එයින් ගොස් සාරදහසක් කල්පයට ආයුෂය ඇති සුදස්ස නම් බඹලොව ඉපද එහි ආයු පමණින් ධ්‍යානක්‍රීඩා කොට, එයින් ගොස් අටදහසක් කල්පයට ආයුෂය ඇති සුදස්සී නම් බඹලොව ඉපද එහි ධ්‍යානක්‍රීඩා කොට මෙසේ පසළොස්දහස් සසිය[5] විසිනව කපක් ගිය කල්හි එයින් ගොස් සොළොස්දහසක් කල්පයට ආයුෂය ඇති අකනිට්ඨා බඹලොව ඉපද එහි ආයු පමණින් ධ්‍යානක්‍රීඩාවට පටන් ගත්හ. එකල පශ්චිම අනාගාමීන් අතුරෙන් රහත් බවට පැමිණියා වූ එක්තරා බ්‍රහ්මරාජයෙක් ධ්‍යානයෙන් නැඟී ලොව[6] බලනුයේ පඤ්චශුද්ධාවාසයෙහි බ්‍රහ්මයන් ඉතා ම බොහෝ නොවන සේ දැක මීට කාරණ කිම් දෝහෝ යි පරීක්ෂා කරනුයේ කප් අසංඛ්‍යයයක් යනතුරු බුදුකෙනකුන් වහන්සේ ලොකයෙහි නූපන් හෙයිනැයි[7] දැන ලොවට වූ හානියෙකැයි මහත් වූ සංවෙගයට පැමිණ දැන් කවර වීර පුරුෂයෙක් බුද්ධකාරක ධර්ම්[8] පූරණයට සමර්ථ වේ දෝහෝ යි මුළුලොව බලනුයේ විකසිතායතන ව හිරුරැස් පතන පද්මකුලයන්[9] සේ එකල බුදුබැව් පතපතා පාරමිතා පුරන නොයෙක් දහස් ගණන් බොධිසත්ත්වවරයන් දැක සතුටුවූ සිත් ඇත්තේ තව ද වඩ වඩා ලෝවැඩ වඩනු පිණිස කරුණාපර වීරපුරුෂයන් ලවා බුදු බැව් ප්‍රාර්ථනා කරවා බොධිසත්ත්වයාවෙහි වීර්‍ය වඩවමි යි සිතා යළිදු මුළුලොව බලනුයේ සියලු අර්ථානර්ථ නිශ්චය කිරීමෙහි සමර්ථ වූ සථිරතර වූ විදුරු බඳු සියුම් නුවණ හා නොපසුබස්නා වීර්‍ය ඇති පරහිත කරණයෙහි[10] සමර්ථ වූ අප මහබෝසතාණන් දැක චිත්තාභ්‍යන්තරගත ව බුදුබව ප්‍රාර්ථනා කරවීය.[11] හේ කෙසේද යත්,

එසමයෙහි අප මහබෝසතාණෝ එක්තරා කුලයෙක ඉපද වැඩිවිය පැමිණ මාතුපොෂක ධර්මය රක්නාහු ධන සොයා[12] ස්වර්ණභූමියට යනු කැමතිව එකල නැව් නැඟී වෙළෙඳාමට යන වෙළෙඳුන් කරා එළඹ නායක වෙළෙඳණන්ට එපවත් කියා ඔවුන් යහපතැයි ගිවිසි කල්හි තමන්ගේ වැන්දඹු[13] මැණියන් හා සමඟ නැව් නැඟී මුහුදුයාත්‍රාවෙහි නික්ම එයින් සත්වන දවස් චණ්ඩ වූ වායුවේගයෙන් නැඟී නැව

---

1. ධ්‍යාන ක්‍රීඩා - I
2. සැප - ACDJ
3. පන්සියක් කප්......... අතප්ප නම් බඹලොව ඉපිද එහි (නැත) - GH
4. ධ්‍යාන ක්‍රීඩාවෙන් - I
5. දෙලොස් දහස් දෙසිය -L
6. ලෝ - ACEFJ
7. හේකැයි - ACFIJ, බෙ. ස.
8. ධර්මය - HJK; ධර්මයන් - BCI
9. කැලයන් - ACJ; කැලයක් -. BGHI, බෙ මුකුලයක්- L; කුමුදයක් - K මකුලයන් - E; මුකුලයන් - කි.ක.ඤ.ස. කුඩ්මලයන් - ම.
10. කරුණායෙහි - ABDGHIJL කරුණාවෙහි - C
11. කැරවිය - ADG
12. ධන සොයා වෙළඳම් පිණිස - I
13. වැඳු - E, කා. කි. ඤා. ම.

Non-Commercial Distribution

නැසුණු කල්හි පවන් වේගයෙන් හැලලී මහගල්කුළු සේ අහසට නැඟෙන්නා වූ මහරළපතර[1] මඩිමින් මෑණියන් පිට හොවාගෙන මුහුදු පීනන්ට[2] පටන්ගත්හ. එකෙණෙහියට කියනලද මහබඹු[3] මුහුදු පීනන මහබෝසතුන් දැක 'මේ මහා පුරුෂයා දිගසරස කෙළවරක් නොපෙනෙන්නාවූ මෙබඳු මේ මහාසාගරයෙහි කිඹුල් දැහිමුවරු කොරළ මහරළ[4] ආදි වූ සැඩමසුන් නිසා වන නොයෙක් උපද්‍රව නොසලකා ස්වකීය වූ ජීවිතයෙහි ආලය ද හැර තමා වැදූ මවගේ දිවි රක්නා සඳහා ම උත්සාහ කරන්නේය. එබැවින් මෙබඳු වූ ඉතා දෘඪ වීර්‍ය ඇති මේ මහාපුරුෂ[5] වනාහි බුද්ධකාරකධර්මපූරණයට එකාන්තයෙන් ම සමර්ථය' යි[6] නිශ්චය කොට සිතා බෝසතුන්ගේ චිත්තාභ්‍යන්තරයට ප්‍රවිෂ්ට ව බුදුබැව් ප්‍රාර්ථනා කරන සේ සිත්සතන් යොමු කැරවීය. එකල ඒ මහාබ්‍රහ්මයා විසින් උත්සාහිත[7] වූ මහාපුරුෂයාණෝ,

බුද්ධොහං බොධයිස්සාමි - මුත්තොහං මොචයෙ පරෙ,
තිණ්ණොහං තාරයිස්සාමි - සංසාරොඝා මහබ්භයා

යනාදීන් 'මතු බුදු ව මුළුලොව ගලවම්මැ' යි[8] යනාදීන් මෙසේ සිතින් ම ප්‍රාර්ථනා කොට සිත හටගන්නා වූ එම බුද්ධත්වයෙහි ආනුභාව බලයෙන් හා බ්‍රහ්මානුභාවයෙන් සැප සේ මුහුදින් ගොඩනැඟී පිටිසර එක්තරා ගමකට පැමිණ මෑණියන් හා සමඟ එහි වැස දිවි හිමියෙන් මෑණියන්ට උපස්ථාන කොට එයින් ගොස් දෙව්ලොව ඉපද අනොපමෙය්‍ය[9] වූ දිව්‍යසැපත් විඳ නැවත එයින් අවුත් දඹදිව එකල සිරිමතී නම් වූ මෙකල බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජහට පුත් ව ඉපද පියරජහු ඇවෑමෙන් රාජ්‍යයට පැමිණියාහ. එකල ඒ බෝසතුන්ගේ තේජසින් තැතිගත්තා වූ දඹදිවුතෙලෙහි සියලු රජදරුවන් විසින් එවන ලද[10] නොයෙක් පඬුරු පාක්කුඩමින් අඩුරෙක් නොවීය. අතරතුර තුමූ ද බෝසතුන් කරා උපස්ථානයට එළඹෙන්නාහ. එසේ හෙයින් ම ඒ රජ්ජුරුවෝ ශත්‍රුතාප මහරජ යයි යන නමින් ප්‍රසිද්ධ ව[11] සුරඉසුරු විඳුනා සක්දෙවිඳු මෙන්[12] අපමණ නරඉසුරු විඳ වසනුවෝ ඇත් කෙළියෙහි නියුක්ත ව වාසය කෙරෙති. ඉදින් යම් කිසි තෙනෙක්හි ඇතෙකුගේ ස්වරූප[13] ඇසුවාහු වීනම් රෑ දහවල්[14] කවර වේලෙක වී නමුත් එතැන්හි ගොස් ඒ ඇතු බඳවා තමන්ගේ විජිතයට ගෙනවුත් සෙසු ඇතුන් හා දළින් දළ අන්වා මෙසේ නිරන්තරයෙන් ඇත්කෙළි ම කෙළනාහ. එකල්හි එම නුවර වසන එක්තරා වැද්දෙක් දුනු හී ගෙන මුවදඩ ගොස් වල ඇවිදුණේ එක්තරා වනවිලක් සමීපයෙහි සිටියාවූ සර්වලක්ෂණසම්පන්න මහත් හස්තිරාජයකු දැක නුවරට අවුත් රජහු කරා එළඹ ඇතුගේ රූපය[15] වර්ණනා

---

1. පතර (නැත) - AG
2. පිහිනන්ට - F, මුද්‍රිත හැම ස.
3. මහබඹහු ද - B. මහබඹු - ස, මහබඹහුද - D
4. කොරළ මහරළ - ABCDEFGHIKL, කි. මහරළ (නැත), AJ බෙ.ස.
5. මහාපුරුෂයා - I, කි.
6. සමර්ථ වන්නේයයි - මුද්‍රිත හැම
7. උත්සාහ සහිත - C
8. ගලවම්හයි - BGHIKL
9. අනොපමෙය්‍ය - IJ
අනුපමෙය්‍ය - ABCDEH
10. එලවන ලද - BK
11. ප්‍රසිද්ධ විය - BGHIKL
12. දේවේන්ද්‍ර විලාසයෙන් -BGHIKL
13. ස්වරූපයක් - BGHI ස
14. දවහල් - BCFHI
15. ස්වරූප - B
රූප - AJ

Non-Commercial Distribution

කොට කීය. එපවත් අසමින් ම රජ්ජුරුවෝ ඒ වැද්දට බොහෝ[1] සැපත් දී මහසෙනඟ පිරිවරා වැද්ද ඉදිරි කොට නුවරින් නික්ම කතර ගෙවා ඒ ස්ථානයට පැමිණ ඇතු බඳවා නුවරට ගෙනවුත් සියලු ඇතරුවන්ට ප්‍රධාන වූ එක් හස්ත්‍යාචාර්යයකු සමීපයට කැඳවා ඕහට බොහෝ සත්කාර කොට 'එම්බා ආචාරීනි, මීට සත් වන දවස් මොහු පිටට[2] නැඟී මා නුවර ප්‍රදක්ෂිණා කොට නකත් කෙළි කෙළනා පරිද්දෙන් මේ ඇතු සුශික්ෂිත කොට හික්මවා වහා ගෙනවුත් දක්වා ලව'යි කියා ඇතු පාවා දුන්හ. එද යහපතැ යි ගිවිස එම සත්දවස ඇතුළත ඇතු සුශික්ෂිත කොට හික්මවා ගෙනවුත් රජහට පාවා දින. එකල්හි රජ්ජුරුවෝ ඇතු ඉතා විනීත බැව් දැන රන්සැත් රන්පොරොදු කුම්භාලඞ්කාර සෝවැති කණ්ණචූළිකා කොකවැල ගළමුතු මාලා ආදි වූ නොයෙක් හස්ත්‍යාලඞ්කාරයෙන් රන් පර්වතයක් මෙන් ඇතු සරහවා[3] ඇත්රජු පිටට පැන නැඟී සිව්රඟ සෙනඟ පිරිවරා නුවර ප්‍රදක්ෂිණාවෙහි නික්මුණාහ. ඊට පළමු වන දින තුදුස්වක් රාත්‍රියෙහි බොහෝ ඇත්හු වලින් අවුත් උයනට වැද අඹ දෙඹ[4] නා පනා පොල් පුවක් ආදි වූ නොයෙක් වෘක්ෂ ජාති සිඳ බිඳ හෙළා පයින් මැඩ සුනු විසුනු කෙරෙමින් ඒ ඒ තන්හි දිය සලා ඉලත්ති ලා උයන බැලිය නොහැකි සේ නිශ්ශ්‍රීක කොට ගියහ. ඒ රාත්‍රිය පහන් වූ කල්හි උයනට ගිය උද්‍යානපාලයා එපවත් දැක ගොසින් නුවර ප්‍රදක්ෂිණා කොට ඉක්බිති ව සිටි රජහට දැන්විය. එකල රජ්ජුරුවෝ එම ඇතුපිටින් උයනට ගොස් ඒ ඒ තන්හි ඇතුන් කළ විප්‍රකාර බල බලා ඇවිදුනාහ. රජ්ජුරුවන් නැඟි මඟුලැත් වනාහි ඇතින්නන්ගේ ශරීරගන්ධය ආඝ්‍රාණය කොට මද නැඟී මත් ව තමාගේ ශරීරය සොලවා පිට හුන් ඇතරුවා (බිම) හෙළා[5] ඇතින්නන් ගිය දසාවට[6] අභිමුඛ ව නික්මිණ. එකල රජ්ජුරුවෝ සතර ගාතය දමා උඩුකුරු ව බිම වැදහොත්තා වූ ඇතරුවා දැක තුමූ ම අකුස්ස ඇරගෙන කොට කොටා තමන්ගේ වැර පමණින් ඇදත් ඇතු රඳවාගත නොහී මහ සෙනඟ නොබලා ම ඇතු කෙරෙහි ලොභයෙන් ඔහු අත් නොහැර ම ගොසින් එක් වන මධ්‍යයකට වන්හ. පසු පස්සෙහි දිවන්නාවූ මහසෙනඟ රජු හඹාගත නොහී[7] ඇත්හුගේ පියවර සලකුණෙන් අත් නො හැර පසු පස්සෙහි නික්මුණාහ. එකල්හි රජ්ජුරුවෝ මනුෂ්‍යපථය ඉක්ම මහවලට වන් හෙයින් දිග්විභාග දැනගත නොහී සිතන්නාහු 'ඉදින් මම මෙ ඇතු අත් නොහැර ගියෙම් වී නම් මෙතෙමේ වල් ඇතුන් දැක ඔවුන් හා සමඟ සොඬින් සොඬ බඳ පොර ගන්නේ ය. එසේ කල්හි මාගේ ජීවිතය කෙසේ බවත් නොදැනෙයි. එබැවින් ඇතුන් තබා දිවි රැකගත මැනවැ'යි සිතා ඇතු පිටින් බසිමියි සිතූහ. ඒ ක්ෂණයෙහි ඇත්රජ මහ සරස නමා සිටි මහ දිඹුල් ගසක් යටින් යන්ට නික්මිණ. ඒ ගසෙහි වනාහී එක් ශාඛාවෙක් බිමට නැමී

---

1. මහ - C
   බොහෝ (නැත)ABEFGHIJKL
2. පිට - මුද්‍රිත නැම
3. සරභා - BGHIKL
4. දඹ - I
5. ඇද හෙළා - I
   ඇත හෙළා - ABCDEFGHJKL. ඍ.
   බිම හෙළා - බෙ. ක. කි. ස.
6. දිසාවට - ACFIJ
7. රජු හා හඹාගත නොහී - J
   රජු හා කැටිව හඹාගත නොහී - ස

Non-Commercial Distribution

සිටියේය. රජ්ජුරුවෝ ඒ ශාඛාව එල්බ ගෙන ඇතු හැර දිඹුල්ගසට නැගී එහි එල අනුභව කොට ශාඛාවක් පිට උන්හ. පස්සෙහි එන්නා වූ මහසෙනහ ඇතුගේ පියවර සලකුණෙන් අවුත් එක් තැනෙක සිට මහත් කොට ශබ්ද පැවැත්වූහ. රජ්ජුරුවෝ ඒ ශබ්දය අසා තුමූ ද හඬ ගෑහ. එකල මහ සෙනහ රජහුගේ ශබ්දය අසා වහා දිවගෙන අවුත් ඇතුන් කෙරෙහි භයින් ගස් නැංගා සේ ගස උඩ උන් රජ්ජුරුවන් දැක ගසින් බාගෙන නොයෙක් හෙරිතූර්යභාණ්ඩයන් එක පැහැර එකනිනනාද කරවමින්[1] රජ්ජුරුවන් හා සමඟ නුවරට අවුත් වන්හ. මෙසේ නුවරට වැද අමාත්‍ය මණ්ඩලයා පිරිවරා සිංහාසනාරූඪ ව උන්නා වූ රජ්ජුරුවෝ හස්ත්‍යාචාර්යයා කැඳවා කියන්නාහු 'ඇයි කොල, තෝ මා මරනු[2] කැමැත්තෙහි ද. මෙසේ ඉතා චණ්ඩ වූ පරුෂ වූ දුෂ්ට වූ ඇතකු පිටට කුමක් පිණිස මා නැංවී දැ'යි කියමින් තරයේ ම උදහස් වූහ. එතෙපුල් අසා හස්ත්‍යාචාර්යයා කියනුයේ 'හැයි[3] ස්වාමීනි, එසේ වදරන්නට කාරණ කවරේ ද. මේ ඇත්රජ විශෙෂයෙන් ම විනීත ය, ඉතා සුශික්ෂිත ය. එතෙකුදු[4] උවත් මදයෙන් මත් ව සිටි හෙයින් රාගයෙන් රත් ව ඇතින්නන් කරා ගියේය. එබැවින් තමාගේ මනොරථය පුරාගෙන නොබෝ දවසකින් නැවත එන්නේය. ඊට සැක නොසිතා වැඩහුන මැනවැ' යි කීය. ඒ අසා මඳක් මොළොක් වූ සිත් ඇති රජ්ජුරුවෝ එසේ වී නම් ආචාරිනී, ඇතු එන තෙක් තෙපි බැහැර නොයව. ඉදින් ඇත්රජ සත් දවසක් ඇතුළත[5] නොආයේ වීනම් තොපගේ ජීවිතයට[6] නොසිතව'යි කීහ. එකල්හි හස්තිරාජ තෙමේ ඇතිනි මුළු කරා එළඹ තමාගේ මනොරථය පුරා සදවසක් වන සිරි විඳ සත්වන දවස් අවුත් ඇත්හල්හි සිටගත. එම දවස් රාත්‍රියෙහි හස්ත්‍යාචාර්යතෙම අලුයම නැඟී සිට ඇත්හලට ගියේ එහි සිටියා වූ ඇතු දැක රජ්ජුරුවන් කරා ගොස් 'දෙවයන් වහන්ස, එදවස් නුඹවහන්සේ ගස් නංවා වල් වැද දිවූ[7] ඇත්රජ තෙමේ ම අවුත් දැන්[8] ඇත්හල සිටගත. වහා ගොසින් ඇතු සිටිනා විනීතකමක් බලා වදළ මැනවැ'යි කී ය. එතෙපුල් අසමින්ම රජ්ජුරුවෝ හුනස්නෙන් නැඟී වහා ප්‍රාසාදයෙන් බැස ඇත්හලට දිවගෙන ගොස් බැලුවාහු එදවස් තමා කළ මොළකමට ගහටයක් කෙරෙති යි යන භයින් තැතිගෙන සිටියා සේ සුවිනීත ව ඉතා ශාන්තදාන්ත ව සිටියා වූ ඇත්රජු දැක ඔහුගේ සොඬ[9] පිරිමැද මැද හස්ත්‍යාචාර්යයාට කියන්නාහු 'එම්බා ආචාරිනී, මෙබඳු මේ විනීත වූ ඉතා සුශික්ෂිත වූ හස්තිරාජයා කවර කාරණයක් පිණිස එදවස් මා අකුස්සෙන් කෙටියදීත් නො වැළකෙ දිවී දැ'යි විචාළහ. එවේලෙහි හස්ත්‍යාචාර්ය තෙම කියනුයේ 'හැයි දේවයන් වහන්ස, රාගය නම් අඞ්කුශයට වඩා තියුණු වූ දෙයක[10], ගින්නට වඩා උෂ්ණ දෙයක. තව ද සත්වයන්ගේ සිත ඇතුළෙහි ගැටෙන[11] හීයක් වැන්න. ශීල සමාධ්‍යාදි වූ ගුණ ධර්ම නමැති ධන පැහැරගන්නා සොරකු වැන්න. ශිල්පශාස්ත්‍ර

---

1. කෙරෙමින් - IKL
2. මරවනු - D
3. ඇයි - BGHIKL
4. එතකුදු - CDFGHIJKL
5. සත් දවසකින් - I
6. ජීවිතය - CE; ජීවිතයට - L
7. වැද්දවූ - BI කි. ක. සා
8. ඇත් රජු අවුත් දැන් තෙමේම - ACDEFJ
9. පිට - IL
10. දෙයෙක - ACDEHI
11. ගැවසි - I; ගැවෙන - AGH

Non-Commercial Distribution

නමැති චන්ද්‍රයාහට රාහු අසුරේන්ද්‍රයා වැන්න: තපස් නමැති මහවනයට ලැව්ගින්නක් වැන්න. එසේ හෙයින් එදවස් අකුසු පහරින් වැළකූ චද නොවැළක ම නික්මිණ. දැන් මාගේ මන්ත්‍රයෙහි ආනුභාවයෙන්[1] තමාගේ මනොරථය පිරුණු වේලෙහි ම වල නොසිට වහා අවුත් මේ ඇත්හල්හි සිටගතැ'යි දැන්විය. ඒ අසා රජ්ජුරුවෝ 'එසේ වීනම් තොපගේ මන්ත්‍රයෙහි බල දැන් ම මා දුට මැනවැ'යි කීහ. එවේලෙහි ආචාරී යහපතැයි ගිවිස මහත් වූ යවටන් ගෙන්වා බැලූ බැලුවන් ඇස් පිහී යන පරිද්දෙන් කිහිරහුරු රැසක් සේ රත් කරවා යහඩුවෙකින් ගෙන තමන්ගේ මන්ත්‍රය සිහිකොට 'එම්බල, හස්තිරාජය, තෙල යවට සොඬින් බඳ අල්වාගෙන මා නැවත කී කල මිස බිම නොහෙළ'යි ඇතු දසාවට යවට දික් කෙළේය. එ වේලෙහි ඇත්රජ සොඬ දික්කොට යවට අල්වාගෙන තමාගේ සොඬ දන කල්හි ද හස්ත්‍යාචාරීහු කෙරෙහි හයින් යවට අත නොහැර සිටියේය: ඒ දැක රජ්ජුරුවෝ ඇතු ද මියෙතියි[2] යන ශොකයෙන් යවට අතහරවා ආචාරීන් කීයේ සබාම යයි කියමින් මහත් වූ සංවෙගයට පැමිණ 'අහෝ, රාගය නම් ඉතා චණ්ඩ ය. පරුෂ ය. සාහසික ය. සාදිනව ය. සියලු දුකට භාජනය. නොයෙක් උපද්‍රවයට කාරණ ය. යනාදීන් රාගයෙහි ආදිනව සලකා හස්ත්‍යාචාර්‍යයාහට බොහෝ සම්පත් දී 'මෙසේ මේ සසර දුක් ගන්නා සත්වයන් කවර ධර්මයෙකින් යෙදී කෙසේ නම් මේ සංසාරදුඃඛයෙන් මුදම් දෝ හෝ'යි පරීක්ෂා කොට 'බුධකාරක ධර්මයන් හැර අනික්[3] කිසි උපායෙකින් සසර දුක් ගෙවා බොහෝ දෙනාහට උපකාර විය නොහැක්කැ'යි දැන 'දැන් ම මා බුදුබවට ප්‍රාර්ථනා කළ මැනවැ'යි සිතා මනොප්‍රණිධානය කරන්නාහු.

බුද්ධොහං බොධයිස්සාමි - මුත්තොහං මොචයෙ පරෙ,
තිණ්ණොහං තාරයිස්සාමි - සංසාරොඝා මහබ්භයා

යනාදීන් මෙසේ මනොප්‍රණිධානය කොට රාජ්‍යය හැර හිමාලය වනයට වැද[4] තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් මහණ ව දිවිහිමියෙන් තපස් කොට ආයු කෙළවර දෙව්ලොව ඉපද මහත් වූ දිව්‍යසැපත් විඳ නැවත දඹදිව මගධ දෙශයෙහි දළිද්දිය නම් බමුණුගම නායක බමුණාණන්ගේ බ්‍රාහ්මණදේවීන් කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් බිහි වූහ. මෙසේ මවුකුසින් බිහි වූ ඒ මහබෝසතාණන්ගේ ශරීරවර්ණය බ්‍රහ්මරාජයකුගේ ශරීරවර්ණයක් සේ ඉතා පැහැපත් ව බැලූ බැලූවන්ට අතිශයින් ම පියකරු විය. එසේ හෙයින් එමහතාණන්ට[5] නම් තබන දවස් බ්‍රහ්ම කුමාරයෝ යයි නම් තුබූහ. ඒ බ්‍රහ්ම කුමාරයෝ තමන් ඉතා නුවණැති හෙයින් සොළොස් හැවිරිදි අතුරෙහි ඍග්වේදය යජුර්වේදය සාමවෙදයයි කියනලද ත්‍රිවිධවෙදයෙහි[6] ද අක්ෂර ලිඛිත ගණිතගාන්ධර්වාදි වූ[7] අෂ්ටාදශ විද්‍යාස්ථානයෙහි ද ශ්‍රැතිය ස්මෘතිය ව්‍යාකරණ ය යනාදි වූ සුසැට කලාශිල්පයෙහි ද යන සියලු ශිල්ප ශාස්ත්‍රයෙහි නිෂ්පත්තියට පැමිණියහ. එකල්හි

---

1. බලයෙන් - I
2. මියෙයි - ACDJ, බෙ. ස.
   මිය යෙයි - F
   මියහි - කා. නි. කැ. ම.
3. අන් - BDGGHIKL. කි. ක. කැ. ම.
4. වැඩ - GH
5. මහබෝසතාණන්ට - BHIKL
6. ත්‍රිවේදයෙහි - EF, ක.කි.කො.එ.
7. අක්ෂරලිඛිතාදි වූ - BGHIKL

Non-Commercial Distribution

ඒ මහතාණන් සමීපයෙහි පන්සියයක් පමණ බමුණු කුමරුවෝ ත්‍රිවේදය ඉගෙන නිමවූහ. ඉක්බිති ඒ මහතාණෝ මවුපියන්ට කළ මනා අත් පා මෙහෙ නිමි කල්හි තමන්ගේ අතවැසි වූ ඒ පන්සියයක් පමණ බමුණු කුමරුවන් ළඟට කැඳවා සෙසු උගැන්වුවමනා ශිල්පශාස්ත්‍ර උගන්වා තමන් සන්තක වූ සියලු ධනරාශිය ඔවුන්ට හස්තෝදක කොට දන් දී අවවාද කොට ගිහිගෙන් නික්ම හිමාල[ය] වනයට වැද තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි ව මෙකල ඒරක නම් වූ එකල මුණ්ඩ නම් පර්වතය සමීපයෙහි පන්සලෙක වෙසෙති. එකල බොහෝ කුලපුත්‍රයෝ බෝසතුන් කෙරෙහි පැවිදි ව කිසුණු පිරියම් ඉගෙන තම[1] තමන්ගේ සිතට සැප වූ විවේක ස්ථානවල ඉඳ කිසුණු පිරියම් කොට ධ්‍යාන උපදවා අපරිහීන[2] ධ්‍යානයෙන් ගොස් බ්‍රහ්මලොකයෙහි උපන්හ. බෝසතුන්ගේ අතවැසි වූ යට කියන ලද පන්සියක් පමණ බමුණු කුමරුවෝ ද තම තමන්ගේ මවුපියන් ඇවෑමෙන් බෝසතුන් සමීපයෙහි මහණ ව පූර්වස්නෙහයෙන් බෝසතුන් අත් නොහැර වෙසෙති. ඔවුන් අතුරෙන් මතු බුදු වන මෛත්‍රෙය[3] මහබෝසතාණෝ ඒ ශිෂ්‍යයන්ට ප්‍රධාන ව අප බෝසතුන්ට අග්‍ර ශිෂ්‍ය වූහ. එකල්හි එක් දවසෙක මහබෝසතාණෝ සෙසු තාපසවරුන් ඵලාඵල සොයා ඒ ඒ දිග ගිය කල්හි ප්‍රධාන ශිෂ්‍යයන් හා සමග තුමූ ද ඵලාඵල පිණිස ඒ මුණ්ඩ[4] නම් පර්වතයට නැඟී එක් දසාවෙකින් පර්වත ප්‍රාන්තය බැලුවාහු එහි දරුවන් වද කීප දවසක් නිරාහාර හෙයින් ක්‍ෂුධාව ඉවසිය[5] නොහී තමා හා සමග කෙළනා දරු පැටවුන් කනු කැමැති ව හොත්තාවූ ව්‍යාඝ්‍රධෙනුව[6] දැක සසර කළකිරී 'අහෝ, මේ සංසාරයට නිඳු වෙව'යි යනාදීන් මහත් වූ ඛේදයට පැමිණ ප්‍රධාන ශිෂ්‍යයාණන් කැඳවා 'සබඳ, තෙපි මේ වනයෙහි පරීක්‍ෂා කොට සිංහ ව්‍යාඝ්‍රාදීන් විසින් මරන ලද යම් කිසි සතක්හුගේ මාංසයක් දුටු නම් වහා ගෙනවුත් මේ ව්‍යාඝ්‍රධෙනුවට දෙව'යි කියා ශිෂ්‍යයාණන් නික්මවා ඔවුන් නො එන තෙක් ම තමන්ගේ ශරීරය නුවණින් පරීක්‍ෂා කරන්නාහු හැම ලෙසින් ම ප්‍රතිභය සහිත බව සලකා නැවත 'මෙබඳු මේ අනෙකවිධ දුක් අනුභව කරන සත්වවර්ගයා කවර ධර්මානුභාවයෙකින් එදුකින් මුද සුවපත් කොට ලිය හෙම් දෝහෝ'යි පරීක්‍ෂා කරන්නාහු අතීත ජාතියෙහි කරනලද ප්‍රාර්ථනා වශයෙන් බුධකාරකධර්මයන් දැක 'මේ බුධකාරකධර්මයෝ නම් ඇස් නොදී ඉස් නොදී අඹු දරුවන් නොදී ශරීරයෙහි ලෙහෙ මස් නොදී[7] දුෂ්කර ක්‍රියාවක් නොකොට එසේ මෙසේ පුරාලිය නොහැක්කාහ. එසේ හෙයින් අනෙකාදීනවයෙන් යුක්ත වූ මේ ශරීරය සියලු සත්වයන්ට හිත පිණිස බුදුබැව් පතා දැන් ම[8] මේ ව්‍යාඝ්‍රධෙනුවට දෙමි. එසේ කල්හි මැගේ ක්‍ෂුධාදුඃඛය ද සන්හිඳෙයි. ව්‍යාඝ්‍රපැටවුන්ගේ ජීවිතය ද රැකෙයි. මට ද මතු බුදුබව සිධ වන්නේය'යි මෙසේ ඔද වැඩියා වූ සිත් ඇති ව දෙවියන්ට පින් දෙන්නාහු,

1. තමන් - AEJ, බෙ. ස.
2. පරිචිත - ක.සි.සැ.
3. මෙත් - ACDEFJ මෛත්‍රී - KL
4. මණ්ඩ - A
5. ඉවසාගත - BHIKL ක.සි.සැ.
6. ව්‍යාඝ්‍රධෙනුවක - B
7. දන් හොදී - ABCDEGHJK
8. දැන් මම - HEIKL

Non-Commercial Distribution

තස්ස මෙ අනුමොදන්තු උභො නාරද පබ්බතා
ඉන්දො ච බ්‍රහ්මා ච පජාපතී ච සොමො යමො වෙස්සවණො රාජා
සබ්බෙ දෙවානුමොදන්තු යම්දං[1] පුඤ්ඤං කතං මයා

යනාදීන් දෙවියන්ට පින් දී පර්වත මුදුනෙහි සිට ව්‍යාඝ්‍රධෙනුවගේ අභිමුඛයට පිනූහ. එකල්හි ව්‍යාඝ්‍රධෙනු තොමෝ පර්වත මුදුනෙන් හෙන්නා වූ බෝසතුන් දැක තමාගේ දරුවන් හැර බෝසතුන්ගේ ශරීරමාංසය අනුභව කළා ය. බොධිසත්ත්වයෝ වනාහි ඒ කුශල විපාකයෙන් දෙව්ලොව උපන්හ.

එකල පුරාණ දීපඞ්කර නම් බුදුරජාණන් වහන්සේ සොළසාසඞ්ඛ්‍යය කප්ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇති ව දඹදිව කපපවතී නම් නුවර රජකුලයෙහි[2] ඉපද දසදහසක් හවුරුදු ගිහිගෙයි වැස ක්‍රමයෙන් ජරා රුවෙක ලෙඩ රුවෙක මළ රුවෙක මහණ රුවෙකැයි යන සතර පූර්වනිමිත්තයන් දැක මහභිනික්මන් නික්ම මහණ ව සත් දවසක් ප්‍රධන් වීර්‍යකොට බෝමඩ හරා[3] බුදු ව සද්ධර්ම නමැති රත්නවර්‍ෂාවන්[4] වස්වමින් සත්ත්වයන් සතුටු කරවා චාතුර්ද්වීපික මහාමෙඝයක් සේ වැඩවසනසේක. මෙසේ වැඩවසන බුදුරජාණන් වහන්සේගේ රූපසම්පත්තිය හා අශ්‍රැතපූර්ව සද්ධර්මය අසමින් ම සතුටුව වූවා වූ[5] ඒ කපපවතී නම් නුවර රජ කරන රජ්ජුරුවන් ප්‍රධාන කොට ඇති සියලු මනුෂ්‍යයෝ බුදුන් ප්‍රධාන කොට ඇති භික්‍ෂු සඞ්ඝයාවහන්සේට දවසින් දවස ඔවුනොවුන් පරයා සිවුපසයෙන් උපස්ථාන කරන්නාහ. එකල පශ්චිම දීපඞ්කර නම් බොධිසත්ත්වයෝ සියලු උපභොග පරිභොග වස්තුවෙන් සමෘද්ධ වූ බොහෝ සම්පත් ඇති බමුණු මහසල් කුලයෙක ඉපද යෞවන අවස්ථාවට පැමිණ ගිහි සැපත් විඳිනාහු කාමයෙහි ආදීනව දැක ගිහිගෙය හැර[6] මහණ ව පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා ධ්‍යානලාභී ව වසනුවෝ දවසෙක නොයෙක් ලක්‍ෂ ගණන් රහතුන් විසින් පිරිවරන ලද්දවූ පුරාණ දීපඞ්කර නම් බුදුරජාණන් වහන්සේගේ ශොභාමත් වූ ආත්මභාවය දැක 'මම ද මතු මේ සර්වඥයන් වහන්සේ සේ ම ලොවුතුරා බුදුවීම් නම් යහපතැ'යි සිතා තමන්ගේ[7] පාත්‍රය ගෙන තෙල් සිඟා ගෙනවුත් බුදුන් වැඩහිඳිනා ගඳකිළිය සිවුදැගඳින් පිරිබඩ ගෙන බුදුන් උදෙසා රාත්‍රිය මුළුල්ලෙහි නොයෙක් ලක්‍ෂගණන් පහන් පූජා කොට ඒ රාත්‍රිය පහන් වූ කල සියලු භික්‍ෂු සඞ්ඝයා වහන්සේ බුදුන් කරා වැඩි කල්හි නැවත සඞ්ඝයා වහන්සේට ද පහන් පූජා කොට බුදුන් සමීපයට එළඹ පසඟ පිහිටුවා වැඳ ශ්‍රීපාද මූලයෙහි බැස හෙව බුදුන් දිවි පුදා 'ස්වාමීනි, භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්ස, යම් සේ නුඹ දැන් දීපඞ්කර නම් ලොවුතුරා බුදු ව සියලු සත්ත්වයන් සංසාරබන්ධනයෙන් මුද සුවපත් කෙළේ ද එපරිද්දෙන් ම මම ද මේ පහන් පූජාවෙහි අනුසසින් හා නුඹට දිවි පිදුවා වූ මේ

1. යම්මං - ABCDFGHIJK
2. රජකුලෙහි - ACDEFJ
3. කරා එළඹ - I
4. වර්‍ෂා - ADIL
5. වූවාහු - BEFGHI
වූ - ස.
6. ගිහිගෙයි ආලය හැර - IKL, ක.සි.ඥා.බෙ.ස.
7. තමන් - AJ

Non-Commercial Distribution

කුශලානුභාවයෙන් මතු දීපඞ්කර නම් ලොවුතුරා බුදු ව සංසාරගත සත්වයන් එයින් ගොඩනඟා නිවන් දැක්විය හෙම්ව´යි ප්‍රාර්ථනා කළහ. එකල බුදුහු අනාගතංසඥානය පතුරුවා ඔවුන්ගේ ප්‍රාර්ථනාව සිධවන සේ දැක භික්ෂූන් වහන්සේට ආමන්ත්‍රණය කොට ´එම්බා මහණෙනි, ඊයේ රෑ තුන්යම් රාත්‍රියෙහි පහන් පූජාකොට දැන් මට දිවි පුද හොත්තා වූ මේ මහණ තෙමේ මතු මා සේම දීපඞ්කර නම් බුදු වෙ යි. යනාදීන් විවරණ දී වදළසේක. මෙසේ විවරණ ලද්දවූ දීපඞ්කර මහබෝසතාණෝ එතැන් පටන් නිරන්තරයෙන් තෙල් සිඟා ගෙනවුත් බුදුන්ට පහන් පූජා කරන්නාහු දවසෙක නුවර මුළුල්ලෙහි සිඟා තෙල් නොලැබ රජගෙට ගොසින් වන්හ. එසමයෙහි යට කියනලද අප මහ බෝසතාණෝ පෙර ජාතියෙහි තමන් විසින් කරන ලද අපරාපර්යවේද්‍ය වූ කිසි අකුශලකර්ම බලයෙකින් දෙව්ලොවින් චුත ව එම පුරාණ දීපංකර නම් බුදුරජාණන්වහන්සේට දෙබිහින්නන් දරු නංව[1] රජකුලයෙහි ඉපද රජගෙයි සත්මාල්පායෙක මතුමහල් තෙලෙහි හුන්නාහු නොවේලේ රජගෙට වඩනා වූ දීපඞ්කර මහබෝසතුන් දැක එක් දසියක කැඳවා ´එම්බල කෙල්ල[2], එක් භික්ෂුකෙනකුන් වහන්සේ රජගෙට වැඩිසේක. තෝ උන්වහන්සේ[3] සමීපයට ගොසින් කුමක් පිණිස වැඩිසේක් දෝහෝ´යි විචාරා නියම දැන වහා අවුත් මට කියාල´යි කියා යවූහ. හො ද[4] යහපතැයි ගිවිස ගොස් වැඩි කාරණ විචාරා පහන් තෙල් සිඟා වැඩි බව අසා එපවත් රාජකුමාරිකාවන්ට දැන්වූව. රාජකුමාරිකාවෝ එ තෙපුල් අසමින් ම හිඳිනා අස්නක් පනවා එහි වැඩහුන් දීපඞ්කර මහබෝසතුන්ගේ පතුල් ශෝධවා තෙල් ගල්ලවා[5] පසඟ පිහිටුවා වැඳ ඉක්බිති ගන රන්තලියෙක රත්වන් පැහැ[6] අබතෙල් පුරා තමන් හිස් මුදුනෙහි තබාගෙන ´මේ කුශලානුභාවයෙන් සියලු සත්වයන්ට හිත පිණිස ඔබැණින් වහන්සේ පරිද්දෙන් ම මම ද මතු ලොවුතුරා බුදු වෙම්ව යි, මා බුදුවන ජාතියෙහි මෙ සිදුහතු තෙලෙහි[7] නමින් ම සිධාර්ථ නම් වෙම්ව´යි මෙසේ සිතින් ම ප්‍රාර්ථනා කොට තෙල් තලිය ගෙනවුත් මහබෝසතුන්ගේ පාත්‍රයෙහි වත්කොට බෝසතුන්ට කියන්නාහු ´ස්වාමීනි, බුධපූජාවට මේ සිදුහතු තෙල් දුන්නා වූ කුශලයෙන් මම ද මතු ලොවුතුරා බුදු වනු කැමැත්තෙමි. මා බුදු වූ කල්හි මේ සිදුහතු තෙලෙහි නමින් ම සිධාර්ථ නම් වනු කැමැත්තෙමි. එබැවින් මේ තෙල් ගෙන ගොස් පහන් පූජා කොට ඉක්බිති මා මෙසේ ප්‍රාර්ථනා කළ බව ඔබැණින් වහන්සේට දැන්වුව මැනවැ´යි කීහ. දීපඞ්කර මහ බෝසතාණෝ ද යහපතැයි ගිවිස බුදුන් කරා එළඹ පහන් පූජා කොට ඉක්බිති බුදුන් වැඳ ´ස්වාමීනි,

1. දරු ව - GHIKL
2. කෙල - EFI; කොළ - D; කෙල - CGHJ
3. තෙල වහන්සේ - ABCJ
4. හෙද - ABCJ, බෙ.
   හොද (නැත) - BGHIKL
   ඕතොමෙර් - ක.සි.සං.
5. ගල්වා - ABCDFGHIJK
6. පැහැ ඇති - BEGHIKL
7. තෙල - BDEGHIKL

Non-Commercial Distribution

අද මේ පහන් සියල්ල ම නුඹවහන්සේගේ නං වූ රාජකුමාරිකාවන් දුන් සිදුහතු තෙලින් ම පූජා කෙළෙමි. ඒ නුඹවහන්සේගේ නැගණියෝ ද සිදුහතු තෙල් දුන්නා වූ කුශලානුභාවයෙන් මතු බුදුවනු කැමැත්තාහ. බුදු වූ කල්හි එම සිදුහතු තෙල නමින් ම සිද්ධාර්ථ නම් වනු කැමැත්තාහ'යි දැන්වූහ. එතෙපුල් අසමින් ම බුදුහු 'එම්බල මහණ, මනැගිණියෝ ස්ත්‍රීබැව්හි සිටි හෙයින් විවරණ ලැබීමට අයොග්‍යයහ'යි වදරා ඊට කාරණ කවරේ දැයි විචාළ කල්හි 'එම්බල මහණ, බුද්ධකාරකධර්ම පූරණය නම් ඉතා දුෂ්කර ය. එබැවින් යම්කිසි කෙනෙක් දෘඪ වීර්‍ය ඇති ව නොයෙක් කප් කෙළ ගණන් මුළුල්ලෙහි පාරමිතා පුරා බොහෝ කාලයක් ප්‍රාර්ථනා කොට හෙවත් සතාසඞ්ඛ්‍යෙය කල්පලක්ෂයක් මුළුල්ලෙහි මනොවීර්‍ය කොට නවාසඞ්ඛ්‍යෙය කල්පලක්ෂයක් මුළුල්ලෙහි වාග්වීර්‍ය කොට මෙසේ සොළසාසඞ්ඛ්‍යෙය කල්පලක්ෂයක් ගිය කල්හි අෂ්ටධර්ම සමොධානයෙන් යුක්ත වූවාහු වී නම් එකල්හි විවරණ ලද හැක්ක. ඔවුන්ගේ ප්‍රාර්ථනාව ද සිද්ධ වන්නේ ය'යි වදරා ඒ කෙසේ වූ අෂ්ටධර්මයෙක් දැයි විචාළ කල්හි ඒ අෂ්ටධර්මය ප්‍රකාශ කොට වදරන බුදුරජාණන් වහන්සේ,

මනුස්සත්තං ලිඞ්ගසම්පත්ති - හෙතු සත්ථාරදස්සනං,
පබ්බජ්ජා ගුණසම්පත්ති - අධිකාරො ච ඡන්දතා,
අට්ඨධම්මසමොධානා - අභිනීහාරො සමිජ්ඣති.

යනාදීන් 'එම්බල මහණ, මිනිසත් බවය, පිරිමි බවය, රහත් වීමට හේතුසම්පත් ඇති බවය, සජීව බුදුන් දැක්මය, මහණ වූ බවය, ධ්‍යානලාභී බව ය, බුදුන්ට දිවි පිදූ බවය, බුදුකුරුදම් පිරීමෙහි උත්සාහ වීර්‍යයෙන් යුක්ත බවය, යන මේ අෂ්ටධර්ම නම් වෙයි. එ බැවින් මනුෂ්‍ය ජාතියෙහි පිරිමි ව ඉපද එම ආත්මභාවයෙහි රහත් වීමට හේතු සම්පත් ඇති ව මහණවෙස් ගෙන ධ්‍යානලාභී ව දිවමනු[1] බුදුන් දැක ඔවුන් වහන්සේට ජීවිතය පරිත්‍යාග කොට බුද්ධකාරකධර්මයන් පිරීමෙහි මහත් වූ උත්සාහ වීර්‍යයෙන් යුක්ත ව ප්‍රාර්ථනා කරන්නාහට ම බුදුබව සිද්ධ වන්නේය. එසේ හෙයින් ඔහු විවරණ ලැබීමට ද යොග්‍යයහ. ස්ත්‍රීත්වයෙහි සිටියාහු එබඳු අෂ්ටධර්ම සමොධානයක් නැති හෙයින් විවරණ ලද නොහෙති'යි වදාළසේක. එතෙපුල් අසා දීපඞ්කර මහබෝසතාණන් වහන්සේ 'එ සේ කල ස්වාමීනි, නුඹවහන්සේගේ නැගණියන් බුදුවෙම්ව යි කළා වූ ප්‍රාර්ථනාව සිද්ධ වේ ද නොවේ දැ'යි විචාළසේක. එකල බුදුරජාණන් වහන්සේ අතීතාංශඥානය මෙහෙයා යට ගිය දවස තුන් ආත්මභාවයෙක තමන් සිතින් ම බුදු වෙම්වයි පැතූ බව දැක නැවත අනාගතාංශඥානය මෙහෙයා මතු බුද්ධකාරකධර්මයන් පුරා බුදු වන්ට සමර්ථ බව දැක දීපඞ්කර මහබෝසතුන්ගේ මුහුණ බලා 'එම්බල මහණ, මෙයින් මතු සොළොසාසඞ්ඛ්‍යෙය කප්ලක්ෂයක් ගිය කල්හි සාරමණ්ඩ නම් කප තොප මා සේ ම දීපඞ්කර නම් බුදු වූ කල මා නැඟණියෝ තොපගෙන් සම්මුඛ විවරණ ලබති'යි වදාළසේක. එකල

1. ජීවමාන - KL

Non-Commercial Distribution

දිව්කුරු බෝසතාණෝ එවදන් මුදුනෙන් පිළිගෙන මහත් වූ සන්තොෂයෙන් බුදුන් වැඳ වැඳ හුනස්නෙන් නැඟී බුදුන් ප්‍රදක්ෂිණා කොට අවසර ඉල්වාගෙන නික්මුණාහ. අප මහබෝසතාණෝ එකල දුන්නා වූ ඒ සිදුහතු තෙල අනුසසින් සත්‍රීභාවයෙන් මිදී සත් පනස්කෙළ සැටලක්ෂයක් හවුරුද්දට ආයුෂ ඇති තුසීපුර දෙව්ලොව මහානුභාවසම්පන්න දිව්‍යරාජන් ව උපන්හ.

මේ මෙහි බාහිර නිදන ය.

මහා නිදනය නම් කවර යත්, මෙසේ අප මහ බෝසතාණන් නොයෙක් සිය දහස් ගණන් ජාතියෙහි දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳිමින් සසර සැරිසරන කල්හි මේ මහා භද්‍රකල්පයට කප්ලක්ෂයක් උතුරු කොට ඇති විසි අසංඛ්‍යයෙන් මනොප්‍රනිධානයට පළමු වන තෘෂ්ණ නම් අසංඛ්‍යයෙහි ලෞකික ලොකොත්තර වශයෙන් ද්විප්‍රකාර සියලු ගුණසාර ජනක වූ එක ම ලොවුතුරා බුදුකෙනකුන් වහන්සේගේ ලොකොත්පත්තිය නිසා විශෙෂාතිසාර වූ සාර නම් කල්පයෙහි බුධත්වය[1] පතා අටාසංඛ්‍යය කප්ලක්ෂයක් පිරූ පාරමිතා ඇති ව සම්‍යක් සම්බොධි සමධිගමයට පැමිණියාවූ බ්‍රහ්මදෙව නම් බුදුරජාණන් වහන්සේ බ්‍රහ්මාරාධනාව පිළිගෙන දහම්සක් පවත්වා සුවිසි අසංඛ්‍යයක් සත්වයන් එක් තැනෙක්හි වැඩහිඳ නිවන් දැක්වීම[2] නොපිළිවන් හෙයින් සත්වානුග්‍රහය සඳහා දනවු සැරිසරා දඹදිව කාරකණ්ඨක නම් නුවරට වැඩිසේක.

සුවණ්ණ වණ්ණාය පභාය ධීරො
සුවණ්ණ වණ්ණෙ කිර මගගරුකෙබ,
සුවණ්ණ වණ්ණෙන සමෙ කුරොනෙතා
සුවණ්ණ වණ්ණා පටිපජ්ජි මගගං.

යනු හෙයින් මහත් වූ බුධානුභාවයෙන් යුක්ත ව නොයෙක් දහස් සුවහස් ගණන් හිර සඳ එකවිට පහළ වූ කලක් පරිද්දෙන් සියලඟින් නික්මුණාවූ සවණක් ඝන බුධරශ්මීන් එකපැහැර මුළු නුවර බබුළුවා විදුලිය කැළ වැළඳි රන් මෙරන් පරිද්දෙන් නුවර මහ වේ මැදට පැමිණිසේක. එකල අප මහ බෝසතාණෝ එම කාරකණ්ටක නම් නුවර අතිදෙව නම් රජ ව සක්විති රජ සැපතක් හා සමාන මහත් වූ[3] රජසැපත් විඳිමින් වසනුවෝ එදවස් රජගෙයි මතුමහල් තෙලෙහි අමාත්‍ය මණ්ඩලයා පිරිවරා

---

1. බුද්ධවරයන් - KL
2. දැක්වීමට - ACFJ
3 මහත් වූ (නැත) - BGHIKL

Non-Commercial Distribution

ශක්‍ර දෙවේන්ද්‍ර ලීලාවෙන් සිංහාසනාරූඪ ව හුන්නාහු සියලු නුවර එක පැහැර[1] පතළ බුදුරස්කඳ හා අනොපමෙය්‍ය වූ ශ්‍රී විලාසයෙන් වඩනා බුදුන් දැක පළමු ව තමන් එබඳු බුදුරුවක්[2] නුදුටු හෙයින් මෙතෙමේ දෙවියෙක් බඹෙක් දෙහෝ නොහොත් නාග සුපර්ණ යක්‍ෂ රාක්‍ෂසාදීන් අතුරෙන් එක්තරා අමනුෂ්‍යයෙක් දෝහෝ යි භයින් තැතිගෙන සිංහාසනයෙන් බස්නට වන්හ. එකල සිරිගුත්ත නම් අමාත්‍ය ව එම අතිදෙව රජහට අර්ථයෙන් ධර්මයෙන් අනුසාසනා කරන්නාවූ මෛත්‍රෙය[3] මහබෝසතාණෝ රජ්ජුරුවන්ට අභිමුඛ ව එකත්පස් ව උන්නාහු අස්නෙන් බස්නා රජ්ජුරුවන් හා රජගෙයි පතළ ආලොකය දැක සිව්මැදුරු කවුළුවෙන් පිටත බැලුවාහු දෙතිස් මහාපුරුෂලක්ෂණයෙන් සශ්‍රීක ව අසූ අනුව්‍යඤ්ජනයෙන් ශොභමාන ව ව්‍යාමප්‍රභා මණ්ඩලයෙන් පිරිවරන ලදු ව කෙතුමාලාලඞ්කාරයෙන් අලඞ්කෘත ව නීල පීත ලොහිතොදතාදි වූ[4] සවනක් ඝන බුඬරශ්මීන් එක පැහැර මුළු නුවර සරහමින් වඩනා බුදුන් දැක ඊට පූර්වභාගයෙහි තමන් බ්‍රහමදෙව නම් බුදුකෙනකුන් වහන්සේ ලොකයෙහි උපන්සේක යනු ඇසූ හෙයිනුත් පෙර තමන් නොයෙක් සියගණන් සර්වඥවරයන් දැක දනමානනාදී වශයෙන් බොහෝ සත්කාර කොට බුදුබව ප්‍රාර්ථනා කෙරෙමින් ආවාවූ කෘත්‍යාධිකාර මහතාණන් හෙයිනුත් පළමුවන දැක්මෙහි ම බුදුන් බව දැන වහා හුනස්නෙන් නැඟී රජහට අභිමුඛ ව සිට දකුණත ඔසවා කියන්නාහු,

එස බුඬො මහාරාජ - ලොකෙ උත්තමපුග්ගලො,
සබ්බසත්තහිතත්ථාය - ලොකෙ උප්පජ්ජි සො ජිනො.
අයඤ්ච බො මහාරාජ - බ්‍රහමදෙවො තථාගතො,
භාසන්තො විථියා මජ්ඣෙ - පස්සථෙතං[5] පුනප්පුනං.

යනාදීන් 'මහරජ' මේ ආශ්චර්යයීමත් වූ මනහර පෙළහරක් ඇති මහාපුරුෂයාණෝ නම් සියලු සත්වයන්ට හිත සැප පිණිස ලොකයෙහි[6] පහළවූ දෙවාතිදෙව වූ ශක්‍රාතිශක්‍ර වූ බ්‍රහමාතිබ්‍රහම වූ බ්‍රහමදෙව නම් බුදුරජාණන්වහන්සේ ය. එබැවින් කිසි භයක් නොකළ මැනවැ'යි රජ්ජුරුවන් අස්වසා ඉක්බිති බුදුන්ට වඩනා කුශලක්‍ෂෙත්‍රයක් ලොකයෙහි නැති බව හඟවන්නාහු,

සතං හත්ථී සතං අස්සා - සතං අස්සතරී රථා
සතං කඤ්ඤා සහස්සානි - ආමුත්ත මණිකුණ්ඩලා,
එකස්ස පදවීතිහාරස්ස - කලං නාග්ඝන්ති සොළසිං.

යන මේ ගාථාව කියා 'එම්බා මහරජ, යම් කිසිවෙක් රන්සැත් රන්පොරදු ආදි වූ නොයෙක් භාණ්ඩාලඞ්කාරයෙන් සරහා නිමවන ලද සර්වලක්ෂණ සම්පන්න වූ ඇතුන් ලක්ෂයක් ද එසේ ම නොයෙක් අශ්වාලඞ්කාරයෙන් සරහා නිමවනලද අවයවසම්පත්තීන්

1. පැතිර - ABCEFGHIJKL
2. බුදුරුවනක් - BGHKL
3. මෛත්‍රීය - පිටපත් හැම
4. ලොහිතාවදාතාදි වූ - BEGHIKL, ක.කි.ඥ.ම.
5. පස්සථෙවං - KL
6. මේ ලොකයෙහි - BGHIKL ක.කි.ඥා.ම.

Non-Commercial Distribution

යුක්ත වූ ජවබල සම්පන්න අසුන් ලක්ෂයක් ද එපරිද්දෙන් ම මනහර සැරහීමෙන් සරහා එක වියෙහි[1] අසුන් සතර සතරදෙනා බැගින් යොද රන්ධවජ නගා නොයෙක් රථාලඞ්කාරයෙන් සරහා නිමවනලද[2] මනහර වූ රථ ලක්ෂයක් ද එසේ ම බහා පළඳනා ලද මාණික්‍යමය කුණ්ඩලාභරණ නූපුරාදි වූ නොයෙක් බිසෝපළඳනායෙන් සරහන ලද ශරීර අවයවයන් ඇති සිවුසැටක් පමණ ස්ත්‍රීලක්ෂණයෙන් ශොභමාන වූ බාලපරායෙහි[3] සිටි උතුම් වූ ස්ත්‍රීන් ලක්ෂයක් ද යන මෙසියල්ලක් ම තමන්ගේ ශක්ති පමණින් යාචකයන්ට දන් දුන්නේ වී නම් එසේ වූ ආශ්චර්යීමත් දනයෙන් ලබන්නා වූ විපාකයටත් වඩා යම් කිසිවෙක් බුඩරත්නය ධර්මරත්නය සඞ්ඝරත්නය යන තිරත්නයෙන් එක්තරා රත්නයක් උදෙසා තමා හුන් තැනින් නික්මුණේ වී නම් ඔහු සන්හිඳී යන ගමනෙහි එක් පියවරක් ඔසවා තුබූ කල සිටි පියවර ඇඟිලි අග පටන් ඉදිරියෙහි තුබූ පියවර විළුම දක්වා දෙඅතුරෙහි පදවීතිහාර නම් වූ පියවරක් පමණ අවකාශයෙක් පෙනෙන්නේය. ඒ[4] පදවීතිහාර සඞ්ඛ්‍යාත වූ පියවරක් පමණ භූමිප්‍රදෙශය සොළොස් කොටසක්[5] කොට එයින් භාගයක් ගෙන එයිදු සොළොස් භාගයක් කොට මෙසේ මෙසේ ම සොළොස් වාරයෙක බෙදූ කල අස්ලොමක්[6] එළාලන පමණ ඉතා සූක්ෂම වූ භූමියෙක් වෙයි. එපමණ භූමියෙන් ජනිත වූ කුශලසම්භාරය ම සුවහස් ගුණෙන් වඩනේ ම ය. එබැවින් වහා හුනස්නෙන් නැඟී ඔබට පෙර ගමන් කොට නික්මුණ මැනවැ'යි කීහ. එතෙපුල් අසමින් ම අප මහබෝසතාණෝ ප්‍රීතිවේගයෙන් මත් ව උඩුමාලෙන් බස්නා[7] දෙරකවුළු හිනිමං ආදිය විභාග දැනගත නොහී මතු මහල්තෙලෙහි සිට බුදුපුදයට දමන මිණිරුවනක් සේ සිවුමැදුරු කවුළුවෙන් බිමට පැන තමන්ගේ ශ්‍රද්ධාබලයෙන් මහපොළොව පළාගෙන දහසක් පෙත්තෙන් ගැවසී සිටගත්තා වූ[8] රථසකක් සා පමණ මහපියුමක් නැඟී තමන්ගේ පාපියුම් පිළිගත් කල්හි පුෂ්පරස පානය කොට අභිමත ස්ථානයකට නික්මුණු ස්වර්ණ හංසරාජයකු සේ පියුම්ගබින් බැස බුදුන් කරා එළඹ සමන් මලින් බුදුන්[9] පුද නැවත සත්රුවනින් විසිතුරු මහපියුම් තුනක් හා සමඟ නොයෙක් රත්නයෙන් බුදුන්ට පූජා කොට පසඟ පිහිටුවා වැඳ පළමුත් තමන්[10] හෙතුසම්පත් ඇති හෙයින් බුදුන්ගේ ප්‍රථම දර්ශනයෙහි ම බුඩත්වයෙහි සාභිලාෂී ව සිතින් ම ප්‍රාර්ථනා කරන්නාහු 'ස්වාමීනි, ජනහිත නිරත වූ[11] බුදුරජාණෙනි,[12] දැන් නුඹවහන්සේ, ලොවුතුරා බුදුව සවි සතුන් සසර සයුරෙන් එතර කොට නිවන්පුර සිරි ගෙනහැර දුන්නේ ද එපරිද්දෙන් මම ද මතු ලොවුතුරා බුදු ව සියලු සත්වයන් සංසාර සාගරයෙන් ගොඩනගා නිවන්පුර ලියහෙම්ව'යි[13] යනාදීන් සිතින් ම ප්‍රාර්ථනා කොට බුදුන් වැඳ අවසර ගෙන තමන්ගේ අන්තඃපුරයට ම වන්හ.

---

1. වියෙහි - ADFJ බෙ. ප.
2. සරහන ලද - DEFJ
3. බාලපරායණයෙහිK
4. එසේ - BGHIKL
5. කොට්ඨාසයක් - ACDGHIJKL
6. අස්ලෝමයක් - ABCDFJKL, ස අසුලොමයක් - I
7. බස්නාහු - I
8. ගැවසීගත්තාවූ - BGHIKL
9. බුදුන්ට - ADJ, බුදුන් (නැත) බෙ. ස.
10. තමන්ගේ - BHI. සි.සද.ක.
11. නිහිත - DFJ
12. නුඹ යම් සේ - AEFJ
    නුඹ යම් - C
13. පුරාලිය හෙම්වයි - BDFHIKL. බෙ. සඃ

Non-Commercial Distribution

තව ද ඔබට ඉක්බිති එම නන්‍ද නම් අසඞ්ඛ්‍යයෙහි ලොව පහළ වූ පන්දහසක් පමණ සර්‍වඥවරයන් හා දෙවන සුනන්‍ද නම් අසඞ්ඛ්‍යයෙහි නවදහසක් පමණ සර්‍වඥවරයන් හා තුන්වන පෘථිවි නම් අසඞ්ඛ්‍යයෙහි දසදහසක් පමණ සර්‍වඥවරයන් හා සතර වන මණ්ඩ නම් අසඞ්ඛ්‍යයෙහි එකොළොස් දහසක් පමණ සර්‍වඥවරයන් හා පස්වන ධරණී නම් අසඞ්ඛ්‍යයෙහි විසිදහසක් පමණ සර්‍වඥවරයන් හා සවන සාගර නම් අසඞ්ඛ්‍යයෙහි තිස්දහසක් පමණ සර්‍වඥවරයන් හා සත්වන පුණ්ඩරීක නම් අසඞ්ඛ්‍යයෙහි සතලිස් දහසක් පමණ සර්‍වඥවරයන් හා මෙසේ සත් අසඞ්ඛ්‍යය[1] ඇතුළත ලොව පහළ වූ එක්ලක්‍ෂ පස්විසිදහසක් පමණ සර්‍වඥවරයන් හැම නො වරදවා දැක බුදුබව පතා මහ දන් දී මනොප්‍රණිධානය මස්තකප්‍රාප්ත කළහ. වදරන ලද මැයි,

නන්දෙ සුනන්දෙ පඨවි - මණ්ඩො ධරණී සාගරො,
පුණ්ඩරීකො'ති මෙ සත්ත - අසඞ්ඛ්‍යා පකාසිතා.
මනසා පත්ථිතා මය්හං - තිඞ්ඩිට්ඨාසඞ්ඛියා ඉමෙ,
තෙසු සත්ත අසඞ්ඛෙසු - ජාතා ලොකෙකනායකා
පඤ්චවීස සහස්සාවස[2] - ලක්ඛමෙකං භවෙකතො
එත්තකානං මහෙසීනං - මනසා පත්ථනෙ තද
දශනෙන මෙ සමො නත්ථි - එසා මෙ දානපාරමී.

මේ මෙහි
මහා නිදාන ය.

අවිදූරේ නිදානය නම් කවර යත්? මෙසේ උපනුපන් බුදුන් නොවරදවා දැක මස්තකප්‍රාප්ත කළා වූ මනොප්‍රණිධාන ඇති අප මහබෝසතාණෝ නොයෙක් සියගණන් ශූන්‍ය කල්පවල දිව්‍ය මනුෂ්‍යලොක දෙක්හි නොයෙක් ශ්‍රී විභූති විඳ ඇවිදුනාහු එක් ජාතියෙක මිනිස්ලොව ඉපද වැඩිවිය පැමිණ පූර්‍වහෙතු බලයෙන් බුදුබව පතා තාපසප්‍රව්‍රජ්‍යාවෙන් මහණ ව ප්‍රථමධ්‍යානය ප්‍රණීත වශයෙන් භාවනා කොට පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති උපදවා අපරිහීන ධ්‍යානයෙන් ගොස් එක් අසඞ්ඛ්‍යය[3] කල්පයකට ආයු ඇති මහාබ්‍රහ්ම නම් බඹලොව ඉපද එහි ආයු පමණින් ධ්‍යාන සුව විඳ වසනුවෝ මේ මහාභද්‍රකල්පයට තෙළෙසාසඞ්ඛ්‍යය කප් ලක්‍ෂයකින් යට වාක්ප්‍රණිධානයට පළමුවන සර්‍වභද්‍ර නම් අසඞ්ඛ්‍යයෙහි සර්‍වඥවරයන් සතරදෙනකුන්[4] වහන්සේගෙන් ප්‍රතිමණ්ඩිත වූ සාරමණ්ඩ නම් කප දඹදිව ධඤ්ඤවතී

1. සතාසඞ්ඛ්‍යයන් - BGHIKL
2. පඤ්චවීසති - ACEFJ
3. අසඞ්ඛ්‍යයක් - BEI
4. සතර දෙනකු - BCDEFGHIJK

Non-Commercial Distribution

නම් නුවර රජකුලයෙහි[1] උපන්හ. එකල ඔවුන්ට නම් තබන්නාහු සාගර කුමාර යයි කියා[2] නම් තුබූහ. ඒ සාගර කුමාරයෝ වැඩිවිය පැමිණ තමන්ගේ පිය මහරජාණන් ඇවෑමෙන් ඔවුනු පැළඳ රාජ්‍යයට පැමිණ දශරාජධර්මයෙන් රාජ්‍යය කෙරෙමින් කලක් ගිය කල මෑත භාගයෙහි පුරෝහිත බ්‍රාහ්මණයකු විසින් උගන්වන ලද දශවිධ සක්විතිවත් පුරා මස්තකප්‍රාප්ත කොට චක්‍රරත්නය හස්තිරත්නය අශ්වරත්නය මාණික්‍යරත්නය ස්ත්‍රීරත්නය ගෘහපතිරත්නය පරිනායකරත්නය යන සප්තවිධ රත්නයන් ලදින් සාගර නම් චක්‍රවර්ති රජ ව වටින් සතිස්ලක්‍ෂ දසදහස් තුන්සිය පනස් යොදුන් පමණ ඇති චක්‍රවාට කුහරය ඇතුළත දෙදහසක් කොදෙව්[3] පිරිවරා මෙර සතරදිග පිහිටි සතර මහාද්වීපයෙහි ඒකාතපත්‍ර චක්‍රවර්ති රාජ්‍යය කෙරෙමින් අමරගණානුබද්ධ දෙවේන්ද්‍ර විභ්‍රමයෙන් මහසෙනඟ පිරිවරා දෙව්හානන් බඳු වරඟනන්ගේ නෘත්‍ය ගීත වාදයෙන් සන්තුෂ්ට වෙමින් සක්විති සැපත් විඳුනාහ. එකල සොළොසාසඞ්ඛ්‍යය කප්ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇති පුරාණ ගෞතම නම් ශාක්‍ය බුදුරජාණන් වහන්සේ එම සර්වභද්‍ර නම් අසඞ්ඛ්‍යයෙහි සාරමණ්ඩ නම් කප දඹදිව මධ්‍යමණ්ඩලයෙහි සිරිනිවාස නුවර යශෝවාස රජහු නිසා නෙත්‍රාභිරාම වූ රූපලාවණ්‍ය ගුණෝපේත විමලා මහාදේවීන් කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් බිහි ව යෞවනාවස්ථාවට පැමිණ නොයෙක් සියදහස් ගණන් වරඟනන් විසින් පිරිවරන ලදු ව පන්දහසක් හවුරුදු මුළුල්ලෙහි මධුර කේලි රසික ව රාජ්‍ය ශ්‍රී අනුභව කොට සතර පූර්වනිමිත්ත දැක මහභිනිෂ්ක්‍රමන් නික්ම අඩමසක් මහාවීර්ය කොට බෝධිපර්යඞ්කාරූඪ ව මරසෙනඟ බිඳ බුදු ව සත්සති යවා බ්‍රහ්මාරාධනා පිළිගෙන දහම්සක් පවත්වා වදළසේක. එකල බුදුන්ගේ ධර්මචක්‍රයෙහි තේජසින් නැති ගත්තා වූ දසදහසක් සක්වළ මහපොළොව එකපැහැර ගුගුරා පැන නැඟී[4] මෙරු මන්දරාදි වූ සප්තකුල පර්වතයෝ අත්බමරක්[5] සේ බමා එක විට[6] නැමී වැඳුම් ගත්හ. ලොකයෙහි නොයෙක් ආශ්චර්ය පහළ විය. මෙසේ සත් සයුරු සත් කුළපව් සත් දහතළා සක්වළගල් ආදීන්ගේ කම්පා වීම හා සමඟ ඒ සක්විති රජහුගේ චක්‍රරත්නය ද වෙවුලා පළමු තමා ආකාශයෙහි සිටියා වූ ස්ථානයෙන් ඉගිල පාත් ව පසුබැස නිශ්ශොභ ව සිටියේය. ඒ දැක සක්විති රජ්ජුරුවෝ මහත් වූ සංවේගයට පැමිණ සිතන්නාහු 'මේ චක්‍රරත්නය මාගේ කුශලබලයෙන් පහළ විය. නිරන්තරයෙන් ම රාජ රාජ මහාමාත්‍යාදි වූ සියලු ලොකවාසීන් විසින් පුදන ලද්දේය. දැන් මේ චක්‍රරත්නය කවර කාරණයක් පිණිස පළමු තමා සිටි තැනින් පාත් ව පසු බැස නිශ්ශොභ වී දේ හෝ'යි සිතා බමුණන් අතින් විචාළහ. එකල ලක්‍ෂණ පාඨක බමුණෝ ඊට කාරණ කියන්නාහු 'එම්බා මහරජ සක්විති රජුන්ගේ කාලක්‍රියාව

---

1. රජකුලයෙක - I
2. කියා (නැත) - ACDFIJ
3. කොදිව් - ABEJH ක.කි.ඤ.ම.
   කුහරය දෙදහසක් කොදෙව් - ස.
4. නැංගාය - E, ක.කි.ඤා.බෙ
   නැංග - ම.ස.
5. අත්බමර - BFGJ. බෙ. ස.
6. එක පිටින් - BGHIKL
   එක පිට - E
   එක පැහැර - මුද්‍රිත හැම, ස.

Non-Commercial Distribution

ආසන්න වීමෙන් හෝ සක්විති රජුන් මහණ වීමෙන් හෝ බුදුන් ලොකයෙහි ඉපදීමෙන් හෝ චක්‍රරත්නය නිශ්ශොභ ව අන්තර්ධාන වන්නේ ය. නුඹවහන්සේ වනාහී ඉතා දීර්ඝායුෂ්ක සේක. එසේ හෙයින් නුඹවහන්සේගේ ජීවිතයට කිසි සැකයක් නොසිතුව මැනව. දැන් වනාහී ගෞතම නම් වූ ශාක්‍ය බුද්ධකෙනකුන් වහන්සේ ලෝකයෙහි පහළ වූ සේක. ඒ බුදුන්ගේ බුද්ධානුභාවයෙන් හා ධම්මචක්‍රයෙහි ආනුභාව බලයෙන් මේ චක්‍රරත්නය නිශ්ශොභ විය. තව ද ඒ ගෞතම නම් ශාක්‍ය බුදුන්ගේ ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො යනාදීන් සඞ්ක්‍ෂෙප වශයෙන් නවප්‍රකාර කොට දක්වනලද කලණ ගුණයෙන්[1] යුක්ත වූ කීර්තිශබ්දය කෙළලක්‍ෂයක් සක්වළ එකහෙළා පැතිර උස් ව පැනනැංගේය. යනාදීන් අනන්තාපරිමාණ වූ බුද්ධගුණයන් තම තමන් නුවණ පමණින් ම වර්ණනා කොට කීහ. එකල ඒ සක්විති බෝසතාණෝ බුදුන් ලෝකයෙහි උපන්හ යනු අසමින් ම පස්වනක් ප්‍රීතීන් පිනා ගිය ශරීර ඇති ව 'සාධු සාධු, දැන් ඒ බුදුහු කොයි වැඩවසන සේක් දැ'යි විචාළහ. එවේලෙහි බ්‍රාහමණයන් අතුරෙන් බුදුන් කෙරෙහි අතිප්‍රසන්න වූ ඉතා නුවණැති එක් බ්‍රාහමණයෙක් තමාගේ උතුරුසළුව එකාංශ කොට බහාගෙන එකල බුදුන් වැඩවසන මිගාවිනවන නම් උයන දසාවට අභිමුඛ ව පසඟ පිහිටුවා වැඳ නැඟී[2] බද්ධාඤ්ජලී ව දෙහොත් මුදුනෙහි තබාගෙන නැමී සිට[3] බොහෝ දෙනාහට ඇසෙන සේ මහත් කොට හඬගා කියනුයේ,

එස බුද්ධො මහාරාජ - ලොකනාථො අනුත්තරො,
ලොකම්හි අසමො වෙහථ - මහෙසී අග්ගපුග්ගලො
සබ්බඤ්ඤූ බුද්ධො භගවා - සක්‍ය මුනීති විස්සුතො,
නිස්සායිමං ධඤ්ඤවතිං - මිගාචිත වනං ගතො

යනාදීන් 'මහරජ ඒ ලෝකස්වාමී වූ ලොකනාථ වූ ලොකෛකගුරු වූ අසමසම වූ අප්‍රතිපුද්ගල වූ අනුත්තර වූ සම්‍යක්සම්බුද්ධ වූ ගෞතම නම් ඒ ශාක්‍ය බුදුහු දැන් මෙම ධඤ්ඤවතී නුවර නිසා මිගාවිනවන නම් උද්‍යානයට වැඩිසේකැ'යි කීය.[4] එතෙපුල් අසමින් ම සක්විති රජ්ජුරුවෝ මහත් වූ සන්තොෂයෙන් පින පිනා ප්‍රීතිහර්ෂිත වූ ගාත්‍ර ඇති ව එම විට ම නොයෙක් යාල ගණන් පුවඳ මල් පුවඳ සුනු දීප ධූප ආදි වූ බොහෝ පූජාභාණ්ඩ ගෙන්වාගෙන සතිස් යොදනෙක පැතිර සිටි තමන්ගේ මහසෙනඟ හා සමඟ නුවරින් නික්ම ඒ මිගාවිනවන නම් උයනට ගොසින් වැඳ බුදුන් කරා එළඹ බුදුරුවට සලකුණු වූ දෙතිස් මහාපුරුෂ ලක්‍ෂණයෙන් හා අසූ අනුව්‍යඤ්ජන ලක්‍ෂණයෙන් හා බ්‍යාමප්‍රභා කෙතුමාලාලඞ්කාරයෙන් විරාජමාන වූ ආත්මභාවයක් ඇති ව ස්වර්ණගිරි ගුහාද්වාරයක හුන්නා වූ කෙශර සිංහරාජයකු සේ ද උදයගිරි ශිඛරයට පැමිණියා වූ බාලභාස්කරයා සේ ද අලඞ්කෘත වූ බුද්ධාසන

1. සකල ගුණ ගුණයෙන් - GIL
2. නැමී - I
3. නැඟී සිට - BGHIKL
4. කීව - BGHIKL

Non-Commercial Distribution

මස්තකයෙහි සුවර්ණක් රසින් දිලිහි දිලිහී වැඩහුන්නා වූ බුදුන් දැක අතිශයින් ම විස්මයට පැමිණියා වූ සිත් ඇති ව අමාහැල්ලෙක ගැලෙන්නක්හු[1] මෙන් සවනක් ඝනබුධරශ්මිමාලාවන් පිහිරාගෙන බුදුන් කරා එළඹ[2] තමා[3] උපන් ජාතිය සඵල කෙරෙමින් පසඟ පිහිටුවා වැඳ අනොපමෙය්‍ය වූ බුධශ්‍රී බල බලා සිට සිත උපන්නා වූ ප්‍රීතිවෙගය උතුරුවා දමන්නක්හු මෙන්,

> සුදිට්ඨං වත මෙ දිට්ඨං- ජස්සිතබ්බං ච පස්සිතං,
> සඵලං ජීවිතං මය්හං- යං පස්සාමි තථාගතං.

> න තෙ සමො කොචි මනුස්සලොකෙ
> සමොපි තෙ නත්ථි ච දෙවලොකෙ,
> සදිසොපි තෙ නත්ථි ච බ්‍රහ්මලොකෙ
> යං ලොකනාථං අසමංහ පස්සෙ

යනාදීන් බුදුන්ගේ තුන්ලෙව්හි පතළ නවඅරහාදී ගුණ සමූහයන් අරභයා නොයෙක් ලෙසින් ස්‍තුතිකොට කොට[4] සුවඳින් මලින් බුදුන් පුද[5] දෙළොස් යොදනෙක පැතිර සිටිනා තුයී සේනාවක් හා පස්විසි යොදනෙක පැතිර සිටිනා බ්‍රාහ්මණ මණ්ඩලයක් හා අටසාලිස් යොදනෙක පැතිර සිටිනා අමාත්‍ය මණ්ඩලයක් හා [6]අනූයොදනෙක රන් කොන්ත ගෙන සිටිනා යොධමණ්ඩලයක් හා පන්සියයක් යොදනෙක සැරහී[7] සිටිනා මහාපර්ෂද් මණ්ඩලයක් හා මේ සා මහත් පර්ෂදකින් දිලිහි දිලිහී චක්‍රවාටය වට කෙරෙමින් මහමෙර සිසාරා ගමන් ගත් චක්‍රරත්නය සේ බුදුන් සිසාරා ප්‍රදක්ෂිණා කොට පසඟ පිහිටුවා වැඳ අවසර ගෙන නුවරට අවුත් දෙවතාවන් ලවා හිමාල[ය][8] වනයෙන් වර්ණ[9] ගන්ධ සම්පන්න රත්සඳුන් ගෙන්වාගෙන තුන් සතර පස්මහල් ආදි වූ ප්‍රභෙද ඇති ප්‍රාසාද ලක්ෂයෙක කූටාගාර ලක්ෂයෙක රාත්‍රිස්ථාන ලක්ෂයෙක දිවාස්ථාන ලක්ෂයෙක සක්මන්මළු ලක්ෂයෙක[10] මණ්ඩප[11] ලක්ෂයෙක ලතාගෘහ ලක්ෂයෙක භොජනශාලා ලක්ෂයෙක ගිනිහල් ගෙවල්[12] ලක්ෂයෙක යනාදී වසයෙන් වහසල් දෙරටු පැන්හල්[13] ආදි වූ සියල්ල ම මාහැඟි කොට රත්සඳුන් හරින් ම කරවා වෙහෙර වටා සුරක්ෂිත කොට පවුරු පදනම් බඳවා විහාර කර්මාන්ත නිමි කල්හි ස්වකීය වූ රාජභවනය හා උභය වීථි පාර්ශ්වය ද වෙහෙරට නික්මෙන්නා වූ මඟ ද යන හැම තැන්හි කළුවැලි පියා සුදුවැල්ලෙන් තවරා ලදපස්මල් ඉස නානා ස්ථානයෙහි වින්‍යාස කොට ලන ලද රන්තොරණ රිදීතොරණ කෙහෙල්තොරණ මල්තොරණ පිළිතොරණ ආදි වූ තොරණ පඞ්කතියෙන් ද රන්වැට රිදීවැට ලියවැට දඬුවැට ආදි වූ පහන්වැට පඞ්කතියෙන් ද රන්ඇගෑ රිදීඇගෑ ආදි වූ පහන් ඇගෑ

1. ගැලෙන්නාක්හු -BIL
   ගලන්නක්හු -A
   ගලන්නාක්හු -CD
2. වැද - BCDEHIKL
   එළඹ වැද - J
   එළඹ (නැත) - FG
3. තමන් -BG, මුද්‍රිත හැම: තමාගේ -L
4. ස්තුතිකොට - ABGHIJKL කි.
5. පුද පුද - ABGH
6. අනූ යොදනෙක........යොධමණ්ඩලයක් හා (නැත) - ස.
7. පැතිර සරහී - D
   පැතිර - ස.බෙ.
8. හිමාලා - පිටපත් හැම
9. ස්වර්ණ වර්ණ - බෙ
10. මළු (නැත). EGH
    මළු ලක්ෂයෙක (නැත) - ABCIJ - රාත්‍රිස්ථාන ලක්ෂයෙක (නැත) - ස.
11. ජන්තා මණ්ඩප - CJ
12. ගිනිහල් ගෙ BGHK
    ගිනිහුල - IL , ගිනිහල් - ක.කි.හැ.බෙ.
13. පැන්සල් - ACDE; පැන්සැල් - F

Non-Commercial Distribution

පඞ්ක්තියෙන් ද ස්වර්ණකුම්භ රජතකුම්භ ආදි වූ පූර්ණඝට පඞ්ක්තියෙන් ද දෙපස නඟන ලද රත්ධජ රිදීධජ ආදී වූ නානා වර්ණ ධජපතාකා පඞ්ක්තියෙන් ද අගරු දෙව්දුරු කළුවැල් ආදියෙන් ලනලද සුවඳ සුඹුලු[1] සුනු පඞ්ක්තියෙන් ද හිරුරැස්[2] වළකනු පිණිස මුදුනෙහි බඳනා ලද ඛොම කොසෙය්‍යාදි වූ නානා වර්ණ වස්ත්‍රජාතියෙන් විචිත්‍ර වූ විතාන පඞ්ක්තියෙන් ද එම වියන්හි එල්වනලද සිය දහස් ගණන් ඔලම්බක පද්මයෙන් හා කුසුමදම පඞ්කතියෙන් ද අභිනව දිවාකර කිරණ දර්ශනයෙන් පිපී වැනී ගිය පස්පියුම් වනයක් හා සාදෘශ්‍ය වූ නානා වර්ණ ජනසමූහයෙන් ද එසේ අනේකප්‍රකාර වූ සිටුර පඞ්කතියෙන් ද රන්සන්නාහ රිදීසන්නාහ බහා පිළියෙල කරන ලද්ද වූ ඇත්සෙනගින් ද අස්සෙනගින් ද සත්රුවනින් විසිතුරු වූ කර්මාන්තකොට නිමවනලද චක්‍රමාලාවෙන් යුක්ත වූ රථපඞ්කතියෙහි[3] යොදනලද සෛන්ධව අශ්වයන්ගෙන් ද ඒ ඒ ස්ථානයෙහි සිට ස්තුති කරන්නාවූ වන්දිභට්ටයන්ගේ ජයනාද සහස්‍රයෙන් ද දසදිග සුවඳ විහිදුනා වූ සපු දුනුකේ සීනිද්ද බෙලිද්ද යොහොඹු වැකොඳ මහනෙල් උපුල් ජයසුමන[4] ආදි වූ නොයෙක් පුෂ්පජාතියෙන් ද ඒ සියලු වීථිමාර්ග දිගන්තරය එකපැහැර නිරන්තර කෙරෙමින් නොයෙක් අලංකාරයෙන් සරහවා නන් විසිතුරු වූ වෙශ භූෂණයෙන් සැරහුණාවූ නළුනාටකයන් ඒ ඒ තන්හි සිට මහබෙර මිහිඟුබෙර ලොහොබෙර පණාබෙර ගැටබෙර එකැස්බෙර ඩවුර තම්මැට නිසාන ආදි වූ නොයෙක් හෙරිතූර්යභාණ්ඩයන් ගෙන වයන සේ නියෝග කොට තුමූ ද සර්වාභරණයෙන් සැරහී අභිෂේකධර ව මහත් වූ ශ්‍රී විභූතීන් යුක්ත ව නානාප්‍රකාර ධනුර් විකෘති හා බංග කොන්ත තෝමර හෙණ්ඩිවාල කරවාලාභචන්ද්‍ර චක්‍ර ඉට්ටි මිට්ටුරු ආදි වූ ආයුධ ගත් අත් ඇති ව නානාවර්ණ සන්නාහ බහා සැරහුණාවූ සතිස්යොදනෙක පැතිර සිටි තමන්ගේ මහසෙනඟ හා සමඟ බුදුන් කරා එළඹ පසඟ පිහිටුවා වැඳ නැඟී සිට මුදුනෙහි ඇඳිලි බැඳ 'ස්වාමීනි, භාග්‍යවත් වූ බුදුරජාණන්වහන්ස, නුඹවහන්සේ උදෙසා මා විසින් විහාරයක් කරවන ලද. මා කෙරෙහි අනුකම්පායෙන් වැඩ දැන් ඒ විහාරය පිළිගත මැනවැ'යි ආරාධනා කොට මුළුලෝ බිහිරි[5] කරවන්නක්හු මෙන් නොයෙක් පූජෝත්සව කරවමින් බුදුන් වඩාගෙනවුත් විහාරය පිළිගන්වා ප්‍රණීත වූ නොයෙක් කන බොන දෑ ආදියෙන් බුදුන් වළඳවා නොයෙක් රත්නයෙන්[6] බුදුන්ට පූජා කොට බුදුන්ගේ ශ්‍රීපාදමූලයෙහි බැසහෙව දෙහොත් මුදුනෙහි තබාගෙන පූර්වහේතු බලයෙන් ප්‍රාර්ථනාකරන්නාහු 'ස්වාමීනි, ලෝකස්වාමී වූ බුදුරජාණන්වහන්ස, යම් සේ නුඹ වහන්සේ දැන් ශාක්‍යවංශයෙහි ඉපද ගෞතම නම් බුදු ව

චතුවීසති[7] අසඞ්ඛ්‍යෙ - සට්ඨිඤ්ච නව කොටියො
පාණානං සතසහස්සානි - එකො බුද්ධො පමොචයෙ[8]

---

1. දුඹුලු - CDEFJ
2. සුයම්රශ්මි - KL
3. පවඞ්කතියෙන් ද - BGHI
4. ජයසමන් - BIKL
ජයදසමන් - GH
5. මිහිරි - ABDEFGH
6. සියදහස් ගණන් රත්නයෙන් -D
7. චතුවීස - C
8. පමොචයි - CDEGHIJKL

Non-Commercial Distribution

යනාදි වශයෙන් දක්වන ලද නවකෙළ සැටලක්ෂයක් උතුරු කොට ඇති සූවිසි අසංඛ්‍යයක් සත්වයන් අමාමහ නිවන් දක්වා ලෝකානුග්‍රහ[1] කළේ ද එපරිද්දෙන් ම මම ද මතු මේ කුශලානුභාවයෙන් ශාක්‍යරාජවංශයෙහි ඉපද ගෞතම නම් බුදු ව සියලු සත්වයන් සංසාරසාගරයෙන් ගොඩනගා නිවන්පුර සිරි ගෙනහැර[2] දීලිය හෙම්ව`යි යනාදීන් වාග්භේද ප්‍රාර්ථනා කළහ. එකල බුදුහු බුධකාරකධර්මයන් පුරා බුදු වීම ඉතා දුෂ්කර නියාව නොයෙක් උපමාවෙන් දක්වා වදාළසේක. එ හැම මෙ තැන්හි කියත් ඉතා බෙහෙව. එම්බල මහරජ, බුද්ධකාරකධර්මයන් පිරීම නම් ඉතා දුෂ්කර ය. ඉදින් බුදුවනු කැමැතහොත් අධිකතර වීර්‍ය ඇති ව අනේකප්‍රකාර වූ දුෂ්කරක්‍රියා කොට අෂ්ටධර්මසමෝධානයෙන් යෙදී විවරණ ශ්‍රී[3] ලදින් දානශීලාදි වූ දශවිධ පාරමිධර්මයන් අඛණ්ඩ කොට රක්ෂා කළා නම් මතු මා සේ ම ලොව්තුරා බුදුවන්නේ වේදැ`යි[4] යනාදීන් මෙසේ අනියත විවරණ පමණක් ම[5] දුන්හ. වදරන ලද මැයි,

> හවිස්සති[6] ත්වං සම්බුද්ධො - ලොකෙ ලොකගගනායකො,
> දසබුද්ධකරෙ[7] ධම්මෙ - සචෙ කාතුං සක්ඛිස්සසි යි.

මෙසේ ඒ බුදුන්ගෙන් අනියත විවරණ පමණක් ලදින් එදවස් ම ලැබෙන බුදුබවක් සේ මහත් වූ සන්තෝෂයට පැමිණියාවූ මහබෝසතාණෝ සප්තවිධ රත්නයන් හා සමඟ සියලු චක්‍රවර්ති සම්පත්තිය බුදුන්ට පුද සසුන් වැද මහණ ව ධ්‍යාන උපදවා බ්‍රහ්මලෝකයෙහි උපන්හ.

මෙසේ ජාතියෙන් ජාතියෙහි සංසාරගත ව ඇවිදිනා[8] වූ අප මහබෝසතාණෝ තව ද එම සර්වභද්‍ර නම් අසංඛ්‍යයෙහි ලොව පහළ වූ පනස්දහසක් පමණ සර්වඥවරයන් හා දෙවන සර්වඵුල්ල නම් අසංඛ්‍යයෙහි අසූදහසක් පමණ සර්වඥවරයන් හා තුන්වන සර්වරත්න නම් අසංඛ්‍යයෙහි අනූදහසක් පමණ සර්වඥවරයන් හා සතරවන උසභස්කන්ධ නම් අසංඛ්‍යයෙහි සැත්තෑදහසක් පමණ සර්වඥවරයන් හා පස්වන මාණිභද්ද නම් අසංඛ්‍යයෙහි සැටදහසක් පමණ සර්වඥවරයන් හා සවන පදුම නම් අසංඛ්‍යයෙහි විසිදහසක් පමණ සර්වඥවරයන් හා සත්වන උසභ නම් අසංඛ්‍යයෙහි දසදහසක් පමණ සර්වඥවරයන් හා අටවන ඛන්ධත්ව නම් අසංඛ්‍යයෙහි පන්දහසක් පමණ සර්වඥවරයන් හා නවවන සර්වශෛල[9] නම් අසංඛ්‍යයෙහි දෙදහසක් පමණ සර්වඥවරයන් හා මෙසේ මේ නවාසංඛ්‍යය

---

1. ලොවට අනුග්‍රහ - BKL මුද්‍රිත හැම, ශ.
2. ගෙනහැර (නැත) - BI
3. සිරි - I
4. බුදුවන්නාවාදැයි -CDEFJ
5. විවරණක්ම - BGHIKL
   විවරණ පමණක් - CJ
6. හවිස්සසි - මුද්‍රිත හැම
7. බුද්ධකාරක - I
8. ඇවිදිනාවූ - ACEF
   ඇවිදිනාහු - I
9. සර්වසෙල - පිටපත් හැම

Non-Commercial Distribution

ඇතුළත ලෝකයෙහි පහළ වූ තුන්ලක්‍ෂ සතාසූදහසක් පමණ සර්‍වඥවරයන් දැක බුදුබව පතා අපමණ වස්තු පරිත්‍යාගයෙන් මහදන් පවත්වා වාක්ප්‍රණිධානය මස්තකප්‍රාප්ත කළහ. වදරන ලද මැයි,

සබ්බභද්දො ච ඵුල්ලො ච - රතනොසභක්ඛන්ධකො,
මාණිභද්දො ච පදුමො - උසභො ඛන්ධත්තමෙව ච

සබ්බසෙලො අසංඛෙය්‍යා - නවමොති පවුච්චති,
වචසා පත්ථනා මය්හං - නිද්දිට්ඨාසංඛියා ඉමෙ.

තෙසු නව අසංඛෙසු - ජාතා ලොක[1]හිතෙකතො,
තීනි සතසහස්සානි - සතනාසීති සහස්ස ච

එත්තකානං මහෙසීනං - වචසා පත්ථනෙ[1] තද,
දනෙ මෙ සමො නත්ථි - එසා මෙ දනපාරමී - යි.

මෙසේ අනේකාදිනවයෙන් ගැවසී ගත්තාවූ සංසාර ව්‍යසනාපන්න ව[2] නොයෙක් දුක් විඳුනා සත්‍වවර්ගයා දැක ඔවුන් කෙරෙහි උපන්නා වූ මහකුලුණු ඇති ව, බුද්ධො බොධෙය්‍යං, සුද්ධො සොධෙය්‍යං, අස්සත්ථො අස්සත්ථාපෙය්‍යං, යනාදීන් පරවැඩ පිළිබඳ ව යොමු කරන ලද චිත්තසන්තානයන් ඇත්තා වූ ප්‍රඥාසම්පන්න උත්තම සත්‍වයෝ අනන්ත කල්පකාලයක් මුළුල්ලෙහි නිරන්තරයෙන් මහාවීර්‍ය්‍ය කොට දන මානනාදි වශයෙන් බොහෝ කුශලසම්භාරයන් පුරමින් සත්‍වයන්ට හිතසැප ම සොයන්නාහ. සියලු ප්‍රාර්ථනාවෙන් බුදුවෙමියි කරන ප්‍රාර්ථනාවට වඩනා උතුම් වූ ප්‍රාර්ථනාවකුදු නැත් මය. එසේ හෙයින් පින්වත් වූ සත්පුරුෂයන් විසින් ආත්මාර්ථපරාර්ථ සංඛ්‍යාත සියලු හිත සිද්ධ කිරීමට ඒකාන්තකාරණ වූ සම්‍යක්සම්බෝධි සමධිගමය පිණිස රෑ දෙවෙහි[3] නොපමා ව අනවරතයෙන් වීර්‍ය්‍ය වඩා බෝධිසම්භාරධර්‍මයන් පිරීමෙහි උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි,

එවං පරත්ථ පටිබද්ධමනා සපඤ්ඤා
සත්තා හි සත්තහිතමෙව ගවෙසයන්ති,
සාධූහි තෙන සපරත්ථහිතස්ස ඨානං
බොධාගමාය විරියං කරණීය මෙව යි

මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි
නිදාන වර්ග නම් වූ
දෙවන පරිච්ඡේදය නිමි.

1. ලොකෙ - H
2. ව්‍යසනාපන්න -ADE
3. දෙවේලෙහි - ABDF

Non-Commercial Distribution

තවද මේ සද්ධර්මාලංකාරයෙහි තුන්වන අභිනීහාර වර්ගය නම් කවර යත්

මෙසේ අප මහ බෝසතාණෝ මනෝප්‍රණිධානය පිරීමෙන් සතාසංඛ්‍යයක්[1] හා වාක්ප්‍රණිධානය පිරීමෙන් නවාසංඛ්‍යයක්[2] හා ඇතුළුව සොළොසාසංඛ්‍යයක් ඇතුළත ලොව පහළවූ පස්ලක්‍ෂ[3] දෙළොස් දහසක් සර්‍වඥවරයන් දැක බොහෝ පින් රැස්කෙරෙමින් මස්තකප්‍රාප්ත කළාවූ මනෝවාක්ප්‍රණිධාන[4] ඇති ව බුධකාරකධර්‍මයන් සොයා සසර ඇවිදුනාහු මැත භාගයෙහි සාරාසංඛ්‍යයකප්ලක්‍ෂයක් ඇතුළත ලොව පහළවූ සූවිසි බුදුකෙනකුන් දැක සූවිසි ප්‍රාර්ථනාවක්කොට සූවිසි විවරණයක් ලදහ. ඒ හැම මෙතැන්හි විස්තර වශයෙන් දක්වත් ඉතා බෙහෙව. එබැවින් විස්තර වර්ණනාව හැර විවරණ කථා මාත්‍රයක් ගෙනහැර දක්වමි. සත්පුරුෂයන් විසින් සාවධාන ව ඇසිය යුතු. හේ කෙසේද යත්?

මේ මහා භද්‍රකල්පයට සාරාසංඛ්‍යය කප්ලක්‍ෂයකින් යට සර්‍වඥවරයන් සතරදෙනකුන් වහන්සේගෙන් ප්‍රතිමණ්ඩිතවූ සාරමණ්ඩ නම් කල්පයෙක්[5] විය. ඒ කප තණ්හඞ්කරය මේධඞ්කරය සරණඞ්කරය දීපඞ්කරය යි සර්‍වඥවරයෝ සතර දෙනෙක් ලොව පහළ වූහ. එයින් සොළොසාසංඛ්‍යය කප්ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇතිව තුසීපුර පැමිණ දෙව්බඹුන්ගේ අයදමෙන් දඹදිව පුෂ්පවතී නම් නුවර අමන්ද[6] වූ යස ඉසුරු ඇති සුනන්ද නම් රජහු නිසා සුනන්ද නම් බිසොව කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් මවුකුසින් බිහි ව ක්‍රමයෙන් වැඩී දස දහසක් අවුරුදු ගිහිසැපත් වළඳ සතර පූර්‍වනිමිත්ත දැක මහභිනික්මන් නික්ම මහණ ව සත්දවසක් මහාවීර්‍ය්‍ය කොට රුක්අත්තන බෝමුල්හි වැඩහිඳ මරසෙනඟ බිඳ බුදු ව සත්වානුග්‍රහකොට අවුරුදු ලක්‍ෂයක් ආයිරි වළදා වැඩසිටි තණ්හංකර[7] බුදුරජාණන්වහන්සේය. නව ද ඔබට ඉක්බිති එම කප දෙවන අන්තඃකල්පයෙහි අටාසංඛ්‍යයකප්ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇතිව තුසීපුර පැමිණ දෙවුබඹුන්ගේ අයදමෙන්[8] දඹදිව මැද මඩුල්ලෙහි[9] මේඛලා නම් නුවර සම්මුති දෙව වූ සුදේව නම් රජහුගෙන් යශෝධරා නම් අග බිසොව කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් මවුකුසින් බිහි ව ක්‍රමයෙන් වැඩී අට දහසක් අවුරුදු ගිහිසැපත් විඳ මහභිනික්මන්කොට මහණ ව අඩමසක් ප්‍රධන්වීර්‍ය්‍යකොට කැලබෝමුල්හි වැඩහිඳ මාරාන්ධකාර ප්‍රබන්ධ විධ්වංසනයකොට සර්‍වඥපදප්‍රාප්ත ව[10] සද්ධර්මාලෝක පතුරුවා අනූදහසක් අවුරුදු ආයිරි වළඳ ලෝවැඩ වඩා වැඩසිටි[11] මේධංකර නම් බුදුරජාණන් වහන්සේ ය. නව ද ඔබට ඉක්බිතිව එම කප තුන්වන අන්තඃකල්පයෙහි අටාසංඛ්‍යය කප්ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇති ව තුසී පුර පැමිණ දෙවුබඹුන්ගේ අයදමින්[8] දඹදිව විපුල නම් නුවර අභිමංගල සම්මත වූ සුමංගල නම්

---

1. සතාස සංඛ්‍යකල්ප ලක්‍ෂයක් - BGHIKL
   සත් අසංඛ්‍ය කප් ලක්‍ෂයක් - ක.කි.ඤ
2. නවාසංඛ්‍යකල්ප ලක්‍ෂයක් - BGHIKL
   නවාසංඛ්‍යකප් ලක්‍ෂයක් - ක.ඤ
3. පලක්‍ෂ - L
4. වර්‍යප්‍රණිධාන - ACEJ
5. කල්පයක් - I
6. නොමඳ -GHIKL ස.
   අමඳ - J
7. තණ්හංකර නම් - ACFGJ
8. වරහන් තුළ පාඨය පිටපත්හි නැත
9. දඹදිව (නැත) - AJ
10. කොට - GI
11. ලෝවැඩ වඩා සිටි - ACDEFGHJK

Non-Commercial Distribution

රජහුගේ යශවතී නම් අග බිසොව කුස පිළිසිඳ දසමස් පිරුණු සඳ[1] බිහි ව ක්‍රමයෙන් වැඩී සත් දහසක් අවුරුදු ගිහිසැපත් විඳ මහබිනික්මන් නික්ම මහණ ව මසක් පමණ කල් මහාවීර්‍ය්‍ය කොට පුලිල බෝමුල්හි වැඩහිඳ මරසෙනඟ ලුහුබඳවා බුදු ව දම්සක් පවත්වා සත්ත්වානුග්‍රහකොට අසූදහසක් අවුරුදු ආසිරි වළඳ වැඩසිට නිවන් පුර පිරූ සරණංකර බුදුරජාණන් වහන්සේය යන තුන් බුදුන් සමයෙහි[2] යට කියනලද අප මහබෝසතාණෝ සම්‍යක් සම්බුද්ධ රාජ්‍යය[3] පතා දානමානාදී වශයෙන් බොහෝ කුශලසම්භාරයන් රැස්කොට ද මනුෂ්‍යාත්මභාවාදි වූ අෂ්ටධර්ම සමෝධානයාගේ අසම්භවය නිසා අනියත විවරණ පමණක් ම ලදහ.

තව ද ඔබට ඉක්බිති ව එම සාරමණ්ඩ නම් කප සතර වන අන්තඃකල්පයෙහි බෝධිසම්භාර පූරණයෙන් මස්තකප්‍රාප්ත ව සිටි දීපංකර නම් බුදුරජාණන්වහන්සේ තුසීපුර, පැමිණ දෙව්බඹුන්ගේ අයදමින්[4] දඹදිව මධ්‍යමණ්ඩලයෙහි රම්‍යවතී නම් නුවර සුදේව නම් රජහු නිසා සුමේධා නම් අගබිසොව කුස පිළිසිඳ දස එකධමස් ඇවෑමෙන් මවුකුසින් බිහි ව යෞවන අවස්ථාවට පැමිණ හංසය කොඤ්චය මයූරය යන තුන් මාළිගාවෙහි දස දහසක් අවුරුදු මුළුල්ලෙහි සුරඟනන් බඳු වරඟනන් පිරිවරා දිව්සැපත් වැනි රජසැපත් විඳ ස්ත්‍රීන්[5] ලක්ෂයකට ප්‍රධාන වූ පියුම් නම් අග බිසොව කුසින් උසභක්ඛන්ධ නම් පුත්රුවන වැදූ දිනයෙහි සුවාසූ දහසක් ඇතුන් විසින් පිරිවරනලද මඟුලැත් වාහනයකින් මහබිනික්මන් නික්ම පුරුෂයන් කෙළක් හා සමඟ මහණව දසමසක් ප්‍රධන්වීර්‍ය්‍ය කොට හැම සර්වඥවරයන්ගේ බුදුවීමට ඒකාන්ත නියත වූ වෙසහ මැදි පොහෝදවස් මහණගණයා පිරිවරා නගරාන්තරයකට සිහා වැඩ දේවතා කෙනකුන්ට පිළියෙල කළ කිරිබතක් පිළිගෙන තමන්වහන්සේට පැමිණි කොටස්හි දේවතාවන් අමෝජස්[6] බහාලූ කල්හි එකුන්පනස් පිඩක්කොට වළඳ නිල්තරා[7] හෝ අස සුපිපි සල්උයන්හි දහවල් දවස් යවා සවස් වේලෙහි ගණයා හැර සුනන්ද නම් ආජීවකයා දුන් හීතණ අටමිටක් ගෙන පුලිල බෝධීන්වහන්සේ කරා එළඹ[8] හීතණ සලා වගුරුවා අතුරියන් උස බෝකඳට පිටලා සම්පනස්රියන් වජ්‍රාසන මස්තකයෙහි චතුරංග වීර්‍ය්‍යාධිෂ්ඨානයෙන් පළක් බැඳ වැඩහිඳ මරසෙනඟ ප්‍රලයකොට බුදු ව සත්සති යවා බ්‍රහ්මාරාධනා පිළිගෙන සුනන්දාරාමයෙහි දහම්සක් පවත්වා ක්‍රමයෙන් සුමංගලය තිස්සය යන අග්‍රශ්‍රාවක යුග්මයක් හා නන්දය සුනන්දය යන අග්‍රශ්‍රාවිකා යුග්මයක් ඇතිව සාගර නම් භික්ෂු කෙනකුන්ගෙන්[9] උපස්ථාන ලදින් අවුරුදු ලක්ෂයකට ආසිරි ඇතිව අසූරියන් උස බුදුබඳින් මුළුලොව බබුළුවමින් සාරලක්ෂයක් රහතන් විසින් පිරිවරනලදු ව දනව් සැරිසරා රඹගම් නුවර සමීපයෙහි සුදර්ශන නම් විහාරයට වැඩ දහම් වැසි වස්වා වැඩවසන සඳ අශ්‍රැතපූර්ව වූ සද්ධර්මය අසා පහන් සිත් ඇත්තාවූ රඹගම්නුවර වැසියන් විසින් බුදුපාමොක් මහසඟපිරිසට ආරාධනා කොට දෙවන දවස් උදසන මඟ සරහනු සඳහා කැති උදලු යහුල්

---

1. දසමස් ඇවෑමෙන් - ACJ
2. සමයෙහිම - BGHIKL
3. රාජ්ජය - ACDEFGHIJ
4. අයදමෙන් - I
5. ස්ත්‍රී -BDFGHIKL
6. ඕජස - ABCDEGHJKL
7. නිල්තල - A
   නිල්දලා - මුද්‍රිත ස.
8. පැමිණ - BGHIKL
9. කෙනෙකුන්ගේ - B

Non-Commercial Distribution

කුන්තානි[1] පුවරු පොරෝ කුඩා ආදි වූ කර්මාන්ත උපකරණ ගෙන මහත් වූ සන්තෝෂයෙන් පිනපිනා නොයෙක් දහස්ගණන් ඔල්වර හඬ ගසමින් සාධුකාර දෙමින්[2] කටු පහණ කොට මහ සරහමින් වළ ගොඩ සම කෙරෙමින් පුදුවැලි ගෙනහැර තනමින් තොරණ ලමින් දෙපස තිරිකුඩම් තනමින් වට වැට පහන් ලමින් නානා වර්ණ ධ්වජ පතාක නංවමින් මෙසේ සතුටු සතුටු ව එක පැහැර මහ සරහන්නට පටන්ගත් කල්හි[3] :

නගරෙ අමරවතියා - සුමෙධො නාම බ්‍රාහ්මණො,
අනෙක කොටි සන්නිචයො - පහූත ධන ධඤ්ඤවා

යනු හෙයින් අප මහ බෝසතාණෝ යටකියනලද පරිද්දෙන් පූර්ව සර්වඥවරයන් කෙරෙහි කරනලද මනෝවාක්ප්‍රණිධාන ඇති ව පාංශුවෙන් ප්‍රච්ඡන්නවූ දෑ රහමිණිරුවනක් සේ සංසාරගත ව වසනුවෝ එකල අමරවතී නම් නුවර නොයෙක් කෙළගණන් වස්තු ඇති බමුණු මහසල් කුලයෙක[4] සුමේධ නම් බ්‍රාහ්මණකුමාර ව [ඉපද] වැඩිවිය පැමිණ මවුපිය දෙදෙනා[5] ඇවෑමෙන් තමන් සන්තක සියලු ධනරාශිය යාචකයන්ට දන් දී හිමවුපියසට එළඹ ධම්මක[6] නම් පර්වතයක් මුදුනෙහි සක්දෙවිඳු[7] මවාදුන් පන්සලට වැද තවුස්වෙස් ගෙන පැවිදි වූ සතියක් ඇතුළත පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ධ්‍යාන සුවයෙන් දවස් යවන්නාහු එදවස් තමන්[8] හුන් ආශ්‍රමපදයෙන් නික්ම ආකාශයට පැනනැගී ක්‍රමයෙන් මනුෂ්‍යපථයට පැමිණ රම්‍යගම් නුවර මුදුනෙන් යනුවෝ මහත් වූ සන්තෝෂයෙන් යුක්ත ව[9] මහ සරහන්නාවූ මනුෂ්‍යයන් දැක ආකාශයෙන් බැස ඔවුන් කරා එළඹ 'මෙසේ මනහරකොට මේ මාර්ගය කාට සරහා දැ'යි[10] විචාරා 'තුන්ලොවට අසහාය ප්‍රදීපයක් බඳු වූ දීපංකර නම් බුදුරජාණන්වහන්සේ අද පෙරවරු වළඳන වේලාවට[11] මේ නුවරට වඩනා සේක. එසේ හෙයින් මේ මාර්ගය සරහා පිළියෙල කරම්හ'යි කී කල්හි බුද්ධහුය යන නම අසමින් ම පස්වනක් ප්‍රීතින් පිනාගිය ශරීර ඇති ව 'සැබවින්[ම] බුදුකෙනකුන්ට සරහන මාර්ගයෙක් වී නම් මට ද මෙයින් භාගයක් දෙව'යි ඉල්වා සිහිල් දිය පිරි[12] ගැඹුරු[13] අඳුරු කඳුරැළියක් ලදින් තමන්ට[14] පැමිණියාවූ ඒ මාර්ගභාගය සරහා නොනිමන තෙක් ම :

දීපඞ්කරො නාම ජිනො ස යඩෙසා
රම්මං පුරං යාති විරොචමානො,
මනුස්ස දෙවෙහි සුපූජ්‍යමානො
සහස්ස රංසි විය භානුමා නභෙ

1. කුන්තාලි - BDGH
2. දෙවමින් - ACFG
3. පටන්ගත්හ - L
4. කුලයක ඉපද - BGHIKL- ක.නි.සඳ.බෙ.ස.
5. දෙදෙනාගේ -BGHI - ක.කි.සඳ.
6. ධාර්මික - BCI ධර්මික - K
   ධාරිමික - GH
7. සක්දෙව් රජහු විසින් - BGHIKL
   සක්දෙව් - A
8. තමා - ACJ
9. සන්තෝෂයට පැමිණ - BGHIKL
10. සරහවු දැයි - IKL
11. වේලාව - BEH
12. පිරූ - B
13. ගැඹුරුවූ - AJ
14. තමන් තමන්ට - ACEHJ බෙ.

Non-Commercial Distribution

යනු හෙයින් තමාගේ දහස් ගණන් රශ්මි කදම්බයන් දසදිග විහිදුවමින් ලොව පතළ[1] ගණඳුරු විදහා නභොමණ්ඩල මධ්‍යයට පැමිණ බබළන්නාවූ සහස්‍රකිරණයා සේ නීල පීත ලෝහිතාදි වූ[2] සවනක් ඝන බුදුරසින්[3] දසදිග බබුළුවමින් සත්කුලපව් පිරිවැරූ ස්වර්ණමේරුරාජයා සේ සාරලක්‍ෂයක් රහතුන් පිරිවරා දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණ යක්‍ෂ රාක්‍ෂස සිද්ධවිද්‍යාධර නරේන්‍ද්‍රාදීන් විසින් පුදනලදු ව අපමණ පුදපෙරහරින් වැඩියාවූ බුදුරජාණන්වහන්සේ දැක තමන්ට නියත වූ[4] මාර්‍ගභාගය ද සරහා නොනිමි හෙයින් 'පිරිවර හා සමඟ මේ උතුමාණන් වහන්සේ කලල් මඩ නොමැඩ වඩනාසේක්ව'යි සිතා දොඹමල් ඇතිරියක් හා සමාන වූ අඳුන් දිවිසම්[5] මඩ මත්තෙහි අතුට බුදුන් දසාවට හිස ලා 'මම ද මේ බුදුන් සේම ලොවුතුරා බුදු ව සුවිසි අසංඛෙය්‍යයක් සත්වයන් නිවන් දැක්විය හෙම්ව'යි මෙසේ බුදුබව පතා දිවි පුද බුදුන්ට හොයක් ව හොත්තාවූ තමන්ගේ අදහස් දැන එදවස් අෂ්ටධර්ම සමෝධානය සිද්ධවූ හෙයින් එවේලෙහි දීපංකර බුදුරජාණන්වහන්සේ විසින් :

පස්සථ ඉමං තාපසං - ජටිලං උග්ගතාපනං,
අපරිමෙය්‍යො ඉතො කප්පෙ - අයං බුද්ධො භවිස්සති

යනාදීන් කැටිව වඩනා රහතුන්වහන්සේට ආමන්ත්‍රණය කොට 'එම්බා මහණෙනි, උග්‍රවූ තපො තේජස් ඇති මේ සුමේධ තාපසයන් බලව, මූ තුමූ ශ්‍රාමක කෙනෙක් නොවෙති. මෙයින් මතු සාරසංඛ්‍යය කප්ලක්‍ෂයක් ගියකල මා සේම ලොවුතුරා බුදුවෙති. මොවුන් බුදු වන ජාතියෙහි උපදනා නුවර කපිලවස්තු නම් වෙයි. ශුද්ධෝදන නම් රජෙක් පිය වන්නේය. මහාමායා නම් බිසොවක් මව් වන්නීය. බෝධි වන්නේ ඇසතු වෘක්‍ෂයෙක. මූ තුමූ ගෞතම නම් වෙති. කෝලිතය උපතිස්සය යන මහා ශ්‍රාවකයෝ දෙදෙනෙක් අගසව් වෙති. ඛේමාය උත්පලවර්ණාය යන මෙහෙණින්නෝ දෙදෙනෙක් අග්‍රශ්‍රාවිකා වෙති. ආනන්ද නම් මහතෙර කෙනෙක් [අග්‍රො] පස්ථායක වෙති' යනාදීන් එකල දෙන ලද මේ පළමුවන නියත විවරණය ලදින් සතුටුවූ මහබෝසතාණෝ බුද්ධකාරක ධර්මයන් පරීක්‍ෂා කොට දානය ශීලය නෛෂ්ක්‍රම්‍යය ප්‍රඥය වීර්‍ය ක්‍ෂාන්තිය සත්‍යය අධිෂ්ඨානය මෛත්‍රිය උපේක්‍ෂාය යන දසපාරමිතාවන් දැක එකි එකී පාරමිතාවක් ම[6] ලක්‍ෂණ රස ප්‍රත්‍යුපස්ථාන[7] පදස්ථාන[8] වශයෙන් නිශ්චය කොට බලා දෘඪසමාදානය කළහ. ඒ බව හඟවනු පිණිස දක්වනලදමැයි අපගේ ගුරුපාධ්‍යාය වූ ධර්මකීර්ති මහා ස්වාමිපාදයන්වහන්සේ[9] විසින් සුවිසි විවරණයෙහි :

තණ්හඞ්කරො සකිරණො හරිණඞ්කවණ්ණො
මෙධඞ්කරො සරනනො රතනාලයො සො,

---

1. පතළ - BGHIKL
2. ලෝහිතාවදාතාදිවූ - මුද්‍රිත හැම ස.
3. බුද්ධ රශ්මීන් - AFJ
4. නියමවූ - H
5. සමක් - ACDEFJ-ස.
6. පාරමිතාවන් ම - AGHJKL ක.කි.ඤ.
   පාරමිතාවන් - I
   පාරමිතාවක ම - F
7. පච්චුප්පට්ඨාන - පිටපත් හැම
8. පදට්ඨාන - BGHI, පදස්ථාන (නැත) - K
9. වහන්සේ (නැත) - ACDEFJ

Non-Commercial Distribution

සරණඞ්කරො රතිකරො රතනාවලිනෙ
දීපඞ්කරො දිනකරො විහතන්ධකාරො

චත්තාරිමානි විසරා චතුරොසතිණ්ණා
චත්තාරි සීස පවරා චතුරිද්ධිපාද,

එකෙ යුගෙ සමුහතුං වියුගා වියොගා
යො බොධිසත්ත රතනො සුගතෙසු තෙසු

දීපඞ්කරං ජිනවරං[1] තිභවෙක දීපං
දිස්වා සජීවිත තනුම්පි පරිච්චජිත්වා

අට්ඨංගිකො යති සයිත්ථ ස කද්දමස්මිං
බුද්ධො භවෙය්‍යමිති චාරුතරො සුමෙධො - යි.

තව ද ඒ දීපංකර නම් බුදුන් ඉක්බිති ව බුධශූන්‍ය වූ කප් අසංඛ්‍යයක් ගිය කල මෙකපට[2] තෙයාසංඛ්‍යය කප්ලක්‍ෂයකින් යට සාර නම් කල්පයෙහි බුදුබව පතා සොළොසාසංඛ්‍යය කප්ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇති කොණ්ඩඤ්ඤ නම් බුදුරජාණන්වහන්සේ තුසීපුර පැමිණ දෙව්බඹුන්ගේ අයදමෙන් දඹදිව රම්‍යවතී නම් නුවර සුනන්ද නම් රජහුගේ සුජාතා නම් අග බිසව කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් බිහි ව ක්‍රමයෙන් වැඩී රාමය සුරාමය ශුභය යන තුන් ප්‍රාසාදයෙහි දස දහසක් අවුරුදු ගිහිසැපත් වළඳ තුන් ලක්‍ෂයක් පුරඟනන්ට[3] ප්‍රධාන වූ රුචි නම් බිසව කුසින් විජිතසේන නම් පුත්රුවන වැදූ දිනයෙහි අජානීය[4] සෛන්ධවයන් යෙදූ මංගලරථ වාහනයෙකින්[5] මහාභිනික්මන් නික්ම දසකෙළක් පුරුෂයන් හා සමඟ මහණ ව දසමසක් ප්‍රධන් වීර්‍ය්‍යකොට බුදුවන දවස් [සුනන්ද][6] නම් ගම සමාහිත සන පයෝද්‍රයන් ඇති යශෝධරා නම් සිටුදූව[7] දුන් කිරිබත වළඳ සල්වනෙහි දිවා විහාර කොට සවස් වේලෙහි සුනන්ද නම් ආජීවකයා දුන් කුසතණ අටමිටක් ගෙන සල්කලණ බෝධීන්වහන්සේ කරා එළඹ කුසතණ බිම සළා වගුරුවා අටපනස් රියන් තණඇතිරි මතුයෙහි බෝකඳට පිටලා වැඩහිඳ බුදු ව සත්සති යවා බ්‍රහ්මාරාධනා පිළිගෙන දේවවන නම් උයන්හි දහම්සක් පවත්වා ක්‍රමයෙන් භද්‍රය සුභද්‍රය යන අගසව් යුගළයක් හා තිස්සාය උපතිස්සාය යන අග්‍රශ්‍රාවිකා යුගළයක් ඇති ව අනුරුද්ධ නම් මහතෙර කෙනකුන් අතින් උපස්ථාන ලදින් අවුරුදු ලක්‍ෂයකට ආයිරි ඇති ව අටාසුරියන් බුදුබඳින් මුළුලෝ හොබවා කෙළලක්‍ෂයක් රහතුන් පිරිවරා දනව් සැරිසරනා සේක් චන්ද්‍රවතී නම් නුවරට වැඩිසේක.[8] එකල අප මහබෝසතාණෝ එම චන්ද්‍රවතී නම් නුවර විජිතාවී නම් සක්විතිරජ ව සතර මහාද්වීපයෙහි ඒකාතපත්‍ර ව චක්‍රවර්තිරාජ්‍යය කෙරෙමින් ශක්‍රදේවේන්ද්‍රලීලාවෙන් වසනුවෝ බුදුන් වැඩිබව අසා මහත් වූ සොම්නසින් පින පිනා අවුත් බුදුන් වැඳපුද කෙළලක්‍ෂයක් වස්තු වියදම්කොට විහාරයක් කරවා පිළිගන්වා බුදුන් පවරා වස් සාරමස මහදන් දී දහම්වැයි වස්වා වස් ඉක්බිති කෙළලක්‍ෂයක් රහතුන් හා සමඟ බුදුන්ට ලක්‍ෂ සුවහස් වටනා සළුපිරිකර දන් දී බුදුබවට අභිනීහාර කොට සසුන් වැද මහණ ව යට කියනලද පරිද්දෙන් මේ දෙවන විවරණය[9] ලදහ. දක්වනලදමැයි සුවිසි විවරණයෙහි:

1. දිනකරං - C, දිනවරං - I
   මුනිවරං - ක.කි.කැ.බෙ.ස.
2. කල්පයට - ACDEFJ
3. වරඟනන්ට - මුද්‍රිත හැම ස.
4. අජානෙය - DG - මුද්‍රිත හැම
5. යානකින් - I
6. සුරින්ද - පිටපත් හැම
7. සිටුදුවක් - DFG
8. වන්සේක - BGHIKL
9. විවරණ - ACGH

Non-Commercial Distribution

ආසාළ්හසමානමඛිලං ජනතාලිපාලිං
කොණ්ඩඤ්ඤ නාම ම සමං මුනිපුණ්ඩරීකං,
දිස්වාන කොටිසතලක්ඛමුදරදනං
බුද්ධායදසි පවරො විජිතාවි රාජා - යි.

තව ද ඒ කොණ්ඩඤ්ඤ නම් බුදුන්[1] ඉක්බිති බුධශූන්‍ය වූ කප් අසංඛ්‍යයක් ගිය කල්හි මේ කල්පයට දෙයාසංඛ්‍යය කප්ලක්‍ෂයකින් යට සාරමණ්ඩ නම් කප මංගලය සුමනය රේවතය සෝභිතය යන සර්‍වඥවරයෝ සතරදෙනෙක් ලොව පහළ වූහ. ඒ සර්‍වඥවරයන් අතුරෙන් විශ්වලෝකෛකමංගල වූ මංගල නම් බුදුරජාණන්වහන්සේ සොළොසාසංඛ්‍යය කප්ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇති ව තුසීපුර පැමිණ දෙව්බඹුන්ගේ[2] අයදමෙන් දඹදිව උත්තරා[3] නම් නුවර උත්තර නම් රජ්හුගේ උත්තරා නම් අගබිසව කුස පිළිසිඳ එදවස් පටන් මැණියන් ඇඟින් නිකුත් රසින්[4] අසූරියන් ගෙයි පහන් නොනංවා අඳුරු දුරු කොට දැරහ මිණිරුවනක් සේ ඊ දෙවෙහි[5] ඒකාකාරයෙන් වැස මව්කුසින් බිහි ව යෞවන අවස්ථාවට පැමිණ යසවන්තය සුචිමන්තය[6] සිරිමන්තය[7] යන තුන් පායෙහි නව දහසක් අවුරුදු රාජ්‍ය ශ්‍රී විඳ තිස්දහසක් පුරඟනන්ට ප්‍රධානවූ යශවතී නම් බිසව කුසින් ශීලව නම් පුත්රුවන වැදූ දිනයෙහි[8] අශ්ව[9] වාහනයකින් මහභිනික්මන්කොට තුන් කෙළක් පුරුෂයන් හා සමඟ මහණ ව අටමසක් මහාවීර්‍ය්‍යකොට බුදුවන දිනයෙහි උත්තරා නම් ගම උත්තරා නම් සිටුදුව දුන් කිරිබත වළඳා සල්උයන්හි දහවල්[10] කල්යවා සවස් වේලෙහි උත්තර නම් ආජීවකයා දුන් හීතණ අටමිටක් ගෙන නාගබෝධීන් වහන්සේ කරා එළඹ අටපනස්රියන් තණඇතිරි මත්තෙහි වැඩහිඳ මාර තිමිර නිරාකරණය කොට බුදු ව සත්සති යවා බ්‍රහ්මමුහුතීයෙහි ම සිරිමන්තු[11] නම් උයන්හි දහම්සක් පවත්වා සුදේවය ධම්සේනය යන අගසව් දෙදෙනකු හා සීවලීය අශෝකාය යන අග්‍රශ්‍රාවිකා දෙදෙනකු ඇති ව පාලිත නම් මහතෙරකෙනකුන්ගෙන් උපස්ථාන ලදින් අසූදහසක් අවුරුද්දට ආසිරි ඇති ව අසූරියන් උස බුදුබඳින් දසදහසක් සක්වළ එකාලෝක කොට බබුළුවමින් කෙළ ලක්‍ෂයක් රහතන් පිරිවරා දනවු සැරිසරනසේක් දඹදිව මේඛලා නම් නුවරට වැඩි සේක. එකල අප මහ බෝසතාණෝ සද්ධර්මෙකරුචි[12] වූ සුරුචි නම් බ්‍රාහ්මණ ව මහධනී ව වසනුවෝ බුදුන් කරා එළඹ බණ පහන් සිත් ඇති ව බුදුන් ප්‍රධාන කොට ඇති කෙලලක්‍ෂයක් මහ සඟපිරිසට ආරාධනාකොට වඩා ගෙනගොස් සක්දෙවිඳු මවා දුන් අටසාලිස් ගවු දිග පුළුල ඇති සත්රුවන්[13] මණ්ඩපයෙක වඩා හිඳුවා සත්දවසක් මුළුල්ලෙහි ගවපාන දනයයි

1. බුදුන්ට - B
2. දෙව්බඹුන් - GHI
3. උත්තර - IJ, ක.කි.ඤ.ම.
4. ඊසින් - GHI
5. දෙවේලෙහි - ABDF
6. සුචිමන්ත - ADEFJ
සුචිවන්තු -BCGHIKL,
සුචිමන්තු - මුද්‍රිත
7. සිරිමන්ත - DJKL
සිරිවන්ත - ABGHI,
සිරිවස්තු - මුද්‍රිත
8. ද - GHKL බෙ. ස.
දවස් - I
9. අස් - ACDEFIJ
10. දවකල් - CFHJ
11. සිරිවත - ACDEJ
සිරිවන්ත - BGHIKL
12. සද්ධර්මකරුචි - ABEFGH,
සද්ධර්මෙරුචි - I
සද්ධර්මරුචි - මුද්‍රිත හැම
13. රුවන් - I

Non-Commercial Distribution

ප්‍රසිද්ධ වූ පැන් නුමුසු කිරිබතක් දන් දී කෙළවර දවස් බුදුන්ට අනැගි වූ අටපිරිකරක් හා කෙළලක්‍ෂයක් රහතන්ට කෙළලක්‍ෂයක් පාත්‍ර පුරා ගිතෙල් මී උක්සකුරු ආදී වූ බෙහෙත් බඩු හා සමග කෙළලක්‍ෂයක් සිවුරු පිරිකර දී බුදුබව පතා ඔබගෙන් මේ තුන්වන විවරණය ලදහ. දක්වනලද මැයි :

දෙහාහමාලාය නමං ගිලනනං[1]
භුමඞ්ගලං මඞ්ගල නාම නාථං,
සත්‍යාහ මත්තං ගවපාන දනං
පූජෙසි ජේනාය සුරුචිනො සො-යි

තව ද ඒ මංගල නම් බුදුන්[2] ඉක්බිති බුධාන්තරයක් ගියකල්හි එම කප සුමන නම් බුදුරජාණන්වහන්සේ අටාසංඛෙය්‍යය කප්ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇති ව තුසීපුර පැමිණ දෙව්බඹුන්ගේ අයදමෙන් දඹදිව මේඛලා නම් නුවර සුදත්ත නම් රජහුගේ සිරිමා නම් අගබිසොවුන්[3] කුස පිළිසිඳ බිහි ව ක්‍රමයෙන් වැඩී චන්‍දය සුචන්‍දය වටසංකය යන තුන් ප්‍රාසාදයෙහි නවදහසක් අවුරුදු රජසිරි විඳ තෙසැට දහසක් පුරඟනන්ට නායක වූ වටංසකා නම් බිසොව කුසින් අනුපම නම් පුත්රුවන වැදූ දිනයෙහි ඇත්වාහනයෙකින් මහභිනික්මන් නික්ම තිස් කෙළක් පුරුෂයන් හා සමග මහණ ව දසමසක් ප්‍රධන්වීර්‍ය්‍ය කොට බුදුවන දවස් අනුපම නම් ගම අනුපම නම් සිටු දුව දුන් කිරිබත වළඳ අඹවෙනෙහි දිවාවිහාර කොට සවස් වේලෙහි අනුපම නම් ආජීවකයා දුන් තීතණ අට මිටක් ගෙන නාග බෝධීන්වහන්සේ කරා එළඹ තිස්රියන් තණඇතිරියෙහි වැඩහිඳ බුදු ව සත්සති යවා බ්‍රහ්මාරාධනාවෙන් මේඛලා නම් උයන්හි දහම්සක් පවත්වා සරණය භාවිතත්තය යන අගසවු දෙනමක් හා සෝණය උපසෝණය යන අග්‍රශ්‍රාවිකා යුග්මයක් ඇති ව උදේන නම් මහතෙරකෙනකුන්ගෙන් උපස්ථාන ලදින් අනූදහසක් අවුරුද්දට ආයිරි ඇති ව අනුරියන්[4] බුදුබඳින් තුන්ලොව බබුළුවමින් කෙළ ලක්‍ෂයක් රහතන් පිරිවරා දනවු සැරිසරනසේක. එකල අප මහ බෝසතාණෝ [තුලන][5] වික්‍රම ඇති අතුල නම් දිව්‍යනාගරාජ ව[6] සුවහස්[7] දිවනයින් පිරිවරා බුදුන් කරා එළඹ දිවමල් දිවසුවඳ දිවබෙර ආදීන් බුදුන් පුද කෙළලක්‍ෂයක් රහතන් හා සමග බුදුන්ට ආරාධනාකොට දිවබොජුන් වළඳවා කෙළලක්‍ෂයක් සිවුරු පිරිකර දී බුදුබව පතා ඔබගෙන් මේ සතරවන විවරණය ලදහ. දක්වනලදමැයි.

සුමනං සුගතං සුගතොරසිකං
අතුලො භුජගාධිපති අතුලං,
අමහී මහිතං මුනිතං ගමිතුං
සුරදුන්දුභි හොජනාඹරතො[8] - යි

---

1. ගලනනං - H
2. බුදුන්ව - CF
3. අගබිසව - ACDEFJL
   අගබිසවු - IK,
   අගබිසවුන්ගේ - GH
4. අනුරියන් - BEGHIKL ක.කි.කැ.ම.
5. තුලා -GH - තුලනා - ACDEFIKL
   තුලානා - B, තුලතා - J,
   අතුල නාග - ක.ම. අතුලතා ස.
6. දිව්‍යනාගරජව - ABCFGHIJ
   නා රජව -ED රාජන්ව බෙ.
7. නේ සුවහස් - ස.
8. හෝජනමම්බරතො - BDEHJ
   හෝජනමාම්බරතෝ - I

Non-Commercial Distribution

සමහ මහණ ව දසමසක් ප්‍රධන්වියඹීකොට බුදුවන දවස් අනුපම නම් බමුණුගම අනුපමා නම් බැමිණිය දුන් කිරිබත වළඳ සල්වෙනෙහි දිවාවිහාරකොට සවස් වේලෙහි අනුපම නම් ආජීවකයා දුන් හීතණ අටමිටක් ගෙන කුඹුක් බෝධීන්වහන්සේ කරා එළඹ අටතිස් රියන් තණඇතිරි මතුයෙහි[1] වැඩහිඳ බුදු ව සත්සති යවා බඹහුගේ අයදමෙන් සුදර්‍ශන උයන්හි දහම්සක් පවත්වා ක්‍රමයෙන් නිසභය අනෝමය යන අග්‍රශ්‍රාවක යුග්මයක් හා සුන්දරීය සුමනාය යන අග්‍රශ්‍රාවිකා යුග්මයක් ඇති ව වරුණ නම් මහතෙරකෙනකුන්ගෙන් උපස්ථාන ලදින් අවුරුදු ලක්‍ෂයකට ආසිරි ඇති ව අටපනස්රියන් බුදුබඳින් තුන්ලෝ සරහමින් තිස් දහසක් රහතන් පිරිවරා දනවු සැරිසරා[2] වඩනාසේක. එකල අප මහ බෝසතාණෝ මහානුභාව සම්පන්න වූ මහේශාක්‍ය යක්‍ෂසේනාධිපති ව නේසුවහසක් ගණන් යක්සෙන් පිරිවරා[3] බුදුන් කරා එළඹ උපන් ජාතිය සඵල කෙරෙමින් සත්රුවන්මණ්ඩපයක් මවා[4] බුදුපාමොක් මහ සඟපිරිස් වඩා හිඳුවා සත් දවසක් දිවඅහර දන්දී බුදුබව පතා ඔබගෙන් මේ සත්වන විවරණය ලදහ. දක්වනලදමැයි සූවිසි විවරණයෙහි :

> අනොමදස්සීති අනොමදස්සිං - ජිනම්පි දියවාන අනොමදස්සි,
> භවාමි භූතාධිපති යසස්සි - දනං පමතෙනයි අනොමදස්සි-යි

තව ද ඔබට ඉක්බිති එම කප පදුම නම් බුදුරජාණන්වහන්සේ අටාසංඛ්‍යය කප් ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇති ව තුසීපුරෙන්[5] අවුත් දඹදිව චම්පා නම් නුවර අසම නම් රජහුගේ[6] අසමා නම් අගබිසොව කුස පිළිසිඳ සාගර පයඹීන්ත වූ මුළු දඹදිවු තෙලෙහි පියුම්වැසි වස්වා මවුකුසින් බිහි ව ක්‍රමයෙන් යෞවන අවස්ථාවට සම්ප්‍රාප්ත ව උත්තරය වසුත්තරය යසුත්තරය යන තුන් පායෙහි දසදහසක් අවුරුදු රාජ්‍ය ශ්‍රී විඳ දෙතිස් දහසක්[7] පුරඟනන්ට ප්‍රධාන උත්තරා නම් බිසොව රම්‍ය නම් පුත්රුවන වැදූ දිනයෙහි රථ වාහනයෙකින් මහභිනික්මන්කොට පුරුෂයන් කෙළක් හා සමහ මහණ ව අටමසක් ප්‍රධන් භූමියෝගකොට බුදුවන දවස් ධඤ්ඤවතී නම් නියම්ගම එම නමින් ප්‍රසිද්ධ වූ ධඤ්ඤවතී නම් සිටු දුව දුන් කිරිබත වළඳ අඹ උයන්හි දහවල් දවස් යවා සවස් වේලෙහි සචණික නම් ආජීවකයා දුන් හීතණ අටමිටක් ගෙන මහමුරුත බෝධීන්වහන්සේ කරා එළඹ අටතිස්රියන් තණඇතිරියෙහි වැඩ හිඳ කෙලෙසුන් සිඳ[8] බුදු ව සත්සති යවා බඹහුගේ අයදමෙන් ධනඤ්ජය නම් උයන්හි දහම්සක් පවත්වා ක්‍රමයෙන් සාලය උපසාලය යන අගසවු දෙනමක් හා රාමාය සුරාමාය යන අග්‍රශ්‍රාවිකා දෙනමක් ඇති ව වරුණ නම් මහතෙරකෙනකුන්

---

1. මත්තෙහි - ACEFJ
2. දනවු සැරිසරා (නැත)- I
3. යක්‍ෂ සේනාව ගෙන - K
4. කරවා - I
5. තුසිතභවනයෙන් - BDEGHIK
   තුසිත පුරයෙන් - F
6. චම්පා නම් රජහුගේ අසම නම් නුවර -බෙ.ස.
7. සොළිස් දහසක් - ACDEFGH
8. සිඳ - BIK

Non-Commercial Distribution

අතින් උපස්ථාන ලදින් අවුරුදු ලක්‍ෂයකට ආසිරි ඇති ව අටපනස්රියන් බුදුබඳින් රිවිසඳ කැලුම් වළකා තුන්ලෝ බබුළුවා කෝටිප්‍රමාණ වූ මහණ ගණයා පිරිවරා දහම්වැසි වස්වමින් දනවු සැරිසරා ක්‍රමයෙන් වැඩ හිමවිපියස එක්තරා රුකක් මුල නිරෝධසමාපත්තියට සමවැද වැඩඋන්සේක. එකල අප මහබෝසතාණෝ රුචිරාංග[1] වූ සිංහරාජන් ව ඉපද එම හිමවත වසනුවෝ ධ්‍යාන සැපයෙන් හුන් බුදුන් දැක තෙවටෙක[2] පැදකුණු කොට තුන් යලක් සිංහනාද පවත්වා බුද්ධාලම්බන ප්‍රීතීන් සතියක් මුළුල්ලෙහි ගොදුරු සොයා නොගොස් ඇස් නොමරා බුදුන් ම බලබලා ජීවිතය පුද සත්වන දවස් බුදුන් ධ්‍යානයෙන් නැඟී කල එම ඇසිල්ලෙහි වැඩහුන් බුදුන් සිසාරා වැඩ සිටි රහතන් කෙරෙහිදු ප්‍රීති උපදවා බුදුබව පතා ඔබගෙන් මේ අට [වන][3] විවරණය ලදහ. දක්වනලදුයේ මැයි :

> සුරදුම්හෙද පදුමෙ මුනිනෙද
> මහො නිරොධෙන වනෙ නිසිනෙන,
> මනං පසාදෙස ̆පි සීහනාදි
> සඩෙස මුනිනදය මහා මිගිනෙදා - යි.

තව ද ඒ පදුම නම් බුදුන් ඉක්බිති ව එම කප නාරද නම් බුදුරජාණන්වහන්සේ සොළොසාසංඛෙය්‍ය කප්ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇති ව තුසිත භවනයෙන් අවුත් දඹදිව ධඤ්ඤවතී නම් නුවර සුදේව නම් රජහුගේ අනුපමා නම් අගබිසව කුස පිළිසිඳ සාගර පයඊන්ත වූ මුළු දඹදිවු තෙලෙහි ආභරණ වර්‍ෂා[4] වස්වා මවුකුසින් බිහි ව යෞවන ශ්‍රී නිවාස ව විජිතය විජිතාවිය විජිතාභිරාමය යන තුන් පායෙහි නව දහසක් අවුරුදු ගිහිසැපත් වළඳා එක්ලක්‍ෂ විසිදහසක් පුරඟනන්ට ප්‍රධාන වූ විජිතසේනා නම් බිසොවුන් නඳුත්තර[5] නම් පුත්රුවන වැදූ දිනයෙහි මහභිනික්මනට ඉක්මන් ව වාහන සෙවීමට[6] කල්යන්නා සේ මහසෙනඟ පිරිවරා සිරිපතුල්වාහනයෙන් උයන් වැඩ මඟුල් සලවට වැඩහිඳ කෙස්වැටිය සිඳහැර ලක්‍ෂයක් පුරුෂයන් හා සමඟ මහණ ව සත්දවසක් ප්‍රධන්වීයඊකොට බුදුවන දවස් විජිතසේනා නම් අගබිසොව දුන් කිරිබත වළඳ එම උයන්හි දහවල් දවස් යවා සවස් වේලෙහි සුදසුන් නම් උයන්පල්ලා දුන් හීතණ අටමිටක් ගෙන එම උයන්හි සුළුමුරුත බෝමුල්හි හීතණ සලා වගුරුවා අටපනස්රියන් තණඇතිරියේ වැඩහිඳ මාර තිමිර දිවාකර ව බුදුබවට පැමිණ සත්සති යවා බ්‍රහ්මාරාධනා පිළිගෙන ධනඤ්ජය නම් උයන්හි දහම්සක් පවත්වා ක්‍රමයෙන් භද්‍රසාලය ජූතේන්‍ද්‍රය යන අගසවු දෙනමක් හා උත්තරාය ඵාල්ගුණීය යන අග්‍රශ්‍රාවිකා දෙනමක්[7] ඇති ව වාශිෂ්ට[8] නම් මහතෙරකෙනකුන් අතින් උපස්ථාන ලදින් අනූදහසක් අවුරුද්දට ආසිරි ඇති ව අටාසූරියන් බුදුබඳින් නික්මුණාවූ ව්‍යාමප්‍රභා මණ්ඩලයෙන් දෙලොව් යොදුන් තන්හි දිවා රෑ[9] අඳුරු

1. රුචිරාංශ වූ - ABCDEFI, රුචිරාංශක වූ - KL,
2. තෙවිටෙක - BCEHIK ස. තෙවිසිවිටෙක - L
3. වැනි - පිටපත් හැම
4. වැසි - IKL
5. නදුත්තර - BGHIK
6. පෙවීම - CJ
7. ජූත්මයක් - ACDEJ, දෙනමක් හා - I
8. වාසිට්ඨ - ක.කි.ඤා.ම.
9. දවරු - KL

Non-Commercial Distribution

දුරුකොට අසූකෙළක් රහතන් පිරිවරා දනවු සැරිසරනසේක. එකල අප මහබෝසතාණෝ තවුස් වෙස් ගෙන ධ්‍යාන උපදවා හිමවත වසනුවෝ තමන් කෙරෙහි කරුණාවෙන් අසූකෙළක් රහතන් හා දසදහසක් අනගැමි උපාසකවරුන් පිරිවරා පන්සලට වැඩි බුදුන් දැක බුදුපාමොක් මහසඟ පිරිසට වෙන වෙන ම විසිතුරු පන්සල් මවා සතප්වා තුන්යම් රාත්‍රියෙහි බණ අසා උදය උතුරුකුරුදිව දිවාඅහර[1] ගෙන අවුත් අසූකෙළක් රහතන් හා සමඟ බුදුන් වළඳවා අනගැමි උපාසකවරුනුදු අහර අනුභව කරවා මෙම ලෙසින් සතියක් උපස්ථාන කොට ඉක්බිති දවස්[2] ලක්‍ෂයක් වටනා රත්සඳුන් හරක්[3] ගෙනවුත් බුදුන් පෙරට පුද එද ද බුදුබව පතා ඔබගෙන් මේ නවවන විවරණය ලදහ. දක්වන ලදුයේ මැයි:

විසාරදං නාරද නාම නාථං
තපොධනො අට්ඨසමාධිලාභි,
අන්නෙන පානෙන න'පි තප්පයිත්‍වා ।
සම්බොධියා දසථ රත්තචන්දනං-යි

තව ද ඒ නාරද නම් බුදුන් ඉක්බිති ව බුද්ධාශුන්‍ය වූ කප් අසංඛ්‍යයක් ගිය කල්හි මේ මහාභද්‍රකල්පයට ලක්‍ෂයක් වන සාර නම් කල්පයෙහි සොළසාසංඛ්‍යය කප්ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇති පියුමතුරා නම් බුදුරජාණන්වහන්සේ තුසීපුර පැමිණ එයින් වැඩ දඹදිව හංසවතී නම් නුවර ආනන්ද නම් රජහු නිසා සුජාතා නම් බිසව කුස පිළිසිඳ දසදහසක් සක්වළ පියුම්වැසි වස්වා මවුකුසින් බිහි ව ක්‍රමයෙන් යෞවන අවස්ථාවට පැමිණ නරවාහනය යශවාහනය හංසවාහනය යන තුන් පායෙහි දසදහසක් අවුරුදු අපමණ වූ රාජ්‍ය ශ්‍රී[4] විඳිමින් වාසයකොට එක්ලක්‍ෂ විසිදහසක් පුරඟනන්ට ප්‍රධාන වූ සුදත්තා නම් බිසොව කුසින් උත්තර නම් පුත්රුවන වැදූ දිනයෙහි මහභිනික්මන් කෙරෙමියි සිතූ සිත හා සමඟ පින්බෙලෙන් අහසට පැන නැංගාවූ වසවත් නම් මහපායෙකින් සිවුරඟසෙන් සමඟ බෝමැඩ කරා එළඹ[5] මාළිගාවෙන් බැස කැටි ව පිරිවරා ගිය ස්ත්‍රීජනයන් හා සමඟ නැවත මාළිගාව සියනුවරට ගිය කල්හි මහසෙනඟ සමඟින් මහණ ව සත්දවසක් දුෂ්කරක්‍රියා පුරා[6] බුදුවන දවස් උදේනි[7] නම් ගම රුචිනන්ද නම් සිටුදුව දුන් කිරිබත වළඳ සල්වෙනෙහි දහවල්[8] කල් යවා දිවසානනයෙහි සුචිත්ත නම් ආජීවකයා දුන් හිතණ අටමිටක් ගෙන සළල බෝමුල්හි තණ සලා වගුරුවා අටතිස්රියන් තණඇතිරියෙහි වැඩහිඳ මරසෙනඟ බිඳ බුදු ව එකෙණෙහි දසදහසක් සක්වළ

1. උතුරුකුරු දිවි ගොස් දිව අහර - C
   උතුරුකුරු දිවින් ආහාර -I
   උතුරුකුරු දිවි අහර - ADEJ මුද්‍රිත නැම
   උතුරුකුරු දිපයට ගොස් දිව අහර - ස.
2. ඉක්බිති වටනා දවස් - IKL ස.
   ඉක්බිති දස -ACDI බෙ.
   ඉක්බිති දහස් - ක.සි.සද.
3. හරයක් - ACDFIJKL
   අරයක් - B
4. රජසිරි - ACDEFJ
   රාජ්ජ ශ්‍රී - BGH
5. වැඩ - J
6. කොට - GHIKL ක.සි.සද.
7. උදෙන - KL
8. දවහල් - ACFGHJK

Non-Commercial Distribution

එකපැහැර අලංකෘතකෙරෙමින් පියුම්වැසි වස්වා සත්සති යවා බ්‍රහ්මාරාධනා පිළිගෙන මිථිල[1] නම් උයන්හි දහම්සක් පවත්වා තීර්ථකයන් නැති කොට ක්‍රමයෙන් දෙවලය සුජාතය යන අගසවු යුගළයක්[2] හා අමිත්‍රාය අසමාය යන අග්‍රශ්‍රාවිකා යුගළයක්[2] ඇති ව සුමන නම් මහතෙරකෙනකුන් අතින් උපස්ථාන ලදින් අවුරුදු ලක්‍ෂයකට ආසිරි ඇති ව දොළොස් යොදනෙක පැතිර[3] දිවරැ[4] අඳුරු කොට බබළන්නාවූ ව්‍යාමප්‍රභාමණ්ඩලයෙන් පිරිවරන ලද අවාසූරියන් බුදුබඳින් මුළුලෝ සරහමින්[5] සැත්තෑලක්‍ෂයක් රහතන් පිරිවරා ජනපදචාරිකා කරනසේක. එකල අප මහබෝසතාණෝ නොයෙක් කෙළගණින් ධන ඇති ජටිල නම් මහරැටි ව[6] බුදුපාමොක් මහසඟපිරිසට මහදන් දී සිවුරු පිරිකර පිළිගන්වා බුදුබව පතා ඔබගෙන් මේ දසවන විවරණය ලදහ. දක්වනලදුයේ මැයි:

පාදුත්තරිය පදුමං පදුමුත්තරමපි
දිස්වා මහිඩ්ඪිජටිලව්හය රට්ඨිකො සො[7]
සන්දපයිත්වා[8] සුගතස්ස සභික්ඛුකස්ස
බුඩාය චීවරයුතං[9] විවිධන්නපානං - යි

මෙහි දක්වනලද මේ සාරාසංඛ්‍යයෙන් දීපංකර බුදුන් කෙරෙහි පටන් කොණ්ඩඤ්ඤ බුදුන් දක්වා අතුරෙහි බුද්ධශූන්‍ය වූ කප් අසංඛ්‍යය සෙල අසංඛ්‍යය නම් වෙයි. කොණ්ඩඤ්ඤ බුදුන් කෙරෙහි පටන් මංගල බුදුන් දක්වා අතුරෙහි බුඩශූන්‍ය වූ කප් අසංඛ්‍යය හාස අසංඛ්‍යය නම් වෙයි. මංගලය සුමනය රේවතය සෝභිතය යන සතරදෙනාවහන්සේ ම එක සාරමණ්ඩ නම් කප බුදු වූ හෙයින් සෝභිත බුදුන් කෙරෙහි පටන් අනෝමදස්සි බුදුන් දක්වා අතුරෙහි බුද්ධශූන්‍ය වූ කප් අසංඛ්‍යය වය අසංඛ්‍යය නම් වෙයි. අනෝමදස්සිය පදුමය නාරදය යන තුන් දෙනාවහන්සේ ම එක ම වර නම් කල්පයෙහි[10] බුදු වූ හෙයින් [නාරද][11] බුදුන් කෙරෙහි පටන් පියුමතුරා නම් බුදුන් දක්වා අතුරෙහි බුද්ධශූන්‍ය වූ කප් අසංඛ්‍යය රුචි අසංඛ්‍යය නම් වෙයි. එසේ හෙයින් වදරනලදී සොදත්තක නිදානයෙහි :

සෙලො හාසො වයො චෙව - රුචියා සංඛියා ඉමෙ,
චත්තාරො තෙ අසංඛෙය්‍යා - විනිපාතා'ති වුච්චති - යි.

මෙසේ මේ සාරාසංඛ්‍යයට ඉක්බිති ව පියුමතුරා නම් බුදුන් කෙරෙහි පටන් සිටි ලක්‍ෂයක් කපින් සැත්තෑ දහසක් කප් ගිය කල්හි මේ කල්පයට තිස්දහසක් වන මණ්ඩ නම් කල්පයෙහි සුමේධය සුජාතය යන සර්වඥවරයෝ දෙදෙනෙක් ලොව පහළ

1. මිථිලා - KL
2. යුග්මයක් - ACDJ
3. පැතිරී සිටි - GH
4. දව රැ -ABCEFGHKL
   දිවාරැ - IJ
5. බබුළුවමින් - ACEJ
6. මහතුටිව - ACJ
   මහරුසිව - DGHI
   මහරැටියව - B
   මහ රැටිව - K
7. ජටිලව්හය තට්ඨිකො සො - E
   ජටිලො ජටිලො මහිසී - IL
   ජටිතො ජටිලො මහෙසී - K ක.සි.සං.බෙ.ස.
8. සත්තපායිත්වා - I.
   සදපයිත්වා - DGH
9. චීවරයුගං - ක.කි.සං.බෙ.ස. - KI
10. කප - මුද්‍රිත හැම
11. අනොමදස්සි - පිටපත් හැම
    නාරද - මුද්‍රිත හැම

Non-Commercial Distribution

වූහ. එයින් සුමේධ නම් බුදුරජාණන්වහන්සේ අටාසංඛ්‍යෙය කප්ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇති ව තුසීපුර පැමිණ එයින් බැස දඹදිව සුදසුන් නම් නුවර සුදත්ත නම් රජහුගේ සුදත්තා නම් බිසොව කුස පිළිසිඳ දසමස් පුරා බිහි ව යෞවනශ්‍රීයට පැමිණ සුචන්‍දකය ජයකේතුය සිරිවඩ්ඪය යන තුන් ප්‍රාසාදයෙහි[1] නවදහසක් අවුරුදු රාජ්‍යශ්‍රී විඳ අටසාලිස්දහසක් පුරහනන්ට[2] ප්‍රධාන වූ සුමනා නම් බිසොව කුසින් පුනබ්බසුමිත්‍ර නම් පුත්රුවන වැදූ දිනයෙහි ඇත් වාහනයකින් මහභිනික්මන්කොට කෙළසියයක් පුරුෂයන් හා සමඟ මහණ ව අටමසක් මහාවීර්‍ය්‍යකොට බුදුවන දවස් නකුල නම් නියම්ගම නකුලා නම් සිටුදුව දුන් කිරිබත වළඳ සල්වෙනෙහි දිවාවිහාරකොට දිවසාවසානයෙහි සිරිවඩ්ඪ නම් ආජීවකයා දුන් තීතණ අටමිටක් ගෙන බක්මී බෝධීන්වහන්සේ කරා එළඹ විසිරියන් තණපලඟ පිට වැඩහිඳ[3] බුදු ව සත්සති යවා බ්‍රහ්මාරාධනා පිළිගෙන සුදසුන් නම් උයන්හි දහම්සක් පවත්වා සරණය සබ්බකාම ය යන අගසවු දෙනමක් හා රාමාය සුරාමාය යන අග්‍රශ්‍රාවිකා දෙදෙනෙකු ඇති ව සාගර නම් මහතෙර කෙනකුන්ගෙන් උපස්ථාන ලදින් අනූදහසක් අවුරුද්දට ආයිරි ඇති ව සියලඟ රසින් සතර ගවුවෙක අඳුරු දුරු කොට දවරැ[4] බබුළුවා අටාසූරියන් බුදුබඳින් මුළුලෝ සරහා කෙළසියයක් රහතන් පිරිවරා ජනපදචාරිකා කෙරෙමින් දහම්වැසි වස්වනසේක. එකල අප මහබෝසතාණෝ උත්තර නම් මානවක ව අසූකෙළක් ධන වියදම්කොට බුදුපාමොක් සඟ[5] පිරිසට මහදන් දී මහණ ව බුදුබව පතා ඔබගෙන් මේ එකොළොස්වන විවරණය ලදහ. දක්වන ලද මැයි සූවිසි විවරණයෙහි :

දිස්වා සුමෙධ සුගතං සුගතං සුගත්තං
ලොකුත්තරෙතිරත[6] උත්තරමානවොපි,
සාසීතියා රතනකොටි ධනෙන දනං
ජේනායදසි[7] අසමං අසමස්ස තස්ස-යි.

තව ද ඒ සුමේධ බුදුන් ඉක්බිති එම කප සුජාත නම් බුදුරජාණන් වහන්සේ අටාසංඛ්‍යෙය කප්ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇති ව තුසීපුර බබුළුවා[7] එයින් වැඩ දඹදිව සුමංගල නම් නුවර උග්ගත නම් රජහුගේ ප්‍රභාවතී නම් බිසව කුස පිළිසිඳ දසමස් පිරුණු සඳ බිහි ව යෞවනාභිරාම ව සිරිය උපසිරිය සිරිනන්‍දය යන තුන්පායෙහි නවදහසක් අවුරුදු රජසිරි විඳ තෙවිසිදහසක් පුරහනන්ට ප්‍රධාන වූ සිරිනන්‍දා නම් අගබිසොව උපසෙන නම් පුත් රුවන වැදූ ද හංසවසහ නම් අශ්වරාජයා පිටට පැනනැඟී මහභිනික්මන්කොට සියක් ලක්‍ෂයක් ඇමතියන් හා සමඟ මහණ ව නවමසක් ප්‍රධන්වීර්‍ය්‍යකොට බුදුවන දවස් සුරිනන්‍ද නම් නුවර සිරිනන්‍දා නම් සිටුදුව දුන් කිරිබත වළඳ සල්වෙනෙහි දිවාවිහාරකොට සවස් වේලෙහි සුනන්‍ද

1. පායෙහි -I, මුද්‍රිත හැම ස.
2. පුරඟනාවන් - DGH
   පුරංගනාවන්ට - I
3. වැඩ සිට හිඳ - H
   හිඳ - ACDEFJ
4. දිවා රැ -AJ ස.
   දවා රැ -CK
   දෙවා රැ -I
5. මහසඟ -KL
6. ලොකුත්තරෙපි රථ - I
7. ජනාය - GH
   ජේනා අදසි - I
8. පැමිණ - මුද්‍රිත හැම, ස.

Non-Commercial Distribution

නම් ආජීවකයා දුන් හීතණ අට මිටක් ගෙන හුණතුරු බෝමුල්හි තෙතිස්රියන් තණපලඟ පිට වැඩහිඳ මරසෙනඟ බිඳ බුදු ව සත්සති යවා බ්‍රහ්මාරාධනා පිළිගෙන සුමඟුල් නම් උයන්හි දහම්සක් පවත්වා සුදස්සනය සුදෙවය යන අගසවු යුගළයක්[1] හා නාගාය, නාගසෙනාය යන අග්‍රශ්‍රාවිකා යුග්මයක්[2] ඇති ව නාරද නම් මහතෙරකෙනකුන්ගෙන් උපස්ථාන ලදින් අනූදහසක් අවුරුද්දට ආසිරි ඇති ව අටපනස්රියන් බුදුබඳින්[3] මුළුලෝ බබුළුවා කෙළ ලක්‍ෂයක් රහතන් පිරිවරා දහම්වැසි වස්වමින් දනවු සැරිසරන සේක. එකල අප මහ බෝසතාණෝ සතර මහා සෘද්ධියකින් හා සප්තවිධ රත්නයෙන් යුක්ත වූ මහානුභාව සම්පන්න සක්විති රජ ව වසනුවෝ බුදුන් කරා එළඹ නානාවිධ රත්නයෙන් බුදුන් පුද දෙදහසක් කොදෙව් පිරිවරා සිටි සතර මහාද්වීපයෙහි උපදනා සියලු අය ගෙන බුදුපාමොක් මහසඟ පිරිසට රටවැසියන් උපස්ථාන කරන සේ නියෝග කොට සප්තවිධ රත්නයන් සමඟ[4] සක්විති රාජ්‍යය[5] බුදුන්ට පුද මහණ ව බුදුබව පතා ඔබගෙන් මේ දෙලොස්වන විවරණය ලදහ. දක්වනලදුයේ මැයි :

විජාතමත්තමපි සුජාතහුතං
සුජාතිමන්තං සුගතං සුජාතං
දිස්වාන රාජා වරචක්කවත්ති
පූජේසි ජේනාය වරං සරජ්ජං - යි.

නව ද ඔබට ඉක්බිති ව තිබූ[6] තිස් දහසක් කපින් විසිනවදහස් අටසිය දෙයානූකපක් බුද්ධශූන්‍ය ව ගිය කල්හි මේ කල්පයට එක්සිය අටළොස් වන වර නම් කල්පයෙහි පියදස්සීය අත්ථදස්සීය ධම්මදස්සීය යන සර්වඥවරයෝ තුන්දෙනෙක් ලොව පහළවූහ. එයින් පියදස්සී නම් බුදුරජාණන්වහන්සේ අධාසංඛ්‍යෙය කප්ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇති ව තුසීපුර සිරි විඳ එයින් වැඩ දඹදිව ධඤ්ඤවතී නම් නුවර සුදත්ත නම් රජහුගේ සඳවත් නම් බිසව කුස පිළිසිඳ දස මස් පුරා බිහි ව යෞවනප්‍රාප්ත ව නෙතිස් දහසක් පුරඟනන් පිරිවරා සුනිම්ලය විමලය ගිරිගුහාය යන තුන් මාළිගාවෙහි නව දහසක් අවුරුදු රජසිරි විඳ විමලා නම් අගබිසොව කුසින් කඤ්චනවෙල නම් පුත්රුවන උපන් දිනයෙහි රථවාහනයෙකින්[7] මහබිනික්මන් නික්ම සියක්ලක්‍ෂයක් පුරුෂයන් හා සමඟ මහණ ව සමසක් මහාවීර්‍ය්‍යකොට බුදුවන දවස් වරුණ නම් බමුණුගම වසභ[ා][8] නම් බැමිණිය දුන් කිරිබත වළඳ සල්වෙනෙහි දිවාවිහාර කොට දිවසාවසානයෙහි සුජාත නම් ආජීවකයා දුන් හීතණ අටමිටක් ගෙන කුඹුක් බෝතුරු මුල්හී සලා වගුරුවා තෙපනස්රියන් තණපලඟ මත්තෙහි වැඩහිඳ මරසෙනඟ ප්‍රලයකොට බුදු ව සත්සති යවා මහබඹහු[9] අයදමෙන් උසභවතී නම් උයන්හි දහම්සක් පවත්වා පාලිතය සබ්බදස්සීය යන අග්‍රශ්‍රාවක යුග්මයක් ඇති ව හා සුජාතාය ධම්මදින්නාය යන අග්‍රශ්‍රාවිකා යුග්මයක් ඇති ව සෝභිත නම් මහතෙර කෙනකුන්ගෙන් උපස්ථාන

1. දෙනමක් -BGHIKL
   යුග්මයක් - CDF
2. යුගළයක් - ACDFHJK
3. බුදු බඳකින් - IKL
   බුදුබඳෙකින් - BGH
4. හා සමඟ -ACDEKL
5. රජය -EFIJ
6. තුබූ - BCGHI ක.කි.කැ.ම.
7. රථවාහනයෙන් - B ක.කි.කැ
8. වසභ - පිටපත් හැම ස.
9. මහබඹහුගේ - BCH
   බඹහුගේ - L

Non-Commercial Distribution

ලදින් අනූදහසක් අවුරුද්දට ආයිරි ඇති ව අටඅසූරියන්[1] බුදුබඳින් දිලිහි දිලිහී සියක් ලක්ෂයක් රහතන් පිරිවරා ජනපදචාරිකා කරනසේක. එකල අප මහබෝසතාණෝ නොයෙක් කෙළගණන් වස්තු ඇති කාශ්‍යප නම් බ්‍රාහ්මණව වේදත්‍රයෙහි කෙළ පැමිණ වසනුවෝ බුදුන් කරා එළඹ බණ අසා පැහැද කෙළලක්ෂයක් ධන[2] වියදම් කොට විහාරයක් කරවා සපිරිවර බුදුන්ට පිළිගන්වා බුදුබව පතා ඔබගෙන් මේ තෙළෙස්වන විවරණය ලදහ. දක්වනලද්දුයේ මැයි :

සඤ්ඤසනීය සුතනුං පියදස්සි නාථං
දිස්වාන කොටිසත ලක්ඛ පරිබ්බයෙන
කත්වා විහාරපවරං පණිධාය බොධිං
පූජෙසි විප්පවිහවෙ ධීත කස්සපො සො-යි.

තව ද ඔබට ඉක්බිති එම කප අත්ථදස්සී නම් බුදුරජාණන්වහන්සේ සොළොසාසංඛ්‍යය කප් ලක්ෂයක් පිරූ පාරමිතා ඇති ව තුසීපුර සිරිවිඳ[3] දඹදිව ශෝභන නම් නුවර සාගර නම් රජහුගේ සුදශීනා නම් අගබිසොව කුස පිළිසිඳ දසමස් පුරා බිහිව ඒ ක්ෂණයෙහි කුලපරම්පරාගත ව බොහෝ කාලයක් නිධානගත ව තුබූ සියලු වස්තූන් හිමියන්ට ලාභ කරවා යෞවන අවස්ථාවට පැමිණ අමරගිරිය සුරගිරිය ගිරිගුහාය යන තුන් මාළිගාවෙහි දසදහසක් අවුරුදු රාජ්‍ය ශ්‍රී විඳීමෙන්[4] කල් යවා තිස්දහසක් පුරඟනන්ට ප්‍රධානවූ විශාඛා නම් අගබිසව සෙල නම් පුත්රුවන වැදූ දිනයෙහි අස්වාහනයෙකින් මහබිනික්මන් නික්ම නව කෙළක් පුරුෂයන් හා සමඟ මහණ ව අටමසක් ප්‍රධන්වීයඹීකොට බුදුවන දවස් සුචින්ධරා නම් නාගමානවිකාව දුන් කිරිබත වළඳා සල්වෙනෙහි දිවාවිහාරකොට සවස් වේලෙහි මහාරුචි නම් නාරදහු දුන් හීතණ අටමිටක් ගෙන සපු සිරිබෝමුල්හි සලා වගුරුවා තෙපනස් රියන් තණඇතිරි මත්තෙහි වැඩහිඳ මාරාරි මර්ථනයකොට බුදු ව සත්සති යවා බ්‍රහ්මාරාධනා පිළිගෙන අනෝම නම් උයන්හි දහම්සක් පවත්වා මෙසේ ක්‍රමයෙන් සාන්තය උපසාන්තය යන අගසවු දෙනමක් හා ධර්මාය සුධර්මාය යන අග්‍රශ්‍රාවිකා දෙනමක් ඇති ව අභය නම් මහතෙරකෙනකුන්ගෙන් උපස්ථාන ලදින් අනූදහසක් අවුරුදු[5] ආයිරි ඇති ව[6] සියලඟ රසින් සතර ගවුවෙක දවරැ බබුළුවා අසූරියන් උස බුදුබඳින් මුළුලෝ සරහමින් නවකෙළක් රහතන් පිරිවරා ජනපදචාරිකා කරනසේක. එකල අප මහ බෝසතාණෝ චම්පක[7] නම් නුවර සුසීම නම් බ්‍රාහ්මණ ව සියලු සැපත යාචකයන්ට දන්දී වල් ගොස් මහණ ව අභිඥලාභී ව හිමවත වසනුවෝ බුදුන් කරා එළඹ බණ අසා පහන් සිත් ඇති ව තමන්ගේ ආනුභාව බලයෙන් එකෙණෙහි ශක්‍රභවනයට පැනනැඟී[8] සක්දෙවුරජහුගේ සියක් යොදුන් උස ඇති පරසතුරුක සලා මල් ගෙනවුත් සතර මහදිවයින එකපැහැර

1. අටාසූරියන් -BHIKL
   අසූරියන් - AJ
   අසීති හත්ථුබ්බෙධං - පාලි
2. වස්තු - BGHIKL මුද්‍රිත හැම, ස.
3. සිරිවරා - ADEFGKL, ස.
4. විඳිමින් - බෙ.ස.
5. අවුරුද්දට - ACDEFJ
6. වළඳ -GHIKL
7. චම්පා - CGHIKL
8. ශක්‍රදේවේන්ද්‍රයාගේ ශක්‍රභවනයට
   ගොස් - සං.සි.ඥ.බෙ GH

Non-Commercial Distribution

වස්නා මහ වැස්සක් පරිද්දෙන් දිවමල්වැසි වස්වා අවට මල්තොරණ මල්මඩු මල්ඇගෑ ආදියෙන් විසිතුරුකොට[1] සරහා පරසතුමල් කුඩයක්[2] බුදුන් සිරසට පුද බුදුබවට ප්‍රාර්ථනාකොට[2] ඔබගෙන් මේ තුදුස්වන විවරණය ලදහ. දක්වන ලදුයේ මැයි :

සරත්ථදස්සිං මුනිමත්ථදස්සිං
දිස්වා සුසීමො පණිධාය බොධිං,
නානාවිධං පුප්ඵ මහග්ඝව කත්වා
පූජෙසි මනුරව පුප්ඵඡත්තං - යි

තව ද ඒ අත්ථදස්සි බුදුන් ඉක්බිති එම කප ධම්මදස්සි නම් බුදුරජාණන්වහන්සේ සොළොසාසංඛ්‍යය කප්ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇති ව තුසීපුර සිරි විඳ දඹදිව සරණ නම් නුවර සරණ නම් රජහුගේ සුනන්‍ද නම් අගබිසොව කුස පිළිසිඳ දසමස් පුරා බිහි ව අධිකරණ ශාස්ත්‍ර පොත්වල අධර්ම බැවහාර[3] අතුරුධන් කරවමින් ධර්ම බැවහාර නොපිරිහෙළා සිටුවමින් ක්‍රමයෙන් වැඩී අරජය විරජය සුදර්ශනය යන තුන් මාළිගාවෙහි අටදහසක් අවුරුදු රජසිරි විඳිමින් වාසයකොට එක්ලක්‍ෂ විසිදහසක් පුරඟනන්ට ප්‍රධාන වූ විචිකොලි නම් අගබිසොව කුස වැස[4] පුණ්‍යවර්ධන නම් පුත්රුවන උපන් දිනයෙහි නිද්‍රෝපගත නාටක වෙට්කාවන්ගේ ප්‍රකට[5] වූ විකට දැක සසර කළකිරී මහණවන්ට යෙමි යි සිතූ කෙණෙහි පූර්වෝපචිත[6] කුසල බලයෙන් වැඩඋන්නාවූ සුදසුන් නම් මහරන්පාය පොළෝතෙලෙන් පැනනැඟී සිවුරඟ සෙන් සමඟ අහසින් ගොස් බෝමැඩට ආසන්න ව බිම පිහිටි කල්හි ඇතුළු මාළිගාවෙහිදී ම කෙළලක්‍ෂයක් පුරුෂයන් හා සමඟ මහණ ව මාළිගාවෙන් බැස පිටත වැඩසිට නැවත මාළිගාව අහසින් ගොස් රත්කරවී බෝධීන්වහන්සේ මධ්‍ය කෙරෙමින් බිම පිහිටි ඇසිල්ලෙහි රජබිසෝවරුන් හා අවශේෂ ස්ත්‍රීන් මාළිගාවෙන් බැස ගව් සමාරක් පමණ[7] ගිය කල්හි සත්දවසක් ප්‍රධන්වීර්‍යයිකොට බුදුවන දවස් විචිකොලි නම් අගබිසොව දුන් කිරිබත වළඳ දෙබරවෙනෙහි දිවාවිහාරකොට සවස් වේලෙහි සිරිවඩු නම් යවපල්ලා දුන් හීතණ අටමිටක් ගෙන රත්කරවී බෝතුරු මුල්හි[8] සලා[9] තෙපනස් රියන් තණපලඟ මත්තෙහි සිවුරඟ[වෙර] ඉටා[10] වැඩහිඳ මාරබල විධමනය කොට බුදු ව සත්සති යවා බ්‍රහ්මාරාධනා පිළිගෙන ඉසිපතන උයන්හි දහම්සක් පවත්වා පදුමය ඵුස්සදේවය යන අග්‍රශ්‍රාවක යුග්මයක් හා ඛේමාය සබ්බනාමාය[11] යන අග්‍රශ්‍රාවිකා යුග්මයක් ඇති ව සුනේත්‍ර නම් මහතෙර කෙනකුන්ගෙන් උපස්ථාන ලදින් අවුරුදු ලක්‍ෂයකට ආසිරි ඇති ව අසූරියන්[12] බුදුබඳින් මුළුලෝ විස්මය පත් කරවා[13] කෙළලක්‍ෂයක් රහතන් පිරිවරා ජනපදචාරිකා කෙරෙමින් ලෝවැඩ

1. සරහා......ප්‍රාර්ථනා කොට (නැත) - බෙ.ස.
2. පරසතු මලින් මල් කුඩයක් -I
3. ව්‍යවහාර - CELK මුද්‍රිත හැම, ස.
4. පිළිසිඳ - AFJ
5. පාකට - BCDE
   ප්‍රාකාර - I
6. පුබ්බොපචිත - ADG,
   පුබ්බාපචිත - I
7. ව්වර -IKL
8. තුරුමුල්හි -ACEFGIJKL බෝමුල්හි-B
9. සලා වගුරුවා - BCIK, ම.
10. සිවුරඟ ඉටා - පිටපත් හැම,ක.සි.සැ,ම.
11. සබ්බකාමාය - බෙ.ස.
12. අටාසූරියන් - BCDEFHIJKL,
    අට අසූරියන් - ස.
13. විස්ම කරවා - ABEFGHIJKL

Non-Commercial Distribution

වඩනාසේක. එකල අප මහබෝසතාණෝ ශක්‍රදේවේන්ද්‍ර ව උපන්නාහු දෙදෙව්ලොව දෙවියන් පිරිවරා බුදුන් කරා දිව අවුත් දිව්‍යමය වූ නොයෙක් හේරිතූර්‍යයෙන් හා දිවමල් දිවසුවඳ ආදියෙන් බුදුන්[1] පුද බුදුබව ප්‍රාර්ථනා කොට ඔබගෙන් මේ පසළොස්වන විවරණය ලදහ. දක්වන ලදුයේ මැයි :

තං ධම්මදස්සිං වර ධම්මදස්සිං
දිස්වා සුරින්දො සුරදුන්දුභීහි,
ගන්ධෙහි මාලෙහි මනොරමෙහි
පූජෙසි බොධිං පණිධායමානො-යි.

තව ද ඒ ධම්මදස්සි නම් බුදුන් ඉක්බිති ව තුබූ එක්සිය අටළොස් කපින් බුද්ධශූන්‍ය වූ කප් සූවිස්සක් ගිය කල්හි මෙකපට සුවානුවන[2] සාර නම් කප සිද්ධාර්ථ නම් බුදුකෙනකුන්වහන්සේ අටාසංඛ්‍යෙය කප් ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇති ව තුසීපුර පැමිණ එපුර සිරි විඳ දඹදිව වෙභාර නම් නුවර උදේන නම් රජහුගේ සුඵස්සා නම් අගබිසව කුස පිළිසිඳ[3] සත්වාර්ථසිද්ධිය කරවමින් ක්‍රමයෙන් බිහි ව යොවුන්සිරි සම්ප්‍රාප්ත ව අටසාලිස් දහසක් පුරඟනන් පිරිවරා කොකාසය උත්පලය පදුමය යන තුන්පායෙහි දසදහසක් අවුරුදු රජසිරි විඳීමෙන් කල් යවා සොම්නස් නම් අගබිසොව අනුපම නම් පුත්රුවන වැදූ දිනයෙහි රන් සිවිගෙයකින් මහභිනික්මන්කොට කෙළලක්‍ෂයක් පුරුෂයන් හා සමඟ මහණ ව දසමසක් ප්‍රධන්වීර්‍යකොට බුදුවන දවස් අසදිස නම් බමුණුගම සුනේත්‍රා නම් බැමිණිය දුන් කිරිබත වළඳ දෙබර වෙනෙහි දිවාවිහාරකොට සවස් වේලෙහි වරුණ නම් යවපල්ලා දුන් හීතණ අටමිටක් ගෙන කිණිහිරි තුරුමුල්හි[4] සලා සම සතළිස් රියන් තණඇතිරියෙහි වැඩහිඳ මරසෙනඟ බිඳ බුදු ව සත්සති යවා බඹහුගේ අයදමෙන් ගයා නම් මිගදයෙහි දහම්සක් පවත්වා සම්බහුලය සුමිත්තය[5] යන අගසවු දෙනමක් හා සීවලීය සුනාමාය[6] යන අග්‍රශ්‍රාවිකා දෙනමක් ඇති ව රේවත නම් මහතෙර කෙනකුගෙන් උපස්ථාන ලදින් අවුරුදු ලක්‍ෂයකට ආයිරි ඇති ව සැටරියන් උස බුදුබඳින් මුළුලෝ සරහමින් තව කෙළලක්‍ෂයක් රහතන් පිරිවරා ගම් නියම්ගම් රාජධානි පිළිවෙලින් දනවු සැරිසරා ලෝවැඩ වඩනාසේක. එකල අප මහබෝසතාණෝ සුරසේන නම් නුවර මංගල නම් බ්‍රාහ්මණ ව සවිසැපත් දුක්පතුන්ට දන්දී හිමව් පියස් ගොස් තවුස් වෙස් ගෙන අභිඥලාභී ව ධ්‍යානසුවයෙන් දවස් යවනුවෝ බුදුන් කරා එළඹ බණ අසා පහන්සිත් ඇති ව ඍද්ධිබලයෙන් තොලස් ව ගොස් දඹදිවට සලකුණු වූ සාරසියයක් ගවු උස ඇති මහ දඹගස සලා මහ දියකළ සා දඹ ගෙනවුත් නවකෙළදහසක් රහතන් හා සමඟ බුදුන් වළඳවා බුදුබව[7] ප්‍රාර්ථනාකොට ඔබගෙන් මේ සොළොස් වන විවරණය ලදහ. දක්වනලදුයේ මැයි :

---

1. බුදුන්ට -ACDFJ
2. තවානුවන - I
   සවානුවන - K
   සානුවන - L
3. පිළිසිඳ දසමස් ඇවෑමෙන් මවුකුසින් බිහිව - C
4. බෝමුල්හි - මුද්‍රිත හැම, - ස
   කිහිරි මුල්හි - IL
   බෝමුල්හි සලා වකුරුවා - ම.
5. සුමිත්තය - මුද්‍රිත හැම, ස.
6. සුමනාය - D සුරාමා - පාලි
7. බුදු බවට - ABCDEFIJKL

Non-Commercial Distribution

සිද්ධත්ථනාමසමං සුගතං කතත්ථං
සිද්ධො භවෙ භුවි පසිද්ධ මුනින්දභාවො,
ජම්බු ඵලං වරතරං අදදිත්ථ ධීරො
දිස්වා මහිද්ධි විභවො මුනි මංගලො සො-යි.

තව ද ඒ සිද්ධාර්ථ බුදුන් ඉක්බිති ව තුබූ සුවානූ කපින් කළක් බුද්ධශූන්‍ය ව ගිය කල්හි මේ කල්පයට තෙයානූවන මණ්ඩ නම් කල්පයෙහි තිස්සය ඵුස්සය යන සර්වඥවරයෝ දෙදෙනෙක් ලොව පහළවූහ. එයින් තිස්ස නම් බුදුරජාණන්වහන්සේ අටාසංඛ්‍යය කප්ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇති ව තුසීපුර පැමිණ දෙව්බඹුන්ගේ අයදමෙන් දඹදිව [ඛෙම][1] නම් නුවර ජනසන්ධව නම් රජහුගේ පියුම් නම් අගබිසොව කුස පිළිසිඳ දසමස් පුරා බිහි ව ක්‍රමයෙන් වැඩී ගුහසෙලය නාරිස්‍ය නිසභය යන තුන් මාළිගාවෙහි සත්දහසක් අවුරුදු රජසැපත් විඳ තිස්දහසක් පුරඟනන්ට ප්‍රධාන වූ සුභද්‍රා නම් අගබිසොව ආනන්ද නම් පුත්රුවන වැදූ දිනයෙහි අශ්වාහනයෙකින් මහභිනික්මන් නික්ම පුරුෂයන් කෙළක් හා සමඟ මහණ ව අට මසක් මහාවීර්‍ය්‍යකොට බුදුවන දවස් වීර නම් නියම්ගම එම නමැති සිටුදුව දුන් කිරිබත වළඳ සල්වනෙහි[2] දිවාවිහාර කොට සවස් වේලෙහි විජිතසන්ධගාම[3] නම් යවපල්ලා දුන් හීතන අටමිටක් ගෙන පියා බෝතුරු[4] මුල්හී සලා සමසතලිස් රියන් තණපලඟ මත්තෙහි වැඩහිඳ මරසෙනඟ බිඳ බුදු ව සත්සති යවා බ්‍රහ්මාරාධනා පිළිගෙන යසවත් නම් මිගදයෙහි දහම්සක් පවත්වා බ්‍රහ්මදේවය උදය යන අගසවු දෙදෙනකු හා ඵුස්සාය[5] සුදත්තාය යන අග්‍රශ්‍රාවිකා දෙදෙනකු ඇති ව සම්භව නම් මහතෙරකෙනකුන්ගෙන් උපස්ථාන ලදින් ලක්‍ෂයක් අවුරුද්දට[6] ආයිරි ඇති ව සියක්ලක්‍ෂයක් රහතන් පිරිවරා සැටරියන් බුදුබඳින් මුළුලෝ බබුළුවා මොහඳුරු දුරුකරන සේක. එකල අප මහ බෝසතාණෝ යසවත් නම් නුවර සුජාත නම් රජ ව රජසැපත් හැර මහණ ව ධ්‍යාන උපදවා වසනුවෝ බුදුන් කරා එළඹ බණ අසා පැහැද තව්තිසා දෙව්ලොවට දිව්ගොස් දිවඋයන් වැද යොදනක් සා කරඬුවෙකින් නොයෙක් පැහැ ඇති දිව්මල් පුරා ගෙනවුත් බුදුන් පෙරට පුද ඉඳුනිල්මිණිමය දඬු ඇති ඝන කනකමය පෙති ඇති පබළුමය රත්කෙසුරු ඇති විසිතුරු මහ පියුමක් බුදුන් සිරසට කුඩයක් කොට පුද බුදුබවට ප්‍රාර්ථනාකොට ඔබගෙන් මේ සතළොස්වන විවරණය ලදහ. දක්වන ලදුයේ මැයි :

දිස්වාන තිස්සං[7] සුගතං සුජාතො[8]
මහිද්ධිකො ඛත්තිය තාපසො සො,
පූජේසි නානා සුර මාලිකාහි[9]
විතානමෙකං පතිධාය බොධිං-යි.

---

1. මෙබලා - පිටපත් හැම
   ඛෙම - පාළි
2. සලල වෙනෙහි - ACDFJ
3. ජීවිතසංඝ - BGHI
   ජීවිතසඟා - K
   ජීවිතසඟ - L
4. බෝර්රුක් - BGHIkL
5. ඵුස්සා - පාළි
6. අවුරුදු - BGIKL මුද්‍රිත හැම
7. තිස්ස - ABCDEI
8. සුජතො - I
9. මාලකාහි - සි.ස.,ම.
   මාලගාහි - බෙ. ස.
   පුරමාලකාහි - ක. .

Non-Commercial Distribution

තව ද තිස්ස බුදුන් ඉක්බිති එම කප ඵුස්ස නම් බුදුරජාණන්වහන්සේ ..සාලොසාසංඛෙය්‍යය කප්ලක්‍ෂයක් පිරූ පාරමිතා ඇති ව තුසීපුර පැමිණ දෙව්බඹුන්ගේ අයදමෙන් දඹදිව කසී නම් නුවර ජයසේන[1] නම් රජහුගේ සිරිමා නම් අගබිසොව කුස පිළිසිඳ දස මස් පුරා බිහි ව ක්‍රමයෙන් වැඩී ගරුළපක්‍ෂය[2] හංසය ස්වර්ණද්වාරය යන තුන්පායෙහි සාදහසක්[3] හවුරුදු අනොපමෙය්‍යවූ රාජ්‍යශ්‍රී විඳිමින් දවස් යවා තිස් දහසක් පුරහනන්ට ප්‍රධාන් වූ කිසාගෝතමී නම් අගබිසව කුසින් අනුපම නම් පුත්රුවන වැදූ දිනයෙහි ඇත් වාහනයෙකින් මහහිනික්මන් නික්ම සියක් ලක්‍ෂයක් පුරුෂයන් හා සමඟ මහණ ව සමසක් ප්‍රධන්වීර්‍ය්‍යකොට බුදුවන දවස් එක්තරා නුවරෙක සිරිවඩු නම් සිටුදුව දුන් කිරිබත වළඳ ඉන්සළ[4] වෙනෙහි දිවාවිහාරකොට සවස්වේලෙහි සිරිවඩු නම් තවුසාණ කෙනකුන් දුන් හීතණ අටමිටක් ගෙන් ඇඹුලු බෝතුරු මුල්හි හීතණ සලා වගුරුවා අටතිස් රියන් තණපළඟ මත්තෙහි වැඩහිඳ මාර වීර්‍ය්‍ය නිර්මූලනයකොට සත්සති යවා බ්‍රහ්මමුහුතීයෙන් ඉසිපතන නම් මිගදයෙහිදී දහම්සක් පවත්වා සුරක්‍ෂිතය ධම්සෙනය යන අගසව් යුග්මයක් හා වාලාය උපවාලාය යන අග්‍රශ්‍රාවිකා යුග්මයක් ඇතිව සභිය නම් මහතෙරකෙනකුන්ගෙන් උපස්ථාන ලදින් අනූදහසක් අවුරුද්දට ආයිරි ඇති ව අට පනස්රියන් බුදුබඳින් [මුළුලෝ බබුළුවා][5] කෙළක් පමණ රහතන් විසින් පිරිවරන ලදුව දනවු සැරිසරා මුළුලොවට නිවන්පුරසිරි දෙනසේක. එකල අප මහබෝසතාණෝ විජිතාවි නම් රජ ව වසනුවෝ බුදුන් කරා එළඹ බණ අසා පහන් සිත් ඇති ව මහදන් දී දසවිධ රත්නයන් හා සමඟ සියලු රාජ්‍යය බුදුන්ට පුද සසුන් වැද මහණ ව තෙවළා බුදුවදන් ඉගෙන ධම්කථික ව ප්‍රතිපත්තීන් ප්‍රසිඩ ව ් මතු ඊට වඩා බුදු ව ප්‍රසිඩවන සේ ප්‍රාර්ථනාකොට ඔබගෙන් මේ අටලොස්වන විවරණය ලදහ. දක්වන ලදුයේ මැයි :

සද ඵුසනානං[6] ජනතං හිතෙන
මුනිම්පි ඵුසසං විජිතාවි රාජා,
පූජේසි නානා රතනාපහාය
රජ්ජඤ්ච ජේනායථ පබ්බජීතථ - යි.

තව ද ඒ ඵුස්ස නම් බුදුන් ඉක්බිති තුබු දෙයානූකපින් කපක් ගිය කල්හි මේ කල්පයට එකානූවන සාර[7] නම් කල්පයෙහි විපස්සි නම් බුදුරජාණන්වහන්සේ පාරමිතා ඇති ව තුසීපුර පැමිණ දෙව්බඹුන්ගේ අයදමෙන් එපුර සිරි වරා දඹදිව බන්ධුමතී නම් නුවර බන්ධුමා නම් රජහුගේ බන්ධුමතී නම් බිසොව කුස පිළිසිඳ දසමස් පුරා බිහි ව වැඩිවිය පැමිණ නන්දය සුනන්දය සිරිමන්තය යන තුන් මාළිගාවෙහි අට දහසක් අවුරුදු රජසිරි විඳ එක් ලක්‍ෂ විසිදහසක් පුරවධූන්ට ප්‍රධාන වූ සතන නම් අගබිසොව සමවත්තක්ඛන්ධ නම් පුත් රුවන වැදූ දිනයෙහි රථවාහනයෙකින් ක නික්ම මහහිනික්මන්කොට[8] සුවාසූදහසක් පුරුෂයන් හා සමඟ මහණ ව

1. ජනයෙන - මුද්‍රිත හැම
2. ගරුඩපක්‍ෂ - මුද්‍රිත හැම - ස.
3. දසක් - L
4. ඉන්සල් - I, කි.ඥ
5. මුළු ලෝ බබුළුවා (නැත) - පිටපත් හැම
6. පසනානං - IL
පසන්නං - BHK, ක.කි.ඥ
ඵුසනානං -J
7. සාරමණ්ඩ - L
8. රථවාහනයකින් මහබිනික්මන් නික්ම - ACEFJ

Non-Commercial Distribution

අටමසක් දුෂ්කර ක්‍රියා පුරා බුදුවන දවස් සුදසුන් නම් සිටුදුව දුන් කිරිබත වළඳ දහවල් සල්වෙණෙහි වැස සවස සුජාත නම් යවපල්ලා දුන් හීතණ අට මිටක් ගෙන බෝමැඩ කරා වැඩ පළොල් බෝතුරු මුල්හි තණ සලා වගුරුවා තෙපනස්රියන් තණපලග මත්තෙහි වැඩ හිඳ මාරබලවිධමනයෙන් බුදු ව සත්සති යවා බඹහුගේ අයදමෙන් බෙම නම් මිගදයෙහි දහම්සක් පවත්වා ක්‍රමයෙන් ඛණ්ඩය තිස්සය යන අගසවු දෙනමක් හා චන්‍ද්‍රාය චන්‍ද්‍රමිත්‍රාය යන අග්‍රශ්‍රාවිකා දෙනමක් ඇති ව අශෝක නම් මහතෙරකෙනකුන්ගෙන් උපස්ථාන ලදින් අසූදහසක් අවුරුද්දට ආයිරි ඇති ව අවට අටවිසි ගවුවෙක පැතිර දවරැ අඳුරු දුරු කොට බබළන්නාවූ ව්‍යාමප්‍රභාමණ්ඩලයෙන් පිරිවරනලද අටාසූරියන් බුදුබදින් තුන්ලෝ බබුළුවා සුවාසූදහසක් මහ සවුවන් පිරිවරා දනවු සැරිසරා ලෝවැඩ වඩනසේක. එකල අප මහ බෝසතාණෝ අතුල නම් දිව්‍ය නාගරාජන් ව කෙළගණින් දිවනයින් පිරිවරා බුදුන් කරා එළඹ සඳමඬල බිමට බටුවා සේ එපමණ මනහර රුවන් මණ්ඩපයක් නිර්මිතකොට සපිරිවර බුදුන් සතප්වා සත් දවසක් දිවඅහර දන්දී දිවමිණිරසින් දිලියෙන්නාවූ මනහර මිණිපළහක් පුද බුදුබැවින්[1] පිහිට ලබන සේ ප්‍රාර්ථනාකොට ඔබගෙන් මේ එකුන්විසි විවරණය ලදහ. දක්වන ලදුයේ මැයි :

සුදස්සනීයං ච විපස්සි නාථං
දිස්වා මහිඩ්ං අතුලොරගො සො[2]
මහග්ඝිකං සත්තමණීහි චිත්තං
සම්බොධියා දසි සුවණ්ණ පීඨං - යි.

තව ද ඒ විපස්සි බුදුන් ඉක්බිති ව තුබූ අනූකපින් පනස් නවයක් කප්[3] ගිය කල මේ කල්පයට එක්තිස් වන මණ්ඩ නම් කල්පයෙහි සිඛීය වෙස්සභූය යන සර්වඥවරයෝ දෙදෙනෙක් ලොව පහළ වූහ. එයින් මුළුලෝ සබී වූ[4] සිඛී නම් බුදුරජාණන්වහන්සේ පිරු පාරමිතා ඇති ව තුසීපුර පැමිණ දෙව්බඹුන්[5] අයදමෙන් එපුර සිරිවරා දඹදිව අරුණවතී නම් නුවර අරුණවතී නම් රජහුගේ ප්‍රභාවතී නම් අගබිසව කුස පිළිසිඳ දසමස් පුරා බිහි ව ක්‍රමයෙන් වැඩී චන්ද්‍රකය[6] සිරිගිරිය නාරිවසභය යන තුන් මාළිගාවෙහි සත්දහසක් අවුරුදු රජසිරි[7] විඳ සූවිසිදහසක් පුරස්ත්‍රීන්ට ප්‍රධාන වූ සර්වකාමා නම් අගබිසොව අතුල නම් පුත්රුවන වැදූ දිනයෙහි ඇත්වාහනයෙකින් මහබිනික්මන් කොට සැත්තෑලක්‍ෂයක් පුරුෂයන් හා සමග මහණ ව අටමසක් මහාවීර්‍යකොට බුදුවන දවස් සුදසුන් නම් නියම්ගම් පියදසන නම් සිටුදුව දුන් කිරිබත වළඳ දෙබර වෙනෙහි දිවාවිහාරකොට සවස් වේලෙහි අනෝමදස්සි නම් තාපසකෙනකුන් දුන් හීතණ අටමිටක් ගෙන බෝමැඩ කරා වැඩ ඇටඹ බෝතුරුමුල්හි තණ සලා වගුරුවා සූවිසිරියන් තණපලග මත්තෙහි වැඩහිඳ

1. බුදුබවෙහි - BGHIKL
2. උඅලොරුනාගො - ක.සි.ඤ.බෙ.ස.
3. පනස් නව කපක් - BEGHIKL - ම.ස.
   පනස් වන කපක් - ක.සි.ඤ.
4. සුබිවූ -I ක.සි.ඤ.
   ස්වකීයවූ - ACHJL
5. දෙව්බඹ - BDEFIKL,
   දෙව්බඹුන්ගේ - ACJ
6. චන්ද්‍රකය -ACDEGHKL
   චන්ධකය - I
7. රජසැපත් - ACDFJ

Non-Commercial Distribution

මරසෙනග බිඳ බුදු ව සත්සති යවා බ්‍රහ්මාරාධනා පිළිගෙන මිගාචිත නම් උයන්හි දහම්සක් පවත්වා ක්‍රමයෙන් අභිභූය සම්භවය යන අගසවු දෙනමක් හා මඛිලාය පද්මාය යන අග්‍රශ්‍රාවිකා දෙනමක් ඇති ව කෙම්කරු[1] නම් මහතෙරකෙනකුන්ගෙන් උපස්ථාන ලදින් සැත්තෑදහසක් අවුරුද්දට ආසිරි ඇති ව සියලඟරසින් දෙලොස් ගවුවක්[2] අවට දිව රැ බබුළුවා සැත්තෑරියන් උස බුදුබඳින් දිලිහිදිලිහී සැත්තෑ දහසක් මහසවුවන් පිරිවරා ලෝවැඩ වඩනසේක. එකල අප මහබෝසතාණෝ අරිඳම නම් රජ ව බුදුන් කරා එළඹ බණ අසා [පැහැද ව[3]] පිරිවර සහිත බුදුන් පවරා සත් දවසක් මහදන් දී කෙළවර දවස් අනගි වූ සළු පිරිකර පිළිගන්වා නොයෙක් හස්ත්‍යාලංකාරයෙන් තමන්ගේ මඟුලැතු සරහා බුදුන්ට පූජා කොට ඔහු උසට ගොඩකොට කප්පිය භාණ්ඩ දන් දී බුදුරජය පතා ඔබගෙන් මේ විසිවන විවරණය ලදහ. දක්වන ලදුයේ මැයි :

දිස්වා සිඛිං ඛීනභවං මුනින්දං
අරින්දමො දනමදූ නරින්දො,
[වෙලුත්තරං][4] තං පණිධාය බොධිං
හත්ථිං ච හත්ථාභරණෙහි යුත්තං-යි.

තව ද ඒ පාපෙන්ධනෛකසිඛී වූ සිඛී නම් බුදුන් ඉක්බිති එම කප වෙස්සභූ නම් බුදුරජාණන්වහන්සේ පිරූ පාරමිතා ඇති ව තුසීපුර පැමිණ දෙව්බඹ අයදමෙන් එ පුරසිරි [නොරිසි ව[5]] දඹදිව අනුපම නම් නුවර සුප්‍රතිම නම් රජහුගේ යසවතී නම් අගබිසොව කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් බිහි ව ක්‍රමයෙන් වැඩී තිස් දහසක් පුරඟනන් පිරිවරන ලදුව රුචිය සුරුචිය රතිවර්ධනය යන තුන්ප්‍රාසාදයෙහි සදසක් අවුරුදු රාජ්‍යසම්පත් විඳ සුචිත්‍රා නම් අගබිසොව කුසින් සුප්‍රබුද්ධ[6] නම් පුත්රුවන වැදූ දිනයෙහි රන්සිවිගෙයකින් මහභිනික්මන් නික්ම සැත්තෑදහසක් පුරුෂයන් හා සමඟ මහණ ව සමසක් මහාවීර්‍ය්‍යකොට බුදුවන දවස් සුචිත්‍ර නම් නියම්ගම් සිරිවඩු නම් නාගමානවිකාව දුන් කිරිබත වළඳ සල්වෙනෙහි දිවාවිහාර කොට සවස්වේලෙහි නරින්ද නම් නාරජහු දුන් හීතණ අටමිටක් ගෙන බෝමැඩ කරා වැඩ සල්බෝතුරු මුල්හි සලා වගුරුවා සම සතලිස්රියන් තණපලඟ මත්තෙහි වැඩහිඳ බුදු ව සත්සති යවා බ්‍රහ්මාරාධනාවෙන් අරුණ නම් උයන්හි දහම්සක් පවත්වා සොණය උත්තරය යන අගසවු දෙනමක් හා දමාය සුදමාය යන අග්‍රශ්‍රාවිකා දෙනමක් ඇති ව උපසාන්ත නම් මහතෙරකෙනකුන්ගෙන් උපස්ථාන ලදින් හැටදහසක් අවුරුද්දට ආසිරි ඇති ව සැටරියන් උස බුදුබඳින්[7] යුක්ත ව සැත්තෑ දහසක් මහසව්වන්[8] පිරිවරා ජනපදචාරිකා කෙරෙමින් දහම්වැසි වස්වා කෙලෙස්ගිම්[9]

1. පෙම්සරු - ACDEFJ
2. ගවු - ABDEF
3. පැහැදව(නැත) - පිටපත් හැම
4. සචීවරං - පිටපත් හැම
5. එපුර සිරි නොසිරි විඳ - ABCFGHIJKL ස.සි.සඳ
6. සුප්‍රතිබුද්ධ - I සි.සඳ
7. බදෙකින් - BGH
   බඳකින් - CEF
8. රහතන් - L
9. කෙලෙස්ගිනි - KL

Non-Commercial Distribution

නිවනසේක. එකල අප මහබෝසතාණෝ සුදර්ශන නම් රජ් ව බුදුපාමොක් මහසඟ පිරිස් පවරා සාදර සිතින් දන් සපයා අහර සිවුරු ආදියෙන් උපස්ථානකොට බුදුන්ට මනහර ගඳකිළියක් හා අවට විහාර දහසක් කරවා සපිරිවර බුදුන්ට පිළිගන්වා සියලු රජසැපත සසුන්කෙත වපුට මහණ ව බුදුබව පතා ඔබගෙන් මේ එක්විසිවන විවරණය ලදහ. දක්වන ලදුයේ මැයි :

> සයම්භුනො වෙස්සභූනාමකස්ස
> සුදස්සනො චාරුමුද්දරද්දනං,
> අදසි ජෙනාය සභික්ඛුකස්ස
> සචීවරං චාපි ස පබ්බජිත්වා[1]

තව ද වෙස්සභූ නම් බුදුන් ඉක්බිති ව තිබූ තිස්කපින් විසිනවකපක් ගිය කල්හි මතු බුදුවන මෛත්‍රී බුදුන් ඇතුළු ව පස් බුදුකෙනකුන්ගෙන් අභිවෘද්ධිදායක ව සිටි මේ මහා භද්‍රකල්පය සම්බන්ධ වූ ප්‍රථම අන්තඃකල්පයෙහි කකුසඳ නම් බුදුරජාණන්වහන්සේ පිරූ පාරමිතා ඇති ව තුසීපුර පැමිණ දෙව්බඹුන්ගේ අයදමෙන් දඹදිව මේඛලා නම් නුවර ඛේම නම් රජහට පුරෝහිත වූ අග්ගිදත්ත නම් බ්‍රාහ්මණයාණන්ගේ විසාඛා නම් වූ බ්‍රාහ්මණ දේවීන් කුස පිළිසිඳ දසමස් පුරා බිහි ව ක්‍රමයෙන් වැඩී දෙවහනන් වැනි වරඟනන් පිරිවරා කාමය කාමවණ්ණය කාමශුද්ධිය යන තුන්ප්‍රාසාදයෙහි සාරදහසක් අවුරුදු ගිහිසැපත් වළඳා තිස්දහසක් පුරඟනන්ට ප්‍රධාන වූ රොචිනී[2] නම් අගබැමිණිරුවන උත්තර නම් පුත්රුවන[3] වැදූ දිනයෙහි රථවාහනයෙකින් මහබිනික්මන් නික්ම සතලිස්දහසක් පුරුෂයන් හා සමඟ මහණ ව අටමසක් මහාවීර්‍යයකොට බුදුවන දවස් සුචින්ධර නම් නියම්ගම වජිරේන්ද්‍ර නම් බැමිණිය දුන් කිරිබත වළඳ දෙබරවෙනෙහි දිවාවිහාරකොට දිවසාවසානයෙහි සුභද්‍ර නම් යවපල්ලා දුන් හීතණ අටමිටක් ගෙන බෝමැඩ කරා වැඩ මහරී බෝතුරු මුල්හි තණ සලා වගුරුවා සූතිස් රියන් විදුරසුන් අරා[4] මර සෙනඟ බිඳ බුදු ව සත්සති යවා බ්‍රහ්මයාගේ ආරාධනාවෙන් ඉසිපතන උයන්හි දහම්සක් පවත්වා විධුරය සඤ්ජීවය යන අගසව් දෙදෙනකු හා සාමාය උපසාමාය යන අග්‍රශ්‍රාවිකා දෙදෙනෙකු ඇති ව බුඩිජ්[5] නම් මහතෙර කෙනකුන්ගෙන් උපස්ථාන[6] ලදින් සතලිස් දහසක් අවුරුද්දට ආයිරි ඇති ව සතලිස් රියන් උස බුදුබඳින් නික්මෙන්නාවූ බ්‍යාමප්‍රභාමණ්ඩලයෙන් අවට සතලිස්ගවු පමණ තන්හි දවර් අඳුරු දුරුකොට සතලිස් දහසක් මහසවුවන් පිරිවරා වෛනෙය[7] ජනයන් පිණිස දනවු සැරිසරන සේක. එකල අප මහබෝසතාණෝ ඛේම නම් නරපති ව සතලිස් දහසක් මහසවුවන් හා සමඟ බුදුන් පවරා සතලිස් දහසක් සිවුරු පිරිකර හා මහදන්දී අඳුන් ආදී වූ බෙහෙත්බඩු හා සමඟ සෙසු[8] තවුස්පිරිකර ද පිළිගන්වා සසුන් වැද මහණ ව බුදුරජය පතා ඔබගෙන් මේ දෙවිසිවන විවරණය ලදහ. දක්වන ලදුයේ මැයි :

---

1. දන්වාන සො පබ්බජි චීවරං ච - මුද්‍රිත හැම, ස.
2. සුචිනී - L
3. පුත් කුමරු - ACDEFJ
4. නැගී - ACDEFJ
5. බුද්ධිජන - ABCDEFGIJKL ස.සි.සැ.ම.
   බුද්ධිජ - පාළි
6. අත් පා මෙහෙ - ACDEFJ
7. විනෙය - බෙ.ස.
8. සෙසු - IKL බෙ.ස.

Non-Commercial Distribution

තං සච්චසන්ධං කකුසන්ධ බුද්ධං
සම්බොධියා පූජයී චීවරෙහි,
පත්තෙහි නානාවිධමොසධෙහි
ගුණෙහි සො පබ්බජිතො හි ඛෙමො යි.

තව ද ඒ කකුසඳ බුදුන් ඉක්බිති ව එම කප දෙවන අනන්‍තකල්පයෙහි කෝණාගමන නම් බුදුරජාණන්වහන්සේ පිරූ පාරමිතා ඇති ව තුසීපුර පැමිණ දෙව්බඹ අයදමෙන් දඹදිව සෝභවතී නම් නුවර යඥදත්ත නම් බ්‍රාහ්මණයාණන් නිසා උත්තරා නම් බ්‍රාහ්මණදේවීන් කුස පිළිසිඳ දසමස් පුරා බිහි ව මුළුලොව සත්රුවන් වැසි වස්වා ක්‍රමයෙන් වැඩිවිය පැමිණ සුරඟනන් බඳු වරඟනන් පිරිවරා තුසිතය සන්තුසිතය සන්තුෂ්ටය යන තුන් ප්‍රාසාදයෙහි තුන්දහසක් අවුරුදු ගිහිසැපත් විඳ සොළොස් දහසක් බ්‍රාහ්මණීන්ට ප්‍රධාන වූ රුචිගාත්‍රා නම් බැමිණිදේවීන් සාර්ථවාහ[1] නම් පුත් රුවන වැදූ දිනයෙහි ඇත්වාහනයෙකින් මහබිනික්මන් නික්ම තිස් දහසක් පුරුෂයන් හා සමඟ මහණ ව සමසක් මහාවීයඝීකොට බුදුවන දවස් අග්ගිසෙන[2] නම් බැමිණිය දුන් කිරිබත වළඳ කිහිරි වෙනෙහි දිවාවිහාරකොට සවස්වේලෙහි තින්දුක නම් යවපල්ලා දුන් හීතණ අටමිටක් ගෙන බෝමැඩ කරා එළඹ දිඹුල් බෝතුරු මුල්හි තණ සලා වගුරුවා විසිරියන් පමණ තණ ඇතිරී අරා මරසෙනඟ බිඳ බුදු ව සත්සති යවා බ්‍රහ්මාරාධනාවෙන් ඉසිපතන උයන්හි දහම්සක් පවත්වා සම්බහුලය උත්තරය යන අගසවු දෙනමක් හා සමුද්‍රාය උත්තරාය යන අග්‍රශ්‍රාවිකා දෙනමක් ඇති ව සොත්ථිජ්[3] නම් මහතෙරකෙනකුන්ගෙන් අත්පාමෙහෙ[4] ලදින් තිස් දහසක් අවුරුද්දට ආසිරි ඇති ව තිස් රියන් උස බුද්ධකායකින් යුක්ත ව තිස්දහසක් මහසවුවන් පිරිවරා ජනපද චාරිකා කෙරෙමින් වෛනෙයජන නමැති කුමුදුවන පුබුදුවනසේක. එකල අප මහබෝසතාණෝ මිළිඳු නම් නුවර පර්වත නම් නරපති ව බුදුන් කරා එළඹ බණ අසා පහන් සිත් ඇති ව බුදුන් හා සමඟ සඟපිරිස් පවරා තුන් මසක් මහදන් දී වස්අන්තයෙහි එක්තිස් දහසක් සළුපිරිකර පිළිගන්නවා මනහර මිරිවැඩිසහලක් බුදුන්ට පිළිගන්වා[5] බුදුරජය පතා ඔබගෙන් මේ නෙවිසිවන විවරණය ලදහ. දක්වනලද්දුයේ මැයි :

සදණෙන කොණාගමනම්පි දිස්වා
සම්බොධියා පබ්බතකො නරින්දො,
සදධිං අමච්චෙහි අදසි දනං
පත්තුණ්ණචීනාදි සුචීවරං ච-යි.

තව ද ඒ කෝණාගමන නම් බුදුන් ඉක්බිති මෙම කප තුන්වන අනන්‍තකල්පයෙහි කාශ්‍යප නම් බුදුරජාණන්වහන්සේ පිරූ පාරමිතා ඇති ව තුසීපුර පැමිණ දෙව්බඹුන්ගේ අයදමෙන් දඹදිව බරණැස්නුවර බ්‍රහ්මදත්ත නම් බ්‍රාහ්මණ

---

1. සාර්ථවාහන - KL
2. අග්නිසෙන - ACDEJ
3. සොත්ථිජන - ABCDEGHKL
4. උපස්ථාන - ACFGH
5. පුද - ACDEFJ

Non-Commercial Distribution

උතුමාණන්ගේ ධනවතී නම් බැමිණි දේවින්ගේ[1] කුස පිළිසිඳ දසමස් පුරා බිහි ව ක්‍රමයෙන් වැඩිවිය පැමිණ සුරලියන් වැනි වරලියන් පිරිවරා හංසවන්තය යසවන්තය සිරිනඳය යි යන තුන්ප්‍රාසාදයෙහි දෙදහසක් අවුරුදු ගිහිසැපත් විඳ අටසාලිස් දහසක් බ්‍රාහ්මණීන්ට ප්‍රධානවූ සුනන්දා නම් බ්‍රාහ්මණ දේවින් විජිතසෙන නම් පුත්රුවන වැදූ දිනයෙහි මහගිනික්මන් කෙරෙමියි සිතූ සිත හා සමඟ දෙවන සඳමඩලක් මෙන් දසදික් බබුළුවා අහසට පැනනැංගාවූ වැඩහුන් මහපායෙන් ම මහගිනික්මන් නික්ම සියක් ලක්‍ෂයක් පුරුෂයන් හා සමඟ මහණ ව සත් දවසක් මහා වීයඞ්කොට වෙසඟ මැදිපොහෝදවස් සුනන්‍ද නම් බ්‍රාහ්මණ දේවින් දූන් කිරිබත වළඳ දෙබර වෙනෙහි දිවාවිහාර කොට සවස්වේලෙහි සොමනස්ස නම් යවපාලයා දුන් හීතණ අටමිටක් ගෙන බෝමැඩ කරා එළඹ නුගබෝතුරු මුල්හි තණ සලා[2] වගුරුවා පසළොස්රියන් තණපලඟ මත්තෙහි[3] බෝකඳට පිටලා වැඩහිඳ මාරබල විධමනය[4] කොට බුඩරාජ්‍යය ලදින් සත්සති යවා බ්‍රහ්මාරාධනා පිළිගෙන ඉසිපතන උයන්හි දහම්සක් පවත්වා තිස්සය භාරද්වජය යන අග්‍රශ්‍රාවක යුග්මයක් හා උරුලාය[5] උරුවෙලාය යන අග්‍රශ්‍රාවිකා යුග්මයක් ඇති ව සඞ්මිත්‍ර නම් මහතෙරකෙනකුන්ගෙන් අත්පා මෙහෙ ලදින් විසිදහසක් අවුරුද්දට ආයිරි ඇති ව විසිදහසක් මහසවුවන් පිරිවරා විසිරියන් බුද්‍රබදෙකින් මුළුලොව බබුළුවා ජනසංග්‍රහය නිසා ජනපද චාරිකා කරන සේක. එකල අප මහබෝසතාණෝ ජෝතිපාල නම් බ්‍රාහ්මණ ව වෙදංගයෙහි හේද ගෙවා දැන සියලු ශාස්ත්‍රයෙහි අචිචායඞ් වූ ආචායඞ්භාවයට පැමිණ දඹදිවුතෙලෙහි ප්‍රසිද්ධ ව වසනුවෝ ඝටීකාර නම් අනාගාමී කුම්භකාරකයක්හුගේ මිත්‍රබලයෙන් බුදුන් කරා එළඹ බණ අසා සැපත් හැර මහණ ව වෙදත්‍රය හැර පිටකත්‍රය ඉගෙන ප්‍රතිපත්ති පූජා කොට බුදුරජය පතා ඔබගෙන් මේ සුවිසිවන විවරණය ලදහ. දක්වන ලදුයේ මැයි:

යො කස්සපස්සා පි ජිනස්ස පුජං
ගුණෙහි සම්මා පටිපත්තිජෙහි,
අකා පසිඩො වසුධම්බරස්මිං[6]
සම්බොධියා ජොතන[7] ජොතිපාලො-යි.

මෙසේ අප මහබෝසතාණෝ බුද්ධරාජ්‍යය පිණිස සතාසංඛ්‍යෙය කප්ලක්‍ෂයකින් මනෝප්‍රණිධාන නිමවා නවාසංඛ්‍යෙය කප් ලක්ෂයකින්[8] වාක්ප්‍රණිධානය නිමවා සාරාසංඛ්‍යෙය කප් ලක්‍ෂයකින් කාය වාක් ප්‍රණිධානය මුදුන්පත් කළහ. එසේ හෙයින් වදරනලද මැයි සොදත්තක නිදනයෙහි :

චින්තිතං සත්තසංඛෙය්‍යං - නවාසංඛෙය්‍ය[9] වාචකං,
කාය වාචා චතුපෙථහි - පාරං පාපෙසි පත්ථනං[10] - යි.

---

1. බැමිණි දේවින් - CDEFJ
   බැමිණිය - A
2. සලා (නැත) - ACF
3. තණ ඇතිරියෙහි - I
4. මාරසෙනඟ බිඳ - I
5. අනුලා - පාලි
6. අකා සටීකාර සහායනාග - ස.සි.සද.
   අකා සටීකාරසහායනාග - ම
7. උත්තම - ස.සි.සද.ම.
8. කල්පයකින් - ACDEFJ ස.
9. නවාසංඛෙය්‍යෙසු - මුද්‍රිත නැම
10. කායවාචා චතුසංඛෙය්‍යං - බුද්ධත්තසමුපාගමි - ස. සි. සද

Non-Commercial Distribution

මෙසේ සියලු සත්වයන් සංසාර සාගරයෙන් ගොඩ නංවා[1] අමාමහ නිවන් දක්වමි යන උදරාධ්‍යාශයෙන් යුක්ත ව ආත්මස්නේහයෙහි නිරපේක්ෂ වූ කරුණාපර මහාපුරුෂයාණන් විසින් උපනුපන් බුදුන් නොවරදවා දැක බුද්ධරාජ්‍යය පතා සර්වශක්තීන් උපස්ථානකොට විවරණ ශ්‍රී ලදින් දසවිධ පාරමිධර්මයන් පූරණය කිරීම් වශයෙන් කරනලද්දවූ මේ සියලු බුද්ධකාරක කෘත්‍යයන් සිද්ධකොට මම ද මතු ලොවුතුරා බුදු ව දසදහසක් සක්වළ තුනුරසින් බබුළුවා එපමණ ම සක්වළෙහි එකහෙළා පියුම්වැසි වස්වමින් දහම්සක් පවත්වා නවකෙළ සැටලක්ෂයක් උතුරුකොට ඇති සුවිසි අසංඛ්‍යයක් සත්වයන් මාර්ගඵලයට පමුණුවා ඔවුන් හා සමඟ අතිශාන්ත වූ අමාමහ නිවන්පුර පැමිණෙමිවා. දක්වන ලදුයේ මැයි :

එවං උදර හදයෙන මහාදයෙන
ලොකුත්තමෙන මහතා කත සබ්බකිච්චං,
කත්වාන සාධුජනතාය සහෙව හං ච
පප්පොමි සන්තතර සන්තිපුරං සුරම්මං - යි.

මෙතෙකින් සාධුජනයන්ගේ සිත් පහදවනු සඳහා හෙළුබසින් උපදවනලද මේ
සද්ධර්මාලංකාරයෙහි අභිනීහාර වර්ග[2] නම් වූ

තුන්වන පරිච්ඡේදය නිමි.

තවද මේ සද්ධර්මාලංකාරයෙහි ධම්සොණ්ඩක වර්ගය නම් කවරයත් ?

මෙතැන්හි මතු කියන්නේ එහි පළමුවන ධම්සොණ්ඩක වස්තුව ය. හේ කෙසේද යත්:

මෙසේ මේ යථෝක්ත ප්‍රකාරයෙන් මෙම කප තුන්වන අන්තඃකල්පයෙහි ත්‍රෛලෝක්‍ය කල්පද්‍රැමයක් මෙන් ලෝකයෙහි පහළවූ ද්වාත්‍රිංශද්වර මහාපුරුෂ ලක්ෂණාශීත්‍යනුබ්‍යඤ්ජන ව්‍යාමප්‍රභා කේතුමාලාලංකාරයෙන් විරාජමාන වූ විසිරියන් බුදුබඳින් තුන්ලෝ බබුළුවා විසි දහසක් අවුරුදු ආයිරි වළඳ ලෝවැඩසිටි කාශ්‍යප සර්වඥයන්වහන්සේගේ ත්‍රිවිධ ශාසනය ව්‍යවහතවූ[3] නොබෝ කාලයක් ගිය කල්හි යට කී පරිද්දෙන් බුදුබව පතා විවරණශ්‍රී ලදින් බෝධිසම්භාරපූරණයෙහි තත්පර ව දනශීලාදි වූ අගාධාපාර පාරමිතා[4] සාගරයෙහි කිමිද ඇවිදිනාවූ අප මහබෝසතාණෝ බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජහුගේ අගමෙහෙසුන්[5] බිසව කුස පිළිසිඳ දසඑකඩමස් ඇවෑමෙන් මේඝමුඛයෙකින් නික්මුණු පුන්සඳමඬලක් සේ මවුකුසින් බිහිවූහ. මෙසේ ඒ ශ්‍රීමහාබෝධිසත්වයන් මවුකුසින් බිහිවත් ම[6] සියලු සත්වයන්ගේ සිත්හි සද්ධර්මසංඥව පහළවිය. එසේ හෙයින් ඒ මහතාණන්ට දහම්සොඬ කුමාර[7] යයි නම් තුබූහ. ඉක්බිති ඒ දහම්සොඬ කුමාරයෝ මහත් වූ

1. ගොඩනගා - ACDEFJ
2. වස්තු - B
   වස්තුව - IKL
   වර්ග වස්තුව - GH
3. අන්තරහිතවූ - I
   ව්‍යවහිත - ස.
4. අගාධ පාරමිතා - FJ
   අංගදන පාරමිතා - I
   දාන පාරමිතා - A
5. අග මෙහෙස්න - I
   අග මෙහෙසින් - බෙ.ස.
6. පුන්සඳ මඬලක් සේ මවුකුසින් බිහිවත් ම - ස.
7. කුමාරයෝ - KL

Non-Commercial Distribution

රජපෙරහරින් ක්‍රමයෙන් වැඩී සොළොස් හැවිරිදි වයසට පැමිණියාහු අක්ෂරය, ලිඛිතය, ගණිතය, ගාන්ධර්වය, තර්කය, ව්‍යාකරණය, ඡන්දස්ය, නිඝණ්ටුය, අලංකාරය, ශාලිහොත්‍රය, මන්ත්‍රය, තන්ත්‍රය, යන්ත්‍රය, ආත්මොදය, ජ්‍යොති[ර්]ඥානය, පරහිතඥනය,[1] ඉතිහාසය, පුරාණය, අග්නිස්තම්භය, ජලස්තම්භය, [කෞමාරය][2], කූපශාස්ත්‍රය, සූපශාස්ත්‍රය, කාමශාස්ත්‍රය, ශාස්ත්‍රවින්‍යාසය[3], ශාස්ත්‍රකර්මය, අශ්වාරෝහණය, ගජාරෝහණය, අංකුශමාරණය, මාරණය, මෝහනය, ස්තම්භනය, උච්චාටනය, ත්‍රොටණය, දූරගමනය, දූරදර්ශනය, හෙරිත්‍රොටණය, පත්‍රච්ඡේදනය, චිත්‍රකර්මය, මාලාබන්ධය, ගන්ධයුක්තිය, ද්‍යූතය, හරනය, ස්ත්‍රීලක්ෂණය, පුරුෂලක්ෂණය, නපුංසක ලක්ෂණය, කනක පරීක්ෂාය[4], රෝන පරීක්ෂාය, චාතුර්වාදය, ධාතුවාදය, බීලවාදය, [කන්‍යාවාදය] ආකර්ෂණය, ආකාශගමනය, ශීඝ්‍රකර්මය[5], කාෂ්ඨකර්මය, හේමකර්මය, රත්නපරීක්ෂාය, කණ්ඩරණය,[6] ශූයානය, අදෘශ්‍යකරණය, පරකායප්‍රවේශය, වේණු වීණාවාද්‍යය, විෂහරණය, යන මේ සූසැට කලා ශිල්පයෙහි ද ශ්‍රුතිය, වේදය, ව්‍යාකරණය, ඡන්දෙලක්ෂණය, ශබ්දර්ථය, නක්ෂත්‍රය, ශික්ෂාය, මෝක්ෂඥනය, සිරිතය, ධනුශ්ශිල්පය, හස්තිශිල්පය, කාමතන්ත්‍රය, සාමුද්‍රිකාය, පරකථාය, නිඝණ්ඩුය, නීතිය, තර්කය, වෛද්‍යය, යන මේ අෂ්ටාදශ ශිල්පයෙහි ද එහි ම අන්තර්ගතවූ අක්ෂණවෙධිය, වාලවෙධිය, ශබ්දවෙධිය, ශරවෙධිය, දියෙහි විදමනය, ගොඩෙහි විදමනය, ආකාශ විදමනය, දුර විදමනය, ආසන්න විදමනය, යපට තඹපට විදමනය, පිදුරුබිසි වැලිබිසි විදමනය, මීහං[7] උදලු තැටිලි විදමනය, දිඹුල්පෝරු පියාපෝරු විදමනය, යනාදි වූ නොයෙක් ධනුශිල්පයෙහි ද මෙසේ සියලු ශිල්පශාස්ත්‍රයෙහි නිෂ්පත්තියට පැමිණ පියරජහු විසින් යුවරජ තනතුරෙන් පුදන ලදු ව දනශීලාදි වූ දශවිධ කුශලධර්මයන් නොකඩකොට රක්ෂාකෙරෙමින් පියරජහු ඇවෑමෙන් සියලු රාජ්‍යධූරයෙහි නියුක්තවූ වැඩ පසස්නා අමාත්‍යවරයන් විසින් ඔටුනු පළඳවා රාජ්‍යසම්පත්තියෙහි පිහිටුවනලදු ව තමන්ගේ මහත් වූ ශීලාචාර ගුණනුවණ යශෝතේජස් ප්‍රතාප රූපඓශ්වර්ය හේතුකොටගෙන පවත්වන ලද්දවූ සන්තොස ගීතිකාවන් ලෝකවාසීන් ලවා තුඩ තුඩ කියවමින් දහම්සොඬ මහරජයයි එකපැහැර මුළු දඹදිව්තෙලෙහි ප්‍රසිඩවූහ. ඉක්බිති ඒ දහම්සොඬ මහරජතෙම දිව්‍යපුරයක් හා සමාන[8] වූ බරණැස්නුවර සක්විතිරජ සැපතක් හා සාදෘශ්‍ය වූ මහත් රජසිරි විඳිමින් රාජ්‍යකරනුයේ මෙසේ තමා රජපැමිණි මසක් යෙළ මසක් ඇවෑමෙන් දවසෙක ශ්‍රීයහන් මස්තකයෙහි බඩපර්යංකයෙන් හිඳ මෙසේ සිතුසේක.[9] කෙසේ ද යත් :

---

1. පරහිතය - BDEGHIKL
2. කුංචිමාරණය - ACEFIJL ක.සි.ස.
   කුචිමාරය - BDK
   කුචිමාණේය - GH
   කොමාරය - ම.
3. ශාස්ත්‍රවින්‍යාසය - ABDE
   ශාස්ත්‍රය වින්‍යාසය - CFGHJL
   වින්‍යාසය - IK
   ශාස්‍ත්‍ර වින්‍යාසය - ක. සි. ස.
4. පරහිතඥනය - KL බෙ.
5. ශිශ්‍යකර්මය - ABDFIJKL ක.සි.ස.
   ශිශ්‍යාකර්මය - CGH
   ශික්ෂකර්මය - E
6. කණ්ඩාරණය - BIL
   කක්ෂවරණය - DE
   කක්ෂවනය - J
   කක්ෂවරත්නය - C
7. මී අං - CFJ
8. සදෘශ - I
9. සිතුයේය - ACDEFJ

Non-Commercial Distribution

සියලු සත්ත්වයන් කෙරෙහි පතළ කරුණා ඇති ලෝකස්වාමී වූ බුදුරජාණන්වහන්සේ විසින් මෙලෝ පරලෝ හඟවා[1] සත්ත්වයන්ට වැඩ පිණිස වදරනලද්දවූ සද්ධර්මය නොදන්නා ධර්ම වියෝගයෙන් යුක්ත ව මාගේ මේ රාජ්‍යශ්‍රී විඳීම ඒකාන්තයෙන් නොහොබනේ මය. මම එනාහි පෙර ජාතියෙහි අනලස් ව පුරුදු කරනලද්ද වූ දනශීලාදි වූ කුශලධර්මයන් හේතුකොට ගෙන එක්ලක්ෂ අටසැට දහසක් යොදුන් උස ඇති මහමෙර මුදුනෙහි පිහිටි දහසක් රුවන් දොරටුයෙන් හා සප්ත රත්න ප්‍රාකාර ගොපුර පඞ්ක්තීන් පරික්ෂිප්ත වූ කනක රජත මාණික්‍යමය විමානමාලාවෙන් හා නානාවිධ නාමයෙන් විසිතුරු වූ දිව්‍යමය උයන් පොකුණු ගලතල කල්පවෘක්ෂ ආදියෙන් විරාජමාන වූ අනේකප්‍රකාර දිව්‍යසම්පත්තියෙන් යුක්ත තව්තිසා දෙව්ලොව දිව්‍යරාජ්‍යයට පැමිණි ශක්‍රදේවේන්ද්‍රයා මෙන් දැන් මනුෂ්‍යයන්ට උවමනා සියලු උපයෝග පරිභෝග වස්තුවෙන් සමෘද්ධ වූ මේ බාරාණසී පුරප්‍රවරයෙහි රාජ්‍යයට පැමිණියෙමි[2] බැලූ බැලූ දෙසෙහි නෙත්කලු වූ පියකරු මනහර රූපයෙන් ද කර්ණරසායන වූ මධුරශබ්දයෙන් ද ඝ්‍රාණප්‍රසාද සංවර්ධනයට හේතු වූ කස්තුරු කපුරු ආදි වූ නානාවිධ සුගන්ධ ද්‍රව්‍යයෙන් ද දිවට පිවිතුරු[3] වූ නොයෙක් රසයෙන් ද ශරීරයට සුවපහස් දෙන්නාවූ මනෝනුකූල ස්පර්ශයෙන් දැයි මෙසේ සකල ජන කමනීය වූ[4] පඤ්චකාම සම්පත්තීන්ගේ සමෘද්ධියට පැමිණියෙමි. මහත් වූ රාජසෘද්ධි ඇතියෙමි. එතෙකුදු උවත් මෙපමණ රජසැපතක් පිණිස කුශලකරණයෙහි ප්‍රමාද බවට පැමිණීම අප වැන්නවුන්ට සුදුස්සෙක් නොවෙයි: සියලු කුශලයට ධර්මය ම මුල්වන්නේය: එසේ හෙයින් මේ ලෝකයෙහි ධර්මය දන්නාවූ යම්කිසි ධර්ම කථිකයෙක් ඇත්නම් ඔහු කෙරෙහි පහන්සිත් ඇත්තාවූ මම ශාලිව්‍රීහි යනාදීන් දක්වනලද සප්තවිධ ධාන්‍යයන්[5] හා මුතුමැණික් ආදි වූ දශවිධ රත්නයන්[6] ඔහු කැමැති පරිද්දෙන් සතුටු පඬුරු කොට[7] දෙමි මය.

ඉදින් එතෙම මාගේ ශරීරමාංස කැමැත්තේ වීනම් ඇඟ මස් ලියා දෙමි මය. ඇස් කැමැත්තේ වීනම් නිලුපුල්පෙති පරයන පස්පෑ දිස්නා ඇස් උපුටා දෙමි මය. ඉස් කැමැත්තේ වී නම් සහ ඔටුනුපළන් හිස මඟුල්කඩුවෙන් කපා දෙමින් ජීවිතයෙන් පූජා කෙරෙමි මය.

මෙසේ ශරීර ධනජීවිතාදි වූ සියල්ල ම පරිත්‍යාග කොට වී නමුත්[8] ජාති ජරා මරණාදින් දුරුකොට නිර්වාණයට පමුණුවන්නාවූ බුදුරජාණන්වහන්සේ විසින් වදරනලද සපර්‍යාප්තික නවලෝකෝත්තර සද්ධර්මය අසා මාගේ කර්ණාලංකාර කෙරෙමි මය.

තව ද මේ ලෝකයෙහි සර්වස්ථාන ව්‍යාප්ත වූ ඝනතර තිමිරපටලෝත්පාටනයෙහි සමර්ථ සහස්‍රරශ්මීන් විරාජමාන වූ බාලාර්කමණ්ඩලය අවිද්‍යමාන කල්හි ඒකාන්ධකාර වූ ගගනතලය යම්සේ නොහොබනේ ද එසේ ම නොයෙක් කෙළදහස් ගණන්

---

1. අහවා - D, මුද්‍රිත හැම
2. පැමිණියෙමි - බෙ.ස.
3. විසිතුරු - L
4. රමණීයවූ - ක.කි. කාමිනීයවූ - KL
5. ධාන්‍යයෙන් - ACFIL
6. රත්නයෙන් - ACIL
7. සතුටු කොට - BGHI
8. කොට නමුත් - J, මුද්‍රිත හැම. කොට දී නමුත් - ස.

Non-Commercial Distribution

තාරකාවන් විසින් පිරිවරන ලදු ව සකල චක්‍රවාලාන්තරයෙහි[1] අමෘතරශ්මීන් විහිදුවා[2] නභෝමණ්ඩලයෙහි පැලඹෙන්නාවූ චන්ද්‍රබිම්බය අවිද්‍යමාන කල්හි බහලාන්ධකාරයෙන් යුක්ත රාත්‍රිය යම්සේ නොහොබනේ ද එපරිද්දෙන් ම කුශලාකුශල දෙදෙනාගේ විභාගය ප්‍රකාශ කරන්නාවූ[3] සද්ධර්ම් නමැති ආලෝකය නැති ව එකාන්ධකාර වූ පෘථිවිමණ්ඩලයෙහි මාගේ මේ රාජ්‍යය කිරීම ඒකාන්තයෙන් නොහොබනේ මය.

තව ද රන්සැත් රන්පොරදු ආදි වූ නොයෙක් හස්ත්‍යලංකාරයෙන් සරහනලද සියලු අවයව සම්පත්තීන් යුක්ත ව සප්ත[ාංගභූමි] ප්‍රතිෂ්ඨිතාදි වූ සර්වලක්‍ෂණානුගත අංගප්‍රත්‍යංගයන් ඇති අභිමංගල සම්මත මංගල හස්තිරාජතෙම ඉදින් තමහට මුඛාලංකාර වූ දළ සහළ නැති කල්හි යම්සේ නොහොබනේ ද, එසේ ම නොයෙක්[4] ලක්‍ෂ සුවහස් ගණන් පෙණබුබුලු මාලාවන් හා ඔදවැඩි දැවගත්[5] හැළිඅසුන්සේ ලීලෝපෙත ව පෙළින් පෙළ දිවන[6] උත්තුංගතරංග පංක්තීන් ඇති[7] දශවිධරත්නයෙන් උජ්වලිතවූ වටින් සතිස් ලක්‍ෂ දසදහස් තුන්සිය පනස් යොදුන් සක්වළගල පැහැර සිටි සුවාසූදහසක් යොදුන් ගැඹුර ඇති මහාසාගරය වටා සිටි සඳරස් කලඹක් බඳු වූ[8] සුවිමල ධවල වෙලාන්තය හැර යම් සේ නොහොබනේ ද, තව ද සත්රුවනින් විසිතුරු මනහර වොටුන්නක් පැළඳ රන්පට රුවන්සෝළු ආදි වූ සුසැට ආභරණයෙන් සැරහුණු රජතෙම සකල ජනයන්ට ප්‍රධානාලංකාර වූ වස්ත්‍රාලංකාරයක් නැති ව හිරිඔතප්සම්පන්න සියලු ජනයන් විසින් ලජ්ජා කටයුතු විකට පාකට[9] ගුහ්‍යස්ථාන ඇති ව අහිරික දිගම්බරයකු සේ නග්න ව ඉදින් උපන්වන ම සිටියේ වීනම් යම්සේ නොහොබනේ ද, එපරිද්දෙන් ම සියලු ජනයන්ට සකලාභිමතාර්ථ සිද්ධකොට දෙන සිතුමිණිරුවනක් හා සාදෘශ්‍ය වූ[10] සද්ධර්ම් නමැති අලංකාරයක් නැති ව මාගේ මේ රාජ්‍යශ්‍රී විඳීම එකාන්තයෙන් නොහොබනේ මය.

එසේ හෙයින් සද්ධර්මය ම අසමි. සද්ධර්මයෙහි ම මාගේ සිත් ඇලෙන්නේය. මේ සද්ධර්මය[11] නැති ව සිද්ධවන්නාවූ යම්කිසි ලෞකික ලෝකෝත්තර සම්පත්තියෙක් නැත්තේ මය. චක්‍රවර්තිරාජ්‍ය සම්පත් ආදි වූ මනුෂ්‍ය සම්පත්තිය ශක්‍රසම්පත් ආදී වූ දිව්‍යසම්පත්තිය සම්‍යක්සම්බොධි සමධිගමාදිවූ නිර්වාණසම්පත්තිය යන ත්‍රිවිධ සම්පත්තිය ම සද්ධර්මය[11] මුල්කොට ඇත්තේය. සද්ධර්මයෙන් ම[12] සිද්ධ වන්නේය. යනාදීන් මෙසේ නොයෙක් කාරණ සිතුයේය. එසේ හෙයින් කියන ලදී.:

පුඤ්ඤෙන සීලාදිමයෙන පුබ්බෙ කතෙන පත්තොසමි අතන්දිතෙන,
මසක්කසාරෙ[13] විය දෙවරාජා රාජත්තමිධෙ පුරමුත්තමම්හි.

රූපෙන හාරී නයනුස්සවෙන සද්දෙන සම්මා සවනාමතෙන
ගන්ධෙන ඝානුස්සවසොභනෙන රසක්ඛදුපුඤ්ඤෙන රසෙන වාපි

1. චක්‍රවාලාන්තරාලයෙහි - බෙ.ස.
2. විහිදුවන - KL
3. ප්‍රකාශනවූ - ACDEFJ
4. නොයෙක් (නැත) - BGHI
5. දිවගත් - ACF
   දවහත් - GH
6. දවන - බෙ.ස.
7. ඇසිව - I
8. වැනිවූ - ACFJ
9. ප්‍රකට - මුද්‍රිත හැම, ස.
10. සදෘශ්‍ය - පිටපත් හැම, ක.කි.කඳ.
    සාදෘශ - බෙ.ස.
11. ධර්මය - ABCFGHJKL
12. ධර්මයෙන් - ABCFGHJKL
13. මසක්කසාරො - KL

Non-Commercial Distribution

එසෙසන ගත්‍යස්ස සුඑස්සදෙන සම්දධිපතෙනාසම් මහිදධිකොහං,
නෙවෙත්තකෙනෙව පමාදභාවමපජ්ජිතුං යුත්තරූපන්ති මන්ත්වා
දස්සාමි අඩගං අපි ජීවිතං ච ධඤ්ඤං ධනං වාපි පසන්නචිත්තො,
සොස්සාමි ධම්මං සිවමාදධානං ජිනෙරිතං ජාතිජරාපහානං

න සොභති යථාකාසං - ජලං ධාමපතිං විනා,
රජ්ජකරණං තථා මය්හං - විනා ධම්මා න සොභති

න සොභති යථා රත්ති - නිසානාථං විනා සද
රජ්ජකරණං තථා මය්හං - විනා ධම්මා න සොභති

අලංකතොපි චෙ හත්ථී - විනා දඨා න සොභති,
රජ්ජකරණං තථා මය්හං - විනා ධම්මා න සොභති.

යථා කල්ලොල මාලීයං - විනා වෙලා[1] න සොභති,
රජ්ජකරණං තථා මය්හං - විනා ධම්මා න සොභති.

යථා සුමණ්ඩිතො[2] රාජා - කප්පටො නෙව සොභති,
රජ්ජකරණං තථා මය්හං - විනා ධම්මා න සොභති.

ධම්මමෙව සුණිස්සාමි - ධම්මෙ මෙ රමතී මනො,
නහි ධම්මා පරං අත්ථි - ධම්ම මූලංහිසම්පදං - යි.

මෙසේ නොයෙක් කාරණ සිතින් සලකා උදසන්හි ම ශ්‍රීයහත් ගබඩාවෙන් නික්ම සුවඳපැන් සොළොස් කළයකින්[3] ඉස්ශෝධා නහා ලක්‍ෂයක්[4] වටනා රන්සළුවක්[5] හැඳ රන්පට රුවන්සෝලු කණ් කුණ්ඩලාභරණ[6] කණ්ඨාවතංශක ගෙලමුතුමාලා තාඩංක නාගවඩම් කාදු කාප්පු මුතුපට කටිවොඩං බාහුදණ්ඩි මිණිවළලු ගිගිරිවළලු මණිකෙවඩම් පස්රූ පස්පෙරහැර රුවන්වැල රන්සවඩි කෙයූරාභරණ ඌරුජාලා[7] හිනසැද උදරබන්ධන මකරපට පාදසංබලා පාදහරණ පායලඹ[8] පාදජාල කිංකිණිකජාල පාදංගුලි පාදශරී[9] ජඩසාවළලු පාත්‍රවළලු හස්තාංගුලි හස්තමුද්‍රිකා කෙපොට්ටු අංගදහරණ එකාවැල දහන්හු තිසරපට අවුල්හර නළල්පට වොටුනු යන මේ ආදි වූ සුසැට ආභරණයෙන් සැරහී රාජභවන පයඝීන්තයෙහි රන්රිදී තරුපෙළින් විසිතුරු වියන් බැඳ සරහනලද දිව්‍යසභාවක් හා සාදෘශ්‍ය[10] වූ ආස්ථානශාලාවට[11] එළඹ මුදුනෙහි නගන ලද ධවලාතපත්‍රයෙන් යුක්ත සිංහාසන මස්තකයෙහි බණ කියන පිණිස සුදම් දෙවු සබා මැද ධර්මාසනාරූඪ ව දිව්‍යසෙනඟ පිරිවරා හුන් ශක්‍ර දේවේන්ද්‍රයා මෙන් අමාත්‍යමණ්ඩලයා පිරිවරා මහත් වූ රාජානුභාවයෙන් දිලිහි දිලිහී හුන්නේය.

---

1. වෙලං - BCDEFGHIKL ක.කි.සැ.ම.
2. සුපණ්ඩිතො - KL
3. කළයෙකින් - ABCEJ
4. ලක්‍ෂ - ABDFJ, බෙ.ස.
5. රන්සළු - ADEFJ බෙ.ස.
   සළුවක් - K
6. කර්ණ කුණ්ඩල කර්ණාභරණ - ABEFJ
7. උරජාලා - L
8. පාදසළඹ - BGH
9. පාදශරීර - J, ක.කි.සැ.
   පාදසිරි - ම.
10. සාදෘශ්‍යවූ - පිටපත් හැම,
    සදෘශ වූ - බෙ.ස.
11. ආසනශාලාවට - ක.කි.සැ.බෙ.

Non-Commercial Distribution

මෙසේ මහත් වූ රාජතේජසින් යුක්ත ව හුන්නාවූ දහම්සොඩ රජ්ජුරුවෝ අමාත්‍යවරුන්ට කියන්නාහු 'එම්බා පින්වත් සගයෙනි මේ හුන්නාවූ රාජසභායෙහි[1] යම්කිසි කෙනෙක් බුදුන් විසින් වදරනලද්දවූ ධර්‍මයන් අතුරෙන් යම්කිසි දහම් පදයක් දනු නම් ඒ ධර්‍මය කියව, මම වනාහි දැන් බණ අසනු කැමැත්තෙමි'යි කීහ.

එවේලෙහි අමාත්‍යවරු කියන්නාහු 'දේවයන් වහන්ස, අපි ධර්මයයි යන දෙයක් දන්නා තබා සිහිනෙනුත් නොඇසූ වීරුම්හ. එබැවින් ධර්‍මය නම් කෙසේ බවත් නොදනුම්හ'යි කීහ. මෙසේ අමාත්‍යවරුන් කී තෙපුල් අසා නොසතුටු වූ රජ්ජුරුවෝ සිතන්නාහු 'මම මාගේ මඟුලැතු සරහා දහසින් බැඳි පියල්ලක් ඇත්කඳ පිට තබා නුවර බෙර පියවී කරවමි. එසේ කල්හි වස්තුයෙහි කළ ලොභයෙන් බණ දන්නා කිසිවෙක් සතර පදයෙන් යුක්ත ගාථාවෙකින් වී නමුත් බණ කීයේ වීනම් ඒ බණ ඇසීම සසර මට බොහෝ කාලයක් වන්නාවූ හිතසැප පිණිස වන්නේය'යි සිතූහ. මෙසේ සිතින් සනිටුහන් කොට ඉක්බිති තමන්ගේ මඟුලැතු සරහා ඒ ඇතු පිට දහසින් බැඳි පියල්ලක් තබා 'මේ දහසින් බැඳි පියල්ල ගෙන බණ කියව'යි කියා නුවර බෙර ලවා එසේ ද බණ දන්නා කෙනකුන් නොලැබ නැවත දෙදහසෙක තුන්දහසෙක සාරදහසෙක පන්දහසෙකැයි මෙසේ වරින්වර වස්තු දියුණුකොට නොයෙක් කෙළදහස් ගණන් වස්තු දෙමි යි කියා ද ඉක්බිති ගම් නියම්ගම් රට දනවු ආදිය දෙමි යි කියා ද නැවත සිවු තනතුරු දෙමි යි සෙනෙවිරත් පටබඳවා බොහෝ සැපත් දෙමි යි යුවරජ තනතුරු දෙමි යි වොටුනු පළඳවා රාජ්‍යය දෙමි යි කියා ද බණ කියන කෙනකුන් නොලැබ ඉක්බිති රජවෙස් හැර නුවරවැසියන් මධ්‍යයෙහි තමන් ගැති බව අස්වා කියා ධර්‍මදේශකයා හට[2] ගැති මෙහෙ කෙරෙමි යි කියා ද නුවර බෙර ලැවූහ. අහෝ මහෝත්තමයන්ගේ[3] ධර්‍ම ලෝභයක්[4] ආශ්චර්‍ය්‍ය නියා ය. මෙසේ මෙපරිද්දෙන් නොයෙක්වර මහත් වූ උත්සාහ ප්‍රයත්න කිරීමෙන් බණ දන්නා කෙනකුන් නොලදින් ඉතා කළකිරුණාවූ නොසතුටු සිත් ඇති ඒ දහම්සොඩ රජ්ජුරුවෝ 'ධර්‍මවියෝගයෙන් යුක්ත වූ මේ රාජ්‍යය සම්පත්තියෙන් මට ප්‍රයෝජන කිම් දැ'යි කියා අමාත්‍යවරුන්ට රාජ්‍ය පාවාදී බණ දන්නවුන් සොයා ඇවිදුනාහු ගම් නියම්ගම් රාජධානි පිළිවෙළින් දනවු සැරිසරා ගොස් මහත් වූ වන මධ්‍යයකට පැමිණියාහ. එසේ හෙයින් කියන ලදී :

පුරෙ භෙරිං චරාපෙත්වා - ධම්මසොණ්ඩො නරාධිපො,
සද්ධම්මජෙඩසකං සත්ථු - අලද්ධො ධනකොටිහි

දසො හොමි පහායාහං - රාජත්තං දෙසකස්ස මෙ,
ඉච්චාහ සො මහීපාලො - අහො ධම්මෙසු ලොලතා

රජ්ජං නියාතයිත්වාන - අමච්චානං මනොරමං,
වනං පාවිසි සො රාජා - ගවෙසං ධම්මමුත්තමං - යි.

---

1. සභායෙහි - BCDGHI
2. ධර්මදේශකයාට - I
   ධර්මදේශකයක්හට - බෙ.ස.
3. මහාත්මයන්ගේ - BEGH
4. ලොභයෙක - බෙ.ස.

Non-Commercial Distribution

මෙසේ ඒ ශ්‍රී මහාබෝධිසත්වයන්වහන්සේ ඉතා භයානක ස්වභාව ඇති සිංහයෝය, ව්‍යාඝ්‍රයෝය, දිවියෝය, වලස්සුය, වල්මීවුය, දශකුලෙහි ඇත්තුය, හිත්මුවෝය,[1] පසදමුවෝය, සරහමුවෝය,[2] යනාදි වූ සිව්පා ජාතීන් විසින් ද විෂඝෝර නා පොළොං දරපිඹුරු ආදි වූ දීඝීජාතීන් විසින් ද නොයෙක් කටු පහණ ගල් මුල් සෙල් බැවිල් ආදියෙන් හා මල්පල්ලෙන් සැදුම් ලද නොයෙක් වෘක්ෂ ජාතීන් ගහන වූ ප්‍රතිභය සහිත වනාන්තරයට ගොස් වන් ඇසිල්ලෙහි ඒ මහතාණන්ගේ ගුණානුභාවයෙන් ශක්‍රයන්ගේ පාණ්ඩු කම්බල ශෛලාසනය හුණු විය. ඉක්බිති ශක්‍රදේවේන්ද්‍රතෙම සිතනුයේ 'මා හුණු කැමැති කල්හි හුණු වන්නාවූ[3] සිහිල් කැමැති කල්හි සිහිල් වන්නාවූ මේ පාණ්ඩුකම්බල ශෛලාසනය ගින්නෙහි බහාලූ යවටක් සේ මා නොකැමති පරිද්දෙන් හුණු විය. මීට කාරණ කිම් දේ හෝ'යි සිතා තමාගේ දහසක් නුවණැස් ලා මිනිස් ලොව බලනුයේ පුරන ලද බෝධිසම්භාර[4] ඇති දහම්සොඬ රජ්ජුරුවන් මුළු දඹදිව බණ දන්නවුන් පරීක්‍ෂා කොට ලැබගත නොහී සද්ධර්මය සොයා වනාන්තරයට වන් බව දැක 'මේ දහම්සොඬ මහරජ තෙම සද්ධර්මය පිණිස දිව්‍යපුරයක් හා සාදෘශ්‍ය වූ රාජධානියක් හා නොයෙක් ධනධාන්‍ය සම්පත්තියෙහි ද ප්‍රේම සහිත බන්ධුවර්ගයා හා සමඟ තමාගේ ජීවිතයෙහි ද්[5] යන සියල්ලෙහි ම ආලය හැර දැන් වනාන්තරයට වන්නේය. එතෙම එසේ මෙසේ ප්‍රාමක සත්වයෙක් නොවෙයි. ඒකාන්තයෙන් මෙම කප බුදු වන්නාවූ ශ්‍රීමහා බෝධිසත්වයෙක, මෙසේ වනාන්තරයට වන්නාවූ මේ බුඩ බෝධිසත්වතෙම සද්ධර්මය නොලැබ ඉදින් කිසියම් කායික මානසික දුඃඛයකට පැමිණියේ වී නම් යහපත් නොවන්නේය. අද මා විසින් ඒ බෝධිසත්වයන් කරා ගොස් බණ කියා සද්ධර්ම නමැති අමෘතජලයෙන් අභිෂේක කොට පෙර පරිද්දෙන් ම රාජ්‍යසම්පත්තියෙහි පිහිටුවා අවමැනැවැයි සිතා තමාගේ[6] ශක්‍රාත්මභාවය හැර අඤ්ජනකූට පර්වතයක් මෙන් ඉතා නිල්වූ[7] භයංකරවූ මහත් ශරීර ඇති පර්වත විවරයක් මෙන් මහත් වූ මුඛයක් ඇති රථ හිස් දෙකක් මෙන් මහත් ව දෙකොලින්[8] නික්ම තිබෙන්නාවූ භයංකර වූ දළ සහළක් ඇති ගිනි ගෙන දිලියෙන යවට දෙකක් මෙන් මහත් වූ ඇස් දෙකක් ඇති මැදින් බිඳුනාවූ අගින් පෙතලි විරූප නාසිකාවක් ඇති සළා දිදී ඇවිළෙන ගිනි වැටක්[9] මෙන් කෲර වූ තඹ රවුලු ඇති ගිනිදුම් පහළ මළ පඹකැළයක් මෙන් ඝන වූ තද වූ දැළි ඇති ජලධරගර්භයක් මෙන් හෙවත් නිල් මහමේකුළක් මෙන් ඉතා නිල් වූ මහත් බර උදර[10] ඇති වන්බිඩි දෙකක්යේ කකුල් දැව ඇති සෙනහඬ මෙන් ගර්ජනා කරන්නාවූ

1. හිජ්මුවෝ - GHI
2. සරහමුවෝය - CD බෙ.කි.ස.
3. හුණු පවත්නා වූ - IKL
4. පාරමිතා බෝධිසම්භාර - L
5. ජීවිතය ද - බෙ.ස.
6. තමන්ගේ - FJ
7. නිල් ව - CDGIKL
8. දෙකොලින් - BC බෙ.ස.
   දෙකොහින් - ක.කි.කැ.ම.
9. යවටක් - IKL
   වටක් - CE
10. බඩ උදර - BCEFGHL

Non-Commercial Distribution

භයංකර ශබ්ද ඇති තියුණු මුවහත් ඇති කඩුපෙළක් මෙන් දික් වූ රුධිරධාරායෙන් රත් වූ නියපතර ඇති තුන් සණ ගා මුවහත් තබනලද දිගුපුළුලින් යුත් කෙහෙල්සුලපතක්සේ දකුණතින් ගත් මහත් වූ කඩුවක් ඇති එසේ ම වමතින් ගන්නා ලද නාඹතල්කඳක්සේ මහත් යගදවක් ඇති ව පිටිතොල දත් කමින් භයානක වූ ඊළි සහිත පළල් නළල් තල ඇති ව මනුෂ්‍යමාංස භක්‍ෂණය කොට රුධිර පානය කරන්නාවූ භයංකර චණ්ඩ පරුෂ රාක්‍ෂය වේශයක් මවාගෙන මෙසේ ඒ ශක්‍රදේවේන්‍ද්‍ර තෙම ශ්‍රී මහා බෝධිසත්වයන්ට අභිමුඛ ව වනාන්තර මධ්‍යයෙහි නුදුරු ව සිට තමා දැක්වූයේය. එසේ හෙයින් කියන ලදී.

ව්‍යග්ඝවජ් සීහ මහිසොරග හත්ථි දීපි
මිගාකුලං කණ්ටක සෙල රුක්ඛං
නරාහමිඤො පවිසිත්ව කානනං
ඉතොවිතො විබ්භමි ධම්මකාමො

තස්සානුභාවෙන පුරින්දදස්ස
සිලාසනං උණ්හමහොසි කාමං,[1]
තෙනෙව සො ලොක මුදික්ඛමානො
අද්දක්ඛි ධීරං විපිනෙ චරන්තං

මයජ්ජ තං ධම්ම රසෙන සම්මා
සන්තප්පයිත්වා ගමනං චරන්ති,
මන්ත්වා සුභීමඤ්ජනකූටවණ්ණං
මහාමුඛං නිග්ගත භීම දාඨං

දිත්තග්ගි සංකාස විසාල නෙත්තං
මජ්ෙඩන භග්ගං විපිටග්ඝනාසං,[2]
ඛර තම්බදාඨිං[3] සනමස්සුමත්තං
නීලොදරං ගජ්ජිත භීමඝොසං

කරොරුහං තික්ඛ සලොහිතායතං
විසාල ඩොනායත බග්ග හත්ථං,
ගදායුධෙනංකිත මස්සද බාහුං
දටෙඨාට්ඨ භීමං සවලී[4] ලලාටං

මනුස්සමංසාදන රත්තපානං
භයානකං කක්ඛළ යක්ඛ වණ්ණං,
සුමාපයිත්වාන වනන්තරස්මිං
දස්සෙසි අත්තං ස නරාධිපස්ස - යි.

---

1. මහොස කාමං (පිටපත් හැම)
2. සිපිටග්ඝනාසං - ABDEFGHIKL
3. තම්බදාඨං - AB සැ.බෙ.ස.
4. සවලිං - BCEFGHIKL

Non-Commercial Distribution

මෙසේ ශක්‍රයන් රාක්‍ෂසවේශය මවාගෙන වනමැද සිටි කල්හි බෝධිසත්වයන් වහන්සේ ද තමන්වහන්සේට නුදුරු ව අඳුන් කුළක් මෙන් ඉදිරියෙහි සිටියාවූ ඒ රාක්‍ෂසයා දුටු සේක. එබඳු භයංකර විරූප වේශධාරී වූ රාක්‍ෂයා දැක ද බෝධිසත්වයන් වහන්සේට වනාහි භයෙක් හෝ තැතිගැන්මෙක් හෝ චිත්තොත්‍රාස මාත්‍රයෙක් හෝ මඳකුත් නොවූයේ මය. එවේලෙහි කුමක් සිතූසේක් ද යත් :-

මෙබඳු භයානක ස්වරූප ඇති මනුෂ්‍යමාංස භක්‍ෂණයෙහි දක්‍ෂ වූ රාක්‍ෂසයා වී නමුත් ඉදින් ධර්මය දනී නම් යෙහෙක,[1] මම ඔහු සමීපයෙන් ඒකාන්තයෙන් ම බණ අසමි මය, ඒ ඇසූවාවූ ධර්මය සසර ඇවිදුනා මට බොහෝ කාලයක් වන්නාවූ හිත සැප පිණිස වන්නේයයි සිතූහ. මෙසේ සිතා ඉක්බිති දැන් මා ඔහු සමීපයට එළබ ධර්මය විචාළ මැනවැයි සිතා රාක්‍ෂසයා කරා එළබ ඔහු හා සමඟ කථා කරන්නාවූ මහ බෝසතාණෝ කියන්නාහු 'එම්බා මේ පුපුෂ්පිතවූ නොයෙක් ලියජාතියෙන් හා එසේ ම සුවඳ මලින් ගැවසී ගත්තාවූ සල් සපු නා[2] කොබළීල පළොල් කිණිහිරි අඹ දෙඹ ආදි වූ නොයෙක් වෘක්‍ෂමාලාවෙන් සැරහුණාවූ මේ වනාන්තරයෙහි අධිගෘහිත වූ මහානුභාවසම්පන්න දිව්‍යරාජයාණෙනි, මා සිතට උපන්නාවූ කාංක්‍ෂාවක් තොප අකින් විචාරමි, ඒ මට ඉදුරා කියව, මම වනාහි නිකමෙක මේ වනාන්තරයට ආයෙම් නොවෙමි: ප්‍රේමසහිත බන්ධුවර්ගයා හා සමඟ සියලු රාජ්‍යසම්පත්තිය[3] හැර බුද්ධභාෂිත වූ සද්ධර්මය සොයා අවුත් මේ වනමධ්‍යයට පැමිණියෙමි. එසේ හෙයින් යහළු තෙපි ඉදින් බුදුන් විසින් දේශිතවූ සද්ධර්මය දනු නම් එයින් මට එක ගාථාවෙකින් උවත් බණ කියව'යි කීහ. එසේ හෙයින් කියන ලදී :

අස්මිං වනස්මිං තරුසණ්ඩමණ්ඩිතෙ
සුපුලිතානෙක[4] ලතාකුලාකුලෙ,
අධිගාහීතොසි මහානුභාව
පුච්ඡාමි තං දෙව වදෙහි කංඛං

ධම්මං ගවෙසං වනමාගතොම්හි[5]
පහාය රජ්ජං අපි සඤාතිසංඝං,
ජානාසි චෙ සම්ම වදෙහි මය්හං
එකම්පි ගාථං සුගතෙන දෙසිතං

මෙසේ මහබෝසතාණන් කී තෙපුල් අසා ඉක්බිති රාක්‍ෂස තෙම කියනුයේ 'එම්බල මහත[6], මේ ලෝකයෙහි මූලරසය, ඛන්ධරසය, පුෂ්පරසය, ඵලරසය, යනාදි වූ නොයෙක් රසජාතීන් අතුරෙන් බුද්ධභාෂිත වූ ධර්මරසය හා සමාන අන්කිසි

1. යෙහෙකැයි - I, සි.සං.
2. සපු නා පනා - GH
3. රාජ්‍යය හැර - BCGHIKL
4. සුපුල්ලිතෙනෙක - AÇDEFIL
5. වනමාගතොස්මි - J ක.සි.සං.බෙ.ස.
ඉධමාගතොස්මි - DBGHIKL
වනමාගතම්හි - F
6. මහතාණෙනි - AF ක.සි.සං.ම.

Non-Commercial Distribution

රසයෙක් නැත: එබඳු මධුර ධර්මයෙන්[1] මම එකදේශමාත්‍රයක් දනිමි. එසේ උතුම් වූ[2] ධර්මය ඉදින් මම තොපට කීයෙම් වී නම්[3] බණ කීවාවූ මට තෙපි කවර උපකාරයක් කරව්දැ´යි විචාළේය. එසේ හෙයින් කියන ලදී:

ධම්මං පජානාමහමෙකදෙසං
ජිනෙරිතං සාධුතරං රසානං,
දෙසෙමි චෙහං තව ධම්ම මග්ගං
තුවං හි කිං කාහසි දෙසකස්ස - යි

මෙසේ ඒ රාක්‍ෂසයා කී වචනය අසා ඉක්බිති මහබෝසතාණෝ කියන්නාහු ´එම්බල පින්වත් රාක්‍ෂසය, අද මම රාජ්‍යසම්පත්තියෙහි පිහිටා සිටියෙම් වී නම් අප්‍රමාණ වූ නොයෙක් පූජා කෙරෙමි මය. දැන් මම වනාහි මට නිරන්තර වාසාභිරම්‍ය වූ ස්වර්ණ මණි කිංකිණික නාදයෙන් එකකොලාහළ වූ මඳ මඳ පවනින් ලෙල දෙන ලද නානාවර්ණ ධවජපතාක සහස්‍රයෙන් සැදුම්ලත් සියලු උපභෝග පරිභෝග[4] වස්තුවෙන් ප්‍රසාදකරවූ ප්‍රාසාද පංතීන් ද, අනේකප්‍රකාර විචිත්‍ර වස්ත්‍රාලංකාරයෙන් සමලංකෘත ව බැලූ බැලූ දෙසෙහි[5] රහමඬුලු බැඳ මධුරධවනි විහිදුනා මෘදංග වංශාදි නානාප්‍රකාර හේරිතූර්‍ය්‍යභාණ්ඩයන්ගෙන්[6] නෘත්‍යගීතවාද්‍යොපහාර කරන්නාවූ සිය දහස්ගණන් නාටකජනයන් ද, බහා පළඳනා ලද මාණික්‍යමය කුණ්ඩලාභරණ නූපුර තාඩංග රන්තෝඩු එක්වැටි පාමුදු පාසලඹ පාඩගං සදංගා ඔරවසුන් විජයවස්ත්‍ර කකුසඳ පාදංගුලි ආදි වූ නොයෙක් බිසෝපළඳනායෙන් සැරහුණාවූ සිව්සැටක් පමණ ස්ත්‍රී ලක්‍ෂණයෙන් ශෝභමාන වූ බාලපරායෙහි[7] සිටි සොළොස් දහසක් බිසෝවරුන් ද එසේ ම නොයෙක් වස්ත්‍රාලංකාරයෙන් සැරහී නුවරප්‍රදක්‍ෂිණාදී කාලයෙහි අසි සත්ති තෝමර හෙණ්ඩිවාලාදි වූ නානායුධ ගෙන පිට හිඳිනාලද ඇතරුවන්ගෙන් යුක්ත වූ කනක රජත මණි රත්නාලංකෘත විචිත්‍ර හස්ත්‍යලංකාරයෙන් සරහා නිෂාන පිට බැඳි මහ ඇත්සේනාවය. තව ද නානාවිධ[8] රත්නයෙන් විසිතුරුවූ සන්නාහසන්නද්ධ ව රන්හියවුරු පිට බැඳ මැඩිහගුදුනු එකාංශකොටගෙන හෙළා[9] මනහර සොඳුරු තෝමර අතින් ගෙන පිට හිඳිනා අසරු[10] පෙළින් යුක්ත ව නොයෙක් රත්නයෙන් අලංකෘත සියලු අශ්වාලංකාරයෙන් සරහා තම්මැට පිට බැඳි ශීඝ්‍ර ජවසම්පන්න ජාතිමන්ත අස්සේනාවය. ධනුශ්ශිල්පයෙහි දක්‍ෂ වූ ශෞර්‍ය්‍යවීර පුරුෂබලපරාක්‍රමයෙන් යුක්ත සාහසික යුද්ධක්‍ෂම වූ ධනුර්ධරයන් විසින් නැඟෙනලද නානාවර්ණ විවිධ සුරභි කුසුමදයෙන් අලංකෘත කොට රන්දද නඟා නොයෙක් රථාලංකාරයෙන් සරහන ලද්දවූ සේනාවය. තව ද නොයෙක් රත්නයෙන් උජ්ජවලිතවූ රජ් දූ[11] සන්නාහ සන්නද්ධ කඩු පළිස[12] දුනු හී පළඟ පත්තිරම් ආදි වූ අනේකවිධ ආයුධ ගත් අත්

1. ධර්මරසයෙන් - ක. කි.ඤා.බෙ.ස.
2. එසේ වූ උතුම් - ABCDEFH
එසේ උතුම් - GI
3. වීම් නම් - L, ස.
4. පරිභෝග (නැත) - IL
5. දසාවෙහි - ADFGHJKL
6. හේරිතූර්‍ය්‍යභාණ්ඩයන් ගෙන - BEGHIKL
හේරිතූර්‍ය්‍යභාණ්ඩයන්ගේ - J
7. බාලපරායණයෙහි - K
8. දසවිධ - GHIKL
9. හෙළා (නැත) - KL
10. අස්රාවුත - ABCEFGHIJKL
11. රජදූ - BF කි.ඤ.ම.
ජරදූ - ACDEGHIJKL - බෙ. ස.
12. පළිස් - CIK

Non-Commercial Distribution

ඇති ව මහවතුරක් සේ අතුරු නොහැර සිටිනා පාබලසේනාවය යනාදි වූ ප්‍රමාණාතික්‍රාන්ත චතුරංගනී සේනාව ද මුතුමැණික් පබලු වෛදූර්‍ය්‍ය මසාරගල්ල ලොහිතාංක ශංඛශිලාප්‍රවාල රජත ස්වර්ණාදි වූ දශවිධ රත්නයන් ද මෙතෙකැයි යන ප්‍රමාණයක් නැත්තාවූ දැසි දස් ගව මහිෂාදි වූ නොයෙක් උපභෝග පරිභෝග වස්තූන් ද යන මෙකී සියලු රාජ්‍යසම්පත්තියෙහි ආලය හැර ධර්මලෝභයෙන් උදකලා ව අවුත් මේ වනමධ්‍යයට පැමිණියෙමි. මාගේ මේ ශරීරය හැර අන් කවර ධර්මපූජාවක් කෙරෙම් ද: එසේ හෙයින් තොපට දියයුතු අන් කිසිවෙක් ඇත්තේ නොවෙයි: ඉදින් තෙපි මාගේ මස් ලෙහෙ කැමැත්තා නම් අද මාගේ ශරීරයෙහි මාංස රුධිරයෙන් තොපට සංග්‍රහ කෙරමි. තෙපි මට බුදුන් විසින් පසස්නා ලද සද්ධර්ම දේශනාවක් කරව'යි කීහ. එසේ හෙයින් කියන ලදී :-

රජ්ජෙ ඨිතො අස්සමහං සචෙ හො
අනප්පරූපං පකරොමි පූජං,
ඉදානි එකො වනමජ්ඣපත්තො,
කරොමි කිං දෙහමිමං ඨපෙත්වා.

යදිච්ඡසි ත්වං මම මංසලොහිතං
කරොමහං සංගහමජ්ජ තෙන,
තවත්ථි අඤ්ඤං තව අවචනීයං
දෙසෙහි ධම්මං සුගතප්පසත්ථං - යි

මෙසේ ස්වකීය වූ ශරීරමාංස පරිත්‍යාග කොට බණ අසමි යන මහබෝසතාණන්ගේ ධර්මලෝභය මහත් බව දැන ඉක්බිති රාක්‍ෂස තෙම කියනුයේ 'එම්බල මහතාණෙනි,[1] සාදුකින් පීඩිතවූ මම බණ කිය නොහෙමි, ඉදින් තොපගේ ශරීරමාංසය මා සිත් වූ පරිද්දෙන් බඩ පුරා අනුභව කොට තොපගේ ළමැද ලෝහිතාසයෙහි පුරා සිටි ලෙහෙ ගෙන උකා බී සා පිපාසා දෙක සන්හිඳුවා මඳක් සැනපීගෙන පසුව තොපට බණ කියත් පොහොසත්මි'යි කීහ. එසේ හෙයින් කියන ලදී:

භුත්වාන මංසං සුහිතො'ව සන්තො
හන්ත්වා පිපාසං රුධිරං පිවිත්වා
ධම්මං කථෙතුං පහවාමි තුය්හං
වත්තුං න සක්කොමි බුභුක්ඛිතොහං - යි.

මෙසේ රාක්‍ෂසයා විසින් කියනලද්දවූ වචනය අසා ඉක්බිති මහබෝසතාණෝ කියන්නාහු 'එම්බල කොල රාක්‍ෂසය, තෝ නන්දෙඩයි ද තා අණ ඇත්තේ මා පණ ඇත්නම් වී දැයි' කීවා සේ පළමු කොට මා මරා මස් කෑ කල පසුව තෝ තාගේ කවුරුන්ට බණ කියයිද, එසේ මා[2] වෙහෙසා නොකියා යම් කිසි උපායෙකින් තට මාංසලාභය හා මට සද්ධර්මලාභය යන දෙක එක ඇසිල්ලෙහි යම්සේ සිද්ධවේද

1. මහත - BGHIKL ස.
2. මට - BCDEFGHIJKL

Non-Commercial Distribution

එපරිද්දෙන් ඊට උපායක් දනී නම් තෝ ම පරීක්‍ෂා කොට කියව´යි කීහ. එසේ හෙයින් කියන ලදී :

හුත්වා තුවං[1] මං පඨමං හි යක්ඛ
පච්ඡා තු දෙසෙසි කස්ස ධම්මං,
ධම්මස්ස මය්හං තව මංසලාභං
තථමෙව ජානාහි යථා භවෙය්‍ය-යි.

මෙසේ මහබෝසතාණන් කී කල්හි ඒ ශක්‍රරාක්‍ෂස තෙම ´යහපත මහරජ, මම ඊට සුදුස්සක් දන්නෙමි වේදැ´යි කියා ඒ ස්ථානයට තුදුරු තැන්හි අඳුන් පැහැ වන් ඇති[2] තුන්ගවු උස මහත් ගල් පර්වතයක් මවා බෝධිසත්ත්වයන්ට කියනුයේ ´එම්බා මහරජ, මේ පර්වතයට නැගී ගල්මුදුනෙහි සිට තෙපි මාගේ මුඛයට පැනපියව, එසේ පර්වත මුදුනෙහි සිට පනන්නාවූ තොපට මම බණ කියමි, එසේ කල්හි තොපට ධර්මප්‍රතිලාභයත් වන්නේ මය. මට මා කැමැති මාංසලාභයත් සිද්ධවන්නේ´යි කීය. එබස් අසා මහබෝසතාණෝ සිතන්නාහු ´මේ අක්මුල් නැත්තාවූ සංසාරවෘත්තයෙහි ච්‍යුතිප්‍රතිසන්ධි වශයෙන් සැරිසරා මා ඇවිදුනා කල්හි සිංහ ව්‍යාඝ්‍ර වලස් මස්කැස්බන් හා මිනීමස් කන්නාවූ යක්‍ෂ රාක්‍ෂස ගිජුලිහිණි ආදීන්ට ගොදුරු වූ ජාති මෙතෙකැයි පමණ නැත. එසේ හෙයින් අද මා විසින් සම්‍යක් සම්බුද්ධයාණන් වහන්සේගේ සද්ධර්මය පිණිස ජීවිත පරිත්‍යාග කිරීම යහපතැ´යි සිතා රාක්‍ෂසයාට කියන්නාහු ´එම්බල පින්වත් රාක්‍ෂසය, ආදි කෙළවරක් නැත්තාවූ මේ සංසාර වෘත්තයෙහි ච්‍යුතිප්‍රතිසන්ධි වශයෙන් උඩුයටි ව පෙරළෙන්නාවූ ප්‍රමාණාතික්‍රාන්ත සත්ත්වයෝ රාජචෞරශත්‍රු ආදීන් විසින් වන්නාවූ අනේකප්‍රකාර දුඃඛයට පැමිණෙන්නාහ. එපරිද්දෙන් ඒ දුඃඛයට පැමිණීම යම්කිසි ආත්මාර්ථපරාර්ථසිද්ධියක් පිණිස වන්නේ නොවෙයි: ඒකාන්තයෙන් ම නිෂ්ප්‍රයෝජන වන්නේය. තව ද අර්ථබල සේනාබල කායබලයෙන් යුක්ත රාජරාජමහාමාත්‍යාදීහු මේ තෙම රෞද්‍රවූ[3] ප්‍රාණවධ කෙළේයයි කියා ද අනුන් සන්තක වස්තු සොරා ගත්තේ යයි කියා ද පරදරක්‍රියායෙහි නියුක්ත යයි කියා ද පරපීඩාවට නිසි නොසබා තෙපුල් කීයේ යයි කියා ද මේ තෙම රාඕමත් ව නොකළමනා කටයුතු කළේය යි කියා ද මෙයින් පිටත් කිසියම් දෝෂයක් කෙළේ යයි කියාද සත්ත්වයන් අල්වාගෙන සල්වසල්වා ඇඟමස් කපා ඔහු ම කවමින් සමහරුන් ඉස් සිඳිමින් සමහරුන් දිවස් උල නහමින් මෙසේ අනේකප්‍රකාර වූ දුක් දෙන්නාහ.

තව ද සමහර සත්ත්වකෙනෙක් ගසින් වැටී පර්වතයෙන් හී ප්‍රපාතස්ථානයෙන් පෙරළී වැටී දහගෙයි ලා කරපය මැසීම් අලුපෙලි බැඳීම් ආදියෙන් ද උග්‍ර වූ තද විසවිෂ අනුභව කිරීමෙන් ද[4] නොයෙක් ව්‍යාධීන් වන්නාවූ ක්‍රූරතර[5] වේදනාවෙන් ද ශීතෝෂ්ණාදි වූ විෂම සෘතු ආදියෙන් ද අනයව්‍යසනයට පැමිණෙන්නාහ.

---

1. හුත්වානත්ව - KL
2. අඳුන් පැහැ ඇති - BGHIKL
3. රුදුරුවූ - ACJ
   රුදුවූ - DEF
4. කිරීම් ආදියෙන් ද - I

1. ක්‍රූරතද - BL ක.කි.ඤ.බෙ.ස.
   ක්‍රූරවූ - F -

Non-Commercial Distribution

තව ද පෙර සිංහ ව්‍යාඝ්‍ර දරපිඹුරු කිඹුල් දැතිමුවර වලස් මස්කැසුබු ආදීන්ට ගොදුරු ව ඔවුන්ගේ උදරාභ්‍යන්තරයෙහි වැදහෙව සැලි සැලී මළාවූ මාගේ ජාති මෙතෙකැයි පමණ නැත.

එම්බල පින්වත් වූ රාක්‍ෂසය, එපරිද්දෙන් වන්නාවූ ඒ මරණ ඒකාන්තයෙන් කිසියම් ආත්මාර්ථ පරාර්ථ සිද්ධියක් පිණිස වන්නේ නොවෙයි. නිෂ්ප්‍රයෝජන වන්නේ මය. එසේ එයින් දැන් ඉතා නොසිතිය හැක්කාවූ මාගේ මේ ආත්මපරිත්‍යාගය ශක්‍ර සම්පත් බ්‍රහ්ම සම්පත් මාර සම්පත් ආදි වූ දිව්‍යෛශ්වර්‍ය්‍යයක් පිණිස නොවේ. වැළි[1] කුමක් පිණිස ද යත්? බුදුබවට පැමිණ සියලු සත්වයන් සංසාර සාගරයෙන්[2] ගොඩ නගා නිවන් නමැති අමාපුරයෙහි ගෙනහැර පිහිටවනු පිණිස ය.

එම්බා යහළු රාක්‍ෂසයාණෙනි, තෙපි මට බොහෝ උපකාරයව, එසේ හෙයින් තොප[3] කී පරිද්දෙන් ම මාගේ ශරීරමාංසයෙන් ධම්පූජා කෙරෙමි, තෙපි වනාහි ඊට කිසි සැකයක් නො සිතා මට බණ කියව, තොපගේ මනෝරථය දැන් නොබෝ ඇසිල්ලකින් ම සිද්ධ වන්නේය යි කීහ. එසේ හෙයින් කියන ලදී :

සංසාරවට්ටෙවසු විවට්ටමානා
පප්පොන්ති දුක්ඛං ජනතා අනෙකා,
එතං හි හො අත්තනො වා පරස්ස
අත්ථාය නාහොසි අහොසි තුච්ඡං

ත්වමදින්නහාරිති ච පාරදරිකො
පාණාතිපාතීසි මුසා අහාසි,
ත්වමජ්ජපායීති[4] අකාසි දෙසං
පග්ගය්හ දුක්ඛං බහුසො දදන්ති.

රුක්ඛා පපාතා පපතිත්ව කෙචි
දුබ්බන්ධියා උග්ගවිසාදනෙන,[5]
ව්‍යාධීහි නානා ඛරවෙදනාහි
මරන්ති සත්තා උතුවෙදනාහි

ව්‍යග්ඝච්ඡමච්ඡොරගකුච්ඡියම්හි
මතස්ස මෙ නත්ථි පමාණසංඛා,
එතං හි හො අත්තනො වා පරස්ස
අත්ථාය නාහොසි අහොසි තුච්ඡං

1. යළි - GHIKL ක.සි.ස.
2. සංසාරයෙන් - CDFJ
3. ඒ තොප - CDEF
4. ත්වමමජ්ජපායිනී - GH
ත්වමජ්ජපායිනී - ABCDEFIJ සි.ස.,ම.බෙ. පාලි
ත්වජ්ජපායිසි - ක.
5. උග්ගවිසාදනෙන - ABCEFGHIJ
දුග්ගවිසාදනෙන -D ස.බෙ.ස
දුබ්බවිසාදනෙන - ම.

Non-Commercial Distribution

ඵතජ්ජ මෙ දුච්චජමත්තදනං
න හොති දෙවිස්සරියාදිකස්ස,
සබ්බඤ්ඤුභාවං පන පාපුණිත්වා
සංසාරතො නිත්ථරණාය සත්තෙ

ත්වං සම්ම මය්හං බහුපකාරී
තස්මා තවේතං වචනං කරොමි,
අසංකිතො දෙසයමය්හ ධම්මං
සම්ජ්ඣතෙදනි මනොරථො තෙ-යි.

මෙසේ රාක්‍ෂසයාහට ප්‍රියවචනයෙන් ආමන්ත්‍රණය කොට තුන් ගවු උස ඇති ශක්‍රනිර්මිතවූ ඒ පර්වත[1] මුදුනට පැන නැගී අසම්භීත කේසර සිංහරාජයකු සේ භයචකිත රහිත ව වැඩසිටියාවූ මහබෝසතාණෝ "අද මම මාගේ රාජ්‍යසම්පත් හා ජීවිතය හා මේ ශරීර මාංසය ධර්මය පිණිස දෙමි, සද්ධර්මයට පූජා කෙරෙමි"යි මහත් වූ සන්තෝෂයට පැමිණ "යහළු බණ කියව"යි කියා එතෙපුල් ඇසූ රාක්‍ෂසයා විසින් බොරුවළෙක සදා සිටුවූ මහත් හුල්[2] දෙකක් සේ බිහිසුණු දරුණු දළදෙකක් ඇති පර්වත විවරයක් සේ මහත් වූ කට දල්වා සහළඟුරු ගිනිවළ දෙකක් මෙන් ඉතා භයංකර වූ තෙද යුතු රතැස් බමවමින්[3] උඩබලා සිටි කල්හි ඕහට අභිමුඛ ව සිටුහ.

ඉක්බිති සක්දෙව් මහරජතෙම ඉතා සන්තුෂ්ට ව මහත් වූ ආශ්චර්‍ය්‍යයට පැමිණ තමා මවා ගත්තාවූ ඒ භයානක[4] රාක්‍ෂස වේශය හැර නොයෙක් දිව්‍යාලංකාරයෙන් අලංකෘත වූ ශක්‍රාත්මභාවය මවාගෙන නභෝමණ්ඩල මධ්‍යගත බාලාර්කමණ්ඩලය මෙන් සියලඟ රැසින් දසදික් බබුළුවා තමාගේ ශක්‍රවිලාසයෙන් සැදී පැහැදී සිට ඒ ක්‍ෂණයෙහි ආකාශයෙන් හෙන්නාවූ මහ බෝසතාණන් වහන්සේ ආදර සහිත ව දෙඅතින් පිළිගෙන තමාගේ දෙව්ලොවට ගෙන ගොස් පාණ්ඩුකම්බල ශෛලාසන මස්තකයෙහි වඩා හිඳුවා දිව්‍යසුවඳ මල් ආදියෙන් පූජා කොට ශ්‍රී මහාබෝධිසත්වයන් වහන්සේගෙන් බණ අසා විශේෂයෙන් ම සන්තුෂ්ට ව ප්‍රසන්නාකාර දක්වා චිත්තාභ්‍යන්තරයෙහි පූරිතවූ ප්‍රීතිරස භාරය ධරාගත නොහී උද්ගාරව දෙන්නාක්හු මෙන් ප්‍රවර ගුණ මාණික්‍යාලංකෘත විසුද්ධ බුද්ධාංකුර, ත්‍රිවිධලොකහිත විධායක, විපුලතර විමල කීර්තිසාගර, සමස්ත සත්වාවතංසක, වීරවික්‍රමෛකමන්දිර, බෝධිසත්වාවතාරයාධක, චාරුභාවපඤ්ජර, රාජලො[කෙ]කශෙඛර,[5] සිද්ධධර්මපූජ්ජක[6], ධර්මාමෘතදයක යනාදීන් බෝසතුන්ට මහත් වූ ස්තුති කොට ඉක්බිති කාශ්‍යප බුදුන් විසින් අනිත්‍යාදිය[7] ප්‍රකාශකොට නිර්වාණ සම්පත්තියෙන් කුළු ගන්වා වදාරනලද්දවූ:-

1. පර්වතය - J
   පබ්බත - DI
2. යහුල් - IL මුද්‍රිත හැම ස.
3. බමමින් - ACJ ඛෙ.ස.
4. භයංකර - ස.
5. ලොකශෙඛර - පිටපත් හැම
   ලොකෙකශෙඛර - ක.කි.සං.ම.
6. පූජක - ADEFGHIKL
7. අනිත්‍යය -BGHIKL

Non-Commercial Distribution

අනිච්චා වත සංඛාරා - උප්පාද වය ධම්මිනො,
උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති - තෙසං වූපසමො සුඛො - යි.

යන මේ ගාථාවෙන් බණ කියා මහබෝසතුන්ගේ මනෝරථය මස්තකප්‍රාප්ත කොට දිව්‍යලෝකයෙහි තමන්ගේ අඩු තුන්කෙළක් දෙවඟනන් ආදි කොට ඇති මහත් වූ නොයෙක් ශ්‍රී විභූති දක්වා නැවත මහබෝසතාණන් වහන්සේ මනුෂ්‍ය ලෝකයට කැඳවා ගෙන අවුත් රාජ්‍යසම්පත්තියෙහි පිහිටුවා 'අප්‍රමාද ව බුද්ධකාරකධර්මයන් පූරණය කළ මැනවැ'යි අවවාද කොට තමන්ගේ ශක්‍රභවනයට ම ගියහ.

මෙසේ නුවණැති ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයෝ ප්‍රමාණාතික්‍රාන්ත වූ නොයෙක් ශ්‍රී සම්පත්තීන්[1] යුක්ත වූ රාජ්‍යය ද ප්‍රේම සහිත මිත්‍රපුත්‍රකලත්‍රාදීන් හා සමඟ ස්වකීය වූ ජීවිතය ද සිහි නොකොට හෙවත් සියලු සම්පත්තියෙහි ආලය හැර ලෝකස්වාමී වූ බුදුරජාණන්වහන්සේගේ ප්‍රශස්ත වූ සද්ධර්මය ම පුරුදු කරන්නාහ. ධර්මය ම අසන්නාහ. එබැවින් පින්වත් ජනයෙනි, ඉතා ස්වල්ප වූ සම්පත් ඇති ව මන්දායුෂ්ක[2] කාලයෙහි උපන්නාවූ තොප වැන්නවුන්ට දැන් බණ ඇසීම් ආදී කුශලකරණයෙහි ප්‍රමාදවීම ඒකාන්තයෙන් කාරණයෙක් ම නොවන්නේය. එසේ හෙයින් දියයුතු කිසි දනවස්තුවක් නැත ද සියලු කුශලධර්මයට මුල් වූ සර්වඥයන්වහන්සේ විසින් වදරනලද සපර්යාප්තික නවලෝකෝත්තර සද්ධර්ම සිත හෙළා අසා එම කුශලානුභාවයෙන් මතු ස්වර්ග මෝක්ෂ සම්පත්ති[3] සිද්ධකරන්ට උත්සාහ කටයුතු. කියනලදුයේ මැයි:

ඉති අමිතසිරිං වා ජීවිතං වාපි සන්තො
න සුමරියපසත්ථං ධම්මමෙවාචරන්ති,
තනුතර විභවානං අප්පමායුනමම්හා
ඉහ කුසල පමාදෙ කොනු තුම්හාදිසානං - යි

මෙතෙකින් මේ දහම්සොඬ වග
පළමුවන ධර්මසොණ්ඩක වස්තුව
කියා නිමවන ලදී.

තව ද මේ දහම්සොඬ වග දෙවන වෙස්සාමිත්තා වස්තුව නම් කවර යත් ?

මෙසේ අප බුදුහු බුදුබව පතා බෝධිසත්වභූමියෙහි සිට අනේකප්‍රකාර දුෂ්කරක්‍රියා කෙරෙමින් බුද්ධකාරකධර්මයන් මුහුකුරුවා සසර ඇවිදුනාසේක්[4] ධනපරිත්‍යාගය පුත්‍රපරිත්‍යාගය කලත්‍රපරිත්‍යාගය අඞ්ගපරිත්‍යාගය ජීවිතපරිත්‍යාගය යන පඤ්චමහා පරිත්‍යාගයෙහි කොටිප්‍රාප්ත ව ඥාත්‍යර්ථචර්‍යාය[5] ලොකාර්ථචර්‍යාය

1. ශ්‍රී විභූතීන් - GHK
2. මන්දායුෂ - ABCDGHIKL
3. සම්පත්ති - පිටපත් හැම
සම්පත් - මුද්‍රිත හැම, ස.
4. ඇවිදිනාසේක් - BCDFGHI
5. ඥාතාර්ථ චර්යාය - පිටපත් හැම

Non-Commercial Distribution

බුද්ධිවය්‍යීාය යන ත්‍රිවිධ වය්‍යීායෙහි කෙළ පැමිණ ශශ ජාතකය, සංඛපාල ජාතකය[1], හත්ථිපාල ජාතකය, සත්තුභත්ත ජාතකය, මහාජනක ජාතකය, ඣාන්තිවාදී ජාතකය, සුතසෝම ජාතකය, මූගපක්ඛ ජාතකය, ඒකරාජ ජාතකය, ලෝමහංස ජාතකය, යනාදි වූ නොයෙක් ජාති කොටිසහස්‍රයෙහි දනය, ශීලය, නෛෂ්ක්‍රම්‍යය, ප්‍රඥය, වීය්‍යීය, ඣාන්තිය, සත්‍යය, අධිෂ්ඨානය, මෛත්‍රීය, උපෙක්‍ෂායි කියනලද දසපාරමිතාය දසඋපපාරමිතාය දසපරමාර්ථ පාරමිතායයි යන සමත්‍රිංශත් පාරමි ධර්‍මයන් පූරණය කෙරෙමින් වෙස්සන්තරාත්මභාවයෙහි සිට සත් වරෙක මහපොළොව ගුගුරුවා මහ දන් දී පාරමිතාවන් කුළුගන්වා තුසීපුර පැමිණ සන්තුසිත නම් දිව්‍යරාජන් ව නොයෙක් කෙළගණන් දේවස්ත්‍රීන්[2] පිරිවරා තුන්ලෝතිලකයක්සේ වැඩසිට නෛකසහස්‍ර[3] දිව්‍යරාජයන්ගේ කිරුළුකුළු මිණිරසින් තමන්ගේ පාදපද්මයන් බබුළුවා සද්ධර්ම දේශනාවෙන් සියලු දෙවිබඹුන් ප්‍රීති කරවා සත්පනස්කෙළසැටලක්‍ෂයක් අවුරුදු ආසිරි වළඳ දිවසැපත්විඳ වසනසේක් දසදහසක් සක්වළ දෙවුබඹුන් විසින්

කාලො[යං] තෙ මහාවීර - උප්පජ්ජ මාතු කුච්ඡියං,
සදෙවකං තාරයන්තො - බුජ්ඣස්සු අමතං පදං - යි

යනාදීන් කරනලද ආරාධනා තෙපුල් අසා :

කාලං දෙසං ච දීපං ච - කුලං මාතරමෙව ච,
එතෙ පඤ්ච විලොකෙත්වා - උප්පජ්ජන්ති තථාගතා.

යනු හෙයින් පඤ්චමහාවිලෝකනය කොට දෙවිබඹුන්ට සමුදී ඇසළ මස පුර පසළොස්වක් ලද උත්‍රසල නකතින් කපිලවස්තුපුරයෙහි සුදොවුන් මහරජාණන් නිසා මහාමායාදේවීන් කුස පිළිසිඳ දස එකඩමස් ඇවෑමෙන් ලුම්බිනි නම් උයන්හි මවුකුසින් බිහි ව 'අග්ගොහමස්මි ලෝකස්ස' යනාදීන් අභීතනාද[4] පවත්වා පෙරවමස සඳ සිරින් ක්‍රමයෙන් වැඩී සොළොස් ඇවිරිදි වයසට පැමිණ සතලිස් දහසක් නාටකස්ත්‍රීන් පිරිවරා රම්‍යය සුරම්‍යය සුභය යන තුන් ප්‍රාසාදයෙහි රජ ඉසුරු විඳිමින් එකුන්තිස් අවුරුද්දක් ගිහිගෙයි වැස උද්‍යාන ගමන මාර්‍ගයෙහි දෙවෝපනීත ජරා රෝග මෘත ප්‍රව්‍රජිත සංඛ්‍යාත චතුර්විධ පූර්වනිමිත්ත සන්දර්‍ශනයෙන් ප්‍රව්‍රජ්‍යාවෙහි සාභිලාස ව යශෝධරා නම් අගබිසොව කුසින් රාහුල නම් පුත්‍රුවන උපන් දවස් රජසිරි හැර කන්ථක නම් අශ්වරාජයා පිටට පැනනැඟී මැදුම්යම්[5] මහභිනික්මන් නික්ම නේරඤ්ජරා තීරයෙහි මහණ ව :

---

1. සංඛපාල ජාතකය, හත්ථි ජාතකය -BGHIKL
2. දේව දේව ස්ත්‍රීන් - KL
3. අනෙක - BGHIKL
   නෙක -F
4. අභීත සිංහනාද - L
5. මැදින්යම - ACDEFGHJL
   මැදියම - IK

Non-Commercial Distribution

මත්‍තනිලාහෙළිතපලලවගෙග
ඳෙලා සු ලොලාළි කුලාභි ගීතෙ,
මනුඤ්ඤ නානා මිගපක්ඛිසෙවිතෙ
නිරන්තරාරද්ධ[1] මයූරනච්චෙ

නෙරඤ්ජරායොපවනාභිරාමෙ
පුප්ඵලිතානෙක තරූහි චිතෙත,
එකාකියො අද්දුතියො විවිත්තෙ
නානාවිහාරෙන කද රමාමි.

යනාදීන් වර්ණනීය වූ එම ගංඅසල සුපිපි අඹ උයන්හි සත් දවසක් ප්‍රව්‍රජ්‍යා සැපයෙන් දවස් යවා රජගහා නුවරට වැඩ ගෙපිළිවෙළින් සිහාවැඩ ලද[2] අහර වළඳ බිම්සර රජහට පිළින දී උරුවෙල් දනවූ වැඩ සාවුරුද්දක් දුෂ්කරක්‍රියා කොට සත්වන අවුරුදු වෙසහ මැදි පොහෝ ලද අහහරුවා දවස් විසා නකතින් අජපාල රුක් මුල්හි වැඩහිඳ සංසිද්ධ වූ ප්‍රාර්ථනා ඇති සුජාතාභිධාන වනිතොපනීත පායාසානුභව පූර්වාංගම ව සල්වෙනෙහි දිවාවිහාර කොට සවස්වේලෙහි [සොත්ථිය][3] නම් බ්‍රාහ්මණයකු විසින් දෙනලද කුස තණ අට මිටක් ගෙන දෙවියන් සැරහූ මගින් බෝමැඩ කරා වැඩ ඇසතු බෝමුල්හි තණ සලා වගුරුවා තුදුස් රියන් විදුරසුන් නැඟී බෝකඳට පිටලා චතුරංග සමන්විත වීර්‍ය්‍යාධිෂ්ඨානයෙන් පාදබන්ධනය කොට පූර්වලොකධාතුව බලා වැඩ හිඳ සපරිවාර මාරපරාජය කොට යාමත්‍රයෙහි ඥානත්‍රයාධිගතව අරුණෝදයෙහි බුදු ව ක්‍රමයෙන් සත්සති යවා බ්‍රහ්මාරාධනා පිළිගෙන ඉසිපතන උයන්හි දහම්සක් පවත්වා මුළුලොව සනහමින් ලෝවැඩ වඩා වෛනෙයජනයන් පිණිස බොහෝ භික්ෂු සංඝයා පිරිවරා දඹදිව ගම්නියම්ගම් රාජධානි පිළිවෙළින් දනව් සැරිසරනසේක් ක්‍රමයෙන් වැඩ කොසඹෑ නුවර සමීපයෙහි සුංසුමාර ගිරි නම් පර්වතයෙහි වාසය කරන සේක.

එකල ඒ නුවර රජ කරන කොසඹෑ රජ්ජුරුවන්ගේ[4] අග මෙහෙසුන් වූ[5] වෙස්සාමිත්‍රා නම් බිසෝකෙනෙක් රජ්ජුරුවන් හා සමඟ බුදුන් දක්නා පිණිස විහාරයට ගියාහු අනුපමෙය වූ[6] බුද්ධශ්‍රීන් දිලිහි දිලිහී වැඩහිඳ මිහිරි කටහඬ විහිදුවා බණ වදරන්නාවූ සර්වඥයන් වහන්සේගේ ධර්මදේශනා අසා පහන් සිත් ඇති ව ශරණශීලයෙහි පිහිටා බුදුන් කෙරෙහි මමත්වය ඇති ව වෙසෙති. ඉක්බිති ඒ කොසඹෑ රජ්ජුරුවන්ගේ රාජ්‍යය ගන්නා පිණිස පසල් නුවරෙක[7] වසන්නාවූ රජ්ජුරු කෙනෙක් යුද්ධයට සැරහී සේනාවාහන සන්නද්ධ ව අවුත් නුවර සමීපයෙහි කඳවුරු බැඳගෙන හිඳ රජ්ජුරුවන්ට කියා එවන්නාහු 'රාජ්‍යය හෝ දෙව. නොහොත් අප හා සමඟ සටන් හෝ කරව'යි කියා තමන්ගෙන් දූතයන් හා සමඟ පත් ලියා එවූහ.[8]

එපවත් අසා කොසඹෑ රජ්ජුරුවෝ 'අනිස, මාගේ ජීවිතය තිබියදී අනිකක්ට රාජ්‍යය දෙම්'දැයි මහත් වූ රාජාභිමාන උපදවා තුමූ ද යුද්ධයට සැරහී සිව්රඟ සෙනඟ පිරිවරා සංග්‍රාමභූමියට යන්නාහු බිසොවුන් හා සමඟින් ම ගොස් එක්

---

1. රංග - ක. සි.ඥ
2. සිහන ලද - HKL ක.කි.
සිහා ලද - ම
3. ස්වස්තික -ABCDEGHJL
ස්වස්ති -F
4. රජ්ජුගේ - IK, ක. සි. ඥ.
5. මෙහෙසුන් - ACDEFGIJ, ක. සි. ඥ.
අගමෙහෙසින් - BH බෙ. ස.
6. අනෝපමෙය්‍ය - CGHJKL
7. නුවර - BGHIK ක. සි. ඥ.
දනවුවෙක - L
8. යවූහ -BGHIKL ක. සි. ඥ

Non-Commercial Distribution

තැනෙක්හි කඳවුරු බැඳ ලැගුම් ගෙන යුද්ධයට වදනා දවස් බිසොවුන් ළහට කැඳවා 'එම්බා සොඳුර, සටනෙහි ජය පරාජය නම් කවුරුන්ට බවත් නොදැනෙයි. එබැවින් ඉදින් මට පරාජයෙක් වී නම් පළමු කොට ම රත් පතාකයක් ඔසවා බඳවමි. ඒ සලකුණෙන් තෙපි කොසඹෑ නුවරට ම වහා පලා යව'යි කියා බිසොවුන්ට අවවාද කොට ඉක්බිති යුද්ධයට සැරහී මහමේ[1] ගිගුම් ගත් සමුද්‍රයක්සේ ඩවුර[2] සක් සින්නම් පංච ලොහොබෙර තලප්පර විරන්දම් රණරගඝෝෂාදිවූ සියලු හෙරිතූර්‍යභාණ්ඩයන් එකවිට ඝෝෂා කරවා චතුරංගිනී සේනාව විසින් පිරිවරනලද්දූ ව පවන්වේගයෙන් හැළලී ගොඩගමන් ගත් සමුද්‍රරාජයාගේ යුද්ධමණ්ඩලයට ගොසින් සිටගත්හ.

එකල්හි 'නානායුධ ගත් අත් ඇති ඒ සතුරන් දැක අඩි පසු නොලම්හ'යි එඩිතර ව නොමඳ වූ මදයෙන් උඩඟු වූ සිත් ඇති මහ ඇත් සෙනඟක්සේ දප්සරුව දෙපෙළ ඇනිලා[3] සිටි දෙසෙනඟ ඔවුනොවුන් දැක මහත් වූ සිංහ සමාන වික්‍රම දක්වා වහසි බස් බෙණෙමින් සාහසික ව[4] දිව අවුත් බිහිසුණු දරුණු මරසෙනඟක්සේ ඔවුනොවුන් හා සටනට වැදගත්හ. එවේලෙහි කොසඹෑ රජ්ජුරුවෝ කඩු පළඟ අතලා අසණිපාතයක්සේ දිවගෙන ගොස් රුපුසෙනඟ මධ්‍යයට පැන කෙසෙල් වනයකට වන් මතැත්පොව්වකුසේ සතුරු සෙනඟ ඇන හෙළමින් අසුන් ලුහුබඳවා බඳ මැදින්[5] අලමදන්සේ දෙකඩ කොට පොලුගසමින් ඇතුන් සොඬ සොඬල[6] සේ කපා ඉසිමින්[7] මෙසේ මහත්[8] යුද්ධ කරන්නාහු එනෙකින් මතු තමන්ට පරාජය වන බව දැන බිසවුන් සිහි කොට ඔවුන්ට පෙනෙන පරිද්දෙන් රත්පතාකයක් නංවා සටන් කෙරෙමින් ගොස් රණ දෙරණ සැතපුණාහ.

ඉක්බිති ඒ වෙඝසාමිනා නම් බිසවු සටන් කරන දසාව බල බලා සිටියාහු රත් පතාකය දැක[9] මාගේ ස්වාමිපුත්‍රයාණන්වහන්සේට ඒකාන්තයෙන් ම පරාජය වනැ'යි සිතා හයින් තැති ගෙන කොසඹෑ නුවර බලා නික්මුණාහ. එවේලෙහි සතුරු රජ්ජුරුවන්ගේ සේවකයෝ සැහවී නුවර බලා නික්මුණාවූ බිසොවුන් දැක කොසඹෑ රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසොවුන් බව දැන තමන්ගේ රජ්ජුරුවන් කරා ගෙනවුත් දැක්වූහ. එවිට රජ්ජුරුවෝ බිසොවුන්ගේ රූපශ්‍රී[10] දැක දර්ශන සංසර්ගයෙන් බැඳී ඔවුන්[11] කෙරෙහි පිළිබඳ සිත් ඇත්තාහු 'මේ බිසොවුන් මහත් වූ අභිෂේක මඟුලින් දැන් ම මට අගමෙහෙසුන් කරව'යි[12] කියා අමාත්‍යවරුන්ට විධාන කළහ. මෙසේ රජ්ජුරුවන්ගෙන් නියෝගලත් අමාත්‍යවරු එක් ව අභිෂේක මඟුල් සරහා අගමෙහෙසුන් තනතුරට පමුණුවනු පිණිස බිසොවුන්ට යාච්ඤා කළහ. එකල්හි බිසව් ඇමතියන් කී තෙපුල් අසමින් ම 'එම්බා කුඩාචාරිනි, මට අභිෂේකයෙන් ප්‍රයෝජන කිම් ද, එබැවින් තෙපි යව'යි කියා අගබිසෝ තනතුරු නොකැමැති වූහ. ඇමතියෝ එපවත් රජහට දැන්වූහ. එකල රජ්ජුරුවෝ බිසොවුන් ළහට කැඳවා 'එම්බා දේවිනී කවර කාරණයක් සඳහා අගබිසෝ තනතුරු නොකැමැත්තා දැ'යි[13] විචාළහ. එබසට බිසව් කියන්නාහු 'දේවයන් වහන්ස, ඉදින් මා අභිෂේක නො කැමති කාරණා අසන්නා කැමැතහොත් මා කියන්නා වූ මේ වචනය ඉඳුරා ඇසුව මැනව. මට සියලු ඓශ්වර්ය ගෙන දුන් මාගේ ස්වාමිපුත්‍ර වූ එබඳු රජ්ජුරුවන් වහන්සේ අද ම ස්වර්ගලෝක යාත්‍රාවට පැමිණියේක. ඒ

1. මහමේඝයෙහි - ස.
2. ඩගුර - AEFJ
3. අණිලා -CFGGHI
4. සහසිව - BEGHIK
5. කඳ මැදින් -BGHIKL
6. සොඬලති -L
සොඬලු - ස.,
7. ඉස්මින් - ACEFJ
8. මහත්වූ -GH
9. රත් පතාකය බැඳ සිටුවා තිබුවා දැක - ස.
10. රූපශ්‍රිය - BGHIK
11. උන් - KL
12. කරව් යයි - බෙ. ස.
13. නො කැමැත්තාහු දැයි -L

Non-Commercial Distribution

රජ්ජුරුවන්වහන්සේ මට අභිෂේක මඟුල් කොට සොළොස් දහසක් බිසෝවරුන්ට නායක වූ අගබිසෝ තනතුරට පමුණුවා[මා][1] තමන්වහන්සේගේ ළයක්සේ සිතා මෙතෙක් කල් මුළුල්ලෙහි ජීවිතයක්සේ රක්‍ෂාකළසේක. දැන් උන්වහන්සේ සිහිකරන්නාවූ මාගේ කායචිත්ත දෙක වියෝග ශෝක නැමැති ගිනි ගෙන දවන්නේය. ඉදින් දේවයන්වහන්ස, දැන් මම අන් රජක්හට අග්‍රමහිෂිකා[2] වීම් නම් ඒ රජහටත් මෙබඳු ව්‍යසනයක් පැමිණි කල්හි නැවතත් ඒ දුකින් කෙසේ නම් මිදෙම් ද: එසේ හෙයින් අගමෙහෙසුන් තනතුරු නොකැමැත්තෙමි. දැන් මම වනාහී වියෝග ශෝක නමැති ගිනි ගෙන දිලිසෙන්නාවූ ශරීර ඇතියෙමි. එසේ හෙයින් දැන් මේ ශෝකය[3] මතුවන්නාවූ ශෝකය කෙසේ නම් දුරුකෙරේ ද[4] එබැවින් ගිනි නිවනු කැමැත්තාවූ කවර නම් නුවණැති පුරුෂයෙක් ඇවිළෙන ගින්නෙහි පිදුරු බහා ලන්නේදැ'යි කීහ. ඒ බව ප්‍රකාශකොට දක්වනු පිණිස කියනලදී.

සුණොහි සාධුකං දෙව - භාසමානාය මෙ වචො,
හන්ත්වා මය්හං මනො අජ්ජ - සබ්බසම්පත්තිදායකො.

කත්වාන සො'භිසෙකං මං - අත්තනො හදයං විය,
පාලෙසි තං' සරන්තස්සා - සොකග්ගි දහතෙ මනං

මහාරාජ සචක්ඛුස්ස - අඤ්ඤස්ස මග්ග මහෙසිකා,
මහා දුක්ඛා න මුඤ්චාමි - තෙනාහං තං නපත්ථයෙ.

සොකග්ගිනා පදිත්තාහං - සොකො[5] සොකං කථං ඛිපෙ,
ජලන්තග්ගිම්හි කො නාම - පලාලං පක්ඛිපෙ බුධො - යි.

මෙසේ බිසවුන්[6] කී බස් අසමින් ම ක්‍රෝධයෙන් මඩනාලද සිත් ඇත්තාවූ රජ්ජුරුවෝ 'ඉදින් තෝ අභිෂේක නොකැමැත්තෙහි නම් දැන් ම තී අල්වාගෙන ගින්නට දමා වධ කොට මරමි'යි උදහස් ව මහත් වූ දරසෑයක් බඳවා දෙකෙළවරින් ගිනි අවුළුවා දෙගිනි සා ව ගිනි ඇවිළගත් කල්හි බිසොවුන් කැඳවා 'එම්බල කෙල,[7] තෝ තීගේ මළාවූ සැමියා පතා හිඳිනා කල තෙල ගින්නට පැනපියව'යි කීහ. එබස් අසා බිසවු ගින්නෙහි දැවන් අච්චට පෙරළුවාසේ මහත් වූ චිත්තපීඩාවට පැමිණ රජ්ජුරුවන්ට යාච්ඤා කොට කියන්නාහු 'දේවයන් වහන්ස, කිසි වැරැද්දක් දෝෂයක් නැත්තාවූ නිරපරාධ[8] සත්‍වයන් මෙසේ ඇවිළෙන ගින්නෙහි බහා වධකොට මැරීම ඒකාන්තයෙන් ම මහත් වූ අකුසල් වන්නේය. එබැවින් ඒ අකුශලයාගේ විපාකය මතු ඉහලෝක පරලෝක දෙක්හි ම මහත් වූ අවැඩට කාරණ වන්නේය. හේ එසේ මය.

තව ද දේවයන්වහන්ස, පුරාතනයෙහි රජදරුවන්[9] විසින් ශ්‍රමණ බ්‍රාහ්මණයෝය මව්පිය දෙදෙනාය බාල දරුවෝය රෝගව්‍යසනාදියෙන් පීඩාවට පැමිණි සත්‍වයෝය. ස්ත්‍රීජාතීහුය යන මේ සත්වැදෑරුම් වූ මනුෂ්‍යයන් විෂයෙහි වධබන්ධන කිරීම හෙවත් මැරීම පසස්නා ලද්දේ නොවෙයි. නීතිශාස්ත්‍රයෙකත් නොකීහ. එබැවින් මම වධ විඳීමට සුදුස්සෙම් නොවෙමි'යි කීහ. එසේ හෙයින් කියනලදී:-

පාපො නිප්පාපිනං රාජ - පාතනං බහු පාවකෙ,
හොති පාපඵලං තස්ස - පච්චනෙත ච පරත්ථ ච.

---

1. මට - පිටපත් හැම.
2. මහේෂිකා -AFGHJ
3. දැන් මම මේ ශොක -I
4. කෙරෙම්ද -ACFIHL -ස කෙරෙන්ද - BDGHJ
5. සොකො - පිටපත් හැම සොකෙ - මුද්‍රිත හැම ස. පාලි
6. බිසව් - KL
7. කෙල්ල - K බෙ. ස.
8. නිරපරාධවූ -ACFJ
9. රජ්ජුරුවන් - බෙ. ස.

Non-Commercial Distribution

පුරාතනෙහි භූපාල - සමණෙ බ්‍රාහමණෙපි ච,[1]
මාතා පිතුසු බාලෙසු - රොගෙනාතුර ඉත්ථිසු,
තප්පසත්‍ථෝ වධො දෙව - තස්මාහං න වධාරහා - යි.

මෙසේ සියලු ශාස්ත්‍රයෙහි නිපුණ මහපණ්ඩිතකෙනකුන්සේ බිසවුන් විසින් කියනලද්දවූ නොයෙක් කාරණයන් අසා ද නොපසුබස්නාවූ ක්‍රෝධ ඇති රජතෙම 'තෙල තෙල්ලගේ දැත්[2] දෙපය මිරිකා අල්වාගෙන තෙල ගිනිමැලයට දමාපියව'යි කියා එතැන්හි සිටියවුන්ට විධාන කෙළේය. එකල්හි රජහුගෙන් නියොග ලද්දවූ[3] රාජපුරුෂයෝ සැපයෙන් වැඩී ඒ සිවුමැලි බිසොවුන් මල්දමක්සේ දැත් දෙපය[4] මිරිකා අල්වාගෙන ගිනිදෙවියාට දෙන බිලියක්[5]සේ ගෙනගොස් සළාදිදී ඇවිළ නැඟෙන ගිනිමැලයට දැමූහ.

මෙසේ ගින්නට දමන වේලෙහි එබිසව් සිතන්නාහු 'මෙතැන්හි මට අන්කිසි පිළිසරණෙක් නැත්තේය. තිසරණ ම සරණ කෙරෙමි'යි සිතා බුත්සරණ යෙමි, දහම්සරණ යෙමි, සඟසරණ යෙමි' යි කියමින් එකාවන් සිහින් ද සිහිකෙරෙමින් ගින්නෙහි වැටී හුණුවාහ. ඉක්බිති අවීචි මහ නරකයෙන් පොළොව පළා ගෙන නැඟී මහගිනි කඳක් සේ ගුගුරවමින් සළා දිදී ඇවිළ නැඟෙන්නාවූ එබඳු ගිනිමැලය බිසොවුන්ගේ ශරීරයෙන් රෝමකූප මාත්‍රයකුත් හුණු කොට ගත නුහුණුයේ මය.

බිසව් වනාහි රත්පියුම්[6] ගබකටවන් සවණිහංසධේනුවක් සේ ඉතා සිහිල් ශරීර ඇති ව රත්පළසක් පෙරවගෙන ශ්‍රී යහන් මතුයෙහි සැතපෙන කලක් පරිද්දෙන් ඇවිළෙන ගිනිසළා මධ්‍යයෙහි කිසි පීඩාවක් නැති ව සැපසේ හොත්තාහ. ඒ ආශ්චය්‍ය්‍රීය දැක රජ්ජුරුවෝ 'අනේ මා කෙළේ කිමි දෝ හෝ'යි සිතමින් භයින් තැතිගෙන ලොමුදැහැගත් ශරීර ඇති ව බිසොවුන් සමීපයට වහා දිවගෙන ගොස් ගින්නෙහි හුණු දරු කෙනකුන් දැක දැන සලා මුරගාමින් වෙලෙව් ව[7] වඩා ගන්නා පෙම්බර මවක සේ බිසොවුන් දෙඅතින් ඔසවා ළෙහි හොවාගෙන තමන්ගේ රාජාසන මස්තකයෙහි වඩා හිඳුවා දෙහොත් මුදුනෙහි තබාගෙන ක්‍ෂත්‍රිය කන්‍යාවක දුටු චණ්ඩාලයකුසේ ආදරයෙන් නැමී එකත්පස්ව සිට 'ස්වාමිදියණියෙනි, මෙබඳු මේ ගිනිමැලය කවර කාරණයෙකින් තුඹගේ කවර ආනුභාව විශේෂයෙකින් දැන් මේ ශරීරය දවාපිය නුහුණුයේදැ'යි විචාළහ.

1. සමණාබ්‍රහ්මණෙසු ච - CD මුද්‍රිත හැම, ස. පාලි
2. දැත -BDEGHIKL
3. ලද්දනු - E මුද්‍රිත හැම ස.
4. දෙපා - BEGHIK
5. බලියක් - ACE
බිල්ලක් - BIKL
බිලියමක් - H
6. රත්පියුම් - BCDFGHIK
7. එවේලෙහි - ACDEFJ ක.කි.සැ.බෙ.ස.
ළෙහි - ම.

Non-Commercial Distribution

එවේලෙහි බිසව් කියන්නාහු "එසේ වී නම් ඇසුව මැනව දේවයන්වහන්, මේ ලෝකයෙහි සත්වයන්ට කිසියම් භයක් පැමිණි කල්හි බුත්සරණය දහම්සරණය සඟසරණය යන තුණුරුවන් සරණ හැර මවුපියන් ආදි වූ අවශ්‍ය බන්ධුහු ද අවශේෂ නෑයන් හා පරිවාර ජනයෝ ද එකාත්මික වූ මිත්‍රජනයන් හා මහේශාක්‍ය දේවතාවෝ ද මන්ත්‍ර ඖෂධ ආදීන් හා එයින් පිටත්[1] අන්‍ය වූ බලිබිලි යාගකිරීම් ආදි වූ සෙසු ශාන්ති විධිහු ද යන සියල්ලෝ ම පැමිණියාවූ ඒ භයට පිහිට ව ඔහු රැකගත නොහෙන්නාහ. එබැවින් දේවයන්වහන්ස, මම වනාහී ඒකාන්තයෙන් ම මට පිළිසරණයයි කියා බුඩධම් සංඝ යන තුනුරුවන් සරණ ගතිමි. ඒ තුනුරුවන්ගේ ආනුභාවයෙන් මෙසේ දීප්තිමත් ව ඇවිළෙන්නාවූ මෙබඳු මේ ගිනිමැලය මාගේ ශරීරය දවන්නා තබා රෝමකූප මාත්‍රයකුත් හුණුකොට ගත නුහුණුයේ මය.

මෙබඳු මහානුභාව සම්පන්න වූ ගෙන්වා දැක්වියයුතු ආශ්චර්ය ඇති ඉතා ප්‍රත්‍යක්ෂ වූ අනේකප්‍රකාර උපද්‍රව විධමනය කොට සියලු සම්පත් ගෙනහැර දෙන්ට සමර්ථ වූ තුනුරුවන් සරණ වනාහි යම් කිසිවෙක් සමාදන වසයෙන් නොගනී ද එසේ වූ අඥන සත්වතෙම මෙලෝපරලෝ දෙකින් ම කිසියම් සැපයක් නොලබන්නේය. ඉදින් යම් සත්වයෙක් සමාදන වශයෙන් තුනුරුවන් සරණ ගත්තේ වී නම් එබඳු උත්තම නුවණැති[2] සත්වතෙම ඉහලෝක පරලෝක දෙක්හි ම[3] සියලු සැපයෙන් නොපිරිහෙන්නේ මය. එසේ හෙයින් දේවයන්වහන්ස, නුඹ වහන්සේ ද මෙතැන් පටන් තිසරණ ගතමැනව. ඒ[4] නුඹවහන්සේට හැමතැන්හි ආරක්ෂා නමුදු වෙයි, නිලියන ස්ථාන නමුදු වෙයි. පිහිට නමුදු වෙයි යනාදීන් තුනුරුවන්ගේ ගුණ සඳමඬල අඳනා සේ විස්තර කොට රජ්ජුරුවන්ට කියා ගාථාවෙන් දක්වන්නාහු:-

මාතා පිතා ච ඤාතී ච - පරිවාරා ච සොහද,
මන්තොසධාදයො චා'පි - මහෙසක්ඛා ච දෙවතා

එතෙවඤ්ඤෙ ච භූපාල - සත්තානං භයමාගතෙ,
රක්ඛිතුං නෙව සක්කොන්ති - හිත්වාන සරණත්තයං.

එවං මහානුභාවං තං - පච්චක්ඛං එහිපස්සිකං,
නානොපද්දව විධංසිං - නානා සම්පත්ති දායකං.

සරණත්තයං හි යො සත්තො - සුසමාදය ගණ්හති,
ඉධ වා පරත්ථ වා ලොකෙ - සො සුඛා න විහායති.

තස්මා තුවම්පි භූපාල - ගණ්හාහි සරණත්තයං,
තං තෙ හවති සබ්බත්ථ - තාණං ලෙණං පරායණං-යි.

---

1. පිටත් (නැත) -BDEGHIKL
2. නුවණැති (නැත) -BGHIKL
3. දෙකින් - පිටපත් හැම
4. එම -ABDEFI, ස.

Non-Commercial Distribution

මෙසේ චිත්‍රකථික[1] වූ ධර්මකථික කෙනකුන්සේ අසම්භීත ව බිසොවුන් විසින් කියන ලද්දවූ තුනුරුවන්ගේ ආනුභාව විශෙෂය අසා පහන් සිත් ඇති රජ්ජුරුවෝ ඒ බිසොවුන් ක්ෂමා කරවා මහත් වූ සත්කාර කොට 'අද පටන් නුඹ මාගේ මෑණියන් වහන්සේ ය'යි කියමින් බිසොවුන් තමන්ට මවුතනතුරෙහි තබා තුමූ ද තිසරණ පිහිටියාහ. එතැන්හි රැස්වූ මහජනයෝ ඒ ආශ්චර්යයීමත් පෙළහැර දැක ශරණශීලයෙහි පිහිටා එතැන් පටන් දනාදි[2] වූ කුශල සම්භාරයන් රැස්කොට තම තමන්ගේ කම් වූ පරිද්දෙන් ස්වර්ගපද පරායණ වූහ.

මෙසේ එබිසව් උතුම් වූ ශරණශීල මාත්‍රයක් ඉගෙන එම තිසරණානුභාවයෙන් එබඳු ඇවිළ නැඟෙන්නාවූ ගිනිදැල් මධ්‍යයට[3] පැමිණ පවා සිහිල් හෙල්මැලි කලබක් මධ්‍යයට වන්නා සේ කිසි පීඩාවකට නොපැමිණ ඉතා සිහිලස[4] සැපය ම ලදහ. එබැවින් පින්වත් සත්වයෙනි, උතුම් වූ ශරණශීලය නිරන්තරයෙන් රක්ෂා කරන්නාවූ තෙපි ඇම සසර සිටිනා තෙක් කල් මුළුල්ලෙහි වින්දයුතු භව භොග සම්පත් හා කෙළවර වින්දයුතු නිවන් සම්පත් කෙසේ නම් නොලබව් දඃ ඒකාන්තයෙන් ම ලබන්නාහු මය. එසේ හෙයින් තිසරණ පිහිටා ශරණශීලය රක්ෂා කොට මෙලොවින් වන්නාවූ සියලු උපද්‍රවයෙන් මිදී මතු ස්වර්ග මොක්ෂ සම්පත් සිධකරන්ට උත්සාහ කටයුතු. කියන ලදුයේ මැයි:

ඉති සරණවරං සා කෙවලං උග්ගහෙත්වා
ජලිත දහන මජ්ඣෙ සීතිභාවං අලත්ථ
පරම සරණ සීලං පාලයන්තා කථං වො[5]
න ලභථ භවභොගං නිබ්බුතිඤ්චාපි අන්තෙ-යි.

මෙතෙකින් මේ දහම්සොඬ වග
දෙවන වෙස්සාමිත්තා වස්තුව
කියා නිමවන ලදී.

1. චිත්‍රකථී - ACDEF
2. දානශීලාදි වූ - GH ;
3. මැදට -KL
4. සීතල -ADE කැ.කි.ඝ.බෙ.ස. සිහිල් වූ - ම.
5. හො - BGHIKL

Non-Commercial Distribution

තව ද මේ දහම්සොඬ වග තුන්වන මිගලුද්දක වස්තුව නම් කවර යත්:

යටගිය දවස මේ මහාභද්‍රකල්පයට එක්තිස්වන කල්පයෙහි සිඛී නම් වූ එක් සම්‍යක් සම්බුධ කෙනෙකුන් වහන්සේ දන ශීලාදි වූ සියලු බුද්ධකාරක ධර්‍මයන් පූරණය කිරීමෙන් මස්තකප්‍රාප්ත කොට බොධිපර්‍ය්‍යඞ්කාරූඪ ව සපරිවාර මාර පරාජය කොට සම්‍යක්සම්බුධ රාජ්‍යයට පැමිණ ජනොත්තම වූ තමන්වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලක්‍ෂණ අසූ අනුව්‍යඤ්ජන ඛ්‍යාමප්‍රභා කෙතුමාලාදි වූ[1] අනන්‍යසාධාරණ මහාපුරුෂ ලක්‍ෂණයන් කරණකොට ගෙන හාත්පසින් දීප්තිමත් ව බබළන්නාවූ පහන්රුකක්සේ ද අහස් මැද දහස් ගණන් රශ්මි මාලාවෙන් බබළන්නාවූ හිරුමඬලක්සේ ද ස්වකීය වූ ඝන කනක රශ්මීන් තෙවුනා වූ ස්වර්ණමෙරු රාජයාසේ ද අතිශයින් ප්‍රභාමත් වූ ආත්මභාවයෙන් විරාජමාන වෙමින් තුන්ලෝ තිලකයක් සේ මුළුලෝ සරහා වැඩසිට දෙව්මිනිසුන් සහිත වූ සියලු සත්වයන් සදම් නමැති මහ නැවට නංවා මේ අසාර වූ සංසාර නමැති මහාසාගරයෙන් එතෙර කොට නිවන් නමැති අමාපුරයෙහි ගෙන හැර පිහිටුවමින් දහම් නමැති රුවන් වැසි වස්වමින් සදම් නමැති ජයබෙර ලවමින් දහම් නමැති ජයකෙතු නංවමින් මෙසේ වශීප්‍රධාන වූ ඒ තථාගතයන් වහන්සේ දිව්‍යබ්‍රහ්මාදි වූ සමස්තසත්වයන් ජාති ජරා මරණාදි වූ සංසාරදුඃඛයෙන් මුදා නිවන්පුර සිරි ගෙන හැර දෙමින් වැඩවසන සේක.

ඒ බව දක්වනු පිණිස මතු කියන ධර්‍මපූජක මහ තෙරුන්වහන්සේ විසින් කියන ලදී :

එකතිංසෙ ඉතො කප්පෙ - ලොකෙ උප්පජ්ජි නායකො,
බත්තිංස ලක්ඛණාකිණ්ණො - සම්බුද්ධො ස සිඛිව්හයො.
ජලන්තො දීපරුක්ඛොව - සූරියොව නභමුග්ගතො,
මෙරුරාජාව සම්බුද්ධො - ජනෙසගෙගා පතාපවා.
පූරෙත්වා ධම්මනාවායං - සනාරෝ සකලං පජං,
පතිට්ඨපෙන්තො සංසාර - කන්තාරා සන්තිභූමියං.
ධම්මකෙතුං සමුස්සෙන්තො - හනන්තො ධම්මදුන්දුභිං,
සන්තෙ දුක්ඛා පමොචෙන්තො - වසී තත්ථ ජිනො වසී-යි.

මෙසේ සත්වලොකයෙහි සධර්‍මම නමැති ආලොක පතුරුවා සියලු සත්වයන්ට හිතසැප එළවමින් තුන්ලොවට නැගූ අසහාය ප්‍රදීපයක් සේ වැඩවසන්නාවූ ඒ සර්‍වඥයන්වහන්සේ එක් සමයෙක්හි විවෙකස්ථාන කැමැති ව ඉතා රම්‍ය වූ එක් වනාන්තරයකට එළඹ සුපුෂ්පිත වූ සීනිද්ද බෝලිද්ද යොහොඹු වැකොඳ දැසමන්

1. කෙතුමාලාලංකාරාදික වූ - KL

Non-Commercial Distribution

ආදි වූ සුවඳමල් සහිත නොයෙක් ලියජාතියෙන් වළඳනා ලද අතු පතර ඇති එසේ ම සුපුෂ්පිත වූ අඹ දෙඹ සල් සපු නා කිණි පළොල් ඇසළ මුහුළ[1] නැදුන්[2] සඳුන් දෙව්දුරු කපුරු පුවක් ආදි වූ අනෙකප්‍රකාර වෘක්‍ෂජාතීන්ගේ සුවඳ මලෙහි ලොල් වූ මත් බමරවැලන් විසින් ගිගුම්දෙනලද නානාප්‍රකාර භෘඞ්ගනාදයෙන් හා ඒ ඒ තන්හි කැළ බැඳ සිටිනා තෘණසිංහය කාළසිංහය පාණ්ඩුසිංහය කෙශරසිංහය ගජසිංහය දශකුලෙහි ඇත්තුය තිත්මුවෝය පසද මුවෝය සරභමුවෝය ඔළුමුවෝය[3] සෙමර මුවෝය රුරුමුවෝය රෙහෙරමුවෝය කෙනෙල්මුවෝය සැළමුවෝය දිවනමුවෝය පනිනමුවෝය[4] පවන්මුවෝය ශ්වේතහංසය කාළහංසය ප්‍රාකතික හංසය පාණ්ඩුහංසය ස්වර්ණහංසය ධෘතරාෂ්ට්‍රහංසය දණ්ඩමානවකය ජීවඤ්ජීවකය ලතාකින්නරය පරපුටුකෙවිල්ලෝය කුරවි කෙවිල්ලෝය අටපා කෙවිල්ලෝය කළුලිහිණියෝය කළුතල්ලිහිණියෝය ඇත්ගිජුලිහිණියෝය යනාදි වූ නොයෙක් ද්විපද චතුෂ්පද ජාතීන් විසින් ද එසේ ම ඒ ඒ තන්හි මඩුලු බැඳ වටා සිටිය සෙබඩන් මැද පිල්සත්[5] විදහා කෙකාසර නගා රඟ බස්නා මත් මොනරුන්ට රඟමඩුලු වූ රන් රිදී පිළිවහණමය අතළගල්පෙළින් හා ඉතා සිහිල් වූ ප්‍රසන්න මිහිරි ජල ඇති සුවසේ බැස ස්නාන පානය කිරීමට යොග්‍ය වූ මනා තොට ඇති පස්පියුමෙන් සැදි වන විල් පෙළින් හා මනහර පිළිමිණි පහණවටසේ වැහෙන ජලකර්ණිකාවෙන්[6] යුක්ත ව නොයෙක් දෙසින් හැලි ගසා දිවන ජලධාරාවන් ඇති සියගණන් ගඟුල් හැල්ලෙන් ගැවසීගත්තාවූ ඒ වන මධ්‍යයෙහි මල් රොන් වගුළ සිහිල් සුවඳ සුදුවැලි තලාවන් ඇති ඡායාසම්පන්න මනහර ගල් තළක් මුදුනෙහි සහළසිවුරු සනරපටින් පනවා නීලය පීතය ලොහිතය ඔදාතය මාඤ්ජිෂ්ට[7]ය ප්‍රභාස්වර යයි කියනලද්දවූ සවණක් ඝන බුධරශ්මි මාලාවන් දසදිග විහිදුවමින් ඒ සියලු වනාන්තරය ඒකාලොක කොට බබුළුවා යුගන්ධර පර්වතමස්තකයට පැමිණි බාලාර්කමණ්ඩලය සේ වැඩහුන් සේක.

ඒ බව ප්‍රකාශ කොට දක්වනු පිණිස එම මහතෙරුන්වහන්සේ විසින් කියන ලදී:

එකස්මිං සමයෙ නාථො - ලොකපජ්ජොතකො ජිනො,
විවෙකකාමො සම්බුධො - සුරම්මං කානනං ගතො.

පුන්නාග නාග පූගාදි - නානා පාදප සංකුලං,
ලතාලිංගිතසාඛාහි - සාමොද කුසුමායුතං.

කුසුමාමොද සම්මත්ත[8] - ඡප්පදලි නිසෙවිතං,
නානා මිගගණාකිණ්ණං - මයූර ගණ නච්චිතං

1. මුහුළු - EGHIKL
2. නැදුන් - ACDEFGHIJKL
3. එළුමුවෝය - පිටපත් හැම
4. පනත මුවෝය - ADEFJ
5. පිල්සත් - ක.කි.ඤ.බෙ.
6. කර්ණිකාවෙන් - BDEGHIKL
7. මාංජෙෂ්ට - BFGHIJKL
8. සම්පන්න - BDGHIK පාලි
සම්පන්න - L

Non-Commercial Distribution

සීතලච්ඡොදිකා සාධු - සුපතිත්ථ ජලාසයං,
ආසාර සාර ධාරාහි - නිජ්ඣරා සත සංකුලං.

ගන්ත්වාන සො මහාරඤ්ඤං - සීතලං සිකතා තලං,
සිලාතලෙ නිසිනේනාසි - විස්සජ්ජෙන්තා ඡ රංසියො-යි.

මෙසේ ඒ වනමධ්‍යයෙහි සවනක් රසින් දිලිසෙමින් වැඩහුන්නාවූ බුදුන් දැක දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණ යක්‍ෂ රාක්‍ෂස සිද්ධවිද්‍යාධරාදීහු ඇසිල්ලකින් දිවගෙන අවුත් එතැන්හි රැස් ව දිව්‍යමය වූ සඳුන් සුවඳමල් ආදියෙන් බුදුන් පුදමින් දිව්‍යානුභාවොත්පන්න මෘදඞ්ග [ඩවුර][1] ඩැක්කි මද්දළ පටහ පණව කොටුම්බර දෙණ්ඩිමාදි[2] වූ නානාප්‍රකාර භෙරිතූර්‍ය්‍යභාණ්ඩයන්ගෙන් මධුරධ්වනි විහිදුවා අනෝර්මින්[3] බුද්ධගුණයන් අරභයා ගී කියමින් දිව්‍යමහිමයෙන් යුක්ත අනෙකප්‍රකාර නෘත්‍යාඞ්ග දක්වමින් මහත් වූ සන්තොෂයෙන් පින පිනා 'සමන්තභද්‍ර, සකලලොකානන්දකර, සමස්තජනශෙඛර, සද්ධර්ම ගඞ්ගාප්‍රවාහ, පරදුඃඛදුඃඛිත, ශරණාගත වජ්‍රපඤ්ජර, ත්‍රිභුවන චන්ද්‍ර, අභිධර්මාමෘත ප්‍රශව, දෙවාතිදෙව, ශක්‍රාතිශක්‍ර, බ්‍රහ්මාතිබ්‍රහ්ම යනාදීන් කරනලද ස්තුතිඝොෂාවෙන් දසදිගුන් පුරමින් දෙහොත් මුදුන් දිදී නමස්කාරකෙරෙමින් බුදුන් පිරිවරා සිටගත්හ. එකල්හි ඒ දෙවාතිදෙවයන් වහන්සේ එපරිද්දෙන් පිරිවරා සිටි දිව්‍යසෙනාව මධ්‍යයෙහි මහත් වූ දිව්‍යානුභාවයෙන් දිලිහි දිලිහී වැඩහිඳ තමන් වහන්සේගේ විස්සට්ඨමඤ්ජු විඤ්ඤෙය්‍යාදි වූ අෂ්ටාඞ්ගසමුපෙත මිහිරි කටහඬින් බ්‍රහ්මඝොෂා විහිදුවා අමාවැස්සක් වස්වන්නා[4]සේ දුඃඛ සමුදයාදි චතුස්සත්‍යයෙන් යුක්ත ධර්මදෙශනාවට පටන්ගත්සේක.

ඒ බව ප්‍රකාශ කොට දක්වනු පිණිස එම මහතෙරුන් වහන්සේ විසින් කියනලදි:

දෙවා තත්ථ සමාගන්ත්වා - පූජෙසුං දිපදුත්තමං,
දිබ්බෙහි ගන්ධමාලෙහි - නච්චෙහි තූරියෙහි ච.

දෙව දෙවො තද දෙව - සඞ්ඝමජ්ඣෙ නිසීදිය,
චතුසච්චමදෙසෙසි - නිච්ඡරං මධුරං ගිරං-යි.

මෙසේ සර්වඥයන් වහන්සේ සද්ධර්ම දෙශනාවට පටන්ගත් කල්හි පෙර බොහෝ දවසක්[5] ඒ වනාන්තරයෙහි ඌරන් මුවන් ආදි වූ සිවුපා සතුන් මරා මස් ගෙන අඹුදරුවන් රක්‍ෂා කොට එයින් ම ජීවත්වන්නාවූ ප්‍රාණවධයෙහි නියුක්ත වූ එක් වැද්දෙක් පෙර පරිද්දෙන් ම දුනු හීතල ගෙන[6] මුවදඩ ගොස් ඒ ඒ තන්හි දඩයම් කොට ඇවිදුනේ ඒ ස්ථානයට පැමිණ තරු පිරිවැරූ[7] පූර්ණ[8] චන්ද්‍රයාසේ මහමුහුදු

1. ඩඹර - ABCDEFGHJKL
   ඩාඹර - I
2. ඩිණ්ඩිමාදි වූ - BIKL
   ඩින්ඩිමාදි වූ - GH
   දෙණ්ඩුමාදි වූ - ADFJ
3. අනොමින් - BDFGHI කඳ. ක.
   අනොමින් - කි.
4. වස්නා - ABCDEGHIKL ක. කි.කඳ.ස.
5. දවස් - IL
6. දුනු හී අතට ගෙන - BGHIKL
7. පිරිවර - ABCGHIJK
8. ස්වර්ණ - C ක.කි.කඳ.බෙ.

Non-Commercial Distribution

මැද සප්තකුලපර්වතයන් පිරිවැරූ සවර්ණමෙරු රාජයා සේ මහත් වූ දිව්‍යසේනාහ පිරිවරා රාගද්වෙෂමොහාදි වූ ක්ලේශකාලුෂ්‍යාපගමයෙන් අත්‍යන්ත නිර්මල සුවිසුධ චිත්තසන්තාන ඇති තමන්වහන්සේගේ රජොජල්ලිකාපගත වරදෙහලාවණ්‍ය ශ්‍රීසාරයෙහි[1] සඤ්ජාත සවනක් රැසින් දිලිහි දිලිහී වැඩහිඳ බණ වදරන්නාවූ ඒ සර්වඥයන් වහන්සේ දැක මහත් වූ ප්‍රීතීන්[2] පිනා එකත්පස් ව සිට[3] බණ අසා ඒ ධර්මයෙහි සිත්පහදවා ප්‍රීතිවේගයෙන් තුන්යලක් සාධුකාර දෙමින් අපමණ වූ සන්තොෂයට පැමිණියේය.

ඒ බව ප්‍රකාශ කොට තමන් වහන්සේගේ පූර්වචරිතය දක්වනු පිණිස එම මහ තෙරුන් වහන්සේ විසින් කියනලදී:

තදහං ලුද්දකො ආසිං - මිගසූකර මාරකො,
මිගමංසෙන ජීවාමි - තෙන පොසෙමි දරකෙ.

තද'හං මිගවං යාතො - සබාණෙො සසරාසනො,
අද්දසං විරජං බුධං - දෙවසඞ්ඝපුරක්ඛතං.

චන්දංව තාරකාකිණ්ණං - මෙරුං[4]වණ්ණවමජ්ඣගං,
විරොචමානමාසීනං - චතුසච්චප්පකාස[කං].[5]

එක පස්සෙ ඨිතො තත්ථ - අස්සොසිං ධම්මමුත්තමං,
තත්ථ චිත්තං පසාදෙත්වා - සොමනස්සං පවෙදයිං--යි.

මෙසේ මීට එක්තිස් වන කල්පයෙහි තමා සිත පහදවා බණ ඇසුවාවූ ඒ වැදිපුත්‍රතෙම මැතභාගයෙහි එයින් චුත ව එම කුශලානුභාවයෙන් චාතුර්මහාරාජික දිව්‍යලොකයෙහි ඉපද අනූලක්‍ෂයක් අවුරුදු දිවසිරි වළඳා එයින් ගොස් තවුතිසා දිව්‍යලොකයෙහි තුන් කෙළ සැටලක්‍ෂයක් අවුරුදු දිවසිරි වළඳ එයින් ගොස් යාම දිව්‍යලොකයෙහි තුදුස්කෙළ සතළිස් ලක්‍ෂයක් අවුරුදු දිව්‍යඓශ්වර්‍ය්‍ය විඳ එයින් ගොස් තුසිත[6] දිව්‍යලොකයෙහි සත්පනස්කෙළ සැටලක්‍ෂයක් අවුරුදු දිවසිරි වළඳා එයින් ගොස් නිර්මාණරති[7] දිව්‍යලොකයෙහි දෙසියතිස්කෙළ සතලිස් ලක්‍ෂයක් අවුරුදු දිවසිරි විඳ[8] එයින් ගොස් පරනිර්මිත වශවර්ති නම් දිව්‍යලොකයෙහි නව සිය එක්විසිකෙළ සැටලක්‍ෂයක් අවුරුදු දිවසැපත් වළඳා නැවත මුදුනෙහි පටන් චාතුර්මහාරාජිකය දක්වා පිළිවෙළිනැයි[9] මෙසේ සදිව්‍යලොකයෙහි ච්‍යුතිප්‍රතිසන්ධි වශයෙන් [මබ මොබ][10] සැරි සරා ඒ ඒ දිව්‍යලොකයෙහි වෙනවෙන ම මිණිකිකිණිදැල් බැඳි[11]නන් විසිතුරු දද පෙළින් සැදුම් ලත් සත්රුවන්මය දෙව්විමන්හි නොයෙක් සියදහස් ගණන් නළුනාටකයන් විසින් පිරිවරන ලදු ව මහත් වූ දිව්‍යඓශ්වර්‍ය්‍ය විඳ ක්‍රමයෙන් අවුත් මිනිස්ලොව අග්‍ර වූ සක්විති රජසැපත් ආදි වූ අනෙකප්‍රකාර මනුෂ්‍යසම්පත්

1. සාගරයෙහි - DG, සි.
2. ප්‍රීතියෙන් - BGHIKL
3. හිඳ - BGHIKL
4. මෙරු - BCGHIJ - සි.ස.
   මෙරුං - ADEF බෙ.ම.ස. පාලි.
5. චතුසච්චප්පකාසනං - BCDEFGHIJ
   චතුසච්චප්පකාසනං - AKL
   චතුසච්චප්පකාසකං - පාලි.
6. තුසිපුර - BCGH,
   තුසිතපුර -ADF
7. නිම්මාණරති - ABCFGHIJ
   නෙම්මාණරති - D
8. දිව්‍ය සම්පත් වළඳ - BEGIK
   දිව සැපත් වළඳ - I
   දිවසිරි වළඳ - L
9. පිළිවෙලින් - BEGHIKL
10. මබිනොබ -BCGHIKL
    මබිනුබ - ADEFJ
    මබින් මොබ - L
11. බඳවා - KL

Non-Commercial Distribution

විද මෙසේ ඒ ජාතියෙහි බණ ඇසුවාවූ කුශලයෙන් සත්මහල් මාළිගාවෙක මහලින් මහලට නැඟී බස්නා සේ එක්තිස් කපක් මුළුල්ලෙහි සදිව්‍යලොකය මනුෂ්‍යලොක[1] ය යි යන සප්තවිධ කාමස්වර්ගයෙහි අනූන වූ නොයෙක් ශ්‍රී සම්පත් අනුභව කෙළේය.

ඒ බව ප්‍රකාශ කොට තමන් වහන්සේ විසින් ධර්මශ්‍රවණයෙන් ලද්දවූ සම්පත්ති[2] විශෙෂය දක්වනු පිණිස එම මහතෙරුන් වහන්සේ විසින් කියනලදී:-

එකතිංසෙ ඉතො කප්පෙ - යං පුඤ්ඤං [පසුතං][3] මයා,
තෙනාහං පුඤ්ඤකම්මෙන - ජාතොසිං දෙවයොනියං.

සම්පත්තිමනුභුත්වාන - ඡකාමසග්ගෙ පරාපරං,
දෙවසඞ්ඝපරිබ්බුළ්හො - විමානෙ රතනාමයෙ.

මනුස්සෙසු ච යං අග්ගං - තස්ස භාගී භවාමහං,
භොගෙ මෙ ඌනතා නත්ථි - සද්ධම්මසවණෙ ඵලං-යී.

මෙසේ එක්තිස් කපක් මුළුල්ලෙහි මහත් වූ ශ්‍රී විභූති විද මේ භද්‍රකල්පයෙහි[4] දෙව්ලොවින් අවුත් එම දිව්‍යලොකය පරිද්දෙන් නොයෙක් රත්නයෙන් උජ්වලිතවූ අනෙකප්‍රකාර ප්‍රාසාදලඞ්කාරයෙන් සමලඞ්කෘත[5] වූ ප්‍රාසාදපංක්තීන් හා ඒ ඒ තන්හි නහනලද රන් රිදී පිළිම්ණි තොරණ් ආදියෙන් ප්‍රභාස්වර වූ චතුවඩකාදී වීථි වින්‍යාසයෙන් යුක්ත මහා වීථි පංක්තීන් හා අනෙකවර්ණ විචිත්‍ර අනර්ඝ වස්ත්‍රාභරණයෙන් සැරහී එකාවන් කෙළිනළුයෙහි සනතුෂට ව වාසය කරන්නා වූ දෙවතා සමූහයක් මෙන් රූපශොභාසම්පන්න නොයෙක් කෙළගණන් ස්ත්‍රීපුරුෂයන් විසින් ගැවසී ගත්තාවූ නානාප්‍රකාර විචිත්‍ර සමස්ත වස්තුවිශෙෂයෙන් යුක්ත[6] සකල නගරාඞ්ග සම්පත්තීන් සමෘද්ධ වූ සැවැත් නුවර නොයෙක් කෙළගණන් රන්රුවන් මුතුමැණික් දැසිදස් ගවමහිෂාදි වූ සියලු උපභොග පරිභොග වස්තුවෙන් ආඪ්‍ය වූ ලොකපූජිත[7] බමුණු මහසල් කුලයෙක ඉපද මහත් වූ කුමාර පෙරහරින් යුක්ත ව ක්‍රමයෙන් වැඩී විඥ්ඥු බවට පැමිණ ඍග්වෙදය යජුර්වෙදය සාමවෙදය අථර්වන්වෙද ය යන සතර වෙදයන් ප්‍රධාන කොට ඇති සියලු ශිල්ප ශාස්ත්‍රයෙහි කොටිප්‍රාප්ත ව මහත් වූ ශ්‍රී සම්පත්තීන් යෙදී මෙසේ වාසය කරන්නාවූ මහ පිනැති ඒ බ්‍රාහමණ කුමාරයෝ තමන් විසින් පූර්වජාතියෙහි ධර්මශ්‍රවණයෙන් සඤ්ජනිත ඉෂ්ටවිපාක දයක වූ කුශලකර්මයා විසින් මෙහෙයන ලදුව තමන්ගේ ඉත පුරුදු[8] යහළු මිත්‍රයන් හා සමඟ කෙළිමින් සෙමින් නුවර සැරීසරා ඇවිද්දනාහු එම සැවැත් නුවර සමීපයෙහි ජේත නම් රාජකුමාරයා විසින් රොපිත සංවර්ධිත වූ විකසිත රක්තශ්වෙතාදි පඤ්චවිධ පද්මාමොද මකරන්දයෙහි ලුබ්ධස්වරූප ඇති භෘඞ්ගයන්ගේ ඣඞ්කාරනාදයෙන්

1. මිනිස් ලොක - BEFGHIKL
මිනිස් ලොව -ACJ
2. සම්පත්තියෙහි- D
සම්පත් - GH
3. පත්තං - ACDEFGHIJKL
අත්තං - B
පසුතං - මුද්‍රිත හැම. ස. පාළි.
4. මහාභද්‍රකල්පයෙහි -BCGHIKL
5. අලංකාර වූ - IL
අලංකෘත වූ - BGHK
6. යුක්ත ව -DL
යුක්ත වූ - I
7. ලොකපූජ්‍ය - BGHIKL
8. ඉතා පුරුදු - ABCD මුද්‍රිත හැම ස.

Non-Commercial Distribution

හා හංසශ්‍රේණීන්ගේ මධුරනාදයෙන් එකනින්නාද වූ සිහිල්ජල පිරි පතැස්[1] පෙළින් හා රළපහර සන්හිඳුණාවූ ක්ෂීරසාගරයෙහි සඳ රැස් පතළ ජලතලාවක් සේ අත්‍යන්තශුභ්‍ර වූ සුවිශුද්ධ වාලුකාතලයෙන් හා ගිරා මොනර චක්‍රවාකාදි විහඞ්ග ගණයා විසින් ගැවසී ගත්තාවූ ලතාමණ්ඩප පංක්තීන් හා පුන්නාග නාග කුරවක තිලක උද්දාලක මධුගන්ධිකාශෝක කුරවීක[2] කර්ණිකාරක ගජකොවිලාර[3] පාරිච්ඡත්තකාදි සුපුෂ්පිත ද්‍රැමගණානුචරිත කොකිලාලිකුලයන්ගේ මධුර ඣඞ්කාරනාදකුල කුසුම මඤ්ජරීක[4] රෙහෙණුයෙන් පිඤ්ජර වූ රම්‍ය භූමිභාග ඇති ඡායොදකසම්පන්න ජේතවනොද්‍යානයෙහි අනාථපිණ්ඩික නම් මහසිටාණන් විසින් බුදුන් උදෙසා සිවුපනස් කෙළක් ධන වියදම් කොට කරවා පිළිගන්වනලද අනෙකප්‍රකාර වූ ඝනමහ තුලාසඞ්ඝාට වෙදිකා කවාට මුඛවට්ටි ගොපානසි ඡදන්[5] සොපාණ මාලාවෙන් සාලඞ්කෘත[6] වූ ප්‍රාසාද පඞ්ක්තීන් හා සුධාධවල චක්‍රවාට පර්වතාකාර ප්‍රාකාර ගොපුර චංක්‍රමණ විශාල ශාලාමණ්ඩපශ්‍රේණීන් විරාජමාන වූ ජේතවන විහාරයට එළඹ භූම්‍යඞ්ගනාවගේ උත්තමාඞ්ගයෙහි පිහිටුවනලද නානාවිධ රත්නප්‍රභා විසර භාසුර රත්නකිරීටයක් හා සාදෘශ්‍ය වූ අනෙකප්‍රකාර සවර්ණ සුරභි සුගන්ධ පුෂ්පොපහාර[7] සමලඞ්කෘත භූමිභාගයෙන් හා මුදුනෙහි නිරන්තර ව රන් රිදී මුතු මිණි[8] තරුපෙළින් විසිතුරු වියන් බැඳ ඒ ඒ ස්ථානයෙහි උචිත පරිද්දෙන් සරහා එල්වනලද සුමන මාලතී චම්පක පාරිජාත මඳාර කෙතකාදි කුසුමදමයෙන් හා ගන්ධමාල ධූපදීපාදි නානාප්‍රකාර පූජාවස්තු විශෙෂයෙන් ද එසේ ම තහනලද සුගන්ධ තෛලොජ්වලිත රන්වැට ප්‍රදීප සහස්‍රයෙන් හා සද්ධර්මශ්‍රවණ බුද්ධදර්ශනාදිය පිණිස ආවාවූ නෙක බ්‍රහ්ම සුරාසුරොරග ගරුඩ ගන්ධර්ව සිද්ධවිද්‍යාධරාදීන්ගේ ශරීරප්‍රභායෙන් හා අපරිමිත රාජර්ද්ධීන් සම්පන්න රාජාධිරාජ ප්‍රශස්ත ප්‍රවර රාජයන්ගේ මකුට මණිකාන්තීන් එකොභාස වූ එකොද්භූත වූ එකාලඞ්කාර වූ බ්‍රහ්ම සුරාසුරනරනාග නයනරසායන වූ ධර්මසභා මණ්ඩපයෙහි පනවන ලද විචිත්‍ර බුද්ධාසනාරූඪ ව තරුකැලන් විසින් පිරිවරනලද සොළොස් කලා පරිපූර්ණ චන්ද්‍රයා සේ සවනක් රසින් දිලිහි දිලිහී ශ්‍රාවකගණයා පිරිවරා වැඩ හුන් බුදුන් දැක සිත හටගත්තාවූ භක්තිප්‍රෙමාතිභාරාවනතොත්තමාඞ්ගයෙන් සකසා වැඳ එකත් පස් ව හුන්නාහු. දුඃඛසත්‍යය සමුදයසත්‍යය නිරොධසත්‍යය මාර්ගසත්‍යය යන චතුස්සත්‍යය ප්‍රකාශක වූ මධුමදමුදිතලලිත රතිකර මනොහරකුරවීකනාද නිර්විශෙෂ අෂ්ටාඞ්ගසමුපෙත මධුරස්වර විහිදුවා බුදුන් විසින් වදරනලද සද්ධර්මදෙශනාවන් අසා පහන්සිත් ඇති ව සර්වඥ ශාසනයෙහි මහණ ව ජාති ජරා මරණාදි වූ සියලු සසර දුක් ගෙවා නිවී සැනහී රහත් ව අමාමහ නිවන් දුටහ.

---

1. පතැස් පොකුණු - C
2. කුරවීරක - CGHIKL
   කරවීක - BDE
3. ගරකොවිලාර - BEGHIKL
   ගරකොටවිලාර - I
4. මඤ්ජරි - ABDEFGHIKL
5. ගොපානසිච්චදන - BGH
   ගොපානසිච්ඡාදන -IKL
   ගොපානසිරිධන - ACDFJ
   ගොපානසිරිඡදන - ක.සි.කැ.බෙ.
6. අලංකෘත - AJ සි.කැ.ක.
   සවිලංකෘත - D බෙ.ස.
   සමලංකෘත - C ම.
   ලංකෘත - I
7. පුෂ්පෝපප්‍රහාර - ABCDEFJ සි.කැ.ක.
8. මැණික් - ADF මුද්‍රිත හැම ස.

Non-Commercial Distribution

ඒ බව ප්‍රකාශ කොට දක්වනු පිණිස එම මහ තෙරුන්වහන්සේ විසින් කියන ලදී:

ඉමස්මිං භද්දකෙ කප්පෙ - සාවත්ථිපුර මුත්තමෙ,
අඩ්ඪෙ මහද්ධනෙ සාලෙ - ජාතොහං උදිතෙ කුලෙ.

මහතා පරිවාරෙන - පත්තො වුද්ධිං ච විස්සුතං,
චාරිකං චරමානොහං - පත්තො ජෙතවනං වරං.

අද්දසං සහසිස්සෙහි - නිසින්නං සුගතං තදා,
අස්සොසිං මධුරං ධම්මං - චතුසච්චප්පකාසනං[1].

සුත්වාන මධුරං ධම්මං - පබ්බජිත්වාන සාසනෙ,
අජරාමරං සීතිභූතං - පත්තො නිබ්බාණමුත්තමං-යි.

මෙසේ රහත්බවට පැමිණ ශාන්ත වූ ප්‍රණීත වූ අතෘප්තිකර වූ ඵලසමාපත්ති සැපය අනුභව කෙරෙමින් සකල ලොකයාහට අග්‍රදක්ෂිණෙය්‍ය ව[2] බුඬශාසන නමැති ආකාශයෙහි හිරසඳ සේ බැබළෙමින් වාසය කරන සේක් මෙසේ ගිය දවස තමන් වහන්සේ මොහොතක් කල් සිත් පහදවා එක වරෙක ඇසූවාවූ ධර්මයෙහි අනුසසින් ඒ ජාතියෙහි පටන් නිවන් දක්නා ජාති දක්වා නරක තිර්‍ය්‍යක්ප්‍රෙත අසුරකාය යන සතර අපායට නොගොස් 'එක්තිස් කපක් මුළුල්ලෙහි රාජ චොර ශත්‍රැ[3] භයාදි වූ කිසියම් භයකට නො පැමිණ මිනිස්ලොවින් දෙව්ලොවට යෙමින් දෙව්ලොවින් මිනිස්ලොවට එමින් මෙසේ සසර පමණින් විඳ[4] ඇවිද්දවූ අනෙකප්‍රකාර දිව්‍ය මනුෂ්‍ය සම්පත්ති සඞ්ඛ්‍යාත නොයෙක් ශ්‍රී විභූතීන් හා මේ බුඬොත්පාදයෙහි[5] මිනිස්ලොව ඉපද වැඩිවිය පැමිණ බණ අසා මහණ ව රහත් ව ලද්දවූ නිර්වාණසම්පත්තිය යන මේ උභයලොකාර්ථසිද්ධිය භික්‍ෂු සඞ්ඝයා මධ්‍යයෙහි ප්‍රකාශකිරීම් වශයෙන් උදන් අනා වදරනසේක් තමන් වහන්සේගේ පූර්වචරිතාපදනය මේ යථොක්ත ගාථා දෙවිස්සෙන් ගෙනහැර දක්වා වදරා ඉක්බිති සංසාරගත සත්වයන් සද්ධර්මශ්‍රවණයෙහි යොදනු පිණිස කරුණාපූර්වඞ්ගම ව වදරනසේක් 'එම්බා පින්වත් සත්වයෙනි, දකුණත ඔසවා තොපට ආමන්ත්‍රණය කොට අස්වා කියමි; මා කියන්නාවූ මේ එක වචනය තොප මුදුනෙන් පිළිගනුව; හෙවත් මේ අවවාදය[6] අසා මා කීවා කරව; මෙසේ ගිය දවස මා[7] සිත් පහදවා බණ ඇසූ කුශලයෙන් ලද්දවූ මේ සම්පත්තිය දෘෂ්ටාන්ත කොට සිතාගෙන තෙපි හැම ද දැන් සිත පහදවා හෙළා[8] බණ අසා සියලු අභිමතාර්ථයන් සිඬ කරව'යි අවවාද කොට වදරන සේක්:-

1. චතුසච්චප්පකාසනං - පිටපත් හැම.
   චතුසච්චප්පකාසකං - මුද්‍රිත හැම ස. පාලි.
2. දක්ෂිණාර්හ ව - ක.සි.ඤ.ම.
   දක්ෂිණීයව - බෙ.ස.
3. ශත්‍රු - I
4. සසර අපමණ සැපත් විඳ - ස. විඳ (නැත) KI
5. බුද්ධොත්පාදකාලයෙහි -C
6. අවවාදය - BCDEGHIKL : අවවාද - අන්හැම
7. මා විසින් - I
8. සිත හෙළා - DEGHIKL

Non-Commercial Distribution

සුතං එකමුහුත්තෙන[1] - තද ධම්මං සුදෙසිතං,
තෙනම්හි චතුරොපායෙ - න ජාතො අකුතොභයො[2]

කරමුක්ඛිප්ප වක්ඛාමි - කරොථෙකග්ගිරං මම,
මමොපමං කරිත්වාන - ධම්මං සුණාථ සාධුකං-යි

මෙසේ අවවාද කොට සත්වයන් සද්ධර්මශ්‍රවණයෙහි යොද වදළ සේක. එසේ හෙයින් මතු දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා නිවන්පුරසිරි ප්‍රාර්ථනා කරන්නාවූ පින්වත් සත්වයෙනි, මෙසේ ඉතා මඳ විගසෙක සිත පහදවා සොම්නස්[3] සහගත ව බණ ඇසූ කුශලයෙන් ලද්දවූ මේ ස්වර්ගමොක්ෂ සම්පත්තීන්ගේ ආනුභාව විශෙෂය ඉඳුරා අසා දැන සිත තබාගෙන නම තමා සිත ඇත්තාවූ කුසීතභාවය දුරුකොට හැර කප් අසංඛ්‍යයකින් ලැබගත නො හැක්කා වූ සර්වඥයන් වහන්සේගේ එපරිද්දෙන් ම ඉතා දුර්ලභ වූ මේ සද්ධර්මය සිත හෙළා ඉඳුරා අසාගෙන මතු සියලු අභිවෘද්ධියට පැමිණෙන්ට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි:

ඉති තනුතර කාලං සාධු ධම්මං සුණිත්වා,
අධිගතවිභවානං ආනුභාවං සුණිත්වා,
භව විභව සුඛං හො පත්ථයන්තා කුසීතං
ජහථ සුණථ ධම්මං දුල්ලභං දුල්ලභස්ස-යි

මෙතෙකින් මේ දහම්සොඬ වග
තුන්වන මිගලුද්දක වස්තුව
කියා නිමවන ලදී.

තව ද මේ දහම්සොඬ වග සතර වන සරණසථවිර වස්තුව නම් කවර යත්

අප බුදුන් සමයෙහි සැවැත් නුවර බොහෝ සැපත්[4] ඇති සුමන නම් වූ එක් සිටාණකෙනෙක් ඇතියහ: ඔවුන්ට සුජම්පතිකා නම් සිටුදියෙණි කෙනෙක් භාර්‍ය්‍යා වූහ: ඔහු දෙදෙන සමඟින්[5] වාසය කරන්නාහු පුතණුකෙනකුන් හා එක දියෙණිකෙනකුන් ලදහ.

ඉක්බිති ඒ දරු දෙදෙනා බාල අවස්ථාවෙහි ම තුමූ දෙදෙන කාලක්‍රියා කරන්නාහු තමන් මරණාසන්නයෙහි වැඩිමහලු පුතණුවන් සමීපයට කැඳවා 'එම්බා දරුවෙනි, අපි තොප තිබියදී ස්ථානාන්තරයෙක[6] සලස්වාලිය නුහුණුවම්හ: එබැවින් අපගේ මේ ගෙයි යම් සැපතෙක් ඇත්නම් ඒ සියල්ල ම තෙපි ම ඇරගන්ව: තොපගේ[7] බාල නැඟණියන් වැඩී යොග්‍ය වූ කල සියලු අභිවෘද්ධියට පමුණුවා සැපතෙහි පිහිටුවාලීම ද තොපට ම භාර ය'යි කියා බාලනැඟණියන් අත ගෙන වැඩිමහලු පුතණුවන් අතට පාවා දී තුමූ දෙදෙන කාලක්‍රියා කළහ. ඉක්බිති ඒ සිටුකුමාරයෝ

1. එකමුහුත්තං මෙ - මුද්‍රිත හැම, ස. පාලි
2. අකුතොභයෙ - C බෙ.ස.
   න කුතො භයං - ක.සි.ත.,ම.පාලි
3. සොමනස්ස - බෙ.ස.
4. සම්පත් - බෙ.ස.
5. සමඟ - DEIKL ස.
6. තොපට තිබියදී ස්ථානාන්තරයක් ස.
7. තොපගේ මේ - EGHKL
   තොපගේ මේ සිය - I

Non-Commercial Distribution

තමන්ගේ කලුරිය කළාවූ මවු පිය දෙදෙනා ආදාහන කොට සෙසු කළමනා කටයුතු නිමවා එහි ම වාසය කරන්නාහු කල් යාමකින් තමන්ගේ ඒ නැඟණියන් සුදුසු කුලයකට පාවා දී තුමූ ද තමන් හා සමාන සිටුකුලයකින් කුමාරිකා කෙනකුන් ගෙනවුත් සහඹු ව[1] ඊ.කෙන්නාහ.

එයින් මෑතභාගයෙහි ඒ සිටුකුමාරයන්ගේ නැඟණියෝ ගර්භිණී ව එක් දවසෙක තමන්ගේ ස්වාමිපුත්‍රයාණන්ට කියන්නාහු 'ස්වාමිනි, මාගේ බෑණන්[2] වහන්සේ නො දක්නේ දැන් නැතක් දවස ය; එබැවින් මම මාගේ බෑණන් වහන්සේ දක්නට යනු කැමැත්තෙමි'යි කීහ. එතෙපුල් අසා ඒ කුමාරිකාවන්ගේ ස්වාමිපුත්‍රයා ද 'යහපත සොඳුර.'යි ගිව්ස කන බොන දෑ ආදි වූ සුදුසු පඬුරු ගෙන්වා ගෙන කුමාරිකාවන් හා එක් ව ගොස් සැවැත් නුවරට වන්නේය.

එකල්හි සකල ලොකානන්දකරවූ ලොකස්වාමි වූ බුදුරජාණන් වහන්සේ ඉඳුරා හැඳ පෙරව නීලපීතාදි වූ සවනක් ඝන බුධරශ්මිමාලාවන් දශදිග විහිදුවමින් බොහෝ භික්ෂුසඞ්ඝයා වහන්සේ පිරිවරා අනොපමෙය්‍ය වූ[3] බුධලීලාවෙන් දුටුදුටුවන්ට සතුටු එළවමින් අහර පිණිස නුවරට වන්සේක් දෙර දෙර නැගි කප්රුකක් සේ දිලිහි දිලිහී ගෙපිළිවෙළින් සිහමින් වඩනට පටන්ගත්සේක.

එකල ආගන්තුක ව එන්නාවූ ඒ අඹු සැමි දෙමහල්ලෝ විදුලිය කැළ[4] වැළඳි රන්මෙරක් සේ[5] දීප්තිමත් වූ ආත්මභාව ඇති ව වඩනා බුදුන් දැක පහන් සිතින් පසහ පිහිටුවා වැඳ තමන්ගේ නෙත්‍ර නමැති ඉඳුනිල්මිණිතැටියෙන් බුදුන්ගේ රූප නමැති අමෘතපානය කෙරෙමින් එකත්පස් ව සිටියහ. ඉක්බිති බුදුරජාණන් වහන්සේ එසේ සිටියාවූ ඒ දෙමහල්ලන් සෝවාන් වන්ට නිසි උපනිඃශ්‍රය සම්පත් ඇතිබව දැන ඔවුන් දෙදෙනා ම ශරණශීලයෙහි පිහිටුවා වදරන සේක් 'එම්බා, තොපට කිසි කලෙක්හි යම් කිසි දුකෙක් උපන්නේ වීනම් එකල්හි තොප විසින් බුදුහු සිහි කට යුත්තේය'යි[6] වදළ සේක. හේ එසේ මය:

යම් කිසි කලෙක්හි රාජචොරශත්‍රු[7] ආදීන් නිසා වන්නාවූ යම් කිසි භයෙක් උපන්නේ වී නම් එකල්හි ඒ උපද්‍රවයෙන් තමහට කිසි ව්‍යසනයක්[8] නොවනු කැමැත්තාහු විසින් එකාවන් ව බුදුන් සිහි කට යුත්තේය. ඉදින් යම් කලෙක්හි යක්‍ෂ ප්‍රෙත පිශාචයන් හා සිංහ ව්‍යාඝ්‍ර වලස් දිවි ආදීන් විසින් ද නා පොළොං දර පිඹුරු ආදි වූ දිඝීජාතීන් හා ගිනි අවු සුළං දිය සෙණ ආදියෙන් ද උණ ඉසරුජා ආදි වූ රොගයෙන් හා විෂම වූ ශීතොෂණාදි ඍතුපෙරළීම් ආදියෙන් වන්නාවූ ද යම්කිසි භයෙක් උපද්‍රවයෙක් ව්‍යසනයෙක් පීඩාවෙක් පැමිණියේ වීනම් එකල්හි තමහට එයින් කිසි උපද්‍රවයක් නොවනු කැමැත්තාහු විසින් ඇදහිලි ඇති ව එකාවන් බුදුන් සිහි

1. සහඹුවක - BFHJ බෙ.
   සහඹු -I
2. බෑයන් - BH ක.කි.කැ.බෙ.ස.
3. අනුපමේය වූ - බෙ.ස.
4. කලඹ - ස.
5. මෙන් KL
6. සිහි කටයුත්තාහ යි - ස.
7. ශත්‍රු - AG
8. භයෙක් - BI

Non-Commercial Distribution

කටයුත්තේ ය. ඉදින් යම් කලෙක්හි අන්තිම සෙය්‍යායෙහි වැද හෙව මරහු හා සමග යුධ කරන්නාවූ සත්වයා විසින් ද එකල්හි ඒ මරහුගෙන් තමහට පරාජය නොවීම කැමැතහොත් පස්මරුන් බිඳ ජයගත් බුදුන්ගේ නාමය හැම කල්හි භක්තිප්‍රෙම සහිත ව සිහි කටයුත්තේ ය. එසේ හෙයින් කියන ලදී.

යං කිඤ්චි භයමුප්පන්නං - රාජ චොරාදි සම්භවං,
තද සරෙය්‍ය සම්බුධං - නිච්ඡන්තො තදුපද්දවං.
යං චෙ උපද්දවං හොති - යක්ඛ පෙතාදි සම්භවං,
තද සරෙය්‍ය සම්බුධං නිච්ඡන්තො තදුපද්දවං.
යං සීංහව්‍යග්ඝදීපාදි[1] - පුණ්ඩරීකාදි සම්භවං,
තද සරෙය්‍ය සම්බුධං -නිච්ඡන්තො තදුපද්දවං.
යමාතපගගි[2] වාතාදි - උදකාසණි සම්භවං,
තද සරෙය්‍ය සම්බුධං - නිච්ඡන්තො තදුපද්දවං.
පජ්ජරාදීහි රොගෙහි - විසමොතුහි සම්භවං,
තද සරෙය්‍ය සම්බුධං - නිච්ඡන්තො තදුපද්දවං.
මච්චුනා චෙ යද යුධං - කරොන්තෙනාපි ජන්තුනා,
සරිත[බ්බො[3]]තද බු[ද්ධො[4]] - පත්ථෙන්තෙනත්තනො ජයං-යි.

ඉක්බිත්තෙන් ඔහු දෙමහල්ලෝ බුදුන් වදළ තෙපුල් තමන් මුදුනෙන් පිළිගෙන මහත් වූ සන්තොෂයෙන් පිනා නැවත පසහ පිහිටුවා වැඳ අවසර ගෙන ගියහ. ඉක්බිති ඒ කුමාරිකාවන්ගේ බෑණෝ තමන් සමීපයට ආවාවූ ඔවුන් දෙමහල්ලන් දැක තමන් ශක්ති පමණින් සුදුසු ලෙස බොහෝ සත්කාර සම්මාන කළහ. මෙසේ මහත් වූ සත්කාර විඳ ඒ කුමාරිකාවන්ගේ ස්වාමිපුත්‍ර තෙම කීප දවසක් එහි ම වාසය කොට තමාගේ භාර්‍ය්‍යා වූ ඒ කුමාරිකාවන් ඔවුන්ගේ බෑණන් සමීපයෙහි රඳවා 'මාගේ ගම කළමනා බොහෝ කටයුතු ඇත්තේය: එබැවින් මා නොඑමා ව ගිය මැනව'යි කියා තමා හිඳිනා ගමට ම ගියේය. ඉක්බිති ඒ කුමාරිකාවන්ගේ බෑණෝ තමන්ගේ භාර්‍ය්‍යාවන් ළහට කැඳවා 'සොඳුර, මාගේ මේ නැගණියන්ට කළමනා සියලු ස්වස්ථාන උපස්ථාන අඩුවක් නො කොට කරව'යි කියා විධාන කළහ. හො ද යහපතැයි[5] ගිවිස එතැන් පටන් ඒ කුමාරිකාවන්ට ඇඟ ඉලීම් ඉස් සේදීම් නැහැවීම් කැවීම් පෙවීම් ආදියෙන් නිරන්තර ව අත් පා මෙහෙ කරන්නී ඔවුන්ගේ

1. යං සිංහව්‍යග්ඝදීසාදි - ACJ
සීහව්‍යග්ඝතරච්ඡාදි - මුද්‍රිත හැම, ස. පාලි.
2. විසමාතපගගි - G
විසමාතිපගගි - H
විසමාථපගගි - I
විසමාතපගගි - C
3. සරිතබ්බං - පිටපත් හැම
සරිතබ්බො - මුද්‍රිත හැම ස. පාලි
4. බුද්ධං - පිටපත් හැම
බුද්ධො - මුද්‍රිත හැම ස. පාලි
5. හොඳය යහපතැයි - HI, ක.කි.සද.ම.

Non-Commercial Distribution

අත කර ආදියෙහි පැළඳි පාමුදු පාවගම් මිණි වළලු මණිකෙවඩම් කාදුකාප්පු පමුදිලිඩගම්[1] පට්ටකාර ආදි වූ ආභරණයෙහි ලොභ උපදවා ඒ ලොභතෘෂ්ණාව සන්හිඳුවාගත නොහී නොකා නොබී නිරාහාර ව ඉතා ගිලන් එකකු මෙන් පුළු ඇඳට නැඟී හිස වසා කඩ පෙරවගෙන වැද හොත්තීය. එවේලෙහි ඇගේ ස්වාමිපුත්‍රයා ගෙට අවුත් එපරිද්දෙන් ඇඳට නැඟී වක ගසාගෙන හොත්තාවූ තමාගේ භාර්‍ය්‍යාව දැක එම ඇඳ පිට හිඳ අතින් පිට පිරිමැද 'සොඳුර, තොපට අවාසු කිම් දැ'යි විචාළේය. ඕතොම එබසට ගොළුවන් ගැසූ එකකු මෙන් මුයෙන් නො බැණ කීප වරෙක[2] විචාළ කල්හි ඉතා ගිලන් ආකාර දක්වා බසින් සමහරක් ගලන්තියක මෙන් කෙඳිරි ගගා 'ස්වාමීනි, ඇති අවාසු කියන්නට නො පිළිවනැ'යි කියා නැවත ඔහු විසින් තරකොට විචාළ කල්හි සිතන්නී 'මම නුඹ නැඟණියන්ගේ අත කර පැළඳි ආභරණ කැමැත්තෙමියි අවක්‍ර ව[3] ඉඳුරා කීම සුදුසු නොවෙයි: ඒ කුමාරිකාවන්ගේ හදමස් ළමැඩිමස් අක්මා පපු අතුනු යන පඤ්චමධුරමාංසය කැමැත්තෙම් යි කී කල්හි ඒකාන්තයෙන් ම ඔවුන් මරන්නාහ: එකල්හි උන්ගේ අත කර ආදියෙහි පැළඳි ඒ සියලු ආභරණ මට ම වන්නේ වේ දැ'යි සිතා ඉක්බිති 'ස්වාමීනි, නුඹ නැගණියන්ගේ පඤ්ච මධුර මාංස[4] අනුභව කරනු පිණිස මට දොළෙක් උපන: ඉදින් ඒ පංචමධුර මාංස[4] නොලදිම් නම් මාගේ ජීවිතය නැත්තේ ය: මතු මට[5] ප්‍රාර්ථනා නොකළ මැනවැ'යි කිව. එපවත් අසා ඒ පුරුෂ තෙම 'එම්බා සොඳුර, මිනිසුන් මැරීම නම් මහා සාවද්‍ය ය: බොහෝ නින්‍ද්‍ය ය: ඉතා බැරි දෙයෙකැ'යි මෙසේ නොයෙක් කාරණ කියා ද අඹුව ගිවිස්වා ගත නුහුණුයේ ම ය. ඉක්බිති ඒ පුරුෂතෙම තමා ඉතා අඹුසොඬ හෙයින් ඈ[7] කෙරෙහි අතිශයින් පිළිබඳ සිත් ඇති ව කාමයෙන් මූර්ජා ව මොහයෙන් මූඪ ව කටයුතු නො කටයුතු සලකාගත නොහී තමාගේ අඹුව කී එබඳු අනර්ථ වචනය යහපතැයි ගිවිස්සේය. හේ එසේ මය.

මේ ලෝකයෙහි ස්ත්‍රීන්ගේ වසඟත්වයට පැමිණියාවූ නුවණ නැති අඥාන පුරුෂයෝ මෙලෝ පරලෝ දෙකින් වන්නාවූ සියලු අභිවෘද්ධියෙන් ම පිරිහෙන්නාහ. මොහු මැණියෝ ය. මොහු පියාණෝ ය මොහු බුහුනැණියෝ ය[8] මොහු බෑණෝ ය යනාදීන් සත්කාර සම්මාන කටයුතු කුලදෙටුවන් නොදන්නාහ. තව ද සුචි අසුචි දෙක්හි විභාග නොදක්නා ජාත්‍යන්ධයා සේ කාමයෙන් අන්ධ හෙයින් මේ කාරණය මේ අකාරණ ය මේ කටයුතු ය මේ නොකටයුතු ය යන වෙනසක් නොදන්නාහ.

---

1. පාමුදු දිලංගම් - A
2. වාරයෙක - GHIKL ක.කි.සැ.
3. අවංක ව - ක.කි.සැ.ම.
4. මාංසය - *CDGIKL*, කි.සැ.
5. මා - AGI ක.සැ.ම.
6. ඈ - පිටපත් හැම, ක.කි.සැ.ම.
7. බුහුනණියෝය - නැගණියෝය - DGH, ක. සැ.

මෙලෝ පරලෝ දෙක්හි කිසි භයක් ලජ්ජාවක් නැති ව ප්‍රාණවධ හෝ කරන්නාහ: පරදර ක්‍රියායෙහි නියුක්ත වන්නාහ, බොහෝ සේ නො සබා[1] තෙපුල් ම කියන්නාහ. තව ද මේ ලොකයෙහි ස්ත්‍රීන්ගේ වසහත්‍වයට ගියාවූ පුරුෂයෝ උමං බිඳීම් ආදි වූ සොරකම් හා මං පැහැරීම් රා බීම් කේළාම් කීම් යනාදි වූ ඉතා සාහසික වූ නො කළමනා සියලු කටයුත්තෙහි ම යෙදී වාසය කරන්නාහ. අනේ මේ ලොකයෙහි සිතින් සිහි කරන්නාහට පවා ඉතා භය එළවන්නාවූ ආශ්චර්‍ය්‍යයක් ඇසුව මැනව, පෙර සිය ලේ නෑකමක් නැති ඉතා ධූර්ත වූ තමා අඹුවගේ බස් ගෙන එක කුසෙහි හොත් නැහැණියන් පවා මරනු කැමති වී ය. එසේ හෙයින් කියන ලදි:

හායන්ති ඉධ ලොකත්‍ථා - හායන්ති පාරලොකිකා,
හායන්ති මහතො අත්‍ථා - යෙ ඉත්‍ථීනං වසඞ්ගතා.

එසා මාතා පිතා එසො - භගිනී භාතරො ඉමෙ,
ගරුතබ්බෙ න ජානන්ති - යෙ ඉත්‍ථීනං වසඞ්ගතා

කාරණාකාරණනෙතතං[2] - කත්තබ්බං වා නවා ඉදං,
කාමන්ධත්තා න ජානන්ති - යෙ ඉත්‍ථීනං වසඞ්ගතා.

[පාණංවා අතිපාතෙන්ති හොන්ති වා පාරදරිකා,
භාසන්ති අලිකං වාචං - යෙ ඉත්‍ථීනං වසඞ්ගතා.

සන්ධිච්ඡෙදදිකං ථෙය්‍යං - මජ්ජපානං ච පෙසුනං
කරොන්ති සාහසං සබ්බං - යෙ ඉත්‍ථීනං වසඞ්ගතා[3].]

අහො අච්ඡරියං ලොකෙ - සරන්තානං භයාවහං,
භරියාය වසං ගන්ත්‍වා - සොදරිං හන්තුමිච්ඡති-යි.

ඉක්බිති ඒ සාහසික වූ පව්වු පුරුෂතෙම මතු රහත් ව නිවන් දක්නා මහ පිනැති පුතණුකෙනකුන් කුසින් ධරාගෙන රන්පිළිමයක්[4] සේ ශොභාමත් ව සිටි තමාගේ ළඳ බොළඳ ඒ නැහැණියන් ළඟට කැඳවා කියනුයේ 'එම්බා නැහැණියනි,[5] අපගේ දෙමවුපියන් දුන් ණය එළවා යම්හ: අප දෙදෙනා දැක ණය දරන්නාහු ඉදින් අපට ණය දුන්නාහු වීනම් යහපත් වේ දැ'යි කීයේ ය. එබස් අසා කුමාරිකාවන් යහපතැයි ගිවිසි කල්හි සැප වූ මිටි යානාවෙක කුමාරිකාවන් ඉන්ට සලස්වා ණය දරන්නවුන්ගේ ගමට යන බඳු ව රථය පැදගෙන ගොස් මහත් වූ එක් වනාන්තරයකට වැද රථය මඟින් ඉවත් කොට තබා ඒ කුමාරිකාවන් නොකැමැති කරවා බලාත්කාරයෙන් හඬව හඬවා අත අල්වා ඇදගෙන කොළ කැළයෙන් ගහන වූ වනළැහැබකට ගෙන ගොස් මෙවිට මැගේ හිස කපම්'යි සිතා කෙස්වැටිය අල්වාගෙන බිම ඇද හෙළා ගත්තේය. එකෙණෙහි ඒ කුමාරිකාවට විලි පහරනට

1. සබා - ABCDEGHIKL
සැබා - අන් හැම
2. කාරණාකාරණතෙව - CDEGHIKL
3. මේ ගාථා දෙක පිටපත්හි නැත.
මුද්‍රිත ග්‍රන්ථවල හා පාලියේ ඇත.
4. ලියක් - C
ලියයක් - BDEFGHIKL
5. නැගණියෙනි - ACEGHI

Non-Commercial Distribution

පටන් ගත: එකල්හි කුමාරිකාවෝ බෑණන් කෙරෙහි ලජ්ජායෙන් 'ස්වාමීනි, මට දැන් කම්ජවාතය සෙලවිණ; එබැවින් මා වදපියන තෙක් මඳක් බලා ඉවත් ව සිටිය මැනවැ'යි මෙසේ නොයෙක් පරිද්දෙන් යාච්ඤා කොට කියා ද අතඅරවාගත නොහී මුරගාමින් ම පුතණුකෙනකුන් වැදූහ. ඉක්බිති ඒ පාපිෂ්ඨ වූ දුෂ්ට පුරුෂතෙම ඒ සමීපයෙහි සිටි එක් නුගරුකක් දැක 'මෑ ගෙන ගොස් මේ නුගරුක් මුල්හි මරමි'යි සිතා නැවත හිසකේ අල්වා ඇදගත්තේය: එකල්හි ඒ කුමාරිකාවෝ කියන්නාහු 'ස්වාමීනි, නුඹවහන්සේගේ තෙල බැහැනණුවන්ගේ[1] සුපිපි රත්පියුමක් හා සමාන මුවපියුම බලා උන් කෙරෙහි සෙනහයෙන් වී නමුත් මා නොමරා හැරපුව මැනවැ'යි කියමින් රත්[2] මලස්නෙක[3] රතැඹුල මල් දෙකක් පුදන්නාසේ තමන්ගේ සුරක්ත වූ දෙහොත මුදුන තබා වඳිමින් නොයෙක් පරිද්දෙන් යාච්ඤා කොට ජීවිතදානය ඉල්වූහ. එසේ ජීවිතදනය ඉල්වුව ද චණ්ඩපරුෂ වූ ඒ පාපිෂ්ඨ දුෂ්ට පුරුෂතෙම කුමාරිකාවන්ගේ ළඳබොළඳ වූ එබඳු බැගෑපත් වචනය නොඇසූ කන් ව මරන්ට ම උත්සාහ කරන්නේ ය: එවේලෙහි කුමාරිකාවෝ තමන්ට කිසි ආරක්ෂාවක් පිටිවහලක් නොදැක අසරණ ව සිතන්නාහු 'ඉදින් මම තරකොට මුරගාපීම් නම් ඒ ශබ්දය අසා යම් කිසි කෙනෙක් අවුත් මාගේ බෑණන් වහන්සේට කිසියම් ව්‍යසනයක් කළාහු වී නම් යහපත් නොවන්නේ ය'යි සිතා බෑණන් කෙරෙහි සෙනහයෙන් බැණ නොනැඟී තමන් එදවස් බුදුන් අතින් ගත්තාවූ ශරණශීලය ම ආවර්ජනා කොට සිහි කෙරෙමින් හොත්තාහ.

ඉක්බිති ඒ කුමාරිකාවන් විසින් තමන්ගේ බෑණන් කෙරෙහි පතුරුවන ලද්ද වූ මෛත්‍රියෙහි ආනුභාවයෙන් හා සිතින් සිහිකරන ලද්දවූ බුධරත්නයෙහි ආනුභාවයෙන් එතැන්හි නුගරුක අධිගෘහිත වූ දෙවතාවා සිතනුයේ 'මෙබඳු ශීලාචාර සමපන්න[4] ගුණවත් මේ ස්ත්‍රී තොම මෙතැන්හි මරන ලද්දි වූ[5] නම් ඒකාන්තයෙන් මම දේවසමාගමයට වැද්ද නොහෙමි'යි සිතා ඒ කුමාරිකාවන්ගේ ස්වාමිපුත්‍රයාගේ වෙශයෙන් එතනට අවුත් ඒ පවිටු දුෂ්ට පුරුෂයා භයගන්වා එතැනින් ඔහු ලුහුබඳවා 'තෙපි නොබව'යි කියමින් ඒ කුමාරිකාවන් අස්වසා අලුත වැදූ පුතණුවන් හා සමඟ ඔවුන් රථයෙහි බා හිඳුවාගෙන එදවස් ම සැවැත් නුවරට අවුත් ඇතුළු නුවර ශාලාවෙක ඒ කුමාරිකාවන් සතප්වා[6] දිව්‍යපුත්‍රතෙමේ අන්තර්ධාන වූයේය. හේ එසේ මැයි. මේ ලෝකයෙහි ශක්‍රසම්පත් බ්‍රහමසම්පත් මාරසම්පත්

1. බැනණුවන්ගේ - EGHIKL, ක.කි.කැ.ම.ස.
2. රන් - ACDEFGHIKL
3. පලස්නෙක - I
   ගලස්නෙක - කි. කැ.
4. සම්පන්න වූ - BGHIKL
5. ලද්දේ වී - KL
6. සතප්පවා - DI, ක. කි. කැ.
   සතප්පා - BGHKL

Non-Commercial Distribution

චක්‍රවර්තිසම්පත් තිවන් සම්පත් ආදි වූ ලෞකික ලොකොත්තර සියලු සම්පත් ම සිඩකොට දී ලන්ට සමර්ථ වූ තුන්ලෝවාසීන්ට අසහාය නායක වූ හෙවත් ඒකනායක වූ බුදුරජාණන් වහන්සේ යම් කිසි කෙනෙක් සිතින් වී නමුත් භක්තිප්‍රෙම සහිත ව සිහි කළාහු වී නම් ඔවුන්ට කිසි දුකක් පැමිණි කල්හි දෙවතාවෝ ද පිරිවහල් ව ඔවුන් ඒකාන්තයෙන් ම රක්‍ෂා කරන්නාහ. ඉදින් යම්කිසි කෙනෙක් මඳ ඇසිල්ලෙක වී නමුත් සියලු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රීසිත් පතුරුවා ඉඳුරා මෛත්‍රී කළාහු වී නම් ඒකාන්තයෙන් ම දෙවතාවෝ ද ඔවුන්[1] රක්‍ෂා කොට සතුටුපඬුරු ගෙනහැර දීමෙන් සන්තොෂ කරවන්නාහ. ඒ බව ප්‍රකාශ කොට දක්වන පිණිස කියන ලදී:

සබ්බසම්පත්තිදාතාරං - සබ්බලොකෙකනායකං,
මනසාපි යෙ විභාවෙන්ති - තං වෙ පාලෙන්ති දෙවතා.

මුහුත්තමපි ච යො මෙත්තං - භාවෙති යදි සාධුකං,
තං වෙ[2] පාලෙන්ති දෙවා පි - තොසයන්ති උපායනා[3]-යි.

ඉක්බිති ඒ කුමාරිකාවන්ගේ ස්වාමිපුත්‍රතෙම කිසි කටයුත්තක් පිණිස අවුත් නුවරින් නික්මෙනුයේ ශාලාවෙහි උන්නාවූ ඒ කුමාරිකාවන් දැක 'තෙපි කවර දවසෙක අවු ද, කවුරු තොප මෙතැනට කැඳවාගෙන අවු දැ'යි විචාළේ ය. එතෙපුල් අසා කුමාරිකාවෝ දේවතාවා තමන් කැඳවාගෙන ආ බව නොදැන කියන්නාහු 'නුඹ කුමක් කියන්නෙහි ද:[4] මා කැඳවාගෙන ආ දැ[5] නුඹ වේදැ'යි කීහ. එබසට 'හැයි කෙල,[6] තෝ[7] නැයන්ගේ ගම්[8] රඳ[9] සිත් වූ පරිද්දෙන් බැහැර පෙම් වඩා ඇවිද තව ද ඒ මඳින් මායම් කියයි දැයි කියා හිසකේපත ගසා අල්වාගෙන ගෙඩිබැට දෙම්'යි නොසිතා[10] එකල්හි ඒ පුරුෂයා ද එබසට කියනුයේ 'එම්බල කෙල,[11] තෝ[12] කුමක් දෙඩයිද: තිගේ බෑණන් හිඳිනා ගමදී තී දුටු දවස් පටන් දැන් සාරමසෙක් පිරුණේය: මෙතෙක් කල් මම එක දවසෙකත් තොප නුදුටුයෙමි: උගුරට සොරා බෙහෙත් කැව යි යන කරුණ සේ මට නොහඟවා තෙපි මා හා කැටි ව කෙසේ අවුදැ'යි විචාළේ ය. එතෙපුල් අසා කුමාරිකා තොම[13] 'ස්වාමීනි, එසේ වී නම් මේ රහස් කථාව අන් කිසිවක් හට නොකියමැනවැ'යි කියා ඉක්බිති බෑණන් විසින් තමන් මරන්ට කළ කී උපක්‍රම සියල්ල ම නොවළහා විස්තර කොට කීහ. එකල්හි ඒ කුමාරිකාවන්ගේ ස්වාමිපුත්‍රයාණෝ[14] දියෙහි උස්මෑත වූ එකකු මෙන් භයින් තැති ගෙන ඉතා කළකිරී මහත් වූ භයට පැමිණ ඒ කුමාරිකාවන් තමන්ගේ ගෙට ම කැඳවාගෙන ගොස් එයින් කීප දවසක් ගිය කල්හි දෙමහල්ලෝ එක් ව බුදුන්ට ආරාධනා කොට මහදන් දී වළඳ ඉක්බිති දෙමහල්ලෝ ම බුදුන්ගේ ශ්‍රීපාදය වැඳ එකත්පස් ව උන්හ. ඉක්බිති

---

1. පිරිවහල්ව ඔවුන් - ස
2. වෙ (නැත) - ABDEFJ
3. උපායනං - GHIKL
   උපායනං - C
4. කියන්නේ ද - ABCFGHIJ
5. කැඳවාගෙන අද මෙතැනට ආවෝ - ස
6. කෙල - ABCDEFGI
   කෙල්ල - HJ
7. තී - BHIKL
8. ගෙදර - BHIKL
9. රඳවා - KL හැර අන් හැම
10. සිතා - GHI සං.සි.සැ.
11. කෙල - ABEFGIL
12. තී - L
13. කුමාරිකාවෝ - KL
14. ස්වාමිපුත්‍රයාණෝ මේ
    ගිය ආ අත් අසා - J සං.සි.සැ.ම.

Non-Commercial Distribution

ඔවුන් දෙන්නා අතුරෙන් කුමාරිකාවෝ බුදුන්ගේ ශරණ ශීලයෙහි අනුසසින් තමන්ගේ ජීවිතය ලත් බව ප්‍රකාශ කොට බුදුන්ට දන්වා තමන්ගේ පුතණුවන් ලවා බුදුන්ගේ ශ්‍රීපාදය වඳවා ඒ පුතණුවන්ට ශරණකුමාරයෝ යයි නම් තුබූහ. බුදුහු ඔවුන්ගේ අදහස් දැන කලට සුදුසු වූ ධර්‍මයෙන් බණ වදළසේක: ඒ ධර්‍මදෙශනාවන් අසා ඒ දෙමහල්ලෝ ම පළමු වන සෝවාන් මගින් නිවන් දුටහ. ඉක්බිති ඔවුන්ගේ පුත්‍ර වූ ශරණ කුමාරයෝ විසි හැවිරිදි වයසට පැමිණ බුදු සසුන් වැද මහණ ව විදර්‍ශනා වඩා රහත් බවට පැමිණ ශරණ ස්ථවිරයන් වහන්සේ ය යන නමින් ප්‍රසිද්ධ ව බුදුසසුන් බැබළවූහ.

මෙසේ දෙවාතිදෙව වූ බුදුරජාණන් වහන්සේගේ නාමය මඳ විගසෙක පවා සිතින් සිහි කරන්නාවූ සත්ත්වයෝ කිසි පිළිසරණක් නැති අසරණ අවස්ථාවෙහි මහත් වූ පරම ප්‍රතිෂ්ඨාවට පැමිණ සුවපත් වන්නාහ යි දැන බුදුන්ගේ 'ඉතිපිසො භගවා' යනාදීන් නව අරහාදී වූ ගුණ සමූහයන් ඉඳුරා දන්නා පින්වත් සත්ත්වයෙනි, සර්‍වප්‍රකාරයෙන් හැම කල්හි ම ශරණ ශීලයෙහි පිහිටා එකාවත් බුදුන් සිහිකොට සියලු උපද්‍රවයෙන් මිදී මෙලෝ පරලෝ දෙකින් වන්නාවූ සියලු අර්‍ථසිද්ධියට පැමිණෙන්ට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි:

ඛණමපි මනසෙවං දෙවදෙවං සරන්තා
පරම තර පතිට්ඨං පාපුණන්තීති මච්චා,
භගවති ගුණරාසිං ජානමානා ජනා භො
භජථ සරණසීලං සබ්බථා[1] සබ්බ කාලං--යි.

මෙතෙකින් මේ දහම්සොඬ වග
සතර වන ශරණ ස්ථවිර වස්තුව
කියා නිමවන ලදී.

තව ද මේ දහම්සොඬ වග පස් වන **බුද්ධවම්ම වස්තුව** නම් කවර යත්,

පෙර දඹදිව පැළලුප් නුවර වෙළඳම් කොට ජීවත්වන්නාවූ බුද්ධවම්ම නම් වෙළඳුණ කෙනෙක් වූහ. ඒ වෙළඳුණෝ[2] එක් සමයෙක බොහෝ වෙළඳුන්[3] හා සමඟ ගැල් පුරා බඩු ගෙන්වාගෙන ගම් නියම්ගම් රට දනවු රාජධානි ආදියෙහි වෙළඳාම් කෙරෙමින් ඇවිදුනාහ. එසමයෙහි භාග්‍යවත් වූ බුදුරජාණන්වහන්සේ නොයෙක් දහස් ගණන් මහණගණයා පිරිවරා දිව්‍ය මනුෂ්‍යාදි වූ බොහෝ සත්ත්වර්ගයා මේ අසාර වූ සංසාර නමැති කාන්තාරයෙන් එතෙර[4] කෙරෙමින් හැම සත්ත්වයන්ට කුසල්

1. සබ්බද - CGHI
2. වෙළෙඳුණෝ - CDEF, සි. බෙ. ස.
3. වෙළෙඳුන් - D, සි. බෙ. ස.
4. එතර - ABCEGHIJ ක.සි.ස.

Non-Commercial Distribution

වඩනු සඳහා ගම් නියම්ගම් රාජධානි පිළිවෙළින් දනවු සැරිසරා වඩනා සේක. එකල්හි ඒ බුඩවමම නම් වෙළඳ[1] පුත්‍රයාණෝ එක් දවසෙක මහත් වූ බුඩානුභාවයෙන් යුක්ත ව යුගන්ධරාදී වූ සත්තකුල පර්වතයන් පිරිවරා ස්වකීය වූ රශ්මි සමූහයෙන් දිලිහෙන ස්වර්ණමෙරු රාජයා සේ[2] බොහෝ භික්ෂුගණයා විසින් පිරිවරන ලදු ව තමන් වහන්සේගේ දෙතිස් මහාපුරුෂ ලක්ෂණ අසූ අනුව්‍යඤ්ජන ව්‍යාමප්‍රභා කෙතුමාලාලංකාරයෙන් ප්‍රතිමණ්ඩිත වූ අටලොස්රියන් බුදුබඳින් දශදිග බබුළුවා නෙක[3] සහස්‍ර ඉන්ද්‍රවාපයෙන් වළඳනාලද ස්වර්ණ පර්වතයක් මෙන් දිලිහි දිලිහී වඩනා බුදුන් දැක පස්වනක් ප්‍රීතීන් පිනා ගිය ශරීර ඇති ව සක්විති රජකු දුටු චණ්ඩාලයකු සේ දෙහොත මුදුනෙහි තබාගෙන ආදර ගෞරවයෙන් නැමී නැමී බුදුන් කරා එළඹ සාදරාවනත උත්තමාඞ්ගයෙන් නමස්කාර කොට බුදුසස්නෙහි පෙර තමන් නුපුරුදු හෙයින් සවස් වේලෙහි බුදුහු අහර වළඳන සේක් දෝහෝයි සිතා 'අද සවස අපගෙන් ම අහර වැළඳුව මැනවැ'යි කියමින් බුදුන්ට ආරාධනා කළහ.

එතෙපුල් අසා ඕහට භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ 'එම්බල වෙළඳ පුත්‍රය, සර්වඥවරයෝ විකාලභොජනයෙන් වැළැක්නාහ. එසේ හෙයින් පස්වරු භාගයෙහි ආහාර අනුභවය නොකරන්නාහු වේ දැ'යි වදළසේක. එතෙපුල් අසමින් ම වෙළඳපුත්‍රතෙම නැවත බුදුන් වැඳ දන්වනුයේ 'ස්වාමීනි බුදුරජාණන් වහන්ස, එසේ නල සර්වඥවරයෝ සායණ්හකාලයෙහි තුමක් අනුභව කෙරෙද්ද; කෙසේ වූ දෙයෙක් නැප දැ'යි විචාළේය. ඔහු විසින් කියන ලද්දාවූ ඒ වචනය හෙතුකොටගෙන සර්වඥයන් වහන්සේ වදරනසේක් 'එම්බල වෙළඳ පුත්‍රය, සර්වඥවරයෝ විකාලයෙහි අෂ්ටවිධ පානවර්ගය, අනුභව කරන්නාහ, ඒ කවරේද යතහොත් අම්බපානය, ජම්බුපානය, චොචපානය, මොචපානය, මධුපානය, මුද්දිකපානය, සාලූකපානය, ඵාරුෂක පානය යන මේ අෂ්ටවිධ පානවර්ග නම් වෙයි; මෙකී මේ අටවැදෑරුම් වූ පානවර්ගය විකාලයෙහි වැළඳීම පූර්ව සර්වඥවරයන්[4] විසිනුදු පසස්නා ලද්දේ මය; එසේ හෙයින් මේ අෂ්ටවිධ පානවර්ගය විකාලයෙහි වැළඳීම සර්වඥවරයන්ට එකාන්තයෙන් ම කැප ය; ඉතා නිරවද්‍ය' යි වදළ සේක.

මෙසේ බුදුන් වදළ වචනය අසමින් ම සතුෂ්ට වූ සිත් ඇති ඒ වෙළඳ පුත්‍රයාණෝ පැන් නුමුසු කොට සියදැම්දි පැන් මිරිකා උක්පකුරු හා සමඟ එකස්කොට යොද බුදුපාමොක් මහසඞසයා වහන්සේට පිළිගැන්වූහ. එකල

---

1. වෙළෙඳ - D බෙ. ස.
2. මෙන් - KL
3. අනෙක - සා. කි. සැ. බෙ. ස.
4. බුද්ධවරයන් - ABDF
බුද්ධවරයෝ - B
සර්වඥයන් - CK

Non-Commercial Distribution

සර්වඥයන් වහන්සේ වෙළඳ පුත්‍රයාණන් විසින් එළවනලද්දවූ මුද්දිකපානය බික්සඟුන් හා සමඟ වැඩහිඳ වළඳ ඉක්බිති ඕහට අනුමෙවුනි[1] බණ වදරා ජනපද චාරිකාවෙහි වැඩිසේක. එකල්හි වෙළඳ පුත්‍රයාණෝ මහත් වූ සන්තොෂයෙන් පින පිනා බුදුන්ට පසු ගමන් කොට පරමාදර දක්වා දශනඛසමොධානයෙන් සමුජ්වලිත වූ දෙහොත් මුදුනෙහි තබා නමස්කාර කොට අවසර ගෙන නැවත සෙසු වෙළඳුන් හා සමග ඒ ඒ ජනපදවල්හි වෙළඳාම් කොට ඇවිදුනාහු දියදර විරහිත මහා වත්ත[නි]ය[2] නම් වූ කාන්තාර මාර්ගයට පැමිණියහ. එකල්හි ඒ සියලු වෙළඳුන්ගේ ගැල් මුළුල්ලෙහි අතරමග නහන බොන පිණිස ගෙනයන ලද්දවූ ජලය හැම තිමාවට ගියේය: එතැන්හි සියලු මනුෂ්‍යයන්ට ද ගැල් අදනා ගවයන්ට ද යන හැම දෙනාහට ම තලු තෙමන පමණකුත් පැනෙක් නම් නොවීය. ඉක්බිති බුධවම්ම නම් වූ ඒ වෙළඳ පුත්‍රයාණෝ[3] පිපාසිත ව පැන් පවස් ඉවසිය නොහී ඒ ඒ ගැල්හි වෙන වෙන ම පළමු නහන බොන පිණිස පැන් ගෙනගිය පානීය භාජනවල්හි පැන් පරීක්‍ෂා කෙරෙමින් ඇවිදුනාහ. එකල්හි එක් ගැලෙක මනුෂ්‍යයෝ එපරිද්දෙන් ම පැන් පරීක්‍ෂා කොට ඇවිදුනාවූ ඒ වෙළඳුණන් දැක ඔවුන් කෙරෙහි කරුණාවෙන් කියන්නාහු 'මෙසේ අව මැනව: මේ සැළෙහි යම්තම් පැනිත්තෙක්[4] ඇත: එයින් පැන් බී මඳක් පිපාස සන්හිඳුවාගත මැනවැ'යි කීහ. එතෙපුල් අසා ඒ වෙළඳුණෝ ඒ ගැල සමීපයට ගොස් සැළින් දුන් පැන් ගෙන මඳක් බීපීහ: එකල්හි ඕහට ඒ පැනෙහි රසය උක්සකුරු බහා[5] යොදන ලද පැන් නුමුසු සියදෑම්දිපැනෙහි රස හා සමාන විය: එකල පැන් බොමින් සිට ම වෙළඳණෝ සිතන්නාහු 'සහපිරිවර සහිත සම්‍යක් සම්බුධයන් වහන්සේට එදවස් මා විසින් දෙන ලද්දවූ මුද්දිකපානයෙන් ජනිත ඉෂ්ට විපාක දයක වූ කුශලප්‍රවාහය මෙතැන්හි විපාක දීම් වශයෙන් අද ම පැමිණියේ වනැ'යි සිතා අපමණ වූ ආශ්චර්‍ය්‍යයට මහත් වූ අද්භූතයට පැමිණි සිත් ඇති ව තමන් සිත හටගත්තා වූ අනන්ත සන්තොෂයෙන් පින පිනා සැළ සමීපයට ගොස් අනුන්ට විධානයක් නොකොට සැළමුවවිට තමන්ගේ විධානයෙන් ම විධානය හැරපීහ:[6] එකල්හි සැළ මුළුල්ල අවසර නොහැර සියදෑම්දිපැනින් ම පිරී සිටගත්තේය. ඉක්බිති ඒ වෙළඳපුත්‍රයාණෝ දිවඔජසින් යුක්ත ඉතා රසවත් වූ කෙතෙක් වියදම් කළත් අඩුවක් නොපෙනෙන්නාවූ දෙවියන්ගේ අමෘතපානය හා සමාන මධුර රසයෙන් ආර්ද්‍ර වූ සුවඳ ගඳ විහිදුනාවූ පැන්සැළ දැක මහත් වූ ප්‍රීතීන් පින පිනා ගිය ශරීර ඇති ව දිව්‍ය සුරාපානයෙන් මත් ව ඔල්වර හඬ ගසන අසුරභටයකු සේ සියල්ලවුන්ට ඇසෙන පරිද්දෙන් අඩගා කියන්නාහු 'එම්බා පින්වත්නි, හැමදෙන ම පැන් නිසා දුක් නොවිඳ වහා අවුත් සිත් වූ පරිද්දෙන් පැන් බී විඩා සන්හිඳුවා ගනුව' යි කියා හඬගෑහ. ඔහුගේ ඒ ශබ්දය අසා හැමදෙන ම එතැන්හි රැස් ව ඇම කල්හි අඩු නොවී පිරී සිටිනා භාගිරථී නම් ගඞ්ගාවෙහි ජලය මෙන් සමතිත්තික ව මුවවිට

1. අනුමෙවෙනි - BCHIKL ක.කි.කැ,ම.
2. මහාවත්තිය - පිටපත් හැම
   මහාවණ්ණනිය - මුද්‍රිත හැම පාලි.
3. වෙළඳණෝ - GHI
4. පැනිත්තක් - BCFK ක.කි.කැ,
5. පරහා - KL
6. හැරපියා - KL

Non-Commercial Distribution

පැහැර පිරී තුබුවාවූ ඒ පානීය භාජනය දැක මහත් වූ ආශ්චර්‍ය්‍යයට පැමිණියහ. ඉක්බිති ඒ වෙළඳ පුත්‍රයාණෝ එතැන්හි රැස්වූ නොමඳ වෙළඳජනයා මධ්‍යයෙහි සිට බුදුන්ගේ බුද්ධානුභාවවිශෙෂය ගාථා පඤ්චකයෙකින් ප්‍රකාශ කොට දක්වන්නාහු:

පස්සථෙදං භවන්තා හො - ආනුභාවං මහෙසිනො,
අචින්තනීයමච්ඡෙරං - සන්දිට්ඨිකමකාලිකං.

පසන්නමනසා බුද්ධෙ - දින්නං පානීයකං මයා,
විපච්චති ඉදානෙව - තං දානං මුනි වාහසා.

ඔජවන්තං සුධන්නං ච - සීතලං මධුරොදකං,
දිබ්බපානං ච දෙවානං - ජාතමබ්භුතමක්ඛයං.

සීලවන්තෙසු කො නාම - න දදෙය්‍ය විචක්ඛණො,
ඉධ ලොකෙ පරත්ථෙ ච - සුබ්දං දානමුත්තමං.

යථිච්ඡිතං ගහෙත්වාන - පිවන්තු මධුරොදකං,
භාජනානි ච පූරෙත්වා - යන්තු සබ්බෙ යථිච්ඡිතං-යි.

යනාදීන් 'එම්බා පින්වත් සත්වයෙනි, මේ ලොකයෙහි විද්‍යමාන ස්ථූල සූක්ෂ්මාදි වූ සමස්ත වස්තූන් විෂයෙහි නිරාවරණ ව නිරන්තරයෙන් පැතිර පවත්නාවූ තමන් වහන්සේගේ අසාධාරණ වූ දශවිධ පාරමිතාබල ප්‍රතිලබ්ධ විශුද්ධ බුද්ධඥානයෙන් සියලු සත්වයන්ට වියයුතු වූ ලෞකික ලොකොත්තර වශයෙන් ද්විප්‍රකාර වූ සකලාභිවෘද්ධි සංඛ්‍යාත මහත් වූ අර්ථසිද්ධියට එකාන්ත කාරණයන් බලා පරීක්ෂා කොට හිත සැප සිද්ධ කිරීමෙහි සමර්ථ වූ සර්වඥයන් වහන්සේගේ විශෙෂයෙන් ඉහාත්මභාවයෙහි විපාකදායක හෙයින් ඉතා ප්‍රත්‍යක්ෂ වූ අන්‍ය කාලාන්තරයට නොයවා කුශල කරණානන්තර ව ඵලප්‍රදානය කරන හෙයින් අකාලික වූ විශෙෂ ප්‍රබුද්ධ විශුද්ධබුද්ධීන්[1] ප්‍රසිද්ධ වූ බුද්ධිසම්පන්න මහජනයන් එක් ව තම තමන් නුවණ පමණින් දිවිහිමියෙන් සිතුව ද සිහින් සිනා කෙළවරක් දැක්ක නොහැක්කාවූ ඉතා ආශ්චර්‍ය්‍යමත් වූ මේ ආනුභාව විශෙෂය බලව.

සකලජන සන්තානවර්ති වූ අශෙෂ දෙෂාන්ධකාර විශෙෂ විධ්වංසනය හෙතුකොට ගෙන සහස්‍රකිරණයන් හා සාදෘශ්‍ය වූ රහත්ගණයා පිරිවරා පරානුග්‍රහ පිණිස ජනපද චාරිකාවෙහි වඩනා බුදුන් දැක පහන්සිත් ඇත්තාවූ මා විසින් උක්සකුරු හා එක් ව සකස් කොට යොද බුදුන්ට පිළිගන්වන ලද්දවූ ඒ මුද්‍රිකපානදානය ඉහාත්මභාවයෙහි බුද්ධානුභාවබලයෙන් විපාක දෙන්ට පටන් ගත්තේය. දැන් ඒ බුදුන්ට පිළිගන්වන ලද්ද වූ පානීය දානමය කුශලප්‍රවාහයෙන් මේ ඒ ඡායූදක[2] විරහිත වූ නිරුදක කාන්තාරයෙහි දෙවතාවන්ගේ සුධාභොජනය මෙන් දිව්‍යඔජසින් යුක්ත වූ මහසැළ බඳුන් පුරපුරා කෙපමණ ජනයන් සිත් වූ පරිද්දෙන් ගෙන ගිය ද ඇද නිමවාගත නො හැක්කාවූ ඉතා අද්භූත වූ අනවතප්ත ජලය මෙන් අතිශයින් සිහිල් වූ දෙවියන්ගේ දිව්‍යපානය මෙන් ඉතා මිහිරි වූ මෙබඳු ජලය පහළ විය. එසේ හෙයින් මෙලෝ පරලෝ දෙකින් ම නොයෙක් සැප එළවා කෙළවර

1. විශද විශෙෂ ප්‍රබුද්ධ විශුද්ධ බුද්ධීන් - ස
2. ඡායොදක බෙ.ස.

Non-Commercial Distribution

නිර්වාණසැපය සිධකොට දෙන්නාවූ කැමැති කැමැති වස්තු සිධකොට දෙන සිතුමිණි රුවනක් හා සමාන වූ උතුම් වූ දනය තමහට හිත කැමැති නුවණැත්තා වූ කවර නම් සත්වයෙක් සිල්වතුන් වහන්සේට කෙසේ නම් නොදේද: ඒකාන්තයෙන් දෙන්නේ මය. එබැවින් මාගේ කුශලානුභාවයෙන් උපන්නාවූ මේ බඳුන් පිරී මිහිරි ජලය සිත් පිරිය පරිද්දෙන් උක උකා බොත්වයි මෙතැන් පටන් හැමදෙන ම පැනින් දුක් නොවිඳ තමතමන් සිත් වූ පරිද්දෙන් මහසැළ තාළි කුට්ටම් බඳුන් පුරපුරා තඩි පිටින් මැඩි මැඩී මෙයින් පැන් ගෙන යෙත්වයි යනාදීන් මෙසේ ද කියා බුදුන්ගේ බුධානුභාවය හා දනඵල විශෙෂය ප්‍රකාශ කොට දක්වා ඉක්බිති එතැන්හි රැස්වූ මනුෂ්‍යයන් හා ගැල් අදනා ගොන් ඇතුළු වූ සියල්ලවුන් ම මුද්දික පානයෙන් ම සන්තර්පණය කෙළේ ය. පසුව සෙසු ඒ ඒ දිගින් ආවාවූ මහජනයෝ ද සිත් සේ කැමැති පමණ පැන් බොන්නාහු මය: එතෙකුදු වුවත් සැළෙහි පැන් අඩු නොවේ මය. ඉක්බිති ඒ වෙළඳ පුත්‍රයාණෝ සෙසු වෙළඳුන් හා එක් ව ඒ ඒ රට ඇවිද වෙළඳම් කොටගෙන නැවත තමන්ගේ නුවරට එන්නාහු ‘මුළුලොවට හිත සැප එළවන්නා’[1]වූ බුදුරජාණන් වහන්සේ දැක වැඳ පින් පුරාගෙන යෙමි’ යි සිතා රජගහ නුවර සමීපයෙහි එම නුවර බිම්සර රජ්හු විසින් මුනිරජ්හු උදෙසා කරවා පිළිගන්වන ලද වේළුවන මහා විහාරයට ගොස් බුදුන් දැක බැතිපෙම් සහිත ව පසඟ පිහිටුවා වැඳ මහත් වූ ප්‍රීතින් පිනපිනා සිටියාහු බුදුන් විසින් අනුදන්නා ලදු ව එකත්පස් ව උන්හ. එකල බුදුහු ඒ වෙළඳුණන් හා සමඟ කලට සුදුසු වූ කන්කලු මිහිරිවූ පිළිසඳර කථා කිරීමෙන් සඳරැස් පහළ කෞමුද වනයක් සේ වඩවඩා ඔහු සිත සතුටු කරවා වදාළ සේක. ඉක්බිති ඒ වෙළඳ උපාසක බුදුන්ට දන්වනුයේ ‘ස්වාමීනි, නුඹ වහන්සේගේ ඉතා ආශ්චර්යීමත් වූ ප්‍රෙමනීය වූ ප්‍රාතිහාර්යී දැක විශෙෂයෙන් ම පහන් සිත් ඇත්තාවූ මම නුඹවහන්සේ දැක වැඳ පින් පුරාගෙන යෙමියි සිතා ආමි,[2] ස්වාමීනි, පැළලුප් නුවර සිට වෙළඳමට යන්නාවූ අප හැම විසින් අතරමඟ නහන බොන පිණිස සැළ තබා වළන් පුරා[3] ගෙනගිය ජලය හැම නිමාවට ගිය කල්හි තලු තෙමන පමණ පැනක් ලැබගත නොහැක්කාවූ කාන්තාර මාර්ගයෙහි පවා එදවස් සහපිරිස් සහිත නුඹවහන්සේට දුන්නාවූ මිදිපැනෙහි අනුසසින් සිස් බඳුන් පිරී මිහිරි ජලය පහළ විය. ඒ ජලය සීතලය මිහිරිය ඔජාවත්ය[4] ක්‍ෂය නොවන්නේය. දෙවියන්ගේ දිව්‍ය පානය හා සමානය. නුඹ වහන්සේගේ මහිමයෙන් ම මෙසේ ද පෙළහර පහළ විය යනාදීන් ආදියෙහි පටන් මදකුත් නොහැර විස්තර වශයෙන් කීහ. ඉක්බිති භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ මිහට අමාවැස්සක් වස්වන්නා[5] සේ ධර්මදෙශනා කොට වදාළසේක. ඒ වෙළඳ උපාසකයෝ ද බුදුන් වදාළ බණ අසා හිරුරැස් පතළ පද්මයක්

---

1. එළවන - EGHIKL
2. අයිමි - L
3. සැළි වළන් පුරා - EGIKL
   සැළ වළන් - B
4. ඔජාවන්තය - KL
5. වස්නා - GHIKL

Non-Commercial Distribution

ජේ මහත් වූ සන්තොෂයට පැමිණ සෙටවන[1] දවස් වන්නාවූ ප්‍රීතිප්‍රමොද්‍ය පිණිස බුදුන්ට ආරාධනා කොට මෙනම් දෙයෙක් මෙහි නැතැයි නොකියන පරිද්දෙන් දෙවන දවස් මහදන් දී බණ අසා බුදුන් වැඳ අවසර ගෙන පැළලුප් නුවර තමන්ගේ වාසස්ථානයට ම ගොස් එතැන් පටන් වඩ වඩා දනාදී කුශලසම්භාරයන් රැස්කොට ඒ ආත්මභාවයෙන් මිදී ගොස් දෙවුලොව දෙළොස් යොදුන් රන් විමනෙක්හි නොයෙක් සියගණින් දෙවඟනන්[2] පිරිවරා මහත් වූ දිව්‍යෛශ්වර්‍ය්‍යයෙන් යුක්ත ව උපන්හ. එකල ඔහු තමා විසින් පූර්වජාතියෙහි කරන ලද්ද වූ කුශලය ප්‍රකාශ කරනු පිණිස ඒ දිව්‍යපුත්‍රයාගේ විමානය සිසාරා ඒ ඒ තන්හි දිව්‍යමය මිදිපැන් පිරුණාවූ සත්රුවන් විසිතුරු දිව්‍ය[3] භාජන පහළ විය. දෙවතාවෝ එයින් මිහිරි වූ දිවරසයෙන් නොමිදි මිදි පැන් උකා බී සන්තුෂ්ට වූවාහු දිව්‍යමහිමයෙන් යුක්ත වූ අනෙකප්‍රකාර නෘත්‍යගීතවාද්‍යයෙන් උපලක්ෂිත ව නිරන්තරයෙන් කෙළි කෙළනාහ.

එසේ හෙයින් මුළුලොවට අග්‍රදක්ෂිණෙය්‍ය වූ බුදුරජාණන් වහන්සේගේ කිසි විශෙෂ ගුණසාරයක් නොදන්නාවූ එබඳු වෙළඳ ජනයෝ පවා පහන් සිතින් දුන්නා වූ පැන් දන් පමණක් හෙතු කොටගෙන මෙසේ මහත් වූ දිව්‍යසම්පත් ලබන්නාහ: එබැවින් තුන්ලෙව්හි පතළ ගුණ සොභාවන්[4] ඇති බුධරත්නය ධර්මරත්නය සඞ්ඝරත්නය යන ත්‍රිවිධ රත්නයෙහි විද්‍යමාන ගුණසමූහයන් තම තමා නුවණ පමණින් ඉඳුරා දන්නාවූ පින්වත් සත්වයෙනි, තෙපි හැම දැන් දිව සත්රුවනින් පිරුණාවූ මහා නිධාන සේ සියලු ගුණගණාඩගයෙන් අනූන වූ සිල්වතුන් වහන්සේට කම්පල අදහා දෙන්නාවූ චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍යය යන සිවුපස දනය හෙතුකොටගෙන මතු එන දවස දිව්‍යලොකයෙහි එකාන්තයෙන් ම විශෙෂවත් වූ නොයෙක් ශ්‍රී සම්පත්තීන් ලබව: එබැවින් දනඵල විශෙෂයෙන් යුක්ත මේ කථා වස්තුව ඇසුවාවූ සත්පුරුෂ ස්ත්‍රී පුරුෂයන් විසින් තම තමා ශක්ති පමණින් පිළිවන් කුසල් කොට මතු දිවසැපත් විඳින්ට උත්සාහ කළ මැනවි.

කියන ලදුයේ මැයි:

න විපුල ජිනසාරං ජානමානොප්නෙවං
ලභති විපුල භොගං තොයමත්තස්ස දනා,
විදිත ගුණගණා හො තීසු වත්ථූසු තුමෙහ
ලභථ බලු විසෙසං සීලවන්තෙසු දනා - යි.

මෙතෙකින් මේ දහම්සොඬ වග
පස් වන බුධවම්ම වස්තුව
කියා නිමවන ලදී.

මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි ධර්මසොණ්ඩක වර්ග නම් වූ
සතර වන පරිච්ඡෙදය නිමි.

---

1. වැනි - පිටපත් හැම
   වෙනි - ක.කි.ඤ.ම.
2. දිව්සෙනඟ - K
3. දිව - AEFJ
4. සෝභාවක් - KL

Non-Commercial Distribution

තව ද මේ සද්ධර්මාලංකාරයෙහි
මහාමන්‍ධාතු වර්‍ගය නම් කවර යත්?

මෙතැන්හි මතු කියන්නේ එහි පළමු වන මහා මන්‍ධාතු වස්තුව ය. හේ කෙසේ ද යත්,

මේ කල්පයට එකානූවන කපින් මත්තෙහි මහාවිපස්සි නම් වූ එක් සම්‍යක් සම්බුද්ධකෙනකුන්වහන්සේ ලොකයෙහි පහළ ව පවත්වන ලද උතුම් වූ ධම්වක්‍ර ඇතිසේක් දෙව්මිනිසුන් සහිත සියල් ලොවැසියන් විසින් පුදනලදුව බන්‍ධුමතී නම් රාජධානියෙහි වැඩ වසනසේක. එකල්හි මේ මහා මන්‍ධාතු රජ්ජුරුවෝ එම නුවර සන්නාලි කුලයෙහි[1] ඉපද එම සන්නාලි මෙහෙවර කොට ජීවත් වෙමින් වාසය කරන්නාහ. එකල්හි එනුවර වාසය කරන්නාවූ සියලු මනුෂ්‍යයෝ ම බුදුන් ප්‍රධානකොට ඇති මහාසඞ්ඝයා වහන්සේට දවසින් දවස දියුණු කෙරෙමින් මහදන් සරහා දෙන්නාහ. මෙසේ දන් දෙන්නාවූ මහජනයා දැක දවසෙක ඒ තුනාදරුතෙම සිතනුයේ 'මේ නුවර වැසි හැමදෙන ම දැන් සතුටු සතුටු ව දවසින් දවස දියුණු දියුණු මහදන් දෙන්නාහ: මම වනාහී දැන් දුක්පත් හෙයින් දන් දී ගත නොහී වෙන ම තෝරී ගියෙමි: ඉදින් මම දැන් මෙබඳු මේ කුශලක්‍ෂෙත්‍රයෙහි මතු මහා ඵල[2] මහානිසංස වන්නාවූ පින් නමැති බිජුවටක් වපුටගත නුහුණුයෙම් වීම් නම් එන දවස මේ සසරදුකින් කෙසේ නම් මිදෙම් ද? එබැවින් මා විසිනිදු දනක් දුන මැනවැ'යි සිතා දවසෙක උත්සාහවත් ව සන්නාලි මෙහෙවර කොට යම්තම් මිලයක් උපදවාගෙන ඒ මිලයෙන් එක් භික්‍ෂු කෙනකුන් වහන්සේ පමණකටත් දනක් දීලන්ට නුවර වැසියන් අවසර නොහරනා හෙයින් අඟානියට දිවගෙන ගොස් මිල දී මහමෑ පුමුහක් පුරා ගෙනවුත් බුදුපාමොක් මහාසඞ්ඝයා වහන්සේ වළඳන භොජනශාලාවට වැද එපමණකුත් පිළිගන්වාලන්ට අවසරයක් නො ලැබ එකත්පස් ව සිට මෙසේ සිතුයේය. කෙසේද යත්, මෙයින් එක් භික්‍ෂුකෙනකුන් වහන්සේ පමණකටත් මේ මා දන් පිළිගන්වාලන්ට අවසර නැත්තේය: එබැවින් මම මේ අතින් ගෙන එකාන්තයෙන් ම අහසට දමම්: එසේ කල්හි අහසින් ගොස් හෙන්නාවූ මෙයින් එකක් වී නමුත් එක් භික්‍ෂු කෙනකුන්වහන්සේ වළඳන පාත්‍රයෙහි හුණුයේ වී නම් ඉතා මැනවි: ඒ දනමය කුශලය මතු සසර සැරිසරා ඇවිදුනාවූ මට බොහෝ කාලයක් මුළුල්ලෙහි නොයෙක් හිත සැප එළවීමට එකාන්තකාරණ වන්නේය යි සිත සිතා මහත් වූ සන්තොෂයෙන් යෙදී තමා ගෙන ගිය රාජමාෂයන් පුමුහින් ගෙන අහසට දැමුයේය. ඉක්බිති අහසින් ගොස් හෙන්නාවූ ඒ සියල්ල ම බුදුන් පිරිවරා සිටි දෙවියන්ගේ දිව්‍යානුභාවයෙන් හා බුදුන්ගේ බුධානුභාවයෙන් එකකුත් පිටත නොවැගිර බුදුන් ආදි කොට[3] ඇති හැම භික්‍ෂූන් වහන්සේගේ පාත්‍රයෙහි වෙන වෙන ම ගැන හෙළා ලූවාක් මෙන් අඩු වැඩි නොව එකවිවර නොවරදවා ම හුණුයේය. මෙසේ මහත්

1. කුලයෙක - ස
2. මහාඵල - පිටපත් හැම
   මහත්ඵල - මුද්‍රිත හැම ස.
3. ප්‍රධාන කොට - C

Non-Commercial Distribution

වූ ඒ ආශ්චර්‍ය්‍යය දැක ඉක්බිති ඒ තුනාදරුතෙම ඉතා ප්‍රසන්න වූ සිත් ඇති ව බුදුන් දසාවට නමින ව දසනඛසමොධාන සමුජ්වලිතවූ තමාගේ දෙහොත් මුදුනෙහි තබාගෙන කෘතාංජලී ව සිට ප්‍රාර්ථනා කරනුයේ:

> ඉමිනා මෙ අධිකාරෙන - පසාදෙන යතිස්සරෙ,
> කාමභොගීනහං අග්ගො - භවෙය්‍යං ජාති ජාතියං.
> පහරිත්වා යද පාණිං - ඔලොකෙමි නභොතලං,
> සත්තරතන සම්පන්නං[1] - වස්සං වස්සතු සබ්බද - යි.

යනාදීන් 'මෙසේ මා විසින් දැන් කරන ලද්දවූ මේ දනමය කුශලබලයෙන් හා රහත්ගණයා පිරිවරා වැඩහුන්නාවූ සපිරිවර බුදුන් කෙරෙහි කරන ලද මේ චිත්තප්‍රසාදයෙන් ජනිතවූ කුශලසම්භාරය හෙතුකොටගෙන මතු උපනුපන් ජාතියෙහි රූපශබ්දදි වූ පංචකාම සම්පත්තීන් යුක්ත ව ප්‍රමාණාතික්‍රාන්ත වූ මහඉසුරු විඳිමින් දිව්‍යමනුෂ්‍යාදී වූ සියලු කාමභොගීන්ට අග්‍ර වෙම්ව යි. යම් කලෙක්හි මම වමත හකුළුවා දකුණතින් අත්පොළසන් දෙමින් මා දෙඇස්[2] දල්වා අහස්තලය බලම් ද ඒ හැම කල්හි මාගේ අදහස් වූ පරිද්දෙන් දිව්‍යමය සත්රුවන් වැසි වැස මිහිමඬල පුරා සිටීව'යි යනාදීන් ප්‍රාර්ථනා කොට එතැන් පටන් එකානුකපක් මුළුල්ලෙහි දිව්‍ය මනුෂ්‍යලොක දෙක්හි චුතිප්‍රතිසන්ධි වශයෙන් සැරිසරා ඇවිදිමින් මහත් වූ ශ්‍රී සම්පත් අනුභව කොට මේ මහා භද්‍රකල්පයෙහි ප්‍රථමයෙන් රජ පැමිණි සූර්‍ය්‍යපුත්‍ර වූ මහසම්මත රජ්හු පටන් අසම්භින්න ව පැවති හිරුගොත් වංශයෙහි සත් වන මහාමන්ධාතු නම් රජ ව උපන්නේය. හේ කෙසේ ද යත්.

ප්‍රථම අනන්තකල්පයෙහි සූර්‍ය්‍යදිව්‍යපුත්‍රයා ශ්‍රී කාන්තාව හා සංගමය කළ කල්හි ලොකයෙහි පහළ වූහ යි යන පරමතය හෙතුකොට ගෙන සූර්‍ය්‍යපුත්‍ර යයි කියන ලද මහාසම්මත නම් වූ ඖපපාතික රජෙක් විය. ඒ රජ මහජනයාගේ සම්මතයෙන් පළමුවන අභිෂෙකය පැළඳ[3] රාජ්‍යයට පැමිණි හෙයින් මහාසම්මත රජ යයි මෙනමින් ප්‍රසිද්ධ ව දශවිධ රාජධර්මයෙන් යෙදී සකල ජනානුපාලනය කෙරෙමින් අසඞ්ඛ්‍යයක් අවුරුදු රාජ්‍යය කෙළේය. ඔහු පිත් රොජ නම් රජ ද අසඞ්ඛ්‍යයක් අවුරුදු රාජ්‍යය කෙළේය.

ඔහු පිත් වරරොජ නම් රජ ද අසංඛ්‍යයක් අවුරුදු රාජ්‍යය කෙළේය. ඔහු පිත් කල්‍යාණ නම් රජ ද අසංඛෙය්‍යයක් අවුරුදු රාජ්‍යය කෙළේය. ඔහු පිත් වරකල්‍යාණ නම් රජ ද අසංඛෙය්‍යයක් අවුරුදු රාජ්‍යය කෙළේය. ඔහු පිත් උපොසථ නම් රජ ද අසංඛෙය්‍යයක් අවුරුදු රාජ්‍යය කෙළේය. මෙසේ මහාසම්මත රජ්හු පටන් සූර්‍ය්‍යවංශයෙහි අසංඛෙය්‍යායුෂ්ක වූ රාජපරම්පරාවක් ගිය කල්හි යට කියන ලද්දා වූ තුනාදරු තෙම ක්‍රමයෙන් අවුත් එකල්හි උපොසථ රජහට පුත්‍ර ව ඉපද මහා මන්ධාතු නම් සක්විති රජ ව පූර්වජාතියෙහි ප්‍රාර්ථනා වූ පරිද්දෙන් ලොකයෙහි

1. සම්භූතං - පිටපත් හැම
2. මාගේ ඇස් - GHIKL
3. ලැබ - GHIKL

Non-Commercial Distribution

නොයෙක් ආශ්චර්‍ය්‍ය පහළ කෙරෙමින් සුවාසූදහසක් අවුරුදු චක්‍රවර්ති රාජ්‍යය කෙළේය. හුදෙක් ආදියෙහි පටන් චක්‍රවර්ති රාජ්‍යය කෙළේ නොවෙයි. ඒ රජ එනාහි එම ජාතියෙහි සුවාසූ දහසක් අවුරුදු කුමාරකෙළි කෙළියේය. සුවාසූ දහසක් හවුරුදු යුවරජය[1] කෙළේය. සුවාසූ දහසක් හවුරුදු මුළු දඹදිව එක්සත් කොට රාජ්‍යය කෙළේය. ඉක්බිති දනශීලාදි වූ දශවිධ සක්විති වත් පුරා පුරපසළොස්වක් ලත් පොහෝ දවසෙක උදයන්හි ම ලක්‍ෂයක් වටනා[2] වස්තු වියදම් කොට මහ දන් පවත්වා සුවඳ පැන් සොළොස් කළයෙකින් ඉස් ශොධා නහා ලක්‍ෂ සුවහස් වටනා සළු හැඳ අනෙක ප්‍රකාර රසයෙන් ආර්ද්‍ර වූ නොයෙක් සූපව්‍යඤ්ජනයෙන්[3] යුක්ත දිව්‍යභොජනයන්[4] හා සමාන වූ සයංජාත[5] සුවඳ රත්හැල් සාලේ බත කල් තබා[6] මෙහෙ නිමවා පොසථාඞග[7] ශීලය සමාදන් ව නානාවිධ සම්පත්ති සමූහයෙන් ප්‍රසාදකර වූ ප්‍රාසාදයෙහි අතුල වූ[8] මතුමහල් තලයට පැනනැඟී සුවඳ තෙල් වත් කළ රන්වැට පහනින් හා ජාතිරඞග මාණික්‍යාලොකයෙන් එකාලොක ව දිලියෙන්නාවූ[9] ශ්‍රී යහන් ගබඩාවෙක කොඳමල් රැසක් හා සමාන ශෙවතවර්‍ණ විචිත්‍ර ආස්‍තරණ වස්ත්‍රයෙන් විරාජමාන වූ ශ්‍රී යහන් මස්‍තකයෙහි බධපර්‍ය්‍යංකයෙන් උපලක්‍ෂිත ව ක්‍ෂීරසාගරයෙහි පැනනැඟී රළ පතර සමූහයක් හා සමාන වූ පිවිතුරු[10] උතුරු සළුවක් එකාංශ කොට බහා ගෙන තමාගේ දනශීලාදි වූ කුශල සම්භාරයන් ආවර්ජනා කෙරෙමින් හුන්නේය. එකල්හි ඔහුගේ කුශලානුභාවයෙන් සර්‍වාකාර පරිපූර්‍ණ නාගි නිම්වළලු සහිත වූ එසේම දැවි දහසකින් හා ස්‍වභාවයෙන් පිඹිනා වස්කුළල් සෙයින් ඇතුළතින් සිදුරු ව විචිත්‍ර වූ ජීද්‍රමණ්ඩලිකාවෙන් පටන් ගෙන පංචාඞගික තූර්‍ය්‍යනාදයක් මෙන් මධුරනාද පවත්වන්නාවූ මනහර පබළු දඩු සියයෙකින් හා නීල පීත ලොහිතාදි වූ පස්වනක් පැහැයෙන් යුක්ත ව ලෙල දෙන්නාවූ විචිත්‍ර කුසුම දමයන් ඇති දිව්‍යමය රන් කොත් දෙසියකින් සැදුම් ලද්දවූ කිරිමුහුද පැනනැඟී පෙණබුබුලු[11] පඞක්තියක් මෙන්[12] අතිධවල වූ ධවලාතපත්‍රයක් ධරා සිටි පබළුදඩු සියයෙකින් ශොභමාන ව දොළොස් යොදනෙක පැතිර පවත්නා වූ මධුරනාදයෙන් සියලු ජනයන්ගේ කර්‍ණයන් තමා දශාවට යොමු කරවමින් සතර ගවුවෙක පැතිර සිටිනාවූ අනෙක ප්‍රකාර විචිත්‍ර ශොභා විශෙෂයෙන් යුක්ත චක්‍රරත්නය පහළ විය. එසේ ම සියලු අවයව සම්පත්තීන් ශොභමාන ව රිදී පර්‍වතයක් මෙන් දිලිසෙන්නා වූ සර්‍වලක්‍ෂණ සම්පන්න හස්‍තිරත්නය ප්‍රධාන කොට ඇති නොයෙක් දහස්ගණින් ඇත්සෙනඟ පහළ වූහ. එසේ ම ජවබල සම්පන්න අශ්වරත්නය ප්‍රධාන කොට ඇති නොයෙක් දහස් ගණින් අස්සෙනඟ පහළ වූහ. සුවාසූ දහසක් මාණික්‍යරත්නයන් පිරිවරා රාත්‍රිභාගයෙහි හාත්පසින් සතරගවුවෙක අන්ධකාර විධමනය[13] කොට ආලොක පතුරුවා දිලියෙන්නාවූ සතර රියන් දිග ඇති අෂ්ටාංගික[14] වූ චින්තාමාණික්‍ය රත්නය ප්‍රධාන කොට ඇති නොයෙක් දහස් ගණින්

---

1. යුවරජකම් - KL
2. වටනා (නැත) - GH
3. සූපව්‍යඤ්ජන - බෙ.ස.
4. දිව්‍යභොජනයක් - CDEGHIL
5. ස්‍වයංජාත - CGHIKL
6. බතක් තබා - ADFJ, ක.කි.කැ,බෙ.
7. පොසථාඞ්ගං - කැ.
8. අතුළ වූ - D
   ඇතුල් වූ - BCF ක.කි.කැ,බෙ.
   ඇතුළෙ වූ - ම.
   ආතුල වූ - A
9. දිලිසෙන්නා වූ - ABCDEFIJ,ක.කි.කැ,ම.
10. විසිතුරු -CEGH
11. රන්බුබුළු -GHIL
12. සේ - ADEGHIJKL
13. විධ්වංශන ය - BGH
14. අෂ්ටවංක - EI ස.
    අෂ්ටාංශක - DK
    අෂ්ටාංක - L

Non-Commercial Distribution

මාණික්‍ය රත්නයෝ පහළ වූහ. බහා පළඳනා ලද මාණික්‍යමය කුණ්ඩලාභරණාදි වූ දෙවනිර්මිත නොයෙක් බිසෝපළඳනායෙන් සැරහුණාවූ ශරීරශොභාවන් ඇති සිවුපැටක් පමණ සත්‍රීලක්‍ෂණයෙන් යුක්ත දිව්‍යප්සරාවක මෙන් රූපශ්‍රීන් විරාජමානවූ ශරීරසම්පත්තීන් යුක්ත ස්ත්‍රීරත්නය ප්‍රධාන කොට ඇති නොයෙක් දහස් ගණන් බිසෝවරු පහළ වූහ. මහ පොළොව ඇතුලෙහි පවා යොදනක් පමණ තන්හි ඇතුළත පිහිටියාවූ නිධාන දක්නා තරම් මහානුභාව සම්පන්න දිවැස් ඇති ගෘහපතිරත්නය ප්‍රධාන කොට ඇති සියලු උපභොග පරිභොග වස්තුයෙන් ආඪ්‍ය වූ නොයෙක් දහස්ගණන් සිටුවරු පහළ වූහ. සතිස් යොදනෙක පැතිර සිටි මහසෙනඟ හා සමඟ රජ්හුගේ අභිප්‍රාය දැන ඒ වූ පරිද්දෙන් පිළිපදිනට සමර්ථ වූ පරසිත් දන්නා දිව්‍යඥාන ඇති ස්වභාවයෙන් ම ප්‍රඥසම්පන්න වූ කායකිෘත්‍යයන් දැන්මෙහි දක්‍ෂ යුක්ත මුක්ත[1] ජ්‍යෙෂ්ඨ පුත්‍ර වූ පරිනායක රත්නය ප්‍රධාන කොට ඇති නොයෙක් දහස්ගණන් සෙවක රජ්දරුවෝ පහළ වූහ. තව ද පිරිවර සහිත සතර මහාද්වීපයෙහි වාසය කරන්නාවූ හැම මනුෂ්‍යයන් එකපැහැර තම තමන් සිත් වූ පරිද්දෙන් උකා ගනුත් අඩුවක් නොපෙනෙන්නාවූ වටින් ගවු දෙගවු තුන්ගවු සතරගවු වට ඇති ව ගැඹුරෙන් දෙලක්‍ෂ සතලිස් දහසක්[2] යොදුන් ඝනකඩ බොල් මහ පොළොව නිමම දක්වා නොයෙක් වස්තුවෙන් පිරී සිටියාවූ සතර මහා නිධානයකුදු පහළ විය. ඒ රජ්හු ඇමතියන් කැමැති පරිද්දෙන් ප්‍රසාද දෙනු කැමැති ව වමත හකුළුවා දකුණතින් අත්පොළසන් දෙමින් ආකාශ මණ්ඩලය බැලූ කල්හි දෙවතාවෝ මහපුළං ගත් සල්වනයක් සේ වෙවුලමින් හයින් තැති ගෙන වෙන වෙන ම දිව්‍යමය සත්රුවන් වැසි වස්වා වටින් සතිස් යො දුන් පමණ තන්හි අතුරු නො හැර උයින් දණ පමණ සත්රුවන් ගොඩ කරන්නාහ. එසේ ම රජ්හුගේ කුශලානුභාවයෙන් නිර්මිත පංචාඞ්ගික තූර්‍යනාදයක් මෙන් මධුරනාද විහිදුනාවූ කිංකිණී දැල් බැඳි නානාවර්ණ ධ්වජමාලාවෙන් සැදුම් ලද්දවූ හෙමන්තය ගිම්හානය වස්සානය යන තුන් ඍතුවට සුදුසු වූ තුන් පහය සියාරා අනෙකප්‍රකාර දිව්‍යමය වස්ත්‍රාභරණ අන්නපානාදියෙන් සැදී සිටගත්තාවූ කල්පවෘක්‍ෂයෝ මෙතෙකැයි පමණ නැත. ඒ රජ්හු බැණනැහි[3] බස හා සමඟ මුඛයෙන් නිකුත් මහනෙල් මල් සුවඳ යොදනක් තැන් දිවෙයි. ශරීරයෙන් නික්මුණා වූ දිවසඳුන් සුවඳ සතරගවුවෙක පැතිර සිටිනේය. ආකාශයෙහි දෙවෙන්ද්‍ර ලීලාවෙන් පලක් බැඳ හිඳ මහ සෙනඟ දුටුගස්වා[4] අනුශාසනා කරන තරම් මහත් වූ ඍද්ධි ඇතියේය. දෙවතාවෝ සතර දෙනෙක් සර්වාභරණයෙන් සැරහී දිව රන්කඩු ගත් අත් ඇති ව ඕහට සතරදිග රැකවල් ගෙන සිටිනාහ. ඒ රජ්හු තමාගේ අණසක පවත්නාවූ පිරිවර සහිත සතර මහ ද්වීපය බලම්හ යි සිතූ ඇසිල්ලෙහි චක්‍රරත්නය අභිමුඛ ව ඉදිරියෙහි නික්ම ගන්නේය. එකල්හි රජතෙම සියලු රාජාභරණයෙන් සැරහී කැමැති

1. යුක්ත මුක්තවාදී - KL
   ව්‍යක්ත මුක්තවාදී - ස.
2. එක්ලක්‍ෂ විසිදහසක් - BDI L
   එක්ලක්‍ෂ දස දහසක් - GH
   එක්ලක්‍ෂ සතලිස් දහසක් - K
3. බැණ නැඟි කල -IL - ස.
4. කුටු ගන්වා - ක.කි.සද.ම

Non-Commercial Distribution

වාහනයකට නැගී එසේ ම සර්වාභරණයෙන් සැරහුණාවූ දෙවඟනන් හා සමාන විශේෂ රූපශොභාවෙන් විරාජමාන වූ මනහර පුරඟනන් හා එසේ ම අනෙකාලංකාරයෙන් විභූෂිත ව තල්වැට සෙමර[1] විසිරිපත්[2] පුන්කලස සෙන්කෝල පිල්[3] කුඩ[4] කොඩි සේසත් මඟුල් කඩු ආදි කොට ඇති නොයෙක් මඟුල් පෙරහර ගත්තාවූ පරිවාර ජනයන් හා එපරිද්දෙන් ම අනෙකවිධ කර්මාන්ත විශෙෂයෙන් විචිත්‍ර ජර්දු කුප්පායම් ආදි වූ නානාවර්ණ සන්නාහයෙන් අලඞ්කෘත ව අනෙකප්‍රකාර ආභරණප්‍රභායෙන්[5] දිලියෙමින් අතින් ගන්නාලද අසි සත්ති තොමර චන්‍ද්‍රචක්‍ර භෙණ්ඩිවාලාදි වූ විවිධායුධයන්ගේ ප්‍රහරණ ප්‍රභාවයෙන් හා නගන ලද නොයෙක් දහස් ගණින් ධජපතාකයෙන් ප්‍රතිමණ්ඩිත වූ තම තමන්ගේ මහ සෙනඟ හා සමඟ අහසින් අවුත් සිටගත්තාවූ යුවරජ සෙනෙවිරත් ඈපා මාපා ආදි වූ මණ්ඩලිකවරුන් හා. එපරිද්දෙන් ම පෙළ පෙළ සැදී වෙන වෙන අවුත් රැස් වෙමින් සතිස්යොදුන් පමණ තන්හි අතුරු නොහැර දිව්‍යසෙනාවක් සේ සැරහී සිටගත්තාවූ මහසෙනඟ පිරිවරා තරු පිරිවැරූ[6] පූර්ණචන්‍ද්‍රයා සේ දිලිහි දිලිහී ආකාශයෙන් නික්මෙන්නාහ. එකල්හි රජ්ජුරුවන්ට අභිමුඛ ව දිව්‍යාඞ්ගනාවන් හා සමාන වූ සැටදහසක් පමණ නාටකස්ත්‍රීහු ආකාශයෙහි දිව්‍යලීලාවෙන්[7] නටාගෙන යෙති. උන්ට අභිමුඛ ව එසේ ම දෙවඟනන් හා සමාන වූ සැටදහසක් පමණ පුරඟනාවෝ වීණා වෙණු ආලවර්ණී[8] වංගි වස්දඬු එකචජ්ද්‍ර මණිපර්වී විජයොධවනි ඔත්තු තන්ත්‍රිපටසිරිවිලි කෞලස්වර ආදියෙන් මධුරස්වර පතුරුවා ගායනා නාද කෙරෙමින් නික්මෙන්නාහ. එසේ ම දෙව්කුමරුවන් බඳු වූ සැටදහසක් පමණ ගන්ධර්වපුත්‍රයෝ නොයෙක් ලෙසින් සැරහී ඉදිරි ව සිට පණාබෙර ගැටබෙර තුණ්ඩිබෙර මහබෙර පොකුරු බෙර රොදු බෙර එකස් බෙර[9] මිහිඟු බෙර දුදුඟු බෙර[10] දැදුරු බෙර තම්මැට නිසාන ආදි වූ අනෙකප්‍රකාර භෙරීඝොෂාවෙන් ඒකකොලාහල කෙරෙමින් නික්මෙන්නාහ. මෙසේ මහපිරිවරින් නික්මුණාවූ රජ්ජුරුවෝ වෙන වෙන ම පන්සියයක් පන්සියයක් කොදෙව්[11] පිරිවරා සිටි දසදහසක් යොදුන් ජම්බුද්වීපය ද සත් දහසක් යොදුන් අපරගොයානය ද අටදහසක් යොදුන් උතුරුකුරු දිවයින ද සත්දහසක් යොදුන් පූර්වවිදෙහය ද යන සතරමහ ද්වීපය බලා දිග්විජය කොට ඇවිද එහි වසන්නාවූ මනුෂ්‍යයන්ට 'ප්‍රාණවධාදි වූ අකුශලධර්මයන් දුරු කරව, දනශීලාදි වූ[12] දශවිධ කුශල ධර්මයන් පුරුදු කරව' යනාදීන් අවවාද කොට පන්සිල් දී එම දවස් පෙරවරු බතට තමන්ගේ මාළිගාවට ම එන්නාහ. මෙසේ දැන් මෙතැන්හි මේ ගෙන හැර දැක්වූයේ වනාහී හිදිකටු සිදුරෙන් ආකාශය දැක්වූවා සේ ඒ සක්විති රජහුගේ ශ්‍රීවිභූතියෙන් එකදෙශමාත්‍රයක් මය. එසේ හෙයින් මෙබඳු අප්‍රමෙය[13] වූ නොයෙක් ශ්‍රී සම්පත්තීන්

1. චාමර - BCDEFGHIJ
2. විජිනිපත් - ක.සි.ක.,බෙ.
3. සෙන් කෝල්පිල් - ADFGHJKL
   සෙන් කෝල්විල් - BCE ස.
   සෙන් කොල්පිල් - I
4. තඹ තුඩ - ABEGHIJKL
   තඹ තුඩ - C
   කුඹ තුඩ - F
5. ආභරණයෙන් - BI
6. පිරිවර - ACDFJKL
7. දිව්‍යලීලායෙන් - KL
8. ආලවනනි - HIL; ආලවණණි - K
9. එකස්බෙර - පිටපත් හැම කි.ක.,ම.
   එකැස්බෙර - බෙ.සි.ස.
10. දුදුබෙර - D බෙ.ස.
    දුදුබෙර (නැත) BCGHIKL
11. කොදිව් - AEJKL
12. දනාදි වූ - KL
13. අප්‍රමෙය්‍ය - EFIJKL

Non-Commercial Distribution

හා සක්විති රජුන්ට ම ඒකාන්තනියත වූ මහානුභාවසම්පන්න චක්‍රරත්නය හස්තිරත්නය අශ්වරත්නය මාණික්‍යරත්නය ස්ත්‍රීරත්නය ගෘහපතිරත්නය පරිනායකරත්න යයි කියන ලද සප්තවිධ රත්නයෙන් හා අනන්‍යසාධාරණ ප්‍රිය මනාප රූපවර්ණ සම්පත්ත්‍යාදි වූ සතර මහා සෘද්ධියෙකින් යුක්ත ව වටින් සතිස්ලක්ෂ දසදහස් තුන්සිය පනස් යොදුන් චක්‍රවාට පර්වතය ඇතුළත දෙදහසක් කොදෙව්[1] පිරිවරා මෙර සතර මුහුණ පිහිටි සතරමහාද්වීපයෙහි ඒකාතපත්‍ර චක්‍රවර්තිරාජ්‍යය කෙරෙමින් ප්‍රමාණාතික්‍රාන්ත වූ මෙවැනි ශ්‍රීවිභූතියක් විඳිනාවූ ඒ මහාමන්ධාතු නම් චක්‍රවර්ති රජ්ජුරුවෝ වනාහී :

තව ද වස්තුකාම ක්ලේශකාමයන් විෂයෙහි පැවැත්තාවූ තමන්ගේ ලොභචේතනාව ඉතා අධික හෙයින් කාමතෘෂ්ණාව පුරාගත නොහී එබඳු චක්‍රවර්තී රාජ්‍යසම්පත්තියෙහි පවා කළකිරී දවසෙක නො සතුටු වූ ආකාර දැක්වූහ. එපරිද්දෙන් අසන්තොෂ ව හුන්නාවූ රජ්ජුරුවන් දැක අමාත්‍යවරු එක් ව 'කිමෙක් ද දෙවයන් වහන්ස, කවර කාරණයක් පිණිස අසන්තොෂ ව වැඩහුන්සේක්'දැයි විචාළහ. එබසට මහාමන්ධාතු රජ්ජුරුවෝ කියන්නාහු 'එම්බා අමාත්‍යවරුනි[2] පූර්වජාතියෙහි මා විසින් කරන ලද්දවූ කුශල සම්භාරයන් බැලූ කල්හි මේ චක්‍රවර්ති රාජ්‍යසම්පත්තිය කෙතෙක් අගනේ ද: ඉතා ස්වල්ප වන්නේය: එබැවින් සියලු සම්පත්තීන් මීට වඩනා වූ අන් කිසි තෙනෙක් ඇත්නම් පරීක්ෂා කොට කියව:[3] කවර තැනෙක්[4] උතුම් ද සිත්කලු දැ'යි විචාළහ. එබසට අමාත්‍යවරු කියන්නාහු 'දෙවයන් වහන්ස, දිව්‍යලොකය මීටත් වඩා සියක් ගුණයෙන් වඩනේ මය; ඉතා රම්‍ය ය; විශෙෂ වූ දිව්‍යමය වූ පඤ්චකාම සම්පත්තීන් යුක්ත ය'යි කීහ. එතෙපුල් අසමින් මහාමන්ධාතු රජ්ජුරුවෝ ස්වර්ණභිඞ්කාරයෙන් සුවඳපැන් ගෙන 'පවත්තතු භවං චක්කරතනං, අභිවිජිනාතු භවං චක්කරතනං' යනාදීන් වාක් නිච්ඡාරණය[5] කෙරෙමින් චක්‍රරත්නයට පැන් වැඩූහ. එකල්හි චක්‍රරත්නය දෙවන සඳමඬලක් සේ අහසට පැනනැඟී දශදිග් බබුළුවමින් ඉදිරියෙහි නික්මුණේය. ඉක්බිති රජ්ජුරුවෝ තුමූ ද නොයෙක් අලඞ්කාරයෙන් සැරහී හාත්පසින් සතිස්යොදුන් පමණ තන්හි අතුරු නොහැර පිරිවරා සිටගත්තාවූ මහසෙනඟ හා සමඟ අහසට[6] පැනනැගී මේ භූමියට දෙසාලිස් දහසක් යොදනින් මත්තෙහි පිහිටියාවූ චාතුර්මහාරාජික දිව්‍යලොකය බලා නික්මුණාහ.

එකල්හි යුගන්ධර පර්වත මස්තකයෙහි සක්දෙවුරජහට රකවල් ගෙන සිටියා වූ ධෘතරාෂ්ට්‍රය විරූඪකය විරූපාක්ෂය වෛශ්‍රවණ යයි කියන ලද නාමප්‍රසිද්ධ වරම් රජදරුවෝ සතරදෙන දිවමල් දිවසුවඳ ගත් අත් ඇති ව නොයෙක් කෙළගණන් දිව්සෙනඟ පිරිවරා පෙර ගමන් කොට අවුත් මහාමන්ධාතු රජ්ජුරුවන් කැඳවාගෙන තමන්ගේ චාතුර්මහාරාජික දිව්‍ය ලොකයට ගෙනගොස් දිව්‍යරාජ්‍යය දුන්හ.[7] මෙසේ දිව්‍යලොකයෙහි දිව්‍යසෙනාවය තමන් හා කැටි ව ගිය මනුෂ්‍යසෙනාවය යන

1. දෙදහසක් කොදිව් - AEIJKL
   දෙදහස් කොදෙව් - ස.
2. අමාත්‍යවරිනි -BEGH
3. කියවයි - ACFJ
4. තැනෙක්හි - ACFJ ක.සෑ.
   තෙනෙක් - GHIKL ස.
5. නිච්ඡාරය - BEFIJKL
6. ආකාශයට - KL
7. දුන්නාහ - බෙ. ස.

Non-Commercial Distribution

දෙසෙනඟ පිරිවරා සවුමහරජයෙහි දිව්‍යරාජ්‍යය කරන්නාවූ මහාමන්ධාතු රජ්ජුරුවන්ට බොහෝ කාලයක් අතික්‍රාන්ත විය. මෙසේ ඒ දෙවුලොව මහත් වූ දිව්‍යෛශ්වර්‍ය්‍ය විඳීමෙන්[1] පවා තමන්ගේ ලොභතෘෂ්ණාව පූරාගත නොහී ඒ දිව්‍යසම්පත්තියෙහි උකටලී ව පෙර පරිද්දෙන් ම දවසෙක නොසතුටු ආකාර දැක්වූහ. ඉක්බිති වරම් රජ්දරුවෝ සතරදෙන 'කිමෙක් ද දෙවයන් වහන්ස නොසතුටු වූ සේක් නැ'යි විචාළහ. එබසට මහාමන්ධාතු රජ්ජුරුවෝ කියන්නාහු 'එම්බා දිව්‍යරාජයෙනි, මේ දිව්‍යලොකයෙහි මාගේ සිත් ඇලෙන්නේ නොවෙයි: එබැවින් මේ දෙවුලොවට වඩා කවර දිව්‍යලොකයක් සිත්කලු දැ'යි විචාළහ. එතෙපුල් අසා වරම් රජ්දරුවෝ සතරදෙන කියන්නාහු 'දේවයන් වහන්ස අපි හැම නම් අනුන්ට මෙහෙ කරන කර්‍මකාරක[2] මනුෂ්‍යයන් හා සමානයහ: එබැවින් අපගේ ශක්‍රදෙවෙන්ද්‍රයන් වහන්සේ වැඩවසන තවුතිසා දිව්‍යලොකය[3] මීට වඩා ශතසහස්‍ර ගුණයෙන් වඩනේ මය: ඉතා සිත්කලු ය: හැම දෙවතාවන්ගේ සිත් අලවන්නේය[4]: දිව්‍යෛශ්වර්‍ය්‍ය ආදි වූ සියල්ලෙන් ම තවුතිසා දිව්‍යලොකය උතුමැ'යි කීහ. එතෙපුල් අසා මහාමන්ධාතු රජ්ජුරුවෝ පෙර පරිද්දෙන් ම චක්‍රරත්නය ඉදිරි කොට තමන්ගේ මහසෙනඟ පිරිවරා[5] තවුතිසා දිව්‍යලොකයට අභිමුඛ ව නික්මුණාහ. එකල්හි ශක්‍රදෙවෙන්ද්‍රයෝ දිවමල් දිවසුවඳ ගෙන නොයෙක් කෙළ සුවහස් ගණන් දිවසෙනඟ පිරිවරා ශක්‍රභවනයෙන් පෙරගමන් කොට ඉදිරියට අවුත් මහාමන්ධාතු රජ්ජුරුවන් අත අල්වාගෙන 'මෙසේ වැඩිය මැනව මහරජ'යි කියා ප්‍රියකථා කෙරෙමින් තමන්ගේ දිව්‍යලොකයට කැඳවාගෙන නික්මුණාහ.

මෙසේ මහාමන්ධාතු රජ්ජුරුවන් දිවසෙනඟ පිරිවරා මහත් වූ පෙරහරින් අපමණ වූ උත්සවයෙන් අනොපමෙය්‍ය[6] වූ දිව්‍යෛශ්වර්‍ය්‍යයෙන් යුක්ත ව තවුතිසා දෙවුලොව බලා නික්මුණු කල්හි ඒ රජහුගේ පරිනායකරත්න යයි කියනලද ප්‍රධාන පුත්‍රයාණෝ සතිස් යොදනෙක පැතිර සිටි මනුෂ්‍යසෙනාව හා සමඟ චක්‍රරත්නය ගෙන මිනිස් ලොවට බැස තමන්ගේ මාළිගාවට ම වන්හ. ශක්‍රදෙවෙන්ද්‍රයෝ වනාහී මහාමන්ධාතු රජ්ජුරුවන් තවුතිසා දෙව්ලොව තමන්ගේ ශක්‍රභවනයට කැඳවාගෙන ගොස් දිවසෙනඟ දෙභාගයක් කොට සෙසු තමන්ගේ දිව්‍යරාජ්‍යසම්පත්තිය ද දෙදෙනාට සරියේ[7] මැදින් දෙකක් කොට බෙද මහාමන්ධාතු රජ්ජුරුවන්ට එයින් භාගයක් දුන්හ. එතැන් පටන් ශක්‍රදෙවෙන්ද්‍රය මහාමන්ධාතුය යන රජ්දරුවෝ දෙදෙන ගඞ්ගොදකය හා යමුනොදකය මෙන් නොවෙනස් ව ඔවුනොවුන් කෙරෙහි මෙත්සිත් පතුරුවා සමගි ව තව්තිසා දෙව්ලොව දිව්‍යරාජ්‍යය කරන්නාහ. මෙසේ දිව්‍යෛශ්වර්‍ය්‍ය විඳීමෙන් බොහෝ කාලයක් ගිය කල්හි ශක්‍රදෙවෙන්ද්‍ර තෙම තුන් කෙළ සැටලක්ෂයක් අවුරුදු ආයු වළඳා දිව්‍යරාජ්‍යය කොට මෙළේය. ඉක්බිති අනික් ශක්‍රයෙක් පහළ විය: ඒ ශක්‍රයා ද පළමු ශක්‍රයා පරිද්දෙන් ම තුන්කෙළ සැටලක්ෂයක් අවුරුදු ම ආයු වළඳ මෙළේය. මෙම ක්‍රමයෙන් වරින් වර ඉපද තුන් කෙළ සැටලක්ෂයක් අවුරුදු ම ආයු වළඳ අධිරාජ්‍යය කොට සතිස් ශක්‍රකෙනෙක් මළහ.

---

1. විඳිමින් - BG
2. කර්මකර - GHK කර්මකාර - A
   කර්මකල - L
3. දෙව්ලොව - GHIKL
4. ඇලවන්නේය - ABDEFGHIJK ම.ස.
   ඇලෙන්නේය - ක.කී.ඝඳ.බෙ.
5. පිරිවරා මහත් වූ පෙරහරින් - BGHI
6. අනොපමෙය වූ - ස.
7. සරි - B
   සරියේ - බෙ.

Non-Commercial Distribution

මහාමන්‍ධාතු රජ්ජුරුවෝ වනාහී එම මනුෂ්‍යශරීරයෙන් ම හිඳ එනෙක් කල් මුළුල්ලෙහි ම දිව්‍යරාජ්‍යය කළහ. මෙසේ දිව්‍යෛශ්වර්‍ය්‍යී විඳීමෙන් කල් යන කල්හි මහාමන්‍ධාතු රජ්ජුරුවන්ට පළමු කාලයට වඩා අධික වූ කාමතෘෂ්ණාව උපන්නේය: එකල්හි තමන් සිතට[1] හටගත්තාවූ කාමතෘෂ්ණාව ධරාගත නොහී සිතන්නාහු 'ශක්‍රයන්ගේ උපකාරයෙන් ලද්දවූ මේ අධිරාජ්‍යයෙන් මට ප්‍රයොජන කිම් ද: එබැවින් දැන් ශක්‍රයන් අල්වා ගෙන මරා දම්වා[2] වටින් සතිස් ලක්‍ෂ දසදහස් තුන්සිය පනස් යොදුන් චක්‍රවාටපර්‍වතයෙහි බාහිරාන්‍තය දක්වා අතුරු නොහැර විචිත්‍රාකාරයෙන් සැදී[3] සිටගත්තාවූ කනක රජත මාණික්‍යමය විමාන පඞ්ක්තීන් යුක්‍ත වූ තවුතිසා දෙවුලොව දිව්‍යරාජ්‍යය එක්සත් කොට පොළෝතෙලෙහි පටන් එක්ලක්‍ෂ අට සැටදහසක් යොදුන් උස ඇති මහමෙර මුදුනෙහි පිහිටි දිව සත් රුවනින් විසිතුරු වහසල් පවුරු පදනමින් හෙබියාවූ දහසක් රුවන් දෙරටුවෙන් පිරිවරන ලද රන් රිදී විදුරු මුතු මැණික් වෙරළුමිණි පබලු ආදි වූ සප්තවිධ රත්නයෙන් විචිත්‍ර විමාන මාලාවෙන් හා උයන් පොකුණු ගලතල කල්පවෘක්‍ෂ පඞ්ක්තීන් සශ්‍රීක වූ ශක්‍රභවනයෙහි වාසය කෙරෙමින් සිත් සේ[4] වාසය කෙරෙමි'යි සිතූහ. ඒ රජ්හු එපරිද්දෙන් සිතූ පමණක් මිස ශක්‍රදෙවෙන්‍ද්‍රයන් මරාගත නො හැක්කේ මය. මෙසේ ඔහු සිත හටගත්තාවූ ඒ කාමතෘෂ්ණාව වනාහි එකාන්‍තයෙන් ම ඕහට වන මහත් වූ විපත්තිය මුල්කොට ඇත්තේය. හේ එසේ මය.

මේ ලොකයෙහි ගහක් දෙපිට තණබිමට බට ගවයන් එතෙර මෙතෙර දුර නිල්තණ දැක කිඹුල් දැතිමුවර ආදි වූ චණ්ඩසත්‍වයන් නිසා වන උපද්‍රව නො සලකා ගොචරතෘෂ්ණාවෙන් ඔබිනොබ[5] දිය පීනා ඇවිද වෙහෙස විඳිනා සේ මේ ස්ථානය උතුම මෙතැන්හි ඉතා සැප යයි මෙසේ අධික වූ ලොභයෙන් චිත්තඛෙදයට පැමිණ පෙළෙන්නාවූ සත්‍වයෝ මෙලෝ පරලෝ දෙකින් හැම කල්හි ම කිසියම් සැපයක් නොලබන්නාහ. සියලු සත්‍වයන්ට තෘෂ්ණාව නිසා ම චිත්තාභ්‍යන්‍තරයෙහි ඉපද ශරීර ශොෂය[6] කරන්නාවූ ශොකය[7][ත්] උපදනේය. එම තෘෂ්ණාව හේතුකොටගෙන ශරීර සන්‍තාපය කරන්නාවූ භයත් උපදනේය. එබඳු තෘෂ්ණාවෙන් මිදුණාවූ බුදු පසේබුදු මහරහතන් වහන්සේට වනාහි කිසි ශොකයෙක් නැත්තේ ය: භයෙකැයි යන දෙයෙක් කැල ම නැත්තේය.

තව ද මේ ලොකයෙහි තෘෂ්ණාවට ගැති ව හෙවත් කාමතෘෂ්ණාවගේ වශගත්‍වයට පැමිණ වාසයකරන්නාවූ සත්‍වයෝ රජදරුවන් හා සතුරු සොරු ආදීන් නිසා වන්නාවූ අත් පා සිඳීම් කන් නාසා කැපීම් ආදි වූ අනෙකප්‍රකාර[8] දුඃඛයට පැමිණ මහත් වූ ක්‍රෑරතර වෙදනාවෙන් වෙහෙසෙන්නාහ. එසේ ම ක්‍ෂෙත්‍ර වස්තූන් හා රත්රන් අමුරන් ආදිය ද ඇත් අස් ගව මී දැසි දසුන් හා අවශෙෂ පරිවාර ජනයන්ද

1. සිත - EFGHIKL
2. දමවා - FH
   දමවමින් - B
   දම්මවා - L, ස. බෙ.
3. සැරහී - GHIKL
4. වාසය කෙරෙමින් සිත් සේ (නැත) - J
5. ඔබමුබ - BL
6. ශොෂය - EJ
   ශොෂයය - AF
   ශොෂණය - IKL
7. ශොකයන් - පිටපත් හා ක.සි.සද.බෙ.ස.
   ශොකයක් - ම.
8. නොයෙක් ප්‍රාකාර - E
   අනෙකප්‍රකාරවූ - F

Non-Commercial Distribution

යන මේ ආදි වූ නොයෙක් උපභොග පරිභොග වස්තූන් නිසා සිත හටගත්තා වූ යම් ලොභයක් හේතුකොට ගෙන මේ ලොකයෙහි සත්වයෝ මහත් වූ විනාශයට පැමිණෙද් ද හැම කල්හි එබඳු අනර්ථයට කාරණ වූ ඒ ලොභ තෘෂ්ණාව නුවණැත්තා වූ උත්තම සත්වයන් විසින් තමතමාගේ නුවණ බලයෙන් සර්වප්‍රකාරයෙන් ම දුරු කටයුත්තේ මැයි. එසේ හෙයින් කියන ලදී:

වරමන්‍ධු පුබ්බන්ත්‍යන්ධු - අන්‍රිච්ඡාවිහතො නරො,
ඉධ වා පරත්ථ වා කිඤ්චි - න සාතං වින්දතෙ සද.

තණ්හාදාසො නරො එත්ථ - රාජචොරාරි[1] සම්භවං,
හත්ථච්ඡෙද්දිකං දුක්ඛං - පාපුණාති විහඤ්ඤති.

යෙන ලොභෙන ජාතෙන - සද ජීයන්ති පාණිනො,
ඛෙත්තං වත්ථුං හිරඤ්ඤං ච - ගවාස්සං දසපොරිසං,
පබ්බත්ථාමෙන සො ලොභො - පහාතබ්බොව විඤ්ඤුනා-යි.

මෙසේ මහෙච්ඡතාවෙන් මහත් වූ ලොභයෙන් පහරන ලද්දවූ සිත් ඇති ඒ මහාමන්ධාතු රජහුගේ ආයුසංස්කාරය පිරිහිණ: සකල ශරීරය යනතලා[2] රස මිරිකාගත් උක්සපයක් සේ ජරාවෙන් උපහත[3] විය. එනෙකුදු වුවත් මනුෂ්‍ය ශරීරය වනාහි දිව්‍යලොකයෙහි නො නස්නේ මය. එබැවින් මහමන්ධාතු රජ්ජුරුවෝ කල්පාන්ත පවනින් මුලිනුපුළ ශාලද්‍රුමයක් සේ එකෙණෙහි දෙව්ලොවින් ඉපිළ[4] මිනිස්ලොව පළමු තමන් චක්‍රවර්තිරාජ්‍යය කළ නුවර උද්‍යානයට බටහ. එකල්හි උයන රකවල[5] සිටි උද්‍යානපාලනෙම නුවරට දිවගෙන ගොස් මහාමන්ධාතු රජ්ජුරුවන් දෙවුලොවින් ආ බව ඒ රජහුගේ පුත්‍ර වූ වරමන්ධාතු නම් රජහට දැන්වීය. එපවත් අසා රජ්ජුරුවෝ මහසෙනඟ පිරිවරා නුවරින් නික්ම අවුත් මහාමන්ධාතු රජ්ජුරුවන් දැක පිළිසඳර කථා කොට නොයෙක් පරිද්දෙන් උයන සරහා එම උයන්හි හිඳිනා අසුන් පැනවූහ. එකල මහාමන්ධාතු රජ්ජුරුවෝ උයන්හි පනවන ලද උතුම් වූ ඒ රාජාසන මස්තකයෙහි සැතපුණාහු නැඟී නොසිටිනා සෙය්‍යාවෙන් වැදහොත්නාහ. එසේ අනුට්ඨාන සෙය්‍යාවෙන් සැතපුණාවූ[6] රජ්ජුරුවන් දැක අමාත්‍යවරු කියන්නාහු දේවයන්වහන්ස, නුඹ වහන්සේ ස්වර්ගස්ථ වූ කල්හි එන දවස අපි මහජනයා හට[7] කුමක් කියමෝ දැ'යි විචාළහ. එතෙපුල් අසා මහාමන්ධාතු රජ්ජුරුවෝ කියන්නාහු 'එම්බා ලොවට හිත කැමැති ඇමැතියෙනි, මා ඇවෑමෙන් එන දවස තෙපි හැම මහජනයාට මෙසේ කියව. කෙසේ ද යත්:

අපගේ ස්වාමිපුත්‍ර වූ මහාමන්ධාතු රජ්ජුරුවන් වහන්සේ සුවාසූදහසක් අවුරුදු කුමාරකෙළි නෙළ, සුවාසූ දහසක් අවුරුදු යුවරජකම් කොට, සුවාසූදහසක් අවුරුදු

---

1. රාජචොරාපි - A
   රාජචොරාදි - පාලි
2. පතලා - CL යන තළා - බෙ.
3. උපගත - DGHI, KL ක.කි.කඳ.බෙ.
4. ඉපිල හී - KL
5. රැකවල - CIKL ක.කි.කඳ.ම.
   රැකවල් - BGH
6. වැදහොත්තා වූ - IL
7. මහජනයාට - ADEJ කි.කඳ.ක.ම.
   මහජනහට - IKL

Non-Commercial Distribution

මුළු දඹදිව රාජ්‍යය කොට, ඉක්බිති සුවාසූදහසක් අවුරුදු සප්තවිධ රත්නයෙන් හා සතරමහා ඍද්ධියකින් යුක්ත දෙදහසක් කොදෙව් පිරිවරකොට ඇති සතර මහ ද්වීපයෙහි එකාතපත්‍ර වූ චක්‍රවර්තිරාජ්‍යය කොට එම ආත්මභාවයෙන් දෙව්ලොවට නැඟී චාතුර්මහාරාජිකදිව්‍යලොකයෙහි බොහෝ කාලයක් දිව්‍යරාජ්‍යය කොට එයින් තවුතිසා දෙව්ලොවට නැඟී ශක්‍රයන්ගේ අධිරාජ්‍යය ගෙන සතිස් ශක්‍ර කෙනකුන්ගේ ආයු පමණින් එක්සිය විසිනවකෙළ සැටලක්‍ෂයක් අවුරුදු තව්තිසා දෙව්ලොව දිව්‍යරාජ්‍යය කොට එම මනුෂ්‍ය ශරීරයෙන් නැවත මිනිස් ලොවට බැස මෙසේ හැම ඇතුළු ව අසඞ්ඛ්‍යයක් හවුරුදු[1] ආයු වළඳ කාලක්‍රියා කළසේක˙ යන[2] මේ අස්න එන දවස මහජනයාට කියව˙යි මෙසේ අමාත්‍යවරුන්ට උගන්වා ඉක්බිති ඒ මහාමන්ධාතු රජ්ජුරුවෝ එයින් කාලක්‍රියා කොට තමන්ගේ කම් වූ පරිද්දෙන් ගියහ. ඒ බව ප්‍රකාශ කොට දක්වනු පිණිස භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ සිවුවනක් පර්ෂද් මධ්‍යයෙහි වැඩහිඳ ගාථාවෙන් වදාරනසේක්:

යාවතා චන්දිමසුරියා පරිහරන්ති දිසා භන්ති[3] විරොචනා,
සබ්බෙව දසා මන්ධාතා - යෙ පාණා පඨවිනිස්සිතා-යි.

යනාදීන් ˙එම්බා මහණෙනි, මේ චන්‍ද්‍ර සූර්‍ය්‍ය දෙදෙන යම් පමණ තැනෙක්හි අන්ධකාර විධමනය[4] කොට තමන්ගේ ශරීරාලොකයෙන් දසදිග් බබුළුවා ප්‍රජාලනය[5] කෙරෙමින් ආකාශමණ්ඩලයෙහි පැළඹෙද්ද එපමණ තන්හි මහපොළොව ඇසුරු කොට වාසය කරන්නාවූ යම් පමණ සත්වකෙනෙක් ඇද්ද ඒ සියලු සත්වයෝ ම මහාමන්ධාතු රජහුගේ පරිවාර දසයහ˙යි වදරා මත්තෙහිදු භික්‍ෂූන් වහන්සේට අවවාද වශයෙන් ධර්මදෙශනා කොට වදරන සේක.:

න කහාපණ වස්සෙන - තිත්ති කාමෙසු විජ්ජති,
අප්පස්සාද දුඛා කාමා - ඉති විඤ්ඤාය පණ්ඩිතො.
අපි දිබ්බෙසු කාමෙසු - රතිං සො නාධිගච්ඡති,
තණ්හක්ඛය රතො හොති - සම්මා සම්බුද්ධ සාවකො-යි.

යනාදීන් ˙එම්බා මහණෙනි, ඒ මහාමන්ධාතු රජුනෙම සෙසු සම්පත්ති[6] තබා මෙසේ දිව්‍යමය සත්රුවන් වර්ෂාවෙන් පවා වස්තුකාමයෙහි මෙතෙක් පමණැයි යන තෘප්ති නිවාරණයක් නොලද්දේය:[7] දවසින් දවස වඩ වඩා ම තෘෂ්ණා වසහයට පැමිණ අනොපමෙය්‍ය වූ එබඳු දිව්‍යසම්පත්තියෙන් පවා පිරිහුණේය: එබැවින් මේ තෘෂ්ණාව නම් ඒ ඒ දිශාභාගයෙහි[8] සිට අනවකාශයෙන් අවුත් වදනා නොයෙක්

1. අවුරුදු - BGHIKL කි.
2. කළ සේකැයි යන - EI
3. භන්ති - IJL කි. ක.
   ගන්ති - A
4. විධ්වංසනය - GH
5. ප්‍රජාලනය - GH
   ප්‍රජාපාලනය - ABCDEFIJK මුද්‍රිත හැම ස.
6. සම්පත් - BEGHIKL
7. නැත්තේය - ABCEFGHIJKL
8. දශාභාගයෙහි - IJ

Non-Commercial Distribution

සියගණන්[1] ගඞ්ගාජලයෙන් මහා සාගරය පුරා ලිය නොහැක්කා සේ කවර තරම් සම්පත්තියක් ලදත් මහේච්ඡතාවෙන් යුක්ත ලොභී සත්ත්වයන්ගේ කාමතෘෂ්ණාව පුරාලිය නොහැක්කේ මය.

මේ වස්තුකාම කෙලශකාමයෝ ද සිහිනෙන් අනුභව කළ ආහාරයක් සේ ඉතා ස්වල්ප වූ ආස්වාද ඇත්තාහ; සසර පමණින් නැවත නැවත උපදනාවූ අනෙකප්‍රකාර සංසාරදුඃඛයට ආධාර වන හෙයින් බොහෝ දුඃඛයහ යි මෙසේ කාමයන්ගේ ආදීනව දැන සම්‍යක් සම්බුධයන් වහන්සේ විසින් වදරනලද සධර්මය ඇසීමෙහි නියුක්ත වූ නුවණැති යොගාවචර මහණතෙම මනොඥ වූ එබඳු දිව්‍යමය පඤ්චකාම සම්පත්තියෙහි පවා මඳ විගසකුත් ඇල්මක් නොකරන්නේය; සියලු දුකට කාරණ ව සිටියා වූ තෘෂ්ණාව ක්‍ෂය කොට අර්හත්ඵල සඞ්ඛ්‍යාත නිර්වාණසම්පත්තියට පැමිණීමෙහි ම ඇල්ම කරන්නේ ය හෙවත් නොයෙක් සසරදුකට භාජන ව සිටියා වූ තෘෂ්ණාව නැති කොට නිවන් දක්නා සඳහා ම වීර්‍ය්‍ය වඩන්නේය යනාදීන් බණ වදළ සේක. ඒ බණ අසා බොහෝ දෙන සෝවාන් ආදි වූ සතරමග සතරඵලයට පැමිණියහ. එසේ හෙයින් එම්බා පින්වත් සත්ත්වයෙනි, මෙසේ සම්‍යක්සම්බොධියට එකාන්තනියත වූ එබඳු උත්තම සත්ත්වයන් පවා මේ තෘෂ්ණා නොමෝ තමාගේ වශභාවයට පමුණුවා අනෙකප්‍රකාර වූ දුක් දෙන්නීය; එබැවින් සංසාරගති ඇති[2] අප වැන්නවුන් තමාගේ වශභාවයට පමුණුවා දුක් විඳුවයි යනු කියනුම කවරේ දැයි මෙසේ තම තමාගේ නුවණින් මෙනෙහි කොට මතු අනර්ථදායක වූ එබඳු ඒ තෘෂ්ණාව දුරුකොට හැර සියලු අර්ථසිද්ධියට කාරණ වූ බුධ රත්නය ධර්මරත්නය සඞ්ඝරත්නය යන ත්‍රිවිධ රත්නයෙහි ගුණ සලකා එම තුනුරුවන් භජනය කොට එයින් ජනිතවූ ඉෂ්ටවිපාකදයකවූ කුශලානුභාවයෙන් මතු නිවන්පුර සිරි විඳින්ට උත්සාහකළ මැනවි. කියන ලදුයේ මැයි:

ඉති ගතිනියතානං බොධියා උත්තමානං
ඍක වසමුපනෙත්වා දෙති දුක්ඛානි තණ්හා,
අනියතගතිකානං කා කථා මාදිසානං
ජහථ තම්ති මන්ත්වා හො භජෙථා තිවත්ථුං - යි.

මෙතෙකින් මේ මහාමන්ධාතු වග

පළමුවන මහාමන්ධාතු වස්තුව

කියා නිමවන ලදී.

1. සියදහස්ගණන් - GHIKL
2. සංසාරගත - GHIK
සංසාරගත ව - L

Non-Commercial Distribution

තව ද මේ මහාමණ්ඩාතු වග දෙවන චොරඝාතක වස්තුව නම් කවර යත්?

එක් සමයෙක්හි අප මහා ගෞතම බුදුරජාණන් වහන්සේ සද්ධර්ම දෙශනාවෙන් මහජනයන් ප්‍රීති කරවා ඔවුන්ට ස්වර්ගමොක්‍ෂ සම්පත් සාධා දෙමින් සැවැත් නුවර නිසා දෙවුරම් වෙහෙර වැඩ වසන සේක. එසමයෙහි ගහනනිශ්‍රිත ව වසන්නාවූ පන්සියයක් සොරහු වලින් එලි බැස නුවරට[1] අවුත් රාත්‍රිභාගයෙහි ඒ ඒ තැන සොරකම් කොට වස්තු උපයා එයින් ම ජීවත් ව තමන්ගේ අඹුදරුවන් රක්නාහ. මෙසේ දවස් යවන සොරහු එක් දවසෙක සොරකම් සඳහා නුවරට වදනාහු වහසල් සමීපයෙහි සිටි එක් ඉතා දිළිඳු වූ දනවු වැසි පුරුෂයෙකු දැක 'එම්බා යහළු, තෙපි ඉතා දුඃඛිතයව, කොයි වසන කෙනෙක් දැ'යි[2] විචාළහ. එකල දනවු වැසි පුරුෂයා කියනුයේ 'ස්වාමීනි, මම පිටිසර වැසි දුක්පත් මිනිසෙකිමි'යි කිව. ඉක්බිති සොරහු[3] කියන්නාහු 'එසේ කල යහළු තෙපි කුමක් නිසා මෙසේ දුඃඛජීවිකාවෙන් වෙසෙවු ද? තොපගේ මේ අනාථවාසය හැර අප හා එක් ව පලා එව; සිය අතින් දුක් නොගෙන අනුන් සන්තක වස්තු සොරකම් කොට නොයෙක් වස්ත්‍රාභරණ හා ධනධාන්‍ය උපදවාගෙන සියලු සම්පත්තීන් සමෘද්ධ ව සුව සේ කා බී අඹුදරුවන් රැකගන්ව'යි[4] කීහ. එකල දනවුවැසි පුරුෂයා ද තමා ඉතා දුක්පත් හෙයින් මොවුන් කියන්නේ කටයුතු මය යි සිතා සොරුන්ගේ බස් යහපතැයි ගිවිස්සේය. ඉක්බිති සොරහු 'එසේ කල යහළු අප හා සමඟ එව'යි ඔහු කැඳවාගෙන ඇතුළු නුවරට වැද ඒ ඒ තැන්හි උමං බිඳ සොරකම් කොට බොහෝ වස්තු ලදහ. එකල දනවු වැසි පුරුෂතෙම[5] ලබන ලද සම්පත් ඇති ව එතැන් පටන් එම යහපතැයි ඔවුන් හා එක් ව සොරකම් කෙරෙමින් වස්තු උපයා ජීවත් වෙයි; මෙසේ කල්යාමක් ගිය කල්හි එක් දවසෙක සොරකමට වන්නාවූ ඔවුන් හැම දැක රාජපුරුෂයෝ අල්වා ගෙන පිටිතොල හයා බැඳ මර මරා ගෙනගොස් කොසොල් රජ්ජුරුවන්ට දැක්වූහ. එකල්හි රජ්ජුරුවෝ ඔවුන් දැක කියන්නාහු 'එම්බා සගයෙනි, තොප හැමදෙනා අතුරෙන් යම් කිසිවෙක් මේ සියල්ලවුන් ම මරා ජීවිතක්‍ෂයට පමුණුවා නම් ඕහට දැන් ජීවිතදනය දෙමි'යි කීහ. එතෙපුල් අසා සොරහු තමන් හැම ඥාතිමිත්‍ර සම්බන්ධයෙන් ඔවුනොවුන්ට අවශ්‍ය හෙයින් රජහු කී බස් නොගිවිස්සාහ. එකල දනවු වැසි පුරුෂයා 'ස්වාමීනි, මට සැබවින් ජීවිතදනය දෙන සේක් වී නම් මේ සියල්ලවුන් ම මරමි'යි කීය. රජ්ජුරුවෝ ද යහපතැයි ගිවිස ඕහට ජීවිතදනය දුන්හ. ඉක්බිති ඒ පුරුෂතෙම රජහුගෙන් ජීවිතදනය ලැබ සොරුන් හැමදෙනා ම මරාපීය; එපවත් දැක සන්තුෂ්ට වූ රජ්ජුරුවෝ එතැන් පටන් සොරුන් මැරීම ඕහට භාර කළහ. මෙසේ ඒ පුරුෂයා එවක් පටන් සොරුන් හා සෙසු වධයට පැමිණියවුන් මරමින් පස්විසි

---

1. සැවැත් නුවරට - GHKL
2. කෙනකුදැයි - KL හැර අන් පිටපත් හා මුද්‍රිත හැම
   කෙනෙක් දැයි - KL
3. සොරු - BDEFGH
4. රැකගනැයි - GHKL
5. පුරුෂයා ද - GHKL
   පුරුෂයා - BEL

Non-Commercial Distribution

හවුරුද්දක්[1] දවස් යවා පසුව මහලු වයසට පැමිණියේ තමාගේ ශරීරයෙහි ඉතා ශක්ති මඳ හෙයින් කීප පහරකිනුත්[2] සොරුන් මරාගත නොහෙයි: රජ්ජුරුවෝ එපවත් අසා සොරුන් මැරීම අනිකක්හට භාර කළහ. එකල ඒ පුරුෂයා චොරඝාතක ක්‍රියාවෙන් පිරිහී තමාගේ ගෙයි වෙසෙයි: එකල්හි ඒ නුවර අනික් පුරුෂයෙක් මන්ත්‍ර පිරිවහා[3] නාසාවාතයෙන්[4] මිනිසුන් මරන මන්ත්‍රයක් දන්නේය. හේ එසේ මැයි:

යම් කිසි කෙනකුන්ගේ දැත් දෙපා කන් නාසා ආදී වූ ශරීර අවයවයන් අතුරෙන් යම් යම් අවයවයක් සිඳබිඳ හරනා කැමති ව මන්ත්‍රය පිරිවහා නාසාවාතය හරනේ වී නම් ඔවුන්ගේ ඒ ඒ ස්ථානය ම සිඳී බිඳී වෙන් වෙයි: මෙසේ ඒ මන්ත්‍රය මහත් වූ ආනුභාව ඇත්තේ මය. ඉක්බිති චොරඝාතකයා එපවත් අසා ඒ පුරුෂයා වැඳ පුදා උපස්ථාන කොට මන්ත්‍රය ඉගෙන ගෙන රජ්ජුරුවන්ට කියා යවනුයේ 'මහරජ, මා මහලු හෙයින් පළමු සොරුන්ගේ හස්තපාදදී ශරීර අවයවයන් මහත් වූ උත්සාහයෙන් කපාහරිමි: මැරුව මනා මිනිසුන් ද උත්සාහයෙන් ම මරමි: දැන් වනාහී එසේ නොකෙරෙමි. කන් නාසා ආදිය කැපීම් ද මිනී මැරීම් ද යන සියල්ල ම මාගේ මන්ත්‍රයෙහි ආනුභාවයෙන් ම සිධ කොට දීලමි' යි කියා යවීය. එතෙපුල් අසා රජ්ජුරුවෝ යහපතැයි ගිවිස ඔහු ගෙන්වාගෙන මිනීමැරීම නැවත[5] ඕහට ම භාර කළහ. ඉක්බිති චෝරඝාතකයා එතැන් පටන් නැවත පස්විසි හවුරුද්දක්[6] මුළුල්ලෙහි එපරිද්දෙන් ම මිනිසුන් මරමින් දවස් යවා ඉතා ජරා දුර්වල ව ආයු ගෙවී මරණමඤ්චකයට පැමිණ මරණ වෙදනා[7] ඉවසිය නොහී භයානක ශබ්ද පවත්වා මහත් කොට මොරගා සසලමින් ඇස දල්වා බැලිය නොහී වසන ලද ඇසින් ඉතා භයඞ්කර වූ නරක ගිනිදැල් දක්මින් ගිනි ගෙන දිලියෙන යකුළු හා යමුඟුරු ගත් යමපලුන් දක්මින් භයගෙන මුරගා වෙවුලමින් සුසුම් ලලා වැද හොත්තේය: එකල ඔහු වැදහොත් ගෙට සමීප වූ ගෙවල වසන මනුෂ්‍යයෝ ඔහුගේ භයානක ශබ්දය අසා අතිශයින් භය ගෙන තමතමන්ගේ ගෙවල් හැර ගියහ.

එදවස් සැරියුත් මහතෙරුන් වහන්සේ දිවසින් ලොව බලන සේක් චොරඝාතකයා එදවස් එයින් මිය නරකයෙහි උපදනා බව දැක දැන් වනාහී මම එතෙනට ගියෙම් වීම් නම් මා කෙරෙහි සිත් පහදවා ගෙන ආහාර දනයක් දී ඒ කුශලබලයෙන්[8] දෙව්ලොව උපදනේ යයි දැන අද මා ඕහට අනුග්‍රහ කළ මැනවැයි සිතා පෙරවරු එම විට[9] සුපිළිසන් ව ගැටවවු ගන්වාගෙන චෝරඝාතකයාගේ ගෙදෙරට වැඩිසේක. එකල්හි එතෙම මහතෙරුන් වහන්සේ දැක කිපී මහත් කෝපයෙන්[10] තට තට යන අනුකරණ පවත්වමින් අද මොහු විද පළා මරමි යි

1. අවුරුද්දක් - BCDFGH
2. වාරයෙකිනුත් - GHK
   පාරෙකිනුත් - CL
3. පිරුවා - GHKL
4. ප්‍රාණස්වාසයෙන් - GHKL
5. නැවතත් - KL ස.
6. පඤ්චවීසානි - පාලි
   පස් හවුරුද්දක් - ක.සැ.ම.
7. මරණ වෙදනා - AEGHJKL
   වේදනා - අන් තැම
8. කුශලයෙන් - BDEFGHKL
9. විගස - GHKL
10. ක්‍රෝධයෙන් - GHKL

Non-Commercial Distribution

හොත් තෙන ම වැදහෙව මන්‍ත්‍රය පිරිවහා නාසාවාතය හළ. එකෙණෙහි මහතෙරුන් වහන්සේ ධ්‍යානයට සම වැද එම විට එයින් නැගී හිරුමඬල සේ බබළමින් වැඩසිටිසේක. තව ද චොරඝාතකයා එපරිද්දෙන් ම දෙතුන් වරෙක මන්ත්‍රය පිරිවහා නාසාවාතය හැර මහතෙරුන් වහන්සේට කිසි අන්තරායක් කොට ගත නොහී මහත් වූ ආශ්චර්‍යයට පැමිණ මහතෙරුන් වහන්සේ කෙරෙහි සිත් පහදවාගෙන තමහට පිළියෙල කොට තිබූ කිරිබතක්[1] ගෙන්වාගෙන මහතෙරුන් වහන්සේට පිළිගැන්වීය. එකල්හි මහතෙරුන් වහන්සේ ඕහට අනුමෙවුනි[2] බණ වදරා විහාරයට වැඩ පිළිගත් අහර[3] වැළඳූසේක.

එකල චොරඝාතකයා මහතෙරුන් වහන්සේට තමා දුන්නාවූ ඒ දනය සිහි කෙරෙමින් වැදහොත්තේ ම එකෙණෙහි කාලක්‍රියාකොට දෙව්ලොව උපන. අහෝ වීතරාගී වූ බුඩපුත්‍රයන්ගේ ආනුභාවය ඉතා ආශ්චර්‍යයෙක් මැයි. මෙසේ නරකයට එකාන්ත නියත ව සිටියාවූ එබඳු පව්ටා පවා රහතන්ට දුන්නාවූ ඒ දනමය කුශලයාගේ බලයෙන් දෙව්ලොව උපන. හේ එසේ මැයි.

මේ දනය නම් මනුෂ්‍යයන්ට රක්‍ෂාස්ථානයෙක: සියලු දුර්ගති[4] භය වළකන්නේ ය: දෙව්ලොවට නැගෙන හිණක් වැන්නේය: අතිශයින් ශාන්ති එළවයි: නිවන් සම්පත් හස්තගත කෙරෙයි. දනය නම් සත්වයන්ට කැමැති කැමැති වස්තු සිඩ කරන හෙයින් සිතුමිණිරුවනක් වැන්න: කල්පවෘක්‍ෂයක් වැන්න: භද්‍රඝටයක් වැන්න: සිල්වතුන්ට දෙන ලද්දාවූ දනයෙන් සත්වයෝ මිනිස්ලොව චක්‍රවර්තිසම්පත් ද දෙවුලොව ශක්‍රසම්පත් ද සියල්ලට උතුම් ව සිටි ලොකොත්තර සම්පත්තිය ද සුවසේ ලබන්නාහු මය. මෙසේ අකුශලයෙහි නියුක්ත ව නරකයට ගමන්ගතු ව සිටියාවූ එවැනි චෝරඝාතකයා පවා සැරියුත් මහතෙරුන්වහන්සේට දුන්නාවූ ආහාරදනයෙහි විපාකයෙන් අනෙකප්‍රකාර දුඃඛරාශීන් ගැවසී ගත්තාවූ නරකයට යන ගමන්[5] පෙරළා දිව්‍යසමූහයා විසින් පිරිවරන ලදු ව සකල සම්පත්තීන් සමෘඩ වූ දිව්‍යලොකයට ගියේය. එසේ හෙයින් කැමැති කැමැති වස්තු සිඩකොට දෙන්ට සමර්ථ වූ දනය දෙන ශ්‍රඩාවන්තයන් විසින් සිල්වතුන් උදෙසා ම දිය යුත්තේ ය: එසේ දන් දෙන නුවණැති ශ්‍රඩාවන්තයන් විසින් පන්සිල් අටසිල් ආදි වූ සිල් රැකීම ද ඉතා යහපත් මැයි. කීයේ මැනො.

1. කිරිබත් - DKL
2. අනුමෙවෙනි - BCDGHL
3. කිරිඅහර - J, ක.කි.ඤ.
4. දුගගති - AJKL ස.
   දුක්ගති - GH
   දුගති - ක.කි.ඤ.බෙ.
5. මග - KL

Non-Commercial Distribution

දනං තාණං මනුස්සානං - දනං දුග්ගතිවාරණං,
දනං සග්ගස්ස සොපානං - දනං සන්තිකරං පරං.

ඉච්ඡිතිච්ඡිතදනෙන - දනං චින්තාමණී විය,
කප්පරුක්ඛොව සන්තානං - දනං භද්දඝටො විය.

සීලවන්තස්ස දනෙන - චක්කවත්ති සිරිම්පි ච,
ලභන්ති සක්කසම්පත්තිං - තථා ලොකුත්තරං සුඛං.

පාපකම්මෙසු නිරතො - ධීතොයං නරකායනෙ,
සාරිපුත්තස්ස ථෙරස්ස - පිණ්ඩපාතස්ස වාහසා.

අපායං පරිවජ්ජෙත්වා - නෙකදුක්ඛ සමාකුලං,
දෙවසඞ්ඝ පරිබ්බුළ්හො - ගතො දෙවපුරං වරං.

තස්මා සුඛෙත්තෙ සද්ධාය - දෙථ දනානි කාමදං,
දනං දෙන්තෙහි සීලම්පි - පාලනං වාතිසුන්දරං - යි.

මෙසේ චෝරඝාතකයා දෙව්ලොව උපන් කල්හි එදවස් සවස ධම්සභාමණ්ඩපයෙහි රැස් ව හුන්නාවූ පෘථග්ජන භික්ෂූන්වහන්සේ මහු මළ පවත් අසා ඒ පාපී පුරුෂයා කවර නරකයෙක උපන් දෝ හොයි ඔවුනොවුන් වහන්සේ හා කථා කෙරෙමින් වැඩඋන් සේක. එකල්හි සනරාමර ලොකෙක ශාස්තෘ වූ සර්ඥයන් වහන්සේ අනෙකප්‍රකාර සුගන්ධගන්ධයෙන් ආර්ද්‍ර වූ මනහර ගඳකිළියෙහි වැඩහුන්සේක් ඒ කථාප්‍රබන්ධය තමන්වහන්සේගේ අසාධාරණ වූ දිව්කනින් අසා වදරා 'දැන් මම එතනට ගියෙම් නම් ශ්‍රද්ධාවන්ත බොහෝදෙනාට දනඵල විශෙෂය ප්‍රකාශ වන්නේ ය' යි සිතා වැඩ හුන් සිරියහනින්[1] පැනනැඟී සුරක්ත වර චීවරයන්[2] සකස්කොට හැඳ පෙරව එබු එබු පත්ලෙන් මිහිකත සනහමින් වඩනාසේක් ශ්‍රී හස්තය නො දික් කරවා තෙමේ ම තමහට හැරුණාවූ ගඳකිළි මහදෙරින් පිටත් ව සියලඟින් නික්මුණු බුඩරශ්මිමාලාවෙන් දශදිග්[3] හොබවමින් එබු එබු පත්ලෙහි මහපියුම් දක්ව දක්වා අනන්ත වූ ශ්‍රී විලාසයෙන් යුක්ත ව ඇත්මුළක් මැදට නොබා නික්මුණු අභීත කෙසරසිංහරාජයකු සේ ධම්සභාමණ්ඩපයට වැඩ යුගඳුරු මුදුනෙහි පැනනැඟි සරාහිරුමඩල පරිද්දෙන් පනවන ලද බුඩාසන මස්තකයෙහි අනොපමෙය්‍ය වූ බුඩලීලාවෙන් දිලිහි දිලිහී වැඩහුන්සේක. එකල්හි භික්ෂූන් වහන්සේ කියමින් හුන් කථා ප්‍රබන්ධය තබාලා හුනස්නෙන් නැඟී[4] බුදුන් වැඳ බුඩ රශ්මි නමැති සුයර්‍යකාන්තීන් හැකිළ ගිය රත්නැඹුල වනයක් සේ දෙහොත් මුදුන් දිදී එකපැහැර

---

1. සිරියහන් මස්තකයෙන් - L
2. චීවරය - KL
3. දශදිග් - BF
   දශදික් - DEGH
4. පැන නැඟී - පිටපත් හැම, ස.

Non-Commercial Distribution

මොනවට පිපී වැනී ගිය රත්පියුම් වනයක් සේ බුදුන් සිසාරා වැඩ සිටිසේක. එවේලෙහි බුදුරජාණන් වහන්සේ එපරිද්දෙන් සිටියාවූ භික්ෂුසඞ්ඝයා බලා ʼමහණෙනි, මා එන්නාට පූර්වභාගයෙහි කිනම් කථාවෙකින් යුක්ත ව උනු දැʼයි වදළසේක. එකල්හි භික්ෂූන් වහන්සේ ʼස්වාමීනි, නුඹවහන්සේ විසින් නොකියන්ට වදළ රාජකථා චෞරකථා ආදි වූ දෙතිස්කතාවෙන් එක කථාවකුත් නොකීම්හ: මේ නුවර චෞරඝාතකයා නම් බොහෝ අකුසල් කොට පුරාපු[1] පව්ටා හෙයින් ඔහු මළ පවත් අසා හෙතෙමේ දැන් කවර අපායක උපන් දෝ හොයි කථා කෙරෙමින් උනුම්හʼයි දැන්වූ සේක. එකල සකල ලොකෙකලොචන වූ බුදුරජාණන් වහන්සේ ʼඑම්බා මහණෙනි, යම් සේ ගවයන් සියයක් හෝ පනසක් හෝ ඇති විවරක් ගෙන හැම එක් ගාලෙක ලූ කල එයින් ගාල් දෙරට සරස් ව ළං ව සිටියාවූ දෙනක හෝ ගොනකු හෝ යටත් පිරිසෙයින් වැස්සක හෝ වස්සකු හෝ එතනින් පිටත් ව ගිය කල මිස සෙස්සවුන් නික්මෙන්ට අවසර නොපෙනේ ද එපරිද්දෙන් ම මරණාසන්නයෙහි කළ කුශලයක් හෝ අකුශලයක් හෝ විපාක දීම් ඉක්බිත්තෙහි මිස සෙස්සට අවකාශ නොවන්නේ ය. අද ඒ චෞරඝාතකයා සැරියුත් මහතෙරුන් වහන්සේට ආහාරදනයක් දින: දැන් එහි අනුසසින් දෙවුලොව ඉපද දිව්‍ය[2] වූ පඤ්චකාමසම්පත්තීන් යුක්ත ව මහත් වූ දිවසැපත් විඳිනට පටන්ගත: ක්ෂෙත්‍රශුද්ධි බලවත් හෙයින් එම කුශල හේතුවෙන් මතු අනාගතයෙහි පසේබුදු ව නිවන් දක්නේ යයි වදළ සේක. මෙසේ එදවස් සැරියුත් මහතෙරුන් වහන්සේට දෙන ලද්දාවූ දනය එබඳු ඉතා පව්ටු වූ චෞරඝාතකයා පවා එම ඇසිල්ලෙහි දිව්‍යලොකයට පමුණුවාලීය. එසේ හෙයින් පින්වත් සත්පුරුෂයෙනි, තෙපි හැම ද පරලොව දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා නිවන් සම්පත් විඳිනා කැමැත්තා නම් කුසල් නමැති බිජු[3] වැපිරීමට සරුකෙත් ව සිටියාවූ සිල්වතුන් කෙරෙහි දනපරිත්‍යාග කොට එයින් ජනිත වූ ඉෂ්ටවිපාකයෙන් මතු ස්වර්ගමොක්ෂ සම්පත් සිධ කළ මැනවි. කියන ලදුයේ මැයි:

හො සාරිපුත්තෙන නිහිතපාදනං
බණෙන පාපෙති හි සගගමගගං,
තස්මා සුඛෙත්තෙසු දදථ දනං
කාමත්ථ වෙ සගගමොක්ඛං පරත්ථ - යි.

මෙතෙකින් මේ මහාමණ්ඩාතු වග

දෙවන චෞරඝාතක වස්තුව

කියා නිමවන ලදී.

---

1. කොටපු - AGHJKL
2. දිව්‍යමය - BC, කි.
3. බිජුවට - E

Non-Commercial Distribution

තව ද මේ මහාමන්ධාතු වග තුන්වන සීවලි වස්තුව නම් කවර යත්?

මේ මහා භද්‍රකල්පයට ලක්‍ෂයක් වන කප බුදු වූ පියුමතුරා නම් බුදුරජාණන් වහන්සේ සධර්ම දෙශනාවෙන් මහාජනයා පහදවා ඔවුන්ට ස්වර්ගමොක්‍ෂ සම්පත් සාධා දෙමින් එක් කලෙක හංසවතී නම් නුවර නිසා[1] විසිතුරු විහාරයෙක වැඩවසනසේක් එක් දවසෙක දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණ යක්‍ෂ රාක්‍ෂස සිද්ධ විද්‍යාධරාදීන් හා එම හංසවතී නුවර වසන සරාජක පර්ෂත් මධ්‍යයෙහි සවනක් රසින් දිලිහි දිලිහී වැඩහිඳ බණ වදරා ඉක්බිති එම මහ පිරිස් මධ්‍යයෙහි සුදසුන් නම් එක් භික්‍ෂුකෙනකුන් වහන්සේ කැඳවා ඔබට[2] සිව්පසලාභීන් කෙරෙහි අග්‍ර වූ තනතුරු දෙවුසේක. ඒ දැක හංසවතී නුවර රජ්ජුරුවෝ තුමූ ද ඒ තනතුරු පතා බුදුපාමොක් මහා සඞ්ඝයා වහන්සේට සත් දවසක් මහදන් දී ඉක්බිති බුදුන්ගේ ශ්‍රී පාද මූලයෙහි වැඳගෙන හෙව 'ස්වාමීනි භාග්‍යවත් වූ බුදුරජාණන්වහන්ස, මේ මා දුන්නාවූ දනයෙහි කුශලයෙන් තෙල සුදසුන් නම් මහතෙරුන්වහන්සේ සේ ම මම ද මතු එක් බුදු කෙනකුන්වහන්සේගේ ශාසනයෙහි සිවුපස ලාභීන්ට අග්‍ර වූ තනතුරු ලැබෙම්ව'[3] යි ප්‍රාර්ථනා කළහ. එකල බුදුරජාණන් වහන්සේ අනාගතඥානය මෙහෙයා[4] මොහුගේ ප්‍රාර්ථනාව සිද්ධ වන බව දැක දෙව් බඹ නා ගුරුළු යක් රකුස් මිනිස් ආදි වූ මහපිරිස් මධ්‍යයෙහි අෂ්ටාඞ්ග සමුපෙත වූ බ්‍රහ්මඝොෂා විහිදුවා වදරනසේක් 'එම්බල මහරජ, මෙයින් කප්ලක්‍ෂයක් ගිය කල ගෞතම නම් බුදුකෙනෙක් ලොකයෙහි උපදිති. එකල්හි තෙපි ඒ බුදුන්ගේ ශාසනයෙහි මහණ ව සීවලී යන නමින් ප්‍රසිද්ධ ව සිවුපස ලාභීන් කෙරෙහි අග්‍ර වූ ස්ථානාන්තරයට පැමිණ හිර සඳ සේ බුද්ධශාසනයෙහි ප්‍රසිද්ධ වන්නාවා දැ'[5] යි වදළසේක. කියන ලදුයේ මැයි[6] අපදානයෙහි-

පදුමුත්තරො නාම ජිනො - සබ්බධම්මෙසු චක්ඛුමා,
ඉතො සතසහස්සම්හි - කප්පෙ උප්පජ්ජි නායකො.

සසාවකං මහාලාභිං - පුඤ්ඤවන්තං ජුතින්ධරං,
ඨපෙසි එතදග්ගම්හි - පරිසාසු විසාරදෙ.

තදහං ඛත්තියො ආසිං - නගරෙ හංසවතවහයෙ,
සුත්වා ජිනස්ස තං වාක්‍යං - සාවකස්ස ගුණං බහුං.

නිමන්තයිත්වා සත්තාහං - භොජයිත්වා සසාවකං,
මහාදනං දදිත්වාන - තං ඨානං අභිපත්ථයිං.

---

1. හංසවතී නුවර - E
2. ඕ හට - AFJ
3. ලබම්වයි - ක. කි. ඤ.
4. මෙහෙයා වදරා - E;
   මෙහෙයා බලා වදරා - බෙ. ස.
5. වන්නා වේ දැයි - ස.
6. ලද මැයි - ACDEFJ ක. කි. ඤ. ම.

Non-Commercial Distribution

තද මං විනතං[1] පාදෙ - දිස්වාන පුරිසාසභො,
සො සරෙන මහාවීරො - ඉමං වචනමබ්‍රැවි.

සතසහස්සෙ ඉතො කප්පෙ - ඔක්කාක කුල සම්භවො,
ගොතමො නාම නාමෙන - සත්ථා ලොකෙ භවිස්සති.

තස්ස ධම්මෙසු දායාදෙ - ඔරසො ධම්ම නිම්මිතො,
සීවලී නාම නාමං හුත්වා - ලච්ඡසෙ තං අනාගතෙ - යි.

මෙසේ දිව්‍යබ්‍රහ්මාදීන් මධ්‍යයෙහි බුදුන් වදළ වචනය අසා එම විට ලබන ස්ථානාන්තරයක් සේ සන්තුෂ්ට වූ රජ්ජුරුවෝ එතැන් පටන් වඩ වඩා බොහෝ පින් කොට එයින් ගොස් තවුතිසා දෙව්ලොව ඉපද බොහෝ කාලයක් දිව්‍යසම්පත් විඳියහ. එයින් අවුත් බරණැස් නුවර බොහෝ සම්පත් ඇති සිටු කුලයෙක ඉපද දිවසැපතක් හා සමාන මහත් වූ සිටුසැපත් විඳිනාහු දහසක් පමණ පසේ බුදුවරුන් වහන්සේ දැක ඊර්යාපථ උපසමයෙහි පැහැද සමීපයට එළඹ පසඟ පිහිටුවා වැඳ ආරාධනා කොට හැම දෙනා වහන්සේට ම රාත්‍රිස්ථාන දිවාස්ථාන සක්මන් මණ්ඩප ආදි වූ වාසස්ථාන කරවා මහත් වූ ආදර සම්භාවනාවෙන් ජීවිතාන්තය දක්වා උතුම් උතුම් වූ සිවුපසදනයෙන් උපස්ථාන කළහ. ඉක්බිති එයින් ගොස් සදිව්‍යලොකයෙහි වෙන වෙන ම මිණි කිකිණිදැල් බැඳි[2] නානාවර්ණ ධ්ජමාලාවෙන් හොබනා මනහර දිව්‍යවිමානවල වෙසෙමින් නොයෙක් සියදහස් ගණන් සුරසුන්දරීන් පිරිවරා දිව්‍යසම්පත් විඳියහ. ඒ බව දක්වන පිණිස එම සීවලී මහතෙරුන් වහන්සේ විසින් කියන ලදි:

තතො පරස්මිං සමයෙ - බාරාණසි පුරුත්තමෙ,
සෙට්ඨිපුත්තො අහං ආසිං - අජ්ඣප්පත්තො[3] මහාධනං[4].

සහස්සමත්තෙ පච්චෙක - නායකෙ ච නිමන්තිය,
මධුරෙනන්නපානෙන - සන්තප්පෙසිං සද්දරො[5].

තතො චුතො ජකාමග්ගෙ - අනුභොසිං මහායසං,
දෙවච්ඡරා පරිවුතො - පාසාදෙ රතනාමයෙ - යි.

තව ද මීට එකානූවන කප බුදු වූ මහාවිපස්සි නම් බුදුන්[6] සමයෙහි මෙම සීවලී මහතෙරහු බන්ධුමතී නම් නුවර නාමගොත්‍රයෙන් අප්‍රසිඩ වූ කුලගෙයක[7] ඉපද මුහුකළ වයසට පැමිණ එක්තරා ජනපද ජ්‍යෙෂ්ඨයකු ඇසුරු කොටගෙන ඔහු පිළිබඳ නොයෙක් රාජකාරියෙහි[8] ව්‍යාපෘත ව වසනසේක. එසමයෙහි බුදුහු මහජනයාට

1. වන්දිතං - KL
2. බද - BCEFGHJK
3. අධිප්පත්තො - ක. කි. ඝ. ම. පාලි.
4. මහද්ධනො - ක. ම.
5. තද්දරො - පාලි
6. බුදුරජාණන් වහන්සේ - CD බෙ.ස.
7. කුලයෙක - ක.කි.ඝ.බෙ.
කුලස්ස - පාලි
8. කාරියෙහි - KL

Non-Commercial Distribution

අනුග්‍රහ සඳහා ජනපදචාරිකාවෙහි වැඩ නැවත පිය මහරජාණන් වසන බන්ධුමතී නුවරට වැඩියේක. එකල බන්ධුමා රජ්ජුරුවෝ ආගන්තුක ව වැඩි බුදුන්ට ආගන්තුක දනයක් දුන මැනවැ'යි සිතා අටසැට දහසක් පමණ රහතන් හා සමඟ බුදුන්ට ආරාධනා කොට මහදන් සරහා නුවර වැසියන්ට කියා යවන්නාහු 'හැමදෙන ම අවුත් මාගේ දනට සහාය වව'යි කියා යවූහ. එතෙපුල් අසා නුවර වැසියෝ අවුත් බලනුවෝ රජහු විසින් පිළියෙල කරන ලද දනය දැක 'මෙ රජ තමා දෙන දන් දක්වන පිණිස අප හැම කැඳවා එවූයේ වනැ'යි සිතා මොහු දුන්[1] දනට වඩා අපිත් දනක් දෙම්හ'යි සිතා ඔවුනොවුන් හා මන්ත්‍රණය කොට බුදුන් කරා එළඹ අමාහැල්ලෙක ගැලෙන්නවුන් මෙන් බුදුන් පාමුල්හි වැඳ පෙරළී දන් පවරා දෙවන දවස් දන් සරහා තබා එපවත් රජ්ජුරුවන්ට කියා යවූහ. එබස් අසමින් ම රජ්ජුරුවෝ ද අවුත් ඔවුන්ගේ දන් දැක 'මුන් හැම පරදවා මාත් මීට වඩා දනක් දුන මැනවැ'යි සිතා බුදුන් පවරා තුන්වන දවස් මහදන් දුන්හ. මෙම ක්‍රමයෙන් පස් දවසක් දන් දුන් කල්හි සවන වර නුවර වැසි හැමදෙන ම එක්සිත් ව බුදුන් වැඩහිඳිනා පරිද්දෙන් මාහැඟි කොට මහත් පිරිවෙනක් කරවා විහාරය පිළිගන්වන පූජාවෙහි දන් දෙන්නාහු මෙනම් දෙයක් මෙහි නැතැයි නොකියන පරිද්දෙන් දන් පිළියෙල කොට තබා මේ දනෙහි නැත්තේ කවරේ දෝ හොයි විමසා බලනුවෝ කකාළ මී හා පරණ දී බොහෝ කොට ඇත ද අලුත් දී හා කැටි මී නැති බව දැක එකෙණෙහි පුරුෂයන් සතරදෙනකු කැඳවා සාරදහසක් කහවණු දී අලුත් දී හා කැටි මී ඇති යම් ම තෙනකින් වහා ගෙනෙව'යි කියා සතරදිග[2] සතරවාසලට යවූහ: ඔහු සතරදෙන සතරදිග ඇවිද සොයාගිය අලුත් දී හා කැටි මී ලැබගත නොහී බල බලා සිටියහ. එයින් එක් පුරුෂයෙක් තමා අනට දුන් මසු දහස ගෙන 'තව පරීක්‍ෂා කොට යෙමි'යි නුවර මහා වහසල්දෙර සිටගත. එකල්හි යට කී දනවුවැසි පුරුෂයා තමාගේ ගම්මුදලියා දක්නා සඳහා අලුත් දී ගෙඩියක්[3] හා සමඟ බත් පිසවා ගෙන්වාගෙන නුවරට එනුයේ අතරමඟ දඬුවැල්බැමීයක්[4] දැක මැස්සන් පලවා[5] දඬුවැල්බැය කඩාගෙන අවුත් නුවර වහසල්දෙරට පැමිණියේය. එකල්හි අලුත් දී හා කැටි මී සොයා ගිය පුරුෂයා දඬුවැල්බැය හා දී මුට්ටිය දැක 'එම්බල පින්වත්නි,[6] මේ කහවනුව ගෙන තෙල දඬුවැල් මීය[7] මට දෙව'යි ඉල්විය. එකල දනවුවැසි පුරුෂයා සිතනුයේ 'මේ දඬුවැල්බැය කහවණුයෙන් භාගයකුත් නොවටනේය: මේ මිනිසා ආදි කොට එක බසින් ම කහවනුවකට ඉල්වයි: මොහු අත මසුරන් බොහෝ ව ඇති වනා: එබැවින් මිල වැඩුව මැනවැ'යි සිතා 'එම්බල පින්වත, තෝ කුමක් කියයි ද? උදසන පටන් වල ඇවිද දුක සේ සොයාගෙන මාගේ රට නායකයන්වහන්සේට ගෙන යන පඬුර[8] එක මස්සකට දීපියම් දැ'යි කීය. එතෙපුල් අසා මී සොයා ගිය පුරුෂයා 'එසේ කල යහළු දෙමස්සක් ඇරගෙන[9] දීපියව'යි ඉල්වීය: 'එසේ ද නොදෙම්' යි කී කල්හි ක්‍රමයෙන් තුනෙක සතරෙක පසෙකැයි[10] වැඩිමිලයට ඉල්වා

1. දෙන - D
2. සතර දෙන සතර දිග - EGHKL ස.
3. දී මුට්ටි ගෙඩියක් - ස.
4. දඬුවැල්මීයක් -ABDEFJ, ක.කි.ජ.ම.
5. එළවා - KL
6. පින්වත - BDGKL ස.
7. දඬුවැල් බැ මීය -BCGHKL
8. ගෙන යන දඬුවැල් - GHKL
9. හැර ගෙන - BCDFGH
10. තුනෙකැයි, සතරෙකැය, පසෙකැයි -DE

Non-Commercial Distribution

එසේ ද නොදෙන හෙයින් 'එසේ වීනම් යහළු මේ සියල්ල ම ඇරගෙන තෙල දඬුවැල්මීය[1] මට දීපියව'යි කියා මසුදහය දික්කළේ ය. ඒ දැක දනවුවැසි පුරුෂයා කියනුයේ 'කිමෙක් ද යහළු, තෙපි වියරු හුණු කෙනෙක් ද? නොහොත් තොපගේ රන් තබන තැනක් නැති හෙයින් දෙවූ ද? මසුභාගයෙන් භාගයකුත්[2] නොවටනා ඉතා සවල්ප වූ මේ දඬුවැල් මීය[3] මසුදහසකට ඉල්වව: මෙසේ ම මෙයින් තොපට කවර ප්‍රයොජනයෙක් දැ'යි විචාළේය. එකල මී නිසා ගිය පුරුෂයා සිතා සී කියනුයේ 'එම්බා යහළු, මම මෙහි අගය නො දැන මසුදහස දෙන්නෙමි නොවෙමි: එකාන්තයෙන් ම මස්සෙන් මසුභාගයකුත් නොවටනා බව දනිමි මය: එතෙකුදු වුවත් මෙයින් මට අවශ්‍ය කටයුත්තෙක් ඇත: එද වනාහි අනික් කටයුත්තෙක් නොවෙයි: නුවරවැසි අපි හැම එක් ව අටසැට ලක්‍ෂයක් රහතන් හා සමඟ විපස්සි නම් බුදුරජාණන්වහන්සේට ආරාධනා කොට දනක් සරහා ලුම්හ: ඒ දනෙහි නැත්තේ නම් අලුත් මී පමණෙක් මය: එසේ හෙයින් මෙසේ වැඩි මිලයට ඉල්වමි'යි කී ය. එතෙපුල් අසා දනවුවැසි පුරුෂයා 'එසේ වී නම් යහළු, මම මිලට[4] නොදෙමි. ඉදින් මට ඒ දනෙහි පින් දෙවු නම් මිල නොගෙන ම මේ දඬුවැල් බෑය දෙමි'යි කීය. එකල මී සොයාගිය පුරුෂයා ගොසින් නුවරවාසීන්ට එපවත් කීය. නුවර වැසියෝ ඔහුගේ ශ්‍රධාව බලවත් බව දැන 'යහපතැයි පින් ඇරගන්ව'යි කියා තමන් දෙන දනෙහි පින් ඕහට දී බුදුපාමොක් මහසඞ්ඝයා වඩා හිඳුවා පළමුකොට කැඳ අවුළුපත් වළඳවා මහත් රන්තලියක් ගෙන්වාගෙන ඒ තලියෙහි දඬුවැල්බෑ පැණි මිරිකා වත්කරවා ඔහු විසින් ම ගෙනෙන ලද දී මුට්ටිය ද එම රන්තලියෙහි වත්කරවා පැණි හා මිශ්‍ර කොට සකුරු දුරුම්රිස් හා සමඟ මී පැණි යොද භොජනශාලාවට එළවූහ: ඒ වනාහී බුදුන් ප්‍රධාන කොට ඇති අටසැටලක්‍ෂයක් පමණ රහතන් වහන්සේ වළඳ ඉතිරිවන සේ බොහෝ විය: එකල අග්‍රාසනයෙහි වැඩහුන් බුදුන් ඇතුළු ව හැමදෙනා වහන්සේ වළඳ ඉතිරි වත් තුබුයේ මය.[5] මෙසේ මඳ දෙය බොහෝ දෙනා වහන්සේට කෙසේ සැපවිණි දැයි නොසිතිය යුතු. ඒ වනාහී බුදුන්ගේ බුධානුභාවයෙන් ම සැපයිණ: හේ මෙසේ මැයි: බුදුන්ගේ බුධවිෂය ද ධර්ම විෂය ද ඉතා නොසිතිය හැක්කේ ය: එබඳු අචින්ත්‍ය වූ[6] බුදුන් කෙරෙහි ද ධර්මයෙහි ද පහන් වුවත් ලබන්නාවූ විපාකය ද නොසිතිය හැක්කේ මැයි. එසේ හෙයින් කියන ලදී:-

> එවං අචින්තියා බුධා - බුධධම්මා අචින්තියා,
> අචින්තියෙසු පසන්නානං විපාකො හොති අචින්තියො-යි.

මෙසේ එකල පමණ[7] කුසල් කොට ආයු කෙළවර තවුතිසා දෙව්ලොව ඉපද අනුපමෙය වූ දිව්‍යසැපත් විඳියහ. කියනලද මැයි:

---

1. දඬුවැල්බෑමීය - CGH
2. මසු භාගයකුත් - KL
3. දඬුවැල් බෑ මීය - BCGHKL
4. මිලයට - ACDEGHKL ස.
5. බොහෝ තුබුයේම ය - JCD
6. අචින්තෙය්‍ය - KL
7. අපමණවූ - KL

Non-Commercial Distribution

එකනවුතෙ ඉතො කප්පෙ - විපස්සී නාම නායකො,
උප්පජ්ජි චාරුනයනො - සබ්බධම්මවිපස්සකො.

තද්‍ාහං බන්ධුමතියා - කුලස්සඤ්ඤතරස්ස ච,
දයිතො පත්ථිතො පුත්තො - ආසිං කම්මන්ත ව්‍යාවටො - පෙ -

තද්‍ාහං චින්තයිත්වාන - නවං දධි මධුම්පි ච[1],
යොජෙත්වා ලොකනාථස්ස - සසඞ්ඝස්ස අදාසහං.

තෙන කම්මෙන සුකතෙන - චෙතනාපණිධීහි ච,
ජහිත්වා මානුසං දෙහං - තාවතිංස මගඤ්ඡහං-යි.

මෙසේ බොහෝ කාලයක් දෙවුලොව දිව්‍යසම්පත් විඳ එයින් අවුත් නැවත බරණැස් නුවර රජකුලයෙහි ඉපද පියරජහු ඇවෑමෙන් රාජ්‍යයට පැමිණ මහත් වූ යශොතෙජස් ඇති ව රජසැපත් විඳිනාහු ඉසුරු මදයෙන් මත් ව අනික් රජ්ජුරු කෙනෙකුන්ගේ රාජ්‍යය පිණිස සිවුරඟසෙන් පිරිවරා සටනට ගොස් නුවර වටලාගෙන හිඳ 'අපට රාජ්‍යය හෝ දෙව, නොහොත් අප හා සමඟ සටන් හෝ කරව'යි[2] කියා නුවරවාසීන්ට අසුන් හා සමඟ මිනිසුන් යවූහ. ඔහු එපවත් අසා 'අප දෙන රාජ්‍යයකුත් නැත; කරන සටනකුත් නැතැ'යි කියා එවා සුළුදෙරින් නික්ම දර පලා පැන් ආදිය ගෙන යති; සෙසු තමන්ගේ සියලු කාරිය ද කරන්නාහු ම ය. එකල සටනට සැරහී ගිය ඒ රජ්ජුරුවෝ නුවර සතරදිග මහවාසල් දෙර සතර රැකගෙන සත් අවුරුදු සත්මසක් නුවර වටලාගෙන උන්හ. ඉක්බිති ඒ රජ්ජුරුවන්ගේ මවු බිසව් 'මෙතෙක් දවස් මුළුල්ලෙහි රජ්ජුරුවෝ කුමක් කෙරෙද්දැ'යි විචාරා 'ඇතුළු නුවරට වැද්ද නොහී නුවර වටලාගෙන ඉඳිති'යි යනු අසා 'මපුතණුවෝ නුවණ මඳ කෙනෙක; වහා ගොසින් රජ්ජුරුවන්ට කියන කල නුවර සුළු දෙරවලුත් වසාගෙන කිසි කෙනකුන් නුවරින් පිටත් විය නොහැකි සේ තර කොට රකවල් ලවා හිඳිනා කීප දවසකින් උකටලී ව වහසල්දෙර හැරපියති; එකල නුවර ඇරගත හැක්ක; ඒ නියාවට රකවල් ලවන්ට කියව'යි උපදෙස් කියා යවූහ.[3] එකල බරණැස් රජ්ජුරුවෝ මවු බිසොවුන් කියා එවූ උපදෙස් අසා එපරිද්දෙන් ම නුවරින් කිසි කෙනකුන්[4] පිටත් විය නොහැකි සේ නුවර සිසාරා රකවල් ලවාගෙන උන්හ. එකල්හි නුවරවාසීහු තමන් හැම නුවරින් පිටත් විය නොදෙන හෙයින් මැදිරියේ හසු වූ පක්ෂීන් පරිද්දෙන් උකටලී වූවාහු එයින් සත් වන දවස් තමන්ගේ රජ්ජුරුවන් මරා දමා සටනට ආවා වූ බරණැස් රජ්ජුරුවන්ට රාජ්‍යය පාවාදුන්හ. ඉක්බිති ඒ බරණැස් රජ්ජුරුවෝ ආයු කෙළවර එම අකුශල කර්‍මබලයෙන්[5] අවීචි මහ නරකයෙහි ඉපද දහසක් අවුරුද්දෙන් අඟලක් වඩනා මහ පොළොව සත්ගවුවක් උසට වඩනා කල් නරකයෙහි පැසුණාහු ම ය. කියන ලද මැයි අපදානයෙහි :-

1. තදහමෙවං චින්තෙත්වා - දධිං මධුච එකතො - (පාලි) -
2. යුද්ධ කරවයි - GHKL
3. යවූ - KL
4. කෙනකුත් - BGH
5. කර්මයෙන් - KL

Non-Commercial Distribution

පුනාහං බාරාණසියං - රාජා හුත්වා මහායසො:
සත්තුකස්ස තද රුද්ධො - ද්වාරරොධං අකාරයිං.

තතො තපස්සිතො රුද්ධා - එකාහං රක්ඛිතා අහු,
තතො තස්ස විපාකෙන - පාපත්ථං නිරයං භුසං-යි.

මෙසේ බොහෝ කාලයක් නරකයෙහි පැසී එයින් ගොඩ නැඟී අවසර ලද කුශල බලයෙන් පශ්චිමාත්මභාවයෙහි අප බුදුන් දවස කොළිය නුවර මහාලිච්ඡවි නම් මහරජහු නිසා සුප්‍රවාසා නම් අගබිසොව කුස පිළිසිඳ යට ශෙෂ ව සිටි අකුශල කර්ම බලයෙන් සත්හවුරුදු සත්මසක් මුළුල්ලෙහි එළියක් දැක්ක නොහී ලෝඅඳුරු මහනරකයෙහි හුණුවාවූ නරක සත්වයකු සේ බොහෝ දුක් අනුභව කොට ඉක්බිති මවුකුසින් බිහි වන කාලයෙහි යොනිමුඛයෙහි සරස් ව සත් දවසක් මහදුක් විඳියහ. මොවුන්ගේ මවු බිසොව ද එකල්හි සතුරන් අල්වන්ට උපදෙස් දුන් අකුශලකර්මයෙන් ඒ සත්හවුරුදු සත්මස මුළුල්ලෙහි මහදුක් අනුභවකොට ඉක්බිති ප්‍රසව කාලයෙහි ද සත් දවසක් මූඪගර්භ ව දුස්සහ[1] වේදනා සහස්‍ර භාජන ව මහදුක් විඳියහ. කියන ලද මැයි:

පච්ඡිමෙ ච භවෙ දානි - ජාතොහං කොලියෙ පුරෙ,
සුප්පවාසා ච මෙ මාතා - මහාලිච්ඡවි මෙපිතා.

ඛත්තියෙ පුඤ්ඤකම්මෙන - ද්වාරරොධස්ස වාහසා,
සත්තමාසෙ සත්තවස්සෙ - වසිං කුච්ඡිම්හි දුක්ඛිතො.

සත්තාහං ද්වාරමූළ්හොහං - මහා දුක්ඛ සමප්පිතො,
මාතා මෙ ඡන්දදානෙන - එවමාසි සුදුක්ඛිතා - යි.

මෙසේ මහදුක් විඳිනා වූ සුප්‍රවාසයෝ සත් වන දවස් බුදුන් සිහි කොට තමන්ගේ ස්වාමිපුත්‍ර වූ මහාලිච්ඡවි රජ්ජුරුවන් බුදුන් සමීපයට යවා තමන්ගේ වැඳීමෙන් බුදුන් වැඳ යවූහ. එකල බුදුරජාණන් වහන්සේ උන් කෙරෙහි උපන්නා වූ මහා කරුණාවෙන් `සුප්‍රවාසා නම් වූ කොළියධීතාවෝ නිරොගි වේත්ව යි සුවපත් වේත්ව යි නිරොගි ව සුවපත් වූ කොළියධීතාවෝ නිදුක් නිරොගි පුතකු වදත්ව´ යි වදළසේක. එකෙණෙහි ඒ සුප්‍රවාසා නම් බිසව් නිදුක් නිරොගි සුවපත් පුතකු වැදූහ. එකල එතැන්හි රැස්වූ ඔවුන්ගේ බන්ධුජනයෝ එක් ව තමන්ගේ කඳුළු මුසු වූ නොසතුටු මුහුණු සතුටුකරවමින් ශෝකගින්නෙන් තැවෙන තමන්ගේ සිත්සතන් සිහිල් කෙරෙමින් උපන් හෙයින් ඒ කුමාරයන්ට සීවලී යයි[2] නම් තුබූහ. එකල්හි සන්තුෂ්ටවූ සුප්‍රවාසාවෝ බුදුපාමොක් මහසඞ්ඝයාවහන්සේට සත් දවසක් මහදන්

---

1. දුක් සහ - බෙ.
   දුස් සහ - KL
2. සීවලී කුමාරයෝ යයි - DGHKL

Non-Commercial Distribution

දුන්හ. ඔවුන්ගේ පුත් වූ ඒ සීවලී කුමාරයෝ ද උපන් දවස් පටන් ධම්මකරකය ගෙන සඞ්ඝයා වහන්සේට පැන් පරහා ගෙනෙමින් හිඳිනා අසුන් පනවමින් පතුල් ශොධවමින් දැහැටි ගෙන දෙමින් මෙසේ වතාවත් කොට ගිහිගෙන් නික්ම එදවස් ම සැරියුත් මහතෙරුන් වහන්සේ උපාධ්‍යාය කොට මුගලන් මහතෙරුන් වහන්සේ ආචාර්‍ය්‍ය කොට සසුන් වැද මහණ ව කරගෙහි ම රහත් ව බුදුසසුන් හෙබවූහ. එතැන් පටන් සියලු දිව්‍යමනුෂ්‍යාදීහු මහවතුරක් මෙන් එකපැහැර සිවුපසය එළවමින් උපස්ථානයට පටන් ගත්හ. කියන ලද මැයි:

[සු]වප්පිතොහං නික්ඛන්තො - බුද්ධෙන අනුකම්පිතො,
නික්ඛන්ත දිවසෙ යෙව - පබ්බජිං අනගාරියං.

උපජ්ඣා සාරිපුත්තො මේ - මොග්ගල්ලානො මහිද්ධිකො,
කෙසෙ ඔරොපයන්තො මෙ - අනුසාසි මහාමති.

කෙසෙසු ඡිජ්ජමානෙසු[1] - අරහත්තමපාපුණිං,
දෙවා නාගා මනුස්සා ච - පච්චයානුපනෙන්ති මෙ-යි.

මෙසේ ඒ සීවලී මහතෙරුන් වහන්සේ බරණැස් රජ ව[2] උපන් සමයෙහි මවු බිසවුන් කී උපදෙස් ගෙන එකල්හි සුළුදෙර සතර වසා නුවරවාසීන්ට දුක් දුන්නා වූ අකුශලයෙන් නරකයෙහි පැසී එයින් අවුත් ශෙෂ ව සිටි එම අකුශලකර්‍මයාගේ බලයෙන් මේ පශ්චිමාත්මභාවයෙහිදු එම මෑණියන් කුස පිළිසිඳ සත් අවුරුදු සත් මසක් මුළුල්ලෙහි මවුකුස් නරකයෙහි පැසී යළිදු සත් දවසක් යොනිමුඛයෙහි සරස් ව පළමුත් එම මෑණියන් වහන්සේ හා දෙදෙනා එක් ව කළ අකුශලකර්‍මය හෙයින් එක් ව ම දුක් විඳි සේක. පියුමතුරා නම් බුදුන් සමයෙහි දන් දී කළා වූ ප්‍රාර්ථනා බලයෙන් හා විපස්සී බුදුන් සමයෙහි අලුත් දී හා කැටි මී දුන්නාවූ කුශල විශෙෂයෙන් බොහෝ ජනසමෘද්ධ ඇති ගම් නියම්ගම් රාජධානි ආදියෙහි ද කිසි මනුෂ්‍යසඤ්චාරයක් නැති මහ වල්හි ද ඇළ කඳුරු ගං හෝ සත්සයුරු සද්දහතලාදි වූ දියෙහි ද මහමෙර සක්වළගල සත්කුළපව්ව හිමවත් ආදි වූ ගොඩෙහි ද යන හැම තන්හි සුලභ වූ උතුම් වූ ප්‍රත්‍යය ලාභයන් ලබන සේක් මය. කියනලද මැයි:-

පදුමුත්තර නාමං ච - විපස්සිං ච විනායකං,
සම්පූජයිං පමුදිතො - පච්චයෙහි විසෙසතො.

තතො තෙසං විසෙසෙන[3] - කම්මානං විපුලුත්තමං,
ලාභං ලභාමි සබ්බත්ථ - වනෙ ගාමෙ ජලෙ ථලෙ-යි.

---

1. ඡිජ්ජමානෙසු - G
ඡෙජ්ජමානෙසු - KL
3. බරණැස් නුවර රජ ව - මුද්‍රිත හැම
3. විපාකෙන - GH

Non-Commercial Distribution

ඉක්බිති එක් සමයෙක භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ සැරියුත් මහතෙරුන් වහන්සේගේ බාල මල් වූ රේවත තෙරුන් වහන්සේ දක්නා පිණිස කිහිරිවන විහාරයට වඩනාසේක් තිස් දහසක් භික්ෂූන් හා සමඟ නික්මුණු සේක: ඉක්බිති මඳක් තැන් වැඩි කල්හි අනඳ මහතෙරුන් වහන්සේ දෙමඟක් දැක සිටිසේක් 'ස්වාමීනි, මේ මං දෙක ම රේවත මහතෙරුන් වසන තෙනට යන මාර්ග ය: මේ මං දෙකින් තෙල සැටයොදුන් මඟ මනුෂ්‍යවාසය: තෙල තිස්යොදුන් ඍජුමාර්ගීය මිනිසුන් නැති අමනුෂ්‍යවාසය: මේ මං දෙකින් කවර මඟක යමෝ දැ'යි දැන්වූසේක. එකල බුදුහු 'ආනන්දයෙනි, අප හා සමඟ සීවලී අවු දැ'යි විචාරා 'එසේ ය ස්වාමීනි'යි කී කල්හි 'එසේ වී නම් ළං මඟ ම යම්හ'යි වදාළසේක. එසේ වදාළේ කුමක් පිණිස ද යත්? දෙවතාවෝ වනාහී බොහෝ සේ සීවලී මහතෙරුන්වහන්සේ කෙරෙහි ම පහන් සිත් ඇතියහ: එසේ හෙයින් බුදුහු 'මම තොපට කැඳබත් ආදිය උපදවා දෙමි: ළං මඟ යව'යි නොවදරා සීවලී මහතෙරුන් වහන්සේගේ කුශලය විපාක දෙන්ට අවසර ලත් තැන යයි දැන ඔබගේ කුශලමහිමය ප්‍රකාශ කොට දක්වන පිණිස 'සීවලී අවු නම් ළං මඟ යම්හ'යි වදාළසේක. මෙසේ බුදුන් එමඟට පිළිපන් කල්හි දෙවතාවෝ 'අපගේ ආයුෂ්‍යයන් වූ[1] සීවලී මහතෙරුන් වහන්සේට සත්කාර කරම්හ'යි ඔවුනොවුන් හා කථාකොට සතර ගවුවෙන් සතර ගවුවෙහි එකි එකී විහාරයක් බැගින් කරවා උදයන්හි ම දිව්‍යමය වූ කැඳ අවුළුපත් ආදිය ගෙන්වාගෙන අවුත් 'අපගේ ආයුෂ්‍යයන්[2] වූ සීවලී මහතෙරුන් වහන්සේ කොයි ද කොයි දැ'යි විචාර විචාරා ඇවිදිති. තෙරුන් වහන්සේ ද තමන් වහන්සේට ගෙනා කැඳ අවුළුපත් ආදිය බුදුන් ප්‍රධාන කොට ඇති භික්ෂු සඞ්ඝයා වහන්සේට පිළිගන්වනසේක. මෙසේ බුදුහු සහපිරිස් හා සමඟ සීවලී තෙරුන් වහන්සේගේ පින්[3] අනුභව කෙරෙමින් ම තිස්යොදුන් මඟ ගෙවා වැඩිසේක. රේවත තෙරුන් වහන්සේ ද බුදුන් වඩනා බව දැන සර්වඥයන්වහන්සේට මනහර ගඳකිළියක් නිර්මිත කොට සෙසු රහතුන්වහන්සේට පන්සියයක් කුළුගෙවල් හා පන්සියයක් සක්මන් හා පන්සියයක් පන් සියයක් ම රාත්‍රිස්ථාන දිවාස්ථාන ආදිය ද නිර්මිත කොට දෙවූසේක. සර්වඥයන් වහන්සේ එහි වසන සේකුත් සීවලී තෙරුන්වහන්සේට[4] දෙවියන් විසින් එළවන ලද දනය ම වළඳ දවස් හළ[5] සේක. නැවත ඒ කිහිරිවන විහාරයෙහි සිට පෙරළා වඩනා ගමනෙහි ද මසක්[6] මුළුල්ලෙහි තිස්දහසක් භික්ෂූන් වහන්සේ හා සමඟ එම සීවලී තෙරුන් වහන්සේගේ කුශලයෙන් උපන් ආහාරය ම වළඳ අනුක්‍රමයෙන් දුරු කතර ගෙවා සැවැත් නුවර දෙව්රම් වෙහෙරට ම වැඩ එම දවස් සවස සහපිරිස් පිරිවරා ධර්මසභා මණ්ඩපයෙහි වැඩහුන් බුදුරජාණන් වහන්සේ සීවලී තෙරුන් වහන්සේ කැඳවා 'එම්බා මහණෙනි, මාගේ ශාසනයෙහි සිවුපසලාභීන් කෙරෙහි සීවලී තෙරහු අග්‍රයෝය'යි එතදග්‍රපාලියෙහි තබා ස්ථානාන්තර දෙවූසේක. කියන ලද මැයි, එම සීවලී මහතෙරුන් වහන්සේ විසින්[7] අපදනයෙහි :-

1. ආශ්චර්ය වූ - GHL, ආර්ය වූ - E
   ආර්ය වූ - BCDE, ආචාර්ය වූ - K
2. ආර්ය වූ - ABCDEFGHK
3. දන් - ස.
4. මහතෙරුන් වහන්සේට - BCGHKL
5. අළ - KL
6. තුන්දවසක් K. තුන්මසක් L,
7. විසින් (නැත) CGH .

Non-Commercial Distribution

රෙවතං දස්සනත්ථාය - යදා යාති විනායකො,
තිංසභික්ඛුසහස්සෙහි - සහ ලොකග්ගනායකො.

තද දෙවොපනීතෙහි - මමත්ථාය මහාමති,[1]
පච්චයෙහි මහාවීරො - යසස්සො ලොකනායකො.

උපට්ඨිතො මයා බුද්ධො - ගන්ත්වා රෙවතමද්දස,
තතො ජේතවනං ගන්ත්වා - එතදග්ගෙ ඨපෙසි මං-යි.

මෙසේ එකල්හි ලබන ලද ස්ථානාන්තර ඇති සීවලී තෙරුන් වහන්සේ ප්‍රීතිවාක්‍ය වශයෙන් භික්ෂුසඞ්ඝයා වහන්සේ මධ්‍යයෙහි මේ තමන්වහන්සේගේ පූර්ව චරිතාපදනය ගෙන හැර දක්වා කුශලාකුශල දෙක්හි ඉෂ්ටානිෂ්ට විපාක විභාගය හඟවා වදාළසේක. එසේ හෙයින් කුශලකර්මයාගේ ආනුභාවය ද ශ්‍රීවන්තයන්ගේ සම්පත්ති විශෙෂය ද යන මේ ආශ්චර්ය්‍ය සහිත අද්භූත චරිතය ඇසුවා වූ ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයෙනි, තෙපි තෙපිදු මතු ඉදින් භවභොග සම්පත් හා නිවන් සම්පත් කැමැතියා නම් සිත ඇති කුසීතභාවය දුරුකොට හැර තම තමා ශක්ති පමණින් නො පමාව කුසල් කළ මැනවි. කියන ලද මැයි :

සුත්වාන එතං චරිතං මහබ්භුතං
පුඤ්ඤානුභාවං ච සිරිං සිරීමතං,
හිත්වා කුසීතං කුසලං කරොථ හො
කාමත්ථ කාමං භවභොග නිබ්බුතිං-යි.

මෙතෙකින් මේ මහානන්ධාතු වග

තුන්වන සීවලී වස්තුව

කියා නිමවන ලදී.

තව ද මේ මහාමන්ධාතු වග සතරවන සද්ධෙය්‍ය වස්තුව[2] නම් කවර යත්?

යට ගිය දවස මෙම කප බුදු වූ කාශ්‍යප බුදුන් සමයෙහි ශ්‍රද්ධාවන්ත උපාසක කෙනෙක් උක්යත කර්මාන්තයෙහි නියුක්ත ව එයින් ම තමන්ගේ අඹුදරුවන් රකිමින් ජීවත් වෙති. ඌ තුමූ දවසෙක ගිලන් සඟරුවනක් දැක ගිතෙල් සැන්දක් පිළිගැන්වූහ. නැවත එක් දවසෙක එසේ ම ගිලන් භික්ෂුකෙනකුන් වහන්සේ දැක උක්සකුරු පිඩක් පිළිගැන්වූහ. අනික් දවසෙක සයින් පීඩිත වූ බල්ලකු දැක ඕහට බත් පිඩකින් සංග්‍රහ කළහ. පසුව එක් දවසෙක ණයගැති මිනිසකු දැක ඕහට කහවණුවක් දුන්හ. තව ද එක් දවසෙක බණ අසා පැහැද වස්ත්‍රයක් දුන්හ. මෙසේ මෙපමණ කුසල් කොට ඉක්බිති ප්‍රාර්ථනා කරනුවෝ ච්‍යුතිප්‍රතිසන්ධි වශයෙන්

1. මහාමුනි - CGH
2. සද්ධාගසක - පාලි

Non-Commercial Distribution

ජාතියෙන් ජාතියෙහි සසර ඇවිදිනාවූ මම සමුද්‍ර පර්‍වතාදි වූ යම් යම් තැනෙක්හි යමක් යමක් කැමැති වෙම් ද මා කැමැති කැමති ඒ සියල්ල ම එම ඇසිල්ලෙහි සිද්ධ වේවා' යි ප්‍රාර්ථනා කළහ. ඉක්බිති ඒ උපාසකයෝ එම කුශලකර්‍මයන්ගේ හේතුයෙන් දෙව්ලොව ඉපද එකල්හි කළ ප්‍රාර්ථනා වූ පරිද්දෙන් මහත් වූ දිව්‍ය සම්පත්[1] විඳ එක් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි සදිව්‍ය ලොකය මනුෂ්‍යලොකය යන සප්තවිධ කාමඝවර්ගීයෙහි අනොපමෙය වූ ආශ්චර්‍ය්‍ය සහිත දිව්‍යමනුෂ්‍ය සම්පත් වළඳ අප බුදුන් සමයෙහි සැවැත් නුවර බොහෝ සම්පත් ඇති ලොකපූජිත සිටුකුලයෙක ඉපද අනුක්‍රමයෙන් වැඩී සියලු සම්පත්තියෙන් සමෘද්ධ ව මහත් වූ නර ඉසුරු විඳිමින් වසනුවෝ කලින් කලට විහාරයට එළඹ බණ අසා ගිහිගෙයි ආදීනව හා මහණ වීමෙහි අනුසස් මෙනෙහිකොට සසුන් වැද මහණ ව ධ්‍යාන උපදවා සමාපත්ති සැප විඳිමින් ක්‍රමයෙන් කෙලෙසුන් ගෙවා රහත් ව සඩෙයා මහ තෙරුන් වහන්සේ යයි ප්‍රසිද්ධ වූහ. කියන ලදුයේ මැයි[2].

ඒතෙසං පුඤ්ඤකම්මානං - වාහසා කාමභූමියං,
සම්පත්තිමනුභුත්වාන - සාවත්ථිපුරමුත්තමෙ.

ජාතො කුලෙ මහාභොගෙ - වුඩ්ඪිප්පත්තො සුඛෙ ඨිතො,
තස්ස ධම්මං සුණිත්වාන - පබ්බජිත්වාන සාසනෙ.

ලොකුත්තරං අග්ගරසං - භුඤ්ජන්තො මුනි වාහසා,
කිලෙසෙ පජහිත්වාන - අරහත්තමපාපුණිං - යි.

මෙසේ රහත් ව මුදුන් පැමිණියාවූ මනොරථ ඇති ඒ සඩෙයා මහතෙරුන් වහන්සේ එක් සමයෙක්හි බුදුන් වැද අවසර ගෙන පන්සියයක් භික්ෂූන් පිරිවරා උගග[3] නම් නුවරට වැඩීයේක. ඒ නුවර සිටාණන්ගේ ඇබෙණියෝ තුනුරුවන්හි[4] පැහැද ශ්‍රද්ධාවන්ත ව වසන්නාහු එකල ඒ පන්සියයක් භික්ෂූන් පිරිවරා නුවරට සිහා වන් තෙරුන්වහන්සේ දක වහා පෙරමහට ගොස් පසඟ පිහිටුවා වැඳ පාත්‍රය ගෙන මහත් වූ ආදරයෙන් හැමදෙනා වහන්සේ ම ගෙට[5] වඩාගෙන ගොස් හිඳිනා අසුන් පනවා වඩා හිඳුවා පිරිවර භික්ෂූන් හා සමඟ මහතෙරුන්වහන්සේ වළඳවා එම නුවර නිබද්ධවාසයෙන් වසන සේ තෙරුන්වහන්සේට ආරාධනා කොට පන්සියයක් කුළුගෙවල් කරවා උඩ සුදුවියන් බඳවා තිර ජවනිකා ආදියෙන් අලඞ්කාර කොට සරහා හැඳපුටු පනවා පන්සියයක් දෙනාවහන්සේ එහි වස්වා නිරන්තර ව සිව්පසයෙන් උපස්ථාන කෙරෙති. මහතෙරුන්වහන්සේ ද ඒ සිටු දියණියන් ආදි වූ

1. දිව්‍යසම්පත්තිය- GH
2. කියන ලද මැයි - CDHJ
   කියන ලදු මැයි - A
3. උග්ගථ - L
4. තුනුරුවන් කෙරෙහි -L
5. තමාගේ ගෙට -D

Non-Commercial Distribution

බොහෝ දෙනාට කුශල් වඩවා[1] ඔවුන් පන්සිල් පිහිටුවා ඒ නුවර අභිප්‍රා[ය][2] කාලයක් වැස අනික් තැනකට වඩනා කැමැති ව එයින් නික්ම අනුක්‍රමයෙන් මුහුදුතෙර පටුන්ගමකට වැඩ දවස් ගණනක් එහි වැස පසු ව එයින් නික්ම නැවු නැඟී පන්සියයක් භික්ෂූන් හා සමඟ මුහුදු පිටින් වඩනාසේක. එකල එක් දවසෙක සමුද්‍රමධ්‍යයෙහිදී මහතෙරුන් වහන්සේට බඩරුජාවක් පහරනට පටන්ගත. භික්ෂූන් වහන්සේ ඒ දැක 'ස්වාමිනි, පළමු මේ රුජාව ගත් කල කවර බෙහෙදකින් සන්හිදේ ද'යි විචාළසේක. එබසට මහ තෙරුන් වහන්සේ 'එම්බා ඇවැත්නි, පළමු මේ රුජාව ගත්[3] කල සැන්දක් පමණ ගිතෙල් වැළඳූ කල්හි සන්හිදේ'යි වදාළසේක. එකල්හි භික්ෂූන්වහන්සේ ස්වාමිනි, ආසන්නයෙක[4] ගමක් ගෙයක් නැති දිග සරස කෙළවරක් නොපෙනෙන්නාවූ මේ මහා සමුද්‍ර මධ්‍යයෙහි කෙසේ ගිතෙල් ලබමෝදැයි කී සේක. එතෙපුල් අසා මහතෙරුන්වහන්සේ 'එම්බා ඇවැත්නි, ගිතෙල් නම් අපට දුර්ලභ දෙයක් නොවෙයි; තෙල අපගේ පාත්‍රය ගෙන මුහුදින් පැන් උකා ගෙනෙව'යි වදාළසේක. එකල භික්ෂූන් වහන්සේ ද එපරිද්දෙන් ම මුහුදින් කරදිය උකා ගත්සේක; පාත්‍රයෙන් ගත් කෙණෙහි එම කරදිය පෙරළී ගිතෙල් විය. ඒ දැක ආශ්චර්‍යමත් වූ සිත් ඇති භික්ෂූන්වහන්සේ මහතෙරුන්වහන්සේට ගිතෙල් එළවූසේක. එයින් මදක් වැළඳූ කෙණෙහි මහතෙරුන්වහන්සේගේ බඩරුජාව සන්හිඳිණ. ඉක්බිති භික්ෂූන් වහන්සේ 'ස්වාමිනි, මේ කෙසේ වූ ආශ්චර්‍යයෙක් ද? මෙබඳු පෙළහරක් නුදුටුවිරුම්හ'යි කීසේක; එකල මහතෙරුන්වහන්සේ 'එසේ වී නම් ඇවැත්නි, පින්වතුන්ගේ කුශල විශේෂය බලව'යි වදරා 'මේ මුහුද[5] දිය ගිතෙල් වේව' යි සිතා සමුද්‍රය බැලූසේක. එකෙණෙහි මහතෙරුන් වහන්සේ බැලූ තෙක් මානයෙහි මුහුද කරදිය පෙරළී ගිතෙල් ඇතිලියක් සේ සිටගත. ඒ දැක අතිශයින් ආශ්චර්‍යමත් වූ භික්ෂූන්වහන්සේ 'ස්වාමිනි, මේ කෙසේ වූ කුශල විපාකයෙන් ද'යි විචාළ සේක. එකල මහතෙරුන්වහන්සේ පෙර තමන්වහන්සේ කළ කුශලය ගෙනහැර දක්වනසේක්:-

කාලෙ කස්සප බුද්ධස්ස - උච්ඡුයන්තෙ නියුත්තකො,
ගුළකම්මෙන ජීවාමි - පොසෙන්තො පුත්තදාරකෙ-යි.

යනු හෙයින් 'එම්බා ඇවැත්නි, මම පෙර මෙම කල්පයෙහි බුදු වූ කාශ්‍යප නම් බුදුන් සමයෙහි උක්යන කර්මාන්තයෙහි නියුක්ත ව උක්සකුරු ලා විකොට එම කර්මාන්තයෙන් අඹුදරුවන් රැක ජීවත් වෙමි;[6] එකල්හි ඉතා මිරිකුණා වූ දුර්වල ශරීර

1. වඩා - GHKL
   වඩ වඩවා - F
   වඩ වඩා - බෙ.ස,
2. අභිප්‍රා - පිටපත් හැම
3. ගන්හා - DGH
4. ආසන්නයෙහි - BC
5. මුහුද - GHJ
6. විමි - ස

Non-Commercial Distribution

ඇති ගිලන් භික්ෂු කෙනකුන්වහන්සේ මා දෙරට සිහා වැඩි සේක්[1] ඔබ දක කරුණාවෙන් කම්පිත වූ සිත් ඇති මම දනඵල විශෙෂය අදහා ඔදවැඩි සිතින් එදවස් උන්වහන්සේට සැන්දක් පමණ ගිතෙල් දන් දිනිමි. ඒ කුශල කර්ම බලයෙන් එතැන් පටන් මෙතැන් දක්වා එක් බුධාන්තරයක් මුළුල්ලෙහි උපනුපන් යම් ම ජාතියෙක සමුද්‍ර පර්වතාදි වූ යම් කිසි තැනෙක්හි ගිතෙල් කැමති වීම් නම් ඒ හැම තැන්හි පමණ නැති ව ගිතෙල් උපදනේය: ඉදින් මම සාගර ජලය ගිතෙල් වනු කැමැති වීම් නම් එම ඇසිල්ලෙහි මුහුද්[2] කරදිය පෙරළී ගිතෙල් වෙයි; මේ හැම වැළින් මාගේ අනික් සෘද්ධි මහිමයෙක් නොවෙයි; එකල්හි ඒ ගිලන් භික්ෂූන්වහන්සේට දුන්නාවූ ගිතෙල් සැන්දෙහි විපාක ය`යි වදළසේක. මෙසේ වදරා ඉක්බිති අනික් කුශලවිශෙෂයක්[3] දක්වනු පිණිස ඒ ඒ තන්හි වට සිටියාවූ මහත් මහත් පර්වතයන් බැලූ සේක. එකෙණෙහි ඒ සියලු ම පර්වතයෝ උක්සකුරුමය වූහ. ඒ දක විස්ම[ය][4] පත්වූ භික්ෂූන් වහන්සේ `ස්වාමිනි, මේ කවර කුශල විපාකයෙක් ද`යි විචාළසේක. එවේලෙහි මහතෙරුන් වහන්සේ ඒ කුශලය ගෙනහැර දක්වන සේක්:-

දිස්වා කස්සප බුද්ධස්ස - කාලෙ එකං ගිලානකං,
භික්ඛුං භික්ඛාය සම්පත්තං - පත්තං ආදායහං තද.

යනු හෙයින් `එම්බා ඇවැත්නි, මම පෙර එම කාශ්‍යප බුදුන් සමයෙහි මා දෙරට සිහා වැඩියාවූ රොගාතුර එක් භික්ෂුකෙනෙකුන්වහන්සේ දක උක්සකුරු පිඩක් ගෙන ඔබගේ පාත්‍රයට පිළිගැන්වීමි, ඒ ගෙන ගොස් වැළඳූ කෙණෙහි ඔබගේ ශරීර ආබාධය සන්හිඳිණ; ඒ කුශලයෙන් ම දෙව්මිනිස් සැපත් විඳිනෙමි යම් යම් තැනෙක්හි උක්සකුරු කැමැති වීම් නම් ඒ ඒ තන්හි එම විට සුලභ වූ උක්සකුරු ලැබෙමි; මහත් වූ ගල්පර්වත වී නමුදු මාගේ සිත හා සමඟ උක්සකුරු වෙයි; ඒ වනාහි මාගේ අනික් උපදෙශයෙකැයි නො සිතව; එකල්හි ඒ ගිලන් නමට එදවස් දුන්නාවූ උක්සකුරු දනයෙහි විපාකය` යි වදරා තව ද අනික් කුශලයක් හඟවන පිණිස වටින් ඇස්සනක්[5] මානයෙහි සැළින් සැළ ගසා සිටිනා සේ රසමසවුලෙන් යුක්ත වූ බත් භාජන දක්වූසේක. ඒ දක භික්ෂූන්වහන්සේ `ස්වාමිනි, මේ කෙසේ වූ කුශල විපාකයෙක්ද` යි විචාළසේක. එකල්හි ඒ කුශලය ද ගෙනහැර දක්වන තෙරුන් වහන්සේ :-

ඣාතෙකං දුනකං දිස්වා - එන්දමානං පුරෙ අහං,
භත්තපිණ්ඩෙන සඞ්ගණ්හිං - තම්පි දනං ඵලාවහං[6] යි.

---

1. සේක - BCDEFGHKL
2. මුහුදු - ADFJ, හැ.ක.කි
3 කුශලවිපාකයක් - GHKL
4. විස්ම - පිටපත් හැම
5. අඩසනක් - ACEFJ, ක.කි.හැ.බෙ.
   එකඩ්ඪපථෙ සමන්තතා - පාලි.
6. ඵලාමහං - ACF. ස.
   ඵලාවහිං - ක.කි.හැ.

Non-Commercial Distribution

යනු හෙයින් 'එම්බා ඇවැත්නි, එම කාශ්‍යප බුදුන් සමයෙහි දවසෙක ඎයින් පීඩිත වූ බල්ලකු දැක ඕහට බත්පිඩකින් සංග්‍රහ කෙළෙමි; ඒ දානයෙහි විපාකයෙන් ඒ ජාතියෙහි පටන් මෙතැන් දක්වා බුධාන්තරයක් මුළුල්ලෙහි අන්නපානාදියෙන් අඩුවක් නොදිටිමි;[1] මා උපනුපන් යම් ම ජාතියෙක සුලභ වූ යහපත් අන්නපානාදිය ලැබෙයි; ඉදින් ආහාරයක් කැමැති වීම් නම් මා බැලූ තෙක්මානයෙහි මෙසේ ම හාක්පස බොහෝ බත්භාජන පහළ වෙයි; මේ හැම ඒ කාශ්‍යප බුදුන් සමයෙහි ඎයින් පීඩා පත්[2] වූ බල්ලාට දුන් බත්පිඩ[3] විපාකය' යි වදාළ සේක; නව ද ඉක්බිති අනික් කුශල මහිමයක් හඟවන පිණිස හිමවත් පර්වතය බැලූසේක. එකෙණෙහි ඒ තුන් දහසක් යොදුන් වට ඇති හිමාලය පර්වතය ඝනරන් විය. ඒ දැක භික්ෂූන් වහන්සේ ඉතා ආශ්චර්යමත් ව 'ස්වාමිනි, මේ කෙසේ වූ කුශලයෙක් ද' යි විචාළසේක. එකල්හි ඒ කුශලය ද ගෙනහැර දක්වන තෙරුන් වහන්සේ:-

තමපි මෙ කුසලං සම්මා - සුණාථ සාධු සාධවො,
ඉණට්ඨකස්ස පොයස්ස - අද[සෙ ක]ං[4] කහාපණං.

යනාදීන් 'එම්බා ඇවැත්නි, යට කී කාශ්‍යප බුදුන් සමයෙහි ණයගැති ව මා සමීපයට ආවාවූ දුක්පත් මිනිසකු දැක කහවණුවක් දිනිමි; ඒ කුශලයෙන් ඒ ජාතියෙහි පටන් මෙතැන් දක්වා උපනුපන් ජාති ජාතියෙහි බොහෝ භවභොග සම්පත් ලැබෙමි;[5] අපමණ වූ රන්රිදී මුතුමැණික් පබළු වෛදූර්ය[6] මසාරගල්ල සඞ්ඛ ශිලා ප්‍රවාල රජත ස්වර්ණාදි වූ ධනසම්පත් ලැබෙමි; ඉදින් ධන සම්පත් කැමැත්තෙම් වීම් නම් එකෙණෙහි මා සිත හා සමඟ මෙපරිද්දෙන් ම මහත් ගල්පර්වත පවා[7] ඝනරන් පර්වත වෙයි; එම්බා මේ සියල්ල ම එදවස් ඒ ණයගැති පුරුෂයා ණයින් ගළවන්ට දුන්නාවූ කහවණුයෙහි විපාක ය' යි වදාළසේක. නව ද ඉක්බිති අනික් කුශලයක් හඟවන පිණිස ඉදිරියෙහි මහත් වූ වනලැහැබක් බැලූසේක. එම ඇසිල්ලෙහි ඒ මහත් වනලැහැබ කප්රුක්[8] පහළවූ කලක් පරිද්දෙන් නීලපීතාදි වූ නානාවර්ණ වූ විචිත්‍ර වස්ත්‍රජාතින් ගැවසී සිටගත. ඒ දැක භික්ෂූන්වහන්සේ ඉතා විස්මයට පත් ව[9] 'ස්වාමිනි, මේ කෙසේ වූ කුශල මහිමයෙක් ද' යි විචාළසේක. එකල ඒ කුශලධර්මය[10] ද ප්‍රකාශකොට දක්වන තෙරුන්වහන්සේ:-

දිස්වා කස්සපබුද්ධස්ස - සාසනෙකං බහුස්සුතං,
දෙසෙන්තං මුනිනො ධම්මං - සුත්වා පීණිතමානසො

යනාදීන් 'එම්බා ඇවැත්නි, දවසෙක එම කාශ්‍යප බුදුන්ගේ ශාසනයෙහි බහුශ්‍රැත වූ එක් භික්ෂුකෙනකුන්වහන්සේගෙන් දවසෙක බණ අසා පහන්සිත් ඇත්තාවූ මම ධර්මයට වස්ත්‍රයක් පිදීමි; ඒ කුශලකර්මයෙන් එතැන් පටන් මෙවක්[11]

1. නුදුටිමි - CGH
2. පීඩිත - DFGH
   විඩාපත් - BC
3. බත් පිඩෙහි - BC, ස.
4. අද එකං - පිටපත් හැම
   අදසෙකං - මුද්‍රිත හැම, පාලි.
5. ලබමි - C,සි.ස.
   ලැබෙයි - GH
6. වෛදූර්ය - BEFHJ
7. වී නමුත් - KL
8. කප්රුකක් - BGHKL
9. විස්මපත්ව - ABCDEGHJKL
10. කුශලකම්මය -BCEFGH
11. මෙතැන් - CGHK

Non-Commercial Distribution

දක්වා දිව්‍ය මනුෂ්‍ය ලොක දෙක්හි ච්‍යුතිප්‍රතිසන්ධි වශයෙන් ඇවිදිනාවූ මම උතුම් උතුම් වූ බොහෝ වස්ත්‍රජාතීන් ලැබෙමි; ඉදින් කැමැති වීම් නම් තුන්දහසක් යොදුන් වට ඇති හිමවත් පර්වතරාජයා වී නමුදු මෙසේ නානාවර්ණ වස්ත්‍රයෙන් ඇසිල්ලක වසාපියමි; තව ද සිතිම් නම් පූර්වවිදෙහය අපරගොයානය උතුරුකුරු දිවයිනය ජම්බුද්වීපය යන සතරමහාද්වීපයෙහි වසන සත්වයන්ට ඔවුන් කැමැති කැමැති වස්ත්‍රයන් දීලමි; මේ මාගේ අනික් උපදෙශයෙකැයි නොසිතව; කාශ්‍යප බුදුන් සමයෙහි බණ අසා එදවස් ධර්මයට පිදූවාවූ වස්ත්‍ර දනයෙහි විපාකය ් යි වදළසේක. මෙසේ තමන්වහන්සේ පූර්වජාතියෙහි කළාවූ කුශලය හා ලද්ද වූ සම්පත්ති විශෙෂය ගාථා සූවිස්සකින් ගෙනහැර දක්වා මත්තෙහිදු සත්වයන් කුශලකරණයෙහි උත්සාහ වඩවන තෙරුන් වහන්සේ:-

කුසලං නාවමන්තබ්බං - ඛුද්දකන්ති කදච්පි,
අනන්තඵලදං හොති - නිබ්බාණ...ි දදති තං.

යනාදීන් ්එම්බා සත්වයෙනි, කුශලය නම් ස්වල්පය යි නොසිතව; පින්කම කුඩා වුවත් දයකයන්ගේ චිත්තශුද්ධියෙන් හා පිළිගන්නවුන්ගේ ක්ෂෙත්‍රශුද්ධියෙන් අනන්ත වූ විපාක දෙයි; ඒ කුශලය ම කෙළවර නිර්වාණ සම්පත්තිය ද සිධකොට දෙන්නේය ්යි වදළසේක. එකල තෙරුන් වහන්සේගේ මේ ධර්මදෙශනාව අසා එතැන්හි පැමිණියාවූ භික්ෂූන් වහන්සේ ද මහජනයෝ ද තම තමන් ශක්ති පමණින් පිළිවන් පින්[1] කොට බොහෝ දෙන දෙව්ලොව උපන්හ. එසේ හෙයින් පින්වත් සත්වයෙනි, ස්වල්ප වූ කුශලය පවා චිත්තප්‍රසාද බලයෙන් මෙසේ මහත් වූ විපාක දෙන්නේය යි දන[2] කුශලය නම් කුඩා යයි නොසිතා අප්‍රමාද ව තම තමා ශක්ති පමණින් කුශල් කටයුත්තේ මය.

අප බුදුන් දවස මහසුප් මහතෙරුන් වහන්සේට විලඳ පමණක් දන් දී දෙවුලොව උපන් ලාජ නම් දෙවුදුවගේ විමාන වස්තුව හා එසේ ම පෙර ස්වල්පමාත්‍ර වූ විලඳ දනයක් දී බොහෝ දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳි පද්මාවතී දේවින්ගේ කථාවස්තුව මෙතැන්හි දෘෂ්ටාන්ත වශයෙන් සිහි කොට කුසල් කළ මැනවි. කියන ලදුයේ මැයි:-

මනො පසාදෙන ්පි අප්පපුඤ්ඤං
එවං මහන්තං භවතීති ඤත්වා,
මා අප්පපුඤ්ඤන්ති පමජ්ජථමෙහා[3]
සරාථ දෙවිං ඉධ ලාජදයිං.

මෙතෙකින් මේ මහාමණ්ඩාතු වග

සතරවන සඞ්ඛ්‍යා වස්තුව

කියා නිමවන ලදී.

---

1. කුසල් - GHJ
2. දනමය - KL
3. පමජ්ජනවෙහා - CEFGH

Non-Commercial Distribution

තව ද මේ මහාමණ්ඩාතු වග පස් වන පද්මාවතී වස්තුව නම් කවර යත්?

යට ගිය දවස මේ කල්පයට ලක්‍ෂයක් වන කප බුදු වූ පදුමුත්තර නම් බුදුන් සමයෙහි පද්මාවතී නම් වූ රාජ මහේසිකාවෝ[1] හංසවතී නුවර සියලු සම්පත්තීන් සමෘද්ධ වූ සිටුකුලයෙක ඉපද වැඩිවිය පැමිණ මහජනයන් හා සමඟ බණ අසනු සඳහා දවසෙක විහාරයට ගියාහු බුදුන්[2] එක් මෙහෙණින්නක සෘද්ධිමත් භික්‍ෂුණීන් කෙරෙහි අගතන්[3] තබන්නා දැක සපිරිවර බුදුන්ට සත් දවසක් මුළුල්ලෙහි මහ දන් දී තුමූ ද ඒ තනතුරු පතා ජීවිතාන්තය දක්වා බොහෝ කුසල් කොට ච්‍යුති ප්‍රතිසන්ධි වශයෙන් දිව්‍යමනුෂ්‍යසම්පත් විඳ ඇවිදිනාහු මෙම කප බුදු වූ කාශ්‍යප බුදුන් සමයෙහි බරණැස් නුවර කිකී නම් රජහට දූ ව ඉපද විසිදහසක් අවුරුදු බඹසරවස් රැක භික්‍ෂු සඞ්ඝයාට විහාරයක් කරවා දී එකල්හිදු බොහෝ පින්[4] කොට දෙව්ලොව ඉපද දිව්‍ය සම්පත් විඳ නැවත එයින් අවුත් අරිට්ඨපුර නුවර තිරීටවච්ඡ නම් සිටාණන්ට දූව ඉපද උම්මදන්ති ය යන නමින් ප්‍රසිද්ධ ව අභිපාරක[5] නම් සෙනෙවිරදුන්ට ප්‍රියභාර්‍ය්‍යා ව මනුෂ්‍ය සම්පත් විඳ එයින් මිය අපරාපර්‍ය්‍යවේද්‍ය වූ කිසි අකුශල කර්මයෙකින් බරණැස් නුවර ධන සිටාණන්ට දසී ව උපන්හ. එකල ඒ සිටාණෝ බොහෝ ඇල්කෙත් වපුරවා ගොයම් පීද[6] පැසෙන අවස්ථාවෙහි ඒ තමන්ගේ දසි කුමාරිකාවන් කැඳවා කෙත ගොයම් රක්නට යවූහ. එකල ඒ කුමාරිකාවෝ කෙතට ගොස් කුරුලු කොබෝ ආදි වූ සතාසතුන් බැණ ඇල් කෙත අස දඬුපැලෙක උන්නාහු කරල් ගණනක් කඩාගෙන ගිනි දල්වා පත්සියයක් විලඳ බැඳ තබා විලට ගොස් මුව ශුද්ධකොට නෙළුම් මලක් දැක කඩාගෙන නැවත අවුත් දඬුපැලට නැඟී ගී කිය කියා උන්හ. එසේ හෙයින් කියන ලදි:-

එකස්මිං සමයෙ පුබ්බෙ - රම්මෙ බාරාණසී පුරෙ,
බ්‍රහ්මදත්තවහයො නාම - රාජා රජ්ජං කරිස්සති.

යසුස්සුපුස්සො මහාභොගො - සෙට්ඨී ආසි තහිං තදා,
ඛෙත්තකම්මෙ නියුත්තො සො - බහුං ඛෙත්තං වපාපයි.

දිනෙකස්මිං සකං දසිං - ඛෙත්තරක්ඛාය පෙසයි,
නිසින්නා ඛෙත්තකුටියං - සා දසී ඛෙත්ත සන්තිකෙ.

සාලිසීසං ගහෙත්වාන - ලාජං කත්වාන ඛාදිතුං
තතො'කස්මිං සරං ගන්ත්වා - ධොවිතුං මුඛමත්තනො.

මහන්තං පදුමං දිස්වා - උද්ධරිත්වා සදණ්ඩකං,
තමාදය පුනාගම්ම - ගායමානා නිසීදි සා - යි.

එකල ගන්ධමාදන පර්වතයෙහි වසන එක් පසේ බුදුකෙනකුන්වහන්සේ නිරොධසමාපත්තීන් නැඟී 'අද කවරක්හට අනුග්‍රහ කෙරෙම් දෝ හෝ' යි ලොව බලනසේක් ඒ කුමාරිකාවන් සැදැහැ[7] ඇති බව ද දන් දෙන්නට පොහොසත් බව ද එදවස් තමන් වහන්සේට දුන් දනින් උන් මතු ලබන විපාක විශෙෂය ද යන සියල්ල ම දිවසින් දැක සුපිළියන් ව ගැටවටු ගන්වා පාත්‍රය අතින් ගෙන අහසින්

1. මහිෂිකාවෝ - B බෙ.
2. බුදුහු - බෙ.ස.
3. අගතනතුරු - CF
4. පින්කම් - KL
5. අභිපාර - J
6. පීදී - මුද්‍රිත හැම, ස.
7. සැදෑ -බෙ.ස.

Non-Commercial Distribution

අවුත් බැස ඒ කුමාරිකාවන්ට පෙනෙන සේ එක් තෙනෙක වැඩ සිටිසේක. එකල්හි ඒ කුමාරිකාවෝ පසේබුදුන් දක පහන් සිත් ඇති ව ඒ තමන් බැඳ තිබූ විලඳ හා සමඟ නෙළුම්මල හැර ගෙන පැලින් බැස පසේබුදුන් කරා එළඹ පාත්‍රයෙහි විලඳ බහා පිළිගන්වා නෙළුම්මලින් පාමුව වසා පසඟ පිහිටුවා වැඳ 'ස්වාමීනි, මේ දුන් විලඳ දනයෙහි අනුසසින් මේ පොළෝතෙලෙහි රූපත් වූ සියලු ස්ත්‍රීන්ට වඩා මනහර රූ ඇති වෙම්වයි, මාගේ ශරීරය රන්වන් පැහැ ඇතිවේවයි, හැම කල්හි මාගේ ශරීරයෙන් සඳුන් සුවඳ වහනය වේවයි, මුඛයෙන් මහනෙල්මල් සුවඳ හමා බසීවයි, මේ නෙළුම්මල දුන් කුශලයෙන් මා එබූ එබූ පත්ලෙහි මනහර පියුම් නැඟේවයි, පෘථිවීශ්වර වූ රජක්හට අගබිසෝ වෙම්වයි, ඒ රජු හා සමඟ ප්‍රියසංවාසයෙන් වසන්නාවූ මම මේ දුන් විලඳ ගණනායෙන් ම ප්‍රඥාසම්පන්න වූ රූ පින් ඇති පන්සියයක් පුතුන් ලැබෙම්වයි, ඒ සියලු පුත්‍රයෝ ම නුඹවහන්සේ විසින් පසක් කරනලද නිවන් දහම් පසක් කටහෙත්වයි[1] මම ද මෙසේ මෙකී පරිද්දෙන් සසර සිටිනා තෙක් මහත් වූ ශ්‍රී සම්පත් විඳ මෙම කුශලය හේතුකොටගෙන කෙළවර අතිශාන්ත වූ නිවන්පුර පැමිණෙම්. ව'යි යනාදීන් ප්‍රාර්ථනා කළහ. එසේ හෙයින් කියන ලදි:

හන්තෙ ඉමස්ස දනස්ස - නිස්සන්දෙන ඉතො චුතා,
රූපවන්තීන මිත්ථීනං සබ්බාසං අවනීතලෙ.

අග්ගා හුත්වාන ජායෙය්‍යං - අහං සෙට්ඨා මනොරමා,
සුවණ්ණවණ්ණො මෙ කායො - හොතු භන්තෙ අනාගතෙ.

කායෙන[2] චන්දන ගන්ධංච - මුඛෙනුප්පල ගන්ධකං,
සද වායතු මෙ වීර - උප්පන්නුප්පන්න ජාතියං.

අක්කන්තක්කන්ත පාදෙසු - සුපුප්ඵා පදුමානි ච,
උට්ඨහන්තු මහාපඤ්ඤ - පුප්ඵදනඵලෙන මෙ.

භූමිස්සරො නරින්දෙව - පතී හොතු පියො මම,
තෙන සද්ධිං වසන්තීහං - කරොන්තී පිය සඞ්ගමං.

ලභෙය්‍යං[3] පඤ්ඤවා සෙට්ඨෙ - පුත්තෙ පඤ්චසතෙ'පි ච,
තුම්හෙහි යො ගුණො ලද්ධො - සබ්බෙ තෙපි ලභන්තු තං.

එවං වුත්තවිධානෙන - වින්දිත්වා මහතිං සිරිං,
පාපුණිස්සාමි නිබ්බාණං - ඵලෙනෙතෙ[න]හම්පි ච[4]-යි.

ඉක්බිති පසේබුදුන් වහන්සේ ද 'ඒ තොප සිතූ පැතූ සියල්ල එපරිද්දෙන් ම සිධ වේව' යි අනුමෙවුනි බණ වදරා නික්මුණු සේක. එකල ඒ කුමාරිකාවෝ මඳක් බලා සිට සිතන්නාහු 'පසේ බුදුන්ට මේ මලින් ප්‍රයෝජන කිම් ද. මම් ම හැරගෙන පැළඳගන්මි'යි සිතා පසුපස්සෙහි ගොස් පාත්‍රය මත්තෙහි තුබූ නෙළුම්මල හැරගෙන

1. කෙරෙත්වයි - GHFL
2. කායෙ - CDEFGHJKL ම.
   කාය - කි.ක.
3. ලභෙය්‍යං - GHKL
   ලභෙය්‍ය - කි.
4. ඵලෙනෙතෙවහම්පිච - පිටපත් හැම, ක.කි.ඤ.

Non-Commercial Distribution

එකෙණෙහි නැවත සිතන්නාහු ‘ඉදින් මේ මලින් ප්‍රයෝජන නැත්නම් පසේබුදුන් වහන්සේ පාත්‍රය මත්තෙහි ආදිම තිබිය නොදෙන සේක. එකාන්තයෙන් ම මේ මලින් ප්‍රයෝජනයක් ඇත් මය’යි සිතා නැවත ගොස් පාත්‍රය මත්තෙහි නෙළුම්මල තබා පසේබුදුන් ක්‍ෂමා කරවා ගියහ. ඉක්බිති පසේබුදුන් එතැන් පියවා මඳක් තැන් වැඩි කල්හි පන්සියයක් පමණ ගොපලුදරුවෝ වඩනා පසේබුදුන් දැක සමීපයට එළඹ ‘කිමෙක් ද ස්වාමීනි, අහර ලත්සේක් ද’යි විචාළහ. පසේබුදුන් වහන්සේ ‘එසේය දරුවෙනි, තෙල ඇල්කෙත රක්නා කුමාරිකාවෝ විලඳ දනයක් දුන්හ’ යි වදාළසේක. එතෙපුල් අසා ඔහු ‘ස්වාමීනි, ඒ කුමාරිකාවෝ මේ විලඳ දන් දී කෙසේ වූ ප්‍රාර්ථනාවක් කළෝදැ’යි විචාරා මෙසේ මෙසේ පැතුහයි කුමාරිකාවන් කළාවූ ප්‍රාර්ථනාව වෙන වෙන[1] වදාළ කල්හි ඔහු ද එක්සිත් ව අලුත් දී හා කැටි මී පිළිගන්වා පසේ බුදුන් වැඳ ‘ස්වාමීනි, මේ දනයෙහි අනුසසින් මතු ඒ .කුමාරිකාවන් කුස පිළිසිඳ අනුක්‍රමයෙන් වැඩී සත් හැවිරිදි වයසට[2] නුඹ වහන්සේ සේම පසේබුදු වමෝව’ යි ප්‍රාර්ථනා කළහ. එකල පසේබුදුන් වහන්සේ ඔවුන්ට අනුමෙවුනි බණ වදරා දෙපක්‍ෂය බල බලා සිටියදී ම ගරුඩරාජයකු සේ අහසට පැනනැඟී ඇසිල්ලකින් ගන්ධමාදන පර්වතයට වැඩ නෙළුම්මල ගෙන ගොස් නන්දමූල පබ්භාරයෙහි පසේබුදුවරුන්වහන්සේ ඇක්මෙන මස්වැල් පහණ සමීපයෙහි පාපිස්නි කොට තබා සෙසු පසේබුදුවරුන් හා සමඟ මී දී හා විලඳ වැළඳූසේක. කුමාරිකාවෝ කල්යාමකින් මිය එම දනයෙහි අනුසසින් දෙවුලොව උපන්හ. ඔවුන් උපන් දවස් පටන් එබු එබු පත්ලෙහි මහපියුම් නැඟෙයි; සෙසු නොයෙක් ආශ්චර්‍ය්‍ය ද පහළ විය.[3] එකල ඒ දෙවුලොව සියලු දෙවඟනන් අභිභවනය කෙරෙමින් රූපශ්‍රීන් දිලිහි දිලිහී දිවනළුවන් පිරිවරා මනහර දෙවුවිමන්හි බැස බොහෝ කලක් දිවසැපත් වළඳ එයින් මිය හිමවත[4] පර්වතප්‍රාන්තයෙක පස්පියුමෙන් සැදි මහ විලෙක්හි පියුම්ගැබෙක උපන්හ. ඒ විල සිසාරා පලු පල්ලව කුසුමයෙන් සශ්‍රීක වූ සපු දුනුකේ නා පනා කෙබොලිල[5] පළොල් ඇසල කොළොම් සළල මුහුළු අඹ දෙඹ කිණ බක්මී ආදි වූ වෘක්ෂජාතියෙන් හා ඔවුනොවුන් පරයා රැව් පිළිරැව් දිදී ගසින් ගසට දිවන ගිරා මොනර කොවුලු කොස්ලිහිණි හංස චක්‍රවාකාදි වූ පක්‍ෂිසමූහයන්ගෙන් ශොභමාන වීය. ඒ විල්හි පඤ්චප්‍රකාර පද්මොත්පලයෙහි සුගන්ධගන්ධයෙන්[6] රැස්වූ නානාප්‍රකාර භෘඞ්ගජාතීන්ගේ ඣඞ්කාර නාදයෙන් හා හංස චක්‍රවාකාදී වූ ජලචරපක්‍ෂීන්ගේ මධුරනාදයෙන් එකනින්නාද වීය. විල්තෙර ලියමඬුලු ආදියෙහි නැවත වන දෙවඟනන් හා දිව්‍යපුත්‍රයන්ගේ නෘත්‍යගීත වාද්‍යයෙන් මනහර ය. එකල අප මහ බෝසතාණෝ බමුණු මහසල් කුලයෙක ඉපද කාමයෙහි ආදීනව දැක ගිහිගෙන් නික්ම තාපසප්‍රව්‍රජ්‍යායෙන් පැවිදි ව ධ්‍යාන උපදවා ඒ විල නිසා පර්වත සමීපයෙහි පන්සලෙක වසන්නාහු දවසෙක උදයන්හි මුව ශුධකරනු සඳහා විලට ගොස් ඒ

1. වෙන වෙන ම - BCDEFGHKL
2. වයස - BDEGHKL
   වයසට පැමිණි කල්හි - C
3. පහළ විය - ABCGHJ, ක.කි.ඤ.ම.
   පහළ වෙයි - DEF බෙ.
4. හිමවත් - EF ස.කි.ඤ.
   නැවත - GHKL
5. කොබලීල -. BCEFH කි.ඤ.
6. සුගන්ධයෙන් - බෙ.ස.

Non-Commercial Distribution

නෙළුම්මල දක සිතනුවෝ 'මේ නෙළුම්මල සෙසු මලට වඩ ඉතා මහත; සෙසු මල් දවසින් දවස පිපී පරවෙයි, මේ නෙළුම් මල කැකුළු වම තිබෙයි, මීට කාරණ කිම් දේ හෝ'යි සිතා විලට බැස එමල් කැකුළ අතින් ගත්හ; එකෙණෙහි බෝසතුන් දක සතුටු ව සෙන්නාක්[1] මෙන් නෙළුම්මල පිපී වැනී ගිය; මහ බෝසතාණෝ රන්පිළිමයක් සේ පියුම්ගබ හොත් කුමාරිකාවන් දක දරුපෙම් උපදවා පියුම හා සමඟ පන්සලට ගෙනවුත් කුරුහැඳෙක හොවාලූහ; එකල ඒ කුමාරිකාවන්ගේ කුශලානුභාවයෙන් උන් අත මහපට ඇඟිල්ලෙන් කිරි පිහිරී නික්ම මුඛගත ව සිරුරු සපා සිටගත; මහබෝසතාණෝ ඒ මල මලානික වූ කල අනික් මලක් ගෙනවුත් කුමාරිකාවන් එහි ඇර හොවති; මෙම ක්‍රමයෙන් ඒ කුමාරිකාවන් වැඩී කෙළ ඇවිදිනා අවස්ථාවෙහි ඔවුන් එබු එබූ පත්ලට මහපියුම් නැඟෙන්ට වන: ශරීර වර්ණය දවසින් දවස වැඩි වැඩී ඔප් නැඟූ රන්රුවක් සේ ඉතා මනොඥ විය. මෙසේ කුමාරිකාවන් ක්‍රමයෙන් වැඩී සොළොස් හැවිරිදි වයසට පැමිණි කල්හි ඔවුන්ගේ කුශල තෙජසින් ශක්‍රයන්ගේ පාණ්ඩුකම්බල ශෛලාසනය හුණු විය. එකල ශක්‍රයෝ කිමෙක් දෝ හොයි මිනිස්ලොව බලන්නාහු ඒ කාරණය දැක[2] එකෙණෙහි මහබෝසතුන් කරා අවුත් පසඟ පිහිටුවා වැඳ එකත්පස් ව උන්හ: එකල්හි බොධිසත්වයෝ ශක්‍රයන් හා පිළිසඳර කථා කොට ඉක්බිති ඒ තමන්ගේ දියණියන් ශක්‍රයන්ට දක්වා 'එම්බා ශක්‍රයෙනි, මේ කුමාරිකාවෝ පියුම්ගබකින්[3] උපන්හ: එසේ හෙයින් මොවුන්ට සුදුසු නමක් තබව'යි කීහ. එකල ශක්‍රයෝ ඒ කුමාරිකාවන්ට පද්මාවතී යයි නම් තබා ඔවුන් සුවසේ විසුවමැනවැයි සිතා නොයෙක් රත්නයෙන් විසිතුරු වූ රන්මිණි තොරණින් හොබනා සත්රුවන් මහපායක් මවා[4] දී උපද්‍රව දුරුකොට රකවල්[5] ලවා දෙවුලොව ගියහ: එහි වසන කුමාරිකාවෝ නඳුනුයන්හි වසන දෙවඟනක සේ කිසි දෙම්නසක් නැති ව දිව්‍යමය අන්නපානයෙන් සන්තුෂ්ට ව දවසෙක ගී කිය කියා උන්හ.

එකල බරණැස වසන වැද්දෙක් ඒ වල[6] ඇවිදිනේ කුමාරිකාවන්ගේ කුරවීකනාදයක් හා සමාන ඒ ගීතිකා ශබ්දය අසා පරීක්ෂා කෙරෙමින් අවුත් රන්පාය සමීප විය. එකෙණෙහි කුමාරිකාවෝ රන්විමනින් පිටත් ව ආකාශයෙහි පහළ රන්විදුලියක් සේ බබළමින් ඔහු ඉදිරියෙහි සිටගත[7]. එසේ හෙයින් කියන ලදී.

බාරාණසීපුරෙ රම්මෙ - වසන්තෙකො වනෙ චරො,
මිගානමග්ගමෙසන්තො - වනං තං සමුපාගතො.

කුරවීකසමං සද්දං - අස්සා සුත්වාන ගීතිකං,
කමෙන උපධාරෙන්තො - ගතො පාසාද සන්තිකං.

නික්ඛමිත්වාන පාසාද - සාපි ආගම්ම තං ඛණෙ,
පුරතො තස්ස අට්ඨාසි - නභෙ විජ්ජු ව භාසුරා-යි.

---

1. සිනාසෙන්නාක් - C
2. දැන - JK ක.කි.ඝ.
3. පියුම් ගැබකින් - HK
   පියුම් ගබෙහි - G
   පියුම් ගැබෙහි - B
4. කරවා - D
5. ඊකවල් - BCH ක.කි.ඝ.
6. වල්හි - C
   වල් - AF .ක.කි.ඝ.
7. සිටියහ - KL

Non-Commercial Distribution

මෙසේ ඉදිරියෙහි සිටි කුමාරිකාවන් දැක එකෙණෙහි වැදි මදක් ඉවත් ව පන්සල දැක සිතනුයේ 'මිනිස්ලොව ස්ත්‍රීන්ගේ මෙවැනි ගායනාවක් හා රූප සම්පතෙක් ඇත්තේ නොවෙයි: එබැවින් මෝතොමෝ මේ පන්සල වසන තාපසයන්ට උපස්ථාන පිණිස දෙව්ලොවින් ආවාවූ දෙවඟනක්[1] දෝ හො'යි සිතා විමසනු කැමැති ව මහ බෝසතුන්[2] එන පෙරමඟ බල බලා හුන්නේය. එකල්හි මහ බෝසතාණෝ වලින් ඵලාඵල හැරගෙන අවුත් වන්හ. කුමාරිකාවෝ බෝසතුන් දැක මාළිගාවෙන් බැස පෙරමඟට ගොස් අතතුඹු ඵලාඵල කඳ හැරගෙන තැන්පත්කොට තබා බෝසතුන් සැතපී උන් කල්හි තමන් කළමනා වත් සපයා එකත්පස් ව සිටියාහ. එකල වැදිපුත්‍රයා මේ කුමාරිකාවෝ තාපසයන්ගේ දියණි කෙනෙක් මය යි දැන පන්සලට වැද බෝසතුන් වැඳ එකත්පස් ව හුන්නේය: එවේලෙහි බෝධිසත්වයෝ වැද්දහු ඵලාඵල කවා පැන්පොවා ඉක්බිති විචාරන්නාහු 'කිමෙක්ද පින්වත, මෙ තැන්හි ම රඳයි ද[3] නොහොත් යනු කැමැත්තෙහි දැ'යි විචාළහ. එකල වැදිපුත්‍රයා[4] 'ස්වාමීනි, මෙතැන්හි රඳ කුමක් කෙරෙම් ද? මනුෂ්‍යපථයට යෙමි'යි බෝසතුන් වැඳ අවසර ගෙන පිටත් ව මගදිග අතුසන් දක්ව දක්වා දෙපස රුක් සලකුණු සලකමින් ගොස් බරණැස් නුවර වැද[5] රජ්ජුරුවන් දැක 'තෝ කවරෙක්හි දැ'යි විචාළ කල්හි 'ස්වාමීනි, මම වැද්දෙකිමි, වෙනෙහි ඇවිදිනෙමි හිමවත එක් පර්වතයක් සමීපයෙහි පන්සලෙක[6] වසන තාපස කෙනකුන්ගේ ඉතා ආශ්චර්‍යවීමත් වූ රූපශ්‍රීන් බබළන මනහර දුවක දිටිමි, ඕතොමෝ දෙවඟනක මෙන් විසිතුරු රන් විමනෙක වෙසෙයි, උන් හැර එවැනි රූ ඇති අන් ස්ත්‍රීරත්නයක් මේ පොළෝ තෙලෙහි නොදිටිමි, එසේ හෙයින් ඒ බව නුඹවහන්සේට දන්වනු පිණිස ආමි'යි කී ය. එතෙපුල් අසා විස්ම[ය] පත්වූ[7] රජ්ජුරුවෝ තමන්ගේ අන්තඃපුරයෙහි නොයෙක් වස්ත්‍රාලඞ්කාරයෙන් සැරහුණාවූ සොළොස් දහසක් පමණ බිසෝවරුන් ඕහට දක්වා 'එම්බල සගය, ඒ තා දුටු කුමාරිකාවෝ මෙයින් කවුරුන් වැනියෝ දැ'යි විචාළහ: එකල වැදි සිනාසී 'මහරජ, කුමක් කියනසේක් ද? නුඹ වහන්සේ මට නොකිපුණ මැනව: උපමාවක් කියමි: ඒ කුමාරිකාවන්[8] දුටු මා ඇසට මොහු රත්රුවක් ළඟ සිටුවූ දඹු රූපෙළක් වැනියහ:[9] රිවිමඬල හමුයෙහි කණාමැදිරියන් වැනියහ: දෙවඟනක ළඟ සිටුවූ[10] මැහැලි වැදිරිමුළක්[11] වැනියහ: මේ සියලු ස්ත්‍රීන්ගේ රූපය ඒ කුමාරිකාවන්ගේ ඇඟින් කෙසඟක් පමණකුත් නොඅගනේය: එසේ හෙයින් දෙවයන් වහන්ස, ඒ කුමාරිකාවන්ගේ සියලු රූපසම්පත්තිය වෙන වෙන කියා නිමවිය නොහැක්ක: එසේ ද වුවත් ඔවුන්ගේ රූපයෙන් එකදෙශමාත්‍රයක් කියමි: ඉඳුරා ඇසුව මැනව.

මහරජ, ඒ කුමාරිකාවෝ රතැඹුලපෙති දෙකක් මෙන් ඉතා රත් වූ පතුල් දෙකක් ඇතියහ:[12] ඔප් නැඟූ කනක රූපයක් සේ බබළන රන්වන් ශරීර ඇතියහ:

---

1. දිව්‍යාඞ්ගනාවක් - බෙ.ස.
2. බෝසතාණන් - A, මුද්‍රිත හැම, ස.
   බෝසතාණෝ - CFJ
   බෝසතුන්ගේ - GHL
3. රඳවුද - GHKL
4. ඒ වැදිපුත්‍රයා - GH
5. නුවරට වැද - BCGHKL
   නුවරට බැස - ක.කි.ඤ.
6. පන්සලක - ABGH ක.කි.
7. විස්මපත් වූ - පිටපත් හැම
8. කුමාරිකා - G
9. වැනියාහ - AGI ක.කි.ඤ.
10. සිටි - BDEGH
    සිටවූ - C
11. හැලිවැදුරුමුළක් - KL
12. ඇතියාහ - BG

Non-Commercial Distribution

රන් මොනරකර දෙකක් මෙන් යහපත් වූ කෙණ්ඩා සහලක් ඇතියහ: වට මටසිලුටු වූ කලවා සහළක් ඇතියහ:[1] ඉතා පළල් වූ උකුලුපෙදෙස් ඇතියහ: සිහින් වූ කටිපෙදෙස් ඇතියහ: ඉතා රත් වූ අතුල්තල ඇතියහ: පුන්සඳ මඬලක් වැනි මුහුණක් ඇතියහ; තිලපුෂ්පාකාර වූ උස් නාසිකාවක් ඇතියහ: ලියනහලා[2] පෙති සේ ලීලොපෙත ව වට වූ ඇඟිලි පෙළක් ඇතියහ: රන්හංස[3] පැටවුන් වැනි මනහර තන සහළක් ඇතියහ: ඉතා මොළොක් වූ බාහුයුග්මයක් ඇතියහ: උඩුබලා සිටිනා තඹවන් නිය පතර ඇතියහ: අඳුන්වන් වූ සිහිඳු තුනු රෝමයන් ඇතියහ: නිලුපුල්පෙති පරයන දිගුපුළුල් වූ නිල් නුවන් ඇතියහ: කොඳ කැකුළු සේ සුදු සිහිඳු වූ දන්ත පංක්තීන් ඇතියහ: රනෝවිලි දෙකක් වැනි කන්වැල් සහළක්[4] ඇතියහ: උතුරු මුහුදු[5] දියසළාවක් සේ ගැඹුරු වූ නාභිමණ්ඩලයක් ඇතියහ; රන්පෝරුවක් සේ පළල් වූ පිටක් ඇතියහ: කෙම්වැල[6] දෙකක් සේ රත් වූ තොල් සහළක් ඇතියහ: බඹරවැල[7] දෙකක් සේ නිල් වූ බැම සහළක් ඇතියහ: රන්කළස කරක් සේ වට වූ ග්‍රීවයක් ඇතියහ: අක්බඹුරු දික් මොළොක් වූ නිල් කෙස්වැටියක් ඇතියහ: බොහෝ කොට කීමෙන් ප්‍රයෝජන කිම් ද? ඒ කුමාරිකාවෝ තමන්ගේ ශරීරයෙහි රන්වන් පැහැයෙන් දශදිග් හොබවා හිරමඬල[8] සේ බබළති´යි කීය. එසේ හෙයින් කියන ලදී :-

සුරත්තපාද සුතනු සුජඞ්ඝා - සුවට්ට ඌරු සුවිසාල සොනා,
තනුදරා චාරුථනාභිරාමා - චන්දනනා සා වර තුඞ්ගනාසා.

වට්ටංගුලී චාරු කරාභිරාමා - බාහා මුදූ තම්බනඛා සුලොමා,
සුනීලනෙත්තාවරකුන්දදන්තා - සුවණ්ණදොලාභවකණ්ණචූලි.

ගම්භීර නාභි සුවිසාල පිට්ඨී - රත්තාධරා නීලභමු සුගීවා,
නීලා මුදූ දීඝ සිරෝරුහා සා - සුවණ්ණවණ්ණෙන විරාජිතාසි-යි.

මෙසේ ද කියා ඉක්බිති ´මහරජ, එවැනි රූපත් කුමාරිකාවන්ගේ සිරුරුපහස් නොලබන නුඹවහන්සේට ජීවිතයෙන් හා රාජ්‍යසම්පත්තියෙන්[9] ප්‍රයෝජන කිම් දැ´යි කීහ. එතෙපුල් අසා ඔදවැඩි තුටු පහටු සිත් ඇති රජ්ජුරුවෝ එදවස් ම කුමාරිකාවන් දක්නා කැමැති ව ගමනට සැරහෙන සේ සේනාවට විධාන කරන්නාහු ´එම්බා, මාගේ[10] ධනුශ්ශිල්පයෙහි දක්‍ෂ වූ සටනෙහි පසු නොබස්නා ශුර වීර සවභාව ඇති නානා ජාතියෙහි ධනුර්ධරයෝ විසිතුරු සන්නාහ බහා සැරහී දුනු හී සන්නද්ධ ව මා හා සමඟ වහා නික්මෙත්ව යි. තව ද මහත් ඇත්බඳ වී නමුදු ගසා පළවන්නට සමත් වූ කඩුසරඹයේ දක්‍ෂ මාගේ මහා යොධසේනාව නාගභටයන් සේ මණිකවචයෙන් සැරහී කඩුපළඟ අත ලා ලෙලවමින් වහා නික්මෙත්ව යි. තව ද සතුරන් දැක අඩි පසු නොලා එඩිතර ව ඉදිරියට දිව අවිපහර දෙන්නට සමත් වූ මාගේ මහබල සේනාව අසුරභටයන් සේ සැරහී තියුණු මුවහත් ඇති නා නා

1. ඇතියාහ - BG
2. නියහලා - BDGH
3. හස් - ක.සෑ.ම.
4. කන් සහළක් - කි.
5. මුහුද - EGH
6. කෙම්එල - GK
   කෙම්වැල් - ADH
7. බඹරවැල් - BD
8. හිරුමඬල - ACDFGHKL; හිරිමඬල - බෙ.ස.
9. සම්පත්තීන් - FJ ක.කි.සෑ.ම.
   සම්පතින් - E
10. මාගේ මහබල සේනාව - බෙ.

Non-Commercial Distribution

ප්‍රකාර ආයුධගෙන දශ දිග මුණ පැපැ[1] දෙපස වහා නික්මෙත්වයි, තව ද මාගේ අන්තඃපුරවාසීහු ද රජකුමරුවෝ ද වෛශ්‍ය ශුද්‍රාදීහු ද බ්‍රාහ්මණයෝ ද යන හැමදෙන ම තමන් තමන්ට[2] අනුරූප වූ වස්ත්‍රාලංකාරයෙන් සැරහී මා සමීපයෙහි දෙපස පුරා නික්මෙත්වයි, තව ද මෙයින් අන්‍ය වූ මාගේ ඇත්සේනාවය අස්සේනාවය, රථසේනාවය පාබළසේනාවය යන චතුරංගිනී සේනාව වෙන වෙන සැරහී ඉදිරි ව නික්මෙත්ව යි. තව ද සක් සින්නම් ආදිය ගත්තාවූ මාගේ තූර්‍ය්‍යසේනාව දිව්‍යගාන්ධර්වයන් සේ නානාලංකාරයෙන් සැරහී යුගන්ධුරු සමීපයෙහි සාගර නාදයක් මෙන් පසඟතුරු ඝොෂා කෙරෙමින් ඉදිරියෙහි නික්මෙත්ව යි යනාදීන් මෙසේ සේනාවට විධාන කළහ. කියනලද මැයි:

චිත්‍රවම්මධරා සූරා - ධනුසිප්පෙහි කොවිදා
ඛිප්පමායන්තු සන්නද්ධා - නානා ජච්චා ධනුග්ගහා.

ඛග්ගහත්ථා මහායොධා - නාගක්ඛන්ධාතිපාතිනො,
නාගභටාච සන්නද්ධා - ඛිප්පමායන්තු මෙ සහ.

සත්තිගාහා මහායොධා - තික්ඛග්ගාතිප්පහාරිනො,
අසුරා විය සන්නද්ධා - ඛිප්පමායන්තු මෙ සහ.

ඔරොධා ච කුමාරා ච - වෙසියානා ච[3] බ්‍රාහ්මණා,
විභූසිතඞ්ග පච්චඞ්ගා - ඛිප්පමායන්තු මෙ සහ.[4]

හත්ථී අස්සා රථා පත්ති - සෙනා ච චතුරංගිනි,
අක්ඛොභිණී අනන්තා ච - ගච්ඡන්තු පුරතො මම.

පඤ්චංගිකානි තුරියානි - සඞ්ඛ කාහළ ගාහකා.
වදෙන්තු පුරතො මය්හං - සාගරොව යුගන්ධරෙ-යි.

මෙසේ සේනාවට විධානකොට එකෙණෙහි රැස්වූ මහසෙනඟ පිරිවරා වැද්දවූ ඉදිරි කොට මහත් වූ රාජානුභාවයෙන් දිලිහි දිලිහී නුවරින් නික්ම අනුක්‍රමයෙන් දුරුකතර ගෙවා හිමවතට වන්හ. එකල මහ බෝසතාණෝ එපවත් දැන තමන්ගේ සෘද්ධ්‍යනුභාවයෙන් ඒ තුන්දහසක් යොදුන් වට ඇති හිමාලය[5] වනයෙහි ගිරිදුර්ග ආදිය නොපෙනෙන සේ වළගොඩ තනා දෙවියන්ගේ නඳුනුයන සේ සරහා පත්සල් පස [තුදුරු][6] රුකක් මුල උන්හ. එපවත් දැන ශක්‍රයෝ ද දිව්‍යසෙනඟ පිරිවරා දෘශ්‍යමාන රූපයෙන් ඇසිල්ලක දිව අවුත් තමන්ගේ ආනුභාවයෙන් ඒ ඒ තන්හි නානාවර්ණ ධජපතාක නංවා රන් රිදී මිණි මුතු තොරණ ආදියෙන් ද දිවමල් දිව සුවඳ දීප ධූප ආදියෙන් ද රන්ඇගෑ රිදීඇගෑ ආදියෙන් ද ඒ ආශ්‍රමපදය දිව්‍යපුරයක් සේ අලඞ්කාර කොට සරහා තුබූහ. හිමවෙනෙහි වසන සමහර දෙවතාවෝ පඤ්චාංගික

1. පපා - C
පැ - GH
2. තම තමන්ට - CDEHKL
තමන්ට - B
තමා තමන්ට -G
3. වෙස්සා සුද්ද ච - H, බෙ. ම.
4. මේ ගාථාව ස.හි නැත.
5. හිමාල - ABCEFGHJKL
6. පසත - CDEFGKL, ස.
පසතුරු - ABJ
අස - H
තුදුරු - මුද්‍රිත හැම

Non-Commercial Distribution

තූර්‍යභාණ්ඩගෙන වාද්‍යයට පටන්ගත්හ: සමහර දේවතාවෝ දිව්‍යමය වූ දීපධූපාදීන් පූජාදියට පටන්ගත්හ.[1] සමහර දෙවතාවෝ අත්පොළසන් දිදී පිළී හිස සිසාරමින් අනෙක ප්‍රකාර නෘත්‍යගීතාදියට[2] පටන්ගත්හ. මෙසේ ඒ කුමාරිකාවන් පෙර නොයෙක් ජාතියෙහි කළ කුශලබලයෙන් සියලු දේවතාවන් උත්සවයට පටන්ගත් කල්හි ඒ ආශ්චර්‍ය දැක විස්ම[ය] පත් වූ රජ්ජුරුවෝ බෝසතුන් වසන පන්සල සමීපයෙහි පර්වතප්‍රාන්තයට අවුත් මහසෙනඟ රඳවා මඟුල්කඩුව අතින් ගෙන වැද්දහු හා සමඟ පුරුෂයන් කීපදෙනකු කැඳවාගෙන පන්සලට ගොස් මහබෝසතුන් වැඳ එකත්පස් ව උන්හ. ඉක්බිති මහබෝසතාණෝ රජ්ජුරුවන් හා සමඟ පිළිසඳර කථා කෙරෙමින් දැන දැන ම විචාරන්නාහු 'එම්බා මහාපුරුෂය, තෙපි කිනම්හු ද? තොපගේ මවුපියෝ කවුරු ද? කුමක් නිසා මේ මහ වලට අවු දැ'යි විචාළහ: එතෙපුල් අසා රජ්ජුරුවෝ 'ස්වාමීනි, බරණැස් නුවර[3] බ්‍රහ්මදත්ත රජ නම් මම ය: මාගේ පියාණෝ ද බ්‍රහ්මදත්ත නම් වෙති, දැන් මම නුඹවහන්සේගේ දියණි කෙනකුන් ඇත යනු අසා උන් නිසා ආමි'[4]යි කීහ. එකල්හි මහබෝසතාණෝ මතු අපවාද නිවාරණය පිණිසඃ-

> සබ්බා නදී වඞ්කගතා - සබ්බෙ කට්ඨමයා වනා,
> සබ්බිත්ථියො කරෙ පාපං - ලභමානා නිවාතකෙ.

යනාදීන් ගැහැණුන්ගේ නුගුණ වෙන වෙන දක්වාලා 'මහරජ, ස්ත්‍රීහු නම් ඉතා ලාමක සත්ව කෙනෙක: එබැවින් සිහිපත්[5] ඇති ව වසව'යි රජ්ජුරුවන්ට අවවාද කොට ඉක්බිති 'මහරජ, මනුෂ්‍යයන්ගේ සිත නම් මඳකින් ම කැළඹෙයි: එසේ හෙයින් මා දියෙණියෝ බොහෝදෙනා මධ්‍යයෙහි කෙසේ වෙසෙද් දැ'යි කීහ. එතෙපුල් අසා රජ්ජුරුවෝ 'ස්වාමීනි, මාගේ සෙසු බිසෝවරුන්ට වඩා මුන් ම නායක තනතුරෙහි තබා රකිමි'යි කීහ. එකල්හි මහබෝසතාණෝ පද්මාවතීන් කැඳවා කියන්නාහු 'එම්බා පුත පද්මාවතීනි, තෙපි දැන් වැඩී යෞවනයට[6] පැමිණියව: මෙතැන් පටන් මේ වෙනෙහි තනි ව විසිය නොහැක්ක: තෙල බරණැස් රජ්ජුරුවෝ ද තොප නිසා ම මෙතෙක් දුරුකතර ගෙවා අවුත් සිටියහ: එසේ හෙයින් තෙල රජ්ජුරුවන් හා කැටි ව යව'යි කීහ. එතෙපුල් අසා කුමාරිකාවෝ යහපතැයි ගිවිස බෝසතුන් වැඳ හඬ හඬා සිටියහ. ඒ දැක රජ්ජුරුවෝ ඔවුන් සිත් ගන්නා සඳහා එතැන්හි ම කහවණු රැසක් පිට සිටුවා අභිෂෙක මඟුල් කොට සරහනලද රථවාහනයකට නංවා මහ පෙරහරින් කැඳවාගෙන නික්මුණාහ. එකෙණෙහි නානාලංකාරයෙන් සැරහී රන් චාමර රිදී චාමර ආදී වූ නොයෙක් මඟුල් පෙරහර ගත්තාවූ මහාජනයෝ දෙපස පුරා නික්මුණාහ. එසේ ම රන්කරඬු රිදීකරඬු ආදිය ගත්තාවූ දෙවහනන් බඳු උත්තම

---

1. සමහර.........පටන්ගත්හ (නැත). ක.සි.කා.බෙ.
2. නෘත්‍යගීතයට - ABDEFGHK
3. බරණැස - CE
4. අයිමි - CDEFJ ස.
   ආයෙමි - GHK
5. සිහිපස් - BDEGH
   සිහිපහස් - AJ
6. යෞවන වයසට - EH

Non-Commercial Distribution

ස්ත්‍රීහු ඔවුනොවුන් පරයා නික්මුණාහ. තව ද මහල්වෙස් ගත්තා වූ නොයෙක් සිය ගණන් ජනයෝ දළපුඩු මුදුන සැදි සේසත් මුදුන් දිදී කිරිමුහුද රළපෙළ දිවන්නා සේ දෙපස පුරා නික්මුණාහ. එසේ ම නොයෙක් වස්ත්‍රාලංකාරයෙන් සැරහී මිණි දඬුවැට පහන් ගත්තාවූ නොයෙක් සියගණන් ස්ත්‍රීහු ඉදිරි ව නික්මුණාහ. සමහර ඇමැතියෝ ඉදිරියෙහි දිව මහදිග කණුමුල් උදුරුවා වළ ගොඩ සම කරවා සුදුවැලි අතුරුවා මග දෙපස ඒ ඒ තන්හි සුවඳදිය පිරූ පුණ්සට තනවමින් නික්මුණාහ. එසේ හෙයින් කියන ලදි:-

සජ්ඣු හෙමාදි නෙකානි - චාරු චාමර ගාහකා,
නික්ඛමිංසු උභො පස්සෙ - නරා නෙකවිධා බහූ.

සුවණ්ණාදි සුමුගගානි - ධාරයන්තා වරඞ්ගනා,
නික්ඛමිංසු උභො පස්සෙ - දෙවකඤ්ඤූපමා සුභා.[1]

තස්සා සෙතානි[2] ඡත්තානි - ධාරයන්තා සිරොපරි,
නික්ඛමිංසු උභො පස්සෙ - නරා නෙක සතා තද.

මණි දණ්ඩ පදීපානි - ධාරයන්තා වරඞ්ගනා,
ගමිංසු පුරතො තස්සා - දස්සෙන්තා පුඤ්ඤසම්පදං.

ගන්ධොදක සුපුණ්ණානි - ඝටා නෙක සතා තද,
මග්ගස්ස උභතො පස්සෙ - ඨපිතා හොන්ති භූමියා-යි.

මෙසේ මහ සෙනඟ පිරිවරා නොයෙක් උත්සවයෙන් පද්මාවතීන් කැඳවාගෙන සරහනලද මහට පිළිපන් රජ්ජුරුවෝ දුරුකතර ගෙවා අවුත් නුවර වහසල්[3] සමීප වූහ. එකල නුවර වාසීහු ඒ ඒ තන්හි ධජපතාක නංවා මහවේ දෙපස පුන් කලස තබ්බවා රන් රිදී රඹතොරණ ආදියෙන් මුළු නුවර දෙවුපුරයක් සේ සරහා පෙරමහට දිවූහ. රජ්ජුරුවෝ සුජාතා නම් අසුර කන්‍යාව හා සමඟ දිවසෙනඟ පිරිවරා නඳුන්වන උයන් කෙළ දිව්‍යපුරයට වදනා ශක්‍රදෙවේන්‍ද්‍රයා සේ මහ සෙනඟ පිරිවරා පද්මාවතීන් හා සමඟ බරණැස් නුවරට වන්හ. එකල පද්මාවතී තමන්ගේ කුශල මහිමය බොහෝ දෙනාට දක්වනු පිණිස රථයෙන් බැසපිහ. ඔවුන් පය බිම තබන් ම එබූ එබූ පත්ලෙහි පියුම් නැඟෙන්නට වන. මුඛයෙන් නික්මුණු මහනෙල්මල් සුවඳ හා ශරීරයෙන් නික්මුණු චන්‍දනගන්ධය සියලු බරණැස් නුවර පැතිර සිටගත. මහජනයෝ ඒ ආශ්චර්‍ය්‍ය දැක කුල්මත් වූවාහු කුසල් නම් කළමනා දෙයෙක් මය යි එකපැහැර සාධුකාර දුන්හ. එකල ඒ කුමාරිකාවෝ තමන්ගේ කුශල මහිමය නුවරවාසීන්ට දක්ව දක්වා මහජනයා පිරිවරා පියුම් පිටින් ගොස් දෙවුවිමනකට වදනා දෙවඟනක සේ මාළිගාවට වන්හ.[4]

---

1. සභා - J ක.සි.සං.
2. සෙසානි - ADE මුද්‍රිත හැම
   සෙතානි - C
3. වහසල් දොර - H
4. වන්නාහ - GHL

Non-Commercial Distribution

රජ්ජුරුවෝ එම විට ඔවුන් සොළොස් දහසක් බිසෝවරුන්ට නායක කොට අගබිසෝ තන්හි තබා එතැන් පටන් සෙසු බිසෝවරුන් මුහුණ පමණකුත් නොබලා පද්මාවතීන් කෙරෙහි ම පෙම් බැඳ වෙසෙති. එසේ හෙයින් ඒ බිසෝවරු එක් ව පද්මාවතීන් කෙරෙහි රජු බිඳුවනු කැමැති ව දවසෙක රජු කරා එළඹ 'මහරජ, පද්මාවතී මනුෂ්‍ය ස්ත්‍රියක් නොවෙයි: මිනිසුන් එබු එබු පත්ලට කවර කලෙක පියුම් නැහෙන්නා දුටුසේක් ද? මෙර්[1] ඒකාන්තයෙන් යකින්නක් මය: එසේ හෙයින් අප හැමත් නොනසා නුඹවහන්සේත් නොනැසී වහා ම නුවරින් පිටත ලව'යි කිහ. රජ්ජුරුවෝ එබසට කිසිවකුත් නොකියා පද්මාවතීන් කෙරෙහි ම සිත් අලවා වෙසෙති. මෙසේ ඔවුන් ප්‍රියසංවාසයෙන් වසන කල්හි යට කී පන්සියයක් පමණ ගොපලු දරුවෝ ඔවුන් කුස පිළිසිඳ ගත්හ: එකෙණෙහි දවසට ලක්‍ෂයක් ධන වියදම් කොට දන් දෙන සේ පද්මාවතීන්ට දෙළෙක් උපන: එපවත් අසා රජ්ජුරුවෝ අන්‍ධ බධිරාදි වූ සියලු යාචකයන්ට එපරිද්දෙන් ම මහදන් පැවැත්වූහ: මෙසේ රජ්ජුරුවෝ[2] පද්මාවතීන් කෙරෙහි ම ඇලුම් ඇති ව වසන හෙයින් සෙසු බිසෝවරු එකාවන් ව 'මේ දැරිය කවර දවසෙක පිටිදකුමෝ[3] දෙ හෝ, මැගෙන් කවර වරදක් දක්වා රජහු බිඳුවාපියමෝ දෙ හෝ'යි සිත සිතා ඇවිදිති. එකල්හි රජ්ජුරුවන්ගේ පසල් දනවුවෙක් සතුරන්ගෙන් කුපිත විය. එපවත් අසා රජ්ජුරුවෝ සටනට යන්නාහු පද්මාවතීන් වදන පියවිලි[4] බඩ හෙයින් සෙසු බිසෝවරුන් කැඳවා උන්ගේ පවිටු අදහස් නොදැන පද්මාවතීන් ඔවුන්ට පාවා දී සේනා වාහන සන්නද්ධ ව සටනට ගියහ. ඉක්බිති පද්මාවතීන් බඩ දස එකඩමස් පිරී දවසෙක රාත්‍රියෙහි විලි පහරනට පටන්ගත. එපවත් අසා ඒ බිසෝවරු එක් ව දුක්පත් ගැහැණියක් කැඳවා වෙන වෙන අත්ලස් දී කියන්නාහු 'එම්බා මැණියෙනි, පද්මාවතී වැදූ කෙණෙහි ඒ දරුවන් සහවා අපට දී දඬුකඩෙක ලේ ගා තබව'යි මැහැල්ලට උගන්වා මිණිනාඹු[5] කමට සලස්වා තුමූ හැම යහන පිරිවරා සිටියහ.[6] එකෙණෙහි පද්මාවතී ඩබරාවකින් ගත් පැනිත්තක් හළුවා සේ කිසි වැසනයක්[7] නැති ව සුව සේ වදපීහ. එකල මවුකුසින් උපන්නාහු මහාපදුම කුමාරයෝ මය: සෙසු සාරසිය නවානුවක් පමණ රජකුමරුවෝ එම වැදැමස රුධිරයෙහි සංසෙදජ ව උපන්හ. පළමු අත්ලස් ගත් මැහැලි ඒ කුමරුවන් පන්සියය සහවා පන්සියයක් බිසෝවරුන්ට දී දඬුකඩෙක ලෙහෙ[8] ගා තබා පද්මාවතීන්ට පෑ 'මැණියෙනි, මේ තොප වැදුයේ කිමෙක් දැ'යි කීහ. වැදූවන් ඉදිරියෙහි කොළොඹු ලූව'යි යන කරුණ නම් මේ යයි සිතමි. පද්මාවතී ඒ කාරණය නොදැන පුවරුකඩ දැක 'පෙර මම කවර අකුශලයක් කෙළෙම් දැ' යි බලවත් දෙම්නසට පැමිණියහ.

---

1. මෙ - ABCDEFJ, ක.කි.සැ.බෙ.
2. රජ්ජුරුවන් : ස.
3. පිටදකුමෝ - EGH
4. පියලි - BGHJKL ක.කි.සැ.ම.
5. විත්නඹු - B
6. සිටගත්හ - GHKL
7. ව්‍යසනයක් - C
8. ලෙ - CE

Non-Commercial Distribution

එකෙණෙහි දරුසෙර[1] බිසෝ පන්සියය තමන් තමන් ගත් කුමරුවන් උතුරුසළුපටින් වසා ගෙන ගොස් කරඬුවල ලා තුබූහ. එකල ඒ කුමරුවන්ගේ කුශලානුභාවයෙන් මවුන් අත ඇඟිල්ලෙන් කිරි එරිණ. එවිගස කුමරුවන්ගේ කුශලතෙජසින් ශක්‍රයන්ගේ ආසනය හුණු විය: ශක්‍රයෝ එපවත් දැන අදෘශ්‍යමාන රූපයෙන් අවුත් රජකුමරුවන් දැක ‘මොහු බරණැස් රජු නිසා පද්මාවතීන් කුස පිළිසිඳ[2] උපන් පන්සියයක් රජ කුමරුවෝ ය: පද්මවතීන්ට වෛරී වූ පන්සියයක් බිසෝවරු මොවුන් කරඬුවල ලා තුබූහ: මම ශක්‍රදෙවෙන්‍ද්‍රයෙමි: මේ කාරණය ඉඳුරා රජ්ජුරුවෝ දතිත්ව’යි[3] කරඬුවල අකුරු ලියා තබා ‘මේ අකුරු මොවුන්ගේ පියරජ්ජුරුවන්ට මිස සෙසු කෙනකුන්ට නොපෙනේව’යි අධිෂ්ඨාන කොට දෙවුලොව ගියහ. බරණැස් රජ්ජුරුවෝ ද ගිය කාරිය තීරණය කොට ගෙන නැවත බරණැස් නුවරට අවුත් මාළිගාවට වැද මතුමහල්තෙලෙහි හුන්නාහු[4] පද්මාවතීන් කැඳවා ‘කිමෙක්ද දේවිනි, තොප වැදුයේ දුවක ද නොහොත් පුතකු දැ’යි විචාළහ. එබසට පද්මාවතී මුවෙන් නොබැණ කරබාගෙන සිටියහ. සෙසු බිසෝවරු අවුත් රජ්ජුරුවන් වැඳ පිළිසඳර කථා කොට ඉක්බිති පළමු ලෙහෙ ගල්වා තුබූ පෝරුකඩ[5] ගෙනවුත් රජු ඉදිරියෙහි තබා ‘මහරජ, නුඹවහන්සේගේ ආවෙණික බිසොවුන් වැදූ තෙල පුතණුවන් වඩාගෙන සනහපුව මැනව’ යනාදීන් කෙළි සිනා මුසු බස් කියා රජහු ලජ්ජා කරවා ‘මහරජ, මැගේ තරම් පළමු කොට ම නුඹවහන්සේට කිවමෝ වේ ද: මෝ නොමෝ මනුෂ්‍යස්ත්‍රියක් නො වෙයි: එකාන්තයෙන් ම යකින්නක: වහා ම මේ නුවරින් නික්මවාපියව’යි කීහ. රජ්ජුරුවෝ පුවරුකඩ දැක ලජ්ජා වූවාහු ඒ බිසෝවරුන්ගේ බසින් අතිශයින් දුර්මුඛ ව පද්මාවතීන් පිටත ලැවූහ.

එකෙණෙහි පසේබුදුන්ට එදවස් නෙළුම්මල දී නැවත හැර ගත් අකුශලය නිසා එබූ එබූ පත්ලෙහි නැහෙන පියුම් හැම අතුරුදන්[6] විය. ශරීරවර්ණය ද විවර්ණ විය. එකල පද්මාවතීන් අප්‍රසිද්ධ වෙසින් උදකලා ව වීථි මැද යන්නා දැක වයස්ගත ස්ත්‍රියක් දරුස්නෙහ[7] උපදවා වැදූ දුවක දුටුවා සේ ගෙට කැඳවාගෙන ගොස් හිඳිනා තැන් සලස්වා බත්බුලත් දී උපස්ථාන කළා ය.

එකල්හි ඒ පන්සියයක් බිසෝවරු එක් ව රජ්ජුරුවන්ට කියන්නාහු ‘මහරජ, අපි නුඹවහන්සේ සටනට ගිය දවස් ම ඉදින් අපගේ රජ්ජුරුවන් වහන්සේ සතුරන් ජය ගෙන වහා වැඩි සේක් වී නම් ගඟ දෙවියන්ට බිලියම් කොට දිය කෙළම්හ’යි යාදිනියක් කළම්හ: එසේ හෙයින් ඊට කල් දන මැනවැ’යි කීහ.

එතෙපුල් අසා සතුටු වූ රජ්ජුරුවෝ මහසෙනඟ පිරිවරා ගඟට ගොස් ගඟ සරස උඩ පාත දැල් බඳවා දියකෙළියට පටන්ගත්හ. එකෙණෙහි ඒ පන්සියයක් බිසෝවරු හිස වසා පෙරව පන්සියයක් කරඬු උතුරු සළුවල සඟවාගෙන ගඟට

1. දරුසොර - BCGH
2. පිළිසිඳ (නැත) - BEGH
3. දතිත්වයි - KL
4. හුන්නාවූ - CH
5. පොහොරුකඩ - KL
6. අන්තර්ධාන - බෙ. ස.
7. දරුසෙනෙහෙ - AFG

Non-Commercial Distribution

ගොස් පෙරව් පිළී හා සමහ ගහට බැස කරඬු පත්සියය දියෙහි හැරපීහ. එකල ඒ කරඬු ගොස් යටිගඟ සරස බැඳි දැලෙහි[1] බැඳිණ. රජ්ජුරුවෝ දිවාභාගයෙහි දියකෙළ සවස ගොඩනැගී සිටියහ. එකල දැල් අකුළන කෙවුළෝ ඒ කරඬු දැක ගෙන ගොස් රජ්ජුරුවන්ට දැක්වූහ. රජ්ජුරුවෝ 'කොල, මේ කිමෙක් දැ'යි විචාරා 'නොදනුම්හ මහරජ'යි කී කල්හි කරඬු හරවා බලන්නාහු පළමු කොට මහා පදුම කුමාරයන් හොත් කරඬුව පිධානය හරවා රාජකුමාරයන් දැක ඒ ලියා තුබූ අකුරු කියවා සෙසු කරඬු ද හරවා රන්පිළිම සේ හොත් පන්සියයක් රජකුමරුවන් දැක සන්තුෂ්ට වූ රජ්ජුරුවෝ ගංතෙර පටන් මහ සරහා නුවර දෙව්පුරයක් සේ අලඩ්කාර කොට මහත් උත්සවයෙන් දරුකුමරුවන් ඇරගෙන සිවුරඟසෙන් පිරිවරා නුවරට ගොස් රජගෙට වැද මතුමහලට නැඟී මහා මඩ්ගලික නම් වූ සුශික්ෂිත[3] අමාත්‍යයකු කැඳවා 'මේ රජකුමරුවන් රජපෙරහරින් වඩව'යි මෙහෙවර කියා පද්මාවතීන් සඳහන් කොට ඇමැතියන් මුහුණ බලා 'එම්බා සගයෙනි, මම අනුන් බස් ගිවිස මෙබඳු දරුසිරි ඇති පද්මාවතීන් නොසලකා හැරපීම්: දැන් උන් බලා වහා කැඳවා ගෙන එව'යි කීහ. රජහුගෙන් නියෝග ලත් අමාත්‍යයෝ පද්මාවතීන් කොතැන්හි වසන බවත් නො දැන එම විට රජ්ජුරුවන්ගේ මඟුලැතු සරහා ඔහු පිට දහසින් බැඳි[4] පියල්ලක් තබා 'පද්මාවතීන් දුටු කෙනෙක් අපට කියා මේ දහසින් බැඳි[4] පියල්ල හැරගන්ව'යි. නුවර බෙර ලැවූහ. පද්මාවතී එපවත් අසා තමන් රැකි මැණියන් කැඳවා 'අම්ම, තෙල දහසින් බැඳි[5] පියල්ල හැර ගන්ව'යි. කීහ. එබසට මැහැලි වහන්සේ 'කුමක් කියා ගනිම් ද? බම්'යි කී කල්හි 'නො බව මැනව' මා [දුවණි][7] පද්මාවතීන් උන් තැන් දනිමියි කියා ගත මැනවැ'යි කීහ. එකල මැහැලි වහන්සේ 'දුටුවක් දකිම්'යි දහසින් බැඳි[8] පියල්ල ගෙන රාජපුරුෂයන් හා සමඟ ගෙට වන්දැය. එකල පද්මාවතීන් දැක හැඳිනගෙන බැසහෙව වැඳ නැඟී සිට එම ඇසිල්ලෙහි ඒ ගෙය උඩ සුදුවියන් බඳවා වට තිර අඳවා පද්මාවතීන් ඉස් සොධා නහවා සළු පෙරළා සළු හඳවා දෙරකඩ රකවල්[9] සලස්වා වහා ගොස් රජ්ජුරුවන්ට කීහ. එපවත් අසා රජ්ජුරුවෝ රන්සිවිගෙයක් යවා පද්මාවතීන් රන්සිවිගෙයට නොනැඟෙන හෙයින් පයින් ම එනු කැමැති වන්හ යි සිතා රජගෙය පටන් පද්මාවතීන් උන් ගෙය දක්වා මේ දෙයතුරෙහි වීථිය දෙපස කීල හිඳුවා රන් රිදී තරු පෙළින් විසිතුරු වූ සුදුවියන් බඳවා උතුම් වූ මහඅවන්[10] පියවිලි අතුරුවා මනහර වස්ත්‍රාභරණ හා නොයෙක් මඟුල්පෙරහර යවූහ. එකල පද්මාවතී බිසව් සුවඳ පැනින් ඉස්සොධා නහා සියලු වස්ත්‍රාලඩ්කාරයෙන් සැරහී දෙවඟනක් සේ රජගෙය බලා නික්මුණාහ. එබු එබු පත්ලට පියවිලි පළා නැගි මහ පියුම් මඩිමින් බරණැස් නුවර[11] වාසීන්ට තමන්ගේ කුශල සම්පත් දක්ව දක්වා මහ පෙරහරින් ගොස් රජගෙට වැද ඒ අතුළ පියවිලි සියල්ල ම තමන් රැකි මැණියන්ට දී මතුමහල්තලයට නැඟී රජ්ජුරුවන් දුටහ. රජ්ජුරුවෝ පද්මාවතීන් දැක ප්‍රේම ධරාගත නොහී දැතින් වැළඳ සිඹ සනහා

1. දැලෙයි - BGHL
2. එහි - BCEGHKL
3. ශික්ෂිත - KL
4. බඳ - CDFGKL, ස.
   බඳ - AHJ
5. බඳ - CDFGKL; බඳ AHJK
6. හැරගන්නැයි - J, කි.සැ.ක.
   ඇරගණ්වයි - GH
7. දුවණියෙෝ - පිටපත් හැම
   දුවණියන් - ම
   දියෙණියන් - බෙ. ස.
8. බඳ - CEKL
   බඳ AFGHJ
9. රැකවල් - BCH ක.කි.සැ.ම.
10. මඟ අවන් - H
11. පුර - J ක.කි.සැ.ම.

සමානාසන ව උන්හ. පන්සියයක් රජකුමරුවෝ ද එවිගස දිව අවුත් මැණියන් පිරිවරාගත්හ. එකෙණෙහි පද්මාවතීන්[1] දෙතනයෙන් කිරි පිහිරි[2] නික්ම රජකුමරුවන් මුඛයට විහිදන්ට[3] වන. එකල පද්මාවතීන් හා පන්සියයක් පමණ රූබර පුත්රුවන් දැක සන්තුෂ්ට වූ රජ්ජුරුවෝ 'මෙවැනි ස්ත්‍රීරත්නයක් හා පුත්‍රසම්පත්තියක් දුරු කොට මට මෙතෙක් අලාභ කළහ'යි ඒ පන්සියයක් බිසෝවරුන්ට කිපී ඔවුන් ගෙන්වාගෙන පද්මාවතීන්ට ප්‍රසාද වහල් කොට දුන්හ. එකල පද්මාවතී ද යහපතැ යි ගිවිස 'එසේ වීනම් මහරජ, මොවුන් හැම දෙනා මට මිඩි මෙහෙයට දුන්බව කියා නුවර බෙර ලැව්ව මැනවැ'යි රජුගේ මෙහෙවරින් බෙර ලවා, එම විට ඔවුන් නිදහස් කොට නැවත මහරජ, මොවුන් හැමදෙනා නිදහස් කළ බව නුවරවාසීන්ට අස්වා යළිදු බෙරලැව්ව මැනවැ'යි කීහ.

එතෙපුල් අසා රජ්ජුරුවෝ බෙර ලවන්නාහු 'පද්මාවතී නමහට[4] ප්‍රසාද වහල් කොට මිඩි මෙහෙයට මා දුන් බිසෝවරුන් පන්සියය නිදහස් කොට පීහ: නුවරවාසිනී, තෙපි හැම ද එපවත් දැන හිඳුව'යි බෙර ලැවූහ. මෙසේ ඒ බිසෝවරුන් පන්සියය නිදහස් කොට එම විට ඔවුන් තමන්ගේ පන්සියක් පුත්කුමරුවන්ට කිරි මා[5] කමට සලස්වා තුමූ මහා පදුම කුමාරයන් වැඩූහ. එකල දෙවු කුමරුවන් සේ වැඩෙන ඒ පන්සියයක් රජකුමරුවෝ අනුක්‍රමයෙන් වැඩී සත්හැවිරිදි වයසට පැමිණ දවසෙක සර්වාලඞ්කාරයෙන් සැරහී රජ්ජුරුවන් හා සමඟ උයන් කෙළියට ගොස් නඳුනුයන් වන් දෙවු කුමරුවන් සේ සරහන ලද උයන්හි නොයෙක් විසිතුරු බලමින් ඒ ඒ තන්හි කෙළ ඇවිද පස් පියුමෙන් සැදි මඟුල් පොකුණ දැක දියකෙළියට බටුවාහු ඒ පොකුණෙහි අභිනව මල්කැකුළු මුහුකරන බව හා මුහුකළ කැකුළු පිපෙන බව හා පරණ පිපි මල් පෙති ගිලිහී හෙන[6] බව දැක 'මෙබඳු අනුපාදින්න රූපයට පවා මෙසේ ජරාව පැමිණෙන කල අපගේ සඋපාදින්න ශරීරයට ජරාව පැමිණෙයි යනු කියනු ම කවරේ දැ[7]'යි එම අරමුණු කොට ගෙන පළමුත් එක් ව කුසල් කළ හෙයින් පන්සියයක් රජ කුමරුවෝ හැමදෙන ම එක විට ම විදර්ශනා වඩා පසේබුදුබවට පැමිණියහ. එසේ හෙයින් කියනලදී:

අථෙකස්මිං දිනෙ රාජා - උය්‍යානං සාධු සජ්ජිතං,
කීළිතුං සහ පුත්තෙහි - සසෙනො සමුපාගමි.

තද පඤ්චසතා තෙපි - කුමාරා සමලඞ්කතා,
චරන්තා තම්හි උය්‍යානෙ - සම්පත්තා පදුමං සරං.

---

1. පද්මාවතීන්ගේ - BCFGHKL
2. පිරි -කි
3. විදින්ට - ABCHKL ස. නික්මෙන්ට -D
4. පද්මාවතීන්ට - ක.කි.සැ.ම.
5. කිරිමවු - BGHKL; ක.කි.සැ.
6. ගිලිහෙන - GH ක.ම.කි.සැ.
7. යනු ම කවරේ දැයි - AFJ
යනු කවරේදැයි - DHK
කියනුම කවරේදැයි - BC

Non-Commercial Distribution

පතමානෙසු පතෙතසු - ඔපුප්පපදුමෙ තහිං,
පසසමානාව තෙ සබෙබ - වඩ්ඪයනතා විපසසනං.

සහෙව කතපුඤඤතතා - පුබෙබ නෙකාසු ජාතිසු,
පචෙචකබොධිඤාණම්පි - සච්ඡාකාසුං[1] සහෙව තෙ-යි.

මෙසේ[2] පිළිම පඞ්ක්තියක් සේ පියුම්කෙමි මත්තෙහි පලක් බැඳ පිළිවෙළින් වැඩහුන්නාවූ පසේබුදුවරුන් දැක තව ද ගිහි වෙස් නොහළ හෙයින් පසේබුදු වූ බව නොදැන සවස රාජපුරුෂයෝ කියන්නාහු "කිමෙක් ද රජකුමරුවන් වහන්ස, ඉතා ම සවස් විය: වහා රජගෙට වැඩිය මැනවැ"යි කීහ. එතෙපුල් අසා පසේ බුදුවරුන්වහන්සේ "එම්බා අපි රජකුමරුවෝ නොවෙමු,[3] පසේබුදුහු" යයි වදළසේක. එකල රාජපුරුෂයෝ "ස්වාමිපුත්‍රයෙනි, තොපි හැම සර්වාභරණයෙන් සැරහී ගෙන ඉඳ කුමක් කියා ද? ප්‍රත්‍යෙක බුඩවරයෝ නම් තොප හැම සේ නොවෙති: ඔවුන් හිස මුඩු ය: දැළිරැවුලු නැත, තුන් සිවුරු පාත්‍ර ධරයෝ ය, උපශාන්ත වූ ඊර්යාපථයන් ඇතියහ, දෙයාසඞ්ඛ්‍යය කප් ලක්ෂයක් පාරමිතා පුරා බුදු වන එබඳු උත්තමයන් හා තොප හැම සමාන කොට නො කියව"යි කීහ. එකල්හි පසේබුදුවරුන් වහන්සේ "එසේ වී නම් බලව යි මහ මේකුළු පෙළක් පහරනා රන් විදුලිය පෙළක් සේ තමන් වහන්සේගේ දකුණත් ඔසවා ඉස් පිරිමැදිසේක: එකෙණෙහි හිසකේ දැහැගුල්[4] පමණ විය: ගිහිවෙස් අතුරුධන් විය: ශරීරයෙහි පාසිවුරු මැවිණ. ඉක්බිති ඒ හැම දෙනා වහන්සේ පියුම් ගබින් පැනනැඟී අෂ්ටපරිෂ්කාරධර ව සැට වයස් පිරුණු මහතෙරපඞ්කතියක් සේ සන්හුන් පියොවින් පොකුණු තෙර වැඩසිටිසේක.

එකල ඒ ආශ්චර්‍ය්‍යය දුටු රජ්ජුරුවෝ සතුටුකඳුලෙන් දෙනුවන් තෙමා දිව අවුත් දෙහොත මුදුනෙහි තබා වැඳ වැතිර ගියහ: සෙසු රාජසේනාව ද මහපවනින් මුලිනුපුළ සල්වනයක් සේ එක හෙළා වැඳ වැතිර ගියහ. එපවත් අසා පද්මාවතී බිසව් ද ඇසිල්ලෙක අවුත් හිරුරැස් පතළ රන්පියුම් වනයක් සේ ශොභාමත් ව පසේබුදු ව සිටියා වූ පන්සියයක් පුත් කුමරුවන් දැක පෙම් ධරා ගත නොහී සතුටු තෙපුල් කිය කියා වැඳ වැතිර ගියහ. මෙසේ මහජනයන් වැඳ පෙරළී නැඟීසිට දෙහොත් මුදුනෙහි තබ තබා සතුටු සතුටු ව සාධුකාර දීදී පිරිවරා සිටි කල්හි ඒ පසේබුදුවරුන් වහන්සේ රජ්ජුරුවන් ආදි වූ මහපිරිසට බණ වදරා සියල්ලවුන් බල බලා සිටියදී ම අහසට පැනනැඟී රාජහංස පෙලක් සේ ගන්ධමාදන පර්වතයට වැඩිසේක. බරණැස් රජ්ජුරුවෝ ද වඩනා පසේ බුදුවරුන් වහන්සේ දැක දරු ශොකයෙන් වැලප සිවුරහසෙන් පිරිවරා පද්මාවතීන් හා සමඟ ශක්‍රදෙවේන්‍ද්‍ර ලීලායෙන් ගොස් බරණැස් නුවරට වන්හ.

---

1. සච්ඡිකාසුං - F
2. මෙසේ පසේබුදුවරුන් - පිටපත් හැම
3. නොවෙයි - පිටපත් හැම
4. දැඟුල් - CFGHKL

Non-Commercial Distribution

එකල මෙසේ පූර්වයෙහි[1] කළ ප්‍රාර්ථනා වූ පරිද්දෙන් සිධ වූ මනොරථ ඇති ඒ පද්මාවතී නම් රාජමහේසිකාවෝ කල් යාමකින් එයින් මිය දෙවන ජාතියෙහි ඒ තමන්ගේ පුත් වූ පන්සියයක් පසේබුදුවරුන්වහන්සේට ආශ්‍රයභූතමත් වූ දනක් දී ඉක්බිති නිලිපුල්මල් කලප් අටක් ගෙනවුත් පසේබුදුවරුන් පාමුල්හි පුද 'මෙහි අනුසසින් මතු උපනුපන් ජාති[2] මාගේ ශරීරවර්ණය නිලිපුල් ගබක් සේ නිල්පැහැ වේව'යි ප්‍රාර්ථනා කොට එයින් ගොස් දෙව්ලොව ඉපද දිව්‍යසම්පත් වළඳ අප බුදුන් සමයෙහි සැවැත් නුවර සිටු කුලයෙක ඉපද නිලුපුල් මල් දමක් සේ නිල්රස් විහිදුනා වූ රූබර නිල්ශරීර ඇති ව යෞවන අවස්ථාවෙහි ම සසුන් වැද මහණ ව නොබෝ දවසකින් රහත් ව ඍද්ධිමත් මෙහෙණින්නන් කෙරෙහි අග්‍ර වූ තනතුරු ලැබ උපුල්වන් මහාස්ථවිරී යයි ප්‍රසිධ වූහ.

මෙසේ ඒ පද්මාවතී නම් රාජමහෙසිකාවෝ[3] පූර්වජාතියෙහි කරනලද එපමණ ස්වල්ප වූ පින්කමකින් පවා රන්කඳක් මෙන් බබළන සිත්කලු වූ රන්වන් ශරීරයක් ලැබ සියලු ජනයන් විසින් දැකුම් කටයුතු විශිෂ්ට වූ රූපසම්පත්තියෙන් යුක්ත ව මහත් වූ යශො තෙජස් ඇති පින්වත් රජුන්ට අගබිසෝ තනතුරට පැමිණ අපමණ රජ්ඉසුරු විඳ එබඳු පසේබුදු වන මහ පින් ඇති රූබර පුතුන් පන්සියයක් එකවිට ම ලදහ. එසේ හෙයින් පින්වත් සත්වයෙනි, සියලු සම්පතට මුල්කාරණ ව සිටිනා දන ශීලාදි වූ දශවිධ කුශල ධර්මයෙහි අප්‍රමාද ව තම තමා ශක්ති පමණින් පිළිවන් කුසල්කොට මතු ඒ පද්මාවතීන් පරිද්දෙන් ම දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා නිවන් සම්පත් සිධ කරන්ට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි:-

ඉති පදුමවතී සා කිඤ්චි කාතූන පුඤ්ඤං
කනකරුචිරකායා දස්සනීයාභිරූපා,
අවනිපති මහෙසී සී[4]සතං පඤ්ච පුත්තෙ
ලභි වරහි භවන්තා මාලසා හොථ පුඤ්ඤෙ-යි.

මෙතෙකින් මේ මහාමන්ධාතු වග
පස් වන පද්මාවතී වස්තුව
කියා නිමවන ලදී.

මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි
මහාමන්ධාතු වර්ග නම් වූ
පස් වන පරිච්ඡෙදය නිමි.

---

1. පූර්වජාතියෙහි - B
2. ජාතියෙහි - BEGH ස.
3. කුමාරිකාවෝ - C
   මහිෂිකාවෝ - AD; ස.
4. සා - K

Non-Commercial Distribution

තව ද මේ සද්ධර්මාලංකාරයෙහි නන්දිරාජ වග පළමු වන නන්දිරාජ වස්තුව නම් කවර යත්?

අප මහා ගෞතම බුදුන් බුදු වූ මේ මහා භද්‍රකල්පයට ලක්‍ෂයක් වන කපින් මත්තෙහි සම්‍යක් සම්බෝධි සමධිගමය පිණිස පාරමිධර්මයන් මුහුකුරුවා සසර සැරිසරා ඇවිදිමින් පූර්වජාතියෙහි කරනලද්දවූ කිසි කුශලානුභාවයකින් තමන් වහන්සේගේ ප්‍රතිසන්ධි ග්‍රහණයෙහි පටන් ඒ ඒ මඞ්ගල්‍ය දිනයෙහි වටින් සතිස්ලක්‍ෂ දශදහස් තුන්සිය පනස් යොදුන් පමණ වට ඇති මේ චක්‍රවාට කුහරය ඇතුළත්හි[1] එක පැහැර පියුම් වැසි වස්වා පවත්වන ලද මහත් වූ ලොකොත්සව ඇති හෙයින් පියුමතුරා නම් වූ ලොවුතුරා බුදුකෙනකුන්වහන්සේ ලොකයෙහි පහළ ව දෙවිමිනිසුන් සහිත සියල් ලොවැසියන් තමන්වහන්සේගේ සද්ධර්ම නමැති සාර්ථවාහනයට[2] නංවාගෙන මේ ප්‍රතිභය සහිත වූ සංසාර නමැති කාන්තාර මාර්ගයෙන් එතර කොට අමාමහ නිවන් නමැති නිර්භය[3] පුරයෙහි ගෙනහැර පිහිටුවමින් අජර වූ අමර වූ අතෘප්තිකර වූ අමෘත මහා නිර්වාණ සම්පත්තීන් සත්වයන් සන්තුෂ්ට[4] කරවා නිරන්තරයෙන් මෙසේ ලෝවැඩ වඩා වැඩවසන සේක. එකල හංසවතී නම් නුවර නොයෙක් කෙළ ගණන් වස්තු ඇති වේදෙහ නම් වූ එක් කෙළෙඹි පුත්‍රයෙක් දවසෙක බුදුන්ගෙන් බණ අසා පහන් සිත් ඇති ව බුදුන් ප්‍රධාන කොට ඇති මහ සඟපිරිසට ආරාධනා කොට මහදන් සරහා තමා හිඳිනා ගෙය බිම සුවඳ පිරිබඩගෙන ලද පස් මල් ඉස උඩ සුදුවියන් බැඳ මලෝලඹු එල්වා දිව්‍යවිමානයක් මෙන් අලඞ්කෘත කොට බුදුන් වැඩහිඳිනා ලෙස මාහැඟි වූ බුද්ධාසනයක් පනවා මහසඞ්ඝයා වහන්සේට වෙන වෙන සුදුසු ලෙස පිළිවෙළින් හිඳිනා අසුන් පනවා වේලා දැන විහාරයට ගොස් මහත් වූ ගෞරවයෙන් බුදුන් වැඳ ආදර දක්වා 'ස්වාමීනි, භාග්‍යවත් වූ බුදුරජාණන්වහන්ස[5], ගැත්තවුට කරුණා කොට දැන් මේ භොජනශාලාවට වඩනා[6] වේලා ය, වැඩ වදළ මැනවැ'යි ආරාධනා කෙළේය.

ඉක්බිති කරුණාගුණාකර වූ බුදුරජාණන් වහන්සේ බොහෝ මහණ ගණයා විසින්[7] පිරිවරන ලදු ව මහත් වූ බුද්ධානුභාවයෙන් යුක්ත ව නීල පීත ලොහිතාදි වූ සවනක් ඝන බුද්ධරශ්මි මාලාවන් දශදිග විහිදුව විහිදුවා[8] මහජනයා ප්‍රීති කරවමින් එබු එබු පන්ලෙහි පියුම් දක්ව දක්වා මිහිකත සනහමින් පියුම් පිටින් වැඩ ලොකයෙහි එක පැ[හැ]ර[9] පතළ ඝනාන්ධකාර විධ්වංසනය කෙරෙමින් යුගන්ධර ගිරිශිඛරයට පැමිණි සහස්‍රකිරණයා සේ පනවනලද බුද්ධාසන මස්තකයෙහි දිලිහි දිලිහී සඟපිරිස් පිරිවරා වැඩහුන්සේක. මෙසේ අනොපමෙය්‍ය වූ බුද්ධමහිමයෙන් යුක්ත ව සපිරිවරින් වැඩ හුන් බුදුන් දැක මහත් වූ සන්තොෂයෙන් ඔද වැඩියා වූ සිත් ඇති ඒ කෙළෙඹිපුත්‍ර තෙම තමාගේ පරිවාරජනයන් හා සමඟ භොජනශාලාවට වැද මධුර වූ නොයෙක් අන්නපාන ආදියෙන් බුදුපාමොක් මහාසඞ්ඝයා වහන්සේ

---

1. ඇතුළෙහි - GHKL
2. වාහනයට - DE
   සාර්ථවාහයට - KL
3. නිර්වාණ - H
4. සතුටු - GH
5. බුදුරජාණන් වහන්සේ - B
6. වඩනට - C
7. විසින් (නැත) - KL
8. විහිදුවමින් - GH
9. එක පැහිර - පිටපත් හැම

Non-Commercial Distribution

වළඳවන්ට පටන් ගත්තේය. එකල්හි බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි ධුතාඞ්ගධර භික්ෂූන්වහන්සේ කෙරෙහි අග්‍ර ස්ථානාන්තරයට පැමිණියා වූ වසභ නම් වූ එක් මහ තෙරකෙනකුන්වහන්සේ සපදානව්‍රතයෙන් පිඬු පිණිස ගෙපිළිවෙළින් සිඟා වඩනාසේක් එම කෙළෙඹි පුත්‍රයාණන්ගේ ගෙදෙරට පැමිණ සිඟා වැඩ සිටිසේක.

ඉක්බිති ඒ කෙළෙඹිපුත්‍ර තෙම සිඟා වැඩසිටි තෙරුන්වහන්සේ දැක සමීපයට එළඹ පසඟ පිහිටුවා වැඳ 'ස්වාමීනි, වසභ ස්ථවිරයන් වහන්ස, කරුණාගුණාකර වූ බුදුරජාණන් වහන්සේ බොහෝ භික්ෂු සඞ්ඝයා පිරිවරා දැන් මේ ඇතුළුගෙයි අහර වළඳන්ට වැඩහුන්සේක: එබැවින් නුඹවහන්සේ ද ගැත්තවුට කරුණා කොට ඇතුළුගෙට වැඩ අහර පිළිගත මැනැවැ'යි ආරාධනා කෙළේය. තෙරුන්වහන්සේ වනාහි තමන්වහන්සේ උත්කෘෂ්ට සපදානචාරික හෙයින් ඇතුළු ගෙට නොවැද උත්තමාධම[1] හැම සත්ත්වයන් කෙරෙහි සම ව පවත්නා සඳපහනක්[2] සේ සියලු සතුන් කෙරෙහි මෙත් කුළුණු පතුරුවා ගෙපිළිවෙළින් සිඟමින් අනික් ගෙදෙරකට වැඩිසේක[3]. එවේලෙහි ඒ කෙළෙඹිපුත්‍ර තෙම බුදුන් කරා එළඹ එපවත් බුදුන්ට දන්වා 'කිමෙක් ද ස්වාමීනි, දෙව්මිනිසුන් සහිත මේ සමස්තලොකයෙහි සියලු ගුණධර්මයෙන් ලොවුතුරා බුදුන්ටත් වඩනා[4] කෙනෙක් ඇද්දැ'යි විචාළේය. මෙසේ ඒ කෙළෙඹිපුත්‍රයා විචාළ ඉක්බිති අසමසම වූ අප්‍රතිපුද්ගල වූ අනන්‍යසාධාරණ වූ ත්‍රිභුවනෛශ්වර වූ බුදුරජාණන්වහන්සේ ඕහට[5] පුත්‍රොපමාවක් දක්වා තෙරුන් වහන්සේගේ අප්‍රමෙය වූ ගුණ සමූහයන් ප්‍රකාශ කිරීම් වශයෙන් වර්ණනා කොට දක්වා වදරනසේක්:

පාලෙන්ති නිම්මලං කත්වා - පාතිමොක්ඛාදි සංවරං,
සමාදින්නා ධුතඞ්ගා ච - අප්පිච්ඡා මුනි සූනවො.

නිච්චමන්තකයුද්ධම්හි - නධ යොධාව දප්පිතා,
පුඤ්ඤදානං වත්ථුභූතා තෙ - දෙවමානුසකාදිනං.

ධාරෙමහං වණ්ණවන්තං - සීවෙය්‍යම්පි ච චීවරං,
බුද්ධපුත්තා මහානාගා - න ධාරෙන්ති තථාවිධං.

ධාරෙන්ති තෙ පංසුකූලං - සඞ්ඝාටෙත්වා පිලොතිකෙ,
වණ්ණච්ඡාදන චොලං ච ඉච්ඡා ලොභ විවජ්ජිතා.

සාදියාමි සදාහමෙහා - උපාසක නිමන්තණං,
නෙව සාදෙන්ති සම්බුද්ධ - පුත්තොපාසකයාචනං.

සපදානෙන යං ලද්ධං - ලූඛං වාපි පණීතකං,
තෙන තුස්සන්ති මෙ පුත්තා - රසගෙධ විවජ්ජිතා-යි.

1. උත්තමාධමමධ්‍යම - C
2. සඳපහන් මඬලක් - GHKL
3. පැමිණිසේක - KL
4. වඩා - BE
   වැඩි - කි. භ. ක.
5. ඔහුට - GHK

Non-Commercial Distribution

යනාදීන් ඵම්බල කෙලෙඹිපුත්‍රය, චීවර පිණ්ඩපාත සෙනාසන ගිලාන ප්‍රත්‍යය යන සිවුපස ලාභයෙහි ඉතා අල්පෙච්ඡ වූ මාගේ සඟහු වනාහි ප්‍රාතිමොක්‍ෂ සංවරශීලය ඉන්ද්‍රිය සංවරශීලය ආජීව පාරිශුද්ධිශීලය ප්‍රත්‍යය සන්නිශ්‍රිතශීලය යන මේ සතර සංවරශීලය අත්‍යන්ත නිර්මල කොට තමන්ගේ ජීවිතය පරිද්දෙන් නිරන්තරයෙන් රක්‍ෂා කරන්නාහ. එසේ ම පංසුකූලිකඞ්ගය තෙචීවරිකඞ්ගය පිණ්ඩපාතිකඞ්ගය සපදනචාරිකඞ්ගය ඒකාසනිකඞ්ගය පත්ත පිණ්ඩිකඞ්ගය යනාදි නාම ව්‍යවහාර වශයෙන් තෙරස ප්‍රකාරයක් ඇත්තා වූ උත්කෘෂ්ට මධ්‍යම මෘදුක වශයෙන් එකුන් සතලිස් ප්‍රකාරයකින් යුක්ත වූ මේ සියලු ම ධූතාඞ්ග ගුණයන් නොපිරිහෙළා සමාදන් ව අඛණ්ඩ කොට රක්‍ෂා කරන්නාහ. නිරන්තරයෙන් මාරයුද්ධ පිණිස හෙවත් 'කාමා තෙ පඨමා සෙනා' යනාදීන් දක්වනලද හෙයින් මරහුගේ සෙනාව යයි කියන ලද කාමක්‍රොධාදි වූ කෙලෙස් සතුරන්ගේ එඩි මඩනා පිණිස සන්නාහසන්නද්ධ ව සැරහී දර්පවත් ව[1] සිටියාවූ සටන්හි අඩිපසු නො ලන එඩිතර යොධභටයන් වැනියහ. සියලු දෙව් මිනිසුන් විසින් කරන ලද්දා වූ කුසල් නමැති බීජ ප්‍රතිෂ්ඨාවට ක්‍ෂෙත්‍ර ව සිටියහ. ඵම්බල කෙලෙඹිපුත්‍රය, මම වනාහි මනහර වර්ණ සම්පත්තීන් යුක්ත සීවෙය්‍ය වස්ත්‍රයෙන් කරන ලද්ද වූ මාහැඟි සිවුරු ද ප්‍රයෝජන විඳිම් ම ය. මණි කවච[2] සන්නද්ධ ගන්ධහස්තිරාජයන් හා සමාන සර්ඥපුත්‍ර වූ මහසඟහු වනාහි රතිජ්ජනක[3] වූ එබඳු වර්ණ සම්පත්තීන් යුක්ත මහාර්ඝ චීවරයන් නො ඉවසන්නාහු ම ය. චීවර ප්‍රත්‍යයෙහි ඉතා අල්පෙච්ඡ හෙයින් ලොභ තෘෂ්ණාවෙන් පහ වූ ඉතා පවිත්‍ර වූ චාරිත්‍ර හා නිර්මල වූ චිත්තසන්තාන ඇති[4] ප්‍රතිපත්තිසාර වූ මාගේ සඟහු වනාහි දුහද පිළිකුල් වණ වසන්නට ලන තෙල් පියලි[5] සෙයින් කඩරෙදි ගොතා කරනලද ඉතා රූක්‍ෂ වූ පාංශුකූල චීවරයන් ධරන්නාහ. තව ද මම වනාහි ඇම කල්හි ම උපාසක ආරාධනා ගිවිස නොයෙක් සූපව්‍යඤ්ජනයෙන් යුක්ත වූ දිව්‍යබොජුන් හා සමාන මිහිරි ආහාරය අනුභව කෙරෙම් මය. සම්‍යක් සම්බුද්ධයන්ගේ පුත්‍ර වූ මේ සුපිළිපන් මහසඟහු වනාහි එපරිද්දෙන් උපාසක ආරාධනා නොගිවිස්නාහ. යළි[6] කෙසේ ජීවත් වෙද් ද යත හොත්[7] නිරන්තරයෙන් වෙහෙර කළමනා වත් සපයා සියල්ලවුන් කෙරෙහි මෙත් පතුරුවා ධාතු කර්මස්ථාන මෙනෙහි කෙරෙමින් සිවුරු[8] ගැටගත්වා පාත්‍රය අතින් ගෙන ගමට වැද හීනොත්කෘෂ්ට මධ්‍යම යන හැම සත්වයන් කෙරෙහි ඒකාකාරයෙන් පවත්නා සොම් සිහිල් සඳපහනක් සේ සපදනව්‍රතයෙන් යෙදී ගෙපිළිවෙළින් සිඟා රූක්‍ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ යම්කිසි ආහාරයක් ලද්දහු වී නම් රසයෙහි ගිජුබවක් නැත්තාවූ මාගේ සඟහු එයින් ම සන්තුෂ්ටවන්නාහ. තව ද කෙලෙඹි පුත්‍රය, මම වනාහි ශරීරයට සුව පහස් දෙන

---

1. දක්ෂවත් ව - AFJ
   දර්පමත් ව - C
   දප්වත්ව - BDEC - බෙ
   දක්ෂව - ක.කි.සද.ම.
2. මණිකවචයෙන් - GHKL
3. රුචිජනක - A
   රුතිජනක - F
4. ඇතියාහ - L
5. පියල්ලක් - GHKL
6. ඔවුහු - ක.කි.සද.
7. යත් - KL
8. පා සිවුරු - ක.කි.සද.

Non-Commercial Distribution

මාහැඟි වූ පිඩහම් තිලි[1] කොඳු පළස් [අතුට කොඳමල් හා සමාන මනහර සුදු සිනිඳු මොළොක් ඇතිරි][2] අතුරනලද යහපත් වූ යහන්හි සැතපෙම් මය. මාගේ සඟහු වනාහි සිංහ ව්‍යාඝ්‍රාදි චණ්ඩසත්වයන් කෙරෙහි හයින් නිදිවර්ජිත ව වසන මෘගජාතීන් මෙන් මේ ප්‍රතිභය සහිත වූ අසාර වූ සංසාරයෙහි ආදීනව දැක සසර හයින් හයපත් වුවාහු පරිද්දෙන් නොසැතපෙන්නාහු මය. චිත්තානුකූල වූ කර්මස්ථානයක් ගෙන හිඳීම සිටීම සක්මන් කිරීම යන මේ තුන් වැදෑරුම් වූ ඊර්යාපථ පරිවර්තනයෙන්[3] දවස් යවන්නාහ.

තව ද මම වනාහි එක් මහල් දෙ මහල් තුන් මහල් සතර පස් සත් මහල් ආදි වූ ප්‍රභෙද ඇති දිව්‍යවිමාන හා සමාන උතුම් වූ ප්‍රාසාදයෙහිදු වාසය කෙරෙම් මය. බුදුන් දරු සුපිළිපන් මහසඟහු වනාහි ශරීරයට සැප දී සැතපෙනු සඳහා එබඳු ප්‍රාසාද ආදියට කිසි කලෙකත් නො වදනාහු ම ය. නිරන්තරයෙන් භවදුඃඛ විනාශයට කාරණ වූ උතුම් භාවනාමාර්ගයක් සිතින් ගෙන එකාවත් භාවනා කෙරෙමින් සෙනසුන් පළිරොධ හැර සමහරකෙනෙක් අභ්‍යවකාශයෙහි වාසය කරන්නාහ. එම්බල කෙළෙඹිපුත්‍රය, තව ද මම වනාහි බොහෝ ජනයන් නිර්වාණපුරයට පමුණුවමින් ජනසම්බාධ වූ ගාමන්තසෙනාසනයෙහිදු වාසය කෙරෙම් මය. මාගේ සඟහු වනාහි එකචාරික[4] සිංහරාජයන් සේ ගණසඞ්ගණිකාවෙන් දුරු ව ජන විවික්ත වූ ප්‍රාන්ත සෙනාසනයෙහි එකඟ වූ සිතින් භාවනායොගයෙහි[5] යෙදී උදකලා ව වාසය කරන්නාහ. මෙබඳු මේ සියලු ගුණගණාඞ්ගයෙන් සැරහී සිටියා වූ ඒ මාගේ ශ්‍රාවක සමූහයා කෙරෙහි ඇතුළත් වූ මේ වසභ නම් මහතෙරහු වනාහි නසන ලද සියලු අකුශල ධර්මයන් ඇති ව ධූතාඞ්ගධරයන් කෙරෙහි අග්‍ර වූ ස්ථානාන්තර ලදින් මාගේ ශාසන නමැති ආකාශයෙහි හිරසඳ සේ ප්‍රසිද්ධ වූ උත්තමයාණ කෙනෙක් වේ'ද යනාදීන් මෙසේ ඒ භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ අත ඔසවා සඳමඬල පානා සේ[6] තෙරුන්වහන්සේගේ අප්‍රමෙය වූ ගුණසමූහයන් ප්‍රකාශ කොට දක්වා වදාළසේක.

ඉක්බිති ඒ කෙළෙඹිපුත්‍ර තෙමේ තෙරුන් වහන්සේගේ ඉතා ආශ්චර්ය්‍ය ගුණවිශෙෂයන් අසා තෙමේ ද ඒ ස්ථානාන්තරය කැමැති ව 'මම ද මේ මහතෙරුන් වහන්සේ පරිද්දෙන් ම මතු එන දවස එක්තරා ලොවුතුරා[7] බුදුකෙනකුන් වහන්සේගේ ශාසනයෙහි ධූතාඞ්ගධරයන්ට අග්‍ර වීම් නම් යෙහෙකැ'යි සිතා ඒ ස්ථානාන්තරය ප්‍රාර්ථනා කෙරෙමින් බුදුන්ගේ ශ්‍රීපාදමූලයෙහි වැඳගෙන හොත්තේ ය. බුදුහු ඒ කාරණය දැන තමන් වහන්සේගේ අසාධාරණ වූ අනාගතඥානයෙන් බලා වදරා ඔහුගේ ප්‍රාර්ථනාව සිද්ධවන සේ දැක[8] කෙළෙඹි පුත්‍රයාහට වදරනසේක: 'එම්බල පින්වත් කෙළෙඹි පුත්‍රය, මේ කල්පයට ලක්ෂයක් වන කපින් මත්තෙහි ලොකොත්තම වූ ගෞතම නම් බුදුකෙනෙක් ලොකයෙහි උපදනාහ. එකල තෙපි ඔවුන්ගේ

---

1. පඩම්පිලි - කි.සද.ක.
   පිඩම්පිලි - D
2. වරහන් තුළ කොටස - ස.හි.නැත.
3. වර්තනයෙන් - කි.සද.ක.ම.
4. එකචාරී - CH
   එකචර - AFDKL
   එකසර - E
5. භාවනානුයොගයෙහි - මුද්‍රිත හැම.
6. පහරනා සේ - CDL
   පහරන සේ - AF
7. ලොවුතුරා (නැත) - GHL
8. දැන - GH

Non-Commercial Distribution

ශාසනයෙහි මහණ ව ධුතාඞ්ගධරයන් කෙරෙහි අග්‍ර වූ ස්ථානාන්තර ලදින් මහා කාශ්‍යප ස්ථවිර ය යන නමින් ප්‍රසිද්ධ ව මුළු ලොවට අග්‍ර දක්ෂිණෙය්‍ය වන්නාහ' යනාදීන් විවරණ දී වදාළසේක.

එවේලෙහි ඒ කෙළෙඹි පුත්‍රයාණෝ එම විට ලද්ද වූ ස්ථානාන්තරයක් මෙන් මහත් වූ සන්තෝෂයට පැමිණ එතැන් පටන් බොහෝ කුශල සමූහාරයන් රැස් කොට ඒ ආත්මභාවයෙන් චුත ව දිව්‍ය මනුෂ්‍ය ලොක දෙක්හි ච්‍යුති ප්‍රතිසන්ධි වශයෙන් බොහෝ කාලයක් දෙවු මිනිස් සැපත් වළඳ මීට එකානූ වන කල්පයෙහි බුදු වූ මහාවිපස්සි නම් බුදුන් සමයෙහි එකසාටක නම් බමුණු ව ඉපද මහ දන් දී බුදුන්ට උපස්ථාන කොට මෙම ස්ථානාන්තරය පිණිස ඔබගෙන් ද විවරණ ශ්‍රී ලදින් දිවිපමණින් බොහෝ පින්කම් කොට එයින් ගොස් පෙර පරිද්දෙන් ම අප්‍රමෙය්‍ය වූ දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳ මේ මහා භද්‍රකල්පයෙහි තුන් වැනි ව බුදු වූ කාශ්‍යප සර්වඥයන් වහන්සේ පිරිනිවි පසු බරණැස් නුවර සියලු උපභොග පරිභොග වස්තුවෙන් ආඪ්‍ය වූ සිටුකුලයෙක ඉපද වැඩි විය පැමිණ මහත් වූ ශ්‍රී සම්පත්තීන් යුක්ත ව වාසය කරන්නාහු පූර්ව හෙතුබලයෙන් ලද්දවූ ශ්‍රද්ධා ඇති ව බුදුන්ගේ [ශාරීරික][1] ධාතූන් වහන්සේට බොහෝ පූජා සත්කාර කිරීමෙන්[2] අපමණ වූ පුණ්‍යසමූහාරයන් රැස් කොට එයින් චුත ව සසර සැරිසරා ඇවිදිනාහු විසිදහසක් හවුරුද්දට ආයුෂය ඇති කාලයෙහි බුදු වූ කාශ්‍යප සර්වඥයන්වහන්සේගේ ශාසනාවසානයෙහි[3] පටන් සත්වයන්[4] පරමායු පිරිහෙමින් ක්‍රමයෙන් අවුත් දසදහසක් අවුරුද්දට ආයුෂය පැමිණි කල්හි නැවත දඹදිව බරණැස් නුවර කෙළෙඹි පුත්‍ර ව ඉපද වැඩිවිය පැමිණ සහඹු ව රැකෙමින් දවසෙක කිසි කටයුත්තක් පිණිස වලට වැද වනාන්තරයෙහි ඇවිදිනාහු ප්‍රත්‍යන්ත ජනපදයෙහි වන මැද රුකක් මුල වැඩ හුන්නා වූ එක්තරා පසේ බුදුකෙනෙකුන් වහන්සේ දැක ඔබ සමීපයට එළඹ පසඟ පිහිටුවා වැඳ එකත්පස් ව සිටියහ. එකල්හි පසේබුදුන් වහන්සේ ද සිවුරක් ගෙත්තම් කරනසේක් තමන් වහන්සේ ගෙත්තම් කරන්නා වූ සිවුරට නුවා නැති හෙයින් සිවුර හකුළුවා පත් කොට[5] තබන වහන්සේ දැක කෙළෙඹි පුත්‍රයාණෝ විචාරන්නාහු 'කිමෙක් ද ස්වාමීනි, සිවුර ගෙත්තම් නොකොට කවර කාරණයක් පිණිස හකුළුවා තබන සේක් දැ'යි විචාළහ. එබසට පසේබුදුන් වහන්සේ අල්පෙච්ඡතාවෙන් කිසිවකුත් නොවදළසේක. එකල්හි ඒ කෙළෙඹි පුත්‍රයාණෝ 'සිවුරට නුවා නැති හෙයින් හකුළුවා තබනසේක්[6] වනැ'යි දැන තමන්ගේ උතුරු සළුව ගෙන පසේබුදුන් වහන්සේගේ පාමුල තබා 'ස්වාමීනි, ගැත්තවුට පින් පුරා[7] වදළ මැනවැ'යි කියා පසේබුදුන් වහන්සේ වැඳ අවසර ඉල්වාගෙන ගියහ.

ඉක්බිති පසේබුදුන් වහන්සේ ඒ උතුරුසළුව ගෙන සිවුරෙහි දිග සරස නුවා ලා ගෙත්තම් කොට නිමවා කැපසරුප් ලෙස රඳන් කොට සිවුර වැළඳගත් සේක.

---

1. ශරීර - පිටපත් හැම
   ශාරීරික - මුද්‍රිත හැම
2. කොට - KL
3. ශාසනයෙහි - BJ
4. සත්වයන්ගේ - KL
5. හැන්පත් කොට - කි.ඝද.ක.
6. පත්කොට තබන්නට වන්සේක් - C
7. පුරවා - කි. සද. ක. ම.

Non-Commercial Distribution

කෙළෙඹි පුත්‍රයාණෝ වනාහි එපමණ කුශලානුභාවයෙන්[1] තවුතිසා දිව්‍යලොකයෙහි ඉපද තුන්කෙළ සැටලක්‍ෂයක් හවුරුදු මුළුල්ලෙහි අපමණ වූ දිවසැපත් විඳ ජීවිතාවසානයෙහි එයින් ගොස් දඹදිව බරණැස් නුවරට තුන් යොදුන්[2] පමණ තැන්හි එක්තරා නියම්ගමෙක නාමගොත්‍රයෙන් අප්‍රසිඩ වූ එක්තරා කුලගෙයක උපන්හ. එකල්හි මවුපිය දෙදෙන ඔවුන්ට නන්‍දියයෝ යයි නම් තුබූහ. තව ද ඒ නන්‍දියයන්[3] හා කුසෙහි ඔත් සත් බෑකෙනෙක් වූහ. එයින් වැඩිමහලු සබෑයෝ ගොවිතැන් වෙළඳම් ආදි වූ නොයෙක් කර්මාන්‍තයෙහි ව්‍යාවෘත වූවාහු නිරන්‍තරයෙන් දුග්ගෙන මවු පිය දෙදෙනා රක්නාහ. නන්‍දියයෝ වනාහි දඩබිම කළමනා කර්මාන්‍තයන් නො කොට ගෙයි ම හිඳිනාහ.

එසේ හෙයින් වැඩිමහලු සබෑයෝ නන්‍දියයන් කෙරෙහි නොසතුටු ව 'මේ සොරු බඩ පුරා බත් කාලා බිජුවට රකිනා කිකිළියක සේ සිහිල් සෙවෙන[4] ගෙට වැදලා හින්දදී අපි කුමක් පිණිස මෙහෙ කරමෝ දැ'යි කියා නිරන්තරයෙන් නන්‍දියයන්ට කිපෙන්නාහ. එතෙපුල් අසා නන්‍දියයන්ගේ මවුපිය දෙදෙන නන්‍දියයන් සමීපයට කැඳවා, 'එම්බා පුත නන්‍දියයෙනි, දුක්පත් ව ගිහිගෙයි වසන්නවුන්[5] විසින් කිසි කර්මාන්තයක් නොකොට හැම දවස් ම ගෙට වැදලා හිඳ ජීවත් විය නොහැක්ක. තමාගේ උපයන[6] වහලක් සරකක් නැති කල දුක් සැප නොසිතා කල් නො වරදවා දඩබිම කළමනා මෙහෙවර කොට ගෙන හැම වේලෙහි අප්‍රමාද ව සිහිනුවණින් යෙදී අනලස් ව රැකුණ මනා නොවේ ද'[7] යනාදීන් අවවාද කියන්නාහ.[8]

එසේ මවුපිය දෙදෙනා අවවාද කරන කල්හි නන්‍දියයෝ එක බසකුත් මුවෙන් නො බණන්නාහු මය. ඉක්බිති එක් දවසෙක රාජපුරුෂයෝ 'හැමදෙනා ම නකත්කෙළි කෙළිය මැනවැ'යි කියා එගම්හි බෙර ලැවූහ. එකල්හි නන්‍දියයෝ තමන්ගේ මෑණියන් සමීපයට ගොසින් කියන්නාහු 'මෑණියන්වහන්ස, අද මම ද[9] නකත්කෙළි කෙළනා කැමැත්තෙමි, ඇඳගන්ට යහපත් ඉනකඩක් දුන මැනවැ'යි කීහ. එතෙපුල් අසා නන්‍දියයන්ගේ මෑණියෝ 'තෙල ඉනකඩ හැඳගෙන කෙළින්ට යව'යි කියා යහපත් කොට අපුළා තිබූ ඉනකඩක් දුන්හ. ඒ දැක නන්‍දියයෝ මෑණියන්ට කියන්නාහු 'මෑණියන් වහන්ස, මේ ඉනකඩ ඉතා ම දළ,[10] අතික් ඉනකඩක් දුන මැනවැ'යි කීහ.

කෙසේ නොකීකරු වූවත් දරුවන්ගේ තෙපුල් දෙමවුපියන්ට ඉතා ප්‍රිය වන බැවින් නැතැයි නොකියා නැවත අතික් ඉනකඩක්[11] දුන්හ. නන්‍දියයෝ වනාහි ඒ වස්ත්‍රය ද අතින් ගෙන බලා 'මෙසේ වූ පිළී ද අප අඳිනෝ' යයි කියා නොකැමති ව දැමූහ. ඉක්බිති නන්‍දියයන්ගේ මෑණියෝ කියන්නාහු 'එම්බා පුත නන්‍දියයෙනි,

---

1. කුසලානුභාවයෙකින් - K ක.කි.සැ.ම.
2. යොදනක් - KL
3. නන්දිකයන් - ABCDFGHKL, ක.සැ.ම.
   නන්දිය - පාලි
   ABCDFGHKL පිටපත්වල හා ක.සැ.ම.
   පිටපත්වල මේ නම 'නන්දික' යනුවෙන් පෙනේ.
4. සෙවනේ - ABCDFGHKL
5. වසන්නාවුන් - ABCDJ කා.සැ.ක.
6. උපයන සොයන - EGHKL
7. මැනවැයි වේ දැයි - GHKL
8. කියන්නාහු - KL
9. මම් ද අද - FL
10. දළ ය- BCDFG ක.කි.සැ.ම.
11. වස්ත්‍රයක් - BDEGHL
    සනකඩක් - බෙ.

Non-Commercial Distribution

අපගේ මේ කුලයෙහි[1] මීට වඩනා සිහින් මොළොක් පිළියෙක් ඇත්තේ නොවෙයි, ඉදින් යහපත් පිළියෙක් ඇත්නම් මෙබඳු උත්සව දිනයෙක තොපට නොදී තව කවුරුන්ට තබමෝ දැ'යි කීහ. එතෙපුල් අසා නන්දියයෝ 'එසේ කල මෑණියන් වහන්ස, යහපත් පිළී ලැබෙන තැනකට දැන් ම යෙමි'යි කීහ. එවේලෙහි නන්දියයන්ගේ මෑණියෝ කියන්නාහු 'කුමක් කියව් ද පුත, සෙසු දැ තබා අද ම තොප බරණැස් නුවර රාජ්‍යසම්පත්තියට පැමිණෙන්නා කැමැත්තෙමි, ඉදින් තොපට අභිවෘද්ධියෙක් වේ නම් එම කැමැත්තෙමි' යි කීහ.

ඉක්බිති නන්දියයෝ 'වනු සමස්[2] බණව'යි කීවා සේ මෑණියන් කී තෙපුල් අසා 'එසේ වී නම් යහපත මෑණියන් වහන්සැ'යි කියා තමන්ගේ මෑණියන් වැඳ අවසර ඉල්වාගෙන නික්මුණාහ. ඒ දැක නන්දියයන්ගේ මෑණියෝ සිතන්නාහු 'මාගේ මේ බාලදරුවෝ ගමින් බැහැර කොයි යෙත් ද, පළමු සේ ම තමන්ගේ අඳුනන ඉතා පුරුදු යහළු මිත්‍රයන්ගේ ගෙයක හිඳ සවස බත් කන වේලාවට[3] වී නමුත්[4] ගෙට එන්නේ වේ දැ'යි සිතූහ.

නන්දියයෝ වනාහි පූර්වජාතියෙහි කරනලද්ද වූ කුශලකර්මයා විසින් මෙහෙයන ලදුව තමන් හුන් ගමින් නික්මුණාහු බරණැස් නුවරට ගොස් සෙනෙවිරදුන් දැක ඔවුන්ගේ ගෙයි ම රැඳුණාහ. ඉක්බිති නන්දියයෝ එක් දවසෙක සෙනෙවිරදුන්ගේ දසකර්මකරයන්[5] හා සමඟ කථාකෙරෙමින් හිඳ නිදන්නාහු සීනයක් දැක පිබිද භයපත් ව මහත් කොට මුරගාපීහ. ඒ ශබ්දය අසා සෙනෙවිරද්දු 'කුමක් පිණිස මුරගාපී දැ' යි විචාළහ. එවේලෙහි නන්දියයෝ 'සීනයක් දැක භයින් මුරගාපීමි'යි කීහ. 'කෙසේ වූ සීනයෙක් ද තොප දුටුයේ'යයි විචාළ කල්හි නන්දියයෝ 'තමන්ගේ බඩවැල තුඹස් සිදුරකින් පිටත නික්මුණු හැළි නාගරාජයකු සේ තමන් මුඛයෙන් පිටතට නික්ම මේ දසදහසක් යොදුන් පමණ ඇති මේ සියලු මුළු දඹදිව්තෙලෙහි පැතිර නැවත තමන්ගේ[6] කුසයට ම වන්නා සේ දිටිමි'යි කීහ. එවේලෙහි සෙනෙවිරද්දු 'මේ කවර කාරණයක් පිණිස දුටු සීනයෙක් දෝ හෝ'යි සිතා තමන්ගේ කුලුපග වූ පරිබ්‍රාජිකා කෙනකුන් සමීපයට ගොස් විචාරන්නාහු 'ස්වාමීනි, යම් කිසිවෙක් සීනයෙන් තමන්ගේ බඩවැල මුඛයෙන් පිටතට නික්ම මුළු දඹදිවුතෙලෙහි පැතිර නැවත එම බඩවැල මුඛයෙන් ගොස් බඩට වන්නා සේ දිටි නම් ඕහට කෙබඳු විපාකයෙක් වේ දැ'යි විචාළහ. එකල පරිබ්‍රාජිකාවෝ කියන්නාහු 'ඉදින් යම් ගැහැණියක් මෙබඳු සීනයක් දුටු නම් සත් දවසක් ඇතුළත[7] අභිෂෙක පළන් රජක්හට අග්‍රමෙහෙසුන් වන්නීය. ඉදින් පුරුෂ කෙනෙක්[8] මෙබඳු සීනයක් දුටුයේ වීනම් සත් දවසක් ඇතුළත ම රාජ්‍යයට පැමිණෙන්නේය'යි කීහ. මෙසේ පරිබ්‍රාජිකාවන් කී තෙපුල් අසා සෙනෙවිරද්දු පළමු කොට ම නන්දියයන් හා නෑ ව ගන්නා කැමැති ව

1. කුලගෙයි - GHKL
2. සබස් - C
   සවස් - K
   සවස් බනවමින් - K
3. වේලාව - AEFJ
4. නුමුත් - මුද්‍රිත හැම
5. දසකර්මකාරයන් - J ක.සි.සද.ම.
6. තමන් - G
7. දවසකින් - J
8. පුරුෂයෙක් - BDEGHKL

Non-Commercial Distribution

තමන්ගේ එවකට දීගයට යන තරම් යොග්‍ය ව සිටි දූන් සත්දෙනා සමීපයට කැඳවා 'එම්බා දරුවෙනි, තෙල නන්‍දියයන් අතුරේ හිඳු දැ'යි[1] කියා වැඩිමහලු දියෙණියන් පටන් පිළිවෙළින් විචාළහ. එබසට වැඩිමහලු දූ සදෙන කියන්නාහු 'මේ නන්‍දියයෝ තුමූ ඉවත රටින් අලුත ආගන්‍තුකව ආ තැනැත්තෝ ය: එසේ හෙයින් කවුරුන් බවත් නොදනුම්හ'යි කියා නොගිවිස්සාහ. එවිට සෙනෙවිරද්දු හැමදෙනාට බාල දියෙණියන් ළඟට කැඳවා 'පුත, තෙපි නන්‍දියයන් අතුරෙ හිඳු දැ'යි විචාළහ. එබසට බාල කුමාරිකාවෝ තමන් මහ පිනැති හෙයින් සිතන්නාහු 'දෙමවුපියෝ නම් දරුවන්ට ඒකාන්‍තයෙන් ම වැඩක් මිස අවැඩක් වන්නා[2] නොකැමැත්තාහ: එබැවින් මාගේ මවුපිය දෙදෙන යම් බඳු කෙනකුන්ට මා පාවා දෙත් නම් එම යහපත් වේ දැ'යි සිතා 'යහපතැයි[3] නන්‍දියයන් අතුරෙ හිඳිමි'යි කීහ. එතෙපුල් අසා සමාධි ව සෙනෙවිරද්දු නන්‍දියයන් ළඟට කැඳවා තමන්ගේ දියෙණියන් ඔවුන්ට[4] පාවා දී බොහෝ සැපත් දුන්නාහ.

එයින් සත් දවසක් ගිය කල්හි නන්‍දියයෝ එක් දවසෙක ගෙන් නික්ම ඒ ඒ තැන්හි සිත් සේ කෙළ ඇවිදිනාහු රජ්ජුරුවන්ගේ මඟුල් උයනට වැද නොයෙක් විසිතුරු බලමින් ගොස් මඟුල් සලවට පිටට පැනනැඟී හිස වසා පෙරවගෙන වැදහොත්තාහ. හෙද වනාහි බරණැස් රජ්ජුරුවන් කාලක්‍රියා කළ[5] සත් වන දවස ය. එසේ හෙයින් පුරෝහිතයා හා අමාත්‍යවරු එක් ව මහපෙරහරින් රජ්ජුරුවන් ආදහන කොට සොහොන්හී කළ මනා කටයුතු නිමවා හැමදෙන ම රාජාඞගණයෙහි[6] රැස් ව එක් ව හිඳ මන්‍ත්‍රණය කරන්නාහු 'අපගේ රජ්ජුරුවන් වහන්සේ ස්වර්ගස්ථ වූ සේක්, දැන් මේ රාජ්‍යය රැකලන්ට නිසි ඔබගේ පුත්රුවනෙකුත් නැත, ඇතිසේකුත් එක ම දියෙණිකෙනකුන් වහන්සේ ය, රාජ්‍යය නම් කවර තරම් අමාත්‍ය බලයක් ඇතත් රජ්දරුකෙනකුන් නැති ව රැකගත නොහැක්කේ මය: එබැවින් වහා මඟුල් රථය හළ මැනවැ'යි කියා නොයෙක් රථාලඞකාරයෙන් සරහනලද්දවූ රජ්ජුරුවන්ගේ මඟුල් රථයෙහි හෙළ ඇඹුළපෙති හා සමාන සුදු අසුන් සතර දෙනකු[7] යොද නළල්පටය වල්විදූනාවය සේසතය මඟුල් කඩුවය මිරිවැඩි සඟළය යන පඤ්චකකුධ භාණ්ඩයන් රථයෙහි තබා රථය ඉදිරියේ හැර පුරෝහිතයා ඇතුළු වූ මහ ඇමැතියෝ සිව්රඟසෙනඟ හා සමඟ නොයෙක් සිය ගණන් හෙරිතූර්‍ය්‍යභාණ්ඩයන් ගස්වමින් පස්සෙහි නික්මුණාහ. එකල්හි රථය නැඟෙනහිරි වාසලින් නික්ම මඟුල් උයන බලා නික්මුණේය. ඒ දැක සමහර කෙනෙක් 'මේ රථය පළමු උයනට ගිය අභ්‍යාසයෙන්[8] දැවුදු උයන බලා ම යන්නේය: එබැවින් රථය නවතමෝ දැ' යි කීහ. එතෙපුල් අසා පුරෝහිතයාණෝ 'කවුරු කියද් ද දනිද් ද, උයනෙහි පින්වත් කෙනකුන් ඇති නියා ය: රථය නො නවතව'යි කීහ.

1. හිඳුවයි - BCDEFGHJKL
2. වන්නා (නැත) - KL
3. යහපත - BDEGHKL
4. ඕහට - ක.සි.සඳ.බෙ.ස.
5. කොට - G
6. රාජාංගනයෙදී -A
රාජාංගනයෙහිදී - J
7. සතර දෙනකුන් - මුද්‍රිත හැම
8. පුරුදුකාවෙන් - KL, ස.

Non-Commercial Distribution

ඉක්බිති රථය උයනට වැද ක්‍රමයෙන් ගොස් නන්දියයන් වැද හොත් මඟුල් සලවට වටා තුන්වරෙක පැදකුණු කොට නන්දිය කුමාරයන් රථයට නැඟෙන ලෙස නුවර දසාවට අභිමුඛ ව සැරහී සිටගත. එවේලෙහි පුරෝහිත බමුණාණෝ සලවට සමීපයට ගොස් නන්දිය කුමාරයන් පෙරවගෙන හොත්තාවූ ඉනකඩ එක්කොනකින් ඉවත් කොට දෙපතුල්තෙලෙහි[1] ලක්ෂණ බලා ‘මේ එක දසදහසක් යොදුන් ජම්බුද්වීපය තබා දෙදහසක් කොදෙවු පිරිවර කොට ඇති සතර මහාද්වීපයෙහි ඒකාතපත්‍ර චක්‍රවර්තිරාජ්‍යය කරන තරම් මහ පින් ඇතියේකැ’යි කියා දැන රාජ්‍යධෛර්‍ය පරීක්ෂා කරනු පිණිස නොයෙක් දහස් සුවහස් ගණන් සෙනඟ සෙනහඩ සේ මහබෙර තලප්පර වීරන්දම්[2] රණරහ ඝොෂා ආදි වූ සියලු හෙරි තූර්‍යභාණ්ඩයන් එක පැහැර තුන්විටෙක ඝොෂා කැරවූහ. එකල්හි නන්දිය කුමාරයෝ තමන් පෙරවගෙන හොත්තා වූ ඉනකඩ මුහුණින් මඳක් පහ[3] කොට සලවට වටා සිටි මහසෙනඟ හා පුරෝහිතයා දැක ‘කුමක් පිණිස අවුදැ’යි විචාළහ. එබසට පුරෝහිතයා ‘දේවයන් වහන්ස, බරණැස් නුවර රාජ්‍යය තුඹවහන්සේට පැමිණියේය; එසේ හෙයින් තුඹවහන්සේ නුවරට කැඳවාගෙන යන පිණිස ආම්හ; වහා වැඩිය මැනවැ’යි කීය. එවේලෙහි නන්දිය කුමාරයෝ ‘තොපගේ රජ්ජුරුවෝ කොයි දැ’යි විචාළහ. ‘ස්වර්ගස්ථ වූසේකැ’යි කී කල්හි ‘දැන් කෙතෙක් දවස් ඉක්මිණි දැ’යි විචාරා ‘අදට සත් දවසෙකැ’යි කී කල්හි ‘රජ්ජුරුවන්ගේ අතික් දූදරු කෙනෙක්[4] නැද්දැ’යි විචාරා ‘දියෙණි කෙනකුන් වහන්සේ ඇත; පිරිමිදරුවෝ නැතැ’යි කී කල්හි ‘එසේ වී නම් යහපතැ’යි කියා රාජ්‍යය ගිවිස්සාහ. එකෙණෙහි අමාත්‍යවරු එම උයන්හි විසිතුරු අභිෂෙකමණ්ඩපයක් කරවා බරණැස් රජ්ජුරුවන්ගේ දියෙණියන් පට්ටකාර පමුතිලිංහම් කාදු කාප්පු කොණ්ඩ මල්[5] ආදි වූ සියලු බිසෝපළඳනායෙන් දෙවඟනක සේ සරහා මහත් වූ පෙරහරින් එම විට මඟුල් උයනට කැඳවාගෙන වුත් නන්දිය කුමාරයන්ට අභිෂෙක මඟුල් කළහ.

මෙසේ අභිෂෙකප්‍රාප්ත ව සිටියා වූ නන්දිය රජ්ජුරුවන්ට ලක්ෂයක් වටනා සළුවක් ගෙනාහ. ඒ දැක නන්දිය රජ්ජුරුවෝ ‘සගයෙනි, මේ කිමෙක් දැ’යි[6] විචාරා ‘දේවයන් වහන්ස, තුඹ වහන්සේට අඳිනට ගෙනා සළුවෙකැ’ යි කී කල්හි ‘සගයෙනි, මේ ඉතා ම දළ වේ දැ’යි කියා ‘දේවයෙනි, මේ මනුෂ්‍යලොකයෙහි මීට වඩනා වස්ත්‍රයෙක් නැතැ’යි කී කල්හි ‘තොපගේ රජ්ජුරුවෝ මෙබඳු පිළී අඳිත් දැ’යි විචාරා ‘එසේ ය දේවයන් වහන්සැ’යි කී කල්හි ‘තොපගේ රජ්ජුරුවෝ ඉතා[7] පින් මඳ කෙනෙක් වනැ’යි කියා ‘මනුෂ්‍ය ලෝකයෙහි මීට වඩනා වස්ත්‍ර නැති බැවින් ස්වර්ණභිංකාරයෙන් වහා පැන් ගෙනෙව. දැන් ම සිහින් මොළොක් පිළී ලබන්නමෝ වේ දැ’යි කීහ. එතෙපුල් අසා ස්වර්ණභිංකාරයෙන් පැන් ගෙනා කල්හි නන්දිය රජ්ජුරුවෝ හුනස්නෙන් නැඟී අත මුව ශුධ කොට දෝතින් පැන් ගෙන නැඟෙනහිර

---

1. දෙපත්ලෙහි - ක.කි.සැ.ම.
   දෙපතුලෙහි - GHKL
2. වින්දම් - ක.කි.සැ.ම.
3. ඉවත් - AB
4. දරුකෙනෙක් - GHKL
5. කොණ්ඩමාලා - KL
6. කාට දැයි - KL
7. ඉතා ම - GHKL

Non-Commercial Distribution

දසාවට[1] දැමූහ. එකෙණෙහි ඝනකඩ බොල් මහ පොළොව පළාගෙන කප්රුක් සොළොසෙක් පැන නැංගේය. නැවතත් දෝතින් පැන් ගෙන දකුණුදිගය පැළදිගයය උතුරුදිගය යන තුන් දසාවට[2] පළමු පරිද්දෙන් ම පැන් දැමූහ. ඒ සියලු දිශාභාගයෙහි එකි එකී දිග සොළොසක් සොළොසක් බැගින් සූසැටක් කප්රුක් පහළ වී ය. නන්දිය රජ්ජුරුවෝ එයින් දිවසළු දෙකක් ගෙන එක් දිවසළුවක් විද හැඳ එක් දිවසළුවක් එකාංශ කොට බහා ගෙන 'මෙතැන් පටන් නන්දිය රජ්ජුරුවන්ගේ අණසක පවත්නා විජිතයෙහි හූ කටනා ස්ත්‍රීන් හූ කැට දූක් නො ගෙන කප්රුක්වලින්[3] ම කැමැති කැමැති වස්ත්‍ර හැරගෙන සැප සේ හැඳ පෙරව වාසය කරන ලෙස බෙර ලව' යි කියා නුවර බෙර ලවා රන්පට රුවන් සෝළු ආදි වූ සූ සැට ආභරණයෙන් සැරහී සේසත් නංවා මඟුල් කඩුව අතින් ගෙන රන්සැත් රන්පොරොදු ගලමුතුමාලා කුම්භාලඩකර රන්දැල් කණ්ඩුළිකා ආදියෙන් ස්වර්ණ පර්වතයක් මෙන් සරහන ලද්දවූ උතුම් ඇත්වාහනයකට පැනනැඟී මහත් වූ ඓශ්වර්යයෙන් යුක්ත ව ඓරාවන නම් ඇත්රජහු පිටට පැනනැඟි දෙදෙව්ලොව දෙවියන් පිරිවරා දිව්‍ය වීථියෙහි ගමන් ගත් ශක්‍ර දෙවේන්ද්‍රයා පරිද්දෙන් අපමණ වූ චතුරංගිනි සෙනාව විසින් පිරිවරනලද්දු ව රන් රිදී රම්භතොරණ පූර්ණඝට ආදියෙන් සරහන ලද්දවූ රාජමාර්ගයෙන් ගොස් මහත් වූ උත්සවයෙන් නුවරට වැද දිව්‍ය විමානයක් හා සමාන ඉතා ප්‍රසාදකර වූ ප්‍රාසාදයෙහි මතුමහල් තලයට පැනනැඟී දිවසැපතක්[4] හා සමාන උතුම් වූ ශ්‍රී සම්පත්තීන් අනුභව කරන්නට පටන් ගත්හ. අහෝ එකල්හි පසේබුදුන් වහන්සේගේ සිවුරට දුන්නා වූ නුවාකඩෙහි ආනුභාවයක් ඉතා ආශ්චර්ය නියා ය. හේ එසේ මය.

මේ ලොකයෙහි අබ බිජු පමණ ඉතා සූක්ෂම වූ බිජුවටින් නුග පැළය[5] නැඟී ක්‍රමයෙන් වැඩී නොයෙක් සියගණන් අතු පතරින් ගැවසී නිල් මහමේකුළක් මෙන් ශොභාමත් වෙමින් ආකාශ කුහරය වසා සිටිනා පරිද්දෙන් නුගරුක[5] යම් සේ මහත් වේ ද එපරිද්දෙන් ම කුශලකර්මය ඉතා ස්වල්ප වී නමුත් විපාක දෙන කල්හී ඉතා අප්‍රමෙය වූ විපාක දෙන්නේය. එසේ හෙයින් නුවණැත්තා වූ සත්වතෙම කුසල් නම් දෙය ස්වල්ප යයි නිඥ නො කරන්නේ මය. එයින් කීහ පූර්වාචාර්යවරයෝ :

යථා සාසපමත්තාපි - බීජා නිග්‍රොධ පාදපො,
ජායතෙ සත සාඛඩ්ඩො - මහා නීලම්බුදෙපමො.

තථෙව පුඤ්ඤකම්මම්හා - අණුම්හා විපුලං ඵලං,
හොතීති අප්පපුඤ්ඤන්ති - නාවමඤ්ඤෙය්‍ය පණ්ඩිතො-යි.

මෙසේ මහත් වූ රාජ්‍යශ්‍රී විඳිමින් කල් යාමක් ගිය[6] කල්හි දවසෙක අග මෙහෙසුන් බිසව් රජ්ජුරුවන්ගේ අපමණ වූ සම්පත් බලා 'අපගේ රජ්ජුරුවන් වහන්සේ ඉතා බැගෑපත් සේකැ'යි කරුණා උපදවා කළකිරුණාවූ ආකාර දැක්වූහ.

1. දිසාවට - BFGH ක.කි.ඤ.
2. දිසාවට - BFGHKL, ක.කි.ඤ.
3. කප්රුකින් - KL
4. දිව සැපත් - BCDFGH, ක.කි.ඤ.ම.ස.
5. පැලයක් - KL
6. පලාගිය - KL

Non-Commercial Distribution

ඒ දැක 'මේ කිමෙක් ද දෙවිනි'යි රජ්ජුරුවන් විචාළ කල්හි 'දේවයන් වහන්ස, නුඹවහන්සේ පූර්වජාතියෙහි පිරිසිදු සිතින් කරනලද්දවූ කුශලානුභාවයෙන් දැන් මෙබඳු රාජ්‍යසම්පත්තියක් ලත්සේක. එසේ හෙයින් මතු සැප විඳිනා ලෙස දැන් කුසල් නොකරන සේක් නැ' යි[1] කීහ. එතෙපුල් අසා රජ්ජුරුවෝ 'සිල්වතුන් වහන්සේ නැත, කාට දන් දෙමෝ දැ'යි කීහ.

එබසට බිසව් කියන්නාහු 'දේවයන් වහන්ස, මේ ජම්බුද්වීපය නම් වටින් දස දහසක් යොදුන් පමණ ඇතියේය: සුවාසූ දහසක් පමණ රාජධානීන් හොබනේය: සපනසක් රුවන් ආකරයෙන් පැරහුණේය:[2] නව අනූවක් ද්‍රොණමුඛයෙන් විරාජමාන ය: සයානූකෙළක්[3] පටුන් ගමින් ශොභාමත් විය: ධර්මිෂ්ඨ වූ සක්විති රජුන් හා බුදු පසේබුදු මහරහතන්ට වාසස්ථාන විය: මෙසේ හැම ලෙසින් අනූන වූ මේ ජම්බුද්වීපයෙහි දන් පිළිගන්ට සුදුසු රහතුන් වහන්සේ නැතැයි නොසිතුව මැනව: ඒකාන්තයෙන් ඇතිසේක් ම ය: නුඹවහන්සේ සැකයක් නොසිතා දන් පැරහුව මැනව. රහතන්වහන්සේ ගෙන්වීම මට භාර යැ'යි කීහ.

එකල රජ්ජුරුවෝ යහපතැයි ගිවිස දෙවන දවස් මෙනම් දෙයෙක් මෙහි නැතැයි නොකියන පරිද්දෙන් මහ දන් සරහා තිබූහ[4]. බිසවු වනාහි උදසන්හි ම පෞෂධාඞ්ග[5] ශීලය සමාදන් ව මතුමහල්තලයට පැන නැඟී[6] උතුරුදිග් බලා හිමාලය පර්වතයට අභිමුඛ ව සිට 'ඉදින් මේ දිශාභාගයෙහි[7] රහතුන් වහන්සේ ඇත් නම් අප හැම කෙරෙහි කරුණාවෙන් දැන් මේ මාළිගාවට වැඩ අහර පිළිගන්නාසේක්ව'යි කියා සමන් මල් මිටක් ගෙන ආකාශයට දමා දණ්ඩනමස්කාරයෙන් වැඳගෙන ඔත්හ. එවේලෙහි ආකාශයට දමනලද්දවූ ඒ ජයසුමන කුසුමයෝ බිසවුන්ගේ ශ්‍රද්ධාබලයෙන් බිම නොබී ආකාශයෙන් ගොස් පද්මාවතී බිසවුන්ගේ පුත් වූ එකල හිමාලය පර්වතයෙහි වසන පන්සියයක් පසේබුදුවරුන් වහන්සේ අතුරෙන් හැමදෙනා වහන්සේට වැඩිමහලු මහපදුම්[8] නම් පසේබුදුන් වහන්සේගේ පාමුල්හි හුණුවාහ. අහෝ පින්වත් සත්වයෙනි, කුශලකර්මයාගේ ආශ්චර්යයක් බලව: මේ ලොකයෙහි අචෙතස්ක වූ[9] පුෂ්පයෝ පවා කුසල් කළවුන්ට දූත මෙහෙවර කරන්නාහ. එසේ හෙයින් මේ ලොකයෙහි සියල්ල ම තමාගේ[10] වසඟත්වයට පමුණුවනු කැමැත්තාවූ නුවණැත්තහු විසින් හැම කල්හි නොපමා ව තමාගේ ශක්ති වූ පරිද්දෙන් උත්සාහවත් ව කුසල් කටයුත්තේ මය. එසේ හෙයින් කියනලදී:

අහො පස්සථ හො දනි - විම්හයං පුඤ්ඤකම්මිනො
අචෙතනාපි පුප්ඵානි - දූත කිච්චෙසු ව්‍යාවටා

---

1. සේක් නුයි - ADEFGHJK කි.ජු.ක.ම.
   සේක් වනැයි - L
   සේ නුයි - B
2. සැදුණේය - KL
3. සයානූකෙළ ලක්‍ෂයක් - EGKL
   සයානූනැට ලක්‍ෂයක් - H
4. සැරහූහ - GH
5. උපොසථාංග - කි.ජු.ක.ම.
6. නැඟී - මුද්‍රිත හැම, ස.
7. දසාභාගයෙහි - A, බෙ.
8. පදුම - ABCEFGHJKL
9. අචෙතසික - C, ජු.
   අචෙතනික - ක.කි.ම.
10. තමා - KL

Non-Commercial Distribution

කත්තුකාමෙන ලොකස්මිං - සකලං අත්තනො වසං
සබ්බත්ථාමෙන කත්තබ්බං - පුඤ්ඤං පඤ්ඤවතා සදා-යි.

මෙසේ ආකාශයෙන් ගොස් තමන් වහන්සේගේ පාමුල්හි හුණුවාවූ මල් දැක ඉක්බිති මේ කවර විස්මයෙක් දෝහොයි දිවසින් බලා වදරන්නාවූ මහාපදුම නම් පසේබුදුන් වහන්සේ එපවත් දැන යෙසු මල් පසේබුදුවරුන් වහන්සේ සමීපයට කැඳවා 'එම්බා සත්පුරුෂයෙනි, නන්දිය රජ්ජුරුවෝ තොප හැම දෙනාහට ආරාධනා කොට කැඳවා එවූය: එබැවින් තෙපි හැමදෙන ම ඔහුගේ ආරාධනා ඉවසව[1]' යි වදළසේක. එතෙපුල් අසා මුවෙන්[2] නොබිණීමෙන් හැමදෙනා වහන්සේ ම ආරාධනා ගිවිස දෙවන දවස් උදයන්හි ම අනවතප්ත විලින් මුවමුහුණු[3] ශුඩ කොට ගැට[4] ගන්වා පාත්‍ර අතින් ගෙන පියුම් විලකට නික්මුණු හංස සේනාවක් සේ ආකාශයෙන් අවුත් බරණැස් නුවර උතුරු දිග වහසල්දෙර සමීපයට බටසේක. එකෙණෙහි මනුෂ්‍යයෝ දිව ගෙන ගොස් 'රජ්ජුරුවන්[5] වහන්ස, පන්සියයක් පසේබුදුවරුන් වහන්සේ අවුත් උතුරුදිග වාසල්දෙර සමීපයෙහි වැඩසිටිසේකැ' යි කියා රජ්ජුරුවන්ට දැන්වූහ. එපවත් අසා බිසවුන් හා රජ්ජුරුවෝ පෙරගමන් කොට ගොසින් පසේබුදුවරුන් වහන්සේ වැද පාත්‍රය[6] ගෙන හැමදෙනා වහන්සේ රජගෙට වඩා ගෙනවුත් මහදන් දී වළඳවා ඉක්බිති රජ්ජුරුවෝ වැඩිමහලු පසේබුදුන් වහන්සේගේ පාමුල්හි වැදගෙන හොත්තාහ. බිසවු හැමදෙනා වහන්සේට බාල පසේබුදුන් වහන්සේගේ පාමුල්හි වැදගෙන හොත්තාහ. මෙසේ වැදගෙන හෙව දන්වන්නාහු 'ස්වාමිනි, හැමදෙනා වහන්සේ ප්‍රත්‍යයෙන් නොමිරිකුණ මැනව: අපි හැම පින්කමින් ඉස් ශොධා නහා පිරිසිදු වම්හ; එබැවින් ආහාරය පිණිස බැහැර නොවැඩ මෙහි ම වසන ලෙස අපට ප්‍රතිඥ දුන මැනවැයි' කියා හැමදෙනා වහන්සේ ලවා ප්‍රතිඥ කරවාගෙන පලු පලලව කුසුමයෙන් සශ්‍රීක වූ තමන්ගේ මඟුල් උයනෙහි හැමදෙනා වහන්සේට වෙන වෙන රාත්‍රිස්ථාන දිවස්ථාන සක්මන් මණ්ඩප ආදී වූ වාසස්ථාන කරවා ජීවිතාන්තය දක්වා සිවුපසයෙන් උපස්ථාන කොට ඒ සියලු පසේ බුදුවරුන් වහන්සේ පිරිනිවිකල්හි සාධු ක්‍රීඩා කරවා මහ පෙරහරින් ආදහන කොට පිනිදිය මුසු සඳුන් සුවඳ කස්තුරු කපුරු තුවරලා ආදී වූ සුවඳ බඩු සුනු කොට බහන ලද සුවඳ ජලයෙන් සොහොන් නිවා ධාතූන් වහන්සේ ගෙන දගබ් කරවා නොයෙක් හේරීතූර්‍යභාණ්ඩයන් හා බත් මල් පහන් ආදියෙන් අපමණ වූ පූජා කොට 'මෙබඳු දෙයාසංඛ්‍යෙය කප් ලක්‍ෂයක් පාරමිතා පුරා පසේබුදුබවට පැමිණියාවූ මහානුභාවසම්පන්න මහොත්තමයන්ට[7] පවා මරණ එකාන්ත වන්නේ මය: අප වැන්නවුන්ට කියනු ම කවරේ දැ' යි කියා මහත් වූ සංවේගයට පැමිණ සසර කළකිරුණාවූ රජ්ජුරුවෝ වැඩිමහලු පුතණුවන් රාජ්‍යයෙහි පිහිටුවා තුමූ ගිහුපුව්‍රජ්‍යාවෙන් මහණ වූහ. බිසවු ද 'රජ්ජුරුවන් මහණ වූ කල මම තව කුමක් පිණිස ගිහිගෙයි හිඳිම් දැ' යි කියා රජසැපත් හැර මහණ ව මඟුල් උයනට වැද

1. ඉවසව - ABCDEFGHKL
   ඉවස - J
   ඉවසව් - මුද්‍රිත හැම
2. මුයෙන් - KL
3. අතමුව - E; මුව - BCD
   මුවමුහුණ - AFJ; මුහුණ - GH
4. ගැටවවු - BCEK කි.කැ.ක.ම.ස.
5. දේවයන් - DEFGHKL ස.
6. පාත්‍ර - KL ස.
7. මහාත්මයන්ට - KL

Non-Commercial Distribution

බ්‍රහ්මරාජයන් දෙදෙනකු සේ වෙන වෙන ම පන්සල්හී වෙසෙමින් නොබෝ කලකින් පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ධ්‍යානසුවයෙන් දවස් යවන්නාහු ජීවිතාවසානයෙහි අපරිහීනධ්‍යානයෙන් ගොස් බ්‍රහ්මලොකයෙහි ඉපද එහි ආයු පමණින් ධ්‍යානසුව විඳ අප මහා ගෞතම බුදුන් සමයෙහි බ්‍රහ්මලොකයෙන් අවුත් බමුණු මහසල් කුලයෙක ඉපද බුදුසසුන් වැද මහණ වූහ.[1]

එකල[2] ගිය[3] දවස පියුමතුරා නම් බුදුන් සමයෙහි තමන් ප්‍රාර්ථනා කළ පරිද්දෙන් ම ධුතාඞ්ගධරයන් කෙරෙහි අග්‍ර වූ ස්ථානාන්තර ලදින් මහා කාශ්‍යප ස්ථවිර ය යන නාමින් ප්‍රසිඩ ව බුදු සසුන් නමැති ආකාශයෙහි හිරසඳ සේ බබළමින් බුදුන් පිරිනිවි කල්හි පන්සියයක් රහතන් වහන්සේ පිරිවරා අජාසත් මහ රජහුගේ ආරක්‍ෂාවෙන් ධර්‍මසඞ්ගායනා කොට බුදුසසුන් බැබළවූහ. එකල්හි නන්‍දිය රජ්ජුරුවන්ගේ බිසවු ද මේ බුඩොත්පාදයෙහි භද්‍ර කපිලානි[4] නම් වූ බ්‍රාහ්මණ කුමාරිකා ව ඉපද බුදුසසුන් වැද[5] මහණ ව රහත් වූහ.

මෙසේ ගිය දවස වනාන්තරයෙහි ඇවිදිනා වූ එක් කෙළෙඹි පුත්‍රයෙක් පවා පසේබුදුකෙනකුන් වහන්සේගේ සිවුරට නුවා පමණක් දන් දී දිව්‍යලෝකයෙහි ඉපද බොහෝ කාලයක් දිවසැපත්[6] විඳ නැවත මිනිස්ලොව ඉපද එම කුශලානුභාවයෙන් පොළොව පළාගෙන නැංගාවූ කල්පවෘක්‍ෂ සමූහයෙන් සියලු රාජ්‍යය උතුරුකුරු දිවයින පරිද්දෙන් ශොභාමත් කරවා මහානුභාවසම්පන්න ව අපමණ වූ රාජ්‍ය ශ්‍රී වින්දේය. එබැවින් පින්වත් සත්වයෙනි, නොප හැම විසිනුදු එපරිද්දෙන් ම සියලු භවභොග සම්පත් ලබන ලෙස අප්‍රමාද ව සිල්වතුන් වහන්සේට තම තමා ශක්ති පමණින් දන් දෙව: එසේ දෙනලද්දවූ දනය මතු නොපට ඒ ඒ ජාතියෙහි සියලු ඓශ්වර්‍ය්‍ය ලැබීමට ප්‍රතිෂ්ඨාධාර නමුදු වෙයි: කැමැති කැමැති වස්තු සිඩ කොට දෙන සිතුමිණිරුවනෙක්[7] නමුදු වෙයි: නොයෙක් සම්පත්තීන් සමෘඩ ව පිටියාවූ කල්පවෘක්‍ෂයෙක් නමුදු වන්නේ ය: එසේ හෙයින් තම තමා ශක්තිපමණින් පිළිවන් දන්පින් කොට මතු සියලු භවභොග සම්පත්තීන් සිද්ධ කොට[8] නිවන් පුර සිරිවිඳින්ට උත්සාහකළ මැනවි. එසේ හෙයින් කියනලදුයේ මැයි:

දත්වා පුරෙකො විපිනෙ චරන්තො
පච්චෙකබුඩස්සානුවාත මත්තං,
අකාසි රට්ඨං[9] කුරුදීප සොභං,
මහානුභාවොවනිපො අහොසි.[10]

තුහෙම ච හොන්තො බලු සීලවන්ත
දදථ දනානි අනප්පකානි,
තං වො[11] පතිට්ඨා ච භවන්තරස්මිං
චින්තාමණිං කප්පතරුංව සාරං-යි.

මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි
නන්‍දිරාජ වර්ග පළමු වන නන්‍දිරාජ වස්තුව
කියා නිමවන ලදී.

---

1. මහණවෙ - *ACDEFI*
2. එකල්හි - AK; ස.බෙ.
3. යටගිය - BKL; ස.බෙ.
4. භද්‍රකාපිලානි - E බෙ.ම.ස.
5. පසුන් වැද - ABFGHJKL
6. දිව් සම්පත් - BCJ කි.කඳ.ක.ම.
7. සිතුමිණිරුවනක් - *ABJ* කි.කඳ.
8. මතු...... සිද්ධ කොට (නැත) - F
9. තංවො පරට්ඨං - පාලි
10. මහානුභාවො වසුධාධිපොස - පාලි
11. තෙ - KL

තව ද මේ නන්දිරාජ වග දෙවන උත්තර සාමණේර වස්තුව නම් කවර යත්?

එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු: ඒ උත්තර නම් සාමණේරයන් වහන්සේ පූර්ව සර්වඥවරයන් දැක දන මානනාදි වශයෙන් රැස් කරනලද මහ පින් ඇති ව ඒ ඒ ජාතියෙහි නිවන් පතා කුසල් කෙරෙමින් සසර ඇවිදිනාසේක් මේ මහාභද්‍රකල්පයට තිස්දහසක් කපින් මත්තෙහි ලොව පහළ වූ සුමෙධ නම් බුදුන් සමයෙහි විද්‍යාධර ව හිමවත වසනසේක. එකල්හි ඒ සුමෙධ නම් බුදුරජාණන් වහන්සේ එක් දවසෙක විවෙකස්ථාන කැමැති ව හිමාල[ය] වනයට එළඹ ඉතා සිත්කලු වූ එක් භූමිප්‍රදෙශයෙක්හි පළක් බැඳ වැඩහුන්සේක.

එකල ඒ විද්‍යාධර පුරුෂයා ත්‍රිශූලායුධයක් අතින් ගෙන අහසින් යනුයේ පර්වතයක් මුදුනෙහි දිලියෙන ගිනිකඳක් සේ ද පුරපසළොස්වක් දවස් සොළොස් කලාවෙන් සම්පූර්ණ ව ආකාශ මණ්ඩලයෙහි දිලිසෙන පූර්ණචන්ද්‍රයා සේ ද මුල පටන් අග දක්වා එකපැහැර පිපී වැනී ගිය ශාලද්‍රැමරාජයකු සේ ද මහවනය හොබවමින් වැඩහුන්නාවූ ඒ බුදුරජාණන් වහන්සේ හා හුණවනයෙක ගිනි ගත් කල අහසට නැගෙන ගිනිසළා සේ සියලඟින් නික්ම දසදික් බබුළුවා මහවනය මුදුනෙන් දිවන බුදුරස්කඳ දැක මහත් වූ සන්තොෂයෙන් යෙදී 'මෙබඳු ආශ්චර්යාමත් වූ බුදුන්ට පූජාවක් කළ මැනවැ'යි සිතා පිදියයුතු වස්තුවක් පරීක්ෂා කරනුයේ[1] මල් පිපී සිටි කිණිහිරිගසක් දැක එයින් කිණිහිරිමල් තුනක් කඩා ගෙනවුත් බුදුන්ට පූජා කෙළේය. එකල ඒ කිණිහිරිමල් තුන බුදුන්ගේ බුද්ධානුභාවයෙන් තුවටු උඩ බලා පෙති බිම් බලා බුදුන් සිරසට ඡායා කොට ගෙන රන් ඡත්‍ර තුනක් සේ ශොභාමත් ව සිට ගත. ඒ බව හඟවා තමන් වහන්සේගේ පූර්වචරිතය[2] දක්වන පිණිස එම උත්තර සාමණේරයන්[3] විසින් කියනලදී:

පබ්බතග්ගෙ යථා අග්ගි - පුණ්ණමා[සෙ][4] ව චන්දිමා,
වනං ඔභාසතෙ බුද්ධො - සාලරාජාව ඵුල්ලිතො.

වනග්ගා නික්ඛමිත්වාන - බුද්ධරංසී විධාවරෙ,
නළග්ගිවණ්ණසංකාසා - දිස්වා චිත්තං පසාදයිං.

විචිනං අද්දසං පුප්ඵං - කණිකාරං දෙවගන්ධිකං,
තීනි පුප්ඵානි ආදය - බුද්ධ සෙට්ඨං අපූජයිං.

බුද්ධස්ස ආනුභාවෙන - තීනි පුප්ඵානි මෙ තදා,
උද්ධවණ්ටා අධොපත්තා - ඡායං කුබ්බන්ති සත්ථුනො-යි.

එකල ඒ විද්‍යාධර පුරුෂයා බුදුන්ගේ බුද්ධානුභාවයෙන් සිද්ධ වූ ඒ ආශ්චර්ය්‍ය දැක වඩ වඩා සතුටු වූ සිත් ඇති ව මෑතභාගයෙහි එයින් චුත ව එම කුශලානුභාවයෙන්

1. කරනුවෝ - ABCDFI, ක.කි.කැ.ඔ.
   කරන්නේ - GHK
2. පූර්වචරියාව - GHL.
3. සාමණේරයන් වහන්සේ -GHKL
4. පුණ්ණමාසෙව - හැම

Non-Commercial Distribution

තවුතිසා දෙව්ලොව උපන. එකල ඕහට සැටයොදුන් උස ඇති තිස් යොදුන් දිගපුළුල ඇති ලක්ෂගණින් කන්කුළුපෙළින් ශොභමාන[1] වූ කිණිහිරි නම් දිව්‍යවිමානයෙක් පහළ විය. ඒ දිව්‍යවිමානයෙහි දහස් ගණින් කඩ ඇති සියගණින් හෙණ්ඩුකයන් ඇති රන්වන් වූ ධවජ[2] මාලාවෝ මඳ මඳ පවනින් කම්පා කරන ලද්දාහු රන්රස ධාරාවන් ඉස්නා කලක් මෙන් තන්හි තන්හි ලීලොපෙත ව ලෙල දෙන්නාහ. තව ද එ විමානය කැමැති කැමැති සුවපහස් දෙන්නාවූ ඝනරන්මය වූ ද ඉන්ද්‍රනීල මාණික්‍යමය වූ ද ලොහිතඞ්ක මාණික්‍යමය වූ ද ස්ඵටික මාණික්‍යමය වූ ද දහස් ගණන් ආසනවලින් සැදුම් ලද්දේය. එසේ ම දිව කන්වයින් සහිත වූ මනහර දිවතිලින් හා සිංහ ව්‍යාඝ්‍රාදි නානාප්‍රකාර විචිත්‍රරූප පඞ්ක්තීන් විසිතුරු වූ මනහර දිව ඇතිරි හා එක් පස රෝමයන් සහිත ඇතිරිය දෙපස රෝමයන් සහිත ඇතිරිය දෙවඟනන් සොළොස් දෙනකු සිට[3] නැටිය හැකි මහඅවන් ඇතිරිය යනාදි වූ මනහර දිවඇතිරි අතුරන ලද මහඇඟි දිවයහන්වලින් ශොභමාන ය. තව ද ඒ දිව්‍යපුත්‍රයා යම් දවසෙක තමා වසන ඒ කිණිහිරි නම් දිව්‍යවිමානයෙන් පිටත් ව දිවසෙනඟ පිරිවරා දෙවචාරිකාවෙහි නික්මේ ද එකල්හි[4] හාත්පසින් සියක් යොදුන් පමණ තැන ආකාශ කුහරය වසා කිණිහිරි මලින් ම අහස් වියන් වෙයි. එසේ ම එපමණ තන්හි බිම නොපෙනෙන සේ කිණිහිරි මලින් ම බුමුතුරුණු වෙයි. දෙපස රන්තිර ඇද්ද සේ කිණිහිරිමලින් ම තිර මැවී සිට ගත්තේය. තව ද සැටදහසක් පමණ දිව්‍යනාටකයෝ නොයෙක් දිව්‍යලීලාවෙන් සැරහී නානාප්‍රකාර හෙරීතූර්‍යභාණ්ඩයන් ගෙන හැම දවස් ම සවස උදාසන ඒ දිව්‍යපුත්‍රයාහට උපස්ථානයට එළඹ පිරිවරා සිටිති. එකල ඒ දිව්‍ය පුත්‍රතෙම ඔවුන්ගේ දිව්‍යමය වූ මනහර නෘත්‍ය ගීත වාද්‍ය ආදියෙන් සන්තුෂ්ට ව තමා කැමැති කැමැති වූ දිව්‍යක්‍රීඩාවෙන් දවස් යවන්නේය.

මෙසේ නළුනාටකයන් හා මනහර සුරසුන්දරීන් පිරිවරා කැමැති කැමැති දිව්‍යභොජනයන් අනුභව කොට දිව්‍යපානයන් බොමින් තවුතිසා දෙව්ලොව ඒ කිණිහිරි නම් දිව්‍යවිමානයෙහි මහත් වූ සන්තොෂයෙන් යුක්ත ව බොහෝ කාලයක් දිව්‍යසම්පත් අනුභව කෙළේය. ඒ බව හඟවන පිණිස එම උත්තර සාමණේරයන් වහන්සේ විසින් කියනලදී:

සට්ඨිං[5]තුරිය සහස්සානි - සායං පාතං උපට්ඨහුං,
පරිවාරෙන්ති මං නිච්චං - රත්තින්දිව මතන්දිතා.[6]

තත්ථ නච්චෙහි ගීතෙහි - තාලෙහි වාදිතෙහි ච,
රමාමි ඛිඩ්ඩරතියා - මොදාමි කාම කාමහං.

තත්ථ භුත්වා ච පිත්වා ච - මොදාමි තිදසෙ තදා,
නාරිගණෙහි සහිතො - මොදාමි ව්‍යම්හ[7]මුත්තමෙ-යි.

---

1. ශොභාමත් - GHKL
2. ධජ - FGHJK
3. පිට සිට - ස.
4. නික්මෙන කල්හි - BGHKL
5. සට්ඨි - ස
6. මතන්දිතං - FJ
   මතන්දිතො - KL
7. බ්‍යම්හ - EDJKL
   බ්‍යම්හ - F
   බ්‍යම්හ - BGH

Non-Commercial Distribution

තව ද ඒ උතුරු[1] නම් සාමණේරයන් වහන්සේ එම විද්‍යාධර ව උපන් සමයෙහි සුමෙධ බුදුන් දැක පහන් සිතින් පිදූ කිණිහිරි මල් තුනෙහි අනුසසින් පන්සියක් වාරයෙහි ශක්‍රදෙවේන්ද්‍ර ව ඉපද චාතුර්මහාරාජිකය තාවතිංසය යන දෙදෙව්ලොවට අධිපති ව දිව්‍යරාජ්‍යය කළසේක. තුන්සියක් වාරයෙහි දෙදහසක් කොදිවු[2] පිරිවර කොට ඇති සතර මහාද්වීපයට එකච්ඡත්‍ර නංවා චක්‍රවර්ති රාජ්‍යය කළසේක. තව ද අසංඛ්‍යගණන් ජාතියෙහි දඹදිව ප්‍රදෙශ රාජ්‍යය කළසේක. මෙසේ කුඩු මහත් භවයෙහි සැරිසරා ඇවිදිනාවූ[3] ඒ සාමණේරයන් වහන්සේ එම මල්පූජාවෙහි අනුසසින් අපමණ වූ උපභොග පරිභොග සම්පත් ලබනසේක්[4] කෙපමණ වියදම් කළත් ඒ සම්පතෙහි අඩුවක් නොපෙනෙන්නේය. තව ද එම මල් පූජාවෙහි අනුසසින් තිස් දහසක් කප් මුළුල්ලෙහි දිව්‍යගතිය මනුෂ්‍යගතිය යන මේ දෙගතිය හැර අනික් නරකගතිය ප්‍රෙතගතිය යනාදි වූ දුර්ගතියෙක[5] නූපන් සේක. ඉනුත් මනුෂ්‍යගතියෙහි උපදන සේක් වී නම් රජකුලය බමුණුකුලය යන මේ දෙකුලයෙහි[6] උපදනා සේක: එයින් අන්‍ය වූ හීන කුලයෙක නූපන්සේක් මය. ඒ උපනුපන් හැම තැන්හි මෙතෙකැයි පමණ නැත්තාවූ ඇත්වාහන අස්වාහන රථවාහන ඉදෝළි[7] දෝළි කුනම් රන්සිවිගෙවල් ආදි වූ බොහෝ වාහන සම්පත් ලබන සේක. එසේ ම ගණන් නැති දැසිදස් ගව මහිෂාදීන් හා නොයෙක් වස්ත්‍රාලඞ්කාරයෙන් සැරහී සිව් සැටක් පමණ ස්ත්‍රී ලක්ෂණයෙන් විරාජමාන ව[8] තම තමන්ගේ භාව හාව ලීලාවිලාසයෙන් හා ප්‍රෙමනීය වූ ළඳ බොළඳ මුග්ධවචනයෙන් සිත් පොළොඹා[9] වසන ඒකාත්මික[10] වූ ස්ත්‍රීජනයන් ද එසේ ම මාහැඟි වූ තිහිරිපිළිය[11] කපුපිළිය උතුම් වූ[12] පලසය දෙවාඞගය යනාදි වූ ඒ ඒ දේශයෙහි උපන් අනඝ වූ වස්ත්‍ර ජාතීන් ද ලබනසේක. තව ද එසේ ම අලුත් වූ උතුම් ව[13] සිටි අග්‍රවස්ත්‍රය අග්‍රඵලය අග්‍ර වූ රස භොජනය යන මේ සියල්ල ද හැම කල්හි ම ලබනසේක. මධුර වූ මේ කන දෙය කව, මේ මිහිරි වූ ආහාරය අනුභව කරව, මේ පාන වර්ගීය පානය කරව, මේ මනොඥ වූ මොලොක් ශයනාසනයෙහි සැතපෙව යි මෙසේ උතුම් වූ කන බොන දැ හා ශයනාසන එළවා මහත් වූ ආදර ගෞරවයෙන් පිය වදන් කිය කියා පිරිවරා සිටිනා පෙම් වඩන[14] පරිවාර ජනයන් ලබනසේක. ඒ බව හඟවනු පිණිස එම උත්තර සාමණේරයන්වහන්සේ විසින් කියනලදී.

කොසෙය්‍ය කම්බලියානි - ඛොමකප්පාසිකානි ච,
ලභාමි සබ්බමෙවෙතං - බුද්ධපූජායිදං ඵලං.

---

1. උත්තර - D, කි.
2. කොදෙව් - CFHI, ක.කි.ඤ.බෙ.
   කොදිව් - ABDEGIKL ම.
3. ඇවිදිනාහු - ACF
4. ලබනසේක - BCGHJKL ම.
5. දුගතියෙක - BGHKL
6. රජකුලෙහි හෝ බමුණු කුලෙහි හෝ -ACFJ
   රජකුලයෙහි හෝ බමුණු කුලයෙහි හෝ - GHKL, ක.කි.ඤ.ම.ක.
7. ඉදෝළු - ABFGJ
   ඊදෝළු - H
   ඉනෙළු - E
   ඉම්දෝලි - L
8. විරාජමාන වෙමින් - BDEGHKL ම.
   විරාජමාන වූ - CF
9. පොලඹා - BDGHL, ක.කි.ඤ.
10. කාමික - ක.කි.ඤ.
11. තිහිරිපිළිය කොමුපිළිය - ස
12. උත්තම වූ - ක.කි.ඤ.බෙ.ස.
13. උතුම් උතුම් ව - CDEF බෙ.ම.ස.
14. සහිත - BDEGHKL ම.

Non-Commercial Distribution

නව වත්ථං[1] නව ඵලං - නවග්ග රස භොජනං
ලභාමි සබ්බ මෙවෙතං - බුද්ධපූජායිදං ඵලං.

ඉමං ඛාද ඉමං භුඤ්ජ - ඉමම්හි සයනෙ සය,
ලභාමි සබ්බමෙවෙතං - බුද්ධපූජායිදං ඵලං--යි.

තව ද එම මල්පූජායෙහි අනුසසින් උපනුපන් යම් ම ජාතියෙක හිර සඳ සේ හැම තැන්හි පූජිත වනසේක: දශදිග පතළ යශො තෙජස් ඇතිවනසේක: මහත් වූ පක්‍ෂබල ලබනසේක: කිසි කෙනකුන් විසින් බිඳුවා වෙනස් කරවා පිය නොහැකි පරිවාර ජනයන් ලබනසේක: බන්‍ධුජනයන්ට ජ්‍යෙෂ්ඨ ව උතුම් වනසේක. තව ද උන්වහන්සේට සෘතු පෙරළීමෙන් වන ශීතොෂ්ණාදි[2] වූ ව්‍යසනයකුත් නැත: ශරීරදහයකුත් නැත: සිත්හි උපදනාවූ චෛතසික දුඃඛයකුත් නැත, එහැම කල්හි එක ජාතියෙකත් අමනොඥ වූ නපුරු ශරීර වර්ණයක් ඇති ව නූපන්සේක: ඝන රන්කඳක් සේ[3] ශොභාමත් වූ රන්වන් ශරීර ඇති ව ම උපන්සේක.[4] ඒ බව හඟවන පිණිස එම හෙරණුන් වහන්සේ විසින් කියනලදී:

සබ්බත්ථ පූජිතො හොමි - යසො අච්චුග්ගතො මම,
මහා පක්ඛො සදා හොමි - අභෙජ්ජ පරිසො සදා:
ඤාතීනං උත්තමො හොමි - බුද්ධපූජායිදං ඵලං.

සීතං උණ්හං න ජානාමි - පරිළාහො න විජ්ජති,
අථො චෙතසිකං දුක්ඛං - හදයෙ මෙ න විජ්ජති.

සුවණ්ණවණ්ණො හුත්වාන - සංසරාමි භවාභවෙ,
වෙවණ්ණියං න ජානාමි - බුද්ධපූජායිදං ඵලං--යි.

මෙසේ ආශ්චර්‍ය්‍යීමත් වූ නොයෙක් ශ්‍රී සම්පත් විඳිමින් දෙව්ලොවින් මිනිස්ලොවට එමින් මිනිස්ලොවින් දෙව්ලොවට යෙමින් තිස් දහසක් කප් මුළුල්ලෙහි දිව්‍ය මනුෂ්‍ය ලොක දෙක්හි සැරිසරා ඇවිදිනාසේක් එම කුශලකර්‍මයා විසින් ගමනෙයවන ලදු ව මේ බුද්ධොත්පාදයෙහි රජගහානුවර බොහෝ ධනධාන්‍ය සම්පත් ඇති බමුණු මහසල් කුලයෙක උපන්සේක: එකල උන්වහන්සේට උත්තර කුමාර යයි නම් තුබූහ. ඒ කුමාරයෝ බාල අවස්ථාවෙහි ම ස්වර්ණ ප්‍රතිමබයක් හා සමාන වූ මනහර රූප සම්පත්තියක් ඇති ව විඥබවට පැමිණ බමුණන් විසින් උගත මනා සියලු ශිල්පශාස්ත්‍රයෙහි නිෂ්පත්තියට පැමිණ තමන්ගේ ජාතිය රූපය විද්‍යය ශීල ය ආචාරය ගුණය නුවණය යනාදි වූ උත්තමභාවය නිසා ලොවැසියන් විසින් සම්භාවනීය වූහ.

එකල ඒ කුමාරයන්ගේ ගුණ නුවණ හා මහත් වූ ඓශ්චර්‍ය්‍ය සම්පත් දැක වස්සකාර නම් වූ මහා[5] අමාත්‍යයෙක් තමාගේ දුවක මිහට පාවා දී ඒ කුමාරයන්

1. වණ්ණං - GH
2. සීතුණ්හාදි - BH
3. මෙන් - BDEFGHKL
4. උපදනාසේක - BCDEFGHJKL ස.
5. මගධ මහා - KL ම.

Non-Commercial Distribution

නෑ කොට ගත්නා කැමති ව තමාගේ ඒ අභිප්‍රාය බ්‍රාහමණ කුමාරයන්ට හැඟවී ය.[1] ඒ තෙපුල් අසා ඒ උතුරු නම් බමුණු කුමාරයෝ තමන් ගිහිගෙයි ඇල්මක් නැති හෙයින් ඒ වචනය ප්‍රතික්ෂේප කොට බොහෝ සේ සැරියුත් මහතෙරුන්වහන්සේ කරා එළඹ බණ අසමින් බුධශාසනයෙහි පැහැද මහණ ව වත් පිළිවෙත් සරු ව සැරියුත් මහතෙරුන් වහන්සේට උපස්ථාන කරන සේක. එසමයෙහි දවසෙක සැරියුත් මහතෙරුන් වහන්සේට එක්තරා ව්‍යාධියෙක් උපන. ඒ ව්‍යාධියට බෙහෙත් පිණිස එදවස් ඒ උතුරු නම් සාමණේරයන් වහන්සේ උදසන්හි ම පා සිවුරු ගෙන විහාරයෙන් නික්ම අතරමග වැම්යරක් පිට පාත්‍රය තබා ජලසමීපයට ගොස් මුව ධොවනය කරන සේක. එකල්හි එක්තරා උමං බිඳිනා සොරෙක් නුවර සොරකම් කොට ගෙන එනුයේ නුවර රකවල සිටි ගම්රකවලුන් විසින් ලුහුබඳවන ලදු ව නුවර මහවාසල් දෙරින් නික්ම පලා යනුයේ තමා ගෙන යන රුවන්පොදිය සාමණේරයන් වහන්සේගේ පාත්‍රයෙහි ලා පලා ගියේය. එකෙණෙහි ඒ උතුරු නම් සාමණේරයන් වහන්සේ ද එම පාත්‍රය සමීපයට වැඩිසේක. එකල ඒ සොරුන් ලුහුබඳවාගෙන ආවාවූ රාජපුරුෂයෝ සාමණේරයන්වහන්සේගේ පාත්‍රයෙහි තිබූ[2] රුවන් පොදිය දැක 'කොල! මේ සොරා නොවේ දැයි මොහු අල්වව'යි කියා නිරපරාධ වූ සාමණේරයන් වහන්සේ අල්වා පිටිතොල හයා බැඳගෙන ගොස් වස්සකාර නම් බමුණාට දැක්වූහ. එකල ඒ වස්සකාර නම් බමුණු රජ්ජුරුවන්ගේ සියලු රාජධුරයෙහි නියුක්ත ව ජෙදඹ හෙදද්දීය අනුශාසනා කරන්නේය. එසේ හෙයින් ඒ බමුණු සාමණේරයන් වහන්සේ දකිමින් ම ' මෙතෙමේ[3] පළමු මාගේ කියමන් නොගෙන ශුද්‍ර[4] පාෂාණ්ඩයන් කෙරෙහි මහණ වීය'යි බධවයිර ඇති හෙයින් වැරදි නොවිචාරා ම 'මොහු ගෙන ගොස් දිවස් උලහිඳුවා පියව' යි විධාන කෙළේය. එතෙපුල් ඇසූ රාජපුරුෂයෝ සාමණේරයන් වහන්සේ ගෙන ගොස් කොසඹ උලක් සැස සිටුවා එහි උල[5] හිඳුවා පීහ.

එකල උල උන්නාවූ ඒ සාමණේරයන්වහන්සේ 'මාගේ උපාධ්‍යායයන් වහන්සේට කවුරු බෙහෙදක් සපයා ගෙන යෙත් දෙ හො'යි සිතා තමන් වහන්සේගේ උපාධ්‍යාය වූ සැරියුත් මහතෙරුන් වහන්සේ සිහි කළසේක. ඉක්බිති සැරියුත් මහතෙරුන්වහන්සේ ඒ සාමණේරයන් වහන්සේ උල හිඳුවූ බව දැන නොලස් ව ගොස් ඒ බව බුදුන්ට දැන්වූසේක. එකල බුදුහු සාමණේරයන් වහන්සේගේ නුවණ පිරිපුන්[6] බව දැන බොහෝ භික්ෂු සංඝයා පිරිවරා ඒ ස්ථානයට නික්මුණුසේක. එකෙණෙහි බුදුන් නික්මුණු බව මුළු නුවර එක කොලාහල විය. නුවරවැසි මහ ජනයා ද ඇසිල්ලකින් දිව අවුත් එ තැන්හි ම රැස් වූහ. ඉක්බිති බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ නිය පෙළ නමැති මාණික්‍යරශ්මීන් හා මිශ්‍ර වූ රන්වන් පැහැ ඇති හෙයින් දැහිඟුල්[7] ධාරාවක් හා සමඟ වහනය කරන්නාවූ රත් රසධාරාවක් මෙන් විස්ඵුරිතවූ හස්තතලයෙහි ජාල කවුළුවක් සේ මනොඥ වූ ඉතා මොළොක් ඇඟිලි ඇති හස්තතලය ඒ උතුරු නම් සාමණේරයන් වහන්සේගේ ඉස් මුදුනෙහි තබා

1. ඇඟවීය - J
2. තුබු - BGHKL
3. මෙතෙම - ABCDEJKL
4. ක්‍ෂුද්‍ර - ක.කි.නඃ.ම.
   සමුද්‍ර - J
5. හුල - BEGHKL
6. පිරිහුන් - ABCDEFGHKL ම.
   පිරි ඇති - ක.කි.නඃ.
7. ද හිඟුල් - ABCFGGHJ

Non-Commercial Distribution

'එම්බා උත්තර සාමණේරයෙනි, මෙතැන්හි වූයේ මේ තොප පෙර ජාතියෙහි කළ අකුශල කර්මයාගේ විපාක ය. එසේ හෙයින් මේ අකුශල විපාකය තොප විසින් ප්‍රත්‍යවේක්ෂා බලයෙන් ම ඉවසිය යුත්තේ ය'යි වදරා ඒ අකුශල කර්මය ප්‍රත්‍යක්ෂ කොට ගෙනහැර දක්වන්නාවූ බුදුරජාණන් වහන්සේ:-

අතීතෙ කිර එකස්මිං - ගාමෙ තුවමසි දරකො,
දරකෙහි සමාගම්ම - කීළන්තො කෙළි මණ්ඩලෙ.

ගහෙත්වා සුඛුමං සූකං - තද තුවං නිම්බජල්ලියා,
උත්තාසෙසි තහිං සූකෙ - ජීවමානක මක්ඛිකං.

අපරම්පි තෙ පාපකම්මං - පවක්ඛාමි සුණොහි මෙ,
ඔවදන්තිං හිතෙන තුවං - අතීතෙ සක මාතරං.

ජීවසූලෙ නිසීදති - කොපෙනාභිසපී තුවං,
ඉමෙහි ද්වීහි පාපෙහි - සරං සංසාර සාගරෙ.

පඤ්ච ජාතිසතෙ අවීහි - ජීවසූලම්හි නිම්බජෙ,
අයං තෙ චරිමා ජාති - එත්ථාපි ච විපච්චි සො යි.

යනාදීන් 'එම්බා පෙර තෙපි එක් ගමෙක ගම්දරු ව ඉපද සෙසු[1] බොහෝ ගම්දරුවන් හා සමඟ කෙළනාහු දවසෙක කොසඹගස සුඹුලකින් ඉතා සියුම් වූ කුරක් ගෙන එක් මැස්සකු අල්වා ගෙන එකොසඹකුරෙහි උල හිඳුවාපුව; මේ එක් අකුශලයෙක. තවද එක් දවසෙක තෙපි තොපට වැඩ කැමැති ව අවවාද කරන්නා වූ මෑණියන්ගේ බස් අසා එකල්හි තෙපි කිපී 'නුඹ දිවස් උල හිඳිතේ වනැ'යි[2] කියා කොපයෙන් මෑණියන්ට බිණුව; මේ එක් අකුශලකර්මයෙක[3]. මේ අකුශල් දෙක නිසා සසර පන්සියක් වාරයෙහි කොසඹ දඬෙහි දිවස් උල උන්නෙව; මේ තොපගේ කෙළවර ජාතිය ය; දැනුදු තොපට එම අකුශලකර්මය මෙසේ විපාක දිනැ' යනාදීන් සාමණේරයන් වහන්සේගේ අදහසට සුදුසු පරිද්දෙන් බණ වදාළසේක. එකල ඒ උතුරු නම් සාමණේරයන් වහන්සේ අමෘතාභිෂේකයක් බඳු වූ බුදුන්ගේ හස්තතල ස්පර්ශ ලදින් උපන්නා වූ ප්‍රසාද සෞමනස්‍යයන් ඇති හෙයින් මහත් වූ සන්තොෂයට පැමිණ පෙර බොහෝ දවසක්[4] පුරුදු කොට ආවාවූ විදර්ශනා මාර්ගයට බටසේක් නුවණ මුහුකුරා සිටි හෙයින් බුදුන්ගේ ධර්ම දෙශනානුසාරයෙන් සිත් සතන් යොමු කොට එකෙණෙහි සියලු කෙලෙසුන් නසා ෂට් අභිඥා ලදින් රහත් වූ සේක. එම ධර්ම දෙශනාව අසා එතැන්හි රැස්වූ දෙව්මිනිසුන් අතුරෙන් සුවාසූ දහසක් ප්‍රාණීහු අමාමහ නිවන් දුටහ. ඒ උතුරු නම් සාමණේරයන් වහන්සේ ෂට් අභිඥාලාභී ව උලින් අහසට

---

1. සෙසු - BGHKL
2. හිඳිනේවයි - BDEL
   හිඳිනේයයි - GHK
3. අකුශලයෙක - ක.කි.ඤ.බෙ.
4. දවස් - B මුද්‍රිත හැම, ස.

Non-Commercial Distribution

පැනනැඟී සවිරතර ව ම හුණු[1] විදුලිය කලඹක් සේ ලීලෝපෙත ව ආකාශයෙහි වැඩසිට නොයෙක් පෙළහර දක්වා වදළසේක. එතැන්හි රැස්වූ මහජනයා ඒ දැක මහත් වූ ආශ්චර්‍ය්‍යයට පැමිණ හන් පලන් වස්ත්‍රාභරණාදියෙන් පූජා කළහ. ඒ කෙණෙහි උල ඇනි වණ මුඛය මස්බැඳ හැසවිණ. ශරීරය දිව්‍යශරීරයක්සේ නිරොගි විය.

එකල ඒ උතුරු නම් සාමණේරයන් වහන්සේගේ ඒ මහිමය දැක සෙසු භික්ෂූන් වහන්සේ 'එම්බා ඇවැත්නි, තෙපි එබඳු දුකක් විඳිමින් හිඳ කෙසේ නම් විදර්ශනා වඩා මෙබඳු[2] ගුණ විශෙෂයක් ලදු දැ'යි විචාළසේක. එවේලෙහි උතුරු සාමණේරයන්වහන්සේ 'ස්වාමීනි, පළමුකොට ම මා විසින් සංසාරයෙහි ආදීනව හා සියලු සංස්කාරධර්මයන්ගේ ස්වභාවය ඉඳුරා ම දන්නා ලද. එසේ හෙයින් මම එබඳු දුක් අනුභව කරන්නෙමුදු[3] විදර්ශනා වඩා විශෙෂාධිගමයට පැමිණියෙමි'යි වදළසේක. මෙසේ වදරා එයින් මෑතභාගයෙහි එම උත්තර සාමණේරයන් වහන්සේ විසිවයස් පිරී උපසම්පද ව තරුණ අවස්ථාවෙහි ම හිරසඳ සේ ලොකපූජිත ව වසන සේක් තමන් වහන්සේ පෙර මේ මහා භද්‍රකල්පයට තිස්දහසක් කපින් මත්තෙහි බුදු වූ සුමෙධ බුදුන් සමයෙහි බුදුන් දුටු සතුටින් කිණිහිරි මල් තුනක් පුද එතැන් පටන් මෙතුවක් කල් මුළුල්ලෙහි සතර අපායට නොගොස් දිව්‍ය මනුෂ්‍ය ලොක දෙක්හී ඉපද ලද්ද වූ නොයෙක් ශ්‍රී සම්පත් හා කෙළවර ජාතියෙහි මිනිස් ලොව ඉපද සසුන් වැද මහණ ව සත්හැවිරිදි වයස[4] රහත් ව ලද්දවූ නිවන් සම්පත් හා මේ සියල්ල ගෙනහැර දක්වන[5] පිණිස 'සුමෙධො නාම සම්බුද්ධො' යනාදි වූ ගාථා අටතිසකින් මේ තමන් වහන්සේගේ පූර්ව චරිතාපදානය භික්ෂු සඞ්ඝයා මධ්‍යයෙහි ප්‍රකාශ කොට වදළසේක. එකල ඒ ඇසුවාවූ බොහෝ ජනයෝ තම තමා ශක්ති පමණින් කුසල්කොට දෙවුලොව උපන්හ. මෙසේ එම ජාතියෙහි රහත් ව නිවන් දක්නට නිසි හෙතුසම්පත් ඇති පශ්චිමභවික වූ මහපිනැති සත්වයෝ පවා පූර්වජාතියෙහි තමන් විසින් කරනලද්ද වූ ඉතා ස්වල්ප වූ එපමණ අකුශලකර්මය පවා දුරුකොට හැරපියන්ට අසමර්ථ වූවාහු මය. එසේ හෙයින් සසර සිටිනා තෙක් කල් මුළුල්ලෙහි කිසි දුකක් නොවිඳ සසර පමණින් සියලු දිව්‍යමනුෂ්‍ය සම්පත් විඳ නිවන් සැපතින් සුවපත් වනු කැමැති සත්පුරුෂයන් විසින් එබඳු අනිෂ්ට විපාක දයක වූ අකුශල කර්මයන්[6] දුරින් ම දුරු කොට ස්වර්ග මොක්ෂ සම්පත් සාධා දීමට එකාන්ත නියත වූ කුශල ධර්මය පිරුව මැනවි. කියන ලදුයේ මැයි:-

සහෙතුකා පච්ඡිම්කාපි[7] සත්තා
පාපං න සක්කොන්ති ජහාතුමෙවං,
අනිච්ඡමානෙහි ජනෙහි දුක්ඛං
ආරාව පාපං පරිවජ්ජනීයං - යි.

මෙතෙකින් මේ නන්දිරාජ වග
දෙවන උත්තර සාමණේර වස්තුව
කියා නිමවන ලදී.

---

1. මැවුණු - BDEGHKL
2. මෙබඳු වූ - BGHK
3. කරන්නේ නමුදු - BC
   කරත් නමුදු - KL
4. වයස් ව - A
   වයස් හි - BGHKL
   වයසට - EJ
5. දක්වනු - BGHKL
6. ධර්මයන් - BGHK
7. පච්ඡිමකාපි - පිටපත් හැම; පච්ඡිම්කාය - මුද්‍රිත

Non-Commercial Distribution

තව ද මේ නන්දිරාජ වග තුන් වන **සාඛමාල වස්තුව** නම් කවර යත්? එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු:

අප මහා ගෞතම බුදුරජාණන් වහන්සේ යට කී පරිද්දෙන් දීපඞ්කර පාදමූලයෙහි විවරණ ලත් තැන් පටන් දස පාරමිතාය පඤ්ච මහා පරිත්‍යාගය ත්‍රිවිධ චර්‍ය්‍යාය යනාදි වූ සියලු බුද්ධකාරක ධර්‍මයන් පුරා තුසී පුර පැමිණ දස දහසක් සක්වළ දෙවිබඹුන්ගේ ආරාධනාවෙන් කිඹුල්වත් පුර නුවර ශාක්‍යරාජ කුලයෙහි[1] ඉපද අනුක්‍රමයෙන් සම්‍යක්සම්බුධරාජ්‍යයට පැමිණ තමන් වහන්සේගේ පළමු වන ධර්‍මදේශනාව පිළිගෙන නිවන් දක්නට නිසි විනෙය[2]ජනයන් පරීක්ෂා කොට එක්සිය විසි යොදුන් පමණ දුරු කතර ගෙවා ඉසිපතන නම් ආරාමයට වැඩ[3] දහම්සක් පවත්වා අටළොස් කෙළක් බ්‍රහ්මයන් හා සමග අඤ්ඤා කොණ්ඩඤ්ඤ මහතෙරුන් වහන්සේ අමාමහ නිවන් දක්වා මෙම ක්‍රමයෙන් මහා කාශ්‍යප ස්ථවිරාදීන් පිණිස තුන්ගවු පමණ තැන් හිඳ ආලවක අංගුලිමාලාදීන් සඳහා තුන් යොදුන් පමණ තැන්හිඳ පුක්කුස පරිබ්‍රාජකාදීන් සඳහා පන්සාළිස්[4] යොදුන් පමණ තැන්හිඳ කප්පිණ මහා ස්ථවිරාදින් සඳහා එක්සිය විසියොදුන් පමණ තැන්හිඳ වනවාසී තිස්ස සාමණේරාදීන් සඳහා එසේ ම එක්සිය විසි යොදුන් පමණ තැන්හි ද ධනිය ස්ථවිරාදීන් සඳහා සත්සියයක්[4] යොදුන් පමණ තැන්හි ද චූලොදර මහොදරාදි වූ නාගරාජයන් සඳහා අන්‍ය දීපාන්තරයෙහි ද මාතලී දිව්‍යපුත්‍රාදීන් සඳහා දිව්‍යලොකයෙහි ද බ්‍රකබ්‍රහ්මාදීන් සඳහා බ්‍රහ්මලොකයෙහි ද ඇසිල්ලකින් පෙනී මෙසේ උදකලා ව ශීඝ්‍රචාරිකා කිරීමෙන් ද.

කිසි කලෙක්හි ලෞකික ලොකොත්තරාදි සියලු ගුණගණාලඞ්කාරයෙන් හෙබියාවූ මහානුභාව සම්පන්න ශාරීපුත්‍ර මෞද්ගල්‍යායනාදි මහා ශ්‍රාවක සමූහයා විසින් පිරිවරන ලදු ව වෘෂභ සමූහයා විසින් පිරිවරනලද වෘෂභරාජයකු මෙන් ද සිංහ සමූහයා විසින් පිරිවරන ලද සිංහරාජයකු මෙන් ද ගරුඩ සමූහයා විසින් පිරිවරන ලද ගරුඩරාජයකු මෙන් ද සප්තකුල පර්වතයෙන්[5] පිරිවරන ලද ස්වර්ණමේරු රාජයා[6] මෙන් ද දහසක් රසින් පිරිවරනලද බාලාර්කමණ්ඩලය මෙන් ද තාරකා සමූහයා විසින් පිරිවරන ලද පූර්ණචන්ද්‍රයා මෙන් ද දඬුවැට පහන් සමූහයක් මධ්‍යයට පැමිණියාවූ පහන් රුකක් මෙන් ද මහා ශ්‍රාවකයන් විසින් පිරිවරන ලදු ව දෙතිස් මහා පුරුෂලක්ෂණයෙන් හා අසූ අනුව්‍යඤ්ජන ලක්ෂණයෙන් සශ්‍රීක ව නීල පීත ලොහිතාවදාත මාංජෙෂ්ඨ[7] ප්‍රභාස්වර යයි කියනලද සවනක් රසින් දිලිහෙන විචිත්‍ර ශොභා විශෙෂයන් ඇති ව්‍යාමප්‍රභා මණ්ඩලයෙන් පිරිවරන ලදු ව සුපුෂ්පිත පද්මොත්පල පුණ්ඩරීකාදීන් හෙබියාවූ ජලතලාවක් මෙන් ද තාරකා සමූහයාගේ

---

1. කුලෙහි - AEFJ
2. වෙනෙ - ABDEFGHJKL
3. පැමිණ - H
4. සත්සියක් - AEFJK
5. පර්වතයන් - BCDEFGHL, මුද්‍රිත හැම:
   පර්වතයා විසින් - ණ
6. පර්වතරාජයා - C
7. මාංජිෂ්ඨ - CF, ම.

Non-Commercial Distribution

රශ්මිශොභාවෙන් බබළන්නාවූ අකාශතලයක්[1] මෙන් ද සන්ධ්‍යා වලාපටලයෙන් හා දෙව්දුන්නෙන් හා විදුලිය කැලයෙන් වටකරන ලද ස්වර්ණපර්වත රාජයක්හු මෙන් ද තමන්වහන්සේගේ ශරීරශ්‍රීසමෘද්ධියෙන්[2] සියලු ගම් නියම්ගම් රාජධානීන් හා උද්‍යාන විමාන ආදීන් එකපැහැර ශොභාමත් කරවමින්[3] තුන් සියයක් යොදුන් වට ඇති අන්තොමණ්ඩලයෙහි ද සසියයක් යොදුන් වට ඇති මධ්‍යමණ්ඩලයෙහි ද නවසියයක් යොදුන් වට ඇති මහාමණ්ඩලයෙහි ද ගම් නියම්ගම් රාජධානි පිළිවෙළින් මෙසේ අතුරිත චාරිකා කෙරෙමින් අනෙකප්‍රකාර ආශ්චර්‍ය්‍ය සහිත[4] නොයෙක් ප්‍රාතිහාර්‍ය්‍ය දැක්වීම් ආදි වූ අපමණ උපායශක්තීන් යුක්ත ව සද්ධර්ම නමැති ජයබෙර ගස්වමින් දහම් නමැති ජය පතාක නංවමින් සද්ධර්ම නමැති ජයස්තම්භ ඉඳුවමින්[5] මෙසේ දවස දවස එකෙක දෙකෙක තුනෙක සතරෙක පසෙක සයෙක පනසෙක සැටෙක සියයෙක දෙසියයෙක පන්සියයෙක සසියයෙක දහසෙක දෙදහසෙක ලක්‍ෂයෙක දෙලක්‍ෂයෙක කෙළෙක දෙකෙළෙකැයි මෙසේ වරින් වර භව නමැති බන්ධනයෙන් මුද මුද නිවන්පුරයට මෙහෙයූ සත්ත්වයන් හැර,

සුමන මාලාකාර සමාගමය ධනපාල සමාගමය ගරහදින්න සමාගමය ආනන්ද සෙට්ඨි සමාගමය ජම්බුකාජීවක සමාගමය පාටිකපුත්ත සමාගමය ආලවක සමාගමය බකබ්‍රහ්ම සමාගමය සරභ පරිබ්‍රාජක සමාගමය එරකපත්ත[6] නාගරාජ සමාගමය කොලිය මහාමාත්‍ය සමාගමය උග්ගසෙන සෙට්ඨිපුත්ත සමාගමය මණ්ඩූක දෙවපුත්‍ර සමාගමය මට්ටකුණ්ඩලී දෙවපුත්‍ර සමාගමය සුලසා නගරශොභිනී සමාගමය සිරිමා නගරශොභිනී සමාගමය පෙසකාරධීතු සමාගමය උග්ගපුරයෙහි චූළසුභද්‍රා සමාගමය සාකෙතනුවර බුදුන් කෙරෙහි පුත්‍රප්‍රෙම කළ බමුණාණන්ගේ ආදහනයට රැස්වූ මහජනයාගේ සමාගමය සුනාපරන්ත ජනපදයෙහි වෙළෙඳගම් වැසි මහජනයන්ගේ සමාගමය "සබ්බදානං ධම්මදානං ජිනාති" යනාදීන් ශක්‍රයන්ට වදළ ධර්මදෙශනාවට රැස්වූ දෙවියන්ගේ සමාගමය දම්සක් පැවතුම් සූත්‍ර සමාගමය මහාසමය සූත්‍රසමාගමය මඞ්ගල සූත්‍ර සමාගමය යන මේ සූවිසි සමාගමයෙහි එකී එකී දවස් දිව්‍ය මනුෂ්‍යයන්ගෙන් අසඞ්ඛ්‍යයක්[7] බැගින් සූවිසි වාරයෙක සූවිසි තෙනෙක හිඳ වදළා වූ සූවිසි ධර්මදෙශනාවකින් සූවිසි අසඞ්ඛ්‍යයක් සත්ත්වයන් අමාවහ නිවන් දක්වා තව ද අභයරාජ කුමාරය බොධි රාජ කුමාරය ජයසෙන රාජකුමාරය භද්දියලිච්ඡවිය මහාලිලිච්ඡවිය පායා සිරාජඤ්ඤය දණ්ඩපාණිශාක්‍යය මාසුරනරපතිය අජාතශත්‍රුය උදෙන මහරජය යන මේ ආදි වූ ක්‍ෂත්‍රිය පණ්ඩිතවරුන් ද වඞ්කි බ්‍රාහ්මණය තාරුක්ඛ බ්‍රාහ්මණය පොක්ඛරසාති[8] බ්‍රාහ්මණය ජානුශ්‍රොණි බ්‍රාහ්මණය තොදෙය්‍ය බ්‍රාහ්මණය වෙරඤ්ජ බ්‍රාහ්මණය ධනඤ්ජානීය වස්සකාරය එසුකාරිය වංගීසය අ[ස්]සලායනය[9] ශ්‍රොණිය ත්‍රිකණ්ණිය[10] ශ්‍රොණදණ්ඩය කණ්ඩරායනය ආරාමදණ්ඩය දෙවහිතය කූටදන්තය අග්ගිදත්තය ශෙලය ශිඛාමෞද්ගල්‍යායනය බ්‍රහ්මායුය උදයය උජ්ජයය උදායිය අක්කොස හාරද්වාජය සුන්දරිකහාරද්වාජය

1. ආකාශ මණ්ඩලයක් - BGHKL
2. සමෘද්ධීන් - ACFJ මා
3. කෙරෙමින් -BGHKL
4. සහිත ව -BGHKL
5. හිඳුවමින් -BDEGHKL
6. එරපත් -ABCEFGK
7. අසංඛ්‍යයක් අසංඛ්‍යයක් HCDE, බෙ.ම.ස
8. පොක්ඛරසාතිය -ADEFGJ, කි.ඤ,ක.
   පොක්ඛරසාරතීය -L
9. අසලායනය - පිටපත් හැම
10. තිකණ්ණිය -CDFGHJKL -
    තිකණ්ණිය - E

Non-Commercial Distribution

කසීභාරද්වාජය කාපටික මානවකය අම්බට්ඨ මානවකය සෙට්ඨ[1] මානවකය භාරද්වාජමානවකය උත්තර මානවකය සුභ මානවකය යනාදි වූ නොයෙක් දහස් ගණන් බ්‍රාහ්මණ පණ්ඩිතවරුන් ද උපාලි ගහපතිය පොතලී ගහපතිය විසාඛ ගහපතිය දසමගග ගහපතිය සුදත්ත ගහපතිය සීහ සෙනාපතිය[2] යනාදි වූ නොයෙක් දහස් ගණන් ගෘහපති පණ්ඩිතවරුන් ද සභිය පරිබ්‍රාජකය බාහිය පරිබ්‍රාජක ය සරභ පරිබ්‍රාජක ය පොට්ඨපාද පරිබ්‍රාජකය න්‍යග්‍රොධ පරිබ්‍රාජකය ජනන පරිබ්‍රාජකය සුසිමය සුභද්දය පිලොතිකය[3] පොතලිකය කන්දරකය මාගන්දිය තින්දුකය සාදකය උග්ගමානය භග්ගවගොත්‍රය වච්ඡගොත්‍රය දීඝ තපස්සීය සුනක්ඛත්තය මාලුජ්ජපුත්‍රය අන්‍යභාරය සකළුදායීය වෙමාන පරිබ්‍රාජකය යනාදි වූ අනෙක සහස්‍ර ශ්‍රමණ පණ්ඩිතවරුන් ද මොවුන් කෙරෙන් පිටත් මහානුභාව සම්පත් ඇති යක්ෂ රාක්ෂස නාග සුපර්ණ ගරුඩ ගන්ධර්ව සහස්‍රයන් ද ස්වකීය වාදයෙන් හික්මවා ඔවුන්ට අමාමහ නිවන් ගෙනහැර දෙමින් මෙසේ බුදු ව වැඩහුන් පන්සාලිස් හවුරුද්දෙන් පළමු වන හවුරුදු බරණැස් නුවර ඉසිපතනාරාමයෙහි වස් වැස, දෙවන තුන්වන සතරවන හවුරුදු පිළිවෙළින් ම රජගහා නුවර වෙළුවනාරාමයෙහි වස් වැස, පස්වන හවුරුදු විශාලා මහනුවර කූටාගාරශාලාවෙහි වස් වැස, සවන හවුරුදු කොසඹෑ නුවර කොසම්බිය නම් ආරාමයෙහි වස් වැස, සත්වන හවුරුදු සක්දෙව් රජහුගේ ඒකපුණ්ඩරීක නම් උයන්හි පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි වස් වැස, අටවන හවුරුදු සුංසුමාරගිරි නම් පර්වතයෙහි වස් වැස, නවවන හවුරුදු කොසඹෑ නුවර ඝොෂකාරාමයෙහි වස් වැස, දසවන හවුරුදු පාරලී වනයෙහි පාරලී නම් මතැත්හුගෙන් උපස්ථාන ලදින් සල්රුකක් මුල ගල්අතළෙක වස් වැස, එකොළොස්වන හවුරුදු නාලක නම් බමුණුගම නාලාකාරාමයෙහි වස් වැස, දෙළොස්වන හවුරුදු වෙරඤ්ජා නම් බමුණුගම නළෙරු නම් කොසඹ රුක්මුල්හි ශාලාවෙක වස් වැස, තෙළෙස්වන හවුරුදු චාලිය නම් පර්වතයෙහි දෙවියන්ගේ ආරාධනාවෙන් වස් වැස, තුදුස්වන හවුරුදු දෙව්රම් වෙහෙර වස් වැස, පසළොස්වන හවුරුදු කිඹුල්වත් පුර නුවර න්‍යග්‍රොධාරාමයෙහි මණිගුහායෙක වස් වැස, සොළොස්වන හවුරුදු අලවු නුවර වස් වැස, සතළොස් වන හවුරුදු රජගහා නුවර වෙළුවනාරාමයෙහි වස් වැස, පිට පිට දසනව හවුරුද්දක් දෙවුරම් වෙහෙර වස් වැස, මෙසේ ම පිළිවෙළින් සාවුරුද්දක් විශාඛාවන්ගේ පූර්වාරාමයෙහි මිගාරමාතු නම් ප්‍රාසාදයෙහි වස් වැස, අතික් තුන් හවුරුද්දෙහි අනිබද්ධවාස ව ඒ බුදු ව වැඩ හුන් පන්සාලිස් හවුරුද්ද ඇතුළත යටකී පරිද්දෙන් දවස දවස එකෙක දෙකෙක දසෙක සියයෙක දහසෙක ලක්ෂයෙක කෝටියෙක යනාදි වශයෙන් නොයෙක් වර නොයෙක් දෙශනාවෙහි සසරින් ගොඩනැඟූ සත්වයන් හැර සුමන මාලාකාර සමාගමාදි වූ සුවිසි සමාගමයෙහි සුවිසි තෙනෙක වැඩහිඳ සුවිසි වාරයෙක වදළා වූ සුවිසි ධර්මදෙශනාවෙකින් සුවිසි අසඞ්ඛ්‍යයක් සත්වයන් සෝවාන් කොට සුවිසි අසඞ්ඛ්‍යයක් සත්වයන් සකෘදගාමී කොට සුවිසි අසඞ්ඛ්‍යයක් සත්වයන් අනාගාමී කොට සුවිසි අසඞ්ඛ්‍යයක් සත්වයන්

1. වාසෙට්ඨ - BEGHKL, ම.ස.
2. සීහසෙන ගහපතිය - ACFJ
3. පලොතිකය - ACF, පිලොතිලකය - L
   පලොතිකය - සි.සැ.

Non-Commercial Distribution

රහත් කොට අමාමහ නිවන් දක්වා මෙසේ අසඞ්ඛ්‍යය ගණනාවෙන් ම සයානු අසඞ්ඛ්‍යයක් ප්‍රාණීන් සංසාර සාගරයෙන් ගොඩ නහා සුවාසූදහසක් ධර්මස්කන්ධය දෙශනා කොට තමන් වහන්සේ වැඩසිටියා සේ අනුශාසනා[1] ශාසනය කොට තබා සියලු බුද්ධකෘත්‍යය නිමවා කුසිනාරා නුවර මල්ල රජුන්ගේ උපවර්තන නම් වූ සල්උයන්හි යුවළ[2] ශාල වෘක්ෂයන් දෙදෙනා අතුරෙහි පනවනලද යහන්හි උතුරුදිග සල්ගසට[3] සිරස[4] ලා දකුණුදිග සල්ගසට පය ලා පැදුම්දිගට පිට ලා පැළදිගට මුහුණ ලා වෙසඟපුර පුණු පොහෝ ලද අඟහරුවා දවස්හි විශා නකතින් සිහිනුවණින් යෙදී නැඟී නොසිටිනා සෙය්‍යාවෙන් දකුණැළයෙන් වැදහොත්සේක් පෙරයම් රාත්‍රියෙහි සැටදහසක් මල්ල රජදරුවන්ට බණ වදරා මධ්‍යම යාමයෙහි සුභද්‍ර නම් පරිබ්‍රාජකයාහට බණ වදරා මහණ කොට මාර්ගඵලයෙහි පිහිටුවා අලුයම් රාත්‍රියෙහි භික්ෂූන්වහන්සේට අප්‍රමාද විහරණයෙන්[5] අවවාදකොට ඉතා අලුයම් වේලෙහි දසදහසක් සක්වළ මහමෙර සක්වළගල් සත්කුලපව් සත්දහතලා මුළු පොළොව නටවනලද අත්බමරක් සේ වෙවුල්වා සතරාව සහස්‍රාව දෙවමින් විශෙෂයෙන් කම්පා කරවා නිරුපධිශෙෂ නිර්වාණ ධාතුයෙන් පිරිනිවන් පෑ වදළසේක. මෙසේ ලොකස්වාමි වූ භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ පිරිනිවි කල්හි ආයුෂ්මත් වූ අනඳ මහතෙරුන්වහන්සේ එපවත් මල්ල රජදරුවන්ට වදළසේක. එබස් ඇසූ කුසිනාරා නුවර සැට දහසක් මල්ල රජදරුවෝ ළෙයි පහළ අතින් පිට හෙළූ හිසකෙහෙයෙන් පවනට ලෙලෙන මහවනයක් සේ වැනි වැනී පුරඟනන් හා සමඟ සුවඳමල් සුවඳසුනු හා පඤ්චාංගික තූර්යභාණ්ඩයන් ද පන්සියයක් දුහුල්පිළී ද ගෙන්වාගෙන යමහලට දිව අවුත් හඬා වැලප රහතන්ගේ අවවාදයෙන් සන්හිඳී බුදුන්ගේ ශරීරය ඇසට රසවත් වූ නෘත්‍යයෙන් ද කනට මියුරු වූ ගායනාවෙන් ද ගසනලද භේරීනාදයෙන් ද අනෙකප්‍රකාර සුවඳින් මලින් ද නොයෙක් සත්කාර ගරුකාර කෙරෙමින් මහත් වූ ආදර බහුමානයෙන් අප්‍රමාණ වූ පූජා පෙරහරින් ගෙන්වාගෙන නුවර මධ්‍යයෙන් ගොස් මල්ල රජදරුවන්ගේ වොටුනු පළඳනා මකුටබන්ධන චෛත්‍ය නම් වූ ඔටුණු හෙට වඩා සදවසක් මුළුල්ලෙහි අප්‍රමාණ වූ පූජා කොට සත්වෙනි දවස් අනඳ මහතෙරුන්වහන්සේගේ විධාන වූ පරිද්දෙන් සක්විති රජුන්ට කළමනා චාරිත්‍ර ලෙසින් ම නොයෙක් චාරිත්‍ර කොට සියක් වර පොළා පදන්කරනලද පුලුන්පටින් වාරයක් හා සළුපටින් වාරයක් බැගින් පන්සියයක් පුලුන්පටින් හා පන්සියයක් සළුපටින් හා මෙසේ දහසක් පටින් දහසක් වර බුදුන්ගේ ශ්‍රී ශරීරය වෙළා සුවඳතෙල් පිරූ සනරන් දෙනකට වඩා එබඳු වූම අනික් රන් දෙනකින් වසා එක්සිය විසිරියන් සඳුන් දරසෑයක් බැඳ නොයෙක් සුගන්ධජාතයන් බහා රන්දෙන සඳුන් දරසෑයට වැඩූහ. එකල්හි මහසුප් මහතෙරුන්වහන්සේ හිමාලයෙහි[6] වසනසේක් බුදුන් පිරිනිවිබව දැන එකෙණෙහි පන්සියයක් රහතන්පිරිවරා එතැන්හි වැඩ දරසෑය සිසාරා තුන් යලක් පැදකුණුකොට ඇවිද ශ්‍රීපාදය දසාවෙන් අහසට පැනනැඟි වැඳගෙන හොත්සේක. එකෙණෙහි දිය පළාගෙන පැනනැඟී මහ පියුම් දෙකක් සේ බුදුන්ගේ ශ්‍රීපාදදෙක පන්සියයක්

---

1. අනුශාසන - A
   අනුශාසක - බෙ
2. යුග්ම - BGH, ස.
3. සල්රුකට - BGH
4. හිස - BGH
5. විහාරයෙන් - BDEGH
6. හිමවල - BDEGHKL
   හිමාලවනයෙහි - A
7. පළා (නැත) - BDGHKL

Non-Commercial Distribution

පුලුන්පටය පන්සියයක් සළුපට ය රන්දෙනය දර සෑයය යන සියල්ල පළා[7] දෙබේ කොටගෙන වලාගබකින් පෙනී ගිය සඳමඩලක් සේ පිටත් ව දිව්‍ය මනුෂ්‍යයන් බල බලා සිටියදී මහතෙරුන්වහන්සේ නළල් මැදෙහි පෙනී ගිය. එකල මහතෙරුන් වහන්සේ තමන්වහන්සේගේ රත්පියුම් පෙති සහළක් බඳු වූ අතුල්තල දෙකින් බුදුන්ගේ දෙපතුල් දෙක[1] අල්වාගෙන වැඳ මහත් වූ ධර්‍මසංවේගයට පැමිණ,

සසසිරිකතරො නාථ - කෙතුමාලාය ලඞ්කතො,
දක්‍ඛිණාවත්‍ත කෙසොසි - නීලමල සිරොරුහො.

උණ්හීස සීසො රුචිරො - පරිපුණ්ණසිරො වරො,
අනොලොකිය මුඩාසි - සුගන්‍ධතර මුඩනො.

යනාදීන් බුදුන්ට ස්‍තුති කෙරෙමින් බුදුන්ගේ ගුණවර්ණනා හා රූපවර්ණනා කොට වැඳි කල්හි සිරිපතුල් දෙක වලාගබකින් සැඟවුණු පුන්සඳමඩලක් සේ රන්දෙනට වන. එකෙණෙහි දෙවතාවන්ගේ ආනුභාවයෙන් හා බුදුන්ගේ බුඩානුභාවයෙන් දරසෑයෙහි තෙමේ ම හාත්පසින් එකපැහැර ගිනි ගත. එකල බුදුන්ගේ ශරීරයෙහි ඡවිය චර්‍මය මාංසය නහරය යන සියල්ල දවා හළු පමණකුත් නැති කෙළේ ය. එකල බුදුන්ගේ සතර දන්‍තධාතුය අකුධාතු දෙකය ලලාටධාතුය යන මේ ධාතුසත තිබියදී අවශෙෂ ධාතු හැම මුං පියළි[2] පමණය කඩසාල් පමණය අබඇට පමණ ය යන තුන් තරමෙක බිඳී සමන්මල් කැකුළු[3] රැසක් සේ මුතු රැසක්[4] සේ විය. මෙසේ බුදුන්ගේ ශරීරය ආදහන ව ගිනි සන්හුන් කල අහසින් ද පොළොවින් ද දෙපස සිටි ශාලවෘක්‍ෂවලින් ද එකපැහැර ජලධාරාවෝ දිව අවුත් දරසෑයෙහි ගිනි නිවූහ. උපචාර වශයෙන් මල්ල රජදරුවෝ ද රන් රිදී කළ පුර පුරා සුවඳපැන් ගෙනවුත් සලමින් දළකඩින් කරනලද දඬුඇණිය[5] ඇණින් සොලව සොලවා දරසෑයෙහි ගිනි නිවූහ. මෙසේ මල්ල රජදරුවෝ මහත් වූ පූජාසත්කාරයෙන් ආදාහනකෘත්‍යය නිමවා තමන්ගේ නුවරමැද සන්නිපාතසාලාව සිව්දෑ ගඳින් පිරිබඩ ගෙන එහි බිම සුදු අබ ය පුනසාල්ය[6] දෑසමන් කැකුළුය හීතණය විළඳය යන ලදපස්මල් ඉස රන්තරු රිදීතරු ආදියෙන් විසිතුරු වූ සුදුවියන් බඳවා රන්දම් රිදීදම් මල්දම් ආදිය එල්වා වටතිර බඳවා ඒ සන්නිපාතසාලාවෙහි පටන් බුදුන් ආදහන කළ මකුටබන්‍ධන චෛත්‍ය නම් වූ ඔටුනු පළඳනා ගෙය දක්වා මේ අතුරතුර[7] දෙපස තිර බඳවා මුදුනෙහි අහස්වියන් බැඳ මනහර මලොලඹු එල්වා තන්හි තන්හි මැණික්මය දඬුඇගෑ පඤ්චවර්ණ ධජපතාක නංවා බිම රජස් ඔබා පැන් හිස කළුවැලි හැර සුදුවැල්ලෙන් තවරා ලද පස්මල් ඉස දෙපෙළ රන් රිදීමය පූර්ණඝට පූර්ණකළස තබ්බවා දෙපස තිරිකුඩම්[8] තනා මිණි දඬුවැටපහන් දල්වා රන්පර්වතයක් සේ සරසන ලද ඇත්වාහනයක් පිටට ධාතු සහිත රන්දෙන වඩා සුවඳින් මලින් පුදමින් මහත් වූ උත්සවයෙන් ඇතුළු නුවරට වැද සන්ථාගාර මධ්‍යයෙහි සරහනලද කෙළක් අගනා සිවුරැස් පයර්‍යඞ්කය මුදුනෙහි රන්දෙනින් ම ධාතූන් වහන්සේ වඩා මුදුනෙහි රන්මලින්

1. පතුල් දෙක - BGHKL
2. කීයලි -BCFGHJKL
3. සමන් කැකුළු -BDEGHKL
4. පැයක් -A
5. දඬිඇනිය -E, ස.: දඬුඇනිරිය -L
6. පුන්සාල -ABCHJK
7. අතුර -BDEFGHKL
8. තිරිකුඩම් - පිටපත් හැම
තිරිකුඩම් - මුද්‍රිත හැම

Non-Commercial Distribution

විසිතුරු වූ දළපුඩු සේසත් නංවා අඩයටි ගත් යොධභටයන් උරෙන් උර ගසා පදනම වට සිටුවා ඉන් පිටත කුඹින් කුඹ ගසා කන්තලින් කන්තල ගසා පැහැර සිටිනා පරිද්දෙන්[1]ඇත්පෙළක් සිටුවා ඉන් පිටත කරින් කර ගසා අස්පෙළක් සිටුවා ඉන් පිටත සකින් සක පහරවා රථපෙළක් සිටුවා ඊට ඉක්බිති උරෙන් උරගසා නොයෙක් ආයුධ ගත් යොධසෙනඟක්[2] සිටුවා උන්ට කෙළවර පිලින් පිල ගසා දුනු ගත් සෙනඟක් සිටුවා මෙසේ හාත්පසින් සතර ගවුවක් මානයෙහි සන්නාහයෙකින් වැසුවා සේ අතුරු නොදී සතුරන් නිසා ම ඊකවල් ලවා ඉක්බිති සැටදහසක් පමණ මල්ල රජ්දරුවෝ සාධුක්‍රීඩා නම් වූ මහත් උත්සවයක් කෙරෙමින් නැවත ධාතුපූජාවට පටන්ගත්හ.

එකල්හි පසේනදි[3] කොසොල් රජ්ජුරුවන්ගේ ජනපදයෙක වසන එක්තරා ස්ත්‍රියක් ධාතු ක්‍රීඩාවට එන්නී[4] අතරමඟ ශරීරයෙහි ඇති වූ [වාත]රුජාවක්[5] නිසා ධාතුපූජාවට යා නොහී පසුව ආදහනභූමියට ගොස් බුදුන්ගේ ධාතුශරීරයට කැලමල් තුනකින් පූජා කොට පහන් සිතින් පසඟ පිහිටුවා වැඳ මහත් වූ සන්තොෂයෙන් පින පිනා තමාගේ ගෙට ගොසින් එම දවස් මධ්‍යම රාත්‍රියෙහි කාලක්‍රියා කොට තවුතිසා දෙව්ලොව නොයෙක් දහස් ගණන් කන්කුළින්[6] ගැවසී ගත්තාවූ තිස් යොදුන් පමණ ඇති කැලමල් නම් රන්විමනෙක උපන. එකල්හි ඈගේ පූර්වකුශලය ප්‍රකාශ කරන පිණිස එරන්විමන්හි මහත් වූ රථසක් සා පමණ කැල පුෂ්පයෝ ඒ ඒ තන්හි ලෙලදෙන්නාහ. ඒ කැල කුසුමයන්ගේ ප්‍රභා සමූහයෙන් ඒ සියලු රන්විමන එකහෙළා බබළමින් ශොභාමත් ව[7] දිවසුවඳ පිරී කරඬුවක් සේ සුවඳ හමා බස්නේය. එකල ඒ දෙව්දූ තොමෝ තමාගේ දිව්‍යශොභාවෙන් අග්‍රප්‍රාප්තවූ ආත්මභාවය හා විමාන සම්පත් පරිවාර සම්පත් ආදිය දැක විස්මය පත්වූ සිත් ඇති ව "පෙර කවර කුශලයක් කොට මා විසින් මේ සම්පත් ලබනලද දෝහෝ"යි දිවසින් බලන්නී බුදුන්ගේ ධාතුශරීරයට පහන් සිතින් පිදූවාවූ කැලමල් තුනෙහි විපාකයෙන් ලත් සම්පත් බව දැක අතිශයින් පහන් වූ සිත් ඇති ව මහත් රථසක් සා පමණ කැලමලක් අතින් අල්වාගෙන[8] එම විට තවුතිසා දෙව්ලොවින් නික්ම ධාතුපූජාවට ගියාය. එකල එතැන්හි රැස්වූ මනුෂ්‍යයෝ ඒ දිව්‍යස්ත්‍රියගේ රූපසම්පත් හා අත්ලෙහි[9] තුබූ ආශ්චර්‍යමත් වූ කැලමල දැක විස්මයපත්වූ සිත් ඇති ව "මැණියෙනි, තෙපි කොයි වසන කෙනෙක් ද? මේ කැලමල කොයින් ලදු දැ"යි විචාළහ. එතෙපුල් අසා දෙව්දූ තොමෝ බුදුන්ගේ ධාතුශරීරයට තමා පිදූ කැලමල් තුනෙහි අනුසසින් ලද්දවූ සම්පත්තිය ද දිව්‍යවිමානය ද පළමු ජාතියෙහි තමාගේ මෘතශරීරය ද යන මේ සියල්ල ම ඒ මනුෂ්‍යයන්ට දක්වාලා කුශලයෙහි විපාක හඟවා බණ කියන්නාවූ දෙවතා දූ තොමෝ,

1. සේ - GHKL
2. යොධසේනාවක් - ක.කි.කැ.ම.
3. පසේනාධි - ABCDEFGHIJ, බෙ. පසේනදි - KL, ස
4. යන්නී - BGHKL
5. රුජාවක් - පිටපත් හැම
6. කුළින් - J
7. ශොභාමත් වූ - ABCDE
8. ඇරගෙන - BGHK
ගෙන - L
9. අත්කෙලෙහි - E
අල්ලෙහි - BGHKL

Non-Commercial Distribution

සමාගතා භවන්තා හො - පස්සන්තු මම සම්පදං,
කතමප්පෙන කාරේණ - සම්මා සම්බුද්ධ ධාතුයා.

සාඛමාලානි තීනෙව - හීයේ‍යාහං මුනි ධාතුයා,
පූජයිත්වාන සන්තුට්ඨා - නිවත්තා තාය[1] රත්තියං[2].

මරන්තී ඛරවාතෙන - තමහං සුචරිතං සරිං,
තෙනාහං පුඤ්ඤකම්මේන තාවතිංසූපගා අහුං.

තත්‍ථ මෙ ආසි පාසාදෙ - තිංස යොජනමුග්ගතො,
කූටාගාර වරාකිණ්ණො - සාඛමාලාති[3] විස්සුතො.

යථා සබ්බ සුගන්ධෙහි - කරණ්ඩං පරිභාවිතං,
තථා දිබ්බ සුගන්ධෙහි - ගන්ධිතං භවනං මම.

චක්කමත්තා සාඛ පුප්ඵා - තත්‍ථ තත්‍ථුපලම්බරෙ,
දිබ්බා ගන්ධා පවායන්ති - මධුබ්බත නිසෙවිතා.

හය්‍යන්ති එක පුප්ඵස්මා[4] - තුම්බමත්තා හි රේණවො,
තෙහි පිඤ්ජරිතා දෙවා - කිළන්ති ච ලලන්ති ච.

පිළන්ධිත්වාන මාලායො - සුදිබ්බාභරණානි ච,
සහචජරා දෙවපුත්තා - නච්ච ගීතාදි ව්‍යාවටා.

යනාදීන් 'එම්බා මෙතැන්හි රැස්වූ පින්වත් සත්වයෙනි, සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේගේ ශරීර ධාතූන්වහන්සේට කරන ලද ඉතා ස්වල්ප වූ සත්කාරය නිසා මා විසින් ලබන ලද මේ දිව්‍යසම්පත් බලව. ඊය්යේ දවස් මම බුදුන්ගේ ශරීර ධාතූන්වහන්සේට සතුටු සිතින් කැලමල් තුනක් පුද පසහ පිහිටුවා වැඳගෙන ගෙට ගොසින් රාත්‍රිභාගයෙහි ඉතා කෲර වූ රුජාවක් පැහැර මියන්නා වූ මම මා විසින්[5] කරනලද ඒ සුචරිතය[6] සිහි කොට එම පින්කමින් තවුතිසා දෙව්ලොව උපන්මි. ඒ දෙව්ලොව මට සිය ගණන් කන්කුළින් ගැවසී ගත්තාවූ තිස් යොදුන් උස ඇති කැහැලමල් නම් රන්විමනෙක් පහළ විය. ඒ රන්විමන ලොව විද්‍යමාන වූ සියලු සුගන්ධගන්ධයෙන් සුවඳ කවනලද[7] සනරන් කරඬුවක් මෙන් හැම වේලෙහි ම සුවඳ හමා බස්නේය. තව ද මධුර නාද පවත්වන්නාවූ නානාප්‍රකාර භෘඞ්ගයන් විසින් සෙවුනාලද දිවසුවඳ හමා බස්නාවූ මහත් රථසක් සා පමණ කැලපුෂ්පයෝ ඒ විමන ඒ ඒ තැන්හි ලීලොපෙත ව ලෙලදෙන්නාහ. එයින් එකි එකී මලෙහි[8] තිඹක් පමණ රේණු වහනය වෙයි, ඒ රේණු සමූහයෙන් ශොභාමත් වූ දෙවස්ත්‍රීහු[9] නොයෙක් දිව්‍යලීලා දක්වමින් කෙළ ඇවිදිනාහ. සමහර දිව්‍යපුත්‍රයන් හා දිව්‍යාඞ්ගනාවෝ දිවමල් දිවපළඳනා පැළඳ[10] නෘත්‍ය ගීත වාදනයෙහි ව්‍යාපෘත ව[11] ඇවිදුනාහ යනාදීන් මෙසේ ඒ දිව්‍යස්ත්‍රී තොමෝ තමාගේ විමාන සම්පත් හා පරිවාර සම්පත් දක්වා නැවත උඩගු වූ සිත් ඇති අඥාන ජනයන්ට අවවාද පිණිස,

---

1. තමහි - BEKL, - තම්පි - ACF, -තම්හි GH
2. රත්තියා - පාලි
3. සාඛමාලොති - පාලි
4. පුප්ඵම්හා - BGHKL
5. මියන්නීම් මා විසින් - ක.කි.සැ,ම.
6. කුසල සුචරිතය - GHKL
7. කරන ලද - BDEGHL
   කරවන ලද - FK
8. මලෙක්හි - මුද්‍රිත හැම, ස.
9. දෙව දෙවස්ත්‍රීහු - DEGHL, බෙ.ස.
10. දිවමල් දිවසුවඳ දිවපළඳනා පැළඳ - BDGHKL,
    දිවමල් පළඳනා පැළඳ - AJ, ම.
    දිවමල් පැළඳ - CF, ක.කි.සැ,බෙ
    පිළන්ධිත්වාන මාලායො - සුදිබ්බාභරණානි ච-පාලි
11. ඛ්‍යාවෘත ව - JK
    ඛ්‍යාවෘතව - L
    ව්‍යාවෘතී ව - ක.කි.සැ,ම.

Non-Commercial Distribution

පස්සථිමං[1] භුජඞ්ගා භො-සද මොහෙන පාරුතා,
හීයො මතං 'පවිඩං මෙ - පූතිභූතං කලෙබරං.

පුළවෙහි සමාකිණ්ණං - මක්ඛිකාගණ කීළිතං,
කාක සොණාදි සත්තාන - මාහාරං කුණපාලයං.

පත්ථෙන්ති පුරිසා පුබ්බෙ - අනෙකොපායනෙනතං,
දට්ඨුම්පි'දනි නිච්ඡන්ති - තණ්හාය'ස්සාදනතා අහො.

ලොක පජ්ජොතකස්සාහං - විමලස්ස යසස්සිනො,
ධාතුං හීයොහා මහිං සම්මා - අජ්ජ සග්ගෙ පතිට්ඨිතා.

හිත්වානෙතාදිසං කායං - ලද්ධාන ඉමමීදිසං,[2]
දිබ්බත්තභාවං සොභාහි - භාසමානමුදික්ඛථ.

භාසමානාය මෙ වාචං - සුණොථෙත්ථ සමාගතා,
නහෙත්වා'කතපුඤ්ඤස්ස - අනුමත්තං භවෙ සුඛං.

බින්දුමත්තම්පි යො පුඤ්ඤ - බීජං රොපෙති සාසනෙ,
නහානත්ථඵලං[3] හොති - යාව නිබ්බාණ පත්තියා.

යනාදීන් "එම්බා මොහයෙන් මුළා වූ අඥාන නාගරික ජනයෙනි, මාගේ තෙල දමනලද ඊයේයේ මළ කුණු ශරීරය බලව. පෙර කාමී පුරුෂයෝ නොයෙක් පඬුරු පණ්‍යම් දීමෙන් තෙල ශරීර පහස් ප්‍රාර්ථනා කෙරෙති. දැන් එම ආත්මය ඇසින් දක්නට පවා පිළිකුල් ඇති ව ළං නොවන්නාහ. ඊයේයේ දවස් මම නිර්මල වූ යශස් ඇති ලොකාලොක දිවාකර වූ බුදුරජාණන්වහන්සේගේ ශරීරධාතුන්වහන්සේට මල් තුනෙකින් පූජා කෙළෙමි. අද දෙව්ලොව ඉපද මෙබඳු මහත් වූ දිවසැපතක් විඳින්ට පටන් ගතිමි. තෙල සේ ඉතා පිළිකුල් වූ මිනිස් ශරීරය හැර මෙබඳු දිව්‍ය ශරීරයක් ලැබ දිව්‍ය ශොභාවෙන් බබළන්නා වූ මාගේ රූප සම්පත් බලව. තව ද මෙතැන්හි රැස්වූ මහජනයෙනි, මා කියන්නාවූ මේ වචනය ඉදුරා අසව්. කුශල් නොකළවුන්ට සසර ලැබෙන්නාවූ ස්වල්පමාත්‍ර වූත් සැපයෙක් නැත. යම් කිසි කෙනෙක් මේ බුඩශාසන නමැති ක්ෂෙත්‍රයෙහි යම්තම් වුවත් කුශල් නමැති බිජුවටක් රොපණය කළාහු වී නම් ඔවුන්ට ඒ කුශලය නිවන් දක්නා ජාති දක්වා ආකාශය සේ අනන්තාපර්යන්ත විපාක දෙන්නේය"යි මෙසේ එදෙව්දූ තොමෝ තමා විසින් ලබන ලද දිව්‍ය සම්පත් දක්වා එතැන්හි රැස් වූ මහජනයාට අවවාද කොට දිව්‍යමය කැලමලින් බුදුන්ගේ ශරීර ධාතුන්වහන්සේට පූජා කොට මහජනයා බලබලා සිටියදී ම රන් විමන හා සමඟ දිව්‍යලොකයට ගියාය. ඒ දැක මහජනයෝ දනශීලාදි වූ සුචරිතධර්මය පුරා බොහෝ දෙන දෙව්ලොව උපන්හ. මෙසේ ඒ ස්ත්‍රී[4] තොමෝ බුදුන්ගේ ශරීරධාතුන්වහන්සේට මල් පමණක් පූජා කොට ඒ පිනින්[5] ගොස් දෙව්ලොව ඉපද මහත් වූ දිවසැපත් ලද්දී ය. එසේ හෙයින් පින්වත් සත්වයෙනි, තෙපි

1. පසසථිමං. - ACDEJ
පසසථමං - BGHKL
පසථිමං -F
පසසථෙමං - මුද්‍රිත හැම
2. ලද්ධංදනි ඉමෙදිසං - පාලි
3. තම්භානත්ත ඵලං - BGKL
තම්භාන්තඵලං - H
නහානන්ත ඵලං - J., පාලි
4. දිවසත්‍රී - BGHK
5. එයින් - BGHK

ද මතු දිවසැපත් කැමැත්තා නම් ආදිචේතනාවය මධ්‍යචේතනාවය[1] අන්තචේතනාවය යන තුන්සිත පිරිසුදු කොට තම තමා ශක්ති පමණින් කුශල් කොට දෙව් මිනිස් සැපත් සාධා ගන්ට උත්සාහ කරව්[2] කියන ලදුයේ මැයි.

එවං හි සා පුප්ඵමත්තෙන ධාතුං
පූජෙත්වා දෙවෙසු අලත්ථ භූතිං,
තුම්හෙපි භොන්තො තිදිවෙසු සාතං
කාමත්ථ වෙ කත්ථ පුඤ්ඤානි සාධුං-යි.

මෙතෙකින් මේ නන්දිරාජ වග
තුන්වන ශාඛමාල වස්තුව
කියා නිමවන ලදී.

තව ද මේ නන්දිරාජ වග සතරවන කපණා වස්තුව නම් කවරයත්, එහි පිළිවෙළ කථාව මෙසේ දතුයුතු.

අප මහා ගෞතම බුදුන් පිරිනිවි පසු දඹදිව ගම් නියම්ගම් රාජධානි ආදි වූ ඒ ඒ තැන වසන භික්ෂු භික්ෂුණීන් හා ශ්‍රද්ධාවන්ත උපාසක උපාසිකාවරු බොහෝ සේ ගොසින් බුදුන්ගේ ජයමහාබොධීන්වහන්සේ වඳනාහ. එකල බොහෝ සඞ්ඝයාවහන්සේ එක් ව එපරිද්දෙන් ම ජයමහාබොධීන්වහන්සේ වඳනා පිණිස වඩනාසේක් එක්තරා පිටිසර ගමෙක අහර සිහාගෙන භොජනශාලාවට එළඹ අහරකිස සපයා මඳක් සැතපී වැඩහුන්සේක. එකල්හි ඒ ගම වසන එක්තරා [දුගී] දුක්පත්[3] ගැහැණියක් එපරිද්දෙන් වැඩහුන් භික්ෂූන්වහන්සේ දක[4] සමීපයට එළඹ පසඟ පිහිටුවා වැඳ එකත්පස් ව සිට "ස්වාමීනි, මේ කොයි වඩනා ගමනෙක් ද"යි විචාළීය. භික්ෂූන්වහන්සේ එතෙපුල් අසා ශ්‍රී මහාබොධීන්වහන්සේගේ ආනුභාව හා ඒ ජයමහාබොධීන්වහන්සේ වඳනා පිණිස තමන්වහන්සේලා වඩනා බව වදරනසේක්:

යත්ථ 'සීනො ජිනො ජෙසි - සසෙනං මකරධජං,
හන්ත්වා කිලෙසසෙනං ච - බුද්ධො ආසි නිරුත්තරො.

යං පූජෙසි මහාවීරො - ඨිතො පදමකොපයං,
සත්ත රත්තින්දිවං නෙත්ත - නීල නීරජරංසිනා.

සුරාසුරනරාදීනං - නෙත්තාලි පාළි පාතනා,
මෙචකාකාරපත්තෙහි - සිඛණ්ඩී විය භාති යො.

සුරපාදපො'ව සත්තානං - යං තිට්ඨති මහීතලෙ,
ඉහ ලොකෙ පරත්ථෙ ච - දදන්තො ඉච්ඡිතිච්ඡිතං.

---

1. මධ්‍යම චෙතනාවය - BCDGHKL
2. කටයුතු - H
3. දුක්පත් - පිටපත් හැම
   දුගී දුක්පත් - මුද්‍රිත හැම
   කපණ දුග්ගතිත්ථී - පාලි
4. දක (තැන) - KL

Non-Commercial Distribution

යස්ස පුරාණ පණ්ණම්පි - පතිතං යො නරො ඉධ,
පූජෙසි තස්ස සො දෙති - භවභොගං මහීරු[හො][1].
ගන්ධමාලෙහි සලිලෙහි - යමුපාසති සද නරො,[2]
අජ්ඣත්තං ච බහිධා ච - දුරිතං සො විහඤ්ඤති.
යො දෙති ඉහ ලොකත්ථං - යො දෙති පරලොකිකං,[3]
සම්පදං ජයබොධිං තං - හොති ගච්ඡාම වන්දිතුං.

යනාදීන් "එම්බා, යම් වෘක්ෂමූලයෙක වැඩහුන්නාවූ සර්වඥයන්වහන්සේ[4] දස බිම්බරක් පමණ මහසෙනහ[5] ගෙන ආවාවූ මාරයා හා සියලු කෙලෙස් නමැති මරසෙනහ සාධා නිරුත්තර වූ බුදුබවට පැමිණියේක් ද, තව ද මහත් වූ වීය්‍යී ඇති එම බුදුරජාණන්වහන්සේ බුදු වූ දෙවන සතියෙහි දෙපය නුගුලුවා සිටි පියෙහි සිට සත් රෑ සත් දවාලන් මුළුල්ලෙහි යම් බොධිකෙනකුන් වහන්සේට තමන් වහන්සේගේ නුවන් නමැති නිලුපුල් දෙකින් නික්මෙන නිල්රස් සමූහයෙන් පූජා කළසේක් ද, යම් බොධිකෙනකුන්වහන්සේ දිව්‍යමනුෂ්‍යයන් හා සුරාසුරනර ගරුඩගන්ධර්ව යක්ෂ රාක්ෂස සිධවිද්‍යාධරාදීන්ගේ නුවන් නමැති බමරවැල නිපතනයට එකාන්තකාරණ වූ[6] මයුරරාජයන්ගේ ඇස්පිල් බඳු ආකාර ඇති පත්‍රශාඛාවන් කරණකොටගෙන රිදී පර්වතයක් මුදුනෙහි කුල්මත් ව නැටුම් ගත්තාවූ මයුරරාජයකු සේ[7] බබළනසේක් ද, තව ද යම් බොධිකෙනකුන්වහන්සේ මෙලෙෝ පරලෙෝ දෙකින් ම සත්වයන්ට කැමැති කැමැති වස්තු සිධකොට දීමෙන් පොළෝතෙලෙහි පිහිටි කප්රුකක්[8] වැනි වූසේක් ද, යම් බොධීකෙනකුන්වහන්සේගේ බිම හුණු පුරාණ[9] පත්‍රශාඛාවක් පවා මේ ලොකයෙහි යම් කිසිවෙක් ආදරයෙන් ගෙන තබා පූජා කෙළේ වී නම් ඒ බොධීන් වහන්සේ ඕහට නොයෙක් වර මහත් වූ භවභොගසම්පත් ගෙනහැර දෙනසේක් ද. මේ ලොකයෙහි යම් කිසි සත්වයෙක් යම් බොධිකෙනකුන්වහන්සේට මල් සුවඳ පුද පැන් සනාභවා නිරන්තරයෙන් උපස්ථාන කෙළේ වී නම් ඒ බොධීන්වහන්සේ ඔහුගේ ආධ්‍යාත්මික වූ කෙලෙස් නමැති සතුරන් හා බාහ්‍ය වූ සියලු පිරිපත් නසනසේක් ද. ඉතා බොහෝ කොට කීමෙන් ප්‍රයෝජන කිම් ද, එම්බල පින්වත, මේ ලෝකයෙහි යම් බොධිකෙනකුන්වහන්සේ මෙලොවත් සත්වයන්ට සියලු වැඩ සාධා දී පරලොවත් සවර්ගමොක්ෂ සම්පත් සිධකොට දෙනසේක් ද එබඳු මහානුභාව ඇති දෙලොව[10] සැපත් සිධකොට දෙන්නාවූ ජයමහාබෝධීන්වහන්සේ[11] වඳනා පිණිස යමිහ"යි වදළසේක. එනෙපුල් අසා මඳ වැඩි සතුටු සිත් ඇත්තාවූ ඒ ස්ත්‍රීතොමෝ[12] භික්ෂුසඞ්ඝයාවහන්සේට මෙසේ කිව. කෙසේ ද යත්,

'ස්වාමීනි, මම අනුන්ගේ ගෙහි[13] බැළමෙහෙ කොට දුඃඛජීවිකාවෙන් ජීවත් වෙමි. සෙට දවසට මාගේ ගෙහි සාල්නැළියක් පමණකුත් නැත. සෙසු වස්තු තමා

1. මහීරුහෙ - පිටපත් හැම
2. සදදරො - BGHKL
3. පාරලොකිකං -E, ක.කු.බෙ.ම.ස
4. සර්වඥයන්වහන්සේ බුදු වන සතියෙහි -BK
සර්වඥයන්වහන්සේ බුදු ව දෙවන සතියෙහි -HL
5. මහසෙනග - පිටපත් හැම,
මරසෙනග - මුද්‍රිත හැම.
6. කාරණාව - ACDEFGHJK
7. මෙන් -BDEGHKL
8. කල්පවෘක්ෂයක් -BGHKL
9. පොරණ -ACDEFGHJKL, ස
පෞරාණ - ක.කි.කු.ම.
10. දෙවුලොව -BDEGHKL, මුද්‍රිත හැම, ස
දෙවලො -AJ
දෙවුලො - F
11. වහන්සේට - KL
12. ස්ත්‍රීතොම - BDEGHKL, ස.
13. ගෙයි - CDEGH, ක.ම.

Non-Commercial Distribution

නැති හෙයින් ම නැත. මේ මා හින තුබූ වස්ත්‍රය හැර අනික් පිළියකුත් නැත. ඒ කුමක් පිණිස දැයි යතහොත් පෙර පින් නොකළ හෙයින් මය, එසේ හෙයින් ස්වාමීන්, මාගේ මේ වස්ත්‍රය මට අනුග්‍රහ පිණිස ගෙනගොස් බෝධීන්වහන්සේට ධජයක් කොට බැඳවුව[1] මැනවැ"යි යාච්ඤා කොට කියා කඩරෙද්දක් හැඳගෙන ඉන තුබූ වස්ත්‍රය දියෙහි ශොධා ඒ භික්ෂූන්වහන්සේ අතට දුන. භික්ෂූන්වහන්සේ ද ඒ ගැහැනිය කෙරෙහි අනුකම්පාවෙන් ඒ වස්ත්‍රය හැරගෙන වැඩිසේක.

ඒ ස්ත්‍රීතොමෝ වස්ත්‍රය දී සතුටු සොම්නසින් පින පිනා තමාගේ ගෙට ගොස් එදවස් ම මධ්‍යම රාත්‍රියෙහි ශස්ත්‍රකවාත නම් වූ බඩරුජාවකින් පීඩිත ව කාලක්‍රියා කොට ඒ භික්ෂූන්වහන්සේ වඩනා පෙරමහ ඉතා රම්‍ය වූ එක් වනළැහැබෙක බුමාටු දෙවතා ව උපන්නීය. ඉක්බිති ඇගේ කුශලානුභාවයෙන් තිස් යොදුන්[2] පමණ තන්හි දිව්‍යමය කල්පවෘක්ෂයෝ පහළ වූහ. ඒ කල්පවෘක්ෂයන්ගේ අතුරතුර ඒ ඒ තන්හි නීල පීතාදි නානා වර්ණ ධජ පතාකයෝ ලෙලදෙන්නාහ. බොහෝ දිව්‍යපුත්‍රයන් හා දිව්‍යාඞගනාවෝ සියලු වස්ත්‍රාභරණාදියෙන් සැරහී පස්වනක් පැහැයෙන් යුක්ත වූ ධජපතාකා ගෙන ඒ ඒ තන්හි කෙළනාහ. නැටීම් ගීකීම් ආදි වූ නොයෙක් ආශ්චර්‍ය්‍ය දක්වන්ට පටන් ගත්හ. ඉක්බිති දෙවන දවස් ඒ භික්ෂූන් වහන්සේ ද බොධිමණ්ඩලයට වඩනාසේක් සවස් වේලෙහි ඒ වනළැහැබට පැමිණ "අද මේ වනළැහැබ සැතපී යම්හ" යි කියා එතන්හි රෑ සැතපුණුසේක. එදවස් ඒ රාත්‍රිභාගයෙහි නොයෙක් පැහැයෙන් යුක්ත වූ ධජපතාකා හා දෙව දෙවස්ත්‍රීන් විසින් ප්‍රයෝග කරන ලද්ද වූ ගීනැටුම් ආදිය ද තිස්යොදුන්[2] පමණ තන්හි ගැවසී සිට ගත්තාවූ කල්පවෘක්ෂ[යන්] ද[3] යන ඒ සියලු දිව්‍ය ඓශ්වර්‍ය්‍යය ම එම දිව්‍යස්ත්‍රියගේ ආනුභාවයෙන් දක[4] විස්ම[ය]පත්වූ සිත් ඇති භික්ෂූන්වහන්සේ ඒ දිව්‍යස්ත්‍රිය සමීපයට කැඳවා "තෙපි කවර කුශලයක් කොට මෙතැන්හි උපනු දැ"යි විචාළසේක. එකල ඒ දිව්‍යස්ත්‍රීතොමෝ භික්ෂූසඞ්ඝයාවහන්සේ වැඳ දෙහොත[5] මුදුනෙහි තබාගෙන එකත්පස් ව සිට 'ස්වාමීනි, මා නොහඳුනන සේක් දැ යි' කීව. භික්ෂූන් වහන්සේ "නැහැණියනි, අපි නොහඳුනම්හ" යි වදළසේක. එකල ඒ දිව්‍යස්ත්‍රීතොමෝ තමා වූ නියාව ස්වභාවයෙන් ම හඟවා කියන්නී මෙසේ කියා:

හීයො ආසනසාලාය - නිසීදිත්වා සමාගතා,
තුම්හාකං සන්තිකං[6] ගම්ම - යා වරාකී'හිවාදයි.
යා බොධිං පූජනත්ථාය - වත්ථකං පටිපාදයි,[7]
සාහං හීයො චුතා ආසිං - රත්තියං ව්‍යාධිපීළිතා.
නානාසම්පත්තිසංයුත්තා - නානාභූසනභූසිතා,
විමානෙ රතනාකිණ්ණෙ - ජාතාහං එත්ථ කානනෙ.

---

1. බැඳපුව - BGHKL
2. තිස්යොදුන් - පිටපත් හැම, කි.ස.
   තුන්යොදුන් - බෙ.ස.
   තියොජනිකෙ - පාලි
3. කල්පවෘක්ෂයෙන් ද - පිටපත් හැම , ක.කි.ස.
   කප්පරුක්ඛානි ච - පාලි
4. පහළ වූ බව දැන - බෙ.ස.
5. දෙහොත් - BCDFL, ක.ම.
6. සන්තිකා - KL
7. පටිපාදයිං - ACDF

Non-Commercial Distribution

හීයො පස්සිත්වා මෙ ගත්තං - රජොජල්ලෙහි සඞ්කුලං,
අජ්ජ පස්සථ මෙ ගත්තං - වණ්ණවන්තං පභස්සරං.

හීයො පස්සිත්වා මෙ හනෙත - නිවත්ථං මලිනම්බරං,
අජ්ජ පස්සථ මෙ හනෙත - දිබ්බමම්බරමුත්තමං.

විකිණ්ණදලිතගෙහෙහි[1] - කෙසෙහි විරලාකුලං,
ඌකාගුථපටිකකුලං - හීයො ආසි සිරං මම.

අජ්ජ තං පරිවත්තිත්වා - මම පුඤ්ඤානුභාවතො,
සුනීලමුදුධම්මිල්ලං - කුසුමාභරණභූසිතං.

පුරා මෙ සකසීසෙන - වහිතං දරුදකාදිකං,
පුඤ්ඤෙනාහං අජ්ජ මාලා - භාරං සීසෙ සමුබ්බහෙ.

ධජ්ජත්ථාය මයා හීයො - පදින්නං ථූලසාටකං,
අජ්ජ නිබ්බත්ති මෙ හනෙත[2] - මහන්තං දිබ්බසම්පදං.

ජානමානෙන කාතබ්බං[3] - දනාදිසු මහප්ඵලං,
දෙවලොකෙ මනුස්සෙසු - සුඛදං දනමුත්තමං.

යනාදීන් ඊය්යේ දවස් ආසනසාලාවෙහි ඔබ ඇමදෙනාවහන්සේ වැඩහුන් තෙනට යම් දුක්පත් ගැහැනියක් අවුත් වැඳලා සිටියා ද යම් ගැහැනියක් බෝධීන් වහන්සේට පුදන පිණිස වස්ත්‍රයක් දුන්නී ද, ඒ ස්ත්‍රී නම් අනිකක් නොවෙයි මම් මය. ඊය්යේ දවස් රාත්‍රියෙහි ව්‍යාධියකින් පීඩිත ව එයින් මිය අවුත් නොයෙක් දිව්‍යසම්පත්තීන් යුක්ත ව නොයෙක් දිව්‍යාභරණයෙන් සැරහී මේ වනය[4] මැද නොයෙක් රත්නයෙන් ගැවසී ගත්තාවූ මේ දිව්‍යවිමානයෙහි උපන්මි. ස්වාමීනි, ඊය්යේ දවස් මාගේ ශරීරය රජස් ධූලින් ගැවසී කිලිටි ව තුබූ[5] නියාව ප්‍රත්‍යක්ෂයෙන් ම දුටුසේක් වේ ද, දන් එම මාගේ ශරීරය පෙරළී අද රන්කඳක් සේ ශොභාමත් ව බබළන නියාව බලා වදළ මැනව. තව ද ඊය්යේ දවස් මා ඇඳගෙන සිටි ඉතා කිලුටු වූ දළ රෙදිකඩ දුටු සේක් වේ ද, දන් අද මා ඇඳගෙන සිටිනා මේ උතුම් වූ දිවසළු බලා වදළ මැනව. ඊය්යේ දවස් මාගේ ඉස සතරපිට විසිර අගින් දෙකක් ව පැළී දුර දුර තිබෙන්නාවූ හිසකේපතින් හා උකුණන්ගේ ගුථගන්ධයෙන් ඉතා පිළිකුල් වීය. අද දන් ඒ හැම පෙරළී මාගේ කුශලානුභාවයෙන් ඒ මාගේ හිස ඉතා නිල් වූ මොළොක් වූ අග්බඹුරු ව තිබෙන්නාවූ කෙස්වැටියකින් ශොභාමත් ව මනහර දිවමලින් හා කොණ්ඩමල් ආදි වූ[7] දිව්‍යාභරණයෙන් සැරහිණ. පෙර දර පැන් ආදිය ඇද්දවූ ඒ මාගේ හිසින් දන් මම ඊය්යේ දවස් කළාවූ කුශලානුභාවයෙන් අද මෙබඳු දිව්‍යමය වූ සුවඳමල් භාරයක් ධරා සිටි[නෙ]මි[8]. ස්වාමීනි, ඊය්යේ දවස් ශ්‍රීමහාබෝධීන්වහන්සේට ධජපතාකා පූජා පිණිස මා විසින් ඉතා දළ වූ වස්ත්‍රදනයක් දෙනලද්දේ වේ ද ඒ කුශලයෙන් අද මෙබඳු මහත් වූ දිව්‍යසම්පත් පහළ වීය. එබැවින් දනාදි වූ කුශලධර්මයෙහි මහත් වූ විපාක ඇති බව ඉඳුරා දන්නා ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයන් විසින් දිව්‍යලොක මනුෂ්‍යලොක දෙක්හි උපදවා සියලු සැපත්[9] සාධා දෙන උතුම් වූ දනශීලාදි කුශලධර්මය නම් කළමනා

1. ජලිතගෙහෙහි - BDGHJKL
   එලිතගෙහෙහි - ක.කි.කු.ම පාලි.
2. හොනෙතා - BDGHKL
3. කතතබ්බං. - CDEF, මුද්‍රිත හැම. ස.
4. වන -ABCDEFGHKL, ස.
5. සිබූ - ADEFGHJKL
6. එම - ABCDEGHJKL
7. කොණ්ඩමාලාදි වූ - KL
8. සිටියෙමි - පිටපත් හැම
9. සම්පත් - BGHKL

Non-Commercial Distribution

දෙයෙක් මය" යි කිව. එතෙපුල් අසා භික්ෂූන්වහන්සේ මහත් වූ ආශ්චර්‍ය්‍යයට පැමිණියේක. ඒ දිව්‍යස්ත්‍රීතොමෝ එදවස් රාත්‍රිය පහන් වූ කල්හි භික්ෂුසඞ්ඝයා වහන්සේට ආරාධනා කොට දිව්‍ය වූ[1] කන බොන දෑ ආදිය එළවා තමා සිය අතින් වළඳවා ඉක්බිති ශ්‍රීමහාබොධීන්වහන්සේ වඳනා පිණිස එම භික්ෂූන්වහන්සේ හා කැටුව ම නික්ම අතරමග ලැගි ලැගි තැන්හි දන් දෙමින් මහබෝ පියස ගොසින් බුදුන්ගේ ජයමහාබොධීන්වහන්සේට දිව්‍යමය වූ ධජපතාකායෙන් හා නොයෙක් වර්ණගන්ධසම්පන්න දිව කුසුමයෙන් හා එසේ ම දිව්‍යමය වූ පහනින් හා සුවඳසුනු සුවඳදුම් ආදියෙන් පූජා කොට ඉක්බිති භික්ෂූන්වහන්සේට සිවුරු පිණිස දිව්‍යවස්ත්‍ර දන් දී වැඳ අවසර ගෙන පෙරළා අවුත් එම වන මැද[2] රන්විමන වෙසෙමින් නොයෙක් පින්කම් කොට තවුතිසා දෙව්ලොව උපන. භික්ෂූන්වහන්සේ ද ඒ ආශ්චර්‍ය්‍යය ඒ ඒ තන්හි ප්‍රකාශ කෙරෙමින් බොහෝදෙනා කුසල් කිරීමෙහි යොද වදළසේක. එසේ හෙයින් එබඳු දුක්පත් ගැහැනි පවා බුදුසස්නෙහි ප්‍රසාද උපදවා බුදුන්ගේ ශ්‍රීමහා බෝධීන්වහන්සේට ස්වල්ප වූ ඉතා දළ වස්ත්‍රයක් පමණ පුද දෙවන දවස් එබඳු දිව්‍යසම්පතක් ලද්දීය යි දන නුවණැති සත්පුරුෂයන් විසින් කම්පල අදහා බුද්ධරත්නය ධර්මරත්නය සඞ්ඝරත්නය යන ත්‍රිරත්නය උදෙසා තම තමා ශක්ති පමණින් පූජා සත්කාර කොට එම කුශලානුභාවයෙන් මතු සියලු සම්පත් සාධන්ට[3] උත්සාහ කළ මැනවි. කියනලදුයේ මැයි:

එවං විධා'පි කපණා ජිනසාසනම්හි
කත්වා පසාදමථ ථූල කුචෙලකෙන,
පූජෙත්වා දිබ්බවිභවං අලභීති ඤත්වා
පූජාපරා භවථ වත්ථුසු තීසු සම්මා -යි.

මෙතෙකින් මේ නන්දිරාජ වග
සතරවන කපණා වස්තුව
කියා නිමවන ලදී.

තව ද මේ නන්දිරාජ වග පස්වන කන්‍යාවනදේවී වස්තුව නම් කවර යත්

යටගිය දවස දඹදිව සියලු නගරාඞ්ගසම්පත්තීන් පරමදර්ශනීය වූ දෙවපුත්‍ර නම් වූ නුවරෙක් වීය. ඒ නුවර මනුෂ්‍යයෝ බොහෝ සේ පාත්‍රමහ නම් වූ පූජාවක්[4] කෙරෙති. හේ කෙසේ වූ පූජාවෙක් ද යත්,

එසමයෙහි[5] එනුවර රාජ්‍යය කරන රජ්ජුරුවෝ රන් රිදී මුතුමැණික් වෙරළුම්ණි පබළු ආදි වූ සත්රුවනින් විසිතුරු වූ මනහර කර්මාන්ත ඇති සර්වරත්නමය වූ රථවාහනයක් කරවා නොයෙක් රථාලඞ්කාරයෙන් සරහා එළ ඇඹුලපෙත්තෙහි පැහැ සමාන වූ මාහැඟි ඇළිඅසුන් සතරදෙනකු ඒ රථයෙහි යොද සුශික්ෂිත වූ ශිල්ප

---

1. දිව්‍යමය වූ - CL, සි.ම.
2. වනය මැද - C
3. සාධාගන්ට - BCGHKL, ම.
4. පූජාවෙක් - GH
5. එක් සමයෙක්හි - ABCFGHJKL, ක.සි.සැ.ම.

Non-Commercial Distribution

දන්නා සුවර්ණකාරයන් ලවා සත්රුවනින් ම විසිතුරු කොට අසූරියන්[1] උස උණ්දණ්ඩක් කරවා සරහනලද සත්රුවන්[2] රථයෙහි ඒ උණ්දණ්ඩ සිටුවා අප බුදුන් බුදු ව වැඩහුන් පන්සාලිස් අවුරුද්ද මුළුල්ලෙහි අහර වැළඳූ ශෛලමය පාත්‍රධාතූන් වහන්සේ මිණිමුතුදල් ආදියෙන් අලඩකාර කොට සරහා සත්රුවන් උණ්දණ්ඩ[3] මුදුනෙහි වඩා මුළු නුවර දෙව්පුරයක් සේ සරහා මහවේ දෙපස ධජපතාක නංවා පූර්ණඝට පූර්ණකළස පඞ්ක්තීන් තබ්බවා[4] තන්හි තන්හි තිරිකුඩම්[5] තනවා වට වැට[6] පහන් ලවා[7] රත්රිදී රඹතොරණ ඇගෑ ආදියෙන් අලඞ්කෘත කොට අපමණ වූ නොයෙක් පූජාවිධීන් පාත්‍රධාතූන්වහන්සේ නුවර ප්‍රදක්ෂිණා කරවා නැවත එම නුවර මධ්‍යයෙහි සරහන ලද රත්නමණ්ඩපයෙක[8] විසිතුරු වූ ඇතිරි අතුළ පරම දර්ශනීය වූ ආසනයක් මත්තෙහි පාත්‍රධාතූන් වහන්සේ වඩා [හිඳුවා][9] සත්දවසක් මුළුල්ලෙහි මහත් වූ පූජා සත්කාරයෙන් රාත්‍රි බණක් කියවති. එකල්හි ඒ ඒ ජනපදයෙහි වසන බොහෝ මනුෂ්‍යයෝ ද දිව්‍ය නාගසුපර්ණ යක්ෂරාක්ෂස සිද්ධවිද්‍යාධරාදීහු ද මනුෂ්‍යවේශයෙන් බොහෝ සේ ඒ පූජාසමාගමයට අවුත් වදනාහ. මෙසේ ඒ පූජෝත්සවය ඉතා ආශ්චර්‍ය්‍යීමත්[10] විය.

එකල්හි එක් දිව්‍යනාගරාජයෙක් බණපිරිස් කෙළවර හුන්නාවූ ඉතා විශිෂ්ට වූ රූ ඇති කන්‍යාරත්න වූ එක්තරා කුමාරිකාවක දැක ඒ කුමාරිකාව කෙරෙහි පිළිබඳ සිත් ඇති ව නොයෙක් පරිද්දෙන් යාච්ඤා කොට ලබවා[11] ගත නොහී ඒ කුමාරිකාවන්ට කිපී අතට නොවත්කළ[12] තෙල් පනහින් දවනී කීවා සේ "මට නොලැබෙන මැ දුන් ම මරමී" සිතා විෂධූමයක් හැරපීය. එකල්හි ඔහු විසින් හරනලද විෂධූමය[13] ඒ කුමාරිකාවන්ගේ ශ්‍රද්ධාබලයෙන් කිසි උපද්‍රවයක් කොටගත නොහිණ. ඒ ආශ්චර්‍ය්‍යීය දැක පවා[14] නොපසුබස්නා ක්‍රෝධ ඇති නාරජ්ජුරුවෝ නැවත ඒ කුමාරිකාවන්ගේ දෙපත්ලෙහි පටන් සියලු ශරීරය රත් දගබෙක[15] සමන් මල්දමක් සිසාරන්නා සේ දරණවැලයෙන් වෙළාගෙන ඉස්මුදුනෙහි පෙණය තබා හයගන්වමින්[16] සිටගත්හ. මෙසේ සකල ශරීරය දරණවැලයෙන් වෙළා තමන් ඉස්මුදුනෙහි පෙණය තබා භය ගන්වන්නාවූ නාරජ්ජුරුවන් කෙරෙහි කිසි භයක් නොකොට ධ්‍යානයට සම වන්නා සේ එකඟ වූ සිතින් අන්‍යවිහිත නොව තමන් අසන්නා වූ ධර්මය ම අකුරෙන් අකුර පදයෙන් පදය මදකුත් නොපිරිහෙළා අසන්නාහු මය. එසේ ශ්‍රද්ධාවෙන් අසන්නාවූ ධර්මයෙහි බලයෙන් කුමාරිකාවන්ගේ ශරීරයට ස්වල්පමාත්‍රයකුත් දුකෙක් නම් නොවීය.

---

1. අසූරියනක් - BGHKL
2. සත්රුවන්මය - BGHKL
3. හුණ්දඬු - FG
   උණ්දඬු - BHKL
4. තබා - BGHKL
5. තිරිකුඩම් - පිටපත් හැම.
   සිරිකුඩම් - බෙ.ම.සා.
6. දඬුවැට - AJ
7. දල්වා - BDEGHL, ස.
8. රත්නමණ්ඩපයෙක්හි - බෙ.ස.
   රත්නමණ්ඩපයෙක් - A
   මණ්ඩපයෙක - KL
9. හිඳුවා(නැත) - පිටපත් හැම
10. ආශ්චර්ය - BGHKL
11. ලබ්බවා - BCGHJK
    ලබා - ක.කි.සා.ම.
12. නොගත් කල - AJ
13. විෂධූමයෙන් - ක.කි.සා.ම.
14. දකත් - මුද්‍රිත හැම, ස.
15. දගබක - FGHKL
    දගැබක - B
    දගැබෙක - C, ක.කි.සා.ම.
16. හයගන්වමියි - ACJ, බෙ.ස.

Non-Commercial Distribution

ඉක්බිති ඒ රාත්‍රිය පහන් වූ කල්හි මනුෂ්‍යයෝ මහත් වූ ආශ්වර්‍ය්‍යයට පැමිණ 'මේ කිමෙක් ද' යි කාරණ විචාළහ. එවේලෙහි කුමාරිකාවෝ ආදියෙහි පටන් මේ සියලු කථා ප්‍රවෘත්තිය නොවරදවා ම විස්තර කොට කියා ඉක්බිති සත්‍යක්‍රියා කරන්නාහු, 'ඉදින් මම මේ මනුෂ්‍යලොකයෙහි උපන් දවස් පටන්ගෙන අද දක්වා ඒකාන්තයෙන් ම බාලබ්‍රහ්මචාරී වීම් නම් ඒ සත්‍යවචනය හේතු කොටගෙන මේ නාරජ්ජුරුවෝ තමන්ගේ[1] දරණවැල බන්ධනයෙන් වහා ම මා උනා හැරපියත්වයි. තව ද යම් බණ ඇසීමක් හේතුකොටගෙන හෙවත් මහත් වූ ශ්‍රද්ධාසම්පත්තීන් යුක්ත ව බණ අසන්නාවූ මම ඒ අසන්නාවූ ධර්මයෙහි ආදරයෙන් ම මෙබඳු මා කෙරෙහි බද්ධානුරාගයෙන් කාමාතුර ව නොයෙක් පරිද්දෙන් යාච්ඤා කරන්නාවූ මේ නාරජහු [කෙරෙහි][2] ඒකාන්තයෙන් ම මාගේ කාය වාග්[3] මනඃ යන ද්වාරත්‍රයෙන් ක්ෂණමාත්‍රයකුත් අවසරයක් නොකෙළෙම් වීම් නම් මේ සත්‍යවචනය හේතුකොටගෙන මේ නාරජ්ජුරුවෝ වහා මා හැරපියත්වයි. තව ද තමන්ගේ මනොරථපූරණයට මා නොලැබුණු හෙයින් කෝපයෙන් දිලිහී[4] මා මරනු පිණිස විෂධූමය[5] හළුවාවූ මේ නාරජහු කෙරෙහි කෝපයෙක් ඉදින් එකවිටකත්[6] මා සිත්හි නූපන්නේ වී නම් ඒ සත්‍යවචනය හේතුකොටගෙන මේ නාරජ්ජුරුවෝ වහා මා හැරපියත්වයි. තව ද බණ අසන්නාවූ මම මහත් වූ ආදර ගෞරවයෙන් යුක්ත ව භක්තිප්‍රේම සහිත ව බණ ඇසීම් නම් ඒ සත්‍යවචනය හේතු කොටගෙන මේ නාරජ්ජුරුවෝ මා කෙරෙහි මෙත් සිත් පතුරුවා තමන් සිත උපන් කෝප සන්හිඳුවා වහා මා හැරපියත්වයි. තව ද මේ තුන්යම් රාත්‍රියෙහි මෙබඳු විෂඝොර සර්පරාජයකු සකල ශරීරය තමාගේ දරණවැලයෙන් වෙළාගෙන මා හිස්මුදුනෙහි පෙණය තබා මෙසේ භය ගන්වමින් සිටියදී එහි භයක් නොකොට මා අසන්නාවූ බණෙහි මුල පටන් අග දක්වා අකුරෙන් අකුර පදයෙන් පදය මඳකුත් නොපිරිහෙළා ඉඳුරා සිත හෙළා ඇසීම් මය, එසේ හෙයින් ඒ සත්‍යවචනය හේතුකොටගෙන මේ නාරජ්ජුරුවෝ වහා මා හැරපියත්ව' යි කියා මෙසේ සත්‍යක්‍රියා කළහ. එසේ හෙයින් කියන ලදී:

බ්‍රහ්මචාරී අහොසාහං - සඤ්ජාතා ඉධ මානුසෙ,
තෙන සච්චෙන මං නාගො - ඛිප්පමෙව පමුඤ්චතු.
කාමාතුරස්ස නාගස්ස - නොකාසමකරිං යතො,
තෙන සච්චෙන මං නාගො - ඛිප්පමෙව පමුඤ්චතු.
විසවාතෙන ඛිත්තස්ස - කුපිතස්සොරගස්ස'හං,
අකුද්ධා තෙන සච්චෙන - සො මං ඛිප්පං පමුඤ්චතු.
සද්ධම්මං සුණමානාහං - ගරුගාරව භත්තියා,
අස්සොසිං තෙන සච්චෙන - ඛිප්පං නාගො පමුඤ්චතු.
අක්ඛරං වා පදං වාපි - අවිනාසෙත්වාව ආදිතො,
අස්සොසිං තෙන සච්චෙන - ඛිප්පං නාගො පමුඤ්චතු-යි.

---

1. තමත් - BGHKL
2. කෙරෙහි (නැත) - පිටපත් හැම
3. වාක් - පිටපත් හැම
4. දිලිහි දිලිහී - AJ
5. විෂධූමයක් - BGH
6. එකවිටත් - AJ

Non-Commercial Distribution

මෙසේ සත්‍යක්‍රියා කළ ඉක්බිති ඒ කුමාරිකාවන් කෙරෙහි අතිප්‍රසන්න වූ හාරජ් ජුරුවෝ දරණවැල[1] ගළවා හකුළුවාගෙන තමන්ගේ එක ශරීරයෙහි පෙණසිය[2] මවාගෙන කුමාරිකාවන් පෙණ ගබිහි[3] වඩාහිඳුවා බොහෝ නාමෙනෙවියන් හා සමඟ උදක පූජා නම් වූ මහත් වූ පූජාවක් කළහ. ඒ දක ආශ්චර්‍ය්‍යීමත් වූ දෙවපුත්‍ර නුවර වැසි බොහෝ මනුෂ්‍යයෝ අවළොස් කෙළක් පමණ ධනරාශීන් පූජා කළහ. හේ එසේ මය. මේ ලොකයෙහි තුනුරුවන් කෙරෙහි කරන ලද ශ්‍රද්ධාව හා සමාන වූ සත්වයන්ට කැමැති කැමැති වස්තු දෙන්ට සමර්ථ වූ මිත්‍රයෙක් නැත් මය. ඒ කුමාරිකාවන්ගේ ශ්‍රද්ධාබලයක් බලව. එබඳු විෂඝොර සර්පරාජයන් හා කිසි නෑසියකමක් නැති මනුෂ්‍යයෝ පවා නොයෙක් කෙළගණින් වස්තු දීමෙන් මෙසේ බොහෝ පූජා සත්කාර කළහ. මෙසේ ඒ කුමාරිකාවෝ මතු ලබන ස්වර්ගමොක්‍ෂසම්පත් තබා මේ ජාතියෙහි ම අපමණ වූ භවභොගසම්පත් ලදහ. එසේ හෙයින් තමහට වැඩ කැමැති ශ්‍රද්ධාවන්ත ස්ත්‍රී පුරුෂයන් විසින් තුනුරුවන් කෙරෙහි ආදර ගෞරවයෙන් යෙදී භක්තිප්‍රෙම සහිත ව ව්‍යාසය කළ මැනවි. කියනලද මැයි:

> නත්ථි සද්ධා සමො ලොකෙ - සුහදෙ සබ්බකාමදෙ,
> පස්සථ'ස්සා බලං සද්ධා - පූජේණෙතවං නරොරගා.
> ඉධ ලොකෙව සා'ලත්ථ - භවභොගමනප්පකං,
> තස්මා සද්ධෙන කාතබ්බං - රතනත්තය ගාරවං -යි.

මෙසේ ලබනලද මහත් වූ සම්පත් ඇති ඒ කුමාරිකාවෝ තමන්ගේ ජීවිතාන්තය දක්වා පුරුෂයන් තරා[4] ළං නොවී කුමාරි බ්‍රහ්මචර්‍ය්‍යීය[5] රක්‍ෂා කොට ආයු කෙළවර ඒ ආත්මභාවයෙන් මිය[6] එම දෙවපුත්‍ර නුවර රාජ්‍ය කරන්නාවූ දෙවපුත්‍ර රජ්-ජුරුවන්ගේ අගමෙහෙසින් වූ බිසොවුන් කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් මවුකුසින් බිහි වූහ. ඒ කුමාරිකාවන් මවුකුසින් බිහි වූ දවස් ඒ සියලු දෙවපුත්‍ර නුවර හැම තැන්හි සත්රුවන් වැසි වැසපීය. එසේ හෙයින් ඒ කුමාරිකාවන්ට නම් තබන දවස් කණ්ඩන දේවී යයි නම් තුබූහ. ඒ කුමාරිකාවෝ වනාහි බැලූ බැලූවන්ට ප්‍රසාද එළවන්නාහ, දෙවගනක මෙන් විශිෂ්ට වූ රූ ඇතියහ, යහපත් වූ ඡවිපහස් ඇතියහ. ඔවුන්ගේ මුඛයෙන් මහනෙල් මල් සුවඳ හමයි, ශරීරයෙන් සඳුන් සුවඳ වහනය වෙයි. සියලු ශරීරයෙන් හිරුමඬල සේ රශ්මි නික්මෙයි, සියලඟින් නික්මෙන්නාවූ ඒ රශ්මිකදම්බයෙන් සතරරියන් ගබඩාව ඊදෙවෙහි වෙනසක් නොවී බබළයි, එහි පහන් ලුව මැනවැයි නැත. සියලු ගබඩාව[7] ශරීරාලොකයෙන් ම එකාලොක ව බබළයි. මෙසේ මෙබඳු ඒ කුමාරිකාවන්ගේ රූපසම්පත්තිය මුළු දඹදිව හැම තැන්හි ප්‍රසිද්ධ විය. ඉක්බිති ජම්බුද්වීපවාසී වූ සියලු රජදරුවෝ ම ඒ කුමාරිකාවන් පිණිස ඔවුන්ගේ පියරජ්ජුරුවන්ට වෙන වෙන පඬුරු පාක්කුඩම් එවූහ.[8] එතෙකුදු වුවන් ඒ

1. දරණවැලය - BDEGHKL
2. සියගණන් පෙණ - DE, ම.
   සියදහස්ගණන් පෙණ - BGHKL, ඵ
3. ගප්හි - BEGHKL
4. කරා (නැත) - කි.ම.
5. බ්‍රහ්මචරියාව - J
   බ්‍රහ්මචරියාව - BEF
   කුමාරිකා බ්‍රහ්මචර්‍ය්‍යීය - K , ස.
6. මිදී - C
7. ගබඩා - ACEFJ
8. යවූහ - BGHKL

Non-Commercial Distribution

කුමාරිකාවෝ තමන් පඤ්චකාමයෙහි ඇල්මක් නැති හෙයින් පියරජ්ජුරුවන් අනුදන්වාගෙන මෙහෙණවරකට ගොස් මහණ ව නොබෝ දවසකින් විදර්ශනා වඩා සිවුපිළිසිඹියා පත් රහත් ව බුදුසසුන් බැබළවූහ. මෙසේ ඉතා ළද බොළඳ එබඳු බාලකුමාරිකාවෝ පවා තමන් කෙරෙහි බඩානුරාග ඇති නාරජහුගේ තෙපුල් නොගෙන ඔහු විසින් කරනලද නොයෙක් වැසන්[1] ඉවසා එකඟ වූ සිතින් ආදර සහිත ව බණ අසා තමන්ගේ ගුණයෙහි ප්‍රසන්න වූ නාරජහු විසින් කරනලද උදකපූජා[2] නම් වූ මහත් වූ පූජාවක් හා එසේ ම පහන් සිත් ඇති මනුෂ්‍යයන් විසින් ගළවා දමනලද ආභරණ[3] ආදි වූ අටළොස්කෙළක් පමණ ධනරාශීන් පූජා ලැබ ජීවිතාන්තය දක්වා අත්‍යන්තනිර්මල වූ කුමාරී[4] බ්‍රහ්මචර්යාව රක්ෂාකොට එම කුශලානුභාවයෙන් දෙවන ජාතියෙහි පරම්පරානුගත අත්‍යන්තනිර්මල වූ රාජවංශයෙහි ඉපද මුළු දඹදිව රුවන් වැසි වස්වා අපමණ වූ නොයෙක් ශ්‍රීසම්පත් ලැබ සිත් වූ පරිද්දෙන් සැප විඳ සසුන් වැද මහණ ව නිවන්පුර සිරි ලදහ. එබැවින් පින්වත් සත්වයෙනි, තොප හැම විසිනුදු එපරිද්දෙන් ම හැම කල්හි අප්‍රමාද ව කුසල් කොට මතු ස්වර්ග මෝක්ෂ සඞ්ඛ්‍යාත උභයාර්ථසිද්ධිය කරන්ට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි:

සුත්වාන සාදරවසෙන කුමාරිකෙවං
ධම්මං හි සීලමමලං පරිපාලයන්ති,
ලද්ධාන නෙක විභවං විභවං පයාතා
මා හො පමජ්ජථ සද කුසලප්පයොගෙ[5]-යි.

මෙතෙකින් මේ නන්දිරාජ වග
පස්වන කණ්ඩනදේවී වස්තුව
කියා නිමවන ලදී.

මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි

නන්දිරාජ වර්ග නම් වූ

සවන පරිච්ඡේදය නිමි.

තව ද මේ සද්ධර්මාලංකාරයෙහි **යක්ඛවඤ්චිත** වග පළමුවන **යක්ඛවඤ්චිත** වස්තුව නම් කවර යත්, එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු :

අප මහාගෞතම බුදුරජාණන් වහන්සේ යට දිවකුරු බුදුන් සමයෙහි සතර පදයෙන් යුක්ත ගාථාමාත්‍රයක් අසා අමාමහ නිවන් දක්නට තිසි උපනිශ්‍රය සම්පත් ඇතියේක් මේ ලොකයෙහි අවිද්‍යා නමැති අන්ධකාරයෙන් මුළා ව ජාති ජරා මරණ

1. ව්‍යසන - CG
   ව්‍යාසන - BH
2. ඝනකපූජා - BGHKL
3. මනහර ආභරණ - BGHKL
4. කුමාරී(නැත) -KL
5. කුසලප්පහොතෙ - AFJ

Non-Commercial Distribution

නමැති යක්ෂාධිගෘහිත වූ භව නමැති මහවනයට වැද අමාමහනිවන් නමැති අභයපුරයට වදනාවූ පිළිවෙත් නමැති රජමහවත් නොදක මං මුළා ව ඇවිද[1] කෙලෙස් නමැති පසමිතුරන්ට අසුව තෘෂ්ණා නමැති බන්ධනයට[2] පැමිණ අපමණ දුක් ගන්නාවූ බොහෝ සත්වවර්ගයා දක උපන්නාවූ මහකුළුණු ඇති ව ඔවුන් එදුකින් මුද ගැන්මට නිසි උපාය සොයා නොබුදු ව[3] නොපිළිවන් බව දන භවදුර්ගයට වැද බුධකාරකධර්මයන් මුහුකුරුවා ප්‍රඥ වීර්‍ය්‍ය නමැති බාහුබල වික්‍රමයෙන් සංසාර නමැති මහවනය ප්‍රදලනය කොට බොධ්‍යධිෂ්ඨාන[4] නමැති මහඑළියට බැස දස පාරමිතා නමැති දස මහායොධයන් පිරිවරා විදර්ශනා නමැති රජමහවතට බැස ප්‍රඥ නමැති හස්තයෙන් ආශ්‍රවක්‍ෂයකරඥන නමැති ජයකොන්තය ගෙන ආධ්‍යාත්මික වූ කෙලෙස් නමැති සතුරන් සාධා විමුක්ති නමැති ජේසත් නංවා අර්හත්ඵල නමැති මිණි ඔටුනු[5] පැළඳ මුළුලොව බුධරාජ්‍යයට පැමිණ සර්වඥතාඥන නමැති හස්තයෙන් දෙශනා නමැති ඛඩ්ගපත්‍රය ගෙන වෛනෙයජන නමැති සෙවකජනයන්ට[6] පීඩා කරන්නාවූ කෙලෙස් නමැති සතුරන් සාධා තෘෂ්ණා නමැති බන්ධනයෙන් මුදනලද එම වෛනෙයජන නමැති මහසෙනඟ පිරිවරා චතුපාරිශුධශීල නමැති සුදු වැලිතල ඇති පසළොස් චරණධර්ම නමැති මිණිතොරණ පඞක්ති ඇති සතර ඍද්ධිපාද නමැති කල්පවෘක්ෂ සතරක් ඇති සතර බ්‍රහ්මවිහරණ නමැති පියුම්විල් සතරක් ඇති සතර සතිපට්ඨාන නමැති මහපා පඞක්ති ඇති කීර්ති නමැති ධජ මාලාවන් ඇති සමාපත්ති නමැති මහපවුරු ඇති කෙලෙස් නමැති පසමිතුරන් වැද්ද නොහැකි සතර ආර්‍ය්‍යමාර්ග නමැති වහසල් දෙර සතරක් ඇති සප්ත බොධ්‍යඞ්ග ධර්ම නමැති සල්පිල්පඞක්ති[7] ඇති සප්තවිධ ආර්‍ය්‍යධන නමැති රුවන්ගබඩා ඇති අර්හත්ඵල නමැති මහාප්‍රාසාදයකින් මුදුන් පැමිණ සිටියා වූ සොපාදිශෙෂ නිර්වාණධාතු නමැති ශාන්තිපුරයට[8] වැද ධ්‍යානසුව නමැති ජයපානය කොට ශ්‍රාවක නමැති සෙවකජනයන්ට දහම් නමැති රුවන් බෙද දී මෛත්‍රී කරුණා නමැති අඞ්ගනාවන් දෙදෙනා අගබිසෝ කොට සමාපත්ති නමැති රාජ්‍ය සම්පත් වළඳ පන්සාලිස් අවුරුද්දක් බුධරාජ්‍යය කොට නිරුපාදිශෙෂ නිර්වාණධාතු නමැති අභයපුරයට පැමිණි[9] කල්හි හෙවත් අප බුදුන් පිරිනිවි කල්හි දඹදිව මධ්‍යමණ්ඩලයෙහි කොසොල් රජ්ජුරුවන් සන්තක ජනපදයෙක තුණ්ඩ[10] නම් වූ ගමෙක් විය. ඒ ගම්හි වසන බුධදස නම් මනුෂ්‍යයෙක් ,ජීවිතාන්තය දක්වා බුත්සරණ යෙමි. බුදුහු මට පිහිටසේක, ආරක්‍ෂා නමුත් වනසේක, ක්‍ෂෙමස්ථානසේක, අභයස්ථාන නමුදු වනසේක, උතුම් වූ පිහිටෙක් නමුදු වනසේකැ,යි මෙසේ ජීවිතපරියන්ත කොට බුත්සරණ ගෙන වාසය කෙරෙයි. එසමයෙහි එක්තරා දනවුවැසි මනුෂ්‍යයෙක් ඒ ඒ ජනපදයෙහි ඇවිදගෙන ඒ බුධදස

---

1. ඇවිදිනා - BCGHKL
2. අන්ධ වනයට - BGHKL
3. බුදුවනොව - BEFGHKL, ස.
4. බොද්ධාධිෂ්ඨාන - ක.බෙ.
   බොද්ධ්‍යාංග - KL,
5. ඔටුනු - ABFGHKL, ම.
6. සේවකයන්ට - BCGHKL
7. සල්පිලි පඞක්ති - ABCDEFGH
8. ශාන්තපුරයට - CDEF, මුද්‍රිත හැම, ප.
9. වන් - BDEGHKL
10. තුණ්ඩ - KL

Non-Commercial Distribution

නම් උපාසකයන් වසන තුණ්ඩ නම් ගමට අවුත් එම උපාසකයන්ගේ ගෙයි නවාතැන් ගත. ඒ ආගන්තුක ව ආවාවූ දනවුවැසි පුරුෂයාගේ ශරීරයෙහි පළමු එක් යක්ෂයෙක් ආවෙශ ව බොහෝ සේ පීඩා කෙරෙයි. එදවස් ඒ පුරුෂයා ඇතුළුගමට වදනා වේලෙහි මෙතෙක් දවස් ආවෙශ වන යක්ෂයා ඒ ගම වසන බුඩදස නම් උපාසකයාගේ ගුණතෙජසින් ඔහු වසන ගෙට වැද්ද නොහී ඒ දනවුවැසි ආගන්තුක පුරුෂයා හැර නැවත ඔහු ගමින් පිටත්වූ කල අල්වමියි සිතා සත් දවසක් මුළුල්ලෙහි ගමින් පිටත ම බලා[1] සිටියේය. ඉක්බිති ඒ දනවුවැසි පුරුෂයා සත් දවසක් එහි වැස අටවැනි දවස් තමාගේ ජනපදයට යනු කැමැති ව ගමින් පිටත් විය. එකල ඔහු දක යක්ෂයා බලාත්කාරයෙක[2] වැදලා හුන් ණය ධරන එකකු අවසරයක් බලා මෙවිට කුමක් කෙරෙයි දැයි ගසා අල්වා ගන්නා සේ ඔහු අල්වා ගත. එකල දනවුවැසි පුරුෂයා "එම්බා, තෙපි මෙතෙක් දවස් කොයි ගියා දැ"යි විචාළේය. එවේලෙහි යක්ෂයා කියනුයේ "එම්බල පුරුෂය, තා අල්වාගන්ට අවසරයක් නැති හෙයින් මේ සත් දවස මුළුල්ලෙහි ම අවසරයක් බලබලා මෙතැන සිටියෙමි" යි කීය. එබසට දනවුවැසි මනුෂ්‍යයා කියනුයේ "එම්බල යක්ෂය, මාගෙන් තට ප්‍රයොජන කිම් ද? කවර කාරණයක් පිණිස මා අල්වයි ද? කුමක් දෙම් දැ"යි විචාළේය. ඉක්බිති යක්ෂයා කියනුයේ "එම්බල පින්වත, මම සා දුකින් පීඩිතයෙමි. එසේ හෙයින් මට අනික් දෙයකින් ප්‍රයොජන නැත, බතක් දෙව"යි කීය. එබසට දනවුවැසි පුරුෂතෙම "එම්බල යක්ෂය, එසේ තට ආහාරයෙන් ප්‍රයොජන ඇති කල ඇතුළුගමදී මා කුමක් පිණිස නොඇල්වීදැ"යි කීය. එවේලෙහි යක්ෂයා "එම්බල පින්වත, තා හුන් ගෙයි බුත්සරණ පිහිටි උපාසකයෙක් වෙසෙයි. මම ඔහුගේ තෙජසින් තා හුන් ගෙට වැද්ද නොහී ගමින් පිටත ම සිටියෙමි"යි කීය[3] එතෙපුල් අසා දනවුවැසි පුරුෂ තෙම බුත්සරණ නම් කෙබඳු[4] දෙයක් බවත් පළමු තමා නොදන්නා හෙයින් "එම්බල, ඒ පුරුෂයා කුමක් කියා බුත්සරණ ගනී දැ"යි විචාළේය. එවේලෙහි යක්ෂයා කියනුයේ "බුඩං සරණං ගච්ඡාමි යි කියා මෙසේ බුත්සරණ ගනැ"යි කීය.[5] එතෙපුල් අසා ඒ දනවුවැසි මනුෂ්‍ය තෙම "මේ යක්ෂයා උපායකින් වඤ්චා කොට මා ගැළවුණ මැනවැ,යි සිතා ,එසේ වී නම් යක්ෂය, මමත් බුත්සරණ යෙමි,යි කියා බුඩං සරණං ගච්ඡාමි යි කීය. මෙසේ ඔහු බුත්සරණ යෙමි යි කී ඇසිල්ලෙහි ම යක්ෂයා ඉතා භයපත් ව මහ හඬින් ගුගුරා හයින් වෙවුල වෙවුලා දිවපීය. මෙසේ බුත්සරණ යෙමි යන වචනය නම් මෙලොව වන්නාවූ සියලු භය උපද්‍රව වළකනා පිණිස වන්නේය, පරලොව ස්වර්ගමොක්ෂ සම්පත් සාධා දෙන්නේය. හේ එසේ මැයි.

මේ බුඩො යන වචනය නම් අමනුෂ්‍යයන්ට භය එළවයි, බුදුන් කෙරෙහි ආදරභක්ති ඇත්තාහට හැම නැන්හි ම සන්තොෂයක් ම එළවයි. මේ බුඩ යන වචනය

1. බල බලා - BGHKL
2. බලාත්කාරයෙක් - මුද්‍රිත හැම
3. කිව - BGHKL
4. කෙසේ වූ - KL
5. කිව - BGHKL

Non-Commercial Distribution

නම් සියලු උපද්‍රවයන් නසන්නාවූ[1] ඉතා ප්‍රත්‍යක්ෂ වූ අත්දුටු ඖෂධයක් හා සමාන ය. සංසාර නමැති රාක්ෂසයාට දිව්‍යමන්ත්‍රයක් හා සමානය. ජරා රුජා[2] නමැති දළ සහළක් ඇති සතර අපා නමැති පා සතරක් ඇති මෘත්‍යුමාර නමැති සොඬක් ඇති නිරන්තරයෙන් වහනය වන්නාවූ කෙලෙස් නමැති මදජලධාරාවන් ඇති ඉතා දරුණු වූ වැළකිය නොහැකි සංසාර නමැති හස්තිරාජයා රැඳවීමට හෙවත් දමනය ලීමට තියුණු වූ විදුරු අකුස්සක් වැන්න. සංසාර නමැති යක්ෂයාට ඉතා අද්භුත වූ මාහැඟි යන්ත්‍රයක්[3] වැන්න. එසේ හෙයින් එබඳු දරුණු වූ චණ්ඩ පරුෂ යක්ෂතෙම ශරණශීලයෙහි පිහිටියාවූ ඒ පුරුෂයා දුක උද්විග්න ව මහත් වූ භයට පැමිණ ලොමුදැහැගත්[4] ශරීර ඇති ව හයින් තැතිගෙන අත්බමරක් සේ බමමින් හිරු දුටු අන්ධකාරයක් සේ ද සැඩ පවනින් දිවූ පුලුන් රළක් සේ ද ආසන්නයෙක නොරඳ දිවපීය. එබැවින් රාජභය චොරභය [ශස්ත්‍රභය][5] අග්නිභය[6] උදකභය යක්ෂභය ප්‍රෙතභය ආදීන් වන්නාවූ යම් කිසි පීඩාවෙක් ඇද්ද එසියල්ලෙන් ම කිසි දුකක් නොවනු කැමැත්තාවූ සත්වයන් විසින් තුනුරුවන් ශරණ ගත මැනවි. කියනලද මැයි:

බුද්ධො'ති වචනං එතං - අමනුස්සානං භයාවහං,
බුධගත්තිකජන්තූනං - සබ්බද මුදමාවහං

සබ්බොපද්දවනාසාය - පච්චක්ඛං දිබ්බමොසධං,
දිබ්බමන්තං මහාතෙජං - මහායන්තං මහබ්භුතං

තස්මා සො දරුණො යක්ඛො - දිස්වා තං සරණෙ ඨිතං,
උබ්බිග්ගො ච භයප්පත්තො - ලොමහට්ඨො ච ජම්භිතො

හමන්තො ධාවි තං දිස්වා - තිමිරොව සුරියුග්ගතෙ,
සිම්බලිතූලහට්ටං'ව - චණ්ඩවාතෙන ඛණ්ඩිතං

යං දුක්ඛං රාජචොරාරි - යක්ඛපෙතාදි සම්භවං
තිවජ්ජෙත්ත මනුස්සෙන - ගන්තබ්බං සරණත්තයං - යි.

තව ද යමෙක් මුළු ලොවට අග්‍ර දක්ෂිණෙය්‍ය වූ[7] බුධරත්නය ද එම බුදුන් විසින් දෙසනලද ස්වාක්ඛ්‍යාතතාදි ගුණොපෙත සපර්‍ය්‍යාප්තික නව ලොකොත්තර සධර්ම සඞ්ඛ්‍යාත ධර්මරත්නය ද ඒ ධර්මය වූ පරිද්දෙන් පිළිපදනා සුප්‍රතිපන්නතාදි ගුණගණාඪ්‍ය සංඝගත අෂ්ටාර්‍ය්‍ය පුද්ගල සංඝරත්නය ද යන තුනුරුවන් ශරණ ගියේ වී නම් ඒ තෙම මතු ඒ කුශලානුභාවයෙන් ලබනලද මාර්‍ගප්‍රඥා නමැති ඇසින් දුඃඛ සමුදයාදි වූ චතුරාර්‍ය්‍යසත්‍යය එකාන්තයෙන් ම දක්නේය, හෙවත් එම කුශලානුභාවයෙන් දිව්‍යමනුෂ්‍ය සම්පත් විඳ කෙළවර රහත් බවට පැමිණ චතුස්සත්‍යාවබොධය කරන්නේය. එසේ හෙයින් කියනලදි,

---

1. සත්හිඳුවන්නාවූ - BGHKL
2. රුජා - පිටපත් හැම, ස. මරණ - මුද්‍රිත හැම
3. මන්ත්‍රයක් -G, කි.
4. ලොමුදහාගත් - ADGJ
5. ශස්ත්‍රභය(නැත) - පිටපත් හැම
6. අග්නිභය(නැත) - BGHKL
7. දක්ෂිණාර්හ වූ - ක.ම. දක්ෂිණීය වූ - බෙ.ස.

Non-Commercial Distribution

යො ච බුද්ධඤ්ච ධම්මඤ්ච - සඞ්ඝඤ්ච සරණං ගතො,
චත්තාරි අරියසච්චානි - සම්මප්පඤ්ඤාය පස්සති යි.

ඉක්බිති එදනවුවැසි පුරුෂයා සරණගමනයෙහි මහත් වූ ගුණානුභාව හා ආනිශංසය ප්‍රත්‍යක්ෂයෙන් ම දුටු හෙයින් බුදුන් කෙරෙහි මහත් වූ ගෞරව ඇති ව භක්තිප්‍රෙම සහිත ව එතැන් පටන් ජීවිත පරියන්තං බුද්ධං සරණං ගච්ඡාමි යි මෙසේ සරණගත ව එම සරණගමනයෙහි[1] ආනුභාවයෙන් ජීවිතාවසානයෙහි නිදි පිබිදියක්හු මෙන් දිව්‍යලොකයෙහි උපන. මෙසේ ශරණගතයන් දක ඉතා දරුණු වූ චණ්ඩ පරුෂ යක්ෂයෝ පවා මහත් වූ භයින් තැති ගෙන පහව පලා යන්නාහ. එසේ හෙයින් පින්වත් සත්වයෙනි, තොප හැම විසිනුදු තිසරණ පිහිටා ශරණශීලය රක්ෂා කොට සියලු අකුශලකර්මයන්[2] දුරුකොට හැර මෙලොව නොයෙක් උපද්‍රවයෙන් මිදී පරලොව සියලු දිව්‍යමනුෂ්‍ය සම්පත් විඳ කෙළවර ජරාමරණ රහිත වූ නිවන් සැපත් සාධන්ට උත්සාහ කළ මැනවි. කියනු ලදුයේ මැයි,

දිස්වාන එවං සරණං ගතං තං
අපෙන්ති යක්ඛාපි මහබ්භයෙන,
පාලෙථ සීලං සරණඤ්ච තස්මා
ජහාථ දුරිතං සුගතිං භජවෙහා-යි

මෙතෙකින් මේ යක්ඛවග්ගවිත වග
පළමුවන යක්ඛවඤ්චිත වස්තුව
කියා නිමවන ලදි.

තව ද මෙහි යක්ඛවඤ්චිත වග දෙවන මිථ්‍යාදෘෂ්ටික වස්තුව නම් කවර යත්,

අප මහාගෞතම බුදුන් නිවන් පුර පැමිණි පසු දඹදිව රජගහා නුවර එක් වීථියෙක බ්‍රහ්මභක්ති ගත්තාවූ මිථ්‍යාදෘෂ්ටිකයෙක් වෙසෙයි. එම වීථියෙහි සම්‍යග්දෘෂ්ටි ගත් උපාසකයෙක් ද වාසය කෙරෙයි. ඔවුන් දෙදෙනාගේ ම පුත්‍රයෝ දෙදෙනක් ද වූහ. ඔහු දෙදෙන බාල අවස්ථාවෙහි පටන් එක කෙළිමඩලෙහි එක් ව කෙළිමින් සෙමින් වැඩෙන්නාහ. එයින් මැත භාගයෙහි එක් ව ගුළකෙළි කෙළනා වූ ඔවුන් දෙදෙනා අතුරෙන් සම්‍යග්දෘෂ්ටියෙහි පිහිටි උපාසකයාගේ පුත්‍රයා නමො බුද්ධාය යි කියමින් හුවට දමා කෙළනේ දවසින් දවස් ම ජය ගන්නේය. මිථ්‍යාදෘෂ්ටිකයාගේ පුත්‍රයා නමො බ්‍රහ්මුනො[3] යි කියමින් හුවට දම දමා කෙළනේ නිරන්තරයෙන් ම පරදනේය. මෙසේ කල් යාමක් ගිය කල්හි මිථ්‍යාදෘෂ්ටික කුමාරතෙම නිරන්තරයෙන් ම සම්‍යග්දෘෂ්ටික කුමාරයන් ජය ගන්නා බව දක 'යහලු, තෙපි ඇම දවස් ම මා පරදවා ජය ගනුව.[4] තෙපි කුමක් කියා හුවට දමවු ද, තොප දන්නා මන්ත්‍රයෙක් ඇද්ද' යි විචාළේය. එබසට සම්‍යග්දෘෂ්ටික කුමාරයා 'යහලු, මා දන්නා අනික් මන්ත්‍රයෙක් නැත. නමො බුද්ධාය යි යන මෙපමණක් ම කියා හුවට දමමි,'යි

1. සරණාගමනයෙහි - BGH
2. ධර්මයන් - FGHKL
3. මහාබ්‍රහ්මනො - KL
4. ජයගන්නේය - F
ජයගන්නානුය - කි.ම.
ජයගන්නනුය - ක.ස.

Non-Commercial Distribution

කීය[1] එතෙපුල් අසා මිථ්‍යාදෘෂ්ටික කුමාරයා ද එතැන් පටන් නමො බුද්ධාය යි කියමින් නුවට දමයි. එතැන් පටන්[2] ඔහු දෙදෙන ගුළුනෙළියෙහි දිනුම් පැරදුම් බොහෝ සේ සම සම වන්නාහ.

එයින් මෑත භාගයෙහි ඒ මිථ්‍යාදෘෂ්ටික කුමාරයා දවසෙක දර පිණිස පියාණන් සමඟ නුවරින් පිටත වල් ගොස් දර ගැලක් පුරාගෙන නුවරට එනුයේ නුවර වාසල්දෙර සමීපයෙහි ගැල රඳවා ගොන් තණ බිමට හැරපීය. එකල තණ කකා යන්නාවූ ගොන් හැම සෙසු ගවයන් හා සමග ඇතුළු නුවරට වන්හ. ඉක්බිති ඒ කුමාරයන්ගේ පියාණෝ ගොන් ගිය අත් පරීක්‍ෂා කරන්නාහු මේ ගැල බලව යි කියා පුතණුවන් රඳවා ඒ ඒ තැන ගොන් විමසා බලමින් ගොස් නුවරට වන්හ. එකල සවස් වූ හෙයින් රකවල සිටි මනුෂ්‍යයෝ වහසල් දෙර අගුළු ගත්හ. එකල ඒ මිථ්‍යාදෘෂ්ටික කුමාරයා අනික් යන තෙනක් නැති හෙයින් නුවරින් පිටත දර පිරූ ගැල යට වැදහෙව නිදන්ට පටන්ගත. මෙසේ ඒ කුමාරයා වැදහෙව නිදන කල්හි එම රාත්‍රියෙහි සම්‍යග්දෘෂ්ටි ගත් යක්‍ෂයකු හා මිථ්‍යාදෘෂ්ටි ගත් යක්‍ෂයකු හා දෙදෙන තමන් අනුභව කරන්ට සුදුසු වූ ආහාරයක් සොයා ඇවිදිනාහු දරගැල යට වැද හෙව නිදන්නාවූ ඒ කුමාරයා දුටහ. ඔවුන් දෙදෙනා අතුරෙන් මිථ්‍යාදෘෂ්ටි යක්‍ෂ තෙම "මේ කුමරුවා අල්වාගෙන කාපියම්හ"යි කීය. සම්‍යග්දෘෂ්ටි යක්‍ෂයා "එසේ නොසිතව, මේ කුමරු[3] එසේ කාපිය නොහැක්ක. මේතෙම නමො බුද්ධාය යි කියා සරණගත වූ කුමාරයෙකැ" යි කීය. එබසට මිථ්‍යාදෘෂ්ටි යක්‍ෂතෙම "දුන් මේ කුමරුවා[4] අල්වාගෙන මුල පලා අලයක් කන්නා සේ සපා කාපියම්" යි කීය. සම්‍යග්දෘෂ්ටි යක්‍ෂයා තුන් වරෙක වළක්ව වළක්වා[5] නොවැළක ම ගොස් එ කුමරුවාගේ දෙපය අල්වා ඇදගත. එකෙණෙහි කුමර පළමු කී[6] අභ්‍යාසයෙන් නමො බුද්ධාය යි කීය. එබස් අසමින් ම සියලඟ ලොමුදැහැගෙන මහත් වූ භයට පැමිණි යක්‍ෂතෙම මුත්හරෙකැයි සිතා සර්පයකු දසාවට දික්කළ අතක් වහා හයා ගන්නා සේ අතහැර හයින් ඉවත් ව සිටියේය. අහෝ, බුදුන්ගේ බුද්ධානුභාවය ඉතා ආශ්චර්‍ය්‍යයෙක් මැයි, ඉතා අද්භූතයෙක් මැයි! කම්පල අදහා ආත්ම පරිත්‍යාගයක් නොකොට උදක් පූර්වපරිචය මාත්‍රයෙකින් නමො බුද්ධාය යි කීවාවූ සත්වයන්ට පවා කිසි භයෙක් නැති ගැන්මෙක් ලොමොද්ගමනයෙක් නූවූයේ මය. එසේ හෙයින් යාවජීවං බුද්ධං සරණං ගච්ඡාමි යි මෙසේ ආත්මපරිත්‍යාග වශයෙන් ජීවිතාන්තය දක්වා සරණගත ව වසන්නාහට කිසි ව්‍යසනයෙක් නොවෙයි යනු එකාන්ත මැයි.

තව ද මේ ලෝකයෙහි මයූරයන්ගේ ශබ්දය යම් සේ සර්පයන්ට භය එළවා ද, එපරිද්දෙන් ම මේ බුද්ධ යන වචනය ද යක්‍ෂ රාක්‍ෂසාදීන්ට එකාන්තයෙන් භය එළවන්නේය. තව ද යම් සේ මන්ත්‍ර ජ[ල්]පනයෙන්[7] සියලු විෂ විනාසයට යේ ද,

1. කිව - BGHK,
   කිවුය - L
2. ඉක්බිති - මුද්‍රිත හැම.
3. කුමරුවා - CGK
4. කුමරු - KL
5. වළක්ව වළක්වා සිටියදී - ස.
6. කියා ආ - KL
7. ජපනයෙන් - පිටපත් හැම, ස.
   ජල්පනයෙන් - මුද්‍රිත හැම

Non-Commercial Distribution

එපරිද්දෙන් ම මේ බුඩ යන වචනය කන හුණු ඇසිල්ලෙහි යක්‍ෂයෝ භය ගෙන පලා යන්නාහු මය. තව ද යම් සේ ගිනි දුටු ඉටි පහන දුරදී ම කකියා ද එපරිද්දෙන් ම ශරණගතයන් දුරින් ම දුටු කෙණෙහි යක්‍ෂ ප්‍රෙතයෝ භයින් තැති ගෙන දුරින් ම පහවන්නාහ. කියන ලද මැයි,

යථාපි සීහිනො නාදං - භූජඩගානං භයාවහං,
එවං බුඩො'ති වචනං - අමනුස්සානං භයාවහං.
යථා මනතස්ස ජපෙපන - විලයං යාති කිබ්බිසං,
එවං බුඩානුභාවෙන - භායනති කුණපාදකා.
අගගිං පත්වා[1] යථා සිත්ථං - දූරතොව විලීයති,
පත්වානෙවං[2] සරණගතං - පෙතා, පෙතෙනව[3] දූරතො-යි.

එසේ හෙයින් මේ බුඩ යන අකුරු දෙක නම් මේ ලෝකයෙහි ශ්‍රඩාවන්තයන්ගේ උපද්‍රව නිවාරණය පිණිස උස් ව පැනනැංගාවූ ඉතා අද්භූත වූ උතුම් වූ ස්ථිරතර විදුරු පවුරක් හා සමාන ය. සත් රුවනින් විසිතුරු මහපායක් හා සමානය, කෙශර සිංහයකු විසින් රක්නාලද විදුරු ගුහාවක් හා සමානය. රන් ගුහාවක් හා සමානය. සසරසයුරට මහනැවක් හා සමානය. සංසාර නමැති ඝනාන්ධකාරයට[4] මහාප්‍රදීපයක් හා සමානය, සංසාර නමැති මහාසාගරයෙහි වැටී දුක් විඳිනා සත්වයන්ට නිඝීය වූ දිවයිනක් හා සමානය. සංසාරව්‍යසන නමැති ශරනිවාරණයට ඝනනාහයක් හා සමානය. මේ බුඩ යන අකුරු දෙක නම් ශ්‍රඩාවන්තයන්ගේ මුදුනෙහි පළඳනාවූ රත්නකිරීටයක් හා සමානය. නළල්තෙලෙහි බබළන්නාවූ තිලකාභරණයක් හා සමානය. නෙත්‍රයුග්මයට සැප එළවන්නාවූ කර්පූර ශලාකාවක් හා සමාන ය. දෙකන පළඳනා කර්ණාභරණ යුග්මයක් හා සමානය. ග්‍රීවයෙහි පළඳනා රත්මාලාවක් හා සමානය. කර උරබිත සරහන එකාවැලයක් හා සමානය. මුත්හරක් හා සමානය. බාහුමූලයෙහි පළඳනා අඩගදහරණයක් වැන්නේ මය. අත්කර සරහන හස්තකංගයක්[5] වැන්නේ මය. හස්තාංගුලීන් සරහන රුවන්මුදු සහළක් වැන්නේ මය. ප්‍රතිපක්‍ෂයන් ජය ගන්නා අභිමඞගල සම්මත වූ ඛඩ්ගපත්‍රයක් වැන්නේ මය. එම ශ්‍රඩාවන්තයන්ගේ මුදුනෙහි නහනලද රත්මල්[6] සේසතක් වැන්නේ මය. නළල් තලය සරහන උෂ්ණීෂපට්ටයක් වැන්නේ මය. නළල්පටක් වැන්නේ මය. ශත්‍රුවිජය පිණිස ගන්නාලද ශර සහිත ශරාසනයක් වැන්නේ මය. සකල ශරීරය සරහන ආභරණ රාශියක් වැන්නේ මය. සියලු දුශ්චරිත නමැති රජස් පහකිරීමට චණ්ඩමාරුතයක් වැන්නේ මැයි. එසේ හෙයින් කියන ලදී:

පවරං බුඩ ඉචෙචත - මකඛරද්වයමබ්භුතං,
සබ්බොපද්දවනාසාය - පීරපාකාරමුගගතං.

1. දිස්වා - මුද්‍රිත හැම ස. පාලි
2. දිස්වානෙවං - මුද්‍රිත හැම ස. පාලි
3. පෙතාපෙතනාව - ක.කි.ඥා.ම, පාලි
4. මහ ඝනාන්ධකාරයට - GH
5 හස්තකංගයක් - ACDEFJ
හස්තකටයක් - BGHKL
වලයාභරණයක් - මුද්‍රිත හැම
වලයං - පාලි
6. රන් - BGHKL

Non-Commercial Distribution

සත්තරතනපාසාදං - තමෙව චජිරං ගුහං,
තමෙව නාවං දීපං තං - තමෙව කවචං සුභං.

තමෙව සිරසි භාසන්තං - කිරීටං රතනාමයං,
ලලාටෙ තිලකං රම්මං - කප්පූරං නයනඤ්ජනෙ.

තාඩඞ්කං කණ්ණයුගලෙ - සොණ්ණමාලා ගළෙ සුභා,
එකාවලී තාරහාරා - හාර ජත්තුසු ලඞ්කතා.

අඞ්ගදං බාහු මූලස්ස - කරග්ගෙ වලයං තථා,
අංගුලීසඞ්ගුලීයඤ්ච - බ්ගගං මඞ්ගලසම්මතං.

සොණ්ණාතපත්තමුණ්හීසං - සබ්බාණෙන සරාසනං,[1]
තමෙව යබ්බාලඞ්කාරං - තමෙව දුරිතාපහං -යි.

එසේ හෙයින් නුවණැති සත්පුරුෂයන් විසින් මුළු ලොවට අසහාය නෙත්‍රයක් බඳු වූ සර්වඥයන්වහන්සේගේ "බුද්ධ" යන මේ ගුණනාමය එකාවන්[2] සිහිකොට ශරණගත ව මතු මුළුලොවට අග්‍ර[3] විය යුත්තේය. මෙසේ බුදුන් කෙරෙහි කිසි ගෞරවයක් නැත්තාවූ එබඳු මිථ්‍යාදෘෂ්ටි[ක] කුමරුවා විසින් හුදක් පළමු අභ්‍යාසයෙන් එකල්හි නිඳ නිඳ කියනලද නමො බුධාය යන වචනය ඇසූවාවූ මිනීකුණපයෙහි ම ගිජු ව වසන මිථ්‍යාදෘෂ්ටික යක්ෂයා පවා කුමාරයාහට කිසි උපද්‍රවයක් කොට ගත නුහුණුයේ මය. අහෝ, අප බුදුන්ගේ ගුණසාර මහත්තවය ඉතා නොසිතිය හැක්කේ මැයි. එසේ හෙයින් කියනලදි,

නමො'ති වචනං පුබ්බං - බුධායෙ'ති ගිරං තද,
සුපන්තෙන කුමාරෙන - මිච්ඡාදිට්ඨික සූනුනා.

සුත්වා වුත්තං පිසාචාපි - මනුස්සකුණපෙ රතා,
න හිංසන්ති අහො බුධ - ගුණසාර මහන්තතා -යි.

මෙසේ ඒ මිථ්‍යාදෘෂ්ටි යක්ෂයා බුධානුභාවබලයෙන් ගැල යට හොත් කුමරුවා ගත නොහී හයින් සිටියා දක සම්‍යග්දෘෂ්ටි යක්ෂයා කියනුයේ "එම්බල යහලු, මා වැනි මිත්‍ර වූ යක්ෂයකු සිට නොකළමනා දෙයෙකැයි කියව කියවා තොප කෙළේ කටයුත්තෙක් ම නොවෙයි[4]. මේ ලොකයෙහි ප්‍රදේශ රජදරුවෝ පවා තම තමන්ගේ[5] ආඥ පවත්නා රට දනවු ආදියෙහි යම්කිසි කෙනෙක් තමන්ගේ ආඥව මර්දනය කළාහු වී නම් ඔවුන්ගේ අත් පා කන් නාසා ආදිය හෝ කප්පා පියති. දිවස් උල හෝ ඉඳුවා පියති. හක්ක හෝ ඉරවා පියති. සිරගෙයි හෝ ලවා පියති. එසේ නැත පිට පළා දහස් ගණන් ගෙඩි ගස්වා උදහස් ව දහස්[6] දඩ හෝ ගනිත් මය. එසේ

1. සබ්බාණෙ ස සරාසනං - ක.කි.ඤ පාලි
2. එකාවන් ව - C, ස.
එකාවන් සිහින් - GHK
එකාන්ත ව සිහින් - L
3. අග්‍රදක්ෂිණෙය්‍ය- F
අග්‍රදක්ෂිණාහී - ක.කි.ඤ.
4. නොකටයුත්තෙක් ම වෙයි - ක.කි.ඔ.
5. තමන් තමන්ගේ - GHL
තමන්ගේ - ක.ස
6. දහස් දහස් - ක.කි.ඤ.ම
දහස් (නැත) - KL

Non-Commercial Distribution

හෙයින් මුළු තුන්ලොවට අධිපති වූ තිලෝගුරු බුදුරජාණන්වහන්සේගේ ආඥා ගුණචක්‍රයෙහි තා විසින් පහර දෙනලද. ඒ කළ අපරාධයට දුන් තා දඬුවම් කළ මැනවැ'යි කීය.

යුධයෙහි බිඳී වල් වන්නවුන් රණමැස්සන්ගේ හඬට භය ගන්නා සේ ආදියෙහි ම භයින් සිටියාවූ මිථ්‍යාදෘෂ්ටි යක්ෂතෙම ඉතා භයපත් ව "එසේ කල යහළු මා කළමනා කවරේ ද"යි විචාළේය. එවේලෙහි සම්‍යග්දෘෂ්ටි යක්ෂයා ඕහට කියනුයේ "එම්බා යහලු, මේ කුමාරයා උදසනක් සේ කෑ බතින් තව දක්වා බතක් නොලද්දේ ය. එසේ හෙයින් ඉතා ම සයින් පීඩිත ය. එබැවින් ඕහට ආහාරයක් ගෙනව'යි කීය. එකල මිථ්‍යාදෘෂ්ටි යක්ෂයා ඔහු කී තෙපුල් අසා යහපතැයි ගිවිස "මා එනතෙක් යහළු තෙපි මෙතෙන ම සිටුව"යි කියා සම්‍යග්දෘෂ්ටි යක්ෂයා රඳවා ඇසිල්ලකින් ගොස් ඇතුළු නුවර රාජභවනයට අදෘශ්‍යමානරූපයෙන් වැද රජ්ජුරුවන්ට[1] රන් තලියෙහි බහා තුබූ රසභොජනය[2] ගෙනවුත් ඒ කුමාරයන්ගේ පියාණන් වැනි රූපයෙන් සිට කුමාරයන් බත[3] අනුභව කරවා ඉක්බිති ඒ කුමාරයන් එදවස් රාත්‍රියෙහි ගැලයට උදකලා ව හොත් නියාව ද තමන් දෙදෙනා ගොදුරු සොයා අවුදින් කුමාරයන් දක කාපියනු කැමැති ව පය ගෙන ඇද එකල ම කුමාරයන් විසින් කියනලද නමො බුඬාය යන වචනය අසමින් ම භය ගෙන කුමාරයන් අතහැර ඒ කළ අපරාධයට දඬුවම් නිසා[4] රන්තලියෙන් බත් ගෙනවුත් කුමාරයන්[5] කැවූ නියාව ද යන සියල්ල ම රන්තලියෙහි ලියා තබා "මේ අකුරු රජ්ජුරුවන් දුටු විටෙක විනා සෙස්සවුන්ට නොපෙනේව"යි අධිෂ්ඨාන කොට ගියහ. ඉක්බිති ඒ රාත්‍රිය පහන් වූ කල රජ්ජුරුවන් මෙහෙ නිමවන වේලෙහි රාජපුරුෂයෝ රන්තලිය බලා නොදක පරීක්ෂා කොට ඇවිදිනාහු ගැල යට ඒ කුමාරයන්[6] හා රන්තලිය දක තලිය හා සමඟින් ඒ කුමාරයන් ගෙන ගොස් රජ්ජුරුවන්ට දක්වූහ. එවේලෙහි ඒ[7] රජ්ජුරුවෝ රන්තලියෙහි ලියා තුබූ අකුරු දක කියවා ඒ කුමාරයන්ගේ ගුණයෙහි ප්‍රසන්න වූවාහු "කිසි බුදුගුණයක් නොදන්නාවූ ළෙයි කරුණාවක් නැති ඉතා රෞද්‍ර වූ යක්ෂයා පවා බුදුන්ගේ නාමය සඳහන් කළාවූ මේ බාලදරුවන්ට මෙබඳු උපකාරයක් කෙළේය. බුදුන්ගේ ගුණවිශෙෂය දන්නාවූ අප වැනි ශ්‍රද්ධාවන්තයන් විසින් අවශ්‍යයෙන් ම උපකාරයක් කළමනා ය" යි[8] කියා බොහෝ සැපත් හා සමඟ එදවස් ම ඒ කුමාරයන්ට සිටුතනතුරු දුන්හ. මෙසේ බුදුන්ගේ නාමය ස්වප්නයෙන් සිහිකොට කියන්නාවූ සත්ත්වයන්ට පවා කිසි භයෙක් උපද්‍රවයෙක් නොවන්නේ ම ය[9]. එසේ හෙයින් සියලු සත්ත්වයන්ට අභයදායක වූ සර්වඥයන්වහන්සේ නිරන්තරයෙන් සිහි කොට ඔබගේ තුන්ලෙව්හි පතළ නව අරහාදි ගුණසමූහයන් සඳහන් කෙරෙමින් ශරණගත ව මේ ලොකයෙහි[10] සියලු උපද්‍රවයෙන් මිදී පරලොව ස්වර්ගමොක්ෂ සම්පත් සාධන්ට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි,

1. බිම්බිසාර රජ්ජුරුවන්ට - ක.කි.කැ.ම.
   බිම්බිසාර රඤ්ඤො - පාලි
2. රාජභොජනය - BGHKL, ස.
3. බත් - CGHL, ක.ම.
4. පිණිස - H, ක.කි.කැ.බෙ.ස.
5. ඒ කුමාරයන්ට - C
   ඒ කුමාරයන් - ක.කි.කැ.ම.
6. උදකලාව හොත් ඒ කුමාරයන් - බෙ.ස.
7. ඒ (නැත) - KL
8. මනාමයයි - BGHKL
9. නොවේමය - BGHKL
10 ලොව - CDEFJ;
   මේ ලෝකයෙහි (නැත) - KL

Non-Commercial Distribution

ජිනස්ස නාමං සුපිනේනපෙවං
න හොති භීතිං ලභතො ජනස්ස,
තස්මා මුනින්දං සතතං සරාථ
ගුණෙ වදන්තා[1] සරණඤ්ච යාථ-යි.

මෙතෙකින් මේ යක්ඛවස්තූවිත වග
දෙවත මිථ්‍යාදෘෂ්ටි[ක] වස්තුව
කියා නිමවන ලදී.

තව ද මේ යක්ඛවස්තූවිත වග තුන්වන අභිගුණ්ඨීක වස්තුව නම් කවර යත්,

අප මහාගෞතම බුදුන් බුදුවන්නට[2] පළමු මේ මහාභද්‍රකල්පයෙහි කාශ්‍යප නම් වූ එක් ශාස්තෘ කෙනෙකුන්වහන්සේ ලෝකයෙහි පහළ ව දෙව්මිනිසුන් සහිත සියලු ලෝවැසියන් සංසාරසාගරයෙන් එතෙර කොට නිවන්පුරයෙහි ඇර සිටුවමින් මෙසේ තමන්වහන්සේ විසින් කළමනා සියලු බුධකෘත්‍යයන් නිමවා උදයගිරි පර්වතොද්භූත ව ලොව පතළ ගනඳුරු විදහා ආලොක කොට අස්තගත වූ දිවසකරයා[3] මෙන් කසී රට සෙතව්‍ය නම් නුවර එම නමින් ප්‍රසිඩ වූ උයන්හි වැද හෙව නිරුපධිශෙෂ නිර්වාණධාතුයෙන් පිරිනිවන් පා[4] වදාළසේක. එකල්හි [එක් වූ][5] දේවතාවන් හා [මනුෂ්‍යයන් විසින්][6] මහත් වූ පූජාවිධීන් බුදුන්ගේ මෘතශරීරය ආදහනය[කළ][7] ඉක්බිති ඒ බුදුරජාණන්වහන්සේගේ[8] වෙන වෙන නොවිසිර රන්කඳක් මෙන් එකඝන ව තුබුවාවූ ධාතූන්වහන්සේ ගෙන දඹදිව් වැසි මනුෂ්‍යයෝ එක් ව දගබක් බඳනාහු ධාතුගර්භයෙහි පිටත කර්මාන්ත සඳහා එකි එකී තුලයෙන් රුවන්බැඳි කර්මාන්තයෙන් විසිතුරු වූ කෙළක් අගනා රන් උළක් හා ඇතුළතින් බැඳ අතුර පුරන පිණිස අඩ කෙළක්[9] අගනා රන් උළෙකැයි මෙසේ නොයෙක් රත්නයෙන් හෙබියාවූ සතරන් උළු ගස්වා දගබ කර්මාන්තයට පටන්ගෙන මැටි කර්මාන්ත කළමනා තන්හි සුවඳ තලතෙල්[10] වත්කොට සිනිඳු කොට හඹරන[11] ලද්දවූ රන් සිරියෙලින් උළු අතුර[12] ඇසවා සතර ගවුවක් උස රන්දගබක් බැඳ නිරන්තරයෙන් මහත් වූ පූජාසත්කාර කරන්නාහ.

එකල්හි එක් අභිගුණ්ඨිකයෙක් ගම් නියම්ගම් රාජධානි ආදියෙහි නයින් කෙළවා තමාගේ ජීවිකාවෘත්තිය[13] කෙරෙමින් ඇවිදුනේ එක්තරා එක් කුඩා ගමකට පැමිණ ඒ ගම බොහෝදෙනා මධ්‍යයෙහි නයින් කෙළවා එදක සතුටු වූ ගම්වැස්සන්

1. සරන්තා - මුද්‍රිත හැම, ස. පාලි.
2. බුදුවන්නාට - ACDE, ම.
   බුදුන්ට - KL
3. දිවසකරරාජයා - BDGHKL, ම.ස.
4. පෑ - පිටපත් හැම
5. එක්වූ (නැත) - පිටපත් හැම. ම.
6. මනුෂ්‍යයෝ එක්ව - පිටපත් හැම. ම.
7. තොට - පිටපත් හැම
8. බුදුරජාණන්වහන්සේගේ ශරීරය - H
9. අඩු කෙළක් - ABEFGHJKL
10. සුවඳ තලියෙන් තෙල් - CF, ක.සි.සැ.ම.
    සුවඳ තයිලයෙන් තෙල් - J
    සුවඳ තලයෙන් තෙල් - E
    සුවඳ තෙලින් තෙල් - KL
11. අඹරන - BCEGHKL, ම.
12. අතුරු - CEGH
13. ජීවිකානුවෘත්තිය - BGHKL

Non-Commercial Distribution

විසින් දෙන ලද කන බොන ද ආදි වූ අනෙකප්‍රකාර බොහෝ පඬුරු ඇති ව සැපසේ කා බී එහි ම වාසය කරන්නේය. ඒ ගම්හි මනුෂ්‍යයෝ වනාහි බොහෝ සේ තුනුරුවන් කෙරෙහි විශෙෂයෙන් ම ප්‍රසන්නයෝ ල.[1] එසේ හෙයින් ඔහු රාත්‍රි භාගයෙහි සැතපෙන වේලෙහි නමො බුධාය යනාදීන් තුනුරුවන් සිහි කොටගෙන සැතපෙන්නාහ. ඒ අභිගුණ්ඨිකයා වනාහි පරම මිථ්‍යාදෘෂ්ටියා ය[2], තුනුරුවන්හි ගුණ නොදන්නේය, එසේ හෙයින් ඒ මනුෂ්‍යයන් කියන්නාවූ 'නමො බුධාය' යන වචනය අසා තෙමේ ද කෙළනා සඳහා රැවටීම් වශයෙන් "නමො බුධාය" යි කියන්නේය.

ඉක්බිති එක් දවසෙක අභිගුණ්ඨික තෙම තමා විසින් කෙළවන්ට සුදුසු වූ නයකු පරීක්‍ෂා කෙරෙමින් ඒ ඒ තැන්හි ඇවිදුනේය. එකල්හි එක් දිව්‍ය නාගරාජයෙක් කාශ්‍යප සර්‍වඥයන්වහන්සේගේ යට කියනලද රන්දගබ කරා ගොස් දිව්‍යමය වූ සඳුන් සුවඳමල් ආදියෙන් පූජා කොට බැතිපෙම් සහිත ව වැඳ එක් තුඹසකට වදනේය. එකල තඹ කරඬුවෙක රිදී සවඩියක් බහා ලන්නා සේ තුඹසට වදනාවූ[3] නාරජහු දක අභිගුණ්ඨික තෙම ඉතා සමාධි ව වහා දිවගෙන ගොස් ඔහු අල්වනු පිණිස මන්ත්‍රයක් ජපනය[4] කෙළේය. එකල්හි නාරජ මන්ත්‍රය අසමින් ම කොපයෙන්[5] දිලිහී තමා යන ගමන් තබා ඔහු මරනු කැමැති ව[6] ලුහුබඳවා ගත්තේය. එදක අභිගුණ්ඨික දරුවා[7] මරණ භයින් තැතිගෙන මුරගා සසලමින්[8] "ඇයන් තබා මා අඳුව" යි කියන කාරණය සේ නයින් තබා තෙමේ තමා නොගත හී ආපසු බල බලා දිවෙමින් එක් ගල්කැටෙක පැකිළ වැටෙනුයේ පෙර තමා සිනා පිණිස අනුන් වෙහෙසීම් වශයෙන් කියා පුරුදු කරන ලද්දවූ වචනාභ්‍යාසයෙන් 'නමො බුධාය' යි කියමින් වැටී හුණුයේය[9]. ඔහුගේ ඒ වචනය පසුපස්සෙහි ලුහුබැඳ දිවන්නාවූ නාරජහුගේ කන්හි අමාපෙතක් හුණුවා සේ ඉතා මිහිරි විය. ඉක්බිති නාරජ තෙම තුනුරුවන් කෙරෙහි ගෞරවයෙන් ඒ අභිගුණ්ඨිකයා කෙරෙහි කෝප සන්හිඳුවා කියනුයේ "යහළු, තෙපි දන් නොබව. තොප විසින් කියන ලද්දවූ තුනුරුවන් මන්ත්‍රානුභාව නමැති පාසයෙන් තරයේ බැඳී ගියෙමි. එසේ හෙයින් තොප දඬුව කිරීම අප වැන්නවුන්ට සුදුස්සෙක් නොවෙයි. දන් මම[10] තොප කෙරෙහි අතිප්‍රසන්න වීමි. එබැවින් තොපට සතුටු පඬුරු දෙමි. තෙල ඇරගන්ව"යි කියා මාහැඟි වූ දිව රන්මල් තුනක් දුන්නේය.

මෙසේ තුනුරුවන්ගේ නාමය නම් විෂඝොර වූ සර්‍පයන්ගේ පවා සිත් පිනවන්නේය. එසේ හෙයින් තුනුරුවන් කෙරෙහි ප්‍රසන්න වූ ශ්‍රධාවන්තයන්ට මේ ලොකයෙහි බුඩො, ධම්මො, සඞෙඝා යන මේ තුන් වචනය හා සමාන උතුම් වූ ශ්‍රෙෂ්ඨ වූ කර්‍ණරසායන වූ අන් කිසි වචනයෙක් ඇත්තේ නොවෙයි. ඉදින් යම් කිසිවෙක් දිව්‍ය මනුෂ්‍යාදි වූ සියලු සම්පත්ති ගෙනහැර දෙන්ට සමර්ථ වූ ඉතා දුර්ලභ

1. ප්‍රසන්නයෝය - BDGHKL, ම.ස.
2. මිථ්‍යාදෘෂ්ටිය - AEF, බෙ.ස.
   මිත්‍යාදෘෂ්ටිකයාය - ක.කි.ඤ.
   මිත්‍යාදෘෂ්ටික ය - ම.
3. වන්නා වූ - BGHKL
4. ජප - F, ක.කි.ඤ.ම.
   ජපන - E
   ජපනයක් - BH
   මන්ත්‍ර ජපනයක් - KL
5. ක්‍රොධයෙන් - A, මුද්‍රිත හැම
6. පිණිස - BGHKL
7. තෙම - ක.කි.ඤ.බෙ.ස
8. සසලවමින් - ACJ
9. හුන්නේය - ABG
10. මම වනාහි - K

Non-Commercial Distribution

වූ බුධ ධම්ම සඞ්ඝ යන මේ තුන් වචනය ඇම[1]කල්හි ඇදහිලි ඇති ව තමා මුඛයෙන් කියන්නේ වී නම් ඔහුගේ මුඛය ම මුඛ නම් වෙයි. යමෙක් සිතින් සිතන්නේ වී නම් ඔහුගේ සිත ම සිත නම් වෙයි. යමෙක් තුනුරුවන්ගේ නාමය අනුන් කියනු අසන්නේ වී නම් ඔහුගේ කන ම කන නම් වෙයි. එම සියලු උපද්‍රව නිවාරණය පිණිස ශරීරයෙහි බහා ගත් සන්නාහයෙක් නමුදු වෙයි. ඒ තුනුරුවන්ගේ නාමය ම කැමැති කැමැති වස්තු සිධකොට දෙන චින්තාමාණික්‍යයෙක් නමුදු වෙයි. සුරභිධෙනුවක් නමුදු වෙයි. එම කල්පවෘක්ෂයෙක් නමුදු වෙයි. එබැවින් මේ බුධ යන වචනයෙහි ආනුභාව විශෙෂයක් බැලුව මැනව, හැම කල්හි මෙබඳු හලාහල විෂයෙන් යුක්ත ඉතා විෂඝොර වූ නාගරාජයා පවා නමෝ බුධාය යන වචනය අසමින් ම සන්තුෂ්ට වූයේ තමාගේ ක්‍රොධචිත්තය සන්හිඳුවා ඒ අහිගුණ්ඨිකයාහට ජීවිතදනය දී නැවත ඉතා මාහැඟි ඝන බොල් වූ දිව රන්මල් තුනක් දුන්නේය. ඒ බව ප්‍රකාශ කොට දක්වනු පිණිස කියනලදී:

බුධොති වචනං සෙට්ඨං - බුධොති පදමුත්තමං,
නත්ථි තෙන සමං ලොකෙ - අසඞ්ඛං සොතරසායනං.

තමෙව කවචං දෙහෙ - තමෙව මණිං කාමදෙ,
තමෙව සුරභීධෙනු - තමෙව සුරපාදපො.

එවං විධොරගො ඝොරො - හලාහලවිසො සද,
බුධොති වචනං සුත්වා - සන්තුට්ඨො'දසි ජීවිතං.

සොණ්ණපුප්ඵත්තයඤ්චාපි - මහග්ඝං බහලං අද,
පස්ස බුධොති වාචාය - ආනුභාවමහන්තතා-යි.

මෙසේ නාරජ තෙම අහිගුණ්ඨිකයාහට ඒ රන්මල් තුන දී ඉක්බිති කියනුයේ "යහළු, මේ රන්මල් තුනින් එකක් තොපට පින් පිණිස දගබට පූජා කරව. එකක් ගෙන මට පින් පුරා[2] පූජා කරව. අනික් රන්මල ඇරගෙන තොප දිවි හිමියෙන් සැප සේ ජීවත් ව අඹුදරුවන් රක්ෂා කෙරෙමින් දනාදි වූ කුශලක්‍රියායෙහි අප්‍රමාද ව දැහැමින් ජීවිකාවෘත්තිය[3] කරව. මේ හීන වූ අහිගුණ්ඨික ක්‍රියායෙහි ව්‍යාවෘත නො වව, මෙතැන් පටන් තොපගේ තෙල මිථ්‍යාදෘෂ්ටි ගුණයන් හැරපියව"යි කියා මෙසේ අවවාද කොට තමාගේ වාසස්ථානයට ම ගියේය. එවේලෙහි ඒ අහිගුණ්ඨිකයා ද මහත් වූ සන්තොෂයට පැමිණ නාරජුහු කී පරිද්දෙන් ම දගබට රන්මල් දෙකකින් පූජා කොට එක් රන්මලක් විකොට දහසක් අගනා වස්තු[4] ලැබ එයින් අඹුදරුවන් රක්ෂා කෙරෙමින් දුගී මඟී යාචකයන්ට[5] තමා ශක්ති පමණින් දන් දෙමින් අහිගුණ්ඨික ක්‍රියාව හැර නොයෙක් කුශලක්‍රියාවන් රැස් කොට දැහැමින් දවස් යවා ආයු කෙළවර ගොස් දෙව්ලොව උපන්නේය. මෙසේ කිසි බුධානුභාවයක් නොදන්නා වූ පරම මිථ්‍යාදෘෂ්ටි ගත් සත්වයෝ පවා සර්වඥයන්වහන්සේගේ නාමය සදහන් කිරීම් මාත්‍රයෙකින් විශෙෂවත් වූ[6] වස්තු ලදින් සුවපත් වන්නාහ. එබඳු බුදුරජාණන්

1. හැම - BDEGHKL
2. පිණිස - GHKL
3. ජීවිකාවෘත්තිය - BGHKL
4. වස්තුව - මුද්‍රිත හැම
5. යාචකාදීන්ට - මුද්‍රිත හැම, ස.
6. විශෙෂ වූ - BGHKL

Non-Commercial Distribution

වහන්සේගේ ආනුභාව විශේෂය ඉඳුරා දන්නාවූ ජනසමූහයෝ අන් කිසි කාරියක් හැර සියලු ලෞකික ලෝකෝත්තර සම්පත්ති[1] සිධ කොට දෙන්නාවූ ලෝකස්වාමි වූ බුදුරජාණන්වහන්සේගේ නම පමණක්[2] කුමක් පිණිස කෙසේ නම් සඳහන් නොකෙරෙද් ද. එබැවින් තමහට වැඩ කැමති සත්පුරුෂයන් විසින් හැම කල්හි ම නමො බුධාය, නමො ධම්මාය, නමො සඞ්ඝාය යනාදින් තුනුරුවන් සිහි කටයුතු. කියන ලදුයේ මැයි:

ඉති අවිදිතසතෙතා කිඤ්චි බුධානුභාවං
ලභති ධනවිසෙසං යස්ස නාමප්පකාසා,
විදිත ජනනිකායො කිනනු තස්සානුභාවං
නලපති ජිනනාමං කිච්චමඤ්ඤප්පහාය-යි.

මෙතෙකින් මේ යක්ඛවඤ්චිත වග
තුන්වන අභිගුණ්ඨික වස්තුව
කියා නිමවන ලදී.

තව ද මේ යක්ඛවඤ්චිත වග සතර වන පාදපීඨිකා වස්තුව නම් කවර යත්? එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු:

ජම්බුද්වීපයෙහි ශ්‍රී මහාබෝධීන්වහන්සේ පිහිටි බෝධිමණ්ඩලයට දකුණුදිග් භාගයෙහි එක්තරා පසල් නුවරෙක් විය. එනුවර ශ්‍රධාසම්පන්න වූ තුනුරුවන් කෙරෙහි මමත්වය ඇති එක් උපාසකයෙක් වාසය කෙරෙයි. එකල්හි එක් රහත් කෙනෙකුන්වහන්සේ අප බුදුන් ජීවමාන කාලයෙහි සිරිපතුල් දෙක තබා පරිභොග කළා වූ පාදපීඨය ඵව්කාවෙක බහාගෙන ගිය ගිය තන්හි පූජා කෙරෙමින් ක්‍රමයෙන් අවුත් ඒ පසල් නුවරට පැමිණ දෙවන දවස් ඉඳුරා හැඳ පෙරව පාත්‍රය අතින් ගෙන වියදඬු පමණකින් වඩා නොබලා[3] තමන්වහන්සේගේ තපොලීලාවෙන් මහජනයා සතුටු කරවමින් ඇතුළු නුවරට වැද වීථියෙහි ගෙපිළිවෙළින් පිඬු පිණිස වඩනට පටන්ගත්සේක. එකල ඒ උපාසකයා එපරිද්දෙන් වඩනා තෙරුන්වහන්සේ දැක පහන් සිත් ඇති ව ඉදිරියට ගොස් පසහ පිහිටුවා වැඳ පාත්‍රය අතින්ගෙන ගෙට වඩාගෙන ගොස් හිඳිනා ආසනයක් පනවා වඩා හිඳුවා ආදර සහිත ව ස්වහස්තයෙන් වළඳවා ඉක්බිති තෙරුන්වහන්සේ දහැට් වළඳ අනුමුව ශුඩකොට පාත්‍රවත්[4] සපයා ගමනාකාර දක්වූ කල්හි උපාසක තෙම තෙරුන්වහන්සේ වැඳ, "ස්වාමීනි, මෙතැන් පටන් නුඹවහන්සේ මාගේ ගෙට ම නිරන්තරයෙන් සිහා වඩනා කැමැත්තෙමි. මට කරුණාකොට මෙහි ම වාසය කළ මැනවැ"යි තෙරුන්වහන්සේට ආරාධනා කොට නුවරට නුදුරු තන්හි ගහක් අස මල්රොන් වගුළ සුදුවැලිතලාවෙන් හා නන් විසිතුරු තුරු පෙළින් සැදුම්ලද රම්‍ය වූ වනළැහැබෙක පන්සලක් කොට තෙරුන්වහන්සේට පිළිගන්වා සිව්පස දනයෙන් උපස්ථාන කෙරෙමින් දවසින් දවස වඩ වඩා තෙරුන් වහන්සේ කෙරෙහි බහුමාන ඇති ව නිරන්තරයෙන් වැඳ පුද මෙසේ පින් රැස් කෙරෙමින් වාසය කරන්නේය. එකල තෙරුන්වහන්සේ ද එම පන්සලට නුදුරු

1. සම්පත්තිය - BGH
2. වචනය පමණ - BGHKL
3. දුර නොබලා - ස.
4. පාත්‍රයවත් - ක.කි.සැ.බෙ. පිටපත් හැම

Non-Commercial Distribution

වූ[1] මනහර භූමිප්‍රදෙශයක් බලා බිම සමතල කරවා බුදුන් විසින් පරිභොග කරනලද පාද පීඨ ධාතුව නිධාන කොට ඒ වසා වැලි දගබක් බැඳ නිරන්තරයෙන් ගඳ දුම් මල් පහන් ආදියෙන් පූජා කෙරෙමින් වාසය කරනසේක. එසමයෙහි තෙරුන් වහන්සේට උපස්ථාන කරන උපාසකයන් වසන ගෙට නුදුරු ගෙයක[2] ඊශ්වර භක්ති ගෙන වසන්නාවූ එක් මිථ්‍යාදෘෂ්ටියෙක් තමාගේ ඊශ්වර දෙවතාවාට නිරන්තරයෙන් වැඳ පුද සත්කාර කෙරෙයි. ඒ දක උපාසකයෝ ඕහට බුදුන්ගේ ගුණ වර්ණනා කොට දක්වා "යහළු, තෙපි මිරිඟු ජලයෙන් ස්නානපානය[3] කරන්නට උත්සාහ කරන්නා සේ මේ අක්ෂෙත්‍රයෙහි කුමක් පිණිස මෙබඳු උත්සහ වීර්ය කරවු ද? නිෂ්ඵල මිථ්‍යාදෘෂ්ටි හැරපියව" යි කීහ. එතෙපුල් අසමින් ම මිථ්‍යාදෘෂ්ටි වූ ඒ ශඨ කූට කෛරාටික පුද්ගලතෙම 'ඒ තාගේ බුදුන්ගේ කවර ගුණයෙක් ඇද්ද? අපගේ මහෙශ්වරයන්වහන්සේගේ තුන්ලෙව්හි පතළ ගුණප්‍රබන්ධය අසාගන්ව'යි කියා ඊශ්වරයන්ගේ අගුණය ම ගුණය යි ගෙන ප්‍රකාශ කොට දක්වනුයේ:

"එම්බල යහළු, අපගේ මහෙශ්වර දෙවියෝ නම් මහත් වූ ආනුභාව ඇතියහ. හේ කෙසේ වූ ආනුභාවයෙක් දැයි යතහොත් එක් කලෙක මනුෂ්‍යයෝ අසුරයන් අවුත් තමන්ගේ ගම් ගෙවල් ගව මහිෂාදීන් නසන හෙයින් අපගේ ඊශ්වර දෙවියන්ට යාච්ඤා කොට කියා ඔවුන් ලවා අසුරයන් මර්ථනය කරවාපීහ. එකල ඊශ්වර දෙවියන් කෙරෙහි භයින් ඒ ඒ දිග පලා ගොස් ගැළවුණු අසුරයෝ එක් ව බ්‍රහ්මයන් කරා එළඹ එපවත් කියා "අප සැප සේ භය නැති ව වාසය කරන පරිද්දෙන් නැවත[4] අප කැමැති කැමැති තැනෙක විමන් හා සමඟ ඇවිදිනා ලෙස නුවර තුනක් මවා දුන මැනවැ"යි කීහ. එතෙපුල් අසා මහාබ්‍රහ්මයා අසුරයන්ට ජඞ්ගම[5] ඇවිදිනා පරිද්දෙන් ආකාශයෙහි නුවර තුනක් මවා දින[6]. එතැන් පටන් එහි වසන අසුරයෝ නැවත එම නුවර තුන හා සමඟ මිනිස්ලොවට අවුත් ගම් ගෙවල් නසා මනුෂ්‍යයන්ට බොහෝ[7] ගහට කෙරෙති. එකල මනුෂ්‍යයෝ අපගේ ඊශ්වරයන්වහන්සේ කරා එළඹ අසුරයන් තමන්ට කරන ගහට කියා ඒ සතුරන් සාධාදුන මැනවැයි කීහ. එතෙපුල් අසා අපගේ මහෙශ්වරයන්වහන්සේ කිපී තමන්වහන්සේගේ නළල් තෙලෙහි ඇසින් නැංගාවූ ගිනිකඳින් අසුරයන්ගේ[8] නුවර තුන නසා හෙවත් අසුරයන්ට කිපී බැලූ බැලූ පමණකින් තමන්වහන්සේගේ ආශ්චර්යමත් වූ නළල් තෙලෙහි ඇසින් නැගි මහ ගිනිකඳින් අසුරයන්ට ආකාශයෙහි මහාබ්‍රහ්මයා මවා දුන් ජඞ්ගම නුවර තුන දවා භස්ම කොට මෙසේ ත්‍රිපුරදහනය කළ කල්හි භයින් බිඳී දිවන අසුර මහ සෙනඟ ලුහුබඳවා ගොස් තමන් අත ත්‍රිශූලායුධයෙන් මරා මෙසේ ත්‍රිපුරදහනය කොට අසුර මර්ථනය කළ නියාව එක ගුණයෙක් නොවේ ද. තව ද අපගේ මහෙශ්වරයෝ දවසින් දවස නොවරදවා නිරන්තරයෙන් ම සවස සන්ධ්‍යාවේලෙහි එක් අතකින් වැකබෙරයක්[9] ගෙන ගසමින් හඬ ගා ගී කිය කියා වීණා ගායනා කොට කොට ත්‍රිශූලායුධයක් එකු අතකින් නටව නටවා කොඳුකඹා[10] කසල්ලක් සේ ඉතා යහපත් වූ තමන්ගේ ජටාකලාපය රථසකක් සේ බමවා ආවර්තනය කෙරෙමින් මුළු ලොවට

1. තන්හි - KL
2. තෙනක - FGHK
3. ස්නානය - AEFGHK
4. භය නැති ව ඉන්නට සැලසුව මැනවැයි නැවත - ම.
5. ජඞ්ගම ව - KL ස
6. දුන - DEGHKL
7. බොහෝ සේ - C
8. අසුරයන් හා - BEGH
9. කැටබෙරයක් - BGH
10. කොඳුකඹ - BGHK, ම.
කොඳුකඹා - කි.
කොඳුකඹා - ක.කඳ.

Non-Commercial Distribution

සෙන් කොට නටා බස්නාහ. එසේ හෙයින් මෙයිදු එක් ගුණයෙක් නොවේ ද. තව ද ඒ අපගේ මහෙශ්වරයන්ගේ භාර්‍ය්‍යාවෝ තුන්දෙනෙක් ඇත. එයින් එක් කෙනෙකුන් තමන්ගේ හිස් මුදුනෙහි ජටාන්තරයෙහි හිඳුවා ඉස තබාගෙන එක් කෙනකුන් ශරීරභාගයෙක ඇලවාගෙන එක් භාර්‍ය්‍යාවක් ඉදිරිකොට ලා ඇම වේලෙහි ම බල බලා ඇවිදිනාහ. මෙසේ වූ ක්‍රියාවක් අන් කිසි කෙනකුන්ට නැති හෙයින් මෙයින් එක් ගුණයෙක් නොවේ ද.

තව ද ඇත් වෙස්[1] ගත් ගජ නම් අසුරයාගේ කුඹ මත්තෙහි සංහාර තාණ්ඩවය කොට ඔහු මරා හෙළා සම උපුටාගෙන ඒ ඇත්සමින් භාගයක් කඩා හැඳගෙන එක් භාගයක් එකාංශ කොට හෙළාගෙන එම ඇත්සමින් භාගයක් ගෙන එයින් සැදූ ඇත්සම්[2] කුඩයක් හිසට කොට ගෙන ඇවිදිති. මෙයිදු එක් ගුණයෙක් නො වේ ද. තව ද අපගේ මහෙශ්වරයෝ තමන් හා සාදෘශ්‍ය නොවන්නාවූ පුතුන් ඇතියහ. හේ එසේ මය, මේ ලෝකයෙහි සෙස්සවුන්ගේ දරුවෝ බොහෝ සේ මවුන්ගේ සැටි හෝ[3] වෙති. පියන්ගේ සැටි හෝ[3] වෙති. අපගේ ඊශ්වරයන්ගේ පුත්‍රයෝ එසේ නො වෙති. එක් කෙනකුන්ගේ අත් දෙක කිකුරන්ගේ[4] අත් මෙන් ඉතා ලුහුඩු ව අග මුල වෙනසක් දනගත නොහැක්ක. බඩ පුනාවක් වැන්න. සෙසු ශරීර අවයවයෝ ඇතකු වැනි සටහන් ඇතියහ. එක් පුතණුකෙනකුන්ගේ මුහුණු සයෙක, අත් දෙළොසෙකැයි මෙසේ එක් වැනි නොවන පුතුන් දෙදෙනකු ඇතියහ. ඒ අපගේ ඊශ්වරයන් වහන්සේගේ ශරීරය වනාහි එක් භාගයෙක් හුණකිලිලක් වැනි පැහැ ඇත්තේය. එම භාගයෙහි[5] තනයකුදු ඇත. එක් භාගයෙක් අළුපුසුලක් සේ ඉතා සුදුය. ග්‍රීවය නිල්පැහැ ඇත්තේය, ඉසින් එක් භාගයෙක ජටා මණ්ඩලයෙක. එක් භාගයෙක ගැහැණු කොණ්ඩයෙක. එසේ හෙයින් මෙබඳු විශිෂ්ට වූ විරූප[6] රූපයෙක් අන් කිසිවක්හට ඇත්තේ නොවෙයි. එබැවින් මෙයත් අපගේ මහෙශ්වරයන්ගේ[7] විශෙෂ ගුණයෙක් මය. තව ද අපගේ මහෙශ්වරයෝ තමන්ගේ භාර්‍ය්‍යාවන් තුන්දෙනා වෙන වෙන ම සතුටු කරවනු සඳහා නිරතුරු ව[8] රතික්‍රීඩාවෙහි යෙදී බඹුරන් සේ රා පීමෙහි ව්‍යාවෘත ව මිනීඇට අවුනා මාලාවක් සේ කරලාගෙන මිනී හිස්කබලකින් අහර අනුභව කෙරෙති. එසේ හෙයින් මෙබඳු මහිමයෙක් අනිකක්හට ඇත්තේ නොවෙයි. ඒ හැම තබා අපගේ මහෙශ්වරයන්[9] මේ ලොව උපන්නෙත් නැත. ඔවුන්ට කිසි භයකුත් නැත, ජරාමරණෙකුත් නැත. එකාන්ත ශාශ්වතයෝ ය. අපගේ මහේශ්වරයෝ මෙසේ මෙසේ වූ විශෙෂ ගුණ ඇතියහ. මේ ලොකයෙහි අන් කිසිවක්හට මෙබඳු ගුණයෙක්[10] ඇත්තේ නොවෙයි' කියා මෙසේ ඊශ්වරයන් නුගුණ ම ගුණ යයි ගෙන වර්ණනා කොට දක්වීය. එසේ හෙයින් කියන ලදී:

තිපුරං සො[11] විනාසෙසි - ලලාට නයනග්ගිනා,
අසුරෙ ච විනාසෙසි - තිසූලෙන මහිස්සරො.

---

1. වෙසක් - BGHKL
2. ඇත්සම - පිටපත් හැම
3. හෝ සැටි පත් ඇති - BGHKL
4. කිඳුරන්ගේ. - G, ක.කි.සද.බෙ.ස. කුරන්ගේ - KL
5. එක් භාගයෙක්හි - KL, ක.ම.
6. විරූප (නැත) - BD
7. මහෙශ්වරයන් වහන්සේගේ - මුද්‍රිත හැම,ස.
8. නිරන්තර ව - BGHKL
9. මහේශ්වරයන් - පිටපත් හැම, ම. මහේශ්වරයෝ - මුද්‍රිත හැම, ස.
10. ගුණ විශේෂයෙක් - BGHKL
11. සො - H

Non-Commercial Distribution

ජටාකලාපමාවත්‍ථං - නච්චති දින සත්‍ධියං,
වාදෙති හෙරි වීණාදිං - ගීතං වාපි[1] ස ගායති.

හරියායො තස්‍ස තිස්‍සො - ජටායෙකං සමුබ්බහෙ,
එකමෙකෙන පස්‍සෙන - පස්‍සමානො චරෙකකං.

හත්‍ථි චම්මම්බර ධරො - තෙනෙව වාරිතාතපො,
අස්‍සාදිසෙහි පුත්‍තෙහි - රූපෙහි ච සුපාකටො.

රතියා ච මධුපානෙ ච - ව්‍යාවටො සබ්බ[ද ච සො],[2]
මනුස්‍සට්ඨිධරො සීස - කපාලෙනෙ ස භුඤ්ජති.

න ජාතො න භයං තස්‍ස - මරණං නත්‍ථි සස්‍සතො,
ඊදිසො මෙ මහාදෙවො නත්‍ථඤ්ඤස්‍සීදිසො ගුණො යි.

එතෙපුල් අසා උපාසකයෝ කියන්නාහු "යහළු, මේ තොපගේ මහෙශ්වර දෙවියන්ගේ ඇති ගුණයෝ මය, අගුණයෝ කොපමණ[3] වෙද් ද" යි කියා ඉක්බිති බුදුන්ගේ සියලු ගුණයන් හකුළුවා එකදෙශයෙකින්[4] දක්වන්නාහු, "මේ ලෝකයෙහි සියලු ගඩගාවන්ට යම් සේ මහාසාගරය ආධාර වේ ද, එපරිද්දෙන් ම සියලු උතුම් වූ ගුණසමූහයන්ට අපගේ බුදුහු ම ආධාරසේක. තව ද මේ ලෝකයෙහි ස්ථාවර ජඩගම වූ සියලු වස්තූන්ට මහපොළොව යම් සේ ආධාර වේ ද, එපරිද්දෙන් ම සියලු ගුණයන්ට බුදුහු ම ආධාරසේක. අපගේ බුදුහු මෙසේ[5] මෙසේ වූ ශාන්තගුණ ඇතිසේක. මෙසේ මෙසේ වූ වියත්කම් ඇතිසේක. මෙබඳු වූ කරුණාවක් ඇතිසේක. මෙවැනි ඍද්ධිමහිමයක් ඇතිසේක. මේ මේ ගුණය මෙසේ මෙසේය යි කියා නිමවන්ට නොපිළිවන. මේ ලොකයෙහි බුදුන්ට වඩනා ඍද්ධිවත්ත කෙනෙක් නැත් මය, එසේ වූ ඍද්ධිඥන ඇති බුදුකෙනකුන්වහන්සේ බුදු වූ දවස් පටන්ගෙන අන් කිසිවෙක ව්‍යාවෘත නොවී තමන්වහන්සේගේ ආයුෂ්කල්පය මුළුල්ලෙහි බුදුකෙනකුන් වහන්සේගේ ගුණමුහුදට වැද බුද්ධඥන නමැති මතින් අළලා බලා ගුණ වර්ණනා කරනසේක් වී නම් උන්වහන්සේගේ ආයුෂ්කල්පය ගෙවේ මය. බුදුන්ගේ ගුණ නොගෙවෙන්නේ මය. මෙසේ බුදුන්ට පවා බුදුගුණ කියා නිමවන්ට නොපිළිවන් හෙයින් අපමණ ගුණ සමූහයක් ඇති අප බුදුන්ගේ ගුණ වර්ණනාව මහෙශාක්‍ය වූ දිව්‍යබ්‍රහ්මාදීන් විසිනුදු තමතමන්ගේ නුවණ පමණින් ම වර්ණනා කරත් මිස කියා නිමවාගත නොහැක්කේ ම ය"යි සීහ. කියනලද මැයි:

ලොකෙ සබ්බ සවන්තීනං - ආධාරො සාගරො යථා,
එවෙමෙවං ගුණරාසීනං - ආධාරො ච[6] තථාගතො.

1. ගීතං වාපි - AJ
2. සබ්බදෙවබ්‍රහ්මා - පිටපත් හැම
සබ්බදච සො - ක.කි.කැ.බෙ.ස.
සබ්බදච සො - ම.
3. කොපමණ - KL
4. එකදේශමාත්‍රයකින් - K, ක.කි.කැ.ම.
5. මෙසේ (නැත) - BCFGHJKL, ක.ම.
6. ආධාරො ච - ABCFJ

Non-Commercial Distribution

වරාවරානං සබ්බසං - ආධාරාව ධරා අයං,
තථා ගුණානං සබ්බසං - ආධාරොව තථාගතො.

එවං සන්තො වියත්තො ච - එවං සො කරුණාපරො,
එවම්ඞ්විධා තස්ස - එවමෙවං ගුණා ඉති.

බුද්ධොපි සක්කොති න යස්ස වණ්ණං[1]
කප්පම්පි වත්වා ඛයතං ගමෙතුං,
පගෙව න බ්‍රහ්මසුරාසුරෙහි
වත්තුං තහාතන්ත[2]ගුණස්ස වණ්ණං-යි.

මෙපරිද්දෙන් තමතමන්ගේ දෙවියන් ම උතුමැයි කියන්නාවූ ඔහු දෙදෙන අපගේ දෙවියෝ ම උත්තමයෝය අපගේ දෙවියෝම උත්තමයෝය යි මෙසේ කලහ වඩා ඩබර[4] කොට රජ්ජුරුවන් සමීපයට ගොස් එපවත් කීහ. එකල රජ්ජුරුවෝ ඔවුන් දෙදෙනාගේ බස් අසා "එසේ වී නම් තොප දෙදෙනාගේ දෙවියන්ගේ ආනුභාව විශෙෂය සෑඩි ප්‍රාතිහාර්‍ය්‍යයකින් ම පරීක්‍ෂා කරම්හ. තොප තොපගේ දෙවියන් ලවා අපට සෑඩි ප්‍රාතිහාර්‍ය්‍යයක් දක්වාලව" යි කියා "මෙයින් සත් දවසක් ගිය කල මොවුන් දෙදෙනාගේ දෙවියන්ගේ මහත් වූ පෙළහරෙක් වෙයි. ඒ පෙළහර දක්නා කැමති සියල්ලෝ ම වහා අවුත් රැස් වෙත්ව" යි[5] කියා රජ්ජුරුවෝ නුවර බෙර ලැවූහ. මෙසේ නුවර බෙර ලැවූ බව ඇසුවාවූ මහජනයෝ ඒ ඒ දිශාභාගයෙන් අවුත් රැස්වූහ. ඉක්බිති මිථ්‍යාදෘෂ්ටි ගතුවාහු "අද අපගේ මහේශ්වර දෙවියන්ගේ ආනුභාව දක්වම්හ"යි මහත් වූ පූජාසත්කාර කරන්නාහු ඔවුන්ගේ කිසි සාරගුණයක් නුදුටුවාහු මය. එකල සම්‍යක්දෘෂ්ටි ගත්තාහු "අද අප[6] බුදුන්ගේ ආනුභාව විශෙෂය[7] සියලු සත්වයන්ට ප්‍රකාශ කොට දක්වම්හ"යි සැරහී වැලිදගබ සමීපයට එළඹ ගඳ දුම් මල් පහන් ආදියෙන් පූජා කෙරෙමින් ප්‍රදක්‍ෂිණා කොට දෙහොත් මුදුනෙහි තබාගෙන වැඳ වැඳ සිටියහ. එකෙණෙහි රජ්ජුරුවෝ ද සිවුරඟසෙනඟ පිරිවරා අවුත් එකත්පස් ව සිටගත්හ. මුළු නුවර නාලාගිරිහු වන් රජගහා නුවර සේ හැළලී ගිය[8]. සෙසු නොයෙක් දෘෂ්ටි ගත්තාවූ නානා සමය වාදීහු ද "අද බෞද්ධයන්ගේ ශාස්තෲන් දක්වන ප්‍රාතිහාර්‍ය්‍ය බලම්හ"යි කියා මැසි මත්තෙහි මැසි බැඳ සිටගත්හ. මෙසේ මහ පවනින් හැළලා ගිය මුහුද රළපෙළ දිවන්නා සේ ඔවුනොවුන් පරයා ඇසිල්ලෙක දිවගෙන අවුත් රැස්ව සිටගත්තාවූ මහජනයා බල බලා සිටියදී ම සම්‍යක්දෘෂ්ටි ගතුවාහු වැලිදගබ දශාවට අභිමුඛ ව මුදුනෙහි ඇඳිලි බැඳ සිට පාදපීඨ ධාතුන් වහන්සේට ආරාධනා කරන්නාහු 'ස්වාමීනි, අපගේ භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ සියලු බුද්ධකෘත්‍ය නිමවා නිරුපධිශෙෂ නිර්වාණ ධාතුයෙන් පිරිනිවිසේක. ශාරිපුත්‍ර මෞද්ගල්‍යායනාදි වූ අසූ මහසවුවන්වහන්සේ ද පිරිනිවිසේක. එසේ හෙයින් මෙතැන්හි අපට නුඹවහන්සේ හැර අතික්[9] කිසි පිළිසරණෙක් නම් නැතැ"යි කියා ඉක්බිති සත්‍යක්‍රියා කරන්නාහු:

1. වණ්ණ - A, පාලි.
2. න හානන්ත - පාලි.
3. බුදුහු - AJ
4. දබර - ABDEH
5. රැස්වෙයි - CEJ
   රැස්වයි - AFD
6. අපගේ - KL, බෙ.
7. ආනුභාව හා විශෙෂ ගුණ - ම.
8. හැළො ගිය - AEFJ; හැළලී ගියේය -KL
9. අන් - FGHKL, ක.ම

Non-Commercial Distribution

ආපාණකොටිං බුද්ධස්ස - සරණං නො ගතා[1] යදි,
තෙන සච්චෙනයං ධාතු - දස්සෙතු පාටිහාරියං.

රාමකාලෙ මුනින්දස්ස - පාදුකාසි අබ්භුතං,
තෙන සච්චෙනයං ධාතු - දස්සෙතු පාටිහාරියං.

ජාතමත්තො තද බුද්ධො - ඨිතො පඞ්කජ මුද්ධනි,
නිච්ඡාරෙසාසභිං වාචං - අග්ගො සෙට්ඨොති ආදිකං,[2]
තෙන සච්චෙනයං ධාතු - දස්සෙතු පාටිහාරියං.*

මාරසෙනං පරාජෙත්වා[3] - නිසින්නො බුජ්ඣි බොධියං,
තෙන සච්චෙනයං ධාතු - දස්සෙතු පාටිහාරියං.

නන්දොපනන්ද භොගින්දං - නාගං නාලාගිරිව්හයං,
ආලවකාදයො යක්ඛ - බ්‍රහ්මණො ච බකාදයො.

සච්චකාදි නිගණ්ඨෙ ච - කූටදන්තාදයො ද්විජෙ,
දමෙසි තෙන සච්චෙන - දස්සෙතු පාටිහාරියං.

යනු හෙයින් "ඉදින් අපි හැමදෙන ම ජීවිත පරියන්තං බුද්ධං සරණං ගච්ඡාමි යනාදීන් අපගේ ජීවිතාන්තය දක්වා තිසරණ ගතුවමෝ[4] වී නම් ඒ සත්‍යවචනය හෙතු කොටගෙන මේ පාදපීඨ ධාතූන්වහන්සේ අද අපට ප්‍රාතිහාර්‍ය්‍යයක් දක්වන සේක්වයි. තව ද දශරථ ජාතකයෙහි අප බුදුන් රාම නම් රජ ව උපන් සමයෙහි පය ලූ මිරිවැඩි දෙක පවා මුළුලොවට අද්භූත වූ පෙළහර දැක්වී. එසේ ම අප බුදුන් හිමවත ඡද්දන්ත නම් ඇත්රජ ව උපන් සමයෙහි ඔබගේ දළසඟලින් සවනක් රැස් විහිදිණි ද, ඒ සත්‍යවචනය හේතු කොටගෙන අද මේ පාදපීඨ ධාතූන්වහන්සේ සවනක් රැස් විහිදුවා පෙළහරක් දක්වන සේක්වයි. බුදු වන ජාතියෙහි මවුකුසින් බිහි වූ විගස සත්බුමු මහපියුම් මත්තෙහි වැඩසිට අග්ගොහමස්මි ලොකස්ස යනාදීන් අභීත සිංහනාද කළ සේක් ද, එසේ ම සතර පූර්වනිමිත්ත දැක මහභිනික්මන් කළ සේක් ද, එසේ ම බෝමුල්හි වැඩ හිඳ මරසෙනඟ බිඳ බුදු වූ සේක් ද, තව ද බ්‍රහ්මාරාධනාවෙන් ඉසිපතන උයන්හි වැඩ දහම්සක් පැවැත්වූ සේක් ද, තව ද නන්දොපනන්ද නම් නාගරාජය නාලාගිරි නම් හස්තිරාජය ආලවකාදි වූ යක්ෂයෝය බකබ්‍රහ්මාදි වූ බ්‍රහ්මරාජයෝය සච්චකාදි නිගණ්ඨයෝය කූටදන්තාදී වූ බ්‍රාහ්මණයෝය යන මොවුන් දමනය ලා හික්මවූසේක් ද, ඒ සත්‍යවචනය හේතු කොටගෙන අද මේ පාදපීඨ[5] ධාතූන්වහන්සේ මෙතැන්හි අපට ප්‍රාතිහාර්‍ය්‍යයක් දක්වනසේක්ව"යි කියමින් වැඳ වැඳ, තව ද ඒ උපාසකවරහු "ස්වාමීනි, දැන් අප කෙරෙහි අනුකම්පා උපදවා මහජනයාගේ මිථ්‍යාදෘෂ්ටිය බිඳ ප්‍රාතිහාර්‍ය්‍යයක් දක්වුව මැනවැ"යි ආරාධනා කළහ. මෙසේ ආරාධනා කළ ඉක්බිති බුදුන්ගේ බුද්ධානුභාවය රහතන්වහන්සේගේ ඍද්ධ්‍යනුභාවය උපාසකවරුන්ගේ සත්‍යක්‍රියානුභාවය යන මේ

---

1. ගතං - ABCEFGHJ
   නො ගතං - KL
2. ආදිනා - ABCDFHJKL, ක.කි.සැ.ම.ස
3. පලාපෙත්වා - ක.කි.සැ. පාලි.
4. ගතුමෝ - BH
5. පාදපීඨිකා - C

* නිමිත්තෙ චතුරො දිස්වා නික්ඛන්තො අභිනික්ඛමං
තෙන සච්චෙනයං ධාතු - දස්සෙතු පාටිහාරියං
ධම්මචක්කං පවත්තෙසි - ජිනොසිපතනෙ තද
තෙන සච්චෙනයං ධාතු දස්සෙතු පාටිහාරියං
මේ ගාථා දෙක ම. හි පමණක් පෙනේ.

Non-Commercial Distribution

තුන් ආනුභාවය හේතු කොටගෙන එකෙණෙහි වැලිදගැබ දෙබේ කරමින් පාදපීඨ ධාතුන්වහන්සේ අහසට පැනනැඟී සවනක් රස් විහිදුවමින් ශරත් සූර්‍ය්‍යමණ්ඩලය සේ දිලිහි දිලිහී ලිලොපෙත ව අහස්කුස සිටගත්සේක. ඒ ආශ්චර්‍ය්‍යය දුටුවාවූ මහාජනයෝ නොයෙක් සියදහස් ගණන් පිළී හිස නටවමින් සිටි සිටි තැනින් පැන නැඟී සාධුක්‍රීඩා කරන්නාහු එතැන්හි වටා සිටි මහපිරිස එකපැහැර අහො සාධු යි බැණනැගි හඬින් මහපොළොව පැළී යන්නා සේ මහත් ශබ්ද පවත්වා දහස් සුවහස් ගණන් ඔල්වර හඩ ගසමින් හන් පළන් වසත්‍රාභරණ ගළවා දමමින් සිත ඇතුළෙහි පිරී ඉතිරෙන සන්තොෂයෙන් මත් ව උතුරුසළු ගළවා දමමින් මෙසේ මහත් පූජාවට පටන්ගත්හ. ඒ ආශ්චර්‍ය්‍යය දක මිථ්‍යාදෘෂ්ටි ගත්තාහු ඉතා විස්මය[1] පත් වූ සිත් ඇති ව තමතමන්ගේ මිථ්‍යාදෘෂ්ටි තාක් සුළං දුටු වලාකඩවල් සේ ගසා දුරු කොට තුනුරුවන් ම සරණ කොට තිසරණ පිහිටියාහ. මෙසේ බුදුන්ගේ පාදස්පර්ශ ලද්දවූ සිත් පිත් නැති පුවරුකඩ පවා මෙපරිද්දෙන් මහානුභාවසම්පන්න විය. එසේ හෙයින් සකල ක්ලේශකාලුෂ්‍යාපගමයෙන් අත්‍යන්තපරිසුධ වූ චිත්තසන්තාන ඇති තුන්ලොවට අසහාය නායක වූ බුදුරජාණන්වහන්සේගේ මහත් වූ ඍද්ධ්‍යනුභාවය නොසිතිය හැක්කේ මය. එබඳු අචින්ත්‍ය වූ ගුණ ඇති බුදුන් කෙරෙහි සිත් පහදවා ගන්නාවූ සත්වයන් ලබන්නාවූ විපාකයන්[2] අචින්ත්‍ය වන බැවින් තුනුරුවන් කෙරෙහි සිත් පහදවා සියලු සගමොක් සැපත් සැදුව මැනවි. කියන ලදුයේ මැයි:

පුටෙඨාපි පාදෙන ජිනස්සපෙවං[3]
කලිඞ්ගරොපාසි මහානුභාවො,
ලොකෙකනාථස්ස අනාසවස්ස[4]
මහානුභාවො හි අචින්තනීයො[5]-යි.

මෙතෙකින් මේ යකඛවඩ්ඪිත වග
සතරවන පාදපීඨිකා වස්තුව
කියා නිමවන ලදී.

තව ද මෙහි යකඛවඩ්ඪිත වග පස්වන කාවීරපට්ටන වස්තුව නම් කවර යත්:

මෙතැන්හි මතු කියන්නේ එහි පිළිවෙළ කතාව ය. කෙසේ ද යත්:

දඹදිව සොළීරට කාවෙරි[6] නම් පටුන්ගමෙක් විය. එහි මහෙශ්වර භක්ති ඇති බොහෝ මිථ්‍යාදෘෂ්ටි ගත්තාහු වාසය කෙරෙති. එකල එම කාවෙරි පටුන එක් දෙවාලයෙක සිතියම් කරන්නාහු එක් පුවරුකඩෙක ඊශ්වරයන්ට වැඳ[7] සිටිනා සේ බුධරූපයක් ඇන්දහ. එසමයෙහි එම කාවෙරි පටුනෙහි වසන බොහෝ උපාසකවරු එක් ව ඒ දෙවාලයට ගොසින් ඒ ඒ තැන්හි සිතියම් කර්මාන්ත බලන්නාහු ඒ

1. විජ්ම - ABDFGHJKL
2. විපාකයන් - BFGH
3. ජිනස්ස එවං - මුද්‍රිත හැම, ස. පාලි
4. මනාසවස්ස - BDEGHKL
   මනාපවස්ස - ACFJ
5. අචින්තනීයෙහා - BEGHKL
6. කාවීර - HKL
7. නැමී වැඳ - ක.කි.කඳ.ම

Non-Commercial Distribution

පුවරුකඩෙහි ඇඳ තුබූ විප්‍රකාර වූ චිත්‍රකර්මාන්තය දක "අනේ, අප විසින් නො දක්ක යුත්තෙක් දක්නාලද්ද. දෙවි මිනිසුන් සහිත වූ මේ ලෝකයෙහි සදෙව සමාර සබ්‍රහ්ම ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ සියලු සත්වප්‍රජාවෙහි අප්‍රමාණ වූ සක්වළවල බුදුන්ට වඩනා කෙනකුන් තබා බුදුන් හා සමාන කෙනෙකුත් නැත් මය.[1] සියලු සත්වසමූහයා විසින් වැඳ පිදිය යුත්තා වූ එබඳු බුදුන්ට මොවුන් හැම කෙළේ ඒකාන්තයෙන් සුදුස්සෙක් ම නොවෙයි" කිය කියා හඬමින් වලපමින් රජගෙයි දෙරකඩට ගොස් සිට මහහඬින් ගුගුරාපූය. ඒ සෝෂාව අසා රජ්ජුරුවෝ උපාසකවරුන් කැඳවා "තෙපි හැම කුමක් පිණිස මුරගාවූ දැ"යි විචාළහ. එකල ඔහු "මහරජ, අපගේ බුදුහු නම් දෙවාතිදෙවසේක, ශක්‍රාතිශක්‍රසේක, බ්‍රහ්මාතිබ්‍රහ්ම සේක. මේ ලෝකයෙහි අප බුදුන් හා සමාන කෙනෙක් නැත. මහමෙර සේ නිශ්චල වූ ගුණ ඇතිසේක. මහමුහුද සේ ගැඹුරු වූ ගුණ ඇතිසේක, ආකාශය සේ අනන්ත වූ ගුණ ඇතිසේක. මහපොළොව සේ පැතිර පවත්නා ගුණ ඇතිසේක. නක්‍ෂත්‍ර තාරකාවන් විසින් පිරිවරන ලදුව සකල චක්‍රවාලාන්තරයෙහි[2] අමාරස් විහිදුවා ආකාශමණ්ඩලයෙහි පැලඹෙන චන්ද්‍රබිම්බය සේ දෙතිසක් පමණ මහාපුරුෂ ලක්‍ෂණයන් ධරන්නාවූ ආත්මයක්[3] ඇතිසේක. මුල පටන් අග දක්වා එක පැහැර පිපී වැනී ගිය සල්රුකක් සේ අසූවක් පමණ අනුව්‍යඤ්ජන ලක්‍ෂණයෙන් විරාජමානසේක. යුගන්ධරාදී වූ සප්තකුල[4] පර්වතයන් පිරිවරා සණ කනක රශ්මීන් දිලියෙන්නාවූ සුවර්ණ මෙරුරාජයා මෙන් සවනක් රසින් දිලිහෙනසේක. දහස් ගණින් රශ්මීන් පිරිවරන ලද බාලාර්කමණ්ඩලය සේ හාත්පසින් පිරිවරනලද ව්‍යාමප්‍රභා මණ්ඩලයක් ඇතිසේක. ශ්‍රමණරූප ව්‍යාජයෙන්[5] ලොව පහළ වූ රන්රස[6] විහිදුනා වූ සවර්ණ පර්වතයක් සේ රන් රස් විහිදුනාවූ මුඛ මණ්ඩලයක් ඇතිසේක. සතර දිගය සතර අනුදිගය යි මෙසේ හාත්පසින් ඉතිරී ඉතිරී[7] සිටිනා විචිට සාගරයක් සේ කරුණාවෙන් පිරුණාවූ සිත් ඇතිසේක. මහාමෙරු පර්වතරාජයා සේ උස් ව ලෝකයෙහි පතළ කීර්තිසොභාවක්[8] ඇතිසේක. ආකාශය සේ දශදිග පතළාවූ යශොරාශියක් ඇතිසේක, දශදිග හමා බස්නා සුවඳ මඳ පවනක් සේ හැම තැන්හි අලග්න වූ සිත් ඇතිසේක. මහ පොළොව සේ සියලු සත්වයන්ට ආධාරසේක. දියෙහි ඉපද දියෙහි වැඩී එහි ලග්න බවක් නැත්තාවූ පද්මයක් සේ ලෝකයා කෙරෙහි අලග්න වූ සිත්සතන් ඇතිසේක. මිථ්‍යාවාද නමැති මහවනය දවන ගිනිකඳක් වැනිසේක. කෙලෙස් නමැති විෂ විනාශයට දිව්‍ය වූ ඖෂධයක් වැනිසේක. පුෂ්පගන්ධාදි වූ දශවිධ සුගන්ධයෙන් ශොභනීය වූ[9] ගන්ධමාදන පර්වතය සේ ගුණ සුවඳින් ශොභමානසේක. දශවිධ රත්නයන්ට උත්පත්තිස්ථාන වූ මහමුහුද සේ ශීල සමාධ්‍යාදි වූ සියලු ගුණධර්මයන්ට උත්පත්තිස්ථානසේක. හිමාලය[10] පර්වතයට වන රේඛාවක් වැනිසේක, කෙලෙස් නමැති මලයන් පහකළසේක. සතුරු සටන් ජයගැන්මෙහි සමර්ථ වූ මහායෝධයකු මෙන් මරසෙනඟ මර්දනය කළසේක. සත් තිස්

1. නැත්මයයි - BGGHKL
2. චක්‍රවාලාභ්‍යන්තරයෙහි - ක.කි.ක.
3. ආත්මභාවයක් - BGHKL
4. සප්තකූට - මුද්‍රිත හැම, ශ.
5. ව්‍යංජනයෙන් - ක.කි.කැ.ම., ව්‍යාජනයෙන් - KL
   ඛ්‍යංජනයෙන් - DF
6. රන්රැස් - BCDEGHKL
7. ඉතිර පැතිර - ම
8. කීර්තිසොභාවන් - ACDEFJ
9. ශොභමාන වූ - මුද්‍රිත හැම,ස.
10. මලය - EGHL

Non-Commercial Distribution

බොධිපාක්ෂික ධම්ම නමැති රත්නයන්ට ඊශ්වර හෙයින් සක්විති රජකු වැනිසේක. දොෂ නමැති ව්‍යාධියට වෛද්‍යාචාර්‍ය්‍යකු වැනිසේක. මිථ්‍යාදෘෂ්ටි නමැති ගඩපොළ පැළීමට මහවෙදකු වැනිසේක. එසේ හෙයින් මහරජ, අප බුදුහු ලොකප්‍රසිද්ධ වූ මහාබ්‍රහ්මයා විසින් ද දෙදෙව්ලොවට අධිපති වූ ශක්‍රදෙවෙන්ද්‍රයා විසින් ද වෙපචිත්ති ආදි වූ අසුරරාජයන් විසින් ද සෙසු සිද්ධ විද්‍යාධරාදීන් විසින් ද වන්‍දනීය[1] සේක. හැම කල්හි ම ඔවුන් විසින් පූජනීය සේක. මේ සියලු අනන්තාපරිමාණ සක්වළවල අග්‍ර වූ පූජ්‍ය වූ යම් සත්වකෙනෙක් ඇද්ද ඒ සියල්ලවුන්ට වඩා[2] අප බුදුහු ම අග්‍රසේක, ජ්‍යෙෂ්ඨසේක, ශ්‍රෙෂ්ඨසේක යනාදි බුදුන්ගේ ගුණ වර්ණනා කළහ. කියනලද මැයි අපදනයෙහි:

> රංසිමාලා[3] පරික්ඛිත්තො - දිප්පොව කනකාචලො,
> බ්‍යාමප්පභා පරිවුතො - සරංසීව[4] දිවාකරො.
>
> සොණ්ණානනො[5] ජිනවරො - සමණීව සිලුච්චයො,
> කරුණාපුණ්ණහදයො - විචටෙටා විය සාගරො.
>
> සත්ථා නො භගවා දෙව - මහාබ්‍රහ්මෙ වන්දිතො,
> දෙවින්ද පුර සිඩෙහි - වන්දනීයො සදදරා.
>
> සබ්බෙසු චක්කවාළෙසු - යෙ අග්ගා යෙ ච පූජිතා,
> තෙසමග්ගො මහාරාජ - භගවා නො පතාපවා-යි.

මෙසේ රජ්ජුරුවන් මැදයෙහි බුදුන්ගේ ගුණයෙන් එකදෙශයක්[6] දක්වාලා "දේවයන්වහන්ස, මෙබඳු වූ බුදුන්ගේ රූපය ද[7] මෙසේ කෙළේ අයුක්තය"යි කීහ. එතෙපුල් අසා රජ්ජුරුවෝ "එම්බා සගයෙනි, මේ ලෝකයෙහි[8] සියලු මනුෂ්‍යයෝ තම තමන්ගේ දෙවියන් ම මහත් කොට කියති. එබැවින් තොප බුදුන්ගේ ආනුභාව විශෙෂය කෙසේ ද? ඒ අපට දන් දක්වාලව"යි කීහ. එවේලෙහි උපාසකවරු එක් ව "මහරජ, ඒ බැරි දෙයෙක් නොවෙයි, නුඹවහන්සේ ඒ සිතියම් පුවරුකඩ ගෙන්වා ගෙන යහපත් සුදු වස්ත්‍රයෙකින් වසා බැඳ නුඹවහන්සේගේ අස් මුන්දකින් ම අස් ඔබ්බවා ඉඳුරා රකවල් ලවා එක් දෙවාලයෙක තබ්බවා සත් වන දවස් ගෙන්වාගෙන ඒ පුවරුකඩ බැලුව මැනව් එකල්හි අප බුදුන්ගේ ආනුභාව[9] විශෙෂය ප්‍රත්‍යක්ෂයෙන්[10] ම පෙනෙයි. එවිට අප බුදුන්ගේ බුධානුභාවය නම් මෙවැනි දෙයකැයි දන වදළ මැනවැ"යි කීහ.

ඉක්බිති රජ්ජුරුවෝ ඔවුන් කී පරිද්දෙන් ම පුවරුකඩ අස් ඔබ්බවා ඇතුළු දේවාලයෙහි තබා හැම දෙරවල් අගුළු ලවා පිටතින් අස් ඔබ්බවා "මෙතැනට කිසි කෙනකුන් වැද්ද නොදෙව"යි විධාන කොට රකවල් ලැවූහ. මෙසේ රජ්ජුරුවන් ලවා සංවිධාන කරවා ඒ සියලු උපාසකවරු එක් ව ඒ සත්දවස මුළුල්ලෙහි දන් දෙමින් සිල් රකිමින් පෙහෙවස් සමාදන් වෙමින් සියලු සතුන් කෙරෙහි මෛත්‍රී පතුරුවමින් තමන් කළාවූ ඒ සියලු කුශලයෙහි පින් දෙමින් තුනුරුවන්ට පූජා කරන්නාහු "මේ

1. වන්දනීය වන - KL
2. ඒ සියල්ලවුන්ට ශතසහස්‍ර ගුණයෙන් වඩා - AJ
3. රංසිජාල - BGHKL, පාලි
4. සතරංස - පාලි
5. සොණ්ණනන්දො - BDEGHKL
6. ගුණවර්ණනාව එකදේශයෙකින් - ස.කි.ස.
7. ද (නැත) - BEFGHKL
   රූපයට - කි.ම.
8. ලොව - BDEGHKL
9. බුද්ධානුභාව - BGHKL
   බුද්ධානුභාවය - A
10. ප්‍රත්‍යක්ෂ කොට - KL

Non-Commercial Distribution

අප කළාවූ කුශලය හේතු කොටගෙන මෙලොව මහත් වූ සෘද්ධි ඇති මහත් වූ ආනුභාව ඇති සියලු ම දේවතාවෝ ද මෙලොව රක්නාවූ සතරවරම් මහරජ්හු ද යන හැම දෙන ම එක් ව අප බුදුන් ස්වකීය විලාසයෙන් වැඩසිටිනා සේ ද ඊශ්වරයන් බුදුන්[1] වැඳගෙන බැස හෝනා සේ ද දක්වා ලවත්ව"යි කියා සත්‍යක්‍රියා කළහ. ඉක්බිති උපාසක ජනයන්ගේ කුශලතේජසින් සක්දෙවු රජ්හුගේ පාණ්ඩුකම්බල ශෛලාසනය හුණු විය. එකෙණෙහි ශක්‍රයෝ මීට කාරණ කිම් දෝහෝ"යි මිනිස්ලොව බලන්නාහු මිථ්‍යාදෘෂ්ටීන් විසින් කරනලද ඒ විප්‍රකාරය දක මහත් වූ සංවේගයට පැමිණ එකෙණෙහි මිනිස්ලොවට අවුත් ඊශ්වරයන් බුදුන්ගේ ශ්‍රීපාදය[2] වැඳගෙන හොත්නාවූ ආකාර දක්වා එපවත් උපාසක ජනයන්ට කියා තමන්ගේ දෙව්ලොවට ම ගියහ. මෙසේ ශක්‍රයන් ගිය ඉක්බිති සත්වන දවස් උදසන්හි ම උපාසකවරු එක් ව රජ්ජුරුවන් කරා එළඹ වැඳ එකත්පස් ව සිට කියන්නාහු 'දෙවයන්වහන්ස, අද අප[3] බුදුන්ගේ මහිම බැලුව මැනව. ඊශ්වරයා දන් අප බුදුන්ගේ ශ්‍රීපාද දෙක වැඳගෙන හොත්තේ වේ ද යි කීහ. එබස් අසමින් ම රජ්ජුරුවෝ එපවත් කියවා නුවර බෙර ලවා මහජනයා රැස් කරවා ඔවුන් විසින් පිරිවරන ලදුව දේවාලයට ගොස් පළමු එබු අස් බිඳුවා දෙරහැර බුදුරුව ඇඳි පුවරුකඩ ගෙන්වාගෙන ඒ වසා සිසාළ වස්ත්‍රය හරවාපීහ. එකල තමාගේ දෘෂ්ටිගතුවන් කළ අපරාධයට තෙමේ ම බුදුන් වැඳ ක්‍ෂමා කරවන්නා සේ දර ගල්ලව[4] වැඳගෙන හොත් ඊශ්වරයන් හා බුදුන් වැඩසිටි විලාසය හා මහත් වූ ඒ ප්‍රාතිහාර්‍ය්‍ය[5] දක රජ්ජුරුවන් හා මහඇමතියෝ ද සෙසු බොහෝ දෙන ද තම තමන් ගත් මිථ්‍යාදෘෂ්ටි හැර ශරණගත වූහ. ඉක්බිති රජ්ජුරුවෝ ඒ දේවාලය බිඳුවා හැර ඉතා සිත්කලු වූ රජමහා විහාරයක් කරවා තමන් දිවි හිමියෙන් බොහෝ පින් කොට සපිරිවරින් දෙව්ලොව උපන්හ.

එසේ හෙයින් යම් කිසි කෙනෙක් බුදුන් ජීවමාන කාලයෙහි ඔබගේ මනොඥ වූ සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය දක කුසල් කරන්නාහු වී නම් ඒ ආශ්චර්‍ය්‍ය[6] නොවන්නේය. යම් කිසි කෙනෙක් අරණි මථනයෙන් ගිනි හෙළා එයින් ප්‍රයෝජන විඳිනා සේ එබඳු බුදුන් පිරිනිවි කල්හි ඒ උතුමන්ගේ[7] සුචරිත ධර්මානුභාවයෙන් මෙබඳු පෙළහර දක්වා බොහෝ දෙනා ලවා කුසල් කරවන්නාහු වී නම් එම ඉතා ආශ්චර්‍ය්‍ය වන්නේ මැයි. එසේ හෙයින් කියනලදී:

න අබ්භුතං සත්ථු ධරීයමානෙ
කරොන්ති දිස්වා කුසලානි ඉද්ධිං,
යෙ තං[8] මුනින්දෙ පරිනිබ්බුතම්හි
කරොන්ති පුඤ්ඤානි මහබ්භුතනෙත-යි.

මෙතෙකින් මේ යකබ්වස්ථිත වග
පස්වන කාවීරපට්ටන වස්තුව
කියා නිමවන ලදී.

මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි යකබ්වස්ථිත වර්ග නම් වූ
සත්වන පරිච්ඡේදය නිමි.

---

1. බුදුන්ට - C
2. ශ්‍රී පාදයට - FL
3. අපගේ - මුද්‍රිත හැම, ස.
4. දරගල්වා - K, දරගල්ලා - L
5. ප්‍රාතිහාර්‍ය්‍ය - ක.ම.
6. ආශ්චර්‍යයෙක් - B
7. තමන්ගේ - BDEGHKL, ම.
8. තථා - KL

Non-Commercial Distribution

තව ද මේ සද්ධර්මාලංකාරයෙහි තුන්යහළු වග පළමුවන තුන්යහළු වස්තුව නම් කවර යත්. එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු:

යටගිය දවස දඹදිව එක් සමයෙක්හි මහත් වූ නියං සායෙක් ගැසීය. එකල්හි ගිම්හාන සූර්‍ය්‍යමණ්ඩලයා විසින් තමාගේ[1] දහස් ගණන් රශ්මිකදම්බ නමැති සහස්‍ර බාහුයෙන් ගං හෝ ඇළ අමුණු හැලි ගිරිකඳුරු වැව් පොකුණු විල් ආදියෙහි ජලය නිඃශෙෂ කොට උකා බීපුවාක් මෙන් දිය සිඳිණ. ජලය නිසා ජීවත් වන්නාවූ මස් කැසුප් ආදීහු බොහෝ සේ විනාශයට පැමිණියහ. වනාන්තරයෙහි නොයෙක් ගස් තුරු ලිය තෘණපර්ණාදීහු එක පැහැර මලානික වූහ. සියලු සිවුපා සතුන් හා පක්ෂීහු හිරුරසින් තැවී දහ ගත් සරීර ඇති ව පිපාසිත වූවාහු මහ අවුවෙහි දුර පෙනෙන්නාවූ මිරිඟු දක ජලයෙක් දෝහෝ යි යන ශංකාවෙන්[2] ඔබ මොබ[3] දිව පැන මහත් වූ දුඃඛයට පැමිණෙන්නාහ. එකල්හි එක් ගිරාපොතකයෙක් පිපාසා ඉවසිය නොහී ඒ ඒ තැන්හි පැන් සොයා ඇවිදුනේ මහත් වූ වන මධ්‍යයෙහි එක් ගසක් දිරා බට පූතිපාදපය යි කියන ලද සැටරියන් උස ඇති නරාවළෙක යට ජලයෙහි ගන්ධය ආඝ්‍රාණය කෙරෙමින් පැන් බොනු පිණිස ඒ නරාවළ යට[4] බැස ලොභයෙන් බොහෝ කොට පැන් උකා බී බඩ බර ව ගොඩනැංග නොහී එම දියවළෙහි හුණුයේය. නැවත එපරිද්දෙන් ම පැන් බොනු සඳහා ගියාවූ නාගරාජයෙක මනුෂ්‍යයෙකැ යි මෙසේ දෙදෙනෙක් ද එහි ම වැටී හුන්හ.[5] මේ දිව්‍ය නාගරාජයෝ නම් පිළිසන් වූ ජනවිවික්ත විවෙකස්ථානයක් ලත් කල්හි තමන්ගේ ස්වකීය වූ නාගශරීරය හැර දිව්‍යමනුෂ්‍යාදි වූ යම් කිසි ආත්මභාවයක් මවාගෙන තමන් සිත් වූ පරිද්දෙන් අභිමත ස්ථානයකට සැප සේ පලා යන්නාහ. මේ නාගරාජයා වනාහී මනුෂ්‍යයාත් එම දියවළෙහි හෙයින් තමා මිහට පෙනෙතියි සිතා වෙස් වළා දියෙන් ගොඩ නැඟී යා නුහුණුයේය. එහි හුණුවාවූ මනුෂ්‍යයා ද තමා[6] අතින් එල්බගෙන උඩ නැඟී යන ආධාරයක් නැති ව නිරාලම්බනික හෙයින් ගොඩනැඟී යා නුහුණුයේය. මෙසේ ඔහු තුන්දෙන වළින් ගොඩනැංග නොහී මරණභයින් භයපත් ව ඔවුනොවුන්ට කිසි පීඩාවක් නොකොට එහි ම කීප දවසක් විසූහ.

ඉක්බිති බරණැස් නුවර වසන්නාවූ එක් මනුෂ්‍යයෙක් කිසි කටයුත්තක් නිසා වල් ගොස් ඒ වනාන්තරයට වැද පළමු තුන්දෙනා පරිද්දෙන් ම පැන් පරීක්ෂා කොට ඇවිදුනේ ඒ ස්ථානයට පැමිණ දියවළෙහි වැටී දුක් විඳුනා ඔවුන් තුන්දෙනා දක ඉතා කම්පා වූ සිත් ඇති ව ඔවුන් කෙරෙහි මහත් වූ කරුණා උපදවා වලින් වැල් කපා ගෙනවුත් කුඩයක් වියා සාල්ලෙක තබා වැලකින් බැඳ දියවළට බා ඔවුන් තුන්දෙනා ම කුඩයට නංවාගෙන වළින් ගොඩනැගුයේය. ඉක්බිති ඔහු තුන්දෙන[7] "මේ සත්පුරුෂයා විසින් අපගේ ජීවිතය රැකදෙන ලද්දේය"යි සතුටු ව ඒ පුරුෂයාට කියන්නාහු, "ස්වාමිනි, අපි නුඹවහන්සේ නිසා ජීවිතය ලදුම්හ. එසේ හෙයින්

---

1. තමන්ගේ - මුද්‍රිත හැම. ස.
2. ශාංකාවෙන් - ABDEFGHJKL
   ශාංකාවෙ - C
3. ඔබිනොබ - CGHKL
   ඔබනුඹ - ADEJ
   ඔබනුබ - F
4. නරාවළට - BCL
   නරකාවාටයට - E, ස.
   නරාවවයට - G
   නරාවාටයට - HK
5. හුනහ - AEGH, වැටුනාහ - L
6. තමන් - ක.කි.ඇ.බෙ.ස.
7. ඔවුන් තුන්දෙන - මුද්‍රිත හැම, ස.

Non-Commercial Distribution

නුඹවහන්සේ මෙතැන් පටන් අපට ජීවිතදායක වූ ප්‍රිය මිත්‍රයාණන්වහන්සේ ය. අපිත් නුඹවහන්සේට එපරිද්දෙන් ම මිත්‍රයම්හ. එබැවින් අප හැමදෙනා වාසය කරන්නා වූ ස්ථානයට වඩනා කැමතිසේක් ද"යි විචාරා "ඉදින් මට එබඳු කටයුත්තෙක් පැමිණියේ වී නම් එන්නෙම් වේ ද"යි ඒ පුරුෂයා කීකල්හි ඔවුන් තුන්දෙනා අතුරෙන් පළමු කොට ගිරාපොතක තෙම තමා වසන තැන් සලකුණු කියනුයේ "ස්වාමිනි, බරණැස් නුවර දකුණු වාසල්දෙර සමීපයෙහි ශාඛා විටප සම්පන්න වූ මහත් නුහරුකෙක් ඇත්තේය. ඒ නුහගස නම් මාගේ නිරන්තර වාසස්ථාන ය. නුඹවහන්සේට මා නිසා සිඩවන්නාවූ එබඳු කටයුත්තක් ඇති[1] කල්හි ඒ නුහ රුකමුලට අවුත් ගිරාපොතකය යි කියා මට හඩගාලුව මැනවැ"යි කියා ඒ පුරුෂයා කෙරෙහි මිත්‍රකම පුසස්ථිර කොට අවසර ගෙන නික්මුණේය. ඉක්බිති නාගරාජයා කියනුයේ "යහළු, බරණැස් නුවර දකුණු වහසල් දෙර එම නුහරුකට නුදුරු තැන්හි මහත් තුඹසෙක් ඇත්තේය. "ඒ තුඹසෙහි මම නිරන්තරයෙන් වාසය කෙරෙමි. නුඹ වහන්සේට මාගෙන් එබඳු ප්‍රයෝජනයක් ඇති කල්හි එම තුඹස සමීපයට අවුත් දීඝී යයි කියා මට හඩලුව මැනවැ"යි කියා ඒ පුරුෂයා අතින් අවසර ඉල්වාගෙන නික්මුණේය. ඉක්බිති මනුෂ්‍යයා කියනුයේ "ස්වාමිනි, මම බරණැස් නුවර අසෝ වීථියෙහි අසවල් ගෙයි වාසය කෙරෙමි. නුඹවහන්සේට මා නිසා වන්නාවූ යම් කිසි[2] ප්‍රයොජනයක් පෙනුණු[3] කල්හි මා සමීපයට අව මැනවැ"යි කියා පළමු දෙදෙනා පරිද්දෙන් ම අවසර ඉල්වාගෙන ගියේය.

මෙසේ ඔවුන් තුන්දෙනා අවසර ඉල්වාගෙන ගිය කල්හි ඒ පරොපකාරී පුරුෂතෙම නැවත තමාගේ වාසස්ථානයට ම අවුත් එයින් මෑත භාගයෙහි කල්යාමකින් තමහට කිසි කටයුත්තක් පැමිණි කල්හි "මාගේ මිත්‍රයන් සමීපයට යෙමි"යි සිතා පළමු ඔවුන් කී සලකුණෙන් ගොස් බරණැස් නුවර දකුණුවාසල් දෙර සමීපයෙහි නුගරුක් මුල සිට ගිරවාණෙනි, යි හඩ ලූයේය[4]. ඒ ශබ්දය අසමින් ම ගිරාපොතක තෙම නොලස් ව දිව අවුත් ඒ පුරුෂයා හා සමඟ නැවත නැවත සතුටු ව පිළිසඳර කථා කොට "යහළු, නුඹ මා සමීපයට බොහෝ දවසකින් ආ දෑය. කිමෙක් ද නුඹ දන් මා සමීපයට ආ කාරණය නොවළහා මට ඉඳුරා කිව වැනවැ'යි[5] කීය. ඉක්බිති ඒ පුරුෂතෙම කියනුයේ "යහළු, මම ස්වශක්තීන් රැකී ජීවත් ව ගන්ට අසමත් වූයෙමි අඹුදරුවන් ඔවුන්ගේ නෑයන් අතට පාවා දී ජීවත් ව ගන්නා පිණිස දන් නුඹ සමීපයට ආයිමි" යි කීය. එතෙපුල් අසා ගිරවාණෝ කියන්නාහු "යහළු, නුඹ මා සමීපයට ආයේ[6] ඉතා මැනව. නුඹ විසින් පළමු මාගේ ජීවිතය රැකදෙන ලද්දේය. දන් මා විසින් නුඹ රැකී ජීවත් ව ගන්නා උපායක් කළමනා මය. එබැවින් මා එන තෙක් මෙතැන්හි ම මදක් සැතපී උන මැනවැ'යි කියා ඕහට ජීවනොපායක් සොයා ගියෝය.[7]

එකල්හි බරණැස් රජ්ජුරුවෝ සිය සෙනඟ පිරිවරා නුවරින් නික්ම ගොස් රන් රිදී කෙහෙල් තොරණ ධජ පතාක පුන්කළස් තිරිකුඩම්[8] ආදියෙන් විසිතුරු කොට

---

1. පැමිණි - BGHKL
2. කිසියම් - BGHKL
3. පැමිණි - GHK, ඇති - BL
4. හඬ ගෑයේය - J, ක.කි.පු.ම.
5. කියවයි - GHKL
6. ආයේ - බෙ.ම.ස.
7. ගියහ - මුද්‍රිත හැම.
8. තිරිකුඩම් - පිටපත් හැම
   තිරිකුඩම් - මුද්‍රිත හැම ස.

Non-Commercial Distribution

සරහනලද්දවූ උද්‍යානයට වැද ඒ ඒ තැන්හි පතැස් පොකුණු ගලතල සුදුවැලි තලා ලියමඬුලු ආදි වූ නොයෙක් විසිතුරු බලමින් පුරඟනන් හා සමඟ උයන්කෙළි කෙළ[1] ඇවිදුනාහු දෙවේලා මධ්‍යයෙහි සුපුෂ්පිත වූ පස්පියුමෙන් සැදි මඟුල් පොකුණ[2] දැක ඉස් ශොධා නහා දිය කෙළනා කැමැති ව හන් පළන් සියලු වස්ත්‍රාභරණ ගළවා තබා රාජපුරුෂයන් රකවල සිටුවා පුරඟනන් හා සමඟ පොකුණට බැස දියකෙළියට පටන් ගත්හ. එකල්හි ඒ ගිරාපෝතක තෙම එම පොකුණ සමීපයෙහි මඟුල් සල්ගස් අතුපතර අතුරෙහි සැඟවී හිඳ රකවල සිටි පුරුෂයන්ගේ ප්‍රමාදයක් දැක ඒ ක්‍ෂණයෙහි රජ්ජුරුවන්ගේ මුක්තාහාරය යහඬුවකින් බැඳුවා සේ තරකොට තුඩින් අවුලාගෙන අහසට පැනනැඟී පවන් වේගයෙන් ඇසිල්ලකින් දිවගෙන ගොස් ගෙනගිය මුක්තාහාරය තමාගේ ඒ මිත්‍රයා අත තබා "යහළුව, මේ මුක්තාහාරය අප්‍රමාද ව ඉඳුරා තබාගෙන මතු ප්‍රයෝජන විඳුව"යි කියා දුන්නේය. ඉක්බිති ඒ පුරුෂතෙම මුක්තාහාරය අතට ගෙන සිතනුයේ "මේ මුක්තාහාරය කොතැනෙක ක්‍ෂෙමස්ථාන කොට තබා ගනිම් දෝ හෝ"යි සිතා ඉක්බිති යට කියනලද ඒ දවස් වළින් ගොඩනැඟු මනුෂ්‍ය මිත්‍රයා සිහිකොට "මාගේ එක් යහළුවෙක් ඇතුළු නුවර වාසය කරන්නේය. ඔහු සමීපයෙහි තබමි"යි යන[3] සනිටුහන් කොට පළමු ව ඔහු විසින් කියනලද්දවූ සලකුණෙන්[4] නොවරදවා ගොස් ඒ පුරුෂයා දැක සිහි කටයුතු දුක්සැප කථා කොට ඉක්බිති ගිරවාණන් තමහට කළ උපකාරය ප්‍රකාශ කොට දක්වා "යහළු, මේ මුක්තාහාරය ඉඳුරා තබව"යි කියා ඔහු අතට දුන්නේය.

එකෙණෙහි බරණැස් රජ්ජුරුවෝ ඉස් ශොධා නහා දියෙන් ගොඩනැඟී සළු හැඳ සුවඳ විලෙවුන් ගෙන ආභරණ පළඳනාහු[5] මුක්තාහාරය නොදැක එපවත් රාජපුරුෂයන්ට කීහ. ඉක්බිති රාජපුරුෂයෝ උයන ඇතුළ පිටත සියලු ජනයන් විමසා පරීක්‍ෂා කොට මුක්තාහාරය නොදක්නාහු "යමෙක් මුක්තාහාරය දැක ගෙනවුත් දුන්නේ වී නම් රජ්ජුරුවන් වහන්සේ ඔහට බොහෝ සම්පත් දෙනසේක"යි කියා නුවර බෙර ලැවූහ. එපවත් අසා ඒ නුවර වසන ඒ මිත්‍රද්‍රොහි වූ පුරුෂතෙම සිතනුයේ "මම වනාහි ඉතා දුඃඛිතයෙමි. එබැවින් මේ මුක්තාහරය ගෙනගොස් රජ්ජුරුවන්වහන්සේට දක්වා ඔබගෙන් බොහෝ සැපත් ලදින් සුවසේ වාසය කෙරෙමි. මොහුගෙන් මට ප්‍රයෝජන කිම් ද"යි සිතා ඉතා අවිෂය කාලයෙහි තමාගේ ජීවිතය රැක දී ඒ පුරුෂයා විසින් කරනලද්දවූ එබඳු උපකාර නොසලකා ඒ මිත්‍රද්‍රොහි වූ පාපී පුරුෂතෙම රාජපුරුෂයන් කරාගොස් මුක්තාහාරය තමා කෙරෙහි තුබු බව කියනුයේ "එම්බා පින්වත්නි, එක් පුරුෂයෙක් මා සමීපයෙහි මුක්තාහාරයක් ගෙනවුත් තුබුයේය"යි කියා මුක්තාහාරය හා සමඟ ඒ පුරුෂයා දක්වූයේය. එබැවින් අසත්පුරුෂයන් හා එක්වීම නම් මෙසේ සියලු අනර්ථයට ඒකාන්තකාරණ වන්නේය. හේ එසේ මැයි:

---

1. උයන් කෙළ - ABCDEFGHJL
2. පොකුණු - ADEFJ
3. යන (නැත) - මුද්‍රිත හැම,ස
4. සලකුණු - KL ම.: සලකුන් - ක.
5. පැළඳ - ACDFJ, මුද්‍රිත හැම

Non-Commercial Distribution

මේ ලොකයෙහි මී සකුරු පැණි කිරිපැන් ආදිය වත්කොට සකසා වඩනා ලද්දවූ කොසඹ වෘක්‍ෂය යම් සේ මධුරත්වයට නොපැමිණේ ද තමාගේ තික්ත ගුණයෙන් ම වඩනේ ද, එපරිද්දෙන් ම අසත්පුරුෂයන්ට කෙතෙක් උපකාර කළත් තමාගේ අසත්පුරුෂ ගුණය නොහරණාහු මය. හිසින්[1] පැන් ගෙනවුත් වත්කොට සිහිදසු සිහින් වැඩුවත් දලුග්ගස[2] යම්සේ මිහිරි ව රසවත් බවට නොපැමිණේ ද, එසේ ම නිරන්තරයෙන් ප්‍රෙම සහිත ව කිරි පැන් පොවා වැඩුවත් සර්පරාජතෙම යම් සේ විෂය ම පරිවර්තනය කෙරේ ද, තමාගේ විෂතෙජස ම දියුණු කෙරේ ද, එපරිද්දෙන් ම කෙළෙහි ගුණ නොදන්නාවූ අසත්පුරුෂයන්ට කවර තරම් උපකාරයක් කළත් තමන්ගේ දුෂ්ටගුණය ම දක්වා සත්වයන්ට අනර්ථ එළවන්නාහ. තව ද පීරඹු දඬු ගොම වැරටි ආදිය අතින් ඝට්ටා ලමින් තණ පරඬලා ආදිය ගෙනවුත් ලමින් මෙසේ නොයෙක් උත්සාහ කොට තමා විසින් මුළු කරන ලද්දවූ ගින්න තමහට කළ උපකාරය තකා යම් සේ ඕහට සීතලත්වයක් නොදේ ද, එකාන්තයෙන් ම ඔහුගේ ශරීරය දවන්නේ ද එපරිද්දෙන් ම කෘතොපකාර නොදන්නා නීචගුණ ඇති අසත් පුරුෂයන්ට කරනලද්දවූ උපකාරය ද මතු මහත් ශොක දුක් නමැති ගින්නට පමුණුවා ඒ වහ්නිය පරිද්දෙන් ම ශරීරය දවන්නේය. එසේ හෙයින් උත්තමාධම මනුෂ්‍යයන්ගේ[3] ස්වභාව ගුණය තමාගේ කාරණාකාරණ ස්වභාව දන්නාවූ සූක්ෂ්ම නුවණින් ඉදුරා පරීක්‍ෂා කොට සත්පුරුෂයන් හා සමඟ මිත්‍රසන්ථවය කටයුතු ය. අසත්පුරුෂ දුර්ජනයන් හා මිත්‍ර වූ සත්වතෙම එකාන්තයෙන් දෙලොවින් ම කිසියම් සැපයක් නොලබන්නේය. එසේ හෙයින් කියනලදී:

යථා[4] සංවඩ්ඪිතො නිම්බො - මධුඛීරොද සිඤ්චනා,
න යාති මධුරං තං - වොපකාරමසතං කතං.

සීසෙනුදකමාදය - වඩ්ඪිතො'පි නුඛී තරු,
න යාති මධුරං තං - වොපකාරමසතං කතං.

නිච්චං ඛීරොදපානෙන - වඩ්ඪිතා'සිවිසො යථා,
විසංව පරිවත්තෙති - තථා නීචොපකාරකං.

යථාභතනා [කතො][5] අග්ගි - සීතලං න දදෙ බලූ,
තථා නීචෙ කතං කාරං - අග්ගීව දහතෙ තනුං.

තස්මා උපපරික්ඛිත්වා - භාවං භාවෙන බුද්ධියා,
කාතබ්බා[6] මෙත්ති ජන්තුහි - නාමිතෙනා ලභතෙ සුඛං--යි.

මෙසේ ඒ මිත්‍රද්‍රොහී වූ අසත්පුරුෂයාගේ බස් ශිවිස රාජපුරුෂයෝ මුක්තාහාරය හා සමඟ ඒ පුරුෂයා අල්වාගෙන ගොස් රජ්ජුරුවන්ට දැක්වූහ. ඉක්බිති ඒ බඩු[7] හා සමඟ ඔහු දක කිපියාවූ රජ්ජුරුවෝ "මේ මුක්තාහාරය තෝ කෙසේ

1. සිහිල් - BDFGHKL
2. දල උක්ගස - BCDEFGHJKL, ස.
දලු උක්ගස - A
3. සත්වයන්ගේ - BGHK
සත්වයන් - L
4. සද -බෙ.
5. කතං - පිටපත් හැම
කතො - මුද්‍රිත හැම, ස.
6. කාතබ්බා - BDEGHKL
7. බඩුව - F, ක.සි.සං.ම.

Non-Commercial Distribution

ගති ද'යි නොවිචාරා ම කියන්නාහු[1] මොහු ගෙනගොස් දකුණු වහසල් දෙර සමීපයෙහි දිවස්හුල හිඳුවාපියව"යි විධාන කළහ. එසේ රජහුගෙන් නියෝග ලත් රාජපුරුෂයෝ ඔහු පිටිතොල හයා බැඳ සියලු ශරීරයෙහි උළුපුණු ගල්වා[2] රත්මල්වඩම් කර පළඳවා හිස පස් කොණ්ඩයක් කොට බැඳ එනුවර කොවේ මහවේ ආදී වූ ඒ ඒ වීථි සන්ධියෙහි සිටුවාගෙන කටු සැමිටි ආදියෙන් පිට පළා පහර දහස් ගණන් ගසමින්[3] මෙසේ නොයෙක් විචිත්‍රවධ[4] කෙරෙමින් වධබෙර ගස්වා ගෙන හුලක් සැස කර තබා ආඝාතන භූමිය බලා නික්මුණහ.

මෙසේ වධකයන් විසින් ගෙනයන ලද්දවූ ඒ පුරුෂතෙම දකුණු වහසල් දෙරින් නික්ම යට කියනලද තමාගේ මිත්‍ර වූ නාගරාජයා සිහිකොට ඔහු නිසා යම්තම් සැපයෙක් වී නම් යහපතැයි සිතා පෙර කී සලකුණෙන් තුඹස දක "යහළු දිඹි ය"යි කියා හඬලූයේය. එවේලෙහි නාගරාජතෙම ඒ ශබ්දය අසමින් ම මාගේ මිත්‍රයාණන්ගේ කටහඬක් වැනි ශබ්දයෙකැයි වහා තුඹසින් නික්ම පරීක්‍ෂා කරනුයේ එපරිද්දෙන් පිටිතොල හයා බැඳ වධ කෙරෙමින් මර මරා ගෙනයන ලද්දවූ ඒ පුරුෂයා දක ළපිරුණු[5] ශොක ඇති ව මහත් වූ චිත්තඛෙදයට පැමිණ "මාගේ මිත්‍රයාණන්ට අද මා අවශ්‍යයෙන් ම උපකාර විය යුතු ය"යි සිතා "මා සිටිය දී නොබව මැනවැ"යි ඔහු අස්වසා තමාගේ නාග ශරීරය හැර එක්තරා එක් වෙශයකින් රාජපුරුෂයන් කරා එළඹ "එම්බා පින්වත්නි, මා එන තෙක් මේ පුරුෂයා මොහොතක් කල් නොමරව"යි තර කොට අස්වසා කියා එම ඇසිල්ලෙහි රජ් ජුරුවන්ගේ අගමෙහෙසින් බිසොවුන් වසන තෙනට දිවගෙන ගොස් සර්පවෙශයෙන් බිසොවුන් දෂ්ට කොට ඒ බිසොවුන් විෂවෙගයෙන් මූර්ඡාවට පැමිණි කල්හි නැවත මනුෂ්‍ය වේශයෙන් සිට කියනුයේ "තෙල වධයට පැමිණි පුරුෂතෙම [සර්ප][6] විෂයට මාහැඟි දිව්‍ය ඖෂධයක් දන්නේය"යි කියා ඒ ක්‍ෂණයෙහි තමාගේ වධයට පැමිණි මිත්‍රයා සමීපයට ගොස් කියනුයේ "යහළු, නුඹ රජ්ජුරුවන් වහන්සේගෙන්[7] කැඳවා එවූ කල්හි නොලස් ව වහා ගොසින් අතින් පැන් අතලොස්සක් ඇරගෙන බිසොවුන් මුහුණට පැන් ගසා විෂ බස්වා බිසොවුන් නිරොගී කළ මැනවැ" උගන්වා තමා වසන තෙනට ම ගියේ ය. ඉක්බිති රජ්ජුරුවෝ බිසොවුන් නයා දෂ්ටකළ බව අසා විෂ වෛද්‍යවරයන් සොයන්නාහු සමීපයෙහි සිටියවුන් අතින් එපවත් අසා "ඒ වධයට පැමිණියහු ගෙනෙව"යි කියා ඔහු ගෙන්වාගෙන "එම්බල සගය, තෙල දේවීන්ගේ විෂ බාපියව"යි කීහ. එතෙපුල් අසමින් ම ඒ පුරුෂතෙම යහපතැයි ගිවිස[8] නාරජ් ජුරුවන් කී පරිද්දෙන් ම බිසොවුන්ගේ විෂ බැස්වූයේය. එවේලෙහි බිසවුන් සැපසේ නිරොගී ව නැඟී සිටියහ. රජ්ජුරුවෝ එදක සතුටු වූවාහු ඒ පුරුෂයාහට ක්‍ෂෙත්‍ර වස්තු යාන වාහන දසි දස් ගව මහිෂාදි වූ බොහෝ සැපත් දීමෙන් මහත් වූ සත්කාර කළහ.

---

1. කියන්නාහු (නැත) - BGHKL
2. ගන්වා - ස.
3. ගස්මින් - බෙ.
   ගස්වමින් - ක.කි.සෘ.ස
4. චිත්‍රවධ - AFGHJKL
   විචිත්‍රවධ - BCDE
5. ළය පිරුණු - BCDFHL, ක.කි.සෘ.ම.
6. සර්ප (නැත) - පිටපත් හැම.
7. රජ්ජුරුවන් වහන්සේ - මුද්‍රිත හැම,ස.
8. ගිවිස (නැත) - ක.කි.සෘා.බෙ.ස.

Non-Commercial Distribution

ඉක්බිති ඒ මනුෂ්‍යතෙම රජ්ජුරුවන් කරා එළඹ පළමු තමා ගිරවා ඇතුළු වූ තුන්දෙනා දියවළින් ගොඩනැගූ තැන් පටන්ගෙන ඔවුන් තුන්දෙනා හා තමා විසින් ඔවුනොවුන්ට කී වචන ප්‍රතිවචනාදි වූ උපකාර අනුපකාර සියල්ල ම රජ්ජුරුවන් මධ්‍යයෙහි ප්‍රකාශ කොට දක්වනුයේ[1] 'ස්වාමීනි, ජනප්‍රධාන වූ දේවයන්වහන්ස, මා කියන්නක් ඉදුරා ඇසුව මැනව. දවසෙක මම කිසි කටයුත්තක් නිසා වනාන්තරයට ගියෙමි. එකල්හි සැටරියන් උස ඇති එක් නරාවළෙක පැන් බොනු පිණිස ගොස් දියෙහි හුණුවාවූ ගිරවෙක නාගරාජයෙක මනුෂ්‍යයෙකැයි මෙසේ මහත් දුඃඛයට පැමිණ සාදුකින් පීඩිත වූ තුන්දෙනකු දැක ඔවුන් කෙරෙහි මහත් වූ[2] අනුකම්පාවෙන් ඒ තුන්දෙනා ම දියවළින් ගොඩ නැඟීමි. එකල්හි ඔහු තුන්දෙන වෙන වෙන ම මට කියන්නාහු 'ස්වාමීනි, නුඹවහන්සේ විසින් අපගේ ජීවිතය රැක දෙනලද්දේය, නුඹවහන්සේ අපට බොහෝ උපකාරී සේක, එබැවින් නුඹවහන්සේට අප නිසා විය යුතු කිසියම් අර්‍ථසිද්ධියක් ඇති කල්හි අප සමීපයට අව මැනව යි කීහ. මෙසේ ඔවුන් විසින් යාඥ කොට කියන ලද්දවූ මම පළමු කොට ගිරවාණන් සමීපයට ගියෙමි. ඒ ගිරවාණන් විසින් කරනලද්දවූ උපකාර විඳගෙන මේ මනුෂ්‍යයා සමීපයට අයිමි.[3] ඔහු විසින් මෙසේ වධයට පමුණුවනලද්දවූ මම එකල්හි මාගේ මිත්‍ර වූ නාරජ්ජුරුවන් දැක එපවත් කීමි. ඒ නාරජතෙම මට[4] ජීවිතය රැක දුන්නේය. දන් මම බොහෝ සම්ප[තු]ත්[5] ලදිමි. එසේ හෙයින් ජනෙශ්වර වූ දේවයන් වහන්ස, සත්පුරුෂ තෙම ඉතා ක්‍ෂුද්‍රය යි නිඳ කටයුතු නොවෙයි. අහෙතුක වූ තිරිසන් යෝනියෙහි උපන් ගිරාපෝතකය නාරජය යන දෙදෙන මිත්‍රධර්‍මයෙහි පිහිටා සත්පුරුෂ ධර්‍මය ම රක්‍ෂා කළහ. මේ කාරණාකාරණ දන්නා අප හා සමාන වූ මනුෂ්‍යජාති ඇති මනුෂ්‍යයන් කෙරෙහි[6] ඉතා අධම වූ මේ මනුෂ්‍යතෙම පළමු මා විසින් තමහට කරනලද උපකාර නොසලකා මෙසේ දන් මට සතුරු ව මෙබඳු අනර්‍ථයකට පැමිණවූයේය. එබැවින් දේවයන්වහන්ස, කෙළෙහි ගුණ නොදන්නා දුර්ජන මනුෂ්‍යයෝ කිසි කාරණයක් නැති ව නිෂ්කාරණයෙහි මඳකින් ම කෝප වන්නාහ. නැවත තමන්ගේ එබඳු කිසියම් කටයුත්තක් පැමිණි කල්හි මඳකින් ම පහදනාහ, යන මේ කාරණාකාරණ නොදන්නාවූ අඥන අසත්පුරුෂයන්ගේ ස්වභාවධර්‍මයෙක් ම වන්නේය. තව ද දේවයන්වහන්ස, සමහර සත්වකෙනෙක් මනුෂ්‍යයෝය යි කියා විශ්වාස කටයුත්තාහු නොවෙති. සිත වඤ්චා නැති අවක්‍ර වූ[7] ඍජු සිත් ඇත්තාහු 'තිරිසන්හු වුවත් විශ්වාස කටයුත්තාහ' යනාදීන් අසත්පුරුෂයන්ගේ නුගුණ ප්‍රකාශ කිරීම් වශයෙන් පළමු තමා ඔවුන් තුන්දෙනාට කළ උපකාර ගෙනහැර දක්වූයේය. එසේ හෙයින් කියනලදි:

එකදහං මහාරාජ - වනං කම්මෙන කෙනචි,
ගතො'ද්දසං මහාවාටෙ - පතිතං සුවපොතකං.

අථොරගං මනුස්සං ච - දුක්ඛප්පත්තෙන බුද්දපරෙ,
උක්ඛිපිං කරුණායාහං - තෙ මෙ'වොචුං තද තයො.

අදසි ජීවමම්හාකං - උපකාරො'සි නො තුවං,
තව කිච්චෙ සමුප්පන්නෙ - අම්හාකං එහි සන්තිකං.

1. දක්වනුයේ - J, බෙ.ම.ස.
2. මහත් වූ (නැත) - BGHKL
3. ආමි - ක.ම.: ආවෙමි - ස.
4. මා - KL
5. සම්පත් - පිටපත් හැම
6. කෙරෙන් - BDGHKL, මුද්‍රිත හැම.
7. අවංක වූ - K, ක.ම.

Non-Commercial Distribution

එවං තෙහි පවුත්තො 'හං - අගඤ්ජිං සුවණ්ණිකං,
කතූපකාරො තෙනාහං - මනුස්සස්සාපි සන්තිකං.

තෙනාහං මරණං පත්තො - අද්දසං උරගාධිපං,
සොදසි ජීවිතං මය්හං - අලද්ධං විපුලං ධනං.

සුජනො නාවමන්තබ්බො - බුද්දකො'ති නරාධිප,
සුවො ච උරගො චෙති - මිත්තධම්මෙ පතිට්ඨිතා.

කාරණඤ්ඤූ මනුස්සොසො - අම්හෙහි සමජාතිකො,
කතූපකාරො එවම්පි - දිසො ජාතො නරාධමො.

අකස්මා දෙව කුප්පන්ති - පසීදන්ත්‍යාතිමිත්තතො,[1]
සීලං හෙතමසාධූනං - බාලානමවිජානතං.

මනුස්සානි මහාරාජ - කෙචි විස්සාසියා න වෙ,
තිරච්ඡානා'පි හොන්තෙව - අජිම්හ මනසා සදා -යි.

මෙසේ ඒ පුරුෂතෙම ප්‍රථමාරම්භයෙහි පටන් තමාගේ ප්‍රවෘත්තිය රජහට දැන්වූයේය.[2] එපවත් අසා පහන් සිත් ඇති රජ්ජුරුවෝ "මේ පුරුෂයාට යහපත් ගෙයක් නංවා මහත් වූ පෙරහරින් ගෙවදනා මඟුල් කරව"යි කියා අමාත්‍යවරුන්ට විධාන කළහ. එවේලෙහි ඒ මනුෂ්‍යතෙම කියනුයේ "ස්වාමීනි, ඉදින් මට ගෙයක් කරවන්නා කැමති හොත් දකුණු වහසල් දෙර සමීපයෙහි නුහරුක හා තුඹසට අතුරෙහි ගෙය නැංවුව මැනවැ"යි කියා එපරිද්දෙන් ම ගෙය නංවාගෙන ඒ ගෙහි බොහෝ දැසි දස් පිරිවරින් සැපසේ වාසය කරනුයේ අප්‍රමාද ව රාජසේවය කෙරෙමින් ගිරාපෝතකය නාගරාජය[3] යන යහළුවන් දෙදෙනා හා සමඟ එකාවන්[4] සතුටුවෙමින් ජීවිතාන්තය දක්වා සැපසේ සමඟ වාසය කොට ආයුකෙළවර ඒ යහළුවන් දෙදෙනා හා සමඟ තමාගේ[5] කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියේය[6]. මෙසේ ශරීර ධන ජීවිතාදි වූ සියලු සැපයෙන් පිරිහුණාවූ යහළුවන්ට උතුම් වූ සත්පුරුෂ මිත්‍රයෝ අවශ්‍යයෙන් ම ප්‍රතිෂ්ඨාධාර ව ඒ දුකින් මුදා සැපයෙහි පිහිටුවා ලන්නාහ. එබැවින් පින්වත් සත්වයෙනි, කිසියම් දුකක් පැමිණි කල්හි සජ්ජන යහළු මිත්‍රයන් නැත්තාවූ සත්වයන්ට යම් හෙයකින් ඒ දුකින් මිදී අභිවෘද්ධියට පැමිණීමෙක් නම් නැද්ද, එසේ හෙයින් මේ ලෝකයෙහි මෙලෝ පරලෝ දන්නා ස්වභාව ගුණයෙන් යුක්ත වූ සත්පුරුෂයන් හා මිත්‍ර ව ගෙන බොහෝ යහළු මිත්‍රයන් ඇත්තාවූ තොප විසින් මහත් වූ නොයෙක් කුශලධර්මයන් රැස් කොට මතු ස්වර්ග මොක්ෂ සම්පත් සිධ කරන්ට උත්සාහ කටයුතු. කියන ලදුයේ මැයි:

ඉති පතිත සුඛම්හා අඩගතො වා ධනම්හා,
පරමතරපතිට්ඨා හොන්ති මිත්තා සඛානං,
විරහිත සඛිනමෙහා[7] නත්ථි යස්මා'භිවුඩ්ඩි,
විනථ[8] කුසලධම්මං මිත්තවන්තා මහන්තං-යි.

මෙතෙකින් මේ තුන්යහළු වග

පළමුවන තුන්යහළු වස්තුව
කියා නිමවන ලදි.

---

1. පසීදන්ති නිමිත්තතො - ක.ම.
2. දැන්වූයේය - ABGH
3. ගිරාපෝතකයාය නාගරාජයාය - GHKL
4. එකාවන් ව - CG
5. තමන්ගේ - BGHKL
6. ගියාහ - BGHKL
7. සඛිනමෙහා - DEGH, ක.කි.සැ.ම.ස. පාලි
   සඛිනමෙහා - AJ
   සඛිතමෙහා - C
   සඛිතමෙහා - BF
   සඛිනං සො - බෙ.
8. විතුථ - ACEFJ
   විතථ - K
   මිත්ථ - L

Non-Commercial Distribution

තව ද මේ තුන්යහළු වග දෙවන ව්‍යාඝ්‍ර වස්තුව නම් කවර යත්, එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු:

දඹදිව සොළීරටට නුදුරු වූ බරණැස් නුවර සමීපයෙහි එක් පාංශුපර්වතයක් විනිවිද යන්නාවූ මහ මාවතෙක් විය. ඒ පාංශු පර්වත මධ්‍යයෙහි එක්තරා[1] ව්‍යාඝ්‍රයෙක් තමාගේ පිය වූ ඇස් අන්ධ ව්‍යාඝ්‍රයකු පර්වත ගුහායෙක තබාගෙන[2] කන බොන දෑ ගෙනවුත් ලමින් පොෂ්‍යය කොට වාසය කෙරෙයි. තව ද එම පර්වතයට වදනා වන දෙර සමීපයෙහි එක් ගසෙක නමින් තුණ්ඩිල නම් වූ ගිරවෙක් ද වාසය කෙරෙයි. ඒ ගිරාපෝතකයා හා ව්‍යාඝ්‍රයා හා දෙදෙන ඔවුනොවුන්ට ප්‍රියමිත්‍ර ව වෙසෙති. එසමයෙහි පසල්ගමෙක වසන්නාවූ එක් පුරුෂයෙක් තමාගේ අඹුව හා සමඟ ඩබරක් කොටගෙන බරණැස් නුවරට යන්නේ ඒ වනදෙරට[3] පැමිණියේය. එකල්හි ගිරවාණෝ ගමනින් මිරිකුණු ශරීර ඇති ව සාදුකින් පීඩිත ව යන්නාවූ ඒ පුරුෂයා දැක ඉතා කම්පිත වූ සිත් ඇති ව ඔහු ළඟට කැඳවා, "එම්බල පුරුෂය, තෝ කොයි යෙයි ද"යි විචාරා "මේ වල්කඩින්[4] එපිට යෙමි"යි කී කල්හි 'එම්බල පින්වත, මේ වනකඩ මධ්‍යයෙහි එක් ව්‍යාඝ්‍රයෙක් වෙසෙයි. ඒ ඉතා ක්‍රෑරය, චණ්ඩය, පරුෂය. මේ පර්වතය මධ්‍යයට පැමිණි යම් ම කෙනකුන් අල්වාගෙන සල්ව සල්වා මරා කන්නේය. එබැවින් තෙපි ඒ මඟ නොයව"යි කීහ. එසේ කිව ද ඒ පින්මඳ කාළකණ්ණි පුරුෂයා තමහට හිත කැමැති ව ගිරවාණන් කී බස් නොගිවිස "තොප කෙසේ ව්‍යාඝ්‍රයාගේ තදකම් කීවත් මා යන්ට ම වුව මැනවැ"යි කීය. එවේලෙහි ගිරවාණෝ "එසේ වීනම් යහළු තෙපි ඉදින් නොනැවත යනු කැමැත්තා[5] නම් මා කීවක් කරව. ඒ ව්‍යාඝ්‍රයා නම් මාගේ යහළුවා ය. එබැවින්[6] මාගේ නම කී කල තොප නොමරයි, ඕහට තෙපි[7] කියන කල 'තොපගේ යහළු වූ තුණ්ඩිල නම් ගිරවාණන් ළඟ සිට එමි'යි මෙපමණක් කියා ඔහු අතින් ගැළවී යව"යි කීහ. මෙසේ ගිරවාණන් විසින් කියනලද වැඩට නිසි තෙපුල් නොගෙන ඒ පාපිෂ්ට වූ දුෂ්ට පුරුෂයා ගිරවාණන්ට කිපී තමා අත තුබූ මුගුරෙන් පැහැර[8] ගිරවාණන් මරා තබාලා ගිනි ගාගෙන මස් පළහා කාපීය. අහෝ අසත්පුරුෂයන් හා එක්වීම නම් මෙලෝ පරලෝ දෙකින් ම දුක් දෙන්නේ මැයි. ඒ එසේ මය, මේ ලෝකයෙහි යම් කිසිවෙක් ගිනි දඬු ආදි වූ ගිනි උපදවා ගන්ට නිසි කිසියම් දෙයකින් ගිනිදුහක් ගා එළා ගෙන තණ පරඬලා පීරඹු දඬු ආදිය අතින් සටාලමින් දෙදණ බිම ඔබාගෙන ඇස් රතු වන තුරු පුබුක්ක පැළී යන්නා සේ පිඹ මහත් උත්සාහ කොට ගිනි රැසක්

---

1. එක්තරා එක් - GHKL
2. තබා - BGHK
3. වනදෙරකඩට - GH.
4. වාසල්කඩින් - ACJ, මුද්‍රිත හැම
5. කැමැත්තා - පිටපත් හැම
   කැමැත්තහු - මුද්‍රිත හැම
6. එහෙයින් - BGHK
   එසේ හෙයින් - L
7. තොප - GHK
   තොපි - BDL
8. පහර දී - GH

Non-Commercial Distribution

කොට ගිනිරැසක් මුළු කොට ගෙන පසුව "මහොත්සාහයෙන් මා ඇතිකොට ගත් මාගේ ම ගිනි ය" යි සිතා ප්‍රෙම සහිත ව ඉදින් එගිනි රැස පිපගත්තේ වී නම් තමහට කළ එතෙක් උපකාර නොසලකා ඒ ගිනිරැස ඔහුගේ ශරීරය යම්සේ දවා ද, එසේ ම[1] මිහිරි කිරි හා මීපැණි පොවා ප්‍රෙම සිතින් වඩනා ලද්දවූ යම් කිසි සර්පයෙක් ඉදින් කිපියේ වී නම් තමා වඩා වර්ධනය කළාවූ ඔහුගේ ශරීරය දෂ්ට කොට යම් සේ ජීවිතක්‍ෂයට පමුණුවා ද එපරිද්දෙන් ම, හීන ගුණ ඇති ඉතා පව්ටු වූ[2] කෙළෙහි ගුණ නොදන්නා මනුෂ්‍යයන්ගෙන් අධම වූ ඉතා බැගෑපත් වූ මනුෂ්‍යයන් හා සමග මඳ ඇසිල්ලෙක කළාවූ මෙපමණ විශ්වාසය පවා මෙසේ අවැඩට කාරණ වන්නේය යි දන්නා නුවණැති සත්වයන් විසින් ඒ බඳු අනර්ථ එළවන අසත්පුරුෂයන් හා සමඟ එකවිටෙකත් විශ්වාසයක් නොකළ මනා මැයි. එසේ හෙයින් කියනලදි,

මයා කතං මයහමිදං - ඉති වෙස්සානරං[3] නරො,
සමාලිඩ්ගති සප්පෙමො - දහතෙවස්ස විග්ගහං.

මධුඛීරාදි දනෙන - පෙමසා පරිපාලිතො,
සොරගො කුපිතො වස්ස - ඩහතෙවස්ස විග්ගහං.

එවං නිහීන ජච්චෙන - පාපෙන අකතඤ්ඤුනා,
නරාධමෙන දීනෙන - කතොපි ඛණසඩ්ගමො.

අසාධුකො අයනෙනවං - ජානමානෙන ජන්තුනා,
මුහුත්තමපි න කාතබ්බො - සඩ්ගමො සො අනත්ථදෙ - යි.

මෙසේ ඒ අසත්පුරුෂ වූ පුරුෂයා ගිරවාණන් මරා මස් කා ඉක්බිති මග බැස යන්නේ වනකඩ මධ්‍යයට ගොසින් වන. එකල්හි ව්‍යාඝ්‍රයා ඔහු දැක මහත් කොට නාද පවත්වා ඔහු මරනු පිණිස සමීපයට අවුත් වන. එවේලෙහි ව්‍යාඝ්‍රයා දැක මරණ භයින් භයපත්වූ ඒ පුරුෂයා පළමු ගිරවාණන් කී වචනය සිහිකොට ව්‍යාඝ්‍රයාට කියනුයේ "එම්බා යහළු, මම තොපගේ මිත්‍ර වූ තුණ්ඩිල නම් ගිරවාණන් ළඟ සිට අයිමි; ඇයි තොප මෙතැන්හි[4] වසන බව නො දන ම ආවයි සිතවූ ද? එක විටෙකත් එසේ නොසිතව. මා එන්නේ තොපගේ මිත්‍රයාණන් ළඟ සිට යැ" යි කීය. එබස් අසමින් ම සතුටු වූ සිත් ඇති ව්‍යාඝ්‍රයාණෝ "එසේ වී නම් යහළු මෙසේ එව" යි කියා ඒ අසත්පුරුෂයා කැඳවාගෙන තමන් වසන පර්වත ගුහාවට ගෙනගොස්[5] මනුෂ්‍යයන් කැවමනා ආහාරයෙන් ඔහු සන්තර්පණය කොට තමන්ගේ පියාණන් සමීපයෙහි රඳවා නැවත වනකඩ රකවලට ගියහ. එකල ඒ ව්‍යාඝ්‍රයාණන්ගේ පිය වූ ඇස් අන්ධ[6] ව්‍යාඝ්‍රතෙම පුතණුවන් ගිය ඉක්බිති ඒ පුරුෂයා හා සමඟ කථා කරනුයේ ඔහු කියන බසින් ම ගිරවාණන් මරාකෑ බව දැන නැවත තමාගේ පුත්

1. එපරිද්දෙන් ම - මුද්‍රිත හැම, ස.
2. ගුණ නැති පව්ටු වූ - KL
3. වෙස්සානලං - ABCEGHIKL
4. මෙතැන - ක.ම.
5. අවුත් -ACDEJ, මුද්‍රිත හැම, ස.
6. නැති -BGHKL

Non-Commercial Distribution

වූ ව්‍යාඝ්‍රයා ආ කල්හි "එම්බා පුත, තෙල පුරුෂයා තොපගේ මිත්‍ර වූ තුණ්ඩිල නම් ගිරවාණන් මරා මස් කැයේ වේ ද" යි කී ය. එතෙපුල් අසා නොසතුටු වූ සිත් ඇති ව්‍යාඝ්‍රයාණෝ මහත් වූ ශොකයෙන් ගිරවාණන් වසන තෙනට දිව ගොස් "යහළු තුණ්ඩිල නම් ගිරවාණෙනි", යි මහත් කොට කීප වරක අඬගා ගිරවාණන් නොදක ඔවුන්ගේ ශරීරයෙන් උදුරා හළ පියාපත් දක "එකාන්තයෙන් ම මේ පුරුෂයා විසින් ගිරවා මරන ලද්දේ සැබෑ ම යැ"යි මහත් වූ ශොකයෙන් ගිරවාණන්ගේ ගුණ කිය කියා හඬමින් වලපමින් නැවත තමන් වසන පර්වතගුහාවට එමින් සිටියහ. එකල්හි ඒ මිත්‍රද්‍රොහි වූ අසත්පුරුෂතෙම ව්‍යාඝ්‍රයාණන් තුණ්ඩිලයන් බලන්ට ගිය පසු මතු සේළමක් නොකිව[1] මැනවැයි හික්මවන්නා සේ ඔවුන්ගේ පිය වූ ඇස් නැති ව්‍යාඝ්‍රයාණන් ගලකින් පැහැර මරා දමා මෙවිට ව්‍යාඝ්‍රයා ද මැරුව මැනවැයි සිතා ව්‍යාඝ්‍රයාණන් එන මහ අස සැඟවී සිටගත, එකෙණෙහි ව්‍යාඝ්‍රයා ද අවුත් වන. එන්නාවූ ව්‍යාඝ්‍රයාණන් දක ඔහුගේ[2] තෙජසින් කිසිවක්[3] කොටගත නොහී මරණභයින් භයපත් ව ව්‍යාඝ්‍රයාණන් දසාවට නැමී නැමී දිවගෙන අවුත් "ස්වාමීනි, මට ජීවිත දනය දුන මැනවැ"යි කියමින් ඔහු පාමුල්හි වැදගෙන හොත්තේය. එවේලෙහි ව්‍යාඝ්‍රයා[4] ඔහු විසින් කරනලද ඒ ක්‍රියාව දක:

අමිත්තම්පි ච යො දීනං - අත්තනො සරණාගතං,
ව්‍යසනෙසු නුගණ්හාති - සවෙ භූපති භූපති.

යන මේ නීතිශාස්ත්‍ර ගාථාව තමන්ට ම කී දෙයක් සේ[5] සිතා ඒ අසත්පුරුෂයා කෙරෙහි උපන්නාවූ ක්‍රොධය[6] සන්හිඳුවා "මාගේ මිත්‍රවූ ගිරවාණන්ගේ නම කියා ආවාවූ මෝහට කිසියම් ද්‍රොහයක් කිරීම මා වැන්නවුන්ට යුක්ත නොවෙයි. ඒකාන්තයෙන් ම සත්පුරුෂධර්මයකුත් නොවන්නේය"යි සිතා එබඳු අපරාධ කළා වූ අසත්පුරුෂයා කෙරෙහි මෙත් සිත් පතුරුවා ඔහු ම අස්වසා "යහළු තෙපි නො බව. සැපසේ යව"යි කියා ඔහුගේ සිත භය අරවා මියුරු කථාකොට සැප සේ යැවූහ.[7] අහෝ, සත්පුරුෂයන්[8] හා එක්වීම නම් මෙලෝ පරලෝ දෙකින් ම සත්වයන්ට සැප එළවන්නේ මැයි.[9] එසේ හෙයින් පින්වත් සත්වයෙනි, තෙපි හැම ද එපරිද්දෙන් ම උභය සාධාරණ වූ කාරණාකාරණ දන්නා යහපත් අදහස් ඇති සත්පුරුෂයන් හා ම එක් ව කරුණාවෙන් වඩන ලද අදහස් ඇති ආත්මාර්ථ පරාර්ථ සාධක වූ සත්පුරුෂයන් හා ම යහළු මිත්‍ර ව වාසය කරව.[10] එබඳු සත්පුරුෂයන් හා සමඟ කරන ලද්දවූ මිත්‍රසන්ථවය හැම කල්හි ම උතුම් වෙයි. කිසි කලෙකත් ලාමක ක්‍රියාවට නොපමුණුවන්නේය. තව ද[11] සත්පුරුෂයන් හා එක්වීම නම් හැම

---

1. නොකිය - ABGH
   නොකියව - CFJ
2. ඔවුන්ගේ - ACDFJ
3. කිසිවකුත් - මුද්‍රිත හැම, ස.
4. ව්‍යාඝ්‍රතෙම - හ.කි.සැ.බෙ.
   ව්‍යාඝ්‍රයාණෝ - ම.
5. මෙන් - මුද්‍රිත හැම, ස.
6. ක්‍රොධ -ACFJ
7. යවූය - ක.ම.ස.
8. අසත්පුරුෂයන් - BGHKL
9. නොවෙයි - BGHKL
10. කරවූ - ක.ම.
11. තව ද අසත්පුරුෂයන් හා එක්වීම නම් අවැඩ කාරණ ය. - KL

Non-Commercial Distribution

කල්හි ම සත්වයන්ට සැප එළවයි. කායික චෛතසික දුක් දුරු කෙරෙයි. එබැවින් මේ ජාතියෙහි පටන් නිවන් දක්නා ජාති දක්වා සත්පුරුෂයන් හා එක් වීමෙක් ම වේවා. පුරාතනයෙහිදු කියනලද මැයි:

සබ්භිරෙව සමාසෙථ - සබ්භි කුබ්බෙථ සන්ථවං,
සබ්භත් සන්ථවො සෙන - සෙය්‍යො හොති න පාපියො.
සුඛාවහො දුක්ඛනුදෙ - සද සබ්භි සමාගමො,
තස්මා සප්පුරිසෙනෙව - සඞ්ගමො හොතු ජන්තුනං[1] යි.

ඉක්බිති ඒ ව්‍යාඝ්‍රයාණෝ එම මෛත්‍රියෙහි ආනුභාවයෙන් මැත භාගයෙහි ඒ තිරිසන් ආත්මභාවයෙන් මිදී දිව්‍යලොකයෙහි උපන්හ. මෙසේ අනුන් ඇඟ මස් කන ඉතා දරුණු වූ චණ්ඩ පරුෂ ව්‍යාඝ්‍රයා පවා තමාගේ මෛත්‍රීබලයෙන් දෙව්ලොව ඉපද මහත් වූ දිව්‍යසම්පත් ලද. එසේ හෙයින් පින්වත් වූ නුවණැති සත්වයෙනි, හීනොත්කෘෂ්ට මධ්‍යම යන හැම සත්වයන් කෙරෙහි මෛත්‍රී කරව. එපරිද්දෙන් ඒ මෛත්‍රී කිරීම වනාහි මතු තොප උපනුපන් ජාතියෙහි සියලු භවභොග සම්පත් සාධා දී අන්තයෙහි අජර වූ අමර වූ අත්‍යන්තිකර වූ නිර්වාණ සම්පත්තිය ද ගෙනහැර දෙන්නේ මැයි. එසේ හෙයින් කියන ලදී:

එවං විධොපි එරුසො පරමංස භොජී
ව්‍යග්ඝො දයායුපගතො සුගතිං සුමෙධො,
තස්මා කරොථ කරුණං සතතං ජනානං
තං වො දදති විභවඤ්ච භවෙසු භොගං - යි.

මෙතෙකින් මේ තුන්යහළු වග
දෙවන ව්‍යාඝ්‍ර වස්තුව
කියා නිමවන ලදී.

තව ද මේ තුන්යහළු වග තුන්වන එලක[බණ්ඩදින්න][2] වස්තුව නම් කවර යත්, හේ මෙසේ දතයුතු.

යටගිය දවස සැවැත් නුවර වසන එක්තරා පුරුෂයෙක් උත්තරාපථයට යෙමි යි අධන්මඟට පැමිණියේ ගිම්හාන මාසයන්[3] සම්බන්ධ වූ මධ්‍යාහ්න කාලයෙහි ගිනි හෙන්නා සේ ඉතා තද ව පහරන හිරුරැසින්[4] තැවී මිරිකුණාවූ ශරීර ඇති ව ඉතා විඩාපත් ව බුලත් කකා එක් සෙවනක පුවරුකඩක් පිට හුන්නේය. ඉක්බිති උත්තරාපථයෙහි සිට එන්නාවූ පුරුෂයෙක් ද, එපරිද්දෙන් ම අවුවෙන් විඩා ව අවුත් පළමු උන් මිනිසා සමීපයෙහි හිඳ "යහළු, පිපාසිතයෙමි. බීපියන්ට[5] පැන් ඇද්ද"යි විචාළේ ය. එතෙපුල් අසා පළමු එතැන උන් තැනැත්තවූ පැන් නැතැයි කී කල්හි පසුව ආ පුරුෂයා කියනුයේ "එසේ වීනම් යහළු පිපාස ඉවසිය නොහෙමි, තොප අතින් මටත් බුලත් දෙව"යි කියා ඉල්වීය. නොමිලයේ නොදෙන හෙයින් රන් සතර

1. ජන්තුනා - පිටපත් හැම.
ජන්තුනං - මුද්‍රිත හැම, පාලි.
2. එලක බණ්ඩදින්න - මුද්‍රිත හැම. ස. පාලි
එලක - පිටපත් හැම
3. මාසයක් -ක.ම.ස.
4. හිරුරැසින් - BCFGH, ම.ස.ක.
5. බී යන්ට - D
පියන්ට වී - ඛෙ.

Non-Commercial Distribution

මස්සක් දී එක ම උප්පතක් ඇරගෙන එතන ම හිඳ බුලත් කා මදක් සැතපී පිපාසා සන්හිඳුවාගෙන එපමණ උපකාරය[1] නිසා ඔහු කෙරෙහි සෙනහ උපදවා මිත්‍ර ව ගෙන "යහළු, අපි යම්හ" යි කියා අවසර ගෙන තමා යන ගමට ම ගියේය. පසුව කල් යාමකින් මෑත භාගයෙහි ඒ පුරුෂතෙම පටුන් ගමකට ගොස් වෙළෙඳම් පිණිස නැව් නැඟී යාත්‍රාවෙහි යන්නේ මුහුදු මැදට පැමිණියේය. එකල්හි ඔහු නැඟි නැව එයින් සත්වන දවස් මහ සුළං හමා රළ පැහැරීමෙන් බිඳිණ. සියලු මනුෂ්‍යයෝ ම මස් කැසුප් ආදීන්ට ගොදුරු වූහ. එකල ඒ පුරුෂයා පමණෙක් ම[2] කිසි උපද්‍රවයක් නැති ව එක් පුවරු කඩෙක ළය තබාගෙන මුහුද[3] පීනන්ට වන. එකල්හි ඕහට පළමු මිල ගෙන බුලත් දුන් පුරුෂයා ද එපරිද්දෙන් ම වෙළෙඳම් පිණිස නැව් නැඟී ගොස් මුහුද මැද නැව නැසුණු කල්හි තෙමේ පමණක් ගැළවී මුහුදු පීනනුයේ පළමු මුහුද පීනමින් යන තැනැත්තවූ සමීපයට පැමිණියේය. එකල්හි මෙසේ සත් දවසක් මුළුල්ලෙහි නිරාහාර ව මුහුදු පීනන්නාවූ ඔහු දෙදෙන ඔවුනොවුන් දක හැඳිනගත්හ. ඔවුන් දෙදෙනා අතුරෙන් කහවණු සතර දී උප්පන ගත් තැනැත්තේ එක් පුවරුකඩෙක ළය තබාගෙන පිහිනන්නේය. අනික් තැනැත්තවුට එපමණකුත් නැත. ඉක්බිති මිල දී බුලත් ගත් පුරුෂයා එකල්හි රන් ගෙන වී නමුත් බුලත් දුන්නාවූ උපකාරය ම සිහිකොට තමා ළය තබාගෙන යන පුවරුකඩ ඕහට දින. එකල්හි ඒ පුරුෂයා තමා ලත් පුවරුකඩෙහි[4] ළය තබා පීනාගෙන නික්මුණේ පුවරුකඩ දුන් පුරුෂයා හැර ආපසු නොබලා ම ගියේය. එවේලෙහි පුවරුකඩ දුන් තෙනැත්තේ[5] කිසි ආධාරයක් නැති ව පීනනුයේ සත් දවසක් මුළුල්ලෙහි නිරාහාර ව මුහුද පීනා විඩා වූ හෙයින් ශක්ති මඳ ව වීය්‍ය්‍ය හැර දියෙහි ගිලෙන්ට[6] පටන්ගත. එකෙණෙහි මුහුද අරග්ගත් මණිමෙඛලා නම් දිව්‍යස්ත්‍රියක් දියෙහි ගිලෙන්නාවූ[7] ඔහු දක" මේ පුරුෂයා එසේ මෙසේ කෙනෙක්[8] නොවෙයි. කෙළෙහි උපකාර දන්නා ඉතා සත්පුරුෂ මනුෂ්‍යයෙකැ යි දන ඔහුගේ ගුණ සඳහන් කෙරෙමින් දියෙහි හුණු පුතකු දක ළෙයි අත් ගසා මුර ගාමින් ඒ පුතු ගොඩ ලන්නට දිවනා[9] පෙම්බර මවක සේ වහා දිවගෙන අවුත් ඔහු තමාගේ ආනුභාවයෙන් දියෙන් ගොඩනහා සිටුවා අනික් පුරුෂයා ද ඔහුගේ ම ගුණානුභාවයෙන් මුහුදින් ගොඩලුව. එකල්හි පුවරුකඩ ළය තබා පීනා ගෙන පළමු ව ඇවිදිනුත් පසුව ගොඩනැගි තෙනැත්තේ තමහට පුවරුකඩ දී පස්සෙහි අවුත් පළමු කොට ගොඩනැඟී සිටි ඒ පුරුෂයා[10] දක මහත් වූ ආශ්චය්‍ය්‍යයට පැමිණ,

1. උපකාරයක් - BDEFGHK
   උපකාර - L
2. පමණෙක් මැ - A
   පමණෙක් මැයි - F
   පමණෙක් - BGHKL
   පමණක් ම - බෙ.ම.
   එපමණක් ම - ස
3. මුහුදු - මුද්‍රිත හැම.
4. පුවරුකඩ - BGHKL
5. තැනැත්තේ - ABCFCFGHKL, කි.ඤ.ක.ම.
6. ගැලෙන්ට - BGHKL
7. ගැලෙන්නාවූ -BGHKL
8. එකෙක් - BDEGHKL
9. දුවනා - මුද්‍රිත හැම.
10. ඒ පුරුෂයා - BDEGHKL

Non-Commercial Distribution

"යහළු, තෙපි කවර විටෙක කෙසේ මට පළමු වූ ද"යි[1] විචාළේය. එවේලෙහි එතෙම කියනුයේ "යහළු[2] මම කෙසේ ආ බවත් නොදනිමි. එතෙකුදු වුවත් සැප සේ ම ගොඩනැංගෙමි" යි කීය. මෙසේ ඔවුන් දෙදෙනා කථා කරන වේලෙහි දෙවතාදු තොමෝ දෘශ්‍යමාන රූපයෙන් සැදී පැහැදී ආකාශයෙහි සිට තමාගේ ආනුභාවයෙන් ඔහු ගෙනවුත් ගොඩ ලූ බව ප්‍රකාශ කොට දක්වන්නී මෙසේ කියා.[3]

යො මාතරං වා පිතරං වා - ධම්මෙන ඉධ පොසති,
රක්ඛන්ති තං සද දෙවා - සමුද්දෙ වා ථලේ'පි වා.

යො වෙ බුද්ධඤ්ච ධම්මඤ්ච - සඞ්ඝඤ්ච සරණං ගතො,
රක්ඛන්ති තං සද දෙවා - සමුද්දෙ වා ථලේ'පි වා.

පඤ්චවිධං අට්ඨවිධං - පාතිමොක්ඛඤ්ච සංවරං,
පාලෙති යො තං පාලෙන්ති - දෙවා සබ්බත්‍ථ සබ්බද

කායෙන වාචා මනසා - සොභනං[4] චරතී'ධ යො,
පාලෙන්ති තං සද දෙවා - සමුද්දෙ වා ථලෙපි වා.

යො සප්පුරිසධම්මෙසු - ඨිතො'ධ නතවෙදිකො,
පාලෙන්ති තං සද දෙවා - සමුද්දෙ වා ථලේ'පි වා

යනාදීන් "එම්බා පින්වත්නි, මේ ලෝකයෙහි යම් කිසිවෙක් තමා වැදූ මවුපියන්ට බත් පිළී ආදිය දෙමින් උණු පැන් සිහිල් පැන් තබමින් අත්පා මෙහෙ කෙරෙමින් දැහැමෙන් සෙමෙන් මවුපියන් පොෂ්‍යය කෙරේ ද, එසේ සත්පුරුෂධර්මයෙහි පිහිටියාවූ එබඳු උත්තම සත්වයා ඉදින් යම්කිසි කලෙක දිග සරස කෙළවරක් නොපෙන්නාවූ ගැඹුරු මහසයුරු මධ්‍යයෙහි ද ජනශූන්‍ය වූ යක්ෂාධිගෘහිත පර්වත වන ගහනාදියෙහි ද යි යන දියෙහි ගොඩෙහි හැම තැන්හි ම ඔහු දෙවියෝ රක්නාහ[5]. තව ද මේ ලෝකයෙහි යම් කිසිවෙක් බුත්සරණ යෙමි දහම්සරණ යෙමි සඟසරණ යෙමි යි මෙසේ තිසරණ ගෙන වෙසේ නම් එබඳු ගුණධර්මයෙහි පිහිටියාවූ ඔහු ද එකාන්තයෙන් හැමතැන්හි ම දෙවියෝ රක්නාහ. එසේ ම යම් කිසිවෙක් පඤ්චශීලය හෝ අෂ්ටාඞ්ගශීලය හෝ ප්‍රාතිමොක්ෂ සංවරශීලය හෝ ඛණ්ඩාදි භාවයට නොපමුණුවා නිරන්තරයෙන් තමාගේ ජීවිතය සේ සිතා රක්ෂා කෙරේ ද එබඳු ශීලසංරක්ෂණයෙහි නියුක්ත සත්වයා හැම කල්හි කිසි උපද්‍රවයක් වැද්ද නොදී සර්වප්‍රකාරයෙන් දෙවියෝ රක්නාහු මය. තව ද මේ ලෝකයෙහි යම්කිසි සත්වකෙනෙක් තමන්ගේ[6] කායවාක්මනඃ යන ද්වාරත්‍රයෙන් නිරන්තරයෙන් ම සුචරිත ධර්මයෙහි හැසිර වාසය කෙරේ ද එබඳු කුශලධර්මයෙහි පිහිටියාවූ සත්වයනුදු කවර ස්ථානයකට පැමිණිය ද ඒ හැම තැන්හි දෙවියෝ රන්නාහු මය. තව ද මේ ලෝකයෙහි යම්කිසි සත්වයෙක් කිසි තැනෙක ව්‍යසනප්‍රාප්ත සත්වකෙනකුන් දැක ඔවුන් එදුකින් මුද සුවපත් කිරීමෙන්

1. පළමුව අවුදයි - CD
   පළමුව ආදයි - B,කි.
   පළමු අවුදැයි - E,ම.
2. යහළුව -මුද්‍රිත හැම, ස.
3. කිය - KL
4. සුචරිතං - ක.ම.
5. රක්ෂා කරන්නාහ. - BD
6. තමාගේ - ABCGHKL

Non-Commercial Distribution

සත්පුරුෂ ධර්මයෙහි පිහිටියේ ද කෙළෙහි උපකාර දනී ද එබඳු උත්තම සත්වයා මහමුහුදු මැදට පැමිණියෙ ද පර්වත මුදුනකට පැමිණියේ ද වනගහනයට පැමිණිය ද දියෙහි ගොඩෙහි පර්වතස්ථානයෙහි හැම කල්හි දෙවියෝ රක්නාහ. එසේ හෙයින් මම ද තොපගේ සත්පුරුෂධර්ම බලයෙන් නැතිගෙන පළමු මා සිටි තැන්හි සිටපිය නොහී මෙතැන්හි දිව අවුත් අදෘශ්‍යමාන රූපයෙන් සිට මම වේ ද දූන් තොප ගොඩ ලූවෙමි" යි කීහ. මෙසේ මණිමෙඛලා දෙව්දූ කී කල්හි නැවත ඒ පුරුෂයා එම දෙව්දූ අතින් විචාරනුයේ:

නෙව දනං අදසාහං - න සීලං පරිපාලයිං,
කෙන මේ පුඤ්ඤකම්මෙන - මමං රක්ඛන්ති දෙවතා
පුච්ඡාමි සංසයං තුය්හං - තං මෙ අක්ඛාහි දෙවතෙ

යනු හෙයින් 'එම්බල[1] දේවතා දුව, මහණ බමුණු ආදි වූ කිසි කෙනකුන්ට මා දුන් දනයෙකුත් නැත තොප කී පන්සිල් අටසිල් ආදියෙන් මා රක්‍ෂා කළ ශීලයෙකුත් නැත; එසේ හෙයින් කවර කුශලකර්මයක් හේතුකොට ගෙන කෙසේ නම් මා දෙවියෝ රකිද් ද? ඒ තොප කී කාරණය මා සිතට සැක හෙයින් දූන් තොප අතින් ම විචාරමි. ඒ මට සකාරණ කොට උගන්නා පරිද්දෙන් ඉඳුරා කියා බලගැ' යි[2] කීය. එවේලෙහි ඔහු සිතට හැඟෙන පරිද්දෙන් ඒ බව ප්‍රකාශ කොට දක්වන්නාවූ දේවතා දූ තොමෝ:

අගාධා පාරගෙ භීමෙ - සාගරෙ දුරිතාකරෙ,
භින්නනාවො තරන්තො ත්වං - හදයෙ කත්වා කළිඩගරං.

ඨත්වා සප්පුරිසෙ ධම්මෙ - අත්තාන මනපෙක්ඛිය,
ඛණසත්තස්ස පොසස්ස - අදසි ඵලකං සකං.

තං තුය්හං මිත්තධම්මත්‍ථ - දනත්‍ථ ඵලකස්ස තෙ,
පතිට්ඨාසි සමුද්දස්මිං - එවං ජානාහි මාරිස

යනු හෙයින් "එම්බල පින්වත් වූ පුරුෂය, මේ දිග සරස කෙළවරක් නොපෙනෙන්නා වූ එතෙර මෙතෙර විය නොහැකි ඉතා භයංකර වූ ජලචර මකර සුංසුමාරාදී චණ්ඩ සත්වයන්ට වාසස්ථාන වූ මෙබඳු ගැඹුරු මහා සාගරමධ්‍යයෙහි නැව් (බිඳී)[3] දඬුකඩෙක ළය තබාගෙන පීනන්නාවූ තෙපි සත්පුරුෂ ධර්මයෙහි පිහිටා තොපගේ ජීවිතය නොසිතා මොහොතක් පමණ කල් එක නැනෙක පුවරුකඩ පිට හිඳ කථාකොට ගිය පමණ ඇසිල්ලකින් මිත්‍ර වූ ඒ පුරුෂයාහට එපමණ මිත්‍රසත්වයක් සලකා තොප ළය තබා පීනාගෙන යමින් සිටි යම්කිසි පුවරුකඩක් දුන්නාහු ද ඒ තොපගේ මිත්‍රධර්මය හා එදවස් දුන්නාවූ ඒ පුවරුකඩ දනය ද යන මේ දෙක මෙදවස් මේ සමුද්‍රමධ්‍යයෙහි තොපට පිහිට වීය. එබැවින් මාම[4] අවුත් දූන් තොප ගොඩලීමට කාරණ මෙසේ දනුව සත්පුරුෂයාණෙනි" යි කිව. මෙසේ ද කියා ඉක්බිති ඒ දෙවතාදූ තොම ඔහු දිවඅහර අනුභව කරවා දිවසළු හඳවා දිව්‍යාභරණ පළඳවා තමාගේ ආනුභාවයෙන් ඔවුන් දෙදෙනා ගෙනගොස් සැවත්නුවර ම සිටුවුව[5]. එතැන් පටන් ඔහු දෙදෙන ඒ ම කාරණ කොටගෙන ශක්ති පමණින් දන් දෙමින් නිරන්තරයෙන් පන්සිල් රැක පොහොය පෙහෙවස් රැක ආයු කෙළවර

1. එම්බා - බෙ. ස.
2. කියා බලාගයි - ACDFHK
   කියාලවයි - ක.කි.ස.
3. නැගී - හැම, භින්නනාවො - පාලි
4. මම - ක.ම.
5. සිටුවූහ - BCGHKL

Non-Commercial Distribution

දෙව්ලොව උපන්හ. මෙසේ ඉතා ස්වල්පමාත්‍ර වූ කුශලයෙන් පවා සත්වයෝ නිරාධාර වූ සාගරමධ්‍යයෙහි දෙවියන්ගෙන් පිහිට ලබන්නාහ. එසේ හෙයින් පින්වත් සත්වයෙනි, තොප හැම විසිනුදු සත්පුරුෂධර්මයෙහි පිහිටා අප්‍රමාද ව නිරන්තරයෙන් කුසල් කොට එයින් ජනිත වූ ඉෂ්ට විපාකයෙන් මතු ස්වර්ගමොක්ෂ සම්පත් සිධකරන්ට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි,

එවං පරිත්තකුසලෙනාපි සාගරස්මිං
සත්තා ලභන්ති සරණං බලු දෙවතාහි,
තුම්හෙපි සප්පුරිසනං න විනාසයන්තා
මා හො පමජ්ජථ සද කුසලප්පයොගෙ-යි.

මෙතෙකින් මේ තුන්යහළු වග
තුන්වන ඵලක[ඛණ්ඩ දින්න] වස්තුව[1]
කියා නිමවන ලදී.

නව ද මේ තුන්යහළු වග සතරවන චෞරමිත්‍ර[2] වස්තුව නම් කවර යත්:

අප මහා ගෞතම බුදුන් පිරිනිවි පසු දඹදිව දෙව්දහ[3] නම් නුවරෙක් විය. එහි වසන එක්තරා දුඃඛිත මනුෂ්‍යයෙක් පෙරිවාරි ව ගම් නියම්ගම් රාජධානි ආදී වූ ඒ ඒ තැන්හි ඇවිදුනේ ප්‍රත්‍යන්ත ජනපදයෙහි පිටිසර එක් ගමකට ගොස් එගම්හි එක්තරා කුලගෙයෙක වාසය කෙරෙයි. එකල්හි එහි[4] මනුෂ්‍යයෝ ඕහට කැඳ බත් ආදිය දෙමින් පොෂ්‍යය කරන්නාහ. ඉක්බිති ඒ පුරුෂතෙම එගම්හි මනුෂ්‍යයන් හා සමග යහළු මිත්‍ර ව ගෙන කල් යාමක් එහි ම දවස් යවා නැවත අනික් තෙනකට ගොස් වසනුයේ මැත භාගයෙහි ඒ ඒ තෙන සොරකම් කෙරෙමින් ජීවත් වෙයි. මෙසේ සොරකම් කිරීමෙන්[5] කල්යාමක් ගිය කල්හි එක් දවසෙක රාජපුරුෂයෝ ඔහු සොරකම් කරන්නා දක ගසා අල්වාගෙන පිටිතොල හයා බැඳ රජගෙය කරා ගෙන ගොස් "දේවයන් වහන්ස, මෙනුවර සොරකම් කරන සොරු හසු කළම්හ. දන් මෝහට කුමක් කළමනා දැ"යි කියා රජහට දක්වූහ.[6]

එනෙපුල් අසමින් ම රජ්ජුරුවෝ "ඔහු සිරගෙයි ලා කර පය මස්ව" යි[7] විධාන කළහ. එකල්හි රජුගෙන් නියෝග ලද්දවූ රාජපුරුෂයෝ ඔහු සිරගෙට ගෙනගොස් කර පය මසා සිර රක්නවුන්ට පාවා දී ගියහ. මෙසේ සිරගෙයි වසන්නාවූ ඕහට දෙළොස් අවුරුද්දක් ඉක්මිණ. ඉක්බිති ඕහට [පෙර[8]] යහළු වූ පසල්ගමෙක වසන එක් මනුෂ්‍යයෙක් කිසි කටයුත්තක් නිසා දෙවුදැ නුවරට අවුත් කොවේ මහවේ ආදියෙහි නොයෙක් විසිතුරු බලමින් ඒ ඒ තැන්හි ඇවිදුනේ සිරගෙයි මැස්මෙහි

1. ඵලක වස්තුව - පිටපත් හැම.
2. චොරමිත්‍ර - පිටපත් හැම.
3. දෙව්දහ - DEGH
දෙව්දහැ - B
දේහදහ - CFJ
දේහදෙහ - A
දෙව්ද - L
4. එහි වසන - මුද්‍රිත හැම, ස.
5. කෙරෙමින් - BGHK, කොට -L
6. දන්වූහ - ABCJ
7. මසව්යි - ABCEFGHL, ම.
8. පෙර (නැත) - පිටපත් හැම
පුබ්බසහායො - පාලි

Non-Commercial Distribution

උන්නාවූ ඔහු දක ළය පැළී යන තරම් මහත් ශොකයෙන් කම්පිත ව දැසින් වැහෙන කඳුළුධාරා නියඟින් ඉස ඉස "යහළු, මේ තොපට කෙසේ වූ දුකෙක් ද"යි කිය කියා මහහඬින් හඬා වැළප "යහළු, දන් මා තොපට කළමනා කවරේ ද" යි විචාරා ඉක්බිති ඔහු විසින් "එම්බා යහළු, සිරගෙයි වසන්නාවූ මට දන් දෙළොස් අවුරුද්දෙක් අතික්‍රාන්‍ත විය. මෙතුවක් කල් මුළුල්ලෙහි දුස්සයන දුබ්භොජනාදියෙන්[1] බොහෝ දුක් විඳිමි. එසේ හෙයින් මා ආහාරයක් සොයාගෙන බඩපුරා අනුභව කොටපියා එන පරිද්දෙන් මේ සිරගෙන් මිදී යන උපායක් සිතව" යි කී කල්හි ඒ සත්පුරුෂ වූ පුරුෂතෙම:

රූපෙන කිං තු ගුණ සීල විවජ්ජිතෙන
මිත්‍රා ලසස්ස කිතවස්ස ධියා කිමත්ථං
දානාදි චාගවිග්ගතෙන ධනෙන කිං වා
මිත්‍රෙන කිං ව්‍යසනකාල පරම්මුඛෙන.

යනු හෙයින් "මේ ලෝකයෙහි යම් කිසිවෙක්[2] අනඩගයා හා සමාන රූපසම්පත්තීන් යුක්ත වී නමුත් ආචාරශීලය ගුණධර්මය යන මෙයින් යුක්ත නුවූයේ වී නම් ඔහුගේ රූපයෙනුත් ප්‍රයෝජන කවරේ ද? තව ද යම් කිසිවෙක්[3] ග්‍රහතාරකාවන්ට ප්‍රධාන වූ බෘහස්පතී[4] හා සමාන මහත් වූ නුවණ ඇත්තේ වී නමුත් නොසබා තෙපුල් කියමින් අලසකාරී ව වෛරක්‍රියායෙහි යෙදී වාසය කෙරේ නම් ඔහුගේ ප්‍රඥාවෙනුත් ප්‍රයෝජන කවරේ ද? තව ද යම් කිසිවෙක් මහාමණ්ඩාතුය ජෝතිය සිටාණෝය යනාදී වූ මහ ඉසුරුමතුන් මෙන් බොහෝ වූ සියලු උපභොග පරිභොග වස්තුවෙන් යුක්ත වී නමුත් අනුන්ට කිසි වස්තුවක් නොදී මසුරු ව වෙසේ නම් ඔහුගේ වස්තුයෙනුත් ප්‍රයෝජන කවරේ ද? තව ද යම්කිසි මිත්‍රයෙක් තමාගේ යහළුවාට කිසියම් ආපදාවක් පැමිණි කල්හි නුදුටුවන් ව මුහුණ ඉවත් කොට පිටිපාලා[5] යේ නම් ඔහුගේ මිත්‍රකම්නුත් ප්‍රයෝජන කවරේ ද? එසේ හෙයින් දන් මා මෝහට අවශ්‍යයෙන් ම උපකාර විය යුතුය යි සිතා "යහපත යහළු, තොප කීවක් කෙරෙමි"යි කියා හිර රක්නවුන් සමීපයට ගොස් කියනුයේ "එම්බා පින්වත්නි, මොහු ආහාරයක් සොයා අනුභව කොට එන තෙක් මම ඇපයෙමි, මා රඳවාගෙන මොහු ඇරපියව" යි කී ය. එබසට සිර රක්නාහු "එම්බල පින්වත, මොහු එසේ ඇරපිය නොහැක්ක. එතෙකුදු වුවත් මොහු බත් අනුභව කොට එන තෙක් තෙපි එම දම් මැස්මේ ඉඳු නම් මොහු අරුම්හයි,[6] එසේ නොපිළිවන් වී නම් මොහු මැස්මෙන් අරින්ට නොපිළිවනැ" යි කීහ. එවේලෙහි ඒ පුරුෂතෙම "සබඳිනි, එසේ වී නමුත් යහපතැ"යි කියා ඔහු පයින් දම ගළවා තමා පය ලාගෙන සිරගෙට වැද තමාගේ මිත්‍රයා ගළවා යැවිය. එකල්හි

1. දුර්භොජනාදියෙන් - මුද්‍රිත හැම
2. යම්කිසි කෙනෙක් - ක.බෙ.ස.
3. කිසියම් සත්වයෙක් - ම.
   යම්කිසි කෙනෙක් - ක
4. බෘහස්පතිනු - BGHKL
5. පිටිපෑලා - ABCGHKL, ම.
   පිටිපෑ පලා - DEJ, ස.
6. ඇරපියම්හ යි - ක.කි.ඝ.

Non-Commercial Distribution

ඒ අසත්පුරුෂ[1] සඩ්ඛලික බන්ධනයෙන් මිදී නික්ම ගියේ නැවත සිරගෙය තරා නොආයේ මය. අහෝ, කෙළෙහි උපකාර නොදන්නා අසත් පුරුෂයන්ගේ චිත්තස්වභාවය දත්ම නොපිළිවන් මය. ඉතා ආශ්චර්ය්‍ය මැයි. හේ එසේ මය:

මුඳුනේ දිය පිරී සිටි විල් පොකුණු හෙප් ආදියෙහි දියයට සම්[2] විෂමස්ථාන යම් සේ නොපෙනේ ද එපරිද්දෙන් ම සිතින් එකක් සිතා මුඛයෙන් එකක් කියන අසත්පුරුෂයාගේ චිත්තප්‍රකෘතිය නොදත හැක්කේ මය. වඤ්චා සිත් ඇති අසත්පුරුෂයෝ සිතින් එකක් සිතා මුඛයෙන් එකක් කියා කයින් එකක් කරන්නාහු මය. මෙසේ මේ ක්‍රියාව අසත්පුරුෂයන්ගේ ස්වභාවධර්මයෙක් මය. එසේ හෙයින් මේ ලෝකයෙහි ඔවුන්ගේ ඒ වඤ්චකස්වභාවය[3] යම්කිසි කෙනෙක් දන්නාහු වී නම් පණ්ඩිත වූවාහු නමුත් ඔහු මය, බහුශ්‍රැත වූවාහු නමුත් ඔහු මය, පරසිත් දන්නාහු නමුත් ඔහු මය, එසේ හෙයින් කියන ලදී:

වාරිපූරෙ යථා සොබ්භෙ - නෙවඤ්ඤො විසමං සමං,
පඤ්ඤායතෙවං[4] සාධුස්ස - භාවං මනසි සම්භවං.

භාසන්ති මුඛතො එකං - චින්තෙන්ති මනසා’පරං,
කායෙනෙකං කරොන්තෙවං - පකතා’යමසාධුනං.

තෙසං යො භාවමඤ්ඤාති - සොව පණ්ඩිතජාතිකො,
බහුස්සුතො’පි සො යෙව - පරචිත්තවිදූ’පි සො - යි.

මෙසේ සිරගෙයි මැස්මේ හිඳිනාවූ ඕහට දෙළොස් අවුරුද්දෙක් අතික්‍රාන්ත විය. මෙසේ මේ දෙළොස් අවුරුද්ද මුළුල්ලෙහි සාදුකින් පීඩිත ව වසන ඔහු විසින් එක දවසෙකත් අනුන් අතින් ආහාරයක් නොඉල්වන ලද්දේ මය. නොඉඳුල් ආහාරයක් ලබන දවසට වඩා නොලබන දවස් ම බොහෝ විය[5]. මෙසේ දෙළොස් අවුරුද්දක් ගිය කල්හි දවසෙක රජ්පුරුවන්ගේ පුතණුකෙනෙක් උපන්හ. එකල රජ්පුරුවෝ තමන්ගේ විජිතයෙහි සියලු සිරගෙවල ම දෙර අරවාපිහ. යටත් පිරිසෙයින් වඩන ඌරන් මුවන් ආදී වූ සිවුපාවන්[6] හා මැඳිරියෙහි වසන ගිරා මොනර සැළලිහිණි ආදි වූ පක්ෂීන් පවා බන්ධනයෙන්[7] උනවාපූහ. එකල සිරගෙවල දෙර අළ[8] ඇසිල්ලෙහි එහි වසන මනුෂ්‍යයෝ ඔවුනොවුන් පරයා නික්ම තම තමන් කැමැති කැමැති අත ගියහ. එකල්හි ඒ පුරුෂයා ඔවුන් හා කැටි ව නොගොස් සිරගෙයි ම හුන්නේය. එපවත් දක සිර බලන්නවුන් විසින් "එම්බල පුරුෂය, තෙපි කුමක් පිණිස නොයා ද"යි විචාළ කල්හි "එම්බා පින්වත්නි, මම මෙතෙක් කල් මුළුල්ලෙහි කන බොන දෑ

1. අසත්පුරුෂ තෙමේ - B
අසත්පුරුෂ තෙම - GHKL ය.
අසත්පුරුෂයා - ක.කි.කැ.ම.
2. යම් - ABEFJKL
3. වංචනස්වභාවය - BGHKL
4. පඤ්ඤායතෙව - JKL
පඤ්ඤායතෙවං - ABCGH
5. බෝම ය - KL
6. සිවුපාවුන් - EFGH, ක.කි.කැ.ම.ය.
සිවුපාසතුන් - D
7. බන්ධනවලින් - ක.ම.
8. ඇරපූ- BGHKL

Non-Commercial Distribution

ආදියෙන් හා හිඳිනා සිටිනා වැදහෝනා තැන් ආදියෙන් බොහෝ දුක් විඳි හෙයින් ඉතා ම මිරිකුණාවූ දුර්වල ශරීර ඇතියෙමි. ඒ මාගේ දුර්වල ශරීරය බොහෝ දෙනාට ප්‍රකාශ ව පෙනෙන හෙයින් දහවල් යන්ට ලජ්ජා ඇත්තෙමි. රෑ වූ කල්හි පලායෙමි" යි කියා හිරුඅස්තයට යාමෙන් අන්ධකාර වූ කල්හි සිරගෙන් නික්ම ඇතුළු නුවර අඳුනන ඉත පුරුදු[1] නෑසිය කෙනකුන් නැති හෙයින් "කොයින් ආහාරයක් ලැබෙම් දෝ හෝ" යි සිත සිතා නුවරින් නික්ම සොහොන් බිමින් වී නමුත් ආහාරයක් ලදිම් නම් යහපතැයි සිතා ඝනාන්ධකාරයෙන් යුක්ත වූ රාත්‍රි භාගයෙහි මළ මිනී දමන අමුසොහොනකට ගොසින් වැද එතැන්හි අලුත දමූ මළ මිනියක් දැක මිනී ඇටයකින් මස් කපා අනික් මිනී හිස්කබලෙක කපාගත් මාංසය බහා මිනී හිස් තුනකින් උදුනක් බැඳ ඒ උදුන මුදුනෙහි මාංස සහිත වූ මිනී හිස්කබල තබා සොහොන් තිවන්නට ගෙනා පැනින් ඉතිරි ව තුබු පැනිත්තක් වත්කොට දර සෑයකින් සොහොන් පෙනෙලි ගෙනවුත් ගිනි දල්වා කොළ අතු කඩා හැඳ[2] වටින් සුළං හොගසන සේ පළමු තමා හැඳි[3] කිලුටු කඩරෙද්ද වට කොට බැඳ මිනී ඇටයක් ගෙන අළල අළලා මස් පිසමින් හුන්නේය. එකෙණෙහි එම අමුසොහොන අසල පුළිල ගසෙක අධිගෘහිත වූ දෙවතාවෙක් ඔහුගේ ඒ ක්‍රියාව දැක "දන් මා මොහු අතින් මේ කාරණය විචාළ මැනවැ" යි සිතා ඔහු කරා එළඹ විචාරනුයේ "එම්බල පින්වත් පුරුෂය, දන් තෝ ඉතා ඝනාන්ධකාරයෙන් යුක්ත වූ මෙබඳු මේ රාත්‍රියෙහි ඒ ඒ තැන විසිර තිබෙන මිනී ඇටසැකිල්ලෙන් ගැවසී ගත්තාවූ බලු කැණහිල් ආදීන්ගෙන්[4] හා මනුෂ්‍යමාංස භක්ෂණයෙහි දක්ෂ වූ යක්ෂ රාක්ෂසාදීන් විසින්[5] ගහන වූ ඒ ඒ තැන්හි මිනී දවන දරසෑවල දිලිහෙන ගිනිදලින් භයානක වූ මේ සොහොන් මධ්‍යයෙහි ඉඳ මිනීමස් පිස කුමක් කෙරෙහි ද" යි විචාරන්නාවූ දිව්‍යපුත්‍රතෙම:

රත්තන්ධකාරෙ කුණපාදකෙහි
සමාකුලෙ සීවථිකාය මජ්ඣෙ,
මනුස්සමංසං පචසීධ සීසෙ
වදෙහි කිං තෙන පයොජනං තෙ.

යනු හෙයින් "එම්බල පුරුෂය, ඝනාන්ධකාරයෙන් යුක්ත වූ මධ්‍යම රාත්‍රියෙහි මනුෂ්‍යකුණපයෙහි ගිජු වූ බලු කැණහිල් කබරගෝ ආදීන් හා යක් රකුසු ආදීන් විසින් ගැවසී ගත්තාවූ මේ සොහොන් මධ්‍යයෙහි හිඳ තෝ දන් මිනී හිස්කබලින් මස් පිසන්නෙහි. ඒ මාංසයෙන් තට ප්‍රයෝජන කවරේ ද" යි විචාළේය. එකල්හි ඒ පුරුෂයා කියනුයේ:

න යාගහෙතු නච දනහෙතු
සුසාන මජ්ඣමහි පචාමි මංසං,
ඛුද සමො නත්ථි නරස්ස අඤ්ඤං
ඛුද විනාසාය ඉමං පචං හො[6].

---

1. ඉතා පුරුදු - ADJ, මුද්‍රිත හැම ස.
2. ඇඳ - BDGHKL
3. ඇඳි - BGHKL
4. ආදීන් - ක.ම.ස.
5. විසින් (නැත) - BGHL
රාක්ෂසාදීන්ගෙන් - K
6. ඉමං පචං හො - පිටපත් හැම
පචාමි මංහො - ක.කැ.බෙ.ම. පාලි
පචාමි මංසො - කි.
පචාමි මංසං - ස.

Non-Commercial Distribution

යනාදීන් "එම්බල දිව්‍යපුත්‍රය, මේ මාංසය සොහොත් මැද ඉඳ පිසන්නාවූ මම යම්කිසි යාගයක් පිණිස පිසන්නෙමුත් නොවෙයි[1]. අන්[2] කිසි ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනකුන් උදෙසා දියයුතු දනයක්[3] පිණිස පිසන්නෙමුත් නොවෙයි.[1] වැළි[4] කුමක් පිණිස ද යත්? මේ ලොකයෙහි සත්වයන්ට සාදුකට වඩනා දුකෙක් නම් නැත් ම ය, එසේ හෙයින් මාගේ බඩසායට ප්‍රතිකාර පිණිස හෙවත් සාදුක් නසනු සඳහා මේ මාංසය පිසෙමි" යි කීය. එතෙපුල් අසා දිව්‍යපුත්‍ර[5] කියනුයේ "එම්බල පින්වත, ඒ මාංසය වනාහි අනුභව කරනු පිණිස පිසව. මේ කිලුටු කඩරෙද්ද දත් වට ඇඳ බැඳ වාත නිවාරණය කරව. ඒ කුමක් පිණිස ද" යි විචාරනුයේ:

නිවත්ථසාඛො හිරිසංවරාය
පිලොතිකං තත්ථ පසාරයන්තො,
කාරෙසි වාතාවරණං ච සම්ම
කිමත්ථමෙතං වද පුච්ඡිතො මෙ

යනාදීන් "එම්බල යහළු, තෙපි දත් හිරි සංවරණය පිණිස කොළ අතු ගොතා හැඳගෙන පළමු හැදි කිලුටු කඩරෙද්ද වටා බඳිමින් වටින් එන පවන් වළකා වාතනිවාරණය කරව. ඊට කාරණ තොප අතින් විචාරමි. ඒ මට[6] නොවළහා කියව" යි කීය. එකල්හි ඊට කාරණ කියා ප්‍රකාශ කොට දක්වන්නාවූ පුරුෂතෙම:

සුහාසුහාමිස්සිනසීතවාතො
පයං අචිතෙතාව අචිත්තභාවා,
දෙහං ඵුසිත්වාන අසාධුකස්ස
අකතඤ්ඤුනො මිත්තපධංසකස්ස.

සමාවහන්තො යදි මෙ සරීරෙ
ඵුසාති සා සංහතිමජ්ජ දනි,[7]
දුක්ඛං දදතීති විසංවනමෙහා
පරිවජ්ජිතුං බධම්මං කුචෙලං.

යනාදීන් "එම්බල පින්වත් දිව්‍යපුත්‍රය, සැබවින් ම මීට කාරණ අසනු කැමැත්තෙහි වී නම් මා කියන්නක් අස.[8] මේ ලොකයෙහි ඉෂ්ටානිෂ්ට දෙකින් මිශ්‍ර ව හමා බස්නාවූ සීත මාරුතය[9] තෙමේ තමා අචිත්තක හෙයින් සිත් පිත් නැත්තේ ම කෙළෙහි උපකාර නොදන්නා මිත්‍රද්‍රොහී වූ අසත්පුරුෂයාගේ ශරීරයෙහි පැහැර දුර්ජන සජ්ජන දෙපක්ෂයට සම ව පවත්නේ හෙවත් අසත්පුරුෂයාගේ ශරීරයෙහි පැහැර එන්නාවූ මාරුතය ඉදින් මාගේ ශරීරයෙහි පහරනේ වී නම් ඒ ළාමක සත්වයාගේ ශරීරයෙහි පැහැර එන්නාවූ මාරුතය මාගේ ශරීරාවෙශ ව කාය චිත්ත දෙකට දුක් දේ දේහෝ

1. නොවෙමි - BGHK, ම.ස.
2. යම් - මුද්‍රිත හැම, ස.
3. දන වස්තුවක් - BGHKL
4. යළි - BGHKL
5. දිව්‍යපුත්‍රයා - BCGHKL, ම.ස.
6. මට ඒ - CDEJ
7. ඵුසාති තං වායු මොවිසින්වා - පාලි.ක.කි.සැ.ම.
8. අසව - BCGHKL
9. මාරුත - BGHKL

Non-Commercial Distribution

යි සිතා ඒ අසත්පුරුෂයාගේ ශරීරයෙහි වැදගෙන එන්නාවූ සුළං පවා ඒක්ෂණයෙහි ජීවිතහරණය කරන උග්‍රතරද[1] විෂයක් මෙන් සිතා දුරු කරනු පිණිස මේ කිලුටු කඩරෙද්ද තිරයක් මෙන් වටකොට එල්වීමි" යි කීය. මෙසේ ඔහු කී තෙපුල් අසා "අසත්පුරුෂයා තොපට කවර අනර්ථයක් කෙළේ ද" යි විචාරන්නාවූ දිව්‍යපුත්‍රතෙම:

කිමකාසි භො සො කතනාසකො තෙ
ධනං ච ධඤ්ඤං තව නාසයී නු,[2]
මාතා පිතා බන්ධවො ඛෙත්තවත්ථූ
විනාසිතා තෙන වදෙහි කිං තෙ

යනු හෙයින් "එම්බල පුරුෂය, හැයි ඒ අසත්පුරුෂයා විසින් තට කළ අනර්ථ කවරේ ද? [තාගේ ධන ධාන්‍යයන් නැසී ද? මවුපිය නෑයන් හා කෙත් වත් විනාස කෙළේ ද?][3] ඒ දන් මා සිතට දනෙන පරිද්දෙන් ඉඳුරා කියා බලගැ" යි[4] කීය. එතෙපුල් අසා අසත්පුරුෂයාගේ නුගුණ ප්‍රකාශකොට දක්වන්නාවූ පුරුෂතෙම:

යං රාජතො හොති භයං මහන්තං[5]
සබ්බස්ස හරණාදි වධාදිකං ච,
අකතඤ්ඤුනා 'සප්පුරිසෙන හොති
ආරාච සො භො පරිවජ්ජනීයො.

යමප්පි චොරාරිභයං හි ලොකෙ
අථොදකෙනාපි ච පාවකෙන,
අකතඤ්ඤුනා තං කලහං හි හොති
ආරාච සො භො පරිවජ්ජනීයො[6].

පාණාතිපාතම්පි අදින්නදානං
පරස්ස දාරූපගමං මුසා ච,
මජ්ජස්ස පානං කලහං ච පෙසුනං
සම්ඵං ගිරං ධුත්තජනෙහි යොගං.

සබ්බං අනත්ථං අසිවං අනිට්ඨං
ආපායිකං දුක්ඛමනන්තමඤ්ඤං
අකතඤ්ඤුනා 'සප්පුරිසෙන හොති
ආරාච සො භො පරිවජ්ජනීයො.

යනාදින් "මේ ලොකයෙහි සත්වයන්ගේ මුතු මැණික් ආදී වූ දශවිධ රත්නයන් හා සෙසු සම්පත්ති සමූහයන් පැහැරගැන්ම ය වධබන්ධන කිරීමය යනාදි වසයෙන්

---

1. උග්‍රතර - මුද්‍රිත හැම
2. නාසයී නො - BEFGH
   නාසයී ච - පාලි, ච ක කි.සැ.ම.
   නාසයීච - ස.
3. වරහන් තුළ කොටස පිටපත්හි නැත.
4. බලවයි - ම.: බලාවයි - ක.
5. මහන්තං - පිටපත් හැම.
6. පරිවජ්ජනෙයො - GH

Non-Commercial Distribution

රජ යුවරජ ආදීන් නිසා[1] වන්නාවූ යම් භයෙක් ඇත්නම් එසියල්ල ම කෘතොපකාර නොදන්නා අසත්පුරුෂයා නිසා ම වන්නේය. එසේ හෙයින් ඒ අසත්පුරුෂයා අහසට පොළොව සේ දුරින් ම දුරු කටයුත්තේය. තව ද මේ ලෝකයෙහි සොරුන් සතුරන් නිසා වන්නාවූ භය ද දියෙන් ගින්නෙන් වන්නාවූ භය ද යන යම්[2] කිසි භයෙක් ඇත් නම් එසියල්ල ද කෙළෙහි උපකාර නොදන්නා අසත්පුරුෂයා හා කලහ විග්‍රහාදියෙන් ම වන්නේය. තව ද ප්‍රාණවධ කිරීම ය අනුන් සන්තක වස්තු උදුරා ගැන්මය අනුන් විසින් ප්‍රෙම සහිත ව රක්ෂිත පොෂිත[3] වූ පරදරාවන් කරා යාමය අනුන්ට අනර්ථ එළවන්නාවූ නොසබා තෙපුල් කීමය රා පීමය ඉසකේ එකුරුතු ගෙන කළහ විග්‍රහ කිරීමය කේලාම් කියා ඔවුනොවුන් කෙරෙහි බිඳවීමය මෙරමාහට ද තමහට ද කිසි වැඩක් ප්‍රයෝජනයක් නැති සම්ඵප්‍රලාප දෙඩීමය අත පය කන් නාසා ආදියට උකස් තබා දූකෙළි ආදියෙහි යෙදී වාසය කිරීමය යනාදී වූ සියලු අනර්ථදායක වූ අමනොඥ වූ ඉෂ්ට විපාකයක් නැත්තාවූ මතු සතර අපායට පමුණුවන්නාවූ ඉතා ඉවසිය නොහැකි[4] කෙළවරක් දක්ක නොහැක්කාවූ මෙයින් අන්‍ය වූත් යම් කිසි දුඃඛයෙක් ඇද් ද ඒ සියල්ල ම කෙළෙහි උපකාර නොදන්නා මිත්‍රද්‍රොහි වූ අසත්පුරුෂයා නිසා ම වන්නේය. එසේ හෙයින් එම්බල දිව්‍යපුත්‍රය, සත්පුරුෂයන් විසින් එබඳු ඒ අසත්පුරුෂයා දුරින් ම දුරු කටයුත්තේය' යි කියා පළමු තමා අසත්පුරුෂයා හා එක් වූ දෙෂයෙන් දෙලොස් අවුරුද්දක් මුළුල්ලෙහි අනුභව කළාවූ ඒ සියලු දුඃඛරාශිය තමා මුඛ නොසෑහෙන සේ ඒ දිව්‍යපුත්‍රයාට කීය. ඉක්බිති ඒ දිව්‍යපුත්‍රයා කියනුයේ 'එම්බල පින්වත් පුරුෂය, මම ද වනාහි බුදුන් මඩගලසූත්‍රය දෙසන දවස් මෙම පුළිල වෘක්ෂයෙහි හුන්නෙමි:

> අසෙවනා ච බාලානං - පණ්ඩිතානං ච සෙවනා,
> පූජා ච පූජනියානං - එතං මඩගල මුත්තමං.

යන මේ ගාථාවෙන් අඟන අසත්පුරුෂයන් හා එක්වීමෙහි ආදීනව දෙෂයන් විශේෂයෙන් ඇසුයෙමි වේ ද"යි කියා ඒ පුරුෂයා කෙරෙහි අතිශයින් ප්‍රසන්න වූයේ ඔහු තමාගේ විමානයට කැඳවාගෙන අවුත් යුවඳ පැතින් ඉජ් ශොධා නාවා දිව්‍යවස්ත්‍ර දිව්‍යාභරණයෙන් සරසා දිවමල් පළඳවා දිව්‍ය වූ අන්නපානයන් අනුභව කරවා මහත් වූ සත්කාර සම්මාන කොට තමාගේ ම ආනුභාවයෙන් එම දෙව්දෑ නුවර රාජ්‍යසම්පත්තියෙහි පිහිටුවා අභිෂෙක මඟුල් කරවීය. එතෙම මෙසේ රාජ්‍යයට පැමිණ එතැන් පටන් දැහැමින් රාජ්‍යය කෙරෙමින් දන ශීලාදී වූ බොහෝ කුශලසම්භාරයන් රැස්කොට ජීවිතාවසානයෙහි තමාගේ කර්ම වූ පරිද්දෙන් පරලෝකප්‍රාප්ත විය. එසේ හෙයින් එම්බා පින්වත් වූ සත්වයෙනි, මේ යථොක්ත ප්‍රකාරයෙන් අසත්පුරුෂයන් හා සංසර්ගය හැර අතිශයින් නිර්මල වූ චිත්තසන්තාන

1. විසින් - මුද්‍රිත හැම.
2. ඓ - F ,ක.කි.කැ.ම
3. ගොපිත - ක.කි.කැ.ම.
4. නොහැකි වූ - ක.ම.ස.

Non-Commercial Distribution

ඇති සත්පුරුෂයන් හා එක් ව දන ශීලාදි වූ කුශලසමහාරයන් රැස්කොට මතු ස්වර්ග මොක්ෂ සම්පත්ති සඞ්ඛ්‍යාත අභිමතාර්ථය සිද්ධකරන්නට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි:

එවං අසාධුජනසඞ්ගමසන්නිවාසං
සඞ්වජ්ජ[1] සාධු සුචි සජ්ජනසඞ්ගමෙන,
දානාදි නෙක කුසලං පරිපූරයන්තා
සග්ගාපවග්ග විභවං අභිසමනුභොථ - යි[2]

මෙතෙකින් මේ තුන්යහළු වග
සතරවන [චෞර][3]මිත්‍ර වස්තුව
කියා නිමවන ලදී.

තව ද මෙහි තුන්යහළු වග පස්වන පානීය වස්තුව නම් කවර යත්,

යටගිය දවස දඹදිව මහීමණ්ඩල නම්[4] දනවුවෙහි නාමගොත්‍රයෙන් අප්‍රසිද්ධ වූ එක්තරා පුරුෂයෙක් දෙශ චාරිත්‍ර පරීක්‍ෂා කරනු පිණිස දෙ හෝ රටින් රට ජනපදයෙන් ජනපදයෙහි ගම් නියම්ගම් රාජධානි පිළිවෙළින් දනවු සැරිසරා ඇවිද අනුක්‍රමයෙන් අවුත් චන්ද්‍රභාගා[5] නම් ගංතෙරට පැමිණ බොහෝ මිනිසුන් හා සමඟ නැවූ නැඟී එතෙරට නික්මිණ. එකල දරි ඇති ගැහැණියක් ද එම නැවට නැංගාය.[6] මෙසේ ඔවුන් නැඟී යන නැව ගංමැදට ගිය කල්හි ඒ ස්ත්‍රියට[7] පිට පිට විළි පහරනට පටන්ගත. එකල ඒ දරි[8] දරුවන් වදගත නොහී මහදුක් ගන්නී පිපාසිත ව පැන්පවස් ඉවසිය නොහී "පින්වත්නි, පිපාසිතයෙමි. වහා මට පැනක් දෙව" යි කිව[9]. එකල්හි නැව නුන් මිනුෂ්‍යයෝ එබස් නොඇසුවා සේ ඉවත බල බලා ඔවුනොවුන් හා ම[10] කථා ම කරන්නාහ. පිපාසයට බීපියන පැනක් දුන්නාවූ එක ද මිනුෂ්‍යයෙක් නැත. එවේලෙහි යට කියනලද දනවුවැසි පුරුෂයා ගැහැණියගේ බැගෑපත් වූ ඒ වචනය අසා එකෙණෙහි උපන්නාවූ මහත් කරුණා ඇති ව පැන් ගෙනවුත් පොවා මුහුණට පැන් ගැසීය.[11] එකෙණෙහි ස්ත්‍රී නොමෝ මහත් වූ ආසවාද ලදින් සැප සේ දරුකෙනකුන් වදපුව. ඉක්බිති ඔහු දෙදෙන නැවින් ගොස් ගොඩබැස කීප දවසකින් තම තමන් යන වාසස්ථානවලට ම ගියහ. එයින් මෑතභාගයෙහි දනවුවැසි පුරුෂයා කිසි කටයුත්තක් නිසා එම ස්ත්‍රිය හිඳිනා නුවරට ගොසින් නවාතැනක් සොයා ඒ ඒ තැන්හි ඇවිද ඨ දවස් ලැග පියන තෙනක් ලැබගත නොහී නුවර වහසල් දෙර සමීපයෙහි[12] ශාලාවකට ගොස් රාත්‍රිභාගයෙහි උදකලා ව එම ශාලාවේ වැද හොත්තේය.

1. සංත්‍යජ්ජ - KL
2. අභිසම්පූණාථ - GH
3. චොර - පිටපත් හැම
4. මණ්ඩල නම් - ක.කි.කු. ම.
5. චන්ද්‍රභාග - AJ
චන්ද්‍රභාරා - GH
6. නැංගාය - BGHKL
නැඟිය - ACDEJ
7. ස්ත්‍රියට - පිටපත් හැම.
ස්ත්‍රිය - මුද්‍රිත හැම, ස.
8. දරි - ක.ම.ස.
9. දෙවයි කීය. - BGH, ක. කි.කු. දෙයි කිව -L
10. ඔවුන් හා සමග - ACDBFJ, මුද්‍රිත හැම.
11. ඉසීය - ක.කි.කු.
12. සමීපයෙහි - BHJ

Non-Commercial Distribution

එම දවස් සොරහු නුවර වැද රජගෙයි උමං බිඳ මුතු මැණික් ආදි වූ බොහෝ සාරවස්තු ඇරගෙන උමඟින් පිටත් ව දිවන්නාහු රාජපුරුෂයන් විසින් លුහුබඳවනා[1] ලදු ව මරණභයින් භයපත් ව සම්පත් තබා විපත්තියෙක් වී නම් නපුරැයි සිතා තමන් ගෙනයන රාජවස්තුව රාජපුරුෂයන් එන පෙරමඟ එම ශාලාවට දමා ගියහ. එකල සොරුන් ලුහුබඳවා ගිය රාජපුරුෂයෝ එතැන්හී තුබූ රාජවස්තුව දැක "සොරු කොයි ගියෝ දෝ හෝ"යි පරීක්ෂාකරන්නාහු ශාලාවේ හොත්තාවූ ඒ දනවුවැසි පුරුෂයා දැක "කොල, මේ සොරා[2] නොවේ ද" යි කියා ඔහු අල්වාගෙන පිටිතොල හයා බැඳ රාජවස්තුව හා සමඟ ඔහු රජගෙට ගෙනගොස් දෙවන දවස් "සොරුන් අල්වා ගෙනාම්හ"යි රජ්ජුරුවන්ට දැක්වූහ. එකල රජ්ජුරුවෝ ඔහු දැක "කිමෙක් ද කොල, මෙසේ ම නිර්භීත ව මාගේ රජගෙයි උමං බිඳ කුමක් පිණිස සොරකම් කෙළෙහි දැ"යි විචාළහ. එබසට දනවුවැසි පුරුෂයා කියනුයේ "ස්වාමීනි, මම සොරෙක් නොවෙමි. මේ නුවරට ආගන්තුක ව ආ මිනිසෙකිමි.[3] ඊය්යේ දවස් මේ නුවර නවාතැනක් නොලැබුණ හෙයින් තෙල වහසල්දෙර සමීපයෙහි ශාලාවේ හොත්තෙමි. මෙපමණක් මිස අනික් මා කළ සොරකමෙක් නැතැ"යි කීය. එවේලෙහි රජ්ජුරුවෝ නැවත සොරුන් පරීක්ෂා කරවා නොදක්නාහු "සොරා නම් මේ මය"යි[4] සිතී "මතු මොහු බලා 'අනිකකු සොරකම් නොකරන පරිද්දෙන් දැන් ම මොහු ගෙන ගොස් මරාදමව"යි විධාන කළහ. එකල රජහුගෙන් නියෝග ලත් රාජපුරුෂයෝ ඔහු නැවත පිටිතොල හයා බැඳ නොයෙක් වධ කෙරෙමින් මරන්නට ගෙන නික්මුණාහ[5].

එකල්හි යට කියනලද ඒ ස්ත්‍රීතොමෝ ඒ කොලාහලය අසා දෝ හෝ තමා හිඳිනා ගෙන් පිටත් ව සිටියා එපරිද්දෙන් මරන්නට ගෙනයන්නාවූ ඔහු දැක හැඳිනගෙන පළමු ඔහු තමහට කළ උපකාරය සිහි කොට මහත් වූ ළපිරුණු[6] සොක ඇති ව[7] "දැන් මා මෝහට අවශ්‍යයෙන් ම උපකාරී ව ජීවිතය රැකදුන මැනවැ"යි සිතා එම ඇසිල්ලෙහි රජගෙට දිවගෙන ගොස් රජ්ජුරුවන් දැක බැස හෙව දණ්ඩනමස්කාරයෙන් වැඳ නැඟී සිට රජහට කියන්නී "ස්වාමීනි, තෙල මරන්නට ගෙනයන පුරුෂයා සොරකමක් කරන මිනිසෙක් නොවෙයි. අලුත ආගන්තුක ව ආ මිනිසෙක. ඉතුත් ඉතා නිරපරාධ[8] වූ මහත් සත්පුරුෂයෙක. ඔහු නොමරා[9] හරවාපුව මැනවැ"යි කිව. රජ්ජුරුවෝ එතෙපුල් නොඅදහා කියන්නාහු "එම්බල කෙල්ල, තෝ ඉදින් සැබවින් ම ඔහු අරවනු කැමැත්තෙහි[10] නම් ඒ පුරුෂයා අගනා වස්තුවක් දී අරවාගනැ"යි කීහ. එකල ඒ ස්ත්‍රී කියන්නී "සවාමිනි, මගේ එබඳු වස්තුවක් නැත. එතෙකුදු වුවත් මාගේ දරුවෝ සත්දෙනෙක් ඇත. ඒ දරුවන් සත්දෙනා හා සමඟ මා ගැතිකොටගෙන ඔහු අරවා වදළ මැනවැ"යි කිව. එබසට රජ්ජුරුවෝ කියන්නාහු "එම්බල, තෝ කුමක් කියයි ද? තෝ[11] ම දැන් ඒ පුරුෂයා මෙනුවරට ආගන්තුක ව ආ මිනිසෙකැයි කිව. නැවත දැන් ඔහු නිසා දරුසත්දෙනකු හා සමඟ වහල් වෙමි යි කියයි. කිමෙක් ද මේ පුරුෂයා තිගේ නෑ එකෙක් ද නොහොත් තිට පළමු උපකාරයක් කෙළේ දැ යි විචාරන්නාහු:

1. ලුහුබඳවන - AD., ස.
   ලුහුබඳවනු - B
   ලුහුබඳනා - මුද්‍රිත හැම.
2. සොරු - GHKL
3. මිනිසෙක්මි - C, ක.කි.හැ.ම.ස.
4. මොහුමය - C
5. ගියහ - ක.කි.හැ.ම.
6. ළය පිරුණු - ABCGH, ක.කි.හැ.ම.
7. ශොකයෙන් - KL
8. නිරපරාධි - BDGHKL, ම.ස.
9. නොමරවා - BCEFGKL
10. කැමැත්ත - GHKL
    කැමැත්තෙක් වී - F, ක.කි.හැ.ම.
11. තී - ක.කි.හැ.

Non-Commercial Distribution

කිං තෙ හොති අයං පුරිසො - තුවං පුච්ඡාමි සංස මෙ[1]
භාතා වා තෙ පිතා හොති - පති වා දෙවරො තව.
ඤාති සාලොහිතො[2] කින්නු - උදාහු ඉණ දායකො,
අථොපකාරකො කිංනු කස්මාස්ස දෙහි[3] ජීවිතං

යනාදීන් "එම්බල ස්ත්‍රිය, තී කියන වචනයෙන් මා සිතට සැකයක් උපන, එසේ හෙයින් ඒ සැකය තී අතින් ම විචාරමි, ඒ මට ඉඳුරා නොවළහා කිය[4]. මේ පුරුෂයා තිට කුමක් වේ ද? තිගේ මලෙක් බෑයෙක් ද නොහොත් කුඩා පියෙක් ද මහලු පියෙක් ද? එසේ නැත පළමු තී පිසවා කෑ සැමියෙක් ද සුළු ගෙයියෙක් ද? සෙසු අවශෙෂ නෑයන් අතුරෙන් එක්තරා එකෙක් ද එසේ නැත කුසෙයි හොත් සාලොහිතයෙක් ද? නොහොත් තීගේ[5] ණයක් ධරන එකෙක් ද නොහොත් තිට පළමු උපකාරයක් කළ පුරුෂයෙක් ද කවර කාරණයක් සිතා කුමක් පිණිස මොහු නිසා දරු සත්දෙනකුන්[6] හා සමඟ වහල් ව ජීවිතය රැකදෙයි ද"යි විචාළහ. මෙසේ රජ්ජුරුවන්[7] විචාළ කල්හි ඕහු පළමු තමාට කළාවූ උපකාරය ප්‍රකාශ කොට දක්වන්නාවූ ස්ත්‍රී තොම,[8]

එසො [මෙ] පුරිසො දෙව - කතපුබ්බොපකාරකො,
අත්තාණමෙකිකං[9] මං සො - දුක්ඛිතං මරණෙ ඨිතං.
විජායිතු මසකෙකානතිං - ගබ්භිතිං තිබ්බවෙදතිං
නොයෙන මං උපට්ඨාසි - තෙනාහං සුඛිතා තද.
තුඩග[10] කලෙලාලමාලාහි - උත්තරන්තං මහණ්ණවං,
පහාය පාතුං කූපස්ස - යාති ලොකො පිපාසිතො.
තථෙව විජ්ජමානෙසු - ජනෙසු මනුජාධිප,
එකසෙසව මනස්මිං සො[11] - ගුණෙො තිට්ඨති සාධුකො[12]

යනු හෙයින් "ස්වාමීනි, මේ පුරුෂයා පළමු මට බොහෝ උපකාර ව සිටියේය. කලෙක මා දැරි ඇති ව දරුගැබ උසුළා කිසි කටයුත්තක් පිණිස නැවු නැඟී චන්‍ද්‍රභාගා නම් ගංගාවෙන් මෙතෙර එන අවස්ථාවෙහි ගං මැදදී ම විළි පැහැර දරුවන් වදගත නොහී කිසි ආරක්ෂාවක්[13] වෙවයි පිළිසරණක් [වෙවයි][14] නැති ව මහත් වූ දුඃඛයට පැමිණ අපමණ වැසන විඳීමෙන්[15] මරණප්‍රාප්තවූ මා දක මේ පුරුෂයා පැන් ගෙනවුත් පෙවීය. එකල පැන් බී සුවපත් වූවා වූ මම සැප සේ දරුවන් වදපිමි. එසේ හෙයින් මේ පුරුෂයා මට එකල්හි බොහෝ උපකාර ව සිටියේය. මනුෂ්‍යයෝ නම් සියල්ලෝ ම ගුණ ඇත්තාහු නොවෙති. යම් සේ ලීලොවෙන ව

1. සංසයං - මුද්‍රිත හැම, ස. පාලි
සංසමෙ - පිටපත් හැම
2. සාලොහිතා - KL හැර පිටපත් හැම
3. යාචි - BDFGJK
සාචි - AC
යාච - L
4. කියව - BCGHL, ක.කි.ඤ,ම.
5. තිගෙන් - BGHKL
6. සත්දෙනකු - ABCDEGKL
සත්දෙනෙකු - FH
7. රජ්ජුරුවෝ - ACEFJ
8. තොමෝ - ක.ම.ස.
9. අතාණමෙකිකං. - මුද්‍රිත හැම
10. තඩග - ක. ක. ඤ. ම. පාලි.
11. හි - ක.කි.ඤ,ම. පාලි.
12. සාධුකං - ක.ම.ස.
13. රක්ෂාවක් - ADEFJ
14. වෙවයි (නැත) - පිටපත් හැම.
15. විඳිමින් - ABCDEGHJKL

Non-Commercial Distribution

පෙළින් පෙළ බිඳි බිඳී දිවන තරඞ්ගමාලාවෙන් ඉතිර ඉතිර[1] පිරී සිටිනා අතිනීල ජලප්‍රවාහයන් ඇති මහාසාගරය හැර[පියා] පිපාසිත සත්ත්වයෝ පැන් නිසා ළිඳට ම දිවෙද් ද[2] එපරිද්දෙන් ම බොහෝ ජනයන් ඇත ද ඔවුන් අතුරෙන් එක් කෙනකුන්ගේ ළෙහි ම සත්පුරුෂගුණය පිහිටන්නේය. දුකක් පැමිණි කල්හි එවැනි සත්පුරුෂයෝ ම ඒ දුකට පිහිටවන්නාහ. තව ද මේ ලෝකයෙහි මාංසයෙන් ප්‍රයෝජන ඇති සමහර සත්ත්වකෙනෙක් යම් සේ ඇත මැත දිව පැන ආයාස නොගෙන සැපසේ කැමති පමණක් මස් කපාගෙන යාහැකි මළා වූ මහත් ඇත් මිනියක්[3] දුටු ද ඒ හැර මාංස පිණිස කුඩා උවත් දිව පැන ඇවිදිනා නොමළ සාවුන් ම ලුහුබඳවා දිවෙද් ද එපරිද්දෙන් ම ලෝකවාසීහු නිෂ්ප්‍රයෝජන වූ බොහෝ සත්ත්වයන් ඇත ද ඔවුන් හැර කෙළෙහි ගුණ දන්නා සත්පුරුෂ වූ උතුම් ගුණ ඇතියවුන් ම සොයා ඇවිදිනාහ[4]. සත්පුරුෂයෝ තමන්ට කරන ලද්දවූ ඉතා ස්වල්ප වූ උපකාරයක් වුවත් නිරන්තරයෙන් සිහිකොට ඒ වූ පරිද්දෙන් පිළිපදනාහ. එසේ හෙයින් දේවයන් වහන්ස, මේ පුරුෂයා විසින් එකල්හි මට කළාවූ උපකාරය සිහිකරන්නාවූ මම සත්පුරුෂධර්‍මයෙහි පිහිටියෙමි. එකල්හි මේ පුරුෂයා නිසා [ම[5]]මම ද මාගේ දරුවෝ ද යන දෙපක්‍ෂය ම සුවපත් වූම්හ. එසේ හෙයින් අප ඇමගේ[6] ජීවිතය පරිත්‍යාග කොට වී නමුත් මේ පුරුෂයා දන් මේ දුකින් ගළවා මොහුගේ ජීවිතය රැකදුන මනා මය" යි කීව.

එකල්හි රජ්ජුරුවෝ වාසල රකිනා දෙරටුපාලයා ගෙන්වා ඔහු අතිනුදු එපවත් විචාරා ඒ පුරුෂයා ආගන්තුක ව ආ බව නිශ්චය දන ස්ත්‍රියගේ[7] සත්පුරුෂ ගුණයෙහි ප්‍රසන්න වූ රජ්ජුරුවෝ ඔවුන් දෙදෙනාට ම බොහෝ සැපත් දුන්හ. මෙසේ තමන්ගේ ගුණධර්‍මය නිසා රජ්ජුරුවන්ගෙන් ලබනලද සැපත් ඇති ඔහු දෙදෙන එතැන් පටන් දනාදි වූ දශවිධ කුශලධර්‍මයෙහි යෙදී බොහෝ කුශලසම්භාරයන් රැස්කොට එයින් ගොස් දෙවුලොව ඉපද අනූන වූ දිව්‍යසම්පත් ලදහ. මෙසේ සත්පුරුෂධර්‍මයෙහි පිහිටියාවූ ස්ත්‍රීජනයෝ පවා තමන්ගේ ගුණානුභාවයෙන් අපමණ වූ සම්පත් ලදින් බොහෝ දෙනාගෙන් ප්‍රශංසා ලබන්නාහ. එසේ හෙයින් පින්වත් සත්ත්වයෙනි, පවිත්‍ර වූ අදහස් ඇති සත්පුරුෂයන්ගේ ස්වභාවගුණයෙන් යුක්ත වූ මේ චාරිත්‍රධර්‍මය ඉඳුරා අසා සිත තබාගෙන හැම කල්හි ම සත්පුරුෂ ධර්‍මයෙහි යෙදී වාසය කළ මැනවි. කියන ලදුයේ මැයි:

ධම්මෙ පතිට්ඨිතමනා අපි මාතුගාමා
එවං ලභන්ති විභවං ච පසංසනං ච
ධම්මං ච සාධුචරිතං මනසී කරොන්තා
ධම්මෙසු වත්තථ සදා සුචි සජ්ජනානං - යි[8]

මේ මෙහි[9] තුන්යහළු වග පස්වන පානීය වස්තුව ය.[10]
මෙතෙකින් සාධුජනයන්ගේ සිත් පහදවනු පිණිස
හෙළුබසින් උපදවන ලද මේ සද්ධර්මාලංකාරයෙහි
තුන්යහළු වග නම් වූ
අටවන පරිච්ඡේදය නිමි.

---

1. ඉසිරි ඉසිරි - BGHK, ම.
2. ළිඳට බැසම ජීවත් වේද - BGHKL
3. කුණක් - ක. සි.ස.ම.
4. ඇවිදිනාහ - BCDGHKL
5. ම(නැත) - පිටපත් හැම.
6. හැමගේ - CDFGH
7. ඒ ස්ත්‍රියගේ - BCEGHKL,
8. සජ්ජනානි - ක.ම.
9. මෙතෙකින් මේ - C
10. කියා නිමවන ලදී. - C

Non-Commercial Distribution

තව ද මේ සද්ධර්මාලංකාරයෙහි නවවන බ්‍රාහ්මණ වර්‍ගය නම් කවර යත්. එහි පළමුවන මරුත්ත බ්‍රාහ්මණ වස්තුව මෙසේ දතයුතු:

දඹදිව චන්‍ද්‍රභාගා නම් ගඟ සමීපයෙහි හෝම නම් බමුණුගමෙක් වීය. එගම්හි මරුත්ත නම් වූ එක්තරා බමුණෙක් වාසය කෙරෙයි. එක් කලෙක ඒ බමුණු වෙළෙඳාම් පිණිස තක්සලා නුවර[1] ගොස් නැවත එම හෝම නම් බමුණුගමට එනුයේ අතරමඟ එක් ශාලාවෙක හොත්තාවූ කුෂ්ඨරෝගයකින් පීඩිත වූ බල්ලකු දැක ඔහු කෙරෙහි කරුණා උපදවා ගෝනිල්[2] වැලක් ගෙන ඉස්ම මිරිකා ඇඹුල් මෝරු හා[3] මිශ්‍ර කොට පෙවීය. එකෙණෙහි ඒ ශුනකයාගේ කුෂ්ඨරෝගය මඳක් සංහිඳිණ. මෙසේ ක්‍රමයෙන් සංහිඳුණාවූ රෝග ඇති ශුනක තෙම පෙර සේ ම නිරොගී ව පියවි ස්වභාව[4] ඇති ව ඔහු තමහට කළ උපකාරය සලකා බමුණු[5] හා එක් ව හෝමග්‍රාමයට ගියේය. එයින් මැත භාගයෙහි බමුණාගේ භාය්‍යාවෝ පිරි[පු]න්[6] දරුගැබ්[7] ඇති ව වදන අවස්ථාවෙහි දරුවෝ සරස හී කුස ඇතුළෙහි ම මළහ. එකල මළ දරුවන් සැත්කටුයෙන් කඩ කඩ කොට කපා පිටත් කළහ. එකල්හි බමුණු ඒ විප්‍රකාරය දැක සසර කළකිරුණාවූ සිත් ඇති ව ගිහිගෙය හැර තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් මහණ ව[8] වනාන්තරයෙහි පන්සලෙක වසන්නේය. එකල්හි ඒ බ්‍රාහ්මණයාගේ භාය්‍යා තොමෝ අන් පුරුෂයකු කෙරෙහි වසන්නී "මේ මා හැර මහණ වීය"යි කියා බ්‍රාහ්මණ තාපසයන් කෙරෙහි වෛර බැඳ තමාගේ වල්ලභයා හා සමඟ මන්ත්‍රණය කරන්නී "ස්වාමීනි, මේ බ්‍රහමණ තාපසයන් මරාපුව මැනවැ"යි කීව. එකල ඔවුන් දෙදෙනාගේ ඒ මන්ත්‍රණය ශුනකයා අසා දැන බ්‍රාහමණ තාපසයන්ට රකවල් පිණිස කැටිව ම ඇවිදුනේය. ඉක්බිති එක් දවසෙක ඒ ස්ත්‍රියගේ වල්ලභ පුරුෂයා "අද තාපසයන් මරමි" යි දුනු හීතල හැරගෙන ගෙන් නික්මිණ. එකල තාපසයෝ ඵලාඵල සඳහා වලට ගියහ. බලු[9] වනාහි තාපසයන්ගේ ආශ්‍රමපදයෙහි ම රැඳුණේය. තාපසයන් මරන්ට ගිය පුරුෂයා ද තාපසයන් ඵලාඵල ගෙන වලින් එන වේලාය යි දැන දුන් දුන් විදිමි යි සනිටුහන් කොට තාපසයන් එන පෙරමඟ බල බලා තුරු අතුරු සැඟවී උන්නේය. එකල ශුනකයා ඔහුගේ ප්‍රමාදයක් බලා දුන්නෙහි දුනුදිය කපා හැරපීය. ඒ බව දැක නැවතත් ඒ පුරුෂයා දුනුදිය පියවි ස්වභාවයෙන් සන්ධි කොට දුන්න නැඟීය. ශුනකයා ද එපමණකින් නොවැළකෙ දුන්න නැඟූ නැඟූ සේ ම දුනුදිය කපා හරනේය. ඉක්බිති ඒ අධර්මිෂ්ඨ වූ පාපිෂ්ඨ[10] පුරුෂ තෙම ඵලාඵල ගෙන වලින් එන්නාවූ තාපසයන් දැක "මෙවිට මා සිටි බව නොදක්වා ම ඉමොහු විද මරමි" යි සිතා දුනු හී ගෙන නික්මුණේය. එසේ පව්වූ අදහසින් යන්නාවූ ඔහු දැක

1. නුවරට - CDGHK, ක.කි.ඤ.ම
2. ගොනිම් - E, නිල් - FL
3. ඇඹුල් හා මෝරු හා -GH
4. ප්‍රිය විශ්වාස - AC
5. බමුණා - ක.ම.ස.
6. පිරිනුන් - පිටපත් හැම, ක. ස.
7. දරුගැබි - ක.ම.ස.
8. පැවිදි ව - ක.ම.
9. බලුතෙම - ක.කි.ඤ.ම.
10. පාපී - ක.ම.

Non-Commercial Distribution

ළපිරුණු[1] ශොක ඇති ව බලු දිවගෙන ගොස් ඔහුගේ දෙපය කඩා කා බිම හෙළා ගෙන මුහුණ ද කඩා කා දූවිල කොට තාපසයන්ට ඇසෙන සේ බුර බුරා සිටියේ ය. හේ එසේ මය. උතුම් වූ ගුණ ඇති සත්පුරුෂ සත්වයෝ තමන්ට උපකාර කළාවූ ජනයන්ට නැවත තුමූ ද ප්‍රත්‍යුපකාර කරන්නාහු මය. මෙසේ කෙළෙහි උපකාර දන්නාවූ ඒ ශුනකයා පවා පළමු තමහට තාපසයන් කළ උපකාරයට ප්‍රත්‍යුපකාර කරනුයේ තාපසයන් මරන පිණිස ආවාවූ සතුරු පුරුෂයාහට එපමණ ව්‍යසනයක්[2] පමුණුවා තාපසයන්ගේ ජීවිතය රැක දින. අහෙතුක ප්‍රතිසන්ධි ඇති තිරිසන්හු පවා තමන්ට කළ උපකාර දන්නාහු මය. එසේ හෙයින් කාරණාකාරණ දන්නා නුවණැති සත්වයෝ මෙසේ මේ කාරණය ඉදුරා සලකා දන කැම කල්හි ම කෙළෙහි උපකාර දන ප්‍රත්‍යුපකාර කිරීමෙන් බොහෝ දෙනා මිත්‍රකොටගෙන ඔවුනොවුන් කෙරෙහි මෙත් සිත් පතුරුවා සමඟ ව විසීමෙන් මිත්‍ර ධර්මය රක්‍ෂාකොට උභයලොකාර්‍ථසිද්ධියට පැමිණෙත්වා. කියේ මැනෝ:

උපකාරං කරොන්තො[3] සො - සුනඛො කතවෙදිකො.
සත්තුපඝාතකං[4] කත්වා - ඉසිනො'දසි ජීවිතං.
තිරච්ඡානාපි ජානන්ති - ගුණමත්තානි කතං සදා,
ඉති ඤත්වාන මෙධාවී - කතඤ්ඤු හොන්තු පාණිනො - යි.

ඉක්බිති තාපසයෝ ඵලාඵල ගෙන එන්නාහු බල්ලා බුරන ශබ්දය අසා එතැන්හි අවුත් නිරාපරාධ වූ තමන් මරම් යි කළ උපක්‍රමය නිසා ඕහට වූ විප්‍රකාරය දැක එකෙණෙහි උපන්නාවූ මහත් කරුණාවෙන් ඔහු සෙමෙන් නැඟී සිටුවා දෙඅතින් ඔල්වාගෙන[5] තමන් වසන පන්සලට ගෙන ගොස් නවා පළා බෙහෙත් බැඳ කන බොන දැ දෙමින් උපස්ථාන කොට නොබෝ කලකින් වණ ගුණ කොට ශරීරයෙහි බල හිඳෙන තෙක් පොෂ්‍ය කොට ඔහු යවා එම පන්සල්හි වසන්නාවූ තාපසයෝ කිහුණු පිරියම් කොට පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා දිවිහිමියෙන් ධ්‍යානසුව විඳ අපරිහීනධ්‍යානයෙන් ගොස් දෙළොස් යොදුන් ආත්මභාව ඇති ව බ්‍රහ්මලොකයෙහි උපන්හ. එසේ හෙයින් පින්වත් සත්වයෙනි, මෙසේ එක් දවසෙක තමහට බෙහෙත් පමණක් දුන්නාවූ තාපසයන් කෙරෙහි ස්නේහ උපදවා ඔවුන්ගේ ජීවිතය රැකදීමෙන් සුනඛයා විසින් කරන ලද ප්‍රත්‍යුපකාර විශෙෂය හා තව ද දුනු හී ගෙන තමන් මරනු පිණිස ආවාවූ එබඳු දරුණු සතුරු පුරුෂයා කෙරෙහි තාපසයන් විසින් කරනලද මෛත්‍රීවිශෙෂය මේ කථාප්‍රබන්ධයෙන් අසා දැන ඉඳුරා සිත තබාගෙන තොප හැමදෙනා විසිනුදු එපරිද්දෙන් ම සතුරු මිතුරු සියල්ලවුන් කෙරෙහි මනා ව සාධාරණ ව මෛත්‍රී කිරීමෙන් හා උපකාර කළවුන්ට ප්‍රත්‍යුපකාර කිරීමෙන් සියලු ගුණධර්මයන් පුරා සසර සිටිනා තෙක් කල් මුළුල්ලෙහි කැමැති කැමැති සම්පත් සිද්ධ කරගන්ට[6] උත්සාහ කළ මැනවි. දක්වන ලදුයේ මැයි:

---

1. ළය පිරුණු - BCGH
2. ව්‍යසනයක් - H
   ඛ්‍යසනයක් - F
3. සරන්තො - ඛෙ.
4. සත්තුපකාරං - KL
5. අල්වාගෙන - ABCDEFJKL, මුද්‍රිත හැම, ස.
6. කරන්ට - ABCEFJKL
   කෙරෙන්ට - GH

Non-Commercial Distribution

සුත්වාන සාධු සුතබෙන කතූපකාරං
මෙත්තිං දියඩ්ඩ පකතං ඉසිනා ච සුත්වා,
සම්මා කරොථ කරුණං ච පරූපකාරං
තං සබ්බද භවති වො භවභොග හෙතු-යි.

මෙතෙකින් මෙහි පළමු වන
මරුත්ත බ්‍රාහමණ වස්තුව
කියා නිමවන ලදී.

තව ද මෙහි දෙවැනි **සොම බ්‍රාහ්මණ වස්තුව** නම් කවරයත්: අප මහා ගෞතම බුදුන් සියලු බුධකෘත්‍යය සිධකොට[1] නිමවා[2] නිවන්පුර පිරූ පසු දඹදිව සැවැත්නුවර සොම බ්‍රාහ්මණය සොමදත්ත බ්‍රාහ්මණය යි බමුණෝ දෙදෙනෙක් වූහ. ඔහු දෙදෙන බොහෝ සේ උකස් තබා ඔවුනොවුන් හා සමඟ දූකෙළ යෙති. මෙසේ දූකෙළනාවූ ඔවුන් දෙදෙනා අතුරෙන් සොමදත්ත නම් බමුණු එක් දවසෙක සොම නම් බමුණු දූකෙළියෙන් පරදවා ඔහුගේ උතුරුසළුව හා අත ලන පේරැස්මුන්ද ඇරගෙන තමාගේ ගෙට යෙමි යි පිටත් ව සොම නම් බ්‍රාහ්මණයා මුහුණ බලා "යහළු, කුමක් පිණිස හිඳිව්[3] ද? පලා එව, ගෙට යම්හ" යි කීය.[4] එවේලෙහි සොම බ්‍රාහ්මණයා කියනුයේ "යහළු, මම්[5] කර ලන උතුරුසළුව නැති ව තනි වස්ත්‍රය හැඳගෙන වීථියට බට නොහෙමි.[6] ඉතා ලජ්ජා ඇතියෙමි. එසේ හෙයින් ගෙට යාමට වඩා මෙතැන ම හිඳීම යහපතැ"යි කීය. එවේලෙහි සොමදත්ත බ්‍රාහ්මණයා "එසේ කල යහළු, මේ උතුරුසළුව ඇරගන්ව"යි[7] කියා නැවත සොම නම් බ්‍රාහ්මණයාට උතුරුසළුව දී "මෙවිට යහළු පලා එව" යි[8] කැඳවා එසේ ද ඔහු නොඑන හෙයින් දන් කුමක් පිණිස නොඑවු ද"යි විචාළේ ය. එකල සොම බ්‍රාහ්මණයා කියනුයේ "එම්බා යහළු, සැබවින් මම ගෙට ගියෙම් වී නම් තෙල පේරැස්මුන්ද මෙතෙක් දවස් මා ඇඟිල්ලෙහි ම තිබෙන හෙයින් මාගේ පුත්‍රදරාවෝ ඒ අද නුදුටු විට[9] නුඹ අත ලන පේරැස්මුන්ද කොයි දැයි විචාරති. එවිට මා[10] අනිකක් කිය නොහැක්ක. දූ කෙළ පැරද පේරැස්මුන්ද උකස් කොට දුන් බව ඇති සැටියේ නොවළහා ම කිව මැනව.[11] එබස්[12] ඇසූ විට ම මාගේ පුත්‍රදරාවෝ "යහපත නොපිළිවන් දූකෙළියක් කෙළ අත ලන පේරැස්මුන්ද පවා දීපියා තව ලජ්ජාවක් නැති ව ගෙට ආ නියා ද" යි කියා මා හා සමඟ කළහ කෙරෙති. එසේ හෙයින් ගෙට යන්ට මැලියෙමි"යි කීය. එතෙපුල් අසා සොමදත්ත බ්‍රාහ්මණ තෙම "එසේ වී නම් යහළු, තොපට පිළිවන් දවසෙක දීපියව"යි කියා පේරැස්මුන්ද ද ඕහට ම දී "මෙවිට වික්ෂෙප නොව පලා එව"යි කියා සොම බ්‍රාහ්මණයා කැඳවාගෙන ගෙට ගියේය. මෙපමණ උපකාරයක් සඳහා එතැන් පටන් ඔහු දෙදෙන ඔවුනොවුන්ට ජීවිතය[13] සමාන මිත්‍ර ව වසන්නාහ.

---

1. සිල් කොට - කඳු.
   සියල් කොට - කි.ක.
2. නිමවා (නැත) KL ස.ම.ස.
3. හිඳු ද - BGHKL
4. කියා - ABGHJKL
5. මා - ක.කි.කඳු.ස.
6. නොහෙයි - කි.ක.
   නොහෙ - කඳු.
7. හැරගන්වයි - GH
8. යවයි - BGH
9. විට ම - BCFGJ
10. ඉඳ මා - CDEFGJKL
    ඉඳුරා ම - B
11. කිව මැනවයි - CF
12. එබසට - BFL
13. ජීවිත - KL

Non-Commercial Distribution

මෙසේ ඔවුන් දෙදෙනා මිත්‍ර ව වසන සමයෙහි එක් දවසෙක රාජපුරුෂයෝ සොමදත්ත නම් බ්‍රාහ්මණයා පරදරයෙහි හසුකොට අල්වාගෙන මතු පරදරයෙහි[1] සන්තොෂයට රිසි යන[2] පරිද්දෙන් අතින් පයින් තළා [මරා][3] දුර්වලකොට පිටිතොල හයා බැඳ රකවලින් ගෙනවුත් රජ්ජුරුවන්ට දැක්වූහ. එකල රජ්ජුරුවෝ සවර්ණ ප්‍රතිබිම්බයක් බඳු වූ ඔහුගේ රූපසම්පත්තිය දැක ප්‍රසන්න වූවාහු අන් කිසි රාජාඥවක් නොකොට හී "එම්බල මෙතැන් පටන් මතු මෙවැන්නක් කෙළෙහි නම්[4] දන්නෙම්[5] වේ ද"යි කියා බසින් භය ගන්වා අවවාද කොට හැර සතරවන වාරයෙහි උදහස් ව "යව කොල, මොහු සොරුන් මරන තෙනට ගෙනගොස් මරව"යි නියෝග කළහ. අකුශලක්‍රියායෙහි යෙදුණාවූ සත්වයන් නොයෙක් පරිද්දෙන් අවවාද කොට ද වැළකිය නොහැකි බව මෙයින් ම දත යුත්තේ ය. හේ එසේ මැයි:

මේ ලෝකයෙහි ඇත්කුණු මිනීකුණු ගවකුණු අශුචි ආදි වූ අපවිත්‍රයෙහි ඇලුණාවූ සිත් ඇති බල්ලෝය. කැණහිල්ලුය. කපුටුවෝය නිලමැස්සෝය යන මොහු කෙසේ වැළකුවත් යම් සේ නොවළක්නාහු ද එපරිද්දෙන් ම ප්‍රාණවධ කිරීමය පරදරයෙහි යෙදීමය රා පීමය බොරුකීමය සොරකම් කිරීමය යන මෙකී පාපයෙහි[6] ඇලුණාවූ සිත් ඇති සත්වයෝ ද එයින් වැළකිය නොහැක්කාහු මය. එසේ හෙයින් කියන ලදි:

සොණා චෙව සිගාලා ච-වායසා නීලමක්ඛිකා,
ඉච්චෙතෙ කුණපෙ සත්තා - න සක්කාච[7] නිසෙධිතුං.
තථා පාණාතිපාතෙසු - පරදරෙ සුරාය ච,
මුසාවාදෙසු ථෙය්‍යෙසු - සත්තසත්තා න වාරියා -යි.

එසේ හෙයින් ම මෙසේ රජහු විසින් නොයෙක් වාරයෙහි වැළකුව ද ඒ බ්‍රාහ්මණතෙම පරදර ක්‍රියායෙන්[8] නොවැළැක්කේ මය.

ඉක්බිති රාජපුරුෂයෝ සොමදත්තයන්[9] පිටි තොල හයා බැඳ මරන්ට ගෙන නික්මුණාහ. එකල සොම බ්‍රාහමණ තෙම එපරිද්දෙන් සොමදත්තයන් මරන්ට ගෙන යන්නා දැක ඉතා ළපිරුණු ශොක ඇති ව රාජපුරුෂයන් සමීපයට ගොස් "එම්බා පින්වත්නි, දන් මා ගොසින් රජ්ජුරුවන් වහන්සේ දැක එන තෙක් මේ සොමදත්තයන් මොහොතක් කල් නොමරව" යි කියා රජ්ජුරුවන් සමීපයට ගොස් වැඳ එකත්පස් ව සිට "දේවයන් වහන්ස, සොමදත්තයන් කළ වරදට උන් මාරුවේ මාගේ ජීවිතය දෙමි. ඔහු හැරපුව මැනව. ඉදින් උන් මරනු කැමැතියේක් වී නම් මා මැරුව මැනව"යි කීය. සොමදත්තයන් වරින් වර කළ වැරදි බොහෝ හෙයින් එබසට රජ්ජුරුවෝ මුයෙන් නොබිණූහ. එකල රජ්ජුරුවන් අභිප්‍රාය[10] දැන රාජපුරුෂයෝ අපරාධ කළ

---

1. පරදර - BDGHKL
2. රිසි නොවන - GH
   රිසි යෙන - CK
3. තළා වළා - ACDEFGHJKL, ස.
   තළා මරා - මුද්‍රිත පැම
   තළා - B
4. කෙළෙයි නම් - ACFGHK
   කෙළෙව් නම් - B
5. දන්නෙහි - ACDEFGHJKL
6. පාපයන්හි - මුද්‍රිත පැම
7. නසක්කා යෙ - BDGHKL
   නසක්කා යෙව - ACFJ
   නසක්කා තෙ - ක.කි.සැ.ම. පාලි
8. ක්‍රියාවෙහි - DEGHK
   ක්‍රියායෙහි - ACFJL
9. සොමදත්ත නම් බ්‍රාහ්මණයා - බෙ.ස.
10. අභිප්‍රාව - BCDFGHJKL. ක.කි.සැ.

Non-Commercial Distribution

සොමදත්තයන් හැර සොම බ්‍රාහ්මණයා ආඝාතන භූමියට ගෙනගොස් මරාපීහ. අහෝ, කෙළෙහි උපකාර දන්නා සත්පුරුෂයන්ගේ කෘතොපකාර දන්ම ඉතා ආශ්චර්‍ය්‍ය මැයි. හේ එසේ මය. පළමු තමහට කළ උපකාරයට ප්‍රත්‍යුපකාර සඳහා සොමදත්ත නම් බ්‍රාහ්මණයාහට තමාගේ ජීවිතය දුන්නාවූ මේ සොම නම් බ්‍රාහ්මණයා මෙන් තමහට කළ උපකාර සිහි කරන්නාවූ කෙළෙහි ගුණ දන්නා උත්තම මනුෂ්‍යයෝ තමන් දිවි පුද වී නමුත් උපකාර කළවුන් රක්‍ෂා කරන්නාහු මය. කියන ලද්දුයේ මැයි:

කතුපකාරමත්තානං - සරන්තා කෙචි මානුසා,
ජීවිතං [දෙන්ති][1] සොමොව - සොමදත්තස්ස අත්තනො -යි

මෙසේ ඒ සොම නම් බ්‍රාහ්මණයා එදවස් තමාගේ ජීවිතය දී එම කුශලයෙන් දිව්‍යලොකයෙහි ඉපද දෙළොස් යොදුන් රන්විමනෙක දෙව්දූන් දහසක් පිරිවරා දිව සැපත් අනුභව කෙරෙමින් වාසය කෙරෙයි. එකල සොමදත්ත නම් බ්‍රාහ්මණ තෙම 'මාගේ යහළු වූ සොම බ්‍රාහ්මණයා මරණයට පැමිණියාවූ මා ගළවා සුවපත් කොට තෙමේ මා නිසා ම ජීවිතය දිනැ' යි මෙසේ සොම බ්‍රාහ්මණයා කෙරෙහි ස්නෙහයෙන් ඔහට පින් පිණිස දන් දී පින්පෙත් දින. එකෙණෙහි ආදි කොට ම තමා උදෙසා පින් පෙත් දෙති යි යන පූර්‍වභොග[2] ඇති හෙයින් දෝ හෝ දෙව්ලොව උපන්නාවූ ඔහට පළමු ලද සම්පතට වඩා මහත් වූ දිව්‍යෛශ්චර්‍ය්‍ය හා දිව්‍යානුභාව පහළ විය.

ඉක්බිති ඒ සොම දිව්‍යපුත්‍ර තෙම තමාගේ මහත් වූ දිව්‍යෛශ්චර්‍ය්‍යය දැක "කවර කුශලයකින් මෙබඳු දිව්‍යෛශ්චර්‍ය්‍යයක් ලදිම් දෝ හෝ" යි පරීක්‍ෂා කරනුයේ එකල යහළුවා පිණිස තමා දිවි දුන් කුශලයෙන් ලද්දවූ දිව්‍යසම්පත් බව දැන එම ඇසිල්ලෙහි තමාගේ[3] දිව රත්කඳක් බඳු වූ තුන් ගවු උස දිව්‍යාත්මභාවය හැර ළදරු මානවක වෙශයක් මවාගෙන සොමදත්ත බ්‍රාහ්මණයා සමීපයට ගියේය. එවේලෙහි සොමදත්ත නම් බ්‍රාහ්මණ තෙම ඔහුගේ රූපශ්‍රී හා බුහුටිභාවය දැක පූර්‍වහෙතු බලයෙන් උපන්නාවූ බලවත් සන්තොෂ ඇති ව කියනුයේ "යහළු, තොප දුටු වේලෙහි පටන් මා සිතට වූ සන්තොෂ මෙතෙකැයි පමණ නැත. තෙපි ඉතා යහපත් කෙනෙකුව. තොප සේ වූ කෙනෙකුන් මීට පූර්‍වභාගයෙහි නොදිටිම්. ඉතා ම තෙපි ශොභමානයව. තෙපි කාගේ දරුකෙනෙක් ද, කොයි සිට ආවු ද'යි විචාළේ ය. එබසට සොම දිව්‍යපුත්‍රයා[4] කියනුයේ "යහළු මම අනිකෙක් නොවෙමි. පළමු තොපගේ මිත්‍ර වූ සොම බ්‍රාහ්මණයා නම් මම ය. එදවස් තොප නිසා ජීවිතය දී මිත්‍රධර්මය රක්‍ෂා කළාවූ කුශලයෙන් දෙව්ලොව මහත් වූ රන්විමනෙක උපන්මි. දහස් ගණන් දෙවඟනන් ලදිමි. මාගේ විමානය[5] ඒ ඒ තන්හි රහමඩුලු බැඳ නටන ගී කියන බෙර

1. දෙති - පිටපත් හැම
   දෙන්ති - ස.
2. පූර්‍වභොග - AE, ස
   පූර්‍වහේතු - BGH
   පූර්වභාගයෙහි - C
3. තමාගෙ මහත් වූ - BGHKL
4. දිව්‍යපුත්‍ර - ක.බෙ.ම.ස.
5. විමන - BGHKL

Non-Commercial Distribution

ගසන වීණා[1] වයන නළු නාටකයෝ මෙතෙකැයි පමණ නොදන්මි" යනාදීන් මෙසේ තමා ලද්දවූ දිව්‍යසම්පත්තිය ප්‍රකාශ කිරීම් වශයෙන් තමා දෙව්ලොව උපන් බව හඟවා ප්‍රස්තාවට සුදුසු වූ[2] සිහි කටයුතු වූ පිළිසඳර කථාකොට ඒ සොමදත්ත නම් බමුණු කැඳවාගෙන තමාගේ ආනුභාවයෙන් දෙව්ලොවට ගොස් "යහළු, තොප කැමැති පරිද්දෙන් පඤ්චකාම සැප අනුභව කරව"යි කියා සත්දවසක් මුළුල්ලෙහි මහත් වූ දිව්‍යසම්පත් අනුභව කරවා අටවන දවස් කැඳවාගෙන අවුත් මිනිස්ලොව ඔහුගේ ගෙයි ම ඇර සිටුවා ගියේය. එකල මෙසේ එම ආත්මභාවයෙහි [ම][3] දෙව්ලොව දිව්‍යසම්පත් අනුභව කොට ආ හෙයින් මනුෂ්‍ය සම්පත්තිය ඔහට ඉතා පිළිකුල් ව වැටහෙයි. හේ එසේ මය. දෙවඟනන් දුටු ඇසට මනුෂ්‍යස්ත්‍රීහු ප්‍රේතලොකයෙහි උපන් ප්‍රේතියන් සේ ද ජරාපත් වැදිරි මැහැල්ලන් සේ ද පිළිකුල් ව වැටහෙති. සෙසු දරු මුණුබුරු ආදීහු නරකයෙහි නිරිසතුන් මෙන් වැටහෙති; සියලු මනුෂ්‍යසම්පත්තිය ම සියගණින් මිනී කුණපයෙන් ගැවසීගත් අමුසොහොනක් සේ පිළිකුල් ව වැටහෙයි. ඉක්බිති ඒ සොමදත්ත නම් බ්‍රාහ්මණයා තමා විසින් අනුභූත වූ ඒ දිව්‍යසම්පත්තිය ම සිත සිතා වසනුයේ දවසින් දවස සියලඟ නහර ඉපිළ නැඟි පඬුපඬුවන්[4] ශරීර ඇති ව ඉතා දුර්වල විය. මෙසේ කල් යාමක් ගිය කල්හි එක් දවසෙක සොම දිව්‍යපුත්‍රයා" මාගේ යහළු වූ සොමදත්ත බ්‍රාහ්මණ[5] කෙසේ වෙසේ දෝ හෝ"යි මිනිස්ලොව බලනුයේ දිව්‍යසම්පත්තියෙහි ලොභ උපදවා දුඃඛ ජීවිකාවෙන් දරිද්‍රව වසන්නාවූ ඔහු දැක "මනුෂ්‍ය ව සිට ස්වල්ප වූ පින් ඇති සත්වයන් විසින් දිව්සැපත් අනුභව කිරීම නොපිළිවනැ"යි සිතා කැමැති කැමැති වස්තු දෙන මහානුභාවසම්පන්න වූ චින්තාමාණික්‍යයක් ඔහට දී තමාගේ ආනුභාවයෙන් ඔහුගේ භාර්‍ය්‍යාව ද රූපසම්පන්න කරවා දිව්‍යාභරණයෙන් සරහා මනුෂ්‍යස්ත්‍රීභාවය හැර දිව්‍යස්ත්‍රීභාවයට පැමිණියා සේ ප්‍රභා විහිදුවූ[6] ශරීරවර්ණ ඇතිකොට මහත් වූ ඓශ්චර්‍ය්‍යයෙහි පිහිටුවිය. එතැන් පටන් ඔහු දෙමහල්ලෝ ඉහාත්මභාවයෙහි ම දිව්‍යසම්පත් ප්‍රත්‍යක්ෂයෙන් ම දුටු හෙයින් එම දිව්සැපත් පත පතා දන් දී සිල් රැක ආයුකෙළවර එයින් ගොස් තමන්ගේ මිත්‍ර වූ ඒ දිව්‍යපුත්‍රයා සමීපයෙහි දෙව්ලොව උපන්හ. මෙසේ තමන්ට කරන ලද ඉතා ස්වල්ප වූ උපකාරය පිණිස පවා සන්තුෂ්ට ව මිත්‍රභාවයට පැමිණියාවූ සත්පුරුෂයෝ එම මිත්‍රයන් නිසා තමන්ගේ ජීවිතය පවා දී පියන්නාහ. එසේ හෙයින් පින්වත් සත්වයෙනි, මිත්‍රද්‍රොහී නොව සියල්ලවුන්ට ප්‍රත්‍යුපකාරී ව බුද්ධප්‍රත්‍යෙකබුද්ධ ආර්‍ය්‍යශ්‍රාවකාදි වූ සාධුජනයන් විසින් ප්‍රශංසා කටයුතු බවට පැමිණෙනු[7] සඳහා ම උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි:

---

1. වෙණ - මුද්‍රිත හැම
2. සුදුසු ව - ADHJKL
3. ම (නැත) - පිටපත් හැම.
4. පඬුවන් - ස.
5. බ්‍රාහ්මණයා -BKL, ක.සි.ස.,ම
6. විහිදුනාවූ - BDGHK
   විහිදුනා සේ -L
   විදුනා - C
   විහිදුවා - ක.සි.ස.
   විහිදුණා - ම.
7. පැමිණෙන - ACDFGHJK

Non-Commercial Distribution

මඤ්ඤෙන නන්දිතමනා උපකාරකෙන
පාණම්පි දෙන්ති සුජනා ඉති චින්තයිත්වා,
මිත්තද්දු මා භවථ භො උපකාරකස්ස[1]
පාසංසිකා[2] භවථ සාධුජනෙහි නිච්චං-යි.

මෙතෙකින් මෙහි දෙවන
සොම බ්‍රාහ්මණ වස්තුව
කියා නිමවන ලදී.

තව ද මෙහි තුන්වන මෞරිය බ්‍රාහ්මණ වස්තුව නම් කවර යත්, හේ මෙසේ දතයුතු:

අප මහා ගෞතම බුදුන් පිරිනිවි පසු මගධ දේශයෙහි මචල නම් වූ මහත් ගමෙක් විය. එහි මෞරිය නම් බ්‍රාහ්මණයෙක් වෙසෙයි. එතෙම ශ්‍රද්ධාසම්පන්න ය. තුනුරුවන් කෙරෙහි ඉතා ප්‍රසන්න ය. ඔහුගේ සේනානී නම් වූ භාර්‍ය්‍යා ද[3] සැදැහැ ඇත්තීය, තුනුරුවන් කෙරෙහි පහන් ව[4] වෙසෙයි. ඔහු දෙමහල්ලෝ ම ඔවුනොවුන් කෙරෙහි පෙම් සහිත ව සමගි ව වසන්නාහු භික්ෂු සඞ්ඝයාවහන්සේට ආරාධනා කොට නිරන්තරයෙන් දන් දෙමින් චීවරාදි චතුර්විධ ප්‍රත්‍යයෙන් උපස්ථාන කෙරෙමින් දවස දවස[5] පන්සිල් රකිමින් පෙහොය පෙහෙවස් වෙසෙමින් මෙසේ හැම දවස් ම කුසල් කිරීමෙන් දවස් යවති. ඉක්බිති ඔවුන්ගේ ගෙයි සියලු සම්පත්තිය ම බොහෝ සේ දන් දීමෙන් නිමාවට ගිය.[6] එකල බැමිණිතොමෝ බමුණාණන් බණවා "ස්වාමීනි, අපගේ ගෙයි සියලු වස්තුව ම පිරිහිණ. එසේ හෙයින් දන් කෙසේ දන් දෙමෝ ද"යි කිව. එකල බ්‍රාහ්මණතෙම කියනුයේ "එම්බා සොඳුර. වස්තු නැතැයි නොසිතව. යම් කිසි උපායකින් දනය නොපිරිහෙළා පැවැත්වුව මැනවැ' යි කියා දනාදි වූ ඒ කුශලධර්මයෙහි ම තමා උත්සාහ සහිත ව දවස් යවන බව ප්‍රකාශ කොට දක්වන්නාවූ බ්‍රාහ්මණතෙම.

ජානමානො හි[7] ලොකස්මිං - දනසෙසදං ඵලං ඉති,
න දජ්ජා කො සුසීලෙසු - අප්පම්පි දිවසම්පත්ති.
සග්ගලොක නිදනානි - දනානි මතිමා ඉධ,
කොහි නාම නරො ලොකෙ - න දදෙය්‍ය හිතෙ රතො.

යනාදීන් "දන් දීමෙහි විපාක මෙපරිද්දෙන් වන්නේය යි කියා විශෙෂයෙන් දනඵල විභාග[8] දන්නාවූ මේ ලොව කවර නම් මනුෂ්‍යයෙක් සිල්වතුන් වහන්සේට දවස් පතා ස්වල්පමාත්‍ර වුවත් දනයක් නොදෙන්නේ ද. ඒකාන්තයෙන් දෙන්නේ මය. සියලු ස්වර්ගමොක්ෂ සම්පත්තිය සිද්ධ කොට දීමට ඒකාන්තකාරණ වූ දනය මේ ලොකයෙහි

1. උපකාරකස්ස - ACDEFJK
උපකාරකානං - BGHKL
2. පාසංසියා - D, මුද්‍රිත හැම. ස.
3. භාර්‍ය්‍යාව ද - F, ක.සි.සඳ.
4. පහන් සිත් ඇති ව - KH
5. දවස නිරතුරු ව -C
6. ගියේය - BCDEGHJKL
7. ජානමානෙහි -C; ජානමානෙහි -K
ජානමානෙන -GH; ජානමානෙන-L
ජානමානෙ - B
8. විපාක - BGHKL

Non-Commercial Distribution

නුවණැත්තාවූ තමහට වැඩ කැමැති කවර නම් මනුෂ්‍යයෙක් නොදෙන්නේ ද" යි මෙසේ දනය ම[1] ප්‍රසංසා කොට කියා "එම්බා සොඳුර, වලට වැද අනෙකප්‍රකාර වූ පත්‍රජාතීන් හා ඵලජාතීන් පැස් පුරා ගෙනවුත් විකොට වී නමුත් දන් නොකඩ කොට දෙම්හ"යි කියා එතැන් පටන් වලට ගොස් පළාකොළ හා නොයෙක් ඵලාඵල ගෙනවුත් විකොට එයින් ලුණු මිරිස් තෙල් සාල් ආදි වූ දනෝපකරණ සපයාගෙන දන් දෙමින් වාසය කෙරෙති. ඉක්බිති එක් දවසෙක වලට වන්නාවූ බ්‍රාහ්මණතෙම අඹ දඹ වැල වරකා ආදි වූ ඵලාඵල හා පළාකොළ ආදියෙන් පැසපුරා හිස තබාගෙන ගෙට එනුයේ නොයෙක් පලුපලලව කුසුමයෙන් සශ්‍රීක ව[2] ඵලභාරයෙන් නැමුණාවූ අතුපතර ඇති නොයෙක් වෘක්ෂ සමූහයෙන් ගැවසී ගත්තාවූ ද එසේ ම නොයෙක් මිහිරි ඵලරස අනුභව කිරීමෙන් සන්තුෂ්ට වූ අනෙකප්‍රකාර පක්ෂි සමූහයන්[3] හා සිවුපා ජාතීන් විසින් භජනය කරනලද ඒ ඒ තන්හි විසිර තිබෙන්නාවූ අපමණ මල්පෙත්තෙන් හා මල්රොනින් ගැවසී ගත්තාවූ සුදු වැලිතලා ඇති හැලිගසා දිවන සිහිල් වූ නිර්මල ජල ප්‍රවාහයන්[4] ඇති මඩ බොර නැති ව සම ව තිබෙන්නාවූ මනහර තොටින් සිත්කලු වූ සොඳුරු කඳුරැලියක් දැක පැස බා තබා කඳුරැලියට බැස නහන්නට පටන් ගත්තේය. එකල එතැන්හි ගසෙක වසන දිව්‍යපුත්‍රයෙක් නහන්නට බටුවාවූ ඔහු දැක "කිමෙක් දෝ හෝ මේ තෙම කල්‍යාණාධ්‍යාශය ඇති උත්තම පුරුෂයෙක් දේ හෝ නොහොත් පාපාධ්‍යාශය ඇති අසත්පුරුෂයෙක් දේ හෝ" යි දිවසින් පරීක්ෂා කරනුයේ 'මේ තෙම ඉතා ආශ්චර්‍ය්‍ය පුරුෂයෙක. මෙසේ ඉතා දුඃඛිත ව පවා තමාගේ දනධර්මය උපච්ඡේද වේ දෝහෝයි යන භයින් වනාන්තරයට වැද පළාකොළ හා නොයෙක් ඵලාඵල ගෙනවුත් ඉතා කෘපණ ව පවා මහත් දුකින් තමාගේ ජීවිකාවෘත්තියත් පවත්වනුයේ දනධර්මයත්[5] අත් නොහරනේය"යි දැන ඔහුගේ ගුණයෙහි පැහැද පැසෙහි තුබූ පළාකොළ හා ඵලාඵල ආදි වූ සියල්ල ම රත්රන් වේව යි අධිෂ්ඨාන කෙළේය. එකල ඔහුගේ ආනුභාවයෙන් ඒ සියල්ල ම රත්රන් විය. ඉක්බිති ඒ දිව්‍යපුත්‍රතෙම රත්රන් පිරුණාවූ පැස මත්තෙහි කැමැති කැමැති වූ සියලු වස්තු දෙන[6] මාහැඟි වූ මහත් මාණික්‍යරත්නයක් තබා අනතර්ධාන ව නො පෙනී සිටියේ ය. ඉක්බිති බ්‍රාහ්මණතෙම කඳුරැලියෙන් ඉස් සෝධා නහා ගොඩනැඟී පැසෙහි පිරුණාවූ රන්වන් රසින් භින්නවර්ණ ව බබළන්නාවූ මාණික්‍යරත්නයක් දැක මේ කිමෙක් දෝ හෝ"යි ආශ්චර්‍ය්‍යමත් සැක සිතමින් පැස සමීපයට ගොස් භයින් අත් දික් කළ නොහී සිටියේය. ඒ දැක දිව්‍යපුත්‍රතෙම දෘශ්‍යමාන රූපයෙන් සිට "එම්බල බ්‍රාහ්මණය, තෝ භය නොකර. මේ ධනරාශිය මා විසින් නිර්මිත කරන ලද්දේය. කිසි සැකයක් නොසිතා ඇරගෙන පලා යා"යි[7] කීය. ඉක්බිති බ්‍රාහ්මණතෙම දිව්‍යපුත්‍රයා කී වචනය අසා "මේ දිව්‍යපුත්‍ර තෙම තෙල වස්තුව මා විසින් නිර්මිත කරන ලද්දේය. සැක නොසිතා ඇරගෙන ය'යි[8] කියයි. කිමෙක් දෝ හෝ, මෙතෙම

---

1. දනයට - මුද්‍රිත හැම
2. සශ්‍රීක වූ - BGHKL
3. සමූහයන් - BCDEFGHKL, ම.
   සමූහයෙන් - අන්හැම
4. ප්‍රවාහයක් -DGHJ
5. දනධර්මයත් - AEFJ, ක.කි.සැ
6. සියලු දෙය සිද්ධ කොට දෙන -HL
7. පලා යවයි -F
   පලා යයි -ABGHJKL
8. යවයි - B

තමාගේ ආනුභාවයෙන් මේ වස්තුව දේ දෝ හෝ නොහොත් මා විසින් කරනලද කුශලකර්මයක් නිසා මේ සම්පත් දේ දෝ හෝ. ඒ කාරණය ඔහු අතින් ම විචාරමි" යි සිතා දෙහොත මුදුනෙහි තබා අඤ්ජලිප්‍රණාම[1] කොට දිව්‍යපුත්‍රයා අතින් විචාරනුයේ,

පුච්ඡාමි පඤ්ජලී දනි දෙවපුත්තං මහිද්ධිකං
දදසි මෙ සුවණ්ණං ච කාමදං මණිමුත්තමං

යනාදීන් "එම්බා මහත් වූ ආනුභාව ඇති දිව්‍යපුත්‍රයාණෙනි, තොපට නමස්කාර කොට දන් මා සිතට උපන්[2] සැකයක් තොප අතින් විචාරමි. තෙපි දන් මට මෙබඳු රත්රන් රාශියක් හා කැමති කැමති වස්තු සිධකොට දෙන්නාවූ මෙවැනි උතුම් වූ චින්තාමාණික්‍ය රත්නයකුදු[3] දුනුව. එතෙකුදු වුවත් තෙපි මාගේ නෑසිය කෙනෙකුන් නොවෙයි, මිත්‍රයාණ කෙනෙකුත් නොවෙයි. පළමු මාගේ ගෙන්[4] කිසි යම් උපකාරයක් විඳ සිටි අඳුනන කෙනෙකුත් නොවෙයි. මාගෙන් කවර ප්‍රයෝජනයක් සලකා කුමක් පිණිස මේ ධනරාශිය මට දෙවු ද? මා විසින් මේ ජාතියෙහි රක්නා ලද යම්කිසි තපසක් නිසා දෙවු ද, නොහොත් මාගේ ශීලාචාර ගුණයක් සලකා දෙවු ද? එසේ නැත මා විසින් පුරනලද අන්කිසි සුචරිතධර්මයක් නිසා දෙවු ද? නොහොත් පූර්වජන්මයෙහි මා විසින් කරනලද කුශලයක් නිසා දෙවු ද? ඒ නැත තොපගේ දිව්‍යානුභාවයෙන් දෙවු ද? ඒ කාරණය නොවළහා මට ඉඳුරා කියව" යි කීය. ඉක්බිති දිව්‍යපුත්‍රයා කියනුයේ "එම්බල බ්‍රාහ්මණය, මම දෙවතා වීමි නමුත්[5] කුසල් නැත්තවුන්ට කිසිවක් දුන[6] නොහෙමි. මේ සම්පත් සියල්ල ම තා විසින් පූර්වජන්මයෙහි කරන ලද්දවූ කුශලානුභාවයෙන් උපදනේ ය"යි කියා තමාගේ දිවසින් ඔහු පූර්වජාතියෙහි කළ කුශලය දක ඕහට ප්‍රකාශ කොට දක්වනුයේ,

කස්සපෙ ලොකපජ්ජොතෙ - සම්බුධෙ පරිනිබ්බුතෙ,
සබ්බපාඨ පජ්ජටං ආසී - තස්ස ධීරස්ස[7] සාසනං.

යනාදීන් "එම්බල බ්‍රාහ්මණය, මෙම කප තුන්වන අනන්තකල්පයෙහි ලොවුතුරා බුදු ව විසිරියන් බුදුබඳින් තුන්ලොව බබුළුවා විසිදහසක් හවුරුදු ආයිරි වළඳ වැඩසිටි කාශ්‍යප නම් බුදුරාජාණන්වහන්සේ පිරිනිවි කල්හි ඔබගේ ශාසනය මුළු දඹදිව් තෙලෙහි හැම තන්හි ම පැතිර පවතින්ට වන. එකල්හි තෙපි එක්තරා පිටිසර ගමෙක නාමගොත්‍රයෙන් අප්‍රසිඩ වූ කුලගෙයෙක[8] ඉපද වැඩිවිය පැමිණ තුනුරුවන් කෙරෙහි පැහැද ශ්‍රධාසම්පන්න ව කුසල් කිරීමෙහි ඇලුම් ඇති ව ශක්ති පමණින් දන්දෙමින් වාසය කෙළෙහි ය.[9] එසමයෙහි අතරමඟ වඩනා එක් භික්ෂුකෙනෙකුන්

---

1. අඤ්ජලී - පිටපත් හැම, ස.
   අඤ්ජලි ප්‍රණාම - මුද්‍රිත හැම.
2. උපන්නාවූ - BDEGHKL
3. රත්නයක් - BCDEFGHKL
4. ගෙයි -KL
5. වී නමුත් - BEG, ක.සි.ඥ.ම.
6. දින -ACDEFJKL. ඥ ක.
   දී ගත -B
   දිය - බෙ.ම.කි.ස.
7. බුද්ධස්ස - පාලි
8. කුලයෙක - BEGHL, ස.
9. කරව - BCDFGHJKL; කෙරෙයි -E

Non-Commercial Distribution

වහන්සේගේ පා සිවුරු ආදිය සොරුන් පැහැරගත් හෙයින් කොළ අතු ගොතා හැඳ එපරිද්දෙන් ම කොළ [අතු] ගොතා[1] පෙරව ඒ ඒ තන්හි දමනලද කඩරෙදි සොයමින් ඇතුළුගමට වන්සේක. එකල්හි තෙපි එපරිද්දෙන් කඩරෙදි සොයා ඇවිදුනා ඔබවහන්සේ[2] දක කම්පිත වූ සිත් ඇති ව දනඵලවිශෙෂය සලකා උන්වහන්සේට පිළීසහළක් දන් දී ශුඬ වූ ශ්‍රඬාවෙන් සාල්නැළියක් පමණකින් පිසන ලද සූපව්‍යඤ්ජන සහිත වූ ආහාරයක් ද වළඳවා වැළඳූ[3] ඉක්බිති පසඟ පිහිටුවා වැඳ ඒ භික්‍ෂූන් වහන්සේට පසුගමන් කොට නික්මවා එකල්හි තෙපි මෙසේ බොහෝ පින් රැස් කළව[4] මේ තොපගේ පූර්වචරිතය. තොප විසින් කරනලද ඒ කුශලකර්මයාගේ අමුඛ්‍ය විපාකය දුන් මෙසේ මෙබඳු විපාක දෙන්නට පටන් ගතැයි" යි කීය.[5] මෙසේ ද කියා ඉක්බිති "එම්බල බ්‍රාහ්මණය, මේ ධනරාශිය සොරුන් සතුරන් රජදරුවන් විසින් නොගන්නා පරිද්දෙන් මා විසින් අධිෂ්ඨාන කරනලද. තෝ දන් කිසි සැකයක් නොසිතා ගෙනගොස් තබාගෙන තා කැමැති යම් ම දනක් පිනක් කොට ගන. තෙල මාණික්‍යරත්නය වනාහි කැමති කැමති යම් ම දෙයක් සාධා දෙයි. ඒ මාණික්‍යරත්නයාගේ ආනුභාවයෙන් තා දෙන්නාවූ දනය නොකඩ කොට පවත්වා දහැමින් සෙමින් පුත්‍රදාරාවන් රක්‍ෂා කොටගනැ" යි කියා අවවාද කෙළේය. එතෙපුල් අසා බ්‍රාහ්මණයාණෝ[6] දිව්‍යපුත්‍රයා කී පරිද්දෙන් ම සඞ්ඝයා වහන්සේට මහදන් දෙමින් නිරන්තරයෙන් පන්සිල් රැක පොහොය පෙහෙවස් රැක බොහෝ කාලයක් වාසය කොට මෑතභාගයෙහි එයින් මිය සියලු පඤ්චකාම සම්පත්තියෙන් සමෘඬ වූ දිව්‍යලොකයෙහි උපන්හ. මෙසේ දන් දීමෙන් සියලු සම්පත්තිය ම නිමාවට ගිය කල්හි පවා ශ්‍රඬාවන්ත සත්පුරුෂයෝ තමන්ගේ දනපරම්පරාව[7] අත් නොහරනාහු මය. එසේ හෙයින් පින්වත් සත්වයෙනි, දිය යුතු දනවස්තු[8] ඇති ව සුවපත් අවස්ථාවෙහි දන් පින් නොකොට ප්‍රමාද ව විසීම කාරණ නොවන්නේය. එබැවින් තම තමා ශක්ති පමණින් පිළිවන් කුසල් කොට දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳ නිවන් සම්පත්[9] විඳින්ට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි:

එවං නිහීනාපි ධනෙන සන්තො
දනන්වයං නෙව පරිච්චජන්ති,
තස්මා හි හොන්තො සති දෙය්‍යධම්මෙ
මාකත්ථ දනෙසු පමාදභාවං - යි.

මෙතෙකින් මෙහි තුන්වන
මෞර්ය බ්‍රාහ්මණ වස්තුව
කියා නිමවන ලදී.

---

1. කොළ ගොතා -පිටපත් හැම.
2 උන්වහන්සේ - මුද්‍රිත හැම.
3. වළඳා - ACEFJ
4. කරව - BGHJ
   කළාහුය - ක.
   කළහුය - බෙ.ස.ම.
5. කියා - GHK
6. බ්‍රාහ්මණහෙම - පිටපත් හැම.
   බ්‍රාහ්මණාණෝ - සද.ක.
   බමුණාණෝ - බෙ.ස.
7. දනපාරමිතාව -BGHKL
8. දනවස්තුව - ABJ, ක.කි.සද.ම.
9. නිවන්පුර සිරි - BDEGHKL

Non-Commercial Distribution

තව ද මෙහි සතරවන දුගගත වස්තුව නම් කවරයත්,

අප බුදුන් ඇවැමෙහි බරණැස් නුවර වසන එක්තරා දිළිඳු මිනිසෙක් අනුන්ගේ ගෙයෙක බැළමෙහෙ කොට ජීවත් වෙයි. එසමයෙහි නුවරවැසි මනුෂ්‍යයෝ බොහෝ දෙන එක් ව ඒ ඒ තන්හි මණ්ඩප ආදිය කරවා මහදන් දෙති. ඔවුන් දක එක් දවසෙක ඒ දිළිඳු මනුෂ්‍යයා සිතනුයේ "මම පෙර පින් නොකළ හෙයින් දැන් අනුන්ගේ ගෙයි බැළමෙහෙ කොට දුක සේ ජීවත් වෙමි. ඇඳගන්නා පිළී පමණකුත් නැත. ගෙයක් දෙරක් නැති හෙයින් සෙසු සැපත් කැල ම නැත. වැදැහෝනා තැනක් පවා දුක සේ ලැබෙමි. දැන් මේ බුද්ධොත්පාද කාලය. තුනුරුවන් ලොව පවත්නේය. මේ සියලු මනුෂ්‍යයෝ ම දැන් පින්[1] කොට තමන් දෙව්ලොව යන්ට මං සරහති. එසේ හෙයින් මමත් දැන් දනක් දී පිනක් කොට ගතිම් නම් යහපත් මය. එසේ දන් පිනක්[2] කොට ගතිම් නම් මතු මට සසර බොහෝ සැපත් විඳීමට හෙතු වන්නේය. එසේ ද වී නමුත් මාගේ ගෙහි යටත් පිරිසෙයින් එක් සාල් නැළියක් පමණකුත් නැත. එසේ හෙයින් උත්සාහයක් නොකොට දනක් දීගත නොහැක්ක. අනුන්ට බැළමෙහෙ කොට වී නමුත් කිසියම් උපදෙශයකින් දනොපකරණයක් සපයාගෙන දන් දෙමි" යි සිතා එතැන් පටන් බැළමේ සොයා ඇවිද ඒ ඒ තන්හි මෙහෙවර කොට ලද්ද වූ උඳු මුං තල කලත් ආදිය ද එකතැන් කොට තබා මිනිසුන් සමාදන් කරවාගෙන නුවර මැද මණ්ඩපයක් කරවා නොයෙක් වන කුසුමයෙන් ඒ මණ්ඩපය අලඞ්කාර කොට සරහා සඞ්ඝයා වහන්සේට ආරාධනා කොට හැඳවාගෙන අවුත් සරහන ලද මණ්ඩපයෙහි වඩා හිඳුවා හැමදෙනා වහන්සේට පැන් නුමුසු කිරිබත් පිළියෙල කරවා වැළඳවීය. ඉක්බිති ඒ දිළිඳු මනුෂ්‍යයා මරණාසන්නයෙහි තමා විසින් දෙනලද ඒ දනය සිහිකොට එම කුශලබලයෙන් නිද පිබිදියක්හු[3] මෙන් තවුතිසා දෙව්ලොව උපන[4]. ඒ දෙව්ලොව ඔහු විසින් කරනලද කුශලකර්මයට සුදුසු පරිද්දෙන් මහත් වූ රන් විමනෙක් පහළ වීය. හාත්පසින් තුන්ගවු පමණ තන්හි දෙවතාවෝ නොයෙක් හෙරි තූර්‍ය්‍යභාණ්ඩ ගෙන නෘත්‍ය ගීත වාද්‍ය පවත්වති. නොයෙක් දිව්‍යාලඞ්කාරයෙන් සැරහුණාවූ දහස් ගණන් දිව්‍යාඞ්ගනාවෝ නිරන්තරයෙන් ඔහු පිරිවරා සිටිති. මෙසේ ඔහු මහත් වූ දිව්‍යසම්පත් විඳිනා කල්හි එක් දවසෙක රන්ගිරි වෙහෙර වසන සිවුපිළිසිඹියා පත් සඞ්ඝරක්ෂිත නම් මහතෙරුන් වහන්සේ දෙවචාරිකාවෙහි වඩනා සේක් මහත් වූ දිව්‍යශොභාවෙන් දිලිහි දිලිහී අනොපමෙය වූ දිව්‍යසම්පත් විඳිනා ඒ දිව්‍යපුත්‍රයා දක සමීපයට එළඹ වැඩසිටිසේක් "එම්බල දිව්‍යපුත්‍රය, තාගේ මේ ප්‍රාසාදය ඝන කනකපර්වතයක් මෙන් සියල්ල ම ඝහරනින් නිමියේය. සියගණන් රන්කොත් පෙළින් ගැවසී ගත්තේ ය. අක්ෂිකොප ඇති එකක්හු ඇස හුණු මධ්‍යාහ්න සූර්‍ය්‍යමරීචියක් මෙන් බලන්නවුන්ගේ නුවන් බමවමින් දිලිහෙන්නාවූ ප්‍රභාමාලාවන් ඇති හෙයින් ඉතා බැලිය නොහැකි ව දශදිග විහිදුනා රශ්මිමාලාවන් ඇත්තේය. නොයෙක් සියගණන් කූළුගේ පෙළින් හා කර්ණිකමාලා සමූහයෙන්[5] ගැවසී ගත්තේය.

---

1. දන් පින් - ABCDF, ක.කි.කැ.බෙ.
   දන් දන් පින් - L, ප..
   දන් පින් - ම
2. දනක් පිනක් -BGHKL
3. පිබිදි එකකු - GHKL
4. උපන්නේය - KL
5. කර්ණිකාමාලා පෙළින් - BGH, කර්ණමාලා පෙළින් -L
   කර්ණිකා මාලා සමූහයෙන් - K

Non-Commercial Distribution

ඒ ඒ තන්හි මනහර මුක්තාකලාපයෝ[1] ලෙලදෙන්නාහ. මනොනුකූල දිව්‍යපහස් දෙන දිව්‍යමය සයනාසනයෙන් සැරහුණාවූ නොයෙක් සියගණන් ගබඩාවලින් ගැවසී සිටිනේය. පූර්වජන්මයෙහි කරන ලද්දවූ කුසල් නමැති වඩුවා විසින් මවනලද මේ ප්‍රාසාදය පිළිකඩ සෙවෙණි හිත්ති දෙරකවුළු හිණිපෙති පියගැටපඩකති ගබඩා ආදි වූ සියලු ම ප්‍රාසාද අලංකාරයෝ[2] ඒ ඒ දිග්භාගයෙන් වෙන වෙන ම සාලංකාර ව සවිභාග ව හොබනේය. ඒ ඒ තන්හි සිට ගසනලද බෙරමඬුලු මධ්‍යයෙහි රඟබැස නානාලංකාරයෙන් සැරහුණාවූ දිව්‍යාඞ්ගනාවෝ අනෙකප්‍රකාර නෘත්‍යාඞ්ග දක්වති. සමහරු ගී කියති. සමහරු ලීලා දක්වා කෙළිති. සමහරු තන්ත්‍රී ගසති. සමහරු වීණා ගායනා කෙරෙති. තව ද මේ ප්‍රාසාදය සිසාරා හාත්පසින් තුන්ගවු පමණ තන්හි නොයෙක් වස්ත්‍රාලංකාරයෙන් සැරහුණාවූ දිව්‍යාඞ්ගනාවන් හා දිව්‍යපුත්‍රයෝ ආතත විතතාදි වූ පඤ්චාඞ්ගික තූර්‍යභාණ්ඩ ගෙන නිරතුරු ව පිරිවරා සිට නෘත්‍ය ගීත වාද්‍යාදීන් සන්තොෂ කරවති. සමහරු ඔල්වරහඬ ගසමින් පැන පැන දිවෙති. සමහරු පිළී හිස[3] නටවති. සමහරු වන්දිභට්ටයන් සේ එකත් ඔසවා හාත්පසින් පිරිවරා සිට සතුතිඝොෂා කෙරෙති. මෙසේ නොයෙක් දිව්‍යසැපින් අනෙකප්‍රකාර වූ දිව්‍යමහිමයෙන් යුක්ත වූ තෙපි දන් තරුපිරිවැරූ[4] පූර්ණචන්ද්‍රයා සේ දිලිහෙව. පෙර තෙපි කවර පින්කමක් කළා දැයි විචාළසේක. එසේ හෙයින් කිනයලදී,

සබ්බ සොවණ්ණයො ආසි - පාසාදෙ රතනාමයො,
සොණ්ණසිඞ්ග සතාකිණ්ණා - දුදිකෙබ්‍රා ව පභස්සරො.
එවං මහිද්ධිකො දනි[5] - තුවං වතෙව භාසසි,
පුච්ඡාමි තං දෙවපුත්තං[6] කිං කම්මමකරී පුරා - යි.

ඉක්බිති දිව්‍යපුත්‍රයා කියනුයේ "ස්වාමීනි, මම "පෙර බරණැස් නුවර දිළිඳු කුලයෙක ඉපද අනුන්ට බැළමෙහෙ කොට ජීවත් ව වසනුයෙමි එනුවර මහජනයන් එක් ව භික්ෂුසංඝයා වහන්සේට ආරාධනා කොට මහත් වූ සන්තොෂයෙන් පින පිනා සඟමොක් සැපත් පත පතා මහදන් දෙන්නා දැක එකල්හි මම සිතනුයෙමි "මෙ මහජනයෝ පෙර කළ කුශලබලයෙන් දන් නොයෙක් වස්ත්‍රාභරණ අන්නපානාදියෙන් සමෘධ ව සැප විඳිනාහු දනුදු සතුටු[7] සතුටු ව මහදන් දෙති. ඔහු මතු පරලෙවුහි ද එම තමන් කළ කුශලානුභාවයෙන් සතුටු සතුටු ව සැපත් විඳිනාහුය. දන් මේ නවවන බුද්ධොත්පාදකාලයත් පැමිණියේය. කුශලාකුශල දෙක්හි විභාග ප්‍රකාශ කෙරෙමින් ධර්මයත් ලොකයෙහි පවත්නේය. ශ්‍රද්ධාවන්තයන්ගේ දන ප්‍රතිග්‍රහණයට යොග්‍ය ව සිටි සෘෂීලාාදී ගුණයෙන් යුක්ත බුද්ධපුත්‍ර වූ සංඝයා වහන්සේත්

1. මුක්තාජාලයෝ - BGHK; මුක්තාමාලායෝ -CL.
2. අලංකාරයෝ - පිටපත් හා ක.කි.සඥ.බෙ.ස අලංකාරයෙන්.
3. හිස සිසාරා - ස.
4. තරු පිරිවර - ACFGHJK
5. මහිද්ධිකො ආසිදනි - *BGHKL*
6. දෙවපුත්ත - බෙ.ස.
7. සතුටු (නැත) - GH, ක.කි.සඥ.

Non-Commercial Distribution

ලොකයෙහි පවතිමින් සිටිසේක. මේ සසර නම් අවුල් වූ කැටියක් සේ අක්මුල් නැත්තේය. කුසල් නොකරන සත්වයන් ම බොහෝ වන බැවින්[1] සතර අපාය ම අඩු නොව පිරෙයි. කුසලධර්මයක් නොකරන්නාවූ කෘපණ ලොභී සත්වයෝ ඒකාන්තයෙන් දුර්ගතියෙහි ම උපදනාහ. පෙර පින් නොකළ හෙයින් දන් මම ඉතා දුඃඛිත ව දිළිඳු ව කෘපණ ව බැගෑපත් ව කිසි සැපතක්[2] නැති ව, සහල් නැළියක් පමණකුත් නිරායාසයෙන් ලැබගත නොහී දුඃඛජීවිකාවෙන් දවස් යවමින් සිටියෙමි.[3] එබැවින් මතු පරලොව දිව්‍ය මනුෂ්‍ය සම්පත් සැප සේ විඳිනා පරිද්දෙන් දන් මේ බුධසාසන නමැති යහපත් වූ කුශලක්ෂෙත්‍රයෙහි පින් නමැති බීජුවටක් රොපණය කෙළෙම් වී නම්[4] යෙහෙකැයි' සිතා සිහා සොයා බැළමෙහෙ කොට මහත් වූ උත්සාහයෙන් උඳු මුං තල කලත් තෙල් පොල් සහල් ආදි වූ දනසම්භාර සපයා බොහෝදෙන සමාදන්[5] කරවාගෙන නුවර මැද මණ්ඩපයක් කරවා උඩ සුදුවියන් බඳවා ඒ ඒ තන්හි මලොලම්බු එල්වා බිම සුවඳ පිරිබඩගෙන ලඳපස්මල් විසුරුවා[6] වට වැට පහන් ලවා දෙපස තිරිකුඩම් තනවා මනහර අසුන් පනවා සංඝයා වහන්සේට ආරාධනා කොට කැඳවාගෙන අවුත් මණ්ඩපයෙහි වඩා හිඳුවා දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා නිවන් සම්පත් ප්‍රාර්ථනා කොට පැන් නුමුසු කිරිබතක් පිසවා දන් දිනිමි. එකල්හි මා පිරිසුදු සිතින් කළාවූ ඒ කුශලයෙහි විපාකයෙන් දන් සියලු සැපතින් අඩුන ව සිත්කලු වූ මේ දෙව්ලොව උපන්මි. දන් මම දිව්‍යමය වූ නොයෙක් පඤ්චකාමසම්පත්තීන් සතුෂ්ට ව දිව්‍ය වූ ආයුසයෙන් හා වර්ණසම්පත්තීන් යුක්ත ව මාගේ දිව්‍යතෙජසින් සියලු දෙවියන් හිරු දුටු කදෝපැණියන් සේ නිශ්ශොභා කරවන තරම් මෙබඳු වූ දිව්‍යතෙජසක් ලදිමි"යි මෙසේ ඒ දිව්‍යපුත්‍රයා තමා කළ කුශලය සඳමඬල අඳනා සේ විස්තර කොට මහතෙරුන් වහන්සේට දන්වීය. එසේ හෙයින් කියන ලදී,

> ආයාසෙන අදසාහං - පායාසං අමතාසයො,[7]
> තෙන කම්මවිපාකෙන - දෙවලොකෙ මනොරමෙ
>
> ජානොමිහි දිබ්බකාමෙහි - මොදමානො අනෙකධා,
> දීඝායුකො වණ්ණවනෙතා - තෙජසීච අහොසහං -යි.

ඉක්බිති ඒ සංඝරක්ඛිත මහතෙරුන් වහන්සේ මිනිස්ලොවට අවුත් තමන් වහන්සේ ප්‍රත්‍යක්ෂයෙන් දුටුවාවූ ඒ දිව්‍යසම්පත්තිය මනුෂ්‍යයන්ට ප්‍රකාශ කොට වදාළසේක. එතෙපුල් අසා මහජනයෝ කුසල්කොට බොහෝ දෙන දෙව්ලොව උපන්හ. මෙසේ එක සහල් නැළියක් පමණ උපකරණයක්[8] නැතිව ද බැළමෙහෙ

---

1. හෙයින් - BDGHKL
2. සැපයක් - BGHL
3. සිටිනෙමි - මුද්‍රිත හැම, ස.
4. කෙළේ වීන් නම් - BG
5. සම්මාදම් - ක.කි.ඝ.ඕ.ස.
6. ඉසුරුවා - BGHKL, ඝ.
7. අමතා යසො - පාලි.
8. උපකරණයක් (නැත) -BGHKL

Non-Commercial Distribution

කොට සිහා සොයා දන් දුන්නාවූ දුඃඛිත දිළිඳු පුරුෂයා පවා තමා විසින් දෙනලද දනයෙහි අනුසසින් දෙව්ලොව ඉපද විශෙෂ වූ දිව්‍යසම්පත් ලද. එසේ හෙයින් පින්වත් සත්‍වයෙනි, තොප හැම විසිනුදු ඉදින් දෙවුමිනිස්සැපත් හා නිවන්සම්පත් අත්පත් කරනු කැමැතහොත් මසුරුසිත් දුරු කොට දන්පින් කිරීමෙන් දශවිධ කුශලකර්මයෙහි ද යෙදී වාසය කරන්ට උත්සාහ කටයුතු. කියන ලදුයේ මැයි:

අභාළහියො දුගගත දීනකොපි
දතං දදනෙතාධිගතො විසෙසං;
සගගාපවගගං යදි පත්‍ථයවෙහා
හතඣාන මචෙඡරමලං දදථාති.

මෙතෙකින් මෙහි
සතරවන දුගගත වස්තුව
කියා නිමවන ලදී.

තව ද මෙහි පස්වන දේවසඤ්චිර[1] වස්තුව නම් කවර යත්,

අප මහා ගෞතම බුදුන් බුදු වූ මේ මහාභද්‍රකල්පයට එකාසංඛ්‍යය කප් ලක්‍ෂයකින් යට මණ්ඩ නම් කල්පයෙහි බුදු වූ නාරද නම් බුදුන් සමයෙහි මේ ලඞකා ද්වීපය රත්නදීපය යන එක්තරා නාමයකින් ප්‍රසිඬ විය. එකල්හි මේ දිවයින මහත් වූ නියංසායෙක් ගැසීය. සියලු සත්‍වයෝ ම බොහෝ සේ සාපිපාසායෙන් පීඩිත ව වෙසෙති. එසමයෙහි ඒ නාරද නම් බුදුරජාණන්වහන්සේගේ ශාසනයෙහි එක් රහත්කෙනකුන් වහන්සේ එක් ගමෙක සිහා ඇවිද යටත් පිරිසෙයින් බත්සරළුවක් පමණකුත් නොලැබ පාත්‍රය සේදූ වන ම ඇරගෙන ගමින් පිටත්වූසේක. ඉක්බිති ඒ ගම්හි එක් ගෙයෙක මනුෂ්‍යයෝ එක ම සාල්නැළියක් කඩ පොට්ටනිය[2] බැඳ සැළෙක බහා පැන් වත්කොට කකාරා ඒ පැන් ගෙන බිබී ජීවත් වෙති. එකල්හි ඔහු තෙරුන්වහන්සේ දුක සමීපයට එළඹ පසහ පිහිටුවා වැඳ පාත්‍රය ගෙන ඒ සාල් නැළිය බත්පිය පාත්‍රයෙහි බහා තෙරුන්වහන්සේට පිළිගැන්වූහ. එකෙණෙහි ඔවුන්ගේ ශ්‍රඬාබලයෙන් ඒ බත් පිඩු සිස් භාජනය බත් පුරා සිටගත. ඔහු ඒ ආශ්චර්‍ය්‍යය දුක "ආයුෂ්මතුන්වහන්සේට දුන්නාවූ දනයෙහි[3] විපාකය අද දවස් ම ලදුම්හ"යි උපන්නාවූ සතුටු සොම්නස් ඇත්තාහු බතින් දුක් විඳිනා මහජනයා රැස් කරවා පළමුකොට ඔවුන් හැම බත් කවා පසුව තුමූත් බත් අනුභව කළහ. කෙතෙක් දෙනා කැව ද සැළෙහි බත් අඩු නො ව ගත් ගත් තැන් පිරෙන්නේ මය. එතැන් පටන් ඔහු දෙමහල්ලෝ ම තමන් කරා පැමිණියාවූ මහජනයාට දන් දෙන්නාහු බොහෝ පින් රැස්කොට ආයු කෙළවර දෙව්ලොව උපන්හ. ඉක්බිති බත් පිළිගත් තෙරුන් වහන්සේ එ බත් පාත්‍රයෙන් ම ගෙනගොසින් පැන්පාසු වූ එක්තරා රුක්මුලෙක වැඩහිඳ අහර පස්විකා වළඳන්ට පටන්ගත්සේක. ඒ වෘක්‍ෂයෙහි අධිගෘහිත වූ දිව්‍යපුත්‍රයා වනාහි සාදුකින් පීඩිත ව වසනුයේ අහර වළඳන තෙරුන්

1. දේවපුත්‍ර - සි.ඤ.ම.: දේසපුත්‍ර - ක.
2. පොට්ටනියෙක - BDEGHKL
3. ඒ දනයෙහි - ACJ

Non-Commercial Distribution

වහන්සේ දක තමාගේ ආත්මභාවය හැර මහලු වෙසක් මවාගෙන තෙරුන් වහන්සේට සමීප ව සිටගත. ඒ බව හඟවා තමන්වහන්සේගේ පූර්වචරිතය ප්‍රකාශ කරනු පිණිස එම දෙව සථවිරයන්වහන්සේ විසින් කියන ලදී:

නාරදෙ කිර සම්බුධො - පුබ්බෙ ආසි නරුත්තමො,
ලොකං දුක්ඛා පමොචෙන්තො - දදන්තො අමතං පදං.

තස්මිං තු සමයෙ තස්ස - සාවකො ජිතබන්ධනො,
භික්ඛිත්වා දීපකෙ ලද්ධ - මාහාරං පරිභුඤ්ජිතුං.

රුක්ඛමූලමුපාගඤ්ජි - තත්ථාසිං රුක්ඛදෙවතා,
බුභුක්ඛිතා උදික්ඛන්ති - අට්ඨාසිං තස්ස සන්තිකෙ -යි.

එකල්හි තෙරුන්වහන්සේ පළමු එතැන්හි කිසි කෙනකුන් නුදුටු හෙයින් ඔහු නොබලා ම අහර වළඳනසේක. ඒ බව දන දිව්‍යපුත්‍රතෙම එක ආලොපයක් තබා තෙරුන්වහන්සේ අහර වැළඳූ කල්හි මදක් යටිගුරෙන්[1] කාරමින් එතැන්හි තමා සිටි බව හැඟවීය. එකල තෙරුන්වහන්සේ ඔහු දක කළකිරී එකෙණෙහි[2] උපන්නාවූ මහත් කරුණා ඇති ව තමන්වහන්සේ වළඳන්ට තිබූ ඒ කෙළවර බත් ආලොපය ඕහට දුන්සේක. ඉක්බිති ඒ දිව්‍යපුත්‍රතෙම බත් ආලොපය අතින් අල්වාගෙන සිට සිතනුයේ "මා විසින් මීට පූර්වජන්මයෙහි[3] ශ්‍රමණබ්‍රාහ්මණ කෙනකුන්ට වේවයි සෙසු දුගීමගී යාචක කෙනකුන්ට වේවයි යටත් පිරිසෙයින් බලු කපුටු ආදි වූ තිරිසන් සතක්හට වේවයි ආහාර දනයක් නොදෙන ලද්දේ වන. දන් මම මෙසේ දිව්‍යපුත්‍ර ව ඉපද පවා සිත් සේ අනුභව කරන තරම් ආහාරයක් ලැබගත නොහෙමි. අද මෙවැනි යහපත් වූ කුශලක්‍ෂෙත්‍රයකුත් ලදිමි, දියයුතු දන වස්තුවකුත් ඇත. එබැවින් මේ බත්පිඩ තෙරුන්වහන්සේට ම පිළිගැන්වූයෙම් වී නම්[4] ඒ දනය මට සසර සිටිනා තෙක් කල් මුළුල්ලෙහි බොහෝ සැප එළවන්නේ ය"යි සිතා ඒ බත් ආලොපයෙහි ලොභය හැර[5] තෙරුන්වහන්සේ කරා එළඹ "ස්වාමීනි, නුඹවහන්සේගේ ගැත්තවුට මෙලොවින් සංග්‍රහ නොයිනා පරලොවින් අනුග්‍රහ කොට වදළ මැනැවැ"යි කියා ඒ බත්පිඩ දෙවනු ව තෙරුන්වහන්සේගේ පාත්‍රයට පිළිගැන්වීය. ඔහු ඒ බත් ආලොපය තෙරුන් වහන්සේගේ පාත්‍රයෙහි බහාලූ ඇසිල්ලෙහි ම වටින් තුන්ගවු පමණ තන්හි රසමසවුලෙන් යුක්ත වූ දිව්‍යමය බත් භාජන[6] නිර්මිත ව පෙනී ගිය. එකල ඒ දක සන්තුෂ්ට වූ දිව්‍යපුත්‍රයා තෙරුන්වහන්සේ[7] පසහ පිහිටුවා වැඳ එයින් දිව්‍යභොජනය ගෙන පළමු කොට දන් දී පසුව තෙමේ බත් අනුභව කෙළේය. එසේ හෙයින් කියන ලදී:

---

1. යටි උගුරෙන් - CDGHJ
2. එකණෙහි - EFG
3. ජාතියෙහි - F, මුද්‍රිත හැම.
4. වීන්නම් - BFGHKL
5. ඒ බත් ආලොපය හැරගෙන - BGHKL
6. බඳුන් - මුද්‍රිත හැම
7. තෙරුන්වහන්සේට -BCDGHKL

Non-Commercial Distribution

අදසි මෙ හත්‍ථපිණ්ඩං - කරුණාපූරිතන්‍තරො,
ගහෙත්‍වාන ඨිතො පිණ්ඩං - සහමානො බුද්ධං තද - පෙ
ඉති වත්‍වා අදසාහං - භුඤ්ජි සොපි දයාපරො,
තෙනාහං පුඤ්ඤකම්මෙන - සුධන්‍නමලභිං ඛණෙ-යි.

ඉක්බිති ඒ දිව්‍යපුත්‍රතෙම දෙවන දවස් පටන් එම තෙරුන්වහන්සේට ද සෙසු තමා කරා පැමිණි මහජනයාට ද නිරන්තර ව මහදන් දෙමින් බොහෝ පින් කොට ආයු කෙළවර දෙව්ලොව ඉපද එහි ආයු පමණින් දිව්‍යසම්පත් විඳ එයින් ගොස් මෙම ක්‍රමයෙන් කප් අසංඛ්‍යයක් මුළුල්ලෙහි ඔබිනොබ සැරිසරා සදෙව්ලොව මහත් වූ දිව්‍යමය පඤ්චකාමසම්පත්[1] විඳ ඉක්බිති මේ කල්පයට ලක්‍ෂයක් වන කප බුදු වූ පියුමතුරා නම් බුදුන් සමයෙහි දෙව්ලොවින් චුත ව බරණැස් නුවර අපමණ වූ නොයෙක් සම්පත් ඇති මිථ්‍යාදෘෂ්ටි ගත් කෙළෙඹිපුත්‍රයක්හට පුත් ව උපන. එකල ඕහට දෙව යයි නම් තිබූහ. පසුව ඔහු කටයුතු[2] දන්නා වයසට පැමිණි කල්හි ඔහුගේ මවුපිය දෙදෙන පරලොව ගියහ. එකල්හි ඒ කෙළෙඹිපුත්‍රයා තමාගේ කුලපරම්පරායෙන් පැවත ආවාවූ රත්රන් අමුරන් මුතු මැණික් ආදියෙන් පිරී සිටිනා කොටු ගුලු[3] ආදිය දක සිතනුයේ "මාගේ මවුපිය දෙදෙන නමත් මිථ්‍යාදෘෂ්ටි හෙයින් මේ සා මහත් ධනරාශියක් ඇති ව පවා දනාදි වූ කිසි කුශලයක් නොහොට මිය පරලොව යන්නාහු මෙයින් එක කහවනුවක් පමණකුත්[4] නොගෙන සිසතින් පලා ගියාහ; මම වනාහි එසේ නොකරමි. දන්පින් කිරීම් වසයෙන් අනුගාමික නිධානයක් මෙන් කැටුව ම ඇරගෙන යෙමි" යි සනිටුහන් කොට නුවර බෙර ලවා දුගී මගී යාචකයන් රැස්කරවා සතියක් ඇතුළත සියලු ධනරාශිය ම යාචකයන්ට දන් දී ගිහිගෙන් නික්ම තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් මහණ ව කිසුණු පිරියම් කොට පඤ්චාභිඥවන් හා අෂ්ටසමාපත්තීන් උපදවා මහත් වූ ඍද්ධ්‍යනුභාව ඇති ව ආකාශචාරී ව වෙසෙති. එකල්හි යට කී පියුමතුරා නම් බුදුරජාණන් වහන්සේ හංසවතී නුවර නිසා වැඩවසනසේක් දවසෙක දිව්‍යබ්‍රහ්මනාගසුපර්ණාදි වූ මහපිරිස් පිරිවරා සවනක් ඝන බුඩරශ්මි මාලාවෙන් වටකරන ලදු ව ඛ්‍යාමප්‍රභාමණ්ඩලයෙන් සැරහී කෙතුමාලාලංකාරයෙන් බබළමින් මහත් වූ බුඩලීලායෙන් වැඩහිඳ බණ වදරනසේක. එකල්හි ඒ තාපසයෝ කිසි කටයුත්තක් නිසා හංසවතී නුවර මුදුනෙන් යන්නාහු මහත් වූ ජනසමාගමය හා බුදුන්ගේ සියලඟින් දිවන්නාවූ බුදු රැස්කඳ දක කිමෙක් දෝහෝයි විස්මයපත්වූ සිත් ඇති ව අහසින් බැස බුදුන් දක බණ පිරිස් අතුරෙහි සිට බණ අසා ඔදවැඩි පහන් සිතින්[5] බුදුන් වැඳ අවසර ගෙන තමන් වසන පන්සලට ම ගියාහ. ඉක්බිති ඒ තාපසෝ එහි ආයු පමණින් සිට එයින් මිය තව්තිසා දෙවුලොව උපන්හ. එසේ හෙයින් කියන ලදී,

---

1. සම්පත්තීන් - BGHKL
2. කටයුතු කාරිය - J
3. කොටගුලු - ABEF
4. විවරකුත් - BGHKL
5. ඔද වැඩි සිතින් - BGHL

Non-Commercial Distribution

සතසහස්සෙ ඉතො කප්පෙ - පදුමුත්තර නාමකො,
උප්පජ්ජි ලොකනායකො - ධම්මරාජා තථාගතො - පෙ -
ධම්මං සුත්වා උදග්ගොහං - කාලං කත්වාන සත්ථුනො,
තතො චුතොපපන්නොස්මි - තාවතිංසෙ මනොරමෙ-යි.

මෙසේ තව්තිසා දෙව්ලොව ඉපද තුන්කෙළ සැටලක්‍ෂයක් අවුරුදු මුළුල්ලෙහි පරමරමණීය වූ දිව්‍යසම්පත් විඳ ඉක්බිති තිස්දහසක් කප් මුළුල්ලෙහි යම්කිසි දුර්ගතියෙක නොඉපද සදිව්‍යලොකය මිනිස්ලොකය යි යන සප්තවිධ වූ කාමස්වර්ගයෙහි අනෙක ප්‍රකාර දිව්‍යමනුෂ්‍ය සම්පත් විඳිනාහු එක්පනස් වරෙක ශක්‍රදෙවෙන්ද්‍ර ව දෙදෙව්ලොව දිව්‍යරාජ්‍යය කළහ. එක්විසි වරෙක සක්විති රජ ව සතරමහද්වීපයෙහි එකාතපත්‍ර චක්‍රවර්තිරාජ්‍යය කළහ. දඹදිව ඒ ඒ දෙශයෙහි නොයෙක් වර ප්‍රදෙශ රාජ්‍යය කළහ. පසුව මේ භද්‍රකල්පයෙහි අප මහා ගෞතම බුදුන් බුධරාජ්‍යය කොට සියලු බුධකෘත්‍යය නිමවා පිරිනිවි කල්හි එම පූර්ව ජන්මයෙහි තමන් විසින් කරන ලද කුශලකර්මයා විසින් මෙහෙයන ලදු ව දඹදිව සැවැත් නුවර උතුම් වූ කුලයෙක ඉපද මහත් වූ මනුෂ්‍යසම්පත් විඳ වසන්නාහු සත් හැවිරිදි වයස එක් දවසෙක දෙව්රම්විහාරයට[1] ගොස් එක් භික්‍ෂු කෙනකුන්වහන්සේ බණ කියන්නා දැක ඔබ කරා එළඹ බණ අසා සසර කළකිරී මහණ ව අනිත් ලකුණු උපදවා එතැන්හි ම හිඳ සිව්පිළිසිඹියා පත් රහත් ව නිවන්සැපත් විඳිමින් වසනසේක් පෙර ජාතියෙහි කෙබඳු කුශලයක් කොට දැන් මෙබඳු මේ නිවන්සැපත් ලදිම් දෝ හෝ" යි දිවසින් බලා තමන්වහන්සේ විසින් පූර්වජන්මයෙහි කළ කුශලකර්මය හා ඒ කුශලයෙන් ලද්ද වූ සම්පත්තිවිශෙෂය[2] විශෙෂයෙන් දැක භික්‍ෂුසංඝයාවහන්සේ මධ්‍යයෙහි ප්‍රකාශකොට දක්වන සේක්,

නාරදෙ කිර සම්බුධො - පුබ්බෙ ආසි නරුත්තමො,
ලොකං දුක්ඛා පමොචෙන්තො - දදන්තො අමතං පදං.

යනාදි වූ මේ යථොක්ත ගාථා විස්සෙන් තමන්වහන්සේගේ මේ පූර්වචරිතාපදනය ගෙනහැර දක්වා එම කුශලය ප්‍රශංසා කොට හඟවනසේක්,

සුදින්නං මෙ තදා දානං - සුස්සුතං ධම්ම මුත්තමං,
දුක්ඛස්සන්තං අකාසාහං - තස්ස කම්මස්ස වාහසා.

යනාදීන් "එම්බා සත්වයෙනි, එකල්හි ඒ දනය මා විසින් පිරිසුදු සිතින් ඉඳුරා ම දෙනලද. ධර්මය ද ආදර සහිත ව ඉඳුරා ම අසනලද. එසේ හෙයින් මම එම කුශලකර්මයාගේ ආනුභාව මහිමයෙන් දැන් සියලු සසරදුක් දුරුකොට නිවන්සැපත් විඳින්ට පටන් ගත්මි" යි වදරා බොහෝ දෙනා කුශලක්‍රියාවෙහි යොද වදළසේක. මෙසේ එක බත් ආලොපයක් පමණ දුන්නාවූ දනයෙන් හා ඇසිල්ලෙක මොහොතක් කල් බණ ඇසුවාවූ කුශලයෙන් පවා ශ්‍රධාවන්ත සත්වයෝ දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා

1. දෙව්රම්වෙහෙරට - GH
2. විශෙෂය (නැත) - BGHKL, ක.කි.කැ.ම.

Non-Commercial Distribution

තිවත් සම්පත් ලබන්නාහු මය. එසේ හෙයින් පින්වත් සත්වයෙනි, බොහෝ දන්පින් කළාවූ සත්වයන් මතු ලබන්නාවූ ස්වර්ග මොක්ෂ සම්පත්තිය කවරෙක් නම් කියා නිමවා ද? එබැවින් තම තමා ශක්ති පමණින් පිළිවන් කුසල් කොට සවර්ග මොක්ෂ සම්පත් ලද මැනවි. කියන ලදුයේ මැයි:

දනෙනපෙවං චරිමාය පිණ්ඩියා
සවනාය ධම්මස්ස මුහුත්තකෙන,
ලභන්ති සත්තා තිවිධම්පි[1] සම්පදං
ඵලං වදෙකො බහුදයකස්ස හො-යි.

මෙතෙකින් මෙහි
පස්වන දෙවයස්විර වස්තුව
කියා නිමවන ලදී.

මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි බ්‍රාහ්මණ වර්ග නම් වූ
නවවන පරිච්ඡේදය නිමි.

තව ද මේ සද්ධර්මාලංකාරයෙහි දසවන මහාසෙන වර්ගය නම් කවර යත්, එහි පළමුවන මහාසෙන වස්තුව මෙසේ දතයුතු.

අප බුදුන් පිරිනිවි පසු දඹදිව පැළලුප් නුවර මහාසෙන නම් වූ ධර්මරජ්ජුරුකෙනෙක් දශරාජධර්මයෙන් රාජ්‍යය කෙරෙති. ඒ රජ්ජුරුවෝ තමන්ගේ මවුපිය මුතුන් මීමුතුන්[2] ආදි වූ කුලපරම්පරාවෙන් උදිතොදිත ව පැවතගෙන ආවා වූ අපමණ ධනරාශිය බලා "අනේ මොහු මෙතෙක් සැපත් හැර පරලොව යන්නාහු සෙසු දෑ තබා මෙයින් එක මස්සක් පමණකුත් නොගෙන සිසතින් පලා ගියාහ. අහෝ සංසාරගත සත්වයන්ගේ අඥානභාවය ඉතා නොසිතිය හැක්කේ මය. උපයා රැස් කළ වස්තුව[3] තබා තමන්ට වන්නාවූ විනාසය ද තමා හැර වස්තුව නස්නා බව ද යන මේ දෙක ම තමන් නුවණ මඳ හෙයින් නොදන්නාහුය" යි මෙසේ සම්පත්තිය ද විපත්තිය ද යන සියල්ල ම නුවණින් සලකා වෙහෙරට[4] එළඹ බණ අසා තුනුරුවන් කෙරෙහි පැහැද ලබනලද මහත් වූ ශ්‍රද්ධා ඇති ව මිහිරි වූ කන

---

1. චිවිධම්පි - BGHKL
2. මීමුතුන් (නැත) - BGHKL
3. වස්තු - BEGHK
4. මෙහෙණිවරට - AC
   මෙහෙවරට - FI

Non-Commercial Distribution

බොන දෑ ආදිය සපයා දවස [දවස][1] දහසක් දෙනාවහන්සේට මහදන් දෙමින් මෙසේ අනෙකප්‍රකාර කුශලකර්‍මයන් රැස් කෙරෙමින් කල් යාමෙකින් එක් දවසෙක සිතන්නාහු "මෙසේ ම රාජ්‍ය සම්පත්තියෙහි[2] පිහිටා රාජනියොගයෙන් මහජනයන්ට පීඩාකොට දෙන්නාවූ[3] දනයට වඩා සිය අතින් මෙහෙකොට උපදවා ගත් ධන ධාන්‍ය ආදි වූ වස්තුවෙන් දෙනලද්දවූ දනය මහාඵල[4] මහානිසංස වන්නේය. දන් මා විසින් එපරිද්දෙන් ම සිය අතින් මෙහෙ කොට දනක් දුන මැනවැ"යි සිතා තමන්ට[5] විස්වාසී වූ ශික්‍ෂිත අමාත්‍යයක්හට රාජ්‍යය පාවා දී සැදෑහැ ඇති තමන්ගේ එක්තරා නැහැණියකෙනෙකුන් කැඳවාගෙන කිසි කෙනකුන්ට නොහහවා අප්‍රසිඩ වෙශයෙකින් නුවරින් නික්ම උත්තර මධුරා නම් නුවරට ගොස් ඒ නුවර බොහෝ සම්පත් ඇති අමිතභොගී සිටාණකෙනකුන් සමීපයට එළඹ ඒ සිටාණන් විසින්[6] "තෙපි කුමක් පිණිස අවු ද"යි විචාළ කල්හි තොපට බැළමෙහ කරන්නට ආම්හ යි කියා ඒ සිටාණන් යහපතැයි ගිවිසි කල්හි ඔවුන්ගේ ගෙයි තුන් අවුරුද්දක් මුළුල්លෙහි රජ්ජුරුවෝ බැළමෙහෙ කළහ. ඉක්බිති එක් දවසෙක සිටාණෝ බැළමෙහෙ කරන රජ්ජුරුවන් හා නැහැණියන් දක සමීපයට කැඳවා "එම්බා, තෙපි දෙදෙන ඉතා ම සිව්මැලිය ව. එතෙකුදු වුවත් අපගේ මේ ගෙයි බැළමෙහෙ පිණිස මෙහෙ කරන්නාවූ තෙපි දෙදෙන බොහෝ කලක් මෙහි ම විසුව. මෙතුවක් කල් මුළුල්ලෙහි කිසි කර්‍මාන්තයකත්[7] තොපගේ කුසීතභාවයෙක් නොපෙනෙයි. සෙඩු අනාචාරයකුත් නුදුටුම්හ. කැඳබත් පමණක් හැර අපගෙන් තොප හැම ලත් අතික් උපකාරයකුත් නැත. කුමක් පිණිස මෙසේ ම මෙහෙ කරා ද" යි විචාළහ. එතෙපුල් අසා රජ්ජුරුවෝ "එම්බා සිටාණෙනි. තොපගේ මේ ජනපදයෙහි රත්හැල් සාල් ඉතා යහපතැයි බොහෝ දෙන කියති. එසේ හෙයින් රත්හැල් පිණිස මෙහෙ කරම්හ" යි කීහ. එබස් අසා ඔවුන් කෙරෙහි සන්තුෂ්ට වූ සිටාණෝ දහසක් ගැල් පුරා රත්හැල් දුන්හ. රජ්ජුරුවෝ ද දහසක් ගැල් පුරා රත්හැල් ලැබ සිටාණන්ට කියන්නාහු "එම්බා පින්වත් සිටාණෙනි, මේ ගැල් හැම අපගේ නුවරට පමුණුවාපියව" යි කීහ. එබස් අසා සිටාණෝ ද යහපතැයි කියා රත්හැල් පිරූ ගැල් දහස රජ්ජුරුවන්ගේ

---

1. දවස - පිටපත් හැම
   දවස දවස - මුද්‍රිත හැම
   දිවසෙ දිවසෙ - පාලි
2. සම්පතෙහි - ABEJ
   සම්පතෙයි - G
3. දන් දෙන්නාවූ -GH
   දන් දෙන්නාවූ - L
4. මහත්ඵල - B, මුද්‍රිත හැම
5. තමන් - BGHL
6. විසින් (නැත) - BGHKL
7. කර්මාන්තයක් - ACFJ
   කර්මාන්තයෙක්හි - ක.සි.සැ.බෙ.

Non-Commercial Distribution

නුවරට ම තමන්ගෙන්[1] මිනිසුන් සලස්වා[2] යවූහ. එකල්හි රජ්ජුරුවෝ නුවරට ගොස් සිටාණන්ට මාහැඟි වූ නානා වර්ණ වස්ත්‍රජාතීන් රන්[3] අමුරන් ආදියෙන් එම ගැල් පුරා එවා[4] සිටාණන් හා මිත්‍රසන්ථවය සුස්ථිර කොටගෙන ඒ රත්හැල් සියල්ල ම ගෙන්වා රජගෙයි රැස් කරවූහ. පසු ව රජ්ජුරුවෝ එයින් කීප දවසක් ගිය කල්හි තුමූ ම මොහොලක් ඇරගෙන සිය අතින් වී පහරනාහ.[5] රජ්ජුරුවන්ගේ නැඟිණියෝ දවසෙ[6] පොළා අරනාහ. මෙසේ දෙදෙනා වී පැහැර පැහැස[7] සහල් රැස්කොට දරපැන් ගෙනවුත් පැසිබත් පිස රජගෙයි පන්සියයක් ආසන පනවා තබා "මා කෙරෙහි කරනලද අනුකම්පායෙන් මහාසඞ්ඝයාවහන්සේ මාගේ රාජභවනයට වැඩ අහර පිළිගන්නා සේක්ව"යි කියා කාලඝොෂා කැරවූහ. ඒ ආයාචනා වචනය අසා[8] පන්සියයක් රහතන්වහන්සේ ආකාශයෙන් වැඩිසේක. රජ්ජුරුවෝ ඒ හැමදෙනා වහන්සේ ම[9] තමන් ස්වහස්තයෙන් ම වැළඳවූහ. එකල්හි ඒ පන්සියයක් දෙනාවහන්සේ අතුරෙන් පුවඟු දිවයින වසන මහාසීව නම් එක් තෙරකෙනකුන්වහන්සේ තමන්වහන්සේ ලත් බත් පාත්‍රය ගෙන, මොහු මා දකිත්වයි අධිෂ්ඨාන කොට අහසින් පුවඟුදිවයින්[10] වැඩ තමන්වහන්සේ ගෙන ගිය බත්පාත්‍රය එහි වසන පන්සියක් දෙනාවහන්සේ හා සමග බෙද වැළඳූසේක. ඒ බත්පාත්‍රය උන්වහන්සේගේ ආනුභාවයෙන් හැමදෙනා වහන්සේ කැමති පමණක් වළඳන්ට සෑහැයිණ[11]. මෙසේ ස්වල්ප වූ දෙයාධර්මයෙන් පවා සත්පුරුෂ වූ ආයර්‍ය්‍යශ්‍රාවකයන් වහන්සේ දායකයන්ගේ සිත් පහදවා පරලොවට ප්‍රතිෂ්ඨාවක් ම කරනසේක. හේ එසේ මය. තමාගේ අතිධවල වූ අමෘත කාන්ති සමූහයෙන් කිරිමුහුද උද්දම කරවා ශොභා වඩවන්නාවූ චන්ද්‍රයා පරිද්දෙන් ම සථානොචිත ප්‍රඥවෙන් යුක්ත වූ ආයර්‍ය්‍යශ්‍රාවකයන් වහන්සේ ස්වල්පමාත්‍ර වූත් දෙයධර්මයෙකින් දායකයන්ගේ සිත් පහදවා ඔවුන්ගේ ශ්‍රද්ධා වර්ධනය කරන සේක් මය. සිල්වත් වූ තමන්වහන්සේට දුන්[12] දනය නොසිල්වතුන්ට දී අසථාන නියොජනයට නොපමුණුවනසේක. පමණ නොසලකා මහෙච්ඡතාවෙන් බොහෝ ප්‍රත්‍යය පිළිගෙන තබා සන්නිධි නොකරනසේක. තමන්වහන්සේට නියත කොට දුන් ප්‍රත්‍යය අග නොගෙන අතික් තෙනකට දීමෙන් අසත්පථයෙහි නො නසනසේක. සිල්වත් ව සිට ප්‍රත්‍යය පරිභොග කරන හෙයින් ථෙය්‍යපරිභොගයට නොපමුණුවනසේක. දැහැමින් ලත් ප්‍රත්‍යය පස්විකා පරිභොග කරන හෙයින් ඉණ පරිභොගයට නොපමුණුවනසේක. ලත් ලත් දෙය සඟවා තබා නොනසන හෙයින් නුගුණ කියා නින්ද කොට නොදමන හෙයින් අපරිභොගයට නෙපමුණුවනසේක. කුලයන් සිත්

---

1. තමන්ගේ -ABGHK
2. ලවා - BGHL
3. රත්රන් - BCEFGHKL,
   රන් - AJ, ක.කි.කැ.බෙ.ස.
4. එවා (නැත) - ACDFJ, මුද්‍රිත හැම
5. පරනාහ - DEJ; පහරිනාහ -L
   පරිනාහ - BGHK
6. දවසෙයියා - CF, ක.කි.කැ.
7. පැහැර පැහැසල් - කැ.ක.
   පැහැර පැහැර සහල් - කි.
   පැහැර සහල් - බෙ.
   පැහැර පැස සහල් - ම.
8. නිසා - බෙ.
9. වහන්සේට ම -J
10. පුවඟු දිවයිනට - BCJ
11. සෑහැවිණ -AFJ, ක.කි.කැ.ස.
    සෑහිණ- ම.; සැපවිය-K; සැපවිණ - J
12. දුන්නාවූ - BC, මුද්‍රිත හැම, ස.

Non-Commercial Distribution

ගන්නා පිණිස දී කුලදූෂණයට නොපමුණුවනසේක. නුසුදුසු ලෙස පරිභොග කිරීමෙන් දුෂ්පරිභොගයට[1] නොපමුණුවනසේක. තමන්වහන්සේ සිල්වත් ව සිට ලද්ද වූ සිවුපසය සිල්වතුන් හා සමග කොටස් කොට බෙද, ලද පසය පස්විකා දයක[2] පරිභොගයෙන් පරිභොග කරන හෙයින් දයකයන්ට මහාඵල මහානිසංස කරනසේක් මය. කියන ලදුයේ මැයි:

අප්පකෙනපි මෙධාවී - දයකානං මනම්පති,
සඩං වඩ්ඪෙන්ති වජෙව - රංසිනා තීරසාගරං[3]

අට්ඨානෙ න නියොජෙන්තා - කරොන්තා නෙව සන්නිධිං,
පරිභොගමකත්වාන - නෙව නාසෙන්ති පච්චයං.

න පාපෙන්තා ච ධෙය්‍යස්ස - න කරොන්තා තපෙච් ඡණං,
විභජන්ති තෙ සුසීලෙසු - සයං භුත්වාන සීලවා -යි.

ඉක්බිති රජ්පුරුවෝ තමන්ගේ බාල නැගිණියන් හා සමග රජ්ගෙයි ම සිට පුවහුදිවයින වැඩහිඳ තමන්ගෙන් ගෙනගිය පැසිබත වළඳන්නාවූ පන්සියයක් රහතන්වහන්සේ දක අතිශයින් ම සන්තුෂ්ට වූහ. ඉක්බිති ඔහු මැනහාගයෙහි තමන් විසින් දෙන ලද එම උතුම් වූ දනය නිරන්තර ව සිහි කෙරෙමින් ප්‍රීති උපදවා බණ අසා නොබෝ කලකින් දෙදෙන ම සෝවාන් වූහ. මෙසේ මතු ලබන සම්පත් පිණිස කුසල් කිරීමෙහි මහත් වූ අදහසින්[4] උත්තම සත්වයෝ මේ ජාතියෙහි තමන්ට වන්නා වූ කායික දුක්[5] නොසලකා මහත් වූ රජසැපත් හැර පලා ගොස්[6] සිය අතින් මෙහෙ කොට දහැමින් ලද වස්තු ගෙන පින් රැස් කරන්නාහු මය. එසේ හෙයින් නුවණැති පින්වත් සත්වයෙනි, තමාගේ ශරීරයට දුක් දී ආත්මශක්තියෙන් කරන්නාවූ කුශලයක් ආදර සහිත ව සිය අතින් කොටගෙන සියලු ස්වර්ගමොක්ෂ සම්පත්තිය ම සාධාගන මැනවි. කියන ලදුයේ මැයි:

හිත්වා මහන්ත සිරිමායති භාවි භූතිං
ආකංඛ්‍ය කිඤ්චි සක දුක්ඛමචින්තයන්තා,
පුඤ්ඤං කරොන්ති සුජනා ඉති මන්තයිත්වා
නිච්චං කරොථ කුසලං කුසලා[7] සහත්ථා-යි.

මෙතෙකින් මෙහි පළමුවන
මහාසෙන වස්තුව
කියා නිමවන ලදී.

1. දුක්පරිභොගයට -ACDEFJ, ක.කි.ඝ.
2. දයජ්ජ - බෙ.ස.
3. ඛීරසාගරෙ - KL - ඛිරසාගර - බෙ.
4. අදහස් ඇති - BEGHKL
5. දුක්මය - BGHKL
6. පලා ගොසින් - බෙ.ස.
පවා ගොස් - KL
7. කුසලං -BCDEFGHJ, ක.කි.ඝ.ම.

Non-Commercial Distribution

තව ද මෙහි දෙවන අනන්‍යතර මනුෂ්‍ය වස්තුව නම් කවර යත්, එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු:

අප මහාගෞතම බුදුන් බුදු ව[1] බුද්ධරාජ්‍යය කොට නිවන්පුර පැමිණි මැතභාගයෙහි දඹදිව පැළලුප් නුවර සමීපයෙහි පිටිසර ගමෙක වසන්නාවූ එක්තරා දුක්පත් මිනිසෙක් දවසෙක අතික් ගමකට යනු සඳහා පිළී දෙකක් හැඳගෙන නික්ම සමීපයෙක මිනිසුන් නැති මහත් වූ වනමධ්‍යයකට පැමිණියේය. එකල්හි මග එන්නාවූ එක් සොරෙක් ඔහු හැඳගෙන යන්නාවූ වස්ත්‍රය පැහැර ගනිමි යි සිතා පසුපස්සෙහි ලුහුබඳවා නික්මිණ. එකල්හි මඟී ව යන්නාවූ ඒ පුරුෂතෙම දුරින් එන්නාවූ සොරහු දක මෙසේ සිතීය. "මම වනාහි දන් මේ සොරහු කෙරෙන් දුර තබා ම ගැළවී දිවපියන්ට ද, එසේ නැත ළං වූ කල්හි සොරු මිරිකා අල්වාගෙන පිටිකර පැහැර කර අල්වා ඉවත දමා පියා බලාත්කාරයෙන් ම පලා යන්ට ද එබඳු ශක්තියක් නැති හෙයින් අසමර්ථයෙමි. දන් ඇසිල්ලකින් මේ සොරා අවුත් මා නො කැමතිව ද[2] මේ වස්ත්‍රය බලාත්කාරයෙන් ම පැහැරගන්නේය. එසේ බලාත්කාරයෙන් ගන්නාවූ මේ සොරහට මා විසිනුත් මේ වස්ත්‍රය වල දමන දෙයක් සේ නිකම් හැරපීම යුක්ත නොවෙයි. එබැවින් මෝහට දන් දීම් වසයෙන් ම දෙමි යි සනිටුහන් කෙළේය. එකෙණෙහි සොරා දිවගෙන අවුත් ඔහුගේ වස්ත්‍රය ගසා අල්වාගත. එකල මඟී ව යන්නාවූ පුරුෂතෙම 'මාගේ මේ වස්ත්‍රදානය මතු සසර මා උපනුපන් ජාතියෙහි සියලු සැප විඳීමට ඒකාන්ත කාරණ වෙව"යි සිතා සිත නොපහදවා ම[3] වස්ත්‍රය දන් දී ඉක්බිති අප බුදුන් යමාමහ පෙළහර දක්වන දවස් පුරාණ කාශ්‍යප නම් නිඝණ්ඨයා සැඟවී දිව්වා සේ හිත පිලි නැති හෙයින් මහ මඟින් පහ ව වල් හසරකින් නික්මිණ. එකල ඔහු සර්පයෙක් දෂ්ට කෙළේය. එතෙම ඒ ක්‍ෂණයෙහි විෂවෙගයෙන් කාලක්‍රියා කොට එම වස්ත්‍රදානයෙහි අනුසසින් හිමාලය වන ප්‍රදේශයෙහි නොයෙක් සියදහස් ගණන් සුරසුඳුරින් විසින් පිරිවරන ලදුව තුන් යොදුන් පමණ තන්හි අතුර නොහැර සිසාරා සිටගන්නාවූ නොයෙක් ලක්‍ෂ සුවහස් ගණන් කල්පවෘක්‍ෂයෙන් සශ්‍රීක වූ දෙළොස් යොදුන් උස ඇති රන්විමනෙක උපන. එකල ඒ දිව්‍යපුත්‍රතෙම තමාගේ මහත් වූ දිව්‍ය ඓශ්වර්‍ය්‍ය දක "ගිය දවස මේ කවර පින්කමක් කොට ලද්දවූ සම්පත්තියෙක් දෝහෝ"යි දිවසින් බලනුයේ එම දවස් සිත නොපහදවා[4] සොරාට දුන් වස්ත්‍රදානයෙන් ලද්දවූ සම්පත් බව දන මහත් වූ සන්තොෂයට පැමිණ තමාගේ පූර්වකුශලය හා එයින් ලද්දවූ දිව්‍යසම්පත්තිය ප්‍රකාශ කිරීම් වශයෙන් වෙන වෙන වර්ණනා කොට දක්වන්නාවූ දිව්‍යපුත්‍රතෙම:

---

1. බුදුව (නැත) - BCGKHL, කකි.සෑ,ම
2. නොකැමති වුව ද - ACEF, බෙ.ම.
   නොකැමැති වුවා ද ක.කි.සෑ
3. පහදවා ම - BGHKL, බෙ. පහදවා - ම.
   චිත්තං පසාදෙත්වා - පාලි
   එහෙත් 'න සම්මාදිත්‍ථාවත්ථෙස්ස' යි ගාථාවෙහි දක්වේ.
4. පහදවා -BGHKL, ම.ක.

Non-Commercial Distribution

පරිණාමිතමත්තෙන - දනස්ස සකසන්තකං
දදති විපුලං භොගං - දිබ්බමිස්සරියං වරං

ද්වාදස යොජනුබ්බෙධං - දුද්දික්ඛං චක්ඛු මූසනං,
කූටාගාරවරූපෙතං - සබ්බ සොවණ්ණියං සුභං.

මම පුඤ්ඤෙන නිබ්බත්තං - නෙක රාගධජාකුලං
තථෙව පරිසුද්ධෙහි - විතානෙහි ච ලඞ්කතං.[1]

පාසාද පරියන්තම්හි - දිබ්බවත්ථානි ලම්බරෙ,
වාතෙරිතා තෙ සොභන්ති - අවෙහන්තාව සුධාසිනො.

පාසාදස්ස සමන්තා මෙ-භූමිභාගෙ තියොජනෙ,
ඉච්ඡිතිච්ඡිත දතාරො - ජාතාසුං සුරපාදපා.

නච්චෙ නවෙවහි ගීතෙහි - වාදෙහි තුරියෙහි ච,
නෙකච්ඡරා සහස්සෙහි - මොදමි භවනෙ මම.
න සම්මාදින්නවත්ථස්ස - අබ්භෙන ඵලම්දීසං,
ඛෙත්තෙ සම්මා දදන්තස්ස - කො ඵලං වණ්ණයිස්සති යි

යනාදීන් "එම්බා සත්වයෙනි, තමා සන්තක වස්තුව දන් දෙමියි සිතින් පිරිනැමූ පමණකින් ම හැම කල්හි අඩු නොවන්නාවූ සියලු උපභොග පරිභොග වස්තුවෙන් සමෘධ වූ දිව්‍යෛශ්වර්‍ය්‍ය ගෙනහැර දෙන්නේය. දන් මාගේ කුශලානුභාවයෙන් ශරත් කාලයෙහි හිරුමඬල පරිද්දෙන් බලන්නවුන්ගේ නුවන් පැහැර ගන්නාක් මෙන් දශදිග විහිදුනා රශ්මි මාලාවන් ඇති හෙයින් ඉතා බැලිය නොහැකි වර්ණශොභාවෙන් යුක්ත වූ දෙළොස් යොදුන් උස ඇති රන්විමනෙක් පහළ විය. එ ද වනාහි නොයෙක් සියගණන් කුළුගෙවලින් සැරහුණේය. නානාවර්ණ ධජමාලාවෙන් හා රන් රිදී තරුපෙළින්[2] විසිතුරු වූ විතාන පඞ්ක්තීන් එකාලඞ්කාර විය. තව ද මේ ප්‍රාසාද කෙළවර ඒ ඒ තන්හි පස්වනක් පැහැයෙන් යුක්ත වූ විසිතුරු දිව්‍යවස්ත්‍රයෝ ලීලොපෙත ව ලෙලදෙන්නාහ. ඒ සියලු ම දිව්‍යවස්ත්‍රයෝ පවන් වේගයෙන් අහසට නහනලද්දහු දිව්‍යලොකයෙහි දෙවතාවන් තමන් කරා කැඳවන්නවුන් මෙන් අතිශයින් ශොභමානයහ. මාගේ මේ ප්‍රාසාදය සිසාරා හාත්පසින් තුන්යොදුන් පමණ සම වූ භූමිප්‍රදෙශයෙහි කැමැති කැමැති වස්තු දෙන්නාවූ නොයෙක් සියදහස් ගණන් කල්පවෘක්ෂයෝ පහළ වූහ. මෙසේ හැම ලෙසින් සශ්‍රීක වූ මේ දිව්‍යවිමානයෙහි නොයෙක් සියදහස් ගණන් දිව්‍යනාටකයන් විසින් පවත්වනලද නෘත්‍යගීතවාද්‍යයෙන් හා නානාප්‍රකාර තූර්‍ය්‍යඝොෂාවෙන් එකාවන් සන්තුෂ්ට වෙමින් විදුලිය කැළ වැළඳි රන්ලිය වැනි දිව අබරණින්[3] සැරහී සිටියාවූ නොයෙක් සියදහස් ගණින් දෙවඟනන් විසින් පිරිවරන ලදු ව අපමණ වූ දිවසැපත් විඳින්ට පටන් ගත්මි ය. මෙසේ කිසි

1. විතානෙහි අලංකතං - BDGH,
2. තුරුපෙළින් - KL
3. ආභරණින් -ABCDFGHJ

Non-Commercial Distribution

සිල්වත් ගුණවත්කමක් නැත්තාවූ සොරාට පවා සිත් නොපහදවා[1] දුන්නාවූ වස්ත්‍රදානයෙහි විපාක[2] මෙසේ ඉතා උදාරතර විය. එබැවින් ශීලසමාධ්‍යාදි වූ සියලු ගුණගණාඪ්‍යයෙන් යුක්ත වූ සිල්වතුන්වහන්සේට පහන් සිතින් ඉඳුරා දෙනලද සිවුරුපිළි ආදි වූ සිවුපසදානයෙන් ලබන්නාවූ විපාකවිශේෂය කවරෙක් නම් වර්ණනා කෙරේ ද?" යනාදීන් තමා පළමු ජාතියෙහි කළාවූ කුශලය හා ඒ කුශලයෙන් ලද්දවූ සම්පත්තිවිශේෂය ප්‍රීතිවාක්‍ය වශයෙන් ගෙනහැර දක්වා දානයෙහි විපාක මහත්ත්වය[3] ප්‍රකාශ කෙළේය. එසේ හෙයින් පින්වත් සත්ත්වයෙනි, මෙබඳු ඉතා ස්වල්ප වූ පින්කමින් පවා මේ ලොකයෙහි සත්ත්වයෝ කිසි කෙනකුන් විසින් අවර්ණනීය වූ බුදුන් විසින් ම වර්ණනා කරන ලද මහත් වූ දිව්‍යෛශ්වර්‍ය්‍යයට ද පැමිණෙන්නාහ යි දැන සසර සිටිනා තාක් කල් මුළුල්ලෙහි දිව්‍ය මනුෂ්‍යාදි වූ සියලු සම්පත් සිඩකොට දෙන සිතුමිණිරුවනක් හා සදෘශ වූ උතුම් දානය කම්පල අදහා පහන්සිත් ඇති ව දන්දීම් වශයෙන් සිල්වතුන්වහන්සේ කෙරෙහි පිහිටුවා එම කුශලානුභාවයෙන් මතු ස්වර්ගමොක්ෂසම්පත් සිද්ධ කරන්ට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි:

එවං විධම්පි කුසලං මනුජො කරිත්වා
පප්පොති දිබ්බවිභවං මුනිවණ්ණනීයං,
මන්‍යවාන හො දදථ දානවරං සුසීලෙ
සධාය සුඛම්භසාසස විසෙසභාගී[4] යි.

මෙතෙකින් මෙහි දෙවන
අන්‍යතර මනුෂ්‍ය වස්තුව
කියා නිමවන ලදී.

තව ද මෙහි තුන්වන රූපදෙවී වස්තුව නම් කවරයත්?

යටගිය දවස මේ මහාභද්‍රකල්පයට එකානූවන කල්පයෙහි අතීත නෙක[5] කල්ප කොටි ශතසහස්‍රාන්තරයෙහි[6] පූරිතාමිත[7] පාරමිතා බල ප්‍රතිලබ්ධ විශුඩ බුඩත්වයෙන් ම සිඳිනාලද රාගද්වෙෂමොහ මදමාන මාත්සර්‍ය්‍යාදි වූ සකලක්ලෙශබන්ධන ඇති ව ස්වර්ග මර්ත්‍ය පාතාල සඞ්ඛ්‍යාත භුවනත්‍රයට අසහාය නෙත්‍රයක් හා සමාන මහාවිපස්සී නම් වූ එක් සම්‍යක් සම්බුඩකෙනකුන්වහන්සේ ලොකයෙහි පහළ ව

---

1. පහදවා - BGHKL
2. විපාක - BDEGH
   විපාකයෙන් - ACFJ
   විපාකය - බෙ.ස.
3. මහන්තත්වය - ACDJ
4. විසෙසලාභී - BGH, ස.
   විසෙසභාගි - ACFJ
   විසෙසභොගී - D
5. අතීතානෙක -ACEFJ
   අතීතානෙක - මුද්‍රිත හැම, ස.
6. ශතසහස්‍රාන්තයෙහි - BGHKL, සි.
7. පරිපූරිතාමිත - BEGHKL, ස.

Non-Commercial Distribution

අනවරතයෙන් ඔවුහොවුන් කෙරෙහි මෙත්සිත් පතුරුවා අන්‍යොන්‍ය සම්බන්ධයෙන් බන්ධුර ව[1] වසන අමන්‍ද බන්ධුවර්ගයා ඇති බන්ධුමතී නම් රාජධානි සමීපයෙහි විසිතුරු විහාරයෙක වැඩවසනසේක. එකල්හි දෙවියන්ගේ ආලකමන්‍ද නම් රාජධානිය පරිද්දෙන් සියලු උපභොග[2] වස්තුවෙන් හා නුවර සතරදිග විචිත්‍රාකාරයෙන් පිහිටියා වූ වහසල් දෙරටු පවුරු පදනම් උයන් පොකුණු ලියමඬුලු මණ්ඩප වැලිතලා ආදියෙන් ඉතා සිත්කලු වූ එම බන්ධුමතී නම් රාජධානියෙහි වාසය කරන ඉතා ළඳරි වූ ගම්දරියක් දවසෙක විහාරයට ගොස් ඒ ඒ තන්හි භික්ෂූන්වහන්සේ වැඩවසන රාත්‍රිස්ථාන දිවාස්ථාන රත්පත්[3] සුළුපා මහපා සක්මන් මණ්ඩප පිරිවෙන් ආදියෙහි නොයෙක් විසිතුරු බලමින් සිත් සේ කෙළ ඇවිදිනී එම විහාරයෙහි එක්තරා රෝගයෙකින් ආතුර වූ පඬු[4] පඬුවන් ව දුර්වල ශරීර ඇති ව ආන ආනා තතනමින් සැතපුණාවූ එක්තරා තෙරකෙනකුන්වහන්සේ දක කරුණාවෙන් කම්පිත වූ සිත් ඇති ව උන්වහන්සේ සමීපයට එළඹ පසහ පිහිටුවා වැඳ ඔබගේ ශරීර අප්‍රාසු විචාරන්නී "කිමෙක් ද ස්වාමීනි, නුඹවහන්සේගේ ශරීරය ඉතා ම දුර්වල ය. මේ කෙසේ වූ ව්‍යාධියෙක් දැ"යි විචාළීය. එබසට තෙරුන්වහන්සේ වදාරනසේක් "එම්බා නැඟණියෙනි, මේ මම අසො ව්‍යාධියෙකැයි නොදනිමි. ඉතා ඉවසිය නොහැකි කෲර[5] වූ තද ව්‍යාධියෙක් ශරීරයෙහි වැළඳගෙන බොහෝ දුක් දෙන්නේය"යි වදාළසේක. එවේලෙහි ඒ කුමාරිකාවෝ "එසේ වී නම් ස්වාමීනි, මම ඊට පිළියම් කොට ඒ ව්‍යාධිය සන්හිඳුවාලමි. එබැවින් සෙට අපගේ ගෙට ම සිහා වැඩිය මැනවැ"යි කියා ඒ තෙරුන්වහන්සේට ආරාධනා කොට ගෙට ගොසින් එපවත් තමන්ගේ දෙමවුපියන්ට කියා ඔවුන් ගිවිස්වාගෙන දෙවන දවස් උදසන්හි ම නැඟී සිට නොයෙක් රසයෙන් අග්‍ර වූ බෙහෙත් ආහාරය පිළියෙල කොට තබා තෙරුන්වහන්සේ වඩනා පෙරමග බල බලා සිටියහ. ඉක්බිති එගිලන් තෙරුන්වහන්සේ දෙවන දවස් උදයසන්හි ම සිරුරු පිළිදඟ සිවුරු ගැටගන්වා[6] පාත්‍රය අතින් ගෙන භික්ෂාචාර වෘත්තියෙන් වඩනාසේක් ඒ කුමාරිකාවන්ගේ ගෙදොරට ම වැඩිසේක. එකල්හි ඒ කුමාරිකාවෝ තමන් ගෙදොරට ම වැඩියාවූ ඒ තෙරුන්වහන්සේ දක මහත් වූ සන්තොෂයෙන් ඉදිරියට ගොස් පාත්‍රය ගෙන හිඳිනා අස්නක් පනවා තෙරුන් වහන්සේ එහි වැඩහුන් කල ආදියෙ ම[7] සපයා තුබූ බෙහෙත් හා සමග නොයෙක් සූපව්‍යඤ්ජනයෙන් යුක්ත වූ මියුරු ආහාරය එළවා තබා ආදර සහිත ව වළඳවා සත්කාර කළාහ. එකල්හි ඒ කුමාරිකාවන්ගේ ශ්‍රද්ධාබලයෙන් හා ඖෂධයෙහි ආනුභාවබලයෙන් ඒ බෙහෙත්

---

1. බන්ධු ව - C, මුද්‍රිත හැම.
2. උපභොග පරිභොග - BCEGHKL
3. රත්වත් - EF, බෙ.
4. පඬු (නැත) - ABCGH, ක.සි.හැ.
5. කර්කශ - KL
6. ගැටවටු ගන්වා - ස.
7. ආදියෙන් ම - GHKL
   ආදියෙන් - B
   ආදිය ම - J, ක.සි.හැ.ම.

Non-Commercial Distribution

ආහාරය වැළඳූ ඇසිල්ලෙහි ම එබඳු කෲර[1] වූ තද ව්‍යාධිය අලපත නෙළුම්පත වත් කළ[2] ජලකණිකාවක් සේ ශරීරයෙහි මඳකුත් අලග්න ව පහ විය. එකල්හි ඒ තෙරුන්වහන්සේ කිසි පීඩාවක් නැති ව නිරොගි නිර්ව්‍යාධි අනුපද්‍රැත වූසේක. ඒ බව ප්‍රකාශ කොට දක්වන[3] පිණිස සඞ්ඝරක්ඛිත නම් මහතෙරුන්වහන්සේ විසින් කියන ලදි:

එකනවුතෙ ඉතො කප්පෙ - විපස්සී නාම නායකො,
අහොසි ලොකෙ ලොකෙක[4] - නායකො[5] ජිනභබ්ඣනො.

තද තස්මිං පුරෙ රම්මෙ - ආසිං අහං ගාමදරිකා,
ආහිණ්ඩන්ති විහාරස්මිං - අද්දක්ඛිං ජිනසාවකං.

රොගාතුරං කිසං පණ්ඩුං - අස්සාසන්තං මුහුං මුහුං,
දිස්වාන කම්පිතා චිත්තා - නිමන්තෙත්වාන තං මුනිං.

භෙසජ්ජං චෙව භත්තං ච - අද අහං තෙන සො යති,
අව්‍යාබාධො අනීඝොච - අහොසි අනුපද්දවො-යි.

මෙසේ සන්හිඳුණාවූ ව්‍යාධි ඇති ඒ තෙරුන්වහන්සේ දෙවන දවස් ඒ කුමාරිකාවන්ගේ ගෙදෙරට බෙහෙත් ආහාරය පිණිස නොවැඩිසේක් මය. ඉක්බිති ඒ කුමාරිකාවෝ පළමු දවස් පරිද්දෙන් ම බෙහෙත් බත පිළියෙල කොට පෙරමග බල බලා සිට එදවස් තෙරුන්වහන්සේ නොවැඩි හෙයින් "පළමු දවස් තමන් වැළඳූ බෙහෙත් පසයෙන් අප්‍රාසු ව නොවැඩිසේක් වනැ"යි සිතා දෝ හෝ සන්සල සිතින් තුමූ ම විහාරයට ගොස්[6] තෙරුන්වහන්සේ දක වැඳ එකත්පස් ව සිට "කිමෙක් ද ස්වාමීනි, බෙහෙදක් නම්[7] වළඳනා කළ යටත් පිරිසෙයින් පිට පිට සතියක් හෝ පස් දවසක් වැළඳුවමනා නොවේ ද? අද අපගේ ගෙදෙරට කවර කාරණයක් නිසා කුමක් පිණිස නොවැඩිසේක් දැ"යි විචාළාහ. එතෙපුල් අසා තෙරුන්වහන්සේ වදරනසේක් "එම්බා නැඟිණියෙනි, ඊය්යේ දවස් පෙරවරු තොප වළඳවාලූ බෙහෙත් ආහාරයෙන් ම මාගේ ව්‍යාධිය සන්හිඳිණ. එසේ හෙයින් අද තොපගේ ගෙදෙරට නොගියෙමි"යි වදළසේක. එවේලෙහි කුමාරිකාවෝ අපමණ වූ සන්තොෂයට පැමිණ "එසේ ද සවාමිනි, ඊය්යේ දවස් මා වළඳවාලූ බෙහෙත් ආහාරයෙන් ම ස්වාමීන්ගේ ශරීරයට ප්‍රාසු වී ද? සාධු සාධු. එසේ වීනම් ඉතා ම යහපතැයි" කියමින් මහත් සන්තොෂයෙන් පින පිනා තෙරුන්වහන්සේ වැඳ අවසර ඉල්වාගෙන තමන්ගේ ගෙට ම ගියාහ. මෙසේ ඒ කුමාරිකාවෝ පහන් සිතින් තමන් එදවස් ඒ ගිලන් තෙරුන් වහන්සේට දුන්නාවූ බෙහෙත් ආහාරදානයෙහි කුශලානුභාවයෙන් මෑතභාගයෙහි ඒ

---

1. කර්කශ - BGHKL
2. වතළ - CEJ
   පතළ - BKL
3. දක්වනු- BGHKL
4. ලෝකස්ස - C
5. නායකො - J
6. ගොසින් - BGHL
7. බෙහෙත් නාම් නුදෙක් - ස.

Non-Commercial Distribution

මනුෂ්‍යාත්මභාවයෙන් චුත ව දිව්‍යමය වූ සියලු පඤ්චකාම සම්පත්තීන් සමෘද්ධ ව දිව්‍යලොකයෙහි උපන්හ. එකල්හි ඒ දිව්‍යලොකයෙහි උන්ගේ කුශලතෙජසින්[1] දිව සත්රුවනින් හෙබියාවූ දෙළොස් යොදුන් උස ඇති සත්මහල් රන්විමනෙක් පහළ විය. ඒ දිව්‍යප්‍රාසාදය සිය ගණන් ඉඳුනිල්මිණිකොතින් ගැවසීගත්තේය. එසේ ම නොයෙක් සියගණන් කන්කුළුපෙළින් සැදුම් ලද්දේය. එකි එකී මාලෙහි නොයෙක් සියගණන් ගබඩා පඞ්ක්ති ඇත්තේය.[2] ඒ සියල්ල ම මනහර දිවයහනින්[3] හා මනොනුකූල දිවපහස් දෙන්නාවූ ආසනවලින් සැරහුණේය. නිරන්තරයෙන් එකාකාරයෙන් ම සැරහී සිටිනාවූ නොයෙක් සියදහස් ගණන් දෙවඟනන්ගෙන් ශොභමාන ය. එසේ ම අනෙකප්‍රකාර දිව්‍යාලඞ්කාරයෙන් සැරහී ඒ ඒ තන්හි රඟමඬුලු බැඳ නානා ප්‍රකාර වූ දිව්‍යලීලා දක්වමින් බෙර වයන නටන ගී කියන නොයෙක් සියගණන් දිව්‍යනාටකයන්ගේ නෘත්‍ය ගීත වාද්‍යයෙන් මනොහර ය. තව ද ඒ ප්‍රාසාදය සිසාරා සතරදිග දිව්‍යමය වූ පුෂ්පඵල[4] පල්ලවයෙන් සශ්‍රීක වූ අඹ දඹ දෙඹ නැඹිලි කොබොලීල[5] පළොල ඇසළ මුහුළු නා පනා දෙවුදුරු කපුරු කෙහෙල් දෙල් බෙලි[6] පොල් පුවක් ආදි වූ නොයෙක් දිව්‍යවෘක්ෂ සමූහයෙන් ප්‍රතිමණ්ඩිත වූ උද්‍යාන පඞ්ක්තීන් හා එසේ ම පුෂ්පමධුපානයෙහි ලොල්[7] මත් බමරවැලන් හා හංසාවලීන් විසින් නිරන්තර වූ රත්පියුම් වනය හෙළපියුම් වනය නිල්උපුල් වනය හෙළඋපුල් වනය මහනෙල් වනය හෙල්මැලි වනය ජලකොල වැකොඳ වනය යන මෙයින් සැදුම්ලද මනහර විල්පෙළින් ගැවසී ගත්තේය. මෙසේ හැම ලෙසින් අලඞ්කෘත වූ ඒ දිව්‍යලොකයෙහි නොයෙක් සියදහස් ගණන් දිව්‍යපුත්‍රයන් හා දෙවඟනන් විසින් පවත්වනලද අනෙකප්‍රකාර උත්සවක්‍රීඩාවෙන් හා සියලු උපභොග පරිභොග වස්තුවෙන් යුක්ත ව නිරන්තරයෙන් චිත්තප්‍රසාද එළවන්නාවූ දිව්‍යප්‍රාසාදයෙහි පින් සේ වාසය කෙරෙමින් බුද්ධාන්තර සයක්[8] මුළුල්ලෙහි අපමණ වූ දිවසැපත් වින්දහ. ඒ බව ප්‍රකාශ කොට දක්වන[9] පිණිස සඞ්ඝරක්ඛිත නම් මහතෙරුන්වහන්සේ විසින් කියන ලදී:

> තතො චවං තෙන කම්මෙන - සුකතෙන තතො චුතා,
> ජාතායි දෙවලොකස්මිං - සබ්බකාම සමිද්ධිනී.

---

1. කුශලානුභාවයෙන් - BGHKL
2. පඞ්ක්තියෙන් ගැවසී ගත්තේය. - BGHKL
3. දිවපහනින් - J
   දිව්‍යාලංකාරයෙන් - ක.කි.ස.
   දිවයහන් - ම.
4. පලු - KL
5. කොබලීල - ABCDEFGHL
6. බෙල් - පිටපත් හැම.
   බෙලි - මුද්‍රිත හැම, ස.
7. ලොල් වූ, - KL, ස.
8. සබුද්ධාන්තරයක් -J
9. දක්වනු - BGHK

Non-Commercial Distribution

තත්ථ තෙ පුඤ්ඤතෙජෙන - පාසාදෙ රතනාමයො,
මණිථූපි[1] සතාකිණ්ණෙ - කූටාගාරෙහි'ලඞ්කතො.

නෙකගබ්භසතාකිණ්ණෙ - සයනාසනමණ්ඩිතො,
අච්ඡරාසතසංකිණ්ණෙ[2] - නච්චගීතාදිසංකුලො.

රම්භාම්බජම්බුසන්නීර - පූගපුන්නාගපාටලී,
නාගාදි තරුසණ්ඩෙහි - මණ්ඩිතුය්‍යානපන්තිහි.

පදුමුප්පලකල්හාර - කුන්ද කානන මණ්ඩිතෙ,
මධුමත්තාලිපාලිහි - සාරයී සර සංකුලෙ.

දෙවපුත්තෙහි නෙකෙහි - තථා දෙවච්ඡරාහි ච,
නිච්චුස්සවෙ මහාභොගෙ - විමානෙ මනනන්දනෙ -යි.

මෙසේ ඒ කුමාරිකාවෝ එකානුකපක් මුළුල්ලෙහි අපමණ වූ දිව‍්‍යසැපත් විඳිමින් දිව‍්‍යලොකයෙහි වාසය කොට මේ භද්‍රකල්පයෙහි අප මහා ගෞතම බුදුන් බුදු ව සියලු බුධකෘත්‍යයන් සිඩ කොට නිවන්පුර පැමිණි පසු දෙවුලොවින් අවුත් දඹදිව දෙවපුත්‍ර නම් නුවර සියලු සම්පත්තීන් සමෘධ වූ ලොකප්‍රසිද්ධ වූ බ්‍රාහමණ මහාසාර කුලයෙක්හි ප්‍රධාන බ්‍රාහ්මණයාණන්ගේ ප්‍රියභාර්‍ය්‍යා වූ බ්‍රාහමණදේවීන් කුස පිළිසිඳ දසළුකඩමස් ඇවෑමෙන් මව්කුසින් බිහි වූහ. ඒ කුමාරිකාවන් මව්කුසින් බිහි වූ දවස් පටන්ගෙන උන්ගේ කුශලානුභාවයෙන් දවස් පතා නිරන්තරයෙන් ම අට අට නැළියක් පමණ සුවඳ රත්හැල්සාල් උපදනේය. එකල්හි ඒ කුමාරිකාවන්ගේ කනකරූපයක් හා සමාන රූපසම්පත්තිය දක පහන් සිත් ඇත්තාවූ මව්පිය දෙදෙන ඔවුන්ට[3] රූපදෙවි යයි නම් තුබූහ. ඉක්බිති ඒ කුමාරිකාවන් වැඩී සොළොස් හැවිරිදි වයසට පැමිණි කල්හි ඔවුන් හා සමාන ජාතිගොත්‍ර රූපඓශ්චර්‍ය්‍යසම්පත්තීන් යුක්ත වූ බ්‍රාහ්මණ කුමාරකෙනෙකුන්ට විවාහ කොට සරණපාවා දුන්හ. එකල්හි ඒ රූපදෙවීන් එක ම නැළියක් පමණ සාල් අරගෙන අහර පිසන්නට පටන්ගත් කල්හි උන්ගේ කුශලතෙජසින් කැමැති කැමැති මත්ස්‍යමාංස ආදි වූ අනෙකප්‍රකාර සූපව්‍යඤ්ජන ද කිරි වෙඬරු ගිතෙල් ආදි වූ පඤ්චගොරසය[4] ද දුරු මිරිස් ආදී වූ කුළුබඩු ද කෙහෙල් වැල වරකා අතිරස උක්සකුරු ආදි වූ ප්‍රණීත උපකරණ ද යන සියල්ල ම භාජන පුරා වෙන වෙන පහළ වන්නේය. ඒ කුමාරිකාවන්ගේ අතින් අල්වනලද යම්කිසි කන බොන දෙයක් ඇත්නම් ඒ සියල්ල ම කෙතෙක් දවස් කල් යවා තුබුව ද පිළිණි[5] නොවන්නේ මය. තව ද ඒ රූපදෙවීන් එක ම බත්සැළියක් තබාගෙන ඒ දෙවපුත්‍ර නුවර වසන හැම ජනයන් සිත් වූ පරිද්දෙන් බඩපුරා බත් අනුභව කැරවුව ද ඒ සැළින් එක ම බත් සැන්දක් ඇරගත් පමණ අවකාශය පෙනෙන බව මිස සැළියෙහි[6] බත් අඩු නොවන්නේ මය. එපරිද්දෙන් ම ක්‍ෂය නොවන්නා වූ සියලු වස්තූන් ලබන ආශ්චර්‍ය්‍යීමත් වූ මහපින් ඇතියහ. අපමණ වූ ගුණ නුවණ ඇතියහ. රූපයෙන් අග්‍රප්‍රාප්තයහ. ඉතා කත්කලු වූ[7] ප්‍රියතෙපුල් ඇතියහ. මෙසේ

1. මණිථූපික -AFJ.
2. අච්ඡරාගණසංකිණ්ණෙ - BCDEJKL
3. ඇට - ක.කි.කු.
4. පඤ්චගවරසය - ACDEFJ
5. පිළිහිණි - ACDEJ
6. සැළෙහි -ADEFJKL
7. කත්කලු වූ ළෙද බොළෙද - K, ස.

Non-Commercial Distribution

ඒ කුමාරිකාවෝ පෘථිවිතලයෙහි පහළවීම හා සමඟ පුෂ්පඵලපල්ලවයෙන් සශ්‍රීක වූ සාලකල්‍යාණිවෘක්ෂයක් සේ බාලකාලයෙහි ම සියලු ගුණ නුවණ ප්‍රියවචන රූපෛශ්වර්‍ය්‍යසම්පත්ති ආදියෙන් සමෘද්ධ ව ලොකප්‍රසිද්ධ වූහ. ඒ බව එම රූපදේවීන්ට හඟවන පිණිස සඞ්ඝරක්ෂිත නම් මහතෙරුන්වහන්සේ විසින් කියනලදී:

ත්වමෙවං දෙවලොකම්හි - වින්දමානා මහායසං,
අද්ධානං වීතිනාමෙත්වා - නිබ්බුතෙ ගොතමෙ ජිනෙ.
ජම්බුදීපෙ ඉදනි ත්වං - නිබ්බත්තා[1] උදිතෙ කුලෙ,
පුඤ්ඤපඤ්ඤාදිගුණාවාසා - රූපෙනග්ගා පියංවද-යි.

මෙසේ ඒ කුමාරිකාවෝ ඒ දෙවපුත්‍ර නුවර හැම තැන්හි හිර සඳ සේ ප්‍රසිද්ධයහ. පූර්වජාතියෙහි පුරුදු කළ දනාධ්‍යාසය හෙතු බලයෙන් ලද්දවූ ශ්‍රද්ධා ඇති ව සඟ පන්සියයක් දෙනාවහන්සේට ආරාධනා කොට නිරන්තරයෙන් මහදන් සරහා තමන්ගේ ගෙහිදී ම දන් වළඳවන්නාහ. එකල්හි ඒ භික්ෂූන්වහන්සේ අතුරෙන් සිවුපිළිසිඹියා පත් රහත්බවට පැමිණියාවූ මහාසංඝරක්ෂිත නම් එක් තෙරකෙනෙකුන් වහන්සේ ඒ රූපදෙවීන්ගේ විශේෂවත් වූ රූපසම්පත්තිය හා අනූන වූ පරිවාර[2] භොගසම්පත් ආදිකොට ඇති නොයෙක් ශ්‍රී සම්පත්තීන් බලා වදරා ගිය දවස මේ කෙසේ වූ පින්කමක් කොට ලද්දවූ සම්පත්තියෙක් දෝ හොයි පරීක්ෂා කරන සේක් අතීතකාලයෙහි උන් විසින් කරනලද්දවූ මේ යට කියන ලද්දවූ[3] කුශලවිශෙෂය තමන්වහන්සේගේ දිවැසින් දක වදරා "මේ කුමාරිකාවෝ වනාහි දන් තමන්ගේ අතීත ජාතිදක්නා තරම් දිව්‍යඥානයක් නැති හෙයින් තමන් විසින් පෙර ජාතියෙහි පුරුදු කරන ලද්දවූ භෙසජ්ජදනමය කුශලකර්‍මය එකාන්තයෙන් ම නොදන්නාහ. එබැවින් මේ රූපදෙවීන්ට භවයෙන් සැඟවුණාවූ ඒ කුශලවිශෙෂය ප්‍රකාශ කොට කීයෙම් වී නම්[4] යෙහෙකැ'යි සිතා දවසෙක ඒ රූපදෙවීන්ගේ ගෙයිදී ම අහර වළඳ ඉක්බිති අනුමෙවුනිබණ වදරණසේක් "එම්බා රූපදෙවීනි, දන් ඉතා ආශ්චර්‍ය්‍යමත් වූ[5] මෙබඳු මේ සම්පත් ලැබීමට හෙතු වන සේ තොප[6] විසින් ගිය දවස කළ කුශලකර්‍මය දනු ද"යි විචාළසේක. එවේලෙහි රූපදෙවි කියනනාහු "ස්වාමීනි, අතීත අනාගත වර්තමාන යන තුන්කල් දන්නාවූ බුද්ධපුත්‍රයාණන් වහන්ස, මා විසින් අතීතජාතියෙහි කළ කුශලාකුශල දක්මට නිසි වූ දන් මාගේ[7] දිව්‍යඥනයක් නැති වුව. එසේ හෙයින් ඒ කෙසේ දකිම් ද? දන් මේ කවර පින්කමකින් කෙසේ ලත් සැපතක් බවත් නොදනිමි. එබැවින් මාගේ ඒ කුශලවිශෙෂය විශෙෂයෙන් ම දන් අසනු කැමැත්තෙමි"යි ආරාධනා කළහ. එකල්හි ඒ සංඝරක්ෂිත නම් මහතෙරුන් වහන්සේ මහත් වූ ඝනතර තිමිරයක්[8] පහකොට විචිත්‍ර වූ චිත්‍රකර්මාන්තයක් දක්වන්නා සේ ඒ රූපදෙවීන් විසින් අතීතභවයෙහි කරන ලද්දවූ කුශලකර්‍මය හා එම කුශලකර්‍මයෙන් ලද්දවූ සම්පත්ති

1. නිබ්බත්තො - බෙ.ස.
2. පරිභොග - BGH
3. ලද - BGHKL
4. වීන්නම් - EGHKL
5. යහපත් වූ ආශ්චර්යමත් වූ -KL
6. නී - ක. සි.ඥ.
7. මට - B
8. තිරයක් - ACDEJK

Non-Commercial Distribution

විශේෂය සංක්ෂෙප වසයෙන් සංග්‍රහ කොට මේ යථොක්ත වූ ගාථා දෙළොසින් ගෙනහැර දක්වා වදරා මත්තෙහිදු ඒ රූපදෙවීන්ට අවවාද වශයෙන් ධර්මදෙශනා කොට වදරනසේක්:

එතං තෙ දෙවලොකස්මිං - දෙවිස්සරියමබ්භුතං,
ඉමං තෙ ඉධ ලොකම්හි[1] - සබ්බං මානුසිකං සුඛං.

විපස්සිමුනිනො කාලෙ - තුවං තස්සෙකභික්ඛුනො,
දින්නදනෙ ගිලානස්ස - තස්සෙතං ඵලමීදිසං.

කාතබ්බං හි සද පුඤ්ඤං - ඉච්ඡන්තෙන සුඛප්පදං,
තස්මා ත්වං සබ්බද භද්දෙ - උස්සුක්කා කුසලෙ භව

යනාදීන් "එම්බා රූපදෙවීනි, තොප එකල දිව්‍යලොකයෙහි ඉපද එකාන්තකපක් මුළුල්ලෙහි වින්දවූ ඒ දිව්‍යෛශ්චර්‍ය්‍යය ද එයින් අවුත් දන් මනුෂ්‍යලොකයෙහි ඉපද ලද්දවූ මෙබඳු මේ මනුෂ්‍යසම්පත්තිය ද යන සියල්ල ම විපස්සී නම් බුදුන් සමයෙහි ඒ එක ගිලන් භික්ෂූන්වහන්සේට තොප විසින් ඒ එක ද දෙනලද්දවූ බෙහෙත් ආහාර දනයෙහි කුශලයෙන් ලද්දවූ සම්පත්ති සමූහය ය. එබැවින් මතු සියලු දිව්‍යමනුෂ්‍යසම්පත් සාධා කෙළවර නිවන් සැප[2] විඳිනා කැමැත්තාවූ සත්පුරුෂයන් විසින් හැම කල්හි අප්‍රමාද ව තම තමා ශක්ති පමණින් කුසල් කටයුත්තේය. එසේ හෙයින් එම්බා රූපදෙවීනි, තෙපි මෙසේ පූර්වජාතියෙහි[3] ඒ එක ගිලන් භික්ෂූන් වහන්සේට එක ද දුන්නාවූ බෙහෙත් ආහාරදනයෙහි කුශලයෙන් බොහෝ කාලයක් දිව්‍යලොකයෙහි සැපවිඳ[4] දන් මේ ජාතියෙහි ඉතා ආශ්චර්‍ය්‍යමත් වූ මෙබඳු මේ සම්පත්තීන් ලදුව. එබැවින් පනතින් පහනට යන්නා සේ මතු එන දවස ජාතියෙන් ජාතියෙහි වඩ වඩා සැප විඳිනා පරිද්දෙන් අප්‍රමාද ව නිරන්තරයෙන් කුසල් කිරීමෙහි වීර්‍ය්‍ය කරව" යනාදීන් අවවාද කොට බණ වදළසේක. ඉක්බිති රූපදෙවී නම් වූ ඒ කුමාරිකාවෝ මෙසේ ඒ මහතෙරුන්වහන්සේ ගෙනහැර දක්වා වදළ තමන්ගේ පූර්වචරිතය හා අවවාදධර්මය අසා අපමණ වූ සන්තොෂයට පැමිණ එතැන් පටන් දවසින් දවස වඩ වඩා නිරන්තරයෙන් දනාදී වූ දශවිධ කුශලධර්මයෙහි ම යෙදී බොහෝ කුශලසම්භාරයන් රැස් කෙරෙමින් මෑතභාගයෙහි එම කුශලසන්තොෂයෙන් සෝවාන් ව උතුම් වූ ආර්‍ය්‍යශ්‍රාවිකා බවට පැමිණියහ. එසේ හෙයින් කුසල් කිරීමෙහි කිසි ආනිසංස විශේෂයක් නොදන්නාවූ එබඳු ළද බොළඳ බාල කුමාරිකාවෝ පවා පහන් සිතින් දවසෙක එක් භික්ෂුකෙනෙකුන්වහන්සේට බෙහෙත් ආහාරයක් දන් දී එම කුශලානුභාවයෙන් එතැන් පටන් එකාන්තකපක් මුළුල්ලෙහි කිසි දුකක් නොවිඳ දිව්‍ය මනුෂ්‍ය ලොක දෙක්හි අනර්ඝ වූ නොයෙක් ශ්‍රී සම්පත්තීන් ලැබ මෙසේ ප්‍රමාණාතික්‍රාන්ත වූ සැපත් වින්දහ. එසේ හෙයින් කුසල් කිරීමෙහි විපාක ඇති බව ඉඳුරා දන්නාවූ සිත්වත් සත්වයෙනි, තෙපි හැම මතු ශාන්ත වූ ප්‍රණීත වූ අමෘතමහානිර්වාණසම්පත්තිය කවර හෙයකින් නොලබවු ද? එකාන්තයෙන්

1. ලොකස්මිං - බෙ.ස.
2. සම්පත් - KL
3. පූර්වභාගයෙහි - GH
4. ඉපද සැප විඳ - BGHL

Non-Commercial Distribution

ලබන්නාහු මය. එබැවින් තමහට හිත කැමැති සත්පුරුෂ සත්වයෙනි[1], දන් මේ බුධොත්පාදකාලයෙහි අප්‍රමාද ව පින්කම් කොට එන දවස සසර සිටිනා තෙක් කල් මුළුල්ලෙහි නොයෙක් දිව්‍යමනුෂ්‍ය සම්පත් විඳ අමාමහනිවන් දක්නට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි:

ඉති තරුණකුමාරී පුඤ්ඤකම්මෙසු සාරං
අවිදිත ගුණමත්තා දත්ව භික්ඛුස්ස දනං,
දිවමනුජසුඛං සා ලත්ථ තුම්හෙ භවන්තා
විදිතකුසලපාකා කිං න ලබ්භෙථ සන්තිං[2] - යි.

මෙතෙකින් මෙහි
තුන්වන රූපදෙවි වස්තුව
කියා නිමවන ලදී.

නව ද මෙහි සතරවන විෂමලොම වස්තුව නම් කවරයත්:

යටගිය දවස අනල්ප කල්පකාලයක් මුළුල්ලෙහි බුධරාජ්‍යය පිණිස පිරූ පාරමිතා ඇති ව මෙම කප තුන්වන අන්තඃකල්පයෙහි බුධරාජ්‍යයට පැමිණියාවූ කාශ්‍යප නම් බුදුරජාණන්වහන්සේ තමන්වහන්සේගේ අටවිසිරියන්[3] බුදුබඳින් තුන්ලොව බබුළුවා සියලු ම සසරදුක් දුරුකොට මුළුලොවට හිතසැප එළවමින් විසිදහසක් අවුරුද්දට ආසිරි ඇති ව වැඩවසන සමයෙහි එක්තරා පුරුෂයෙක් බුදුන් කරා එළඹ බණ අසා ශාසනයෙහි පැහැද ශ්‍රධාසම්පත්තියෙහි යෙදී පහන්සිතින් භික්ෂුසඞ්ඝයාවහන්සේට මිහිරි වූ බොහෝ අන්නපානයන් හා පා සිවුරු කාබහන්[4] පෙරහන්[5] ආදිය ද කිරි දී වෙඬරු ආදි පඤ්චගවරසයෙන් යුක්ත ලහබද් ද සැරයටි[6] හැඳ පුටු පිටහටු පිධහම්[7] පොරෝනා පළස් ආදිය ද නිරෝගී නිර්ව්‍යාධි බව පිණිස සිද්දිහුරු වගපුල් ආදී වූ කුළුබඩු හා දර පළන පොරෝ වග්ගිනි ආදිය ද යන මෙකී සියල්ල ම පහන් සිතින් දන් දෙමින් නිරන්තරයෙන් පන්සිල් රැක පොහොය පෙහෙවස් රැක මෙසේ ජීවිතාන්තය දක්වා නොයෙක් පින්කමින් දවස් යවා ආයු කෙළවර නිඳ පිබිදියාක්හු[8] මෙන් දිව්‍යලොකයෙහි දිව් සත්රුවනින් විසිතුරු වූ දෙළොස් යොදුන් උස ඇති රන්විමනෙක උපන. එසේ හෙයින් කියනලදී:

1. සත්පුරුෂයෙනි - BGHL
2. පච්ඡා - KL
3. විසිරියන් - GH
4. කහබාත් - JKL, බෙ.ස.
5. පෙරහන් පටි - DFGHKL, ස.
   පෙරහන් හටි - E
   පෙරහන් යටි - J
6. සැරයටි පටි - KL
7. පිටහම් - ක. කි. කැ.
8. පිබිදි එකක්හු - BGHKL

Non-Commercial Distribution

කස්සපස්ස මුනින්දස්ස - කාලෙ අඤ්ඤතරො නරො,
සම්බුද්ධමුපසංකම්ම - සුත්වා ධම්මං සුදෙසිතං.

පටිලද්ධසද්ධො හුත්වාන - සීලවන්තස්ස භික්ඛුනො,
මධුරන්නපානෙ පචුරෙ - අදසි සුමනො තදා. - පෙ -

අද භෙසජ්ජදානානි - අරොගත්ථාය භික්ඛුනං,
එවං නානාවිධං පුඤ්ඤං - කත්වාන තිදිවං ගතො-යි.

මෙසේ දෙව්ලොව උපන්නාවූ ඒ දිව්‍යපුත්‍රතෙම මහත් වූ දිව්‍යමහිමයෙන් යුක්ත වූ නොයෙක් දහස්ගණන් දෙවඟනන් හා අපමණ දිව්‍යසෙනඟ පිරිවරා විශෙෂ වූ දිව්‍යලීලාවෙන් යුක්ත ව නන් විසිතුරු රන්විමන්හි වසනුයේ ඒ ඒ තන්හි රඟමඬුලු බැඳ දේව[1] දේවස්ත්‍රීන් විසින් දක්වන ලද නෘත්‍යගීතවාද්‍යයෙන් හා නානා විධ වීණාගායනාදි වූ නොයෙක් දිව්‍ය සම්පත්තීන් සතුණ්ට වෙමින් ජීවිතාන්තය දක්වා අපමණ වූ නොයෙක් දිව්‍යසැපත් විඳිමින් ඒ දිව්‍යලොකයෙහි වැස අප බුදුන් පිරිනිවී දෙසිය සොළොස් හවුරුද්දක් ගිය කල්හි දෙව්ලොවින් චුත ව සුවාසූදහසක් රාජධානීන් විරාජමාන වූ දඹදිව් තෙලෙහි එම දිව්‍යපුරය මෙන් ඉතා රම්‍ය වූ පැළලුප් නුවර ආඥචක්‍රවර්ති වූ ධර්මාශොක නම් මහරජහුගේ අගමෙහෙසුන් බිසොව කුස පිළිසිඳ දස එකඩමස් ඇවෑමෙන් මවුකුසින් බිහි විය. එකල්හි ඕහට නම් තබන්නාහු හිසකේ[2] විෂම ව හටගත් හෙයින් විෂමලොම කුමාර යයි නම් තුබූහ. ඉක්බිති ඒ රජකුමර ක්‍රමයෙන් වැඩී විඥබවට පැමිණ මහත් වූ කායබලයෙන් හා ඥනබලයෙන් යුක්ත විය. දුටු දුටුවන් ලමු[3] කරවන තරම් විශිෂ්ට වූ රූපයක් ඇත්තේය. ඉතා ප්‍රියකරුය, ප්‍රසාද එළවන්නේය. ස්වර්ණප්‍රතිබිම්බයක් සේ මනොඥ වූ වර්ණසම්පත්තීන් යුක්තය. මහත් වූ යසසින් හා පරිවාරසම්පත්තීන් සමෘද්ධ විය. මෙතෙකැයි පමණ නැත්තාවූ සියලු උපභොග පරිභොග වස්තුවෙන් ආඪ්‍ය විය. බුද්ධරත්නය මාගේමය, ධර්මරත්නය මාගේමය, සඞ්ඝරත්නය මාගේමය යි මෙසේ තුනුරුවන් කෙරෙහි මමත්වය ඇති ව වාසය කරන්නේය. එසේ හෙයින් කියනලදී:

තත්ථ දිබ්බවිමානම්හි - උප්පන්නො සො මහිද්ධිකො,
දෙවච්ඡරාපරිවුතො - දෙවසෙනා පුරක්ඛතො.
දිබ්බෙහි නච්චගීතෙහි - දිබ්බ වාදිත්තකෙහිපි,
මොදමානො අනෙකෙහි - දිබ්බසම්පත්තියා සහ.
යාවතායුං තහිං ඨත්වා - ජම්බුදීපෙ මනොරමෙ,
පුරෙ පාටලිපුත්තම්හි - ධම්මාසොකස්ස රාජිනො.

---

1. දේව (නැත) - BGHKL
2. හිසකෙස් - BCDEFGHKL
3. ලමු - පිටපත් හැම, ම.
මුළා - ක. කි. කු. බෙ. ස.

Non-Commercial Distribution

පුත්තො භුත්වාන නිබ්බන්ති - මහාථාමො මහාබලො,
මහායසො මහාභොගො - ආසි බුද්ධාදිමාමකො-යි.

මෙසේ ඒ රාජකුමාරයන් කප්රුකක් සේ සියලු සම්පත්තීන් සමෘධ ව වසන සඳ එක් දවසෙක ධර්මාශෝක රජ්ජුරුවෝ කෙළනා සඳහා සුවාසූදහසක් රජදරුවන් විසින් පිරිවරන ලදු ව අපමණ බලසෙනඟ හා යානවාහන සහිත ව සිත් සේ කෙළිමින්[1] ක්‍රමයෙන් ගොස් හිමාලවනයට වැද අභිප්‍රාය කාලයක් මුළුල්ලෙහි එහි කෙළ ඇවිද නැවත නුවරට එන්නාහු ක්‍රමයෙන් අවුත් චන්‍ද්‍රභාගා නම් ගංගාවට[2] පැමිණියහ. ඒ ගඟ වනාහි පුළුලින් සතරගවුවක් හා ගැඹුරෙන් තුන්ගවු පමණ ඇත්තේය. එකල්හි ඒ ගංහිස[3] මහවැස්සෙක් වැස වතුරු හෙළා පෙණ බිබුලු[4] මාලාවෙන් ආකුල ව ගල්කුළු සේ දිවන මහත් රළපතර සමූහයෙන් යුක්ත ව දෙපස ඉවුරු පැහැර ඇන හෙලමින් උතුරුවා ගෙන දහස්ගණන් පෙණ මවා මහත් වූ ඝෝෂධ්වනි පවත්වමින් සියවෙසින් නික්මුණාවූ අනන්තයා සේ අතිභයංකර ව හළ හළ යන නාද පවත්වමින් අභිනව තඹවතුරු[5] මහාවේගයෙන් දිවන්නට පටන්ගත. එකල ධර්මාශෝක රජ්ජුරුවෝ මෙසේ මහ සැඩවතුරු දිවන්නා දක තමන්ගේ පිරිසට කියන්නාහු "එම්බා සගයෙනි, මෙතැන්හි සිටියාවූ මේ පිරිස අතුරෙන් මේ ගඟට බැස දිය පීනා එතෙර පලායන්ට[6] සමර්ථ වූ වීරපුරුෂයෙක් ඇද්දැ"යි විචාළහ. එකෙණුල් අසමින් ම විෂමලොම කුමාරයෝ අවුත් රජ්ජුරුවන් වැඳ "දේවයන්වහන්ස, මම මේ ගඟ පීනා එතර ගොස් නැවත ඊරකු සේ ඇසිල්ලකින් පීනාගෙන මෙතර දිවෙමි. මඳක් බලා වැඩසිටිය මැනවැ"යි කියා, රජ්ජුරුවන් යහපතැයි ගිවිසි කල්හි කච්චිය[7] මිරිකා හැඳ [කරල්] කොට[8] හිසකේ ගොතා පිට හෙළා ගංඉවුරෙහි සිට අටළොස් රියනක් උස අහසට පැන ඉස්බක් පමණ තෙන ගංමැද[9] වැටී ගඟසරස දිවන මහ තලමසකු[10]සේ දිය පීනන්ට පටන්ගත්හ. මෙසේ මහ සැඩවතුර සරස කපා පීනාගෙන යන්නාවූ රාජකුමාරයෝ එතර මෙතර යන එන ඇසිල්ලෙහි තමන් කන්නට ආවාවූ කිඹුලුන් දක මහත් යමුගුරකින් ටිටිසුඹුළු තළන්නාක්හු සේ අතින් පැහැර සුණුවිසුණු කොට තළා එක්සිය විස්සක් කිඹුලුන් මරා හැර පීනාගෙන අවුත්

---

1. කෙළිමින් සෙමින් - BEGHKL
2. ගංතෙරට - B
3. ගඟ - ක.කි. කැ, ම.
4. බිබිලි - B
 බුබුලු - බෙ. කි.
5. තදවතුරු - ක. කි. කැ.
6. එතර ගොස් මෙතර පළායන්ට - AJ
 තරිතුං - පාලි
7. කත්තිය - ABCDEFGHJL, බෙ.ස.
 කච්චිය - K
8. කාල් කොට - ACDEFJ, බෙ. ස.
 කාල් කෝල් කොට - BGHKL
9. ගං මැදට - GHKL
10. දල මසකු - BGHKL

Non-Commercial Distribution

දියෙන් ගොඩ නැඟී රජ්ජුරුවන් වැඳ[1] එකත්පස් ව සිටියාහ. එප්‍රවත් දුටු රජ්ජුරුවෝ හයින් තැතිගෙන "මේ රජකුමර මා මරා ලුහුබඳවා මතු රජසැපත පැහැර ගනී[2] නමුදු සමත්ථ ය. එබැවින් කල් නොයවා දැන් ම මොහු මරවාපුව මැනවැ යි" සිතා නුවරට අවුත් වත්නාවූ[3] විෂමලොම කුමාරයන් ගෙන්වා අමාත්‍යවරුන්ට පාවාදී සිරගෙයි ලැවූහ. මෙසේ සිරගෙයි වසන්නාවූ විෂමලොම කුමාරයන්ට සාරමසෙක් ඉක්මිණ. ඉක්බිති ඒ සාරමස ඇවෑමෙන් දවසෙක රජ්ජුරුවෝ සැටරියන් දිග ඇති උණදඬු සැටමිටියක් ගෙන්වාගෙන ඇතුළෙහි ගැට හරවා ශුඩකොට එහි[4] යකඩ නාරාචන[5] බහා රාජාඞ්ගණයෙහි තබ්බවා විෂමලොම කුමාරයන් සිරගෙන් පිටත් කරවා ගෙන්වාගෙන අමාත්‍යවරුන්ට විධාන කරන්නාහු "එම්බා සගයෙනි, මේ විෂමලොම කුමාරයා තෙල එක් ව බැඳි හුණදඬු සැටමිටිය මේ කඩුවෙන් පැහැර එකි එකී පහරින් සතර[6] සතරහුල් කොට වහා පොලු ගසා දමන්ට කියව. එපරිද්දෙන් පොලුගැසිය නොහේ නම් දැන් ම ඔහු මරව යි නියෝග කළහ.

එතෙපුල් අසා විෂමලොම කුමාරයෝ කියන්නාහු "දේවයන්වහන්ස, දැන් සාරමසක් මුළුල්ලෙහි සිරගෙයි විසීමි. සාදුකින් පීඩිතයෙමි. ඉතා ම ආහාරයෙන් මිරිකිණිමි. බඩපුරා බතක් ලදිම් නම් මේ හුණදඬු සැටමිටිය අලමදන් සේ පොලුගසා වගුරුවා පියමි"යි කීහ. එබස් අසා 'එම්බල, තට ආහාරයෙක් නම් නැත. පිළිවන් වීනම් තෙල හුණදඬු සැටමිටිය වහා පොලුගෙනපියව"යි[7] කී කල්හි "එසේ වී නම් පොකුණට බැස පැන් බී පියන්ට මඳක් අවසර දෙව"යි කියා යහපතැයි ගිවිස පොකුණට කැඳවාගෙන ගිය කල්හි විෂමලොම කුමාරයෝ පොකුණට බැස ඉස්සොධා නහා දියයට කිමිද කලල්මඩ බඩපුරා අනුභව කොට පැන් බී පොකුණෙන් ගොඩනැඟී සිට කඩුපත අතින් ගෙන විදුලියක් සේ හිස වට සිසාරා මහජනයා කුහුල් ව බල බලා සිටියදී ම ගරුඩ පොතකයකු සේ අටාසුරියනක් අහසට පැන නැඟී එක් ව බඳ[8] හුණදඬු සැටමිටිය තෙබුදඬු[9] මිටියක් කප කපා හරනා සේ මුදුනෙහි පටන් සතර සතරහුල් කොට පොල්ලගසා හෙළා රාජාඞ්ගණයෙහි විසුරුවමින් බැස මුල මහත් යකඩනාරාචනයට පැමිණ කඩුව පැහැර කිරීන්[10] යන ශබ්දය අසා ඇතුළෙහි යනාරාචනය[11] බව දැන අත තුබූ කඩුව දමා හඬ හඬා සිටියහ, ඒ දැක "කුමක් පිණිස හඬා දැ"යි රාජපුරුෂයන් විචාළ කල්හි "එම්බා, මේ සිටියා වූ මනුෂ්‍යයන් අතුරෙන් මට හිතකාමී එක ද මනුෂ්‍යයෙක් නැත. ඉදින් එබඳු හිතකාමී වූ මිත්‍රයෙක්[12] ඇත්නම් මේ හුණදඬු ඇතුළෙහි යකඩ නාරාචනය ඇති බව කියන්නේ ම ය. මම වනාහි සැබවින් මේ හුණදඬු ඇතුළෙහි යදඬු බහා තුබූ බව දනිම් නම් මේ සියල්ල ම එකි එකී අහුල් කොට පොලු ගසා දමන්නෙම් වේ දැ"යි කීහ. ඉක්බිති ධම්මාශෝක රජ්ජුරුවෝ මෙසේ විෂමලොම කුමාරයන් කළ පුරුෂවික්‍රම දැක ප්‍රසන්න වූවාහු එදවස් ම යුවරජ තනතුරු දී බොහෝ සැපත් දුන්හ. මෙසේ ඒ

1. දක වැඳ - J
2. ගනිත් - B
3. වත්නාහු - BGKL
4. එහි තුළ - ක. කි. ක. ම.
5. යානාරාස - BGH
නාරාසන - ක.ම.
යනාරාච - K, ස.
6. සතර(නැත) BFGHKL, මුද්‍රිත හැම. ස.
7. පොලුගසා පියවයි - KL, බෙ.ස.
8. බැදි - C, මුද්‍රිත හැම. ස.
9. තෙළුඹුදඬු - C ක.කි.කඳ.බෙ.ස.
10. කීත් - GH
11. යනාරාසය - BGHKL
12. මනුෂ්‍යයෙක් - බෙ.ස.

Non-Commercial Distribution

කුමාරයන් එකල්හි ලද්දවූ ඒ ශක්තිසම්පත්තිය නම් ඔවුන්ගේ ජාති ගොත්‍ර කුල ප්‍රදේශාදියෙහි බලයෙකුත් නොවෙයි. සෙසු ප්‍රාණඝාතාදි වූ දුශ්චරිතයෙහි බලයෙකුත් නොවෙයි. යළි කවරක්හුගේ බලයෙක් ද යත හොත්, කාශ්‍යප බුදුන් සමයෙහි භික්‍ෂු සංඝයාවහන්සේට දුන්නාවූ දනය හා සෙසු පිරූ සුචරිතධර්මයාගේ බලය ය. එසේ හෙයින් සසර සිටිනා නෙක් කල් මුළුල්ලෙහි සියලු භවභොග සම්පත් විඳිනා[1] කැමැත්තා වූ හැම සත්ත්වයන් විසින් දනාදි වූ කුසල් නම් දෙය එකාන්තයෙන් කළ මනා දෙයෙක් මය. තව ද තමා සිහින්[2] පවිත්‍ර කොට පන්සිල් අටසිල් ආදිය ද රක්‍ෂා කටයුත්තේය. සෙසු භාවනා නැත. යටත් පිරිසෙයින් තිලකුණු පමණක් වී නමුත් සලකුණු කිරීම් වශයෙන් භාවනා කටයුත්තේ මය. එසේ හෙයින් කියනලදී:

> කාතබ්බං කුසලං තස්මා - භවසම්පත්තිමිච්ඡතා,
> පාලෙතබ්බමථො සීලං - භාවෙතබ්බං ච භාවනං-යි.

මෙසේ[3] විෂමලොම කුමාරයෝ යුවරජ තනතුරු ලදින් මහත් වූ ඓශ්වර්‍ය්‍ය විඳිනාහු මොග්ගලිපුත්තතිස්ස මහතෙරුන්වහන්සේ ආදි[4] කොට ඇති මහාසඞ්ඝයාවහන්සේට සිවුරුපිඬු සෙනසුන් බෙහෙත්සත්[5] ආදි වූ සිවුපසදනයෙන් හා නොයෙක් කප්පිය භාණ්ඩ දන් දීමෙන් බොහෝ සත්කාර සම්මාන කොට නිරන්තරයෙන් පන්සිල් රැක පොහොය පෙහෙවස් රැක ජීවිතාවසානයෙහි තමන්ගේ කම් වූ පරිද්දෙන් ස්වර්ගපදපරායන වූහ. මෙසේ තමන්ට හිත කැමැත්තා වූ සත්පුරුෂ ජනයෝ දිවිහිමියෙන් බොහෝ පින්කොට සසර උපනුපන් ජාතියෙහි නොයෙක් භවභොගසම්පත් ලබන්නාහ. එබැවින් පින්වත් සත්ත්වයෙනි, තොප හැම විසිනුදු එපරිද්දෙන් ම තොප තොපගේ විභවානුරූපයෙන් අප්‍රමාද ව කුසල් කොට මතු දිව්‍යමනුෂ්‍ය සම්පත් විඳ අන්තයෙහි අජර වූ අමර වූ නිර්වාණපදය අත්පත් කරන්ට උත්සාහ කටයුතු. කියන ලදුයේ මැයි:

> එවං විධං සුචරිතං සුමනො කරිත්වා
> භාගිස්ස නෙක විභවස්ස [භවාභවෙසු[6]]
> තුම්හෙපි භො සුචරිතං විභවානුරූපං
> කත්වාන නිබ්බුතිපදං කරගං කරොථ-යි.

මෙතෙකින් මෙහි

සතරවන විෂමලොම වස්තුව
කියා නිමවන ලදී.

---

1. විඳුනා - *BGHKL*
2. තම සිත - BGHKL
3. මෙසේ මේ - BGH
4. ප්‍රධාන - KL
5. බෙහෙත් - BF, මුද්‍රිත හැම
   බෙහෙසත් - J
6. භවෙභවෙසු - ABCDEFGHJK
   භවාභවෙපි - L
   භවාභවෙසු - මුද්‍රිත හැම, පාලි

Non-Commercial Distribution

තව ද මෙහි පස්වන ඉන්‍දගුත්ත වස්තුව නම් තවර යත්. හේ මෙසේ දතයුතු.

අප මහාගෞතම බුදුන් පිරිනිවී දෙසිය අටළොස්වන හවුරුදු[1] දඹදිව පැළලුප් නුවර ආඥාචක්‍රවර්ති වූ ධර්මාශොක නම් මහරජෙක්[2] මුළු දඹදිව එක්සත් කොට රාජ්‍යය කරන්නේය. ඒ රජහුගේ ආඥාව දසදහසක් යොදුන් මුළු දඹදිවු තෙලෙහි පැතිර අහසින් යොත්නෙක පොළොවින් යොත්නෙක වටින් සාගර ජලය පර්‍යන්ත ව එකහෙළා පවත්නේය. සෙසු විශෙෂ සියල්ල ම මතු කියන තෙහාතික වස්තුයෙහි ප්‍රකාශ වන්නේය. එකල්හි[3] දඹදිව සුවාසූදහසක් රාජධානිවල ඔටුනු පළන් සුවාසූදහසක් රජදරුවෝ තමතමන්ගේ සිවුරඟසෙන් පිරිවරා අවුත් ධර්මාශොක රජහට උපස්ථාන පිණිස පිරිවරා සිටිති. එසමයෙහි දෙවපුත්‍ර නුවර දෙවපුත්‍ර නම් රජ්ජුරුවෝ ද තමන්ගේ බළසෙනඟ පිරිවරා ධර්මාශොක රජ්ජුරුවන්ට උපස්ථානයට ගියහ. එකල ධර්මාශොක රජ්ජුරුවෝ දෙවපුත්‍ර රජ්ජුරුවන් දැක මිහිරි වූ පිළිසඳර කථා කොට ඉක්බිති "කිමෙක් ද රජ්ජුරුවෙනි, තොපගේ රාජ්‍යයෙහි ගුණානුවණ ඇති ත්‍රිපිටක ධර්මයෙහි දක්ෂ බහුශ්‍රැත වූ සිල්වතුන්වහන්සේ ඇද් ද"යි විචාළහ. එතෙපුල් අසා දෙවපුත්‍ර රජ්ජුරුවෝ "එසේය මහරජ, අපගේ නුවර සිංහගුම්බ[4] නම් මහා විහාරයෙක් ඇත. එහි නොයෙක් දහස්ගණන් මහාසඞ්ඝයා වහන්සේ වැඩවසනසේක. ඒ හැමදෙනාවහන්සේ ම සිල්වත්සේක, ගුණවත්සේක, අලෙපවජ්‍රසේක, සන්තුෂ්ටසේක, විවේකකාමීසේක. ඒ භික්‍ෂූන්වහන්සේ අතුරෙහි සියලු අර්ථකථාවන් හා සමඟ ත්‍රිපිටකධාරී වූ ඉන්‍දගුත්ත නම් මහතෙරකෙනකුන් වහන්සේ එහැමදෙනාවහන්සේට ප්‍රධාන ව වසනසේක.[5] උන්වහන්සේ නොයෙක් පරිද්දෙන් දෙව්මිනිසුන් සහිත වූ භික්‍ෂු සඞ්ඝයාවහන්සේට ත්‍රිපිටක ධර්මයෙන්, මෙලෝ පරලෝ හඟවා විදහා බණ වදරනසේක. ඉතා සිල්වත්[6] ගුණවත්සේක. තමන් වහන්සේගේ එම ගුණධර්මය නිසා හිරසඳ සේ ලොකප්‍රසිඬසේක.[7] බොහෝ දෙනාට කුසල් වඩමින් වැඩවසනසේකැ"යි කීහ. එතෙපුල් අසා සන්තුෂ්ට වූ ධර්මාශොක රජ්ජුරුවෝ ඒ ඉන්‍දගුත්ත නම් මහතෙරුන්වහන්සේ දක්නා කැමැති ව[8] "සබඳ, තෙපි ම ගොස් මාගේ ආරාධනාවෙන් මහතෙරුන්වහන්සේට ආරාධනා කොට අපගේ නුවරට කැඳවාගෙන එව"යි කීහ. එකල දෙවපුත්‍ර රජ්ජුරුවෝ ඇත් අස් බළවාහන ආදි වූ මහසෙනඟ පිරිවරා නැවත තමන්ගේ දෙවපුත්‍ර නුවරට අවුත් ඉන්‍දගුත්ත මහතෙරුන්වහන්සේ සමීපයට එළඹ පසඟ පිහිටුවා වැඳ එකත්පස් ව හිඳ පිළිසඳර කථා කොට ඉක්බිති තමන් ආ කටයුතු දන්වන්නාහු "ස්වාමිනී, ධර්මාශොක රජ්ජුරුවන්වහන්සේ ඔබ දක්නා කැමැති ව ආරාධනා කොට කැඳවාගෙන යන පරිද්දෙන් මා එවා වදාළසේක. කරුණාකොට වැඩවදාළ යහපතැ"යි කීහ. එතෙපුල් අසා මහතෙරුන්වහන්සේ ද

1. අවුරුදු - DFJ
   අවුරුද්දෙහි - BGHKL
2. මහරජ - BGHKL
3. එසමයෙහි - F
   එකල - D
4. සිංහගුත්ත - BGHK
   ඉන්දගුත්ත - L
   සීහකුම්භ - පාලි.
5. ප්‍රධානසේක - BGHKL
6. සිල්වත්සේක - BGHKL
7. ප්‍රසිද්ධ ව - KL, ස.
8. කැමැත්තෙම් - BGHKL

Non-Commercial Distribution

යහපතැයි ගිවිසියේක. දෙවපුත්‍ර රජ්ජුරුවෝ මහතෙරුන් වහන්සේ ආරාධනාව[1] ගිවිසි බව කියා නැවත ධර්මාශෝක රජ්ජුරුවන් සමීපයට මිනිසුන් යැවූහ. ඉක්බිති ධර්මාශෝක රජ්ජුරුවෝ උපන්නාවූ මහත් සන්තොෂ ඇති ව තමන්ගේ ආඥාව[2] පවත්නාවූ දසදහසක් යොදුන් දඹදිව්තෙලෙහි රජදරුවන්ට කියා යවන්නාහු "එම්බා සබඳිනි, හැමදෙන ම අපගේ ආර්‍ය්‍ය වූ ඉන්ද්‍රගුත්ත මහතෙරුන් වහන්සේ පැළලුප් නුවරට වඩනා පරිද්දෙන් මහදිග කණුමුල් කැටපහණ පහ කොට වළගොඩ තනා ඉඳුරා මහ සරහාලව"යි කියා යවූහ.

එතෙපුල් අසා සුවාසුදහසක් රාජධානිවල රජදරුවෝ තුටු පහටු වූ සිත් ඇති ව තමන් තමන්ගේ[3] ආඥා පවත්නා රට දනවු ආදියෙහි බෙර ලවා අන්තඃපුර පිටිපුර[4] රට දනවුවැසි මහජනයන් රැස්කරවා "එම්බා සගයෙනි, අප මහාගෞතම බුදුන් මහණ වන්ට වඩනා දිනයෙහි දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්ම සෙනාව නොයෙක් පූජාභාණ්ඩ ගෙන මේ එක මඟුල්සක්වළට රැස් ව ඉදිරියෙහි සැටදහසක් දෙවියෝ මිණි දඬුවැටපහන් ගෙන සිටියහ. දකුණැළයෙහි[5] සැටදහසක් මිණි දඬු වැටපහන් ගෙන සිටියහ. එසේ ම වම්ඇළයෙහි[6] සැටදහසක් පමණ මිණි දඬුවැටපහන් ගෙන සිටියහ. පිටිපස්සෙහි සැටදහසක් මිණි දඬුවැටපහන් ගෙන සිටියහ. සෙසු දිව්‍යසෙනාව වටින් සක්වළගල දක්වා අතුරු නොහැර උතුරු උතුරුවා යන වතුරක් සේ උරෙන් උර ගසා මිණි දඬුවැටපහන් ගෙන නික්මුණාහ. තව ද සෙසු දෙවතාවෝ ද නාගරාජයෝ ද ගරුඩරාජයෝ ද ගාන්ධර්වයෝ ද යක්‍ෂරාක්‍ෂස සිඬවිද්‍යාධරාදීහු ද දිව්මලින් දිව්ගඳින් දිව්සුවඳ සුන්නෙන් දිව්දුමින් පූජා කෙරෙමින් නික්මුණාහ. දෙවියන් දමන පරසතු මදරා මලින් හා අසුරයන් දමන පළොල් මලින් හා නයින් දමන කඩුපුල් මලින් හා මෙසේ අතුරු නොදී දමන දිව්මල් වර්‍ෂාවෙන් එදවස් ආකාශකුහරය අනවකාශ විය. තව ද පඤ්චාඞ්ගික තූර්‍ය්‍යභාණ්ඩ ගෙන දිව ආවා වූ ගාන්ධර්ව දිව්‍යපුත්‍රයෝ ඉදිරියෙහි අටසැටදහසක් තූර්‍ය්‍යනාද කෙරෙමින් නික්මුණාහ. දකුණැළයෙහි අටසැටදහසක් තූර්‍ය්‍යනාද ගෙන[7] නික්මුණාහ. වම් ඇළයෙහි අටසැටදහසක් තූර්‍ය්‍යනාද පවත්වමින් නික්මුණාහ. පිටිපස්සෙහි අටසැටදහසක් පමණ දිව්‍යභෙරිනාදයෙන් පූජා කෙරෙමින් නික්මුණාහ. අවශෙෂ වූ දිව්‍යගාන්ධර්වයෝ සිටින්ට[8] අනික් අවකාශයක් නැති හෙයින් සක්වළගල සිසාරා සිටගත්හ. එදවස් පැවැති දිව්‍යතූර්‍ය්‍යශොභාව මහාසමුද්‍රමධ්‍යයෙහි මෙඝනාදයටත් වඩනේය. යුගන්ධරපර්වත සමීපයෙහි සාගරනාදයටත් වඩනේය. අහස්පොළෝ දෙක එකපැහැර ගුගුරන්නා වූ ශබ්දයක් වැන්නැයි කිය නොහැක්ක. එදවස් ඒ තූර්‍ය්‍යශොභාව පොළෝතෙලෙහි පටන්ගෙන අකනිට්ඨබඹලෝ දක්වා එකනින්නාද විය. තව ද බුදු වන දිනයෙහි සියලු දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණාදීහු, නිල්තරා හෝ

1. ආරාධනා - BEGHKL
2. ආඥා - ABCJ
3. තම තමන්ගේ - CE, ක.කි.නෑ.ම. තමන්ගේ - BFGHKL
4. පිරිසර - බෙ.ස.
5. දකුණැළයෙහි දෙවියෝ - ABEFKL
6. වම් ඇළයෙහි දෙවියෝ - BGHKL
7. කෙරෙමින් - BFGHKL
8. සිටින්ට - ABCDFGHKL සිටිනා - EJ බෙ.

අස සල්වෙනෙහි පටන්ගෙන මහබෝමැඩ[1] දක්වා මේ දෙඅතුරෙහි මාර්ගය පුළුලින් අටසියක් රියන් පමණ තන්හි හෙරිතලයක් සේ තනා කළුවැලි පියා සුදුවැල්ලෙන් තවරා නානාවර්ණ දිවකුසුම් විසුරුවා දෙපස පහන් දල්වා නන්විසිතුරු තොරනින් හා පූර්ණඝට පූර්ණකලස මාලාවෙන් අලඞ්කාර කොට සරහා නොයෙක් පූජාභාණ්ඩ ගෙන බුදුන්[2] පුදු පුදු නික්මුණාහ. එයින් මහාකාල නම් නාගරාජයා සැටදහසක් නානළුවන් පිරිවරා සතුති ගී කිය කියා බුදුන් පෙරටුව නට නටා නික්මිණ. සෙසු නාග සුපර්ණ යක්‍ෂ රාක්‍ෂස ගරුඩ ගාන්ධර්ව සිඞ විද්‍යාධරාදි වූ දිව්‍ය දේවතාදීහු දිවමල් දිවසුවඳින් පුදමින් නික්මුණාහ. මෙසේ දසදහසක් සක්වළ දෙවියන් කරන නොයෙක් පූජාවෙන් හා සුවඳින් මලින් සාධුකාරයෙන් මුළුසක්වළ පිරී සිටගත්හ.

අප බුදුන් දම්සක් පැවතුම් සූත්‍රය දෙසන දවස් දසදහසක් සක්වළ අසුරයන් වන් ශක්‍රපුරය සේ හැළලී දිව්‍යනාගයෝ කඩුපුල් මල් ගෙන දිවුහ. ගරුඩයෝ මහපියුම් තුඩින් කඩා ගෙන දිවුහ. ගාන්ධර්වයෝ තූර්‍ය්‍යභාණ්ඩ ගෙන දිවුහ. අසුරයෝ පළොල් මල් ගෙන දිවුහ. දෙවියෝ පරසතුමඳරාදි වූ දිවමල් ගෙන දිවුහ. බ්‍රහ්මයෝ සේසත් ගෙන දිවුහ. මෙසේ ආවාවූ දිව්‍යබ්‍රහ්මයන් අතුරෙන් දෙලොස්යොදුන් උස ඇති දසදහසක් බ්‍රහ්මරාජයෝ තුන්යොදුන් වට ඇති දසදහසක් සේසන් බුදුන් සිරසට මතුමත්තෙහි අල්වා සිටගත්හ. දසදහසක් ශක්‍රයෝ එක්ජියවිසිරියන් ජයතුරාසක් තමතමන්[3] තුඩ තබා පිඹිනට පටන්ගත්හ. දසදහසක් සුයම්දෙවියෝ චාමර[4] ගෙන සැලූහ. දසදහසක් සන්තුෂිතයෝ මිණිතල්වැට ගෙන සැලූහ. සෙසු දෙවියෝ රන්තොරණ මිණි[5]තොරණ රන්ඇගෑ මිණි ඇගෑ[6] රන්පියුම් රිදීපියුම් රන්මල් රිදීමල් රන්කරඬු රිදීකරඬු රන්සුනු රිදීසුනු රන්දම් රිදීදම් ආදි වූ පූජා භාණ්ඩ ගෙන සිටියහ. එකල දෙවියන්ගේ ඒ පූජාකොළාහලයෙන් බ්‍රහ්මාණ්ඩය දක්වා එක කොළාහළ විය.

තව ද බුදුන් කිඹුල්වත් නුවරට වඩනා දවස් බුදුන්ට පෙරගමන් කරන්නාවූ ශාක්‍ය රජ්දරුවෝ මහ සරහා නොයෙක් අලඞ්කාරයෙන් හෙබියාවූ සොළොස් හැවිරිදි පන්සියයක් සිටුකුමරුවන් සරහා සුවඳ මල්දම් දී පළමු කොට පෙරමහට යවා දෙළොස් හැවිරිදි සිටුකුමරියන් පන්සියයක් සරහා මහනෙල්මල්කලප් අතට දී දෙවනු ව නික්මවා තුන්වැනි ව පන්සියයක් ශාක්‍ය කුමරුවන් මහමඟුල් පෙරහරින් නික්මවා සතරවැනි ව පන්සියක් ශාක්‍ය කුමරියන් සරහා නික්මවා පස්වැනි ව එක් ලක්‍ෂ සැටදහසක් ශාක්‍ය රජ්දරුවෝ මහපෙරහරින් ගොස් මහත් වූ පූජාවෙන් සුවඳින් මලින් බුදුන් පුදමින් නිග්‍රොධාරාමයට වඩාගෙනාහ.

1. මහබෝමඩ - ABCDFGH
2. බුදුන්ට - AJ
3. තමන් තමන් - J
   තමන් - ACDEF
4. සෙළ චාමර - BGH
5. රිදී - BHKL
6. රිදී ඇගෑ මිණි ඇගෑ - BGHKL

Non-Commercial Distribution

සැවැත් නුවරට[1] වඩනා දවස් අනේපිඬු මහසිටාණෝ ජේතවනෝද්‍යානය ඒ ඒ තන්හි ධජ පතාකා පුන්කලස් කෙහෙල්තොරණ පිළිතොරණ ආදියෙන් දිව්උයනක් සේ අලඞ්කාර කොට තමන් පුතණුවන් සර්වාභරණයෙන් සරහා පන්සියක් සිටුකුමරුවන් පිරිවර කරවා පස්පැහැයෙන් දිලියෙන පන්සියක් ධජපෙළ හා සමඟ යවූවාහුය.[2] ඔවුන් පස්සෙහි මහාසුභද්‍රා නම් සිටුදුව හා චූලසුභද්‍රා නම් සිටුදුව හා දූන් දෙන්නා දෙව්කුමරියන් සේ සරහා සමවයස් ඇති පන්සියක් සිටුකුමරියන් හා සමඟ පන්සියක් රන්කළස් දී යවූහ. ඔවුන් ඉක්බිති තමන්ගේ අග්‍ර සිටුදියණියන් පන්සියක් කුලස්ත්‍රීන් හා සමඟ සර්වාභරණයෙන් සරහා පන්සියක් රන්පැන දී යවූහ. එසිටුදුන් ඉක්බිති ව කොසොල් රජ්ජුරුවන්ගේ දූ වූ සුමනා නම් රාජකුමාරිකාවෝ පන්සියක් රජකුමරියන් පිරිවරා පන්සියක් රථ නැඟී සර්වාභරණයෙන් සැරහී ශක්‍රපුරයෙන් නික්මුණු දෙවඟනන් රැසක් සේ සුවඳ මල්කරඬු ගෙන එක පෙළ[3] නමා ගත්හ. ඒ රජකුමරියන් ඉක්බිති ව පන්සියක් ඇමැතියෝ ද සර්වාභරණයෙන් සැරහී මල්කලප් ගෙන නමාගත්හ. ඔවුන් ඉක්බිති ව නුවර වැසි මහජනයෝ සියලු අලඞ්කාරයෙන් සැරහී නොයෙක් පූජාභාණ්ඩ ගෙන මහවතුරක් සේ නික්මුණාහ.[4] ඔවුන් හැමදෙනා ම මෙසේ ගිය ඉක්බිති අනේපිඬු මහසිටාණෝ පන්සියක් සිටුකුමරුවන් හා සමඟ අලුත් සුදු දවලු පිළී හැඳ පූජා මඟුල්වෙස් ගෙන සුවඳ මල් ගත් අත් ඇති ව බුදුන් පෙරමඟට ගොසින් දක වැඳපුද මහත් වූ පූජා පෙරහරින් වඩාගෙනවුත් දෙව්රම් වෙහෙර පිළිගැන්වූහ.

තව ද බුදුන් තව්තිසා දෙව්ලොවට වැඩ දෙවියන්ට විජම්බණ වදරා මිනිස්ලොවට වඩනා දවස් ශක්‍රදෙවේන්ද්‍රයෝ මෙරමුදුනෙහි පටන් සකස්පුරදෙර දක්වා බුදුන් වඩනා සේ සත්රුවන් හිණක් මවා නොයෙක් පූජාභාණ්ඩ ගෙන දෙවියන් බස්නා සේ දකුණැළයෙහි රන්හිණක් මවා බ්‍රහ්මයන් සේසත් ගෙන බස්නා සේ වමැළයෙහි රිදීහිණක් මවා තුබූහ. ඒ හිණි තුන ම සුවාසූදහසක් යොත්නටත් වඩා දිග් ව සිටියේය. හිණිහිස මහමෙර මුදුනෙහි විය. හිණි පාමුල සකස්පුරදෙර විය. බුදුන් දිව්සෙනඟ පිරිවරා මධ්‍යයෙහි සත්රුවන් හිණින්[5] බස්නට පටන්ගත් වේලෙහි දසදහසක් ශක්‍රදෙවේන්ද්‍රයෝ දසදහසක් ජයතුරාසක් පිඹිමින් රන්හිණපෙති පෙත්තෙහි සිටගත්හ. දසදහසක් සුයම්දෙව්රජහු දසදහසක් මිණිචාමර ගෙන විහිදුවමින් පෙළසැදී සිටගත්හ. දසදහසක් සන්තුෂිතරාජයෝ දසදහසක් මිණිතල්වැට ගෙන සැරහී සිටගත්හ. දසදහසක් සුනිර්මිත[6] දිව්‍යරාජයෝ නොයෙක් පූජාභාණ්ඩ ගෙන සිටගත්හ. දසදහසක් පරනිර්මිත රජහු මහත් උත්සවයෙන් බුදුන් පුද පුද සිටගත්හ. වම්භාගයෙහි රිදීහිණ දසදහසක් සහම්පතී බ්‍රහ්මරාජයෝ තුන්යොදුන් වට[7] ඇති සඳමඬුලු වැනි මහත් සේසත් ගෙන සිටගත්හ. අවශේෂ වූ බ්‍රහ්මරාජයෝ ද රිදීහිණ පෙතිපෙත්තෙහි බුදුන් පුදපුද සිටගත්හ. දකුණැළයෙහි රන්හිණ

1. නුවර - BGHL
2. යවූහ - BGHKL
3. එකහෙළා - BGH
4. නමාගත්හ - KL
5. හිණිමගින් - ක.සි.සැ.
6. පරනිර්මිත - ක.සි.සැ.බෙ.ස.
7. පමණ - BGH

Non-Commercial Distribution

මෙරමුදුනෙහි පටන් සකස්පුරදෙර දක්වා පෙතිපෙත්නෙහි අතුරු නොහැර සිටගත්තා වූ දිව්‍යසෙනාව රත්ඇගෑයෙක පහන්පෙළක් දිළියෙන්නා සේ එකාකාරයෙන් සිටගත්හ. චමැළයෙහි රිදීහිණ පෙතිපෙත්නෙහි හිටගත්තාවූ බ්‍රහ්මසෙනාව ද මෙරමුදුනෙහි පටන් සකස්පුර දෙර දක්වා එපරිද්දෙන් ම හිවී ගැවසී එකාකාරයෙන් සිටගත්හ. එකල රන්හිණින් බස්නට අවකාශ මඳ හෙයින් දසදහසක් පඤ්චසිඛ දිව්‍යපුත්‍රයෝ තුන්ගවු පමණ දිග ඇති දසදහසක් බෙලුවපණ්ඩු නම් දිව්‍යවීණාවන් ගෙන පුවහස් ගණින් තතින් පරහා ගවු පමණ දිග ඇති දසදහසක් වීණාපතින් එකපැහැර බුදුගුණ ගායනා කෙරෙමින් පනස් යොදුනෙහි[1] රහමඬුලු බැඳ පෙළ පෙළ සැදී[2] බස්නට පටන් ගත්හ. දසදහසක් මාතලී නම් දිව්‍යරථාචාරීහු දහස්දහස් දිව්‍ය අශ්වයන් යෙදූ දසදහසක් වෛජයන්ත රථ ගෙන නොයෙක් ධජපතාකා දිව මල්දම් ආදි වූ පූජා පෙරහරින් අලඞ්කෘත කොට තම තමන්ගේ පුවහස් ගණින් දිව්‍ය සෙනාව හා සමඟ පෙළ පෙළ සැදී[2] බස්නට පටන්ගත්හ. දසදහසක් පමණ ඓරාවන නම් දිව්‍යහස්තිරාජයෝ තම තමන්ගේ එකි එකී ශරීරයෙහි දෙතිස් දෙතිස්[3] කුම්[4] මවා එකි එකී කුඹෙහි සත් සත් දළ හා එකි එකී දළෙහි සත් සත් පොකුණු හා එකි එකී පොකුණෙහි සත් සත් නෙළුම්පඳුරු හා එකි එකී පඳුරෙහි සත් සත් නෙළුම්මල් හා එකි එකී මලෙහි සත් සත් පෙති හා එකි එකී පෙත්නෙහි සිට නටන සත් සත් දෙව්ඟනන් හා සමඟ තුන්ලක්ෂ සතලිස්දහසක් පමණ ශ්වේත බුදුන් සිරසට කෙරෙමින් ආකාශයෙහි පෙළ පෙළ සැදී බස්නට පටන්ගත්හ. සෙසු නට නටා ගී කිය කියා වීණා ගගා දිවකුළල් පිඹ පිඹ බුදුන් පුද පුද බස්නා දෙවඟනන් හා දිවනළුවෝ මෙතෙකැයි පමණ නැත. තව ද අහස්කුස මුළුල්ලෙහි දෙවියන් මැවූ දිවමඬුලු දිවතොරන් රන්ඇගෑ රුවන්ඇගෑ ධජ පුන්කලස් ආදි වූ නොයෙක් පූජාපෙරහර මෙතෙකැයි පමණ නැත. සමන්තභද්‍ර, ශාක්‍යසිංහ, ශරණාගත වජ්‍රපඤ්ජර, ත්‍රිභුවනචන්ද්‍ර, අභිධර්මාමෘතප්‍රසව, දේවාතිදේව, ශක්‍රාතිශක්‍ර, බ්‍රහ්මාතිබ්‍රහ්ම යනාදීන් ස්තුති කෙරෙමින් බුදුන්ට ජයකාහළ පිඹ පිඹ බස්නා දෙවියෝ ම මෙතෙක් දහස් ගණනැයි කියා නිමවිය නොහැක්කාහ.

තව ද බුදුන් විශාලාවෙහි සිට රජගහා නුවරට වඩනා දවස් විශාලා මහනුවර වැසි සත්දහස් සත්සිය සත්රජුන් හා මහසෙනඟ සමඟ ව මඟ සරහා බුදුන් සිරසට ශ්වේත අටක් හා පන්සියක් රහතන්වහන්සේට සතර සතර ශ්වේත බැගින් අටතුරු දෙදසක් ශ්වේත හා සමඟ ගංතෙර දක්වා මහපුදෙන් බුදුන් වඩාගෙනාහ. එකල ගඟ වසන දිව්‍යනාගයෝ[5] එපවත් දැක අපි ද බුදුන්ට පූජාවක් කරම්හ යි සත්රුවන් නැව් මවා ගඟදිය නොපෙනෙන සේ පස්පියුමෙන් සද බුදුන් හා පන්සියක් රහතන් වහන්සේ තමන්ගේ නාගභවනයට වඩාගෙනගොස් දෙවන ද දිවබොජුන් වළඳවා තමන් ශක්තිපමණින් බුදුන් පුද[6] නාගභවනයෙන් මිනිස්ලොවට වඩාගෙනාහ. එකල භූමියෙහි වසන්නාවූ විමානස්ථ දෙවියෝ අපි ද පූජාවක් කරම්හයි මේ සා මහත්

1. යොදනෙක - BGH
2. දී - ABEFGHL. ස
3. තෙතිස් තෙතිස් - KL
4. කුඹ - AEJK ම
   කුඹු - ක.කි.ක.
5. දිව්‍යනාගරාජයෝ - BGHL
6. පුද පුද - GH

Non-Commercial Distribution

සක්වළගබ මුළුල්ලෙහි නොයෙක් පර්වත ගිරිකූළු වෘක්‍ෂලතා මුදුනෙහි අවකාශයක් නැති ව යටත් වසයෙන් තණගස පිලගස වසන දෙවතාවෝ පවා කුඩ පිට කුඩ නගා පූජා කෙරෙමින් සක්වළගබ ඝේසතින් වසා සිටගත්හ. මෙම ක්‍රමයෙන් ඔවුනොවුන් බල බලා ආකාශසථ දෙවියෝ්ය විමානසථ දෙවියෝ්ය අබ්භ්‍රවලාහකය උෂ්ණවලාහකය ශීතවලාහකය වස්සවලාහකය යනාදී දෙවියෝ්ය චාතුර්මහාරාජිකාදී සදෙව්ලෝ වැසි දෙවියෝ්ය අරූතල අසංඥතලයන් හැර පසළොස් බඹතෙලෙහි බ්‍රහ්මයෝ්ය යි හැම දෙව්බඹුහු අපි අපි ද ඒ උතුමාණන්වහන්සේට පූජාවක්[1] කරම්හ යි ඔවුනොවුන් පරයා දිව අවුත් නාගභවනයෙහි පටන් අකණිටා බඹලොව දක්වා මුළු ලොව ඝේසතින් වසා සිටගෙන පූජාවට පටන්ගත්හ. එකල බිම්සර රජ්ජුරුවෝ ද බුදුන් සිරසට ඝේසත් සොළොසක් හා පන්සියක් රහතන්වහන්සේට අට අට ඝේසත් බැගින් සොළොසුතුරු[2] පාරදහසක් ඝේසත් හා සමග මහත් වූ පූජා කෙරෙමින් යොදනින් යොදනෙහි සතප්ව සතප්වා රජගහා නුවර වෙළුවනාරාමයට වඩා ගෙනාහ. එබඳු පූජා සත්කාර ලබන බුදුන්ට පවා පෙර දගබිම්මළුවෙක වටාපතක් සා තැන පරඬලා දුරු කළ කුශලයෙන් විශාලා මහනුවර[3] පටන් රජගහා නුවර දක්වා අටයොදුන් මහ පුළුලින් සියක් රියන් පමණ තෙන හෙරිතලයක් සේ තැනුම් ලද. එම දගබිම්මළුයෙහි එකුරුතුපවින් ගෙනවුත් බහාලූ වැලිපුහෙක අනුසසින් අටයොදුන් මහ සුදුවැල්ලෙන් තැනුම් ලද. එම දගබට පිදූ මල්මිටෙහි අනුසසින් ගඞගාව ඇතුළු ව නවයොදුන් මහ පස්වනක් මලින් සැදුම් ලද. එම දගබිම්මළුයෙහි කමඬලාවෙන් ඉසලූ පැන් අතළොස්සෙහි අනුසසින් තුන්සියක් යොදුන් විශාලා මහනුවර පොකුරුවැසි වැසපීය. එම දගබට පිදූ වියතක් පමණ පතාකයෙහි පිහිත් නාගභවනයෙහි පටන් අකනිටා බ්‍රහ්මලෝකය[4] දක්වා ධජපතාකයෙන් සැරහී සිටගත. එම දගබට පුදලූ පත්කුඩයෙහි[5] අනුසසින් නාලොව[6] පටත් බඹලොව දක්වා අතුරු නොහැර උතුරුව උතුරුවා ඝේසතින් සැදී සිටගත. මෙසේ බුදුන් පවා මෙබඳු පූජා ලබන්නේ පෙර කළ කුශලයෙන් මය. හේ එසේ මැයි. මුළු ලොවට අග්‍රදක්ෂිණෙය්‍ය[7] වූ බුදුරජාණන්වහන්සේ හා එම බුදුරජාණන්වහන්සේ වදළ ධර්මය වූ පරිද්දෙන් පිළිපදනා සඞඝරත්නය උදෙසා පහන් සිතින් කරන ලද ස්වල්පමාත්‍ර වූ ද සත්කාර ගරුකාර මානන පූජනාදියෙහි විපාක මෙතෙකැයි යන ප්‍රමාණයක් නැත්තේය. අප්‍රමාණ වේ මය. කියන ලද මැයි සක්දෙව්රජහු විසින් කොසාතකී[8] විමාන වර්ණනාවෙහි.

නත්‍ථි චිත්තෙ පසන්නම්හි - අප්පිකා නාම දක්ඛිණා,
තථාගතෙ වා සම්බුද්ධෙ - අථවා තස්ස සාවකෙ-යි.

---

1. පූජා - BGHKL
2. සොළොසක් උතුරු - BGHKL
3. නුවර - ABEGHJKL
4. බඹලොව - BGHKL
5. පත්කුඩයෙක - ABEFJ
6. සියක් යොදුන් නා ලොව - KL
7. අග්‍රදක්ෂිණාර්හ - ක.සි.සැ.ම.
   අග්‍රදක්ෂිණීය - බෙ.ස.
8. කොසොතක - KL

Non-Commercial Distribution

එසේ හෙයින් මතු එපරිද්දෙන් ම පූජාසත්කාර ලබන සේ අප හැම[1] විසිනුදු ඉන්‍දගුත්ත මහතෙරුන්වහන්සේ වඩනා මහ හෙරීතලයක් සේ සමතල කොට තනා රන් රිදී රඹ තොරණ ආදියෙන් හා පිළීතොරණ පිළීමාලිගා ආදි වූ නොයෙක් අලඬ්කාරයෙන් දිව්‍යවීථියක් මෙන් සරහා පිළියෙල කළ මනා මය. එබැවින් නොලස් ව වහා පලා එව'යි විධාන කොට හැම රජදරුවෝ තම තමන්ගේ[2] රාජ්‍යවාසීන් ගෙන තුමූ තුමූ ම නික්ම දෙවපුත්‍ර නුවර පටන් පැලලුප් නුවර දක්වා මෙදෙයාතුරෙහි පස්පනස්යොදුන් පමණ වූ මහමඟ දිගට වල් කප්පවා කණුමුල් උදුරුවා වළගොඩ තනා[3] සම කොට දෙවියන්ගේ දිව්‍යවීථියක් පරිද්දෙන් නොයෙක් අලඬ්කාරයෙන් සරහා ධම්මාශොක රජ්ජුරුවන්ට එපවත් කියා මෙසේ අස්නක් ලියා දී යවූහ. කෙසේ ද යත්.

'මහරජ්ජුරුවන්වහන්ස, නුඹවහන්සේ විසින් ඉන්‍දගුත්ත මහතෙරුන් වහන්සේ වඩනා මහ සරහන පරිද්දෙන් අපට කියා එවූ මෙහෙවර නියාවට ම අප හැම විසිනුදු මහදිග ඇතුන් අසුන් කුඩ කොඩි සේසත් ධජ පතාකා සැප සේ ගෙන යාහැකි පරිද්දෙන් මහ දෙපස වල් හරවා කණුමුල් උදුරුවා මහගල් පෙරළවා කැට පහණ පහකොට වළගොඩ තනා පරඬලා පහකොට පැන් හිස හැමද මනහර මුතු සුනු හා සමාන සුදුවැලි අතුරුවා ඒ ඒ තන්හි පිළීතොරණ පඞක්තිය රන් තොරණ පඞක්තිය රිදීතොරණ පඞක්තිය කෙහෙල්තොරණ පඞක්තිය මල් තොරණ පඞක්තිය පෙතිතොරණ පඞක්තිය යනාදි වූ නානාප්‍රකාර තොරණ පඞක්තීහු මතු මත්තෙහි අලඬකාර කොට සරහා නඟනලදහ. එසේ ම ඒ ඒ තන්හි රන්ඇගෑ රිදිඇගෑ මල්ඇගෑ පඞක්තීහු සකස් කොට සරහා ලනලදහ. තව ද මහ දෙපස රන් වැටය රිදිවැටය ලියවැටය ලොහොවැටය දඬුවැටය යනාදියෙහි සුවඳතෙල් වත්කොට ප්‍රදීප පඞක්තීහු දල්වනලදහ[4]. එසේ ම රත්පියුම හෙළපියුම රක්තොත්පලය ශ්වේතොත්පලය නීලොත්පලය නැඹිලිමල මහරුක්මල හෝපලුපලලවය යනාදියෙන් අලඬකෘත කොට සුවඳදිය පිරි පූර්ණඝට පඞක්තීහු තබනලදහ. බඳනාලද රන්ධජ රිදීධජ ආදියෙන් හා නීලපීතාදි නානාවර්ණ ධජපතාකාසහස්‍රයෙන් මහ දෙපස මහවනය ගැවසී සිටගත. මඳ මඳ පවනින් අහසට නඟනාලද ඒ ධජපතාකයෝ[5] දෙව් බඹ නා ගුරුළු ආදි වූ දිව්‍යසමූහයන් මිනිස් ලොවට අත්සන් කොට කැඳවන්නාවුන් මෙන් ලීලොපෙත ව හොබනාහ. නා සපු දුනුකේ දෙඹ මුහුළු ආදි වූ ථලජකුසුමයෙන් හා රත්නෙළුම් හෙළනෙළුම් රත්උපුල් හෙළඋපුල් නිල්උපුල් හෙල් මැලි ආදී වූ ජලජකුසුමයෙන් හා දෑසමන් දෙඹුද්ද පරසතු මඳාරාදි වූ නොයෙක් ලක්‍ෂසුවහස් ගණන් මල්දම් සමූහයෙන් සියලු මාර්ගය එකහෙළා විචිත්‍ර විය. දිය හිස හමදනාලද භූමියෙහි අතිධවල වූ පියවිලි අතුට මනහර දෑසමන් කැකුළු ආදි වූ ලදපස්මල් ඉස්නාලද. නොයෙක්

---

1. ඇම - BDEGHKL
   හැම හැම - F
2. තමන් තමන්ගේ - BG
3. තනා (කැන) - BDGHKL
4. තබනලදහ - BGHKL
5. ධජපතාකාවෝ - ක.සි.සැ.බෙ.

Non-Commercial Distribution

කුසුමාභරණාදීන් සරහනලද ඇත් අස් ආදීහු[1] මාර්ගය අලඞ්කාර කරන පිණිස ඒ ඒ තන්හි සිටුවනලදහ. තව ද ඒ ඒ තන්හි සිට තාල නොවරදවා ගසනලද බෙරමඬුලු මධ්‍යයෙහි රඟ බැස නෘත්‍යගීතයෙහි දක්ෂ වූ දිව්‍යාඞ්ගනාවන් බඳු නාටකස්ත්‍රීහු නව නාට්‍යරසයෙන් අනපෙත වූ නෘත්‍යාඞ්ග දක්වමින් නටන සේ නියෝග කොට සිටුවනලදහ. සමහරු දළහං ලෝහං වංගි වස්දඬු ආදිය ගෙන නාද කෙරෙමින් සිටියහ. සමහරු බ්‍රහ්මවීණා නකුලවීණා දද්දරවීණා ආදි වූ නානාප්‍රකාර වීණාවන් ගෙන තාරය කලය මදය යන තුන්ලයින් යුක්ත වූ මිහිරි ගී කියා කියා ගායනා නාද කෙරෙමින් සිටියහ. ඒ සියලු ම මාර්ගය සන්තුෂ්ට වූ ස්ත්‍රීපුරුෂයන්ගේ සාධුනාදයෙන් හා මුහුදුහඬ සේ ගැඹුරු හඬ ඇති භෙරී නාදයෙන් හා ඇතුන්ගේ කුඤ්චනාදයෙන් හා අසුන්ගේ හේෂාරවයෙන් හා සිංහ ව්‍යාඝ්‍ර දිවි වලස් ආදි වූ නානාප්‍රකාර රූප පඞ්ක්තීන් හා ඇර බඹුරු[2] ආදි වූ නොයෙක් වෙස් විසෙස්[3] දක්වා නටා බස්නා අනෙකප්‍රකාර කෝලාහලීරූපයෙන් ගැවසීගත්තේය. මහ දෙපස දෙවඟනන් හා සමාන වූ මනහර බාලස්ත්‍රීහු නොයෙක් මල්කලඹ් ගෙන සතුටු සතුටුව සිටිනාහ. එසේ ම රත්පියුම් හෙළපියුම් උපුල්මල්[4] ආදියෙන් අලංකෘත වූ පූර්ණඝට පූර්ණකලස මාලාවන් හා අටමඟුල ආදිය ගත්තාවූ භාවභාවලීලා විලාසයෙන් යුක්ත ස්ත්‍රීසමූහයෝ ද ඒ ඒ තන්හි සැරහී සිටියාහ. එසේ ම ඒ ඒ තන්හි ඉතා ප්‍රසන්න වූ සිහිල් මිහිරි ජලයෙන් යුක්ත පානීය මණ්ඩප ආදියෙන් මහදිග ශොභමාන විය. මහජනයන් සුවසේ බැස නහන බොන පිණිස මහ දෙපස පොකුණු පතැස් ආදිය ද කණනලද. තව ද ඒ ඒ තන්හි මනහර දන්හල් කරවා උඳු මුං තෙල් පොල් සහල් ලුණු පැණි ආදි වූ නොයෙක් දනොපකරණ එහි රැස් කරන ලද. එතුඹාගා නම් ගඞ්ගාව තුන්ගවු පමණ ගැඹුරු හා සතරගවු පමණ පුළුල ඇති හෙයින් ඒ ගඞ්ගාව සරහාලන්ට අපට නොපිළිවන. එබැවින් එපමණක් තබා නොයෙක් පරිද්දෙන් අප විසින් කළමනා පූජාවිශෙෂ[5] සියල්ල ම සර්වප්‍රකාරයෙන් කරවා පිළියෙල කරනලද. ඒ ගඞ්ගාව සරහන්නාවූ උපායක් තුඹවහන්සේ ම දන වදළ මැනවැ'යි ධර්මාශොක රජ්ජුරුවන්ට කියා එවූහ. එසේ හෙයින් කියන ලදී:

> මගෙගා ෂො සාධුවාදෙහි - හෙරීනං නිනදෙහි[6] ච,
> කරීනං කුඤ්චනාදෙහි - හයානං හෙසිතෙහි ච,
> නෙකවිටඞ්කසංසෙහි - සො කරීහි සමාකුලො.
>
> මග්ගස්ස උභතො පස්සෙ - දෙවකඤ්ඤූපමා සුභා,
> මාලාකලාපෙ පග්ගය්හ - තිට්ඨන්ති තුට්ඨමානසා.
>
> තථා පුණ්ණඝටෙ ගය්හ - පදුමුප්පල සංකුලෙ,
> අට්ඨමඞ්ගලමුග්ගය්හ - තිට්ඨන්ති පමද තහිං.

---

1. මනහර දැසමන්...... අස් ආදීහු (නැත) - ස.
2. බඹුරු - කි.ඳ.
3. වෙසෙස් - BGHK
   වේශ - L
4. උපුල් - BGHKL
5. පූජාවිධි - BDEHL
6. හෙරී තන්ති නදෙහිච - පාලි

Non-Commercial Distribution

තහිං තහිං කතා ආසුං - දානසාලා මනොරමා,
නිචිතාසුමනෙකානි - දානොපකරණා තහිං.

එවං නෙකවිධා පූජා - අම්හෙහි පටිපාදිතා,
ඨපෙත්වාන මහාගඞ්ගං - තං ජානාතු මහීපති-යි.

මෙසේ රජදරුවන් කියා එවූ අසුන් අසා ධර්මාශොක රජ්ජුරුවෝ යක්ෂයන් සොළොස් දෙනකු කැඳවා "වහා ගොස් ගංගාව අලංකාර කොට සරහා ලව"යි මෙහෙවර කියා යවූහ. ඔහු සොළොස්දෙන තම තමන්ගේ පිරිවර හා සමඟ චන්ද්‍රභාගා නම් ගංගාවට ගොසින් තමන්ගේ ආනුභාවයෙන් තුන්ගවු පමණ ගැඹුර හා සතරගවු පමණ පුළුල ඇති මහ ගඟ ඇතුළත පාදහීල[1] පිහිටුවා ගල්වැම් සිටුවා දුව තුලාම් ඇද හිමාලය වනයෙන් මාහැඟි රත්සඳුන්හර ගෙනවුත් පුවරු අතුට හේ[2] ලවා දෙපස රන්තොරණ රිදීතොරණ පිළීතොරණ රඹතොරණ සත්රුවන් තොරණ ආදියෙන් අලංකාර කොට පූර්ණඝට පූර්ණකලස මාලාවන් හා රන්රිදී දඬුවැට ආදියෙහි ලන ලද ප්‍රදීපමාලා සහස්‍රයෙන් හා හෙය දෙපස ඒ ඒ තන්හි රන්දම් රිදීදම් මුතුදම් සත්රුවන් දම් ආදියෙන් සරහා අලංකාර කොට හෙය මත්තෙහි වැලි පිණිස ඔප් නඟනලද පැහැපත් වූ මුතු අතුට ජොතිරසපාසාණයයි[3] කියන ලද ප්‍රභාසම්පන්න වූ මහත් මාණික්‍යරත්නයන් ඒ ඒ තන්හි තබ්බවා මුදුනෙහි නීල පීත ලොහිතාදි වූ නානාවර්ණ මනහර වියන් බැඳ දිව්‍යමය මලොලඹු එල්වා මෙසේ තමන් විසින් කළමනා පූජා අලංකාර කරවා නිමවා මේ සියල්ල ම රජ්ජුරුවන් වහන්සේ දන්නාසේක්වයි කියා ධර්මාශොක රජ්ජුරුවන්ට අස්නක් ලියා එවූහ. එසේ හෙයින් කියනලදි:

ගාවුතත්තයගම්භීරං - ගඞ්ගං යොජනවිත්ථතං,
ථම්භෙ පතිට්ඨපෙත්වාන - අනග්ඝං රත්තචන්දනං
හිමවන්තතො හරිත්වාන - සෙතුං තත්ථ සුමාපිතං.

තොරණා ච උභො පස්සෙ - රතනෙහි සුනිම්මිතා,
පුණ්ණකුම්භද්ධජා චේ'ව - පදීපාවලියො තථා.

උභො පස්සෙසු රතනානි - මාපෙත්වා ලම්බනානි ච,
සුවණ්ණමණිමුත්තාදි - දාමෙහි සමලඞ්කතා. - පෙ -

නිට්ඨිතං ඉධ කාතබ්බං - යුත්තං පූජාවිධිං තු නො,
දෙවො තං පටිජානාතු - ඉති වත්වාන පෙසයුං-යි.

මෙසේ යක්ෂයන් විසින් කියා එවූ අසුන් අසා ධර්මාශොක රජ්ජුරුවෝ සතුටු ව "තෙපි හැමදෙන ම ඉන්ද්‍රගුප්ත මහතෙරුන්වහන්සේ කැඳවාගෙන එව"යි කියා නැවත අස්නක් යවූහ. එකල්හි ඔහු යහපතැයි ගිවිස ඉන්ද්‍රගුප්ත මහතෙරුන් වහන්සේ

---

1. පාදසිලා - BGHKL ස.
2. හේයලවා - ABFJ සි.ස.
   හෙය ලවා - KL ක.ම.
3. ජොතිරංගපාසානයයි - ක.සි.ස.ම.

Non-Commercial Distribution

කරා එළඹ පසඟ පිහිටුවා වැඳ එකත්පස් ව සිට "ස්වාමීනි, දන් මේ පැළලුප් නුවරට වඩනා කලැ"යි ආරාධනා කළහ. ඉක්බිති ඉන්‍දගුත්‍ත මහතෙරුන්වහන්සේ සැටදහසක් පමණ මහ සඟපිරිස් පිරිවරා සරහා පිළියෙල කරන ලද ඒ පස්පනස් යොදුන් පමණ වූ අද්ධානමාර්ගයට පිළිපන්සේක. එකල දෙවපුත්‍ර නුවර දෙවපුත්‍ර රජ් ජුරුවන් හා මහජනයෝ එක් ව අනෙකප්‍රකාර සුවඳමල් සුවඳසුනු ධජ පතාක ආදියෙන් හා ආතත විතතාදි වූ අනෙකප්‍රකාර භෙරීතූර්‍ය්‍ය නාදයෙන් හා නෘත්‍ය ගීත වාද්‍යාදියෙන් පූජා කෙරෙමින් ඉන්‍දගුත්‍ත මහතෙරුන්වහන්සේ පිරිවරා නික්මුණාහ. එකල දඹදිවු තෙලෙහි සුවාසූදහසක් රාජධානිවල පෙසු රජදරුවෝ ද එපවත් අසා තමතමන්ගේ රාජ්‍යවල මහසෙනඟ රැස්කරවා මහදිග නොයෙක් පූජා පෙරහර ගත් මනුෂ්‍යසෙනාව ම අතුරු නොහැර සිටිනා සේ නියොග කොට සියලු රජදරුවෝ ම සර්වාභරණයෙන් සැරහී එසේ ම නානාලංකාරයෙන් සැරහුණාවූ චතුරඞ්ගිනී සෙනාව පිරිවරා රන්ධජ රිදීධජ රන්පැන රිදීපැන රන්කලස රිදීකලස රන්කරඬු රිදීකරඬු රන්විසිරි රිදීවිසිරි රන්චාමර රිදීචාමර රන්පතැස් රිදීපතැස් ආදි වූ නොයෙක් රජපෙරහරින් ඒ මාර්ගය අතුරු නොදී පෙළපෙළ දී[1] නික්මවා තුමූ හැම ඇත් අස් රථ පාබල පිරිසින් පිරිවරනලදු ව මහා මේඝගුමෙන් උද්දම වූ සමුද්‍රයක් සේ පසඟතුරු[2] රැවු දෙවා මහපුද කරවමින් මහ දෙපස අතුරු නොහැර සිටගත්හ. ඉක්බිති ඉන්‍දගුත්‍ත මහතෙරුන්වහන්සේ මෙසේ ජම්බුද්වීපවාසීන් විසින් කරනලද මහත් වූ පූජා සත්කාර විඳිමින් අනුක්‍රමයෙන් දුරුකතර ගෙවා චන්‍ද්‍රභාගා නම් ගංගාවෙහි රත්සඳුන්මය පුවරුහෙය මුදුනට පැමිණ එතැන්හි මහත් වූ පූජා අලංකාර බලමින් වැඩසිටියේක් මෙසේ සිතුසේක. කෙසේද යත්, 'මෙබඳු ඉතා උදරතර වූ පූජා විධානයෙක් දන් මේ ජම්බුද්වීප තලයෙහි මා හැර අන්කිසිවක්හට ඇත්තේ නොවෙයි. මේ සියලු පූජා සත්කාර මා නිසා ම කරන ලද. මේ දඹදිවි තෙලෙහි මට වඩනා කෙනෙක් නැත. මම ම උත්‍තමයෙමි, ජ්‍යෙෂ්ඨයෙමි, ශ්‍රෙෂ්ඨයෙමි, අසදෘශයෙමි' යි මෙසේ සියලු උත්‍තමයන්ට වඩා මම ම උත්‍තමයෙමි පූජ්‍යයෙමි යි අභිමාන උපදවා වැඩසිටිසේක. එකෙණෙහි එක් රහත්කෙනෙකුන්වහන්සේ එපරිද්දෙන් අභිමාන උපදවා අහංකාරපුරස්සර ව ඉන්‍දගුත්‍ත මහතෙරුන්වහන්සේ වැඩසිටි නියාව දිවසින් දක එතැන්හි එළඹ මහතෙරුන්වහන්සේ වැඳ ඔබට අවවාද කරනසේක්:

මා මානස්ස වසී හොථ - මානං හන්‍ත්‍ව වසී තතං,
අනත්ථදෙ සද හොති - පාතෙත්‍වාන[3] භවාවටෙ.[4]

මානොපලාළිතො සත්‍තො - තණ්හා පටිසන්‍ධගතො,[5]
මක්කටොරගසොණාදි - හුත්‍වා ජායති ජාතිසු.

මා මනං[6] සාමි පූජෙහි - අත්‍තානං පරිසොධය,
අපරිසුද්ධාසයො භික්ඛු - දයකං න පරිතොසති.

1. සැදී - AEJ
2. දෙපස තුරු - BGHKL
3. පාපෙත්‍වාන - BGHL
4. භවාභවෙ - GHKL කි.
5. තණ්හාය පටිසන්‍ධගතො - KL
6. මානං - ක.කි.ඥ.ම. පාලි

Non-Commercial Distribution

දදන්තානං සරන්තානං - පූජෙන්තානං සවෙ තුවං,
මහප්ඵලං මහාභූතිං - කාමප්ථ හොථ නිබ්බුතා[1].

යනාදීන් "ස්වාමීනි, මානවශගී නුවුවමැනව. යම් කිසිවෙක් මානවශගී ව වෙසේ නම් ඒ අභිමානය ඔහු සංසාරවෘත්තයෙහි හෙළාගෙන හැම කල්හි ඕහට බොහෝ අනර්ථ එළවන්නේය. වඩනලද අභිමාන ඇති ව ලෝභතෘෂ්ණාවශයට පැමිණියාවූ සත්වතෙම සසර ජාතියෙන් ජාතියෙහි වඳුරු බලු නාග යක්ෂ රාක්ෂස ව උපදනේය. එසේ හෙයින් ස්වාමීනි, අභිමානය උසස් කොට නොසිතා ස්වසන්තානය පිරිසිදු කළමැනව. මද මාන මාත්සර්‍යයීර්ෂ්‍යාදීන් සකිලිටු වූ[2] සිත් ඇති මහණතෙම තමහට ප්‍රත්‍යයදායක ව සිටි උපාසකජනයන් සන්තෝෂ කරවිය නොහෙයි. ඉදින් තුඹවහන්සේට චීවරාදි වූ චතුර්විධ ප්‍රත්‍යය දෙන්නවුන්ට ද පහන් සිතින් නමස්කාර කරන්නවුන්ට ද සැදැහැයෙන් නම සිහිකරන්නවුන්ට ද කිසියම් පූජා සත්කාරයක් කරන්නවුන්ට ද යන සියල්ලන්ට ම ඔතු මහත්ඵල මහානිසංස වනු කැමැතහොත් උත්තමයෙමි ජ්‍යෙෂ්ඨයෙමි ශ්‍රේෂ්ඨයෙමි යි යන අභිමානය හැර කෙලෙසුන් සිඳ ස්වසන්තානය පිරිසුදු කළමැනවැ"යි අවවාද වදළසේක. ඒ අවවාද වචනය අසා ඉන්දගුත්ත මහතෙරුන්වහන්සේ සසර කළකිරුණුසේක් එතැන්හි ම සිට තිලකුණු මෙනෙහි කොට තමන්වහන්සේගේ කර්මජශරීරයෙහි නුවණ පතුරුවා උදයව්‍යය[3] වසයෙන් සම්මර්ෂණය කරනසේක් සියලු කෙලෙසුන් නසා සිවුපිළිසිඹියා හා සමඟ රහත්බවට පැමිණ මුළුලොවට අග්‍රදක්ෂිණෙය්‍ය ව[4] මහජනයාට කුසල් වඩවඩා[5] මහත් වූ පූජාපෙරහරින් නික්මුණුසේක.

එකල්හි ධර්මාශෝක රජ්ජුරුවෝ නමන් වසන පැළලුප් නුවර පටන් මං පෙත් සරහා දෙපස ධජ [පතාකා][6] පුන්කලස තනවා මහමඟ දෙපස වනරාජ් නමැති මේඝරාජීන් පැනනැඟි ඉන්ද්‍රචාපසහස්‍රයන් බඳු වූ විචිත්‍ර චිත්‍රකර්මාන්තයෙන් හොබනා මහත් වූ නානාප්‍රකාර තොරණසහස්‍රයෙන් හා බුදුන් අවිද්‍යමාන වුව ද ඔබගේ පුත්‍ර වූ සංඝරත්නය වඩනා විභූති බැලුවමැනවැයි නානා ලොකධාතුයෙන් දිව අවුත් චන්ද්‍රබිම්බයන් බඳු වූ ශ්වේතච්ඡත්‍ර සහස්‍රයෙන් හා තරුපෙළ සේ දිලියෙන මිණිදඬුවැට ප්‍රදීපසහස්‍රයෙන් හා පූජාවට දිව අවුත් ආකාශයෙහි සිට නටන දිව්‍යනාටකයන්ගේ[7] ඒ ඒ දිගින් නහනලද පඤ්චවර්ණ ධ්වජමාලාවෙන් හා දෙවියන් විමන් හා සමඟ අකාශයෙන් බැස දෙපස වසා සිටගත්තා සේ නානාලංකාරයෙන් සද පෙළ පෙළ දී නික්මවන ලද රත්නමණ්ඩප පංක්තීන් හා සංඝපූජාවට සිය වෙසින් අවුත් මිහිමඬලට බට මහබඹ සේනාවක් සේ සේසත් අතින් ගෙන පෙළ පෙළ දී නටා බස්නා බඹරූප පෙළින් හා දෙහොත් මුදුන් දිදී යන්ත්‍රබලයෙන් නටනටා නික්මෙන

1. නිබ්බුතො - CF
   නිම්මිතා - පාලි
2. සකිලුටු - ABDEG
3. උදව්ය - ACDEF සෑ: ඔදවිය - KL
4. අග්‍රදක්ෂිණාර්හ ව - ක.කි.කු.
   අග්‍ර දක්ෂිණීය ව - බෙ.ම.ස.
5. වඩවා - ADEF
   වඩා - GKL
6. පතාකා (නැත) - පිටපත් හැම
7. දිව්‍යනාටකයන් සේ - BDEGHK

Non-Commercial Distribution

පෙතැලිරුපෙළින් හා එසේ ම යන්ත්‍රබලයෙන් ඇවිදිනා හස්ති අශ්වාදි නානා රූපපංක්තීන් හා ඒ පූජා නමැති මහමුහුදු මැද බිඳෙන මහරළ පතර සේ ඒ ඒ දික්හි යන්ත්‍රබලයෙන් දිවන අශ්වරූප පංක්තීන් හා මෙසේ වෙන වෙන කියත් වර්ණනා කොට නිමවාගත නොහැකි නොයෙක් පූජා පෙරහර ගෙන්වාගෙන මහ[1] බළසෙනඟ පිරිවරා අහස් පොළෝ දෙක එකවිට ගුගුරා පැතනැංගා සේ මහත් වූ පූජා කොලාහලයෙන් එකනින්නාද කරවමින්[2] ධර්මාශොක රජ්ජුරුවෝ පෙරමහට අවුත් ඉන්ද්‍රගුප්ත මහතෙරුන්වහන්සේ දක පසඟ පිහිටුවා වැඳ මහත් වූ සන්තොෂයෙන් පිනපිනා සෙසු රජදරුවන් කැරවූ පූජාවට දියුණක් පූජා කරවන්ට පටන් ගත්හ. දසදහසක් යොදුන් දඹදිවුතෙලෙහි සුවාසූදහසක් මහරජුන්[3] හා මුළු දඹදිවු වැසියන් එකහෙළා රැස්කරවා මහත් වූ කුශලබල වික්‍රම ඇති ආඥාචක්‍රවර්ති වූ දිව්‍යසමාන මහිම ඇති එබඳු පින්වත් රජක්හු සැදූහැයෙන් කරවන්නාවූ ඒ පූජාමහිමය කෙසේ වර්ණනා කෙරෙම් ද. සෙසු දෑ තබා එදවස් ඒ පූජා සම්බන්ධය දක සිහි එළවාගත නොහී හන් පිළි ගළවා කරට දමා උමතු වෙසින් නටන්නවුන් කෙනෙක් දහස්ගණනැයි කියම් ද. එසේ ම ප්‍රීතිවෙගයෙන් මත් ව සාධුකාර දෙන්නවුන් කෙනෙක් දහස්ගණනැයි කියම් ද. නොයෙක් පූජාභාණ්ඩ ගෙන ඔල්වරහඬ ගසමින් පිළීහිස නටවමින් ඒ ඒ දිගින් දිව එන්නවුන් කෙනෙක් දහස් සුවහස්ගණනැයි කියම් ද. අත් පොළසන් දිදී අසුරුසන් දිදී පැන පැන නටා බස්නවුන් කෙනෙක් ලක්ෂ ගණනැයි කියම් ද. රා බී මත් බඹුරන් මෙන් මහමුහුරු කර තබා කට දල්වා දිව් ලෙලව ලෙලවා නටා බස්නා ළදරුපුරුෂයන් කෙනෙක් දහස් සුවහස් ගණනැයි කියම් ද. ඉදිරියට දිවදිව එකත් නහා ලෙලවමින් ගී කියකියා වීණා ගගා නටන්නවුන් කෙනෙක් දහස් ගණනැයි කියම් ද. දිව්‍යගාන්ධර්වයන් සේ නානාලංකාරයෙන් සැරහී ඒ ඒ තන්හි රඟමඬුලු බැඳ බෙර ගසන නටන ගී කියන නාටකජනයන් කෙනෙක් ලක්ෂ සුවහස්ගණනැයි කියම් ද. මෙසේ නොයෙක් පූජාසත්කාර කරවමින් සැටදහසක් පමණ මහසංඝයාවහන්සේ හා සමඟ ඉන්ද්‍රගුප්ත මහතෙරුන්වහන්සේ පැළලුප් නුවරට වඩාගෙනවුත් ධර්මාශොක රජ්ජුරුවෝ ඔබගෙන් බණ අසා පැහැද පන්සිල් පිහිටා සක්මන් මණ්ඩප රත්පත් දූළුපා මහපා ආදියෙන් හා වහසල් පවුරු පදනමින් අලංකෘත කොට නානාවිධ කර්මාන්ත විශෙෂයෙන් විසිතුරු වූ රජමහා විහාරයක් කරවා පිළිගන්වා කැටි ව වැඩී සැටදහසක් දෙනාවහන්සේ හා සමඟ මහතෙරුන්වහන්සේට[4] සිවුපසදනයෙන් උපස්ථාන කළහ. ඉක්බිති මහතෙරුන් වහන්සේ සියලු අර්ථකථාවන් හා සමඟ ත්‍රිපිටකධර්මය ප්‍රකාශ කොට දක්වමින් ජීවිතාන්තය දක්වා එහි ම වැස මහජනයාට කුසල් වැඩවූසේක. මෙසේ පූර්

---

1. මහ (නැත) - BGHKL
2. කෙරෙමින් - KL
3. රජදරුවන් - KL
4. මහරහතුන් වහන්සේට - ක.කි.කු.ම.

Non-Commercial Distribution

ජන්මයෙහි කරන ලද කුසල් ඇති පුණ්‍යවන්තයන්ට ඔවුන්ගේ ශීලාදි ගුණධර්මයන්ගේ ආනුභාවය හේතුකොටගෙන ලොකවාසීහු උදරතර පූජා සත්කාර කරන්නාහු මය: එසේ හෙයින් ඉන්‍දගුත්ත මහතෙරුන්වහන්සේ ලද්දාවූ මේ පූජාව ඇසූ දෙව්මිනිසුන් සහිත සියලු සත්වයන් විසින් මෙම පූජාව දෘෂ්ටාන්ත කොට සිතාගෙන බුද්ධරත්නය ධර්මරත්නය සංඝරත්නය යන ත්‍රිරත්නය[1] උදෙසා ආදර සහිත ව පූජා සත්කාර කිරීමෙන් කුශලසමභාරයන් රැස් කළමැනවි. කියනලදුයේ මැයි,

පුරාකතානං භුවි පුඤ්ඤකම්මිනං
ගුණානුභාවෙන මහෙන්ති එවං,
සදෙවකා තං[2] මනසීකරොන්තා
පුඤ්ඤං කරොථායතනෙ සදදරා-යි.

මේ මෙහි පස්වන
ඉන්‍දගුත්ත වස්තුව ය.

මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි
මහාසෙන වර්ග නම් වූ
දසවන පරිච්ඡේදය නිමි.

තව ද මේ සද්ධර්මාලංකාරයෙහි එකොළොස්වන තෙභාතික වර්ගය නම් කවර යත්. එහි පළමුවන තෙභාතික වස්තුව මෙසේ දතයුතු.

යටගිය දවස දඹදිව බරණැස් නුවර වෙළඳ කුටුම්බකෙනෙක් මී වෙළඳාම් කෙරෙමින් තම තමන්ගේ අඹුදරුවන් හා සමඟ ජීවත් ව වෙසෙති. ඔවුන් තුන්දෙනා අතුරෙන් වැඩිමහලු වෙළෙඳණෝ ප්‍රත්‍යන්ත ජනපදයට ගොස් එහි වසන්නවුන් අතින් මිලයට මී ගනිති. මැදි බෑ වෙළෙඳණෝ ගත් ගත් මී නුවරට ගෙනහැර දෙති. බාල වෙළෙඳණෝ ගෙනා ගෙනා මී නුවර හිඳ විකුණති. එකල ගන්ධමාදන පර්වතයෙහි එක් පසේබුදු කෙනෙකුන්වහන්සේ ව්‍රණරොගයකින් ආතුර ව වසනසේක. එකල්හි අනික් පසේබුදු කෙනකුන්වහන්සේ ඒ ව්‍රණරොගය මීපැණියෙන් ඵාසු වන බව දැන ගන්ධමාදන පර්වතයෙහි වැඩසිටිසේක් ම සිවුරු ගැටවටු ගන්වා[3] පාත්‍රය අතින් ගෙන අහසින් ගොස් බරණැස් නුවර වහසල්දෙර[4] සමීපයට බැස "කවර වීථියකින් මී ලැබෙම් දෝහෝ" යි[5] ආවර්ජනා කෙරෙමින් වැඩසිටිසේක. එකල්හි එන් කුලයෙක්[6] බැල්මෙහෙකොට ජීවත් වන්නාවූ දුක්පත් ස්ත්‍රියක් කළයක් ගෙන පැනට යන්නී පසේබුදුන් දැක මගින් පහ ව කළය බිම තබා ඵසහ පිහිටුවා වැඳ එකත්පස් ව

1. ත්‍රිවිධරත්නය - මුද්‍රිත හැම. ස.
2. තං - මුද්‍රිත හැම.
3. ගැටගන්වා - BDEGKL
4. මහසල්දෙර - BD
5. ලැබේදෝහෝයි - BG
6. කුලගෙයක - BEGKL ස.

Non-Commercial Distribution

සිට "ස්වාමීනි කුමක් පිණිස වැඩසිටිසේක්ද"යි[1] විචාළාය.[2] එකල පසේබුදුන්වහන්සේ "එම්බා නැගණියෙනි, මේ නුවර භික්ෂාටනය කරන්නවුන්ට කවර වීථියකින් මී ලැබේ ද"යි විචාළසේක. එතෙපුල් අසා ඒ ස්ත්‍රීතොමෝ මී තිබෙන පිළ පෙනෙන තෙන සිට අත දික්කොට "ස්වාමීනි, තෙල ඉදිරියෙහි පෙනෙන්නේ මී විකුණන පිළ ය"යි දක්වා "ඉදින් පසේබුදුන්වහන්සේ එතැනින් මී නොලත්සේක් වී නම් හිණ තිබූ කඩ විකොට වී නමුත් මී ගෙන දන්දෙමි"යි සිතා එතැන්හි ම බල බලා සිටියාය. එකල්හි පසේබුදුන් වහන්සේ ගෙපිළිවෙළින් ගොස් මීපිළ සමීපයට පැමිණිසේක. පිළ හුන් වෙළඳණෝ පසේබුදුන් දක වහා හුනස්නෙන් නැගී පෙරමහට අවුත් පසඟ පිහිටුවා වැඳ අතින් පාත්‍රය ගෙන වලයාධාරයෙක තබා මී කළයක් ගෙනවුත් පාත්‍රයෙහි වත්කරන්නාහු ප්‍රුහුව නමාලූහ. එකල්හි මී පාත්‍රය පිරී මුවවිටින් උතුරුවා ගෙන බිම වැතිර මිහිමඬල ගලා සිටගත. ඒ බව දක වෙළෙඳණෝ අතිශයින් පහන් වූ සිත් ඇති ව ප්‍රාර්ථනා කරන්නාහු "දන් මේ පාත්‍රය පුරා මී දන් දුන්නාවූ කුශලයෙන් මතු මම දසදහසක් යොදුන් දඹදිවුතෙලෙහි එකච්ඡත්‍ර නංවා රාජ්‍යය කෙරෙම්වයි, පාත්‍රය පිරී මුවවිටින් ඉතිර මී උඩ නැඟි පරිද්දෙන් ම මාගේ ආඥව උසස් ව[3] නැඟී අහසින් යොදනෙක පවතීවයි, තෙල මී බිම වැගිර වට පැතිර රසාතලයට[4] බට පරිද්දෙන් ම මාගේ ආඥව මුළු දඹදිවුතෙලෙහි එකහෙළා පැතිර මහපොළොවට බැස යටින් යොදනෙක දක්වා පවතීවයි යනාදීන් ප්‍රාර්ථනා කළහ. කියනලද මැයි මහාවංශයෙහි,

තස්ස පත්තස්ස බුද්ධස්ස - වාණිජෝ සො පසාදවා,
විස්සන්දයන්තො මුඛතො - පත්තපූරං මධුං[5] අද.

පුණ්ණං ච උප්පතන්තං ච - පතිතං ච මහීතලෙ,
දිස්වා මධුං පසන්නො සො - එවං පණිදහී තද.

ජම්බුදීපෙ එකරජ්ජං - දනෙනානෙන හොතු මෙ,
ආකාසෙ යොජනෙ ආණා - භූමියං යොජනෙ තථා-යි.

මෙසේ ප්‍රාර්ථනා කොට වෙළෙඳණන් පාත්‍රය පිළිගැන්වූ කල්හි පසේබුදුන් වහන්සේ ද ඒ මී පාත්‍රය පිළිගෙන එතැන්හි ම වැඩසිට,

ඉච්ඡිතං පත්ථිතං තුය්හං - ඛිප්පමෙව සමිජ්ඣතු,
පූරෙන්තු චිත්තසංකප්පා - චන්දො පණ්ණරසී යථා.

ඉච්ඡිතං පත්ථිතං තුය්හං - සබ්බමෙව සමිජ්ඣතු,
පූරෙන්තු චිත්තසංකප්පා - මණි ජොතිරසො යථා.

---

1. වැඩිසේක්දයි - J
2. විචාළිය - BG
   විචාළහ - ACFJ
3. උස් ව - CL
4. රසාල්තලයට - KL
5. පත්තපූරමධූරං - ACEFJ

Non-Commercial Distribution

යනාදීන් ඒ තොප සිතූ පැතූ දෙය වහා ම තොපට සිද්ධ වෙවයි, ඒ තොපගේ චිත්තසංකල්පනාව පුරපසළොස්වක් දිනයෙහි පඤ්චොපක්ලෙශයෙන් විනිර්මුක්ත ව අහස්මැද දිලිහෙන්නාවූ සොළොස් කලා පරිපූර්ණ චන්ද්‍රයා මෙන් සම්පූර්ණ වෙවයි. තව ද ඒ තොප සිතූ පැතූ සියල්ල ම නොලස් ව ම සිද්ධ වෙවයි, ඒ තොපගේ චිත්තසංකල්පනාව හාත්පසින් සතරගවුවෙක පමණ තන්හි දව රෑ අඳුරු දුරුකර ඒකාකාරයෙන් දිලිහෙමින් කැමැති කැමැති වස්තුප්‍රදානය[1] කරන චින්තා මාණික්‍යරත්නයක් මෙන් හැම කල්හි ඒකාකාර ව ප්‍රාර්ථනා වූ පරිද්දෙන් සම්පූර්ණ වෙවයි යනාදීන් අනුමෙවුනි බණ වදරා නික්මුණුසේක.

එකල්හි මී පිළට මග දක්වා අතරමග බල බලා සිටි ස්ත්‍රී තොමෝ[2] වඩනා පසේබුදුන් දැක ඉදිරියට ගොස් වැඳ "ස්වාමීනි, මී ලත්සේක් ද"යි විචාරා "එසේය නැඟණියෙනි, ලදුම්හ"යි වදළ කල්හි "ස්වාමීනි, ඒ වෙළෙඳුණෝ මී දන් දී කවර ප්‍රාර්ථනාවක් කොළෝ ද"යි විචාරා, මෙසේ මෙසේ මහත් වූ ආඥා තේජස් ඇති ව මුළු දඹදිව රාජ්‍යය කරන්නට ප්‍රාර්ථනා කොළෝය යි ඒ සියල්ල ම වෙන වෙන ම වදළ කල්හි එපවත් අසා ඒ ස්ත්‍රීතොමෝ[2] පහන් සිත් ඇති ව "එසේ වී නම් ස්වාමීනි මිඩියට අනුග්‍රහ කොට මෙතැන්හි මඳක් වැඩසිටිය මැනවැ"යි කියාලා නොලස් ව ගෙට ගොසින් පරණ කඩරෙද්දක් ඇඳගෙන තමා ඉන තුබූ කඩ දියෙහි සොධා ගෙනවුත් වට කොට අකුළා පසේබුදුන් පාමුල්හි තබා දන් දී ප්‍රාර්ථනා කරන්නී "ස්වාමීනි, මේ මී දන් දුන්නාවූ වෙළෙඳුණෝ යම් කලෙක මුළු දඹදිව එක්සත් කොට රාජ්‍යය කෙරෙද් ද එකල්හි මම ඔවුන්ට ප්‍රිය වූ අග්‍රමහීෂිකා[3] වෙම්වයි, දිව්‍යාඞ්ගනාවක් හා සමාන මනා වූ රූ ඇතිවෙම්වයි, මිහිරි වූ කන්කලු වූ තෙපුල් ඇතිවෙම්වයි, මහත් වූ යසස්[4] හා පරිවාර සම්පත් ඇතිවෙම්වයි, මනා වූ පතිව්‍රතාධර්මයෙන් යුක්ත වෙම්වයි, මුහුණ දකීමෙන් ම[5] ප්‍රිය වෙම්වයි, මෙසේ ම යහපත් වූ සියලු කායවාක් ක්‍රියායෙන් සිතට සතුටු වඩවම්වයි, හැම කල්හි මාගේ ශරීරයෙන් ම ශීතොෂ්ණාදි වූ කැමැති කැමැති සෘතු ප්‍රදානය කෙරෙම්වයි, යනාදීන් මෙසේ ප්‍රාර්ථනා කළාය. කීයේ මැ නො,

යද තෙ[6] මධුදෙ භන්තෙ - භූභුජො හොති භූතලෙ,
තස්ස හෙස්සං තද භන්තෙ - පියා අග්ගමහෙසිකා.

සුරූපා ච සුවාණී ච සුයසා සුබ්බතා සුභා,
අස්සං තස්ස පියා චාථ - මනාපා ඉච්ඡද සද - යි.

මෙසේ ප්‍රාර්ථනා කළ ඉක්බිති පසේබුදුන් වහන්සේ ඒ ස්ත්‍රියට ද 'ඒ තොප සිතූ පැතූ සියල්ල ම එපරිද්දෙන් ම සිද්ධ වෙව"යි යනාදීන් අනුමෝදනා කරවා මහජනයා බලබලා සිටියදී ම සෘද්ධියෙන් අහසට පැනනැඟී දික් කළ අතක් වක්

1. ආලොකදනය - A
2. ස්ත්‍රීතොම - බෙ. ස.
3. අග්‍රමහෙසිකා - ABCDFGJKL
4. යසස් - ACDEFJ
5. චන්ද්‍රයා මෙන් ම - A
6. වො - KL

Non-Commercial Distribution

නොකරන ඇසිල්ලෙහි අහසින් ගන්ධමාදන පර්වතයට ම වැඩිසේක. ඉක්බිති ඒ වෙළෙඳ තුන්බෑයෝ එක් ව වරින් වර ගෙනා මී කළ හා එයින් ගත් මිල සියල්ල ම වෙන වෙන බලා පරීක්ෂා කරන්නාහු එක් මී කළයකින් වූ අය වැය දෙක ම[1] නොදක වැඩිමහලු දෙබෑයෝ "අනික් මී කළය කොයි ද"යි විචාළහ. එකල බාල වෙළෙඳණෝ ඒ මී කළය තමන් පසේබුදුන්ට දන් දුන් බව කියා "ඒ දනයෙහි පින් හෝ අනුමෝදන් වුවමැනව, නොහොත් ඒ මී කළය වටිනා මිල හෝ මා අතින් ඇරගතමැනවැ"යි කීහ. එකල්හි වැඩිමහලු දෙබෑයෝ කියන්නාහු "අපට ඒ මිලයෙන්[2] දන් කවර ප්‍රයෝජනයෙක් වේ ද. තොප තමා මී දන් දුන්නේ කෙසේ වූ කෙනකුන්ට ද"යි විචාළහ. එතෙපුල් අසා බාල වෙළෙඳණෝ[3] "මා මී දන් දුන්නේ පසේබුදුකෙනකුන් වහන්සේට ය. ඒ ප්‍රත්‍යෙකබුඬවරයෝ නම් හිමවත ගන්ධමාදන පර්වතයෙහි වෙසෙති. හිස මුඩුය, කාෂායවස්ත්‍ර[4] පෙරවගෙන කුලගෙවල භික්ෂාටනය කොට ඇවිදිති, ඉතා ශාන්තදන්තයහ. සිල්වත් ගුණවත්හ" යනාදීන් විද්‍යමාන ගුණ කීහ. එකල වැඩිමහලු වෙළෙඳණෝ කිපී කියන්නාහු "එම්බල, බ්‍රාහ්මණචණ්ඩාලයෝත් කාෂායවස්ත්‍ර පෙරවගෙන ඇවිදිනාහු මය.[5] එබැවින් තොප අතින් මී දන් ගත්තේ චණ්ඩාලයෙකැයි සිතමි"යි කීහ. මැදිබෑ වෙළෙඳණෝ "ඒ තාගේ පසේබුදුන් ගෙනගොස් මුහුදින් එතෙර දමාපිය"යි[6] කීහ. මෙසේ වැඩිමහලු දෙබෑයන් කියන පරුෂබස් අසා බාල වෙළෙඳණෝ කියන්නාහු "මහෙශාක්‍ය වූ මහානුභාවසම්පන්න පසේබුදුවරුන් වහන්සේට එසේ නොබිණුව මැනව. සිල්වතුන්වහන්සේට ආක්‍රොශපරිභව බිණුවාහු මතු අපායෙහි ඉපද මහදුක් විඳුනාහ" යනාදීන් ධර්මයෙන් මුසු ව නොයෙක් කාරණ කියා ඔවුන් වළකා පසේබුදුවරුන්වහන්සේගේ ගුණ හා දනයෙහි අනුසස් ප්‍රකාශ කොට කීහ. එකල ඔවුන්ගේ ධර්මාන්විත කථා අසා වැඩිමහලු දෙබෑයෝ "එසේ වී නම් මී දන් දුන්නේ ම යහපතැ"යි පහන් සිතින් පින් අනුමෝදන් වූහ. මෙසේ පින් අනුමෝදන් ව පසුව ඔහු ඒ ජාතියෙන් චුත ව දිව්‍යමනුෂ්‍ය ලොක දෙක්හි චුතිප්‍රතිසන්ධි වශයෙන් සැරිසරා ඒ ඒ තන්හි මහත් වූ දෙව්මිනිස් සැපත් විඳිනාහු අප බුදුන් පිරිනිවි දෙසිය අටළොස් අවුරුද්දක් ගිය පසු එයින් මී දන් දුන් බාල වෙළෙඳණෝ දඹදිව ධර්මාශොක නම් රජ වූහ. මී පිළට මග කී සටවෙටිකාවෝ ඒ රජහට අසන්ධිමිත්‍රා නම් අගබිසෝ වූහ. එකල්හි පසේබුදුන්ට චණ්ඩාලවාදයෙන් උපවාද කළ වැඩිමහලු වෙළෙඳණෝ නිග්‍රොධ නම් මහතෙර වූහ. පසේබුදුන් මුහුදින් එතෙර දමාපියව යි කී මැදිබෑ වෙළෙඳණෝ ලක්දිව දෙවනපෑතිස් නම් රජ වූහ. එයින් කීහ මහාවංශයෙහි,

1. මිල අය දෙක ම - BGHL
2. මී කළයෙන් - BCDFGHJKL
3. වෙළෙඳණෝ කියන්නාහු - BGHK
4. කසාවස්ත්‍ර - BDFGL ක.කි.ඝ.
5. කුලගෙවල භික්ෂාටනය කොට ඇවිදුනාහු මය - AJ
6. දමාපියවයි - BCEGHKL, ක.කි.ඝ.ම.

Non-Commercial Distribution

අසොකො මධුදෙ සන්ථි මිත්තා දෙවී තු වෙටිකා,
චණ්ඩාලවාදි නිග්‍රොධො - තිස්සො සො පාරවාදිකො-යි.

මෙහි විස්තර කථාව මහාවංශයෙහි කී පරිද්දෙන් දතයුතුය. මෙතැන්හි මම එනාහි ඔවුන්ගේ උත්පත්ති කථාක්‍රමය පමණක් දක්වමි. තමහට හිත කැමැති සත්පුරුෂයන් විසින් සාවධාන ව ඇසිය යුතු. කෙසේද යත්? යට කී පරිද්දෙන් මී දන් දුන් බාල වෙළෙඳාණෝ දෙවුලොව ඉපද මහත් වූ දිව්‍යසම්පත් විඳ එයින් චුත ව දඹදිව පැළලුප් නුවර බින්දුසාර නම් රජහට පුත් ව උපන්හ. එකල ඒ රාජකුමාරයන්ගේ මුහුණ ඔප්නැඟූ රන් කැඩපතක්[1] මෙන් සියල්ලවුන්ට ප්‍රියකරු ව බබළන හෙයින් පියදස කුමාර යයි නම් තුබූහ.

තව ද ඔවුන් පිය බින්දුසාර රජ්ජුරුවන්ගේ එක්සියක් පුත් කුමරුවෝ ඇතියාහ. එකල ඒ බින්දුසාර රජ්ජුරුවෝ තමන්ගේ සුමන නම් වූ වැඩිමහලු පුතණුවන් යුවරජ තනතුරෙහි සිටුවා[2] ඒ පියදස නම් පුතණුවන්ට අවන්ති රට උදෙනි නුවර රාජ්‍යය දී යවූහ. එකල්හි ඒ පියදස කුමාරයෝ උදේනී නුවරට යන්නාහු අතරමඟ වෙටිස[3] නම් නුවර ලැගුම් ගෙන එනුවර සිටාණන්ගේ වෙටිසදෙවි[4] නම් දියණියන් තමන්ට[5] අගබිසෝ කොට කැඳවාගෙන ගොසින් උදෙනි නුවර රජසිරින් වසන්නාහු මිහිඳු නම් කුමාර කෙනකුන් හා සංඝමිත්‍රා නම් කුමාරිකා කෙනකුන් හා දරු දෙදෙනකු ලැබ දවසින් දවස වඩවඩා සියලු සැපතින් සමෘධ ව නිශ්ශොකී ව [ස්වාස්ථ්‍යයෙන්][6] වාසය කෙරෙති. එසේ හෙයින් ඒ කුමාරයෝ එකල අශොක කුමාරය යන දෙවන නාමයකින් ප්‍රසිධ වූහ. මෙසේ රජසිරි විඳ වසන ඒ අශොක කුමාරයෝ කල් යාමකින් තමන් පිය වූ බින්දුසාර රජ්ජුරුවන් ගිලන්හ යනු අසා නොලස් ව අවුත් පිත්‍රුපස්ථාන කොට ඔවුන් ඇවෑමෙන් පැළලුප් නුවර තමන් අත්කොට ගත්හ.

එපවත් අසා යුවරජ තනතුරෙහි සිටි වෙන ඔවුන් දරු සුමන නම් වූ වැඩිමහලු රාජකුමාරයෝ කිපී "අද මරණ හෝ වුවමැනව, රාජ්‍යය හෝ ගතමැනවැ"යි එහසි බැණ තමන්ට වසඟී ව සිටි අටානුවක් මල් රජකුමරුවන් පිරිවරා තරු පිරිවැරූ චන්‍ද්‍රයා සේ දිලිහෙමින්[7] මහසෙනඟ රැස් කරවා වෙන වෙන අතින් ගෙන උඩුකුරු කරනලද ආයුධ සමූහයෙන් මුළු නුවර තිලුපුල් කැකුළෙන් ගැවසී සිටගත් මහවිලක් සේ සරහමින් ප්‍රලය[8] සාගරයෙහි එකහෙළා පෙළඹී දිවන රළපතර සමූහයක් මෙන් ඔදවැඩී පෙනෙමින් දිව ගෙන අවුත් වැද ගියහ. එකල්හි අශොක කුමාරයෝ ද යුධයට සැරහී සියසෙනඟ පිරිවරා සහස්‍රකිරණයා සේ මහත් වූ රාජතෙජසින් දිලිහි

1. කැටපතක් - BGHK ම.
2. පිහිටුවා - BDGHKL
3. වෙටිය - CE, ක.කු.ස.
   වෙටි - J
   වෙටී - A
4. වෙටිය දෙවි - F
   වෙටි දෙවි - CE, ක.කු.ස
   වෙටී දෙවි - A
5. තමහට - BDEGH
6. ස්වස්ථයෙන් - ADEFGHJL, ස.
   ස්වස්ථාවයෙන් - B
   ස්වත්ථයෙන් - K
7. දිලියෙමින් - CDG
8. ප්‍රවාල - BGH, ක.කි.කු.ම.

Non-Commercial Distribution

දිලිහි රණබෙර ගස්වා සිව්රඟ සෙනඟ මෙහෙයමින් මිහිමඬල මඩනාක්හු[1] මෙන් දිවගෙන අවුත් යුඩයට වැද සටන්කොට සුමන රාජකුමාරයන් අල්වාගෙන මරවා මෙම ක්‍රමයෙන් තමන් හා එකකුසෙහි ඔත් තිස්ස නම් රාජකුමාරයන් හැර සෙසු අටානුවක් මල් රජකුමරුවන් ද මරවාපීහ. එතැන් පටන් ඒ අශොක කුමාරයෝ චණ්ඩාශොකය යි තුන්වන නාමයකින් ප්‍රසිඩ වූහ. මෙසේ චණ්ඩපරුෂ ව සටන් කරන්නාහු ද සතර අවුරුද්දක් මුළුල්ලෙහි ඔටුනු නොපැළඳ ම රාජ්‍යය කොට ඒ සතර අවුරුද්ද ඇවෑමෙන් අප බුදුන් පිරිනිවී දෙසිය අටළොස්වන අවුරුදු මුළු දඹදිව එක්සත් කොට ඔටුනු පැළඳ තමන්ගේ සහෝදර මල් වූ තිස්ස නම් රාජකුමාරයන් යුවරජ තනතුරෙහි පිහිටුවූහ.

එකල දසදහසක් යොදුන් දඹදිවුතෙලෙහි සුවාසුදහසක් රාජධානිවල සහ ඔටුනු පළන් සුවාසුදහසක් රජදරුවෝ තමතමන්ගේ සිව්රඟසෙන් පිරිවරා අවුත් උපස්ථාන කොට යෙති. හිමත් ගිමන්[2] වසන්[3] යන තුන් සෘතුවට සුදුසු තුන් මාළිගාවෙක් විය. එයින් එක් මාළිගායෙක්[4] මහාකප්පින නම් වෙයි. එකෙක් මොරගීව නම් වෙයි. එකෙක් මඞ්ගල නම් වෙයි. ඒ තුන් මාළිගාවෙහි නොයෙක් දහස් ගණන් නළුනාටකයන් පිරිවරා කලින් කල වෙසෙති. පළමු පින් කරන ජාතියෙහි පසේබුදුන්ට මී පිළ දුක්වූ ස්ත්‍රීතොමෝ එකල්හි රජකුලෙහි ඉපද දෙවඟනක් මෙන් දිලිහෙන රූපශ්‍රී ඇති ව සොළොස් දහසක් බිසෝවරුන්ට නායක ව අසන්ධිමිත්‍රා නම් වූ අග්‍රමහීෂිකා වූව. ඒ බිසොවුන්ගේ වනාභි කෙසාන්තයෙහි පටන් පාදන්තය දක්වා අසො නෙනෙක සන්ධියෙක් ඇතැයි දනගත නොහැක්ක. ජාම්බොනද[5] කනකයෙන් මවාලූ රුවක් වැනියහ. ඔහු සැහැවී තිබෙන සන්ධි ඇති හෙයින් අසන්ධිමිත්‍රා නම් වෙති. තව ද රජ්ජුරුවන් ඔටුනු[6] පැළඳීම හා සමඟ නොයෙක් රාජ සැඩි පහළ විය. දසදහසක් යොදුන් දඹදිවුතෙලෙහි අණසක පැතිර ඉතිරෙමින් අහසින් යොදනෙක පොළොවින් යොදනෙක එකහෙළා ආඥව පවත්නේය. හිමවත අනවතත්ත නම් මහවිලින් සොළොස්කළයක් පැන් අටකදෙකින් දවස්පතා දෙවියෝ රජහට ගෙනවුත් දෙති. එම හිමාලයෙන් ඉතා සිනිඳු වූ මොළොක් වූ රසවත් වූ නාලිය දැහැටි දවස් පතා දෙවියෝ ගෙනවුත් දෙති. එසේ ම දෙවියෝ දිව්‍යමය වූ බෙහෙත් ඇඹුල ද දිව්‍යමය වූ අරළු ද වර්ණගන්ධ රසයෙන් යුක්ත වූ මහදියකළ පමණ රන්වන් අඹ ද[7] හිමාලයෙන් ගෙනවුත් දෙති. ඡද්දන්තවිල සමීපයෙහි පිහිටි දිව්‍යවිමාන කල්පවෘක්ෂ ආදියෙන් පස්වනක් පැහැ ඇති අඳනට පොරෝනට නිසි මනහර දිවසළු දෙකක් හා රන්වන් පැහැ ඇති අත්පිස්නාවක් හා දිව්‍යමය වූ

---

1. මඩන්නාක්හු - AH . කි.බෙ.
2. හිමන් ගිමන් - BCEFGHKL, කි.ම.
   ගිමන් හිමන් - ක.
3. වසන් - BEKL කැ.
4. මාලිගාවෙක් - ACDFJ
   තුන්මාලිගාවෙන් එකක් - BGHKL
5. ජාම්බුනද - බෙ.ස.
6. ඔොටුනු - AE
7. දඹ ද - BGH
   අඹදඹ - ක.කි.කැ.
   අඹදඹ ද - බෙ.ස.
   අම්බපක්කං - පාලි

Non-Commercial Distribution

පානවර්ගීයන් දවස් පතා දෙවියෝ ගෙනහැර දෙති. එසේ ම දවස් පතා ඇඟ ගල්වන සුවඳ හා කප්රුකින් උපන් හෙයින් හුයින් නොවියන ලදුව හැම තන්හි සියුම් සියුම් ව උද්ගත ව පෙනෙන සමන් පුෂ්පාකාර ඇති හෙයින් සමන්මල් පටය යි කියනලද පොරෝනට සුදුසු මනහර දිව්‍යවස්ත්‍රයක් හා දිව්‍යමය වූ මාහැඟි අඳුන්කැටයක් හා මෙකී සියල්ලම දවස් පතා නාගභවනයෙන් නයි ගෙනවුත් දෙති. ඡද්දන්තවිලින් ස්වයඤ්ජාත වූ රත්හැල් නවදසක් යාල ගිරවු ගෙනවුත් දවස් පතා බඩහල් පුරා යෙති. ඒ වී සියල්ල ම මීයෝ පොතු ගළවා නොකඩ කොට කුඩු තෝ නොතබා සාල් කොට තබාලති. හැම දවස් ම රජහට ඒ රත්හැල් සාලේ බත් ම අනුභවයට යෙයි. මීමැස්සෝ අවුදින් මහා භාජන කන්කුළු ආදී වූ ස්ථානයෙහි මී බැඳ පුරා පෙනකුත්[1] නොබී පලායෙති. වලස්සු කම්මල් වැද යකඩ කර්මාන්තයෙහි කුළු ගසති. දිවියෝ දවල් සරක් රැක සවස ගෙනවුත් ගාල්වල ලා රාත්‍රිභාගයෙහි තුමූ ගොදුරු සොයා කති. කුරවිකෙවිල්ලෝ අවුදින් රජගෙයි පලපදනම් පිට හිඳ මධුරනාද පවත්වා රජහට සේවය කොට යෙති. මයූරයෝ අවුදින් රජගෙට[2] පෙනෙන පේ සිට නටා සේවය කොට යෙති. ඒ රජ්ජුරුවන්ගේ පරන්තප නම් වූ බඩිගපත්‍රයෙක් සියක් යොදුන්[3] දක්වා ගොස් සතුරන් සාධා නැවත අවුත් හස්තතලයෙහි ම පිහිටයි.

මෙසේ මෙකී රාජර්ධිමහිමයෙන් යුක්ත ව රාජ්‍යය කරන්නාවූ ඒ අශෝක රජ්ජුරුවෝ තුන්අවුරුද්දක් මුළුල්ලෙහි පළමු තමන්ගේ චන්‍ද්‍රගුප්ත නම් මුත්තණුවන් හා බින්දුසාර නම් වූ තමන්ගේ පියමහරජාණන් දවස පැවැති පරිද්දෙන් ම බ්‍රාහ්මණයන් හා බ්‍රාහ්මණජාති ඇති පණ්ඩරඞ්ග පරිබ්‍රාජකාදි[4] වූ සැටදහසක් තීර්ථකයන්ට තමන්ගේ ඇතුළු රජගෙහිදී ම නිරන්තරයෙන් බත් දී උපස්ථාන කෙරෙමින් වැස එක් දවසෙක සිවුමැදුරු කවුළුව සමීපයෙහි සිටියාහු නොසන්හුන් කාය වාක් සමාචාරයෙන් යුක්ත ව දමනය නොකරනලද ඉඳුරන් ඇති ව නොහික්මුණු ඊර්ය්‍යාපථයෙන් උපලක්ෂිත ව හිඳ බත් අනුභව කරන තීර්ථකයන් දැක "මා දෙන්නා වූ මෙබඳු මේ දනය පරීක්ෂාකොට සුදුසු තෙනකට දීම යහපතැ"යි සිතා අමාත්‍යයන් බණවා "එම්බා සගයෙනි, වහා යව. තොප තොප උපස්ථාන කරන තොපගේ කුලදෙවතා වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් අපගේ අන්තඃපුරයට කැඳවාගෙන එව. ඔවුන්ට[5] මාගෙන් දනක් දෙන්නා කැමැත්තෙමි"යි කීහ. එතෙපුල් අසා ඇමැතියෝ යහපතැයි ගිවිස තම තමන් උපස්ථාන කරන පණ්ඩරඞ්ග පරිබ්‍රාජක නිගණ්ඨ ආජීවකාදි වූ තීර්ථකයන් කැඳවාගෙන අවුත් "මහරජ, මොහු[6] අප හැම සංසාරබන්ධනයෙන් ගළවා නිවන් දක්වන රහත්හුය"යි කීහ. එකල්හි රජ්ජුරුවෝ තමන්ගේ ඇතුළු රජගෙයි වෙන වෙන ම උස් මිටිකොට ආසන පනවා එන්ට කියවයි කියා ආ ආවවුන්ට කියන්නාහු "තම තමාට සුදුසු ආසන බලා හුන මැනවැ"යි කීහ. එකල්හි එයින් සමහරෙක්

---

1. පොදකුත් - K
2. රජහට - JKL ක.කි.ඝ.,ම.
3. යොදනක් - BGHL
4. පරිබ්‍රාජිකා - BEFGH ක.කි.ඝ.
5. එවුන්ට - ADFJ
   ඔවුන්ට (නැත) - KL
6. මොහු හැමදෙන - BGHL

Non-Commercial Distribution

හදුපීය්වල උන්හ. සමහරෙක් මෝරපුටුවල උන්හ. සමහරෙක් කළල්පැදුරු[1] ආදියෙහි බැස උන්හ. මෙසේ සග මහලු පිළිවෙළක් නැති ව උන්නාවූ ඒ තීර්ථිකයන් දුක එදවස් ඔවුන්ට සුදුසු කන බොන දෑ දී නික්මවා දෙවන දවසුදු එපරිද්දෙන් ම උස් මිටි ආසන පනවා තබා තීර්ථිකයන් ගෙන්වා පළමු පරිද්දෙන් ම නියොග කොට පළමු දවස් උස් ආසනවල හුන්නවුන් දෙවන දවස් නීචාසනවල හිඳිනා නියාව ද නීචාසනවල හුන්නවුන් උස් ආසනවල[2] හිඳිනා නියාව ද සංයම රහිත වූ ආලොකන විලොකන සම්මිඤ්ජන පසාරණාදී ක්‍රියාවන් ද යන නොයෙක් අනාචාර දුක එකාන්තයෙන් ම මොවුන්ගේ අභ්‍යන්තරයෙහි සාරගුණයෙක් නැත් මය යි නිශ්චය කෙරෙමින් මෙසේ පරීක්‍ෂා කරන්නාවූ රජ්ජුරුවෝ එයින් නොබෝ දවසක් ගිය කල්හි නිග්‍රොධ නම් සාමණේරයන්වහන්සේ දුක බුද්ධශාසනයෙහි ප්‍රසන්න වූහ.

ඒ නිග්‍රොධ සාමණේරයන්වහන්සේ නම් එම අශොක රජ්ජුරුවන් හා එක පියන්ට ද වෙන මවුන් දරු වූ යට කී සුමන රාජකුමාරයන්ගේ පුතණුවන් වහන්සේ ය. ඔබ වූ පරිදි කෙසේ ද යත්,

මෙහි ම යට කී පරිද්දෙන් යුවරජ තනතුරෙහි සිටි ඒ සුමන නම් රාජකුමාරයන් මැරූ දවස් එරාජකුමාරයන්ගේ දරි ඇති සුමනා නම් බිසවු තමන්ගේ ස්වාමිපුත්‍රයාණන් මැරූ පවත් අසා භය ගෙන වෙස් වළා රජගෙන් නික්ම නුවරට නුදුරු තෙන චණ්ඩාලයන් වසන සැඩොල්ගමෙක් නිසා යන්නාහු එගම ජ්‍යෙෂ්ඨ චණ්ඩාලයාගේ ගෙදෙරට නුදුරු තෙන මහත් වූ නිග්‍රොධවෘක්‍ෂයක් සමීපයට පැමිණියහ. එකල එහි වසන දෙවතාවා බිසොවුන් දුක "මෙසේ එව සුමනාවෙනි"යි හඬගීය. ඒ ශබ්දය අසා බිසවු දෙවතාවා සමීපයට ගියහ. එවේලෙහි දෙවතාවා තමාගේ[3] ආනුභාවයෙන් එතැන්හි ශාලාවක් මවා දී "මේ ශාලාවෙහි සැප සේ වසව"යි කියා බැහැර නික්මුණා සේ දක්වා අන්තර්ධාන වීය. බිසවු ඒ ශාලාවට වැද එදවස් ම පුතණුකෙනකුන් වදා ඒ පුතණුවන්ට නුගගස දෙවතාවා නමින් නිග්‍රොධ කුමාරයෝය යි නම් තුබූහ.

ඒ ගම ජ්‍යෙෂ්ඨ චණ්ඩාලයා ද බිසොවුන් දුටු දවස් පටන් තමන්ගේ ස්වාමිදුවක දුටුවා සේ සිතා නිරන්තරයෙන් කන බොන දෑ ආදිය ගෙනහැර දෙමින් පොෂ්‍යය කෙරෙයි. මෙසේ එබිසවු එම ශාලාවෙහි සත් අවුරුද්දක් විසූහ. නිග්‍රොධ කුමාරයෝ ද සත් හැවිරිදි වූහ. එකල්හි මහා වරුණ නම් එක් රහත් කෙනෙකුන් වහන්සේ ඒ නිග්‍රොධ කුමාරයන් රහත්වන්ට හෙතු ඇති බව දුන මහණ කරවන්ට සුදුසු කල් බල බලා වසනසේක් "දැන් මේ කුමාරයෝ පුරා ම සත් ඇවිරිදි වූහ, එබැවින් මහණ කරවන්ට[4] කලැ"යි සිතා සුමනා නම් වූ මවු බිසොවුන්ට කියා අනුදන්වාගෙන නිග්‍රොධ කුමාරයන් වෙහෙරට කැඳවාගෙන අවුත් ඉසකෙස් බහවා මහණ කළසේක. එකෙණෙහි ඒ නිග්‍රොධ නම් සාමණේරයන්වහන්සේ ද කරගෙහි ම රහත් ව මහාක්‍ෂීණාශ්‍රව වූසේක. කියනලද මැයි මහාවංශයෙහි:

1. කලාල් පැදුරු - BEGHF
2. උච්චාසනවල - BDEFGHJ , ස
3. තමාගේ - ABDEL
4. කරවන්ට - ABCDEFJL
කරවන්ඩ - GH, කරන්ට - K, ක.සි.කු. බෙ.ස.

Non-Commercial Distribution

තං මහාවරුණත්ථේරො - තද දිස්වා කුමාරකං,
උපනිස්සයසම්පන්නං - අරහා පුච්ඡි මාතරං,
පබ්බාජේසි ඛරගෙහ[1] සො - අරහත්තමපාපුණි-යි.

මෙසේ රහත් ව වසන ඒ නිග්‍රොධ සාමණේරයන්වහන්සේ එක් දවසෙක උදයන්හි ම සිරුරු පිළිදගැ ආචාර්‍ය්‍ය උපාධ්‍යායයන්වහන්සේට කළමනා වත් පිළිවෙත් සපයා සිවුරු ගැටගන්වා පාත්‍රය අතින් ගෙන 'මවුබිසොවුන්ගේ ගෙදෙරට යෙමි'යි සිතා වෙහෙරින් පිටත් ව වඩනාසේක් එබිසොවුන් වසන ගමට පැළලූප් නුවර දකුණු වහසල්දෙරින් වැද නුවර මධ්‍යයෙන් ගොස් නැගෙනහිරි වාසලින් පිටත් ව යායුතු හෙයින් නුවරට වැද සන්හුන් ඉඳුරන් ඇති ව එකඟ වූ සිතින් වියදඬු පමණෙකින් වඩා නොබලා බැලූ බැලූවන්ට රිසියෙන තපොලීලායෙන් ඊර්‍ය්‍යාපථ සම්පන්න ව රාජාඞ්ගනයට පැමිණිසේක. එකෙණෙහි අශොක රජ්ජුරුවෝ මතු මහල්තලයට පැනනැඟී නැගෙනහිරට අභිමුඛ ව සිවුමැදුරු කවුළුව සමීපයෙහි සක්මන් කරන්නාහු රාජාඞ්ගනයෙහි වඩිනා[2] නිග්‍රොධ සාමණේරයන්වහන්සේ දක මෙසේ සිතූහ: "මේ සියලු ජනයෝ ම වික්ෂිප්ත සිත් ඇතියහ. භයින් භ්‍රාන්ත වූ මුවන් වැනියහ. මේ බාල දරුවෝ අවික්ෂිප්තයහ. මොවුන්ගේ ඉදිරියෙහි පස්සෙහි බැලීම් ද අතපය දික්කිරීම් වක්කිරීම් ද ඉතා හොබනේය. ඒකාන්තයෙන් මොවුන්[3] අභ්‍යන්තරයෙහි ලොකොත්තර වූ ගුණධර්මයෙක් ඇත් මය"යි සිතා දක්ම හා සමඟ සාමණේරයන් වහන්සේ කෙරෙහි රජ්ජුරුවන්ගේ සිත් පහන් විය. මහත් වූ ප්‍රෙම උපන.

කවර හෙයකින් ප්‍රෙම උපන් ද යත්, ඒ නිග්‍රොධ සාමණේරයන්වහන්සේ නම් පෙර මී දන් දී පින්[4] කරන සමයෙහි ඒ අශොක රජ්ජුරුවන්ගේ වැඩිමහලු බෑණන් වහන්සේ ය. එසේ හෙයින් පූර්වහේතු බලයෙන් ප්‍රෙමය[5] උපන. හේ එසේ මය. උත්පල පදුම පුණ්ඩරීකාදි වූ ජලජ කුසුමයෝ ජලය හා කදිමය නිසා යම් සේ උපදිද් ද එපරිද්දෙන් ම සත්වයන් කෙරෙහි උපදනාවූ ප්‍රෙමය ද පෙර ජාතියෙහි කරනලද පූර්වසන්නිවාසයක් හෝ ඉහාත්මභාවයෙහි කරනලද යම් කිසි හිතකාරණයක් මුල් ව උපදනේය යි දතයුතු. එසේ හෙයින් කියන ලදී:

පුබ්බෙව[6] සන්නිවාසෙන - පච්චුප්පන්නහිතෙන වා,
එවං තං ජායතෙ පෙමං - උප්පලංව යථොදකෙ-යි.

මෙසේ මහවතුරක් මෙන් උපන්නාවූ ප්‍රෙම හා බහුමාන ඇති රජ්ජුරුවෝ "තෙල යන සාමණේරයන්වහන්සේ කැඳවාගෙන එව"යි අමාත්‍යයකු යවූහ. ඒ ගිය අමාත්‍යයාගේ වචනය අසා ද සාමණේරයන්වහන්සේ පියවි ගමනින් ම වඩනා

1. ඛුරගෙහ - GHKL, ක.සි.සැ.ම.
2. වඩනා - GHJ, ක.කිසැ.ම
3. මොවුන්ගේ- EGHJKL
4. පින්කම් - BEGHL
5. ප්‍රේම - BDEGHKL
6. පුබ්බෙන - පාලි

Non-Commercial Distribution

හෙයින් නැවතත් සතිකෝ එන්ට කියව යි දෙතුන් වරෙක[1] මිනිසුන් යවූහ. ගිය ගිය මිනිසුන් ඉක්මන් ව එන්ට කිව ද සාමණේරයන්වහන්සේ ඇත් මැත් නොබලා ස්වභාව ගමනින් ම වැඩිසේක. එකල රජ්ජුරුවෝ "නුඹවහන්සේට සුදුසු ආසනයක් බලා වැඩලන මැනවැ"යි කීහ. සාමණේරයන්වහන්සේ ඇත් මැත් බලා එහැන්හි තමන් වහන්සේට වැඩිමහලු අනික් භික්ෂුකෙනෙකුන්වහන්සේ නැති හෙයින් මුදුනෙහි නඟනලද දළපුඩු සේසත් ඇති සිංහාසනය සමීපයට එළඹිසේක. රජ්ජුරුවෝ සාමණේරයන්වහන්සේ සිංහාසනය සමීපයට වඩනා දැක "අද ම සාමණේරයන් වහන්සේ මේ රජගෙට නායක වූසේකැ"යි සිතූහ. එකල සාමණේරයන්වහන්සේ ද රජ්ජුරුවන් අතට පාත්‍රය දී එම රජ්ජුරුවන්ගේ අත එල්බගෙන සිංහාසනයට නැඟී වැඩහුන්සේක. රජ්ජුරුවෝ තමන්ට පිළියෙල කොට තිබූ සියලු ම කැඳ අවුලුපත් බත් මාලු[2] විකෘති ආදිය එළවූහ.[3] සාමණේරයන්වහන්සේ එයින් තමන්වහන්සේ යැපෙන පමණක් ම පිළිගත්සේක. මෙසේ වළඳවා ඉක්බිති රජ්ජුරුවෝ කියන්නාහු "පුතණුවන්වහන්ස, නුඹවහන්සේ බුදුන් වදළ අවවාද ධර්මය දන්නාසේක් දැ"යි විචාළහ. සාමණේරයන්වහන්සේ "එසේය මහරජ, අප අලුත මහණ වූ හෙයින් විස්තර වශයෙන් කියාලන්ට නොපිළිවන, එතෙකුදු වුවත් එකදෙශමාත්‍රයක් දනුම්හ"යි වදාළසේක. එකල රජ්ජුරුවෝ "එසේ වී නම් පුතණුවන් වහන්ස, අපටත් ඒ අවවාදධර්මය වදළමැනවැ"යි කීහ. සාමණේරයන්වහන්සේ ද යහපතැයි වදරා ඒ රජ්ජුරුවන් තමන් හා එක පියන්ට ද නවානුවක් මල්බෑ රජකුමරුවන් මරවාපි හෙයින් "මෙ රජ ඉතා චණ්ඩපරුෂය.[4] කුසල් කිරීමෙහි ප්‍රමාදය"යි සිතා රජ්ජුරුවන්ට සුදුසු ලෙස ධම්පදයෙහි අප්පමාද වර්ගයෙන්[5] අනුමෙවුනි බණ වදළසේක. රජ්ජුරුවෝ වනාහි අප්පමාදෙ අමතපදං පමාදෙ මච්චුනො පදං යන මේ පදද්වය පමණක් ම අසා "ස්වාමීනි පුතණුවන්වහන්ස, සියලු ධර්මය ම මෙපමණකින් ම දනපීමි. බොහෝ කොට බණ කියා වෙහෙස නොවිඳ සමාප්ත කළමැනවැ"යි කීහ. සාමණේරයන් වහන්සේ ද මෙසේ අනුමෙවුනි බණ වදරා ඉක්බිති රජ්ජුරුවන්ගෙන් දෙතිස් ලහබතක් ලැබ දෙවන දවස් දෙතිස් දෙනකුන්වහන්සේ කැඳවාගෙන රජගෙට වැඩ අහර වළඳ එදවස් අනුමෝදනාවසානයෙහි පර්ෂද් හා සමඟ ඒ චණ්ඩාශොක රජ්ජුරුවන් තිසරණ ගන්වා පන්සිල් පිහිටුවා ශාසනයෙහි පෘථග්ජන ශ්‍රද්ධාවෙන් හා චිත්තප්‍රසාදයෙන් අචල ප්‍රසාද[6] කොට පිහිටුවූසේක. එකල රජ්ජුරුවෝ නිග්‍රොධ සාමණේරයන් වහන්සේ[7] පසඟ පිහිටුවා වැඳ "ස්වාමීනි, පුතණුවන්වහන්ස, සෙට නුඹවහන්සේ හා කැටිව අනිකුත් දෙතිස් දෙනකුන්වහන්සේ කැඳවාගෙන වැඩියමැනවැ"යි ආරාධනා කොට මෙම ක්‍රමයෙන් දවසින් දවස භික්ෂූන් වහන්සේ වඩ වඩා ගෙනවමින් සැටදහසක් පමණ බ්‍රාහ්මණපාෂාණ්ඩයන්ට දෙන්නාවූ බත් වැටුප් හරවා නිග්‍රොධ සාමණේරයන්වහන්සේ කෙරෙහි උපන්නාවූ චිත්තප්‍රසාදයෙන් ම සැටදහසක් භික්ෂූන්වහන්සේට දනවෘත්ති නංවා නිරන්තරයෙන් තමන්ගේ ඇතුළු රජගෙහිදී ම දන් දෙන්ට[8] පටන් ගත්හ. එසේ හෙයින් කියන ලදී;

තතො රාජා පසන්නො සො - දිගුණෙන දිනෙ දිනෙ,
භික්ඛූ සට්ඨිසහස්සානි - අනුපුබ්බෙන වඩ්ඪයං,

---

1. මෙසේ දෙතුන් වරෙක - BGH
2. මාලු (නැත) - BGHKL ක.කිස.
3. වැළඳවූහ- BGHL; එවූහ - ම.
4. චණ්ඩය පරුෂය - BDGHKL
5. වගානයෙන් - J
6. අචල ශ්‍රද්ධා -BGHKL
7. වහන්සේට - BCEHKL
8. මහ දන් දෙන්ට - මුද්‍රිත හැම. ස.

Non-Commercial Distribution

තිපටියානං සහස්සානි - නික්කඩ්ඪිත්වාන සට්ඨි සො,[1]
සට්ඨි භික්ඛුසහස්සානි - ඝරෙ නිච්චමභොජයී - යි.

මෙසේ නිරන්තරයෙන් මහදන් දෙන්නාවූ ඒ චණ්ඩාශොක රජ්ජුරුවෝ එම සැටදහසක් දෙනා වහන්සේට තමන් හමින් අශොකාරාම නම් විහාරයක් කරවා දුන්හ. එකල්හි නිග්‍රොධ සාමණෙරයන්වහන්සේ ද ක්‍රමයෙන් විසිවයස් පිරී උපසම්පද ව නිග්‍රොධ නම් මහතෙර ව මහත් වූ පින්බල ඇති හෙයින් ලාභයෙන් යශයින් අග පැමිණ හිරසඳ සේ ලොකප්‍රසිඬ වූ සේක. මෙසේ රජ්ජුරුවෝ ශාසනයෙහි ප්‍රසන්න වූ තැන් පටන් අනවතප්තවිලින් දෙවියන් තමන්ට ගෙනෙන පැන් සොළොස් කළයෙන් අටකළයක් සංඝයාවහන්සේට දෙති. දෙකළයක් ත්‍රිපිටකධාරී සැටදෙනකුන්වහන්සේට දෙති. දෙකළයක් අගමෙහෙසුන් වූ අසන්ධිමිත්‍රාවන්ට දෙති. සතරකළයක් තුමූ පරිභොග කෙරෙති. එසේ ම හිමාලයෙන් දෙවියන් එළවන නාලියදඬුවූ ද අසන්ධිමිත්‍රාවන්ට හා සොළොස්දහසක් නාටකස්ත්‍රීන්ට ද සැටදහසක් භික්ෂූන්වහන්සේට ද දවස් පතා දී තුමූ ද පරිභොග කෙරෙති. බෙහෙත් අරළු ආදිය ද එසේ ම දෙති. තව ද දවස් පතා පස් ලක්ෂයක් ධන වියදම් කරවා බුඬශාසනයට මහත් වූ ලාභසත්කාර පැවැත්වූහ. කෙසේ ද යත්: එකල්හි ඒ දසදහසක් යොදුන් දඹදිව සුවාසූදහසක් රාජධානියෙන් හා සපනසක් රුවන් ආකරයෙන් හා නවානූදහසක් ද්‍රොණමුඛයෙන් හා සයානූකෙළ ලක්ෂයක් පටුන් ගම්වලින් හා දවස් පතා තිමන්නාවූ[2] අය හැර එම පැළලුප් නුවර සතරවාසල්[3] දෙරින් සාරලක්ෂයක් හා නුවර මැද අධිකරණ ශාලාවෙන් ලක්ෂයක් හා මෙසේ දවස් පතා පස්ලක්ෂයක් ධන උපදනෝය. එයින් අධිකරණ ශාලාවෙන් ලබන ලක්ෂය සංඝයාවහන්සේට සතර වාසල්[4] දෙර පොකුණු බිඳුවා පුරා දෙනලද බෙහෙත් පසය පිණිස දෙති. සතර වහසල් දෙරින් උපදනා සාරලක්ෂයෙන් දවස් පතා බුදුන්ට බත් මල් පහන් පූජා පිණිස ලක්ෂයක් දෙති. ධර්මපූජා පිණිස ත්‍රිපිටකධාරී බහුශ්‍රැත වූ ධර්මධර භික්ෂූන්වහන්සේට සිවුපසදනය සඳහා ලක්ෂයක් දෙති. සාමාන්‍ය සංඝයාවහන්සේට ද සිවුපසදනය පිණිස ලක්ෂයක් දෙති. එක ම නිග්‍රොධ මහතෙරුන් වහන්සේට දවස් පතා ලක්ෂයක් දෙති. හේ කෙසේද යත්: ඒ නිග්‍රොධ මහතෙරුන් වහන්සේට දවස් පතා උදසන්හි තුන්සිවුරක් මඟුලැතු පිට තබා පන්සියයක් අමුණු සුවඳසුනු හා පන්සියයක් මල්කරඬු හා සමඟ මහපෙරහරින් ගෙන ගොස් පිළිගන්වති. දවල්ද එසේ ම දී යවති. සවස ද තුන්සිවුරක් එසේ ම නික්මවති. රජ්ජුරුවෝ දවස තුන් වේලෙහි සළු පෙරළන කල "අපගේ මහතෙරුන්වහන්සේට සිවුරු දී යවූ ද" යි විචාරා ම සළු පෙරළති. මහතෙරුන්වහන්සේ ද තුන්වේලෙහි වැළඳ අළ සිවුරු සමීපයට සම්ප්‍රාප්ත වූ සබ්‍රම්සරුන්වහන්සේට දන් දෙනසේක. එකල්හි දඹදිව සංඝයාවහන්සේට බොහෝ සේ නිග්‍රොධ මහතෙරුන්වහන්සේගෙන් ම සිවුරු සැලසිණ. උන්වහන්සේගෙන් ම

1. සට්ඨියො - EGHKL, ක.කි.ඝ.
2. නික්මුණාවූ - ක.කි.ඝ.ම.
3. සතර වහසල් - KL
4. දහවල් - KL

ආහාරප්‍රත්‍යය ද සැලසිණ. මෙසේ දවස් පතා ලක්‍ෂයක් ලබන මහපිනැති ඒ නිග්‍රොධ මහතෙරුන්වහන්සේ එවැනි රජ්ජුරුකෙනකුන්ට ද ව බිසෝකෙනකුන් කුස පිළිසිඳ පවා පළමු වෙළෙඳ ව උපන් ජාතියෙහි පසේබුදුන්ට චණ්ඩාලවාදයෙන් ආක්‍රොශ කළාවූ අකුශලබලයෙන් උපදනා දවස් චණ්ඩාලයන් වසන සැඩොල් ගම්මැද[1] නුගගසක් මුල ශාලාවෙක අනාථ ව උපන්සේක. එකල පසුව සමයිතින් සමාදන් වූ කුශලයෙහි අනුසසින් සසුන් වැද මහණ ව රහත් වූසේකැයි දතයුතු. කියන ලදුයේ මැයි:

චණ්ඩාලවාදි දෙසෙන - ජාතො චණ්ඩාලගාමකෙ,
පත්තානුමොදනාපාකා - අසෙසො හි අනාසවො-යි.

තව ද ඒ චණ්ඩාශොක රජ්ජුරුවන් ඔටුනු පැළඳි සතරවන අවුරුද්දෙහි ඔවුන්ගේ සහෝදර මල් වූ යුවරජ තනතුරෙහි සිටි තිස්ස නම් රාජකුමාරයන් හා සංඝමිත්‍රාවන්ගේ ස්වාමිපුත්‍ර වූ අග්ගිබ්‍රහ්මා[2] නම් රාජකුමාරයන් හා දෙදෙන ලක්‍ෂයක් පුරුෂයන් හා සමඟ සසුන් වැද මහණ ව රහත් වූහ. ඉක්බිති ඒ චණ්ඩාශොක රජ්ජුරුවෝ දවසෙක ඇමැතියන් බණවා "එම්බා සගයෙනි, මම බුදුන් සමයෙහි[3] උපනිම් නම් මුළු දඹදිව රාජ්‍යය බුදුන්ට පූජා කෙරෙමි. දෙව්රජ ව උපනිම් නම් දිව්‍යරාජ්‍යයෙන් පූජා කෙරෙමි. දන් මා එවැනි පිනක් කොටගන්ට පින් මඳ හෙයින් දෝ හෝ දිවමනු බුදුන් දක දෙනුවන් පිනවාගත නුහුණුයෙමි, බුදුන් අඳුනන කෙනෙක් ඇද් දැ"යි විචාළහ. එකල ඇමැතියෝ "මහරජ, දන් බුදුන් පිරිනිවියෙ දෙසිය එක්විසි හවුරුද්දෙක. පුරුෂයුග දෙකක් ඉක්මෙමින් සිටියේය. එසේ හෙයින් බුදුන් අඳුනන මනුෂ්‍ය කෙනෙක් නැත. මාඤ්ජරික නම් නාගභවනයෙහි පාතාලවාසී වූ මහාකාළ නම් නාරජ්ජුරුවෝ කල්පයකට ආයු ඇතියහ. මේ කප බුදු වූ සතරදෙනා වහන්සේ ම[4] දුටහ. බුදුවෙස් මවා දක්වන්ට සුදුසු වූ මහත් ආනුභාව ඇතියහ" යි කීහ. එබස් අසා රජ්ජුරුවෝ "ඒ නාරජහු ගෙන්වා බුදුන්ගේ රූපශ්‍රී බලමි"යි සිතා රන් ඇකිල්ලක්[5] කරවා තමන් අතින් ගෙන "සැබැවින් මම තුනුරුවන් කෙරෙහි පහන්සිත් ඇතියෙම්[6] වීම් නම් මේ මට සබා ශ්‍රද්ධාවෙක් ඇත්නම් මේ ඇකිල්ල[7] වහා දිවගෙන ගොස් ඒ මහාකාළ නම් නාරජහු බඳ ගෙනෙව"යි සත්‍යක්‍රියා කොට තමන්ගේ තෙජොගුණය ද සලකා බිමට දමූහ. එකෙණෙහි ඒ ඇකිල්ල කිසි පැකිල්ලක්[8] නැති ව මහපොළොව දෙබේ කෙරෙමින් ඇසිල්ලක දිවගෙන ගොස් ඒ මහාකාළ නම් නාරජහුගේ වාලධිය පැහැර හිණ; නාරජ ඇකිල්ල දක කිමෙක් දෝ හෝයි දිවයින් බලා රජ්ජුරුවන්ගේ අචල වූ ශ්‍රද්ධාබලය හා තෙජොබලය දක එම ඇසිල්ලෙහි දහස් ගණන් නානළුවන් පිරිවරා නාගභවනයෙන් නික්ම රාජාඞ්ගනයෙහි මහපොළොව පළාගෙන උඩ නැඟී රජ්ජුරුවන්ට අභිමුඛ ව දෘශ්‍යමාන රූපයෙන් මහජනයාට පෙනි පෙනී සහපිරිවරින් සිටගත. රජ්ජුරුවෝ පිරිවර සහිත ඒ මහාකාළ නම් නාරජ්ජුරුවන් දක "තෙපි කවුරු දයි විචාරා තත් වූ පරිද්දෙන් නාරජ් ජුරුවන් බව දන "බුදුන් දුටු දැ"යි විචාරා "එසේය මහරජ, දිටිමි"යි කී කල්හි එබසට

1. ගමක් මැද - BGHL
2. අග්ගිබ්‍රහ්ම -BCEFG
3. සම්පයෙහි - BGHL
4. සතර බුදුන් ම - BEGHKL
5. හැකිල්ලක් - CD
6. ඇසිවෙමි - ක.කි.සැ
7. හැකිල්ල - CD
8. පැකිල්මක් - AGFKL
පැකිළීමක් - CDHJ, ක.කි.ක.සැ

Non-Commercial Distribution

සාධුකාර දී දෙහොත් මුදුනෙහි තබා නමස්කාර කොට මුදුනෙහි නඟනලද සේසත් ඇති සිංහාසන මස්තකයෙහි නාරජ්ජුරුවන් වඩාහිඳුවා නොයෙක් සියගණින් ජාති ඇති දියෙහි ගොඩෙහි පිපෙන නානාවර්ණ කුසුමයෙන් හා රන්මල් රිදීමල් ආදියෙන් පූජා කොට කනක කටක රසන නූපුරාදි වූ සියලු අලඞ්කාරයෙන් සැරහුණාවූ[1] තමන්ගේ සොළොස් දහසක් පමණ නාටකස්ත්‍රීන් හාත්පසින් පිරිවර කොට සිටුවා නැවත "මේ කප බුදු වූ සතර බුදුන් ම දුටු ද"යි විචාරා "එසේ ය දිටිමි"යි කී කල්හි "එසේ වී නම් ඒ සතර බුදුන්ගේ රූපශ්‍රිය මවා දක්වා බුදුසිරි දක්මෙහි ලොල් වූ මාගේ දෙනුවන් සනහාලව"යි කීහ. එවේලෙහි නාරජ්ජුරුවෝ "එම්බා රජ්ජුරුවෙනි, මම සරාගියෙමි, බුදුහු අරාගිසේක. සරාගී සදෙසි සමොහී කෙනකුන් තබා දසගිල්ල[2] නැඟීමෙන් දසදහසක් සක්වළ ආලොක කරන්ට සමර්ථ වූ විතරාගී වූ මහබඹු වී නමුත් බුදුන්ගේ රූපය ඉඳුරා මවා දක්වාලිය නොහැක්කේ මය;[3] එසේ ද වී නමුත් බුදුන්ගේ රූපවිලාසයෙන් එකදෙශයක් බැලුව මැනවැ"යි කියා මේ කප පළමුවෙන් බුදු වූ කකුසඳ බුදුන්ගේ සතලිස්රියන් බුද්ධකාය මවාගෙන සතලිස්දහසක් මහරහතන් පිරිවරා මොහොතක් කල් ඒ බුදුන් අහස්කුස සිටියා සේ දක්වා ගුවන් කුස සරහා සිටගත. ඒ බුද්ධවිලාසය දැක රජ්ජුරුවෝ ප්‍රීතින් මත් ව 'ජීවිතයෙහි ඵල ලදිමි'යි සාධුකාර දුන්හ. දෙවැනි ව කොණාගමන[4] බුදුන්ගේ තිස්රියන් බුද්ධකාය මවාගෙන[5] තිස්දහසක් රහතන් හා සමඟ අහස්කුස පෙනීගියා සේ දක්වාලීය. එවේලෙහි ද රජ්ජුරුවන් හා මහපිරිස එකපැහැර සාධුකාර දුන්හ. තුන්වැනි ව කාශ්‍යප බුදුන්ගේ විසිරියන් පමණ බුද්ධ කාය මවාගෙන විසිදහසක් පමණ රහත්ගණයා[6] හා සමඟ අහස්කුස වැඩසිටියා සේ දක්වාලීය. එවේලෙහි ද සාධුකාර දී මහත් වූ උත්සව පැවැත්වූහ. සතරවැනි ව අප මහාගෞතම බුදුන්ගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණයෙන්[7] හා අසූ අනුව්‍යඤ්ජන ලක්ෂණයෙන් විරාජමාන වූ අටළොස්රියන් බුද්ධකාය මවාගෙන බෝමැඩ වජ්‍රාසන නැඟී මාරපරාජයෙහි වැඩ හුන්නා වූ ශ්‍රී විලාසය දක්වාලීය. එවේලෙහි ඔහු විසින් මවන ලද ඒ බුද්ධවෙශය සකල ශරීරය එකපැහැර සරහා සිටගත්තාවූ අසූ අනුව්‍යඤ්ජන ලක්ෂණයෙන් ප්‍රතිමණ්ඩිත දෙතිස් මහාපුරුෂ ලක්ෂණයෙන් සශ්‍රීක වූ හෙයින් විකසිත පද්මොත්පල පුණ්ඩරීකාදීන් ප්‍රතිමණ්ඩිත ජලතලාවක් මෙන් ද තාරකානිකරයන්ගේ රශ්මි සමූහ ස්පර්ශයෙන් විස්ඵුරිත වූ ගගනතලයක් මෙන් ද නීල පීත ලොහිතාදි වූ ප්‍රභෙද ඇති විචිත්‍රවර්ණ බුද්ධරශ්මි සමූහයෙන් වළඳනාලද ව්‍යාමප්‍රභා පරික්ෂෙපයෙන් විරාජමාන විලාසශ්‍රී ඇති හෙයින් සන්ධ්‍යාඝනප්‍රභානුරාග ඉන්ද්‍රචාප විද්‍යුල්ලතා ආදියෙන් පරික්ෂිප්ත ව[8] තරුණරවිකිරණයෙන් දිලියෙන කනකගිරිශිඛරයක් මෙන් ද නානාවිරාග විමල කෙතුමාලාලඞ්කාරයෙන් සමුජ්ජ්වලිත වූ මනහර ශිරොධාතු ශොභාවකින් යුක්ත ව නෙක බ්‍රහ්ම සුරාසුරොරග නරගරුඩගන්ධර්ව යක්ෂ රාක්ෂස සිද්ධවිද්‍යාධරාදීන්ට නයන රසායනයක් බඳු විය. එබඳු ඒ බුද්ධ රූපශ්‍රී බලමින් මහත් වූ බුද්ධාලම්බන ප්‍රීතින් පිනා මුළු දඹදිව රාජ්‍යය බුදුන්ට පුද සොළොස් දහසක් පුරස්ත්‍රීන් හා සමඟ සත්දවසක් මුළුල්ලෙහි බුදුන් වැඳ සිට නෙත්‍රපූජා කළහ.

---

1. සැරසුණු - BEGHKL
2. දස ඇඟිල්ලක් - ADEFJKL
3. නොහැක්කේ වන - BDEGH
   නොහේමය - KL
4. කොණාගම නම් - BCGH
   කොණාගම - KL ක.කි.සං.
5. මවා - BDEGHKL ක.කි.සැම.
6. රහතන් - බෙ. ස.
7. ලක්ෂණ - BGHL
8. වූ - BGH

Non-Commercial Distribution

මෙසේ දවසින් දවස වැ වඩා තුනුරුවන් කෙරෙහි අතිප්‍රසන්න ව කුශලධර්මය පිරීමෙන් ධර්මාශෝකය යි ප්‍රසිද්ධ ව පින් රැස් කරන්නාවූ රජ්ජුරුවෝ තමන් ඔටුනු පළන් එම සතරවන අවුරුද්දෙහි එක් දවසෙක අශෝකාරාමයෙහි වැඩවසන සැටදහසක් භික්ෂූන්වහන්සේට පාසිවුරු කහබහන්[1] කරකතුරු හිදිකටු නූල් පෙරහන් ආදි වූ අෂ්ටපරිෂ්කාරයන් හා සමග ඇඳ පුටු බිසි කන්වයින් ආදි වූ බොහෝ ශ්‍රමණපරිෂ්කාර දන් දී රත්පියුම් වනයක් මැදට බට සවර්ණ රාජහංසයකු සේ සඟපිරිස් මැදට වැද පසහ පිහිටුවා වැඳ නව ද සිවුපසයෙන් පවරා එකත්පස් ව හිඳ "ස්වාමීනි, බුදුන් වදළධර්මය ප්‍රමාණ වශයෙන් කොපමණෙක්[2] දැ"යි විචාළහ.

එකල මත්තෙහි වියයුතු ශාසනොපකාර සඳහා බඹලොවින් අවුත් මිනිස්ලොව උපන් මොග්ගලිපුත්තතිස්ස නම් මහතෙරුන්වහන්සේ "මහරජ, අඞ්ග වශයෙන් නවාඞ්ගයෙක, සකන්ධ වශයෙන් සුවාසූදහසක් ධර්මස්කන්ධය"යි වදළසේක. රජ්ජුරුවෝ ධර්මයෙහි පැහැද එකි එකී ධර්මස්කන්ධයකට[3] එකි එකී විහාරයකින්[4] පූජා කෙරෙමියි එක දවස් ම සයානූකෙළක් ධන වියද "එකි එකී නුවර එකි එකී විහාරයක් බැගින් සුවාසූදහසක් රාජධානිවල සුවාසූදහසක් විහාර කරවාලව"යි අමාත්‍යවරුන්ට විධාන කොට තුමූ එම පැළලුප් නුවර අශෝකාරාමයෙහි අශෝක නම් මහා විහාරය[5] කරවන්ට පටන්ගත්හ. එකල මහාසඞ්ඝයාවහන්සේ එක් ව මහානුභාව ඇති ඉන්දගුත්ත නම් මහතෙරකෙනකුන් වහන්සේ විහාරවල නව කර්මාන්ත කරවන ලෙස සලස්වා වදළසේක. මහතෙරුන්වහන්සේ ද යම් යම් කර්මාන්තයෙක් නොනිමා නම් ඒ ඒ කර්මාන්තය තමන්වහන්සේගේ ආනුභාවයෙන් වහා සමෘද්ධ කරවනසේක. මෙසේ කරවන කර්මාන්ත තුන් අවුරුද්දකින් නිමවා එපවත් රජ්ජුරුවන්ට කියා එවන්නාහු "සකල ශ්‍රී නිවාස වූ අපගේ ස්වාමීන් විහාර කරවන්ට එවා වදළ මෙහෙවර නියාවට නොලස් ව අවුත් විහාරවින්‍යාසයට යොග්‍ය වූ තිසි බිම් බලා පරීක්ෂා කොට චෛත්‍යාඞ්ගන බොධ්‍යඞ්ගන ප්‍රතිමාගෘහ ධර්මශාලා ප්‍රාසාද චඞ්ක්‍රමණ ප්‍රාකාර ගොපුර පුෂ්කරණී පුෂ්පාරාම ඵලාරාමාදි වූ ඒ ඒ වස්තූන් කරවන්ට නියතස්ථාන බලා සලක්ෂණ කොට බිම් බෙද සුවාසූදහසක් විහාර දගබ් කරවා නිමවනලද. දගබ්වල ධාතු පිහිටුවා කොත් පළඳවන්ට අදළ[6] නකත් මොහොත් දවස් නියම කරවා වදළ යහපතැ"යි කියා සුවාසූදහසක් රාජධානිවලින් එක දවස් ම පත් ගෙනාහ. එකල රජ්ජුරුවෝ පත් අසුන් අසා මහසඞ්ඝයාවහන්සේ කරා එළඹ "ස්වාමීනි, මා විසින් සුවාසූදහසක් විහාර කරවනලද. ධාතුන්වහන්සේ කොයින් ලැබෙම් දැ"යි විචාළහ. එබස් අසා මහාසඞ්ඝයාවහන්සේ විහාරවල ජරාවාස කර්මාන්ත කරවීම නම් ආසිරි වඩනා පින්කමක්[7] හෙයින් රජ්ජුරුවන්ට කුසල් වඩවනා නිසා[8] දෝ හෝ ධාතුනිධානය මසැසින් නුදුටු බව හේතුකොටගෙන එවේලෙහි වදරහසේක් "මහරජ, ධාතුනිධානයෙක් ඇතැයි යන බස් පමණක් ඇසුම්හ, අසෝ තැනෙකැයි[9] නොපෙනෙයි" වදළසේක. ඉක්බිති රජ්ජුරුවෝ

1. කහබාන් - DFK
2. කෙපමණෙක් - EJKL
3. ධර්මස්කන්ධයක් - EF, ක.සි.සැ.ම
4. විහාරයක් - බෙ.ස.
5. විහාරයක් - BEFGH
6. සදළ - ABCF
   වදළ - DEGHKL
7. පිනක් ම - BGHL
8. වඩනා නියා - BFH, මුද්‍රිත හැම. ස.
   වඩවන පිණිස - KL
9. නැතෙකැයි - J, ක.සි.සැ.ම.

Non-Commercial Distribution

මහසෙනඟ පිරිවරා උදලු යහුල් කුණ්‍ඩාලි ආදි වූ කර්මාන්තෝපකරණ ගෙන්වාගෙන රජ්ගහා නුවරට ගොස් එනුවර පළමු අජාසත් රජ්ජුරුවන් කැරවූ දගබ බිඳුවා එහි ධාතු නොදක පෙර පරිද්දෙන් ම දගබ බඳවා භික්‍ෂු භික්‍ෂුණීන් හා උපාසක උපාසිකාවරුය යන සියලු පර්ෂද් ඇරගෙන විශාලා මහනුවරට ගොස් එහි දගබ බිඳ එතැන්හිදු ධාතු නොදක ඒ ද පෙරලා බඳවා කිඹුල්වත් නුවරට ගොස් එහි දගබ බිඳුවා ඉනුත් ධාතු නොලැබ ඒ දගබ ද පෙරලා බඳවා රාමග්‍රාමයට ගොස් එහි දගබ බිඳුවන්ට පටන්ගත් කල්හි දගබ බිඳින්ට එළනලද යහුල් කුණ්‍ඩාලි පොලු පොලුව බිඳී ගොස් නායින් විසින් බිඳගත නොදෙන හෙයින් ඒ දගබිනුත් ධාතු නොලැබ අලලකප්ප නම් නුවරට ගොස් එහි දගබ බිඳ ඉනුත් ධාතු නොලැබ එද පෙර පරිද්දෙන් ම බඳවා පාවා නම් නුවරට අවුත් එහි දගබ බිඳුවා ධාතු නොලැබ එද පෙරලා බඳවා කුසිනාරා නුවරට ගොස් එහි දගබ බිඳුවා ඉනුත් ධාතු නොලැබ එද නැවත බඳවා පෙරලා පැළලුප් නුවරට අවුත් දෙවන දවස් නුවර වැසියන් රැස් කරවා භික්‍ෂු භික්‍ෂුණී උපාසක උපාසිකා යන සිවුවනක් පර්ෂද් මධ්‍යයෙහි සිටියාවූ රජ්ජුරුවෝ "කිමෙක් ද වයොවෘඩ වූ ගෘහස්‍ථ ප්‍රව්‍රජිතාදි වූ කිසියම් කෙනෙකුන් විසින් අසෝ තෙනක ධාතුනිධාන යයි නිශ්චය කොට ඇසූ දුටු කෙනෙක් ඇද්ද'යි විචාළහ. එතැන්හි රැස්වූ මහාසඞ්ඝයාවහන්සේ අතුරෙන් එක්සිය විසිහැවිරිදි එක් තෙරකෙනකුන්වහන්සේ "මහරජ, අසෝ තෙන ධාතුනිධානය යි නියමයක් ව[1] නුදුටුම්හ. එතෙකුදු වුවත් අපගේ උපාධ්‍යායයන්වහන්සේ අප සත්හැවිරිදි සමයෙහි අප ලවා මල් ගෙන්වාගෙන "මෙසේ එව සාමණෙරයෙනි, අසෝ තෙන කටුගස් අතුරෙහි ගල් දගබෙක් ඇත. එතෙනට යම්හ'යි අප කැඳවාගෙන ඔබ වදළ තෙනට ගොස් එතැන මල් පුදාවැද "මෙතැන සිත් තබවයි" බස් පමණක් දනුම්හ"යි වදළසේක. එවේලෙහි රජ්ජුරුවෝ එසේ කල ධාතුනිධානය නම් එතැන්හි ම වියයුතුය යි කියා ඔබ ඇතුළු වූ මහාසංඝයා වහන්සේ හා සේනාව ඇරගෙන ඔබ වදළ තෙනට ගොස් ගල්දගබ දක වට වැඩී[2] සිටි ගස් කප්පවා දගබ බිඳ පස් හරවා සුනු බිම දක සුනු හා උළු හැර අනුක්‍රමයෙන් ඇතුළු දගෙට බැස පෙර අතුළ සත්රුවන් වැලි හා පළමු විශ්වකර්මයා විසින් මවනලද කඩුගත් අත් ඇති ව සිසාරා දිවන යන්‍ත්‍ර රුවළල්ල දක ඒ යන්‍ත්‍රයෙන් ඇතුළට වැද්ද නොහී යකැදුරන් ගෙන්වාගෙන බිලියම් කරවා එසේ ද යන්‍ත්‍රයෙහි කෙළවරන් දක්ක නොහී නොසතුටු වූ රජ්ජුරුවෝ දෙවියන්ට නමස්කාර කොට "එම්බා දෙවියනි, මේ ධාතුන්වහන්සේ ගෙන සුවාසූදහසක් වෙහෙරවල ධාතු පිහිටුවා පූජා සත්කාර කෙරෙමි. එසේ හෙයින් දෙවතාවෝ මෙයට අන්තරායක්[3] නොකෙරෙත්ව"යි ආරාධනා කළහ. එවේලෙහි සක්දෙව් මහරජ චාරිකාවෙහි හැසිරෙනුයේ එපවත් දක විශ්වකර්ම දිව්‍යපුත්‍රයා කැඳවා "එම්බා දරුව, ධර්මාශොක රජ්ජුරුවෝ ධාතුනිධානය උගුළුවා ධාතුන්වහන්සේ ගෙන තමන්[4] විසින් කරනලද සුවාසූදහසක් විහාරවල පිහිටුවා පූජාසත්කාර කෙරෙමි යි පිටත උළු සුනු බිඳුවා ඇතුළට බටුවාහු තොප විසින් යොදනලද යන්ත්‍රරූපයෙහි ආනුභාවයෙන් වැද්ද නොහී සිටියහ. දැන් තෙපි වහා ඔබ ගොසින් ඒ යන්ත්‍රය උගුළුවා පියව' යි නියොග කෙළේය. එකල්හි විශ්වකර්ම දිව්‍යපුත්‍රයා ඉස

1. නියම දක්වනු - බෙ.ස.
2. වැඩී - බෙ.ස.
3. අන්තරායෙක් - BGH
   අන්තරාවක් - CD
4. තලින් - බෙ.ස.

Non-Commercial Distribution

පස්කොණ්ඩයක් කොට බැඳගෙන බාලදරු වෙසකින් අවුත් දුනුහී ගත් අත් ඇති ව රජ්ජුරුවන් ඉදිරියෙහි පෙනී "රජ්ජුරුවන් වහන්ස, මේ දඬුරු වළල්ල හැර දමාපියම් ද" යි කීය. එබසට රජ්ජුරුවෝ සතුටු ව "දරුව, තොපට පිළිවන් වී නම් හැරපියව" යි කිහ. ඉක්බිති බාලදරු වෙසින් ආ විශ්වකර්ම දිව්‍යපුත්‍රයා හීයක් හිඳුවාගෙන සියලු යන්ත්‍රරූපසන්ධිය රඳවා සිටි ඇනෙහි පැහැර විසිරුවා හෙළාපීය. එවේලෙහි අතිශයින් සන්තුෂ්ට වූ රජ්ජුරුවෝ අසුරොද්දෙහි බැඳ තුබූ යතුරුමුදු හා කෙප්ස ගෙන පළමු එළිපත පිට තබනලද මැණික දක "මතු ඇතිවන දිළිඳු රජදරුවෝ මේ මැණික ගෙන ධාතු පූජා කෙරෙත්ව"යි රන්පත ලියා තුබූ අකුරු කියවා "මා වැනි රජක්හු[1] දිළිඳු යයි කියන්ට කාරණ කිම්"යි කිපී දෙර හැර ඇතුළුගෙට වැද දෙසිය අටළොස් අවුරුද්දකින් මත්තෙහි තහන ලද පහන් සියල්ල ම එම විට නැඟූ පහන් මෙන් ඇවිලෙන නියාව ද එම සමයෙහි පිදූ නිලුපුල් මහනෙල් ආදිය එම විට ගෙනවුත් පිදූ මල්රැසක් මෙන් නොමලා ව තිබෙන නියාව ද ගල්වනලද සුවඳ පිරිබඩ එම විට ගැල්වූ දෙයක් මෙන් නොවියළී තිබෙන නියාව ද යන සියල්ල ම බලා ඉක්බිති එහි ම ලියා තුබූ රන්පතක් ගෙන "මතු අනාගතයෙහි පියදස නම් කුමාරයෙක් මුළු දඹදිවට එකච්ඡත්‍ර නංවා අශෝක නම් ධර්මරාජන් වෙයි. එතෙම මේ ධාතු නිධානයෙන් ධාතු ගෙන සුවාසූ දහසක් විහාර කරවා පිහිටුවන්නේය"යි[2] ලියා තිබූ අකුරු කියවා "ආයර්‍ය වූ මහසුප් මහතෙරුන් වහන්සේ විසින් ප්‍රත්‍යක්‍ෂයෙන් ම දක්නා ලද්දෙම්"යි සතුටු වදන් කිය කියා ඔදවැඩී වමත හකුළුවා දකුණතින් අත්පොළසන් දී ඉක්බිති එතන යම්තම් ධාතු කෙනෙකුන්වහන්සේ තබා සෙසු ධාතු ඇරගෙන පෙර පරිද්දෙන් ම දෙරවල් සියල්ල ම අගුළු ගෙන පළමු සේ ම මත්තෙහි ගල්දගබ පිහිටුවා මහත් වූ පූජා සත්කාර[3] පෙරහරින් ධාතුන්වහන්සේ පැළලුප් නුවරට වඩා ගෙනවුත් සුවාසූ දහසක් විහාරවල එකදවස් ම ධාතුපූජා කරවනු කැමැති ව නුවර බෙර ලවන්නාහු "මෙයින් සත්වන දවස් සියලු විහාරවල ම එකවිට ම ධාතු පිහිටුවා කොත් පළඳවන මහත් වූ පූජා පෙරහරෙක් වෙයි. හැම දෙන ම තොලස් ව දඹදිවුතෙලෙහි ඇති ගම් නියම්ගම් රාජධානීන් හා සියලු මාර්‍ගදිගන්තරයන්[4] එක පැහැර නානාලඞ්කාරයෙන් සරහා ලව. යොදතින් යොදනෙහි දන්හල්[5] කරවා මහදන් පවත්වාලව. ඒ ඒ විහාරවල වැඩවසන මහාසඞ්ඝයාවහන්සේට තම තමා ශක්ති පමණින් මහදන් පවත්වා උපස්ථාන කරව. හැම තන්හි අතුරු නොහැර ඇගෑ බඳවා පහන් පූජා කරව. නානා ජාතියෙහි සුවඳමල් ගෙනහැර පුදව. නන් විසිතුරු හෙරිතූර්‍යභාණ්ඩයන් ගෙන ඒ ඒ තන්හි සිට උපහාර කරව. හැමදෙන ම සිල් සමාදන් ව ධර්මශාලා සරහා බණ අසව" යනාදින් මෙහෙවර කියා බෙර ලැවූහ.

එපවත් අසා මහජනයෝ[6] සතුටු ව ඔදවැඩී "දෙවුලොව අමරවතී නම් රාජධානියෙහි සර්වකාලික වූ සකලශ්‍රීසෞභාග්‍යයට වඩා සශ්‍රීක කොට මුළු නුවර සරහා පිළියෙල කරම්හ"යි සොතසාහි[7] වූවාහු නොයෙක් පරිද්දෙන් පැළලුප් නුවර

1. රජහු - ACFJ
2. ධාතු පිහිටුවන්නේයි - AJ
3. සත්කාර (නැත) - BDEGHKL, ක.කි.සද.ම.
4. දිගාන්තරයන් - CEGHKL
   දිශාන්තරයන් - ක.කි.සද.ම.
5. දන් සැල් - බෙ.ස.
6. මහජනයා - AC, ක.කි.සද.බෙ.
7. සොම්නස් සහිත - BCH
   සිත් සහිත - L
   සොත්සහිත - AEK
   සොත්සාහික - ක.සද.
   ප්‍රොත්සාහික - ක.ම.

Non-Commercial Distribution

සරහා අලඞකාර කළහ. සෙසු තැන් ද එපරිද්දෙන් ම සරහා පිළියෙල කළාහු මය. ඉක්බිති සත්වන දවස් රජ්ජුරුවෝ සර්ාභරණයෙන් විභූෂිත ව එසේ ම සියලු අලඞකාරයෙන් සැරහුණාවූ සොළොස් දහසක් බිසෝවරුන් හා මහ ඇමතියන් ඇතුළු ව අපමණ වූ චතුරඞගිනී සෙනාව පිරිවරා නානාප්‍රකාර හෙරිතූර්‍ය්‍යභාණ්ඩයන් එක පැහැර නාද කරවමින් දශදිගන්තරය[1] එකකොලාහල කරවා මහපොළොව මැඩ ගලන්නාක්හු මෙන් අශොකාරාමයට අවුත් වැද මහාසඞඝයා වහන්සේ වැද එකත්පස් ව සිටියහ. එසේ හෙයින් කියන ලදී;

> තස්මිං දිනෙ මහාරාජා - සබ්බාලඞකාරභූසිතො,
> සහොරොධො සහාමච්චො[2] - බලොඝපරිවාරිතො.
>
> අගමාසි සකාරාමං - භින්දන්තො විය මෙදිනිං
> **සඞඝමජ්ඣම්හි** අට්ඨාසි - වන්දිත්වා සඞඝමුත්තමං -යි.

එදවස් ඒ සමාගමයෙහි රැස්ව සිටි අසූකෙළක් භික්ෂූන් වහන්සේ හා අනූලක්ෂයක් භික්ෂුණීන්[3] අතුරෙන් රහත් භික්ෂූන්[4] වහන්සේ ම ලක්ෂයෙක; ක්ෂීණාශ්‍රව භික්ෂුණීහු දහසෙක[5]. එකල්හි රජ්ජුරුවෝ මහත් වූ සඞඝසමූහයා බලා ප්‍රීතින් මත් ව "ස්වාමීනි, මේ සියලු විහාරවල පවත්නා ධාතුපූජාව එකවිට ම දක්නා කැමැත්තෙමි, එතෙකුදු[6] වුවත් ජම්බුද්වීපය ඉතා මහත. නානා ස්ථානයෙහි කරවන පූජාසත්කාර කෙසේ දක පියම් ද"යි දැන්වූහ. එකල්හි රහතන් වහන්සේ "මේ රජ [හු][7] මෙම අශොකාරාමයෙහි සිට සුවාසූ දහසක් විහාරවල පවත්නාවූ උදාරතර ධාතු පූජාව සැප සේ දකිත්ව"යි අධිෂ්ඨාන කොට ලොකවිවරණ නම් වූ ප්‍රාතිහාර්‍ය්‍යයක් කළසේක. එකල රජ්ජුරුවෝ එම අශොකාරාමයෙහි සිට සතරදිසාව බලන්නාහු හාත්පසින් සාගරපර්‍ය්‍යන්ත වූ මුළු දඹදිවුතලය හා උදාරතර පූජොත්සවයෙන් බබළන්නාවූ සුවාසූ දහසක් විහාර බලා මහත් වූ ඒ පූජාවිභූති දක අපමණ වූ ප්‍රීතිප්‍රමොද්‍යයෙන් යුක්ත ව "මා හැර අන් කිසිවක්හට පෙර මෙබඳු ප්‍රීතිප්‍රමොද්‍යයෙක් උපන් දෙ හෝ නුපන් දෙ හො" යි සිතා විචාරන්නාහු "ස්වාමිනි, අපගේ ලොකස්වාමි වූ බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි කවරෙක් මහත් වූ පරිත්‍යාගයක් කෙළේ ද කවුරුන්ගේ දනපරිත්‍යාගය මහතැයි කියද් ද, ඒ මට ඉඳුරා වදළ මැනවැ"යි කීහ. එකල්හි මොග්ගලිපුත්ත තිස්ස මහතෙරුන් වහන්සේ "මහරජ, තොප වැනි ප්‍රත්‍යයදායක කෙනෙක්[8] බුදුන් දවසත් නැත් මය; එබැවින් තෙපි ප්‍රත්‍යයදායකයන් කෙරෙහි අග්‍රය" යි වදළසේක. එබස් අසා රජ්ජුරුවෝ "එසේ කල ස්වාමිනි, මම බුද්ධශාසනයට ඇතුළත් වීම් ද නොවීම් ද" යි විචාළහ. එකල මහතෙරුන් වහන්සේ "මහරජ, තෙපි ශාසනයට ඇතුළත් නොවෙ" යි වදළසේක.

---

1. දිගාන්තරය - ABDGHJKL
   දිගාන්තය - K
   දිගාන්තරය - ක.කි.කැ.
2. මහාමච්චො - ACDFHJ
3. භික්ෂුණීන් වහන්සේ - මුද්‍රිත හැම. ස.
   භික්ෂුණීන් හා - L
4. භික්ෂුණීන් - ABCDEFGHJ මීණාසවා යති - පාලි
5. දස දහසෙක - මුද්‍රිත හැම ස.
   සහස්සං - පාලි
6. එතකුදු - පිටපත් හැම
7. රජ - පිටපත් හැම, ස.
8. කෙනකුන් - ACDFJ බෙ. ස.
   කෙනෙකු - ක.කි.කැ.

Non-Commercial Distribution

එබස් අසා රජ්ජුරුවෝ "ස්වාමීනි, සයානුකෙළක් ධන වියදම් කොට සුවාසුදහසක් විහාර කරවා මෙබඳු පූජාවක් කරවා දවස් පතා පස් ලක්‍ෂයක් ධන වියදම් කොට කුනුරුවන් පුදන මා වැනි ශ්‍රද්ධාවන්ත රජකු ශාසනයට හිමි නොවන කල ශාසනයට හිමියෝ කවුරු ද"යි විචාළහ. එවේලෙහි මහතෙරුන් වහන්සේ "මහරජ, යම් කිසි කෙනෙක් තමන්ට ද දියෙණි කෙනකුන් හෝ පුතණු කෙනකුන් හෝ ශාසනයෙහි මහණ කරවා ලූනම් ඔහු මය ශාසනයට හිමියෝ"යයි වදළසේක. එතෙපුල් අසා රජ්ජුරුවෝ සාසනයට ඇතුළත් වනු සඳහා ළඟ සිටි විසි හැවිරිදි මිහිඳු නම් පුතණුවන් මුහුණ බලා "කිමෙක්ද පුත, මහණවන්ට පිළිවන් ද" යි විචාළහ. කුමාරයෝ ද තමන්ගේ සුළුපිය වූ තිසස නම් යුවරජ්ජුරුවන් මහණ වූ දවස් පටන් තුමූ ද මහණ වනු කැමැති ව උත්සාහ රජ්ජුරුවන් කී වචනය අසමින් ම සතුටු ව "යහපත දේවයන් වහන්ස, දැන් ම මා මහණ කරවුව මැනවැ"යි කීහ. මෙසේ පුතණුවන් කී බස් අසා දෙවැනි ව සමීපයෙහි සිටි අටළොස් හැවිරිදි වූ සංඝමිත්‍රා[1] නම් දියෙණියන් මුහුණ බලා "කිමෙක් ද දියෙණියෙනි, තෙපිත් මහණ වවු ද"යි විචාළහ. එකල්හි ඒ කුමාරිකාවෝ ද තමන්ගේ ස්වාමිපුත්‍ර වූ අග්ගිබ්‍රහ්ම නම් කුමාරයන් මහණ වූ තැන් පටන් තුමූ ද මෙහෙණිසස්නෙහි මහණවනු කැමැති ව උත්සාහ රජ්ජුරුවන්ගේ බස් අසා[2] "යහපත පියාණන් වහන්ස, මම ද මෙහෙණිසස්නෙහි මහණ වෙමි" යි ගිවිස්සාහ. මෙසේ රජ්ජුරුවෝ තමන් දරු දෙදෙන සිත් ලදින් සතුටු ව සඞ්ඝයා වහන්සේ සමීපයට ගොස් "ස්වාමීනි, මාගේ මේ දරු දෙදෙනා මහණ කරවා ශාසනයට මා ඇතුළත් කොට වදළ මැනවැ"යි කීහ. එකල භික්ෂූන් වහන්සේ යහපතැයි ගිවිස මොග්ගලීපුත්තතිස්ස මහතෙරුන් වහන්සේ උපාධ්‍යාය කොට මහාදෙව නම් මහතෙරකෙනකුන් වහන්සේ ආචාරී[3] කොට මිහිඳු කුමාරයන් මහණ කරවා වදළ සේක. නැවත මජ්ඣන්තික නම් මහතෙරකෙනකුන් වහන්සේ ආචාරී[3] කොට උපසම්පද කැරවූ සේක. එකල ඒ මිහිඳු නම් වහන්සේ එම උපසම්පද මළුවෙහිදී ම සිවු පිළිසිඹියා පත් රහත් බවට පැමිණිසේක. ඉක්බිති සඞ්ඝමිත්‍රා[4] නම් දියණියන් ද මෙහෙණි සස්නට ගෙන ගොස් ආයුපාලි නම් රහත් මෙහෙණිනිකෙනකුන් උපාධ්‍යාය කොට ධම්පාලි[5] නම් මෙහෙණිනිකෙනකුන් ආචාරී[6] කොට මහණ කරවූහ. පසුව ඒ සංඝමිත්‍රා නම් මෙහෙණින් වහන්සේ උභතො සංඝයා කෙරෙහි උපසම්පද ව රහත් වූ සේක. මෙහි ම මතු කියන පරිද්දෙන් ලඞ්කාද්වීපයට මහොපකාරී ව ශාසනය බබුළුවන සඞ්ඝමිත්‍රාය මිහිඳුය යි යන ඒ රාජනන්දනයෝ දෙදෙන ධර්මාශෝක රජහට සවැන්නෙහි මහණ වූහ. කියනලද මැයි මහාවංශයෙහි;

උභො සාසනපජ්ජෝතා ලඞ්කාදීපොපකාරිනො,
ඡට්ඨෙ වස්සෙ පබ්බජිංසු - ධම්මාසොකස්ස රාජිනො -යි.

---

1. සම්මිත්ත - CFJ
   සංඝමිත්ත - L
   සංඝිත් - බෙ.ස
2. රජ්ජුරුවන් කී වචනය අසමින් ම සතුටු ව - ADEGH
3. ආචාරී - පිටපත් හැම.
   ආචාර්ය - මුද්‍රිත හැම.ස.
4. සංඝිත්ත - AJ
5. ධර්මපාලිනී - KL
6. ආචාරී - පිටපත් හැම
   ආචාරිනි - මුද්‍රිත හැම

Non-Commercial Distribution

එයින් මිහිඳු නම් වහන්සේ උපසම්පද වූ තැන් පටන් තමන් වහන්සේගේ උපාධ්‍යායයන් වහන්සේ කෙරෙහි ධර්මවිනය උගන්නාසේක් සඞ්ගායනා දෙකට[1] ආරූඪ වූ අර්ථකථා සහිත ස්ථවිරවාද සියල්ල ම තුන් අවුරුද්දක් ඇතුළත ඉගෙන තමන් වහන්සේගේ උපාධ්‍යායයන් වහන්සේට අනවැසි වූ දහසක් භික්ෂූන් වහන්සේට නායක වූ සේක. එකලට[2] ධර්මාශෝක රජ්ජුරුවන් ඔටුනු පැළැඳියේ නව හවුරුද්දෙක් වීය.

එකල එයින් පූර්වභාගයෙහි පැළලුප් නුවරින් නික්ම වෙනෙහි ගිය නෙසාද පුත්‍රයකු නිසා කුන්තානි නම් කින්නරාව කුසින් උපන් හෙයින් කුන්තපුත්‍ර නම් වූ තිස්සය සුමිත්‍රය යි යන කුමරුවෝ දෙදෙන වැඩිවිය පැමිණ වරුණ නම් මහතෙරුන් වහන්සේ කෙරෙහි මහණ ව නොබෝ කලෙකින් විදර්ශනා වඩා රහත් ව ඵල සමාපත්ති සැපයෙන් දවස් යවති. එසමයෙහි එයින් වැඩිමහලු තිස්ස නම් රහතන් වහන්සේ අශෝකාරාමයෙහි වැඩවසනසේක් ගෝනුසු විෂයකින් ආතුර ව ඒ ව්‍යාධියට ප්‍රතිකාර පිණිස අයත්න ලෙස භික්ෂාව්‍රතයෙන් පතක් පමණ ගිතෙල් නොලැබ විෂවේදනාවෙන් පිරිහුණාවූ ආයුසංස්කාර ඇති ව "සියලු කෙලෙසුන් නසා සංසාරබන්ධනයෙන් මිදී සිටි අප වැන්නවුන්ට පවා මෙසේ බෙහෙත් පසය දුර්ලභ විය. එබැවින් විශ්වාස නොකළ හැකි සසර මලෙහි දවටී සිටි සංසාරභීරුක භික්ෂූන් විසින් අප්‍රමාද ව මහණධම් පුරා සංසාරබන්ධනයෙන් මිදී අතිශාන්ත වූ නිවන්පුරයට වන මැනවැ"යි භික්ෂූන් වහන්සේට අවවාද කොට අහසට පැනනැගී පලක් බැඳ වැඩහිඳ බණ වදරා "මේ මා පිරිනිවි ඇසිල්ලෙහි මෙම ශරීරයෙන් තෙජොකඳෙක්[3] නැඟී සියල් සිරුරු දවා ධාතුමාත්‍රයක් ශෙෂකොට නිවේව" යි අධිෂ්ඨාන කොට තෙජොකසිණ සමාපත්තියට සමවැද පිරිනිවිසේක. එකල්හි ඔබගේ අධිෂ්ඨාන බලයෙන් එම ශරීරාභ්‍යන්තරයෙන් ගිනිකඳෙක් නැඟී සකලශරීරයෙහි සම් මස් නහර නිශ්ශෙෂ කොට දවා අළු පමණකුත් නැති ව ධාතුමාත්‍රයෙක් ශෙෂ වීය. එපවත් අසා මහ සෙනඟ සමඟින් ධර්මාශෝක රජ්ජුරුවෝ අශෝකාරාමයට අවුත් මඟුලැතු පිට සිට ඒ ධාතූන් වහන්සේ අහසින් බාගෙන ධාතුසත්කාර කොට ඉක්බිති "මහතෙරුන් වහන්සේ කවර ව්‍යාධියකින් කාලක්‍රියා කළසේක් ද"යි විචාරා තත් වූ පරිද්දෙන් අසා "මහ ඉසුරුමත් ත්‍යාගී[4] වූ මා වැනි ශ්‍රද්ධාවන්ත පින්වත් රජකු රාජ්‍යය කරමින් සිටියදී සිල්වතුන් වහන්සේට මෙසේ බෙහෙත් පසය දුර්ලභ වන්ට කාරණ කිම්ද"යි කළකිරුණු සිත් ඇති ව සතර වහසල් දෙර මහ පොකුණු බිඳුවා උළින් බැඳ සුණු ගස්වා යට කී පරිද්දෙන් නුවරමැද අධිකරණ ශාලාවෙන් දවස් පතා ලබන ධන ලක්ෂයෙන් ගිතෙල් මී උක්සකුරු ආදී වූ නොයෙක් බෙහෙත් බඩු ගෙන පොකුණු පුරවා සංඝයා වහන්සේට සරුප් ලෙස[5] දෙවූහ. ඉක්බිති කුන්තපුත්‍ර සුමිත්‍ර නම් මහතෙරුන් වහන්සේ ද සක්මනට නැඟී සක්මන් කරමින් සිට ම කාලක්‍රියා කළ සේක; මෙසේ ඒ දෙදෙනාවහන්සේගේ ඒ පෙළහැර දක බොහෝ දෙන ශාසනයෙහි ප්‍රසන්න වූහ. මෙසී මේ කුන්තපුත්‍ර වූ මහතෙර දෙදෙනාවහන්සේ ධර්මාශෝක රජ්ජුරුවන්ට අටවන්නෙහි පිරිනිවිසේක. කියනලද මැයි මහාවංශයෙහි;

1. දෙක - ACDFJ
2. එකල - ABCDEGHKL.මුද්‍රිත හැම.
3. තෙජස්කන්ධයක් - ක.කි.කඳ.ම
4. මහ ඉසුරු මහත් ත්‍යාගී - GHKL
5. වස් සරුප් ලෙස - L

Non-Commercial Distribution

කුන්තපුත්තා දුවෙ ථෙරා - තෙ ලොකහිතකාමිනො,[1]
නිබ්බායිංසු අසොකස්ස - රඤ්ඤො වස්සම්හි අට්ඨමෙ-යි.

මෙසේ ශාසනයෙහි[2] විශෙෂ[3] දක[4] මෑතභාගයෙහි ශාසනයෙහි ප්‍රසන්න වූ මහජනයන් විසින් දවස් පතා මහොඝයක් මෙන් පවත්වන ලද මහත් වූ ලාභසත්කාර දක පළමු ලාභයෙන් පිරිහුණු තීර්ථකයෝ ලාභසත්කාර නිසා ශාසනයෙහි තුමූ ම මහණ ව නොයෙක් ශාසනාර්බුද ඉපදවූහ. එකල ධර්මාශොක රජ්ජුරුවෝ මොග්ගලිපුත්ත[5] තිස්ස මහතෙරුන්වහන්සේට සහාය ව සැට දහසක් පමණ වූ ශඨ කූට කෛරාටික ලුබ්ධ මායාකාරක දුශ්ශීල තිත්ථික මහණුන් බුද්ධශාසනයෙන් පිටත් කොට සිවුරු හරවා එතැන්හි රැස් වූ සැටලක්‍ෂයක් භික්‍ෂූන් වහන්සේ අතුරෙන් දහසක් දෙනා වහන්සේ ලවා තමන්ට සතළොස් වන්නෙහි තුන් වන ධර්මසඞ්ගායනාව කරවා මහපොළොව ගුගුරුවමින් නොයෙක් ලොකොත්සව පැවැත්වූහ. කියනලද මැයි මහාවංශයෙහි;

සාධුකාරං දදන්තීව - සාසනට්ඨිතිකාරණා,
සංගීති පරියොසානෙ - අකම්පිත්ථ මහාමහී-යි.

මේ මෙහි සංක්‍ෂෙප කථාව ය; විස්තර කථාව වනාහි මහාවංශයෙහි කී පරිද්දෙන් ම දතයුතු.

මෙසේ ඒ ධර්මාශොක රජ්ජුරුවෝ පූර්වජාතියෙහි කුන්සිත පිරිසුදු ව[6] දුන්නාවූ මධුදානයෙහි අනුසසින් සියලු සම්පත්තීන් සමෘද්ධ ව දසදහසක් යොදුන් මුළු දඹදිවට එකනායක ව අනුපමෙය්‍ය වූ රාජ්‍ය ශ්‍රී විඳිමින් තව ද පහනින් පහනට යන්නා සේ මත්තෙහි ද දෙවු මිනිස් සැපත් හා නිවන්පුර සිරි විඳිනා පරිද්දෙන් නොයෙක් ලෙස බුදුසසුන් බබුළුවා පින් රැස් කළහ. කියන ලද මැයි මහාවංශයෙහි;

සම්පුණ්ණත්තා අයං තිසෙසා - චෙතනායො[7] මධුප්පදෙ,
සබ්බත්ථ සබ්බද සබ්බ - සම්පත්තිමහිසම්භුනි -යි.

තව ද පළමු මී දන් දෙන සමයෙහි මැදිබෑ වෙළෙඳණෝ වනාහි "පසේබුදුන් මුහුදින් එතෙර දමා පියව"යි කී අකුශලයෙන් දඹදිව ඉපදගත නොහී මුහුදින් මෙතෙර ලඞ්කාද්වීපයෙහි අනුරාධපුර නුවර මුටසීව නම් රජහට දෙවනපෑතිස් නම් පුත් ව උපන්හ. ඒ මුටසීව රජ්ජුරුවන්ගේ වනාහි මහත් වූ කුශලයෙන් හා ගුණානුවණින් යුක්ත ව ඔවුනොවුන්ට හිතකාමි වූ පුත්‍රයෝ දශදෙනෙක් හා දූ දෙදෙනෙක් වූහ. ඔහු හැමදෙන ම කයින් සිතින් සමඟි ව ඔවුනොවුන් කෙරෙහි පෙම් සහිත ව නිත්‍ය සනෙහාශයෙන් එකාන්මික ව වෙසෙති. ඔවුන් අතුරෙන් දෙවන දෙවනපෑතිස් නම්

1. ලොක හිතකාරිනො - A බෙ.ම.
2. ශාසන - EFGJ
   ශාසනය ම - B
3. විශෙෂය - GH
4. දක දක - ABCDFGHL
5. මොග්ගලි පුත් - AE
6. කුන්සිත පහද පිරිසිදු ව - මුද්‍රිත හැම.ස.
7. චෙතනා සො - BGH
   චෙතයො - A
   චෙතනාවො - D

Non-Commercial Distribution

රජ්කුමර කුශලබලයෙන් හා යශ තෙජසින්[1] වැඩිතරම් ව වෙසෙයි. ඉක්බිති මෑතභාගයෙහි මුටසීව රජ්හු සැටවයස් පිරී කාලක්‍රියා කළ කල්හි මහ ඇමැතියෝ එක් ව අභය රාජකුමාරය දෙවනපෑතිස්ස මහානාගය උත්තියය මත්තාභයය සූරතිස්සය යනාදි දසබෑ රජ්කුමරුවන්ගෙන් එම දෙවනපෑතිස් කුමාරයන් ඔටුනු පළඳවා රාජ්‍යයෙහි පිහිටුවූහ[2]. ඔටුනු පැළඳීම හා සමඟ ඒ දෙවන පෑතිස් රජහට අනෙකප්‍රකාර වූ ආශචර්‍ය්‍යී පහළ විය[3]. කෙසේ වූ ද යත්;

මේ සියලු ලඞ්කාවීපයෙහි ඇති තාක් නිධාන හා ඉන්ද්‍රනීල මාණික්‍යාදි වූ නොයෙක් රත්නයෝ පොළෝතෙලෙන්[4] උඩ නැඟී මිහිමඩල පුරා සිට ගත්හ. ලඞ්කාද්වීප සමීපයෙහි නැසුණාවූ නැව් ආදියෙහි වස්තු හා එම මුහුදින් උපන්නා වූ නොයෙක් රත්නයෝ වෙරළ[5] ගොඩ ගැසී සිට ගත්හ. සීගිරි[6] පර්වතප්‍රාන්තයෙහි එක් හුණපඳුරෙක රථකැවිටි පමණ වූ හුණදඬු තුනෙක් උපන; එයින් එක් හුණ දණ්ඩක් ලතායෂ්ටි නම, එක් හුණ දණ්ඩක් පුෂ්ප යෂ්ටි නම, එක් හුණ දණ්ඩක් ශකුනයෂ්ටි නම, ඒ හුණදඬු රිදීමය වෙයි. එයින් ලතායෂ්ටියෙහි උපන් ලිය රන්වන් පැහැයෙන් බැලුබැලුවන්ට සිත්කලු ව[7] සනරත් ලියයක් ව වැටහෙයි. කුසුම යෂ්ටියෙහි රන්වන් රත් නිල් සුදු කළු ආදි වූ නානා වර්ණ දියෙහි ගොඩෙහි පිපෙන නොයෙක් පුෂ්පජාතිහු[8] නටු පෙති රෙණු ආදි වශයෙන් විභාගවත් ව බැලු බැලුවන්ට වෙන වෙන ම තෝරී පෙනෙන්නාහ. ශකුන යෂ්ටියෙහි හංස මයුර ජීවංජීවක සැදිකුකුළු[9] විළිකුකුළු[10] සක්වාලිහිණි ආදි වූ පක්ෂිජාතීන් හා සිංහව්‍යාඝ්‍ර දිවි වලස් ආදි වූ සිවුපාජාතිහු ද යන සියලු සත්වයෝ ම බැලුබැලුවන්ට සජීවයන් මෙන් විභාගවත් ව පෙනෙන්නාහ. එසේ හෙයින් කියන ලදී;

ජාත[11] පබ්බතපාදම්හි - තිස්සො ච වෙළුයට්ඨියො,
ජාතා රථපතොදෙන - සමානා [පරිමාණතො][12]

තාසු එකා ලතායට්ඨි - රජතාභා තහිං ලතා,
සුවණ්ණවණ්ණා රුචිරා - දිස්සනෙත තා[13] මනොරමා.

එකා කුසුමයට්ඨි තු - කුසුමානි තහිං පන.
නානානි නානා වණ්ණානි - දිස්සනෙත ඵුල්ලානිච

එකා සකුනයට්ඨි තු - තහිං පක්ඛිමිගා බහූ,
නානා ච නානාවණ්ණා ච - සජීවා විය දිස්සරෙ[14] - යි.

තව ද සමුද්‍රයෙන් අනෙකවිධ වූ මුතුජාති ද පහළ විය. ඒ කවර මුතුජාති ද යත්? ඇලිඅසුන්ගේ ආකාර ඇති අශ්ව නම් මුතුය, ඇළි ඇතුන්ගේ ආකාර ඇති ගජ නම් මුතුය, එසේ ම රථචක්‍රාකාර ඇති රථ නම් මුතුය. ඇඹුලඵලාකාර ඇති

---

1. යශස් තෙජසින් - මුද්‍රිත හැම.
2. පිහිටවූහ - BCG
   පිහිටිවූහ - A
   සිටිවූහ - F
3. වූහ. - ACDFJ, කි.ක.බෙ.
4. පොළොව පළා - ක.කි.සැ.ම.
5. වෙරළට - J බෙ.ම.ස.
6. සිරි - D
   සැගිරි - කි.සැ අධොලිපි
   සාගිරි - සැ අධොලිපි
7. සිත් කලු - F
   සිත්කලු වූ - ක.කි.සැ.ම.
8. පුෂ්පජාතිහු ද - BGHKL
9. සැලි කුලු කුකුළු -BEGHKL ස.
10. විලිකුළු - ABEGHJKL ස.
11. ජාත - බෙ. ම. මහාවංස
12. පරිණාහතො - ACDEFGHJKL
    පරිණාහතො - B
13. දිස්සනෙතති - ABCDEGHJKL
14. දිස්සරො - ස.

Non-Commercial Distribution

ආමලක[1] නම් මුතුය, අත ලන වළලු බඳු වූ වලය නම් මුතුය; ඇඟිල්ලෙහි ලන මුදු බඳු වූ අඞ්ගුලිවෙඨක[2] නම් මුතුය, කුඹුක් ඵල වැනි අණ්ඩාංශ[3] වූ කකුධඵල නම් මුතුය, සවභාවයෙන් ලොව පවත්නා පියවි මුතු යයි මෙසේ අට ජාතියෙක මුතු පහළ විය, ඒ මුතු අට ජාති ම දෙවනපෑතිස් රජ්ජුරුවන්ගේ පින්බලයෙන් මුහුදින් ගොඩනැඟී වෙරළ අස වැටියක් සේ සිට ගත. ඒ සියලු මුතු හා යට කී ඉන්‍ද්‍රනීලාදි වූ නොයෙක් රත්නජාතයන් ද ලතායෂ්ටි ආදි වූ හුණයෂ්ටි තුන ද යන සියල්ල ම දෙවනපෑතිස් රජ්ජුරුවන් පළමුවෙන් ඔටුනු පැළඳි පතියක් ඇතුළත සමීපයට ගෙනහැර දක්වූහ.

එකල එයින් පූර්වභාගයෙහි ම දෙවන පෑතිස් රජ්ජුරුවන් හා දඹදිව ධර්මාශොක රජ්ජුරුවන් හා[4] දෙදෙන ඔවුනොවුන්ගේ සවරූප අසා උනුන් නොදක ම පූර්වහෙතු බලයෙන් අදෘෂ්ටමිත්‍ර ව වෙසෙති. එසේ හෙයින් දෙවන පෑතිස් රජ්ජුරුවෝ ඉතා ආශ්චර්යමත් වූ ඒ රුවන් සමූහය දක සතුටු ව "මුතුමැණික් ආදි වූ ඒ රත්නයන් හා ලතායෂ්ටි ආදි වූ සියල්ල ම මාගේ මිත්‍රයාණන්ට දෙව"යි අමාත්‍යයන් අතට දී ධර්මාශොක රජ්ජුරුවන්ට පඬුරු පිණිස[5] දඹදිවු යවූහ. ඒ දක ධර්මාශොක රජ් ජුරුවෝ සතුටු ව තමන්ගේ මඟුල්කඩුවය වල්විදුනාවය ශ්වේතච්ඡත්‍රය තලල්පටය රත්මිරිවැඩිසඟලය යන මේ පඤ්චරාජකකුධභාණ්ඩයන් හා අනිකුත් බොහෝ මාහැඟි පඬුරු දී "මාගේ මිත්‍රයාණන්ට මෙයින් අභිෂෙක මඟුල් කරව" යි කියා එවූහ. හුදක් ආමිස පඬුරු පමණක් ම එව්වාහු නොවෙති; දහම් නමැති පඬුරු ද එවූහ. ඒ කවරේ ද යත්;

එම්බා රජ්ජුරුවෙනි, මම බුදුන්ගේ ධර්මය අසා බුද්ධරත්නය ධර්මරත්නය සඞ්ඝරත්නය යන මේ තුනුරුවන් සරණ[6] ගෙන උපාසක වීමි; එසේ හෙයින් පින්වත් රජ්ජුරුවනි, තෙපිත් මා සේ ම උතුම් වූ තුනුරුවන් කෙරෙහි පැහැද සැදැහැයෙන් තිසරණ ගෙන උපාසක ව දශවිධ කුශලධර්මයෙහි යෙදී වාසය කරව යි කියා එවූහ. කියන ලද මැයි;

> අහං බුද්ධං ච ධම්මං ච - සඞ්ඝං ච සරණං ගතො,
> උපාසකත්තං වෙදෙසිං[7] සක්‍යපුත්තස්ස සාසනෙ.
>
> ඉමෙසු තිසු වත්ථූසු උත්තමෙසු නරුත්තම,
> චිත්තං පසාදයිත්වාන - සද්ධාය සරණං වජ -යි.

---

1. ආමලකී -ක.කි.ස.,ම
2. අඞ්ගුලිවෙය - ACJL
3. අණ්ඩාංග - CDFGHKL ක.කි.ස.
4. යන - ක.කි.ස.
5. කොට - BDEGHKL
6. තුන්සරණ -CEGHJ, ස
7. දෙසෙසිං - ACFJ, මහාවංස

මෙසේ රජහු විසින් දෙනලද පඬුරු ගෙන ඇමැතියෝ නැවත මේ ලඞකාද්වීපයට අවුත් දෙවන පෑතිස් රජ්ජුරුවන්ට දෙවැනි ව අභිෂෙකමඟුල් කැරවූහ. එසමයෙහි මොග්ගලිපුත්ත තිස්ස මහතෙරුන් වහන්සේ යට කී පරිද්දෙන් තුන්වන ධම් සඞගායනාව නිමවා මතු බුදුරජාණන් වහන්සේගේ ශාසනය කොයි පිහිටා දේ හෝයි බලන සේක් ප්‍රත්‍යන්තදෙශයෙහි පිහිටන බව දැක ගිය ගිය තැන්හි අනුබුඞ ව බණ කියන්ට සමර්ථ වූ මහත් සෘඞිප්‍රාතිහාය්‍ය ඇති මහාස්ථවිරවරයන් කැඳවා "එම්බා ඇවැත්නි, එන දවස දඹදිව මධ්‍යදෙශයට වඩා ප්‍රත්‍යන්ත දෙශවල[1] ජනසමෘඞි ඇති වෙයි. එබැවින් තොප හැමදෙනාට මෙවැනි නිවන් සැපතක් සිඞකොට දීලූ බුදුරජාණන්වහන්සේගේ ත්‍රිවිධ ශාසනය පස්වාදහසක් මුළුල්ලෙහි අඛණ්ඩ ව පවත්නා පරිද්දෙන් ප්‍රත්‍යන්ත දෙශවල ශාසනය පිහිටුවා ලව ̈ යි ඒ ඒ දෙශයට භික්ෂූන් වහන්සේ නිල කොට 'නික්මවූසේක. කෙසේ ද යත්;

මජ්ඣන්තික නම් මහතෙරකෙනකුන් වහන්සේ කාශ්මීර ගන්ධාර දෙශයට නිල කොට මහාදෙව නම් මහතෙරකෙනකුන් වහන්සේ මහිසමණ්ඩල නම් දෙශයට නිල කොට රක්ඛිත නම් මහතෙරකෙනකුන් වහන්සේ වනවාසී නම් දෙශයට නිල කොට යොනකධම්රක්ඛිත නම් මහතෙරකෙනකුන් වහන්සේ අපරන්තක නම් දෙශයට නිල කොට මහාධම්රක්ඛිත නම් මහ තෙරකෙනකුන් වහන්සේ මහාරාෂ්ට්‍ර නම් දෙශයට නිල කොට මහාරක්ඛිත නම් මහතෙරකෙනකුන් වහන්සේ යොනකදෙශයට නිල කොට මජ්ඣිම නම් මහතෙරකෙනකුන් වහන්සේ හිමවන්ත නම් දෙශයට නිල කොට සෝණය උත්තරය යන මහතෙර දෙදෙනකුන්[2] වහන්සේ සුවර්ණභූමි නම් දෙශයට නිල කොට තමන් වහන්සේගේ සද්ධිවිහාරික වූ මිහිඳු නම් මහතෙර කෙනකුන් වහන්සේ ලඞකාද්වීපයට නිල කොට හැමදෙනා වහන්සේ ම පස් පස් දෙනා වහන්සේ බැගින් ඒ ඒ දෙශයට නික්මවූ සේක.

එකල හිමාලය වනප්‍රාන්තයෙහි කාශ්මීර ගන්ධාර දෙරට ගොයම් පීද පැසුණු සමයෙහි එම දේශයට[3] මැද හිමවි අබියස[4] ආරවාළ නම් විල වසන්නාවූ ආරවාළ නම් නාගරාජයෙක් පහණ වැසි වස්වා මහ වතුරෙන් කොළ ගොයම් උපුල්වා ගෙන ගොස් මුහුද හෙළා නසා පියයි. එසේ හෙයින් ඒ නාරජහු දමනය ලා ලෝවැඩ වඩනු සඳහා යටකී මජ්ඣන්තික නම් මහතෙරුන් වහන්සේ අශොකාරාමයෙන් අහසට පැනනැඟී හිමවත ඒ ආරවාළ නාරජහු වසන ආරවාළ නම් විලට වැඩ ඉඳුනිල්මිණි ගල්තලක් මත්තෙහි සක්මන් කරන්නා සේ දියපිට සක්මන් කරන සේක; සමහරවිට වැඩසිටිනා සේක; සමහරවිට[5] හිඳිනා සේක; සමහරවිට[6] සැතපෙන සේක. එකල්හි නාරජ මහතෙරුන්වහන්සේ දැක "මාගේ විල නිර්මල වූ ජලය තමාගේ පාදරජසින් අපවිත්‍ර කරනුයේ මේ[7] කොයි මුඩමහණෙක්[8] ද"යි කිපී ආකාශයෙහි

1. ජනපදවල - BEGH
2. දෙදෙනකු - ABCEGHKL
3. දේශයට - ABCHJ
   දේශඅබියට - මුද්‍රිත හැම, ස.
4. පියස - AD
5. සමහර විටක. - BCEGHL
6. සමහර විටක - BGHL
7. කොල මේ - C
8. මුඩුමහණෙක් - BCEGH

Non-Commercial Distribution

නොයෙක් භයඞ්කර වූ විකාර නිර්මිත කොට දක්වාලීය. එකල දෙකන් අගුළු එළන්නා සේ ඒ ඒ දිග්භාගයෙන් මහ සුළඟ හමන්නට වන; හාත්පස මහරුක් මුලිහිදිර කඳුපතර[1] වෙන වෙන බිඳිබිඳී උඩනැගී අහස්කුස බමා බස්නට වන; අවට සිටි මහ ගල්කුළු බිඳගෙන සතරදිගින් ගුගුරා දිවන්නට වන; දශ දිගන්තරය[2] එකපැහැර අඳුරු කෙරෙමින් පියගණින් මහමේකුළු නගා ආකාශය ගුගුරන්ට පටන්ගත; දසදිග මහත් ගිනිසුළු ගසන්නා සේ එකපැහැර විදුලිය කැළ නික්මෙන්ට වන; දෙකන් බිහිරි කරන්නා[3] සේ මහත් ගර්ජනා කෙරෙමින් එ ඒ තන්හි දහස් ගණින් සෙණගසන්ට වන; එදවස් ආකාශකුහරය බිඳුණාක් මෙන් අනවකාශ ව තල් පොල් කඳ පමණ මහත් ජලධාරාවෝ වස්නට[4] වන්හ. ළදරු නාකුමරුවෝ භයඞ්කර වෙස් මවා ඒ ඒ දිගින් දිව එන්ට වන්හ; නාරජ්ජුරුවෝ තුමූ ද එකපැහැර විසගිනි[5] හරිති; විසදුම් හරිති; අනෙකප්‍රකාර ආයුධවර්ෂා වස්වති; "ජීනා ගිනන පටධර වූ මේ කොයි මුඩමහණෙක්ද" යනාදීන් කර්කශ වූ වාක්පරුෂයෙන් මහ තෙරුන් වහන්සේ භයගන්වා පලවම් යි නොයෙක් ලෙස බෙණෙති; කොල, වහා එව, නොහරුව, වටකරව, අල්වව, මේ මුඩමහණු[7] දෙකකුල ගෙන පරසක්වල ගසව, පිටිකර අල්වා දමව යනාදීන් තමන්ගේ නාග සෙනාවට විධානකොට කැඳවමින් සමීප ව අවුත් වන්හ. මහ තෙරුන් වහන්සේ ඒ සියලු භයංකර විකාර නාක් තමන් වහන්සේගේ ඍද්ධිබලයෙන් ප්‍රතිබාහනය කොට නා රජහට වදරන සේක්;

සදෙවකොපි චෙ ලොකො - ආගන්ත්වා තාසයෙ මමං.[8]
න මෙ පටිබලො අස්ස - ජනෙතුං භය භෙරවං.

සචෙපි ත්වං මහිං සබ්බං - සසමුද්දං සපබ්බතං,
උක්ඛිපිත්වා මහානාග - ඛිපෙය්‍යාසි මමූපරි.

නෙව මෙ සක්කුණෙය්‍යාසි - ජනෙතුං භයභෙරවං,
අඤ්ඤදත්ථු[9] තවෙව" ස්ස[10] විඝාතො උරගාධිප - යි.

යනාදීන් තමන්වහන්සේගේ මහිම දක්වා වදාළසේක. එකල්හි නාරජ මහතෙරුන් වහන්සේගේ ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය දක සුරවීර තෙපුල් අසා අන් කිසිවක් කිය කළ නොහී තමා කළ කී නිෂ්ඵල ව්‍යායාමය පිනසිතා කනස්සලු ව ලජ්ජාවෙන් කරබාගෙන සිටියේය. එවේලෙහි මහතෙරුන්වහන්සේ ප්‍රඥාවට සුදුසු වූ ධර්මදෙශනාවෙන් නාරජහට මෙලෝ පරලෝ දක්වා කුශලකරණයෙහි සමාදන් කරවා වඩවඩා කුශලයෙහි ඔහු සිත තියුණු කරවා විද්‍යමාන ගුණයෙන් ප්‍රසංශා කළසේක. එකල නාරජ්ජුරුවෝ සුවාසූ දහසක් නයින් හා ලක්ෂගණින් යක්ෂ රාක්ෂස[11] ගරුඩ

1. කඳ පතර - B
2. දිගාන්තය - DEFGHJKL
   දිගාන්තය - A
   දිශාන්තරය - ක.කි.කැ.
3. කරවන්නා - GH
4. වසින්ට - BGHK
5. විසවිනි - EGHKL
6. මුඩුමහණෙක් -BCDEGH
7. මුඩුමහණු - CDE.
   මුඩුමහණු - BGH
8. තාසයෙය්‍ය මං - ක.කි.කැ.ම.
9. අඤ්ඤදත්‍ථු - CDH.බෙ.
   අඤ්ඤදත්ථු - BG
   අඤ්ඤදත්ථුං - E
10. තවෙවස්සු - KL
11. රාක්ෂසොරග - කි.කැ.ම.
    රක්ෂොරග - ක.

Non-Commercial Distribution

ගාන්ධර්වාදීන් හා සමඟ සරණයෙහි[1] පිහිටා පන්සිල් සමාදන් වූහ. පංචක නම් යක්ෂසේනාධිපතීහු හා හාරිති[2] නම් යක්ෂණිය හා පන්සියක් යක් කුමරුවෝ සෝවාන් පෙළෙහි පිහිටියහ. ඉක්බිති මහතෙරුන්වහන්සේ එසියලු නාගයන් හා යක්ෂ රාක්ෂය ගරුඬ ගාන්ධර්වයන් සමීපයට කැඳවා;

මා දානි කොධං ජනයිත්ථ - ඉතො උද්ධං යථා පුරෙ,
සස්සඝාතඤ්ච මා කත්ථ - සුඛකාමා හි පාණිනො;
කරොථ මෙත්තං සත්තෙසු - වසන්තු මනුජා සුඛං.

යනු හෙයින් "එම්බා, කිසි කෙනකුන් කෙරෙහි ක්‍රොධ නොකරව; මනුෂ්‍යයන් තමන්ගේ ප්‍රාණාරක්ෂා පිණිස මහොත්සාහයෙන් ඇතිකොට ගත් ශස්‍යජාතයන්[3] නොනසව; සියල්ලවුන් කෙරෙහි මෛත්‍රී කරව" යනාදීන් අවවාද කළසේක. එකල ඔහු හැමදෙන ම "යහපත ස්වාමීනි"යි මහතෙරුන් වහන්සේගේ අවවාද මුදුනෙන් පිළිගත්හ. නාරජ්පුරුවෝ තමන් හිඳිනා මනහර රුවන් ආසනයක් ගෙන්වා මහතෙරුන් වහන්සේ එහි වඩාහිඳුවා පසඟ පිහිටුවා වැඳ පවන් පතක් ගෙන සලමින් මහතෙරුන් වහන්සේ සමීපයෙහි සිටියහ. එකෙණෙහි කාශ්මීර ගන්ධාරදෙදෙශවාසීහු[4] තමන් අවුරුදු පතා නාරජහට දෙන පුදපඬුරු ගෙන්වා ගෙන ආවාහු මිණිපලඟ මත්තෙහි වැඩහුන් මහතෙරුන්වහන්සේ හා පිළිවෙත් සරු ශ්‍රද්ධාවන්ත හුදියකු සේ ශාන්තදාන්ත ව සමීපයෙහි සිටි නාරජ්පුරුවන් දැක "අපගේ නාරජහට වඩා මහතෙරුන් වහන්සේ ම මහත් වූ ඍද්ධිබල[5] ඇතිසේකැ"යි මහතෙරුන් වහන්සේ වැඳ එකත්පස් ව උන්හ. එවේලෙහි මහතෙරුන් වහන්සේ ඔවුන්ට සංයුත්සඟියෙහි සළයින්වග බුදුන් වදළ ආසිවිසොපම සූත්‍රයෙන් බණ වදළසේක. එකල් අසූ දහසක් ප්‍රාණීහු සෝවාන් වූහ. ලක්ෂයක් පුරුෂයෝ මහණවූහ. එතැන් පටන් කාශ්මීර ගන්ධාර දෙරට කාෂාය වස්ත්‍රයෙන් බබළන්නාක් මෙන් ශොභමාන විය. එසේ හෙයින් කියලදී;

ගන්ත්වා කස්මීර ගන්ධාරං - ඉසි මජ්ඣන්තිකො තදා,
රුට්ඨං නාගං පසාදෙත්වා - මොචෙසි බන්ධනා බහූ -යි.

තව ද දෙවන මහාදෙව නම් මහතෙරුන්වහන්සේ මහි[ස] මණ්ඩලයට[6] වැඩ මැදුම්සඟියෙහි උපරිපණ්ණාස වදළ දෙවදූත සූත්‍රයෙන් බණවදරා සතලිස් දහසක් ප්‍රාණීන් නිවන් දක්වා සතලිස් දහසක් පුරුෂයන් මහණ කොට එහි ශාසනය පිහිටුවූසේක. තව ද තුන්වන රක්ෂිත නම් මහතෙරුන්වහන්සේ දහම් අනාවාස ව තුබූ වනවාසි[7] නම් දනවුවට[8] වැඩ අහස්කුස පුන්සඳක් සේ දිලිහි දිලිහී වැඩහිඳ සියලු සතුන්ට පෙනි පෙනී සංයුත්සඟියෙහි වදළ අනමතග්ගිය සූත්‍රයෙන් බණ වදරා

1. සරණසීල - EFIK
 සරණ සිල් - ABGH
 සරණ සීලයේ -L
2. හාරිති - BCDGHK
 හරිති - F
 හරිතී - AEL
 හාරිත - ක.සි.සං.ම.පාලි
3. සස්සජාතීන් - BGH
4. දේශවාසීහු - ACJL ක.සි.සං.ම.
5. ඍද්ධි -ABCDEGHJKL
6. මහිමණ්ඩලයට - පිටපත් හැම
7. වනවාස - ක.සි.සං.ම.
8. දනවු - KL

Non-Commercial Distribution

සැටදහසක් ප්‍රාණීන් නිවන් දක්වා සත්තිස් දහසක් මනුෂ්‍යයන් මහණ කොට පන්සියක් විහාර ඇති කරවා එහි සසුන් පිහිටුවූසේක. එසේ හෙයින් කියනලදී;

> ගන්ත්වාන රක්ඛිතත්ථෙරො - වනවාසිං[1] මහිද්ධිකො,
> අන්තලික්ඛෙ ඨිතො තත්ථ - දෙසෙසි අනමතග්ගියං -යි.

තව ද සතර වන යොනක ධම්මරක්ඛිත නම් මහතෙරුන් වහන්සේ අපරන්තක නම් ජනපදයට වැඩ අග්ගික්ඛන්ධොපම සූත්‍රයෙන් බණ වදරා සත්තිස් දහසක් ප්‍රාණීන් එකද නිවන් දක්වා රජකුලෙන්[2]ම දහසක් පුරුෂයන් හා සදහස් පන්සියයක් බිසෝවරුන් මහණ කරවා එහි ශාසනය පිහිටුවූසේක.

තව ද පස්වන මහාධම්මරක්ඛිත නම් මහතෙරුන් වහන්සේ මහාරාෂ්ට්‍ර නම් ජනපදයට වැඩ කුඩුගොත් සභියෙහි වදළ මහා නාරද කාශ්‍යප ජාතකයෙන් බණ වදරා එම ද සුවාසූදහසක් ප්‍රාණීන් අමාමහනිවන් දක්වා තෙළෙස්දහසක් මනුෂ්‍යයන් මහණ කොට එහි ශාසනය පිහිටුවා වදළසේක. එසේ හෙයින් කියන ලදී:

> මහාරට්ඨං ඉසි ගන්ත්වා - සො මහා ධම්මරක්ඛිතො,
> ජාතකං කථයිත්වාන - පසාදෙසි මහාජනං - යි.

තව ද සවන මහාරක්ඛිත නම් මහතෙරුන් වහන්සේ යෝනක දෙශයට වැඩ දික්සභිය ශීලස්කන්ධ[3] වර්ගයෙහි වදළ කාලකාරාමසූත්‍රයෙන් බණ වදරා එක්ලක්ෂ සත්තිස්දහසක්[4] ප්‍රාණීන් නිවන් දක්වා දසදහසක් පුරුෂයන් මහණ කොට දහස් ගණන් විහාර ඇතිකරවා මෙසේ යොනක දෙශයෙහි ශාසනය පිහිටුවූසේක.

තව ද සත්වන මජ්ඣිම නම් මහතෙරුන් වහන්සේ කාශ්‍යපගොත්‍ර ස්ථවිරයන් වහන්සේය ආලකදෙව ස්ථවිරයන් වහන්සේය දුන්දුභිස්සර ස්ථවිරයන් වහන්සේය සහස්‍රදෙව ස්ථවිරයන් වහන්සේය යන මේ [සතර[5]] මහාස්ථවිරයන් හා සමඟ හිමවන්ත දෙශයට වැඩ පළමුවන දම්සක්පැවතුම් සූත්‍රයෙන් බණ වදරා අසූකෙළක් ප්‍රාණීන් නිවන් දක්වා පඤ්ච මහා ස්ථවිරයන් වහන්සේ පස් රටක් පැහැදවූසේක. එකි එකී තෙර කෙනකුන් වහන්සේ කෙරෙහි ලක්ෂයක් ලක්ෂයක් බැගින් පස් ලක්ෂයක් පුරුෂයෝ මහණ වූහ. මෙසේ ඒ පස්දෙනා වහන්සේ පස් රටක් පහදවා සසුන් පිහිටුවූ සේක. එසේ හෙයින් කියනලදී;

---

1. වනවාසං - ක.කි.සැ.ම.
2. රාජකුලයෙන් - BGHKL
3. සීලක්ඛන්ධ - B ක.කි.සැ.ම
4. සතිස්දහසක් බෙ.ක.කි.සැ. සැත්තෑදහසක් - ම.
   සහස්සානි සත්තති - මහාවංස
5. පඤ්ච - පිටපත් හැම. ස.
   ගන්ත්වා චතූහි ථෙරෙහි දෙසෙසි මජ්ඣිමො ඉසි - මහාවංස

Non-Commercial Distribution

ගන්ත්වාන මජ්ඣිමත්ථෙරො - හිමවන්තං පසාදිය,
යක්ඛසෙනං ප[තා]සෙන්තො[1] - ධම්මචක්කං පවත්තයි - යි.

නව ද අටවැනි වූ සොණ නම් මහතෙරුන් වහන්සේ උත්තර නම් මහතෙරුන්වහන්සේ හා සමග සුවර්ණභූමියට වැඩිසේක. එකල එක් යකින්නක්[2] මුහුදින් නික්ම අවුත් එරට රජකුලෙහි උපනුපන් දරුවන් අල්වාගෙන සල්ව සල්වා කන්නීය. එදවසුදු රජකුලෙහි දරුකෙනෙක් උපන්හ. ඔවුන්ට රකවල් ගෙන සිටි මනුෂ්‍යයෝ තෙරවරුන් වහන්සේ[3] දක තමන් ස්වභාවයෙන් ම භික්ෂූන් නොහඳුනන හෙයින් රාක්ෂසයෝ දේහොයි සිතා ආයුධ ඇරගෙන තෙරවරුන් වහන්සේ[3] මරනු. කැමැති ව අවුත් වන්හ. ඔබ දෙදෙනා වහන්සේ ඔවුන් දක "තෙපි හැම කුමක් පිණිස ආයුධ ගෙන අවු ද" යි විචාළසේක. එකල "මේරට[4] රජකුලෙහි .උපනුපන් දරුවන් යක්ෂරාක්ෂසයෝ කා පියති. එසේ හෙයින් තොප හැම රාක්ෂසයනැයි සිතා මරන්ට ආම්හ"යි කීහ. එවේලෙහි මහතෙරුන්වහන්සේ "අපි රාක්ෂසයෝ නොවෙමු. ප්‍රාණඝාතාදි වූ සියලු පාපයන් දුරු කොට සියල්ලවුන් කෙරෙහි මෙත්[5] පතුරුවා එකභත්තික ව සිල්වත් ව කලණ ගුණයෙන් යුක්ත ව වසන්නාවූ ශ්‍රමණයම්හ" යි වදළසේක. එකෙණෙහි දරුවන් කන යකින්නී එදවස් රජකුලයෙහි[6] දරුවන් උපන් බව දන ඔවුන් අල්වාගෙන කා පියම් යි සිතා තමාගේ පිරිවර හා සමඟ මුහුදින් නික්ම අවුත් එතැන්හි පෙනී ගියාය. මනුෂ්‍යයෝ ඈ දක මහ තෙරුන් වහන්සේ වැඳ "ස්වාමීනි, මිනී කන යකිනී[7] එන්නීය යි භයින් මුරගාන්ට වන්හ. එවේලෙහි මහ තෙරුන් වහන්සේ රාක්ෂසයන්ට වඩා දියුණු ආත්මභාව ඇති ව[8] මහසෙනඟක් නිර්මිත කොට පිරිවර සහිත වූ යකින්න මධ්‍යකොට දෙපිටින් වට කළ සේක, එකල පිරිවර හා සමඟ යකිනි[7] සිතන්නී "එකාන්තයෙන් ම මොවුන්ට මේ භූමිස්ථානය වෙසමුණුරජහු විසින් දෙනලද්දේ මය; අනුන්ගේ දරුවන් කැවිලි තබා තමාගේ දිවිරැකගත මැනවැ"යි භයින් වෙවුලා ඒ සියලු යක්ෂයෝ ම මහත් වූ වෙගයෙන් ආපසු නොබලා දිවපීහ. මහතෙරුන්වහන්සේ මෙසේ යක්ෂයන් භය ගන්වා පලවාපියා ඒ ජනපදය සිසාරා සීමා බැඳ එතැන්හි රැස්වූ මහජනයාට බ්‍රහ්මජාලසූත්‍රයෙන් බණ වදරා සැටදහසක් ප්‍රාණීන් නිවන් දක්වා තුන්දහස් පන්සියයක් පුරුෂයන් හා එක්දහස් පන්සියයක් ස්ත්‍රීන් මහණකරවා එහි සසුන් පිහිටුවූසේක. එතැන් පටන් එරට රජකුලයෙහි උපන් දරුවන්ට සොණුත්තර යයි නම් තබන්නාහ. මෙසේ ලොවුතුරා බුදුන් පවා ලොභ කරවන නිවන් සැප ලදින් ධ්‍යානසුවයෙන් ඒ ඒ තැන්හි වැඩහිඳ සැප විඳුම්හ යි නොසිතා මෙසේ මේ ස්ථවිරවරයන් නිවන් සැප හැර ඒ ඒ තැන්හි ඇවිද ලෝවැඩ සැධූ කල සසර සිටිනාවූ[9] නුවණැති කවර නම් සත්වයෙක්

1. පතාසෙන්තො -ABCDEFGHJL
පසාදෙන්තො - K කි.ම.ස.
2. යක්ෂණියෙක් - H
ජලයකින්නක් - මුද්‍රිත හැම. ස.
3. තෙරුන්වහන්සේ - ABCGHK කි.
4. මහු මෙරට - BDEGHK ස.
5. මෙත්සිත් - සා.කි.සැ.ම.
6. ඒ රජකුලයෙහි - GH
7. යකින්නී - BCFGHKL
8. ඇති - KL ස.
9. සිටියාවූ - ABCEGHJKL

Non-Commercial Distribution

ලෝවැඩෙහි උපෙක්‍ෂා[1] වේ ද? එසේ හෙයින් නුවණැත්තාවූ ශාසනික භික්‍ෂූන් විසින් ලෝවැඩ සදහුත් වැඩෙහි අප්‍රමාද ව දවස් යැවිය යුතු. එසේ හෙයින් කියනලදි.

මහාදයස්සාපි ජිනස්ස කඩ්ඪනං
විහාය පත්තං අමතං සුඛම්පි තෙ,
කරිංසු ලොකස්ස හිතං තහිං තහිං
භවෙය්‍ය කො ලොකහිතෙ පමාදවා -යි.

තව ද ලඞ්කාද්වීපයෙහි සදහුත් පිහිටුවන ලෙස සැලැස්වූ මිහිඳු මහ තෙරුන්වහන්සේ ඉට්ඨිය මහතෙරුන් වහන්සේය උත්තිය මහතෙරුන් වහන්සේය සම්බල මහතෙරුන් වහන්සේය භද්දසාල මහතෙරුන් වහන්සේය යන මේ සතරදෙනා වහන්සේ කැඳවාගෙන අශොකාරාමයෙන් නික්ම ලඞ්කාද්වීපයට වඩනට සුදුසු කල් පරීක්‍ෂා කෙරෙමින් රජගහානුවර සමීපයෙහි දක්‍ෂිණගිරි නම් දනවුවට වැඩ එහි සැරිසරනසේක් සමසක් කල්යවා තව ද ලක්දිවු වඩින්ට කල් නො වන හෙයින් ක්‍රමයෙන් තමන් වහන්සේගේ මවු බිසොවුන් වසන වෙටිස නම් නුවරට වැඩ එම බිසොවුන් විසින් කරනලද[2] වෙටිසගිරි නම් විහාරයෙහි සැතපී මවු බිසොවුන්ගෙන් උපසථාන විඳ වෙසෙමින් මෙසේ ද එක් මසක් කල් යවා මෙවිට ලක්දිවු නික්මෙන්ට සුදුසු කලැයි දන ගමනොන්මුඛ ව වැඩඋන් සේක. එකල්හි සක්දෙවු රජ්ජුරුවෝ මහතෙරුන් වහන්සේ කරා එළඹ පසහ පිහිටුවා වැඳ "ස්වාමීනි, ලක්දිව රජ කරන දෙවන පැතිස් මහරජ නුඹ වහන්සේගේ පිය වූ ධර්මාශොක රජ්ජුරුවන්ට තමහට යැවූ මඟුල් පෙරහර[3] ලැබ දෙවැනිව අභිෂෙක මඟුල් කෙළේ ය; තුනුරුවන්හි ගුණ අසා සතුටු විය; තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයෙහි ම "එන දවස මිහිඳු නම් මහ තෙර කෙනෙක් ලක්දිව මිනිසුන් පහදවා සදහුන් පිහිටුවති'යි නුඹවහන්සේ ම දක්වා වදාළසේක; එසේ හෙයින් නොපමා ව ලක්දිවු වැඩිය මැනව,[4] මමත් සහාය වෙමි"යි ආරාධනා කළහ. එකල මිහිඳු නම් මහතෙරුන්වහන්සේ යහපතැයි ගිවිස යට කී මහ තෙර සතර දෙනා වහන්සේ හා තමන් වහන්සේගේ සහොදර නැහිණියන්[5] සංඝමිත්‍රා ස්ථවිරින්ගේ පුත් වූ සුමණ සාමණෙරයන් වහන්සේ හා දෙබිහින්නන් දරු නැහිණියන් පුත් වූ භණ්ඩුක නම් අනාගාමි බැණනු කෙනකුන් ඇතුළු වූ සදෙනා වහන්සේ කැඳවාගෙන වෙටිසගිරි නම් විහාරයෙන් අහසට පැනනැඟී දික් කළ අතක් වක් නොකරන ඇසිල්ලෙහි

---

1. උපේක්‍ෂක. - මුද්‍රිත හැම. ස.
2. කරවන ලද - EGHKL
3. පෙළහර - H ක.කි.කැ.
4. මැනවැයි - E ක.කි.කැ.ම.
5. නැහණියන් - ABCDF

Non-Commercial Distribution

අනුරාධපුර නුවරට නැගෙනහිර මිස්සක නම් පර්වතයෙහි[1] පිළය නම් ගල්කුළමුදුනට බැස ලක්දිවු වැසි වන දෙවියන්ගේ මනනුවන් පිනවමින් මීඅඹ ගසක්මුල අඹතලා නම් ගල් අතළ මත්තෙහි සදෙනා වහන්සේ පිළිවෙළින් වැඩහුන්සේක. එසේ හෙයින් කියනලදී;

ලඞ්කාපසාදනගුණෙන වියාකතො සො
ලඞ්කාහිතාය මුනිනා සයිතෙන අනෙත,
ලඞ්කාය සත්‍ථුසදිසො හිතහෙතු තස්සා
ලඞ්කාමරූහි මහිතොහි නිසීදි තත්‍ථ-යි.

මෙසේ එතැන්හි මහ තෙරුන් වහන්සේ වැඩහුන් දවස්[2] නම්: අප බුදුන් පිරිනිවි දෙසිය සතිස් වන හවුරුදු ධර්මාශොක රජහට අටළොස් වන්නෙහි දෙවනපෑතිස් රජහට පළමු වන්නෙහි එම මිහිඳු මහ තෙරුන් වහන්සේ උපසම්පද වූ දෙළොස් වන අවුරුදු පොසොන් පුර මුල නකත ලද පසළොස්වක් දවසයැ. එසේ හෙයින් දෙවනපෑතිස් රජ්ජුරුවෝ පළමු සත් දවසක පටන් මුළු නුවර දෙව්පුරයක් සේ සරහා සැණකෙළි කෙළනාහු එදවස් නුවර වැසියන් හා මහ ඇමැතියන් නකත්කෙළි කෙළනා සේ නියොග කොට තුමූ සතලිස් දහසක් පුරුෂයන් පිරිවරා මිහින්තලාවට මුව දඩ ගියහ. එකල ඒ පර්වතයෙහි වසන එක්තරා දේවතාවෙක් මහතෙරුන් වහන්සේ රජහට දක්වමී' රොහිත නම් මුව වෙසක් මවාගෙන තණ කන මුවකු මෙන් රජහට නුදුරු තෙන පෙනී ගිය; රජ්ජුරුවෝ මුවා දැක 'තණ කන මුවා විදීම යුක්ත නොවේ'යි සිතා දුනුදිය අත පොළාපීහ; ඒ ශබ්දය අසා ඉගුලුණාක් මෙන් මුවදෙවතාවා පර්වතයට අභිමුඛ ව නික්ම අඹතලවුවට නැඟී අන්තර්ධාන විය. රජ්ජුරුවෝ මුවා ලුහුබැඳ යන්නාහු එම අඹතලවුවට නැංගාහ. එකල මිහිඳු මහතෙරුන් වහන්සේ ආසන්නව එන රජහු දැක "බොහෝදෙනා දුටු කල්හි රජ භය ගනී"යි[3] සිතා "මේ රජ මා පමණක් ම දකීව යි සෙස්සවුන් නොදකීව"යි අධිෂ්ඨාන කොටලා "තිස්සය, මෙසේ එව"යි වදළසේක; එබස් ඇසූ රජ්ජුරුවෝ මහතෙරුන් වහන්සේ දැක සිතන්නාහු "මේ ලංකාද්වීපයෙහි මාගේ නම කියා කැඳවන්ට සමර්ථ කෙනෙක් නැත; මේ ජිනන ගිනන පටධර වූ කාෂාය වස්ත්‍රය හැඳ පෙරවී හිස මුඩු තෙනැත්තේ මට තිස්ස යයි නම කියා කැඳවයි; මේ මනුෂ්‍යයෙක් දෙ හෝ නොහොත් අමනුෂ්‍යයෙක් දෙ හො" යි සිතූහ. එවේලෙහි මහතෙරුන් වහන්සේ රජුගේ අදහස් දැන තමන් වහන්සේ[4] බුදුසවු බව හඟවා දඹදිවින් වැඩි කටයුතු වදරන සේක්;

සමණා මයං මහාරාජ - ධම්මරාජස්ස සාවකා,
තමෙව[5] අනුකම්පාය - ජම්බුදීපා ඉධාගතා-යි.

---

1. පර්වත සම්පයෙහි - H
2. දවස - BEGHKL
3. ගනිතියි - K, ස.
4. තමන්වහන්සේගේ - බෙ. ස.
5. තවෙව - බෙ.ම.පාලි. මහාවංස

Non-Commercial Distribution

යන මේ ගාථාව වදළසේක. එකල දෙවන පැතිස් රජ්ජුරුවෝ ධර්මාශෝක රජ්ජුරුවන් පළමු නොබෝ කලෙක කියා එවූ තුනුරුවන් ස්වරූප සඳහන් කොට "රහතන් වහන්සේ වැඩිසේක් වනැ"යි සිතා එකෙණෙහි අත තුබූ දුනු හීතල ඉවත දමා ළං ව ගොප් වැද එකත්පස් ව උන්හ. ඉක්බිති රජ්ජුරුවන් හා මහතෙරුන් වහන්සේ පිළිසඳර කථා කෙරෙමින් වැඩඋන් කල්හි සතලිස් දහසක් යෝධයෝ[1] අවුත් රජ්ජුරුවන් පිරිවරා ගත්හ. එවේලෙහි මහතෙරුන් වහන්සේ ද කැටිව වැඩි අනික් සදෙනා වහන්සේ දක්වූසේක. රජ්ජුරුවෝ ඔබ හැම දක "මේ හැමදෙනා වහන්සේ කවර ද වැඩිසේක් ද" යි විචාරා "මහරජ, මා හා කැටිව ම අවුයැ"යි වදළ කල්හි "නුඹ ඇමදෙනා වහන්සේ කෙසේ වැඩි සේක් ද"යි විචාරා "දියෙනුත් ගොඩිනුත් නොආම්හ"යි වදළ කල්හි ආකාශයෙන් වැඩිසේක් වනැයි සතුටු ව "කිමෙක් ද ස්වාමීනි, මෙබඳු ශ්‍රමණයෝ දඹදිව තවත් ඇද් ද"යි විචාළහ. එකල මහතෙරුන් වහන්සේ "මහරජ, කුමක් කියා ද දන් ඒ දඹදිවුතලය කාෂාය[2] වස්ත්‍රයෙන් ම දිලිහෙයි" වදරාඃ

තෙවිජ්ජා ඉද්ධිපත්තා ච - චෙතොපරිය[3] කොවිද
ඛීණාසවා[4] අරහන්තො - බහූ බුද්ධස්ස සාවකා.

යන මේ ගාථාවෙන් දඹදිව රහතන් වහන්සේ බොහෝ බව හඟවා වදළසේක; එතෙපුල් අසා රජ්ජුරුවෝ අතිශයින් ප්‍රසන්න වූහ. ඉක්බිති මහතෙරුන් වහන්සේ රජ්ජුරුවන්ගේ නුවණ පරීක්ෂා කරනු පිණිස සමීපයෙහි සිටි අඹගසක් දක්වා "මහරජ, මේ කිනම් ගසෙක් ද" යි විචාළසේක; රජ්ජුරුවෝ "ස්වාමීනි, අඹ ගසය"යි කීහ; "මහරජ, මේ අඹගස හැර තවත් අඹගස් ඇද්ද"යි විචාළසේක; රජුරුවෝ "එසේය ස්වාමීනි, බෙහෙවැ"යි[5] කීහ; "අඹගස් හැර සෙසු ගස් ඇද්ද"යි විචාළසේක; "ස්වාමීනි, අඹගසින් පිටත් සෙසු ගස් පමණ නැතැ"යි කීහ; "සෙසු අඹගස් හා නොඅඹගස් හැර එයින් පිටත් ගස් කවරේද"යි විචාළ සේක; "සවාමීනි; මේ අඹ ගස එයින් පිටත් වේද"යි කීහ. එකල මහතෙරුන් වහන්සේ "මහරජ, මේ ප්‍රශ්නය තොප කී නියා ඉතා යහපතැ"යි රජ්ජුරුවන්ට ප්‍රශංසා කොට තව ද ප්‍රශ්නයක් විචාරනු කැමැති ව "මහරජ, තොපගේ නෑයෝ ඇද් ද නැද් ද"යි විචාළ සේක; "ඇත ස්වාමීනි, නෑයෝ බෙහෙවැ"යි කීහ; නොනෑයෝ ඇද් ද නැද් දැ"යි විචාළසේක; "ස්වාමීනි, නෑයන්ට වඩා නොනෑයෝ බෙහෙවැ"යි කීහ; "තොපගේ නෑයන් හා නොනෑයන් හැර අනික් කවුරු මෙහි ඇද්ද"යි විචාළසේක; "ස්වාමීනි, මම ඇත්තෙම් වේ ද"යි කීහ. එවේලෙහි මහතෙරුන් වහන්සේ "හේ

1. පුරුෂයෝ - මුද්‍රිත හැම. ස.
2. රහතන් වහන්සේලාගෙන් ශොභමාන ව කාෂාය - AJ
3. චෙතොපරියාය ක.කි.ක., චෙතොපරිඤ්ඤ - පාලි.
4. දිබ්බසොතා - ක.ඤ. මහාවංස.
5. බොහොවැයි - AJ
බොහෝ වනැයි - ක.කි.කු.

Non-Commercial Distribution

එසේ මය මහරජ, කිසියම් කෙනෙක් තුමූ නමන්ට නැ නමුත් නොවෙති: නොනැ නමුත් නොවෙති: එබැවින් මේ ප්‍රශ්නය කී නියාව ද යහපතැයි වදරා "රජ්ජුරුවෝ ධර්මවිනය දැනගන්නා තරම් නුවණ ඇතියහ"යි දැන මැදුම්සහියෙහි බුදුන් වදළ චූලහත්ථිපදෙපම සූත්‍රයෙන් බණ වදරා එකපැහැර දෙව්මිනිසුන් ලවා සාධුකාර දෙවූසේක: රජ්ජුරුවෝ බණ අසා ඉක්බිති සතලිස් දහසක් පුරුෂයන් හා සමඟ ශරණශීලයෙහි පිහිටියහ. එසේ හෙයින් කියනලදී;

පණ්ඩිතොති විදිත්වාන - චූළහත්ථිපදෙපමං
සුත්තන්තං දෙසයී ථෙරො - මහීපස්ස මහාමති.
දෙසනා පරියොසානෙ - සද්ධිං තෙහි නරෙහි සො:
චත්තාළීස සහස්සෙහි - සරණෙසු පතිට්ඨහී-යි.

ඉක්බිති රජ්ජුරුවෝ හුනස්නෙන් නැඟී මහ තෙරුන්වහන්සේ නුවරට කැඳවා ඔබ නොවඩනා හෙයින් හැමදෙනා වහන්සේ වැඳ "ස්වාමීනි, සෙට මාගේ රජගෙට වැඩිය මැනවැ"යි ආරාධනා කොට නුවරට ගියහ. රජ්ජුරුවන් ගිය නොබෝ ඇසිල්ලකින් ම මිහිඳු මහතෙරුන්වහන්සේ භණ්ඩුක නම් බෑනණුවන් මහණ කරවා එම විට[1] උපසම්පද කරවා ඔබ රහත් බවට පැමිණි කල්හි සුමන සාමණේරයන් වහන්සේ කැඳවා "සුමනයෙනි, බණ අසන පරිද්දෙන් දෙවියන්ට අඬගාව"යි වදළසේක. සාමණේරයන් වහන්සේ "ස්වාමීනි, කෙළලක්‍ෂයක් සක්වළට ඇසෙන සේ හඬ ගාම් ද? නොහොත් දසදහසක් සක්වළට ඇසෙන සේ හඬ ගාම් ද? නොහොත් සතිස්ලක්‍ෂ දසදහස් තුන්සිය පනස් යොදුන් වට ඇති මේ සක්වළට ඇසෙන සේ හඬගාම් දැ"යි විචාළසේක. එකල මහතෙරුන්වහන්සේ "මේ ලංකාද්වීපය[2] පමණකට ඇසෙන පරිද්දෙන් හඬගාව"යි වදළසේක. එතෙපුල් අසා සාමණේරයන්වහන්සේ අභිඥ පාදක කොට ඇති චතුර්ථධ්‍යානයට සමවැද එයින් නැඟී අධිෂ්ඨාන කොට එකඟ වූ සිතින් සත්සිය පනස් ගවු වට ඇති මේ ලක්දිවට ඇසෙන පරිද්දෙන් "පින්වත්නි, මේ බණ ඇසුවමනා කලැ"යි හඬගා වදළසේක. ඒ හඬ අසා බුම්මාටු දෙවියෝ හඬ ගැසූහ. ඔවුන්ගේ ශබ්දය අසා චාතුර්මහාරාජිකාදි වූ සදෙවුලෝවැසි දෙවියෝ පිළිවෙළින් ශබ්ද පැවැත්වූහ. මෙම ක්‍රමයෙන් බ්‍රහ්මලොකය දක්වා ශබ්ද පතළේය. ඒ ශබ්දයෙන් රැස්වූ මහත් වූ දිව්‍යසමාගමය දැක මහතෙරුන් වහන්සේ සමචිත්තපරියාය සූත්‍ර දෙශනාවෙන්[3] බණ වදළසේක. එකල අසඞ්ඛ්‍යයක් දෙවියෝ නිවන් දුටහ. බොහෝ නාගසුපර්ණයෝ[4] ශරණශීලයෙහි පිහිටියහ. රජ්ජුරුවෝ නුවරට ගොස් දෙවන දවස් උදයන්හි ම වීථි[5] කැලිසකළ[6] අරවා කළුවැලි පියා සුදු වැල්ලෙන් තවරා[7] ලද පස්මල් ඉස ධජපතාකා කෙහෙල්

1. එම විට ම - B
   එම ඇසිල්ලෙහි ම - C
2. ලංකාද්වීපයට - HJ
3. සූත්‍රයෙන් - ම.ස.
4. නාගසුපර්ණ සිද්ධවිද්‍යාධරාදීහු - AJ
5. වීථිය - BCDGHKL ක.සි.සද.බෙ.ස.
6. කැලිසකළ - F
   කසළ - BEGHKL
7. තරවා - F

Non-Commercial Distribution

තොරණ පිළී තොරණ පූර්ණඝට පූර්ණ කලස ආදියෙන් මුළු නුවර දෙව්පුරයක් සේ සරහා රජගෙය ද දිව්‍යවිමානයක් මෙන් අලංකාර කොට මහතෙරුන් වහන්සේ කැඳවාගෙන එන පරිද්දෙන් තමන්ගේ මඟුල් රථය නික්මවූහ; එකල මහතෙරුන් වහන්සේ රථාචාර්‍ය්‍යයා හා රථය පළම්බු කොට එවා තමන් වහන්සේ පසුව අහසින් ඇසිල්ලක[1] අවුත් ඕහට ඉදිරි ව නැගෙනහිර වහසල් දෙර සමීපයට[2] [පඨමක චේතිය ස්ථානයට] බැස වැඩසිටි සේක. එකල්හි රථාචාර්‍ය්‍යයා ආශ්චර්‍ය්‍යමත් ව එපවත් ගොස් රජහට දැන්විය. එකල රජ්ජුරුවෝ පෙරමඟට ගොස් මහත් වූ පූජාසත්කාරයෙන් මහතෙරුන් වහන්සේ රජගෙට වඩා ගෙනවුත් තටුවක්[3] පනවා කොඳුපලස් හෙලා විසිතුරු කොට පනවන ලද ආසන මත්තෙහි වඩාහිඳුවා ප්‍රණීත වූ කැඳ අවුළු අහර ආදිය එළවා සියඅතින් වළඳවා පස්පළවතින් බුලත් පිළිගන්වා පසඟ පිහිටුවා වැඳ ඉක්බිති තමන් මල් මහානාග නම් රාජකුමාරයන්ගේ අගබිසෝ වූ එකල රජගෙයි වසන අනුලා දේවීන් ඇතුළු වූ පන්සියයක් බිසෝවරුන් හා සමඟ එනත්පස් ව උන්හ. එවේලෙහි මහතෙරුන් වහන්සේ පේවත්[4] විමන්වත් හා සච්චසංයුත්තකයෙන් බණ වදළසේක. එකල අනුලා දේවීන් ඇතුළු වූ පන්සියයක් බිසෝවරු සෝවාන් වූහ. එකෙණෙහි නුවර වැසියෝ මහතෙරුන් වහන්සේගේ ගුණ අසා තාලාගිරිනු වන් රජගහාව[5] සේ හැළලී ඇසිල්ලෙක දිව අවුත් රජගේ දෙර රැස් ව "ලක්දිවු වැසියන්ට වැඩ නිසා වැඩ දහම් අමා දෙන අප මහතෙර හිමියන් වහන්සේ සිත් සේ දැක බණ පදයක් අසාපිය නොහෙම්හ; හිමිසඳ, අපට අවසරයක් ගෙනහැර දෙව"යි එකපැහැර ගුගුළහ. එකල රජගෙය සම්බාධ හෙයින් රජුගේ නියෝගයෙන් ම මහතෙරුන් වහන්සේ එදවස් පස්වරු [මඟුල්] ඇත්හල[6] වැඩහිඳ නුවර වැසියන්ට දෙවදූත සූත්‍රයෙන් බණ වදරා දහසක් පුරුෂයන් සෝවාන් කරවා එතැන ද සම්බාධ හෙයින් එදවස් ම දකුණු වහසල් දෙර නඳුනොදුනයෙහි ධර්මාසන නැඟී වැඩහිඳ නුවර වැසියන්ට මැදුම්සඟියෙහි උපරිපන්නාස වදළ බාලපණ්ඩිත සූත්‍රය[7] වදරා දහසක් ස්ත්‍රීන් සෝවාන් කරවා මෙසේ එක දවසින් ම දෙදහස් පන්සියයක් දෙනා නිවන් දක්වා සවස මීන්තලා නික්ම රජ්ජුරුවන්ගේ ආරාධනාවෙන් කොළොම් හොය සිට නැවත අවුත් මහමෙවුනා උයන්හි කරනලද රජගෙයි රාත්‍රියෙහි සැතපී දෙවන දවස් රජ්ජුරුවන්ට වෙළුවනාරාම වස්තුව වදරා අනුලා දේවීන් ඇතුළු වූ පන්සියයක් බිසෝවරුන් සකෘදගාමී කරවා මහපොළොව ගුගුරුවමින් තිස්සාරාම නම් වූ මහමෙවුනා උයන පිළිගෙන එම උයන්හි කරන ලද රජගෙට දකුණු දිග බදසිම්[8] මළුවය උතුරුදිග ජන්තාඝර නම් පොකුණය නැගෙනහිරි වහසල් දෙර මහා බොධිස්ථානය ලෝවාමහපාය ස්ථානය ලහබත් ගෙය පිහිටන තැනාය මහා භොජන

1. ඇසිල්ලෙකදී - ක.කි.ඤ.ම.
   ඇසිල්ලකින් - K
2. සමීපයේ - බෙ.ස.
3. තටුවක් - BEFJ, තුටුවක් - H
   පුටුවක් - CL; තටුවක් පනවා (නැත) - K
   මණ්ඩපයක් - ක.කි.ඤ.ම.
   මණ්ඩපං - මහාවංස
4. ප්‍රේතවත් - ABCDFGHJKL ස.
5. රජගහානුවර - BKL ක.කි.ඤ.ම.
6. ඇත්හල - පිටපත් හැම, මඟුල්
   ඇත්හල - මුද්‍රිත හැම ස.
   සාලං මංගලහත්ථිනො - මහාවංස
7. සූත්‍රයෙන් බණ - AE
8. බදසිම - E
   බදසිම - I කි. බෙ. ක. ඤ.
   බදයින් - H
   බදසිලුම - BC, බෙ
   බදසිලුම් - AJ
   බදසියලුම් - F
   මාලක සීමා - ක.කි.ඤා.
   බදසී - ම

Non-Commercial Distribution

ශාලාවය රත්නමාලි චෛත්‍ය ස්ථානය යන මේ අට මහා ස්ථානයෙහි මල් පුද අට වරෙක මහපොළොව ගුගුරුවා එතැන්හි ම වැඩසිට මෙකප බුදුවූ කකුසඳ කොණාගමන[1] කාශ්‍යප ගෞතම යන සතරදෙනා වහන්සේ පළමු ලක්දිවූ වැඩ ඒ කියන අටමහාස්ථානය පරිභොග කළ පරිදි පිළිවෙළින් වදරා රත්නමාලි චෛත්‍යස්ථානය විශෙෂයෙන් වර්ණනා කොට එයින් ගොස් රජගෙයි දී අහර වළඳ නඳුන්වනයෙහි වැඩහිඳ අඞ්ගුත්තරසඟියෙහි අග්ගික්ඛන්ධොපම සූත්‍රයෙන් බණ වදරා දහසක් දෙනා මාර්ගඵලයට පමුණුවා තුන්වන දවස් ද එම නඳුන් වනයෙහි වැඩහිඳ ආසිවිසොපම සූත්‍රයෙන් බණ වදරා දහසක් පුරුෂයන් මාර්ගඵලාලංකාරයෙන් සරහා එදවස් මහමෙවුනා උයන්හි රජ්ජුරුවන් තමන් නමින් කරවූ තිස්සාරාම නම් මහපාය පිළිගෙන එහි සැතපී සතරවන දවස් ද එම නඳුන්වනයෙහි වැඩ හිඳ අනමතග්ගිය සූත්‍රයෙන් බණ වදරා එදවස් ද දහසක් පුරුෂයන් සෝවාන් කරවා පස්වන දවස් රජ්ජුරුවන් තමන් බුදුන්ගේ ආඥාචක්‍රය ඇතුළත වසනු කැමැත්තෙමි යි කී හෙයින් මහාවිහාරය හා නුවර ඇතුළු කොට සීමා බැඳ මහපොළොව ගුගුරුවා එයින් ගොස් නඳුන් වෙනෙහි වැඩහිඳ මැදුම්සඟියෙහි ඛජ්ජනීය නම් සූත්‍රයෙන් බණ වදරා එදවස් ද දහසක් මනුෂ්‍යයන් මාර්ගඵලයට පමුණුවා සවන දවස් ද එම නඳුන්වනයෙහි වැඩහිඳ ගොමය පිණ්ඩිය[2] නම් සූත්‍රයෙන් දහසක් මනුෂ්‍යයන්ට මාර්ගඵල දී සත්වන දවස් ද එම නඳුන්වනයෙහි වැඩහිඳ ධම්සක් පැවතුම් සූත්‍රයෙන් බණ වදරා දහසක් දෙනා සෝවාන් කරවා මෙසේ හැම එක් ව සත් දවසින්[3] අටදහස් පන්සියයක් දෙනා නිවන් දක්වා ලංකාද්වීපවාසීන්ට නොයෙක් පරිද්දෙන් කුසල් වඩවනසේක් තව ද සද්ධර්ම නමැති අමා වැසි වස්වා නොයෙක් සිය දහස් ලක්‍ෂ ගණන් මනුෂ්‍යයන්ගේ සිත් නමැති ක්‍ෂෙත්‍රයෙහි කුසල් නමැති අඞ්කුරයන් ඉපදවූ සේක. එසේ හෙයින් කියන ලදී;

මහා මහින්ද සූරියො - ලඞ්කාවෙහාසමණ්ඩගො,
බොධනෙය්‍යම්බුජේ'කාසි - විකාසං ධම්ම රංසිනා.

මහා මහින්ද චන්‍ද සො - ලඞ්කාවෙහාසමණ්ඩගො,
බොධෙසි ධම්මරංසීහි - වෙනෙය්‍ය කුමුදකරෙ.

මහා මහින්ද මෙඝො සො - වස්සං ධම්මම්බු වුට්ඨියා,[4]
සාධූනං චිත්තඛෙත්තෙසු[5] - ජනෙසි කුසලංකුරෙ-යි.

---

1. කොණාගම - BCFGH ; ක.කි.සැ.ම.
2. ගොමය පිණ්ඩ - ACFJ
   සොයාමපණ්ඩ - BEGH
   ගොයාමපණ්ඩ - KL
3. දවසකින් - BGHKL
4. වුට්ඨියං - ABFGHJKL
5. ඛිත්තෙසු - ක.කි.සැ. පාලි.

Non-Commercial Distribution

මෙසේ මහතෙරුන් වහන්සේ පිට පිට සත් දවසක් බණ වදරා ඥනාලොක පතුරුවා ශාසනය බැබළවූ තෙන හෙයින් ඒ නඳුන්වන උයන එතැන් පටන් ජොතියවන[1] නම් විය. එකල තිසසාරාම නම් වූ මහමෙවුනා උයන්හි මිහිඳු මහතෙරුන් වහන්සේට ආදිකොට කැරවූ මහපායෙහි බිම් හිත්ති තෙත් හෙයින් ගිනිසිළු පැපැ වියලූහ: එකල ඒ ප්‍රාසාදය අග්නිධූමයෙන් කෘෂ්ණවර්ණ විය: එම කාරණය මුල් ව ඒ මහපාය කළුපා පිරිවෙන්[2] නම් විය. තව ද රජ්ජුරුවෝ මහාබොධිස්ථානය ලෝවාමහපාය[3]ස්ථානය යන මේ දෙතැන්හි මහත් වූ සාලා දෙකක් කරවා එසේ ම ලහබත්ගෙය බත්හල්ගෙය ආදි වූ ගෙවල් හා ඒ ඒ තන්හි බොහෝ පිරිවෙන් හා රාත්‍රිස්ථාන දිවාස්ථාන සක්මන් මණ්ඩප පොකුණු පතැස්[4] ආදි වූ නොයෙක් විහාරවින්‍යාස කැරවූහ. එයින් මහතෙරුන් වහන්සේ පැන් සැනහූ පොකුණු තෙර කැරවූ විහාරය නහන පිරිවෙන්[5] නම් විය. සක්මන් කළ තෙන කැරවූ විහාරය සක්මන් පිරිවෙන් නම් විය. නිරොධසමවතින් වැඩ හුන් තැන කැරවූ විහාරය එලග්ග පිරිවෙන් නම් විය. බොහෝ දෙවියන් උපස්ථානයට එළඹ සිටි තෙන කැරවූ විහාරය මරුගණ පිරිවෙන් නම් විය. එම දෙවන පැතිස් රජ්ජුරුවන්ගේ දික්සඳ නම් සෙනෙවිරදුන් කැරවූ සුළුවාගෙය[6] දික්සඳ සෙනෙවියා පිරිවෙන් නම් විය.

මෙසෙයින් සවිසර්ජිතකොට කරවනලද මහා විහාරයෙහි මිහිඳු මහතෙරුන් වහන්සේ සවිසි දවසක් වැස ඇසළ මස්[7] පුරතෙළෙස් වක් දවස්[8] රජගෙයි දී වළඳ රජ්ජුරුවන්ට අප්‍රමාද සූත්‍රයෙන්[9] බණ වදරා මින්තලාගලට වැඩ නාගචතුස්ක නම් පොකුණ සමීපයෙහි වැඩසිට රජ්ජුරුවන්ට වස්සූපනායිකස්කන්ධකය වදරා රජ්ජුරුවන්ගේ බෑන වූ අරිට්ඨ නම් මහ ඇමැතියාණන් හා ඔවුන්ගේ වැඩිමහලු බාල මල්බෑයන් සිව්පනසක් ඇතුළු ව පස්පනස් දෙනකු එම විට මහණ කොට කරගෙහි ම[10] රහත් කැරවූසේක. රජ්ජුරුවෝ එදවස් ම මින්තලාගල කරණ්ඩක නම් දගබ සිසාරා අටසැටලෙනක් කටාර කොටවා නව මෙහෙයට පටන්ගන්වා වහා[11] කර්මාන්ත නිමවා ඇසළ පුර මැදි පොහෝ දවස් පිළිගැන්වූහ. මහතෙරුන් වහන්සේ එහි දෙතිස් මළුවක් බෙද වෙන වෙන ම සිම්[12] බැඳ විහාරය වට ද[13] එදවස් ම සීමා බැඳ එයින් පළමු ව සිම් බැඳි තුඹරුප් නම් මළුවෙහි දී අලුත මහණ කළ පස්පනස් දෙනා වහන්සේ එදවස් ම උපසම්පද කැරවූ සේක. එකල්හි ඒ මිහිඳු මහතෙරුන්

---

1. ජොතියවන - ABCDEFGHJL
   ජොතිවන - K මුද්‍රිත හැම, මහාවංස
2. පිරිවෙන - BCDHK
3. ලෝවාමහාප්‍රාසාද - ක.සි.කැ.ම.
4. පතස් - ABCGHKL
5. සුනහාත - මහාවංස
6. සුළුපාගෙය - L
7. මස (නැත) - BDEGH ක.සි. කැ. ම.
8. ලත් දවස් - බෙ.ම.ස.
9. මහාප්‍රමාද - කා.සි.කැ.
   මහාපපමාද - මහාවංස
10. ම (නැත) - ABDEGHJKL
11. මහා - ABCDEGHJKL
12. සිදුම් - BGHK
    සීමා - L ක.සි.කැ.බෙ.ස.
13. විහාරයට ද - DF මුද්‍රිත හැම ස.

Non-Commercial Distribution

වහන්සේ ඇතුළු වූ දෙසැට රහතන් වහන්සේ එම මීන්තලෙහි වස් වැස රජ්ජුරුවන්ට ධම්දනයෙන්[1] සංග්‍රහ කළ සේක. එකල මේ ලංකාද්වීපවාසී වූ දිව්‍යයන් හා මනුෂ්‍යයෝ පිරිවර සහිත වූ මිහිඳු මහතෙරුන් වහන්සේ කරා එළඹ බොහෝ පින් රැස් කළහ. එසේ හෙයින් කියන ලදී;

දෙවමනුස්සගණා ගණිනං තං
තඤ්ච ගණං ගුණවිත්ථත කිත්තිං,
යාතමුපෙච්ච ච මානයමානා
පුඤ්ඤචයං විපුලං අකරිංසු-යි.

තව ද ඒ දෙවන පෑතිස් රජ්ජුරුවෝ සුමන සාමණේරයන් වහන්සේ හා කථාකොට දඹදිවු යවා ධර්මාශෝක රජ්ජුරුවන් කෙරෙහි තිබූ බුදුන්ගේ ශෛලමය පාත්‍රාධාතුව[2] පුරා ශරීර ධාතුන් වහන්සේ හා ශක්‍රයන් කෙරෙහි තිබූ දකුණු අකුධාතුන් වහන්සේ ගෙන්වාගෙන ථූපාරාම නම් දාගබක් බඳවා දකුණු අකුධාතුව පිහිටුවන දවස් ලක්දිවු වැසියන් රැස්කරවා මුළුනුවර දෙව්පුරයක් සේ සරහා තුමූ සර්වාභරණයෙන් සැරහී මහසෙනහ පිරිවරා ශක්‍රදෙවේන්ද්‍ර ලීලාවෙන් විහාරයට අවුත් වන්හ. එකෙණෙහි අකුධාතුන් වහන්සේ සත් තලයක් උස අහසට පැන නැඟී සරාහිරුමඩලක් සේ පියල්ලවුන්ට පෙනි පෙනී ආකාශ කුහරය සරහා දිලිහි දිලිහී වැඩසිට සවනක් රැස් විහිදුවමින් මහජනයා විස්මය කරවා සැවැත්නුවර ගණ්ඩඹ නම් රුක්මුල්හි දිවමනු බුදුන් දැක්වූ යමාමහ පෙළහර පරිද්දෙන් ම යමකප්‍රාතිහාර්‍ය්‍ය දක්වා එදවස් හළ[3] මහදියකඳින් හා ගිනිකඳින් ලක්දිව මුළුල්ලෙහි එක පැහැර බිම් තෙමා දසදිග ආලෝක පතුරුවා ආකාශයෙන් බැස රජ්ජුරුවන් හිස්මුදුනෙහි පිහිටි සේක. එවේලෙහි රජ්ජුරුවෝ "දිවි ලදුයෙහි පල ලදිම්"යි සන්තෝෂයෙන් මහත් කොට සාධුකාර දී ධාතුන් වහන්සේ ගෙන ථූපාරාමයෙහි පිහිටුවූහ. එකෙණෙහි මහපොළොව[4] ගුගුරා[5] පැන නැඟී පොකුරු වැසි වස්නට පටන්ගත; සියලු දිව්‍යමනුෂ්‍යයෝ එකපැහැර සාධුකාර දුන්හ.[6] එදවස් ඒ ප්‍රාතිහාර්‍ය්‍ය දැක බුදුසස්නෙහි පැහැද රජ්ජුරුවන්ගේ මල් වූ මත්තාභය නම් රාජකුමාරයෝ දහසක් පුරුෂයන් හා සමඟ මහණ ව රහත් වූහ. එසේ ම එදවස් නුවර වැසියන් හා දනවු වැසියන්ගෙන් තිස් දහසක් පුරුෂයෝ මහණ වූහ. මෙසේ ථූපාරාමදාගැබ් බඳවා ධාතු පිහිටුවා නොයෙක් රත්නයෙන් පූජාකොට ඒ විහාරය චෛත්‍යය ප්‍රධාන කොට කැරවූ හෙයින් ථූපාරාමය යි නම් තුබූහ.

---

1. ධර්මදේශනායෙන් - ACDFJ
2. පාත්‍රධාතුව - AFHJL
3. කළ - ක.කි.කැ.
4. මහපොළෝ - AEJ
5. ගුගුරුවා - J ක.කි.කැ.ම.
6. දෙන්නට පටන් ගත්තාහ - H

Non-Commercial Distribution

තව ද අනුලාදෙවීන් ඇතුළු වූ සකෘදගාමී[1] පන්සියයක් බිසෝවරුන් හා එසේ ම පන්සියයක් පුරවනිතාවන් කෙස්වැටි කපා හැර කසාපිළි පෙරව දසසිල් සමාදන් ව වසන හෙයින් රජ්ජුරුවෝ ඔවුන්ට නුවර එක් පයසක වෙහෙරක් කරවා වැස්වූහ: ඒ වෙහෙර ගැහැණුන් විසූ වෙහෙර හෙයින් උපාසිකා වෙහෙර[2] නම් විය. ඉක්බිති ඒ දෙවන පෑතිස් රජ්ජුරුවෝ අනුලාදෙවින් මහණවනු[3] කැමැති හෙයින් එපවත් කියා සඞ්ඝමිත්‍රා සඞ්ඝමිත්‍රා වහන්සේ හා සමඟ ශාඛා මහාබොධීන් වහන්සේ වඩා ගෙනෙන ලෙස තමන්ගේ මහා අරිට්ඨ නම් බෑනණුවන් දඹදිවු යවූහ. එකල ධර්මාශෝක රජ්ජුරුවෝ පැළලුප් නුවර පටන් මහබෝමඩ දක්වා සත්යොදුන් මඟ බෙර ඇසක් සේ තනවා නොයෙක් අලංකාරයෙන් සරහා සර්වාභරණ විභූෂිත ව දිගින් අටවිසි ගව්වක් හා පුළුලින් දෙළොස් ගවු[4] මානයෙහි එක පැහැර සැරහී සිටි මහසෙනඟ පිරිවරා මහසඞ්ඝයා වහන්සේ හා සමඟ නොයෙක් රත්නයෙන් උජ්ජ්වලිත වූ නානා වර්ණ ධ්වජ මාලාවෙන් හා නා සපු දුනුකේ දෑසමන් සීනිද්ද බෝලිද්ද ආදි වූ නානාවර්ණ කුසුම්දම සහස්‍රයෙන් හා අනෙකප්‍රකාර හෙරිතුර්යවයෙන්[5] උපහාර කරනලදු ව නානාලංකාරයෙන් එකාලංකාර ව සිටියාවූ[6] ජයමහා බොධීන්වහන්සේ කරා එළඹියාහ. එසේ හෙයින් කියන ලදී;

අමිතයසො පරහිතමාවහනෙතා
සුජනහිතො ධිතිමා අවිත සඩො,
සුපරිවුතො මිත මහති චමූහි[7]
සවතිපති බොධිවරං[8] උපාගමී-යි.

මෙසේ මහබෝමඩට ගොස් වන්නාවූ රජ්ජුරුවෝ සුවාසූ දහසක් සාමන්ත රජදරුවන් හා මහසෙනඟ හාත්පස[9] පිරිවරා සිටුවා ශ්‍රී මහා බොධීන් වහන්සේ වටා කඩතුරාවක් අදවා රන්හිණින් උඩ නැඟී රන් තෙල්ලක් සුරතින් ගෙන දකුණු මහාශාඛාවෙහි රන්හිරියෙලින්[10] රේඛාවක් ඇඳ තමන්ගේ සත්‍යක්‍රියා බලයෙන් හා බුදුන්ගේ අධිෂ්ඨාන බලයෙන් කියතින්[11] කපා හළුවා[12] සේ සිඳුණාවූ දක්ෂිණ මහා ශාඛාව වට නවරියන් ගැඹුර පස්රියන් පුළුල තුන්රියන් බොල අටඟුල් තනඹ ඇත්සොඬක් පමණ මුවවිටක් ඇති දෙවන හිරු මඬලක් වැනි රන් කටාරයෙහි පිහිටා එම විට මුල්බට. එවේලෙහි[13] අතිශයින් සන්තුෂ්ට වූවාහු සාධුකාර දුන්හ. මහපොළොව[14] ගුගුරා පැනනැංග: හෙරිතුර්යභාණ්ඩයෝ තුමූ තුමූ ම නාද කළහ: ඒ ආශ්චර්යය දැක දහස්ගණන් මනුෂ්‍යයෝ පිළි හිස නටවන්ට පටන් ගත්හ: එදවස් මහබඹුන්ගේ අත්පොළසනින්[15] හා දෙව් මිනිසුන්ගේ සාධුනාදයෙන් හා යක්ෂයන්ගේ

1. සකෘදගාමී - EGJ
2. විහාර - BDEGH, ස.
3. මහණ කරවනු - F ක.සි.ඳ.
4. ගවුවක් හා - GH
5. හෙරිතුර්යාවයෙන් - BCGH සි.
6. සිටිනාවූ - BEGHKL
7. මහතිචරාහි - BGH
8. බොධිපවරං - F
9. හාත්පසින් - AFK ක.සි.ඳ.ම.
10. රන්සිරියෙලින් - ABCFGHK ක.ම.
11. කියතකින් - BEGHKL
12. හෙළුවා - BEHKL
13. මුල්බට වේලෙහි - L, බෙ.ස.
14. මහපොළො - BDEGH
15. අත්පොළසන් - GH

Non-Commercial Distribution

හිංකාර නාදයෙන් හා ඇතුන්ගේ කුඤ්චනාදයෙන් හා අසුන්ගේ හේෂාරවයෙන් හා මෙඝයන්ගේ ඝනගර්ජිතාවෙන් හා ද්විපද චතුෂ්පද ජාතින්ගේ තුෂ්ටිරාවයෙන් හා අහස් පොළෝ දෙක එකවට[1] ගුගුරන්නා සේ මහත් කොලාහළ විය. එකෙණෙහි බොධීන්වහන්සේගේ ඵලපත්‍ර ශාඛා ආදියෙන් සවනක් ඝන බුඩරශ්මිමාලාවෝ නික්ම මුළු සක්වළ හොබවා සිට ගත්හ. ඒ ආශ්චය්‍ය්‍යීමත් පෙළහර දුටුවාවූ රජ්ජුරුවෝ මහත් වූ පූජා පෙරහරින්[2] ශාඛා මහබොධීන් වහන්සේ පැළලුප්නුවරට වඩා ගෙනවුත් නානාවර්ණ ධ්වජපතාක පුන්කලස්[3] සේසත් ආදි වූ රජ පෙරහරින් වඩ වඩා දෙව් මිනිසුන් සන්තොෂ කරවමින් පූජාපෙරහර කැරවූහ. එසේ හෙයින් කියන ලදී;

ඉති කුසුමපුරෙ සරෙ සරංසා
බහුවිධ චාරු ධජාකුලා විසාලා
සුචිතර[4] පවරොරු බොධිපූජා
මරුනර චිත්තවිකාසිනී අහොසි-යි.

මෙසේ මහත් වූ පූජා කරවා බොධිරක්ෂාවට අටළොස් කුලයෙක පරිවාර සලස්වා සඞ්ඝමිත්‍රා ස්ථවිරීන් වහන්සේ හා සමග භික්‍ෂුණීන් එකොළොස් දෙනකු හා අරිට්ඨ කුමාරයන් ඇතුළු වූ අටළොස් කුලයන් විසින් පිරිවරන ලද බොධීන් වහන්සේ නැවට නංවා මහත් වූ පූජා පෙරහරින් නික්මවා වැඳ අවසර ගෙන ධර්මාශොක රජ්ජුරුවෝ නුවරට ගියහ. එකල බොධීන් වහන්සේ නැගි නැව සඞ්ඝමිත්‍රා ස්ථවිරීන්ගේ ආනුභාවයෙන් තොලස් ව අවුත් ලක්දිවු දනවූ දිට.

එකල දෙවන පෑතිස් රජ්ජුරුවෝ මහ සෙනඟ පිරිවරා පෙර ගමන්කොට ගොසින් අටළොස් කුලන් පිරිවැරූ ශ්‍රී මහා බොධීන් වහන්සේ හා සපිරිවර සංඝමිත්‍රා ස්ථවිරීන් වහන්සේ නොයෙක් පූජෝත්සවයෙන් අනුරාධපුර නුවර මහමෙවුනා උයනට වඩා ගෙනාහ. එකල්හි එම උයන පළමු පිළියෙල කළ භූමි ප්‍රදෙශයෙහි බොධීන් වහන්සේ පිහිටුවන දවස් ඒ ශ්‍රී මහා බොධීන්වහන්සේ රන්කටාරය හා සමග අසූරියනක් අහසට පැනනැඟී සවනක් රස් විහිදුවා බ්‍රහ්මලොකය දක්වා එකාලොක කොට එදවස් හිරු හස්තයට යන තෙක් ආකාශයෙහි වැඩසිටිසේක. එකල්හි ඒ ප්‍රාතිහාය්‍ය්‍යීය දැක දසදහසක් පුරුෂයෝ බුදුසස්නෙහි පැහැද විදර්ශනා වඩා රහත් ව මහණ වූහ. බොධීන් වහන්සේ හිරු හස්තයට යාම හා සමග රෙහෙණ නකතින් බිමට බැස ධර්මාශොක රජ්ජුරුවන්ට අටළොස් වන හවුරුදු මහමෙවුනා උයන්හි පළමු සකස් කළ භූමිප්‍රදෙශයෙහි පිහිටි සේක. එකෙණෙහි මහ පොළෝ ගුගුරා පැන නැංගෑ[5] සෙසු නොයෙක් ආශ්චය්‍ය්‍යී ද පහළ විය. මෙසේ ඒ ශ්‍රී මහා බොධීන් වහන්සේ මහමෙවුනා උයන්හි පිහිටි දවස් ඒ ශාඛා මහා බොධියෙහි පක්‍ව මහා ශාඛාවෙන් පතිත වූ පක්‍ව මහා ඵලයන්[6] රොපණය කොට පිරිත්පැන් වඩා එම විට එකී එකී

1. එකවිට - BCGH කි.
2. පෙළහරින් - H
3. පුන්කලස - CDEHJ
4. සුරුචිර - මහාවංශ, බොධිවංස
5. නැඟ - පිටපත් හැම
6. ඵල ශාඛාවන් - ABCEFJKL
ඵල ශාඛාවෙන් - GH

Non-Commercial Distribution

ඵලයෙන් අට අට පැළයක් බැගින් පැන නැඟී වනස්පති ව සිටි සතලිස් මහාබොධිය ලක්දිව සතලිස් මහා ස්ථානයෙක පිහිටුවා බොධිපූජා කරවූහ[1]. එකල අනුලාදෙවින් ඇතුළු වූ දහසක් ස්ත්‍රීහු සංඝමිත්‍රා ස්ථවිරින් කෙරෙහි මහණ ව රහත් වූහ. රජ්ජුරුවන්ගේ මෙහෙවරින් දඹදිවු ගොසින් සංඝමිත්‍රාස්ථවිරින් හා මහබෝ වඩාගෙනා[2] මහා අරිට්ඨ නම් බෑනණුවෝ ද පන්සියක් පුරුෂයන් හා සමඟ මිහිඳු මහතෙරුන් වහන්සේ කෙරෙහි මහණ ව රහත් වූහ. එකල මහඉසුරුමත් පන්සියයක් දෙනා මිහිඳු මහතෙරුන් වහන්සේ කෙරෙහි මහණ ව ගොස් විසූ තැන්හි කරවූ විහාරය ඉසසර සමණක නම් විය. එසේ ම මහණ වූ පන්සියක් පමණ වෛශ්‍ය භික්ෂූන් විසූ තැන් වෙස්ස ගිරිවිහාර නම් විය. මිහිඳු මහ තෙරුන් වහන්සේ විසූ ගුහාව මිහිඳු ගුහා නම් විය. එකල සංඝමිත්‍රා ස්ථවිරින් වහන්සේ භික්ෂුණී සඞ්ඝයා හා සමඟ යට කියනලද උපාසිකා වෙහෙර විසූසේක. පසුව ඒ මෙහෙණවරැ දෙවන පැතිස් රජ්ජුරුවෝ දෙමහල් මහත් රත්වන් ගෙයක් කරවා ඒ ගෙය සතරදිග පිරිවරා එකි එකී දිග තුනක් තුනක් බැගින් සුළුවා[3] ගෙවල් දෙළොසක් කැරවූහ.

ශ්‍රී මහාබොධීන් වහන්සේ වඩා ගෙනා නැවෙහි කුඹය පලුපතය රීටය යන මේ තුන තුන්තෙනක පිහිටුවා එකි එකී තෙන සුලුවා[3] ගෙවල් එතර සතර බැගින් යළිදු ගෙවල් දෙළොසක් කැරවූහ. එම මෙහෙණවරට නුදුරු තෙන නුවර එක් පසෙක කොළොම් වනළැහැබක් මැද මහුලැතු සිටි ඇත්හල් බිම එම ඇතුගේ අභිප්‍රාය[4] දැන දගබක් බැඳ[5] ධාතු පිහිටුවා වටදගෙයක් කරවා හස්ථාළ්හක විහාරය යි නම් තුබූහ. පසුව ඒ දගෙය සිසාරා හාත්පස එම රජහු විසින් සංඝමිත්‍රාස්ථවිරින් උදෙසා කරවන ලද මෙහෙණවර ද එම නමින් හස්ථාළ්හක නම් විය. එතැන් පටන් සංඝමිත්‍රා ස්ථවිරින් වහන්සේ එහි විසූ සේක. තව ද ඒ දෙවන පැතිස් රජ්ජුරුවෝ සුමන සාමණේරයන් වහන්සේ ගෙනවුත් මීන්තලාගල තිබූ ධාතූන් වහන්සේ ගෙන එම මීන්තලාගල අඹතලවූවෙහි දගබ පටන් කොට ලක්දිව යොදනින් යොදනෙහි දගබ් බඳවා ධාතු වඩා පූජා කරවා පාත්‍ර[6] ධාතූන් වහන්සේ රජගෙයි ම තබා පූජා කළහ.

මෙහි ධර්මාශොක රජ්ජුරුවෝ වනාහි සතුරන් සාධමින් සතර අවුරුද්දක් මුළුල්ලෙහි පළමුවෙන් ඔටුනු නොපැළඳ ම රාජ්‍යය කොට පසුව ඔටුනු පැළඳ එතැන් පටන් යට කී රාජර්ද්ධියෙන් යුක්ත ව රාජ්‍ය ශ්‍රී විඳිමින් තුන් අවුරුද්දක් මුළුල්ලෙහි සැට දහසක් තීර්ථිකයන්ට උපස්ථාන කොට ඔටුනු පළන් සතර වන අවුරුද්දෙහි නිග්‍රොධ මහතෙරුන් වහන්සේ දැක ඔබගේ වචනාදයයෙහි පෙනෙන දශබල ධර්මකාය සම්පත්තිය තමන්ගේ සාහිසය සහිත ඥානචක්ෂුසින් නිරීක්ෂණය කොට අතිප්‍රසන්න ව පින් රැස්[7] කරන්නාහු තමන් මල් තිෂ්‍යකුමාරයන් හා අග්ගිබ්‍රහ්මා නම් බෑනණුවන් හා දෙදෙනා මහණ කරවා මහකෙළ නාරජහු ගෙන්වා බුදු වෙස්

1. කැරවූහ - ABE
2. වඩාගෙන - AFJ
වඩාගෙන ආ - මුද්‍රිත හැම. ස.
3. සුළුපා - BGHKL
4. අභිප්‍රාව - ACEFGHJL; අභිප්‍රා - K
5. බඳවා - BGH
6. පාත්‍රා - BCFG
7. රැස් - (නැත) BEGHKL

Non-Commercial Distribution

දැක නෙත්‍ර පූජා කොට[1] එම සතර වන්නෙහි සයානුකෙළක් ධන වියදම් කොට සුවාසූ දහසක් විහාර කරවන්ට පටන් ගෙන තුන් අවුරුද්දෙකින් සවන්නෙහි විහාර කරවා සමෘඬ කොට එම සවන්නෙහි[2] මිහිඳු කුමාරය සංඝමිත්‍රාය යන රාජනන්දනයන් දෙදෙනා මහණ කරවා අටවන්නෙහි තිස්සය සුමිත්තය යන කුණ්ඩපුත්‍ර වූ මහතෙර දෙදෙනාවහන්සේට[3] ආදහන සත්කාර කරවා සතළොස් වන්නෙහි ශාසනය ශුඬකොට ධර්‍මසඞ්ගායනා කරවා අටළොස් වන්නෙහි ශාඛා මහාබොධීන් වහන්සේ ලක්දිවු ගමන් කරවා එයින් දෙළොස්වන අවුරුදු අසන්ධිමිත්‍රා නම් අගබිසවුන්ට ආදහන සත්කාර කරවා එයින් සතරවන අවුරුදු තිෂ්‍යාරක්‍ෂා නම් යොවුන් පත් බිසවක අගබිසෝ තනතුරෙහි තබා එයින් තුන්වන අවුරුදු ඒ බිසව ජයමහා බොධීන් වහන්සේ කෙරෙහි වෛර බැඳ මරන්ට මඩුකටු ගැසූ පසු එයින් මත්තෙහි සතර අවුරුද්දක් ඇතුළු ව සතිස් අවුරුද්දක් රාජ්‍යය කළහ.

දෙවන පෑතිස් රජ්ජුරුවෝ වනාහි යට කී පරිද්දෙන් මිහිඳු මහතෙරුන් වහන්සේගේ අවවාද පිළිගෙන ආදි කොට මහමෙවුනා උයන්හි මහාවිහාරය කරවා, දෙවැනි ව මීන්තලාගල කරවා, තුන්වැනි ව ථූපාරාම විහාරය කරවා, සතරවැනි ව ශ්‍රී මහා බොධීන්වහන්සේ වඩා, පස් වැනි ව රත්නමාලී චෛත්‍යස්ථානයෙහි ශිලාස්තම්භය පිහිටුවා තමන් මල්[4] චූළාභයනම් රාජකුමාරයන් ලවා[5] ශ්‍රීවාධාතු පිහිටි මහියඞ්ගණ චෛත්‍යය තිස් රියන් කොට බඳවා, සවැනි ව ඉස්සර සමණක නම් විහාරය කරවා, සත්වැනි ව තිසා වැව බඳවා, අටවැනි ව මිහිඳු මහතෙරුන්වහන්සේ මීන්තලා ගලින් අවුත් පළමු දවස් බට තෙන පඨමක නම් චෛත්‍යය හා එම දවස් මහතෙරුන්වහන්සේ සවස මීන්තලාවට නික්ම කොළොම් හොය සිට නැවත වැඩි තෙන නිවත්තක නම් චෛත්‍යය බඳවා, නවවැනි ව වෙස්සගිරි විහාරය කරවා, එසේ ම උපාසිකා විහාරය හත්ථාළ්හක විහාරය යන මෙහෙණවර දෙකක් කරවා, සර්‍වසාධාරණ කොට මහාපාලි නම් බත්හල් ගෙයක් කරවා, ලක්දිව යොදනින් යොදනෙහි දගබක් සංඝාරාමයක් බැගින් හැම එක් ව සුවාසූදහසක් දගබ් හා සුවාසූදහසක් සංඝාරාම කරවා අවුරුදු පතා දහසක් දෙනා වහන්සේට වස් පවරන දවස් ම අටපිරිකර දෙමින්, නාගදිවයින කිරිපලු විහාරය දඹුලුතොට තිස්ස නම් මහා විහාරය නුවරට නැඟෙනහිර පූර්‍වාරාමවිහාරය යන මේකී පියල්ල ම තමන් ඔටුනු පැළඳි පළමුවන අවුරුද්දෙහි ම සමෘඬ කරවා නොයෙක් දහස් ගණන් කුලපුත්‍රයන් හා කුලස්ත්‍රීන් මහණ කරවා ලක්දිව උභයශාසනය පිහිටුවා බුදුන් වදළ සුවාසූ දහසක් ධර්‍මස්කන්ධය පෙරලා දඹදිවින් නොගෙන්වා මිහිඳු මහතෙරුන්

1. කරවා - ACD
   කොට කරවා - EKL
2. සත්වන්නෙහි - සා.කි.පද.
3. වහන්සේගේ - C
4. මල් වූ - BGHL
5. යවා - B

Non-Commercial Distribution

වහන්සේගේ සිත් නමැති භාණ්ඩාරයෙන්[1] පිටත් කරවා දහස් ගණන් ස්ථවිරයන් ආගමධර කරවා ධර්මශාසනය ද පිහිටුවා ලක්දිව සියල්ලෙන් ම සජ්ජීත්[2] නැරවූහ.

මෙසේ ඒ දෙවන පෑතිස් රජ්ජුරුවෝ පළමු වෙළෙඳ ව උපන් සමයෙහි 'පසේ බුදුන් මුහුදින් එතෙර දමා පියව'යි කී අකුශලයෙන් දඹදිව ඉපද ගත නොහී මුහුදින් මෙතර ලංකාද්වීපයෙහි උපන්හ. එදවස් ම පසුව සමසිතින් සමාදන් වූ කුශලයෙහි[3] විපාකයෙන් මහ පින්වත් ව ලංකාද්වීපය[4] ඒකාතපත්‍රකොට මහත් වූ රජසිරි[5] විඳිමින් සතළිස් අවුරුද්දක් රාජ්‍යය කළහ. එසේ හෙයින් කියන ලදී;

පාරවාදික[6] දෙසෙන - ජාතො යං පරසාගරෙ,[7]
පත්තානුමොදනා එවං - ලඞ්කායං ආසි ඉස්සරො-යි.

මෙසේ සත්වයන් තමන් විසින් ම පූර්වජාතිවල කරනලද කුශලාකුශල කර්ම දෙකින් විඳිනාවූ ඉෂ්ටානිෂ්ට විපාක දෙන මේ කථා වස්තුවෙන් අසා දැන තමහට වැඩකැමති පින්වත් සත්වයන් විසින් සිල්වතුන් විෂයෙහි අනාදර නොබැණ තුනුරුවන්හි ගුණ නුවණින් සලකා ශ්‍රද්ධාසම්පත්තීන් යෙදී කුසල්කොට මතු ස්වර්ගමොක්ෂ සම්පත් සිද්ධකරන්ට උත්සාහ කළ මැනවි. කියනලදුයේ මැයි:

පාපම්පි එවං ඵලතීති ඤත්වා
ඤත්වාන පුඤ්ඤස්ස ඵලං ඉදන්ති,
හො යොනිසො කුබ්බථ පුඤ්ඤකම්මෙ
ගන්ත්වාන යෙ යත්ථ න සොචයන්ති යි.

මෙතෙකින් මෙහි
පළමුවන පෙතාතික වස්තුව
කියා නිමවන ලදී.

තව ද මෙහි දෙවන පුත්‍ර[8] වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු;

එක් සමයෙක්හි ලඞ්කාද්වීපවාසී වූ මහණ සැටදෙනකුවහන්සේ බුදුන්ගේ ජය මහාබොධීන් වහන්සේ වඳනා කැමති ව එක් ව කථා කොට ගොස් මාවොටු[9] තොටින් නැවු නැඟී ක්‍රමයෙන් දඹදිවු බැස තමලිංගමු නම් පටුන්ගමට වැඩ එතැන්

1. භාණ්ඩාගාරයෙන් - EFGH ක.කි.සැ.ම.
   භාජනයෙන් - K
2. සජීවිත - ABCDEF
3. කුශලබලයෙහි - ක.කි.සැ.ම.
4. ලංකාද්වීපය ම - C
5. රාජශ්‍රී - DK
6. පරවාදික - BGHL කි.
7. පාරසාගරෙ - BGH ක.බෙ.ම.ස.
8. දේවපුත්‍ර - පිටපත් තැම
   පුත්ත වත්ථු - පාලි
9. මාවටු - BDGHL

Non-Commercial Distribution

පටන් ගම් නියම්ගම් රාජධානි පිළිවෙළින් දනවු සැරිසරා පැළලුප් නුවරට පැමිණ දෙවන දවස් නුවරට සිඟා වන් සේක. එකල්හි ඒ නුවර දුප්පත් මිනිසෙක් සිඟා වඩනා එසැටදෙනා වහන්සේ දැක "බුඩපුත්‍ර වූ සඞ්ඝයා වහන්සේ බොහෝ දවසකින් දැකපුම්හ"යි සන්‍තුෂ්ට වූ සිත් ඇති ව භාර්‍ය්‍යාව කැඳවා "එම්බා සොඳුර, මේ ආර්‍ය්‍යයන් වහන්සේට දනක් දෙන්නා කැමැත්තෙම්: පෙර අපි පින් නොකළ හෙයින් දැන් දුක්පත් වූම්හ: දැන් මේ පින්කෙතෙහි කුසල් නමැති බිජුවටක් රොපණය නොකොළමෝ නම් නැවතත් මෙසේ මෙසේ ම දුක්පත් වම්හ: එබැවින් ගෙයි දෙන්ට නිසි දනවස්තුවෙක් ඇද්දැ"යි විචාළේය. එතෙපුල් අසා ඔහුගේ භාර්‍ය්‍යා තොමෝ "ස්වාමීනි, අපගේ මේ ගෙයි දන් දෙන්ට නිසි කිසි වස්තුවකුත් නැත: එතකුදු උවත් එක් උපායෙක් ඇත: අපගේ මේ දරුවන් මරාපුව හොත් දන් දෙන්ට පිළිවනැ"යි කිව.

එබස් අසා පුරුෂයා කියනුයේ "එම්බල භද්‍රාව, දරුවන් මරා කෙසේ දන් දෙමෝ දැ"යි කීය. එකල්හි ස්ත්‍රී කියන්නී "කිමෙක්ද ස්වාමීනි, මෙපමණකුත් නොදන්නා සේක් ද: අපගේ දරුවන් මළ කල්හි අප දෙපක්‍ෂයෙහි නෑයන් හා සෙසු යහළු මිත්‍රයෝ එපවත් අසා අප සමීපයට එන කල යම්තම් වී නමුත් කන බොන දෙයක් ඇරගෙන එන්නාහු මය; අපි ඒ පඩුරු ඇරගෙන[1] දන් දෙම්හ"යි කිව. එකල්හි ඒ උපාසකයා ද "යහපත,[2] එසේ ම කරව"යි කියා පුතණුවන් මරන්ට උන්ගේ මෑණියන්ට ම භාර කෙළේය. ඊ තොම පුතු මැරිය නොහී ස්නෙහයෙන් කියන්නී "නිලිපුල්පෙති පරයන නිල්නුවන් හා කොසඹ පතට බඳු වූ යහපත් බැම සහළක් ඇති ව අම්ම මෑණියෙනි යි ප්‍රිය තෙපුල් කිය කියා සතුටු වඩවා ඇවිදුනාවූ දුක සේ ලත් එක ම ප්‍රිය පුත්‍රයා කවරක්[4] නම් මැරිය හෙයි ද: ඉදින් මම මරන්නෙම් වී නමුත් එකල්හි අම්ම මෑණියෙනි යි මාගේ නම ම කිය කියා හඬ [යි.][5] එසේ හෙයින් දරුවන් මැරිය නොහෙම්: මාගේ ළය මහ සුළඟින් වෙව්ලන ලද පලලවයක් මෙන් ඉතා ම කම්පා වන්නේය යි කිව. එසේ හෙයින් කියනලදී:

කිච්ඡා ලද්ධං පියං පුත්තං - අම්ම'මොති[6] පියං වදං
සුනීලනෙත්තං සුභමුං - කො පසක්කමිතු මිච්ඡති
මාතරා මාරියන්තොපි - මාතරං එව රොදති,
මාරෙතුං තං න සක්කොමි - හදයං මෙ පවෙධති-යි.

---

1. මෙසේ (නැත) - CDG, ක.කි.කු.ම.
2. ගෙන - BEGHKL
3. යහපතැයි - AJ
4. කවරෙක් - BC
5. හඩකි - පිටපත් හැම
6. අම්ම අම්මාකි - ACDJ

Non-Commercial Distribution

මෙසේ ද කියා ඉක්බිති "ස්වාමීනි, මම දරුවන් මැරිය නොහෙමි: නුඹ අතින් ම මොහු මරාපිය මැනවැ"යි පුතණුවන් උන්ගේ පියාණන් සමීපයට යවූහ[1]. එකල්හි ඔහුගේ පියාණෝ ද පුතණුවන් මැරිය නොහී කියන්නාහු "පිරිමිදරුවෝ තමන්ගේ වැදෑ පියන්ට දුකක් පැමිණි අවසථාවෙහි ඔවුන් ඒ දුකින් ගළවා රක්‍ෂා කරන හෙයින් පුත්‍ර යයි කියනලදහ. පිරිමිදරුවෝ නම් හැම කල්හි ම තමන් වැදෑපියන්ට පැමිණි දුක්සැප සියල්ලට දයාද ව සිටියහ: එසේ හෙයින් ඉතා කන්කලු වූ මිහිරි තෙපුල් කිය කියා ළය සනහනා මා හා එක්වැනි වූ මේ බාල දරුවන් සොඳුර, මම දැන් මරාගත නොහෙමි: තව ද අන් කාරණයෙකුදු ඇත: තමන්ගේ දරුවන් මැරුවාහු මෙම ජාතියෙහි බොහෝ අපකීර්ති අසා සියල්ලවුන් විසින් [කරනු ලබන][2] නින්දවට පැමිණෙන්නාහ: තව ද එම ප්‍රාණාතිපාතය කළාවූ ඒ අකුශලයෙන් මතු ඒකාන්තයෙන් ම බොහෝ දුක් විඳිනාහු මය"යි කීහ. එසේ හෙයින් කියනලදී;

තායන්ති පිතුනො දුක්ඛං - පුත්තා පුත්තානි කිත්තිතා,
පිතු දුක්ඛං සුඛං[3] පුත්තා - දයාද හොන්ති සබ්බද.

තස්මා මෙ සදිසං පුත්තං - පියලකං මඤ්ජුභාසකං,
න සක්කොමි අහං හන්තුං - ජීවිතා තං[4] වියොජිතුං.

අයසං ච අකිත්තිං ච - පප්පොති පුත්තඝාතකො:
පාණාතිපාතකම්මම්පි - කාමං සො ඵුසතෙ නරො-යි.

මෙසේ ද කියා ඉක්බිති උපාසක තෙම "තොපගේ දරුවන් තෙපි ම මරාපියව" යි කියා පුතණුවන් උන්ගේ මෑණියන් සමීපයට ම යැවීය. මෙසේ ඔහු දෙදෙන පුතු මරන්ට උපායක් සොයන්නාහු "අපි දෙදෙන ම මරාපිය නොහෙම්හ: අප වසන මේ ගෙය පිටිපස්සෙහි තුඹස ඇතුළෙහි මහත් නාගරාජයෙක් වෙසෙයි: මේ දරුවන් එතැන්හි යවම්හ: ඒ නාගරාජයා මොහු දෂ්ට කොට මරන්නේය"යි මෙසේ ඔහු දෙමහල්ලෝ මේ උපාය සිතා ඒ තමන්ගේ පුතණුවන් කැඳවා අඳුන්තෙල් ගා වැල්වළලු ආදියෙන් සරහා ඔවුන් අතට හුවටක් දී "එම්බා පුතණ්ඩ, ගෙය පිටිපස්සෙහි තුඹස සමීපයට ගොසින් කෙළනැ"යි කියා යවූහ. එකල්හි ඒ බාල දරුවෝ දෙමවුපියන් කී පරිද්දෙන් ම ගොස් හුවට උඩ දම දමා කෙළනාහු අත වැරද තුඹස් බිලයෙහි හුවට එළාපීහ. ඉක්බිති කුමාරයෝ "හුවට ඇරගන්මි" සිතා තුඹස් සිදුරෙහි අත එවූහ. එකල්හි එහි වසන නාගරාජයා කිපී කම්මල් සමක්

1. යවූය - බෙ. ස.
2. කරනු ලබන (නැත) පිටපත් හැම, ස
3. දුක්ඛසුඛං - ACDEJ
4. නං - BCH
5. එක් - ක.සි.සැ.ම.

Non-Commercial Distribution

මඩනා සේ සුස්මමින්[1] මහත් වූ පෙණය[2] කොට තුඹස් බිලයෙන් හිස ඔසවා මරහු අතින් ගිලිහී බිම හුණු මාරපාසයක් මෙන් අති භයංකර ව කුමාරයන් මුහුණ බලා සිට ගත: එවේලෙහි කුමාරයෝ තමන් කිසිවක් නොදන්නා ඉතා බාල හෙයින් නයා බව නොදැන ඔහුගේ ග්‍රීවය තද කොට අල්වා ගත්හ. එකල්හි ඒ කුමාරයන්[3] මව්පිය දෙදෙනාගේ ශ්‍රද්ධාබලයෙන් නාරජ්ජුරුවෝ කැමැති කැමැති වස්තු දෙන තමන් කරබඳනා අෂ්ටාංශ[4] වූ මාණික්‍යරත්නය කුමාරයන්ගේ හස්තතලයෙහි එළූහ. එකෙණෙහි ඒ කුමරුගේ මවුපිය දෙදෙන තමන්ගේ බාලදරුවන් කරන ඒ සියලු ක්‍රියාව බල බලා පැළදෙර සමීපයෙහි නොපෙනී සිටියාහු කුමාරයන් නාරජුගේ ග්‍රීවය ඇල්වූ නියාව ද උන්ගේ අත්ලෙහි බබලන්නාවූ මාණික්‍යරත්නය ද යන සියල්ල ම දැක වහා දිවගෙන ගොස් පුතණුවන් ඔසවා වඩාගෙන අත තුබූ මාණික්‍යරත්නය ඇරගත්හ. ඉක්බිති ඔහු ඒ මාණික්‍යරත්නය සුදු[5] අතුට සරහන ලද පිරිසුදු[6] ආසනයක් මත්තෙහි තබා මල් පහන් සඳුන් සුවඳ ආදිය පුද සත්කාර කොට "අපට වස්තු දුන මැනවැ"යි ආරාධනා කොට මාණික්‍යරත්නයට පැන් ඉස්සහ. ඔවුන් කැමති කැමති වූ වස්තු සියල්ල ම ඉන්‍ද්‍රජාලයක් මෙන් එකෙණෙහි නිර්මිත ව පෙනී ගියහ. මෙසේ ලබනලද වස්තු ඇත්තාවූ ඒ දෙමහල්ලෝ එම මාණික්‍යරත්නයෙහි ආනුභාවයෙන් තමන්ගේ ගෙදෙර සමීපයෙහි මහත් වූ මණ්ඩපයක් කරවා උඩ සුදුවියන් ආදියෙන් අලඞ්කාර කොට බිම සුවඳ පිරිබඩ ගෙන ලද පස්මල් ඉස සුවඳ තෙලින් පහන් දල්වා හිඳිනා අසුන් පනවා ලඞ්කාවීපයෙහි සිට අමුතු ව[7] වැඩි යටකී සැටදෙනා වහන්සේට ආරාධනා කොට කැඳවාගෙන අවුත් වඩාහිඳුවා මෙනම් දෙයෙක් මෙහි නැතැයි නොකියන පරිද්දෙන් මහදන් දුන්හ.

ඉක්බිති පැළලුප් නුවර වාසීහු ඒ මාණික්‍යරත්නයෙහි ආනුභාවය අසා බොහෝ දෙන රැස්වූහ. ඔහු දෙමහල්ලෝ නුවරවැසි[8] ඒ මහජනයා මධ්‍යයෙහි තමන්ගේ ශ්‍රද්ධාබලයෙන් ඒ මාණික්‍යරත්නය ලත් බව ආදියෙහි පටන් ප්‍රකාශ කොට කියා මේ මාණික්‍යරත්නය දනවිෂයෙහි ම පරිත්‍යාග කරම්හ යි එක් තෙනක නිධාන කොට පිහිටුවා එම මාණික්‍යරත්නයෙහි ආනුභාවයෙන් දන් දෙමින් සිල් රකිමින් පොහොය පෙහෙ වෙමින් බොහෝ කුසල් කොට ආයු කෙළවර දෙවුලොව උපන්හ. මෙසේ මේ මනුෂ්‍ය ලොකයෙහි සමහර ශ්‍රද්ධාවන්ත සත්පුරුෂ සත්වයෝ තමන් වැදූ දරුවන් කෙරෙහි පවා ප්‍රේමය සිඳ හැරපියා මතු ලබන්නාවූ ස්වර්ග මොක්ෂ සම්පත් පිණිස දන් දෙන්නාහු මය. එබැවින් දනයෙන් සිඩ වන විපාක විශෙෂය විශෙෂයෙන්

---

1. සුස්ම සුස්මින් - C
   සුස්වමින් - ක.කි.ඤ.
2. පණය - ABCJKL ස.
3. කුමාරයන්ගේ - KL
   කුමාරයන් (නැත) - ක.කි.ඤ.ම.
4. අෂටාංග - ACDEGHKL , ක.කි.බෙ.
5. සුදු ඇතිරිලි - B
6. පිරිසිදු වූ - CEGJKL
7. අමුත් ව - ක.කි.ඤ.ම.
8. නුවරවාසී - ABGHKL

Non-Commercial Distribution

සිහි කරන්නාවූ දන් දෙන්ට පොහොසත් සම්පත් ඇති[1] කවර නම් මනුෂ්‍යයෙක් දන් නොදේ ද? ඒකාන්තයෙන් දෙන්නේ මය; එසේ හෙයින් පින්වත් සත්ත්වයෙනි, තම තමා ශක්ති පමණින් පිළිවන් කුසල් කොට ස්වර්ග මොක්ෂ සම්පත් සාධාගත මැනවි. කියන ලද්දුයේ මැයි;

ජෙත්වාන පෙමං අපි අත්‍රජෙසු
දදන්ති දානං ඉධ මානුසෙවං,[2]
න දාති[3] කො නාම නරො සම්ධො
දානං හි දානස්ස ඵලං සරන්තො-යි.

මෙතෙකින් මෙහි
දෙවත පුත්‍ර[4] වස්තුව
කියා නිමවන ලදී.

තව ද මෙහි තුන්වන ස්වර්ණතිලකා වස්තුව නම් කවර යත්. එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු;

ලඞ්කාද්වීපයෙහි අනුරාධපුර නුවර ශ්‍රද්ධාවන්ත වූ එක්තරා ස්ත්‍රියක් නිරන්තරයෙන් මල්කඩා ගෙනවුත් අභයගිරි වෙහෙර දාගබට පූජා කරන්නීය. ඉක්බිති එක් දවසෙක ඒ ස්ත්‍රීතොමෝ තමාගේ බාලදූවක් කැඳවාගෙන දාගබට මල් පුදන පිණිස ගොසින් මලසුන් ගෙයි පැන් නොදැක මල්පැස දූව අතට දී පැන් ගෙනෙනු සඳහා කළය ගෙන පොකුණට ගියාය. එ කල්හි ඒ ස්ත්‍රියගේ දූ තොම මලස්න නොසෝධා අත ශුද්ධ නොකොට තමාගේ මව නොඑන තෙක් ම මල් මිටක් ඇරගෙන මණ්ඩලාකාරයෙන් වට කොට පුද මෙසේ ප්‍රාර්ථනා කළාය. කෙසේද යත්.

මහත් වූ වීර්‍ය්‍ය ඇති අනන්තඥානයෙන් යුක්ත වූ ස්වයම්භූඥානයෙන් සියල්ල ගෙවා දත්තාවූ මුළුලොවට හිතාන්වෙසී වූ තුන් ලොවට අසහාය නායක වූ ලොකස්වාමී වූ අනාථ නාථ වූ භාග්‍යවත් වූ ත්‍රෛලොක්‍ය ශාස්තෘ වූ බුදුරජාණන් වහන්සේ උදෙසා දැන් මා විසින් පුදන ලද්දවූ මේ මල් පූජාවෙහි අනුසසින් මතු සසර මම උපනුපන් ජාතියෙහි යහපත් රූ ඇති වෙම්ව යි මනොඥ වූ ආරෝහපරිණාහයෙන් යුක්ත වෙම්ව යි ශරත් කාලයෙහි ගුවන් මැද දිලියෙන සූර්‍ය්‍යමණ්ඩලය පරිද්දෙන් මාගේ සියලඟින් රශ්මිමාලාවෝ විහිදෙත්ව යි මා දුටුවා වූ යම්ම පුරුෂයෙක් කාමයෙන් මූර්ඡාව හෙව යි ලියකිඳුරන්ගේ නාද මෙන් සියල්ලවුන් ළගන්නා ඉතා කන්කලු වූ මිහිරි කටහඬ ඇති වෙම්ව යි යනාදීන් මෙසේ ප්‍රාර්ථනා කළා ය. එසේ හෙයින් කියනලදි;

1. ඇති ව - J
2. මානුසෙවි - KL
3. දෙති - BD . මුද්‍රිත හැම, ස.
4. දෙවපුත්‍ර - සිටපත් හැම
පුත්ත වත්‍ථු - පාලි

Non-Commercial Distribution

මහාවීරස්ස ධීරස්ස - සයම්භුස්ස මහෙසිනො,
තිලොකගගස්ස නාථස්ස - භගවන්තස්ස සත්ථුනො.

යමහං පූජයිං පුප්ඵං - තස්ස කම්මස්ස වාහසා,
රූපිනං පවරා හෙස්සං - ආරොහපරිණාහවා.

මං දිස්වා පුරිසා සබ්බෙ - මුය්හන්තු කාමමුච්ඡිතා,
නිච්ඡරන්තු සරීරා මෙ - රංසිමාලීව රංසියො.

හදයඞ්ගමා කණ්ණසුඛා - මඤ්ජුවාණී මුඛා[1] මම,
කින්නරානං යථා වාණී - එවමෙවං පවත්තතු-යි.

මෙසේ මල් පුද ප්‍රාර්ථනා කළ ඉක්බිති ඒ කුමාරිකාවන්ගේ මෑණියෝ අවුත් තමන් දියණියන් මලස්න ශුඩ නොකොට මල් පිදූ බව දැක "එම්බල චණ්ඩාල කෙල්ල, අත්‍යන්ත නිර්මල වූ බුදුරජාණන් වහන්සේට මලස්න නොසෝධා කුමක් පිණිස මල් පිදී ද: තී කෙළේ කටයුත්තෙක් නොවේ"යි කීහ. ඒ අසා කුමාරිකාවෝ මෑණියන්ට කිපී "චණ්ඩාලකෙලි නම් තෙපි ම යැ"යි කියා තමන් මෑණියන්ට බිණූහ. මෙසේ ඒ කුමාරිකාවෝ මෙපමණ [කුසල් අකුසල්][2] කොට මෑතභාගයෙහි එයින් චුත ව දඹදිව උත්තර මධුරා නම් නුවර වීණා ගායනා කරන එක්තරා චණ්ඩාල බ්‍රාහ්මණයක්හට දූව උපන්හ: එකල්හි පළමු කළ ප්‍රාර්ථනා වූ පරිද්දෙන් විශිෂ්ට වූ රූ ඇති වූහ: ඔවුන්ගේ සියලඟින් විදුලිය කළඹක් වැනි රශ්මි[මාලා][3] සමූහයෝ නික්මෙති: හාත්පසින් සතර රියන්[4] පමණ තන්හි ශරීරාලොකයෙන් ම අන්ධකාර දුරු ව එකාලොක වෙයි: මුඛයෙන් මහනෙල්මල් සුවඳ හමා බස්සී: ශරීරයෙන් සඳුන් සුවඳ වහනය වෙයි: ඔවුන් දෙතන මැද රන්වන් වූ තිලකාභරණයෙක් මැවිණ: ඒ තිලකාභරණයෙන් අභිනව බාලාර්ක මණ්ඩලය සේ රශ්මි සමූහයෝ නික්මෙති: ඒ කුමාරිකාවන් දුටු දුටු පුරුෂයෝ බොහෝ සේ උමතු වූවන් මෙන් කාමයෙන් මත් ව විසංඥ වෙති: අහෝ කුශලාකුශල කර්මයන්ගේ[5] ආනුභාවය නම් ඉතා නොසිතිය හැක්කේ මැයි. හේ එසේ මැයි;

ගිය ජාතියෙහි ඒ කුමාරිකාවෝ යම් ක්‍රොධයක් හෙතු කොට ගෙන තමන් වැදූ මෑණියන්ට "චණ්ඩාල කෙල්ල"යි බිණුවාහු ද ඒ අකුශල කර්මය නිසා උත්තම ජනයන් විසින් පිළිකුල් කටයුත්තාවූ හීනජාතියෙහි චණ්ඩාල ව උපන්හ. එම කාලයෙහි ඒ කුමාරිකාවෝ බුදුන්ගේ තුන් ලෙවුහි ව්‍යාප්ත ව සිටි නව අරහාදි වූ ගුණ ධර්මයන් සලකා යම් මල් පූජාවක් කළාහු ද ඒ කුශලකර්මයාගේ ආනුභාවයෙන් බැලූ බැලූවන්ට ඉතා ප්‍රියකරු වූ මනොඥ වූ රූ ඇති වූහ. මේ ලොකයෙහි යම්කිසි

1. සුභා - ක.කි.කැ.ම. පාලි
2. කුසලාකුසල් - පිටපත් හැම
3. රශ්මි - පිටපත් හැම
4. රියනක් - BGH
5. ධර්මයන්ගේ - ABCGHJL

Non-Commercial Distribution

නොනෙක් යම් යම් ආකාරයකින් පින් පවු දෙක ම කළාහු වී නම් ඔහු තමන් විසින් කරනලද්දවූ ඒ ඒ කුශලාකුශල කර්‍මයට සුදුසු සුදුසු පරිද්දෙන් මනොඥ වූ නානාවර්ණ වූ මොනරුන් මෙන් එහි විපාක ලබන්නාහු මය. මයූරජාතීහු වනාහි පූර්‍වජන්මයෙහි කළ එක් අකුශලයකින් තිරිසන් යොනියෙහි උපදනාහ; අතික්[1] කුශලකර්‍ම බලයකින් නානාවර්ණ ව ඉතා පැහැපත්[2] වූ වර්ණසෞන්‍දර්‍ය්‍යයෙන් යුක්ත වෙති. එබැවින් මොනරුන් තිරිසන් යොනියෙහි උපදනේ අකුශලකර්‍මයෙන් මය, නානා වර්ණ ව නොයෙක් පැහැයෙන් යුක්ත ව රූපත් ව උපදනේ පූර්‍වජන්මවල කළාවූ වෙන වෙන කුශලකර්‍මයෙන් මය යි මෙසේ මොනරුන්ගේ කුශලාකුශල කර්‍මවිභාගය මෙකී පරිද්දෙන් දත මැනවි. එසේ හෙයින් කියනලදී;

යෙන සා කොධසා මාතු - චණ්ඩාලී ඉති භාසි ච,[3]
තෙන සා ආසි චණ්ඩාලී - ජිගුච්ඡා[4] හීනජාතිකා.

සලලකෙඛ්තවාන සම්බුධ - ගුණං පූජෙසි යං තදා,
තෙන පුඤ්ඤානුභාවෙන - සාසිරූපි මනොරමා.

යෙන යෙන පකාරෙන - පුඤ්ඤපාපානි යො කරෙ,
තස්ස තස්සානුරූපෙන - [මොරෝ'ව][5] ලභතෙ ඵලං.

පාපෙන ච තිරච්ඡානෙ - ජායන්ති කුසලෙන තෙ,
වණ්ණපොක්ඛරතා හොති - මොරානං කම්මමීදිසං-යි

ඉක්බිති ඒ කුමාරිකාවන්ගේ මවු පිය දෙදෙන ඔවුන්ට සවර්ණතිලකාය යි නම් තුබූහ. එකල්හි ඒ උත්තරමධුරා නම් නුවර මනුෂ්‍යයෝ ඒ කුමාරිකාවන්ගේ රූපසම්පත්තිය ඇසීමෙන් හා දැකීමෙන් ඔවුන් කෙරෙහි අතිශයින් ම ඇලුණාවූ සිත් ඇත ද මෝ තොමෝ සැඩොල් දුවකැයි අනුන් කියන නින්ද බසට හයින් ආවාහ කොට නොගෙන යෙති.

ඉක්බිති ඒ උත්තර මධුරා නම් නුවර නායක චණ්ඩාලබ්‍රාහමණයාගේ පුත්‍රයෙක් ඒ සවර්ණතිලකාව නිසා ඇගේ මවුපියන් සමීපයට වස්ත්‍රාභරණ මල් බුලත් ආදිය [ගෙන ගොස්[6]] දී සවර්ණතිලකාව පාවා දුන මැනවැයි කියා යවීය. ඔහු එපවත් සවර්ණතිලකාවන්ට කීහ. ඕතොමෝ එපවත් අසා චණ්ඩාල බ්‍රාහමණයාගේ පුත්‍රයාට පිළිකුල් ව නොයෙක් ආක්‍රොශ පරිභව බැණ නින්ද කළාය. එකල්හි බ්‍රාහමණ පුත්‍රයා මහත් වූ ලජ්ජාවට පැමිණ රජ්ජුරුවන් සමීපයට ගොස් තමාගේ වීණාව මුසන් පිටුවා සද ගායනා කරනුයේ;

---

1. අතික් අතික් - ACDJ
2. යහපත් - BEGHL
3. භාසිකා - ක.කි.ඤ. පාලි
4. ජේගුච්ඡා - බෙ. ස.
5. මොරාව - BDEGHL
   මොරූව - ACJ
   මොරෝව - මුද්‍රිත හැම, පාලි.
6. ගෙනගොස් (නැත) -පිටපත් හැම

Non-Commercial Distribution

ලලනානනානි චල ලොචනානි
තරුණාරුණානි චලිතාධරානි,
මනුජෝ[1] හි [යො][2] නෙත්තවිසයං[3] කරොති
සතු නීචජාතිමපි නො ජහාති[4]

යනාදීන් "ජනප්‍රධාන වූ රජ්ජුරුවන් වහන්ස, ඔප්නැඟූ රන් කැඩපතක් මෙන් බබළන්නාවූ ස්ත්‍රීන්ගේ මුහුණ දැල බැඳුණු මසුන් මෙන් චලිත ව ලීලොපෙත වූ නෙත්‍රයන් ඇත්තේ ද තරුණ හිරුරස් කළඹක් මෙන් අරුණවණී ව ලෙල දී දිලිසෙන්නාවූ අධර යුග්මයක් ඇත්තේ ද එබඳු රූපත් වූ මනහර මුහුණු යම් පුරුෂයෙක් තමා සිය ඇස පුරා දැකපි නම් ඒ තෙම එවැනි රූපසම්පත්තීන් යුක්ත ස්ත්‍රීන් හීනජාතියෙහි උපනත් නොහරනේ මය"යි කීය. එතෙපුල් අසා "කිමෙක් ද තා කියන්නේය" යි රජ්ජුරුවන් පුළුවුත් කල්හි නැවත කියනුයේ,

සමෙති කිං දෙව ජමාය මත්තිකා
කදචි චාමීකර ජාතිකාය,
සිගාල ධෙනු අපි නීචජාතිකා
සමෙති කිං සීහවරෙන දෙව

යනාදීන් "දේවයන් වහන්ස, දෙවියන්ගේ උපභොග පරිභොගයට සුදුසු ව සිටි චාමීකර ස්වණීය හා මහ පොළොව පියවි පස් කවර කලෙක කෙසේ නම් එක් වේ ද නැවත සිවුපා ජාතීන්ගෙන් හීන වූ කැනහිල් ධෙනුවක් තොමෝ උතුම් වූ සිංහරාජයකු හා එක් ව කෙසේ නම් සමාගම් වේ දැ"යි කී ය. මෙසේ ද කියා නැවත "ඇසුව මැනව දේවයන් වහන්ස, මේ උත්තර මධුරා නම් නුවර ස්වර්ණතිලකා නම් වූ එක් සැඩොල් දුවක් ඇත; ඕතොමෝ තමා හා සමාන ජාති ඇති පුරුෂයන් විසින් එවනලද පඬුරු නොගන්නීය; වංශවතුන් ම ප්‍රාර්ථනා කෙරෙයි, කිමෙක් ද දේවයන් වහන්ස, පක්ෂීන්ගෙන් හීන වූ කපුටු[5]ධෙනුවක් තොමෝ කවර කලෙක ස්වර්ණහංසරාජයකු හා සමඟ කෙසේ නම් සමාගම වේ දැ"යි[6] කීය. එතෙපුල් අසා රජ්ජුරුවෝ ස්වර්ණතිලකාවගේ පියාණන් කැඳවා "එම්බල සගය, තාගේ දුවක් කුලවන්තයන් මිස සමාන ජාති ඇති පුරුෂයන්[7] නොකැමැත්තී ලු; කිමෙක් ද ඒ සබා දැ"යි විචාළහ.

එකල්හි ඒ චණ්ඩාල බ්‍රාහමණයා "එසේය දේවයන් වහන්ස, මාගේ ස්වර්ණ තිලකා නම් වූ දූ තොමෝ ජාතිසම්පන්න කුලපුත්‍රයන් මිස සෙස්සවුන් නොකැමැත්තී ය"යි කීය. එබස් අසා රජ්ජුරුවෝ "එම්බල සගය, එසේ වී නම් පඤ්චමධුරා නම් නුවර උද්දල නම් බමුණෙක් වෙසෙයි; ඒ බ්‍රාහමණයා ඉතා ජාති සම්පන්නය; මවුපිය

1. මනුංජාතු - J
2. යො (නැත) - පිටපත් හැම
3. නෙත්තපියං - D, මුද්‍රිත හැම, ස. පාලි.
නෙත විසයං - L
4. පහාති - J
5. කවුඩු - ක.කි.කැ ම.
6. සමාගම් ව වෙසේ දැයි - ක.කි.කැ..
7. මිස සෙස්සවුන් - BEGHL

Non-Commercial Distribution

දෙපක්‍ෂයෙන් ම අනින්දිතය, සත්‍රීන් දුටු කල්හි මොහු ජුගුප්සා[1] කටයුතු වූ ඉතා පිළිකුල් ජාතියෙකැ"යි හිඳු බැණ ඔවුන් හා සහවාසය නොකෙරෙයි: තමා වසන ගෙන් නික්ම රජගෙට යන එන වේලෙහි කිරිපැන් සොළොස් කළයක් මගදිග්[2] ඉස්වයි: ගැහැණුන් දුටු කල කාළකණ්ණියක දකපිම් යි කිරිපැනින් මුහුණ්[3] ශුධ කෙරෙයි: එබැවින් තාගේ දූ සමපැමි වූ නම් ඒ බමුණා හා සහවාසය කෙරේව යි මෙසේ මා කී ලෙස ම තාගේ දුවට කියා බලගැ"යි[4] කීහ.

එකල්හි ඒ චණ්ඩාල බ්‍රාහමණයා එබස් අසා තමා වසන ගෙට ගොස් ස්වර්ණතිලකාව කැඳවා ඈට රජ්ජුරුවන් කී පරිද්දෙන් ම උද්දල බ්‍රාහමණයාගේ ස්වරූප නොවළහා ම කීය. එතෙපුල් අසා ස්වර්ණතිලකා තොමෝ "මම ඉඳින් සැබවින් ම ගැහැණියක් වී[5] නම් ඒ උද්දල බ්‍රාහමණයා හා[6] වාසය කෙරෙමි මය: ඊට කිසි සැකයක් නොසිතා ඉතා ප්‍රසන්‍ව නොකොට කල් නොයවා උදසන්හි ම නික්මුණ මැනව: සෙට දවස් ම යෙමි"යි කිව.

එකල්හි ස්වර්ණතිලකාවගේ පියා ද යහපතැයි ගිවිස විසිතුරු වූ කම්හන ඇති දහසක් වටනා පලසකින් දුවගේ ශරීරය වසා පොරවා තමා ගායනා කරන වීණාදි වූ තූර්යභාණ්ඩ ගෙන්වා ගෙන ස්වර්ණතිලකාවන් හා සමහ මග බැස නික්මිණි. මෙසේ නික්මුණාවූ ඒ චණ්ඩාල බ්‍රාහමණතෙම අතරමහ එක් නුවරෙක[7] රජ්ජුරු කෙනකුන් දැක වීණා ගායනා කරනුයේ ස්වර්ණතිලකාව තමා පිටිපස හිඳිනා සේ සලස්වා තෙමේ වීණා ගායනා කරන්ට පටන් ගත. එකල්හි ඕහු පිටිපස හුන්නාවූ ස්වර්ණතිලකා තොමෝ නුවන් කෙළවරින් දෘෂ්ටිය හෙළා ස්වකීය වූ ස්ත්‍රීලීලාවෙන් යුක්ත ව මදලස බැල්මෙකින් රජහු මුහුණ බලා තමා පෙරව හුන් පලස මඳක් පහකොට ශරීරප්‍රභා දක්වාලූව. රජ්ජුරුවෝ ඈගේ ශරීරාලොක හා රූපසම්පත්තිය දැක කාමයෙන් විසංඥ ව සිහි මුළා ව මඳ ඇසිල්ලකින් ලබනලද ආස්වාද ඇති ව "මෝ තොම සස්වාමික ද අස්වාමික දැ" විචාරා "අස්වාමිකය එතෙකුදු වුවත් සැඩොල් දුවක" යනු අසා අනුන් බණන නිඳු බසට හයින් ස්වර්ණතිලකාව අන්තඃපුරයට ගත නොහී "මෙබඳු වූ වර්ණසෞන්දර්‍යයක් හා රූපසම්පත්තියකින් යුක්ත වූ ස්ත්‍රීරත්නයක් නොලබන්නාවූ මට ජීවිතයෙන් ප්‍රයෝජන කිම් දැ" යි ශොකාතුර ව නොයෙක් ප්‍රලාප කියා හඬමින් කාමයෙන් මත් ව කටයුතු නොකටයුතු සලකා ගත නොහී කඩුව ගෙන තමන් හිස තුමූ ම කපා මළහ. මෙපරිද්දෙන් ම පඤ්චමධුරා නුවරට යන අතරමහ රාජධානි පසෙක රජදරුවෝ පස්දෙනෙක් ඈගේ රූපසම්පත්තිය දැක කාමයෙන් මත් ව කඩු ගෙන තමන් හිස් තුමූ ම කපා මළහ. හේ එසේ මය.

---

1. ජිගුප්සා - BCEJ
   පිගුප්සා - G
   ගිගුප්සා - A; ජිගුස්සා - L
2. මගදිගට - ක.කි.ඍ.බෙ.ස.
3. මුහුණ සෝධා - EGHL ක.කි.ඍ.ම.
4. බලවයි - ADEJL
   බලැයි - B
   බලයි - GH
5. වීම් - ක.කි.ඍ.ම.
   වින් - L
6. හා එක් ව - BGHL ඍ.
7. මිහනුවරෙක - *BEGHL*, ක.කි ඍ.

Non-Commercial Distribution

සත්වයෝ රත්රන් අමුරන් ආදිය හා දැසිදස් පුත්‍රදරාදි වූ ප්‍රිය වස්තූන් නිසා වස්තුකාම ක්ලේශකාමයෙන් මූර්ඡා ව නොයෙක් ව්‍යසනයට පැමිණෙන්නාහු මය. පුත්‍රදරාදි වූ ඒ ඒ මනාප වස්තුයෙහි ප්‍රිය වීමය ප්‍රෙම ඉපදවීමය සිත් ඇලවීමය කැමැති වීමය තෘෂ්ණාවීමය යි[1] මේ පසින් එක්තරා කාරණයක් මුල් ව ශරීර [ශොෂණය][2] කරන්නාවූ ශොකය ද කායචිත්ත සන්තාපය[3] කරන්නාවූ භය ද යන මේ දෙක ම සත්වයන්ට උපදනේය: ඒ ප්‍රියභාවාදි වූ පසින් විශෙෂයෙන් ම මිදී සිටියා වූ බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ ආර්‍යශ්‍රාවකාදි වූ විශුද්ධ සත්වයන්ට කිසි ශොකයෙකුත් නැත: භය සන්ත්‍රාස[4]ය යි යන දෙයෙක් එකාන්තයෙන් නැත් මය. බුදුන් විසිනුදු වදරන ලද මැයි;

පියතො ජායතී සොකො - පියතො ජායතී භයං,
පියතො විප්පමුත්තස්ස - නත්ථි සොකො කුතො භයං.

පෙමතො ජායතී සොකො - පෙමතො ජායතී භයං,
පෙමතො විප්පමුත්තස්ස - නත්ථි සොකො කුතො භයං.

රතියා ජායතී සොකො - රතියා ජායතී භයං,
රතියා විප්පමුත්තස්ස - නත්ථි සොකො කුතො භයං.

කාමතො ජායතී සොකො - කාමතො ජායතී භයං,
කාමතො විප්පමුත්තස්ස - නත්ථි සොකො කුතො භයං.

තණ්හාය ජායතී සොකො - තණ්හාය ජායතී භයං,
තණ්හාය විප්පමුත්තස්ස - නත්ථි සොකො කුතො භයං--යි.

ඉක්බිති ඒ චණ්ඩාල බ්‍රාහ්මණයා හා ස්වර්ණතිලකාව හා[5] දෙදෙන අනුක්‍රමයෙන් දුරුකතර ගෙවා පඤ්චමධුරා නම් නුවරට ගොස් තමන් ආ බව රජ්ජුරුවන්ට කියා යවා එන්ට කියව යි කැඳවූ කල්හි රජගෙට වැද රජ්ජුරුවන් දුටහ.

එකල්හි එනුවර යට කී උද්දල බ්‍රාහ්මණයා රජ්ජුරුවන්ට නුදුරු ව බඳපුටුවෙක පළසක් මත්තෙහි හුන්නේය. ගාන්ධර්ව බ්‍රාහ්මණයා ද රජහු වැඳ අවසරගෙන වීණා ගායනා කෙරෙමින් ස්වර්ණතිලකාව හා සමග එකත්පස් ව හුන්නේය. එකෙණෙහි තමා පියාණන්[6] පිටිපස්සෙහි උන්නාවූ ස්වර්ණතිලකා තොමෝ "උද්දල බ්‍රාහ්මණයාණෝ නම් කවුරු දැ"යි විචාරා තෙල හදුපීඨය මත්තේ හිඳිනාහු ඒ බ්‍රාහ්මණයාණෝ යැ"යි කී කල්හි තමාගේ නිලිපුල් පෙති දෙකක් හා සමාන නිම්මල වූ සුනිල් නෙතින් ඔහු බලන්නී, කොඳකැකුළු මෙන් සුදු සිනිඳු දත්පෙළෙහි මනහර සුදු රසින් හිනාවණී වූ අතිරක්ත අධරයුග්මය පොපි දෙවා මඳ මඳ සිනා පහළ කෙරෙමින් උද්දල බ්‍රාහ්මණයා මුහුණ බලා තමා පෙරව ගෙන උන් පළස මඳක් පහකොට ශරීරප්‍රභා

---

1. තෘෂ්ණාවය යි - BEGHJL
2. ශෝෂණය - AJ
   සොශන - B
   ශෝෂනය - CE
   පෝෂනය - DGHL
3. සන්තාපනය - B
4. සන්තාප - BCDGH; සන්තාශ - L
5. ස්වර්ණතිලකාව හා - BCEGHL ස.
   ස්වර්ණතිලකාව - J
   ස්වර්ණතිලකාවන් - ම.
   ස්වර්ණතිලකාවත් - AD, ක.සි.සැ.ස.
6. පියා - ABCEGHJL

Non-Commercial Distribution

විහිදුවාලූව. හිරුරැස් කලබක් වැනි ඒ ශරීරාලොකය දැක උද්දල බ්‍රාහ්මණයා ඉතා ආශ්චර්‍ය්‍යීමත් ව කවර ආලොකයෙක් දෙ හොයි විස්මය පත් ව බලනුයේ සුවර්‍ණතිලකාව දැක කාමයෙන් උමතු ව මහත් වූ ශොකයෙන් දහගත් ශරීර ඇති ව හුණු වූ ආශ්වාස ප්‍රශ්වාසයෙන් පිරුණු මුඛ නාසිකා හා කඳුලුධාරාවෙන් තෙත්වූ නෙත්‍ර ඇති ව විසංඥ විය.

ඉක්බිති මඳ ඇසිල්ලකින් ලබනලද ආස්වාද ඇති ඒ බ්‍රාහ්මණ තෙම බලවත් රොගයකින් පීඩිත වූ පුරුෂයකු මෙන් කෙඳිරි ගගා රජගෙන් නික්ම තමා වසන ගෙට ගොස් යහළුමිත්‍රයන් කැඳවා ඔවුන්ට කියනුයේ "එම්බා යහළුවෙනි, යම් කිසි මිත්‍ර කෙනෙක් ආපදර්‍ථයක් පැමිණි කල්හි තමන්ගේ යහළුවන් අත් නොහැර සමීපයට එළඹ සිටිද් ද දුක්සැප දෙක්හි සම වූ සිත් ඇත්තාහු ද මිත්‍රයන්ගේ යහපත් ගුණය ප්‍රකාශ කෙරෙද් ද ඇසූ කෙනකුන් නිඥ කටයුතු නුගුණයක් ඇත සඟවා වෙසෙද් ද කළමනා කටයුත්තෙහි යොදද් ද නොකළමනා දෙය වළකද් ද මිත්‍රයෝ නමුත් ඔහු මය: නැයෝ නමුත් ඔහු මය: කාමයෙහි ඉතා ලොල් වූ සුවර්‍ණතිලකා නම් ස්ත්‍රියක් තමාගේ තිල්නුවන් නමැති තද වූ ශරප්‍රහාරයෙන් මාගේ සිත් නමැති ශරීරය විද කඩ කඩ කොටපුව, ඇගේ මුඛ නමැති රත්පියුමෙහි ඇලුම් කළාවූ මාගේ නෙත්‍ර නමැති භෘඞ්ගයෝ දෙදෙන මඳකුත් මා සිහි නොකොට සුවර්‍ණතිලකාවගේ මුඛ නමැති පද්මයෙහි ම සිත් අලවා වෙසෙති; ඒ නුවන් නමැති භෘඞ්ගයන් දෙදෙනා හා සමඟ මාගේ චිත්තය ද ලජ්ජා නමැති මහ ගැඹුරු අගල හා උස් ව සිටියාවූ ධෛර්‍ය්‍ය නමැති මහපවුර මුදුන් පැන නික්මිණ. විපරීත ව පෙරළියාවූ සිත් ඇති හෙයින් වැටහෙන්නාවූ කිසි කාරණයෙකුත් නැත: සියලු දිගන්තරය අන්ධකාර වූවාක් මෙන් චලිත ව වැටහෙයි: දැන් මට පිළිසරණ ව සංග්‍රහකරව'යි කී ය. එසේ හෙයින් කියනලදී;

සුවණ්ණතිලකා නාම - ලලනා කාමලාලසා,[2]
නීලක්ඛි චණ්ඩ කණ්ඩෙහි - විඛණ්ඩසි මනො මම.

තස්සා මුඛම්බුජෙ සත්තා - මම නෙත්ත මධුබ්බතා,
අප්පම්පි න සරන්තා මං - තත්ථෙවාභිරමන්ති තෙ.

සහෙ ව තෙහි මෙ චිත්තං - ගතො උල්ලඞ්ඝ්‍ය උද්ධතො,
ලජ්ජා ගම්භීර පරිඛං - ධිති පාකාර මුග්ගතං.

සම්මුය්හාමි පමුය්හාමි - සබ්බා මුය්හන්ති මෙ දිසා,
තස්ස මෙ සරණං හොථ - කරොථ මම සඞ්ගහං-යි.

---

1. දැහැගත් - BEGL, ක.සි.සඳ.
   දහගත් - E
2. කාමලාලයා - BDGHL
   කාමලාලනී - AC

Non-Commercial Distribution

මෙසේ උද්දලබ්‍රාහ්මණයා විසින් කියන්නාවූ ඒ වචනය අසා ඔහුගේ මිත්‍ර ජනයෝ එක් ව කියන්නාහු "එම්බා ආචාරිනී, තෙපි දැන් යම් ස්ත්‍රියක් ප්‍රාර්ථනා කරා නම් ඕතොමෝ උත්තම ජාතීන් විසින් සහවාසයක් නොකට යුත්තා වූ චණ්ඩාල කෙල්ලක් මය: කිමෙක් ද ආචාරිනී, ඉතා ළං විය නොහැකි දුගඳ පිළිකුල් වූ අපවිත්‍ර අමෙධ්‍යය හා මනොඥ වූ සුවඳ විහිදුනා සිහිල් සඳුන් හා දෙක කවර කලෙක කෙසේ නම් එක් වේ ද? සමාන නොවන හෙයින් එක් නොවන්නේ මය: එබැවින් කිසි කලෙකත් එක් නුව මනා හීනජාතීන් හා සහවාසය[1] කරන්නාවූ උත්තම සත්වයාගේ ශ්‍රී කාන්තාවය කීර්තිය ආයුෂය ශරීරබලය නුවණය යන මෙකී සියල්ල ම ඔහු අත්හැර දුරු ව පලා යන්නේය: එතෙම කෙළවර බොහෝ අයශස් අසා නින්දාවට පැමිණෙන්නේ යි කීහ. එසේ හෙයින් කියන ලදී;

යං ඡවමාචරිය[3] පහෙජසි - චණ්ඩාලී සා අසඞ්ගමා,
කිනනු මීළ්හෙන සංයොගො - චන්දනස්ස කද සියා.
අගම්ම ගමනා යාති - නරානං දූරකො සිරි,
කිත්තිමායුබලං[4] බුද්ධි- අයසස්සුව[5] ස ගච්ඡති[6]-යි.

මෙසේ අවවාද කී මිත්‍ර ජනයන්ට උද්දල බ්‍රාහ්මණයා කියනුයේ;

න පරිච්චජති ලොකොයං - අමෙජ්ඣා[7] මණිමුත්තමං,
පීරතනං සුවාණී ච - දුක්කුලා අපි ගාහියා.

යනාදීන් "එම්බා මේ ලොකවාසී සත්වතෙම අනර්ඝ මුතුමැණික් ආදී වූ රත්නජාතයන් අමෙධ්‍යයෙහි හුනත් අපවිත්‍ර යයි නින්දා කොට නොහරනේ මය: එ පරිද්දෙන් ම පුරුෂයන් සිත් ගන්නා තරම් මනා වූ මොළොක් තෙපුල් ඇති පඤ්චකල්‍යාණ රූපයෙන් යුක්ත වූ ස්ත්‍රීරත්නය ද හීනකුලයෙහි උපනත් ගත යුත්තේ ම යැ" යි කියා "ඒ ස්වර්ණතිලකා තොමෝ සස්වාමික දෙ හෝ නොහොත් අස්වාමික දෙ හොයි විචාරා නියම දැන වහා කැඳවා ගෙන එව"යි කීය. එබස් අසා ඔහු ගොස් එපරිද්දෙන් ම විචාරා අස්වාමික බව දැන ස්වර්ණතිලකාව කැඳවා ගෙන අවුත් උද්දල බ්‍රාහ්මණයාහට පාවා දුන්හ. ඉක්බිති ඒ බ්‍රාහ්මණයා ස්වර්ණතිලකාව ගෙට ආ දවස් පටන් සාරමසක් මුළුල්ලෙහි රාජසේවයටත් නොගියේය: එබමුණු සමීපයෙහි පන්සියයක් රජකුමරුවෝ අක්ෂර ලිඛිත ගණිතාදි වූ නොයෙක් ශිල්පශාස්ත්‍ර උගනිති: එකල්හි ඒ රජකුමරුවෝ තමන් ශිල්ප උගන්ට නැති හෙයින් බමුණා ගෙන් පිටත් නොවන කාරණය දැන ඉදින් ස්වර්ණතිලකාව ජීවත් ව උනහොත් අපගේ ශිල්ප ශාස්ත්‍ර

1. සම්භවාසය - ක.සි.සැ.ම.
2. අයස - ක.සි.සැ.ම.
3. ජවං මාරිය - ක.සි.සැ.ම.
4. කිත්තිවායුබලං - ABDEGH, ම. පාලි
5. යසස්සුව - බෙ.
6. සහ ගච්ඡති - ACDGHJL, බෙ.
7. අමෙජෙඣා -සි.සැ.ම.ස. පාලි.
අමෙජ්ඣා - ක.

Non-Commercial Distribution

ඉගනීමට අන්තරාය වෙයි: එබැවින් යම්කිසි උපායකින් ඈ මරවාපුව මැනවැයි සිතා ඇතරුවන් කැඳවා ඔවුන්ට අත්ලස් දී කියන්නාහු "එම්බා සබඳිනි, මොළ ඇතකු රා පොවා මත් කරවා ඔහු ලවා සුවණ්ණතිලකාව මරවාපියව"යි කීහ: ඇතරුවෝ ද යහපතැයි ගිවිස්සාහ. ඉක්බිති ඒ රජකුමරුවෝ හැමදෙන ම රාජාඞ්ගණයෙහි රැස්ව හිඳ "අපගේ ආචාරීන් වහන්සේ දක්නා කැමැත්තම්හ"යි දූතයකු යවූහ: එකල ඒ දූතයාගේ බස් අසා බමුණාණන් අවුත් උන් කල්හි කලට සුදුසු වූ පිළිසඳර කථාකොට ඉක්බිති "ආචාරීන් වහන්ස, නුඹවහන්සේගේ භාර්‍ය්‍යා වූ සුවණ්ණතිලකාවන් දක්නා කැමැත්තම්හ"යි කීහ. එතෙපුල් අසා බමුණාණෝ "සුවණ්ණතිලකාවන් කැඳවාගෙන එව"යි මිනිසුන් යවූහ. ඒ ගිය මනුෂ්‍යයන් සුවණ්ණතිලකාවන්[1] කැඳවා ගෙන වීථිමධ්‍යයට පැමිණි කල්හි මද නැඟී[2] සිටි මොළ ඇතකු රා පොවා මත් කරවා ඇත් කොහොලින් ඇන කුප්පවා ඉදිරියට ලුහුබඳවාලූහ:[3] එකල්හි රා බී මත් ව කොපයෙන් සොඬ ගෙන බිම පහරමින් මහත් වූ කුඤ්චනාදයෙන් දසදිග් පුරමින් ඒ ඒ අත[4] මිනිසුන් ලුහුබඳවමින්[5] සෙණ පහරන සේ[6] දිව අවුත් වන්නාවූ එඇත්තෙම සුවණ්ණතිලකාව දැක එකෙණෙහි උපන්නාවූ ස්නේහයෙන් සොඬින් ගෙන ඔසවා තමාගේ කුඹමත්තෙහි[7] තබා ගත: එපවත් දැක රජකුමරුවෝ නොසතුටු ව එපරිද්දෙන් සුවණ්ණතිලකාව මරා ගත නොහැකි හෙයින් දෙවන දවස් මිනිසුන් යවා[8] රාත්‍රිභාගයෙහි මරවාපීහ. එකල්හි ඒ උද්දල බ්‍රාහ්මණයා ද "මෙබඳු ස්ත්‍රීරත්නයෙකින් වියෝ ව ජීවත් වීමට වඩා මිය යාම යහපතැ"යි මහත් වූ ශොකයෙන් නොයෙක් ප්‍රලාප කිය කියා හඬමින් රාජාඞ්ගණයෙහි දරසෑයක් බඳවා ගිනි වැද මළේය.

එබැවින් ස්ත්‍රීන්ගේ වසඟභාවයට පැමිණියාවූ කාමී පුරුෂයෝ පරලොව විඳිනා අපායදුක් තබා මෙම ජාතියෙහි මෙසේ නොයෙක් වැසන විඳ මරණටත් පැමිණෙන්නාහු මය. ස්ත්‍රීහු නම් පුරුෂයන් වඤ්චා කරන හෙයින් මායා රූපයක් වැනියහ: ඇදහිලි නොකට හැකි හෙයින් මිරිඟු ජලයක්[9] වැනියහ: ශොකය රෝගය උපද්‍රවය යන මොවුන් උපදවන ආකරයක් වැනියහ: පුරුෂයන්ට තද වූ බන්ධනයක් වැනියහ: කාමී පුරුෂයන් බඳනා පිණිස මරහු විසින් මවනලද තද මලක්[10] වැනියහ: වැලසින්නන් වසන ගුහාවක් වැනියහ: මරහු වසන ලෙනදෙරක් වැනියහ: එබඳු ස්ත්‍රීන් කෙරෙහි යම් කිසි පුරුෂයෙක් විශ්වාසය කෙරේ නම් එතෙම මනුෂ්‍යයන් කෙරෙහි අධමයා නම් වේ. වදරන ලද මැයි;

1. ස්වර්ණතිලකාව - ACDEJ
2. නී - L, ස
3. ලුහුබඳවාලුව - J
4. තැන - BEGHL, ක.සි.ඤ.
5. මරා ලුහුබඳවමින් - BEGHL ක.සි.ඤ.ම.
6. පහරක් සේ - ACDJ, බෙ.
7. කුම්භස්ථලයෙහි - BGHL ක.සි.ඤ.ම.
8. නැති - BGHL
9. දිය - ක.සි.ඤ.ම.
10. මලපතක් - මුද්‍රිත පොත

Non-Commercial Distribution

මායා වෙසා මරිචිව[1] - සොකො රොගො චුපද්දවො,
ඛරා ච බන්ධනා වෙසා - මච්චුපාසො ගුහාසයො:
තාසු යො විස්සසෙ පොසො - සො නරෙසු නරාධමො-යි.

මෙසේ ඒ සවණ්තිලකා තොමෝ පූර්වජාතියෙහි ඉඳුරා නුවණින් සලකා කුසල් කොට ගතනොහී අත නොසොධා නොදෙව් මලස්නෙහි මල් පුද දුෂ්ට වූ ප්‍රාර්ථනාවක් කොට රූපත් ව ඉපද පවා ප්‍රිය මනාප අවස්ථාවෙහි මෙබඳු වූ මරණකට[2] පැමිණියාය. එබැවින් නුවණ පෙරදැරි ව කුසල් කරන්නාවූ පින්වත් සත්වයෙනි, බුදු පසේබුදු මහසවුවන් විසින් වර්ණිතීය වූ නිවන් පුර සිරි පතා ම කුසල් කළ මැනවි. කියන ලදුයේ මැයි;

අයොනිසො සා පුරිමාය ජාතියා
පුඤ්ඤං කරිත්වා අලභිද්දිසං ගතිං,
ධීසම්පයුත්තා කුසලං කරොන්තා
නිබ්බාණමෙවාභිමුඛං කරොථ-යි.

මෙතෙකින් මෙහි තුන්වන
සවණ්තිලකා වස්තුව
දක්වන[3] ලදී.

තව ද මෙහි සතරවන **බුදෙනී[4] වස්තුව** නම් කවර යත්. යටගිය දවස ජම්බුද්වීපයෙහි පැළලුප් නුවර නිධානගත වූ සතාසූකෙළක් වස්තු ඇති එක් සිටුකුලයෙක් වූයේය. ඒ සිටුකුලයෙහි වනාහි නමින් බුදෙනි නම් වූ එක ම කුමාරිකා කෙනෙක් වූහ.

ඒ කුමාරිකාවන් සත් හැවිරිදි කල්හි ඔවුන්ගේ මව් පිය දෙදෙන මිය පරලොව ගියාහ: ඒ කුලයෙහි ඇති සියලු සම්පත් ම ඒ කුමාරිකාවන් නතු විය. ඒ සිටු කුමාරිකාවෝ වනාහි විශිෂ්ට වූ මනහර රූ ඇත්තාහ: දුටු දුටුවන්ට ප්‍රසාද එළවන්නාහ: උතුම් වූ රූප සම්පත්තීන් යුක්තයහ: මනා වූ ඡවිපහස් ඇත්තාහ: දිව්‍යාප්සරාවක මෙන් සියලු අවයව සම්පත්තීන් ශොභමානයහ: බැලූ බැලූවන්ට ප්‍රියකරු වන්නාහ: මන වඩන්නාහ: අචල වූ ශ්‍රද්ධා ඇත්තාහ,[5] තුනුරුවන් කෙරෙහි පහන් සිත් ඇත්තාහ: මෙසේ බුද්ධ රත්නය ධර්මරත්නය සංඝරත්නය යි යන රත්නත්‍රයෙහි නිරන්තරයෙන් මමත්වය ඇති ව වාසය කරන්නාහ.

එකල්හි ඒ නුවර සිටුවරුන් හා රජ යුව සෙනෙවිරත් ආදීහු ඒ කුමාරිකාවන්ගේ ගුණ නුවණ හා රූප සම්පත්තිය අසා තමන්ට පාදපරිචාරිකා කොට ගෙන යනු කැමැති ව වෙන වෙන ම පඬුරු හා සමඟ මිනිසුන් එවූහ: එසේ එවූ මිනිසුන් අතින්

1. මරීචිව - L ක.කි.කැ.ම. පාලි.
2. මරකට - ක. කි. කැ.
3. කියා නිමවන - ABCDHL ක.කැ.ම.ස.
4. බුදෙධනියා - පිටපත් හැම.
5. ඇතියහ - BE, ක.කැ.
ඇතියාහ - L

Non-Commercial Distribution

එපවත් අසා කුමාරිකාවෝ සිතන්නාහු "මාගෙ මව්පිය දෙදෙන නොයෙක් කෙළගණන් මේ සම්පත් හැර මිය පරලොව ගියහ. මාවිසින් වනාහි එසේ නොයා යුතුය: එබැවින් සරණ පිණිස පතිකුලයට යාමෙන් මට ප්‍රයෝජන කිම් ද? හෙ[ද] වනාහි උදක් වස්තු විනාශයට ම කාරණ වන්නේය: දැන් මා විසින් මේ සියලු වස්තු රාශිය ම දන් පින් කිරීම් වශයෙන් බුඩශාසනයෙහි නිධාන කොට තිබීම යහපත් වන්නේ යැ"යි සිතා සරණ බණවා ආවවුන්ගේ වචනය ප්‍රතික්‍ෂෙප කොට එතැන් පටන් මහදන් පවත්වා ධාර්මික වූ සියලු ශ්‍රමණ බ්‍රාහ්මණයන් සිවුපස දනයෙන් සන්තර්පණය කරන්නාහ. ඒ කුමාරිකාවගේ ප්‍රාසාදය නම් සතර දිගින් වඩනා බුදුන් දරු සුපිළිපන් මහ සංඝයා වහන්සේට සිවුපස පඩුරු පිරූ බඩහලක් වැනි විය: උපකරණ සහිත පානීය ශාලාවක් වැනි විය. සතරමං සන්ධියෙහි බිඳුනා ලද සිහිල් ජල[2] පිරි පොකුණක් වැනි විය: කැමැති කැමැති ප්‍රත්‍යය ලාභයට කාරණ වූ මහානුභාව සම්පන්න කල්පවෘක්‍ෂයක් වැනි විය: නිරන්තරයෙන් උඩ සුදු වියන් ආදියෙන්[3] අලඞ්කෘත කොට මලොලඹු එල්වා බිම සුවඳ පිරිබඩගෙන ලදපස්මල් ඉස පස්වනක් පැහැයෙන් යුක්ත[4] සුවඳ මල් තනා සුවඳ තෙලින් වට වැට පහන් දල්වා යට කොඳුපළස් හෙළා[5] මත්තෙහි සුදු අතුට පනවන ලද මනොඥ වූ ආසන පඞ්කති ඇති ශරීරයට සුවපහස් දෙන්නාවූ ඒ [ආසනයන්හි][6] සාන්තදාන්ත වූ කාය වාක් සමාචාරයෙන් යුක්ත ව වැඩහුන්නාවූ තපස්විවරයන් විසින් එකාලඞ්කෘත වූ ඒ කුමාරිකාවන්ගේ ප්‍රාසාදය එකාවන්[7] සරභා පිළියෙල කොට තබන ලද උතුම් වූ දන්හලක් වැනි විය. දන් දෙනු සඳහා ම නිරන්තරයෙන් සකසා පිරිසිදු කරන ලද අතුල් තල ඇති කුසල් කිරීමෙහි පවිත්‍ර වූ අදහස් ඇති අනවරතයෙන් ආදර සහිත ව රක්‍ෂාකරන ලද අඛණ්ඩ වූ පඤ්චශීලයන් ඇති කරුණාගුණයෙන් අග්‍ර වූ ඒ බුඩෙනී නම් කුමාරිකාවෝ මෙසේ අනවකාශයෙන් පසස්නා ලද උතුම් වූ මහදන් පවත්වා දැහැමින් වාසය කරන්නාහ. එසේ හෙයින් කියන ලදී:

> චාතුද්දිසායාත ජිනත්‍රජානං - ඔපානභූතං[8] සරමාසි තස්සා,
> යදිච්ඡිතප්පච්චයලාභහෙතු - දෙවද්දුමොවාසි මහානුභාවො.
>
> පුඤ්ඤුපහාරාදිවිතානලඞ්කතා - පදීපපජ්ජෝතත සුභාසනාවලි,
> සුඛාසනාසීනවසීහි ලඞ්කතා - තස්සාසි තස්මිංවරදානසාලා.
>
> සුධොතහත්ථා සුචි පුඤ්ඤචිත්තා - සද්දරා රක්ඛිතපඤ්චසීලා,
> බුඩෙනිනාමාකරුණා ගුණග්ගා - අද මහාදානවරං පසත්ථං[9]-යි.

මෙසේ ඒ කුමාරිකාවන් මහදන් දෙමින් සැපසේ වසන කල්හි එක් අස් වෙළෙඳෙක් අසුන් ඇරගෙන වෙළඳම් පිණිස නැගෙනහිරි දනවුවෙහි සිට බස්නාහිර

1. හේ - පිටපත් හැම, ඛෙ.
   හෙ ද - ක.කි.සැ.ම.
2. දිය - B ක.කි.සැ.ම.: ජල (නැත) - L
3. බඳවා මල් ආදියෙන් - BGHL
4. යුක්ත ව - BGHL ක. කි. සැ.
   යුක්ත වූ - C
5. එළා - ක.කි.සැ.ම.
6. ආසනවල්හි - පිටපත් හැම
7. එකාවන් ව - BC ක.කි.සැ.ම.
8. ආපානභූතං - ක.කි.සැ. පාලි
9. පරත්ථං - ACDJ
   පසත්ථං - L

Non-Commercial Distribution

බලා යනුයේ පැලලුප් නුවරට අවුත් ඒ කුමාරිකාවන්ගේ ගෙහි නවාතැන් ගත්තේ ය. ඉක්බිති ඒ අස් වෙළෙඳණෝ සිටු කුමාරිකාවන් දැක ස්නෙහ උපදවා තමන්ට දූ තනතුරෙහි තබා සඳුන් සුවඳ කස්තුරු කපුරු මල් සුවඳ වස්ත්‍රාභරණ ආදියෙන් බොහෝ උපකාර කොට නැවත එතනින් නික්ම යන දවස් සිටු දියණියන් සමීපයට කැඳවා "එම්බා දියණියෙනි, මේ සිටි අසුන් අතුරෙන් තොපට අභිප්‍රා[ය] වූ සිත්වන් අසකු තෝරා ඇරගන්ව"යි කීහ. එවේලෙහි ඒ සිටු දියණියෝ එතැන්හි සිටියාවූ අසුන් මුළුල්ල ම බලා පරීක්‍ෂා කරන්නාහු එක් සෛන්ධව අස්පැටවකු දැක මොහු මට දුන මැනවැයි කීහ. එවේලෙහි වෙළෙඳණෝ කියන්නාහු "එම්බා දියෙණියෙනි, මේ තෙම සෛන්ධව කුලයෙහි උපන් බලසම්පන්න අස්පැටවෙක; එබැවින් මොහු අප්‍රමාද ව පොෂ්‍යය කරව"යි කියා ඒ අස් පැටවා සිටුදියණියන්ට ම දී තමා යන[1] අස් වෙළෙඳමට ගියේය.

එකල්හි සිටුදියණියෝ ද ඒ අස් පැටවා මහත් වූ ආරක්‍ෂාවෙන් පෙම්බර දරුකෙනෙකුන් මෙන් වඩමින් ඔහු ආකාශයෙන් යන සෑධි ඇති බව දැන දවසින් දවස වඩ වඩා ඉඳුරා පොෂ්‍යය කෙරෙමින් සිතන්නාහු "දැන් මා විසින් කුසල් කිරීමට සහායෙක් ලබන ලද්දේය;[2] මම වනාහි මීට පූර්ව භාගයෙහි සපිරිවර පස්මරුන් බිඳ බුදු වූ බුදුරජාණන් වහන්සේගේ ජය මහා බොධීන් වහන්සේ පිහිටි මාරසංග්‍රාම භූමි වූ මහාබොධි මණ්ඩලයට නොගියවිරිමි; එසේ හෙයින් මහා මණ්ඩලාදි වූ ත්‍රිවිධ මණ්ඩලයෙන් අලංකෘත වූ දඹදිව මධ්‍ය මණ්ඩලයට නාභිමණ්ඩලයක් හා සාදෘශ්‍ය වූ ශ්‍රී මහා බොධි මණ්ඩලයට ගොස් බුදුන්ගේ සවනක් රස් විහිදුනාවූ ජයමහා බොධීන් වහන්සේ වැන්දෙම් නම් යෙහෙකැයි සිතා රන් රිදී මල් ආදි වූ බොහෝ පූජාඋපකරණ[3] සපයාගෙන එක්දවසෙක අශ්වරාජයා පිටට පැනනැඟී අහසින් ගොසින්[4] මහ බෝ මළුයෙහි සිට ශ්‍රී මහා බොධීන් වහන්සේට රන්මල් පුදනු පිණිස රහතන් වහන්සේ වඩනා සේක්වයි අඩගා කියන්නාහු "යම් අවස්ථාවෙක පටන් මම පිරිසුදු සිත් ඇති ව බුඩශාසනයෙහි පහන් වීම් ද ඒ සත්‍ය වචනය හේතුකොට ගෙන මා කෙරෙහි අනුග්‍රහ බුධීන් බුඩපුත්‍ර වූ ආර්‍ය්‍ය ශ්‍රාවකයන් වහන්සේ නොලස් ව අවුත් ශ්‍රී මහා බොධීන් වහන්සේට සකසා රන් රිදී මලින් පූජාකොට වඳනා පිණිස වඩනාසේක් ව"යි කියා හඬගෑහ. ඒ වචනය දිව්‍යකණින් අසා සිංහලද්වීපවාසී වූ බොහෝ රහතන් වහන්සේ පෙළ සැදී පියුම් විලකට ගමන් ගත් පද්මමධුලොල හංසසෙනාවක් සේ අහසින් අවුත් බොධිමණ්ඩලයට බැස රන් රිදී මලින් බොධීන්වහන්සේට පූජාකොට සාදරාවනත උත්තමාංගයෙන් නමස්කාර කෙරෙමින් වැඩිසේක. එසේ හෙයින් කියන ලදී;

---

1. තමා ගෙන ආ - ක.කි.කු.ම.
2. ලද්දේ යයි - ABCEGJL
3. පූජාභාණ්ඩ - BGH
4. ගොස් - CDJ

Non-Commercial Distribution

යතො පට්ඨාය සම්බුධ[1] - සාසනෙ සුධමානසා,
පසන්නා තෙන සංවච්න - මමානුග්ගහබුද්ධියා.

ආගච්ඡන්තු නමස්සන්තු - බොධිං පූජෙන්තු සාධුකං,
සොණ්ණමාලාහි සම්බුධ - පූජ්ජා අරියසාවකා.

සුත්වා තං වචනං අරියා[2] - බහු සීහලවාසිනො,
ආගම්ම නහසා තත්ථ - වන්දිංසු ච මහිංසු චා-ති.

මෙසේ ඒ කුමාරිකාවෝ එතැන් පටන් බුධශාසනයෙහි අතිශයින් පහන් සිත් ඇත්තාහු නිරන්තරයෙන් ම දවස විටෙක තමන්ගේ ඒ අශ්වරාජයා පිටට පැනනැඟී බොධිමණ්ඩලයට ගොස් රහතන් වහන්සේ හා සමඟ රන්මල් සඳුන් සුවඳ ආදියෙන් ශ්‍රී මහා බොධීන් වහන්සේට පූජා කොට එන්නාහ.

ඉක්බිති පැළලුප් නුවරට නුදුරු වූ සමීප වනයෙහි වසන්නාවූ වැද්දෝ[3] මෙසේ එකාවන් ව ඔබිනොබ යනු[4] එන්නාවූ ඒ කුමාරිකාවන්ගේ රූපසම්පත්තිය දැක තමන්ගේ රජ්ජුරුවන්ට ගොසින් කියන්නාහු "දේවයන් වහන්ස, දෙවඟනක හා සමාන යහපත් රූ ඇති එක් කුමාරිකාවක් අශ්වරාජයකු පිටට පැන නැඟී නිරන්තරයෙන් මෙසේ යනු[4] එන්නීය: ඒ කුමාරිකා තොමෝ දේවයන් වහන්ස, නුඹවහන්සේට අගමෙහෙයින්[5] වන්ට සුදුස්සීයැ"යි කීහ. එපවත් අසමින් ම රජ්ජුරුවෝ මහත් වූ සොම්නසට පැමිණ "එසේ වී නම් සගයෙනි, ඒ කුමාරිකා තිර කොට[6] අල්වාගෙන නොකැමති උවත් ඇදගෙන පලා එව: ඈ මට අගමෙහෙයින්[7] කෙරෙමි"යි කියා තමන්ගෙන් මිනිසුන් යවූහ: මෙසේ ඒ රජහු විසින් යවන ලද්දවූ රාජ්පුරුෂයෝ ඒ කුමාරිකාවන් ගොස් බොධීන් වහන්සේට පූජා කොට එන කල්හි අතරමඟදී අල්වම්හ යි කියා මහ දෙපස ඒ ඒ තැන්හි සැඟවී කුමාරිකාවන් අල්වන්ට සැරහී සිටගත්හ. එකල්හි ඒ කුමාරිකාවෝ අශ්වරාජයා පිටට පැන නැඟී ජයමහා බොධීන් වහන්සේ කරා ගොස් රහතන් වහන්සේ හා සමඟ ශ්‍රීමහා බොධීන් වහන්සේට මල්පූජා කොට පසහ පිහිටුවා වැඳ නැවත පැළලුප් නුවරට එන පිණිස රහතන් වහන්සේගෙන් අවසර ගෙන සිටියහ. ඉක්බිති ඒ රහතන් වහන්සේ අතුරෙන් ධම්රක්ඛිත නම් වූ එක් තෙරකෙනකුන් වහන්සේ ඒ කුමාරිකාවන්ට වදරනසේක් "එම්බා නැඟණියෙනි, අද තොප අල්වනු පිණිස අතරමඟ සොරහු සැඟවී සිටියාහ[8] අසවල් තෙනට ගිය කල්හි අප්‍රමාද ව වහා පලා යව"යි වදළසේක. ඉක්බිති ඒ කුමාරිකාවෝ ද තෙරුන් වහන්සේ වදළ තෙපුල් සිත තබා සැක ඇති ව යන්නාහු ඒ ස්ථානයට පැමිණ සොරුන් විසින් ලුහුබඳවන ලදු ව අශ්වයාට විලුඹින් සන්කොට වහා නික්මුණාහ. එසේ නික්මුණාවූ ඒ කුමාරිකාවන් දැක සොරහු පසුපස්සෙහි

1. යතො පට්ඨායහං බුද්ධ - ම. පාලි.
   තතො පට්ඨාය සම්බුද්ධ - ස.
2. අයසා - ම. පාලි
3. වැද්දෙක් - BGHL
4. යනු - ABCDGHJL ම.
   යන - E, බෙ
5. අගමෙහෙසුන් - ACDJ
6. තිර කොට - DJ කි.ම.
   තීරු කොට - ABCEGHL ක.කැ.බෙ.
7. අග මෙහෙසුන් - ACDEJ
8. සිටිසි - E, බෙ.ස.

Non-Commercial Distribution

ලුහුබඳවා ගත්හ. එවේලෙහි අශ්වරාජ තෙම මහත් වූ වෙග දනවා සවන් වෙගයෙන් උඩනැඟී පුලුන්පෙදක් සේ අහසට පැනනැංගේය. එකල කුමාරිකාවෝ අශ්වරාජයාගේ[1] ගමන් වෙගය ධරාගත නොහී අසු පිටින් ගිලිහී වැටෙමින් සිට අශ්වරාජයාට කියන්නාහු "පුත, මා තොපට කළ උපකාර සිහි කරව"යි කීහ. එබස් අසමින් ම ඒ අස්රජ තෙම නිරාලම්බන ව අහසින් වැටෙන්නාවූ ඒ කුමාරිකාවන් දැක වහා දිවගෙන ගොස් පිට හිඳුවා ගෙන අහසින් ගෙන ගොස් ඒ කුමාරිකාවන්ගේ ප්‍රාසාදයෙහි ම ඇර සිටුවූයේය. එබැවින් මෙසේ තිරිසන්හු පවා කෘතොපකාර සිහි කෙරෙමින් තමහට උපකාර කළාවූ සත්වයන්ට කිසියම් ව්‍යසනයක් පැමිණි කල්හි අත් නොහැර සිට ඒ දුකට පිටිවහල් වන්නාහ යි දැන මේ ලොකවාසී සත්වයෝ තම තමන්ට[2] උපකාර කළාවූ සත්වයන්ට මෙසේ ප්‍රත්‍යුපකාර කොට සත්පුරුෂ ධර්මය රක්‍ෂා කිරීමෙන් කෙළෙහි උපකාර දැන මෙලෝ පරලෝ දෙකින් වන්නාවූ සියලු අභිවෘද්ධියට පැමිණෙත්වා. කියනලදුයේ මැයි;

තිරච්ඡානගතාපෙවං - සරන්තා උපකාරකං,
න ජහන්තීති මන්තවාන - කතඤ්ඤූ හොන්තු පාණිනො-යි.

ඉක්බිති ඒ කුමාරිකාවෝ තමන් සන්තක සතාසූකෙළක් පමණ වූ ඒ සියලු ධනරාශිය ම බුදුසසුන් නමැති සරු කෙතෙහි වපුට දිවි හිමියෙන් පන්සිල් රැක පොහොය පෙහෙවස් රැක ආයු කෙළවර ඒ ආත්මභාවයෙන් [සැව]ගොස් නිද පිබිදි එකක[3] මෙන් සියලු සම්පත්තීන් සමෘද්ධ වූ දිව්‍යලොකයෙහි ඉපද මහත් වූ දිව්‍ය ඓශ්වර්‍ය්‍ය ලද්දහ. මෙසේ ඉතා ළදැරි වූ ළඳබොළඳ පියකරු යෞවන වයස පිහිටා සිටි බාල වූ තරුණ ස්ත්‍රීහු පවා දනශීලාදි වූ අනෙකප්‍රකාර කුශලධර්මයන් රැස් කොට සැපසේ දිව්‍යලොකයට යන්නාහ.[4] එබැවින් සියලු කුශලයන්ගේ ආනිසංස මහත්වය[5] ඉඳුරා දන්නාවූ පින්වත් සත්වයෙනි, දනශීලාදි වූ දශවිධ කුශලධර්මයෙහි කෙසේ නම් උපෙක්‍ෂා වවු දැ; එසේ හෙයින් කුසල් කිරීමෙහි අප්‍රමාද ව තම තමා ශක්ති පමණින් පිළිවන් කුසල් කොට මතු සසර දුක් නොවිඳ සියලු අභිමතාර්ථයන් සිඩ කරන්ට උත්සාහ කටයුතු. කියන ලදුයේ මැයි;

අතිතරුණවයා හො මාතුගාමාපි එවං
විවිධ කුසලකම්මං කත්ව සග්ගං වජන්ති,
කුසල ඵල මහන්තං[6] මඤ්ඤමානා භවන්තා
භවථ කථමුපෙක්ඛා දනමානාදි කම්මෙ-යි.

මෙතෙකින් මෙහි සතර වන
බුධෙනී[7] වස්තුව
කියා නිමවන ලදී.

---

1. අශ්වයාගේ - BDEGHL
2. තමන් තමන්ට - ACJ
3. එකකු - BCGHL, කි.
   එකක්හු - ම
   එකෙකු - ක.කු.
4. පලා යන්නාහ - පිටපත් හැම
   යන්නාහ - මුද්‍රිත හැම, ස.
5. මහත්තත්වය - ABCDEH
6. මහන්තං - පිටපත් හැම, පාලි
   මහන්තං - මුද්‍රිත හැම.
7. බුධෙනියා - පිටපත් හැම

Non-Commercial Distribution

තවද මෙහි පස්වන කුණ්ඩලී වස්තුව නම් කවර යත්? හේ මෙසේ දතයුතු;

ලක්දිව රුහුණු ජනපදයෙහි මාගම නොයෙක් සියගණන් සක්මන් මණ්ඩප පිරිවෙන් ආදියෙන් ප්‍රතිමණ්ඩිත ව[1] නොයෙක් දහස් ගණන් භික්ෂුසංඝයා වහන්සේගෙන් ශොභාමත් ව තිබෙන්නා වූ තිස්ස නම් මහා විහාරයෙක් විය. එම විහාරයෙහි තිස්ස නම් එක් සාමණේර කෙනකුන් වහන්සේ ද[2] වාසය කරනසේක. එක් කලෙක ඒ සාමණේරයන් වහන්සේ ජනපද චාරිකාවෙහි වඩනාසේක් පාණවැ[3] නම් ගමට සිඟා වැඩ ගිතෙල් හා සමඟ යපෙන පමණ ආහාරයක් ලැබ ගමින් නික්ම ගම්දෙරට පැමිණ මාගමට අභිමුඛ ව වඩනාසේක් අතරමඟ මිනිසුන් දැක පැන්ඵාසු තෙනක් විචාළසේක: එකල්හි මනුෂ්‍යයෝ "ස්වාමීනි, තෙල නුඹවහන්සේ වඩනා ඉදිරියෙහි නුදුරු තෙන හැලිගසා දිවන සිහිල් ජලධාරාවන් ඇති අතිධවල වැලිතලායෙන් යුක්ත වූ කුඹුබන්[4] නම් කඳුරැළියෙක් ඇත: එතැන්හි වැඩ පැන් සනහා සිහිල් සෙවණ වැලිතලා මත්තෙහි වැඩහිඳ අහර වළඳ සැපසේ වැඩිය මැනවැ"යි කීය. එකල්හි සාමණේරයන් වහන්සේ යහපතැයි ගිවිස එතැන්හි ගොස් පැන් සනහා අත මුව ශුධ කොට ඵාසු තෙනක වැඩහිඳ අටඟ සමනා පස්විකා අහර වළඳන්ට පටන්ගත්සේක.

එකල්හි කිසි කටයුත්තක් නිසා ගමින් නික්ම යන මිනිසුන් හා සමඟ වලට ගියාවූ දැරි ඇති බැල්ලක් එම කඳුරැලිය සමීපයෙහි නොතෙමෙන පබ්භාර ස්ථානයෙක දරුවන් වද කීප දවසක් නිරාහාර හෙයින්[5] පීඩිත ව තමාගේ දරුපැටවුන් ළං කොට ගෙන වැද හොත්තී සාමණේරයන් වහන්සේගේ පාත්‍රයෙහි ආහාර ගන්ධය ආඝ්‍රාණය[6] කොට වැද හොත් තැනින් නැඟී සිට වෙවුල වෙවුලා සාමණේරයන් වහන්සේගේ සමීපයට අවුත් නඟුට සලමින් ප්‍රසාද දක්වා[7] මුහුණ බලා සිටියාය. සාමණේරයන් වහන්සේ බැල්ල දැක කම්පිත වූ සිත් ඇති ව තමන් වහන්සේ වළඳන්ට පළමුවෙන් අතටගත් බත් ආලෝපය බැල්ල ඉදිරියෙහි තබාලූසේක: එකල්හි බැලී සතුටු සතුටු ව ඒ බත්පිඩ අනුභව කළාය: එපවත් දැක සතුටු වූ සාමණේරයන් වහන්සේ විටින්විට බත්පිඩු[8] වටවටා ඒ බත් සියල්ල ම බැල්ලට දන් දී පාත්‍රය ශොධා දිය සිඳ පයියෙහි බහා බැඳගෙන වැඩිසේක. ඉක්බිති ඒ බැලිතොමෝ සාමණේරයන් වහන්සේ කෙරෙහි එදවස් උපදවන ලද්දවූ චිත්තප්‍රසාදයෙන් එයින් මිය දඹදිව දෙවපුත්‍ර නම් නුවර රාජ්‍යය කරන රජ්ජුරුවන් නිසා ඒ[9] රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසොවුන් කුස පිළිසිඳ දසමස් ඇවෑමෙන් මවු කුසින් [බිහිවූය.][10] එකල ක්‍රමයෙන් මවුන්ගේ ඉසකෙස් බහනා මඟුල් දිනය පැමිණි කල්හි ඒ කුමාරිකාවන්ගේ හිස කෙස් කුණ්ඩලාකාර ව නැමී

---

1. ප්‍රතිමණ්ඩිත වූ - BGH මුද්‍රිත හැම
2. තිබඳ ව - H, ස.
   තිබඳ - B
3. පාණවැව - බෙ. ස.: පානම - L,
4. කුඹුකන් - BCGHL, කුඹුබන් - C
   කුඹුක් - D
   කුඹුබන්ද - පාලි
5. නිරාහාරයෙන් - BGHL
6. ආඝ්‍රාණ - ABCEGHJL
7. සාදර දක්වා - BDE, ක.කි.සං.ම. : ආදර දක්වා - L
   සාර දක්වා - GH
   සාද දක්වා - ස
8. බත් පිඩි - ACDEJ
9. රජ්ජුරුවන් නිසා ඒ (නැත) - ක.කි.සං.
10. බිහිවූහ - පිටපත් හැම

Non-Commercial Distribution

අග් බබුරු ව[1] තිබෙන හෙයින් මවුපිය දෙදෙන ඔවුන්ට කුණ්ඩලි කුමාරිකා[2] යයි නම් තුබූහ. ඉක්බිති ඒ කුමාරිකාවන් පෙරඩමස සඳ සෙයින් ක්‍රමයෙන් වැඩී සොළොස් හැවිරිදි වයසට පැමිණි කල්හි යට කියනලද තිස්ස නම් සාමණේරයන් වහන්සේ බුදුන්ගේ ශ්‍රී මහා බොධීන් වහන්සේ වඳනා පිණිස මේ ශ්‍රී ලංකාද්වීපයෙන් නික්ම නැවු නැඟී දඹදිවු වැඩ, ගම් නියම්ගම් රාජධානි පිළිවෙළින් සැරිසරා දෙවපුත්‍ර නුවර සමීපයට පැමිණ අදනා සිවුර තුන් මඩුල්ල වසා වට සමකොට හැඳ කායබන්ධනය බැඳ සහළ හා පොරෝනය සගුණකොට සුපිළිසන් ව ගැට[3] ගන්වා පාත්‍රය අතින් ගෙන නුවරට වැද වියදඬු පමණකින් වඩා නොබලා බැලුවන්ට[4] රිසියෙන තපො විලාසයෙන් පිඬු පිණිස හැසිරෙනසේක් නුවර මහා වීථියට පැමිණිසේක.

එකල්හි කුණ්ඩලී නම් රාජකුමාරිකාවෝ උඩුමහලෙහි සිවු මැදුරු කවුළුව හැර වීථිය බලබලා සිටියාහු අහර සිහා වඩනා සාමණේරයන් වහන්සේ දැක පූර්වහෙතු බලයෙන් උපන්නාවූ බලවත් ස්නෙහ ඇති වූහ. එම ඇසිල්ලෙහි ඒ කුමාරිකාවන්ට පෙර උපන් ජාති දක්නා ජාතිස්මරණ නුවණ පහළ විය. ඒ කුමාරිකාවෝ වනාහී බැලි ව උපන්නාට[5] පළමු ජාතියෙහි මනුෂ්‍ය ව ඉපද භික්ෂුණී ශාසනයෙහි මහණ ව මහණධම් පුරන්නාවූ එක් භික්ෂු කෙනකුන් වහන්සේට උල් කටුවක් හා සමහ පොත්ගෙඩියක් හා පහන්තෙල් දන් දී ජාතිස්මරණ[6] නුවණ ඇති වෙම්ව'යි ප්‍රාර්ථනා කළහ. ඒ කුශලයෙන් ලබන ලද ජාතිස්මරණ නුවණින් තමන්ගේ පූර්වජාතිය සිහි කොට බලන්නාහු ඒ තිස්ස නම් සාමණේරයන් වහන්සේ විසින් තමන්ට පළමු බැලි ව උපන් ජාතියෙහි කළාවූ උපකාරය දැක සතුටු ව සාමණේරයන් වහන්සේ ආරාධනාවෙන් ගෙන්වා රජගෙයි ආසනයක් පනවා එහි වඩා හිඳුවා නොයෙක් රසයෙන් අග්‍ර වූ රාජ භොජනය වළඳවා සාමණේරයන් වහන්සේ දැහැටි වළඳ අත මුව ශුධ කොට වැඩහුන් කල්හි සමීපයට එළඹ පසහ පිහිටුවා වැඳ එකත්පස් ව හිඳ කථා කරන්නාවූ කුමාරිකාවෝ;

[න][7] සඤ්ජානාසි ත්වං[8] ධීර - පුබ්බෙ 'හං තව දසිකා,
තයා'හං සුඛිතා ආසිං - තස්මා ත්වම'සි ඉස්සරො.

යනාදීන් 'ස්වාමීනි, මා නොහඳුනනසේක් ද පෙර මම නුඹ වහන්සේගේ එක් දසියකිමි: නුඹ වහන්සේ නිසා ම සුවපත් වීමි: එසේ හෙයින් නුඹවහන්සේ ම

1. අක්බබුරුව - BCGHL
2. කුමාරිකාවෝ - BDEGHL
3. ගැටවවු - B, ස
4. බැලු බැලුවන්ට - CDL
5. උපදනාව - L, ස.
6. ජාතිස්මර - ACDEGHJL
7. න (නැත) - පිටපත් හැම
8. තුවං - ABCEGHJL
මං - ක.කි.සැ.ම. පාලි

Non-Commercial Distribution

මට ඉසුරුයේක, නායකයේක, හිමියේකැ"යි කීහ. එතෙපුල් අසා වදරන සාමණේරයන් වහන්සේ;

නත්ථි මෙ තාදිසී දසී - න සඤ්ජානාමි තං අහං,
නාසි ත්වං කස්ස වා ධීතා - තං මෙ අක්ඛාහි පුච්ඡිතා.

යනාදීන් "එම්බා නැගිණියෙනි, කුමක් කියා ද: මාගේ එබඳු දසියක් ඇත්තේ නැත: මීට පළමු තොප මා හඳුනන්නෙත් නැත: තෙපි තමා කවරක් ද: කාගේ දියෙණි කෙනෙක් ද: මෙසේ මා විසින් විචාරන ලද්දවූ තෙපි ඒ සියල්ල ම දැන් මට නොවළහා ඇති සැටියේ ම කියා සඳහන් කරවාලව"යි වදළසේක. එකල්හි කුමාරිකාවෝ කියන්නාහු;

පාසාණවාපි ගාමම්හි - තම්බපණ්ණිම්හි රෝහණෙ,
භික්ඛිත්වාන තුවං භන්තෙ - යද කතුබන්ධකන්දරෙ.
නිසීදිත්වාන තං භත්තං[1] - භුත්තකාලං සරිස්සසි,
තද 'හං සුනඛී ආසිං - විජාතා 'ලද්ධගොචරා.
දිස්වා තං මං තද භන්තෙ - වෙධමානං බුභුක්ඛිතං,
ජීතන භත්තා තුවං භුත්වා - මං භත්තෙන තොසයි.
තදහං මුදුචිත්තෙන - [තයි[2]] චිත්තං පසාදයිං,
තෙනාහං පුඤ්ඤකම්මෙන - දුතියෙ අත්තසම්භවෙ.
ඉධ රාජකුලෙ ජාතා - සබ්බකාම සමිද්ධිනී,
චිත්තප්පසාදමත්තෙන - ලොකනාථස්ස සාසනෙ.
තදනු පබ්බජිතස්සාපි - ඊදිසා හොති සම්පද,
කීදිසං හොති සම්බුද්ධෙ - පසාදෙන ඵලං අහො.
අඤ්ඤානි පන කිච්චානි - පහායත්තහිතෙ රතො,
අතන්දිතො දිවාරත්තිං - සරාතු රතනත්තයං.

යනාදීන් "ස්වාමීනි, බුධපුත්‍ර වූ උත්තම තපස්වින්[3] වහන්ස, දැන් නුඹ වහන්සේ කිසියම් ආකාරයෙකින් සිහි කරවා කී කල්හි ඉදුරා මා හැඳින ගන්නාසේක් වී නම් එපරිද්දෙන් ම නුඹවහන්සේට සිහි කරවාලමි: අසාධාරණ වූ ජාතිස්මර[ණ[4]]නුවණින් පූර්වජාති දක්නා මා විසින් දැන්[5] හඟවන ලද්දවූ ක්‍රමයෙන් ම මා දැන වදළ මැනව: ස්වාමීනි, නුඹවහන්සේ ලක්දිව රුහුණු ජනපදයෙහි පාණව[6]

1. භන්තෙ - H, බෙ.ස.
2. තව - පිටපත් හැම
   තයි - මුද්‍රිත හැම, පාලි
3. තපස්වියාණන් - EGHL
4. ජාතිස්මර - පිටපත් හැම
5. දැන - මුද්‍රිත හැම
6. පාවන - ක.නි.ඤ.: පානම - L
   පාණවැව - බෙ.ස.

Non-Commercial Distribution

නම් ගම සිහා ලත් අහර ගෙන කුඹුබන් නම් සඳුරැළියට වැඩ අහර වළඳන්ට වැඩලන් දවස් සඳහන් ඇද් දැ යි" විචාරා එසේ යයි කී කල්හි එකල මම බැලි ව ඉපද දරුවන් වද කීප දවසක් නිරාහාර ව එම වැදූ දරුවන් කාපියන තරම් ක්‍ෂුධාවෙන් පීඩිත ව වෙවුලුම් ගත්තාවූ දුර්වල ශරීර ඇති ව ආහාර[1] නිසා ගොසින් නුඹවහන්සේ සමීපයෙහි සිටියෙමි: එකල නුඹවහන්සේ මා දැක උපන්නාවූ කරුණාවෙන් එදවස[2] පුන්බත් ව හිඳ මා, බත් අනුභව කැරවූ සේක: එකල්හි මම මොළොක් වූ සිත් ඇති ව නුඹවහන්සේ කෙරෙහි සිත් පහදවා ගෙන ඒ කුසලකර්මයෙන් දෙවන ජාතියෙහි සියලු සම්පත්තියෙන් සමෘද්ධ ව රාජවංශයෙහි උපන්මි: මේ බුද්ධ ශාසනයෙහි එදවස් ම මහණ වූ සාමණේර කෙනකුන් වහන්සේ කෙරෙහි පවා මඳ ඇසිල්ලෙක කරන ලද්දවූ චිත්තප්‍රසාද මාත්‍රයෙකින් මෙබඳු ඉතා උදරතර වූ සම්පත් ලැබෙන්නේ මය:[3] එබැවින් මුළු තුන්ලොවට අග්‍රදක්ෂිණේය්‍ය වූ බුදුරජාණන් වහන්සේ කෙරෙහි කරනලද චිත්ත ප්‍රසාදයෙන් ලබන්නාවූ විපාක විශේෂය කෙසේ කියා නිමවිය හැකි ද: අනන්ත වූ ආකාශය සේ කෙළවරක් දැක්ක නොහැකි ඉතා ආශ්චර්‍ය්‍යමත් වූ[4] විපාක දෙන්නේ මය: එසේ හෙයින් තමතමන්ට වැඩ කැමැත්තා වූ නුවණැති උත්තම සත්වයෝ ලත් ලත් අවකාශයෙහි අන් කිසි කාරියෙක ව්‍යාපෘත නොව රෑ දෙවෙහි නොපමා ව පහන් සිතින් තුනුරුවන් සිහි කොට එම කුශලයෙන් සියලු දිව්‍යමනුෂ්‍ය සම්පත් ම සාධා ගනිත්ව යි කීහ. මෙසේ කුමාරිකාවෝ පූර්වජන්මයෙහි තමන්ට ඒ සාමණේරයන් වහන්සේ විසින් කරනලද්දවූ උපකාරය තුමූ ම සිහි කරවා "ස්වාමීනි, නුඹවහන්සේගේ මිඩියට අනුග්‍රහ නිසා මෙහි ම විසුව මැනවැ"යි ආරාධනා කොට ඔවුන් වහන්සේ යහපතැයි ආරාධනා ගිවිසි කල්හි රාත්‍රිස්ථාන දිවාස්ථාන සක්මන් මණ්ඩප වහසල් පවුරු පදනම් ආදියෙන් හෙබියාවූ රජමහා විහාරයක් කරවා ඒ තිස්ස නම් සාමණේරයන් වහන්සේ ආදි කොට ඇති නොයෙක් දහස් ගණන් භික්ෂූන් වහන්සේට ආරාධනා කොට එම විහාරයෙහි වස්වා මහ වතුරක් මෙන් දෙනලද සිවුපස දානයෙන් උපස්ථාන කළහ. ඒ සාමණේරයන් වහන්සේ ද එදවස් තමන් වහන්සේ විසින් ඒ බැල්ලට දුන්නාවූ ආහාරදානය සිහි කොට ඉතා සන්තුෂ්ට වූ සිත් ඇතියේක් මෑත භාගයෙහි;

අරහං සුගතො ලොකෙ - භගවා ලොකපාරගූ,
විජ්ජාචරණසම්පන්නො - විමුත්තිපදදයකො.

ජෙට්ඨො සම්මාභිසම්බුද්ධො - සෙට්ඨො පුරිස සාරථී,
සත්ථා දෙවමනුස්සානං - ලොකෙ අප්පටිපුග්ගලො.

සබ්බ ලොකහිතො බන්ධු - සමන්තා[5] රතනාලයො,
සත්තාන මනුකම්පාය - ජාතො නාථො සිවංකරො.

---

1. ආහාරය - පිටපත් හැම
2. එදවස් නුඹ - ක. කි. ඤ. ම.
3. ලබන්නේ මය - A
4. ආශ්චර්ය - ABCEGHJL
5. සමන්තා - BCGHJL

Non-Commercial Distribution

යනාදීන් දක්වන ලද බුධානුස්මෘති කමටහන් මෙනෙහි කෙරෙමින් නොබෝ කලකින් ම රහත් බවට පැමිණ දිව්හිමියෙන් එම වෙහෙර වැඩවෙසෙමින් බොහෝ දෙනා කුශලකරණයෙහි යොද වදළසේක. එබැවින් තුන්ලෝවාසී වූ සියලු සත්වයන්ට කැමැති කැමැති වස්තු සිඩ කොට දෙන්නාවූ තුනුරුවන් හා සමාන අන් කිසි කල්පවෘක්‍ෂයෙක් අතීත අනාගත වර්තමාන යන තුන් කල්හි ම නැත; එසේ හෙයින් දිව්‍යමනුෂ්‍ය නිර්වාණ සංඛ්‍යාත ත්‍රිවිධ සම්පත්ති ප්‍රදානයට පිහිට ව සිටියාවූ බුඩ ධර්ම සඞ්ඝ යන රත්නත්‍රය පහන් සිත් ඇති ව අනවරතයෙන් සදහන් කොට ත්‍රිවිධ සම්පත්තිය ම සාධා ගත මැනවි. කියනලදුයේ මැයි;

ලොකත්තයාභිමතදං සතතං තියධෙ
වත්ථුත්තයස්ස සදිසං නහි කප්පරුක්ඛං,
තස්මා තිසම්පදපදං රතනත්තයං'ව
නිච්චං පසන්නමනසා මනසී කරොථ.

මෙතෙකින් මෙහි
පස් වන කුණ්ඩලී වස්තුව
දක්වන[1] ලදී.

මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි
තෛභාතික වර්ග නම් වූ
එකොලොස් වන පරිච්ඡේදය නිමි.

තවද මේ සද්ධර්මාලංකාරයෙහි බොධිරාජ වර්ගය නම් කවර යත්. එහි පළමුවන බොධිරාජ වස්තුව මෙසේ දතයුතු;

යට ගිය දවස මෙම ලඞ්කාද්වීපයෙහි ශාසනය පිහිටි පසු අකුරැලි නම් ගමෙක් විය. ඒ ගම්හී එක් කුමාරිකාවක් සෙසු ගම්දැරියන් හා එක් ව ඒ ඒ තන්හි කෙළ[2] ඇවිදිනී ගමට නුදුරු තන්හි දිය පිරී සිටිනා මහත් හෙබක් දැක එතැන්හි ගියාය; එකල්හි ඒ හෙබ සමීපයෙහි එක් මුරුත්[3] ගසෙක් මුල පටන් අග දක්වා සර්වප්‍රකාරයෙන් මල් පිපී සිටිනේය. එකල බුඩපූජාවට එහි මල් කඩන පිණිස

1. කියා නිමවන - BCL ක. ඤ. ම. ස.
   දක්වා නිමවන - GH
2. කෙළ කෙළ - BGH
3. මුරින - ACDEGHJ

Non-Commercial Distribution

මනුෂ්‍යයෝ බොහෝ දෙන හෙබ දියට බැස පිහිනාගෙන ගොස් ගසට නැඟී මල් කඩති. ඒ මනුෂ්‍යයන් දැක කුමාරිකාවෝ "මොහු සැපසේ ගොස් ගසට නැඟී මල් කඩාගෙන බුදුන්ට පූජා කෙරෙත්වා"යි සිතා එතැන්හි වියලි ලඝු සැහැල්ලු ව තිබූ එරබදු දණ්ඩක් ගෙනවුත් හෙයක් කොට තැබූහ.[1] එතැන් පටන් මනුෂ්‍යයෝ ඒ හෙයපිටින් සැපසේ ගොස් ගසට නැඟී[2] මල් කඩන්නාහ.[3] මෙපමණ පිනක් කොට ඉක්බිති ඒ කුමාරිකාවෝ නොබෝ කලෙකින් එයින් මිය එහෙය ලූවාවූ කුශලයෙන් දඹදිව පැළලුප් නුවර සොමදත්ත නම් රජ්ජුරුවන්ට දූ ව උපන්හ.[4] එකල්හි ඒ කුමාරිකාවෝ දිව්‍යාප්සරාවක මෙන් බැලූ බැලූවන්ට ඉතා ප්‍රියකරු ව උතුම් වූ රූ ඇති වූහ: මවුපිය දෙදෙන ඔවුන්ට බොධිරාජ කුමාරිකාවෝ යයි නම් තුබූහ: පළමු ජාතියෙහි හෙය ලූ කුශලානුභාවයෙන්[5] ඒ කුමාරිකාවන්ට අහසින් යන සෘද්ධි ඇති පුවීරක නම් වූ සෛන්ධව අස්පැටවෙක් උපන. ඒ රාජ කුමාරිකාවන්ගේ පිය රජ්ජුරුවෝ වනාහි "බුද්ධ රත්නය මාගේ මය, ධම්ම රත්නය මාගේ මය, සඞ්ඝ රත්නය මාගේ මය"යි මෙසේ තුනුරුවන් කෙරෙහි මමත්වය ඇති ව මහත් වූ පින් රැස් කෙරෙමින් වසන්නාහු ඒ සෛන්ධව අස් පැටවා දැක "දැන් වඩ වඩා පින් කරන්ට නිසි සහායක් ලදිමි" යි සතුටු වූ සිත් ඇති ව ඒ අස් පැටවා පිටට පැන නැඟී දවස තුන්විටෙක ගොස් ශ්‍රී මහා බොධීන් වහන්සේ වදනාහ. බොධිරාජ කුමාරිකාවෝ ඒ දැක පිය රජ්ජුරුවන් සමීපයට ගොස් "පියාණන් වහන්ස, එකාවන් ව මේ කොයි යන ගමනෙක් දැ" යි විචාළහ: එබසට රජ්ජුරුවෝ මුවෙන් නොබිණූහ: ඉක්බිති රාජකුමාරිකාවෝ නැවත නැවතත් "පියාණන් වහන්ස, දවස තුන් විටෙක නුඹවහන්සේ කොයි වඩනා සේක් ද, ඒ මට නොවළහා කිව මැනවැ"යි කීහ. එකල්හි රජ්ජුරුවෝ තමන් යන ගමන කුමාරිකාවන්ට ප්‍රකාශ කොට හඟවා කියන්නාහු;

අම්හාකං භගවා පුබ්බෙ - පූරෙන්තො දසපාරමී,
අදසි සීසං රත්තක්ඛි - මංසං ජීවිතමෙව ච.

පුත්තදාරෙච රජ්ජේච - කත්වා[6] පාරමී මත්ථකං,
අනප්ප කප්පකොටීනං - බෙපෙත්වා කපිලවහයෙ.

සක්‍යරාජකුලෙ ජාතො - ලොකෙ අප්පටිපුග්ගලො,
සම්පත්ත චක්කවත්තිත්තං - පහත්වාන නරාධිපො.

1. තිබූහ - පිටපත් හැම
2. ගසට නැඟී (නැග) - CDJL
3. කඩා ගන්නාහ - DE බෙ. ස.
4. උපන්නාහ - ස.
5. කුසලයෙන් - BDEGHL ක. කි. සැ. ම.
6. පත්වා - මුද්‍රිත හැම, ස
   දත්වා - පාලි

Non-Commercial Distribution

දිස්වා නිමිත්තෙ චතුරො - නික්ඛම්ම අභිනික්ඛමං,
බොධිමූලමුපාගම්ම - නිසින්නො වජිරාසනෙ.

සහස්සබාහුං මාපෙත්වා - නානායුධසමාකුලං,
මහාභිතිකරං වෙසං - කාළපබ්බත සාදිසං.

මාපෙත්වාන සමාරුය්හ - ගිරිමෙඛල වාරණං,
මාරසෙනං සමානෙත්වා - ආගතං මකරධජං.

පාරමීබලමොලුබ්භ[1] - මාරසෙනං පලාපිය,
යත්ථාසීනො කිලෙසාරි - සහස්සං ඝාතයී ජිනො.

නයනංසු ජලසෙකෙහි - සත්තාහං ජිනසෙවිතං,
පූජිතං සුරබ්‍රහ්මෙහි - සිද්ධොරගනරාදිහි.

වන්දිතුං ජයබොධිං තං - ගච්ඡාමි සතතං අහං,
උපාසති සද්ද ගන්ත්වා - යො නරො බොධිපාදපං.

ගන්ධොදදීපධූපාදි - නානාපූජාහි සාධුකං,
සනරො නිරාමයො හොති - පච්චත්තෙ ච පරත්ථ ච.

පූජිතො මානිතො හොති - දීඝායු බලවා සුඛී,
තදත්ථං[2] පත්ථයන්තෙන - අත්තකාමෙන ජන්තුනා
උපාසනීයො[3] සද්ධාය - නිච්චං සො[4] බොධිපාදපො[5].

යනාදීන් "එම්බා දියෙණියෙනි, අප බුදුහු පෙර මේ මහාභද්‍ර කල්පයට සාරාසංඛ්‍යය කප්ලක්‍ෂයකින් මත්තෙහි ලොව පහළ වූ දීපඞ්කර නම් බුදුකෙනකුන් වහන්සේ දැක බුදුබව පතා[6] ඔබගෙන් විවරණ ලත් තැන් පටන් දන ශීලාදි වූ දශප්‍රකාර පාරමී ධර්මයන් පුරනසේක් ඇස් ඉස් මස් ලේ අඹුදරු රට දනවු ජීවිත යනාදි වූ ඉතා නොසිතිය හැකි ප්‍රියවස්තු දන් දීමෙන් කෙළගණිතින් පවා පමණ කට නොහැකි අනල්ප කල්ප කාලයක් ගෙවා පාරමී ධර්මයන් මස්තකප්‍රාප්ත කොට කපිලවස්තු නම් නුවර ශාක්‍යරාජ වංශයෙහි මුළු ලොවට මුදුන් මල්කඩක් මෙන් අප්‍රතිපුද්ගල ව ඉපද ක්‍රමයෙන් වැඩී සතර පූර්වනිමිත්ත දැක සංවේගප්‍රාප්ත ව සිටි චක්‍රවර්ති රාජ්‍යය හැර මහභිනික්මන් නික්ම මහණ ව බෝමඩ කරා එළඹ විදුරසුන් නැඟී වැඩහිඳ එකෙණෙහි තමාගේ එක ශරීරයෙහි දහසක් අත් මවා ඒ දහසක් අතින්

---

1. පාරමීබලමුලුබ්භ - පිටපත් හැම
2. සදත්ථං - බෙ.
3. උපාසනීය -පිටපත් හැම: උපාසනීයො - මුද්‍රිත හැම
4. නිච්චං තං -ABDEGJ;
   නිච්චං සො - CH, මුද්‍රිත හැම
5. උපාසනීයං සද්ධාය නිච්චං තං බොධිපාදපං - JL පාලි
   බොධිපාදපො - මුද්‍රිත හැම, ස
6. තකා - BGH

Non-Commercial Distribution

ගිනි ගෙන දිලියෙන අසි සත්ති තොමර ඉට්ටි මිට්ටෙරු ආදි වූ නානා ප්‍රකාර ආයුධ ගෙන ඉතා භයඞ්කර වූ කාල[1] පර්වතයක් වැනි කෘෂ්ණ වර්ණ ශරීරයක් මවා අති භයානක වූ වෙෂ භූෂණයෙන් යුක්ත ව එසේ ම අති භයඞ්කර වූ දෙවන මාරයකු හා සමාන යෙළසියයක් යොදුන් උස ඇති ගිරිමෙඛලා නම් ඇත්රජහු පිටට පැන නැඟී නානාප්‍රකාර විරූප වෙසධාරී වූ දසබිම්බරක් මරසෙනඟ ගෙන අවුත් වන්නාවූ මාරයා හා ඔහුගේ සේනාව දශපාරමිතා නමැති දශ මහා යොධ භටයන් මෙහෙයමින් හිස් ලූලූ අත ලුහුබඳවා යම් බොධිමූලයෙක්හි වැඩහිඳ කෙලෙස් නමැති දහස් ගණන් සතුරන් නසා ජය ගෙන බුදු ව බුධරාජ්‍යය ලත් සේක් ද, ඉක්බිති ඒ[2] බුදුරජාණන් වහන්සේ විසින් තමන් වහන්සේගේ පස්පෑ දිස්නාවූ ඇස්සහලින් නික්මෙන නෙත්‍රකාන්ති සමූහ නමැති ජලපරිෂෙක කෙරෙමින් සත් දවසක් මුළුල්ලෙහි ඇසිපිය නොහෙළා සිටිපිය නොසොල්වා සිට යම් බොධිකෙනකුන් වහන්සේ භජනය කරන ලද ද, එසේ ම සියලු දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණ මනුෂ්‍ය යක්ෂ රාක්ෂස සිඬ විද්‍යාධරාදීන් විසින් දිවමල් දිව සුවඳ දීප ධූපාදීන් යම් බොධි කෙනකුන් වහන්සේට පූජා සත්කාර කරන ලද ද ඒ ජයමහා බොධීන් වහන්සේට නිරන්තරයෙන් සත්කාර කොට වඳනා සඳහා යෙමි. ඉදින් යම් කිසි ශ්‍රඬාවන්ත කෙනෙක් නිරන්තරයෙන් ඒ බොධීන් වහන්සේ කරා එළඹ සුවඳ පැන් සුවඳ සුනු මල් පහන් සුවඳ දුම් පිදීම් ආදියෙන් මනා කොට පූජාසත්කාර කෙරෙමින් මානනය[3] කෙරෙත් නම් ඔහු මෙලෝ පරලෝ [දෙක්හි] ම[4] නිරොගි නිර්ව්‍යාධි ව දීර්ඝ වූ ආයු ඇති වෙති; මනා වූ ජවිවර්ණ ඇති වෙති; සියල්ලෙන් සුවපත් වෙති; මහත් වූ ඥාන ශක්ති ඇති වෙති; එසේ හෙයින් මේ සියල්ල ප්‍රාර්ථනා කරන්නාවූ තමහට වැඩ කැමැති සත්පුරුෂයන් විසින් නිරන්තරයෙන් ඒ ශ්‍රී මහා බොධීන් වහන්සේ කරා එළඹ තම තමා ශක්ති පමණින් ආදර සහිත ව පූජාසත්කාර කටයුත්තේය" යි කීහ.

මෙසේ පියරජ්පුරුවන් විසින් කියනලද ශ්‍රී මහා බොධීන් වහන්සේගේ ආනුභාව හා ගුණවිශෙෂ[5] අසා සන්තුෂ්ට වූ කුමාරිකාවෝ ප්‍රීතීන් පිරුණාවූ ශරීර ඇති ව තමන්ගේ පියරජ්පුරුවන් වැඳ[6] කියන්නාහු "පියාණන් වහන්ස, මමත් ඒ ශ්‍රී මහා බොධීන් වහන්සේ වඳනා කැමැත්තෙමි, නුඹවහන්සේ හා කැටිව එමි"යි කීහ. රජ්පුරුවෝ වනාහි ඒ කුමාරිකාවන්ට අතරමඟ උපද්‍රවයෙක් වේ දෙ හොයි යන

---

1. කාළකූට - H
2. එම - ADEGHJL
3. සම්මානනය - BGHL මමානය - L
4. දෙකින් ම - පිටපත් හැම.
5. ගුණ විශේෂය - ACDHJ
6. දැක - BGHL

Non-Commercial Distribution

හයින් කැඳවාගෙන යන්ට මැලි වූහ:[1] ඉක්බිති කුමාරිකාවෝ එපමණෙකින් නොවැළක තුන් යළක් දක්වා රජ්ජුරුවන්ට යාච්ඤා ව කන්නලව් කියා ගිවිස්වා ගෙන එතැන් පටන් පිය රජ්ජුරුවන් හා සමඟ අශ්වයා පිටට පැන නැඟී බොධීන් වහන්සේ වඳනා සඳහා දවස තුන් විටෙක යන්නාහ. එයින් මෑත භාගයෙහි කුමාරිකාවන්ගේ පිය රජ්ජුරුවෝ තමන් මරණාසන්නයෙහි සිතන්නාහු "මාගේ මේ දියණියෝ නිරන්තරයෙන් ම ශ්‍රී මහා බොධීන් වහන්සේට උපස්ථාන පිණිස යෙති: ඉදින් මොවුන්ට මතු යම්කිසි භයෙක් වේ නම් මේ ගමන් නිසා ම වන්නේය: ඊට කළමනා කිම් දෝ හෝ"යි සිතූහ. මෙසේ සිතා ඉක්බිති අස්පැටවා සමීපයට ගෙන්වා ඔහුගේ කන්මුලට[2] කොඳුරා කියන්නාහු "එම්බා පුත[3], මා දුවණියෝ තොප සහාය කොට ගෙන දවස තුන් විටෙක ශ්‍රී මහා බොධීන් වහන්සේ වඳනට[4] යෙති: එතැන්හි උන්ට කිසියම් භයෙක් පැමිණියේ වී නම් යහපත් නොවෙයි: ඒ යන එන ගමන්හි මාගේ දියණියන් සිහි ඇති ව රැකගන්ට" යි කියා අස්පැටවාට දියණියන් භාර කොට තුමූ කාලක්‍රියා කළහ. එකල කුමාරිකාවෝ මහත් වූ රජපෙරහරින් පියරජ්ජුරුවන් ආදහන කරවා ඉක්බිති පළමු පරිද්දෙන් ම දවස තුන්විටෙක අශ්වයා පිටට පැන නැඟී ශ්‍රී මහා බොධීන් වහන්සේ වඳින්ට යෙති.

එකල එතැන්හි සමීප ගම්වැසි මනුෂ්‍යයෝ කුමාරිකාවන්ගේ රූපසම්පත් දැක විස්මය පත්වූ සිත් ඇති ව සිතන්නාහු "ඒකාන්තයෙන් ම මේ රජදරුවන්ට සුදුසු වූ පඬුරෙක් මය: එබැවින් අපි දැන් ගොසින් මේ කුමාරිකාවන්ගේ රූපසම්පත්තිය අපගේ රජ්ජුරුවන් වහන්සේට කීවමෝ වී නම් අපට සන්තුෂ්ට ව කිසියම් සැපතක් දෙන සේක් මය: එබැවින් යම්හ"යි සිතා රජ්ජුරුවන් කරා එළඹ දැක වැඳ එකත්පස් ව සිට කියන්නාහු "දේවයන් වහන්ස, ඉතා රූපත් වූ දෙවඟනක හා සමාන එක් කුමාරිකාවක් දවස තුන් විටෙක්[5] අසකු නැඟී බෝමඩ කරා අවුත් පතුටු සතුටු ව ශ්‍රී මහා බොධීන් වහන්සේ වැඳ විදුලිය කලබක් මෙන් බබළමින් යන්නීය: ඒ කුමාරිකාවන්ගේ රූප ශ්‍රී වෙන වෙන වර්ණනා කොට කිය නොහැක්ක: තමලු ලිය සිරි පරයන්[6] අග් බඹුරු[7] වූ නිල් සිනිඳු කෙස් වැටියක් ඇතියහ: නිලුපුල් පෙති පරයන දිගුපුළුල් වූ සුනිල් නුවන් ඇතියහ: රනොවිලි පරදවන විදුලිය දෙකක් වැනි කන්වැල් සහලක් ඇතියහ: රන් හංස පැටවුන් දෙදෙනකු වැනි මනොඥ වූ තනසහළක් ඇතියහ: චන්ද්‍රකාන්තිය හා මිශ්‍ර වූ සන්ධ්‍යා වලාපටලයක් මෙන් අතිධවල දන්තරශ්මීන් භින්නවර්ණ වූ සුරක්තවර තොල් සහළක් ඇතියහ: රන් අකුස්සක් වැනි අගින් උස් වූ නාසිකාවක් ඇතියහ: පරවියන්ගේ බැම මෙන් නිම්බපත්‍රාකාර ව බබළන්නාවූ සිත්කලු වූ බැම සහළක් ඇතියහ: මඳ මඳ සිනා පෙරදැරි ව කියන්නා වූ

---

1. මැලියහ - ACDJ
2. කම්මුල - ABCDL
3. පුතණ්ඩ - ක.කි.සැ.ම.
4. වඳිනට - AEJ
   වඳින්ට - CDL
5. විටක් - AJ
6. පරදවන - BEGHL ක.කි.සැ.ම.
7. අක්බඹුරු - BCGHL

Non-Commercial Distribution

ළදබොළඳ වචනයෙන් ම දුටුදුටුවන් සිත් පිනවන්නාහ: මහරජ්ජුරුවන් වහන්ස, එබඳු කුමාරිකා කෙනකුන් උන් හැර පළමු අපි කිසි කලෙකත් නුදුටුම්හ:[1] එබැවින් නොඋපමා ව වැඩිය මැනව:[2] අප කියන ඒ කුමාරිකාවගේ රූසිරි[3] සියල්ල නුඹවහන්සේ ම[4] සිය ඇසින් දැන් නොබෝ කලකින් බොධි මණ්ඩලයෙහිදී ම දක්නාසේක් වේ දැ"යි කීහ. එසේ හෙයින් කියන ලදි;

බොධිමණ්ඩං සමාගම්ම - අභිණ්හං තුට්ඨමානසා,
වන්දන්ති යාති කඤ්ඤකා - විජ්ජු ව සිරියා ජලං.

නීලධම්මිල්ලභාරා සා විසාලායත ලොචනා
සොණ්ණදෙලාහ සවණා - සාමා සුභ පයොධරා.

සසිරංසිහි සම්මිස්ස - සඤ්ඤධම්බුද[5]සමාධරා,
තුඩ්ගනාසා නීල හමු - හාසභාසා මනොරමා.

[ඊදිසං* හො][6] මහාරාජ - දිට්ඨපුබ්බා[7] කුදචනං,
එහි තස්සා සිරිං දෙව - බොධි මණ්ඩමහි දක්ඛසී-යි.

මෙසේ ඔවුන් විසින් කියන ලද රූපවණ්ණනා අසා ශ්‍රවණ සංසර්ගයෙන් ම ඒ කුමාරිකාවන් කෙරෙහි පිළිබඳ සිත් ඇත්තාවූ රජ්ජුරුවෝ එම විට තමන්ගේ මහත් වූ චතුරඞ්ගිනී සෙනාව පිරිවරා ගොස් මහ බෝමඩ පවුර වටා පිටතින් සේනාව රකවල සිටුවා "තෙල කුමාරිකාව පලා යා නොදී අල්ව"යි[8] නියොග කළහ. එකල්හි සෙනාව ද "මේ කුමාරිකාව අපි අපි ම අල්වම්හ"යි සාහසික ව තරයේ සැරහී සිටගත්හ: එකල ශ්‍රී මහාබොධීන් වහන්සේ වඳිමින් සිටි රාජකුමාරිකාවෝ තමන් අල්වන්ට වටලා සිටියාවූ සෙනාව දැක වහා ගොස් අශ්ව පිටට පැන නැඟී විලුඹින් සන්නළහ: එකෙණෙහි අශ්වයා මහත් වූ වේග දනවා[9] අහසට පැන නැඟී විදුලිය කැළ වැළඳී හෙළ වලාකුළක් මෙන් දිලිහි දිලිහී යුහු ව ගමන්ගත. කුමාරිකාවෝ වනාහී භය ගෙන ඉක්මන් ව අශ්වනැඟී ඉඳුරා වැද හිඳින්ට කල් නොවූ හෙයින් අශ්වගේ ගමන්වේගය[10] ධරා ගත නොහී අශ්වපිටින් ගිලිහී ගියහ: එකල්හි අස් පැටවා බිම හෙන්නාවූ රාජකුමාරිකාවන් දැක ඔවුන්ගේ පියරජ්ජුරුවන් පළමු තමහට කී අවවාද සිහිකොට ඇසිල්ලෙක පෙරළී බැස කුමාරිකාවන්ගේ ඉසකෙස් වැටිය ඩැහැගෙන උඩ ඔසවා පාත් ව පිට දී අහසින් ගෙන ගොස් පැලලුප් නුවර රජගෙයි ම ඇර සිටවීය.[11]

---

1. නුදුටුවම්හ - ACDEJL කි. ස.
2. මැනවැ යි - AB මැනවැ - L
3. රූසිරු - BJ ක.කි. ඤ.
4. නුඹවහන්සේ වැඩියොසින් - BGH
5. සඤ්ඤධාම්බුද - ABCDEJ
   සඤ්ඤාම්බුද - ක. කි. ඤ.
6. ඊදිසහො - පිටපත් හැම
   ඊදිසං හො - පාලි
* මෙතැන්හි සිට 371 වන පිටුවේ ....දසදහසක් ප්‍රාණීන් යන්න දක්වා කොටස B හි නැත.
7. දිට්ඨපුබ්බං - CDGHJL, පාලි.
8. අල්වව යි - L, ස.
9. දක්වා - 'H
10. ගමනවේගය - ACEJL
11. සිටිවීය - පිටපත් හැම.

එබැවින් අහෙතුක ප්‍රතිසන්ධි ඇති තිරිසනුන් එවා තමන්ට තණ පැන් පමණකින් කරන ලද ස්වල්පමාත්‍ර වූ උපකාරය සිත තබාගෙන ඔවුන්ට මෙසේ ආපදර්ථයෙහි[1] අත් නොහැර පිටිවහල් ව සිට දුකින් ගළවා ගත්තා බව මේ අඞ්ඩයාගෙන් දැන සිත තබාගෙන සියලු සත්වයෝ ම තම තමන්ට උපකාර කළවුන්ට ප්‍රත්‍යුපකාර කිරීමෙන් කෙළෙහි උපකාර දැන වාසය කෙරෙත්වා යි මෙසේ ඒ කුමාරිකාවෝ එතැන් පටන් අනිකුත් බොහෝ පින්කම් කොට ස්වර්ගපද පරායන වූහ. එබැවින් නුවණැති යම් කිසිවෙක් බුදුන් විසින් පුදන ලද ඒ ශ්‍රී මහා බොධීන් වහන්සේට බත් මල් පහන් ආදියෙන් පූජා [සත්කාර][2] කෙරේ ද එතෙම උපනුපන් ජාතියෙහි අපමණ වූ භවභොග සම්පත් ලැබෙයි;[3] නිරොගි නිර්භාධි වෙයි, හැම තැන්හි ම සියල්ලවුන් විසින් ප්‍රශංසා කටයුතු වූ මනහර රූ ඇති වෙයි; එසේ හෙයින් පින්වත් සත්වයෙනි, තොප හැම විසිනුදු එම ශ්‍රී මහා බොධීන් වහන්සේය තදවයවභූත ශාඛා මහා බොධීන් වහන්සේය තත් ප්‍රභව ඵලරුහ මහා බොධිය යන තුන් මහා බොධීන් සැදැහැයෙන් ගොස් දැක වැඳ පුද ගතහැකි යම් බොධිකෙනකුන් වහන්සේ කරා එළඹ තණපරඬලා ඇත පහ කොට මළු හැමඳ පිරිසිදු සිතින් බත් මල් පහන් ආදියෙන් පූජා කොට මතු සියලු සම්පත් ම අත්පත් කළ මැනවි. කියනලදුයේ මැයි;

යො යං දුමින්දං යතිනන්දනෙන
සම්පූජිතං පූජයතෙ සපඤ්ඤො,
සභොගවා හොති අනිතිකො ච[4]
සබ්බත්ථ සො හොති පසත්ථරූපො යි.

මෙතෙකින් මෙහි පළමුවන
බොධිරාජ වස්තුව
කියා නිමවන ලදී.

මෙසේ මේ සද්ධර්මාලංකාරයෙහි ධම්සොණ්ඩක වස්තුවෙහි පටන් බොධිරාජ වස්තුව අවසන් ව[5] ජම්බුද්වීපොත්පන්න වූ එක් සාලිසක් පමණ කථාවස්තූන් වෙන වෙන ම දක්වා මෙයින් මතු කියන ලඞ්කාද්වීපොත්පන්න කථාවස්තූන් දක්වන්නාවූ මම වනාහි මතු කියන ඒ[6] කථාවස්තූන්ට උත්පත්තිස්ථාන වූ මේ ශ්‍රී ලඞ්කාද්වීපය අබුද්ධොත්පාද කාලයෙහි යක්‍ෂයන්ට ම නිවාස ව බුද්ධොත්පාදයෙහි මනුෂ්‍යයන්ට වාස වන බව ද අනන්තාපර්‍යන්ත සර්වඥවරයන්ගේ බොධිද්‍රුමවල දක්‍ෂිණ මහාශාඛාවන් හා ධම්ධාතු ආදි වූ ශාසන ප්‍රතිෂ්ඨාව මෙහි ම වනු එකාන්ත බව ද සමහර බුදුකෙනකුන් වහන්සේ තමන් වහන්සේගේ ප්‍රථම බොධියෙහි ම මෙහි

1. ආපදයෙහි - මුද්‍රිත හැම, ස.
2. සත්කාර (නැත) - පිටපත් හැම, ස.
3. ලබයි - ක. කි, ඝ, ම.
4. අනීතිකොව - ACDEGHJL
5. අවසන් කොට - මුද්‍රිත හැම
6. ඒ (නැත) - ABCDEGHK

Non-Commercial Distribution

යක්‍ෂයන් දුරු ව මනුෂ්‍යාවාස වූ කල පසුව කල්බලා වැඩ ධම්දෙශනාවෙන් මහජනයා පහදවා මහබෝධි[1] පිහිටුවීම් ආදී වූ පාරිභොගික ධාතු ප්‍රතිෂ්ඨාවෙන් රකවරණ දී සසුන් පිහිටුවා වඩනා බව ද සමහර බුදු කෙනකුන්වහන්සේ තමන් වහන්සේ ම වැඩ යක්‍ෂයන් ප්‍රලය කොට මනුෂ්‍යාවාසයට[2] අවකාශ කරවා කෙසධාතු හා පාරිභොගික ධාතු ප්‍රතිෂ්ඨාවෙන් අරක් දී රජුන් ඇති කොට මනුෂ්‍යාවාස[3] කරවා සසුන් පිහිටුවා සියලු සම්පත්තීන් සමෘද්ධකරවන බව ද යන මේ සියල්ල ම යට කියන ලද නෙහාතික වස්තුවෙහි දෙවන පැතිසස කථාවට මූලාරම්භයෙහි ම දැක්විය යුතු වුව ද ග්‍රන්ථය [විශාල][4] වේයි සිතා නොදැක්වූ හෙයින් මෙතැන්හි පළමු කොට ඒ කථාප්‍රබන්ධය සංක්‍ෂෙප වශයෙන් දක්වා ශාසන කථා පමණක් පිළිවෙළින් පහළ කොට තදනන්තර ව "ශ්‍රද්ධාසුමනා වස්තුව" ගෙනහැර දක්වමි. තමහට වැඩ කැමැති රජ යුවරජ මහඇමැති ආදී වූ ශ්‍රද්ධාවන්තයන් විසින් සිත් හෙළා ඇසිය යුතු. හේ කෙසේද යත්;

පෙර අතීතකාලයෙහි බුදු වූ අනන්තාපයර්‍යන්ත සර්‍වඥවරයන් හැර මේ මහා භද්‍රකල්පයෙහි පළමු ව බුදු වූ කකුසඳ නම් බුදුන් සමයෙහි මේ ශ්‍රී ලඞ්කාද්වීපය ඕජ දීප නම් විය; මහමෙවුනා උයන මහාතිත්ථ වන නම් විය; උයනට නැගෙනහිර නුවර අභයපුර නම් විය; එහි රජ්ජුරුවෝ ද අභය නම් වූහ; දැන් පියල්කුළු නම් වූ මිහින්තලා ගල දෙවකූට නම් විය; එකල මෙහි අප බුදුන් දවස විශාලා මහනුවර පැමිණි රොගදුර්භික්‍ෂ යක්‍ෂ භය සේ ම ජ්වරරොගයකින්[5] මහත් වූ පීඩාවක් ඇති ව බොහෝ සත්ත්වයන් මියන්ට වන් කල්හි ඒ බව දැක කකුසඳ නම් බුදුහු ඔවුන් කෙරෙහි උපන් මහත් වූ කරුණා ඇති ව සතලිස් දහසක් පමණ මහණ ගණයා පිරිවරා තරු පිරිවැරූ[6] චන්ද්‍රයා සේ දෙවකූටයට අවුත් බැස සවනන් රසින් දසදිගුන් බබුළුවා ගල්කුළ මත්තෙහි වැඩසිට සියලු සත්ත්වයන්ට ම පෙනී ජ්වරරොග අන්තර්ධාන කරවා එකෙණෙහි තමන් වහන්සේ දැක මහත් වූ සන්තොෂයෙන් ඉපිල නැගී ඇසිල්ලක දිව අවුත් පර්‍වතය සිසාරා රැස්ව සිට ගන්නාවූ රජ යුවරජ මහ ඇමති ආදීන් පිරිවරා ඔවුන්ගේ ම ආරාධනාවෙන් වැඩ මහපොළොව ගුගුරුවා මහත් වූ උත්සවයෙන් මහාතිත්ථවන නම් උයන පිළිගෙන සතලිස් දහසක් මහසඟුවන් පිරිවරා වැඩහිඳ අහර වළඳ මහජනයාට බණ වදරා සතලිස් දහසක් ප්‍රාණීන් සසරින් මුද මහාබොධිස්ථානයට එළඹ මොහොතක් කල් ධ්‍යානයෙන් හිඳ එයින් නැඟී අධිෂ්ඨානකොට දඹදිව ඛෙමවතී නම් නුවර [ඛෙම][7] නම් රජුනු ලවා තමන් වහන්සේගේ මහරීබොධියෙහි සිරියෙල් රෙඛා දෙවා ස්වයංජිනන ව[8] අහසට පැන නැගී දක්‍ෂිණ මහාශාඛාව රන්කටාරයෙක පිහිටුවා පන්සියයක් භික්‍ෂුණීන් හා සමඟ රුචිනන්ද නම් අග්‍රශ්‍රාවිකාවන් ලවා අහසින් ගෙන්වා අභය නම් රජුනු ලවා

1. මහබෝ - ACDEJ
2. මනුෂ්‍යාවාසයට - ADGHL
3. මනුෂ්‍යාවාස - ACDGHL
4. විසාරද - පිටපත් හැම
5. ශ්ලෙෂ්මජ්වරරොගයකින් - ස
   මහත් ජ්වරරොගයකින් - L
6. පිරිවර - ACDEHJL
7. ඛෙම - ABCDEGH
   ඛෙමවතී - L
8. ස්වච්ජිනන ව - ACEJ
   ස්වයම්ජිනන ව - L

Non-Commercial Distribution

බොධිප්‍රතිෂ්ඨා කරවා එතැනට උතුරුදිග එකල සිරිසමාලක නම් ලද ලොවාමහපා තන්හි වැඩහිඳ ධර්‍මදෙශනා කොට විසිදහසක් ප්‍රාණීන් සසරින් මුදා එයින් ථූපාරාම භූමියට වැඩ ධ්‍යානයෙන් හිඳ එයින් නැඟී බණ වදරා දසදහසක් ප්‍රාණීන් සසරින් මුදා එතැන්හි දගබක් කරන සේ තමන් වහන්සේගේ ධර්‍මකරකය පාවා දී එම රුචිනන්‍ද නම් ශ්‍රාවිකාවන් හා පන්සියයක් භික්‍ෂුණීන් ද මහාදෙව නම් මහතෙරුන් වහන්සේ හා දහසක්[1] භික්‍ෂූන් ද මෙහි ම රඳවා එයින් දෙවකූටයෙහි ආදි බට මහසලයෑ පිහිටි තන්හි ම වැඩ සිට සියලු දීපවාසීන්ට අනුශාසනා කොට මහජනයා බල බලා සිටියදී ම දඹදිව් වැඩියේක. එසේ හෙයින් කියන ලදී;

ඉති මුනිකකුසන්‍ධො දීපමාගම්ම මෙතං
බහුලජනනිකායං නිබ්බුතිං පාපයිත්වා,
තදහනිව සිරීසං බොධිසාඛඤ්ච නෙත්වා
නිදහිය ගගණමහා ජම්බුදීපං අගඤ්ඡි-යි.

එතැන් පටන් ඒ බුද්ධොත්පාදය මුළුල්ලෙහි මෙහි[2] උපනුපන් රජ ඇමැති ආදීහු තුනුරුවන් පුදා පුදා සගමොක්සැපත් සෑධූහ.

නව ද දෙවන කොණාගමන නම් බුදුන් සමයෙහි මේ ද්වීපය වරද්වීප නම් වීය; මහමෙවුනා උයන මහාඅනොමවන නම් වීය; උයනට දකුණු දිග නුවර වඩ්ඪමානක පුර නම් විය; එහි සමිඞ් නම් රජෙක් රාජ්‍යය කරන්නේය; පියල්කූටය[3] සුමනකූට නම් වීය; එකල මේ ද්වීපයෙහි වැසි නැති ව මේ බුද්ධොත්පාදයෙහි බැමිණිටියා සාය[4] සේ ම මහත් වූ දුර්භික්‍ෂයෙක් වීය; එකල්හි බුදුහු තිස් දහසක් රහතන් හා සමඟ ආකාශයෙන් වැඩ සුමනකූට මස්තකයෙහි දසදිග් බලාවා වැඩ සිට තමන් වහන්සේගේ අධිෂ්ඨාන බලයෙන් වැසි වස්වා ගිම් නිවා වැසි අන්තර්ධාන කොට සියලු සතුන්ට පෙනි පෙනී සියලඟින් නැවත දියකඳ හැර ජලශාන්ති කොට ඒ ප්‍රාතිහාර්‍ය්‍යයෙහි පැහැද තමන් වහන්සේ කරා රැස්වූ මහජනයා පිරිවරා ඔවුන්ගේ ම ආරාධනාවෙන් වැඩ මහපොළොව ගුගුරුවා මහාඅනොමවන නම් උයන පිළිගෙන වළඳ අන්තයෙහි බණ වදරා තිස්දහසක් ප්‍රාණීන් පසරමලින් ගළවා පෙර සේ ම අධිෂ්ඨාන කොට දඹදිව සොභනා නම් නුවර සොභන නම් රජහු ලවා තමන් වහන්සේගේ උදුම්බරා බොධියෙහි දක්‍ෂිණ ශාඛාව යට කී පරිද්දෙන් ම ඡවයංජිනන[5] කරවා කනකදත්තා නම් ශ්‍රාවිකාවන් ප්‍රධාන වූ පන්සියයක් භික්‍ෂුණීන් ලවා ඇසිල්ලෙක ගෙන්වා සමිඞ් නම් රජහු ලවා බොධි ප්‍රතිෂ්ඨා කරවා එකල නාගමාලක නම් වූ ලෝවාමහපා භූමියෙහි වැඩහිඳ බණ වදරා විසිදහසක් ප්‍රාණීන්ට මාගීඵල

1. දසදහසක් - AEGHL
2. මෙහි (නැත) - AEGHL, ක. ඤ. ම.
3. පිලයකූටය - ACDEJ;
ජලයකූටය - L
4. සායෙහි - GHL
5. ඡවඡින්න - ACDEGHL

Non-Commercial Distribution

දී එයින් ගොස් ථූපාරාම භූමියෙහි ධ්‍යානසුවයෙන් වැඩහිඳ එයින් නැඟී ධර්මදේශනා කොට *දසදහසක් ප්‍රාණීන් සසරින් ගළවා එතැන්හි චෛත්‍යයක් කරන[1] සේ ජලධාතුව පාවා දී එම කනකදත්තා නම් ශ්‍රාවිකාවන් ප්‍රධාන වූ පන්සියයක් භික්ෂුණීන් හා සුධර්ම නම් මහතෙරුන් වහන්සේ ප්‍රධාන වූ දහසක් භික්ෂූන් මෙම ද්වීපයෙහි රඳවා එයින් ගොස් සුදස්සනමාලක නම් වූ මහසල සෑය පිහිටි තැන වැඩසිට සියලු සතුන්ට අවවාද දී මේ ද්වීපයෙන් ජම්බුද්වීප ම[2] වැඩියේක. එසේ හෙයින් කියන ලදී:

එවං හි කොණාගමනො මුනින්දො
දත්වා බහුන්නං ඵලමග්ගදනං,
ඨෙත්වා තතො දුම්බරබොධිසාඛං
නිධායගා ජම්බුසිරිවහදීපං-යි.

එතැන් පටන් ඒ බුද්ධොත්පාදයෙහි ද මෙහි උපනුපන් රජ දරුවන් හා බොහෝ දෙන තුනුරුවන් වැඳ පුද සගමොක්සැපත් අත්පත්[3] කළහ.

තව ද තුන්වැනි ව බුදු වූ කාශ්‍යප නම් බුදුන් සමයෙහි මෙම ද්වීපය මණ්ඩද්වීප නම් වීය: මහමෙවුනා උයන මහාසාගර උයන[4] නම් වීය: ඊට පශ්චිම දිග් භාගයෙහි[5] නුවර විශාලාපුර නම් වීය: ජයන්ත නම් රජෙක් එහි රාජ්‍යය කෙරෙයි: පියලකූටය[6] ශුභකූට නම් විය: එකල මේ ද්වීපවාසීන් හා රජ යුවරජ මහ ඇමැතියෝ [ද්විභාග] ව[7] බෙදී යුධ සන්නාධ ව සටනට පටන්ගත්හ: ඒ බව දැක බුදුහු විසිදහසක් රහතන් පිරිවරා ආකාශයෙන් වැඩ ශුභකූටයට බැස මහ අඳුරක් මවා දෙසෙනඟ ඔවුනොවුන්ට නොපෙනෙන සේ අධිෂ්ඨාන කොට අන්ධකාරයෙන් මූර්ජා කරවා එම විට ම අඳුරු දුරු කොට සියලු ද්වීපය දුම් කඳින් වසා එයිදු අනතර්ධාන කොට පියලු දිවයින[8] ගිනිදැලින් වසා මහසෙනඟ මරණ භයින් වෙවුල්වා අත[9] තුබූ ආයුධ හෙළවා දෙසෙනඟ සමඟි කරවා ගිනිකඳු[10] අන්තර්ධාන කොට තරුපිරිවර සඳක් සේ සහපිරිවරින් පෙනී සන්තොෂ කරවා ඔවුන්ගේ ම ආරාධනාවෙන් එදවසුදු මහපොළොව ගුගුරුවා මහාසාගර වන නම් උයන පිළිගෙන වළඳ අන්තයෙහි බණ වදරා විසිදහසක් ප්‍රාණීන්ට මාර්ගඵල දී එයින් ශ්‍රී මහා බොධිස්ථානයට වැඩ මොහොතක් කල් ධ්‍යාන සුවයෙන් වැඩහිඳ[11] එයින් නැඟී පෙර සේ ම අධිෂ්ඨාන කොට බරණැස බ්‍රහ්මදත්ත රජහු ලවා නිග්‍රොධ බොධියෙහි දක්ෂිණ ශාඛාව ස්වයං ඡින්න[12] කරවා සුධර්මා නම් ශ්‍රාවිකාවන් ප්‍රධාන වූ පන්සියයක් භික්ෂුණීන් ලවා පුද

1. කරවන - GHL
2. ජම්බුද්වීපයට ම - BL මුද්‍රිත හැම. ස.
3. අත් - DEGHJ
4. මහාසාගරවන - C
   සාගරඋයන - L
5. දිශාභාගයෙහි - මුද්‍රිත හැම
6. පිලයකූටය - AJ;
   ජලයකූටය - L
7. දෙභාග ව - පිටපත් හැම
8. දිව - BEG
   දිග - DH, ක. සි.සද. ම.
9. අත අත - ACJ
10. ගිනිකඳ - BGHL, ක.සි.සද.ම.
11. යෙදී වැඩහිඳ - ක.සි.සද.ම.
12. සවච්ඡින්න - BCDEGH

* B පොත මෙතැන දී යළි ඇරඹේ.

Non-Commercial Distribution

පෙරහරින් ගෙන්වා ජයන්‍ත නම් රජ්හු ලවා මහබෝ[1] පිහිටුවා අශෝකමාලක නම් වූ ලෝවාමහපා භූමියෙහි වැඩහිඳ වදළාවූ බණින් සාරදහසක් ප්‍රාණීන්ට අමාමහ නිවන් දී ථූපාරාමස්ථානයට වැඩ[2] ධ්‍යානයෙන්[3] නැඟී බණ වදරා දසදහසක් ප්‍රාණීන්ට මාර්ගඵල දී තමන් වහන්සේගේ ජලසාටිකාව[4] පිහිටුවා එතැන්හි දගබක් කරවන සේ සලස්වා සුධර්මා නම් ශ්‍රාවිකාවන් ප්‍රධාන වූ පන්සියයක් භික්ෂුණීන් හා සර්වනන්‍ද නම් මහාස්ථවිරයන් ප්‍රධාන වූ දහසක් භික්ෂූන් වහන්සේ මෙහි ම රඳවා එයින් සෝමනස්සමාලක නම් වූ මහසලසෑ තන්හි වැඩහිඳ[5] සියලු දෙව්මිනිසුන්ට අනුශාසනාකොට අහස් කුසට පැන නැඟී තරුපිරිවර චන්‍ද්‍රයා සේ දිලියෙමින් රහතන් හා සමඟ දඹදිව්වූ වැඩිසේක. එසේ හෙයින් කියන ලදී;

එතං හි කස්සපජිනො වරමණ්ඩදීපං
පත්තො ඵලග්ගරතනං බහුනො ජනස්ස,
දත්වාන ආනිය[6] තතො වටබොධිසාඛං
රොපාපයිත්වමගමා පුන ජම්බුදීපං-යි.

එතැන් පටන් ඒ බුද්ධොත්පාදයෙහි ද මෙහි උපනුපන් සරාජික සත්වයෝ තුනුරුවන් පුද පුද සගමොක් සැපත් අත්පත් කළාහු මය.

තව ද මෙම කප සතර වැනි ව බුදු වූ අප මහා ගෞතම නම් බුදුරජාණන් වහන්සේ බුදු වූ නව වැනි මස දුරුතු මැදි පොහෝදිනයෙහි මේ ලඞ්කාද්වීපයට වැඩ මහවැලි ගං අස දිග තුන් යොදනක්[7] හා පුළුල දෙයොදනක්[8] පමණ ඇති මහමෙව්නා උයන්හි කඳවුරු බැඳ ඔවුනොවුන් හා සංග්‍රාමයට පටන්ගත්තාවූ මහා යක් සෙනඟ මැද ආකාශයෙහි වැඩ සිට අහස්[9] පොළෝ ගුගුරුවා යක්‍ෂයන් තැති ගන්වා වැසි සුළං සහිත ඝනාන්‍ධකාරයක් මවා යක්‍ෂයන් මූර්ඡා කරවා අඳුරු දුරුකොට පුන්සඳක් සේ පෙනී නැවත සියලඟ දුමවා[10] දුම් සළා හැර යක් සෙනග ධූමාන්‍ධකාරයෙන් භය ගන්වා පෙනී එකල යක්‍ෂයන් විසින් අවකාශ කොට දෙනලද මහියඞ්ගණ චෛත්‍යස්ථානයෙහි සම්කඩ අතුට යක්සෙනඟ මැද වැඩහිඳ සම්කඩ සතරදිගින් ගිනිකඳ සතරක් මවා දසදිග ගිනිකඳු විහිදුවා යක්‍ෂයන් ලුහුබැඳ[11] මුහුදු වෙරළ රැස්කරවා යක්[12] ගිරිදිවයින ගෙන්වා යක්‍ෂයන් එහි පිහිටුවා පෙර තුබූ තන්හි ම ස්ථාවර කොට එකෙණෙහි පූජා භාණ්ඩ ගෙන නොයෙක් දෙසින් අවුත් රැස්ව සිටියා වූ සමන්කුළ වසන මහ සමන්දෙව්ඳු හා ලක්දිව ඒ ඒ තන්හි පිහිටි වෘක්‍ෂ පර්වත හැළි දෙළ[13] විල් පොකුණු වැලිතලා ලියමඩුලු ආදියෙහි වසන දෙවදෙව් සත්‍වන්ට බණ වදරා නොයෙක් කෙළගණන් දෙවියන් මාර්ගඵලයට පමුණුවා අසඞ්ඛ්‍යයක්

---

1. මහාබෝධි - *CDJL*
2. වැඩහිඳ - BGHJL
3. ධ්‍යානසුවයෙන් - L
4. ජලසාටිකා - BEGHL ක. කි. කැ. ම.
5. වැඩසිට - ABEGHJL
6. ආනය - ACDEJ ක.කි.කැ.ම.: ආය - L, ආනස - ස
7. යොදුනක් - ABCJL
8. දෙයොදුනක් - BCEHL
9. අහස - DGHL
10. දුමමින් - ක.කි.කැ.ම.: දුම මවා -L
11. ලුහුබඳවා - මුද්‍රිත හැම
12. යක් (නැත) - ABEGH ක.කි.කැ.ම.
13. දෙළෙන් - ABEGJL, ස. දෙළින් - H

Non-Commercial Distribution

දෙනා ශරණ ශීලයෙහි පිහිටුවා එදවස් සොවාන් වූ සමන්දෙවු රජහට කෙශධාතු මිටක් දී ලක්දිව පිසාරා ප්‍රදක්ෂිණා කොට නැවත යක්‍ෂාවාස නොවන සේ අරක් දී උරුවෙල් දනවු වැඩිසේක.

එකල මහ සමන්දෙවු රජ තමහට දුන් කෙශධාතු රුවන් කරඬුවෙකින් පිළිගෙන බුදුන් වැඩහුන් තෙන රුවන් රැසක් පිටට වඩා සත්රියන්[1] උස ඉඳුනිල්මිණි රැසකින් වසා අපමණ වූ දිව සුවඳ මල් ආදියෙන් පූජා කෙළේය. පසුව සරභූ නම් රහත් කෙනකුන් වහන්සේ බුදුන්ගේ ග්‍රීවාධාතුව වඩා ඒ වසා මෙඝවර්ණපාෂාණයෙන් දෙළොස් රියනක් උස දගබක් මවා මහත් වූ පූජා කළසේක. පසුව චූළාභය නම් රජෙක් ඒ වසා තිස්රියන් උස මහ සෑයක් බඳවා පූජා කෙළේය. ඉක්බිති දුටුගැමුණු නම් රජෙක්[2] ඒ වසා අසූරියන් උස මහසෑය[3] බඳවා ඝනරන්පතින් වසා ධන පමණින් පූජා කෙළේය. සූසැට රියනක් උසය යි කියා ද කියන්නාහු මය. කියන ලදුයේ මැයි;

චූළාභයවහවනිපො අපරම්හි කාලෙ
තං එව තිංසරතනුච්චමකාසි ථූපං,
දුට්ඨාදිගාමණිනුපො දමිළෙ හණන්තො,
කාරෙසි කඤ්චුකමථො චතුසට්ඨිහත්ථං-යි.

තව ද අප බුදුන් බුදු වූ පස්වන හවුරුදු බග අව පසළොස්වක් දිනයෙහි[4] චූළොදර මහොදර නම් දෙමයිල් නා රජුන් දෙදෙනාගේ[5] මිණිපළඟක් නිසා කරන යුධයෙහි නස්නා බොහෝ නයින් දැක ඔවුන් කෙරෙහි උපන් මහා කරුණාවෙන් පෙරවරු ම [දඹදිව] දෙවුරම් වෙහෙරින් නික්ම එම වෙහෙර දෙරටුවෙහි පිහිටි කිරිපලුරුක අරක්ගත් සමිද්ධිසුමන නම් දෙව් රජ්හු විසින් උපුටා සිරසට කරනලද එම කිරිපලුතුරු නමැති ඉඳුනිල්මිණි ඡේසත් සෙවණ ආකාශයෙන් ම මණිනාගදිවයින් වැඩ ඝොර වූ යුධයට පටන් ගත් නාග සෙනාවට පෙනී අහස්කුස වැඩහිඳ අන්ධකාර නිර්මාණාදි වූ නොයෙක් පෙළහර[6] දක්වා ධර්මදේශනා කිරීමෙන් දෙසෙනඟ සමඟ කරවා ඔවුන් විසින් පිළිගන්වනලද මිණිපළඟ මත්තෙහි වැඩහිඳ එම නාරජුන් විසින් එළවනලද දිව බොජුන් වළඳ අනුමෙවුනි[7] බණ දෙසා අසූකෙළක් නයින් ශරණශීලයෙහි[8] පිහිටුවා ඔවුන් වැඳ පුදන සේ කිරිපලුරුක හා සමඟ මිණිපළඟ නාරජුන්ට පාරිභොගික චෛත්‍යය කොට පාවා දී මෙසේ දෙවන ධාතුප්‍රතිෂ්ඨාවෙන් ලක්දිවට අරක් දී දෙවුරම් වෙහෙර වැඩිසේක. එසේ හෙයින් කියනලදී;

ජලට්ඨෙ ථලට්ඨෙ භුජඞ්ගෙ පනෙවං
සමග්ගෙ කරිත්වා මුනී "සීතිකොටී",
පතිට්ඨාපයිත්වා තතො පඤ්චසීලෙ[9]
අගා ජේත නාමං විහාරං උළාරං - යි.

1. වඩු සත්රියන - BGH
2. රජ - BGHL, ක. කි. සැ. ම.
3. මහසෑයක් - L
4. ලත් දිනයෙහි - ACJ
5. දෙදෙනා - BEGHL, ක. කි. සැ. ම.
6. අසිරි පෙළහර - ක. කි. සැ. ම.
7. අනුමෙවෙනි - BCEGH, ක. කි. සැ.
8. සරණසීල - E
සරණසිල් - CJ
9. තථාවාදිසීලෙ - J
තතොවාසීලෙ - ABCDEGHL

Non-Commercial Distribution

තව ද අප බුදුහු බුදු වූ අට වන හවුරුදු සුනාපරන්තක නම් මහතෙරුන් වහන්සේගේ ආරාධනාවෙන් පන්සියයක් රහතන්[1] හා සමඟ සක්දෙවුරජහු මවා දුන් පන්සියයක් රුවන් මඩු නැගී සුනාපරන්තක නම් ජනපදයට වැඩ මුහුළු නම් ආරාමයෙහි චන්දන ශාලාව පිළිගෙන කීප දවසක් එහි වැස ධර්මදෙශනාවෙන් මහ ජනයා[2] පහදවා එයින් නම්මද නම් ගඟට වැඩ එහි වසන නම්මද නම් නාරජහු දුන් දිව්‍යබොජුන් වළඳා ධර්මදෙශනා කොට බොහෝ නයින් ශරණශීලයෙහි[3] පිහිටුවා ඒ නාරජහුගේ ආරාධනාවෙන් නම්මදනම් ගංතෙර රළින් මුවා වන තෙන ශ්‍රීපාදයක් දක්වා එයින් සච්චබද්ධක[4] නම් පර්වතයට වැඩ එහි වසන සච්චබද්ධක නම් තෙරුන් වහන්සේගේ ආරාධනාවෙන් ඒ පර්වත මුදුනෙහි ද පාදලක්ෂණයන් හා සමඟ ශ්‍රීපාදයක් දක්වා එයින් මහොදර නම් නාරජහු මයිල් මිණි ඇස්[5] නම් නාරජහුගේ ආරාධනාවෙන් වෙසහමැදි පොහෝ දිනයෙහි ලක්දිව් වැඩ කැළණි මහසෑය පිහිටි තැන ඔහු විසින් මවනලද රත්නමණ්ඩපයෙහි රහතන් හා සමඟ වැඩහිඳ එම නාරජහු විසින් එළවනලද දිව්‍යබොජුන් වළඳා ධර්මදෙශනා කොට නේ සුවහස් නයින් තිසරණ ගන්වා එයින් නික්ම සමන්කුළ වසන මහාසුමන නම් දෙවුරජහුගේ ආරාධනාවෙන් සමනොළට[6] වැඩ පර්වත මුදුනෙහි ගනරන් කඳක් සේ දිලිහි දිලිහී ආකාශයෙහි ම වැඩ සිට දෙව් බඹ නා ගුරුළු ආදීන් විසින් කරන ලද පූජා සත්කාර විඳ විඳ එම දෙව්රජහුගේ ආරාධනාවෙන් අහසින් බැස පැළදික් බලා වැඩසිට තමන් වහන්සේගේ අටතුරාසියක් මඟුල් ලකුණෙන් හෙබියාවූ එක් රියන් එක් වියත් තවඟුල් පමණ වූ අයම් ඇති වාම ශ්‍රී පාදය සමනොළ[7] මුදුන්කුළ මස්තකයෙහි සලක්ෂණ කොට පිහිටුවා එම පර්වත පාර්ශ්වයෙහි භගවා නම් ලෙන දිවාවිහාරයෙන් වැඩහිඳ එයින් සිරිලක ඇතුළු කොට අනුරාධපුර නුවර[8] වැඩ දකුණු මහසෑය පිහිටි මහ පුළිල මලුවය මහමෙවුනා උයන් මැද මහා බොධිස්ථානය මුචලින්ද මාලක නම් ලද ලෝවාමහපායස්ථානය පැනඹ මළුවය යි ව්‍යවහාර[9] ලද රාශිමාලක නම් වූ ලහබත් ගෙය පිහිටි තැනය උතුරු දෙස ජන්තාඝර[10] නම් වූ ගිනිහල් පොකුණ පිහිටි තැනය පතන්[11] භූමියෙහි රුවන් මහ පාය[12] පිහිටි තැනය ථූපාරාම ස්ථානය මීන්තලෙහි[13] මහසල සෑය පිහිටි තැනය රුහුණු ජනපදයෙහි දිගානකය[14] පිහිටි තැනය යන මේ නව මහා ස්ථානය පූර්වසර්වඥවරයනුදු වැඩහුන් තැන් හෙයින් තමන් වහන්සේ ද [ඒ තැන්හි] ධ්‍යානයෙන් වැඩහිඳ ඒ ඒ තන්හි රැස්වූ දෙවියන්ට බණ වදරා නොයෙක් ලක්ෂ සුවහස් ගණන් දිව්‍යසමූහයන් මාර්ගඵලාලඞ්කාරයෙන් සරහා මෙසේ තුන් වාරයෙකින් තුදුස් තැනක තුදුස් මොහොතක් කල් තුදුස් සමවතකින් වැඩහිඳ පාරිභොගික ධාතු ප්‍රතිෂ්ඨාවෙන් මේ ශ්‍රී ලඞ්කාද්වීපයට අරක් දී ජම්බුද්වීපයට වැඩිසේක. එසේ හෙයින් කියනලදි;

1. රහත් පිරිවර - B
   රහතුන් පිරිවර - GL
   රහතන් වහන්සේ - E,ක.සි.ක.ම.
2. මහජනයන් - ACDEGHJL
3. ශරණසීල - EJ
4. සච්චබන්ධක - ADEGHJ.
5. මිණි අක් - L ක.සි.ක.ම.
6. සමනලට - BCDGH, ක. සි. ක. සමනල - ම.
7. සමනළ - BCDGH
8. නුවරට - BCGHL
9. බැවහාර - AEGHJL
10. දන්තාදර - ACDEHJL
11. පුධන් - BGHL
12. රුවන්වැලි මහ සෑය - L
13. මින්තෙලෙහි - BEL
    මිහින්තලයෙහි - මුද්‍රිත හැම, ස.
14. දිගැනකය - ADEJ;
    ගැනකය - L

Non-Commercial Distribution

එවං ලඞ්කාය නාථො හිතමමිතමතී ආයතිං පෙක්ඛමානො
තස්මිං කාලම්හි ලංකා සුරගුරුග ගණාදීනමප්පේසුච පස්සං,
ආගා තික්ඛත්තුමෙතං ඉති විපුලදයො ලොකදීපො සුදීපං
දීපො තෙනායමාසං[1] සුජනබහුමතො ධම්මදීපංච භාති-යි.

තව ද මේ ලක්දිව රජුන් ඇති ව මනුෂ්‍යාවාස වූ පරිදි කෙසේ ද යත්? පෙර දඹදිව කලිඟුරට කලිඟු නම් සක්විති රජහුගේ වංශයෙහි උපන් කලිඟු රජහට දූ[2] රාජකන්‍යාවක් වඟුරට වඟුරජහු කෙරෙහි වැස දුවක ලද; ඕතොමෝ වැඩිවිය පැමිණ අතිකාමී බැවින් වෙස් වළා සෛවරණචාරී ව[3] ඇවිදිනී මගධ දෙශයට යන වෙළෙඳ කෙනකුන් හා එක් ව ගොස් අතරමඟ ලාඩ දෙශයෙහි වන මැද සිංහයක්හට[4] හසු ව ඔහු කෙරෙහි වැස සිංහබාහු නම් පුතකු හා සිංහවල්ලි නම් දුවක ලද; පසුව සිංහබාහු නම් රජකුමර සිංහවල්ලි නම් වූ එම නඟා නඟ තමහට බිසෝ කොට ලාඩදෙශයෙහි වනමැද අමුතු ව සිංහපුර නම් නුවරක් කරවා එහි වැස සොළොස් වාරයෙකින් හිමුත් දරුවන් දෙතිස්දෙනකු ලද. එයින් වැඩිමහල්[5] විජය නම් රජකුමර අප බුදුන් පිරිනිවන් පානා දවස් සත්සියක් යොධයන් ගෙන ලක්දිව් බැස බුදුන්ගේ මෙහෙවරින් සක්දෙවු රජහුගෙන් නියෝග ලත් උපුල්වන් දෙවිරජහු විසින් කරනලද ආරක්ෂා ඇති ව කුවෙණි නම් යකින්නගේ සහායයෙන් ලක්දිව අතුරතුරෙහි නො ගොස් සිටිය[6] යක්ෂයන් මරා ලුහුබඳවා මේ ශ්‍රීලඞ්කාද්වීපයට සිංහලය යි නම් තබා තම්මැන්නා වෙනෙහි[7] එම නමින් නුවරක් කරවා තමාගේ[8] දූතයන් දඹදිවු යවා දක්ෂිණමධුරා නම් නුවර පඬිරජහුගේ දුව සත්සියයක් පමණ ඇමැති දැරියන් හා සමඟ අටළොස්කුලයෙක වැඩිතරමුත් පිරිවර කොට පස් කුලයෙක කර්මකාරක ජනයන් ඇතුළු ව මහ පිරිවරින් මෙරට ගෙන්වා ඒ රජකුමරිය තමහට අගබිසෝ කොට ඔටුනු පැළඳ තම්මැන්නා නුවර හිඳ දැහැමින් දවස් යවා[9] අටතිස් හවුරුද්දක් රාජ්‍යය කෙළේය. කියනලද මැයි මහාවංශයෙහි;

හිත්වාන පුබ්බචරිතං විසමං සමෙන
ධම්මෙන ලඞ්කමඛිලං අනුසාසමානො,
සො තම්බපණ්ණි නගරෙ විජයො නරිනෙ,
රජ්ජං ආකාරයි සමා බලු අට්ඨතිංස-යි.

1. තෙනයමාසිං - සඳ.ක.කි.
තෙනායමාසි - මහවං.ස.ස.
තෙනාය මායං - D
තෙනාය මානාය - BGHL
2. දූ. දූ - ක.කි.සඳ.ම.
3. සෙරිචාරී ව - L
4. සිංහරජක්හට - BGH
5. එයින් මහලු පින් - ABDEGHL, ස.
6. හුන් - EGHL, ක. කි. සඳ, ම.
7. තඹපත් වෙනෙහි - ක.සඳ. අධොලිපි
8. තමාගෙන් - ACHJL
9. යවමින් හුරා - මුද්‍රිත පැම

Non-Commercial Distribution

ඒ විජය රජහු ඉක්බිති ව රාජ්‍යය කරන්නට හිමි අන් රජක්හු නැති හෙයින් ඔහුගේ ම උපතිස්ස නම් අමාත්‍යයෙක් මහජනයා විසින් අභිසම්මත ව රජ පැමිණ තම්මැන්නා නුවර හැර අනුරාධපුරයට උතුරු දිග ඇලසර නමා නමින් උපතිස්ස නම් නුවරක් කරවා එහි වැස අවුරුද්දක් රාජ්‍යය කෙළේය. ඔහු ඉක්බිති ව විජයරජහුගේ මල් වූ සුමිත්ත නම් රජු නිසා මදුරජහු දුව වැදූ පුතුන් තුන්දෙනා අතුරෙන් පඬුවස්දෙවු නම් බාල රජකුමර ඇමතියන් දෙතිස්දෙනකු ගෙන දඹදිව සිංහපුරයෙන් නික්ම ලක්දිවු බැස උපතිස්ස නම් නුවරට පැමිණ රාජ්‍යය ලැබ තමහට නිසි බිසොවක් නැති හෙයින් ඔටුනු නොපැළඳ ම රාජ්‍යය කෙරෙයි.

එකල අප බුදුන්ගේ සුළු[1] පිය වූ අමිතොදන නම් ශාක්‍ය රජ්ජුරුවන්ගේ පුත් වූ පණ්ඩුවාස[2] නම් ශාක්‍ය රජ්ජුරුවන් විඩූඩභ සංග්‍රාමයෙහි කපිලවස්තු පුරයෙන් නික්ම ගොස් ගඟින් එතෙර මොරපුර නම් නුවරක් කරවා එහි වසන සඳ ඔහු අගබිසව වැදූ දරු සත්දෙනකු අතුරෙන් බදකසයින් නම් රජකුමරියක් කිසි උවදුරක් නිසා වෙස් වළා ඇමැතිදුන් දෙතිස්දෙනකු හා සමඟ ලක්දිව් බැස පඬුවස්දෙව් රජහු දුටහ. එකල්හි රජ ඒ බදකසයින් කුමරිය තමහට අගබිසෝ කොට ඈ හා කැටිව ආ ඇමැති දැරියන් දෙතිස්දෙනා තමා හා සමඟ ආවාවූ ඇමැතියන් දෙතිස් දෙනහට සලස්වා මහ පෙරහරින් ඔටුනු පැළඳ සැප සේ විසිය. එසේ හෙයින් කියනලදී මහාවංශයෙහි ;

සුභද්‍ද කච්චානමනොම රූපිනිං[3]
මහෙසි භාවෙ අභිසිඤ්චියත්තනො,
සහාගතා තාය පදසි අත්තනා
සහාගතානං වසි භූමිපො සුඛං--යි.

මෙසේ පඬුවස්දෙව් රජහු හා [බද]කසයින් බිසොව සමඟ ව වසන සඳ එම බදකසයින් [බිසොව හා][4] කුසෙයි හොත් රජකුමරුවෝ සදෙනෙක් ලක්දිවු බැස පඬුවස්දෙව් රජහු දැක නැගිණියන් හා සුවදුක් කථා කොට තම තමන්ට වාසු තැන් පරීක්ෂා කොට ඒ ඒ තන්හි නුවර කරවා විසූහ. එයින් රාම නම් ශාක්‍යයන් විසූ තැන් රාමගෝණ නම් විය: රෝහණ නම් ශාක්‍යයන් විසූ තැන් රුහුණු නම් විය: දිඝැ[5] නම් ශාක්‍යයන් විසූ තැන් දිඝාමඩුලු නම් විය: උරුවෙළ නම් ශාක්‍යයන් විසූ තැන් මහවැලිගම් නම් විය: විජිත නම් ශාක්‍යයන් විසූ තැන් විජිතපුර නම් විය: අනුරාධ නම් ශාක්‍යයන් විසූ තැන් අනුරාධපුර නම් විය. එකල බදකසයින් බිසව් පඬුවස්දෙවු රජහු නිසා පුතුන් දසදෙනකු හා දුවක ලදහ: එයින් මහලු පිත් අභය නම් විය: බාල දූ උන්මත්ත්සිත් නම් වුව. ඔවුන් පිය වූ පඬුවස්දෙව්රජ තිස් අවුරුද්දක්

1. සිළ - ABDEGHJL
2. පණ්ඩු - C. බෙ.
3. මනාපරූපිනිං - බෙ. ස.
මනොපරූපිනිං - BEGHL
4. බිසොවගේ - පිටපත් හැම
5. දිගා - BGHL ක.කි.සැ.ම.

Non-Commercial Distribution

රාජ්‍යය කොට තමා දුව උන්මත්සිත් නම් කුමරිය මතු කියන පණ්ඩුකාභය නම් පුත් කුමරුවා ලද කල්හි ජන්මාන්තරගත විය. පසුව ඔහුගේ මහලු පිත් අභය නම් රජකුමර රජ පැමිණ විසි හවුරුද්දක් රාජ්‍යය කෙළේය. ඔහු නම්ඃ යට කී උන්මත්සිත් නම් කුමාරිකා ඒකස්තම්භ මාලිගාවෙක වසන්නී තමා මයිල් දිගැණින් දරු වූ දීඝගාමණී නම් කුමරුවා කෙරෙහි වැය පණ්ඩුකාභය නම් කුමරහු වැදූවඃ පසුව ඒ රජකුමර වැඩී තමාගේ ඇවැස්ස මයිලන් නව දෙනකු මරා තමා මයිල් හරිකණ්ඩ නම් රජහු දුව රන්පල් නම් කුමරිය රක්‍ෂා කොට සත් තිස් ඇවිරිද්දෙහි රජ පැමිණ ලඞ්කා නමැති අඞ්ගනාවට සිරිකත් වැනි වූ ශ්‍රී මහා බොධිස්ථානයට උත්තර දිශාභාගයෙහි සතරගවු පමණ අයමින් විතරින් හා සොළොස් ගවු පමණ තැන් වටින් ගෙන දිව්‍යපුරයක් වැනි අනුරාධපුර නම් නුවරක් මුල්පිස කරවා බයාවැව බඳවා ඒ කුලවාසීන් හා නානා සමය වාසීන්ට වෙන වෙන වාසස්ථාන කරවා ලක්දිව මුළුල්ලෙහි ග්‍රාම සීමා සලකුණු කරවා සමයාන්විත ව සැත්තෑ හවුරුද්දක් රාජ්‍යය කෙළේය. කියනලද මැයි දික්සඳ සෙනෙවියා පිරිවෙන අනාගාමී ත්‍රිපිටක මහානාම මහතෙරුන් වහන්සේ විසින් මහාවංශයෙහි;

> සො පණ්ඩුකාභයමහීපති සත්තතිංස
> වස්සොධිගම්ම ධිතිමා ධරණීපතිත්තං,
>
> රම්මෙ අනූනමනුරාධ පුරෙ සමිද්ධෙ
> වස්සානි සත්තති අකාරයි රජ්ජමෙත්ථ-යි.

මෙකී මේ පණ්ඩුකාභය රජු හා ඔහු මයිල් අභය රජු හා දෙදෙනාට අතුරෙහි රාජ්‍යය නොතන්පත්වූ සතළොස් හවුරුද්ද එම අභය රජහුගේ මල් වූ ගණතිස්ස නම් රජහට අයිති විය යි දතයුතු.

ඉක්බිති ව පණ්ඩුකාභය රජහු[1] පිත් මුටසීව නම් රජ්[2] මහමෙවුනා උයන කරවා සැට හවුරුද්දක් රාජ්‍යය කෙළේය. පසුව ඔහු ද්විතීය පුත්‍ර වූ දෙවන පෑතිස්ස[3] නම් රජ්ජුරුවෝ රජතන් පත් ව ලක්දිව නොයෙක් ආශ්චර්‍ය්‍ය පහළ කෙරෙමින් යට තෙභාතික වස්තුවෙහි කී පරිද්දෙන් ම මිහිඳු මහ හිමියන් වහන්සේගේ අනුශාසනා පිළිගෙන ශරණශීලයෙහි පිහිටා පින්පල වෙසෙස් දැන මහමෙවුනා උයන්හි මහා විහාරය[4] කරවන්නාහු සිංහ වික්‍රාන්තකොට තැරවූහ. කෙසේ ද යත්? සිංහරාජයකු වාලධිය දික් කොට හස්තපාද තලයන් නොසරි කොට ඉදිරි ව්[5] තබා දක්ෂිණ පාර්ශවයෙන් ආපසු බලා සිටි කල්හි යම් සේ එම සිංහයාගේ වාලකොටිස්ථානයෙහි මහාබොධි ගෘහය වේ ද දක්‍ෂිණපාද ස්ථානයෙහි මහපාය වේ ද වාමපාදස්ථානයෙහි

---

1. රජහුගේ - BGHL
   රජ - ADJ
2. රජ - බෙ.ස.
3. දෙවනපෑතිස් - ABEH
4. මහාවිහාරයක් - BEGHL
5. ඉදිරිකොට - BEGHL

Non-Commercial Distribution

සන්නිපාත සාලාව වේ ද නාභිස්ථානයෙහි ධාතුගෘහය වේ ද වාමෝදර පාර්ශ්වයෙහි රාසිමාලකය වේ ද දක්ෂිණහස්තස්ථානයෙහි ලහබත් ගෙය වේ ද වාමහස්තස්ථානයෙහි මහා චෛත්‍යය වේ ද කණ්ඨස්ථානයෙහි කණ්ඨකූප නම් පුෂ්කරණිය වේ ද කර අඹරා දක්ෂිණ පාර්ශ්වයෙන් බලා සිටියහුගේ දෘෂ්ටි නිපතන ස්ථානයෙහි ප්‍රතිමා ගෘහය වේ ද එපරිද්දෙන් සිංහවික්‍රාන්ත කොට මහාවිහාරය කරවා එසේ ම ලක්දිව ඒ ඒ තන්හි නොයෙක් දහස් ගණන් විහාර දහගබ් කරවා මහබෝ පිහිටුවා උභය ශාසනය ඇති කොට නොයෙක් දහස් ගණන් භික්ෂු භික්ෂුණීන්ගෙන් ආකීර්ණ කරවා අප්‍රමෙය වූ පින් රැස්කෙරෙමින් සතලිස් හවුරුද්දක් මුළුල්ලෙහි දැහැමින් රාජ්‍යය කොට දෙව්ලොව උපන්හ.

මෙසේ මේ ලඞ්කාද්වීපය හැම කල්හි ම සර්වඥවරයන්ගේ ආනුභාවයෙන් ම යක්ෂයන් දුරු ව මනුෂ්‍යාවාස ව[1] තුනුරුවන් පිහිටා හැම සර්වඥවරයන්ගේ ධර්මධාතු රක්ෂාවට සුරක්ෂිත වූ භාණ්ඩාගාරයක් සේ පවත්නා බව ඒකාන්ත බැවින්[2] මෙහි මිථ්‍යාදෘෂ්ටි ගතුවන්ගේ වාසය සථිර නොවේ මය. ඉදින් මිථ්‍යාදෘෂ්ටි ගත් රජෙක් කිසි කලෙක ලක්දිව බලාත්කාරයෙන් ගෙන රාජ්‍යය කෙළේ වී නමුදු ඔහුගේ වංශප්‍රතිෂ්ඨාව නොවනු බුදුන්ගේ ම ආනුභාව විශේෂයෙක් මය. එසේ හෙයින් මේ ලක්දිව සම්‍යක්දෘෂ්ටි ගත් රජුන්ට ම සිහෙන්නේය; ඔවුන්ගේ කුලප්‍රවේණිය[3] පවත්නේ ද ඒකාන්ත මය; එබැවින් ලඞ්කාධිපති රජදරුවන් විසින් තුනුරුවන් කෙරෙහි බොහෝ වූ[4] ආදර බහුමානයෙන් ශාසන රක්ෂාවෙහි අප්‍රමාද ව ආඥාචක්‍රය ධර්මචක්‍රය පවත්වා රාජ්‍යය කිරීමෙන් කුලප්‍රවේණිය රක්ෂා කළ මැනවි. කියන ලදුයේ මැයි;

යක්ඛෙ දමෙත්වා මුනයො ඉමස්මිං
වත්ථුත්තයාවාසමකංසු තස්මා,[5]
ධම්මෙ ඨිතානං'ව නරාධිපානං
වංසො පවත්තිස්සති සීහළස්මිං-යි.

මෙසේ ශාසන භාරධාරණාදි වූ අනෙකප්‍රකාරයෙන්[6] සකලද්වීප දීපායමාන වූ මේ ශ්‍රී ලඞ්කාද්වීපයෙහි කකුසඳ කොණාගමන කාශ්‍යප ගෞතම යන සතර

---

1. මනුෂ්‍යාවාස ව - J, ක.සි.ඤ.ම.
2. පවත්නා බැවින් - BDEGHL
3. කුලප්‍රවේණි රක්ෂා කළ - C
   කුලප්‍රවේණි රක්ෂාව - බෙ.ස.
4. ස්වභා වූ - BD
   සභාව වූ - EGHL
5. තස්මිං - ක.සි.ඤ.
6. අනෙකප්‍රකාර කාරණයෙන් - BEHL

Non-Commercial Distribution

බුදුන්ගේ ධාතුප්‍රතිෂ්ඨාවෙන් පවිත්‍ර ව නොයෙක් සියදහස් ලක්‍ෂගණින් රහතන්ගේ නිරන්තර සඤ්චාරයෙන් හා දහගබ් මහබෝ සුළුපා[1] මහපා සක්මන් මණ්ඩප රත්පත් පඞ්ක්තීන් ගැවසී ගත්තාවූ අතිපවිත්‍ර භූමිප්‍රදෙශයෙහි පිහිටියාවූ ඉතා සිත්කලු වූ යට කියනලද ඒ අනුරාධපුර නම් නුවර[2] එකලට පෘථිවිතල නමැති කාන්තාවගේ සරහා පිළියෙල කරනලද අති මනොඥ වූ මුඛ මණ්ඩලයක් වැන්න. තව ද ඒ රාජධානියෙහි ශ්‍රී සමෘද්ධි දක්නා සඳහා නාගභවනයෙන් දිව අවුත් පෙළ පෙළ සැදී[3] හොත්තාවූ හැළි නාගරාජයන්ගේ දරණවැල පඞ්ක්තියක් මෙන් පුහුයමින් ධවල ව හාත්පසින් වටකරනලද ඉතා උස් වූ ප්‍රාකාර පඞ්ක්තීන් හා ඒ ඒ තන්හි විචිත්‍රාකාරයෙන් සරහා කරන ලද වහසල් දෙරටු අට්ටාල වට වෙට්ටමින් ප්‍රතිමණ්ඩිත ය.[4] ශ්‍රද්ධා සම්පන්න වූ දිව්‍ය මනුෂ්‍යයන් විසින් නිරතුරු ව කරන ලද පූජා සත්කාර ඇති කෛලාශකූට ශිඛරයක් සේ අතිශයින් උස් වූ දහගබ් පඞ්ක්තීන් ශොභමාන ය. නිරන්තරයෙන් වැඳ පුදනලද ලොකවාසී වූ සත්ව සමූහයන්ට ඉහලොක පරලොක දෙකින් ම කැමැති කැමැති වස්තු ප්‍රදනය කරන හෙයින් කල්පවෘක්ෂ පඞ්ක්තියක් හා සාදෘශ්‍ය ව නා නා ස්ථානයෙහි පිහිටියාවූ බොධිවෘක්ෂ පඞ්ක්තීන් ප්‍රතිමණ්ඩිත ය.[4] නොයෙක් සියදහස් ගණන් භික්‍ෂු භික්‍ෂුණීන් විසින් ආකීර්ණ වීමෙන් අතිමනොඥ වූ දුටු දුටු ජනයන්ගේ සිත් පැහැර ගන්නා තරම් අනෙකාලඞ්කාරයෙන්[5] යුක්ත වූ නොයෙක් සියදහස් ගණන්[6] විහාරාරාමයෙන් සැරහුණේය. තව ද ඒ අනුරාධපුර නම් රාජධානියෙහි බහා පළඳවනලද රන් කොත් සමූහයෙන් අලඞ්කෘත වූ දෙමහල් තුන්මහල් ආදි වූ ප්‍රභෙද ඇති නව ලක්‍ෂයක් පමණ උස් වූ මහා ප්‍රාසාද පඞ්ක්තියෙන් හා බිම් මහල් අනූලක්‍ෂයකින් ප්‍රතිමණ්ඩිත විය. සවර්ණ රජතමය වූ පූර්ණඝට පූර්ණකලස මාලාවෙන් හා රන්වැට රිදීවැට ලියවැට දඬුවැට ආදියෙහි[7] දල්වනලද ප්‍රදීප සහස්‍රයෙන්[8] හා ඒ ඒ තන්හි නඟනලද සවර්ණරජතාදි වූ නානාවර්ණධ්වජපතාකා පඞ්ක්තීන් හා එසේ ම නානාස්ථානයෙහි විසිතුරු කොට සරහා නඟනලද රන් රිදී රඹ තොරණ ආදි වූ මනහර තොරණ පඞ්ක්තීන් විරාජමාන වූ චන්ද්‍රවංක වීථිය මහවැලි වීථිය සිහුරුවක්[9] වීථිය යනාදි වූ වීථි පඞ්ක්තීන් හා චක්‍රවාට පර්වතාකාර ගොපුර පඞ්ක්තීන් ඉතා ශොභමාන ය. එසේ ම එපුර මස්තකාකාශයෙහි නඟනලද[10] මහ මේකුළු පෙළක් මෙන් ශොභමාන වූ ධ්වජපතාකා පෙළින් හා රාජවාහනොපෙත හස්තිසමූහයන්ගේ කුඤ්චනාදයෙන් හා එම පුර සම්පත්ති නැමැති මහමුහුද මැද

---

1. සුළුවා - DE
2. එනුවර - ACDEGHJL
3. සැදී - බෙ.ස.
4. විය - BCEGHL
5. අනෙකප්‍රකාරයෙන් - ACJ
6. සියගණන් - ACDJ
7. ආදියෙන් - ABGH
8. ශ්‍රෙණියෙන් - BDEGHL,ස.
9. සිහුරුවන් - BEGHL
10. නංවන ලද - BEGHL

Non-Commercial Distribution

බිඳෙන[1] රළපෙළ[2] සේ නිරන්තරයෙන් දිවන්නාදූ පතින්නාවූ[3] අශ්වයන්ගේ හෙෂාරවයෙන් හා දිව්‍යගාන්ධර්වයන් වැනි මනහර වාද්‍යකාරයන් විසින් ප්‍රයොග කරන ලද නා නා ප්‍රකාර භෙරීතූර්‍ය්‍යභාණ්ඩයන්ගේ ශ්‍රවණ රමණීය වූ ගම්භීරධීරනාදයෙන් එකනින්නාද ය. තාලසුධ දක්වා ගසන ලද බෙරමඬුලු මධ්‍යයෙහි නානාප්‍රකාර නෘත්‍යාඞ්ග දක්වමින් රඟබැස නටන නළුනාට්කාවන් විසින් අලඞ්කෘත ව ඒ ඒ තන්හි ජනසමූහ සම්බාධ ව නිත්‍යොත්සවයෙන් හොබනා නෘත්‍යමණ්ඩල මාලාවෙන් ප්‍රතිමණ්ඩිත ය[4]. නානාප්‍රකාර වූ ශ්‍රී සම්පත්තීන් යුක්ත ස්ත්‍රීපුරුෂයන් විසින් ගැවසී ගත්තාවූ ඒ අනුරාධපුර නම් රාජධානිය දිව්‍යලොකයෙහි දෙවියන්ගේ ආලකමන්‍ද[5] නම් රාජධානිය මෙන් සියලු දිව්‍ය මනුෂ්‍යයන්ට සන්තොෂ එළවන්නේය. එසේ හෙයින් කියන ලදී;

අනුරාධපුරං රම්මං - ආසි ලඞ්ක ,මහීතලෙ,
භූමි කාමිනියා සාධු - මණ්ඩිතං වදනං විය.
ද්විභූමකාදි උත්තුඞ්ග - හෙමථූපිකසුන්‍දරං,
නවලකඛම්භාකිණ්ණ - පාසාදෙහි සුමණ්ඩිතං
අනෙකවිභවාකිණ්ණ - නරනාරීහි සෙවිතං,
දෙවානමාලකංවාති[6] - මනොනන්‍දනමාවහං-යි.

මෙසේ සකල . සම්පත්තීන් සමෘධ වූ ඒ අනුරාධපුර නුවර තුන් ගවු පමණ දිග ඇති මහවැලි වීථියෙහි වසන සුමනා නම් වූ ස්ත්‍රියක් මහත් වූ ශ්‍රද්ධා ඇත්තීය; තුනුරුවන් කෙරෙහි අතිප්‍රසන්නය; ඕතොමෝ ඒ ඒ විහාරවල දාගැබ් මහබෝ ආදියෙහි මල් පහන් පුදමින් බැතිපෙම් සහිත ව වඳිමින් බණ අසමින් භික්‍ෂූන් වහන්සේට ද උපස්ථාන කෙරෙමින් මෙසේ කුශල ක්‍රියායෙහි ම යෙදී වාසය කරන්නීය. මෙසේ ඒ ස්ත්‍රිය[7] ශ්‍රද්ධාවන්ත ව වසන හෙයින් මෑතභාගයෙහි ශ්‍රද්ධා සුමනාය යි නම් තුබූහ. එකල රුහුණු ජනපදයෙහි මාගම වසන[8] එක්තරා පුරුෂයෙක් කිසි කටයුත්තක් නිසා අනුරාධපුරයට අවුත් මහවැලි වීථියෙහි ලැගුම් ගත්තේය; ඕහු දැක ශ්‍රද්ධාසුමනාවෝ රාගයෙන් රත් ව[9] මොහයෙන් මුළා ව මතු වන දුක් සැප නොසලකා පෙර පුරුදු ගෙහිමි පුරුෂයකු දුටුවා සේ භය

1. සිඳී - BGH;
   බිඳෙන (නැත) - L
2. රළපෙලක් - AL, මුද්‍රිත නැම
3. පතන්නාවූ - ABCGHJ පතින්නා වූ (නැත) - L
4. ප්‍රතිමණ්ඩිත විය - BDEGHL
5. නන්දනොද්‍යානය - ක.සැ.ම. අධො ලිපි
6. දෙවානමාලකාවාති - බෙ.ස.
7. ස්ත්‍රී - J මුද්‍රිත නැම
8. මාගමට යන - J
9. මත් ව - ක.කි.සැ.ම.

Non-Commercial Distribution

ලජ්ජා නැති ව සමීපයට[1] එළඹ ඒ පුරුෂයා හා සමඟ මෛථුන සංවාසයෙන් විශ්වාසී ව ඕහට ම පිළිබඳ වූහ. අනේ ගැහැණුන්ගේ නුගුණ විශේෂය ක්[2] බැලුව මැනවි. හේ එසේ මැයි: මේ ලොකයෙහි ලබු පුසුල් සොඬල වැටකොලුවැල් ආදි වූ සියලු ම ලිය ජාතීහු මේ කටු ඇති රුකය මේ විෂඵල ඇති රුකය[3] මේ සඳුන් රුකය යන විශෙෂයක් නොබලා සමීප ව සිටි යම් ම ගසෙක තොලු තබා යම් සේ වැළඳ ගනී ද එපරිද්දෙන් ම මේ ලොකයෙහි කාමයෙන් අන්ධ වූ ස්ත්‍රීජනයෝ ද උත්තමය අධමය මධ්‍යමය යි මෙසේ පුරුෂයන්ගේ කුල නුකුල නොබලා ඇස දක්මෙන් ම ලොභ උපදවා ඉතා වැළපෙන්නාහු මය. කියන ලද මැයි;

අයං කණ්ටකරුක්ඛොති - විසරුක්ඛොති වා අයං,
අයං චන්දනරුක්ඛොති - න විසෙසෙති යථා ලතා.

කාමන්ධා වනිතා ලොකෙ - හීන උක්කට්ඨ මජ්ඣිමෙ,
කුලීනෙ දුක්කුලීනෙපි - න ජහන්ති ලතා විය - යි.

මෙසේ සුමනාවන් තමහට වසඟ වූ බව දන එපිටිසර වැසි පුරුෂ තෙමේත් උන් කැඳවා ගෙන තමාගේ ගමට[4] ගියේය. එකල්හි සුමනාවෝ මාගමට ගොස් ඔහුගේ ගෙයි වසන්නාහු දවස් පතා සඟ අටදෙනකු[න්] වහන්සේට ලහබත් අටක් තබා දෙමින් බණ අසමින් දහගබ් මහබෝ ආදිය වඳිමින් මෙසේ නිරන්තරයෙන් පින්කම් කොට ඇවිදිති. ඉක්බිති එක් දවසෙක ශ්‍රද්ධාසුමනාවෝ ආසනශාලාවට ගොසින් සඞ්ඝයා වහන්සේට පැන් පෙරහා[5] ගෙනෙමින් දහැවිදඩු එළවමින් මෙසේ වතාවත් කෙරෙමින් කල් යවා ගෙට ගියහ. ඒ සුමනාවන්ගේ ගෙහිමි පුරුෂයා වනාහී සැදැහැ නැත්තේය. එසේ හෙයින් සුමනාවන් ගෙට ආ කල්හි "කිමෙක් ද තෙපි ගෙයි කළමනා දෙයින් කිසිවකුත් නොකොට පින්කම් ම කොට ඇවිදු ද" යි කියා සුමනාවන්ට කිපී ගෙන් පිටතට[6] නෙරපිය. සුමනාවෝ වනාහි හිතනි වැගිරගිය මිනිසුන් නැති පාලු ගෙයක භිත්ති කොණක් අසළ සද්දවසක් මුළුල්ලෙහි නිරාහාර ව ඔත්තාහු සැබවින් ම තමන් නිරාලය ව හළ බව දන අනුරාධපුරයෙහි තමන්ගේ දෙමව්පියන් සමීපයට යනු කැමැති ව ඔත් තැනින් නැඟී සිට අනුරාධපුරයට යන මාවතට පිළිපන්නාහු ඒ ඒ විහාරවල දහගබ් මහබෝ වඳිමින් ක්‍රමයෙන් ගොස් නුගගල්කඩ දෙරට[7] පැමිණියහ.

අහෝ! ඛෙදයක් ඇසුව මැනවි. නොකීකරු ව සිත් සේ ඒ ඒ තැන ඇවිදිනවුන්ට මෙපරිද්දෙන් ම පිරිහීම වන්නේය; ඒ එසේ මැයි: කුඩා වූ හෝ මහත් වූ හෝ ඉෂ්ටානිෂ්ට වූ යම්කිසි කාරියක් මවුපියන් ආදි වූ වැඩිමහල්ලන් විචාරා ඔවුන්ගේ අදහස් දන කට යුත්තේ මය; දෙමවුපියන්ගේ අභිප්‍රාය[8] නැති ව ඉඳින්

1. සමීපයට - ABCEGH
2. ගැහැණුන්ගේ අවිශෙෂයක් - ACDEGHI
3. වෘක්ෂය - ACDEJ
4. ගමට ම - මුද්‍රිත නැම
5. පරහා -BGH
6. පිටත - ABEGHI
පිටත් - D
7. නුගගල්කඩුදොරට - . BCEGH
8. අභිප්‍රාව - ABCDEG
අභිප්‍රාවක් - H

Non-Commercial Distribution

රාජ්‍යසම්පත්තියක් ලැබෙන්නේ වී නමුත් ඒ ලාභය පුවච කීකරු ව දෙමවුපියන් අනු ව පවත්නා උත්තම පුත්‍රයන් විසින් එබඳු රාජ්‍යසම්පත්තියෙහිදු ආලය නොකටයුත්තේ මය; මවුපියන් ආදි වූ වැඩිමහල්ලන්ගේ අදහස් නොබලා යම්කිසි ආශාවෙයෑමෙන් වූ කාරියක් කළත් "මේ සිතුවක් ම කරන[1] නොකීකරු එකෙකැ"යි කියා බන්ධුජනයෝ පවා ඕහට නිඳු කරන්නාහු මය. එබැවින් කවර තරම් තමාගේ සමෘද්ධිකමක් ඇතත් උඩත වපල නොවී සිහිනුවණින් යෙදී සන්හිඳුවනලද ඉඳුරන් ඇති ව කීකරු ව නිහතමානී ව වසන්නාවූ පුත්‍රයෝ නෑ නොනෑ බොහෝ දෙනාගෙන් ප්‍රශංසා ලැබ සර්වප්‍රකාරයෙන් ම මහත් වූ අභිවෘද්ධියට පැමිණෙන්නාහු මය. එසේ හෙයින් කියනලදි;

අනුද්ධතො අචපලො - නිපකො සංවුතින්ද්‍රියො,
පසංසං ලභතෙ පුත්තො - වුඩ්ඪිං පප්පොති සබ්බසො-යි.

මෙසේ ඒ ශ්‍රද්ධාසුමනාවෝ දෙමවුපියන්ට නොකියා තමන්ගේ අභිප්‍රායෙ න්[2] ම ආ හෙයින් මෙපමණ දුක් අනුභව කළහ. ඉක්බිති දිව්‍යමනුෂ්‍යලොක දෙක්හි ම සැරිසරා ඇවිදිනාවූ ශක්‍රදෙවේන්ද්‍රයෝ එතැන්හි සිටියාවූ ඒ ශ්‍රද්ධාසුමනාවන් දැක මෝතොම ඉතා ශ්‍රද්ධාවන්තය, කුනුරුවන් කෙරෙහි මමත්වය ඇත්තීය යි දැන මහලු මිනිස් වෙසක් මවාගෙන බත් මුළක් අතින් ගෙන සුමනාවන් ඉදිරියෙහි පෙනී ඔවුන් සමීපයට ගොස් "මැණියෙනි, කොයි යව් ද" යි විචාරා "අනුරාධපුර නුවර යෙමි" යි ඒ සුමනාවන් කී කල්හි" නෙපි ඉතා සයින් පීඩිතයව. මේ බත් අනුභව කරව"යි කියා සක්දෙව් රජ බත් මුළ සුමනාවන්ට දින. ඒ කල්හි සුමනාවෝ බත් මුළ අතින් ගෙන "මෙතැන්හි පැනක් නැත, කෙසේ බත් කමෝ ද"යි[3] සිතා සිටියහ. සක් දෙව්රජ තමාගේ ආනුභාවයෙන් එතනට නුදුරු තන්හි පස්පියුමෙන් සැදි මනහර පොකුණක් මවා දැක්වීය. සුමනාවෝ පොකුණට ගොස් ඉස් ශෝධා නහා බත්මුළ ගෙන අත ශෝධා සිට වේලා පරීක්‍ෂාකොට තව පෙරවරු බව දැන "පෙර දනක් නොදී බතක්[4] නොකෑවිරු හෙයින් අදත් පළමුකොට දන් දී බත් අනුභව කෙරෙමි"යි සිතා කාල ඝොෂා කරන්නාහු 'දන් මේ සර්ඥ පුත්‍ර වූ සඞ්ඝයා වහන්සේ සිහා වඩනට වේලා ය. එසේ හෙයින් මා කෙරෙහි කරනලද අනුකම්පා ඇති ව සඞ්ඝයා වහන්සේ වඩනා සේක්ව" යි කියා කාලඝොෂා කළහ. එසේ හෙයින් කියනලදි;

කාලොයං මුනිපුත්තානං - භත්තං හොතුමුපාගතො,
අනුකම්පාය මෙදනි - ආගච්ඡන්තු ජිනොරසා - යි.

---

1. කරන ලද - ACDJ ක.ම.
2. අභිප්‍රායෙන් - පිටපත් හැම.
3. කමෝදෝ හෝයි - පිටපත් හැම
4. බත් -CDEGH
   බත -A

එකල තලගුරු මුහුදුපව්වෙහි වසන මහා ධම්මරක්ඛිත ස්ථවිරයන්වහන්සේ නිරොධසමාපත්තියට සමවැද සත්වනදවස් නිරොධ සමාපත්තින් නැගී "අද කවරක්හට අනුග්‍රහකෙරෙම් දෙ හො" යි සිතා වැඩසිටිසේක් ඒ ශ්‍රද්ධාසුමනාවන්ගේ කාලඝොෂා ශබ්දය දිව කනින් අසා කයින් සිවුරු හා අතින් පාත්‍රය ගෙන සුමනාවන්ට නුදුරුතැන ඇසිල්ලෙක අවුත් වැඩසිටිසේක. සුමනාවෝ තෙරුන් වහන්සේ දැක පහන්සිත් ඇති ව පාත්‍රය ගෙන බත් පාත්‍රය පුරා තෙරුන් වහන්සේට පිළිගන්වා "මඳක් වැඩසිටිය මැනව ස්වාමිනි"යි කියා පිළිසත් තැනකට වැද කොළ අතු කඩා හැඳ තමා ඇඳි කඩ ශෛර්ධා පුඹුළුවක් කොට අකුළා දන් දුන්හ. තෙරුන් වහන්සේ ද "මේ සුමානාවෝ මා දකිත්ව"යි අධිෂ්ඨාන කොට පිළී වැටිය පිටින් පාත්‍රය අත්ලෙහි තබා ගෙන අහසට පැනනැගී විහාරයට ම වැඩිසේක. ඒ සුමනාවෝ ද එපරිද්දෙන් වඩනා තෙරුන් වහන්සේ දැක මහත් ප්‍රීතින් පිනාගිය ශරීර ඇති ව තෙරුන් වහන්සේ දර්ශනපථය ඉක්ම ගිය කල්හි පසහ පිහිටුවා වැඳ දන් දී ඉතිරි බත් අනුභව කොට අනුරාධපුරයට යන මහට පිළිපන්හ. එතැන්හි නුගරුක වසන දෙවතාවා එක් පයියෙක[1] දිව්‍ය වස්ත්‍ර අටක් තබා ගෙන එක් පයියෙක[1] දිව්‍ය ආහාර ද දිව්‍යමය වූ අතිරස කැවුම් ද පුරාගෙන ගැලකට පැනනැගී දිව්‍යමය වූ කනබොන දෑ ආදිය එහි ම තබාගෙන ගැල පදිමින් අවුත් සුමනාවන්ට නුදුරු තැන පෙනී "මෑණියෙනි, කොයි යව් ද"යි විචාරා "අනුරාධපුර නුවරට යෙමි"යි සුමනාවන් කී කල්හි "එසේ වී නම් මෙසේ එව, මේ ගැලෙහි බැය හිඳුව; මම ද අනුරාධපුරයට යෙමි"යි කී කල්හි ශ්‍රද්ධාසුමනාවෝ "යහපත ස්වාමිනි, නුඹවහන්සේ පසුපස්සෙහි එමි, කොළ අතු කඩා හැඳගෙන නුඹවහන්සේ හා සමඟ ගැලට නැගී හිඳීම නො පිළිවනැ"යි කීහ. ඉක්බිති ඒ දිව්‍යපුත්‍රයා "මේ වස්ත්‍රය හැඳගෙන ගැලට නැඟෙව"යි කියා එක් දිව්‍යවස්ත්‍රයක් දුන්නේය. ශ්‍රද්ධා සුමනාවෝ ඒ දිව්‍යවස්ත්‍රය හැඳගෙන ගැලට නැංගාහ; ඒ ගැල වනාහි මොහොතක් පමණ කලින් සෑගිරි සමීපයට පැමිණියේය. එකල දිව්‍යපුත්‍රයා සකුරුපුසියඹරාව සමීපයෙහි ගැල නවත්වා "මෙතැන් පටන් මා යා නොහැක්කේය"යි කියා පිළිපයිය සුමනාවන් අතට දී අන්තර්ධාන වීය. එකල්හි ඒ සකුරුපුසියඹරාවෙහි වසන දෙවතාවා පිළිපයිය ගෙන යන සුමනාවන් දැක උන්ගේ මෙහෙකරුවකු මෙන් සුමනාවන් අතින් පිළී ආ දී[2] එසියල්ල ම ගෙන අනුරාධපුරයට පැමිණ මහාපාලි නම් වූ බත්හල් ගෙට සඞ්ඝයා වහන්සේ රැස්වන වේලා හෙයින් එසියල්ල ම එතැන්හි තබා අන්තර්ධාන විය. ඉක්බිති ඒ සුමනාවෝ භික්ෂූන් වහන්සේ දැක පහන් සිත් ඇත්තාහු දෙනානකය හගිරිනකය මිරිසවැටිය[3] දකුණුගිරි විහාරය මහා විහාරය යන පඤ්චමහා ආවාසයෙහි නොයෙක් සිය දහස් ගණන් භික්ෂූන් වහන්සේට ද භික්ෂුණීන් වහන්සේට ද දිව්‍යමය වූ ආහාරයන් හා පූපාපූප වර්ගයන් ද දිව්‍යවස්ත්‍ර ද දන් දුන්හ. එදවස් රජ්ජුරුවෝ විහාරයට යන්නාහු බත්හල් ගෙයි තිබුවාවූ එසියල්ල ම දැක විස්මය පත්වූ සිත් ඇති ව "මේ කවුරුන්

1. පසෙක - BCEGH
   පැසෙක - D
   පසුම්බියක - ම.
2. පිළී ආදි (නැත) -BDEGH
   ආදි (නැත) -AJ
3. මිරිසව්ටිය - ACDEJ

Non-Commercial Distribution

විසින් දෙන ලද්දේ දැ"යි විචාළහ. එතැන්හි රැස්වූ මනුෂ්‍යයෝ "ශ්‍රද්ධා සුමනාවන් විසින් දෙන ලද ධනසම්භාරය"යි කීහ. රජ්ජුරුවෝ ශ්‍රද්ධා සුමනාවන් කැඳවා "මේ ධනොපකරණ කෙසේ ලදු දැ"යි විචාළහ. ශ්‍රද්ධා සුමනාවෝ එසියල්ල ම විස්තර වශයෙන් කීහ; රජ්ජුරුවෝ සුමනාවන් කෙරෙහි පැහැද ඒ ශ්‍රද්ධා සුමනාවන් තමන්ට අගමෙහෙසුන් කොට අභිෂෙක පැළඳවූහ. මෙසේ අභිෂෙක ප්‍රාප්තවූ සුමනාවෝ රජ්ජුරුවන් ආදි කොට ඇති සියලු නුවර වාසීන්ට දිව්‍ය වස්ත්‍ර ම දුන්හ; එසේ කෙතෙක් දුනත් පිළිපයියෙහි දිව්‍යවස්ත්‍ර අට අඩු නුවූයේ මය; ඒ ශ්‍රද්ධා සුමනාවෝ එතැන් පටන් දනාදි වූ නොයෙක් පින්කම් කොට පරමායු කෙළවර අතිප්‍රවර වූ දෙවපුර පරායන වූහ. එසේ හෙයින් පින්වත් සත්වයෙනි, තුනුරුවන් කෙරෙහි පහන් සිත් ඇති උත්තම ජනයන්ගේ ශ්‍රද්ධා බලමහිමයක් බලව, මෙම ජාතියෙහි ඔවුන්ගේ ශ්‍රද්ධා විශෙෂය දැක පහන් සිත් ඇති දේවතාවෝ පවා දිව්‍යවස්ත්‍ර දිව්‍යආහාර[1] ආදිය ගෙන දෙමින් පක්ෂපාත දසිදසාදීන් මෙන් ඔවුන් සමීපගත ව උපස්ථාන කරන්නාහු මය; එම ශ්‍රද්ධාවෙන් කරනලද කුශල මහිමයෙන් පරලොව දිව්‍ය මනුෂ්‍ය ලොක දෙක්හි ඉපද ඔවුන් ලබන මහත් වූ ශ්‍රී විභූතිය කියනුම කවරේ ද; කියා නිමවිය නොහැක්කේ මය. එබැවින් තම තමා ශක්ති පමණින් කුසල් කොට මතු දිව්‍ය මනුෂ්‍ය සම්පත් ලබන්නට උත්සාහ කළ මැනවි. කියන ලද මැයි;

සද්ධාබලං පස්සථ භො ජනානං
ඉධෙව දෙවා තමුපාසයන්ති,
කරොන්තු දෙවෙසු ච මානුසෙසු
පරත්ථ තෙසං මහතිං විභූතිං -යි.

මේ මෙහි දෙවන
ශ්‍රද්ධා සුමනා වස්තුව ය.

තව ද මෙහි තුන්වන ධම්මසවණොපාසිකා වස්තුව නම් කවරයත්. එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු. කෙසේද යත්;

මෙම ලක්දිව රුහුණු ජනපදයෙහි නොයෙක් සියදහස් ගණන් භික්ෂු භික්ෂුණීන් විසින් ගැවසී ගත්තාවූ නොයෙක් සිය දහස් ගණන් විහාරාරාමයෙන් හා රත්රන් අමුරන් මුතු මැණික් ආදි වූ නොයෙක් නානාප්‍රකාර සම්පත්ති සමූහයෙන් සමෘධ වූ ඉසුරුමත් මහ ජනයාගෙන් ගැවසීගත්තාවූ සත්රුවනින් විසිතුරු සොඳුරු මනහර රන්කොත් සමූහයෙන් බබළන මුදුන් කුළු පෙළින් හා නානා ප්‍රකාර විචිත්‍ර චිත්‍රකර්මාන්තයෙන් ශොභාමත් වූ දෙමහල් තුන්මහල් ආදිකොට ඇති නොයෙක් මහලින් ගැවසීගත් තිස්ලක්ෂයක් පමණ ගෘහමාලාවෙන් විභූෂිත වූ නොයෙක් සියගණන් වීථි පංතීන් ශොභමාන ව දිවනළුවන් වැනි නාටක ජනයන් විසින් පවත්වනලද නෘත්‍ය ගීත වාද්‍යයෙන් නිරතුරු ව මහජනයන් සන්තුෂ්ට කරවන්නා වූ එකාවනු ව දන ක්‍රීඩායෙහි නියුක්ත අනෙක ප්‍රකාර මහජන සමූහයන්ගෙන් ගැවසී ගත්තාවූ බුද්ධ ධර්ම සඞ්ඝ යන තුනුරුවන් අරභයා කරනලද පූජාසත්කාරයෙහි

1. දිව ආහාර - AGH
දිව අහර - C ක.
දිවහර - B

Non-Commercial Distribution

නිරන්තර තත්පර වූ ශ්‍රද්ධා සම්පන්න මහජන සමූහයාගේ නිරන්තර සංචාර ඇති කුශල සමාදානයෙහි ලොභයෙන් ඒ ඒ තන්හි ඇවිදිනා ශ්‍රද්ධා සම්පන්න පින් සොඬ වූ මහජනයන් විසින් සන්තොෂ ගීතිකා වශයෙන් පවත්වනලද සාධුනාදයෙන් එකනින්නාද වූ මාගමය යි ප්‍රසිද්ධ පරම රමණීය වූ මහ ගමෙක් විය. එමහගම් නුවර සමීපයෙහි කරනලද රජමහා විහාර මධ්‍යයෙහි අති ධවල වූ මහා ප්‍රාකාරයෙන් පරික්‍ෂෙප කරනලද මුතුරැසක් හා සමාන සුදුවැලි තලාවෙන් ශොභමාන වූ මහ වැලි මළුව මැද පෘථිවි තල නමැති අඞ්ගනාවගේ මුදුනෙහි බහා පළඳනාලද රජත කිරීටයක් මෙන් අතිධවල ශොභාවෙන් අග්‍රප්‍රාප්ත ව මාණික්‍යමය ථූපිකාවකින් මුදුන් පැමිණියාවූ මහත් දාගබෙක් විය. එදාගබ වහසල් දොර සමීපයෙහි කරන ලද ධර්මමණ්ඩපයෙහි නිරන්තරයෙන් ධර්මදෙශනා පවත්නේය. එකල්හි එක් උපාසිකාවක් බණ අසනු පිණිස තමාගේ පුතකු ඇඟිල්ල අල්වාගෙනවුත් බණ පිරිස් කෙළවර හිඳ කිසි පරක්කුවක් නැති ව සිත හෙළා බණ අසයි. එකල්හි ඒ උපාසිකාවගේ පුත්‍රයා ඒ ඒ තැන කෙළ ඇවිදිනේ පවුර සමීපයෙහි[1] ගොස් වැලි කෙළිමින් හුන්නේය; එකල එක් සර්පයෙක් පවුරු සිදුරෙන් නික්ම ඔහු දෂ්ට කොට එතැන්හි ම සැඟවිණ. එකල්හි ඒ උපාසිකා තොමෝ තමා පුතු දෂ්ට කරන්නාවූ සර්පයා දැක "කිසිවක්හට මෙපවත් කීම් නම් මාගේ බණ ඇසීමට අන්තරාය වෙයි, දරුවෝ නම් දුර්ලභ නොවෙති. කප් අසංඛ්‍යයෙකිනුත් බුදුකෙනෙකුන් වහන්සේ ලොව පහළ වීම දුර්ලභ හෙයින් බුද්ධොත්පාදක්‍ෂණය අති දුර්ලභ ය. බණ ඇසීම ද එපරිද්දෙන් ම දුර්ලභ ය; මනුෂ්‍යාත්ම භාවයෙහි ඉපදීම ද අති දුර්ලභ ය. මෙබඳු දුර්ලභ වූ ධර්මය ඇසීම ම උතුම් වන්නේය"යි සිතා සර්පයා තමා පුතු දෂ්ට කළබව කිසිවක් හටත් නොකියා ම සිත එකඟ ව තමා අසන ධර්මය ම ඇසුයේය. ඒ ස්ත්‍රියගේ පුත්‍රයා ද විෂවෙගයෙන් විසංඥ විය. ඉක්බිති ධර්මදෙශනාවසානයෙහි උපාසිකාතොමෝ නැඟී සිට පුතු සමීපයට ගොස් විෂවෙගයෙන් තද වූ ශරීර ඇති පුතු දැක "මෙතැන්හි මෝහට සෙසු මන්ත්‍රයෙන් හා ඖෂධයෙන් ප්‍රයෝජන කවරේ ද; සත්‍යක්‍රියා නමැති ඖෂධය ම උතුම් වන්නේය"යි සිතා පුතු ඉස අල්වා ගෙන සත්‍ය ක්‍රියා කරන්නාවූ උපාසිකා තොමෝ;

යෙන සච්චෙනහං බුද්ධ සරණෙ සුප්පතිට්ඨිතා,
තෙන සච්චෙන මෙ පුත්තො - සුඛිතො හොතු නිබ්බිසො

බුද්ධො නීය්‍යානිකො ධම්මො - සන්දිට්ඨිකමකාලිකො
තෙන සච්චෙන මෙ පුත්තො - සුඛිතො හොතු නිබ්බිසො.

සඞ්ඝො සුප්පටිපන්නො ච - චතුමග්ගඵලෙ ඨිතො,
තෙන සච්චෙන මෙ පුත්තො - සුඛිතො හොතු නිබ්බිසො.

පඤ්ච වස්ස සහස්සානි - සබ්බෙ තිට්ඨන්ති සාසනං,
තෙන සච්චෙන මෙ පුත්තො - සුඛිතො හොතු නිබ්බිසො.

---

1. සමීපයට - ABDEGH

Non-Commercial Distribution

යනාදීන් "සියලු සත්ත්වයන් කෙරෙහි පතළ කරුණා ඇති ලොක සවාමි වූ බුදුරජාණන් වහන්සේ[1] ඉතිපි සො භගවා අරහං[2] යනාදීන් දක්වන ලද නව පෙදෙහි සඞ්ගෘහිත නව අරහාදි විශෙෂ ගුණධර්මයෙන් යුක්ත සේකැයි යන යම් සත්‍ය වචනයක් හේතු කොට ගෙන එබඳු බුදුරජාණන් වහන්සේ මට මෙලෝ පරලෝ දෙකින් ම පිහිට සේකැයි සිතා බුඞං සරණං ගච්ඡාමි යනාදීන් මම ශරණ ශීලයෙහි පිහිටියෙම් වීම් නම් ඒ සත්‍ය වචනය හේතු කොට ගෙන මාගේ මේ පුත්‍රයා විෂවෙග රහිත ව සුවපත් වෙව"යි කියා ද, ස්වාක්ඛාතො භගවතා ධම්මො යනාදීන් වූ යම් සත්‍ය වචනයක් හේතුකොට ගෙන ස්වාක්ඛාතාදි ගුණොපෙත සපර්‍ය්‍යාප්තික නව ලොකොත්තර සඞර්මය ම මට පිහිටය යි මෙසේ සාදරොදර ශ්‍රද්ධාධ්‍යාශයෙන් යුක්ත ව ධම්මං සරණං ගච්ඡාමි යනාදීන් දහම් සරණයෙහි පිහිටියෙම් වීම් නම් ඒ සත්‍ය වචනය හේතුකොට ගෙන මාගේ මේ පුත්‍රයා විෂවෙග රහිත ව සුවපත් වෙව"යි කියා ද, සුපටිපන්නො භගවතො සාවකසඞ්ඝො යනාදි වූ යම් සත්‍ය වචනයක් හේතුකොට ගෙන සුප්‍රතිපන්නතාදි ගුණගණාඪ්‍ය සඞ්ගත අෂ්ටාර්‍ය්‍ය පුද්ගල සඞ්ඝරත්නය ම මට පිහිට වන්නේය යි මෙසේ සාදරසිතින් සඞ්ඝං සරණං ගච්ඡාමි යනාදීන් සඟසරණයෙහි පිහිටියෙම් වීම් නම් ඒ සත්‍ය වචනය හේතුකොට ගෙන මාගේ මේ පුත්‍රයා විෂවෙග රහිත ව[3] සුවපත් වෙව"යි කියා ද, සබ්බං රසං ධම්මරසො ජිනාති යනාදීන් දක්වනලද යම් සත්‍ය වචනයක් හේතුකොට ගෙන මූල රසය ඛන්ධ රසය පුෂ්පරසය ඵලරසය භොජන රසය යනාදි වූ සියලු ම රසජාතීන්ට වඩා ධර්මරසය ම උතුම් වන්නේය යි මෙසේ සාදරාවනත උත්මාඞ්ගයෙන් යුක්ත ව බණ ඇසීම් වශයෙන් අද මේ ධර්මරසය අනුභව කරන්නාවූ මම ක්‍ෂණමාත්‍රයකුත් අන්‍ය විහිත නොව ඉඳුරා ඇසුයෙම් වීම් නම් ඒ සත්‍ය වචනය හේතු කොටගෙන මපුතු විෂ විනාශයට යේව යි කියා ද, බණ අසන්ට උන් වේලෙහි පටන් අසන්නාවූ ධර්මයෙන් අක්ෂරයක් හෝ පදයක් හෝ කථාමාර්ගයක් හෝ මඳකුත් නොපිරිහෙළා ඉඳුරා ඇසුයෙම් වීම් නම් මේ සත්‍ය වචනය හේතුකොට ගෙන මොහුගේ විෂය නොලස් ව බසීව යි කියා ද, බුදුහු සව්නෝ ගෙවා දන නෛර්‍ය්‍යාණිකයේක් වී නම් ධර්මරත්නය ඉහාත්මභාවයෙහි අකාලික ඵල දෙන්නේ වී නම් ඒ සත්‍ය වචනය හේතුකොට ගෙන විෂවෙග රහිත ව මපුත් සුවපත් වේව යි කියා ද, සඞ්ඝයා වහන්සේ සුප්‍රතිපන්නයේක් වී නම් සතරමඟ සතර ඵලයෙහි පිහිටියේක් වී නම් ඒ සත්‍යක්‍රියාව හේතුකොට ගෙන මපුත්[4] විෂවෙග රහිත ව සුවපත් වෙව යි කියා ද අප බුදුන්ගේ මේ සර්වඥ ශාසනය ඉදින් පන්දහසක් අවුරුදු මුළුල්ලෙහි පැවත සිටින්නේ වී නම් ඒ සත්‍ය වචනය හේතුකොටගෙන මපුත් විෂවෙග රහිත ව[5] විංදාඳභාවය හැර සුවපත් වේව යි කියා ද මෙසේ තමන් පිහිටි ශරණශීලය හා ශ්‍රද්ධාසම්පත්තීන් යුක්ත ව එකඟ වූ සිතින් බණඇසූ බව ද රත්නත්‍රයෙහි ගුණානුභාව හා මතු ශාසනය

1. බුදුරජාණන් වහන්සේගේ - CJ
2. අරහං (නැත) - BCDEGH ක.
3. විරහිත ව - *AB*
4. මපුතුන් - BCDEGHJ ක.
5. විරහිත ව - BCDE

Non-Commercial Distribution

පවත්නා කාලපරිච්ඡේදය ද යන සියල්ල ම දක්වමින් මෙසේ කරනලද සත්‍ය ක්‍රියාවසානයෙහි ඒ සත්‍රියගේ පුත්‍රයා නිදුක් නිරොගී සුවපත් ව නිඳ පිබිදියක්හු[1] මෙන් වහා නැගී සිට මව සමීපයෙහි සිටගත.

මෙසේ ඒ උපාසිකාවෝ සත්‍යක්‍රියාවෙන් විෂ බස්වා පුතු නිදුක් නිරොගී කොට කැඳවා ගෙන තමන්ගේ ගෙට ගොස් එම අරමුණු කොට උපන්නාවූ සන්තොෂයෙන් පින පිනා මෑතභාගයෙහිදු බොහෝ පින්කම් කොට එයින් ගොස් දෙවුලොව උපන්හ. මෙසේ ශ්‍රද්ධාවන්ත සත්‍රීහු පවා පහන් සිතින් ආදර සහිත ව බණ අසා එවැනි උග්‍ර වූ තද විෂය පවා පහ කොට තමන් විසින් කරන ලද එම කුශලානුභාවයෙන් දෙවුලොව ඉපද දිව්‍ය නාටකයන් විසින් ප්‍රයොග කරනලද අනෙකප්‍රකාර නෘත්‍ය ගීත වාද්‍යාදීන් සන්තුෂ්ට ව අප්‍රමෙය්‍ය වූ දිව්‍යසැපත් විඳිනාහු මය; එබැවින් දක්‍ෂවූ ශ්‍රද්ධාබුද්ධි සම්පන්න ව සැදැහැයෙන් බණ අසා කුශලධර්මයෙහි හැසිරෙන්නාවූ ජන සමූහයන් දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳ කෙළවර නිවන් සම්පත් ලැබෙති යි යනු එකාන්ත වන බැවින් සාදර සිතින් බණ අසා තම තමා ශක්ති පමණින් පිළිවන් කුසල් කොට දිව්‍ය මනුෂ්‍ය සම්පත් සාධා අමාමහ නිවන් දකින්ට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි;

සුත්වා ධම්මං පමුදිතමනා මාතුගාමාපි එවං
උප්පජ්ජිත්වා රමති තිදිවෙ කිබ්බිසං වා පහාති,
සද්ධාබුද්ධිප්පමුඛ්ජනතා සාධු ධම්මෙ චරන්තා
නිබ්බාණං වා දිවිජමනුජං සම්පදං චානුභොන්ති-යි.

මේ මෙහි තුන් වන
ධම්ම සවණොපාසිකා වත්ථුව ය.

නව ද මෙහි සතරවන කුඩ්ඩරජ්ජ වත්ථුව නම් කවරයත්. එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු;

මෙම ලඞ්කාද්වීපයෙහි රුහුණු මාගම නොයෙක් සියගණන් මහණ ගණයා වසන මහවැ නම් විහාරයෙක් විය; එකල ඒ විහාරයෙහි අවුරුද්දක් අවුරුද්දක් පාසා ම ආයර්‍යවංශ ධර්මදෙශනාව පවත්නේය. දුර සිටත් බොහෝ දෙන බන අසන්ට එන්නාහු මය.[2] මහත් වූ ජන සමාගමය වන්නේය. එකල්හි කුඩ්ඩරජ්ජ දනවුවෙහි වසන එක් මහතෙරකෙනකුන්වහන්සේ මම ද ආයර්‍ය වංශධර්මය අසමි යි ඒ විහාරයට ගොස් මහත් වූ ජනසමාගමය හෙයින් තමන්වහන්සේ ඉඳිනට නිසි අවකාශයක් නොලැබ බණ පිරිස් කෙළවර මලුවෙන් පිටත තණපදුරෙන් ගහන වූ එක් තැනක යම්තම් අවසරයක් ලැබ එතැන්හි සිට තුන්යම් රාත්‍රියෙහි බණ අසමින්[3] මහත් වූ සන්තොෂයෙන් ලොමුදැහැගත් ශරීර ඇති ව ප්‍රීතීන් පින පිනා බණ අසනසේක. එකල ඒතණ කැලයෙහි වසන පොළොහෙක් තමා ඔන් තැනින් නික්ම අවුත් තෙරුන්

1. පිබිදියාක්හු - AJ ම.
2. එන්නාහුය - BGH
3. බණ අසා - පිටපත් හැම.

Non-Commercial Distribution

වහන්සේගේ කකුල් අතරට වැද සතරදළ ඔබා පිඩිපිට දෂ්ට කෙළේය. තෙරුන් වහන්සේ ඒ බව දැන ඉඳින් මම මෙතැනින් පහවගියෙම් නම් බණඇසීමට අන්තරාය වන්නේය යි සිතා සෙමෙන් අත පාත බහා පොළහා ඉස තරකොට අල්වාගෙන වහන්පයියෙහි බහා මෝවිට බැඳ එක් පසෙක තබා බණ ඇසූසේක; එම සද්ධර්මශ්‍රවණානුභාවයෙන් උන්වහන්සේගේ ශරීරයෙහි විෂය[1] ව්‍යාප්ත නොවීය; ඉක්බිති අරුණු නැඟි කල බණ පිරිස ගිය කල්හි තෙරුන් වහන්සේ සර්පයකු ඇල්වීමි යි කියා වහන්පයියෙහි ලා තිබූ පොළහා දක්වූසේක; මේ සර්පයා කවර වේලෙහි ඇල්වූ සේක් ද යි භික්ෂූන් වහන්සේ විචාළ කල්හි බණ කියන්ට පටන් ගත් නොබෝ කලකින් ම ඇවිත් ශරීරය දෂ්ට කළ හෙයින් ඇල්වීමි යි කීසේක; එකල්හි භික්ෂූන්වහන්සේ "ස්වාමීනි මෙබඳු ඝොර වූ ශීඝ්‍රවිෂ ඇති සර්පයකු දෂ්ට කොටපියදිත් විෂ වේගයෙන් වික්ෂිප්ත නොවී බණ ඇසූ බව ඉතා අද්භූතය ආශ්චර්‍ය්‍යය" යි වදාළසේක. ඉක්බිති තෙරුන්වහන්සේ "එම්බා ඇවැත්නි, මාගේ ශරීරයෙහි විෂය ශේෂ ව සිටියේය; ඒ විෂශේෂය සත්‍යක්‍රියානුභාවයෙන් නැති කෙරෙමි" යි කියා සත්‍යක්‍රියා කරන්සේක්;

ධම්මං මයා ලොකහිතස්ස තස්ස
සුභාසිතං සුස්සුතමජ්ජ යස්මා
සච්චේන මෙ තෙන විසං විනාසං
පයාතු[2] ආපො විය පොක්ඛරස්මා.

පදක්ඛරං තස්ස න නාසයන්තො
අත්ථං ච ධම්මං මනසී කරොන්තො
යස්මා සුතං තෙන විසං විනාසං
පයාතු[2] තොයං විය පොක්ඛරස්මා.

ගුණානුභාවා පතිට්ඨානතො චිතො
ජිනස්ස තෙනෙව සුදෙසිතෙන
ධම්මානුභාවෙනපි සබ්බතෙජා
විසං විනාසං මමුපෙතු ඛිප්පං.

යනාදීන් "ලොකස්වාමි වූ බුදුරජාණන්වහන්සේගේ තුන්ලෙවුහි[3] පතළ නවඅරහාදි ගුණධර්මයන් මෙනෙහි කොට ඒ බුදුරජාණන් වහන්සේ විසින් මුළු ලොවට වැඩ පිණිස අෂ්ටාඞ්ග සමුපෙත මධුරස්වර විහිදුවා නානානය නිපුණ ධර්මාර්ථදෙශනා ප්‍රතිවේධ ගම්භීර වශයෙන් මොනවට වදාරනලද සපර්‍ය්‍යාප්තික ලොකොත්තර සද්ධර්මය අද මා විසින් ඉඳුරා අසනලද්දේ වීනම් ඒ සත්‍යය[4] හෙතුකොට ගෙන පොකුරුපත නොඇලී පහ ව යන පැනින්නක් මෙන් මාගේ ශරීරගත විෂය විනාසයට යේව යි කියා ද ඒ අසන්නාවූ ධර්මයෙහි[5] එක පදයක් එක අකුරක් පමණ කුත් නොපිරිහෙළා පදගත අර්ථය ද ධර්මස්වභාවය ද මෙනෙහි කෙරෙමින් ඉඳුරා බණ ඇසීම් නම් ඒ සත්‍යය[6] හෙතුකොට ගෙන අලපත නෙළුම්පත නොහැලී පහ ව යන ජලකණිකාවක්[7] මෙන් ශරීරයෙහි විස විනාශයට යේව යි කියා ද මේ මහා

1. විෂ - A
2. පායාතු - ABCGH
3. ලොවුහි - AGJ
4. සත්‍ය වචනය - BGH
5. ධර්මයෙන් - ABDEGH
6. සත්‍ය වචනය - B
7. ජලකර්ණිකාවක් - *BGH*

Non-Commercial Distribution

භද්‍රකල්පයට සාරාසඞ්ඛ්‍ය කප් ලක්‍ෂයකින් යට සාරමණ්ඩ නම් කප සතර වනු ව බුදු වූ දීපඞ්කර නම් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රීපාද මූලයෙහිදී බුදුවෙමි යි කරනලද ප්‍රාර්ථනාවෙහි පටන් පාරමිතා පිරීමෙන් රැස්කරන ලද කුශලයෙන් බුදු වූ බුදුරජාණන්වහන්සේගේ ගුණානුභාවයෙන් ද එම බුදුන් විසින් දෙසන ලද්දවූ ධර්මානුභාවයෙන් ද එම[1] ධර්මය වූ පරිද්දෙන් පිළිපදනා සඞ්ඝයා වහන්සේගේ ආනුභාවයෙන් ද යන මේ ත්‍රිරත්නානුභාවයෙන් ශරීරයෙහි ශෙෂ ව සිටි සියලු විෂය වහා විනාශයට යේව"යි කියා ද මෙසේ සත්‍යක්‍රියා කළ සේක. මෙපරිද්දෙන් උන්වහන්සේ විසින් කරනලද සත්‍යක්‍රියාවසානයෙහි අලපත නෙළුම්පත නොහැලී පලායන ජලබින්‍දුවක් මෙන් පොළොං විෂය පෙරළී පොළොවට වන. මෙසේ විෂය බට කල්හි සන්තුෂ්ට වූ තෙරුන් වහන්සේ ධර්මානුභාව විශෙෂය දක්වා භික්‍ෂූන් වහන්සේ මධ්‍යයෙහි ස්තුති කරනසේක්:

ධම්මො පනෙසො සුගතප්පසත්ථො
තරීච[2] සංසාරමහණ්ණවස්ස,
බ්‍රහ්මාසුරාදීහි නමස්සනීයො
රසො රසානං පරමො තිලොකෙ.

මහා'ගදො මච්චු ජරාපහාණො
සබ්බීති නාසාය විසෙස මන්තො
සබ්බත්ථ දනෙන ච කප්පරුක්ඛො
චින්තාමණී භද්‍දඝටො'ව ධම්මො.

ධම්මං විනා[3] නත්ථි පිතා ච මාතා
තමෙව තාණං සරණං පතිට්ඨා
තස්මා හි භො කිච්චමඤ්ඤං පහාය
සුණාථ ධාරෙථ චරාථ ධම්ම-යි.

යනාදීන් "මේ ධර්මය නම් බුදුන් විසින් පසස්නා ලද්දේය. සංසාර නමැති සාගරයෙන් එතරවීමට මහනැවක් වැන්න; දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණ යක්‍ෂ රාක්‍ෂස සිද්ධවිද්‍යාධරාදීන් විසින් නමස්කාර කටයුත්තේය; ස්වර්ගී මර්ත පාතාල යන තුන්ලෙව්හි විද්‍යමාන වූ සියලු රසයන්ට වඩා උතුම්[4] රසයෙක. ජරා මරණ නමැති රොග පහ කිරීමට දිව්‍යඖෂධයක් වැන්න; සියලු උපද්‍රව නමැති විෂ විනාශයට දිව්‍යමන්ත්‍රයක් වැන්න; කැමැති කැමැති වස්තු ප්‍රදනය කරන හෙයින් කප්රුකක් හා සමානය; සිතූ සිතූ දෙය සිද්ධකරන හෙයින් සිතුමිණිරුවනක් හා සමානය; යහපතට ම කාරණ හෙයින් භද්‍රඝටයක් හා සමානය. මේ ධර්මයට වඩනා මවුපිය කෙනෙක් නැත්තාහු මය; මේ ධර්මය ම රක්‍ෂාස්ථාන නමුදු වෙයි; පිළිසරණ නමුදු වෙයි; ප්‍රතිෂ්ඨාධාර නමුදු වෙයි; එසේ හෙයින් පින්වත්නි, සෙසු කාර්ය තබා නිරන්තරයෙන්

1. ඒ - ABEGH
2. තරංච - පිටපත් හැම.
3. සමො - GH
4. උතුම් වූ - BD

Non-Commercial Distribution

ධර්‍මය අසව; සිහිනුත් මේ ධර්‍මයෙහි ම හැසිරව යනාදීන් මෙසේ උන්වහන්සේ ධර්‍මයට ස්‍තුති කිරීමෙන් භික්‍ෂූන්වහන්සේට අවවාද කොට තමන්වහන්සේ වසන විහාරයට ම ගොස් බොහෝ කාලයක් එහි ම වැස ආයුකෙළවර දෙවුලොව උපන්සේක. මෙසේ ඒ මහතෙරුන්වහන්සේ විෂඝොර සර්‍පයා දෂ්ටකළ එවැනි විෂවේදනාව[1] ඉවසා සතුටු සොම්නසින් බණ අසා ඒ ධර්‍මානුභාවයෙන් එබඳු තද විෂය පවා බස්වා නිදුක් නිරොගි වූ සේක් මය, එබැවින් පින්වත් සත්‍වයෙනි, තෙපි හැම ද සෙසු දෑ නැතත් බණ පමණක් අසව. ඒ ඇසුවාවූ ධර්‍මය තොපට මතු ඒකාන්තයෙන් දිව්‍යමනුෂ්‍යසම්පත් හා නිර්‍වාණ සම්පත්තිය සාධා දෙන්නේ මය. දක්වන ලදුයේ මැයි;

එවං හො සො පමුදිතමනො හිකඛු සුත්වාන ධම්මං
පාපෙසාසං[2] විසමතිභුසං[3] තස්ස ධම්මානුභාවා,
සුත්වා ධම්මං භජථ භවතා කිච්චමඤ්ඤං පහාය
තං වො සග්ගෙ දදති විභවං මොක්ඛමග්ගාඤ්ච කාමං-යි.

මේ මෙහි සතරවන
කුඩ්ඩරජ්ජ වස්තුව ය.

තව ද මෙහි පස්වන මිගපොතකවස්තුව නම් කවරයත්. එහි පිළිවෙළ කථාව මෙසේ දත යුතු;

මෙම ලඩකාද්වීපයෙහි පරම රමණීය වූ උදල්කුළු[4] නම් විහාරයෙක් විය; ඒ විහාරයට නුදුරු වූ සමීප වනයෙහි ඌරන් මුවන් ආදි වූ බොහෝ සිවුපා සත්හු වාසය කෙරෙති. එකල එක් ගමෙක වසන්නාවූ වැදිපුත්‍රයෙක් එතැන්හි වසන බොහෝ ඌරන් මුවන් දක දවසෙක එක් පසෙක්හි කොටුපතක් කොට වනළැහැබ කෙළවර ප න්[5] එළා දුනු හී ගෙන මුවන් එනු බලා කොටුපතෙක සිට ගත. එකල්හි එක් මුවෙක් ඒ ඒ තන්හි ගොචර ග්‍රහණය කොට පැන් බොනු පිණිස පැන් තොටට යනුයේ සවස් වේලෙහි බණ අසනු පිණිස අඩගෑ ශබ්දය අසා කරදික් කොට උඩුකුරු කරනලද කන්තල ඇති ව එසවූ දකුණු පය බිම නොතබා ධර්‍මකථිකයන් වහන්සේගේ කණ්ඨස්වරයෙහි නිමිත්ත ග්‍රහණය කොට නිශ්චල ව සිටියේය. එකෙණෙහි වැදි පුත්‍රයා ඕහු එක ශරප්‍රහාරයෙන් ම[6] විද ජීවිතක්‍ෂයට පමුණුවාපිය. ඉක්බිති එමුවා කාලක්‍රියා කොට එම වෙහෙර වසන අභය නම් මහතෙරුන් වහන්සේගේ නැගණියන් කුස පිළිසිඳ ගෙන දසඑකඩ මස් ඇවෑමෙන් මවුකුසින් බිහි ව ක්‍රමයෙන් වැඩෙනුයේ සත් හැවිරිදි වයසට පැමිණියේය; එකල්හි ඕහුගේ මවුපිය දෙදෙන ඕහු මයිල්මහතෙරුන් වහන්සේ සමීපයට කැඳවා ගෙන ගියහ. මහතෙරුන්වහන්සේ ඕහු

1. විෂ වේගය - D
2. පාපෙසාසං - ABDEGH
3. විසමතිභයං - D
4. උදම්කුළු - E
5. පත් - BDG
6. ධර්‍ම කථිකයන් වහන්සේගේ ධර්‍ම ශබ්දය අසමින් සිටි කල්හි එක ශරපහරින් ම - D

Non-Commercial Distribution

නොබෝ දවසකින් කර්මස්ථාන දී මහණ කළසේක. ඒ සාමණේරයන් වහන්සේ පළමු මුව ව උපන් සමයෙහි තමන්වහන්සේගේ ධර්මශ්‍රවණානුභාවයෙන් කරගෙහි ම රහත් බවට පැමිණි සේක; උන්වහන්සේගේ මයිල් මහතෙරුන්වහන්සේ වනාහි ලබනලද පඤ්චාභිඥ පමණක් ඇතිසේක; ඉන්බිති එක් දවසෙක සාමණේරයන්වහන්සේ සවස් වේලෙහි උපාධ්‍යායයන්වහන්සේ සමීපයට එළඹිසේක. එකල්හි ඒ උපාධ්‍යායයන් වහන්සේ අත දික් කොට අත්ලෙන් සඳමඬල පිරිමදිමින් සිටිසේක. ඒ දැක සාමණේරයන්වහන්සේ "ස්වාමිනි, තෙල සෘද්ධි මහිමය රැකවදළ යහපතැ"යි දන්වූසේක. තෙරුන් වහන්සේ වනාහි ඒ සාමණේරයන්වහන්සේ අග්‍ර වූ අර්හත්ඵලයෙහි පිහිටි බව නොදැන උන්වහන්සේගේ ඒ වචනය ඉඳුරා මෙනෙහි නොකළසේක. ඒ බව දැන සාමණේරයන්වහන්සේ සෘද්ධි බලයෙන් දහසක් සඳමඬුලු ගෙනහැර මහතෙරුන්වහන්සේට දක්වා "ස්වාමිනි, සඳමඬුලු පියයක් හෝ දහසක් හෝ ලක්ෂයක් හෝ ගෙන හැර දැක්වීම බැරි දෙයෙක් නොවෙයි; යම් මහණ කෙනෙක් එකම තෘෂ්ණාව දුරු කොට හළුවාහු වී නම් එම උත්තම ය; එම ඉතා නොපිළිවන් දෙයෙකැ"යි වදරා උපාධ්‍යායයන් වහන්සේට අනුශාසනා කරනසේක්:

යො ගන්ත්වා පුරිසො දිස්වා - තීරට්ඨො 'ව මහම්බුධිං,
සමුද්දේ'යං මයා දිට්ඨො - භාසතෙව අපඤ්ඤතා.

එවමෙව්ධ යො භික්ඛු - කිලෙසෙ කෙචි අත්තනි,
වික්ඛම්භෙත්වානභිඤ්ඤාණ[1] - බලං ලද්ධාන අඩ්ඪුවා.

අචෙජත්වාන කිලෙසානං - ලද්ධපෙට්ඨාස්මීති මඤ්ඤති,
තණ්හාදසව්‍යථො සොහි අමුත්තො යෙව වත්තති.

අලක්ඛිං අසිවං[2] භීමං - අනපායිං අනත්ථදං
යො තණ්හං පජ්හෙ භික්ඛු සො මුත්තො මාරබන්ධනා.

යනාදීන් "යම් කිසි පුරුෂයෙක් මුහුද දක්නා පිණිස ගොස් වෙරළ අස සිට මහාසමුද්‍රය දැක උදකාභ්‍යන්තරයෙහි විද්‍යමාන වූ සෙසු දශවිධ රත්නයන් හා කෝරළ මහරළ දකිමුවර තිමි තිමිඩගලාදි වූ මස් කැසුප් ආදි වූ[3] කිසි විශේෂයක් දක්නට නිසි තමාගේ දිව්‍යඥනයක් නැතත් දුටු විවරක් ම සිතින් ගෙන මහාසමුද්‍රය මම දිටිමි යි යම්සේ කියා ද එ පරිද්දෙන් ම මේ ශාසනයෙහි යම් කිසි භික්ෂු කෙනෙක් සපිර ව නොපවත්නාවූ අභිඥබලයෙන් කිසි කෙලශකෙනකුන් සන්හිඳුවාගෙන සර්වප්‍රකාරයෙන් කෙලශක්ෂයට නොපැමිණ මම අර්හත්ඵල සඞ්ඛ්‍යාත වූ අභිවෘද්ධියට පැමිණියෙමි යි සිතන්නාහු වීනම් ඔහු තෘෂ්ණාදසත්වයෙන් නොමිදී ම වාසයකරන්නාහු මය. යම් කිසි භික්ෂුකෙනෙක් ඉතා නිශ්‍රීක වූ ශාන්ත බවක් නැන්නාවූ භය එළවන්නාවූ දුරු කළ නොහැකි අනර්ථ දයක වූ එබඳු තෘෂ්ණාව දුරුකොට හැරපීවාහු වීනම් ඒ මහණ මාරපාසයෙනුත් මිදුණේ මය"යි වදළසේක. මෙසේ

1. විඤ්ඤාණං - ABECH
2. අසිමං - BE
3. ආදි - CDE

Non-Commercial Distribution

සාමණේරයන්වහන්සේ වදාළ අනුශාසනා ධර්මය අසා මහතෙරුන් වහන්සේ විදර්ශනා වඩා එදවස් ම රහත් බවට පැමිණිසේක. ඉක්බිති දෙවන දවස් මහතෙරුන්වහන්සේගේ නං උපසිකාවෝ සාමණේරයන් වහන්සේ හා සමඟ මහතෙරුන් වහන්සේට ආරාධනා කළහ; එවේලෙහි මහතෙරුන්වහන්සේ "එම්බා උපාසිකාවෙනි, අද බොහෝ භික්ෂූන්වහන්සේ දක තොප විසින් සිත පහදවා ගත යුත්තේය; තොප විසින්[1] දෙන දන කොට්ඨාසය දෙනමකට ම වෙව"යි වදරා උපාසිකාවන් නික්මවා පෙරවරු වේලෙහි අඳනා සිවුරු සකස්කොට හැඳ ගැටවවුගන්වා පාත්‍රය අතින් ගෙන තිස්දහසක් පමණ[2] භික්ෂූන් හා සමඟ ගමට වන්සේක; උපාසිකාවෝ භික්ෂූන්වහන්සේ දක දෙමයිලන් වහන්සේට ඉඳිනා අසුන් දෙක පැනවූහ; ඒ ආසනදෙක දෙදෙනාවහන්සේගේ ආනුභාවයෙන් තිස් දහසක් පමණ විය; එම දෙදෙනාවහන්සේගේ ආනුභාවයෙන් ගෙට වන් හැමදෙනාවහන්සේ තමන්වහන්සේට[3] පැමිණි ආසනවල වැඩ උන්සේක; එකල්හි උන් විසින් දෙනලද්දවූ ආහාර කොට්ඨාස දෙක හා සූපව්‍යඤ්ජනාදි වූ සියල්ල ම තිස්දහසක් පමණ භික්ෂූන්වහන්සේට ප්‍රයෝජන ඇති විචර සෑහිණ. අහර වළඳ ඉක්බිති උපාසිකාවෝ දූන් දනෙහි අනුසස් අසනු කැමැති ව සාමණේරයන්වහන්සේගේ පාත්‍රය ගෙන සිටියාහ; සාමණේරයන් වහන්සේ මිහිරි කටහඬ විහිදුවමින් බණ වදාළසේක. ඒ ධර්මදෙශනාවසානයෙහි මවුපිය දෙදෙනා ආදිකොට ඇති පන්සියයක් පමණ ස්ත්‍රී පුරුෂයෝ සෝවාන් ඵලයෙහි පිහිටියාහ; ඒ ධර්මදෙශනාව බොහෝ දෙනාට අභිවෘද්ධිදයක විය. මෙසේ වල ඉපද වෙනෙහි වසන්නාවූ කිසි විශෙෂයක් නොදන්නාවූ මෘගජාතීහු පවා බණ කියන්නාවූ ශබ්දමාත්‍රයක් අසා එපමණ කුශලයෙන් මිනිස්ලොව මහත් වූ ශ්‍රී සම්පත්තිය විඳ නිර්වාණ සම්පත්තියත් ලද්දාහු මය. එබැවින් පින්වත් සත්වයෙනි, බුධාදිරත්නත්‍රයෙහි[4] ගුණවිශෙෂය නුවණින් සලකා සැදැහැයෙන් දන් ඉඳුරා බණ අසන සත්වයෝ බුදුන් විසින් වර්ණනා කරනලද දෙවුලොව දිව සත්රුවනින් විසිතුරු වූ දිව්‍යවිමානවල වෙසෙමින් අපමණ දිවසැපත් විඳිති යි යනු කවර විස්මයෙකැයි කියම් ද; ඒකාන්තයෙන් ම දෙවුලොව දිව්‍යසම්පත් ලබන්නාහු මය. එබැවින් කුසීත නොව බණ අසා කුසල්කොට සගමොක්සැපත් සාධන්ට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි:

දෙසෙනෙතවං විජනජම්ගා සද්දමනෙන නිමිත්තං
ලද්ධා ධම්මං මනුජ විභවං වාපවග්ගං ලභන්ති,
සද්ධං බුද්ධෙ විහිතමතිමා සාධු සුත්වාන ධම්මං
කිං හො සග්ගෙ රමති මුනිනා වණ්ණනීයෙ විමානෙති - යි

මේ මෙහි පස්වන
මිගපොතක වස්තුව ය.
මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි
බොධිරාජ වගී නම්වූ
දෙලොස්වන පරිච්ඡේදය නිමි.

1. විසින් (නැත) - ABEGH
2. පමණ (නැත) - ABEGH
3. තමතමන් වහන්සේට - BCDEGH
4. බුද්ධාදි වූ රත්නත්‍රයෙහි - CF

Non-Commercial Distribution

තව ද මේ සද්ධර්මාලංකාරයෙහි තෙළෙස්වන ආරබ්භදක වර්ගය නම් කවර යත්. එහි පළමුවන ආරබ්භදක අභය ස්ථවිර වස්තුව මෙසේ දතයුතු. කෙසේ ද යත්:

යටගිය දවස මෙම ලඞ්කාද්වීපයෙහි මහාතලා නම් විහාරයෙක් විය; එහි වසන ත්‍රිපිටකධාරී වූ අභය නම් තෙරකෙනකුන් වහන්සේ ග්‍රාමාන්ත සෙනාසනය හැර එම විහාර සමීපයෙහි වන ලැහැබෙක කරනලද පන්සලෙක වසනසේක;[1] එසේ හෙයින් මැත භාගයෙහි උන්වහන්සේ ආරබ්භදක අභය ස්ථවිරයන්වහන්සේය යි ප්‍රසිඩ වූ සේක. එකල එක් උපාසකයෙක් උන්වහන්සේ කරා එළඹ පසඟ පිහිටුවා වැඳ එකත්පස් ව හිඳ බණ අසා පහන් සිත් ඇති ව ආරාධනාකොට එතැන් පටන් දෙළොස් අවුරුද්දක් මුළුල්ලෙහි සිවුපස දනයෙන් උපස්ථාන කරන්නේය. මෙසේ උපස්ථාන කරනුයේ තෙරුන්වහන්සේට සිවුරු පිණිස වස්විසීම් ආදි වූ ඒ ඒ කාලයෙහි පිළි[2] දන් දෙයි: එපවත් දන එම උපාසකයා වසන ගෙය සමීපයෙහි අනික් ගෙයක ඉඳිනා හරණික නම් වූ එක් සොරෙක් රාත්‍රිභාගයෙහි ගොසින් දුන් දුන් පිළි ඇරගෙන පලා එන්නේය; තෙරුන්වහන්සේ ඉරී ගියාවූ දුර්වල සිවුරු ම වැළඳගෙන ඉන්නාසේක. ඉක්බිති එක් දවසෙක සිවුරු පිළි දෙන උපාසකයා විහාරයට ගොසින් තෙරුන් වහන්සේගේ සිවුරු දුර්වල ව තිබෙන්නා දක නැවතත් සිවුරු පිණිස පිළි දන් දී සිතනුයේ "මා විසින් මුන් වහන්සේට සිවුරු පිණිස බොහෝ පිළි දෙන ලද. ඉන් සිවුරක් කොට අඳනා පොරෝනා දෙයකුත් නුදුටිමි. ඉදිම කොට බැඳ වෙළා තබන දෙයක් වත් අන් තෙනකට දෙන දෙයක් වත් නුදුටිමි; මෙසේ වන්ට කාරණ කවරේ ද; අද ඒ පරීක්ෂා කළ මැනවැ"යි සිතා රාත්‍රි භාගයෙහි කඩුවක් අතින් ගෙන විහාර සමීපයෙහි මඟින් ඉවත් ව යන එන්නන් පරීක්ෂා කෙරෙමින් සැඟවී සිටගත. එකල ඒ සොරා තෙරුන්වහන්සේට පිළි දන් දුන් බව දන පළමු සේ ම ඇරගන්මි යි සිතා රාත්‍රිභාගයෙහි විහාරයට ගොස් පිළිතුබූ තැනින් ඇරගෙන නැවතත් සැක නැති ව එම මඟින් ම එමින් සිටියේය. එකල උපාසකයා කඩු හා සමඟ සොරු දක දිවගෙන ගොස් ඔහුගේ ඉසකේපත ගසා අල්වාගෙන "එම්බල කොල මෙතෙක් කල් මා[3] තෙරුන්වහන්සේට දුන් පිළි ගෙන ගියේ තෙපි ම ද"යි විචාරා "එසේ ය ස්වාමිනි"යි කී කල්හි ඒ උපාසකයා ඔහු අතින් පිළි ඇරගෙන "මතු මෙසේ වූ සොර කමක් කෙරෙයි ද නොකෙරෙයි ද" යි කිය කියා අතින් පයින් ඔහු තළා දුර්වල කොට අමුසොහොනකට ඇදගෙන ගොස් පළමු ගෙන ගොස් දමූ අලුත් මළ මිනිසකු[4] අධොමුඛ කොට මුහුණින් බිම හොවා ඔහු පිට සොරා උඩුකුරු කොට වැදහොවා දැත දෙපය පිට ඉස ආදි වූ තැන් මුදගත නොහැකි පරිද්දෙන් වෙන වෙන ම තද කොට බැඳ හොවා තුමු ඉස් සෝධා නහා පළමුකොට ගමට අවුත් ගම්මැද සිට "එම්බා මේ ගම හැමදෙන ම මා කියන්නක් අසව: අද මේ රාත්‍රියෙහි එක් අමනුෂ්‍යයෙක් එයි; ඒ යක්ෂයා සැබවින් දිටි නම් තොප හැම කා මරයි; මහත් වූ විනාශයට පමුණුවයි; එ බැවින් කල් තබා ගෙවලට වැද දෙරවල්

1. වසන සේක් - GHJ
2. පිළි ද - ABDGH
3. මා මාගේ - ABEGH
4. මිනියක් - මුද්‍රිත.

Non-Commercial Distribution

වසාගෙන බැණ නොනැඟී හිඳුව; ඒ යක්ෂයා දන් දන් ඇවිත්[1] මම අසවලාය අසවලුන්ගේ නෑයෝය අසවලා මාගේ මිත්‍රයාය යනාදීන් කිය කියා කථා කරන්නේ වී නමුත් ඔහු හා සමඟ කථාවක්[2] නොකරව; ගොළුවන් බිහිරන් සේ බැණ නොනැඟී හිඳුව"යි අඬගා කියා තමන්ගේ ගෙට ගියේය. ඔහුගේ බස් අසා ගම්වැසි මනුෂ්‍යයෝ භයින් තැති ගෙන ගෙවල දෙර අගුළුලාගෙන ඒ ඒ තැන්හි සැඟවී ගියහ. එකල සොරා ඒ රාත්‍රිභාගයෙහි තමා පිට තබා බැඳි මළමිනිය උනා ගත නොහී ඒ මිනිය පිට බැඳි වන ම ඇරගෙන තමා වසන ගෙදෙරට ඇවිත් භාර්‍ය්‍යාවට කියනුයේ "එම්බල සොඳුර, දෙර ඇරපියව"යි කීය. එසේ දෙර නොහරනා හෙයින් නම් සලකුණු කියනුයේ "එම්බල, මම හරනතිකයා ය. මාගේ කටහඬිනුත් දනගත නොහැකි ද; දෙර ඇර පියව"යි කීය. එසේ කීව ද ඔහුගේ භාර්‍ය්‍යාතොම භයින් තැතිගෙන පිට මළමිනියකුත්[3] බැඳගෙන ආ හෙයින් සැබවින් ම යක්‍ෂයෙකැයි සිතා බැණ නොනැඟී සැඟවී ගියාය. එකල සොරා නොයෙක් ලෙස කාරණ කියාත් ගිවිස්වා දෙර අරවා ගත නොහී එසේ ම තමාගේ දෙමව්පියන්ගේ ද සෙසු නෑයන් හා කුසෙහි ඔත්තවුන්ගේ ද යහළුමිත්‍රාදීන්ගේ ද ගෙවලට වෙන වෙන ම ගොස් එක තැනෙකත් දෙර අරවාගත නුහුණුයේ මය. ඔහු ගිය ගිය තැන්හි මනුෂ්‍යයෝ සැබවින් ම යක්ෂයෙක් ආයේය යි සිතා භයින් දෙර නොහැරියාහු මය; මෙසේ ඒ සොරා ගම මුළුල්ලෙහි ඇවිද එක තැනෙකත් පිටිවහලක් නොලැබ තෙරුන්වහන්සේගේ සමීපයට ම යෙමි යි සිතා විහාරයට ගොස් "ස්වාමීනි, ගැත්තවුට පිටිවහල් වුව මැනව මේ පිට බැඳි මළ මිනිය උනා හැර මා සුවපත් කළ මැනවැ"යි කීය. තෙරුන්වහන්සේ ඔහු දැක කම්පා ව ළයපිරුණු ශොක ඇති ව වහා හුනස්නෙන් නැඟී ඔහු සමීපයට එළඹ පිට බැඳි මළ මිනිය උනා ගෙන ගොස් දුර දමා ඔහු උණුපැනින් නහවා කුලාවෙන් තෙල්ගෙන සකල ශරීරය තෙල් ගල්වා මුගුරෙන් පහළ තැන් තවමින් උන් කල්හි ඕහට බැටදුන් උපාසකයා උදෑසන්හි ම සොරා කොයි ගියේ දෝ හොයි විචාර විචාරා සොයා ඇවිදුනේ විහාරයට ගොස් සොරා පිට තෙල් ගා තවමින් උන් තෙරුන්වහන්සේ දක ඔබ හා සමඟ කථා කරන්නාවූ උපාසක තෙම:

එසො මය්හං සහායොති - උපකාරං කරොති යො,
න තං සො සරතෙ චොරො - නත්ථි චොරෙ සහායතා.

බාදනෙනාපි පිවනෙනාපි - සයනෙනාපි ච එකතො,
න ජහාතත්තනො ධම්මං - නත්ථි චොරෙ සහායතා.

මුඛෙනෙකං ලපෙ චොරො - කායෙනෙකං කරොති සො
ලද්ධොකාසො හරනෙනව - නත්ථි චොරෙ සහායතා.

මාතා පිතා ච බන්ධු ච -දිස්වා චොරං සහායතා.
දූරතො පරිවජ්ජෙන්ති - කංඛන්ති සංගමෙ සදා.

---

1. දන් ම ඇසිල්ලකින් ඇවිත් - BGH
2. කථාත් - ABCEHJ
3. මළමිනියකුත් - ADEGH

Non-Commercial Distribution

යනාදීන් "ස්වාමිනි, වස්තුවායින් නැති යම්කිසි සත්පුරුෂයෙක් තමා ස්වභාව[1] හෙයින් මේ මාගේ මිත්‍රයා වේ දැයි සිතා සොර සිත් ඇති අසත්පුරුෂයාට කවර තරම් උපකාරයක් කෙළේ නමුත් ඒ උපකාරය මඳකුත් සඳහන් නොකරන්නේ මය; වස්තුවා දන්නා මනුෂ්‍යයෝ එක තෙන ඉඳ එක් ව කා බී එක් ව වැදහෙව එක් ව කථා කොට හිඳත් තමන්ගේ වෛරස්වභාවය නොහරනාහු මය. එබැවින් වස්තුවාසිත් ඇති අසත්පුරුෂ සොරුන් අහසට පොළොව සේ දුරින් ම දුරුකට යුත්තේය. වස්තුවා දන්නා සොරහු සිතින් එකක් සිතති, කටින් එකක් කියති, කයින් අනිකක් කෙරෙති, ඉදින් යම්තම් අවසරයක් ලද්දාහු වී නම් තමන්ට උපකාර කළවුන්ගේ බාල්‍ය අවස්ථායෙහි පටන් උපයා රැස් කළ වස්තුව සියල්ල ම ඇරගෙන පලා යන්නාහු මය. එබැවින් සොරුන් කෙරෙහි විශ්වාසයෙක් නැත් මය. සෙස්සන් තබා වැදූ මව්පියන් හා බන්ධුජනයෝ ද බාල අවස්ථාවෙහි පටන් එක කෙළිමඩලෙහි කෙළ ඇවිදි මිත්‍රජනයෝ ද පවා සොරසිත් ඇති අසත්පුරුෂයන් දුර එන්නා දුටත් අනර්ථයක් අවැඩක් කෙරේ දෝ හො යි යන හයින් සැකයෙන් දුරින් ම දුරු වන්නාහු මය"යි මෙසේ සොරුන්ගේ නුගුණු ප්‍රකාශ කොට කියා "ස්වාමිනි, මෙබඳු අනුන් සන්තක වස්තු සොරා පැහැරගන්නාවූ මිත්‍රද්‍රෝහියා ළඟ රඳවාගෙන තවා පළා නාවා තෙල් ගල්වා ඇඟ ඉස ගා පියන තෙල් පුහත් නසා කුමක් පිණිස දුක් ගන්නාසේක් ද, ඇසිල්ලකුත් මෙතන නොරඳවා ලුහුබඳවාපුව මැනව"යි කීය. එසේ කී උපාසකයාහට අවවාද වදරන තෙරුන්වහන්සේ:

> යො සා[2] යස්ස ධසෙ පාදං - තස්ස පාදං න සො ධසෙ,
> එවමෙව හි දුට්ඨස්ස - අදෙසොයෙව සංසිතො[3].
>
> අකතඤ්ඤුස්ස පොසස්ස මෙත්තිං යො න කරිස්සති,[4]
> කස්ස[5] මෙත්තිං හි සො කයිරා-තමාහුං වරියං බුධා.

යනාදීන් "එම්බා උපාසකය, චණ්ඩ පරුෂ නීචගුණ ඇති යම් කිසි බල්ලෙක් සත්පුරුෂ ගුණ ඇති යමක්හුගේ පය කඩා කැයේ වී නම් ඒ මිනිසා නැවත ඔහුගේ පය කඩා කන්නේ නොවෙයි; එ පරිද්දෙන් ම දුෂ්ටගුණ ඇති අසත්පුරුෂයන් කවර තරම් අපරාධයක් නපුරක් කළත් උන්ට සත්පුරුෂයන් විසින් නපුරක් නොසිතා යහපතක් ම කිරීම බුදු පසේබුදු මහසව් ආදි වූ උත්තමයන් විසින් ප්‍රශංසා කරනලද්දේ මය. මේ ලෝකයෙහි යම්කිසි උත්තමයාණ කෙනෙක් කෙළෙහි උපකාර නොදන්නා අසත්පුරුෂයන් කෙරෙහි මෛත්‍රී නොකරන්නාහු වීනම් ඔහු කවුරුන්ට මෛත්‍රී කෙරෙත් ද. හේ එසේ මැයි: සත්පුරුෂයන්ට මෛත්‍රී කිරීම සත්පුරුෂයන්ගේ ස්වභාවධර්මයෙක් මය; කිසියම් කෙනෙක් අසත්පුරුෂයන්ට මෛත්‍රී කරන්නාහු වීනම් ඒම වේ ද උතුම් වූ මෛත්‍රී නමැයි[6] බුධාදි වූ ප්‍රඥාසම්පන්න උත්තමයෝ කියන්නාහු

1. ස්වභාවී - පිටපත් හැම
2. සො - AC
3. අදෙසොව පසංසිතො - මුද්‍රිත
4. න කස්සති - ABDEGH
5. කස්ස - AJ
6. නමැති - මුද්‍රිත

Non-Commercial Distribution

මය"යි වදරා "එම්බා පින්වත් උපාසකය, මෝහට සොරකම් කරන ද්‍රොහියා යයි නොසිතා මෛත්‍රී කරව. මූ තමන් කළ සොරකමෙහි විපාක මතු තබා මෙම ජාතියෙහි ම ලද්දේ වේ ද"යි වදරා උපාසකයාණන්ට අවවාද කොට නික්මවූසේක.

එයින් කීප දවසක් ගිය කල හරන්තික නම් වූ ඒ චෞරකාරයා[1] ශරීරයෙහි බල ඇති ව ගෙන තෙරුන්වහන්සේ කරා එළඹ "ස්වාමීනි, මම මේ ආත්මභාවයෙහි අනික්කෙනකුන් සේ ව[2] ගියෙමි. එසේ හෙයින් නැවත ගිහිගෙයි විසිය නොහෙමි. මෙතෙක් කල් සොරකම් කිරීමෙන් රැස් කළාවූ අකුසල රාශිය ගෙවී යන පරිද්දෙන් තවත් මා කෙරෙහි අනුකම්පා උපදවා මහණකොට වදාළ මැනවැ"යි යාච්ඤා විය. එතෙපුල් අසා කරුණාපර බුධපුත්‍ර වූ මහතෙරුන්වහන්සේ ඔහු මහණකොට උපසම්පද කැරවූසේක. එතැන් පටන් උන්වහන්සේ වත් පිළිවෙත්හි යෙදී අප්‍රමාද-ව භාවනා කරනසේක් නොබෝ කලකින් රහත් ව හරන්තික මහ තෙරුන් වහන්සේ ය යි ප්‍රසිඩ වූසේක. එසේ හෙයින් යම් කිසි කෙනෙක් පළමුවන වයස පඤ්චකාමයෙහි ගිජු ව නොයෙක් අකුසල් කිරීමෙන් පාපිෂ්ඨ ව ඇවිද්දහු වී නමුත් පසු ව කාරණාකාරණ දන්නා වයසට පැමිණ යෞවනමදය ආරෝග්‍යමදය ජීවිතමදය යන ත්‍රිවිධ මදාදීන් මත් ව කුසල් කිරීමෙහි ප්‍රමාද වීම සසර දුක් විඳීමට එකාන්ත කාරණය යි නුවණින් සලකා ප්‍රාණාතිපාතය අදත්තාදානය කාමමිථ්‍යාචාරය මුසාවාදය සුරාපානය යනාදි වූ අකුශල ධර්මයන් දුරු කොට ගෘහස්ථ ප්‍රව්‍රජිතාදි වූ ඒ ඒ භාවයට සුදුසු වූ කුශල ක්‍රියාවන් රැස්කෙළේ වීනම් එසේ වූ උත්තම සත්ව තෙම බුදු පසේබුදු මහ රහතන් විසින් පසන්නා ලද්දවූ දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳ ශාන්ත වූ ප්‍රණීත වූ උතුම් වූ අමාමහ නිවන් පුරයටත් පැමිණෙන්නාහු මය. එසේ හෙයින් කියනලදී:

පාපො හුත්වා පඨමසමයෙ පඤ්චකාමානුගිධො
යො වෙ පච්ඡා පජහති මදං යොනිසොලොකයන්තො
සොපායමෙහා තිභවවිභවං කාමමාසාදයිත්වා
නිබ්බාණග්ගං සිවමමතපුරං යාති සත්ථුප්පසත්ථං.

මේ මෙහි පළමු වන
ආරක්ඛක අභයථේර වස්තුව ය.

තව ද මෙහි දෙවන සමණගාම වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්:

එක් සමයෙක්හි සෑගිරි වෙහෙර වසන සඟ දෙළොස් දෙනකුවහන්සේ ලඞ්කාද්වීපයෙහි ඒ ඒ තැන පිහිටි දගබ් මහබෝ පිළිම ආදිය වඳිමින් ක්‍රමයෙන් අවුත් ශ්‍රමණග්‍රාම යයි ප්‍රසිඩ වූ මහණ නම් ගමට පැමිණිසේක. එකල්හි ඒහැමදෙනා

---

1. චෞරකාරයාණෝ -ABCEGHJ
2. සේ ම - AC
   සේ - G
   සේවය - H
3. ඒ (නැත) - BCEGH

Non-Commercial Distribution

වහන්සේ සවස ඉරගල උණු හෙයින් අන් තැනකට රාත්‍රියෙහි යා නොහී මහණ ගමට පූර්විදිග්භාගයෙහි පර්වතයක් අස ඡායාසම්පන්න වූ මයිල ගසක් දක රුක්මුලට එළඹ පරඩලා පහකොට පස්විකා බණ දහම් පිරිවාගෙන සැතපුණුසේක. ඉන් එක්කෙනකුන් වහන්සේ රාත්‍රි භාගයෙහි නැගී සිට පළමු කාශ්‍යප සර්ඥයන් වහන්සේ විසින් දෙසන ලදු ව පසුව නන්ද නම් බ්‍රාහමණයා විසින් අප මහා සුත සොම බොධිසත්වයන් වහන්සේට කියනලද උතුම් වූ අර්ථයෙන් යුක්ත වූ සතාරහ ගාථා නම් වූ ගාථා සතරක් පිරිවා දෙවියන්ට පින් දුන්සේක. කෙසේද යත්:

සකිදෙව සුතසොම - සබ්භි හොති සමාගමො,
සා තං සඞ්ගති පාලෙති - නාසබ්භි බහුසඞ්ගමො.

සබ්භිරෙව සමාසෙථ - සබ්භි කුබ්බෙථ සන්ථවං,
සතං සද්ධම්මමඤ්ඤාය - සෙය්‍යො හොති න පාපියො.

ජීරන්ති වෙ රාජරථා සුචිත්තා - අථො සරීරම්පි ජරං උපෙති,
සතඤ්ච ධම්මො න ජරං උපෙති - සන්තො හවෙ සබ්භි පවෙදයන්ති.

නභංච දූරෙ පඨවිච දූරෙ - පාරං සමුද්දස්ස තදාහු දූරෙ
තතො හවෙ දූර තදං වදන්ති - සතඤ්ච ධම්මං අසතංච රාජ

යන මේ ගාථා සතර ය. මේ ගාථා සතරෙහි අභිප්‍රාය[1] විචාළ පොරිසාද රජහට සුතසොම රජ්ජුරුවන් කී අභිප්‍රාය[1] නම් "සබඳ පොරිසාද රජ්ජුරුවනි, යහළුවන්ට මෙලෝ පරලෝ දෙකින් ම වැඩට නිසි බස් කියන්නාවූ කල්‍යාණ මිත්‍රයන් හා සමඟ එක් තෙනෙක හිඳ සිට සාකච්ඡා කිරීම් වශයෙන් එක වාරයෙකත් සමාගමයෙක් වී නම් එපමණ සමාගමය බොහෝ කාලයක් මුළුල්ලෙහි ඓහලෞකික පරලෞකික සියලු අභිවෘද්ධීන් සිද්ධ කොට රැකලන්ට සමර්ථ වන්නේය. යහපත නපුර කියා වැඩෙහි යොදලන සේ නොදන්නා අසත්පුරුෂයන් හා සමඟ සියක් අවුරුදු එකතැන වාසය කරනලද්දේ වීනමුත් එසේ වූ අසත්පුරුෂ සමාගමය දෙලොවින් ම නුගුණ නූපදනා ලෙස එක දවසක් රැකලන්ටත් අසමර්ථ වන්නේය. තව ද මහරජ, ඉඳීමය සිටීමය සක්මන් කිරීමය සැතපීමය යන සතර ඉරියව්වෙහි ම නුවණැති වූ සත්පුරුෂයන් හා එක් ව වාසය කරව. කාරණ කිම් ද යත්? සත් තිස් බොධිපාක්ෂික ධර්මයන් පුරන්නාවූ සත්පුරුෂයන් හා එක් වූ සත්ව තෙම එම ධර්මය උතුම් සේ දක බොධිපාක්ෂික ධර්මයන් පුරා බුදු පසේබුදු මහරහත් බැව් ලැබෙයි.[2] එසේ හෙයින් ඒ ධර්මය දන පුරුදු කිරීම හැමලෙසින් සැප එළවයි. අනික් ළාමක භාවයකට නොපමුණුවන්නේ මයි. තව ද රජ්ජුරුවෙනි, රජ්දරුවන්ට අග්‍ර වාහන වූ යහපත් කර්මාන්ත ඇති රථය පවා කල්යාමකින් එකාන්තයෙන් ම යම්සේ දිරා ද එපරිද්දෙන් ම දෙතිස් කුණප කොට්ඨාසයකින් ගැවසීගත්තාවූ මේ ශරීරය ද කලෙක ජරාවට පැමිණෙයි. එසේ ජරාවට නොපැමිණෙන්නේ කවරේ ද යත්? සත්පුරුෂ සමවායයෙන්[3] පැමිණෙන්නාවූ ගුණධර්මය ජරාප්‍රාප්ත නොවෙයි. කවර

1. අභිප්‍රාව - BCDEGH
2. ලැබෙතියි - BEGH
3. සමාගමයෙන් -BGH

කාරණයෙන් ද යත්? ඒ සධර්මය පුරුදු කළාහු ජරාවට පැමිණිය ද ජාතියෙන් ජාතියට එම පුරුදු කරන ලද්දවූ ධර්මය ඔහු ගෙන ගොස් දිව්‍ය මනුෂ්‍ය නිර්වාණ සඞ්ඛ්‍යාත බොහෝ සම්පත්ය රූප යෞවන ඓශ්චර්‍ය්‍ය ආධිපත්‍යය යන මෙකී විශිෂ්ට[1] ස්වභාවයෙහි පිහිටුවා ලන හෙයින් සත්පුරුෂ ධර්මය ම උතුමැයි දන ගන්ව. අහසට පොළොව දුරු වූවා සේ ද සමුද්‍රයෙහි මෙතෙරට එතෙර දුරු වූවා සේ ද ධර්මාධර්ම දෙක ඉන් ඊට දුරින් දුර එක් නොවන්නේය යි නුවණැත්තෝ කියති. අසත්පුරුෂ සමාගමයෙන් පිහිටියාවූ අධර්ම සමාදනය ඇත්තාහු ද ඉදින් සත්පුරුෂ සමාගමයක් ලදින් ඔවුන් කී අවවාද පිළිගෙන විසුවාහු වී නම් පඤ්චොපක්ලෙශයෙන් විනිර්මුක්ත ව දශදිගන්තය එකාලෝක කොට නභොමණ්ඩලයෙහි පැළඹෙන්නාවූ චන්ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනා මෙන් තමන්ගේ යශොතෙජසින් මුළුලෝ බබුළුවා දෙව්මිනිස් සැපත් විඳ මේ ප්‍රතිභය සහිත වූ සංසාර සාගරයෙන් එතෙර ව අමාමහ නිවන්පුර සිරි අනුභව කළ හැක්ක" යනාදීන් සියලු වන දෙවතාවන් ලවා සාධුකාර දෙවමින් පොරිසාද රජහට සුතසොම නම් මහබෝසතාණන් වහන්සේ මේ සතාරහ නම් වූ ගාථා සතරෙහි අර්ථ වදළසේක යනු මෙහි අභිප්‍රාය ය[2].

මේ ගාථා සතර අසා අභිප්‍රායාර්ථය දන මයිලගස වසන දෙවතාවා පහන් සිත් ඇති ව ඒ රාත්‍රිය පහන් වූ කල්හි භික්‍ෂූන් වහන්සේ වඩනට පටන් ගත්තා දැක දිව්‍ය පුත්‍රයා මනුෂ්‍ය වෙශයෙන් අවුත් කියනුයේ "ස්වාමීනි, අහර සොයා අද ඉවත නොවැඩිය මැනව, මම ඇමදෙනා වහන්සේට දන් දෙමි"යි ආරාධනා කෙළේය. භික්‍ෂූන් වහන්සේ ද ඔහුගේ ආරාධනාව පිළිගෙන එම රුක්මුල්හි වැඩඋන් සේක. ඒ දිව්‍යපුත්‍රයා වනාහි අනික් දිව්‍ය ආහාරයක් උපදවා ගන්ට නිසි කුශලකර්මයක් ඇත්තේ නොවෙයි. නිරන්තරයෙන් ම ඕහට බදලතා[3] ය යි යන ලියජාතියෙහි කොළ පත් පමණෙක් උපදනේය. එසේ හෙයින් ඒ දිව්‍යපුත්‍රයා බදලතා[3] කොළ පමණක් අනුභව කොට එහි වෙසෙයි; එකල්හි භික්‍ෂූන් වහන්සේට ද දිව්‍යඔජසින් යුක්ත වූ බදලතා[3] කොළ පමණක් ම එළවීය; ඒ භික්‍ෂූන් වහන්සේ ද එයින් ම ආහාර කෘත්‍යය නිමවා මඳක් සැතපී දිව්‍යපුත්‍රයාහට "මහා පුරුෂය, යම්හ"යි වදළසේක. එතෙපුල් අසා දිව්‍යපුත්‍රයා "ස්වාමීනි, ඇමදෙනා වහන්සේ අද මාගෙන් ඉතා රළු වූ බදලතා[3] කොළ පමණක් ම අනුභව කළසේක. මාගේ යහළු වූ එක් දිව්‍යපුත්‍රයෙක් ඇත; ඒ දිව්‍ය පුත්‍රයා දවසක් ඇර දවසෙක දිව්සෙනහ පිරිවරා මෙතනට අවුත් තමාගේ දිව්‍යමහිමය දක්ව දක්වා දිව්‍යමය අන්නපානාදිය අනුභව කරන්නේය; මෙතෙක් කල් සේ ම එන්නේ වී නම් සෙට දවස් ඒ දිව්‍යපුත්‍රයාණන් එන දවස ය; උන් ආ කල උන්ගේ ඓශ්චර්‍ය්‍යයත් දක ඇමදෙනා වහන්සේ දිවඅහර වළඳා වඩනේ යහපතැ"යි ආරාධනා කෙළේය. භික්‍ෂූන් වහන්සේ ද ඒ දිව්‍යපුත්‍රයාගේ ආරාධනාව ගිවිස එ තැන්හි රැඳුණුසේක. ඉක්බිති ඒ රාත්‍රිය පහන් වූ කල්හි ඔහුගේ යහළු දිව්‍යපුත්‍රයා තමාගේ දිව්‍යසේනාව හා සමඟ ඔහු සමීපයට අවුත් වන. ඒ දිව්‍යපුත්‍රයා හා දිව්‍යසේනාව අනුභව කරන පිණිස දේවතාවෝ දිව්‍යමය යාගු භාජන අල්වාගෙන

1. විශේෂ - BCDEGHJ
2. අභිප්‍රාව ය - BCDEGH
3. බදලතා -D
හදලතා -BGH

Non-Commercial Distribution

තුන් ගවු පමණ මහදිග අවසර නොහැර පිළිවෙළින් සිටගත්හ. එකල්හි ඒ දිව්‍ය පුත්‍රයා දිව්‍යයාගු ආදිය ගෙන්වා ගෙන තෙරුන් වහන්සේ වඩා හිඳුවා දිවඔජසින් යුක්ත වූ කැඳ අවුළු වළඳවා පසුව තුමූ තමන්ගේ දිවසෙනඟ හා සමඟ කැඳඅවුලු අනුභව කෙළේය. පසුව වළඳන වේලාවට අතුරෙහි දිව්‍යමය උඳු මුං තල ලාලු අතිරස අත්ගලා ඇඹිටි පූ පුලුබ්බදරා ආදි වූ කන බොන දෑ ඇරගෙන පළමු පරිද්දෙන් ම තුන් ගවු පමණ තන්හි හිවී ගැවසී සිටගත්හ. ඒ සියල්ල ද පළමු පරිද්දෙන් ම හිමියන් වහන්සේ වළඳවා තුමූ හැමදෙන[1] අනුභව කළහ. ඊට ඉක්බිති ව වේලා ආසන්න වූ කල්හි දිව්‍යමය අනෙක ප්‍රකාර වූ සූප ව්‍යඤ්ජනාදීන් යුක්ත වූ දිවබොජුන් භාජන හැරගෙන පළමු පරිද්දෙන් ම තුන් ගවු පමණ තැන අවසරයක් නැති ව සිටගත්හ. ඒ ආහාරය ද දිව්‍යපුත්‍රයා තෙරුන් වහන්සේ වළඳවා සත්කාර සම්මාන කොට පිරිවර හා සමඟ තෙමේ අනුභව කෙළේය. මෙසේ ආහාර අනුභව කළ ඉක්බිති ඔහු පිරිවර දෙවතාවෝ ඒ දිව්‍යපුත්‍රයා හාත්පසින් පිරිවරා සිට නෘත්‍ය ගීත වාද්‍යාදියට පටන් ගත්හ. එකල තෙරුන් වහන්සේ ඒ දිව්‍යපුත්‍රයාගේ මහත් වූ දිව්‍යෛශ්වර්‍ය්‍යය දක විස්මය පත් ව ඔහු පූර්වජාතියෙහි කළ කුශලකර්මය කවරේ දැයි විචාරන සේක්:

දෙවිද්ධිපත්තො 'සි මහානුභාවො
වණ්ණෙන ච තෙ සබ්බ දිසා පභාසති,
දිබ්බා ච පරිසා පරිවාරයන්ති
නානායුධා[2] චාමර මොර හත්ථා.

සුරඞ්ගනා රඞ්ගගතා සමන්තා
නච්චෙහි ගීතෙහි සමංගිභූතා
නච්චන්ති ගායන්ති ලයා විදුත්තං
සවනාමතං ගීතමුළාර වණ්ණා.

පග්ගය්හ වීණාදි සවංස තන්ති
නාතික්කමං තනන්ති සරං සරෙන
සමජ්ජ මජ්ඣම්හි ච කාචි කඤ්ඤා
ලයන්තියො තං[3] පරිතොසයන්ති.

භෙරී මුතිඞ්ගා මුරජා ච දෙණ්ඩිමා
සඛා ච නෙකා සුසිරාදයො ච;
පග්ගය්හ වාදෙන්ති පහට්ඨරූපා
නච්චන්ති කීළන්ති ජනා අනෙකා.

දිබ්බන්නපානෙහි සුපුණ්ණ සොණ්ණ
මයාදි නානාවිධ භාජනානි,
පග්ගය්හ තිට්ඨන්ති තිගාවුතස්මිං
ත්වං තෙන මොදෙසි සපාරිසජ්ජෙ.

---

1. හැම ද - BEGH
2. නානාවුධා - ABCEHJ
3. ලසන්තියො -ACE

Non-Commercial Distribution

පුච්ඡාමි තෙ දෙව මහානුභාව
මනුස්සභූතො කිමකාසි පුඤ්ඤං,
කිං තෙ වතං කිං පන බ්‍රහ්මචරියං
කිස්ස සුචිණ්ණස්ස අයං විපාකො

යනාදීන් "එම්බා දිව්‍යපුත්‍රයාණෙනි, තෙපි මහත් වූ දිව්‍යසෘද්ධියට පැමිණිය ව; මහත් වූ ආනුභාව ඇතියව; තොපගේ ශරීර වර්ණය හිරු දහස් සඳ දහස් නැංගා සේ දසදිගුන් බබුළුවා එකාලොක ව සිටිනේය. තව ද කඩු පලිස දුනු හී පලඟ පත්තිරම් ඉට්ටි මිට්ටෙරු ආදි වූ දිව්‍යායුධ සමූහයන් ගත්තාවූ දිව්‍යභටයන් හා එසේ ම කුඩ කොඩි සේසත් පිල්කඹ සෙන් සෙල්[1] විසිරිපත් වාරුචාමර මයුර හස්තාදි වූ[2] අනෙකප්‍රකාර අලඞ්කාර භාණ්ඩයන් ගත්තාවූ දිව්‍යසෙනාව මෙසේ තොප පිරිවරා සිටිති. තව ද නානා වර්ණ දිව්‍යවස්ත්‍ර දිව්‍යාලඞ්කාරයෙන් සැරහුණාවූ දිව්‍යාඞ්ගනාවෝ හාත්පස රඟමඬුලු බැඳ[3] නෘත්‍ය ගීත වාද්‍යයෙහි නියුක්ත වූවාහු එක්සිය විසි ලයින් අනපෙත වූ ගායනා නාද කෙරෙමින් කර්ණාමෘත නම නමා තොප සිත් සනහමින් දෙනුවන් පිනව පිනවා සමහරෙක් නටති, සමහරෙක් ගී කියති, සමහරෙක් ගායනා කෙරෙති. සමහර දිව්‍යාඞ්ගනාවෝ වීණාවේණු ආලවණ්ණි වඩිඟි වස්දඬු තනතිරි ආදිය ගෙන රඟ බැස නටමින් තමන්ගේ ගීතස්වරය හා තන්ත්‍රස්වරය නොඉක්මවා එක නියාවට ගී කිය කියා ගායනා කෙරෙමින් නොයෙක් ලීලා විලාස දක්ව දක්වා තොප සන්තොෂ කරවති. තව ද නොයෙක් සියදහස්ගණන් දිව්‍යපුත්‍රයන් හා දිව්‍යාඞ්ගනාවෝ නානාලඞ්කාරයෙන් සැරහී මහබෙර පොකුරු බෙර මිහිඟු බෙර මුරජ දෙණ්ඩිමාදින් හා ආතතය විතතය විතතාතය ඝනය සුශිරය යනාදි වූ භෙරිතූර්‍යභාණ්ඩයන් ගෙන සතුටු සතුටු ව සමහරෙක් නටති, සමහරෙක් කෙළිති, සමහරෙක් බෙරගසති, සමහරෙක් ගී කියති. තව ද දිව්‍යමය වූ අන්නපාන ඛජ්ජ භොජ්ජ ලෙය්‍ය පෙය්‍ය සායනීයය යි කියන ලද නානාප්‍රකාර කන බොන දෑ ආදියෙන් පිරුණාවූ රන්භාජන ගත් දිව්‍යසෙනාව ම තුන්ගවු පමණ තන්හි අතුරු නොදී වතුරක් සේ සිටිති. පිරිවර හා සමඟ තෙපි එයින් ම සනතුෂ්ට ව ප්‍රීතින් පින පිනා සිටුව. එම්බා මහත් වූ ආනුභාව ඇති දිව්‍යපුත්‍රයාණෙනි, තොප අතින් ම විචාරම්හ. පෙර මනුෂ්‍යලොකයෙහි ඉපද කවර කුශලයක් කළා ද, තොප රක්‍ෂා කළා වූ කවර ශීලයෙක කවර බ්‍රහ්මචර්‍යයෙක කෙසේ වූ ව්‍රතසමාදනයෙකින් ලද්දවූ විපාකයෙක් ද"යි විචාළසේක. එසේ විචාළ තෙරුන් වහන්සේට ඒ දිව්‍යපුත්‍රයා තමා අතීත ජාතියෙහි සෑගිරිවෙහෙර මහණ ව වසනකල තමහට වසගින් පැමිණි ආහාරයෙන් භාගයක් සඞ්ඝයාවහන්සේට දන් දී ඒ කුශලබලයෙන් මේ දිව්‍ය සම්පත් ලදිමි යි ප්‍රකාශ කොට දක්වනුයේ:

ලඞ්කාතලෙ මිස්සක පබ්බතොති
පසිද්ධනාමොසි මහා විහාරො,
බහූහි ථූපෙහි විරොචමානො
මුනින්ද බිම්බාලයපන්ති යුත්තො.

---

1. සෙන්කොල් - BEGH
2. හස් චාමරාදී වූ - BH
3. බැස - D

Non-Commercial Distribution

විභූසිතො බොධි මහීරුහෙහි
විරාජිතො සෙතක මාලකෙහි
සුඵුල්ල සීතොදක සම්පපුණ්ණ
සමාකුලානෙක ජලාසයෙහි.

විසාධිකෙ සත්තසතෙ සමන්තා
අධිකෙහි ජබ්බීස සතෙහි සත්ත,
පරිවෙණපන්තීහි සුදස්සනීයො
පීතිං පවඩ්ඪෙති සද ජනානං.

තහිං වසන්තා යතිරාජ පුත්තා
සුපෙසලානෙක ගුණාධිවාසා,
කතාදරා සබ්බජනෙහි සම්මා
කරොන්ති අත්තත්ථ පරත්ථසිද්ධිං.

අහං භදන්තා දුතියත්තභාවෙ
තහිං තදෙකො සමණො අහොසිං,
සද්ධාධුරං සීලධුරං වහන්තො
පටිපත්තියා[1] වත්තුතයං මහන්තො.

තතො 'පරස්මිං සමයෙ මහාජනා
උද්දිස්ස භික්ඛූ සමුපානයිත්වා,
සුචිං පණීතං පචුරන්නපානං
භොජෙන්ති භික්ඛූ සුමනා සහත්ථා.

අහම්පි ලද්ධා පටිවිංසකං මෙ
සඞ්ඝස්සුපඩ්ඪං අදදිං තතොපි,
ඵලම්පි දනස්ස ච සද්දහන්තො
බුද්ධානුභාවං මනසී කරොන්තො.

මමිදං පදනං මමිදං වතං තං
අනෙන පුඤ්ඤෙන මයා කතෙන,
තතො චුතො භුම්මදෙවෙසු ජාතො
භුඤ්ජාමහං දෙවසිරිං අනූනං.

යනාදීන් "ස්වාමිනි, ලංකාද්වීපයෙහි මිස්සකපර්වතය යි ප්‍රසිද්ධ වූ මිහින්තලාගල මහත් වූ විහාරයෙක් විය. ඒ විහාරය තුන්සිය සැටක් පමණ වූ ධාතුගර්භසමූහයකින් ප්‍රතිමණ්ඩිත ය. එසේ ම විචිත්‍ර චිත්‍රකර්මාන්තයෙන් හොබනා සියගණින් ප්‍රතිමාගෘහ පඞ්ක්තීන් යුක්ත ය. මහත් වූ බොධිවෘක්ෂපඞ්ක්තීන් සැරහුණාවූ අතිධවල වැලිමලු පෙළින් විරාජමාන ය. සුපුෂ්පිත පද්මොත්පල පුණ්ඩරීකාදීන් ප්‍රතිමණ්ඩිත වූ සිහිල්

1. පටිපත්තිනා - පිටපත් හැම

Non-Commercial Distribution

දියපිරි සියගණන් පොකුණු පතැස් ආදීන් ගැවසී ගන්නේය. තව ද එක්දහස් සාරසිය සතලිස් සයක් පමණ පිරිවෙන් ගෙවල් පඞ්කතීන් අතිශොභමාන ව දර්ශනීය වූ ඒ විහාරය දුටු දුටු යම් ම කෙනකුන්ට සතුටු සොම්නස් එළවයි; එහි වසන්නාවූ අල්පෙච්ඡතාදි ගුණොපෙත ප්‍රතිපත්ති සාර වූ දෙළොස් දහසක් පමණ මහ සඞ්ඝයා වහන්සේ ශ්‍රද්ධාවන්‍ත මහජනයා විසින් ආදර සහිත ව එළවන ලද සිවුපසය පිළිගෙන ඔවුන්ට කුසල් වැඩවීමෙන් හා සිල්වත් ව ධ්‍යාන භාවනා කොට මාර්ගඵල ඉපදවීමෙන් ස්වාර්ථපරාර්ථ දෙක සිද්ධකරනසේක[1] ස්වාමීනි, මම මීට දෙවන ජාතියෙහි ඒ විහාරයේ වසන්නාවූ භික්‍ෂූන් වහන්සේ අතුරෙන් එක් මහණෙකිමි. එකල ශ්‍රද්ධාවන්ත ව අඛණ්ඩශීලය රක්‍ෂා කොට ප්‍රතිපත්ති පිරීමෙන් තුනුරුවන්ට පූජා කෙළෙමි. නැවත මෑතභාගයෙහි ශ්‍රද්ධාවන්‍ත මහජනයන් විසින් සංඝයා වහන්සේ උදෙසා එළවනලද අතිපවිත්‍ර උතුම් වූ බොහෝ වූ අන්‍නපාන ආදියෙන් මට පැමිණියාවූ කොටඨාසය දෙකක් කොට එයින් භාගයක් සැදැහැයෙන් ආදර සහිත ව සංඝයා වහන්සේට දන් දිනිමි. එකල්හි දුන්නාවූ ඒ දානයෙන් හා රැක්කාවූ ශීලව්‍රතාදියෙහි අනුසසින් මෙසේ වූ බුමාවූ දෙවියන් කෙරෙහි ඉපද පවා මෙබඳු ආශ්චර්‍ය්‍යමත් වූ දිව්‍ය සම්පතක් විඳින්ට පටන් ගත්මි. ස්වාමිනි, සැදැහැයෙන් සිල්වතුන්වහන්සේට දුන්නාවූ ඉතා ස්වල්ප දානයෙක් වී නමුත් මහත් වූ විපාක දෙන්නේ මය. කුමක් මෙන් ද යත්? යම්සේ සරුකෙතක වපුරනලද ස්වල්ප බීජුවටෙක් වී නමුත් ක්‍ෂෙත්‍රය යහපත් හෙයින් බොහෝ ශස්‍ය ඵලදෙමින් ගොවියා සතුටු කරවා ද; එපරිද්දෙන් ම සිල්වතුන් වහන්සේට දෙනලද්දවූ දානය ස්වල්ප වී නමුත් දෙන්නාවුන්ගේ චිත්තශුද්ධි වස්තුශුද්ධි දෙකින් හා පිළිගන්නා දක්ෂිණෙය්‍ය පුද්ගලයන්ගේ ක්‍ෂෙත්‍රශුද්ධීන් බොහෝ විපාක දෙන්නේය"යි මෙසේ ඒ දිව්‍යපුත්‍රයා තමා පූර්වජාතියෙහි කළ කුසල් හැම ප්‍රකාශකොට කී කල්හි භික්‍ෂූන් වහන්සේ ඔහුගේ බස් අසා විස්මයපත් ව ගිය ගිය තන්හි ඒ දිව්‍යපුත්‍රයා කළ කුසලය හා එයින් ලද්දවූ සම්පත්ති විශෙෂය ප්‍රකාශ කොට කියමින් බොහෝ දෙනා දාන ශීලාදී වූ කුශලධර්මයෙහි යොද වදළසේක.

මෙසේ යහපත් බිම් බලා ගොයම් කොට බොහෝ ශස්‍යඵල ලබන්නාවූ ගොවීන් මෙන් කුසල් කරන්නාවූ නුවණැති ශ්‍රද්ධාවන්තයෝ තුමූත්[2] සිල්වත් ව සිට දැහැමින් ලද්දවූ දෙය්‍යධර්මය කම් පල අදහා සිල්වතුන් වහන්සේට දුන් හෙයින් එබඳු ආශ්චර්‍ය්‍යමත් වූ දිව්‍යසම්පත්තියක් ලදහ; එබැවින් පින්වත්සත්වයන් විසින් ආලොපයක් පමණ ආහාරයක් වී නමුත් සිල්වතුන් වහන්සේට සාදරසිතින් දන් දී ආදර සම්භාවනාවෙන් එම දානමය කුශලය වඩ වඩා දියුණුකොට ගෙන මතු දිව්‍යමනුෂ්‍ය සම්පත් හා නිවන් සම්පත් ලබන්ට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි:-

එවං හො හො කුසලනිරතා ඛෙත්තමොයලොකයිත්වා,
දත්වා බීජං අණුමපි අහො'නප්පභොගං ලභන්ති,
ලද්ධානෙකං කබලමපි හො හන්ති නිත්‍යා සුසීලෙ,
දත්වා භොගං දිවිජ මනුජං අස්ස භාගී සිවං ච-යි.

මේ මෙහි දෙවන
සුමණගාම වස්තුව ය.

---

1. වර්ධන කරනසේක. - BGH
2 තමුන් - BEGH.

Non-Commercial Distribution

තව ද මෙහි තුන්වන නාගාවස්තුව නම කවර යත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්:

මෙම ලඞ්කාද්වීපයෙහි දිව සත්රුවනින් විසිතුරු වූ පවුරුපදනමින් හා උදාන විමානාදීන් සශ්‍රීක ව එක මඟුල් ගෙයක් සේ සශ්‍රීක වූ දිව්‍යනාගයන්ට වාසස්ථාන වූ නාගභවන තුනෙක් වීය. එයින් වඩුන්නාගල නාගභවනයෙහි තිස්කෙළක් නයින්ට නායක වූ චූළොදර නම් නාරජෙක් වෙසෙයි. කැලණිගඟ නාගභවනයෙහි විසිකෙළක්[1] නයින්ට නායක වූ මණිඅක්ඛික නම් නා රජෙක් වෙසෙයි. මණිනාග දිවයින සමුද්‍ර නාගභවනයෙහි තිස් කෙළක් නයින්ට නායක වූ මහෝදර නම් නාරජෙක් වෙසෙයි. මේ තුන් පක්‍ෂයෙහි නයින් ම ඔවුනොවුන් හා නොවෙනස් ව අන්‍යොන්‍ය සම්බන්ධයෙන් බන්ධු ව වසන්නාහු මහොදර නාරජහුගේ දුවක චූළොදර නාරජහට පාවා දෙන දවස් සත්රුවනින් විසිතුරු වූ ඉන්ද්‍රනීලමාණික්‍යමය මාහැඟි මිණිපළඟක් දයාද කොට දුන්හ. පසු ව ඒ නාගකන්‍යාව මළ හෙයින් චූළොදරය මහොදරය යන මයිල් [බෑන][2] නාරජහු දෙදෙන ඒ මිණිපළඟ නිසා බසින් බස් ව කලහ වඩා දෙදෙන ම තම තමන්ගේ සෙනාවාහන සරහාගෙන වහසි බස් බෙණෙමින් යුධයට දපුණහ. එකල වඩුන්නාගල නාගභටයෝ කල්පාන්තවාතයෙන් හැළලී ගිය මහාසමුද්‍රය සේ ක්‍රොධයෙන් ඇළලී නාගදිවයින නයින්ට වහසී කියා "එම්බල කොල, දියබරණුන් සේ දියෙහි වසන නාගවෙටකයිනි, තෙපි හැම කවර කටයුත්තකින් අප හා සමාන වවු ද; වඩුන්නාගල නාග භටයෝ ශෞර්‍ය්‍යවීර්‍ය්‍ය පුරුෂබල පරාක්‍රමයෙන් යුක්තයෝය යි යන කීර්තිඝොෂාව තොප හැමට නොඇසිණි ද; ධනධාන්‍ය සම්පත්තීනුත් අපි ම වැඩියම්හ; යසෝ තෙජසිනුත් අපි ම වැඩියම්හ; පරිවාර සම්පත්තීන් අපි ම වැඩියම්හ; කායබලයෙනුත් ඍද්ධිබලයෙනුත් අපි ම වැඩියම්හ; අප හැම කඩුපලඟ අත ලා යුධයට වන් විට තොප හැම හිරු දුටු කදෝපැණියන් සේ නිෂ්ප්‍රභා ව හයින් බිඳී ඒ ඒ අත දිවන බව තෙපි ම දක්නාවා ද" යනාදීන් බණන්ට පටන් ගත්හ. උන්ගේ වහසිබස් අසා නාගදිවයින වසන නාගභටයෝ ද කිපී ගර්ජනාකොට වඩුන්නාගල නයින් භයගන්වා අත්පොළසන් දෙමින් පිටිතොල දත් කකා සැහැසෙමින් "එම්බල ගල වසන නාගයෙනි, මහත්කොට කුංචනාද කෙරෙමින් ඒ ඒ අත දිවපැන පැළඹෙන්නාවූ මහත් ඇත්පොවුවෝ කෙශර සිහරාජයන් ඉදිරියෙහි සිටිනා තබා ඔවුන්ගේ සිංහනාද ඇසූ පමණකින් ම කැනහිලුනුත් නොවටනා ව දප් සිඳී සැඟවෙන්නාහු මය; එපරිද්දෙන් ම දූත් එක්වගෙන කැනහිල් මූලකේ සේ මුරගා ඇවිදිනා තොප හැමගේ දප් මර්දනය කොට ඒ ඒ අත මරා ලුහුබඳවා මිසක් නොහරුම්හ"යි මෙසේ දෙසෙනග ඔවුනොවුන්ට සටා බෙණෙමින් අතින් ගන්නාලද කඩු පලිස් පලඟ පත්තිරම් ආදි වූ නානාප්‍රකාර ආයුධ සමූහයන් එක පැහැර ලෙලව ලෙලවා පිට පිට පහරනා මහ පවන් වෙගයෙන් සැලි සැලී මුහුද රළපෙළ දිවන්නා සේ විටින් විට වඩ වඩා ක්‍රොධ වසඟ ව පැන පැන ඉදිරියට දිවෙමින් වහසි කිය කියා සටනට සැරහී දෙසෙනග දෙපිට ඈනි ලා සිටගත්හ. කියනලද මැයි:

1. කෙළක්. - BEGH
2 දෙමයිල් - පිටපත් හැම

Non-Commercial Distribution

ඉති තදුභය සෙනා ඝට්ටයන්තා'ඤ්ඤමඤ්ඤං
විවිධ පහරණෙසා උග්ගිරන්ති ගිරන්ති
සතත බ්‍රුහිත වෙලා සාගරූමිව හන්තා
ලුළිත ලුළිත චිත්තා යුද්ධනින්නා ධීතාසුං-යි.

එකල අප බුදුහු බුදු වූ පස්වන හවුරුදු බග අවපසළොස්වක් දවස් අලුයම් වේලෙහි සමාපත්තීන් නැගී මුළුලොව බලා වදාරනසේක් එදවස් ඒ නායින්ගේ යුද්ධයෙක් වී නම් බොහෝ නායින් නස්නා සේ දැක ඔවුන් කෙරෙහි උපන්නාවූ මහා කරුණාවෙන් උදසන්හි ම දෙව්රම් වෙහෙරින් නික්ම කැටිව ගමනට සුදුසු කෙනෙකුන් පරීක්‍ෂා කරනසේක් එම වෙහෙර වහසල්දෙර සමීපයෙහි පිහිටි කිරිපලුරුක අරක් ගත් සමිද්ධිසුමන නම් දිව්‍ය පුත්‍රයා දැක ළහට කැඳවා "අප හා සමඟ ලක්දිවට ගොසින් පළමු ජාතියෙහි තොප විසූ තන්හි ම වාසය කරව"යි වදළසේක. එසේ වදළේ කුමක් පිණිස ද යත්:

ඒ දිව්‍යපුත්‍රයා නම් ඊට තුන්වන ජාතියෙහි මණිනාගදිවයින නාමගොත්‍රයෙන් අප්‍රසිද්ධ වූ එක්තරා මනුෂ්‍යයෙක; එකල්හි ගන්ධමාදන පර්වතයෙහි වසන්නාවූ පසේබුදු කෙනෙකුන් වහන්සේ අහර සිඟා ගෙනවුත් මණිනාග දිවයින දැන් කිරිපලුරුක පිහිටි තැන වැඩහිඳ අහර වළඳනසේක. එකල්හි ඒ මනුෂ්‍යයා පසේබුදුන් වහන්සේ දැක ඔබගේ තපොවිලාසයෙහි පැහැද පාත්‍රය ශොධන්ට කොළ කඩා ගෙනවුත් දින. පසුව ඒ මනුෂ්‍යයා එපමණ පින් කමින් එයින් චුත ව දෙව්ලොව ඉපද බොහෝ කාලයක් දිවසැපත් වළඳ එයින් අවුත් අප බුදුන් සමයෙහි දෙව්රම් වෙහෙර වහසල් දෙර සමීපයෙහි පිහිටියාවූ කිරිපලුරුක දිව්‍යපුත්‍ර ව උපන. එසේ හෙයින් "බුදුහු මේ දිව්‍යපුත්‍රයා තමා වසන කිරිපලුරුක මුලිනුදුරා මා සිරසට සෙවණ කොට අල්වා ගෙන එක් ව ගියේවිනම් ගියජාතියෙහි මොහු විසූ දිවයින ම මෝහට වාසස්ථාන වෙයි; දිව්‍යනාගයන්ට හා මනුෂ්‍යයන්ට ද බොහෝ කුසල් පිරෙන්නේය" යි සිතා ඒ දිව්‍යරාජයා කැඳවා "අප හා සමඟ ලඞ්කාද්වීපයට එව, ගියදවස තොප විසූ මණිනාග දිවයින භූමිප්‍රදේශයෙහි ම මේ තොප වසන භවනය හා සමඟ තොපට පිහිට වෙයි. නාගරාජයන්ට ද බොහෝ අභිවෘද්ධි වන්නේය" යි වදළසේක. කියන ලද මැයි:

අථ මුනි සුමනං තං දෙවමාමන්තයිත්වා
ඉදමවච මයා හො සද්ධිමාගච්ඡ ලඞ්කං
සහ තව භවනමෙහා පුබ්බවුත්ථප්පදෙසෙ
තව භවති පතිට්ඨා භොගිනං චාභිවුද්ධිං -යි.

මෙසේ බුදුන් වදළ වචනය අසා සමිද්ධිසුමන නම් දව්‍යපුත්‍රයා තමන් වසන එකිරිපලුරුක මුලිනුපුටා බුදුන් සිරසට ඡායාවන සේ අල්වාගත: බුදුහු මහ මේකුළක් මැද දිලියෙන සහස්‍රකිරණයා සේ සවණක් රසින් දිලිහි දිලිහී මණිනාග දිවයින් වැඩ යුද්ධයට සැරහී සිටි දෙසෙනඟ මධ්‍යයෙහි අහස වැඩහිඳ නාගරාජයන්ගේ දප් මදිනය පිණිස වැයි සුළං සීත සහිත වූ අති භයානක ගණඳුරක් මවා සියලු නාගසෙනාව

එකපැහැර ගයින් නැතිගන්වා එම විගස අඳුරු දුරුකොට හිරුදහස් සඳදහස් නැංගා සේ සියලඟ රසින් දසදිග් බබුළුවා නාගසෙනාවට තමන් වහන්සේ දක්වූසේක.

එකල නාගරාජයෝ හිරුරස් කලබක් මෙන්[1] බබළන්නාවූ කෙතුමාලාලංකාරයකින් හා අමෘතරශ්මීන් විහිදුනා චන්‍ද්‍රමණ්ඩලයක් හා සමාන වූ මුඛමණ්ඩලයකින් හා අනන්‍යසාධාරණ වූ ද්වාත්‍රිංශද්වර මහා පුරුෂ ලක්‍ෂණාශීත්‍යානුව්‍යඤ්ජන ලක්‍ෂණයෙන් ප්‍රතිමණ්ඩිත වූ ශරීරශ්‍රී ශොභාවකින් හා නානා වර්ණයෙන් වටා සිට ගත්තාවූ ඛ්‍යාමප්‍රභා මණ්ඩලයෙන් පිරිවරන ලදු ව සවනක් රස් විහිදුවමින් අහස වැඩඋන්නාවූ බුදුරජාණන් වහන්සේ දැක එකෙණෙහි උපන්නාවූ අනන්ත සන්තොෂයෙන් පිනා බුඩ පූජාවට ඉස්නා නන් කුසුම රාශියක් මෙන් අතින් ගත් ආයුධ හෙළා දෙහොත් මුදුන් දිදී වඳිමින් මුදුනෙහි තබන ලද රතකුල් තල නමැති රත්නෙලුම් පුද පුද සතුටු සතුටු ව බුදුන් දශාවට[2] යොමු කරනලද රන්වන් මුහුණු නමැති රත්පියුම් තන තනා තිල්නුවන් නමැති තිලිපුල් සමඟ කඩුපුල්මල් පුදමින් තමන් තමන් ධරා සිටි නානා වර්ණ ධජ පතාක නංවමින් සන්තාන හමැති මල්මිටි ගෙන ඉසිමින් සපු දුනුකෝ දැසමන් ආදි වූ නන් කුසුම් වර්ෂාවන් එක පැහැර වස්වමින් උතුරු සළු ගළවා දමමින් ලක්‍ෂසුවහස්ගණන් පහන් දල්වමින් නානාවර්ණ ධජපතාක නංවමින් අනෙකප්‍රකාර හෙවිතුයධ්වරාවයෙන් එකකොලාහළ කරවා පූජාවට පටන්ගත්හ.

එකල මඳ මඳ පවනින් ලෙලදෙන රත්ලිය ලීලාවට අපහාස්‍ය කරන්නාවූ මනහර රූපවිලාස ලීලා ඇති නාගාඞ්ගනාවෝ තම තමන්ගේ ලීලොපෙත වූ ඝනහාර නමැති දහස්ගණන් කලස මාලාවන් ධරා නාගභවනයෙන් පිටත්ව ඒ ඒ තන්හි මුළු මුළුව සිට "ශාක්‍යකුලතිලක, ශාක්‍යකුලකෙතු, ශාක්‍යකුලකල්පද්‍රුම දෙවාතිදෙව, ශක්‍රාතිශක්‍ර, බ්‍රහ්මාතිබ්‍රහ්ම, වාදීභසිංහ, පරදුඃඛදුඃඛිත, කරුණාප්‍රවාහක, ශරණාගත වජ්‍රපඤ්ජර" යනාදීන් කරන ලද ස්තුති ඝොෂාවෙන් දශදිගන්තය එකකොලාහළ කරවා සාධුක්‍රීඩාවට පටන්ගත්හ. කියන ලදුයේ මැයි:

තරුණතරුණිසොභං කෙතුමාලාවිලාසිං
සුහරුචි මුඛචන්‍දං ලක්ඛණාකිණ්ණගත්තං
තිභව විභව දයිං තං විදිත්වාන නාගා
ධුත පහරණ හත්‍ථා වන්‍දමානා මහිංසු.

සිරසි නිහිත පාණී රත්තපඞ්කරුහෙහි
විකච වදන නෙත්තා මන්‍දකණ්ඩුප්පලෙහි,
සක සක ධුත නානා වණ්ණවම්මාදිකෙහි
විවිධ කුසුම වත්‍ථා වන්‍ද දීපං ධජෙහි.

උරග භවන වාසා නාගකඤ්ඤා සමග්ගා
කුච කලස සහස්සං ධාරයන්තා සලීලං,
ලලිත කණක වල්ලී ලීල මාදන්ත ගත්තා
ථුතිමුඛමුපෙතා සාධුකීලං අකංසු-යි.

---

1. සේම - AC
2. දිශාවට - ACJ.

Non-Commercial Distribution

මෙසේ නාමෙණෙවියන් හා නාගාඞ්ගනාවන් එකපැහැර පූජාවට පටන්ගත් කල්හි අමාවැස්සක් වස්වන්නා සේ අප බුදුහු මධුර ස්වර විහිදුවා ධර්මඝොෂා පැවැත්වීමෙන් දෙසෙනග සමහ කරවා එකල පමහ සතුටු වූ නාරජුන් විසින් දෙනලද මිණිපලඟ පිළිගෙන දෙව්ලොවින් බස්නා දිව්‍යවිමානයක් මෙන් දිලිහි දිලිහී අහසින් බැස මිණිපලඟ මත්තෙහි වැඩහිඳ නාරජුන් එළවූ දිවබොජුන් වළඳ භොජනාවසානයෙහි අනුමෙවුනි බණ දෙසා සටනට එක්වූ අගණිත නාගයන් අතරෙන් අසූකෙළක් නයින් ශරණශීලයෙහි පිහිටුවා මිණිපලඟ හා සමග කිරිපලුරුක පාරිභොගික ධාතු කොට වැඳ පුදන සේ නාරජුන්ට පාවා දී "එම්බා නාගරාජයෙහි, මාගේ මේ පාරිභොගික වූ මිණිපලඟ හා කිරිපලුරුක, තොප දිවි පමණින් සත්කාර සම්මානකොට වැඳ පුදව[1] මෙම තොපට මතු සගමොක් සැපත් සාධා දෙන්නේය" යි වදළසේක. කියනු ලද මැයි මහාවංශයෙහි:

තෙ ජලට්ඨ ථලට්ඨ ච - භුජඞ්ග 'සීති කොටියො,
සරණෙසු ච සීලෙසු - පතිට්ඨාපෙසි නායකො.

තංචාපි රාජායතනං - පල්ලඞ්කංච මහාරහං,
අප්පෙසි නාගරාජූනං - ලොකනාථො නමස්සිතුං.

පරිභොගං චෙතියං මය්හං - නාගරාජා නමස්සථ,
තං භවිස්සති වො තාතා - හිතාය ච සුඛාය ච-යි.

මෙසේ ධර්මදෙශනා කොට දෙසෙනහ සමහ කරවා සමිද්ධිසුමන නම් දිව්‍යපුත්‍රයා ඒ කිරිපලුරුක හා සමග එ තැන්හි ම පිහිටුවා දෙව්රම් වෙහෙරට වැඩිසේක. නාරජහු එතන චෛත්‍යයක් කොට නිරන්තරයෙන් වැඳපුද සත්කාර කෙරෙමින් විසූහ. බුදුන් පිරිනිවි පසු මනුෂ්‍යයෝ එතන මහත් දගබක් කළහ. ඒ දුන් දක්වාත් රාජායතන චෛත්‍ය යයි ප්‍රසිද්ධ වීය.

මේ රාජායතන චෛත්‍යයෙහි උත්පත්ති කථාව ය.

එක් සමයෙක ලංකාද්වීපවාසී වූ සඟ සැටදෙනකු වහන්සේ සමනොළ කැලණිය ආදී වූ සිද්ධස්ථාන වැඳපුද ඇවිදිනාසේක් මණිනාග දිවයින ඒ රාජායතන නම් වූ දගබ වඳනා කැමැති ව අතරමඟ විහාර වඳිමින් ක්‍රමයෙන් නාගදිවයිනට වැඩ රාජායතන චෛත්‍යය වැඳපුද එතැන්හි ම සැතපී දෙවන දවස් උදයන්හි සිරුරු පිළිදඟ කළ මනා එන් සපයා වැඳ පුද ඉක්බිති ගැටවවූ ගන්වා ගමට පිහා වැඩ එක ගෙයකිනුත් අහරක් නොලත් හෙයින් පාත්‍රා සේධූ වන ඇරගෙන ගමින් පිටත්වූසේක.

එකල්හි එගම කහවණු සැටකට දසී ව එක් කුලගෙයක වසන්නාවූ නාගා නම් ගැහැණියක් කළයක් ගෙන පැනට යන්නී ගම්දෙර සිටි ඒ භික්ෂූන්වහන්සේ දක සමීපයට එළඹ පසඟ පිහිටුවා වැඳ "ස්වාමිනි, අහරක්[2] ලද්දේ ඇද් ද"යි විචාළිය; එබසට භික්ෂූන්වහන්සේ "උපාසිකාවෙනි තුව ම පෙරවරු ම වේ ද"යි වදළසේක.

1. සම්මානකොට පුදව - BE
2. අහර - BGH

Non-Commercial Distribution

එබසින් කිසිවක් නොලත් බව දැන දෙම්නස් ව ඒ ගැහැණි "කවර උපායකින් මේ හැමදෙනාවහන්සේට දනක් දෙම් දේ හෝ"යි සිතා "පළමු මම කහවණුසැටක්[1] ණය ව දීගනනොහී දසී ව අනුන්ට දන් දවස්පතා මෙහෙ කෙරෙමින් සිටියෙමි; රෑ මෙහෙවර කරන සේ ගිවිස තව දසී ව වී නමුත් දන් දුන මැනවැ"යි සනිටුහන්කොට භික්ෂූන්වහන්සේ ඉදිරියෙහි කළය තබා "ස්වාමීනි, මේ කළය රත්රන් දකක් අගනේය, මා එන තෙක් මේ ඇමදෙනා වහන්සේට භාරය"යි කියා නොලස් ව එම තමා මෙහෙවර කරන කුලගෙයට දිවගෙන ගොස් "ස්වාමීනි, අනික් කහවණු සැටකුත් දුන මැනවැයි කිව. ඒ ගෙයි පුරුෂයා එබස් අසා "කිමෙක් ද පින්වතිය, පළමු ගත් කහවණු සැටට දසී ව මෙහෙවර කෙරෙමින් සිට නැවත කහවණු සැටක් ඇරගෙන කහවණු එක්සිය විස්සක් වූ කල කෙසේ දීගත එයි ද"යි කීය. එබසට ගැහැණි[2] "ස්වාමීනි, රනට පණමට[3] ලෝබ නොසිතුව මැනව, පළමු ගත් කහවණු සැටට දහවල් මෙහෙ කෙරෙමි; දැන් දෙන කහවණු සැටට රෑ මෙහෙ කෙරෙමි; මෙසේ රෑ දහවල් මෙහෙවරත් කොට කියයම් සැලැස්මකින් ණයත් ගෙවා ගන්මි; කහවණු සැටක් දුන මැනවැ"යි කිව. ඒ පුරුෂයා ද යහපතැයි ගිවිස එපවත් පතෙක ලියා ගෙන කහවණු සැටක් දුන්නේය. එකල ඒ ගැහැණි කහවණු සැට ඇරගෙන හැම් ගෙයක් පාසා ඇවිද එකි එකී ගෙයකට එකි එකී කහවණුවක් බැගින් දෙමින් කහවණු සැට ම දී දන් පිසවා පාත්‍රවල බහා අහර පිළිගන්වා ඒ දන් සපයා ගැන්මට තමා කළ උත්සාහ සියල්ල ම භික්ෂූන්වහන්සේට දන්වන්නාවූ උපසිකා නොම:

පාදෙ වන්දිය අය්‍යානං - පවක්ඛාමි පුණෝථ මෙ,
නත්ථි මෙ තාදිසී අඤ්ඤා - කපණිත්‍යෙන භූතලෙ.

ඉණං දතුමසක්කොන්ති - ඉණදසී අහොසහං,
අනාළ්හිකා අප්පභොගා - විහරාමි අබන්ධවා.

දනං දදන්ති අජ්ජාපි - රත්තිදසිත්තමාගමිං,
පරිභුඤ්ජන්තු අය්‍යා[5] මෙ-දින්නං දුග්ගත පාභතං.

යනාදීන් "ස්වාමීනි, ඇමදෙනාවහන්සේගේ ශ්‍රීපාදයන් භක්ති ප්‍රෙමයෙන් වැඳ දන්වමි; මා කියන්නක් ඉඳුරා ඇසුව මැනව; දුප්පත්කමින් මා හා සමාන ගැහැණියක් මේ පොළොනෙළෙහි නැත. පළමු ණයට ගත් කහවණු සැටක් දීගත නොහී ඉණදසී ව[6] වසන; හෙයින් මාගේ අන්කිසි වස්තුවක් තබා නෑසියකෙනෙක්වත් යටත් පිරිසෙයින් එක වේලෙක් පිස කාපියන්ට සාල්නැළියක් පමණකුත් නැති ව දුකසේ දවස් අරිමි, අද මේ දන් දෙන්නෙම් පවා පළමු දහවල් කරන මෙහෙවරත් කොට රෑත් මෙහෙවර කරන පරිද්දෙන් ගිවිස පතක් ලා කහවණු සැටක් ඇරගෙන

1. සැටකට - EGH
2. ගැහැණි කියන්නී - A
3. පණමට මෙහෙයට - ACJ
4. එගම - BEGH
5. අරියා - GH
6. ණයදසී - ABEGH

ඒ සියල්ල ම වෙනවෙන ගෙවලට දී දන් පිසවා දිනිමි. ස්වාමීනි, මාගේ මේ දුප්පත් දනය නපුරුය යි නොසිතා මිඩියට කරුණා කොට වැළඳුව මැනවැ"යි ආරාධනා කොට පසහ පිහිටුවා වැඳ කළය[1] ගෙන පැනට ගියාය.

භික්‍ෂූන්වහන්සේ ඒ ගැහැණියගේ බස් අසා විස්මය පත් ව ඒ ආහාරය ගෙන මහානාග[2] නම් බිල සමීපයෙහි මිදෙල් වනයට වැද ඉන් නායක සඞ්ඝ ස්ථවිරයන්වහන්සේ සෙසු ඇමදෙනා වහන්සේට ආමන්ත්‍රණය කොට "එම්බා ඇවැත්නි, මේ ස්ත්‍රියගේ දන නමැති බිජුවට වැපිරීමට තොප හැමගේ සිත්සතන් නමැති ක්‍ෂෙත්‍රය ශුධකරව මෙබඳු ශ්‍රධාවකින් දුන්නාවූ දනය සරාගී ව සදෙසි ව[3] සමෝහී ව සිට හිඳ නොවළඳව"යි වදරා අවවාදයක් දක්වනසේක්:

අම්හා මාතා න නො එසා - නෙවායං භගිනී ච නො,
න සස්සු සුණිසා එසා - න ඤාතී න ච සොහද.

සීලවන්තා ගුණවන්තා - සුබ්බතා යතයො ඉමෙ,
එතෙසං දින්නමප්පම්පි - අනන්තඵලදං සියා.

ඉති මන්ත්වාන සා දීනා - දළිද්දා පරකම්මිකා,
අත්තානං විකිණිත්වාන - දානමජ්ජමදසි නො.

පරිසොධෙම අත්තානං - ආකඞ්ඛන්තා මහප්ඵලං,
සරාගා තං න භුඤ්ජාම - අප්පහාත්වාන ආසවෙ.

යනාදීන් "එම්බා ඇවැත්නි, මේ ස්ත්‍රීතොම අපගේ කුඩාමවක් මැහැලි මවක් වැදූමවකුත් නොවෙයි. පිටබින්න බඩබින්නෙහි නැඟිණි බුහුනැණිකෙනකුත් නොවෙයි. නැන්දණි කෙනෙකුත් නොවෙයි; යෙහෙලි කෙනෙකුත් නොවෙයි; කුසෙහි හොත් කෙනෙකුත් නොවෙයි; එතෙකුදු උවත් මෙ ඇමදෙනාවහන්සේ සිල්වත් සේක, ගුණවත් සේක මනා වූ ව්‍රතසමාදන ඇති තපස්විවරයන් වහන්සේ ය; මෙබඳු තපස්වි වරයන්ට දුන්නාවූ දනය ඉතා ස්වල්පයෙක් වී නමුත් අපමණ වූ විපාක දෙන්නේ යැ"යි මෙසේ සඞ්ඝයාවහන්සේගේ ගුණධර්මය හා දනයෙහි විපාක සලකා ඉතා දිළිඳු ව මෙසේ අනුන්ගේ ගෙහි මෙහෙ[4] කෙරෙමින් සිට මේ ගැහැණිතොමෝ තමාට මෙලොවින් වන දුක් නොසිතා තොමෝ ම තමා විකොට අද අපට දන් දුන්නීයැ"යි මෙසේ නොයෙක් කාරණා වදරා "ඒ උපාසිකාවට මහාඵල මහානිසංස වනු කැමැති ව අපගේ ස්වසන්තානය ශුධකොට ගෙන මිස සරාගී සදෙසි සමොහී ව කාමාදි ආශ්‍රවයන් ප්‍රහීණ නොකොට හෙවත් රහත් නොව නොවළඳම්හ"යි කතිකා කොට එම මිදෙල්ල වනයෙහි ඒ ඒ තැන වැඩ හිඳ විදර්‍ශනා වඩා සිව්පිළිසිඹියා හා සමග රහත් බවට පැමිණිසේක. මෙසේ රහත් ව ඒ වනලැහැබ වසන වනදෙවතාවන් ලවා සාදුකාර දෙවමින් වැඩහිඳ අහර වැළඳූසේක.

---

1. කළය අතින් - BGH
2. මහානාම - පිටපත් හැම
3. සරාගි සදෝසි - BDGH
4. මෙහෙවර - BGH

Non-Commercial Distribution

එකල ඒ ස්ත්‍රිය දන් දුන් පැලැප්ම ද භික්‍ෂූන්වහන්සේ රහත් වූ පැලැප්ම ද දුන දෙවතාවන් දුන් සාධුකාර ශබ්දය අසා රජ්ජුරුවන්ගේ ඡේසත වසන දෙවතාදූ සතුටු ව සාධුකාර දෙන්නී:

සාධු සාධු මහාසධෙ - සාධු සාධු තයා කතං,
දනං ඛෙත්තගතං ආසි - සුලාභං අජ්ජ තෙ අහු.

යනාදීන් "මහත් වූ ශ්‍රද්ධා ඇති උත්තම ස්ත්‍රිය, සාධු සාධු, යහපත යහපත, තී විසින් [වපු]රනලද්දවූ[1] දන නමැති බිජුවට සමූහය දක්ෂිණෙය්‍ය පුද්ගල නමැති සරුකෙත පිහිටීයේය; අද තිට වූයේ මහත් වූ යහපත් වූ ලාභයෙක. සාධු සාධු; මමත් ඒ පින් අනුමෝදන් වෙමි"[2]යි. සාධුකාර දෙමින් පින් අනුමෝදන් වූව. රජ්ජුරුවෝ දෙවතා දුවගේ සාධුකාර ශබ්දය අසා "තිමෙක් ද දෙවතාදුව, අප දුන් දනයට සාධුකාර දෙයි ද නොහොත් අනික් කෙනකුන්ගේ දනයක් නිසා සාධුකාර දෙයි ද" යි විචාළහ. එසේ විචාළ රජහට "එම්බා රජ්ජුරුවෙනි, තොපගේ දනයට මා දුන් සාධුකාරයෙක් නොවේ"යි කියා නැවත දනවිභාග දක්වන්නාවූ දෙවතාදූ තොමෝ:

ජෙජ්හෙජ්ජාදිනා යො තු - කත්වාන පරපීළනං,
මහා යාගං පවත්තෙති-න තං හොති මහප්ඵලං.

අනාදරං පුරක්ඛත්වා - අසද්ධාය අයොනිසො,
අඛෙත්තෙ යො දදෙ දනං - න තං හොති මහප්ඵලං.

දළිද්දොපි මහාසද්ධො - සාදරො සුද්ධමානසො,
දෙති අප්පම්පි [illegible] හොති - අනන්තඵලදෙ සදා.

යනාදීන් "එම්බා මහරජ, අර්ථබල, කායබල, සේනාබල ඇති යම් කිසිවෙක්[3] අනුන්ට පීඩා කොට දනොපකරණ සපයාගෙන මහත් කොට දනක් දුන්නේ වීනමුත් ඒ දනය මහාඵල මහානිසංස නොවෙයි. තව ද යමෙක් තමාගේ වස්තු ඇතත් සැදැහැ නැති හෙයින් දෙන දනෙහි ආදර නැති ව සිල්වතුන් නොසිල්වතුන් නොහැඳින ගුණ නුගුණ සලකාගත නොහී නොසිල්වතුන්ට දන් දුන්නේ වීනම් එයින් මහාඵල මහානිසංස නොවෙයි. ඉදින් ඉතා දිළිඳු වූ දුක්පත් කෙනෙක් වී නමුත් සැදැහැයෙන් ආදර සහිත ව ශුද්ධ වූ අදහසින් කම්පල අදහා ස්වල්පමාත්‍ර වූවත් දනක් දුන්නාහු වී නම් ඒ දනය මහාඵල මහානිසංස වෙයි" යනාදීන් ශ්‍රද්ධා සම්පත්තීන් යුක්ත ව සාදර සිතින් දුන්නාවූ දනය මහාඵල මහානිසංස වෙයි යන බව වර්ණනා කොට ඉක්බිති, "එම්බා මහ රජ, මණිනාග දිවයින නාගා නම් දුප්පත් ගැහැණියක් කහවණු සැටකට දසී ව මෙහෙ කෙරෙමින් සිට ඵවා තමාගේ ආත්මපරිත්‍යාග කොට ඉතා ආශචර්‍යමත් වූ දනක් දුන්නීය; භික්‍ෂූන්වහන්සේ ද උන්ගේ දනය නිසා රහත් බවට පැමිණිසේක; මම ඒ ස්ත්‍රියට සතුටු ව සාධුකාර දිනිමි"යි යනාදීන් මේ කථාප්‍රබන්ධය ආදියෙහි පටන් සියල්ල ම විස්තර කොට කිව. රජ්ජුරුවෝ එපවත්

1. කරන ලද්දවූ - පිටපත් හැම.
2. වීමි - BDEH
3. යම්කිසි කෙනෙක් - A

Non-Commercial Distribution

අසා සතුටු ව ණය දුන් පුරුෂයා හා සමඟ ගැහැණිය ගෙන්වාගෙන ණය දුන් පුරුෂයාට භාණ්ඩාරයෙන් කහවණු එක්සිය විස්සක් දී ගැහැණිය නිදහස් කොට සියලු ම මණිනාග දිවයින බමුණන්ට දන් දෙන පරිද්දෙන් ම අත පැන් වත් කොට දන් දී නෙසුත් බොහෝ සම්පත් දුන්හ. එතැන් පටන් ඒ දිවයින නාගදීපය යි ප්‍රසිද්ධ විය.[1]

ඒ ස්ත්‍රිය එතැන් පටන් බොහෝ කුශලසම්භාරයන් රැස්කොට ගෙන ජීවිතාවසානයෙහි දෙවුලොව උපන්නී ය. මෙසේ නුවණැති ශ්‍රද්ධාවන්තයෝ තමන්ගේ ආත්මය පවා අනුන්ට දාසභාවයට පමුණුවා දන් පින් කොට මෙම ජාතියෙහි දිව්‍ය මනුෂ්‍යාදි වූ බොහෝ දෙනාගෙන් ප්‍රශංසා ලැබ සැපසේ ගොසින් දෙවුලොව දිව්‍යසම්පත් විඳිනාහු මය. එබැවින් දනය නම් කැමැති කැමැති වස්තු සිද්ධ කොට දෙන හෙයින් කල්පවෘක්ෂයක් හා සමානය යි සිතා පින්වත් සත්වයන් විසින් මසුරු සතුරා දුරු කොට දන නමැති මිත්‍රයා භජනය කළ මැනවි. කියනලද්දුයේ මැයි:

ඒවං පසාදයුපගතමනො ආතුමං කත්වා දාසං
දත්වා දානං පයති තිදිවං හොති පාසංසිකො ච,
තස්මා දානං සුරතරු සමං ඉච්ඡිතත්ථප්පදනා
මච්ඡේරාරිං හනථ භවතා දානමිත්තං භජථෙහා.

මේ මෙහි තුන්වන
නාගා වස්තුව ය.

තව ද මෙහි සතරවන උත්තරොලිය වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු:

මෙම ලඞ්කාද්වීපයෙහි රජරට උතුරුලු නම් ගමෙක් විය; එගමට නුදුරු තෙන ගවපාලයන් වසන ගමෙක එක් ගොපලු දරුවෙක් රජසින් ගැවසුණාවූ ශරීර ඇති ව කිළිටි කඩරෙද්දක් ඇඳ ගෙන උදසන්හි ම කැඳිත්තක් බී පාදමක් හා කැවිට්ලියක් අතින් ගෙන ගවයන් රක්නා පිණිස වලට යෙයි. එකල මහුගේ මවු මැහැලි තොම "පුතඬ තොප ළඟට දහවල් යන්නෝ නැත; දෙවේලා මැද තෙලේ කාලා පැන් බීපියව" යි කියා සවස උයා තිබූ පිළිණි[2] කටු අලයක් දුන; ඒ තෙම කටුඅලය ගෙන යන්නේ අතර මහ සිහා වඩනා තෙරකෙනෙකුන්වහන්සේ දැක පසහ පිහිටුවා වැඳ ඒ කටුඅලයෙ[3] පාත්‍රයෙහි පිළිගැන්විය; තෙරුන්වහන්සේ කටුඅලය[4] පිළිගෙන සිතනසේක් "මේ දරුතෙම ඉතා දුඃඛිත ය; එබැවින් මේ දනය මිහට සඵල කෙරෙමි"යි සිතා එහැන්හි ම සිට විදර්ශනා වඩා රහත් ව වැඩහිඳ එකටුඅලය වළඳ වදළසේක.

අහෝ බුද්ධපුත්‍ර වූ සඞ්ඝයාවහන්සේගේ කරුණාවිශෙෂය ඉතා ආශ්චර්යයීයෙක් මැයි. හේ එසේ මැයි. ඉඳුරා පිටපොතු පමණකුත් නොහැර වැලිපස් නොසෝධා ලුණුපමණකුත් නොලා උයන ලද පිළිණි[5] ව ගිය එබඳු කටුඅලය පවා අනුභව කොට බාල දරුවා සැපයෙහි පිහිටුවූ සේක් මැයි. ඉක්බිති ඒ ගොපලු දරු ආයු කෙළවර

---

1. ප්‍රසිද්ධ විල. - මුද්‍රිත.
2. පිළිහිණි - පිටපත් හැම.
3. කටුවලය - DEGH
4. කටුවලය - ABDEGHJ

Non-Commercial Distribution

එයින් මිය එම ගම අන් ස්ත්‍රියක කුස පිළිසිඳ ගත. එකල්හි ඕහට පළමු ජාතියෙහි කටු අලය[1] දුන්නාවූ කුශලානුභාවයෙන් නිධානයෙක් උපන්නේය; ඒ නිධානය සියල්ලවුන්ට පෙනෙන සේ උතුරුලු වැව දියපිට පෙරළී පෙරළී ඔබිනොබ දිවෙයි; සමහර විටෙක දියෙහි ගිලෙයි, ඉපිලෙයි; එකල එක් ගැහැණියක් දියපිට පෙරළෙන නිධානය දැක දිවගෙන ගොස් අතින් අල්වාගත. එකල එහි අධිගෘහිත දෙවතාවා ඇගේ අත ඇරවීය; එකල ඕතොමෝ එක් අතක් ගැළවුණු සේ අනිත් අතින් අල්වයි. එවිට දෙවතාවා ගැහැණියගේ එක් අතක් නිධානයෙහි ම ඇලවීය; එකල්හි ගැහැණි අත ඇදගත නොහී තමා ඇඳි ඉන කඩ පටන් සියලු ආභරණ ගළවා නිධානයෙහි බහා දෙවියන්ට යාච්ඤා ව අත අරවාගෙන නැවත නිධානය දසාව බලන්නටත් භය ඇති ව ආපසු නොබලා දිවගත; එකල ඒ නිධානය ස්ත්‍රිය අතින් ගිලිහුණු ඇසිල්ලෙහි ගොස් පොළොවට වන. එකල්හි ඒ ස්ත්‍රිය දිවගෙන ගොස් එපවත් මනුෂ්‍යයන්ට කිව. එපවත් අසා ගම්වැසි මනුෂ්‍යයෝ හැම නිධානය දක්නා පිණිස වැවට දිව අවුත් වන්හ. එකල කටුඅලය[1] දුන් කුමරුගේ මෑණියෝ ද ඔහු කුසින් උදුලා අනික් පුතකු වඩාගෙන වැවට ගියාය; එකල ඒ නිධානය පොළෝතෙලෙන් උඩනැඟී දියපිට ඔබිනොබ ඇවිදින්ට පටන්ගත. ඒ දැක මනුෂ්‍යයෝ වෙන වෙන ම "අප ළඟට එවයි, අපගේ පිනෙක් ඇත්නම් අප ළඟට එව"යි කිය කියා සිටියාහ. ඒ කුමාරයාගේ මව ද එපරිද්දෙන් ම කිය කියා සිටියාය. එකල නිධානය මඳක් තැන් ඇවිත් ඉදිරියෙහි සිටගත. නැවත ඒ ස්ත්‍රී "මා උකුලෙහි හුන් දරුවන්ගේ පිනෙක් ඇත් නම් මා සමීපයට එව"යි කිව; එසේ නොවන හෙයින් "මාගේ කුස වසන දරුවන්ගේ කුශලයෙක් ඇත්නම් වහා මා සමීපයට එව"යි කිව. මෙසේ නී බස හා සමඟ ඒ නිධානය යුහු ව දිව අවුත් ඒ ස්ත්‍රිය පාමුල සිටගත; එකල ඒ ගැහැණි "එම්බල නිධානය, තෝ ම තට[2] සුදුසු තැනක් දැන ගොසින් සිට ගනැ"යි කිව. ඒ වචනය හා සමඟ පෙරළී පෙරළී ගොස් උන්ගේ ගෙයි එක් තෙනෙක සිටගත; ඒ නිධානය කුමාරයන් නිසා කළමනා වියදමක් විනා අනික් වියදමක් කළ නොදෙයි; පසුව ඒ කුමාරයන් මවුකුසින් බිහි ව ක්‍රමයෙන් වැඩී ශික්ෂාග්‍රහණ කාලය සම්ප්‍රාප්ත විය. එකල මේ ලංකාද්වීපයෙහි මනුෂ්‍යයෝ පස් ඇවිරීදි කුමාරවරුන් තමන්තමන් විභවානුරූප ව නොයෙක් ආභරණයෙන් සරහා මහත් වූ මඟුලෙන් ශික්ෂාග්‍රහණය කරවති; එසේ හෙයින් ඔහුගේ මවු ශික්ෂාග්‍රහණය කරවන මඟුලෙහි පුතු සරහන්නී එකල්හි පළමු ස්ත්‍රිය නිධානයෙහි බහා ගිය වස්ත්‍රය ඇරගෙන පුත්කුමරුවා ඇඳවූව; එකල ඒ වස්ත්‍රය පළමු හිමි ස්ත්‍රිය දැක ඇඳින ගෙන මේ මාගේ වස්ත්‍රය නොවේදැ"යි අල්වාගත. කුමාරයාගේ මව් එපවත් දැක තමාට ඒ වස්ත්‍රය ආවාවූ ක්‍රමය සියල්ල ම පිළිවෙළ කිව; එබසට වස්ත්‍රය ඇති ගැහැණි "තෙපි නිධාන ලැබ සඟවා තබාගෙන ප්‍රයෝජන විඳු ද. නිධාන නම් රජදරුවන් සන්තක බව නොදනු ද; කිමෙක් ද තෙපි හළාහලවිෂයටත් වඩනා ඉතා උග්‍ර වූ වඟී විනාශයට කාරණ වූ නිධාන තබාගෙන ප්‍රයෝජන විඳු දැ"යි කියා භය ගත්වා බණන්නී;

1. කටුවලය - ACDEGH
2. තොපට - මුද්‍රිත හැම

Non-Commercial Distribution

න විසං විසන්ති අක්ඛාතං - රාජස්සං විසමුච්චතෙ,
නාසෙති[1] විසමෙකංච - රාජස්සං කෙවලං කුලං.

තිට්ඨන්ති දහනා දඩ්ඪා - පාදපා නූන කානනෙ,
රාජකොපානලා දඩ්ඪා -න තිට්ඨන්ති නරා තථා.

කාලො වා කාරණං රඤ්ඤො - රාජා වා කාලකාරණං
මානු තෙ සංසයො හොතු - රාජා වා කාලකාරණං.

යනාදීන් "එම්බා මේ ලොකවාසී වූ අඥනසත්වයෝ විෂ නොවන දෙය විෂ ය යි කියති. සබා විෂයක් නම් රජදරුවන් සන්තක වස්තුව මය; කාරණ කිම්ද යත්? විෂය කෑ තැනැත්තහු විනා අනිකකු නැසිය නොහෙයි; රජදරුවන් සන්තක වස්තුව සොරා සහවා ගත් කෙනෙක් ඇත්නම් උන් තබා උන්ගේ දරුමුනුබුරු පරම්පරාව දක්වාත් සියල්ලවුන් ම නසයි. එම්බා වනාන්තරයෙහි ලැවු ගිනිගත් කල පවා අතුරතුරේ තේරී සිටිනා වෘක්ෂයෝ ඇත් මය. රජදරුවන්ගේ කෝප නමැති ගිනි ගත්තාවූ මනුෂ්‍ය නමැති වනාන්තරයෙහි තේරී සිටිනා මනුෂ්‍යකෙනෙක් නැත් මය. දරුමුණුබුරන් දක්වාත් මරවාපියති. රජදරුවන්ට වඩා බලී මාරයා දෝ හෝ නොහොත් මාරයාට වඩා බලී රජදරුවෝ දෝ හෝයි මෙසේ තොප සිතට සැක වී නම් ඊට කිසි සැකයක් නොසිතව. මාරයා කල් යවා බොහෝ කලකින් මරා ගන්නේය; රජදරුවෝ කෝප වූ ඇසිල්ලෙහි ම මරවා පියති. එසේ හෙයින් මාර යාටත් වඩා රජදරුවන් බලී බව නොදනු ද"යි මෙසේ එගැහැනිය භය ගන්වා බිණුව. ඉක්බිති කුමාරයන්ගේ මවු කියන්නී:

යං යෙන චිත්තං අනයෙන ලද්ධං
තං දෙති රාජාදිභයං හි තස්ස,
නයෙන පප්පොති ච යො මහාධනං
සක්කොන්ති නාසං න හි දෙවතාහි

එම්බා, යම් කෙනෙක් කිසියම් වස්තුවක් අන්‍යායෙන් අයුක්තියෙන් සොරකමින් පැහැර ගත්තාහු වී නම් ඔවුන්ට රාජ රාජ මහා මාත්‍යාදීහු භය ගන්වා මරා තළා ඒ වස්තුවට වඩාත් ඔවුන්ගේ සියලු සැපත පැහැර ගන්නාහ. එසේ නොව යම් කෙනෙක් පූර්ව ජන්මයෙහි තමන් විසින් කරනලද්දවූ කුශලානුභාවයෙන් මහත් ධනරාශියක් ලද්දහු වී නමුත් ඒ වස්තුව රජදරුවන් තබා ආනුභාව සම්පන්න දෙවතාවොත් උදුරාගත නසාගත නොහෙති කියමින් මෙසේ උන් දෙපක්ෂය වස්ත්‍රය මුල් ව කළාවූ කලහ කථා ක්‍රමයෙන් රජ්ජුරුවන්ට සැල විය. එකල රජ්ජුරුවෝ නිධානය නිසා රාජපුරුෂයන් යවූහ. ඔහු ගොස් ධනහිමියන් සමීපයට එළඹ නිධානය දක අතින් අල්වූහ. එකල ඒ නිධානය භයානක ශබ්ද පවත්වමින් ඇත මැත පෙරළෙමින් ඇල්වූ අත එහි ම අලවමින් භය ගන්වා ගත නුදුන්නේය. රාජපුරුෂයෝ එපවත් රජහට කියා යවූහ. රජ්ජුරුවෝ එපවත් අසා විස්මයපත් ව "එසේ වීනම් නිධානය හා සමග වස්තු හිමියනුත් කැඳවාගෙන එව"යි නැවත

1. හනාති - ACDJ

Non-Commercial Distribution

මිතිසුන් යවූහ. එපවත් අසා රාජපුරුෂයෝ නිධානය හා සමඟ වස්තුහිමියන් කැඳවාගෙන අවුත් රජහට දක්වූහ. රජ්පුරුවෝ ආශ්චර්යමත් නිධානය දක සන්තුෂ්ට ව "එම්බා, තොපගේ මේ නිධානයෙන් අපටත් වසතු දෙව"යි කීහ. එකල ඔහු අතින් පැන් ගෙන නිධානයට ගැසූහ. එකෙණෙහි ඒ නිධානය මෝච්චින් නික්ම මහත් වූ ධනරාශියෙක් සිටගත; රජ්පුරුවෝ ඒ දක අතිශයින් විස්මයපත් වූ සිත් ඇත්තාහු ඒ නිධානය හා සමඟ ඔවුන්ට බොහෝ සැපත් දී ඒ ජනපදයත් ඔවුන්ට ම සලස්වා බොහෝ පරිවාර හා සමඟ නික්මවූහ. ඔහු එතැන් පටන් දනාදී වූ බොහෝ කුශල සම්භාරයන් රැස් කොටගෙන ආයු කෙළවර පුත්‍රදරයන් හා සමඟ දෙව්ලොව උපන්හ.

එසේ හෙයින් යමෙක් ශීලාදී ගුණධර්මයන්ට පරමප්‍රතිෂ්ඨාධාර වූ බුදුන් දරු සුපිළිපන් සඞ්ඝරත්නය උදෙසා ස්වල්පමාත්‍ර වූත් දනයක් වී නමුත් පහන් සිතින් දුන්නේ වී නම් ඒ තෙම ප්‍රතිභය සහිත වූ අතිභයානක මේ සංසාර නමැති සාගරයෙහි දිව්‍යමනුෂ්‍ය සම්පත්ති සඞ්ඛ්‍යාත සප්තරත්නමය වූ නෞකාවකින් පිහිට ලැබ චුතිප්‍රතිසන්ධි වශයෙන් පිනපිනා කෙළ ඇවිදිනේ මය. හෙවත් සොක පරිදෙව දුක්ඛ දෙමනස්ස උපායාස නමැති ජලයෙන් පිරුණාවූ ජාති ජරා ව්‍යාධි මරණ නමැති මහත් වූ රළපතර බිඳිම් ඇති ලොභ දෙවෂ මොහ මද මාන මාත්සර්‍ය නමැති චණ්ඩපරුෂ මකර සුංසුමාරාදීන් විසින් ගැවසී ගත්තාවූ මාතුගාම නමැති උදකරාක්ෂසීන්ට වාසස්ථාන වූ තෘෂ්ණා නමැති ගඞ්ගාජලයට පිහිට වූ රූපශබ්දදි පඤ්චකාම කොට්ඨාස නමැති සළාවැටුම් ඇති පමණ නොදත හැකි දිගසරස්[1] ගැඹුර ඇති පරතෙරක් දක්ක නොහැකි සංසාර නමැති සාගරයෙහි චුතිප්‍රතිසන්ධි වශයෙන් ගැළෙමින් ඉපිලෙමින් විතර්ක නමැති තරඞ්ගවෙගයෙන් පහරණ ලදු ව ක්ලේශ නමැති සැඩ දියවතුරෙන් ගෙන යන ලදු ව අපාය නමැති වඩබාමුඛයෙහි වැටී අනයව්‍යසනයට පැමිණෙන්නාවූ සත්වසමූහයා සේ එබඳු මහ දුක් නොවිඳ කුසල් කළ සත්වයෝ තමන් විසින් කරනලද කුශලබලයෙන් ජනිත වූ සම්පත්ති සම්භාර නමැති මහනැවට නැඟී රත්රුවන් මුතුමැණික් දසි දස් ගවමහිසාදීන් හා ඇත් අස් රථ සේනා වාහන සමෘද්ධි නමැති පෙළපෙළ දිවන රළපතර බලා සතුටු සතුටු ව:

සද්ධාය පුබ්බෙ කත පුඤ්ඤතෙජසා
ලද්ධං මයා සබ්බමිදං විභූතිං,
දිස්වා නරො අත්තහිතො හිතෙසකො
කො නාම පුඤ්ඤං න කරෙය්‍ය පඤ්ඤවා.

යනාදීන් උදන් ගී කියකියා තමා හා ඒකාත්මික වූ මිත්‍ර පුත්‍ර කලත්‍රාදීන් හා පරිවාරජනයන් පිරිවරා නිත්‍ය සන්තොෂයෙන් පින පිනා නොයෙක් කෙළිනළුයෙහි නියුක්ත ව සැපසේ වසන්නාහු මය. කියනලදුයේ මැයි:

---

1. දිග රස - මුද්‍රිත

Non-Commercial Distribution

යො වෙ ගුණාධාරජිනත්‍රජාතං
අප්පම්පි සද්ධාය දදති දෙය්‍යං,
සපෙච්ච සංසාර මහා විදුග්ගෙ
සම්පත්ති නාවාය පතිට්ඨමෙති යි.

මේ මෙහි සතර වන
උත්තරෝලිය වස්තුව ය.

තවද මෙහි පස්වන පුබ්බපබ්බතවාසි තිස්ස[ස්ථවිර] වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු:

අප මහා ගෞතම බුදුන් බුදුවන්නාට පළමු මෙම කප තුන් වන අන්තඃ කල්පයෙහි බුදු වූ කාශ්‍යප නම් බුදුරජාණන්වහන්සේ ලොවුතුරා බුදු ව මුළුලෝ බබුළුවා තුන්ලෝ තිලකයක් සේ වැඩහිඳ දහම් නමැති අමාවැසි වස්වමින් කෙලෙස් නමැති ගිම් නිවා මුළුලෝ සනහමින් සියල් ලෝවැසියන් ගෙනහැර නිවන්පුර පුරමින් වැඩවසන කල්හි එක් දනව්වැසි පුරුෂයෙක් වෙළෙඳම් කොට ජීවත් ව වසනුයේ එක් කලෙක රන්වන් සිරියෙල් පුනු විකුණමින් ගම්නියම්ගම් රාජධානි ආදියෙහි ඇවිදිමින් ගොස් පිටිසර ගමකට පැමිණියේය. එකල්හි එගම යෞවන ස්ත්‍රියක් ඔහු දක සමීපයට කැඳවා ඕහට මිල දී සිරියල්පුනු ඇරගෙන ඉක්බිති ඒ වෙළෙඳුණන් එදවස් අහරක් නොලත් බව දන අතපයට[1] පැන් දී ඉඳින්ට සලස්වා ඕහට හැල්සාලේ බතක් ලා සුවඳ ගිතෙල් හා සමඟ මොනරමසක් එළවුව. එකෙණෙහි එක් බල්ලෙක් සයින් පීඩා ව වෙවුල වෙවුලා දෙකොළින් කෙළධාරා වගුරුවමින් ඔහු පෙරට ව සිටියේය. එකල වෙළඳපුත්‍රයා ශුනකයාගේ දුඃඛිත භාවය දක කරුණාවෙන් කම්පිත වූ සිත් ඇති ව මොනරමස් හා සමග ගිතෙලින් අනා මහත් බත්පිඩක් වටා ඔහු පෙරට තිබ්බ. එකල ශුනකයා එබත අනුභවකොට සතුටු ව නඟුට සලමින් සාදර දක්වා වෙළෙඳුණන් මුහුණ බල බලා සිටියේය; එපවත් දක වෙළඳ පුත්‍රයා ද සතුටු සොම්නසින් පිනා ප්‍රාර්ථනා කරනුයේ:

අනෙන පුඤ්ඤෙන භවෙ භවෙහං
මයූරමංසෙන ඝතෙන මිස්සං,
ලභෙය්‍යමග්ගං සුවිසාලිභත්තං
අනෙන තු නිබ්බාණ පුරං භජෙය්‍ය[2]

මේ මා කළාවූ කුශලයෙන් මේ ජාතියෙහි පටන් උපන් යම් ම ජාතියෙක සුවඳ ගිතෙල් මුසු මොනරමස් හා සමඟ කුඩු නොමැති ව[3] ඉතා නිර්මල වූ උතුම් රත්හැල්සාලේ බත් සැපසේ ම ලැබෙම්ව යි මෙසේ කැමැති කැමති සැපත් විඳ කෙළවර අමාමහ නිවන් දකිම්ව යි ප්‍රාර්ථනා කෙළේය. මෙසේ එවෙළෙඳපුත්‍රයා මෙපමණ කුශලයක් කොට ජීවිතාවසානයෙහි දෙව්ලොව ඉපද එක් බුද්ධාන්තරයක්

1. අතට - A
2. වජෙය්‍යං - මුද්‍රිත
3. කුඩු නොර් නැති ව - ABCEGH

Non-Commercial Distribution

මුළුල්ලෙහි අපමණ වූ දිව්‍යසම්පත් විඳ එයින් අවුත් මිනිස්ලොව පන්සියයක් ජාතියෙහි ඉපද ඒ උපනුපන් ජාතියෙහි ගිතෙල් මුසු මොනරමස් හා සමඟ සුවඳ රත්හැල්සාලේ බත් ම ලද්දේය.

ඉක්බිති අප බුදුන් පිරිනිවි පසු මෙම ලඞ්කාද්වීපයෙහි මහවැලි ගං අසබ පූගලු නම් ගම එක්තරා කුලගෙයක උපන; ඕහට දෙමව්පියෝ තිස්‍සය යි නම් තුබූහ. එතෙම යෞවන අවස්ථාවට පැමිණ සහඹුව රැකෙනුයේ ගිහිගෙයි ආදීනව හා මහණවීමෙහි අනුසස් අසා සියලු සැපත් හැර පූගලු නම් විහාරයට ගොස් "මා මහණ කළ මැනවැ"යි භික්‍ෂූන්වහන්සේ අතින් පැවිදි ඉල්විය. එකල භික්‍ෂූන්වහන්සේ ඔහු මහණ කොට උපසම්පද කැරවූ සේක. ඒ තිස්‍ස නම් තැනැත්තවුන්වහන්සේ එතැන් පටන් රැදෙවෙහි අප්‍රමාද ව වීර්‍ය්‍ය වඩා භාවනා කරනසේක් නොබෝ කලකින් ම උතුම් වූ රහත් බවට පැමිණ මුළු ලොවට අග්‍රදක්‍ෂිණෙය්‍ය වූ සේක, නුවණැති වූ සේක, බුදුන් වදළ ත්‍රිපිටකධර්‍මය ඉගෙන නිමවා පූගලුතිස්‍ස මහතෙරුන්වහන්සේ ය යි මුළු ලක්දිව ප්‍රසිද්ධ වූසේක.

ඒ තෙරුන් වහන්සේගේ පාත්‍රය යම් කිසි ඉසුරුමත් කෙනෙක්වත් ඉඳින් දිළිඳු කෙනෙක්වත් ගත්තාහු වීනම් ඔහු උන්වහන්සේට සුවඳ ගිතෙල් මුසු මොනරමස් හා සමඟ රත්හැල්සාලේ බත් ම පුරා දෙති: මෙම ක්‍රමයෙන් යැට හවුරුද්දක් ඉක්මුණු කල්හි දවසෙක එක් අමාත්‍යපුත්‍රයෙක් සිතනුයේ "මේ තෙරුන් වහන්සේට ඇම දවස් ම සුවඳගිතෙල් මුසු මොනරමස් හා සමඟ රත්හැල්සාලේ බත උපදනේය යි බොහෝ දෙන ම කියති; මා විසින් ඒ කාරණය පරීක්‍ෂා කළ මැනවැ"යි සිතා තමාගේ ගෙට ගොස් රාත්‍රියෙහි භාර්‍ය්‍යාවට කියනුයේ "එම්බා සොඳුර, සෙට දවස් මම පූගලු වෙහෙර වසන තිස්‍ස මහතෙරුන්වහන්සේට දනක් දෙනු කැමැත්තෙමි, තෙරුන්වහන්සේ මෙතනට වැඩිකල්හි නිමුඩු[1] සාලින් කුඩුමුසු කැඳ පිස වළඳවා වේලා ආසන්න වූ කල්හි පළාමාලුවක් හා කාඩි ඇඹුල් දෙවනු කොට නිමුඩුසාලේ බත් වළඳවාලව"යි විධාන කොට ඒ රාත්‍රිය පහන් වූ කල්හි තුමූ විහාරයට ගොස් තෙරුන් වහන්සේට වැඳ "ස්වාමිනි, අද මට අනුග්‍රහ කළ මැනවැ"යි ආරාධනාකොට තුමූ කිසි කාරියක ගියා සේ අතික් තැනකට ගියහ. ඉක්බිති අමාත්‍යපුත්‍රයාගේ ගෙහි වසන දෙවතාවෙක් රාත්‍රිභාගයේ භාර්‍ය්‍යාව හා සමඟ මන්ත්‍රණය කරන්නාවූ අමාත්‍යපුත්‍රයාගේ වචනය අසා "මූ හැම ඒ තෙරුන්වහන්සේ පූර්‍වජන්මයෙහි කළාවූ කුශලයෙන් හා ප්‍රාර්‍ථනා බලයෙන් සිද්ධ වන විපාක විශෙෂය කිසි කෙනකුන් විසින් වැළකිය නොහැකි බව තමන්ගේ දිව්‍යඥනයක් නැති හෙයින් නොදන්නාහු මයැ"යි සිතා එම ගෙයි මහලු මිනිසකු සැටියෙන් සුවඳ ගිතෙල් බඳනක් හා මොනරමස් ද රත්හැල් සාල් ද යන සියල්ල ම ඇරගෙන ගෙට අවුත් අමාත්‍යයාණන්ගේ ඇඹෙණියන්ට දින. මේ කොයින් ගෙනා දයි උන් විචාළ කල්හි දිව්‍යපුත්‍රයා කියනුයේ "එම්බා මැණියෙනි, නුඹගේ ගෙයි හිමි වූ අමාත්‍යපුත්‍රයාණෝ අතර මඟ මා දක "එම්බල, අද මම පූගලු වෙහෙර වසන තිස්‍ස තෙරුන්වහන්සේට ආරාධනා කෙළෙමි, තෙපි මේ දනොපකරණ ගෙන ගොස් අපගේ ගෙට දී කියන කල මින් ඉඳුරා බත් මාලු පිස තෙරුන්වහන්සේ වළඳවාලන්ට කියාලව"යි මා අත මෙහැම එවූසේකැ"යි කියා දේවතාවා අන්තර්ධාන විය. ඒ අමාත්‍යයාණන්ගේ භාර්‍ය්‍යාවෝ ද එපවත් අසා ඉඳුරා

1. නිමුඩු - BH
නිමුඩු - CD

Non-Commercial Distribution

එයින් බත් මාලු පිස තබා තෙරුන්වහන්සේ වැඩි කල්හි පාත්‍රය ගෙන හිදිනා අසුන් පනවා වැඩ උන් කල්හි සුවඳ ගිතෙල් හා මොනරමස් යුක්ත වූ සුවඳ ඇල්සාලේ බත වැළඳවූහ; තෙරුන්වහන්සේ වළඳ ඉක්බිති විහාරයට ම වැඩිසේක; ඉක්බිති අමාත්‍යපුත්‍රයා අවුත් "අද තෙරුන් වහන්සේට දන් දුනු ද"යි භායඹාව අතින් විචාළේය.

එකල භායඹාව "නුඹ එවූ ගිතෙල් හා මොනරමස් ඇල්සාල් ආදි වූ උපකරණයෙන් බත් මාලු පිස තෙරුන්වහන්සේ වැළඳවීමි" කී කල්හි අමාත්‍යපුත්‍රයා "සොඳුර, මා එවූ උපකරණයෙක් නැත, ඒ ගෙනාවෝ කවුරු ද"යි විචාළේය; අපගේ අසුවල් මහලු මිනිසාණෝ වේ ද ගෙනායේ යයි කී කල්හි ඔහු අතිනුත් විචාරා ඒ පුරුෂයා විසිනුත් එසේ වූ දෙයක් මා ගෙනායේ නැතැයි කී කල්හි ඒ අමාත්‍යයාණෝ තෙරුන් වහන්සේගේ කුශලානුභාවයෙන් දෙවියන් කළ දෙයෙක් මය යි දන "පින් කළවුන් ලබන්නාවූ කුශල විපාකය කියි කෙනෙකුන් විසිනුත් වැළකිය නොහැක්කැ"යි කියා බුදුසස්නෙහි පැහැද එතැන් පටන් තමා ශක්ති පමණින් මහදන් පවත්වා දනපති වූහ. තෙරුන්වහන්සේ වනාහි ජීවිතාන්තය දක්වා පින් බෙලෙන් ලබනලද එබඳු ආහාරය ම අනුභව කොට කෙළවර පරිනිර්වාණ මඤ්චකයෙහි සැතපුණුසේක් විහාරයෙහි සන්නිපාතභෙරිය ගස්වා භික්ෂූන්වහන්සේ රැස්කරවා තමන් වහන්සේ පිරිනිවන් පානා බව කීසේක. එකල භික්ෂූන් වහන්සේ "ස්වාමීනි, නුඹවහන්සේ මහ පිනැති සේක. නුඹවහන්සේගේ කුශලවිශෙෂය[1] ලක්දිව ඇම තැන්හි ම ප්‍රසිද්ධ විය. පූර්ව ජන්මයෙහි නුඹවහන්සේ කවර කුශලයක් කොට මෙබඳු විපාකයක් ලත්සේක් දැ"යි විචාළසේක. එතෙපුල් අසා තෙරුන්වහන්සේ ගිය දවස තමන් වහන්සේ කළ කුශලය ගෙනහැර දක්වනසේක්:

ඉමස්මිං භද්දකෙ කප්පෙ-කස්සපො නාම නායකො
උප්පජ්ජි ලොකනයනො - සබ්බසත්ත හිතෙ රතො.

මනොසිලා විසකයිකො - අහොසිං වාණිජෝ තදා,
තෙන කම්මෙන ජීවාමි - ආහිණ්ඩන්තො තහිං තහිං.

අථෙ'කදා වණිජ්ජත්ථං - ගමිං[2] ජනපදං තදා,
තතො'කස්මිං කුලෙ ජාතා - දිස්වා මං කුලදාරිකා.

යනාදින් "එම්බා ඇවැත්නි, මම මේ මහා භද්‍රකල්පයෙහි තුන් වනු ව බුදු වූ කාශ්‍යප බුදුන් සමයෙහි රත්වන් වූ සිරියෙල් සුනු ගෙන වෙළෙඳම් කොට ඒ ඒ තැන ඇවිදිනෙම් මිලගෙන එක් කුල කුමාරිකාවකට සිරියෙල්සුනු දිනිමි; ඕතොම මා එවේලා වන තෙක් ආහාරයක් අනුභව නොකළ බව දන ඉඳින්ට සලස්වා අතට පැන් දී රත්හැල්සාලේ බතක් ලා සුවඳ ගිතෙල් හා මොනරමස් ලුව; එකෙණෙහි සාදුකින් පීඩිත වූ ශුනකයෙක් වෙවුල වෙවුලා අවුත් මා ඉදිරියෙහි සිටියේය; ඔහු දැක කරුණාවෙන් කම්පිත වූ මම ගිතෙල් හා මොනරමස් එක් කොට අනා මහත් බත් පිඩක් ඔහු අනුභව කරවා එම විට ඒ ශුනකයා ලබනලද බල ඇති ව සතුටින් මා මුහුණ බලා සිටියා දැක මම ද සතුටු ව එවිට "මේ බල්ලාට බත් දුන් කුශලයෙන් මේ ජාතියෙහි පටන් උපනුපන් යම් ම ජාතියෙක සුවඳ ගිතෙල් මුසු මොනරමස්

1. කුශලානුභාවය - H
2. අගමි - ABCDEHJ.

Non-Commercial Distribution

හා සමහ රත්ඇල්සාලේ බත් සුව සේ ලැබෙම්වා"යි ප්‍රාර්ථනා කෙළෙමි. පසුව එම ආත්ම භාවයෙන් සැව ගොස් දෙව්ලොව ඉපද නොයෙක් සියගණන් සප්තරත්නමය කන්කුළු පෙළින් හා ධජමාලාවෙන් සැදුම් ලත් දිව්‍යමාලිගාවල සියදහස් ගණන් සුරසුන්දරීන්ගේ නෘත්‍යගීතවාද්‍යාදියෙන් සන්තුෂ්ටවෙමින් මනොනුකූල දෙවඟනන් හා මහත් දිව්‍යසෙනඟ පිරිවරා බොහෝ කාලයක් මුළුල්ලෙහි ආශ්චර්‍ය්‍යමත් වූ දිව්‍යසම්පත් අනුභව කොට එයින් අවුත් මිනිස්ලොව රජ බමුණු ආදි වූ උතුම් කුලගෙවල ඉපද එම දිව්‍යලොකය පරිද්දෙන් ප්‍රමාණාතික්‍රාන්ත වූ දැසි දස් ගව මහිෂාදීන් හා රන් රුවන් මුතු මැණික් ආදී වූ සවිඥානක අවිඥානක සියලු සම්පත්තීන් සමෘද්ධ ව ඇත්වාහන අස්වාහන රථවාහන ඉදෝලි දෝලි කුණම් ආදි වූ කැමැති කැමැති වාහන නැඟී මහ සෙනඟ පිරිවරා නොයෙක් ක්‍රීඩායෙහි යෙදී ඇවිදිමින් අවශෙෂ ජනයන් හා බන්ධු වර්ගයා විසින් පුදනලදු ව පළමු කළ ප්‍රාර්ථනා වූ පරිද්දෙන් ශාලිභොජනාදීන් සන්තුෂ්ට වෙමින් පන්සියක් ජාතියෙහි මනුෂ්‍යසම්පත් වින්දෙමි; දැන් මේ කෙළවර ආත්මභාවය දක්වා එකල කළ ප්‍රාර්ථනා පරිද්දෙන් සුවඳ ගිතෙල් හා මධුරමාංසයෙන් යුක්ත වූ රත් හැල්සාලේ බත් නිරතුරු ව ලැබෙමි; එබැවින් පිනැත්තවුන් තමන් කළ කුශලබලයෙන් ලබන්නාවූ විපාක විශෙෂය මනුෂ්‍යයන් විසින්[1] තබා ආධිපත්‍යය ඇති සියල්ලවුන්ට අග්‍රය යි යන මාරයා විසිනුත් වළකා ගත නොහැක්කේය; තුන්පින පිරිසුදු ව පෙර කළ පිනින් වන දෙය කාවිසිනුත් වැළකිය නොහැක්කේ මය; දනුදු යම් කෙනෙක් බලු කුකුළු ආදි වූ යම් කිසි තිරිසනක්හට කම්පල අදහා ඔහු කුස ගන්නා පමණ ආහාරයක් දුන්නාහු නම් ඔහු මා සේ ම දිව්‍යසම්පත්ය, මනුෂ්‍යසම්පත්ය, නිවන් සම්පත්ය යන ත්‍රිවිධ සම්පත්තිය සැප සේ ලබන්නාහු මය"යි මෙසේ තෙරුන්වහන්සේ භික්ෂුසඞ්ඝයා මධ්‍යයෙහි තමන් වහන්සේ පූර්වජන්මයෙහි කළාවූ කුශල කර්මය මේ යථොක්ත ගාථාතුන ඇතුළු ව ගාථා තෙළෙසකින් ප්‍රකාශ කොට දක්වා අවවාද කොට පිරිනිවීසේක. තෙරුන් වහන්සේ වදළ ධර්මකථාව අසා මහජනයෝ දනාදි වූ පින්කම් කොට බොහෝදෙන දෙවුලොව උපන්හ. මෙසේ ස්වල්ප වූ දනයෙන් පවා ශ්‍රද්ධාවන්න සත්වයෝ ඉතා අද්භූත වූ ආශ්චර්‍ය්‍ය සහිත අපමණ විපාක ලබන්නාහ; දනපතී ව බොහෝ දන් පින් කළාවූ ශ්‍රද්ධාවන්තයන් ලබන විපාක ප්‍රබන්ධය බුදු නො ව කවරෙක් නම් කියා නිමවා ද; තමා දිවි පමණිනුත් මෙතෙකැයි කියා නිමවාපිය නොහෙන්නේ මය. කියනලද මැයි:

අප්පෙන දනවිධිනාපි ජනො පනෙවං
අචේජරමබහුනතරං ලහතෙ විපාකං,
දනස්ස දනපතිනොපි බහුප්පදස්ස
කො වා වදෙය්‍ය පුථිරම්භි ඵලං අබුධො-යි.

මේ මෙහි පස්වන
පුවපක්ඛිකවාසි තිස්සථෙර වස්තුව ය.
මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි
ආරසාදක වර්ග නම් වූ
තෙළෙස් වන පරිච්ඡෙදය නිමි.

---

1. විසින් (නැත) - BEGH

Non-Commercial Distribution

තව ද මේ සද්ධර්මාලංකාරයෙහි තුදුස්වන කාකවණ්ණ වර්ගය නම් කවරයත්.

එහි පළමුවන කාකවණ්ණතිස්සරාජ වස්තුව මෙසේ දත යුතු. කෙසේ ද යත්:

ඒ කාවන්තිස්ස නම් රජ්ජුරුවෝ වනාහි "දානශීලාදි වූ දශප්‍රකාර පාරමී[1] ධර්මයන් පුරා මස්තකප්‍රාප්ත කොට ලොවුතුරා බුදු වන්නාවූ එක්තරා බුදුකෙනකුන් වහන්සේට ඒ බුදුවන ජන්මයෙහි ජනක වූ පිය තනතුරු ලැබෙම්වා"යි ප්‍රාර්ථනා කොට කප් ලක්‍ෂයක් මුළුල්ලෙහි නිරතුරු ව වඩනාලද එකාකාර වීර්‍ය්‍ය ඇති ව බොහෝ කුශලසම්භාරයන් රැස් කෙරෙමින් චුතිප්‍රතිසන්ධි වසයෙන් දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳ සසර ඇවිදිනාහු අප මහා ගෞතම බුදුන්ගේ මේ බුද්ධොත්පාදයට පූර්වභාගයෙහි දඹදිව වැද්දන් වසන ජනපදයෙහි පසල් ගමෙක වැදි ව ඉපද වැඩි විය පැමිණ සහඹුව රැකෙන්නාහු දවසෙක පසේ බුදුකෙනකුන් වහන්සේ දක ඔබගේ[2] ශාන්තදාන්ත වූ ඊර්‍ය්‍යාපථයෙහි පැහැද සමීපයට එළඹ බණ අසා පහන් සිත් ඇති ව පසේබුදුන් වහන්සේට ආරාධනා කොට එතැන් පටන් වනමුල් පලාපල කැඳබත් ආදියෙන් උපස්ථාන කෙරෙමින් මෙසේ ශ්‍රද්ධාවන්ත ව වසන්නාවූ ඒ වැදිපුත්‍රයාණෝ තමන් වසන ගෙය වට අල කෙහෙල් පොල් පුවක් අඹ කොස් ආදි වූ ඵලවෘක්‍ෂයන් රෝපණය කළහ. එයින් එක් කොස් පැළයෙක් මහත් ව නොබෝ කලකින් පණාමලක් ගෙන ක්‍රමයෙන් මුහුකුරා විළිකුන් ව කොස්පැළය නමා සිටගත. ඒ දක වැදිපුත්‍රයාණෝ වැලය කඩා ගසින් බාගෙන තුවටු ව අල්වා සොලවා වැලවසල්ල වෙන් කොට පහ කළහ. එකල ඒ අවකාශයෙහි රත්සිරියෙල් කල්කයක් මෙන් රන්වන් වූ වැලපැණි පුරා සිටගත. ඒ දක වැදිපුත්‍රයාණෝ මේ අග්‍ර වූ ඵල රසය අනිකක්හට සුදුසු නොවෙයි; මාගේ පසේ බුදුන් වහන්සේට ම සුදුසු ය; එසේ හෙයින් උන්වහන්සේට ම පිළිගන්වමී සිතා එකත්පස් කොට තබා පසේබුදුන් වහන්සේ වැඩි කල්හි පසඟ පිහිටුවා වැඳ පාත්‍රය ගෙන වැලපැණි පුරා පිළිගන්වා ප්‍රාර්ථනා කරන්නාහු:

ඉතො චවිත්වාන භවෙ භවෙහං
මහිද්ධිකො ධනවා සීලවා ච,
සද්ධො මුදු දනපතීව හුත්වා
සග්ගාපවග්ගං අභිසම්භුණෙය්‍යං

යනාදීන් "මේ ජාතියෙහි පටන් නිවන් දක්නා ජාති දක්වා උපනුපන් ජාතියෙහි මහත් කුශලබල සෘද්ධි ඇති වෙම්වා යි බොහෝ ධනධාන්‍ය ඇති වෙම්වා යි අත්‍යන්ත නිර්මල වූ සීලාචාරගුණයෙන් යුක්ත වෙම්වා යි නිරන්තරයෙන් තුනුරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධා ඇති වෙම්වා යි අසන්නවුන්ට කන්කලු වූ මොළොක් තෙපුල් හා මෘදුගුණ[3] ඇති වෙම්වා යි ඇම කල්හි ම ශ්‍රද්ධාසම්පන්න ව දනසම්පත්තීන් යෙදී දනපති ව මහදන් පවත්වා ස්වර්ගමෝක්‍ෂ සම්පත්ති සිද්ධ කට[4] හෙම්වා" යි කියා ප්‍රාර්ථනා කළහ.

---

1. දස පාරමී - BEGH
2. ඒ බුදුන්ගේ - BGH
3. මෘදු වූ ගුණ - ACDJ
4. සිඩ කොට - BCDGH

Non-Commercial Distribution

ඉක්බිති පසේබුදුන් වහන්සේ එදවස් වැලපැණි වළඳ ඕහට අනුග්‍රහ පිණිස එතැන් පටන් එම පන්සල වසනසේක් හිරන්තරයෙන් ඔහුගෙන් ම අහර පිළිගන්නාසේක. මෙසේ කලක් ගිය කල දවසෙක වැදිපුත්‍රතෙම කිසි කටයුත්තක් නිසා බැහැර යන්නේ තමාගේ භාර්‍ය්‍යාව කැඳවා "සොඳුර, අද මම දවල් බා පස්වරු කොට එමි, මාගේ පසේබුදුන් වහන්සේ වැඩි කල ඉඳුරා වළඳවාලව"යි සම්මත කොට ගියේය. පසේබුදුන් වහන්සේ ද වේලා පරීක්‍ෂා කොට අඳනා සිවුරු වට සම කොට හැඳ සුපිළිසන් ව ගැට ගන්වා[1] පාත්‍රය අතින් ගෙන ශාන්ත වූ සිත් ඇති ව සන්හුන් ඉඳුරන් ඇති ව වියදඬු පමණකින් වඩා නොබලා සන්හුන් පියොවින් අවුත් වැදිපුත්‍රයාගේ දෙර සිහා සිටිසේක.

එකල ඔහුගේ භාර්‍ය්‍යාතොමෝ පසේබුදුන් වැඳ[2] පාත්‍රය ගෙන ඉඳිනා අසුන් පනවා පසේබුදුන් වැඩ උන් කල්හි අහර වළඳවා ඉක්බිති ඔබගේ රූපශ්‍රී බල බලා සිටියා ලොභ උපදවා රාගයෙන් අන්ධ ව මොහයෙන් මූඪ ව පසේබුදුන් තමා වසඟත්වයට පමුණුවා ගන්මි සිතා මිරිඟු පානයට උත්සාහ කරන්නියක මෙන් සරාගින් විසින් ලොභ කටයුතු ප්‍රදෙශ දක්වීම් ආදි වූ තමාගේ නොයෙක් ස්ත්‍රීවිලාස දක්වා අනෙකප්‍රකාර කෙළි සිනා මුසු කොට ළද බොළඳ විදග්ධ වූ ස්ත්‍රීමායම් කියමින් තමාගේ මනොරථය සිධ කොට ගන්නා පිණිස පසේබුදුන් ලොභ කරවම් යි උත්සාහ කරන්නාවූ වැදිවනිතා තොමෝ:

> නනුනාම මනුස්සෙන - භුත්වා කාමං යථාසුඛං,
> යොබ්බනං අවිරාධෙත්වා - පච්ඡා තපසි වත්තියං.[3]
> ජිණ්ණෙන චරිතො ධම්මො - න නස්සති න දුස්සති,
> චිත්තෙසෙකග්ගතා හොති - ලොකෙන ච[4] පසංසියො.
> මනොහරාජ්ජං යො මොහා - බන්ධෙය්‍ය මක්කටංසුනා,
> යොබ්බනෙ රාගමත්තෙහං - බන්ධනංතපසා තථා
> නත්ථසඤ්ඤං මධුරං භන්තෙ - පඤ්චකාමසමං භුවි,
> මා මොහෙන විරාධෙථ - උභො භන්තෙ රමාමසෙ.

යනාදීන් "ස්වාමීනි, මනුෂ්‍යයන් විසින් තම් යෞවන අවස්ථාවෙහි බාලවයස නොවරදවා සැප සේ පඤ්චකාමරසය අනුභව කොට වයෝවෘඩ අවස්ථාවෙහි තපස් කටයුත්තේය. එසේ මහලු අවස්ථාවෙහි රක්නාලද සීලසමාධ්‍යාදි ගුණධර්මයෝ නොනස්නාහ; කාමක්‍රොධාදීන් විසින් දූෂ්‍ය ද නොවන්නාහ. චිත්තය ද එකාග්‍රතාවට පැමිණෙන්නේය; ලොකවාසීන් විසින් ප්‍රශංසා කටයුතුවන්නේය. ඉදින් මේ ලොකයෙහි මොහයෙන් මූඪ වූ යම්කිසිවෙක් ත්‍රිමදගලිත වූ හස්තිරාජ්‍යකු රඳවම් යි මකුළුහුයකින් බැඳ නොයෙක් උත්සාහ කොටත් යම් සේ රඳවාලිය නොහේ ද එපරිද්දෙන් ම යෞවන අවස්ථාවෙහි රාග නමැති මතැත්හු තපස් නමැති රැහැනින්

1. ගැටවවු ගන්වා - C
2. දක - GH
3. වත්තියො - ABCEGHJ
4. ලොකෙනෙව - පිටපත් හැම

Non-Commercial Distribution

බැඳ රඳවාලිය නොහෙන්නේය. තව ද මේ ලොකයෙහි පඤ්චකාමරසය හා සමාන වූ අන් කිසි[1] රසයෙක් නැත; එසේ හෙයින් සවාමිනි, මොහයෙන් මූස ව බාල[2] අවස්ථාවෙහි යෞවනරසය අපවත් නොකළ මැනව. දෙදෙන එක් ව සිත් වූ පරිද්දෙන් කාමසැපය අනුභව කරම්හ"යි කිව. මෙසේ අමෙධ්‍යයෙහි රසවර්ණනා කරන නීලමක්ෂිකාවක සේ ඈ කියන බස් අසා පඤ්චකාමය පිළිකුල් කොට දක්වන පසේබුදුන් වහන්සේ:

අට්ඨිසඞ්ඛලූපමා කාමා - කාමා සප්පසිරූපමා,
අග්ගිකාසූපමා කාමා - කාමා සත්තිසූලූපමා.

යෙ කාමං පතිසෙවන්ති - මොහෙනෙත්ථ පුථුජ්ජනා,
භාගිනො සබ්බදුක්ඛස්ස - හොන්ති ආපායිකා තථා.

යනාදීන් "එම්බා මේ පඤ්චකාමයෝ නම් ස්වල්ප වූ ආස්වාද ඇති හෙයින් ඇටසැකිල්ලක් වැනියහ; අනෙක ප්‍රකාර භය එලවන හෙයින් සර්ප මුඛයක් වැනියහ. ශරීරය දහකරවන හෙයින් සහළහුරු ගිනිවළක් වැනියහ; ශරීරය විනිවිද වෙදනා උපදවන හෙයින් ගිනි ගත් යවුලක්[3] වැනියහ. මේ ලොකයෙහි මොහයෙන් මුළා වූ යම් පෘථග්ජන කෙනෙක් කාමසෙවනය කෙරෙද් ද ඔහු සියලු දුකට භාජන ව අපායෙහි ම උපදනාහ" යනාදීන් අවවාද කොට හුනස්නෙන් නැඟී තමන් වහන්සේ වසන ආශ්‍රම පදයට ම වැඩිසේක.

එවේලෙහි වැදි දූ තොමෝ මහත් වූ භයට පැමිණ, "ඉදින් පසේ බුදුන් වහන්සේ මාගේ ස්වාමිපුත්‍රයාට මෙපවත් කීසේක් වී නම් මාගේ ජීවිතය නැත. එබැවින් එක් උපදෙශයෙකින් ගැළවුණ මැනවැ"යි සිතා තමාගේ ශරීරයෙහි ඒ ඒ තෙන තොමෝ ම නඛව්‍රණ කොට ගෙන සුළු ඇඳකට නැඟී ලෙඩ ව උණසීගතු ගත් එකක මෙන් කිළිටි කඩක් පෙරව ගෙන ගෙට පිටිපෑ වැදහොත්තීය.

ඉක්බිති ඈගේ ස්වාමිපුත්‍ර වූ වැදිතෙම ගිය තෙනින් අවුත් එපරිද්දෙන් හොත් භාර්‍ය්‍යාව දක "කිමෙක් ද සොඳුර, අද අපගේ ආර්‍ය්‍යයන් වහන්සේ ඉඳුරා වැළඳවූ දෑ" යි විචාළේය. එවේලෙහි වැදිදූ තොම තමා කළ කී කටයුත්තෙහි නමකුත් නොකියා "ස්වාමිනි, ඔවුන්ගේ ස්වරූප මා අතින් නොවිචාළ මැනව. ඒ නුඹගේ රහතාණෝ තමන් හා සමඟ ලොකාස්වාදරතියෙන්[4] යෙදෙන්ට කියා මට නොයෙක් යාච්ඤා කොට බලා තමන් කී බස් නොගිවිස්නා හෙයින් දිවගෙන අවුත් මා ගසා; අල්වාගෙන ඉසකේ ඇද ඔබාගෙන මස්රුවක් ගත් දිවිබාවකු සේ සකල ශරීරයෙහි නියපදුරු හෙළා පළා දමා දුර්වල කොට නුඹ එතී යන සැකයෙන් හැර පලාගියෝය"යි කියා තමාගේ ශරීරය දක්වුව. එවේලෙහි වැදිපුත්‍රතෙම ඈගේ ශරීරයෙහි විසිරගිය රත්නෙලුම් කෙසුරු මෙන් ඒ ඒ තෙන වැදගත් නඛරෙඛාවන්

1. අනික් BEGH
2. බාල්‍ය - BCDHJ
3. යහුලක් - BGH
4. ලොකාස්වාදරතියෙහි - BGH

Non-Commercial Distribution

දක "ඈ තීයේ ඒකාන්තයෙන් සබා මයැ"යි සිතා පසේබුදුන් කෙරෙහි කිපි සිත් ඇත්තේ ක්‍රොධයෙන් දිලිහි දිලිහී ගින්හෙහි හුණු[1] ලුණු පුපුරන්නා සේ තටනට යන අනුකරණ පවත්වා තතනමින් "මම මෙතෙක් කල් මුළුල්ලෙහි මූ සබා මහණෙකැයි සිතා කැඳබත් දී පොෂ්‍යය කෙළෙමි, එතෙම දන් බෝධි වැඩුවන්[2] ගසා ය යි[3] කීවා සේ මට ම පෙරළී මෙතෙක් විකාර කොට ගියේය; යහපත, මොහු මා රක්‍ෂා කෙළේ මාගේ භාර්‍ය්‍යාවට චොරවල්ලභ කමට වන. අද ඕහට කියවියක් කියන්නෙමි වේ දැ"යි දුනුහීතල ගෙන පසේබුදුන්ගේ ආශ්‍රමපදය බලා නික්මිණ. හේ එසේ මැයි:

මේ ලොකයෙහි අපරීක්‍ෂාකාරී වූ සත්වයෝ මඳකින් ම ගුණයෙහි පහදනාහ; නැවත ඒ වැදිපුත්‍රයා මෙන් පරීක්‍ෂා නොකොට ස්වල්ප දොෂයකුදු ඇසූ දුටු ඇසිල්ලෙහි කිපෙන්නාහ; යම්සේ තුලා කෙළවර බර මඳ කල්හි මඳකින් ම එසවේද නැවත බර වූ කල්හි මඳකින් ම නමිනා වේ ද එපරිද්දෙන් ම මේ ලොකයෙහි පෘථග්ජන සත්වයෝ යම්තමකින් ම පහදනාහ; මඳකින් ම කිපී බවට පැමිණෙන්නාහ. කියන ලදුයේ මැයි:

> ථොකෙනෙව තුලාකොටි - යාති උන්නතිමොනතිං,
> තථා පුථුජ්ජනා ලොකෙ - යන්ති කොපපසාදතං යි.

ඉක්බිති පසේබුදුන් වහන්සේ ඔහු එන්නාට පූර්වභාගයෙහි පස්පියුමෙන් සැදුණු සිහිල් වූ දිය පිරී තිබෙන සතරපිට මනා වූ පියගැට පඞ්ක්ති ඇති සක්දෙවුරජහුගේ නන්ද නම් පොකුණ හා සාදෘශ්‍ය වූ මනහර පොකුණක් මවා ආකාශයෙහි සිවුරුකුටියක් නිර්මිත කොට වට බඳනය[4] අහස රඳවා ඊමත්තෙහි අඳනය තබා සිවුරුගබින් නික්ම පොකුණට බැස පැන් සනහා ආකාශයෙහි ම සිට සිවුරු වළඳිනාසේක. වැදිපුත්‍රතෙම ඒ ආශ්වර්‍ය්‍යය දක සුළං පිරූ තොලබෝ විතක් මෙන් ප්‍රීතීන් පිරුණාවූ ශරීර ඇති ව මහත් වූ විස්මයට පැමිණ "මෙබඳු වූ උත්තමයෝ එබඳු අනාචාරයක් නොකරන්නාහු මය. ඒකාන්තයෙන් ම තමාගේ මනොරථය නුපුරන හෙයින් පසේබුදුන් වහන්සේ කෙරෙහි වෛර බැඳ බොරු කීහ"යි සිතින් ම සනිටුහන් කොට අත තිබූ දුනුහීතල ගස් අතුරෙහි සහවා තබා මඳක් බලා සිට පසේබුදුන් වහන්සේ පන්සලට වැඩි කල්හි සමීපයට එළඹ පසේබුදුන් වහන්සේගේ පාමුල්හි මුලින් සිඳහෙළූ තල්කණුවක් සේ දණ්ඩනමස්කාරයෙන් වැඳහෙව "ස්වාමීනි, මා නුනුවණින් අපරීක්‍ෂාකාරී ව කළාවූ අපරාධයට ක්‍ෂමා කොට වදළ මැනවැ"යි කිව. එකල්හි පසේබුදුන් වහන්සේ "කිමෙක් ද උපාසකය" යි වදළසේක. එතෙපුල් අසා වැදි පුත්‍රතෙම "ස්වාමීනි, මම ඉඳුරා සලකා ගත නොහී මාගේ දුෂ්ට ගැහැණියගේ බසට නුඹවහන්සේ වැනි උත්තමයාණ කෙනකුන් මරන්ට දුනු හී ගෙන ආයෙමි වේ දැ"යි කීය.

ඉක්බිති පසේබුදුන් වහන්සේ "එසේ කල උපාසකය තොප ආ කටයුතු කුමක් පිණිස නොකරා දැ"යි වදළසේක; එතෙපුල් අසා වැදිපුත්‍රතෙම "ස්වාමීනි, අද මා

---

1. ගින්හෙහි ලූ - BGHJ
2. බොධි වැසුවන් - ACJ
 බොධි වඩුන් - ක.කි.සැ.බෙ.
 බොධි ඉවසුවන් - ම.
3. ගසයි - ABCDE
4. වත බඳනය - ACEGHJ

Non-Commercial Distribution

විසින් නුඹවහන්සේගේ ආනුභාව විශෙෂය විශෙෂයෙන් ම දක්නා ලද; එසේ හෙයින් නුඹවහන්සේ මරමි සිතා ආ ගමන නම් තණසුලක් ගෙන මහාසාගරයෙහි ජලස්කන්ධය වියලාපියමි යි කළ උත්සාහයක් වැන්න; තල්පත්කඩුවක් ගෙන මහාමෙරු පර්වතය කිලිල්කඩක් සේ කඩකඩ කොට කපා දමාපියමි යි අඥනයකු කළ උත්සාහයක් වැන්න; නුඹවහන්සේ වැනි මහෙශාක්‍ය වූ මහානුභාව සම්පන්න උත්තමයාණ කෙනකුන් වහන්සේ උපක්‍රමයෙන් මරන්නට කවරෙක් නම් සමර්ථවේ ද; එබැවින් නුඹවහන්සේ වැන්නවුන් මරාපියන්ට සිතූ දුෂ්ටකෙල්ලට කළමනා කටයුතු මම් ම වේද දන්නේ[1] යි කියා තමාගේ භාර්‍ය්‍යාව මරන පිණිස දුනු හී ගෙන ගෙය බලා නික්මිණ.

එකල්හි පසේ බුදුන් වහන්සේ ඔහු කැඳවා "එම්බල උපාසකය, එසේ කළ නොහැක්ක, ස්ත්‍රීහු නම් සියලු අනර්ථයට මුල් ව සිටියහ; මහමග තැනු ගොණටුකඳක් මෙන් සියල්ලවුන්ට ම සාධාරණයහ; ඔවුන්ගේ මනොරථය පුරන්ට ද අනාචාරයෙන් වළකා ඔවුන් සිත් රක්‍ෂා[2] කරන්ට ද නොපිළිවන් මය"යි වදරා ඕහට අවවාද පිණිස වදරනසේක්:

නෙක සතෙ සහසෙසහි උත්තමාධම මජ්ඣිමෙ,
නහායනෙත්[3] යථා ගඞ්ගා - තිත්තිං නායාති සබ්බද;

තථා තිත්තිං න ගච්ඡන්ති-න විනෙනන්ති කුලාකුලං.
දුප්පූරා වනිතා නාම - එකසෙ[නා][4]න විජ්ජති,

සබ්බසාධාරණා එසා - අධිකානං පථං[5] යථා;
අනත්ථදනු හොන්තානං - ජනානං කිම්ඵලං යථා.

අලිකං භණන්ති සච්චං ච - සච්චං නා අලිකං කරෙ:
කරොනෙන්තකස්ස පෙමං[නා][6] වචසා සන්නුමං පරං.

යනාදීන් "එම්බා උපාසකය, නොයෙක් සියදහස්ගණන් හීන මධ්‍යම උත්කෘෂ්ට යන හැම දෙනා බැස නිරන්තරයෙන් ඉස්ශෝධා නහන කල්හිදු මෙතෙක් පමණැයි කියා යම් සේ ගඞ්ගාව තෘප්තියකට නොයේ ද එපරිද්දෙන් ම මේ ලොකයෙහි ස්ත්‍රීහු ද මෙතෙක් පුරුෂයෝ පමණැයි තෘප්ති නැත්තාහ; හීනය, උත්තමය යන කුල තේරීමක් නැත්තාහ. අනෙකප්‍රකාර අපවිත්‍ර දම්මෙන් නොපිරෙන ගැඹුරු ප්‍රපාතස්ථානයක් මෙන් වස්ත්‍රාලංකාර මෛථුන ආදියෙන් නොපිරෙන අදහස් ඇතියහ; ඔවුන්ට ප්‍රිය කෙනෙකුනුදු නැත; අප්‍රිය කෙනෙකුනු දු නැත; හීන උත්කෘෂ්ට මධ්‍යම යන සියල්ලවුන් යන මහ මගක් මෙන් සර්වසාධාරණයහ; නොයෙක් සිය දහස් ගණන් රාගයොඩුන් වැද සිත් වූ පරිද්දෙන් රා බී යන සුරා අවණනක්[7] මෙන් කෙතෙක් සල්ලාල පුරුෂයන් තමන් කරා අව ද ඔවුන් මනදෙළ නුපුරණ[8] හෙයින් පානාගාර ශාලාවක් වැනියහ; බොහෝ දෙනා සැතපෙන සතර මංසන්ධියෙහි

1. දන්නෙමි - ABCDEJ
2. රක්‍ෂා - BEGH
3. නහායන්ති - BEGH
   නහොයන්ති - ACDJ
4. එකසෙසනා - පිටපත් හැම
5. පථං - පිටපත් හැම
   පාපා - මුද්‍රිත, පාලි
6. පෙමංච - පිටපත් හැම
7. අවණක් - BDGH
8. පුරණ - ADEJ මුද්‍රිත

Non-Commercial Distribution

කරනලද මහාශාලාවක් වැනියහ; මහමාවත මගින් පිණිස තබන ලද පින් පැන් මඩුවක් මෙන් ද සතරමංසන්ධියෙහි බිඳිනාලද පැන්පොකුණක් මෙන් ද සර්වසාධාරණයහ; තමන්ගේ රූපශබ්දදීන් ජනයන් පොළඹා අනර්ථ එළවනහෙයින් වර්ණගන්ධයෙන් ආම්‍රඵල හා සාදෘශ්‍ය වූ කිම්ඵල නම්ලද විෂඵල වැනියහ. ඔහු සබා දෙය නොසබා කොට කියති. නොසබා දෙය සබා කොට කියති; සිතින් එකක්හට ප්‍රෙම උපදවා කයින් එකක්හට ප්‍රෙම හඟවා බසින් එකක්හට සාද[1] "හඟවති" යනාදින් මෙසේ පසේ බුදුන් වදළ අවවාද අසා වැදිපුත්‍රතෙම ඈ කෙරෙහි මධ්‍යස්ථ වූයේය.

ඉක්බිති ඒ වැදිපුත්‍රයා එතැන් පටන් පසේබුදුන් වහන්සේට වඩ වඩා උපස්ථාන කරනුයේ බොහෝ පින් රැස්කොට එයින් මිය කාමාවචර දෙව්ලොව ඉපද උපමා විෂයාතික්‍රාන්ත වූ නොයෙක් දිව්‍යසම්පත් විඳ එයින් අවුත් ලංකාද්වීපයෙහි ගල්වල්රට මරුපුල නම් ලෙන සමීපයෙහි වැදිගමෙක ප්‍රධාන වැද්දට පුත්‍ර ව උපන. එකල මවුපියෝ ඕහට අමරුප්පලය යි නම් තුබූහ; එතෙම බාල දරුවන් හා සමඟ කෙළිනේ වැලි එක්කොට කැටි ව කෙළිනා බාල දරුවන් පිළිවෙළින් ඉන්ට සලස්වා භික්ෂුසඞ්ඝයාට දන්දෙමි යි වැලිබත් ගෙනදෙමින් නිරන්තරයෙන් දන් කෙළි ම කෙළිනේ ය. මෙසේ කෙළිනා වැදිපුත්‍රතෙම දවසෙක වැල්ලෙන් දාගබක් බැඳ තමා හන්කඩ කුරුගුළා කතින් හූ ඇදගෙන ධජපතාකය යි ඉනවලු දඬෙක බැඳ එල්වා කටබෙර ගසා අත් කුලල් පිඹ වැලිදාගබට පූජා කෙළේය. ඉක්බිති වැඩිවිය පැමිණියේ මරුපුල නම් ගල්ලෙන වසන තෙරුන් වහන්සේගේ සත්පුරුෂ සමාගමයෙන්[2] ජීවිතාන්තය දක්වා බොහෝ පින් රැස්කොට එයින් මිය රුහුණු මාගම ගොඨාභය රජ්ජුරුවන්ට පුත් ව උපන.

ඒ ගොඨාභය රජ්ජුරුවෝ නම් කෙසේ වූ කෙනෙක් ද යත්. මුටසීව නම් රජ්ජුරුවන්ට පුත් වූ දෙවනපෑතිස් රජුගේ අගමෙහෙසුන් බිසවු රජ්ජුරුවන්ගේ අයාමෙක එම දෙවනපෑතිස් රජුගේ දෙවන මල් වූ යුවරජ තනතුරෙහි සිටි මහානාග නම් රාජ කුමාරයන් ජීවත් ව උනහොත් තමන්ගේ පුතණුවන්ට රාජ්‍යය නොලැබෙයි සිතා දවසෙක මී අඹ යොද භාජනයෙක බහා විෂ මිශ්‍ර කොට යෙදූ අඹ මත්තෙහි තබා යුවරජ්ජුරුවන් තරස්නා වැව බඳින තැනට යවූහ. එදවස් එම බිසවුන්ගේ පුතණුවෝත් සුළු පියාණන් හා සමඟ වැව බඳවන තැනට ගියාහු භාජනයෙහි අස් කැඩූ කල්හි තුමූ ම අඹයක් ගෙන කා එතැන්හි ම කාල ක්‍රියා කළහ. යුවරජ්ජුරුවෝ ඒ කාරණය දක බැඳ බිසොවුන් කෙරෙහි භයින් දෙවැනි ව නුවරට නොගොස් එතැන ම සිට තමන්ගේ බිසොවුන් හා බලවාහන ගෙන්වා ගෙන දෙවනපෑතිස් රජ්ජුරුවන් රාජ්‍යය කෙරෙමින් සිටියදී ම රුහුණු ගියාහ; ඔවුන්ගේ බිසව් අතරමඟ යටාල නම් විහාරයෙකදී පුතණු කෙනකුන් වැදූහ. ඕහට තමන් බෑණන්ගේ නම හා උපන් විහාරයෙහි නම හා දෙක එක්කොට යටාලතිස්සය යි නම් තබා එයින් ගොස් මාගම වෙසෙමින් රුහුණ ම රාජ්‍යය කළහ. ඔවුන්ගේ පුත් වූ යටාල තිස්සයෝ ද එහි ම රාජ්‍යය කළහ. ඔවුන්ගේ පුත් වූ ගොඨාභය රජ ද එහි ම රාජ්‍යය කළේය. ඔහු පුත් මේ කාවන් තිස්ස රජ විය. ඒ රජ කවුඩන්ගේ බස් දන්නා හෙයින් කාවන්තිස්ස නම් විය.

---

1. සැඳහැ - BCDEGHJ
2. සමවායෙන් - BDEG

Non-Commercial Distribution

ඒ තෙම ක්‍රමයෙන් පියරජහු ඇවෑමෙන් රාජ්‍යයට පැමිණ පූර්ව වාසනා හෙතුවෙන් දනපති ව දහැමෙන් රාජ්‍යය කෙරෙයි. ඒ රජහුගේ විනාහි විහාර මහා දෙවි නම් වූ අග මෙහෙසින් බිසෝ කෙනෙක් ද ඇතියහ. ඕ තොම[1] කෙසේ වූ කෙනෙක් ද යත්. ඒ විහාරමහා දෙවි නම් කැලණිතිස්ස මහරජහුගේ දියෙණියෝ ය. එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු. කෙසේද යත්:

ලක්දිව කැලණිනුවර කැලණිතිස්ස නම් රජෙක් විය. ඒ රජහුගේ යුවරජ තනතුරෙහි සිටි නමින් උත්තිය නම් මලණු කෙනෙක් ද ඇතියහ.[2] ඒ කුමාර කැලණි වෙහෙර වසන කැලණි තෙරුන් වහන්සේ කෙරෙහි අකුරු කොට ශිල්ප උගත්තේය. ඉක්බිති එරජකුමර වැඩි විය පැමිණ යුවරජ තන්පත් වූයේ කැලණිතිස්ස රජහුගේ අගමෙහෙසුන් බිසොව හා සමඟ විශ්වාස ව වෙසෙයි: රජ්ජුරුවෝ[3] එපවත් දන ඔහු අල්වා දහගෙයි ලව යි අමාත්‍යයන්ට විධාන කළහ. එකුමර එපවත් අසා හයින් පලාගොස් පසල් දනවුවෙක වසනුයේ දවසෙක බිසොවුන් සඳහන් කොට එක්ළදරු පුරුෂයකු කැඳවා සිවුරු පොරොවා ඕහට පතක් ලියා දී "මෙ පත ගෙන ගොස් කිසිකෙනකුන්ට නොහඟවා බිසොවුන් අතට දී පියව"යි යැවිය. එද යහපතැයි ගිවිස ගෙන ගොස් රජගෙට සිහාවන් නමක් මෙන් මාළිගා දෙරකඩ සිටියේ කැලණි තෙරුන් වහන්සේ රජගෙට වඩනා දක තෙමේ ද උන්වහන්සේලා කැටුව රජ ගෙට වන. ඔහු දක තෙරුන් වහන්සේ "මේ තෙම රජ්ජුරුවන්ගේ කුලුපග මහණෙකැ"යි සිතූ සේක; රාජපුරුෂයෝ[3] "තෙරුන් වහනසේගේ අතවැසි නමෙකැ"යි සිතූහ. ඉක්බිති රජ්ජුරුවන් හා රාජමහිෂිකාවෝ දෙදෙනා වහන්සේ ස්වභත්‍යයෙන් වළඳවා පසු ගමන් කොට වැඳ අවසර ගෙන නික්මුණ[හ][4], එකල පත ගෙන ගිය දූත මහණතෙම ඒ පත පස්සෙහි යන බිසොවුන්ට පෙනෙන පරිද්දෙන් බිම හෙළීය. රජ්ජුරුවෝ පත හුණු ශබ්දය අසා පෙරලී බලා පත ගෙන බලන්නාහු තෙරුන් වහන්සේ[5] අත අකුරු හා එක් වැනි හෙයින් තමන් මලණුවන් අත අකුරු දනගත නොහී එකාන්තයෙන් තෙරුන් වහන්සේ ලිවූ[6] පතය යි සිතා කොපයෙන් දිලිහී "මොහු අල්වාගෙන ගොස් තෙල් කටාරයෙක ලා ගිනි ගසා මරව"යි විධාන කළහ. ඉක්බිති රාජපුරුෂයෝ මහත් වූ තෙල් කටාරයක් ළදුනෙහි තබා පෙණ නැඟි[7] නැඟී තෙල් කැකෑරුණු කල්හි තෙරුන් වහන්සේ තෙල් කටාරය සමීපයට ගෙන ගියහ. තෙරුන් වහන්සේ විනාහි පූර්වජන්මයෙහි නිවන් පතා කරනලද කුසල් ඇති හෙයින් ඒ කෙණෙහි විදර්ශනා වඩා රහත් ව කකියන තෙල් කටාරයට බැස ඉඳුනීල මිණිඅතලෙක බැස හුන් රාජහංසයකු මෙන් වැඩඋන් සේක; ගිනි ගත් ලොහොදිය සේ කකියන එබඳු තෙල් පවා තෙරුන් වහන්සේගේ රොමකූප මාත්‍රයකුදු[8] හුණුකොට ගත නුහුණුයේ මය. එකල තෙරුන් වහන්සේ තෙල් කටාරයෙහි ම වැඩහිඳ

ලද්ධස්සාරො ජයතු වාරණරාජගාමී
හොගින්ද්‍රහොග රුචිරායත පීණබාහු,
සාධූපචාර නිරතො ගුණසන්නිවාසො
ධම්මෙ ඨිතො විගත කොධමදවලොපො[9]

---

1. ඔහු - ABCEGH
2. ඇතිවිය - ක.කි.ඝ.
3. රජ්ජුරුවෝ ද - ක.කි.ඝ.ම.
4. නික්මුණහු - පිටපත් හැම, ක.කි.ඝ.
නික්මුණාහුය - ම
නික්මුණහ - බෙ
5. වහන්සේගේ - ACJ
6. ලී -AJL
7. නැඟි(නැඟ) - ACJ , ගැසී ගැසී-L
8. මාත්‍රාවකුදු - BCEGHJ
9. මදවලෙහො - AEHJ, කි.ම.
මදවලෙහෙ - C.

Non-Commercial Distribution

යනාදින් ධම්ගාථා නම් වූ ගාථා සියයක් වදරා "මේ කෙසේ වූ අකුශල විපාකයෙක් දෙ හො" යි දිවසින් බලනසේක් යට ගිය දවස තමන් වහන්සේ එඬේර ව උපන් ජාතියෙක[1] නකියමින් සිටි හුණු කිරෙහි මැස්සකු[2] හෙළා නකාරා මැරූ අකුශල බලය[3] දක මේ නොනවත්නා කර්මයෙකැයි සිතා තෙල් කටාරයෙහි වැඩහුන් සේක් ම නිරුපධිශෙෂ නිර්වාණධාතුවෙන් පිරිනිවිසේක. මෙසේ රජ්ජුරුවෝ තෙරුන් වහන්සේ ද පත ගෙනා පුරුෂයා ද මරවා මූදට දම්මූහ.[4]

ඉක්බිති අමාත්‍යවරු එක් ව "අහෝ! අප රජ්හු විසින් නොකළ මනා හැකි[5] ඉතා පාපයක් කරනලද"යි මහත් භයට පැමිණ ගෙට ගොස් රජ්ජුරුවන්ට කියන්නාහු "දිශානායක වූ දේවයන් වහන්ස, රජදරුවන් විසින් යම් සේ[6] කටයුත්තක් පරීක්ෂාකාරී ව කටයුතුය: අපරීක්ෂාකාරී නොවිය යුත්තේය; තම තමන් විසින් කළමනා කටයුතු නුවණින් සලකා කරන්නාවූ රජදරුවන්ගේ යශො කීර්ති දෙක පුරපැළවිය පටන් දවසින් දවස වඩනා සඳ මඬල මෙන් නිරන්තරයෙන්[7] දශදිග පැතිර වඩනේය. ඉදින් දේවයන් වහන්ස, යම්කිසි රජෙක් පරීක්ෂා නොකොට යමක්හට නිග්‍රහ කෙරේ ද ඒ රජතෙම කිසවච්ඡ නම් තාපසයන්ට ගහට කරවා රාජ්‍යය හා සමඟ විනාශයට පැමිණි මෙජ්ඣ නම් රජ්හු මෙන් රාජ්‍යය හා සමඟ විනාශයට පැමිණෙන්නේය. තව ද ලොකයෙහි[8] මිනී කනා රාක්ෂසයකු මෙන් ඉතා භය එළවන්නාවූ ද ඉතා මොළොක් වූ ද ධන ධාන්‍ය නැති ව දිළිඳු වූ ද කළමනා කටයුත්තෙහි මන්දෝත්සාහ ව කල් යවන්නාවූ ද කාමයෙහි ඉතා ගිජු වූ ද යන මේ දෙෂයෙන් යුක්ත රජදරුවන්ට හැම දෙන ම නිඳා කරන්නාහ. තව ද යම් කිසි රජෙක් තියුණු මුවහත් ඇති ශස්ත්‍රයකින් මර්මස්ථානයෙක ඇන ලන්නා සේ ඉතා තියුණු බස් කියා ද කියනකින් දළ කපන්නා සේ ඉතා ක්‍රූර තෙපුල් බෙණේ ද අන්නට[9] කිසිවක් නොදේ ද කටයුත්තක් පැමිණි කල්හි ප්‍රමාද වේ ද ඉතා ගර්විත ව[10] වෙසේ ද සියල් සිරිරු වසා කොළ අතු බැඳි[11] ගසක් මෙන් සිට සත්වයන් අල්වා මරන වැද්දකු මෙන් වසාවා දනී ද ඒ ඒ කාලයෙහි කළමනා කටයුතු ආදි වූ රාජක්‍රියායෙහි කුසීත වේ ද[12] යම්කිසි භයක් පැමිණි කල්හි කිසි රාජධෛර්යයක් නැති ව භය පත් වේ ද එ බඳු රජහට සියලු සත්වයෝ ම නිඳා බණන්නාහ. තව ද දේවයන් වහන්ස, යම්කිසි රජෙක් ගිනිකඳක් සේ ද සර්පරාජයකු සේ ද රාක්ෂසයකු සේ ද තමා මුහුණ දැකීම් මාත්‍රයකින් ම මහජනයා භය ගන්වා අකුළුවා ද එ බඳු රජ්හුගේ යශොතෙජස් දෙක දියපිට තෙල් බිඳු මෙන් විසිර නස්නේය. එසේ හෙයින් මහරජ, රාජධර්මය නම් සියලු සතුන් රැකීමය ඥානවෘද්ධ වයොවෘද්ධයන් භජනය කිරීමය ලොකචාරිත්‍ර දන්මය මෙලෝ පරලෝ දෙකින් වන අපවාදයෙන් ගැළවී දවස් යැවීමය තමා රැක්මය දැහැමෙන් සෙමෙන් රාජ්‍යය රැකීමය[13] මිත්‍රයන් කෙරෙහි නොබිඳෙන බවය. සත්පුරුෂ වූ ශ්‍රමණ

1. ජාතියෙහි - AD බෙ,ක.සැ.ස
2. මැස්සක - EJ
3. අකුශලය - D. ම.
4. දම්මවූහ - A
දමූහ -BGH, ක.කි.සැ. .
5. නොකළ හැකි - BEGHL
නොකළමනා - ම.
6. යම් - BDEGH, ම.ස.
7. නිරන්තරයෙහි - GH
8. මේ ලෝකයෙහි - BDEGHL ම.ස.
9. අනුන්ට - L මුද්‍රිත හැම
10. ගර්හිත ව - AJ ක.කි.සැ.බෙ
11. බැඳි - BDEGHL, මුද්‍රිත හැම.ස.
12. කුසීත ව වෙසේ ද - C.ම
13. කිරීමය - BDGHL ක.කි.සැ.ම.ස

Non-Commercial Distribution

බ්‍රාහ්මණයන් කෙරෙහි ක්‍ෂමාපරවීමය යන මේ රජදරුවන්ට ආහරණ නම් වෙයි. නව ද යම්කිසි රජෙක් අසරණ ව තමා සරණ ගියාවූ සතුරකු වුවත් ව්‍යසනයක් පැමිණි කල්හි හෙවත් බොහෝ අනර්ථයක් කළ සතුරකු වුවත් දුක්පත් ව තමා ළඟට පැමිණි කල්හි ඉදින් යම්කිසි ව්‍යසනයක් පැමිණි කල්හි ඔහු කෙරෙහි අනුකම්පා උපදවා සැපත් දී අනුග්‍රහ කෙරේ ද එසේ වූ රජතෙම ඒකාන්තයෙන් රජ නම් වෙයි. නව ද පෙර රජදරුවෝ දැහැමෙන් ප්‍රජාපාලනය කිරීම ය ධාර්මික ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට රක්‍ෂාසංවිධාන කිරීමය දුගීමගී දිළිඳු යාචකයන්ට කැමැති කැමැති වස්තු දීමය යනාදි වූ සුචරිත ධර්මය[1] පුරා දෙව්ලොව ගියහ. එසේ හෙයින් මහරජ, රාග නමැති සර්පයා හා ක්‍රොධ නමැති රාක්‍ෂසයා හා දෙදෙන යම් දවසෙක ඉදින් නුඹවහන්සේගේ සිත් නමැති වෙනෙහි[2] උපන්නාහු[3] වී නම් සියලු අනර්ථයට මුල් ව සිටියාවූ ඔවුන් දෙදෙනා ක්‍ෂාන්ති නමැති මන්ත්‍රයෙන් වළකා වදළමැනවැ'යි යනාදීන් අවවාද කළහ. කියනලදුයේ මැයි:

නිසම්ම ඛත්තියො කයිරා - නානිසම්ම දිසම්පති,
නිසම්මකාරිනො රඤ්ඤො - යසොකිත්ති ච වඩ්ඪති.

අනිසාමෙත්වාන යො දෙසං - යස්ස කුබ්බති නිග්ගහං,
මෙණ්ඩරඤ්ඤෙව භූපාල - සරට්ඨො සො විනස්සති.

අති භීමං චාතිමුදුං[4] - දීනං ච දීඝසොත්තියං,
විසයෙසු නිරතං ලොකෙ - රාජානම 'වමඤ්ඤති.

තික්ඛං ඛරං අදතාරං - පමත්තං ගබ්බිතං සඨං,
කුසීතං ව්‍යසනෙ භීරුං - රාජානම'වමඤ්ඤති.

ධූමකෙතුව සප්පොච - රක්ඛසො විය යො ජනෙ,
සංකුචෙති යසො තස්ස - සතබින්දුම්වා'මහසි.

රාජධම්මො පජාරක්ඛා - වුඩ්ඪපඤ්ඤූපසෙවනං,
ලොකවොහාරවිඤ්ඤත්ති - අත්තනො පරිපාලනං.

ධම්මේන පාලනං රට්ඨං - සුභදෙසු අජිම්හතා,
බම්භා ච සමණෙ[5] සාධු - රඤ්ඤො එතෙ විභූසනා.

අමිත්තම්පි[ච]යො දීනං - අත්තනො සරණාගතං,[6]
ව්‍යසනෙස්ව 'නුගණ්හාති - සවෙ භූපති භූපති.

---

1. ධර්මයන් -BGHL ක.කි.ඤ.ම.ස.
2. බෙනෙහි - ම.
3. උපදින්නාහු - C, බෙ.
4. චාතිමුදං - H
5. සමණො -ABCEGHJL ක.කි.ඤ.පාලි
6. සරණං ගතං - ක.කි.ඤ.බෙ.ස. පාලි

Non-Commercial Distribution

පජානං පාලනා ධම්මා[1] - ධම්මිකෙ හරණෙන ච,
දීනානං චිත්තදනෙන - රාජානො තිදිවං ගතා.

රාගො 'රගො මහාරාජ - එරුසො කොධරකඛසො,
හදයෙ වෙ[2] සමුට්ඨාති - ඛන්තිමනෙතන වාරියා[3]යි.

මෙසේ අවවාද කරන්නාවූ වැඩ පසස්නාවූ ඇමතියන්ගේ තෙපුල් අසා ද ඒ රජ මදකුත් සනෙතාෂ නුවූයේ මය.

ඉක්බිති තෙරුන්වහන්සේ කෙරෙහි ශොකයෙන් දෙවතාවෝ කිපී "මේ රජහු හා සමඟ මොහුගේ රාජ්‍යය නසම්හ"යි සමුද්‍රය උත්පාතික කොට දිය උතුරුවන්නට පටන් ගත්තාහ; එකල ලක් දිවට පිරිවර වූ කුඩා දිවයින් නවයක් හා සතරක්[4] උතුරුකොට ඇති පන්තිස් දහස් පන්සියයක් පමණ මහ පටුනුගම් වැදූ අමුණු කෙත් වත් ආදි වූ සියල්ල ම මුහුද ගිලුයේය.

එකල්හි කැලණියට මුහුද සත්ගවුවෙක; එයින් ගවුවක් තබා සියල්ල ම වසා ගෙන මුහුද දිය එන්ට වන් කල්හි එපවත් කැලණිතිස්ස රජහට කීහ; එබස් අසා රජතෙම භයින් චකිත ව ඉදිරි පසු බලා අන් උපදෙසක් නොදක තමාගේ දෙළොස්[5] ඇවිරිදි දෙවි නම් වූ දුව සර්වාභරණයෙන් දෙවඟනක මෙන් සරහා මහසැළක් ගෙන්වා බත් පැන් පිළී ආදි වූ උපකරණ හා ඒ දියෙණියන් සැළ ඇතුළෙහි ලා[6] "කැලණිතිස්ස[7] රජ්ජුරුවන්ගේ දියෙණියෝය"යි රන්පත ලියවා එම සැළෙහි බහා අස් ඔබා "මේ සමුද්‍රදෙවතාවන්ට බලි කර්මාන්ත[8]ය යි කියා සමුද්‍රයට අළුයේය. එකල දෙවතාවෝ මුහුද උත්පාතික නොකළහ; ඉක්බිති එසැළ ලක්දිව වමත් කොට දෙවතානුභාවයෙන් ගොස් රුහුණු [ජනපද] තොටලුතොට වෙරළ සමීප ව සිටගත: එකල්හි එම තොටලු ගම වසන කෙවුළෝ දක එපවත් කාවන්තිස්ස රජහට කීහ; එකල රජ සපිරිවරින් අවුත් බිසොවුන් දක රන්පත අකුරු කියවා කැලණිතිස්ස රජහුගේ දියෙණියන් බව දැන ගොඩට බාවා රුවන්රැසක් මත්තෙහි සිටුවා අගමෙහෙසුන් කොට ඔවුන් බට තොටලු තොට විහාරයක් කරවා එම කාරණය මුල්කොට ගෙන විහාරමහාදෙවීය යි ඔවුන්ට නම් තිබීය.

එතැන් පටන් කාවන්තිස්ස රජ්ජුරුවෝ විහාර මහා දෙවීන් හා සමඟ ප්‍රිය සංවාසයෙන් වසනුවෝ[9] ගැමුණු කුමාරය තිස්ස කුමාරය යි යන දරු දෙදෙනකු ලැබ ඔවුන්ට දස මහා යෝධයන් පාවා දී තමන් කළමනා සියලු කටයුතු නිමවා තිස්ස

1. පාලනෙ ධම්මා - ක.සැ.කි.ම
2. කෙ - BCDEGHJL
3. වාරය - DEJ
 වාරයං - ABC
 වාරයො - ම.
4. සතක් - C
5. සොළොස් -ම
6. බහා - BEGHL
 හොවා - D
7. මේ සැළ ඇතුළෙහි කැලණිතිස්ස - BEGHL
8. බලිකර්ම - බෙ.ස.
9. වසනුයේ - පිටපත් හැම

Non-Commercial Distribution

මහ වෙහෙර යටාල වෙහෙර සඳගිරි වෙහෙර ආදි වූ සූසැටක් රජමහා විහාර කරවා උපමා නොකට හැකි අනෙකප්‍රකාර කුසල් කොට සූසැට හවුරුද්දක් දැහැමෙන්[1] රාජ්‍යය පිළිපැද තුෂිත භවනයෙහි උපන. ඒ කාවන්තිස්ස රජ්ජුරුවෝ වනාහි මතු බුදුවන මෛත්‍රී[2] බුදුන්ට බුදු වන ජාතියෙහි පිය වන්නාහ; ඒ විහාර මහාදෙවී එම බුදුන්ට මවු වන්නාහ; මෙතැන්හි කියයුතු සෙසු සියල්ල මතු කියන දුෂ්ටගාමණී වස්තුවෙහි ම ප්‍රකාශ වන්නේය.

මෙසේ සත්පුරුෂයන් විසින් කරනලද ඉතා ආශ්චර්‍ය්‍යමත් වූ ඉතා අද්භූත වූ මේ සුචරිත ධර්මය අසා සැප සේ නුවණැති ශ්‍රද්ධාවන්තයන් විසින් අපායගාමී වූ අකුශල ධර්මයන් දුරුකොට දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා නිවන් සැපත් සාධා දෙන දාන ශීලාදි වූ දශවිධ කුශල ධර්මයන් පිරුව මැනවි. දක්වනලදුයේ මැයි:

ඉච්චබ්භුතං සුචරිතං සුජනෙහි සිද්ධං
සුත්වාන සාධු මතිමා සුඛමෙසමානො,
පාපං අකත්වා සතතං නරකොපගාමිං
සග්ගාපවග්ගසුඛදං කුසලං කරෙය්‍ය-යි.

මෙතෙකින් මේ කාකවර්ණ වග පළමු වන
කාකවර්ණ වස්තුව
කියා නිමවනලදි.

තව ද මෙහි දෙවන දුෂ්ටගාමණී වස්තුව නම් කවර යත්. මෙහි විස්තර කථාව මහාවංශ ආදියෙහි දක්වන ලද්දේ මය.

මෙතැන්හි මම එහි විස්තර කථාව හැර මහත් වූ යශෝ තෙජස් ඇති දුටුගැමුණු රජ්ජුරුවන් විසින් අගසවු බව පතා අතීත ජාතියෙහි කළාවූ පූර්ව ප්‍රාර්ථනාව දක්වා මෑතභාගයෙහි කරනලද මහත් වූ පුරුෂවික්‍රම හා සැදැහැයෙන් රැස් කළාවූ අනෙකප්‍රකාර කුශලසම්භාරයක් එකදෙශමාත්‍රයකින් ගෙනහැර දක්වමි; තමහට වැඩ කැමැති ශ්‍රද්ධාවන්ත වීරපුරුෂයන්[3] විසින් සාවධාන ව ඇසිය යුතු. කෙසේ ද යත්:

ඒ දුටුගැමුණු රජ්ජුරුවෝ වනාහි මේ මහාභද්‍රකල්පයට එකාසඞ්ඛ්‍යය කප් ලක්ෂයකින් යට වර[4] නම් කල්පයෙහි ලොව පහළවූ අනොමදස්සී නම් බුදුන් සමයෙහි එක්තරා කුලගෙයක ඉපද වැඩිවිය පැමිණ මහාජනයන් හා සමඟ විහාරයට ගොස් බණ අසා ශ්‍රද්ධාවන්ත ව වසනුවෝ මෑතභාගයෙහිදු එක් දවසෙක බණ අසන පිණිස විහාරයට ගියහ. එකල බුදුහු සවනක් රසින් දිලිහි දිලිහි සිවි වනක් පිරිස් මැද බුද්ධාසන මස්තකයෙහි වැඩහිඳ මධුරස්වර විහිදුවා ධර්මදෙශනා කොට ඉක්බිති එම පිරිස් මධ්‍යයෙහි නිසභ නම් මහතෙර කෙනකුන් වහන්සේගේ ගුණ නුවණ වර්ණනාකොට වදරා උන්වහන්සේට දකුණුත්සවු තනතුරු දුන්සේක.

---

1. දැහැමෙන් සෙමෙන් - BGHL
2. මෛත්‍රී - පිටපත් හැම
3. ජේත්‍රී පුරුෂයන් - BGHL
4. වරණ - ක.සි.ඤා

Non-Commercial Distribution

එකල මේ දුටුගැමුණු රජ්ජුරුවෝ එපවත් දක "මම ද මතු මේ නියඟ නම් මහතෙරුන් වහන්සේ සේ ම එක් බුද්ධකෙනකුන් වහන්සේගේ ශාසනයෙහි මහණ ව නුවණ ගුණයෙන්[1] අගතැන් පත් ව දකුණත් සවු වෙම්ව"යි ප්‍රාර්ථනා කොට එතැන් පටන් එකාසඞ්ඛ්‍යය කප්ලක්‍ෂයක් මුළුල්ලෙහි දන ශීලාදි වශයෙන් බොහෝ කුශල සම්භාරයන් රැස් කෙරෙමින් ජාතියෙන් ජාතියෙහි දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳ ක්‍රමයෙන් අවුත් මෙම ලඞ්කාද්වීපයෙහි එක්තරා කුලගෙයක ඉපද කටයුතු දන්නා අවස්ථාවට[2] පැමිණ සසුන් වැද මහණ ව රුහුණුරට කෙළපවුව සමීපයෙහි මනහර විහාරයෙක වසන්නාහු "මේ මිනිසත් බව ඉපදීම නම් ඉතා දුර්ලභය; බුද්ධොත්පාද කාලය දුර්ලභය; ශාසනයෙහි මහණවීම දුර්ලභය; අෂ්ට දුෂ්ටක්‍ෂණයෙන් විනිර්මුක්ත වූ නව වන බුද්ධොත්පාදක්‍ෂණයෙහි ඉපද සසුන් වැද මහණ වූ[3] මා විසින් අප්‍රමාද ව කුසල් කටයුත්තේය"යි කල්පනා කොට සාමණේර භූමියෙහි සිට පුහුණු කළ මහා ධර්ම්‍ය අසා පිරිවහා පුහුණු කොට අප්‍රමාද ව වන පිළිවෙත යෙදී සඞ්ඝයා වහන්සේට නහන බොන පැන් පරහා දෙමින් දැහැටිදඬු එළවමින් මළු මංපෙත් අමදිමින් බුදුන් උදෙසා මල් සුවඳ ආදිය පුදමින් දහගප් මහබෝ ආදියෙහි ද වත් සපයා මහත් වූ ආදර සම්භාවනාවෙන් බෝධීන් වහන්සේට පැන් වඩා සුවඳමල් ධූවඳ සුනු ආදිය පුදමින් මෙසේ දවස් පතා කුශලක්‍රියාවෙන් ම දවස් යවන්නාහු දවසෙක ආකාශචෛත්‍ය නම් දගබ පිහිටි දගප්මළුවට නැඟෙන පියවර පහණ[4] සිථිල ව තිබෙන හෙයින් මහගල් තුනක් ගෙනවුත් පියවර පහණ තනා මෙසේ නිරන්තර ව මෙහෙ කිරීමෙන් ශරීරය මිරිකී ගිලන්පත් වූහ. එකල සැදැහැයෙන් වත පිළිවෙත සපයා සුවච ව දවස් අළ හෙයින් කෙලෙහි උපකාර දන්නා භික්‍ෂූන් වහන්සේ කෙළපවු වෙහෙර සිට සිවිකාවෙකින් උසුළාගෙන ඇවිත් තිස්සමහ වෙහෙර[5] සල්වස පිරිවෙනය යි යන ලැගුම් ගෙයි සතප්වා ලෙඩ බලන සේක.

එකල යට කියනලද කාවන්තිස්ස රජ්ජුරුවෝ විහාර මහ දෙවින් හා සමග රුහුණු මාගම රාජ්‍යය හෙරෙමින් උපමා කොකළහැකි මහදන් පවත්වා දනපති ව වසන්නාහු දවසෙක භික්‍ෂූ සඞ්ඝයාවහන්සේට පෙරවරු මහදන් දී පස්වරු විහාරමහදේවීන් හා සමඟ පිරිවරා[6] මහත් රාජානුභාවයෙන්[7] යුක්ත ව තිස්සමහ වෙහෙරට ගොස් ඒ ඒ පිරිවෙන් ගෙවල වසන භික්‍ෂූන් වහන්සේ වඳිමින් ගිලනුන් වහන්සේට බෙහෙත් පිළියෙල කෙරෙමින් අෂ්ටවිධ පාන වර්ගයන් එළවමින් කපුරු තකුල් ආදි වූ පස්පලවතින් යුක්ත ව[8] බුලත් පිළිගන්වමින් මෙසේ භික්‍ෂූන් වහන්සේට උපස්ථාන කෙරෙමින් පිළිවෙළින් ගොස් සල්වස නම් පිරිවෙනට වැද එතැන්හි වැඩ උන් මහ තෙරුන් වහන්සේ දක වැඳ එකත්පස් ව උන්හ. එකල්හි ඒ මහතෙරුන් වහන්සේ රජ්ජුරුවන් හා බිසවුන්ට බණ වදරන සේක්:

---

1. නුවණනුවණින් - C
2. වයසට - BDEGHL ස.
3. මහණ ව - GHL ක.කි.සැ.
4. පදනම - ක.කි.සැ.
5. තිස්මාවෙහෙර - ADEGHJ
   තිස්මහාවෙහෙර - L
6. පිරිවරා (නැත) මුද්‍රිත හැම.
   දෙවියා සද්ධිං සෙනංග පරිවුතො - පාලි
7. රාජාභිමානයෙන් - L
8. යුක්ත වූ - AB
   යුක්ත - EGHL

Non-Commercial Distribution

මහාසම්පත්ති තුම්හෙහි - ලද්ධායං පුඤ්ඤකම්මුනා,
අප්පමාදෙච කාතබ්බො - පුඤ්ඤකම්මෙ ඉදානිපි.

යනාදීන් "එම්බා තෙපි හැම පෙර ජාතියෙහි කළාවූ කුශලයෙන් දැන් මෙබඳු මහත් වූ ඓශ්වර්‍ය්‍ය සම්පත්තියක් ලදුව, එ බැවින් දැනුදු අප්‍රමාද ව කුසල් කළා නම් මතු දිව්‍යමනුෂ්‍ය සම්පත් විඳ නිවන් සම්පත් ලබන්නා වේ ද යි[1] වදළසේක. එතෙපුල් අසා රජ්ජුරුවන් සමීපයෙහි උන් විහාරමහදෙවි කියන්නාහු[2] ස්වාමිනි, මා වඳ වූව. දරු සිරි නැති අපට සම්පත්තියෙන් ප්‍රයොජන කිම් ද" යි කීහ. එතෙපුල් ඇසූ මහ තෙරුන්වහන්සේ "මේ බිසවුන්ට පුත්‍රලාභයෙක් වේ දේ නොවේ දේ හෝ" යි[3] දිවසින් බලනසේක් දරුකෙනකුන් ලබන බව දැක[4] "එම්බා දෙවිනි, තෙල ඇතුළුගෙයි සැතපෙන ගිලන් සාමණේරයන් හා කථා කරව" යි වදළසේක. එ බස් ඇසූ බිසවු ඒ ලැගුම්ගෙට වැද සාමණේරයන් වහන්සේ සමීපයට එළඹ පසඟ පිහිටුවා වැඳ "ස්වාමිනි, ඉතා ගිලන් පත් සේක, අබාසු කවරේ ද"යි විචාරා එකත්පස් ව හිඳ "ස්වාමිනි, මෙයින් ගොස් කොයි උපදනා කැමති සේක් ද" යි විචාළහ. එතෙපුල් අසා සාමණේරයන් වහන්සේ "එම්බා දේවිනි, දිව්‍යලොකය ඉතා සිත්කලුය; එබැවින් දෙව්ලොව උපදනා කැමැත්තෙමි" වදළසේක.

එතෙපුල් අසා බිසව, "ස්වාමිනි, දිව්‍යලොක සම්පත්තිය නම් කොටුවෙක ලා තිබූ වීකක්[5] කා නිමවා දෙවැනි ව ගොයම් කොට බත් සොයන්නා සේ මිනිස් ලොවදී කළ කුශලයෙන් දෙව්ලොව කොපමණ සැප විඳත් මිනිස්ලොවට ඇවිත් කුසල් කළමනා මය; කුසල් වඩනට කාරණයෙක් දිව්‍යලොකයෙහි නැත. උදාරතර වූ කුසල් කිරීමට රජවීම හා සමාන තැනෙක් නැත; එබැවින් මට පුත් ව උපන මැනවැ"යි කීහ. බිසොවුන් එසේ කිව ද මිනිසත් බව පිළිකුලැයි සිතා නොකැමති වූ සේක. ඒ බව දන්නාවූ[6] විහාරමහදෙවි "ස්වාමිනි, දනාදි වූ කුසල් කිරීමට රාජානුභාවය බැලුව මැනවැ"යි කියා සාමණේරයන් වහන්සේ සැතපෙන ගෙයි විසිතුරු වියන් බැඳ බිම සුවඳ පිරිබඩ ගෙන සමන්මල් අතුරනලද මොළොක් ඇතිරිලි[7] මත්තෙහි සාමණේරයන් වහන්සේ සතප්වා උක්පැණි වළඳවා පස්පලවතින් බුලත් වළඳවා සඳුන් අගරු දෙව්දුරු ආදි වූ සුවඳ හා සමන් ඉද්දමල් ආදින් පිරුණාවූ මල්කරඬු හා මහනෙල් උපුල් රත්නෙලුම් හෙළ නෙලුම් ආදි වූ මාලා කලාපයන් ද නානාවර්‍ණ වස්ත්‍රජාතීන් ද එසේ ම භික්‍ෂූන් වහන්සේට සිවුරු පිණිස සියුම් මොළොක් පළුපිළි ද ගිතෙල් මී වෙඬරු උක්සකුරු උක්පැණි සැළවල් ද එසේ ම අෂ්ටවිධ පානවර්‍ගී[8] භාජනයන් ද මෙසේ නොයෙක් දනොපකරණ සකස් කොට ගෙන්වා ගෙන "ස්වාමිනි, තුඹවහන්සේට පින්පෙත් කොට දෙමි, සිත් වූ පරිද්දෙන් දන්දුන මැනවැ"යි කියා[9]

---

1. නිවන් දක්නා වේ ද යි - BDEGHL
2. කියන්නී - ක.කි.සද.ම
3. වේ දේ හෝ නොවේදෝ හෝ - BD
   වේ දේ නොවේ දේ - GH
4. දැන - EGHL
5. වී විකක් - ABCEJ, ක.කි.සද.ම.
   වියක් - G , වී - L
6. දන්නා වූ - BEGHL
7. ඇතිරි - මුද්‍රිත හැම.ස.
8. පානීයවර්ග -BDEGHL
9. කිය -ACJ

Non-Commercial Distribution

රජ ව උපන් කල බුඩ ශාසනයට උපකාරී ව බොහෝ පින් කොටගන්ට පිළිවන, ස්වාමීනි, මට පුත් උව මැනවැ"යි[1] කීහ, සාමණේරයන් වහන්සේ බිසොවුන්ගේ බස් අසා දනසම්භාර බලා සතුටු ව "රජ ව උපනහොත් බුඩ ශාසනයට උපකාරී ව බොහෝ පින් කොට ගත හැකැ"යි[2] සිතා එළඹ සිටියාවූ දිව්‍යලොක සම්පත්තිය හැර බිසොවුන්ගේ ආරාධනාව පිළිගත්සේක. විහාරමහදේවි ඒ බව දන සතුටුසිත් ඇති ව වැඳ අවසර ගෙන නුවර බලා නික්මුණාහ.

එකල්හි බිසොවුන් රජ්ජුරුවන් හා සමඟ රථයට නැඟී නික්මුණු වේලෙහි සාමණේරයන් වහන්සේ චුත ව බිසොවුන් කුස පිළිසිඳගත්සේක: මෙසේ කුස පිළිසිඳගත් උන්වහන්සේගේ කුශලානුභාවයෙන් බිසොවුන් දසාවෙහි[3] රථ චක්‍රය නාභිය දක්වා පොළොව ගැලිණ: බිසොවුන් කුස ද විදුරු පුරාපුවක් මෙන් බර විය. එපවත් දන බිසවු "එකාන්තයෙන් සාමණේරයන් වහන්සේ කාලක්‍රියා කළසේක් වනැ යි සිතා මිනිසකු යවා කාලක්‍රියා කළ බව දන පෙරළා විහාරයට අවුත් මහත් වූ පූජාසත්කාරයෙන් මෘතශරීරය ආදහන[4] කොට සඞ්ඝයා වහන්සේට මහදන් පවත්වා නුවරට ගියහ. මෙසේ උන්වහන්සේ කුස පිළිසිඳගත් ඇසිල්ලෙහි බිසොවුන්ට දෙළෙක් උපන; කෙසේ වූ දෙළෙක් ද යත්:

සියක් රියන් දිග ඇති මහත් මීවද පටලයක්[5] සමීපයෙහි හිසතබා යහපත් ව[6] සැතපී දෙළොස් දහසක් දෙනාවහන්සේට මී දන් දී ඉතිරි මී තමන්ට කඩාගෙන කන්නට ද; නැවත අනුරාධපුර නුවර රජ කරන එළාල රජ්ජුරුවන්ගේ විසි මහයොධයන් අතුරෙන් නායක යොධයාගේ ඉස කැපූ කඩුව සේදූ පැන් ඔහුගේ ඉස මැඩගෙන බොන්නට ද; නැවත අනුරාධපුර නුවර දෙමළ රජුගේ මානෙල් මල් කෙතින් මලා නොගිය මානෙල්මල් පළඳින්ට ද; තිසා වැවින් ගෙනා පැනින් ඉස්සෝධා නහා පැන් බොන්නට ද යන මෙතෙක් දෙළ දේවීන්ට උපන.

එකල බිසවු මෙකී දෙළ ලැබගැන්ම දුර්ලභ හෙයින් කිසිවක්හටත් නොකීවාහු මය. අභිප්‍රාය වූ දෙළ නොලැබීමෙන් බිසොවුන්ගේ ශරීරය දවසින් දවස දුර්වල ව පඬුවන් පැහැ විය: ඒ බව දක රජ්ජුරුවන්[7] මෙසේ දුර්වල වන්නට කාරණා කිම්ද යි දෙතුන් වරෙක විචාළ කල්හි තමන්ට උපන් මේ දෙළ සියල්ල ම කීහ. එපවත් අසා රජ්ජුරුවෝ නුවර බෙර ලවන්නාහු 'යමෙක් සියක් රියන් දිග මීයක් දක කීයේ වී නම් ඔහට බොහෝ සම්පත් දෙමි'යි කියා නුවර බෙර ලැවූහ. එකල බිසොවුන් කුස පිළිසිඳ ගත් කුමාරයන්ගේ කුශලානුභාවයෙන් ගොළුමුහුද වෙරළ අස මුණින් නමා තුබූ මහලු[8] නැවක් ඇතුළත විසියටක් පමණ තැන මී මැස්සෝ මහත් වූ මීපටලයක් බැඳ ගියහ. එක් දනවුවැසි පුරුෂයෙක් ඒ දක ගොස් රජ්ජුරුවන්ට දන්වි ය. රජ්ජුරුවෝ සතුටු ව ඕහට බොහෝ සැපත්[9] දී මහපෙරහරින් බිසවුන් එතනට කැඳවාගෙන ගොස් එතැන්හි ම මහත් වූ මණ්ඩපයක් කරවා ඒ මණ්ඩපය සරහා

1. පුත් ව උපන මැනවැයි -BGHL ක.කි.කැ.ම.
2. හැක්කැයි -B ක.කි.කැ.ම.
3. බිසවුන් උන් දිසාවෙහි - BGHL
4. ආදහන - L
5. මී පටලයක් - BDEGHL
6. යහන්පත් ව - BEGHL ම.ශ.
7. රජ්ජුරුවෝ - ACDJ
රජ්ජුරුවෝත් - BGL
රජු - ස.
8. මාළු - ABDGHL ස.
9. සම්පත් - BGHL ම.ස

Non-Commercial Distribution

යහනක්[1] පනවා යටකී පරිද්දෙන් දෙළොස් දහසක් රහතුන් වහන්සේට මී දන් දී බිසවුන් ද මී අනුභව කැරවූහ. සෙසු[2] දෙළ ද පසිඳිනා කැමති ව ඊට සමර්ථයෝ කවුරු දෝ හෝ යි පරීක්‍ෂා කරන්නාවූ රජ්ජුරුවෝ 'වෙළුසුමන නම් යොධයා සිතුව හොත් සියලු දෙළ ම සමෘඩ වේ' යි සිතා වෙළුසුමනයන් කැඳවා එපවත්[3] ඔහට කීහ. එතෙපුල් අසා වෙළුසුමනයා "ස්වාමීනි, ඉදින් මම සමර්ථයෙක් වී නම්[4] කැමති වූ දෙළ ගෙනෙන්නෙම් වේ ද" යි රජහුගේ බස් මුදුනෙන් පිළිගත. ඉක්බිති රජ්ජුරුවෝ ඔහට බොහෝ සත්කාර කොට අප්‍රමාද වෙව යි අවවාද දී නික්මවූහ.

එකල වෙළුසුමන යොධයා[5] තමාගේ ගෙට ගොස් නාවිසයකු[6] ගෙන්වා ගෙන කුඩුම්බිය පමණක් තබා ඉසකෙස් බාවා රජහුගෙන් ගෙඩි දුන්නා කොට පිට වැයිරි[7] දක්වා රත් පිළි දෙකක් හැඳ උදසන්හි ම ගෙන් පිටත් ව ගොස් දිගාමුඩුල්ලෙහිදී පෙරවරු බත් අනුභව කොට පස්වරු මහවැලිගඟ වඩමන් නම් තොටට ඇවිත් එතන ඊකවල[8] සිටි දහසක් දෙමළුන් එක් ව කැඳවමින් සිටියදී ම ගඟින් මෙතෙර ව මෙගොඩ ඊකවල සිටි දෙමළුන් ළඟට පැමිණ උන් හා එක් ව ගොස් එළාල රජ්ජුරුවන් දක වැඳ සිටියේ ය. රජ්ජුරුවෝ වෙළුසුමනයන් දැක "එම්බල සගය, තෝ කොයි සිට අයි ද" යි[9] විචාළහ. වෙළුසුමනයා "ස්වාමීනි, මම මාගම් සිට ආමි'යි කීය. එබසට රජ්ජුරුවන් කුමක් පිණිස අයි ද යි විචාළ කල්හි "එසේ වී නම් දේවයන් වහන්ස ඇසුව මැනව, කාවන්තිස්ස රජ්ජුරුවෝ එකාවන් ව නුඹවහන්සේගේ අගුණ තමන්ගේ අමාත්‍යවරුන්ට කියා ආක්‍රොෂ පරිභව බෙණෙති; මම ඒ අසා "ස්වාමීනි, එසේ නොබිණුව මැනව, එළාල රජ්ජුරුවන් වහන්සේ මහත් වූ රාජ සෘඩි ඇතිසේක; මහත් වූ ආනුභාව ඇතිසේක; ඉතා ධම්මිෂ්ඨසේක. ධර්මරජ් ජුරුවන් වහන්සේය; තමන්වහන්සේත් යුධ ක්‍රියායෙහි දක්‍ෂ යොධයාණන් වහන්සේය, නොයෙක් දහස් ගණින් යොධයන් විසින් පිරිවරනලද සේක, අසුරභටයන් විසින් පිරිවරනලද වෙපචිත්ති නම් අසුරේන්ද්‍රයා වැනිසේක, යම්කිසි සතුරු කෙනෙකුන් විසින් අනභිභවනීය සේකැ"යි යනාදීන් නුඹවහන්සේගේ ශෞරවීර්‍ය්‍යී ගුණයන්[10] වර්ණනා කොට කීමි. මාගේ මෙපමණ වැරැද්දක් සිත තබාගෙන තෙපි මාගේ ලඞකාද්වීපරාජ්‍යයට[11] සතුරු ව ඉන්නා දෙමළ රජුගේ ගුණ වර්ණනා කරව් ද යි කියා මාගේ ඉස කෙස් කප්පවා මරා තළා දුර්වල කොට කසාරෙදි අඳවා 'පලායව[12]

---

1. යානාවක් - BGHL
   යානක් - ස.
2. සෙසු - B
3. සියල්ල ම - BGHL
4. සමර්ථයෙම් වින්නම් - BGHL
5. යෝධයාණෝ - BGHL
6. නැවැමියකු - GH
   කරණැමියකු - C
   කරනැවියකු - ක.කි.ක.
   නාපිතයකු - ස.
   නහාපිතයකු - බෙ.
7. වැපිරි - L වෙරි - බෙ.ස.
8. රකවල - D
   රකලා - C
9. අවුදයි - BGH
10. ශෞරවීර්‍යය බලපරාක්‍රම ගුණයන් - මුද්‍රිත හැම
    සූරවීරගුණො - පාලි
11. ලංකා රාජ්‍යයට BDEH
    රාජ්‍යයට -L
12. පලය - ACHJ
    පලායා - D ස.
    පලායේ - L

Non-Commercial Distribution

කොල, තාගේ එළාලරජු සමීපයෙහි සැප සේ වසව"යි කියා මා එරවින් තෙරපීහ. එසේ හෙයින් මම නුඹවහන්සේ ළඟට ආමි" යි කීය. එබස් අසා එළාල රජ්රුජුවෝ "තොප ආයේ ම යහපතැ" යි ඔහු බස් ගිවිස "තොපගේ රටදී කවර කටයුත්තෙක නියුක්ත ව සිටියා ද" යි විචාරා අසුන් බලා සිටියෙමි යි අසුන් නැහෙනසේත් දනිමි යි යුධකරනසේත් දනිමි යි, කීපදවසකින් කාවන්තිස්ස රජු බැඳගෙන ඇවිත් නුඹවහන්සේට ගැති කොට පාවා දීලමි. ගහින් එතෙර අද පටන් නුඹවහන්සේගේ මය ගර්ජනා කොට සබා දෙයක් සේ වහයි බිණීය.

එළාල රජ වෙළුසුමනයන්ගේ වහසි බස් අසා බොහෝ සත්කාර සම්මාන කොට අස්සලයන්ට නායක කොට සථානාන්තර දුන්නේය. වෙළුසුමනයෝ අසුන් බලන්නාහු සියලු අසුන් ම පරීක්‍ෂා කොට බලා ලක්‍ෂණසම්පන්න රණමද්දව නම් වූ සෛන්ධව අසකු තෝරාගෙන කීප දවසක් ගිය කල්හි කුඹල් වීථියෙන් මහත් කළයක් ගෙන තිසාවැවින් පැන් ගෙනවුත් කොළොම් ඔය සමීපයෙහි සඟවා තබා නැවත මහනෙල් කෙතට ගොස් මහනෙල් මල් මිටියක් කඩාගෙනවුත් එම කොළොම් ඔය අස සඟවා තබා දෙවන දවස් උදයන ම රණමද්දව නම් අසු[1] පිටට පැනනැඟී රාජවීථිමධ්‍යයෙන් ගොස් නැහෙනහිරි වහසලින් පිටත් ව "එම්බල කොල වෙළුසුමනයා නම් මම ය"යි තමා නම අස්වා කියා "මම දන් රණමද්දව නම් සෛන්ධවයා ආදි වූ මේ මේ දෑ ඇරගෙන අපගේ රජ්ජුරුවන් වහන්සේ ළඟට යෙමි යි තොපගේ එළාල රජ්ජුරුවන්ට මෙපවත් කියාලව, සපන් කෙනෙක් මා අල්වා ගනුව"යි අඬගසා[2] අසුට විලුඹින් සන් කොට අශ්වවේගයෙන් දිවනුයේ කොළොම් හොය සඟවා තුබූ පැන් කළය හා[3] මහනෙල්මල් මිටිය ගෙන මීන්තලා සමීපයට ගොස් අසුගේ ගමන් වේගය[4] සන්හිඳුවා සෙමෙන් සෙමෙන් නික්මිණ.

මෙසේ වෙළුසුමනයන් වාසි කියා නික්මුණු බව එළාලරජ අසා තමාගේ මේල්දේව නම් ප්‍රධාන යොධයා කැඳවා "එම්බල සබඳ, තෝ යෝධයන් සියයක් හැරගෙන නොපමා ව දිව ගොස් වෙළුසුමනයා අල්වා මරා සෛන්ධවයා ඇරගෙන එව"යි කියා වෙත නම් සෙනෙවිරත් කෙනකුන් හා සමඟ නික්මවීය.

ඉක්බිති ඔහු බත් කා සියලු අලඞ්කාරයෙන් සැරහී මාණික්‍යමය කුණ්ඩලාභරණ පැළඳ දෙදෙන ම අජානීය සෛන්ධවයන් දෙදෙනකු පිටට පැනනැඟී සෙනාව ගෙන නික්මුණාහු මීන්තලා සමීපයට පැමිණියාහ. එකල වෙළුසුමනයා තමා ලුහුබැඳ[5] දිවනා දෙමළ යොධයා දක අසුන් වෙග දනවා[6] කීප විටෙක මණ්ඩලාකාරයෙන් ශීඝ්‍ර ව අසු පන්වා ඛුරසංඝට්ටනයෙන් ධූලි කඳු නංවා රජස් ධූලියෙන් එකාන්ධකාර කොට කැළයෙක් මුවා ව අසු පිට හිඳ ම කොපුවෙන් කඩුව හයා අශ්වවේගයෙන් දිවනා යොධයාට[7] කඩුව සරස් කොට පෑ අල්වා ගෙන හුන්නේය. එ කල්හි අශ්වවේගයෙන් දිවනා දෙමළ යොධයන්ගේ හිස් කැපිණ; වෙළුසුමනයෝ ඔවුන්ගේ හිස් දෙක බිම

1. සවින්දව අසු - L
2. අඬගා - මුද්‍රිත හැම, ස.
3. හා සමඟ - ඛෙ.ස.
4. වෙහෙස - BGH, ස.
5. ලුහුබැඳගෙන - මුද්‍රිත හැම,ස.
6. දන්වා -BCEGH, .ක.කි.ජ.
7. දෙමළ යොධයාට - මුද්‍රිත හැම, ස.

Non-Commercial Distribution

හිය නොදී අල්වාගෙන හිසකේ එක් ව ගැට ගසා අසුපිට තබා ගෙන දෙමළ යොධයන් ගෙනා අසුන් දෙදෙනා ද නොහැර අල්වාගෙන ඉර මුදුනේ සිටියදී ම මහවැලිගඟ වඩමන් නම් තොටට අවුත් වන. එකල්හි තොට රකවල සිටි දහසක් පමණ දෙමළ යෝධයෝ වේළුසුමනයන් දක මොහු අල්වව යි වටලා ගත්හ. එකල වේළුසුමනයා ඔවුන් හා යුධ කොට එතැන්හි ම දහසක් දෙනා මරා අසුන් හා සමඟ ගඟට පැන එතෙර වීය; එකල ගඟ එතෙර රකවල සිටි වඩ්ඪමාන නම් දෙමළා දහසක් පුරුෂයන් සමඟ අවුත් පළමු පරිද්දෙන් ම වේළුසුමනයන් වට කොට ගත; එවේලෙහි ද වේළුසුමනයා නොයෙක් සියගණන් මනුෂ්‍යයන් පොලුගසා වගුරුවා[1] එතෙනින් ද නික්මිණ. එතැන් පටන් වඩමන් නම් තොට දහස්තොටය යි කියා ද අස්මඬලා තොටය යි ද ව්‍යවහාර විය. මෙසේ වේළුසුමනයෝ එදවස් අසුන් ගෙන දිගා වැවින්[2] ඉස්සෝධා නහා පැන් බී යන්නාහු සවස්වේලෙහි ම මාගමට පැමිණ නුවර වහසල්දෙර අරවා ඇතුළු නුවරට වැද රජගෙයි දෙරකඩදී අසුපිටින් බැස අසුන් සනස්වා ගෙන ගොස් අස්හල බැඳ මානෙල් මල් මිටිය හා සමඟ පැන් කළය ද කුණ්ඩලාභරණ සහිත දෙමළ යොධයන්ගේ ඉස් දෙක ද යන සියල්ල ම රජ්ජුරුවන්ට දක්වූහ. ඒ දක සතුන්ට වූ රජ්ජුරුවෝ වේළුසුමනයන්ට බොහෝ සත්කාර කොට රන්තැටියක් ගෙන්වා එහි කඩුව ජේදූ පැන් පුරා රන්මිණි කොඩොල් සහිත දෙමළ ඉස් දෙක පිට බිසොවුන් සිටුවා තිසා වැවින් ගෙන ගිය පැනින් ඉස්සොධා නහවා රන්තැටියෙන් පැන් පොවා මානෙල් මල් පැළඳවූහ; එකෙණෙහි බිසොවුන්ට උපන් දෙළ සන්හිඳිණ.

ඉක්බිති කාවන්තිස්ස රජ්ජුරුවෝ නිමිත්තපාඨකයන් ගෙන්වා "මෙබඳු දෙළ උපන් කල එහි විපාක කවරේද" යි විචාළහ. එකල්හි නිමිත්තපාඨකයෝ එහි විපාක ප්‍රකාශ කොට කියන්නාහු:

සූරවීරබලූපෙතො - මෙරුසාරො ගුණාකරො
ධීරො ච මතිවික්ඛණෙතා[3] පුත්තො තෙ දෙව ජායති.

බත්තිංස දමිළෙ හන්ත්වා - කත්වා යුද්ධං අසාදිසං,
එසෙ කත්වානිමං ලඞ්කං - එකරජ්ජං කරිස්සති.

අනුරාධපුරෙ රම්මෙ - වසන්තො සාසනං ඉමං,
සොභෙස්සති යථා සොක - ධම්මරාජාව සාසනං.

යනාදීන් "දේවයන්වහන්ස, නුඹවහන්සේට ශෞරවීර පුරුෂබල පරාක්‍රමයෙන් යුක්ත මහමෙර සේ ධීරසාර ගුණ ඇති ධෛර්‍ය්‍ය සම්පන්න වූ ප්‍රඥ වික්‍රම ඇති පුත්‍රණුකෙනකුන් වහන්සේ[4] උපදනා සේක. උන්වහන්සේ මතු අසුරයුධ කරන්නා සේ අසමාන වූ මහත් වූ යුධ කොට දෙමළ දෙතිස් කඳවුරෙහි ඇණි ලා උන් දෙමළ මහසෙනඟ සාධා ලඞ්කාද්වීපය එකච්ඡත්‍ර කොට රාජ්‍යය කරනසේක. දිව්‍යපුරයක්

---

1. පොලුගෙන වගුරුවා - JL, ම.
   පොලුගසා වගුරුවා - බෙ.ස.
2. තිසා වැවින් - ACHJ
   දිගාවැවට ඇවිත් - L
3. ධීරො පුමතිවිකඛණෙතා - ක.සි.හැ.ම.
4. වහන්සේ (නැත) - ABCDEJ

Non-Commercial Distribution

වැනි ඉතා රම්‍ය වූ අනුරාධපුරයෙහි රජසිරිවිඳ වෙසෙමින් ධර්මාශෝක රජ්ජුරුවන් වහන්සේ සේ ම සර්වඥ ශාසනය බබුළුවනසේකැ"යි කීහ. එබස් අසා සන්තුෂ්ට වූ රජ්ජුරුවෝ නිමිත්තපාඨකයන්ට බොහෝ සත්කාර කොට ඉක්බිති බිසොවුන් බඩ දස එකඩ මස් පිරුණු කල්හි එක් දවසෙක විහාරයට ගොස් භික්ෂූන් වහන්සේ වඳිමින් ගිලනුන්වහන්සේට බෙහෙත් පස එළවා උපස්ථාන කෙරෙමින් ඇවිදිති. එකල්හි එක් භික්ෂු කෙනෙකුන් වහන්සේගේ ශරීරයෙහි මකුණන් කෑ තැන ගඩු දැක "ස්වාමිනි, මේ කිමෙක් දැ"යි විචාළහ. එබසට උන්වහන්සේ "මහ රජ, මකුණන් කෑ තැනැ"යි වදාළසේක. එබසට රජ්ජුරුවෝ 'ඇඳ ඇතිරිලි නැති වනැ'යි සිතා උතුරුසළුව දෙනු කැමැති ව තමන් ඉන එකසළුව ම හෙයින් දීපිය නොහී එතැනින් පසඟ මළුවට ගොස් ත්‍රිපිටකතිස්ස මහතෙරුන් වහන්සේ වැඳ එකත් පස් ව උන්හ. එකල්හි උන්වහන්සේ රජ්ජුරුවන්ට බුද්ධසිංහනාද නම් සූත්‍රයෙන් බණ වදාළසේක; රජ්ජුරුවෝ බණ අසා පැහැද උන්වහන්සේට උතුරුසළුව දෙනු කැමති වත් ඉන එක සළුව ම හෙයින් පසුබටුවාහු දනවෙතනා ඇති ව රජගෙට ගොස් පසුව සෙසු භික්ෂූන් වහන්සේට ද මහ තෙරුන් වහන්සේට ද ඇතිරිලි සිවුරු ආදි වූ දෙයට බොහෝ පිළි එවමි යි සිත සිතා උන්හ. එකෙණෙහි එක් කවුඩෙක් අවුත් අඹගස අතු අගරෙහි හිඳ රජ්ජුරුවන්ට කියනුයේ;

> දෙය්‍යධම්මෙසු මා රාජ - ඔසක්කාපය[1] මානසං,
> උප්පන්නං කුසලං චිත්තං - නෙවොස්සක්කන්ති පණ්ඩිතා.
> දෙහි දනං යථා කාමං - තව චිත්තානුකූලකං,
> අහං තෙ ආහරිං පච්ඡා - සාසනං තුට්ඨිදායකං

යනාදීන් "එම්බා මහරජ, දියයුත්තා වූ දනවස්තුවෙහි මඳකුත් සිත පසු නො බස්සුව[2], නුවණැති ශ්‍රද්ධාවන්තයෝ උපන්නාවූ කුශලචිත්තය පසු නොබස්වන්නාහු මය. තොපගේ චිත්තානුකූල වූ දනය ඒ තොප සිතූ පරිද්දෙන් ම දීපියව, මම තොපට සතුටු එළවන්නාවූ අසුන් පසක් ගෙනාමි" කීය. මෙසේ ද කියා "මහරජ, විහාරමහා දෙවි මහත් වූ පින් ලකුණු ඇති මනහර පුතණු කෙනෙකුන් වැදූහ; මේ එක් අස්නෙක. උපොසථකුලයෙන් එක් ඇතින්නක් ආකාශයෙන් අවුත් තිත්තවිල සමීපයෙහි සර්වාඞ්ගයෙන්[3] ධවල වූ බලයෙන් හා ලක්ෂණයෙන් සම්පන්න වූ ඇළි ඇත් පැටවකු වද ගියාය; මේ එක් අස්නෙක. වලාහක අශ්වකුලයෙන් එක් වෙළඹක් ආකාශයෙන් ඇවිත් ගෝණගම වෙළඹ පැටියකු වද ගියාය; මේ එක් අස්නෙක. ගොළුමුහුද පටපිළි ආදි වූ භාණ්ඩයෙන් පිරුණු නැව් සැටෙක් ඇවිත් සිටියේය. මේ එක් අස්නෙක. අතුරු වඩමන්[4] නම් පව් සමීපයෙහි රාජමානයෙන් සොළොස් කිරියක් පමණ තැන තල්කඳ පමණ රන් පැළ නැඟී සිටියේය; මේ එක් අස්නෙකැ යි මෙසේ මහුල් අසුන් පසකුත් ගෙනාමි. තව ද ගිරිපාද නම් දනව්වෙහි කොතුරුකඩු වෙහෙර මහානාග

1. ඔසක්කාපය - පිටපත් හැම
2. නොබසව - AJ
   නොබස්වා - BEGHL
3. සර්වාංගය - BDGH
4. උතුරු වඩමන් - ක.කි.සැ.බෙ.

Non-Commercial Distribution

නම් මහතෙරුන් වහන්සේ සත්තලයක් උස ආකාශයේ වැඩහිඳ පිරිනිවිසේක; මේ අනිත්‍යතාව ප්‍රකාශකරන්නාවූ අස්නක් ද ගෙනාමී" කියා 'ස්වාමීනි, සිත සතුටු වූ තැනට ම වස්ත්‍රය දුන මැනැවැ"යි කීහ. එබස් අසා රජ්ජුරුවෝ සිනා පහළ කළහ;

ඒ දැක තිස්ස මහ තෙරුන් වහන්සේ "මහරජ, කුමක් පිණිස සිනා පහළ කළ ද"යි[1] විචාළසේක. "තෙල කවුඩා කී අසුන් අසා සිනාසීපීමි" යි රජ්ජුරුවන් කී කල්හි තෙරුන් වහන්සේ ද රජ්ජුරුවන් පූර්වජාතියෙහි කළ කුශලය සිහි කොට සිනා පහළ කළසේක; ඒ දැක රජ්ජුරුවන්[2] "කුමක් පිණිස ස්වාමීනි සිනා පහළ කළ සේක් ද"යි විචාළ කල්හි "මහරජ තොප මරුපුල නම් ගම අමරුප්පල නම් කුමාර ව උපන් සමයෙහි වැලිදගබට නැඟූ තුල් පතාකයෙහි විපාකය අද තොප විසින් ලබනලද යි සිතා සිනාසීපීමි" වදළසේක. එබස් අසා රජ්ජුරුවෝ තමන් පූර්වජාතියෙහි[3] කළ කුසල් කවරේ ද යි විචාළහ. තෙරුන් වහන්සේ ද මූල කාකවර්ණ වස්තුවෙහි කී පරිද්දෙන් කාවන්තිස්ස රජ්ජුරුවන් පළමු ජාතියෙහි වැදි ව ඉපද කළා වූ ඒ සියලු ම කුශලය ප්‍රකාශ කොට වදළ සේක. මෙසේ තමන්ගේ පූර්වචරිතය අසා සන්තුෂ්ට වූ රජ්ජුරුවෝ තෙරුන්වහන්සේට උතුරුසළුව දන් දී කොතුරුපව් විහාරයට ගොස් මහනාග මහතෙරුන් වහන්සේ ආදහන කරවා ධාතු ගෙන දගබක් කැරවූහ.

ඉක්බිති තමන් හා තමන් පුත් කුමරුවන්ගේ පිනින් උපන් සළු සෝලි කසීසළු පටපිළි ආදී වූ නානාවර්ණ වස්ත්‍රජාතීන් හා රන් රිදී මුතු මැණික් රත්වළන් ඇත් අස් ආදි වූ සියල්ල ම ගෙන්වා ගෙන එයින් මහා සඞ්ඝයා වහන්සේට තුන් සිවුරු පසතුරුණු ආදිය පිණිස ඊට සුදුසු පිළී දන් දුන්හ. ගෝණගම දික්හුණ නම් බමුණුගම බමුණකු පළමු වෙළඹ පැටියා දැක ඇවිත් කී හෙයින් වෙළඹට දීඝහුණි යයි නම් තුබූහ[4]. තිත්තවිල බිලී බානට ගිය කඩුලු නම් බිලිවැද්ද ඇත්පැටවකු දැක ඇවිත් කී හෙයින් ඔහුට කඩුලැතාය යි නම් තබා පෙරහර දුන්හ. තව ද අන්තඃපුර පිටිපුර රට දනවු වැසියන් හා සමඟ තමන් පුතණුවන් උපන් දවස් පටන් ගෙන සත්දවසක් මුළුල්ලෙහි පැණකෙළි කෙළ උත්සව මඟුල් කළහ. මෑතභාගයෙහි ඒ කුමාරයන්ට නම් තබන මඟුලෙහි කපණඩික වණිබ්බකාදි වූ සොළොස් යාචකයන්ට මහදන් පවත්වා දෙළොස් දහසක් පමණ මහාසඞ්ඝයාවහන්සේට ආරාධනා කොට සිතන්නාහු "මාගේ මේ පුතණුවෝ මුළු ලක්දිව දෙමළුන් සාධා රාජ්‍ය එක්සත් කොට බුදුසසුන් බබුළුවත් නම් අට දෙනකු වහන්සේ උතුරු කොට ඇති දහසක් රහතුන් වහන්සේ සුපිළිසන් ව සිවුරු ගැටගන්වා[5] පාත්‍රය උඩුකුරු කොට අල්වා ගෙන වඩනා සේක්ව යි ඒ හැමදෙනා වහන්සේ ම පළමු කොට දක්ෂිණ ශ්‍රීපාදයන් එලිපත ඇතුළෙහි තබනසේක්ව යි ගොතම නම් තෙරකෙනෙකුන් වහන්සේ මපුතණුවන් අතින් අල්වා ගන්නා සේක්ව යි උන්වහන්සේ ම ශරණ ශීලයෙහි පිහිටුවන සේක්ව යි සිතූ හ. ඒ සියල්ල ම රජ්ජුරුවන් සිතූ පරිද්දෙන් ම විය. ඒ

---

1. පහළ කළ සේක් ද යි - BGHL
   පහළ කළා ද යි - E ක.සි.සැ.ම.
   පහළා ද යි - J
2. රජ්ජුරුවෝ - ABCDGHL
   රජු - ක.සි.සැ.ම.
3. පෙර ජාතියෙහි - BDEGHL
4. කළහ -බෙ.ස.
5.. ගැටවවුගන්වා - ක.සි.සැ.ම.ස.

Non-Commercial Distribution

දක සන්තුෂ්ට වූ රජ්ජුරුවෝ සඞ්ඝයා වහන්සේ වඩා හිඳුවා මිහිරි වූ ක්ෂීරපායාසයෙන් සන්තර්පණය කොට "ස්වාමීනි, මපුතණුවන්ට සුදුසු නමක් තිබුව මැනවැ"යි කීහ. එතෙපුල් අසා සඞ්ඝයා වහන්සේ මාගම නායකත්වය හා පියමහරජාණන්ගේ නාමාධියක් ගෙන ගාමණී අභය කුමාරයෝය යි නම් තුබූසේක.

ඉක්බිති එම අවුරුද්දෙහි ම විහාර මහාදෙවී අනිකුත් මහපිනැති පුතණු කෙනෙකුන් වද ඔවුන්ට තිස්සය යි නම් තුබූහ. ඒ කුමාරයෝ ද පළමු කී[1] අනොමදස්සී බුදුන් සමයෙහි සෘද්ධිමත් වූ අනොම නම් මහතෙර කෙනකුන් වහන්සේට වමත්සවී තනතුරු දෙන්නා දක තුමූ ද ඒ තනතුර පතා ඒකාසඞ්ඛ්‍ය කප්ලක්ෂයක් මුළුල්ලෙහි බොහෝ කුශලසම්භාරයන් රැස් කෙරෙමින් ආවාවූ පින්වත් මහතාණ කෙනෙක් මය. මෙසේ මහ කුසල් ඇති ව දෙව්කුමරුවන් මෙන් වැඩෙන ඒ කුමාරවරුන් දෙදෙනා බත් කවන මඟුල කන් විදින මඟුල ඉසකෙස් බහවන මඟුල යනාදි වූ ඒ ඒ මඞ්ගල්‍ය දිනයෙහි රහත් පන්සියයක් පන්සියයක්[2] දෙනා වහන්සේට මහදන් දුන්හ. තව ද ඒ කුමාරවරුන් දෙදෙනා දස දෙළොස් ඇවිරිදි වූ කල රජ්ජුරුවෝ ඔවුන් විමසනු පිණිස පන්සියයක් දෙනා වහනසේ රැස්කරවා මහදන් සරහා අහර වළඳවා වැළඳූ අනතයෙහි ඉඳුල් අහර තලියෙක ලවා ගෙන දෙබෑයන් බා[3] හිඳුවා තලියේ බත් තුන් කොටසක් කොට ඔවුන් ඉදිරියේ තබා දෙබෑයන්ට කියන්නාහු "එම්බා දරුවෙනි, අපගේ කුලදෙවතා වූ සඞ්ඝයා වහන්සේට විමතියක් [නොකරම්හ යි[4]] කිසියම් දෙයක් දන්නොදී නොකම්හ යි කියා මෙයින් එක් බත් කොටසක් කව"යි කීහ. එබස් ඇසූ දෙබෑයෝ "අපි දෙන්න ම සඞ්ඝයා වහන්සේට තුඹවහන්සේ වදළ ලෙස ම විමතියක් නොකරම්හ"යි කියා පළමු වන කොටස කෑවූය. නැවත රජ්ජුරුවෝ "අපි දෙබෑයෝ ඔවුනොවුන්ට විපක්ෂ නොවම්හ යි කියා දෙවන කොටස කව"යි කීහ; ඒ කොටසත් එසේ ම කියා අමාවක් මෙන් කෑවූය. නැවත රජ්ජුරුවෝ "දෙමළුන් හා සටන් නොකරම්හ යි දිවුට තුන් වන කොටස කව"යි කීහ. එබස් අසා තිස්ස කුමාරයෝ තමන් අතින් ගත් බත්පිඩ බිමට දමා පලා ගියහ; ගැමුණු කුමාරයෝ ද එසේ ම තමන් ගත් බත් පිඩ අතින් දමා හුනස්නෙන් නැඟී තමන් වසන ගබඩාවට ම වැද යහනට නැඟී අත පය අකුළුවා ගෙන වැද ඔත්හ.

එසේ වැදහොත්තාවූ ගැමුණු කුමාරයන් දක විහාරමහ දේවී "කිමෙක් ද පුත, ගැමුණු කුමාරයෙනි, මේ යහනේ අතපය දික් කොට සුවසේ නොසැතපී කුමක් පිණිස අතපය අකුළුවා ගෙන බැණ නොනැඟී සැතපෙවූ ද"යි කීහ. එබසට ගැමුණු කුමාරයෝ "මෑණියන් වහන්ස, කුමක් කියන සේක් ද; ගඟින් එතෙර දෙමළු වුව; මෑතින් ගොළුමුහුද වුව; කෙසේ ද මා අතපය දික්කොට සුව සේ වැද හෝ නෝ[5] යි කිවූය. කාවන්තිස්ස රජ්ජුරුවෝ එපවත් අසා ඔවුන්ගේ[6] අභිප්‍රාය දන කුමාරවරුන් දෙදෙන ම හස්තශිල්පය අශ්වශිල්පය රථශිල්පය ඛඩ්ගශිල්පය ධනුශ්ශිල්පය යනාදි වූ ශිල්පයෙහි නිෂ්පත්තියට පැමිණවූහ.

---

1. පළමු කී පරිද්දෙන් - L
2. පන්සියයක් (නැත) - ACJ
3. බා (නැත) - BGHL
   වඩා - ක.සි.ස.
4. නොවම්හ යි - පිටපත් හැම
5. හෝනෙම් - ක.සි.ස.ම.
   ඇතපෙන්නේ - L
6. ඔවුන් - J මුද්‍රිත හැම

Non-Commercial Distribution

ඉක්බිති ගැමුණු කුමාර[1] ක්‍රමයෙන් වැඩී සොළොස් ඇවිරිදි විය. ඒ කුමාර මහපින් ඇත්තේය. මහත් යශසට පැමිණියේය. ධෛර්‍ය්‍යයෙන් ද තෙජසින් ද බලපරාක්‍රමයෙන් ද යුක්තය. ඒ මහ පිනැති ගැමුණු කුමාරයෝ මාගම විසූය. කියන ලදුයේ මැයි මහාවංශයෙහි;

සො කමෙනාභිවඩ්ඪන්තො - අහු සොළසවස්සිකො,
පුඤ්ඤවා යසවා ධීමා තෙජො බලපරක්කමො.

හත්ථස්සථරුකම්මස්ස - කුසලො කතුපාසනො,
සො ගාමණි රාජපුත්තො - මහාගාමෙ වසී තද-යි.

ඉක්බිති කාවන්තිස්ස රජ්ජුරුවෝ පුතණුවන් ගැමුණුකුමාරයන්ට සේනාවක් දී ඇති කරනු පිණිස නන්දිමිත්‍රාදි දශමහා යොධයන් පාවා දුන්හ.

ඔහු කිනම්හ යත්. නන්දිමිත්‍රය, සුරනිමිලය, මහාසෝණය,[2] ගොඨයිම්බරය, ථෙරපුත්තාභයය, භරණය, වේළුසුමනය, ඛඤ්ජදේවය, ඵුස්සදෙවය, ලභියවසභය යන මොහු දසදෙන ය; ඔහු දස දෙන ම වෙන වෙන ම දස දෙනා බැගින් සියක් යොධයන් සිටුවූහ. ඒ සියක්දෙන තම තමන්ට දස දසදෙනා බැගින් දහසක් යොධයන් සිටුවූහ. ඒ දහසක් දෙන ද එසේ ම දස දස දෙනා බැගින් දසදහසක් යොධයන් සිටුවූහ. මෙසේ පළමු කී නන්දිමිත්‍රාදි වූ දසමහා යොධයන් ඇතුළු ව යොධසේනාව එකොළොස් දහස් එක්සිය දස දෙනෙක් වූහ. එසේ හෙයින් කියන ලදී;

එකාදස සහස්සං ච - දසුත්තර සතම්පි ච,
අහෙසුං පිණ්ඩිතා යොධා මහා බලපරක්කමා - යි.

එකල කාවන්තිස්ස රජ්ජුරුවෝ ඒ සියල්ලවුන්ට ම ගම් නියම්ගම් ක්‍ෂෙත්‍රවස්තූන් හා බොහෝ සම්පත් දී පුත් කුමරුවන් හා සම[3] කොට සිතා දසමහා යොධයන් ගැමුණු කුමාරයන්ට පාවා දුන්හ. බාල වූ තිස්ස කුමාරයන් රට රක්නා පිණිස[4] ගොවි තැන්බත් කරවන පිණිස බලවාහන දී දිගැමඩුලු[5] යවූහ.

එකල ගැමුණු කුමාරයෝ කාවන්තිස්ස රජ්ජුරුවන් සමීපයෙහි ම රැඳුණාහු තමන්ගේ බොහෝ වූ හස්ත්‍යශ්වරථපත්ති සඞ්ඛ්‍යාත චතුරඞ්ගිනී සේනාව හා දසමහා යොධයන් දැක "මේ සේනාව හැරගෙන දෙමළුන් හා සටන් කළ මැනවැ"යි සිතා එපවත් කාවන්තිස්ස රජ්ජුරුවන්ට සැළකරවූහ. රජ්ජුරුවෝ එපවත් අසා "සටනෙහි ජය පරාජය නම් කවුරුන්ට බවත් නොදනෙයි. දෙමළ සේනාව ඉතා බලවත්හ" යි සිතා පුත්කුමරුවන් නැසීයෙති යි සිතා ශොකයෙන් "එම්බා, අපට මහවැලිගඟින්

---

1. කුමාරයෝ -BDGHL, ක.කි.සඳ.ම.
2. මහාසේනය - BCGHL
3. සමහ - L
4. සඳහා - DEGHL
5. දිගාමඩුල්ලට - BGHL
   දිගාමඩුලු - ක.කි.සඳ.ම.

Non-Commercial Distribution

මෙතෙර පමණ; දෙමළුන් හා යුධයෙන් ප්‍රයෝජන කිම් ද"යි වැළකූහ. එසේ වැළකූව ද ගැමුණු කුමාරයෝ සටනෙහි කළ ලොභයෙන් දෙවැනි තුන්වැනි වත් කාවන්තිස්ස රජ්ජුරුවන්ට කියා යවා තුන්වාරයෙහි ම රජ්ජුරුවන් නොගිවිස්නා හෙයින් සතරවන වාරයෙහි "මපියාණන් වහන්සේ පිරිමියෙක් වී නම් මෙළේ මා සටනට යන ගමන් නොවළකන සේක් මය. ගැහැණියක හෙයින් වේ ද, මා සටනට යා නොදෙන්නේ" යයි පියරජ්ජුරුවන්ට කිපී "අදවක් පටන්[1] මපියාණන් වහන්සේ එකාවැල දහන්හු කට්සූත්‍ර තිසරපට ඔටුනු ආදි වූ පිරිමි ආභරණ නොපළඳනේය;[2] පාමුදු පාඩගම් රුවන් තනපට පමුතිලිංගම් පට්ටකාර මේ ආදි වූ බිසෝපළඳනා පළඳනේය" යි[3] කියා ගැහැණු ආභරණ කරවා කාවන්තිස්ස රජ්ජුරුවන් ළඟට යවූහ. ඒ දැක කාවන්තිස්ස රජ්ජුරුවෝ ගැමුණු කුමාරයන්ට කිපී "කොල, වහා රන් ඇකිල්ලක් කරවා ඔහු එසේ[4] රන් ඇකිල්ලෙන් මසා මීස ඊකගත නොහැක්කැ"යි උදහස් වූහ. එපවත් අසා ගැමුණු කුමාරයෝ පියරජ්ජුරුන්ට කිපී නොකියා ම මායාරට කොත්මලයට පලා ගොස් අප්‍රසිඩ ව විසූහ; මෙසේ පියමහරජාණන්ට නොකියා ම දුෂ්ට ව ගිය හෙයින් දුෂ්ටගාමණිය යි ව්‍යවහාර කළහ.

ඉක්බිති කාවන්තිස්ස රජ්ජුරුවෝ තුහුලු මහසෑ නම් දගබ බඳවා ධාතුකොත් පිහිටුවන පූජා දවස් සූවිසි දහසක් පමණ මහසඞ්ඝයා වහන්සේ රැස් කරවා දස මහා යොධයන් ගෙන්වා ගෙන ඉදිරියේ දවස තමන් ඇවෑමෙහි[5] රාජ්‍යසම්පත්තිය නිසා තමන් පුත් කුමරුවන් දෙදෙනාගේ කලහ විග්‍රහයෙක් වී නමුත් දසමහා යොධයන් දෙපක්‍ෂයට ම එක් නොවන සේ සහමැද දිවුරවාපීහ.

මෙසේ ඒ කාවන්තිස්ස රජ්ජුරුවන්[6] සූසැට විහාරයක් කරවා සූසැට ඔටුන්නක් පැළඳ සූසැට අවුරුද්දක් රාජ්‍යය කොට තමන් පුත් කුමරුවන් රක්නා සඳහා ම දසමහා යොධයන් සපථකරවා[7] රාජ්‍යය තැන්පත් කොට ඉකුත් වූ පසු තිස්ස කුමාරයෝ රජ්ජුරුවන් මළ පවත් අසා දිගැමඩුල්ලෙන්[8] අවුත් මහ පෙරහරින් මිනී ආදහන[9] කරවා සොහොන් අස් කොට එපවත් දුටුගැමුණු කුමාරයන්ට කියා නොයවා ම මෑණියන් විහාරමහා දේවීන් ද කඩුලැතා ද සෙසු රජසැපත් ද ගෙන්වා ගෙන බෑණන් කෙරෙහි භයින් ඔටුනු නොපැළඳ දිගැමඩුල්ලට ම ගියහ. එකල්හි මාගම උන් අමාත්‍යවරු එක් ව එපවත් කියා නොලස් ව වැඩිය මැනවැ යි දුටුගැමුණු කුමාරයන්ට පතක්[10] ලියා යවූහ. ගැමුණු කුමාරයෝ ඒ බව අසා නොලස් ව උදයන්හි ම කොත්මලයෙන් පිටත් ව ගුත්හලට[11] අවුත් එතැන්හි රකවල් ලවා මාගමට අවුත් එතැන උන් අමාත්‍යවරුන් හා කථා කොට ඔටුනු පැළඳ ඉක්බිති මෑණියන් විහාරමහා දේවීන් හා කඩුලැතා ගෙන්වා ගෙන එන ලෙස දිගැමඩුල්ල[12]

---

1. අද පටන් - BDEGHL
2. නොපැළඳ - BGHL
   නොපළඳනේය- ACDEJ, ක.කි.කැ.බෙ.
   නොපළඳනෝය - ම.
3. පළඳනේය - පිටපත් හැම
4. ඒ - මුද්‍රිත හැම, ස.
5. ඇවෑමෙන් - BGHL
6. රජ්ජුරුවෝ - ACJ, ක.කි.කැ.ස.
7. දෙපක්‍ෂයට ම එක් නොවන සේ සපථ කරවා B
8. දිගාමඩුල්ලෙන් - BCGHL
9. ආදහන - L
10. පත් - ACGJ
11. බුත්හලට - ක.කි.කැ.බෙ.
12. දිගා මඩුල්ලෙහි - BCGHJL

Non-Commercial Distribution

උන් තිස්ස කුමාරයන්ට දූතයන් යවූහ. එකල්හි තිස්සකුමාරයෝ "මපියාණන් වහන්සේ කාලක්‍රියා කළසේක, මැණියන් වහන්සේට උපස්ථාන කෙරෙමින් මෙහි ම වෙසෙමි" යි කියා මවුබිසවුන් නොඑවූහ. එබස් අසා දුටුගැමුණු රජ්ජුරුවෝ "මම වැඩිමහල්ලෙමි; එසේ හෙයින් මැණියන් වහන්සේට උපස්ථාන කිරීම මට ම වේද හාර" යයි මෙසේ තුන් වාරයෙක පත් යවා තුන්වන වාරයෙහි යවූ පතටත් මවුබිසවුන් ආ නොදෙන හෙයින් සතරවන වාරයෙහි "ඉදින් මේ වර ආ නුදුන්නාහු වී නම් ගෙන්වා ගන්නා සැටියේ ම[1] මැණියන් වහන්සේ හා කඩුලැතු ගෙන්වා ගනිමි" කොප කොට පත් අස්නක් යවූහ. එසේ කියා යවූවත් තිස්සකුමාරයෝ මවුබිසවුන් නොඑවුවාහු මය. එකල ගැමුණු රජ්ජුරුවෝ මෙවිට මම් ම යෙමි යි සේනා වාහන සනහාධ ව නික්මුණාහ. තිසස කුමාරයෝ ද "මා බෑණන් වහන්සේ වේ ද එනසේකැ"යි නැකුලුකමක්[2] වෙව යි "නායක රජ්ජුරුවන්වහන්සේ වේ ද"යි සරුවක් නොකොට තුමූ සේනාව පිරිවරා කඩුලැතු පිටට පැනනැගී සටනට සැරහී අවුත් පුලගුණ පිටියේදී දෙබෑයන්ගේ මහ සටන් වීය; එදවස් සටනේ දස මහා යෝධයෝ "දෙබෑයන්ගේ සටනකදී එකකෙනකුත් නතු නොවම්හ" යි රජ්ජුරුවන්ට පළමු සපථ කළ හෙයින් දෙබෑයන්ගේ සටන නොඉවසා සිටියාහ. එදවස් දුටුගැමුණු රජ්ජුරුවන්ගේ නොයෙක් දහස් ගණන් සේනාව[3] සටනේ මිය වැගිර ගියහ, එකල දුටුගැමුණු රජ්ජුරුවෝ තිස්ස නම් අමාත්‍යයා හා දීඝහුනි නම් වෙළඹ පමණක් ඇරගෙන බිඳී පලහ.[4]

තිස්ස කුමාරයෝ එසේ බිඳී පලා යන බෑණන් පසුපස්සෙහි සේනාව හැරගෙන "කොල, මෙසේ නික්මෙව"යි මහසෙනහ මෙහෙයමින් ලුහුබැඳ දිවූහ. එසේ දිවන තිස්ස කුමාරයන් හා ගැමුණු රජ්ජුරුවන්ට මධ්‍යයෙහි රහතන් වහන්සේ මහත් ගල් කදක්[5] මැවූසේක. ඒ දක තිස්ස කුමාරයෝ රහතන් වහන්සේ මැවූ ගල්කඳ[6] බව දන සේනාව ඇරගෙන පෙරලා දිගැමඩුලු ගියහ. කියනලදුයේ මැයි මහාවංශයෙහි:

අහු [ද්විත්තං][7] මහා යුද්ධං - චූලඞගණියපිට්ඨියං,
තත්‍ථ නෙකසහස්සානි - පතිංසු රාජිනො නරා.

රාජා ච තිස්සාමච්චො ච - වළවා දිඝථුනිකා,
තයොයෙ'ව පලායිංසු - කුමාරො අනුබන්ධි තෙ.

උභින්නමන්තරෙ භික්ඛු - මාපයිංසු මහීධරං,
තං දිස්වා භික්ඛුසඞ්ඝස්ස - කම්මං ඉති නිවත්ති සො-යි.

මෙසේ දුටුගැමුණු රජ්ජුරුවෝ බිඳී පලා යන්නාහු සප් පඳුරු[8] හොය දියවැල්ලා[9] නම් තොටට ගොස් සන්නාහය ගළවා තබා ඇමැත්තහු බණවා "බෑණෙනි තිස්සයෙනි, සාදුකට වඩනා[10] දුකෙක් නැත, ඉතා ම සයින් පීඩිතයෙමි.

---

1. ගෙන්වා ගන්නා සැටි මම දනිමි - ම.
2. නැකුලුපගකමක් - ක.කි.කැ, බෙ.ය.
3. සේනාව නටහ - ක.කි.කැ.ම.
   සේවකයෝ - L, ස.
4. පලා ගියහ. - BCGHL
5. කන්දක් - DL
   කදක් - ABCEGHJK ක.කි.කැ.ම.
6. ගල්කන්ද - DL
   කඳ -ABCEGHJK ක.කි.කැ.ම.
7. දිනං - පිටපත් හැම
8. කප්පකන්දර - පාලි,
   කප්පඳුරු -ස
9. දියවැල්ලා -AJ මුද්‍රිත හැම, දියවල්ලා - ස.
10. වඩා - ABCJL ක.කි.කැ.ම.

Non-Commercial Distribution

බතෙක් ඇද් ද"යි විචාළහ. එබස් ඇසූ තිස්ස නම් අමාත්‍යයා "ස්වාමිනි, රන්තැටියෙන් ගෙනා බතෙක් ඇත. මෙහෙ නිමවුව මැනැවැ"යි කියා රන්තැටියෙන් ගෙනා බත මැත් කොට රජ්ජුරුවන්ට දින. එවේලෙහි රජ්ජුරුවෝ පියවර බලා වේලා ඇති බව දන සඟුරුවන්ට දන් දී මුත් නොකම් සිතා ඒ රන්තැටියෙන් ගෙනා බත සඞ්ඝයා වහන්සේට දන් දෙන්ට ද තමන්ට ද අමාත්‍යයාට ද වෙළඹට ද මෙසේ සතර කොටඨාසයක් කොට බෙද තබා "බැණෙනි, සඞ්ඝයා වහන්සේට සිහා වඩනට අඩගාව"යි කීහ. එකල්හි අමාත්‍යයා "ස්වාමිනි, දන් මේ සඞ්ඝයා වහන්සේ සිහා වඩනට කලැ"යි කාලඝොෂා කෙළේය. එකල්හි පළමු මෙම දුටුගැමුණු රජ් ජුරුවන්ට ශික්‍ෂාපද දුන් ගොතම නම් තෙරුන් වහන්සේ පුවඟු දිවයින වැඩසිටි සේක් ඒ ශබ්දය දිව්කනින් අසා තමන් වහන්සේගේ අතවැසි වූ කුටුම්බිය තිස්ස නම් මහ තෙරුන් වහන්සේ කැඳවා එපවත් කියා නික්මවූසේක. උන්වහන්සේ ද යහපතැ යි ගිවිස ආකාශයෙන් අවුත් රජ්ජුරුවන් ඉදිරියෙහි වැඩසිටිසේක. එකල්හි රජ් ජුරුවෝ උන්වහන්සේ දක වැඳ අතින් පාත්‍රය ගෙන දන් දෙන්ට තිබූ කොටඨාසය හා තමන්ට තිබූ භාගය පාත්‍රයේ බහාපීහ; ඒ දක අමාත්‍යයා ද තමාට තිබූ භාගය පාත්‍රයේ බහාපීහ; වෙළඹ ද තමාගේ කොටඨාසය දෙනු කැමැති ව රජ්ජුරුවන් මුහුණ බලා කුරයෙන් සංඥ කළාය; ඒ දැක අභිප්‍රාය දන ඇගේ කොටඨාසය ද පාත්‍රයෙහි බහා තෙරුන් වහන්සේට බත් පාත්‍රය පිළිගැන්වූහ; කුටුම්බිය තෙරුන් වහන්සේ ඒ බත් පාත්‍රය ගෙන ගොස් ගොතම තෙරුන් වහන්සේට දුන්සේක. උන්වහන්සේ ඒ බත් පන්සියයක් දෙනා වහන්සේ හා සමඟ බෙද වළඳ එකී එකී නමක්ගෙන් බත් ආලොපයක් බැගින් පාත්‍රය පුරා "මේ බත් පාත්‍රය ආකාශයෙන් ගොස් රජ්ජුරුවන් ඉදිරියෙහි අත පොවා ගත හැකි[1] සැටියේ සිටීව"යි අධිෂ්ඨාන කොට අහසට අළසේක. එවේලෙහි පාත්‍රය එපරිද්දෙන් ම අවුත් ඉදිරියෙහි සිටියා දක තිස්ස නම් අමාත්‍යයා පාත්‍රය ගෙන[2] තබා රජ්ජුරුවන් බත් අනුභව කරවා තෙමේත් බත් කා වෙළඹත් බත් කැවීය. ඉක්බිති රජ්ජුරුවෝ පාත්‍රය සෝධා දියසිඳ තමන් පෙරෙවි සන්නාහය පුඹුළුවක් කොට පාත්‍රය පිට තබා "මේ පාත්‍රය තෙරුන් වහන්සේගේ අත්ලෙහි පිහිටාව"යි සිතූහ. ඒ සිත හා සමඟ පාත්‍රය අහසින් ගොස් තෙරුන් වහන්සේගේ අත්ලෙහි ම පිහිටියේය.

ඉක්බිති රජ්ජුරුවෝ මදක්[3] සැතපී මාගමට අවුත් නොබෝ දවසකින් සේනාව රැස්කොට ගෙන සැටදහසක් පමණ මහසෙනඟ පිරිවරා පඤ්චායුධ සන්නද්ධ ව වෙළඹ පිටට පැනනැඟී මලණුවන් හා සටනට නික්මුණාහ. එපවත් අසා තිස්ස කුමාරයෝ ද කඩුලැතු පිටට පැනනැඟී ආයුධ සන්නද්ධ ව මහ බලසෙනඟ[4] පිරිවරා ඉදිරියට ඇවිත් වන්හ. මෙසේ යුධ සන්නද්ධ ව ආවාවූ දෙබෑ රජුන් හා දෙසෙනඟ ඔවුනොවුන් දක සටන් කෙරෙමින් අවුත් එකතැන් ව සටන් කරන වේලෙහි සේනාව නස්නා දක ගැමුණු රජ්ජුරුවෝ සිතන්නාහු "ඉදිරියේ දවස මා කරන දෙමළ සටන් ඇත, සේනාව නට කල සටන් කොට ගත නොහැක්කැ"යි සිතා සටන් කොට කොට ම[5] තිස්ස කුමාරයන්ට[6] කියා යවන්නාහු "එම්බා, සටන් කොට සේනාව නොනසා

1. ඇසි - AEJ, බෙ.ස.
2. අතින් ගෙන - ක.කි.ඤ,ම.
3. මදක් ඔය -AEGHJL ස.
   මදක් ඔහ -B
4. මහාපාබලසෙනඟ - ACJ
5. සටන් නොකොට ම - L
6. තිස්සකුමාරයන්ට ම - ACDEJ
   තිස්සකුමාරයන්හට - BGH

Non-Commercial Distribution

මා සමීපයට නොබා එන්ට කියව'යි කියා මලණුවන් ළහට මිනිසුන් යවූහ. එබස් අසා තිස්ස කුමාරයෝ බැණන්ට කිපී තෝමරය අමෝරා මුණේ ඉදිරිකොට ඇතු ඉදිරියට විහිදුවාලූහ.[1] එවේලෙහි ගැමුණු රජ්ජුරුවෝ "තිස්සයා එන ගමන සැදහැයෙන්[2] එන ගමනෙක් නොවෙයි" සිතා කඩුව තරයේ ගෙන වෙළඹ පිට උන්නාහු තමන්ට සැහැසී තිස්සකුමාරයන් දමූ තෝමරය වළා[3] ඉදිරියට ගොස් ඇතු වට කොට මණ්ඩලාකාරයෙන් වෙළඹ විහිදුවා මහසෙනහ ලුහුබැඳ නොයෙක් දහස්ගණන් සේනාවෙහි[4] අවසරයක් දක[5] ඇතු හා ඇතුපිට හුන් තිස්සකුමාරයන් ඉස උඩින් වෙළඹ විහිදුවා අත තිබූ කඩුපිටින්[6] මලණුවන් පිට ලූ සනහාහය පිට ගැසූහ. එදවස් සටනෙහි තිස්ස කුමාරයන්ගේ නොයෙක් දහස්ගණන් සේනාව මළහ; සෙසු ඇනි ලා[7] සිටි මහ බල සෙනග ද[8] ඒ ඒ අත බිඳී දිවපීහ. කියන ලදුයේ මැයි මහාවංශයෙහි;

> රාජා වළවමාරුය්හ[9] - තිස්සො තු කණ්ඩුලං කරිං,
> ද්වෙභාතරො සමාගඤ්ජුං - යුජ්ඣමානා රණෙ තද.
>
> රාජා කරිං කරිත්වනෙතා - වළවා මණ්ඩලං අකා,
> තථාපි [ඡිද්දං නො][10] දිස්වා - ලඞ්ඝාපෙතුං මතිං අකා.
>
> ලඞ්ඝාපෙත්වාන වළවාය[11] - හත්ථිනිං භාතිනො සිරං,
> ඛග්ගා පහරි චම්මස්ස - යථා'ච්ඡිජ්ජති පිට්ඨියං.
>
> අනෙකානි සහස්සානි - කුමාරස්ස නරා තහිං,
> පතිංසු යුද්ධෙ යුජ්ඣන්තා - භිජ්ජි චෙව මහබ්බලං-යි.

මෙසේ වෙළඹ ලවා කඩුලැතු ඉස පන්වා සේනාව ද බිඳ[12] පැළවූ කල්හි කඩුලැතා සිතනුයේ "පිරිමි රජු ගැණු වෙළඹ ලවා මා ඉස පැන්වූයේ මා පිට හුන් තිස්ස කුමාරයාගේ නොපිරිමිකමින් වේ ද"යි සිතා තමා පිට හුන් තිස්සකුමාරයන් පිට ඉඳ නොදී සලසලා ගෙන ගොස් ගසකට නංවා තෙමේ ඇවිත් ගැමුණු රජ්ජුරුවන් දිට. තිස්ස කුමාරයෝ ගසින් බැස විහාරයක් බලා නික්මුණාහ; ඒ දක ගැමුණු රජ්ජුරුවෝ සේනාව හැරගෙන 'තිස්සයා නොමරා අල්ව"යි කියමින් පසුපස්සේ ලුහුබඳවා ගත්හ. තිස්සකුමාරයෝ[13] දිවගෙන ගොස් විහාරයට වැද එහි වසන තෙරුන් වහන්සේට වැද "ස්වාමිනි, ගැත්තවූ ගළවාගත මැනව"යි කියා ගෙ මැද සිටගත නොහී බැණන් කෙරෙහි ගත් භයින් තෙරුන්වහන්සේ සැතපුණු ඇඳ යටට වන්හ. එවේලෙහි තෙරුන් වහන්සේ ඇඳ යට උන් කුමාරයන්

---

1. විහුදුවාලූව - C
2. සිනැහැයෙන් - බෙ.
3. වළකා -BGHL ම.
4. සේනාව -ADJ ක.කි.සැ.ම.
   සේනාවගේ - C
5. දක - පිටපත් හැම, ක.කි.සැ.ම.ස.
   නොදක - බෙ
   ඡිද්දං නොදිස්වා - පාලි
6. කඩුමිටින් -C
7. අනිලා -ABCDGHJ
8. බලසේනාව ද -BDEGHL, ස.
9. වළවමාරුළෙහා - BEGHL
   වළව මාරුළ්හ -ACDJ
10. ඡිද්දනෙ - පිටපත් හැම
11. වළවා - CG පාලි
    වළවං - මුද්‍රිත හැම, මහාවංස,ස
12. බිඳී -BGH, මුද්‍රිත හැම ස.
13. තිස්ස කුමාරයෝ ගසින් බැස - පිටපත් හැම

Non-Commercial Distribution

නො පෙනෙන සේ ඇඳ වසා සිවුරක් අතුළ සේක. දුටුගැමුණු රජ්ජුරුවෝ කුමාරයන්[1] ලුහුබඳවා අවුත් විහාරය වට සේනාව සිටුවා තුමූ විහාරයට ඇවිත් තෙරුන් වහන්සේ වැඳ "ස්වාමිනි, තිස්සයා කොයි ද"යි විචාළහ. තෙරුන් වහන්සේ "මහරජ, තිස්සයා ඇඳ නැතැ"යි වදාළසේක. එබසට රජ්ජුරුවෝ "තිස්සයා ඇඳ යට සැඟවුණේ වනැ"යි සිතා එතෙකුදු වුවත් කුලදෙවතාවන් අතින් පටහැණි ව[2] විචාරීම අප සේ වූ තුනුරුවන් දස්[3] ශ්‍රද්ධාවන්තයන්ට සුදුසු නොවෙයි කල්පනා කොට නැවත තෙරුන් වහන්සේ වැඳ අවසර ඉල්වා ගෙන එතැනින් නික්ම විහාරය වට රකවල් ලවා තුමූ දෙරටුවේ රකවල් ගෙන සිටගත්හ. එකල තෙරුන් වහන්සේ තිස්සකුමාරයන් ඇඳක ලා සිවුරකින් වසා බාල සතරදෙනකුන් වහන්සේ ලවා මළ සඟුරුවනක් ගෙන යන පරිද්දෙන් කුමාරයන් ගෙන්වාගෙන ගොස් විහාරයෙන් පිටත් කළ සේක. එපරිද්දෙන් තිස්සකුමාරයන් ගෙන යන්නා දක ගැමුණු රජ්ජුරුවෝ කියන්නාහු "එම්බල තිස්සය, තා සේ වූ තුනුරුවන් ගැත්තෝ කුලදෙවතා ව සිටි ස්වාමිදරුවන් ඉසපිටින් යෙද් ද"යි කියා "ස්වාමිදරුවන් අතින් බලාත්කාරයෙන් උදුරා ගැන්ම අප වැන්නවුන්ට තරම් නොවෙයි. තෙල ස්වාමිදරුවන් තට කළ උපකාරය මතු සිහි කරව"යි කීහ. මෙසේ ද කියා ඉක්බිති සේනාව හැරගෙන මාගමට යන රජ්ජුරුවෝ 'මැණියන් වහන්සේ දුන්[4] කැඳවා ගෙන යෙම්[5] නම් බලාත්කාරයෙන් ගෙන ගියා සේ තිබෙයි[6] ඒ මතු ඇසුවන්ටත් නින්දා මය" සිතා තුමූ මාගම් ගොස් ආදර සහිත ව මහත් වූ පෙරහරින් දිගාමඩුල්ලෙහි උන් මැණියන් වහන්සේ[7] ගෙන්වා ගත්හ.

තිස්ස කුමාරයෝ සඞ්ඝයා වහන්සේගේ අනුග්‍රහයෙන් ගැළවී අප්‍රසිද්ධ වේශයකින් දිගාමඩුල්ලට ගොස් ගොධගත්ත[8] තිස්ස නම් මහතෙර කෙනකුන් වහන්සේ සමීපයට එළඹ දක වැඳ එකත් පස් ව සිට "ස්වාමීනි, මම මාගේ බෑණන් වහන්සේට බොහෝ අපරාධ කෙළෙමි, එබැවින් මම් ම ගොස් ඔබ දකගත නොහෙමි; නුඹ වහන්සේ මා කැඳවාගෙන ගොස් ඔබ දක්වාලා ක්ෂමාකැරවුව මැනවැ"යි කීහ. එබස් ඇසූ මහතෙරුන් වහන්සේ යහපතැ යි ගිවිස තිස්සකුමාරයන් අතට පාත්‍රය හා කුඩයත් දී කප්පියකාර ලේසයෙන් කැඳවාගෙන පන්සියයක් පමණ මහසඞ්ඝයා පිරිවරා මාගමට ගොස් රජගෙට වැද ඉණිඉස තිස්සකුමාරයන් රඳවා රජ්ජුරුවන් සමීපයට වැඩිසේක. රජ්ජුරුවෝ තෙරුන් වහන්සේ ඇතුළු වූ පන්සියයක් දෙනා වහන්සේ දක වැඳ වඩාහිඳුවා පතුල් ශෝධවා තෙල්[9] ගල්වා වළඳන්ට කැඳබත් ආදිය එළවූහ. තෙරුන් වහන්සේ පාත්‍ර පතින් පාමුව වසා වදාළසේක. එවේලෙහි රජ්ජුරුවෝ අහර පිළි නොගන්නා හෙයින් "හැයි සවාමිනි, වැඩි කාරිය කවරේද"යි

---

1. තිස්ස කුමාරයන් - L
2. අපට රැහැණි ව - CD
3. කෙරෙහි - L
4. දක L ක.කි.ඤ.බෙ.
5. ගියෙම් නම් - CGH
   යෙත්නම් - L
   ගියේ නම් - B
   යන්නෙම් නම් - ක.කි.ඤ.ම.
6. සිතෙයි - E
   සිතති - BGHL
7. වහන්සේ (නැත) - BDEGHL ම.
8. ගොධගත්ත- H, ම.පාලි, මහාවංස
   ගොධහත්ත - E
9. සුවඳ තෙල් - BGHL

Non-Commercial Distribution

විචාළහ. එකල්හි "මහතෙරුන් වහන්සේ මහරජ, තිස්ස කුමාරයන් දක්වනු පිණිස කැඳවාගෙන ආම්හ"යි වදළසේක. එබසට රජ්ජුරුවෝ "ස්වාමීනි, ඒ සොරු දැන් කොයි දැ"යි විචාළහ. එකල තෙරුන් වහන්සේ "තිස්ස කුමාරයන් ඉණිඉපස රඳවාලා ආම්හ"යි වදළසේක. එබස් අසමින් ම විහාරමහ දේවී සන්තුෂ්ට ව නො ලස් ව ගොස් ඉණිහිස සිටි තිස්සකුමාරයන් දැක ළං කොට ගෙන හඬා වැළප සිටියහ. දුටුගැමුණු රජ්ජුරුවෝ මහ තෙරුන් වහන්සේට කියන්නාහු ස්වාමීනි, ගැත්තහු කරා සත් හැවිරිදි සාමණේරකෙනකුන් වහන්සේ හා එක් ව තිස්සයා එවා නොපියා මෙතෙක් සඞ්ඝයා වහන්සේ ඇරගෙන ස්වාමිදරුවන් වඩනට කාරණ කිම් දැ"යි කියා නැවත තෙරුන් වහන්සේට කියන්නාහු "ස්වාමීනි, ගැත්තහුට දැන් වදරන අවවාදය ආදියෙහි ම වදළොත්[1] මෙතෙක් දහස් ගණින් සේනාව නොනස්නේ වේ ද, එබැවින් ගැත්තවුගේ වරද නැත; ස්වාමිදරුවන්ගේ වරද මය"යි කියා ඉක්බිති මලණුවන් ගෙන්වා ගෙන මහාසඞ්ඝයා වහන්සේ මැදයේ[2] දෙබෑයෝ ඔවුනොවුන් වැළඳගෙන පියමහරජාණන්ගේ ගුණ සිහි කොට අඬා වැලප ඉස් ශොධා නහා ඇවිත් සඞ්ඝයා වහන්සේ වැඳ පුද පසු ගමන් කොට අවසර ඉල්වාගෙන මාළිගාවට ඇවිත් වන්හ.

එයින් කීප දවසක් ගිය කල්හි මතුමහල්තෙලෙහි හුන්නාවූ රජ්ජුරුවෝ "පළමු කොට ගොවිතැන් කරවා රට බතින් සුභික්ෂ කොට ගෙන දෙමළුන් හා සටන් කළ මැනවැ"යි සිතා රාජ්‍යවාසින් නොපමා ව ගොවිතැන් කරන සේ සම්මත කොට තිස්ස කුමාරයන් දිගාමඬුලු යවා බොහෝ කොට ගොයම් කරවන්ට නියොග කොට තුමූ මාගම හිඳ කුඹුරුකිරි තනවා බොහෝ ගොයම් තැනවූහ. මෙසේ ගොයම්බත් කරවා රට බතින් සමෘද්ධ කොට ඉක්බිති සේනාවට ගම්බිම් ක්ෂෙත්‍ර වස්තු දැසි දස් ගවමහිෂාදීන් ස්ථානාන්තර සැලැස්වීමෙන් සේනාව සිත් ගෙන "දැන් දෙමළ කසළ දුරු කොට බුදුසසුන් ශුද්ධකිරීමට කලැ"යි සිතා ඇත් අස් රථ පාදති වූ[3] චතුරඞ්ගිනී සේනාව හා කඩුපලිස පලඟ පත්තිරම් අසි සත්ති තෝමර හෙණ්ඩිවාල[4] චන්ද්‍රවක්‍රාදී වූ ආයුධ ආදිය ද ජරඳු කුප්පායම් සීසත්[5] ආදි වූ සන්නාහ ද යන සියල්ල ම සමුද කරවා තමන් අල්වන මඟුල්කොන්තයෙහි ධාතු පිහිටුවා තුමූ ශක්‍රදේවේන්ද්‍ර ලීලායෙන් සැරහී මහත් වූ රාජානුභාවයෙන් යුක්ත ව මහබල සෙනඟ පිරිවරා අපරිමිත රාජ්‍යශ්‍රීන් දිලිහි දිලිහී තිස්ස නම් ආරාමයට ගොස් මහ සඞ්ඝයා වහන්සේ වැඳ "ස්වාමීනි, බුදුසසුන් වවා ගන්නා පිණිස මහවැලිගඟින් එතෙර යෙමි යි, වැඳ පුද දන් දී ගන්නා ලෙස මා හා කැටි ව වඩනට භික්ෂූන් වහන්සේ සලස්වා වදළ මැනවැ යි සංඝයා වහන්සේ දක්ම අපට මඟුල් නමුත් වෙයි ආරක්ෂා නමුත් එම වේ දැ"යි කීහ.

සංඝයා වහන්සේ ද එතෙපුල් අසා යහපතැ යි ගිවිස පළමු දෙබෑ රජුන් කරන සටන් නොවැළකූ දඬුවමට පන්සියයක් රහතන් වහන්සේ සැලැස්වූ සේක. එකල්හි රජ්ජුරුවෝ මාගම පටන් මහදිග[6] වල් කප්පවා එළි කරවා සංඝයා වහන්සේ ඉදිරි කොට තමන් මෑණියන් විහාරමහ දෙවීන් ද යානාවකින් ගෙන්වා ගෙන තුමූ කණ්ඩුල

---

1. වදළෝ නම් - ම.
   වදළේ නම් - බෙ.
2. වැද -J
   මද්‍යයේ - BGHL
3. පාදාදි වූ - පිටපත් හැම
4. හෙණ්ඩිවාලු - බෙ.ස.
5. සීසත් - ADEJ;
   සේසත් - L
   සීරාසත් - ම.
6. මගදිගට - BGHL

Non-Commercial Distribution

නම් ඇත්රජු පිටට පැනනැගී නන්දිමිත්‍රාදි දස මහ යොධයන් හා පසුව එක් වූ දය්‍ාසෙනයන් ඇතුළු ව එකොළොස් දහස් එක්සිය එකොළොස් මහා යොධයන් පිරිවරා මහබල සෙනඟ දෙපස සලස්වා මහත් වූ රාජශ්‍රීන් මහත් පෙරහරින් මාගමින් පිටත් ව අසුර විජයට නික්මුණු ශක්‍රදේවේන්ද්‍රයා සේ දෙමළුන් හා සටනට නික්මුණාහ. කියනලදුයේ මැයි මහාවංශයෙහි;

දුට්ඨගාමණී සො රාජා - කත්වාන ජනසඞ්ගහං,
කුන්තෙ ධාතුං නිධාපෙත්වා - ස යොග්ග බලවාහනො.

ගන්ත්වා තිස්සමහාරාමං - වන්දිත්වා සඞ්ඝමබ්‍රැවි,
පාරගඞ්ගං ගමිස්සාමි - ජොතෙතුං සාසනං අහං.

සක්කාතුං භික්ඛුනො[1] දෙථ - අම්හෙහි සහගාමිනො,
මඞ්ගලං චෙව රක්ඛා ච - භික්ඛුනං දස්සනං හි නො.

අදසි දණ්ඩ කම්මත්ථං - සඞ්ඝො පඤ්චසතං යතී,
භික්ඛුසඞ්ඝං තමාදය - තතො නික්ඛමි භූමිපො[2]

සොධාපෙත්වාන මලයෙ - ඉධාගමනමඤ්ජසං,
කණ්ඩුලං හත්ථිමාරුය්හ යොධෙහි පරිවාරිතො;
මහතා බලකායෙන - යුද්ධාය අභිනික්ඛමි -යි.

එදවස් රජ්ජුරුවන් හා කැටිව නික්මුණු සේනාව මාගම පටන් ගුත්හල[3] දක්වා අතුරු නොහැර චතුරක් සේ සිටගත්හ. මෙසේ මහ බලසෙනඟ පිරිවරා මාගමින් නික්මුණු රජ්ජුරුවෝ එදවස් ඇවිත් කළුවල ලැගුම් ගත්හ. එයින් නික්ම ඇවිත් ඒහළ ලැගුම් ගත්හ. එතැන සැතපී සංඝයා වහන්සේ වැඳ පුද දන් දී ඉක්බිති සේනාව කා බී සැරහුණු කල්හි එතැනින් නික්ම ඇවිත් ගීකිත්තේ ලැගුම් ගත්හ. එතෙනින් නික්ම ඇවිත් ගුත්හල ලැගුම් ගත්හ. එතෙනින් නික්ම ගිරිගම ලැගුම් ගත්හ[4] එයින් නික්ම ඇවිත් නියමුල්ලේ ලැගුම් ගත්හ. එතෙනින් නික්ම ඇවිත් මැදිගම් උයන්තොට[5] ලැගුම් ගත්හ. එතෙනින් නික්ම ඇවිත් තුන්ගම්කසටපිටියේ ලැගුම් ගත්හ. එතෙනදී සේනාව සන්නාහසන්නද්ධ ව විදින්නට කොටන්නට සැරහී සිටියාහු නැඟෙනහිර පිරිස් කෙළවර පටන් බටහිර පිරිස් කෙළවරට සතරගව්වෙක උරයෙන් උරය සැටී[6] සිටගත්හ. එවේලෙහි රජ්ජුරුවෝ පෙළසැදී සිටි සේනාව බලා ,දෙමළ මහ සෙනඟ වූ නියාවට මේ සේනාව යම්තමෙක; එතෙකුදු වුවත්

---

1. භික්ඛවො - ක.කි.ඥා.ම
2 නික්ඛමෙ භූපති - මුද්‍රිත හැම පාලි, මහාවංස, ස.
3. බුත්හල -BEGH
4. ඉඩම් ගත්හ. - ACDEJ, ස.
5. උයන්කොට - BGH ඛෙ.ස.
6. ගැවසී - C

Non-Commercial Distribution

ඒකාන්තයෙන් බුද්ධශාසනයෙහි තර[1] පැදැහැයෙක් මට ඇත්නම්, දෙමළුන් සාධා මේ නැසූ වෙහෙර සසුන් කරවමි යන මනදෙළෙක් මට හැම වේලෙහි ම ඇත්නම්, දෙවියොත් මට පිටිවහල් වන්නාහු මැයැ"යි සිතා එදවස් රෑ සැතපී උදසන්හි ධාතූන් වහන්සේ වැඳඳුද පන්සියයක් රහතන් වහන්සේට දන් දී රජ්ජුරුවෝ තුමූ ද කා බී සැරහී දස මහා යොධයන් ඇතුළු වූ මහාසේනාව ද කා බී සැරහී සිටි වේලෙහි ඔවුන්ට ප්‍රසාද දී ගැටබෙර පණාබෙර ඒකැස්බෙර මිහිඟුබෙර[2] මද්දළ පටහ ලොහොබෙර තලප්පර විරඳම් තම්මැට නිසාන රණරහඝොෂා සමුද්‍රඝොෂා ආදි වූ සිය දහස් ගණන් හෙරිතූයඝී ජාතින්[3] ඒකපැහැර ගස්වමින් රන්සක් රිදීසක් රුවන්සක් රන් සින්නම් රිදීසින්නම් රුවන්සින්නම් රන්දරා රිදීදරා දළදරා දළහං ලෝහං විජයොධවනි ඔත්තු තන්තිරි පටපිරිවිල් ආදි වූ කාහළ ජාතීන් ද ඒකපැහැර පුම්බවමින් යුගන්ධර සමීපයෙහි සාගරනාදයක් මෙන් මහත් කොලාහළ කරවා කෙළිමින් සෙමින් අසුරයුධයට නික්මුණු ශක්‍රදේවේන්ද්‍රයා පිරිවැරූ දේවතා සමූහයක් මෙන් ඒ දුටුගැමුණු මහරජ මහසෙනග පිරිවරා තුන්ගම් කසටපිටියෙන් නික්ම මියුඟුණයට අවුත් එහි වසන ජත්‍ර නම් දෙමළා හා සටන් කොට ඔහු ඇතුළු වූ දෙතිස් දහසක් පමණ දෙමළුන් මරා ගඟ බහා ඉක්බිති මියුඟුණයෙහි පළමු අප බුදුන්ගේ බුධරශ්මි නමැති අමෘතජලයෙන් ස්නානය කොට ලීලොපෙත වූ සමුද්‍ර නැමැති දිවසළුවක් හැඳ මහවැලිගං නමැති මුත්හරයක්[4] පැළඳ තුනුරුවන් නමැති සවර්ණාභරණයෙන් සැරහී සිටියාවූ ලඞ්කා නමැති රජහුගේ මුදුනෙහි පළඳවන[5] රජන[6] කිරිටයක් මෙන් අසූරියන් උස මියුඟුණු මහසෑය බැඳවූහ; එහි පිළිවෙළ කථාව ශ්‍රද්ධාසුමනා වස්තුවට මූලාරම්භයෙහි දක්වන ලද්දේ මය.

මෙසේ දුටුගැමුණු රජ්ජුරුවෝ මියුගුණු මහසෑය බැඳ පූජා කරවා මියුඟුණෙන් නික්ම අඹුටුවට ගොස් අඹුටුදෙමළා හා සටන් කොට ඔහු සාරමසකින් සාධා එනුවරින් නික්ම මහසෙනඟ පිරිවරා මහත් බලසෙනඟ ඇති සත්බෑ කෝට්ටය වටලාගෙන සත්බෑ දෙමළුන් සත්දෙනා ඇතුළු වූ බොහෝ දෙමළ සේනාව එකදවස් ම සාධා සේනාවට රන් ප්‍රසාද දී මහසෙනඟ සිත් ගෙන එයින් නික්ම අතුරඹට ගොස් වැද මහාකුණ්ඩ නම් දෙමළා හා යුධකොට ඔහු ඇතුළු වූ බොහෝ දෙමළුන් මරා දෙණගම් ගොස් ගවර නම් දෙමළා සාධා එයින් නික්ම හාලකෝළ නම් නුවරට ගොස් එහි වසන මහාඉස්සරිය නම් දෙමළා සාධා එයින් නික්ම ගොස් පොල්වත්තේ නාළික[7] නම් දෙමළා සාධා දිඝාභයගල්ලට ගොස් දිඝාභය නම් දෙමළා සාධා එයින් නික්ම කසාතොට[7] වසන වසකිසුඩ නම් දෙමළා හා සටන් කොට ඔහු සාරමසකින් සාධා එයින් නික්ම වෙය නම් නුවර වෙඨ නම් දෙමළා ද හාණික නම් ගම හාණික

---

1. දෑළුතර - H;
   තර ව - L
2. මිහිඟුබෙර මහබෙර - ස
3. හෙරිජාතින් - BDEGHL ම.
   හෙරිතූයඝීභාණ්ඩයන් - ඛෙ.ස.
4. මුක්තාහාරයක් - ABGHL
   මුත්හරක් - E
5. පලඳවන ලද - BCGH
6. රාජ - A
   රජන - BGH
7. නැලික - ABCDEGHJK
   නැලිකන - L
8. කසටතොට - BEGHL

Non-Commercial Distribution

නම් දෙමළා ද වසිටය නම් ගම වසිටය නම් දෙමළා ද ගාමණී නම් ගම ගාමණී නම් දෙමළා ද කුම්භ නම් ගම කුම්භ නම් දෙමළා ද නන්දික නම් ගම නන්දික නම් දෙමළා ද ඛානුක නම් ගම ඛානුක නම් දෙමළා ද තඹුන්නා නම් ගම තඹුන්නා නම් දෙමයිල්[1] දෙමළුන් දෙදෙනා හා සටන් කොට බොහෝ දෙමළුන් සාධා එයින් නික්ම දඹුත්තරුවේ දෙමළුන් හා සටන් කරන වේලෙහි සිය සේනාවය සතුරු සේනාවය යි යන වෙනසක් නැති ව එක සැරහුම් හෙයින්[2] එදවස් දුටුගැමුණු මහරජ තමාගේ සේනාව ඔවුනොවුන් නොරා ගත නොහී මරති යනු අසා ඒ සටන් බිමදී සත්‍යක්‍රියා කරනුයේ ,මම කිසි කලෙක්හිත් මට රාජ්‍ය සැපතක් පිණිස සටන් කරන්නෙම් නොවෙමි[3], සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේගේ පස්වාදහසක් හවුරුදු පවත්නා ශාසනය පිහිටුවනු පිණිස සටන් කෙරෙම් යි යන මනදෙළෙක් මට ඇම වේලෙහි ම ඇත්නම් ඒ සත්‍යක්‍රියායෙන් මාගේ මේ සේනාව හන් පිළී ද පළන් ආභරණ ද අතින් ගත් එලකායුධ ද යන මේ සියල්ල ම ගිනි ගෙන දිලිහුණාක් මෙන් වේව යි දෙමළුන්ට එසේ නොවේව"යි සත්‍යක්‍රියා කෙළේය; එකල්හි රජ් ජුරුවන්ගේ[4] සත්‍යක්‍රියාව එපරිද්දෙන් ම විය. කියනලදුයේ මැයි මහාවංශයෙහි;

අජානිත්වා සකං සෙනං - ඝාතෙන්ති සජනං ඉති,
සුත්වාන සච්චකිරියං - අකරී තත්‍ර භූපති.

රජ්ජසුඛාය වායාමො - නායං මම කදාචිපි,
සම්බුද්ධ සාසනස්සෙව - ඨපනාය අයං මම.

තෙන සච්චෙන මෙ සෙනා - කායොපගත භණ්ඩකං,[5]
ජාලවණ්ණිං 'ව[6] හොතූ'ති - තං තථෙව තදා අහු-යි.

මෙසේ ඒ නුවර සාධා මෙපරිද්දෙන් ඒ දුටුගැමුණු රජ්ජුරුවෝ ගඩ්ගාතීරයෙහි පටන් සුවිස්සක් පමණ දෙමළ කඳවුරු පැහැර විජිතපුරයට නික්මුණාහ. එකල සටන් කළ කළ නුවරවල ගැලවුණු දෙමළු අවුත් මහබලසෙනහ ඇති ඒ විජිතපුරයෙහි රැස්වූහ. එකල්හි දුටුගැමුණු රජ්ජුරුවෝ විජිතපුර සමීපයෙහි කඳවුරු බැඳ එනුවර ගන්නා කැමැති ව දසමහ යොධයන්ගේ බල විමසම් යි සිතා මගධනැළියෙන් සොළොස් නැළියක් පමණ රා ගන්නා ලෙස තික් දහසකින්[7]රා ඔඩමක් කරවා කහවණු තුනමුණක් රැස් කොට ඒ කහවණු රැස මත්තෙහි පුරා පිරූ රා ඔඩම තබා එකොළොස් මහා යොධයන් කැඳවා "සපන් කෙනෙක් තෙල්[8] රා බී නිමවා තික් දහසකින්[7] කළ රාඔඩම හා සමඟ තෙල[9] කහවණු තුනමුණ ගනුව" යි කීහ. එබසට යෝධයෝ මුයෙන් නොබැණ සිටියහ; එකල රජ්ජුරුවෝ ගොඨඉම්බරය ථෙරපුත්තාභය දඨාසෙනය යන යොධයන් තුන්දෙනා ද වෙන වෙන ම කැඳවා රා

---

1. දෙමල් - BGHL
   මාතුලභාගිණෙය්‍යා - පාලි
2. එක පැහැර හුන් හෙයින් - ACJ
3. නොවෙයි - ABCDEJL
4. ඒ රජ්ජුරුවන්ගේ - BDEGHL
5. භණ්ඩනං - AJ
6. ජ්වාලවණ්ණිංච - ස.
7. තිස්දහසකින් - ACDCJ,සා.කි.සඳ,බ.ස.
   මැතික් දහසකින්-L
   තිසසහස්සෙන - පාලි
8. මේ - ACJ
9. තෙලෙ - BGHL

Non-Commercial Distribution

බොන්නට නියොග කළහ. ඔහු තුන්දෙනා ද "දේවයන් වහන්ස, අපි රා බොන්නට නුසුදුස්සම්හ"යි කියා ප්‍රතික්ෂෙප කළහ; එකල රජ්ජුරුවෝ සුරනිම්මල නම් යොධයා කැඳවා එපරිද්දෙන් ම රා බොන්නට කීහ; එකල ඒ යොධයා කියනුයේ "දේවයන් වහන්ස, මම තෙල රා බොමි මය; මා රා පූ බව අසා බොහෝදෙන රැස් වෙති, එසේ[1] රැස්වූ මහජනයාට දෙන්නට තෙල කහවණු මඳ වේ ද"යි කී ය. එබස් අසා රජ්ජුරුවෝ අනිකුත් සාමුණක් පමණ කහවණු එතැන්හි ම රැස්කළහ; එකල නිම්ල[2] නම් යොධයා රන්සැල්[3] පුරා තුබූ ඒ රා සියල්ල ම නොතබා ම බී එතැන්හි රැස් වූ මහජනයාට කහවණු බෙද දින; මෙසේ රා පූ බැවින් ඕහට සුරනිම්මලය යි ව්‍යවහාර කළහ.

මෙපරිද්දෙන් රජ්ජුරුවෝ ඔහු විමසා නන්දිමිත්‍රයන් විමසනු කැමැති ව තමන්ගේ කඩුල නම් ඇතු රා පොවා කිපෙන්නට පුදුසු බස් බැණ නියපිට ගල් ගස්වා ඩවුර[4] සින්නම් සක් පණව[5] ලොහොබෙර තලප්පර වීරන්‍දම් ආදි වූ හෙරීතූර්‍යභාණ්ඩයන් එක පැහැර සොෂා කැරවූහ. එකෙණෙහි කඩුලැතා මුහුද දියකඳ දවාගෙන වඩාබාමුඛයෙන් පිටත්ව ගිය නරක ගිනිකඳක් සේ රළු පරළු වූයේ මහපොළොව යදඬෙන් ගසාලූ සණ්ඩාරයක්[6] සේ අනුරාව දෙවමින් ගුගුරන හඬින් දසදික් බිහිරි කෙරෙමින් කොපයෙන් පය ඇදලූ කෙණෙහි මකුළුහුයක් කඩන්නා සේ බැඳලූ යදම සුනුවිසුනු කෙරෙමින් හෙලුඹු දලියක් උපුටා ගන්නා සේ[7] බැඳලූ කඹය[8] පෙරලී සිට ඇන තුතු කෙරෙමින් සිටි ඇත්හල පැහැර ධූලි කෙරෙමින් බිඳපූ කඹය හකුළුවා දළ හස්සේ තබා ගෙන තමාගේ ජේයට[9] ඇනලූ ඇන්මෙන් මහපොළොව දදුරු කෙරෙමින් දිව ලුහුබඳවා පළාපූ මිනි දළඅග අවුණා[10] නගමින් ලෙහෙයෙන් රැඳීගිය මුහුණින් බැලුවන් ඇස් පියවමින් ලෙහෙ ධාරායෙන් රැඳීගිය දළ අගින් ගොන් මීවුන් ලුහුබඳවා ඇන පළමින් ඔවුන්ගේ අතුණු බහනින් වෙළීගිය දළින් බැලූ බැලූ දසා වැසියන් ඇස් පියවමින් සොඬ කට ලා ඉස සල සලා ගුගුරමින් මෙසේ කඩුලැත් අවුත් වීථියට වන. එවේලෙහි රජ්ජුරුවන් දක්නට එන නන්දිමිත්‍ර නම් යොධයාණෝ ඇතු කෙරෙහි ගත් හයින් සේනාව ඒ ඒ අත දිවන්නා දක සිතන්නාහු "මේ කඩුලැතා ඡද්දන්තකුලයෙහි උපන් හෙයින් ඇත් බලයෙන් සියක්කෙළ ඇතුන්ගේ බල ධරන්නේය, පුරුෂ බලයෙන් කෙළදහසක්[11] පුරුෂයන්ගේ බල ධරන්නේය, එතෙකුදු වුවත් ඇතකු දක හියකේ පිටිකර හෙළා ගෙන දිවීම මා සේ වූ යොධයක්හට තරම් නොවෙයි, අද ඇත්රජහට කියවියක් කියමි"යි වමත හකුළුවා දකුණතින් අත්පොළසන් දී මහත් කොට බැණ නැගී තමන් ඉදිරියට

---

1. එබැවින් එසේ - BGH; එබවින් - L
2. සුරනිම්ල - ACEJ
3. රාසැල -මුද්‍රිත හැම, ස. රන් - L
4. ඩගුර - BEGHL
5. සක්ලොහො - L
6. සණ්ඩාවක් - AEJ
7. උපුටන්නා සේ - A
8. කුඹය ක.සි.කැ.බෙ.
9. ජේවයට-ACJ, බෙ.ස. පෙවනට - ක.සි.කැ. ජේයාවට - ම.
10. අමුණ - ACDJ
11. යෙළදහසක් - බෙ.ස.

Non-Commercial Distribution

දිවගෙන අවුත් වත් ඇතු සොඬ හයා කරපිට තබා දැතින් දෙදළ තරයේ ගෙන උක්කුටුකයෙන් හිඳුවාපීහ. එවේලෙහි දුටුගැමුණු මහරජ මහත් වූ සන්තොෂයෙන් පිනා සතුති කෙළේ ය; මහසේනාව ද "නන්දිමිත්‍රයන්ගේ පුරුෂබල පරාක්‍රමයෙක් ඉතා ආශ්චර්‍ය්‍ය තියා ය" යි සන්තුෂ්ට ව එකපැහැර සතුති කෙරෙමින් මහත් කොට කොලාහළ පැවැත්වූහ. එකල්හි කඩුලැතා හා නන්දිමිත්‍රයන් පොර ගත් තන්හි පසුව කැරවූ ගම ඇතුපෝරය යි ව්‍යවහාර විය. කියනලදුයේ මැයි මහාවංශයෙහි;

ගණ්හිතුං ආගතං හත්ථිං - නන්දිමිත්තො කරෙහි තං,
උභො දන්තෙ ගහෙත්වාන - උක්කුටිං කාරයී තද.
හත්ථිනා නන්දිමිත්තො තු - යස්මා යත්ථ අයුජ්ඣි සො,
තස්මා තත්ථ කතොගාමො - හත්ථිපොරො'ති වුච්චති -යි.

මෙසේ දුටුගැමුණු රජ්ජුරුවෝ නන්දිමිත්‍රාදි වූ එකොළොස් මහායොධයන්ගේ බල විමසා විජිතපුර නුවර දෙමළ සටනට සැක නැතැ යි සනිටුහන් කොට විජිතපුරයට යන්නට[1] නික්මුණාහ; එපවත් අසා දෙමළු ද සන්නාහ සන්නද්ධ ව කඩුපලග අතලා ඉදිරියට දිව අවුත් වන්හ. එකල්හි ඔවුන් හා දසමහා යොධයන්ගේ අති භයානක වූ මහ සටන් විය; එකල්හි නැගෙනහිර වාසල්හි[2] වේළුසුමන නම් යොධයා ඇසුපිටට පැන නැගී යුද්ධකරනුයේ නොයෙක් සියදහස් ගණන් දෙමළුන් මැරීය; එකල්හි දෙමළු වේළුසුමනයන් කෙරෙහි භයින් තැතිගෙන අත තිබූ ආයුධ හෙළා අතුළුනුවරට වැද වහසල් දෙර අගුළු හෙළා ඉදි ඇද අට්ටාලවලට නැංගාහ. එකල දුටුගැමුණු රජ යොධයන් කැඳවා "එම්බා සගයෙනි, තෙපි හැම තම තමාගේ බලවාහන ගෙන සතරදිග සතර වාසල වෙන වෙන ම සටන් කරව" යි නියොග කෙළේය. එකල කඩුලැතා හා[3] නන්දිමිත්‍රය සුරනිමලය යන මේ තුන්දෙන දකුණු වාසල්[4] සටනට වන්හ; මහාසෝණය ගොඨයිම්බරය ථෙරපුත්තාභයය යන මේ යොධයන් තුන්දෙනා හා[3] සෙසු යොධයෝ ඉතිරි වාසල්වල[5] සටනට වන්හ. ඒ විජිතපුරය වනාහි වියලි අගලය කලල් අගලය දිය අගලය යි අගල්[6] තුනකින් පරික්ෂිප්ත ය; අටළොස්රියන් උස මහ පවුරකින් වටකරන ලද්දේය; ඒ ඒ තන්හි නොයෙක් සියගණන් මහා බල යොධයන් විසින් ගැවසීගත්තාවූ දිගපුළුළ ඇති මහ වාසලින් හා යදෙරින් යුක්ත ය; පවුර මුදුන ඒ ඒ තන්හි කරනලද අට්ටාල අන්තරට්ටාල බලකොටු ඉඩංගිනි කුරුබිලි පුලිමුගම් ආදියෙහි සිටියවුන් විසින් ගසන විදිනාලද අසි සත්ති තෝමර භෙණ්ඩිවාල කරවාලාධිවන්‍ද වක්‍රාදි වූ නානා ප්‍රකාර ආයුධ වර්ෂාවෙන් හා ශරප්‍රහාරයෙන් අතිභයානක ය. එසේ ම යතුරු දුනු යන්ත්‍ර පාෂාණ යවටාදියෙන් ද කකාරා දමන ලද යමල දුම්මල කැකුණමල ආදියෙන් ද අවසරයක් නැත්තේය.

---

1. විජිතපුර සටනට - DEGHL, ස.
2. වාසල - BCDEGHL
3. හා සමග - ස.
4. වහසල - ABDEHL
5. වහසල්වල - ABCDEHJL
6. අගල - පිටපත් හැම

Non-Commercial Distribution

එකල කඩුලැත් දිවගෙන ගොස් පෙරවා[1] අත දණ බිම ඔබා සිට දෙදළින් පවුරෙහි උළුපුනු ගල් ආදිය බිඳ හෙළා යදෙර බිඳිනට වන: එකල වහසල උඩසිටි දෙමළු අනෙකප්‍රකාර ආයුධ සමූහයන් හා රත්කරනලද යවට ගැසූහ; එසේ නොවැළක දෙර බිඳිනා බලා සකියවාපු යමලකඩ ඇතුපිටට දමූහ. එවේලෙහි කඩුලැතා වෙදනාවෙන් පීඩිත ව මහ හඬින් හඬා දිවගෙන ගොස් දිය අගලෙහි ගැලිණ; මෙසේ දියෙහි ගිලුණු ඇතු දක ගොඨඉඹර යොධයා කියනුයේ "එම්බල, තා මෙතෙක් ද බොන රා සේ නොවෙයි, දෙමළ වහසල් බිඳීම නම් ඉතා බැරි දෙයෙක. "කොල, බලා නොසිට පලා ගොස් පිළිවන් වී නම් යදෙර බිඳ හෙළා පියව"යි කීය. එබස් අසා කඩුලැතා අටගත්තාවූ අභිමාන ඇති ව මහජනයන්ගේ දෙකම් පළා බිහිරි කරන්නා සේ ගජිනා කොට කුඤ්චනාද කෙරෙමින් දිය දෙබේ කොට ගොඩනැගී නික්මිණ; එකල්හි ඇත්වෙදහු ඇවිත් ඇතු පිට ඇලුණු මලකඩ[2] ශොධා බෙහෙත් ගැල්වූහ.

එකල්හි ගැමුණුරජ ඇතුපිටට පැන නැගී අතින් කුඹ පිරිමැද "මා උපන් දවස් මාගේ පිනින් උපන් ඇත්රජ්ජුරුවෙනි, මේ සියලු ලක්දිව රාජ්‍යය තොපට දෙමි"යි මෙසේ මිහිරි තෙපුල් කියා ඇතු සතුටු කොට තමන් මෙහෙ නිමවන්නට තුබූ උතුම් වූ රාජභොජනය ඇතු කවා පිට වණය සිහින් සළුවෙන් වසා ඊපිට මීසම් සියක්පට අතුට ඊමත්තෙහි තෙලිසම් බැඳ ඇතු දෙර බිඳිනට අළභ. එ වේලෙහි ඇත්රජ කුල්මත් ව සෙණහඬ සේ[3] ගජිනා කොට ඇතුළු නුවර දෙමළුන් භය ගන්වමින් දිවගෙන ගොස් දළින් යදෙර බිඳ එලිපතට පයින් හැනලීය; එකල යදෙරබාව හා යදෙර මහ හඬින් ගුගුරා හිණ; එකල්හි වාසල දරුසමහාර බිඳ ගෙන ඇතුයට කොට හෙන්නා දක මහ බලඇති නන්දිමිත්‍ර යොධයාණෝ මාගේ රජ්ජුරුවන්ගේ මඟුලැත් වාහනය නැසුණ හොත් අලාභය'යි සිතා දිවගෙන ගොස් තමන්ගේ උරබාහුවෙන් පැහැර ඉස්ඹක් පමණ තැන් දමාපීහ. එදවස් කඩුලැතා පළමු තමා දෙදළ ගෙන කෙළින් හිඳුවාපු වෛරය හැර සතුටු ව තමා පිටට නහනු[4] කැමති ව නන්දිමිත්‍රයන් මුහුණ බැලී ය. ඒ බව දන නන්දිමිත්‍රයෝ 'එම්බල කොල, අන් කෙනකුන් කළ මහින් පෙර මම කවර කලෙක වතිම් ද" යි වහසි බස් බැණ උයින් අටලොස්රියන් පමණ මහ පවුර උරයෙන් පැහැර අටඉස්බක් පමණ තැන් බිඳ හෙළා සුරනිම්මලයන් මුහුණ බැලී ය; ඒ යොධයා ද "තුඹ බිඳි කඩින් මම වදිම් ද"යි තමා උරයෙන් පැහැර අටලොස්රියන් උස මහපවුර බිඳ ගෙන පෙනෙමින් දෙමළුන් හිස හෙන සෙණක් මෙන් නුවරමැද හිණ. ඒ බව දක ගොඨඉඹර නම් යොධයා ද ථෙරපුත්තාභය නම් යොධයා ද මහාසෝණ[5] නම් යොධයා ද වේළුසුමන නම් යොධයා ද භරණ නම් යොධයා ද ඛඤ්ජදෙව නම් යොධයා ද ඵුස්සදෙව නම් යොධයා ද ලභියවසභ නම් යොධයා ද දඨාසේන නම් යොධයා ද යන මෙකී මහා යොධයෝ හැමදෙන

1. පෙරව - ම.
   පෙරවා (නැත) - ක.කි.සැ.
2. යමලකඩ - D
3. සෙණ හඩක් සේ - ACJ
4. නැහෙනු - ABCDEFAHGJK
   පැන නැඟෙනු - L
5. මහාසෙන - ABCDJ

Non-Commercial Distribution

ම එකකු වන් කඩින් අතිකෙක් නොවැද වෙන වෙන ම එකි එකී දෙන අට අට ඉස්බක් පමණ තැන් බිඳහෙළා ඇතුළුනුවරට වන්හ. එකල වේළුසුමනයා අසුපිටින් නුවරට වැද ඝනාන්ධකාරයෙහි වට සිසාරනලද මහ ගිනි කඳක් සේ අසු විහිදුවා මහ කඩුවක් ගෙන දෙමළුන් මරන්ට වන; කඩුලැනා රථසකක් ගෙන දෙමළුන් මැරීය; නන්දිමිත්‍රයා ගැල්සකක් ගෙන අතලා දෙමළුන් තැළීය; ගොඨඉම්බරයා පොල්ගසක් කඩාගෙන දෙමළුන් තැළීය; මහාසොණ නම් යොධයා[1] තල්ගසක් උදුරාගෙන දෙමළුන් තැළී ය; ථෙරපුත්තාභය නම් යොධයා යගදවක් ගෙන දෙමළුන් තැළීය. එසේ හෙයින් කියනලදි:

හත්ථී ගහෙත්වා රථචක්කං - මිත්තො සකටපඤ්ජරං,
නාළිකෙරතරුං ගොඨො - නිම්මලො ඛග්ගමුත්තමං.
තාලරුක්ඛං මහසොණො[2] - ථෙරපුත්තො මහාගදං,
විසුං විසුං වීථිගතා - දමිළෙ තත්ථ චුණ්ණයුං -යි.

සෙසු යොධයෝ ද තම තමන්ට අභිප්‍රාය වූ ආයුධ ගෙන ඒ ඒ වීථිවල වෙන වෙන ම දිවෙමින් බොහෝ දෙමළුන් මැරුවාහු මය.

මෙසේ විජිතපුරය සාරමසකින් සාධා එයින් නික්ම ගිරිනිල්[3] නුවර ගොස් වැද ගිරි නිල්[3] දෙමළා මරා එතෙනින් නික්ම මානෙල් නුවර[4] ගොස් මානෙල් දෙමළා හා සටන් කොට ඔහු සාරමසකින් සාධා එයින් නික්ම එළිල්ලන්කඩ පැන කෙළිමින් සෙමින් සෙමින් ගොස් කසගලු ගල්පාකඩ කඳවුරු බැඳගෙන හිඳ එතැන්හි පොසොන්නරු නම් වැවක් බඳවා සේනාව හා සමඟ මහත් වූ පෙරහරින් පොසොන් මස දියකෙළියට පටන් ගත්හ.

එසමයෙහි එළාර රජ දුටුගැමුණු රජ්ජුරුවන් ආ බව[5] අසා තමාගේ ඇමතියන් හා සමඟ කථා කරනුයේ 'කිමෙක් ද අමාත්‍යවරුනි, තොප වැනි මන්ත්‍රිවරුන් ඇත්තේ මෙසේ වූ තැනට වේ ද; දුටුගැමුණු රජ මියුඟුණෙහි පටන් සියලු දෙමළ කඳවුරු පැහැර දන් අප උන්[6] මේ අනුරාධපුරය ගනුම්හ යි සැහැසී කසගලු ගල්පාකඩ[7] කඳවුරු බැඳ හිඳගත; ඒ දුටුගැමුණු රජ තෙමේ ද ශෞර්වීර්‍ය්‍ය සම්පන්න වූ මහාබල යොධයෙක; එ රජ්හුගේ සෙසු සේනාව හැර සටනෙහි පසු නොබස්නා බල සම්පන්න [වූ] යොධ සේනාව ම එකොළොස් දහස් එක්සිය එකොළොස් දෙනෙක් ල; ඔවුන් හා සමඟ කෙසේ සටන් කරමෝ ද"යි කීය. එබස් ඇසූ දීඝජන්තු[8] නම් යොධයා ආදිකොට ඇති එළාල රජ්හුගේ යොධසේනාව කියන්නාහු "මෙලොව නුවණින් පරීක්ෂා කොට කළමනා සියලු කටයුත්තෙහි කෙළ පැමිණ සිටියාවූ අප වැනි යොධ මන්ත්‍රීන් විසින් පිරිවරන ලද නුඹවහන්සේ කිසි සැකයක් නොසිතා සෙට දවස් ම සටන් කොට වදළ මැනවැ"යි කීහ. එබස් ඇසූ එළාල රජ්ජුරුවෝ දීඝජන්තු නම්

1. මහසොණයා - DEGHJL
මහාසෙනයා - C
2. මහාසෙණො - CD
මහාසොනෙ - AJ
3. ගිරිසිල් - CJL
4. මානලේ නුවර - ACJ, මානිල් නුවරට - L
මහෙලනගරං - පාලි, මහාවංස.
5. පවත් - H
6. අප ලත් - ACJ
7. ගල්පාබඩ - ABDEGHJL
8. දීඝජන්තු - JL පාලි.

Non-Commercial Distribution

යොධයා ඇතුළු වූ විසිමහා යොධයන් ප්‍රධානකොට මහත් වූ දෙමළ සේනාවට රන් ප්‍රසාද දී සිත් ගෙන දුටුගැමුණු රජ්ජුරුවන්ට කියා යවන්නාහු 'සටනට ඇවිත් එතැන ඉඳ පමා වන්නේ කිම් ද? සෙට දවස් ම සටනට වහා අව මැනවැ"යි කියා යවූහ.

එපවත් අසා දුටුගැමුණු රජ්ජුරුවෝ "සටනට කියා එවුව මනා ද? අපි ම එමින් සිටියම්හ; සෙට දවස් සටනට සැරහී සිටිය මැනවැ"යි කියා යවා නන්දිමිත්‍රයන් ආදි වූ තමන්ගේ මහා යොධයන් ළහට කැඳවා "එම්බා මෙනුවර සටන් සෙසු තැන කළ[1] සටන් සේ නොවෙයි, අසුරභටයන් වැනි සටනෙහි පසුනොබස්නා විසි මහායොධයන් හා මාරසේනාවක් වැනි මහබල සෙනඟින් පිරිවරනලද දෙමළ දෙතිස් කඳවුරට නායක වූ එළාල රජ්ජුරුවන් හා සෙට දවස් සටන් කෙසේ කරමෝ ද"යි විචාළහ. එබස් ඇසූ යොධයෝ "දෙවයන් වහන්ස, එක එළාල රජු[2] හා සේනාවක් තබා දසදහසක් යොදුන් දඹදිව සියලු රජුන් හා මහසෙනඟ අවුදිනුත් අප හැම ජයගත නොහෙන්නාහු මය; ඊට සැකයක් නොසිතුව මැනවැ"යි කීහ.

එබස් අසා දුටුගැමුණු රජ්ජුරුවෝ සතුටු ව සේනාවට ප්‍රසාද දී සන්නාහ සන්නද්ධ ව සටනට නික්මුණාහ. එපරිද්දෙන් ම එළාල රජ්ජුරුවෝ ද දෙවන දවස් සන්නාහ සන්නද්ධ ව මහාපර්වත නම් ඇතුපිටට පැන නැගී දෙමළ මහ සෙනඟ පිරිවරා අවුත් වන්හ. එවේලෙහි දුටුගැමුණු රජ්ජුරුවෝ මැණියන් විහාර මහා දේවීන් හා මන්ත්‍රණය කොට දීඝජන්තු නම් පතාක යොධයා පිණිස මැණියන්ගේ උපදේශයෙන් කරවන ලද දෙතිස් බලකොටුයෙහි ධවලච්ඡත්‍ර නංවා සර්වාභරණයෙන් සැරහූ කිහිරිහරින් කළ රජරූ දෙතිස්[3] බලකොටුවෙහි සිටුවා තෙතිස් වන මහා බලකොටුයෙහි තුමූ ම සිටගත්හ.

මෙසේ සටනට සැරහී දෙපෙළ ඇනි ලා සිටි දෙසෙනඟ ඔවුනොවුන් හා සටනට වැදගත් කල්හි එළාල රජ්ජුරුවන්ගේ දීඝජන්තු නම් යොධයා කඩුපලඟ ගෙන බිමින් අටළොස් රියනක් අහසට පැන නැඟී දෙවනු ව බිම නොහී අහසින් ම කරනම් පැන පැන ඇවිත් දුටුගැමුණු රජ්ජුරුවනැ යි සිතා පෙරට සිටි බලකොටුවෙහි රජරුව දෙපළු[4] කොට ගසා පළමුවන බලකොටුව බිඳ එපරිද්දෙන් ම සෙසු රජ රූ දෙතිස්[5] ද පොලු ගෙන බලකොටු බිඳ දුටුගැමුණු රජ්ජුරුවන් සිටි තෙතිස් වන බලකොටුවට නික්මිණ; එකල රජ්ජුරුවන් දසාවට යන දීඝජන්තුවා දැක සුරනිමල නම් යොධයා තමාගේ නම කියා ඉදිරියට පැන මදක් කඩුව විත්‍ර දක්වාලා "එම්බල දෙමළ, මා මෙතැන සිටියදී කොයි යෙයි ද? ඉදින් තෝ[6] සමර්ථ යොධයෙක් වී නම් මෙසේ පලා වර."යි බැණ හඬ ගිය[7]; එබස් අසා දීඝජන්තුවා "පළමුකොට මොහු දෙකඩ කොට ගසා පසුව මොහුගේ රජ්ජුරුවන්[8] මරමි" යි සිතා කොපයෙන් දිලිහී අහසට පැනනැඟී කඩුව මිරිකා අල්වාගෙන සුරනිමලයාට අභිමුඛ ව බස්නට වන; එකල්හි සුරනිමලයා තමා ඉස්මුදුනට ඔහු බස්නා දැක තමා අත

1. සෙසු තැන්වල - GH;
   සෙසු තැන් කළ -L
2. රජකු - G
3. රජ රූ දෙතිසක් දෙතිස් - BDEHL
4. දෙපොළු - ABCDEGJ
5. එක්තිස - BDEGH
6. තොපි - BEGL
   තෙපි - H
   තොප - A
7. හඬ නැඟීය - ක.සි.සං.ම.
8. රජු - BDEGHL

Non-Commercial Distribution

කුඹු පලහය මිටින් ගෙන ඉස වසා සිට ගත; එකල දීඝජන්තුවා "පලහය හා සමග [මොහු][1] දෙකඩ කොට පළමි"යි සිතා පලහයට ගැසීය, එකෙණෙහි සූරනිමිලයා පලහය අතින් හැරපීය; දීඝජන්තුවා පලහය හා සමග බිම හිණ; එකල සූරනිමිලයා බිම හුණුවාවූ ඔහු නැගී නොසිටිනා තෙක් දෙපළු කොට ගැසීය. එකෙණෙහි ඵුස්සදෙව නම් යොධයා සිය ගණින් ගසන සෙණහඬක්[2] සේ සක පිඹපීය; එවේලෙහි දෙමළු උන්මත්තභාවයට[3] පැමිණියා සේ විසඳ වූහ; එකල දෙමළ මහසෙනහ බිඳී ඒ ඒ දිග දිවන්ට වන්හ; එළාල රජ ද "දීඝජන්තුවා හුණුකල කුමන සටන් ද" යි බිඳී ඇතු පන්වාගෙන පලාගියහ. එදවස් දුටුගැමුණු රජහුගේ සේනාව නොයෙක් දහස් ගණින් දෙමළුන් මරා ඒ ඒ තැන හිස්වරු[4] කළහ; එසේ ම දෙමළුන්ගේ ලෙහෙවතුර වැවට වැද ඒ වැව දිය කැළඹිණ; එසේ හෙයින් ඒ වැව එතැන් පටන් කලතා වැව ය යි ප්‍රසිඩ වී ය. දුටුගැමුණු රජ්ජුරුවෝ "මා හැර සෙසු කෙනෙක් එළාල රජු නොමරව"යි ඒ යුධභූමියෙහි බෙරලවා තුමූ ද සන්නාහ සන්නඩ ව එසේ ම සන්නාහ බහා රන් පර්වතයක් මෙන් සරහන ලද කඩුලැතු පිටට පැන නැගී බිඳී දිවන එළාලරජු ලුහුබඳවා දිවගෙන ගොස් අනුරාධපුර නුවර දකුණු වාසල්[5] සමීපයට පැමිණ එතැන්හිදී රජදරුවන් දෙදෙනාගේ සටන් විය. කෙසේ ද යත්? එළාල රජ දුටුගැමුණු රජු ඇන මරමි යි තෝමරය දමීය; දුටුගැමුණු රජ එළාල රජු දමූ තෝමරය වළහා[6] තමා නැගි කඩුලැතු ලවා එළාල රජු නැගි ඇතු අන්වා තමා අත තෝමරයෙන් එළාල රජු ළෙන් ඇන පිටින් නැංවිය; එකල ඇතු හා සමග එළාල රජ එතැන්හි ම හිණ; මෙසේ ජයගන්නාලද සතුරු සටන් ඇති දුටුගැමුණු මහරජ ලඞ්කාව ඒකාතපත්‍ර කොට මහත් වූ චතුරංගිණී සේනාව පිරිවරා දෙදෙව්ලොව දිවසෙනහ පිරිවැරූ සක්දෙවු රජහු මෙන් මහපෙරහරින් අනුරාධපුර නුවරට වන. කියන ලද මැයි මහාවංශයෙහි:

> සන්නද්ධො සයමාරුය්හ සන්නද්ධං කණ්ඩුලං කරිං,
> එළාරං අනුබන්ධන්තො - දක්ඛිණද්වාරමාගමී.
>
> පුරෙ දක්ඛිණද්වාරම්හී - උභො යුජ්ඣිංසු භූමිපා,
> තොමරං ඛිපි එළාරො - ගාමණී තං අවඤ්චයි.
>
> විජ්ඣාපෙසි ච දන්තෙහි - තං හත්ථිං සකහත්ථිනා
> තොමරං ඛිපි එළාරං - සහත්ථී තත්ථ සො පති.
>
> තතො විජිත සඞ්ගාමො - සයොග්ගබලවාහනො,
> ලඞ්කං එකාතපත්තං සො - කත්වාන පාවිසී පුරං--යි.

ඉක්බිති දුටුගැමුණු රජ නුවර බෙර ලවා වටින් සතර ගවුවක් පමණ තැන මහාජනයා රැස්කොට එළාල රජුගේ මළ ශරීරයට මහත් වූ සත්කාර කරවා රන්සිවිගෙයකින් ගෙන ගොස් ආදහන කරවා සෙහොන් හස් කොට ඔහු දවූ තැන

1. ඔහු - පිටපත් හැම
2. සෙනහඬ - EHJL
3. උන්මත්තභාවයට - ABCDGHL
4. හිස්වර - BGHL
5. වහසල් - ABCDEHL
6. වළා - AEDJ
   බලා - ක.කි.ඤ.
   වළකා - L බෙ.ස.

Non-Commercial Distribution

එළාල නම් දගැබක් කරවා "මා ඇතුළු ව[1] එන දවස රජදරුවන් ඇතුන් අසුන් ඉදේලි කුණම් නැඟී මෙතැනින් නොයා යුතුය, බෙරත් නො ගැස්වුව මැනවැ"යි පෙරහර තබා දී ශිලාලෙඛයක්[2] සිටුවූහ. මෙතැන් දක්වාත් රජදරුවෝ ඒ ස්ථානයට පැමිණි කල බෙර ආදිය නොගස්වන්නාහු මය.

ගැමුණු මහරජ පළමු යම් දවසෙක විජිතපුරය පැහැර ගත් ද එදවස් ම දීඝජන්තු නම් යොධයා එළාල රජු කරා එළඹ තමාගේ බෑණ වූ භල්ලුක නම් යොධයාගේ බල රජ්ජුරුවන්ට කියා ඔහු එන පරිද්දෙන් දඹදිවු පත් යවීය. එපවත් ඇසූ භල්ලූකයා එළාල රජ්ජුරුවන් දවු සත්වෙනි දවස් සැට දහසක් යොධයන් පිරිවරා එඩවූ නැඟී මාවටු තොටට[3] අවුත් බැස එළාල රජු මළ පවත් අසා ලජ්ජාවෙන් "නැවත රට නොයෙමි, සටන් කෙරෙමි"යි මාවටු තොටින් නික්ම කොලඹලා නම් ගම කඳවුරු බැඳ උන්නේය. එපවත් අසා දුටුගැමුණු මහරජ සන්නාහසන්නද්ධ ව කඩුලැතු පිටට පැනනැගි මහසෙනග පිරිවරා මහත් වූ ශ්‍රීශෞභාග්‍යයෙන් මහත් වූ පෙරහරින් සටනට නික්මුණාහ. ඵුස්සදෙව නම් යොධයා ද පඤ්චායුධ සන්නද්ධ ව ගැමුණු රජහු නැගි ඇතුගේ පශ්චිමාසනයෙහි උන්නේය. භල්ලූක නම් යොධයා ද පඤ්චායුධ සන්නද්ධ ව ඇතකු පිටට පැනනැඟී මහ සෙනඟ පිරිවරා ගැමුණු රජ්ජුරුවන්[4] අභිමුඛයට අවුත් වන. එදවස් කඩුලැතා ඔහුගේ වේග මඳ වන පිණිස සෙමෙන් සෙමෙන් පසුබැස යෙයි; ගැමුණු රජු හා සේනාව ද ඇතු හා සමඟ පසුපස්සෙන් බටහ. එවේලෙහි දුටුගැමුණු රජ ඵුස්සදෙව නම් යොධයන්ට[5] කියනුයේ "මේ ඇත්රජ පෙර[6] අප අටවිසි මහසටනක් කරන කල පසුනොබට; දැන් භල්ලූකයාගේ සටනෙහි කුමක් පිණිස පසු බසී දැ"යි විචාළහ. එතෙපුල් අසා ඵුස්සදෙව නම් යොධයා "දේවයන් වහන්ස, ජය අපට මය; මේ ඇත් රජ ජයබිමක් සොයා පසුබස්නේය; එබැවින් ජයබිමකට පැමිණි කල එතැන්හි සිටින්නේය"යි දන්වීය. ඉක්බිති කඩුලැත් ද පසු පස්සෙන් බැස අනුරාධපුර සමීපයෙහි පුරදෙවියා කෝවිල් අස මහා විහාර සීමා අන්තයෙහි සිටගත. එවේලෙහි භල්ලූකයා ද ගැමුණු රජු අභිමුඛයට අවුත් "මයිලණුවන් මැරූ මේ රජහු මුඛයට[7] විදිමි"යි හීයක් හිඳුවාගෙන 'කිමෙක් ද මහරජ'"යි හඬගීය[8], ගැමුණු රජ ද කඩුතලයෙන් මුඛය පියාගෙන "කිමෙක්ද නිවට දෙමැළැ"යි බැණ නැංගේය; බිණු රජහුගේ මුඛයට[7] විදිමි යි භල්ලූකයා හීයක් හැරපීය; ඒ හීය ගොස් කඩුපිට වැදගෙන බිම හිණ; එවේලෙහි රජ්ජුරුවෝ කට තුබු ලා රස බිමට දමූහ[9], එදක භල්ලූකයා දුටුගැමුණු රජු මුඛය තර කොට විද්දෙමි යි සිතා මහ සොම්නසින් මල්වරහඬ පැවැත්වීය.

එකෙණෙහි රජ්ජුරුවන්ට පශ්චිමාසනයෙහි හුන් ඵුස්සදෙව නම් යොධයා රජ්ජුරුවන් පැළඳි කුණ්ඩලාභරණය පැහැරගෙන භල්ලූකයා මුඛයෙහි සැරයක් විද්දහ;

---

1. මා ඇතුළු වූ - BDEGHL
2. ලේඛනයක් - BCD. මුද්‍රිත හැම, ස.
3. මාවටුවට - C
4. රජු - DEL
   රජ - BGH
5. යෝධයන්ට - ACGJ
   යෝධයාණන්ට - BDEHL
6. පෙර අප - BDEGHJ
   පෙර - AC
   පෙර අප විසින් - L
7. මුඛය - BEGH
8. හඬ නැඟීය - ක.සි.කු.ම
9. නැමූහ - ක.සිකු.ම

Non-Commercial Distribution

එවේලෙහි චිත් කා රජ්ජුරුවන්ට පය ලා හෙන්නහුගේ[1] දණ නැවත ශරයකින් විද රජ්ජුරුවන් දසාවට හිස ලා හෙළීය; මෙසේ හල්ලුකයා හුණු කල්හි මහ සෙනඟ එක පැහැර ජයනාද පැවැත්වූහ. කියන ලද මැයි මහාවංශයෙහි;

රඤ්ඤො පච්ඡා නිසින්නො සො - ඵුස්සදෙවො මහබ්බලො,
කණ්ඩං ඛිපි මුඛෙ තස්ස - ඝට්ටෙන්තො රාජකුණ්ඩලං.

රාජානං පාදතො කත්වා - පතමානස්ස තස්ස තු,
ඛිපිත්වා අපරං කණ්ඩං - විජ්ඣිත්වා තස්ස ජණ්ණුකං.

රාජානං සීසතො කත්වා - පාතෙසි ලහු හත්ථකො,
හල්ලුකෙ පතිතෙ තස්මිං - ජයනාදෙ පවත්තථ[2]-යි.

එදවස් ලබනලද ජය ඇති දුටුගැමුණු රජු නුවරට අවුත් වන් කල්හි ඵුස්සදෙව නම් යොධයා රජ්ජුරුවන්ගේ කුණ්ඩලාභරණය පැහැර තමන් සැරය විදි දඬුවමට තමාගේ කන්වැලින් ලෙහෙ ගෙන රජහට දක්වීය; රජහු මේ කිමෙක් ද යි විචාළ කල්හි 'ස්වාමීනි, එදවස් මා නුඹවහන්සේගේ කුණ්ඩලාභරණය පැහැර සැරය විදි හෙයින් ඒ අපරාධයට දඬුවමැ"යි දන්වීය. එවේලෙහි රජ්ජුරුවෝ 'මාගේ සතුරන් සාධන පිණිස විද්දව; ඉන් තොපට වරදෙක් නැතැ"යි කියා ඉක්බිති එදවස් විදි ඊදඬුදෙක ගෙන්වා ගෙන පගලියෙන් පගලිය අමුණා එල්ලකොට සිටුවා ඒ උසට මසුරන් ගොඩක් කොට ඵුස්සදෙවයන්ට දෙවූහ. මෙසේ දුටුගැමුණු රජ්ජුරුවෝ දෙමළ දෙතිස්කඳවුරෙහි දෙතිස් දෙතිස් දහස් බැගින් ඇති ලා උන් ද සලක්ෂ[3] සුවිසිදහසක් පමණ දෙමළ මහසෙනඟ හා දෙමළ දෙතිස් රජුන් සාධා ලඞ්කාරාජ්‍යය ඒකාතපත්‍ර කොට ඔවුනු පැළඳ දස්කම් කළ යොධයන්ට හිමි පමුණු රත්රන් ගව මහිෂාදි වූ වස්තු දී මේ[4] ස්ථානාන්තර සලස්වා ඉක්බිති එක් දවසෙක තමන්ගේ සියලු සම්පත්තීන් ප්‍රසාදකර වූ ප්‍රාසාදයෙහි ඇතුළු මතු මහල්තලයට පැන නැඟී දිව යහනක්[5] බඳු වූ ශ්‍රියහන් මස්තකයෙහි සැතපි දිව්‍යසම්පතක්[6] හා සමාන තමන්ගේ සම්පත්ති සමූහය බලා ගිය ජාතියෙහි කළාවූ සුචරිත පින්කම්න් මේ සා මහත් සම්පතක් ලදිම් යි සතුටු ව නැවත තමන් විසින් මරනලද අටළොස් කලඟයක්[7] දෙමළුන් සඳහන් කොට ඒ නිසා තමන්ට මතු ස්වර්ගමෝක්ෂ දෙකට අනතරායෙක් වේ දෝ හෝ යි සැක සිතා මහත් වූ දොම්නසට පැමිණියහ.

එකල්හි පුවඟු දිවයින වසන රහතන් වහන්සේ රජ්ජුරුවන් සිතූ සිත දිව්‍යඥානයෙන් දන රජ්ජුරුවන් අස්වසනු සඳහා රහතුන් අටදෙනකුන්වහන්සේ එවා වදළසේක; ඒ අටදෙනාවහන්සේ ඇවිත් රජ්ජුරුවන්ට කියා යවා මාළිගාවෙහි මතුමහතල්තලයට නැගිසේක. රජ්ජුරුවෝ තෙරුන්වහන්සේ දක වැඳ අසුන් පනවා වඩා හිඳුවා වැඩි කාරණ කිම් ද යි විචාළහ. එවිට තෙරුන් වහන්සේ "මහරජ,

1. හෙන්නානුගේ - ABGHL, ක.කි.ඤ.
2. අවත්ථ - CJ
අවච
අවච්ඡන - DE; අවච්ඡථ - L
අවත්ථි - පාලි
3. සලක්ෂ - C, ක.කි.ඤ.මෙ.
4. වස්තු දීමෙන් - BCDH
5. දිවයහන් - BEGHL
6. දිව්‍යසම්පත් - ACJ, ක.කි.ඤ.ම.
7. කලංකයක් - C, ක.කි.ඤ.
කලංගයක් - J

Non-Commercial Distribution

තොප සිතට උපන් දෙම්නස් කාරණයක් දන ඒ සැකය අරවන පිණිස ආම්හ"යි වදළසේක. එබස් අසා රජ්ජුරුවෝ "එසේ ය ස්වාමිනි, අටළොස් කලංභයක්[1] පමණ දෙමළුන් මරා මෙසේ මහත් යුධ කළාවූ මා විසින් බොහෝ පවු රැස් කරන ලද; ඒ අකුශලකර්‍මය නිසා මට මතු ස්වර්ගමොක්ෂ දෙකට බාධාවෙක් වේ දෝ හෝ යි සිතා දෙම්නස් වීමි"යි කීහ. එබසට තෙරුන් වහන්සේ "මහරජ, තොප එතෙක් දෙමළුන් මැරුවත් මතු තොප ලබන ස්වර්ගමොක්ෂ සම්පත්තියට ඒ නිසා වන අන්තරායෙක් නැත; ඒ දෙමළුන් අතුරෙන් තොප විසින් මරනලද්දේ නම් ශරණශීලයෙහි පිහිටි එකකු හා පංචශීලයෙහි පිහිටි මනුෂ්‍යයකු ඇතුළු ව එකකු හා භාගයක් මය; සෙසු දෙමළු ආචාරශීලය පමණකුත් නැති[2] දුශ්ශීලයහ; මිථ්‍යාදෘෂ්ටි ගත්හ; එබැවින් දෙමළු ගෙරින් බල්ලන් මියන්නා සේ මළහ"යි වදළසේක. කියනලද මැයි මහාවංශයෙහි;

> සග්ගමග්ගන්තරායොච - නත්ථි තෙ තෙන කම්මුනා,
> දියඩ්ඪ මනුජාචෙත්ථ[3] - ඝාතිතා මනුජාධිප.
>
> සරණෙසු ඨිතො එකො - පඤ්චසීලෙසු චා'පරො,
> මිච්ඡාදිට්ඨී ච දුස්සීලා සෙසා පසු සමා මතා-යි.

මෙසේ රජ්ජුරුවන්ට පව් නැතැ යි කියන්ට කාරණ කිමයත්? මේ දුටුගැමුණු රජ්ජුරුවෝ නම් එකාසඞ්ඛ්‍යය කප්ලක්ෂයක් පිරූ පාරමිතා ඇති කෘතාධිකාර මහතාණ කෙනෙක; මෙයින් ගොස් තුෂිත භවනයෙහි ඉපද අපමණ දිව්‍යසුරු වළඳ මෛත්‍රී[4] බුදුන් සමයෙහි මිනිස් ලොව ඉපද සසුන් වැද මහණ ව දකුණත්සවූ තනතුරු ලැබ බුදුසසුන් බබුළුවා අමාමහ නිවන් දකිති; එබැවින් මේ රජ්ජුරුවන්[5] සසර විසීමෙක් නැත; සසර බොහෝ කල් විසීමක් නැති හෙයින් පාපයට අවකාශ නැතැ යි දන මෙතෙක් කාරණ සලකා[5] රජ්ජුරුවන්[6] සිත දෙම්නස් හරවා සතුටුකොට පව් නැතැ'යි වදළසේක.

මෙසේ තෙරුන් වහන්සේ වදළ කාරණ අසා සතුටු ව අස්වැසුණු රජ්ජුරුවෝ ඒ රහතන්වහන්සේ වැඩ අවසර දී නික්මවා ඉක්බිති එක් දවසෙක සිතන්නාහු 'මාගේ මවුපියෝ[7] දෙදෙන බාල අවස්ථායෙහි ම සඞ්ඝයා වහන්සේට දනක් නොදී කිසිවක් අනුභව නොකරන්ට කියා අප දෙබෑයන් දිවුරවාපීහ, එබැවින් දනක් නොදී කෑ දෙයෙක් ඇද්දේ හෝ[8] නැද්දෙ හෝ"යි සිතා පරීක්ෂාකරන්නාහු සිහි මඳ ව දන් නොදී කෑ මළමිරිස් පැස්සක් සඳහන්කොට "මා විසින් කෙළේ මහා අපරාධයෙක, ඊට දඬුවමක් කළ මැනවැ"යි සිතා මිරිසවැටිවිහාරය කරවන්නට පටන්ගෙන තමන්ගේ ධාතු සහිත ජයකොන්තය පිහිටුවා ධාතු පූජා පිණිස පිදූ අනර්ඝ වස්තු හැර

1. කලංභයක් - C, ක.කි.ඝ.
   කලංගයක් - A
2. නැත -A
3. මනුජාචෙත්ථ - ABCEGHL
4. මෛත්‍රී - ABCDEGHJ, මෛත්‍රෙය - අන් හැම
5. විසීමක්...........සලකා - මේ කොටස ස.නැත.
6. රජ්ජුරුවන්ට - B
7. මවුපිය - BGHL
8. හෝ (නැත) - BCEGHJL

Non-Commercial Distribution

එකුන්විසිකෙළක් පමණ ධන වියදම් කොට මිරිසවැටි මහසෑය බඳවා එහි සඞ්ඝාවාස ද සමෘද්ධකොට විහාරවින්‍යාස කරවා එතැන්හි රැස්වූ ලක්‍ෂයක් පමණ භික්‍ෂූන් වහන්සේ හා අනූදහසක් පමණ භික්‍ෂුණීන් වහන්සේට දගබ සහිත ඒ විහාරය පිළිගන්වා සත් දවසක්[1] මහදන් දී පූජා කැරවූහ.

ඊට ඉක්බිති එක් පෙලෙක ටැම් සතලිසක් බැගින් සතලිස් පෙලෙක එක්දහස් සසියයක් පමණ මහටැම් පිහිටුවා අනඝ වස්තු සතරක් හැර තිස්කෙළක් පමණ ධන වියදම් කොට දහසක් කන් කුළින්[2] හා සියක් ගබඩාවෙන් යුක්ත වූ නවමහල් ලෝවාමහපාය කරවා භික්‍ෂු භික්‍ෂුණීන් වහන්සේගෙන් එක් ලක්‍ෂ අනූදහසක් පමණ මහසඞ්ඝයා වහන්සේට පිළිගන්වා සත්දවසක් මුළුල්ලෙහි මහත් වූ දන පූජා පැවැත්වූහ.

තව ද අනඝ වස්තු සූවිස්සක් හැර කෙළදහසක් පමණ ධන පරිත්‍යාග[3] කොට තුන්සිය සැටක් පමණ විහාරාරාමයෙන් සරහා ශ්‍රී ලඞ්කාද්වීපයට ආභරණයක් වැනි වූ රුවන්වැලි මහසෑය බඳවා දෙළොස් හැවිරිදි සොනුත්තර නම් සාමණේර කෙනකුන් වහන්සේ යවා අනන්ත නම් නාගරාජයා කෙරෙහි තුබූ ද්‍රෝණයක් පමණ ධාතු ගෙන්වා එම ඒ මහසෑයෙහි පිහිටුවා සයානූකෙළක් පමණ රහතන් වහන්සේට සත්දවසක් මුළුල්ලෙහි මහදන් දී මාහැඟි කොට චෛත්‍ය පූජා කැරවූහ.

මෙසේ ඒ දුටුගැමුණු මහරජ කුශලක්‍රියාවෙහි අප්‍රමාද ව සූවිසි අවුරුද්දක් මුළුල්ලෙහි ලක්දිව රාජ්‍යය කරනුයේ නවානුවක් විහාර කරවා එකුන්විස්සක් මහා පූජා කැරවී ය. තව ද සූවිසි වාරයෙක බුදුන් උදෙසා ම වෙසක් පූජා සූවිස්සක් කැරවීය. මේ ශ්‍රී ලඞ්කාද්වීපයෙහි හැම භික්‍ෂූන් වහන්සේ නොවරදවා තුන් වාරයෙක තුන් සිවුරු ඇතුළු ව අටපිරිකර දන් දී සඞ්ඝපූජා කැරවීය. සත් සත් දවස් බැගින් ශ්‍රී ලඞ්කාද්වීපය පස් වාරයෙක තුනුරුවන්ට පූජා කෙළේය. තව ද සුදු සිනිඳු පහන් පියලි අඹරා එළගිතෙල ගලා තෙල් වත්කොට දෙළොස් තෙනෙක දවස් පතා දෙළොස් දෙළොස් දහස් බැගින් යන්ත්‍ර පහන් පූජා කැරවීය. ලඞ්කාද්වීපයෙහි අටළොස් තැනෙක වෙදහල් නංවා වෙදවරුන්ට භාණ්ඩාරයෙන් මිල දී ලක්දිව රෝගී වූ සියලු ගිලනුන්ට පිළියම් කරවා වෙදවරුන් කී ලෙස නිරන්තරයෙන් පවත්වන සැටියේ[4] ආහාරය දෙවූහ. තව ද දවස් පතා සූසාලිස් තෙනෙක මනා කොට කරන ලද මීපිඩු තබා දුන්හ; එසේ ම සූසාලිස් තෙනෙක නිරන්තරයෙන් තෙල් උපුල්වා පිස[5] කිරිබත් තබා දුන්හ; තව ද සූසාලිස් තෙනෙක එළගිතෙල බදනාලද පුලුබ්බදරා[6] හා සමඟ සූපව්‍යඤ්ජන සහිත බත් තබා දුන්හ. තව ද ලඞ්කාද්වීපය මුළුල්ලෙහි සියලු විහාර ම නොවරදවා සූවිසි අවුරුද්දක් ඇතුළත මසකට අට අට දවසක්

1. සත් දවසක් මුළුල්ලෙහි - ස.
2. කන්කළු ගෙවලින් - ක.කි.කු.ම.
3. වියදම් - D
4. පවත්නා සැටියේ - AJ
   ප්‍රත්‍යය සැටියේ - BEGHL, ස.
   පථ්‍ය සැටියේ - ම.
5. පිසූ - ම.
6. පුලුබ්බදනා - A

Non-Commercial Distribution

බැගින් ම සාරපෝයෙහි පහන්පූජාවට තෙල් තබා දුන්හ; ඒ හැම තන්හි ම මැදහත් ව පැමිණි අධිකරණ විචාරන සේ නියොග කොට අධිකරණ ශාලා ද කැරවූහ. මේ මුළු ලක්දිව ගර්භිණී ගැහැණුන්ට දුරු මිරිස් ලුණු ද ප්‍රසව කළ විනිනඹුවන්ට[1] පිළී ද භාණ්ඩාරයෙන් ම දෙවූහ; නව ද දවල් ගෝනි ඇද රෑ සයින් සිටිනා ගොනුන්ට මීයේ වැකු පිදුරු දන් දුන්හ.

මේ සියලු ආමිසදනයට වඩා ධර්‍මදනය ම උත්තමය යි අසා තමන් තෙවළා නිම වූ හෙයින් ලෝවාමහපායේ යටිමහලට මහසඟ පිරිස් රැස් කොට තුමූ ධර්‍මාසන[2] පැනනැඟී මඞ්ගල සූත්‍රයෙන් බණ කියම් පටන්ගෙන දෙළොස් දහසක් පමණ රහතන්වහන්සේ දක උපන්නාවූ අසර්‍ථානභයින් බණ කිය නොහී සර්‍වාඞ්ගයෙහි ඩා සෙලවී ධර්‍මාසනයෙන් බැස 'බණ කීම නම් ඉතා බැරී දෙයෙකැ'යි සිතා එතැන් පටන් මේ ලඞ්කාද්වීපයේ හැමදෙනා බණ අසන ලෙස ධර්‍මකර්‍ථිකයන්ට මහත් සත්කාර කොට මේ සියලු විහාරවල තමන් නමින් බණ පවත්වා එකි එකී ධර්‍මකර්‍ථිකයක්හට ගිතෙල් මී උක් පැණි ශකීරා ආදිය නැළිය නැළිය බැගින් දී සතරහුල් පමණ වැල්මී කඩක් හා පිළි සහලක් බැගින් මස් පතා මෙකී වෘත්ති නංවා දී එකි එකී ධර්‍මශාලාවෙහි අනගි වූ වියනක් ධර්‍මාසනයක් ඇතිරියක් දණ්ඩාසනයක් බණවස්තක් තබලියක් විජිනිපත්‍රයක් බණපොතක් බැගින් සලස්වා මෙසේ ධර්‍මයට ද සත්කාර කොට බණ කියවා සියල්ලවුන්ට ධර්‍මදනය දෙවූහ.

මෙසේ ඒ දුටුගැමුණු මහරජ අනෙකප්‍රකාර කුශලසම්භාරයන් රැස් කෙරෙමින් සුවිසි අවුරුද්දක් මුළුල්ලෙහි දශරාජධර්‍මයෙන් රාජ්‍යය කොට ආයු කෙළවර මරණමඤ්චකයෙහි වැදහොත්තේය. එකල්හි ඒ ඒ විහාරවල වැඩහුන් මහාසඞ්ඝයා වහන්සේ රජ්ජුරුවන් ගිලන් බව අසා සුව දුක් විචාරනු පිණිස අවුත් රජ්ජුරුවන් හා කර්‍ථාකොට අවසර්‍ථා බලා ගණසජ්ඣායනා වසයෙන් බණ පිරිවහන්ට පටන්ගත්සේක. එකල්හි දෙවියෝ සදිව්‍යලොකයෙන් රථ සයක් ගෙනවුත් පිළිවෙළින් තබා රජ්ජුරුවන්ට කියන්නාහු "එම්බා රජ්ජුරුවෙනි, අපගේ දිව්‍යලොකය ඉතා රම්‍යය, අපගේ දිව්‍යලොකයෙහි ආයුසයත් බෙහෙව්[3]; එසේ හෙයින් අපගේ දෙවුලොවට පලා එව; අපගේ දෙවුලොවට පලා එව"යි කියා සදිව්‍යලොකයෙහි දෙවියෝ වෙන වෙන ම රජ්ජුරුවන්ට යාච්ඤා කළහ. දෙවියන් කියන බස් අසා රජ්ජුරුවෝ "යම්තාක් මම බණ අසම් ද ඒ තාක් කල් ඉවසව"යි දකුණත ඔසවා දෙවියන්ට සංඥා කළහ. ඒ දක මහාසඞ්ඝයාවහන්සේ පිරිවහමින් සිටි බණ තබා වදළසේක. එවේලෙහි රජ්ජුරුවෝ බණ[4] තිබුවා දක "ස්වාමිනි, බණ නොපිරිවා තිබුයේ කුමක් නිසා ද"යි විචාළහ. එබසට සඞ්ඝයා වහන්සේ "මහරජ, තොප අතින් සංඥා කොට වැළකූ හෙයිනැ"යි වදළසේක; ඒ තෙපුල් අසා රජ්ජුරුවෝ "ස්වාමිනි,

---

1. මිනිනඹුවන්ට - ABDEGHJL
2. ධර්මාසනයට - CJ
3. බොහෝය- BGH
   බෙහෙය - L
4. යම්තාක් බණ - BGHL

Non-Commercial Distribution

මම පිරිවහන බණ වැළකුයෙම් නොවෙයි;[1] දේවතාවෝ සදිව්‍යලොකයෙන් රථ සයක් ගෙනැවිත් සිට තම තමන්ගේ දෙව්ලොවට මා කැඳවති; එසේ හෙයින් "යම්තාක් මම බන අසම් ද ඒ තාක් බලව"යි සිතා සංඥ කෙළෙම්" යි දන්වූහ.

ඒ අසා සමහර කෙනෙක් සිතන්නාහු "මේ දුටුගැමුණු මහරජ මරණ භය පත් ව නත් දෙඩයි[2] එබැවින් මරනට නොබන කෙනෙක් නම් නැතැ"යි සිතූහ. ඔවුන්ගේ අදහස් දන ථෙරපුත්තාභය නම් මහතෙරුන් වහන්සේ "කිමෙක් ද මහරජ සදිව්‍යලොකයෙන්[3] රථසයක් ගෙනාහ යි යනු කෙසේ අදහා ගත හැක් ද'යි[4] වදළ සේක. ඒ අසා රජ්ජුරුවෝ ආකාශයට මල්දම් සයක් දම්මූහ. එමල්දම් සය ගොසින් වෙන වෙන ම රථහිස්වල එලුනේය. එවේලෙහි මහජනයෝ රථහිස්වල එලෙන්නාවූ වූ මල් දම් දක සැක දුරු කළහ. ඉක්බිති රජ්ජුරුවෝ "ස්වාමිනි, සදෙව්ලොවින් කවර දෙව්ලොවක් යහපත් ද"යි විචාළහ.

එකල මහතෙරුන් වහන්සේ "එම්බා මහරජ, තුෂිත භවනය යහපත; මතු බුදු වීමට කල් බලා හිඳිනා[5] මෛත්‍රී බොධිසත්ත්වයොත් එහි ම වෙසෙති"යි වදළසේක. එතෙපුල් අසා රජ්ජුරුවෝ තුෂිතභවනයෙහි ඇල්ම්[6] උපදවා තමන් බැඳවූ රුවන්වැලි[7] මහසෑය වැඳ[8] බල බලා මත්තාහු එයින් මිය නිඳ පිබිදියාක්හු මෙන් තුෂිත භවනයෙන් ගෙනා රථයෙහි ඕපපාතික දිව්‍යපුත්‍ර ව ඉපද තමන් කළ කුශලයෙහි විපාක විශෙෂය මහජනයන්ට ප්‍රකාශ කොට දක්වනු පිණිස රථයෙහි ම සිට සැට ගැලක් පුරා ලන පමණ දිව්‍යාභරණයෙන් සැරහී බොහෝ දෙනා බල බලා සිටියදී ම රථයෙන් බැස තුන්විටෙක රුවන්වැලි මහසෑය වැඳ ප්‍රදක්ෂිණා කොට භික්ෂු සංඝයා වහන්සේ වැඳ අවසර ඉල්වාගෙන තමන් මල් තිස්සකුමාරයන් ඇතුළු වූ රාජ්‍ය වාසීන්ට තමන් ලද්දවූ දිව්‍යසම්පත් බලා රෑදෙවෙහි නොපමා ව කුසල් කරන සේ අවවාද කොට සියල්ලවුන් බල බලා සිටියදී ම දිව්සෙනඟ පිරිවරා තුෂිත දිව්‍ය ලොකයට ම ගියහ.

මෙසේ ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයෝ පළමු තමන් කළ කුශලයෙන් හස්තගත ව සිටියාවූ දිව්‍යලොක සම්පත්තියෙහි ආලය හැර වඩ වඩා කුසල් කරනු සඳහා ම මිනිස්ලොව ඉපද එබඳු රාජ්‍ය සම්පත්තියක් ලැබත් සැප සේ රජඉසුරු විඳුම්හ යි නොසිතා සුපරිශුද්ධ බුද්ධශාසනය පන් දහසක් අවුරුදු නිම්ල ව පවත්නා පරිද්දෙන් චිරස්ථායි කරනු කැමැති ව නිරන්තර වීර්‍ය්‍යී කිරීමෙන් අනෙක ප්‍රකාර වූ මහ දුක් විඳ ලෝසසුන් වවා[9] රෑ දෙවෙහි නොපමා ව ඇම දවස් ම සාදරසිතින්[10] උතුම් වූ අපමණ කුශලසම්භාරයන් රැස්කොට ගෙන දෙව්ලොව ඉපද මහත් වූ දිව්‍ය සම්පත් ලබන්නාහු මය. එබැවින් මේ කථා ප්‍රබන්ධය ඇසූ සත්පුරුෂයන් විසින් අප්‍රමාද ව කුසල් කොට මතු දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳ අමාමහ නිවන් දකින්ට උත්සාහ කළ මැනවි. කියනලදුයේ මැයි;

1. නොවෙම් - C
2. දෙඩති යි - AJ, ස.
3. දිව්‍ය ලෝකයෙන් - AJL, ක.කි.ඤ.ම.
4. ඇක් ද යි - ABCDEJ, කි.
   හැකි ද යි - L
5. සිටිනා - BGH
6. ඇලුම් - BEGHL
7. රුවන්මැලි - ඛෙ.ස.
8. වැඳ (නැත) - ACJ
9. වඩා - ඛෙ.ස.
10. ආදර සහිත වූ සිතින් - BEGHL

Non-Commercial Distribution

දෙවත්තං උපතිට්ඨිතං ගති වසා හිත්වා හවෙ සාධවො,
දුක්ඛං නෙකවිධං'නුභුය සතතං කත්වාන විරියං ථිරං;
ඉච්ජන්තා ජිනසාසනස්ස සුචිරං ඨානං සද සාදරා,
කුබ්බන්තෙවමනන්තමග්ග කුසලං පප්පොන්ති සග්ගං සුඛං-යි.

මේ මෙහි දෙවන
දුට්ඨගාමණී වස්තුව ය.

මෙතැන්හි ඒ දුටුගැමුණු රජ්ජුරුවන්ගේ කී නොකී නෑ නොනෑ සියල්ලවුන් අතුරෙන් කාවන්තිස්ස රජ්ජුරුවෝ මතු බුදු වන මෛත්‍රෙය බුදුන්ට බුදු වන ජාතියෙහි පිය වන්නාහ. විහාර මහා දේවී මෙතේ බුදුන්ට මව් වන්නාහ; මෙම දුටුගැමුණු රජ්ජුරුවෝ ඔබට දකුණත් සවු වන්නාහ; තිස්ස නම් මලණුවෝ ඒ බුදුන්ට වමත් සවු වන්නාහ; කාවන්තිස්ස රජ්ජුරුවන්ගේ නං වූ අතුලා නම් බිසව් ඒ මෙතේ බුදුන් බුදු වන ජාතියෙහි ගිහිගෙයි වසන කල ලක්‍ෂයක් බිසෝවරුන්ට නායක ව අග මෙහෙසුන් වන්නාහ; දුටුගැමුණු රජ්ජුරුවන්ගේ පුත් වූ සාලිරාජ කුමාරයෝ මෙතේ බුදුන් බුදුවන ජාතියෙහි පුත් වන්නාහු මය; මෙම ගැමුණු රජ්ජුරුවන්ගේ භාණ්ඩාර[1] රක්‍ෂාවෙහි සිටි සඞ්ඝ නම් අමාත්‍යයා ඒ මෛත්‍රෙය බුදුන්ට අග්‍ර උපස්ථායක වන්නේය; ඒ භාණ්ඩාගාරිකයන්ගේ දූ ඒ බුදුන්ට අග්‍ර උපස්ථායිකා වන්නීය. මෙසේ මොහු හැම දෙන ම මාහැඟි කොට කරනලද කුසල් ඇත්තාහු ඒ මෛත්‍රෙය බුදුන්ගෙන් බණ අසා සිවුපිළිසිඹියා පත් රහත් බවට පැමිණ කෙළවර අමා මහ නිවන් දක්නාහු ය යි දතයුතු.

දුට්ඨාදි ගාමණී මහාවනිපොච තුමෙහ
කත්වාන නෙක කුසලං තුසිතො' පගන්ත්වා,
මෙත්තෙය්‍යනාථවර දෙසිත සාධු ධම්මං
සුත්වාන දීපවිභවං අධිගච්ජ පච්ඡා.

තව ද මෙහි තුන් වන නන්දිමිත්‍ර වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු;

ගිය දවස මේ මහා භද්‍රකල්පයෙහි පළමු ව බුදු වූ කකුසඳ නම් බුදුන් සමයෙහි මේ නන්දිමිත්‍ර නම් යොධයාණෝ එක්තරා කුල ගෙයක[2] ඉපද වැඩිවිය පැමිණ සැදැහු ව වසන්නාහු භික්‍ෂුසඞ්ඝයාවහන්සේට දන් දෙන්නාවූ මනුෂ්‍යයන් දැක "මේ හැම තමන්[3] සන්තක බත් පිළි රත්රන් අමුරන් ආදිය මෙහැමදෙනා වහන්සේට කුමක් පිණිස දෙද් ද? මේ සඞ්ඝයා වහන්සේ පළමු මේ හැමට කළ උපකාරයක් පිණිස දෙද් ද නොහොත් නෑකම් නිසා දෙද් ද"යි විචාරා "මේ සඞ්ඝයා වහන්සේ නම් භාග්‍යවත් වූ බුදුන්ගේ ශ්‍රාවකයන් වහන්සේය, සිල්වත් සේක, ගුණවත් සේක, අල්පෙච්ඡ සේක, සන්තුෂ්ට සේක, කුසල් නමැති බිජුවට වැපිරීමට සරුකෙත් ව සිටි සේක. මේ සඞ්ඝයා වහන්සේට ස්වල්පමාත්‍ර වූ දනයක් දුනත් මතු මහාඵල මහානිසංස වෙයි; එසේ හෙයින් දන් දෙම්හ යි සිවුපසයෙන් උපස්ථාන කරම්හ" යි

1. භාණ්ඩාගාර - ABCJ; භාණ්ඩාරයෙහි- L
2. කුලයෙක -ABCJL
3. තම තමන් - BGHL

කී කල්හි එබසට සතුටු ව "මා විසිනුත් දනාදි වූ කුසල් කළමනා මය" යි සිතා එක් භික්ෂුකෙනකුන් වහන්සේට දනක් දෙනු කැමැති ව කහවණු තිසක් දී මුවමස් ඇර ගෙන අඟුරු මස පෙණ මස දුරුමිරිස් ආදි වූ කටුක භාණ්ඩයන් බහා පිසනලද සම්භාර සංයුක්ත මාංසය යි මෙසේ නොයෙක් ආකාරයෙන් මාංස පිස සුවඳ ඇල්සාල් සපයාගෙන බත් පිසවා මාංස රස හා නොයෙක් සූපව්‍යඤ්ජනයෙන් යුක්ත වූ ආහාරය සාදර සිතින් විරොචන නම් වූ එක් රහත් කෙනෙකුන් වහන්සේ[1] වැළඳවූහ. එකල්හි ඒ කුසලානුභාවයෙන් දෙවුලොව ඉපද උපමා කළ නොහැකි මහත් දිවැසැපත් විඳිමින් දිව්‍යලොකයෙහි වාසය කොට මෙම කප තුන් වැනි ව බුදු වූ කාශ්‍යප බුදුන් සමයෙහි දෙවුලොවින් අවුත් බොහෝ සම්පත් ඇති කුලගෙයක[2] ඉපද මුහු කළ වයසට පැමිණ විසි දහසක් අවුරුදු මුළුල්ලෙහි පැන් නුමුසු පායාසයෙන් ලභබත් තබා දුන්හ; එසේ ම සැරයටි කාබහන් ආදි වූ බල වඩනට නිසි නොයෙක් පින්කම්කොට නැවත දෙවුලොව ඉපද මහත් වූ දිවඉසුරු විඳ එයින් අවුත් මිනිස්ලොව මනුෂ්‍ය සම්පත්[3] විඳිනාහු අප බුදුන් පිරිනිවි පසු ලඞකාද්වීපයෙහි උපන්හ. එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු.

මෙම ලක්දිව එළාල රජ්ජුරුවන් රාජ්‍ය කරන සමයෙහි උන්ගේ මිත්‍ත[4] නම් සෙනෙවිරත් කෙනෙක් වූහ. ඒ සෙනෙවිරදුන්ගේ නැඟණි කෙනෙක් සිතුල්පවු සමීපයෙහි නැගෙනහිරි දික් භාගයෙහි කඩරෙද්ද නම් ගම එක් කුලපුත්‍රයාණ කෙනෙකුන් ළඟ වසන්නාහු යහපත් වූ පින්ලකුණු ඇති කොෂයෙහි අවහිත ව සැඟවුණාවූ වස්ත්‍රගුහ්‍ය ඇති පුතකු වැදූහ; ඔහුගේ කුශලානුභාවයෙන් දවස් පතා දහසක් වස්තු උපදනේය; ඕහට නම් තබන්නාවූ මවුපියෝ මයිලණුවන්ගේ නම ම ගෙන මිත්‍ත[5] නම් තුබූහ. එතෙම ඉතා ළදරු අවස්ථාවෙහි ම මහත් වූ බල ඇත්තේය; ශක්තිසමපන්නය; දෙමව්පියෝ ඔහු පියවර ඔසවන අවස්ථාවෙහි තමන් බැහැර යන කල්හි ඔහු පසුපස්සෙහි එන හෙයින් රඳවාගත නොහී සම්යොතකින් ඉඟ බැඳ අනික් කෙළවර දගලෙක බැඳ රඳවා යෙති; එසේ යන දෙමවුපියන් දැක දගල ඇදගෙන ඇත[6] මැත ගැසෙමින් සම්යොත කඩා හරනේය; ඉක්බිති ඔහුගේ මවුපියෝ මහත් වරමන්දක් ගෙනවුත් ඔහුගේ ඉඟ බැඳ ගලෙක බැඳියහ. එයින් එසේ ම කඩා හරනේය. නැවත එක් දවසෙක ඔහුගේ දෙමවුපියෝ කර්මාන්ත භූමියට යන්නාහු ඔහු රඳවාගත නොහී කැටි ව ම වඩාගෙන ගොස් උණපඳුරක් අස සෙවන ඉන්ට සලස්වා මෙහෙවරට පටන්ගත්හ. ඒ තෙම එතෙන නොහිඳ අඬාගෙන ගොස් මෙහෙවර කරන්නවුන්ගේ කකුල් අතුරට වැද මතැත් පැටවකු මෙන් ඇත මැත පෙරළී අතින් පයින් ගසා මෙහෙවර කළ නොදෙයි. එකල ඔහු ගෙන ගොස් වරමන්දකින් ඉඟ බැඳ[7] එක් උණ පඳුරෙක බැඳ ඉන්දවූහ; එකල්හි ද දෙමවුපියන් යන්නා දැක අඬ අඬා තදයේ වේගවත් ව[8] අදිමින් වරමන්ද පුපුරුවා උණපඳුර මුලින් උදුරා ඇරගෙන ගියේය. ඒ උණපඳුර ප්‍රමාණ වශයෙන් ගැල් සැටක් පුරා ගෙන යන පමණ[9] බර ඇත්තේය.[10] මෙසේ ඔහු වරමඳු සිඳ හරනා හෙයින් එ තැන් පටන්

1. වහන්සේට - CEG
2. කුලයෙක - BH
3. සම්පත්හි - AJ
4. මිත් - ACDEJ
5. මිත් - ACDEGHJL
6. ඉවක - ACDEGHL
7. බැඳගෙන - පිටපත් හැම
8. වේග පවත්වා - BC
9. පුරා ලන පමණ - C
10. ඇත්තේල - ADGHJL

Non-Commercial Distribution

නන්දිමිත්‍රය යි නම් විය. එතෙම ක්‍රමයෙන් වැඩෙමින් ඇතුන් දසදෙනකුට බල ඇති වි ය. කියන ලද මැයි මහාවංශයෙහි;

නන්දිං ජීන්දන හාවේන - නන්දිමිත්තොති සො අහු,
කමසො සොභිවඩ්ඪන්තො[1] - දස නාගබලො අහු - යි.

එතෙම ඉක්බිති දෙළොස් ඇවිරිදි අවස්ථාවෙහි අනුරාධපුරයට ගොස් තමා මයිල් මිත් සෙනෙවි රදුන්ට සේවය කෙරෙයි. එකල එහි රජ කරන එළාල රජහුගේ දෙමළු පළමු දෙවුලොවින් භාගයක් මෙන් බබළන ඉතා රම්‍ය වූ අනුරාධපුරය අමුසොහොනක් මෙන් බිහිසුණු කළහ. ඒ ඒ විහාරවල කෛලාස පර්වතය සේ ශොභාමත් වූ දාගැබ් බිඳ එළූහ; අතිධවල වාලුකාතලයෙන්[2] ගැවසී ගත්තාවූ දුටු දුටුවන්ට සතුටු එළවන මනොරම්‍ය වූ මලු ආදිය හාත්පස ඇන දමනලද කුණපගන්ධයෙන් ආකුල කොට බැලිය නොහැකි කළහ. ශ්‍රද්ධාවන්ත දිව්‍යමනුෂ්‍යයන් විසින් නිරන්තරයෙන් වැඳපුදනලද කල්ප පාදප පඞ්ක්තියක් හා සමාන බොධිවෘක්ෂවලට නැගෙමින් අතුපතර ඇන එළති[3], එහි ම ඉඳ කිස අත්පස් ආදියෙන් දූෂ්‍ය කෙරෙති. බුද්ධ රූපාදිය ඇන බිඳ පිළිම ගෙවල වෙසෙමින් බලු කැණහිල් ආදි වූ තිරිසනුන් මෙන් නොයෙක් අනාචාර කෙරෙති; භික්ෂූන් වහන්සේ දුටු කල සිවුරු උදුරා ගනිති. පාත්‍ර කුඩ ආදිය කැටකැබිලිති ආදියෙන් ගසා බිඳිති. කියනලද මැයි;

අනුරාධපුරං රම්මං - සගගඛණ්ඩං'ව භාසුරං,
අකංසු[4] දමිළා සබ්බං - සුසානං විය ආමකං.
චෙතියානි ච භින්දිංසු - මාලකාපි මනොරමා,
ඡඩ්ඩිතාසුං සමන්තා තා - මනුස්සාකුණපාකුලා.
ජිඤ්ජන්ති ආරුහිත්වාන - මහිතං සුරනරාදිහි,
දුම්න්දං තස්ස සාඛා ච - සන්දූසෙන්ති මලාදිහි.
බුද්ධරූපානි භින්දන්ති - වසන්තා පටිමාඝරෙ,
අනාචාරං කරොන්තෙ තෙ - තිරච්ඡානාව දමිළා.
දිස්වාන භික්ඛවො තත්ථ - උච්ඡින්දන්ති ච චීවරෙ,
භින්දන්ති ඡත්ත පත්තෙ'පි - ඛිපන්තා කඨලාදයො -යි.

මෙසේ නොයෙක් අනාචාර කරන ශාසනකණ්ටක දෙමළුන් දැක නන්දිමිත්‍රයෝ සිතන්නාහු "දෙමළු[5] දිව්‍යබ්‍රහ්ම නර අසුර ගරුඩ ගාන්ධර්වාදීන් විසින් තමන් මුදුනෙන් වැඳ පුදන ලද්දවූ ස්වර්ග මොක්ෂ සම්පත් සාද දෙන්ට සමර්ථ සර්වඥ ශාසනය සියල්ලවුන්ට කැමැති කැමැති වස්තු ප්‍රදානය කරන කල්පවෘක්ෂ සමූහයක් ගිකිලා නසන්නවුන්·මෙන් නොයෙක් අපවිත්‍ර අනාචාර අගෞරව කිරීමෙන් නසති; මෙබඳු අනාචාර දැක දැක අප වැනි ශ්‍රද්ධාවන්තයන් විසින් උපෙක්ෂා ව ඉඳීම යුක්ත නො වේ' යි සිතා රාත්‍රියෙහි ගොස් තමන් මහබල ඇති හෙයින් මහබෝ මලු ආදිය

1. වඩ්ඪන්තො - CEGHJL
2. වාලිකාතලයෙන් - ක.කි.ඥ.
3. එලමින් - ක.කි.ඥ.ම.
4. අකාසුං - මුද්‍රිත හැම, ස.
5. මේ දෙමළු - බෙ.ස.

Non-Commercial Distribution

කෙලසන දෙමළුන් අල්වාගෙන සල්ව සල්වා දෙපළු කොට පළා දමති; නන්දිමිත්‍රයන්ට අපවාදයක් වෙති සිතා මැරූ මැරූ දෙමළුන් දෙවියෝ අන්තර්ධාන [කෙරෙති. මෙසේ නන්දිමිත්‍රයන් රාත්‍රියෙහි ගොස් දවස්පතා මැරූ මැරූ දෙමළුන් දෙවියන් අන්තර්ධාන] කරන හෙයින් දෙමළුන් මළ ගිය තැනක් නොපෙනෙතත් බොහෝදෙනා අඩු වූ බව දන දෙමළු එක් ව එළාල රජ්ජුරුවන් කරා එළඹ "මහරජ, රාක්‍ෂසයකු විසින් කරන[1] දෙයක් බවත් නොදනෙයි; මනුෂ්‍යයන් නිසා වන දෙයක් බවත් නොදනෙයි; අපගේ දෙමළු දන් බොහෝ දෙනා අඩු ව ගියහ; එසේ අඩු වන කාරණය නියම දත හොත්[2] යහපතැ"යි කීහ. එ කල රජ්ජුරුවෝ "එසේ කල කොල, ඒ ඒ තැන රාත්‍රියෙහි සැඟවී සිට මිනී මරන්නවුන් බලා අල්වා ගෙනෙව"යි නියොග කළහ. කියනලද මැයි;

දෙවබ්‍රහ්ම පුරාදීහි[3] - මුඩනා නිච්චමච්චුතං,
සග්ගාපවග්ගසුඛදං - සම්මාසම්බුද්ධ සාසනං.

නාසෙන්ති දමිළාදනි - කප්පරුක්ඛං ච[4] අග්ගිනා,
අයුත්තං තං උදික්ඛිත්වා සධෙනෙ'ධ උපෙක්ඛිතුං

මන්ත්වාන ඉති තෙ දමිළෙ - ගහෙත්වා ජාතකොධසා,
ඌරුං අක්කම්ම පාදෙන - හත්ථෙන ඉතරං තුසො.

ගහෙත්වා සම්පදාළෙත්වා - බහික්ඛිපති ථාමවා,
දෙවා අන්තරධාපෙන්ති - තෙන ඛිත්තං කළෙබරං

එවමෙවං නිසාගම්ම - කරොනෙත තෙන අන්වහං,
දමිළානං ඛයං දිස්වා - ජනා[5] රඤ්ඤො නිවෙදයුං;
සහසා[6] ගණ්හථෙතන්ති රාජා තෙසං නියොජයි - යි.

මෙසේ රජ්ජුරුවන් නියොග කළ බව අසා නන්දිමිත්‍රයෝ සිතන්නාහු "මා විසින් මෙපරිද්දෙන් දෙමළුන් මරා නිමවා ලොක ශාසනය වචා ගත නොහැක්ක; රුහුණුරට තුනුරුවන් කෙරෙහි ප්‍රසන්න වූ රජදරුවෝ ඇත; ඒ රජදරුවන් සමීපයට ගොස් සේවය කොට රජදරුවන් ලබ්බවා ගෙන සටන් කොට දෙමළුන් සාධා ඒ රජදරුවන්ට රාජ්‍යය එකච්ඡත්‍ර කරවා ලොකශාසනය බබුළුවම්"යි සිතූහ. කියනලද මැයි මහා වංශයෙහි;

රොහණෙ ඛත්තියා සන්ති - පසන්නා රතනත්තයෙ,
තත්ථ කත්වා රාජසෙවං - ගණ්හිත්වා[7] දමිළෙ 'ඛිලෙ,
රජ්ජං දත්වා ඛත්තියානං - ජොතෙස්සං බුද්ධසාසනං - යි.

---

1. කන - ABDEGHL
2. දතොත් - BEGH
   දනිතොත් - D
3. දෙවබ්‍රහ්මරසුරාදිහි - ක.කි.බෙ.ස.
4. කප්පරුකෙඛච - බෙ.ස.
   කප්පරුක්ඛාච - ක.කි.හැ.ම.
5. ජනො - ABCDEPGHJK, දනො - L
6. සහොඨං - BEGL
   සහොථං - CJ
   සහෙථං - H
7. ගහිත්වා - BGH

Non-Commercial Distribution

මෙසේ කල්පනා කොට අනුරාධපුරයෙහි සිට කඩරෙද්ද නම් ගමට ගොස් දෙමවුපියන් කැඳවාගෙන රුහුණු ගොස් කුඹුබන් නම් ගම ලැග මාගමට ගොස් කාවන්තිස්ස රජ්ජුරුවන් ආයුධ ශාලාවේ හිඳ ආයුධ සණලවන වේලාවට නන්දිමිත්‍ර නම් යොධයාණ කෙනෙක් අවුය යි තමන් ආ බව සැලකරවූව; රජ්ජුරුවන් යහපත එන්ට කියව යි කී කල්හි ගොසින් දක වැඳ එකත්පස් ව සිටියහ; ඉක්බිති රජ්ජුරුවන් "කොයි සිට කුමක් පිණිස අවු ද" විචාළ කල්හි තමන් පළමු කළ කී සිතා ආ කටයුතු සියල්ල ම නො වළහා කීහ; එපවත් අසා රජ්ජුරුවෝ සතුටු ව උන්ගේ දෙමවුපියන්ට බොහෝ සත්කාර සම්මාන කොට ඕහට කුඹුබන් නම් ගම බත්ගම් කොට දී ඔහු විමසනු පිණිස "මේ කඩුව ගෙන මුවහත් තබව" යි කියා කඩුවක් දුන්හ; නන්දිමිත්‍රයෝ කඩුව ගෙන බලා ගල ගා මුවහත් තිබූහ; ඒ කඩු මුවහත ඉතා තියුණු ය. ඉදින් ඒ කඩුවෙන් පහරනලද පර්වතයෙක් වී නමුත් කිලිල්කඩක් සේ කපා ගෙන යන තරම් මුවහත් ඇත්තේය. එපවත් දක සතුටු වූ රජ්ජුරුවෝ මහා වීථියෙහි ගෙයක් සලස්වා දස දහසක් බැගින් ඉලක්ක තබ්බවා බොහෝ පරිවාර ජනයන් හා සමඟ මාගම වසන සේ සැලැස්වූහ. පසුව ඒ නන්දිමිත්‍ර නම් යොධයාණෝ දුටුගැමුණු රජ්ජුරුවන් හා එක් ව මියුගුණෙහි පටන් දෙමළ කඳවුරු පැහැර මහ සටන් කෙරෙමින් ගොස් විජිතපුරය ගන්නා දවස් තමන් බල විමසන පිණිස මෙහෙයනලද කණ්ඩුලනම් ඇත් රජහු දෙදළ ගෙන ඔහු උක්කුටුකයෙන් හිඳුවා කුඹ පහළ අත්තලහඬින් හා බැණ නැඟී ශබ්දඝොෂාවෙන් දෙමළුන් තැති ගන්වා එදවස් ම විජිතපුර යුධයට[2] වැද සටන් කරන්නාහු කඩුලැතා විසින් උගුලුවනලද යදෙර හා සමඟ ඇතු වසා හෙන්නාවූ වහසල් දරුසමහාරය වාම බාහුවෙන් පැහැර දමා 'තිරිසන් ඇතු බිඳි වහසලින් නුවරට වදිම් ද" යි වහසි කියා අවලොස්රියන් උස ලොහොපවුර උරෙන් පැහැර බිඳ නුවර මැද හෙළා ඇතුළට වැද මහත් ගැල්සකක් අතින් ගෙන දෙමළුන් තළා එපරිද්දෙන් ම ඒ ඒ තැන කඳවුරු බැඳ උන් දෙමළුන් මරමින් ගොස් අනුරාධපුරය ගෙන මුළු ලක්දිව සියලු දෙමළ කසළ පහ කොට රජ්ජුරුවන්ට රාජ්‍යය ගෙන දුන්හ.

රජ්ජුරුවෝ ලඞ්කාරාජ්‍යය එක්සත් කොට අනුරාධපුරයෙහි වසන්නාහු ඒ නන්දිමිත්‍ර නම් යොධයාණන්ට බොහෝ සම්පත් දී දුදුරු හොයින් එතෙර බත්ගම් කොට දුන්හ. ඉක්බිති නන්දිමිත්‍ර නම් යොධයාණෝ බත්ගමට ගොස් දුදුරුහොය සමීපයෙහි තමන් නමින් නන්දිමිත්‍ර නම් රජමහා විහාරයක් කරවූහ. මෙසේ එතැන් පටන් රජ්ජුරුවන් හා එක් ව දනාදි වූ බොහෝ පින්කම් කොට ගෙන ආයුකෙළවර දෙව්ලොව උපන්හ. මෙසේ සියලු ආයුධ ශිල්පාදියෙහි දක්‍ෂ වූ මහබල[3] යොධයෝ පවා මහත් වූ බල ඇත්තෙම් ඉතා ම ශක්ති සම්පන්නයෙමි යන අභිමානමදය හැර ලොක ශාසනය වර්ධනය කිරීමෙන් බොහෝ කුසලසම්භාරයන් රැස්කොට ගෙන සකල සම්පත්තීන් සමෘධ වූ දෙව්ලොව උපන්හ,[4] එබැවින් නුවණැති ශ්‍රධාවන්ත වීරපුරුෂයන් විසින් එපරිද්දෙන් ම ලොක ශාසන රක්‍ෂාවෙහි [යෙදී][5] අප්‍රමාද ව කුශල සම්භාරයන් රැස් කළ මැනවි. කියන ලදුයේ මැයි;

1. මුවාත් - BEGH
2. විස්ම යුද්ධයට - BEGHL
3. මහබල ඇති - BDEGHL
4. උපන්හාහ - ACGJ
5. යෙදී (නැත) - පිටපත් හැම.

Non-Commercial Distribution

එවං මහා ථාම බලුපපන්නා
කතූපාසනා ථාම මදං පහාය;
කරොන්ති ලොකස්ස ච සාසනස්ස
අත්ථං සුධීමා'පි තථා කරෙය්‍ය - යි.

මේ මෙහි තුන් වන
නන්දිමිත්‍ර වස්තුව ය.

තව ද මෙහි සතරවන සූරනිම්ල වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු:

අප මහා ගෞතම බුදුන් බුදුවන්නාට පළමු ව මෙම කල්පයෙහි බුදු වූ කාශ්‍යප නම් බුදුන් සමයෙහි සූරනිම්ල නම් යොධයාණෝ පසල්ගමෙක එක්තරා කුලපුත්‍රයක්හට පුත් ව ඉපද වසන්නාහු වෙනෙහි[1] මෘග සූකරාදීන් බැඳගෙන අවුත් ගාල් ගසා එහි ලාගෙන කැවිලිපෙවිලි ලා පොෂ්‍යය කෙරෙමින් දවසින් දවස උන් ම්[2] මර මරා මස් කමින් මෙසේ නිරන්තරයෙන් ප්‍රාණවධ කිරීමෙන් ම ජීවත් වෙති. එකල එක් දවසෙක සිඟා වඩනා භික්ෂු කෙනකුන් වහන්සේ දක සමීපයට එළඹ පසඟ පිහිටුවා වැඳ එකත්පස් ව සිට පාත්‍රය ගෙන තමන් වසන ගෙට කැඳවාගෙන අවුත් ආසනයක් පනවා එහි ඉන්ට සලස්වා පැසිමස වළඳවා දහවල් මත්ස්‍යමාංස[3] සහිත ආහාර වළඳවා වළඳ[4] ඉක්බිති එකත්පස් ව උන්හ.

එකල මහතෙරුන් වහන්සේ සිතනසේක් "මේ උපාසකයාට[5] කුශලාකුශල දෙක්හි විභාග නොදනෙයි[6]; එතෙකුදු උවත් අද දනයක් දීන; සියල්ලවුන් කෙරෙහි සාධාරණ මෛත්‍රීන් සකල ජන හිතොපදෙශ ගවෙසී වූ සර්වඥයන් වහන්සේ විසිනුත්:

ගිහීනමුපකරොන්තානං - නිච්චමාමිසදානතො,
කරොථ ධම්මදානෙන - තෙසං පච්චුපකාරකං-යි.

යනාදීන් "තමහට ප්‍රත්‍යයදනයෙන් උපකාර කළ උපාසක ජනයාට තමා කළ මනා ප්‍රත්‍යුපකාර නම් බණ කියා උපාසක ජනයා අකුශලයෙන් වළකා කුශල[7] මාර්ගයෙහි පිහිටුවීමය"යි[8] වදරන ලද්දේ මය; එබැවින් මේ උපාසකයා අපායේ නොගෙන සේ අවවාදයක් කිව මැනවැ යි සිතා "එම්බා උපාසකය, මිනිසත් බව[9] ඉපදීම නම් ඉතා දුර්ලභ ය. ඊට කාරණ කිම් ද යතහොත් නරක තිර්‍යක් ප්‍රෙත අසුරකාය යන සතර අපායෙන් එක්සිය සතිස් නරකයේ වෙන වෙන සැළ තාලි කුට්ටම් බඳුන් ආදියෙහි බහනලද තුඹ සුනු සෙයින් අවසරයක්* නැති ව අතිඝොර භයානක මහදුක් විඳිනා සත්ත්වවර්ගයා හා තුන් සක්වළක් එක් වූ තැන ලෝ ඇඳිරිමහ

---

1. වෙවෙහි ඇවිද - C
2. ම (නැත) - ABDGH
3. මචස්මාංස - පිටපත් හැම
4. වැළඳූ - ක.කි.කැ.ම.
5. උපාසකයා - ABDEGHJL, ස.
6. නොදනියි - B
7. කුශලසම්භාර - ක.කැ.කි.
8. පිහිටිවීමය - ABCEGHJ
   පිහිටවීමය - L
9. මේ මිනිසත් බව - L ස.

* K පොත මෙතැනින් යළි ඇරඹේ.

Non-Commercial Distribution

නිරවල එපරිද්දෙන් ම මහදුක් විඳිනා කාළකඤ්ජ ප්‍රෙතයන් ඇතුළු ව පර්වත ගහනාදි වූ[1] ඒ ඒ තැන කියා නිමවාගත නොහැකි අසන්ට පවා භයානක වූ මහදුක් විඳිනා ප්‍රෙත සමූහයන් දිවැසට විනා මසැසට නොපෙනෙන හෙයින් නොදනිතත් නොයෙක් පණුවන් පිළවුන් කුරුන් කුහුඹුවන් කඩි සින්නන් හා සෙසු චතුෂ්පද බහුපාදදි වූ තිරිසන් ජාතීන් හැම තබා එක කුහුඹු බිලයෙකින් නික්මෙන කුහුඹුරළෙක කුහුඹුවන්ට ගණිතින් සරිගස්වමිහ යි දශ දහසක් යොදුන් දඹදිව සියලු මනුෂ්‍යයන් රැස්කළත් කුහුඹුවන් වූ නියාවට මනුෂ්‍යයන් මඳ හෙයින් නොයෙක් කාරණයෙන් ම පරීක්‍ෂා කොට බැලූ කල මිනිසත් බව ඉපද ගැන්ම ඉතා දුර්ලභ ය. කියන ලද මැයි;

පිපීලිකානං පුඤ්ජො හි - බිලා එකා විනිග්ගතො,
කිනතු සො නාතිරිච්චෙය්‍ය - මනුස්සෙ ජම්බුදීපකෙ-යි.

මෙසේ ප්‍රමාණාතික්‍රාන්ත ව තිරිසන් යොනියෙහි උපදනෝ ද ප්‍රෙතයොනියෙහි උපදනෝ ද අසුරකායෙහි උපදනෝ ද එක්සිය සතිස්[2] නරකයෙහි උපදනෝ ද තම තමා විසින් කරන ලද ප්‍රාණවධාදි අකුශල බලයෙන් එසේ ම උපදනා බවක් මිස මනුෂ්‍යයෝ ම ය.[3] එබැවින් මෙසේ දුර්ලභ වූ මිනිසත් බවක් හා අති දුර්ලභ වූ බුද්ධොත්පාද කාලයක් ලද්දවූ තමහට වැඩ කැමැති සත්වයන් විසින් මතු නරකාදි සතර අපායෙහි උපදවා අපමණ දුක් විඳුවන ප්‍රාණඝාතය අදත්තාදනය කාමමිථ්‍යාචාරය මුසාවාදය සුරාපානය යනාදි වූ අකුසල්කිරිම නම් සතුරුවන් ගබඩාවකට වැද ඇඟ දව දවා [ගිනි] අඟුරු[4] පොදිබැඳගෙන යන්නාවුන් වැන්න. එසේ හෙයින් පින්වත් උපාසකය, මෙතැන් පටන් ප්‍රාණවධාදී වූ අකුසල කර්මයන් නොකරව' යි වදළසේක. කියන ලද මැයි;

පාණාතිපාතං ච අදින්නාදනං
පරස්සදරූපගමං මුසා ච,
මජ්ජස්ස පානම්පි ච සෙස පාපං
ඉතො පරං භො න කරොථ සබ්බං -යි.

මෙකී නොයෙක් පරිද්දෙන් ප්‍රාණවධාදි වූ පඤ්චපාපයෙහි ආදීනව දක්වා තදනන්තර ව දනශීලභාවනාදි වූ කුශලබලයෙන් ශක්‍ර සම්පත් බ්‍රහ්ම සම්පත් චක්‍රවර්ති[5] සම්පත් නිවන් සම්පත් ආදි වූ සාතිශය විශෙෂ සම්පත් ලබන බව ප්‍රකාශ කොට වදළ සේක. මෙසේ සංක්‍ෂෙප වසයෙන් කුශලාකුශල දෙක්හි විභාග හඟවා මහතෙරුන් වහන්සේ වදළ ධර්මාන්විත කථා අසා මොළොක් වූ සිත් ඇති ඒ උපාසකයෝ පිට පිට තුන්දවසක් පළමු පරිද්දෙන් ම තෙරුන් වහන්සේට දන් දී පන්සිල් සමාදන් ව එතැන් පටන් නොයෙක් පින්කම් කොට ආයු කෙළවර දෙව්ලොව ඉපද මහත් වූ දිව්‍ය ඓශ්වර්‍ය්‍ය විඳ එයින් චුත ව අප බුදුන් පිරිනිවි පසු මෙම ලඞ්කාද්වීපයෙහි කොටසර කිලවාපි[6] ජනපදයෙහි කඩවිටි නම් ගම බොහෝ සම්පත්තීන් ආඪ්‍ය වූ සංඝ නම් කෙළෙඹි පුත්‍රයාහට[7] පුත් ව උපන්හ. ශක්ති

1. ගුහාදි වූ - K
2. සතිසක් - G
3. නැතිනම් මනුෂ්‍යයෝ මය - ක.කි.ඍ.ම.
4. අඟුරු - පිටපත් හැම,
5. චක්‍රවර්ති රාජ්‍ය - මුද්‍රිත හැම.
6. කුලවාපි - බෙ. ස.
7. පුත්‍රයක්හට - BC

Non-Commercial Distribution

සම්පන්නයහ; මහබල ඇතියහ; ඇතුන් දසදෙනකුට බල ධරන්නාහ. මවුපියෝ උන්ට නිමිලයෝ යයි නම් තිබූහ.

ඒ නිමිලනම් යොධයාණන් දසදෙළොස් ඇවිරිදි අවස්ථාවෙහි කාවන්තිස්ස රජ්ජුරුවෝ දෙමළුන් මෙතෙරින් එතෙර යා නොදෙන පිණිස මහවැලිගඟ ඒ ඒ තොට වල රකවල් ලවා තමන්ගේ අනික් බිසෝකෙනකුන් වැදූ දීඝාභය නම් රාජකුමාරයන් කසාතොට රකවලට සිටුවූහ; ඒ රාජකුමාරයෝ වටින් සයොත්නක් පමණ තැන ඒ ඒ ගම්වල නායක කුලවලින් එකි එකී කුලයෙන්[1] එකි එකී කෙනකුන් බැගින් සේවයට ගෙන්වන්නාහු සංඝ නම් කෙළෙඹියාණන් ළහට[2] මිනිසුන් යවූහ. ඒ කෙළෙඹියාණෝ ගිය දූතයාගේ බස් අසා තමන්ගේ පුතුන් සත්දෙනා කැඳවා "තොප සත්දෙනා අතුරෙන් රාජකුමාරයන් වහන්සේ ළහට සේවයට යන්නෝ කවුරු ද" යි විචාළහ. එකල වැඩිමහලු සබෑයෝ කියන්නාහු "නුඹගේ බාල පුතණුවෝ නිමිලයෝ යහපත් පිළි දෙකක් ඔඩුක්කු තබා වලු එල්වා ඇඳගෙන මිහිරි කොට බත අනුභව කොට ලා අවුසුළං ඇඟ නොගස්වා කිසි කර්මාන්තයකුත් නොකොට සැපසේ ගෙට වැදලා ඉඳිති, අපි හැම වෙළඳම් හවාම් ගොවිතැන් බත් කෙරෙමින් දුග්ගෙන වසම්හ, සේවාකමට යවතොත් නිමිලයන් ම යවුව මැනව,[3] අපි නො යම්හ"යි කීහ. එකල කෙළෙඹියාණෝ නිමිලයන්ට ම ගමන් භාර කළහ. නිමිලයෝ වැඩිමහලු සබෑයන්ට කිපී උදසන්හි ම පිටත් ව දෙළොස් ගවු පමණ දුරු[4] කතර ගෙවා ගොස් ඉර පායන වේලාවට ම රාජ කුමාරයන් දුටහ. රාජ කුමාරයෝ "කවර ද ගමින්[5] පිටත් වූ ද" යි විචාරා "අද උදසන ම පිටත්ව ආමි" කී කල්හි විස්මය පත් ව ඔහු විමසනු පිණිස "එසේ කල සගය සෑගිරි සමීපයෙහි ද්වාරමණ්ඩල නම් ගම මාගේ යහළු වූ කුණ්ඩල නම් බමුණු[6] වෙසෙයි, දෙශාන්තරයෙන් ගෙනා සඳුන් සුවඳ කස්තුරු කපුරු තුවරලා පිළී ආදි වූ වස්තුවෙන් උන් දුන් දෙයක් වහා ඇරගෙන එව"යි මෙහෙවර කියා කවා පොවා පතක් ලියා දී නික්මවූහ. කියන ලද මැයි මහාවංශයෙහි;

> චෙතිය පබ්බතාසන්නෙ ද්වාරමණ්ඩල ගාමකෙ,
> බ්‍රාහ්මණො කුණ්ඩලො නාම - විජ්ජතෙ මෙ සහායකො.
>
> සමුද්දපාරෙ භණ්ඩානි - තස්ස විජ්[ජන්ති][7] සන්තිකෙ,
> ගන්ත්වා තවං තෙන දින්නානි - භණ්ඩකානි ඉධා'හර -යි.

එකල නිමිලයෝ පත් අස්න ගෙන නවයොදුන් මඟ ගෙවා ද්වාරමණ්ඩල නම් ගමට පෙරවරු ම ගොස් බ්‍රාහ්මණයාණන්[8] දුටුවුය; බමුණාණෝ ඔහු දැක "කසාතොටින් කවර ද පිටත් ව අවුද"යි විචාරා "අද ඔබදී බත් කාලා ආමි"කී කල්හි "එසේ වී නම් දරුව, වැවට[9] ගොස් නහාපියා[10] එව"යි නික්මවූහ. එකල නිමිලයෝ පළමු තමන් අඳුනන තැනක් නොවන හෙයින් වැව කොතන[11] බවත්

---

1. කුලෙන් - ACDJ, ක.සැ.කි.
   කුලවලින් - KL
2. ළහව ද -EKL
3. මැනවැ යි - GK
4. දුරු (නැත) - BGHKL
5. ගමින - A
6. බමුණකු - C
   බමුණු කෙනෙක් - K
7. විජ්ජති - පිටපත් හැම, විජ්ජන්ති - ස
   විජ්ජන්ති - බෙ
8. බ්‍රාහ්මණයන් - G ක.කි.සැ.ම.
9. සිසා වැවට -G
10. නාපියා - BDEGHKL
11. කොතනක - CD

Non-Commercial Distribution

නො දත අනුරාධපුරයෙහි තිසාවැවට ගොස් ඉස්සොධා නහා එයින් අවුත් ශ්‍රී මහා බෝධීන් වහන්සේ ද ථූපාරාමය ද මල් පුද වැද ප්‍රදක්ෂිණා කොට ඇතුළු නුවරට වැද ඒ ඒ වීථිවල ඇවිද සල්පිළිවලින් සුවඳපුනු සුවඳමල් ආදිය ගෙන සුවඳ ඇඟගල්වා මල් පැළඳ ඒ නුවර උතුරු වහසල් දෙරින් පිටත් ව මානෙල් කෙතින් මානෙල්මල් කඩා ගෙන පෙරලා නුවරට වැද නැගෙනහිරි වහසලින් පිටත් ව පෙර වරු ම බමුණාණන්[1] ළඟට ගියහ. එකල බ්‍රාහ්මණයා විසින් "දරුව, කොයි ගියා ද" යි විචාළ කල්හි නිමිලයෝ තමන් ගිය තැන් සියල්ල ම කීහ. බමුණාණෝ එපවත් අසා "මේ මහා සමත් වූ උත්තම පුරුෂයෙකැ"යි විස්මයට පැමිණ "එළාල රජ්ජුරුවෝ මෙපවත් දනිත් නම් මොහු ගෙන්වා ගනිති. මේ දෙමළුන් ඉන්නා ආසන්නයේ ඇසිල්ලකුත් මොහු රැඳවීම කටයුතු නොවෙයි; කාවන්තිස්ස රජ්ජුරුවන් සමීපයෙහි වසන්ට සුදුසු ය" යි සිතා තමන් ඒ සිතූ පරිද්දෙන් පත් ලියා දී බත්කවා පූර්ණවර්ධන නම් පිළි සහළක් ද කස්තුරු කපුරු සඳුන් ආදිය ද ඕහට පාවා දී රාජකුමාරයන් සමීපයට නික්මවූහ. නිමිලයෝ ඒ සියල්ල ම ඇරගෙන පස්වරු රාජකුමාරයන් සමීපයට ගොස් බමුණාණන් දුන් පඬුරු හා සමඟ ලියා දුන් පත දුන්හ[2]. කියන ලදුයේ මැයි මහාවංශයෙහි;

නිම්මලො[3] දමිළාසනෙන - වසිතුං[4] නෙව අරහති,
රාජපුත්තස්ස පිතුනො - සන්තිකෙ වාසමරහති.

එවමෙවං ලිඛිත්වාන - ලෙඛං තස්ස සමප්පයි,
පුණ්ණවඩ්ඪනවත්ථානි පණ්ණාකාරෙ බහූනි ච.

දත්වා නං භොජයිත්වා ච - පෙසයි[5] සන්තිකං,
සො වඩ්ඪමානච්ඡායායං - ගන්ත්වා [රාජ] සුතන්තිකං
ලෙඛං ච පණ්ණාකාරෙ ච - රාජපුත්තස්ස අප්පයි-යි.

අභය[6] රාජකුමාරයෝ එවූ පඬුරු හා පත් අස්න දැක කියවා බලා සතුටු ව "මොහට[7] මසුරන් දහසක් දෙව"යි කීහ. එබස් අසා රාජකුමාරයන්ගේ සේවකයෝ "ස්වාමිනි, මේ බාලදරුවන් කළ සපත් කමට දෙන්නේ අතිස මසුරන් දහසෙක්ද; ඒ උන්ට තරම් නොවේ"යි කීහ. එබස් අසා රාජකුමාරයෝ දසදහසක් මසුරන් දී ඔහු ඉස කෙස් බහවා[8] දළිඳුවූලු කප්පවා ඉස්සෝධා නහවා බමුණාණන් තමන්ට එවූ පූර්ණවර්ධන නම් පිළිසහළ අඳවා සුවඳමල් සුවඳ පුනු ආදින් අලංකාර කොට සරහා ඉස දුහුල් සළුවෙන් වෙළා තමන් අනුභව කරන පරිද්දෙන් ම බත් කවා තමන්ගේ දසදහසක් අගනා මාහැඟි සයනයක් දුන්හ. නිමිලයෝ තමන්ට දුන් ඒ

1. *බමුණන් - BGH, ක.කි.සැ.ම.*
2. දක්වූහ. - BEGHKL
3. තස්මායං - ක.කි.සැ.ම, මහාවංස
   නිම්මලො - පිටපත් හැම. පාලි
4. වාසෙතුං - ක.කි.සැ.ම, මහවංසය;
   වසිතුං - පිටපත් හැම. පාලි.
5. පෙසෙසි - ක.කි.සැ.ම, මහවංසය
6. දීඝාභය - K
7. මොහුට - BGHL
8. බාවා - BDEGHKL

Non-Commercial Distribution

සියල්ල ම එක් කොට බැඳ කිසිල්ලෙහි තබා ගෙන ගොස් මසුරන් දසදහස ම මෑණියන්ට දී පියාණන්ට දසදහසක් අගනා සයනය දී එදවස් රාත්‍රියෙහි ම අවුත් තමන්ට නියම වූ තැන රකවල් ගත්හ. රාජකුමාරයෙෝ රාත්‍රිය පහත් වූ කල එපවත් අසා සතුටු ව නැවත වස්ත්‍රාභරණ හා මසුරන් දසදහසක් ද පරිවාර ජනයන් ද සලස්වා කාවන්තිස්ස රජ්ජුරුවන් සමීපයට යවූහ. එකල නිමිලයෝ තමන් ලත් ඒ සියල්ල ද දෙමව්පියන්ට දී එදවස් ම මාගමට ගොස් කාවන්තිස්ස රජ්ජුරුවන් දුටහ.

එදවස් රජ්ජුරුවෝ බොහෝ නැවැමියන්[1] රැස් කරවා කර්මාන්ත ශාලාවෙහි නොයෙක් ආයුධ කරවති. නිමිලයෝ ගොස් පිටත සිට "නිමිල නම් යොධයාණ කෙනෙක් අවු ය" යි තමන් ආ නියාව රජ්ජුරුවන්ට කියා යවා එන්ට කියවයි කී කල්හි නිමිලයෝ ගොස් රජ්ජුරුවන් වැඳ සිටියහ. නිමිලයන්[2] ඉතා ම බාල හෙයින් කම්මල උන් නැවැමි හැමදෙන "මෙසේ වූවොත් යොධයෝ ද" යි කෙළිසිනා මුසු ව බස් කියමින් උන්හ. රජ්ජුරුවෝ එසේ වෙහෙසන නැවැමියන් වළකා නිමිලයන් කැඳවා "මේ කඩු[3] ගල ගා මුවහත් තබව" යි දිග සතර රියන් බොල සොළොසඟුල් පුළුල දෙතිසඟුල් පීරි නො ගා ගැසූ වන ම[4] තිබූ කඩු සොළොසක් දුන්හ. මෙසේ කඩු තමන්ට දී රජ්ජුරුවන් මෑත කෙළවර සිට ඈත කෙළවරට ගිය කල්හි නිමිලයෝ කඩු ගෙන ගල ගා උළා මටසිලුටු නොට මුවහත් තබා කඩු අගකින් බිඳී හුණු කඩුමුණ කඩක් දඹිල්ලෙන් බඳ අල්වාගෙන "මේ නැවැම් මට නිඳ කොට කීවෝ වේ"ද යි කිපි අත අඹුරක් ගැසුවා සේ මෑත කෙළවර උන් නවැමියාට ගැසුහ. මහබල ඇති නිමිලයන් අත පාර තද හෙයින් ඒ කඩුමුණ කැබෙල්ල පිළිවෙළින් පන්සියයක් නැවැමියන් ගේ ශරීර විනිවිද ගසා ගෙන ගියේ ය; නැවැමි පන්සියය ම එතැන්හි මළාහුය[5]. රජ්ජුරුවෝ අවුත් කඩු බලා සතුටු ව නිමිලයන්ට බොහෝ සම්පත් දී මහුල් මහ වීථියෙහි ගෙයක් සලස්වා දවස දහසක් බැගින් ඉලක්ක සිටුවා තමන්ට සේවය කරන සේ සලස්වා ගත්හ.

පසුව ඒ නිමිලයෝ දුටුගැමුණු රජ්ජුරුවන් සමඟ දෙමළ සටන් කෙරෙමින් ඒ ඒ තැන්හි දෙමළ කඳවුරු පැහැර විජිතපුර[6] සටනට වැදීමට පළමු ව මගධ නැළියෙන් සොළොස් නැළියක් පමණ රාපිරූ සැළෙක රා සියල්ල ම රාජනියෝගයෙන් බී නිම වූ ද එතැන් පටන් සුරනිමිල නම් වූහ: ඒ සුරනිමිල නම් යොධයාණෝ විජිතපුර සටනට වදනා දවස් අටළොස්රියන් උස මහපවුර

---

1. නැවැමීන් - ABDEHJKL
2. නිර්මලයෝ - ABCEGHJKL
   නිර්මලයා - D
3. කඩු - ACEGHJKL; කඩුව - BD
4. හැසූ වන ම - ක.කි.ඝ.ම.
5. මළවූය - D බෙ.ස.
6. විජිතපුරය - ACDJ, ක.කි.බෙ.

Non-Commercial Distribution

පැන ගොස් දෙමළුන් හිස හෙන සෙණක් සේ නුවරමැද පැන හී කෙහෙල්සුලපතක්[1] සේ මහත් කඩුවක් ගෙන රඹකඳ[2] පොලුගසන්නා සේ දෙමළුන් පොලුගෙන මරා නිමවා ක්‍රමයෙන් ගොස් අනුරාධපුරය ගන්නා දවස් දීඝජන්තු නම් වූ පතාක යෝධයා හා සටන් කොට ඔහු මරා කෙසරසිංහරාජයකු දුටු මුවරළක් බුන්නා සේ බිඳී දිවන මහසෙනහ සාධා රාජ්‍යය එක්සත් කොට රජ්ජුරුවන් ඔටුනු පැළඳවූහ. එතැන් පටන් ඒ සුරනිමල යොධයාණෝ රජ්ජුරුවන් හා එක් ව බොහෝ පින්කම් කොට ගෙන ආයු කෙළවර තමන් කම් වූ පරිද්දෙන් ගියහ.[3]

මෙසේ නුවණැති පින්වත් සත්වයෝ උත්තමයන්ගේ අවවාද ගිවිස මතු නරකයට පමුණුවන්නාවූ අකුසල් දුරු කොට බුදුන් විසින් පසස්නා ලද අනෙකප්‍රකාර කුශලසම්භාරයන් රැස්කොට දිව්‍යමනුෂ්‍යසම්පත් වළඳ මෙසේ ශක්තිසම්පන්න ව මහත් වූ පුරුෂ බල පරාක්‍රමයෙන් සතුරන් සාධා ලොක ශාසන දෙක වර්ධනය කළාහු මය. කියනලද මැයි"

විහාය පාපං හරකොපගාමිං
කත්වාන පුඤ්ඤං සුගතප්පසත්ථං,
විභදන්ති භොගං සනරාමරෙසු
එවම්පි ධීරා බලවා භවන්ති-යි.

මේ මෙහි සතර වන
සුරනිමල වස්තුව ය.

තව ද මෙහි පස් වන මහාසොණ[4] වස්තුව නම් කවරයත්. හේ මෙසේ දතයුතු;

ශාක්‍යකුල තිලකායමාන වූ අප මහා ගෞතම බුදුරජාණන් වහන්සේ බුදුවන්නාට පූර්වභාගයෙහි මෙම කප තුන් වන අනන්තකල්පයෙහි ත්‍රෛලොක්‍ය කල්පද්‍රුමයක් වැනි කාශ්‍යප නම් මහ බෝසතාණන් වහන්සේ දනශීලාදි වූ සමත්‍රිංසත් පාරමී ධර්මයන් පුරා මස්තකප්‍රාප්ත කොට හැම සර්වඥවරයන්ගේ බුදුවීමට දෙවන ආත්මභාවයෙහි විසීපුර වූ[5] තුසීපුරයෙහි ඉපද එහි ආයු පමණින් දිවසැපත් වළඳ දසදහසක් සක්වළ දෙව්බඹුන්ගේ ආරාධනාවෙන් මිනිස්ලොව ඉපද පෙරඩමස සඳ සිරින් ක්‍රමයෙන් වැඩී යෞවන අවස්ථාවට පැමිණ නොයෙක් සියදහස් ගණන් සුරලියන් බඳු වරලියන් පිරිවරා එම තුෂිත භවනයෙහි දිව්‍යප්‍රාසාදවලට අපහාස්‍ය කරන්නාක් වැනි වූ තුන් සෘතුවට සුදුසු වූ තුන් පායෙහි වෙසෙමින් සුරඹුසුරු විඳිනා

1. සුලවනත් - BCDEGH
2. රඹකඳන් - BGH
3. දෙව්ලොව ගියහ - BGHK ස.
මිය පරලොව ගියහ - ම.
4. මහාසෙන - CD
5. වසීපුර වූ - ක. කි. ඤ. ම.

Non-Commercial Distribution

සක්දෙව්රජනු මෙන් නරඉසුරු විඳ උද්‍යානගමන මාර්ගයෙහි දෙවියන් විසින් මවා දක්වන ලද චතුර්විධ පූර්වනිමිත්ත සන්දර්ශනයෙන් ප්‍රව්‍රජ්‍යාවෙහි සාභිලාෂා ව[1] මහබිනික්මන් නික්ම මහණ ව බොධිපර්‍ය්‍යඞ්කාරූඪ ව මරසෙනඟ බිඳ බුදු ව සියලු දෙව් මිනිසුන් විසින් පුදනලදු ව දහම් නමැති රුවන් වැසි වස්වා මුළුලොව සනහ සනහා නිවන්පුර පුරා වැඩවසන සමයෙහි ඒ මහාසොණ[2] නම් යොධයාණෝ බොහෝ සම්පත් ඇති එක්තරා කුලගෙයක[3] ඉපද වැඩිවිය පැමිණ කටයුතු දන්නා අවස්ථාවෙහි බණ අසා බුදුසස්නෙහි පැහැද සංඝයා වහන්සේ උදෙසා කම්පල අදනා ක්ෂීරපායාසයෙන් ලහබත් තබා දුන්හ. සෙසුත් බල වඩනට නිසි කුසල් කොට ආයුකෙළවර එම කුශලයා[4] විසින් මෙහෙයන ලදු ව සප්තරත්නමය දිව්‍යවිමානයෙක ඉපද නොයෙක් දහස් ගණන් සුර සුන්දරීන් පිරිවරා දිව්‍ය නාටකයන්ගේ නෘත්‍ය ගීත වාද්‍යයෙන් සන්තුෂ්ට වෙමින් අනොපමෙය්‍ය වූ දිව්‍ය ඓශ්වර්‍ය්‍ය විඳ එයින් අවුත් මිනිස්ලොව ඉපද එපරිද්දෙන් ම මහත් වූ ශ්‍රී සම්පත්ති[5] විඳිමින් වාසයකොට මෙසේ ච්‍යුතිප්‍රතිසන්ධි වශයෙන් දෙව්මිනිස් සැපත් විඳ එක් බුද්ධාන්තරයක් ගෙවා අප බුදුන් බුදු ව ධර්ම නමැති අමාවැයි වස්වා දිව්‍යමනුෂ්‍යයන්ගේ චිත්තසන්තානයෙහි කෙලෙස් නමැති ගිම්නිවා තමන්වහන්සේ විසින් කළමනා සියලු බුද්ධකෘත්‍යය නිමවා පිරිනිවි පසු සකලද්වීප දීප්‍යමාන සාලඞ්කාර[6] ලඞ්කාද්වීපයෙහි රුහුණුරට මල්වතු මඩුල්ලෙහි කළඹුරු කණ උන්දුරු කරවිටි නම් ගම පුතුන් සත්දෙනකු ඇති තිස්ස නම් කෙළෙඹියාණන්ට පුත් ව උපන්හ. මව්පියෝ මිහට සොණකුමාර[7]ය යි නම් තුබූහ. ඒ සොණ නම් කුමාරයෝ ක්‍රමයෙන් වැඩී සත්හැවිරිදි කල ඉස්වට උස කොර තල්කොලු[8] මුලිනුදුරා දමති: දෙළොස්[9] ඇවිරිදි කල මහත් තල්ගස් උදුරා එළති: සොළොස් ඇවිරිද්දෙහි පටන් තල් පොල් ආදි වූ වෘක්ෂයන් බාහුයෙන් පැහැර එළමින් ඇවිදිති. ඒ සෝණ නම් කුමාරයා ක්‍රමයෙන් වැඩී විසි තිස් ඇවිරිදි අවස්ථාවෙහි ඉතා රූපසම්පන්නයෝ ය. කාලාවක කුලයෙහි ඇතුන් දසදෙනකු[10] බල ධරති. කියනලද මැයි මහාවංශයෙහි;

> සත්තවස්සික කාලම්හි - තාලගච්ඡේ අලුඤ්චි සො,
> දස ද්වාදස වස්සම්හි[11] - තාලේ ලුඤ්චි මහබ්බලො.
>
> කාලෙන සො මහාසොණො - යොබ්බනට්ඨො සුරූපවා,
> කාලාවකානං හත්ථීනං - දසනාගබලො අහු-යි.[12]

ඔහු මෙසේ බලසම්පන්න බව සියලු ලංකාද්වීපයෙහි ප්‍රසිද්ධ විය. එපවත් අසා කාවන්තිස්ස රජ්ජුරුවෝ ඔහුගේ පිය වූ කෙළෙඹි පුත්‍රයා හට දහසින් බැඳි පියල්ලක් යවා එසේ ම ගම් බිම් ක්ෂෙත්‍ර වස්තු දීමෙන් ඔහු සතුටු කරවා ඔහුගේ ඒ කියන

1. සාභිලාෂ ඇති ව - ACJ
2. මහසෙන - CE
3. කුලයෙක - ABCJ
4. කුශලකර්මයා - KL ස.
5. සම්පත් - ACDHJKL
6. සාරාලංකාර - ක.කි.කැ.ම.
7. සේන කුමාරයෝය යි - CD
8. තල්කොල - D, බෙ.
   තල්පැළ - ම.
9. දසදෙළොස් - බෙ.ස.
10. දසදෙනකුගේ - BEGHKL ක. කැ.
11. දසවස්සික කාලම්හි - මහාවංස, ක.කි.කැ.ම.
12. කාලෙන සො මහාසොණො - දසහත්ථිබලො අහු
    රාජා තං තාදියං සුත්වා - පාසෙත්වා පිතු සන්තිකා - මහාවංස

Non-Commercial Distribution

සෝණ නම් වූ බාල පුතණුවන් ගෙන්වා ගෙන ඕහට මහල් මහවීථියෙහි ගෙයක් සලස්වා බොහෝ පරිවාර ජනයන් හා සම්පත් දී දවස දහසක් බැගින් ඉලක්ක සිටුවා ගැමුණු කුමාරයන් සමීපයෙහි වසන ලෙස සැලැස්වූහ.

ඒ මහාසොණ[1] නම් යොධයාණෝ පසුව දුටුගැමුණු රජ්ජුරුවන් හා එක් ව ඒ ඒ තැන්හි යුධ කෙරෙමින් පිළිවෙළින් ගොස් විජිතපුරය ගන්නා දවස් අටලොස් රියන් උස ලොහො පවුර බිඳ හෙළා නුවරට වැද ඉදිරියෙහි සිටි මහ තල්ගසක් මුලින්උදුරා ඇර ගෙන දෙමළුන් තළා යුධ කොට විජිතපුරය ගෙන එපරිද්දෙන් ම ගිරිනිල් නුවර මහගල්පුරය[2] ගෙන එළාල රජු සාධා අනුරාධපුරය ගෙන රජ්ජුරුවන්ට රාජ්‍යය එක්සත් කොට ඔවුනු පළඳවා රජ්ජුරුවන් හා සමඟ ලෝසඳුන් රැක බොහෝ පින් රැස්කොට ගෙන ජීවිතාවසානයෙහි කම් වූ පරිද්දෙන් පරලොකප්‍රාප්ත වූහ[3]. මෙසේ පූර්වජන්මයෙහි කළාවූ කුශලබලයෙන් ලබනලද සම්පත්ති රාශියක් හා ශරීරබලය සෙසු ප්‍රාණවධාදි වූ දුශ්චරිත කිරීමෙන් නොනසා නුවණැති කුලපුත්‍රයෝ ලොකශාසන දෙක රක්‍ෂාකළාහු මය: එබැවින් වියත්වන්ත සත්පුරුෂයන් විසින් ලොකශාසන රක්‍ෂාවෙහි අප්‍රමාද වුව මැනවි. කියනලදුයේ මැයි;

පුඤ්ඤෙන ලද්ධං විභවං ච ථාමං
න නාසයං පාණවධාදිකෙහි,
කරොති එවං ජිනසාසනස්ස
වුඩ්ඪිං විරූළ්හිං මතිමා කුලීනො-යි.

මේ මෙහි පස් වන
මහාසොණ[4] වස්තුව ය.

මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි
ඝාතුවණ්ණ වගී[5] නම් වූ

තුදුස් වන පරිච්ඡෙදය නිමි.

---

1. මහාසෙන - C
2. මහල්පුරය - ACEGHJL;
   මහනිල්පුරය - K
3. විය. බෙ. ස.
4. මහාසෙන - C
5. වගීය - G

Non-Commercial Distribution

තව ද මෙහි පසළොස් වන ගොඨඉම්බර වර්ගය[1] නම් කවර යත්. එහි පළමු වන ගොඨඉම්බර වස්තුව මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මේ මහාභද්‍රකල්පයෙහි තුන් වැනි ව බුදු වූ කාශ්‍යප බුදුන් සමයෙහි ගොඨඉම්බර නම් යොධයාණෝ එක්තරා කුලගෙයක ඉපද තව මතවූ දන්නා[2] අවස්ථාවෙහි විහාරයට එළඹ බුදුන්ගෙන් බණ අසා ශ්‍රද්ධාවන්ත ව සංඝයා වහන්සේට කිරි හා සමඟ ලහබත් තබා දෙමින් එසේ ම කහබහන් සැරයටි පටි ආදි වූ බල වඩන්ට නිසි බොහෝ කුසල් කොට ආයු කෙළවර දෙව්ලොව ඉපද බොහෝ කාලයක් දිව්‍යසැපත් වළඳ එපරිද්දෙන් ම මිනිස්ලොව මනුෂ්‍ය සම්පත් විඳිමින් මෙසේ එක් බුද්ධාන්තරයක් ගෙවා අප බුදුන් බුදු ව පිරිනිවි පසු මෙම ලක්දිව රුහුණු ජනපදයෙහි නිටුල්විටි[3] නම් ගම බොහෝ සම්පත් ඇති මහානාග[4] නම් කෙළෙඹි පුත්‍රයාට පුත් ව උපන්හ. එකල උන්ට මවුපියෝ අභය[5] කුමාරය යි නම් තුබූහ: ඒ කෙළෙඹි පුත්‍රයාගේ අනිකුත් පුත්තු සදෙනෙක්[6] ඇතියහ: ඔහු සදෙන බාල වූ අභය නම් මලණුවන් ඉතා මිටි හෙයින් කෙළනා පිණිස ගොඨය යි පරිහාස කියා වෙහෙසා කෙළිනාහුය. එසේ මිටි බව මිස ඇතුන් දසදෙනෙකුට බලඇත්තේය: එසේ බල ඇතත් කිසි ම මෙහෙවරක් නොකෙරෙයි: ඔහුගේ වැඩිමහලු සබෑයෝ මාසට[7] කුඹුරු තනන්නාහු මහත් වූ ඉඹුරු වනයක් කපා බිම් එලි කොට ලියදි තනා ගොඨයන්ටත් භාගයක් තබා ගියහ:[8] ඔහු මහත් වූ ඉඹුරු ගස් තම්පලා පැළ සේ මුලිනුදුරා ගෙන ගොස් තමන්ට නියම කළ දසාවේ කඳවැට බැඳ බිම උදලු ගා සම කොට ගෙට ගොස් එපවත් සබෑයන්ට කීහ. එබසට සිනාසී සබෑයෝ ගොඨයා කළ මෙහෙවර බලම්හ යි ගොසින් ඔහු විසින් කරනලද ආශ්චර්යමත් වූ මෙහෙවර දැක "මෙතෙක් දවස් කිසිවකුත් නොකොට ගෙට වැදලා උන් ගොඨයා කළ මෙහෙවර ඉතා බැරි දෙයෙකැ"යි කයිවාරු කෙරෙමින් ඔහු සමීපයට අවුත් ස්තුති කොට කීහ. එතැන් පටන් ගොඨයා ගොඨඉම්බර නම් විය. කියනලද මැයි මහාවංශයෙහි;

ලකුණ්ටක සරීරත්තා - අහු ගොඨක නාමකො,
කරොන්ති කෙළිපරිහාසං - තස්ස ජෙට්ඨා ච භාතරො.

තෙ ගන්ත්වා මාසඛෙත්තත්ථං - කොට්ටයිත්වා මහාවනං,
තස්ස භාගං ඨපෙත්වාන - ගන්ත්වා තස්ස නිවෙදයුං.

සො ගන්ත්වා[9] තං ඛණං යෙව - රුක්ඛෙ ඉම්බර සඤ්ඤිතෙ
ලුඤ්චිත්වාන සමං කත්වා - භූමිං ගන්ත්වා නිවෙදයි,
ගන්ත්වාන භාතරො තස්ස - දිස්වා කම්මං තමබ්භුතං.

---

1. වර්ගය - BCDEGHKJ
   වර්ග - බෙ.
2. කටයුතු දන්න - C ම.
   තව යොවුන - D
   තම මවු - ක. සි. සද.
   තමන් තමුන් - බෙ.
3. නිටුල්පිටි - BG
4. මහානාම - C
5. අභයරාජ - ABCDEGHJL
6. සද්දෙනෙක් - ACDHJL
   සත්දෙනෙක් - BEG ක. සද.
7. මාහට - ක. සි. සද. :
   මාස - ස.
8. ගෙට ඇවිත් "එම්බල ගොඨය තටත් කුඹුරු කිරියක් වල් තබලා ආම්හ. මෙතෙක් දවස් සේ කාලා නොඉඳ කට කුඹු භාගය එළිකොට ලව"යි කීහ. එබස් අසා ඔහු ගොස්.....
   - මේ කොටස ස. හි පමණක් පෙනේ.
9. ගන්ත්වාන - E, බෙ. ස.

Non-Commercial Distribution

තස්ස කම්මං නිජ්ඣායන්තා - ආගච්ඡිංසු තදන්තිකං,
තදුපාදය සො ආසි - ගොඨිම්බර නාමකො-යි.

උතුරුතිස් වෙහෙර වැසි භික්ෂූහු 'අභය නම් යොධයා මුහු කළ[1] අවස්ථාවේ වැද්දන් හා සමඟ මුවදඩ ගොසින් කොටුපතෙක බලා සිටියේ දැල්බැඳි තැනට නොවැද යන මුවකු දැක ලුහුබැඳ ගොස් පස්සා කකුල්දෙක අල්වාගෙන ඉස වට සිසාරා මිටි සිදුරු ඉඹුරුගසෙක පැහැර දෙකඩ කොට කැඩීය: එතැන් පටන් ගොඨිම්බරයා යි නාම ව්‍යවහාරය වීය'යි කියත්ල.

කාවන්තිස්ස රජ්ජුරුවෝ ගොඨිම්බරයන්ගේ බල අසා උන්ගේ දෙමව්පියන්ට බොහෝ ප්‍රසාද දී ගොඨිම්බරයන් කැඳවා යවූහ. මෙහෙවර ගියවුන් අතින් එපවත් අසා ගොඨිම්බරයෝ දෙමවුපියන් වැඳ අවසර ගෙන මහජනයා පිරිවරා මාගමට යන්නාහු අතරමඟ සප්පදුරු[2]ඹය සමීපයෙහි සප්පදුරු[2] නම් විහාරයට වන්හ: එකල විහාරයෙහි පොල් උයනක් දැක කැටිව යන පරිවාර ජනයෝ "කසපැන් බී යම්හ"යි කීහ: එබස් අසා ගොඨිම්බරයෝ යහපතැ යි ගිවිස පොල් උයනට වැද මොනරපිල්කලප් සලන්නා සේ පොල්ගස් අල්වාගෙන සලා කසපැන් වගුරුවා ගෙන විලුඹින්[3] ඇන ලෙලි ගළවා කැටිව යන සේවකයන්ට දුන්හ: සේවකයෝ කසපැන් බී ඔහු පිරිවරා නික්මුණාහ: ගොඨිම්බරයෝ ඔවුන් පිරිවරා මාගමට ගොස් රජ්ජුරුවන් දුටුවුය:[4] එකල රජ්ජුරුවෝ "තෙපි කොයි සිට අවු දැ"යි විචාළහ: එබස් අසා ගොඨිම්බරයෝ තමන්ගේ ගම් බිම් නම් සලකුණු කියා තමන් යොධ බව ප්‍රකාශ කොට කීහ: එබස් අසා රජ්ජුරුවෝ ඕහට මහත් වූ සත්කාර කොට දවස් පතා වියදමට දහසක් බැගින් පඩි සලස්වා මඟුල්මහවීථියෙහි ගෙයක් තිලකොට දී සේවයට සලස්වා ගත්හ.

පසුව ඒ ගොඨිම්බර නම් යොධයාණෝ දුටුගැමුණු රජ්ජුරුවන් හා එක් ව දෙමළ දෙතිස් කඳවුරෙහි දෙමළුන් හා යුධයට පටන්ගෙන ඡත්‍ර නම් දෙමළ රජ්ජුරුවන් හා සමග සටන් කරන දවස් මහාඡත්‍ර නම් විල සමීපයෙහි පටන් කොට දහසක් දෙමළුන් මරා සතුරු රජ්ජුරුවන්ගේ හිස ගෙනවුත් දුටුගැමුණු රජ්ජුරුවන්ට දැක්වූහ. එපරිද්දෙන් ම ඒ ඒ තැන දෙමළ කඳවුරු පැහැර යුධ කෙරෙමින් ගොස් විජිතපුරයෙහි මහපවුර බිඳගෙන නුවරට වැද ඉදිරියෙහි සිටි පොල්ගසක් දැක මුලින් උදුරා ඇරගෙන දෙමළුන් තළා මරමින් මහසටන් කෙළේය: එකල රජ්ජුරුවෝ ගොඨිම්බරයන් හා මහසෙනඟ[5] ගෙන ක්‍රමයෙන් ගොස් අනුරාධපුරය ගෙන රාජ්‍යය එක්සත් කොට ඔටුනු පැළඳ රාජ්‍යය කරන්නාහු ගොඨිම්බරයන්ට බොහෝ සම්පත් දී මඟුල් මහවීථියෙහි ගෙයක් තිල කොට බොහෝ පරිවාර සලස්වා එහි වාසය කැරවූහ.

---

1. මුහුනොකළ - BH
   නොමුහුකළ - C
2. සප්පදුරු - සෑ:
   පප්පදුරු - බෙ.
   සප්පසණ්ඩර - පාලි
3. විලුඹේන් - ABCDGJKL
4. දුටුවාහුය - C
   දුටවූහ - E
5. හා සමඟ සෙනඟ - B මුද්‍රිත නැම, ස.

Non-Commercial Distribution

මෙසේ ඒ ගොඨිම්බර නම් යොධයාණෝ මහත් වූ ශ්‍රී සම්පත් විඳිමින් වසනු[වෝ][1] ඉස් සේදීම් නැහැවීම්[2] මුව සේදීම් ආදිය පිණිස ඉදිරියෙහි යොදනක් පමණ දුර තිසාවැවට නිරන්තරයෙන් ම යෙති. දවසෙක වැවට ගොස් නුවර බලා එන්නාහු තිසාවැව මියර අස ඉසුරුමුණු විහාරයට ගියහ. එම විහාරයේ වහසල් දෙර සමීපයෙහි මහත් උණ පඳුරෙක් මඟ අවුරා සිටියේය:[3] එසේ හෙයින් ඒ විහාරයෙහි වසන මහතෙරුන්වහන්සේ එදවස් උදලු පොරෝ ආදිය ගෙන්වාගෙන බොහෝ මිනිසුන් හා සමඟ එතැන්හි වැඩිසේක. ගොඨිම්බරයෝ තෙරුන් වහන්සේ වැඳ "ස්වාමීනි, මෙතැන කුමක් කරවනසේක් දැ"යි විචාළහ. තෙරුන් වහන්සේ "උපාසකය, මේ උණපඳුර අරවන්ට උත්සාහ කරවම්හ"යි වදාළසේක. එබස් අසා ගොඨිම්බරයෝ "එසේ වී නම් ස්වාමීනි, මහත් වරමන්දක්[4] ගෙන්වුව මැනවැ"යි ගෙන්වාගෙන උණපඳුර මුලින් බැඳ වමතින් අල්වා ඇද උණපඳුර මුලින් උදුරා ඉසවට සිසාරා මහමඟින් දුර දමා නුවරට ගියහ: ඒ උණපඳුර ප්‍රමාණයෙන් ගැලක්[5] පුරා ගෙනයන බර ඇත්තේය.

ඉක්බිති ඒ යොධයාණෝ මැන භාගයෙහි නුවර ඇතුළත තුන් මහල්පායක් කරවා දිව්‍යසැපත්[6] හා සමාන මහත් වූ ශ්‍රී සම්පත් අනුභව කරන්නාහු දවසෙක මතුමාලේ චන්ද්‍රාඞ්ගණයෙහි[7] විසිතුරු මණ්ඩපයක් කරවා උඩ සුදුවියන් බඳවා වට කොට කර්මාන්තයෙන් විචිත්‍ර වූ පටකඩ තිරයෙන් පරික්ෂෙප කොට ඒ ඒ තන්හි මනහර සුවඳ මල්දම් එල්වා බිම සුවඳ පිරිබඩ ගෙන ජයසුමන දෙඉද්ද චම්පක වකුලාදී වූ සුගන්ධ කුසුමයන් බිම අතුට ඒ ඒ තන්හි පද්මෝත්පලපුණ්ඩරීකාදීන් යුක්ත සුවඳදිය පිරි පුණ්ඩසට තබ්බවා[8] තුමූ දිව්‍යකුමාරයකු මෙන් සර්වාභරණයෙන් සැරහී මනා කොට සරහන ලද උතුම් වූ ආසනයක් මත්තේ හිඳ තමන්ගේ භාර්‍ය්‍යාවන් ද කණ්ක කටක රසනුපුර්[9] තාඩඞ්ක වලය තිසරපට[10] කොඬමල්[11] ආදි වූ නොයෙක් ආභරණයෙන් දෙවඟනක මෙන් සරහා රා පිරූ රන් ඔඩමක් අතට දී දකුණින් පස සිටුවා එපරිද්දෙන් ම සැරහුණා වූ දෙවඟනන් බඳු වූ නොයෙක් සියගණින් ස්ත්‍රීන් හා නානාප්‍රකාර ආයුධ හා සුවඳ මල් කලප් ද අටමඟල සොළොස්මඟල ආදිය අල්වාගෙන පිරිවරා සිටිනා සේ සලස්වා නෘත්‍යගීතවාදයෙහි දක්ෂ වූ නාටකජනයන් කැඳවා කැමැති පරිද්දෙන් බෙර ගසන නටන ගී කියන සේ නියොග කොට ඒ සියලු ම සුරාපාන මණ්ඩලය දිව්‍යසභාවක් මෙන් ද ස්වභාවයෙන් ම ශ්‍රී කාන්තාවට වාසස්ථාන වූ ප්‍රාසාදයක් මෙන් ද අලඞ්කාර කොට ඒ ඒ තන්හි තියුණු වූ රා පිරූ කළ කොතලා මහසැළ බඳුන් ආදිය තබ්බවා මත්ස්‍යමාංස ඉහුරු ලුණු ආදි වූ උපකරණ රැස් කරවා තබ්බවා ගෙන රා බොන්නට පටන් ගත්හ.

---

1. වසනුයේ - පිටපත් හැම
2. නැහැවීලි - BGHKL
3. සිටිසේය - BEGHKL
4. වරදම්ක් - ක.කි.ඝ.
5. ගැල්සැටක් - K
6. දිව්‍යසැපතක් - ABDEGJKL
7. මණ්ඩාංගනයෙහි -AC
8. තබවා - KL
9. සරනුපුර - J ඝ.
   රසුනුපුර - ක.කි.
   රසනා නුපුර - ම.
   රස රසන් නුපුර - ස.
10. තිසර පහර - AEGHJKL
11. කොංඩමාලා - ACJL

ඒ ක්‍ෂණයෙහි රිටිගල වසන ජයසෙන නම් යක්‍ෂයෙක් නොයෙක් සියගණන් යක්‍ෂයන් විසින් පිරිවරන ලදු ව තාම්‍රපර්ණී නම් වූ අමුසොහොන බලා යනුයේ සුවඳමල් ආදියෙහි සුගන්‍ධය හා නෘත්‍ය ගීතාදියෙහි ශබ්දය ද අසා ඒ දසාව බැලූයේ දිව්‍යවිමානයක් මෙන් සරහනලද සුරාපාන මණ්ඩලය දැක අහසින් බැස තමාගේ යක්‍ෂසෙනාව හා සමඟ මණ්ඩපයට වැද බලනුයේ ගොඨ්ඨුම්බරයන්ගේ භාර්‍ය්‍යාව[1] දැක උන් කෙරෙහි පිළිබඳ සිත් ඇති ව එම ස්ත්‍රියගේ ඇඟ ආවෙශ වීය: ඕතොම එකෙණෙහි අල්වාගෙන සිටි රාඹඩම බිම හෙළා විසංඥ ව බිම්[2] ඇත මැත පෙරළෙමින් මුඛයෙන් සුදු පෙණ පිටත් කොට විරූඪ ව පෙරළියාවූ ඇස් ඇති ව උඩබලා හොත්තීය: එකල්හි ගොඨ්ඨුම්බරයා එපරිද්දෙන් හොත්තාවූ භාර්‍ය්‍යාව දැක දෙම්නස් ව හුනස්නෙන් නැඟී පරීක්‍ෂා කොට බලා යක්‍ෂයා ආවෙශ වූ බව දැන[3] මහත් වූ අභිමාන උපදවා කිපී කියනුයේ "එම්බල කොල දූෂට සොර අශික්‍ෂිත යක් කොල්ල, නොපෙනී සිට කුමක් පිණිස මාගේ භාර්‍ය්‍යාවට ආයාස කෙරෙයි ද, ඉදින් පෙනී සිට මෙබන්දක්[4] කෙළෙයි නම් මාගේ වම්පයින් ගසා මරා භස්ම කොට අළු පමණකුත් නොතබමි: එම්බල යක්‍ෂය, සැබවින් තෝ පිරිමියෙක් වී නම් තාගේ පිරිමිකම් බලමි, දෘශ්‍යමාන රූපයෙන් මෙසේ පලා වර. එසේ වී නම් දෙදෙනා යුධ කළ කල ජය පරාජය දැක්ක හැක්කේ වේ දැ"යි කී ය. කියනලද මැයි;

අරෙ දස මහාචොර - යක්ඛාසික්ඛිත චෙටක,
අදිස්සමානකො හුත්වා - දරං මෙ කිං විහෙඨසි.

දිස්සමානෙන කායෙන - කරොති කම්මමීදිසං,[5]
සියා තෙ දෙහතො භස්මං - වාමපාදෙන පොථිතෙ.[6]

යදි ත්වං පුරිසො යක්ඛ - පස්සාමි තව පොරිසං,
දිස්සමානො ත්වමාගච්ඡ - උභො යුද්ධං කරොමසෙ-යි.

එබස් අසා යක්‍ෂයා මහත් වූ අභිමාන උපදවා ඇගේ ශරීරයෙන් පහ ව ක්‍රොධයෙන් දිලිහී අඤ්ජන පර්වතයක් සේ මහත් කළු ශරීරයක් මවා මහත් දරුණු දළදෙකක් ඇති ව ගිනිගත් යවට දෙකක් මෙන් අතිරක්ත වූ ඇස්දෙකක් බමව බමවා භයංකාර රූපයෙන් පෙනි පෙනී සිට "එම්බල කොලුපැටව, නොයිත් මා සමඟ යුධ කෙරෙයි දැ"යි මෙසේ ගොඨ්ඨුම්බරයන් නැති ගන්වා බෙණෙමින් "එම්බල පැටව, මා මෙසේ වහසි කී කල මේ යක්‍ෂයා භයගෙන පලා යෙයි සිතා දෙඩයි දැ: එසේ එක විටකත් නො සිත.[7] ඒ ඒ තැන අඩ ගසා ඇවිදිනා අඳෙන වූ කැණහිල්ලු

1. භාර්යාවන් - KL
2. බිම්හි - EG
බිම නී - ස.
3. දැක - ACJ ම.
4. මෙබඳු දෙයක් - ක.සි.සද.ම.
5. කාමමීදිසං - ABCEGHJKL
6. පොථිතෙ - ABCEGKL
7. නොසිතව - CDH ම.
නොසිතා - බෙ.ස.

Non-Commercial Distribution

කෙශරසිංහයන්[1] පරදවා කවර කලෙක ජයගත්තු දः කෙශරසිංහයන් පරදවා ජයගන්නා කැණහිල්ලු නැත් මයः එපරිද්දෙන් ම මා හා සමඟ වාදකොට ජය ගන්නා වූ සත්වයෙක් කිසි කලෙකත් නැත් මයः ඉදින් වාදයෙක් පැමිණියේ වී නම් ඇම තැන්හි ම මා ජය ගන්නා හෙයින් මා ජයසේනය යි නම් ලත් බව සියල්ලෝ ම දනිතිः එබැවින් මේ තාගේ නිෂ්ඵල වාසි බස් තබාපියා ඉතා බොහෝ ව කටට ආ නන්[2] නොදෙඩව[3]ः එම්බල පැටව, ඇතකු හා වාද කොට ජය ලද්දවූ සා පැටවෙක් ඇද් දः බැන නොනැඟී හිඳුව"යි කී ය. කියනලද මැයි;

අහො හසන්ති[4] මෙ යක්ඛා - තව සුත්වාන භාසිතං,
නදං බාලසිගාලො කිං - කද ජෙස්සති කෙසරිං.
කදචි කොචි මං සත්තො - පරාජෙසි මමාගතො,[5]
ලද්ධ ජයත්තා සබ්බත්ථ - ජයසෙනොති මං විදූං.
මා තුච්ඡගජ්ජිතං ගජ්ජ - මා ත්වං විප්පල පිල්ලක,
සසච්ජාපො කද යුද්ධෙ - ජයං ලභති හත්ථිනා-යි.

මෙසේ යක්ෂයා කී වහසිබස් අසා ගොධඋම්බරයෝ කියන්නාහු "එම්බල යක්ෂය මම මහත් වූ ශරීරයක් ඇති යක්ෂයෙකිමි යි ඉතා බොහෝ කොට වහසි නොකියවः[6] එක සූර්‍ය්‍යමණ්ඩලය උදයගිරි මුදුනෙන් උද වූ ඇසිල්ලෙහි මුළු ලෝ පැතිර සිටි ඝනාන්ධකාරය කොයි පලායේ දः ඉරු ආලොක කළ ගමනේ ම අන්ධකාරය අන්තර්ධාන වෙයිः එම්බල ඒ තමා කුඩා වී නමුත් කගවෙසතුන්ගේ[7] අඟින් හා සමළප මාත්‍ර වූ විදුරු ඇරගෙන මහමෙර වී නමුත් විද පලවා පියති[8]ः එබඳු මහත් පර්වතයෝ සාර වූ වජ්‍රයට කිසිවක් කොට ගත නොහෙතිः එපරිද්දෙන් ම තාගේ මහත් වූ ශරීරබලය මාගේ පය එක ඇඟිලි පර්වයෙකින් විනාශයට යෙයිः මා හා සමඟ යුද්ධයට පලා වරෙ`යි[9] කීහ. එසේ හෙයින් කියනලදී.

යක්ඛා අසම් මහාදෙහො - අලං තෙ ඉති ගජ්ජිතං,
උග්ගතෙ සුරියෙ එත්ථ - අන්ධකාරො කුහිං ගතො.
ඛග්ගම්ගවිසාණෙන - පරිත්තවජිරෙන වා,
මෙරුං හනන්ති නො මෙරු - කිඤ්චි සක්කොති[10] කාතවෙ.
තව දෙහබලං යක්ඛ - මමෙකඩ්ගුලි පබ්බතො,
විලයං යාති එහජ්ජ - යුජ්ඣ දනි මයා සහ-යි.

1. කෙශරසිංහරාජයන් - BGH
2. කටට ආවක් - CD
3. නොදෙඩ - J ස.
නොදෙඩා - KL
4. හාසන්ති - CDEGHJK
5. නචාගතො - මුද්‍රිත හැම, ස.
මමාගතො - පිටපත් හැම, පාලි.
6. නොකිය - AEGHJKL
7. කහවෙහෙනුන්ගේ - BGHL
කහවේනුන්ගේ - AC
8. පලාපියති - මුද්‍රිත හැම, ස.
9. පලා වරෙව - ක.කී.සඳ.
පලා වර - ම
පලා වර්. - බෙ. ස.
10. සක්කොති - BEGHKL ම.

Non-Commercial Distribution

මෙසේ ගොඨඉම්බරයන්ගේ වහසිබස් අසා යක්‍ෂයා කියනුයේ "එම්බල ගොඨඉම්බරය, තා හා සමඟ මා කරන්නාවූ යුධය බලන්නට නිසි කෙනකුන් නැති ව තිබැදි මෙතැන්හි මා කරන යුධයෙක් නැත: දැන් මම තාම්‍රපර්ණී නම් වූ අමුසොහොන සමීපයට යෙමි, එතැන්හි මහත් වූ යක්‍ෂසමාගමයෙක් වෙයි, එතැන්හිදී තට යක්‍ෂයන්ගේ බලත් මෙසේ වනැ යි ඉඳුරා දැනෙන පරිද්දෙන් තට මාගේ බලත් දක්වන්නෙමි වේ දැ"යි කියා යළිදු වහසි කියනුයේ "එම්බල ගොඨඉම්බරය, ඉදින් තෝ පිරිමියෙක් වී නම් පලා වර, මෙයින් සත් වන දවස් තාම්‍රපර්ණී සුසානයෙහි මහ යක්සෙනග බල බලා සිටියදී අප දෙදෙන යුධ කරම්හ: මෙතන අප දෙදෙනාගේ ජය පරාජය දෙක දක්නෝ කවුරු දැ"යි කියා[1] "ඉදින් තෝ යුධ කරනු කැමැත්තේ වී නම් තාගේ ඇති වස්තු සියල්ල ම බලා සමන්වා මව් පිය බෑබුන් ආදීන් හා පුත්‍රදාරාවන්ට දූන මනා දෙය දී පරලොවට කළමනා සුචරිත ධම්ම[2] පුරාගෙන සටනට පලා වර."යි කීය. එසේ හෙයින් කියන ලදී;

නත්ථී'දනි තයා සද්ධිං - සංගාමො ගොඨඉම්බර,[3]
පුරිසො ත්වං යදි ආගච්ඡ - ඉතො සත්තම වාසරෙ.

තම්බපණ්ණිසුසානස්මිං - මහායක්ඛසමාගමෙ,
යුද්ධං හොතු උභින්නං නො - කො දික්ඛති ජයාජයං.

සාපතෙය්‍යං විචාරෙත්වා - කත්වාන ඤාතිසඞ්ගහං,
පරලොකවිධිං කත්වා - යුද්ධායාගමනං වරං--යි.

මෙසේ යක්‍ෂයා කී කාරණ අසා ගොඨඉම්බරයෝ කියන්නාහු "එම්බල, තා සේ වූ එක යකෙක් මට කුමක් කෙරේ ද, එක තැනට පැමිණි විට එදවස් කළමනා කාරිය මම් ම දනිමි: දැන් මැත නොදෙඩා[4] පලා යව"යි කීහ. එබස් අසා යක්‍ෂයා, තාම්‍රපර්ණී සුසානයට ගොස් බොහෝ යක්‍ෂයන් රැස් කරවා ගෙන ගොඨඉම්බරයන් හා තමා යුධ කරන සේ වහසි කියා සත් වන දවස් ගොඨඉම්බරයන් එන පෙරමඟ බල බලා සිටගත. එකල ගොඨඉම්බරයෝ පළමු කී පරිද්දෙන් ම සත් දවසක් මුළුල්ලෙහි මහත් වූ ශ්‍රී සම්පත් අනුභව කොට සත්වන දවස් යක්‍ෂයා කියාගෙන ගිය වහසි සඳහන් කොට තමා ඇඳි කඩින් පටක් එකාංශ කොට පෙරවගෙන උදසනක් සේ එතැන්හි යන්ට නික්මිණ. ඔහු යන මග ඒ ඒ තැන සිටියා වූ යක්‍ෂයන් හා දෙවතාවෝ ඔහු දැක දෘශ්‍යමාන රූපයෙන් සිට "එම්බල පින්වත, කොයි යෙයි දැ"යි විචාළහ. එබසට ගොඨඉම්බරයෝ කියන්නාහු "ජයසෙන නම් යක්‍ෂයා තමා හා යුධයට මා කැඳවයි: එසේ හෙයින් ඒ යක්‍ෂයා හා යුධයට යෙමි"යි කීහ. එබස් අසා දෙවතාවන් හා යක්‍ෂයෝ කියන්නාහු "කිමෙක්ද තෙපි කිසියම් අපාසුවකින් මොහී ව ගියා ද: මෙසේ ම තෙපි නුවණ මඳ කෙනෙක් ද: මිනිස්ලොව වසන්ට නිසි තොපගේ කුසල් ගෙවී ගියේ ද: තොපට වැඩ පසස්නා යහළු මිත්‍ර කෙනෙක්

1. කීය - JL ක.සි.සද.ම.
   කීහ - K
2. ධර්මයන් - KL
3. ගොඨඉම්බරො - පිටපත් හැම
4. දැන් ම තෝ තන් නොදෙඩා - ම.

Non-Commercial Distribution

නැසිය කෙනෙක් වත් තමාට නැද් ද: එසේ වූ නැසිය මිත්‍ර කෙනෙක්[1] ඇත්නම් මේ යකුන් හා යුධ කිරීම කටයුතු නොවන්නේය යි නො වළකද් ද. මනුෂ්‍යයන් තබා මහත් වූ බලසම්පන්න යක්‍ෂයෝ පවා ඔහු පරදවා ගත නොහෙති: පළමු යක්‍ෂසෙනාව හා යුධයක් කළ කල ඔහු ජයගන්නා හෙයින් ඕහට ජයසෙන යක්‍ෂයාය යි කියති. මෙසේ වූ යක්‍ෂයා හා යුධයට යන තොපගේ ජීවිතය තොපට අප්‍රිය වී දේ හෝ යි සිතම්හ: තොපගේ සියලු සම්පත්තියත් බන්‍ධුවර්ගයාත් අද පටන් තොපට නැති වන්නෝ වේ ද. එසේ හෙයින් ඒ චණ්ඩ පරුෂ වූ යක්‍ෂයා හා යුධකිරීම අපට නොකැමැත්තේය: ඒ තබාලා ඉදින් තෝ[2] යුධ කරනු කැමැත්තෙහි වී නම් පලා ගොසින් තමා හා සමාන මිනිසකු හා යුධ කරව"යි කීහ.

මොහො තෙ ආවිසි කිත්‍නු - කිත්‍නු අඤ්ඤණකො ව'සි,[3]
ජීවලොකස්ස වාසාය - පුඤ්ඤං බීණං නු තෙ ඉධ.
න විජ්ජන්ති නු තෙ මිත්තා - අත්‍ථකාමා'ථ ඤාතකා,
යෙතං ඉමං න වාරෙන්ති - අකත්තබ්බමිදං ඉති.
යක්ඛාපි බලවා එතං - න සක්කොන්ති පරාජිතුං,
ගණ්හාතීති ජයං නිච්චං - ජයසෙනොති වුච්චති.
මඤ්ඤාමහෙ මයං තුය්හං - ජීවිතං අප්පියං ඉති,
සම්පත්තියොච බන්‍ධූ ච - අජ්ජතග්ගෙ න සන්ති තෙ.
අලමෙතෙන යුද්ධෙන - යක්ඛෙන ඵරුසෙන තෙ,
ගච්ඡ සමානජාතීහි - යුද්ධං තෙ සාදිසං සද-යි.

මෙසේ දෙවතාවන් හා යක්‍ෂයන් කී අවවාද අසා ගොධ්ඉම්බරයෝ කියන්නාහු "එම්බා මෙතන රැස්වූ දෙවියන් හා යක්‍ෂයෙනි, මා කියන්නක් අසව: යම් තාක් ඉර නොපායා නම් ඒ තාක් කල් කද්‍යෝතියෝ බලවත්‍ත වෙති, ඉරු ආලෝක කළ ගමනේ ම කද්‍යෝතියන්ගේ ආලොක තබා ළඟ තුමූත් නිශ්ශොභා ව නොපෙනෙන්නාහු මය. එම්බා, සමහර ළදරු වූ[4] ළාබාලයෝ බල සම්පන්නයම්හ යි එඬරුගස් කෙහෙල්ගස් ඇන බිඳහෙළා ගෙන සමත්‍ථකම් දක්වා පැලඹී ඇවිදිති: එසේ වූ මොළ බාලයෝ තදපද අර ඇති කිහිරිගස් ඇන එළන්නා තබා ළං වියත් නොහෙති. හේ මතු නොවෙයි: දෙසාලිස් දහසක් යොදනින් මත්තෙහි අහස යමින් සිට කුඩ කුඩා ඇළ කඳුරු ගං හෝ හෙප් වළවල දිය සිඳුවා වියලාපියන සූර්‍ය්‍යදිව්‍යපුත්‍රයා තෙමේ අවුත් දියෙයි ගිලීත් මහමුහුද දිය වියලාපිය නොහෙයි. තව

1. කෙනෙක්වත් - ABCDEGH
2. තෙපි - C
3. අඤ්ඤණකො වසි - ක.සි.ස.ම.
4. ළදරුවෝ - J ක.සි.ස.ම.
ළදරුවෝ මොළබාලයෝ - ADEGH
ළදරු මොළ බාලයෝ - L ස
ළදරු බොළඳ බාලයෝ - K

Non-Commercial Distribution

ද සවල්ප වූ මකුලුහු[1] ළද[2] ලියපලු ආදිය සොලවමින් ගසාගෙන දිවන මහසුළඟ මහමෙර සොලවාලිය නොහෙයි. එම්බා යක්‍ෂයෙනි, ජයසෙනයා පළමු තමා හා සමාන බලවත්[3] කෙනකුන් නැතැයි සිතයි: දැන් නොබෝ ඇසිල්ලකින් මාගේ බල දක්වා බලවතිමි යි යන ඔහුගේ අභිමානය තබවන්නෙමි[4] වේ දැ"යි කීහ.[5] එසේ හෙයින් කියනලදි;

මංසාමපි වචනං සබ්බ - සුණන්තෙ'ත්ථ සමාගතා,
යාව ගොදෙති සො සූරියො - ඛජ්ජෝතො බලවා හවෙ.

ජීන්දිත්වා කදලෙරණ්ඩ - සණ්ඩං ජුම්හති මාණවො,
තථා න ජුම්හතෙ සාරං - පත්වාන ඛදිරං වනං.

බුද්දවාට නදී වාපි - සොසෙන්තො යං දිවාකරො,
නිමුජ්ජිත්වාපි තාපෙතුං - න සක්කොති මහණ්ණවං.

ජීන්දං මක්කටසුත්තානි - වාලයං බාලපල්ලවෙ,
වායමානා 'නිලො නෙව - මෙරුං සක්කොති කම්පිතුං.

මඤ්ඤතෙ සො 'හං බලවා - අදිස්වා බලවං පුරෙ,
දිස්වාන බලවං අජ්ජ - තම්පි මානං ජහාති සො-යි.

මෙසේ වහසි කියා "එම්බා මා පරදිතියි නොසිතව: අද මා ජයසෙනයාට ලන පහර මම් ම වේ ද දන්නෙමි"යි කීහ. එම යක්‍ෂසමාගමයට ආවාවූ ජයසෙන නම් යක්‍ෂයා ද ගොඨඉම්බරයන් දැක සමීපයට ඇවිත්[6] යුධයට කැඳවීය. ගොඨඉම්බරයෝ ජයසෙන යක්‍ෂයා සමීපයෙහි සිට වට සිටි යක්‍ෂයන්ට කියන්නාහු "එම්බා, මේ බලා සිටිනා යක්‍ෂ රාක්‍ෂසයෙනි, මා කියන්නක් අසව, මාගේ කිසි දෝෂයක් නැත: මේ ජයසෙනයා තෙමේ ම මා ළඟට ඇවිත් යුධයට මා කැඳවයි, අප දෙදෙනාගේ ජය පරාජය බලා ගන්ව. මේ ජයසෙන නම් යක්‍ෂයාට මාගේ දකුණුපයින් වේව යි දැතින් වේව යි පහරක් නොගසමි, මෝහට කළමනා කටයුතු දන්නේ මාගේ වම්පස සුළඟිල්ලය"යි වහසි කියා මහත් කොට අත්පොළසන් දී "එම්බල ජයසෙනය, මියගිය එකකු සේ කට කෙළ සිඳී බලා සිටිනේ කිම් ද, පලා වර, අද තාගේ පිරිමිකමුත් මාගේ පුරුෂවික්‍රමත් තෙල සිටි යක්‍ෂසෙනාවට දැක්වුවමනා වේ දැ"යි කීහ. එසේ හෙයින් කියනලදී;

---

1. මකුළු හු කඩා - KL ස.
2. ළදළු - ම
3. පළමු තමා බලවත් - A, ක.කි.ඤ.බෙ.ස.
   පළමු තමාට බලවත් - ම.
   පළමු තබා මා බලවත් - CDEJKL
4. තබන්නෙමි - BCDE
   තබ්බන්නෙමි - HKL
   තබ්බවන්නෙමි - J
5. කීය - ABDEGH
6. අවුත් - BJ

Non-Commercial Distribution

සුණන්තු වචනං මය්හං - යක්ඛා එත්ථ සමාගතා,
න මය්හං කිඤ්චි දෙසන්ති - උදික්ඛන්තු[1] ජයාජයං.

මයා දක්ඛිණපාදෙන - උභො හත්ථෙන වා පුන,
ජයසෙනො නාමයං යක්ඛො - ඵුසිතුං නෙව අරහති.

වාමපාදස්ස මය්හං තෙ - අග්ග අඞ්ගුලියො පන,
කත්තබ්බමස්ස ජානාති - වත්වාන පොථ්ඨයං භජෙ.

අවෙහාසි යක්ඛමාගච්ඡ - කිං තිට්ඨසි මතො විය,
අජ්ජ තෙ පුරිසාකාරං - පස්සන්තු මම වා තුවං-යි.

මෙසේ ගොඨිඹම්බරයන්ගේ වහසි අසා ජයසෙන නම් යක්ෂයා මහත් කොට අඬගසා අත්පොළසන් දෙමින් දිවගෙන අවුත් වනː එකල ගොඨිඹම්බරයා එතැන්හි සිටියා සේ ම වේග දනවා අසූ අතක් උස අහසට පැන තමා වම්පය සුළැඟිල්ලෙන් යක්ෂයාගේ හනුවට[2] ගැසීයː එකල යක්ෂයාගේ හිස සිඳී පිටිපත්ලෙන් ගසා දැමූ තල්ගෙඩියක් සේ අඬසනක් පමණ තැන් ගොස් බිම හිණ. එකෙණෙහි එතැන්හි රැස්වූ යක්ෂසෙනාව එකපැහැර දහස් ගණින් ඔල්වරහඬ ගසමින් කොලාහල පැවැත්වූහ. දෙවතාවෝ "එම්බල ගොඨිඹම්බරය, තෙල තාගේ බලයෙක් නොවෙයිː කාශ්‍යප බුදුන් සමයෙහි සඞ්ඝයා වහන්සේ උදෙසා දුන්නාවූ පායාසදනයෙහි බල ය" යි කියා දහස් ගණින් දේවතාවෝ එකපැහැර සාධුකාර දුන්හ. මෙසේ යක්ෂයාගේ හිස ගසා දමා ලබනලද ජය ඇති ගොඨිඹම්බරයෝ මහත් වූ උත්සවයෙන් ගෙට ඇවිදින් සත් දවසක් මුළුල්ලෙහි ජයපානය[3] බී සුරාමදයෙන් මත් ව නොයෙක් සියගණින් ආයුධ ගත් මහසෙනඟ පිරිවරා බෙර ගසන නටන ගී කියන නාටකජනයන් ඉදිරි කොට ජය හෙරිඝොෂාවෙන් දස දික් පුරමින් මනහර වස්ත්‍රාභරණයෙන් දෙව් කුමරුවකු සේ සැරහී රජ්ජුරුවන් දකිම් ගොස් නුවර වීථිමධ්‍යයට පැමිණි[යහ][4]. රජ්ජුරුවෝ ඒ මහත් වූ කොලාහළ ශබ්දය අසා "මේ කුමන කොලාහලයෙක් දැ"යි අමාත්‍යයන්[5] විචාළහː එබසට ඇමැතියෝ "මහරජ, ගොඨිඹම්බරයා රිටිගල වසන ජයසෙන නම් යක්ෂයා හා යුද්ධ කොට ජයගෙන සත් දවසක් මුළුල්ලෙහි මහත් වූ උත්සවයෙන් ජයපානය[6] බී රා මදයෙන් මත් ව නුඹවහන්සේ දක්නට එන්නේයː ඔහු තමාගේ සෙනාව පිරිවරා ජයබෙර ගස්වාගෙන එන කොලහලය"යි කීහ. රජ්ජුරුවෝ රා බී මත් වූ බව අසා "ඔහු මෙතැනට වැද්ද[7] නොදෙව"යි අමාත්‍යයන්ට නියෝග කළහ. අමාත්‍යයෝ එපරිද්දෙන් ම ඔහු රජගෙට වැද්ද නුදුන්හ. ගොඨිඹම්බරයෝ රජ්ජුරුවන්ගේ නියොගයෙන් ඇතුළට වැද්ද නුදුන් බව අසා "මෙතැන් පටන් රජ්ජුරුවන් වහන්සේ නැවත දැක්මෙක් නැතැ"යි[8] කියා

1. උද්දික්ඛන්තු - ACJKL
2. අනුවට - ACEGHJKL
3. ජයපාන - ABDEHJKL
4. පැමිණියේය - පිටපත් හැම
5. අමාත්‍යයන් අතින් - BCGH
6. ජයපාන - ACEJ
7. වැද - BDGH
8. නැතෙයි - ABDEGHJL

පෙරලා තමන් වසන ගෙට ගොස් පුත්‍රදාරාවන් හා පරිවාර ජනයන්ට කළ කිව මනා කටයුතු නිශ්චය කොට එදවස් ම නුවරින් පිටත් ව දෙළොස් යොදුන් දුරුකතර ගෙවා මණිනාගදිවයිනට ගොස් එතැන සිට ගොළු මුහුදට පැන සූවිසි යොදුන් පමණ තැන් මුහුද පීනාගෙන ගොස් කාවීරපටනට [1]ගොඩනැඟී පටුන්ගම් මිනිසුන් දැක "බුධපුත්‍ර වූ සිල්වත් ගුණවත් සඞ්ඝයා වහන්සේ කොයි වසන සේක්දැ"යි විචාළහ: එකල "එම්බල පින්වත, හිමාලයේ දෙළොස් යොදුන් පබ්භාරයෙක වාසය කරන්නා වූ භික්‍ෂූන් වහන්සේ අහසින් අවුත් මෙතැනට බැස ගම ඇවිද අහර සිඟාගෙන පෙරලා මෙතැනට ඇවිත් ඍද්ධිබලයෙන් අහසට නැඟී තමන්වහන්සේලා වසන හිමාලයට ම[2] වඩනාසේකැ"යි කීහ. ගොධ්ඝුම්බරයෝ උන්ගේ බස් ශිවිස හිමාලයට අභිමුඛ ව නික්මුණාහු ඒ රහතන් වහන්සේ නිරන්තරයෙන් අහර[3] සිඟන ගමෙක මිනිසුන් දැක "භික්‍ෂූන් වහන්සේ කොයි වසන සේක් දැ"යි විචාළහ. එතැන්හි මනුෂ්‍යයෝ ද සඞ්ඝයා වහන්සේ ඒ ගමට ඇවිත් බැස අහර සිඟාගෙන අහසින් හිමාලයට[4] යන බව කීහ. මෙපරිද්දෙන් ම දුටු දුටුවන් අතින් විචාර විචාරා සඞ්ඝයා වහන්සේ ළඟට යන්නාහු දෙපිටින් බිඳගෙන හුණු ප්‍රපාතස්ථානයෙක පබ්භාරයක් දැක එතනට බැස උඩනැඟී රහත් නොව යා නොහැකි ඉතා රම්‍ය වූ විහාරයක් දැක "භික්‍ෂූන් වහන්සේ නොදැක ජීවත් වීමට වඩා මිය යාම යහපතැ"යි සිතා පබ්භාරාන්තරයට ගොස්[5] පිනූහ. එකල රහත් තෙරකෙනකුන් වහන්සේ පබ්භාරය අතුරෙහි වැටෙන්නාවූ ඔහු දැක අත් දික් කොට දැතින් අල්වා ගෙනවුත් තමන් වහන්සේ සමීපයෙහි ඉන්ට සලස්වා "පින්වත් උපාසකය, මෙතැනට කුමක් පිණිස අවි දැ" යි විචාළ සේක. එකල ගොධ්ඝුම්බරයෝ තමන් ආ කාරණ ආදියෙහි පටන් විස්තර කොට කීහ: තෙරුන් වහන්සේ ඔහුගේ අභිප්‍රාය දැන දැළිරවුලු කප්පවා ඉසකේ[6] බහවා මහණ කොට කර්මස්ථාන දුන්සේක. එකල්හි ඒ ගොධ්ඝුම්බරයන් වහන්සේ මහණ වූ නොබෝ දවසකින් ම විදර්ශනා වඩා රහත් බවට පැමිණ[7] මෙසේ ප්‍රීතිසැපයෙන් දවස් යවන සේක්;

සඞ්ගාමසොණ්ඩො පරසත්තුමද්දනො
සූරො ච වීරො බලවා පරාභිභූ,
රුද්දස්ස යක්ඛස්ස සිරං විනාසයිං
කිලෙසසීසං ච තතො විනාසයි.

යන මේ ගාථාවෙන් උදන් අනා වදාළසේක: මෙසේ ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයෝ සිල්වත් ගුණවත් තැන් පරීක්‍ෂා කොට පූර්වජාතියෙහි දන් දී එයින් ජනිත වූ

1. කාවීරපට්ටනමට - ක.සි.සැ.ම.
2. හිමාල වනයට ම - CDH
3. අහර (නැත) - BEGKL ක.සි.සැ.ම.
4. හිමාල වනයට - H
5. ගොස් (නැත) - BDEGHKL ම.
6. ඉසකෙස් - ABCDEHJKL
7. පැමිණිසේක - KL

ඉෂ්ටවිපාකයෙන් දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳ[1] මතු නිවන්පුර සිරි විඳින්ට[2] උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි;

දත්වා පුරෙ යතිවරෙ සුවිචෙය්‍ය දනං
භුත්වාන දෙව විභවං ච මනුස්සභූතිං,
කත්වාන සාසන වරස්ස ච පග්ගහංතෙ[3]
අන්තෙ ලභන්ති සුජනා අමතම්පි එවං-යි.

මේ මෙහි පළමුවන
ගොඨඅම්බර වස්තුව ය.

තව ද මෙහි දෙවන ථෙරපුත්තාභය වස්තුව නම් කවරයත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

අප මහා ගෞතම බුදුන් බුදුවන්නාට පළමු මෙම කල්පයෙහි බුදු වූ කාශ්‍යප නම් සම්‍යක් සම්බුධයන් වහන්සේගේ සර්‍වඥශාසනය පවත්නා සමයෙහි මතු කියන ථෙරපුත්තාභය නම් යොධයාණෝ එක්තරා කෙළෙඹි පුත්‍රයක් හට පුත් ව ඉපද වැඩිවිය පැමිණ කටයුතු දන්නා අවස්ථාවෙහි විහාරයට ගොස් බණ අසා බුදුසස්නෙහි පැහැද ශ්‍රධාවන්ත ව සඞ්ඝයා වහන්සේට ආරාධනා කොට මෙනම් දෙයෙක් මෙහි නැතැ යි නොකියන පරිද්දෙන් නොයෙක් උපකරණ සපයා මහදන් දී එතැන් පටන් විසිදහසක් අවුරුදු මුළුල්ලෙහි ක්‍ෂීරපායාසයෙන් ලහබත් තබා දී අතිකුත් බල වඩනට තිසි බොහෝ පින්කම් කොට දෙව්ලොව ඉපද නොයෙක් දහස් ගණන් දෙවඟනන් විසින් පිරිවරනලදුව සත්රුවන් මහපායෙක වෙසෙමින් එක් බුධාන්තරයක් මුළුල්ලෙහි මහත් වූ දිව්ඉසුරු විඳ එයින් චුත ව අප බුදුන් පිරිනිවි පසු මෙම ලඞ්කාද්වීපයෙහි රුහුණු රට කෙළපව් නම් පර්‍වත සමීපයෙහි කැතිගම රොහණ[4] නම් සිටාණන්ට පුත් ව උපන. ඉක්බිති ඕහට දෙමවුපියෝ රජ්ජුරුවන්ගේ නමින් ගොඨාභය නම් තුබූහ: එතෙම වැඩිවිය පැමිණ දස දෙළොස් ඇවිරිදි අවස්ථාවෙහි ඇතුන් දසදෙනකුට බල ඇත්තේය, සතර පස්දෙනකු විසින් ඔසවාලිය නොහැකි වටගල් කෙළිනා පන්දුවට[5] සේ ඔබිනොබ ඔසවාගෙන සරු නැති ව දමන්නේය: සොළොස් ඇවිරිදි කල ඔහුගේ පියාණෝ අටතිස් අඟුල් වට ඇති වඩුවෙන් සොළොස් රියන් දිග ඇති යගදවක් කරවා දුන්හ: ඒ යගදවෙන් තල් පොල් ගසා හෙළයි: එසේ හෙයින් ගොඨාභය යොධයා යයි ප්‍රසිඬ විය. කියන ලදුයේ මැයි මහාවංශයෙහි;

1. සම්පත් විඳ සතුරන් දුරු කිරීමෙන් ශාසන සංග්‍රහය කොට කෙළවර මෙපරිද්දෙන් අමෘත මහා නෙර්වාණ සම්පත්තිය ද සැප සේ ලබන්නාහුය. එබැවින් ශ්‍රද්ධාවන්ත වීරපුරුෂයන් විසින් තම තමා ශක්ති පමණින් පිළිවන් කුසල් කොට දිව්‍ය මනුෂ්‍ය සම්පත් වළඳ - මේ පාඨය BEGHKL ස. හි පෙනේ.
2. විඳිසියි - මුද්‍රිත හැම
3. පග්ගහනෙතා - KL
4. රෝහණ - පාලි
රොහෙණ - ක.සැ.
5. පන්දුව - DG, ක.කි.සැ.බෙ.

Non-Commercial Distribution

කොටපබ්බත සාමන්තෙ - කහතිගාමම්හි ඉස්සරො,
රොහණො නාම ගහපති - ජාතං පුත්ත[ක] මත්තනො.[1]

සමාන නාමං කාරෙසි - ගොඨකාභයරාජිනො,
දරකො සො බලී ආසි - දස ද්වාදස වස්සිකො.

අසක්කුණෙය්‍ය පාසාණෙ - උඩ්ඩතුං චතු පඤ්චහි,
කීළමානො ඛිපි තද - සො කීළාගුළකෙ[2] විය.

තස්ස සොළසවස්සස්ස - පිතා ගදමකාරයි,
අට්ඨතිංසංගුලාවට්ටං - සොළසංහත්ථ දීඝකං.

තාලානං නාළිකෙරානං - ඛන්ධෙ ආහච්ච තාය සො,
තෙ පාතයිත්වා තෙනේ'ව - යොධො සො පාකටො අහු-යි.

එකල ඔහුගේ පියාණෝ මහා සුමන නම් මහතෙරුන් වහන්සේගෙන් බණ අසා ගිහිගෙයි ආදීනව හා මහණ වීමෙහි අනුසස් දැන මහණ වනුවෝ[3] "මාගේ පුතණුවෝ අසථානයෙහි නොනසිත්ව"යි සිතා පුතණුවන් කැඳවාගෙන ගොස් දෙදෙන ම මහණ ව වසන්නාහු භාවනානුයොගයෙහි යෙදී නොබෝ දවසකින් පියාණෝ රහත් වූහ. එසේ හෙයින් උන්වහන්සේගේ පුත් වූ අභය සාමණේරයන් වහන්සේට ථෙරපුත්තාභය යි නම් විය. ඒ සාමණේරයන් වහන්සේ මෑත භාගයෙහි සප්පඳුරු[4] නම් ගම ඒ නමින් ප්‍රසිඩ වූ විහාරයෙහි වසන සේක් සඞ්ඝයා වහන්සේ පිණිස මහත් වූ පොල් උයනක් ඇති කළසේක. ඒ සාමණේරයන් වහන්සේ දවසෙක කිසි කටයුත්තක් නිසා ඇතුළුගමට ගියසේක: එකල ගොඨඉම්බර නම් යොධයා රජ්ජුරුවන් දක්නා පිණිස මාගමට යනුයේ විහාරයට වැද කැටිව යන මිනිසුන් කසපැන් බොන්නට උව මැනවැ යි කී කල්හි පොල්ගස් අතින් ගෙන සොලවා කසපැන් පොල්ගසින්[5] වගුරුවා විලුඹෙන් ඇන ලෙලි ගළවා කැටිව යන්නවුන්ට දිනා: ඔහු කැමැති විචරක් කා බී ඉතිරි දෙය විහාරය වට මළුවේ ඒ ඒ තැන දමා එම මළුවේ ඒ ඒ තැන වැදහෙව නිදන්ට පටන්ගත්හ: එකල සාමණේරයන් වහන්සේ ඇවිත් "මේ කසපැන් තළා[6] කා විහාරය සැඩි කොළෝ කවුරු දැ"යි විචාරා "ගොඨඉම්බර නම් යෝධයාණෝ"යි කී කල්හි "අද ඕහට තවත් බලවත්තයන් ඇති බව දක්වමි" සිතා ගොඨඉම්බරයන් වැදහෙව නිදන තෙනට ගොස් තමන් වහන්සේගේ වම්පය ඇඟිල්ලෙන් යහඬුවකින් බැඳුවා සේ ඔහුගේ පය බඳ ඇදගෙන විහාරමලුවේ ඒ ඒ තැන ගසමින් ඒ ඒ දිග පෙරළ පෙරළා අදින්ට වන්[7] සේක: එකල ගොඨඉම්බරයා ඇත මෑත පෙරළි පෙරළී තමාගේ බලයෙන් ගැළවී ගන්ට උත්සාහ

1. පුත්තමත්තනො - ABCDKGHJL
2. කීළං ගුළකෙ - CD බෙ. ස.
3. මහණවනුයේ - ABCDEGHKL
4. කප්කඳුරු - ස
   සප්කඳුරු - බෙ.
5. පොල්ගසින් ද - ADEGJ ක.කි.ඥ.
6. කසපැන් බී පලා තළා - ම.
7. පටන්ගත් - D, ස

Non-Commercial Distribution

කොටත් ගැළවීගත නුහුණුයේ මය; එකල කැට්ව ගිය ඔහුගේ පරිවාර ජනයෝ "අපි අපි ම අරවම්හ"යි දිවගෙන ගොස් පිරිවරා ගත්හ: ථෙරපුත්තාභය සාමණේරයන් වහන්සේ ළහට ආ ආ කෙනකුන් දැහිල්ලෙන් ම[1] ඉවත දමන සේක: යෙසු මනුෂ්‍යයෝ උන්ගේ ඇඟ ඇහිලි වැදගත් තැන් දැක සිටි සිටියා සේ[2] දුරු ව බැසහෙව දණ්ඩනමස්කාරයෙන් උන්වහන්සේගේ ශ්‍රී පාදයන් වැඳ පෙරළී "ස්වාමීනි, ඇරපුව මැනවැ"යි යාච්ඤාව[3] කීහ: යොධයාණෝ "ස්වාමීනි, නුඹ වහන්සේගෙන් මා නැසූ පොලට පොලුත් දෙමි, පොල් උයනකුත් [වවා] දෙමි[4], මා බිම නොපෙරළුව මැනවැ"යි යාච්ඤා [කළහ:][5] එසේ ම භික්ෂූන් වහන්සේ ද ඇවිත් කන්නලව් කී සේක: එකල සාමණේරයන් වහන්සේ යොධයාණන් හැර නැඟී සිටවූ සේක: එතැන් පටන් යෝධයාණෝ සාමණේරයන් වහන්සේ හා විශ්වාසී ව මාගමට ගොස් රජ්ජුරුවන් දුටහ. රජ්ජුරුවෝ පළමු කී පරිද්දෙන් ම ගොඨඹඹරයන්ට සත්කාර කොට තමන්ට සේවය කරන සේ සිටුවා ගත්හ. රජ්ජුරුවෝ දවසෙක ගොඨඹඹරයන් හා කථා කෙරෙමින් උන්නාහු "කිමෙක් ද සගය, අනික් මෙරට බලසම්පන්න යෝධයෝ ඇද් දැ"යි විචාළහ. එ බසට ගොඨඹඹරයා "ස්වාමීනි, කුමක් කියනසේක් ද? සප්පඳුරු[6] නම් විහාරයෙහි ථෙරපුත්තාභය නම් සාමණේරයන් වහන්සේ අපටත් වඩා ශතසහස්‍රගුණයෙන් බලසම්පන්න සේකැ"යි කී ය. එබස් අසා රජ්ජුරුවෝ "එසේ වී නම් සගය, තෙපි ම ගොසින් කැඳවා ගෙන එව"යි ඕහට ම භාර කළහ. එකල ගොඨඹඹර යොධයා රජ්ජුරුවන්ගෙන් දුන් වස්තු ඇරගෙන එතැන්හි ගොස් ඒ විහාරයෙහි සඞ්ඝයා වහන්සේට දන් දී ථෙරපුත්තාභය නම් සාමණේරයන් වහන්සේ සමීපයට ගොස් වැඳ එකත්පස් ව හිඳ රජ්ජුරුවන් කියා එවූ ස්වරූප කියා "ස්වාමීනි, දෙමළුන්ට රාජ්‍යය හස්තගත ව තිබෙන හෙයින් සඞ්ඝයා වහන්සේ[7] සිත එකඟ ව ඉඳුරා ශාසනප්‍රතිපත්ති පුරාගත නොහැක්ක: දනාදි වූ පින්කම් කොට ගතොත් සැපසේ දිව්‍ය සම්පත් ලැබගත හැක්ක: මේ මහණධම් පිරිම් තබා සිවුරුහැර ළඳ බොළඳ බාල අවස්ථාවේ පඤ්චකාම සම්පත් විඳ පින්කොට ගත්නා පරිද්දෙන් අව මැනව: රජ්ජුරුවන් වහන්සේත් නුඹවහන්සේ දක්නා කැමැති සේකැ"යි කීය. එබසට සාමණේරයන් වහන්සේ "එම්බා උපාසකය, ඉතා ලැබගත නොහැක්කාවූ මෙවැනි බුද්ධොත්පාද කාලයක් හා මිනිසත් බවක් ලැබ සසුන් වැද මහණ වූ මා විසින් අත්‍යන්ත නිර්මල ශීලය රක්ෂා කොට ඇම වේලෙහි අප්‍රමාද ව ප්‍රතිපත්ති පුරා සංසාර දුඃඛයෙන් ගැළවී නිවන්පුර පැමිණෙන්ට උත්සාහ කළමනා මය: එසේ හෙයින් බොහෝ ධර්මය අසා සසර දුග්ගන්නාවූ මම ව්‍රතසමාදනය නොහරිම් මය, ඝනාන්ධකාරයෙහි රෑ දුටු වළෙක ඇස් ඇති නුවණැත්තාවූ කවර නම් පුරුෂයෙක්

---

1. මැදගිල්ලෙන් - BEDGH
2. සිටි සිටි සේ - BGH
3. අයැද - ක.කි.කැ.ම.
4. ලවා දෙමි - පිටපත් හැම, ස.
   මවා දෙමි - ම.
   රොපෙත්වා දම්මි - පාලි
5. විය - පිටපත් හැම
6. සප්කඳුරු - බෙ.
   කප් කඳුරු - ස.
7. සංඝයා වහන්සේගේ - C, මුද්‍රිත හැම

Non-Commercial Distribution

සියැසින් බල බලා එම වළ දහවල් වැටේ ද: නොවැටෙන්නේ මය: එපරිද්දෙන් ම සසර ආදීනව දුටු මම සිවුරු හැර ගිහි වෙම් ද: නොහරිමි"යි කී සේක. එසේ හෙයින් කියන ලදී;

> බුද්ධුප්පාදෙ මයා ලද්ධො - මනුස්සත්තං තථෙව ච,
> අලබ්භනීයා ලද්ධා මෙ - පබ්බජ්ජා ජිනසාසනෙ.
>
> විසුද්ධං පරිපූරෙත්වා - තස්මා මෙ [සීලසංවරං].[1]
> භවක්ඛයාය උස්සාහො - කරණීයො සදදරා.
>
> තං වතං න ජහෙ[2] කාමං - ජාතං දුක්ඛං භවා භවෙ,[3]
> කො බුද්ධො රත්තියං[4] දිට්ඨෙ - දිවා 'වාටෙ පතිස්සති-යි.

මෙසේ සාමණේරයන් වහන්සේ කී වචනය අසා ගොඨඉම්බර යොධයා "ස්වාමීනි, එසේ නොකිව[5] මැනව, බොහෝ දෙනා මහ දියක වැටී මියමින් සිටියදී බල බලා යම් වීරපුරුෂයෙක් තමාගේ ආත්මය පමණක් රැකගෙන ගොඩ නැංගේ වී නම් බලා සිටි ජනයෝ කිසි කරුණාවක් නැති පුරුෂයෙකැ යි ඕහට එකාන්තයෙන් ම නිඳා කෙරෙති: පළමු ධර්ම රාජ්‍යය යි යන ලඞ්කාද්වීපයෙහි බොධිවරුන් වහන්සේ දෙමළු දැන් කපා නැති කෙරෙති: ඒ ඒ තෙන දහගබ් පිළිම ආදිය සිඳ බිඳ නසති. අත්‍යන්ත නිර්මල ශීලාලඞ්කාරයෙන් හොබනාවූ බුධපුත්‍ර වූ සඞ්ඝයා වහන්සේ ඒ ඒ තැන දෙමළුන් සිවුරු උදුරන හෙයින් බොහෝ ව්‍යසනයට පැමිණ කොතැනක නිරුපද්‍ර ව ඉඳ ශීලසංවරය රක්‍ෂා කොට ගනුමෝ දෝ හො යි ශරණාන්වෙෂී ව ඒ ඒ තැන ඇවිදිනාසේක. ලැව්ගිනිගත් වනාන්තරයක් මෙන් සියලු ලඞ්කාද්වීපය දෙමළ ගිනි ගෙන දගෙන යෙයි: එගිනි නිවන කෙනෙකුත් නැත. ලඞ්කාද්වීපයෙහි පළමු තල් පොල් කොස් පුවක් ආදීන් සැරහී තිබෙන්නාවූ ගම් සියල්ල නැසී නොගම් ව ගියේය: රාජ්‍යවාසී බොහෝ දෙනත් නැසී ගියහ: එසේ හෙයින් සත්වකරුණා ඇති සමර්ථ සත්පුරුෂයන් විසින් ලොකශාසන වචා ගන්නා ලෙස උත්සාහ කළමනා ප්‍රස්තාව ය. අප බුදුහු දීපඞ්කර බුදුන් සමයෙහි තමන් වහන්සේට හස්තප්‍රාප්ත ව තුබූ නිර්වාණසම්පත්තිය හැර සසර දුග්ගන්නා සියලු සත්වයන් කෙරෙහි පතළ කරුණාවෙන් සසරට[6] වැද හැරුම් පුරා ලොවුතුරා බුදු ව සූවිසි අසඞ්ඛ්‍යයක් සත්වයන් සංසාර දුඃඛයෙන් මුද නිවන් පුර සිරි ගෙන හැර දුන්සේක. එසේ ම නුඹවහන්සේත් රජ්ජුරුවන් වහන්සේට සහාය ව දෙමළ කසළ හැර ලොකශාසනය එළි කොට වචා දැන් සේ ම තුඹන් මහණ ව ගෙන අත්‍යන්ත නිර්මල ශීලයෙහි පිහිටා ධ්‍යානභාවනා කිරීමෙන් නුඹවහන්සේ කැමැති නිර්වාණසම්පත්තිය සිධ කොට ගත මැනවැ"යි කීහ. එසේ හෙයින් කියන ලදී;

---

1. සීලසංවරො - පිටපත් හැම
2. තපනොතා ජහෙ - ක.කි.සැ.ස.
3. භවාවටෙ - BDEGHKL, පාලි
4. රත්තියා - බෙ.ස.
5. නොකියව - ACDJ
6. සසර - BGHKL

Non-Commercial Distribution

එනං'ව දහනා දඩ්ඪං - නිඛිලං සීහලං ඉදං,
දමිළග්ගිනා උඩ්ඩහති - න නිබ්බායති කොචි නං.

ගාමා සබ්බේ අගාමා'සුං - විනට්ඨා රට්ඨවාසිනො,
කාලොයං පභූනා සබ්බං - සමෙතුං ලොකසාසනං.

ලද්ධං පහාය නිබ්බාණං - යො දීපඞ්කරසත්ථුනො,
සංසාරං පාවිසී සත්ථා - දිස්වා නො දුක්ඛිතෙ ජනෙ.

රඤ්ඤො හුත්වා සහායං භො - කත්වා සාසනපග්ගහං,
චරිතබ්බො අයං ධම්මො - තයා අත්තහිතා'වහො-යි.

මෙසේ නොයෙක් කාරණ කියා සාමණේරයන් වහන්සේ ගිව්ස්වාගෙන සිවුරු හරවා කැඳවාගෙන තමා වසන ගෙට ගොස් ඔහුගේ හිසකේ දික් ව වැඩෙන තෙක් ඉස්සෝධා නහවා කවා පොවා උපස්ථාන කොට අඳිනා පළඳිනා සේ උගන්වා කැඳවාගෙන ගොස් රජ්ජුරුවන් දැක්වීය. රජ්ජුරුවෝ සිවුරළ[1] යොධයාණන් දැක සතුටු ව මහුල් මහ වීථියෙහි ගෙයක් සලස්වා දවස දහසක් බැගින් ඉලක්ක සිටුවා තමන් සමීපයෙහි[2] වැස්වූහ. පසුව රජ්ජුරුවන්[3] හා එක් ව ගොස් දෙමළ සටන් කෙරෙමින් විජිතපුරය ගන්නා දවස් ලොහොපවුර බිඳ හෙළා නුවරට වැද සොළොස්රියන් දිග ඇති මහ යගදවක් ගෙන දෙමළුන් පැහැර මරමින් ඒ නුවර සාධා ක්‍රමයෙන් ගොස් අනුරාධපුරය ගෙන රජ්ජුරුවන්ට මුළු ලක්දිව එක්සත් කොට දී ලෝසසුන් බබුළුවා අනුරාධපුරයෙහි විසූහ. පසුව රජ්ජුරුවන් ඔවුනු පැළඳ දස්කම් කළ යොධයන්ට ස්ථානාන්තර දෙන දවස් මෙකී ථෙරපුත්තාභය නම් යෝධයාණෝ නොගත්හ: "කුමක් පිණිස නොගනු දැ"යි රජ්ජුරුවන් විචාළ කල්හි "දෙවයන් වහන්ස, තව කළමනා සටන් තිබැදී මේ ස්ථානාන්තරයෙන් ප්‍රයෝජන කිම් දැ"යි කීහ. එබසට රජ්ජුරු[වන්][4] කුමක් කියා ද දැන් මට ලඞ්කාද්වීප රාජ්‍යය[5] එක්සත් වුව: සතුරු කෙනෙක් නැත: තොපට සතුරෝ කවුරු දැයි විචාළ කල්හි "දේවයන් වහන්ස, කෙලෙස් නමැති සතුරන් හා සමාන සතුරු කෙනෙක් නැත: ඒ සතුරන් සාධා ගන්ට අවසර දුන මැනවැ"යි කියා රජ්ජුරුවන්ගෙන් අවසර ඉල්වාගෙන මහණ ව අප්‍රමාද ව භාවනා කෙරෙමින් සිවුපිළිසිඹියා පත් රහත්බවට පැමිණ පන්සියයක් භික්‍ෂූන් විසින් පිරිවරන ලදු ව ලඞ්කාද්වීපයෙහි හිරසඳ සේ ප්‍රසිඬ වූ

---

1. සිවුරු හළ - C
   සිවුරළු - ක.කි.කැ.ම.
2. සමීපයෙහි ම - BDH
3. දුටුගැමුණු රජ්ජුරුවන් - B, බෙ.ස.
4. රජ්ජුරුවෝ - පිටපත් හැම
5. ලංකා රාජ්‍යය - BDEGH

Non-Commercial Distribution

සේක. මෙසේ කීකරුපර[1] වීරපුරුෂයෝ තමන්ට වන්නාවූ අභිවෘද්ධියත් නොනසා අනුන්ට වැඩ සැදීමෙන් තමන්ගේ සශ්‍රීක වූ[2] කීර්තිය දශදිගන්තරයෙහි[3] පතුරුවති: එබැවින් මහත් වූ ශරීරබල හා ශ්‍රී සම්පත්තිය ලද්ද වූ සත්පුරුෂයන් විසින් තමාගේ කීර්තිය බොහෝ කලක් පවත්නා කැමැත හොත් අනුන්ටත් අභිවෘද්ධියක් කළ මැනවි. කියනලදුයේ මැයි:

අත්තත්ථමෙව'මපහාය දයාලවො[4] හො,
කිත්තිං පරත්ථචරණාදිහි තන්වයන්ති.[5]
ලද්ධාන ථාමවිභවං යදි වො[6] සකිත්තිං,
කප්පට්ඨිතිං කුරුථ කත්ථ පරත්ථමෙව-යි.

මේ මෙහි දෙවන
ථෙරපුත්තාභය වස්තුව ය.

තව ද මෙහි තුන්වන මහාහරණ වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

යට ගිය දවස මෙම කල්පයෙහි තුන් ලොවට එකනායක වූ තුන්ලොවට නැඟි[7] ප්‍රදීපයක් බඳු වූ මුළු තුන්ලොවට කල්පවෘක්ෂයක් බඳු වූ තුන්ලෝවාසීන්ට අසහාය ශරණ වූ කාශ්‍යප නම් සම්‍යක් සම්බුධයන් වහන්සේ ලොකයෙහි ඉපද ධර්ම නමැති අමෘතරසධාරාවෙන් මුළුලෝ පිනවමින් වැඩවසන කල්හි ඒ හරණ නම් යොධයාණෝ පසල්ගමෙක වසන කෙළෙඹි පුත්‍රයක්හට පුත් ව ඉපද වසන්නාහු බණ අසා බුදුසස්නෙහි පැහැද සඞ්ඝයා වහන්සේ උදෙසා ක්ෂීරපායාසයෙන් ලභබත් තබා ජීවිතාන්තය දක්වා දවස් පතා නොකඩ කොට පවත්වා ඒ ආත්මභාවයෙන් චුත ව දෙව්ලොව උපන්හ. එකල ඔවුන්ට දෙළොස් යොදුන් රන්විමනෙක් උපන: ඒ දිව්‍යවිමානයෙහි නොයෙක් දහස් ගණන් සුරසුන්දරීන් පිරිවරා මහත් වූ දිව්‍යසම්පත් අනුභව කෙරෙමින් එක් බුධාන්තරයක් ගිය කල අප බුදුන් පිරිනිවි පසු සකල දීප දීපායමාන වූ මේ ලඞ්කාද්වීපයෙහි කාවන්තිස්ස රජ්ජුරුවන් රාජ්‍යය කරන සමයෙහි රුහුණු රට සප්පදුරු[8] නම් ගම කුමාර නම් කෙළෙඹි පුත්‍රයා නිසා ඔහුගේ භාර්‍ය්‍යාව කුස පිළිසිඳ දස එකඩ මස් පිරුණු සඳ බිහි වූහ. ඔහු මවුකුසින් බිහි වූ කෙණෙහි මවුපියන්ට රක්ෂාව පිණිස මහත් නිධානයෙක් උපන: ඒ දැක ඔහුගේ දෙමවුපියෝ "අපගේ පුතණුවෝ අපට රක්ෂාව පිණිස නිධානයක් ඇරගෙන අවුය"යි සතොෂ ව ඕහට හරණය යි නම් තුබූහ. ඒ හරණ නම් යෝධයා දෙළොස්[9] ඇවිරිදි කල බලයෙන් ද දවයෙන්[10] ද අති සමර්ථ යෑ: බාලයන් හා කැටිව වල ඇවිදිනා කල

1. කීකරුවර - ක. කැ. ම.
   කීකරු වීරවර - කි.
2. සාහසික වූ - ක. කි. කැ.
3. දශදිගාන්තරයෙහි - BCDEGH
   දශදිගාන්තරයෙහි ක. කි. කැ. ම.
4. දයාලයො - ABCDEGHJKL
   දයාලවො - මුද්‍රිත හැම. පාලි
5. තඤ්ඤයන්ති - ABEGHJKL ක. කැ. ම.
6. වෙ - BGH
7. තුන්ලොවට අසහාය - BGHKL
8. කප්කදුරු - ක.කි.කැ.ම.ය.
   සප්කදුරු - බෙ.
   කප්පකන්දර - පාලි.
9. දස දෙළොස් - බෙ. ස.
   දස එවාදස - පාලි
10. ජවයෙන් - C, ම.

Non-Commercial Distribution

සාවුන් ලුහුබඳවා ගෙන[1] පයින් ගසා මරන්නේය: එසේ ම සොළොස් ඇවිරිදි කල ගම් වැස්සන් හා කැටිව වලට ගොස් ඌරන් මුවන් ගෝනුන් ලුහුබඳවා ගෙන ගොස් කකුල් අල්වා ගෙන බිම ගසා මරයි: මෙසේ මහත් බල ඇති හෙයින් මහා හරණ නම් යොධයා යි ප්‍රසිද්ධ වි ය. කියන ලද මැයි මහාවංශයෙහි;

සප්පකදුර[2]ගාමස්ස - කුමාරස්ස සුතො අහු,
හරණො නාම සො කාලෙ - දස ද්වාදස වස්සිකෙ.[3]

දරකෙහි වනං ගන්ත්වා - නුබන්ධිත්වා සසෙ බහූ,
පාදෙන පහරිත්වාන - තං ඛණෙ භූමියං ඛිපි.

ගාමිකෙහි වනං ගන්ත්වා - සොළසවස්සිකො පන,
තථෙව පාතෙසි ලහුං - මිග ගොකණ්ණ සූකරෙ:
හරණො සො මහායොධො - තෙනෙ'ව පාකටො අහු-යි.

*මෙසේ කාවන්තිස්ස රජ්ජුරුවෝ ඔහු බලසම්පන්න යොධ බව අසා ගෙන්වා ගෙන බොහෝ පරිවාරජනයන් හා සමග රාජවීථියේ ගෙයක් සලස්වා දවස දහසක් බැගින් වියදම් දී තමන් සමීපයෙහි වැස්වූහ. පසුව දුටුගැමුණු රජ්ජුරුවන් හා එක් ව ගොස් දෙමළුන් හා සටනට වැද අටවිසි මහා යුද්ධයෙක ජයගෙන අනුරාධපුරයට ගොස් බොහෝ කාලයක්[4] වාසය කොට රජ්ජුරුවන් හා සමඟ දනාදි වූ පින්කම් කෙරෙමින් ජීවිතාවසානයෙහි කම් වූ පරිද්දෙන් පරලොකප්‍රාප්ත විය. මෙසේ නුවණැති ශ්‍රද්ධාවන්තයෝ කුසල් කොට සියලු සම්පත්තීන් සමෘද්ධ වූ දිව්‍යලොකයෙහි ඉපද පරම රමණීය වූ දිවසැපත් වළඳ මිනිස් ලොව බලසම්පන්න ව උපදනාහු ම ය. එබැවින් පින්වත් සත්වයෙනි, තොප විසින් බල වඩනට නිසි කුසල් කොට එපරිද්දෙන් ම ශක්තිසම්පන්න වුව මැනවි. කියන ලදුයේ මැයි;

කත්වාන එවං කුසලං සුධීමා,
පත්වාන දෙවෙසු මනොරමෙසු,
හොතීති නාගොව බලෙනුපෙතො
තථාවිධෙ වො කුසලෙ රමෙථ - යි.

මේ මෙහි තුන් වන

මහාහරණ වස්තුව ය.

---

1. ගෙනගොස් - BGH
2. සප්පකදුර - ACDE, මහාවංස
3. වස්සිකෙ - ම. මහාවංස
   වස්සිකො - පිටපත් හැම, ස.සි.හ.බෙ. පාලි
4. කලක් - BEGHJKL

* මෙතැන් සිට තිස්ස සාමණේර වස්තුව දක්වා වූ කොටස A පිටපතේ නැත.

Non-Commercial Distribution

තව ද මෙහි සතර වන වේළුසුමන වස්තුව නම් කවරයත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

යට ගිය දවස මෙම කල්පයෙහි බුදු වූ කාශ්‍යප නම් බුදුන් සමයෙහි මතු කියන[1] වේළුසුමන නම් යොධයාණෝ බොහෝ සම්පත් ඇති කෙළෙඹියාණ කෙනකුන්ට පුත් ව ඉපද මුහුකළ අවස්ථාවේ බණ අසා ශ්‍රද්ධාවන්ත ව වසන්නාහු අනුන්ට පීඩා කොට දුන්නාවූ දනයෙහි ඵල මහත් නොවන බව ද දැහැමෙන් සෙමෙන් දුන්නාවූ දනයෙහි ඵල[2] මහානිසංස බව ද[3] බණින් අසා දවසෙක රහත් කෙනකුන් වහන්සේ සිහා වඩනා දැක පාත්‍රය ගෙන නොයෙක් අග්‍රරස භෝජනයෙන් පුරා දුන්හ. පසුව ඒ කුශලයෙන් ජීවිතාවසානයෙහි නිඳ පිබිදියක්හු මෙන් දිව්‍යලොකයෙහි දෙළොස් යොදුන් රන් විමනෙක ඉපද නොයෙක් දහස්ගණන් දෙවඟනන් හා දිව්‍යනාටකයන් විසින් පිරිවරන ලදු ව ඒ දිව්‍යලොකයෙහි දිව්‍යසැපත් වළඳ එයින් චුත ව අප බුදුන් ඇවෑමෙහි[4] මිහිඳු මහතෙරුන්වහන්සේ මේ ලංකාද්වීපයට වැඩ ධම්මධාතු ආදි වූ ශාසනය පිහිටුවූ පසු කාවන්තිස්ස රජ්ජුරුවන් රුහුණු රාජ්‍යය කරන සමයෙහි ගිරිනිල් දනව්වෙහි කෙළෙඹියඟණ[5] නම් ගම වසභ නම් කෙළෙඹිපුත්‍රයක් හට පුත් ව උපන්හ: ඔහු[6] උපන් බව අසා එහි වසන මහජනයෝ එකපැහැර සතුටු වූහ. ඔහුගේ පිය වූ වසභ නම් කෙළෙඹි පුත්‍රයාට වේළු නම් ගම වේළු නම් කෙළෙඹි පුත්‍රයකු හා සුමන[7] නම් ජනපද නායකයකු[8] හා දෙදෙන මිත්‍ර ව හිඳිති: ඔහු දෙදෙන තමන්ගේ මිත්‍ර වූ වසභ නම් කෙළෙඹියාණන්ගේ පුතණු කෙනකුන්[9] උපන්හ යි අසා බොහෝ පඩුරු ගෙන්වාගෙන යහළුවාණන්ගේ ගමට අවුත් උන්ගේ පුතණුවන් දැක නම් තබන මඟුලෙහි යාළුවෝ දෙදෙන තමන් දෙදෙනාගේ වේළුය සුමනය යන නම් දෙක එක් කොට වේළුසුමනය යි නම් තබා තමන්ගේ ගමට ගොස්[10] වේළුසුමනයන් මඳක් වැඩි වඩින වූ පසු අවුත් කැඳවාගෙන තමන්ගේ ගමට ගෙන ගියහ. කියනලද මැයි මහාවංශයෙහි;

ගිරිනාමෙ ජනපදෙ - කුටුම්බියඞ්ගණ ගාමකෙ,
කුටුම්බි වසභො නාම - අහොසි තත්‍ථ සම්මතො.

වේළු[11] ජානපදෙ තස්ස - සුමනො ගිරිභොජකො,
සහායස්ස සුතෙ ජාතෙ - පණ්ණාකාර පුරස්සරා.

ගන්ත්වා උභො සකං නාමං - දරකස්ස අකාරයුං
තං වුඩ්ඪං අත්තනො ගෙහෙ - වාසෙසි ගිරිභොජකො-යි.

එසමයෙහි ඒ වේළු නම් කෙළෙඹියාණන්ගේ[12] එක් සෛන්ධව කුලයෙහි අස්පැටවෙක් කිසිකෙනකුන් තමා පිටට නැංග නොදෙන හෙයින් දුෂට වූ කුළු

1. කියන ලද - C
2. මහා ඵල - පිටපත් හැම
3. වන බව ද - GH
4. ඇවෑමෙන් - CH
5. කෙළෙඹිගණ - BCGHKL
6. උහු - C
7. මාගම සුමන - ම.
8. ගිරිභොජකයකු - ම.
9. කෙනකුන් - BCDEGJKL
කෙනෙක් - ABH බෙ
10. නම තමන්ගේ ගමට ගියහ. සුමනයෝ වේළුසුමනයන් - ම.
ඒ වේළුසුමනයන් - KL
11. වෙළො - CDEGHJ
12. ගිරිභොජකස්ස ගෙහෙ - පාලි

Non-Commercial Distribution

අස්පැටවෙකැ යි ඉදුරා කා නම් නොකවති, නොනාවති, ඇඟ ඉස් තෙල් නොගල්වති. කිසි පොෂ්‍යයකුත් නොකෙරති:[1] ඒ අස්පැටවා දවසෙක වෙළුසුමනයන් දැක මේ පුරුෂයා මාපිටට නැහෙන්නට නිසි අශ්වාරෝහයෙකැ යි සිතා වෙළුසුමනයන් මුහුණ බලා හෙෂාරව කෙළේය: එදැක වෙළු නම් කෙළෙඹියාණෝ "ඒකාන්තයෙන් ම මේ අස්පැටවා අද තමා පිටට නැහෙන්නට නිසි යෝධයෙකැ යි සිතා සතුටු ව හෙෂාරව කෙළේ ය"යි දැන වෙළුසුමනයන් කැඳවා "පුත වෙළුසුමනයෙනි, මේ අසු පිටට නැහෙව'යි කියා අස්පැටවා වෙළුසුමනයන්ට භාර කළහ: එකල වෙළුසුමනයෝ[2] ඒ අසු සද පිටට නැඟී දුවාලියේ වටකොට අසු පන්වමින් වෙග දනවා දුවාලිය වට අවසර නොහැර වළල්ලක්[3] සිටියා සේ අලාතචක්‍රාකාරයෙන් ශීඝ්‍ර ව අසු පන්වා යම් සේ විධුර ජාතකයෙහි පුණ්ණභද්‍ර යක්‍ෂසෙනාධිපතියා මනොමය ශෛන්ධවයා පිටට පැනනැඟී සත්යොදුන් ඉඳිපත් නුවර වට අවසර නොහැර කරින්කර බඳ අස් වළල්ලක් සිටියා සේ දක්වා ශීඝ්‍ර ව අසු පැන්වී ද එපරිද්දෙන් ම අසුන්ගෙන් වට ලා යූ අස්වළල්ලක් සේ දක්වා ශීඝ්‍ර ව අසු පන්වා නැවත වෙග දනවා අසු දිගහැර සමහර විට අසු පිට හිඳියි, සමහර විට සිටියි, සමහර විටෙක දිවන අසුපිට සැක නැති ව ඇඳි සළුව පටින් පට ගළවයි, නැවත ඇඳගනියි: ඒ දැක මහජනයෝ කුල්මත් ව සන්තොෂයෙන් පිළී හිස නටවමින් උතුරු සළු කරවට[4] දමා නටවමින් ඔල්වරහඬ පැවැත්වූහ. එකල ඒ අද්භුත වූ ආශ්චර්‍ය්‍යය දැක වෙළුසුමනයන්ගේ කුඩා පිය වූ වෙළු නම් කෙළෙඹියාණෝ සතුටු ව 'මේ[5] අප ළඟ රඳවන්ට සුදුසු එකෙක් නොවෙයි, රාජසේවයට නිසිය'යි සිතා වෙළුසුමනයන්ට කහවණු දහසක් දී කාවන්තිස්ස රජ්ජුරුවන් ළඟට යවූහ: රජ්ජුරුවෝ දැක[6] ආගිය කටයුතු විචාරා රාජමහාවීථියෙහි ගෙයක් සලස්වා දවස දහසක් බැගින් වියදම් දී තමන් සමීපයෙහි ම වාසය කැරවූහ. එතැන් පටන් වෙළුසුමනයෝ රාජසේවය කරන්නාහු යට දුෂ්ටග්‍රාමණී වස්තුවෙහි කී පරිද්දෙන් විහාරමහාදේවීන්ට උපන් දොළ පසිඳ දී පසුව දුටුගැමුණු රජ්ජුරුවන් හා එක් ව දෙමළ කඳවුරු පැහැර ගොස් විජිතපුරය ගන්නා දවස් අසුපිටට නැඟී[7] ඝනාන්ධකාරයෙක ගිනිකඳක් සිසාරන්නා සේ ඒ ඒ වීථියෙහි අසු පන්වා දහස් ගණින් දෙමළුන් හිස් සිඳ වගුරුවමින් මහ සටන් කොට ඒ නුවර ගෙන ක්‍රමයෙන් ගොස් සෙසු තැන් සාධා රාජ්‍යය ගෙන දුන්හ. එකල රජ්ජුරුවෝ සිංහලය ඒකාතපත්‍ර කොට ඔටුනු පැළඳ රාජ්‍යය ස්වසප්[8] කොට ගෙන වෙළුසුමනයන්ට බොහෝ සැපත් දුන්හ: මෙසේ මහත් වූ ශ්‍රී සම්පත් විඳිමින් වෙළුසුමනයෝ රජ්ජුරුවන් හා සමඟ කුසල් කොට ගෙන දෙවුලොව උපන්හ. මෙසේ දෙවුලොව දිව්‍යසම්පත් හා මිනිස්ලොව මනුෂ්‍යසම්පත් ද සක්තිශම්පත්තිය[9] ද අකුසල් කළවුන්ට ලැබෙන්නේ නොවෙයි: ඒ බැවින් සප්තවිධ කාමස්වර්ගයෙහි අනොපමෙය්‍ය

1. නොකරවති - ක.සි.සද.ම.
2. වෙළුසුමනයෝ - පිටපත් හැම, ක.සි.සද.බෙ.
3. අස්වළල්ලක් - KL
4. කරව - BDEGHKL
5. මොහු - B
6. ඔහු දැක - BCGH ම.ස.
   ඒ දැක - ක.කි.සද.
7. පැන නැඟී - L, බෙ.ස.
8. ස්වහස්ත - CJ
   සපථ - L
   එක්සත් - H
9. ශත්‍රුසම්පත්තිය - CEJ

Non-Commercial Distribution

වූ දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා විශෙෂ වූ නිර්වාණ සම්පත්තිය සැප සේ ලබනු කැමැති සත්පුරුෂයන් විසින් අප්‍රමාද ව කුසල් කළ මනා මැයි. එසේ හෙයින් කියනලදී;

එවං විධං සග්ගසිරිං ච ඨාමං
න හොති පාපා'භිරතස්ස යස්මා,
තස්මා සුචරිතං[1] චරථ'ප්පමත්තා
සග්ගාපවග්ගෙසු සිරිං සරන්තා-යි.

මේ මෙහි සතර වන
වෙළුසුමන වස්තුව ය.

තව ද මෙහි පස් වන බඤ්ඡදෙව වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

යටගිය දවස මෙම කල්පයෙහි කාශ්‍යප නම් බුදුරජාණන් වහන්සේ ලොවුතුරා බුදු ව මේ අසාර වූ සංසාර නමැති සාගරයෙහි චුති ප්‍රතිසන්ධි වශයෙන් ගැලෙමින් ඉපිලෙමින් දුක් විඳිනාවූ සත්ව සමූහයා දහම් නමැති සත්රුවන් මහනැවට නංවා නිවන් නමැති නිර්භය වූ අමෘත මහා ශාන්තිපුරයෙහි පිහිටුවන කල්හි මතු කියන බඤ්ජදෙව නම් යෝධයාණෝ එක්තරා කෙලෙඹිපුත්‍රයක්හට පුත් ව ඉපද වසන්නාහු බුදුන්ගෙන් බණ අසා බුධශාසනයෙහි පැහැද මහ වනයක්[2] මැද පන්සලක් කොට ඇඳ, පුටු, පැන්, වළන් ආදි වූ සියලු උපකරණ සපයා තබා එක් භික්‍ෂුකෙනකුන් වහන්සේ කැඳවාගෙන අවුත් පන්සල පිළිගන්වා වස් වසන සේ ආරාධනා කොට තුන් මසක් මුළුල්ලෙහි සිවුපසයෙන් උපස්ථාන කොට වස් ඉක්බිති සිවුරු පිරිකර දුන්හ: පසුව ඒ කළාවූ කුශලයෙන් දෙවුලොව දෙළොස් යොදුන් රන්විමනෙක ඉපද නොයෙක් දහස් ගණන් දෙවස්ත්‍රීන් පිරිවරා මහත් වූ දිව්‍ය සම්පත් අනුභව කොට එයින් චුත ව මෙම ලඞ්කාද්වීපයෙහි රුහුණුරට ගිරිවා නම් දනව්වෙහි අඤ්ජලිපව්වට නුදුරු වූ මුහුන්නරු සමීපයෙහි මිදෙණි[3] නම් ගම පුතුන් සද්දෙනකු හා බොහෝ සම්පත් ඇති අභය නම් කෙලෙඹියාණන්ට පුත් ව උපන්හ.[4] දෙමවුපියෝ ඕහට දෙවය යි නම් තුබූහ: ඔහු පය මඳක් පිළු හෙයින් පසුව බඤ්ඡදෙවය යි නම් වීය: ඒ බඤ්ඡදෙවයා මහත් වූ බල ඇත්තේය: ගම්වැස්සන් හා කැටිව වල දඩයමට ගිය කල මීනිසුන් දැක දිවන වල්මීවුන් ලුහුබඳවා ගෙන ගොස් දෙකකුල අල්වාගෙන ඉසවට සිසාරා බිම ගසා ඇට තුතු[5] කොට මරයි: සියලු ආයුධ සරමයෙහි දක්‍ෂ ය: මෙසේ ඒ බඤ්ඡදෙවයා සමර්ථ හෙයින් බඤ්ඡදෙව නම් යොධයාය යි ප්‍රසිධ වී ය. කියනලද මැයි මහාවංශයෙහි;

---

1. සුචාරිං - ක.කි.ඤ.ම. පාලි
2. මහණ ව වනයක් - C, බෙ.ස.
3. මීහොය - ක.කි.ඤ.ම.
4. ඉපද - CJ ක.කි.ඤ.
   උපන - ස.
   උපණ - බෙ
5. සුණු විසුණු - C

Non-Commercial Distribution

මිගවං ගාමවාසීහි - සහ ගන්ත්වාන සො තදා,
මහිසෙ අනුබන්ධිත්වා - මහන්තෙ උට්ඨිතුට්ඨිතෙ.[1]

හත්ථෙන පාදෙ ගණ්හිත්වා - භමෙත්වා සීසමත්ථකෙ,
ආසම්භ[2] භූමිං චුණ්ණෙති - තෙසං අට්ඨීනි මාණවො.

මහබ්බලො මහාථාමො - ථරුසිප්පෙසු කොවිදො,
අහොසි තෙන යොධොති - පාකටො ආසි භූතලෙ-යි.

මෙසේ ඔහු බලසම්පන්න බව අසා කාවන්තිස්ස රජ්ජුරුවෝ ඔහුගේ දෙමවුපියන්ට බොහෝ සම්පත් යවා බඤ්ජදෙවයන් ගෙන්වාගෙන බොහෝ සත්කාර කොට ගැමුණු කුමාරයන් ළඟ සේවයට සැලැස්වූහ. ඒ බඤ්ජදෙව නම් යොධයා දුටුගැමුණු රජ්ජුරුවන් හා එක් ව ගොස් දෙමළුන් හා සටනට පටන් ගෙන ඒ ඒ තැන බල සෙනග බිඳ අතිඝොර භයානක මහසටන් කොට දෙමළුන් සාධා ලඞ්කාව එකාතපත්‍ර කොට රජ්ජුරුවන් හා සමඟ කුසල් කොට ගෙන ජීවිතාවසානයෙහි කම් වූ පරිද්දෙන් පරලොකප්‍රාප්ත විය. මෙසේ තුනුරුවන් අරහයා දනමානාදී[3] වශයෙන් රැස්කරන ලද්දවූ කුශලධර්මය සකලසම්පත්තීන් සමෘධ වූ දෙව්ලොව උපදවමින් නොයෙක් සියදහස් ගණන් දෙවස්ත්‍රීන් විසින් පිරිවරන ලදුව දිව්‍යනාටකයන් විසින් පවත්වන ලද නෘත්‍ය ගීතවාද්‍යයෙන් සන්තොෂ කරවා නන්‍දනොද්‍යානයෙහි[4] ක්‍රීඩා වශයෙන් දිව්‍ය සම්පත් හා නැවත මිනිස්ලොව මනුෂ්‍ය සම්පත් විඳුවා කෙළවර නිවන්පුර සිරි ගෙනහැර දෙන්නේ මය: එබැවින් සසර දුක් නමැති සියලු ව්‍යාධියට දිව්‍ය ඖෂධයක් බඳු වූ සාධුජනාවතීනයට දිව්‍ය මන්ත්‍රයක් බඳු වූ කැමැති කැමැති සම්පත් සාධා දෙන සිතුමිණිරුවනක් හා සමාන වූ සසර දුකට පිහිට ව ඇම දවස් ම එක් ව අත් නොහැර[5] යන දන නමැති මිත්‍රයා තමහට වැඩ කැමැති ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයන් විසින් භජනය කළ මැනවි. කියනලද මැයි;

එවං ආයතනං[6] ගතං සුචරිතං නන්‍දමහං[7] නන්‍දනෙ
සම්පත්තිං නිඛිලං නරෙසු ච අථො නිබ්බාණමන්තෙ පුරං:
තස්මා දනසහායකං භජථ භො සබ්බත්ථ චින්තාමණිං
දිබ්බං මන්තපදං තථෙව අගදං සඞ්ං වරං සබ්බද-යි.

මේ මෙහි පස් වන
බඤ්ජදෙව වස්තුව ය.

මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි
ගොඨඉම්බර වර්ගී නම් වූ
පසළොස්වන පරිච්ඡෙදය නිමි.

1. උට්ඨිතුට්ඨිතෙ - BDEGH ; ලට්ඨිතුට්ඨිතෙ - L
2. අසුම්භ - ක.සි.කද. පාලි
   ආසුම්භ - ම. මහාවංස
3. දනමානනාදී - J
4. නන්‍දනොද්‍යානාදියෙහි - BEGHKL
5. අත්නොහැර එක් ව - KL
6. ආයතන - ක.සි. කද.
7. නන්දවනං - මුද්‍රිත හැම, පාලි, ස.

Non-Commercial Distribution

තව ද මේ සද්ධර්මාලංකාරයෙහි සොළොස් වන ඵුස්සදෙව වර්ගය නම් කවර යත්. එහි පළමුවන ඵුස්සදෙව වස්තුව මෙසේ දතයුතු. කෙසේ ද යත්.

මේ සද්ධර්මාලංකාරයෙහි මුල නිදානවර්ගයෙහි කී පරිද්දෙන් සාරකල්පය මණ්ඩකල්පය වරකල්පය සාරමණ්ඩකල්පය භද්‍රකල්පය යි කියනලද පඤ්චප්‍රකාර කල්පයන් අතුරෙන් කකුසඳ කොණාගමන[1] කාශ්‍යප ගෞතම මෛත්‍රී යන පස් බුදුකෙනකුන් වහන්සේගේ බුධශ්‍රී සමෘධීන් ශොභමාන හෙයින් ද අලඞ්කාර[2] හෙයින් ද මුළු ලෝවාසීන්ට අභිවෘද්ධිදායක හෙයින් ද නොයෙක් කාරණ හෙයින් ම[3] බොහෝ සත්ත්වර්ගයාට භද්‍ර වන හෙයින් භද්‍රකල්පය යි නම් ලද මේ මහා භද්‍රකල්පයෙහි තුන් වැනි ව බුදු වූ කාශ්‍යප නම් බුදුරජාණන් වහන්සේ ලොවුතුරා බුදු ව රාග ද්වෙෂ මොහ මද මාන මාත්සර්‍ය්‍යාදි වූ ක්ලෙශාග්නීන් දග්ධ වෙමින් සිටි සත්ත්වර්ගයා දැක දහම් නමැති අමාවැසි වස්වා ක්ලෙශසන්තාප සන්හිඳුවා අමෘත මහාමෙඝයක් සේ වැඩවසනසේක් දවසෙක අමන්ද සුගන්ධයෙන්[4] බන්ධුර වූ ගන්ධකුටි වාසය හැර ස්වර්ණරජත මණිතාරකාදීන් විචිත්‍ර ශ්වෙත විතානාලඞ්කෘත සුගන්ධ තෛලොජ්වලිත[5] ප්‍රදීපසහස්‍රයෙන් හා නානාප්‍රකාර පූජාවිධි විශෙෂයෙන් සාලංකාර වූ[6] ධර්මසභා මණ්ඩපයෙහි පනවන ලද බුධාසනාරූඪ ව තරුකැලන් විසින් පිරිවරන ලද්දවූ පූර්ණචන්ද්‍රයා සේ ද දහසක් රැසින් පිරිවරනලද සහස්‍රකිරණයා සේ ද සවනක්රැසින් දිලිහි දිලිහී ශ්‍රාවක සමූහයා මධ්‍යයෙහි වැඩඋන්සේක් ශක්‍ර බ්‍රහ්මසුරාසුරොරග ගරුඬ ගන්ධර්ව සිධවිද්‍යාධරාදි වූ මහ සෙනඟ පිරිවරා නානානය නිපුණ ධර්මාර්ථදෙශනා ප්‍රතිවෙධ ගම්භිර ධර්මදෙශනාවට පටන්ගෙන මධුමදමුදිත ලලිත රතිකර මනොහර කුරවීකනාද නිර්විශෙෂ අෂ්ටාඞ්ග සමුපෙත මධුරභාරතීන් බ්‍රහ්මස්වර විහිදුවා ධර්මදෙශනා කරනසේක් පිරිවරා සිටි මහපිරිස තමන් තමන්ගේ දශනඛ සමොධාන සමුජ්වලිත දෙහොත් මුදුන් දිදී නමස්කාර කෙරෙමින් නොයෙක් දහස්ගණන් සාධුනාද පවත්වමින් විටින්විට ස්තුතිකොට මහත් වූ ආදර බහුමානයෙන් රන් රිදී මල් පුදමින් උතුරුසළු ගළවා දමමින් සතුටු සතුටු ව බණ අසති. එකල මේ ඵුස්සදෙව නම් යොධයාණෝ කෙළෙඹිකුලයෙක ඉපද වැඩිවිය පැමිණ විහාරයට ගොස් එම පිරිස් කෙළවර උන්නාහු[7] බුදුන්ගේ දෙතිස් මහාපුරුෂ ලක්‍ෂණයෙන් හා අසූ අනුව්‍යඤ්ජන ලක්‍ෂණයෙන් ප්‍රතිමණ්ඩිත ව ව්‍යාමප්‍රභාමණ්ඩලයෙන් පිරිවරනලද රූපයෙන් අග්‍රප්‍රාප්ත වූ ආත්මභාවයක් හා ඊට ම සුදුසු වූ මධුරභාරතීන් දෙසනලද සද්ධර්මය අසා අතිශයින් ම ප්‍රසන්න වූ සිත් ඇති ව බුදුපාමොක් මහසඞ්ඝයා වහන්සේට මෙනම් දෙයෙක් මෙහි නැතැ යි නොකියන පරිද්දෙන් මහදන් පවත්වා

---

1. කොනාගම - BCDGHJKL ; ක.කි.ඤ.ම.
2. අලංකෘත - BGHKL
3. කාරණයෙන් ම - KL
4. සුගන්ධ සම්බන්ධයෙන් - BEGHKL ක.කි.ඤ.ම.
5. තෛලොජ්වලිත - පිටපත් හැම
   තෛජොජ්වලිත - . ක.කි.ඤ.ම.
   තෛලොජ්වලිත - බෙ.
6. සාලංකාර වූ - පිටපත් හැම
   සාලංකෘත වූ - ක.කි.ඤ.ම.ය.
   ස්වලංකෘත වූ - බෙ.
7. වැඩ උන්නාහු - J
   වැඩඋන්නාවූ - මුද්‍රිත හැම, ය.
   උන්නාවූ - CHG

Non-Commercial Distribution

එතැන් පටන් විසි දහසක් හවුරුදු මුළුල්ලෙහි නිරන්තරයෙන් සඞ්ඝයා වහන්සේට ක්ෂීරපායාසයෙන් ලහබත් තබා දුන්හ: උදක් ලහබත් මතු නොවෙයි. භික්ෂූන් වහන්සේට චීවරාහාර සෙනාසන ගිලානප්‍රත්‍යයාදිය දන් දෙමින් අනෙකප්‍රකාර කුසල් [කොළෝය].[1] මෙසේ ජීවිතාන්තය දක්වා නොයෙක් පින්කම් කොට එයින් ගොස් නිඳු පිබිදියක්හු මෙන් දෙවුලොව ඉපද දිව්‍යලොකයෙහි දෙතිස් යොදුන් රන්විමනෙක වෙසෙමින් නොයෙක් ලක්ෂසුවහස් ගණන් සුරසුන්දරීන් හා දිවසෙනඟ පිරිවරා නිත්‍යසන්තොෂයෙන් යුක්ත ව එක් බුධාන්තරයක් යන තෙක් මහත් වූ දිව්‍යෛශ්වර්‍ය්‍ය විඳ එයින් චුත ව සර්වසම්පත්ති සම්පන්න වූ[2] දිවයින් දසයකින් පිරිවරනලද මේ ශ්‍රීලඞ්කාද්වීපයෙහි රුහුණුරට සිතුල්පව් විහාරය සමීපයෙහි ගොඩිගමු නම් ගම උත්පල[3] නම් කෙළෙඹියාණන් නිසා ඔවුන්ගේ භාර්‍ය්‍යාවන් කුස පිළිසිඳ දසඑකඩමස් පිරී බිහි වූහ. මීහට මුතුන් මීමුතුන්ගේ නම් නොතබා පුස නකතින් උපන් හෙයින් ඵුස්සදෙවය යි නම් තුබූහ. එනෙම ක්‍රමයෙන් වැඩී සත් හැවිරිදි කල කැටිව කෙළනා කුඩා කොල්ලන් හා එක් ව විහාරයට ගොස් බොධීන් වහන්සේට පූජාවට තුබූ සකක් ඇරගෙන තමාගේ ශක්තීන් සක පිඹපීය: එකල්හි ඒ සංඛනාදය සියදහස් ගණන් සෙණහඬ සේ දසදිශාන්තරයෙහි[4] පැතිර ගිය. ඒ සක්හඬ අසා කැටිව ගිය කුඩා කොල්ලෝ භයපත් ව උමතු වූවන් මෙන් ඒ ඒ තෙන උන්හ: සමීප වනයෙහි වසන ඌරන් මුවන් ආදි වූ සිව්පාවෝ ද භයින් ත්‍රස්ත ව ඒ ඒ අත දිවෙමින් භ්‍රාන්ත වූහ: ගස් උඩ වසන රිලා වඳුරු රුකයින්[5] හා පක්ෂි ජාතිහු ද එපරිද්දෙන් ම භ්‍රාන්ත ව බිම හුණහ: එතැන් පටන් ඒ ඵුස්සදෙව නම්[6] යොධයාය යි මුළු ලක්දිව ප්‍රසිඩ විය. කියනලද මැයි මහාවංශයෙහි;

චිත්තලපබ්බතාසන්නෙ - ගාමෙ ගවිට්ඨනාමකෙ,[7]
උප්පලස්ස සුතො ආසී - ඵුස්සදෙවො'ති නාමකො.

ගන්ත්වා සහ කුමාරෙහි - විහාරං සො කුමාරකො,
බොධියා පූජිතං සංඛං - ආදාය ධමි ථාමවා.[8]

අසණිපාතසද්දෙව - සද්දා තස්ස මහා අහු,
උම්මත්තා විය ආසුං තෙ - භීතා සබ්බෙ'පි දාරකා.

චතුප්පද ච විහඞ්ගා - හම්ංසු චරිතා[9] වනෙ,
තෙන සො ආසි උම්මාද - ඵුස්සදෙවො'ති පාකටො-යි.

---

1. කෙළේය - පිටපත් හැම, ස.
2. සමෘද්ධ සම්පන්න වූ - BEGHJKL
3. උපතල - බෙ.ස.
4. දස දිගන්තරයෙහි - K; බෙ.ස.
5. ආදීන් - ක.කි.සඳ.
6. උන්මාද ඵුස්සදෙවයාය යි - BGH ස. ඒ ඵුස්සදෙව නම් යොධයා උන්මාද ඵුස්සදෙවයාය යි -KL උන්මාද ඵුස්සදෙවොති - පාලි, මහාවංස
7. කවිට්ඨනාමකෙ - ක.කි.සඳ.ම. පාලි, මහාවංස
8. ථාමසා - ක.කි.සඳ.ම. පාලි, මහාවංස
9. චතිතා - ම. පාලි.

Non-Commercial Distribution

මෙසේ ඔහු ක්‍රමයෙන් වැඩී දෙළොස් ඇවිරිදි අවස්ථාවෙහි උන්ගේ පියාණෝ තමන්ගේ වංශානුගත ව පැවත එන ධනුශ්ශිල්පයෙහි දක්ෂ කැරවූහ: තව ද හස්තිශිල්පය අශ්ව ශිල්පය ඛඩ්ගශිල්පය කොන්ත සරමය[1] යනාදියෙහි දක්ෂ කැරවීය. එකල ඒ ඵුස්සදෙව නම් යොධයා ශබ්දවෙධිය වාලවෙධිය විජ්ජුවෙධිය ශරවෙධිය යන විශෙෂ විදමන් ද නිමවා උගත. එසේ ම වැලි පිරූ ගැල් විද පළවයි: සම් සියක්පොට විදියි: අටඟුල් බොල පියාපෝරු විදියි: සොළොසඟුල් බොල දිඹුල්පෝරු විදියි: එසේ ම සාඟුල් බොල යපට තඹපට විද පළවයි: ගොඩින් අටඉස්බක් තැන් විදියි: දියෙන් ඉස්බක් තැන් විදියි: අනිකුත් ආශ්චර්‍ය්‍යමත් වූ ශරරජ්ජුකය ශරපුෂ්කරණිය ශරප්‍රසාදය යනාදි වූ බොහෝ විදමන් උගත. එසේ හෙයින් ඔහු මෙසේ ධනුශ්ශිල්පයෙහි දක්ෂ බව මුළු ලක්දිව ප්‍රසිද්ධ විය. කියනලද මැයි මහාවංශයෙහි;

හත්ථස්සථරුසිප්පං සො - සික්ඛාපෙසි සකං සුතං,
ධනුසිප්පං ච සික්ඛසි - සකවංසාගතං පිතා.

සද්දවෙධී විජ්ජුවෙධී - වාලවෙධී ච සො අහු,
වාලුකාපුණ්ණසකටං - බද්ධ චම්මසතං තථා.

අසනොදුම්බරමයං - අට්ඨ සොළස අංගුලං,
තථා අයොලොහමයං - පට්ටං ද්විචතුරංගුලං.

නිබ්බෙධයති කණ්ඩෙන - කණ්ඩො තෙන විසජ්ජිතො,
ථලෙ අට්ඨුසභං යාති - ජලෙ තු උසභං පන.

නෙකසිප්පානි තස්සා'සුං - අඤ්ඤදනච්ඡරියානි ච,
තෙන සො පාකටො ආසි - සකලෙ තම්බපණ්ණියං-යි.

මෙසේ ඔහු සියලු ශිල්පයෙහි දක්ෂ බව අසා කාවන්තිස්ස රජ්ජුරුවෝ උන්ගේ පියාණන්ට බොහෝ පඬුරු සමඟ[2] පත්අස්නක් යවා ඔහු ගෙන්වා ගෙන බොහෝ සැපත් දී රජමහල් වීථියෙහි ගෙයක් සලස්වා ගම් බිම් ක්ෂෙත්‍රවස්තු ආදිය දීමෙන් සංග්‍රහ කොට ගැමුණු කුමාරයන් සමීපයෙහි වසන සේ සැලැස්වූහ. පසුව ඒ ඵුස්සදෙව නම් යොධයා දුටුගැමුණු රජ්ජුරුවන් හා එක් ව[3] දෙමළ කඳවුරු පැහැර සටන් කෙරෙමින් ගොස් අනුරාධපුරය ගන්නා දවස් එළාල රජ්ජුරුවන් හා මහ සටන් කරන වේලෙහි දෙමළුන්ගේ කණ්පුටයන් උපුට නහා කන් බිහිරි කොට අගුලු හෙන තරම් සියගණන් ඝෙණහඬ ගසන සේ සක පිඹ මහත් වූ ඒ සංඛඝොෂාවෙන් දෙමළුන් භය ගන්වා බිඳ ලුහුබඳවා පසුව හල්ලුකයා හා සටන් කරන දවස් ඇතුපිට පෙරටු ව උන් රජ්ජුරුවන්ගේ කුණ්ඩලාභරණය පැහැරගෙන හල්ලුකයාගේ මුඛයෙහි

1. කොන්තය සරමය - C, බෙ.ස.
2. හා සමඟ - KL
3. කැටුව - ස.කි.සඳ.

Non-Commercial Distribution

විද ඔහු රජ්ජුරුවන්[1] දසාවට පය ලා හෙන්නා[2] දැක "මාගේ රජ්ජුරුවන් වහන්සේ දසාවට දෙමළ කොල්ලා පය ලා හෙන්ට කාරණ කිම් දැ"යි අහික් පැරයක් දණෙහි විද ඔහු රජ්ජුරුවන්ට හිසලා හෙළවා සියලු ලඞ්කාද්වීපය ඒකාතපත්‍ර කොට රජ්ජුරුවන් ඔටුනු පළඳවා බොහෝ සම්පත් ලැබ රජ්ජුරුවන් හා එක් ව කුසල් කොටගෙන කම් වූ පරිද්දෙන් පරලොව ගියහ[3]. මෙසේ ඒ ධූසසදෙව නම් යොධයා අතීතජාතියෙහි තමා විසින් කරනලද්දවූ කුශල කර්මයෙහි විපාකයෙන් දිව්‍යලොකය මනුෂ්‍යලොකය යන ඇමතැන්හි ම එක් බුද්ධාන්තරයක් මුළුල්ලෙහි නිත්‍ය සන්තොෂයෙන් යුක්ත ව මහත් වූ ශ්‍රී විභූති වින්දේය: එබැවින් මේ කථාප්‍රබන්ධය ඇසුවාවූ නුවණැති සත්වයන් විසින් තම තමා ශක්ති පමණින් තුනුරුවන් අරභයා කුසල් කොට එපරිද්දෙන් ම මතු මහත් වූ ශ්‍රී විභූති විඳින්ට උත්සාහ කළ මැනවි. කියනලද මැයි;

කත්වා යං භො ඉති සුචරිතං ධූසසදෙවො අතීතෙ
දිබ්බං භොගං පමුදිතමනො භුඤ්ජි සබ්බත්ථනිච්චං:
තස්මා තුම්හෙ තිභවවිභවං - පත්ථයන්තා[4] මහන්තං:
හිත්වාලස්‍යං කුරුථ කුසලං - තීසු වත්ථුසු[5] සම්මා-යි.

මේ මෙහි පළමුවන
ධූසසදෙව වස්තුව ය.

තව ද මෙහි දෙ වන ලභියවසභ වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

යට ගිය දවස මෙම කල්පයෙහි බුදු වූ කාශ්‍යප නම් බුදුන් සමයෙහි මේ ලභියවසභ නම් යොධයාණෝ බොහෝ සම්පත් ඇති කෙළෙඹියාණ කෙනකුන්ට පුත් ව ඉපද ක්‍රමයෙන් වැඩී සහඹු ව ඒකෙන්නාහු බුදුන්ගෙන් බණ අසා ශ්‍රද්ධාවන්ත ව සුවඳ ගිතෙල් මී සකුරු ආදි වූ මධුර ද්‍රව්‍ය බහා පිසන[6] ලද්දවූ නිරුදක[7] ක්‍ෂීරපායාසයෙන් පාත්‍රයක් පුරා මට සිලුටු වූ සිහින් වස්ත්‍රයක් සුඹුළුවක් කොට අකුළා පාත්‍රය මත්තෙහි තබා භික්‍ෂුසඞ්ඝයා වහන්සේට දන් දුන්හ. එතැන් පටන් විසිදහසක් අවුරුදු මුළුල්ලෙහි නොයෙක් පින්කම් කොට[8] පන්සිල් නොකඩ කොට රක්‍ෂා කෙළේය: පසුව එයින් චුත ව දෙව්ලොව ඉන්ද්‍රනීලමාණික්‍යයෙන් හා ඝන රතින් නිම්යාවූ දිව්‍යවිමානයෙක ඉපද නොයෙක් සිය ගණින් දෙව දෙවස්ත්‍රීන් විසින් පිරිවරන ලදු ව උපමාවිෂයාතික්‍රාන්ත වූ දිව්‍යසම්පත් විඳ එයින් එක් බුද්ධාන්තරයක් ගිය පසු දෙව්ලොවින් චුත ව මෙම ලඞ්කාද්වීපයෙහි රුහුණු රට මාගම තුලාධාර

1. රජ්ජුරුවන්ගේ - E
2. හොත්තා - CJ
3. පරලොකප්‍රාප්ත විය - C
4. පත්ථයන්තො - පිටපත් හැම
5. වත්ථුසු - ක.කෘ.
6. පියන - ක.කෘ.
7. නිරොදක - BCDGHJKL
8. කෙරෙමින් - KL

Non-Commercial Distribution

පර්වත සමීපයෙහි වෙරවැසි[1] ගම බොහෝ සම්පත් ඇති මත්තා[2] නම් කෙළෙඹිපුත්‍රයාහට පුත් ව උපන: දෙමවුපියෝ ඕහට වසභය යි නම් තුබූහ: ඒ වසභ නම් කුමාරයා ක්‍රමයෙන් වැඩෙනුයේ පූර්වජන්මයෙහි රක්‍ෂා කළාවූ පඤ්චශීලයෙහි අනුසසින් විශිෂ්ට වූ රූ ඇති විය: දර්‍ශනීයය: ඉතා ප්‍රසාදවහය: උතුම් වූ වර්‍ණ සෞන්‍දර්‍ය්‍යයෙන් යුක්ත විය: එතෙම ඉතා ස්ථූල නොවෙයි: ඉතා කෘශ නොවෙයි: ආරෝහ පරිණාහයෙන් යුක්තය: දුටුදුටුවන් විසින් වර්‍ණනා කටයුතු වූ අඞ්ගප්‍රත්‍යඞ්ගයන් ඇත්තේය.[3] ඔහුගේ අග් බඹුරු[4] වූ දික් මොළොක් සිනිඳු කෙස්වැටිය තමලු ලිය කැලයක් මෙන් ඉතා හොබනේය: ඔහුගේ ඔප් නඟනලද රන් කැටපතක් හා සමාන මුඛමණ්ඩලය සුපුෂ්පිත රත්පියුමක් හා සමානය. කොසඹ පතට අපහාස[5] කරන්නාක් බඳු වූ මනොහර බැමසහළ බමරවැල දෙකක් වැන්න. නිවාතස්ථානයෙක බබළන ප්‍රදීපශිඛාවක් මෙන් අති මනොඥ වූ නාසිකාව තිලපුෂ්පයක් වැන්න. බඳුවද පෙති දෙකක් මෙන් රත් වූ අධරයුග්මය කෙම්වැල දෙකක් වැන්න: දන්ත පඞ්ක්තීහු ගා ඔප්නඟන ලද මුක්තාහාරයක් හා සමානයහ: රත්නාභරණයෙන් බබළන්නාවූ කර්‍ණයුග්මය රනෝවිලිදෙකක් හා සමානය: බාහුයුග්මය අතුල්තල නමැති රක්තපලලවයෙන් හොබනා රන්ලිය දෙකක් හා සමානය: ඔහුගේ ක්‍රමොන්නත වූ ඌරු යුග්මය ඇත්සොඬදෙකක් වැන්න: කෙණ්ඩාසහළ ඒණිමෘගයන්ගේ ජඞ්ඝායුග්මයක් වැන්න: පිටි පතුල් දෙක රතිබබත් දෙදෙනකු වැන්න, වට මටසිලුටු වූ දීඝාඞ්ගුලිපඞ්ක්තිය රන්තෙලි පෙළක් වැන්න: මෘදුකොමල පතුල්දෙක[6] රතැඹුලපෙති දෙකක් වැන්න. බොහෝ කොට කීමෙන් ප්‍රයොජන කිම් ද? ඔහුගේ සුලක්‍ෂණ[7] වූ ශරීරය දිව්‍යදළින් ඔප්නැඟූ කනකරූපයක් වැන්න: මෙසේ ඔහු යහපත් වූ රූපසම්පන්න ශරීරයක් ඇති හෙයින් දුටු දුටු ජනයෝ ඕහට ලඝියවසභය යි කියති. එසේ හෙයින් කියන ලදී;

පුබ්බෙ සො පඤ්චසීලානි - සමාදය සුගොපයි,
තෙන සො පුඤ්ඤකම්මෙන - රූපී ආසි මනොරමො.

නාතිථූලො නාතිකිසො - ආරොහපරිනාහවා,
අතින්දිතඞ්ගපච්චඞ්ගො - අහොසි පියදස්සනො-යි.

මෙසේ ඒ ලඝියවසභ නම් යොධයා[8] ක්‍රමයෙන්[9] විසි ඇවිරිද්දට පැමිණියේ ඉතා බලසම්පන්නය: ඇතුන් දසදෙනකුගේ[10] බල ඇත්තේය: කඩුසරමෙහි දක්‍ෂය: කුඹුරට දිය රඳවන පිණිස පුරුෂයන් ගණනක් දෙනා ඇරගෙන වැවක් බඳනේ බලසම්පන්න පුරුෂයන් දස දෙළොස් දෙනකු විසින් ඔසවාලිය නොහැකි මහත් පස්

1. වෙරවැසි - C
2. මත්තා - ක.ඤ.කි.ස.
3. අඞ්ගප්‍රත්‍යඞ්ගයෙන් යුක්ත විය - C
4. අක්බඹුරු - BCEGHJ
5. අපහාස්‍ය - KL
6. අතුල් දෙක - J
7. සලක්ෂණ - CDEGHJKL
සකල ලක්ෂණ - B
8. යොධයාණෝ - CDEJ, බෙ.ඤ.ස.
9. ක්‍රමයෙන් වැඩී - C, ක.කි.ඤ.ම.
10. දස දෙනකුට - BGHKL

Non-Commercial Distribution

පිඩි උදැල්ලෙන් ඔසවා දමමින් නොබෝ දවසකින් වැව බැඳ නිම විය; එතැන් පටන් ලභියවසභයා මහා බල යොධයාය යි ලඞ්කාද්වීපය ඇම තැන්හි ම ප්‍රසිඩ විය. කියනලද මැයි මහාවංශයෙහි;

සො කමෙනා'භිවඩ්ඪන්තො - ආසි වීසතිවස්සිකො,
දසනාගබලො ආසී - ථරුසිප්පෙ ච කොවිදෙ.

ආදය සො කතිපයෙ [පුරිසෙයෙව][1] ආරභි,
බෙන්තජීකො මහාවාපිං - කරොන්තො තං මහබ්බලො.

දසහිද්වාදසහි වාපි - වහිතබ්බෙ නරෙහි'පි,
වහන්තො[2] පංසුපිණ්ඩෙ සො - ලහුං වාපිං සමාපයි.

තෙන සො පාකටො ආසි - ලභියවසභො තද,
දීපස්මිං සකලෙ තස්මිං - යොධො ඉති මහබ්බලො යි.

මෙසේ ඔහු මහබල ඇති බව අසා කාවන්තිස්ස රජ්ජුරුවෝ ගෙන්වාගෙන බොහෝ සත්කාර කොට ඒ බැඳි වැව ඔහුට[3] දුන්හ; එතැන් පටන් ඒ වැව ලභියවසභ වැවය යි ප්‍රසිඩ විය. ඉක්බිති රජ්ජුරුවෝ ඒ යොධයා ගැමුණු කුමාරයන් සමීපයෙහි ම වසන සේ සැලැස්වූහ; ඒ ලභියවසභ නම් යොධයා දුටුගැමුණු රජ්ජුරුවන් හා එක් ව දෙමළ දෙතිස් කඳවුරු සාධා ලඞ්කාරාජ්‍යය එකාතපත්‍ර කොට රජ්ජුරුවන් ඔටුනු පළඳවා එතැන් පටන් රජ්ජුරුවන් හා සමඟ බොහෝ කුශලසම්භාරයන්[4] රැස් කොට ගෙන ජීවිතාවසානයෙහි කම් වූ පරිද්දෙන් පරලොකප්‍රාප්ත විය. එසේ හෙයින් මේ ලොකයෙහි යම්කිසි ශ්‍රඩාවන්ත කෙනෙක් තමන් ශක්ති පමණින් දන් දෙන්නාහු ද නිරන්තරයෙන් පඤ්චශීලය අඛණ්ඩ කොට රක්‍ෂා කෙරෙද් ද එබඳු උත්තම සත්වයෝ උපන් උපන්[5] ජාතියෙහි රූපසම්පන්න ව මහත් වූ බලයෙන් හා යශො[6] පරිවාරයෙන් යුක්ත ව මේ ලභියවසභ නම් යොධයාණන් මෙන් මහත් වූ ශ්‍රී සම්පත් ලබන්නාහුය යි දැන කුශලකරණයෙහි අප්‍රමාද වුව මැනවි. කියන ලද මැයි;

දත්වාන දානං සුගතොරසානං
පාලෙත්ව සම්මා බලු පඤ්චසීලං,
රූපඤ්ච ථාමං ච යසං ච භොගං
ලභන්ති සත්තා වසභොව එවං-යි.

මේ මෙහි දෙවන
ලභියවසභ වස්තුව ය.

---

1. පුරිසෙ වාපි - පිටපත් හැම
   පුරිසෙ යෙව - මුද්‍රිත හැම, පාලි, මහාවංස
2. මහන්තො - පිටපත් හැම
3. ඕහට - BCGHJKL
4. කුශලධර්මයන් - බෙ. ස.
5. උපනුපන් - BH
6. යස - BGHKL
7. ලදුයේ - බෙ. ස.

Non-Commercial Distribution

නව ද මෙහි තුන්වන දඨාසෙන[1] වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

යටගිය දවස මෙම කල්පයෙහි බුදු වූ කාශ්‍යප බුදුන් සමයෙහි මේ දඨාසෙන නම් යොධයා බොහෝ සම්පත් ඇති දනවි වැසි පුරුෂයාණ කෙනකුන්ට පුත් ව ඉපද කටයුතු දන්නා අවස්ථාවෙහි බුදුන්ගේ ධර්මදෙශනා අසා සර්වඥශාසනයෙහි පැහැද ශ්‍රද්ධාවන්ත ව වසනුයේ සඞ්ඝයා වහන්සේ උදෙසා විසිදහසක් අවුරුදු මුළුල්ලෙහි උපකරණ සහිත වූ ක්ෂීරපායාසයෙන් ලහබත් තබා දුන්නේය: උදක් ක්ෂීරපායාස මතු නොවෙයි; චීවරාහාරසෙනාසනගිලානප්‍රත්‍යය යන සිව්පසදනය ද අතිකුත් බොහෝ කුසල් ද කෙරෙමින් ජීවිතාන්තය දක්වා අඛණ්ඩ වූ පඤ්චශීලය රක්ෂාකොට එයින් ගොස් නිද පිබිදියාක්හු මෙන් දෙව්ලොව ඉපද දහස් ගණින් දෙවඟනන් පිරිවරා නොයෙක් සියගණින් දිව්‍යනාටකයන් විසින් ප්‍රයොගකරනලද නෘත්‍ය ගීතවාද්‍යයෙන් සන්තුෂ්ට වෙමින් දෙව්ලොව බොහෝ කාලයක් සැප විඳ එයින් චුත ව මෙම ලඞ්කාද්වීපයෙහි රුහුණුරට කුඹුබන්[2] නම් ගම බොහෝ සම්පත් ඇති අනින්දිත වූ කුලගෙයක[3] උපන. දෙමවුපියෝ මිහට දඨාසෙනය යි නම් තුබූහ: ඒ දඨාසෙනයා ක්‍රමයෙන් වැඩී සොළොස් හැවිරිදි අවස්ථාවෙහි දුටුදුටුවන්[4] ප්‍රියකර වූ රූපයෙන් යුක්තය, උතුම් වූ රූප සෞන්දර්‍යයෙන් සමන්විතය, ථාමසම්පන්නය, මහත් වූ ඇත්බල ඇත්තේය, දවසෙක එතෙම තමාගේ බල විමසනු[5] කැමැති ව කුඹුබන්[6] නම් මහවැව සමීපයෙහි ගිරිගල්[7] නම් පර්වතයට නැගී මහත් මහත් කල්වැල්[8] කපා ගෙනවුත් ගැට ලනුවක් වියගෙන බලසම්පන්න පුරුෂයන් දහසක්[9] විසිනුත් ඔසවාලිය නොහැකි වට වූ මහ ගල් එකතැන රැස් කොට ඉන් එකී එකී[10] වට ගලක්[11] ගැටලනුවෙහි තබා දෙකෙළවර එක් ව අල්වා ගෙන ඉසවට සිසාරා පර්වතයෙන් පාත එලිපිටට කෙළනා පෙදවට සේ ගසා විසුරුවා මෙසේ තමාගේ බල පරීක්ෂා කොට ඉස්ශොධා නහා ගෙට ගොස් බත් අනුභව කොට තමාගේ දෙමවුපියන් කරා එළඹ කියනුයේ "මාගේ හිතැති[12] මවුපිය දෙදෙනා සාදරසිතින් වැඳ මා දන්වන්නාවූ බසෙක් ඇත: ඉඳුරා ඇසුව මැනව: අපගේ බුදුරජාණන් වහන්සේ දනශීලාදි වූ සමත්‍රිංශත් පාරමිධර්මයන් පුරා ලොවුතුරා බුදු ව ලොවට අභිවෘද්ධි පමුණුවා නිවන්පුර පරායන වූ සේක: උන්වහන්සේ වදළාවූ සද්ධර්මය[13] වූ පරිද්දෙන් පිළිපදනා සඞ්ඝයාවහන්සේ ද මුළුලොවට සගමොක් සැපත් සාධා දෙමින් මුළුලොව්හි කීර්තිය පතුරුවා වැඩවසනසේක: අපගේ බුදුරජාණන් වහන්සේ ජීවමානකාලයෙහි මේ ලඞ්කාද්වීපයට වැඩ යක්ෂයන්ගෙන් වන උවදුරු දුරු කොට තමන් වහන්සේගේ ශාසනය පිහිටුවා වදළසේක: මෙසේ තමන් වහන්සේගේ

1. දාඨසෙන - BCEGHKL
2. කුඹුබ - CDGH
   කුඹුබන්හ - E. ම.
3. කුලයෙක - B
4. දුටුදුටුවන්ට - BCEGHKL
5. විමසා බලනු - ක.කි.කැ.ම.
6. කුඹුබ - CDE
7. ගිරිහෙල් - J
   ගිරිහල් - ක.කි.කැ.ස.
   ගිරිගල් - ම.
8. මහ කලවැල් - J
   මහත් කලවැල් - C
9. දසයක් - L
10. එකෙකී - BGHKL
11. මහගලක් - EG
12. සිතෙහැති - BEGHJKL
13. සද්ධර්මය ද එම ධර්මය - ස.

Non-Commercial Distribution

ශාසනය[1] රක්‍ෂාව නිසා තනා වදාළ ලඞ්කාද්වීපයෙහි ශාසනය දැන් කර්‍කශ වූ නිශ්ශ්‍රීක ජඩ ගුණ ඇති දෙමළු[2] එක් ව ගෙන පළමු ශ්‍රද්ධාවන්තයන් විසින් කරවාලූ පිළිමගෙවල් බුධරූප සිඳ බිඳ හෙළා ඒ ඒ තැන දහගබ් මහබෝ නසා පොත්පත් ගිනි ලා භික්‍ෂුභික්‍ෂුණීන් වහන්සේගේ කයට සිතට දුක් පමුණුවා පාත්‍රකුඩ ආදිය සිඳ බිඳ දමා නොයෙක් අනාදර කිරීමෙන් වෙහෙස දෙති;[3] එබඳු අනාදර බල බලා අප වැනි ශ්‍රද්ධාවන්තයන් උපෙක්‍ෂා ව හිඳීම යුක්ත නොවෙයි; එබැවින් තුනුරුවන් කෙරෙහි ආදර ඇති ශ්‍රද්ධාවන්ත රජදරුවන් වහන්සේට සේවාකම් කොට ඒ රජදරුවන් වහන්සේගේ සහායෙන් දෙමළුන් මරා සිංහලය නිරුපද්‍රව කොට ගෙන සර්‍වඥශාසනය බොහෝ කලක් පවත්නා[4] පරිද්දෙන් චිරස්ථායි කරනු කැමැත්තෙමි'යි කීය. එසේ හෙයින් කියනලදී;

'මාතාපිතුන්නං පාදනි - දනි වන්දිත්‍වා සාදරො,
වත්තුකාමො අහං කිඤ්චි - තං සුනන්තු සමාහිතා.
ජිනො නො පාරමී චිත්‍වා - බුද්ධො හුත්‍වා අනුත්තරො,
ලොකාභිවුද්ධිං කත්‍වාන - ඉතො සො සුගතිං ගතො.
තස්සෙදං සාසනංදනි - දමිළා කක්ඛළා ජළා,
නාසෙන්තු තං උපෙක්ඛිත්‍වා - අයුත්තං මෙ නිසීදිතුං.
ඝාතෙත්‍වා දමිළං සෙනං - ඛෙමං කත්‍වාන සීහලං,
චිරට්ඨිතිං කරිස්සාමි - ලොකනාථස්ස සාසනං'-යි.

මෙසේ ද කියා දෙමවුපියන් වැඳ අවසර ඉල්වාගෙන මාගමට ගොස් කාවන්තිස්ස රජ්ජුරුවන් දැක වැඳ එකත්පස් ව සිටියේය. එකල්හි රජ්ජුරුවෝ පන්සියයක් පමණ කර්මකරයන්[5] ගෙන්වාගෙන නොයෙක් ආයුධ කරවා සන ලවති; එවේලෙහි රජ්ජුරුවෝ ඒ දය්‍යාසෙනයන් දැක "සගය, තෝ කොයි සිට අයි දැ"යි තාගේ නම කිම් දැ"යි විචාරා "ස්වාමීනි, මම කුඹුබන් නම් ගම සිට අයිම්; මට දය්‍යාසෙනය යි කියති යි කීය. එකල්හි රජ්ජුරුවෝ ඔහුගේ සැටියෙන් ම බලසම්පන්න බව දැන පීරිගා මුවහත් නොතිබූ කඩු සැටක් ගෙන මේ හැම ඉඳුරා ගල ගා මුවහත් තබා දී ලව'යි දය්‍යාසෙනයන් අතට දී රජ්ජුරුවෝ සෙසු ආයුධ කර්මාන්ත බලමින් ශාලාව ඇත කෙළවරට ගියහ; දය්‍යාසෙනයෝ එකඩුසැට ගෙන ගල ගා ඉඳුරා මුවහත් තබා රජ්ජුරුවන් පෙරළා ආ කල්හි තමන් කළ කර්මාන්ත දැක්වූහ; රජ්ජුරුවෝ ඒ කර්මාන්ත දැක සතුටු ව කහවණු දහසක් දී ඉඳිනා ගෙයක් හා ගෙට

1. ශාසන - J
2. දෙමළුන් - BGH, ක.සි.භූ.ම.
3. වෙහෙසති - H
4. පවතිනා - BCGH
5. කර්මාරයන් - ක.සි.භූ.ම.
කර්මකාරයන් - K, ස.
කර්මාන්තකාරයන් - L

Non-Commercial Distribution

උවමනා සියලු උපකරණ සලස්වා තමන්ට සේවය කරන සේ නියොග කළහ. පසුව ඒ දඨාසේන යොධයා දුටුගැමුණු රජ්ජුරුවන් හා එක් ව මියුගුණෙහි පටන් දෙමළ කඳවුරු පහරිමින් ගොස් මහෙළ නම් නුවරට පැමිණියේය. ඒ නුවර වනාහි සොළොස් රියන් උස සපිර සාර මහපවුරු පෙළින් වටකරනලද්දේය: එසේ ම සපිරසාර වූ දරුමය දෙතුන්මහල් වහසලින් සුරක්ෂිතය: පවුරු මුදුන ඒ ඒ තන්හි කරනළද අට්ටාල වට වෙට්ටම් පුලිපුඩගම්[1] ආදී සේ ම කරන ලද්දේය: දිය අගලය කලල් අගලය වියළි අගලය යි මහ අගල් තුනකින් පරික්ෂිප්තය: සෞරවීයවී පුරුෂ බල පරාක්‍රමයෙන් යුක්ත යොධභටයන් විසින් ගන්නාලද රකවල් ඇත්තේය: කිසි පසමිතුරු කෙනකුන් විසින් වැද්ද නොහැක්කාවූ එබඳු මහෙළ පුරයට පැමිණ මහසටන් කළහ. එකල්හි ඒ දඨාසෙන නම් යොධයා මහසටන් කෙරෙමින් "අන් කෙනකුන් බිඳ එඑ මංකඩකින් නුවරට නොවදිමි"යි දළිවත් ව රණහඬ ගළ ගසා පෙනෙමින් අත්පොළසන් දී "එම්බල සොල, දඨාසෙනයා නම් මමය"යි තමාගේ නාමය අඬගා කියමින් කඩුපළඟ අතලා අසුරියනක් අහසට පැන නැඟී බැස මහපවුරු මුලට විලුඹෙන් පැහැර[2] උසින් සොළොස්රියනක් හා දිගින් තිස්රියනක් පමණ මහපවුරු නුවර මැද හෙළා ඇතුළුනුවරට වැද කෙහෙල් වනයක් සිඳ[3] හෙලන්නා සේ දෙමළ මහසෙනහ පොලුගෙන වගුරුවා ඒ නුවර ගෙන පසුව අනුරාධපුරය ගන්නා දවස් එලිල්ලන්කව පැනගොස් පර්වත දෙකට අතුරෙහි මහ සටන් කෙරෙමින් විලිකුන් තල්කැන් ගසා විසුරුවන්නා සේ නොයෙක් සිය දහස් ගණන් දෙමළුන් හිස් සිඳ විසුරුවා සියලු ලඞකාද්වීපය නිරුපද්‍රව කොට රාජ්‍යය ඒකච්ඡත්‍ර කැරවීය. රජ්ජුරුවෝ අනුරාධපුරය ගෙන ඔටුනු පැළඳ දඨාසෙනයන්ට බොහෝ සැපත් දුන්හ. එකල්හි ඒ දඨාසෙනයෝ මහත් වූ ශ්‍රීසම්පත් විඳිමින් දනාදි වූ කුශල සමභාරයන් රැස් කෙරෙමින් සැප සේ වාසය කෙරෙති.

එයින් මෑත භාගයෙහි ඕහට වෛරී වූ සෙවකයෙක් රජ්ජුරුවන් සමීපයට ගොස් වැඳ එකත්පස් ව සිට "දේවයන් වහන්ස, දඨාසෙනයෝ රාජ්‍යය නිසා නුඹවහන්සේට නොබෝ දවසකින් වරදිති යි, රජකමට වේද උත්සාහ කරන්නේය"යි[4] කියා රජ්ජුරුවන් බිඳුවාලීය. රජ්ජුරුවෝ හෙදකාරයන්ගේ බස් ගිවිස සැබවැ යි සිතා දඨාසෙනයන්ට කිපී ඔහු අල්වා මරවයි අමාත්‍යයන්ට නියොග කළහ. එකල්හි දඨාසෙනයෝ සෙනා වාහන සහිත ව ඉස්ශොධා නහන පිණිස වැවට[5] ගියහ. ඒ අවසරය බලා රජ්ජුරුවන්ගෙන් නියෝග ලත් අමාත්‍යයෝ මද නැඟී සිටි බලවත් ඇතකුට යගදවක් දී දකුණු වහසල්දෙර සිටුවා තුමූ තමන්ගේ සේනාව හා සමඟ පඤ්චායුධසන්නාධ ව සැඟවී සිට ගත්හ. එකල්හි දඨාසෙනයෝ ඉස්ශොධා නහා සුවඳ

1. පුලිමුගම් - ම
   පුලිපුගම් - ක.කි.කැ.
   පුලිඩගම් - බෙ.ස.
2. ඇත පැහැර - B
3. සිඳ - K, බෙ.ස.
4. කරන්නානු යි - ම
   කරන්නාහ යි - ක.කි.කැ.
5. කිසාවැවට - BEGHKL

Non-Commercial Distribution

විලවුන් ගෙන සියලු වස්ත්‍රාලඞ්කාරයෙන් සැරහී පිළිසන් වාහනයකට නැඟී තමන්ගේ සේනාව පිරිවරා දකුණු වහසල්දෙර සමීපයට පැමිණියහ: කැටිව යන සෙනාව රා බී මත් ව යගදවක් ගෙන සිටියාවූ ඇතු දැක රජ්ජුරුවන් කළ නියෝග අසා භයින් තැති ගෙන සිටියහ: දධාසෙනයෝ යන ගමන් තබා සේනාව සිටියා දැක 'කුමක් නිසා සිටු දැ'යි විචාරා 'ස්වාමීනි, රජ්ජුරුවන් වහන්සේ නුඹ මරන පිණිස ඇතු රා පොවා මෙහෙයූසේක: තෙල යගදවක් ගෙන සිටිනේ ඒ ඇතා වේ දැ' යි කීහ: එබස් අසා දධාසේනයෝ යානාවෙන් බැස ඇතුට ඉදිරි[1] වූහ: ඔහු දැක ඇතා මහත් කොට ගජ්නා කෙරෙමින් හොඩ බිම ගසමින්[2] කුඤ්චනාද කෙරෙමින් ඉදිරියට දිවගෙන ආය: එකල්හි දධාසෙනයෝ සෙණහෙඩ සේ අතින් අත පැහැර ගර්ජනා කෙරෙමින් විලුඹෙන් ඇන බිම දැදුරු කෙරෙමින් දිවගෙන ගොස් ඇතු දෙදළ අල්වා ගෙන සොලවා කෙහෙල්කඳ දෙකක් සේ උදුරා දමා සොඩ අල්වා ඇදගෙන ඉස වට සිසාරා ඇතු බිම පැහැර සුනුවිසුනු කොට තැළූහ: ඒ දැක දධාසෙනයන් මරන්ට ගිය සේවකයෝ භයින් තැති ගෙන මහසුළඟින් පලන[3] පරඬලා කොළ සේ ඒ ඒ අත දිවූහ. දධාසෙනයෝ එතැන්හි සිට සිතන්නාහු යශදයක ව සිටි රජ්ජුරුවන් වහන්සේට මා අනික්[4] අපරාධයක් කළ සේ[5] නොහැක්ක: සමීපයට යාත් නොහැක්ක, මේ ලත් අවසරයෙන් මට ම පිහිටක් කොට ගත මැනවැ'යි සිතා ජම්බුද්වීපයට යනු කැමැති වූහ. කෙසේ ද යත්: මාගේ ශරීරබලය හා සිතූ දෙයක් සිධකොට ගන්ට තිසි නොයෙක් උපාය පරීක්‍ෂා කොට නොවරදිනා කාරිය නිශ්චය කරන්ට සුදුසු වූ ස්ථානොචිත ප්‍රඥව[6] බැලූ කල මේ නුවර සියලු බලසෙනඟ මරා දමා රාජ්‍යය ඇරගනුත් පිළිවන් මය: එසේ ද වුවත් රජ්ජුරුවන් වහන්සේ මට බොහෝ සැපත් දී මෙතෙක් මා ඉදුරා ම රැකිසේක: එපමණෙක් මතු නොවෙයි: තුනුරුවන් කෙරෙහි අති ප්‍රසන්නසේක: සැදැහැ ඇතිසේක: සර්‍වඥශාසනයට බොහෝ උපකාරී සේක: එසේ හෙයිනුත් මේ රජ්ජුරුවන් වහන්සේට මා අපරාධයක් කළ නොහැක්ක: එසේ හෙයින්[7] ක්‍රොධයෙන් කිසිකෙනකුන් නැසීම නුවණැත්තන් විසින් කළමනා දෙයකුත් නොවෙයි: යමෙක් ක්‍රොධවසඟී වූයේ වීනම් එකාන්තයෙන් නරකයට ම යන්නේය: එසේ හෙයින් ක්‍රොධවසඟී ව පවු කරන තැනැත්තේ මෙලොව නින්දාවෙනුත් පරලොව නරකාදී සතර අපායෙනුත් නොමිදෙන්නේය: මේ ලොකයෙහි නුවණැත්තාවූ උත්තමයෙක් අපායෙහි උපදවා නොයෙක් දුඃඛයට පමුණුවන්නාවූ රාගද්වෙෂමොහමදමානමාත්සය්‍යීාදි වූ කෙලෙස් නමැති සතුරන් පරදවා ජය ගත්තේ වී නම් කිසි කලෙකත් ලාමක සත්වයන් විසින් ජය ගත නොහැක්කාවූ සියලු අකුසල් නමැති සෙනාව හා සමග දරුණු රළු නිර්ගුණී[8] මාරයා පරදවා තුන්ලොව ජය

---

1. ඇතු ඉදිරියට - මුද්‍රිත හැම
   ඇතු ඉදිරි වූහ - CJ
2. ගසා - BCDEGHJKL
3. පලායන - ක.කි.සැ.බෙ.
   ඉපිල යන - ම.
4. අතින් - K ම.
5. සේ (නැත) - BCDEGH ම.
6. ප්‍රඥවෙන් - ක.කි.සැ.ම.
   ප්‍රඥවත් - බෙ. ස.
7. හෙයින් (නැත) - CEGHKL
8. නිර්ගුණ - මුද්‍රිත හැම

Non-Commercial Distribution

ගත්තාවූ වීර්යවන්ත යොධපුරුෂයෙක් නම් එබඳු උත්තමයෙක් මය: සියලු සැපතින් සුඛිත වූ ශාන්ත වූ උපද්‍රව රහිත වූ නිර්භය වූ මෙතෙකැ යි යන ප්‍රමාණයක් නැති බොහෝ ආයු ඇති නිවන්පුර ලද්දහු නමුත් ඔහු මය: එබැවින් නුවණැති ශ්‍රද්ධාවන්ත වූ මා විසින් එබඳු අනර්ථදායක වූ ක්‍රොධවශගත්වයට නොපැමිණ සියල්ලවුන් කෙරෙහි මෛත්‍රී උපදවා පලා ගොස් සදුන් වැද මහණ ව ගල්ගුහා රුක්මුල් ආදි වූ යම්කිසි තෙනෙක භාවනානුයොගයෙන් යෙදී එකඟ වූ සිතින් වාසය කොට සියලු දුකට භාජන ව සිටි රාගද්වෙෂමොහාදි වූ කෙලෙස් සතුරන් නසා මාර්ග පටිපාටින් අර්හත්ඵලයට පැමිණ මෙසේ සසරදුකින් මිදෙන්ට නිසි ප්‍රයොගයකින් තමහට පිහිටක් සොයා ගත මැනවැ´යි සිතා මහණ වන්නට නික්මුණාහ. එසේ හෙයින් කියනලදී;

යො'ධ ජෙති නරො රාග - දෙසමොහාරිනො බලූ,
විජෙතුම'සමත්ථො තෙ - සඅසෙන තිභවුග්ගතෙ.

සසූරො ච ස යොධොච - ජිතො සො'ච ජගත්තයං,
සොච සන්තො සුඛී ඛෙමී - දීඝායු නිරුපද්දවො.

තස්මා තෙසං වසං'දති - අගන්ත්වාන මයා ඉතො,
ගන්ත්වා ඵාසුවිහාරෙන - වසතා යත්ථ කත්ථචි.

යුත්තං කාතුං පතිට්ඨා මෙ - ඉති චින්තිය සො පන,
අපක්කම්ම තතො ඨානා - සංයමං අජ්ඣුපාගමි-යි.

එසේ හෙයිනුත්[1] මෙසේ නොයෙක් කාරණ සලකා සසර කළකිරී මහණ වීමෙහි තත්පර වූ සිත් ඇති දඨාසෙනයෝ සියලු සම්පත්තියෙහි ද මිත්‍රපුත්‍රකලත්‍රාදි වූ බන්ධුවර්ගයා කෙරෙහි ද ආලය හැර කැටිව ගිය සෙනාවත් එතැන්හි ම රඳවා උදකලා ව ම මහුණ නම් ගමට ගොස් එයින් නික්ම මුහුදු අස මහදැල්[2] නම් කෙවුළු ගමට ගොස් වන්හ. ඒ ගම ශක්ති සම්පන්න වූ මහදැල් නම් කෙවුළෙක් මහත් දිග පුළුල ඇති එක්දඬු ඔරුවක් මුහුදට ගෙනගොස් වැලිපුරා කර තබා ගෙනවුත් මහබෝමළුයෙක[3] ලන්නේය: එපරිද්දෙන් ම පැන් පුරා ගෙනවුත් බොධිස්නාන කරවන්නේය:[4] දඨාසෙනයෝ එදවස් කෙවුළා බොධිමළුවේදී ම දැක ඔවුනොවුන් නම් ගොත් විචාරා පිළිසඳර කථා කොට දඨාසෙනයන් බලසම්පන්න යොධයාණන් බව දැන බල පරීක්ෂා කරනු පිණිස තමන්ගේ ගෙට කැඳවාගෙන ගොස් සත්කාර

1. එසේ හෙයිනුත් (නැත) - KL ස.
2. මහදැල්ල - බෙ.ස.
3. මහබෝමළුයෙහි - C
4. බොධිස්ථානයෙහි වත් කරන්නේය - CE
බොධිස්නානය කරන්නේය - BGHKL

Non-Commercial Distribution

සම්මාන කොට තමාගේ අභිප්‍රාය දඨාසෙනයන්ට කීය. එබස් අසා දඨාසෙනයෝ 'එසේ වීනම් යහළු වරා සාල් සතෙක බත් පිසවා පියව'යි කියා සාල්සතෙක බත් පිසවා නොවිලිකුන් ගිවුලු ගෙන්වාගෙන ගිවුලු සියල්ල ම ලෙලි ගළවා වන ලා කොටා බත් හා සමග එක් ව මිරිකා අනා පිඩුසතරක්[1] කොට වටා ගෙමැද ඉඳ ඔහු කැඳවා මා මරම් සිතා ම මාගේ බොටුව තරයේ දැතින් මිරිකා අල්වා ගනැ'යි කියා ඔහු යහපතැ යි ගිවිස එපරිද්දෙන් ම බොටුව මිරිකා අල්වා ගත් කල්හි දඨාසෙනයෝ බත්පිඩක් ගෙන ගිලූහ: කෙවුළුයොධයා ඇල්වූ ගැන්ම ධරාගත නොහී අත ගැළවී තමාගේ දෙරකඩ වැටිණ: දඨාසෙනයෝ නැවත කෙවුළා කැඳවා තෝ මාගේ බෙල්ල සෙමෙන් ඇල්වූව යි සිතමි: දැන් තර කොට අල්වා ගනුව'යි කීහ: ඔහු එපරිද්දෙන් ම තර කොට අල්වාගත් කල්හි බත්පිඩිදෙකක් එක් කොට ගිලූහ: කෙවුළා ඇල්වූ ගැන්ම ධරා ගත නොහී පළමු හුණු තෙනින් එපිට මිදුල මධ්‍යයේ හුණුයේය: නැවතත් දඨාසෙනයෝ කෙවුළා කැඳවා ඕහට අභිමාන වඩනා සේ නිඳුබස් කියා 'බෙල්ල තරයේ අල්වා ගනැ'යි කීහ: එවිට කෙවුළා තමාගේ ඇඟ ඇති බලයෙන් ම මිරිකා අල්වා ගත: එවිට දඨාසෙනයෝ පළමු විවරට දිවුණු[2] කොට බත්පිඩක් වටා ගිලූහ: කෙවුළා පළමු පරිද්දෙන් ම ඇල්වූ ගැන්ම ධරා ගත නොහී කෙවුළු කුඩ වූ අත ගිලිහී ගොස් මල බැඳුණු මුවකු උගුළු ලීයෙන් ගසා දැමුවා සේ පළමු නියාවට දුර ගොසින් වැටුණුවුය: මෙසේ තුන් විටෙක ම බල විමසා පරීක්ෂා කොට දඨාසෙනයන් ළහට ගොස් 'සාමිනි, නුඹවහන්සේ වැනි අනික් යොධයාණකෙනෙක් මේ ලඞකාද්වීපයෙහි තබා ජම්බුද්වීපයෙහිත් නැතැ'යි ස්තුති කෙරෙමින් වැඳ ක්ෂමා කරවා දඨාසෙනයන් හා සමග අරතරයේ ම මිත්‍ර විය. ඉක්බිති දඨාසෙනයෝ කෙවුලාණන් කැඳවා 'එම්බා යහළු, මම දඹදිව යනු කැමැත්තෙමි, මට සම්බානක් දෙව'යි කීහ: එබස් අසා ඔහු සම්බානක් ගෙනා කල්හි ඒ සම්බාන නැඟී රිටක් ගොඩ ඇන ඔරුවක් දැමුවා සේ එක පයක් ගොඩ ඇන අනික් පයින් සම්බාන දැමූහ: ඒ සම්බාන දැමූ වෙගයෙන් සුළං ගෙන එක දවසින් ම රළපතර බිඳ දිවගෙන ගොස් නාගදිවයින නාග නම් තොටට ගොස් වනා: එතැන්හි දඨාසෙනයෝ ගොඩබෑස පිළී තර කොට හැඳ ඉසකෙස් ගොතා බැඳ ගෙන ගොළුමුහුදට[3] පැන පීනාගෙන යන්නාහු පස් පනස්යොදුන් ගැඹුර ගෙවා සොලීරට ගෙවා කාවීර පටුන්තොටින්[4] ගොඩනැංගහ. එකල්හි එහි මනුෂ්‍යයෝ දඨාසෙනයන් දැක මුහුදු පීනාගෙන ආ නියාව අසා විස්මය පත් ව ඉතා ආශ්චර්‍ය්‍යයෙකැ යි[5] කියා බොහෝ සත්කාර සම්මාන කළාහුය. දඨාසෙනයෝ ඒ සත්කාර සම්මානයට සතුටු ව එහි ම රඳපියම් නොසිතා 'රහතන් වහන්සේ මේ අවධියට කොයි වසනසේක්

---

1. පිඩු සතක් - BEGHKL
2. දියුණු - CDEJ
3. මුදට - BCDEGJKL
4. පටුන්තොටට - D
5. ආශ්චර්ය පුරුෂයෙකැයි - BDEGH ම.

Non-Commercial Distribution

දැ'යි විචාරා 'එම්බා සබඳ, මීට දෙළොස් යොදුනක්[1] පමණ තැන තක්ක නම් නුවරෙක් ඇත: ඒ නුවර සමීපයෙහි විහාරයෙක රහතන් වහන්සේ වැඩවසනසේකැ'යි කී කල්හි දඨාසෙනයෝ අතරමඟ ගම් නියම්ගම් රාජධානි පිළිවෙළින් දුරු කතර ගෙවා තක්ක නම් නුවරට පැමිණ 'රහතන් වහන්සේ කොයිවසනසේක් දැ'යි එහි මනුෂ්‍යයන් අතින් විචාළහ. එසේ විචාළ දඨාසේනයන්ගේ බස් අසා සන්තුෂ්ට වූ[2] මනුෂ්‍යයෝ නැවත නැවත පිළිසඳර කථා කොට භික්ෂූන් වහන්සේ වසන තැන් කියන්නාහු:

ඉතො උත්තරතො යත්ථ - දිස්සතෙ'යං මහානගො,
මයූරගීවසංකාසො - නීලොභාසො මනොරමො.

ලබුජම්බ ජම්බු රම්භාදි - තරුරාජි විරාජිතො,
නාග චම්පක පුන්නාග - ඵුල්ල පාදපමුජ්ජලො.

කුටි මණ්ඩප සම්පන්නො[3] - ලෙණපබ්භාර භාසුරො,
සිතසෙකත[4] සඩ්කිණ්ණො - මාලකාලි විරාජිතො.

යනාදීන් 'එම්බා සබඳ, මීට උතුරුදිග පෙනෙන මොනර කරක් සේ නිල්[5] වූ සිත්කලු වූ නෙල මහත් පර්වතය බලාගන්ව. ඒ පර්වතප්‍රාන්තය අඹ දඹ දෙල් බෙලි කෙහෙල් ආදි වූ ඵල හරිත තුරුපෙළින් විරාජමානය: පුන්නාග නාග කුරරක[6] උද්දලක මධුගන්ධිකාශොක කරවීක කර්ණිකාරාදි වූ සුපුෂ්පිත වනපෙතින් ශොභමානය: නොයෙක් ජාතියෙහි නානාවර්ණ පක්ෂීන්ගේ මධුරනාදයෙන් හා හැළි ගසා දිවන මිහිරි සිහිල් ජලපිරි ගඞ්ගාවන්ගේ නිර්ඝොෂාවෙන් අහස් පොළෝ දෙක එකවිට ගුගුරන්නා[7] සේ එකකොලාහලය: පර්වත මුදුන ඒ ඒ තන්හි පිල්සත් විදහා කෙකාසර නභා සන්තොෂයෙන් හාත්පස නටා බස්නා මයූරයන්ගේ කෙකානාදයෙන්[8] දෙව්ලොව දෙවියන් කැඳවන්නා වැන්න: තපස්විවරයන්ගේ කෙලෙස් නමැති සතුරන් සාධන්ට අසහාය සරණ වූ නෙල පර්වත නමැති හස්තිරාජයා නම් තව්තිසා වැසි දෙවියන්ට අසුරයුද්ධයෙහි සහාය ව සිටි ඓරාවන නම් හස්තිරාජයා වැන්න: පර්වත මුදුනෙහි වෘක්ෂරාජයන්ගේ ශාඛාග්‍රයෙහි ලෙලදෙන්නා වූ පුෂ්පමඤ්ජරීහු එම ඓරාවන නම් හස්තිරාජයාගේ දළ අගපොකුණු මැද පියුම් පිට නටන සුරසුඳුරින් මෙන් සන්තොෂ කරයහ:[9] රිලා වඳුරු රුකයින් හා පක්ෂීන් විසින් චලිත වූ සුපිෂ්පිත පාදපාග්‍රයෙහි සමුද්ගත භ්‍රමරාවලීන් විසින් ආකාශමණ්ඩලය නිල්මහ මේකුළු පෙළින් සැරහුණා වැන්න: අවට පිහිටි තටාක නමැති අඞ්ගනාවෝ පුෂ්පරේණු නමැති අඞ්ගරාග ගෙන තුරුමලින් සැරහෙමින් ඇළ කඳුරු ගං නමැති මොළකතින්

1. යොදනක් - BGH
2. සන්තුෂ්ට ව - E
3. සඞ්කිණ්ණො - මුද්‍රිත හැම, ස
4. සිතයෙකත - BCDJKL
5. නිල් ව තිබෙන - ම.
6. කුරවක - BEGK
කුවරක - L
7. ගුගුරුවන්නා - KL
8. කෙකාසරනාදයෙන් - C
කෙකාරනාදයෙන් - E
9. සන්තොෂ කරන්නාහ - D, බෙ.ස.

Non-Commercial Distribution

පර්වත නමැති මහරජහු ප්‍රෙමයෙන් වැළඳ හොත් ප්‍රියකාන්තාවන් වැනියහ, සුපුෂ්පිත වූ හඳුන් සඳුන් දෙවුදුරු කපුරු සරල සාලාදි[1] වූ වෘක්ෂසමූහයෙන් ගැවසී ගත්තාවූ මහවනය දිව්‍යාබරණින් සැරහී දිව්‍යාඞ්ගනන් හා දිව්‍යසෙනඟ වන් නන්දන වනය හා සමානය. පල ගෙන සිටිනා තල් කිතුල් ඉඳි තැඹිලි පොල් පුවක් ආදි වූ වෘක්ෂරාජයෝ මඳමඳ පවනින් ලෙලදෙන්නාහු[2] ලීලා දක්ව දක්වා නටන නාටකයන් වැනියහ. සුපුෂ්පිත පද්මොත්පල පුණ්ඩරීකාදීන් ප්‍රතිමණ්ඩිත වූ සීතල ජලභරිත වූ පුෂ්කරණීහු ඒ ඒ තන්හි පිහිටියහ. මෙසේ නොයෙක් පලුපලලව කුසුමයෙන් සශ්‍රීක වූ විසිතුරු තුරුපෙළින් හා මනහර විල් පොකුණු වැලිතලා ගල තලා ඇළි දෙළන් ආදීන් මනොඥ වූ පර්වතප්‍රාන්තයෙහි පවුරු පදනමින් හා රත්වත් පුළුපා මහපා සක්මන් මණ්ඩප ලෙණ පබ්භාරාදීන් ප්‍රතිමණ්ඩිත අතිධවල වැලිමළු පෙළින් ගැවසී නිරන්තරයෙන් නර සුර අසුර ගරුඩ ගාන්ධර්වාදීන් විසින් භජනය කරනලද අනිවත්තිය[3] නම් වූ මහත් විහාරයෙක් වීය: ඒ විහාරයෙහි බොහෝ දෙව්මිනිසුන්ට කුසල් වඩමින් ශාන්තදාන්ත ගුණ ධර්මයෙන් යුක්ත රහතන් වහන්සේ වාසය කරන සේක. එ ඇමදෙනා වහන්සේට නායක[4] වරුණ නම් මහතෙර කෙනකුන්වහන්සේ ලොවුතුරා බුදුකෙනකුන් වහන්සේ පරිද්දෙන් ශ්‍රද්ධාවන්ත සත්වයන්ගේ චිත්ත සන්තාන නමැති මහලිය[5] ධර්ම නමැති ජලසේකයෙන්[6] වර්ධනය කරවා ස්වර්ගමොක්ෂ සම්පත්ති නමැති ඵල ප්‍රදානය කරවනසේකැ'යි කීහ.

මෙසේ කියනලද විහාර වර්ණනා හා එහි වසන රහතන් වහන්සේගේ ගුණ වර්ණනා අසා සන්තුෂ්ට වූ දධාසෙනයෝ උන් විසින් කියන ලද සලකුණු[7] නො වරදවා අනිවත්තිය නම් විහාරයට ගොස් වරුණ නම් මහතෙරුන් වහන්සේ දැක වැඳ එකත්පස් ව උන්හ. මහතෙරුන් වහන්සේ දධාසෙනයන් දැක පිළිසඳර කථා කොට 'උපාසකය, කොයි සිට කුමක් පිණිස අවු දැ'යි[8] විචාළසේක. එකල දධාසෙනයෝ තමන් ලඞ්කාද්වීපයෙහි සිට සිතා ගිය සියල්ල ම මහතෙරුන් වහන්සේට විස්තර වශයෙන් කීහ. මහතෙරුන් වහන්සේ යහපතැ යි ගිවිස ඔහු ඉසකෙස් බාවා දැළරැවුළු කප්පවා මහණ කොට උපසම්පද කරවා චරිතානුකූල කමටහන් ඉගැන්වූසේක. කර්මස්ථාන ගෙන භාවනා කරන දධාසෙනයන් වහන්සේට කර්මස්ථාන සිතට නොනැඟෙයි: ප්‍රතිභාග නිමිත්ත මාත්‍රයකුදු නොවැටහෙයි: එකල දධාසෙනයන් වහන්සේ කීප දවසක් එතැන්හි වැස උපාධ්‍යායන් වහන්සේ සමීපයට ගොස් වැඳ එකත්පස් ව හිඳ 'ස්වාමීනි, මාගේ සිත එකඟ නොවෙයි: කර්මස්ථාන සිතට නොනැඟෙ'යි වදළසේක. එකල මහ තෙරුන් වහන්සේ 'කිමෙක් දැ: මේ සෙනාසනය වටින් ගැඹුරු ව තිබෙයි: එසේ හෙයින් චිත්තය නානාලම්බණික නොවෙයි: ගොචරග්‍රාමයට තුන් යොදුන් පමණ තැන පිහිටියේය: සෙනාසනාඞ්ග

1. සලලාදි වූ - BEGHKL
2. ලෙලදෙන්නාවූ - BCD
3. අනිවඝ්ඝිය - සද.
   අනවඝ්ඝිය - ක.සි.
   අනිවත්තිය - පාලි
4. නායක ව - DGHJKL
   නායක වූ - B
5. මහාමලියය - CJ
   මහලියය - BDEH
6. ජලයෙන් - CJ, බෙ.ස.
7. සලකුණෙන් - H, ක.සි.සද.බෙ.
8. අයි දැයි : E, ම
   ආහු දැයි - J

Non-Commercial Distribution

සම්පත්තීන් යුක්තය: එතෙකුදු උවත් මොවුන්ගේ සිත කම්සථානයෙහි නොඇලෙන්නේය: මීට කාරණ කිම් දෝ හෝ ʼයි සිතන සේක් ʼබොහෝ භික්‍ෂූන් ඇති විහාර හෙයිනැʼයි දැන ʼඑසේ වී නම් ඇවැත්නි, මීට සැට යොත්නකින් මත්තෙහි ථෙරම්බලක[1] නම් විහාරයෙක් ඇත: ඒ විහාරය වනාහි ශක්දෙවු රජහු විසින් මවනලද්දේය: ඒ විහාරයෙහි දැන් වයොවෘධ කෙනකුන් වහන්සේ හා සාමණේරනමක් හා දෙනමෙක් මය: එතැන්හි ගොස් ඉදින් තමන්ට එාසු වී නම් ඒ විහාරයෙහි සැපසේ වැස තමන්ගේ භාවනානුයොගය සිඩ කොට ගත මැනවැʼයි වදළ සේක.

උන්වහන්සේ ද යහපතැ යි ගිවිස උපාධ්‍යායයන්වහන්සේ වැඳ පාසිවුරු ගෙන නික්මුණුසේක් සැටයොදුන් මහ ගෙවා විහාර සමීපයට පැමිණ විහාරය පර්වතයක් මුදුනෙහි හෙයින් උඩ නැංග නොහී සිටිසේක. ඒ විහාරයෙහි නේවාසික මහතෙරුන්වහන්සේ පර්වත[ය][2] මුදුනේ සිටිසේක් ආගන්තුග ව[3] ගිය දය්‍ාසෙනයන් වහන්සේ දැක සාමණේරයන් වහන්සේ කැඳවා ʼඑම්බා, ආගන්තුක භික්‍ෂුකෙනෙක් ඇවිත් පර්වතයට නැංග නොහී බලා සිටිති, උන්[4] කැඳවාගෙන අවුත් උන් සැතපෙන්නට එාසු සෙනස්නක් බලා සලස්වා ලවʼයි වදළසේක. ඔබ තමන් වහන්සේගේ සෘද්ධීන් දය්‍ාසෙනයන් වහන්සේ කැඳවාගෙන අවුත් සැතපෙන්ට සුදුසු ගෙයක් සැලැස්වූසේක: එතැන්හි ඒ දය්‍ාසෙනයන් වහන්සේට කම්සථාන විත්‍යාරූඪ නොවෙයි: විතර්කවසික වෙයි: එතැන්හි කීප දවසක් වැස මහතෙරුන් වහන්සේ සමීපයට ගොස් ʼස්වාමීනි, මට මෙතැන්[5] සැප නොවෙයි, එකඟ නොවෙයි, සමුද්‍රය පෙනෙයි: ඈත මෑත යන පඩවු පාරු පෙනෙයි: එසේ හෙයින් මාගේ සිත එකඟ නොවෙයි: අනික් මට භාවනා කරන්ට සැප විහාරයක් වදාළ මැනවැʼයි කී සේක. එපවත් අසා මහතෙරුන් වහන්සේ ʼමෙබඳු මෙසේ ශක්දෙවුරජහු විසින් මවා දෙන ලද සිත්කලු වූ විහාරය පවා මුන්ගේ සිත සතුටු කොට ලිය නොහෙයි, ලොහකූට පර්වත විහාරය සැප වී නම් යෙහෙකැʼයි සිතා ʼඑම්බා ඇවැත්නි, මීට පසළොස් යොදනකින් මත්තෙහි ලොහකූට පර්වත නම් විහාරයෙක් ඇත: එහි වැස මහණධම් පුරවʼයි වදරා ඒ විහාරය වර්ණනා කරනසේක්;

ඉතො උත්තර පස්සම්හී - ලොහකූටව්හ පබ්බතෙ,
විහාරො රමනීයො'සි - වීතරාගාන 'මාලයො.

පුබ්බපච්ඡිමපස්සෙ ච - තථා දක්ඛිණ උත්තරෙ,
චත්තාරො පබ්බතා ආසුං - මහන්තා රතනාමයා.

තෙසු පබ්බතපාදෙසු - නානාඵලධරා දුමා,
වාතෙරිතා'ති සොභන්ති - නීලොභාසා මනොරමා-යි.

1. ථෙරම්බලක - ක.කි.කැ.ම.
2. පර්වත - පිටපත් හැම
3. ආගන්තුක ව - CEJKL ස
4. උන්ට - BGH
5. මෙතැන්හි - මුද්‍රිත හැම, ස

Non-Commercial Distribution

යනාදීන් 'මෙතැනට උතුරුදිග් භාගයෙහි ලොහකූට නම් පර්වතයෙහි රහතුන්වහන්සේගේ වාසයට ම සුදුසු වූ ඉතා සිත්කලු මනහර විහාරයෙක් ඇත: ඒ විහාරයට නැඟෙනහිරය බස්නාහිරය දකුණුදිගය උතුරුදිගය යන සතර දිසාවෙහි රන්පර්වත සතරෙක් වීය: ඒ ඒ පර්වතප්‍රාන්තවල නානාප්‍රකාර පලුපලලව කුසුමයෙන් සශ්‍රීක ව වටා සිටගත්තාවූ වෘක්‍ෂරාජයෝ මඳ මඳ පවනින් ලෙලදෙන්නාහු දුර බලා සිටියවුන්ට එකාබද්ධ ව අඳුන්වන් පැහැයෙන්[1] පර්වතරාජයන් සේ ශොභමාන ව පෙනෙති. එහි ගැවසී සිටිනා වෘක්‍ෂයෝ වනාහී කොබලිල පලොල් මුහුලු[2] නඳුන් සඳුන් අගරු කපුරු සපු කිණිහිරි අඹ දෙඹ සල් කිතුල් හෝපලු නා සිහින්කෙන්ද[3] සලල බක්මී ආදි වූ වෘක්‍ෂරාජයෝ නානා වර්ණ සුගන්ධ කුසුමයෙන් සශ්‍රීක ව භෘඞ්ගයන්ගේ තුඩින් වහනය වන්නාවූ මධු බිඳු හා සමඟ කුසුමරේණුන් එකපැහැර විසුරුවමින් සිටිති: එසේ ම තල් පොල් දෝතලු[4] කිතුල් තැඹිලි පුවක් කෙහෙල් ආදි වූ ඵල වෘක්‍ෂයෝ විහාරසමීප වනයෙහි එකහෙළා විහාරය හොබවා සිටිති. ගා ඔප්නහානලද මුතුරැසක් හා සමාන සුදුවැලි අතුරනලද මාලකාවලීහු විභාගවත් ව රළපතර සන්හුන් කිරිමුහුදු ජලතලාව සේ බබළති. එහි අනන්ත නම් නාගරාජයාගේ භොගාවලිය හා සමාන සර්වරත්නමය මහපවුරු පන්තිය විහාරය හොබවා උස් ව සිටගත. එසේ ම සප්තරත්නමය මහපවුරකින් වටකරනලද්දවූ සැටරියන් දිග මහ සක්මනෙක් සුදු සිනිඳු වාලුකාතලයෙන් හොබනේය: දෙවියන් විසින් නිර්මිත කරනලද සංඝාවාස ප්‍රාසාද මණ්ඩප සියල්ල ම සත්රුවනින් නිමියේය: සෙවෙනි සියල්ල ම ඉන්ද්‍රනීලමාණික්‍යයෙන් නිමියේය: මුදුන් කොත් සියල්ල ම චාමීකර සවර්ණයෙන් නිමියේය:[5] රාත්‍රිස්ථාන දිවාස්ථාන වැසිකිළි පස්සාවකුටි ආදිය ද එපරිද්දෙන් ම සත්රුවනින් නිමියේය. රක්තොත්පල ශ්වේතොත්පල[6] රක්තපද්ම ශ්වේතපද්ම ඇඹුල ඉපුල ආදි වූ පඤ්චප්‍රකාර පද්මොත්පලයෙන් සශ්‍රීක පොකුණුපෙළින් සැරහී සිටිනේය. ශ්‍රද්ධාවන්ත දෙවතාවෝ එක්ව[න්][7] ඇමදීම් ආදීන් පිළිදැග නිරන්තරයෙන් රක්‍ෂා කෙරෙති. ඇවැත්නි, මෙසේ දෙවියන් විසින් නිර්මිත කොට රක්‍ෂා කරනලද හෙයින් පෘථග්ජනයන් විසින් ඒ විහාරයෙහි වාසය කිරීම ඉතා නොපිළිවන: ඉදින් දෙවියන්ගේ සිත් පහදවාගෙන වාසය කරන්ට පිළිවන් වී නම් සැප සේ ධ්‍යාන භාවනා කොටගෙන විසුව මැනවැ'යි වදාළසේක. මෙසේ විහාරය වර්ණනා කොට දක්වා 'ඇවැත්නි, ඒ විහාර කෙළවර පිහිටියාවූ මහා වෘක්‍ෂයෙක් වායුවෙගයෙන් පහරනලද්දේ එක් ශාඛාවක් පාතට නැමෙයි; තමන් එතැන්හි ගොස් පාත පර්වත මුදුනෙහි සිට ශාඛාව එල්බගෙන පර්වත මුදුනෙහි විහාරයට නැඟී වාසය කළ මැනවැ'යි කීසේක.

1. පැහැ අභියෙන් - K
2. ඇසළ මුහුලු - BDEGHKL
3. සිහින්ගෙන්ද - BK
4. දෝතුලු - DEJ
5. හොබනේය - BGH
6. ශ්වේතොත්පල (නැත) - BGHKL
7. එක් ව - පිටපත් හැම

Non-Commercial Distribution

මෙසේ විහාරය වර්ණනා කොට දක්වා "ඇවැත්නි,ඒ විහාර කෙළවර පිහිටියාවූ මහා වෘක්‍ෂයෙක් වායුවෙගයෙන් පහරනලද්දේ එක් ශාඛාවක් පාතට නැමෙයි, තමන් එතැන්හි ගොස් පාත පර්වත මුදුනෙහි සිට ශාඛාව එල්බගෙන පර්වත මුදුනෙහි විහාරයට නැඟී වාසය කළ මැනවැ"යි කීසේක.

මෙසේ තෙරුන්වහන්සේ වදළ වචනය යහපතැ යි ගිවිස වැද[1] පාසිවුරු ගෙන නික්ම පසළොස් යොදුන් මහ ගෙවා ලොහකුට පර්වත මුදුනට නැඟී සිටිසේක. එකල පවන් වෙගයෙන් පහරනලදු ව නැමුණාවූ ශාඛාව එල්බගෙන විහාරයට නැඟී පාසිවුරු තැන්පත් කොට තබා බඳුවද පොත්තක පැහැ සමාන අතිරක්ත වූ ගලතලක් මුදුනෙහි බඩ පයඝීඩකයෙන් වැඩහිඳ "යම්තාක් මාගේ චිත්තය කාමාදි ආශ්‍රවයන් කෙරෙන් නොමිදේ ද ඒ තාක් මේ බඩපයඝීඩකය නොහරිමි"යි ඉටාගෙන තමන් වහන්සේගේ කර්ම්ජශරීරය අනුලොම ප්‍රතිලොම වශයෙන් සමමර්ශනය කෙරෙමින් පළමු වන දවස් ඉක්මවූසේක: එසේ ම දෙවන තුන්වන දවසුදු ඉක්මවා සතරවන දවස් පර්වතයෙහි වසන තෙක්[2] දෙවියන් හා දිව්‍ය නාග යක්‍ෂ රාක්‍ෂස සිධ විද්‍යාධරාදීන් සතුටු කරවා එකපැහැර සාධුකාර දෙවමින් සිව් පිළිසිඹියා හා සමඟ රහත්බවට පැමිණි සේක.

ඉක්බිති එතැන වැඩඋන්නා සේ ම පර්වතය පළා පොළොව කිමිදගෙන ගොස් තමන් වහන්සේගේ උපාධ්‍යාය වූ මහාවරුණ ස්ථවිරයන් වහන්සේගේ ශ්‍රී පාද මූලයෙන් උඩනැඟී මහතෙරුන්වහන්සේ වැඳ පිළිසඳර කථාකොට වැඳ අවසර ගෙන සවර්ණහංස රාජයකු මෙන් අහසට පැන නැඟී දසදිග් බබුළුවමින් නැවත ලොහකුටපර්වතපබහාරයට ම අවුත් බොහෝ කලක් වාසය කොට මැනභාගයෙහි පිරිනිවන් පාන්‍ා දවස් පර්වත මුදුනෙහි කාලඝොෂා කළසේක. ඒ ක්‍ෂණයෙහි තිස්දහසක් රහතුන් වහන්සේ රැස්වූ සේක. එකල්හි ඒ රහතුන් වහන්සේ මධ්‍යයෙහි දය්‍ාසෙන ස්ථවිරයන් වහන්සේ තමන් වහන්සේගේ මේ පූර්වචරිතාපදානය ගෙන හැර දක්වා "මේ කුශලකර්මයෙන් මෙබඳු ශරීරබලයක් ලදිමි. දැන් එම කුශලයෙන් ජාතිදුඃඛයෙන් මිදී නිවන්පුර සිරි ලදිමි"යි ප්‍රකාශ කොට දක්වා[3] එතැන්හි ම පිරිනිවිසේක.

යම්කිසි කෙනෙක් මෙසේ විපාකදයක වූ කුශලකර්මයක් කළාහු වී නම් මෙසේ වූ[4] උත්තම සත්වයෝ ස්වර්ගමොක්‍ෂ සම්පත්තිය සැපසේ ම ලබන්නාහු මය; එබැවින් මේ කථාප්‍රබන්ධය ඇසූ ශ්‍රද්ධාවන්තයන් විසින් එබඳු[5] කුසල් කොට සගමොක් සැපත් ලබන්ට උත්සාහ කළ මැනවි. කියනලදුයේ මැයි:

---

1. පා වැඳ - ක.කි.කෑ.ම.
2. නොයෙක් - B
   තාක් - ම
   තෙක් (නැත) K
3 ඒ දක්වා - ABCDEGHJK
4. මෙබඳු -L

Non-Commercial Distribution

එවං විධං පුඤ්ඤඵලොදයාවහං
යො පුඤ්ඤකම්මානි[1] කරෙය්‍ය සොහතං.
ස යාති සග්ගං ච පවග්ගසම්පදං
කරොථ තුම්හෙපි තථාවිධං සුභං-යි

මේ මෙහි තුන්වන
දඨාසෙන වස්තුව ය.

තව ද මෙහි සතරවන මහනෙල[2] වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්.

මෙම ලංකාද්වීපයෙහි රුහුණුරට සප්පදුරු ගං[3] සමීපයෙහි චතුරු නම් විහාරයෙක් විය: ඒ විහාරය රත්වත් සුළුපා මහපා සක්මන් මණ්ඩප ආදියෙන් සැරහී නොයෙක් සියගණන් සංඝයා වහන්සේගෙන් ආකීර්ණ ව තිබෙන්නේය: එහි වනාහි භික්ෂූන් වහන්සේගෙන් ආහාර සිඟා ගෙන එයින් ම ජීවත් වෙමින් කුරුදෙවය යි යන දුප්පත් මිනිසෙක් වාසය කෙරෙයි. එතෙම බත් අනුභව කොට ලා ඒ ඒ තෙන මළුකොන්වල ගෘහච්ඡායා රුක් මුල් ආදියෙහි වැදහෙව නිදමින් දවස් යවයි: මළු හැමදීම් මල් පිදීම් ආදි වූ කිසිවකුත් නොකෙරෙයි: මෙසේ වසන්නාවූන්හට[4] බොහෝ කාලයෙක් ඉක්මිණ. ඉක්බිති මෑත භාගයේ ඒ විහාරයෙහි වසන්නාවූ සංඝස්ථවිරයන් වහන්සේ දවසෙක විහාරචාරිකාවෙහි ඇවිදිනාසේක් ඒ කුරුදෙව නම් මිනිසා බඩපුරා බත් අනුභව කොට ගසමුල[5] වැදහෙව නිදන්නා දැක "මේ මිනිසා මෙයින් මිය ගොස් කොයි උපදී දෝ හෝ යි දිවසින් බලනසේක් එයින් සත්වන දවස් ඒ ආත්මභාවයෙන් චුත ව නරකාදියෙහි උපදනා[6] දැක ඔහු පුබුදුවා සමීපයට කැඳවා අවවාද කරනසේක්:

නත්ථි තුය්හං පිතා මාතා - භාතා භගිනි බන්ධවා,
පුබ්බෙ අකතපුඤ්ඤස්ස - භවෙ තං ලක්ඛණං තව.
අභිරූපො සුවණ්ණො'සි - අඩ්ඪොද්'සි අනාළ්හිකො,
පුබ්බෙ අකතපුඤ්ඤස්ස - භවෙ තං ලක්ඛණං තව.
දුන්නිවත්ථො'සි හො දනි - සහයූක කුචෙලකො,[7]
පුබ්බෙ අකතපුඤ්ඤස්ස - භවෙ තං ලක්ඛණං තව.

---

1. කම්මංහි - ක.කි.ඥ.ම.
2. මහානෙල - CEGHKL
3. ගම් - DEJ
   ගම - C
   මිය - BK
4. වසන්නාවූ මිහට - BGHKL ම
5. ගසක් මුල -CGHKL ම.ස
6. උපදිනා බව - BEGHKL
7. කුචෙලකං - BCEDGHKL

Non-Commercial Distribution

කිලඤ්ජම්පි[1] 'න සෙය්‍යථා - සදා[2] සෙය්‍යා ඡමා[2] ච තෙ,
පුබ්බෙ අකතපුඤ්ඤස්ස - භවෙ තං ලක්ඛණං තව.

යනාදීන් "එම්බා තොපගේ මවුපිය කෙනෙකුත් නැත; බෑබුන්[3] කෙනෙකුත් නැත: අන් කිසි බන්ධුවර්ගී[4] කෙනෙකුත් නැත: තෙසු රන් රන්රන් තබා එක් වේලක යපීගන්නා[5] තරම් සාල් නැළියක් පමණකුත් නැත: උදක් ඉනිකුණන්ගෙන් ගැවසී ගත්තාවූ කුනු රෙදි කඩක් ඇඳගෙන වැතිර ගන්නා පැදුරු කඩක් පමණකුත් නැති ව ඒ ඒ තැන බිම වැදහෙව නිඳති.[6] එසේ නිද පිබිදුණු වේලෙහි පවා අනික් කරන කියන සුචරිත ධර්මයකුත් නැත: ඇම වේලෙහි ම ආහාරතෘෂ්ණාවෙන් දවස් පතා කබලක් ගෙන ගෙයක් ගෙයක් පාසා සිහා ඇවිදත් කුස යැපෙන පමණ අහර නො ලැබ ඇටසැකිලි ප්‍රෙතයකු සේ[7] අස්තිචර්මාවශෙෂ ශරීර ඇති ව ඇවිදිනාවූ තෙපි මිහිරි ආහාර අනුභව කරන්නාවූ කුසල් කළවුන් දැක කෙළ ගැල ගැල ගෙදෙරවල බල බලා සිටිත්.[8] සමහර දවසෙක කිසිවකුත් නොලැබ සුසුම් ලා කදුළු මුසු මුහුණු ඇති ව ශොකයෙන් වැති වැනී ආහාරයෙක් ලැබෙයි යන ආසාව හැර යන්නෙහි ය: මෙසේ දුක් විඳිමින් සිටත් ඉදිරියටත් පිහිට වන කුශලයක් කොටගත නොහෙයි: අනේ තා සේ වූ ආත්මද්‍රොහියෙක් භවත්‍රයෙහි නැතැ"යි වදළසේක. මෙසේ තෙරුන්වහන්සේ වදළ අවවාද වචනය අසා කුරුදෙවයා කියනුයේ:

නිධනො කපණො දීනො - කරිස්සං කුසලං කථං
වුඨෙඨා භනෙත මයාචිකඛ - [යමහං[9]] ගච්ඡාමි නිබ්බුතිං.

යනාදීන් "සවාමිනි, කිසි වස්තුවක් නැති[10] කෘපණ ව බැගෑපත් ව සිහා ලද ආහාරය නිසා දුඃඛදරිද්‍රයෙන් ජීවත් වෙමින් සිට කෙසේ කුසල් කෙරෙම් ද? මේ දරිද්‍රභාවයෙන් මිදී යම්කිසි උපායකින් ස්වර්ගමොක්ෂසම්පත් ලැබේ ද ඊට සුදුසු උපායක් වදළ මැනවැ"යි කීය. එසේ විචාළ කුරුදෙවයාට කුසල් කිරීමට උපාය දක්වන තෙරුන් වහන්සේ:

කීළනති නිමිසා එත්ථ - නජ්ජායං[11] ජලගොචරා
පාඨීනා පාවුසා සිඞගු - සවඞ්ගා රොහිතාදයො.

---

1. කිලජ්ජම්පි - BCDEGHKL
2. සෙය්‍යථො - BCDEGHJ
සෙය්‍යථො සද - KL
3. බෑබු - DEJ බෙ. ස.
4. වර්ගබන්ධු - BCDEGHJKL
5. පිසගන්නා - D. මුද්‍රිත හැම
යපියගන්නා - ස.
6. නිදව - BGHL ස.
7. මෙන් - KL බෙ. ස.
8. සිටත් - E
සිටින්නෙහිය - ම.
9. මයාං - පිටපත් හැම
යමහං - මුද්‍රිත හැම. පාලි
10. නැත - J, ක. කි. ඥ. ම.
11. නජ්ජා -BCDEGHJKL
නජ්ජාය - බෙ.

Non-Commercial Distribution

ත්වං හො භික්ඛිතකං භත්තං - ගහෙත්වා භුත්තසෙසකං.
මච්ඡානං දෙහි දනානි - තං තෙ සග්ගසුඛාවහං.[1]

ගහෙත්වා පඤ්චසීලානි - පාලය ත්වං[2] සුනිම්මලං.
අලං තෙ භවභොගත්ථං - නිබ්බාණත්ථං ච තං අලං.

යනාදීන් "එම්බල, තෙල ගඞ්ගාවෙහි ජලය ම ගොදුරු කොට වසන්නාවූ පෙටියෝය ලුහුල්ලුය සුංගෝය තෙලියෝය රෙහෙමස යනාදි වූ මච්ඡජාතීහු ඔබිනොබ කෙළ ඇවිදිති. උදක් බලා සිටිනාවුන්ට පවා සන්තොෂ එළවති;[3] එසේ ඇවිදිනා මච්ඡයන්ට තොප සිහා ගත් බතින් අනුභව කොට ඉතිරි ව ගිය භුත්තාවශෙෂය දන් දෙව; ඒ ම තොපට ස්වර්ගමොක්ෂ සම්පත් ගෙනහැර දෙයි. තව ද පන්සිල් ඇරගෙන ඉඳුරා නිර්මල කොට රක්ෂා කරව; ඒ තොපට සියලු භවභොගසම්පත් සාධා කෙළවර අමාමහ නිවනුත් ගෙනහැර දෙන්නේය"යි වදළසේක.

එකල කුරුදෙවයා තෙරුන් වහන්සේගේ වචනය අසා පහන් සිත් ඇති ව තෙරුන් වහන්සේ වැඳ පන්සිල් ගෙන එතැන් පටන් බත් අනුභව කරන වේලෙහි එක් බත් ආලොපයක් ඇර ගෙන තබා සිත් පහදවාගෙන මච්ඡයන්ට දන් දෙයි;[4] එපමණ කුසල් කොට ඒ සත්දවස ඇතුළත එයින් චුත ව මෙම ලඞ්කාද්වීපයෙහි මාගම සමීපයෙහි පිටිසර ගමෙක බොහෝ සම්පත් ඇති කෙලෙඹියාණ කෙනකුන්ට පුත් ව උපන. ඕහට නම් තබන මඟුලෙහි මහජනයෝ මහනෙල් මිටි ගෙනාහ; එම කාරණය ගෙන ඕහට මහනෙල් කුමාරයෝය යි නම් තුබූහ. ඔහුගේ වැඩිමහලු සබෑකෙනෙක් ඇතියහ. ඒ මහනෙල් නම් කුමාරයා ක්‍රමයෙන් වැඩී රූපශොභාවෙන් හා මහත් වූ ශරීරබලයෙන් යුක්ත වීය. එසේ බල ඇතත් කිසි කර්මාන්තයක් නොකෙරෙයි; එකාවන් ව ඉස් ශොධමින් නහමින් වස්ත්‍රාභරණයෙන් සැරහී කා බී කෙළි නළුයෙහි යෙදී සැපසීලි ව හිඳිනේය; දඬබිමෙහි[5] කළමනා දෙයින් කිසිවකුත් නොකෙරෙයි; එසේ හෙයින් අනික් සබෑයෝ දෙමවුපියන් සමීපයට ගොස් "නුඹගේ පුතණුවෝ මහනෙලයෝ ගොවිතැන් වෙළෙඳාම් ආදි වූ කිසි වැඩකුත් නො කොට ගෙට වැදලා බිජුවට රකිනා කිකිළියක් මෙන් වැදහෙව නිදති. අපි ඇම මෙහෙවර කොට දුක් විඳුම්හ. ඌ තමා ඉදිරියේ දවස කෙසේ ජීවත් වේ දැ"යි[6] කීහ. එබස් අසා දෙමවුපියෝ මහනෙලයන් කැඳවා "එම්බා, තෙපි කුමක් නිසා[7] මෙහෙවර නොකරා ද? වෙළෙඳම් නවාම් ආදි වූ කිසිවකුත් නොකොට ඉදිරියේ දවස කෙසේ වංශවර්ධනය කරව් දැ"යි යනාදීන් අවවාද

1. සුඛාවහා - පිටපත් හැම
2. පාලයන්තං - ක.කි.සැ.ම.
3. එලවයි - CDJ, මුද්‍රිත හැම. ස.
4. මච්ඡයන්ට දන්දෙව - BCDEGH
5. මඩබිමෙහි - ක.කි.සැ.
6. වෙත් දැ යි - J ක.කි.සැ.ම.
7. පිණිස - BEHJKL ක.කි.සැ.ම.

Non-Commercial Distribution

කීහ. එබස් අසා මහනෙලයෝ කියන්නාහු "පියාණන් වහන්ස, පිරිමි නම් වෙළෙඳම් නවාම් ආදි යම් කාරිය[1] නොකෙරෙති:[2] මම වනාහි බලවත් වූ පුරුෂයන් කෙරෙහි ඇතුළතිමි. එසේ හෙයින් මෙහෙවර කිරීමට සුදුස්සෙක් නොවෙමි"යි[3] කීහ. ඉක්බිති ඔහුගේ දෙමවුපියෝ එබසට නොසතුටු ව "එසේ වී නම් තොපට සුදුසු කටයුත්තක් සලස්වා ලම්හ"යි කියා ඔහු කැඳවා ගෙන මාගමට ගොස් දුටුගැමුණු රජ්ජුරුවන් දැක "දේවයන් වහන්ස, මේ මහනෙලයා දේවයන් වහන්සේ සමීපයෙහි වසන්ට සුදුසු ය; මොහු හස්තිශිල්පාදියෙහි දක්ෂ කරවා ගත මැනවැ"යි රජහට පාවා දී තමන් වසන ගමට ම ගියාහ. රජ්ජුරුවෝ යහපතැ යි ගිවිස මහනෙලයන් කැඳවා මහවැලි වීථියෙහි[4] ඔහුගේ ම නැදිමයිලන්ගේ ගෙයි වසන සේ නියොග කොට ඕහට බත් පිළී හා[5] තෙසු බොහෝ සම්පත් දුන්හ.

එතැන් පටන් ඒ මහනෙලයෝ අප්‍රමාද ව රාජසේවය කෙරෙති: එයින් මැනබාගයෙහි නක්ෂත්‍රපාඨකයෝ චන්ද්‍රග්‍රහණ සූර්‍ය්‍යග්‍රහණ නක්ෂත්‍රපීඩා ආකාශගර්ජිතා උල්කාපාත දිග්දහ භූමිකම්පාදි වූ අනිෂ්ට නිමිත්තක්[6] දැක රජ්ජුරුවන් සමීපයට ගොස් දේවයන් වහන්ස, ඉදිරියේ දවස සාගත භයක් වන්ට කාරණ පෙනෙ"යි කීහ. එබස් අසා රජ්ජුරුවෝ ඒ ඒ තැන වැව් අමුණු බඳවා නොපමා ව ගොයම් බත් කරවන සේ රාජ්‍යවාසීන්ට නියොග කොට තුමූ ද උදලු කැති පොරෝ ආදි වූ කර්මාන්ත උපකරණ ගෙන්වාගෙන ගොසින් තමන් සිය අතින් ඇළඅමුණු බඳිමින් ඒ ඒ තැන අමුතු ඇළ බඳිමින් ලියදි[7] තනමින් මියර බඳිමින් මෙසේ ගොයම්බත් කරවීමෙහි ම ව්‍යාපෘත ව වෙසෙති.

ඉක්බිති එක් දවසෙක රජ්ජුරුවෝ උදැල්ලක් ඇරගෙන ගැඹුරු ඇළක් බිඳිනාහු දෙකිසිල්ලෙහි අත බැඳගෙන සිටියාවූ මහනෙලයන් දැක "එම්බල සගය කුමක් පිණිස බලා සිටී ද? මා හා සමඟ මේ ඇළ බිඳිනට පලා වර"යි කැඳවූහ. එබස් අසා මහනෙලයා කියනුයේ:

නෙදිසං මාදිසා රාජ - පුරිසා කම්මං කරොන්ති හි,
ඊදිසානි හි කම්මානි - පුරිසානං න සොභති.
කරිනං මත්ථලුඞ්ගස්ස - ලුඩො උත්තමකෙසරී,
පීළිතොපි ජිඝච්ඡාය - කිනනු සො ඛාදතෙ තිණං-යි.

---

1. කාරියක් - J
2. කෙරෙහි - CD බෙ.
3. නොවෙයි - J ක.කි.ඤ.ම.
   කිරීම මට සුදුසු දෙයෙක් නොවෙයි - KL
4. වීථියෙහි ම - CDEJ
5. ආදි - ක කි.ඤ.බෙ.ස.
6. නිමිත්තෙක් -ස
7. ලන්දිය - GHK

Non-Commercial Distribution

යනාදීන් "දේවයන් වහන්ස, මෙසේ වූ මෙහෙවර අප සේ වූ පුරුෂයෝ නොකෙරෙති: මෙසේ වූ කාරිය අප වැනි පුරුෂයන්ට හොබනා දෙයක් නොවෙයි: මත්තහස්තීන්ගේ කුඹු පළාගෙන මේදස[1] හෙවත් ඇතුන්ගේ හිස්මුල් අනුභව කිරීමෙහි නියුක්ත උත්තම වංශ ඇති කෙශරසිංහරාජයෝ සයින් විඩාව ගිය යි ගෙරින් මීවුන් සේ තණ කා ඇවිදිද් දැ"යි කීය.

මෙසේ ද කියා "දේවයන් වහන්ස, මෙබඳු කටයුතු පුරුෂයෝ නොකෙරෙති. නුඹවහන්සේගේ[2] සෙසු පුරුෂයන් කරන කාරිය මා ලවාත් කරවාගත මැනවැ"යි කීය. එබස් අසා රජ්ජුරුවෝ මහනෙලයන්ට කිසිවකුත් නොකියා තමන් කරන මෙහෙවර ම කළාහුය. ඉක්බිති එක් දවසෙක රජ්ජුරුවෝ අනුරාධපුරයෙහි තමන්ගේ යහළු වූ වෙළෙඳණ කෙනෙකුන්ට පතක් ලියා මහනෙලයන් කැඳවා "එම්බා දරුව, වහා ගොස් මේ පත දී ඒ වෙළෙඳණන් දුන්[3] දෙයක් ඇරගෙන පලා එව"යි කියා පත දුන්හ. එකල මහනෙලයා රජ්ජුරුවන් වැඳ පත ඇරගෙන තමාගේ ගෙට ගොස් බත අනුභව කොට මහට බත්මුලක් බැඳගෙන උදයනක් සේ දිගාමඩුල්ලට ගොස් එයින් නික්ම මහවැලිගඟ වඩමන් නම් තොටදී දැහැටි කා මුව ශුධ කොට ගෙන ගිය බත් අනුභව කොට මහාපාලි නම් දන්හල සඞ්ඝයා වහන්සේ අහර වළඳන්නාට[4] පළමු අනුරාධපුරයට ගොස් වන. මෙසේ යුහු ව ගොස් ගෙන ගිය පත වෙළෙඳණන්ට දී" කියා එවූ පඬුරු[5] නොපමා ව සපයා තිබුව මැනවැ"යි කියා අනුරාධපුරයෙහි සිට පස්යොදුන් මහ ගෙවා ගෙන මුවදොර[6] ගොස් තමන් පියාණන්ගේ යහළුවකු දැක එතැන්හි බත් අනුභව කොට පෙරලා අනුරාධපුරයට ඇවිත් වෙළෙඳණන් දුටුයේය. එකල වෙළෙඳණෝ නානාවර්ණ විචිත්‍ර වස්ත්‍ර පන්සියයක් හා කස්තුරු කපුරු අගරු සඳුන් ආදි වූ සුවඳ බඩු ද දුරු මිරිස් ආදි වූ කටුක භාණ්ඩ[7] බෙහෙත් ද ගෝනකය පටලිකය[8] උද්දලොමිකය එකන්තලොමිකය පාවාරය යනාදි වූ නොයෙක් සයනාසන භාණ්ඩ ද සපයා දුන්හ. මහනෙලයෝ ඒ සියල්ල ම එක් කොට බැඳ අතින් එල්වාගෙන සිටියහ: ඒ සියල්ල ම එක් ව නවාමුණක් පමණ බඩු[9] බර ඇත්තේය: ඒ හැම මහනෙලයෝ වමතින් එල්වාගෙන එම විට පිටත් ව එදවස් ම ගොස් පවස මාගමට වැද ගෙන ගිය පඬුරු රජ්ජුරුවන්ට දැක්වූහ. එකල රජ්ජුරුවෝ ඕහට සතුටු ව සොළොස් දහසක් කහවනු හා ගම්බිම් ආදි වූ අනිකුත් බොහෝ සම්පත් දුන්හ. එතැන් පටන් මහනෙලයෝ රජ්ජුරුවන්ට සේවය කරන්නාහු දෙමළ

1. මේදය - ක.කි.කෑ,ම.
   මේජය - J
   මොජස - KL
2. නුඹගේ - BDEGHJKL
3. කී දුන් - BGHL
4. ගන්නාට - BCDEGHKL
5. දේ - KL
6. ගොනමුවදෙර - ම.
   ගොනගාමං - පාලි
7. භාණ්ඩ ද - ම
8. පාටලිකය - පිටපත් හැම.
9. බඩු (නැත)- EGKL ම.

Non-Commercial Distribution

යුධයෙහි ජයගෙන දී රජ්ජුරුවන් හා සමඟ දන් දෙමින් සිල් රකිමින් පොහොය පෙහෙවස් රකිමින් ජීවිතාන්තය දක්වා මෙසේ කුසල් කිරීමෙන්[1] දවස් යවා එයින් චුත ව දෙව්ලොව උපන්හ.

මෙසේ මහනෙල නම් යොධයා අතීතජාතියෙහි සිල් සමාදන් ව මත්ස්‍යජාතීන්ට ස්වල්පමාත්‍ර වූ දනයක් දී ඒ කුශලානුභාවයෙන් දෙවන ජාතියෙහි මේ මිනිස්ලොව ඉපද එබඳු වූ ශක්ති සම්පත්තියක් හා භොග සම්පත්තියක් ලැබ නැවතත් බොහෝ කුසල් කොට ගෙන පහනින් පහනට යන්නා සේ සප්තවිධ කාමස්වර්ගයට ඇතුළු වූ[2] මිනිස්ලොවින් දිව්‍යලොකයට ගියහ. එබැවින් දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා නිවන් සම්පත් කැමැති සත්වයන් විසින් තම තමා ශක්තිපමණින් දනශීලාදි කුශලසම්භාරයන් රැස් කළ මැනැවි. කියන ලදුයේ මැයි:

සීලං සමාදය පරිත්තදනං
දත්වා 'තිමෙසානම'න්තකාලෙ
නෙලො ඉධෙවං විපුලං ච භොගං.
අලත්ථ සග්ගූපගතො[3] අහොසි-යි.

මේ මෙහි සතර වන
මහනෙල වස්තුව ය.

තව ද මෙහි පස් වන චූළතිස්ස වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්:

යට දුෂ්ටග්‍රාමණී වස්තුයෙහි කී පරිද්දෙන් එකොළොස් දහස් එක්සිය දශමහායොධයන්[4] ඇතුළු වූ මහසෙනඟ පිරිවරා සෙනාවාහන සන්නාධ ව මියුගුණෙහි පටන් දෙමළ දෙතිස් කඳවුරෙන් එකෙකී[5] කඳවුරෙහි දෙතිස් දෙතිස් දහස් බැගින් ඇති ලා උන් දශලක්ෂ සූවිසිදහසක් පමණ දෙමළ මහසෙනඟ සාධා ලංකාරාජ්‍යය එක්සත් කොට ඔටුනු පැළඳ දුටුගැමුණු රජ්ජුරුවන් අනුරාධපුරයෙහි සැප සේ වැස රාජ්‍යය කරන කල්හි රජ්ජුරුවන්ට තිස්ස නම් වූ චූලොපස්ථායකයෙක් අභ්‍යන්තර පක්ෂපාත ව රාජ කටයුතු කෙරෙයි. එකල රජ්ජුරුවන්ගේ මඟුලැතා පය බැඳි යදම හා බැඳ සිටුවූ කඹය බිඳගෙන නැගෙනහිර බලා ගොස් බැදි වැද[6] ඉන් සල්[7] බෝගස් ආදිය සිඳ බිඳ හෙළා කමින් ක්‍රමයෙන් මහනඳුරු නම් විහාරයට ගොස් රුක්ඛමූලශූන්‍යාගාරාදී වූ ඒ ඒ තැන වැඩහිඳ ධ්‍යාන භාවනා කරන්නාවූ ධූතාඞ්ගධර භික්ෂූන්වහන්සේ දැක පහන් සිත් ඇතියාව ඒ භික්ෂූන් වහන්සේට ඵලාඵල ආදිය ගෙන හැර පිළිගන්වා උපස්ථාන කෙරෙමින් එම විහාර සමීපයෙහි වාසය කෙළේය.

---

1. කරමින් - H
2. ස්වර්ගයෙහි ඇතුළත් වූ - ම.
3. මග්ගූපගතො - BGHKL
4. එකොළොස් යොධයන් - ම.
5. එකි එකී - CHL ක.කි.සැ.ම.
6. බැදි වැදුණේ - ක.කි.සැ.ම.
7. සලු - BCDEGHKL

Non-Commercial Distribution

රජ්ජුරුවෝ ඇතු ගිය අත් නොදැන[1] පරීක්‍ෂා කරන පිණිස අමාත්‍යයන් ඒ ඒ අත මෙහෙයන්නාහු චූලොපසථායක තිස්ස නම් අමාත්‍යයා නැඟෙනහිරි දිග් බලා නික්මවූහ. සෙසු තැන්[2] දසාවට ගියාහු ඇතු නොදැක පලාහ: ඒ තිස්ස නම් අමාත්‍යයා ගම් නියම්ගම් පිළිවෙළින් බලා ඇවිදිනේ එම මහනදුරු නම් විහාරයට පැමිණියේය. ඒ විහාරයෙහි රුක්ඛමූලිකඞ්ගය රක්නා භික්‍ෂූන් වහන්සේ එතැන්හි ගස්මුල් වැද හිඳ[3] භාවනා කරනසේක: එසේ ම අබ්භොකාසිකඞ්ගය රක්‍ෂා කරන[4] භික්‍ෂූන් වහන්සේ විහාරයෙහි ජනශූන්‍යයේ[5] ඒ ඒ තැන[6] වැඩහිඳ අසුභ භාවනා කරන සේක. පංසු කූලිකඞ්ගය රක්නා භික්‍ෂූන් වහන්සේ මණිවර්ම වර්මිත වූ එකචාරික ගන්‍ධ හස්ති රාජයන් සේ එ ඒ තැන වැඩ හිඳ නීලපීතාදි වූ කිසුණු භාවනා කරනසේක: සොසානිකඞ්ගය රක්නා භික්‍ෂූන් වහන්සේ මරණානුස්මෘති භාවනා කෙරෙමින් ඒ ඒ තැන අමුසොහොන් ආදියෙහි වාසය කරන සේක: පිණ්ඩපාතිකඞ්ගය රක්නා භික්‍ෂූන් වහන්සේ මෙත්තා කරුණා මුදිතාදිය භාවනා කිරීමෙන් ඒ ඒ තැන්හි වාසය කරන්සේක නෙසජ්ජිකඞ්ග එකාසනිකඞ්ගාදිය රක්නා භික්‍ෂූන් වහන්සේ ඒ ඒ තැන්හි වැඩහිඳ නිරන්තරයෙන් බුද්ධානුස්මෘති භාවනාවන්[7] භාවනා කරනසේක. මෙසේ සිල්වත් ව ගුණවත් ව බුදුන්ගේ අනුශාසනා වූ පරිද්දෙන් පිළිපදිනා භික්‍ෂූන් වහන්සේ වසන විහාරයට පැමිණියාවූ ඒ චූළතිස්ස නම් අමාත්‍යයා භික්‍ෂූන් වහන්සේ වැඳ එකත්පස් ව සිටියේය. එසේ හෙයින් කියන ලදී;

තහිං තහිං රුක්ඛමූලෙ - නිසින්නා රුක්ඛමූලිකා
භාවෙන්ති භාවනා යත්‍ථ - විහාරොපවනෙ සුභෙ
තස්මිං තස්මිං විහාරස්මිං - අබ්භොකාසික භික්ඛවො
සුඤ්ඤාගාරෙ භිරමන්ති[8] - ගහෙත්වා භාවනං සුභං.

එක චාරික හත්‍ථීව - මණිවම්මෙන වම්මිතා
කසිණාදයො විභාවෙන්තා - රමන්ති පංසුකූලිකා
සීලවන්තා ගුණවන්තා - බුද්ධසාසනකාරකා,
නිවසන්ති යහිං තත්‍ථ[9] - සම්පත්තො චූළතිස්සකො-යි.

මෙසේ චූළතිස්ස නම් අමාත්‍යයා සඞ්ඝයා වහන්සේ වැඳ ආදර දක්වා සිටි කල්හි කඩුලැතා විලිකුන් ඵල සහිත වූ තර අතු කඩා ගෙනවුත් භික්‍ෂූන් වහන්සේට පිළිගන්වයි: අමාත්‍යයා දැක "මෙසේ චණ්ඩ පරුෂ වූ මිනී මරන තිරිසන් ඇත්තු පවා ගුණවතුන් වහන්සේගේ ගුණයෙහි පැහැද වතාවත් කෙරෙති: මේ භික්‍ෂූන් වහන්සේ ද නොයෙක් ව්‍රතසමාදනයෙන් යුක්ත ව මහණධම් පුරා මස්තක ප්‍රාප්ත කොට තම තමන් වහන්සේත් සංසාර දුඃඛයෙන් ගැළවී ප්‍රත්‍යයදායකයනුත් සසරදුකින් ගොඩනඟනසේක: අහෝ බුදුන්ගේ ගුණ ගෙන වසන බුදුසවුවන් වහන්සේගේ ගුණමහිමයක් ආශ්චර්‍ය්‍ය නියා ය"යි විස්මයට පැමිණියේ ය. හේ එසේ මැයි:

---

1. නොදැක - ක.කි.ඤ.ම.
2. තුන් - BCDEGHKL
3. ගස්මුල්හි වැඩහිඳ - BCEGH.
   ගස්මුල්වල වැඩහිඳ - KL
4. රක්නා - KL
5. ජනශූන්‍ය වූ - KL, ස.
6. එක් තැනෙක - DEJ. බෙ.ම.ස.
7. ආදි දශානුස්මෘති භාවනාවන් - ම.
8. සුඤ්ඤාගාරෙහි රමන්ති - ස
9. යත්‍ථ - පිටපත් හැම

Non-Commercial Distribution

ප්‍රත්‍යය ලාභයෙහි අල්පෙච්ඡ වූ සන්තුෂ්ට වූ විවේකකාමී වූ පිරිසුදු වූ සිල් ඇති තපස්විවරයන්ගේ පවිත්‍ර වූ උත්තම ස්වභාවය දුටු කල කවර නම් කෙනකුන්ට ප්‍රීති නූපදනේ ද ඒකාන්තයෙන් ම චිත්තප්‍රීති උපදනේ මැයි. එසේ හෙයින් කියනලදි:

අප්පිච්ඡ සන්තුට්ඨ විවේක කාමිනං
තපොධනානං පරිසුද්ධ සීලිනං
දිස්වාන පූතං මධුරං සභාවං
න කස්ස චිත්තස්ස කරොති පීතිං-යි.

ඉක්බිති අමාත්‍යයා සඞ්ඝයා වහන්සේ වැඳ රජ්ජුරුවන් සමීපයට ගොස් "දේවයන් වහන්ස, කඩුලැතා[1] දුටිමි: ඒ ඇතා ගොසින් දැන් මහනදුරු විහාරයෙහි සඞ්ඝයා වහන්සේට වතාවත් කෙරේ"යි කීය. එබස් අසා රජ්ජුරුවෝ "සගය, තෝ ම නැවතත් ගොස් ඇතා ඇරගෙන පලා වර"යි කියා ඕහට ම භාර කළාහ. ඒ ද යහපතැ යි ගිවිස බොහෝ උක්සකුරු ආදිය ගෙන්වා ගෙන විහාරයට ගොස් විළිකුන් කර ඒල ගෙන්වා ගෙන උක්සකුරු හා සමඟ යොද පැන් මිරිකා ඒ භික්ෂූන් වහන්සේ වළඳවා පහන් සිත් ඇති ව[2] කඩුලැතා ඇරගෙන නුවරට ම ගියාහ.[3]

ඒ අමාත්‍යයා මෙපමණ කුසල් කොට එයින් චුත ව මෙම ලඞ්කාද්වීපයෙහි උතුරුදිග අඹවිටි නම් ගම බොහෝ සම්පත් ඇති උතුම් වූ කුලගෙයක උපන්නේය. දෙමවුපියෝ ඕහට තිස්සය යි නම් තුබූහ: එතෙම පසුව වැඩිවිය පැමිණ තමාට සුදුසු කුමාරිකාවක හා සමඟ වාසය කරන්නේ නොබෝ කලකින් ගිහිගෙයි කළකිරී විහාරයකට ගොසින් තමාගේ අභිප්‍රාය[4] කියා භික්ෂූන් වහන්සේගේ[5] සිත්ගෙන මහණ ව ප්‍රතිපත්තිසාර තිස්ස තෙරුන් වහන්සේය යි ප්‍රකාශ ව[6] වසනසේක් මෑතභාගයෙහි ජයමහා බොධීන් වහන්සේ වඳනා පිණිස යන්නාවූ භික්ෂූන් වහන්සේ හා උපාසකවරුන් හා සමඟ නැවු නැඟී නික්මුණුසේක. එකල ඒ නැවින් යන්නාවුන් අතරමඟ නහන බොන පිණිස ගෙනගිය මිහිරි ජලය නිමාවට ගියේය: එකල්හි තිස්ස නම් තෙරුන් වහන්සේ පිපාසිත ව පැන් පරීක්ෂා කොට මිහිරි පැනක් නැති හෙයින් පිපාසා ඉවසිය නොහී පාත්‍රය බහා මුහුදින් කරදිය උකා ගෙන වළඳන්ට පටන්ගත්සේක: එකෙණෙහි ඒ කරදිය පෙරළී උන්වහන්සේගේ කුශලානුභාවයෙන් මධුර රසයෙන් යුක්ත වූ කකාළ උක්පැණි සේ රසවත් විය. අහෝ ස්වල්ප වූ කුශල කර්මයාගේ ආශ්චර්‍යවීමත් වූ අද්භූත වූ ඇසූ ඇසුවන් ලොමු දැහැගන්නා තරම් ආනුභාව මහත්ත්වයක් ඇසුව මැනවි. යට ගිය ජාතියෙහි සඞ්ඝයා වහන්සේට සකුරු පැන් පමණක් දන් දී උන්වහන්සේ මුහුදු කරදිය දක්වා මිහිරි කරවා මෙසේ මුළුලෝ විස්මය කැරවූ සේක. කියනලදුයේ මැයි:

අහො අච්ඡරියං එතං - අබ්භුතං ලොමහංසනං
අප්පස්ස පුඤ්ඤකම්මස්ස ආනුභාව මහන්තතා.
අතීතෙ භික්ඛුසඞ්ඝස්ස - දත්වාන සක්ඛරොදකං
ලද්ධො සො'දධිපානීයං - මධුරං පරිවත්තිතං-යි.

1. කඩොලැතා - CDEHKL
2. සිත් ඇති ව - KL
3. ගියේය - ම.
4. අභිප්‍රාව - පිටපත් හැම
5. භික්ෂූන් වහන්සේ - BEGHKL
6. ප්‍රසිද්ධ ව - ක.කි.ඤ.ම.

Non-Commercial Distribution

ඉක්බිති උන්වහන්සේ පැන් වළඳ නැවින් යන්නාවූ සියල්ලවුන්ට ම පැන් දුන්සේක: ඒ පැන් සියල්ල ම දෙවියන්ගේ දිව්‍යපානයක් හා සමානය. මධුර[1] රසයෙන් යුක්තය: ඔජාවන්තය. කෙතෙක් දෙනා පැන් පුවත් අඩු නොවන්නේය: ඒ භික්ෂූන් වහන්සේ හා මහාජනයෝ ශ්‍රී මහා බොධීන් වහන්සේ වඳින්ට යන ගමනේ ද නැවත එන ගමනෙහි ද එම පැන් අනුභව කළාහු මය. එතැන් පටන් උන්වහන්සේ ජීවිතාන්තය දක්වා බොහෝ කුසල් කොට එයින් ගොස් දිව්‍යලොකයෙහි දෙළොස් යොදුන් රුවන් විමනෙක ඉපද දහස් ගණන් දෙවඟනන්[2] පිරිවරා නෘත්‍ය ගීත වාද්‍යයෙන් මහත් වූ දිව්‍යසම්පත් විඳින්ට පටන් ගත්හ. ඕහට පළමු ජාතියෙහි දුන් පරිද්දෙන් ම සක්ඛරෝදකය දිව්‍යලොකය මනුෂ්‍යලොකය යන ඇමතන්හි ම නිරන්තරයෙන් අත් නොහැර පැවැත්තේ මය. එසේ හෙයින් දිව්‍යලොකයෙහි ද දිව්‍යපානය[3] සැළවල් පුරා ඒ ඒ තන්හි තිබෙන්නේය: ඔහු සමීපයට ආවාවූ දෙවතාවෝ හැමදෙන ම එයින් දිව්‍යපානය කොට[4] සන්තොෂ ව නට නටා ගී කිය කියා කෙළ කෙළ තම තමන්ගේ දිව්‍යවිමානවලට එයින් දිව්‍යපානය සැළවල් පුරා ගෙන යන්නාහ: මෙසේ ඒ දිව්‍යපුත්‍රයාහට මෙබඳු ආනුභාව සම්පන්න වූ මධුර රසයෙන් යුක්ත පානීය භාජන පහළ විය.

මෙසේ මේ ලොකයෙහි ශ්‍රද්ධාවන්ත සත්වයෝ ස්වල්පමාත්‍ර වූ පානීයදාන මාත්‍රයකින්[5] පවා ප්‍රමාණාතික්‍රාන්ත වූ දිව්‍ය මනුෂ්‍ය සම්පත් ලබන්නාහු මය: බොහෝ වූ අන්නපාන ආදිය දන් දුන්නාවූ සත්වයන් ලබන්නාවූ විපාක විශෙෂය කවරෙක් නම් කියා නිමවා ද: මේ මෙතෙකැ යි කියා නිමවිය නොහෙන්නේ මය. කියනලද්දයේ මැයි,

පානීයමත්තම්පි කෙව් ලොකෙ
එවං මහන්තං විභවං ලභන්ති,
බහුප්පදානස්ස නරස්ස ලොකෙ
වදෙය්‍ය කො නාම මහාවිපාකං-යි.

මේ මෙහි පස් වන
චූළතිස්ස වස්තුව ය

මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි
ප්‍රසාදෙව වර්ග නම් වූ

සොළොස් වන පරිච්ඡෙදය නිමි.

---

1. මධුර වූ - H
2. දිව්‍යසේනාහ - C
3. දිව්‍යප්‍රණීතය - BCGHKL
4. පානය කොට - KL
5. ස්වල්පමාත්‍රයක් පානීය දානමාත්‍රයන් - ක.සි.ස.
   ස්වල්පමාත්‍ර වූ පානීය දානමාත්‍රයකින් - DJ

Non-Commercial Distribution

තව ද මේ සද්ධර්මාලංකාරයෙහි සතළොස් වන සාලිරාජ වර්ගය නම් කවර යත්. එහි පළමු වන සාලිරාජ වස්තුව මෙසේ දතයුතු. කෙසේ ද යත්:

යට ගිය දවස මෙම ලංකාද්වීප නමැති අඞ්ගනාව ගෙලෙහි[1] පළඳනා මුක්තාහාරයක් බඳු වූ මහවැලි ගං සමීපයෙහි මුණ්ඩවාක නම් ගමෙක් වීය, එ ගම්හී තිස්ස නම් වූ නැවැම්යෙක් වෙසෙයි; ඕහට සුමනා නම් නැවැම්දුවක් භාර්‍යා වුව; ඔහු දෙදෙන ම සැදැහැ ඇතියහ; යම් කිසි මධුර ආහාරයක් ලද්දහු නම් දන් නොදී නොකන්නාහ; එක් දවසෙක වැද්දෙක් ඌරකු මරා ගෙනවුත් මේ ඌරුමාංසය කම්ාන්ත මිල පිණිස දෙම් යි තිස්සයන්ට දින. එකල තිස්සයෝ සිතන්නාහු "මාගේ මේ කම්ාන්ත මිලය දැහැමෙන් සෙමෙන් ලබනලද, එසේ හෙයින් පළමු කොට දන් දී පසුව කැව මැනවැ"යි සිතා මාංස පිසන්නාහු තෙල්මස, මධුමස[2] පෙණමස, අඟුරුමස, දුරුමිරිස් ආදිය බහනලද සම්භාර සංයුක්තක[3]ය යි මෙසේ පස් ප්‍රකාරයකින් මාංස පිස අලුත් වළදෙක බහා සුදු කඩෙකින් සැළමුව වසා බැඳ එකත්පස් කොට තබා සිතන්නාහු "ඒකාන්තයෙන් මම සැදැහැ ඇත්තෙම් වීම් නම්[4] මාගේ මේ දන් පිළිගන්ට සුදුසු රහත් කෙනකුන් වහන්සේ වඩනා සේක් මැයැ"යි තමන්ගේ ශ්‍රද්ධාව ආවර්ජනා කොට "මේ ලංකාද්වීපයෙහි ඍද්ධිමත් වූ යම් කිසි උත්තම ක්ෂීණාශ්‍රව කෙනෙක් ඇත්නම් ඔවුන් අතුරෙන් රහත් අටදෙනකුන් වහන්සේ කරුණා කොට සෙට මාගේ ගෙට සිහා වඩනාසේක්ව"යි අඞගගා[5] දෙමහල්ලෝ ම එක් ව දනට උවමනා සෙසු දනොපකරණ සපයා තුබුහ.

ඉක්බිති කම්ාරතිස්සයෝ රාත්‍රිභාගයෙහි ස්වප්නයක් දක්නාහු තමන්ගේ ගෙට ගිනිකඳ අටක් අවුත් වදනා දැක එම ඇසිල්ලෙහි පිබිද "අද මාගේ මනදෙළ මුදුන් පැමිණෙන්නේ වනැ"යි සන්තොෂ ව උදසන්හි ම තමන් වසන ගෙය සුවඳ පිරිබඩ ගෙන උඩ සුදුවියන් බැඳ වට වැට[6] පහන් ලවා[7] සුවඳ දුම් ලවා පූර්ණඝට කෙහෙල් තොරණ ආදියෙන් සරහා ලද පස්මල් ඉස ආසන අටක් පනවා තමන් හිඳිනා ගෙදෙර පටන් ගම්දෙර දක්වා මහදිග වළගොඩ සම කොට බෙර ඇසක් සේ තනා කළුවැලි[8] පියා සුදුවැල්ලෙන් තවරා සපු කිණිහිරි දෑසමන් ආදි නන්පැහැ ඇති සුවඳමල් ඉස මග සරහා රහතුන් වහන්සේ වඩනා පෙරමඟ බල බලා ගම්දෙර සිටියහ.

ඉක්බිති රුහුණු ජනපදයෙහි තලගුරු වෙහෙර වසන ධම්මදින්න නම් මහතෙරුන් වහන්සේ ඔහුගේ ශ්‍රද්ධාසම්පත්තිය දිවසින් දැක ,සෙට මා ඕහට අනුග්‍රහ කළ මැනවැ,යි සිතා තමන් වහන්සේගේ උපාධ්‍යාය වූ ගොධම්ම[9] තෙරුන් වහන්සේ කරා එළඹ වැඳ එකත්පස් ව සිටිසේක් "ස්වාමිනි, සෙට මහවැලි ගං සමීපයෙහි මුණ්ඩවාක නම් ගම කම්මාරතිස්සයන්ගේ ගෙට සිහා යම්හ"යි දන්වූසේක. ගොධම්ම තෙරුන් වහන්සේ ද යහපතැයි ගිවිස දෙවන දවස් දෙදෙනා වහන්සේ ම පා සිවුරු ගෙන

1. අඞගනාවගේ ළෙහි - ක.කි.සැ,ම.
2. මධුරමස - BCGJK
3. සංයුක්ත -BDEGHKL
   සංයුක්ත මස - ම
4. වීන් නම් -BHGJL
5. අඞගහා -J. ක.සැ.කි
   අඞගා - ම.
   අඞගැහ - BEGHKL, ස
6. හැම - CDAJ, ක.කි.සැ,බෙ.
7. අවුළුවා - BGHKL
   දල්වා -E
8. හුළුවැලි - ක.සැ.
9. ගොධ - පාලි

Non-Commercial Distribution

හංසරාජයන් දෙදෙනකු මෙන් ආකාශයෙන් අවුත් මහාසමුද්‍ර විහාරයෙහි වසන සඞ්ඝරක්‍ඛිත මහ තෙරුන් වහන්සේය කාළවෙලම්බක විහාරයෙහි වසන මහානාග තෙරුන් වහන්සේය උඩුකඩ[1] විහාරයෙහි වසන මහා සඞ්ඝරක්‍ඛිත මහ තෙරුන් වහන්සේය උනංගමු වෙහෙර වසන භුම්වාලක[2] ධම්මගුත්ත මහතෙරුන් වහන්සේය හාතිවංක[3] විහාරයෙහි වසන මහානාග තෙරුන් වහන්සේය කල්ලනා[4] පවුවෙහි වසන මලියදෙව මහතෙරුන් වහන්සේය යන මේ මහ තෙරුන් සත්දෙනා[5] වහන්සේ කැඳවා ගෙන අහසින් ගොස් පියුම්විලක් කරා බස්නා රාජහංස පෙළක් සේ කම්මාරතිස්සයන්ගේ ගම්දෙරට බැස සිවුරු ගැට ගන්වා රන්පියුමකට බට නීලභෘඞ්ගරාජයන් බඳු වූ නිල් පාත්‍ර අතින් ගෙන පිළිවෙළින් ගමට වන් සේක.

එවේලෙහි කම්මාරතිස්සයෝ රහතුන් වහන්සේ දක මහත් වූ ප්‍රීතින් පිනා පසඟ පිහිටුවා වැඳ හැමදෙනා වහන්සේගේ පාත්‍ර ගෙන මහත් වූ සත්කාරයෙන් ගෙට වඩාගෙනවුත් පනවනලද ආසනවල්හි වඩාහිඳුවා අවුළු හා සමඟ උපකරණ සහිත වූ කැඳ වළඳවා නැවත වළඳන අතුරෙහි පිළියෙල කරනලද ඌරුමාංසය මී සකුරු හා සමඟ යොද වළඳවා වේලා ආසන්න වූ කල්හි මත්ස්‍ය[6] මාංස සහිත වූ සුවඳ හැල්සාලේ බත වැළඳවූහ. ඉක්බිති හැමදෙනා වහන්සේ අහර වළඳ දැහැටි කිස නිමවා අනුමෙවුනි පිණිස ඔවුන් දෙදෙනාට බන වදරා තම තමන් වහන්සේ වසන විහාරවලට ම වැඩි සේක.

එතැන් පටන් කම්මාරතිස්සයෝ දනාදි වූ නොයෙක් පින්කම් කෙරෙමින් ආයු කෙළවර එයින් මිය අනුරාධපුර නුවර දුටුගැමුණු රජ්ජුරුවන්ට පුත් ව උපන්හ. ඔවුන් මවුකුසින් බිහිවීම හා සමඟ සියලු ලංකාද්වීපයෙහි එක පැහැර සුවඳ රත්හැල් වර්‍ෂා කෙළේය. යටත් පිරිසෙයින් උදුනෙහි[7] තබනලද තණසාල් ආදි බතුදු පෙරළී සුවඳ හැල්සාලේ බත් ම විය, තණ වරා ආදි වූ කටුසර පිරූ කොටුහුලු සුවඳහැලින් පිරිණ, වී[8] නැති සිස් කොටුගුලු ද එපරිද්දෙන් ම හැලින් පිරුණේය. උදක් ඔවුන් උපන් දවස මතු නොවෙයි, ඒ කුමාරයන්ට තුන්මසින් සත්මසින් නවමසින් කළමනා ඒ ඒ මගුල් දිනයෙහි ද බත් කැවීම් කන්විදීම් යුවරජ තැන් ලැබීම් ආදි වූ ඒ ඒ මඟුල්දිනයෙහි ද මුළු ලක්දිව එක පැහැර ඇල් වැසි වැස පිරී ගියඃ තණ වරා ආදි වූ ශස්‍යජාතීහු ද පෙරළී ශාලිජාති ම වූහ. මෙසේ ඒ රාජකුමාරයන් නොයෙක් ආශ්චර්‍ය්‍ය ලොව පහළ කෙරෙමින් ශාලිබන්ධු ව උපන් හෙයින් ඔවුන්ට ශාලිකුමාර[9] ය යි නම් තුබූහ.

ඉක්බිති ඒ මහපිනැති[10] රාජකුමාරයෝ ක්‍රමයෙන් වැඩෙන්නාහු නොයෙක් ශ්‍රී සම්පත්තීන් ආඪ්‍ය වූහ, බැලූ බැලූවන් පිනවන මනා වූ පින්ලකුණු ඇතියහ, මහත්

---

1. උඩුක - ක.කි.ස.
උපරිබඩ - පාලි
2. භුම්මාලක - CJ, බෙ.ස.
3. හාතිවංශ - CDJ, බෙ.
4. කල්ලනා - KL, ස.
5. සදෙනා - බෙ.ස.
6. මච්ඡ - පිටපත් හැම
7. උත්තෙහි - GHJK
8. පිරිණැවි - ක.කි.ස.
පිරිනැමී පිටගත - ම
9. ශාලිරාජකුමාර - BCDHK,
සාළිය කුමාර - L
10. පිනැති - H

Non-Commercial Distribution

වූ තෙජස් ඇතියහ, අපමණ රාජඓශ්වර්ය ඇතියහ, අළාමක වූ වික්‍රම ඇතියහ, දසදිග පතළ යශස් ඇතියහ; සර්වාංගෝචිත ප්‍රඥ ඇතියහ; ප්‍රියකරු වූ රූ ඇතියහ; කන්කළු වූ තෙපුල් ඇතියහ; සපිර වූ සබා දන්නාහ; පහ වූ හය සන්ත්‍රාස ඇතියහ; ත්‍යාගයෙන් කප්රුකක් වැනියහ; භොගයෙන් මහා නිධානයක් වැනියහ; බලයෙන් බලදෙවයන් වැනියහ, සියලු සතුන්ට වැදමවක[1] වැනියහ; දන්දීමෙහි තෘප්තිනිවාරණයක් නැතියහ; තුනුරුවන් ම පිහිට කොට ඇතියහ; දෙවතාවන් හා මනුෂ්‍යයෝ දවස දහසක් වටනා පඬුරු පෙරවරු ගෙනවුත් දෙති; ගෙන ගෙනා පඬුරු පෙරවරු ම දන් දෙන්නාහ; නැවත පස්වරු භාගයෙහි ද පන්සියයක් වටනා වස්තු නිරන්තරයෙන් ම ගෙනවුත් දෙති; ඒ සියල්ල ද තුමූ නොගෙන යාචකයන්ට දන් දෙන්නාහ. එසේ හෙයින් කියන ලදී,

දුට්ඨගාමණිභූපස්ස - පුත්තො සාලිකුමාරකො
ධඤ්ඤලක්ඛණසම්පන්නො - ආසි තෙජිද්ධිවික්කමො.

භූරිමෙධො ච සො ආසි - රූපෙන මකරධජො,
මඤ්ජුවාණී[2] ච සො ආසි - සච්චසන්ධො විසාරදෙ,.

චාගී භොගී බලී චාසි - හිතෙසී සබ්බපාණිනං,
අතිත්තො ආසි දානෙන - රතනත්තය පරායනො.

සහස්සමූලකං භණ්ඩං - පුබ්බණ්හෙ දෙවමානුසා,
දිනෙ දිනෙ ආහරන්ති - සො තං දානෙ පවෙච්ඡති.

තතො සො පඤ්චසතිකං - ලභන්තො[3] අපරණ්හකෙ,
අලග්ගො යාචකෙ දෙති - සබ්බකාලං මහායසො-යි.

ඉක්බිති දුටුගැමුණු රජ්ජුරුවෝ ශාලිරාජ කුමාරයන්ට යුවරජ තනතුරු දී අනුරාධපුර නුවර දකුණු වීථියෙහි මහත් වූ ප්‍රාසාදයක් කරවා දුන්හ. රාජකුමාරයන් ඒ ප්‍රාසාදයෙහි වසන කල්හි දකුණු දිග ගල්වල[4] පටන් ඒ දිශා භාගයෙහි සියලු දනවු වැසි මනුෂ්‍යයෝ ඒ දිගින් නුවරට නිමන අනෙකප්‍රකාර වූ සියලු ම අයමුබය රාජකුමාරයන්ට ම ගෙනවුත් දෙති. එකල දවසෙක රාජකුමාරයෝ අටසිල් සමාදන් ව ඉසුරමුණි[5] විහාරයට ගොස් පොසථාඞ්ගශීලය ආවර්ජනා කෙරෙමින් උන්හ. එ දවස් දකුණු දිශාභාගයෙහි මනුෂ්‍යයෝ සියක් ගැල් පුරා බොහෝ පඬුරු ගෙන්වාගෙන අනුරාධපුරයට යන්නාහු ඉසුරමුණි[5] විහාරය සමීපයට පැමිණියහ, එකල ගැල් අදනා ගොන් වියකරින් හෙළා ගැල් නොඇද සිටියහ. මනුෂ්‍යයෝ නොයෙක් උත්සාහ කොට ගැල් පැද යා නොහී සිටියහ; ඉක්බිති එයින් එක් ගොනෙක් තමා බැඳි රැහැන් කඩාගෙන දිවන්නේ[6] දිවියකු අතින් ගැළවී මවක කරා දිවන වසු පැටවකු සේ ශාලිරාජකුමාරයන් උන් විහාරයට ගොස් වන; මනුෂ්‍යයෝ ගොනුගේ පියවර සලකුණෙන් ගියාහු ශාලිරාජකුමාරයන් දක වැඳ එකත්පස් ව

1. වැදුමවක් - E, ක.කි.හැ.ම.
2. මඤ්ජුපාණී - පිටපත් හැම
3. ලභන්තෙ - පිටපත් හැම
ලභන්තො - පාලි
4. ගම්වල - BGHKL
5. ඉසරමුණු - ස
6. දිවන්නේය - J, ක.කි.හැ.ම.

Non-Commercial Distribution

සිටියහ, රාජකුමාරයෝ ඔහු දැක "සගයෙනි කුමක් පිණිස අවි ද"යි විචාළහ. එබසට ඔහු "ස්වාමීනි, නුඹවහන්සේට පඬුරු ගෙන්වා ගෙන ආම්හ"යි කීහ, එවේලෙහි රාජකුමාරයෝ "එසේ වී නම් ගෙනෙව"යි ගෙන්වා ගෙන ඒ සියල්ල ම දන් දෙනු කැමැති ව "භික්ෂූන්වහන්සේ පිහා වඩනා කලැ"යි කාලඝොෂා කැරවූහ; එකෙණෙහි විසිදහසක් පමණ භික්ෂූන් වහන්සේ රැස්වූසේක; රාජකුමාරයෝ හැමදෙනා වහන්සේට පෙරවරු දන් දී පස්වරු ගිතෙල් මී වෙඬරු තෙල් සකුරු ආදි වූ බෙහෙත් පසය ද මධු මුද්දිකාදි අෂ්ටවිධ පානවර්ගයන් ද දන් දී නැවත විහාරයට නිසි බිමක් දී මහත් වූ පූජාකරවා නුවරට ම ගියාහ. එදවස් රජ්ජුරුවන්ගේ රාජකටයුත්තෙහි නියුක්ත පුරුෂයෝ රජ්ජුරුවන් කරා ගොස් "දේවයන් වහන්ස, දකුණු ජනපදයෙන් නුවරට නිමන සියලු අයමුඛය ශාලිරාජකුමාරයන් වහන්සේ ම ඇරගන්නාසේක, එසේ හෙයින් ඉදිරියේ දවස රාජ කටයුතු කිරීම නොපිළිවනැ"යි කීහ. එබස් අසා රජ්ජුරුවෝ දකුණුදිග මාලිගාව හරවා රාජකුමාරයන්ට බස්නාහිරි වීථියෙහි මනහර ප්‍රාසාදයක් කරවා දුන්හ. රාජකුමාරයන් එහි වසන කල්හිදු බස්නාහිරි දිශාභාගයෙහි සියලු දෙසින් මනුෂ්‍යයෝ පෙර පරිද්දෙන් බොහෝ පඬුරු ගෙනවුත් දෙති, ගෙනා ගෙනා පඬුරු පෙර සේ ම රාජකුමාරයෝ දන් දෙන්නාහු මය.

මෙසේ නිරන්තරයෙන් මහදන් පවත්වා දනපති ව වසන්නාහු එක් දවසෙක උයන්කෙළි පිණිස සර්වාභරණයෙන් සැරහී මහසෙනඟ පිරිවරා බස්නාහිරි වාසලින් නික්ම සරහන ලද මාර්ගයෙන් ගොස් උයනට වැද ඒ ඒ තන්හි මොනරුන්ට රඟමඩුලු වූ අතළගල්පෙළින් හා රක්තශ්වේතාදි පඤ්චප්‍රකාර පද්මයෙන් සැදුම් ලද පතස්පෙළින් හා ගිරා මොනර චක්‍රවාකාදි පක්ෂි සමූහයා විසින් ගැවසී ගත් ලතාමණ්ඩප පන්තීන් හා නොයෙක් කුලයෙහි බමරුන් විසින් ගිගුම් දෙන ලද සල් සපු නා පනා සිහින්ගෙන්ද එරහැන්ද ආදි වූ සුපුෂ්පිත වෘක්ෂමාලාවෙන් හා ඉතා රම්‍ය වූ මනහර උද්‍යානයෙහි නොයෙක් විසිතුරු බලමින් ඒ ඒ තන්හි කෙළ ඇවිදිනා වූ රාජකුමාරයෝ මුල පටන් අග දක්වා මලින් සැදී සිටි සුපිපි හෝපලු ගසක් දැක ගස මුලට ගොස් කර ඔසවා උඩ බැලූහ.

එකල හෙලෙලොලි[1] නම් ගම නායක චණ්ඩාලයාගේ දේවි නම් වූ දුවක් මල් පිණිස ගසට නැඟී ඒ ගස තිල් අතුපතර අතුරෙහි දිලිහෙමින් නිල්වලාකුළෙක පහළ විදුලියක් සේ මහ මේ ගබක් අතුරෙන් පෙනීගිය පූර්ණචන්ද්‍රමණ්ඩලක් සේ තමාගේ අග්‍රප්‍රාප්ත වූ රූප ශොභාවෙන් දසදිග හොබවමින් හෝපලුමල් කඩා පැළඳ පල්ලවයක් අතින්ගෙන සිටියහ.[2] එසේ සිටියාවූ සැඩොල් දුව දැක රාජ කුමාරයෝ එකෙණෙහි උපන්නාවූ බලවත් ස්නේහ ඇති ව මහත් වූ ආශ්චර්යයට පැමිණ පූර්ව වාසනායෙන්[3] ඇ කෙරෙහි උපන්නාවූ ප්‍රෙම ධරාගත නොහී මුඛයෙන් වමාරන්නාක්හු මෙන් ඈ හා සමඟ කථා කරන්නාහු "සොඳුර, තෝ කවරෙක් ද; කොයින් ආ කෙනෙක් ද; දේව්ලොවින් බට දෙවතාදුවක් ද; නොහොත් මනුෂ්‍ය ස්ත්‍රියක් ද; මේ

1. හෙලෙලොලිය - KL. ස.
2. සිටියාය - KL, ස.
3. වාසනා හේතුයෙන් - BEGHJKL.

Non-Commercial Distribution

ලොකයෙහි තොප හා සමාන රූ ඇති අන් ස්ත්‍රියක් නොදුටුවිරීමි; තොපගේ තෙල මොළොක් වූ කොමල පතුල්දෙක රත්පියුම් දෙකක් මෙන් බබළයි; ක්‍රමයෙන් සිහින් ව මොළොක් වූ තොපගේ කෙණ්ඩාසහළ රත්මොනර කර දෙකක් මෙන් ඉතා පියකරුය, මනාව වට වූ තොපගේ දණමඬල දෙක රන්මුහුදු පැනනැගි රනිබ්බන්[1] දෙදෙනකු මෙන් ඉතා හොබනේය, තව ද තොපගේ මටසිලුටු වූ පිරිපුන් කලවා සහළ රන් කෙහෙල් කඳ දෙකක් මෙන් ඉතා සිත්කලුය; මිටින් ගත හැකි තොපගේ සිහුවලඟ රන් සිරිවසක් මෙන් ශොභාමත් වුනේය, තව ද තොපගේ මධ්‍යමාඞ්ගයෙහි[2] රැළි දි දී සිටියාවූ හිරිතුන වසාරොද නමැති ජල ඇති රූප නමැති සාගරයෙහි පැන නැගි රළපතර තුනක් මෙන් දිලිහෙයි; තව ද ස්වර්ණ සාගරයෙන් පැනනැගී රන් බුබුලු දෙකක් හා සමාන වූ තෙල පයෝධරයෝ දෙදෙන තොපගේ රූප සම්පත් නමැති මහමුහුද හොබවති, එම්බා සොඳුර, තොපගේ මොළොක් වූ අතුල් තල[3] නමැති ළඳ පල්ලවයෙන් අලංකෘත ව තෙව්නා මනහර තෙල බාහු යුග්මය ශරීර නමැති කල්පලතායෙහි අටගත් ආශ්චර්‍ය්‍යමත් වූ අරළු දෙකක් මෙන් හොබනේය, තව ද තොපගේ මඳසිනා නමැති චන්ද්‍රකාන්තීන් යුක්ත වූ මුඛ නමැති චන්ද්‍රතෙම මාගේ සිත් නමැති කෞමුද වනය විශෙෂයෙන් ප්‍රබොධ කරවයි, තව ද තොපගේ අතිරක්ත වූ අධරයුග්මයෙහි රශ්මීන් රැඳුණාවූ දන්තපන්තීහු විලිකුන් දෙළුම්බිජු පෙළක්[4] මෙන් බබළන්නාහ, තව ද අනඞ්ගයාගේ මාලිගාදෙර නොහොත් රතිමැදිරිදෙර රන් යටෙක බඳනාලද නිල් ධවජදෙකක් හා සමාන වූ තොපගේ බැම සහළ කාමීපුරුෂයන් තමා කරා කැඳවන්නාක් මෙන් විශෙෂයෙන් බබළයි; තව ද මොනරපිල් කලබක් මෙන් දික් ව අග්බඹුරු වූ තොපගේ කසමල්[5] රැසක් වැනි නිල් වූ කෙස්වැටිය සිසාරා පලඳනාලද ඉද්දමල්දමින් ඉතා සිත්කලුය, සොඳුර, තෙපි කිනම්හු ද; තොපගේ දෙමව්පියෝ කිනම්හු ද; තෙපි තමා සස්වාමික කෙනෙක් ද,[6] නොහොත් අස්වාමික කෙනෙක් ද; ඒ හැම මට නොවළහා කියව"යි කීහ. එසේ හෙයින් කියන ලදී:

කුතො ත්වං ආගතා කා ත්වං - දෙවතානු'සි මානුසී
න තෙ සමසමං පස්සෙ - අස්මිං පුථුවි මණ්ඩලෙ.

පාද තෙ පදුමාකාරා - සුරත්තා මුදු කොමලා
හෙම මොරස්ස ගීවා'ව - ජඞ්ඝා නෙත්ත රසායනා.

හද්දෙ තෙ පීවරා ඌරූ - හෙමරම්භොපමා සුභා
හත්ථෙන පමිතබ්බං තෙ - මජ්ඣිමඞ්ගං විරාජති.

තරඞ්ගභඞ්ගිං සාධෙති - හද්දෙ තෙ රූප සාගරෙ
වලිත්තය මච්චජිත්තං - රොමරාජි විරාජිතං.

---

1. රන් බුබුලු - B
2. මධ්‍යමාංශයෙහි - පිටපත් හැම
3. අතුල්තල - BCDEGHKL
   අතුල්පතළ - J
   අතුල්පතුල් - මුද්‍රිත හැම. ස.
4. දෙළුම් පෙළක් - CDEGHJKL
5. සමන්මල් - DH, මුද්‍රිත හැම
6. කෙනෙකු ද - KL, බෙ.ස

Non-Commercial Distribution

උරෝරුහානි සොභන්ති - භද්දෙ තෙ රූපසාගරෙ
සොණ්ණබුබ්බුලකද්වන්ද - සමා උත්තරසාගරෙ.

බාහූ සොභන්ති තෙ භද්දෙ - පාණී පලලව ලඞ්කතා
කප්පලතාය සඤ්ජාතා - පාරෝහාව මහබ්භුතා.

චන්දනසාරදිච්ඡෙද තෙ - හාසරංසි[1] විමිස්සිතො
විකාසයති මෙ භද්දෙ - මනො කෙරව කානනං.

පක්ක කරක බීජානං - පන්තී'ව දන්තපන්තියො
හාසමානාය තෙ භද්දෙ - රත්තොට්ඨාසු විමිස්සිතා.

සිඞ්ගාරමන්දිරෙ බද්ධ - කෙතූ'ව හෙම යට්ඨියං
විලලිවලලි විරාජේන්ති[2] - අවෙහන්තා විය කාමුකෙ.

නීලවෙල්ලිතධම්මිල්ලං - තාපිඤ්ජ ගුම්බකොපමං
සෙවිතං මාලතිමාලද්දමෙනා'ති මනොරමං.

නාමං තෙ වද මෙ භද්දෙ කෙ[3] තෙ මාතා පිතා සුභෙ.
මයා පුට්ඨා වියාචික්ඛ - සභත්තාසි අභත්තුකා-යි.

ඉක්බිති රාජකුමාරයන්ට තමාගේ ජාතිගොත්‍ර[4] ප්‍රකාශකොට කියන්නාවූ කුමාරිකා තොමෝ,

සාමි හෙලෙලොල[5]ගාමස්මිං - ඉස්සරස්ස සුතා අහං
කම්මාරධීතා චණ්ඩාලි - ඉති මඤ්ඤන්ති මං ජනා-යි.

යනාදින් "ස්වාමීනි, මම හෙලෙලොලි[6] නම් ගම ප්‍රධාන නැවැමියාගේ දූ වූ එක්තරා සැඩොල්දුවකිමි"කිව. එබස් අසා ශාලිරාජ කුමාරයෝ:

න පරිච්චජන්ති[7] ලොකොයං - අමෙජ්ඣෙ මණිමුත්තමං
පීරතනං[8]සුවාණී ච - දුක්කුලා අපි ගාහියා-යි.

යනාදීන් "මේ ලොකවාසීහු අමෙධ්‍යයෙහි හුණු මුතුමැණික් ආදි වූ උතුම් වස්තු අපවිත්‍රය යි නොහරනාහු මය; එසේ හෙයින් රූපශ්‍රීන් විරාජමාන මෙබඳු ස්ත්‍රීරත්නය ද චණ්ඩාල කුලයෙහි උපන ද ගතයුත්තේ මය"යි කියා කුමාරිකාවන් ගසින් බස්වා පිළිසන් යානාවකින් ගෙන්වා ගෙන ගොස් ඒ කුමාරිකාවන්ට නම් තබන්නාහු හොප්පලුගසදී දුටු හෙයින් අශොකමාලා දේවිය යි නම් තුබූහ. මෙසේ රූපශ්‍රීන් විරාජමාන වූ මෙබඳු මහ පිනැති කුමාරිකාවෝ කවර කාරණයකින් චණ්ඩාල කුලයෙහි උප්පන්නාහු ද යත්:

යටගිය දවස ඒ කුමාරිකාවෝ මෙම ලක්දිව එක්තරා කුලගෙයක උපන්නාහ. එකල ඔවුන්ට සුමනාවෝය යි නම් තුබූහ, දවසෙක සුමනාවෝ මැණියන් හා සමග

---

1. හාසරංසි - බෙ.ම
2. විරාජන්ති - පිටපත් හැම
3. කො - බෙ.ස.
4. නාමගොත්‍ර - B
5. හෙලෙලොලි - CJ
6. හෙලෙලොලිය - K ස.
7. පරිච්ජන්ති - ක.කි.ස.
8. ඉත්පීරතනං - BHKL

Non-Commercial Distribution

මල් සුහක් ගෙන බොධි කෙනකුන් වහන්සේ කරා එළඹ බෝමළුව ඉඳුරා හැමද කසළ දමා බොධීන් වහන්සේ පැන් සනස්වනු සඳහා මැණියන් පැනට ගිය කල්හි තමන් ඉතා බාල හෙයින් සයින් පීඩා ව[1] සිටිය නොහී ගෙට දිව ගොස් කැඳිත්තක් බොමින් උන්හ. එකල ඔවුන්ගේ මැණියෝ ද බොධීන් වහන්සේ පැන් සනහවා මල් පුද බොධීන් වහන්සේ වැඳ ගෙට ගියාහු ඒ ඒ තැන විසිර පියා තුබූ බත් උළු ආදිය දක කැඳ බොමින් උන් දියණියන්ට හික්මවීම් වසයෙන් "එම්බල චණ්ඩාල කෙල්ල, මාගේ ගෙය කුමක් පිණිස දූෂ්‍ය කෙරෙයි ද"යි කීහ; එබසට සුමනාවෝ කිපී 'චණ්ඩාල කෙලී නම් තෙපි ම යැ"යි මැණියන්ට බිණුහ.

මෙසේ මැණියන්ට චණ්ඩාල වාදයෙන් බිණූ අකුශලයෙන් එයින් මිය දෙවන ජාතියෙහි මහවැලි ගං අස මුණ්ඩවාක නම් ගම නැවැමි දුව ව ඉපද යට කියන ලද තිස්ස නම් නැවැමියා හා එක් ව බොහෝ කුසල්කොට එයින් චුත ව අනුරාධපුර සමීපයෙහි හෙල්ලෝලි නම් ගම නායක නැවැමියාට දූ ව උපන්හ. මේ සියලු ලක්දිවු තෙලෙහි ඔවුන් හා සමාන වූ රූ ඇති අන් ස්ත්‍රියක් නැත. ඔවුන් වසන ගබඩාවෙහි පහන් ලුව මැනවැ යි නැත; හාත්පසින් සතර රියනෙක ශරීරාලොක පැතිරෙයි, මුඛයෙන් මහනෙල් මල් සුවඳ පැතිරෙයි; ශරීරයෙන් සඳුන් සුවඳ වහනය වෙයි; ඔවුන් අතින් අල්වනලද කැඳ බත් ආදිය සාරමසක් පිලිහිනි[2] නොවෙයි; මෙසේ මහ පින් ඇසක් වැනි කුමාරිකාවෝ වනාහි තමන් වැද්ද[3] මැණියන්ට චණ්ඩාල කෙල්ලය යි බිණූ එක වචනමාත්‍රයකින්[4] සැඩොල් කුලයෙහි උපන්හ. බෝමලු ඇමදි කුශලයෙන් යහපත් වූ රූප සම්පත් ලැබ පූර්ව වාසනා බලයෙන් ශාලිරාජකුමාරයන්ට අගමෙහෙසුන් වූහ. එසේ හෙයින් කුශලාකුශල නම් ස්වල්පය යි නොසිතිය යුත්තේය. කියන ලද මැයි:

මාතු චණ්ඩාලවාදෙන - චණ්ඩාලි ආසි සා ඉධ
සම්මජ්ජනාදි පුඤ්ඤෙන - ධඤ්ඤා ආසි සුරූපවා-යි.

මෙසේ අශොකමාලා දේවීන් ගෙන නුවරට ගිය කල්හි "ශාලිරාජකුමාරයෝ තමන්ට පාදපරිචාරිකා කොට සැඩොල්දුවක ගෙනාහ"යි සියලු නුවර එක පැහැර ක්ෂොභ ව[5] ගියහ[6]. දුටුගැමුණු රජ්ජුරුවෝ එපවත් අසා නොසතුටු ව තමන්ගේ වල්ලභ වූ ස්ත්‍රියක කැඳවා, 'තෙල,[7] තෝ මපුතණුවන් කරා ගොස් 'ස්වාමිනි, නුඹ පියාණන් වහන්සේ නුඹ සිතට ප්‍රිය වූ රාජකුමාරිකාවක හෝ බ්‍රාහ්මණ කුමාරිකාවක හෝ ගෙනවුත් පාදපරිචාරිකා කොට පාවා දී නුඹ[8] ඔවුනු පළඳවා රාජ්‍යය දෙනු කැමති සේක; එසේ හෙයින් තෙල චණ්ඩාලකෙල්ල හැරපුව මැනවැ යි රාජවංශයට කිලුටු නොකළ මැනවැ"යි කාරණා කියා මපුතණුවන්ගේ අභිප්‍රාය දන මට වහා අවුත් කියව"යි උගන්වා යවූහ. ඕ ද[9] එපරිද්දෙන් ම රාජකුමාරයන්ට කිව. එබස්

1. පීඩා ව - BDEGHKL, ස
2. පිළිණි - BGHJK
3. වැද - CDEK
4. වචන මාත්‍රයක් නිසා - KL, ස
5. ප්‍රසිද්ධ ව - C
6. ගිය - JKL
7. තොල - ක.කි.ඥ.ම.
8. නුඹ - BCDEGHJKL,
නුඹවහන්සේ - මුද්‍රිත
9. ඔහු ද - CJ,'බෙ, ඕ ද ගොස් - KL
ඈ ද - ක.කි.ඥ.

Non-Commercial Distribution

අසා ශාලිරාජකුමාරයෝ "කිමෙක් ද කෙල,[1] යහපත් ව විලිකුන් දෙළුන් කනු කැමැති දෙළන සත්‍රියක මනා ව විලිකුන් කෙතෙක් මී අඹ කැවත් ඇගේ[2] දෙළ සන්හිදේ ද නොසන්හිඳෙන්නේ මය; එපරිද්දෙන් ම මොවුන් ඇර අනික් මනුෂ්‍ය ස්ත්‍රියක නබා දිව්‍ය ස්ත්‍රියක පාවාදුන ද මාගේ මනොරථය පිරෙන්නේ නොවෙයි; එසේ හෙයින් හිරු රසින් ප්‍රබුඩ වන්නාවූ[3] පියුම්වනය චන්‍ද්‍රාලොක දක කෙසේ නම් ප්‍රබොධශ්‍රීයට පැමිණේ ද" යනාදීන් නොයෙක් උපමා කියා අශොකමාලා දේවීන් කෙරෙහි තමන් අතිශයින් ඇලුම් ඇති බව හැඟවූහ. කියන ලදුයේ මැයි,

හොතුකාමා දෙහළිනි - සුපක්කං දඩිමං ඵලං,
කිතනු සා පීණිතා හොති ලඩා සහකාරජං ඵලං.
එවං මෙ නෙව පූරෙති - අඤ්ඤං ලඩාන මානසං,
කදු බුජ්ඣති දිස්වාන - චන්දං පඞ්කජකානනං-යි.

ඉක්බිති ඒ ස්ත්‍රී ගොස් රජ්ජුරුවන්ට කිව; නැවත දවසෙක රජ්ජුරුවෝ සාමුද්‍රිකා ලක්ෂණයෙහි දක්ෂ වූ බමුණන් ගෙන්වා "එම්බා පින්වත් බමුණෙනි, තෙපි හැම ගොස් අශොකමාලාදෙවින් බලා ලක්ෂණ පරීක්ෂාකොට එව;[4] ඉදින් ඕතොම ලක්ෂණ හීන වූ කාළකණ්ණි එකක් වූ නම් අපි එවිට කළමනා කටයුතු දන්නමෝ වේ ද'යි කියා යවූහ. එකල බමුණෝ යහපතැ යි ගොස් අශොකමාලාදේවින්ගේ දුසැටක් පමණ ස්ත්‍රීලක්ෂණයෙන් ශොභමාන වූ ආත්මභාවය දක විස්මයපත්වූ සිත් ඇති ව රජ්ජුරුවන් කරා ගොස්[5] අශොකමාලා දේවීන්ගේ රූප නමැති සුරාපානයෙන් මත් ව නට නටා ගී කියන්නවුන් මෙන් ඔවුන්ගේ ලක්ෂණ කියන්නාහු,

සුඩා සාමා සුප්පසන්නා'යත'ක්ඛී
පීණසෝණී දක්ඛිණා වත්තනාභී,
සංඛිත්තංසා නාතිලොමා විතඞ්ගී
ධඤ්ඤා කඤ්ඤා සාලිනී බන්ධවානං.

යස්සා පාද කොමලා පඞ්කජාභා
මජ්ඣෙහාජාකාරරේඛා ගභීරා,
වට්ටඞ්ගුල්‍යො[6] තම්බතුඞ්ගා නඛාච
ධඤ්ඤා කඤ්ඤා සාලිනී බන්ධවානං.

සෙතා දන්තා භාසයන්තා සුවාතී
පීණා බාහූ තුඞ්ගනාසා සුහොරු,
භුනං මජ්ඣෙ සාධුජාතං තිසූලං
ධඤ්ඤා කඤ්ඤා සාලිනී බන්ධවානං.

---

1. කොල - ක.කි.කැ.ම
2. ඇ - DGJ
3. ප්‍රබොධ වන්නාවූ - BC
හිරු රැසින් මිස ප්‍රබෝධ නොවන්නාවූ - KL
4. එව් - ක.කි.කැ.ම.
5. ගියාහු - BDEGHKL
6. වට්ටංගුලෙලා - පිටපත් හැම

Non-Commercial Distribution

ජඞ්ඝාකාරං යදිතු වරඩ්ගං
නෙත්තාසාලා කමලදලාභා,
වත්තං පීනං කරචරණාවා
මත්තා ලක්ඛී විලසති තස්මිං

යනාදීන් "මහරජ, ශාලිරාජකුමාරයන්ගේ බිසෝ වූ ඒ අශෝකමාලා දේවී නම් අතිමනොහර වූ[1] රන්වන් ශරීර ඇතියහ; නිල් මහනෙල් පෙති දෙකක් මෙන් දිගුපුළුල් වූ[2] ප්‍රසන්න වූ ඇස්සහලක් ඇතියහ, පළල් ව සම්පූර්ණ වූ ජඞ්ගා ප්‍රදෙශයක් ඇතියහ, ස්වර්ණ සාගරයෙහි දියසළාවක් මෙන් දක්ෂිණාවර්තී ව ගැඹුරු වූ නාභි මණ්ඩලයක් ඇතියහ, සම ව ගා යෙදූ දුනුමිටක් මෙන් සිහින් වූ කටි ප්‍රදෙශයක් ඇතියහ, තනු ව[3] අග් උඩබලා සිටිනා අඳුන්වන් ශරීර රොමයන් ඇතියහ. රතැඹුලපෙති දෙකක් මෙන් රත් වූ මොළොක් වූ පතුල් සහළක් ඇතියහ; මහරජ, යම් ස්ත්‍රියකගේ සිරස නිල් සේසත් වටක් මෙන් ශොභාමත් ව තිබේ ද නෙත්‍රයුග්මය නිලුපුල් පෙති දෙකක් මෙන් දිගුපුළුල් ව තිබේ ද මුහුණ රත් පියුමක් මෙන් ශොභාමත් ව බබළා ද හස්තපාදතලයෝ මස් හුන් ව පිරී සිටිත් ද එසේ වූ ලක්ෂණ ස්ත්‍රිය කෙරෙහි ශ්‍රීකාන්තා[4]තොම එකාන්තයෙන් ම වාසය කරන්නීය. මහරජ, ඒ කුමාරිකා තොමෝ මෙකී සියලු ස්ත්‍රී ලක්ෂණයෙන් යුක්තය; එසේ හෙයින් සක්විතිරජක්හට අග මෙහෙසුන් වන්නට සුදුසු වූ මහ පින් ලකුණු ඇත්තීය"යි කීහ; රජ්ජුරුවෝ බමුණන්ගේ බස් අසා තුමූ ම ගොස් අශෝකමාලා දේවීන් දක්නා කැමැති ව ශාලිරාජකුමාරයන්ට තමන් එන නියාව කියා යවූහ. රාජකුමාරයෝ ද යහපතැ යි ගිවිස අශෝකමාලා දේවීන් ළඟට කැඳවා 'සොඳුර, රජ්ජුරුවන් වහන්සේ අද මේ මාළිගාවට වඩනාසේක් ල; ඒ ගමන තොප දක්නා පිණිස එන ගමනෙකැ යි සිතමි, එසේ හෙයින් තොප විසින්[5] කළමනා කටයුත්තෙහි අප්‍රමාද වෙව"යි කීහ. එබස් අසා අශෝකමාලාදේවී රජ්ජුරුවන් හා අමාත්‍යවරුන් ඇතුළු ව සියලු සේනාවට බත් මාලු කැවුම් පෙවුම් ආදි නොයෙක් කන බොන දෑ සපයා තිබූහ. ඉක්බිති රජ්ජුරුවෝ බලසෙනඟ පිරිවරා මහත් වූ රාජානුභාවයෙන් යුක්ත ව යුවරජ්ජුරුවන්ගේ මාළිගාවට අවුත් වන්හ, එකල්හි යුවරජ්ජුරුවන් හා ඇමෙණියෝ රජ්ජුරුවන්ට පෙරගමන් කොට වැඳ එකත්පස් ව සිටියහ. එවේලෙහි රජ්ජුරුවෝ දෙව්ලොවින් බට දෙවඟනක සේ රූපශ්‍රීන් දිලිහි දිලිහී සිටි අශෝකමාලාදේවීන් දැක මහත් වූ සන්තොෂයට පැමිණ "පින්වත් අශෝකමාලාදේවී නම් තෙපි ද"යි විචාළහ. එබසට කුමාරිකාවන් "එසේය ස්වාමිනි"යි බැණ නැඟි බස හා සමග මුඛයෙන් නික්මුණාවූ මහනෙල්මල් සුවඳ සියලු රාජභවනයෙහි එකපැහැර පැතිර සිටගත, රජ්ජුරුවෝ ඒ ආශ්චර්යය දැක සනතුෂ්ට වූවාහු පනවන ලද රාජාසනමස්තකයෙහි බැස[6] උන්හ, මෙසේ රජ්ජුරුවන් උන් කල්හි අශෝකමාලාදෙවී තමන් සිය අතින් පිළියෙල කරන ලද නොයෙක් රසයෙන් උද්දම වූ[7] රසමසවුලෙන් යුක්ත සුවඳහැල් සාලේ බත් රජ්ජුරුවන් පෙරට තබා තුමූ ම බත් අනුභව කැරවූහ. රසයෙන් උද්දම වූ[7] නොයෙක් සූපව්‍යඤ්ජනයෙන් යුක්ත බත් අවුළු

---

1. අතිමනොඥ වූ - BEGHKL
2. දිගු පුළුල් ව - BDEGHKL
3. තුනී ව - ක.සි.ඤ.ම.
4. ශ්‍රියාකාන්තා - BCDEGHKL
5. තොපි තොප විසින් - BEGJ
6. වැඩ - BG
7. ආඪ්‍ය වූ - DEGHKL
   ආඪ්‍යම වූ - CJ
   අඩුවූ - B
   ආර්ද්‍ර වූ - ස

Non-Commercial Distribution

ආදිය මෙහෙ නිමවා සතුටු වූ රජ්ජුරුවෝ "මෙබඳු මේ කුමාරිකාව පරීක්ෂා නොකොට මපුතණුවන් කෙරෙන් මඳකින් පහකෙළෙම් වෙමි"යි සිතමින් දෙමහල්ලන් ළහට කැඳවා අවවාද කොට" මූ ඉතා ආශ්චර්‍ය්‍යමත් කුමාරිකා කෙනෙකැ"යි කියමින් එම විට රුවන් රැසක් පිට සිටුවා අභිෂෙක මඟුල් කොට ශාලිරාජකුමාරයන්ට පාවා දී තමන්ගේ මාළිගාවට ම ගියහ. අශොකමාලාදේවී රජ්ජුරුවන් මෙහෙ නිම වූ පරිද්දෙන් ම රජ ඇමතියන් හා මහසෙනග ද බත් කැවූහ, එකල ඔහු කුමාරිකාවන්ගේ ගුණ කියා සතුති කරන්නාහු "මේ ලොකයෙහි සියලු සත්වයෝ ම නොයෙක් අභිවෘද්ධි සඳහා ගෝකුණෙහි උපන ද ගොරද නොදමා හැරගනිති; ගෝකුණ එසේ නොගන්නාහු මය; එසේ හෙයින් උපන් ජාතිය කුමක් කෙරේ ද ගුණ ම වේ ද උතුම් වන්නේ" යයි කිය කියා වර්ණනා කෙරෙමින් ගියාහ.

එතැන් පටන් අශොකමාලා දෙවි මහජනයාට සංග්‍රහ කෙරෙමින් ශාලිරාජ කුමාරයන් හා සමග සුව සේ වෙසෙති; එකල රජ්ජුරුවෝ පෙර පරිද්දෙන් රාජකුමාරයන්ට උතුරුදිග්භාගයෙහි ප්‍රාසාදයක් කරවා දුන්හ; රාජකුමාරයන්[1] එහි වසන කල්හි පෙර සේ ම දෙවියන් හා මනුෂ්‍යයෝ නොයෙක් පඬුරු ගෙනවුත් දෙති, ගෙන ගෙනා පඬුරු රාජකුමාරයෝ දන් දෙති; මෙසේ නිරන්තරයෙන්[2] මහදන් දෙමින් වසන්නාවූ රාජකුමාරයෝ දවසෙක හෙල්ලොලි නම් ගමට නුදුරු තන්හි අස්මඩල නම් ගමකට[3] ගියාහු බොහෝ කන බොන ද ආදිය ලදින්[4] වේලා ඇති බව දන "රහතන් වහන්සේ සිඟා වඩනා කලැ"යි කාලඝොෂා කැරවූහ. එකල රුහුණු තුලාධාර නම් පර්වතයෙහි වසන පත්සියයක් රහතන් වහන්සේ අවුත් සුපිපි රත්පියුම් වනයක් සේ වැඩ සිටිසේක. රාජකුමාරයෝ හැමදෙනා වහන්සේගේ පාත්‍ර[5] ගෙන වඩාහිඳුවා මියුරු වූ රස අහර වළඳවා සළු පිරිකර පිළිගන්වා ඉක්බිති "ස්වාමිනි, කොයි සිට වැඩිසේක්"දැයි විචාරා "රුහුණු තුලාධාර පර්වතයෙහි සිට ආම්හ"යි කී කල්හි "ස්වාමිනි, ඒ විහාරය ඉතා දුරය[6] හැම දෙනා වහන්සේට විහාරයක් කරවමි"යි තමන් වහන්සේ[7] නමින් රජමහා විහාරයක් කරවා පිළිගැන්වූහ. මෙසේ ඒ රාජකුමාරයන් උතුරුදිග මාළිගාවෙහි බොහෝ දවසක් වාසය කළ කල්හි පෙර පරිද්දෙන් ම රජ්ජුරුවෝ අමාත්‍යවරුන්ගේ බස් අසා නුවරට නැගෙනහිර මහත් වූ ප්‍රාසාදයක් කරවා දුන්හ. එහි වසන කල්හිදු රාජකුමාරයෝ පෙර පරිද්දෙන් ම භික්ෂූන්[8] වහන්සේට බොහෝ සිවුපසදනය පැවැත්වූහ. මෙසේ මහදන් දෙමින් වසන දෙමහල්ලෝ ඔවුනොවුන් හා කථා කෙරෙමින් උන්නාහු "මෙසේ සියලු සම්පත් උපදනේ මාගේ කුශලයෙන් ම උපදනේය, මාගේ කුශලයෙන් ම උපදනේය"යි කියමින් විවාදයක් ඉපදවූහ. ඉක්බිති රාජ කුමාරයෝ තමන්ගේ කුසල් විමසනු සඳහා එක් තැනෙක උදකලා ව උන්හ, එකෙණෙහි ඔවුන්ගේ කුශලානුභාවයෙන් දෙවියන් හා මනුෂ්‍යයෝ නොයෙක් සිය දහස් ගණන් ගැල්[9] පුරා අනෙකප්‍රකාර පඬුරු[10] ගෙනවුත් රාජාඞ්ගණයෙහි රැස්වූහ, රාජකුමාරයෝ ඒ පඬුරු දක මහත් වූ සන්තොෂයට පැමිණ තමන් නිසා ම සියලු වස්තු උපදනා බව නිශ්චය කොට දන

1. රාජකුමාරයන්ට - BG
2. නිරන්තර ව - BDGHKL
3. ගමට - BDEGHKL
4. ලැබ - BDEGHKL
5. පාත්‍රා - CHJ, ම.
6. දුර - BEGHKL
7. තමන් - BDEGHKL, ම.
8. භික්ෂුසංඝයා - H
9. බඩහැල් - L
10. රජපඬුරු - B

Non-Commercial Distribution

අශොකමාලාදෙවීන් හා සමඟ කෙළකෙළ හිඳ කියන්නාහු "දේවීනි, තොප විසින් මාගේ කුශලානුභාවය ප්‍රත්‍යක්‍ෂකොට[1] ම දක්නාලද, කිමෙක් ද තොපගේ කුශලයක් නුදුටුමෝ නැ"[2]යි කීහ. එබසට බිසව් "එසේ වීනම් දේවයන් වහන්ස, මඳක් බැලුව මැනව; මමත් පෙරජාතියෙහි කරනලද කුසල් ඇත්තෙම් මය, මාගේ කුශලයත් බැලුව මැනවැ"යි කියමින් එතැන්හි ම උන්හ. එකෙණෙහි අශොකමාලා දේවීන්ගේ ගෙහි වසන දෙවතා දූ තොමෝ ඔවුන්ගේ විතර්කය දැන දිව්‍යබෙහෙත්[3] බහනලද [ඇඹුල්][4] කැඳසැළක් ගෙන දෙමහල්ලන් ඉදිරියෙන් පෙනී ගියාය, උභ දෙදෙන දෙවතාදූ දැක "කිමෙක් ද ගෙනායේ ය"යි විචාළහ; එබසට දෙවතාදූතොමෝ 'ස්වාමීනි, ආශොක-මාලාදේවීන් වහන්සේට ගෙනා බෙහෙත් කැඳිත්තකැ"යි කිව. එතෙපුල් අසා රාජකුමාරයෝ ඇකයෙහි අත් ගසා මහත්කොට සිනාපීහ[5]. එකල දෙවතානුභාවයෙන් බිසව් කියන්නාහු "ස්වාමීනි, සි සී[6] මට නිඳ නොකළ මැනව, මේ කැඳෙහි ආනුභාව නුඹවහන්සේට නොදනෙයි; එසේ හෙයින් මා අතින් ඇසුව මැනවැ"යි කියා කැඳෙහි ගුණ කියන්නාහු;

"දිබ්බාගදං ඉමං[7] ධීර - සබ්බරොගහරං වරං,[8]
යාය අජ්ඣිතමත්තෙන - අන්‍ධා හොන්ති අනන්‍ධකා[9].

සීසං උපසමං යන්ති - කණ්ඩු කච්ඡු වණාදයො,
පීතමත්තෙන මූගාපි මූගත්තං පජහන්ති තෙ.

බධිරා 'බධිරා හොන්ති - හොන්ති බඤ්ජාදිකා සුඛී,
වලී වලීනං නාසෙති - තථෙව පලිතං සිරෙ.

සබ්බරොගවිනාසාය - අලමෙතං ගදං භුවි,
මහාධනො මහාභොගි - සබ්බාලඞ්කාරභූසිතො.

සචෙ හොති සද රොගී - න සො සොභති සබ්බද,
අරොගත්ත සමං ලොකෙ - ධන ධඤ්ඤං න විජ්ජති,
අව්‍යාධි ච නිරාතඞ්කී[10] - සොච සබ්බත්‍ථ සොභති"යි.

යනාදීන් "දේවයන් වහන්ස, මේ බෙහෙත්කැඳ නම් යම්[11] සියලු ව්‍යාධි නසන උතුම් වූ දිව්‍යඖෂධයෙක, මේ බෙහෙත් කැඳින් මඳක් ඇස ඇඳි[12] ඇසිල්ලෙහි අන්‍ධයෝ ඇස් ලැබෙති; ගඩපොළ කස් ආදී වූ[13] සියලු රොග සන්හිඳෙයි, මේ කැඳින් මඳක් අනුභව කළ ඇසිල්ලෙහි ගොළුවෝ කථා කෙරෙති, බිහිරි නැති වෙයි; සියලඟ රැළි නැති වෙයි; ඉස නර නැති වෙයි; මේ පෘථිවිතෙලෙහි සත්වයන්ට ඇති වන යම් ම ව්‍යාධියකට මේ ඖෂධය ම පමණ ය; මේ ලොකයෙහි[14] බොහෝ ධනධාන්‍ය සම්පත් ඇති ව සර්වාභරණයෙන් සැරහී ඇවිදුනේ වී නමුදු ඉදින් රොගී වී නම් ඉතා

1. ප්‍රත්‍යක්ෂයෙන් - BDEGHKL
2. නුදුටුමෝවේ ද යි - C
නුදුටුමෝ වනැයි - ක.කි.සං.
නුදුටුම්හ යි - ම.
3. දිව්‍යබෙහෙදක් - CJ, ම.
4. අඹු - පිටපත් හැම
5. සිනාසිපීහ. - BEGH, ස., සිපීහ - KL
6. සිනාසි - BDEGHK
7. ඉදං - KL
8. පරං - ක.කි.සං.ම.
9. අනන්‍ධා හොන්ති අන්‍ධකා - බෙ.
10. නිරාතඞ්කො - මුද්‍රිත හැම, ස.
11. යම් (නැත) - BDEGHKL
12. ගෑ - HL
13. කිලාස ආදී වූ - ම.
14. යමෙක් මේ ලෝකයෙහි - K, ස.

Non-Commercial Distribution

නොහොබනේ මය; මේ ලොකයෙහි නිර්ව්‍යාධිබව හා සමාන අන්කිසි ධන ධාන්‍යයෙක් නැතැ යි[1] කිසි ව්‍යාධියක් නැති[2] නිරොගී තැනැත්තේ හැම තැන්හි ම ශොභාමත් ව බබලයි" කීහ. එතෙපුල් අසා රාජකුමාරයෝ සියලඟ සම්වැරළි[3] ගත් මහලු මිනිසකු ගෙන්වා ගෙන ඔහුට යම්තම් කැඳිත්තක් පෙවූහ. ඒ මහලු ඒ ඇසිල්ලෙහි තරුණ පුරුෂයකු මෙන් විලිපිලි නැති ව ශොභාමත් ව සිටගත, රාජකුමාරයෝ ඔහු දක මහත් වූ ආශ්චර්‍ය්‍යයට පැමිණ දෙළොස් දහසක් භික්‍ෂූන්වහන්සේට පාත්‍ර පුරා කැඳ දුන්හ[4]. ඉක්බිති යම් ම ව්‍යාධියක් ඇති කෙනෙක් ඔවුන්ගේ මාළිගාවට ගොස්[5] බෙහෙත් කැඳ ඉල්වාගෙන ඉන් ව්‍යාධි යන්හිඳුවා ගනිති; කෙනෙක් වියදම් කළත් සැළෙහි කැඳ අඩු නොවෙයි.[6] මෙසේ ඒ බෙහෙත් කැඳ සැළ ඔවුන් ජීවත් ව වසනතෙක් ම අඩු නොව තිබුයේ මය. ඉක්බිති ඒ දුටුගැමුණුරජ්ජුරුවෝ ශාලිරාජකුමාරයන් කැඳවා "පුත, මා ඇවෑමෙන් ලෝසසුන් දෙක යෙහෙන් රැක දැහැමෙන් රාජ්‍යය කරව"යි කීහ. ශාලිරාජකුමාරයෝ චනාභි රාජ්‍ය සම්පත්තියට වඩා අශොකමාලා දේවීන් කෙරෙහි තමන් අතිශයින් ඇලුම් ඇති හෙයින් රාජ්‍යය නොකැමැති වූහ, එසේ හෙයින් දුටුගැමුණු රජ්ජුරුවන් ඉක්බිති ඔවුන්ගේ ම සහෝදර මල් වූ සැදෑතිස්ස කුමාරයෝ රාජ්‍යයට පැමිණ බොහෝ පින්රැස් කෙරෙමින් අටළොස් අවුරුද්දක් රාජ්‍යය කොට තුසීපුර ගියහ. අශොකමාලා දේවින් හා ශාලිරාජකුමාරයෝ ද තමන් දිවිහිමියෙන් දන් දී සිල් රැක පොහොය පෙහෙ ව මෙසේ නොයෙක් පින් රැස් කොට ජීවිතාවසානයෙහි සත් පනස් කෙළ සැටලක්‍ෂයක් අවුරුද්දට ආයු ඇති තුෂිත භවනයෙහි උපන්හ. ඔවුන් අතුරෙන් ශාලිරාජ කුමාරයෝ මතු බුදු වන මෛත්‍රෙය[7] බුදුන්ට බුදු වන ජාතියෙහි බ්‍රහ්මවර්ධන නම් පුත් ව ඉපද සසුන් වැද මහණ ව සියලු කෙලෙසුන් ගෙවා රහත් ව අමාමහ නිවන් දක්නාහ. එබැවින් මෙසේ බුඬශාසනයෙහි අතිප්‍රසන්න වූ සාධුජනයන්ගේ උතුම් මේ පූර්වචරිතය අසා සිත තබාගෙන නුවණැති සත්පුරුෂයන් විසින් තම තමා ශක්තිපමණින් පිළිවන් කුසල් කොට මතු දිව්‍යමනුෂ්‍ය සම්පත් විඳ නිවන්පුර සිරි ලබන්ට උත්සාහ කළ මැනවි. කියනලදුයේ මැයි;

ඉති සුජනජනානං සාසනෙ සොභදනං
පරම[8] චරිතමෙතං සුත්වා චිත්තෙන නිධාය.
චිනථ[9] කුසල රාසිං ථාමසා සබ්බකාලං
වසථ සිවපුරසමිං[10] ගන්ත්වා රමෙම චිරං භො-යි.

මේ මෙහි පළමු වන
ශාලිරාජ වස්තුව ය.

තව ද මෙහි දෙවන නකුල වස්තුව නම් කවර යත්? හේ මෙසේ දත යුතු. කෙසේ ද යත්;

මෙම ලක්දිව රුහුණු ජනපදයෙහි එක්තරා ගමෙක නකුල නම් උපාසකයෙක් වෙසෙයි; එතෙම ඉතා දුඃඛිතය; බොහෝ දුක් ගෙන මහත් වූ ආයාසයෙන් පුත්‍රදරාවන් රක්‍ෂා කෙරෙයි; ඔහුගේ දුවක් කහවණු දෙළොසකට ණයගැති ව මාගම එක්

1. නැත - BEGHKL
2. නැති ව - C
3. රැළි - KL
4. කැඳ දන් දුන්හ - GH
5. විත් - ක.කි.කැ.ම, ගොස් (නැත) - L, බෙ.
6. නොවේ මය - KL
7. මෛත්‍රී - පිටපත් හැම
8. මධුර - පාලි
9. චිනුථ - BCDEGHJKL
10. දිවපුරසමිං - K

Non-Commercial Distribution

කුලගෙයක මෙහෙ කෙරෙයි; ඒ නකුල නම් උපාසකයා තමා දුව කෙරේ ගළවා ගනිම් දේ හෝ යි උත්සාහ කොට ඇවිදිනේ උක්සකුරු ලන්නවුන්ට උක්පැණි[1] මිරිකා දී බැලමෙහෙ කොට බොහෝ දුක්ගෙන කහවණු දෙළොසක් උපදවාගෙන මාගමට යනුයේ අතරමග ගැලබුන්කඩට[2] පැමිණ එතැන්හි තිස් මහවෙහෙර වසන චූළපිණ්ඩපාතික තිස්ස තෙරුන්වහන්සේ දක සිතනුයේ "තව පෙරවරුභාගය, වේලා ආසන්න ය; සමීපයේ ගමකුත් නැත; තෙරුන් වහන්සේ දුන්බත්වූසේක් නම්[3] කටයුතු නොවෙයි; කුමක් කෙරෙම්දෝ හෝ"යි සිතා සිටියේය. එකෙණෙහි එක් මිනිසෙක් බත් මුළක් ඇරගෙන එතැන්හි පැමිණියේය. උපාසකයෝ ඔහු දක සතුටු ව ;යහළු, තෙල බත්මුළ දීපියව; දන්දෙනු කැමැත්තෙමි" යි කියා බත්මුළ ඉල්වූහ, ඔහු එසේ නිකම් නොදෙන හෙයින් "කහවණුවක් ඇරගෙන දීපියව"යි කීහ. ඔහු එසේත් නොදෙන හෙයින් විටින් විට මිල වඩා "යහළු, මේ කහවනු දෙළොස ඇරගෙන දීපියව"යි කියා තමන් දුක සේ සොයා ගත් කහවණු දෙළොස දී බත්මුළ ඇරගෙන තෙරුන්වහන්සේ සමීපයට එළඹ පසඟ පිහිටුවා වැඳ පාත්‍රය ගෙන බත් බහාලා තෙරුන් වහන්සේට පිළිගැන්වූහ. තෙරුන් වහන්සේ පාත්‍රය පිළිගත් කල්හි උපාසකයෝ ඒ ආහාරය මිල දී ඇරගත් සැලැස්ම සැළකළහ. එපවත් අසා තෙරුන්වහන්සේ සිතනසේක් "මෙසේ[4] මේ උපාසකයා මහත් වූ ශ්‍රද්ධාවෙන් දුන්නා වූ ආහාරය සරාගී සදෙසී සමොහී ව ඉඳ වළඳ මෝහට මා ප්‍රත්‍යුපකාරයක් කළ නොහැක්කැ" යි සිතා එක් රුකක් මුලට එළඹ පාත්‍රය එක් පසෙක තබාගෙන වැඩහිඳ තමන්වහන්සේ තමන්වහන්සේට අවවාද කරනසේක්: "එම්බා තිස්ස ස්ථවිරයෙනි, මේ උපාසකයා තොපගේ කුඩා පියෙක් මහලු පියෙකුත් නොවෙයි, මලෙක් බෑයෙකුත් නොවෙයි, මයිලෙක් සිලියෙකුත්[5] නොවෙයි, ඥතිසාලොහිත කෙනෙකුත් නොවෙයි, අනික් අවශ්‍ය බන්ධු කෙනෙකුත්[6] නොවෙයි, දෘෂ්ටමාත්‍ර මිත්‍රයෙකුත් නොවෙයි, දෘඪ මිත්‍රයෙකුත් නොවෙයි, තොප විසින් පළමු මේ උපාසකයාට කළ උපකාරයෙකුත් නැත, එතෙකුදු උවත් තොපි සිල්වත ගුණවතැ යි සිතා තොපට මෙසේ මහොත්සාහයෙන් දන් දීත. එබැවින් මීහට වැඩිතරම් ආනිසංසයක් වන්නා කැමැත්තා නම් තොපගේ ජීවිතය නිරුද්ධ වේ නමුත් සරාගි සදෙසී සමොහී ව හිඳ මේ ආහාරය අනුභව නොකරව"යි මෙසේ තමන්වහන්සේ තමන්වහන්සේට අවවාද කොට "මෝහට මෙම[7] ජාතියෙහි උපකාරයක් කළමනා මය"යි සිතා තමන් වහන්සේගේ කම්ජශරීරය උදාවිය[8] වශයෙන් සම්මර්ශිතය කොට ශ්‍රොතාපත්ති මාර්ගය ශ්‍රොතාපත්ති ඵලය සකෘදගාමිමාර්ගය සකෘදගාමිඵලය අනාගාමිමාර්ගය අනාගාමිඵලය අර්හත්මාර්ගය අර්හත්ඵලය යි මෙසේ මාර්ගඵල පටිපාටින් රහත්බවට පැමිණ ඒ ආහාරය අටහ සමන්නා පස්විකාගෙන වැළඳූසේක. එසේ හෙයින් කියන ලදී,

නෙසො උපාසකො තිස්ස - පිතා භාතා ච මාතුලො,
න සඤාති සුහදෙ හොති - දිට්ඨ සම්භත්තකො තව.

කිඤ්චි තස්ස කතං නත්ථි - උපකාරං පුරෙ තයා,
සීලවන්තොති තං ඤත්වා - තුය්හං දස්සති භොජනං.

1. උක්පැන් - J, ක.කි.ඤ.
2. ගැල්බුන්කඩට - BDEGKL, ස. ගැන්බුන්කඩට - C.
3. නම් නපුර - ම.
4. මේ මෙසේ - J, ක.කි.ඤ.
5. සිලිපියෙකුත් - H සිලිපියකුත් - B
6. එකෙකුත් - ම.
7. මා මෙම - BEGL
8. උදයව්‍යය - මුද්‍රිත හැම, ස.

Non-Commercial Distribution

මහත්තරං ආනිසංසං - තස්ස ත්වං යදි ඉච්ඡසි,
සරාගො තං[1]න භුඤ්ජාහි - මීයමානො'පි භොජනං.

ඔවදිත්වාන සො අත්තං - කත්වා දුක්ඛක්ඛයං තද,
හත්ථකිච්චමකා ධීරො - බුද්ධසාසනසොභකො-යි.

මෙසේ ඒ නකුල නම් උපසකයා තෙරුන් වහන්සේට දන් දී ඉක්බිති මාගමට ගොස් තමාගේ දුව දුටුයේය. ඕතොමෝ පියාණන් දැක 'කිමෙක් ද පියාණන්වහන්ස, ගෙනා දෙයක් ඇද් ද'යි විචාළීය. එබසට උපාසකයා 'එසේය මැණියෙනි, මම කහවණු දෙළොසක් ගෙනාමි, අතරමග වේලා ආසන්නයේ එක් තෙරකෙනකුන් වහන්සේ දැක සුන්බත් වෙති යි සිතා සියල්ල ම වියදම්කොට බත්මුළක් ඇරගෙන උන්වහන්සේට දන් දිනිමි, ඒ පින්කම තෙපිත් අනුමෝදන් ව ගනුව'යි පින් දුන්නේය, උන්ගේ දුවණියෝ ද 'කළ දෑ යහපතැ'යි කියා සතුටු වූ සිතින් පින් අනුමෝදන් වූහ. ඉක්බිති ඒ තිස්ස තෙරුන් වහන්සේ මෙසේ අග්‍ර වූ අභීන් ඵලයට පැමිණ එම විට තුවටුවෙන් ගිලිහුණු තාලඵලයක් මෙන් ප්‍රසන්න වූ මුඛපද්මයක් ඇති ව විහාරයට වැඩිසේක. එකල භික්ෂූන් වහන්සේ ඔබ රහත් වූ බව ආකාරයෙන් ම දැන ස්වාමිනි, අද එකාන්තයෙන් ම මාගීඵලයකට පැමිණියහ යි සිතම්හ'යි වදාළසේක. එතෙපුල් අසා 'එසේ ය ඇවැත්නි, අසවල් ගම මෙනම් උපාසකයෙක් අද අතරමග වේලා ආසන්නයෙහි දැක දැහැමෙන්[2] දනක් දින. එම දනය නිසා අද සසර දුක් ගෙවා ජාතිය කෙළවරට පැමිණෙන ලද්'යි සියල්ල ම විස්තර වශයෙන් වදරා 'යම් දවසෙක මම පිරිනිවන් පායිම්[3]ද එකල්හි මා සැතපුණාවූ කුළුගෙය සෙස්සවුන් ඔසවන කල්හි නොඑසවේව'යි යම් දවසෙක ඒ උපාසකයා ඇවිත් ඔසවා ද එකල්හි එසවේව යි කියා පිරිනිවන් පානා දවස් ද එපරිද්දෙන් අධිෂ්ඨාන කොට පිරිනිවිසේක. එකල්හි මහාජනයෝ එක් ව උන්වහන්සේ ආදහන කරවම්හ යි මහත් වූ පූජාසත්කාර කොට කුළුගෙය සරහා තෙරුන් වහන්සේ එහි සතප්වා ඔසවන්නාහු තුබූ තැනින් සොලවාගත නුහුණුවූය[4] මෙසේ සියයෙක දෙසියයෙකැ යි වඩවඩා මනුෂ්‍යයෝ එක් ව තුබූ තැනින් සොලවා ගත නුහුණුවූය.[4] ඉක්බිති එපවත් කාවන්තිස්ස රජ්ජුරුවන්ට කීහ, රජ්ජුරුවෝ ද මහසෙනග පිරිවරා අවුත් නොයෙක් උත්සහා කොටත් සොලවා ගත නුහුණුවූය[4]. ඉක්බිති රජ්ජුරුවෝ සඞ්ඝයාවහන්සේ කරා එළඹ 'ස්වාමිනි, මේ දෙණ හා සමග රත්නමණ්ඩපය නොඑසවෙන්නට කාරණ කිම් ද'යි විචාළහ, භික්ෂූන් වහන්සේ ඊට කාරණ පළමු තෙරුන් වහන්සේ වදළ පරිද්දෙන් රජ්ජුරුවන්ට කීසේක, රජ්ජුරුවෝ එපවත් අසා ඒ නකුල නම් උපාසකයා කැඳවා ගෙන්වාගෙන 'මේ කුළුගෙය අල්වව'යි කීහ, රජ්ජුරුවන්ගේ බස් අසා ඒ උපාසකයා ගොස් කුළුගෙය මදක් අතින් ඇල්වූ පමණකින් ම අහසට නැඟී ආදහනස්ථානයට ගියේය. එකල එතැන්හි රැස්වූ මනුෂ්‍යයෝ ද රජ්ජුරුවෝ ද ඒ ආශ්චර්‍ය්‍යය දැක අතිශයින් අද්භූතයට පැමිණියාවූ සිත් ඇත්තාහු ඒ නකුල නම් උපාසකයාට බොහෝ සම්පත් දී ඔහු වසන ගම ඕහට බත්ගම් කොට දුන්හ. එතැන් පටන් ඒ ගම නකුලකර්ණිකාය යි ප්‍රසිද්ධ විය, ඒ උපාසකයා ද එතැන් පටන් බොහෝ කුසල් කොට එයින් ගොස් දෙව්ලොව උපන්හ.

1. ත්වං - C
2. සැදැහැයෙන් - BDEGHKL
3. පාම් ද - BHK, ක.කි.සූ.ම.
4. නුහුණුවාහුය - BCGHL

Non-Commercial Distribution

මෙසේ ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයෝ ස්වල්ප වූ දනයෙන් පවා අපමණ වූ භවභොගසම්පත් ලබන්නාහු මය, එබැවින් භවභෝගසම්පත් කැමැති සත්ත්වයන් විසින් දනශීලාදි වූ කුශලධර්මයෙහි යෙදී එයින් ජනිත වූ ඉෂ්ටවිපාකයෙන් ස්වර්ගමොක්ෂ සම්පත් ලබන්ට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි;

එවම්පි සන්තො භවභොග සම්පදං
ලභන්ති දනෙන පරිත්තකෙන,
තුම්හෙ පි දනෙ අථ සීලසඤ්ඤමෙ
අත්තං නිවෙසෙථ පයාථ නිබ්බුතිං යි.

මේ මෙහි දෙවන
නකුල වස්තුව ය.

තව ද මෙහි තුන් වන ශ්‍රද්ධාතිස්ස අමාත්‍ය වස්තුව නම් කවර යත්, හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මෙම ශ්‍රී ලඞ්කාද්වීපයෙහි ශ්‍රද්ධාතිස්ස නම් රජ්ජුරුවන් රාජ්‍යය කරන කල්හි[1] පුළුන්නරු නම් ගම තිස්ස නම් අමාත්‍යයෙක් විය, ඔහු මහත් වූ ශ්‍රද්ධා ඇති හෙයින් ශ්‍රද්ධාතිස්ස නම් අමාත්‍යය යි නම් විය, එකල්හි ඒ අමාත්‍යයා අනුරාධපුරයට ගොස් රජ්ජුරුවන්ට සේවය කෙරෙමින් වසන්නේය. එක් දවසෙක රජ්ජුරුවන්ට සේවය කොට එන්නේ තාලවත්‍ථක නම් තෙනදී සුදස්සන නම් ප්‍රධාන ශාලාවෙහි වසන්නාවූ පිණ්ඩපාතික තිස්ස තෙරුන් වහන්සේ අහර සිගා වඩනා දක පාත්‍රය ගෙන තමන්ගේ ගෙට ගොස් උදවූ බතක්[2] නැති හෙයින් බත්මුළක් ඇරගෙන මහට පිළිපන්නාවූ පුරුෂයකු දක 'යහළු, කහවණුවක් ඇරගෙන බත්මුළ මට දෙව'යි ඉල්වීය, ඔහු මස්සකට නොදෙමි කී කල්හි එකින් එක වඩා කියකියා 'කහවණු අටක් ඇරගෙන බත්මුළ දීපියව'යි ඉල්වීය, එකල පුරුෂයා යහපතැ යි රන් ඇරගෙන බත්මුළ දුන්නේය. ශ්‍රද්ධාතිස්ස අමාත්‍යයා බත්මුළ ඇරගෙන පාත්‍රයෙහි බහා තෙරුන් වහන්සේට පිළිගැන්වීය, තෙරුන් වහන්සේ ඒ ආහාරය මිල දී ගත් සැලැස්ම දක[3] තමන් වහන්සේට අවවාද කරනසේක් 'පිණ්ඩපාතික තිස්සයෙනි, මේ උපාසකයා තොපගේ කුඩාපියෙක් මහලුපියෙක් වැදපියෙකුත් නොවෙයි; මලෙක් බෑයෙක් මයිලෙකුත් නොවෙයි, තොපගේ වර්ග බන්ධු එකෙකුත් නොවෙයි; යහළු මිත්‍රයෙකුත් නොවෙයි, පෙර තොප ඕහට කළ උපකාරයෙකුත් නැත, එතෙකුදු වුවත් තොප සිල්වතැ යි සිතා තොපට මේ ආහාරය පිළිගැන්වීය; එබැවින් ඕහට වැඩිතරම් ආනිසංසයක් වනු කැමැත්තා නම් ප්‍රාණය නිරුද්ධ වේ නමුත් සරාගි සදෙෂී සමොහී ව හිඳ මේ ආහාරය අනුභව නොකරව'යි මෙසේ තමන්වහන්සේ තමන්වහන්සේට ම අවවාද කොට තමන් වහන්සේ වසන සෙනස්නට වැද තමන්වහන්සේගේ කර්මජ ශරීරය උදවිය[4] වශයෙන් සම්මර්ශනය කොට විදර්ශනා වඩා රහත් ව වැඩහිඳ අහර වැළඳූසේක. එසේ හෙයින් කියනලදී;

1. සමයෙහි - C
2. බත් - CJ, ක.සි.සඤ,බෙ.ම.
3. දක තමන්වහන්සේ - KL
4. උදයව්‍යය - මුද්‍රිත හැම

Non-Commercial Distribution

නෙසො උපාසකො තිස්ස - පිතා භාතා ච මාතුලො,
න ඤාති සුහදෙ හොති - දිට්ඨසම්භත්තකො තව.

කිඤ්චි තස්ස කතං නත්ථි - උපකාරං පුරෙ තයා,
සීලවන්තො'ති තං[1] ඤත්වා - තුය්හං දස්සති භොජනං.

මහත්තරං ආනිසංසං - තස්ස ත්වං යදි ඉච්ඡසි,
සරාගො ත්වං න භුඤ්ජාහි - මීයමානො පි භොජනං.

ඔවදිත්වාන සො අත්තං - කත්වා දුක්ඛක්ඛයං තද,
හත්ථකිච්චමකා ධීරො - බුද්ධසාසනසොභකො-යි.

එකල්හි රජ්ජුරුවන්ගේ ඡේසත වසන දෙවතාදු සාධුකාර දුන[2]; එකල රජ්ජුරුවන් 'කුමක් පිණිස සාධුකාර දෙව් ද'යි විචාළ කල්හි 'ශ්‍රද්ධාතිස්ස අමාත්‍යයා විසින් දෙන ලද්දවූ දනයට සාධුකාර දෙමි'යි කියා ඔහු මිල දී ආහාරය ගෙන දන් දුන් නියාව ද එම ආහාරය මුල් ව තෙරුන්වහන්සේ භාවනා කොට රහත් ව වැඩ හිඳ අහර වැළඳූ නියාව ද යන සියල්ල ම විස්තර වශයෙන් කිව; රජ්ජුරුවෝ ඒ අමාත්‍යයා ද ඔහුගේ මවුපිය දෙදෙනා ද කැඳවා ගෙන්වාගෙන ඔවුන් අතිනුත් ඒ සියල්ල ම විචාරා සන්තුෂ්ට ව පින් ඇරගෙන උන් හැම දෙනාට බමුණන්ට දෙන දනක් මෙන් අතපැන් වත්කොට වඩමන් නම් නුවර දුන්හ.

එයින් මෑතභාගයෙහි වැසි නැති වීමෙන් දුර්භික්ෂ විය. වපුළ බිජුවට ගොයම් ආදිය නියඟින් මෙළේය; මනුෂ්‍යයෝ බීපියන තරම් පැන් නොලැබ බොහෝ සේ ක්ලාන්ත වෙති; වෙහෙස විඳිති; එකල්හි ඒ අමාත්‍යයාගේ කුශලබලයෙන් දෙවතාවෝ විලක් නිර්මිත කොට එයින් පැන්කළයක් ගෙනැවිත් දුන්හ; ඉක්බිති ඒ අමාත්‍යයා 'සඞ්ඝයා වහන්සේට පැන් දන් නොදී පළමු කොට පැන් පීම යුක්ත නොවෙයි'යි සිතා 'මට අනුග්‍රහකොට ආයුෂ්මයන්වහන්සේ වඩනාසේක්ව'යි කියා කාලඝොෂා කෙළේය, එකල තිස් දහසක් පමණ භික්ෂූන් වහන්සේ රැස්වූසේක; ඒ හැමදෙනා වහන්ස්ට පැන් දන් දී උපස්ථාන කෙළේය. එකල්හි ද රජ්ජුරුවන්ගේ ඡේසත වසන දෙවතාදු ඕහට සාධුකාර දුන; රජ්ජුරුවෝ එකල්හි ද ඔහු කැඳවා ගෙන්වා ගෙන සියල්ල ම විචාරා නියම දන සතුටුව හොටදෙර අත්තරගංගා නම් තැනක් බ්‍රහ්ම දෙය්‍ය කොට දුන්නේය.[3]

අනික් දවසෙක ඇතුළු ගං බලා යන්නේ කඩදෙරට පැමිණ මොනරමස් කනු කැමැති ව 'මොනරමස් ඇද් ද'යි කැට්ව යන්නවුන් අතින් විචාළහ; ඔහු 'එසේ වූ මාංසයෙක් නැතැ'යි කීහ; එකල්හි ඔහුගේ කුශලානුභාවයෙන් දෙවතාවෝ මොනරමස් එළවා දුන්හ; ඒ දක අමාත්‍යයා 'ආයුෂ්මයන්වහන්සේට දන් නොදී නොකමි'යි සිතා 'මට කරුණා කොට රහතන්වහන්සේ වඩනා සේක් ව'යි කියා කාලඝොෂා කෙළේය, එකල්හි ද බොහෝ දෙනා වහන්සේ රැස්වූසේක. ඒ ඇමදෙනා වහන්සේ ද මයුරමාංස වැළඳවීය; එකල්හි ද දෙවතාදු පළමු පරිද්දෙන් ම සාධුකාර දුන්හ. එදවස් ද රජ්ජුරුවෝ අමාත්‍යයන් ගෙන්වාගෙන බොහෝ සම්පත් දුන්හ.

1. ත්වං - BCEHJ
2. දුන්හ - C
3. දුන්හ - ම.බෙ.ස.

Non-Commercial Distribution

එයින් මෑතභාගයෙහි රජ්ජුරුවෝ සෑගිරියෙහි අඹතල නම් ගල්කුළ[1] මුදුනෙහි පිහිටි මහසෑයෙහි රන්වන් සිරියෙලින් පිරිබඩ ගන්නා කැමැති ව තිස්ස නම් අමාත්‍යයා හා සමඟ අඹතලවිටට ගොස් සිරියෙල් පිරිබඩ ගත්හ; එකල්හි අමාත්‍යයා ද දෙළොස්දහසක් භික්ෂූන් වහන්සේට රන්සිරියෙල් පැහැ ඇති තුන්සිවුරු දී 'ඇමදෙනා වහන්සේ ම' මේ සිවුරු වැළඳගෙන මේ දගබ්සාමින් වට වැඩ ඇවිදිනාසේක්වා'යි කීය[2], ඉක්බිති හැමදෙනා වහන්සේ ම ඉඳුරා සිවුරු හැඳ පෙරව රන්සිරියෙල් කල්කයෙහි ගැලුණාවුන් මෙන් ශොභමාන ව දගබවට[3] ප්‍රදක්ෂිණා කොට වැඩ රන්වන් හංස සේනාවක් සේ බස්නට වන්සේක. එකල්හි අමාත්‍යයා මහත් වූ සන්තොෂයෙන් පිනා ප්‍රීතිහරිත වූ ගාත්‍රා;[4] ඇති ව එම සන්තොෂයෙන් එතැන්හි ම සිට සෝවාන් විය; එතැන්හි රැස්වූ රජසෙනඟින් සමහර කෙනෙක් ද සෝවාන් වූහ, ඒ ආශ්චර්ය්‍යය දැක බොහෝ දෙන දන් දී සිල්රැක පොහොය පෙහෙවස් රැක ඒ පිනින් ගොස් දෙව්ලොව උපන්හ.

එසේ හෙයින් පින්වත් සත්වයෙනි, මෙසේ ආශ්චර්ය්‍ය[මත්] ලෙස[5] කරන ලද්ද වූ කුශලධර්‍මය දෙවියෝ පවා සාධුකාර දෙමින් අනුමෝදන් ව ස්තුති කෙරෙමින් පින් කරන්නාවුන්ගේ ගුණ වර්‍ණනා කෙරෙති; එපරිද්දෙන් ම තමතමන්ගේ කීර්ත්තිය මුළු ලෙව්හි[6] පතුරුවනු කැමැත්තාවූ පින්වත් සත්වයන් විසින් ක්ෂණමාත්‍රයකුත් සිස් නොයවා නිරන්තරයෙන් කුසල් කළ මැනවි. කියනලදුයේ මැයි;

අචේරං හො කත සුචරිතං නිජ්ජරා චාභිගන්ත්වා
මානෙන්තෙතං අථ ථුතිමුඛා වණ්ණනං වණ්ණයන්ති,
එවං ඤත්වා විබුධ මනුජා තප්පදමානා සුකිත්තිං[7]
ලොකෙ පුඤ්ඤං කුරුථ සතතං මා ඛණංයාතු තුච්ඡං-යි

මේ මෙහි තුන් වන
ශ්‍රද්ධාතිස්ස අමාත්‍ය වස්තුව ය.

තව ද මෙහි සතර වන තිස්සා වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මෙම ලඞ්කාද්වීපයෙහි සද්ධාතිස්ස නම් රජ්ජුරුවන් රාජ්‍යය කරන සමයෙහි රුහුණු රට තසඹතොට[8] ය යි යන ගම මුණ්ඩගුත්ත නම් වූ දුප්පත් වූ මිනිසෙක් වෙසෙයි; ඔහුගේ භාර්ය්‍යාවෝ ද තිස්සා නම් වූහ, ඕ ද එලෙස් ම දුප්පත් තෙනැත්තී ය; ඔහු දෙදෙන ඉතා කෘපණ ව දුක සේ ජීවත් වන්නාහු අනුන්ගෙන් කහවණු සැටක් ණයට ඇරගෙන එපමණක් දීගත නොහී ණය දුන්නාවුන්ගේ ගෙහි ම මෙහෙවර කෙරෙමින් දවස් යවති. එසමයෙහි ඒ ගම වසන බොහෝ මනුෂ්‍යයෝ එක් ව සංඝයා වහන්සේට ආරාධනා කොට දන් දෙමින් සිල් රකිමින් කුශලක්‍රියායෙහි ම නියුක්ත ව වෙසෙති, එකල්හි ඒ දෙමහල්ලෝ සිතන්නාහු 'මේ සියල්ලෝ ම දන් දෙති; පින් කෙරෙති; උදක් අපි දෙදෙන ම පෙර ජාතියෙහිත් පිනක් නොකළ හෙයින් දැන් දුප්පත්

1. ගල්කුල - DJ, ක.කි.කැ.ස.
   ගල්තල - ම.
2. කියා - BEGHJKL, ක.කි.කැ.
3. දගැබට - CHL
4. ගාත්‍ර - BDE
5. ආශ්චර්ය්‍ය ලෙස - පිටපත් හැම
6. තුන් ලෙව්හි - ක.කි.කැ.ම.
7. තප්පදමානාය කිත්තිං - ක.කි.කැ.ම. පාලි
8. තිසඹතොට - ස, කසඹතොට - K

Non-Commercial Distribution

වූණුම්හ;[1] දනුත් පිනක් නොකළමෝ නම් මතුත් මෙසේ ම දුප්පත් වම්හ ය. එබැවින් කිසියම් උපායකින් දනක් දුන මැනවැ'යි සිතා ඉක්බිති ඒ ගැහැණියගේ ගෙයි හිමියා 'එම්බා සොඳුර, මේ ගම්වැස්සෝ නොයෙක් සූපව්‍යඤ්ජනයෙන් හා පඤ්චගව්‍යරසයෙන් යුක්ත කොට දන් දෙති; අපි කෙසේ දන් දෙමෝ ද'යි කියා දනක් දුන මැනවැ යි සිතූ සිත පසුබැස්වීය; එකල සත්‍රීතොම 'මරණ නම් අදය සෙටය යි නියමයෙක් නොදනෙයි[2] රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ තමහට ඇති විතරකින් දුන්නාවූ දනය උතුමැ යි' කියන්නී;

අජ්ජෙව කිච්චං ආතප්පං - කො ජඤ්ඤා මරණං සුවෙ,
න හි නො සඞ්ගරං තෙන - මහාසෙනෙන මච්චුනා.
තස්මාහං[3] සාමි ලූඛං වා පණීතං වා'පි ලද්ධකං,
දනං දදම්[4]සඞ්ඝස්ස - ඛණො වෙ මා උපච්චගා.

යනාදීන් 'කළ මැනවැ යි සිතූ යම් ම කුශලයෙක් එදවස් ම කල් නොයවා කළමනා මය, දෙවන දවසට ජීවිතය කෙසේ බවත් නොදනෙයි, කාමා තෙ පඨමා සෙනා - දුතියා අරති[5] වුච්චති යනාදීන් දක්වන ලද බොහෝ සෙනාවාහන ඇති මාරයා හා අපගේ විශ්වාසයෙකුත් නැත; එසේ හෙයින් සවාමීනි, රූක්ෂ වෙව යි ප්‍රණීත වෙව යි අපට පැදෙන සැලැස්මක සංඝයා වහන්සේට දනක් දුන මනා මය, අෂ්ටදුෂ්ටක්ෂණයෙන් විනිර්මුක්ත වූ නව වන බුද්ධොත්පාදක්ෂණය නොවරදවුව මැනවැ' කියා තමා ඉතා කෘපණ ව දුඃඛිත හෙයින් නිමුඩුසාලේ බත් ලුණු නොලා ඉවූ කර කොළ පමණක් ම එක් භාජනයක් පුරා ඉස තබාගෙන භොජනශාලාවට ගොස් සිටියා[6] මහලු කල මහණ වූ බුඩ්ඪපබ්බජිත භික්ෂු කෙනකුන් වහන්සේ පැවිදිපත්තීන් ලැබ උන්වහන්සේගේ පාත්‍රයෙහි බහා පිළිගැන්වූව; ඒ මහලු වහන්සේ බත් දක නොසතුටු ව කිපී ඒ බත් ගෙන බල්ලන්ට බත් ලන පෝරුවේ බහාපූසේක.

අහෝ! මොහයාගේ ආනුභාවයක් බැලුව මැනවි. හේ එසේ මැයි. මොහයෙන් මුළා වූ සත්වයෝ මෙසේ මේ කිරීම උචිතය අනුචිතය යි දෙක ම නොදනිති; එසේ ම කළමනා දෙය නොකළමනා දෙය යි යන දෙයත් නොදනිති; එසේ වූ මොහී සත්වයෝ මේ ලොව බලන පමණක් මිස[7] පරලොව[8] වන්නාවූ අනිෂ්ට විපාකය නො දනිති; මෙසේ මතු වන දෙය දක්ක නොහෙන්නාවූ මොහී සත්වයෝ බොහෝ දෙනා කරන කියන නින්දවෙනුත් නොමිදෙන්නාහු මය; මෙසේ වූ අනර්ථදයක වූ අනිෂ්ට[9] ඵල දෙන මොහය සියලු සත්වයන්ගේ සිත්හි කිසි කලෙකත් නොපවතීවා. කියන ලද මැයි;

උචිතං නොචිතං එතං - නෙව ජානන්ති[10] මොහිතා,
කාතබ්බඤ්ච න කාතබ්බං - කාරණාකාරණං තථා.
පස්සන්ති[11]ඉහලොකං තෙ - න තෙ පස්සන්ති[11] ආයතිං,
න පස්සන්තා තථා හෙස[12] - ගරහා නො,[13]න මුච්චරෙ.

---

1. වූම්හ - BDGHL, ස.
2. නැත - CHJ, මුද්‍රිත හැම, ස.
3. තස්මාහං - පිටපත් හැම
   තස්මාතං - මුද්‍රිත හැම,ස.
4. දදම - පිටපත් හැම,ස
5. මාර - ක.සි.ඤ
   ආර - CE
6. සිටියහ -ක.සි.ඤ
   සිටියාහ - CJ
7. මුත් - J
8. පරලොවින් - B
9. අනියත - B
10. ජානෙන්ති - BCDEGHJKL
11. පස්සති - පිටපත් හැම
12. මොහා - ම. පාලි
13. ගරහා නෙ - G, පාලි

Non-Commercial Distribution

එවං අනත්ථදෙ මොහො - අනිට්ඨඵලදෙ සද,
සබ්බෙසං පන සත්තානං - මනස්මිං නෙව වත්තතු-යි.

මෙසේ ඒ උපාසිකාව[1] තමන් දුන් බත් බල්ලන්ට ලූවා දැක දෙම්නස් ව ගෙට ගොස් ශොකයෙන් වැද හොත්තීය; එකල්හි ඒ ස්ත්‍රියගේ ගෙයි හිමි පුරුෂයා[2] වලින් අවුත් ශොකයෙන් හොත්තාවූ භාර්‍ය්‍යාව දැක ‘සොඳුර, තොපට අවාසු කිම් ද’යි විචාළේය, එකල්හි ඒ ස්ත්‍රී තොම ගෙහිමියා අනභිප්‍රාය ව[3] ඉන්දැ දී දුන් දන් හෙයින් කිසිවකුත් නොකීවාය; ඉක්බිති ඒ ස්ත්‍රී තොම නැවත නැවතත් ගෙහිමියා විචාරන හෙයින් තමා දන් දුන් සැලැස්මත් ඒ බත් බල්ලන්ට ලූ සැලස්මත් සියල්ල ම කිව; එබස් අසා ගෙහිමි පුරුෂයා කියනුයේ ‘සොඳුර, කුමක් කරමෝ ද; ඒ තොපගේ දෙෂය මය; මෙවැනි බුද්ධොත්පාදකාලයක් ලද්දවූ අප විසින් අපට පිහිටක් කොට ගත නුහුණුවමෝ නම් අපට ම අලාභය; එසේ හෙයින් දන් දිය යුත්තේ මය’යි කියා ඔහු දෙදෙන එක්තරා ඉසුරුමත් කෙනකුන් ළඟට ගොස් තමන්ගේ පුතණුකෙනකුන් ක්‍රය[4] කරවා කහවණු අටක් අගනා දෙනක ඇරගත්හ; ඒ දෙන් එදවස් ම වස්සකු වැදුව,[5] දෙවන දවස් ඒ දෙන් ගිතෙල් ම දුන; ඉක්බිති ඒ දෙමහල්ලෝ පෙරවරු ලත් සතර නැළියක් පමණ ගිතෙල් ගෙන භික්‍ෂූන්වහන්සේට ගිතෙල් හා සමඟ බත්[6] දෙති; පස්වරු ලත් ගිතෙලින් පහන් පූජාත් කොට භික්‍ෂූන්වහන්සේට බෙහෙත්පස පිණිසත් දෙති; මෙසේ කල්යාමක් ගිය කල්හි ඒ ගම වසන්නාවූ රාජපුරුෂයෙක් මෙසේ උන් ගිතෙල් ලබන බව අසා ‘මටත් ඉන් ගිතෙල් ගෙනෙව’යි මිනිසකු යැවීය; ඒ දෙමහල්ලෝ ගිය මිනිසුන්ගේ බස් අසා කියන්නාහු ‘පින්වත්නි, අපි[7] හැම ගිතෙල් කන්නමෝ නොවෙයි, ලත් ලත් පරිද්දෙන් ම සංඝයාවහන්සේට දන් දෙම්හ; පහන්පූජා ආදියත් කරම්හ’යි කියා එයින් කිසිවකුත් නුදුන්හ. එකල රාජපුරුෂයා තමාගෙන් යවූ මිනිසුන් අතින් එපවත් අසා ‘එම්බා, තෙපි රජදරුවන්ට සුදුසු උතුම් වූ වස්තුව සඟවා තබාගෙන ප්‍රයොජන විඳු ද, රජ්ජුරුවන්වහන්සේට කියා තොප හැම ගිතෙල් කවන්නෙම් වේ ද’යි දෙඩා භය ගැන්වීය; එකල මුණ්ඩගුත්තයා භාර්‍ය්‍යාවට කියනුයේ ‘එම්බා සොඳුර, මිනිසුන්ට උපදනා යම් භයෙක් ඇත් නම් ඒ සියල්ල ම අසත්පුරුෂයන් නිසා ම උපදනේය, මේ පුරුෂයා ද රජ්ජුරුවන්වහන්සේට කියා අපගේ දනයට අන්තරායක් කෙළේ වී නම් යහපත් නොවේ; එසේ හෙයින් ඒ පුරුෂයාට මණාවක් පමණ තෙල්[8] දෙම්හ’යි කියා දවස් පතා තෙල් මණාවක් බැගින් දෙති.

එයින් මෑතභාගයෙහි ඒ පුරුෂයා රාජසේවයට ගියේය; ඔහු ගිය බව දැන දෙමහල්ලෝ තෙල් නුදුන්හ, ඉක්බිති ඒ පුරුෂයා රාජසේවයට ගොස් පෙරලා ඇවිත්[9] බත් කමින් ඉඳ ගිතෙල් ගෙනෙව යි කීය; ඔහුගේ භාර්‍ය්‍යාවෝ ‘ස්වාමිනි, නුඹවහන්සේ ගිය තැන් පටන් තෙල් නුදුන්නෝ වේ ද’යි කීහ. එබස් අසා රාජපුරුෂයා දඬෙන් ගැසූ සර්පයකු සේ කිපිණ. හේ එසේ මැයි. අසත්පුරුෂයෝ අකාරණයෙහි ම කිපෙති, විෂ ඝොර භයානක වූ නාගරාජයෝ කිපෙන්ට නිසි කාරණයක් ඇති කල්හි කිපෙති, අධම වූ හීනගුණ ඇති මනුෂ්‍ය නමැති සර්පයෝ අකාරණයෙහි ද කිපෙත්. එසේ හෙයින් කියනලදී;

1. උපාසිකා - BCEGKL
උපාසිකාවෝ - H,
2. ගෙහිමි පුරුෂයා - CDEJ,
ගේ හිමියා - KL
3. අනධිප්‍රා ව - CDEJ, ක.කු.කි
අනධිප්‍රාය ව - ම.
4. කාය - CDJ, බෙ.
කැප - ක.කි.කු.
ඇප - ම.
5. වැදූහ - CD
6. පුත් - C
7. අප - G
8. ගිතෙල් - G
9. අවුත් - BH

කුජ්ඣන්ති හීමා[1] භුජගා - සති හෙතුම්හි කාරණෙ,
අසන්තෙ'පි ච කුජ්ඣන්ති - නරාධම භුජඞ්ගමා-යි.

ඉක්බිති ඒ රාජ්පුරුෂයා රජ්ජුරුවන් සමීපයට ගොස් 'දේවයන් වහන්ස, මිනිසෙක් රජ්දරුවන්ට සුදුසු වූ යහපත් වස්තුවක් සඟවා තබාගෙන තෙමේ ම ප්‍රයෝජන විඳිනේය'යි කීය. රජ්ජුරුවෝ ඒ අසත්පුරුෂයාගේ වචනය අසා එම සැබෑවැ යි ගෙන 'එසේ වීනම් සගය එක ම දෙන ගෙන්වීම යුක්ත නොවෙයි; ඒ දෙන හා සමග කපිලවර්ණ[2] පැහැ ඇති දෙනුන් සියයක් ගෙනව'යි කියා ඔහට ම නියොග කළහ. එබස් අසා රාජ්පුරුෂයා හා සමඟ දෙනුන් සියයක් ගෙනවුත් රජ්ජුරුවන්ට දක්වීය, එකල්හි ඒ දෙනගේ ස්වාමිදරු දෙමහල්ලෝ ද දෙන ගෙනෙන්නා දැක ඇවිත් දුටුවුය, රජ්ජුරුවෝ දෙන ගෙන්වා ගෙන තමන්ගේ බිසොවුන් සර්වාභරණයෙන් සරහා 'තෙල දෙනගෙන් තෙල් දෙව ගනුව'යි කීහ; එබස් අසා බිසවු[3] තෙල් දෝනට තනය ඇල්වූ කල්හි එක තෙල් බින්දුවකුත් තනයෙන් පිටත් නොවීය. එකල රජ්ජුරුවෝ 'දෙනගේ ස්වාමිදුව කැඳවාගෙන එව'යි ගෙන්වාගෙන උනුත් පළමු පරිද්දෙන් ම සියලු වස්ත්‍රාලඞ්කාරයෙන් සරහා 'තෙල් දෙව ගන්ව'යි කී කල්හි[4] ඒ ස්ත්‍රිය 'යහපත දේවයන් වහන්සැ'යි කියා 'ස්වාමිනි, දෙන නොදෙව් දවස් බොහෝය, සැළ දෙකක් තුනක් ගෙන්නවුව මැනවැ'යි කියා සැළවල් ගෙන්වා ගෙන තමන්ගේ ශ්‍රද්ධාව ආවර්ජනා කොට දෙනගේ තනය ඇල්වූහ. ඒ ස්ත්‍රිය අතින් තනය ඇල්වූ ඇසිල්ලෙහි තනයෙන් තෙමේ ම තෙල්ධාරා නික්මිණ, ඒ ස්ත්‍රී සැළවල පිරුණු තෙල් රජ්ජුරුවන්ට දක්වුව; රජ්ජුරුවෝ තෙල් බලා 'මෙතෙක් කල් මේ තෙලින් කුමක් කළා ද'යි[5] විචාළහ. එකල ඒ ස්ත්‍රී තමන් මෙතෙක් දවස් ලබන තෙල් සඞ්ඝයා වහන්සේට දන් දුන් බව ද [6] පළමු තමන්ගේ දරු කෙනකුන් උකස් සිටුවා දෙන ගත් කාරණ[7]ද සියල්ල ම රජ්ජුරුවන්ට කිව; ඒ අසා රජ්ජුරුවෝ 'එසේ කල මේ ගිතෙල් අප ඇම විසින් අනුභව කළ නොහැක්කැ'යි කියා නුවරවැසි මහජනයා ද පඤ්චමහා ආවාසයෙහි සඞ්ඝයා වහන්සේ ද රැස් කරවා ඒ ස්ත්‍රියගේ ශ්‍රද්ධාමහිමය ද ප්‍රකාශ කොට සඞ්ඝයා වහන්සේට ගිතෙල් දන් දෙවූහ; ඉක්බිති දෙනගේ ස්වාමිදුව කැඳවා ඒ ජනපදය එම ස්ත්‍රියට දී එකල හිනනහෙද කී[8] රාජ්පුරුෂයා ද උන්ට ප්‍රසාදවහල් කොට දුන්හ; එකල්හි ඒ දෙමහල්ලෝ එම ජනපදයෙහි වෙසෙමින් ජීවිතාන්තය දක්වා බොහෝ කුසල් කොටගෙන දිව්‍යලොකයෙහි උපන්හ. මෙසේ කිසි වස්තුවක් නැති දිළිඳු වූ දුක්පත් සත්වයෝ පවා තුනුරුවන් කෙරෙහි ශ්‍රද්ධා වර්ධනය කොට දන් දීමෙන් එම ජන්මයෙහි අනූන වූ උතුම් සම්පත් ලද්දහු මය, එසේ හෙයින් තුනුරුවන් කෙරෙහි ශ්‍රද්ධා වර්ධනය කොට කුසල් කළමැනවි. කියනලද්දුයේ මැයි:

එවං නරා අප්පධනා දළිද්දා
වඩ්ඪෙත්වා සද්ධං රතනත්තයම්හි,
ලභන්ති සම්පත්තිම'නූනම'ග්ගං
වඩ්ඪෙථ තස්මා රතනෙසු සද්ධං-යි.

මේ මෙහි සතර වන
තිස්සා[9] වස්තුව ය.

1. හීම - පිටපත් හැම
2. කපිවර්ණ - CJ
3. බිසවුන් - ක.කි.සැ.ම.
4. කීය එකල්හි - ක.කි.සැ.ම.
5. කරා ද යි - CDGHJKL
6. තියාව ද - CJ
7. තියාව ද - මුද්‍රිත හැම
8. හිනහෙදක - B
9. තිස්සාය - පිටපත් හැම

Non-Commercial Distribution

තව ද මෙහි පස් වන චූළනාගස්ථවිර වස්තුව නම් කවර යත්. හෙ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මෙම ලඞ්කාද්වීපයෙහි අනුරාධපුරනුවර අප මහා ගෞතම බුදුන්ගේ දකුණු අකුධාතුන් වහන්සේ පිහිටුවා දෙවන පෑතිස් රජ්ජුරුවන් විසින් කරනලද[1] ථූපාරාම නම් වූ ආශ්චර්‍ය්‍යීමත් තිස් රියන් උස මනහර දගබෙක් විය; ඒ දගබ මතු නොවෙයි; ඒ විහාරය වට උළින් උස් කොට බැඳ සුනුකර්මාන්තයෙන් විසිතුරු කරනලද පවුරුපදනමින් හා දෙරටු අටලු පිරිවෙන් ආදීන් සමලඞ්කෘත ව[2] නොයෙක් සියගණන් භික්ෂූන්ගෙන් ගැවසි ගත්තාවූ දෙමහල් තුන්මහල් ආදි වූ ප්‍රාසාදපන්තීන් ප්‍රතිමණ්ඩිත ව නෘත්‍යගීතවාදයෙන් හා නොයෙක් පූජාවිධිවිශෙෂයෙන් නිරන්තර ව උත්සව පවත්වන ලද්දේ[3] ඔප් නඟනලද මුතුරැසක් හා සමාන සුවිශුද්ධ වාලුකාතලයෙන් ගැවසී ගත්තාවූ මාලකාවලියෙන් ගැවසී සැරහී සියලු දිව්‍ය මනුෂ්‍යයන්ට ප්‍රීති එළවන්නේය.

ඒ විහාරයෙහි අසිග්ගාහක නම් පිරිවෙන වසන චූළනාග නම් තෙර[4] කෙනකුන් වහන්සේ උත්කෘෂ්ට පිණ්ඩපාතිකඞ්ගය රකිනා හෙයින් නිරන්තරයෙන් අනුරාධපුරනුවර චන්‍ද්‍රවඞ්කවීථියෙහි අහර සිඟනසේක; ඉක්බිති එක් දවසෙක අහර සිඟා ගෙන විහාරයට ඇවිත් වළඳ ඉක්බිති දවහල් වැඩ ඉන්නා තැන දිවාවිහාර කොට වැඩඋන්සේක; එකල චන්‍ද්‍රවඞ්කවීථියෙහි වසන බැල්ලක් දරුවන් වද සයින් පීඩිත ව වෙවුලුම් ගත් ශරීර ඇති ව ඒ ඒ තැන ගොදුරු සොයා ඇවිද කිසි ආහාරයක් නොලැබ[5] ථූපාරාම විහාරයට ඇවිත් දිවාවිහාර කොට වැඩඋන් චූළනාග තෙරුන් වහන්සේ දක උන්වහන්සේ ඉදිරියෙහි වෙවුල වෙවුලා මූණ බල බලා සිටියාය; තෙරුන්වහන්සේ එපරිද්දෙන් සිටියාවූ බැල්ල දැක කම්පිත ව සිතනසේක් 'මේ බැලි සයින් පීඩිත ව කිසි පිළිසරණක් නැති ව දත් වෙවුල වෙවුලා සිටියාය; අනේ මේ සංසාරදුඃඛය නුවණින් පරීක්ෂා කළ කල ඉතා භය එළවන්නේය; මෙසේ දුක්විඳ ඇවිදිනා තිරිසන් ජාතීන් දුටු දුටුවාවූ මහජනයෝ කැටකැබිලිති ආදිය ගසා ලුහුබඳවති; කුෑර වූ කැවිටින් ඇන වෙහෙස දෙති; දවසක් මුළුල්ලෙහි සොයා ඇවිද්දත්[6] කුස යපෙන පමණ අහර නොලැබ වෙවුලමින් ඒ ඒ තැන වැටෙමින් දුක් විඳිති; අකුශල විපාක නම් මෙසේ වූ දෙයක් වන; යම් කිසි කෙනෙක් ලොභද්වෙෂ මොහාදි වූ දරුණුකමින් අකුසල් කෙරෙද් ද එසේ වූ සත්වයෝ මේ බැල්ල සේ ම දුකට පැමිණෙන්නාහු මය; යම්කිසි ශ්‍රද්ධාවන්ත සත්වකෙනෙක් මෙසේ වූ[7] සාදුකින් පීඩිත වූ සත්වයන්ට ආහාරයක් දුන්නාහු වී නම් ඔහු එකාන්තයෙන් ම සප්තවිධ වූ කාමස්වර්ගයෙහි ඉපද අනුපමෙය්‍ය වූ[8] ශ්‍රී සම්පත් ලබන්නාහු මය'යි මෙසේ නොයෙක් කාරණ සිතා එදවස් ඒ තෙරුන්වහන්සේ කරුණාවෙන් පිරුණාවූ සිත් ඇති ව අනික් දිය යුත්තක් නොදක 'මා අනුභව කළ ආහාරය වී නමුත් මෙ බැල්ලට යහපත් ම ය'යි සිතා එක් තැනෙක පයින් වැලි පහ කොට ඇහිල්ලක් මුඛයෙහි බහා වමනෙ[9] කොට බැල්ල බඩ පිරෙන විවර අහර දන්දුන්සේක. එසේ හෙයින් කියලදි;

1. කරවන ලද - BGHKL
2. සාලංකෘත ව - BEG
3. පැවැත්වීම් ඇති - ම.
4. මහතෙර - KL
5. නොලදින් - C
6. ඇවිදත් - B, ක.කි.තැ.ම.
7. වූ (නැත) - BCDEGHKL
8. අනුපමෙය - බෙ.ස. අනොපමෙය්‍ය - KL
9. වමන - H, ම

Non-Commercial Distribution

සායං චරාකි කපණා අත්තානා 'සරණා ධුතා,[1]
පවෙධමානා අට්ඨාසි - අහො සංසාරදුක්ඛතා.

දිට්ඨදිට්ඨා ජනා එවං - තාළෙන්ති කට්ඨලාදිනා,
ඛරවාචාපතොදෙන - නිත්තුදන්ති තථේ'ව තෙ.

යාපනං ගොචරං කිඤ්චි - අලද්ධා දිවස'මපි ච,
පරියෙසන්ති පතිසොති - පාපානං ඵලමීදිසං.

යො කරොති නරො පාපං - කොධලොභාදිදරුණං,[2]
සුනඛීව සද'යං සො - දුක්ඛභාගී භවිස්සති.

යො කාමමීදිසෙ සත්තෙ - ජිඝච්ඡාපරිපීළිතෙ,
සාසං දත්වාන පීණෙති - ස යාති සුගතිං ඉතො.

චින්තෙත්වෙවං[3] තද ථෙරො - කරුණාපුණ්ණ මානසො,
වමිත්වාන අද භුත්තං[4] සුනඛියා දනවෙතතො[5]යි.

මෙසේ අහර දන් දී බැල්ල බඩපුරා බත් කෑ කල්හි ඩබරාවෙන් පැන් ගෙනවුත් කබලෙක වත් කොට පැන් පෙවූසේක. ඒ බැලි බත් කා පැන් බී සුවපත් ව සන්තොෂයෙන් නඟුට සලමින් සාද[6] දක්වා තෙරුන් වහන්සේ බලබලා සිටියාය; තෙරුන් වහන්සේ ද එපවත් දක ප්‍රීතීන් පිරුණාවූ සිත් ඇති ව ප්‍රාර්ථනා කරනසේක් 'ශරීරයට ආයාස වේ ද යි නොසිතා ආත්මගත වූ ආහාරය පරිත්‍යාග කොට අද මා විසින් කරනලද්දවූ කුසලයෙන් මේ ජාතියෙහි පටන් උපනුපන් යම් ම ජාතියෙක ප්‍රත්‍යයලාභීන් කෙරෙහි අග්‍ර වෙම්ව යි නිරොගි නිර්ව්‍යාධි වෙම්ව යි සුවපත් වෙම්ව යි හැම කල්හි සියලු සත්වයන් විසින් මමය මාගේය යි මමත්වයෙන් සත්කාර සම්මාන ආදියෙන් පුදනු ලැබෙම්ව යි සසර සිටිනා තෙක් මෙපරිද්දෙන් සැප විඳ කෙළවර අමාමහ නිවන් දකිම් ව'යි ප්‍රාර්ථනා කළ සේක. කියනලද මැයි;

ඉමිනා කතෙන පුඤ්ඤෙන - අත්තානමනපෙක්ඛිය,
හෙස්සං පච්චයලාභීන - ම'ග්ගො අව්‍යාධිකො සුඛී.

මානිතො පූජිතො හෙස්සං - සබ්බසත්තෙහි සබ්බද,
නිබ්බාණං ච සුඛං ඛෙමං - පාපුණෙය්‍යම'නාගතෙ - යි[7].

මෙසේ ප්‍රාර්ථනා කොට තමන් වහන්සේ වසන පිරිවෙනට වන් සේක, එතැන් පටන් බැලි නිරන්තරයෙන් ම විහාරයට එයි; තෙරුන් වහන්සේ ද ඒ බැල්ලට සුදුසු පරිද්දෙන් බත් ලවනසේක. තෙරුන් වහන්සේට ඒ කුශලකර්මය දෙවන ජාතියට නොයන තෙක් එම ජාතියෙහි ම විපාක දෙන්ට පටන්ගත්තේය. තෙරුන් වහන්සේගේ කුශලානුභාවයෙන් එදවස් ම සවස නොයෙක් දහස්ගණන් උපාසකවරුන් හා උපාසිකාවරු ගිතෙල් මී සකුරු ආදි වූ ගිලන්පස ගෙන්වාගෙන 'චූළනාග තෙරුන් වහන්සේ කොයි ද'යි විචාරා පරීක්ෂා කෙරෙමින් ඇවිත් එසියල්ල ම තෙරුන්වහන්සේට ම පිළිගැන්වූහ; එකල තෙරුන් වහන්සේ ද ඒ හැම නොයෙක් දහස් ගණන් භික්ෂූන් වහන්සේට දන් දී තමන් වහන්සේත් වැළඳූසේක. තව ද එපරිද්දෙන් ම මනුෂ්‍යයෝ

1. සුතා - ම. පාලි
2. දරුණා - පිටපත් හැම
3. චින්තෙත්වාන - පාලි
4. භත්තං - BCDEGHKL
5. දනවෙතසා - E
6. සාදර - BCEGHJKL, ක.කි.ඤ,ම.
7. පාපුණෙය්‍යාමනාගතෙ - CGHJL

Non-Commercial Distribution

කපුරු තකුල් ආදි වූ සුවඳ සහිත පස්පලවතින් බෙහෙත්සත්[1] එළවූහ; තෙරුන් වහන්සේ ඒ බෙහෙත්සත් ද[2] සඞ්ඝයා වහන්සේට දන් දී තමන් වහන්සේත් වැළඳූසේක; එසේ ම එදවස් රාත්‍රියෙහි දෙවතාවෝ චන්‍ද්‍රවඩ්කවීථියෙහි ඇවිද 'එම්බා සත්වයෙනි, ථූපාරාම විහාරයෙහි අසිග්ගාහක පිරිවෙන වසන චූළනාග ස්ථවිරයන් වහන්සේට සෙට දවස් මහදන් පවත්වා ලව'යි මෙසේ අඬගා කීහ; එබස් අසා වීථියෙහි වසනා සියලු මනුෂ්‍යයෝ ද දෙවතාවෝ ද ඛජ්ජ භොජ්ජ ලෙය්‍ය පෙය්‍ය සායනීය[3]යි කියනලද පඤ්චප්‍රකාර ආහාරවර්ගයන් ද නොයෙක් ඵලාඵල ආදිය ද නානාප්‍රකාර සෙසු දනොපකරණ ද සපයා දෙවන දවස් විහාරයට එළවූහ. තෙරුන් වහන්සේ ඒ සියල්ල ම දක විහාරයෙහි ගෙවිය ගස්වා තුන් දහසක් පමණ භික්ෂූන්වහන්සේට දන් දී තමන්වහන්සේත් වැළඳූසේක; තුන් වන දවස් තෙරුන් වහන්සේ භික්ෂාව නිසා[4] පිටත්වූ කල්හි වහසල්දෙර වසන දෙවතාවා උන්වහන්සේගේ පාත්‍රය ගෙන දෙරටුවෙන් පිටත නොයෙක් දනොපකරණ පිරූ ගැල්කඳවුරක් මවා දිව්‍යමය කැඳ අවුළු හා නානාප්‍රකාර සූපව්‍යඤ්ජනාදියෙන් යුක්ත දන්වසුන් සපයා චූළනාග තෙරුන් වහන්සේ ප්‍රධාන කොට භික්ෂූන්වහන්සේට මහදන් පැවැත්විය. එතැන් පටන් චන්‍ද්‍රවඩ්ක වීථියෙහි වසන මනුෂ්‍යයෝ 'චූළනාග තෙරුන් වහන්සේට දවස ගෙයකින් දන් දෙම්හ'යි කථා කොට දන් දෙන්නාහු එම කඳවුරෙහි තෙරුන්වහන්සේ ප්‍රධාන කොට ඇති තුන් දහසක් පමණ භික්ෂූන් වහන්සේට දවස් පතා මහදන් පැවැත්වූහ; මෙසේ එකී එකී ගෙන් දවස, දවස බැගින් දන් දෙන කල්හි දෙතිස් අවුරුද්දකින් කෙළවර ගෙට[5] දන් වාරය පැමිණියේය; මෙසේ තෙරුන් වහන්සේ එතැන් පටන් ලාභයෙන් යශසින් අගතැන් පත් ව දිව්‍යමනුෂ්‍යයන් විසින් උපස්ථාන කරනලද්දු ව භාවනා කිරීමෙහි නියුක්ත වූ සේක් නොබෝ කලකින් ම කෙලෙස් සතුරන් බිඳ පලවා[6] රහත්බවට පැමිණිසේක.

ඉක්බිති එක් සමයෙක පන්සියයක් භික්ෂූන්වහන්සේ ශ්‍රී මහා බොධීන් වහන්සේ වඳින්ට යනු කැමැති ව එක තැනට[7] රැස්ව 'ඇවැත්නි, දන් බොධිමණ්ඩලයට යන මහ[8] දුර්භික්ෂය; සොරුන් සතුරන් හා සිංහව්‍යාඝ්‍රාදි චණ්ඩසත්වයන් විසින් උපද්‍රව සහිතය; කෙසේ යමෝ ද'යි කථා කළසේක; ඉන් සමහර කෙනකුන් වහන්සේ 'ඉදින් චූළනාග ස්ථවිරයන් වහන්සේ අප හා සමඟ වඩනා සේක් වී නම් ඒ සියලු උපද්‍රව ම නොවන්නේය; ආහාරයත් සුලභ ව ලැබෙන්නේය, තෙරුන් වහන්සේ මහත් වූ කුසල් ඇතිසේකැ'යි කී සේක. එබස් අසා හැමදෙනා වහන්සේ එක් ව ගොස් 'ස්වාමීනි, අපගේ බුදුරජාණන් වහන්සේ මාරයා හා දසබිම්බරක් පමණ මරසෙනග බිඳ කෙලෙස්සතුරන් සාධා බුදුබවට පැමිණි භූමිප්‍රදෙශයෙහි පිහිටි ජයමහාබොධීන් වහන්සේ වඳනා කැමැත්තම්හ, නුඹවහන්සේ අප හැම කැඳවාගෙන ගොස් බොධීන් වහන්සේ වඳවා වදළ මැනව; නුඹවහන්සේගේ ආනුභාවයෙන් බොධීන්වහන්සේ වැඳ පින් පුරාගෙන එම්හ'යි කී සේක. තෙරුන්වහන්සේ ද යහපතැ යි ගිවිස ඒ ඇමදෙනා වහන්සේ පිරිවරා ථූපාරාමවිහාරයෙහි පටන් මාවටු පටුන්ගම දක්වා මේ දෙඅතුරෙහි දිව්‍යමනුෂ්‍යයන් විසින් කරනලද සත්කාර සම්මාන විඳිමින් සාරමසකින් මාවටුවට වැඩිසේක. එතැන්හි මාවටුතොටින්

1. බෙහෙත්පස - H
   බෙහෙත්පසයන් - BG
2. බෙහෙත්පස ද - BH
3. සාණීය යි - J, ක.කි.ඥ.
4. පිණිස - මුද්‍රිත හැම, ස.
5. ගෙවා - ක.කි.ඥ.ම.
6. එලවා - ක.කි.ඥ.ම.
7. තැනකට - C
8. ගමන - KL

Non-Commercial Distribution

නැව් නැඟී සමුද්‍රයෙහි වසන දෙවතාවන් හා දිව්‍යනාගයන් විසින් කරනලද සත්කාර සම්මාන විදිමින් තුන් මසකින් ගොඩ බැස එතැන් පටන් මහබෝමඩට වඩිනාසේක් ඒ ඒ තැන්හි දෙවිමිනිසුන් විසින් කරනලද උපස්ථාන ඇති ව[1] ගම් නියම්ගම් රාජධානි පිළිවෙළින් ගොස් සාරමසකින් බෝමඩට පැමිණ ශ්‍රී මහාබොධීන්වහන්සේ වැඳ පෙරලා වඩනාසේක් අතරමගදී බඩරුජාවක් ඇති ව මහත් වූ පීඩාවට පැමිණිසේක; ඒ දක භික්ෂූන්වහන්සේ වික්ෂෙපයෙන් වැඩ උන්සේක; ඒ දක තෙරුන් වහන්සේ 'ඇවැත්නි, කුමක් පිණිස දෙම්නස් ව හිඳු දැ'යි විචාළසේක. එපවත් අසා භික්ෂූන් වහන්සේ 'ස්වාමීනි, අප හැම නුඹවහන්සේගේ කුශලානුභාවයෙන් ප්‍රත්‍යය නිසා නොමිරිකී සැප දේ ආම්හ; ඉදින් නුඹවහන්සේට අන්තරායෙක් වී නම් කෙසේ අපි ප්‍රත්‍යයෙන් නොමිරිකී අපගේ රටබලා යමෝ දෝ හෝ යි සිතා වික්ෂෙප ව හිඳුම්හ'යි කීසේක. එපවත් අසා තෙරුන්වහන්සේ 'ඇවැත්නි, එසේ නොසිතව මා පිරිනිවි කල්හි ආදහන සත්කාර කොට ධාතු ගෙන පෙරහත් කඩෙක බැඳ සිහා ගම්වදනා වේලෙහි ධාතුපෙරහන්කඩ කුඩයෙක බැඳගෙන පළමු ව සඬසස්ථවිරයන් ගම් වදනා සේ සලස්වා එක් ව සිහා යව; එසේ කල්හි තමන් හැමට ආහාරයෙන් අඑාසු නොවන්නේය'යි කියා භික්ෂූන්වහන්සේට අවවාද කොට පිරිනිවි සේක. එකල්හි භික්ෂූන් වහන්සේ උන්වහන්සේ ආදහන කොට සොහොන් නිවා ධාතුගෙන නික්මුණුසේක; තෙරුන්වහන්සේ ජීවමානකාලයෙහි මෙන් ප්‍රත්‍යයලාභ ලැබ සැප සේ තමන්වහන්සේලා වසන මෙම සිංහලද්වීපයට පැමිණිසේක. අහෝ එදවස් තෙරුන් වහන්සේ උද්ගීරණය කොට බැල්ලට දුන්නාවූ ආහාරදනයෙහි ආනුභාවය ආශ්චර්‍ය්‍යයෙක් මැයි; උන්වහන්සේ ජීවමාන කාලයෙහි ද මෙසේ ලෞකික ලොකොත්තර සම්පත් සිද්ධ කොට පිරිනිවි කල්හි ද මෙසේ මෙබඳු ආශ්චර්‍ය්‍ය පැවැත්වූයේය යි සතුටු වූවාහු එම ආශ්චර්‍ය්‍ය එකාවන් ව සඳහන් කෙරෙමින් වීර්‍ය්‍ය වඩා භාවනා කොට ඒ හැමදෙනාවහන්සේ ම රහත්බවට පැමිණිසේක.

මෙසේ ස්වල්ප වූ දනය පවා නුවණැති ශ්‍රද්ධාවන්තයෝ ආදරයිතින් විසාල කොට ගෙන මහත් වූ විපාක ලබන්නාහු මය. එපරිද්දෙන් ම නුවණැති ශ්‍රද්ධාවන්තයන් විසින් දෙනලද[2] සවල්ප වූ දනයක් වී නමුත් තමාගේ ආදරයෙන් මහත් කොට සිතාගෙන මතු බොහෝ[3] භවභොග සම්පත් ලබන්ට උත්සාහ කළ මැනවි. කියනලදුයේ මැයි;

අප්පම්පි දනං මනසා සපඤ්ඤ[4]
කත්වා විසාලං ඵලමා'වහන්ති,
තථේ'ව තුම්හෙ'පි පරිත්තදනං
කරොථ චිත්තෙන විසාලභාවං-යි.

මේ මෙහි පස් වන
චූළනාගත්ථෙර වස්තුව ය.

මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි
ශාලිරාජවර්ගී නම් වූ
සතළොස් වන පරිච්ඡේදය නිමි.

1. විදිමින් - B
2. දෙන ලද්දවූ - බෙ.ස.
3. බොහෝ වූ - KL
4. පඤ්ඤා - BGHKL

Non-Commercial Distribution

තව ද මේ සද්ධර්මාලංකාරයෙහි අටළොස් වන නම්බසුමන වර්ගය නම් කවර යත්. එහි පළමු වන නම්බසුමන වස්තුව මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මෙම ලක්දිව ශ්‍රද්ධාතිස්ස රජ්ජුරුවන් රාජ්‍යය කරන කල්හි එක් පුරුෂයෙක් රාජකාර්‍ය්‍යයෙහි නියුක්ත ව වසනුයේ රජ්ජුරුවන්ගේ මෙහෙවරින් කොටහල්[1] නම් දනව්වට ගියේය; එහි වසන මනුෂ්‍යයෝ ඕහට ආගන්තුග[2] සත්කාර කරන්නාහු ගිතෙල් හා නොයෙක් ව්‍යඤ්ජනයෙන් යුක්ත බත් පිසවා රාජපුරුෂයා කැඳවා බත් අනුභව කරන සේ ඉන්ට පැලැස්වූහ; එකල එක් භික්ෂුකෙනකුන් වහන්සේ භික්ෂාචාරයෙන්[3] ඇවිදිනාසේක් ගෙපිළිවෙළින් ඇවිත් එතෙනට පැමිණිසේක. සේවකයා තෙරුන්වහන්සේ දක හුනස්නෙන් නැඟී පහන් සිතින් සමීපයට එළඹ පාත්‍රය ගෙන ගිතෙල් සහිත වූ ආහාරය තෙරුන්වහන්සේට දන් දින. තෙරුන් වහන්සේ අහර වළඳ ගිතෙල් බෙහෙත් පිණිස එළවා තිබූ සේක. සේවකයා මෙපමණ කුසල්[4] කොට ආයුකෙළවර එයින් මිය මෙම ලඞ්කාද්වීපයෙහි වලගම එක් කුලගෙයක[5] උපන්නේය, එකල දෙමව්පියෝ ඕහට සුමනය යි නම් තුබූහ; එතෙම ක්‍රමයෙන් වැඩී ගෙය දෙර[6] වෙන් ව වසනුයේ ගිහිගෙයි ආදීනව හා මහණ වීමෙහි අනුසස් දන සියලු සම්පත් හැර බ්‍රාහමණාරාම නම් විහාරයට ගොස් මහණ ව වඩනාලද වීර්‍ය්‍ය ඇති ව නිවන් කරා මෙහෙයනලද සිත් ඇති ව වත් පිළිවෙත් සරු ව වසනසේක් නොබෝ කලකින් විදශීනා වඩා රහත්බවට පැමිණ නම්බසුමන මහතෙරුන් වහන්සේය යි ප්‍රසිද්ධ වූ සේක. උන්වහන්සේගේ කුශලානුභාවයෙන් එම විහාරයෙහි තිඹිරිගසෙක අධිගෘහිත වූ දිව්‍යපුත්‍රයෙක් ඒ තෙරුන්වහන්සේට නිරන්තරයෙන් ම දිව්‍යාහාරයෙන් උපස්ථාන කෙරෙයි; ඒ තෙරුන්වහන්සේ උපසම්පද වූ දෙළොස් වන අවුරුදු මේ ලඞ්කාද්වීපයෙහි බැමිණිටියා[7] සාය පැමිණියේය; එකල දුර්භික්ෂභයින් මහජනයා[8] පීඩාවට පැමිණි කල්හි තෙරුන්වහන්සේ පන්සියයක් පමණ භික්ෂූන් ආහාරය නිසා දුක්විඳිනා දක සමීපයට කැඳවා 'ඇවැත්නි, අපි කොයි ගොසින් ජීවත් වමෝ ද'යි විචාරා ඒ ඇමදෙනා වහන්සේ විසින් 'ජම්බුද්වීපයට ගොස් ජීවත් වම්හ'යි කියා එක අභිප්‍රායට[9] කී කල්හි තෙරුන් වහන්සේ ද ගමනට පත් පාසිවුරු[10] බැඳිසේක; ඒ දිව්‍යපුත්‍රයා 'කිමෙක් ද ස්වාමීනි, ගමනට ආකාරයක් සේ පෙනෙයි; කොයි වඩනාසේක් ද'යි විචාළේය, එබස් අසා තෙරුන්වහන්සේ දිව්‍යපුත්‍රයාහට වදරනසේක්;

දෙව දනි අයං ලඞ්කා - දුබ්භික්ඛා ආසි කෙවලා,
සුසස්සිත්වා එලිතා ආසුං - තළාකරහද්දයො.
ගතා විනාසං ජලජා - පිපාසා මිගසූකරා,
ධාවන්ති දිස්වා ආරාව[9] - මරීචිං තොයසඤ්ඤිනො.

---

1. කොටගල් - බෙ.ස.
2. ආගන්තුක - J
3. භික්ෂා චෘත්තියෙන් - BGHJKL
4. කුසලයක් - KL
5. කුලයෙක - මුද්‍රිත හැම,ස.
6. ගෙදෙර - B
   ගෙයි දරපරිග්‍රහයෙන් - ම
   දරපරිග්ගහං කත්වා
   ගෙහං අජ්ඣාවසන්තො - පාලි
7. බැමිනිතියා - E
   බැමිණෑටියා - G
8. මහජනයන් - BDEGH
9. අධිප්‍රාවට - L
10. පත් පාසිවුරු - පිටපත් හැම
11. ආරාම - CDEGHJKL

Non-Commercial Distribution

සීනපණ්ණා වනා ආසුං - භූජාතා ච තිණොසධා,
භුසංච[1] විකිරීයිංසු - චණ්ඩානිල සමාගතා.

දුබ්භොජනෙන දීපස්මිං - පීළිතා පන මානුසා,
අට්ඨිචම්මාවසෙසාසුං - ඛීණලොහිතමංසකා.

ජීවිතාසා නරා දෙව - ගහෙත්වා පුත්තදාරකෙ,
තත්ථ තත්ථ ගතා ආසුං - යත්ථ සක්කොන්ති ජීවිතුං.

යස්මා තස්මා මහාදෙව - න සක්කා ඉධ[2] සීහලෙ,
ජීවිතුං ජම්බුදීපස්ස - යාම'දානී'ති 'අබ්‍රැවි යි.

යනාදීන් 'එම්බා දිව්‍යපුත්‍රය, දැන් මේ ලඞ්කාද්වීපය[3] වැසි නැති වීමෙන් දුර්භික්ෂ විය; වැවුපොකුණු ආදියෙහි දිය සිඳී වළල් පැළිණ; දියෙහි වසන ප්‍රාණීහු විනාසයට ගියාහ. මෘගසූකරාදි වූ සිවුපාවෝ දුර පැනෙන මිරිඟු දක ජලයෙකැ යි යන සංඥවෙන් ඔබිනොබ දුවපැන[4] වෙහෙස විඳිති. සියලු වනාන්තරය කොළ වැගිර ඉදල් ව[5] ගියේය, බිම්හි අටගත්තාවූ තණ හා ඖෂධ ලතා ආදිය වියළී සුළඟේ පලා ගිය. කුස යපෙන පමණ අහර නොලැබ සියලු මනුෂ්‍යයෝ ශරීරයෙහි මස් ලේ සිඳී අස්ථිචර්මාවශෙෂ ව ප්‍රෙතයන් වැනි වූහ. එම්බා දිව්‍යපුත්‍රය, ජීවිතයෙහි ආසා ඇති මනුෂ්‍යයෝ තමතමන්ගේ පුත්‍රදාරාවන් ඇරගෙන ඒ ඒ අත[6] ගියහ. එසේ හෙයින් මේ සිංහලයෙහි රඳ ජීවත් විය[7] නොහැක්ක, ජම්බුද්වීපයට ගොස් ජීවත් ව ගනුම්හ ය'යි[8] සිතා යම්හ'යි වදළසේක. එබස් අසා දිව්‍යපුත්‍රයා තම්බසුමන මහතෙරුන් වහන්සේ පූර්වජන්මයෙහි කළ කුශලකර්මය ප්‍රකාශ කොට දක්වා යම්හ යි සිතූ අභිප්‍රාය පසුබස්වනු කැමැත්තේ මය:[9]

අතීතම්හි තුවං භන්තෙ - අද්දසෙකස්ස භික්ඛුනො,
සද්දහන්තො දානඵලං - සතෙන සහ භොජනං.

තතො චුතො තුවං තස්ස - පුඤ්ඤකම්මස්ස වාහසා,
දුතියත්තභාවෙ' දානි[10] - ජායිත්වාන සුඛෙ ඨිතො.

යනාදීන් 'ස්වාමීනි, නුඹවහන්සේ මීට පළමුවන ජන්මයෙහි කම්පල අදහා එක් භික්ෂුකෙනකුන්වහන්සේට ගිතෙල් හා බතක් දුන්සේක. ඒ කුශලකර්මයෙන් මේ දෙවන ජාතියෙහි ඉපද බොහෝ සම්පත් ලත්සේක; මවුපියන් හා සියලු සම්පත්තීන් සමෘද්ධ වූ ගිහිගෙය හැර බුද්ධශාසනයෙහි මහණ ව ප්‍රතිපත්තීන්[11] සාර ව අනිත්‍යය දුඃඛය අනාත්මය යි යන තිලකුණු භාවනා කොට දැන් රහත්වූසේක; නුඹවහන්සේ දැන් මා දෙන දිව්‍යාහාරය අනුභව කරන්නේත් එම කුශලයෙන් මය, යම් පමණ කාලයකින් මේ දුර්භික්ෂය සන්හිඳේ ද ඒ තාක් ම මා දෙන ආහාරය කඩ නොකොට

1. භුසංච - EG, බෙ.ස.
2. න සක්කොම්ධ - පාලි
3. ලඞ්කාද්වීපයෙහි - CJ
4. දිවපැන - BDEGKL
5. ඉදල් ව - BCH
6. තැන - GHKL
   තැන්හි - B
7. ජීවිතය රක්ෂා කොට ගත - C
8. සිතා යම්හ යි (නැත) - බෙ.ස.
9. කැමති ව - KL, ම.
10. එතස්මිං - ක.කි.කැ.ම. පාලි
11. ප්‍රතිපත්ති - BCEGHKL, ස.

Non-Commercial Distribution

දෙමි; මට කරුණා කොට මෙහි ම විසුව මැනව; චීවර ආහාර සෙනාසන හැඳ පුවු ගිලානප්‍රත්‍යය යන මේ සිවුපසය නුඹවහන්සේගේ කුශලයෙන් ම උපදනේය, ඇමදෙනා වහන්සේ ම ජම්බුද්වීපයට යන ගමන් නබා ධ්‍යාන භාවනා කොටගෙන සසර දුක ගෙවා නිවන්පුරසිරි විඳින්ට උත්සාහ කළ මැනවැ'යි කීය. මෙසේ කියා දිව්‍යපුත්‍රයා දඹදිවු යන ගමන් වළකා තෙරුන් වහන්සේට දිව්‍යමය වූ චීවරාහාර සේනාසනාදීන් උපස්ථාන කෙළේය, නිරන්තරයෙන් මහ තෙරුන් වහන්සේට දෙන්නා වූ සිවුපස දනය පන්සියයක් දෙනා වහන්සේට සෑහෙන්නේය, මෙසේ ඒ දිව්‍යපුත්‍රයා පන් සියයක්දෙනා වහන්සේට දොළොස් අවුරුද්දක් මුළුල්ලෙහි උපස්ථාන කෙළේය; ඉක්බිති දුර්භික්ෂ භය සන්හුන් කල්හි මහතෙරුන් වහන්සේ දිව්‍යපුත්‍රයා කැඳවා ජනපදචාරිකාවේ යම්හ යි අවසරගෙන පන්සියයක් දෙනා වහන්සේ සමඟ ජනපදචාරිකා කරනසේක් ගම් නියම්ගම් පිළිවෙළින් ගොස් රජරට කඩරෙද්ද නම් මහගමට පැමිණ අහර සිහාගෙන එක් තැනෙක හිඳ අහර වළඳන්ට පටන් ගත්සේක, සෙසු භික්ෂූන් වහන්සේ ද වළඳන්ට පටන්ගත්සේක, එකල්හි මෙඝපටලයෙන් වැසි ඉරු ආලොක නොපෙනෙන හෙයින් සමහර කෙනකුන් වහන්සේ වේලා ඇද්දෙ නැද් දෙ හො යි සැකයෙන් නොවළඳ උන්සේක, එකල තෙරුන්වහන්සේ නොවළඳ උන් ඇමදෙනා වහන්සේගේ සැක හරන පිණිස එක් ගල්කැටයක් අල්වාගෙන නියඟින් අහසට ගැසූසේක, එකල්හි කැටය[1] අහසට නැඟී ඉරු උදවූවා සේ දිලියෙමින් සිටගත; එකල භික්ෂූන් වහන්සේ සැක නැති ව වැළඳූසේක; එතැන් පටන් ඒ ස්ථානය මිණිසූයභි නමැ යි ප්‍රසිද්ධවිය; තෙරුන් වහන්ංස් එයින් නික්ම මහවැලිගං සමීපයෙහි සුළුවැසර[2] නම් ගම අහර සිහා ගං තෙර වැඩහිඳ අහර වළඳනසේක් සෙසු භික්ෂූන්[3] ව්‍යඤ්ජන මඳ ව අහර වළඳන්නා දක 'ඇවැත්නි, රුක්ෂ භොජනය කුමක් නිසා වළඳව් ද, මාගේ කුශලයෙන් සුවඳ ගිතෙල් උපදනේය; ඒ ගිතෙල් හා සමඟ වළඳව'යි වදළසේක; එපවත් අසා භික්ෂූන්වහන්සේ මුවෙන් නොබැණීමෙන් ඉවසා වදළසේක; තෙරුන් වහන්සේ එදවස් තමන්වහන්සේ පූර්වජාතියෙහි දන් දුන් ගිතෙල් දනය ආවර්ජනා කොට 'මේ ගඞ්ගා ජලය ගිතෙල් වේව'යි අධිෂ්ඨාන කළ සේක; එකල්හි වැලිගම් වෙහෙරතොට පටන් බත්බුන්නාතොට දක්වා දෙයොදුන් පමණ ජලය පෙරළී සුවඳ ගිතෙල් විය; එකල්හි භික්ෂූන්වහන්සේ ප්‍රයොජන පමණක් වැළඳූසේක. ඉතා ඝ්වල්ප වූ ගිතෙල් දනයෙහි විපාක විශෙෂය මෙසේ වන කල බොහෝ බෙහෙත් දුන්නාවුන් ලබන විපාක විශෙෂය කවරෙක් නම් වර්ණනා කෙරේ ද. කියනලද මැයි;

පරිත්තඝතමත්තස්ස - දනෙන ඵලමීදිසං
යො දෙති බහු හෙසජ්ජං - කො ඵලං තස්ස භාසති-යි.

---

1. ඒ ගල්කැටය - KL
2. සුළුවැසර - BDGHJ, ක.සි.ස.ම.
   සුළුවැසර - CE, බෙ.ස.
3. භික්ෂූහු - CDEGJ
   භිකුෂු - KL

Non-Commercial Distribution

මෙසේ ගහ තෙල් වූ බව අසා ගං දෙපස ගම්වල[1] මනුෂ්‍යයෝ මහ සැළ කළ කොතලා ආදිය පුර පුරා තමන්ගේ ගෙවල රැස් කොට ගත්හ[2]. මෙසේ එක් භික්ෂුකෙනෙකුන් වහන්සේට එක වරෙක දුන්නාවූ භෙසජ්ජදානයෙහි විපාක මෙසේ වන කල බොහෝ කොට බෙහෙත් පසය දුන්නාවුන් ලබන්නාවූ විපාකය අප්‍රමාණ වන බව දන පින්වත් සත්වයන් විසින් දෙය්‍යධර්මයෙන් තමහට සෑහෙන විචරක් ස්වල්පය යි නොසිතා සිල්වත් ගුණවත් තැන් පරීක්ෂා කොට දන් දුන මැනවි. කියනලද මැයි;

> එකස්ස භික්ඛුස්ස 'පි එකවාරං - දින්නස්ස දානස්ස ඵලං ඉදන්ති
> මත්වා භවන්තා සති දෙය්‍යධම්මෙ - විචෙය්‍ය සද්ධාය දදථ දානං යි.

මේ මෙහි පළමු වන
තම්බසුමන වස්තුව ය.

තව ද මෙහි දෙවන **වෙපුල්ල පබ්බත වස්තුව** නම් කවර යත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මෙම ලඞ්කාද්වීපයෙහි එක් සමයෙක බැම්ණිටියාසාය නම් වූ දුර්භික්ෂභයෙක් දෙළොස් අවුරුද්දක් පැවැත්තේය, ඒ දෙළොස් අවුරුද්ද මුළුල්ලෙහි මේ ලඞ්කාද්වීපයෙහි වැසි පොදකුත් නොහෙළිය,[3] එසේ හෙයින් දුර්භික්ෂ භය වීය; අහර නොලැබීමෙන් උපදුත වූ මනුෂ්‍යයන්ට රොගභය වීය; එකල ශරීරයෙහි ලෙහෙමස් සිඳී අස්ථිචර්මාවශෙෂ වූ මනුෂ්‍යයෝ ඉතා දුඃඛිත[4] වූහ; ස්ත්‍රීජාතිහු ගෙයි ගෙයි යකින්නන් වැනියහ; පුරුෂයෝ ප්‍රෙත පිශාචයන් සේ වූහ; ඒ ඒ ගෙදරවල ගසනලද අවමඟුල් බෙරහඬින් හා අඬන්නවුන්ගේ ප්‍රලාප ශබ්දයෙන් හා එක කොලාහල වීය, ඒ ඒ තැන්හි මළ මළවුන්ගේ කුණපගන්ධයෙන් රැස් වූවාවූ අමනුෂ්‍යයන් නිසා යක්ෂභයත් පැමිණියේය; මෙසේ දුර්භික්ෂභයය රොගභයය අමනුෂ්‍යභයය යි ත්‍රිවිධභයින් උපදුත වූ ලඞ්කාද්වීපවාසීහු ඒ ඒ තැන පර්වත හෙප් ආදි වූ ස්ථානවලට ගොස් ජීවත් වෙති. එකල්හි කරගල[5] සමීපයෙහි මනුෂ්‍යයෝ පර්වතය ආශ්‍රය කොට ගෙන බොහෝ සේ පර්වතප්‍රාන්තයෙහි වාසය කෙරෙති; එකල පර්වත සමීපයෙහි ගමෙක එක් මිනිසෙක් තමාගේ භාර්‍ය්‍යාව හා සමඟ ජීවත් ව ගන්නා උපායක් සොයමින් පර්වත මුදුනට නැඟී ඇවිදිනේ පර්වත මුදුනෙහි එක් කරගසක් දක මෙතැන්හි ම වාසය කරම්හ යි ඒ කරගස නිසා ගෙයක් කොට ගෙන වාසය කෙරෙයි; ඒ කරගස අතු තුනෙක් විය, 'එයින් එක් ශාඛාවකින් දන් පින් කරම්හ; එක් ශාඛාවකින් ආගන්තුගයන්ට සත්කාර කරම්හ; එක් ශාඛාවක් අපගේ අනුභවයට වන්නේය'යි කල්පනා කොට තමන්ට නියම කළ ශාඛාවෙන් කරකොළ අනුභව කෙරෙමින් එතැන්හි වෙසෙති. ඉක්බිති එක් දවසෙක භික්ෂුකෙනකුන් වහන්සේ සිඟා යන තෙනක් සොයා යනසේක් උන් දෙමහල්ලන් වසන ගෙයි දුම් දක ඒ සලකුණෙන් උන් වසන ගෙදෙරට වැඩිසේක, ඉක්බිති ඒ පුරුෂයා උන්වහන්සේ දක සොම්නසින් පිනා 'මේ කරගස නිසා අපි හැම කුසලයක් කොට ගතුමෝ නම් යෙහෙකැ'යි සිතා 'අප ඇම විසින් බොහෝ

1. ගෙවල්වල - BGH
2. ගත්තාහ - CJ, බෙ.ස.
3. නොහලිය - BDEHJL
4. දුඛිල - G
   දුක්ඛිතයෝ - K
5. කුරගල - DGHKL
   කැරගල - B
   කුහුරගල - ම.

Non-Commercial Distribution

දවසකින් භික්ෂුකෙනකුන් වහන්සේ දක්නාලද; මුන්වහන්සේ වැඳ පිනුත් පුරා ගනුම්හ´යි කියා සමීපයට එළඹ වැඳ පාත්‍රයගෙන එාසු තැනක උන්වහන්සේ ඉන්ට සලස්වා කර කොළ කඩාගෙන එම් යි කරගස සමීපයට ගියේය; එදවස් රාත්‍රියෙහි ඒ කරගස කොළ ආදි කොට යටත් පිරිසෙයින් සුඹුළු වත් නොතබා සියල්ල ම පණුවෝ කා නිමවූහ, ඒ පුරුෂයා කරගස දක ශෝකී ව නැවත ගෙට ආය; සිසතින් ආවාවූ පුරුෂයා දක ඔහුගේ භාර්‍ය්‍යාතොමෝ ´කිමෙක් ද ස්‍වාමිනි, කිසිවකුත් නැති ව සිසතින් ආයේ ඇයි ද යි[1]යි විචාළාය, එසේ විචාල ස්ත්‍රියට එපවත් කියන්නාවූ පුරුෂ තෙම;

> යං චින්තිතං පුබ්බෙඋවතං - සමිද්ධානං සමිජ්ඣති,
> න තථා අප්පපුඤ්ඤානං - ඊහනානාන සිජ්ඣති[2].
>
> චිරද්දිට්ඨස්ස අය්‍යස්ස- දතුමජ්ජතනායපි,
> පණ්ණමත්තම්පි නො ලද්ධං - අහො නො මන්දපුඤ්ඤතා-යි.

යනාදීන් ´එම්බා සොඳුර, පළමුත් කුසල් කළ කෙනකුන්[3] යම් සේ[4] කුශලයක් කරම්හ යි සිතූ කල ඒ කුශලය එබඳු කුසල් ඇත්තාවුන්ට ම සිද්ධ වෙයි; පෙර අකුසල් කළවුන්ට දන් කුසල් කරම්හ යි කෙනෙක් උත්සාහ කළත් සිද්ධ නොවන්නේය; බොහෝ කලකින් දුටුවාවූ ආර්‍ය්‍යයන් වහන්සේට අද දවස් දනක් දී සිත් පහදවා පින් පුරා ගන්ට උත්සාහ සිතූ අපට කරගසෙහි තුබූ කොළ පමණකුත් නැති විය; අනේ අපගේ අකුශලයෙක බලය[5] බලව´යි කීය. මෙසේ ද කියා ´එම්බා සොඳුර, අප දන් දෙන්නට තබා ගෙන උන් කර අත්තේ කොළ තබා අතු තුනෙහි කොළත් පොතුත් සියල්ල ම පණුවෝ කා නැති කොටපුවෝ වේ ද´යි කීය; එපවත් අසා ස්ත්‍රී කියන්නී;

> සභාවමෙතං ලොකස්මිං - කතපුඤ්ඤස්ස ජන්තුනො,
> සයමෙව සමායන්ති - මුත්තා වෙළුරියාදයො.
>
> අලක්ඛිනා අධඤ්ඤෙන - දුබ්භගෙනිධ මානුසෙ,
> පරක්කමෙන යං නත්ථං - සඤ්චිතං ච විනස්සති.

යනාදීන් ´සවාමීනි, පෙර ජාතියෙහි මහ කුසල් කළවුන්ට මුතු මැණික් පබළු වෛදූර්‍ය්‍ය මසාරගලල ලොහිතංකාදි වූ රත්නයෝ තුමූ ම ඇවිත් රැස් වෙති යනු ස්‍වභාව ධර්මයෙක් මය. පින් මඳ කාළකණ්ණි සත්වයන් විසින් බොහෝ උත්සාහයෙන් සොයා ගත් යම්තම් වස්තුවෙක් ඇත් නමුත් එයිත් කිසියම් සැලැස්මකින් අපවත් ව නැසී යන්නේ ම වේ ද´යි කිව. මෙසේ ද කියා ´දන් කුමක් කරමෝ ද තෙරුන් වහන්සේ ඉන්ට සලස්වා යම් කිසිවක් නුදුන් කල යුක්ත නොවෙ´යි කියා ´තමාගේ ශරීරමාංස[6] පිස තෙරුන් වහන්සේට මාංස වළඳවම්´යි සිතා කරයක් ඇර ගෙන

---

1. ආයේ ඇයි ද යි - BDEGHJKL
   ආයේ කින් ද යි - C
   අයේ නැ යි - බෙ.ස.
2. ඊහ තමපී න සිජ්ඣති - බෙ.ස.
   ඊහන්තානම්පි සිජ්ඣති -KL
3. කෙනකුන්ට - CDHJ
4. යම - BDEGHKL
5. අකුශල බලය - BDEG, බෙ.ම.ස.
   අකුශලයෙක් - KL
6. ශරීරමාංසය - KL

Non-Commercial Distribution

තමාගේ කලවයේ මස් කපනු කැමැති ව ගබඩාවට වන්නීය; එකල එම ගැහැණියගේ පුරුෂයා එපරිද්දෙන් ම 'මාගේ[1] මාංස කපා පිස තෙරුන්වහන්සේට දන් දෙමි'යි සිතා මාංස කපනු කැමති ව එම ගබඩාවට වන්නේ තමාගේ භාර්‍යාව ද එපරිද්දෙන් ම මාංස කපන්ට උන්නා දක 'කුමක් කරා ද'යි විචාළේය, එබසට ස්ත්‍රී කියන්නී 'ස්වාමිනි, මාගේ ශරීරමාංස කපා පිස තෙරුන් වහන්සේට දන් දෙමි'යි කිව. එබස් අසා ඒ ස්ත්‍රියගේ පුරුෂයා ද තමාගේ ශරීරමාංසය දෙනු කැමැත්තේ 'සොඳුර, ස්ත්‍රීජාතිහු නම් නුවණ මඳ කෙනෙක; දුක් ඉවසිය නොහෙති; මාගේ ශරීරමාංසය දෙමි'යි කීය.

මෙසේ දෙමහල්ලන් වෙන වෙන ම තම තමන්ගේ ශරීරමාංස කපා දෙම්හ යි උත්සාහ කරන කල්හි උන්ගේ ශ්‍රද්ධානුභාවයෙන් ශක්‍රයන්ගේ පාණ්ඩුකම්බල ශෛලාසනය හුනු විය, එකල ශක්‍රදෙවේන්ද්‍රයෝ මීට කාරණ කිම් දෙ හො යි බලන්නාහු ඒ දෙමහල්ලන් තම තමන්ගේ ශරීරමාංස දෙම්හ යි කියා කරන පිරිසිදු වූ අදහස් දක 'බුදුවන්ට විවරණ ලැබූ පාරමිතා පුරමින් ආවා වූ බොධිසත්ත්වවරයන්ගේ දනාධ්‍යාසයක් සේ මොහු දෙදෙන පිරිසුදු වූ දනාධ්‍යාසය ඇත්තාහු ය'යි සන්තුෂ්ට වූ සිත් ඇති ව රත්හැල් සාල් තිඹක් හා මුවපිඩියක් ද දීගෙඩියක් ද [ගිතෙල් කළයක් ද][2] ඇරගෙන ඇසිල්ලක අවුත් එක්තරා මිනිසකු මෙන් උන්ගේ ගෙදොරට පැමිණියාහ[3]. අහෝ ඔවුන් දෙදෙනාගේ දනාධ්‍යාසය ඉතා ආශ්චර්‍යී මැයි. ඒ එසේ මය; දයකයෝ වනාහි දනදසය දනසහායය දනපතිය යි තුන්දෙනෙක් වෙති; එයින් මොහු දෙදෙන දනපතී නම් වෙති, එබැවින් එසේ දනපතී ව දන් දෙන්නවුන්ගේ චිත්තය ඇම වේලෙහි දන චෙතනාවෙන් ම යුක්ත වන්නේය; එබැවින් මෙසේ ආධ්‍යාත්මික වූ ශරීරමාංස දෙනවුන්[4] සෙසු බාහිර වස්තු දෙති යනු කියනුම කිම් ද. එසේ හෙයින් කියන ලදි;

> එවං දනපතීනහත්‍ථ - දනෙව රමතෙ මනො,
> දෙහෙත්‍ථවජ්ඣත්තිකං දනං - බාහිරෙසු කථාව කා.
>
> අහං අහං ච දස්සන්ති - මනෙතනෙත්‍ථවං උභො ජනෙ,
> තෙසං සම්බලහහෙථ්න - සක්කො පාතුරහු තහිං -යි.

මෙසේ ශක්‍රදෙවේන්ද්‍රයෝ ඇවිත් දෙරකට සිට බලා ගේවට ඇවිද 'මේ ගෙයි මනුෂ්‍යයෝ කොයි ගියෝ ද'යි විචාළෝය,[5]එබසට දෙමහල්ලෝ මෙතැනය යි ගෙන් පිටත්වූහ; ඉක්බිති ශක්‍ර දෙවෙන්ද්‍රයෝ 'පින්වත්ති, මේ ආයුෂ්‍යයන් වහන්සේට දියයුතු කිසි දනොපකරණයක් ඇද් ද'යි[6] විචාළහ; එබස් අසා ඔහු දෙදෙන 'ස්වාමිනි, අප දුප්පතුන්ට දනොපකරණ කොයින් ලැබෙමෝ ද,[7] යටත් පිරිසෙයින් පළාකොළ පමණකුත් නැතැ'යි සියල්ල ම කීහ. ඉක්බිති ශක්‍රදෙවේන්ද්‍රයෝ 'එසේ වී නම් මේ සාලින් බත් පිස මේ උපකරණ හා සමග තෙරුන් වහන්සේ වළඳවාලව; ඉදින් මම

1. තමාගේ - KL
2. ගිතෙල් කළයක් ද (නැත) - පිටපත් හැම
3. පැමිණියේය - BCDEHJKL
4. දෙන්නාහු - ක.කි.කු.බෙ.
5. විචාළේය - BCEGHKL
6. ඇද්දෝ හෝ යි - බෙ.ස.
7. ලැබේ ද - ක.කි.කු.ම.

නොආයේ වී නම් මා නොබලා තෙපිත් අනුභව කරව; අනිකුත් තොප කැමැත්තක් කරව`යි කියා ඒ සියල්ල ම අවු නොවන සේ අධිෂ්ඨාන කොට දිව්‍යලොකයට ගියෝය. එකල ඔහු දෙදෙන බත් මාලු පිස තෙරුන්වහන්සේ වළඳවා ශක්‍රයන් එනී බලා සිට නොඑන හෙයින් තුමූත් අනුභව කළාහුය; සැලෙහි වනාහි එක බත් හැන්දක් ඇරගත් පමණ ම පෙනෙන්නේය; සෙසු උපකරණ ද එසේ මය, එකල ඔහු දෙදෙන ඒ ආශ්චර්‍ය්‍යය දක සතුටු සිත් ඇත්තාහු එතැන් පටන් බොහෝ භික්ෂු සඞ්ඝයා වහන්සේ රැස් කරවා සත්කාර ගරුකාර කෙරෙමින් මමය මාගේය යි ප්‍රත්‍යයදනයෙන් පුදමින් ඒ පර්වතප්‍රාන්තයෙහි වාසය කරන මනුෂ්‍යයන් ද සෙසු දුගී මඟී යාචකයන් ද දිව්‍ය ආහාරයෙන් ම සන්තර්පණය කෙරෙමින් නිරන්තරයෙන් පන්සිල් රැක පොහොය පෙහෙවස් රැක දහැමෙන්[1] ජීවිතාන්තය දක්වා සැප සේ වැස ජීවිතාවසානයෙහි දෙව්ලොව උපන්හ. මෙසේ ඒ දෙමහල්ලන් තම තමන්ගේ ශරීරමාංස දන් දීමෙන් තමන්ගේ දන චේතනාව සිද්ධ කොට ගෙන එම ජන්මයෙහි ඒ දුන්නාවූ දනයෙහි විපාක ඇසුවාවූ ශ්‍රද්ධාවන්තයන් විසින් ආදර සහිත ව දනාදි වූ කුශලක්‍රියාවෙහි යෙදී වාසය කළ මැනවි. කියනලදුයේ මැයි;

සද්ධාබලං පස්සථ භො ජයම්පතී
සමංස දනෙනපි දනමානසං,
පුරෙත්ව දනස්ස ඵලං ලභිංසු තෙ
තුමෙහපි සද්ධාධුරමෙව සෙවථ[2]-යි.

මේ මෙහි දෙ වන
චන්‍ද්‍රපබ්බත වස්තුව ය.

තව ද මෙහි තුන්වන මෙසවණ්ණ වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මෙම ලඞ්කාද්වීපයෙහි මහවැලි ගං අස හෙල්ලෝලිය නම් මහ ගමෙක් විය,එහි වසන්නාවූ දුප්පත් මිනිසෙක් තමාගේ භාර්‍ය්‍යාව හා සමඟ බැලමෙහෙ කොට අනුන්ගේ ගෙයක වාසය කෙරෙමින් දුඃඛජීවිකාවෙන් ජීවත් ව වසනුයේ දවසෙක කලවිට සලා[3] යම්තම් වී ටිකක්[4] ලැබ ඒ වී ණය දී පොලී හා සමඟ ඒ වී නැවත ණය දී මෙසේ වී පොලී වඩමින් ක්‍රමයෙන් බොහෝ වස්තුව උපදවා ගෙන (නිල්)පවු[5] විහාරයට ගොස් භික්ෂූන් වහන්සේට ආරාධනා කොට දන් දී බණ කියවූයේය; මෙසේ ඔහු දෙදෙන[6] ජීවිතාන්තය දක්වා දන් දෙමින් නිත්‍යශීල වශයෙන් පන්සිල් රකිමින් පොහොය පෙහෙවෙමින් ජීවිතාවසානයෙහි එයින් ගොස් උදුම්බරගිරි පර්වතයෙහි භූමාටු දෙවතා ව උපන්නේය; ඔහුගේ භාර්‍ය්‍යාව ද එපරිද්දෙන් ඒ පර්වතයෙහි දෙවතා ව උපන්නීය; ඒ දිව්‍යපුත්‍රයාහට මෙසවණ්ණ දිව්‍යපුත්‍රය යි නම්

---

1. දහැමෙන් සෙමෙන් - BDEGHKL, ස.
2. සද්ධාධුර සෙවථාති - ක.කි.ඍ.ම.
3. ගස්වා -J, ක.කි.ඍ., හසවා - C, බෙ. සලා - BDEGHL, ම.ස.
4. වියක් - GKL
5. විලපවු - පිටපත් හැම
6. හෙතෙම භාර්යාව හා සමග - ම.

Non-Commercial Distribution

විය, ඔහුගේ භාර්‍යාවට ද චන්‍ද්‍රමුඛී නම් විය; ඔවුන්[1] දෙදෙනාට ඒ පර්‍වතය ඇසිරු කොට මහත් වූ රුවන් විමනෙක් උපන; ඒ විමානය උද්‍යාන විමාන කල්පවෘක්‍ෂ පුෂ්කරණ්‍යාදීන් ප්‍රතිමණ්ඩිත ය; නොයෙක් සියගණන් දෙවඟනන්[2] විසින් ප්‍රයොග කරන ලද නෘත්‍ය ගීත වාද්‍යාදියෙන් සන්තොෂ එළවයි; නොයෙක් දිව්‍ය ඓශ්වර්‍යයෙන් යුක්ත විය, මෙසේ ඒ මෙසවණ්ණ නම් දිව්‍යපුත්‍රයා ශක්‍රදෙවෙන්‍ද්‍රයන් පරිද්දෙන් ම මහත් වූ දිව්‍ය ඓශ්වර්‍ය විඳිමින් චන්‍ද්‍රමුඛී නම් දිව්‍යාඞ්ගනාව හා නොයෙක් දහස් ගණන් සුරසුන්දරීන් පිරිවරා ඒ දිව්‍යවිමානයෙහි වෙසෙයි. එකල ඒ උදුම්බරගිරි නම් පර්‍වතයෙහි චන්‍ද්‍රමුඛී නම් ලෙන මලියදෙව මහ තෙරුන් වහන්සේ චිත්තවිවෙකයෙන් යුක්ත ව වාසය කරන සේක; එසේ ම සෙසු බොහෝ භික්‍ෂූන් වහන්සේ ද ඒ ඒ තැන ගල්ගුහා පාංශුගුහා[3] කුටි මණ්ඩප රුක්මුල් ආදියෙහි වාසය කෙරෙමින් මහණධම් පුරනසේක. එකල්හි එක් දවසක් මලියදෙව මහතෙරුන් වහන්සේ බණ අසනු පිණිස ධර්‍මඝොෂා කැරවූසේක; එකල්හි මෙසවණ්ණ නම් දිව්‍යපුත්‍ර තෙම[4] නොයෙක් සියගණන් දෙවඟනන් හා නොයෙක් දිව්‍යාලඞ්කාරයෙන් සැරහුණාවූ දිව්‍යසෙනඟ පිරිවරා තෙමේ ද සියලු දිව්‍යාලඞ්කාරයෙන් සැරහී නීල පීත ලොහිතාදි වූ පස්වනක් පැහැයෙන් යුක්ත ධජපතාක කුඩ කොඩි නංවා ආතතය විතතය විතතාතතය ඝනය සුසිරය යන පඤ්චාඞ්ගිකතූර්‍යාවයෙන් එකඝොෂා කරවමින් මහත් වූ දිව්‍යානුභාවයෙන් දිලිහි දිලිහී එසේ ම නොයෙක් සිය ගණන් දෙවඟනන් විසින් පිරිවරනලදු ව[5] චන්‍ද්‍රමුඛී නම් ප්‍රධාන භාර්‍යාව හා සමග බණ අසනු පිණිස එනුයේ සත්රුවනින් විසිතුරු වූ මිණිපලඟක් හා දිව්‍යමය වූ සඳුන් සුවඳ මල් ආදිය ගෙන්වාගෙන ඇවිත් මලියදෙව මහතෙරුන් වහන්සේ ඇතුළු වූ මහසඞ්ඝයා වහන්සේ වැඳ පුද එකත්පස් ව හිඳ සාධුකාර දී[6] බණ ඇසූහ.[7] මහතෙරුන්වහන්සේ ඒ දෙමහල්ලන්ගේ මහත් වූ දිව්‍යානුභාවය හා දිව්‍ය ඓශ්වර්‍යය දැක 'මුන් දෙන්නා විසින් පූර්‍වජන්මයෙහි කළාවූ කුශලකර්‍මය අද මා[8] විචාළ මැනව'යි සිතා දිව්‍යපුත්‍රයාහට ආමන්ත්‍රණය කොට ඔවුන් විසින් කරනලද්දවූ කුශලකර්‍මය විචාරන්නාවූ මහතෙරුන් වහන්සේ;

පුච්ඡා 'මහං දෙවපුත්තං - මෙසවණ්ණං යසස්සිනං,
කො නු ත්වම්'සි දෙවින්‍දෙ - දෙවරාජා'සි තන්‍දනෙ.
දෙවිස්සරියසම්පන්නො - දිබ්බාභරණභූසිතො,
දිබ්බෙහි නච්චගීතෙහි - වාදිතෙහි පමොදසී.

යනාදීන් "මහත් වූ යශොතෙජසින් යුක්ත වූ මෙසවණ්ණ දිව්‍යපුත්‍රයාණෙනි, තොප අතින් මා විචාරන දෙයෙක් ඇත; නඳුන් වන උයන් කෙළ[9] දිව්‍යසෙනඟ හා සමග මෙතනට ආවාවූ තෙපි ශක්‍රදෙවෙන්‍ද්‍රයෝ ද නොහොත් සුයාම සන්තුෂිතාදීන් අතුරෙන් එක්තරා දිව්‍යරාජයාණ කෙනෙක් ද. තෙපි මහත් වූ දිව්‍යඓශ්වර්‍යයෙන්

1. ඔහු - BCGHJ
2. දෙව දෙවසත්‍රීන් - BEHKL, කි.බෙ.ස.
3. පර්වතගුහා - D
පර්වතගුහා පාංශුගුහා - ස
4. දිව්‍ය පුත්‍රයෝ - K
5. පිරිවරන ලද - CDEJKL, ම.ස.
6. දි දී - BEGHKL
7. ඇසිය - ම.
8. මා විසින් - ක.කි.කැ.ම
9. කෙළි කෙළ - B

Non-Commercial Distribution

සම්පන්න ව දිව්‍යාභරණයෙන් සැරහී නොයෙක් සියගණින් දිව්‍යනාටකයන් විසින් ප්‍රයොගකරනලද නෘත්‍ය ගීත වාද්‍යාදියෙන් සන්තුෂ්ට ව පිනපිනා හිඳුව, නා නා ප්‍රකාර වාද්‍යවිධියෙහි දක්ෂ වාද්‍යකාරයෝ කළ මිහිඟුබෙර[1] එකැස් බෙර ඩව්ර ඩැක්කි මහබෙර ආදි වූ භෙරිජාතීන් ගෙන තොප ඉදිරියෙහි වාද්‍යවිධි දක්වා භෙරිනාද කෙරෙති, සමහර දෙවතාවෝ කංසුතාලං සමුත්තාලං ගෙන ගසති, සමහර දෙවතාවෝ අත්තල දි දී ගී කිය කියා නටති; සමහර දෙවතාවෝ රන්සක් රිදීසක් රන්සින්නම් රිදීසින්නම් වස්කුලල් ආදි වූ තුයර්‍යභාණ්ඩ ගෙන පිඹිමින් ඉදිරියෙහි නික්මෙති; එසේ ම හාවභාවලීලා විලාසයෙන් යුක්ත වූ සමහර දිව්‍යාඞ්ගනාවෝ නෘත්‍යාඞ්ග දක්වති, සමහර දිව්‍යාඞ්ගනාවෝ නානාප්‍රකාර වස්ත්‍රාලඞ්කාරයෙන් සැරහී එක්සිය විසි ලයින් අනපෙන ව අනූන ව[2] ගියාවූ ගී කිය කියා ගායනා කෙරෙමින් තොප සතුටු කෙරෙති; තෙපි නමා කවුරු ද කොයි වසන කෙනෙකු ද අපි තොප කවුරුනැ යි දනුමෝ ද?[3] මෙසේ අප සිතට උපන්නාවූ කාඞ්ක්ෂා දුරු කොට අපි හැම නම් අසවල්හුය; අප වසන්නේ අසුවල් තෙන[4]ය යි තොප දෙදෙනාගේ නාම ගොත්‍ර හා වාසස්ථාන සියල්ල ම අපට කියව`යි වදළසේක. මෙසේ විචාළ මහතෙරුන්වහන්සේට දිව්‍යපුත්‍රයා කියනුයේ;

ඉමස්මිං පබ්බතෙ හන්තෙ - ධූමරක්ඛස[5] නාමකෙ,
මම පුඤ්ඤෙන නිබ්බත්තො - පාසාදෙ රතනාමයො.

ඉච්ඡාදයක[6] නෙකෙහි - කප්පරුක්ඛෙහි ලඞ්කතො,
පුරින්දදොව මොදමි - නන්දනෙ සුරනන්දනෙ.

යනාදීන් `ස්වාමිනි, උදුම්බරගිරි නම් වූ මේ පර්වතයෙහි අපගේ කුශලානුභාවයෙන්[7] කැමැති කැමැති වස්තු ප්‍රදනය කරන්නාවූ කල්පවෘක්ෂසමූහයකින් සැරහුණාවූ සත්රුවනින් විසිතුරු[8] මනහර දිව්‍යප්‍රාසාදයෙක් උපන; ඒ ප්‍රාසාදයෙහි දෙවස්ත්‍රීන් පිරිවරා වාසය කරන්නාවූ මම දෙවඟනන් හා සමඟ දෙදෙව්ලොව දිවසෙනග පිරිවරා නඳුන්වන උයන් කෙළියෙන් සන්තුෂ්ට වූ ශක්‍ර දෙවෙන්ද්‍රයා[9] මෙන් නිත්‍ය සන්තොෂයෙන් යුක්ත ව වාසය කෙරෙමි`යි කීය. එකල ඔහු පූර්වජාතියෙහි කළ කුසල් කවරේ ද යි විචාරන මහතෙරුන්වහන්සේ;

කෙන වතෙන සීලෙන - බ්‍රහ්මචරියාය[10] තෙ අයං,
[ලද්ධා][11] දෙවසිරී දෙව - තං මෙ අක්ඛාහි පුච්ඡිතො.

යනාදීන් `[එම්බා][12] දිව්‍යරාජය, පෙර තොපගේ කවර ව්‍රතසමාදනයකින් කවර ශීලානුභාවයකින් කවර බ්‍රහ්මචර්‍ය්‍යාවකින් මෙබඳු දිව්‍යසම්පත් ලද්දු ද, ඒ කුශලය මට ප්‍රකාශ කොට කියව`යි වදළ සේක. මෙසේ විචාළ මහතෙරුන්

1. එකස්බෙර - පිටපත් හැම
2. අනුව - BCDEGHKL, ම.ය.
3. තොදනුම්හ - C
4. සෙනක - BCGHJKL
5. උදුම්බරගිරි - ම.
6. ඉච්ඡිදයක - පිටපත් හැම
7. කුශලයෙන් - BCDGHJKL
8. විසිතුරු වූ - H
9. දෙවෙන්ද්‍රයන් - H
10. බ්‍රහ්මචරියෙන - ක.කි.ඤ.ම. පාලි
11. ලද්ධො - පිටපත් හැම
12. එම්බල - පිටපත් හැම

Non-Commercial Distribution

වහන්සේට පූර්වජන්මයෙහි කළ කුශලය නම් මේ මේය යි වෙන වෙනම දක්වන දිව්‍යපුත්‍ර තෙම;

අහං හනෙත අතීතසමිං - අහොසිං පරකම්මිකො,[1]
පරකකමෙන[2] ජීවාමි - අපපහොගො අනාලකියො[3].
කදචි හරියා සද්ධිං - පලාලං චාලයං අහං,
ලද්ධාන ධඤ්ඤම්පපං තං - ඉණඤ්ඤාය පයොජයිං,
තතො වඩ්ඪිං පයොජෙනෙතා - අහොසිං දසිදසවා.
ධනධඤ්ඤවා අරොා ආසිං - සද්ධාධනාදිභූසිතො,
අහං ච හරියා මය්හං - උභො දනං අදම්හසෙ.

යනාදීන් ස්වාමිනි, මම මීට පළමු ජාතියෙහි කිසි වස්තුවකුත් නැති ව අනුන්ට මෙහෙ කොට ජීවත් වන්නාවූ දුප්පත් මිනිසෙකිමි;[4] එකල මම හද්‍රාව[5] හා සමඟ කලවිටි සලා යන්තම් වී ටිකක්[6] ලැබ ණයට දී පොලී කොටගෙන මෙසේ මෙසේ වරින්වර පොලී උපදවා ගෙන ක්‍රමයෙන් දසිදස් ගවමහිෂාදීන් හා ධනධාන්‍යයෙන් සමෘද්ධ ව වසන්නාවූ අපි දෙදෙන ශ්‍රද්ධාධනයෙන් සැරහී දන් දෙන්නාහු[7] සිල්වත් ගුණවත් භික්ෂූන් වහන්සේ ම පරීක්ෂා කොට ආරාධනාවෙන් කැඳවාගෙන අවුත් මධුර වූ අන්නපානාදියෙන් හා සිවුරු සෙනසුන් ආදියෙන් උපස්ථාන කළම්හ. ගිලනුන් වහන්සේට බෙහෙත් පසය[8] දුනුම්හ. නානාජාතියෙහි අවුළු හා බත් මල් පහන් ආදියෙන් බුද්ධපූජා කැරවූම්හ; ධර්මකථිකයන්ට සත්කාර සම්මාන කොට බණ කියවා සියලු දනයෙන් උතුම් වූ ධර්මදනය දෙවූම්හ. තව ද අපි දෙදෙන නිරන්තරයෙන් පන්සිල් රැක පොහෝ දවස් පෙහෙව අටසිල් රැකියම්හ. මෙසේ අපි දෙදෙන සමසිතින් කරන ලද්දවූ කුශලානුභාවයෙන් එයින් චුත ව මේ පර්වතයෙහි බුමාටුදෙවතා ව උපනුම්හ; නුවණැති බුද්ධපුත්‍රයාණන් වහන්ස, මේ අපගේ පූර්වචරිතය මෙපරිද්දෙන් දන වදළ මැනව. මෙසේ කුශලයෙහි විපාක ලොකවාසී සත්වයෝ ඉදින් දනිත් නම් සෙසු කාරිය තබා කුසල් ම කරන්නෝ වේ ද [යි කිය,][9] එකල තෙරුන් වහන්සේ 'තොප කළ කුසල් වන්නා එසේ මය, තොපගේ ආයු[10] ප්‍රමාණය කවරේ ද යි විචාරනසේක්;

කිත්තකං චත්තතෙ[11] ආයු - ඉමස්මිං වසතො තව,
අක්ඛාහි සොතුම්ච්ඡාමි - යදි ජානාසි මෙ තුවං.

යනාදීන් 'මේ පර්වතයෙහි වසන්නාවූ තොපගේ ආයු[10] ප්‍රමාණය කවරේ ද? තොපගේ ආයුෂය මෙතෙක් කල් පවත්නේය යි දනු නම් නියම දැන කියව; එයින් අසනු කැමැත්තෙමි'යි කියා වදළසේක. එකල දිව්‍යපුත්‍රයා කියනුයේ;

1. පරකම්මිනො - CEJ
2. පරකමෙමන - ක.කි.සැ. පාලි
පරකකමෙව - HL
3. අනාලයො - K
4. මිනිසෙක් වීමි - D, ක.කි.සැ.ම.
5. මාගේ හද්‍රාවන් - BEGHKL, ස.
6. වියක් - G, ස.
7. දෙන්නාහු අපි හැම - පිටපත් හැම
දෙන්නමෝ - ම.
8. පසයා - E
පසය සපයා - G
9. වේද - පිටපත්හැම, ක.කි.සැ.ම.
10. ආයුෂ් - BDH
ආයුඃ - මුද්‍රිත හැම.ස.
11. වත තෙ - BCGJKL

Non-Commercial Distribution

වඩ්ඪිත්වාන ධරා ධීර - ගිලිත්වා පබ්බතං ඉදං,
යදා භූමි සමං[1] හොති - කූටමපි'ස්ස න දිස්සති.

සකටම්ගොා යදා හොති - අස්මිං පබ්බත මුද්ධනි,
තෙලභාජනසම්පුණ්ණං - සකටං ගොනා වහන්ති හි,
පාජෙන්ති තං පතොදෙහි - කුමාරා සත්තවස්සිකා

තදා ඉතො චවිත්වාන - තාවතිංසෙ මනොරමෙ,
ද්වාදසයොජනුබ්බෙධෙ - රතනෙහි සුසඞ්ඛතෙ.

දෙවිස්සරියසම්පන්නො - දෙවතාහි පමොදිතො,
රමාමි පුඤ්ඤදකමෙමත - පුබ්බෙන සුචරිතෙන'හං.

යනාදීන් 'ස්වාමීනි, මේ මහපොළොව වැඩී මේ පර්වතය යට ව[2] මහාපර්වතය මුදුන පමණකුත් නොපැනේ ද මේ පර්වතය මුදුන මහත් ව[3] තෙල්කළ පිරූ ගැලක ගොන් ගෙයක් යොද සත් හැවිරිදි බාලයෝ කැවුටුවම්[4] කොට පැදෙගෙන යෙද් ද, එකල්හි මෙයින් චුත ව සියලු සම්පත්තීන් සමෘද්ධ වූ තව්තිසා දෙව්ලොව සත් රුවනින් විසිතුරු වූ දෙළොස් යොදුන් රන් විමනෙක ඉපද සියලු දිව්‍යසම්පත්තීන් සමෘද්ධ ව දිවසෙනඟ පිරිවරා පළමු කළ කුශලයෙන් ම බොහෝ කලක් දිවසැපත් විඳිමි'යි කීය.

මෙසේ ඒ දිව්‍යපුත්‍රයා තමා විසින් කරනලද පූර්වකුශලය හා ඒ කුශලයෙන් ලද්දවූ දිව්‍යඓශ්වර්‍ය්‍යය හා තමාගේ ආයු ප්‍රමාණය[5] ප්‍රකාශකොට දක්වා එයින් මතු තව්තිසා භවනයෙහි ඉපද විඳිනා ඓශ්වර්‍ය්‍යය ද යන සියල්ල ම විස්තර වශයෙන් මහතෙරුන් වහන්සේට ප්‍රකාශ කොට කියා මහතෙරුන් වහන්සේ වැඳ ප්‍රදක්ෂිණා කොට අවසර ඉල්වාගෙන එතැනින් අන්තර්ධාන ව තමාගේ පිරිවර හා සමඟ ඇඹෙණියන් හා දෙදෙන විමානයට ගියහ. මලියදෙව මහතෙරුන්වහන්සේ ඒ ආශ්චර්‍ය්‍යය දැක මේ කතාව[6] මූලාරම්භයෙහි පටන් මහජනයාට කියා බොහෝ දෙනා කුශලක්‍රියායෙහි යොද වදළසේක.

එසේ හෙයින් මේ දනය නම් කැමැති කැමැති සවර්ගමොක්ෂ සම්පත් සිද්ධ කොට දෙන සිතුමිණි රුවනක් හා සමානය, තවද මේ දනය නම් ජාතියෙන් ජාතියට එක් ව යන්නාවූ දිව්‍ය නිධානයක් හා සමානය, මෙසේ මේ දනය නම් සතුරු සත් නමැති විෂ විනාශයට දිව්‍ය මන්ත්‍රයක් හා සමානය, එසේ හෙයින් දනය නම් පින්වත් වූ ශ්‍රද්ධාවන්තයන් විසින් තම තමා ශක්ති පමණින් භජනය කළ මැනවි[7]. එසේ හෙයින් කියනලදි;

එවං දනං සග්ගසම්පත්තිදනං
දනං දිබ්බං චානුගාමි[8] නිදනං,
දනං මන්තං සබ්බසත්තුපඝාතං
දනං තස්මා ඨාමසා භො භජ්වෙථා-යි.

මේ මෙහි තුන් වන

මෙසවණ්ණ වස්තුව ය.

1. සමා - ක.කි.සද.ම.
2. බිම හා සමග - DEHL
උසට ම බිම හා සමග - K
සම ව බිම හා සමග - BG
බිම හා සමග සම ව - ම
3. මහ මාවත් ව - KL, ස.
4. කැවිටිකම් - E
5. ආයුඃ ප්‍රමාණය - මුද්‍රිත හැම, ස.
6. කථාවස්තුව - BCEJKL
7. මනාමැ යි - E
8. අනුගාමි - පිටපත් හැම.

Non-Commercial Distribution

තවද මෙහි සතර වන කාකවසතුව නම් කවර යත් හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

යටගිය දවස මෙම ලඞකාද්වීපයෙහි රුහුණුරට මාගම තිසා වැව යටිතියර කවුඩු බෝගසෙක කැදල්ලක් ඉදිකොටගෙන ඒ ඒ තැන ගොදුරු කා ඇවිත් වසන්නා වූ කපුටුවෙක් මණිනාග දිවයින නාග නම් ගම්දෙර තල්ගසෙක වසන කැවිඩියක හා සමඟ සහවාස ව[1] ඇ කැඳවාගෙන ඇවිත් රුහුණ එම කවුඩු බෝගස වෙසෙයි, එයින් මෑතභාගයෙහි කපුටුදෙන් තොමෝ අන් කපුටුදෙනක හා සමඟ කපුටුවාගේ අනාචාරයක් දක කිපී පළමු තමා විසූ මණිනාග දිවයිනට ම ගියාය; කපුටුවා ඇ ගිය කල්හි ශොකයෙන් පීඩිත ව දෙතුන් දවසක් කල් යවා ඒ කපුටුදෙනුව සමීපයට යන්නේ අතරමඟ තෙලිය[2] නම් ජනපදයෙහි මාතුල නම් විහාරයට පැමිණියේය; ඒ විහාරයෙහි[3] භික්ෂූන් වහන්සේ වළඳ ඉක්බිති භොජනශාලාවෙහි වත් කරනසේක, එවේලෙහි කපුටුවා සඞඝස්ථවිරයන් වහන්සේට නුදුරු තැන එක් ගසෙක හිඳ තමා සයින් පීඩිත බව හඟවනු පිණිස කියනුයේ ʻසත්වයන්ගේ ශරීරය වියළන්ට ශොකයට වඩනා දෙයෙකුත් නැත; ගමනට වඩනා ආපදථියෙකුත් නැත; තෘෂ්ණාව හා සමාන ලජ්ජා නැති දෙයකුත් නැත; බඩසායට වඩා දුකකුත් නැත: මේ සියල්ලට ම පැමිණියෙමි; ස්වාමීනි, බඩසාය ඉතා ම තද; තපස්විවරයන් වහන්සේ දනයෙහි විපාක දන්නා සේක යි සිතා මේ තැන්හි ආයෙමි'යි කීය. එසේ හෙයින් කියනලදි;

චින්තා සමො නත්ථි සරීරසොසනං
නෙව'ත්ථි අද්ධික සමාපි ච ආපද හි,
තණ්හා සමො[4] නත්ථි හිහීන ලජ්ජො[5]
ඛුද්‍ද සමං[6] නත්ථි ජනස්ස දුක්ඛං.

එතස්ස සබ්බස්ස'හ'මජ්ජ පත්තො
ඛුද්‍ද හදත්ත අතිපීළතී මෙ,
දනස්ස ජානන්ති ඵලං වසීසා
මනුස්වාන ඉවෙච'ච මි'ධාගතොසමි-යි.

ඒ විහාරයෙහි තෙරුන් වහන්සේ වනාහි කපුටුවන්ගේ බස් දන්නාසේක, එසේ හෙයින් උන්වහන්සේ ʻමේ කපුටුවා තමා සා විඩාබව කියන්නේය'යි දන සාමණේර නමක් කැඳවා කඩරෙද්දක් ගෙන්වාගෙන පහන්පියලි අඹරවාගෙන ගිතෙලින් තෙමා ගින්නේ ලා මඳක් තැව්වන්[7] කරවා කවුඩාට[8] ලැවූසේක, කපුටුවා ඒ පාන්කඩ අනුභව කොට සාවිඩා සන්හිඳුවාගෙන තමා යන කාරිය තෙරුන්වහන්සේට කියා ʻනැවත එන කලත් දක යන්නෙම් වේ ද'යි කියා අවසර ගෙන නාගදිවයිනට ගොසින් තමාගේ භාර්‍යාව දක ඇ සමීපයෙහි කීප දවසක් රඳ කපුටුදෙනුව කැඳවාගෙන

---

1. විශ්වාස ව - B
   සමඟ වාස ව - CJ
2. රොළිය - පාලි
3. විහාරයෙහි වසන - C
4. සමා - මුද්‍රිත හැම
5. හිහීනලජ්ජා - මුද්‍රිත හැම, ස.
6. සමො - KL, ස.
7. කළුවන් - K, කළුවන් - L
8. කපුටුවාට - B

Non-Commercial Distribution

නැවත ඒ මාතුල විහාරයට ඇවිත් තෙරුන්වහන්සේට නුදුරු තෙන[1] එක් ගසෙක හිඳ කපුටුධෙනුව හා එක් ව තමා ආ බව තෙරුන්වහන්සේට කීය. පළමු පරිද්දෙන් ම තෙරුන්වහන්සේ ඔවුන් දෙදෙනාට ගිතෙලින් රඳ පහන්පියලි දෙවූසේක; ඔහු දෙදෙන ඒ පහන්කඩ අනුභව කොට සාය සන්හිඳුවාගෙන කපුටුවා 'මේ[2] ඇමදෙනාවහන්සේ මෙතැන දුක සේ වාසය කරන සේක; ඉදින් අප හා සමඟ වැඩිසේක්[3] වී නම් රාජ්‍යය සුලභ වූ අන්නපානාදින් සමෘද්ධය;[4] අපි හැමදෙනාවහන්සේට උපස්ථාන කරම්හ'යි සිතින් කල්පනා කොට එපවත් තෙරුන්වහන්සේට කියනුයේ 'ස්වාමීනි, මේ කපුටුවෝ නම් චඤ්චල වූ සිත් ඇති චපල වූ තිරිසන් සත්වකෙනෙකැ'යි නොසිතුව මැනව; මා කියන වචනයෙන් සුදුසු දෙයක් ම ගත මැනව; අපවිත්‍ර අමේධ්‍යයෙහි හුනත් උතුම් වූ මැණික ගතමනා මය; මඩෙහි ඇති වූවත් මහනෙල්මල් පළඳනාහු මය, ගෝකුණෙහි ඇති වූවත් ගොරද නොදමා ගනිත් මය, එපරිද්දෙන් ම මා කියන සුභාසිත වචනය ගත[5] මැනව, මම මාගේ ශක්ති වූ පරිද්දෙන් ඇමදෙනා වහන්සේට උපස්ථාන කෙරෙම්; මට අනුග්‍රහ පිණිස අප හා සමඟ වැඩිය මැනවැ'යි කීය. එසේ හෙයින් කියනලදී;

මා ධංකො චපලො එසො - තිරච්ඡාන ගතො'ති වා,
මඤ්ඤිතබ්බො සද්‍ද භන්තෙ - යුත්තං ඤත්වා ච[6] ගාහියං.

ගහණීයං මණි මීළ්හෙ - තථා කද්දමතුප්පලං,
ගොහි ගොරොචනං චෙව - මමතො'පි සුභාසිතං.

උපට්ඨිස්සාම'හං භන්තෙ - යථාසත්තිං යථාබලං,
මයා සහෙ'ව ගන්තබ්බං - මමානුග්ගහබුද්ධියා-යි.

කපුටුවාගේ බස් අසා මහතෙරුන්වහන්සේ 'එම්බා ඇවැත්නි, මේ කපුටුවා අප තමා හා එක් ව යනු කැමැත්තේය'යි වදරා සහ පස්විසි නමක් කැඳවාගෙන කපුටුවා හා සමඟ අද්ධානමාර්ගයට පිළිපන්සේක. කපුටුවා ද මාතුල විහාරයෙහි පටන් මාගම මඤ්ජල නම් විහාරය දක්වා සිව්සාලිස්යොදනක් පමණ මහ දිග භික්ෂූන්වහන්සේට කැඳ බත් ආදිය සුලභ ව පවත්වමින් කැඳවාගෙන ගියේය. භික්ෂූන්වහන්සේට[7] කෙසේ දන් දේ ද යත්;

ඒ කපුටුවා වනාහී තෙරුන්වහන්සේට කියන කල 'ස්වාමීනි, මේ මඟින් වැඩිය මැනව; මේ මේ තැන දුර්භික්ෂය; මේ මේ තැන සුභික්ෂය; මොහු සැදැහැ ඇත්තෝය[8], මොහු සැදැහැ නැත්තෝ[9]ය'යි යනාදීන් පරීක්ෂා කොට කියයි; ඒ හැමදෙනා වහන්සේ ද ඔහු කී සලකුණෙන් ගොස් සුලභ වූ අන්නපාන ලබනසේක. මෙසේ ඒ කපුටුවා භික්ෂූන්වහන්සේ කැඳවාගෙන යන්නේ මාගමට ගොස් එක් විහාරයෙක

1. තැනෙක - B, ක.කි.සැ.ම.
2. කපුටුවා කියනුයේ ස්වාමීනි - පිටපත් හැම
3. වඩනාසේක් - H
4. සමෘද්ධ විය - පිටපත් හැම
5. ඇසුව - GHL
6. ඤත්වාච - J
ඤත්වාන - ක.කි.සැ.ම.ස.
7. කපුටුවා භික්ෂූන්වහන්සේට - KL, ස.
8. ඇත්තේය - BCDGHJKL, ක.කි.ඤා.බෙ.ස.
9. නැත්තේය - BCDHJK, ක.කි.ඤා.බෙ.

Non-Commercial Distribution

වසන්ට[1] සලස්වා වස් තුන් මස ඇතුළත කපුටුදෙනුව හා සමඟ උපස්ථානය කෙළේය; තෙරුන්වහන්සේ වස් තුන්මස අවෑමෙන් ˇඅපගේ විහාරයට ම පවරන්ට යම්හˇයි කපුටුවාට වදළසේක, එකල කියනුයේ ˇස්වාමීනි, භික්ෂූන්වහන්සේගේ සිවුරු දුර්වල ව තිබෙයි; මෙතැන්හි බොහෝ චීවරලාභයට කාරණ පෙනෙයි; එබැවින් ස්වාමීනි, මෙතැන්හි ම පැවරුව මැනවැˇයි කියා පවරන දවස් ˇස්වාමීනි, ගොළුමුහුද සමීපයෙහි අසවල් නම් ගමට අද ඇමදෙනා වහන්සේ වැඩිය මැනව, ඒ ගම්හි එක් උපාසිකා කෙනෙක් බොහෝ සිවුරු හා පිරිකර සපයා ˇභික්ෂූන්වහන්සේ කවර ද එනසේක් දේ හෝ යි මඟ බල බලා හිඳිතිˇයි කීය.[2] එබස් අසා තෙරුන්වහන්සේ සඞ්ඝයාවහන්සේ කැඳවාගෙන එතැන්හි ගොස් ඒ උපාසිකාවන් විසින් දෙනලද සිවුරු හා පිරිකර ගෙන කපුටුවාට කියා තමන්වහන්සේ වසන මාතුල නම් විහාරයට වැඩිසේක.

ඉක්බිති ඒ කපුටුවා හා කපුටුදෙනුතොමෝ තෙරුන් වහන්සේ ඇතුළු වූ සංඝයා වහන්සේ කෙරෙහි කරනලද චිත්තප්‍රසාදයෙන් තිරිසන්යෝනියෙන් මිදී තවුතිසා දිව්‍යලොකයෙහි උපන්හ. මෙසේ තිරිසන්යෝනියෙහි උපන් කපුටුවෝ පවා තමන්ට කළ ස්වල්පමාත්‍ර වූ උපකාරය සිත තබාගෙන නැවත ප්‍රත්‍යුපකාර කළාහු ය. මේ තිරිසන් කපුටුවා කළ උපකාර සිත තබා ගෙන නුවණැත්තවුන් විසින් මිත්‍රද්‍රොහි කම් නොකොට කෙළෙහි උපකාර දැන ප්‍රත්‍යුපකාර කළ මැනවි. කියනලදුයේ මැයි;

කතූපකාරං හදයෙ කරොන්තා
කරොන්ති කාකාපි පුනොපකාරං,
කත්වාන එතං හදයෙ සපඤ්ඤා
මිත්තද්දු මා හොථ කතඤ්ඤු හොථ-යි.

මේ මෙහි සතර වන
කාක වස්තුව ය.

තව ද මෙහි පස් වන රියහල්[3] වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්:

යටගිය දවස රියහල් තිස්ස[4] නම් උපාසක තෙම රුහුණු ජනපදයෙහි සගම්දෙර එක්තරා කුලගෙයක ඉපද වැඩිවිය පැමිණ වසනුයේ දවසෙක සගම්[5] විහාරයට ගොස් බොධින්වහන්සේට ද සංඝයාවහන්සේට ද පහන් සිතින් පසඟ පිහිටුවා වැඳ එතැන් පටන් දවසින් දවස වඩ වඩා තුනුරුවන් කෙරෙහි පැහැද

1. වස් වසන්ට - C
2. කියා - BCDHJK
3. රිහල් - DEHJL
4. රියහල්තිස්ස - BCK,
රිහල්තිස් - ක.සි.සැ
රියහල් තිස් - ම.
රිහල්තිස්ස - L, බෙ.ස.
5. සගම්දෙර - C, බෙ.ස.

Non-Commercial Distribution

නිරන්තරයෙන් විහාරයට එළඹ මහබෝමළුවෙහි වැලි ගෙනවුත් ලමින් රූ නහා[1] මළුව හමදිමින් සුවඳමල් ගෙනවුත් පුදමින් සුවඳපැන් වඩමින් සුවඳපසඟුල් දෙමින් භික්ෂුසංඝයාවහන්සේට ද සිව්පසයෙන් උපස්ථාන කෙරෙමින් මෙසේ කුශලසමභාරයන් රැස් කොට එයින් මිය එම රුහුණු ජනපදයෙහි මාගම රාජමඬගල[2] වීථියෙහි මහා ධනදෙව නම් වූ අමාත්‍යයාහට පුත් ව උපන්නේය; දෙමවුපියෝ ඕහට තිස්සය යි නම් තුබූහ; ඉක්බිති ඔහු සතර පස් ඇවිරිදි අවස්ථාවෙහි කෙළනා හෙයින් කෙළිතිස්ස ය යි නම් තුබූහ; ඒ කෙළිතිස්ස කුමාර තෙම එයින් මෑතභාගයෙහි මැනව නොමැනව[3] දන්නා වයසට පැමිණ බුඩශාසනයෙහි පැහැද භික්ෂූන්වහන්සේ සමීපයෙහි මහණ ව වත් පිළිවෙත් පුරමින් පස් අවුරුද්දක් ශාසනයෙහි සිට ඉක්බිති මහණදම් පුරන්නට අසමර්ථ වූයේ සිවුරු හරනා කැමැති විය. හේ එසේ මැයි:

බුදුසස්නෙහි මහණ වූ ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයන් විසින් ප්‍රාතිමොක්ෂ සංවරශීලය විශෙෂයෙන් ම රක්ෂා කටයුත්තේය, චක්ෂුඃ ශ්‍රොත්‍රාදි වූ පඤ්චද්වාරයට හමු ව සිටි රූපශබ්දාදි පඤ්චාලම්බනයන් එයින් වළකා විත්තසංරක්ෂණය කිරීමෙන් ඉන්ද්‍රියසංවර ශීලය රක්ෂා කටයුත්තේය; වෙළුදනාදි වූ එක්විසි අන්වෙෂණයෙන් දුරු ව[4] නිරවද්‍ය වූ පස සෙවීමෙන් තමාගේ ජීවිතය මෙන් ආජීවපාරිශුද්ධ ශීලය රක්ෂා කටයුත්තේය; දැහැමෙන් සෙමෙන් ලද චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානප්‍රත්‍යය යන සතර පසය ආදර සහිත ව නිරන්තරයෙන් පස් විභා ප්‍රයොජන විදීමෙන් ප්‍රත්‍යයසන්නිඃශ්‍රිත ශීලය රක්ෂා කටයුත්තේය. මෙසේ සතර සංවරශීලය නිර්මල කොට රක්නාවූ බුද්ධපුත්‍රතෙම ස්වර්ගමොක්ෂසම්පත්තිය එකාන්තයෙන් සුව සේ ලබන්නේය. එසේ නො ව 'යම්කිසි මහණෙක් රාගද්වෙෂ මොහයෙන් මඩනාලද සිත් ඇති ව අලසකාරී ව[5] ශීලරක්ෂණයෙහි[6] ආදර මඳ ව වෙසේ ද හෙතෙමේ තමහට සිවුපසදනයෙන් උපස්ථාන කරන උපාසකජනයා සන්තොෂ කරවන්නේ ද නොවෙයි. නොමිය කුණු වූ එකස්හු මෙන් තෙමේ ද සන්තුෂ්ට නොවෙයි; සොහොන්හි දමනලද නිෂ්ප්‍රයොජන[7] සොහොන් පෙණෙල්ලක් මෙන් මෙම ජාතියෙහි නුවණැත්තවුන් විසින් නිරන්තරයෙන් නින්ද කටයුතුබවට පැමිණ මතු එකාන්තයෙන් නරක තිර්‍ය්‍යක් ප්‍රෙත අසුරකාය යන සතර අපායෙහි මහත් වූ දුක් අනුභව කරන්නේය. එසේ හෙයින් තමහට ප්‍රතිනියත වූ චතුපාරිශුද්ධිශීලය රක්ෂා කරන්නට අසමර්ථ වූ භික්ෂූන් විසින් අත්‍යන්ත නිර්මල වූ සර්වඥශාසනය දුශ්චරිත නමැති අමෙධ්‍යයෙන් පිරිබඩ නොගෙන මහණවෙශය හැර ගිහිභාවයට යා යුත්තේය. කියන ලදුයේ මැයි:

---

1. රැ නැගිට - L
2. රාජමඬගලා - පිටපත් හැම
3. නව මනව - GJL, ස.
   මුහුකළ - L
   කළමනා - D
   වැඩිවිය පැමිණ - ක.කි.ඤ.ම.
4. දුරු කොට - පිටපත් හැම.
5. අලසකාමී ව - D
6. ශීලසංරක්ෂණයෙහි - BEGHKL, ස.
7. නිෂ්ප්‍රයෝජන වූ - BEGHKL

Non-Commercial Distribution

සද්ධෙන කුලපුත්තෙන - පබ්බජිත්වාන සාසනෙ,
පාලෙතබ්බමසෙසෙන - පාතිමොක්ඛං ච සංවරං.[1]

එවං චතුබ්බිධං සීලං - පූරයන්තො ජිනත්‍රජො,[2]
සග්ගාපවග්ගසම්පත්ති - මචිරස්සමනුභොස්සති.

තස්මා තං පරිපූරේතු - මපෙක්ඛානෙන භික්ඛුනා,
නාලිම්පිත්වාන මීළ්හෙන - ගන්තබ්බං සත්ථුසාසනා-යි.

ඉක්බිති ඒ තිස්ස නම් මහණතෙම සෙනසුන් පිරිකර තැන්පත් කොට තබා තමා හන් පෙරවි සිවුරු සෝධා පාත්‍රය හා සමඟ විහාරයෙහි නොනස්නා සේ සේම කොට තබා සංඝසන්තක නොවන නිරවද්‍ය වස්ත්‍රයක් නැති හෙයින් සිවුරු හැර නග්න ව ගඟට බැස උදකපටිච්ඡන්නයෙන් පීනාගෙන යනුයේ දියෙහි යන්නාවූ දඬුකඩක් දැක එහි ළය තබාගෙන පීන පීනා යටිගං බලා නික්මිණි. එකල්හි ළඳුරී කුමාරිකාවෝ දෙදෙනෙක් යටිගඟ නහන්නාහු දියෙන්[3] එන්නාවූ දඬුකඩ දැක ඔවුන් දෙන්නා අතුරෙන් එක් කුමාරිකාවක් "තෙල දියෙන් එන දඬුකඩ මාගේය" යි කිව; අනික් කුමාරිකා තොම "ඒ දඬුකඩෙහි යම් වස්තුවෙක් ඇත්නම් එමාසන්තකය" යි කිව, මෙසේ ඔවුන් දෙන්නා කථා කෙරෙමින් සිටියදී ම දඬුකඩ අවුත් සමීපයට පැමිණියේය; ඉක්බිති දෙදෙන ම පීනා ගොස් පෝරුකඩ හා සමඟ තිස්සකුමාරයන් ගං තොටට ගෙනාහ; එකල ඔවුන් දෙදෙනා අතුරෙන් දඬුකඩෙහි තිබූ වස්තුව මාසන්තකය යි කී කුමාරිකාවෝ නග්නත්වයෙන්[4] උන් තිස්ස කුමාරයන් දැක මොවුන් ඇඳගන්නා දෙයක් ගෙනෙන්ට යෙමි තමන්ගේ ගෙට ගියාහ; එකල දඬුකඩ මටය යි කී කුමාරිකාවෝ දියෙන් යන දඬුකඩ මා සන්තක වූ කල එහි තුබූ වස්තුවත් මාගේ නොවේ ද යි සිතා දෝ හෝ තමන් ඉන තුබූ කඩ දෙකක් කොට කඩා එයින් එක් පටක් තිස්සකුමාරයන් අඳවා තමන්ගේ දෙමව්පියන්ගේ ගෙට කැඳවාගෙන ගියහ; ඉක්බිති කුමාරිකාවන්ගේ මව්පිය දෙදෙන තිස්සකුමාරයන්ගේ ජාතිගොත්‍ර විචාරා තමන්ගේ ඒ සුමනා නම් දියණියන් තිස්සකුමාරයන්ට පාවා දුන්හ. එකල ඒ ගම මනුෂ්‍යයෝ තිස්සකුමාරයන් ගඟදී දැක[5] ගෙනා හෙයින් ගඞ්ගාතිස්සය යි නම් තුබූහ.

---

1. පාලියෙහි මෙතැන තවත් ගාථා තුනක් පෙනේ.
චක්ඛුසොතාදිද්වාරානි - රූප සද්දාදිගොචරෙ.
චාරෙතබ්බං සද තෙන - සවෙනින්ද්‍රිය සංවරං,
අනෙසනං පහත්වාන සුද්ධාජීවෙන සබ්බද,
ආජීවසීලං පාතබ්බං - ජීවිතං විය අත්තනො.
චත්තාරො පච්චයෙ නිච්චං - සෙවමානෙන යොනිසො.
පච්චය සන්නිස්සිතං සීලං - පාලෙතබ්බං සදදරා,

2. ජිනත්තජො - DE
3. දියෙනි - K
4. නග්නයෙන් - පිටපත් හැම
5. ගනින් දැක - C, බෙ.
දැක ගනින් - J, ක.කි.ඤ.ම.

Non-Commercial Distribution

එකල ඒ ගඞ්ගාතිස්සයෝ නැදිමයිලන්ගේ ගෙයි ම වාසය කරන්නාහු ගොවිතැන්බත් වෙළෙඳම් නවාම් ආදි වූ කිසි කටයුත්තකුත් නොකොට ඒ ඒ තැන්හි කෙළ ඇවිදිනාහ; මෙසේ කිසි කර්මාන්තයක් නොකරන හෙයින් නැවත ඒ ගම මනුෂ්‍යයෝ නික්කම්මතිස්සය යි නම් තිබූහ. එකල්හි සුමනාවන්ගේ මල් බෑයෝ දෙමව්පියන්ට කියන්නාහු ‘සුමනාවන් ගහින් ගෙනා සැමි සුව සේ බඩපුරා බත් කාලා කිසි කර්මාන්තයක් නොකොට බිජුවට රකිනා කිකිළියක සේ සිහිල් සෙවන ගෙට වැදලා ඉඳිනේය; අපි ඕහට කුමක් පිණිස මෙහෙවර කරමෝ ද’යි කියති. එතෙපුල් අසා සුමනාවන්ගේ මව්පිය දෙදෙනා නික්කම්මතිස්සයන් බැහැර ගිය කල්හි සුමනාවන් සමීපයට කැඳවා කළමනා කටයුතු අවවාද වශයෙන් කියන්නාහු ‘එම්බා සුමනාවෙනි, තොපගේ ස්වාමිපුත්‍ර වූ නික්කම්මතිස්සයෝ ගොවිතැන්බත් වෙළෙඳම් නවාම් ආදි වූ කිසි කර්මාන්තයක් නොකොට පය දා බලුකුකුරකු[1] සේ දසඅත පැන ඇවිද එන දවස කෙසේ නම් අඹුදරුවන් රක්ෂා කොට කවර උපායෙකින් වංශවර්ධනය කෙරෙද් ද; එබැවින් අඹුදරුවන් හා සමඟ සැප සේ ජීවත් ව අවශේෂ බන්ධුනුත් රැක වංශවර්ධනය කරනු කැමැතහොත් ගොවිතැන් බත් වෙළෙඳම් නවාම් ආදි වූ සියලු කර්මාන්තයෙහි අනලස ව විසිය යුත්තේය; එපරිද්දෙන් ම ක්ෂේත්‍රවස්තුයෙහි ද දසිදස් ගවමහිෂාදීන් කෙරෙහි ද දඩබිම කළමනා කර්මාන්තයෙහි ද[2] යන සියල්ලෙහි නිරන්තරයෙන් අලසකාරී නොවන තැනැත්තේ සියලු ජනයන් විසින් ප්‍රශංසා කටයුතු වන්නේය; උදසන්හි ඉතා සීතය මධ්‍යාහ්නයෙහි ඉතා උෂ්ණය ඉතා සවස් ව ගියේය යනාදීන් සීත උෂ්ණ ආදිය නොසිතා[3] කායික චෛතසික දුක් සහනය කොට තමා විසින් කළමනා වූ ඒ ඒ කටයුත්තට කල් නොකල් නුවණින් පරීක්ෂා කොට දන හැම කල්හි වීර්‍ය්‍ය කටයුත්තේය; එපරිද්දෙන් ම වෙළෙඳම් කිරීමෙහි ද ශිල්පශාස්ත්‍ර ඉගැන්මෙහි ද යන නිරවද්‍ය වූ සියලු කටයුත්තෙහි අප්‍රමාද ව අජරාමර කෙනෙකුන් මෙන් උත්සාහ කටයුතුය’ යනාදීන් අවවාද කළහ. කියනලදුයේ මැයි;

කසිං වාථ වණිජ්ජං වා - අකත්වා තව සාමිකො,
කුලවංසං පතිට්ඨෙති - කථං නික්කම්මසීලිකො.[4]

සීතුණ්හාදිමචින්තෙන්තො - සහන්තො කායිකං දුඛං
කාලාකාලං සමඤ්ඤාය - කාතබ්බං විරියං සදා.

තථා වණිජ්ජකම්මෙපි - සිප්පුග්ගහණධාරණෙ,
අතන්දිතෙන කත්තබ්බං - අමරන්තො'ව සබ්බදා-යි.

---

1. බලු කුකුරුවකු - C
   බලු කුකුළු - K
   බලු කුකු - L
2. දසිදස්....කර්මාන්තයෙහි ද කොටස (නැත) - ස.
3. නොසලකා - H
4. නික්කම්මසීලකො- BDEGHKL

Non-Commercial Distribution

මෙසේ කළමනා කටයුතු උගන්වා ඒ සුමනාවන්ට සාල්නැලියක් හා බත් පිස ගන්නා සැළිකුඩික්කියක්[1]දී 'අද පටන් තෙපි දෙදෙනා වෙන ම රැකෙව; අපගේ ගෙයි නොහිඳුව'යි කියා ගෙන් නෙරපුහ. ඒ එසේ මය. මේ ලොකයෙහි දෙමවුපියෝ ද[2] කුසෙහි ඔත් මල්බෑයෝ ද අඹුදරුවන් හා සෙසු බන්ධූහු ද යන සියල්ලෝ ම කිසි වස්තුවක් නැති දිළිඳු තැනැත්තවූ නොකැමැති වෙති යනු ඒකාන්ත ධර්මතාවෙක් ම ය; නැවත හීන වූ චණ්ඩාලකුලයෙහි උපන් එකෙක් වී නමුත් ඉදින් බොහෝ පරිවාරසම්පත් හා භොගසම්පත්තීන් ආඪ්‍ය ව වෙසේ නම් එසේ වූ ඉසුරුමත් තැනැත්තවූ මවුපියන් ආදි වූ උත්තම මධ්‍යම අධම යන සියල්ලෝ ම භජනය කෙරෙති, ඕහට අවනත ව දවස් අරනාහ යන මෙයිදු මේ ලොකයෙහි ඒකාන්ත ධර්මතාවෙක් මය. එසේ හෙයින් කියනලදී;

මාතා පිතා ච භාතා ච - පුත්තදරා ච ඤාතකා,
දළිද්දං නෙව කාමෙන්ති - එවං ලොකෙසු ධම්මතා.
අකුලීනො'පි චෙ භොගී - සධනී[3] චාථ සො පභූ,
තං වෙ සබ්බෙ උපාසන්ති - එවං ලොකෙසු ධම්මතා-යි.

මෙසේ මවුපියන් විසින් ගෙන් පිටත් කරනලද්දවූ සුමනාවෝ තමන්ට දුන් භාජනය හා සාල්නැළිය ගෙන මිනිසුන් නැති එක් ගෙයකට වැද හඬ හඬා දෑසෙන් වැහෙන[4] කඳුළුධාරා නියගින් ඉස ඉස සමණුන්[5] එන පෙරමඟ බල බලා නිකටෙහි අතක් දී සුසුම් ල ලා උන්හ. ඉක්බිති නික්ඛමම්මතිස්සයෝ තමන් ගිය තෙනින් අවුත් ගෙය බලා සුමනාවන් නොදක බැහැර පරීක්ෂා කරන්නාහු මිනිසුන් නැති ගෙයි උදකලා ව අඬ අඬා උන්නාවූ සුමනාවන් දැක සොඳුර, කුමක් පිණිස අඬව් ද'යි විචාළහ. එබසට සුමනාවෝ තමන්ගේ මව්පියන් කළ කී සියල්ල ම පිළිවෙළින් කියා තමන් ගෙන් නෙරපූ බව කීහ.

එබස් අසා නික්ඛමම්මතිස්සයෝ කියන්නාහු 'කිමෙක් ද සොඳුර අප වෙන් කරන්නාවූ තොපගේ මව්පියෝ දෙදෙන කුමක් කුමක් දී වෙන් කළෝ ද'යි විචාළහ. එකල සුමනාවෝ කියන්නාහු 'අපට දුන් දයාදයෙක් නම් බත් පිසගන්නා භාජනයක් හා එක සාල් නැළිය පමණෙක් මය'යි කීහ. එවේලෙහි නික්ඛමම්මතිස්සයෝ කිසි දෙම්නසක් නැති ව 'එම්බා සොඳුර, ශෝක නොකරව; අපි කවර උපායකින් වත් ජීවත් වමෝ මය; එසේ හෙයින් මෙතැන් පටන්ගෙන සඞ්ඝයාවහන්සේට ශක්ති වූ පරිද්දෙන් දනයක් දුන මැනව, එසේ දනයක් නොදී කිසිවක් අනුභව නොකරම්හ'යි කතිකා කොට තුමූ ම විහාරයට ගොස් භික්ෂූන් වහන්සේට ආරාධනා කොට අවුත් සොඳුර, මා එන තෙක් ණය ගෙන වෙව යි යම් කිසි උපායකින් අප්‍රමාද ව සඞ්ඝයාවහන්සේට දන්දෙව'යි විධාන කොට තුමූ බැළමෙහෙ සොයා ගියහ. එකල්හි

1. සැළියක් හා කුඩික්කියක් - B
සැළියක් - CG
2. වැදූ දෙමවුපියෝ ද - ස,
වැදූ මව්පියෝ ද - KH,
වැද මව්පියෝ ද - L
3. සබලී - පිටපත් හැම
4. වැස්සෙන - CJ
වැසෙන - D
5. සමුහාණන් - K

Non-Commercial Distribution

නික්ඛම්මතිස්සයන්ගේ පිය වූ මහාධන දෙවයන්ට මිත්‍ර වූ 'චන්‍ද්‍රසූර්‍ය්‍ය' නම් ජනපදනායකයන්ගේ තිත්තවිල කෙත්වතින් බිජුවට පන්සියයක් කිරිය කෙත්වත මුළුල්ල ම එකලට පැසුණේය. බැළමෙහෙ සොයා ගිය නික්ඛම්මතිස්සයෝ ඒ ජනපද නායකයන්ගේ ගෙදෙරට ගොස් ඔවුන් දුටහ, එකල ජනපදනායක තෙම නික්ඛම්මතිස්සයන් දැක 'යහළු, කුමක් පිණිස අවු දැ'යි විචාරා 'බැළමෙහෙයට ගොයම් දවන කෙතක්[1] ඇත්නම් විචාරා ආමි' කී කල්හි ඔහුගේ ඉස සිට දෙපත්ල බලා 'දරුව, තෙපි පෙර[2] සිය අතින් මෙහෙවරක් කළ කෙනකුන් සේ නොවෙයි,[3] කිමෙක් ද ගොයම් දවන සේ දනු දැ'යි විචාරා නැවත ඔහු විසින් 'මෙහෙවර කරන සේ දනිතත් නොදනිතත් නුඹවහන්සේගේ ගොයම් දවන්ට ම වේ ද වුව මැනවැ'යි කී කල්හි ඒ ජනපදනායක තෙම 'තොපගේ සමර්ථකම් කෙසේ බවත් නොදනෙ'යි කියා නොගිවිස්සේ මය. ඉක්බිති නික්ඛම්මතිස්සයෝ 'එසේ වීනම් මාගේ සමර්ථකම් බැලුව මැනවැයි කියා දකැත්ත[4] ගෙන කුඹුරට බැස පෙරවරුභාගයෙහි ම ඒ පන්සියයක් කිරි[5] පමණ ම කෙත්වත ගොයම් ද නිමවූහ. ඒ දැක ජනපදනායකතෙම මහත් වූ ආශ්චර්‍ය්‍යයට පැමිණ නික්ඛම්මතිස්සයන්ට සතුටු පඬුරු පිණිස[6] තමහට ගෙනා බත් භාජනය හා සමහ දසිදස් ආදි වූ බොහෝ සැපත් දුන්නේය; ඉක්බිති නික්ඛම්මතිස්සයෝ තමන් දලු ගොයම් තුමූ ම ගෙන ගොස් කලවිට ලා මැඩ කොළ සලා වී පැස පුවරු ලා වටින් ඇද වී එක තැන රැස් කළාහ. එවේලෙහි ජනපදනායක තෙම නික්ඛම්මතිස්සයන්ගේ පුරුෂවික්‍රම දැක අතිශයින් සන්තොෂ ව ඒ සියලු ධාන්‍යරාශිය ඕහට ම දුන්නේය; නික්ඛම්මතිස්සයෝ එතැන් පටන් භික්ෂූන් වහන්සේට ලහබත් අටක් තබා දුන්නාහු පැන් හා ලුණු මාත්‍රාවක් දෙන්නේ ද[7] එසේ හෙයින් භික්ෂූහු ඕහට ලොණෝදක තිස්සය යි නම් තුබූහ. භික්ෂූන් අතුරෙන් වනාහි මහලු කල මහණ වූ බුඩ්ඪපබ්බජිත භික්ෂූහු බොහෝ සේ බත් ගෙන බල්ලන්ට බත් ලා දෙන පෝරුවෙහි බහන්නාහුය; ලොණෝදකතිස්සයෝ බුඩ්ඪපබ්බජිතයන් වහන්සේලාගේ ඒ ක්‍රියාව දැක එතැන් පටන් කිරි හා සමහ ලහබත් සොළොසක් තබා දෙන්ට පටන්ගත්හ; ඒ කාරණය මුල්කොට ගෙන ඕහට ඛීරභත්ත තිස්සය යි නම් තුබූහ; බොහෝ දවසක් කිරි හා බත් වළඳන්නාවූ භික්ෂූන්ට එහි අරුචි උපන්නේය; සිත නොපහදනේය.

ඉක්බිති ඛීරභත්තතිස්සයෝ ඒ කාරණය දැන දෙනුන් සියයක්[8] ලැබ 'එකාන්තයෙන් මම තුනුරුවන් කෙරෙහි පැදහැ ඇත්තෙමි වීම් නම් දෙනුන්ගේ කිරි

---

1. කෙත් - C, ම.
   කෙතෙක් - K
2. පෙර (නැත) - ස
3. නොපෙනෙයි - K
4. දැකැත්ත - BCDHKL
5. කිරිය - BG
6. පිණිස - C
   පිණිස (නැත) -BDEGHJKL, ක.කි.සද.ම.
   කොට - බෙ.ස.
7. තබා දෙන්නේ ද - ස.
   තබා දෙන්නා ද - KL
8.. පන්සියක් - C

Non-Commercial Distribution

සුවඳගිතෙල් වේව´යි කියා තමන්ගේ ශ්‍රද්ධාව ආවර්ජිනා කොට දෙනුන්ගේ තන ඇල්ලූහ. එකල්හි; දෙනුන්ගේ තනයෙන් සුවඳගිතෙල් වහනය කෙළේය; එතෙම එතැන් පටන් සොළොස් දෙනකුන් වහන්සේට සුවඳගිතෙල් උපුල්වා වත් කොට ලහබත් සොළොසක් තබා දෙන්නේය; එසේ හෙයින් මහට කල්‍යාණහත්‍ථතිස්සය යි නම් තුබූහ. මෙසේ කල්‍යාණහත්‍ථ තිස්සයෝ දවසින් දවස දිවුන දිවුනා දන් දෙන්නාහු පන්සියයක් දෙනාවහන්සේට නිරන්තරයෙන් සුවඳගිතෙල් උපුල්වා මහදන් දෙන්නාහු මය. මෙසේ දන්[1] දෙන්නාවූ කල්‍යාණහත්‍ථ තිස්සයෝ දවසෙක සිතන්නාහු ´භික්‍ෂූන්වහන්සේට මම පළමු ව කටු අල දනයක් දූන්[2] දවසෙක් නැත; දනුත්[3] මා විසින් කටු අල දනයක් දූන මැනවැ´යි සිතා බොහෝ මනුෂ්‍යයන් සමාදන් කරවා ගෙන කුඹල්පව්ව[4] නම් පර්වතයට නැඟී කටුවල කනන්නාහු නිධාන සැටක් දක ගෙන ගොස් තමන්ගේ ගෙයි නිධාන කොට තබා ´මෙවිට සිත් වූ පරිද්දෙන් දන් පින් කෙරෙම්´යි මහත් වූ සන්තොෂයට පැමිණියහ. හේ එසේ මය.

එතෙකුදු වුවත් පිදුරු වෙනිය හැඳ කුතු නටන කිඩින්ට වක්කාරියක් ලද නොය්‍යාවමැ යි කීවා සේ ඇඳගන්නා පමණකුත්[5] නැති ව සිවුරු හැර උපන් වන ම නග්නයෙන් අවුත් අනුන්ගේ උපකාරයෙන් දෙදෙනාට ලත් එක සාල්නැළිය පමණක් බත් පිස තබා ´දන් නොදී බත් අනුභව නොකරමි´යි සඞ්ඝයා වහන්සේට ආරාධනා කරන්ට විහාරයට දිවන කුඩාවුන් මෙපමණ නිධාන සැටක් ලදින් සිත් වූ පරිද්දෙන් දන් දෙමි සතුටු වෙති යනු කවර ආශ්චර්‍ය්‍යයෙක් ද. මෙපේ එක දවස් ම නිධාන සැටක් ලදින් කුසල් කිරීමෙහි ඔද වැඩියා[6]වූ සිත් ඇති කල්‍යාණහත්‍ථතිස්සයෝ එතැන් පටන් දවසින් දවස වඩ වඩා මහ දන් දෙමින් බොහෝ කුසල් කොට සැප සේ වාසය කරන්නාහුය.

එසමයෙහි පන්සියයක් භික්‍ෂූන්වහන්සේ අනුරාධපුර නුවරින් නික්ම ඒ ඒ තන්හි දහගප්[7] මහබෝ පෙතිපිළිම ආදිය වඳිමින් ගම් නියම්ගම්[8] පිළිවෙළින් සැරිසරා වඩනාසේක් ක්‍රමයෙන් මාගමට වැඩිසේක. එකල කල්‍යාණහත්‍ථතිස්සයෝ භික්‍ෂූන්වහන්සේ දක පහන් සිත් ඇති ව ආරාධනා කොට මහත් වූ සම්භාවනාවෙන්

---

1. මහදන් - CJ
2. නුදුන් - D
3. දන් - BDEGHKL, ම.
4. කුඹුල්පව්ව - J
5. වස්ත්‍ර පමණක් - BEGHKL, ස.
6. ඔද වැඩි - B
7. දහගැප් - CHL, ස.සි.ස.
   දගබ් - B,
   දහගොබ් - K
   දගප් - G
8. ගම්නියම්ගම් රාජධානි - CH

Non-Commercial Distribution

මහදන් දී වළඳ ඉක්බිති අනුමෙවුනි[1] බණ අසා එකත්පස් ව උන්නාහු 'සවාමිනි, වඩිනේ[2] කොයි සිට ද'යි විචාරා 'උපාසකය, අනුරාධපුර නුවර සිට ආමහ'යි කී කල්හි 'සවාමිනි, දන් මේ කාලයෙහි කවර තෙනෙක හික්‍ෂූන්වහන්සේ බොහෝ වාසය කරනසේක් ද'යි විචාරා 'එම්බල උපාසකය, ලඞ්කාද්වීපයෙහි චිරියඹුවා වෙහෙරය අනුරාධපුරනුවරය මණිනාගදිවයිනය යන මේ තුන්තැන්හි නොයෙක් සියදහස් ගණන් හික්‍ෂූන්වහන්සේ වාසය කරනසේකැ'යි කී කල්හි මහත් වූ සනෙනාෂයට පැමිණ ඒ කියන තුන් තැනට ම ගොස් දන් දෙනු කැමැති ව පළමු කොට චිරියඹුවා වෙහෙරට ගොස් එහි වසන හික්‍ෂූන්වහන්සේට මහ දන් දී එයින් ගොස් අනුරාධපුරනුවර දෙනානකය භගිරිනකය මිරිසවැටිය[3] දකුණුගිරිවිහාරය මහාවිහාරය යන මේ පඤ්චමහා ආවාසය ඇතුළු වූ ඒ ඒ විහාරවල නොයෙක් දහස් ගණන් හික්‍ෂූන්වහන්සේට මහදන් දී එයින් තමන් ශකති පමණින් පඩුරු ගෙන්වා ගෙන ගොස් රජ්ජුරුවන් දක ඔවුන්ගෙන් සංග්‍රහ ලැබ මණිනාග දිවයින් ගොස් එතැන්හිදු බොහෝ සංඝයා වහන්සේට අනෙකප්‍රකාර මහදන් දී එයින් අවුත් මහවැලිගඟ රියහල්තොට සමීපයෙහි එම නමින් ප්‍රසිද්ධ වූ එක් ගමෙක වාසය කෙරෙති.

මෙසේ ඒ ගම්හි වාසය කරන්නාවූ කල්‍යාණහතන තිසසයෝ එක් දවසෙක තමන්ගේ භායඝාවන් සමීපයට කැඳවා 'සොඳුර තෙපි මෙතැන් පටන් සංඝයාවහන්සේට මා විසින් දෙනලද්දවූ දන්වැට නොපිරිහෙළා නිරන්තරයෙන් ම පවත්වාලව; මම අද පටන් ගඟින් එතෙර මෙතෙර යනු එනු කැමැත්තාවූ මනුෂ්‍යයන්ට ඔරු පැද පින් පුරාගන්නා පිණිස යෙමි'යි භායඝාවන්ට අවවාද කොට තුමූ ද පින් පිණිස ඔරු පැද මනුෂ්‍යයන් එතෙර මෙතෙර ලමින් දවස් යවන්නාහ. මෙසේ ඔවුන් රියහල් තොට නිරන්තරයෙන් වාසය කරන හෙයින් නැවත රියහල්තිසසයෝය යි නම් තුබූහ. මෙසේ ම රියහල්තිස්සයන් ඔරු පැදීමෙන් දවස් යවන කල්හි දවසෙක ශක්‍රදෙවේන්‍ද්‍රයෝ ඔවුන්ගේ ශ්‍රද්ධාසමපත්තිය දන දනත් විමසනු කැමැති ව නාටකජනයන් විප්‍රලුපාන්ට ලාගත් විකට ජරාරූපයක් සේ ඉතා මහලු වූ බමුණුවෙසක් මවාගෙන පයිරෙද්ද කර දමා කුඩමහල්ලක් ඉසට කොටගෙන නැබුරු ව වකගසාගෙන ආනා ආනා සැරයටිය ගස ගසා අවුත් ඔරුවට නැංගාහ. එවේලෙහි රියහල්තිස්සයෝ 'සැබැවින් ම දිළිඳු වූ බමුණු මහල්ලෙකැ'යි සිතා ඔහු කෙරේ උපන්නාවූ බලවත් කරුණා ඇති ව ගඟින් එතර කරනු පිණිස ඔරුව පැදගෙන යන්නාහු එතර සමීපයට පැමිණියාහ; එකල ශක්‍රබ්‍රාහ්මණයා කියනුයේ

---

1. අනුමෙවෙනි - CEGH
2. වඩනේ - EGH, ම.
3. මිරිසවිටිය - J, ම.

Non-Commercial Distribution

'පින්වත් මහතාණෙනි, සැරයටිය[1] සිහි නැති ව පලා ආමි. වහා මට ගෙනවුත් දුන මැනවැ' කීය: එබස් අසා උපාසක තෙම නැවත ඔරුව පැදගෙන ගොස් සැරයටිය ගෙනවුත් දුන්නේය: දෙවනුවත්[2] ශක්‍රයෝ 'පින්වත් මහතාණෙනි, තෙල්කුලාව සිහිමද ව ආමි[3] කීහ: තිස්ස උපාසකයෝ නැවතත් ඔරුව පැදගෙන ගොස් තෙල්කුලාව ගෙනවුත් දුන්හ: මෙසේ හැම කල්හි ම විකට රූ මවාගෙන අදෝනා[4] කියන සේ දන්නා ඒ ශක්‍රතෙම යමක් යමක් කියා ද ඒ ඒ කී කී දෙය ගෙනවුත් දෙමින් තිස්ස උපාසකයෝ විටින් විටත් සතුටු සතුටු ව ම ඔරුව පදනාහු මය. ශක්‍රයෝ මෙසේ ඔවුන් විමසා අචල වූ ශ්‍රද්ධා ඇති බව දැන සතුටු ව තමන් මවා ගත්තාවූ මහලු බමුණු වෙස්[5] හැර ශක්‍රවිලාසයෙන් සැදී පැහැදී සිට සත්රුවනින් ඔවුන්ගේ ගෙය පුරා[6] 'අප්‍රමාද ව පින්කම් කරව'යි අවවාදකොට තමන්ගේ ශක්‍රභවනයට ගියාහ. එතැන් පටන් රියහල්තිස්සයෝ සත්රුවනින් පිරුණාවූ ගෙයි වෙසෙමින් දනාදි වූ සුචරිතයෙහි යෙදී එතැන්හි ම වාසය කරන්නාහ.

එකල පුවඟු දිවයින වසන බොහෝ සංඝයා වහන්සේ එක් දවසෙක එක තැනකට රැස්ව වැඩහිඳ සමඟ කථා කරනසේක් 'ඇවැත්නි, දැන් මේ දසදහසක් යොදුන් ජම්බුද්වීපයෙහි කවර තෙනක මනුෂ්‍යයෝ ශ්‍රද්ධාවන්තයෝ දැ'යි වදළසේක[7]. ඉක්බිති ඒ භික්ෂූන්වහන්සේලා අතුරෙන් සතිසම්බොධි නම් තෙරුන් වහන්සේ 'සිංහලද්වීපවාසීහු ශ්‍රද්ධාවන්තයෝය'යි වදළසේක. යොන් රජ්ජුරුවන්ගේ පුත් වූ මහාබුධරක්ෂිත නම් තෙරුන් වහන්සේ 'යොන්රට වාසීහු ශ්‍රද්ධාවන්තයෝය'යි වදළසේක.

මෙසේ දෙදෙනා වහන්සේගේ බස් අසා සෙසු ඇමදෙනා වහන්සේ 'අද දවස් ම සැදැහැ ඇත්තවුන් නැත්තවුන් විමසුව මැනවැ'යි කියා ඒ දෙදෙනා වහන්සේ ම ඒ ඒ රට යවූසේක: එකල දෙදෙනා වහන්සේ අතුරෙන් යොනක බුධරක්ෂිත මහතෙරුන් වහන්සේ වේලා ආසන්න වූ කල්හි රියහල්තිස්සයන්ගේ ගම්දෙරට සිහා වැඩිසේක. ඔවුන්ගේ භාර්‍යාවෝ එදවස් ම වෙන වෙන ම වැඩි දෙළොස් දහසක් භික්ෂූන්වහන්සේට දෙළොස් වරෙක දෙළොස් මහා දනයක් දී තමන් දුන්නාවූ දනය ආවර්ජනා කෙරෙමින් 'අද මා විසින් ඉතා සිහින් මොළොක් වූ සිවුරුපිළී ද ශරීරයට සුවපහස් දෙන්නාවූ පිඩහම් ඇතිරිලි ආදිය අතුරන ලද මනහර ඇඳපුටු ආදිය ද දන් දෙනලද්දේය. මිහිරි වූ අන්නපානාදියෙන් සන්තර්පණය කරනලද්දේය. කපුරු තකුල් ආදි වූ පස්පලවතින් යුක්ත බුලතින් ද ගිතෙල් මී උක්සකුරු ආදි වූ බෙහෙත් පසයෙන් ද මනා කොට උපස්ථාන කරන ලද්දේය: සෙට දවස් මීට වඩා කිනම් දනොපකරණ සපයාගෙන මාහැඟිකොට දනක් දීපිය හෙම් දෙ හො'යි සිතසිතා දැසිදසුන් හා කථා කෙරෙමින් කුරුයාන මත්තෙහි උන්හ. එසේ හෙයින් කියනලදි:

---

1. මාගේ සැරයටිය - මුද්‍රිතහැම ස.
2. දෙවැනිවත් - BEGHJKL
3 පළා ආමි - EGHKL
 ද ආමි - ක.සි.සද.ම.
4. අදෙනා කම් - DE ම.
5. බමුණු වෙශය - BEGHK
6. පුරවා - BCG ක.සි.සද.ම.
7. විචාළසේක - KL

Non-Commercial Distribution

ඉදසුච්දසුච බො අජ්ජ - දින්නං මෙ චීවරාදිකං
සුඛුමං සුඛසම්ඵස්සං[1] - මඤ්චපීඨාදිකං තථා.
මධුරෙහි අන්නපානෙහි ඛජ්ජභොජ්ජෙහි තප්පිතො
තම්බුල මුඛවාසාදි - භෙසජ්ජෙහි ච සාධුකං
ඉතොධිකං කථං සොභං - සම්පාදෙත්වාන සාධුකං
දස්සාමීති[2] විචාරෙන්ති අව්ජී දසිගණෙහි සා-යි

මෙසේ සතුටින් පින පිනා උන්නාවූ සුමනාවෝ සිහා වැඩි තෙරුන් වහන්සේ දැක පාත්‍රය ගෙන පියවර බලා 'වේලා ආසන්න හෙයින් බත් පිස දන් දෙන්ට නොපිළිවනැ'යි සිතා වහ වහා ගෙට වැද තෙල් ඇතිලියක් උදුනෙහි තබා සුවඳ ගිතෙල් වත්කොට කාඩිබත පැන්මිරිකා සෝධාහැර ගිතෙලින් බැද උක්සකුරු ආදී වූ චතුමධුර බහා[3] දිව්‍යභොජනයක් මෙන් පාත්‍රයෙහි පුරා පිළිවැටියක තබාගෙන තෙරුන්වහන්සේ සමීපයට ගෙන ගියහ: එවේලෙහි තෙරුන්වහන්සේ සුමනාවන්ගේ චිත්තප්‍රසාද වඩවනු[4] පිණිස 'නැහිණියෙනි[5], තෙල බත්පාත්‍රය අහසට ඇරපියව'යි වදළසේක. සුමනාවෝ හයින් පාත්‍රය අත නොහැර සිටියාහ: නැවත තෙරුන් වහන්සේ 'එම්බා නැහිණියෙනි, අද තොප දුන්නාවූ දනය සිහි කොට පාත්‍රය අහසට ඇරපියව'යි වදළ කල සුමනාවෝ තමන් විසින් කරන ලද්දවූ දන් පින් සිහි කොට බත් පාත්‍රය අහසට ඇරපීහ: තෙරුන්වහන්සේ ද 'මේ පාත්‍රයෙන් ගෙනගිය ආහාරය වළඳන්නාවූ භික්‍ෂූන් වහන්සේ මේ සුමනාවෝ මෙතැන්හි ම සිට සැප සේ දකිත්ව'යි අධිෂ්ඨාන කොට පුවඟු දිවයින් වැඩ ඒ බත්පාත්‍රය භික්‍ෂූන් වහන්සේ[6] වැළඳවූසේක. සුමනාවෝ ද තමන්ගේ[7] දන් වළඳන්නාවූ සංඝයාවහන්සේ දැක මහත් වූ සන්තොෂයට පැමිණ සාධුකාර දෙමින් තමන්ගේ ගෙට වැද ප්‍රීතීන් පින පිනා හිඳ පසුව තමන්ගේ[8] ස්වාමිපුත්‍රයාණන් ආ කල්හි වේලා ආසන්නයෙහි සිහා වැඩි තෙරුන්වහන්සේට තමන් දන් දුන් නියාව ද ඒ දුන්නාවූ බත් පාත්‍රය තමන් ලවා ම අහසට අරවා පාත්‍රය පස්සෙහි එන පරිද්දෙන් අධිෂ්ඨාන කොට තෙරුන්වහන්සේ නික්මුණු නියාව ද පුවඟු දිවයින වැඩහිඳ ඒ දන් වළඳන්නාවූ රහතුන්වහන්සේ ඔබගේ ම අධිෂ්ඨානබලයෙන් ගෙදෙර ම සිට තමන් දුටු නියාව ද යන සියල්ල ම ස්වාමිපුත්‍රයාණන්ට විස්තර කොට කීහ: එතෙපුල් අසා තිස්ස උපාසකයෝ ද ප්‍රීතිවේගයෙන් මත් ව මහත් වූ විස්මයට පැමිණියහ: මෙසේ ඉතා ආශ්චර්‍ය්‍යීමත් වූ බොහෝ කුශලයන් රැස් කෙරෙමින් දවස් යවා කෙළවර මරණමඤ්චකයට පැමිණ තමන් විසින් කරනලද සියලු කුශල සම්භාරයන් සඳහන් කොට සතුටින් පිනපිනා කිසි මරණ භයක් නැති ව සැප සේ සැතපුණාහ. ඒ එසේ මැයි.

---

1. සුඛුමසම්ඵස්සං - H
2. සදස්සාමීති - පිටපත් හැම
3. භා - CDJ
4. වඩන - BCEG
5. නැගෙනියෙනි - B
   නැහිනි - EH
6. වහන්සේට - H ක.සි.සැ.ම.
7. තමන්ගෙන් ගෙන ගිය - ම.
8. තමන් - BEGHJKL

Non-Commercial Distribution

බොහෝ කුසල් කළාවූ සත්වයන්ට මරණවේදනාවෙක් නැත් මය; තමන් කළ කුසල් සිත සිතා සැප සේ මෙයින් මිය නිඳ පිබිදියවුන් මෙන් කැමැති දිව්‍යලොකයෙක උපදිති; බොහෝ කුසල් කළ සත්වයෝ යම් කලෙක මරණවේගයෙන් පීඩිත ව සැලි සැලී මරණමඤ්චකයෙහි හොත්තාහු වී නම් එකල්හි උන් විසින් කරන ලද සියලු කුශලධර්මයෝ තෙපි නොබව යි අස්වසා අභයදනය දෙන කල්‍යාණ මිත්‍රයන් මෙන් චිත්තයට අරමුණු ව මරණභය දුරු කෙරෙති. එකල්හි දෙව්ලොව උපදනා සත්වයන්ට උතුම් වූ උද්‍යානවිමාන කල්පවෘක්‍ෂාදි ස්වරූපයෙන් ඉෂ්ට නිමිත්තයෝ පෙනෙති: දෙවුලොව දිව්‍යප්සරාවන් විසින් පවත්වනලද නෘත්‍යගීත වාද්‍යයෙන් හා නොයෙක් ආශ්වය්‍ය්‍යීයත්‍යයෙන්[1] යුක්ත දිව්‍යසම්පත්තීන් ප්‍රතිමණ්ඩිත වූ දිව්‍ය විමාන දිවයහන්[2] ආදිය දැක සම්පත්ති මදයෙන් උමතු ව ගියා සේ මහත් වූ අහංකාර උපදනේය: 'ඒකාන්තයෙන් ම අප විසින් කුසල් කරනලද්දේ මය; මරණට නොබන තරම් අභයදයක වූ රක්‍ෂාවෙක් කරන ලද්දේය; සැප සේ මෙයින් ගොස් දෙව්ලොව ඉපද අප විසින් කරනලද කුශලයෙන් උපන්නාවූ දිව්‍යසම්පත් අනුභව කරම්හ'යි මෙසේ මේ දිරා වැටෙන ගෙයක් හැර මහත් ප්‍රාසාදයකට නැඟෙන්නවුන් මෙන් කුසල් කළවුන්ට මහත් වූ ආස්වාද[3] උපදනේය. මෙපරිද්දෙන් සත්වයෝ තමන් විසින් කරනලද කුශලධර්මයන් විසින් පොලඹන ලදු ව කිසි භයක් චකිතයක් නැති ව සතුටින් පිනපිනා මිය දෙව්ලොව උපදනාහු මය; එබැවින් සිහිමුළා නැති ව මියන්නාවූ මරණ ද කුසල් කළ සත්වයන්ට එකාන්ත මය. එයින් කීහ, අභයගිරි නිවාසි කවි චක්‍රවර්ති ආනන්ද ස්ථවිරපාදයෝ සද්ධර්මෝපායනයෙහි:

කතපුඤ්ඤස්ස පන යද - මච්චුවේගෙන අද්දිතො,
එත්දනෙතා සයිතො හොති - සයනෙ මාරණන්තිකෙ.

යානිස්ස තම්හි සමයෙ - කල්‍යාණානි කතානි හි,
තානිස්ස තම්හි සමයෙ - අජ්ඣාලම්බනති[4] මානසං.

තද ඉට්ඨනිමිත්තානි - අනුකූලානි දිස්සරෙ,
අග්ගයානවිමානාදි - සග්ගගාමිස්ස ජන්තුනො.

අච්ඡරාගණසංඝුට්ඨෙ - අවෙජ්ර සත මණ්ඩිතෙ,
විමානයානෙ දිස්වාන - හොති තස්ස උදග්ගතා[5].

---

1. ආශ්චර්යයෙන් - BJ, ස, ආශ්චර්ය සතකයෙන් - KL
ආශ්චර්ය වශයෙන් - D ආශ්චර්ය සයනයෙන් - ක.සි.සැ.ම.
2. දිව විමන් දිවයහන් - බෙ.ස.
3. ආසාව ද - BCJ, . මුද්‍රිත හැම
4. අජ්ඣාලම්බති - පිටපත් හැම
5. උදග්ගතං - පිටපත් හැම

Non-Commercial Distribution

තද සො පරමස්සාසං - ලභතෙ දයකො නරො,
වජ්ජිත්වා[1] ජිණ්ණකං සාලං - පාසාදරොහණෙ විය.

සුකතං වත කල්‍යාණං - හිරුත්තාණං කතං මයා
උළාරං අනුභොස්සාමි[2] - සග්ගෙ කුසලජං ඵලං,

ඉති සො සම්පහට්ඨොව - අභීතො සම්පමොදිතො,
සකෙන පුඤ්ඤකම්මෙන - අච්චනතමුපලාලිතො

පුඤ්ඤකම්මරතාවාසං - සග්ගං නීයති පණ්ඩිතො
අමුළ්හො[3] මරණං තස්ස - නියතං පුඤ්ඤකම්මිනො[4]-යි.

මෙසේ තමන් කළ කුශලසම්භාරයන් සඳහන් කෙරෙමින් පින පිනා කිසි මරණභයක් නැති ව වැදහොත්තාවූ තිස්ස නම් උපාසකයන්ට දෙවතාවෝ සදිව්‍යලොකයෙන් රථ සයක් ගෙනවුත් ආකාශයෙහි සිටගෙන ‘අපගේ දිව්‍යලොකයට පලා එව, අපගේ දිව්‍යලොකය යහපත, අපගේ දිව්‍යලොකය [ඉතා][5] රම්‍යය. අපගේ දිව්‍යලොකය ඉතා සිත්කලුය, අපගේ දිව්‍යලොකය පඤ්චකාම සම්පත්තීන් සමෘධය[6], අපගේ දිව්‍යලොකය ආයුෂ ආදියෙන්[7] වඩනේය’යි මෙසේ තමතමන්ගේ දිව්‍යලොක වර්ණනා කොට කැඳවූහ. එපවත් අසා තිස්ස උපාසකයෝ තුෂිත දිව්‍යලොකය යහපතැයි කියා පළමු තමන් බණින් ඇසූ හෙයින් ‘තුෂිත දිව්‍යලොකයෙන්[8] ගෙනා රථය තබා සෙසු රථ ඇරගෙන පලා යව’යි කීහ.

එබස් අසා සමීපයෙහි සිටි සුමනාවෝ ‘කිමෙක් ද සාමිනි, මෙතෙක් කුසල් කොට පුරාපු නුඹවහන්සේ දැන් මරණාසන්නයෙහි ප්‍රලාප කියා දෙඩන්ට[9] කාරණ කිම් දැ’යි කීහ. එබස් අසා තිස්ස උපාසකයෝ ‘එම්බා සොඳුර, මම ප්‍රලාප දෙඩන්නෙම් නොවෙමි[10]. දෙවතාවෝ සදෙනෙක් සදිව්‍යලොකයෙන් රථ සයක් ගෙනවුත් අකාශයෙහි සිටගෙන තමතමන්ගේ දෙව්ලොවට මා කැඳවති: උන් හා සමග කථා කෙරෙමි’යි කීහ. එපවත් අසා සුමනාවෝ ‘මම ඒ රථ නුදුටිමි: රථ කොයි දැ’යි විචාළහ. එකල තිස්ස උපාසකයෝ මල්දමක් ගෙන්වාගෙන අහසට දැමූහ: ඒ මල්දම ගොස් තුෂිතදිව්‍යලොකයෙන් ගෙනා රථයෙහි එල්බිණ: එදැක සුමනාවෝ ගබඩාවට[11] වැද ඇඳට නැඟී කටින් නාසයෙන් සුළං රඳවා කාලක්‍රියාකොට තමන්ගේ ගෙහිමියාණන්ට පළමු ව[12] ගොස් ‘කුළී නුදුන්නෝ ඔරුවට පළමු

---

1. වජ්ජිත්වා - ම
2. අනුපස්සාමි - පිටපත් හැම
3. අසම්මුළ්හ - පිටපත් හැම
4. පුඤ්ඤකම්මුනො - පිටපත් හැම
5. ඉතා (නැත) පිටපත් හැම
6. අපගේ.......... සමෘද්ධය (නැත) ස.
7. ආයු ආදියෙන් - EHJK
   ආයුෂාදීන් -BG
8. දෙව්ලොවින් - CDJ ඛෙ.
9. නන්දෙඩන්ට - BEGHJKL, ස
10. නොවෙයි - KL
11. තම ගබඩාවට - ස.
12. පළමු කොට - ක.කි.ඤ,ම.

Non-Commercial Distribution

නැහෙති'යි කීවා සේ නොවී තමන් බොහෝ කුසල් කළ නැනැත්තන් හෙයින් තුෂිත දිව්‍යලොකයෙන් ගෙනා රථයෙහි ඖපපාතික ව පෙනී එහි ම සිට ගෙහිමියාණන්ට අඬගා කියන්නාහු;

කිං චිරායසි තපෙථච - නිස්සාරෙ මානුසෙ භවෙ,
ජහිත්වා අසුචිං පූතිං - දෙහං කිමිකුලාලයං.

ආගච්ඡථාසු එතෙථදං - සුඛං දෙවසිරිං වරං,
අහමාගතා පුරෙ යෙව - තුසිතං යාම්'දනි හො.

යනාදීන් 'ගතයුතු කිසි සාරවස්තුවක් නැති දෙතිස්කුණප කොට්ඨාසයෙන් ගත්[1] තෙල සේ වූ ශරීරයක් ඇරගෙන මේ[2] මිනිසත් බැව්හි කුමක් පිණිස පමාවනසේක් ද? අසූකුලයෙහි පණුවන්ට වාසස්ථාන වූ අපවිත්‍ර තෙල කුණු ශරීරය හැර මෙතැන්හි මේ උතුම් වූ දිව්‍ය ස්වභාවයෙන්[3] බබළන දිව්‍යරථයට[4] නොපමාව අවමැනව: මම පළමු කොට අවුත් මේ රථයෙහි සිටගතිමි: එක් ව කුසල් කළ හිමියාණෙනි, දෙදෙනා එක් ව තුෂිත දිව්‍යලොකයට[5] යන පරිද්දෙන් වහා අවමැනවැ'යි කීහ. එකල තිස්සඋපාසකයෝ කාලක්‍රියා කොට එම රථයෙහි ඖපපාතික ව උපන්හ.

මෙසේ ඉපද ඔහු දෙදෙන සමඟ වූවාහු ඔවුනොවුන් බලා සතුටු සතුටු ව දිවසෙනඟ පිරිවරා මහාජනයා බල බලා සිටියදී ම මහත් වූ දිව්‍යතෙජසින් දිලිහි දිලිහී තුෂිත දිව්‍යලොකයට ගියහ. එබැවින් නුවණැති ශ්‍රද්ධාවන්තයන්ගේ උතුම් වූ මේ චාරිත්‍රධර්මය[6] අසා දැන දිව්‍යමනුෂ්‍යසම්පත් හා නිවන්සම්පත් ප්‍රාර්ථනා කරන්නාවූ පින්වත් ශ්‍රද්ධාවන්තයන් විසින් බුද්ධපුත්‍ර වූ සිල්වතුන් වහන්සේ උදෙසා දුන්නාවූ දනය කැමැති කැමැති වස්තු ප්‍රදනය කරන කල්පවෘක්ෂයක් මෙන් මේ ජාතියෙහි පටන් නිවන් දක්නා ජාති දක්වා දයකයන්ට ආයු වර්ණ සැප බල බුද්ධිවර්ධනාදි වශයෙන් සියලු දිව්‍යමනුෂ්‍ය සම්පත් සාධා කෙළවර අමෘතමහා නිර්වාණ සම්පත්තියත් සාධා දෙන්නේය යි නිශ්චය[7] දැන කුසල් කටයුත්තේ මය. කියනලද මැයි;

පවර[8]චරිතමෙතං ධීමතානං විදිත්වා
දිවි මනුජ සුඛං වා නිබ්බුතිං පත්ථයන්තා
දදථ විමල සීලෙ බුද්ධපුත්තෙසු දනං
සුරතරු සදිසං හො කාමදං ආභවග්ගා-යි.

මේ මෙහි පස් වන
රියහල් වස්තුව ය.
මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි
තම්බසුමන වර්ග නම් වූ
අටළොස් වන පරිච්ඡෙදය කියා නිමවන ලදී.

---

1. ගැවසී ගත් - BG
   ගහන - ම.
2. තව -ස.
3. දිව්‍ය සොභාවෙන් - ම
4. දිව්‍ය රථයට නැගී - C
5. දිව්‍යපුරයට - H
6. චරිත ධර්මය - මුද්‍රිත නැම
7. නිශ්චය කොට - H
8. පරම - මුද්‍රිත නැම

Non-Commercial Distribution

තව ද මෙම සද්ධර්මාලංකාරයෙහි එකුන්විසි වන අභයථෙර වර්ගය නම් කවර යත්. එහි පළමු වන අභයථෙර වස්තුව මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මෙම ලංකාද්වීපයෙහි අනුරාධපුර නුවරට[1] පශ්චිමදිග්භාගයෙහි මල්වැස්සා නම් වූ මහා විහාරයෙක් විය. ඒ විහාරය සමීපයෙහි දේව නම් ගම දේව නම් අමාත්‍යයෙක් ඉසුරුමත් ව වෙසෙයි: දවසෙක ඒ අමාත්‍යයා ඒ ඒ තැන ඇවිද තමා වසන ගමට ම පෙරළා ඇවිත් සයින් විඩා ව තමාගේ මිනිසුන් කැඳවා බත් අනුභවයට උන්නේය: එකෙණෙහි සයින් විඩා වූ බල්ලෙක් ආහාරගන්ධය ආඝ්‍රාණය[2] කොට වෙවුල වෙවුලා ඇවිත් ඔහු ඉදිරියෙහි සිටියේය: අමාත්‍යයාගේ කුඩා කොල්ලෙක් දඬුකඩක් ඇරගෙන බල්ලාට ගසා ලුහුබඳවන්ට ආය: ඒ දැක අමාත්‍යයා බල්ලාගේ බැගෑපත්කම් දැක කරුණා උපදවා නොගසව යි වළකා නොයෙක් රස මුසු කොට බත්පිඩක් අනා බල්ලාට තිබීය: එකල බලු බත් අනුභව කොට සතුටු ව නඟුට සලමින් සාදර[3] දක්වා මුහුණ බල බලා සිටියේය: ඒ දැක අමාත්‍යයා සුනඛයාට දුන් දනයෙහි සිත් පහදවා ගෙන එපමණ කුශලයෙන් එයින් චුත ව එම ගම අතිකක්හට පුත් ව ඉපද ක්‍රමයෙන් වැඩී කුටුම්බසණ්ඨාපනය කොට වෙන ගෙයක වාසය කරනුයේ මහලු[4] අවස්ථාවෙහි මල්වැස්සා වෙහෙරට ගොස් භික්ෂූන්[5] සමීපයෙහි මහණ ව ත්‍රිපිටක ධර්මය අසා නිමවා අභය මහතෙරුන් වහන්සේය යි ප්‍රසිද්ධ විය. හේ එසේ මැයි.

පහන් සිතින් තිරිසනුන්ට දුන්නාවූ දනය ද මහා විපාක දෙන්නේය. සැදැහැයෙන් යම්කිසි කෙනෙක් කුරුන් කුහුඹුවන් පටන්ගෙන යම්කිසි තිරිසනක්හට කුසපුරා ආහාරයක් දුන්නාහු වී නම් ඒ දනය ඔවුන්ට දිව්‍යමනුෂ්‍ය සම්පත් සාධා දී කෙළවර නිර්වාණ සම්පත්තියත් සාධා දෙන්නේය යි නිශ්චය කරන ලද්දේ මය. එසේ හෙයින් කියනලදී;

යො සද්ධං පුරතො කත්වා - දනං දෙති නරො ඉධ
කිපිල්ලකමුපාදය - තිරච්ඡානගතස්සපි

විපාකං තස්ස දනස්ස - දෙවමානුසකං[6] සුඛං,
දත්වා නිබ්බාණසම්පත්තිං - අන්තෙ දෙතීති නිච්ඡිතං-යි

එයින් මෑතභාගයෙහි බැමිණිටියා සාය පැමිණියේය, එකල්හි දෙළොස් අවුරුද්දක් මුළුල්ලෙහි ඉඳුරා වැස්සක්[7] නොවටුයේය: එසේ හෙයින් දුර්භික්ෂ භය ද අමනුෂ්‍ය භය ද සොර[8] භය ද පැමිණියේය: එකල්හි විහාර සමීපයෙහි ගම්වල

1. අනුරාධපුරයට - BCEGHJKL ස.
2. ආඝ්‍රාණ - BCDJK
3. සාද - BD, බෙ.ස.
4. මහලු වූ - J. බෙ.
5. භික්ෂූන් වැද - මුද්‍රිත හැම භික්ෂූන් වහන්සේ වැද - ස.
6. මානුසිකං - මුද්‍රිත හැම, ස.
7. වැසි - G
8. රොග - BG, ස.

Non-Commercial Distribution

මනුෂ්‍යයෝ තම තමන් උන් උන් තන් හිඳ ජීවත් විය නොහී අනික්[1] එාසු තැනකට ගොස් ජීවත් වම්හ යි සිතා මහතෙරුන් වහන්සේ කරා එළඹ කියන්නාහු 'ස්වාමිනි, රට සාය ගැසීය; මෙතැන්හි හිඳ ජීවත් [ව ගත][2] නොහැක්ක; නුඹවහන්සේත් අප හා සමඟ වැඩියමැනවැ'යි ආරාධනා කළහ. එකල තෙරුන් වහන්සේ 'එම්බා උපාසකවරිනි, බුදුන්ගේ ශරීරධාතු පිහිටුවා බඳනාලද මේ චෛත්‍යය හා බොධීන් වහන්සේ ද ජීවමාන සර්‍වඥයන්වහන්සේ සේ ම සිතාගෙන වත් පිළිවෙත් කෙරෙමින් මමය මාගේය යි මමත්වය ඇති ව මල් පහන් පුදමින් නිරන්තරයෙන් වැඳපුද වාසය කෙරෙමි; මම මේ දහගප් මහබෝ දෙදෙනා වහන්සේ ඇර[3] නොයමි; ජීවිතාන්තය දක්වා මෙතන ම වාසය කොට දහගප් මහබෝ දෙදෙනා වහන්සේට වත් පිළිවෙත් කොටගෙන මෙහි ම වෙසෙමි; මා නොකැඳවා තෙපි හැම එාසු තැනකට පලා යව'යි වදළසේක. එබස් අසා මනුෂ්‍යයෝ එනෙතින් නික්ම ගියහ.

ඉක්බිති තෙරුන්වහන්සේ ආහාරයක් නැති ව පළමු දවස් වත් පිළිවෙතින් ම දවස් යවා එසේ ම දෙවන තුන්වන දවස් ද ඇමදීම් ආදි වූ කළමනා වත් පිළිවෙත් කොට එයින් නික්ම[4] සක්මන් මලුයෙහි වැඩ සිටි සේක; එකල උන්වහන්සේගේ ගුණානුභාවයෙන් මලු කෙළවර සිටි කරඳගස අධිගෘහිත වූ දිව්‍යපුත්‍රයා මිලානික වූ ශරීර ඇති මහතෙරුන් වහන්සේ දැක තමාගේ භාර්‍යාව කැඳවා 'තෙල අභය ස්ථවිරයන් වහන්සේ 'දහගප් මහබෝ දෙදෙනා වහන්සේ ඇර අන් තෙනකට නොයමි'යි ප්‍රතිඥ කොට මෙවැනි සායෙහි පවා අන් තෙනකට නොගොස් සුන්බත් ව වත් පිළිවෙත් කරනසේක; අනික් මුන්වහන්සේ සිහා වඩිනා තැනකුත් ඉදින් නැත; මුන්වහන්සේ කාලක්‍රියා කළසේක් වීනම් කටයුතු නොවෙයි; අද උන් වහන්සේට දනක් දෙම්හ'යි කීය. එබසට දිව්‍යස්ත්‍රී 'ස්වාමිනි, නුඹවහන්සේ[5] මහතෙරුන්වහන්සේට ආහාරයක් දෙම්හ යි කියන දෑය; උන්වහන්සේ පෙර ජාතියෙහි කළ කුශලකර්‍මය මට ප්‍රකාශ කළ මැනවැ'යි[6] විචාරන්නාවූ දිව්‍යස්ත්‍රී තොම;

කිමෙස[7] සංසාර මහා විදුගෙග
අකාසි පඤ්ඤං භවභොග හෙතුං[8]
කෙනස්ස දනෙ නිරතො මනො තෙ
පුච්ඡාමි තං දෙව වියාකරොහි.[9]

යනාදීන් 'ස්වාමිනි, නුඹවහන්සේ මහතෙරුන් වහන්සේට දන් දෙමි කියනසේක; උන්වහන්සේ දැන් මෙවැනි සාගතයේ මෙසේ ආහාර ලබන්ට කවර

1. අනික් අනික් - මුද්‍රිත හැම ස.
2. ජීවත් විය - පිටපත් හැම
3. හැර - BG
අන්හැර - ම.
4. අවුත් - BEGHJKL ස.
5. නුඹ - BDEHKL
6. ප්‍රකාශ කොට කිව මැනවැයි - J
ප්‍රකාශ කරව යි - ම.
7. කිමෙම - පිටපත් හැම
8. හෙතු - BCDGHKL
9. වියාකරයෙහි - CEGHJKL

Non-Commercial Distribution

කුශලයක් කළ සේක් ද: මෙසේ නුඹවහන්සේ දන් දෙමි[1] සිතන්ට හේතු කවරේ ද, ඒ මට ඉඳුරා ප්‍රකාශ කළ මැනවැ'යි කිව. එබස් අසා මහතෙරුන් වහන්සේ පූර්වජන්මයෙහි කළ කුශලය දිව්‍යපුත්‍රයාට ප්‍රකාශ කොට දක්වන්නාවූ දිව්‍යපුත්‍ර තෙමෙ;

අයං යතී සො දුතියත්තභාවෙ
නාමෙන දෙවො ඉති විස්සුතොසී,
හොන්තං තද භත්තමුපට්ඨිතෙ සො
අද්දක්ඛි සොණං තසිතං කිලන්තං,
තෙනෙව භත්තස්ස මහන්තපිණ්ඩං
වට්ටෙත්ව'ද[2] තස්ස බුභුක්ඛිතස්ස.

තෙනස්ස දනෙනිධ අත්තභාවෙ
ඵලං විපච්චිස්සති සාධු භද්දෙ
අප්පන්ති දනං නහි චින්තනීයං,
පරිත්තබීජෙන වටොව ජාතො.

යනාදින් 'එම්බා හද්‍රාව, මෙම තෙරුන් වහන්සේ මීට පළමු වන ජාතියෙහි දෙවය යි යන නමින් ප්‍රසිඩ ව වසනසේක් බත්[3] අනුභව කරන්ට ඉඳ සයින් පීඩිත ව ඉදිරියට ඇවිත් සිටියාවූ බල්ලකු දැක මහත් බත් පිඩක් වටා ඔහට දුන්සේක. ඒ දනයෙහි විපාකය මේ ජාතියෙහි පල දෙන්නේය: දනය නම් සවල්පය යි නොසිතිය යුතුය.[4] ඉතා සවල්පමාත්‍ර වූ බිජුවටින් ඉපද ආකාශමණ්ඩලය වසා සිටගත්තාවූ නුගවෘක්ෂයක් මෙන් විපාක දෙන අවස්ථාවෙහි අපමණ විපාක දෙන්නේ වේ දැ'යි කීය.[5] මෙසේ කියා දිව්‍යපුත්‍රයා තමාගේ දිව්‍යශරීරය හැර මනුෂ්‍යවෙශයෙන් තෙරුන් වහන්සේ කරා එළඹ පසඟ පිහිටුවා වැඳ පාත්‍රය ගෙන දිව්‍යආහාර දී කියනුයේ 'සවාමිනි, නුඹවහන්සේට ජීවිතාන්තය දක්වා ආහාරදනය දෙමි, නුඹවහන්සේ අප්‍රමාද ව මහණධම් පිරුව මැනව: තෙල කරඳගය නම් මාගේ විමානය: ඇම දවස් ම උදසන එතැන්හි වැඩියමැනවැ'යි[6] ආරාධනා කොට තමාගේ විමානයට ම ගියේය. එතැන් පටන් මහතෙරුන් වහන්සේ කරඳගස මුලට වඩනාසේක: දිව්‍යපුත්‍රයා ද නිරන්තරයෙන් දිව්‍යාහාර දන් දෙමින් වාසය කෙරෙයි.

දවසෙක සාගතයෙන් පීඩාවට පැමිණියා වූ මනුෂ්‍යයෝ මිනිසුන් මරා මස් කා ඇවිදිනාහු ඒ විහාරයට අවුත් දිව්‍යාහාර වළඳ වැඩුණාවූ ශරීරමාංස ඇති මහතෙරුන්වහන්සේ දැක මුන්වහන්සේ මරා මස් කම්හ යි කථා කොට මහතෙරුන් වහන්සේ දගප්[7] මලුව හැමඳ පිටත්වූ කල්හි මහත්කොට අඩගසා දඩුමුගුරු ඇරගෙන දිව අවුත් වටකොට ගත්හ. මහතෙරුන් වහන්සේ පළමු අමාත්‍ය ව උපන් ජාතියෙහි සුනඛයාට ගසන පිණිස මුගුරු ගෙන ආවාවූ මිනිසා සුනඛයාට ගැසිය නොදී වැළකුවාවූ කුශලයෙන් එකෙණෙහි විහාරය මැද මහත් වූ ගලක් පෙනී දෙපියන්

1. උන්වහන්සේට දන් දෙමි - ස
2. වඩ්ඩෙත්වද - CDG
3. බතක් - DEHL
4. මැනව - BG
5. කිව - BG
6. වැඩසිටිය මැනවැ යි - GL
7. දගබ - DEK
දගගැප් - HL

Non-Commercial Distribution

දෙරක් හරනාක් මෙන්[1] විවර දිනෑ එකෙණෙහි තෙරුන්වහන්සේ ඒ පර්වතය ඇතුළට වන්සේකෑ සොරහු ඇවිත් ඈත මෑත්[2] බලා මහතෙරුන් වහන්සේ නොදැක රහත් කෙනකුන්වහන්සේ වනැ යි සිතා පලා ගියහ[3]. හේ එසේ මය.

නිෂ්කාරණ වූ යම් කිසි කෙනෙක් නිග්‍රහ විඳින්ට අයොග්‍ය වූ කෙනෙකුන්ට දණ්ඩනය කෙරෙද් ද ඒ රෞද්‍ර සත්වයෝ උපනුපන් ජාතියෙහි නොයෙක් දණ්ඩන ව්‍යසන නිග්‍රහයට[4] පැමිණෙන්නාහුයෑ යම්කිසි උත්තමයෙක් තමාගේ සිත උපන්නා වූ ක්‍රොධය නසා මෛත්‍රී පැතිරවීමෙන් දණ්ඩනයක් නිග්‍රහයක් නොකෙරේ ද එසේ වූ උත්තමසත්වයන්ට ව්‍යසනයෙක්[5] දණ්ඩනයෙක් නිග්‍රහයෙක් පැමිණියේ වී නමුත් දෙවියන් හා මනුෂ්‍යයෝ ඒ දුකින් ගළවා රක්‍ෂා කරන්නාහු මය. එසේ හෙයින් කියන ලදී;

යො යස්ස දණ්ඩෙති අදණ්ඩියස්ස
සදණ්ඩියො හොති භවෙ භවෙසු
යො හන්ත්‍වා කොපං න කරොති දණ්ඩං
සනරාමරා තං පරිපාලයන්ති යි.

එකල්හි අභය ස්ථවිරයන්වහන්සේ දෙවියන්ගේ සුධාභොජනය අනුභව කෙරෙමින් දෙළොස් අවුරුද්දක් පෘථග්ජන ව වාසය කළසේකෑ පසුව විදර්ශනා වඩා රහත් ව එපරිද්දෙන් ම දෙළොස් අවුරුද්දක් එම විහාරයෙහි විසූසේක. මෙසේ දිව්‍යපුත්‍රයා සූවිසි අවුරුද්දක් දිව්‍යභොජනයෙන් මහතෙරුන්වහන්සේට උපස්ථාන කෙළේය, මහතෙරුන්වහන්සේ එම විහාරයෙහි ම වැස පිරිනිවී සේක. මෙසේ ඒ අභය මහතෙරුන්වහන්සේ පළමු ජාතියෙහි සයින් විඩා වූ සුනඛයාට බත් පිඩක් දුන්නා වූ කුශලයෙන් දෙවන ජාතියෙහි එබඳු සාගතයෙහි[6] දිව්‍ය වූ ආහාරය ලැබ අජර වූ අමර වූ ශාන්ත වූ සිහිල් වූ නිර්වාණ සම්පත්තියත් සැප සේ ලත්සේකෑ එබැවින් දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා නිවන් සම්පත් කැමැති ශ්‍රද්ධාවන්ත උත්තමයන් විසින් කුරුන් කුහුඹුවන් පටන්ගෙන මනුෂ්‍යයන් දක්වා යම් ම කෙනකුන්ට ආහාරදානය දියයුත්තේ මයෑ ඒ දානය උපනුපන් ජාතියෙහි දෙව් මිනිස් සැපත් සාධා කෙළවර අමාමහනිවනටත් පමුණුවාලන්නේ මැයි. එසේ හෙයින් කියන ලදී;

දත්වානෙකං කබලමපි භො ඡාතකස්සෙකස්සානො
දිබ්බාහාරං ලභි[7] සිවමථො සීතිභූතං යතින්දො,
තුම්හෙපෙවං දදථ සතතං යස්ස කස්සාපි දෙය්‍යං
තං තෙ වට්ටෙ භවති සරණං හොති නිබ්බාණමන්තෙ-යි.

මේ මෙහි පළමු වන
අභයත්ථෙර වස්තුව ය.

---

1. හරනා සේ - GJK
   හැරුණ සේ - EHL
2. ඈමතැන ම - BG
3. පලාහ - DEHJL
   පැලැහ - ස
4. දණ්ඩනයට ව්‍යසනයට නිග්‍රහයට - මුද්‍රිත හැම, ස
5. නසා.. ව්‍යසනයක් (නැත) - ස
6. සාගතයෙහි පවා - BGK
7. ලභති - පිටපත් හැම

Non-Commercial Distribution

තව ද මෙහි දෙවන ධම්මදින්නථෙර වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මෙම ලක්දිව තලගුරුපව් සමීපයෙහි තිස්[1] මහ වෙහෙර ධම්මදින්න නම් මහතෙර කෙනකුන් වහන්සේ පන්සියයක් පමණ[2] රහතන් පිරිවරා නිරන්තර ව වසනසේක. උන්වහන්සේ එක් සමයෙක මණිනාග දිවයින මහසෑය වඳුම්හ යි පන්සියයක් පමණ රහතන් පිරිවරා ගම් නියම්ගම් රාජධානි පිළිවෙළින් ගොස් යෙහෙළිගිරි[3] නම් විහාරයට පැමිණිසේක. ඒ විහාරයෙහි මහදැළියාතිස්ස මහ තෙරුන් වහන්සේ එසේ ම පන්සියයක් පමණ භික්ෂූන් පිරිවරා නිරන්තර ව වසනසේක. උන්වහන්සේ ධම්මදින්න මහතෙරුන් වහන්සේ දැක පහන්සිත් ඇති ව ආගන්තුක සත්කාර කොට එදවස් එතෙන රැඳවූසේක.

ඉක්බිති දෙවන දවස් දෙදෙනා වහන්සේගේ දහසක් පමණ භික්ෂූන් හා සමඟ මහතෙරුන්වහන්සේ කැඳවාගෙන පූණ්ණශාලා නම් ගමට ගොස් තමන්වහන්සේට උපස්ථාන කරන සිටාණන්ගේ ගෙදෙරට වැඩිසේක: එකල සිටාණෝ බොහෝදෙනා වහන්සේ දැක සතුටු ව මහතෙර දෙදෙනා වහන්සේ ප්‍රධානකොට ඇති ඇමදෙනාවහන්සේගේ පාත්‍ර ගෙන භොජනශාලාවට කැඳවා ගෙන ගොස් පනවනලද ආසනවල ඉන්ට සලස්වා සාමස් රසමුසු අවුළු හා සමඟ කැඳ වළඳවා වළඳන්නාට අතුරෙහි පැණි සකුරු දුරුමිරිස් ආදීන් සකස් කොට පිසන ලද නොයෙක් අවුළු හා එසේ ම සකස් කරන ලද සසමාංස් ද එළවූහ.

ඉක්බිති වේලා ආසන්න වූ කල එසේ ම සසමාංස සූපයෙන් හා නොයෙක් ව්‍යඤ්ජනයෙන්[5] යුක්ත වූ රත්හැල්සාලේ බත් දුන්නාහුය: එකල භික්ෂූන් වහන්සේ ආහාරකෘත්‍යය නිමවා ඉක්බිති මේ ඇසිල්ලෙහි මෙතෙක් දෙනා වහන්සේට දන් සැපයූ[6] නියාව ඉතා ආශ්චර්‍ය්‍යයෙකැ යි විස්මයපත්වූ සේක. මෙසේ විස්මයපත් ව ඒ සිටුපුත්‍රයාට තෙරුන් වහන්සේ අනුමෙවෙනි බණ වදළසේක: සිටාණෝ බණ අසා ඉක්බිති 'ස්වාමිනි, සෙට දවස් ගම්කඳනයක් දෙමි: මාගේ ගෙට ම සිහා වැඩිය මැනවැ'යි ආරාධනා කළහ. භික්ෂූන් වහන්සේ ද යහපතැ යි ගිවිස විහාරයට වැඩිසේක: එකල භික්ෂූන් වහන්සේ මහ දැළියාතිස්ස මහතෙරුන් වහන්සේ කරා එළඹ වැඳ එකත්පස් ව හිඳ 'ස්වාමිනි, අප දහසක් දෙනා වහන්සේ වැළඳවූ තැන වෙන වෙන ම සාවුන්ගේ ඇට ගොඩවල් මෙතෙකැ යි පමණ නැත: මෙසේ සතුන්මරා

---

1. තිස්ස - BCDG
2. පමණ (නැත) - BDEGHKL
3. හෙළිගිරි - බෙ. ස.
   සාගිරිං - පාලි
4. දඩමස් - B
5. ව්‍යඤ්ජන රසයෙන් - KL
6. සැපවූ - පිටපත් හැම

Non-Commercial Distribution

කරන[1] පවු නොවළකන්නේ කුමක් පිණිස ද? සැදැහැයෙන් මෙසේ කරන සිටාණෝ කුමක් නිසා අවවාද නොගිවිසිද් දැ'යි කීයේක.

එකල මහදැළියාතිස්ස තෙරුන් වහන්සේ 'එම්බා ඇවැත්නි, සෙට දවස් අපි සිටාණන්ගේ ගෙට ගියකල[2] තමන් ඇම සිටාණන්ට අවවාද කිව මැනවැ'යි කියා දෙවන දවස් සිරිරු පිළිදැග[3] දහගප් මහබෝ වැඳ ගැටවටු ගන්වාගෙන සයින් සිවුරු හා අතින් පාත්‍රා ගෙන සිටාණන්ගේ ගෙට වැඩීසේක. එකල්හි සිටාණෝ හොජනශාලාවෙහි ආසන පනවා ඇමදෙනා වහන්සේගේ පතුල් සෝධවා වැඩ ඉන්ට සලස්වා පළමු දවස් පරිද්දෙන් ම මහදන් දුන්හ: ඉක්බිති ඇමදෙනා වහන්සේ වළඳ අත මුව ශුඩකොට වැඩ උන් කල්හි සිටාණෝ මහදැළියාතිස්ස මහතෙරුන් වහන්සේ සමීපයට ගොස් 'අනුමෝදනා වදළ මැනවැ'යි පාත්‍රය අල්වාගෙන සිටියහ. එකල මහතෙරුන් වහන්සේ බණ කියන්ට කියා තමන් වහන්සේට කළ ආරාධනාව ධම්මදින්න මහතෙරුන් වහන්සේට භාරකළසේක. එකල ධම්මදින්න මහතෙරුන් වහන්සේ සිටාණන් සතා[4] සතුන් මරා පවු කෙරෙති සිතා ඊට සුදුසු ලෙස බණ වදරනසේක්;

හිංසා අප්පායුකත්තං ච - බව්හාබාධත්තනම්පි ච,
වියොගං දුක්ඛබාහුල්‍යං - ජනෙතුබ්බිග්ගමානසං.

යනාදීන් 'ප්‍රාණවධ කළ සත්වයෝ නොයෙක් හිංසා පීඩාවට පැමිණෙති: අල්පායුෂ්ක වෙති: බොහෝ ව්‍යසනාදීන් පීඩාවට පැමිණෙති: ප්‍රෙම සහිත මිත්‍රපුත්‍රකලත්‍රාදි වූ බන්‍ධුවර්ගයා කෙරෙන්[5] නොකැමති වෙති: එපරිද්දෙන් ම වියොග බොහෝ ව දුඃඛයට පැමිණෙති: නරකාදියෙහි බොහෝ දුක්විඳ ඉදින්[6] ගොඩනැංගාහු වී නම් වෙනෙහි වසන මෘගජාතීන් හා කපුටුවන් මෙන් ඇම වෙලෙහි හයින් තැති ගෙන දැන් මරති සෙට මරති යන්නාක් මෙන් භය ගෙන වාසය කෙරෙති'යි මෙසේ ප්‍රාණාතිපාතයෙහි ආදීනව දක්වා බණ වදළසේක.

ඒ අසා සිටාණෝ 'ස්වාමීනි, ඇමදෙනා වහන්සේ මා සාවුන් මරා මස් කති යි සිතනසේක් දැ'යි කීහ. එබස් අසා භික්ෂූන් වහන්සේ 'එසේය ය සිටාණෙනි," යි වදළසේක. එකල සිටාණෝ 'ස්වාමීනි, එසේ නොසිතුව මැනව: අපගේ ගෙයි ඇම දවස් ම සාවුන්ගේ මස් අඩු නොවෙයි: ඉදින් මේ සක්වළ ගබ පුරා උන් මනුෂ්‍යසමූහයාට වෙන වෙන[7] බෙද දෙතත් නොයෙක් කන බොන දෙය හා සසමාංසය අඩු නොවෙයි: වඩවඩා ඉතිරී ව තිබෙයි: මා උපයා සොයා රැස්කරන දෙයෙකුත් නොවෙයි: ඇසින් දැක කන බොන දෙය හා සසමාංස ඔබට දෙන්ට

1. කන - C ක.කි.ඤ.ම.
2. වළඳන්ට ගිය කල - BG
3. පිළිදග හැඳ - J
   පිළී හැඳ - CDJK
4. සිතා - ස
5. උන් කෙරෙහි - ම
6. එයින් - BG
7. වෙන වෙන ම - BGHJ

Non-Commercial Distribution

දන්නා විනා මෙ හැම උපදින්ට කාරණ මේය යි නොදනිමි: දිවස් ඇති සවාමිදරුවන්ට දැනේ නම් පරීක්‍ෂා කොට වදළ මැනවැ'යි කීහ. ධම්මදින්න මහතෙරුන් වහන්සේ එතැන්හි ම වැඩහිඳ දිවසින් ඒ සිටාණන්ගේ[1] පෙර විසූ කඳපිළිවෙළ බලනසේක් මේ මහා භද්‍රකල්පයට කප්ලක්‍ෂයකින් මත්තෙහි ලොව පහළ වූ පදුමුත්තර නම් බුදුන් සමයෙහි දුන්නාවූ දනය දැක සිටාණන්ට ඒ බව ප්‍රකාශ කොට දක්වනසේක්;

> භික්ඛුසොසකස්ස තව්ං පුබ්බේ - සසමංසෙන සංයුතං,
> භත්තං දත්වා තථෙකස්ස භික්ඛුනො පුන එකද.
>
> සතසක්ඛර සම්පන්නං[2] - මධුරං පූවඛජ්ජකං,
> දත්වා දනං පසීදිත්වා - එවං තව්ං පණිධිං අකා.
>
> එතෙන පුඤ්ඤකම්මෙන - උප්පන්නුප්පන්නජාතියං,
> ජසමංසං ච පූවං ච[3] - අක්ඛයං හොතු මෙ ඉමෙ.
>
> ඉදං තෙ චරිතං ආසි - භවතො පුබ්බජාතියං,
> ඨානොපචිතපුඤ්ඤස්ස - විපුලං ඵලමීදිසං.
>
> දෙහි දනානි[4] සධාය මා පාපම්'කරා බරං,
> යථාබලම්පි භො සීලං - පාලෙහි විමලං සද.

යනාදීන් 'එම්බා සිටාණෙනි, මීට ලක්‍ෂයක් වන කප පියුමතුරා නම් වූ ලොවුතුරා බුදුකෙනකුන් වහන්සේ ලොව පහළ වූ සේක: උන්වහන්සේ දෙව්මිනිසුන් සහිත වූ ලොකවාසී සත්වයන් දහම් නමැති නැවට නංවා සසර නමැති සයුරෙන් එතෙර කොට නිවන් නමැති අභයපුරයෙහි ගෙන හැර පිහිටුවනසේක: එකල තෙපි එක්තරා කුලගෙයක ඉපද වැඩිවිය පැමිණ දවසෙක බණ අසා අවගත්තාවූ ශ්‍රධා ඇති ව තුනුරුවන් කෙරෙහි පැහැද වසන්නාවූ තෙපි අහර සිඟා වඩනා පිණ්ඩපාතික භික්‍ෂුකෙනකුන් දැක පාත්‍රය ගෙන ගෙට කැඳවාගෙන ගොස් ඉන්ට සලස්වා සසමාංස සහිත වූ[5] ආහාර දනයක් දුන: නැවත එක් දවසෙක භික්‍ෂු කෙනකුන් වහන්සේ දැක ගිතෙල් හා උක්පැණි සහිත වූ අවුළුපත් වැළඳවුව; මෙසේ මෙකී දෙය වළඳවා 'මේ කුශලයෙන් උපනුපන් ජාතියෙහි සැප සේ දෙව් මිනිස් සැපත් ලැබෙම්ව යි සියල්ලවුන් කෙරෙහි අග්‍ර වෙම්ව යි අපමණ වූ උපභොග පරිභොග සම්පත් ලැබෙම්ව යි මහත් වූ යශොතෙජස් ඇති වෙම්ව යි සසර සැරිසරා ඇවිදිනා වූ මම යම් කලෙක මිනිස්ලොව උපදිම් නම්[6] එකල්හි සසමාංසය හා පූපවර්ගයෝ ඇම දවස් ම අඩු නොව උපදින්ව'යි කියා මේ තොප එකල්හි කළ ප්‍රාර්ථනාව ය. සිල්වත් ගුණවත් සඞ්ඝරත්නය උදෙසා දුන්නාවූ දනමය කුශලයෙන් මෙසේ මේ විපාකප්‍රවාහය ලදුව: එබැවින් වඩවඩා සිත් පහදවා ගෙන කුසල් කරව: අකුසල්[7]

---

1. සිටාණන් - G
2. සම්පුණ්ණං - ම.ස.
3. පූවයං - BG
4. දනම්පි - DH, ස.
5. රස සහිත වූ - BEGHKL ස.
6. උපනිම් නම් - BEGHKL
7. අකුසලයක් - EHJ

Non-Commercial Distribution

නොකරව: ශරණ ශීලාදි වූ ශීලයෙන් තමහට පිළිවන් ශීලයක් අප්‍රමාද ව රක්‍ෂා කරව ́යි මෙසේ පිටාණන්ගේ පූර්වචරිතය ප්‍රකාශ කොට බණ වදරා විශෙෂයෙන් කුශලක්‍රියාවෙහි යොද හුහස්නෙන් නැඟී සෙසු භික්‍ෂූන් හා සමඟ විහාරයට වැඩිසේක. එතැන් පටන් පිටාණෝ පර්ෂද් හා සමඟ වඩවඩා දන් දෙමින් නිරන්තරයෙන් පන්සිල් රැක පොහොය පෙහෙවස් රැක ජීවිතාවසානයෙහි පර්ෂද් හා සමඟ දෙව්ලොව උපන්හ. මෙසේ අසඞ්ඛ්‍යය ගණන් කපින් මත්තෙහි කරන ලද්දවූ ස්වල්පමාත්‍ර වූ කුශලය පවා නොනස්නේය යි දැන සසර මෙසේ පැප කැමැති සත්‍වයන් විසින් අප්‍රමාද ව කුශලධර්මයෙහි යෙදී දවස් අළ මැනවි. කියන ලද මැයි;

අසඞ්ඛකප්පාන පි මත්ථකස්මිං
කතපුඤ්ඤ[1] කම්මම්පි න නස්සතී ́ති,
මන්ත්වාන පුඤ්ඤස්ස විපාකම්වජ්ජතා[2]
ජහාථ[3] දිවසං කුසලෙන ධීරා[4]-යී.

මේ මෙහි දෙ වන
ධම්මදින්නත්ථෙරර වස්තුව ය.

තව ද මෙහි තුන්වන ගාමදාරිකා වස්තුව නම් කවරයත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මෙම ලඞ්කාද්වීපයෙහි අනුරාධපුරයට දකුණුදිග්භාගයෙහි බ්‍රහ්මවොළ[5] නම් ගමෙක් විය: එහි වසන මනුෂ්‍යයෝ එක් තැනෙක සී සෑ[6] වත්තක් ඉදිකොට උඳු වපුළහ: ඉක්බිති ගම්වැසි මනුෂ්‍යයෝ උඳු පැසුණු කල්හි උඳු කඩම්හ යි යන්නාහු එකලට වැසි නැති මහ නියං අවධිය හෙයින් බොන්නට පැන් ඇරගෙන ගොස් එක් තැනෙක තිබුහ. එකල ගාමන්තසෙනාසනයෙහි වසන භික්‍ෂු කෙනකුන් වහන්සේ පිපාස[7] අධික හෙයින් ́බොහෝ දෙනා සිටි තැනින් පැන් ලැබෙන්නේ වේ දැ ́යි සිතා එතැන්හි වැඩියේක. එකල්හි එක් ගම්දැරියක් පැන් පිපාසයෙන්[8] කලාන්ත ව මිරිකුණා වූ ශරීර ඇති උන්වහන්සේ දැක උපන්නාවූ ශ්‍රධාවෙන්[9] කිසි කෙනකුන්ටත් නොහඟවා කළයෙහි තුබූ පැන් තෙරුන් වහන්සේට පිළිගන්වා සිත් පහදවා ගෙන ඉක්බිති තෙරුන් වහන්සේ වඩනා[10] බල බලා පහන් සිතින් වැඳ වැඳ සිටියාය. එකල්හි උඳු කඩන මනුෂ්‍යයෝ ඇවිත් කළයේ පැන් නැති හෙයින් ́මේ කළයෙන්[11] පැන් ගත්තෝ කවුරු දැ ́යි විචාළහ: එකල කුමාරිකාවෝ ́ස්වාමීනි, පැන් පිපාසයෙන් වැඩි තෙරකෙනකුන් වහන්සේ දැක පිළිගන්වාපීමි ́යි කීහ: එබස් අසා මනුෂ්‍යයෝ ́අප බොන්නට ගෙනා පැන් අපට නොහඟවා භික්‍ෂුකෙනකුන්

---

1. විතප්ප පුඤ්ඤං - G
විරප්පපුඤ්ඤං - H
2. විපාකම්වජං - CEGHKL
3. ජහාතු - CEGHKL
4. ධීරො - CDHJ,
ධීරෙ - KC
5. බ්‍රාහ්මණවොළ - EHJL ම.
බ්‍රහ්මණවොළ - K
6. සී සා - ක.සි.ඤ,ම.
7. පිපාසා - මුද්‍රිත හැම
8. පිපාසායෙන් - මුද්‍රිත හැම, ස.
9. ශ්‍රද්ධාව ඇති ව - B
10. වඩනා දිසාව - ක.කි.ඤ,ම.
11. කළයේ - GHL;
මේ කළයෙන් (නැත) - K

Non-Commercial Distribution

වහන්සේට දිපීම් යි කියයි: මැගේ ශ්‍රද්ධාවක් බලව`යි කුමාරිකාවන්ට නින්ද බැන කිපී `අපි හැම අව්සුළං දෙකින් වියළී පිපාසා ඉවසිය නොහෙම්හ: අපට යුහු ව පැන් ගෙනෙව`යි කියා කුමාරිකාවන් හා ඩබර කළහ. එකල කුමාරිකාවෝ උන් හැම කෙනෙක් දෙඩුවත් ආක්‍රොශ පරිභව බිනුවත් එබසට නොකිපී තමන් දුන් දනය ම සිත සිතා සතුටු සතුටු ව කළය ගෙන උදු කඩන්නවුන්ට පැන් ගෙනෙමි යි සිතා තමන්ගේ ශ්‍රද්ධාව ආවර්ජනාකොට උදුකෙත දිසාව බැලූහ. එකල්හි උන්ගේ ශ්‍රද්ධාබලයෙන් මහපොළොව බිඳ ගෙන ස්ඵටිකමාණික්‍යයක් මෙන් මහත් දියබුබුලෙක් උඩනැඟී වට පැතිර වතුරු ගෙන දිවන්ට වන. අහෝ එ කුමාරිකාවන්ගේ ශ්‍රද්ධා මහත්ත්වය[1] ආශ්වය්‍යී මැයි: එක භික්‍ෂුකෙනකුන් වහන්සේට පැන් පමණක් ම දන් දී එදවස් ම ක්‍ෂය නොවන්නාවූ පැන් පොකුණක් ලද්දහු මැයි. හේ එසේ මය.

දන් දීමට ශ්‍රද්ධාව ම මුල් වන්නේය; සියලු සම්පත් ලැබීමට ද ශ්‍රද්ධාව ම මුල් වන්නේය; සැදැහැයෙන් දෙන ලද ඝවල්පමාත්‍ර වූ දනයෙක් වී නමුත් කල් නොයවා එම විගස ම විපාක දෙයි; සියලු දිව්‍යමනුෂ්‍ය සම්පත් ලැබීමට දනය මූලකාරණ වන්නේය. දනය නම් ජාතියෙන් ජාතියට එක් ව යන්නාවූ නිධානයක් හා සමානය; සියලු ලොකවාසීන් තමාගේ වශභත්වයට පමුණුවන දිව්‍යමන්ත්‍රයක් හා සමානය; දිව්‍ය ඖෂධයක් හා සමානය; ආපදථියට සහාය ව සිටිනා එකාත්මික මිත්‍රයකු හා සමානය; කැමති කැමැති වස්තු ප්‍රදනය කරන සිතුමිණි රුවනක් හා සමානය. දනය නම් භද්‍ර ඝටයක් හා සමානය; දනය නම් එකාන්තයෙන් ම කල්පවෘක්‍ෂයක්[2] හා සමානය. එබැවින් කුමාරිකාවෝ සැදැහැයෙන් මෙසේ පැන් පමණක් දන් දී එම ඇසිල්ලෙහි ම ක්‍ෂය නොවන්නාවූ සිහිල් වූ ද සුවඳ මිහිරි ජලධාරාවක් ලද්දහු මය. එසේ හෙයින් උත්තමය මධ්‍යමය අධමය යි[3] නොසිතා තිරිසනුන් පටන් සියල්ලවුන්ට ම ආදි මධ්‍යාවසාන යන ත්‍රිවිධ චෙතනාවන් ශුද්ධකොට ශ්‍රද්ධාපෙරදරි ව හැම කල්හි දන් දිය යුත්තේය. එසේ හෙයින් කියන ලදී;

සද්ධාව මූලං දනස්ස - සද්ධාමූලා හි සම්පද,[4]
සද්ධෙන කතමප්පම්පි - දනං හොති අකාලිකං.

දනං නිදනං සග්ගස්ස - නිධානං අනුගාමිකං,[5]
සබ්බලොක වසීකාරං - මන්තං තං පරමොසධං.

ආපදසු සහායො තං - කාමදෙ මණි මුත්තමො,
දනං භද්දඝටො කාමං - දනං වෙ සුරපාදපං.

පානීයමත්තං සද්ධාය දත්වානෙසා කුමාරිකා,
මුහුත්තෙනෙව සාලත්ථ - අක්ඛයං සීතලොදකං.

---

1. මහන්තත්වය - පිටපත් හැම, ස.කි.සඳ.
2. කල්පද්‍රැමයක් - HL
3. අධමය මධ්‍යමය - BDGHJKL
4. මූලම්පි සම්පදං - H
   සද්ධාමූලාහිසම්පද - ස.කි.සඳ.
5. අනුගාමියං - පිටපත් හැම

Non-Commercial Distribution

දතබ්බං හි සද දනං - උත්තමාධම මජ්ඣිමෙ,
ආදිමජ්ඣාවසානම්හි - සඞ්ඝං ච[1] පුරතො කරෙ[2] යි.

මෙසේ ඒ කුමාරිකාවෝ දිවන්නාවූ ජලධාරාව දැක සතුටුසිත් ඇති ව අභිප්‍රාය වූ පරිද්දෙන් ඉස්සොධා නහා පැන් බී පැන් කළය ඇරගෙන අවුත් පිපාසිත මනුෂ්‍යයන්ට පැන් දුන්නාහ; එබඳු[3] ජලධාරාව සෙස්සවුන්ට නොපෙනෙයි; කුමාරිකාවන්ට ම පෙනෙයි; එසේ හෙයින් කුමාරිකාවෝ නැවත නැවතත් ගොස් ස්නානය කෙරෙති. පැන් බොති. කළයෙන් පැන් ගෙනවුත් මිනිසුන්ට දෙති; ඒ දැක මනුෂ්‍යයෝ 'මෙතැන අපි පළමු පැනක්[4] නුදුටුම්හ; මැණියෙනි, තෙපි කොයින් ඉස්සොධා නහා පැන් බී එවු ද; ඒ අපටත් පැන් ඇති තැන් දක්වාලව'යි කීහ; එබස් අසා කුමාරිකාවෝ සතුටු සිත් ඇති ව 'ඉදින් මේ ජලය මාගේ කුශලානුභාවයෙන් උපන්නේ වී නම් ඒ ජලය සියලු ම මනුෂ්‍යයන් හා ඌරන් මුවන් පක්ෂීන් ඇතුළු වූ සියලු සිව්පා සතුන් විසින් ප්‍රයෝජන විඳින්ට සුදුසු පරිද්දෙන් පෙනේව' යි සිතූහ; එකෙණෙහි කුමාරිකාවන්ගේ ශ්‍රද්ධාබලයෙන් ජලය විශෙෂයෙන්[5] ගෙන දිවන පෙණබුබුලු මාලාවෙන්[6] හා පවන්[7] වෙගයෙන් බිඳි බිඳී උඩනැඟෙන උත්තුංග තරංග මාලාවෙන් හා මුතුපතර ඉස්නා සේ දසදිග විසිර පවත්නා ජලකණිකාවෙන්[8] ආකීර්ණ ව පෙළින් පෙළ බිඳි බිඳී දිවන ජලධාරා ඝොෂාවෙන් එකඝොෂා ව දිවන්නාවූ මහත් ගංගාප්‍රවාහය දැක මහත් වූ ආශ්චර්‍ය්‍ය අද්භූතයට පැමිණියාවූ සිත් ඇති මනුෂ්‍යයෝ අහෝ, මුන් විසින් දෙනලද්දවූ දානයෙහි ආනිසංසයක් බලව; මුන් දුන්නාවූ දානය ඉඳුරා සැදැහැයෙන් සිල්වතුන් කෙරෙහි ම පිහිටනලද්දේ මයැ'යි කුමාරිකාවන්ට ප්‍රශංසා කෙරෙමින් තුමූ ද ඉස්සොධා නහා පැන් බී ගියහ. එයින් මෑතභාගයෙහි මනුෂ්‍යයෝ ඒ තැන්හි අලුත් ගමක් කළාහු; ඒ ගමට උදන්විට[9] ය යි නම් විය; පසුව එම ජලය නිසා එතැන්හි මහත් විහාරයක් කරවූහ.

ඒ කුමාරිකාවෝ ජීවිතාන්තය දක්වා බොහෝ කුසල් කොට දෙව්ලොව උපන්හ; එකල දිව්‍යලොකයෙහි උන්ගේ[10] කුශලානුභාවයෙන් නානාප්‍රකාර පලුපල්ලව කුසුමයෙන් සශ්‍රීක වූ දිව්‍ය වෘක්ෂපඞ්ක්තීන් ප්‍රතිමණ්ඩිත වූ උද්‍යානමාලාවෙන් විභූෂිත ව පස්පියුමෙන් සැදි[11] මිහිරි ජලය පිරී සිටිනා පොකුණු පතැස් ආදියෙන් සැරහී නොයෙක් දහස්ගණන් දෙවඟනන් විසින් ගසන පිඹිනා ලද හෙරිතූර්‍ය්‍යනාදයෙන් එකකොලාහළ ව නටන ගී කියන නොයෙක් සියගණන් දිව්‍යනාටිකාවන් විසින් ආකීර්ණ වූ දෙළොස්යොදුන් දිව්‍යවිමානයෙක් පහළ විය. උන්ගේ පූර්වකුශලය ප්‍රකාශ කරනු පිණිස දිව්‍යමය සුවඳ ජලයෙන් පිරුණාවූ ස්වර්ණඝටයෙක් ද එහි ම පහළ විය; ඒ සුවඳ දිය පිරී පූර්ණඝටය දිව්‍ය ස්ත්‍රිය යන එන යම් ම තැනකට එක්ව ම නික්මෙයි; දෙදෙව්ලොව දෙවියන් පිරිවරා[12] ඇවිත්[13] පරිභොග කළත් ක්ෂය

1. සසද්ධා ච - J ක.සි.සෑ.
2. කරො - BGHKL ක.සි.සෑ.
3. එබඳු වූ - G
4. පැන් - BC, ක.සි.සෑ.බෙ.
5. ජලවේගයෙන් - BDEGHKL
ජලය වේගයෙන් - K
6. මාලාවන් - පිටපත් හැම.
7. පවන් - BEGK
පහන් - DHJL
මහත් - මුද්‍රිත හැම
8. කර්ණිකාවෙන් - මුද්‍රිත හැම.
9. උදන්විටි - J
10. උපන් උන්ගේ - ක.සි.සෑ.ම.
11. සැදුම් ලත් - ක.සි.සෑ.
12. පිරිවරා (නැත) - BCDEGHKL
13. අවුත් - D

Non-Commercial Distribution

නොවන්නේ මය. මෙසේ ශ්‍රද්ධාවන්‍ත සත්පුරුෂජනයෝ පැන් පමණක් දන් දී තමන්ගේ චිත්තසුද්ධි බලයෙන් මහත් වූ ශ්‍රී විභූති විඳිනාහු මය; ඊට වඩා මහ දන් දුන්නාවූ ශ්‍රද්ධාවන්‍ත මහාත්මයන් ලබන ශ්‍රී විභූතිය බුදු නොවී කවර නම් සත්වකෙනෙක් කෙසේ කියා නිමවා ද; මෙතෙකැ යි කියා නිමවිය නොහෙන්නේය. කියනලද මැයි;

සද්ධාය එවං සුජනා'ප්පදනං
දත්වාන වින්‍දන්ති මහාවිභූතිං
සක්කොති කො වත්තුමසෙසයිත්වා
අබුද්ධසත්තො බහුද්දයකස්ස - යී.

මේ මෙහි තුන් වන
ගාමදාරිකා වස්තුව ය.

තව ද මෙහි සතරවන ධම්මාය වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මෙම ලඞ්කාද්වීපයෙහි ලජ්ජිතිස්ස නම් රජ්ජුරුවන් රාජ්‍යය කරන කල්හි රුහුණුරට ගිරිහිම්බිලතිස් පවු නම් වෙහෙර වසන භික්‍ෂූන් වහන්සේ සිඟන්ට වඩනා සිව්[1] නම් ගමෙක් විය; එගම එක් දුප්පත් ස්ත්‍රියක් අනුන්ට දර පළා පැන් ආදිය ගෙනෙමින් වී පාරිමින්[2] පිදුරු සලමින් කළවිටිවල පාවර[3] කාගිය වී බලා ගන්මින් මෙසේ දුඃඛජීවිකාවෙන් දවස් යවයි; ඒ ස්ත්‍රී මැතභාගයෙහි බැලමෙහෙ කොට වස්ත්‍රයක් උපදවා ගෙන සිතන්නී 'රාග නමැති ගින්නෙන් දන ලදු ව[4] ද්වේෂ නමැති රාක්‍ෂසයා විසින් පීඩාවට පැමිණ මෝහයෙන් මූළ ව බොහෝ කලක් ච්‍යුතිප්‍රතිසන්ධිවශයෙන් සසර ඇවිද්දෙමි. මතු සැප[5] ලබන්ට තිසි කුශලයක් ඒකාන්තයෙන් ම නොකෙළෙමි වන; එකාවත් පව් කෙළෙමි වන. එසේ හෙයින් මම අනුන්ගේ ගෙයි බැලමෙහෙ කොට දුක සේ ජීවත් වෙමි; සැපයෙක් නම් මට අහසට පොළොව සේ දුර ය. දන් බුද්ධොත්පාදකාලයත් විය; ධර්මයත් ලොකයෙහි පවතිමින් සිටියේය. පිරිසුදු නිර්මල වූ සීල නමැති සුදු වැලි තලා ඇති ධූතගුණ නමැති ස්ඵටික මාලාවන් ඇති, ත්‍රිවිධ සන්තොෂ නමැති ජලයෙන් පිරුණාවූ, සමථ විදර්ශනා නමැති රළුපතර ඇති ප්‍රධන්වීර්‍ය්‍ය නමැති මස් කැසුප් ආදීන් විසින් ගැවසී ගත්තාවූ, ප්‍රඥ නමැති සාර වූ රත්නයන් ඇති සඞ්ඝ[6] නමැති සමුද්‍රය ද දශවිධරත්නයන්ට උත්පත්තිස්ථාන වූ මහා සමුද්‍රය සේ ශීලසමාධ්‍යාදි ගුණධර්ම නමැති රත්නයෙන් සමෘද්ධ වූ සඞ්ඝ නමැති සමුද්‍රය ද අඩු නොව පවතිමින් සිටියේය. එසේ හෙයින් කියන ලදී;

තයො අපායා ආරුප්පා - සඤ්ඤං පච්චන්තිමම්පිච,
පඤ්චින්ද්‍රියානං වෙකල්ලං - මිච්ඡාදිට්ඨිං ච දරුණං.

1. සිව - ක.කි.කැ.ම.ස.
2. පරිමින් - BG
   පරමින් - H
3. පාර - BCDEGHKL
4. දවන ලදු ව - BG. ම
5. සැපත් - BCDEGHKL
6. ධර්ම - ක.කි.කැ.ම
   සඞ්ඝ නමැති සමුද්‍රය ද යන්න
   අතිරේක පාඨයක් සේ පෙනේ.

Non-Commercial Distribution

යනාදීන් දක්වනලද අෂ්ට දුඃඛක්ෂණයෙන් විනිර්මුක්ත වූ නව වන බුද්ධෝත්පාදක්ෂණය මා විසින් ලබනලද; මෙසේ වූ ක්ෂණ සම්පත්තියක් ලද්දවූ මා විසින් දන් මාගේ ආත්මය ගොඩනහා ගත නුහුණුයෙම් වීම් නම් මේ අසාර වූ සංසාර නමැති මහාසාගරයෙහි ගිලී කවර දවසෙක ඉස ඔසවා ගත හෙම් ද. අනුන්ට බැල මෙහෙ කොට දුක සේ උපදවා ගත් මාගේ එක වස්ත්‍රයෙක් ඇත. ඒ වස්ත්‍රය දන් දී එහි කුශලඵලය මහ නැවක් කොටගෙන ඒ ම මට පිහිට කොටගෙන් සංසාර නමැති සාගරයෙන් ගොඩ නැංග මැනවැ'යි සිතා. ඒ ධම්මා නම් උපාසිකාවෝ සඞ්ඝයා වහන්සේ උදෙසා ඒ වස්ත්‍රය දුන්හ. එසේ හෙයින් කියනලදී;

රාගානලෙන සංදඩ්ඪා - දෙස රක්ඛස පීළිතා,
මොහෙන මුච්ඡිතා හුත්වා - සංසාරෙ සංසරිං චිරං.

නාකං නූන පුරෙ පුඤ්ඤං - කිඤ්චි ආයති කාරණා,
කතං නූන මයා පාප - මප්පභොගස්ස කාරණා.

තස්මාහං පරගෙහෙසු - භතිං කත්වාන කිච්ඡතො,
ජීවිස්සාමි සුඛං මය්හං - නභතො පථවී යථා.

බුද්ධුප්පාදෙ අයං දනි - ධම්මො ලොකෙසු දිප්පති,
බුද්ධපුත්තා ච ලොකස්මිං - චරන්තනති ගුණසාගරා.*

ඛණො කාමං මයා ලද්ධො - ඉදනනත්තං න උද්ධරෙ,
සංසාරෙසු නිමුග්ගාහං - කද සීසං සමුක්ඛිපෙ.

දුක්ඛෙනුප්පාදිතං එකං - සාටකං මම විජ්ජති,
තෙන'දනි කරිස්සාමි - පතිට්ඨං භවසාගරෙ.

ඉති චින්තිය සා ධම්මා - සඞ්ඝමුද්දිස්ස තං තද,
අද සද්ධාය දනස්ස - සද්දහන්ති මහප්ඵලං.

මෙසේ එකල ගිරිතිම්බිල තිස් පව් නම් විහාරයෙහි පන්සියයක් දෙනා වහන්සේ වස් විසූසේක; ඉක්බිති භික්ෂූන් වහන්සේ සීව නම් ගමට බොහෝ සේ සිහා වඩනාසේක. එකල්හි ධම්මා නම් ස්ත්‍රී තමහට උපන්නාවූ ශ්‍රද්ධාව නොපසුබස්වා තමාගේ ඒ වස්ත්‍රය ගෙන භෝජනශාලාවට ගොස් එක් භික්ෂු කෙනකුන් වහන්සේට කියන්නී 'ස්වාමිනි, මේ වස්ත්‍රය විහාරයෙහි වස් විසූ ඇම්දෙනා වහන්සේට වස්සාවාසික කොට දෙමි; නුඹවහන්සේ ඔබ ගොසින් මා දුක්පත් බව ද මේ වස්ත්‍රය මහත් වූ ආයාසයෙන් උපදවා ගත් බව ද භික්ෂූන් වහන්සේට කියා දුනමැනවැ'යි උන්වහන්සේ අතට වස්ත්‍රය දී මහත් වූ සන්තොෂයෙන් පින පිනා ගෙට ගියාය. උන් වහන්සේ ඒ වස්ත්‍රය ගෙන විහාරයට ගොස් එතැන්හි රැස්වූ භික්ෂූන් වහන්සේට ඒ ස්ත්‍රිය කී[3] සැලැස්ම කියා 'ස්වාමිනි, මේ වස්ත්‍රය සිවුරු[4] කොට පොරෝනට නිසි කෙනකුන් වහන්සේට දුන මැනවැ'යි කියා සඞ්ඝයා වහන්සේට වස්ත්‍රය දුන්සේක.

1. වී නම් - G
2. ඒම මට පිහිට කොට ගෙන (නැත) - ක.සි.ස.බෙ.
3. කළ කී - BG
4. සිවුරක් - මුද්‍රිත හැම, ස.

* මේ ගාථා හතර ක.සි.ස.ම.ය. පිටපත්වල ඉහත ආ තයො අපායා යන ගාථාවට අනතුරු ව යෙදේ.

Non-Commercial Distribution

එබස් අසා ඇමදෙනා වහන්සේ අතුරෙන් එක්කෙනකුන් වහන්සේ 'ස්වාමීනි, මට මේ වස්ත්‍රය තුන්මසකට දුන මැනවැ යි මම මේ වස්ත්‍රය පොරොම්'යි වදළසේක. එබස් අසා අනික් කෙනකුන්වහන්සේ දෙමසකට දුනමැනවැ යි කීසේක; අනික් කෙනකුන් වහන්සේ මසකට දුනමැනවැ යි කීසේක; එක් කෙනකුන් වහන්සේ පසළොස් දවසකට දුනමැනවැ යි කීසේක; එක් කෙනකුන් වහන්සේ දස දවසකට දුන මැනවැ යි කීසේක; එක් කෙනකුන් වහන්සේ පස් දවසකට දුන මැනවැ යි කීසේක. මෙසේ මාසාදි වසයෙන් කල් පිරිහෙළා ක්‍රමයෙන් එක්කෙනකුන් වහන්සේ මට එක් දවසකට දුන මැනව. මම මේ වස්ත්‍රය පොරෝම් කීසේක. එකල භික්‍ෂූන් වහන්සේ උන් වහන්සේට වස්ත්‍රය දුන්සේක. උන් වහන්සේ එම වස්ත්‍රය ගෙන දවලු කඩා ගෙත්තම් කොට රදන් කොට කප්බිඳු ඔබා සිවුරු[1] පෙරව සක්මනට නැඟී භාවනා කෙරෙමින් ඉදිරියට වඩනාසේක් සත්වන පියවර නොඉක්මෙන තෙක් කෙලෙස් සතුරන් ජය ගෙන රහත් ව ඒ සිවුර සෝධා දෙවන දවස් භික්‍ෂූන් වහන්සේට දුන්සේක. අනික් කෙනකුන් වහන්සේ ඒ සිවුර ගෙන පෙරව සක්මනට නැඟී එපරිද්දෙන් ම රහත් වූසේක; මෙම ක්‍රමයෙන් ඒ[2] සිවුර නිසා වස් ඇතුළත පන් සියයක් දෙනා වහන්සේ රහත් වූසේක.

ඉක්බිති ලජ්ජිතිස්ස රජ්ජුරුවෝ මහ පවුරුණු[3] දවස් රජගෙන් නානා වස්ත්‍ර[4] ගෙන විහාරයෙහි වියන් බඳවා පිළීතොරණ රඹ තොරණ පෙතිතොරණ මල් තොරණ ආදියෙන් ඒ ඒ තැන සරහා ලවා ධජපතාක නංවා විහාරය අලඞ්කාර කරව'යි මනුෂ්‍යයන්ට නියෝග කළහ; එපරිද්දෙන් ම ඔහු විහාරය අලංකාර කොට සැරහූය. භික්‍ෂූන් වහන්සේ ද විහාරය සරහනසේක් ඒ සිවුර ගෙන 'මේ සිවුර බොහෝ භික්‍ෂූන්ගේ කෙලෙස් සතුරන් බිඳ පැලවීමට[5] කාරණ වී ය'යි කියා[6] සක්මන් මළුවට නැඟෙන දෙරකඩ ධජයක් කොට බැඳවූසේක. එකල රජ්ජුරුවෝ විහාරයට ගොස් සක්මන්මළු දෙරකඩ ඔසවා බඳනාලද[7] ඒ අභීත් ධජය දැක 'මා විසින් නීලපීතාදි වූ නානා වස්ත්‍ර එළවනලද[8], ඒ හැම අප්‍රකාශ ව තිබෙන ඒ ඒ තැන බැඳ කුමක් පිණිස මේ කන්ථ[9] කඩ ඉදිරිපිට බැඳවූ ද'යි ආරාමිකයන් විචාළහ. එකල ආරාමිකයෝ 'දේවයන් වහන්ස, සඞ්ඝයා වහන්සේ තමන් වහන්සේට බොහෝ උපකාරිවූ අභීත්ධජය යි කිය කියා මෙතැන්හි බැඳවූසේකැ'යි. කීහ. 'මින් සඞ්ඝයා වහන්සේට කවර උපකාරයෙක් වී ද'යි රජ්ජුරුවන් විචාළ කල්හි 'දේවයන් වහන්ස, අපි නොදනුම්හ [සඞ්ඝයා වහන්සේ ම දන්න සේ කැ'යි' කීහ. එකල රජ්ජුරුවෝ] සඞ්ඝයා වහන්සේ කරා එළඹ වැඳ එකත්පස් ව හිඳ 'ස්වාමීනි, තෙල සිවුර සඞ්ඝයා වහන්සේට බොහෝ උපකාරී වීය යි කියති; ඊට කාරණ කවරේ ද' යි විචාළහ. සඞ්ඝයා වහන්සේ 'මහරජ, මේ සිවුර නිසා මේ වස් ඇතුළත ම පන්සියයක් භික්‍ෂූහු රහත් බවට පැමිණියහ; එසේ හෙයින් භික්‍ෂූන්ට මේ සිවුර බොහෝ උපකාර වී යැ'යි වදරා සිවුරෙහි ගුණ කියනසේක්.

---

1. ඒ සිවුර - KL,.ස.
2. එම - BDEGHL
3. මහා පවාරණ - DEHL
4. නා නා වර්ණ වස්ත්‍ර - BGJ
   නා නා ප්‍රකාර වර්ණ වස්ත්‍ර - C
   නානා වර්ණ වස්ත්‍රයන් - ස.
5. පැලඳවීමට - ක.කි.ඤ.
6. සිතා - BG
7. බඳවන ලද - BG
8. එල්වන ලද - BDC
   එවන ලද - EHKL
9. මේ කසට කඩ - D.
   මේ කඩ - J ක.කි.ඤ.ම.
   කන්ථක - පාලි

Non-Commercial Distribution

මලමූත්‍ර වැකීමෙන් අපවිත්‍ර ව දමනලද්දවූ කඩරෙද්දක් වී නමුත් දුටු කල ඉදින් පළමු සිල්වත් ගුණවත් භික්ෂූන් විසින් ප්‍රයෝජන විඳි සිවුරුකඩෙක් වී නම් අනාදර නොකළ මනා මය. එසේ වූ සිවුරුකඩ අඳුන සත්වයන් පයින් මැඩ අනාදර අපවිත්‍ර නොකරන සේ යහපත් තැනෙක තබා වැඳ පුද ආදර කටයුත්තේ මය; එසේ වැඳ පුද ආදර කිරීම නිවන් අවසන් කොට සියලු දෙව්මිනිස්සැපත් සාධා දෙන්නේ මය. එසේ හෙයින් මහරජ කඩකැබලි එක් කොට ගෙත්තම් කළ ද ඉතා ස්ථූල වූ යම් තෙල අභීත් ධජයෙක් බඳනාලද්දේ ද ඒ අභීත් ධජය රහතන් විසින් පරිභොග කරනලද හෙයින් පූජා සත්කාරයට සුදුසු යැ'යි වදළ සේක. එසේ හෙයින් කියනලදී;

මක්ඛිතං[1] මලමුත්තෙහි - අපවිද්ධං පිලොතිකං
දිස්වා ඉසිද්ධජං යත්ථ - කරණීයො න'නාදරො.

පාපෙත්වා පන තං ඛෙමං - වන්දමානෙන ජන්තුනා,
ආදරො එව කාතබ්බො - තං හොති අරහද්ධජං.

යොයං සො කන්තකො රාජ - උස්සිතො අරහද්ධජො,
පරිභුත්තොරහන්තෙහි - තස්මා සො පූජනාරහො - යි.

මෙසේ ඒ සිවුරෙහි විශෙෂගුණ දක්වා බණ වදළසේක. ඒ අසා සන්තුෂ්ට වූ රජ්ජුරුවෝ 'මේ සිවුර දුන්නෝ කවුරු ද'යි විචාළහ; එබස් අසා භික්ෂූන්වහන්සේ 'මහරජ, සීව නම් ගම ඉතා දිළිඳු වූ ධම්මා නම් උපාසිකා කෙනෙක් දුන්හුයැ'යි වදළසේක; එබස් අසා රජ්ජුරුවෝ ඒ ධම්මා නම් උපාසිකාවන් ගෙන්වා ගෙන උන්ට බොහෝ සම්පත් හා සීව නම් ගම උන්ට බත්ගම් කොට දුන්හ; එතැන් පටන් ඒ ගම ධම්මසීව නම් ග්‍රාමය යි ප්‍රසිද්ධවිය. රජ්ජුරුවෝ එතැන් පටන් ධම්මාවන් දූ තනතුරෙහි තබා බොහෝ යශස් දුන්හ. එවක් පටන් ඒ උපාසිකාවෝ දන් දී සිල් රැක ජීවිතාවසානයෙහි දෙව්ලොව උපන්හ.

මෙසේ එකල්හි පියසීලී[2] වූ සිල්වත් සඞ්ඝයා වහන්සේට දුක්පත් ගැහැණිය[3] දුන්නාවූ වස්ත්‍රදානයෙහි ආනුභාවය ඉතා ආශ්චර්‍ය්‍ය මය; එම ජන්මයෙහි ඒ ධම්මා නම් ස්ත්‍රී බොහෝ සම්පත් ලැබ දෙවුලොව උපන්නීය; එම වස්ත්‍රය නිසා භික්ෂූන් වහන්සේ ද රහත් බවට පැමිණිසේක. කියනලද මැයි;

අහොනුභාවං කපණාය දින්න
වත්ථස්ස සඞ්ඝස්ස සුපෙසලස්ස,.
ලද්ධායි ධම්මා භව භොගසම්පදං
භික්ඛු'පි ඛීණාසවතං ගතාසුං - යි.

මේ මෙහි සතර වන
ධම්මාය වත්‍ථුව ය.

1. මක්ඛිතං - පිටපත් හැම
2. ප්‍රියසීලි - BCDEJK
3. ගැහැණිය - EJ
ගැහැනියක - BCDGH, බෙ,ස.
ගැහැනි - ක.සි.සැ,ම.

Non-Commercial Distribution

තව ද මෙහි පස් වන කිසැව් සඞ්ඝා වස්තුව නම් කවරයත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මෙම ලඞ්කාද්වීපයෙහි කලකැත්දෙව තිස් නම් රජ්ජුරුවන් රාජ්‍යය කරන කල්හි අනුරාධපුර නුවර සංඝ නම් අමාත්‍යයෙක් වීය; ඕහට රජ්ජුරුවෝ රුහුණු මාගම බත්ගම් කොට දුන්හ; එකල ඒ අමාත්‍යයා තමාගේ මල් වූ චූළසංඝ අමාත්‍ය නම් වූ මලණු කෙනකුන් කැඳවා 'තෙපි රජ්ජුරුවන් වහන්සේ සමීපයෙහි සිට සේවය කරව'යි කියා රජ නුවර රඳවා තුමූ මාගමට ගොස් වාසය කෙරෙති, එකල්හි උන්ගේ කිංචිසංඝා නම් එක් දියෙණි කෙනෙක් වූහ; ඌ තුමූ ඉතා රූපසම්පන්නයහ. දිව්‍යාඞ්ගනාවක් වැනියහ; උන්ගේ දෙමවුපියෝ ඒ කුමාරිකාවන් සූපශාස්ත්‍රයෙහි අභ්‍යාස කරවා පිසන සේ උගැන්වූහ; එකල ඒ කුමාරිකාවන් පළමු කොට පිසූ උපකරණ සංඝයා වහන්සේට දුන්හ; එතැන් පටන් කුමාරිකාවෝ බොහෝ සේ සඞ්ඝයාවහන්සේට බත් මාලු පිස ගෙනෙති; එසේ හෙයින් ඒ කුමාරිකාවන්ට සංඝූපස්ථායිකාය යි කියා ද කියති. එයින් මෑතභාගයෙහි උන්ගේ පිය වූ සංඝ නම් අමාත්‍යයා දනවුවැසි මනුෂ්‍යයන්ට බොහෝ පීඩා කොට නොයෙක් වස්තු උදුරා ගනිමින් ව්‍යසන පමුණුවයි; මනුෂ්‍යයෝ එපවත් රජ්ජුරුවන්ට කීහ. රජ්ජුරුවෝ එපවත් අසා උන්ගේ මලණුවන් කැඳවා 'එම්බා, තොපගේ බෑණන් දනවුවැසි මනුෂ්‍යයන් සින් ගෙන රාජ්‍යය තනා ගන්නා ලෙස යවු නියා යහපත. ඌ දත් රාජ්‍යය තනන්නා[2] තබා දනවුවැසි මනුෂ්‍යයන්ට පීඩා කොට වස්තු උපයා රැස් කෙරෙත් ල; එසේ නොකරන්ට කියා තොපගේ බෑණන්ට පතක් ලියා යව'යි කීහ. එකල චූළසංඝ අමාත්‍යයා එපවත් අසා තමාගේ බෑණන්ට පතක් ලියා යවනුයේ;

භාතුනො මෙහිවාදෙතබ්බා - පවත්තිං ඉධ පත්පටං[3]
කථෙම් හාතු රාජානො - සෙවිතබ්බා අවක්ඛියා.

[නිම්මිතා][4] විය රාජානො - චරන්ති ජහි භූතලෙ,
යමාදිච්චිඳුමච්චුහි - කුවෙර දහනෙහි ච.

තිට්ඨන්ති කෙචි තරවො - දහනා දඩ්ඪකානනෙ
රාජකොපානලා දඩ්ඪා - න තිට්ඨන්ති පරාධිනො[5].

දූරෙති නාවමන්තබ්බා[6] - රාජානො දීඝබාහුකා
ගණ්හන්ති සහසා දළ්හං - [දිසං][7] ලොකොපපීළිතං.

පක්ඛපාතං ච සප්පෙමං - උපකාරිං හිතාවහං
අභිවඩ්ඪන්ති රාජානො - යසද්නාදිනා නරං.

---

1. තිස්ස - KL
2. තනා ගන්නා - BCDGK
3. පත්පටං - BCDGHL
4. මිත්තා - පිටපත් හැම
5. නතිට්ඨන්තු පරාධිනො - BCDEGJKL
නතිට්ඨන්තපරාධිනො - ක.සි.ඥ.
න තිට්ඨන්තපරාධිනො - මෙ.
6. නාවමන්තබ්බො - පිටපත් හැම
7. දිසං පිටපත් හැම. ස.

Non-Commercial Distribution

යනාදීන් 'මාගේ බැණන්වහන්සේ වැඳ රජ නුවර සැලවූ සවරූප කියමි. බැණන් වහන්ස, තමා සිත වස්තුවක් නැති ව රජදරුවන් වහන්සේගේ අභිප්‍රාය දන රාජසේවය[1] කටයුත්තේය. රජදරුවෝ නම් යමරජ්ජුරුවෝය සූර්‍ය්‍යදිව්‍යපුත්‍රයාය චන්ද්‍රයාය මාරයාය වෛශ්‍රවණයාය වහ්නිය යන මේ සය එක්කොට මවාලූ රූපයක් සේ පොළෝතෙලෙහි ඇවිදිති; හේ එසේ මය.

යමරජ්ජුරුවෝ සත්වයන් චුත ව ගොස් තමන් සමීපයට පැමිණි කල උන් කළාවූ කුසල් අකුසල් විචාරා උන් කළ කුශලාකුශල නියාවට පින්[2] කළවුන් දිව්‍ය ලොකයට පමුණුවති. අකුසල් කළවුන්ට 'තොප අකුසල් කළ කල අප කරන්නේ කිම් ද යි යන විචරක් විනා මුන්ට මෙබඳු නිග්‍රහයක් කරව යි නොකියති. එකල ඊට නියුක්ත ව උපන්[3] උන්ගේ අකුශලබලයෙන් පෙනුණාවූ යමපල්හු ගෙන ගොස් වධබන්ධනාදිය කෙරෙති; රජදරුවෝ ද සමහර කලෙක එපරිද්දෙන් ම කරන කියන හෙයින් යමරජ්ජුරුවන් හා සමාන ය.[4] සූර්‍ය්‍යදිව්‍යපුත්‍රයා මුළුලොව ආලොක පතුරුවා ප්‍රබොධ කළමනා පද්මයන් ප්‍රබොධ කරවයි; වියළුව මනා දෙය වියළයි[5] එපරිදෙන් ම රජදරුවෝ යහපත කළවුන් සන්තොෂ කරවති; නපුර කළවුන් හකුළුවති; එසේ හෙයින් රජදරුවෝ සූර්‍ය්‍යදිව්‍ය පුත්‍රයා හා සමානය[4]. චන්ද්‍රයා ග්‍රහතාරකාවන් පිරිවරා නභො මණ්ඩලයෙහි පැළඹෙමින් අතිසීතල වූ රශ්මිකදම්බයන් දසදිග පතුරුවා ලොකවාසීන් සතුටු කරවයි; එපරිද්දෙන් ම රජදරුවෝ ද මොළොක් වූ සිහිල් වූ ගුණයෙන් ලොකවාසීන් සතුටු කරවා පෘථිවිතලයෙහි පැළඹෙන හෙයින් චන්ද්‍රයා වැනියහ. යම් සේ මාරයා කිසි දයාවක් නැති ව මැරියයුත්තන් මරා ද එපරිද්දෙන් ම රජදරුවෝ ද අපරාධ කළ අසත්පුරුෂයන් මරවති, එසේ හෙයින් රජදරුවෝ මාරයා වැනියහ. යම් සේ වෛශ්‍රවණයා මිත්‍ර ව ඉන්නවුන්ට නොයෙක් වස්තු දීමෙන් සතුටු කරවා ද විපක්ෂ ව ඉන්නවුන්ගේ වස්තු උදුරා ගැන්මෙන් අකුළුවා ද එපරිද්දෙන් ම රජදරුවෝ ද තමන්ට වසඟ ව ඉන්නවුන්ට වස්තු දී සංග්‍රහ කෙරෙති; විරුද්ධව ඉන්නවුන්ගේ වස්තු උදුරා ගනිති; එසේ හෙයින් රජදරුවෝ නම් වෛශ්‍රවණයා හා සමානයහ[6]. යම් සේ වහ්නිය කල්පාන්තකාලයෙහි සත්වසංස්කාර සියල්ල ම දවා නැති කෙරේ ද එපරිද්දෙන් ම රජදරුවෝ ද අපරාධ කළාවූ සියල්ලවුන් ම ගිනි ගසා වධ කොට දවති. එසේ හෙයින් රජදරුවෝ නම් ගිනිකඳක් හා සමානයහ. තව ද ඒ වහ්නිය එක්කෙනකුන් ම දවයි; රාජ නමැති වහ්නිය අපරාධ කළවුන් හා එක් ව සිටියවුන් ඇතුළු ව සියලු බන්ධුවර්ගයා නසන්නේය.

ලැවුගිනි ගත් වනයෙහි අතරතුර සමහර රුක් නොදැ සිටියි. රජදරුවන්ගේ කෝප නමැති ගිනි ගත් මනුෂ්‍ය නමැති වනයෙහි අපරාධ කළවුන්ගෙන් සිටිනා කෙනෙක් නැත. රජදරුවන් වහන්සේ දුරැ යි නොසිතුව මැනව; රජදරුවන්ගේ අත ඉතා දිග; තමන් සන්තක රාජ්‍යවාසීන්ට පීඩා කරන සතුරන් උන් තැන ම ඉඳ අල්වා ගනිති. එසේ හෙයින් රාජ්‍යය නොනැසුව මැනව. රාජප්‍රසාදයෙන් සලස්වා වූ ස්ථානාන්තර නොපිරිහෙළුව මැනව. රාජ්‍යවාසීන්ගේ වස්තු නොගත මැනව;

1. රාජසේවනය - H
2. පින්කම් - BG
3. උපන් (නැත) - BDGHL
   සිටි - K
4. සමානයහ - EHKL
5. වියළුවයි - KL ස.
6. වැනියහ - KL ස.

Non-Commercial Distribution

අනුන්ට පීඩා නොකළ මැනව. රජදරුවෝ නම් පක්ෂපාත ප්‍රෙමසහිත ව තමන්ට උපකාර කිරීමෙන් සැප එළවන්නාවූ සේවක ජනයන්ට නොයෙක් ස්ථානාන්තර දී යසෘශ්‍රියට පමුණුවති. එසේ හෙයින් අපත් නොබලා මෙසේ ම කිරීම කටයුතු නොවෙයි; මෙතැන් පටන් රාජකාරියෙහි අප්‍රමාද ව රාජ්‍යවාසීන් සිත් ගෙන වාසය කළමැනවැ'යි අස්නක් ලියා යවූහ.

එකල සංඝ නම් අමාත්‍යයා මලණුවන් යවූ පත් අස්න අසා 'මාගේ මලණුවෝ රජ්ජුරුවන් වහන්සේගේ අභිප්‍රාය දන මේ අස්න එවූහ; රජ්ජුරුවන් වහන්සේ කොප වූ තැන් පටන් අප මෙතැන වාසය කළ නොහැක්කැ'යි භයානසාර වූ වස්තු හා ඇඹෙණියන් හා දියෙණියන් කැඳවාගෙන පලාගොස් ක්‍රමයෙන් තුගහල් කඩුවට පැමිණ එතැන සිට සිතන්නාහු 'අපි හැම රජ්ජුරුවන් වහන්සේ කෙරෙහි භයින් යම්හ; නැවත රජ්ජුරුවන් වහන්සේ දක්ක නොහැක්ක; අනුරාධපුරයට නොගොස් ගල් වල් බලා පලාගොසින් යම්කිසි තැනෙක අප්‍රසිධ ව ඉඳ ජීවත් වම්හ' යි තමාගේ ඇඹෙණියන්ට කියා උන් විසිනුත් යහපතැ යි ගිවිසි කල්හි තමන් දියෙණියන්ගේ රූපශ්‍රී සම්පත්තිය[1] සලකා 'ඉදින් අපට භයෙක් උපදනේ වී නම් මුන් නිසා ම උපදනේය'යි සලකා 'එම්බා භද්‍රාව, ඉදිරියේ දවස මේ කිංචිසංඝාවන් නිසා [අපට] භය උපදනේය; ඉදින් තොපටත් අභිප්‍රාය වීනම් කිඤ්චිසංඝාවන් මෙතැන ම ඇරපියා යම්හ'යි කීහ; උන්ගේ භායර්‍යාවෝ ද එබස් අසා 'ස්වාමිනි, නුඹ වහන්සේට යමක් අභිප්‍රාය වී නම් එපරිද්දෙන් ම කළ මැනව; මම නුඹවහන්සේගේ අභිප්‍රාය නොබිඳිමි' කීහ. ඉක්බිති සඞ්ඝ අමාත්‍යයා තම දූව කැඳවා 'මැණියනි, අපි දෙදෙන ඇතුළු ගමට ගොස් අනුභව කරන්ට ආහාරයක් සොයා එම්හ, අප එනතෙක් මෙතැන්හි ම සිටිනැ'යි දූවණියන්[2] රඳවා දෙමහල්ලෝ ගියාහුය. අහෝ! ඛෙදයක් ඇසුව මැනව. භයට පැමිණියාවූ සත්වයන්ට ප්‍රෙම කටයුතු වස්තුවෙහි ප්‍රෙමයක් හෝ ලොභ කටයුතු වස්තුවෙහි ලොභයක් නැති වන්නේ මැයි. හේ එසේ මය. ලොකවාසී සත්වයෝ එබඳු දුකක් උපන්[3] කල්හි ප්‍රෙමනීය වූ දරුවන් කෙරෙහි ද ප්‍රෙම හරනාහු මය; කුමක් මෙන් ද? බඩසා[4] අවස්ථාවෙහි දරු පෙම් හැර තමන්ගේ දරුවන් කන කිඹුලුන් හා කැස්බන් මෙනි. එසේ හෙයින් කියනලදී;

තථාවිධෙසු[5] දුක්ඛෙසු - උප්පන්නෙසු ජනා ඉමෙ,
පෙමං ජහන්ති පුත්තානං - නක්ක කච්ඡප සාදිසා-යි.

ඉක්බිති එතැන්හි සිටියාවූ කුමාරිකාවන් මහ යනු එන්නෝ දක මේ කුමාරිකාවෝ විශිෂ්ට වූ රූ ඇතියහ; ඉතා සිවුමැලියහ; කුමක් පිණිස මෙතැන සිටියෝ දෝ හෝ යි විස්මය පත් ව සමීපයට එළඹ මැණියෙනි, කුමක් පිණිස මෙතැන තනි ව සිටූ ද යි අප හා කැටි ව පලා එව'යි කියති; කුමාරිකාවෝ උන්ගේ බස් අසා 'මම මාගේ මවුපියන් කී වචනය නුගලුවම්' යි සිතා බැණ නොනැඟී එතැන්හි ම සිටියහ; මෙසේ දෙමවුපියන් දන් එති දන් එති සිත සිතා සිටිනාවූ ඒ කුමාරිකාවන්ට සත් දවසෙක් ඉක්මිණ; එතෙක් දවස් මුළුල්ලෙහි නිරාහාරව ම සිටියහ.

1. රූපසම්පත්තිය - BDEGHKL
2. දියෙණියන් - K, බෙ.ස.
3. පැමිණි - BG
4. බාල - BGHKL
5. යථාවිධෙසු - CJ

Non-Commercial Distribution

එකල්හි ශක්‍රදෙවේන්ද්‍රයෝ දෙව්මිනිසුන් කෙරෙහි සැරිසරා ඇවිදිනාහු එපරිද්දෙන් සිටියාවූ කුමාරිකාවන් දක 'මේ කුමාරිකාවෝ මහත්[1] ගුණ ඇති කෙනෙක; උන් විමසමි' යි සිතා විශිෂ්ට වූ රූ ඇති ළදරු පුරුෂ වෙසක් මවා ගෙන කුමාරිකාවන් සමීපයට ගොස් කුමාරිකාවන් හා සමග කථා කරන්නාහු එම්බා කුමාරිකාවෙනි, තෙපි නිල් වූ සිනිඳු වූ අග්බඹුරු වූ ධම්මිල්ලකලාපයක් ඇතියව[2], පුපිපි රත්පියුමක් බඳු වූ මුඛපද්මයක් ඇතියව,[2] නිල් වූ දිගු පුළුල් නෙත්‍රයුග්මයක් ඇතියව,[2] දුටු දුටුවන් නුවන් පිනවා සිත් උමතු කරවන රූපශොභාවක් ඇතියව. මඳ මඳ පවනින් ලෙලදෙන රන්ලියයක් මෙන් බබළමින් නඳුන්වන්[3] මධ්‍යගත දෙවඟනක වැනියව; දසදිග අමාරැස් විහිදුවමින් ආකාශමණ්ඩලයෙහි සිටගත් චන්ද්‍රරේඛාවක් මෙන් සොඳුර, තෙපි මෙතැන තනි ව සිට කුමක් කරා ද. තෙපි තමා දිව්‍යාඞ්ගනාවක් ද නොහොත් මනුෂ්‍ය ස්ත්‍රියක් ද? කවුරුන්ගේ දියණිකෙනෙක් ද? කොයි සිට මෙතැනට අවුද? කුමක් පිණිස මෙතැන සිටියාද? තොපගේ ස්වාමිපුත්‍රයෙක් ඇද්ද? ඒ මට ඉඳුරා කියාලව. ළදරු පුරුෂයෝ ළඳරි ස්ත්‍රීන් කැමති වෙති; ළඳරි ස්ත්‍රීහු ද තමන් සේ ම ළදරුපුරුෂයන් කැමැති වෙති; එබැවින් අපි දෙදෙන ම ළඳ සොඳ සමාන වයස් ඇති ව යෞවනයෙහි පිහිටියම්හ. එසේ හෙයින් තෙපි මට භාර්‍ය්‍යා වූ නම් අද පටන් ඉඳුරා තොප රක්‍ෂා කෙරෙමි, තොපට මම ගෙහිමි වෙමි, තෙපි මට භාර්‍ය්‍යාව මා කෙරෙහි වසව' යි කීහ. එසේ හෙයින් කියනලදි;

නීල වෙල්ලිත ධම්මිල්ලා - ඵුල්ල පඞ්කජ කානනා,
නීලායත විසාලක්ඛා - ත්වමාසි නයනුස්සවා.

හෙමවල්ලීව ලීලාය - දෙවකඤ්ඤාව නන්දනෙ,
චන්දලෙඛා වියාකාසෙ - භද්දෙ ත්වමිධ තිට්ඨසි.

කා වා ත්වං කස්ස වා ධීතා - කුතො ත්වමිධ ආගතා,
කිමත්ථායෙත්ථ අට්ඨාසි - කො තෙ භත්තා මනොරමෙ.

යුවතිං යුවාව කාමෙති - යුවානං යුවතී තථා,
ත්වමහං ච භද්දෙ දනිධ - සමානම්හි වයෙ ඨිතා.

පොසෙමි භරියත්තෙන - තුවමජ්ජතනා සද,
අහං තෙ පති හෙස්සාමි - තුවං මෙ භරියා භව -යි.

එබස් අසා කුමාරිකාවෝ 'ස්වාමිනි, නුඹවහන්සේ කීයේ කාරණා මය; මේ ලොකයෙහි පුරුෂාභරණයක් නැති ස්ත්‍රීජනයෝ කෙනෙක් ආභරණ පැළඳගෙන සිටියාහු වී නමුත් නොහොබනාහු මය. යම් ස්ත්‍රියකට ගෙහිමි පුරුෂයෙක් නැත් නම් වැන්දඹු තැනැත්තිය යි නිඳා බෙණෙති; එසේ වූ කණ වැන්දුම්[4] තැනැත්තී සියලු දුකට භාජන වන්නීය; එසේ වී නමුත් මාගේ මවුපිය දෙදෙන තමන් එන තෙක් මා මෙතැන පිටින්ට කියා අවවාද කොට ගියාහුය; දෙමවුපියෝ නම් දරුවන්ට

1. මහා - BG
2. ඇතියා ව - DEGHJL
3. නඳුන් විමන - ක.කු.ම
   නඳුන් උයන - කි.
4. වැන්දඹු - බෙ.ස.
   කණවැන්දඹු - KL

Non-Commercial Distribution

වැඩ කැමැත්තෝය; එසේ වූ දෙමවුපියන්ගේ බස් නොගිවිස සිතුවක් කළ දරුකෙනෙක් ඇත්නම් එසේ වූ නොකීකරු දරු[1] මෙලොව නොයෙක් ව්‍යසනයට පැමිණ පරලොව දුර්ගතියට පැමිණෙති. ඉදින් මාගේ මවුපිය දෙදෙනා තොප කෙරෙහි ඉන්ට කිවු නම් ඉඳිමි; එසේ අනුනොදන්නාහු වී නම් තොප හා සමඟ නොවෙසෙමි'යි කීහ. එසේ හෙයින් කියනලදී;

මය්හං අත්‍ථි පිතා මාතා - මමෙවං තෙ'නුසාසයුං,
යාවායාම මයං පුත්‍ති - තාව එතෙව හොහි'ති.

මාතාපිතුන්නං වචනං - අකරොන්තා නරා ඉධ,
විනාසං ඉධ ලොකෙසු - යන්ති පෙච්ච'පි දුග්ගතිං.

යදි මාතා පිතා මය්හං - අනුජානන්ති මානව,
තථා තෙ සඞ්ගමො හොතු[2] නො චෙ භවතු සඞ්ගමො-යි.

එකල්හි ශක්‍රයෝ කුමාරිකාවන් කී කාරණ අසා සතුටු ව 'එම්බා පින්වත,[3] තොපගේ ශරීරය මිලානික ව මුහුණ වැරී තිබෙයි; ඉතා සයින් විඩා වුව යි සිතමි; මේ බත් අනුභව කරව' යි කියා කුමාරිකාවන්ට බත්මුලක් දුන්හ; එකල කුමාරිකාවෝ බත් මුළ ගෙන වේලා බලා පෙරුවරු බව දන 'දන් දී ඉතිරි බතක්[4] අනුභව කෙරමි'යි සිතා 'සඞ්ඝයා වහන්සේ සිහා වඩනා කලැ'යි තුන් විටෙක කාලඝොෂා කළාහුය; එකල තුන්වන විට හඬ ගෑ ශබ්දය අසා සිතුල්පව් වෙහෙර වසන රහත්කෙනකුන්වහන්සේ ආකාශයෙන් අවුත් කුමාරිකාවන් ඉදිරියෙහි වැඩසිටිසේක; කුමාරිකාවෝ තෙරුන්වහන්සේ දක සතුටු ව පසහ පිහිටුවා වැඳ පාත්‍රය ගෙන බත් පුරා තෙරුන්වහන්සේට පිළිගන්වා 'ස්වාමිනි, මඳක් වැඩ සිටිය මැනවැ'යි කියා යුහු ව ගස් අතුරකට වැද කොළ අතු කඩා ඇඳ වැලකින් බැඳගෙන තමන් ඇඳි වස්ත්‍රය සෝධා සුඹුළුවක් කොට අකුළා තෙරුන් වහන්සේට දුන්හ; තෙරුන් වහන්සේ කඩවැටියැ පාත්‍රය තබාගෙන 'මේ කුමාරිකාවෝ මා යන ගමන් මේතැන ම සිට දකිත්ව'යි අධිෂ්ඨාන කොට කුමාරිකාවන් බල බලා සිටියදී ම ඍද්ධිවෙගයෙන්[5] අහසට පැන නැඟී සිතුල්පව් වෙහෙරට[6]ම වැඩිසේක; කුමාරිකාවෝ වඩනා තෙරුන් වහන්සේ දක පහන් සිත් ඇති ව දන් දී ඉතිරි ආහාරය අනුභවකොට තමන් දුන් දන් සිත සිතා ගස් අතුරක පිළිසන් ව උන්හ. එකල්හි රජ්ජුරුවන්ගේ ජේතන වසන දෙවතාදු කුමාරිකාවන් දුන් දනට සතුටු ව කුඩපුඩුවෙන් පිටත් ව අධිශරීරයක් දක්වා සිට සාධුකාර දුන්නීය;[7]

සාධු සාධු කුමාරිකෙ - සද්ධා'සි ධම්මජීවිනි,
සාධු දනං අදසි ත්වං[8] සාධු පුජ්ජා[9] සද භව.

---

1. නොකීකරුවෝ - BHL, බෙ.ස.
2. හොති - BH, මුද්‍රිත හැම, ප
3. පින්වත්නි - C, ක.කි.සූ.ම.
   පින්වත් - J
   පින්වතිය - බෙ.
4. බත් - BG, ක.කි.සූ.ම.
5. ඍද්ධියෙන් - G
6. විහාරයට - BCDGKL
7. දෙන්නී - BEGHKL
   දුන්නී - D
8. අදසීසි - H
9. පූජා - JKL ක.කි.සූ.ම.

Non-Commercial Distribution

යනාදීන් 'ධාර්මික වූ ජීවිකා ඇති ශ්‍රද්ධාවන්ත කුමාරිකාවෙනි, තොප දුන්නේ යහපත් දනයෙක; සාධු සාධු; මමත් පින් අනුමෝදන් වීමි;[1] වඩ වඩා තොපි දන් දී ප්‍රසිද්ධ වව'යි කිව. රජ්ජුරුවෝ සාධුනාදය අසා 'කවුරුන්ට සාධුකාර දෙව්ද'යි විචාළහ; එවේලෙහි දෙවතාදූ 'මහරජ, මාගම සංඝ නම් අමාත්‍යයාගේ කිඤ්චිසංඝා නම් දුවක් නුහහල්කඩදී දනක් දුන; උන්ට මම සාධුකාර දුනිමි' කිව; රජ්ජුරුවෝ එපවත් අසා අමාත්‍යයන් කැඳවා එම්බා සගයෙනි, තොපමා ව නුහහල්කඩුවට ගොස් කිඤ්චිසංඝා නම් කුමාරිකාව ගැලක ඉන්ට සලස්වා වස්ත්‍රාභරණයෙන් සරහා කැඳවාගෙන එව'යි කීහ; අමාත්‍යවරු ගොස් ගස් අතුරෙහි උන් කුමාරිකාවන් දක 'එම්බා මැණියෙනි, අපගේ රජ්ජුරුවන් වහන්සේ නුඹ කැඳවාගෙන යන්ට අප හැම එවූසේක; පලා එව; යම්හ'යි කැඳවූහ; අපගේ මව්පිය දෙදෙනා නොඑන්නේ දන් මතු නොවෙයි;[2] දන් සත් දවසෙක, දන් මා ඇර යන්නේ හෝ මියන්නේ හෝ දෙකින් එකක් වන්ට කාරණයැ'යි සිතා අමාත්‍යවරුන් කී වචනය යහපතැ යි ගිවිස්සාහ.

ඉක්බිති ඒ අමාත්‍යවරුන්ගේ කියමනින්[3] දියට බැස ඉස්සෝධා නහා ඇඳගෙන උන් කොළ අතු දියෙහි හැර අඳිනට පිළි දෙව යි අත දික්කළාය; අමාත්‍යවරු රජ්ජුරුවන් යවූ වස්ත්‍රයක් ඇරගෙන අතට දුන්හ; කුමාරිකාවෝ ඒ වස්ත්‍රය දක 'පින්වත්නි, මේ වස්ත්‍රය ඉතා දළය; යහපත් නොවෙයි; අනිකක් ගෙනෙව' යි කීහ. එතැන සිටියවුන්ගෙන් එකෙක් එබස් අසා 'කොළ අතු කඩා හැඳගෙන උන්නාවූ නුඹට මේ වස්ත්‍රය නපුරු ද' යි කියා 'මිනිස්ලොව මීට වඩා සිහින්[4] පිළි නැතැ'යි කීය. එකෙණෙහි කුමාරිකාවන්ගේ කුශලානුභාවයෙන් ශක්‍රදෙවේන්‍ද්‍රයෝ දිව්‍යසළු පසක්[5] අඩු නොවන සේ ඉටා[6] එවූහ; කුමාරිකාවෝ එයින් එකක් ඇඳගෙන රථයට නැඟී මියුගුණුවෙහෙරට ගොස් ඒ විහාරයේ බොහෝදෙනා වහන්සේට සිවුරුපිළි දී තමාගේ පිරිවර මනුෂ්‍යයන්ට ද දිව්‍යවස්ත්‍ර [දුන්හ][7] ඉක්බිති කුමාරිකාවෝ ක්‍රමයෙන් අනුරාධපුරයට ගොස් රජ්ජුරුවන් දුටුවූය; රජ්ජුරුවෝ කුමාරිකාවන් දක සතුටු ව ඒ කුමාරිකාවන්ට බොහෝ සම්පත් දුන්හ. කුමාරිකාවෝ ඒ ඒ විහාරවල භික්ෂු භික්ෂුණීන්ට ද රජ්ජුරුවන් ආදි කොට ඇති සියලු රජපිරිසට ද නුවරවාසීන්ට ද[8] දිව්‍යවස්ත්‍ර දුන්හ; රජ්ජුරුවෝ ඒකුමාරිකාවන් තමන්ගේ පුතණුකෙනකුන්ට පාවාදී කුමාරිකාවන්ට රුහුණු ජනපදය බත්ගම් කොට දුන්හ; කුමාරිකාවෝ එතැන් පටන් එහි වසන්නාහු දනාදි වූ බොහෝ කුසල් කොට ගෙන ආයු කෙළවර පර්ෂද් හා සමඟ දෙව්ලොව උපන්හ. මෙසේ සත්වයෝ දනය නිසා ම දෙව්ලොව දිව්‍ය සම්පත් ලැබෙති,[9] එම දනමය කුශලයෙන් මිනිස්ලොව චක්‍රවර්ති

1. අනුමෝ වීමි - BHJ
2. දන් මතු නොවෙයි (නැත) - BEGHKL, ස
3. කී වචනින් - G
   නියෝගයෙන් - HL
4. සිහින් මොළොක් - BG
5. පසක් ගෙන - බෙ.ස.
6. අධිෂ්ඨාන කොට ඇට - ක.සි.කැ.ම.
   සිතා - K
7. දුන්හ (නැත) - පිටපත් හැම, ක.සි.කැ.බෙ.
8. නුවරවැස්සන්ට ද - KL, ස.
9. ලබති - BG

Non-Commercial Distribution

සම්පත් ආදි වූ ශ්‍රී සම්පත් විඳිති; එම දනමය කුශල හෙතුවෙන් තිවන් සම්පත් ලැබෙති; එසේ හෙයින් දන් පින් කිරීමෙහි සතතයෙන් උත්සාහ කළ මැනවි. කියනලද මැයි;

දනෙන සත්තා තිදිවං වජන්ති
දනෙන වින්දන්ති සිරිං නරෙසු,
ලභන්ති දනෙන සිවං පුරම්පි
යතෙය්‍යා[1] තස්මා සතතම්පි දනෙ යි.

මේ මෙහි පස් වන
තිස්ද්විසංඝා වස්තුව ය.

මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි
අභයතෙථර[2] වර්ග නම් වූ

එකුන්විසි වන පරිච්ඡෙදය නිමි.

තව ද මේ සද්ධර්මාලංකාරයෙහි විසිවන සංඝදත්ත වර්ගය නම් කවර යත්. එහි පළමුවන සංඝදත්ත වස්තුව මෙසේ දත යුතු. කෙසේ ද යත්;

මෙම ලංකාද්වීපයෙහි අනුරාධපුර නුවර රාජකාර්‍ය්‍ය කොට ජීවත් වන්නාවූ එක්තරා පුරුෂයෙක් දවසෙක රාජකාර්‍ය්‍යයක් නිසා මුහලයින්[3] රට කෙවුළු ගමකට ගියේය. එගම මනුෂ්‍යයෝ 'රජ්ජුරුවන් වහන්සේගේ[4] කාර්‍ය්‍යය[5] නිසා ආවාවූ සේවාණෝ යැ' යි බොහෝ රා ගෙනවුත් තුමූත් බී රාජපුරුෂයාත් පෙවූහ; එකල ඒ රාජපුරුෂයා මත් ව එදවස් රාත්‍රිය මුළුල්ලෙහි කෙළිමින් සෙමින් දවස් යවා දෙවන දවස් රා මතය[6] සිඳුණු[7] කල්හි සයින් විඩාව මනුෂ්‍යයන් අතින් 'බත් ඇද්ද' යි විචාළේය; එකල මනුෂ්‍යයෝ 'රජ්ජුරුවන් වහන්සේගෙන් ආ දූතයා වේ ද' යි සිතා රත් ඇල්සාලේ බතක් ලා[8] ගිතෙල් හා සමඟ කුකුළුමාංසයත් එළවූහ; එකල්හි බැල්ලක් බත් පුවඳ අසා දිවගෙන අව[9]; රාජපුරුෂයා බැල්ල දැක කිපී ගසන්නට නිසි කිසිවකුත් නැති හෙයින් තමා අනුභවකරන්ට පළමු කොට අනා ගත් බත්පිඩ

1. දදෙය්‍යා - ම.පාලි
තෙය්‍යාථ - ක.කි.ඥ
2. අභයස්ථවිර - මුද්‍රිත හැම
3. මුහලන්හිස් - H
4. වහන්සේගෙන් - J
5. රාජකාරී - BDEGK
රාජකාර්‍ය්‍යය - L ස.
6. රාමත - KL
7. සංසිඳුණු - BG
සංහිඳුණු - C
8. බතක් ලා - EH
බතත් - ම.
බතක් - BCDGJ, ක.කි.ඥ.බෙ.
9. අවුත් සිටියාය - BG

Non-Commercial Distribution

ගෙන පිටිතොල දත්කමින් රතැස් බමවා සැහැසෙමින් තමා ඇඟ ඇති බලයෙන් තද කොට ගැසීය; එකල ඔහු කොපයෙන් ගැසුවත් බැලි බත්පිඩ අනුභව කළාය; සේවකයා අනික් බත් පිඩක් වටා අනුභව කොට රස දන 'මෙබඳු රසවත් මාංසයක් හා ගිතෙල් මුසු ආහාරයක් බැල්ලට දිනිමි; මා කළ සේ යහපතැ'යි මෙසේ අන්තිම චේතනාව පහදවාගත.

එකල ඒ සේවකයා මෙපමණ කුසල් කොටගෙන පෙරලා නුවරට එනුයේ එරවස[2] නම් කඩට පැමිණියේය; එතැන්හි සිටි සොරු ඔහු මැරූය;[3] එකල ඒ දූතයා කාලක්‍රියා කොට මහලැණිය[4] වෙහෙර සමීපයෙහි එක් ගමෙක උපන; ඕහට දෙමවුපියෝ සංඝදත්තය යි නම් තුබූහ. ඒ සංඝදත්ත නම් කුමාරයා ක්‍රමයෙන් වැඩී මහලැණිය වෙහෙර භික්ෂූන් සමීපයෙහි පැවිදි ව වත් පිළිවෙත් සරු ව උපසම්පද ව තෙවළා බුදුවදන් පුහුණුකෙළේය. එයින් මැතභාගයෙහි මේ ලක්දිව බැමිණිටියා සාය පැමිණියේය.[5] මනුෂ්‍යයෝ ජීවත් විය නොහී ගිරිදුර්ග වනදුර්ගාදි වූ ඒ ඒ තැනට වැද ජීවත් වම්හ යි තම තමන් වසන තැනින් නික්ම යන්නාහු ඒ තෙරුන්වහන්සේ ළහට ඇවිත් 'ස්වාමිනි, මෙතැන හිඳ ජීවත් විය නොහැක්ක; අන් තැනකට යම්හ; ඉදින් අභිප්‍රාය ඇත්නම් අප හා සමඟ වැඩිය මැනවැ'යි කීහ; එබස් අසා තෙරුන්වහන්සේ 'උපාසකවරිනි, මේ බොධින්වහන්සේ හා දගබ්වහන්සේ හැර අන් තැනකට යා නොහෙමි; වත් පිළිවෙත් කොට ගෙන මෙතැන ම මිය යාම යහපතැ'යි කියා ගමන් නොගිවිසියේක; මනුෂ්‍යයෝ ඒ ඒ අත ගියහ. එකල තෙරුන්වහන්සේ දෙවන දවස් දගබ් මළු ආදි වූ හැම තන්හි වත් පිළිවෙත් කොට මුසුන් ආදිය සේ ම කොට තබා කයින් සිවුරු හා අතින් පාත්‍රය ගෙන සිහා වඩනට නිසි තැනක් නැති හෙයින් ලෙන දෙර ඉදිරියෙහි වැඩසිටියේක. එකල ලෙනදෙර සමීපයෙහි ගසෙක අධිගෘහිත වූ දිව්‍යපුත්‍රයෙක් මිනිස්වෙසක් මවාගෙන තෙරුන්වහන්සේ ළහට අවුත් පසඟ පිහිටුවා වැඳ 'ස්වාමිනි, නුඹවහන්සේට ආහාරදනය හා ආරක්ෂාව මෙතැන් පටන් මට භාරය; මෙතැන ම සැප සේ වැස අප්‍රමාද ව නුඹවහන්සේගේ මහණධම් පුරාගත මැනවැ'යි ආරාධනා කෙළේය; තෙරුන්වහන්සේ ද මුයෙන් නොබැණීමෙන් ඉවසා වදළසේක. දිව්‍යපුත්‍රයා තෙරුන්වහන්සේ ඉවසූ බව දන එතැන් පටන් දිව්‍යමය අන්නපානාදියෙන් දෙළොස් අවුරුද්දක් මුළුල්ලෙහි ඉදුරා ම

---

1. කිසි වස්තුවක්ත් - DEGHL
2. එරවසැ - CEHJ
   එරවසා - D
3. මැරූහ - BEGHKL ස
4. මහල - BDJK
   මලහා - CHL
   මංගල - G
   මලගල - ක.සි.ඤ,ම
   මහාලෙණ - පාලි
5. පැමිණ - C මුද්‍රිත හැම, ස.

Non-Commercial Distribution

පසඟ පිහිටුවා වැඳ[1] උපස්ථාන කෙළේය. මහතෙරුන්වහන්සේ දවසෙක විත්තෙකාග්‍රතාවෙන් යුක්ත ව වැඩහිඳ සිතනසේක් ‘ලංකාද්වීපවාසී සියල්ලෝ ම සාගතයෙන් පීඩිත වූහ; භික්ෂූන්වහන්සේ ද ආහාරයෙන් මිරිකී ඒ ඒ තැන්[2] වැඩිසේක; මේ දිව්‍යපුත්‍රයා මට දිව්‍ය වූ අන්නපානාදියෙන් නිරන්තරයෙන් උපස්ථානය කෙරෙයි, පූර්ව ජන්මයෙහි මා විසින් බුදු පසේබුදු මහරහතන් ආදි වූ එක්තරා කෙනකුන් වහන්සේට දුන්නාවූ දානයෙක විපාකයෙක් දෝ හෝ මේ කෙසේ වූ කුශලමහිමයෙක්[3] දෝ හෝ යි කල්පනා කෙරෙමින් වැඩ උන්සේක. එකල දිව්‍යපුත්‍රයා තෙරුන්වහන්සේ කරා එළඹ පසඟ පිහිටුවා වැඳ එකත්පස් ව සිටියේය; එකල්හි මහතෙරුන්වහන්සේ දිව්‍යපුත්‍රයා බණවා තමන්වහන්සේ සිතූ කාරණ[4] විචාරනසේක් ‘එම්බා දිව්‍යපුත්‍රයාණෙනි, මා සිතට උපන් සැකයක් තොප අතින් විචාරමි; දේවතාවෝ නම් තමන් දිව ඇස්[5] ඇති හෙයින් සියල්ල ම දනිති[6]. ඉදින් මා විචාරන්නාවූ සැකය තොපට දනේ නම් ඉදුරා කියව. මේ ලංකාද්වීපවාසීන්ගෙන් බොහෝදෙන දුර්භික්ෂභයින් පීඩිත ව කෙසේ රැකෙමෝ දෝ හෝ’යි ශරණාන්වෙෂී ව ඒ ඒ අත පලා ගියහ; මා එක නම විචරක් රඳවාගෙන තෙපි අන්නපානාදියෙන් අඩුවක් නැති ව මෙසේ උපස්ථාන කරව. ඒ මා පූර්වජන්මයෙහි කළා වූ කවර කුශලයෙකින් රක්ෂා කළාවූ කවර ශීලයෙකින් කවර ව්‍රතසමාදානයෙකින් මට මේ අන්නපානාදිය කෙසේ උපදනා දෙයෙක් ද? ඒ මට ඉදුරා කියා ලව යි[7] කීසේක. එසේ හෙයින් කියනලදී;

පුච්ඡාමි තං දෙවපුත්තං විතක්කො උදපාදි මෙ,
පස්සන්ති සකලං දෙවා - යදි ජානාසි සංස මෙ.

උපද්දුතා ඡාතකෙන - ලද්ධකායං ජනතා බහු;
එසන්තා සරණං ගන්තුං - සක්කා තෙ[8] යපෙථ ජීවිතුං.

අහං එකො[9] තවයා දෙව - රක්ඛිතො පරිපාලිතො,
අනුභොමි යථා කාමං[10] සබ්බදා දිබ්බභොජනං.

කෙන මෙ පුඤ්ඤකම්මෙන සීලෙන ව වතෙන ව,
උප්පජ්ජන්ති මමෙතානි - තං මෙ අක්ඛාහි පුච්ඡිතො - යි.

---

1. දෙළොස් අවුරුද්දක් මුළුල්ලෙහි පසඟ පිහිටුවා වැඳ (නැත) - BGH
2. අත - BDEGHKL, ස
3. විපාකයක් - G
4. කාරණය - BG
5. දිවස් - BDEGHJKL ස.
6. දකිති - BG
7. කියා බලවයි - CDEHJK
   කියා ලවයි - B. ම.
   බලා කියවයි - ක.කි.කැ.බෙ.ස.
8. සක්කොන්තො - BCE,
9. අහමෙකො - KL
10. යථාකාරං - BCEGKL

Non-Commercial Distribution

එබස් අසා මහතෙරුන්වහන්සේ[1] කළ කුශලය ගෙනහැර දක්වන්නාවූ දිව්‍යපුත්‍රයා 'ස්වාමීනි, යම් කිසිවෙක් ලොවුතුරා බුදුන්ට බත් සැන්දක් පමණ දුන්නේ වී නම් එහි විපාක ලොවුතුරා බුදුකෙනකුන් විසිනුත් කියා නිමවිය නොහැක්ක; එසේ ම පසේ බුදුකෙනකුන්වහන්සේට දුන්නාවූ දනයෙහි විපාක ද බුදුසව් කෙනකුන්වහන්සේට දුන් දනයෙහි විපාක ද මෙතෙකැ යි කියා නිමවිය නොහැක්කේ මය. යම් කෙනෙක් ධර්මරත්නයට හෝ සර්වඥපුත්‍ර වූ සංඝරත්නයට හෝ ආදරයෙන් උපස්ථාන කළාහු වී නම් එහි විපාක ලොවුතුරා බුදුන් වදරතොත් මිස ශක්‍රබ්‍රහ්මාදි වූ මහානුභාවසම්පන්න දෙවතාවන් විසිනුත්[2] මෙපමණයැ යි කියා නිමවිය නොහැක්කේ මය. ස්වාමීනි, සත්ත්වයන්ගේ උපන් ජාති බොහෝ සෙයිනුත් අප තමා ශක්‍රබ්‍රහ්මාදින් සේ නොවී අල්පේශාක්‍ය මනුෂ්‍යදීන් හෙයිනුත් පළමු ජාතිවල කළ කුසල් අකුසල් කවර බවත් නොදැනෙයි; නුඹවහන්සේ මීට පළමුවන ජාතියෙහි කළාවූ ස්වල්පමාත්‍ර වූ කුශලයක විපාකයෙන් මා දුටු විවරත් කියම්; ඉඳුරා ඇසුව මැනව; නුඹවහන්සේ මීට දෙවන ජාතියෙහි රාජසේවක ව කිසි කටයුත්තක් නිසා රජ්ජුරුවන්ගේ මෙහෙවරක ගොස් දවසෙක සයින් විඩාවූව එක් ගෙයෙක බත් අනුභවයට උන් කල්හි එහි වසන මනුෂ්‍යයෝ ගිතෙල් මුසු මාංසයෙන් යුත් ආහාරයක් එළවූහ; එකල්හි ආහාරගන්ධය ආඝ්‍රාණය කොට සයින් විඩා වූ බැල්ලක් දිව අවුත් සිටියා දක ක්‍රොධයෙන් රත් වූ භයානක ඇසින් බැල්ල දසාව බලා පිටිතොල දත් කමින් පළමුවෙන් කන්ට වටා ගත් බත් පිඩින් ගැසුයේය. බැලි බත් ආලොපය සතුටු සතුටු ව අනුභව කළාය; එවිට නුඹවහන්සේ අනික් බත් පිඩක් අනුභව කොට රස බලා 'මෙවෙනි රසයෙන් යුක්ත ආහාරයෙක මා බැල්ලට දුන්නේ'යි සාධුකාර දෙමින් අනිච් චේතනාව පහදවා ගත්සේක. මීට පළමුවන ජාතියෙහි නුඹවහන්සේ කළාවූ කුශලය[3] නම් මෙපමණෙක් මය. ඒ කුශලයෙන් මේ ජාතියෙහි මාගෙන් මේ සියලු උපස්ථාන ලබනසේක; එසේ හෙයින් සිතින් නොසතුටු ව වී නමුත් හැම දවස්හි ම දන්දිය යුත්තේ මය; එසේ දුන්නාවූ දනය ද මෙසේය යි උපමා නොකළ හැකි විපාක දෙන්නේ මය' යි කීහ. එසේ හෙයින් කියනලදී;

තව භුඤ්ජිතුමා'නීතං - පුබ්බෙ සාදු රසොදනං,
තිසිනෙනා භොජනත්ථාය - දිස්වා සොනිං සමාගතං.

තස්සා ත්වං කුපිතො රුට්ඨො - දට්ඨොට්ඨො භීමලොචනො,
පඨමෙන භත්තපිණ්ඩෙන - පහරී තං පලාපිතුං.

සා කුට්ඨා පිණ්ඩමාසජ්ජ - පරිභුඤ්ජි පීසවජ්ජිතා,
අථ ත්වං දුතියෙ පිණ්ඩෙ - රසඤ්ඤාතො විචින්තයි.[4]

1. වහන්සේට - H
2. විසිනුදු - ක.සි.ස.ම.
3. කුසල් - J ම.ස.
4. රසඤ්ඤතොහි චින්තයි - BGH,
   රසඤ්ඤාතොපි චින්තයි - C

Non-Commercial Distribution

දින්නං මෙ සුරසෙ තන්ති[1] - සාධු සාධූ'ති භාසිය
පසාදෙසි සකං චිත්තං - එත්තකං තෙ පුරා කතං.

තතො චුතං තෙන පුඤ්ඤෙන - වච්චවා තාය ජාතියා,
ඉධ ජාතො'සි තං[2] සබ්බං - ලාභෙසි යතිනන්දන.

දත්තබ්බං සබ්බද දානං - රුධෙඨ්නා'පි ජනෙතිධ,
ඵලං තාදිසකං දෙති - දයකානං අනුපමං-යි.

එබස් අසා මහතෙරුන්වහන්සේ කොපයෙන් බැල්ල පහරන්[3] පිණිස ගැසූ බත්පිඩෙහි විපාක මෙසේ වන කල සැදැහැයෙන් සිල්වතුන්වහන්සේට දුන්නාවූ දනයෙහි විපාක කෙසේ වේ ද'යි විස්මයපත් ව අතිශයින් සතුටු වූ සිත් ඇති ව උපන්නාවූ එම සන්තොෂය නොපිරිහෙළා සිත එකඟ කොට ගෙන විදර්ශනා වඩා රහත්බවට පැමිණියේක. මෙසේ සත්වයෝ දනය නිසා ම දිව්‍ය ලොකයෙහි උපදිති; දනය නිසා ම නිවන්පුරයට පැමිණෙති; එසේ හෙයින් දනය නම් සියලු භවභොගසම්පත් හා නිවන්සම්පත් ලැබීමට එකාන්ත පිහිටය යි දන සත්පුරුෂයන් විසින් දන් දීමෙහි ම සිත් අලවා වාසය කටයුත්තේ මැයි. එසේ හෙයින් කියනලදී;

දනෙන සත්තා තිදිවං පයන්ති[4]
දනෙන නිබ්බාණපුරං පයන්ති,[4]
දනං හි සබ්බත්ථ පරායනන්ති
දනෙ'ව චිත්තං රමයන්තු සන්තො[5] - යි.

මේ මෙහි පළමු වන
සංසදන්න වස්තුව ය.

තව ද මෙහි දෙවන රට්ඨිකපුත්ත වස්තුව නම් කවරයත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මෙම ලක්දිව දකුණු දිග්භාගයෙහි ගම්වල්[6] එක්තරා ගමෙක ජනපද නායකයෙක් වෙසෙයි. ඒ ජනපද නායකයා දවසෙක බත් අනුභවයට ඉඳ අහර සිහා වඩනා භික්ෂුකෙනකුන් වහන්සේ දක පහන් සිත් ඇති ව පාත්‍රය ගෙන තමහට සැපයූ ආහාරය පාත්‍රයෙහි බහා පිළිගැන්විය. එදවස් ඒ ජනපද නායකයා නිරාහාරයෙන් ම[7] දන් දී සිත් පහදවාගෙන මැතභාගයෙහි එයින් මිය මෙම ලඩකාද්විපයෙහි කෙහෙල්ගමු[8] නම් ගම බොහෝ සම්පත් ඇති ඉසුරුමත් වූ උපාසකයකුට පුත් ව උපන; මවුපියෝ ඕහට විලසකුමාරය යි නම් තුබූහ. ඒ

1. සාධු රසං මයා දින්නං - ක.කි.සැ.ම. පාලි
2. ඉදං - BCEGHKL
3. පහ කරන - ක.කි.සැ.ම
4. පයාති - BCDEGHJKL
5. සන්තො - CE, ක.කි.සැ.ම.
6. ගල්වල - ස
7. නිරාහාර ව ම - GK
8. කෙහෙලේගමු - B

Non-Commercial Distribution

විලසකුමාරයා ක්‍රමයෙන් වැඩී සියලු සම්පත්තීන් සමෘධ ව ඒ[1] ජනපදයට නායක විය; ධන ධාන්‍යයෙන් හා දසිදස් ගව මහිෂාදින් උන් හා සමාන කෙනෙක් නැත; මේ සියලු ලඩකාද්විපයෙහි හිරසඳ සේ ප්‍රසිධ විය. හේ එසේ මැයි; දෙන අවසථාවෙහි සවල්පමාත්‍ර වූ දනයෙක් වී නමුත් විපාක දෙන අවසථාවෙහි මහත් වූ ඵල දෙන්නේය. යම්කිසි කෙනෙක් නොයෙක් පරිද්දෙන් අනර්ථ එළවන්නාවූ තෘෂ්ණාව දුරුකොට ශ්‍රධාව පෙරදරි කොට සංසරත්තය උදෙසා ඉදින් දනයක් දුන්නාහු වී නම් ඒ කුශලයෙහි විපාක මෙලෙසය යි උපමා කොට ඇති සැටියේ කිය නොහැක්ක. යම් සේ සවල්පමාත්‍ර වූ නුහබිජුවටින් නැගි පැළය ක්‍රමයෙන් ඇති ව මහත් බවට පැමිණ ශාඛා ප්‍රශාඛා ආදියෙන් අති විශාල වූ නිල් මහ මේකුලක් මෙන් ආකාශමණ්ඩලය වසා ගෙන යම් සේ සිටී ද එපරිද්දෙන් ම සවල්පමාත්‍ර වූ කුසල් නමැති බිජුවටක් බුධපුත්‍රයන්ගේ අතිපවිත්‍ර වූ සිත් සතන් නමැති ක්ෂෙත්‍රයෙහි යම් කිසි ශ්‍රධාවන්ත කෙනෙක් රෝපණය කළාහු වී නම් ඔහු දිව්‍යලොකයෙහි අනොපමෙය්‍ය වූ[2] දිව්‍ය සම්පත් හා මිනිස්ලොව මනුෂ්‍ය සම්පත් විඳ කෙළවර නිවන්පුර සිරි විඳිනාහු මය. එසේ හෙයින් කියන ලදි;

යො වේ'නත්ථාවහං තණ්හං - දූරෙ කත්වා තිරාසයො,
සධං'ව පුරතො කත්වා - දෙය්‍යං දෙති ජිනොරසෙ;
විපාකං හි ඵලං තසස - න සක්කා[3] උපමෙතවෙ.

ජායිත්වා අණුබීජම්හා - මහානිග්‍රොධපාදපො,
ඡාදෙත්වාන නභං යාති - මහා නීලම්බුදේ'පමො[4]

තථේ'ව අණුමත්තම්පි - බීජං කුසලයඤ්ඤිතං
රොපෙති බුධපුත්තසස සීලවන්තසස භූතලෙ.

දෙවෙසු දිබ්බසම්පත්තිං - තථා මානුසිකං සුඛං,
අනෙත නිබ්බාණසම්පත්තිං - ස[5] විඤ්දති අනුපමං-යි.

ඉන්බිති රජ්ජුරුවෝ ජනපදනායකයාණන්ගේ[6] බොහෝ සම්පත් ඇති බව අසා විමසනු කැමැති ව 'අපටත් හැල්[7] එවුව මැනවැ'යි පතක් ලියා යවූහ; එකල්හි ජනපද නායකයාණෝ ගැල් පන්සියයෙක රත්හැල් පුරා[8] පබළුවන්[9] පැහැ ඇති රත් ගොන් දහසක් යොද යවූහු ඒ දක සතුටු ව නැවතත් පරීක්ෂා කරනු කැමැති ව 'අපට මනමැ සුහක් එවාලව' යි යවූහ; එපවත් අසා පළමු පරිද්දෙන් ම ගැල් පන්සියයෙක මහමැ පුරා කළුසුදු තිප් ඇති කබරවන් පැහැයෙන් යුක්ත ගොන් දහසක් යොද යවූහ; ඊට ඉක්බිති ගැල් පන්සියයෙක කළුමැ පුරා කළුපැහැ ඇති ගොන් දහසක් යොද ගමන් කැරවූහ. ඊට ඉක්බිති ව එසේ ම ගැල් පන්සියයෙක උඳු[10] පුරා නික මලෙයි පැහැ ඇති ගොන් දහසක් යොද ගමන් කැරවූහ. එකල රජ්ජුරුවෝ

1. එම - EGHJKL;
2. අනුපමෙය වූ - බෙ.ස.
3. සක්කං - CG
4. ලීලම්බුදෙපමො - DGHKL
5. ස - BCDEGHJKL
6. ජනපදනායකයාණන් - CJ බෙ.
ජනපදනායකයාණන්ට - හ.කි.හැ.ම
7. ගැල් - CDE
8. පුරා එහි - CGHKL
9. නිස්මලෙහි - B
10. උඳු මුං - ම.
මුගන - සහස්සවත්ථු

Non-Commercial Distribution

අතිශයින් විස්මයපත් ව 'මේ ගෙනා ගොන් හා ගැල් කොපමණ තැන්[1] සිටියෝ ද' යි අමාත්‍යයන් විචාළහ. එකල අමාත්‍යයෝ 'ස්වාමිනි තුන් යොදනක් පමණ තැන සිටියෝ යැයි' කීහ; මේ කුමන අද්භූතයෙක් ද යි විස්මයපත් වූ[2] රජ්ජුරුවෝ ඕහට ඒ ජනපදය බත්ගම් කොට දුන්හ. ඉක්බිති රජ්ජුරුවෝ මුං පිරූ ගැල් සිටි තැන මුංගමු විහාර නම් මහාවිහාරයක් කැරවූහ.

එතැන් පටන් ඒ ජනපද නායකයාණෝ භික්‍ෂුසඞ්ඝයා වහන්සේට දන් දෙමින් තෙසුත් බොහෝ කුසල් කොට පන්සිල් රැක පොහොය පෙහෙ වෙමින්[3] ජීවිතාන්තය දක්වා බොහෝ කුශලසම්භාරයන් රැස් කොටගෙන්[4] දෙව්ලොව උපන්හ. යම් කිසි කෙනෙක් අලසවාසය හැර ස්වල්ප වූ හෝ බොහෝ වූ හෝ කුසල් කෙරෙද් ද එසේ වූ ශ්‍රද්ධාවන්තයෝ මතු අනාගතයෙහි ජාතියක් ජාතියක් පාසා තමන් විසින් කරනලද කුසල් වූ පරිද්දෙන් සියලු සම්පත් විඳිනාහු මය. කියනලද මැයි;

> කරොති හිත්වා'ලසියං ජනො යො
> පුඤ්ඤානි අප්පමපි තථා බහුම්පි,
> සො ජාති ජාතීසු අනාගතෙසු
> තථා තථා[5] වින්දති සබ්බසම්පදං - යි.

මේ මෙහි දෙ වන
රට්ඨිකපුත්ත වස්තුව ය.

තව ද මෙහි තුන්වන නෙසාද වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මෙම ලක්දිව රුහුණු ජනපදයෙහි මාගම වියදි නම් වැද්දෙක් වෙසෙයි; මුවන්[6] ඌරන් මොනරුන් ගිරවුන් වටුවන් ආදි වූ සේව සතුන්[7] හා දීනබල්ලෝ[8] ද කරක් කෙමන් බිලී ආදිය ද දුනු මල දල් ආදි වූ සියලු ම වැදි උපකරණ ද යන සියල්ල ම ඔහුගේ ගෙයි සපයා තිබෙයි; දවස් පතා පන්සියයක් මල පටවනු ලැබෙයි. පන්සියයක් උගුලු ලයි; උල් සිටුවීම් බොරුවල සැදීම් මසුන්ට විෂ ලීම් ආදි වූ නොයෙක් ප්‍රාණවධප්‍රයොග කෙරෙයි; යටත් පිරිසෙයින් නැත්නාට දවස් පතා පන්සියයක් පමණ ප්‍රාණීන් මරයි. මෙසේ එවැදි සතුන් කෙරෙහි කිසි දයාවක් නැති ව නිරන්තරයෙන් ලෙහෙයෙන් රැඳුණාවූ අතුල්තල[9] ඇති ව අඟුරේ ලා පැලහු මස් කමින් කකියවා පිසනලද ලේ බොමින් මාංස විකොට පුත්‍රදරාවන් පොෂ්‍යය[10] කෙරෙමින් වාසය කෙරෙයි. දවසෙක මෙසේ පාපක්‍රියාවෙහි නියුක්ත ව වසන්නාවූ

1. නැන්හි - ක.කි.ඝ.
   තන්හි - ම.
2. විස්මයෙක් ද යි - B
3. පෙහෙවස් රකිමින් - K
4. කරමින් සිට - H
5. තථාපි - BGH
6. ඔහුගේ ගෙයි මුවන් - KL ස.
7. සේවතුන් - KL
8. කීන බල්ලෝ - BCEGHJKL
9. අතුල්පතුල් - J, ස.
   අත්පතුල් - ක.කි.ඝ,ම.
10. පොෂණය - ක.කිඝ,ම.

Non-Commercial Distribution

ඒ වැදිපුත්‍රයා ඒ ඒ තැන ඇවිද මාංස[1] නොලැබ මාංසයක් නැති ව බත් නොකමී තණමිටක් අල්වාගෙන වස්සන් සිටි[2] තැනට ගොස් තණ පෑ ඒ තණ කන පිණිස දිව දික් කළ වස්සා අල්වාගෙන දිව කපා පිසගෙන බත් කෑය; එදවස් රාත්‍රියෙහි ඔහුගේ සකල ශරීරයෙහි දහ උපන; ඉස යකුළු යමුගුරු ආදියෙන් පහරන කලක් මෙන් විය. තියුණු තෙප් ල ලා ඒ ඒ තැන පහරනා සේ විය; සියගණින් උල් ල ලා අන්නා සේ වීය; මෙසේ රාත්‍රිය මුළුල්ලේ දුක් විඳ නින්දක් නොලැබ නරකගින්නෙහි හුණු එකකු මෙන් ආශ්වාසයක් නොලැබ ඒ රාත්‍රිය පහන් වූ කල මාගම තිස්සමහවෙහෙරට ගොස් භික්ෂූන්වහන්සේ දක පසහ පිහිටුවා වැඳ එකත්පස් ව සිටියේය; භික්ෂූන්වහන්සේ ද මේ ප්‍රාණවධ[3] කරන තැනැත්තේය යි දන දෙවදූත සූත්‍රයෙන් බණ වදළසේක; පසුව විමන්වතින් ස්වර්ගකථාව වදළසේක; එතැන් පටන් වැද්ද ප්‍රාණවධ කිරීම් හැර දවස් යවයි. ඉක්බිති එක් දවසෙක එම වැද්ද මුහුද දියකෙළනාවූ මහජනයා හා සමඟ ගොළුමුහුදට ගොස් දිය කෙළිනේය; එතැන්හි එක් දිව්‍යනාගරාජයෙක් ඔහු දක දරණවැලයෙන් වෙළාගතැ; එවිට වැදි තෙමේ නාගරජයා තමා දරණවැලයෙන් වෙළා ගත් බව දැන පළමු තමා ඇසූ දෙවදූත සූත්‍රය සඳහන් කොට "මේ ධර්මය බුදුන් විසින් දෙසන ලද්දේය; බුද්ධපුත්‍ර වූ සඞ්ඝයා වහන්සේ විසින් ධරනලද;[4] එසේ වූ ධර්මය මා විසින් අසනලද; ඒ ධර්මයෙහි ආනුභාවයෙන් මට කවර අනතරායෙක් වේ ද; ඒ ධර්මානුභාවයෙන් කිසි අන්තරායෙක් නොවන්නේයැ"යි සිතීය; ඉක්බිති නාගරාජයා ධර්මානුභාවයෙන් ඔහු මරාගත නොහී[5] තමාගේ භවනයට ගෙන ගොස් "යහළු, තෝ[6] කුමක් පිණිස මරනට නොබවු ද; ඒ මට ඉඳුරා කියව" යි කීය. එකල වැදි නාරජහට ධර්මානුභාවය කියනුයේ;

> පුතං මෙතං මහානාග - ධම්මං ධම්මිස්සරීරිතං,
> සබ්බුපද්දව විද්ධංසි[7] - මධුරං රතිවඩ්ඪනං.
>
> තස්‍ය මේ'නුස්සරන්තස්ස - භයං නා'හොසි කිඤ්චනං,
> තථා හි ධම්මො නාගින්ද - වම්මොව[8] වජිරුබ්භවො.

යනාදින් "එම්බා නාරජ්ජුරුවෙනි, ධර්මේශ්වර වූ බුදුරජාණන් වහන්සේ විසින් සියලු සත්වයන්ට වැඩ පිණිස වදරනලද්දවූ සියලු රසජාතීන්ට වඩා මිහිරි වූ ඇලුම් උපදවන්නාවූ මාහැඟි ධර්මයක් ඇසීමි; ඒ ධර්මය සඳහන් කරන්නාවූ මට කිසි භයෙක් නුවූයේය; එම්බා නාරජ්ජුරුවෙනි, හේ එසේ මය; බුදුන්ගේ ධර්මය නම් ආත්මාරක්ෂාව පිණිස ශරීරයෙහි බහා ගත් විදුරු සන්නාහයක් හා සමානය; එසේ හෙයින් වේද මා[9] මරනට නොබන්නේයැ"යි[10] කීය; ඉක්බිති නාරජ්ජුරුවෝ;

---

1. මාංසයක් - B
2. සිටිනා - BEGKL
3. ප්‍රාණඝාත - BGHKL
4. වදරන ලද - BGHK
5. මරන්නට නොහැකි ව - ක.සි.ඤ.
6. තොපි - BDEGH; තෙපි - KL; තොප - ක.සි.ඤ.ම.
7. විද්ධංසිං - ක.සි.ඤ.ම. පාලි; විද්ධංසං - පිටපත් හැම, බෙ.ස.
8. වම්මොව - බෙ.ස.
9. මම - ක.සි.ඤ.ම.
10. නොබන්නේ වේ ද යි - B; නොබන්නේය යි - ක.සි.ඤ.; නොබන්නෙමි - ම.

Non-Commercial Distribution

අහම්පි සොතුමිච්ඡාමි - ධම්මං සුගතදෙසිතං,
සුතං තෙ අවිනාසෙත්වා - මය්හම්පි[1] වද තං සබ්බෙ.

යනාදීන් 'එසේ කල යහළුව, මමත් ඒ බුදුන් දෙසූ ධර්මය අසනු කැමැත්තෙමි; ඒ තොප ඇසූ පරිද්දෙන් මටත් කියව' යි කීහ. ඉක්බිති වැදි පුත්‍රතෙම නාරජහට අකුසල් කළවුන් නරකයෙහි විඳිනා දුක් තමා ඇසූ සැලැස්මෙන් හකුළුවා සංක්ෂෙපයෙන් දක්වනුයේ;

අධිමත්තානි පාපානි - අවිසඞ්කා කරොන්ති යෙ,
නිරයෙ තෙ මහාඝොරෙ - උප්පජ්ජන්ති අසංසයං.

සංජීවං කාළසුත්තං ච - සඞ්ඝාතං රොරුවං තථා,
මහාරොරුව තාපං ච - පතාපාවීචි නාමකා.

චතුක්කණ්ණා චතුද්වාරා - විභත්තා භාගසො මිතා,
අයොපාකාරපරියන්තා - අයසා පටිකුජ්ජිතා.

තෙසං අයොමයා භූමි - ජලිතා තෙජසා යුතා,
සමන්තා යොජනසතං - ඵුටා තිට්ඨන්ති සබ්බදා.

ඉච්චෙතෙ අට්ඨ නිරයා - අක්ඛාතා දුරතික්කමා,
ආකිණ්ණා ලුද්දකම්මෙහි - පච්චෙකා සොළසුස්සදා[2].

යනාදීන් එපිණ්ඩ වූ යම් කිසි කෙනෙක් මෙලොව පරලොව[3] නොබලා භයක් ලජ්ජාවක් සැකයක් නැති ව ප්‍රාණාතිපාතය අදත්තාදානය කාමමිථ්‍යාචාරය මුසාවාදය සුරාපානය යනාදි වූ අකුසල් කෙරෙද් ද එසේ වූ පාපි සත්වයෝ ඒකාන්තයෙන් ම අතිඝෝර භයානක වූ නරකයෙහි උපදනාහු මය. එසේ උපදනා අකුසල් කළවුන්ට සංජීවය කාලසූත්‍ර ය සඞ්ඝාතය රෞරවය මහාරෞරවය තාපය ප්‍රතාපය අවීචිය යි මහනරක අටෙක්[4] වෙයි. ඒ අටමහනරකය ම චතුරශ්‍රය. චතුර්ද්වාරය. සතර දෙසෙහි නවයොදුන් බොල භිත්තිය. යට නවයොදුන් බොලය. පොළොවය. උඩ නවයොදුන් බොලය පියන්පතකින් සේම වීය; එහි පූර්ව භිත්තීන් නික්මෙන අග්නිජාලාවෝ ඇතුළත ඇඹරෙමින් සළා දෙමින් සියක් යොදුන් තැන් දිවගෙන ගොස් පශ්චිමභිත්තියෙහි[5] පැහැර විනිවිද ගෙන[6] පිටත සියක් යොදුන් තන්හි පැතිර සිටිති; පිටත සියක් යොදනෙහි සිටියවුන්ගේ ඇස් පිපිරී යන[7] තරම් අතිභයානක තෙජස් ඇතියහ; පශ්චිම භිත්තියෙන් නික්මෙන්නාවූ අග්නිජලාවෝ ද එපරිද්දෙන් ම දිවගෙන ගොස් පූර්වභිත්තිය පැහැර විනිවිදගෙන පිටත් ව සියක් යොදනෙහි පැතිර සිටිති; සෙසු නොකී තුන් දිසාවෙහි ද එසේ මය; එබඳු ගිනිසළා

1. මහම්පි - CDEGHJKL
2. ක.කි.සැ.ම. පොත්වල මේ ගාථා ඇත්තේ එක වචනයෙනි.
3. මෙලෝ පරලෝ - CDEJL
4. අවීචි මහනරකය යි අටෙක් වෙයි. CJK ක.කි.සැ.ම
5. භිත්තියෙන් - BGH
6. විනිවිද - BEGHJKL ක.කි.සැ.ම.
7. පිපිර යන - DE
පිපිරෙන - BC

Non-Commercial Distribution

මධ්‍යයෙහි උපන්නාවූ අකුසල් කළ සත්වයන් අල්වාගෙන සල්ව සල්වා යමයන් කරන කම්කටුල් හා දුක් විඳිනාවූ ආකාර හැම කියන්නා තබා සිතන්ටත් භයානක වන්නේය. එබඳු තද ගිනිසළා මධ්‍යයෙහි දද පැසෙන සත්වයෝ කර්මය නොගෙවෙන තෙක් නොමියන්නාහු මය. ඒ අටමහනරකය ම ඇතුළතින් ද අයමින් ද විතරින් ද සියක් සියක් යොදුන. ඒ අටමහනරකයෙන් එකි එකී නරකයෙහි මහදෙර සතරෙක් සතරෙක් වෙයි; ඒ නියායෙන් අටමහ නරකයෙහි එක් ව මහදෙර දෙතිසෙක් වෙයි,[1] එකි එකී මහදෙරින් පිටත උස්සද නරක සතරෙක් සතරෙක් වෙයි; ඒ නියායෙන්[2] එකි එකී මහනිරය පිරිවරා උස්සද නරකයෝ සොළොසක් සොළොසක් බැගින් අටමහනරකයට උස්සද නරක එක්සිය අටවිස්සෙක් වෙයි; එහැම අටමහ නරකය[3] හා සමග එක්සිය සතිසෙක් වෙයි. එයින් අවීචි මහනිරය සතරදිසා[4] ජ්වලාන්තයෙන්[5] ඇතුළත තුන්සිය අටළොස් යොදුන් වෙයි; වටින් නවසිය සිවුපනස් යොදුන් වෙයි; උස්සද නරකය හා සමඟ දසදහසක්[6] යොදුන් වෙයි. මෙනී අවීචිමහනිරය[7] පිරිවරා සිටි උස්සද නරකයෝ සොළොස නම් අබ්බුදය නිරබ්බුදය අබබය අටටය අහහය කුමුදය සෞගන්ධිකය[8] උත්පලය පුණ්ඩරීකය පදුමය යන මේ දසය හා ගූථනරකය කුක්කුළනරකය කොළහිඹුල්වනය[9] අසිපත්‍රවනය ඛාරොදිකා නදිය ලොහොකුඹු නරකය යන මේ සය ඇතුළු වූ සොළොසය. පළමු සංජීව ආදි වූ මහනරක අට තබා මෙයින් එක් උස්සද නරකයෙක හුණු සත්වයන් විඳිනා දුක් මෙසේ මෙසේය යි නිමවා කියන් ලොවුතුරා බුදුන්ට මිස සෙසු සෘද්ධිවන්තයන්ටත් නොපිළිවන් මය. එසේ හෙයින් කියනලදී;

උස්සදන්ති හි තං[10] වුත්තං - අබ්බුදං ච නිරබ්බුදං
අබබං අටටං චෙව - අහහං කුමුදං තථා.

සොගන්ධිකං උප්පලං ච - පුණ්ඩරීකමථා පරං,[11]
පදුමං ගූථනිරයං - කුක්කුළං කොටිසිම්බලිං.

අසිපත්තවනං චෙව - තථා වෙතරණි නදි,
ලොහකුම්භීති චෙකස්ස[12] - සොළසුස්සානි[13] තං විදූ.

එතෙසු පන එකස්ස - උස්සදස්සාපි සබ්බසො,
දුක්ඛං නිට්ඨාපයෙ වත්වා - අබුධො කො ජගත්තයෙ - යි.

තව ද මෙයින් අවීචි මහනිරයෙහි දුකුත් බෙහෙව,[14] ආයුත් බොහෝ මය, අබ්බුදදී ඔඳුපත් දසයෙහි ආයු බොහෝ මය. ගූථනරකය කුක්කුළනරකය ශාල්මලිවනය[15] අසිපත්‍රවනය වෛතරණීනදිය අඞ්ගාර පර්වතය සඞ්ඝාත නරකය

1. දෙතිසෙක - KL
2. අටමහ නරකයෙහි..... ඒ නියායෙන් (නැත) - ස.
3. මහනරක අට - KL ස,
4. සතර දෙස - G
සතර දිග - L
5. ජ්වලාන්තරයෙහි - G
6. දසදහස් - B
7. අවීචිමහනරකය -C
8. සෞගන්ධිය - GH
9. කොළදිඹුල් වනය - BD
කොළහිඹුල්වනය - G
10. යං - GH
11. පුණ්ඩරීකං තථා පරං - GH
12. වෙතස්ස - BCJL
මෙතස්ස - DEGHK
වෙකස්ස - බෙ.
13. සොළස උස්සද විදූ - ම.
14. බොහෝ ව - BDEGHKL
බොහෝ ය - C
15. සල්මල් වනය - BDEGH

Non-Commercial Distribution

රෞරව නරකය කාලසූත්‍ර නරකය මහා රෞරවය සංජීවය ලොහොකුඹු නරකය යන මෙහි ඇසිය ඉවසිය නොහැකි අතිඝොර භයානක වූ අපමණ බොහෝ දුක් ඇත්තේ ය. එසේ හෙයින් කියනලදී;

උස්සදෙ[1] ගූථනිරයො - කුක්කුළං කොට්සිම්බලිං[2]
අසිපත්තවනං චෙව - තථා ඛාරොදකා නදී.

අඞ්ගාරපබ්බතො චාපි - සඞ්ඝාතං රොරුවම්පි ච,
කාළසුත්තී මහායන්තො - ලොහකුම්භාදිකාපි[3]ච.

අම්බාදුස්සහා භීමා - ඝොරා හදයදරුණා,
මහාදුක්ඛානුභොත්තබ්බා - නිරයෙ පාපකම්මිනා - යි.

මෙසේ අකුසල් කළ සත්‍වයන් ආදියෙහි විඳිනා අතිඝොර භයානක දුඃඛරාශියෙන් ඒකදෙසමාත්‍රයක් ගෙන හැර දක්වා නැවත තිරශ්චීන ජාතීන් හා ප්‍රෙතයන් විඳිනා දුඃඛසම්භාරය ගෙනහැර දක්වන්නාවූ වැදිපුත්‍ර තෙම;

තිරච්ඡානභවෙ දුක්ඛං - තථා පෙතභවෙ භවං,
දුක්ඛං දට්ඨුම්පි සොතුම්පි - පටිකූලං භයාවහං.

යනාදීන් තිරිසන් ජාතියෙහි උපදනාවුන්[4] බොහෝ සේ ඇත්කුණු මිනීකුණු ගෙරිකුණු අත්පස් ආදියෙහි ඉපද වියළි වියළී දුක් විඳ වියකෙන හෙයින් තිරිසනුන් විඳිනා දුක් ඇසින් දක්නටත් පිළිකුල; ප්‍රෙතනිකායෙහි උපන්නාවුන් බොහෝ සේ බිහිසුණු දරුණු දර පිඹුරු නා පොළොං ආදීන්ගේ ශරීර බඳු අමනොඥ ශරීර හා ඌරන්ගේ මුහුණු බඳු දෙදළ යුතු විරූප වූ මුඛ මුහුණු ඇති ව සොටු සෙම්[5] පමණ අහරක් නොලැබ ඇතුළ ගිනිගත් සිදුරු තුරු[6] සේ උදරාග්නියෙන් දද දුක් විඳිනා හෙයින් ඇසින් දක්නටත් භයානකය යි මෙසේ මෙපමණකින් තිරිසන්ජාතීන් හා ප්‍රෙතජාතීන් විඳිනා දුක් සංක්‍ෂෙපයෙන් දක්වා එසේ වූ නරක තියඃක් ප්‍රෙත අසුරනිකායය යි යන සතර අපායෙහි දුක් නොවිඳ සැප විඳිනා කැමැති දුඃඛභීරුක සත්පුරුෂයන් විසින් සියලු අකුශලයන් දුරුකොට කුසල් කටයුත්තේය' යනාදීන් නාරජහට ධර්මදෙශනා කෙළේය. එසේ හෙයින් කියනලදී;

අනිට්ඨඵලදං පාපං - හිත්වා තං දුක්ඛභීරුනා,
කුසලෙ ආදරො නිච්චං - කත්තබ්බො හිතසාධකෙ[7]-යි.

මෙසේ වැදිපුත්‍රයා විසින් කියන ලද්දවූ ධර්මකථාවෙහි පැහැද නාරජ්ජුරුවෝ ඕහට කැමැති කැමැති වස්තු සිඬකොට දෙන මාණික්‍යරත්නයක් දුන්හ; එතැන් පටන් වැදිපුත්‍රයා මාණික්‍ය රත්නානුභාවයෙන් දන් පින් කෙරෙමින් බොහෝ කලක් ගිහි ගෙයි වැස මාණික්‍යරත්නය පුත්‍රදරාවන්ට දී තිස්[8] මහ[9] වෙහෙරට ගොස් භික්‍ෂූන්

---

1. අවීචි - ම. පාලි
2. කොට් සම්බලිං - ක.කි.ක.ම.
3. ලොහකුම්භාදියං - GH
4. උපන්නාවුන් - BD, ම.
5. සෙම් සොටු - BCEGHK
6. රුකක් - BC
7. හිතසාධකො - BG
   හිතසාවකො - J
8. තිස්ස - ක.කි.ක.
9. මා - EJ

Non-Commercial Distribution

කරා එළඹ 'ස්වාමිනි, මා මහණ කළ මැනැවැ'යි කීය; භික්ෂූන් වහන්සේ ඔහුගේ හෙතු සම්පත් බලා මහණ කොට උපසම්පද කැරවූසේක; එකල උන්වහන්සේ වස්[1] පිරී නෙසාද තෙරුන්වහන්සේය යි ප්‍රසිඬ ව වසනසේක් මැතභාගයෙහි එම දෙවදූත සූත්‍රය අසා රහත් බවට පැමිණිසේක. එපවත් අසා දූක්[2] මහජනයෝ 'මෙසේ අකුශලක්‍රියාවෙහි නියුක්ත වැද්දේ පවා සත්පුරුෂ සමවායයෙන්[3] කුශලක්‍රියාවෙහි යෙදී මහණ ව රහත් බවට පැමිණියෝ වේ ද'යි කියා ප්‍රාණාතිපාතාදි වූ අකුශලකර්මයෙන් වැළක දනාදි වූ දශවිධ කුශලධර්මයන් පුරා බොහෝ දෙන දෙව්ලොව උපන්හ. එබැවින් යම් කිසි කෙනෙක් ලොභයෙන් මුළා ව පළමුවන වයස කුසල් කිරීමෙහි ප්‍රමාද ව පසුව උත්තමයන්ගේ අවවාදයන් ගිවිස කුසල් කළාහු වී නම් එබඳු කීකරු, ගුණසම්පන්නයෝ පක්‍ෂොපක්ලෙශයෙන් විනිර්මුක්ත වූ[4] පූර්ණචන්ද්‍රයා මෙන් බැබළෙති' යි බුදුන් විසින් ම වදරනලද හෙයින් ම පළමුවන වයස යම්කිසි කාරණයකින් කුසල් කිරීමෙහි මන්‍දොත්සාහ ව විසුවෝතිනුත් අප්‍රමාද ව[5] කුසල් කොට දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳ බුදුන් විසින් පසස්නාලද නිවන් පුරසිරි විඳින්ට උත්සාහ කළ මැනවි. කියනලද[6] මැයි;

පමාදමාපජ්ජ පුරෙ පනෙකෙ
මොහෙන පච්ඡා පනුදිත්‍ව මොහං,
චරන්ති ධම්මෙ සුගතප්පසත්ථෙ
තෙ වෙ ජනා හොන්ති ජිතප්පසත්ථා-යි.

මේ මෙහි තුන් වන
නෙසාද වස්තුව ය.

තව ද මෙහි සතරවන සිලුත්ත[7] වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

එක් සමයෙක්හි සකලදීපදීපායමාන වූ මෙම ශ්‍රී ලඞ්කාද්වීපයෙහි සියලු සම්පත්තීන් සමෘඬ ව සැරහුණාවූ රුහුණුරට තලගුරු තිස්ස නම් පර්වතයෙහි වසන ධම්මදින්න මහතෙරුන් වහන්සේ දෙවුරුභා නම් ගල්ලෙනක වසනසේක. එකල්හි ඒ ගල්ලෙන සමීපයෙහි මහත් තුඹසෙක් වීය; එසමයෙහි එක් ගරඬියෙක් ඒ ඒ තන්හි[8] ගොදුරු කා ඇවිත් ඒ තුඹසෙහි වෙසෙයි; මෙසේ කල්යාමක් ගිය කල්හි එක් දවසෙක ගොචරග්‍රහණය කොට ඇවිදින්නාවූ ඔහුගේ ඇස් දෙක ම නැසිණ; එකල්හි ඒ ගරඬියා ඇස් දෙක ම නැසුණු හෙයින් වෙදනා ඉවසිය නොහී තුඹසින් පිටත දරණ ලා ගෙන ගොදුරු නොලැබ සුස්ම සුස්මා වැදහොත්තේය. එකල්හි ධම්මදින්න මහතෙරුන්වහන්සේ එපරිද්දෙන් හොත්තාවූ[9] ගරඬියා දක ඔහු කෙරෙහි උපන්

1. වයස් - BCDEGJKL
2. දන - GH
3. සමවාසයෙන් - CGHK ක.සි.හ. සමාගමයෙන් - B
4. විනිර්මුක්ත ව - D
5. පසුව අප්‍රමාද ව - බෙ.ස.
6. කියනලදුයේ - BCDEGHKL
7. සිලුත්තර - J
8. තන්හි ඇවිද -C තන්හි බොහෝ - B
9. වැදහොත්තාවූ - GHK

Non-Commercial Distribution

මහත් වූ කරුණාවෙන් ඕහට ඇසෙන සේ සතිපට්ඨාන සූත්‍රයෙන් බන වදළසේක. එකල ඒ ගරඬියා සූත්‍රය වදරන ශබ්දය අසා සිත පහදවාගෙන එකඟ වූ සිතින් වැදහොත්තේය; එකෙණෙහි මහත් වූ ගොයෙක් දිව ගෙන ඇවිත් ඕහු මරා ගැලපීය; එකල ඒ ගරඬියා තමා සිත පහදවා බණ ඇසූ කුශලයෙන් එයින් මිය අනුරාධපුරයෙහි දුටුගැමුණු රජ්ජුරුවන්ගේ එක් අමාත්‍යයකුහට පුත් ව උපන; ඕහු වැඩිවිය පැමිණි කල්හි ඒ අමාත්‍යපුත්‍රයාට තිස්ස අමාත්‍යය යි නම් විය; ඒ තෙමේ ක්‍රමයෙන් වැඩී රන් රුවන් මුතු මැණික් දැසි දස් ගවමහිෂාදි වූ සියලු සම්පත්තීන් සමෘද්ධ විය. මෙසේ කිසි විශෙෂයක්[1] නොදන ශබ්දමාත්‍රයක් ඇසූ පමණකින් පවා මේ ධර්මය සත්ත්වයන්ට බොහෝ සම්පත් සාධා දෙන්නේ මය; එසේ හෙයින් මේ ධර්මය නම් ආශ්චර්යය දෙයෙක් මය. හේ එසේ මැයි.

බුදුන්ගේ ධර්මය නම් මහත් වූ ආශ්චර්යය ඇත්තේය; තිරිසන් යොනියෙහි[2] උපන් මණ්ඩූකයන්[3] හා දීඝීජාතීන් පවා ජාතිසම්පන්න වූ මනුෂ්‍යභාවාදියට පමුණුවා ලොකපූජිත කරවන්නේය. කිසි වස්තුවක් නැති නිර්ධන[4] සත්ත්වයන් ධනවන්ත කරවන්නේය; කුලයෙන් හීන සත්ත්වයන් අග්‍රවූ උතුම් කුලයෙහි උපදවන්නේය. අඥාන සත්ත්වයන් ඥානවන්ත කරවන්නේය. අපායට යන මග අවුරන මහත් වූ කටුවැටක් හා සමානය; දිව්‍යලොකයට යන්ට සරහා ලූ රජ මහවතක් හා සමානය. ජාති ජරා මරණ නමැති තද ව්‍යාධීන් නසන හෙයින් දිව්‍යඖෂධයක් හා සමානය; එසේ හෙයින් සියලු සත්ත්වයන් විසින් ම ආදර සහිත ව ඇසුවමනා මය; භජනය කළමනා මය; එම්බා පින්වත් සත්ත්වයෙනි, බුදුන්ගේ ගුණමහිමය හා එබඳු බුදුන් වදළ ධර්මයෙකැ යි යන ව්‍යවහාර මාත්‍රයකුත් නොදන්නා එවැනි ගරඬියා පවා බණ ඇසූ කුශලයෙන් මනුෂ්‍ය ව ඉපද බොහෝ ඓශ්චර්යය ලද්දේ මය. එබැවින් තමහට වැඩ කැමැත්තාවූ කවර නම් සත්ත්වයෙක් බණ නොඅසා ද; එකාන්තයෙන් බණ අසන්නේ මැයි. එසේ හෙයින් කියනලදි;

අහො ධම්මානුභාවො'යං - සුගතස්ස මහෙසිනො,
අජාතිං ජාතිමන්තං සො - කරොති ලොකපූජිතං.

නිධනං ධනවන්තං ච - අකුලීනං කුලග්ගතං,
දුම්මෙධං ච සුමෙධන්තං - ධම්මො පාපෙති සබ්බදා.

ස්කණ්ටකා[5] වතී ධම්මො - අපායගමනස්සසෙ,
දුස්සජ්ජිතො මහා මග්ගො - සග්ගලොකස්ස ගාමිකො[6].

ජරාරොග පහා'නෙසො[7] - සධම්මො අමතාගදෙ,
තස්මා සො සෙවිතබ්බො'ව - ජනකායෙන සාදරා,

සොයං ධම්මිනි[8] හො සුත්වා - ලද්ධො මානුසිකං සිරිං,
කො තං ධම්මං න සෙවෙය්‍ය - අත්තකාමො ජනො හිතං-යි.

---

1. විශේෂ ගුණයක් - B
2. ජාතියෙහි - H
3. මඩුවන් - DGHKL ම.
4. නිර්ධනී - BCGHJKL
   නිර්ධන - ADE බෙ
5. සකණ්ටකො - පිටපත් හැම
6. ගාමිනො - ක.කි.ක. පාලි
7. පහානෙසු - BCDEGHJ
8. ධම්මිකි - CDG

Non-Commercial Distribution

මෙසේ එගැරඬියා මනුෂ්‍යා ව ඉපද පූර්වහෙතුබලයෙන් ශ්‍රද්ධාවන්ත ව ඉසුරුමත් බැවින් බොහෝ කුසල් කොට එයින් ගොස්[1] නිඳ පිබිදියක්හු මෙන් තුසිතභවනයෙහි උතුම් වූ රත්විමනෙක උපන්නේය. එබැවින් ධර්මය නම් සියලු භවභොග සම්පත් සාධා දෙන සිතුමිණිරුවනක් හා සදෘශ වන්නේය යි සිතාගෙන ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයන් විසින් බුදුන්ගේ සද්ධර්මය සිත හෙළා ඇසිය යුත්තේය; ධර්මයට පූජා කටයුත්තේය. හිඳීම් සිටීම් සක්මන් කිරීම් සැතපීම් ආදි වූ සතර ඉරියව්වෙහි ම අප්‍රමාද ව ධර්මය ම සිහි කටයුත්තේය; එපරිද්දෙන් ආදර සහිත ව සිහි කරන ලද්දවූ ඒ ධර්මය හැම කල්හි ම තමහට පිහිට වන්නේ මැයි. එසේ හෙයින් කියනලදී;

සුණන්තු සන්තො අමතං ජිනෙරිතං
භජන්තු පූජෙන්තු උපාසයන්තු තං,
ඨානෙ ච ගමනෙ සයනාසනෙ ච
සරන්තු[2] තං හොති සද පරායනං-යි.

මේ මෙහි සතර වන
සිලුත්ත වස්තුව ය.

තව ද මෙහි පස්වන හේමා වස්තුව නම් කවරයත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මෙම ලඞකාද්වීපයෙහි අනුරාධපුරයට පශ්චිම දිග්[3]භාගයෙහි එක් ගමෙක නාමගොත්‍රයෙන් අප්‍රසිද්ධ වූ එක්තරා කුලපුත්‍රයකුගේ එක ම දියණියෙනෙක් වූහ; ඕ තොමෝ උතුම් වූ රූ ඇතියහ; යහපත් වූ වර්ණසෞන්දර්යයෙන් යුක්තයහ; කාව්‍යකාරයන් විසින් වර්ණනා කටයුතු මනොඥ වූ රූ ඇතියහ; මහත් වූ නුවණ ඇතියහ; තමන් ඇසූ කිසියම් ධර්මයෙක් ඇත්නම් ඒ සියල්ල ම්[4] එකශ්‍රැතීන් ධරා ගනිති; උන්ගේ සකල ශරීරය රන්වන් පැහැ ඇත්තේය; එසේ හෙයින් ඒ කුමාරිකාවන්ට දෙමවුපියෝ හේමාවෝය යි නම් තුබූහ. ඒ කුමාරිකාවෝ දවසෙක තමන්ගේ පියාණන් හා සමඟ බණ අසන පිණිස විහාරයට ගියාහ; එකල්හි ධර්මකථිකයන් වහන්සේ ධර්මයක් පැවතුන් සූත්‍රය වර්ණනා කොට තීයේක; එකල කුමාරිකාවෝ තමන් ස්වභාවයෙන් ම නුවණැති හෙයින් කිසි පරක්කුවක් නැති ව බණ අසන්නාහු මුතුවැලක් අමුණන කෙනකුන් සේ එක අකුරකුත් නොවරදවා අර්ථකථා හා සමඟ සියලු සූත්‍රාන්තය එකවිට ඇසූ ගමනේ ම[5] ධරා ගත්හ. එයින් මෑතභාගයෙහි මාවටු පටුනෙහි වසන එක් වෙළෙඳෙණ කෙනෙක් වෙළෙඳම් පිණිස පශ්චිමදිග් බලා ගොස් වෙළෙඳම් කොට ඇවිදිනාහු හේමාවන් දක පිළිබඳ සිත් ඇති ව උන් හා සමඟ සංවාසයෙන් විශ්වාසී ව ඒ හේමා නම් කුමාරිකාවන් ප්‍රේමපාශයෙන් බැඳ රඳවා 'නොබොහෝ[6] දවසකින් එන්නෙම් වේ ද' යි කියාගෙන

1. මිය - D
2. සද සරන්තු - BCDEHJ
3. දිශා - ක.කි.සු.ම.
4. ඇසිල්ල ම - බෙ.ස.
5. ගමණින් ම - GJK
6. නොබෝ - BCDEGHKL

Non-Commercial Distribution

තමන් වසන මාවටුවට ගොස් කිසි කාර්‍යයක ව්‍යාපෘත ව නැවත නොඅාවාහුය. එකල්හි වෙළෙඳුණන් කල් යවා ම නොඑන හෙයින් හේමාවෝ ඒ වෙළෙඳුණන් අද එති සෙට එති බල බලා[1] සිහි කොට කොට උන්නාහු රාගයෙන් රත් ව මොහයෙන් මුළා ව එක් දවසෙක රාත්‍රිභාගයෙහි මහවටුවට යෙමි යි පිටත් ව ගොඩ මගින් යමින් සිට ඒ මහ දුරැ යි සිතා මුහුදු පීනාගෙන යුහු ව යෙමි වෙරළ අස සිට හිසකේ ගොතා බැඳ ඉනකඩ මිරිකා හැඳ මුහුදු[2] දියට බැස පීනන්ට පටන් ගත්හ. අහෝ! රාගයාගේ ආනුභාවයක් ඇසුව මැනවි; නොයෙක් උපද්‍රවයෙන් යුක්ත වූ මෙතෙක් දුරු කතර සමීප ගෙයකට යන ගමනක් මෙන් සිතා නික්ම ගතු. එහේ එසේ මැයි.

රාග නමැති යක්‍ෂිණීන් ආවෙශ ව අධික වූ රාගයෙන් උමතු වූ සත්වයෝ යහපත නපුරැ යි යන කිසි ම කාරණාකාරණයක් නොදන්නාහු මය. එසේ හෙයින් ඒ කුමාරිකාවෝ තමන්ගේ මවුපියන් හා සෙසු තමන්ට හිතාන්වෙෂී ව[3] ඉන්නා ඥතිමිත්‍රාදි වූ කිසි කෙනකුන්ටත් නොහඟවා උදකලා ව රාග නමැති සන්නාහයෙන් සැරහී එම රාග නමැති ප්‍රදීපය අල්වාගෙන්[4] අන්ධකාරයෙන් යුක්ත රාත්‍රියෙහි කණු කටු ගල් මුල් කැට පහණ ආදීන් ගැවසී ගත්තාවූ විෂම මාර්ගයෙහි, නා පොළොං දර පිඹුරු ආදීන් හා දිවි වලස් සිංහ ව්‍යාඝ්‍රාදීන් ගහන ව බැකිසි බකමූහුණු උලලිහිණි කැනහිල් බලු ආදීන්ගේ අමනොඥ භයඞ්කාර නාදයෙන් හා යක්‍ෂ රාක්‍ෂස ප්‍රෙත පිශාචයන් විසින් අති භයානක වූ අමුසොහොන් මිනී දවන්[5] සොහොන් ආදියෙහි මහත් වූ භයින් කිසිවකුත් නොසලකා, තමාගේ කාම තෘෂ්ණාව ම සහාය කොට ගෙන වෙළෙඳුණන් කරා යෙමි යි යන දෘඪ වූ සිත් නමැති ආයුධයක් ධරා නොයෙක් උපද්‍රවයෙන් යුක්ත වූ මාර්ගයෙන් ගොස් සමුද්‍රයට බැස, කිඹුල් දති[6] මොහොර කොරළ මහරළ ආදි වූ මහත් චණ්ඩ මත්ස්‍යයන් විසින් ආකීර්ණ ව පවන්වේගයෙන් පැහැර අහසට නඟන ගල්කුළු සේ උඩ නැඟී[7] පෙළින් පෙළ දිවන මහත් වූ රළපතර සමූහයෙන් ගැවසී ගත්තාවූ එබඳු සමුද්‍රය පවා පිහිනන්නාවූ කුමාරිකාවෝ කිසි භයක් නැති ව නික්මුණාහ. එසේ හෙයින් යම්කිසි ස්ත්‍රියක් බිම් යි කියා නම් ඇගේ වචනය නුවණැත්තවුන් විසින් සැබෑවැ යි නොසිතිය යුත්තේය; කාරණ කිම් ද යත්? උන්ගේ භය නම් 'ලලනා භීරු කාමිනී' යනු හෙයින් ස්ත්‍රීහු නම් භය ඇත්තාහ යි යන ලොකප්‍රසිද්ධ වචනය පිණිස බම්භ යි යනු විනා මිනීමස් කන යකින්නන් වැනි ස්ත්‍රීන්ට භයෙක් නම් නැත. එසේ හෙයින් කියන ලදී;

රාගයක්ඛිණියාවිට්ඨා - රාගෙනා'ති විමොහිතා,
කාරණා'කාරණං කිඤ්චි - න ජානන්ති හිතා'හිතං.
තස්මා මාතු[8] පිතුන්න'මිපි - ඤාතිමිත්තහිතෙසිනං,
අජානෙත්වා'ව එකා'ව - රාගවමෙමන වම්මිතා.

---

1. මඟබලබලා - B
2. යුහු ව - B
3. හිතෙෂී ව - B
4. දල්වාගෙන - බෙ.ස.
5. දන - CDEJKL
   දමන - BH
6. දකි (නැක) - B
7. නැඟී නැඟී - BEGHKL;
8. පිතා - බෙ.ස.

Non-Commercial Distribution

ජාලෙත්වා රාගපජ්ජෝතං - රත්තියං තිමිරෙ ඝනෙ,
ඛාණුකණ්ටකපාසාණෙ - බහුලෙ විසමඤ්ජසෙ.

අජගරෝ'රග සද්දූල - අච්ඡව්‍යාලකුලාකුලෙ,
උණ්ණා සකුන හුංකාර - අසිවොරුසිවාරුතෙ.

යක්ඛ පෙත පිසාචාදි - භයභෙරව සංකුලෙ,
ආම පක්ක සුසානෙසු - න ගණෙන්ති මහබ්භයං.

කත්වාන දුතියං තණ්හං - දළ්හමානස්ස ආවුධං,[1]
ධාරෙන්ති ආරූහි මග්ගං - ගහණං ඝණසංයුතං[2]

කුම්භීල මකරාකිණ්ණං - මහාවීචි සමාකුලං,
සමුද්දම්පි තරන්ති සා - අගා'පගත භෙරවා.

භයාමහන්ති යා කඤ්ඤා - යදි භාසෙය්‍ය විඤ්ඤුනා,
න තං මනසි කාතබ්බං - භයං තාසං තු[3] කිත්තිමං-යි.

මෙසේ මුහුදු පිහිනන්නාවූ හේමාවත් නාගරාජයෙක් දැක 'මෝ තොමෝ නාගකන්‍යාවක් දෙ හෝ නොහොත් මණිමෙඛලා නම් දිව්‍යස්ත්‍රී දෝ හෝ නොහොත් මනුෂ්‍ය ස්ත්‍රියක් දෝ හෝ එ දත් මා නියම දත මැනවැ'යි සිතා හේමාවත්ගේ සකල ශරීරය ජලයෙන් පිහිත ව තිබෙන හෙයින් තමන් ඇසට පෙනුණාවූ මුහුණ පටන් එක ම ශරීරභාගය නිසා වර්ණනාවක් උපදවා මුන් තමන් අසුවල් කෙනකුනැ යි නියම දත මැනවැ යි කල්පනා කොට විචාරන්නාහු, 'එම්බා සොඳුර, තොපගේ රූපය ඉතා යහපත; තොපගේ සියලු ශරීර අවයව ජලයෙන් සැඟවී මුහුදුමැද පෙණබුබුලු[4] මාලාවන් මධ්‍යයෙහි බබළන්නාවූ තොපගේ තෙල පැහැපත් වූ මුහුණ තාරකාවන් පිරිවරා අහස්මැද බබළන්නාවූ පුන්සඳමඬලක් හා සමානය; ඉතා නිල් වූ තොපගේ තෙල නෙත්‍රයුග්මය නිලිපුල්[5] පෙති දෙකක් හා සමානය; තොපගේ තෙල මනොඥ වූ නාසිකාව භ්‍රෑයුග්ම නමැති නිල පට්ටිකාවක් ඇති නළල්තල නමැති සුවර්ණපත්‍රයෙහි රන්පුඩුවක් හා සමානය; තොපගේ තෙල ලීලොපෙත වූ කන්වැල් සහල කාමී පුරුෂයන්ගේ ඇසට රසඳුන්[6] පිඩක් බඳු වූ තොපගේ ම ධම්මිල්ල කලාප නමැති මෙඝකූටයෙහි පහළ විදුලිය දෙකක් හා සමානය; තොපගේ සෙසු ශරීර අවයවයන් විශෙෂවත් ව මා නුදුටු හෙයින් වෙන වෙන කිය නොහෙමි; එතෙකුදු උවත් මෙසේ අතිමනොඥ වූ රූප සම්පත්තියකින් යුක්ත ව උදකලා ව පීනන්නාවූ තෙපි තමා කවුරුදැ'යි විචාළහ. එසේ හෙයින් කියනලදී;

වීචිසතාරෙ[7] ඵෙණවිකිණ්ණෙ - සලිලමගාධෙ චන්දසමවත්තා,
තුවම්'හිරූපා නීලතරක්ඛි - ජලපිහිතඞ්ගී කාසි තරන්ති[8]යි.

1. ආයුධං - GH
2. ඝනසංයුතං - ක.කි.කැ.ම.
3. භයං තා සබ්බතෙ - BGH
4. පෙණ බිබුලු - GH
5. නිලිපුල - BEJ
6. සඳුන් - C
7. වියසිසතාරෙ - BCDEGHJKL
8. ජලධී තරන්ති කාසි තුවං ති - ක.කි.කැ.ම.

Non-Commercial Distribution

එසේ විචාළ නාරජහට තමන්ගේ ස්වභාවය කියන්නාවූ හේමාවෝ;

උරගපති ත්වං ජීව චිරකාලං - තව වනිතායො සාධු රමයන්තු,[1]
වචනපථංමෙ නාග සුණ සම්මා - ජලධිතරන්ති චිත්තවසගාහං.

යනාදීන් 'එම්බා නාරජ්ජුරුවෙනි, තෙපි බොහෝ කාලයක් ජීවත් වව; තොපට වැඩෙක් ම වේව යි; තොපගේ භාර්‍ය්‍යා වූ නාගකන්‍යාවෝ තොප සිත් වූ පරිද්දෙන් පොළඹා[2] වාසය කෙරෙත්ව යි; එම්බා නාරජ්ජුරුවෙනි, මා කියන්නාවූ වචනය ඉඳුරා අසව; මුහුදු පිනන්නාවූ මම නිකමෙක පිහිනන්නෙම් නොවෙමි යි, තෘෂ්ණා නමැති රජ්ජු විසින් මෙහෙයන ලදු ව ඕහුගේ අණසක ඉක්මවාගත නොහී චිත්තවසහීව[3] යන්නා වූ මනුෂ්‍යස්ත්‍රියකිමි,' කීහ. එකල නාරජ්ජුරුවෝ 'ඒ වන්නා තෙපි මනුෂ්‍ය ස්ත්‍රියක් මය. දන් තෙපි හස්ත තලයක්[4] මෙන් මටසිලුටු මනොඥ වූ කළුවා සහලකින් හා සෙසු ශරීර අවයවයෙන් ශොභමාන ව දියපිට පෙරළෙන සනරන් කඳක් සේ දිලිහි දිලිහී මෙසේ වූ ඝනාන්ධකාරයෙන් යුක්ත රාත්‍රියෙහි කොයි යවු දැ' යි විචාළහ. එබසට හේමාවෝ 'එම්බා නාරජ්ජුරුවෙනි, මාගේ ජීවිතයටත් වඩනා සිනෙහැති ගෙහිමියාණකෙනෙක් ඇත; උන් සඳහන් කරන්නාවූ මට මහත් වූ ශොක උපන; එසේ හෙයින් උන් දක්නා පිණිස යෙමි' කීහ. එකල නාරජ්ජුරුවෝ 'එම්බල නුවණමඳ ජඩ නැනැත්තිය, උදකලා ව පිහිනන්නාවූ තොප[5] භය නැතිවන්ට කාරණ කිම් ද; ඒ මට කියා බලව'යි[6] කීහ. එබස් අසා හේමාවෝ 'එම්බා නාරජ්ජුරුවෙනි, මාගේ තද වූ කාමතෘෂ්ණා නමැති යෙහෙළියක් ඉදිරි ඉදිරි ව කැඳවාගෙන යන්නියක මෙන් අත් නොහැර එන්නීය; එසේ හෙයින් කිසි භයක් නැත්තෙමි' කීහ. එසේ හෙයින් කියනලදී;

ත්වං යාසි වාම කරහොරු මහා නිදායං
පාණාධිකො වසති යත්ථ ධවො ගතිං මෙ,
බාලෙ කථං වද න භායසි එකිකා ත්වං
නත්ථෙව්ති දළ්හතණ්හා හි සහායිකා මෙ-යි.

මෙසේ කථා කොට ඉක්බිති නාරජ්ජුරුවෝ 'එම්බා සොඳුර, තෙපි නො කළමනා කාරියෙහි යෙදී ඇවිදුව; ඉතා සිතුවක් කරන්නාවූ තද අදහස් ඇති කෙනෙකැ'යි අපහාස කොට බැන දෙඩා නැවත 'එම්බා සොඳුර, ලඞ්කාද්වීපවාසීහු බොහෝ සේ යම්තම් වී නමුත් බණ පදයක් දන්නාහු මය; කිමෙක් ද තෙපි බණ දනු දැ'යි විචාළහ. එකල හේමාවෝ 'එසේය; නාරජ්ජුරුවෙනි, බණ දනිමි; ධම්සක්පැවතුන් සූත්‍රය අර්ථකථා හා සමඟ මට ප්‍රගුණය; වාචොද්ගතය; වනපොතැ'යි කීහ.

---

1. රමන්තු - B ස.
   රමයන්තු - CDEGHJKL, බෙ.
2. පෙළඹවා - මුද්‍රිත හැම, ස.
3. චිත්තවසග ව - B
4. කලාත්තයක් - BEGHKL ස.
5. තොපට - GHK
6. බලයි - B
   බලනැ යි - බෙ.ස.
   කියව යි - ක.සි.ඤ
   කියාලව යි - ම.

Non-Commercial Distribution

එබස් අසා නාරජ්පුරුවෝ සතුටු ව තමන්ගේ ආනුභාවයෙන් මුහුද මැද සත්රුවනින් විසිතුරු වූ මණ්ඩපයක් මවා නොයෙක් පරිද්දෙන් අලඞ්කාර කොට සරහනලද විසිතුරු වූ ආසනයක් මත්තෙහි හේමාවන් ඉන්ට සලස්වා දශනඛ සමොධාන සමුජ්ජ්වලිත වූ තමන්ගේ දෙහොත මුදුනෙහි තබාගෙන ක්‍ෂත්‍රිය කන්‍යාවක දුටු චණ්ඩාලයකු සේ මහත් වූ ආදර දක්වා 'ස්වාමිනි, බුදුන් විසින් වදරනලද්දවූ ධර්‍මයක් පැවතුන් සූත්‍රය වදළ මැනවැ'යි ආරාධනා කළහ. එකල හේමාවෝ පනවනලද ධර්‍මාසන මස්තකයෙහි දිවිදළින් ඔප්නැඟූ රන්රුවක් සේ ලීලොපෙත ව ධර්‍මාසන[1] මස්තකයෙහි බඩපය්‍ය්ඞ්කයෙන් හිඳ කිසි භයක් චකිතයක් නැති ව නාරජහට බණ කීහ. නාරජ්පුරුවෝ බණ අසා පැහැද හේමාවන් නොයෙක් වස්ත්‍රාලඞ්කාර[2] ආදියෙන් සරහා කැමැති කැමැති වස්තු ප්‍රදනය කරන උතුම් වූ මාණික්‍යරත්නයක් අත්ලෙහි තබා තමන්ගේ ආනුභාවයෙන් කැඳවාගෙන ගොස් මාවටුවෙළෙඳුණන් වාසය කරන ගෙහි ම ඇර සිටුවූහ; ඉක්බිති රාත්‍රිය පහන් වූ කල එහි වසන මනුෂ්‍යයෝ හේමාවන් අත තිබූ ඒ මාණික්‍යරත්නය දැක 'මේ මාණික්‍යරත්නය තෙපි කොයින් ලදු ද'යි විචාළහ; එකල හේමාවෝ තමන් ඒ මාණික්‍යරත්නය ලත් සැලැස්ම ඇති සැටියේ ම කීහ. මනුෂ්‍යයෝ හේමාවන් කියන බස් සබා නොවෙයි සිතා අනුරාධපුරයට ගොස් රජ්පුරුවන්ට කීහ. එකල රජ්පුරුවෝ හේමාවන් කැඳවා ගෙන්වාගෙන උන් අතින් ඒ මාණික්‍යරත්නය අනිකක්හට දෙවූහ; එකල ඒ මාණික්‍යරත්නය හේමාවන්ගේ අතින් පහ වූ ඇසිල්ලෙහි එම විට ඔබකින්[3] ගෙනහැර දක්වූ පාෂාණ[4] වටක් සේ නිඃශොභා ව ගියේය; ඒ දැක රජ්පුරුවෝ නැවතත් හේමාවන් අතට දෙවූහ; එකල ඒ මාණික්‍යරත්නය හේමාවන්[5] අතට පැමිණි ඇසිල්ලෙහි හේමාවන්ගේ ශරීර රශ්මීන් ශොභාසම්පන්න වූවා සේ ජොතිමත් ව[7] දිලියෙමින් සිටගත. මෙසේ රජ්පුරුවෝ තුන් විටක්[8] පරීක්‍ෂා කොට හේමාවන් ළහට කැඳවා මේ මාණික්‍යරත්නය තෙපි කෙසේ ලදු ද යි විචාළහ; එකල ඒ මාණික්‍යරත්නය තමන් ලත් සැලැස්ම නොවරදවා ඇති සැටියේ ම කීහ; එකල්හි රජ්පුරුවෝ සතුටු ව හේමාවන්ට දහසින් බඳ පියල්ලක් දී හේමාවන් ඉන්නා ගම උන්ට ම අත පැන් වත්කොට දත් දී සැපසේ ගොසින් වසව යි නික්මවූහ; එතැන් පටන් හේමාවෝ ධර්‍මයෙහි ආනුභාවය තමන් විශෙෂයෙන් ම දුටු හෙයින් නිරන්තරයෙන් අනලස් ව අප්‍රමාද ව බණ අසමින් වනපොත් කෙරෙමින් ධර්‍මයෙහි[9] පවතිමින් දැහැමෙන් සෙමෙන් ජීවිකාවෘත්තිය කෙරෙමින් දැහැමෙන් ලත් දෙය දනාදි වූ කුශල ක්‍රියාවෙහි ම යොදමින් ජීවිතාන්තය දක්වා බොහෝ කුසල් කොට එයින්

---

1. ධර්මාසන (නැත) ස.
2. වස්ත්‍රාභරණ - B
3. ඔබ්බකින් - KL
4. පහණ - BEGHKL ම.ස.
5. හේමාවන්ගේ - CGH
6. එම හේමාවන්ගේ - BDEGHKL ක.සැ.ම
7. ජ්‍යොතිස්මත් ව - බෙ.ස.
8. විටෙක - KL
9. ධර්මයෙහි ම - BDEGHKL

Non-Commercial Distribution

ගොස් දෙව්ලොව උපන්හ. එබැවින් යම් කිසි කෙනෙක් සත්පුරුෂධර්මයෙහි පවතිද් ද ධර්මයෙන් යුක්ත වූ කථා ම කියද් ද ධර්මය ම තමන්ට අලඞ්කාර ධජයක් මෙන් උසස් කොට සිතද් ද ධර්මය අසා ධරද් ද එසේ ධර්මයෙහි පිහිටියා වූ උත්තමයන් දෙවියෝ ද ඒකාන්තයෙන් රක්‍ෂා කරන්නාහු මැයි. එසේ හෙයින් කියනලදී;

යො වෙ ජනො වත්‍තති සාධු ධම්මෙ
ධම්මානපෙතං ච කථං කථෙති,
ධම්මද්ධජො ධම්මධරො ච හොති
දෙවා'පි තං ධම්මඨිතං අවෙන්ති - යි.

මේ මෙහි පස්වන
හේමා වස්තුව ය.

මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි

සඞ්ඝදත්ත වර්ග නම් වූ

විසිවන පරිච්ඡේදය නිමි.

තව ද මේ සද්ධර්මාලංකාරයෙහි එක්විසිවන සිරිනාග[1] වර්ගය නම් කවර යත්. එහි පළමු වන සිරිනාග[1] වස්තුව මෙසේ දත යුතු.* කෙසේද යත්;

මෙම ලඞ්කාද්වීපයෙහි සිරිනාග නම් බ්‍රාහමණ පුත්‍රයෙක් දවසෙක සිතනුයේ 'යම් කිසි උපායෙකින් වස්තු උපදවා ගෙන ඒ වස්තුවෙන් පිරිසක් සිටුවා ගෙන ඒ පිරිස් ඇරගෙන ගොසින් සටන් කොට අනුරාධපුරය ඇරගෙන රාජ්‍යය එක්සත් කොට ඔටුනු පැළඳ රජකම් කෙරෙමි' යි සිතින් ම කල්පනා කොට ඉක්බිති 'වස්තු නමා[2] කොයින් ලැබ ගනිම් දෝ හෝ'යි වස්තු ඇති තැන් පරීක්‍ෂා කරනුයේ දකුණුගිරි විහාරයෙහි මහදගබ දැක ඒ දගබ බිඳ වස්තු ඇරගෙන පිරිස් සිටුවා ගනිම් කියා බොහෝ මිනිසුන් ඇරගෙන ඒ ඒ තැන ගම්[3] පැහැර වස්තු රැස් කෙරෙමින් දකුණුගිරි විහාරයේ දගබ සමීපයට ඇවිත් මේ දගබ බිඳුවයි කියා කැටිව ගිය මිනිසුන්ට නියොග කෙළේය. එකල මනුෂ්‍යයෝ දගබෙහි[4] සන්ධිය පරීක්‍ෂා කොට සොයාගත නොහී 'සවාමීනි, මෙදගබෙහි[4] සන්ධිය නුදුටුම්හ; එසේ හෙයින් දගබ බිඳගත නොහැක්කේයැ'යි කීහ. එකල සිරිනාග නම් බ්‍රාහමණයා 'එසේ කල මේ දගබෙයි සන්ධිය කවුරු දනිද්දැයි විචාළේ ය. එකල මනුෂ්‍යයෝ 'සවාමීනි, හෙල්ලෝලිය නම්

---

* 21 වන හා 22 වන වර්ග B පිටපතේ නැත.
1. ශ්‍රී නාග - GHK ම;
2. මා - GHK
3. ගෙවල් - GHK; ගල් - L
4. දගබෙයි - DEGHL

Non-Commercial Distribution

ගම බහුල[1] නම් චණ්ඩාලයා දගබ සන්ධිය දනි' යි[2] කීහ. එකල ඔහු ගෙන්වාගෙන 'එම්බල කොල, මෙ දගබෙයි සන්ධිය තා දනිති යි කියා බොහෝ දෙන කියති; ඒ දගබ්[3] සන්ධිය බලා දන දගබ බිඳුව'යි කීහ. එකල ඒ නැවැමියා 'ස්වාමිනි, මම ස්වර්ග මර්ත්‍ය පාතාල සංඛ්‍යාත වූ මුළු තුන්ලොවට අග්‍ර වූ ජ්‍යෙෂ්ඨ වූ ශ්‍රෙෂ්ඨ වූ සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ මට පිළිසරණ සේක යි මෙසේ සැදැහැයෙන් ආපාණකෝටීන් බුද්ධං සරණං ගච්ඡාමි යි සරණගත වූ උපාසකයෙමි[4]; එසේ හෙයින් දෙවාතිදෙව වූ ශක්‍රාතිශක්‍ර වූ බ්‍රහ්මාතිබ්‍රහ්ම වූ වන්‍දනෙය්‍යාභිවන්‍දනෙය්‍ය වූ පූජනෙය්‍යාභිපූජනෙය්‍ය වූ එබඳු බුදුරජාණන් වහන්සේගේ ධාතු පිහිටුවා කළ මෙසේ වූ චෛත්‍යය[5] බිඳීම නම් මාතුඝාතක පිතුඝාතක අරහන්තඝාතක ලොහිතුප්පාදක සඞ්ඝභෙදක යන පඤ්චානන්තර්‍ය්‍ය කර්‍මය හා සම යැ'යි කීය.

මෙසේ ඔහු කියනලද්දවූ එබඳු බුද්ධගුණ මහිමය ඒ බ්‍රාහ්මණයාගේ කන යහුල් බාන්නා සේ විය; එකල බ්‍රාහ්මණයා බුදුගුණ කී නැවැමියාට කිපී 'මොහු අල්වා ගෙන ගොස් දිවස් උල තබව'යි නියොග කෙළේය. එකල නියොග ලත් මනුෂ්‍යයෝ ඔහු ගෙන ගොස් උල හිඳුවා 'ස්වාමිනි, මොහුගේ පුත්තු සත්දෙනෙක් ඇත; ඌ හැම මෙ දගබෙයි සන්ධිය දනිති' කීහ. එකල්හි ඒ බ්‍රාහ්මණයා ඔහුගේ පුතුන් සද්දෙනා ගෙන්වා ගෙන 'තෙල දගබෙයි සන්ධිය බලා බිඳපියව'යි කීහ. එකල ඔහු සද්දෙන 'ස්වාමිනි, අපි හැම සරණගතයම්හ; ලොවුතුරා බුදුන්ගේ ධාතු පිහිටවූ ධාතු ගර්භය බිඳ නසන්ට නොහිස්සම්හ'යි කීහ. එබස් අසා සිරිනාහ නම් බ්‍රාහ්මණයා කිපී ඔවුන් සද්දෙනා ද දිවස් උල හිඳුවාපීය. හේ එසේ මැයි.

යහපත් වූ සඳුන් සුවඳ කස්තුරු කපුරු අගරු ආදියෙහි සුවඳ ඇසූ කල නීලමක්ෂිකාවෝ එහි ඇල්මක් නොකෙරෙති; නොසතුටු වෙති; කුණප ගන්ධයක් ඇසූ කල එම නීලමක්ෂිකාවෝ අමාවක් ලද්ද සේ සතුටු සොම්නස් ව එම ආඝ්‍රාණය කරන්නාහු මය. එපරිද්දෙන් ම අමනොඥ වූ දෙය[6] දක පිළිකුල් ව[7] ලජ්ජා වන තරම් ශිවලිඞ්ගාදිය දක සතුටු වන සංසාරබාණ්ඩක වූ නිර්භාග්‍යවත්ත සත්වයෝ යහපත් වූ බුද්ධරූපාදිය දුටත් ධර්මය ඇසුවත් සිත් පහදවා පින්පුරා ගත නොහෙන්නාහු මය. එසේ හෙයින් කියන ලදී;

චන්‍දනාගරුගන්ධෙසු[8] - ගන්ධමාඝායා සාධුසු.
විරජ්ජන්ති සුරජ්ජන්ති - කුණපෙ නීලමක්ඛිකා.
දිස්වා සුත්වා ච බුද්ධං ච - ධම්මං සොතරසායනං,
ජනෙන්ති න මනොභාසං - තථා සංසාරබාණ්ඩකා -යි.

---

1. බදුල - ක.කිසු
   පාලි බහුල -
2. දනිති යි - CD
3. දගබ (නැත) - DEGHKL
4. උපාසකයෙකි - DEGH
   උපාසකයෙකිමි - KJ ම.
5. මේ චෛත්‍යය - H
6. දෙය (නැත) - DEGHL; දෙයක් K
7. වන - GH
8. ගන්ධෙහි - GHKL

Non-Commercial Distribution

ඉක්බිති ඒ අටදෙනාගේ ගුණානුභාවයෙන් දෙවියෝ දිව්‍ය ලොකයෙන් රථ ගෙනවුත් සියල්ලවුන් බලබලා සිටියදී ම රථවලට නංවා ගෙන දිව්‍යසෙනාව හා සමඟ ම තුෂිත දිව්‍යලොකයට ගෙන ගියහ. එතැන්හි රැස්වූ මහජනයෝ මහත් වූ ඒ ආශ්චර්‍ය්‍ය දක පහන් සිත් ඇත්තාහු 'දේවයන් වහන්ස, බුදුන්ගේ ධාතු පිහිටුවා බැඳි මෙබඳු චෛත්‍යයක් බිඳීම[1] කටයුතු නොවේ' යි කියා සිරිනාගයන්ට නොයෙක් කාරණා කීහ. එබස් අසා සිරිනාහයෝ ඒ දගබ හැර නැහෙනහිරි දිශාවට ගොස් මහවැලිගං සමීපයෙහි මීවිටි නම් ගම පැහැර වස්තු උදුරාගෙන එම ගම් මීවිටි නම් දගබ බිඳ වස්තු ඇරගෙන පඩි ලා සෙනාව සිත් ගෙන සටන් කොට රාජ්‍යය ගෙන මුළු ලක්දිව එක්සත් කොට ඔටුනු පැළඳියහ. එසේ රාජ්‍යය ලැබ ඔටුනු පැළැන්දත් දගබ බිඳුවූ අකුශලයෙන් කල් නොයවා ම එම ජාතියෙහි උදරාබභ්‍යන්තරයෙහි කෲරතර වූ මහත් වූ අසාධ්‍ය බ්‍යාධියෙක් ඇතිවිය; වෙදවරු නොයෙක් ප්‍රතිකාර කොටත් ව්‍යාධි සන්හිඳුවා ගත නුහුණුවාහුය; නැවත ඒ සිරිනාහයෝ වස්තු එක්කොට පළමු පරිද්දෙන් ම දගබෙයි පිහිටුවා පළමු නියාවට වඩා දගබ බඳවාත් ව්‍යාධි සන්හිඳුවා ගත නුහුණුවාහුය. එම ව්‍යාධීන්[2] මහත් වූ පීඩාවට පැමිණ දුඃඛය ඉවසාගත නොහී තුමූ ම තමන් බඩ පළා ගෙන කාලක්‍රියා කොට දෙපා උඩුකුරු ව හිස් බිම් බලා අග්නිජ්වාලයෙන්[3] නිරන්තර වූ අවීචි මහ නරකයෙහි[4] මේ කප මුළුල්ලෙහි නරක දුකට භාජන වූහ. හේ එසේ මැයි.

යම් කිසිවෙක් බුදුන්ගේ උතුම් වූ ශරීරධාතු පිහිටුවා බැඳි දගබක් බින්දේ වී නම් එසේ වූ පවු කළ තැනැත්තේ පාපිෂ්ට වූ සිරිනාගයන් පරිද්දෙන් ම අවීචි මහ නරකයෙහි උපදනාහු මය.[6] තව ද යම් කිසිවෙක් බුද්ධරූපවල අත්පා කන් නාසා ආදිය සිඳ බිඳ නැසුයේ වී නම් එයිත් එපරිද්දෙන් ම මෙම ජාතියෙහි බොහෝ දුක් විඳ සංජීවාදියෙහි උපදනේ මය.[7] තව ද යමෙක් බොධි වෘක්ෂවල අතු පතු සිඳ බිඳ හළුයේ වී නම් මෙම ජාතියෙහි විනාශයට පැමිණ පරලොව ඝොර භයානක රෞරව නරකයෙහි උපදනේ මය. තව ද යම් කිසි කෙනෙක් කිසියම් ආකාරයෙකින් බණ පොත් නැසුවාහු වී නම් සංජීවාදී නරකයෙහි ඉපිද යමපලුන් විසින් කඩ කඩ කොට කපනලද ශරීර ඇති ව නැවත නැවතත් ඉපද පැසී ගොඩ නැඟී මිනිසත්බවක් ලද්දහු වී නම් හස්තපාද කන්[8] නාසාදි ඡේදයට පැමිණෙන්නාහු මය. තව ද යම් කිසි කෙනෙක් සඞ්ඝයා වහන්සේට සඞ්ඝභෙදදි වශයෙන් කිසියම් අපරාධයක් කළාහු

---

1. බිඳවීම - EGHK
2. ව්‍යාධියෙන් - G
3. අග්නිජාලායෙන් - CDGK;
   අග්නිජාලාවෙන් - HL
4. නරකයෙහි ඉපිද - DEGHKL
5. බින්ද වී - ක.කි.සැ.බෙ. -
6. උපදනේ මය - ස.
   උපදවන්නේය - G
7. කණීණ - බෙ.ස. EGHKL

Non-Commercial Distribution

වී නම් එසේ වූ සත්වයෝ නරක තියඝීක් ප්‍රේත අසුරකාය යන සතර අපායෙහි මහදුක් විඳිනාහු මය. මෙසේ තුනුරුවන්ට අපරාධ කිරීම මහත් අකුසල් බව දන නුවණැත්තවුන් විසින් එසේ වූ අකුශලරාශිය ම සිංහ ව්‍යාඝ්‍ර දිවි වලස් සොර සතුරු භය සහිත සොපද්‍රව මාර්ගයක් මෙන් දුරු කටයුත්තේය. එසේ හෙයින් කියනලදී:

ගණං යො තීහි වාරෙහි[1] - නරො'ධ අපරජ්ඣති,
සො හවෙ චතුරොපායෙ - දුක්ඛභාගී භවිස්සති.

යො නරොධ විනාසෙති - සම්බුධාගම පොත්ථකං,
ජනනහිනෙනාපි සො හොති - නිරයං ච නිගච්ඡති.

මහානත්ථකරං පාපං - ඉති විඤ්ඤාය පණ්ඩිතො,
දූරතො පරිවජ්ජෙය්‍ය - මග්ගං පටිභයං යථා - යි.

මෙසේ එකල්හි ඒ චණ්ඩාලයෝ අටදෙන පූර්වජන්මයෙහි කළ කිසියම් අකුශලයෙකින් සැඩොල් කුලයෙහි උපනත් උතුම් ගුණ නුවණ ඇති ශ්‍රද්ධාවන්තයන් හෙයින් තමන් දිවස් උල තබතත් දහගබ් නොබිඳුම්හ යි අකුසල් කිරීමට නොලැබී සරණ සීලය රක්ෂා කළාවූ ගුණධර්මය නිසා දෙවතාවෝ දෙවුලොවින් රථ ගෙනවුත් ඔවුන් හැම දිව්‍යරථවලට නංවා ගෙන දිව්‍යසෙනඟ පිරිවරා මහත් වූ උත්සවයෙන් දෙවුලොවට කැඳවා ගෙන ගියහ. ඔහු අටදෙන දුන් මෙත් මහ බෝසතුන්ගෙන් බණ අස අසා දිව්‍යසැපත් විඳිති. එකල සිරිනාග නම් බ්‍රාහ්මණයා එබඳු ශීලාචාරසම්පන්න ශ්‍රද්ධාවන්තයන් දිවස් උල හිඳුවා එවැනි අපායකුත්[2] සිධකොට ගෙන දහගබ් වහන්සේ බිඳුවූ අකුශලයෙන් කල් නොයවා එම ජන්මයේ උදරාබාධයෙන් ජීවිත ව තමා බඩ නෙමේ ම පළාගෙන එයින් මිය අවීචි මහ නරකයෙහි ඉපද මේ මහා භද්‍රකල්පය ගෙවෙන තෙක් නිරා[3] දුකට භාජන ව මහදුක්[4] විඳිනේය. අවීචි මහ නරකයෙහි අන්තඃකල්පයකට ආයු හෙයින් ඒ සිරිනාග රජ දසක් අවුරුද්දෙන් අහලක් වඩනා පොළොව සත් ගවුවක් උඩ[5] වැඩෙන තෙක් නරකයෙහි පැසෙන්නේය යි දතයුතු.

මෙසේ දිව්‍යලොකයෙහි දෙවතාවෝ චණ්ඩාලයන් වී නමුත් කුසල් කළවුන් දිව්‍යරථයට නංවා දෙවුලොවට කැඳවා ගෙන ගොස් අප්‍රමේය වූ දිව්‍යසම්පත්තියෙන් පූජා කරන්නාහුය; රජදරුවෝ වී නුමුත් අකුසල් කළාහු වීනම් ඒකාන්තයෙන් අති

1. වාරෙහි - EGHKL
2. පාපයකුත් - DGHKL ක.සි.සද.ම
3. නිර් - DE
   නිරය - බෙ.ස.
4. මහත් දුක් - CGH
5. උස - CEGHKL

Non-Commercial Distribution

ඝොර භයානක වූ නරකයට තුමූ ම ගොස් තමන් කළ අකුශල බලයෙන් මහදුක් විඳිනාහු මය; එබැවින් නුවණැති ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයන් විසින් අකුශල ධර්මයන් දුරු කොට කුශලසම්භාරයන්[1] රැස් කොට ස්වර්ගමොක්ෂසම්පත් විඳින්ට උත්සාහ කටයුතු. කියන ලදුයේ මැයි;

පුජෙනෙවං කතසුචරිතං සාධුචණ්ඩාලකම්පි
නෙත්වා කාමං තිදිවම'මරා සග්ගසම්පත්තිදනා,
ගච්ඡන්තී ථො අකත සුකතා භූමිපාලාපි කාමං
ඝොරාපායං ජහථ[2] භජථාපුඤ්ඤං පුඤ්ඤාදනි පඤ්ඤා - යි.

මේ මෙහි පළමුවන
සිරිනාග වස්තුව ය.

නව ද මෙහි දෙවන අම්බ අමාත්‍ය වස්තුව නම් කවර යත්: හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මෙම ලඞ්කාද්වීපයෙහි රජරට පුළුන්නරු නම් කදවුරෙහි[3] මහත්[4] ඉසුරුමත් වූ වෙණිංශාල[5] නම් අමාත්‍යයෙක් විය; ඔහුගේ පුත් වූ අම්බ නම් අමාත්‍යයෙක් දසි දස් ගව මහිෂාදීන් හා මුතු මැණික් ආදි වූ සියලු උපභොග පරිභොග සම්පත්තීන් යුක්ත ව එම කදවුරෙහි[6] වාසය කෙරෙයි. එකල්හි ඒ ජනපදය වැසි නැති වීමෙන් වපුළ ගොයම් ඉඳුරා නොපැසුණේය; සියලු වනය ළැවු ගිනි ගත්තා සේ මලානික විය, වැවු පොකුණු ගල්කෙම් ආදියෙහි ජලය සිඳී ක්ෂය ව ගියේය; සියලු ද්විපද චතුෂ්පදයෝ[7] පිපාසයෙන් පීඩිත ව මහදුක් විඳිති; ගොයම් නැති වීමෙන් සියලු ජනපදය දුර්භික්ෂ විය; මනුෂ්‍යයෝ සිහා ඇවිදත් ඉඳුරා ආහාරයක් ලැබ ගත නොහෙති; එකල ඒ අම්බ නම් අමාත්‍යයාගේ ගෙහි පවා සියලු ධාන්‍ය ම නිමාවට ගියේය; එකල අමාත්‍යයා තමාගේ දසීන් හා කර්මකාරයන් කැඳවා 'එම්බා තෙපි හැම ගල් වල් බලා ගොස් ඉහුරු කසා ආදි වූ බඩු ගෙනවුත් ඒ ඒ තැන ඇවිද විකොට වීසාල් ඇරගෙන එව'යි කියා නික්මවීය. එසේ ගිය මනුෂ්‍යයන් පමා වන හෙයින්[8] තමාගේ ගෙය බලා පරීක්ෂා කරවා එක ම සාල්නැළියක් දක බත් පිසවා

1. කුශලධර්මයන් - GH
2. පිහථ - E
3. කඳයුරෙහි - GH
4. මහත් වූ - CJ
5. වෙනිහාල - DEGHKL ම.
6. කඳයුරෙහි - GH
7. චතුෂ්පාදයෝ - C.D.K.L. ක.කි.ඤ.
8. තෙක් - C

Non-Commercial Distribution

අතමුව ශුද්ධ කොට බත් කන්ට උන්නේය. එකල රාත්‍රිය[1] විහාරයේ බටකඩු නම් භාවනාගෙයි වසන චූළ පිණ්ඩපාතික නාග මහ තෙරුන් වහන්සේ සුපිළිසන්[2] ඒ ගැට වටු ගන්වා අහර පිණිස ඒ කඳවුරට වැඩ සිහා ඇවිද කිසිවකුත් නොලැබ පාත්‍රය වත්කළ වන ම ඇරගෙන වඩනට පිටත්වූ සේක. අම්බ අමාත්‍යයා මහතෙරුන් වහන්සේ දුක කම්පාව සිතනුයේ 'පෙර මා සසර ඇවිදිනා කල ඒ ඒ ජන්මයෙහි අන්නපානාදිය නොලද්දවූ ජාති මෙතෙකැ යි පමණ නැත; තිරිසන් ජාතිවල ඉපද මහත් වූ සාදුක් ඉවස ඉවසා ඇවිදි ජාති මෙතෙකැ යි පමණ නැත; එසේ ම අවීචි ආදියෙහි[3] ඉපද නරකාග්නින් පැසී පැසී නොයෙක් කෙළගණින් අවුරුදු එක බත් උළක් පමණක්[4] නොලැබ සාදුකින් පීඩිත ව දුක් විඳිකල් මෙතැකැ යි පමණ නැත. ශරීරමාංශ නැති[5] අස්ථිචර්මාවශෙෂ වූ ප්‍රෙත ව ඉපද ක්‍ෂුධා නමැති ගින්නෙන් දද දුක් විඳි කල් මෙතෙකැ යි පමණ නැත; බුද්ධාන්තරයක් මුළුල්ලෙහි අන්නපානයක් නොලැබ සාපිපාසායෙන් පීඩිත ව උපමා කළ නොහැකි මහ දුක් විඳ විඳත් ජීවත් වන්නාවූ ප්‍රෙතයෝ ඇත් මය; ඉදින් යම් ප්‍රෙතයෙක් මනුෂ්‍යයන් කැස කිවිය දමූ සෙම් සොටු පමණක් වත් වමනය කොට දමූ බතක් හෝ අලුත වද දමූ ගර්භමලයක් ලබන්නේ වී නම් එයිත් කුශලයෙකින් මය. පූර්වජාතිවල අනුන්ට ආහාරයක් නුදුන්නාහු අනුන් කන තැන බල බලා සිටත් ආහාරයක් ලැබගත නොහෙති. එසේ හෙයින් අද මා විසින් කුසල් නමැති බිජුවට වැපිරීමට අනන්ත ජාතිවලට සුදුසු වූ යහපත් සරු ක්‍ෂෙත්‍රයකුත් ලදිමි; දෙන්ට සුදුසු වූ දැහැමෙන් සෙමෙන් ලත් ආහාරයකුත් ඇත. මේ සඞ්ඝ නමැති ක්‍ෂෙත්‍රයෙහි කුසල් නමැති බිජුවටක් රොපනය කෙළෙම් නම් ඒ මට අනන්ත ජාතිවල හිත සැප එළවන්නේය' යි මෙසේ නොයෙක් කාරණ සිතුයේය. එසේ හෙයින් කියනලදී;

අදත්වාන පුරෙ කිඤ්චි - දනං යාචක ජන්තුනං,
උද්දික්ඛමානෙ භුඤ්ජන්තස්ස - ලභතෙ කිඤ්චි භොජනං.

ඉදන්'ජ්ජ මයා ලද්ධං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං,
භොජනම්පි ච මෙ අත්ථි - ධම්මෙනු'ප්පාදිතං ඉදං.

සුඛෙත්තෙ අජ්ජ රොපෙමි - බීජමප්පම්පි සාධුකං,
තං මෙ භවති දිඝද්ධං - හිතාය ච සුඛාය ච - යි.

---

1. රාත්‍රියෙහි C;
   රාත්‍රියේ - K
2. සුපිළිපන් ව - JK බෙ.
3. අවීචියෙහි - බෙ.ස.
4. පමණවත් - H
   පමණත් - සැ
5. නැති ව - GHK

මෙසේ ඒ අමාත්‍යයා සසර නොයෙක් දුක් හා දනයෙහි අනුසස් සලකා මහතෙරුන් වහන්සේ සමීපයට එළඹ පාත්‍රය ගෙන ඉදිරියෙහි අනුභව කරන්ට තිබූ බත් මාළු සියල්ල ම පාත්‍රයේ බහා මහතෙරුන් වහන්සේට පිළිගැන්වීය. මහතෙරුන් වහන්සේ අමාත්‍ය පුත්‍රයා දන් දී සන්තොෂයෙන් සිටියාවූ ආකාරය දැක[1] "අද මේ උපාසකයා අතිශයින් ම ප්‍රසන්න වීය: දන් මා විසින් මේ අමාත්‍ය පුත්‍රයාට වඩ වඩා ප්‍රීති උපදවා මොහු දූන් දනයෙහි ආනිසංස්[2] වඩවමි" සිතා බත්පාත්‍රය ගෙන වලට වැද රුකක් මුල වැඩහිඳ තමන් වහන්සේගේ කම්ජ ශරීරයෙහි නුවණ පතුරුවා උදව්ය වශයෙන් සම්මර්ශනය කොට විදර්ශනා වඩා රහත් බවට පැමිණ ඒ ආහාරය දයාද පරිභොගයෙන් වැළඳූසේක. අහෝ! ආශ්චර්‍යයක් ඇසුව[3] මැනවි: සත්පුරුෂ ගුණ ඇති කෙලෙහි ගුණ දන්නා නුවණැති බුධපුත්‍රයෝ අනුන්ට වැඩක් ම සාධන්ට උත්සාහ කෙරෙත්. එසේ හෙයින් කියන ලදී;

අහො සප්පුරිසා ධීරා-බුධපුත්තා ගුණාකරා,
පරත්‍ථෙ පටිපජ්ජන්ති- කතඤ්ඤූ කතවෙදිනො-යි.

මෙසේ ඒ අමාත්‍යයා දන් දී ඉක්බිති ගෙට ඇවිත් සයින් විඩා ව ඇඳට නැඟී වැදහෙව මඳක් නිද පිබිද සාය ඉවසිය නොහී භාර්‍යාව කැඳවා "එම්බා සොඳුර, සායට වඩනා[4] දුකෙක් නැත" තෙල පිසූ සැළෙහි ද ඇලිව්ව[5] බතෙක් ඇත්නම් පරීක්‍ෂා කරව යි කී ය. එකල ඔහුගේ භාර්‍යා තොමො පළමු සැළෙහි බත් නැති බව[6] දන දන ම ස්වාමිපුත්‍රයාගේ වචනය නොඉක්ම[7] බලන පිණිස වළන් දෙරට ගොස් සැළ වැසූ පිධානය හැර බලා සමන් කැකුළු රැසක් සේ සැළ පුරා තිබූ බත් දැක සතුටු ව 'ස්වාමීනි, මේ කුමන ආශ්චර්‍යයෙක් ද? සැළ පුරා බත් තිබෙයි: මහතෙරුන් වහන්සේට දුන්නාවූ දනයෙහි විපාක අද ම අපි ලදුම්හ: නැඟී සිට බත් අනුභව කළ මැන වැ' 'යි අමාත්‍යපුත්‍රයා නඟාසිටුවා[8] අතපයට[9] පැන් දී ඉන්ට සලස්වා බත් අනුභව කරවූහ.[10] එසේ අනුභව කැරවූ බත් සැළෙයි බත් අඩු නොවන්නේ මය: ඒ ආශ්චර්‍යය දැක ස්වාමිපුත්‍රයාට කියා දෙමහල්ලෝ ම එක් ව ගම ඇති මිනිසුන් ඇම දෙනා ම ගෙන්වා ගෙන බත් අනුභව කැරවූහ: කෙතෙක් දෙනාට බත් ලුවත් සැළෙයි බත් අඩු නොවන්නේ මය, එසේ ම එතනට පැමිණි යම් ම කෙනෙකුන් නොවරදවා බත් අනුභව කරවූහ, ඒ ගම සීමාන්තයෙහි අධිගෘහිත දෙවතාවෝ ඒ දෙමහල්ලන් දුන් දනයට සතුටු ව ස්වභාවයෙන් ම ඒ ගම මිනිසුන් සැටියෙන් සිය ගණින් ගැල්පුරා වී ගෙනවුත් ඔවුන්ගේ කොටුගුළු පිරූහ: එසේ ම උන් වසන ගෙයි වසල් වස් යටෙහි වසන දෙවතාදූ ද සන්තුෂ්ට ව තමාගේ ආනුභාවයෙන් වස් යටෙහි පටන් ගෙමැද දක්වා එකාබද්ධ ව සිටියා සේ මහත් වූ පුවඳ ඇල්සාල් ධාරාවක් පැවැත්වූහ. එකල්හි ඒ ජනපද වාසී වූ සියලු මනුෂ්‍යයෝ ම එම අමාත්‍යපුත්‍රයාණන්ගෙන්[11] බත් බිජුවට ඇරගෙන ගොයම් බත් කරවා ධනධාන්‍යයෙන්

1. සිටියා දැක - GHK
2. අනුසස් - DE
මද - GHK
ආනිසංස - (නැත) - L
3. බැලුව - GHK
4. වඩා -JKL - ක.කි.කැ.ම.
5. ඇවිලිජ්ජ - ක.කි.කැ.
6. තියා - G
7. නොඉක්මවා - GH
8. නැඟීසිටුව - CDEGHKL
9. අතට - ක.කි.කැ.ම.:
අත මුව සුද්ධනොට -K
10. කරවූව - E කැරවූය - D කැරවිය -ස.
11. අමාත්‍යාණන්ගෙන් - DEGHK

Non-Commercial Distribution

සමෘද්ධ වූහ. එකල ඔහු දෙදෙන දනයෙහි අනුසස් තමන් ප්‍රත්‍යක්‍ෂයෙන් ම දුටු හෙයින් එතැන් පටන් දනාදි වූ බොහෝ කුසල් කොට එයින් ගොස්[1] දෙමහල්ලෝ ම දෙව්ලොව උපන්හ. මෙසේ පිරිසිදු වූ මහත් ශ්‍රද්ධා ඇති උත්තම සත්පුරුෂයෝ ආදිමධ්‍යාවසාන [යන][2] තුන් සිත පිරිසිදු ව තමන් විසින් දෙන ලද්දවූ දන නමැති යානාවට පැනනැගී සැප සේ දිව්‍යලොකයට යන්නාහු මය: ඉදින් පඤ්චශීලාදිය රක්‍ෂාකිරීම නමැති ධවලාතපත්‍රයක් හෙවත් සේසතක්[3] ඉඳුරා ධැරුවාහු වී නම් සසරදුක් නමැති ඉතා තද වූ සූර්‍ය්‍යරශ්මීන් නොතැවී සැප සේ පලා ගොස් නිවන් නමැති රාජසම්පත්තියෙහි පිහිටන්නාහු මය. කියනලදුයේ මැයි;

සද්ධො විසුද්ධො සුවිදන යානං
ආරුය්හ එවං තිදිවං පයාති:
ධාරෙය්‍ය[4] චෙ සීලමයාතපත්තං
නිබ්බාණ රජ්ජෙ ස පතිට්ඨහෙය්‍ය-යි.

මේ මෙහි දෙ වන
අම්බ අමාත්‍ය වස්තුව ය.

තව ද මෙහි තුන්වන කාණසිගාල වස්තුව නම් කවර යත් හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්

මෙම ලඞ්කාද්වීපයෙහි දඬගොණ[5] නම් ගම සමීපයෙහි එක් සිහාලයෙක් ඒ ඒ තැන ගොදුරු සොයා ඇවිදිනේ ඉත්ඇයකු[6] දක අල්වන්ට දිවගෙන ආයේය, එකෙණෙහි ඉත්ඇයා[7] තමා ඇඟ සොල්වා ඇවිත්[8] කීපයක් හැරපීය: ඉන් එක් ඇවිදෙක්[9] ඇවිත් සිගාලයාගේ එක් ඇසක් කණ කෙළේය: එසේ හෙයින් ඒ සිහාලයා කාණසිහාලය යි ප්‍රසිද්ධ වීය. එයින් මෑතභාගයෙහි ඒ සිහාලයා ඒ ගම සමීපයෙහි වැවක් බඩ ගොදුරු සොයා ඈතමෑත ඇවිදිනේය: එකල්හි එක් පිඹුරෙක් ඔහු දක දරණවැලයෙන් වෙළා ගත: එකල ගොපල්ලෙක් ගවයන් බලා ඇවිදිනේ සිහාලයා පිඹුරාට අසු ව[10] වෙහෙස විඳුනා දක ඔහු කෙරෙහි කරුණාවෙන් පිඹුරාට දඬුකඩකින් ගසා සිහාලයා ගළවා හැරපීය. එකල පිඹුරා සිහාලයා හැර ගවපාලයා බදගත: සිහාලයා එපවත් දක "මා දන් මේ බල බලා[11] යාම කටයුතු නොවෙයි: මට කළ උපකාරයට මාත් උපකාරයක් කළමැනවැ"යි සිතා දිවගෙන ගොස් පිඹුරා ඇඟ ඒ ඒ තැන කඩා කා හය ගන්වා අඬ ගසමින් නොයෙක් උත්සාහ කොට ගවපාලයා ගලවා ගත නොහී සමීපයේ කුඹුරක සීසානවුන් දක යුහු ව එතැනට දිව ගොස් අඬ ගසා සීසානවුන්ගෙන් එතැන්හි තිබූ ඉනකඩක් ඩැගෙන දිවගත: සීසාන මනුෂ්‍යයෝ ඉනකඩ එළවම්හ යි අඬ ගසා හය ගන්වාත් වස්ත්‍රය එළවා

1. සැව ගොස් - ක.කි.කැ.ම.
2. යන (නැත) - පිටපත් හැම
3. සේසත් - CDEGH, ක.කි.කැ.ස.
4. ධාරෙති - GHJK
5. දඬගොඩවන - GH
   දඬගොණාව - JKL
6. ඉත්තෑයකු - E
7. ඉත්තෑයා - EL
8. ඉත් - ක.කි.කැ.ම.
9. ඇ ඉතෙක් - GH
   ඉත් ඇ විදෙක් - ක.කි.කැ.
   ඉත් ඇ ඉතෙක් - ම.
10. අසු වූ කල්හි - බෙ. ස.
11. බල බලා සිටි - J
    බල බලා සිට - ක.කි.කැ.ම.

Non-Commercial Distribution

ගත නොහී කැබිලිති කැට දඬුකඩවල් ඇරගෙන සිහාලයා ලුහුබඳවා ගත්හ; සිහාලයා තමා ගෙන ගිය වස්ත්‍රය පිඹුරා සමීපයෙහි එළා එතැනින් පහ ව සිටගත: ඔහු ලුහුබැඳ ගිය මනුෂ්‍යයෝ පිඹුරා හා ගවපාලයා දැක පිඹුරා මරා[1] ගවපාලයා ගලවා ගත්හ. මෙසේ තිරිසන්හු පවා තමන්ට කළ උපකාර දැන ප්‍රත්‍යුපකාර කෙරෙති: කාරණාකාරණ දන්නා මනුෂ්‍යයන් ප්‍රත්‍යුපකාර නොකරන්ට කාරණ කිම් ද? තමහට උපකාර කළ මිත්‍රයන්ට අවශ්‍යයෙන් ම උපකාර කළමනා මය. හේ එසේ මැයි;

යමෙක් තමාගේ මිත්‍රයාට දුකක් පැමිණි කල්හි නුදුටු වත් ව ඉවත් ව යේ ද සැපයක් පැමිණි කල්හි ළඟට ඒ ද එසේ වූ තැනැත්තේ මිත්‍ර ප්‍රතිරූපකයා[2] නම: මිත්‍රයෙක් නම් නොවෙයි දැන නුවණැත්තවුන් විසින් සත්පුරුෂ මිත්‍රයන් හා එක්විය යුත්තේ මය. යම් කෙනෙක් යහළුවන්ට යම්කිසි දුකක් අසැපයක් පැමිණි කල්හි එක් ව සිට සරියේ ම දුක් විඳිද් ද එසේ වූ මිත්‍රයෝ මිත්‍රයන්ට හිතකාමි වූ උතුම් මිත්‍රයෝ නම් වෙති: යම් මිත්‍රයෙක් තමාගේ මිත්‍රයා නොකළමනා කටයුත්තෙන් වළකා ද කළමනා කටයුත්තෙහි යොද ද මිත්‍රයාගේ ගුණ ප්‍රශංසා කොට කියා ද එසේ වූ මිත්‍රයා මිත්‍රයන්ට හිතෙසි මිත්‍රයා නම් වෙයි. යම් මිත්‍රයෙක් තමාගේ මිත්‍රයාට නැති වස්තු මේ මේය යි දැන ඊට සුදුසු කාලයෙහි මිත්‍රයාට බත්පිළි ආදී වූ වස්තු දේ ද සිතිනුත් ඕහට වඤ්චාවක් වෙනසක් නැති ව කථා කෙරේ ද එසේ වූ මිත්‍රයා මිත්‍රයා නම් වෙයි. යම් මිත්‍රයෙක් තමාගේ මිත්‍රයා පාණාතිපාත අදත්තාදනාදී වූ අකුසල් කළ නොදී වළකා ද දනශීලාදී වූ කුශල ධර්මයෙහි සමාදන් කරවා ද එසේ වූ මිත්‍රයා මිත්‍රයන්ට වැඩ කැමැති යහපත් මිත්‍රයා නම් වෙයි. යමෙක් මිත්‍රයන් කෙරේ සාදර ව වෙසේ ද ඇම කල්හි ම ප්‍රියවාදී ව වෙසේ ද සිත ඇත්ත නොහහවා ද යන මේ සියල්ල ම සත්පුරුෂ මිත්‍රයන්ගේ මිත්‍රලක්ෂණ[3] නම් වෙයි: යමෙක් මිත්‍රයන්ට මිත්‍රබව අහවා සතුරු ව වසන්නේ වී නම් එසේ වූ මිත්‍රයා තෙමේ තමාටත් සතුරා නම් වෙයි: මිත්‍රයාට නුදුටු විට නිඥලෙස කියා ද එසේ වූ අසත්පුරුෂ මිත්‍රයා පරලොව අපාය හජනය කරන්නේ නම් වෙයි. යමෙක් තමාගේ මිත්‍රයා නුදුටු විට මාගේ මිත්‍රයා නිදුක් නිරෝගි වේව යි සුවපත් වේව යි කියා මෛත්‍රී කෙරේ ද මිත්‍රද්‍රොහ නොකෙරේ ද එසේ වූ මිත්‍රයා සියලු සත්වයන්ට ප්‍රියවත් වෙයි: මනුෂ්‍ය ජනයන් අතුරෙන් ජනොත්තම නම් වෙයි. එසේ හෙයින් කියනලදි;

සමුප්පන්නෙසු දුක්ඛෙසු - සඛීනං[4] චිත්තතාපනං,
සමදුක්ඛී සද හොති-සඛා සො සඛීනං හිතො.

අකත්තබ්බා නිසෙධෙති-කත්තබ්බෙසු නියොජ්ති,
ගුණං තස්ස පකිත්තෙති-අගුණං තස්ස නිගුහති.[5]

දදති කාලෙ මිත්තස්ස-භත්තවත්ථාදිකං ධනං,
මනසා අසයො හොති-සඛා සො සඛීනං හිතො,

පාණාතිපාත ථෙනාදි-පාපතො පටිසෙධති,
කුසලෙසු තං නියොජෙති-සඛා සො සඛීනං හිතො.

1. ගසා මරා - ක.කි.කු.
2. ප්‍රතිරූපයා - DGHK; ප්‍රතිරූප - L
3. මිත්‍රපක්ෂ - CDJ
4. සඛිනා - ක.කි.කු.ම. පුඛීනං - ස
5. නිගුයාති - KL

Non-Commercial Distribution

සාදරො හොති මිත්තස්ස-මසජ්ජවාණි සද හවෙ,
අලිකං න භාසයෙ තස්ස-එතං සම්මිත්තලක්ඛණං.

යො මිත්තානං දිසො හොති-සහොති අත්ත සත්තුකො,
පච්චහෙට් නින්දිතො හොති-පෙච්ච සො නරකං භජේ.

සුඛිතො හොති නිද්දුක්ඛො-යො මිත්තානං න දූහති,
සබ්බසත්තපියො හොති-ජනානං සො ජතුත්තමො-යි.

එතැන් පටන් ඒ සිහාලයා හා ගවපාලයා ඔවුනොවුන් කෙරෙහි භක්ති ඇති ව මිත්‍රධර්මය නොබිඳ රක්‍ෂා කොට[1] මෙසේ බොහෝ කාලයක් වාසය කොට ජීවිතාවසානයෙහි තමන්ගේ කම් වූ පරිද්දෙන් පරලොව[2] ගියහ. එබැවින් හීනජාතියෙහි උපනත් යම් කිසිවෙක් ස්වභාවික[3] මැදහත් ගුණ ඇත්තේ වී නම් එසේ වූ ගුණවතුන්ගේ ජාතිය නොසලකා උත්තම අධම මධ්‍යම සියල්ලවුන් ම භජනය කටයුත්තේය, එසේ විශ්වාසී ව භජනය කිරීමෙන් ප්‍රයෝජන කිම් ද යි යතහොත් අඩු වැඩි තරම් කටයුත්තක් පැමිණි කල්හි ඒ අවස්ථාවට සියල්ලවුන්ගෙන් ම ප්‍රයෝජන වන්නේ මය; එසේ නොව යමෙක් අනුන් නොතකා අහංකාර ව වෙසේ නම් විරුඩ ව ඉන්නා කිසි කෙනෙකුන්ගෙන් වැසනයක්[4] දුකක් පැමිණි විට ඔබෙන් බස් පමණකින් වත් සහායක් ලද නොහී එවිට කිසි සහායෙක් නැතැ යි තෙමේ ම තමහට කම්පා වෙයි; එසේ හෙයින් බොහෝ දෙනා සිත් ගෙන යහළුමිත්‍ර ව විසිය යුත්තේය. කියනලදුයේ මැයි;

භජේ සද උත්තම මජ්ඣිමාධමෙ
තද තද තෙහි සියා පයොජනං,
අමිත්තවනෙතා හි කදචි පීළිතො
දුක්ඛෙන එකොව'ස වෙධතෙ සද-යි.

මේ මෙහි තුන් වන
නාණසිහාල වස්තුව ය.

තව ද මෙහි සතර වන වානර වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්.

මෙම ලඞකාද්වීපයෙහි අනුරාධපුර නුවරට දකුණුදිග්[5] විල්ගමය යි ප්‍රසිඩ වූ මහත් ගමෙක් විය; ඒ ගම වසන්නාවූ දුක්පත් මිනිසෙක් වෙනෙහි ඇවිද මී බඹර සලා ගෙනෙමින් සෙසුත් බොහෝ ප්‍රාණවධ කෙරෙමින් මෙසේ නොයෙක් අකුශලක්‍රියාවෙහි යෙදී භායභීාව හා සමඟ ජීවත් ව වෙසෙයි; එතෙම එක් දවසෙක කාරියවාන[6] වනයට ගොස් මී බඹර ආදිය පරීක්‍ෂා කොට ඒ ඒ තැන ඇවිදිනේ

1. රක්ෂාකොට (නැත) - DEGHKL
2. මිය පරලොව - ක.කි.කඳ.ම.
3. ස්වභාවී ව -GHKL
4. ව්‍යසනයක් -C
   වැසනයක් - බෙ.ස.
5. දකුණු දිග් භාගයෙහි - G
6. වියවාන - ම.ස. - DGHKL
   භායභීව හා - G.H.K.L

Non-Commercial Distribution

ඵලහරිත වූ ගසක් උඩ වඳුරන් ඇවිදිනා දක ගසට නැඟී එක් කඳක් පිට මල පටවා තබා ගමට ගියේය; එකල එක් වඳුරෙක් ඒ ඒ තැන ගොදුරු සොයා ඇවිදිනේ ඵලහරිත වූ ඒ ගස දක ගසට නැඟී ඵල අනුභව කරනුයේ ඔහු එබූ[1] මලෙහි බැඳිණ; එකල්හි ඒ පුරුෂයා උදසනක් සේ ඒ ඒ තැන එබූ මලවල් බලා ගොසින් මල බැඳුණු වඳුරා දක මහත් වඳුරකු ලදිමි සතුටු ව දුන්නෙහි දුනු දිය නහා හීයක් ගෙන වඳුරා විද දුර්වල කොට ගසට නැඟී 'මෙවිට මොහු අතින් ම අල්වා ගනිමි' වඳුරා සමීපයට ගොස් මාංසලොභයෙන් ඉක්මන් ව ඉඳුරා සිටගත නොහී කඳපිටින් ගිලිහී වැටෙන්ට වන; ඔහු වැටෙන්නා දක වඳුරා "මා ජීවත් ව ඉන්දදී මොහු මිය නොදෙමි" තමාගේ සත්පුරුෂගුණ ම ඉදිරි කොට සිතා ඔහුගේ හිසකේ අල්වා ඇද ඔසවාගෙන කඳ පිට සිටු විය. කෙළෙහි ගුණ නොදන්නා අසත්පුරුෂ මිත්‍රද්‍රොහි වූ ඒ මිනිසා කඳපිට මඳක් සැතපී ආශ්වාස ලැබ ගෙන තිරිසන් ව සිට ගෙන ජීවිතය රැකදුන් එබඳු සත්පුරුෂයා[2] මරා මස් ඇර ගෙන ගෙට ගොස් ඒ සියලු ප්‍රවෘත්තිය තමාගේ භාර්‍යාවට කීය. ඕ තොමෝ එපවත් අසා "නුඹ කළ කටයුතු ඇසූ යම්[3] කෙනෙකුන්ට[4] චිත්තවික්ෂේප උපදවයි; නුඹ කෙළේ ඉතා මහත් වූ පාපයෙක; යම් කිසිවෙක් මිත්‍රද්‍රොහ කෙරේ ද තමහට කළ උපකාර නොදනී ද එසේ වූ අසත්පුරුෂයාට මෙලොව ම කයට සිතට සැපයෙක් නොලැබෙයි; පරලොව සතර අපායෙහි මහදුක්[5] විඳිනේය" යි කිව. එදවස් ඔහුගේ භාර්‍යාව කී ධර්මාන්විත කාරණා සියල්ල ම ගාථාබන්ධනයෙන් දක්වනු ලැබේ. කෙසේ ද යත්;

නාත්තනො'ති සරං හොති - විසාසාදෙ'ව පීළිතො,
අප්පන්නපානො සො හොති - යො නරො අකතඤ්ඤුකො.

මාතාපිතුන්න'මපි සරං - සචෙ සො උපසප්පති,
ධී'ති නං පටිසෙධෙන්ති - යො නරො අකතඤ්ඤුකො.

ථෙනාදීන්‍යපරාධානි[6] ලොකවජ්ජානි නෙකධා
තයෙස'ව රුහතෙ දෙසං - යො නරො අකතඤ්ඤුකො.

යනාදීන් "යමෙක් තමහට කළ උපකාර නොදනී ද එසේ වූ දුර්ජනයා උපනුපන් ජාතියෙහි මමය මාගේය යි ගෙයක් දෙරක් වාසයක් ලද නොහෙයි;[7] ඉඳුල් තොලු ගසාකන විසාසාදයකු මෙන් ඉඳුරා බතක් පැනකුත් ලද නොහෙයි; එතෙම ඉදින් බතක් පැනක් ලැබගත ඇකැ යි සිතා තමාගේ දෙමවුපියන් වසන ගෙට ගියේ වී නමුත් "අතිස මෙතැන නොසිට පලා ය" යි[8] කියා නෙරපියති. තව ද උමං බිඳීම් මං පැහැරීම් මිනීමැරීම් ආදි වූ අනුන් කළ ලෝක වද්‍ය අපරාධයෙක් ඇත්නම් ඒ සියල්ල ම කෙළෙහි උපකාර නොසලකා මිත්‍රද්‍රොහි[9] කළ අසත්පුරුෂයන්ට ම පැමිණෙයි; රජුන් සොරුන් සතුරන් දියෙන් ගින්නෙන් හා සිංහ ව්‍යාඝ්‍ර දිවි වලස්

1. නුබූ - ක.කි.ඝ.
2. සත්පුරුෂ වඳුරා - ි ක.කි.ඝ.ම.
3. යම් ම - GHKL,
4. කෙනෙකුට - ක.කි.ඝ.ම.
5. මහත් දුක් - DEGHKL
6. ථෙනා දීනපරාධානි - CDEGHK
7. ගෙයක් දෙරක් තනා වාසය කළ නොහෙයි - C
   ගෙයක් දෙරක් ව වාසය කළ නොහී - GHDKL
8. පලා යවයි - D
9. මිත්‍රද්‍රොහිකම් - H

Non-Commercial Distribution

ආදීන් නිසා වන්නාවූ යම් ම භයෙක් ඇත්නම් ඒ සියලු භය ම කෙළෙහි උපකාර නොදන්නාවූ අසත්පුරුෂයන්ට ම පැමිණෙයි; තව ද මිත්‍රද්‍රොහ කළ අසත්පුරුෂයෝ අත පය කන් නාසා හිස් සිඳීම් ආදි වූ නොයෙක් වධබන්ධනයටත් පැමිණෙති. තව ද කායික චෛතසික සැපයෙක් වේව යි අනිකුත් එබඳු යම්කිසි සැපයෙක් ඇත්නම් ඒ සියලු සැපය ම කෙළෙහි උපකාර නොදන්නවුන්ට සිහිනෙනුත් නොලැබෙයි. තව ද යමෙක් කෙළෙහි උපකාර නොදනී නම් ඔහු විසින් කරනලද යම්තම් අගුණයෙක් අපකීර්තියෙක් අයශයෙක්[1] ඇත් නමුත් ඒ ම ඒ ඒ තැන පැතිර පාපිෂ්ඨයා යි ප්‍රකාශ වන්නේය. යමෙක් කෙළෙහි උපකාර නොදනී නම් ඔහු දුටු කල ඉතා හීන චණ්ඩාලයකු මෙන් ද විරූපි වූ ප්‍රේතයකු මෙන් ද කුණු සාරා කන කවුඩකු මෙන් ද ඉස පණු හුණු බල්ලකු මෙන් ද පිළිකුල් ව සියල්ලෝ ම නිඳා බෙණෙති. තව ද නරක තිර්‍යග්‍යෝනි ප්‍රේත අසුරකාය යන සතර අපායෙහි වන්නාවූ යම් ම දුකෙක් ඇත්නම් ඒ සියලු දුක් ම කෙළෙහි උපකාර නොදන්නාහට ම පැමිණේ"යි යනාදීන් මෙසේ කෙළෙහි උපකාර නොදන්නාවුන්ට වන්නාවූ අකුශල විපාක දක්වා "යමෙක් මෙබඳු කෙළෙහි උපකාර නොදන්නා පාපිෂ්ඨයන් හා එක් ව වාසය කෙරේ නම් ඕහටත් ඒ අකුශලය පැමිණෙන්නේය; එබැවින් පාපිෂ්ඨ වූ නුඹ ළඟ නොවෙසෙමි"යි එවිට[2] ම ගෙන් නික්ම භික්ෂුණීන් වසන මෙහෙණවරකට ගොස් මහණ ව උපසම්පද ව භාවනා කොට ධ්‍යාන උපදවා නොබෝ කලකින් රහත් වූහ.

එකල්හි ඒ වානරඝාතකයා ද තමාගේ භාර්‍යාව කී කාරණ අසා 'මා කෙළේ නොකළමනා දෙයෙක් මයැ'යි භයපත් ව ලජ්ජිධර්මයෙහි පිහිටා භයඞ්කාරයෙන්[3] වැටහුණාවූ මහත් සංවේගයට පැමිණ ගිහිගෙය හැර විහාරයට ගොස් ස්ථවිරයා වහන්සේට කියා මහණ ව උපසම්පද ලැබ රැදෙවෙහි නොපමා ව වීර්‍ය්‍ය වඩා භාවනා කොට නොබෝ දවසකින් ම රහත්බවට[4] පැමිණියේය. එසේ හෙයින් මිත්‍රද්‍රොහි කම් නොකොට තමහට කිසියම් උපකාරයක් කළවුන්ට නැවත ප්‍රත්‍යුපකාර කිරීමෙන් කෙළෙහි උපකාර දත ස්වර්ගමෝක්ෂ සම්පත්[5] සාධාදෙන්ට නිසි කුශලසම්භාරයන් රැ ස්කොට ගෙන සියල්ලවුන් ම මතු නිඳා නොඅසන්ට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි"

කරොථ මා මිත්තදුභිං කදාචි
අකතඤ්ඤු මා හොථ කතං සරාථ,
සග්ගාවහං භො කුසලං කරොථ
අනින්දිතා හොථ අනාගතෙසු-යි.

මේ මෙහි සතර වන
වානර වස්තුව ය.

---

1. අයශයෙක් (නැත) - GH
2. එවිගස - ක.කි.ඤ.ම.
3. භයාකාරයෙන් - L, බෙ.
4. විදර්ශනා වඩා රහත්බවට - H
5. සම්පත්තිය - GHJKL

Non-Commercial Distribution

නව ද මෙහි පස් වන ජයම්පතිකා වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මෙතැන්හි මතු කියන්නේ එහි පිළිවෙළ කථාව ය. යට ගිය දවස මෙම ලඬකාද්වීපයෙහි සඬඝ නම් අමාත්‍යපුත්‍රයකු හා සඬඝ දත්තා නම් කුමාරිකාවක හා දෙමහලු කෙනෙක් වූහ; ඔහු[1] දෙමහල්ලන් අතුරෙන් සඬඝ නම් අමාත්‍ය පුත්‍රතෙම ඉතා නොපිළිවන් කාලයෙහි විශෙෂ වූ ශ්‍රද්ධාවෙන් යුක්ත ව දන පරිත්‍යාග කිරීමෙන් සතර වාරයෙක දෙවතාවන් ලවා සාධුකාර දෙවූයේය. ඔහුගේ භාර්‍ය්‍යා වූ සඬඝදත්තා නම් කුමාරිකාවෝ තමන්ගේ දනතෙජසින් ශක්‍රදෙවෙන්‍ද්‍රයන්ගේ පාණ්ඩුකම්බල ශෛලාසනය හුණු කරවා ඒ බව දත්තාවූ ශක්‍රදෙවෙන්‍ද්‍රයන්ගෙන් එම ඇසිල්ලෙහි දිව්‍ය වස්ත්‍රයෙන් පූජා ලත්හ. ඔවුන් දෙමහල්ලන් අතුරෙන් පළමු කොට සඬඝ නම් අමාත්‍යයාණන්ගේ කථාව දක්වනු ලැබේ. හේ කෙසේ ද යත්;

යට ගිය දවස මෙම ලඬකාද්වීපයෙහි රුහුණු මාගම සඬඝ නම් එක් අමාත්‍යයෙක් දියෙණිකෙනකුන් හා එක ම පුතණුකෙනකුන් ලදින් ඒ පුතණුවන්ට තමන්ගේ නමින් ම සඬඝ අමාත්‍යය යි නම් තබා මහත් වූ ශ්‍රී සම්පත්තීන් යුක්ත ව වාසය කොට තමා මරණාසන්නයෙහි දරුදෙදෙනා තමා සමීපයට කැඳවා සඬඝ අමාත්‍ය නම් වූ බාලපුතණුවන් අත ගෙන වැඩිමහලු දියෙණියන් අතට පාවා දී "තොපගේ මලණුවන් වැඩීගත් කල නොහසා තබා දී ලව"යි කියා දහසක් වටනා පිළිසඟළක් ද මාහැඟි කඩුවක් හා මහත් වූ පුරභයක් ද යන සියල්ල ම දියෙණියන් අතට පාවා දී තෙමේ කාලක්‍රියා කෙළේය. ඉක්බිති ඒ සඬඝ අමාත්‍ය නම් කුමාර තෙම ක්‍රමයෙන් වැඩී දෙළොස් ඇවිරිදි වයසට පැමිණ මහත් වූ කායබලයෙන් හා රූපසම්පත්තීන් යුක්ත ව බුහුනණියන්ගේ ගෙහි ම වාසය කෙරෙයි. එසමයෙහි බැමිණිටියා සාය පැමිණියේය; ඉක්බිති ඒ සඬඝ අමාත්‍ය තෙමේ "දුර්භික්ෂභය සන්හුන් කල්හි නැවත එන්නෙම් වේ ද"යි කියා තමා සන්තක සියල්ල ම බුහුනණියන්[3] සමීපයෙහි තබා පසල්දනව්වෙක ගොස් වාසය කොට දුර්භික්ෂභය සන්හුන් කල්හි නැවත මාගමට අවුත් බුහුනණියන්ගේ ගෙහි ම නවාතැන් ගෙන දෙවන දවස් උදයන්හි ම ඉස්ගොධා නහන පිණිස තිසාවැවට ගියේ ය. එකල්හි කොටගල වසන මහානාග නම් තෙරුන් වහන්සේ අහර පිණිස මාගමට වැඩ ගම මුළුල්ලෙහි සිගා ඇවිද බත්සරළුවක් විවර[4] නොලැබ පාත්‍රය සේදූ වන ම ගෙන විහාරය බලා නික්මුණුසේක. එකල්හි සඬඝ අමාත්‍ය තෙම තෙරුන් වහන්සේ දක සමීපයට එළඹ "ස්වාමිනි, අහර ලද්දේ ඇද් ද"යි විචාළේ ය; එබසට තෙරුන් වහන්සේ "උපාසකය, අහර නොලබන්නෙම් වේ ද"යි වදාළසේක. එකල සඬඝ අමාත්‍ය තෙම "සවාමීනි, එසේ වී නම් මෙතැන්හි මඳක් වැඩසිටිය මැනවැ"යි කියා බුහුනණියන්ගේ ගෙට දිවගෙන ගොස් "පිසූ බත් ඇද් ද"යි විචාරා නැතැ යි කී කල්හි සමීපයෙහි ගෙයකට ගොස් තමාගේ දහසක් වටනා මුක්තාහාරයක් උකස්

1. ඔවුන් - DEGHL ම. ස
2. ඔවුන්ගේ - GHK
3. බුහුනණියන්ගේ - DEG
4. පමණ - H

Non-Commercial Distribution

කොට තබා එක ම කහවණුවක් අගනා පමණ ආහාරයක් ඇරගෙන තෙරුන් වහන්සේ කරා එළඹ ඒ බත් ලැබගත්තාවූ ආයාසයෙහි විවර කියා ගෙන ගිය බත් පාත්‍රයෙහි බහා පිළිගැන්වූයේය; මහානාහ තෙරුන්වහන්සේ ඒ බත පිළිගෙන පැන් ඵාසු තැනකට ගොස් වැඩහිඳ තමන් වහන්සේ තමන් වහන්සේට ම අවවාද කරනසේක් "එම්බා මහානාහයෙනි, මෙබඳු ශ්‍රද්ධවන්තයන් දුන්නාවූ මේ ආහාරය තොපගේ සන්තානය පිරිසුදුකොට ගෙන වළඳව"යි අවවාද කොට[1] සියලු සංස්කාර ධර්මයන් උදයව්‍යය වශයෙන් සම්මර්ශනය කොට එම පෙරවරු භාගයෙහි රහත් ව වැඩහිඳ ඒ බත වළඳ වදළසේක. එකෙණෙහි අනුරාධපුර නුවර වළගම්බාහු රජ්ජුරුවන්ගේ දළපුඩුසේසත වසන දෙවතාදූතොම සඞ්ඝ අමාත්‍යයන් දුන්නාවූ දනය අනුමෝදන් වන්නී සේසත් පුඩුවෙන් පිටත් ව අර්ධශරීරයක් දක්වා;

සාධු සාධු තයා දින්න - දනං ඨානෙ පතිට්ඨිතං,
තස්මා තං අනුමොදමි - සාධු සාධු උපාසක.

යනාදින් "සාධු, සාධු, උපාසකය, තා විසින් තෙරුන් වහන්සේට දෙනලද්ද වූ දනය සරුකෙත්[2] වපුළ බිජුවටක් මෙන් සවස්ථානියෙහි[3] පිහිටියේය; සඵල වීය. එසේ හෙයින් තා විසින් දෙන ලද්දවූ ඒ දනය සාධු සාධු මමත් අනුමොදන් වෙමි" සාධුකාර දෙමින් පින් අනුමෝදන්[4] වූව. මේ ඒ දෙවතාදූවගේ පළමුවන සාධුකාර ය.

රජ්ජුරුවෝ දෙවතාදූවගේ සාධුකාර ශබ්දය අසා "කවුරුන්ගේ සාධුනාදයෙක් ද"යි විචාළේය[5]. එවේලෙහි දෙවාතාදූතොමෝ සඞ්ඝ අමාත්‍යයාණන්ගේ දන මහත්‍ම්‍යය විස්තර වශයෙන් ප්‍රකාශ කොට කිව. රජ්ජුරුවෝ එපවත් අසා මහත් වූ සන්තොෂයට පැමිණියහ.

ඉක්බිති එක් දවසෙක එම අමාත්‍යයාණන් ගොළුමුහුද තාන්ට බට කල්හි ඔවුන්ගේ කුශලානුභාවයෙන් උදක් සතරන්මය වූ මසු දහසකින් පිරුණාවූ එක් දඬුඹරුවෙක්[6] අවුත් ඔහුගේ ශරීරයෙහි පහළේය; එකල අමාත්‍ය පුත්‍රතෙම සතරන් දෙන දක වතුරෙහි එන දඬුකඩෙකැ යි සිතා අතින් දුරු කෙළේය; එතෙම නැවත නැවතත් අවුත් ඔහුගේ ශරීරයෙහි ම පහරනේය; එවේලෙහි ඒ අමාත්‍යතෙම මේ එක් කාරණයෙක් වියයුතුය යි සිතා දියෙන් ගෙන වුත් ගොඩ තබා කඩුවෙන් පැහැර රත්රන් බව දන එයිදු ගෙනවුත් බුහුනණියන් අතට පාවා දී අනුරාධපුර නුවර යෙමි කියා බුහුනණියන් අත පළමු තිබූ පිළිසහල ඇරගෙන ඇඳ සුරහය බැඳ කඩුව උරෙහි එල්වාගෙන මහබැස නික්මුණේය. එකල්හි භික්ෂු කෙනකුන් වහන්සේ තිඹිරිගමුවය යි යන ගම සිහා ඇවිද කිසි ආහාරයක් නොලැබ පාත්‍රය සේදූ වන ම ගමින්

1. කොට ගෙන - H
2. සරුකෙතක - GHE
3. සස්ථානයෙහි -DEJ,ස ස්ථානයෙහි - KL
4. අනුමෝ - G
5. විචාළේය - පිටපත් හැම
6. දඬුරුවෙක් - CH

Non-Commercial Distribution

නික්මුණුසේක; එකල යන්නාවූ ඒ අමාත්‍ය පුත්‍රතෙම සිය පාත්‍රය ගෙන ගමින් නික්මුණාවූ භික්ෂූන් වහන්සේ දැක තමා ඇඳගෙන යමින් සිටියාවූ පන්සියයක් අගනා කසීසළුව මිල පිණිස එක් ගෙයක තබා බත් ගෙනවුත් ඒ භික්ෂූන් වහන්සේගේ පාත්‍රයෙහි බහා පිළිගැන්වූයේය; ඔවුන් වහන්සේ ද ඒ ආහාරය ගෙන ගොස් පැන්ඵාසු එක් රුක් මුලෙක්හි වැඩඋන්සේක් තමන් වහන්සේගේ කර්මජශරීරයෙහි නුවණ පතුරුවා ද්වත්‍රිංසාකාර කර්මස්ථාන මෙනෙහි කොට විදර්ශනා වඩා රහත් ව වැඩහිඳ ඒ ආහාරය දායාද පරිභොගයෙන් වළඳ වදාළසේක; එකල්හි ද රජ් ජුරුවන්ගේ ඡේසත වසන දෙවතා දූතොම මහත් වූ සන්තොෂයට පැමිණ පෙර පරිද්දෙන් ම ඒ ඒ දනය අනුමෝදන් වන්නී "සාධු, සාධු, උපාසකය, තා විසින් දෙන ලද්දවූ දනය ස්වස්ථානයෙහි[1] පිහිටියේය; එසේ හෙයින් තා විසින් දෙන ලද්දවූ දනය සාධු සාධු මමත් අනුමෝදන් වීමි' සාධුකාර දෙමින් අනුමෝදන් වූව. මේ ඒ දෙවතාදුවගේ දෙවන[2] සාධුකාරය යි. ඉක්බිති රජ්ජුරුවෝ පෙර පරිද්දෙන් ම සාධුකාර ශබ්දය අසා "මේ කවුරුන්ගේ සාධුනාදයෙක් ද"යි විචාළහ; දෙවතාදූ පළමු පරිද්දෙන් ම සඞ්ඝ අමාත්‍යයන්ගේ ඒ දන විශෙෂය ප්‍රකාශ කොට කිව; එකල්හි රජ්ජුරුවෝ මහත් වූ සන්තොෂයට පැමිණියහ.

නැවත එයින් මෑතභාගයෙහි දෙවගිරි නම් වෙහෙර වැඩ වසන එක් භික්ෂුකෙනකුන් වහන්සේ දෙළොස් අවුරුද්දක් මුළුල්ලෙහි වාතව්‍යාධියකින් මහත් වූ පීඩාවට පැමිණ වාසයකරනසේක් එක් දවසෙක තමන් වහන්සේට උපස්ථාන කරන සාමණේරයන් වහන්සේ සමීපයට කැඳවා "ඇවැත්නි, මට යම්තම් එළගිතෙලෙක්[3] ලදෙත් ප්‍රයෝජන ඇතැ"යි වදාළසේක; එතෙපුල් අසා සාමණේරයන් වහන්සේ සුපිළිසන් ව[4] සිවුරු ගැට ගන්වා තලු තැටියක් අතින් ගෙන ගම සිහා ඇවිද කිළිදිල්ලක් පමණ තෙලිත්තකුත් නොලැබ නැවත විහාරයට එනසේක. එවේලෙහි සඞ්ඝ අමාත්‍යතෙම සිය තලුතැටිය ගෙන විහාරය බලා වඩනා වූ ඒ සාමණේරයන් වහන්සේ දැක "ස්වාමිනි, කුමක් පිණිස ගමට වැඩිසේක් ද" යි විචාළේය; එකල සාමණේරයන් වහන්සේ[5] උපාධ්‍යායයන් වහන්සේට ගිතෙල් සිහා වැඩි නියාව වදාළසේක; එවේලෙහි සංඝ අමාත්‍ය තෙම "එසේ වී නම් ස්වාමිනි, මඳක් වැඩ සිටිය මැනව"යි කියා සාමණේරයන් වහන්සේ අතින් තලුතැටිය ගෙන ඇතුළුගමට වැද නොමිලයේ ගිතෙල් නොලැබෙන හෙයින් තමා අත තිබූ සුරහය උකස් කොට තබා කහවණු අටක් අගනා ගිතෙල් ඇරගෙන තලුතැටිය පුරා ගෙනවුත් සාමණේරයන් වහන්සේට දුන්නේය. සාමණේරයන් වහන්සේ තෙල් ගෙනවුත් තෙරුන් වහන්සේට පිළිගන්වා ඒ ගිතෙල් ලත් සැලැස්ම තෙරුන් වහන්සේට සැල කළසේක;[6] ඉක්බිති තෙරුන් වහන්සේ ගිතෙල්හි ඖෂධ බහා කකාරවා ගෙන නස්‍ය කළසේක; එකල ඒ සියලු ව්‍යාධිය අලපත නෙළුම්පත ඔත් දියත්තක් සේ මඳකුත් අලග්න ව පහ

1. ස්ථානයෙහි - DEKL
   ස්වසන්තානයෙහි - C
2. දෙවෙනි - J, ක.කි.කැ.ම
3. එළගිතෙලක් - ක.කි.කැ.ම.
4. සුපිළිපන් ව - EJKL
5. සාමණේරයන් වහන්සේගේ - JKL ක.කැ.ම.
6. වදාළසේක - CDFGHJKL

Non-Commercial Distribution

ව ගියේය; ඉක්බිති සන්හුන්නාවූ ව්‍යාධි ඇති තෙරුන් වහන්සේ "පිරුළෙන්[1] පිරුළු උතුම් පිරුළු" යයි කීවා සේ දැහැමෙන් ලද්දවූ එතෙලින් අධික ව තිබු ගිතෙල් ගෙන පිළිමගෙයි පහන් පූජා කළසේක. මෙසේ තෙරුන් වහන්සේ නිරොගි බවට පැමිණ කර්මක්ෂමවන්නාවූ කායචිත්ත ඇතිසේක් සිත එකඟ ව විදර්ශනා වඩා රහත් වූසේක. එකල්හි ද රජ්ජුරුවන්ගේ ඡත්‍රයෙහි වසන දෙවතාදූ තොමෝ;

> සාධු සාධු තයා දින්න - දානං ඨානෙ පතිට්ඨිතං,
> තස්මාහං[2] අනුමොදමි - සාධු සාධු උපාසක.

යනාදීන් සාධුකාර දෙමින් පින් අනුමොදන් වුව. මේ දෙවතාදුවගේ තුන්වන සාධුකාර ය. එකල රජ්ජුරුවෝ පෙර පරිද්දෙන් ම විචාරා ඒ දෙවතාදුව[3] විසින් එපවත් ප්‍රකාශ කොට කී කල්හි මහත් සන්තොෂයට පැමිණ ඔවුන් දක්නා කැමැති ව "ඒ සඞ්ඝ අමාත්‍යයාණන්[4] කොයි වසන පුරුෂයෙක් ද"යි අමාත්‍යවරුන් අතින් විචාළහ; එබසට අමාත්‍යවරු "දේවයන් වහන්ස, අපි ඔවුන් කොයි වසන කෙනකුන් බවත්[5] නොදනුම්හ; නොඅඳුනම්හ"යි කීහ.

ඉක්බිති රජ්ජුරුවෝ කියන්නාහු "ඒ අමාත්‍ය පුත්‍රයා උන් තැනකින් විචාරා සොයා කැඳවාගෙන එව; ඉදින් යමෙක් ඕහු දැක කැඳවාගෙන ආයේ වී නම් ඕහට බොහෝ සැපත් දෙමි" කීහ. එබස් අසා රාජපුරුෂයෝ ඒ සඞ්ඝ අමාත්‍යයාණන් ඉඳිනා තැනක් පරීක්ෂා කොට කැඳවාගෙන එම්හ යි ඔවුනොවුන් පරයා නුවර සතර වාසලින් නික්මුණාහ; එකල නැගෙනහිරි වාසලින් ගිය රාජපුරුෂයෝ ගමනින් මිරිකුණාවූ විඩා මුසු ශරීර ඇති ව කඩුවක් උරෙහි එල්වාගෙන රජ්ජුරුවන් දක්නා පිණිස සමීපයේ එමින් සිටියාවූ ඒ අමාත්‍යයාණන් දැක කථා කිරීමෙන් ම ඔවුන් හැඳින ගෙන" සොයා ගිය බෙහෙත්[6] පෙරමඟ තිබුවා සේ නුඹ දුටු සේ[7] ඉතා මැනව; රජ්ජුරුවන් වහන්සේ නුඹ දක්නා කැමැති සේක; නොපමා ව යම්හ යි කියා ඒ අමාත්‍යයාණන් එන දවස මහත් තනතුරු ලබන බවට පූර්වනිමිත්ත දක්වන්නා සේ ඉදිරි කොට කැඳවා ගෙන පිරිවරා නික්මුණාහ. මෙසේ රජ්ජුරුවන් දකින්ට එන්නා වූ ඒ අමාත්‍ය තෙම සෑගිරි වෙහෙර කෙළවර පිරිවෙනට වැද සඞ්ඝයා වහන්සේ වැඳ එකත්පස් ව උන්නේය; එකල එක් රහත් තෙර කෙනකුන් වහන්සේ සිවුරක් ගෙත්තම් කරනසේක් මැඩිල්ලක් අඩු හෙයින් අකුළුවා තබන්ට වන්සේක; ඒ දැක තමා හින තිබූ පන්සියයක් වටනා කසීසළුව එක් කෙළවරකින් කඩා භාගයක් දුන්නේය; ඉක්බිති තෙරුන් වහන්සේ ඒ කඩකැබැල්ල ගෙන සිවුරෙහි අඩුව පුරා ගෙත්තම් කළසේක[8]; ඒ දැක අමාත්‍යතෙම මහත් වූ සන්තොෂයට පැමිණ වැඳ අවසර ඉල්වා

---

1. පිරිලෙන් - J
2. තස්මාහං - KL
3. දේවතාදූ - ක.සි.ඤ.ම
4. අමාත්‍යයා නම් - ම.
5. ඉඳිනා බවත් - DEGHKL ය
6. බෙහෙතක් - C
7. දුටුයේ - C
   දුටුවේ - E
8. කරන සේක - ක.සි.ඤ.ම.

Non-Commercial Distribution

ගෙන අනුරාධපුර නුවරට ගියේය. එකල්හි ද රජ්ජුරුවන්ගේ සේසත වසන දෙවතාදු තොම පළමු පරිද්දෙන් ම අධිශරීරයක් දක්වා සිට සාධුකාර දෙමින් පින් අනුමොදන් වුව. මේ දෙවතාදුවගේ සතර වන සාධුකාර ය. රජ්ජුරුවෝ ද ඒ සාධුකාරනාදය අසා පෙර පරිද්දෙන් ම විචාරා දෙවතාදුව[1] විසින් ඒ බව ප්‍රකාශ කොට කී කල්හි තමන් සිය අතින් කළ කුශලයක් මෙන් අතිශයින් සන්තොෂ ව ඒ අමාත්‍යයාණන්ගේ ගුණකථා ම කියකියා ඔවුන්ගේ ශ්‍රද්ධාගුණය ම වර්ණනා කෙරෙමින් උන්හ.

එකෙණෙහි ඒ සංඝ අමාත්‍ය තෙමේ නොලස් ව ගොසින් රජගෙයි දෙරකඩ සිට තමා ආ බව රජ්ජුරුවන්ට කියා යවා එන්ට කියවයි කී කල්හි රජගෙට වැද රජ්ජුරුවන් දක එකත්පස් ව සිටියේය; එකල අමාත්‍යපුත්‍රයා දක සතුටු වූ රජ්ජුරුවෝ කලට සුදුසු මිහිරි වූ පිළිසඳර කථා කොට බොහෝ පරිවාර හා සමඟ මහත් වූ සම්පත් දී භාණ්ඩාරනායක[2] ස්ථානාන්තරයෙන් පූජා කොට ඔහු විසින් කරනලද්ද වූ සියලු පින්කම් ම අනුමෝදන් ව බොහෝ සම්මාන[3] දුන්හ. එකල සංඝ අමාත්‍ය තෙම රජ්ජුරුවන්ගෙන් ලබනලද බොහෝ සම්පත් ඇති ව තමහට සුදුසු කුමාරිකාවක් පරීක්ෂා කෙරෙමින් දරාහරණයක් නැති ව වාසය කරන්නේය.

මේ සංඝ අමාත්‍යයාණන්ගේ උත්පත්ති කථාව ය.

ඔවුන්ගේ භාර්‍ය්‍යා වූ සංඝදත්තාවන්ගේ පිළිවෙළ කථාව නම් කවර යත්;

මෙම ලඞ්කාද්වීපයෙහි[4] යට කියනලද්දවූ බැමිණිටියාසායට පූර්වභාගයෙහි අනුරාධපුර නුවර එක් කුලයෙක පුතුන් සත්දෙනකු හා එක ම දියෙණි කෙනෙක් වූහ. එයින් මෑත භාගයෙහි ඔවුන්ගේ මවුපිය දෙදෙන මිය පරලොව ගියාහුය; ඉක්බිති බැමිණිටියාසාය පැමිණියේය; එකල්හි සත්බෑයෝ[5] ඔවුනොවුන් හා මන්ත්‍රනය කොට "අපි හැමදෙන ම ප්‍රත්‍යන්තජනපදයකට ගොස් ජීවත් වම්හ"යි කියා සියල්ලෝ ම[6] එක්සිත් ව එපවත් තමන්ගේ බාල නැගණියන්ට කී කල්හි ඒ නැගණියෝ ද යහපතැ යි ගිවිස වැඩි මහලු සත්බෑයන්ට කියන්නාහු 'පියඞ්ගල[7] වෙහෙර වසන අපගේ කුලූපග වූ චූළනාග තෙරුන් වහන්සේත් කැඳවා ගෙන යම්හ" යි කීහ. එවේලෙහි ඔහු සත්බෑයෝ ද යහපතැ යි ගිවිස තෙරුන් වහන්සේ කැඳවාගෙන ප්‍රත්‍යන්තයට ගොස් පන්සලක් කොට තෙරුන් වහන්සේ එහි වස්වා සත්බෑයෝ එක් ව වනාන්තරයට ගොස් ඵලාඵල ගෙනවුත් තෙරුන් වහන්සේට දන් දෙමින් නැගණියන් ද පොෂ්‍යය කරන්නාහ.

ඉක්බිති එක් දවසෙක ඔහු සත්බෑයෝ ගිය තැනින් වස්ත්‍රයක් ලැබ ගෙනවුත් නැගණියන්ට දුන්හ; ඒ කුමාරිකාවෝ දෙවන දවස් ගෙදෙරට සිහා වැඩි චූළනාග තෙරුන් වහන්සේ දක ඔබගේ සිවුරු ඉතා දුර්වල හෙයින් තුමූ පළමු තුබූ රෙදිකඩ

---

1. දේවතාදූ - ක.කි.ඤ.
2. භාණ්ඩාගාරනායක - ක.කි.ඤ.ම. සම්පත් භාණ්ඩාරයෙක - L; සම්පත් හා භාණ්ඩාරනායක - K
3. සැපත් - GH; සම්පත් - K
4. ලක්දිව- GHKL, ස
5. සත්බෑයෝ එක් ව - DEGHKL, ස
6. සියල්ල ම - ක.කි.ඤ. සියල්ලෝ ම - ABCDEFGHJK
7. පියන්ගලු - C; පියගල - KL

Non-Commercial Distribution

හැඳගෙන දුක සේ ලත් ඒ කඩපොල්ල දන් දෙනු කැමැති ව තෙරුන් වහන්සේ සමීපයට එළවූහ. එකල්හි ඔවුන් දුක්පත් බව දන්නා කරුණාපර වූ[1] තෙරුන් වහන්සේ කුමාරිකාවන් කෙරෙහි අනුකම්පාවෙන් වදරන සේක් "එම්බා නැගණියෙනි; මේ වස්ත්‍රය නොකැමැත්තෙමි ය;[2] ඉදින් පරණ රෙදිකඩෙක් ඇත්නම් අපට යහපතැ"යි වදළසේක. ඔබ එසේ වදළ ද කුමාරිකාවෝ "ස්වාමිනි, දුක්පත් මිඩියට මෙලොවින් කරුණා නොකොට පරලොවින් අනුග්‍රහ කළ මැනවැ"යි කියා නැවත නැවත යාච්ඤකොට ඒ වස්ත්‍රය ඔබගේ පාමුල්හි තුබූහ; එකල්හි තෙරුන් වහන්සේ ඒ වස්ත්‍රයෙන් සිවුරක් කොට රඳ ගෙන බොහෝ කඩරෙදි තට්ටු තබා දළහුයින් ගෙත්තම් කරන ලද්දවූ පරන සිවුරු කන්ථනය[3] තබා ඒ අලුත් සිවුර වැළඳගත් සේක. ඉක්බිති තෙරුන් වහන්සේ සිවුරු කළ එාසු හෙයින්[4] සිත එකඟ ව විදර්ශනා වඩා රහත් වූසේක; සංඝදත්තා නම් වූ කුමාරිකාවෝ ඒ වස්ත්‍රය දන් දී සතුටුසිතින් ගෙට වැද තමන් දුන් දන් සිත සිතා වැදහොත්තාහ;[5] එකෙණෙහි කුමාරිකාවන්ගේ දන තෙජසින් ශක්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය හුණු විය; එවේලෙහි සක්දෙව් මහරජනෙම් තමාගේ දහසක් නුවණැස් ලා මිනිස්ලොව බලනුයේ කුමාරිකාවන් විසින් කරනලද්දවූ කුශල විශෙෂය දක තුටුපහටු[6] සිත් ඇති ව දිව්‍යවස්ත්‍ර අටක් කුරපයියක ලා ගෙනවුත් පිළීකුරපයිය කුමාරිකාවන්ගේ ඉස්දෙර තබා එයින් පිළී කෙතෙක් වියදම් කළත් පයියෙහි තුබු පිළී අට අඩු නොවන සේ අධිෂ්ඨාන කොට තෙමේ[7] ශක්‍රභවනයට ගියේය.

ඉක්බිති කුමාරිකාවෝ තමන් ඉස්දෙර තුබූ කුරපයිය උනා දිව්‍යවස්ත්‍ර දක "තමා[8] විසින් තෙරුන් වහන්සේට දුන්නාවූ වස්ත්‍රදානයෙහි විපාකය අද ම ලදිමි"යි බලවත් සන්තොෂයට පැමිණ එයින් එක් දිව්‍යවස්ත්‍රයක් හැඳ ගෙන සෙසු සත් බෑයන්ට එකී එකී පිළිසහළක් බැගින් තුදුසක් දිව්‍යවස්ත්‍ර දී නැවත තෙරුන් වහන්සේට තුන්සිවුරට සෑහෙන විතර දිව්‍යවස්ත්‍ර පිළිගැන්වූහ. මෙපරිද්දෙන් කෙතෙක් වස්ත්‍ර වියදම් කළත් කුරපයියෙහි පිළී අඩු නොවන්නේ මය. මෙසේ ඔහු බොහෝ දවසක් එහි ම වාසය කොට දුර්භික්ෂ භය සන්හුන් කල්හි ඒ ප්‍රත්‍යන්තයෙහි පර්වතයෙන් බැස අනුරාධපුර නුවරට එන්නාහු තිසාවැව සමීපයට පැමිණියහ.

එකල්හි යට කියනලද සංඝ නම් අමාත්‍යතෙම බොහෝ පරිවාරජනයන් හා නුවණැති බහුශ්‍රැත වූ පණ්ඩිතවරුන් විසින් පිරිවරනලදු ව ඉස් ශෝධා නහනු පිණිස තිසාවැවට ගොස් දියකෙළියට පටන් ගත්තේය; එකල අකාලමෙඝයෙක් නැහෙන්නේ

---

1. කරුණාකර වූ - JKL ක.සි.සැ.ම.
2. නොකැමැත්තේය - EGHKL
3. කන්ථය - K ම.
   කන්ථක චීවරං - පාලි
4. සිවුරු කොළ පසුන් හෙයින් - DEGKL
   සිවුරු කොළ එාසු - J, ම.
5. වැදහොත්හ - E ක.සි.සැ.ම.
6. තුටුපහටු වූ - GH
7. තමන්ගේ - H
   තමන් - DEGJKL
8. මා - KL

Non-Commercial Distribution

මහත් වූ ගර්ජනා කෙරෙමින් ඒ ඒ තැන්හි පෙණ සියගණන් ගසමින් දශදිගන්තරය[1] අඳුරු කොට ගෙන එන්නට වන; ඒ වර්ෂාව දක හැමදෙන ම දියෙන් ගොඩ නැගි වැව් මියර[2] පිට කරනලද්දවූ එක් ශාලාවෙක සිටියාහ. බාල නැගණියන් හා සමග නුවරට එන්නාවූ සත්බෑයෝ ද වර්ෂා වැස ගෙන එන්නා දක දිවගොස් හෙල්ලෝලිය නම් ගමට වන්හ; කුමාරිකාවෝ වනාහී ඉක්මන් නො ව ඇත්ගමනින්[3] ඇත් මැත් නොබලා බැලුවන්ට රිසියෙන ආකල්පසම්පත්තීන් යුක්ත ව සුශික්ෂිත මඬගල්‍ය හසතිරාජයකු මෙන් පියවරින් පියවරට තබා සෙමින් සිට ම එන්නාහ; සංඝ අමාත්‍යතෙම එසේ එන්නාවූ කුමාරිකාවන් දක "මේ කුමාරිකා තොමෝ ඉතා සුශික්ෂිත වූ විනීත වූ එකක,[4] මෙබඳු හයලජ්ජා සම්පන්න යහපත් ගුණ ඇති කුමාරිකාවක් මීට පළමු නුදුටුයෙමි" සිතසිතා ඒ කුමාරිකාව කෙරෙහි පිළිබඳ සිත් ඇති ව ඔවුන් නුදුටු කෙනකුන් මෙන් පණ්ඩිතවරුන් දිසාවට මුහුණ ලා සිට "පින්වත් වූ පණ්ඩිතවරුනි, මේ ලොකයෙහි කෙසේ වූ ආචාරගුණ ලක්ෂණයෙන් යුක්ත ස්ත්‍රීහු තුමු[5] ස්වාමිකුලයා වර්ධනය කොට පමුණුවද් ද" යි විචාළේය; එබසට පණ්ඩිතවරු "එසේ වී නම් ඇසුව මැනවැ" යි කියා ස්ත්‍රීන්ගේ ගුණ නුගුණ[6] ලක්ෂණ දක්වන්නාහු;

ලොකො වදති පුංසානං - සුඛං දුක්ඛං භවාභවං,
භරියායත්තනන්ති තං ඤත්වා - කලත්තං[7] සඞ්ගහෙ බුධො.

යා කඤ්ඤා දෙවකඤ්ඤාව - හොති සබ්බඞ්ගසොභනා,
තස්සා වෙ දුග්ගුණා හොන්ති - තෙහි රූපං පිථීයති.

උත්තරොට්ඨෙ කපොලෙ ච - ඌරු ජංඝාසු බාහුසු,
සා වෙ පතිං විනාසෙති - යස්සා හොන්ති තනූරුහා.

රවන්ති ගච්ඡමානාය - සද්ධයො ච හසන්තියා,
ගණ්ඩ කූපානි ජායන්ති - සාරිනී පතිනො සද.

යනාදීන් "මේ ලොකයෙහි පුරුෂයන්ට වන්නාවූ දුක් සැප වැඩ අවැඩ යන සියල්ල උන් උන්ගේ ගෙහි වසන භාර්‍යාවන් පිළිබඳය යි ලොකවාසී සත්වයෝ කියන්නාහු මය; එසේ හෙයින් ඊට සුදුසු වූ යහපත් ස්ත්‍රීන් පරීක්ෂා කොට දන නුවණැති පුරුෂයන් විසින් ස්ත්‍රී සංග්‍රහය කොට කුටුම්බසණ්ඨාපනය කටයුත්තේ ය. එබැවින් මේ ලොකයෙහි යම් ස්ත්‍රියක් තොමෝ රූපශ්‍රීන් බබලන දිව්‍යාඞ්ගනාවක මෙන් සියලු අවයව සම්පත්තීන් හොබනී වී නමුත් ඉදින් තොමෝ නිර්ගුණ එකක් වූ නම් ඇගේ ඒ සියලු රූපසම්පත්තිය මහත් වූ දුම්වලාකඩකින් වැසුණු පුන්සඳ මඬලක් මෙන් නුගුණයෙන් ම යට ව අප්‍රකාශ වන්නේය. ඉදින් යම්කිසි ස්ත්‍රියකගේ දැත් දෙපය ද උඩු තොල්හි ද දෙකපොලයෙහි ද යන මෙකී ස්ථානයෙහි දික් රෝමයෝ ඇත්තාහු වූ නම් ඕතොමෝ එකාන්තයෙන් ස්වාමිපුරුෂයන් කන යකින්නක වැන්නීය. ඉදින් යම් ස්ත්‍රියක් තොම බඳුන් මුවවිට් සේ මහත් කළුපැහැ

1. දශ දිගාන්තරය - CDEGHKL
   දශ දිශාන්තරය - ක.කි.ඤ.
2. මීය - ඛෙ.
3. ඇත් ගමනින් (නැත) - ක.කි.
4. එකෙක - CDEGH
5. ස්ත්‍රී තොමෝ - J, ක.කි.ඤ.ම.
6. ගුණ නුවණ - G,
   ගුණාගුණ - ක.කි.ඤ.ම.
7. කලං තං - DGHJ

Non-Commercial Distribution

ඇති ව කෙළ තොලු වූ තොල් ඇත්තී ද කිඹුලුන්ගේ දත් මෙන් අවුල් ව කෲර වූ දත් ඇත්තී ද පියාපත් සිඳ හළ මයුරයකු මෙන් හිසකේ නැත්තී ද [තල්හිළමෙන් ඉතා දළ වූ තද ඉසකේ ඇත්තී ද[1]] අසුරයන් සේ දෙකොළින් පිටත නික්ම තිබෙන්නා වූ දළ ඇත්තී ද [එසේ වූ ස්ත්‍රී ද බකල පෙණ පා[2] ඇත්තී ද][1] එසේ වූ ස්ත්‍රීතොම ඉතා කෘපණ ව දිළිඳු වන්නීය. මේ ලොකයෙහි යම් ස්ත්‍රියක් තොම එක් ඇසක් කණ ද වමරැසි ද[3] දැස් අන්ධ ද ඌරුළිඳ[4] ජලය මෙන් ගැඹුරු ව විෂම වූ අක්ෂිකූප ඇත්තී ද මීයේ පැහැ මෙන් ඉතා පිඟුවන් වූ ඇස් ඇත්තී ද කකුළුවන්ගේ ඇස් මෙන් පිටතට නික්ම දියබුබුලක් මෙන් තිබෙන්නාවූ පුප්ඇස් ඇත්තී ද එබඳු වූ ස්ත්‍රීතොම ඒකාන්තයෙන් ම වැන්දඹු වන්නීය. තව ද යම් ස්ත්‍රියක් තොම දුෂ්ට වූ ප්‍රතිශ්‍යා ඇත්තී ද නිරන්තරයෙන් මුකුණු[5] වැහෙන නාසා ඇත්තී ද ගිරවුන් තුඩු මෙන් වක් වූ දික් නැහැ ඇත්තී ද පාපිෂ්ඨ වූ කුෂ්ඨරොග ඇත්තී ද ඔරුදඬක් මෙන් දික් වූ උර ඇත්තී ද වණ ඇති ශරීර හා කාකස්වර ව බිඳුණාවූ හීනස්වර ඇත්තී ද එබඳු ස්ත්‍රීතොම ඉතා කාළකණ්ණි වෙයි. ඉදින් යම් ස්ත්‍රියක් තෙම ඉතා කෲර වූ ශබ්ද ඇත්තී ද කේළාම් කියා ද මිත්‍රද්‍රොහි ද ඩබර කැමැත්තී ද එකාවන් බඩ වෛර ඇත්තී ද ඕතොම පෙනි පෙනී සිට පුරුෂයන් මරන මාර යකු වැන්නීය. තව ද යම් ස්ත්‍රියක් බොහෝ කොට දෙඩමලු ව කථා කෙරේ ද දුර ඇසෙන සේ මහත් කොට ඔක්කොල් සිනා සේ ද සිත් වූ පරිද්දෙන් නුවර මැද නුරා කොට ඇවිදිනා වෙශ්‍යාවක මෙන් ඒ ඒ තැන්හි ඇවිදිනා කැමැති වේ ද ඉතා බොහෝ කොට කැවිලි කා ද කිසියම් භයක් ලජ්ජාවක් නැත්තී ද එසේ වූ ස්ත්‍රීතොමෝ ස්වාමිපුත්‍රයා හා සමඟ සියලු සැපත් ම නසන්නී ය. නැවත යම් ස්ත්‍රියක් සොරකම් දනී ද තද වූ සිත් ඇත්තී ද සුරාපානය කෙරේ ද නොසබා තෙපුල් කියා ද උඩඟු ව වාසය කෙරේ ද එකාවන් ව කෙළි සිනා කැමැත්තී ද එසේ වූ දුෂ්ට ගුණ ඇති ස්ත්‍රීතොමෝ වැන්දඹු වන්නී ය. ඉදින් යම් ස්ත්‍රියක් ගමන් යන කල ශරීරයෙහි ඇට සන්ධි බැණ නැගේ ද සිනාසෙන කල්හි කපොලය වළ වේද[6] එසේ වූ ස්ත්‍රීතොම තමාගේ ස්වාමිපුත්‍රයාට නිරන්තරයෙන් ම අනර්ථ පමුණුවන්නීය" යනාදීන් ලක්ෂණහීන වූ ස්ත්‍රීන් දක්වා නැවත ස්වාමිකුල වර්ධනයට යොග්‍ය වූ ගතමනා ස්ත්‍රීන් දක්වන්නාහු;

යා වෙ ලක්ඛණහීනා'පි - අඤ්ඤවා ගුණවා වධූ,
පුබ්බුට්ඨායි ච යා හොති - තථා පච්ඡා නිපාතිනී.

න හින්දති සද කාමං - යා කතඤ්ඤා පතිනො මනං,
සුඛදුකෙඛ සමා හොති සා පාණෙන සමාගතා,[7]

පුත්තං සපතිරූපෙන[8] - ජනෙති[9] නා 'තිවාරිනී,
ධීතරං සකරූපෙන - යා ජනෙති ස උත්තමා.

---

1. වරහන් තුළ වූ කොටස් (නැත) - ABCDEFGH
2. පේනපා - ක.කි.සඳ.
   ප්‍රේනපා - මා
   පෙත් රූ - K
3. වපරැසි ද - EGHKL
4. ඌරු ළිඳක - KL ස.
5. මකුණු - CEGH
6. ගැසේ ද - GHKL
7. සමාමිනා - ම. පාලි
8. සම්පත්තිරූපෙන - CDEGHJKL
9. ජනෙන්ති - GHKL

Non-Commercial Distribution

භූමිං අකම්පයං යාති - යාති කත්‍ථදා සනිං සනිං,
දිසං යා නාවලොකෙති - චරිතබ්බා චරෙතිධ.[1]

යනාදීන් "තව ද අමාත්‍යපුත්‍රයාණන් වහන්ස, මේ ලොකයෙහි යම් ස්ත්‍රියක් තොමෝ ඉදින් කිසි ලක්‍ෂණයක් නැත්තී වූ නමුත්[2] ස්වාමිපුත්‍රයාහට කීකරු ව වාසය කෙරේ ද මනා වූ ගුණ ඇත්තී ද සැතපෙන වේලෙහි ස්වාමිපුත්‍රයාහට පසුව ශයනගත වේ ද නිද පුබුදිනා කල්හි පළමු ව නැඟී සිටී ද තමාගේ ස්වාමිපුත්‍රයාහට නිරන්තරයෙන් හිතකාමී ව අභිප්‍රායවෘඩ්[3] පමුණුවා සැපතෙහි පිහිටුවා ද එසේ වූ ස්ත්‍රීතොමෝ ඒකාන්තයෙන් ස්වාමිපුත්‍රයාහට වැඩ පසස්නා වූ යහපත් ස්ත්‍රී නම් වෙයි. නැවත යම් ස්ත්‍රියක් තොමෝ හැම කල්හි ම තමාගේ ස්වාමිපුත්‍රයා සිත් වූ පරිද්දෙන් වාසය කෙර් ද යම් කිසි ව්‍යසනයක් පැමිණි කල්හි දුක්සැප දෙක්හි ඒකාකාරයෙන් සම වූ[4] අදහස් ඇති ව අත් නොහැර සිටින්නී ද එසේ වූ ස්ත්‍රී තොමෝ ස්වාමිපුත්‍රයාහට ජීවිතය හා සමාන වූ යහපත් ස්ත්‍රී නම් වෙයි. තව ද යම් ස්ත්‍රියක් තොමෝ ස්වාමිපුත්‍රයාහට කවන පොවන කල්හි ද සමීපයෙන් යන එන වේලෙහි ද සමඟ සැතපෙන වේලෙහි ද යම් කිසි භයක් උපද්‍රවයක් ව්‍යාධියක් පැමිණි කාලයෙහි ද යන හැම තැන්හි සම වූ ප්‍රෙම සහිත වූ සිත් ඇත්තී ද එසේ වූ උත්තම ස්ත්‍රීතොමෝ පතිපූජිකා[5] නම් වෙයි. තව ද යම් ස්ත්‍රියක් තොමෝ ස්වාමිපුත්‍රයාහට හුණු සිහිල් පැන් තබා ද හස්තපාද සම්බාහනාදි කාලයෙහි අනාදරසීලී නොවේ ද ඇඟ ගල්වන සඳුන් සුවඳ හා පළඳනා සුවඳ මල්[6] ආදිය එළවා තබා ද ස්වාමිපුත්‍රයා[7] බලබලා හැඳපුටු ආදි උස් ආසනයෙක නො හිඳී ද එසේ වූ ස්ත්‍රීතොම පතිපූජිකා නම් වෙයි. තව ද යම් ස්ත්‍රියක් තොමෝ තමාගේ මවුපියන් හා නැදිමයිල් ආදීන් කෙරෙහි ද මල්බෑයන් හා අවශ්‍ය බන්ධු ආදීන් කෙරෙහි ද නිරන්තරයෙන් ආදර සහිත ව වාසය කෙරේ ද එසේ වූ ස්ත්‍රීතොමෝ තමාගේ බන්ධුකුලයා සතුටු කරවන හෙයින් කුලනන්දනී නම් වෙයි. නැවත යම් ස්ත්‍රියක් තොමෝ දඩබිම ආදියෙහි කර්මාන්ත කරන්නාවූ දාසි දාසුන් හා අවශෙෂ කර්මකාරී[8] ජනයන් ඒ ඒ කර්මාන්තයෙහි දැහැමෙන් යොදන්නී ද ඉතා චණ්ඩපරුෂ වූ බස් නොකියා ද ඉසකේ එකුරුතු[9] ගෙන මැරීම් තැළීම් ආදි වූ යම්කිසි දණ්ඩනයක් නොකෙරේ ද ආක්‍රොශ පරිභවයක්[10] නොකෙරේ ද[11] ඕතොමෝ තමා කෙරෙහි ජනයන් සිත් අලවා වාසය කරන හෙයින් ජනරඤ්ජනී නම් වෙයි. තව ද යම් ස්ත්‍රියක් තොම එකාවන් ව දන් පින් කිරීම් ආදි වූ සුචරිත ධර්මයෙහි හැසිරේ ද තුනුරුවන් කෙරෙහි මමත්වය ඇත්තී ද ශීලාචාර ගුණයෙන් යුක්ත ද එසේ වූ ස්ත්‍රීතොම සියලු ගුණධර්මයෙහි හැසිරෙන හෙයින් ධර්මචාරිණී නම් වෙයි. තව ද යම් ස්ත්‍රියක් තොමෝ අන්‍ය පුරුෂයන් කෙරෙහි අනුරාගයක් නූපදවන්[12] හෙයින් තමාගේ ස්වාමිපුරුෂයා[13] හා සමාන වූ පුතුන් වදන්නී ද තමා හා සමාන

1. සාපි කත්‍ථදා වරාරොහා චරිතබ්බා චරෙතිධා යන අතිරේක ගාථාර්ධයක් මෙතැන්හි ම. හා පාලි හි පමණක් පෙනේ.
2. නම් - CDEGHJ,
3. අභිප්‍රාවර්ධන - CGH; අභිවෘද්ධි - D අභිප්‍රාවෘද්ධි - E
4. සම ව පවත්නා - ම.
5. පතිපූජිකා - L ක.කි.
6. සඳුන් සුවඳ මල් - ක.කි.කැ.
7. ස්වාමීහු - DEGHKL
8. කර්මකාරක - ක.කි.කැ.ම
9. එකුඅරු - ක.කි.කැ එකඅරු - ම
10. පරිභව - GHK; පරිභවනය - L
11. නොබෙණේ ද - GHKL
12. නූපදනා - CJ
13. ස්වාමිපුත්‍රයා - CJ

Non-Commercial Distribution

රූපශොභා ඇති දූන් වදන්නී ද ඕ තොමෝ උත්තම[1] ස්ත්‍රී නම් වෙයි. ඉදින් මේ ලොකයෙහි යම් ස්ත්‍රියක් තොමෝ පය කඩියන් කෑ ගෝණදෙනක මෙන් අඩි ගසා නොගොස් කරබාගෙන දසදික් නොබලා කිසිවෙක නොපැකිළ මලස්නෙක පිළිවෙළින් රත්පියුම් තනන්නියක මෙන් පියවරින් පියවර තබා සෙමෙන් ගමන් යේ ද ඔයිදු උත්තම ස්ත්‍රී නම් වෙයි. එසේ හෙයින් එබඳු හය ලජ්ජාසම්පන්න ආරොහ පරිණාහයෙන් යුක්ත උත්තම ස්ත්‍රීන් පරීක්ෂා කොට නුවණැති පුරුෂයන් විසින් කැමැති ව රක්ෂා කටයුත්තේය" යි කීහ.

මෙසේ ලක්ෂණ කීවාවූ පණ්ඩිත ජනයන්ගේ බස් අසා සඬස අමාත්‍ය තෙම දුරින් ම එන්නාවූ ඒ කුමාරිකාවන් දැක ලක්ෂණ පාඨකයන්ට ද දක්වා ඔවුන් විසිනුදු "මෙබඳු සුශික්ෂිත කුමාරිකාවක මීට පූර්වභාගයෙහි නුදුටු විරුම්හ"යි කී කල්හි කීපදෙනකු කැඳවා "එම්බා සගයෙනි, නෙපි ගොසින් තෙල එන කුමාරිකා තොමෝ සස්වාමික දෝ හො යි අස්වාමික දෝ හො යි විචාරා නියම දැන වහා එව" යි කියා යවීය; ඒ පුරුෂයා ද ගොසින් කුමාරිකාවන් අතින් එපවත් විචාරා අස්වාමික බව දැන අවුත් අමාත්‍යයාණන්ට කීහ; එකල සඬස අමාත්‍යතෙම අස්වාමිකය යනු අසා ඒ කුමාරිකාවන්ගේ වැඩිමහලු සත්බෑයන් සමීපයට කැඳවා තමන්ගේ අභිප්‍රාය කියා ඔවුන් යහපතැ යි ගිවිසි කල්හි එතැනදී ම මඟුල් කොට කුමාරිකාවන් පාවා ගෙන එම විට ම මහත් වූ ඓශ්වර්‍ය්‍ය දුන්නේය. ඒ කුමාරිකාවෝ ද සඬස අමාත්‍යයාණන් ආදි කොට ඇති යටත් පිරිසෙයින් කුඩා කොල්ලන්[2] දක්වා සියල්ලවුන්ට ම දිව්‍යවස්ත්‍ර දුන්හ. ඉක්බිති සඬස අමාත්‍යතෙම සඬසදත්තාවන්ගේ වැඩිමහලු සත්බෑයන් අසුන් සත්දෙනකු පිට නංවා මහත් වූ පරිවාර[3] හා සමඟ නුවරට නික්මවා තුමූ සඬසදත්තාවන් හා සමඟ රථවාහනයකට පැනනැඟී සුජාතා නම් අසුරකන්‍යාවන් හා සමඟ වෛජයන්ත රථයට නැඟී දිව්‍යවීථියෙහි ගමන් ගත් ශක්‍රදෙවේන්ද්‍රයා පරිද්දෙන්[4] මහත් වූ සශොභාෂයෙන් යුක්ත ව නුවර බලා නික්මුණාහ.

එකල්හි සඬසදත්තාවෝ දක්ෂිණ මහා චෛත්‍යය හා රුවන්වැලි මහසෑය දැක සඬස අමාත්‍යයාහට කියන්නාහු "ස්වාමිනි, මේ චෛත්‍ය දෙකෙහි ම ධජපතාක බඳවා පූජාකොට යනු කැමැත්තෙමි; දිග ඇති බොහෝ හුණදඬු ගෙන්වුව මැනවැ"යි කීහ; එතෙපුල් අසා අමාත්‍යතෙම එම ඇසිල්ලෙහි ගැල් සැටක්[5] පුරා හුණදඬු ගෙන්වූයේය; ඉක්බිති කුමාරිකාවෝ විහාර දෙකෙහි ම වටා හුණදඬු සිටුවා රන්වන් වූ දිව්‍ය වස්ත්‍රයෙන් ධජපතාක බැඳ පූජා කළහ; එකල මඳ මඳ පවනින් ලෙලදෙන ලද්දා වූ ඒ ධජපතාකයෝ දසදිග රන්රස ධාරාවන් ඉස්නා කලක් මෙන් අතිශයින් ශොභාමත් ව බැබළෙන්ට වන්හ. නැවත දගබ් දෙකෙහි ම සුවඳ පසඟුල් දී බිම සුවඳ කලල් පිරිබඩ ගෙන පසඟ පිහිටුවා වැඳ ස්වාමිපුත්‍රයාණන් හා සමඟ අනුරාධපුර නුවරට වැද රජ්ජුරුවන් දැක ඒ රජ්ජුරුවන් ආදි කොට[6] සියලු නුවරවාසීන්ට දිව්‍යවස්ත්‍ර බෙද දුන්හ. නැවත එම අනුරාධපුර නුවර මහා විහාරය ආදි කොට ඇති පසළොස් මහා ආවාසයෙහි වාසය කරන්නාවූ නොයෙක් දහස් ගණන් භික්ෂුසංඝයා වහන්සේට ද තුන්සිවුරට සෑහෙන පමණ දිව්‍ය වස්ත්‍ර ම පිළිගැන්වූහ; එතෙකුදු වුවත් තුරපයියෙහි පිළී නොනිමන්නේ මය.

1. ඉතා උත්තම - GH
2. කෙල්ලන් - ක.කි.කැ. කෙල්ලන් කොල්ලන් - ම.
3. පිරිවර - EGHKL ම. ස.
4. මෙන් -G
5. හැටක් -J ක.කි.කැ,ම,
6. ආදි කොට ඇති - CDEJ, ස

Non-Commercial Distribution

මෙසේ ඒ දෙමහල්ලන් දවසින් දවස දියුණු දියුණා බොහෝ කුශල වර්ධනය කෙරෙමින් සැප සේ වසන කල්හි එක් දවසෙක[1] සංඝ අමාත්‍ය තෙම මී හා සමඟ බොහෝ මාංස කත් බඳවා රජ්ජුරුවන් සමීපයට යවීය; රජ්ජුරුවෝ ඒ පඬුරු දැක සිතන්නාහු "මෙතෙම වැද්දන් වසන ප්‍රත්‍යන්ත ජනපදය නමහට අත්කොට ගෙන ප්‍රයොජන විඳිනා[2] කැමැත්තේ වනැ" යි සිතා අනුරාධපුර නුවර දකුණු වහසල පටන් ඒ දිග්භාගයෙහි සියලු රාජ්‍යය අමාත්‍යයාහට දුන්හ. එහි බොහෝ දවසක් වාසය කරන්නාවූ අමාත්‍යතෙම නැවත එක් දවසෙක සබලපෙති[3] කොටවා රජ්ජුරුවන් සමීපයට යවී ය; ඒ දැක රජ්ජුරුවෝ "මේ තෙම දූන් මහුණු දනාවුව අත්කොට ගන්නා කැමැත්තේ වනැ"යි සිතා බස්නාහිර වාසල පටන් ඒ දිශාභාගයෙහි සියලු ජනපදය ඕහට දුන්හ. එකල ඒ ජනපදයෙහි වාසය කරන්නාවූ අමාත්‍යතෙම නැවත එක් දවසෙක නෙළුම්දලි උදුරුවා කත් බඳවා රජ්ජුරුවන් සමීපයට යවීය; රජ්ජුරුවෝ ඒ දැක "මෙතෙම දූන් මහවැලිගං සමීපයෙහි වසනු කැමැත්තේ වනැ" යි සිතා නැඟෙනහිරි වාසල පටන් ඒ දිශාභාගයෙහි සියලු රාජ්‍යය සංඝ අමාත්‍යයන්ට දුන්හ. එහි වසන්නාවූ අමාත්‍ය තෙම එක් දවසෙක ගඟ දියකෙළියට ගොස් දිය කෙළ කෙළ ගංමුව දෙරකඩට ගියේය; එකල ඔහුගේ කුශලානුභාවයෙන් නීලපීතාදි වූ නානා වර්ණ වස්ත්‍රයෙන් පිරුණා වූ නැවෙක් අවුත් ඔහු ඉදිරියෙහි සිටගත; ඒ තෙම එයින් බොහෝ වස්ත්‍ර ගෙන්වා ගෙන දිඹුලැවෙහෙර[4] වසන සංඝයා වහන්සේට පිළිගන්වා එපරිද්දෙන් ම නොයෙක් වාරයෙහි බොහෝ කුශලයන් රැස් කෙරෙමින් නැවත අනුරාධපුර නුවරට ම අවුත් වාසය කොට ජීවිතාවසානයෙහි සංඝදත්තා නම් වූ භාර්‍යාව හා සමඟ දෙමහල්ලෝ ම දෙව්ලොව ඉපද මහත් වූ දිව්‍ය ඓශ්වර්‍ය ලදහ. මෙසේ මෙලොව පරලොව දන්නා නුවණැති සත්පුරුෂ ජනයෝ රාජ චොර භයාදි වූ අනෙකප්‍රකාර භය එළවන්නාවූ ගතයුතු කිසි සාරයක් නැති අසාර වූ මේ සංසාර නමැති ඉතා දුර්ග[5] වූ ගැළවිය[6] නොහැකි මහවන මධ්‍යයෙහි දන නමැති කල්පවෘක්ෂය රොපණය කොට ඒ දන නමැති කල්පවෘක්ෂයාගේ ආනුභාවයෙන් උපන්නාවූ අනෙකප්‍රකාර භව[7] සම්පත්ති සැපය අනුභව කොට කෙළවර ඒ දන නමැති කල්පවෘක්ෂයෙහි අට ගන්නාවූ අමාමහ නිවන් නමැති අමෘතඵලය අනුභව කරන්නාහු මය; එබැවින් මේ කථාවස්තුව ඇසුවාවූ නුවණැති ශ්‍රද්ධාවන්තයන් විසින් දුක සේ ලද්දවූ මනුෂ්‍යාත්මභාවය අපවත් නොකොට තම තමා ශක්ති පමණින් පිළිවත් කුසල් කොට මතු දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳ කෙළවර අමාමහ නිවන් දකින්ට උත්සාහ කළ මැනවි. කියනලදුයේ මැයි;

සංසාරදුග්ගවිපිනෙ භයදෙ අසාරෙ
රොපෙත්ව[8] දානසුරපාදප මවුළාරං,
තස්සානුභාවජනිතං සුඛමෙ"ධමානා[9]
අනෙත ලභන්ති සුජනා අමතප්ඵලානි යි.[10]

මේ මෙහි පස් වන
ජයම්පතිකා වස්තුව ය.
මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි
සිරිනාග වර්ගය නම් වූ
එක්විසිවන පරිච්ඡේදය නිමි.

1. එයින් - EGH
2. විඳුනා - E
3. සබල පෙති - ක.කි.සෑ.ම.
4. දිඹුල් වෙහෙර - GHKL
දිඹුලාවෙහෙර - C සෑ.ම
දිඹුලවෙහෙර - DE
දිවුලාවෙහෙර - ක.කි.
කුඹෙහල මහා විහාර - පාලි
5. දුර්ග - KL
දුර්ගති - ABCDEFGHJ
6. ගැළවී යා - KL ම.
7. භව (නැත) - DEGHJKL
8. රොපෙත - GH
9. සුඛමෙසමානා - ක.කි.සෑ.ම.
10. අමතප්ඵලං - මුද්‍රිත සෑ.ම.

Non-Commercial Distribution

තව ද මේ සද්ධර්මාලංකාරයෙහි දෙවිසිවන නන්දිවාණිජ[1] වර්ගය නම් කවරයත්. එහි පළමුවන නන්දිවාණිජ වස්තුව මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මෙම ලඞ්කාද්වීපයෙහි මාවටු නම් පටුන්ගම නන්දිය නම් වෙළෙඳුණු කෙණෙක් වෙසෙති. ඒ වෙළෙඳාණෝ ශ්‍රද්ධාසම්පන්නයහ. තුනුරුවන් ම මට පිහිටය යි මමත්වය ඇතියහ; උං තුමූ මැත භාගයෙහි තමන් හා සමාන වෙළෙඳ කුලයෙකින් රූපසම්පන්න වූ කුමාරිකා කෙනකුන් ගෙනවුත් උන් හා සමඟ සැපසේ වසනුවෝ වෙළෙඳම් පිණිස නැවු නැඟී මුහුදින් එතෙර ගොස් තුන් අවුරුද්දක් එහි ම විසූහ. එකල්හි රජ්ජුරුවෝ සීව[2] නම් අමාත්‍යයකු කැඳවා මාවටු පටුන්ගම ප්‍රධාන ව ඉඳ බදු පඩුරු[3] දෙන සේ සලස්වා සනුමාන[4] දී නික්මවූහ. ඒ ගිය අමාත්‍යයා අතරමඟ සිට එපවත් කියා යවීය; එකල මාවටු පටුනෙහි මනුෂ්‍යයෝ වීථි හැම්[5] කැලිකසළ හරවා[6] අලඞ්කාර කොට ධජපතාක නංවා දෙරකඩක් දෙරකඩක් පාසා පූර්ණඝට හා මාරුක්මලින් සරහා[7] පූර්ණ කලස තබ්බවා මහවේ දෙපස තිරිකුඩම් තනා වට වැටපහන් ලවා සියලු වීථිමාර්ගය එකහෙළා සරහා තබා හැමදෙන ම ඉදිරියට ගියහ. එකල ඒ අමාත්‍යයා ඉස් ශොධා නහා සියලු වස්ත්‍රාලඞ්කාරයෙන් සැරහී මුදුනෙහි වියන් බැඳ සුවඳ මල්දම් එල්වා සරහන ලද රථ වාහනයකට නැඟී මහසෙනඟ පිරිවරා මාවටු ගමට වැද වීථි සැරහීම් බල බලා නුවර ප්‍රදක්ෂිණා කොට නික්මුණු මහරජකු සේ ගොසින් නන්දිය නම්[8] වෙළෙඳාණන්ගේ ප්‍රාසාද සමීපයට පැමිණියේ ය. එකල නන්දිය වෙළෙඳුණන්ගේ භාර්‍ය්‍යාවෝ උත්සව බලනු සඳහා ඉස්ශොධා නහා සර්වාභරණයෙන් සැරහී දසිසමූහයා පිරිවරා එක් දසියක ඇඟ එල්බ ගෙන ශරීරභාගයක් පෙනෙන සේ මතු මහල් තෙලෙහි උත්සව බල බලා සිටියහ. එකල්හි අමාත්‍යයා දෙපස වීථිවින්‍යාස සැරහීම් බල බලා සතුටු සතුටු ව යනුයේ උඩුමහල් තෙලෙහි සිට වීථිය දසාව බැලූ වෙළෙඳ භාර්‍ය්‍යාව[9] දැක උන්ගේ රූප නමැති සුරාපානයෙන් එම විට උමතු ව ගියා සේ මූර්ජා ව[10] භ්‍රාන්ත ව ගිය සිත් ඇති ව තද හීයකින් විත් කැ මුවකු සේ වෙළෙඳ භාර්‍ය්‍යාවන්ගේ මදලස බැලූම්[11] නමැති ශරප්‍රහාරයෙන් මූර්ච්ඡා ව දැසින් වැහෙන කඳුළු ධාරා නමැති රුධිරයෙන් ඤළී විරූපභාවයට පැමිණියාවූ මුහුණු ඇති ව අඬ අඬා පෙරළෙමින් තමා හා එක් ව යන්නවුන් බණවා "එම්බා නෑයෙනි, යහළුවෙනි, මිත්‍රයෙනි, තෙල උඩුමාලේ දෙවඟනක සේ සිටිනෝ කවුරු ද, කාගේ දියෙණිකෙනෙක් ද"යි විචාළේය.

එබසට කැටි ව යන සේවකයෝ කියන්නාහු "මේ පටුන්ගම් බොහෝ සම්පත්තීන් සමෘද්ධ වූ නන්දිය නම් වෙළෙඳුණ කෙනෙක් ඇත; දන් තෙල රන්පියුමෙක[12] රන්පියුම්[13] කෙමියක් වටා ලීලොපෙත ව පෙළ සැදී සිටගත්තාවූ රත් පුදු වෛවර්ණ

1. නන්දියවාණිජ - KL
2. සිව - ක.කි.බෙ.ස. පාලි
3. අයබදු පඩුරු - මුද්‍රිත හැම
4. සනුමාන -DEGHKL; සනුමා - ස සම්මාන - CJ, මුද්‍රිත හැම
5. හැමද - C, ක.කි.සඳ.ම.
6. අරවා - GHKL
7. සැරහූ - DEKL ස. සැරහුණු - GH, ම.
8. යට කියන ලද නන්දිය නම් - ක.කි.සඳ.ම.
9. වෙළඳ භාර්‍යාවන් - EHKL ස. වෙළඳුණන්ගේ භාර්‍යාව - ම.
10. මූර්ජාවෙන් - G
11. බැලීම් - DEGKL
12. රන් පියුමෙක - DEGKL
13. රන් වූ පියුම් - CEGJKL ම.

Non-Commercial Distribution

මුසු කෙශර පඞ්කතියක් හා සමාන අතුරතුර[1] රත්පැහැ මුසු කොඳ කැකුළු පෙළක් වැනි පුදු සිනිඳු වූ දන්තරශ්මීන් විහිදුවා මඳ මඳ සිනාසිසී නිලිපුලපෙති[2] පරයන නිල්නෙතින් මේ දසාව බලා සිටි රූප සම්පන්න වූ අවබාල ගැණුබාලයෝ නම් ඒ වෙළෙඳුණන්ගේ භාය්‍ර්‍යාවෝ යැ"යි කීහ. එසේ හෙයින් කියනලදී;

නන්දිවාණිජකො නාම - එත්ථ අත්ථි මහද්ධනො,
තස්සෙ'සා භරියා කුන්ද - දසනා නීලලොචනා-යි.

මෙසේ කැටිව යන්නවුන් කී බස් අසා අමාත්‍යයා "සබඳිනි, දැන් ඒ වෙළෙඳණෝ කොයි ද"යි විචාළේය. එබසට සේවකයෝ කියන්නාහු "ඒ වෙළෙඳණෝ මේ ගම නැත; වෙළෙඳම් පිණිස නැවු නැඟී පරදෙශයට[3] ගියාහ; උන් දැන් නොඑන්නේ තුන් අවුරුද්දෙකැ" යි කීහ. එපවත් අසා අමාත්‍යයා තමාට නිල කොට සැලැස්සු ගෙට ගොසින් එක් කෙල්ලක කැඳවා කිසිකෙනකුන් නොදන්නා ලෙස රහසින් රන් දහසක් දී එදසිය වෙළෙඳුණන්ගේ භාය්‍ර්‍යාවන් සමීපයට නික්මවීය[4]. එකල ඒ කෙලි ගොසින් වෙළෙඳ භාය්‍ර්‍යාවන්ට කියන්නී "එම්බා මැණියෙනි, යම් කිසි කෙනකුන්ගේ මුහුණ එක් ඇසකින් හොබින්නේ[5] නොවෙයි; එපරිද්දෙන් ම පුරුෂයන් නැති ව තනිව ඉන්නා කල ස්ත්‍රීන්ට නොහොබනේය; ඉදින් යම් කිසි ඇතෙක් සියලු අවයව සම්පත්තීන් යුක්ත වී නමුත් එසේ වූ ඇතාගේ මුහුණ එක දළකින් හොබනේ නොවෙයි; එපරිද්දෙන් ම කවර තරම් රූපසම්පත්තියක් ඇතත් පුරුෂයන් නැති ව තනි ව ඉන්නා කල ස්ත්‍රීන්ට හොබනේ නොවෙ" යි කිව. එසේ හෙයින් කියනලදී;

යථා යස්සෙක නෙත්තෙන - වදනං නෙ'ව සොභති,
නෙව සොභති මත්තකඛි -විනෙකා කාමුකං තථා.

යථා එකෙන දන්තෙන - න සොභති ගජානනං,
නෙව සොභති මත්තකඛි - විනා එකා'ව කාමුකං.

හෙමලතා සචෙ ගන්ත්වා - සීතං චන්දන පාදපං,
ආසිලිස්සති[6] සොභන්ති - උභො තෙතෙ විසුං විසුං - යි.

මෙසේ අමාත්‍යයාගේ මෙහෙවර ගිය තැනැත්තී කී ස්වරූපය අසා වෙළෙඳුණන්ගේ භාය්‍ර්‍යාවෝ ස්වභාවයෙන් ම තමන් කුනුරුවන් කෙරෙහි මමත්වය ඇති ව ශ්‍රද්ධාවන්ත හෙයිනුත් පළමු තමන් ශ්‍රමණබ්‍රාහ්මණයන් අතින් බණ ඇසූ හෙයිනුත් "මේ කුණු ශරීරයෙන් තොපගේ අමාත්‍යයාණන්ට ප්‍රයොජන කිම් ද? එම්බා

1. අතරතුර - C ක.කි.ඝ.ම
2. නිලිපුල්පෙති - CGKL
   නිලුපුලපෙති - E
   නිල්පුල්පෙති - H
3. පරදේශයකට - J
4. යවීය -GH
5 හොබනේ -KL
6. අසිලිස්සති -GH
   ආසලිස්සති - ක.කි.ඝ.

Non-Commercial Distribution

මේ ශරීරය නම් මුත්තකින්[1] මැණිකකින් රනකින් රත්රනකින්[2] නිමියේ නොවෙයි; උත්පල පදුම පුණ්ඩරිකාදීන් මෙන් අභ්‍යන්තරයෙහි සුවිපවිත්‍ර තැනෙක උපන්නෙත් නොවෙයි; මවුකුස නමැති කුණපයෙහි පණුවකු මෙන් උපන්නේය;[3] එසේ උපන්නා වූ සරාගි පුරුෂ නමැති කුණපය තෙමේ තමාට[4] වඩනා[5] මාතුගාම නමැති කුණපයෙහි ම ඇලුම් කරන්නේය; ඉන්ද්‍රජාලයෙහි පෙනී ගිය රූපයක් බඳු වූ අසාර වූ මේ රූපය අඥාන ජනයෝ සාරසාර දෙයෙකැ යි ප්‍රාර්ථනා කෙරෙති. මෙසේ මේ ශරීරය නම් කෙසලොමාදි වූ[6] දෙතිස් කුණප කොටසින් යුක්ත හෙයින් ඇතුළෙහි කසළ පුරා පිටත සිතියම් කළ ප්‍රතිමා රූපයක් හා සමානය; එසේ පිළිකුල් වූ[7] ශරීරය අඥාන ජනයන්ට සන්තොෂ එළවන්නේය. එසේ හෙයින් කියනලදී,

> කායො'යං කුණපෙ ජාතො - කුණපො කුණපෙ රතො,
> ඉන්ද්‍රජාලක රූපො'ව - බාලානම්'භිපත්ථිතො.
>
> අමෙජ්ඣපොත්ථකොවායං - චිත්තිතො බාලනන්දිනො,
> වත්තිංස විධ කොට්ඨාසො - කෙස ලොමාදිකො අයං-යි

තව ද යහපත් අන්නපානාදි මධුර වූ වස්තූහු මුඛ නමැති එක දෙරින් වැද නවවණ මහදෙරින්[8] නික්මෙති. තව ද මනොඥ වූ මධුර රසයෙන් යුක්ත වූ ආහාරය අනුභව කරන වේලෙහි බොහෝදෙනා පිරිවරාගෙන්[9] ඉඳ අනුභව කෙරෙති. එම ආහාර පානයන් උදරාග්නින් පැසී මලමූත්‍ර සෙම්සොටු ආදි භාවයට පැමිණ නික්මෙන වේලෙහි අනුන්ට තබා තමහටත් පිළිකුල් හෙයින් තනි ව සැඟවී ඉවත යෙති. තව ද අන්නපාන[10] ආදිය කන බොන වේලෙහි සතුටු සොම්නසින් පිනපිනා කති බොති. එම ආහාරපානයන් මලමූත්‍රාදිභාවයට පැමිණ පිටත නික්මෙන වේලෙහි පිළිකුල් වෙති. තව ද යහපත් වූ සඳුන් සුවඳ කපුරු හා දුරුම්රිස් ආදි වූ කටුක භාණ්ඩයන් බහා පිසනලද සොඳ සුවඳ කැඳ අවුළුබත්[11] ව්‍යඤ්ජන ආදිය බොහෝ සේ එක රැයක් කල් යවා තිබූ ගමනේ ම පිළිණු ව[12] දුර්ගන්ධ ව කුණපභාවයට පැමිණෙන්නේය. මේ ශරීරය නම් ඉතා දුර්ගන්ධ ය: අපවිත්‍ර ය: ඒ ඒ තැනින් පණුවන් වැහෙන කුණපයක් වැන්න; නොයෙක් කුණුකසළ දමන කසළ ගොඩක් වැන්න; නුවණ නමැති ඇස් ඇති උත්තමයන් විසින් නිඥ කරන ලද්දේය. නුවණ මඳ අඥාන අන්ධයන්ට[13] සන්තොෂ වඩන්නේය.[14] කෙශ රොමාදි වූ දෙතිස්[15] කුණප කොටසින් ගහන ව ඩාදිය මුකුණු[16] සෙම් සොටු ආදියෙන් ආදූ වූ කුණු මසින් වසනලද නවවාර නමැති මහත් වූ වණමුඛ නවයෙන් දුර්ගන්ධ අශුචි වහනය වන්නේය. ඉදින් මේ ශරීරයාගේ ඇතුළත පිට පෙරළී ගියේ නම් එකාන්තයෙන් ම දඬුකඩක් අල්වා ගෙන

---

1. මුතුවකින් - ක.කි.සඳ.
2. විදියකින් - E
   රජතකින් -KL
   රත්නයකින් - ක.කි.සඳ.
3. උපන්නේ වේ ද යි - GHKL
4. තමාටත් - EGHKL ක.කි.සඳ.ම.
5. වඩා - ක.කි.සඳ.ම.
6. කෙස් ලොම් ආදි - මුද්‍රිත හැම
7. සමාන පිළිකුල් වූ - EGJ
8. නව මහදෙරින් - මුද්‍රිත හැම
9. පිරිවරා - GHKL
10. ආහාර පාන - GH
11. අවුළපත් - J ක.කි.සඳ.බෙ.ස.
    අවුළපත් බත් - ම.
12. පිළිණි ව - DK ම.
    පිළිහිණි ව - GHL, ස.
13. සත්වයන්ට - GH, බෙ.
14. වඩවන්නේය - DE
15. දෙතිස් (නැත) - DEGHKL
16. මුසු කුණු -CG
    මූ කුණු - ම

Non-Commercial Distribution

ඉඳ සිට ගසාන් කවුඩන් බල්ලන් වළකා ගත්[1] නොහැක්ක; මෙසේ මේ නිශ්ශ්‍රීක වූ දුර්ගන්ධ ශරීරය සඳුන් සුවඳ මල් ආදියෙන් දුර්ගන්ධය පැටිකොට්[2] පමුතිලිඩගම් පටවකාර කාදුකාප්පු ආදි වූ ආගන්තුක අලඞ්කාරයෙන් සරහනලද්දේ රාගයෙන් අන්ධ වූ අඥාන සත්ත්වයන්ට යහපත් රූපයක් මෙන් පෙනෙන්නේය. මෙබඳු මෙසේ පිළිකුල් දුර්ගන්ධ ශරීරය කවර නම් ස්ත්‍රියක් හෝ පුරුෂයෙක් හෝ ප්‍රාර්ථනා කෙරේ ද" යනාදීන් නොයෙක් කාරණ කියා අමාත්‍යයාගේ වචනය නොගිවිස්සාහු මය. කියනලද මැයි;

දුග්ගන්ධො අසුචි කායො - කුණපො උක්කරූපමො,
නින්දිතො චක්ඛුභූතෙහි - කායො බාලාභිනන්දිතො.

අද්දචම්මො[3] පටිච්ඡන්නො - නවද්වාරො මහාවණො,
සමන්තතො පග්ඝරති - අසුචි පූතිගන්ධයො.

සචෙ ඉමස්ස කායස්ස - අන්තො බාහිරතො සියා,
දණ්ඩං නූන ගහෙත්වාන - කාකෙ සොණෙ ච වාරයෙ.

ආගන්තුකෙන කායො'යං - අලඞ්කාරෙන මණ්ඩිතො,
රාගන්ධීකත චක්ඛූනං - සුභරූපං'ව දිස්සති - යි.

මෙසේ වෙළෙඳුණන්ගේ භාර්යාවන් විසින්[4] කියනලද ධර්මාන්විත කථා අසා අනිකක් කිය නොහී උන් කැඳවා ගෙන එන්ට ගිය කෙලි පෙරලා ඇවිත් අමාත්‍යයාට එපවත් කීහ. එතෙපුල් අසා අමාත්‍යයා රාගයෙන් රත් ව මොහයෙන් මූඪ ව මෙලෝ පරලෝ කටයුතු නොකටයුතු සලකාගත නොහී වෙළෙඳුණන්ගේ භාර්යාවන් කියා එවූ එබඳු කටයුතු කාරිය කිසිවකුත් නොගිවිස දෙවනු ව පඬුරු දෙදහසක් යැවීය.

ඒ දක වෙළෙඳුණන්ගේ භාර්යාවෝ "මේ අමාත්‍යයා තව ම නොවළක්නේ ය" යි සිතා කෙල්ල කැඳවා "එම්බා නැහැණියෙනි, මේ ශරීරය කිසි ගතයුතු සාරයක් නැත්තේය; නිස්සාරය; ජරා මරණ ව්‍යාධි ආදීන් පීඩිතය; සියලු ආරොග්‍යතා ව්‍යාධි කෙළවර කොට ඇත්තේය; සියලු යෞවනය ජරාව අවසන් කොට ඇත්තේය; සියලු ජීවිත මරණ අවසන් කොට ඇත්තේය; මේ සියලු සත්ත්වයෝ ම ජාතිය අනුව යනුවහ; ජරාවෙන් මිරිකුණුවහ; ව්‍යාධියෙන් අභිභූතයහ; මරණින් වියකෙනුවහ. ඒකාකාරයෙන් පවත්නා එක ද වස්තුවෙක් නැත; සියල්ල ම අනිත්‍යය; යම් සේ කල්පාන්ත පවනින් අහසට නැහෙනලද එකඝන පර්වතරාජයෝ සතරදිග බමා බස්මින් ඔවුනොවුන් පැහැර සුනු විසුනු ව වියකී පලා යෙද් ද එපරිද්දෙන් ජරාමරණ දෙදෙන රජ බමුණු වෙළෙඳ ගොවි චණ්ඩාල පුක්කුසාදි වූ සියල්ලවුන් ම ඉක්ම පවත්නාහ. කිසි කෙනකුනුත් නොහරිති; සියල්ල ම මර්දනය කෙරෙති. කෙළවර ඒ මරණ නමැති

---

1. කවුඩන් බල්ලන් නීලමක්ෂිකාදි සත්වයන් ඵලවාගත - ම.
2. සුගන්ධ කැටිකොට - ක.සි.ඤ.
   සුගන්ධය කැටි කොට - බෙ.
3. අල්ලවම්ම - බෙ.
4. විසින් (නැත) - CGHKL

Non-Commercial Distribution

මෘත්‍යුමාරයා හා යුධ කරන්නාවූ සථානය ඇතුන් අසුන් රථ පාබල සෙනඟ ගෙන යුධකිරීමට භූමියකුත් නොවෙයි; එසේ හෙයින් යුද්ධයෙනුත් ජයගත නොහැක්ක; අන් කිසි මන්ත්‍රප්‍රයොග ඖෂධ ප්‍රයොග ආදියෙන් ද්[1] ධනධාන්‍යාදි වස්තු දී සිත් ගැන්මෙන් ද යන කිසි ප්‍රයොගයකිනුත් මෘත්‍යුමාරයා ජය ගත නොහැක්ක. මරණ නම් අදය සෙටය යි දනගත නොහැක්ක; ඒ නියමයෙක් නැත; සියල්ලවුන්ට ම මරණ ඒකාන්ත ව[2] පවතිමින් සිටියදී යමෙක් මරණ අදය සෙටය යි නියම නැතිබව තමාගේ නුවණින් පරීක්‍ෂා කරන්නේ වී නම් ඕහට හාසයෙක් වෙව යි සන්තොෂයෙක් වෙව යි කිසිවෙක ඇල්මෙක් වෙව යි වස්තු සෙවීමෙක් වෙව යි සෙසු දෑ තබා බතක් පැනක් කන්නට බොන්නට වත් අභිප්‍රාය නොවන්නේ මය යි" කීහ. එසේ හෙයින් කියතලදී;

යථාපි සෙලා විපුලා - නභං ආහච්ච[3] පබ්බතා,
සමන්තා අනුපරියෙය්‍යුං - නිප්පොථෙන්තා චතුද්දිසා.
එවං ජරා ච මච්චු ච - අධිවත්තන්ති පාණිනො,

ඛත්තියෙ බ්‍රාහ්මණෙ වෙස්සෙ - සුද්දෙ චණ්ඩාලපුක්කුසෙ,
න කිඤ්චි පරිවජ්ජෙති - සබ්බමෙවාභි මද්දති.

න තත්ථ හත්ථීනං භූමි - න රථානං න පත්තියා,
න චා'පි මන්තයුද්ධෙන - සක්කා ජෙතුං ධනෙන වා.

අජ්ජ සෙව වා පරසෙ'ති - මරණං නෙ'ව ඤායති,
එව'මාසන්නමච්චුම්හි - වත්තමානෙ මම'න්තිකෙ.

කො නු හාසො කිමා'නන්දො - කා රති කා ධනෙසනා,
යො තං[4] පජානිය විනෙන්ති - හන්තමපි'ස්ස න රුච්චති[5]-යි.

මෙසේ ඒ වෙළෙඳුණන්ගේ භාර්‍ය්‍යාවෝ නොයෙක් කාරණයෙන් තමන් කැඳවා ආ කෙල්ල ගිවිස්සා නික්මවූහ. ඉක්බිති ඒ අමාත්‍යයා තමාගේ කෙල්ල අතින් එපවත් අසා ඒ බසටත් නොපසුබැස සාරදහසක් දී එම කෙල්ල නික්මවීය. එකල වෙළෙඳුණන්ගේ භාර්‍ය්‍යාවෝ තුන්වන වාරයෙහි ආ කෙල්ල දක "එම්බා නැහැණියෙනි, මේ අනුන් සන්තක වස්තුවෙහි වරදවා පිළිපදනේය යි තොපගේ අමාත්‍යයාණන්ටත් නුගුණය; මෝතොමෝ තමාගේ ගෙහිමියා[6] ඉක්ම පවත්නීය යි මටත් නින්ද වන්නේය; මෙසේ වරදවා[7] පිළිපැද්දවුන් අපායෙනුත් නොමිදෙන්නාහු මය" යි කියා මේ ලොකයෙහි ස්ත්‍රී පුරුෂ යම් කෙනෙක් අනුන් සන්තක භාණ්ඩයෙහි වරදවා පවතිද් ද හෙවත් පුරුෂයෝ පරස්ත්‍රීසෙවනය කෙරෙද් ද ස්ත්‍රීජාතිහු පරපුරුෂයන්[8] සෙවනය කෙරෙද් ද එසේ අපරාධ කළ ස්ත්‍රී පුරුෂ දෙපක්‍ෂයට ම නින්දත් පැමිණෙයි. දඬුවම් ආදියත් වන්නේය. මෙසේ මෙලොව නොයෙක් බැසනත් විඳ පරලොව නරකයෙහි

---

1. ආදියෙකින් ද -DEGJKL
2. ඒකාන්තයෙන් ම - DEGHKL
3. ආගාධ - G
4. යං - H
5. හන්තමපිස්ස න රූහති - KL
6. ගෙයි හිමියා - ක.සි.ස.ම.
7. වරදවා ගැන්මෙන් - GHKL
8. පරපුරුෂ - DEGHKL

Non-Commercial Distribution

ඉපද සියක් යොදුන් උස ඇති සෙළොසාඟුල් දිග කටු ඇති කොළඹුල් වෙනෙහි ඉවසිය නොහැකි දුක් විඳිති "මේ ආදි වශයෙන් නොයෙක් කාරණා කෙල්ලට කියා නික්මවූහ. එසේ හෙයින් කියනලදී;

යො වෙ පරස්ස භණ්ඩස්මිං - අපරජ්ඣති නරො ඉධ,
ගරහා ච භවෙ තස්ස - දණ්ඩදනාදිකම්පි ච.

ආදිත්තෙ යොජනුබ්බෙධෙ - සොළසඞ්ගුලකණ්ටකෙ,
සද සො වින්දතේ'සය්හං - දුක්ඛං සිම්බලිකානනෙ -යි.

මෙසේ වෙළෙඳ භායභීවන් කී නොයෙක් කාරණ කටයුතු සියල්ල ම මෙහෙවරට ආ කෙලී ගොසින් අමාත්‍යයාට කිව. නැවතත් ඒ මොහයෙන් මුළා වූ අඥාන අමාත්‍යයා තමා ස්වභාවයෙන් ම මුළා හෙයින් පළමු තුන්වාරයට වඩා පඬුරු දී කෙල්ල නික්මවිය. වෙළෙඳුණන්ගේ භායභීවෝ සතරවන වාරයේ පඬුරු ඇරගෙන ගිය එම කෙල්ල දක "මේ ලජ්ජා නැති මිනිසෙක; දන් මා ඔහු තද කොට කියා වැළකුව මැනවැ"යි සිතා කියන්නාහු "එම්බා, තොපගේ අමාත්‍යයාණෝ මිරිහුදිය ගෙනවුත් කළ සැළ ආදියෙහි පුරා තබාගෙන ඉදින් ප්‍රයොජන විඳිත් නමුත් ඒකාන්තයෙන් ම උන් හා මා හා සමාගමයෙක් නොවන්නේය. ඉදින් ශරත්කාලයෙහි වලාකඩක් ගෙන වැටියක් කොට අඹරාගෙන වණ්ණු තෙලයෙන් තෙමා තමාගේ ගෙය පහන් දල්වා ආලොක පතුරුවාගෙන ඉන්නේ වී නුමුත් උන් හා සමඟ[1] මාගේ සමාගමයෙක් නොවෙයි. තව ද නුග දිඹුල් ඇසතු ආදි වනස්පති වෘක්ෂයෝ පුෂ්පදමයෙන් විභූෂිත ව මාගේ[2] ගෙට තුමූ ම එන්නාහු වී නමුත් එබඳු[3] අපූර්වයක් පැමිණි දවසෙකත් උන් හා මා හා සමාගමයෙක් නොවෙයි. යම් කලෙක චන්ද්‍රයා එළනෙළුම් රත්නෙළුම් වනයක් එක් පැහැර සුපුෂ්පිත කරවා ද එසේ පෙර නුවූ[4] අපූර්වයක් පැමිණි දවසෙකත් උන්ගේ ගෙට මාගේ යාමක්වත් මාගේ ගෙට උන් ඇවිත් සමාගමයෙක්වත් නොවන්නේය. තව ද යම් කලෙක සූර්යදිව්‍යපුත්‍රයා මහත් වූ නිලුපුල් වනයක් ප්‍රබොධ කරන්නේ වී නමුත් උන් හා මා හා සමාගමයෙක් නොවන්නේය. යම් තාක් මාගේ ස්වාමිපුත්‍රයාණෝ ජීවත් ව ඉඳිද්ද ඒ තාක් කල් ම මට අනික් ගෙහිමියෙක් නම් නැත; එබඳු නපුරු අදහස් ඇති මිනිසකු දන දන මාගේ ගෙට වැද්ද නොදෙමි. හේ එසේ මය. ඉතා යහපතැ යි ප්‍රශංසා කටයුතු වූ ලොකපූජිත වූ කල්පලතාව කවර කලෙක කපුටුවන්ට වාසස්ථාන වේ ද; නොවන්නෙ ම වේ ද" යි කීහ. එසේ හෙයින් කියනලදී;

මරීචි තොය'මානෙත්වා[5] - පූරෙත්වා ඝට චාටියො,
පරිභුඤ්ජති සො කාමං - සංගමො තෙන මෙ නද.

---

1. උන් හා මා හා - GHJKL
2. තමාගේ - GH
3. එවැනි - GHKL
4. නුවූ - KL
5. මරීචිතො සමානෙත්වා - CGH

Non-Commercial Distribution

සරදබ්භං වට්ටිකං කත්වා - වණ්ණුතෙලෙන තෙමිය,
සො දීපං කුරුතෙ ගෙහෙ - සද්ධාගමො තෙන මෙ තද.

යද වතෙද පබොධෙති - මහාරාජීව කානනං,
තද තස්ස මයා වා'පි - තෙන වා මම සද්ධාගමො.

අඤ්ඤෙද මෙ පති නො හොති - යාව ජීවති මෙ පති,
තද කප්පලතා හොති - වායස්ථානං නිවෙසනං -යි.

මෙසේ නොයෙක් කාරණ කියා නැවත "එම්බා නැහැණියෙනි, මාගේ ගෙහිමියාණෝ ඒකාන්තයෙන් ම නැත්නම් එදවස් දන්නෙම් වේ ද"යි කියා කෙල්ල ආපස්සේ නික්මවූහ. ඔයින් ගොසින් ඒ සියලු ම පවත් තමාගේ අමාත්‍යපුත්‍රයාට කිව; අමාත්‍යයා[1] එපවත් අසා "ඒකාන්තයෙන් මූ තමන්ගේ ගෙහිමියාණන් මළහොත් මා හා සමඟ වාසයට ලැබෙන්නී මය"යි[2] සිතා වෙළෙඳාණන් මරන්ට සිතනුයේ බොහෝ යකදුරන් ගෙන්වාගෙන "මේ උන්නාවූ තොප ඇමදෙනා අතුරෙන් පරදෙශයට ගිය මිනිසුන් මරන්ට කවරෙක් සමර්ථ ද"යි විචාළේය;[3] එබසට සෙස්සෝ නොදනුම්හ යි කීහ; එයින් එක් යකදුරෙක් පුළුවනැ යි කියා මධ්‍යම රාත්‍රියෙහි ඊට සුදුසු බලිබිලි ගෙන්වාගෙන අමාත්‍යයා හා සමඟ ප්‍රෙත පිශාච යක්ෂ රාක්ෂසයන් විසින් ගහන වූ ගිනි ඇවිළෙන සියගණන් දරසෑ ඇති ඒ ඒ තැන දවාගත නොහී දමනලද සිය ගණන් මළ මිනී ඇති මහවටුවේ සොහොන්පොළට ගොස් කැණහිල් බලු කවුඩු[4] කබරගොයි ආදීන් විසින් කා කඩ නොකරනලද ශරීරබන්ධන ඇති මළ මිනියක් දක එතැන්හි බලිබිලි පුද අමාත්‍යයා තමා පිටිපස්සේ ඉන්ට සලස්වා මන්ත්‍රයක් ජපනය කොට අතින් පැන් පතක් ගෙන මළමිනියට ගැසීය; එකෙණෙහි ඒ මෘතශරීරයෙහි අමනුෂ්‍යයෙක් ආවෙශ විය; එකල ඒ මිනිය නැඟීසිට "තොපට කුමක් කෙරෙම් ද" යි කියා ඉදිරියේ සිටගත. එකල්[5] යකදුරා "එම්බල, මේ කඩුව ඇරගෙන ගොස් තන්දිය නම් වෙළෙඳණන්[6] මරා වහා පලා එව" යි කීය; යක්ෂයා එපවත් අසා යහපතැ යි ගිවිස යන්නේ නැවු නැඟී එමින් සිටි වෙළෙඳණන් දක මොහු මරම් සිතා කටින් ගිනිකඳු දමමින් පිටිතොල දත් කමින් රතැස් බමවමින් මුහුද රළපතර මඩිමින් කඩුව ඔසවාගෙන උදකරාක්ෂසයා සේ දිවගෙන ගොස් වන. නැව උන් මනුෂ්‍යයෝ එපරිද්දෙන් දිවගෙන අවුත්[7] වන්නාවූ ඕහු දක හැමදෙන ම භය ගෙන එකපැහැර මුරගාපීන. ඒ අසා වෙළෙඳණන් "කුමක් පිණිස මුරගාවු ද"යි කී කල්හි අමනුෂ්‍යයා ආ බව කීහ; එකල වෙළෙඳණෝ "එසේ වී නම් පින්වත්නි, තොප ඇම අප්‍රමාද ව මෛත්‍රීභාවනාව කරව; තොප හැමට මෛත්‍රිය හා සමාන අනික් පිළිසරණෙක් නැතැ"යි කියා "ඇමදෙනා ම සම්‍යක්සම්බුද්ධ වූ බුදුරාජාණන් වහන්සේගේ නම කියා ශරණගත වව"යි කීහ. එපවත් අසා ඒ සියල්ලෝ ම බුද්ධං සරණං ගච්ඡාමි යනාදීන් ශරණශීලයෙහි පිහිටියහ.

1. අමාත්‍යපුත්‍රයා - මුද්‍රිත හැම, ස.
2. ලැබෙන්නේ මය යි - GHKL
3. විචාළහ - පිටපත් හැම
4. කපුටු - GHKL
5. ඒ - මුද්‍රිත හැම, ස
6. වෙළෙඳා - DGHKL
7. ගොස් - KL

Non-Commercial Distribution

එකල්හි යම් සේ පෙරළාගෙන දිවන්නාවූ ගලෙක් අනික් ගලෙක පැකිළ සිටපියා ද එපරිද්දෙන් ම අමනුෂ්‍යයා ශරණශීල නමැති පාෂාණප්‍රාකාරයෙහි පැකිළ සමීපයට යා නොහී නැවත ආපස්සේ ඇවිත් යකදුරා ඉදිරියෙහි කඩුව දමා මළ මිනිය එළා පහවිය. යකදුරා නැවත මන්ත්‍රය පිරිවා යක්‍ෂයා ආවේශ කරවා තුන් විටෙක නික්මවිය; ඒ දැක නන්දිය නම් වෙළෙඳණන් ආදි කොට ඇති නැව උන් මනුෂ්‍යයෝ පළමු පරිද්දෙන් ම දෙවෙනි තුන් වෙනිවත් ශරණශීලයෙහි පිහිටියහ. එසේ ම සතරවන වාරයෙහි ආවේශ කරවා නික්මවූ කල්හි ගොසින් වෙළෙඳාණන් කරා වැද්ද නොහී ආපස්සේ ඇවිත් අමාත්‍යයා හා යකදුරා දෙපළුකොට පොලු ගසා ආවේශ ව ගිය මිනියන්[1] එතැන ම එළා පලා ගිය.[2]

මෙසේ අමාත්‍යයා අනුන් මරම් උපක්‍රම කොට තෙමේ ම මෙළේ ය. හේ එසේ මැයි; යම් කිසි කෙනෙක් කිසි අපරාධයක් නැති ගුණවත් කෙනකුන් මරන්ට උත්සාහ කෙරෙත් නම්[3] එසේ වූ අසත්පුරුෂයා නන්දිය නම් වෙළෙඳණන් මරන්ට උපක්‍රම කොට මරාගත නොහී විනාශයට පැමිණි සීව නම් අමාත්‍යයා මෙන් තෙමේ ම නස්නේ ය. එසේ හෙයින් කියනලදී;

වධායෝ'පක්කමෙ සත්තො[4] - අදුහිං ගුණභාජනං,
විනාසං යාති සො සත්තො - සිවා'මච්චො'ව වාණිජං.

මෙසේ චණ්ඩ පරුෂ අමනුෂ්‍යයෝ පවා ශරණගතයන් කරා පැමිණ ගින්නට ළං විය නොහෙන මැස්සන් මෙන් දුරින් ම දුරුවෙත්. ශරණානුභාවයාගේ මහත්තත්වය ආශ්චර්‍ය්‍ය මැයි. ශරණානුභාවය පූර්වාචාරීවරයන් විසිනුදු කියනලද මැයි. දෙවපුත්‍රමාරය කෙලශමාරය අභිසංස්කාරමාරය මෘත්‍යුමාරය යන සිවු මරුන් ජය ගත්තාවූ මාරසඞ්ග්‍රාම ඇති කරුණාවෙන් වඩනලද අදහස් ඇති තථාගතයන් වහන්සේ තමහට ශරණය යි කවරෙක් නම් ශරණගත නොවේ ද. එම බුදුන් විසින් වදරනලද සසර භය නසන බුදුන්ගේ කරුණාගුණ උපදවා ප්‍රකාශකරන්නාවූ සද්ධර්මය ම මට ශරණය යි කවරෙක් නම් දහම් ශරණ නොගනී ද. අමා මහනිවන් නමැති අමෘතපානය කළාවූ සද්ධර්මය ධරා ප්‍රකාශ කිරීමට භාජන ව සිටියාවූ ශ්‍රද්ධාවන්තයන්ගේ කුසල් නමැති බිජු වැපිරීමට සරු කෙත් වී[5] සිටියාවූ සඞ්ඝරත්නය මට පිළිසරණය යි කවරෙක් නම් ශරණගත නොවේ ද. එසේ හෙයින් කියනලදී;

තථාගතං වීත රණං - චතුමාර රණංජයං,
සරණං කො න ගවෙසෙය්‍ය - කරුණාභාවිතාසයං.

ස්වාක්ඛාතං තෙන සද්ධම්මං - සංසාර භය භඤ්ජකං,
කරුණාගුණජං තස්ස - සරණං කො න ගච්ඡති.

---

1. මිනිසාන් - EGHKL
2. පහ විය - H
3. කෙරේ නම් - *EGHKL* ස.
4. සත්තා -EGHKL
5. සරුකෙතක් ව, -GHKL

Non-Commercial Distribution

පරිපීතාමතරසං - සද්ධම්මෝදය භාජනං
සංඝං පුඤ්ඤකරං[1] කො හි - සරණං න ගමිස්සති - යි.

ඉක්බිති වෙළෙඳුණෝ නැවින් බැස ඇවිත් තමන්ගේ භාර්‍ය්‍යාවන් අතින් මෙහි පළමු කී කළ සියලු ප්‍රවෘත්තිය ම[2] අසා අමාත්‍යයා කෙරෙහි කරුණා උපදවා පින්පෙත් දී ජීවිතාන්තය දක්වා භාර්‍ය්‍යාවන් හා සමඟ නොයෙක් පින්කම් කෙරෙමින් සිල් රකිමින් තමන්ගේ පරිවාරජනයන් හා සමඟ දිව්‍යලොකයෙහි උපන්හ. මෙසේ මෙකී පරිද්දෙන් යම්කිසි නුවණැති ශ්‍රද්ධාවන්ත උත්තමයාණ කෙනෙක් සියලු විපත්තියට එකාන්තකාරණ ව සිටි කාමරාගය දුරුකොට හැර ස්වල්පමාත්‍ර වූ කුශලයක් කළාහු වී නම් එබඳු උත්තමයෝ ස්වර්ග මර්ත්‍ය පාතාල යන තුන්ලෝ බබුළුවන්නාහු මැයි. එසේ හෙයින් කියනලදී;

එවං විධං යෙ බලු කාමරාගං
විපත්තිමූලං පජහිත්‍වා ධීරා,
කරොන්ති පුඤ්ඤානි සුබුද්ධයානි[3]
තෙ වෙ පභාසෙන්ති ජනා තිලොකං - යි.

මේ මෙහි පළමුවන

නන්දිවාණිජ වස්තුව ය.

තව ද මෙහි දෙවන දුතිය ජයම්පතිකා වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මෙම ලඞ්කාද්වීපයෙහි රුවකපිටි[4] නම් ගමෙක් වීය. ඒ ගම මහත් වූ ශ්‍රී විභූති ඇති නොයෙක් සම්පත්තීන් සමෘද්ධ වූ පන්සියක් පමණ උතුම් කුලගෙවල් ඇත්තේය. එහි වසන්නාවූ සියල්ලෝ ම මහත් වූ ශ්‍රද්ධා ඇතියහ; තුනුරුවන් ම පිහිට කොට ඇතියහ; එගමට නුදුරු තැන නොයෙක් සියගණන් සඞ්ඝාවාසවලින් පැරහුණාවූ රුවකපිටි[4] නම් මහ විහාරයෙක් වීය; ඒ විහාරයෙහි දෙලක්ෂ පනස්දහසක් පමණ භික්ෂූන් වහන්සේට ම එම ගම පන්සියක් පමණ කුලගෙවල මනුෂ්‍යයෝ වෙන වෙන ම පන්සියක් පන්සියක් දෙනා වහන්සේට ආරාධනා කොට මහදන් පවත්වති[5], එකල මේ ලඞ්කාද්වීපයෙහි මහත් වූ නියංසායෙක් වීය; මනුෂ්‍යයෝ දුර්භික්ෂ භයින් පීඩිත ව[6] දුකසේ ම ජීවත් වෙති. එකල්හි ඒ පන්සියක් පමණ කුලගෙවල මනුෂ්‍යයෝ පළමු පරිද්දෙන් දන් දීගත නොහී ක්‍රම ක්‍රමයෙන් දන් අඩුකොට එකි එකී කුලගෙයක මනුෂ්‍යයෝ එක් ව එකි එකී භික්ෂු කෙනෙකුන් වහන්සේට දන් දෙම්හ යි නියම කොට ගෙන පන්සියයක් උපාසකවරු පන්සියයක් දෙනා වහන්සේට ආරාධනා කොට දන් දෙති. එකල්හි එගම වසන දුක්පත් මිනිසාණ කෙනෙක් තමන්ගේ භාර්‍ය්‍යාවන් හා සමඟ කලවිටිවල බොල් පොළමින් පිදුරු සලමින් මහත් වූ දුකින් උත්සාහයෙන්

---

1. පුඤ්ඤං කරං - C
2. සියල්ල ම ප්‍රවෘත්තිය - GHKL
3. සුබුද්ධයානි - CEGK
4. රුවකපිටි - H, ක.සි.ස.
5. පවත්වමින් වාසය කෙරෙති - GHK; පවත්වමින් - L
6. පීඩිත ව වාසය කරන්නාහු - GHL,

Non-Commercial Distribution

ජීවත් වෙති. ඉක්බිති ඒ මිනිසාණෝ තමන් ඉන්නා ගම මනුෂ්‍යයන් හික්‍ෂූන්වහන්සේට දන් දෙන්නා දක කුමුත් දන් දෙනු කැමැති ව හායම්බාවන් කැඳවා උන් හා සමඟ කථා කරන්නාහු "එම්බා පින්වත, පෙර අපි ඒකාන්තයෙන් ම කුශලයක් නොකළ හෙයින් දන් ඉතා දුක්පත් වූම්හ; පෙර මධුර වූ අන්න පාන[1] දනයක් නුදුන් හෙයින් දනුත් බඩපුරා මිහිරි වූ ආහාරයක් නොලබම්හ්[2], දනුත් පිනක් නොකළමෝ නම් මතු කෙසේ ලබමෝ දැ"යි කීහ. එබස් අසා සත්‍රී කියන්නී[3] හේ එසේ මය; යාචකයන් ඇවිත් දොර සිටියදී උන්ට කිසිවක් නොදී බඩ පුරා කාලා ඉන්නාවූ මසුරු මිනිසුන්ට උපනුපන් ජාතියෙහි බඩ පුරා කාපියන තරම් මිහිරි ආහාරයක් ලැබෙන්නේ නොවෙයි; ඉදින් ලදත් උන්ගේ අකුශලබලයෙන් අන්‍යාධීන ව යෙයි; අහසට පොළොව සේ දුරු ව යෙයි. දන් අපට වස්ත්‍රයෙක් නම් දිග සරස දළහුයින් ගෙත්තම් කළ ඉනිකුණින් සහිත වූ මේ කිලිටි කඩකැබිලි පමණෙක් මය; මේ තමාත් මෙසේ වූයේ පෙර වස්ත්‍රදනයක් නුදුන් හෙයින් මය. පෙර පින් කළ හෙයින් මේ ගම බොහෝදෙන ඇත්වාහන අස්වාහන දසිදස් ගවමහිෂාදි වූ සියලු සම්පත්තින් සමෘද්ධ ව සැප විඳිති; පෙර කුශලයක්[4] නොකළ හෙයින් අපි හැම මෙසේ පොහොසත් ව සැප විඳිනා බොහෝදෙනා මධ්‍යයෙහි අනාථ අශරණ ව්[5] දුඃඛදරිද්‍රයෙන් දිළිඳු ව ඇවිදුම්හ. පෙර තුන්සිත පිරිසුදු ව ඉඳුරා කුසල් කළ මහත්මයෝ[6] දන් මොළොක් වූ සොඳ සුවඳ මල් අතුරන ලද තෙලිසම් ජීවාම් ආදි වූ නොයෙක් ආභරණ ආදියෙන් සරහා අලඞ්කාර කළාවූ ශයනාසන නැඟී සැප සේ සැතපෙති; පෙර පිනක් නොකළ හෙයින් දන් අපි බිම වැද හෙව ලා මැක්කන්[7] කව කවා දුක් විඳුම්හ. දන් අපි මත්තට හේතුවන සේ කුශලයක් නොකළමෝ නම් පසු ව කුමක් කරමෝ ද? එබැවින් නපුර මඳ යි නොසිතා සඞ්ඝයාවහන්සේට දනක් දෙන්ට උව මැනවැ'යි කීහ. එසේ හෙයින් කියනලදී;

නා'කම්හ කුසලං බහු [හොති පුබ්බෙ][8]
ඉදනි තස්මා අති දුග්ගතම්හ,
න කුච්ඡිපූරං මධුරන්නපානං
ලභාම පුබ්බෙසු අදින්නභාවා.

ධීතෙසු අත්ථීසු අදත්ව භුත්ත
මච්ඡෙරභූතස්ස නරස්ස දනි,
හො[9] කුච්ඡිපූරං මධුරන්නපානං
ලාභො නභාතො පථවීව දූරං.

ඉතොචිතො සිබ්බිත ථූලකණ්ණං
සයූකමවචනත[9] කිලිට්ඨමෙකං,

1. ආහාර - C
2. නොලදුම්හ - GHKL
3. කියන්නාහු - EGHKL
4. කුසල් - GH
5. අශරණී ව - ස
6. සත්වයෝ - ක.කි.සු.බෙ.
7. බැලිමැක්කන් - C
8. දෙයානධමෙම - පිටපත් හැම
9. න - පාලි
9. සායූකමණ්ඩං ච - පාලි, ස.

Non-Commercial Distribution

නිවාසනං ආසි අහො අතීතෙ
අදින්නදානස්ස කුතො නු වත්ථං.

හත්ථිගවාස්සා මහිසාදි නානා
කුලාකුලානම්හ කුලානමජ්ඣෙ,
දීනා අනාථා කපණා වරාකා
න'මාසි දුක්ඛෙ කතපාපකම්මා.

සයන්ති නානාසයනෙ අලඞ්කතෙ
මාලාදි නානා සුභගන්ධවාසිතෙ,
සක්කච්ච පුඤ්ඤප්පචිතා මහාජනා
අපුඤ්ඤතා සෙම ජමාය අම්හෙ.

අකත්ව පුඤ්ඤානි මයම්පි'දානි
කරොම කිං ආයති ජාති හෙතුං,
ලුඛන්ති අප්පන්ති[1] අචින්තයිත්වා
නිධෙම සඞ්ඝෙ බලු දෙය්‍යධම්මං - යි.

මෙසේ පෙර තමන් පින් නොකොට විඳිනා දුක් සිත සිතා නොයෙක් කාරණා කියා දෙදෙන එක්සිත් ව ඒ ඒ තෙන ඇවිද සාල් සපයාගෙන බත් පිය සාමුසු පළා මාලුවක් හා සමහ බත් ඇරගෙන හික්ෂූන්වහන්සේ වළඳන සමීපයට ගොස් තමන් දුක්පත් හෙයින් ඉන රෙදි කඩින් ලජ්ජා පමණක් වසාගත නොහී ලජ්ජාවෙන් හික්ෂූන්වහන්සේ වළඳන භොජනශාලාවට වදින්ට භය ඇති ව දුක සේ සොයා ගෙන ගිය දන් වළඳවාගත නොහී හික්ෂූන් වහන්සේට පෙනෙන සේ දුර ම සිටියාහ.

එකල්හි ඒ භොජනශාලාවේ වළඳන්ට වැඩඋන් ඇමදෙනා වහන්සේ අතුරෙන් වැඩිමාලු සඞ්ඝස්ථවිරයන්වහන්සේ රහත් සේක. එසේ හෙයින් ඒ සඞ්ඝස්ථවිරයන්වහන්සේ එකල්හි දන් ඇරගෙන දුර සිටියාවූ දෙමහල්ලන් දැක උන් කෙරෙහි කරුණාවෙන් ඒ දසාව බලා උන්ගෙන් දන් පිළිගන්නා ආකාර දක්වූසේක. ඔහු දෙදෙන මහතෙරුන්වහන්සේගේ අභිප්‍රාය දැන සමීපයට එළඹ තමන් ගෙන ගියායින් බත් සුහක් ඇරගෙන පාත්‍රයෙහි බහාලූහ. මහතෙරුන් වහන්සේ එපමණකින් ම පාමුව වැසූ සේක. ඉක්බිති ඔහු දෙදෙන සෙසු හික්ෂූන් වහන්සේගේ පාත්‍රාවලත් බහා[2] පිළිගන්වා හික්ෂූන්වහන්සේ වැඳ ප්‍රාර්ථනා කරන්නාහු 'අපි දෙදෙන දන් මේ කළා වූ කුශලයෙන් මෙයින් චුත ව මතුත් දෙමහලු ව එකතැන උපදුමෝව යි, ඔවුනොවුන්ට ප්‍රිය වමෝව යි, දුටුදුටුවන් ප්‍රශංසා කරන තරම් රූ ඇති වමෝව යි, දසදිග පැතිර පවත්නා ශරීරාලොකයෙන් හා යශොපරිවාරයෙන් යුක්ත ව ආයු

1. ලුබම්පි අපොම්පි - පාලි, ක.කි.සද.ම.
2. පාත්‍රවලට ලා - C
පාත්‍රයෙහිත් ලා - ක.සද.
පාත්‍රවලත් බත් බහා - K ස.

Non-Commercial Distribution

බොහෝ වමෝව යි මෙතෙකැ යි පමණ නැති උපභොග පරිභොග සම්පත් ලැබෙමෝව යි[1] තුනුරුවන් කෙරෙහි විශුඬ ශ්‍රඬාවෙන් යුක්ත වමෝව යි මතු උපදනා මෛත්‍රී බුදුන්ට සිවුපසයෙන් උපස්ථාන කොට සසුන් වැද මහණ ව සව් කෙලෙසුන් ගෙවා රහත් ව අමා මහ නිවන් දක්මෝ ව˙යි මෙසේ ප්‍රාර්ථනා කළහ. එසේ හෙයින් කියන ලදී;

ඉතො චුතා නො උභයො ජයම්පති
ජයම්පතිත්තං අවිනාසයන්තා,
එකත්ථ ජායෙම පියා මනාපා
හෙස්සාම රූපෙන පසත්ථරූපා[2]
දීඝායුකා වණ්ණවන්තා යසස්සි
හෙස්සාම භොගී සුවිසුද්ධසද්ධා,
මෙත්තෙය්‍යනාථං චතුපච්චයෙහි
තප්පෙත්ව කස්සාම භවස්ස අන්තං--යි.

මෙසේ ඔවුන් දෙදෙනා ප්‍රාර්ථනා කොට ගිය කල්හි භික්‍ෂූන්වහන්සේ උන් දෙදෙනා කෙරෙහි අනුග්‍රහයෙන් ඒ ආහාරය අමාවක් මෙන් වැළඳූසේක. එකල්හි එතන රැස්වූ උපාසිකාවරුන් හා උපාසකජනයෝ මෙසේ දුඃඛිත ජනයන් දුන් අමනොඥ භොජනය භික්‍ෂූන් වහන්සේ වැළඳූ නියාව ඉතා[3] යහපතැ යි විස්මයපත් ව සාධුකාර දුන්හ. ඉක්බිති ඒ දෙමහල්ලෝ තමන්ගේ ආයු පමණින් සිට එයින් චුත ව මෙම ලංකාද්වීපයෙහි දිඹුලාගල සමීපයෙහි එක් පර්වතයක් නිසා[4] පර්වතස්ථායි[5] දෙවතා ව උපන්හ. උන්ගේ කුශලානුභාවයෙන් නොයෙක් රත්නයෙන් දිලිහෙන්නා වූ[6] නොයෙක් සියගණන් කන්කුළු පෙළින්[7] ගැවසී ගත්තාවූ උයන් පොකුණු පතැස් ආදියෙන් ප්‍රතිමණ්ඩිත වූ මහත් දිව්‍යවිමානයෙක් පහළ වීය; ඒ දිව්‍යවිමානයෙහි ඔහු දෙදෙන දිව්‍යනාටකයන් විසින් පවත්වන ලද භෙරිතූර්‍ය්‍යනාදයෙන් හා නෘත්‍යගීතවාද්‍යාදියෙන් සතුටු සතුටු ව නොයෙක් දහස්ගණන් දිවසෙනඟ පිරිවරා දිව්‍යෛශ්වර්‍ය්‍ය අනුභව කෙරෙති. එකල ජනපදචාරිකාවෙහි නික්මුණු රහත් සත්දෙනකුන්[8] වහන්සේ උන් හැම වසන පර්වතසමීපයෙන් වඩනට පටන් ගත් සේක; එසේ වඩනා රහතන් වහනසේ දක ˙අපට යශදයක කුශලක්‍ෂෙත්‍ර වූ බුදුසවු වූ සඞ්ඝයා වහන්සේ වඩනා සේකැ˙යි සතුටු සොම්නස් ව සමීපයට එළඹ පසඟ පිහිටුවා වැඳ එතැන්හි මහත් සෙනාසන නිවෙසනයක් මවා මනහර මිණි කිකිණිදැලින් නෙවුණාවූ විසිතුරු මණ්ඩපයක් නිර්මිත කොට රහතන් වහන්සේ එහි වැඩ ඉන්ට සලස්වා දිව්‍යමය වූ කන බොන දෑ ආදිය එළවා තමන් අභිප්‍රාය වූ පරිද්දෙන් වළඳවා පස්වරු දිව්‍යමය වූ පානවර්ග වළඳවා පළමු තමන් අප්‍රකාශ ව මනුෂ්‍යයන් සේ සිටි හෙයින් දිව්‍යභාවය[9] මවාගෙන දිව්‍යාභරණයෙන් සැරහී ඔවුනොවුන් පරයන රූපයෙන් හා

1. ලබමෝව යි - CEGHKL ම.ස.
2. පසත්ථරූපං - පිටපත් හැම
3. ඉතා ම - GHKL
4. පර්වතයෙක - KL
5. කල්පස්ථායි - GHK, ම.
6. දිලියෙන්නාවූ - DEG
7. ගෙවලින් - GHKL
8. සත්දෙනකු - පිටපත් හැම.
9. දිව්‍යාත්මභාවය ම - ම,ස.
දිව්‍යභාවයට - ක.කි.සං.

Non-Commercial Distribution

ශරීරාලෝකයෙන් දසදිග් බබුළුවා දිවසෙනඟ පිරිවරා සිටගත්හ. එකල සඞ්ඝස්ථවිරයන්වහන්සේ උන් දෙදෙනාගේ රූපසම්පත් හා දිව්‍යෛශ්වර්‍ය්‍යය දැක 'මුන් මේ දිව්‍යෛශ්වර්‍ය්‍යය ලද්දේ කවර[1] කුශලයකින් දෝ හෝ, ඒ දැන් මා විචාළ මැනවැ'යි සිතා වදරනසේක්;

පුච්ඡාමහං දම්පතිකෙ ජලන්තෙ
අනන්ථ කිං පුඤ්ඤම'තීත කාලෙ,
තං මෙ වියාචික්ඛථ පඤ්හකාමො
දනාදිනං කස්ස[2] අයං විපාකො.

යනාදීන් 'එම්බා දිව්‍යශෝභාවෙන් බබළන්නාවූ තොප දෙමහල්ලන් අතින් විචාරමි[3] තෙපි දෙදෙන ගිය දවස කවර කුශලයක් කළෝ ද[4] ඒ තොප හැම කළ කුසල් මේ මේය යි නියම දන්නා කැමැත්තෙමි. මෙසේ වූ දිව්‍යසම්පත්තියක් ලද්දේ දනාදි වූ කවර කුශලයෙකින් දැ'යි විචාළසේක. ඉක්බිති ඔහු දෙදෙන කියන්නාහු;

අහුම්හ පුබ්බෙ කපණා වරාකා
අදම්හ සඞ්ඝස්ස කදන්නමත්තං,
සද්ධාය තං දනවරං හදන්තෙ
අකාසි තොද්'නි මහා විභූතිං.

යද්[5] පරිත්තං ච අදම්හ දනං
තථාපි තං හොති කදන්නමත්තං,
සද්ධාය ඨානෙ[6] සුපතිට්ඨිතත්තා
තස්සා 'දිසං ආසි ඵලං හදන්තෙ.

යනාදීන් 'ස්වාමිනි, අපි මීට පළමුවන[7] ජාතියෙහි දිළිඳු දුක්පත් ව වසන්නමෝ පෙර පිනක් නොකළ හෙයින් වේ ද මෙසේ දුක්පත් වූයේ යි සිතා ඒ දුක්පත් සැලැස්මට සුදුසු වූ කිලිත්තභෝජනයක් මහත් වූ ශ්‍රද්ධායෙන් සඞ්ඝයාවහන්සේට දන් දුනුම්හ; අපගේ දනය යහපත් නොවන නමුත් අපගේ චිත්තශුද්ධිය හා ක්ෂෙත්‍රශුද්ධිය යහපත් හෙයින් ඒ දනානුභාවයෙන් මෙබඳු ශ්‍රී විභූතියක් ලදුම්හ. ස්වාමීනි, අපි එකල සවල්පමාත්‍ර වූ එබඳු කිලිත්ත භෝජනය දෙන්නමෝ දනසහායභාවයෙහි පිහිටි[8] අපට ඇති විචරක් ම හෙයින් මහත් වූ ශ්‍රද්ධාවෙන් තුන්සිත පිරිසුදු ව දුනුම්හ. ඒ අප ශ්‍රද්ධාවෙන් දුන්නාවූ දන නමැති බිජුවට රාශිය අනාශ්‍රව සඞ්ඝ නමැති සරුකෙත[9] පිහිටි හෙයින් මෙසේ විපාක දිනැ'යි කීහ. එපවත් අසා මහතෙරුන්වහන්සේ 'එම්බා, මේ දිව්‍ය සම්පත් අනුභව කෙරෙමින් තෙපි හැම මෙතැන්හි කෙතෙක් කල් වසවූ දැ'යි විචාරනසේක්;

---

1. කුමන කවර - C
2. දනාදි පුඤ්ඤස්ස - පිටපත් හැම
3. විචාරන දෙයෙක් ඇත. - EGHKL ස.
4. කළා ද - පිටපත් හැම
5. යද- පිටපත් හැම
   තද - මුද්‍රිත හැම
6. දනෙ -GHL පාලි;
   දනො - K
7. පළමු - DEGHKL, ම.ස.
8. පිහිටා - EGHKL
9. සරුකෙතෙහි - GHKL

පුච්ඡාමි තුම්හෙ වසතං ඉධේ'වං
වදෙථ කිං කීවතකො'නු ආයු,
සුඛෙ ඨිතානං පියමෙව අත්‍ථං
චිරං වසිස්සන්තු අපාපකම්මා.

එම්බා, තොප හැමගේ ආයුප්‍රමාණ[1] කවරේ ද; කෙතෙක් කල් මෙහි ම වසවු ද? සැප විඳිනවුන්ට තමන්ගේ ආත්මය ප්‍රියවන්නෝ මය; කුශලබලයෙන් සැප විඳිනා තෙපි හැම බොහෝ කාලයක් ජීවත්වව යි' වදළසේක. එසේ වදළ මහතෙරුන් වහන්සේට තමන්ගේ ආයු ප්‍රමාණය[2] ප්‍රකාශකොට දක්වන්නාහු;

භීයොසො සුඛං එත්ථනුභුයමානා
අනන්තරායෙනථ වසාම යාව
මෙත්තෙයය නාථස්ස ජිනස්සුපත්ති[3]
ඉතො චුතා කෙතුමතිං ගමාම.

අඩ්ඪෙ කුලෙ පූජිත ලොකසම්මතෙ
ජාතා තතො තස්ස ජිනස්ස ධම්මං
සුත්වාන දත්වාන සසාවකස්ස
අනුපමං උත්තමදානම'ග්ගං.

පබ්බජ්ජ සබ්බත්ථ සුපාකටා නො
පූරෙත්ව සීලං පටිපත්තිසාරං[4]
තද කරිස්සාම ජිනස්ස සාසනෙ
භවස්ස අන්තං මුනිනො 'සකාසෙ

යනාදීන් 'ස්වාමීනි, මතු මෛත්‍රී බුදුන් බුදුවන තෙක් කිසි අන්තරායක් නැති ව උපමා කට නොහැකි අනූන වූ දිව සැපත් විඳිමින් මෙහි ම වාසය කරම්හ. පසු ව මෙයින් ගොස් කෙතුමතී නම් රාජධානියෙහි සියලු සම්පත්තීන් ආඪ්‍ය වූ ලොකපූජිත බමුණු මහසල් කුලයෙහි ඉපද මෛත්‍රී බුදුන්ගෙන් බණ අසා බුදුපාමොක් මහසඞ්ඝයා වහන්සේට අසදෘශ මහදන් දී ඉක්බිති සසුන් වැද මහණ ව හිරසඳ සේ ලොකප්‍රසිද්ධ ව ශීලාදි වූ ප්‍රතිපත්ති පුරා රහත් ව අමාමහ නිවන් දකුම්හ'යි මෙසේ තමන්ගේ ආයු ප්‍රමාණ හා මතු තමන් නිවන් දක්නා බව කීහ. එපවත් අසා තෙරුන් වහන්සේ සතුටු ව මේ කථාවස්තුව බොහෝ දෙනාට ප්‍රකාශකොට වදළසේක; මේ අසා බොහෝදෙන දනාදි වූ කුසල් කොට දෙව්ලොව උපන්හ. මෙසේ නුවණැති ශ්‍රද්ධාවන්ත උත්තමයෝ තමන්ගේ ගුණ නමැති බඩු පිරු ' ශ්‍රද්ධා නමැති

---

1. කිත්තාවතකො - ක.කි.කැ.ම. පාලි
2. ආයුඃ ප්‍රමාණය - ලීඩීන හැම. ස.
   ආයුෂ ප්‍රමාණය - G
3. ජිනස්සපත්ති - ක.කි.කැ.ම. පාලි
   ජිනස්සුප්පත්ති - බෙ.ස.
4. පටිපත්තිසාරා - පිටපත් හැම

Non-Commercial Distribution

රුවල්[1] ඇති දනප්‍රබන්ධ නමැති මහනැවට නැගී ජාති ජරා මරණාදි වූ නොයෙක් උපද්‍රවයට ආකර ව සිටි සංසාර නමැති සාගරයෙන් පරතෙරට පැමිණ නිවන් නමැති අභයපුරයට සැප සේ වැද සැනහෙනු මැනවි[2]. කියන ලදුයේ මැයි:

ආරුය්‍හ දනමය නාවමනූනපක්ඛං
සද්ධාලකාර සහිතං ගුණභණ්ඩ පුණ්ණං,
සංසාර පාපදුරිතාකර සාගරස්ස
පාරං පයන්ති සුජනා න චිරෙන එවං - යි.

මේ මෙහි දෙ වන
දුතිය ජයම්පතිකා වත්‍ථුව ය.

තව ද මෙහි තුන්වන රුක්ඛදෙවතා වසතුව නම් කවරයත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

යට කී පරිද්දෙන් මෙම ලක්දිව බැමිණිටියාසාය සමයෙහි රුවකපිටි නම් ගම පන්සියයක් පමණ කුලගෙවල මනුෂ්‍යයෝ එකි එකී කුලගෙයකින් පන්සීයක් පන්සීයක් දෙනා වහන්සේට දවස්පතා දන් දෙන්නාහ. ඒ දෙන දන් හැම දුර්භික්‍ෂ භයින් දීගත නොහී ක්‍රමයෙන් පිරිහෙළා එකි එකී කුලගෙයකින් එක එක කෙනකුන්වහන්සේට දන් දෙම්හ යි පටන් ගෙන එපමණකුත් දීගත නොහී එක් කුලගෙයක මනුෂ්‍යයෝ එක ම සාල්නැළියක් සේ ම කොට තබාගෙන කඩපොට්ටනියෙක් බැඳ සැළෙක පැනෙයි කකාරා සාලේ පහළ පැන් පමණක් බී නැවතත් එම සාල් අවුළා වියලා භාජනයෙක බහා[3] සොරුන් කෙරෙහි භයින් බිම සඟවා තබා දවසින් දවස මෙසේ ජීවත්වෙති. එකල්හි එක් රහත්තෙර කෙනකුන් වහන්සේ දවසෙක උදෑසනක් සේ ගැටවටු ගන්වා එම රුවකපිටි නම් ගමට සිඟා වැඩ පාත්‍රය සේධූ වන ම ඇරගෙන ගමින් පිටත් වූ සේක. එකල ඒ සාල්නැළිය නිසා ජීවත්වන මනුෂ්‍යයෝ තෙරුන් වහන්සේ දැක ඒ ඇමදෙන ම එක්සිත් ව 'පෙර අපි හැම ඉදුරා දනක් නුදුන් හෙයින් දන් මෙබඳු වූ දුක් විඳුම්හ; දන් මේ සාල්නැළිය නිසා පිනක් කොට ගතුමෝ නම් මතු එකාන්තයෙන් ම මෙවෙනි දුක්[4] නොවිඳුනමෝ[5] වේ ද' යි සිතා තෙරුන්වහන්සේ අතින් පාත්‍රය ගෙන තබා සාල්නැළිය සඟවා තිබූ තැනින් ගෙනවුත් බත් පිස පාත්‍රයේ බහා තෙරුන් වහන්සේට පිළිගැන්වූහ. එකල ඔවුන්ගේ ශ්‍රද්ධාබලයෙන් බත් පිසූ සැළ්[6] දෙවෙනිවත් බත් පිරී සිටගත; දන් දුන් උපාසකජනයෝ ඒ ආශ්චර්‍ය්‍යය දැක 'ආර්‍ය්‍යයන් වහන්සේට දුන් දනයෙහි විපාක අද ම ලදුම්හ'යි සතුටු ව මහජනයා රැස්කරවා උන් හැම බත් කවා පසු ව තුමූ බත්

1. රුවන් - DEGHJKL
2. සැනසෙත්. ඒ මැනවි -ත.සි.ස. සැනසෙත් මැයි - ම.
3. ලා - මුද්‍රිත හැම. ස.
4. දුකක් - GHL
5. නොවිඳුමෝ - CG
6. සැලෙහි - KL

Non-Commercial Distribution

අනුභව කළහ. සැළෙහි බත් ගත් ගත් තැන් පිරෙයි; එතැන් පටන් ඒ හැමදෙන ම තමන් කරා පැමිණි පැමිණි යම් ම කෙනකුන්ට බත් දෙමින් දන් දෙමින් බොහෝ කුසල් කොටගෙන දෙව්ලොව උපන්හ.

අහර පිළිගත් තෙරුන්වහන්සේ එගම වැවක් සමීපයට වැඩ රුකක් මුල ඉඳ අහර වළඳන්ට පටන් ගත්සේක; ඒ රුක අධිගෘහිත දේවතාවා ආහාරයෙන් කලාන්ත ව වසනුයේ අහර වළඳන තෙරුන්වහන්සේ දැක තමාගේ දිව්‍යාත්මභාවය හැර මහලු වෙසකින් තෙරුන්වහනසේට සමීප ව සිටියේය. තෙරුන් වහන්සේ ඔහු නොදැක නොබලා ම වළඳන සේක; දිව්‍යපුත්‍රයා තෙරුන්වහන්සේ අන්තිම ආලොපය තබා වැළඳූ කල්හි යටිගුරෙන් මදක් කාරා තමා එතැන සිටි බව ඇඟවීය; තෙරුන් වහන්සේ ඔහු දැක 'බත් නිසා ඇවිත් සිටි ඍහාව මිනිසෙකැ'යි ඒ අන්තිම ආලොපය ඔහුට[1] දුන්සේක; එකල දෙවතාවා බත්පිඩ අතින් ගෙන සිතනුයේ 'පූර්වජන්මවල මම ශ්‍රමණබ්‍රාහ්මණාදි වූ මිනිස් කෙනකුන්ට වේව යි යටත්පිරිසෙයින් බලු කවුඩු ආදී තිරිසන් සත්ව කෙනෙකුන්ට වේව යි බතක් නුදුන්නෙම් වන; එසේ හෙයින් දිව්‍ය දෙවතා ව ඉපද පවා ආහාරයක් නොලබමි,[2] එබැවින් මම මේ බත් පිඩ තෙරුන්වහන්සේට පිළිගන්වාපීම් නම් ඒ මට බොහෝ කාලයක් හිත්[3] සැප එළවන්නේය'යි මෙසේ දනයෙහි විපාක සිතා බත්පිඩෙහි ආලය හැර තෙරුන්වහන්සේ සමීපයට එළඹ 'සවාමීනි, ගැත්තවුට මෙලොවින් සංග්‍රහ නොකොට පරලොවින් සංග්‍රහ කළ මැනවැ'යි කියා බත් ආලොපය තෙරුන්වහන්සේගේ පාත්‍රයෙහි ම බහාලීය; ඒ බත් ආලොපය පාත්‍රයෙහි බහාලූ ඇසිල්ලෙහි ම ඒ කුශලයෙන් දෙවතාවාට සැළ අටක් පුරා දිව්‍යභොජන උපන; තෙරුන්වහන්සේ අහර වළඳ තමන්වහන්සේ වාසය කරන තැනට ම වැඩිසේක. ඉක්බිති ඒ දිව්‍යපුත්‍රයා දිව්‍ය වූ අන්නපාන ආදිය දැක මහත් වූ ප්‍රීතීන් පිනා එම ප්‍රීතිවෙගයෙන්:

සුලද්ධා වත මෙ ජාති - සුපහ ගාතජ්ජ[4] වාසරං,
යො අද්දසාසි මජ්ඣිණෙහ[5] තස්ස මෙ සුගතොරසං.

යම්හං අද්දසං භික්ඛුං - පටිපත්ති පරායනං,
ආහුණෙය්‍යං පාහුණෙය්‍යං - තස්සජ්ජ මම මඞ්ගලං.

යනාදින් 'සාධු සාධු; මෙතෙක් දවස් මෙසේ දුක් විඳ ආවා වූ මට සඞ්ඝරත්නය දුටු වේලෙහි පටන් දශදිගන්තරය[6] එකාලොක ව ගියා සේ පෙනෙයි, මේ උපන්නා වූ දිව්‍යාත්මභාවයෙහි ඵල ලදිමි. ප්‍රතිපත්ති පිරීම ම පිහිටකොට[7] සුප්‍රතිපන්නතාදි ගුණ සලකා ආදරයෙන් කැඳවාගෙන ඇවිත් ප්‍රත්‍යයදනාදීන් කළමනා පූජාවට සුදුසු හෙයින් ආහුණෙය්‍ය නම් වූ එම සුප්‍රතිපන්නතාදි ගුණ අසා කප්පියභාණ්ඩ වූ දනොපකරණ නිමවා කැරවියයුතු ප්‍රත්‍යයදනාදි පූජාවට සුදුසු හෙයින් පාහුණෙය්‍ය නම් වූ මේ සඞ්ඝරත්නය අද දුටු වේලෙහි පටන් මට මහමඟුල් වී[8] ගිය; අනාශ්‍රව

1. ඔහට - KL
2. නොලැබෙමි - DEGJ; නොලබෙමි - KL නොලදිමි - H
3. හිතව - KL
4. සුපභාසජ්ජ - ක.කි.කඳ.ම. පාලි
5. යො අදසි මජ්ඣිමාහො - ක.කි.කඳ. යං අද්දස මජ්ඣිභො - ම.
6. දශ දිගාන්තරය - ක.කි.කඳ.ම. දශදිසාන්තය - ස. දිගාන්තය
7. පිහිටකොට ඇති සේකැයි - KL ස.
8. මඟුලක් ව - GH

Non-Commercial Distribution

සඞ්ඝරත්නය උදෙසා ප්‍රත්‍යයදානයෙන් පූජාකිරීම හෙවත් සඞ්ඝරත්න නමැති[1] ක්‍ෂෙත්‍රයෙහි බිජුවට[2] වැපිරීම කාලාන්තරයකට නොයවා මෙම ජාතියෙහි ම විපාක දෙන්නේය යි බුදුන් වදළ වචනය ඒකාන්ත බව අද මම ප්‍රත්‍යක්‍ෂයෙන් ම දිටිමි. පෙර මම ශ්‍රමණ බ්‍රාහ්මණය සෙසු අවශෙෂ යාචකය යනාදී වූ කිසි කෙනකුන්ටත් ආහාරදානයක් නුදුන්නෙමි වන; දන් මෙසේ දිව්‍යදෙවතා ව ඉපදත් ආහාරයක් ලැබගත නොහිණිමි. අද මේ ආර්යයන් වහන්සේ මට දුන් එක බත් ආලොපය මම දන් උන්වහන්සේට ම සැදැහැයෙන් ම පිළිගන්වා ලීමි; උන්වහන්සේ 'මාගෙන් දුන් බත් පිඩ වේ දැ'යි නොසිතා මා කෙරෙහි කරුණාවෙන් වැළඳූසේක. ශ්‍රද්ධාවන්තයන් දෙන දන් පිළිගන්ට සුදුසු වූ ලොකොත්තර ගුණ ඇති උත්තමයාණන් වහන්සේට අද මම එක බත් ආලොපයක් දන් දී අද ම එහි විපාක ලදිමි. ක්‍ෂෙත්‍රශුද්ධි මහත්තත්වය ඉතා ආශ්චර්‍ය්‍ය දෙයෙක් මය; සඞ්ඝරත්නයෙහි ගුණමහත්තත්වය ඉතා අද්භූතය; කියා නිමවිය නො හැක්කේ මය. බුද්ධපුත්‍ර වූ සඞ්ඝරත්නය නම් අකාලිකය යි සංක්‍ෂෙපයෙන් බුදුහු වදළ වචනයෙහි අර්ථ අද මම ඉඳුරා ම දැනගතිමි. දැන් මෙසේ මට රසමසවුළෙන් යුක්ත වූ කෙනෙක් වියදම් කළත් ක්‍ෂය නොවන්නාවූ සුධාභොජන පිරී තිබෙන මහසැළ අටෙක් ඉන්ද්‍රජාලයෙහි[3] පෙනී ගියා සේ මේ ඇසිල්ලෙහි පහළ ව පෙනී ගිය; දානයෙහි විපාක නම් මෙසේ ආශ්චර්‍ය්‍ය දෙයෙක් වනැ'යි ප්‍රීතින් මත් ව උදන් ඇනීම් වශයෙන් සිත ඇතුළෙහි උපන් ප්‍රීතිවෙගය ධරාගත නොහී මුඛයෙන් උතුරුවා දමන්නා සේ මෙසේ ඒ දිව්‍යපුත්‍රයා උදානවාක්‍ය පවත්වා එතැන් පටන් බත් අනුභව කරනු කැමැති ව තමා සමීපයට පැමිණි සියල්ලවුන්ට ම දන් දෙමින් ජීවිතාන්තය දක්වා එහි ම වාසය කෙළේය.

එබැවින් පින්වත් සත්වයෙනි, යම් කිසි ශ්‍රද්ධාවන්තයෙක් සිල්වත් සඞ්ඝ නමැති මහපොළොව තමාගේ අතිපවිත්‍ර වූ ශ්‍රද්ධා නමැති තොතැන්න ආධාර කොට[4] දැහැමෙන් උපදවා ගත් දාන නමැති බිජුවටක් රොපණය කෙළේ වී නම් එයින් ජනිත වූ දානඵල නමැති කල්පවෘක්‍ෂයෙන් දිව්‍ය මනුෂ්‍ය සම්පත් හා නිවන් සම්පත් නමැති විපුල ඵල ලබන්නේ මැයි. එසේ හෙයින් කියන ලදී;

යො සීලවන්තමහියං සුචි පුනහුත[5]
සද්ධාලවාලවලයෙ සුචි දානබීජං,
රොපෙති සො ජනිත කප්පමහාදුමින්දෙ
සග්ගාපවග්ගවිපුලං ලභතෙ[6] ඵලං හො යි.

මේ මෙහි තුන් වන
රුක්ඛදෙවතා වත්ථුව ය.

---

1. සඞ්ඝ නමැති - DEGHKL
2. බිජුවටක් - GH
3. ඉන්ද්‍රජාලයෙක - GHKL ස.
4. ආරාධනා කොට - C
5. පුඤ්ඤදහුතං - C හැ.ම.ස., පාලි,
පුනහුම්ං - KL
පුඤ්ඤදහුත - ක.කි
6. දදතෙ - මුද්‍රිත හැම, ස.

Non-Commercial Distribution

තව ද මෙහි සතර වන පණ්ඩරඬග වස්තුව නම් කවරයත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මෙම සිංහලද්වීපයෙහි එක්තරා ගමෙක බොහෝ සම්පත් ඇති වෙණිහාල[1] නම් උපාසකයෙක් විය; ඒ උපාසකයා පුතණු කෙනකුන් ලැබ උන්ට තිස්සය යි නම් තබා වැඩිවිය පැමිණි පසු ආයුධ ශිල්පයෙහි දක්‍ෂ කරවා රජ්ජුරුවන්ට දක්වීය; එතෙම එතැන් පටන් රජ්ජුරුවන්ට අප්‍රමාද ව සේවය කෙරෙමින් අභ්‍යන්තර විය; රජ්ජුරුවෝ උන් කෙරෙහි පැහැද අමාත්‍යතනතුරු දී මාගම අයගම් කොට දුන්හ; එතැන් පටන් ඒ තිස්ස නම් අමාත්‍යයා මාගම වසනුයේ දැසි දස් ගවමහීසාදිවූ බොහෝ සම්පත්තීන් සමෘඬ විය; ශ්‍රද්ධාසම්පන්නය, භික්‍ෂූන් වහන්සේට නිරන්තරයෙන් සිවුපස දනයෙන් උපස්ථාන කෙරෙමින් වාසය කෙරෙයි; මෙසේ ශ්‍රද්ධාවන්ත ව වසන්නා වූ ඒ අමාත්‍යයා දවසෙක තිස්සමහ වෙහෙරට[2] ගොස් තමාගේ කුලූපග වූ තෙරකෙනකුන් වහන්සේ සමීපයට ගොස්[3] දක්‍ෂිණාවිභඬග සූත්‍රය අසා ඒ ඇසූ බණ වූ නියාවට කුසල් කළ මැනවැ යි සිතා සඬඝයා වහන්සේට මහදන් පවත්වා එතැන් පටන් අග්‍ර භොජනය සඬඝයා වහන්සේට නොදී[4] බත් අනුභව නොකෙරෙයි.

ඉක්බිති එක් දවසක් ඒ අමාත්‍යයා තමා වසන ගෙය සුවඳ පිරිබඩ ගෙන උඩ සුදුවියන් බඳවා වට තිර ජවනිකා අද්ද මලොලඹු එල්වා අලංකාර කොට අසෝර් දෙයෙක් මෙහි නැතැ යි නොකියන පරිද්දෙන් මහදන් සරහා සංඝයා වහන්සේ[5] පූජාසත්කාරයෙන් කැඳවා ගෙන අවුත් ආසන පනවා පතුල් සෝධවා ඉන්ට සැලැස්වීය. එදවස් ඒ අමාත්‍යයා දක්නා පිණිස ජනපදවාසීහු[6] බොහෝදෙන ඇවිත් වන්හ; එකල ගෙයි සෙසු මිනිසුන්[7] දන් දෙන්ට සලස්වා තුමූ ඒ දනවුවැසි මිනිසුන් හා සමඟ සාකච්ඡා කරනුවෝ සිහිනැති ව අග්‍ර භොජනය නුදුන්හ; ඒ වේලාවට වළඳන වේලා ඉක්මිණ; සංඝයා වහන්සේ වළඳ[8] විහාරයට වැඩිසේක; ඉක්බිති අමාත්‍යයා ඉස් සෝධා නහා බත් අනුභවකරන්ට ගෙට්[9] ගොසින් උන්නේය; එකල ඔහු ඉදිරියේ අග්‍රරස[10] භොජනය එළවා තිබූහ; අමාත්‍යයා ඒ දැක 'කුමක් නිසා මේ අග්‍ර භොජනය සංඝයා වහන්සේට නුදුනු ද' යි විචාළේය; එබස් අසා ගෙයි මනුෂ්‍යයෝ 'නුඹවහන්සේගෙන් විධානයක් නැති ව කෙසේ දෙමෝ ද'යි කීහ. එ පවත් අසා අමාත්‍යයා 'මීට පළමු අග්‍ර භොජනය දන් නොදී බතක් අනුභව නොකෙළෙමි; එසේ හෙයින් සංඝයාවහන්සේට නොවේලේ දන් දිය[11] නොහැක්ක; කවුරුන්ට දෙමෝ ද' යි කියා ඒ බත් දෙන්ට සුදුසු කෙනකුන් පරීක්‍ෂා කෙරෙමින් උන්නේය. එකල ඒ නුවර සමීපයෙහි සුසානයක වසන පණ්ඩරඬග පරිබ්‍රාජකයකු හා විස්වාසී ව වසන ඊශ්වර භක්ති ගත් මිනිසෙක් මේ අග්‍රරස[12] භොජනය ඒ පරිබ්‍රාජකයාහට දන් දෙවාපියමී සිතා ඒ පරිබ්‍රාජකයාගේ ගුණ කියනුයේ,

1. වෙණිහාල - DE
   වෙණිබාල - GH
   වෙණියාල - ක.සි.ඤ.ම.ස. පාලි
2. තිස් මහ වෙහෙරට - EHK
3. එළඹ - C
4. දන් නොදී - G
5. සඬඝයාවහන්සේට - CDJ,, ස.
6. ජනපදවාසී මනුෂ්‍යයෝ - මුද්‍රිත හැම, ස.
7. අවශෙෂ මනුෂ්‍යයන් - C
8. නොවළඳ - GHKL
9. ගෙයි - HJKL
10. අග්‍ර - GHKL ස.
11. දුන - H
12. අග්‍ර - GKL

Non-Commercial Distribution

යො වෙ දෙව අයං ලොකො - සබ්බො[1] ඉස්සරනිම්මිතො,
ලොකස්මිං යං සුඛං දුක්ඛං - සබ්බමිස්සරජනිතකං.

තස්සේ'කො තාපසො එත්ථ - සුසානස්මිං වසිස්සති,
භස්මඞ්ගරාගලිත්තඞ්ගො - රූළ්හකච්ඡො රජස්සිරො.

ජටාධරො ජලධරො - පාණිපත්තෙන භික්ඛති,
නත්ථ'ඤ්ඤො ගුණතො තෙන - සමො අඤ්ඤො ජගත්තයෙ
පුඤ්ඤකාමෙන තස්සේ'ව දතබ්බං තං සුභොජනං.

යනාදීන් 'ස්වාමීනි, මේ මුළුලොව සියල්ල ම ඊශ්වර නිර්මිතය; මනුෂ්‍යයන්ට වන්නාවූ යම් කිසි දුකෙක් සැපයෙක් ඇත් නම් එසියල්ල ම ඊශ්වරයන් විසින් මවන්නේය. ඒ ඊශ්වරයන්ගේ භක්ති ඇත්තාවූ තාපස කෙනෙක් සුසානයෙහි වෙසෙති; ඒ තාපසයෝ සියලඟ[2] අලු තවරා ගෙන ඉඳිති; උඩුරැවුළෙන් කටවසා තිබෙයි; යටි නිකටේ දැළිවල්ලෙන්[3] ළය වසා තිබෙයි. දෙකිසිල්ලත්[4] එසේ මය. ඉස රජස්[5] ගැවසී තිබෙයි[6]. ඌ තුමූ ජටාධරයෝය; වසුන්පයි මහල්ලක් බඳු කිලුටු කන්ථකඩක් පොරොවති; පාණිපාත්‍රයෙන් සිඟති; ගුණයෙන් උන් හා සමාන කෙනෙක් මේ තුන්ලොව ම නැත; කුසල් කැමැත්තවුන් විසින් ඒ රසභෝජනය ඒ තාපසයන්ට ම දිය යුත්තේය' යි කීය.[7] එබස් අසා අමාත්‍යයා 'එසේ කල මේ භෝජනය ඒ තාපසයන්ට දෙව'යි කීය.[8] එකල මනුෂ්‍යයෝ බත් ගෙන සුසානයට ගියාහ. එකල්හි ඒ පණ්ඩරඞ්ග පරිබ්‍රාජකයා රාත්‍රියෙහි මාගමක හා සමඟ වාසය කොට උදයන ඈ හා සමඟ රා බී මත් ව සවස රා හා එක් ව අනුභවයට බිලියක් ගෙන කුඩමස්සන් බා වැලෙක අමුණා බිලිය දියට දමා බිලි ඉපල්[9] අල්වාගෙන සිටියේය; එකල බත් ඇරගෙන එන මනුෂ්‍යයන් දැක කුඩමස්සන් හා බිලි ඉපල දියෙයි සඟවා පයින් මිරිකාගෙන සිටියේය; බත් ගෙන ගිය මනුෂ්‍යයෝ එම සියල්ල ම දැක මේ ලජ්ජා නැති ජඩයා ගුණවතැ යි කියති. මොහුගේ මොහානුභාවයක් බලව'යි ගෙන ගිය අග්‍රභොජනය ඔහට නොදී අමාත්‍යයා සමීපයට ගොස් කියන්නාහු:

න දක්ඛිණාරහො ස්වා'යං - අගුණො හිරිවජ්ජිතො.
ඉත්ථිධුත්තො සුරාධුත්තො - ථෙනො පාණාතිපාතිකො.

පීත්වා ඉත්ථියා සද්ධිං - සුරං එසො යථිච්ඡිතං,
මච්ඡෙ උද්ධරතෙ'දනි - බලිසෙන අසඤ්ඤතො.

නත්ථ'ස්සා'චාරමත්තම්පි - කුතො සීලං සමාධි කො,[10]
එතාදිසානං යං දින්නං - කින්නු තස්ස මහප්ඵලං.

---

1. සබ්බෙ - DGHKL
2. සියොලඟ - H
3. දැළිවලෙන් - G
4. දෙකිසිල්ලෙන් - D
   දෙකසිල්ලෙන් -C
5. රජසින් - DEGHKL
6. ගත්තේය - GHKL
7. කීහ. - CH
8. කියා. - CD
9. ඉපල් - H;
   ඉපිල -KL;
10. සමාධිකා - CDEGHJKL

Non-Commercial Distribution

යනාදීන් තෙල ඊශ්වරභක්තිකයා ගුණ කී පණ්ඩරඩ්ග තපස්වියා නම් සත්‍රිධූර්ත කම් කොට ඇවිදිනා නිර්ගුණී සොරාය. දක්ෂිණාව පිළිගන්ට සුදුසු එකෙක් නොවෙයි. තෙල[1] අහිරික භක්තිකයා එක්විටෙක මෙතැන ගුණ කී පණ්ඩරඩ්ග තපස්වියා ගැහැණියක හා සමඟ කැමැති පමණක් රා බී රාත්‍රිභාගයෙහි අනාචාර කොට ඇවිද දන් ගොසින් බිලියක් ඇරගෙන කුඩමස්සන් බාමින් සිටියේය. ආචාර මාත්‍රයකුත් නැත[2]. ඔහුගේ[3] කවර ශීලයෙක් ද? ඌට දුන් දනයෙහි විපාක කවරේ දැ'යි කියා 'ඇසුව මැනව; ස්වාමිනි, ඒ පණ්ඩරඩ්ග තපස්වියා බිලි බාමින් සිට අප දුක මැරූ කුඩමස්සනුත් බිලි ලීයත් දිය යට සඟවා පයින් මිරිකාගෙන කිසිවක් නොකළ නොකී කෙනෙකුන් සේ අප දසාව බලා ගෙන සිටියේ වේ දැ'යි කීහ.

එබස් අසා අමාත්‍යයා 'බිලී ලීය හා මැරූ මසුන් සඟවාලා සිටියේ ලජ්ජා ඇති හෙයින් වේ ද; එසේ භය ලජ්ජා ඇති නැතැත්තවුට දුන්නාවූ දනයෙහි විපාක ඇත්තේ මය' යි කියා ඒ බව දක්වන්නාවූ උපාසක තෙම;

දෙති යො 'පචිකානම්පි - තිණපණ්ණම්පි චෙතසා,
තෙන තාදිසකං හොති - ඵලං තස්ස භවන්තරෙ.
තිත්තිං කත්වා දින්නදනං - තිරච්ඡානසතස්ස යං,
මනුස්සෙසකස්ස තං සබ්බං[4] - දිනෙනන සමකං සියා.
යථා සාරතරෙ ඛෙත්තෙ - බීජම්'ප්පම්පි[5] රොපිතං,
ඵලං දෙති මහා හුත්වා - කස්සකස්ස අනප්පකං[6].

යනාදීන් 'යමෙක් සැදැහැයෙන් වේයන්ට තණ පමණක් දන් දුන්නේ වී නම් ඕහට උපනුපන් ජන්මයෙහි එවිචර[7] ස්වල්ප වූ විපාක දෙයි. තිරිසනුන් සියයකට බඩ පුරා දුන් දනය එක් මිනිසකුට දුන් දනයක් හා සමාන විපාක දෙයි. සරු කෙතක වපුරන ලද ස්වල්පමාත්‍ර වූ බිජුවටෙක් වී නමුත් යම් සේ ගොවියාට අනල්ප වූ බොහෝ ඵල දෙන්නේ වේ ද, එපරිද්දෙන් ම උතුම් වූ දක්ෂිණෙය්‍ය පුද්ගල නමැති ක්ෂෙත්‍රයෙහි යමෙක් සැදැහැයෙන් දන නමැති බිජුවටක් රොපණය කෙළේ වී නම් දිව්‍ය මනුෂ්‍ය සම්පත් නමැති ඵල ප්‍රදනය කොට නිවන් නමැති අමෘතඵලයත් සිඩ කොට දෙන්නේ මය. යමෙක් නිසරු කෙතක බොහෝ බිජුවට වපුළේ වී නමුත් බොහෝ ශස්‍යඵල ලබන්නේ නොවෙයි; සවල්පමාත්‍රයක් ම ලබන්නේය.[8] එපරිද්දෙන් ම ගුණහීන වූ දුශ්ශීලයන්ට දුන්නාවූ දනය මහත් විපාක දෙන්නේ නොවෙයි; සවල්ප වූ විපාක දෙයි. එසේ හෙයින් පණ්ඩරඩ්ගතපස්වියාට මේ අග්‍ර ආහාරය දන් දුන් කල ස්වල්පමාත්‍ර වූ විපාකයෙක්වත් එකාන්තයෙන් ලැබෙන්නේ මය; මේ ආහාරය ඒ තපස්වියාට ම දන් දී පියව යි කීහ.[9] 'යම්තම් වී නමුත් ලජ්ජා ඇති වීම මිනිසුන්ගේ

1. මෙතන තෙල - පිටපත් හැම
2. අනාචාර මාත්‍රයක් විනා - J මුද්‍රිත හැම ස.
3. මුහුගේ - G
4. ධම්මං - GH; කණ්ඩං - KL
5. බීජමප්පම්පි - GHKL
6. අනප්පකං - GHKL
7. එවිචරට - G; එවිචර - KL
8. ලබන්නේ මය - GH
9. දී පියම් - බෙ.ස.

Non-Commercial Distribution

ගුණයෙක් මය; එපමණ ලජ්ජා ඇතිවුන්ට දුන්නාවූ දානයෙහි විපාක උන්ගේ ගුණ වූ නියාවට ලැබෙන්නේය' යි[1] කියා 'එම්බා, බිලී බාමින් සිට තොප හැම දක බිලීලීය සැහවූයේ ලජ්ජා ඇති හෙයිත; එසේ හෙයින් ඕහට අග්‍ර ආහාරය[2] දෙමි'යි එදවස් ඒ ආහාරය දන් දී දෙවන දවසුත් ඒ පණ්ඩරඞගයා ගෙන්වා ගෙන දන් දී සිත් පහදවාගෙන පණ්ඩරඞගයා නික්මවූහ.

ඉක්බිති ඒ තිසස නම් අමාත්‍යයාට ආයුකෙළවර මරණාසන්නයෙහි මහ පොළොව සේ මහ මුහුද[3] සේ ඔහු දුන්නාවූ දන් සියල්ල ම තිබැදී පණ්ඩරඞගයාට දුන්නාවූ ඒ දානය ම සිතට වැටහිණ; එසේ හෙයින් ඒ ආත්මභාවයෙන් චුත ව එම දානයෙහි විපාකයෙන් කළු තිඹිරි වෙහෙර රුක් අත්තන ගසෙක බුමාටු දෙවතා ව උපන. ඒ ක්‍ෂණයෙහි ඕහට දිව්‍යමය වූ ඛජ්ජ භොජ්ජ ලෙය්‍ය පෙය්‍ය සායනීයය යි කියනලද පඤ්චප්‍රකාර අනුභොග වස්තූහු ද සෙසු නොයෙක් දිව්‍යසම්පත්තීහු ද පහළ වූවාහු මය.

මෙසේ කිසි ගුණලවයක් නැති මිථ්‍යාදෘෂ්ටි ගත් පණ්ඩරඞග පරිබ්‍රාජකයාට දුන්නාවූ දානය පවා මෙසේ මහත් විපාක දෙන කල සුශීල සඞ්ඝරත්නය උදෙසා සැදැහැයෙන් දෙනලද්දවූ දානයෙහි විපාක අපමණ වන්නේය යි දැන තමහට වැඩ කැමැති ශ්‍රද්ධාවන්තයන් විසින් දානාදි වූ කුසල් කටයුත්තේ මැයි. එසේ හෙයින් කියන ලදී.

'අවේරමෙතං[4] ජනතා සුණාථ
නිහීනපච්චයස'පි දින්නදානං,
එවං ඵලං හොති කථන්නු තුම්හෙ
ඛෙත්තෙසු'නගෙසු පමාදයිත්ථ'යි.

මේ මෙහි සතර වන
පණ්ඩරඞග වස්තුව ය.

නව ද මෙහි පස් වන දුබ්බිට්ඨි මහාතිස්ස වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු. කෙසේ ද යත්;

මෙම ලංකාද්වීපයෙහි අනුරාධපුරයට නුදුරු තැන මහෙළ නම් නුවරෙක් විය; ඒ නුවර දුබ්බිට්ඨිමහාතිස්ස නම් අමාත්‍යයෙක් වෙසෙයි; ඒ අමාත්‍ය බොහෝ ධනධාන්‍ය හා පරිවාර සම්පත් ඇත්තේය; ශ්‍රද්ධාවන්තය; දන් පින් කිරීමෙහි අප්‍රමාද ය; ඔහුගේ භාර්‍ය්‍යාවෝ ද ශ්‍රද්ධාසම්පන්නයහ; තුනුරුවන් කෙරෙහි මමත්වය ඇතියහ; මෙසේ ඔවුන් දෙදෙනා දානාදි වූ කුශලක්‍රියායෙහි යෙදී දවස් යවන[5] කල්හි මැත භාගයෙහි උන්ගේ මහත් වූ වප්මඟුලෙක් විය; නොයෙක් සිය ගණන් මනුෂ්‍යයෝ

1. ලැබෙන්නේ මය - H
2. අග්‍රාහාරය - EH.
   අග්‍රභොජනය - D
3. සමුද්‍රය - DHKL ම.ස.
4. අවේරමනං. - ක.කි.ඤ.ස. පාලි
5. වාසය කරන - H

Non-Commercial Distribution

කර්මාන්තයෙහි නියුක්ත වූවාහු සර්වාඞ්ගයෙන් ධවල වූ සුදුගොනුන් කසා නාවා කර බොලු ආභරණ පළඳවා අංවල රන් රිදී කුප්පි බහා පය රන්රසු බැඳ සර්වාලංකාරයෙන් සරහා නඟුල් වියදඬු ආදියෙහි යොද පියලූ මනුෂ්‍යයෝ තමතමන්ගේ විභවානුරූප[1] පරිද්දෙන් නොයෙක් කන බොන දෑ සපයා කමින් බොමින් සර්වාභරණයෙන් සැරහී සමහරෙක් සාති; සමහරෙක් වපුරති, ගෙවල ස්ත්‍රීජනයෝ ද එපරිද්දෙන් ම වස්ත්‍රාභරණාලංකාරයෙන්[2] ම සැරහී මහත් වූ උත්සවයෙන් වපුරති. එකල්හි සෙට දවස් මඟුලැ යි දන ඒ අමාත්‍යයාගෙන් ණය ධරන මිනිසෙක් ඒ වප්මඟුලට අන්තරායක් කළ මැනවැ යි[3] සිතා වප්මඟුල් තබ්බවන්ට උපායක් පරීක්ෂා කරනුයේ 'මූ හැම ශ්‍රද්ධා ඇතියහ; බෙහෝ භික්ෂු සඞ්ඝයා ගෙදෙරට පැමිණි කල්හි දන් දීමෙහි ව්‍යාපෘත ව වප්මඟුල් තබති; එසේ කල්හි ඔවුන්ගේ වප්මඟුලට අන්තරාය වන්නේය' සිතා සවස අභයගිරි විහාරයට ගොස් තිස්සදත්ත තෙරුන්වහන්සේ සමීපයට එළඹ පසඟ පිහිටුවා වැඳ 'ස්වාමීනි, දුබ්බිටඨිතිස්ස අමාත්‍යයාණන්ට අනුග්‍රහ කොට පන්සියයක් භික්ෂූන් හා සමඟ උන්ගේ ගමට වැඩිය මැනවැ' යි ආරාධනා කොට ගියේය. එපවත් නොදන අමාත්‍යයා දෙවන දවස් තමාගේ[4] දාසකර්මකාර ජනයන් පිරිවරා සානා තැනට[5] ගියේය; මෙසේ ඒ අමාත්‍යයා කෙතට ගිය කල්හි තිස්සදත්ත තෙරුන් වහන්සේ උදසන්හි ම නැඟී සිට සිවුරු පිළිදඟ ගැටවටු ගන්වා ගෙන පන්සියයක් භික්ෂූන් වහන්සේ කැඳවා ගෙන අමාත්‍යයාණන්ගේ ගෙදෙරට පැමිණිසේක; එකල්හි ඒ අමාත්‍යයාණන්ගේ භාර්‍යාවෝ තිස්සදත්ත තෙරුන් වහන්සේ ඇතුළු වූ පන්සියයක් භික්ෂූන් වහන්සේ දක සතුටු ව තෙරුන් වහන්සේ කරා එළඹ භක්තිප්‍රේමයෙන් වැඳ අතින් පාත්‍රය ගෙන ඒ පන්සියයක් දෙනා වහන්සේ එක්ව ම කැඳවා ගෙන ඇවිත් තමන්ගේ ගෙයි ආසන පනවා ඉන්ට[6] සලස්වා දෝත[7] මුදුනේ තබාගෙන සනෙහාක්ෂයෙන් වැඳ වැඳ සිටියාහ. තෙරුන් වහන්සේ ඒ ගෙයි මනුෂ්‍යයන් දන් දෙන්ට කරන උත්සාහයක් නොදක 'උම්බා උපාසිකාවෙනි, අද තොපගේ ගෙයි මහා කෝලාහලය; අනික් කාරියෙක ව්‍යාපෘතය යි සිතමි' වදළසේක; එසේය; ස්වාමීනි, අද අපගේ වප්මඟුලෙක; ඒ වප්මඟුලුත් මේ දන් මඟුලුත් දෙක ම පිරිමයන්ට[8] මට ම භාරය යි' කියා[9] පළමු පිළියෙල කොට තුබූ කැඳක් අවුලක් නැති හෙයින් ගෙයි බාලයන්ට පිළියෙල කළ ආහාරය දීකිරි තෙල් පැණි සකුරු එක්කොට පාත්‍රවල බහා පිළිගැන්වූහ; තෙරුන්[10] වහන්සේ පාත්‍ර ඇරගෙන වඩනට ආරම්භ කළසේක; ඒ දක උපාසිකාවෝ 'ස්වාමීනි, එසේ වඩින්ට කාරණ කිම් ද? දන් පිළියෙල කරන තෙක් මේ ආහාරය වළඳ ඇමදෙනා වහන්සේ ම වැඩඋන මැනවැ' යි අරාධනා කොට දන් පිසන්ට පටන් ගත්හ.

---

1. විභාවානුරූප වූ - CH
2. වස්ත්‍රාලංකාරයෙන් - DEGHKL
3. කරමැ යි - KL
4. තමන්ගේ - EGHKL
5. කෙතට - KL
6. වැඩ ඉන්ට - CD
7. දෙහොත් - DEGHKL
8. පිරිමස්වන්ට - DEGHJKL
9. කිහ - D, මුද්‍රිත හැම
10. තෙරවරුන් - E

Non-Commercial Distribution

එකල්හි දුබ්බිට්ඨිතිස්ස නම් අමාත්‍යයා කුඹුරේ සිට ගෙට අවුත් තෙරුන් වහන්සේ දක සන්තොෂයෙන් පසඟ පිහිටුවා වැඳ එකත්පස් ව සිටියේය. එකල තෙරුන් වහන්සේ 'එම්බා උපාසකයෙනි, අපි එකාන්තයෙන් තොපගේ ගෙයි මෙසේ වූ මඟුලෙක් බව දනුමෝ නම් නොඑම්හ; අපි හැම තොපගෙන් ගිය අසුවල් මිනිසාණන් ආරාධනා කළ හෙයින් ආම්හ'යි වදාළසේක. එපවත් අසා උපාසකයෝ 'ස්වාමිනි, ඒ ගිය මිනිසාණෝ නම් මාගෙන් ණය ධරන තැනැත්තෝය; මාගේ වප්මඟුලට අන්තරායක් කෙරෙමි යි සිතා මෙසේ කෙළේය.[1] ස්වාමිනි, ඒ මිනිසාණෝ මට අන්තරාය කෙරෙමි යි සිතා ඔහු විසින් මට කළාවූ උපකාරය ඉතා යහපත; උන් නිසා නුඹවහන්සේ වැනි සිල්වත් ගුණවතුන් වහන්සේ දකින්ටත් වඳින්ටත් දනමානාදීන්[2] සත්කාරකොට පින් පුරාගන්ටත් සැලසිණ, ස්වාමිනි, අද පටන් ඒ මිනිසාණෝ මාගේ මිත්‍රයාණෝය'යි කියා නැවත කියනුයේ,

සහායකා මයං තෙ'කෙ[3] - පටිඤ්ඤාතා නරා ඉධ,
පාණාතිපාතකම්මෙ තෙ - නියොජෙන්ති සහායකං.

පරස්සාහරණෙ චෙ'කෙ - සන්ධිච්ඡෙද්දි දරුණෙ,
නියොජෙන්ති සකං මිත්තං - තෙ මිත්තපතිරූපකා.

ඉත්ථිධුත්තො සුරාධුත්තො - අක්ඛධුත්තො සහායකො,
සහායං තත්ථ යොජෙති - සො මිත්තපතිරූපකො.

භාසන්තා අලිකං ලොකෙ - වණ්ණෙන්තා තුච්ඡවණ්ණිතං,
මිත්තං මිච්ඡාසු යොජෙන්ති - තෙ මිත්තපතිරූපකා.

යනාදීන් 'ස්වාමීනි, මේ ලොකයෙහි යම් කෙනෙක් මිත්‍රයම්හ යි කියා ගෙන මිත්‍රයන් ප්‍රාණාතිපාතාදි වූ අකුශලක්‍රියාවෙහි යොදත් ද එසේ වූ මිත්‍රයෝ මිත්‍රප්‍රතිරූපකයෝ නම් වෙති. තව ද යම් මිත්‍රයෙක් තමාගේ මිත්‍රයා උමං බිඳීම් අනුන්ගේ වස්තු සොරා ගැනීම් ආදි වූ නොකළමනා[4] කාර්‍ය්‍යයෙහි යොදා ද එසේ වූ මිත්‍රයා ද මිත්‍රප්‍රතිරූපකයා නම් වෙයි. ස්ත්‍රීධූර්ත සුරාධූර්ත කම්, පැරදගිය කෙනකුන්ගෙන් මෙතෙක් දෙන්ටය යි[5] වඩ්ඩි තබා දූකෙළීම් ආදි වූ නොකළමනා කාරියෙහි නියුක්ත ව ඇවිදිනාවූ යම් මිත්‍රයෙක් තමාගේ මිත්‍රයනුත් එසේ ම අකාරියෙහි යොදා ද එයිත් මිත්‍රයා නම් නොවෙයි. යම් මිත්‍රයෙක් සිත ඇත්ත සඟවා පබා දෙයක් සේ මිත්‍රයන්ට බොරු කියා ද මිත්‍රයා සිත් ගන්නා පිණිස නැති ගුණ කියා වර්ණනා කෙරේ ද තමාගේ මිත්‍රයා නොකළමනා නිෂ්ඵලකාරියෙහි යොදා ද එසේ වූ මිත්‍රයාත් මිත්‍රයා නම් නොවෙයි. යම් මිත්‍රයෙක් විජ්ජතුන්[6] සේ නටමින් ගී කියමින් බෙර ගසමින් කෙළගෙන සීගෙන[7] ඇවිදී ද තමාගේ මිත්‍රයනුත් එසේ ම

1. කොළේය - බෙ.ස.
2. මානනාදීන් - J ම.
3. මයං තෙහි -මුද්‍රිත හැම, ස.
මයා තෙකෙ - පිටපත් හැම, පාලි
4. නොයෙක් නොකළමනා - G
5. දවය යි - HKL
6. විද්දතුන් - බෙ.
7. කෙළගෙන සිනාගෙන - C
කෙළා සීගෙන - ක.කි.සද.ම.

Non-Commercial Distribution

නොසරුප් කටයුත්තෙහි යොද ද එයින් මිත්‍රයා නම් නොවෙයි. දන් මේ මාගෙන් ණය ධරන තැනැත්තේ මා කෙරෙහි රොසයෙන් අවැඩ සිතා මාගේ වප්මඟුල් නැති කරනු පිණිස මෙසේ කෙළේ වී නමුත් මින් මට පින් පිරුණු[1] හෙයින් මෙලෝ පරලෝ දෙකට ම යහපත් කටයුත්තෙහි යෙදූ මිත්‍රයා නම් වෙයි. අද පටන් මේ මිනිසාණෝ මට අභිවෘද්ධයක වූ මිත්‍ර නමුත් වෙති; නෑයෝ නමුත් වෙති; එසේ හෙයින් අද මේ වේලෙහි පටන් උන්ට මා උපකාර කළ මැනවැ'යි කියා උන්ගෙන් ලබාගත් ණය පත ඉරා දමා තමා සමීපයෙහි වසන සේ සලස්වා ගෙන තමන්ගේ විභවානුරූපයෙන් සැපත් දී ඉඳුරා ම මෛත්‍රී ඇති ව රක්‍ෂා කෙළේය. මෙසේ අනර්ථ අවැඩ සිතූ අසත්පුරුෂයාට සංග්‍රහකොට එදවස් වේලා ආසන්න වූ කල දෙමහල්ලෝ එක් ව මහ දන් දී ඉක්බිති තුන් සිවුරු ආදි වූ පිරිකර දී තෙරවරුන් වහන්සේ විහාරයට ම නික්මවූහ.

මෙසේ ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයෝ තමන් ලත් සැපත් සැදැහැයෙන් දන් දී එම දනානුභාවයෙන් මෙම ජාතියෙහි අහස් මැද දිලිහෙන්නාවූ පූර්ණචන්ද්‍රයා සේ ලොකප්‍රසිද්ධ ව මේ පෘථිවිතල නමැති ආකාශයෙහි පැළබෙති; එසේ හෙයින් එපරිද්දෙන් ම ශ්‍රද්ධාවන්ත සත්පුරුෂයන් විසින් සර්වඥශාසනයෙහි සිත් පහදවා දනාදි කුසල් කොටගෙන දෙව් මිනිස් සැපත් විඳ නිවන්පුර සිරි විඳින්ට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි;

> සද්ධාය[2] ලද්ධකං දක්ඛිණෙය්‍යෙසු දත්වා
> භූතලෙ භාති යො සාමිනී සාමිකො ච,
> සාධවො සාධුනං සාධු දත්වාන තස්මා[3]
> නිබ්බුතිං යාථ භො සොගතෙ සුප්පසන්නා.

මේ මෙහි පස් වන
දුබ්බිටඨි මහාතිස්ස වස්තුව ය.
මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි
නන්දිවාණිජ වර්ග නම් වූ
දෙවිසි වන පරිච්ඡේදය නිමි.

* තව ද මේ සද්ධර්මාලංකාරයෙහි තෙවිසිවන චූළගල්ල වර්ගය නම් කවර යත්. එහි පළමුවන චූළගල්ල වස්තුව මෙසේ දත යුතු. කෙසේ ද යත්;

මෙම ලංකාද්වීපයෙහි දදුරුහොයට නුදුරු වූ සුළුගලු නම් ගම එම නමින් ප්‍රසිද්ධ වූ මහත් විහාරයෙක් වීය. ඒ විහාරය නොයෙක් සියගණන් භික්‍ෂූන් හා ශ්‍රද්ධාවන්ත ජනයන් විසින් ගැවිසී ගත්තේය. ඉක්බිති එම සුළුගලු ගම තුනුරුවන්

1. රජ් වනු - GKL
2. සදධායා - ක.කි.ඤ.ම. පාලි
   සදධාය - පිටපත් හැම
3. තමහා - ක.කි.ඤ.ම.
* මෙතැන් සිට B පිටපත යළි ආරම්භවේ.

Non-Commercial Distribution

කෙරෙහි ප්‍රසන්න වූ ශ්‍රද්ධාවන්ත උපාසකයෙක් භික්‍ෂූන් වහන්සේ උදෙසා විසිතුරු වූ භොජන ශාලාවක් කරවා උඩ සුදුවියන් ආදියෙන් සරහා සතර දිගින් වඩනා සඞ්ඝයා වහන්සේ නිසා නිරන්තරයෙන් නහන බොන පැන් පරහා තබයි; ඉඳිනා හසුන්[1] පනවයි; දැහැටිදඬු එළවා තබයි; ගිලනුන් වහන්සේ පිණිස උණුපැන් සිහිල් පැන් ගෙන හැර තබයි. හිස් තෙල් පහන් තෙල් තබා දෙයි; බෙහෙත් කැඳ ආදිය එළවයි[2]. එසමයෙහි මලියදෙව නම් මහ තෙරුන් වහන්සේට දවසෙක රාත්‍රි භාගයෙහි බලවත් වූ බඩරුජාවෙක්[3] පහරනට පටන් ගත; මවුන් වහන්සේට පළමු ඒ රුජාව ගත් කල දුරු මිරිස් ආදි වූ ඖෂධ එකොළොසක් බහා පිසන ලද එකාදශයාගු නම් වූ බෙහෙත් කැඳක් වැළඳූ කල්හි රුජාව සන්හිඳෙල,[4] එසේ හෙයින් එදවස් තෙරුන් වහන්සේ එබඳු බෙහෙත් කැඳිත්තක්[5] කොයින් ලැබෙම් දෙ හො යි දිවසින් බලනසේක් සුළුගලු නම් උපාසකයන් සමීපයෙන් ලැබෙන බව දැන උදසන්හි ම නැඟී සිට සිරිරු පිළිදගා දහගැබ්[6] මහබෝ ආදියෙහි කළමනා වත් සපයා කයින් සිවුරු හා අතින් පාත්‍රය ගෙන නිල් පියුමක් තුඩින් ගෙන අහසට පැනනැඟී ගරුඩරාජයකු සේ සෘඩි වෙගයෙන් අහසට පැන නැඟී දික් කළ අතක් වක් නොකරන ඇසිල්ලෙහි සක්විතිරජක්හු කරා යන සිතුම්ණිරුවනක් සේ අහසින් ගොස් සුළුගලු උපාසකයන්ගේ ගම්දෙරට බැස ග්‍රාමූපචාරයෙන් පිටත සිට සිවුරුගැට ගන්වා පාත්‍රය අතින් ගෙන ඇතුළුගමට වැද ගෙපිළිවෙළින් සිඟමින් ගොස් ආසන ශාලාවට වැඩිසේක. එකල්හි සුළුගලු උපාසකතෙම ආසනශාලාවෙහි ම වත් කෙරෙමින් සිටියේ සමීපයට වැඩි තෙරුන් වහන්සේ දැක හිඳිනා හසුන්[7] පනවා වඩා හිඳුවා පතුල් සෝධා තෙල් ගල්වා පවන් පතක් ගෙන ඇඟ විඩා දුරු කොට තෙරුන් වහන්සේ හා සමඟ කථා කෙරෙමින් ම සිටියේ ඔබගේ ආකාරයෙන් ඔබ් ගිලන් බව දැන 'ස්වාමීනි, නුඹවහන්සේට ශරීරායාසයෙක් ඇද් ද'යි විචාළේය, ඉක්බිති තෙරුන් වහන්සේ 'පුවජිතපඥා[8] දෙසොනත්ථි' යනු හෙයින් තමන් වහන්සේට බඩරුජාවක් පහරන බවක් හැඟවූසේක. එකල උපාසකතෙම 'මේ රුජාවට එකාදසයාගු නම් වූ බෙහෙත් කැඳ යහපතැ'යි සිතා 'ස්වාමීනි, මා බෙහෙත් කැඳිත්තක් සපයා ගෙනෙන තෙක් මට අනුග්‍රහ කොට මඳක් වැඩඋන මැනවැ'යි ආරාධනා කෙළේය; තෙරුන් වහන්සේ ද මුවෙන් නොබිණීමෙන් ඉවසා වදළසේක,

---

1. අසුන් - BGH
2. එළවා තබයි - H
3. රුජාවෙක් - BCDGKL
4. සන්හිඳෙයි - මුද්‍රිත හැම
5. දියත්තක් - BCDEJ ස, මුද්‍රිත හැම
6. දහගප් - DGKL
   දහගැප් - CH
   දහගබ් - E
7. අසුන් - BDGHKL
8. පඤ්ඤා - ක.කි.සැ.ම

Non-Commercial Distribution

ඉක්බිති උපාසකතෙම තමාගේ[1] ගෙට ගොස් බෙහෙත් බඩු පිළියෙළ කොට දියත්ත්[2] පිසන තෙක් නැවත අවුත් තෙරුන්වහන්සේ සමීපයෙහි කථා කෙරෙමින් හුන්නේය. ඉක්බිති තෙරුන් වහන්සේ සිතනසේක් 'මේ උපාසක තෙම එසේ මෙසේ ළාමක සත්වයෙක්[3] නොවෙයි; එන දවස්[4] මහෙශාක්‍ය වූ දිව්‍යපුත්‍ර ව උපදනේය' යි දැන උපාසකයාහට වදරන සේක් 'එම්බා උපාසකය, බෙහෙත් දියත්ත පිසන තෙක් තවුතිසා ලොවට[5] ගොස් සිළුමිණිසෑය වැඳ එනු කැමැත්තම්හ; අප හා සමහ තෙපිත් එව' යි වදාළසේක. ඉක්බිති උපාසකතෙම 'ස්වාමීනි, මම සිළුමිණිසෑය වඳනා කැමැත්තම් මය; එතෙකුදු උවත් ආකාශයෙන් යන තරම් සෘද්ධියක් නැති ව කෙසේ යෙම් ද' යි කීය. එබසට තෙරුන් වහන්සේ 'එම්බා උපාසකය, තෙපි ඉදින් සිළුමිණිසෑය වඳනා කැමැත්තා නම් අපි අපගේ ආනුභාවයෙන් කැඳවාගෙන ගොස් වන්දවාලම්හ; අප හා සමහ එව' යි වදාළසේක. උපාසකයෝ ද යහපතැයි ගිවිස්සාහ; ඉක්බිති මහතෙරුන් වහන්සේ වැඩහිඳිනා සම්කඩ සුළුගලු උපාසකයන් අතට දී 'මේ උපාසක තෙම මා හා සමහ එව' යි අධිෂ්ඨාන කොට අලුත පියාසර උගන්වන ගුරුළු පැටවකු පස්සෙහි ලා ගමන් ගත් ගරුඬරාජයකු සේ අහසට පැන නැඟී තවුතිසා භවනයට ගොස් සුළුගලු උපාසකයන් හා සමහ සිළුමිණි සෑයෙහි සත්රුවන්මය සත්වන දෙරටුයෙහි වැඩසිටි සේක.

එකල්හි පුරන ලද සමතිස් පෙරුම් ඇති මෙත් මහබෝසතාණෝ සදිව්‍යලෝකයෙහි නායක දිව්‍යරාජයන් ඇතුළු ව මහත් වූ දිවසෙනඟ පිරිවරා දිවමල් දිව සුවඳ දිව්‍යමය දීප ධූපාදි වූ අනෙකප්‍රකාර පූජෝපකරණ ගෙන්වාගෙන සිළුමිණිසෑය වඳනා පිණිස[6] තුසීපුරයෙන් නික්ම වඩනට පටන්ගත්හ. එකල මහබොසතාණන්ට ඉදිරියෙහි එක් දිව්‍යපුත්‍රයෙක් අතිධවල වූ තුන්ගවු උස ශරීර ඇති ව අටසාළිස් ගවු දිග ඇති ශ්වේතවර්ණවස්ත්‍රයක් ඇඳ සුදුමල් පැළඳ සුදු සුවඳ ඇඟ ගල්වා සුදු ආභරණ පැළඳ තමා හත් පළන් වස්ත්‍රාභරන ශරීරාලොකයෙන් දසදික් බබුළුවමින් මහත් වූ දිව්‍යතෙජසින් යුක්ත ව රිදීකඳක් සේ දිලිහි දිලිහී ස්ඵටිකමාණික්‍යමය අශ්වාලංකාරයෙන් යුක්ත වූ ඇළි අසුන් යොදන ලදු ව් ස්ඵටිකමාණික්‍යමය ආසන ඇති ශ්වේතවර්ණ විචිත්‍රරථාලංකාරයෙන් සරහන ලද ශ්වේත රථවාහනයකට පැනනැඟී එන්නේය. ඔහු පිරිවරා කිරිමුහුද රළපෙළ දුවන්නා සේ සතර දිසාවෙහි එකි එකී දිගින් තුන් තුන් ගවු පමණ තන්හි එසේ ම ශ්වේත වස්ත්‍ර ශ්වේතාලංකාරයෙන් සැරහුණාවූ දහස්ගණන් දිව්‍යපුත්‍රයෝ

---

1. තමා - DGH
2. දියත්තක් - BDEGKL
   කැඳිත්තක් - H
   කැඳදියත්ත - C
3. සත්ව කෙනෙක් - B
4. දවස - CG
5. දිව්‍යලොකයට - DEGHJKL ම.
   දෙවුලොවට - බෙ.ස.
6. පදහා - BDEGHKL
7. ලද - BDEGHKL ම.

Non-Commercial Distribution

ස්ඵටිකමාණික්‍යමය ධජ පතාක ගෙන දිවෙති; එසේ ම නොයෙක් දහස් ගණන් දිව්‍යපුත්‍රයෝ ධවලාතපත්‍ර ගෙන මුදුන් දිදී නික්මෙති. තව ද නොයෙක් දහස් ගණන් දිව්‍යපුත්‍රයෝ ස්ඵටික මාණික්‍යමය නානාප්‍රකාර ඵලකායුධ ගෙන දස දිග මූණ පෑපෑ දිවෙති; එසේ ම දහස් ගණන් දිව්‍යපුත්‍රයෝ නන් විසිතුරු සැරහීමෙන් සැරහී හාත්පස්හි පැන පැන දිව්‍ය වස්ත්‍ර ඉස් වට නටව නටවා පෙළ පෙළ දි දී කෙළ කෙළ දිවෙති. තව ද නොයෙක් සිය ගණන් දිව්‍යස්ත්‍රීහු ශ්වේතවස්ත්‍ර ශ්වේතාලංකාරයෙන් සැරහී රජත ඝටයෙන් ගෙනහැර නමන ක්ෂීරධාරා පරිද්දෙන් ස්ඵටිකමාණික්‍යමය ශ්වේතචාමර ගෙන විහිදුවමින් ඔහු පිරිවරා දෙපස නික්මෙති. එසේ ම සිය ගණන් දිව්‍යස්ත්‍රීහු ශ්වේතවර්ණ විචිත්‍ර වස්ත්‍රාලංකාරයෙන් සැරහී මධුරධ්වනි විහිදුනා පඤ්චාඞ්ගික තූර්යභාණ්ඩ ගෙන වයමින් ඉදිරි ව නික්මෙති. එසේ ම නොයෙක් සියගණන් දිව්‍යස්ත්‍රීහු මිහිරි කටහඬින් ගී කිය කියා නානාප්‍රකාර වීණාවන් ගෙන ගායනා කෙරෙමින් නික්මෙති; එද වනාහි මිනිස්ලොව ගායනා සේ නොවෙයි; මනුෂ්‍ය ගාන්ධර්වයෝ වීණා වයන කල උසභය ධෛවතය ෂඩ්ජය ගන්ධාරය මධ්‍යමය පඤ්චමය නිෂාදය යි මෙසේ සරසතක් හා ෂඩ්ජග්‍රාමය මධ්‍යමග්‍රාමය සාධාරණ ග්‍රාම සඞ්ඛ්‍යාත සර සමූහ තුනක් හා උසභාදි වූ සප්තස්වරයන් අතුරෙන් එකි එකී ස්වරයකට තුන් තුන් මූසන් බැගින් එක්විසි මූසනක් හා එකි එකී ස්වරයට සත් සත් ස්ථාන මන්ද්‍රබ්‍යාවස්ථාව[2] පවත්නා එකුන්පනස් ස්ථාන විශේෂයක් හා ශ්‍රැතිභෙද වශයෙන් පළමුවන ස්වරයෙහි ශ්‍රැති තුනෙක දෙවන ස්වරයෙහි ශ්‍රැති දෙකක තුන්වන ස්වරයෙහි ශ්‍රැති සතරෙක සතර වන ස්වරයෙහි ශ්‍රැති සතරෙක පස්වන ස්වරයෙහි ශ්‍රැති තුනෙක සවන ස්වරයෙහි ශ්‍රැති දෙකෙක සත්වන ස්වරයෙහි ශ්‍රැති සතරෙකැ යි මෙසේ සප්තස්වරයෙහි ශ්‍රැති භෙද දෙවිස්සක් හා මෙකී සකල ප්‍රයොගයට යොග්‍ය වන සේ වීණා සද ගායනා[3] කෙරෙති. දිව්‍යලොකයෙහි දිව්‍යගාන්ධර්වයෝ වනාහි උසභාදි වූ ස්වර සතින් එකි එකී ස්වරයට සත් සත් මූසන් හා අන්‍යස්වරයට එකුතුරු මූසනෙකැ යි මෙසේ සමපනස් මූසනට යොග්‍ය වන සේ වීණා සද වාද්‍යවිධි විශේෂාදී වූ ගායනා කෙරෙති. එසේ හෙයින් එකල්හි නොයෙක් දහස් ගණන් දිව්‍යාඞ්ගනාවෝ ශ්වේතවස්ත්‍ර ශ්වේතාලංකාරයෙන් සැරහී උසභය ධෛවතය ෂඩ්ජය ගන්ධාරය මධ්‍යමය පඤ්චමය නිෂාදය යි යන සප්තස්වරයන් අනුනව[4] පවත්නාවූ තාරය කලය මන්ද්‍රය යන තුන්ලය ප්‍රමුඛ ව පවත්නා එක් සිය විසි ලයින් අනුපෙත වූ මනහර දිව්‍යගීතිකාවන් කිය කියා එම සප්තස්වරයෙන් එකි එකී ස්වරයට සත් සත් මූසනක් හා අන්‍යස්වරයට එකුතුරුමූසනෙකැ යි මෙසේ සමපනස් මූර්ච්ඡනාවට යොග්‍ය වන ලෙස සදනලද ඝනරන්මය පොකුරු ඇති පබළුමයවෙළ් ඇති ඉන්ද්‍රනීල

1. සැරහුමෙන් - DEKL
2. මන්ද්‍රකාරව්‍යවස්ථාව - ම
   වන්‍ද්‍රකාව්‍යවස්ථාව - පිටපත් හැම
3. වාද්‍යවිධි විශේෂාදී වූ ගායනා - ක.කි.කැ.ම.
4. අනුව - DEGHKL
5. වෙළ - පිටපත් හැම, බෙ.ස.
   වෙරළ - ක.කි.කැ.
   වෙළම් - ම.

Non-Commercial Distribution

මාණික්‍යමය දඬු ඇති බ්‍රහ්මවීණා නකුලවීණා රෞද්‍රවීණා භ්‍රෑඞගීවීණා ආදි වූ නානාප්‍රකාර වීණාවල රන් තතෙක රිදී තතෙක මැණික් තතෙක ලොහිතඞ්ක තතෙක මැසිරිගල් තතෙක විදුරු තතෙක සත්රුවන් තතෙකැ යි මෙසේ සත්සත් තත් නඟා සරහා තුන්ගවුදිග මහවීණාපත[1] වමතින් ගෙන ඝන රන්මය වීණාපත්‍රයන් දකුණතින් අල්වාගෙන ඉදිරියට දිව දිව පෙරලී බලමින් ලීලා දක්ව දක්වා තම තමන් කියන ගීතස්වරය නොඉක්මවා[2] වීණා ගායනා කෙරෙමින් කර්ණාමෘත නම නමා නික්මෙති. තව ද කෙම්වැළ වැනි[3] සුරක්ත වූ අධරයුග්මයෙන් හා දිවරන් තිසර පැටවුන් වැනි මනහර පයොධරභාරයෙන් හා එම පයොධරභාරයෙන් වෙවුල වෙවුලා ලෙලදෙන්නාක් වැනි වූ ලීලොපෙත සිහුවලගින් හා දිව්‍යමය නිලිපුල්පෙති වැනි දිගුපුළුල් වූ සුනිල් නෙතින් හා සියලු අවයව සම්පත්තීන් ශොභමාන වූ හාවභාව ලීලාවිලාසයෙන්[4] යුක්ත වූ ඇසට රසඳුන් පිඩු වැනි නොයෙක් සිය ගණන් සුරසුන්දරීහු නන් විසිතුරු සැරහීමෙන් සැරහී ඕහට ඉදිරි ව ලයමානයෙහි දක්‍ෂ වූ වාද්‍යකාරයන් විසින් වයනලද බෙරමඬුලු මධ්‍යයෙහි රඟ බැස නවනාට්‍ය රසයෙන් යුක්ත වූ හෙවත් සිඞ්ගාරය කරුණය වීරය අද්භූතය හාස්‍යය භයානකය ශාන්තය බීභත්සය රෞද්‍රය යි යන නවනාට්‍යරසයෙන් යුක්ත වූ නානාප්‍රකාර නෘත්‍යාඞ්ග දක්ව දක්වා නික්මෙති. මෙසේ හාත්පසින් සොළොස් ගවු පමණ තන්හි අතුරු නොහැර සිටගත් දිව්සෙනඟ පිරිවරා මහත් වූ දිව්‍යතෙජසින් යුක්ත ව එන දිව්‍ය පුත්‍රයා දක මලියදෙව මහතෙරුන් වහන්සේ අතින් විචාරන උපාසක තෙම;

සෙතමඬ්ගා සෙතවත්ථො - සෙතාභරණභූසිතො,
සෙතඞ්ගරාගලිත්තඞ්ගො - සෙතමාලා විභූසිතො.

සෙතාලඞ්කාරසඤ්ඤුත්තං - සෙතසින්ධවයොජිතං;
සෙතාසනසුපඤ්ඤත්තං - සෙතමාරුය්හ සන්දනං[5].

මහායසං දිසා සබ්බා - ආගච්ඡන්ති[6] මහායසො,
අථා'පි තං මහාසෙනා - පරිවාරෙන්ති[7] ඊදිසා.

සෙතාලඞ්කාර සෙතවසනා[8] - සෙතගන්ධානුලොපිනො,
පග්ගය්හ පණ්ඩරච්ඡත්තෙ - පතාකායො ධජේ තථා.

යනාදීන් ඔහුගේ දිව්‍යසම්පත්තිය වර්ණනා කොට දක්වා 'ස්වාමිනි, මේ දිව්‍යපුත්‍ර තෙම පූර්වජාතියෙහි කෙසේ වූ කුශලකර්මයක් කොට දත් මෙසේ වූ

---

1. මහවීණ පත් - KL
2. නොඉක්මවා - BCDGHKL
   නොඉක්ම - E
3. කෙම්වල වැනි - BG
   කෙම්වල වැනි - DH
4. ලීලාවිශේෂයෙන් - ස
5. චන්දනං - BHKL
6. ආගච්ඡන්ති - පිටපත් හැම
7. පරිවාරෙති - KL
8. සෙතවත්ථා - J බෙ.ස.
   වසනා - ක.කි.සෑ.ම.

Non-Commercial Distribution

දිව්‍යසම්පත්තියක් ලද්දේ ද'යි විචාළේය. එසේ විචාළ උපාසකයාහට ඔහු පූර්වජාතියෙහි කළාවූ කුශල කර්මය ගෙනහැර දක්වන මහතෙරුන් වහන්සේ;

ලඞ්කාදීපම්හි හො එසො - ගාමෙ කම්මාර නාමකෙ,
එකො ගොපාලකො ආසි - රක්ඛන්තො ගොගණං හි සො.

දිස්වා සුපුප්ඵිතං එකං - වල්ලිගුම්බං මනොරමං,
සෙතකං උපසංකම්ම[1] - මාලමොචිත්ව පුප්ඵිතං.

යනාදීන් 'එම්බල පින්වත් වූ උපාසකය, මේ දිව්‍යපුත්‍රතෙම ලක්දිව ඇත්කඳ විහාරය සමීපයෙහි කඹුරුගමුවය යි යන ගම පෙර එඬේරදරු ව ඉපද වැඩී මුහුකළ වයසට පැමිණියේ දවසෙක සෙසු ගොපලු දරුවන් හා එක් ව ගොස් ගවයන් තණ කවා සවස් වේලෙහි තමා වසන ගෙට එනුයේ අතරමඟ සුපුෂ්පිත වූ බොකල වැල් කැළයක් දැක එයින් මල් කඩාගෙන එක් මල්කැනක් ඉස පැළඳ මල්කැන් දෙකක් දෙකන්[2] තබාගෙන නැවත මල්කැන් දෙකක් දෙතන් තබාගෙන නැවත මල්කැන් දෙකක් දෙවුරයේ පැළඳ රා බී මත් වූ බඹුරු දරුවකු සේ කැව්ටි ලීයක් කර තබා දෑතින් දෙකෙළවර ගෙන නට නටා ගී කියමින් ගෙට එනුයේ අතරමග තුඹසක් දැක තමා පැළඳගෙන එමින් සිටි මල් සියල්ල ම තමා ශරීරයෙන් ගළවා බුදුන්ට පූජා වේව යි තුඹස මත්තෙහි පුද සමීපයෙහි වළෙකින් පැන් ගෙනවුත් ඉස දෙහොත් මුදුනෙහි තබා වැඳ මහත් වූ සන්තොෂයෙන් කෙළිමින් සෙමින් තමාගේ ගෙය බලා නික්මිණ. ඉක්බිති අතරමඟ සර්පයෙක් මොහු දැක දෂ්ට කෙළේය. මේ තෙම එවේලෙහි තමා විසින් කරනලද ඒ ආසන්නකුශලය සිහි කෙරෙමින් කාලක්‍රියා කොට මේ දිව්‍යලොකයෙහි ඉපද බුදුන් උදෙසා කරනලද්දවූ ඒ මල් පූජාවෙහි අනුසසින් මෙබඳු ඓශ්වර්‍ය්‍යයක් ලද්'යි වදළසේක. එබස් අසා උපාසකතෙම මහත් වූ සන්තොෂයට පැමිණියේය.

ඉක්බිති ඒ දිව්‍යපුත්‍රයා එතැන්[3] ඉක්ම ගිය කල්හි අනික් දිව්‍ය පුත්‍රයෙක් බඳුවද මල්දමක් මෙන් ඉතා රත් වූ ශරීර ඇති ව රක්තවර්ණ වස්ත්‍රයක් හැඳ රන් ආභරණයෙන් සැරහී රත්සුවඳ ඇඟ ගල්වා මඳටවන් මල් පැළඳ ලොහිතඞ්ක මාණික්‍යමය නොයෙක් අඞ්ගාලංකාරයෙන් යුක්ත වූ රත් අසුන් යොදනලද පද්මරාග මාණික්‍යමය ආසන ඇති මඳටවන් රථාලංකාරයෙන් සරහනලද ලොහිතඞ්කමාණික්‍යමය රථවාහනයකට පැනනැඟී තමා හන්පළන් වස්ත්‍රාභරණ ශරීරාලොකයෙන් දශදිග්[4] බබුළුවමින් මහත් වූ දිව්‍යානුභාවයෙන් යුක්ත වූ[5] ලොහිතඞ්ග මාණික්‍ය රාශියක්[6] මෙන් දිලිහි දිලිහී එන්නේය. ඔහු පිරිවරා පැළ

1. සො තං තමුපසංකම්ම - ක.කි.කැ.ම.
2. දෙකොල - BCDEGH
   දෙකොන - J ක.කි.කැ.ම.
   දෙකන - ම.ය
   උභො කණ්ණෙසු - පාලි
3. එතැනින් - C;
4. දසදික් - H
5. යුක්තවූ දිව්‍යමය L ස.
6. රත්නයක් - ස.

Non-Commercial Distribution

මුහුදු රළපෙළ දිවන්නා සේ සතර දිසාවෙහි එකි එකී දිගින් තුන් තුන් ගවු පමණ තන්හි එපරිද්දෙන් ම රක්තවර්ණ වස්ත්‍රාභරණාලංකාරයෙන් සැරහී නොයෙක් දහස් ගණන් දිව්‍යපුත්‍රයෝ ලොහිතඞ්කමාණික්‍යමය ධජපතාක ගෙන දිවෙති; එසේ ම ලක්‍ෂගණන් දිව්‍යපුත්‍රයෝ රත් කුඩ ගෙන මුදුන් දි දී දිවෙති; නොයෙක් දහස්ගණන් දිව්‍යපුත්‍රයෝ පද්මරාගමාණික්‍යමය වස්ත්‍රාලංකාරයෙන් සැරහී ලොහිතඞ්කමාණික්‍යමය නානාප්‍රකාර එලකායුධ ගෙන දශදිග මූණ පැපෑ පැන්[1] දිවෙති; එසේ ම දහස්ගණන් දිව්‍යපුත්‍රයෝ දිවසළු ගෙන හිසවට නටවමින් පෙළ පෙළ සැදී බම බමා[2] දිවෙති. නොයෙක් සියගණන් දිව්‍යස්ත්‍රීහු මදටවන් පැහැ ඇති වස්ත්‍රාභරණ කුසුම දමාදීන් සැරහී ලොහිතංක මාණික්‍යමය චාමර ගෙන විහිදුවමින් දිව්‍යපුත්‍රයා පිරිවරා දිවෙති; එසේ ම සියගණන් දිව්‍යස්ත්‍රීහු රක්තවර්ණ වස්ත්‍රාලංකාරයෙන් සැරහී මධුරධ්වනි විහිදුනා ආතතවිතතාදි වූ පඤ්චාඞ්ගික තූර්යභාණ්ඩ ගෙන වාද්‍යකෙරෙමින් ඉදිරි ව නික්මෙති. එසේ ම සිය දහස්ගණන් දිව්‍යාඞ්ගනාවෝ මිහිරි කටහඬින් දිව්‍යගීතිකාවන් කිය කියා වීණා ගායනා කෙරෙමින් එති; එසේ ම බලන්නවුන්ගේ ඇසට රසඳුන්පිඩු වැනි වූ භාව භාව ලීලාවිලාසයෙන් යුක්ත ව නොයෙක් දහස්ගණන් දිව්‍යාඞ්ගනාවෝ ඔහු [පිරිවරා][3] ඉදිරියෙහි 'රඟමඩුලු බැඳ නටමින් නොයෙක් දිව්‍යලීලා දක්ව දක්වා දිවෙති. මෙසේ හාත්පසින් සොළොස් ගවු පමණ තන්හි හිවී ගැවසී සිට ගත්තාවූ දිව්‍ය සෙනාව පිරිවරා මහත් වූ දිව්‍යානුභාවයෙන් යුක්ත ව එන දිව්‍ය පුත්‍රයා දක තෙරුන් වහන්සේ අතින් විචාරන උපාසක තෙමෙ;

රත්තාලඞ්කාරසංයුත්තං - රත්තසින්ධව යොජිතං,
රත්තාසන සුපච්ඡාදත්තං - රත්තමාරුය්හ සන්දනං.
ඔභාසයං දිසා සබ්බා - ආගච්ඡති මහායසො,
අථාපි තං මහාසෙනා - පරිවාරෙන්ති ඊදිසා[4]

යනාදීන් ඔහුගේ දිව්‍යඓශ්වර්ය්‍ය විස්තර කොට දක්වා 'ස්වාමීනි, මේ දිව්‍යපුත්‍රතෙම ගිය දවස කෙසේ වූ කුශලයක් කොට දන් මෙසේ වූ දිවසැපතක් ලද ද''යි[5] විචාළේය. ඉක්බිති ඒ දිව්‍යපුත්‍රයා පූර්වජාතියෙහි කළාවූ පින්කම්[6] පුළුගලු උපාසකයාහට දක්වා වදරන මලියදෙව මහතෙරුන් වහන්සේ;

ලඞ්කාදීපම්හි හො එසො - ගාමෙ අඤ්ඤතරෙපුරෙ,
ගොපාලදරකො ආසි - රක්ඛන්තො ගොගණං හි සො.

---

1. පැන පැන -DEHKL
2. බමව බමවා - ස.
3. පිරිවරා (නැත) - පිටපත් හැම
4. ඊදිසං - බෙ.ස.
5. ලද්දේ ද යි - BCH
6. කුශලකර්මය - GH

Non-Commercial Distribution

නෙත්වාන ගොගණං තත්ථ - ජජ්ජරවහං මහානදිං,
කීළනේතා වාලුකා තත්ථ - දරකෙහි සහා තහිං.

කත්වාන වාලුකා ථූපං - රත්තමාලාහි පූජිය,
ආසිඤ්චිත්වා ජලං තත්ථ - කත්වානාතපවාරණං.[1]

යනාදීන් 'එම්බල පින්වත් උපාසකය, මේ දිව්‍යපුත්‍රතෙම ගිය දවස ලඞ්කාද්වීපයෙහි වේරිය[2] විහාරය සමීපයෙහි එක්තරා ගමෙක ගොපලු ව ඉපද සෙසු ගොපලුදරුවන් හා සමඟ ගොස් ගවයන් දදුරු හොය දියට බා තෙමේ වැලි කෙළනේ වැල්ලෙන් දගබක් බැඳ වලට වැද රත්මල් කඩා[3] ගෙනවුත් වැලිදගබට පුද එහි පැන් ඉස සිත් පහදවාගෙන හිරුරසින් මල් නොමලනා සේ[4] කොළමඩුවක් ලා සෙවන කොට සවස තමා වසන ගෙට ගියේය. රාත්‍රිභාගයෙහි බඩරුජාවක් පැහැර එයින් මිය බුදුන් උදෙසා කරන ලද එම මල් පූජාවෙහි අනුසසින් මේ දිව්‍යලොකයෙහි ඉපද මෙබඳු දිව්‍යසම්පත්තියක් ලද'යි වදළසේක. එතෙපුල් අසා පුළුගලු උපාසකතෙම මහත් වූ සන්තොෂයට පැමිණියේය.

මෙසේ ඔවුන් එතන ඉක්ම ගිය කල්හි එක් දිව්‍යපුත්‍රයෙක් දිව රන්කඳක් සේ[5] බබළමින් තුන්ගවු උස දිව්‍යශරීර ඇති ව රන්වන් වස්ත්‍රයක් හැඳ රන්වන් ආභරණයෙන් සැරහී රන්වන් සුවඳ ඇඟ ගල්වා රන්වන් මල් පැළඳ රන්වන් පැහැ ඇති නොයෙක් අශ්වාලඞ්කාරයෙන් යුක්ත වූ රන්වන් අසුන් යොද රන්වන් රථාලංකාරයෙන් සරහනලද රන් ආසන ඇති[6] රන්වන් රථවාහනයකට පැන නැඟී තමා හන් පළන් වස්ත්‍රාභරණ ශරීරාලොකයෙන් දශදික් බබුළුවමින් දිව රන්කඳක් මෙන් දිලිහි දිලිහී එයි. ඔහු පිරිවරා සවර්ණසාගරයෙහි පෙළ සැදී දිවන තරඞ්ගමාලාවන් සේ සතර දිසාවෙහි[7] එකි එකී දිගින් තුන් තුන් ගවු පමණ තන්හි එපරිද්දෙන් ම වස්ත්‍රාලංකාර[8] කුංකුමාදීන් සැරහී දහස් ගණන් දිව්‍යපුත්‍රයෝ රන්වන් ධජපතාක ගෙන දිවෙති, එසේ ම සියදහස් ගණන් දිව්‍යපුත්‍රයෝ රන්වන් සේසත් ගෙන දෙපස මුදුන් දි දී එති, නොයෙක් දහස් ගණන් දිව්‍යභටයෝ රන්වන් ඵලකායුධ ගෙන දසදිග මුණ ල ලා[9] දෙපස දිවෙති, එසේ ම දහස්ගණන් දිව්‍යපුත්‍රයෝ දිවසළු ඉසවට නටවමින් හාත්පස්හි පැන පැන නොයෙක් ලෙසින් විලාස පැ පැ කෙළ කෙළ දිවෙති. නොයෙක් සිය ගණන්[10] දිව්‍යස්ත්‍රීහු රන්වන් වස්ත්‍රාලංකාරයෙන් සැරහී රන්රසධාරා ඉස්නා සේ රන්චාමර ගෙන විහිදුවමින් එම දිව්‍යපුත්‍රයා පිරිවරා එති, එසේ ම සියගණන් දිව්‍යස්ත්‍රීහු නානාලඞ්කාරයෙන් සැරහී මනහර හඬ විහිදුනා ආතතාදි[11] පඤ්චාඞ්ගික තූර්‍ය්‍ය භාණ්ඩ ගෙන එකඝොෂා[12] කෙරෙමින් එති, එසේ ම නොයෙක් සිය ගණන් දිව්‍යාඞ්ගනාවෝ ගී කිය කියා වීණා ගායනා කෙරෙමින් එති, එසේ ම බලන්නවුන්ගේ ඇසට රසාඤ්ජන බඳු වූ හාවභාව ලීලා විලාසයෙන් යුක්ත

1. කත්වානාතපසංවරං - ත.කි.සැ,ම.
2. වේරිස - B
වේගිරිය - ක.කි.සැ,ම.
වේසිය - ස
3. සොයා -B
4. නොමළනායේ -CJ. ක.කි.සැ,ම.
නොමලිවන සේ - K
5. මෙන් - DEGHKL, ම
6. ඇති ව - GEHL
7. දසාවෙහි - DEJ
8. වස්ත්‍රාලංකාරයෙන් - BGH
9. පැ පැ - BJ
10. සිය දහස් ගණන් -K, මුද්‍රිත හැම, ස.
11. ආතත විතත ආදි වූ - BDEGHKL,
12. එකපැහැර ඝොෂා - ක.කි.සැ,ම.

Non-Commercial Distribution

සියගණන් දිව්‍යාඞ්ගනාවෝ ඔහු ඉදිරියෙහි රඟබැස නට නටා එති. මෙසේ හාත්පසින් සොළොස් ගවුවක්[1] පමණ තන්හි හිවී ගැවසී සිටගත්තාවූ දිව්‍යසේනාව පිරිවරා මහත් වූ දෙවසෑදධින්[2] යුක්ත ව එන දිව්‍යපුත්‍රයා දක මහතෙරුන් වහන්සේ අතින් විචාරන උපාසක තෙම:

> සොණ්ණවණ්ණො සොණ්ණවත්ථො - සොණ්ණාභරණභූසිතො,
> සොණ්ණවණ්ණඞ්ගරාගඞ්ගො - සොණ්ණමාලාවිභූසිතො.
>
> සොණ්ණාලඞ්කාරසංයුත්තං - සොණ්ණසින්ධවයොජිතං,
> සොණ්ණාසනසපඤ්ඤත්තං - සොණ්ණමාරුය්හ සන්දනං.
>
> මහාසයං දිසා සබ්බා - ආගච්ඡති මහායසො,
> අථා'පි තං මහාසෙනා - පරිවාරෙන්ති ඊදිසා.

යනාදීන් ඔහුගේ දිව්‍යඓශ්වර්‍ය්‍යී දක්වා "ස්වාමීනි, මේ දිව්‍යපුත්‍ර තෙම ගිය ජාතියෙහි කෙසේ වූ පිනක් කොට දන් මෙසේ දිවසැපතක් ලද ද'යි විචාළේය. එසේ විචාළ උපාසකයාහට ඔහු කළ කුශලය ප්‍රකාශ කොට දක්වන මහතෙරුන්වහන්සේ:

> ලඞ්කාදීපම්හි හො[3] එසො - ගඞ්ගාසන්නෙ මනොරමෙ,
> ගාමෙ තිණ්ඩුකනාමම්හි - ආසි ගොපාලදරකො.
>
> සචා'යං කිරේ'කදා ගාවො - ගඞ්ගාසන්නෙ සුචාරයං,
> දිස්වා කොසාතකීගුම්බං - වණ්ණවන්තං සුපුප්ඵිතං.

යනාදීන් "එම්බල පින්වත් උපාසකය, මේ දිව්‍යපුත්‍රතෙම ලක්දිව මහවැලිගං සමීපයෙහි තිඹිරිගමු නම් ගම ගිය දවස ගොපලු දරු ව ඉපද වැඩිවිය පැමිණියේ දවසෙක උදසන්හි ම නැඟී සිට ගවයන් ගඟ සමීපයට ගෙනගොස් ඒ ඒ තන්හි තණ කවා ඇවිදිනේ මොනවට පිපියාවූ වැටකොලුවැල් කැලයක් දක එයින් මල් කඩාගෙන ගඟට බැස වැලිදගබක් බැඳ තමා ගෙන ගිය වැටකොලු මල් පුද පැන් ඉස හිරුරැස් වළකනු පිණිස කොළ අතු සිටුවා[4] සෙවන කොට සිත් පහදවා වැඳගෙන ගියේය.[5] පසුව එයින් මිය එම කුශල හෙතුවෙන්[6] මේ දිව්‍යලොකයෙහි ඉපද මෙබඳු වූ දිවසැපත් ලද"යි වදළසේක. මෙසේ මහතෙරුන් වහන්සේ වදළ තෙපුල් අසා උපාසකතෙම 'බුදුන් උදෙසා වැලිදගබට කළ මල්පූජාවෙහි විපාක මෙසේ වන කල ශරීරධාතු පිහිටි චෛත්‍යාදියට කරනලද පුෂ්පපූජාවෙහි[7] විපාක කියනුම කවරේ ද"යි මහත් වූ සන්තොෂයට පැමිණියේය.

තව ද ඒ දිව්‍ය පුත්‍රයා එතැන ඉක්ම ගිය කල්හි අනික් දිව්‍යපුත්‍රයෙක් ඉන්ද්‍රනීලමාණික්‍යයක් මෙන් නිල් වූ ශරීර ඇති ව නිල්[8] වස්ත්‍රයක් හැඳ නිල් ආභරණ පැළඳ නිල්පුවඳ ඇඟ ගල්වා නිල්මල් පැළඳ ඉන්ද්‍රනීලමාණික්‍යමය අශ්වාලංකාරයෙන්

1. ගවු - CG
2. දිව්‍යසෑද්ධින් - KL
3. සො - BGHKL
4. කඩා සිටුවා - බෙ.ස.
5. ගෙට ගියේය - J
6. හේතුකොටගෙන - BGHKL
7. පුෂ්පපූජා ආදියෙහි - KL, ස.
8. නීල - BGH

Non-Commercial Distribution

යුක්ත වූ නිල් අඳුන් යොද ඉන්‍ද්‍රනීලමාණික්‍යමය දිව‍අඳුන් පනවා නිල් වූ නොයෙක් රථාලංකාරයෙන් සරහනලද නීල[1] රථවාහනයකට පැන නැඟී තමන් හන් පළන් වස්ත්‍රාභරණ ශරීරාලොකයෙන් දසදිගුන් එක පැහැර ඉඳුනිල්මිණි රැසක් සේ බුබුළුවමින් මහත් වූ දිව්‍යමහිමයෙන් යුක්ත ව දිව්‍යමය වූ ඉඳුමිණි නිල්[2] මහපායක් මෙන් දිලිහි දිලිහී එන්නේය. ඔහු පිරිවරා සතර දසාවෙහි එකි එකී දිගින් තුන් තුන් ගවු පමණ තන්හි නිල්මුහුදින් දිවන රළපතර සේ නීලවස්ත්‍ර නීලාලංකාරයෙන් සැරහී දහස් ගණන් දිව්‍යපුත්‍රයෝ නිල් ධජපතාක ගෙන දිවෙති, එසේ ම දහස්ගණන් දිව්‍යපුත්‍රයෝ නිල් කුඩ ගෙන මුදුන් දි දී එති, නොයෙක් දහස්ගණන් දිව්‍යපුත්‍රයෝ ඉන්‍ද්‍රනීල මාණික්‍යමය ඵලකායුධ ගෙන දෙපස පිරිවරා දිවෙති, එසේ ම දහස් ගණන් දිව්‍යපුත්‍රයෝ දිවසළු හිසවට නටවමින් පෙළ[3] සැදී පැන පැන දිවෙති. තව ද නොයෙක් සියදහස් ගණන් දිව්‍යාඞ්ගනාවෝ නීලවස්ත්‍ර නීලාලංකාරයෙන් සැරහී නිල් මල් පැළඳ නිල්චාමර ගෙන විහිදුවමින් එම දිව්‍යපුත්‍රයා පිරිවරමින් නික්මෙති, එසේ ම නොයෙක් සියදහස් ගණන් දිව්‍යස්ත්‍රීහු නීලවස්ත්‍ර නීලාලංකාරයෙන් සැරහී පඤ්චාඞ්ගික තූර්‍යභාණ්ඩයන් ගෙන වාද්‍ය කෙරෙමින් ඉදිරි ව නික්මෙති, එසේ ම බලන්නවුන්ගේ ඇසට රසාඤ්ජනයක් බඳු වූ භාවභාවලීලා විලාසයෙන් යුක්ත නොයෙක් සියගණන් දිව්‍යාඞ්ගනාවෝ ඔහු ඉදිරියෙහි රඟ බැස නටමින් නික්මෙති. හාත්පසින් සොළොස් ගවු පමණ තන්හි අතුරු නොදී සිටගත්තාවූ දිවසෙනඟ පිරිවරා මහත් දිව්‍යානුභාවයෙන් යුක්ත ව එන දිව්‍යපුත්‍රයා දැක මලියදෙව මහතෙරුන් වහන්සේ අතින් විචාරන උපාසක තෙම:

නීලවණ්ණො[4] නීලවත්ථො - නීලාභරණභූසිතො,
නීලවණ්ණඞ්ගරාගඞ්ගා - නීලමාලාවිභූසිතො.

නීලාලඞ්කාරසංයුත්තං - නීලසින්ධවයොජිතං,
නීලාසනසුපඤ්ඤත්තං - නීලමා'රුය්හසන්දනං.

මහායසං දිසා සබ්බා - ආගච්ඡති මහායසො,
අථා'පි තං මහාසෙනා - පරිවාරෙන්ති ඊදිසා.

යනාදීන් ඔහුගේ දිව්‍යසම්පත්තිය දක්වා "ස්වාමීනි, මේ දිව්‍යපුත්‍රතෙම ගිය දවස කෙසේ වූ පිනක් කොට දන් මෙසේ වූ දිව්‍යසම්පත්තියක් ලද ද"යි විචාළේ ය. ඉක්බිති ඒ දිව්‍යපුත්‍රයා පූර්ව ජාතියෙහි කළාවූ කුශලය දක්වා වදරන තෙරුන් වහන්සේ[5]:

එසො සීහලදීපස්මිං - ලඞ්කාපබ්බතසන්තිකෙ,
මහාතිස්සවිහාගාමස්මිං - ජාතො ගොපාලදාරකො.

---

1. ඉන්‍ද්‍රනීල - EGH
2. ඉඳුනිල් - KL, ස.
3. පෙළාපෙළ - BC
4. පාලියෙහි 'නීල' වෙනුවට හැමතන්හි 'මණි' යයි යොද ඇත.
5. තෙරුන්වහන්සේ වදරන සේක් - බෙ.ස.

Non-Commercial Distribution

එකද සො කුමාරෙහි - සද්ධිං ගාවො චරාපයං,
තස්මිං පබ්බතපාදස්මිං - ගිරිකණ්ණික[1]'වන'ද්දසි.

යනාදීන් "එම්බල උපාසකය, මේ දිව්‍යපුත්‍රතෙම ගිය දවස ලක්දිව ලක්ගල් පර්වත සමීපයෙහි මහා තිසව[2] නම් ගම ගොපලු දරු ව ඉපද වැඩිවිය පැමිණියේ දවසෙක සෙසු ගොපලු දරුවන් හා සමඟ ගොස් ගවයන් තණ කවා ඇවිදිමින් ලක්ගල් පර්වත සමීපයට ගියේ[3] මොනරපිල් කලබක් මෙන් සුපුෂ්පිත වූ ගිරිනිල් වනයක් දක එයින් මල් කඩාගෙන කඳුරැළියකට ගොස් වැලි දගබක් බැඳ ගෙනගිය ගිරිනිල්මල් නටුවෙන් නටු පෙත්තෙන් පෙති[4] සම කොට පුද පැන් ඉස මල් නොමලන සේ කොළමඩුවක් ලා සෙවන කොට පහන් සිතින් වැඳ ගෙන[5] ගියේය, පසුව[6] එයින් මිය එම කුශල බලයෙන් මේ දෙව්ලොව ඉපද මෙබඳු දිව සැපත් ලද, මේ හැම එදවස් බුදුන් උදෙසා වැලිදගබට පුදලූ මල් පූජාවෙහි අනුසස් වේ දැ"යි වදාළසේක. එතෙපුල් අසා උපාසකතෙම මහත් වූ සන්තෝෂයට පැමිණියේය.

ඉක්බිති ඒ දිව්‍යපුත්‍රයා එතැන ඉක්ම ගිය කල්හි අනික් දිව්‍යපුත්‍රයෙක් සත්රුවන් පර්වතයක් මෙන් බබළන්නාවූ තුන්ගව් උස ශරීර ඇති ව සත්රුවන් වස්ත්‍රයක් හැඳ සත්රුවන් ආභරණ පැළඳ සත්රුවන්මය [නොයෙක්] දිවසුවඳ ඇඟ ගල්වා සත්රුවන් මල් පැළඳ සත්රුවන්මය නොයෙක් අශ්වාලංකාරයෙන් යුක්ත වූ සත්රුවන්මය[7] අසුන් යොද සත්රුවන්මය දිව සුවඳ අසුන්[8] පනවා තුන් යොදුන් පමණ තන්හි අහස වසා සිටි සත්රුවනින් විසිතුරු වියන් හා සත්රුවන්මය නොයෙක් රථාලංකාරයෙන් සරහන ලද දිව්‍යරථවාහනයකට පැනනැඟී තමා හන් පළන් වස්ත්‍රාභරණ ශරීරාලෝකයෙන් එකපැහැර දසදිසා බබුළුවමින් සත්රුවන් පායක්[9] සේ දිලිහි දිලිහී ගමන් ගත. ඔහු පිරිවරා සතරදිශාවෙහි එකී එකී දිගින් තුන් තුන් යොදුන් පමණ තන්හි එපරිද්දෙන් ම සත්රුවන්මය වස්ත්‍රාලංකාරයෙන් සැරහී දහස්ගණන් දිව්‍යපුත්‍රයෝ සත්රුවන්මය ධජපතාක ගෙන දිවෙති, එසේ ම දහස් ගණන් දිව්‍යපුත්‍රයෝ සේසත් ගෙන දෙපස මුදුන් දි දී නික්මෙති, නොයෙක් දහස් ගණන් දිව්‍යපුත්‍රයෝ සත්රුවනින් විසිතුරු ඵලකායුධ ගෙන පිරිවරා නික්මෙති, එසේ ම දහස්ගණන් දිව්‍යපුත්‍රයෝ දිවසළු හිස[වට] නටවමින් හාත්පස්හි පැන පැන පෙළින් පෙළ දිවෙති. නොයෙක් සියගණන් දිව්‍යාඞ්ගනාවෝ සත්රුවන්මය වස්ත්‍රාලඞ්කාරයෙන් සැරහී සත්රුවනින් විසිතුරු චාමර ගෙන දෙපස සිට සලමින් දිව්‍යපුත්‍රයා පිරිවරා සමීපයෙන්[10] නික්මෙති, එසේ ම සියගණන් දිව්‍යස්ත්‍රීහු ලීලොපෙත ව සැරහී ආතත විතතාදි පඤ්චාඞ්ගික තූර්‍යභාණ්ඩ ගෙන වාද

1. ගිරිකණ්ණක - BDEGJL
   ගිරිකන්නක - CH
2. මහාතිස්ස - ක.කි.ඤ.ම.
3. ගියේය - CDJ, ක.
4. නටුවෙන් නටුව පෙත්තෙන් පෙත්ත - B,
5. වැඳ හෙව - C
6. වැඳ ගිය පසුව - BD, ක.කි.ඤ.ම.
7. සත්රුවන්මය - බෙ.ස.
8. දිව අසුන් - බෙ.ස.
9. මහාපායක් - BHKL
10. සමීපයට - මුද්‍රිත හැම. ස. සමීපයෙහි - KL

Non-Commercial Distribution

කෙරෙමින් නික්මෙති, එසේ ම දිව්‍යාඞ්ගනාවෝ මිහිරි කටහඬින් ගී කිය කියා වීණා ගායනා කෙරෙමින් කණ්ණාමෘත නම නාමා නික්මෙති. තව ද බලන්නවුන්ගේ ඇසට රසඳුන්පිඩක් වැනි වූ තඹුරු තඹලවනින් හා දිව රන්තිසර පැටවුන් වැනි මනහර පයොධරහාරයෙන් හා එම පයොධරයෙන්[1] ලෙලදෙන්නාක්හු වැනි වූ ලීලොපෙත සිඟුවලහින් හා දිව්‍යමය නිලුපුල්පෙති වැනි දිගුපුළුල් යුනිල් නෙතින් හා සියලු අවයවසම්පත්තින් සැරහුණාවූ භාවහාවලීලා විලාසයෙන් යුක්ත නොයෙක් පියගණන් දිව්‍යාඞ්ගනාවෝ ඕහට ඉදිරි ව ගසන බෙරමඬුලු මධ්‍යයෙහි රඟබැස නටා ගෙන යෙති, මෙසේ හාත්පසින් පුසාලිස්ගවු පමණ තන්හි අතුරු නොහැර සිටගත් දිවසෙනග පිරිවරා මහත් වූ දිව්‍යානුභාවයෙන් යුක්ත ව එන දිව්‍යපුත්‍රයා දුක මහතෙරුන්වහන්සේ අතින් විචාරන උපාසක තෙමේ:

තම්බබිම්බොධරා චාරූ - පයොධරහරා සුභා,
විසාලායත නීලක්ඛා - සබ්බාවයව[2] මණ්ඩිතා,
නච්චන්ති පුරතො තස්ස - භෙරීමණ්ඩලමජ්ඣගං.

භාවභාව රසූපෙතා - මනුඤ්ඤ නයනුස්සවා,
නමෙ එතාදිසො ධීර - දිට්ඨපුබ්බො කුදචන,
පුට්ඨො ආචික්ඛ මෙ එසො - කිං පුඤ්ඤ'මකරා පුරෙ.

යනාදීන් "ස්වාමිනි, නුවණැති බුධපුත්‍රයාණන්වහන්ස, මෙසේ වූ ආශ්චර්යයීයෙක් මම පළමු නුදුටුවිරිමි, මේ දිව්‍යපුත්‍රතෙම ගිය දවස කෙසේ වූ පින්කමක් කොට දන් මෙසේ වූ දිව්‍යසම්පත්තියක් ලද ද"යි විචාළේය. එසේ විචාළ උපාසකයාහට ඒ දිව්‍යපුත්‍රයා ගිය දවස කළ කුශලය හස්තාමලකයක් සේ දිවසින් දුක ප්‍රකාශ කොට දක්වන මහතෙරුන්වහන්සේ:

සො'යං සීහලදීපස්මිං - පුරිමත්තභවෙ ඉතො,
චිත්තලපබ්බතාසන්න - කප්පකන්දරගාමකෙ.

සද්ධාසීලගුණූපෙතො - ආසි අඤ්ඤතරො නරො,
එකං ආසනසාලං සො - සඞ්ඝං උද්දිස්ස කාරයි.

තෙන'ස්ස පුඤ්ඤකම්මෙන - උච්චතො සට්ඨියොජනො,
තිංසයොජනවිත්ථිණ්ණො - නෙකභූමිසමාකුලො.

සබ්බසොවණ්ණයො ආසි - පාසාදෙ මනනන්දනො,
තත්ථ සො රමතෙ නිච්චං - සාලාය කරණෙ ඵලං.

යනාදීන් "එම්බල උපාසකය, මේ දිව්‍යපුත්‍රතෙම ගිය දවස මේ සිංහලද්වීපයෙහි සිතුල්පවු විහාරයට නුදුරු වූ සප්පඳුරු[3] නම් ගම ශ්‍රද්ධාසම්පන්න වූ ශීලාචාරගුණයෙන් යුක්ත උපාසකයෙක. මෙතෙම ඒ සප්පඳුරු[3] නම් ගම සංඝයාවහන්සේ උදෙසා

1. පයොධරහාරයෙන් - BEGHKL
2. සබ්බාභරණ - සි.ම.බෙ.ස.
සබ්බාධනෙ - ක.ක.
3. කප්කඳුරු - ක.සි.ඤ.ම.
කප්පඳුරු - ස

Non-Commercial Distribution

ආසන ශාලාවක් කැරවීය. දුන් ඒ කුශලානුභාවයෙන් අයම්විතරින් තිස් යොදුන් උස ඇති නොයෙක් මහලින් යුක්ත වූ සියගණන් කන්කුළින් ගැවසී ගත්තාවූ හිරුරස්කලබක් මෙන් බලන්නවුන්ගේ ඇස් බමන්නා වූ මෙසත්රුවන් මාළිගාව ද[1] නැවත ශාලාවක් කරවන මනුෂ්‍යයන් දැක පුවරුවක් හා ගොනසක් ද වැල් මිටියක් ද ගෙනවුත් දින. දුන් ඒ කුශලානුභාවයෙන් මොහුගේ දිව්‍යමාළිගාව හොබවමින් නොයෙක් සියගණන් දිව්‍යවිමාන හා දිව උයන් පහළ වීය. තව ද [මෙම දිව්‍යපුත්‍රයා ගිය දවස] එක් පුරුෂයකු පොකුණක් බිඳුවන්නා දැක ඕහට සහාය ව දවසෙක පස් දෙතුන් කුඩයක්[2] ගොඩ ලීය. දුන් ඒ කුශලානුභාවයෙන් වඩු[3]රියනක් වට ඇති සිහිල් සුවඳ ජලධාරවෙක් සැටයොදුන් පමණ තැන් අහසට නැඟී මොහුගේ අභිප්‍රාය වූ පරිද්දෙන් ඉස්මුදුනෙහි වහනය කෙරෙමින් සකලශරීරය සෑතු ගන්වා මොහු සතුටු කරවන්නේය. නැවත දවසෙක එක් පුරුෂයකු බොධිකෙනකුන් වහන්සේට වෙදිකාවක් බඳන දැක මැටි කීප පිඩක් ගෙනවුත් දින. දුන් ඒ කුශලානුභාවයෙන් සර්වාභරණයෙන් සැරහී නොයෙක් සියදහස්ගණන් සත්රුවන්මය ඵලකායුධ හා ධජපතාක කුඩකොඩි චාමර අටමඟල ආදිය ගෙන පිරිවරා සිටගත්තාවූ දිවසෙනඟ මධ්‍යයෙහි තාරකාවන් මැද නභොමණ්ඩල මධ්‍යගත ව දශදිග අඳුරු විහිදුවා බබළන චන්ද්‍රමණ්ඩලය සේ හොබනේය.

තව ද හෙයක් ලන්නවුන් දැක එයට නිසි වූ පුවරුකඩක් ගෙනවුත් ලීය,[4] දුන් ඒ කුශලානුභාවයෙන් සත්රුවන්මය ධජපතාක නඟා[5] දිව්‍යමය කුසුමදමාදීන් සරහා දහසක් පමණ සෛන්ධව අශ්වයන්[6] යොදනලද මේ තිස්යොදුන් දිව්‍යරථ වාහනය පහළ විය, දුන් දිව්‍යරථවාහනයකට පැනනැඟී මහත් වූ දෙවසෑදීන් යුක්ත ව දිවසෙනඟ පිරිවරා සිටගත්තාවූ දිවසෙනඟ මධ්‍යයෙහි දෙවචාරිකාවෙහි ඇවිදුනේ ය[7]. නැවත මෙතෙම බණ අසන සේ සවස උදසන මිනිසුන් රැස්වනු සඳහා ධර්මඝොෂා කෙළේය, දුන් ඒ කුශලානුභාවයෙන් මිහිරි කටහඬ ඇති ව සෙසු දෙවතාවන්ට වඩා දිව්‍යඓශ්වර්‍ය්‍ය ආදියෙන් උතුම් ව අපමණ වූ දිවසෙනඟ පිරිවරා ඇවිදුනේය.

තව ද නිත්‍යශීලවසයෙන් පඤ්චශීලය අඛණ්ඩ කොට රක්‍ෂා කෙළේය, දුන් ඒ කුශලානුභාවයෙන් නොයෙක් දහස් ගණන් මනහර දිව්‍යස්ත්‍රීහු නිරන්තර ව මොහු පිරිවරා සිටිනාහු මය. නැවත එක් දවසෙක බණ අස අසා ඉඳ මහත් වූ ධර්මාලම්බන ප්‍රීතීන් මත් ව තමාගේ උතුරු සළුව ධර්මයට පූජා කෙළේය, දුන් ඒ කුශලානුභාවයෙන් මොහුගේ දිව්‍යප්‍රාසාදය සිසාරා නොයෙක් සියගණන් කප්රුක් පහළ විය.

තව ද ගිය දවස බොහෝ දෙනා හා එක් ව සංඝයාවහන්සේට[8] මහ දන් පැවැත්විය, තුනුරුවන් කෙරෙහි අතිශයින් ම භක්තිප්‍රෙම ද ඇතිවිය, මේ තෙම දුන් ඒ කුශලානුභාවයෙන් තමා ගේ[9] විශෙෂ වූ දිව්‍යඓශ්වර්‍ය්‍ය ආදියෙන් සියලු දෙවියන්

---

1. මාළිගාව ද පහළ විය - ම.
2. දෙතුන්වට ඇති - ක.කි.ඤ.
   දෙතුන් කුඩයක් තුල - ම.
3. අසූ - BG
4. ගෙන ලීය - BGH
5. නංවා - B, ධජනඟා - KL
6. සෛන්ධවයන් - GH
7. ඇවිදිනේය - CDH
8. භික්‍ෂුසඞ්ඝයා - BDEGHKL,
   භික්‍ෂුසංඝයා වහන්සේට - ස.
9. තමා - J, මුද්‍රිත හැම, ස.

Non-Commercial Distribution

මැඩ පැවත්තේ ය.[1] මේ තෙමේ [පූර්වජන්මයෙහි][2] යම් යම් කුශලයක් කෙළේ ද ඒ ඒ කුශලයෙහි විපාක දන් මෝහට මේ දිව්‍යලොකයෙහි පහළ වෙයි, එසේ හෙයින් තෙපිදු මේ සියල්ල ම අසා දනගෙන වඩවඩා කුසල් කරව යි වදළසේක.

මෙසේ මහතෙරුන් වහන්සේ විසින් ඒ දිව්‍යපුත්‍රයාගේ පූර්ව චරිතය ගෙනහැර දක්වා වදළ කල්හි පුරුගලු උපාසකයෝ මහත් වූ සතොෂයට පැමිණ[3] තව ද ඒ දිව්‍යපුත්‍රයා එතැන ඉක්ම ගිය කල්හි මෙත් මහබෝසතාණෝ දිව්‍යමය මුතු මැණික් රන් රිදී ආදි වූ දශවිධ රත්නයෙන් විසිතුරු අනෙකප්‍රකාර දිව්‍යාභරණයෙන් සැරහී නානාවර්ණ දිව්‍යවස්ත්‍රයෙන් හා අනෙකප්‍රකාර දිව්‍යාලඞ්කාරයෙන් අලඞ්කෘත ව වෙන වෙන ම සත්රුවන්මය සුවාසූදහසක් දිවකොත්හ බැගින් පස්ලක්ෂ අට අනූදහසක් පමණ සත්රුවන්මය මනහර කොතන පඞ්ක්ති ගත් දිව්‍යසෙනාව ඉදිරි කොට ඊට ඉක්බිති ව මෙසේ නානාලඞ්කාරයෙන් සැරහී රක්තශ්වෙතාදී පඤ්චප්‍රකාර දිව්‍යවර්ණයෙන් යුක්ත පියුම් කලප් ආදියෙන් අලඞ්කෘත වූ දිවසුවඳ[4] පිරූ ලක්ෂගණන් පූර්ණඝට පූර්ණකලස මාලාවන් හා අටතුරාසියක් මඟුල් පෙරහර ගත්තාවූ නොයෙක් ලක්ෂගණන් දිව්‍යසමූහයා විසින් පිරිවරනලදු ව මුදුනෙහි බඳනාලද මිණිකිකිණිදලින් විසිතුරු වියනින් හා ඒ ඒ ස්ථානයෙහි උචිත පරිද්දෙන් අවට සරහා එල්වනලද නානාවර්ණ දිව්‍යමය මාලාදමසහස්‍රයෙන් අලඞ්කෘත කොට සත්රුවන්මය ආසනතනා දිව්‍යමය නොයෙක් අශ්වාලඞ්කාරයෙන් සරහනලද දිව අසුන් යෙදූ තුන්යොදුන් දිව්‍යරථවාහනයකට පැනනැඟී නීල පීතාදි වූ නානාවර්ණ වූ ලක්ෂගණන් ධජපතාක පන්තීන් හා කුඩසිනිඳුසහස්‍රයෙන් පිරිවරනලදු ව තරු පිරිවැරූ[5] දෙවන පුන්සඳමඬලක් හා සදෘශ වූ[6] තුන් යොදුන් වට ඇති සත්රුවන්මය ජේසතක්[7] ඉසට කරවා තුන්ගවු උස දිව්‍ය ශරීර ඇති ව ගවු දිග[8] මිණි ඔටුනු ධරා සැටගැලක් පුරාලන පමණ දිව ආභරණ පැළඳ යෙළයාලක් සුවඳ විලෙවුන් ගෙන රන්ගිරිකුළු දෙකක් බඳු වූ දිවමිණිකොඩොල් දෙකන පැළඳ දෙළොස් යොදුන් දිග දිවසළුවක් විද හැඳ රන් ගිරිඅතලක් මුදුනෙන් හුණු ගඟුල්හැල්ලක් හා සමාන මනහර මුත්හරක්[9] පැළඳ අනෙකප්‍රකාර දිව්‍යාලඞ්කාරයෙන් සැරහී විදුලිය කැළයෙන් හා ඉඳුවාපසහස්‍රයෙන් වළඳනා ලද රන්පර්වතයක් සේ දිලිහි දිලිහී වැඩසිට, එසේ ම සර්වාභරණයෙන් සැරහී උතුරුසළුව ඒකාංශ කොට බහා දෙහොත් මුදුන් දී තමන්වහන්සේගෙන් බණ අසනු[10] පිණිස වට සිටගත් දහම්සොඩ දිව්‍යපුත්‍රයන් හා සදිව්‍යලොකයෙහි ප්‍රධාන දිව්‍යරාජයන් විසින් ද එසේ ම පූර්වජාතියෙහි නිවන් පතා කරනලද කුසල් ඇති ව තමන් වහන්සේ බුදු වන කල් බල බලා හිඳිනා නොයෙක් ලක්ෂ සුවහස් ගණන් දිව්‍යස්ත්‍රීන් හා දිව්‍යපුත්‍රයන් විසින් ද එසේ ම සියගණන් පසේබොධිසත්වයන් හා අගසවු බව පතා බොහෝ කුසලසම්භාරයන් රැස් කොට දෙවුලොව ඉපද මහත් වූ දිව සැපත් විඳිනා මහානුභාවසම්පන්න දිව්‍යරාජයන් විසින්

---

1. පවත්තේය - GHKL, ම.
2. පූර්වභාගයෙහි - පිටපත් හැම
3. පැමිණියේය - CK
   පැමිණියෝය - ම.
4. දිවසුවඳලිය - BEGHKL, ස.
5. පිරිවර - DEGHJKL,
6. සාදෘශ්‍ය වූ - ස.
7. ජේසත් - BCJ, ක.කි.ඤ.බෙ.
8. උස - B, ඤ.
9. මුත්හරයක් - CG
10. අසන - BC

Non-Commercial Distribution

ද යි මෙසේ ප්‍රමාණාතික්‍රාන්ත දිව්‍යසෙනාව විසින් පිරිවරන ලද්දූ ව එසේ ම නානාවර්ණ දිව්‍ය වස්ත්‍ර දිව්‍යාලඞ්කාරයෙන් සැරහී තුන්ගවු දිග මහබෙර කර ලා බෙර ගසමින් ඉදිරි ව නික්මුණාවූ නොයෙක් දහස් ගණන් ගාන්ධර්ව දිව්‍යපුත්‍රයන් හා දිව්‍යස්ත්‍රීන් විසින් ද එසේ ම සර්වාභරණයෙන් සැරහී තාල නොවරදවා ගසනලද බෙරමඩුලු මධ්‍යයෙහි රඟ බැස නටා බස්නා දිව්‍යපුත්‍රයන් හා මිහිරි කටහඬින් මනහර ගී කිය කියා වීණා ගගා කුල්මත් ව එකත් නහා ලෙලවමින් නටා බස්නා දිව්‍යස්ත්‍රීන් විසින් ද යනාදීන් වෙන වෙන කියත් නිමාවක් දක්ක[1] නොහැකි අනෙකප්‍රකාර දිව්‍යනාටකයන්ගේ නානාප්‍රකාර වූ නෘත්‍යගීත වාදයෙන් හා එසේ ම වන්දිභට්ටයන් සේ එකත් ඔසවා දෙපස[2] සිට ස්තුති ඝොෂාකරන නොයෙක් දහස් ගණන් දිව්‍යපුත්‍රයන්ගේ ස්තුතිඝොෂාවෙන් දසදික් පුරමින් තමන් වහන්සේගේ ශ්‍රී විභූතියෙන් සියලු දිව්‍යරාජයන්ගේ ශ්‍රී සම්පත්තිය අභිභවනය කෙරෙමින් මෙසේ දෙවතාවන්ගේ නේත්‍ර[4] නමැති භෘඞ්ගයන්ට[4] පද්මයක් මෙන් ද සියලු දෙවතාවන්ගේ නුවන් නමැති නාටකයන්ගේ නෘත්‍යයට රඟමඩුල්ලක් මෙන් වඩනා මෛත්‍රි මහබෝසතාණන් දක මහත් වූ ප්‍රීතීන් මත් ව ඔබ වඩනා ශ්‍රී විභූතියට සුදුසු වූ අනික්[5] කිසි උපමාවක් දක්ක නොහී මෙත් බෝසතුන් දක්වා මහතෙරුන්වහන්සේ අතින් විචාරන්නාවූ උපාසක තෙම:

අනූපමො අසදිසො - මහතියා සිරියා ජලං,
ආපූරයං දිසා තාහි - කො'යං එති මහායසෙ.[6]

යනාදීන් 'ස්වාමිනි, උපමා කටහැකි අන් සාදෘශ්‍ය වස්තුවක් නැති ව මහත් වූ ශ්‍රී ශොභාවෙන් දිලහි දිලිහී තමාගේ දිව්‍ය ඓශ්වර්‍ය්‍යයෙන් දසදික් පුරමින් සියල්ලවුන්ගේ නෙත් සිත් තමා කරා හයවමින් අප ඉදිරියෙහි එන්නේ මේ කෙසේ වූ ආශ්චර්‍ය්‍යමත් කුශලයක් කළ දිව්‍යරාජයෙක් ද'යි විචාළේය. එසේ විචාළ උපාසකයාහට ඔබ වූ නියාව ප්‍රකාශ කොට දක්වන මහතෙරුන් වහන්සේ:

යො සොළස අසඞ්ඛ්‍යය්‍යං - පූරෙත්වා සබ්බපාරමී,
ධම්මං දෙසෙති දෙවානං - ස මෙත්තෙයෙ‍්‍යා ජිනඞ්කුරො.

පුඤ්ඤං කත්වාන යෙ ස්ත්තා - ජායාම[7] තුසිතෙ පුරෙ‍ා,
පපෙ‍්‍යාන්ති කාරණා[8] යස්ස - ස මෙත්තෙයෙ‍්‍යා ජිනඞ්කුරො.

යො කෙතුමතියං ජාතො - බුද්ධො හුත්වා අනුත්තරො,
ලොකං දුක්ඛා පමොචෙති - සමෙත්තෙයෙ‍්‍යා ජිනඞ්කුරො.

යනාදීන් 'එම්බල පින්වත්[9] උපාසකය, යට ගිය දවස මුහුනී නම් බුදුරජාණන් වහන්සේගේ ශ්‍රීපාදමූලයෙහිදී විවරණ ලත් තැන් පටන් සොළොසාසංඛ්‍ය

1. කළ - GH
   කට - B
2. දෙපෙළ - BDEGHKL
3. නෘත්‍ය - BCDEHJ, ත.සි.සැ.බෙ.
4. භෘඞ්ගයන් නටන - KL
   නැමති (නැත) - ස.
5. අන් - BDEGHKL
6. මහායසො - ස.
7. ජායාමා - පිටපත් හැම
8. කාරණං - BCDEGHKL
9. පින්වත් (නැත) - BGHL

Non-Commercial Distribution

කප්ලක්‍ෂයක් ඇතුළත ලොව පහළ වූ දහස් ගණන් සර්වඥවරයන් අතින් විවරණ ශ්‍රී ලදින් දන ශීලාදි වූ සමත්‍රිංශත් පාරමීධර්මයන්[1] පුරා මස්තකප්‍රාප්ත කොට බුදු වීමට කල් එන තෙක් ලොකොත්තම්[2] යම් කිසි බුද්ධාඞ්කුරයෙක් තුසීපුර පැමිණ දෙවතාවන්ට කර්ණාමෘත කෙරෙමින් ධර්මදෙශනා කෙරේ ද, මේ ලොකවාසී වූ ශ්‍රද්ධාවන්ත සත්වයෙෝ තමන් තමන් ශක්ති පමණින් කුසල් කොට තුසිතභවනයෙහි යම් බුද්ධාඞ්කුරයක්හු කෙරෙහි උපදුමෝව යි ප්‍රාර්ථනා කෙරෙද් ද, යම්කිසි බුද්ධාඞ්කුරයෙක් එන දවස සියලු සම්පත්තීන් සමෘද්ධ වූ කෙතුමතී නම් රාජධානියෙහි ඉපද සම්‍යක්සම්බුද්ධ ව අට අසූරියන් බුදු බදින් තුන්ලෝ බබුළුවා අසූදහසක් හවුරුදු ආසිරි වළඳ වැඩසිට සුවිසි අසංඛ්‍යයක් සත්වයන් සංසාර සාගරයෙන් ගොඩ නඟා අමාමහ නිවන් දක්වා ද ඒ සියලු දිව්‍යමනුෂ්‍යයෝ යම් සර්වඥ කෙනකුන් වහන්සේ දැක බණ අසා එන දවස සියලු[3] සසර දුක් ගෙවා අමාමහ නිවන් දක නිවී සැනහේ ද එබඳු මහිම ඇති ඒ මෛත්‍රී බොධිසත්වය යි යන්නේ[4] මේ දිව්‍යරාජොත්තමයාහට වේ ද යි වදාළසේක.

මෙසේ මලියදෙව මහතෙරුන්වහන්සේ හා සුළුගලු උපාසකයන් හා කථා කෙරෙමින් සිටියදී ම මෛත්‍රී මහ බෝසතාණෝ අවුත් රථයෙන් බැස මහතෙරුන්වහන්සේ කරා එළඹ පසඟ පිහිටුවා වැඳ "ස්වාමීනි, කුමක් පිණිස මෙදෙව්ලොවට වැඩිසේක් ද"යි විචාළහ. එබසට මහතෙරුන් වහන්සේ 'මහා පුරුෂය, අපි සිළුමිණි සෑය වඳනා පිණිස ආම්හ"යි වදාළසේක. ඉක්බිති සුළුගලු උපාසකතෙම මෛත්‍රී බොධිසත්වයන් වැඳ එකත්පස් ව සිටියේය. එවේලෙහි මෛත්‍රී බොධිසත්වයෝ සුළුගලු උපාසකයන් දැක "ස්වාමීනි, මේතෙම කිනම් උපාසකයෙක් ද"යි විචාළහ. ඉක්බිති මහතෙරුන් වහන්සේ "එම්බා මහාපුරුෂය, ලඞ්කාද්වීපයෙහි ශ්‍රද්ධාශීලගුණයෙන් යුක්ත වූ සුළුගලු උපාසකයෝ නම් මූ ම[5]ය"යි වදාළසේක. එකල මෛත්‍රී බොධිසත්වයෝ සුළුගලු උපාසකයන්ට යහපත් වූ[6] දිවසළු සහළක් දී[7] "තව ද වඩවඩා නොපමා ව කුසල් කරව"යි අවවාද කොට ඔවුන් හා සමග මහ තෙරුන්වහන්සේ කැඳවාගෙන ගොස් සිළුමිණි සෑය වැඳවූහ. මහතෙරුන්වහන්සේ ද සිළුමිණිසෑය වැඳ උපාසකයන් හා සමග සුළුගලු විහාරයට අවුත් හොජනශාලාවෙහි වැඩහිඳ බෙහෙත් කැඳ වළඳ සන්හිඳුණාවූ ව්‍යාධි ඇතිසේක් තමන් වහන්සේ වසන වෙරිය[8] විහාරයට වැඩිසේක. එකල සුළුගලු උපාසකයෝ තෙරුන් වහන්සේට පසුගමන් කොට වැඳ අවසර ගෙන රැඳුණාහ.

ඉක්බිති ඒ ගම්හි මනුෂ්‍යයෝ සුළුගලු උපාසකයන් අත තිබූ ඒ දිවසළු දෙක දැක "මේ ආශ්චර්යමත් වූ සාටකයුග්මය තෙපි කොයින් ලදු ද"යි විචාළහ. එකල සුළුගලු උපාසකයෝ මලියදෙව මහතෙරුන් වහන්සේ හා එක් ව තමන් තවුතිසා දිව්‍යලොකයට ගොස් දුටුවාවූ සියලු සම්පත්තිය ද මෛත්‍රී බොධි සත්වයන්ගෙන් තමන් ඒ දිවසළු දෙක ලත් බව ද යන සියල්ල ම විසතර වශයෙන් කියා මහජනයා

1. පාරමිතාධර්මයන් - GH
2. ලොකොත්තර - BDEGH
3. සියලු සත්වයන් - පිටපත් හැම
4. කියන්නේ - ක.සි.සැ.ම.
5. ම (නැත) - BDEGHKL, ම.
6. මහත් වූ - H
7. දී නරනායු ගණනින් සතියකට ආයු මේ හොපට වද - ස
8. වේගිරිය - මුද්‍රිත හැම. වේහිය - ස

Non-Commercial Distribution

කුසල් කිරීමෙහි යොදු තුමු සත් දවසක් මුළුල්ලෙහි නොයෙක් පින්කම් කිරීමෙන් දවස් යවා අටවන දවස් එයින් ගොස් නිදු පිබිදියාක්හු මෙන් තුසීපුර දෙව්ලොව එම මෛත්‍රී බොධිසත්වයන් කෙරෙහි මහෙශාක්‍ය වූ දිව්‍යරාජත් ව උපන්හ.

මෙසේ දන ශීලාදි වූ ගුණධම්මය[න්][1] ආභරණ කොට ඇති උත්තම සත්වයෝ තමන්ගේ ශීලාචාරාදි වූ ගුණානුභාවයෙන් මනුෂ්‍යශරීරයෙන් ම දිව්‍යලොකයට ගොස් මහානුභාව සම්පන්න දිව්‍යරාජයන්ගෙන් සංග්‍රහ විඳ අවවාද ලදින් මිනිස්ලොවට අවුත් බොහෝ පින් රැස් කොට නැවත ගොස් දෙව්ලොව ඉපද අපමණ වූ දිවසැපත් ලබන්නාහ. එසේ හෙයින් දිව්‍යමනුෂ්‍ය ලොක ආදි හැම තන්හි[2] ගුණධම්මය ම උතුම් වන්නේය යි දන දනශිලාදි වූ සියලු ගුණයන් පුරා මතු ස්වර්ග මොක්ෂ සම්පත් සිධකරන්ට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි:

එවං හි නානා ගුණභූසණා ජනා
ගුණානුභාවෙන උපෙන්ති සග්ගං,
පූරෙථ තස්මා ගුණමෙව කෙවලං,
ගුණං හි සබ්බත්ථ පසත්ථමෙව.

මේ මෙහි පළමුවන
සුළුගඳු වස්තුව ය.

*තව ද මෙහි දෙවන තිස්සසාමණේර වස්තුව නම් කවරයත්. එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු. කෙසේ ද යත්:

මෙම ලඞ්කාද්වීපයෙහි උතුරුදිග නාග මහාවිහාරය යි ප්‍රසිඩ වූ මහත් විහාරයෙක් විය, ඒ විහාරයෙහි තිස්ස නම් සාමණේර කෙනකුන් වහන්සේ වසනසේක, උන්වහන්සේ සිල්වත් සේක, ගුණවත්සේක, වත්පිළිවෙත් සරුසේක, ආචාර සම්පන්න සේක, මහත් වූ සැදැහැ ඇතිසේක. ඒ සාමණේරයන් වහන්සේ 'විහාර සන්තක වස්තු නොනැසී සඞ්ඝයාවහන්සේට ප්‍රයෝජන වුව මැනවැ'යි සිතා එයින් කප්පිය භාණ්ඩ වියදම් කරවා සඞ්ඝයාවහන්සේට මහදන් පැවැත්වූසේක, එ දෙන දනයත් ආදර සහිත ව ඒ ඒ විහාරවලට ගොසින් ආරාධනා කොට කැඳවාගෙන ඇවිත් සැතපෙන්ට සලස්වා වළඳන ගෙයි වියිතුරු වියන් බැඳ මලොලඹු[3] එල්වා නහන බොන පැන් පිළියෙළ කරවා දැහැටිදඬු ගෙන්වා තබා ඉඳිනා අසුන් පනවා හැමදෙනාවහන්සේගේ පතුල් ශොධවා පිළිවෙළින් ඉන්ට සලස්වා උදසන කැඳ අවුළු වළඳවා දහවල් නොයෙක් සූපව්‍යඤ්ජනයෙන් යුක්ත ආහාර වළඳවනසේක, මෙසේ නිරන්තරයෙන් සඞ්ඝයා වහන්සේට සිවුපසයෙන් උපස්ථාන කොට මැතභාගයෙහි ඒ දනමය කුශලයෙන් හා සඞ්ඝයාවහන්සේ කෙරෙහි පැවැත්තාවූ චිත්තප්‍රීතියෙන් එම විහාර සමීපයෙහි ශාඛාවිටප සම්පන්න වූ මහත් නුහරුකෙක බූමාටු දේවතා ව[4] උපන් සේක.

*A පිටපත නැවත මෙතැනින් පටන් ගැනේ.
1. ගුණධර්මය - පිටපත් හැම
2. තැන්හි ම - BCD
3. මලලොඹු - ACD
4. දෙව ව - J, මුද්‍රිත හැම, දෙවි ව - KL

Non-Commercial Distribution

ඒ දිව්‍යපුත්‍රයාණන් පළමු නමින් ම තිස්ස දිව්‍යපුත්‍රයාය යි නම් විය. ඒ දිව්‍යපුත්‍රයාණෝ මහත් වූ ආනුභාව ඇතියහ, අපමණ වූ පිරිවර ඇතියහ, ඒ දිව්‍යපුත්‍රයාණන්ට පස්යොදුන් පමණ නැන දිව්‍යමය වූ අන්නපාන ආදිය ගෙන දේවතාවෝ අවසර නොහැර සිටිති, ඒ ගෙනා අන්නපානයෙන් ම පිරිවර දේවතාවන් හා ඒ දිව්‍යපුත්‍රයාණන්ට ආහාරකෘත්‍යය සැපයෙන්නේය. ඉක්බිති එක් දවසෙක් එම විහාරයෙහි වස්නාවූ භික්ෂූන්වහන්සේ අතුරෙන් සැටදෙනකුවහන්සේ විහාර සමීපයෙහි ගම්වල සිඟා ඇවිද කිසිවකුත් නොලැබ පාත්‍රය සේදූ වන ම ඇරගෙන පෙරළා විහාරයට ම වඩනාසේක. එකල ඒ තිස්ස දිව්‍යපුත්‍රයාණෝ එපරිද්දෙන් ම වඩනා භික්ෂූන්වහන්සේ දක සිතන්නාහු "පළමු මම විහාරසන්තක දෙයින් භික්ෂූන් වහන්සේට දන් දී මේ දෙවන[1] ආත්මභාවයෙහි මෙබඳු දිව්‍යසම්පත්තියක් ලදිමි. දන් මම[2] මා සන්තකයෙන්[3] භික්ෂූන් වහන්සේ දන් දෙමි"යි සිතා තමන්ගේ භාර්‍ය්‍යාවන් කැඳවා "එම්බා සොඳුර, තෙල භික්ෂූන් වහන්සේ වඩනා තපොලීලාවක් බලව"යි කියා සංඝයාවහන්සේ දක්වා 'එම්බා සොඳුර, මේ සංඝයා වහන්සේ නම් ලොකස්වාමි වූ බුදුරජාණන්වහන්සේගේ ශ්‍රාවකයන්වහන්සේය. සිල්වත් සේක, ගුණවත්සේක, වත් පිළිවෙත් සරුසේක, සියල්ලවුන්ට ම වැඩක් වන්නා කැමැතිසේක. මේ ඇමදෙනා වහන්සේ ම බුදුන්ගේ ශාසනය තමතමන්වහන්සේගේ ජීවිතය[න්][5] සේ රක්ෂා කරන සේක, රාග දෙවෂ මොහාදි වූ කෙලෙස් නැමැති සතුරන්ගේ දළී නමැති හිස් සිඳීමට සැරහී සිටි යොධ භටයන් වැනිසේක. මෙසේ[5] සංඝයාවහන්සේට සැදැහැයෙන් දුන්නාවූ දනයෙක් හෝ යම්කිසි පූජා සත්කාරයෙක් ඇත්නම් එසියල්ල ම මහත් විපාක දෙන්නේය, යම් කිසි කෙනෙක් මෛත්‍රියෙන් ප්‍රෙම සහිත ව මේ සංඝයා වහන්සේගේ මුහුණ පමණක් බැලුවාහු වී නම් උන්ගේ ඇසට කිසියම් රොගයෙක් දුකෙක් නොවන්නේ මය, මේ සංඝයාවහන්සේ සාදර සිතින් භක්ති ප්‍රෙම සහිත ව සදහන් කළ කෙනෙක් ඇත්නම් උපනුපන් ජාතියෙහි ඔවුන්ගේ සිතට ශොකයෙක් නොවන්නේය. එම්බා පින්වත, බුධරත්නය ධර්මරත්නය යන දෙරත්නය ඉක්බිති තුන්වැනි ව ලොකපූජිත වූ තෙල සංඝරත්නය ය, යම්හ, අපගේ ශක්ති වූ පරිද්දෙන් ප්‍රත්‍යයදනයක් දී සත්කාර කරන්ට වුව මැනවැ"යි කීහ.

ආගච්ඡන්තා ඉමෙ භද්දෙ - බුධසෙට්ඨස්ස සාවකා,
සීලවා වත්තසම්පන්නා - සබ්බසත්තහිතෙ රතා.

පාලෙන්ති ජීවිතං'වෙතෙ[6] - සම්මා සම්බුධ සාසනං,
එතෙ සන්නධයොධාව කෙලසාරි සීස පාතනෙ.

යත්ථ දින්නං යත්ථ යිට්ඨං - අනන්තඵලදං සියා,
යස්ස දස්සනමා'ගම්ම - චක්ඛු හොති නිරාමයං,
සම්භාවිතස්ස චිත්තස්ස - කොචි සොකො න විජ්ජති.

---

1. දෙවතා - AC
2. මෙම - බෙ.ස.
3. සන්තක දෙයින් - BD, ක.කි.සැ,ම.
5. ජීවිතයක් - ACDEGHJKL
   ජීවිතය - B
6. මේ - BDEGH
   ජීවිතං වෙතෙ - ABCEGHJKL, ක.කි.සැ.

Non-Commercial Distribution

හොතේ'තං සඞ්ඝරතනං - තතියං ලොකපූජිතං,
එහි තං පයිරුපාසාම - සක්කරොම යථාබලං-යි.

මෙසේ ඒ දිව්‍යපුත්‍රයාණන් කී වචනය අසා දිව්‍යස්ත්‍රී කියන්නී "ස්වාමීනි, සඞ්ඝරත්නය මෙසේ වූ ගුණධර්මයකුත් ඇති කල ඒ සඞ්ඝරත්නය උදෙසා දුන්නාවූ දනය අනන්ත කාලයක් සසර සැප විඳීමට හේතු වන කල තුමූ තමන්ට සැප කැමැති කෙනෙක් දන් නොදෙද් ද[1], යහපත දන් දෙම්හ"යි කීහ. එසේ හෙයින් කියන ලදී:

දෙම දනානි හො දනි - යත්ථ දින්නං මහප්ඵලං,
තං භවිස්සති නො දනං - අත්ථාය ච හිතාය ච-යි.

මෙසේ කථා කොට ඔහු දෙදෙන භික්ෂූන්වහන්සේ සමීපයට[2] එළඹ පසඟ පිහිටුවා වැඳ සැටදෙන[3] වහන්සේට ආරාධනා කොට කැඳවා ගෙන තමන් වසන නුහරුක සමීපයෙහි පර්වතයට අභිමුඛ ව නික්මුනාහ. එකල භික්ෂූන්වහන්සේ "උපාසකයෙනි, මේ පර්වතයෙහි මනුෂ්‍යවාසයෙක් නැත, අප කැඳවාගෙන කොයි යවු ද"යි කීසේක, එකල ඒ දිව්‍යපුත්‍රයාණෝ "ස්වාමීනි, අපගේ වාසස්ථානය මෙතැන ය"යි කියා කැඳවාගෙන ගොස් තමන්ගේ දිව්‍යවිමානයෙහි ඉන්ට සලස්වා 'එම්බා සබඳිනි, දිව්‍යමය වූ අන්නපානාදිය නොපමා ව ගෙනෙව"යි තමන්ගේ පිරිවර දෙවතාවන්ට විධාන කළහ, එකල ඒ දිව්‍යපුත්‍රයෝ දිව්‍යමය වූ නොයෙක් අන්න පාන පූපාපූප වර්ගයන් ඇරගෙන පස්යොදුන් පමණ තන්හි අවසර නොහැර ඇවිත් සිටගත්හ.

එකල රිටිගල[4] වසන මහාසුමන නම් දිව්‍යපුත්‍රයෙක් තමාගේ දෙවු පිරිස් හා සමඟ "රාජායතන චෛත්‍යය වඳින්ට යම්හ"යි මනිනාග දිවයිනට යනුයේ අතරමඟ තිස්ස නම් දිව්‍යපුත්‍රයාගේ පිරිවර දෙවතාවන් ගෙනෙන්නාවූ දිව්‍යමය අන්නපානාදිය දැක "මේ පඬුරු කවුරුන්ට ගෙන යන පඬුරෙක් ද"යි විචාළේය, එකල ඒ දෙවතාවෝ 'මහානාග විහාරය[5] සමීපයෙහි වසන තිස්ස දිව්‍යපුත්‍රයාණන්ට ගෙන යන පඬුරු ය'යි කීහ. එකල්හි මහා සුමන නම් දිව්‍යපුත්‍රයා තමා එක් ව ගෙන යන උපකරණ ගෙන්වා ගෙන තිස්ස දිව්‍යපුත්‍රයාණන් සමීපයට ගොස් දෙදෙන ඔවුනොවුන් හා පිළිසඳර කථා කොට ඉක්බිති දෙදෙන ම එක් ව ගොස් භික්ෂුසඞ්ඝයා වැඳ මහදන් පවත්වා තම තමන්ගේ පිරිවර හා සමඟ එකත්පස් ව හුන්හ. එකල භික්ෂූන්වහන්සේ වළඳ ඉක්බිති අනුමෙවුනි බණ වදරා ඔවුන් දෙදෙනාගේ දිව්‍යෛශ්වර්ය්‍ය දැක සඞ්ඝස්ථවිරයන්වහන්සේ තිස්ස දිව්‍යපුත්‍රයන්ට[6] ආමන්ත්‍රණය කොට තොප පූර්වජන්මයෙහි කළ කුසල් කවරේ ද යි විචාරන සේක් "එම්බා දිව්‍යපුත්‍රයාණෙනි, තොපගේ මේ දිව්‍යවිමානයෙහි භිත්ති පල සෙවෙනි ආදි වූ සියල්ල ම සත්රුවනින් නිමියේය, දිව්‍යමය ශයනාසනාදියෙන් සැරහුණේය, මනහර වියනින් හා දිවසුවඳ මල්දම් ආදියෙන් ශොභමානය. නොයෙක් දිව්‍යාලඞ්කාරයෙන් සැරහුණාවූ දිව්‍යස්ත්‍රීන් හා

1. නොදේ ද - G
2. කරා - KL
3. සැට දෙනකු - J, ක.කි.ඤ.
   සැට දෙනකුන් - ම
4. පිටිගල - KL
5. විහාර - BEGH, ක.කි.ඤ.ම.
6. දිව්‍යපුත්‍රයාණන්ට - BGH, ම.

Non-Commercial Distribution

දිව්‍යපුත්‍රයෝ නානාප්‍රකාර හෙරිතූර්‍ය්‍ය භාණ්ඩයන් ගෙන සමහරෙක් බෙර ගසති, සමහරෙක් ගී කියති, සමරහරෙක් කාහළ පිඹිති, සමහරෙක් නටති, සමහර දිව්‍යාඞ්ගනාවෝ නොයෙක් වස්ත්‍රාලංකාරයෙන් සැරහී ලීලා[1] විලාස දක්ව දක්වා සිටිති, එසේ ම නොයෙක් වස්ත්‍රාලංකාරයෙන් සැරහී දිව්‍යමය වූ රන්කොණ්ඩ හා කුඩකොඩි පේසත් කොල්[2] පිල්කඩ ආදි වූ දිව්‍යාලංකාරයන් අල්වා ගෙන සමහර දිව්‍යපුත්‍රයෝ තොප පිරිවරා දෙපස සිටිති. තෙපි දත් සියලු වස්ත්‍රාලංකාරයෙන් සැරහී සියලඟින් නික්මෙන්නාවූ ශරීරාලෝකයෙන් දස දිගුත් බබුළුවා නභොමණ්ඩලයෙහි පැළබෙන්නාවූ මධ්‍යාහ්න සූර්‍ය්‍යමණ්ඩලය සේ බබළව[3]. තොප පූර්වජාතියෙහි කළ කවර කුශලයකින් තොප රක්ෂා කළාවූ කවර ශීලානුභාවයකින් කවර ව්‍රතසමාදානයකින් මේ දිව්‍යෛශ්වර්‍ය්‍ය ලදු ද, ඒ හැම දත් අසන්නා කැමැත්තෙමි, ඉඳුරා මට කියව'යි වදළසේක. එසේ හෙයින් කියනලදී:

විමානං තෙ මහා එතං - සබ්බං තං රතනාමයං,
සයනාසනසම්පන්නං - මාලාදමාදි භූසිතං.

පංචඞ්ගිකානි තුරියානි - පග්ගහෙත්වාන දෙවතා,
වාදෙන්ති මධුරං ගීතං - ගායන්ති හදයඞ්ගමං.

නච්චන්ති චතුරා එත්ථ - දෙවකඤ්ඤා මනොරමා,
හාවභාව විලාසෙහි රමාපෙන්ති තවං සද.

කුන්තඡත්ත පතාකායො - ගහෙත්වා රතනාමයා,
පරිවාරෙන්ති තං නිච්චං - දෙවසෙනා මනොරමා.

සබ්බාලඞ්කාරසම්පන්නො - වණ්ණවන්තො මහායසො,
විරොචෙති දිසා සබ්බා - සූරියො 'ව නභමු'ග්ගතො.

කෙන තෙ පුඤ්ඤකම්මෙන - සීලෙන ච වතෙන ච
උප්පජ්ජන්ති ඉමෙ භොගා - තං මෙ අක්ඛාහි පුච්ඡිතො.යි'

මෙසේ විචාළ සඞ්ඝස්ථවිරයන්වහන්සේට තමන් පූර්වජාතියෙහි කළ කුශල්[4] ප්‍රකාශ කොට දක්වන්නාවූ දිව්‍යපුත්‍රයාණෝ "ස්වාමිනි, මම මීට පළමු ජාතියෙහි නාග නම් විහාරයෙහි ශ්‍රද්ධා සම්පන්න සාමණේරයෙකිමි. ඒ විහාරයේ සෙනසුන් පිරිකර නස්නා සේ දක ඒ මිලයෙන් සඞ්ඝයාවහන්සේට දන් දෙවිමි. එසේ දන් දෙන්නාවූ මම සාදර[5] පිතින් භොජන ශාලාවෙහි සුවඳ පිරිබඩ ගෙන උඩ සුදු වියන් බඳවා ආසන පනවා නානාවර්ණ සුවඳ මල් පුද මල්දම් ආදියෙන් අලංකාර කොට වට වැටපහන් ලවා, උදසන්හි ම නොයෙක් පූපාපූප වඟී හා සමහ කැඳ අවුළුපත්[6]

1. ලීලා (නැත) - BDEGHKL
2. පෙන්කොල් - KL, ම.ස.
3. බබලව - BDEGHL, බබලවහි - K
බබලන්නේය - ACJ
බබලන්නානුය - මුද්‍රිත නැම, ස
4. කුශලය - H
5. ආදර - BGH
6. අවුල්පත් - AJ
අවුළ - BEGHL

වළඳවා දහවල් කැපසරුප් ලෙස මච්ඡමාංසවිකෘති හා පංචගවරසයෙන් යුක්ත වූ අහර වැළඳවීමි. මෙසේ භික්ෂූන්වහන්සේට එකල්හි උපස්ථාන කරන්නාවූ මම බොහෝ කාලයක් ගිය කල එයින් චුත ව කුශලානුභාවයෙන් මහත් දිව්‍යානුභාව ඇති ව මෙම සිත්කලු වූ සත්රුවනින් විසිතුරු දිව්‍යවිමානයෙහි උපන්මි. එකල්හි "ශ්‍රද්ධාවන්තයන් දුන් අනුන් සන්තක දේය්‍යධර්මය[1] නොනසීව" යි සිතා සිත් පහදවා ගෙන දන් දෙවූ පමණකින් මෙසේ වූ දිව්‍යෛශ්වර්යයක් ලදිමි, තම තමා සන්තක දෙයින් දන් දුන්නවුන් ලබන්නාවූ විපාක විශේෂය කවර නම් කෙනෙක් කියා නිමවද්ද? එසේ හෙයින් ස්වාමීනි, ලොකයෙහි[2] සියලු අභිමතාර්ථ සාධා දෙන්ට දානය හා සමාන අනික් උත්තරීතර වස්තුවෙක් නැත, සියලු දිව්‍යමනුෂ්‍ය සම්පත් හා නිර්වාණසම්පත්තිය දානයෙන් ම සිද්ධ වන්නේය"යි කීහ. එසේ හෙයින් කියන ලදී:

අහං භන්තෙ අතීතස්මිං - විහාරෙ නාගසව්හයෙ,
අහොසිං සමණුද්දෙසො - සද්ධාසීලගුණාකරො.

සෙනාසනපරික්ඛාරං - නස්සමාන 'මුදික්ඛිය,
තෙන මූලෙන භික්ඛූනං - මහාදානම'දාසහං.

බන්ධිත්වාන විතානානි - පඤ්ඤපෙත්වාන ආසනෙ.
පූජෙත්වා 'නෙකපුප්ඵානි - උජ්ජාලෙත්වා පදීපියං.

මධු සක්ඛරගුළොපෙත - ඛජ්ජභොජ්ජෙහි සංයුතං,
නානාවිධාහි යාගූහි - භික්ඛුසඞ්ඝමු 'පට්ඨහිං[3].

සමච්ඡමංසවිකතිං - උපෙතං ගොරසෙන ච,
මධුරන්නෙන තප්පෙසිං - භික්ඛවො යාවදත්ථකං.

උපට්ඨහන්තො භික්ඛූනං - එවමෙ'වං[4] තද අහං,
බහූනි වස්සපූගානි[5] - ඛෙපෙත්වාන තතො චුතො.

එත්ථාහං රුචිරෙ දෙව[6] - විමානෙ රතනාමයෙ,
ජාතොසිං තෙන කම්මෙන - දෙවො හුත්වා මහිද්ධිකො.

පරසන්තකෙන දින්නස්ස දානස්ස ඵලමීදිසං,
කීදිසං නු[7] ඵලං හොති - සකසන්තකතො අහො.

නත්ථි දානසමො භන්තෙ - ලොකෙ සබ්බත්ථදායකො,
දෙති සො භවසම්පත්තිං - තථා ලොකුත්තරං සුඛං-යි.

---

1. දෙයධර්මය - බෙ.ස.
2. මේ ලෝකයෙහි -BDEGHKL
3. සඞ්ඝ උපට්ඨහිං - ACDEJ
   සඞ්ඝ උපට්ඨහි - *BGHKL*
4. එවමෙව - ABCGHKL
5. වස්සපූගානි - ම.පාලි
   වස්ස පූගානි - කි.
6. එත්ථාරුහං විරෙ - ACDEJKL
   අත්ථාරුහං විරෙ - BGH
7. නනු *AB*.

Non-Commercial Distribution

මෙසේ ඒ දිව්‍යපුත්‍රයාණන් තමන් පූර්වජාතියෙහි කළ කුශලය ප්‍රකාශ කොට දක්වූ කල්හි සඞ්ඝසථවිරයන්වහන්සේ ඒ දිව්‍යපුත්‍රයාණන්ට ආමන්ත්‍රණය කොට විචාරනසේක් 'එම්බා දිව්‍යපුත්‍රයාණෙනි, දැන් තොප ලද්දවූ මේ දිව්‍යඓශ්වර්‍ය්‍යය දක පූර්ව ජාතියෙහි කළ කුශලයත් විචාරා තියම දක්[1] හෙයින් මා සිතට මහත් වූ ප්‍රීති උපන, අනිකුත් මා විසින් විචාරන දෙයෙක් ඇත, මේ ආශ්චර්‍ය්‍යමත් වූ දිව්‍යපුත්‍රයාණෙෝ "ස්වාමීනි, මේ ආකාශයෙහි කෙළවර යම් සේ නොපෙනේ ද එපරිද්දෙන් මාගේ කුශලයෙහි කෙලවරක් දක්ක නොහෙම්, ලොවුතුරා බුදුන් හැර සවර්ග මත්‍ර්‍ය පාතාලය යි යන තුන් ලොව ම මාගේ කුශලයෙහි කෙළවරක් දක්ක හෙන කෙනෙක් ඇද් ද. මාගේ කුශලයෙහි කෙළවරක් දකිතොත් ලොවුතුරා බුදුන් මිස කවුරු දක්ක හෙද් ද"යි කීහ. එසේ හෙයින් කියනලදී:

යථා'කාසො අනන්තාසො - යස්ස අන්තං න දිස්සති,
එවං මෙ පුඤ්ඤකම්මස්ස - අනන්තං[2] නො දිස්සතෙ මයා,

ලොකනාථං ඨපෙත්වාන - කො නු අඤ්ඤො ජගත්තයෙ,
සක්කුං මෙ චරිමං කොටිං - තං හොති ජිනගොචරං-යි.

මෙසේ දිව්‍යපුත්‍රයාණන් නී වචනය අසා භික්ෂූන්වහන්සේ සතුටු ව එතැන් පටන් ගම් නියම්ගම් රාජධානි ආදියෙහි සැරිසරා ඇවිදිමින් දුටු දුටු මනුෂ්‍යයන්ට ඒ දිව්‍යපුත්‍රයාණන්ගේ දිව්‍ය සම්පත්තිය වර්ණනා කොට කියා බොහෝ දෙනා දනාදි වූ කුශලධර්මයෙහි යොද වදළසේක. එබැවින් මෙසේ මහත් ආනුභාව ඇත්තාවූ දනය දැහැමෙන් ලද්දවූ අනුන් සන්තක වස්තුවෙන් හෝ එසේ දැහැමෙන් ලද්දවූ තමා සන්තක වස්තුවෙන් හෝ ප්‍රියවචනයෙන් අනුන්[3] සමාදන් කරවා හෝ දන්දිය යුත්තේ මය. කියන ලදුයේ මැයි:

ධම්මෙන ලද්ධං පරසන්තකං'වා - තථෙව ලද්ධං සකසන්තකං[4]'වා,
සමාදපෙත්වාන පරම්පි තෙන - දදෙය්‍ය දනං පචුරානුභාවං-යි.

මේ මෙහි දෙවන
තිස්ස සාමණේර වස්තුව ය.

තව ද මෙහි තුන් වන ගොළ උපාසක වස්තුව නම් කවර යත්. එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු. කෙසේ ද යත්:

මෙම ලඞ්කාද්වීපයෙහි රුහුණු ජනපදයෙහි ගොළුමුහුද සමීපයෙහි ගොළු ගම ය යි ප්‍රසිද්ධ වූ මහ ගමෙක් විය, එහි වසන උපාසකයකුහට මඳක් මිටි හෙයින් ගම්වැස්සෝ ගොළුයාය යි කියති, ඒ උපාසකයෝ ශ්‍රද්ධාවන්තයහ, බුදුසස්නෙහි ඉතා

1. දන්නා - D
2. අනන්තා - ම. අන්ත - KL
3. අනුන් සන්තක ව - ACDJ
   අනුන් සන්තක - GHKL
4. පරසන්තකං - ABDEJ

Non-Commercial Distribution

ප්‍රසන්නයහ, දනපති ව දන් දෙති, එක් දවසෙක බුධපූජාවට මුහුද අස ඇවිද මල් කඩති. එකල පුවඟුදිවයින සිට සහ දෙළොස් දෙනකුන්වහන්සේ මුහුදුපිට ආකාශයෙන් ඇවිත්[1] එක් රුක්ක් මුල සිට සිවුරු ගැටගන්වන සේක, ඒ උපාසකයා භික්‍ෂූන්වහන්සේ දක පහන් සිත් ඇති ව සමීපයට එළඹ පසඟ පිහිටුවා වැඳ "ස්වාමිනි, මේ ගම අසුවල් වීදියෙහි සිඟන්ට පාසුය"යි[2] කියා තුමූ පළමුකොට තමාගේ[3] ගෙදෙරට පැමිණි කල්හි සඞ්ඝයා වහන්සේ වැඳ පාත්‍රය ගෙන ඉන්ට සලස්වා උතුම් වූ නොයෙක් වර්‍ගයෙහි අවුළු හා නොයෙක් සූපව්‍යඤ්ජනයෙන් යුක්ත වූ අහර වළඳවා ඉක්බිති ඒ ගොළ නම් උපාසකයා භික්‍ෂූන්වහන්සේ සමීපයෙහි එකත්පස් ව හිඳ "ස්වාමීනි, ගැත්තවුට අනුග්‍රහ කොට නිරන්තරයෙන් මාගෙන් ම අහර පිළිගත මැනවැ"යි ආරාධනා කෙළේය. භික්‍ෂූන්වහන්සේ ආරාධනා නොගිවිසිනා[4] සේක, ඉක්බිති උපාසක 'ස්වාමීනි, මාගෙන් ලහබත් අටක් දෙමි, මට කරුණා කළ මැනවැ"යි ආරාධනා කෙළේය, භික්‍ෂූන්වහන්සේ 'එසේ වී නම් සමීපවිහාරයෙක භික්‍ෂූන්ට[5] දෙව'යි වදළ සේක, එකල උපාසකයා 'ස්වාමිනි, තුඹවහන්සේලා නිරන්තරයෙන් වැඩ ඉන්නා තැන භික්‍ෂූන්වහන්සේට ම දන් දෙන්නා කැමැත්තෙමි"කී කල්හි මුයෙන් නොබැනීමෙන්[6] ඉවසූසේක. ගොළ උපාසකයා[7] ආරාධනා ඉවසූ බව දන තමන්ගේ නමින් ලහ කප්පවා භික්‍ෂූන්වහන්සේ අතට දුන්නේය. භික්‍ෂූන්වහන්සේ ඒ ලහ ගෙන පුවඟුදිවයිනට ගොස් පැවිදි පන්තීන් භික්‍ෂූන්වහන්සේට පමුණුවා අවදෙනකුන් වහන්සේ නිරන්තරයෙන් එනසේක. ඉක්බිති එක් දවසෙක ගොළ උපාසකයෝ තමන්ගේ භාර්‍ය්‍යාව[8] කැඳවා[9] 'එම්බා සොඳුර, ආර්‍ය්‍යයන්වහන්සේ වැඩි කල අප්‍රමාද ව දන් දෙව"යි විධාන කොට කිසි කටයුත්තක් නිසා අනික් ගමකට ගියහ, ඉක්බිති උන්ගේ භාර්‍ය්‍යාවෝ ගොළ උපාසකයන්ගේ වචනය අසා භික්‍ෂූන්වහන්සේ ආ කල්හි දන් පිළියෙල කොට වළඳවා පසඟ පිහිටුවා වැඳ එකත්පස් ව සිට 'ස්වාමීනි, ඇමදෙනාවහන්සේ නිරන්තරයෙන් වසන්නේ කොයි ද'යි විචාළහ[10]. එබස් අසා භික්‍ෂූන්වහන්සේ කිසිවකුත් නොකියා ම පලා ගොයින් එතැන් පටන් 'අප වසන තැන් විචාරති, මුන්ට මින් ප්‍රයෝජන කිම් ද"යි කියා නැවත නොවැඩිසේක්. දෙවන දවස් ගොළ උපාසකයෝ "ආර්‍ය්‍යයන්වහන්සේ කුමක් පිණිස නොවැඩිසේක් ද"යි භාර්‍ය්‍යාවන් අතින් විචාළහ, එකල්හි උඹ නමන් විචාළ සැලැස්ම කියා මා කීයේ මෙතෙක් ම ය, ඒ වචනය නිසා නොවැඩිය යි සිතමි' කීහ, ගොළ උපාසකයෝ එපවත් අසා තමන්ගේ භාර්‍ය්‍යාවන්ට බැන දෙඩා ශොකයෙන් වෙහෙසී "දන් මෑ නිසා මාගේ ආර්‍ය්‍යයන්වහන්සේ දක වැඳ පුද දනක් දීගන්ටත් නැතැ"යි නොයෙක් විලාප[11] කියා හඬමින් දවස් යවති, භික්‍ෂූන්වහන්සේ ඒ කාරණය දන ඒ උපාසකයා හට අනුග්‍රහ පිණිස දවස් පතා ලහ ගෙන ගොළ උපාසකයන්ගේ[ම][12] ගෙට වඩිනාසේක[13].

---

1. අවුත් - BCGH
2. පාසු වනැ යි - C
3. තමන්ගේ - BDEGHKL
4. නොගිවිසි - BDEHKL ස.
5. භික්‍ෂූන්වහන්සේට - KL
6. නොබිනීමෙන් - BCGHKL
7. උපාසකයෝ - පිටපත් හැම
8. භාර්යාවන් - BGHJKL
9. ගෙට කැඳවා - BGHKL
10. කීහ - BGH
11. ප්‍රලාප - ABCDEGHJKL
    විලාප - මුද්‍රිත හැම
12. උපාසකයන්ගේ - පිටපත් හැම
13. වඩනාසේක - BGH

Non-Commercial Distribution

එතැන් පටන් ඒ භාර්‍යාවන් හා ගොළ උපාසකයෝ දන් දෙන්නාහු බොහෝ කාලයක් ගිය කල මැතභාගයෙහි තමන්ගේ ගෙයි වස්තු නිමා[1] ගිය හෙයින් නැවු නැඟී ගොසින් වෙළෙඳම් කොට ගෙන ඇවිත් දන් දෙමි සිතා භාර්‍යාවන් කැඳවා "ආර්‍යයන් වහන්සේට දෙන දන් අඩු නොකොට දෙව"යි දන්[2] විධාන කොට වෙළඳුන් හා එක් ව නැවු නැඟී නික්මුණාහ, ඒ නැව සත් දවසක් සැප සේ ගොස් මුහුදු මැද මහසුළං පැහැර නැව දියෙහි ගිලිණ, එහි සියලු මනුෂ්‍යයෝ ම මස් කැසුප් ආදීන්ට ගොදුරු වූහ, ඒ ගොළ නම් උපාසකයා විවරක් මුහුදු පීනා පසු බට වූ[3] වීර්‍ය්‍ය ඇති ව පීනාගත නොහී දියෙහි ගිලෙන්ට[4] වන. ඒ ක්ෂණයෙහි පුවඟු දිවයින වසන [5]සඞ්ඝස්ථවිරයන්වහන්සේ දිවසින් සමුද්‍රය බලනසේක් ගොළ උපාසකයන් දියෙහි ගිලෙන්නා දක භික්ෂූන්වහන්සේට ආමන්ත්‍රණය කොට 'එම්බා, තමන් ඇමගේ උපාසකයෝ දියෙහි ගිලෙති. රැකගන්ව'යි කියා රහත් සාමණේර කෙනකුන් වහන්සේට භාර කළසේක, ඒ සාමණේරයන් වහන්සේ ඍද්ධිවේගයෙන් එතැන්හි ගොස් ගොළ උපාසකයන් ගෙනවුත් පුවඟු දිවයින් භොජන ශාලාවේ ඉන්ට සැලැස්වූසේක.

බොහෝ සේ ශක්‍රදෙවේන්‍ද්‍රයෝ පුවඟුදිවයිනට ඇවිත්[6] භික්ෂූන්වහන්සේ වඳිති, ඒ භික්ෂූන්වහන්සේ සමීපයෙහි බණත් අසති, එදවස් ශක්‍රදෙවේන්‍ද්‍රයෝ තමන්ගේ දෙකෙළ පනස් ලක්ෂයක් දෙවඟනන් හා ද්‍රවිසි කෙළලක්ෂයක් පමණ දිව්‍යනාටකයන් ඇතුළු ව මහත් වූ දිවසෙනඟ පිරිවරා තව්තිසාභවනයෙන් ඇවිත්[7] භික්ෂූන්වහන්සේට පූජා කොට පසඟ පිහිටුවා වැඳ පිළිසඳර කථා කෙරෙමින් එකත්පස් ව උන්හ, මෙසේ ශක්‍රදෙවේන්‍ද්‍රයන් මහත් වූ දිවසෙනඟ පිරිවරා සර්වාභරණයෙන් සැරහී තමන්ගේ ශරීරාලොකයෙන් දශදිගන්තරය එකාලොක කොට බබුළුවා එන්නා දක ගොළ උපාසකයෝ භයින් ගෙට වැද ගෙයි දෙර වසාගෙන සිටියාහ.

එකල සාමණේරයන්වහන්සේ "මහරජ, ගොළ උපාසකයන් පළමු දුටු දැ'යි විචාළසේක, සක්දෙවු රජ්ජුරුවෝ පළමු නුදුටුම්හ යි කීහ. ඉදින් මහරජ දක්නා කැමැත්තා නම් ඒ උපාසකයෝ මෙතැනමය යි කියා සක්දෙවු රජ්ජුරුවන්ගේ මෙහෙවරින් ගොළ උපාසකයන් කැඳවාගෙන ඇවිත් සක්දෙවු රජ්ජුරුවන් දක්වූසේක, ඉක්බිති සක්දෙවු රජ්ජුරුවෝ ගොළ උපාසකයන් හා සමඟ පිළිසඳර කථා කොට 'එම්බා ගොළ උපාසකයෙනි, තොප දන්පින් කෙරෙති යි යන කීර්ත්තිඝොෂාව සියලු දෙවුලොව එක හෙළා පැතිර ගියේ වේ දැ"යි කියා නැවත කියන්නාහු:

ඉමං දනවිධිං ගොළ දසපාරමිධම්මතො,
පඨමං තත්ථාන සමාහටං - මුනිනා ලොකසාමිනා.

---

1. නිමා ව - CKL
2. දන් (නැත) - C
3. පසුබටුවාවූ - BDEGHKL
4. ගැලෙන්ට - GH
5. වසන (නැත) - KL, බෙ.ස.
6. අවුත් - BGH
7. නික්ම ඇවිත් - D

Non-Commercial Distribution

දයකා ජනු දෙවෙසු - උප්පජ්ජන්ති මහා යසා,
අනෙකසතමුබ්බෙධෙ - පාසාදෙ රතනාමයෙ,
නෙක දෙවච්ඡරාකිණ්ණෙ - උය්‍යාන පතිමණ්ඩිතෙ.

දයකා ගොළ සඟෙහසු - තාවතිංසෙ මනොරමෙ,
සක්කත්තම්පි ච කාරෙන්ති අබුධෙන අවාචියං.

ලභන්ති දනපතිනො - චක්කවත්තිසිරිම්පි ච,
සත්තරතන සම්පන්නං[1] - චතු දීපස්ස ඉස්සරං[2].

පදෙසරජ්ජං විපුලං ගොළ කුබ්බන්ති දයකා,
ධම්මාසොකනරින්දෙ'ව - තෙජවන්තො මහායසා.

යනාදීන් "එම්බා ගොළයෙනි,[3] දන් දීම නම් ලොකස්වාමි වූ බුදුරජාණන් වහන්සේ විසින් දශපාරමිතාවෙන් පළමුකොට පිරූ පාරමිතාවය. දන් දුන්නාහු සදිව්‍යලොකයෙහි වෙන වෙන ම දිව සත්රුවනින් විසිතුරු වූ වහසල් පවුරු පදනමින් හොබනාවූ උද්‍යාන විමාන පුෂ්කරණ්‍යාදීන් ප්‍රතිමණ්ඩිත වූ නොයෙක් යොදුන් සිය ගණන් උස ඇති දිව්‍යවිමානවල[4] එසේ ම නොයෙක් සියදහස් ගණන් දෙවඟනන් හා අපමණ දිවසෙනඟ පිරිවරා නිත්‍යසන්තොෂයෙන් පින පිනා දිවසැපත් විඳිනාහු මය. තව ද දන් පින් කළාහු වටින් සතිස්ලක්‍ෂ දසදහස් තුන්සිය පනස් යොදුන් පමණ ඇති චක්‍රවාටපර්වතයෙහි බාහිරාන්තය දක්වා අතුරු නොහැර විචිත්‍රාකාරයෙන් ගැවසී සිටගත් කනක රජත මාණික්‍යමය විමානමාලාවෙන් සමලංකෘත වූ[5] තවුතිසා දිව්‍යලොකයෙහි ශක්‍රදෙවෙන්ද්‍ර ව ඉපද දිව්‍යමය උයන් පොකුණු ගලතල කල්පවෘක්‍ෂ වහසල් පවුරු පදනමින් හා දහසක් සත්රුවන් දෙරටුවෙන් සැදුම්ලත් වෛජයන්ත නම් මහපායෙන් මුදුන් පැමිණියාවූ ශක්‍රභවනයෙහි වෙසෙමින් දෙදෙව්ලොව දිව්‍යසෙනාව පිරිවරා සතරවරම් මහරජුන් හා අටවිසි යක්සෙනෙවියන් විසින් ගන්නාලද ආරක්‍ෂා ඇති ව දෙකෙළ පනස් ලක්‍ෂයක් පමණ දෙවඟනන් හා සමඟ සූවිසිකෙළලක්‍ෂයක් දිව්‍ය නාටකයන්ගේ නෘත්‍ය ගීත වාදයෙන් පින පිනා මෙසේ වෙන වෙන වර්‍ණනා කරන් බුදු නොව කියා නිමවාගත නොහැකි අප්‍රමෙය්‍ය[6] දිවසැපත් විඳිමින් දිව්‍යරාජ්‍යය ද කරන්නාහු මය. තව ද දයකයෝ දෙදහසක් පමණ කොදෙව්[7] පිරිවරා මෙර සතරමුණ පිහිටි සතර මහද්වීපයට නායක ව සප්තරත්නයෙන් හෙබියාවූ චක්‍රවර්තිසම්පත්තියත් ලබන්නාහු මය. තව ද දයකයෝ ධර්මාශොක රජහු තමන් මහත් වූ යශොතෙජසින් යුක්ත ආඥචක්‍රවර්තී ව ප්‍රදෙශ රාජ්‍යයන් කරන්නාහු මය. තව ද දයකයෝ දැසි දස් ගවමහිෂාදින් හා ඇත් අස් රථ පත්ති සඞ්ඛ්‍යාත සෙනා සමූහයින් අනූන ව ඒ ඒ කුශලානුරූප අයවැය[8] නිධාන වසයෙන් දවස් පතා පවත්වනලද අපමන ධනසම්පත් ඇති ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණ

1. සම්පන්නා - පිටපත් හැම
2. ඉස්සරා - පිටපත් හැම
3. ගොළ උපාසකයෙනි - D
4. දිව්‍යවිමානමාලා -ADJ
   දිව්‍යවිමාන මාලාවෙන් ද - C
5. සාලංකෘත වූ - BEGHK
6. අනුමෙය - බෙ.ස.
7. කොදිව් - DEGH, සි.ම.
8. අවයව - A, ක.කි.කු.ම.අයවය -L ය.

Non-Commercial Distribution

වෛශ්‍යශූද්‍රාදි වූ ඒ ඒ වංශයෙහි මහාසාරවත් ව උපදනාහු මය. තව ද දයකයෝ පසේබුදු බවය අගසවු බවය මහසවු බවය යන උත්තමභාවයට[1] පැමිණ අග්‍ර වූ ලොකොත්තර සැපත් ලබන්නාහු මය. අප බුදුහු බාහිර වස්තු තබා ඇස් ඉස් මස් ලෙහෙ ආදි වූ ආධ්‍යාත්මික වස්තු දන් දී බුදුබවට පැමිණ දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණ යක්ෂ රාක්ෂස මනුෂ්‍ය අග්‍රශ්‍රාවක මහාශ්‍රාවක[2] ප්‍රත්‍යෙකබුද්ධ ආදි වූ හැමදෙනාහට උතුම් ව අග්‍රප්‍රාප්ත වූ සේක. එබැවින් දනය නම් ඇම දවස් ම සාදර ව[3] දියයුත්තේ ය, එම්බා යහළු, දනයෙහි මෙසේ උතුම් විපාක ඇති බව දන්නා තොප වැනි ශ්‍රද්ධාවන්තයන් විසින් යහපත නපුර ස්වල්පය යි නොසිතා සැපයෙන්[4] පමණක් ම දියයුත්තේය. කම්පල අදහා සාදර සිතින් දුන්නාවූ දනය ස්වල්ප වී නමුත් පරලොව උපමා නොකට හැකි අප්‍රමෙය්‍ය වූ විපාක දෙන්නේ මය යි දන නුවණැති සත්පුරුෂයන් විසින් දන් පින් නම් කළමනා දෙයෙක් මය"යි මෙසේ දනය නම් මහාඵල මහානිසංස වන බව දක්වා නැවත කෙළෙඹිපුත්‍රයාහට ප්‍රශංසා කරන්නා වූ ශක්‍රදෙවෙන්ද්‍රයෝ:

> තව දනමයා[5] ඝොසං[6] - පත්ථරිත්වා සදෙවකෙ,
> දෙවජීවහගගරධඩමහි - නිච්චං නච්චති මණ්ඩිතා.
>
> දත්වා දනවරං සම්ම - සීලවන්තෙ බහුස්සුතෙ,
> අතිත්ථිතො දෙවලොක - මාගච්ඡ මම සන්තිකං.

යනාදීන් "එම්බා ගොළයෙනි, තොපගේ දනප්‍රබන්ධය නිසා උපන්නාවූ කීර්තිඝොෂාව මිහිස්ලොව පැතිර උතුරුවා ගෙන දෙව්ලොව දක්වා නැඟී නාටිකාස්වරූපයෙන් සැරහී දෙවියන්ගේ ජිහ්වාග්‍ර නමැති රඟමඩලෙහි[7] අනවරතයෙන් නටා බස්නීය. එබැවින් ගොළයෙනි, සිල්වත් වූ බහුශ්‍රැත භික්ෂූන් වහන්සේ උදෙසා උතුම් වූ ප්‍රත්‍යයදනයන් දන් දී සියල්ලවුන්ගෙන් ප්‍රශංසා ලැබ දෙවුලොව මා සමීපයට නොපමා ව පලා එව"යි කීහ.

මෙසේ සක්දෙව් රජ්ජුරුවෝ ගොළ උපාසකයන්ට අවවාද කොට සාමණෙරයන් වහන්සේ කරා එළඹ "කුමක් පිණිස මේ උපාසකයෝ මෙතැනට අවු ද යි" විචාළහ. සාමණෙරයන් වහන්සේ "මහරජ, මේ උපාසකයා නැවු නැඟී දියෙහි ගිලෙන්නා දක මම ගොසින් කැඳවා ගෙන ආමි" සියල්ල ම කීසේක, එපවත් අසා සක්දෙව් රජ්ජුරුවෝ විශ්වකර්මයා කැඳවා "එම්බා දරුව,[8] තොප ගොසින් මුන්ගේ නැව පළමු පරිද්දෙන් තර කොට සත්රුවන් නැවින් මුන් කැඳවාගෙන ගොසින් නොපමා ව උන්ගේ ගෙදෙර ඇරලාලව"යි[9] කීහ, එබස් අසා විශ්වකර්මයා දියෙහි ගිලුණාවූ උන්ගේ[10] නැව තමාගේ ආනුභාවයෙන් දියෙන් ගොඩ නඟා සත්රුවනින් පුරා[11] ගොළ උපාසකයන් නැවට නංවා එදවස් ම උන්ගේ ගෙදෙර ඇරලා තමන්ගේ දෙව්ලොවට ම ගියහ. ගොළ උපාසකයෝ සත්රුවනින් පිරුණු ගෙයි වෙසෙමින් දන් දෙමින් බොහෝ කුශලසම්භාරයන් රැස්කොට ගෙන දෙවුලොව උපන්හ. ඒ දක මහජනයෝ බොහෝ කුසල් කොට දෙව්ලොව උපන්හ.

---

1. උත්තමාගමයට - C
2. මහාශ්‍රාවක (නැත) - ACJ
3. සාදර සිතින් - G
4. සැපවෙන - ස
5. දානමය - මුද්‍රිත හැම, ස.
6. ඝොසා - මුද්‍රිත හැම, ස.
7. රඟමඩුලෙහි - ADJ
8. දරුව (නැත) - ABDEJKL
9. ඇරලව යි - KL
10. උන් ගෙනා - B
11. පුරවා - B

Non-Commercial Distribution

මෙසේ දනය නම් දෙවුලොවට නැඟෙන හිනිපෙති[1] හා සමානය, මනොඥ වූ උතුම් දිව්‍යයානාවක් හා සමානය, දනය නම් දෙව්ලොවට යන රජ මහවතක් හා සමානය, එසේ හෙයින් පින්වත් සත්වයෙනි, නිරන්තරයෙන් දන්පින් කොට දෙව්ලොවට ගොස් උතුම් වූ දිව්‍යසම්පත් විඳින්ට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි:

එවං දනං සග්ගසොපානමග්ගං
දිබ්බං යානං භූසිතං චාරුමග්ගං
තස්මා හොන්තො දෙථ දනානි නිච්චං
ගන්ත්වා සග්ගං භුඤ්ජථස්සාරමග්ගං[2].

මේ මෙහි තුන්වන
ගොළ උපාසක වස්තුව ය.

නව ද මෙහි සතරවන පූවගන්ධදායිකා වස්තුව නම් කවර යත්. එහි පිළිවෙළ කතාව මෙසේ දතයුතු. කෙසේ ද යත්:

මෙම ලඞ්කාද්වීපයෙහි රුහුණුරට සප්පදුරු[3] නම් ඔය සමීපයෙහි එරාමණී[4] නම් වූ මහ ගමෙක්[5] වීය. ඒ ගම වසන ගැහැනියක් කිසි කටයුත්තක් නිසා අනුරාධපුරයට යෙමි යි බත්මුලක් ඇරගෙන යන්නී වේලා ආසන්නයෙහි අතරමඟ ගම් නැති වනමැදක වඩිනා රහත්කෙනකුන්වහන්සේ[6] දක "මේ වේලේ මුන්වහන්සේට සිඟන තැනෙක් නැත, මා අත බත්මුලෙක් ඇත, ඒ උන්වහන්සේට පිළිගන්වමි" සිතා තෙරුන්වහන්සේ සමීපයට එළඹ පසඟ පිහිටුවා වැඳ පාත්‍රය ගෙන බත් පාත්‍රයෙහි බහා "ස්වාමීනි, මඳක් මෙතැන්හි ම වැඩසිටිය මැනවැ"යි කියා කඳුරැළියකට බැස කොළ අතු කඩා ඇඳ තමන් ඇඳි කිලිටු දළකඩ වස්ත්‍රය[7] ශොධා ගෙනවුත් තෙරුන්වහන්සේට දුන්හ. තෙරුන්වහන්සේ ඒ වස්ත්‍රය ගෙන "මේ ස්ත්‍රී[8] මා යන නියාව දකීව"යි අධිෂ්ඨාන කොට ඒ ස්ත්‍රියට ප්‍රසාද උපදවනු පිණිස අහසට නැඟී රාජහංසයකු මෙන් වැඩිසේක. ස්ත්‍රී අහසින් වඩිනා තෙරුන්වහන්සේ දක ප්‍රීතින් හරිත ගාත්‍ර ඇති ව "සාධු සාධු, මා දුන් දනය ඉතා යහපතැ"යි සාධුකාර දි දී දෙහොත් මුදුනෙහි තබා ගෙන බල බලා සිටියාහ. ඒ ක්ෂණයෙහි ම ඒ කඳුරැළිය ආසන්නයේ එක්තරා රුකෙක වසන දිව්‍යපුත්‍රයෙක් ඒ ස්ත්‍රියගේ ශ්‍රද්ධාවිශෙෂය දක එක් කරඬුවෙක දිව්‍යවස්ත්‍ර බහා ගෙන "මේ අඩු නොවේව"යි අධිෂ්ඨාන කොට ඒ ස්ත්‍රිය අතට දී අන්තර්ධාන වීය, එකල ඒ ස්ත්‍රී කරඬු පිධානය හැර දිව්‍යවස්ත්‍ර දක "ආයර්‍යයන් වහන්සේට අද මා දුන් වස්ත්‍රයෙහි විපාක අද ම ලදිමි"[9] සතුටු ව මේ වස්ත්‍ර එබඳු ම ආයර්‍යයන් වහන්සේට දන් දී මමත් ප්‍රයොජන විඳිමි" සිතා "ආයර්‍යයන්

---

1. හිනිපෙති පෙළක් - BEGHKL
2. භුඤ්ජිසොපාරමග්ගං - පිටපත් හැම
   භුඤ්ජථස්සාරමග්ගං - පාලි. මුද්‍රිත හැම
3. සප්සඳුරු - ස.
4. එරාමණිය - ACJ
5. මහ (නැත) - BGH
6. රහතුන් වහන්සේ නමක් - C, රහත් තෙර කෙනකුන් වහන්සේ - KL, රහතුන් වහන්සේ - බෙ.ස.
7. දළ වස්ත්‍රය - BDEGHKL, ම.ස.
7. ඒ ස්ත්‍රී - BCDEGHKL
8. ලබමී - BGH

Non-Commercial Distribution

වහන්සේ මිඩියට අනුග්‍රහ නොට මෙතැන්හි වඩනාසේක්ව"යි කියා අඩගැහ. ඒ ක්ෂණයෙහි ආයස්කර නම් විහාරයෙහි වසන දෙලොස් දහසක් පමණ භික්ෂූන් වහන්සේ ඇවිත් ඒ ස්ත්‍රිය ඉදිරියෙහි පෙනුණුසේක, ඒ උපාසිකාවෝ භික්ෂූන් වහන්සේ දැක අතිශයින් ප්‍රසන්න වූ සිත් ඇති ව පසග පිහිටුවා වැඳ ඇමදෙනාවහන්සේට ම තුන්සිවුරට සෑහෙන පමණ දිව්‍යවස්ත්‍ර දන් දුන්හ. කෙතෙක් දන් දුනත් කරඬුවෙහි පිළී අඩු නොවන්නේ මය. ඒ ඇමදෙනා වහන්සේ පිළී පිළිගෙන වැඩි කල්හි ඒ ස්ත්‍රීතොමෝ එක් දිව්‍යවස්ත්‍රයක් ඇඳගෙන තමාගේ ගෙට ඇවිත් බොහෝ කුශල සම්භාරයන් පුරා එයින් ගොස් දිව්‍ය ලොකයෙහි නානාවර්ණ වස්ත්‍රාලංකාරයෙන් ප්‍රතිමණ්ඩිත වූ දෙළොස් යොදුන් පිළීවිමානයෙක උපන්හ. ඒ විමානයෙහි එකි එකී දිග සැටක් සැටක් බැගින් දෙසිය හතලිසක්[1] පමණ කප්රුක් පහළ විය, එකල්හි ඒ දිව්‍යස්ත්‍රී ඒ දිව්‍යවිමානයෙහි නොයෙක් දහස්ගණන් දෙව්[2] දෙවස්ත්‍රීන් පිරිවරා දිව්සැපත් වළඳන්නීය. මෙසේ ඒ ස්ත්‍රී අනාශ්‍රව මහතෙරුන් වහන්සේට සැදැහැයෙන් එක් බත්මුළක් හා තමා ඇඳි ථූල වූ දළ කිලිටු වස්ත්‍රය පමණක් දන් දී එදවස් ම දිව්‍යවස්ත්‍ර ලැබ අතිශයින් සන්තුෂ්ට වූ සිත් ඇති ව සර්වඥපුත්‍ර වූ සඞ්ඝයා වහන්සේට නැවත ඒ දිව්‍යවස්ත්‍ර දන් දී එම කුශලානුභාවයෙන් දෙව්ලොව උපන්නීය. එසේ හෙයින් කියනලදී:

සද්ධාය දත්වා පුටහත්ථමෙකං[3]
නිවත්ථවත්ථං මලිනං ච ථූලං,
භික්ඛුස්ස එකස්ස අනාසවස්ස
දිබ්බම්බරෙ සා තදහෙව'ලත්ථ[4].

දිබ්බානි වත්ථානි පුනා'පි එසා
දත්වාන දානං මුනිසාවකානං,
තස්සා'නුභාවෙන තතො චවිත්වා
නිබ්බත්ති සග්ගෙ පරමප්පතීතා[5]යි.

මෙසේ ඒ දිව්‍යස්ත්‍රිය දෙව්ලොව උපන් කල්හි උන්ගේ කුශලානුභාවයෙන් නානාප්‍රකාර උද්‍යාන විමාන කල්පවෘක්ෂ පුෂ්කරණ්‍යාදීන්[6] ප්‍රතිමණ්ඩිත වූ[7] මහත් දිව්‍යවිමානයෙක් පහල වීය. ඒ දිව්‍යවිමානයෙහි නොයෙක් දහස් ගණන් සුරසුන්දරීන් පිරිවරා නිත්‍ය සන්තොෂයෙන් පින පිනා මාසය කරන්නීය. ඒ බව ගාථාවෙන් දක්වන්නාහු:

තත්ථ'ච තස්සා'සි මහා විමානං
උබ්බේධතො ද්වාදස යොජනෙන,
තස්සා'නුරූපෙන විසාලවන්තං
දුස්සවහයං නෙක විරාගවන්තං.

1. සතලිසක් - BCEGHKL
2. දෙව (නැත) - AGH, ස.
3. පුටහත්ථමත්තකං - මුද්‍රිත හැම. ඵ.
4. තදහෙව ලද්ධා - JKL, පාලි.
5. පරමප්පතීතා - BD, ක.කි.සැ.ම. පාලි.
6. පුෂ්කරණීන් - KL
7. විරාජමාන වූ ප්‍රතිමණ්ඩිත වූ - B

Non-Commercial Distribution

ථම්භාදි ගොපාණසි ආදිකෙසු
භූමීසු භිත්තිච්ඡදනෙසු තෙසු,
අන්තො[1] සමන්තා ඡදනස්ස තස්ස
නානා විරාගම්බරලඞ්කතානි.

තථෙ'ව වත්ථෙහි විභත්තවත්ථා[2]
ගබ්භානුමන්තො[3] සයනාසනානි,
පාවාර පච්චත්ථරණත්ථතා තෙ
භාසන්ති නිච්චං රමණීය රූපා.

නානා විරාගධජ පන්තිකෙහි
මුත්තා මණී ලම්බිත කණ්ණිකෙහි,
වාතෙරිතා කිංකිණී රාවකෙහි
අමන්ද නන්දාවහමාසි නිච්චං.

සා දෙවකඤ්ඤා කනකා'වභාසා
පයොධරා තාරහාරාභිරාමා,
බිම්බාධරා කඤ්චන වලලීලා
මුඛම්බුජා නෙත්තමධුබ්බතෙහි.

විචිත්තවත්ථාදි විභූසිතංගී
සුගන්ධ කඤ්ඤා පතිසෙවිතංගී,
භාසන්තමාලා ජිත උත්තමංගි
පභාසි සා දෙවකඤ්ඤා සමංගී.

අනන්ත සම්පත්ති සමංගිභූතෙ
විසාල පාසාද වරෙ සුරම්මෙ,
නච්චෙහි ගීතෙහි ච මොදමානා
විභාසි එවං සුචිරං දිවස්මිං.

යනාදීන් මෙසේ ඒ දිව්‍යස්ත්‍රිය දෙවුලොව උපන් කල්හි පූර්වජාතියෙහි කළ කුශලය ප්‍රකාශ කරනු පිණිස උන්ගේ කුශලානුභාවයෙන් දෙළොස් යොදුන් උස හා ඊට සුදුසු වූ දිග පුළුල ඇති නානාවර්ණ වස්ත්‍රයෙන් සැරහුණාවූ මහත් පිළී විමානයෙක්හි[4] උපන. ඒ විමානයෙහි බිම ඉන්ද්‍රනීල මාණික්‍යමය වර්ණ වස්ත්‍රයෙන් ශොභමානය. ටැම් හා භිත්ති ගොණෑස් සෙවෙනි ආදි වූ සියල්ල ද ඡදනයෙන් ඇතුළත්හි ද නානා වර්ණ වස්ත්‍රයෙන් සාලඞ්කෘතය. එසේ ම නානා වර්ණ වස්ත්‍රයෙන් විභාග කරන ලද්දවූ වෙන වෙන ගබඩා පන්තීන් හා ඒ ඒ ගබඩාවල

1. අන්තො - J, බෙ.
2. විභත්තවත්ථං. - BCDG
   විභත්තවත්ථ - AEH
   විභත්තවත්ථා - බෙ.ස.
3. ගබ්භාසමන්තො - KL
4. පිළී විමානයෙක් - මුද්‍රිත හැම. ස.

Non-Commercial Distribution

දිව්‍යමය තෙලිසම් පිඩාම් ඇතිරි ආදීන් සරහන ලද්දවූ ශයනාසනයෝ අතිශයින් සිත්කලු ව බබළති. තව ද නානාවර්ණ ධජ මාලාවන්[ගෙන්][1] ද මුක්තාමාණික්‍යාදි වූ පෙති පතරින් හොබනා ලම්බමාන කර්ණිකාවන්ගෙන්[2] ද පලග ලෙල දෙන්නාවූ මිණි කිකිණිදැල්හු ද මඳ මඳ පවනින් කම්පා කරනලද්දහු නිරන්තරයෙන් සන්තොෂ එළවති. මෙසේ මනහර දිව්‍ය විමානයෙහි ඒ දිව්‍යස්ත්‍රී නොමෝ රන්කඳක් සේ බබළමින් මහත් සිත්කලු මුත්හරක් පැලඳ දිව්‍යමය කොකුම් ගල්වනලද පයොධර හාරයකින්[3] හා බිඹුවැල දෙකක් බඳු අධර යුග්මයකින් ශොභමාන ව තමාගේ මුඛ නමැති රත්පියුමට බට නීලභෘඞ්ගරාජයන් දෙදෙනකු බඳු නෙත්‍රයුග්මයකින් යුක්ත ව රන්ලියයක්[4] සේ බබළමින් විචිත්‍ර වස්ත්‍රාලඞ්කාරාදීන් සැරහී සුවඳ කවනලද අබතලකල්කාදියෙන් ඔප්නහනලද මුඛාදි අවයවයන් ඇති ව සුවඳ මල්දමින් බබළන උත්තමාඞ්ගයෙන් යුක්ත ව පිරිවර දෙව්ගනන් මැද බබළමින් මෙසේ අනන්ත සම්පත්තීන් සමෘධ ව මහත් වූ ඒ ප්‍රාසාදයෙහි නොයෙක් සිය දහස් ගණන් දෙව්ගනන් හා දිව්‍යපුත්‍රයන්ගේ නෘත්‍ය ගීත වාදයෙන් සන්තුෂ්ට වෙමින් බොහෝ කාලයක් වාසය කරන්නීය.

මේ මනුෂ්‍ය ශරීරය නම් අස්ථිරය, ක්ෂණක්ෂණයෙහි බිඳෙන්නාවූ දියබුබුලක් හා සමානය, බාල අවස්ථාවෙහි පටන් මනුෂ්‍යයන් උපදවා ගත් මුක්තාමාණික්‍යා දි වූ වස්තූහු නම් ඒකාන්තයෙන් නස්නාහුය, දෝතින් ගත් දියත්තක් හා සමානය, ස්වර්ගී සම්පත්තිය හා නිර්වාණසම්පත්තිය ඒකාන්තයෙන් මධුරය යි දන දනාදි වූ කුශලධර්මයන් පිරීමෙහි[5] උත්සාහ කරන්නේ මය. එසේ හෙයින් කියනලදී:

ඤත්වාන දෙහමථිරං ඛණභඞ්ගුරන්ති
සම්පත්ති නාම මනුජස්ස ච නස්සතීති,
සග්ගාපවග්ග විභවං මධුරන්ති එවං
දනාදි නෙක කුසලෙසු යතෙය්‍ය ධීරො-යි.

මේ මෙහි සතරවන
පුටභත්තදායිකා වස්තුව ය.

තව ද මෙහි පස්වන අඤ්ඤතරකුමාරිකා වස්තුව නම් කවර යත්. එහි පිළිවෙළ කථාව මෙසේ දතයුතු. කෙසේ ද යත්:

මෙම ලංකාද්වීපයෙහි මහවැලිගඟ සමීපයෙහි[6] සේරු නම් විලට නුදුරු තැන කිරි නම් ගමෙක් වීය, එගම වසන්නාවූ බොහෝ සම්පත් ඇති කුලපුත්‍රයෙක් එක්තරා කුමාරිකාවක් තමහට[7] පාදපරිචාරිකා කොට වාසය කරනුයේ දනාදි වූ කුසල් කරන්නේය, එසමයෙහි මහදිඹුලා වෙහෙර සමයින් සමඝ ආර්යවංශ සූත්‍රයෙන්

1. මාලාවන්ගේ ද - පිටපත් හැම.
2. කර්ණිකාවන්ගේ ද - පිටපත් හැම
කර්ණිකාවන්ගෙන් ද ශොභාමානය - ම.
3. හරකින් - BGH
4. රන්ලියක් - C
5. පිරීමෙහි ම - CDGHKL
6. සමීපයෙහි (නැත) - BDGHKL
7. තමහට (නැත) - BGH

Non-Commercial Distribution

ධර්මදෙශනා පවත්නේය යි එවිත් සතර පස් යොත්හෙක මනුෂ්‍යයෝ රුප්ව මහත් වූ පූජාසත්කාර පවත්වති. එකල්හි කිරිගම්[1] මනුෂ්‍යයෝ බණ අසනු පිණිස ගමනට සැරහී සිටියහ. ඒ උපාසකයා ද තමාගේ භාර්‍ය්‍යා වූ කුමාරිකාව ළහට කැඳවා "සොඳුර, මේ බණ අසන්ට යන්නාවුන් හා සමඟ ගොසින් බණ අසා සඞ්ඝයා වහන්සේට උපස්ථාන කොට එනතෙක් උකටලී නොව වාසය කරව"යි කියා ගෙය හා කෙසි යතුරු පාවාදී බණ අසන්ට යන්නවුන් එක් ව තල සාල් පැණි සකුරු ආදි වූ දනෝපකරණ ගෙන්වා ගෙන මහදිඹුලා නම් විහාරයට ගියාහ. මෙසේ ඒ කුමාරිකාවෝ ඔවුන් හැම බණ අසන්ට ගිය කල්හි සිතන්නාහු "මේ ගම සියලු මනුෂ්‍යයෝ ම මා රඳවා බණ අසන්ට ගියහ, ධර්මය නම් ඒ හැමදෙනාට මතු ප්‍රිය වන්නේ නොවෙයි, මටත් යහපත් මය, සවර්ගමොක්ෂ සම්පත්තිය නම් ඒ ඇමට ම[තු][2] ප්‍රිය වන්නේ නොවෙයි, මටත් ප්‍රිය වේ[3] මය, පෙර මම ඉඳුරා කුශලයක් කොට ගත නුහුණු හෙයින් අල්පේශාක්‍ය කුලයෙහි උපන්මි, දන් මා මහණ වන්ට නපුරු ද"යි සිතා සසර කළකිරුණාවූ සිත් ඇති ව ධර්මයෙහි කරනලද ආදරසම්භාවනාවෙන් තමන්ට යහළු ව ඉන්නා එක් ස්ත්‍රියක කැඳවා කෙසියතුරු හා ගෙය දෙර උන්ට පාවාදී මුහුදු කෙළවර යමින් සිට සකරාල[4] ගංමුව දෙරින් එතෙර ව කෙළානරු නොටට පැමිණියහ. එකල්හි ඒ තොට ඔරු අහුළ නැත, ඒ තොට වනාහි ඉතා පළල[5] ගැඹුරුය, එසේ වූ තොට ඒ කුමාරිකාවන්ට ළං දෙයක් මෙන් ද නොගැඹුරු දියක් සේ ද පෙනුණේය, කුමාරිකාවෝ ගොඩ සිට ඉනකඩ මිරිකා ඇඳ තමා ශ්‍රද්ධාසම්පන්න හෙයින් බණ අසන්ට යෙම් යන ප්‍රීතිප්‍රමෝදයෙන් මුහුද පිහිනන්ට පටන්ගත්හ. එකල්හි තද සුළඟින් මුහුද උත්පාතික ව මහරළ නැඟෙන්ට වන, ඒ කුමාරිකාව මහ රළපතර අතුරෙහි පීනන්නා දක එක් මෝරෙක් ඇවිත් ගොදුරක් ලදිම් මැද්දෙන්[6] ඩැහැ ගෙන මළ සම විවරකුත් සිඳගත නුහුණුයේය, මෙසේ ඒ මෝරා දෙතුන් විටෙක ඇවිත් ඩැහැත්[7] කිසිවක් කොටගත නුහුණයේය, ශරීරයෙහි ඡවි මාත්‍රයකුත් විවර්ණ නුවූයේය, ධර්මානුභාවය ඉතා ආශ්චර්‍ය්‍ය මැයි, නොසිතිය හැක්කේ මැයි, ධර්මය[8] හැසිරෙන්නවුන්ට මෙලෝ පරලෝ දෙක්හි ම භයෙක් නැතිගැන්මෙත් නොවන්නේය, පරලොව සවර්ගමොක්ෂ සම්පත්තියටත් පමුණුවන්නේ මැයි. එසේ හෙයින් කියනලදී:

ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං[9]
ධම්මො සුචිණ්ණො සුඛ'මාවහාති,
එසානිසංසො ධම්මෙ සුචිණ්ණෙ[10]
න දුග්ගතිං ගච්ඡති ධම්මචාරී-යි.

මෙසේ ඒ කුමාරිකාවෝ සැප සේ මුහුදින් එතෙර ව ගොඩ නැඟී මහදිඹුලා වෙහෙරට ගොස් ඒ විහාරයේ දාගැප් මහබෝ වැඳ සඞ්ඝයා[11] වැඳ පන්සිල්

1. ගිගිරිගම - B
2. ඇමට ම - පිටපත් හැම, බෙ.ස.
3. ප්‍රිය වන්නේ මය - GH
4. සරාලු - G, පකරාලු - KL
   කසරාල - ක.කි.සද.බෙ.
   සක්කගංගා - පාලි
5. පළලය - C, ම.
6. මද්දෙන් - ABDGHKL
8. ඩැත් - BCE, මුද්‍රිත හැම, ස.
9. ධර්මයෙහි- BCGHKL
10. ධම්මචාරී - පිටපත් හැම
10. ධම්මො සුචිණ්ණෝ - K, පිටපත් හැම
11. සංඝයාවහන්සේ - BEGHKL

Non-Commercial Distribution

සමාදන් ව පිරිස් කෙළවර සිට දෙහොත් මුදුනෙහි තබාගෙන කිසි පරක්කුවක් නැති ව බණ අසන්නාවූ කුමාරිකාවෝ කෙලෙස් නමැති අවුල් දල සිඳහැර දහසක් නයින් ප්‍රතිමණ්ඩිත වූ සෝවාන් පලයට පැමිණියහ.

ඉක්බිති ඒ කුමාරිකාවෝ තුන්යම් රාත්‍රියෙහි සිට බණ අසා ඒ රාත්‍රිය පහන් වූ කල්හි නැදිමයිලන් හා තමන්ගේ ගෙහිමියාණන් දක තමන් ආ සැලැස්ම විස්තරවශයෙන් කියා සඞ්ඝයාවහන්සේට වැඳ තමන්ගේ නැසියන් හා සමඟ ගමට ගියාහ. එතැන් පටන් ඒ කුමාරිකාවෝ කායගතාසති කර්මස්ථාන මෙනෙහි කෙරෙමින්[1] ගිහිගෙයි ඇල්මක් නැති ව වෙසෙති. ඉක්බිති එක් දවසෙක තමන්ගේ ගෙහිමියාණන් ඉස පැළඳි මල්දමක් මුදන්නාහු ඉස උෂ්ණයෙන් මලානික ව ඉස ධාදියෙන් කිලුටු ව දුර්ගන්ධ වූ මල්දම දැක අනිත් ලකුණු උපදවා මල්දම ගෙහිමියාණන්ට දක්වා කියන්නාහු ස්වාමීනි, සුවඳ සහිත මේ මල්දම මෙසේ මලානික ව දුර්ගන්ධභාවයට පැමිණියේ ද එපරිද්දෙන් ම මේ ශරීරය ද බාහිර වූ සඳුන් සුවඳ ආදිය ඇඟ තුළා නො නා තිබුයේ වී නම් මීටත් වඩා දුර්ගන්ධය, මෙසේ වූ දුර්ගන්ධ වූ ශරීරය අඥාන වූ ලොකවාසී සත්ත්වයෝ ශරීරයෙහි විද්‍යමාන ස්වභාවය නො දන්නාහු මය.[2] ස්වාමීනි, අසූ කුලයෙහි පණුවන්ට වාසස්ථාන වූ මේ ශරීරයෙහි අඩුතුන්කෙළක් කෙශයෝය. නවානුදහසක් රෝමයෝය, විසිනියපොත්තෝය, දත් දෙතිසෙක, සියල් සිරිරු වසා සිටි[3] සමය, නව සියයක් මස් පිඬුය, නවසියයක් නහරය, තුන්සියයක් ඇට සහළය, ඇටකුළල් පුරා සිටි ඇටමිදුළුය, හදවතෙහි වැතිර සිටි වකුගඩුය, දෙතන මැද පිහිටි හෘදයමාංසය, හදමසට දකුණු භාගයෙහි සිටි අක්මාවය, මස්පිට සිටි දළබුවය, උදරය නිසා[4] සිටි බඩදිවය, හදමස් අක්මා මතුභාග පිළිසොයා සිටි පපුකැණය. දෙතිස්රියන් අතුණු වැටියය, අතුණුබද අතුණුබහනය අතුණුවැටියෙහි සිටි[5] උදරියය, ගුදපියස්හි පිහිටි අහරමලය, හිස්කබල පිරුණු හිස්මුලය, පිත්කොෂයෙහි පිරී සිටි පිතය, උගුරුපිරුණු ශ්ලෙෂ්මා ය, කුණු ඇඹුල් මඩක්[6] බඳු වූ පූයාය, ළමැද ලොහිතාසයෙහි සිටි ලෙහෙය නවානුදහසක් ලොමකූපයෙන් බස්නා සෝදියය, සම් මස් දැතුරෙහි සිටි මෙදතෙල ය, ඇස්වල පිරී සිටිනා කඳුළුය, විසිරී[7] පවත්නා වුරුණු තෙලය, දෙකපොල් බිත්හි උපදනා කෙළය, දෙනාසාපුටයෙහි පිරී සිටිනා මුකුණුය, අටසියයක්[8] ඇටසන්ධියෙහි සිටිනා සඳමිදුළුය, විත්පළා පිරුණු දියටනුය යි[9] මෙසේ මෙකී දෙතිස්කුණු කොටසින් යුක්තයහ. මේ දෙතිස්කුණු කොටසින් අන්‍ය වූ මුක්තාමාණික්‍යාදි ධනයෙක් නැත. මේ ශරීරයෙහි අනික් සුගන්ධයෙකුත් නැත; මේ සියලු ශරීරය කුණුයෙහි තුබූ කුණුය, මේ ආත්මය කුණපයෙහි උපන්නේය; මේ කුණු ශරීරය කුණෙහි ම ඇලුම් ඇත්තේය; මේ තෘෂ්ණාව හා මොහයාගේ ආනුභාව මහත්තත්වය ඉතා ආශ්චර්යයෙක් මැයි. මේ ලොකයෙහි කපුටුවෝය, බල්ලෝය, කැණහිල්හුය, නිලමැස්සෝය යන මොනු

1. කිරිමෙන් - ක.කි.ඤ.ඛ.
2. නොදන්නාහුය - BEH; නොදන්නාහු මය -KL
3. සිටිනා - B
4. උදරිය වසා - KL
5. සිව් - මුද්‍රිත හැම
6. කුණු කැකඹුල් මඩක් - BEGHKL
7. විරි - ම.
8. අසූ සියයක් - BEGHKL
9. එක්සිය අසූවක් -ම.
දියටනු සය යි - ACDJ

Non-Commercial Distribution

සුගන්ධය යි යන දෙයක් නොකැමැතියහ, කුණපගන්ධයෙක් ඇත්නම් ඒ ආඝ්‍රාණය කොට ඇවිදිති. මේ දෙතිස් කුණප කොට්ඨාසයෝ වෙන වෙන ම පටික්කූලයහ. මෙසේ පිළිකුල් වූ ශරීරය මොහ නමැති පටලයෙන් නුවණ නමැති ඇස් වැසුණාවූ අඥාන අන්ධජනයෝ සිත්කලු යහපත් දෙයෙකැ යි සිතති. ධෛර්‍ය්‍ය වීර්‍ය්‍යයෙන් යුක්ත වූ නුවණැති උත්තමයෝ මේ ශරීර සවභාවය සිතින් සලකා තමන්ගේ ස්වසන්තානය එබඳු කුණපයෙහි නොඅලවා නිවන් කරා මෙහෙයනලද සිත් ඇති ව ඇමකල්හි ම නිර්වාණාභිමුඛ ව සීල නමැති වලින් ඉස් ශොධා නහා සිවුපිරිසුදු සිල් නමැති සුවඳ විලෙවුන් ගෙන ශ්‍රධා නමැති මල් පැළඳ නිවන් නමැති ශාන්ති පුරයට පැමිණෙන්නාහු මය. ඉදින් මම නුඹ වහන්සේ අතින් අවසරයක් ලදිම් නම් අද ම මහණ වෙමි; මට මහණ වන්ට අභිප්‍රාය ඇතැ යි කීහ. එසේ හෙයින් කියන ලදී:

වායසා ච සුවානා ච - සිගාලා මක්ඛිකා තථා,
සුගන්ධං නෙව ඉච්ඡන්ති ඉච්ඡන්ති කුණපං'ච තෙ.

පච්චෙකං ච පටිකකූලං - බත්තිංසකුණපං ඉදං,
රමණීයන්ති මඤ්ඤන්ති - බාලා මොහෙන පාරුතා.

ධීරා සම්පන්න මෙධාවී[1] - තං සභාවං විචින්තිය,
නොපලිම්පන්ති අත්තානං - නිබ්බාණාභිමුඛා සදා.

නහාත්වා සීලරහදෙ - සීලගන්ධ විලෙපිනො
සධාපුප්ඵං පිළන්ධිත්වා - යන්ති සන්තිපුරං ඉතො.

ඔකාසං චෙ ලභිස්සාමි - අහං හො තව සන්තිකා,
අජ්ජේ'ව පබ්බජිස්සාමි - පබ්බජ්ජා මම රුච්චති - යි.

මෙසේ ඒ කුමාරිකාවෝ තමන්ගේ ගෙහිමියාණන්ට චිත්‍රකථී[2] වූ ධර්මකථිකයාණ කෙනකුන් සේ "මේ ශරීරය නම් මුත්තකින් මැණිකකින් රතකින්[3] රිදියකින් කළ දෙයෙක් නොවෙයි, කෙසින් ලොමින් නියෙන් දතින් සමින් මසින් නහරින් ඇටින් ඇටමිදුලෙන් වකුගඩුවෙන් හදවතින් අක්මාවෙන් දලබුවෙන් උදරියෙන් බඩදිවින් පපුකැණින් අතුණින් අතුණුබහනින් පැසුණු අහරින් නොපැසුණු අහරින් පිතින් සෙමින් පූයායෙන් ලෙහෙයෙන් ධාදියෙන් වුරුණුතෙලින් කෙළින් කඳුලෙන් මුකුණෙන් සඳමිදුලෙන් මූත්‍රයෙන් හිස්මුලිනැ යි මෙසේ ශරීරය සර්වප්‍රකාරයෙන් පිළිකුල් බව ප්‍රකාශ කොට දක්වා මෙබඳු නිඃශ්‍රීක වූ ශරීර භාරයක්[4] උසුළා ගෙන ඇවිදීමට වඩා මහණධම් පුරා නිවන්දහම් පසක් කිරීම යහපතැ යි සිතා මහණ වන්ට අවසර ඉල්වූහ. ඒ උපාසකයෝ ද 'යහපත; සොඳුර, තොපගේ අභිප්‍රාය[5] නියාවට ම මහණ වව'යි කියා අවසර දුන්හ. මෙසේ ඒ කුමාරිකාවෝ ගෙහිමියාණන් අනුදන්වාගෙන මාගම සමීපයෙහි මෙහෙණවරකට ගොසින් තමන්ට කුඩාමව් වූ සුමනා ස්ථවිරින් සමීපයෙහි මහණ ව ශාසන ධුරයෙහි යෙදෙමින්[6] දුක්ඛිටධී[7] මහරජනු කරවන ගිරිහඬු

1. ධීරා විරිය සමපන්න - ක.කි.සඳ.
2. චිත්‍රකථික - BCDGHJKL කි.ම.
3. රත්රනකින් - GH
4. ශරීරභාවයක් - GH; ශරීරප්‍රභාවයක් - K
5. අභිප්‍රාව - පිටපත් හැම
6. ධුරය පුරමින් - KL; ස.
7. දුක්ඛුටධී - AGHJL
දුඛඛුධය - BC

Non-Commercial Distribution

පූජාව අනුමෝදන් වන්ට තමන්ගේ උපාධ්‍යාය වූ සුමනා ස්ථවිරීන් හා සමග ඊරුවසැකඩ[1]ය යි යන තැනට පැමිණ කර්මස්ථාන මෙනෙහි කෙරෙමින් ඒ වෙනෙහි ගල් පර්වත තුරු ලියමඬු ආදියෙහි වසන දේවතාවන් ලවා එක පැහැර සාධුකාර දෙවමින් රහත් ව තමන්ගේ මහණධම් පුරා[2] මුදුන් පැමිණවූහ.

මෙසේ නුවණැති ශ්‍රද්ධාවන්තයෝ සියලු සංස්කාර ධර්මයෝ ම අනිත්‍යයහ යි දැන තමන්ගේ ශරීරය ධනය බන්ධුජනයෝය මිත්‍රයෝය යෞවනය යන සියල්ලෙහි ම ආලය හැර නිවන්පුරයට පැමිණෙන්නාහුය යි[3] දන සියල්ලවුන් විසින් ම නිවන් පුරසිරි විඳින්ට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි:

දෙහෙ ධනෙ සඤති මිත්තෙ සුහජ්ජෙ
විහාය රාගං නවයොබ්බනෙ ච,[4]
පසන්නය සඞ්ඛාරගතං විදිත්වා
පප්පොනති නිබ්බාණපුරං සපඤ්ඤා-යි.

මේ මෙහි පත්වන
අඤ්ඤතර කුමාරිකා වස්තුව ය.

මෙතෙකින් මේ සද්ධර්මාලංකාරයෙහි
චූළගල්ල වර්ග නම් වූ

තෙවිසි වන පරිච්ඡේදය නිමි.

තව ද මේ සද්ධර්මාලංකාරයෙහි සූවිසි වන තිස්සනාග වර්ගය නම් කවර යත්. එහි පළමු වන තිස්සනාග වස්තුව මෙසේ දත යුතු. කෙසේ ද යත්:

මෙම ලක්දිව රුහුණු ජනපදයෙහි කෙළෙඹිය[5] නම් විහාරයෙක් විය. ඒ විහාරයෙහි අන් කිසි කෙනෙකුන් හා සමාන නොවන මහත් වූ ශ්‍රද්ධා ඇති තිස්සනාග නම් මහ තෙරකෙනකුන් වහන්සේ සෙසු ඇමදෙනා වහන්සේට ප්‍රධාන ව වසනසේක. ඒ මහතෙරුන් වහන්සේ අම්රලෙන වසන සිවුපිළිසිඹියා පත් තිස්ස නම් මහතෙරුන් වහන්සේ සමීපයට ගොස් පත්කඩ තබා වැඳ එකත්පස් ව උන්සේක. ඉක්බිති එහි වසන නේවාසික තෙරුන් වහන්සේ ආගන්තුක මහතෙරුන් වහන්සේ හා සමඟ මිහිරි

1. ඊරුවසකඩ - BH ම.
2. පුරා (නැත) - BDEGHKL
3. පැමිණෙන්නාහු මය යි - A
4. ච - ABCEGHKL, ස
ච - අන් හැම
5. කෙළෙඹිහරු - ACJK
කෙළඹිරු - BDEGHL

Non-Commercial Distribution

වූ පිළිසඳර කථා කොට "එම්බා ඇවැත්නි, පෘථග්ජනයෝ නම් අනියතගතිකයහ; සැදැහැයෙන් මහණ වූ තමන් වැනි පිළිවෙත් සරු උතුම් ගුණ ඇතියවුන් රහත් නොව කාලක්‍රියා කිරීම් යුක්ත නොවෙයි; විනය පිටකයෙහි අන්තර්ගත වූ ප්‍රාතිමොක්ෂසංවර ශීලය සම්පාදනය කරන්නාවූ භික්ෂූන් විසින් ආචාර ගොචර[1] සම්පන්න විය යුතු ය. ඉන්ද්‍රියසංවරශීලය රක්නාහු විසින් ඔළාරික වූ ප්‍රාණාතිපාතාදි වූ අකුශලයන්[2] දුරු කොට සිහිනුවණින් යෙදී වාසය කටයුත්තේය. ආජීව පාරිශුද්ධිශීලය රක්නාහු විසින් එක්විසි අන්වේෂණයෙන් වන්නාවූ මිථ්‍යාජීවයෙන් දුරු ව කෙලෙස් තවන වීර්‍ය්‍යසම්පත්තීන් යුක්ත විය යුත්තේය. ප්‍රත්‍යය සන්නිඃශ්‍රිත ශීලය රක්නාහු[3] විසින් දැහැමින් ලද්දවූ සිවුපසය නුවණින් යෙදී පස්විනා පරිභොග කිරීම් වශයෙන් ප්‍රඥසම්පන්න ව විසිය යුත්තේය. මෙසේ චතුපාරිශුද්ධිශීලයෙහි පිහිටා පිරිසුදු සිල් ඇති ව භාවනානුයොගයෙන්[4] වීර්‍ය්‍ය කරන්නාහට මාර්ග ඵල දෙක වහා ම සිධ වන්නේ ය. එබැවින් පළමු කොට ශීලවිශුද්ධිය කටයුත්තේය යි දක්වනසේක්:

සාසනෙ කුලපුත්තානං - පතිට්ඨා නත්ථි යං විනා,
ආනිසංස පරිච්ඡෙදං - තස්ස සීලස්ස කො වදෙ.

න ගඞ්ගා යමුනා වා'පි - සරභූ වා සරස්සති,
නින්නගා වා'චිරවතී - මහී වා'පි[5] මහානදී.

සක්කුණන්ති විසොධෙතුං - තං මලං ඉධ පාණිනං,
විසොධයති සත්තානං - තං වෙ සීලජලං මලං.

යනාදින් "එම්බා ඇවැත්නි, මේ සර්වඥ ශාසනයෙහි සැදැහැයෙන් මහණ වූ කුලපුත්‍රයන්ට ශීලසංරක්ෂණයට වඩා පිහිටෙක් නැත; අඛණ්ඩ අච්ඡිද්‍රාදි වශයෙන් රක්‍ෂා කරන ලද්දවූ ශීලයෙහි ආනිසංස පරිච්ඡේදය මෙපමණෙකැ යි කියා නිමවිම සෙසු සෘද්ධිවන්තයන්ටත්[6] නොපිළිවන් මය. ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී යන පඤ්ච මහා ගඞ්ගායෙහි මහා ජලයෙන් ද පවා සත්වයන්ගේ කෙලෙස් නමැති මල ශොධා ශුධකළ නොහැක්කේය; එසේ ශුධ කළ නොහැකි රාගද්වේෂාදි වූ කෙලෙස් නමැති මලය ශීල නමැති ජලයෙන් ශුධ කරන්නේය. ශීත සහිත වැසි සුළං ආදිය ද රන්වන් සඳුන් ගොශීර්ෂ සඳුන් ආදි වූ අතිශීතල චන්දනාදීහු ද එසේ ම මුක්තාහාරයෝ ද ඉන්ද්‍රනීලාදි මාණික්‍ය ජාතිහු ද සොම් සිහිල් චන්ද්‍රකාන්ති පමුහයෝ ද යන මෙකී අතිසිහිල් වූ සියලු වස්තූහු එක්වන් සත්වයන්ගේ කෙලශදහය

1. ආචාර ගෝචර - C
2. අකුශලයන් සඳෙනා - BEGH
3. රක්නාවුන් - ADEGH ම.
4. භාවනානුයොගයෙන් යෙදී- BDEGH
5. වාපි - ක.කි.ඤ.ම. පාලි
6. සෘද්ධිමතුන්ටත් - බෙ.ස.

Non-Commercial Distribution

සන්හිඳවිය නොහෙන්නෝ මය.[1] එපරිද්දෙන් සන්හිඳවිය නොහැකි කෙලශදහය මනාකොට රක්නාලද උතුම් වූ ශීල නමැති ශීතලභාවය ම[2] සන්හිඳුවන්නේ මය. සතර දිගය සතර අනුදිගය උඩය යටය යි කියනලද දශදිගට ඒකාකාරයෙන් සම ව හමා බස්නට නිසි ශීලගන්ධයට වඩනා අනික් සුගන්ධයෙකුත් නැත් මය. මේ ශීලය නම් දෙව්ලොවට නැඟෙන හිණිපෙති පන්තියක් වැන්න; නිවන්පුර වදනා දෙරක් වැන්න. මුතු මැණික් ආදිවූ දශවිධ රත්නයෙන් හොබනා සුසැට ආභරණ පැළඳ මිණිඔටුනු ධරා සිටි රජදරුවන්ට ද වඩා ශීල[3] නමැති ආභරණයෙන් සැරහුණාවූ තපස්විවරයෝ ම හොබනාහු මය, අත්තානුවාදභය පරානුවාදභය යනාදි වූ සියලු භය ම හිරු උදය දුරුවන අන්ධකාරයක් මෙන් පිරිසුදු සිල් ඇති භික්ෂූන්ගේ සිත තුළෙහි නොරඳ පහව යන්නේය. ශීලසම්පත්තීන් යුක්ත ව තපොවෙනෙහි බබළන්නාවූ මහණතෙම තමාගේ ශොභා සම්පත්තියෙන් ආකාශ [මධ්‍යයෙහි][4] පැළඹෙන්නාවූ චන්ද්‍රමණ්ඩලය මෙන් හොබනේය. සිල්වත් භික්ෂූහුගේ ශරීරගන්ධය පවා දෙවියන්ට සන්තොෂ උපදවන්නේය. ශීල නමැති සුගන්ධය දෙවියන්ට සන්තොෂ එළවයි යනු කියනුම කවරේ ද. ශීල නමැති සුගන්ධය සියලු සුවඳ බඩුයෙහි සුගන්ධය ඉක්ම දශදිග හමා බස්නේය. සිල්වතුන් විෂයෙහි කරන ලද ස්වල්පමාත්‍ර වූ කුශලයෙක් වී නමුත් මහත්[5] විපාක දෙන්නේය; එබැවින් සිල්වත් භික්ෂූන් වහන්සේ ම ශ්‍රද්ධාවන්තයන් විසින් කරන ලද සියලු පූජාසත්කාර විඳින්ට නිසි වනසේක. කාමක්‍රොධාදි වූ ආශ්‍රවයෝ මෙලොව ම සිල්වතුන්ට කිසි අපාසුවක් කළ නොහෙති, සිල්වත් භික්ෂූහු පරලොව වන්නාවූ දුඃඛයෙහි මුල්සිඳිනාහු මය. සිල්වත් භික්ෂූහු ඉදින් කැමැති වූවාහු වී නම් දිව්‍ය මනුෂ්‍යසම්පත්තියත් ඔවුන්ට දුර්ලභ නොවන්නේය, අතිශාන්ත වූ නිර්වාණ සම්පත්තියත් සිල්වත් භික්ෂූන් කරා තෙමේ ම පැමිණෙන්නේය. යනාදීන් පූර්වාචාර්ය්‍යවරයන් වහන්සේ වදළ පරිද්දෙන් ශීලයෙහි අනුසස් දක්වා "මෙසේ අඛණ්ඩ වූ ශීලය රක්‍ෂා කරන්නාවූ තමන් වහන්සේ වැනි සිල්වත් භික්ෂූන් විසින් ශීලවිශුද්ධි ආදි වූ සප්තවිශුද්ධි පරම්පරාවෙන් ගොස් භාවනා මස්තකප්‍රාප්ත කටයුත්තේය"යි අවවාද කොට සතිපට්ඨානසූත්‍රය වදරා කර්මස්ථාන දුන්සේක.

ඉක්බිති ඒ තිස්සනාග මහතෙරුන් වහන්සේ කර්මස්ථාන ගෙන අමරලෙන වසන තිස්ස මහ තෙරුන් වහන්සේ වැඳ අවසර ගෙන තමන් වහන්සේ වසන විහාරයට නික්මුණුසේක. එකල්හි අතරමග ඉතා කර්කශ වූ චණ්ඩපරුෂ වූ මිනී මරන මතැතෙක් මහ අවුරා සිට ගත; එකෙණෙහි මහත් වූ මෙඝයෙක් නහා වස්නට පටන් ගත්තේය; එකල්හි මදයෙන් මත් වූ ඒ ඇතා තෙරුන් වහන්සේගේ මෛත්‍රී බලයෙන් මද සිඳී අවුත් තෙරුන් වහන්සේගේ ඉදිරියෙහි සිටියේය, එකල්හි තෙරුන් වහන්සේ ගොස් ඔහුගේ සතර කකුල් අතුරෙහි වැඩඋන්සේක් වැසි වසිමින් සිටියදී

1. පොහොන්නාහු මය - BDGHKL, ස
2. ශීතලභාවයට - AJ, ක.කි.ඤ.බෙ.ස.
3. ශීලගන්ධ - ACDJ කි.
4. මණ්ඩලයෙහි - පිටපත් හැම.
5. මහත් වූ - BDEGHKL

Non-Commercial Distribution

සතිපට්ඨානසූත්‍රය මෙනෙහි කොට කමටහන් වඩා මාර්‍ගපටිපාටියෙන් ගොස් මහපොළොව සේ අනන්ත වූ කෙලෙස් සමූහයන් දුරු කොට පර්‍වතරාජයන් හා සමඟ මහපොළොව උඳුරන්නා සේ නාද[1] කරවමින් වනදෙවියන් ලවා සාධුකාර දෙවමින් රහත්බවට පැමිණිසේක. එකෙණෙහි ඇතු වටකොට හාත්පස ආකාශයෙන් දෙවියෝ මල්වැසි වැස්සූහ; නයි නාගභවනයෙන් අවුත්[2] අනෙකප්‍රකාර සුවඳ මල් සුවඳ සුනු දීප ධූපාදීන් පූජා කළහ. ඒ වන ලැහැබ වසන සියලු දේවතාවෝ එක් ව දිව්‍යමය පුෂ්පාදීන් උපමා විෂයාතික්‍රාන්ත වූ පූජා කළහ; ඉක්බිති තෙරුන් වහන්සේ ඇතු ආදි කොට දෙවියන්ට බණ වදළසේක; ඒ අසා ඇත්රජතෙමේ තෙරුන් වහන්සේ කෙරෙහි ප්‍රසන්න වූයේ තෙරුන්වහන්සේගේ වියොගය ඉවසිය නොහී උන්වහන්සේ හා සමඟ වියොළක නම් විහාරයට ගොස් තිස් අවුරුද්දක් මුළුල්ලෙහි තෙරුන්වහන්සේට උපස්ථාන කෙරෙමින් එහි ම විසීය. ඉක්බිති තෙරුන් වහන්සේ එම විහාරයෙහිදී පිරිනිවිසේක, මනුෂ්‍යයෝ උන්වහන්සේගේ ශරීරය මහත් වූ පූජාසත්කාරයෙන් කුළු ගෙයකට නඟා කෙළෙඹිය[3] වෙහෙරට ගෙනැවිත් සත්දවසක් මුළුල්ලෙහි මහත් පූජාසත්කාර කරවා සාධුක්‍රීඩා කළහ; ඇත් රජ ද ඒ මිනිසුන් හා සමඟ ඇවිත් තෙමේත් පූජාකොට වියොළක නම් විහාරයට නැවත ඇවිත් භික්ෂූන් සමීපයෙහි බණ අසමින් මල් ආදිය ගෙන හැර පුදමින් බොහෝ පින්කම් කොට ආයු කෙළවර තවුතිසා දෙව්ලොව උපන්නේය. ඔහු මෙසේ තුනුරුවන් උදෙසා කරන ලද පින්කම් අසා දක මහාජනයෝ කුසල් කොට බොහෝදෙන ස්වර්‍ගපදපරායන වූහ.

මෙසේ ත්‍රිමදගලිත ඇත්රජහු පවා සිල්වතුන් වහන්සේ දක උපස්ථාන කරන්නාහු මය; එබැවින් මෙසේ තුන්ලෝවාසීන්ගේ නමස්කාරයට භාජන ව සිටියා වූ එබඳු අනර්‍ඝ වූ ශීලය ශ්‍රද්ධාවන්ත පින්වත් සත්වයන් විසින් රක්ෂා කළ යුත්තේ ම ය.[4] කියන ලදුයේ මැයි:

තිධාප්පභින්නා මදවාරණාපි
දිස්වාන සීලං පණිපාතයන්ති,
පාලෙථ භොන්තො සකජීවිතං'ව
සීලං තිලොකෙහි නමස්සනීයං.

මේ මෙහි පළමු වන
තිස්සනාග වස්තුව ය.

---

1. උන්නාද - BDEGHKL. ම.
2. ඇවිත් - DEGH
3. කෙළෙඹිරු - ABEGHKL
   කෙළෙඹුරු - C
4. කටයුත්තේය - BCEGHKL; කළ යුත්තේ මය -ස.

Non-Commercial Distribution

තව ද මෙහි දෙ වන මහල්ලිකා වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු.

මෙම ලක්දිව රුහුණු ජනපදයෙහි කුඹුබන් නම් ගම එක් මැහැල්ලක් වෙසෙයි; ඕතොමෝ චණ්ඩය[1] පරුෂය දබර කැමැත්තීය. දනාදි වූ යම් කුශලයක් කරන්නා තබා සිතිනුත් නොසිතයි. එසමයෙහි මලියදෙව නම් මහතෙරුන්වහන්සේ දිවසින් ලොව බලනසේක් ඒ මැහැල්ල නොබෝ දවසකින් කාලක්‍රියා කොට නරකයෙහි උපදනා බව දුටුසේක. ඒ බව දැක උන්වහන්සේට මෙසේ වූ අදහසෙක් විය. "මේ වනාහි ඉතා කර්කෂය, පරුෂය. කවර උපායකින් මේ මැහැල්ල නරක දුකින් ගොඩලම් දෝ හෝ යි සිතනසේක් මා එතැනට ගිය කල්හි ඒ මැහැලි සාළුවක් පමණ කැඳිත්තක් පිළිගන්වන්නීය; ඒ කුශලයෙන්[2] ඕ තොමෝ මහත් වූ නරක දුකින් මිදෙන්නී ය"යි දැක මා විසින් ඒ මැහැල්ල දෙන කැඳ මහාඵල මහානිසංස කළ මැනවැ"යි සිතා නිරොධසමාපත්තියට සමවැද එයින් සත්වන දවස්[3] සමාපත්තීන් නැඟී සිටිසේක් සිරිරු පිළිදඟ කයින් සිවුරු හා අතින් පාත්‍රය ගෙන ඈ වසන ගමට වැඩ සිවුරු වළඳනා තැන්හි සිට සිවුරු ගැට ගන්වා පාත්‍රය අතින් ගෙන ගෙපිළිවෙළින් සිඟමින් මැහැල්ලගේ ගෙදෙරට පැමිණි සේක; එකල්හි මැහැලි තමාගේ ගෙදෙරට පැමිණි මහතෙරුන්වහන්සේ දැක කැඳ සාළුවක් ගෙන තෙරුන් වහන්සේ කරා එළඹ පාත්‍රයෙහි වත්කොට තමා සිත් පහදවා වැඳ ගෙට වන්නීය. තෙරුන්වහන්සේ කැඳ සාළුව ගෙන ගමින් පිටත පැන් පාසු තැනක හිඳ මැහැල්ලට අනුග්‍රහ පිණිස ඒ දියත්ත[4] වළඳන්ට පටන් ගත්සේක.

එකල්හි යොන් රජ්ජුරුවන්ගේ පුත් වූ ධර්මරක්ෂිත නම් මහතෙරුන් වහන්සේ එපරිද්දෙන් ම නිරොධසමාපත්තියට සමවැද සත්වන දවස්[5] එයින් නැඟී උතුරුකුරුදිවු වැඩ අහර සිඟා ලැබ එයින් එක් කොට්ඨාසයක් ගෙන සිංහබොධි ස්ථවිරයන්වහන්සේ කැඳවා "මේ ආහාරය මලියදෙව මහතෙරුන්වහන්සේට ගෙන ගොස් දෙව"යි කියා නික්මවූසේක. උන්වහන්සේ ද ඒ ආහාරය ගෙන අහසින් අවුත් මලියදෙව මහතෙරුන්වහන්සේට එළවූසේක. මහතෙරුන්වහන්සේ විසින් මේ කිමෙක් ද යි විචාළ කල්හි සිංහබොධි මහතෙරුන්වහන්සේ "ස්වාමිනි, ධර්මරක්ෂිත මහතෙරුන්වහන්සේ මේ ආහාරය තුඹවහන්සේට එවූසේකැ"යි කී කළ දැ සියල්ල ම කීසේක. එපවත් අසා මහතෙරුන්වහන්සේ "ඇවැත් වූ සිංහබොධි ස්ථවිරයෙනි, තමන්ගේ මහතෙරහු කුමක් පිණිස මැහැල්ල දුන් දන් උදුරද් දැ" යි කියා උතුරුකුරුදිවින් ගෙනා ආහාරය නොවළඳ ඒ කැඳ සාළුව පමණක් වළඳ අහරකිස නිමවූසේක. ඉක්බිති සිංහබොධි ස්ථවිරයන්වහන්සේ "ස්වාමිනි, ඒ මැහැල්ලට වන්නාවූ කවර අනුසසක් දැක මෙසේ වූ අනුග්‍රහ කළසේක් ද" යි විචාරනසේක්:

පුච්ඡාමි ථෙරං කතකිච්චං - පහීන භව බන්ධනං,
කිමත්ථං පඤ්ඤමානො ත්වං තස්සාකාසි අනුග්ගහං.

කිමායතිං ඵලං එසා - යාගු දනෙන වින්දති,
තං මෙ ධීර වියාචික්ඛ - සොතුමිච්ඡාමි තං ඵලං.

---

1. චණ්ඩය - ACJ
   ඉතා චණ්ඩය C
2. කුශලානුභාවයෙන්
3. සත් දවසක් - පිටපත් හැම
4. කැඳිත්ත - B
   කැඳදියත්ත - C
5. සත් දවස් - පිටපත් හැම

Non-Commercial Distribution

යනාදීන් "රහත්බව පිණිස කරනලද කාරියෙහි නිමාවට පැමිණ භවබන්ධනයෙන් මිදී සිටියාවූ උත්තමයාණන් වහන්ස, නුඹවහන්සේගෙන්[1] විචාරමි: මතු මේ මැහැල්ලට වන්නාවූ කවර අභිවෘද්ධියක් දක ඒ මැහැල්ලට අනුග්‍රහ කළසේක් ද, මේ දුන්නාවූ යාගුදනයෙන් එමැහැලී මතු කවර විපාකයක් ලබා ද ඒ යාගුදනයෙහි අනුසස් දන් අසනු කැමැත්තෙමි. ප්‍රඥසම්පන්න වූ බුධ පුත්‍රයාණන් වහන්ස, ඒ මට ඉඳුරා වදළ මැනවැ"යි කීසේක. ඉක්බිති ඒ විපාක විශෙෂය ප්‍රකාශ කොට දක්වන මලියදෙව මහතෙරුන්වහන්සේ:

යා සා අදයි මෙ අජ්ජ - පරිත්තං යාගුමත්තකං,
තෙන සා පුඤ්ඤකම්මෙන - දෙවලොකෙ රමිස්සති[2]

තත්ථ නච්චෙහි ගීතෙහි දිබ්බෙහි වාදිතෙහි ච,
පමොදති මහාභොගා මහා සුඛ සමඞ්ගිනී[3]

යා මනුස්සෙසු සම්පත්ති යාච දෙවෙසු සම්පද
එතෙන පුඤ්ඤකම්මෙන ලච්ඡතෙ සා අනාගතෙ.

එතෙනෙව නියාමෙන - සංසරන්ති භවාභවෙ
සම්පුණ්ණ සට්ඨිකප්පානි සම්පත්ති මනුභොස්සති.

යනාදීන් 'අද මට දුන්නාවූ මේ ස්වල්මාත්‍ර වූ යාගුදනයෙහි කුශලයෙන් ඒ මැහැලි මතු දෙවුලොව උපදනී[4] ඒ දෙවුලොව දිව්‍යනාටකයන් විසින් දක්වනලද නෘත්‍ය ගීත වාද්‍යයෙන් සන්තුෂ්ට ව මහත්වූ දිව්‍ය සම්පත් අනුභව කෙරෙමින් අපමණ සැප විඳින්නීය. මෙම කුශලකර්මයෙන් මතු දිව්‍ය මනුෂ්‍ය ලොක දෙක්හි යම් බඳු විශෙෂ සම්පත්තියක් ඇත්නම් ඒ සියල්ල ම ලබන්නීය. මෙපරිද්දෙන් ජාතියෙන් ජාතියෙහි චුතිප්‍රතිසන්ධිවශයෙන් සැරිසරා ඇවිද අනූන්[5] වූ සැටකපක් මුළුල්ලෙහි දිව්‍ය මනුෂ්‍ය සම්පත් විඳින්නීය" යි වදළසේක.

එබස් අසා සිංහබොධි ස්ථවිරයන්වහන්සේ මලියදෙව මහතෙරුන්වහන්සේ වැඳ අවසර ගෙන පුවඟුදිවයිනට ගොස් එපවත් බුධරක්ෂිත මහතෙරුන්වහන්සේට දන්වූසේක. උන්වහන්සේ ද එපවත් අසා "එම්බා ඇවැත්නි, ඒ මැහැල්ල[6] තොමෝ අසූකපක් මුලුල්ලෙහි දිව්‍යමනුෂ්‍ය සම්පත් විඳිනාය"යි[7] වදළසේක. එපවත් අසා අනිත් තෙරකෙනෙකුන් වහන්සේ "ඇවැත්නි, ඒ මැහැලි සියයක් කප් පිරෙන තෙක් දිව්‍යමනුෂ්‍ය සම්පත් අනුභව කෙරෙ"යි වදළසේක. මෙසේ තුන්දෙනාවහන්සේ තමතමන් වහන්සේලාගේ දිවසට පෙනෙන පෙනෙන පමණක් ගෙන අනුසස් වදළ කල්හි එපවත් අසා සඞ්ඝරක්ෂිත නම් මහතෙරුන්වහන්සේ "මේ ස්ථවිරවරයෝ රහත් තෙනට දුන්නාවූ දනයෙහි විපාක වෙන වෙන ම පරිච්ඡෙද කොට කියති. ඒ හැමතැන්

1. නුඹවහන්සේ අතින් - BDGHKL ස
2. රමෙස්සති - පිටපත් හැම
3. මහාසුඛස්සුමඞ්ගිනී
4. උපදනීය - BCDEGHKL
5. අනූන - ADEGHJ
6. මැහැලි - BEGHKL
7. විඳියයි - BGL; විඳිනියයි - K විඳිවයි. E

Non-Commercial Distribution

කී සේ ම යුක්තයෙක් නොවෙයි; අප බුදුහු දක්ඛිණාවිභඞ්ගසූත්‍රය දෙසන සේක් තිරිසනුන්ට දුන් දනයෙහි පටන් මනුෂ්‍යජාතීන්ට දුන්නාවූ දනයෙහි විපාක උන් උන්ගේ ගුණවසයෙන් වෙන වෙන ම දක්වා "එම්බා මහණෙනි, රහතන්ට දුන්නාවූ දනයෙහි විපාක කියනු ම කවරේ ද" යි වදරා මෙසේ කාලපරිච්ඡේදයක් නොකොට දෙසූසේක. මේ ස්ථවිරවරයෝ කුමක් පිණිස මෙපරිද්දෙන් සැප විඳිනා කල් නියම කොට කීවාහු දඃ රහතන් වහන්සේට දුන්නාවූ දනයෙහි විපාක කියන් බුදුන්ට මිස සෙස්සවුන්ට විෂය නොවේ" යි කියා ඒ තෙර තුන්දෙනා වහන්සේට දඬුවම් යොද වදළසේක. ඉක්බිති ඒ මහතෙර තුන්දෙනා වහන්සේ මහමෙර පත්ලෙන් වැලි ගෙනවුත් පුවඟු දිවයින සඞ්ඝරක්ඛිත මහතෙරුන්වහන්සේගේ මළුවෙහි බහා තෙරුන් වහන්සේ ක්‍ෂමා කැරවූසේක. ඉක්බිති ඒ මැහැලි සත්වන දවස් කාලක්‍රියා කොට දෙව්ලොව ඉපද යට කී පරිද්දෙන් මහත් වූ දිව්‍ය සම්පත් අනුභව කරන්ට පටන් ගත්තීය.

මෙසේ මේ ලොකයෙහි සරුබිම්ය නිසරුබිම්ය[1] යනාදි වූ ක්‍රමයෙන් එහි වපුරනලද බිජුවටෙහි ස්වල්පඵල මහාඵල[2] වේ ද එපරිද්දෙන් ම දන් දෙන්නවුන්ගේ චිත්තශුද්ධිය දෙන්නාවූ දනවස්තු[3] ශුද්ධිය දන් පිළිගන්නාවූ දක්ෂිණෙය්‍ය[4] පුද්ගලයන්ගේ වසයෙන් ක්‍ෂෙත්‍රශුද්ධිය යන මේ ත්‍රිවිධාඞ්ග සම්පත්ති ශුධ වී නම් දන් දුන්නාහු අපමණ වූ භවභොග සම්පත් ලබන්නාහු මය. එබැවින් දන් දෙන්නා වූ ශ්‍රද්ධාවන්තයන් විසින් ආදිමධ්‍යාවසානයෙහි ත්‍රිවිධ චෙතනාවන් ශුද්ධ කොට චිත්ත ශුද්ධිය වස්තු ශුද්ධිය ක්‍ෂෙත්‍රශුද්ධිය යන ත්‍රිවිධසම්පත්තීන් යුක්ත දන පරිත්‍යාගයෙන් භවභොග සම්පත් ලබන්ට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි.

න සාර සාරාදි කමෙන භූමිසු
නිවුත්ථ බීජේ කමතො මහාඵලං,
එවම්පි දනස්ස ච ඛෙත්ත සම්පද
ලභන්ති දනා භවභොග සම්පදං - යි.

මේ මෙහි දෙ වන
මහල්ලිකා වස්තුව ය.

තව ද මෙහි තුන්වන පඤ්චසතභික්ඛු වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු.

මෙම ලංකාද්වීපයෙහි කුඹල්තිස්[5] පවු නම් පර්වතයෙහි ආයර්කර නම් විහාරයෙක් විය. එහි එක් පබ්භාරයෙක පන්සියක් පමණ කිරිවවුලෝ ඒ ඒ තන්හි ගොදුරු කා ඇවිත්[6] එක් ව වාසය කෙරෙති. එසමයෙහි එක් භික්‍ෂුකෙනකුන්

1. නොසරුබිම්ය - ක.කි.ඤ.ම.
2. ස්වල්ප ඵල බව මහාඵල බව - BGH
3. දනයෙහි වස්තු - B
4. දක්ෂිණීය - බෙ.ස.
5. කුඹුල්තිස් - AGHJ
   කුඹල්තිස - BKL
   කුඹුල්තිස්ස - D
6. ඇවිදින් - GHKL
   ඇවිදින්ට - B

Non-Commercial Distribution

වහන්සේ වවුලන් වසන පබ්භාරයට ආසන්න ව තිබෙන ගල්ලෙනක වසන සේක් දවස් පතා සතිපට්ඨානසූත්‍රය පිරිවානා සේක. එකල්හි ඒ කිරිවවුලෝ සූත්‍රය පිරිවහන ශබ්ද මාත්‍රයක් අසා එහි අර්ථයක්වත් පදයක්වත් අක්ෂරයක් වත් නොදන ශබ්ද මාත්‍රයෙක සිත් පහදවා මැත භාගයෙහි එයින් මිය එම කුශලධර්මයෙන් එම විහාරය සමීපයෙහි එක්තරා ගමෙක ඒ ඒ කුලගෙවල උපන්හ. ඒ සියල්ලෝ ම නිරෝගී ව සුවපත් වූවාහුය;[1] වැඩිවිය පැමිණ සමහ ව නිත්‍ය සන්තොෂයෙන් යුක්ත ව වාසය කෙරෙති. මෙසේ වසන්නාවූ ඔහු එක් දවසෙක ඒ විහාරයෙහි ආයුර්වංශ සූත්‍රදෙශනාව අසනු පිණිස මහජනයන් එක් ව ධර්මපූජා පවත්වන කල්හි එපවත් අසා ඒ පන්සියයක් දෙන ද විහාරයට ගොස් බණ අසමින් උන්හ. ඉක්බිති බණ කී මහතෙරුන් වහන්සේ සංසාරගත සත්වයන් ලබන්නාවූ සියලු සම්පත්තිය ම ස්ථිර[2] නොවන බව හඟවා බණ වදාළසේක. ඒ බව සංග්‍රහ කොට දක්වන පූර්වාචාරීන්වහන්සේ:

භවෙසු සබ්බෙසු සද අසෙසතො
අසාරකං පුඤ්ඤඵලං අසස්සතං,
තරඞ්ග දෙලානල විජ්ජු චඤ්චලං
පිහෙය්‍ය කො තං පි[3] නරො විචක්ඛණො.

භවග්ගපත්තාපි පජා අරූපිනො
ආයුක්ඛයා තෙ[4] සමුපෙන්ති දුග්ගතිං
සයම්පභා බ්‍රහ්මගණා මහිද්ධිකා
ඛජ්ජොතභූතා විචරන්ති එකදා.

දෙවින්දභූතා තිදිවෙ මහායසා
උපෙන්ති චණ්ඩාලගතිං ජිගුච්ඡිතං,
අලඞ්කතා දෙවගණා සුඛෙ ඨිතා
භවන්ති පෙතෙසු පුනො[5] බුභුක්ඛිතා.

සුඵුල්ලිතෙ නන්දන කානනෙ රතා
චරන්ති භූයො[6] අසිපත්තකානනෙ,
විමාන සෙට්ඨෙසු චිරං පමොදිතා[7]
භවන්ති පච්ඡා නිරයෙ ජලන්තරෙ.

යනාදීන් "එම්බා ඇවැත්නි, කාමභවය රූපභවය අරූපභවය යි කියනලද මෙ සියලු ම භවත්‍රයෙහි උපදවා විපාක දෙන්නාවූ කුශල ඵලය සමහර තැනෙක චිත්තාත්ම විරහිත කරන හෙයින් අසාරය, එකාකාරයෙන්[8] නොපවත්නා හෙයින් අශාශ්වතය, ඉතා චඤ්චලය. ස්ථිර ව නොපවත්නේ මය.[9] වායුවෙගයෙන් සැලෙන රළපතර සමූහයක් වැන්න; ඕවිලි යානාවක් වැන්න; වහ්නිශිඛාවක් වැන්න. විදුලිය කලබක් වැන්න; එවැනි[10] අස්ථිර වූ භවභොගසම්පත්තිය නුවණැත්තාවූ කවරෙක් නම් කැමැති වේ ද, එහි ආලය නොකරන්නේ මය.[11] හේ එසේ මැයි: කලෙක

1. වූවාහු - KL
2. ස්ථිර - ක.කි.ඤ.බෙ
3. තං හි - මුද්‍රිත හැම, ස
4. ආයුක්ඛයා තෙ - බෙ.ස.
5. පෙතෙසුපිනො - L හැර පිටපත් හැම, පෙතෙසුපුනෙ - L
6. භියො -ABCEGHJKL
7. චිරප්පමොදිතා - ACG
8. එයාකාරයෙන් - බෙ.ස.
9. නොපවත්නේය - BLEGHKL
10. එබඳු - B
    එවෙනි - ACJ
11. හරනේ මය - B

Non-Commercial Distribution

නෙවසඤ්ඤා නාසඤ්ඤායතනයට පැනනැඟී භවයෙන් අගපැමිණියාවූ ප්‍රීති සැප විඳි අරූපී බ්‍රහ්මරාජයෝ පවා කලෙක සතර අපායට පැමිණ මහදුක් විඳිනාහු මය. කලෙක බ්‍රහ්මරාජන් ව ඉපද දසහිල්ලක්[1] නැඟීමෙන් දසදහසක් සක්වළ අලොක කරන්ට සමර්ථ වූ රූපී මහාබ්‍රහ්මරාජයෝ පවා කිසි කලෙක තනුතර ශරීර ප්‍රදේශ[2] ඇති කදෝපැණිවත් උපදනාහු මය. කලෙක ශක්‍ර සුයාම සන්තුෂිතාදි දිව්‍යරාජයන්[3] ව දිව්‍යසැපත්[4] විඳිනාහු[5] කලෙක පිළිකුල් කටයුතු සැඩොල් කුලයෙහිත් උපදනාහු මය. කලෙක දිව අබරණින්[6] සැරහී දිවබොජුන් වළඳ සැප විඳි දිව්‍ය සමූහයෝ කලෙක ප්‍රෙතලොකයෙහි ඉපද සාදුකින් පීඩිත ව ප්‍රෙත දුක් විඳිනාහු මය. කලෙක නන්දනොද්‍යානාදියෙහි දිවකෙළි කෙළ ඇවිද්දාහු කලෙක අසිපත්‍රවනයෙහි කැපිකැපීත් ඇවිදිනාහු මය. කලෙක ඓරාවනාදි වූ හස්ති වාහනාදියට නැඟී ඇවිදිනාහු කලෙක සක්විති රජ ව ඇවිද්දාහු කලෙක තුමූ අනුන්ට වාහනවත් උපදනාහු මය. කලෙක දස[7]වත් ඇවිද්නාහු මය. කලෙක ධනාධාන්‍යයෙන් මහාමණ්ඩාතුරජ හා සමාන වූවාහු පවා කලෙක නිර්ධනී ව කබල් ගත් අත් ඇති ව භික්ෂාටනය කොටත් ඇවිදිනාහු මය. කලෙක බහුශ්‍රැත ව විදුරු හා සමාන නුවණින් සකල සත්වයන්ට ආචාරී ව ඇවිද්දාහු කලෙක නුවණ මඳ ව කෙළතොලු වත් ඇවිදිනාහු මය. කලෙක මිහිරි වූ කටහඬින් චිත්‍රකථික[8]ව ඇවිද්දාහු කලෙක මූගබධිර ව ඉහිලාත් ඇවිදිනාහු ම ය. මේ ආදි කාරණයෙන් කාමරූපාරූපි වූ[9] තුන් භවයෙහි සියලු සම්පත්තිය ම නිෂ්ප්‍රයෝජනය යි දැන සසර කළකිරුණු සිත් ඇති ප්‍රඥාවන්ත සත්වයෝ භවභොග සම්පත්තියෙහි ආලය හැර නිවන් දක්නා සඳහා ම වියර්‍ය කරන්නාහුය යි මෙසේ පූර්වාචාරීවරයන් කී පරිද්දෙන් ම බණ වදළසේක.

එකල්හි බණ අසමින් උන්නාවූ පන්සියයක් පමණ ළදරු පුරුෂයෝ සසර කළකිරුණාහු දනාදි වූ කුශල ක්‍රියායෙහි ම යෙදී වාසය කෙරෙති. මෙසේ වසන්නාහු අනිත් දවසෙක විහාරයට ගොස් මහා සතිපට්ඨාන සූත්‍රය අසා ගිහිගෙයි වාසය හැර ඇම දෙන ම මහණ ව පළමු කිරිවවුල් ව උපන් සමයෙහි විසූ පබ්භාරයෙහි ම ඇලුම් ඇති ව වාසය කෙරෙති; ඉක්බිති එක් දවසෙක ඉන් එක් කෙනෙකුන් වහන්සේ "ස්වාමීනි, මේ පබ්භාරයෙහි වවුල් ගඳ හමයි[10]. කෙසේ වෙසෙමෝ දැ"යි කීසේක, එබස් අසා සඞ්ඝස්ථවිරයන් වහන්සේ "කිමෙක්ද; ඇවැත්නි, තෙපි ඊට කාරණ නොදනු ද; මීට පළමු ජාතියෙහි තොප හැම වවුල් ව ඉපද මෙතැන්හි බොහෝ දවසක් විසුව. මේ දුර්ගන්ධය තොපගේ ම වර්චසෙහි[11] ගඳ යැ"යි වදරා පූර්වජාතිය හඟවා එහැමදෙනා වහන්සේ සසර කළකිරී මැන භාගයෙහි මහාසතිපට්ඨාන ධර්මය අසා සෝවාන් වූ සේක. නැවත එක් දවසෙක එම සතිපට්ඨානසූත්‍රය[12] අසා සිව්පිළිසිඹියා හා සමඟ රහත් බවට පැමිණිසේක.

මෙසේ යහපතෙක නපුරෙකැ යි යන කිසි විශෙෂයක් නොදන්නා කිරිවවුලෝ පවා පාලි ධර්මයෙහි[13] හඳරන්නාවූ ශබ්ද මාත්‍රයක් අසා එම කුශලානුභාවයෙන් මහත්

1. දසහිල්ලෙන් - AD ක.කි.
   දසහිල්ලෙක් - C
   දසහිලි - බෙ.
   දසහිල්ලන් - කු.
2. ශරීරප්‍රභා - බෙ.ස.
3. දිව්‍යරාජන් - BEJ ක.කි.වෙ.ස
4. ඉපද දිව්‍යසැපත් - මුද්‍රිත හැම
5. විඳියාහු - BDC
6. ආභරණින් - පිටපත් හැම
7. දසී - ABEGH; දසිවත් - KL
8. චිත්‍රකථී - AEGHJ
9. කාමරූපාදීවූ - CGH
   කාමරූපාරූපාදී වූ - ADE
10. ගඳමය - CJ
    ගඳයයි - J
11. වච්චයෙහි - AJ;
    වසවසයෙහි ම - ස.
12. සතිපට්ඨාන ධර්මය - B
13. පාලි ධර්මය - BCDGHKL

Non-Commercial Distribution

වූ පඤ්චකාම සම්පත් අනුභව කොට බුදුන් විසින් භජනය කරන ලද්දවූ නිර්වාණපදයටත් පැමිණියාහුය. ධර්මයෙහි විභාග දන බණ අසන්නාවූ ශ්‍රද්ධාවන්තයන් ලබන්නා[1]වූ සම්පත් විශෙෂය කියා නිමවිය නොහැක්කේ මය, එබැවින් වඩ වඩා සතුටු සොම්නස් ව බන අසා කුසල් කොට සගමොක් සැපත් ලබන්ට උත්සාහ කළ මැනවි. කියන ලදුයේ මැයි:

සාරාසාර විවෙකභාවරහිතා පක්ඛීපි කිඤ්චාවිදූ
සුත්වා වග්ගලියො රවං'ව යතිනො පාලිම්හි සජ්ඣායතො,
විනදන්තනා[2] මහතිං සිරිං ඨිතිහරං කාමග්ගියං තප්ඵලා
සම්පත්තා ජිනසෙවිතං සිවපදං තුම්හාදිසෙ[3] කා කථා - යි.

මේ මෙහි තුන්වන
පඤ්චසත භික්ෂු වස්තුව ය.

තව ද මෙහි සතර වන දත්තකුටුම්බික[4] වස්තුව නම් කවර යත්. හේ මෙසේ දතයුතු.

මෙ ලඞ්කාද්වීපයෙහි උතුරුදිග නාගකාර නම් ගමෙක් විය. ඒ ගම සියලු සම්පත්තීන් ආඪ්‍ය වූ මහත් ධන ඇති මහත් වූ උපභොග පරිභොග වස්තු ඇති දත්ත නම් කෙළෙඹි පුත්‍රයෙක්[5] වාසය කෙරෙයි; එතෙම සැදැහැ ඇත්තේය. තුනුරුවන් කෙරෙහි අතිප්‍රසන්නය; බුද්ධාදි රත්නත්‍රයෙහි මමත්වය ඇත්තේය; තමහට ප්‍රිය වූ උතුම් උතුම් දෙය දෙන හෙයින් දනපති විය; එතෙම එක් සමයෙක බොහෝ ගොයම් කරවා දවසෙක පීද පැසුණාවූ ඇල්කෙත් බලමින් ඇවිදිනේය; එකල්හි පුවගුදිවයින වසන මලියදෙව මහාසථවිරයන් වහන්සේ රහත් සත්දෙනකු වහන්සේ හා සමඟ ආකාශයෙන් අවුත් ඔහු වසන ගම්දෙරට[6] බැස පුදුසු තැනක සිට සිවුරු ගැටගන්වනසේක; එකල්හි කෙළෙඹි පුත්‍රයා ගැටගන්වන භික්ෂූන්වහන්සේ දක පහන් සිතින් ලොමුදහගත් ශරීර ඇති ව තොලස් ව සමීපයට ගොස් පසඟ පිහිටුවා වැඳ "ස්වාමිනි, අසුවල් ගෙයි ඇත්තන්ට අනුග්‍රහ කොට සිහා වැඩිය මැනවැ"යි ආරාධනා කොට තුමූ පළමු කොට ගොස්[7] මහ දෙපස තොරණ ලවා ධජපතාක නංවා පූර්ණඝට පූර්ණකලස දිපධූපාදීන් දෙපස සරහා පැන් ඉස අමදනා ලද්ද වූ භූමියෙහි පියවිලි අතුට ලදපස්මල් ඉස ඇතුළුගෙයි සුදුවියන් බැඳ හිඳිනා අසුන් පනවා භික්ෂූන් වහන්සේ වැඩි කල්හි පසඟ පිහිටුවා වැඳ අතින් පාත්‍රය ගෙන ඇතුළුගෙයි වඩා හිඳුවා පතුල් ශොධවා සුවඳ තෙල් ගල්වා කැඳ අවුළු එළවා ඇමදෙනා වහන්සේ කැඳ වළඳ[8] ඉක්බිති සමීපයට එළඹ වැඳ අවසර ගෙන හිඳ බණ අසා වේලා ආසන්න වූ කල්හි එපරිද්දෙන් ම මිහිරි වූ නොයෙක් සූපව්‍යඤ්ජනාදීන් යුක්ත ආහාරය ආදර සහිත ව වළඳවා බත් වළඳ[8] ඉක්බිති

1. ලබන - ABDEGHL
2. විනදනෙත - AJ
 විනදනෙතා - C
 විනිදිත්වා - බෙ.ස.
3. තුම්හාදිකෙ - ACJ
 තුම්හාදිසා - ක.කි.කඳ
4. දත්තකුටිම්බික - CE
 දත්තකුටුම්බිය - BJ
5. කෙළෙඹි කුලපුත්‍රයෙක් - පිටපත් හැම
6. ගෙදෙර ජවම්පයේ ගම්දොරට - C
7. ගෙට ගොස් - BEGHKL ස.
8. වළඳවා - KL ස.
 වැළඳු - මුද්‍රිත හැම.

Non-Commercial Distribution

පස්පලවතින් දහැත් පිළිගන්වා පසග පිහිටුවා වැඳ "ස්වාමිනි, ස්වාමීන්ගේ ගෙණෙහි[1] භික්ෂූන් වහන්සේට නිරන්තරයෙන් ලහබත් අටක් දෙමි"යි තෙරුන් වහන්සේට ආරාධනා කෙළේය; මලියදෙව මහතෙරුන් වහන්සේ ද යහපතැ යි ගිවිස විහාරයට වැඩිසේක. එතැන් පටන් පුවඟුදිවයින වසන සඟ අටදෙනකු වහන්සේ නිරන්තරයෙන් ඇවිත් අහර වළඳනසේක, කෙළෙඹි පුත්‍රයා ද භික්ෂූන් වහන්සේට[2] දවසින් දවස වඩ වඩා සත්කාර සම්මානයෙන් උපස්ථාන කෙරෙයි, එකල්හි පුවඟුදිවයින දෙළොස් දහසක් පමණ භික්ෂූන් වහන්සේවසනසේක; එබැවින් ලහබත් අට අධිකයක්[3] සහිත සතර අවුරුද්දක් පමණින් මහතෙරුන්වහන්සේට පැමිණෙන්නේය; මෙසේ දන් දෙමින් පන්සිල් රකිමින් මෑත භාගයෙහි වස්තු සපයා දන් දෙමි යි සිතා ධන සොයා මුහුදින් එතර යනු කැමති ව තමන්ගේ භාර්‍ය්‍යාවන් කැඳවා "එම්බා සොඳුර, මා විසින් තබා දෙනලද්දවූ මේ දනය නොකඩ කොට ම අප්‍රමාද ව පවත්වාලව යි" අවවාද කොට තුමූ නැවූ නැඟී ස්වර්ණභූමියට නික්මුණාහ; ඉක්බිති ඒ නැව සත්දවසක් මුහුදුපිට ගොස් චණ්ඩ වූ වායු වෙගයෙන් පහරනලද්දේ[4] දියපිට පෙරළී බිඳිණ, නැවට නැඟි මනුෂ්‍යයන්ගෙන් දත්තකුටුම්බිකයන් හැර හැම දෙන ම මස්කැසුප් ආදීන්ට ගොදුරු වූහ; එකල්හි කෙළෙඹි පුත්‍රයා මුහුදු පිනා ශරීරය ක්ලාන්ත වූ හෙයින් පසුබටුවාවූ වීර්‍ය්‍ය ඇති ව දියෙහි ගිලෙන්ට ගත;[5] එකෙණෙහි මලියදෙව මහතෙරුන් වහන්සේ දිවසින් මුහුද බලන සේක් කෙළෙඹිපුත්‍රයා මුහුදු[6] ගිලෙන්නා දැක සිංහබොධි ස්ථවිරයන් වහන්සේ කැඳවා "ඇවැත්නි, තමන්ගේ බත් පාත්‍රය මුහුද ගිලෙයි" වදාළසේක; එතෙපුල් අසා සිංහබොධි ස්ථවිරයන් වහන්සේ අත දික්කොට මවා ඕහු දියෙන් ගොඩනගා පුවඟුදිවයිනට වුසේක;[7] ඉක්බිති කෙළෙඹි පුත්‍රයා දෙළොස් දහසක් පමණ භික්ෂූන් වහන්සේ දැක මහත් වූ ප්‍රීතීන් පිනා පසග පිහිටුවා වැඳ එකත්පස් ව හිඳ බත අනුභව කොට ඉක්බිති මහතෙරුන් වහන්සේ කරා එළඹ "ස්වාමිනි, මා ගමට ගිය මනා වේ ද" යි කීය. එතෙපුල් අසා මලියදෙව මහතෙරුන් වහන්සේ "අද මේ එක රාත්‍රියට ඉවසව යි[8] භික්ෂූන් වහන්සේ දක්නා පිණිස සෙට දවස් ශක්‍රදෙවේද්‍රයෝ එති. අද මෙතැන්හි රූඳුණා නම් දෙවඟනන් හා සමඟ දිව්‍යසෙනාව විසින්[9] පිරිවරනලද ශක්‍රදෙවේන්‍ද්‍රයන්ගේ ශ්‍රීවිභූතිය ප්‍රත්‍යක්‍ෂයෙන් ම දක්නා වේ ද, එබැවින් මෙතැන්හි ම රඳව" යි වදාළසේක; එතෙපුල් අසා කෙළෙඹිපුත්‍රයා ද යහපතැ යි කියා එදවස් විහාරයෙහි ම විසීය; දෙවන දවස් ශක්‍රදෙවේන්‍ද්‍රයෝ පරසතුමල් ආදි වූ නානාවර්ණ සුගන්ධ පුෂ්පයන් හා දීපධූපාදිය ගෙන්වා ගෙන දෙකෙළපනස් ලක්‍ෂයක් පමණ දෙවඟනන් හා සූවිසිකෙළලක්‍ෂයක් පමණ දිව්‍ය නාටකයන් ඇතුළු ව මහත් වූ දිව්‍යසෙනඟ පිරිවරා තව්තිසා භවනයෙන් ඇවිත්[10] භික්ෂූන් වහන්සේට පූජාකොට පසග පිහිටුවා වැඳ පිළිසඳර කථා කෙරෙමින් එකත්පස් ව උන්හ. එකල්හි මහතෙරුන් වහන්සේ කෙළෙඹි පුත්‍රයා ශක්‍ර දෙවේන්‍ද්‍රයන්ට දක්වා "එම්බා, මේ උපාසකයා ශ්‍රද්ධාවන්තය;

---

1. මාගේ ගෙහි - D
   මාගේ ගෙණෙහි - A
2. ඒ භික්ෂූන්වහන්සේට - DEGHKL, ක.භ.,ම.
3. සාධියක් - AJ
   සාදිකයක් - BCDEKL
   සාදික් - GH
4. පහරන ලද්දේය - පිටපත් හැම
5. වන - BGH
6. මුහුදු මැද - BDEKL ස.
7. සිටුවූසේක - BGL
   යවූසේක - K
8. ඉවසව - BDGHKL
9. දිව්‍යසෙනාව හා සමග - B
10. අවුත් - BCGH

Non-Commercial Distribution

තිසරණ පිහිටියේය. දන්පින් කෙරෙයි, දනපතිය" යනාදීන් බොහෝ ගුණ කියා වදළසේක; එකල්හි ශක්‍රදෙවේන්‍ද්‍රයෝ හුනස්නෙන් නැඟී කෙළෙඹිපුත්‍රයා සමීපයට එළඹ දිවමල් දිවසුවඳ ආදියෙන් පූජා කොට කෙළෙඹිපුත්‍රයා හා සමඟ එකත්පස් ව හිඳ පිළිසඳර කථා කරන්නාහු:

> ඉමං දනවිධිං සම්ම - දසපාරමිධම්මතො,
> පඨමං කත්වාන සම්භට්ට - මුනිනා ලොකසාමිනා.
>
> දයකා ඡසු දෙවෙසු - උප්පජ්ජන්ති මහායසා,
> අනෙක සතමුබ්බෙධෙ - පාසාදෙ රතනාමයෙ,
> නෙකදෙවච්ඡරාකිණ්ණෙ - උය්‍යාන පතිමණ්ඩිතෙ.
>
> දයකා සම්ම සග්ගෙසු - තාවතිංසෙ මනොරමෙ,
> සක්කත්තම්පි ච කාරෙන්ති - අබ්බුධෙන අවාචියං.
>
> ලභන්ති දනපතිනො - චක්කවත්ති සිරිම්පි ච,
> සත්ත රතන සම්පන්නා - චතුදීපස්ස ඉස්සරා.

යනාදීන් "එම්බා යහළු, දන් දීම නම් ලොකස්වාමී වූ බුදුරජාණන් වහන්සේ විසින් දශපාරමිතාවෙන් පළමු කොට පිරූ පාරමිතාවය. දන් දුන්නාහු සදිව්‍යලොකයෙහි වෙන වෙන ම දිව සත්රුවනින් විසිතුරු වූ වහසල් පවුරු පදනමින් හොබනා උද්‍යාන විමාන පුෂ්කරණ්‍යාදින් ප්‍රතිමණ්ඩිත වූ නොයෙක් යොදුන් සියගණින් උස ඇති දිව්‍යවිමානවල නොයෙක් සියදහස් ගණින් දෙවඟනන් හා අපමණ දිවසෙනඟ පිරිවරා නිත්‍යසන්තොෂයෙන් පින පිනා දිවසැපත් විඳිනාහු ම ය. තව ද දන්පින් කළාහු වටින් සතිස් ලක්‍ෂ දස දහස් තුන්සිය පනස් යොදුන් පමණ ඇති චක්‍රවාට පර්වතයෙහි බාහිරාන්තය දක්වා අතුරු නොහැර විචිත්‍රාකාරයෙන් ගැවසී සිටගත්තාවූ කනක රජත මාණික්‍යමය විමාන මාලාවෙන් සමලඞ්කෘත[1] වූ තවුතිසා දිව්‍යලොකයෙහි ශක්‍රදෙවේන්‍ද්‍ර ව ඉපද දිව්‍යමය උයන් පොකුණු ගලතළ කල්පවෘක්‍ෂ වහසල් පවුරු පදනමින් හා දහසක් රුවන්දෙරටුවෙන් සැදුම්ලද වෛජයන්ත නම් පායෙන්[2] මුදුන් පැමිණියාවූ ශක්‍රභවනයෙහි වෙසෙමින් දෙදෙව්ලොව දිව්‍යසෙනාව පිරිවරා සතරවරම් මහරජුන් හා අටවිසි යක් සෙනෙවියන් විසින් ගන්නාලද ආරක්‍ෂා ඇති ව දෙකෙළපනස් ලක්‍ෂයක් පමණ දෙවඟනන් හා සමග සූවිසි කෙළලක්‍ෂයක් දිව්‍ය නාටකයන්ගේ නෘත්‍ය ගීත වාද්‍යයෙන් පින පිනා මෙසේ වෙන වෙන ම වර්ණනා කරත් බුදු නොව කියා නිමවා ගත නොහැකි අප්‍රමෙය්‍ය වූ[3] සැපත් විඳිමින් දිව්‍යරාජ්‍යය ද කරන්නාහු මය. තව ද දයකයෝ දෙදහසක් පමණ කොදිවු පිරිවරා මෙර සතරදිග පිහිටි සතර මහාද්වීපයට නායක ව සප්ත රත්නයෙන් හෙබියාවූ චක්‍රවර්ති සම්පත්තියත් ලබන්නාහු මය.

---

1. සාලංකෘත - CDEGHJ, ස.
2. මහපායෙන් - BEHKL
3. අප්‍රමෙය වූ - ඛෙ.ස

Non-Commercial Distribution

තව ද දයකයෝ ධර්මාශොක රජ්ජුරුවන්[1] මෙන් මහත් වූ යශො තෙජසින් යුක්ත ආඥාචක්‍රවර්ත්ති ව ප්‍රදෙශරාජ්‍යයත් කරන්නාහු මය. තව ද දයකයෝ දැසි දස් ගව මහිෂාදීන් හා ඇත් අස් රථ පඩකති සංඛ්‍යාත සෙනාසමූහයින් අනූන ව ඒ ඒ කුලානුරූප[2] අයවැය නිධාන වසයෙන් දවස්පතා පවත්වනලද අපමණ ධන සම්පත් ඇති ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍යශූද්‍රාදි[3] වූ ඒ ඒ වංශයෙහි මහාසාර වත් උපදනාහු මය. තව ද දයකයෝ පසේබුදුබවය අග සවුබවය. මහසවුබවය යන උත්තමභාවයට පැමිණ අග්‍ර වූ ලොකොත්තර ස්වභාව සැපත්[4] ලබන්නාහු මය. අප බුදුහු බාහිර වස්තු තබා ඇස් ඉස් මස් ලෙහෙ ආදි ආධ්‍යාත්මික වස්තු දන් දී බුදුබවට පැමිණ දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණ යක්‍ෂ රාක්‍ෂ මනුෂ්‍ය අග්‍රශ්‍රාවක[5] ප්‍රත්‍යෙකබුද්ධ ආදි වූ හැමදෙනහට උතුම් ව අග්‍රප්‍රාප්ත වූ සේක. එබැවින් දනය නම් ඇම දවස් ම සාදර ව දියයුත්තේය. එම්බා යහළු, දනයෙහි මෙසේ උතුම් විපාක ඇතිබව දන්නා තොප වැනි ශ්‍රද්ධාවන්තයන් විසින් යහපත නපුර ස්වල්පය යි නොසිතා සැපයෙන්[6] පමණක් ම දිය යුත්තේය. කම්පල අදහා සාදර සිතින් දුන්නාවූ දනය ස්වල්ප වී නමුත් පරලොව උපමා නොකොට හැකි අප්‍රමෙය්‍ය වූ විපාක දෙන්නේය යි දන නුවණැති සත්පුරුෂයන් විසින් දන් පින් නම් කළමනා දෙයෙක් මය" යි මෙසේ දනය[7] මහත්ඵල මහානිසංස වන බව දක්වා නැවත කෙළෙඹි පුත්‍රයාහට ප්‍රශංසා කරන්නාවූ ශක්‍රදෙවේන්ද්‍රයෝ

තව දනමයා සොසා[8] - පත්ථරිත්වා සදෙවකෙ,
දෙව ජිවහගාරඩගමහී - නිච්චං නච්චති මණ්ඩිතා.
දත්වා දනවරං සම්ම - සීලවන්තෙ බහුස්සුතෙ,
අනින්දිතො දෙවලොක - මාගච්ඡ මම සන්තිකං.

යනාදීන් "එම්බා කෙළෙඹිපුත්‍රය, තොපගේ දන ප්‍රබන්ධය නිසා උපන්නාවූ කීර්තිඝොෂාව මිනිස්ලොව පැතිර උතුරුවා ගෙන දෙවුලොව දක්වා නැඟී නාටිකා ස්වරූපයෙන් සැරහී දෙවියන්ගේ ජිව්හාග්‍රය[9] නමැති රඟමඬලෙහි අනවරතයෙන් නටා බස්නීය. එබැවින් යහළු, සිල්වත් වූ බහුශ්‍රැත භික්‍ෂූන්වහන්සේ උදෙසා උතුම් වූ ප්‍රත්‍යයදනයන් දී සියල්ලවුන්ගෙන් ප්‍රශංසා ලැබ දෙවුලොව මා සමීපයට නො පමා ව පලා එව"යි කීහ. මෙසේ සක්දෙවුරජ්හු පිළිසඳර කථා කිරීම් වශයෙන් කීවාවූ ධර්මකථාව අසා ඉක්බිති කෙළෙඹිපුත්‍රයා තමා දන් දෙන්ට වස්තු සොයා ඇවිත් එතැනට පැමිණි බව සක්දෙවුරජහට දන්වීය. එතෙපුල් අසා සක්දෙවුරජ විශ්වකර්මදිව්‍යපුත්‍රයා කැඳවා "මේ කෙළෙඹිපුත්‍රයාට සත්රුවන්මය නැවක් මවා ඒ නැවින් ගෙන ගොස් මොහුගේ ගෙදෙර ම[10] ඇර සිටුවාලව"යි කීහ. එතෙපුල් අසා

1. රජ්ජු - BDEGHKL
2. කුසලානුරූප - BCDHK
කාලානුරූප - ම.
3. වෛශ්‍යාදි වූ - මුද්‍රිත හැම
4. ලොකොත්තර භාව සැපත් - BGH
ලොකොත්තර සැපත් - ACJ
5. අග්‍රශ්‍රාවක මහාශ්‍රාවක - DEGHK, ස.
6. සැපවෙන - K හැර පිටපත් හැම
සැහෙන - K
7. දනය නම් - ACJ, ම.
8. දනමයං ඝොසං - ABCDJ
9. ජිව්හාග්‍ර - BGHA
10. ගෙහි ම - EGHKL

Non-Commercial Distribution

විශ්වකර්ම දිව්‍යපුත්‍රයා සත්රුවන් නැවක් මවා එහි සත්රුවන් පුරා කෙළෙඹි පුත්‍රයා සත්රුවන් මහනැවට නංවා තමාගේ ආනුභාවයෙන් නොලස් ව ගෙන ගොස් සත්රුවන් සහිත වූ මහ නැව කෙළඹිපුත්‍රයා වසන ගෙහි ම පිහිටුවා දෙව්ලොවට ගියේය.

එකෙණෙහි රජ්ජුරුවන්ගේ දළපුදුයේසන වසන දෙවතා දූ ඔහුගේ කුශලානුභාවය දක සාදුකාර දුන්නීය. රජහු ඒ අසා "මේ කවුරුන්ගේ සාධුකාර ශබ්දයෙක් දැ" යි විචාළ කල්හි දෙවතාදූ කෙළෙඹිපුත්‍රයාගේ සියලු ම ප්‍රවෘත්තිය කියා ඔහුගේ කුශලානුභාව විශෙෂය බලා සාධුකාර දිනිම් කීහ. එතෙපුල් අසා රජ්ජුරුවෝ සතුටු ව කෙළෙඹි පුත්‍රයා කැඳවා ගෙන්වා ගෙන බොහෝ සම්පත් දී රට තොට සියලු විධාන ම ඕහට සලස්වා දනත[1]ය යි යන මහගමක් ඕහට බත් ගම් කොට දුන්හ. එතැන් පටන් ඒ කෙළෙඹි පුත්‍රයා අපමණ වූ කුශලරාශි වර්ධනය කෙරෙමින් ආයු කෙළවර තමාගේ යශොතෙජසින් දශදිගාන්තරය[2] පුරා උතුරවමින් දෙව්ලොව උපන[3].

මෙසේ ප්‍රඥසම්පන්න වූ උත්තමයෝ තමන් විසින් දෙනලද දනමය කුශලානුභාවයෙන් මහාසමුද්‍රයෙහි දෙවියන් විසින් මවන ලද දිව සත්රුවනින් පිරුණාවූ දිව්‍යනෞකාවෙන් ගොඩ බැස දිව සත්රුවනින් පිරුණාවූ ගිහිගෙයි වැස දනමානනාදි[4] වූ බොහෝ කුශලසම්භාරයන් රැස්කොට දෙව්ලොවට නැඟී දිව්‍යප්‍රාසාදයෙහි වෙසෙමින් ප්‍රමාණාතික්‍රාන්ත වූ දිව්‍යසම්පත් වළඳ අති ශාන්ත වූ නිවන්පුරයටත් පැමිණෙන්නාහු මය. එබැවින් අප්‍රමාද ව කුශල් කොට දිව්‍ය මනුෂ්‍ය සම්පත් වළඳ නිවන්පුර සිරි විඳින්ට උත්සාහ කළ මැනවි. කියනලදුයේ මැයි.

එවං බුධා පරම දන මහා සමුද්දෙ
නාවාය මණ්ඩිතමනොමයකායකාමං,[5]
කීළිත්වා දිබ්බවිභවෙහි පමොදමානා
පප්පොන්ති සාධු සුඛසන්තිපුරං සුරම්මං.[6]

මේ මෙහි සතරවන
දනකුටුම්බික[7] වස්තුව ය.

තව ද මෙහි පස් වැනි වූ මෛත්‍රෙය්‍ය වස්තුව නම් කවරයත්. ඒ වනාහි මතු උපදනා මෛත්‍රී බුදුන්ගේ බුධ ශ්‍රී ප්‍රකාශ කිරීම් වශයෙන් අප මහ ගෞතම බුදුන් විසින් වදරනලද අනාගතවංශ දෙශනාව මය. එබැවින් එහි විස්තර කථාව අනාගත වංශයෙන් ම දතයුතු. මෙතැන්හි මම වනාහි ඒ මෛත්‍රීය බුදුන්ගේ ඉතා ආශ්චර්‍ය්‍යමත් වූ බුධරාජ්‍යශ්‍රී[8] විශෙෂය අසා ශ්‍රධාවන්ත වූ සියලු සත්වයෝ ම මේ බුධොත්පාදයෙහි

---

1. දන්ව - AGHK
   දනව - DL
   ධානව - B
2. දශදිගාන්තය - DEGH
3. උපන්හ - BC
4. දනමානාදි - බෞ.ස.
5. මනොමයිකා සකාමං - B
   මනොමයකායකාම - පාලි, ක.සි.සඳ.ස.
6. පප්පොන්ති සගගපවරංහි පුරං සුරම්මං - A
7. කුටුම්බික - AC
   කුටිම්බිය - B
8. බුද්ධරාජශ්‍රී - C

Non-Commercial Distribution

වඩවඩා කුසල් කොට මතු ඒ මෛත්‍රීය බුදුන් දක ප්‍රාර්ථනා වූ පරිද්දෙන් ත්‍රිවිධසම්පත්තිය සාධා ගනිත්ව යි යන ප්‍රාර්ථනාව[1] හා "මම ද ඒ මෛත්‍රීය බුදුන්ගේ[2] සමයෙහි අෂ්ටාඞ්ගධර්මයෙන් යුක්ත ව විවරණ ශ්‍රී ලදින් දශප්‍රකාර පාරමිධර්මයන් සමතිස් ආකාරයකින් පුරා මස්තක ප්‍රාප්ත කොට ලොවුතුරා බුදු ව සසර දුක් ගත්තා සත්ව වර්ගයා අමාමහ නිවන් දක්විය හෙම්ව"යි යන මාගේ අභිමත ප්‍රාර්ථනාව ද සාධා[3] ගන්නා පිණිස ඒ මෛත්‍රීය බුදුරජාණන් වහන්සේගේ පූර්වාභිනීහාරයෙහි පටන් එකදෙශමාත්‍රයක් ගෙන හැර දක්වමි; තමහට වැඩ කැමැති සත්පුරුෂයන් විසින් සාවධාන ව ඇසිය යුතු. හේ කෙසේ ද යත්:

මතු උපදනා ඒ මෛත්‍රීය බුදුරජාණන්වහන්සේ අතීතකාලයෙහි අනෙකාදිනවයෙන් සමාකීර්ණ[4] වූ අනවරාග්‍ර සංසාරවෘත්තයෙහි චුතිප්‍රතිසන්ධි වශයෙන් ජාතියෙන් ජාතියෙහි සැරිසරා ඇවිදිනාසේක් බුධ ප්‍රත්‍යෙකබුධ ආර්‍යශ්‍රාවකාදි වූ කල්‍යාණමිත්‍රයන් සෙවනය භජනය පයුරුපාසනය කෙරෙමින් අනෙක ජාති කොටි ශතසහස්‍රයක්[5] මුළුල්ලෙහි ප්‍රතිරූපදෙශවාසයෙන් යුක්ත ව සත්පුරුෂ සංසෙවනය[6] සද්ධර්මශ්‍රවණය යොනිසොමනස්කාරය ධර්මානුධර්මප්‍රතිපත්ති යයි කියනලද චතුශ්චක්‍රසම්පත්තිය[7] පුරා මේ මහා භද්‍රකල්පයට සොළොසාසඞ්ඛ්‍යයකප්ලක්ෂයකින් මත්තෙහි දඹදිව මධ්‍යමණ්ඩලයෙහි ප්‍රභාවන්ත නම් චක්‍රවර්තිරජ ව අනන්‍යසාධාරණ වූ සප්තරත්නයකින් හා සතර මහා සෘද්ධියකින් යුක්ත ව දෙදහසක් කොදිව්[8] පිරිවරා මහමෙර සතරදිග පිහිටි සතරමහා ද්වීපයෙහි ඇවිද සියලු සත්වයන් පඤ්චශීලයෙහි පිහිටුවා ප්‍රජාපාල නය කෙරෙමින් විද්‍යාධර පක්ෂියක් හා සමාන වූ අවිකලාඞ්ග ඇති මහසෙනඟ පිරිවරා අමරගණානුබද්ධ දෙවෙන්ද්‍රවිභ්‍රමයෙන් චක්‍රවර්ති රාජ්‍යය කරනසේක. එකල මුහුර්ත නම් සර්වඥ කෙනකුන් වහන්සේ ලොකයෙහි පහළ ව සද්ධර්මදෙශනාවෙන් මහජනයා පහදවා[9] නොයෙක් කෙළලක්ෂ ගණන් ආර්‍ය සමූහයා[10] විසින් පිරිවරන ලදු ව මුළු ලොව[11] සනහමින් ගම් නියම්ගම් රාජධානි පිළිවෙළින් දනවු සැරිසරනසේක. එකල ඒ ප්‍රභාවන්ත නම් සක්විතිරජව උපන් මෙත් මහබෝසතාණන්වහන්සේ "බුදුහු ලොකයෙහි පහළ වූසේක" යනු අසා සතිස් යොදනෙක පැතිර සිටි මහසෙනඟ පිරිවරා බුදුන් කරා එළඹ නොයෙක් රත්නයෙන් පූජාකොට අමාහැල්ලෙක ගැලෙන්නාක් හු මෙන් භක්තිප්‍රෙමයෙන් බැසහෙව වැඳ නැඟී සිට බුධාලම්බන ප්‍රීතීන් පිනපිනා පක්ෂිද් හා සමහ එකත්පස් ව හිඳ අෂ්ටාඞ්ගසමුපෙත මධුරභාරතීන් දෙසනලද සද්ධර්මය අසා අතිශයින් පහන්සිත් ඇතිව සප්තවිධ රත්නයෙන් හා සියලු උපභොග පරිභොග වස්තුවෙන් හෙබියාවූ චක්‍රවර්ති රාජ්‍යය හැර සසුන් වැද මහණව රත්න සර්විරයන්වහන්සේය යි යන නමින් ප්‍රසිධ ව ශාසන නමැති ආකාශතලයෙහි[12] පූර්ණ චන්ද්‍රමණ්ඩලය සේ බැබළෙමින් ශීලසමාධ්‍යාදි ගුණධර්මයෙන් යුක්ත ව

1. ප්‍රාර්ථනය - E
2. බුදුරජාණන්වහන්සේගේ -C
3. සිද්ධ කර - B
4. සංකීර්ණ - B
5. සහස්‍රයක් - C
6. සත්පුරුෂයන් සේවනය - BCK ක.කි.ස.ම.
7. චතුස්සම්පත්තිය - ක.කි.ස.
8. කොදෙව් - C
9. සිත් පහදවා - B
10. ගණයා - C
11. ලෝ - BDEGH
12. ආකාශතලයෙහි - ක.ස.

Non-Commercial Distribution

පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ධ්‍යානලාභී ව වසනසේක් එම ජන්මයෙහි සර්වඥයන් වහන්සේගේ සම්මුඛයෙන් සතර පදයකින් යුක්ත ගාථාවක් අසමින් එහි අර්ථ විභාග කොට නොනිමන තෙක් ම ෂඩ් අභිඥවන් හා සමඟ සිවුපිළිසිඹියාපත් රහත් බවට පැමිණෙන්ට උපනිශ්‍රය ඇති ව ද සසර දුර්ගන්නා සත්වවර්ගයා කෙරෙහි කරනලද මහත් වූ කරුණාවෙන් සර්වඥතාඥානය ප්‍රාර්ථනා කොට එදවසට තමන් වහන්සේ මනුෂ්‍යාත්මභාවාදි වූ අෂ්ටධර්මසමෝධානයෙන් යුක්ත වීර්‍යාධික මධ්‍යම ශ්‍රද්ධා ඇති ඥෙය බෝධිසත්ව හෙයින් විශෙෂයෙන් ම දනාධ්‍යාශය ඇති ව දනයෙහි ඇලී ජීවිතය ද පරිත්‍යාග කොට දන් දීමෙහි බලවත් ව අටගත්තාවූ[1] උත්සාහ ඇති වූ සේක. එකල ධර්මසභාමණ්ඩපයෙහි රැස්ව හුන්නාවූ භික්ෂූන් වහන්සේ "එම්බා ඇවැත්නි, මේ දනාධ්‍යාශ ඇති මහණ තෙම අනාගතයෙහි ශක්‍රදෙවෙන්ද්‍ර ව උපදී දෝ හෝ නොහොත් මාර ව බ්‍රහ්ම ව උපදී දෝ හෝ නොහොත් බුදු වේ දෝ හෝ යන මේ[2] කථාවක් ඉපදවූසේක.

එසමයෙහි මුහුර්ත නම් බුදුරජාණන්වහන්සේ නොයෙක් අලංකාරයෙන් සරහා පිළියෙල කරන ලද ධර්මසභා මණ්ඩපයෙහි විසිතුරුකොට පනවන ලද උතුම් වූ බුද්ධාසන මස්තකයෙහි සහශ්‍රරශ්මීන් සාගරකුක්ෂිය බබුළුවමින් උදයගිරි මස්තකයට පැමිණි තරුණ සූර්‍යයා මෙන් සියලු ධර්මසභාමණ්ඩපය රුවන් රසධාරාවෙන්[3] පරිෂෙක[4] කරන්නාක් මෙන් නීලපීත ලොහිතාවදාත මාඤ්ජෙෂ්ඨ ප්‍රභාස්වරය යි කියන ලද ෂඩ්වර්ණ ඝන බුද්ධරශ්මිමාලාවෙන් බබුළුවමින් තාරකා සමූහයා විසින් පිරිවරනලදු ව පූර්ණචන්ද්‍රමණ්ඩලය මෙන් භික්ෂු සමූහයා විසින් පිරිවරන ලදු ව වැඩහුන්සේක් පුපිපි රන්පියුම් වනයක් මධ්‍යයෙහි සඤ්චාරය[5] කරස්නාවූ පන්වනක් පැහැයෙන් හෙබි[6] භ්‍රමරයුගලයක් හා සමාන වූ පස්පෑ දිස්නා විසිතුරු ඇස් සහළින් සියලු භික්ෂුසමූහයා බලා ඔබ ඇමදෙනා වහන්සේගේ අදහස් දන සිව්දෑගදින් පිරූ රුවන් කරඬුවක් හරනා කලක්[7] පරිද්දෙන් භික්ෂු සඞ්ඝයා සතුටු කරවමින් මුඛපද්මය විදහා අෂ්ටාඞ්ගයෙන් සමන්විත වූ බ්‍රහ්මස්වර විහිදුවා "එම්බා මහණෙනි, මේ රත්න නම් මහණ[8] එසේ මෙසේ වූ ලාමක සත්වයෙක් නොවෙයි, බුදු බිජුවටෙක, මෙතෙම මතු අනාගතයෙහි සොළොසාසඞ්ඛ්‍ය කප් ලක්ෂයක් ගිය කල මා සේ ම බෝධි සම්භාර පුරා මෛත්‍රීය නම් වූ ලොවුතුරා බුදුවෙයි. එබුදු වන ආත්මභාවයෙහි මෝහට කෙතුමති නම් රාජධානියෙක් වාසස්ථාන වෙයි. එහි සඞ්ඛ නම් චක්‍රවර්ති රජ්ජුරු කෙනෙක් රාජ්‍යය කෙරෙති; ඒ රජ්ජුරුවන්ට අග්‍රපුරොහිත වූ සුබ්‍රාහ්මණ[9] නම් බ්‍රාහමණ උතුමාණකෙනෙක් පිය වන්නාහ. බ්‍රහ්මවතී නම් බැමිණි දේවි කෙනෙක් මවු වන්නාහ. පදුමා ය සුමනා ය යන අග්‍රශ්‍රාවිකා දෙදෙනෙක් වන්නාහ. සුධන ය සඞ්ඝ ය යන උපාසකවරු දෙදෙනෙක් අග්‍රඋපස්ථායක වන්නාහ. යශවතීය සඞ්ඝාය යන උපාසිකාවරු දෙදෙනෙක් අග්‍ර උපස්ථායිකා වන්නාහ. නාග

---

1. හටගත්තාවූ - ක.කි.ඤ,ම.
2. මෙසේ වූ -C
3. රන්රසධාරාවන් - මුද්‍රිත හැම, ස. රුවන් රැස්ධාරාවන් - L
4. ස්පර්ශ - ක.කි.ඤ
5. සංචාරය - පිටත් හැම
6. හෙබියාවූ - K මුද්‍රිත හැම, ස.
7. කලස් හරන - ක.කි.ඤ
8. මහණ කොට - GH ම.
9. සුබ්‍රහ්ම - BCEGH; සබ්‍රාහ්මණ බෙ.ස.

Non-Commercial Distribution

වෘක්ෂයෙක් බොධි වන්නේය; අටඅසූරියන් උස බුඩශරීර[1] වන්නේය. බ්‍යාමප්‍රභා මණ්ඩලය පස්විසියොදනෙක පැතිර සිටිනේය; අසූ දහසක් අවුරුද්දට ආයුෂය වන්නේය" යි මෙසේ විවරණශ්‍රී දී වදරා ස්තුති කොට හුනස්නෙන් නැඟී ගඳ කිළියට වන්සේක.

ඉක්බිති ඒ මහාපුරුෂයාණන් වහන්සේ සන්තුෂ්ට වූ සිත් ඇති ව දිව්‍ය මනුෂ්‍යයන් විසින් පුදන ලදු ව බුඩකාරකධර්මයන් පරීක්ෂා කරනසේක්:

දනං සීලං ච නෙක්ඛම්මං - පඤ්ඤා විරියෙන පඤ්චමං,
ඛන්ති සච්ච'මධිට්ඨානං - මෙත්තු 'පෙක්ඛා'ති තෙ[2] දස.

යනාදීන් දක්වන ලද දශ පාරමිතාවන් දක අනුලොම ප්‍රතිලොමාදී වශයෙන් සම්මර්ශනය කෙරෙමින් දශදහසක් සක්වළ මුළු පොළෝ[3] මෙරු යුගන්ධරාදීන් කම්පිත කරවා මෙයින් අන්‍ය වූ බුඩකාරක ධර්මයෙක් නම් නැත්තේය යි[4] නිෂ්ඨාවට පැමිණ දෘඪ සමාදනය කොට එතැන් පටන් අවිචිමහනරකාදි වූ අටලොස් අභව්‍යස්ථානයට නොපැමිණ සොළොසාසඞ්ඛ්‍ය කප්ලක්ෂයක් මුළුල්ලෙහි නිරතුරු ව වඩනලද ඒකාකාර වීර්‍ය්‍ය ඇති ව දශප්‍රකාර පාරමීධර්මයන් පුරා සමතිස් ආකාරයෙකින් මස්තකප්‍රාප්ත කොට අප මහා ගෞතම බුදුන් බුදුවන්නාට පළමු කොට තුසීපුර දිව්‍ය ලොකයෙහි ඉපද අපමණ වූ දිව සැපත් අනුභව කෙරෙමින් දෙවියන්ට ධර්මදෙශනා පවත්වා නේසුවහස් දිව්‍යරාජයන්ගේ කිරුළු කුළු මිණිරැසින් තමන් වහන්සේගේ පාදපද්මය[5] බබුළුවා සධර්මශ්‍රීන් යුක්ත ව ඒ තුසීපුර[6] දිව්‍යලොකයෙහි දූන් සහපිරිවරින් වාසය කරනසේක.

කවර කල බුදුවනසේක් ද යත්. අප මහා ගෞතම බුදුන්ගේ මේ කරුණාශාසනය පන්දහසක් අවුරුදු පැවති කල්හි එයින් මත්තෙහි අකුශල ධර්මයන්ගේ උත්පන්න වීම හේතුකොට ගෙන සත්වයන්ගේ ආයු සංස්කාරය ක්‍රමයෙන් පිරිහී දස අවුරුද්දට පරමායු වෙයි. එකල සත්වයෝ තිරිසනුන් වැනියහ; වැදූ[7] මවුපියෝය යි වෙනසක් නොදනිති. නැඟිණියෝය බුණැණියෝය මලණුවෝය බෑණෝය මයිලණුවෝය බෑනණුවෝය දියනියෝය යනාදි ව්‍යවහාරයක්[8] නැති ව තම තමන් කෙරෙහි ම ප්‍රේම දෙති; සියලු රස ම අන්තර්ධාන වෙයි; අමු මෙනේරි වරා ආදි වූ කටුසර සාලේ බත් ම රජදරුවන්ට අග්‍ර භොජන වෙයි; මෙසේ ලොව සියලු සැපතින් හීන වූ කල්හි යට නිදන වර්ගයෙහි කී පරිද්දෙන් රොගාන්තඃකල්පය ශස්ත්‍රාන්තඃකල්පය දුර්භික්ෂාන්තඃ කල්පය යි කියන ලද ත්‍රිවිධ වූ අන්තඃකල්පයන් අතුරෙන් දූන් සත්වයාගේ ද්වේෂය උත්සන්න බව හේතුකොට ගෙන ශස්ත්‍රාන්තඃ නම් කල්පයකින් ලොකවිනාසය[8] වෙයි. හේ කෙසේ ද යත්.

අන්තඃකල්පය නස්නට පළමු සත් දවසක් තිබියදී කාමාවචර දේවතාකෙනෙක් අවමඟුල් වෙස්[9] ගෙන මිනිස්ලොව ඇවිද "සත්වයෙනි, මෙයින් සද්දවසක් ගිය කල

1. බුද්ධශරීරය - ABEHJK
2. මෙ -BDEGHKL
3. පොළොව - පිටපත් හැම
4. නැතැ යි - KL ස
5. පාදපද්මයන් - BDEGH
6. තුසිතපුර - DEGH; තුසිත - KL
7. වැදූ - DEGH; ක.කි.සද.ම.
8. බැව්හාරයක් - KL
   ලොක විනාස - ABDGHJ, ක.කි.සද.ම
9. වෙසක් - ABG

Non-Commercial Distribution

මෘගසංවර්‍තාවය යි යන විනාස කර වූ මහා වර්‍ෂාවෙක් සද්දවසක් මුළුල්ලෙහි ධාරානිපාතයෙන් වස්නේය; එහි තෙමුණු කෙනෙක් ඔවුනොවුන් ඇසට මුවන් සේ පෙනෙති, එකල උනුන්ගේ[1] ජීවිත විනාස කෙරෙති; දිවි රක්නා කැමැති කෙනෙක් ඒ සත් දවසට දර පැන් බත් සාල් ලුණු ඇඹුල් රැස්කොට ගල්ගුහා ආදියෙහි තබා ගෙන වැදහිඳ දිවි රකුව"යි කිය කියා කෙළ ලක්‍ෂයක් සක්වළ ඇවිදිති. එබස් අසා සත්වයෝ තමන් ස්වභාවයෙන් ම අඥාන හෙයින් ඒ දුටුවෝ කවුරු ද ඇසුවෝ කවුරු ද, ඒ දක ආවෝ කවුරු ද, එනම් කුමන බසෙක් ද" යි නොගිවිස සිනාසෙති; සමහර නුවණැති කෙනෙක් "කවුරු දනිද් ද, දෙවියන් කී ලෙස ම කරම්හ"යි ගල්ගුහා පර්‍වතගුහා ආදියෙහි දෙදෙනෙක් ඔවුනොවුන් ඇසට නොපෙනෙන සේ ඉඳිති, එකල මෘගසංවර්‍තාව කෙළලක්‍ෂයක් සක්වළ එකහෙළා ධාරානිපාතයෙන් වසින්ට පටන් ගන්නේය; පොද බින්දුවකින් තෙමුණාවූ කෙනෙකුදු ඔවුනොවුන් ඇසට මුවන් සේ පෙනෙති. කොළ, තෙල මුවා ගනුව මරව අසු කරව'යි කිය කියා ඔවුනොවුන් ලුහුබඳවා ගනිති; තණපත් පරඬලාපත් සියුම් වූ මුවහත් ඇති කඩුපත් සේ මැවී යෙයි. එ සද්ද[3] මුළුල්ලෙහි සත්වයෝ මෙසේ ඔවුනොවුන් මරා මුළුපොළොව[3] එක මස් කළවිටක් සේ ලේ මුහුදු කෙරෙති; ඉක්බිත්තෙන් වැසි හළ කල ජීවත් වූ කෙනෙක් එලිබැස මළමළ නෑයන්ගේ පොලුගෙන[4] තිබෙන අතුල් පතුල් ඉස් කන් නාසා ආදි වූ ඇඟ මස් දක" අපගේ නෑයෝ අප කියමන් නොගෙන දන් හැමදෙන ම නටහ"යි මහත් වූ කරුණා උපදවා "අපි හැම ජීවත් වූ ගණන ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රී උපදවා මෙතැන් පටන් ප්‍රාණවධ නොකරම්හ" යි පළමුකොට පාණාතිපාතය දුරු කෙරෙති; ඒ කුශලයෙන් ඔවුන් වැදූ දරුවන්ට විසි අවුරුද්දකට ආයු වෙයි; ඔහු දෙවැනි ව අදත්තාදානය[5] හැරපියති; උන් වැදූ දරුවන්ට සැට අවුරද්දකට ආයු වෙයි යනාදීන්[6] ක්‍රමයෙන් පරුෂවචනය සම්ඵප්‍රලාපය අධික ලොභය අධික ද්වේෂය විපරීත දෘෂ්ටිය යන මේ දශවිධ වූ අකුශල කර්‍මයන් හැර දසවිධ වූ කුශල කර්‍මයන් කෙරෙහි පිහිටා යෙති. ඒ කුශලධර්මයන්ගේ[7] ආනුභාවයෙන් ක්‍රම ක්‍රමයෙන් වැඩී දෙසියයක් අවුරුද්දට ආයු වෙයි. එකලට දඹදිව ඉතා සමෘධ ව හුණවනයක් බටවනයක් මෙන් අතුරු නැති ව මනුෂ්‍යයන්ගෙන් ගැවසී සිටිනේය; කුකුළු පියාසර[8] ගම් නියම්ගම් රාජධානි සමෘධ වන්නේය. සියලු ජනපදයෝ ම සොරුන් සතුරන්ගෙන් භය නැති හෙයින් සුභික්‍ෂ වන්නාහ. එකල බරණැස් නුවර එම නමින් ව්‍යවහාර[9] වෙයි.

තව ද එයින් මත්තෙහි කුශලධර්‍මය වැඩි වැඩී සේ සත්වයාගේ ආයු ක්‍රමයෙන් වැඩි අනූදහසක් අවුරුද්දට පරමායු[10] වෙයි; එකල බරණැස් නුවර නම් පෙරළී උත්පල නම් නුවරෙක් වෙයි; ඒ නුවර දිගින් පළලින් යොදනක් පමණ මහත් ව සමෘධ වෙයි; එයින් මත්තෙහි තව ද ආයු ක්‍රමයෙන් වැඩී ලක්‍ෂයක් අවුරුද්දට වූ කල උත්පල

1. උනුඋනුන්ගේ - CJ
   උනුඋන්ගේ -A
   උනුනුන්ගේ - ක.කි.සඳ.ම
2. සත් දවස - ACE ක.කි.සඳ.ම
3. මුළු ලොව -A
4. පොලු ගැසී - D
5. අදින්නාදනය - DH;
6. යනාදි - ABDEGNJKL
7. කුශල කර්මයන්ගේ - KL
8. පියාසරයෙන් - BK
9. බැවහාර - ABGHJKL
   බැවහැර - J
10. පරමායුෂ - ABG

Non-Commercial Distribution

නම් නුවර නම් පෙරළී අයම් විතරින් සත් යොදුන් පමණ ඇති පදුම නම් නුවරෙක් වෙයි; තව ද, වඩ වඩා කුශල ධර්මයාගේ බලයෙන් අසංඛ්‍යයක් අවුරුද්දට ආයු වෙයි; එකල පදුම නම් නුවර නම් පෙරළී දෙළොස් යොදුන් අයම් විතර ඇති මහුර නම් නුවරෙක් වෙයි; ඒ අවධියට මිනිස් ලොව ආයු ශක්තීන් දෙව්ලොවටත් වඩනේ ම ය. එසේ හෙයින් කියනලදී:

> සම්ඩ් ගාමා නිගමා පුරා වරා
> බහු භවෙ අඩ්ඪකුලෙහි ආකුලා,
> ස ජම්බුදීපො සුරවාසනොටිකො[1]
> භවෙය්‍ය තස්මිං සමයෙ පනායුතා[2] යි.

මෙසේ එකල්හි මනුෂ්‍යයෝ ආයු බොහෝ හෙයින් උපන් කල් නොදනිති, මියන කල් නොදනිති; ජරා විලිපිලි නැත. රොගාන්තරාය[3] නැත; මෙසේ සුවදුක් නම් කෙසේ බවත් නොදන සත්වයෝ කුසල් කිරීමෙහි ප්‍රමාද වෙති; ඒ අකුශලයෙන් ආයු පරිහානියට පැමිණ ක්‍රම ක්‍රමයෙන් අසූදහසක් අවුරුද්දට ආයු වෙයි. පන්සියයක් හැවිරිදි කුමරුවන්ට පන්සියයක් හැවිරිදි කුමරියන් ශරණ පාවා දෙති; මුළු දඹදිව සියලු උපභොග පරිභොග වස්තූන් හා පඤ්චකාම සම්පත්තීන් සමෘධවන්නේය. වර්ෂාව ද දෙපෝයෙන් දෙපෝයෙහි දස දවසින් දස දවස[4] මධ්‍යම යාමයෙහි භූමිරසය වඩමින් වස්නේය. එකල මහුර නම් නුවර නම් පෙරළී දිග දෙළොස් යොදුන් පුළුල සත්යොදුන් අවටින් තිස් යොදුන් පමණ ඇති කෙතුමතී නම් රාජධානියෙක් වෙයි. වදළේ මැ තෝ.

> තද කෙතුමතී නාම - රාජධානි භවිස්සති
> ද්වාදස යොජනායාමා - සත්තයොජන විත්ථතා. යි

තව ද පෙර දිඹුල්දඬෙන්[5] ගෙයක් නංවා සත් ඇතවළෙක[6] සත් පසේ බුදුකෙනකුන් වහන්සේ වස් වසවා පින් කළ කුළුපොතු දෙපුතු පියකෙනකුන්ගෙන් පුතණුවෝ සදෙවු ලොව ඔබ්නොබ සැරිසරා සැපත් විඳ මිනිස්ලොව මහාපණාද නම් රජ ව ඉපද පස්විසි යොදුන් උස ඇති සත්රුවන් මාලිගාවෙක වෙසෙමින්

---

1. සුරම්ාසනොටිකො - J ක.සි.ත.
2. තතායුතා - ක.සි.ත.
   පනායුතා J
3. රොගාන්තරා -ACEGHJL
4. සදවසින් සදවස - C
   දවසින් දවස - ක.සි.ත.ම.
5. දඬින් - ම
6. සත්වසෙක - ක.සි.ත.
   සත්දවසක - BG
   සත්වසෙක - L

Non-Commercial Distribution

එහි ම සතෙනක[1] සිට නටන්නාවූ සදහසක්[2] පමණ නළු නාටකයන්ගේ නෘත්‍යගීත වාද්‍යයෙන් සන්තුෂ්ටවෙමින් සොළොස් දහසක් පුරාඞ්ගනාවන් හා නොයෙක් දහස් ගණන්, අමාත්‍යමණ්ඩලයා විසින් පිරිවරන ලදු ව ශක්‍රදෙවේන්ද්‍ර ලීලාවෙන් අසංඛ්‍යයක් අවුරුදු රාජ්‍යය කොට දෙවුලොව ඉපද දිව්‍යසැපත් වළඳ නැවත අප බුදුන් සමයෙහි මිනිස්ලොව ඉපද භද්දිය නම් නුවර එනමින් සිටු ව ඉපද මහා සම්පත් විඳ බුදුන්ගෙන් බණ අසා සසුන් වැද මහණ ව නිවන් දුටහ. පියාණෝ තමන් කළ පින් වැඩිතරම් හෙයින් මෙම බුද්ධාන්තරය මුළුල්ලෙහි සදෙවුලොව සැරිසරා දිව සැපත් විඳ එකල කෙතුමතී නම් රාජධානියෙහි සඞ්ඛ නම් චක්‍රවර්ති රජ ව උපදනාහුය.

ඒ රජ්ජුරුවන් පෙර කළ ආවාස දනයෙහි කුශලයෙන් පළමු කී මහාපණාද රජ්ජුරුවන් විසූ පස්විසි යොදුන් උස ඇති සියක් මාල් ඇති සුවාසුදහසක් රුවන් ගබඩා ඇති ඉන්ද්‍රනීල මාණික්‍යමය වූ බිම් ඇති ඝන රන්මය[3] වූ ටැම් ඇති රිදීමය වූ කොතුරු හා පේකඩ ඇති ප්‍රවාලමය වූ ව්‍යාඝ්‍රපන්ති ඇති රන්මය වූ පළසෙවෙනි ඇති සත්රුවන් මහපාය ගඞ්ගා නම් ගඟින් ආකාශතලයට පැන නැඟී දෙවැනි සඳමඩලක් සේ දසදික් බබුළුවමින් අවුත් නුවරමැද පිහිටා යෙයි. චක්‍රරත්න ය හස්තිරත්නය අශ්වරත්නය මාණික්‍යරත්නය පරිනායක රත්නය ගෘහපති රත්නය ස්ත්‍රීරත්නය යන සත්රුවන් පහළ වෙයි. ඒ රජ නමා හා සමබල ඇති දහසක් පුතුන් ඇති වෙයි; ආකාශයෙන් යන සෑඩි ඇති වෙයි; ශරීරයෙන් සඳුන් සුවඳ වහනය වෙයි, මුඛයෙන් මහනෙල් මල් සුවඳ හමයි; දෙවියෝ සතර දෙනෙක් සතර දිග කඩුගත් අතින්[4] රැකවල් ගෙන සිටිති. ඒ රජහුගේ ආතත විතතාදිය ගන්නාවූ තුයඹීසෙනාව දෙළොස් යොදනෙක පැතිර සිටිති. බ්‍රාහ්මණ මණ්ඩලය පස්විසි යොදනෙක පැතිර සිටිති. සර්වාභරණයෙන් සැරහී නානාවර්ණ අඞ්ග රාගුගල්වා පඤ්චායුධ සන්නද්ධ වූ අමාත්‍ය මණ්ඩලය[5] ම අටසාලිස් යොදනෙක පැතිර සිටිති; සර්වාභරණයෙන් සැරහුණාවූ දිව්‍යාප්සරාවන් හා සමාන රූප ශොභාවන් ඇති ව නැටීම් ගී කීම් බෙර ගැසීම් වස්කුලල් පිඹීම් ආදි වූ චතුරඞ්ග සංගීතයෙහි දක්ෂ වූ භාවභාවලීලා කටාක්ෂ මන්දස්මිතයෙන් යුක්ත වූ සුවාසු දහසක් නාටක ස්ත්‍රීන් පිරිවරා දිව්‍ය සම්පත්ති ඉක්ම පවත්නාක් වැනි මහත් වූ ශ්‍රී විභූතීන් යුක්ත ව ඒ සත්රුවන් මහපායෙහි වෙසෙමින් සියලු පෘථිවි මණ්ඩලයට අනුශාසනා කරන්නාහු ම ය. එසේ අනුශාසනා කරන්නාහු ද තමන්ගේ ප්‍රමාණාතික්‍රාන්ත වූ මහසනඟ පිරිවරා තරු

1. සත්තෙනක - ම.
2. සද්දහසක් - DJ
   දසදහසක් - ACGHI ම.
3. ස්වර්ණමය - ක.කි.කැ.ම
4. අත් ඇති ව - BKL
5. මණ්ඩලයා -CE
6. රජ්දරුවන් -AJ

Non-Commercial Distribution

පිරිවැරූ පූර්ණචන්ද්‍රයා සේ මහත් වූ රාජානුභාවයෙන් දිලිහි දිලිහී චක්‍රරත්නානුභාවයෙන් පන්සියක් පන්සියක් පමණ කොදිවු[1] පිරිවරා මහමෙර සතරදිග පිහිටි සතරමහ ද්වීපයෙහි අහසින් ඇවිද සියලු සත්‍වයන් පව් නොකොට පන්සිල් රක්නා සේ අවවාද කියා දහවල් බතට තමන්ගේ මාළිගාවට ම එන්නාහ. වදළේ මැනෝ:

සංඛො නාම සො රාජා - අනන්ත බලවාහනො;
ඝත්තරතන සමපන්නො - චක්කවත්ති මහබ්බලො.

ඉඩිමා යසවා චෙච - සබ්බකාම සමප්පිතො,
හතපච්චත්ථිකං ඛෙමං - අනුසාසිස්සිති[2] ධම්මතො. යි.

තව ද ඒ කෙතුමතී නම් රාජධානිය කෝවේ මහවේ ආදි වූ ඒ ඒ ස්ථානයෙහි රන්ධජ රිදීධජ රන්පතාක රිදීපතාක රන් තොරණ රිදීතොරණ රන් ඇගෑ රිදී ඇගෑ පුන්කලස කෙහෙල් තොරණ ආදියෙන් සැරහී තිබෙන්නේය. නානාප්‍රකාර වස්ත්‍ර ජාතීන් ද රන් රිදී මුතුමැණික් ආදි වූ අනේකප්‍රකාර වූ වස්තුවෙන් ද එසේ ම අසෝර වස්තුවෙක් මෙහි නැතැ යි නොකිය හැකි සර්වප්‍රකාර සුගන්ධ ද්‍රව්‍යයෙන් හා නොයෙක් කටුක භාණ්ඩාදීන් බබළන්නාවූ සල්පිල් පෙළින් හොබනේය. තව ද ප්‍රසන්න වූ නිර්මල මිහිරි සිහිල් ජලතලාවෙන් යුක්ත ව රක්ත ශ්වේතාදි පඤ්චප්‍රකාර පද්මොත්පලයන්ගේ සුගන්ධගන්ධයෙන් බන්ධුර වූ දිව්‍යමය පුෂ්කරණී පන්තීන් හා පතැස් පෙළින් ගැවසී සිටගන්නේය. තව ද ඒ ඒ තන්හි මනහර අතළ ගල්පෙළින් හා සුපුෂ්පිත ඡායා වෘක්ෂසමූහයෙන් සමෘධ වෙයි. එසේ ම පලුපලලව කුසුමයෙන් සශ්‍රීක වූ අඹ දඹ[3] නා පතා කොබලීල පළොල ඇසළ මුහුර් හඳුන් සඳුන් දෙවුදුරු කපරු දෙල් බෙලි[4] ආදි වූ දිව්‍ය වෘක්ෂ සමූහයෙන් සැරසී සිටිනාවූ දිව්‍යමය උද්‍යාන පන්තීන් ශොභමාන වන්නේය. එකල්හි සෙසු දැ තබා එසේ ම පොකුණු පතැස් උද්‍යාන ආදීහු ම එකාවන් ව මහජනයාට සන්තොෂ එළවන්නාහු මය. එසේ හෙයින් කියන ලදී:

සපොක්ඛරා[5] පොක්ඛරණී විභූසිතා
තහිං තහිං නෙක සුපුප්ඵලපාදපා,
සිලාතලුය්‍යාන පරම්පරා තද
සද ජනානන්දවහා මහාරහා යි.

තව ද ඒ කෙතුමතී නම් රාජධානියෙහි පොළොව පළා නැඟි සත්රුවන්මය මහපවුරු සතෙක් නුවර පිසාරා සිට රියදවලැ යි යන වෙනසක් නොදක්වා[6] ප්‍රභාමත් කෙරෙයි. එයින් එක් පවුරු වළල්ලෙක් සනරන්මයය, එකෙක් රිදීමයය, එකෙක් වෛදූර්‍ය මාණික්‍යමයය, එකෙක් ස්ඵටිකමාණික්‍යමයය, එකෙක්

---

1. කොංදෙව් - BC
2. අනුසාසති - මුද්‍රිත හැම. ස.
3. දෙඹ - පිටපත් හැම.
4. බෙල් - BCDEGHKL
   පොල් - A
5. සාපොක්ඛරා - ABCDEJKL
6. නොදන්වා - මුද්‍රිත හැම, ස.

Non-Commercial Distribution

ලොහිතංකමාණික්‍යමයය, එකෙක් මසාරගල්ල මාණික්‍යමයය, එකෙක් සත්රුවන්මය වන්නේය. ඒ සත්රුවන්මය වූ මහපවුරු උසින් සැටරියන් පමණ මධ්‍යයෙහි පිහිටන්නේය. රන් රිදී වෙරළුම්ණිමය තුන් පවුර එම සත්රුවන්මය මහපවුරෙන් පිටත අනුක්‍රමයෙන් එකිනෙකට මිටි ව පිහිටන්නේය. පිළිවහණ ලොහිතංක ම්සාරගල්ල යන තුන් පවුර සත්රුවන්මය ඒ පවුරට ඇතුළු[1] පිට අනුක්‍රමයෙන් එකිනෙකට මිටි ව පිහිටන්නේය. තව ද ඒ සත්රුවන්මය සත් පවුරු අතුරෙහි අසූරියන් උස ඇති ඝනරන්මය වූ ද රිදීමය වූ ද වෛදූර්‍ය්‍යමාණික්‍යමය වූ ද ස්ඵටිකමාණික්‍යමය වූ ද ලොහිතංකමාණික්‍යමය වූ ද මසාරගල්ලමාණික්‍යමය වූ ද සර්වරත්නමය වූද තාලපන්තිනු සත්දෙනෙක් වටින් වට ගසා පිහිටන්නාහ. එයින් සුවර්ණමය වූ තාලපන්තිය සුවර්ණමය වූ ප්‍රාකාර සමීපයෙහි පිහිටන්නේය. රජතමය වූ තාලපන්තිය රජතමය ප්‍රාකාර සමීපයෙහි පිහිටන්නේය. වෛදූර්‍ය්‍යමය වූ තාලපන්තිය වෛදූර්‍ය්‍යමය වූ ප්‍රාකාර සමීපයෙහි පිහිටන්නේය. ස්ඵටිකමය වූ තාලපන්තිය ස්ඵටිකමය වූ ප්‍රාකාරසමීපයෙහි පිහිටන්නේය. ලොහිතංකමය වූ තාලපන්තිය ලොහිතංකමය වූ ප්‍රාකාර සමීපයෙහි පිහිටන්නේය. මසාරගල්ලමය වූ තාලපන්තිය මසාරගල්ලමය වූ ප්‍රාකාර සමීපයෙහි පිහිටන්නේය. සර්වරත්නමය වූ තාලපන්තිය සර්වරත්නමය වූ ප්‍රාකාර සමීපයෙහි පිහිටන්නේය.

තව ද ඒ කෙතුමතී නම් නුවර සතර දශාවෙහි[2] සත්රුවනින් විසිතුරු වූ වහසල් සතරෙක් මැවී සත් සත් මහල් ව නුවර අලංකාර කෙරෙයි. එම සත්රුවන් වහසල් දෙර කප්රුක් සතරෙක් පොළොව පළා පැන නැඟී නන් විසිතුරු වූ අනෙකප්‍රකාර වූ සම්පත්තීන් සැරහී සිටගන්නේය. මුළු දඹදිව සත්වයන් කැමැති කැමැති වස්ත්‍රාභරණ ආදිය ඉන් එක කප්රුකකින් ගෙනයත් අසූදහසක් අවුරුදු මුළුල්ලෙහි ඇදත් නිමවා ගත නොහැක්ක. තව ද ඒ නුවර මැද සත්රුවන්මය[3] සාලාවකුදු පහළ වන්නේ ය. ඒ ශාලාව සතරදිග කප්රුක් සතරෙක් මැවී තිබෙයි. එසේ ම ඒ නුවර වීථි චතුෂ්ක කෝවේ ආදි වූ ඒ ඒ තැන්හි සර්වරත්නමය දිව්‍යානුභාවයෙන් යුක්ත වූ නොයෙක් සිය ගණන් කල්පවෘක්‍ෂයෝ සර්වසම්පත්තීන් සජ්ජිත ව සිටිනාහ. ඒ කෙතුමතී නම් රාජධානියෙහි දඬෙන් පතින් කළ ගෙයක වසන්නාවූ එක ද සත්වකෙනෙක් නැත; සත්රුවනින් විසිතුරු වූ ප්‍රාසාදවල ම වාසය කෙරෙති; එකල්හි ඒ දඹදිව මුළුල්ලෙහි සත්වයන්ගෙන් සාහ වපුරන කෙනෙක්වත් වෙළෙඳම් නවාම් කරන කෙනෙක්වත් බඩ නිසා දුග්ගන්නා එක ද මනුෂ්‍යකෙනෙක් නැත. සුදුසු භූමි ප්‍රදෙශවල පෙළොව පළාගෙන නැංගාවූ ස්වයඤ්ජාත හැල්කරල්වල කුඩු හෝ නැති ව මුතු සේ පැහැපත් ව සුවඳ හැල්සාල් ගෙන තිබෙයි; එක බිජුවටක් හුණු තැතින් නැඟි පඳුරෙක කරල් කපා මැඩගත් කල දෙදහස් දෙසිය දෙසැත්තෑ ගැලක් පුරා සොළොසාමුණු අටලාසක් සාල් ඉතිරී ව තිබෙයි. ඒ සාල් රන්බඳනෙහි ලා මැණික් උදුනෙහි[4] තබා ජොතිරස[5] පාසාණයෙන් නැඟි ගින්නෙන් බත් පැසුණු කල්හි ඒ බත්

1. ඇතුළු - ACDEGHKL; ඇතුළෙ - BJ
2. දිසාවෙහි - ACHK
3. සත් සත්රුවන්මය - C
4. උක්නෙහි - GH
5. ජොතිරවිග - හ.කි.සු.ම.

Non-Commercial Distribution

රසමසවුලෙන් යුක්ත කොට හැම සත්වයෝ ම අනුභව කරන්නාහ. සත්වයන් මලමූත්‍ර කරම්හ යි සිතූ වේලෙහි නිල්වලාකඩෙක් දිවගෙන අවුත් තිරයක් සේ සිසාරා සිටගන්නේය; එකෙණෙහි පොළොව පැළී මහ වළෙක් මැවී යෙයි. එහි ශරීර කෘත්‍යය කළ කල එවළ අන්තර්ධාන ව පැන් පොකුණෙක් මැවී යෙයි; එයින් උදකකෘත්‍යය කළ කල්හි ඒ වලාකඩ අන්තර්ධාන වෙයි; මෙසේ ඒ කෙතුමතී නම් රාජධානිය හැම ලෙසින් ම දිව්‍යපුරයක් හා සමාන ය. එසේ හෙයින් කියනලදී:

අනන්තභොගෙහි ජනෙහි පූරිතං[1]
මනුඤ්ඤ පාසාද මනෙක තොරණං,
සුගොපුරං දෙවපුරං ව භාසුරං
පුරං භවෙ කෙතුමතී'ති විස්සුතං -යි.

තව ද ඒ කෙතුමතී නම් රාජධානිය පරිද්දෙන් ම දසදහසක් යොදුන් මුළු දඹදිවු තලය එකලට එක මහුල්ගෙයක් සේ[2] සැරහී සමෘධ ව තිබෙන හෙයින් ඒ කෙතුමතී නම් රාජධානිය ඇතුළු වූ මුළු දඹදිවු වැසි සියලු සත්‍රීපුරුෂයෝ ම ඒ ඒ තන්හි පහළ වූ අතිධවල වැලිතලායෙන් යුක්ත ව ප්‍රසන්න වූ මිහිරි සිහිල්දිය පිරී සත්රුවන්මය පියගැටපන්තියෙන් ගැවසී ගත් මනා තොට ඇති හංස චක්‍රවාකාදි අනෙකප්‍රකාර පක්ෂි සමූහයා විසින් රැවු පිළිරැවු දෙන ලද ඇඹුල ඉපුල හෙල්මැලි රත්නෙලුම් හෙළනෙලුම් ආදි වූ පඤ්ච ප්‍රකාර පද්මොත්පලයෙන් ගැවසී ගත් මනහර පොකුණුවල තම තමන්ගේ අභිප්‍රාය වූ පරිද්දෙන් ජලස්නානය කොට දිවසුවඳ විලෙවුන් ගෙන දිවමල් පැළඳ කප්රුක්වලින් තමතමන් අභිප්‍රයානුකූල[3] වූ දිවපිළි හැඳ පෙරව දිව්‍යාභරණයෙන් සැරහී උක්තප්‍රකාර වූ සුවඳ හැල්සාලේ බත් අනුභව කොට දිව්‍යමය වූ නොයෙක් ඇතිරිලි අතුරනලද මහඇඟි යහන්හි වැදහෙව දිව්‍යමය වූ ගාන්ධර්වයන් හා සමාන නාටක ජනයන්ගේ නොයෙක් නැටීම් ගීකීම් බෙරගැසීම් ආදිය බලමින් අසමින් සැප සේ නිදි ගෙන එම ගසන පිඹිනා හඬින් නැවත පිබිද සුවඳතෙල් පහන් ආලොකයෙන් තම තමන්ගේ නොයෙක් සම්පත් හා ශ්‍රී සමෘධිය දක්නාහු ධාන්‍ය හස්ති අශ්ව දසි දස කම්කරාදි සමෘධිය සිහි කෙරෙමින් විශෙෂයෙන් සන්තුෂ්ට වූ සිත් ඇති ව සියලු උපභොග පරිභොග වස්තුවෙන් සම්පූර්ණ ව කායික චෛතසික සැපයෙන් යුක්ත ව හැම කල් ම මහත් වූ අධික සැප අනුභව කරන්නාහ. එකල්හි සියලු සත්වයන්ට ම අටඅනුවක් රෝගය නව අනුවක් ව්‍යාධිය දෙසිය තුනක්[4] අන්තරාය යන මෙයින් කිසිවකිනුත් ව්‍යසනයෙක් නොවන්නේය; දිව්‍ය ශරීර හා සමාන නිරොගි ශරීර ඇති වන්නාහ. එසේ හෙයින් කියනලදී:

සක විභව සමිද්ධිං පෙක්ඛතෙ ජම්බුදීපා
සතත මුදිත චිත්තා පඤ්චකාමා චරන්තා,[5]

විවිධ සුරභි භූසා භූසිතත්තා සුරූපා
විගත සකල රොගා දෙවදෙහා'ව හොන්ති-යි.

---

1. පූජිතං - ACDG
2. මෙන් - KL
3. අභිප්‍රානුකූල - පිටපත් හැම
4. දෙතිස් වනක් - JKL, ම.
5. විරන්තා - BGHK; රන්තා - L . චරන්තා - AC

Non-Commercial Distribution

මෙසේ ඒ සඞ්ඛ නම් චක්‍රවර්ති රජ්ජුරුවෝ පෙර දිඹුල් දඬෙන් කළ ලැගුම්ගෙයි පිනින් ඒ සා මහත් ප්‍රාසාදයක් ලැබෙති;[1] එහි ලාලූ ඇඳෙයි පිනින් සුවාසූදහසක් යහන් ලැබෙති, එක ඇතිරියෙහි පිනින් සුවාසූදහසක් ආස්තරණ ලැබෙති;[1] බැලමෙහෙ කොට දුන් දනයෙහි පිනින් දිව්‍යාභොජන ලැබෙති;[1] ඒ ගෙයි ලාලූ එක පීඨයෙහි පිනින් සුවාසූ දහසක් සිංහාසන ලැබෙති;[1] රැක්කාවූ ශීලයෙහි පිනින් එකල සමසිතින් දන් පිසූ ක්‍ෂත්‍රිය ප්‍රධාන කොට ඇති සුවාසූ දහසක් බිසෝවරුන් ලැබෙති;[1] ඒ පන්සල වට වැට කරවාලූ පිනින් නුවර වට සත්රුවන් පවුරු සතෙක් මැවෙයි; වෙහෙරට ඉඳුවාලූ තල්පැළෙහි පිනින් සත්රුවන්මය වූ තල්ගස් සත්වළල්ලෙක් නුවර සිසාරා පැනනැඟී[2] සිටියේය; සත් වසක් වස් වස්වා දුන් පානීය භොජන ආදියෙහි පිනින් සත්රුවන් ලැබෙති; වස් අන්තයෙහි නොවරදවා දුන් වස්වාසික සිවුරු පිළියෙහි පිනින් ඒ සා මහත් කප්රුක් සමූහයක් ලැබෙති;[1] මෙසේ ඒ සඞ්ඛ නම් චක්‍රවර්ති රජ්ජුරුවෝ එකල කෙතුමතී නම් රාජධානියෙහි ශක්‍රදෙවේන්‍ද්‍ර ලීලාවෙන් රාජ්‍යශ්‍රී විඳිනාහ.

එකල මෙසේ මිනිස්ලොව දෙව්ලොවටත් වඩනා සේ සියල්ලෙන් ම සමෘද්ධ ව අසූදහසක් අවුරුද්දට පරමායු වූ කල්හි මේ මඟුල් සක්වළ පිරිවරා සිටි දසදහසක් සක්වළ ශක්‍ර බ්‍රහ්ම සුයාම සන්තුෂිත සුනිර්මිතාදි සියලු දිව්‍ය බ්‍රහ්මයෝ මේ එක මඟුල් සක්වළට රැස් ව දන් තුෂිත භවනයෙහි වසන ඒ මෛත්‍රීය මහබෝසතාණන් කරා එළඹ 'මහාපුරුෂයාණන් වහන්ස, දන් නුඹ වහන්සේ බුදුවන්නට කලැ'යි ආරාධනා කරන්නාහ. එකල මහබොසතාණෝ:

කාලං දෙසං ච දීපං ච[3] - කුලං මාතරමෙව ච,
එතෙ පඤ්ච විලොකෙත්වා - උප්පජ්ජන්ති තථාගතා යි.

යනු හෙයින් පඤ්චමහා විලොකනය කොට බුදුවන්ට කලැ යි දන දෙවියන්ට ප්‍රතිඥා දී කෙතුමතී නම් රාජධානියෙහි සඞ්ඛ නම් චක්‍රවර්ති රජ්ජුරුවන්ට අග්‍රපුරොහිත වූ උභයකුල පරිශුද්ධ වූ ලොකප්‍රසිද්ධ වූ සුබ්‍රහ්මා නම් පුරොහිත බ්‍රාහ්මණයාණන් නිසා බ්‍රහ්මවතී නම් බැමිණි දේවීන් කුස පිළිසිඳ දසඑකඩමස් ඇවෑමෙහි දසදහසක් සක්වළ මුළු පොළෝ සක්වළගල් මෙරු යුගන්ධරාදීන් කම්පිත කරවා දෙතිස් පූර්වනිමිත්ත දක්වීම් ආදි වූ නොයෙක් ආශ්චර්‍ය්‍ය පහළ කෙරෙමින් මහත් වූ උත්සවයෙන් ඉසිපතන නම් නාගවනොද්‍යානයෙහි දී දසදහසක් සක්වළ දෙවිබඹුන් මධ්‍යයෙහි මහාබ්‍රහ්මයා අතට මවුකුසින් බිහි ව පෙර දෙපෝයෙහි සඳ සෙයින් දවසින් දවස වඩනා[4] අනන්ත වූ යශසින් හා මහත් වූ ශ්‍රී සෞභාග්‍යයෙන් දිව්‍යකුමාරයකු සේ ක්‍රමයෙන් වැඩිවිය පැමිණෙන්නාහ.

---

1. ලැබෙයි - AC
2. එලගෙන - BDEGHKL
3. දීපංච දෙසංච - සි.ම.
4. වැඩෙමින් - GH මුද්‍රිත හැම.
   වඩ වඩා - C.

Non-Commercial Distribution

එකල[1] ඒ අජිත නම් වූ මෛත්‍රී මහ බෝසතාණන්ගේ කුශලානුභාවයෙන් මහපොළොව පළාගෙන දෙළොස් දෙළොස් ගවු උස ඇති වර්ධමානකය සිද්ධාර්ථක[2]ය. චන්ද්‍රකය යි මෙසේ සත්රුවන්මය වූ තුන් සෑතුවට සුදුසු වූ තුන් මාළිගාවෙක් පැන නැඟෙයි; එයින් එකි එකී ප්‍රාසාදයෙක් ම සත් සත් මහල් වෙයි; එකි එකී මාලෙහි කෙළලක්‍ෂයක් කෙළලක්‍ෂයක් කුළුගෙවල් වෙයි; එකි එකී ප්‍රාසාදය සිසාරා සත්රුවන්මය වූ සත් සත් පවුරු වෙයි; එසේ ම සත්රුවන්මය වූ සත් සත් වහසල් වෙයි; එකි එකී වහසල් දෙර වෙන වෙන ම වර්ණභෙද වශයෙන් සත්රුවන්මය සත් සත් තොරණ වෙයි. ඒ තුන් පායෙහි ම පලසෙවෙණිවල[3] අග පසඟතුරු රැව් දෙන රන්රසුදැල් මැවී තිබෙයි; මුදුනෙහි නඟනලද සත් රුවන්මය වූ ධජකතුල්වල ලෙලදෙන්නාවූ රන්මිණි ඝොෂාවෙන් මුළුනුවර එකනින්නාද වෙයි. ඒ ප්‍රාසාදයන් තුන්දෙනාගේ භිත්තිවල සත්රුවන්මය වූ තාලපන්තිය මකරපන්තිය සිංහපන්තිය ව්‍යාඝ්‍රපන්තිය හස්තිපන්තිය අශ්වපන්තිය රථපන්තිය[4] මයුරපන්තිය හංසපන්තිය කොස්ලිහිණිපන්තිය බලාකාපන්තිය ගිජුලිහිණිපන්තිය ගරුඩපන්තිය නාගපන්තිය දෙවපන්තිය බ්‍රහ්මපන්තිය ලතාපන්තිය වෘක්‍ෂපන්තිය පර්වතකූටපන්තිය ගඞ්ගා යමුණාදි ගඞ්ගාපන්තිය අනවතප්තාදි විල්පන්තිය ක්‍ෂීරසාගර ආදි වූ සමුද්‍රපන්තිය රන්රිදී පබළුවන් නැවුපන්තිය ජම්බුද්වීපාදි වූ ද්වීපපන්තිය කෙතුමති ආදි වූ නගරපන්තිය දෙවුදුනු බඳු රත්නිල් ආදි පස්වනක් පැහැයෙන් දිලියෙන පට්ටිගාපන්තිය[5] යනාදි විචිත්‍ර රූපපන්තීහු වනාහි[6] විභාගවත් ව පෙනෙන්නාහ. තව ද ඒ ප්‍රාසාද මස්තකයෙහි දවස් පතා දිව්‍යමල්වැසි වස්නේය. ඒ ප්‍රාසාදවල එකි එකී මාලෙහි සත්දහසක් සත්දහසක් රුවන්ගබඩාය. සරහා පිළියෙලකරනලද වෛදූර්‍ය්‍යමාණික්‍යමය වූ සද්දහසක් සද්දහසක් සිංහාසනය. සත්රුවන්මය වූ පුටු[7] ඇති සද්දහසක් සද්දහසක් ධවලාතපත්‍රය. නානාවර්ණ මනහර ඇතිරි[8] අතුරනලද සද්දහසක් සද්දහසක් යහන්ය. සත්රුවනින් විසිතුරු වූ මිටි ඇති සද්දහසක් සද්දහසක් රන්කොන්තය.[9] එකි එකී ප්‍රාසාදය සිසාරා ඡද්දන්ත නම් හස්තිරාජයා ප්‍රධානකොට ඇති සද්දහසක් සද්දහසක් මඞ්ගල හස්තීහු නොයෙක් හස්ත්‍යලංකාරයෙන් සැරහී[10] සිටිති; එසේ ම වලාහක නම් අශ්වරාජයා ප්‍රධාන කොට ඇති සද්දහසක් සද්දහසක් අශ්වයෝ සරහා සිටිති; සත්රුවන් ධජමාලාවෙන් හොබනා හිරුමඬුලු සේ බබළන සද්දහසක් සද්දහසක් රථපන්ති සරහා තිබෙයි; එකි එකී මාලෙහි සද්දහසක් සද්දහසක් නාටකස්ත්‍රීහු සැරහී සිටිති.

ඔවුන් හැමදෙනාහට ප්‍රධාන වූ අගමෙහෙසුන් වූ බිසව් චන්ද්‍රමුඛී නම් වෙති;[11] ඔහු[12] ඉතා විශිෂ්ට වූ රූ ඇතියහ. සිවුසැටක් පමණ ස්ත්‍රීලක්‍ෂණයෙන් ශොභමානයහ; ඉතා උස් නොවෙති; ඉතා මිටි නොවෙති; ඉතා කෘශ නොවෙති; ඉතා ස්ථූල නොවෙති; ඉතා කැළි[13] නොවෙති; ඉතා එළලි නොවෙති; මනුෂ්‍යරූපය ඉක්ම[14] දිව්‍යරූපයට නොපැමිණෙන්නාහ; ඒ බිසොවුන්ගේ ශරීරයෙන් සඳුන් සුවඳ

1. එකල්හි - CH
2. සිද්ධාර්ථය - ACDEGNKL
3. පලසෙවෙණි - BGHKL
4. ව්‍යාලපන්තිය රථපන්තිය - ම.
5. පට්ටිකාපනතිය. - මුද්‍රිත හැම.
6. මනාව - BDEGHKL
7. පුඩු - ස
8. ඇතිරිලි - BDG
9. රන්කොන්ය - බෙ.ස.
10. සරහා - ක.කු.බෙ.
11. වෙයි. - B
12. ඕහොමෝ - ක.සි.කු.
 ඌ - ම.
13. කළු - BC
14. ඉක්මවූ - C

Non-Commercial Distribution

හමයි; මුඛයෙන් මහනෙල්මල් සුවඳ වහනය වෙයි; ශරීරාලොකය දෙළොස්රියනෙක පැතිර සිටිනේය. පොළාපී[1] පුළුන් පිඩක් මෙන් මොළොක් වූ ශරීර ඇතියහ. අස්ථිකල්‍යාණය මාංසකල්‍යාණය ඡවිකල්‍යාණය කෙශකල්‍යාණය වයොකල්‍යාණ[2]ය යි කියනලද පඤ්චකල්‍යාණයෙන් සමන්විත වෙති; එම ජන්මයෙහි රහත් ව නිවන් දක්නට නිසි කුසල් ඇති හෙයින් පශ්චිමාත්මභාව ඇති වෙති. එසේ හෙයින් කියනලදී:

චිරමුපචිත නානා පුඤ්ඤසම්භාර භාරා
චරිමභවිකභූතා චාරුරූපූපපන්නා,
මුදුසුරභි සුගත්තා[3] චන්දවත්තාභිධානා
භවති ඉති මනුඤ්ඤා බොධිසත්තස්ස ජායා-යි.

තව ද ඒ මහබෝසතාණන්ගේ පුතණුවෝ බ්‍රහ්මවර්ධන නම් කුමාර වෙති. ඒ ඒ බ්‍රහ්මවර්ධන කුමාරයන් ප්‍රධාන කොට ඇති දහසක් පුත්‍රයෝ වන්නාහ. එකි එකී ප්‍රාසාදයෙක යොදනක් යොදනක් පමණ දිගපුළුල ගැඹුර ඇති නිධාන සැළ සතරෙක් සතරෙක් පිරී සිටිනේය. ඒ ප්‍රාසාදවල සතර සතර කොන කප්රුක් සතරෙක් සතරෙක් පොළොව පළාගෙන නැඟී නොයෙක් වස්ත්‍රාභරණාදියෙන් සැරහී සිටිනේය. ඒ අජිත නම් මහබෝසතාණෝ තුමූ සර්වාභරණයෙන් සැරහී එසේ ම නොයෙක් වස්ත්‍රාලංකාරයෙන් සැරහුණාවූ භාවභාව ලීලාවිලාසයෙන් යුක්ත වූ[4] ස්ත්‍රීසමූහයා විසින් පිරිවරනලද්දූ ව එකි එකී ප්‍රාසාදයෙක සෘතු වශයෙන් අවුරුදු දහසක් බැගින් පඤ්චකාම සම්පත්[5] අනුභව කොට වාසය කරන්නාහ. එසේ හෙයින් කියනලදී.

විවිධ රතන භූමිං නෙක චිත්තාභිරම්මං
සුරභි කුසුම දමං නච්ච ගීතාභිරාමං
පරම යුවති පුණ්ණං නෙක භොගාවකිණ්ණං[6]
රතනමය විමානං හොති තස්සා[7]ධිවාසං-යි.

එකල්හි ඒ අජිත නම් මහබෝසතාණන්ගේ කුශලානුභාවයෙන් මෙහෙයනලද චිත්තසන්තාන ඇති ව දසදහසක් යොදුන් මුළු දඹදිව සුවාසූදහසක් රාජධානිවල වසන සේනාවාහන සහිත සුවාසූ දහසක් මහරජුන් පිරිවරකොට ඇති සඞ්ඛ නම් චක්‍රවර්ති රජ්ජුරුවන් හා සෙසු බොහෝ දිව්‍යමනුෂ්‍යයෝ මහබෝසතාණන් කරා එළඹ 'මහාපුරුෂයාණන්වහන්ස, අපි හැම නුඹවහන්සේට සේවය කරන පිණිස ආම්හ' යි කියති; එසඳ මහ බෝසතාණෝ 'මාගේ පඬිද් බෙහෙව, තොප තොපගේ වාසස්ථානවලට ම ගොස් රාජශ්‍රී අනුභවකරව' යි ඒ රජදරුවන් හා සෙසු දිව්‍යමනුෂ්‍යයන්ට සමු දී යවන්නාහ. එකල බෝසතුන් හා සමඟ දෙව්ලොවින් අවුත් එම කෙතුමතී නම් රාජධානියෙහි උතුම් කුලගෙවල උපන්නාවූ අටළොස් කෙළක් පමණ අමාත්‍යපුත්‍රයෝ මහබෝසතුන්ට නිරතුරු ව අරග්[8] ගෙන සිටිති.

---

1. පොළාපු - BC
2. දන්තකල්‍යාණය වයොකල්‍යාණය - BDH
   වයකල්‍යාණය - JKL ;ක.සි.ඝ.
   වයඃකල්‍යාණය - කි.ම.
3. මුඛගත්තා - මුද්‍රිත හැම, ස.
4. යුක්ත ව - පිටපත් හැම
5. සම්පත්හි - AJ
6. භොගාවකිණ්ණං - ABCDGHJKL; - සොභාවකිණ්ණං - මුද්‍රිත හැම.
7. තස්සා - පිටපත් හැම, ක.සි.ඝ.
8. අරස් - BC

Non-Commercial Distribution

මෙසේ ඒ මහ බෝසතාණෝ දිව්‍යසම්පත්තියක් හා සමාන මහත් වූ ශ්‍රී සම්පත් අනුභව කෙරෙමින් අටදහසක් අවුරුදු මුළුල්ලෙහි ගිහිගෙයි වැස උද්‍යානගමන මාර්ගයෙහි දෙවියන් විසින් ක්‍රමයෙන් මවා දක්වන ලද ජරාරූවෙක ලෙඩරූවෙක මළරූවෙක යන තුන් පූර්වනිමිත්ත දක සසර කළකිරී යෞවනමදය ආරෝග්‍යමදය ජීවිතමදය යන ත්‍රිවිධමදය හැර සතරවන වර දෙවියන් විසින් මවා දක්වනලද තපස්විරූපයක් දක මහණවීමෙහි අභිප්‍රාය[1] උපදවා මහත් වූ ඝෝෂාවෙන් දහවල් උයන්කෙළි කෙළ දෙවියන් විසින් සරහනලද රාජමාර්ගයෙන් නුවරට අවුත් වැද සත් මහපායෙහි ඇතුළ වූ මතුමහල්තලයට පැතනැඟී සුවඳ තෙල් වත්කළ රන්වැට පහනින් දිලියෙන්නාවූ ශ්‍රීයහන් ගබඩාවට[2] වැද කායවිවේකයෙන් යුක්ත ව සද්දවසක් මුළුල්ලෙහි ප්‍රධන්වීර්‍ය කොට හැම සර්වඥවරයන්ගේ බුදුවීමට එකාන්ත නියත වූ වෙසහපුණුපොහොය පැමිණි කල්හි චන්ද්‍රමුඛී නම් අගමෙහෙසුන් බිසොව බ්‍රහ්මවර්ධන නම් පුත්රුවන වැදූ දිනයෙහි මහහිනික්මන් නික්මෙනු කැමැතිවන්නාහ.

මහබෝසතුන්ගේ චිත්තෝත්පාදනුභාවයෙන්[3] සියලු දසදහසක් සක්වළ දෙවතාවෝ එකෙණෙහි මේ මහල් සක්වළට රැස්වන්නාහ; සුවාසූදහසක් රාජධානීන් යුක්ත වූ මුළු දඹදිවුතෙලෙහි 'අද අජිත කුමාරයෝ මහහිනික්මන් නික්මෙන්නාහුය' යි ඒකකෝලාහල වන්නේය. එකෙණෙහි සඞ්ඛ නම් චක්‍රවර්ති රජ්ජුරුවෝ සුවාසූදහසක් නාටක ස්ත්‍රීන් හා සතිස් යොදනෙක පැතිර සිටි මහසෙනඟ පිරිවරා නොයෙක් පූජාභාණ්ඩ ගෙන අවුත් මහබොසතාණන් හුන් රන්පාය සිසාරා සිටගන්නාහ; අවශේෂ වූ ක්ෂත්‍රිය බ්‍රාහ්මණ වෛශ්‍ය ශුද්‍ර උපාසක උපාසිකාවරුන් හා යට කියනලද අන්තඃපුර පිටිපුර රට දනවු වැසි සියලු ජන සමූහයෝ සුවඳ මල් සුවඳසුනු සුවඳදුම් ධජ පතාක කුඩ කොඩි කෙහෙල්ගස් පුන්කලස සෙත් කෝල්[4] මල්ඇගෑ මල්තොරණ මල්මාලා මල්කරඬු ආදිය ගත් අත් ඇති ව එම පාය පිරිවරා ගන්නාහ. ආකාශයෙහි දෙවතාවෝ සැණකෙළි ගෙන දිවමල් දිවසුවඳ ආදිය ගත් අත් ඇති ව සාධුකාර නාදයෙන් හා දිව්‍ය ගන්ධර්ව ධ්වනිඝෝෂයෙන්[5] අකණිට්ඨා බඹලොව දක්වා එකනිනනාද කෙරෙමින් සිටිනාහ. චක්‍රවාට පර්වත අකනිට්ඨ[6] භවනාදියෙහි සිටියාවූ දිව්‍යබ්‍රහ්මයන් විසින් රන්රිදී මිණි පබළු පිළිවහණ ලොහිතඞ්ක මැසිරිගල් සත් රුවන්මය දිවකරඬුවලින් පුර පුරා දමනලද සුවඳමල් සුවඳසුනු ආදියෙන් සියලු මුළු පොළොව අතුරු නැති වන්නේය.

එකල මහබෝසතාණන් මහහිනික්මන් කෙරෙමි යි සිතූ සිත හා සමඟ වැඩහුන් සත්රුවන් මහපාය සත්පවුරු සත්දෙරටු හා එක් ව අග්‍රමෙහෙසිකාවන්[7] ඇතුළු ව බෝසතුන් පිරිවරා සිටි නළුනාටකයන් හා සමඟ දෙවන සඳමඩලක් සේ

1. අභිප්‍රා - ACDEGJ
   අභිප්‍රාව - BHKL
2. ශ්‍රීයහන් ගබඩාවකට - CGHKL
3. චිත්තොවාදනුභාවයෙන් - ක.කි.ඝ
   චිත්තොත්වාදනුභාවයෙන් - J
4. සේසත් කෝල් - බෙ.
5. ධ්වනිඝොෂාවෙන් - ACDEGHJKL
6. අකනිෂ්ටා - ACDEGHJKL
7. අග්‍රමහිෂිකාවන් - බෙ.ස.

Non-Commercial Distribution

අහසට පැනනැඟී යෙයි. එකෙණෙහි පිරිවරා සිටි සියලු පම්ද ම මහබෝසතාණන්ගේ කුශලානුභාවයෙන් හා ඒ චක්‍රවර්ති රජ්ජුරුවන්ගේ රාජානුභාවයෙන් හා දෙවියන්ගේ දිව්‍යානුභාවයෙන් සිටි සිටි තැනින් ම අහසට පැන නැඟෙන්නාහ. යම් යම් කෙනෙක් මහ බෝසතාණන් හා එක් ව නික්මෙනු කැමැති වෙද් ද ඒ ඒ සත්වයෝ ආකාශයෙහිදී ම තමතමන් දක්නාහ. එකෙණෙහි දසදහසක් සක්වළ දසදහසක් පමණ මහාබ්‍රහ්මරාජයෝ තුන් යොදුන් පමණ දසදහසක් සේසත් ගෙන මහබෝසතුන් මස්තකයට ධරන්නාහ; එසේ ම දසදහසක් ශක්‍රයෝ එක්සිය විසි රියන් ජයතුරාසක්[1] තුඩතුඩ තබා[2] පිඹිමින් නික්මෙන්නාහ; දසදහසක් සුයම් දෙවුරජ්ජු දසදහසක් වල්විදුනා ගෙන සලමින් සිටිනාහ. දසදහසක් සන්තුෂිත දෙවුරජ්ජු දසදහසක් මැණික් තල්වැට ගෙන සලන්නාහ; පංචශිඛ නම් වූ දසදහසක් ගාන්ධර්ව දිව්‍යපුත්‍රයෝ බෙලුවපාණ්ඩු නම් වූ දසදහසක් වීණා ගෙන ගායනා කෙරෙමින් සිටිනාහ; සතලිස් දහසක් වරම් දෙවුරජ්ජු කඩු ගත් අත් ඇති ව සතරදිග රකවල් ගෙන සිටිනාහ; දෙතිස් දිව්‍යාඞ්ගනාවන් හා දෙතිස් දිව්‍යපුත්‍රයෝ දිවසුවඳ මල් හා සුවඳ සුනු පිරුණු රන් රිදී මැණික්මය කරඬු ආදිය ගත් අත් ඇතිව සුවඳින් මලින් පුද පුද සිටිනාහ. එසේ ම කඩුගත් අත් ඇති ව අටවිසි යක් සෙනෙවියෝ රකවල් ගෙන සිටිනාහ; හාත්පසින් දිව්‍යමය වූ රන්ධජ රිදීධජ ආදිය ගත් අත් ඇති ව අසුරයෝ සිටිනාහ, මිණි දඬුවැට පහන් ගෙන දිව්‍යනාගරාජයෝ සිටිනාහ. ස්තුති ගායනා කෙරෙමින් දිව්‍යගරුඩරාජයෝ සිටිනාහ; මධුරස්වර විහිදුවා ගායනා කෙරෙමින් කිම්පුරුෂයන් හා කින්නරාංගනාවෝ සිටිනාහ. එසේ හෙයින් කියනලදී:

මනෝරමා කින්නර කින්නරඞ්ගනා
මනෝරමඞ්ගා උරගෝරගඞ්ගනා,
මනෝරමෙ තම්හි ච නච්චගීතියො
මනෝරමෙනෙක පවත්තයන්ති තෙ-යි[3].

තව ද දිව නැටුම් නට නටා ගායනා කෙරෙමින් ගාන්ධර්ව දිව්‍ය පුත්‍රයන් හා දිව්‍යාංගනාවෝ දසදික්හි සිටිනාහ. මෙසේ මෙබඳු ශ්‍රී සෞභාග්‍යයෙන් සමෘද්ධ වූ දිව්‍යමනුෂ්‍යාදීන් විසින් පිරිවරනලද මහබෝසතාණෝ පර්වතයන්ගේ නැටීමෙන් හා ඇතුන්ගේ කුංචනාදයෙන් හා අසුන්ගේ හෙෂාරවයෙන් හා සිංහයන්ගේ සිංහනාදයෙන් හා ව්‍යාඝ්‍රයන්ගේ නාද සහිත පැලඹීමෙන් හා හංසයන්ගේ කූජිතරාවයෙන් හා දෙවියන්ගේ සාධුනාදයෙන් හා අසුරයන්ගේ ස්තුතිඝොෂාවෙන් හා බ්‍රහ්මයන්ගේ අත්පොළසනින් හා එකනින්නාද එකනිඝෝෂ[4] වූ ආකාශතලය සරහමින් ප්‍රාසාදයෙන් ගොස් බෝමඩ සමීපයට පැමිණ ප්‍රාසාදය හා සමඟ ආකාශයෙන් බස්නාහ. එකෙණෙහි මහාබ්‍රහ්මයෙක් දිව්‍යමය වූ අටපිරිකර ගෙන එතැන්හි[5] මහබෝසතාණෝ ප්‍රාසාදයෙන් බැස රන්කඩුවෙන්[6] මුහුළස සහිත ව කෙස්වැටිය කපා[*] ආකාශයට[7] දමා මහාබ්‍රහ්මයා අතින් අටපිරිකර පිළිගෙන ප්‍රාසාද්වාරයෙහිදී

1. විජයතුරා - ABCDEGHJKL
2. තුඩ තබා - පිටපත් හැම
3. මනෝරමෙනෙව පවත්තයන්ති - ක.බෙ.ස.
   මනෝරමා නෙකවිධා පවත්තයුං - C, ම.
   මනෝරමෙ නිච්ච නෙක පවත්තයන්ති තෙ - ක.කි.ඤ
* J පොත මෙතැනින් අවසන් වේ.
4. එකනිඝොසා - ABCGH
5. එන්නේය, එකල්හි - බෙ.ස.
6. රුවන් කඩුවෙන් - ABCDKL
   රුවන් කරඬුවෙන් - EGHJ
7. අහසට - B

Non-Commercial Distribution

ම මහණවන්නාහ. මෙසේ ඒ මෛත්‍රීය බෝධිසත්ත්වයන් වහන්සේ මහණ වූ දවස් ම වෛද්‍යුන්‍යෙහි පරතෙරට පැමිණියාවූ සුවාසූදහසක් බ්‍රාහ්මණයෝ බෝධිසත්ත්වයන්ට අනු ව මහණ වන්නාහ. ඉසිදත්තය පුරාණය යන බ්‍රාහ්මණදෙබෑකෙනෙක් සුවාසූදහසක් සුවාසූදහසක් පිරිවර ගෙන එම විටම මහණ වන්නාහ.[1] ජිතමිත්‍රය විජිතමිත්‍රය යන පණ්ඩිතවරු දෙදෙනෙක් අග්‍ර ධර්මදේශනාවෙහිදී ම රහත් වන්නට නිසි කුසල් ඇත්තාහු සුවාසූදහසක් පිරිවර ගෙන එමවිට ම මහණවන්නාහ. සිඩාර්ථ නම් සිටාණකෙනෙක් සුවාසූදහසක් උපාසක පර්ෂද් හා සමඟ මහණ වන්නාහ. සුධනා නම් උපාසිකා කෙනෙක් සුවාසූදහසක් උපසිකාවරුන් හා සමඟ මහණ වන්නාහ. මේ බුද්ධොත්පාදයෙහි පින්කළ යසවතීය විශාඛාය යන ප්‍රසිඬ යෙහෙලියෝ දෙදෙනෙක් සුවාසූදහසක් සුවාසූදහසක් සත්‍රීන්[2] පිරිවරා මහණ වෙති. එසේම අනතඃපුර පිටිපුර දනවු වැසි රජබමුණු වෙළෙඳ ගොවි[3] සතර පක්ෂයෙහි බොහෝ සත්ත්වයෝ ද නොයෙක් ජාති ඇති අවශේෂ ලක්ෂගණන් මහජනයෝ ද එම ද ම මහණ වෙති. වදරන ලද මැයි:

> චතුරාසීතිසහස්සානි - බ්‍රාහ්මණා වේදපාරගා;[4]
> මෙත්තෙයාසමිං පබ්බජිතෙ පබ්බජිස්සන්ති තෙ තද - යි.

මෙසේ මහබෝසතාණන් වහන්සේ මහභිනික්මන් නික්ම මහණ ව සීලසංවර සමාදනය කොට ගඟට බැස ජලස්නානය කිරීමෙන් ශරීරය සෑතු ගන්වා චන්ද්‍රමුඛී නම් කිසොවුන් විසින් එළවන ලද දිව්‍ය ඕජස් බහාලූ මිහිරි කිරිබත් වළඳ තළිය උඩුගං බලා නාග භවනයට හැර පුෂ්ප ඵලපුලලවයෙන්[5] සැරහුණාවූ වනළැහැබෙක දිවාවිහාර කොට සවස්වේලෙහි දෙවියන් විසින් සරහනලද මාර්ගයෙන් දසදහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මයන් විසින් පිරිවරනලදු ව නොයෙක් පූජෝත්සවයෙන් ගොස් එක්තරා පුරුෂයක්හු විසින් එළවනලද තීතණ අටමිටක් ගෙන දක්ෂිණ දිශාභාගයෙන් නාග ශ්‍රීබෝධි සමීපයට පැමිණ තුන් යළක් පැදකුණු කොට පරීක්ෂා කරනලද අවිජහිත අචලස්ථානයෙහි තීතණ සලා වගුරුවා එකෙණෙහි පොළොව පළා ගෙන නැංගාවූ[6] අපරාජිත ජයපර්‍යඞ්කයට පැන නැඟී බෝකඳට පිට ලා නැගෙනහිරට මුහුණ ලා වජ්‍රාසන මස්තකයෙහි චතුරංග වීර්‍ය්‍යාධිෂ්ඨානයෙන් පලක් බැඳ ඉඳිනා[7] සේක. එසමයෙහි වශවර්ති මාරයා තමාගේ දිව්‍යලොකයෙහි සිටියේ ම බෝධි පර්‍යඞ්කාරූඪ ව මහ බෝසතාණන් වහන්සේ සිවු රහ ඉටා බුදුවන්ට වැඩහුන් බව දන 'ඔහු අද බුදුවිය නොදෙමි, දෙකකුල ගෙන පරසක්වළ ගසමි'යි සැහැසෙමින් ක්‍රොධ වසඟ ව.

> නානා'ननාය නලවණ්ණ[8] සිරොරුහාය
> රත්තොරු වට්ට බහි නිග්ගත ලොචනාය,
> දට්ඨොට්ඨ හිංසන[9] මුඛාසුරගබ්භුජාය
> සෙනාය සො පරිවුතො විවිධා'යුධාය.

1. වෙති - DKL
2. ස්ත්‍රීපුරුෂයන් - ACDEGHKL
3. සූදුරු - මුද්‍රිත නැම ස.
4. වේදපාරගූ - GH
5. ඵලපල්ලවයෙන් - BGH
6. පැනනැංගාවූ - BDEGHKL
7. වැඩ ඉඳිනා - GH
8. කලවණ්ණ - A
9. හිංසන - BGH, බෙ. හිසන - H

Non-Commercial Distribution

යනාදීන් දක්වනලද ප්‍රකාර ඇති අතිභයානක වූ දසබිම්බරක් මරසෙනඟ ගෙන සක්වළ මුවවිටට බැස කර නභා බලා ඒ මෛත්‍රී මහබෝසතුන්ගේ මෛත්‍රී පිඩක් බඳු වූ ශ්‍රී මුඛය දක ළං විය නොහී හයින් වෙවුලා පැරද පලා යෙයි; එකෙණෙහි සහස්‍රරශ්මීන් හෙබියාවූ සමපනස් යොදුන් හිරුමඬල නිම් වළල්ලෙහි ගෙන මහාසමුද්‍රයෙහි ගලන්නාවූ සවර්ණචක්‍රයක් මෙන් අස්ත[1] පර්වතයට යෙමින්[2] සිටිනේය. සියලු චක්‍රවාටගර්භය ක්ෂීරසාගරයෙහි ගලන්නාක් මෙන් ද නිම්වළල්ල අල්වා ගෙන ආකාශයට නඟන්නාවූ රජතචක්‍රයක් මෙන් ද දසදිග ප්‍රභා විහිදුවමින් උනු පනස් යොදුන් චන්ද්‍රමණ්ඩලය නැඟෙනහිරි සක්වළ මෝවිටින් උද්ගත වෙමින් සිටිනේය.

එසඳ මහබෝසතාණෝ තමන්ගේ රන්වන් වූ ශරීරාලොකයෙන් චක්‍රවාට මධ්‍යයෙහි ඒ බෝමඬ ප්‍රදෙශය රන්රසෙහි ගලන්නාක් මෙන් එකපැහැර[3] බබුළුවමින් ඉඳිනාහුය. ඔවුන් පිරිවරා දසදහසක් සක්වළ ශක්‍ර බ්‍රහ්ම සුයාම සන්තුෂිතාදි වූ දිව්‍යසමූහයෝ මහභිනික්මන් නික්මෙන වේලෙහි සෙයින් තම තමන්ට[4] අනුරූප වූ ඡත්‍ර චාමර අටමඟල සොළොස් මහලාදි වූ පූජාභාණ්ඩ හා අනෙකප්‍රකාර තූර්‍ය්‍යභාණ්ඩ ගෙන නානාප්‍රකාර නෘත්‍යාඞ්ග දක්වමින් ගී කිය කියා සතුති කෙරෙමින් සිටිනාහ. සියලු අකාශතලය දිවසුවඳ දිවමල් වර්ෂායෙන් අතුරු නැතිවන්නේය. එසඳ මහාපුරුෂයාණන් වහන්සේ චක්‍රවාටපර්වත නමැති තිරයෙන්[5] වට කරන ලද තාරකා නමැති මැණික් කර්ණකයෙන් විසිතුරු වූ ආකාශ නමැති වියන් ඇති සකල රාත්‍රියෙහි එකාකාරයෙන් දිලියෙන්නාවූ චන්ද්‍රමණ්ඩල නමැති ප්‍රදීපාලොක ඇති චක්‍රවාට ගර්භ නමැති රත්නමණ්ඩපයෙහි බොධිද්‍රැම නමැති මරකත මාණික්‍යමය ඡත්‍රයෙකින් යුක්ත ව සිංහාසන මස්තකයෙහි නාටක ස්ත්‍රීන් සහිත දිව්‍යමනුෂ්‍ය සෙනාව පිරිවරා වැඩහුන්සේක් ම ප්‍රථම යාමයෙහි පූර්වේනිවාසානුස්මෘති ඥානය සමධිගම කොට මධ්‍යම යාමයෙහි දිව්‍ය චක්ෂුරභිඥානය ප්‍රතිවෙධ කොට පශ්චිම යාමයෙහි ද්වාදශාඞ්ග ප්‍රතීත්‍යසමුත්පාදචක්‍රය අනුලොම ප්‍රතිලොමාදී වශයෙන් සම්මර්ශනය කෙරෙමින් අරුණෝද්ගමනය හා සමඟ සියලු දසදහසක් සක්වළ එකනින්නාද කොට දසබල චතුවෛශාරද්‍යාදි සියලු ගුණ සමූහයෙන් හෙබියාවූ සර්වඥතාඥනය ප්‍රතිවෙධ කොට ලොවුතුරා බුදුවන සේක. එකෙණෙහි ප්‍රතිසන්ධිග්‍රහණාදියෙහි මෙන් දෙතිස් පූර්වනිමිත්ත[6] පහළ වෙයි, දසදහසක් සක්වළ වට කොට හකුළුවා දමාලූ මල්වටක් සේ ද[7] ඝන කොට හපුරුවා බඳනාලද මල්කලබක් මෙන් ද මනා කොට සරහනලද මලස්නක් මෙන් ද දිව්‍යමානුෂික වූ නන් කුසුමයෙන් සැරහෙන්නේය. මෙසේ මුළු ලොව[8] එකොත්සව කරවා නොයෙක් පෙළහර පහළ කෙරෙමින් ප්‍රතිවෙධ කරනලද සර්වඥතාඥන ඇති ඒ මෛත්‍රී සර්වඥයන් වහන්සේ "අනෙකජාතිසංසාරං" යනාදීන් ප්‍රීතිවාක්‍ය පවත්වා නොයෙක් කෙළලක්ෂගණන් සමාපත්තියට සමවදිමින් බෝමඬ සමීපයෙහි ම සත්සති යවා අටවන සතියෙහි ධර්මගම්භීරත්වය ප්‍රත්‍යවෙක්ෂා කොට බ්‍රහ්මාරාධනා පිළිගෙන ඉසිපතන නම් නාග වනොද්‍යානයට ම වැඩ වටින් සියක්[9] යොදනෙහි පැතිර සිටි මනුෂ්‍යසෙනාව හා එසේ ම වටින් සතිස්ලක්ෂ දසදහස් තුන්සියපනස් යොදුන් සක්වළ ගබ පුරා සිටි දිව්‍යසෙනාව මධ්‍යයෙහි වැඩහිඳ,

1. හස්ත - ABCDE හස්තගිරි - GH
2. යමින් - ACDEGKL
3. එකපැහිර - GH
4. තම තමන්ට - ක.සි.ඥ.බෙ.ස. තමන් වහන්සේට - K
5. රන් තිරයෙන් - බෙ.ස.
6. දෙතිස් මහාපූර්වනිමිත්ත - GHK
7. මෙන් ද - BEGHKL
8. පොළොව - ACD
9. සතිස් - D

Non-Commercial Distribution

දුක්ඛං දුක්ඛසමුප්පාදං - දුක්ඛස්ස ච අතික්කමං,
අරියං චට්ඨඞ්ගිකං මග්ගං - දුක්ඛූපසමගාමිනං.

යනාදී ක්‍රමයෙන් දක්වනලද ත්‍රිපරිවර්තීයක්[1] හා ද්වාදශාකාරයක් ඇති දුඃඛසත්‍යය සමුදය සත්‍යය නිරොධ සත්‍යය මාර්ග සත්‍යය යන චතුරාර්‍ය්‍ය සත්‍යයෙන් යුක්ත නිරුත්තර වූ ධර්මචක්‍රය පවත්වන සේක. එකල මනුෂ්‍යයන්ගෙන් කෙළලක්ෂයක් දෙනා සතරමඟ සතර ඵලයට පැමිණ අමාමහ නිවන් දක්නාහ. දිව්‍ය බ්‍රහ්මයන්ගෙන් මාර්ගඵල ලැබ නිවන් දක්නාහු මෙතෙකැ යි පමණ නැතියහ. එයින් වදළහ.

උපෙත්වා උය්‍යානවරං[2] - ඵුල්ලං නාගවනං ජිනො,
අනුත්තරං ධම්මචක්කං - එවං සො වත්තයිස්සති - යි.

මෙසේ ඒ මෛත්‍රීය සර්වඥයන් වහන්සේ දහම්සක් පවත්වා ලොකාර්ථසිද්ධිය කරන කල්හි සඞ්ඛ නම් චක්‍රවර්ති රජ්පුරුවෝ තමන් බොහෝ කලක් රජසිරි විඳ විඳූ පස්විසියොදුන් පමණ ඇති[3] සත්රුවන් මහාප්‍රාය බුදුපාමොක් මහාසඞ්ඝයා වහන්සේට සඞ්ඝාරාම කොට පිළිගන්වා එයින් මත්තෙහි දුගී මඟී යාචකයන්ට මහදන් දී නාටක ස්ත්‍රීන් සහිත අග්‍රමහිෂිකාවන් හා සමඟ මහත් වූ රාජානුභාවයෙන් දිලිහි දිලිහී අපරියන්ත වූ[4] සෙනාවාහනයෙන් යුක්ත ව ඒ මෛත්‍රී සර්වඥයන් වහන්සේ කරා එළඹ අමාමහ ගඟෙක ගැලෙන්නාක්හු මෙන්[5] බුදුන්ගේ චරණනඛමයූඛයෙහි ගැලී භක්තිප්‍රෙමයෙන් බැස හෙව වැද එකත්පස් ව හිඳ අශ්‍රැතපූර්ව වූ සද්ධර්මය අසා පහන්සිත් ඇති ව අනූකෙළදහසක්[6] පමණ පුරුෂස්ත්‍රීන්[7] හා සමග මාර්ගඵලයට පැමිණ එහිභික්ෂුභාවයෙන් මහණ වන්නාහ. වදරන ලද මැයි.

තද සො සඞ්ඛරාජා ච - පාසාදං රතනාමයං,
ජින පාමොක්ඛ[8] සඞ්ඝස්ස - නීය්‍යාදෙත්වා පුනාපරං-යි.

තව ද සියලු දිව්‍යමනුෂ්‍යයෝ ම ඒ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ කරා එළඹ ස්‍රොතාපත්තිමාර්ගීය ඵලය සකෘදගාමිමාර්ගීය ඵලය අනාගාමිමාර්ගීය ඵලය අර්හත්මාර්ගීය ඵලයය යන සතර මඟ සතර ඵලයෙන් උතුම් වූ අර්හත් ඵලය උදෙසා ප්‍රශ්න විචාරන්නාහ; එසඳ බුදුහු අර්හත්ඵල ප්‍රාප්තියට උපායක් දක්වමින් ප්‍රශ්න ව්‍යාකරණය කරනසේක. ඒ ප්‍රශ්නවිසර්ජනය හේතුකොටගෙන දිව්‍ය මනුෂ්‍යයන්ගෙන් අසූකෙළදහසක් දෙන සංසාරසාගරයෙන් ගොඩ නැඟෙන්නාහ. හෙවත් සොක පරිදෙව දුක්ඛ දෙමනස්සුපායාස නමැති ජලයෙන් හරිත වූ ජාති ජරා ව්‍යාධි මරණ නමැති මහත් වූ රළපතර බිඳීම් ඇති ලොභ දොෂ මොහ මදමාන මාත්සර්‍ය්‍යාදි

---

1. ත්‍රිපරිවෘත්තයක් - AEGHKL
   ත්‍රිපරිවෘත්තයක් - ක.සි.කද.ම.
2. උද්‍යානවරං. - BGH
3. උස ඇති - GH
4. අපර්‍ය්‍යන්ත වූ - BGH
5. සෙයින් - BDGHL ස.
6. අසූකෙළදහසක් - GH
7. ස්ත්‍රී පුරුෂයන් - BC
8. ජිනපාමොක්ඛස්ස - පිටපත් හැම

Non-Commercial Distribution

චණ්ඩමත්ස්‍ය සමූහයාගෙන් ගැවසී ගත්තාවූ ග්‍රහරාක්‍ෂසි[1]ය යි කියනලද ස්ත්‍රීජනයන්ට වාසස්ථාන වූ හෙවත් මාතුගාම නමැති උදකරාක්‍ෂසීන්ගෙන් ගැවසීගත්තාවූ තෘෂ්ණා නමැති ගඞ්ගාජලය වැදීමට පිහිට වූ රූපශබ්දදී පඤ්චකාම කොට්ඨාස නමැති සළා වැටුම් ඇති පමණ නොදත හැකි දිග සරස ගැඹුරු ඇති පරතෙරක් දක්ක නොහැකි සංසාර නමැති සාගරයෙහි චුතිප්‍රතිසන්ධි වශයෙන් ගැලෙමින් ඉපිලෙමින් විතර්ක නමැති සාගරයෙහි තරඞ්ගවෙගයෙන් පහරන ලදු ව කෙලෙස් නමැති සැඩ[2] වතුරෙන් ගෙනයන ලදු ව අපාය නමැති වඩබාමුඛයෙහි වැටී අනය ව්‍යසනයට පැමිණෙන්නාවූ සත්වවර්ගයා දෙශනා නමැති හස්තයෙන් ඔසවාගෙන එබඳු සංසාර නමැති සාගරයෙන් ගොඩනභා අමාමහ නිවන් නමැති අභය පුරයෙහි පිහිටුවනසේක. මෙසේ වරින් වර ධර්මදෙශනා කෙරෙමින්[3] රහත්බවට පමුණුවනලද ආයර්‍යශ්‍රාවකයන් වහන්සේගෙන් කෙළලක්‍ෂයක් පමණ මහාක්ෂීණාශ්‍රවයන් වහන්සේ හැම කල්හි ම ඒ මෛත්‍රී සර්‍වඥයන් වහන්සේ පිරිවරා ඇවිදිනාසේක. එ හැමදෙනා වහන්සේ ම පූර්වේනිවාසානුස්මෘතිඥානය දිව්‍ය චක්‍ෂුරභිඥනය දිව්‍යශ්‍රොත්‍රඥනය චෙතොපරිච්ඡේදකඥනය ඍද්ධිවිධඥනය ආශ්‍රවක්‍ෂයකරඥනය යන මේ ෂට්අභිඥවෙන් හා අධිෂ්ඨාන ඍද්ධිය විකුර්වණඍද්ධිය මනොමයඍ ය ඥනවිෂ්ඨාරඍද්ධිය සමාධිවිෂ්ඵාරඍද්ධිය අරියාය ඍද්ධිය[4] කර්මවිපාකජ ඍද්ධිය පුණ්‍යවතො ඍද්ධිය විජ්ජාමයඍද්ධිය යන මේ දශවිධ ඍද්ධීන් යුක්තසේක.

තව ද අර්ථපටිසම්භිදය ධම්පටිසම්භිද ය නිරුත්තිපටිසම්භිදය ප්‍රතිභානපටිසම්භිද ය යන සිවුපිළිසිඹියායෙහි දක්‍ෂසේක. ප්‍රගුණ ව වාචොද්ගත වූ ත්‍රිපිටකබුද්ධවචන ය ඇති හෙයින් බහුශ්‍රැතසේක. සපර්‍යාප්තික නවලොකොත්තර සද්ධර්මය ධරන හෙයින්[5] ධර්මධරසේක. දෙව්මිනිසුන් සහිත සියලු ලොකයෙහි ප්‍රසිද්ධ හෙයින් ව්‍යක්තසේක. උක්තප්‍රකාර ගුණයෙන් යුක්ත හෙයින් හා ශීලාදි ගුණධර්මයෙන් සමන්විත හෙයින් සඞ්ඝශොභන සේක යනාදී වශයෙන් වෙන වෙන කියත් නිමාවක් දක්ක නොහැකි සියලු ගුණ ගණාඞ්ගයෙන් හෙබියාවූ මෙබඳු කෙළලක්‍ෂයක් පමණ රහතන් වහන්සේ විසින් පිරිවරන ලද[6] ඒ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ සප්ත කුලපර්වතයෙන් පිරිවරනලද මහාමෙරු පර්වතරාජයා මෙන් ද නොයෙක් දහස් ගණන් මිණිදඬුවැටපහන් මධ්‍යයෙහි දිලිහෙන පහන් රුකක් මෙන් ද තාරකාසමූහයා විසින් පිරවරනලද පූර්ණචන්‍ද්‍රයා[7] මෙන් ද දහසක් රශ්මීන් පිරිවරනලද ශරත් සූර්‍යමණ්ඩලය මෙන් ද සතිස් යොදනෙක පැතිර සිටිනා පර්ෂද්මණ්ඩලයකින් පිරිවරනලද සක්විති රජක්හු මෙන් ද දිව්‍ය සමූහයා විසින් පිරිවරනලද ශක්‍රදෙවෙන්ද්‍රයා මෙන් ද බ්‍රහ්මසමූහයා විසින් පිරිවරනලද මහාබ්‍රහ්මරාජයා මෙන් ද අතිශයින් ශොභමාන ව

1. ග්‍රහරාක්‍ෂසී - බෙ.ස.
2. සැඩ දිය - BEGHKL
3. දේශනා කිරීමෙන් - BDEGHKL, ස.
4. අරියායසඬ්ධිය (නැත) - KL, ස.
5. බැවින් - BDEGH
6. ලදු ව - මුද්‍රිත හැම ස.
7. පූර්ණචන්ද්‍රමණ්ඩලය - BDEGH, ස; චන්‍ද්‍ර මණ්ඩලය - KL

Non-Commercial Distribution

දෙතිස් මහාපුරුෂලක්ෂණයෙන් හා අසූ අනුව්‍යඤ්ජන ලක්ෂණයෙන්[1] යුක්ත ව නීලපීත ලොහිතාදි විචිත්‍රවර්ණ බ්‍යාම ප්‍රභාමණ්ඩලයෙන් පිරිවරනලද්දූ ව විකසිත පද්මොත්පල පුණ්ඩරීකාදීන් විසින් ප්‍රතිමණ්ඩිත ජලතලාවක් මෙන් ද තාරකානිකරයන්ගේ රශ්මිසමූහ ස්පර්ශයෙන් දිලියෙන්නාවූ ආකාශතලයක් මෙන් ද සන්ධ්‍යාඝනප්‍රභා ඉන්ද්‍රචාප විද්‍යුල්ලතාපරික්ෂිප්ත කනකගිරි ශිඛරයක් මෙන් ද තමන් වහන්සේගේ ශ්‍රී සෞභාග්‍යයෙන් මුළුලොව එකාලොක කෙරෙමින් එසේ ම තමන් වහනසේගේ සකලශ්‍රී ශොභා[2] ශරීරයෙන් එකපැහැර නික්මෙමින් ඇඹරෙමින් සළා දෙමින් දස දිග දිවන්නා වූ නීලය පීතය ලොහිතය ඕදතය මාඤ්ජෙෂ්ඨය ප්‍රභාස්වරය යි කියනලද සවනක් ඝන බුධරශ්මි මාලාවෙන් මුළු ලෝ හොබවා[3] දඹදිව තුන්සියයක් යොදුන් පමණ ඇති අනෙතා[4] මණ්ඩලයෙහි ද සසියයක් යොදුන් පමණ ඇති මධ්‍යමණ්ඩලයෙහි ද නවසියයක් යොදුන් පමණ ඇති මහා මණ්ඩලයෙහි ද සැරිසරා වඩිමින් ධර්මදෙශනා පවත්වා මහජනයාට ස්වර්ගමොක්ෂසම්පත් සාධා දෙන සේක.

එකල්හි ඒ මෛත්‍රී බුදුන් සොළොසාසඞ්ඛ්‍ය කප්ලක්ෂයක් මුළුල්ලෙහි නිරතුරු ව පිරුවාවූ දන ශීලාදි දශපාරමිතාවෝ එක ආත්මභාවයෙහි ම ඵල දෙම්හ යි සැරහී සිටියවුන් මෙන් මහත් වූ ලාභ සත්කාර පවත්වන්නාහුය. හේ කෙසේ ද යත්:

එකල මෛත්‍රී බුදුන්ගේ කුශලානුභාවයෙන් මහජනයෝ ඒ ඒ දිශාභාගයෙන් අන්නපාන යාන වාහන වස්ත්‍ර ගන්ධ මාලා දීප ධූපාදි වූ නොයෙක් දනොපකරණ සපයා සියගණන් ගැල්පුරා ගෙනවුත් දන් දෙන්ට අවකාශ නොලදින් හාත්පස[5] කීප ගවු පමණ තන්හි ගැලින් ගැල පැහැර සිටගනිති; එකල්හි ඒ ගැල් සකෙහි චක්‍රනාදය හා මහජනයාගේ කොලාහලය වටින් සතිස් යොදුන් පමණ තන්හි පැතිර සිටිනේය. මෙසේ කොදිව් මහදිව් මෙරු යුගන්ධර සක්වළගල් මහපොළෝ මුලිනුපුරා කෙළ පුවහස්[6] සක්වළ එකපැහැර බමන[7] කොලාහලයක් සේ පඤ්චපස්සෙහි හුණු දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකාදීන් විසින් හා අවසරයක් ලද තන්හි දන් දෙම්හ යි බඩු පුරා[8] ගෙන යන සිය දහස් ගණන් ගැල්හඩින් හා පිඹිනා සක්හඬින් හා 'සරණාගත වජ්‍රපඤ්ජර, පර දුඃඛ දුඃඛිත, කරුණානිධාන, ත්‍රිභුවන චූඩාමාණික්‍ය, සද්ධර්මාභරණ විභූෂිත, සර්වඥ, ශිරොමාණික්‍ය, දෙවාතිදෙව, ශක්‍රාතිශක්‍ර, බ්‍රහ්මාතිබ්‍රහ්ම, යනාදීන්[9] පිඹිනා ජයකාහල ශබ්දයෙන් හා දෙව්මිනිසුන් ගසන මිහිඟු බෙර හඬින් හා තුන්යොදුන් පමණ සේසත් අතින් ගෙන දෙඅත් නහා වැඳ වැඳ යන මහබඹ පිරිවරින් හා පරසතු මල් දමමින් මඳරා මල් ඉස්මින් තල්වැට චාමර සලමින් සතුටු සතුටු ව දිවසළු හිස නටවමින් පුද පිණිස නෘත්‍යගීතවාද්‍ය පවත්වමින් එක් පසෙක්හි නිස්ම ගත් අනන්තාපරියන්ත දිව්‍යපරිවාරයෙන් හා පෙණ දහස්

1. ලක්ෂණයෙන් හා - KL
2. ශොභා (නැත) - BEGHKL
3. බබුළුවා - BCDGH
4. අන්ත - ක.සි.සැ.ම.
5. හාත්පසින් - AO
6. සුවහසක් - ABDE
7. හමන - බෙ.
8. පැසපුරා - GH
9. බ්‍රහ්මාතිබ්‍රහ්ම වූ තථාගතයන්වහන්සේට පූජා පිණිස දිව්‍යබ්‍රහ්මාදීන් - ක.සි.සැ.ම.

Non-Commercial Distribution

සුවහස් මවා කර බඳනා[1] කණ්ඨමාණික්‍යයෙහි අලොකයෙන් මුළු ලෝ ඒකාලොක කෙරෙමින් පෙරමගෙහි කඩුපුල් මල් තන තනා පෙණපතර බිම ඔබ ඔබා වදිමින් පසුබස්නා නේ සුවහස් දිව්‍ය නාග පරිවාරයෙන් හා පඤ්චවර්ණ පියා විදහා අහස්කුස් වසා මහපියුම් තුඩින් ගෙන පසුපස්සෙහි ගමන් ගත් යෙළසියයක් යොදුන් ගරුඩරාජයන් සිය දහස් ගණිතින් හා එබු එබු පතුල් පිළිගන්නා පිණිස මහ පොළොව පළා නැගි මහ ගැල්සක් පමණ මහ පියුම් මඩුත් මඩුත් පැනනැගී රෙණුකඳින් අකනිටා බඹලොව දක්වා සියලු සක්වළ සුවඳ ගන්වමින් ශ්‍රීපාදය දික් කළ කෙණෙහි මහ මෙර සේ උස් තැන් එබී වළතැන් පිරී බිම සමතලා කෙරෙමින් එබු එබු පයට පූජා පිණිස මහපොළොව පළා පැනනැගී සත්රුවනින් වඩනා මහ විසිතුරු කෙරෙමින් සෙසු සියලු සියොත්[2] සිවුපාවනුදු සතුටු කරවමින් මහොත්සවයෙන් වැඩ මහජනයා විසින් මෙසේ මහොසයක් මෙන් පවත්වනලද සිවුපසදනය පිළිගනිමින් මහත් වූ පූජාසත්කාරයෙන් වඩනා ඒ මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ පයර්‍යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවෙධ වශයෙන් ද යථාපරාධ යථානුලොම යථාධම්ම[3] වශයෙන් ද ත්‍රිවිධ වූ සියලු ශාසනය එකල මුළුලෙව්හි ව්‍යාප්ත වන්නේය. සියලු ජම්බුද්වීපය භික්‍ෂු භික්‍ෂුණීන් විසින් පොරෝනාලද සිවුරෙහි ආලොකයෙන් ඒකාලොක වෙයි. කුලගෙවලට වදනාවූ ද නික්මෙන්නාවූ ද භික්‍ෂු භික්‍ෂුණීන්ගේ චීවරමාරුතයෙන් හා අතපය දික්කිරීම් වක්කිරීම් ආදියෙන් උපන්නා වූ ශරීර මාරුතයෙන් සියලු රොග දුක් දුරු වන්නේය. කිසි කලෙක මෙසේ මහාශ්‍රාවකයන් පිරිවරා දඹදිව ගම් නියම්ගම් රාජධානි පිළිවෙළින් දනවු සැරිසරා සත්වවිනයනය[4] කරනසේක. සමහර කලෙක විනෙයජනයන්[5] පිණිස දුරු කතර ගෙවා දිව්‍ය ලොක බ්‍රහමලොක අන්‍යචක්‍රවාටාන්තරයෙහි ද අනන්තාපරිමාණ සක්වළවල කෙළවරට ගොසින් ඇසිල්ලක පෙනී හෙතු සම්පත් ඇති සත්වයන් අමාමහ නිවන් දක්වනසේක. එයින් වදළහ.

> බොධනෙය්‍යං ජනං දිස්වා - සතසහස්සෙපි යොජනෙ,
> ඛණෙන උපගන්ත්වාන - බොධයිස්සති සො ජිනො - යි.*

තව ද මූල පූර්වාභිනිහාරයෙහි කියනලද පරිද්දෙන්ම අශොකය බ්‍රහ්මදෙව ය යන අග්‍රශ්‍රාවක යුග්මයක් හා පදුමාය සුමනාය යන අග්‍රශ්‍රාවිකා යුග්මයක් ඇති ව සිංහ නම් මහ තෙර කෙනෙකුන්ගෙන් අත්පා මෙහෙ විද[6] කෙළලක්‍ෂයක් පමණ මහාශ්‍රාවකයන් පිරිවරා ලෝවැඩ වඩන්නාවූ ඒ මෛත්‍රී සර්වඥයන් වහන්සේට සුධනය සඞ්ඝය යන සිටුවරු දෙදෙනෙක් අග්‍රඋපස්ථායක වන්නාහ. යසවතීය සඞ්ඝාය යන උපාසිකාවරු දෙදෙනෙක් අග්‍ර උපස්ථායිකා වන්නාහ. ඒ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ පිට දී බුදු වූ නාගශ්‍රීබොධියෙහි රිදීකඳක් බඳු සමවට වූ කඳවට එක්සිය විසිරියන් උසය, එපමණ ම වූ පඤ්චමහා ශාඛාවක් ඇත්තේය. මූල පටන් අග දක්වා දෙසිය සතලිස් රියන් උසය; නැගෙනහිරි ශාඛාග්‍රයෙහි පටන් බස්නාහිරි

---

1. බැඳි - BGH, ම.ස.
   බඳ - DEKL
2. වැසියොත් - ABCDH
3. යථානුධම්ම - ABDEGHKL
4. සත්ව විලොචනය - B; සත්වවිනය - L
5. වෛනෙයජනයන් - පිටපත් හැම, ස
6. මෙහෙවර විද - BK; මෙහෙ ගෙන - KL

* G පොත මෙතනින් අවසන් වේ.

Non-Commercial Distribution

ශාඛාග්‍රයට දෙසිය සතලිස් රියන් පමණය. දකුණුදිග ශාඛාග්‍රයෙහි පටන් උතුරු දිග ශාඛාග්‍රයට දෙසිය හතලිස් රියන් පමණය; ශාඛාමණ්ඩලය වටින් සත්සිය විසිරියන් පමණය; ඝන කොට හසුරුවා බඳනාලද මොනරපිල් කලඹක් මෙන් ද රිදී පර්වත මස්තකයෙක්හි පිහිටියාවූ මුදුන්කුළු නමැති ඉන්‍ද්‍රනීලමාණික්‍යමය පර්වතයක් මෙන් ද ඉතා ශොභමාන ව සියලු පෘථිවිමණ්ඩලය සරහමින් සිටිනේය. ඒ බොධිවෘක්‍ෂයෙහි ලහටු හා පඬෙරවන් පත්‍ර ද තුවටුවෙන් ගිලිහෙන්නාවූ පුරාණ පත්‍ර ද කිසි කලෙකත් නැත්තේ මැයි. හැම කල ම ඉන්‍ද්‍රනීල මාණික්‍යමය වූ පත්‍රපන්තීන් ගැවසී අතරතුරෙහි පබළුදලු හා සමාන මඳ මඳ පවනින් ලෙලදෙන්නා වූ ළපලුපන්තීන් සැරහී සිටිනේය. අතුරතුරෙහි හටගන්නාවූ[1] ඉඳුනිල්මිණිවන් එකි එකී නා කැකුළෙහි දෙළොස් දෙළොස් නැළියක් පමණ පැන් ගන්නේය; පිපිමල් රථසක් පමණ වන්නේය; එකි එකී මලෙහි නැළියක් පමණ රේණු වන්නේය. ඒ මෛත්‍රී සර්ඥයන් වහන්සේ බුදුවන දවස් පිපි මල් සියල්ල ම අසූ දහසක් අවුරුදු මුළුල්ලෙහි පර නොවී තිබෙයි; ඒ ශ්‍රී මහා නාගබොධීන් වහන්සේට හාත්පසින් තුන් යොදුනක්[2] පමණ තැන නොයෙක් පැහැ ඇති මලින් සැරහුණා වූ වෘක්‍ෂයෝ ඒ බොධීන්වහන්සේ පිරිවරා උන් වහන්සේට අභිමුඛ ව සිටිනාහ. එසේ ම නොයෙක් පැහැ ඇති මල් පලගන්නා ලතාජාතිහු මනා වූ සුවඳ ඇති නොයෙක් පැහැයෙන් බබළන්නාවූ මල්කැන් සමූහයෙන් සැරහී දක්‍ෂිණාවෘත්ත ව[3] මුක්තාමාණික්‍යයෙන් කරනලද මහ පවුරක් මෙන් බොධීන් වහන්සේ වටා සිටිනාහ. ඒ බෝධීන් වහන්සේට අවටින්[4] අඩයොදනක්[5] පමණ තන්හි සියලු භූමිතලය සත්රුවන් වැල්ලෙන් ගැවසී තිබෙන්නේය. ඒ සත්රුවන් වැලි මත්තෙහි අනෙකප්‍රකාර වර්ණගන්ධයෙන් යුක්ත වූ දියෙහි ගොඩෙහි පිපෙන සියලු සුවඳ පුෂ්පජාතීහු අතුට තිබෙන්නාහ. තව ද එහි අතුරු නැති ව හෙළනික රත්නික සීනිද්ද බෝලිද්ද දසමන් ඇසළ පළොල් දෙඹ කීන බක්මී සපු දුනුකේ මුහුණමල්[6] ආදි මල්වැසි වස්නේය. හාත්පසින් රක්තොත්පල ශෙවතොත්පල රක්තපද්ම ශෙවතපද්ම[7] රතැඹුල හෙළැඹුල තිලිපුල් මිටියෙන් පුරණලද සවර්ණඝට පන්තීන් සැරහී තිබෙන්නේය. තව ද වාසල්දෙර සන්ධියෙන් යුක්ත රත්නප්‍රදීපමාලාවෝ වන්නාහ. බොධිවෘක්‍ෂමස්තකයෙහි ඔලම්බක පද්මයන් ඇති මල් වියන් ආකාශයෙහි බැඳ තිබෙයි; ආකාසයෙන් යන්නාවූ නොයෙක් පැහැ ඇති පක්‍ෂිසමූහයෝ මධුරනාදයෙන් පූජාකොට පැදකුණු කෙරෙමින් යන්නාහ. අතුපතර වෙළෙප් අතුරෙහි සැඟවී පක්‍ෂිකෙනෙක් නම් නැත්තාහ. මහාබ්‍රහ්මයාගේ කුශලානුභාවයෙන් උපන්නාවූ මරකත මාණික්‍යමය ඡත්‍රයෙක්හි ශ්‍රී සමෘද්ධිය මැඩ

---

1. හටගන්නා වූ - ABDKL
2. යොදුන් - H
   යොදනක් - BE
3. දක්‍ෂිණාවෘත ව - බෙ. ස.
3. වටින් - B
4. අවයොදනක් K ම; අවයොදුන් - L
5. මුහුළුමල් - BCDEGH; මුහුණුමල් - KL; මුහුදුමල් - ස.
6. ශෙවතපද්ම (නැත) - KL බෙ.ස.

Non-Commercial Distribution

අපහාස කරන්නාක් වැනි වූ සකල ශ්‍රී සෞභාග්‍යයෙන් අග්‍රප්‍රාප්ත වූ ඒ ශ්‍රී මහා බොධිය අතිශයින් බබළන්නේය. නිරන්තරයෙන් දිව්‍යමනුෂ්‍යයන් සහිත ලෝකවාසීන් විසින් කරනලද සත්කාර ගරුකාර ඇත්තේය, දිව්‍ය බ්‍රහ්ම ගරුඬ ගාන්ධර්ව ආදීහු නිරන්තරයෙන් බල බලා සිටිනාහු ද තෘප්තියකට නොපැමිණෙන්නාහ. ඒ ශ්‍රී මහා බොධීන් වහන්සේ කරා පැමිණියාවූ රට දනවු වැසි මහාජනයෝ දෙවිමිනිසුන් විසින් පුදන ලද සුවඳ මල් හා සුවඳසුනු ආදියෙහි උතුම් වූ සුගන්ධගන්ධය ආඝ්‍රාණය කෙරෙමින් සන්තුෂ්ටවූවාහු ස්තුති කොට ගී කිය කියා නටා බස්නාහ. එසේ හෙයින් කියනලදී:

පභා විසෙසුජ්ජල පුප්ඵභූසිතො
සමන්තතො නිග්ගත ගන්ධ බන්ධුරො
විචිත්ත සාඛාවලි පත්තසඞ්කුලො
හවෙය්‍ය නාගව්හය බොධිපාදපො.

ගතාගතා තත්ථ සුගන්ධ ගන්ධතො
පමොදිතා ජානපද මහාජනා
සවෙණු වීණා ථුති ගීත නච්චතො
කරොන්ති එවං සතතං මහුස්සවං-යි.

තව ද ඒ මෛත්‍රී සර්වඥයන් වහන්සේගේ බුද්ධ ශරීරය අට අසූරියන් පමණ වන්නේය. සුප්‍රතිෂ්ඨිත පාදතලයෙහි පටන් දෙදණ මඩලට දෙවිසිරියන් උසය; දණමඬලෙහි පටන් නාභිමණ්ඩලයට දෙවිසිරියන් උසය; නාභිමණ්ඩලයෙහි පටන් අකුධාතුවට දෙවිසිරියන් උසය; අකුධාතුයෙහි පටන් ශිරොධාතුවට දෙවිසිරියන් උසය. දකුණු උරමඬලෙහි පටන් වම් උරමඬලට පළල පස්විසිරියන් පමණය. විදුලිය දෙකක් වන් කන්වැල් සහළ සත් සත් රියන් පමණය. පස්පෑ දිස්නා එකි එකී ඇස පස් පස් රියන් පමණය. ස්වර්ණ පර්වත මස්තකයෙක හුණු නිල් දෙව්දුනු සහළක් වැනි සශ්‍රීක වූ බැමසහළ පස් පස් රියන් පමණය. බැම අතුර පස්රියන් පමණය. රන් අකුස්සක් හා සමාන උස් වූ නාසිකාව සත්රියන් පමණය. බිඹුවැල[1] දෙකක් හා සමාන අතිරක්ත වූ තොල් සහල පස් පස් රියන් පමණය. ඉතා සිනිඳු වූ මොළොක් වූ තුනු වූ අතිරක්ත වූ දිගු[2] පුළුල් වූ ජිව්හා ධාතුව දසරියන් පමණය. ශිරොධාතුව වටින් පස්විසිරියන් පමණය. එසේ ම රන් කැඩපතක්[3] හා සමාන වූ මුඛමණ්ඩලය වටින් පස් විසි රියන් පමණය. රන් මිහිඟුබෙරයක් මෙන් සම ව වට වූ ශ්‍රීවාධාතුව පස්විසිරියන් උසය. වට මටසිලුටු වූ පිරිපුන් ශ්‍රී හස්ත දෙක හතලිස් හතලිස් රියන් දිගය. එකි එකී අතුල්තලය පස් පස් රියන් පමණය. සශ්‍රීක වූ ශ්‍රීපාද දෙක තෙළෙස් රියන් එක්වියත් සාඟුල් පමණ දිග ඇත්තේය. වදරන ලද මැයි.

1. බිඹුඵල - කි.ම.
   බිඹුපැල - ක.ඝ.
2. දික් - ක.කි.ඝ.ම.
3. රන්කැටපතක් - ABKL

Non-Commercial Distribution

අට්ඨාසීති හවෙ හත්ථා - ආයාමෙනෙව සො ජිනො,
උරං හවෙ පණ්ණුවීස[1] - විකඛමහා තස්ස සත්ථුනො - යි.

මෙසේ සශ්‍රීක වූ ශ්‍රී ශරීරයක් ඇති ඒ මෛත්‍රී සර්වඥයන් වහන්සේ රාත්‍රින්දිනයෙහි එකාකාර ව පවත්නා අනිමිසලොචන යුගළයෙන් චතුරඩ්ගසමන්නාගත ඝනාන්ධකාරයෙහි ද හාත්පසින්[2] එකි එකී දිගින් දෙළොස් දෙළොස් යොදුන් ඇතුළත්හි තුබු අබඇට සා සියුම් රූපයන් ද සත්වසංස්කාරාදී වූ ස්ථූල රූපයන් ද සාවරණ වූ මාංසචක්‍ෂුසෙහි ආනුභාවයෙන් අනාවරණ ව දක්නා සේක. තව ද ඒ සර්වඥයන් වහන්සේගේ ව්‍යාමප්‍රභා සංඛ්‍යාත ඝන වූ රශ්මිමණ්ඩලය ආයු පමණින් නිරතුරු ව පස්විසි යොදනෙක පැතිර සිටිනේය. එසේ ම ඒ සර්වඥයන්වහන්සේගේ සකල ශ්‍රී ශරීරය සරහා සිටගත්තාවූ දෙතිස් මහාපුරුෂ ලක්‍ෂණයන් හා අසූඅනුව්‍යඤ්ජනලක්‍ෂණයන් කරණකොටගෙන තාරකා සමූහයෙන් දිලියෙන ආකාශතලයක් මෙන් ද විකසිත පද්මොත්පල පුණ්ඩරීකාදියෙන්[3] දිලියෙන්නාවූ[4] මහ විලක් මෙන් ද නානා ප්‍රකාර මාණික්‍යාලොකයෙන්[5] බබළන්නාවූ රුවන් ආකරයක් මෙන් ද සන්ධ්‍යා වලාපටලයෙන් හා සියරැලි විදුලියකැල දෙව්දුනු ආදියෙන් රැඳී ගිය රන් පර්වතයක් මෙන් ද විශෙෂයෙන් බබළන සේක.

තව ද ඒ සර්වඥයන් වහන්සේගේ සියලඟින් දිවන්නාවූ ඝවනක් ඝන බුධරශ්මීහු ඉන්ද්‍රනීල මාණික්‍යමය ඝටයකින් නික්මුණාවූ නීලමණි රසධාරාවක් මෙන් ද ස්වර්ණඝටයකින් නික්මුණාවූ කුඞකුම 'රසධාරාවක් මෙන් ද ප්‍රවාල ඝටයකින් නික්මුණු ලාක්‍ෂාරසධාරාවක් මෙන් ද රජතඝටයකින් නික්මුණාවූ ක්‍ෂීර රසධාරාවක් මෙන් ද පද්මරාග මාණික්‍යමය ඝටයකින් නික්මුණාවූ පියුම්[6] රසධාරාවක් මෙන් ද සත්රුවන් ඝටයකින් නික්මුණාවූ නානාවර්ණ රුවන් රසධාරාවක් මෙන් ද ඒ ඒ ස්ථානයෙන් නික්ම අතිශයින් බබළ බබළා කරකැවී කරකැවී[7] යුවළ යුවළ ව රථසක් සා ඡේසත් සා කුළුගෙවල් සා පමණ ව දසදහසක් සක්වළ ඒකාවර්ත්ත ව යටින් වාපොළොව ඉක්ම මත්තෙන් භවාග්‍රය ඉක්ම ශාසනානන්තය දක්වා අතුරු නැති ව ප්‍රමාණාතික්‍රාන්ත සක්වළවල පැතිර පවත්නාහ. වදරනලද මැයි:

පභා'තිධාවතී[8] තස්ස - යාවතා පණ්ණුවීසති,
සොහති විජ්ජුලටඨීව - දීපරුකෙඛාව සො ජිනො.[9]
ලකඛණ ව්‍යඤ්ජනාරංසා - දිස්සන්ති සබ්බකාලිකා,
පතන්ති විවිධා රංසා - අනෙකසතසහස්සියො -යි.

තව ද ඒ සර්වඥයන් වහන්සේ යම් තැනෙක්හි වඩනාසේක් වී නම් එකල්හි එබු එබූ පත්ලට සුපුෂ්පිත වූ මහපියුම් පැන නැඟෙයි. ඉන් එකි එකී පද්මයෙක තිස් තිස් රියන් පමණ මහපෙති වන්නේය; පස් පස් රියන්[10] පමණ අනුපෙති වන්නේය; පියුම් කෙසුරු විසි රියන් පමණ වෙයි; සොළොස් රියන් පමණ කෙමි වෙයි; එකී එකී මලෙක අමුණක් අමුණක් පමණ රෙහෙණු[11] වෙයි. ඒ

1. පණ්ණ වීස - ABH
2. හාත්පය - BDEHL
3. පුණ්ඩරීකයෙන් - BEHKL
4. දිලිහෙන්නාවූ - ABEH
5. මාණික්‍යාලංකාරයෙන් - B
6. පියුම්රාමණි - BEHKL ම.ස.
7. කර්කැවී - BCEGKL
8. පභා නිච්චාවති - CE
   පභා නිමිහාවති - A
   පභා නිධාවති - ම
9. රතනගන්ධ සංකායො - හාත්‍ථමා විය භාසති යන ගාථාර්ධය මෙතැන් හි පෙනේ -ම.
10. පස්විසිරියන් - B
11. රේණු - BCHKL

Non-Commercial Distribution

සර්වඥයන්වහන්සේ[1] ශ්‍රීපාදය එබු එබු වේලෙහි හිඟුල්සුනු[2] හා සමාන වූ ඉතා රත් පැහැ ඇති රොන්සළා සමූහයෝ අනොලෝ මුදුන් දක්වා නැඟී රන්පිළිමයෙක ලාක්‍ෂාරසධාරාවන්[3] තවරන්නාක් මෙන් සකල ශරීරය[4] හාත්පසින් තවරාගෙන සරහමින් ශ්‍රීපාද මූලයෙහි වැහෙන්නාහුය. අතුරතුරෙහි අතිධවල වූ ශ්වේතපද්මයෝ ද පොළොව පළාගෙන පැනනැඟී ඒ බුදුන්ගේ පාපියුම් හොබවන්නාහ. වදාරනලද මැයි:

කෙසරා වීසති හත්ථා - කණ්ණිකා සොළසං භවෙ,
සුරත්තරේණුහරිතා - පදුමා කොකා සමන්තරෙ[5] - යි.

තව ද ඒ සමයෙහි ඒ මෛත්‍රී සර්වඥයන් වහන්සේගේ ගඳකිළිය සිසාරා හාත්පසින් කාමාවචර දේවතාවන් හා දිව්‍යනාගයෝ අනෙකප්‍රකාර රන්රුවන් ඇගෑපන්තීන් මවන්නාහ; එයින් ඇගෑ අටෙක් සතරන්මය වෙයි. අටෙක් රිදීමය වෙයි. අටෙක් මැණික්මය වෙයි, අටෙක් පබළුමය වෙයි, නොයෙක් සියදහස්ගණන් මල් ඇගෑ හා මල් තොරණ ආදිය ගඳකිළිය සතරදිග සරහා සිටිනේය. ඒ සියල්ල ම උසින් අටාසූරියන් පමණ වෙයි. මහත් වූ ආනුභාව ඇති ගරුඩගන්ධර්වාදින් හා දිව්‍යඞ්ගනාවෝ සප්තරත්නයෙන් විචිත්‍ර වූ ධජමාලාවෙන් හා රන්දම් රිදීදම් මුතුදම් මැණික්දම් සුවඳ මල්දම් රන්රසුදල් මල්කලස මල්කැන් ආදියෙන් ද හාත්පසින් එල්වනලද රන්තරු රිදීතරු මැණික්තරු ආදියෙන් විසිතුරු සත්රුවන්මය වියනින් ද ඒ සියලු රන්රුවන් ඇගෑ[6] සරහන්නාහ. හැම කල ම අනෙකප්‍රකාර දිවසුවඳමල් වැසි වස්නේය.[7] දිව්‍යමය සුගන්ධගන්ධයෙන්[8] ආර්ද්‍ර[9] වූ සඳුන් සුවඳ[10] සුනු විසුරුවන්නාහ. තව ද ඒ ඇගෑ මධ්‍යයෙහි පස්වනක් පැහැයෙන් බබළන්නාවූ නානා වර්ණ දිව්‍යවස්ත්‍රයෝ දස දිගුන්[11] හොබවමින් ලෙලදිදී[12] සිටිනාහ. තව ද ඒ ඇගෑ තොරණ සියල්ලට ම වඩා ගඳකිළිය දෙරකඩ පිහිටියාවූ දහසක් රියන් උසඇති සත්රුවන්මය ඇගෑ හා රුවන් තොරණ සමූහය සියදහස් ගණන් විචිත්‍ර ධජ මාලාවෙන් ගැවසී ගෙන සර්භාගයෙන්[13] අලඞ්කෘත ව බැබළී බැබළී සිටිනේය.

ඒ ඇගෑ තොරණ දෙපන්තියට අතුරෙහි පොළොව පළාගෙන පැනනැඟී දෙලොස් යොදනක් පමණ රත්නමණ්ඩප මධ්‍යයෙහි සර්වරත්නමය ධවලාතපත්‍රයෙකින් හෙබියා වූ සප්තරත්නයෙන් සමලඞ්කෘත මාණික්‍යමය බුධාසන මස්තකයෙහි භික්‍ෂුසඞ්ඝයා පිරිවරා වැඩහුන්නාවූ ඒ මෛත්‍රී බුදුරජාණන් වහන්සේ සතිස් යොදනෙක පැතිර සිටි මහපිරිස් පිරිවරා හුන් සක්විතිරජක්හු මෙන් ද මහබඹ පිරිස් පිරිවරා හුන් බ්‍රහ්මරාජයා[14] මෙන් ද පාණ්ඩු කම්බලශෛලාශන මස්තකයෙහි

---

1. වහන්සේගේ - BK
2. ඉඟුල් සුනු - KL
3. ධාරාවක් - B
4. ශරීරයෙහි - B
5. සත්තරෙ - KL
සකන්තරෙ - ම.
6. රන් ඇගෑ - BKL
7. වස්වන්නාහ - BEDH
වස්නාහ - KL
8. සුගන්ධයෙන් - මුද්‍රිත හැම
* 9. ආර්ද්‍රම
10. සුවඳ (නැත) - BDEKL
11. දසදික් - DEHKL, ස.
දසදිග් - BH
12 ලෙලි ලෙලී - Kl
13. සර්වශොභාගයෙන් - ALEK, ස
සර්වාභරණයෙන් - L
14. බ්‍රහමරාජයකු - BDEHKL

දිව්‍යසේනාව පිරිවරා හුන් ශක්‍ර දෙවේන්‍ද්‍රයා මෙන් ද සප්තකුල පර්වතයන් පිරිවරනලද මහාමේරු රාජයා මෙන් ද අතිශයින් ම බබළා සියලු සත්වයන්ට ප්‍රීති සොම්නස් වඩවමින් දෙව්මිනිසුන් සහිත මහජනයාට ධර්මදෙශනා කොට මාර්ගඵලයට පමුණුවන සේක. තව ද ඒ මෛත්‍රී සර්වඥයන් වහන්සේගේ කුශලානුභාවයෙන් උපන්නාවූ ඒ මණ්ඩපය සතරකොන නිර්මිත ව තිබෙන්නාවූ තිස් තිස් රියන් පමණ ඝණ්ටා[1] සතරෙක් වන්නේය. ඒ ඝණ්ටා[1] සතර පවන්[2] සැලෙන කල්හි ඒ නාදය සියලු සක්වල ගැබ පැතිර එකනින්නාද කෙරෙයි. මෙසේ සියලු අලංකාරයෙන් හෙබියාවූ ඒ සත්රුවන් මණ්ඩපය හා රන් ඇගෑ රිදී ඇගෑ මැණික් ඇගෑ පබළුඇගෑ රන්තොරණ රිදීතොරණ මැණික්තොරණ පබළුතොරණ රන්ධජ රිදීධජ මැණික්ධජ පබළුධජ සත්රුවන්ධජ රන්දම් රිදීදම් මැණික්දම් පබළුදම් සත්රුවන්දම් සුවඳමල්දම් රන්කලස රිදීකලස සත්රුවන්කලස රන්පැන රිදීපැන රන්මල්[3] රිදීමල් නන්විසිතුරු දිවදුහුල් පස් වනක් පැහැ ඇති දිවපිළී මලොලඹු රන්තරු රිදීතරු මැණික්තරු ආදි වූ සර්වරත්නයෙන් විචිත්‍ර වූ මනහර පටවියන් සුවඳමල් පිරූ රන්මාලා රිදීමාලා සුවඳසුණු පිරූ රන්කරඬු රිදීකරඬු සත්රුවන්කරඬු නන් විසිතුරු රන්රුවන් කර්මාන්ත කරනලද මිට් ඇති රන්චාමර රිදීචාමර රන්තල්වැට රිදීතල්වැට රන්කැටපත්[4] රිදීකැටපත්[4] ආදී වූ නොයෙක් පූජාභාණ්ඩ විශෙෂය ඒ මෛත්‍රී සර්වඥයන් වහන්සේ වඩනා යම් තැනකට සජීවයන් සේ එක් ව ම ගොස් පිරිවර සහිත ඒ සර්වඥයන් වහන්සේ හුන් සිටි යම් ම තැනක දෙවියන් විසින් අල්වාගෙන සිටිනාවූ පූජාභාණ්ඩයන් මෙන් හැම වේලේ ම්[5] බුදුන් පිරිවරා සිටිනේය. එකල්හි ඒ බුදුන් පුදනු සඳහා ආවාවූ දිව්‍යබ්‍රහ්මයන් හා රජ බමුණු වෙළෙඳ ගොවි ආදි වූ මහජනයෝ ඒ ප්‍රාතිහාර්ය්‍ය දැක අතිශයින් ප්‍රසන්න වූ සිත් ඇති ව තමතමන් ගේ[6] පුත්‍රදාරාවන් හා සමඟ තිසරණ ම සරණ කොට ගෙන සරණශීලයෙහි පිහිටන්නාහ. බුදුහු ඒ මාණික්‍යපර්ය්‍යංකයෙහි වැඩහිඳ ම ත්‍රිසහශ්‍රී මහාසහශ්‍රී ලොක ධාතුව ද තමන් වහන්සේගේ ධර්මදෙශනා ශබ්දයෙන් ම අස්වා බණවදරණ සේක.

එකල ඒ රත්නමණ්ඩපයෙහි රත්නාලොකයෙන් හා රන් රුවන් ඇගෑ ආදියෙහි සත්රුවන් ආලොකයෙන් හා වියන් තොරණ රන් රිදී කරඬු කැටපත් ආදියෙහි ප්‍රභා සමූහයෙන් හා ඒ මෛත්‍රී සර්වඥයන් වහන්සේගේ ශරීරාලොකයෙන් නිෂ්ප්‍රභා වූ සූර්ය්‍යමණ්ඩලය රාත්‍රින්දිනයෙහි විභාග දක්වන්නට අසමර්ථ වන්නේය. බුදුන්ගේ ශරීරාලොකය ම අතුරු නැති ව ලොකයෙහි පැතිර සිටිනේය. එසමයෙහි සවස උදසනයෙහි අඬ නඟන්නාවූ කුකුළන් ආදි වූ පක්ෂීන්ගේ ශබ්දයෙන් හා සවස පිපෙන දසමන් සීනිද්ද බෝලිද්ද සෙඵාලිකා ආදි මලින් හා උදසන පිපෙන නාමල් සපුමල් රත්නෙළුම් හෙළනෙළුම් ඇඹුල ඉපුල[7] ආදි නොයෙක් මල් පිපෙන සලකුණෙන් ම ලොකවාසීහු රෑ දවල යන වෙනස දැනගන්නාහ. මෙසේ ඒ මෛත්‍රී සර්වඥයන් වහන්සේ අතීත ජාතිවල බොහෝ සර්වඥවරයන් වහන්සේට කරවා

1. ඝණ්ටාර - CEHKL
2. පවනින් - BEHKL, ස
3. රන්මිරි - BL
රන්මිරි - E; සත්රුවන් දෙන රන්මල් - K
රන් විසිර රිදී විසිර රන්මල් - ස.
4. කැඩපත් - A
5. වේලෙහි ම - BH
6. තමතමාගේ - BKL, මුද්‍රිත හැම, ස.
7. ඉපල - බෙ.ස.

Non-Commercial Distribution

පිළිගන්වනලද නොයෙක් ප්‍රාසාද මණ්ඩපවල විපාකයෙන් හා පූජා පිණිස කරනලද රන්රුවන් ඇගෑ ආදියෙහි විපාකයෙන් උපන්නාවූ ඒ සත්රුවන් මණ්ඩපය සකලලොකශ්‍රිය එක තැනකට රැස් කොට ලූවාක් මෙන් ඉතා සශ්‍රීක වන්නේය. තවද ඒ මණ්ඩපයෙහි ඒ ඒ කොන සුවඳමල් හා සුවඳ දුමින් සුවඳ කරනලද මිහිරි සිහිල් පැන් පිරුණු රන් රිදී රුවන් කළ හා සිව්දෑගඳ පිරුණු රුවන් කරඬු ආදිය අතුරු නැති ව පිළිවෙළින් සිටිනාහ. එසේ ම දිව සුවඳ දුමින් පිරුණු රන්රිදී පබළුමිණි සත්රුවන්මය දුඹුලොසු හා සුවඳපුනු පිරුණු රන්රිදී රුවන්කරඬු හා සුවඳතෙල් පිරුණු සකල රාත්‍රියෙහි ඇවිළෙන සත්රුවන්මය පහන්රුක් පන්තිහු සතරදිග අතුරු නැති ව පිළිවෙළින් සිටිනාහ. තව ද රත්පියුම් හෙළපියුම් ආදි වූ ජලජමල් මිටිපෙළින් ගැවසීගත් රන්රුවන් ආදි වූ සප්තරත්නමය පූර්ණඝට පූර්ණකලස මාලාවෝ ද අතුරු නැති ව පිළිවෙළින් සිටිනාහ. ඊ මත්තෙහි සර්වරත්නයෙන් විචිත්‍ර ව බබළන්නා වූ ධජමාලාවෝ ලෙල දිදී සිටිනාහ. එසේ ම විචිත්‍ර රත්නයෙන් අලංකෘත වූ ධවලාතපත්‍ර පන්තීහු හාත්පසින් අතුරු නැති ව මස්තකය හොබවා පිළිවෙළින් සිටිනාහ. ඒ මෛත්‍රී සර්වඥයන් වහන්සේට උපාසකවරුන් ආරාධනා කොට තම තමන්ගේ ගෙවලට පූජාසත්කාරයෙන් වඩාගෙන යන කල්හි සත්රුවන් මණ්ඩපය ආකාශයෙන් ගොස් ඔවුනොවුන්ගේ ගෙදෙරවල පෙරටු ව පිහිටන්නේය. ඒ මණ්ඩපයෙහි ලෙලදෙන්නා වූ ඝණ්ටාර[1] නාදයෙන් බුදුන් වඩනා බව දන සියලු මනුෂ්‍යයෝ ම ඉදිරියට නික්ම පෙරගමන් කරන්නාහ. මනුෂ්‍යයන් අතුරෙහි දෙවියන් හා නාග මානවකාදීහු සිට ගෙන නන් රස බොජුන් එළවා සාදර සිතින් වළඳවති, ඒ සමයෙහි මුළු දඹදිව ඉතා දුඃඛිත සත්ව කෙනෙකුන් නැති හෙයින් සර්වඥයන් වහන්සේ හා භික්ෂූන් වහන්සේ වඩා හිඳුවා අටළොස් වර්ගයෙහි සූපාසූප හා නොයෙක්[2] රසමසවුලෙන් යුක්ත වූ සුවඳ ඇල්සාලේ[3] බත වළඳවති; වළඳ ඉක්බිති අනුමෙවුනි[4] ධර්මදෙශනා කරන්නාවූ ඒ සර්වඥයන් වහන්සේගේ ශබ්දය සියලු සක්වළගැබ එකපැහැර පැතිර සිටිනේය. හැම මනුෂ්‍යයෝ ම තම තමන්ගේ ගෙවල ම සිටියාහු බුද්ධාලම්බන ප්‍රීති උපදවා රත්නමණ්ඩපයෙහි ඒ ආශ්චර්යමත් වූ ප්‍රාතිහාර්ය හා රන්රුවන් ඇගෑ පියුම් ආදිය හා සර්වඥවිලාසය දක තම තමන්ගේ ලබ්ධි හැර තිසරණ ම සරණ කොට පංචශීලයෙහි පිහිටා බඹසර වස් රැක මාර්ගඵල උපදවා සකල කෙලශයන් ප්‍රහීණකොට අර්හත් ඵලයට පැමිණෙන්නාහ, සියලු ලොකයෙහි අන්‍ය පාෂාණ්ඩ කෙනෙක්වත් සෙසු ප්‍රව්‍රජ්‍යාවෙක්වත් නොවන්නේ ය. හැම දෙන ම දනශීලාදි දශපුණ්‍යක්‍රියා වස්තුවෙන් හා කායසුචරිතාදි ත්‍රිවිධ සුචරිතයෙන් හා ත්‍රිපිටකධාරී වීමෙන් හා මාර්ගඵල ඉපදවීමෙන් හා සර්වඥශාසනය බබුළුවා සමහර සත්වකෙනෙක් රහත් ව ඉහාත්මභාවයෙහි ම අමාමහ නිවන් දක්නාහ. සමහර සත්වකෙනෙක් ඒ ඒ මාර්ගඵලයට අනුරූප වූ පරිද්දෙන් දිව්‍යලොක බ්‍රහ්මලොකවල උපදනාහ. එසමයෙහි ඒ මෛත්‍රී සර්වඥයන්වහන්සේගේ ද්වාත්‍රිංශද්වර මහාපුරුෂලක්ෂණ අශීත්‍යනුව්‍යඤ්ජනව්‍යාමප්‍රභා කෙතුමාලාලංකාරයෙන් විරාජමානවූ

1. ඝණ්ටා - DE ම.
2. නොයෙක් නොයෙක් - මුද්‍රිත හැම, ස.
3. හැල් සාලේ - EH
4. අනුමෙවෙනි - ක.කි.කැ.

Non-Commercial Distribution

රූපවිලාසය හා දිව්‍ය බ්‍රහ්මනාග ගරුඩ[1] ගාන්ධර්වාදි සියලු සත්ත්වයන් විසින් අතුරු නැති ව කරන්නාවූ නොයෙක් පූජාසත්කාර හා උන්වහන්සේගේ කුශලානුභාවයෙන් නිර්මිත වූ රත්නමණ්ඩපය රන්රුවන් ඇගෑ සත්රුවන් තොරණ රන්රිදීමය ධජපතාකා ආදි වූ පූජාභාණ්ඩ විශෙෂය හා නිත්‍ය පරිවාර කෙළලක්‍ෂයක් රහතන් වහන්සේ නිරන්තර ව පිරිවරා ඇවිදීම් ආදි වූ නොයෙක් යශශ්‍රීසමෘද්ධිය මෙතෙක් ප්‍රමාණය යි සර්වප්‍රකාරයෙන් සඞ්ඛ්‍යා කොට කියන්ට එබඳු ම සර්වඥකෙනකුන් වහන්සේට මිස පෘථග්ජන[2] ව සිටි අන්‍ය සත්ත්වයක්හට නොපිළිවන් මය. වදරන ලද මැයි:

අනප්පකං පුඤ්ඤරාසිං - මෙත්තෙය්‍යස්ස මහායසං,[3]
න සක්කා සබ්බසො වත්තුං - විත්ථාරෙනෙ'ව කස්සචි යි.

එසේ හෙයින් සියලු සත්ත්වයන් විසින් ම එබඳු වූ නොයෙක් ආශ්චර්‍ය්‍ය හා ඒ මෛත්‍රී සර්වඥයන් වහන්සේ දක ආදි මධ්‍යාවසාන යන[4] ත්‍රිවිධ කල්‍යාණයෙන් යුක්ත කොට වදරන්නාවූ[5] සද්ධර්මය අසා අමාමහ නිවන් දකින්ට උත්සාහ කටයුත්තේ මය.

එසමයෙහි සියලු සත්ත්වයන්ට ම අසූදහසක් අවුරුද්දට ආයු වන්නේය; ඒ තාක් කල් මුළුල්ලෙහි ජීවත් ව වැඩහිඳිනාවූ ඒ මෛත්‍රී සර්වඥයන් වහන්සේ මේ බුද්ධොත්පාදයෙහි කුසල් කළ බොහෝ ජනසමූහයා සංසාර සාගරයෙන් එතෙර කොට අමාමහ නිවන් දක්වනසේක. තව ද ඥානපරිපාකගත වූ සියුම් නුවණ ඇති සත්ත්වයන් සර්වප්‍රකාරයෙන් චතුස්සත්‍යාවබොධය[6] කරවා, ඥාන පරිපාකයට නොපැමිණි අවශෙෂ සත්ත්වයන්ට නිර්වාණගාමිනීමාර්ගය මේ ය මේ අමාර්ගය යි මාර්ගාමාර්ග දෙක වදරා පවත්වන ලද ශාසන ධර්මය ඔබ ඇවෑමෙහි ද එක්ලක්‍ෂ අසූදහසක් අවුරුදු පවත්නේය.

තව ද ඒ මෛත්‍රී සර්වඥයන් වහන්සේ දක්නාහු කවුරු[7] ද නොදක්නාහු කවුරු ද යත්: මාතෘඝාතක පිතෘඝාතක, අරහන්තඝාතක, ලොහිතුප්පාදක, සංඝභෙදකය යන මේ පඤ්චානන්තර්‍ය්‍ය කර්මය කොට අවීචිමහනරකයෙහි උපන්නාවූ සත්ත්වයෝ ඒ මෛත්‍රී සර්වඥයන් වහන්සේ දක්ක නොහෙත් මය. දගබ් බිඳ බොධිශාඛා කපා රන් රිදී පිළිම පොතු[8] උපුටා පොත්පත් සිඳ මෙකී පවු කිරීම ද පංචානන්තර්‍ය්‍ය කර්මයට ඇතුළත් හෙයින් ඔහුත් ඒ බුදුන් නොදකිත් මය. සංඝයා වහන්සේට ආක්‍රොශපරිභව බිනූ සත්ත්වයෝ ද සිල්වතුන්ට බොරුවෙන් වත් ඉපදවූවාහු ද ධර්මයට අනාදර බිනූවාහු ද ඒ මෛත්‍රී බුදුන් දක්ක නොහෙත්මය. දන්වැට කැවෝ ද කුසලාන්[9] ගසා කැවෝ ද බුදුන් සතු දෙය කැවෝ ද ධර්මය සතු දෙය කැවෝ ද සාංඝික[10] දෙය ගසා කැවෝද

1. නරනාගගරුඩ - B
නරගරුඩ - EH
ගරුඩ - KL
2. පුථුජ්ජන - පිටපත් හැම
3. මහාරසං - B
4. යන (නැත) - පිටපත් හැම.
5. වදරන ලද - B
ධරන්නාවූ - A
6. වබොධ - BDEH
බොධ - L
7. කවරහු - AB
8. පෙති - C
9. කුසලන් - ABCD
10. සංඝයා සතු - H

Non-Commercial Distribution

යන මොහුත් ඒ බුදුන් දක්ක නොහෙත් මය. මේ බුද්ධොත්පාදයෙහි අළු ගා[1] මිථ්‍යාදෘෂ්ටි ගෙන ඇවිද්දහු ද මෙලෝ නැත පරලෝ නැත කම් නැත කම්පල නැත මවු නැත පියෝ නැත කළාවූ කුශලාකුශලයෙහි විපාක නැතැ යි මෙසේ මිථ්‍යාදෘෂ්ටි ගෙන ඇවිද්දහු ද ඒ මෛත්‍රී බුදුන් දක්ක නොහෙත් මය. හිරසඳ දෙවියන්ට වැසිවලා දෙවියන්ට දෙස් කළෝ ද[2] සෙසු ආයෙ‍්‍ය්‍යාපවාද කළාහු ද ඒ මෛත්‍රී බුදුන් දක්ක නොහෙත් මය. නරක තියර්‍යක් ප්‍රෙත අසුරකාය යන සතරඅපායෙහි උපන් සත්වයෝ ද අරූතල අසංඥතලයෙහි උපන්නාහු ද පරසක්වළ උපන්නාහු ද ඒ මෛත්‍රී බුදුන් නොදක්නාහු මය.[3] ඉන්ද්‍රිය වෛකල්‍යයට පැමිණි සත්වයෝ ද ප්‍රත්‍යන්ත ජනපදයෙහි උපන් සත්වයෝ ද නිගණ්ඨ ආජීවකාදි පාෂණ්ඩයෝ ද ඒ මෛත්‍රී බුදුන් දක්ක නොහෙත් මය.

තව ද මේ බුද්ධොත්පාදයෙහි බණ අසා මෙලෝ පරලෝ දන තම තමා[4] ශක්ති පමණින් දන් පින් කළාහු ඒ මෛත්‍රී බුදුන් දක්නාහු මය. තව ද සිල් රක්‍ෂා කළෝ දකිති; බණ කියවා ලෝවැඩ කළාහු[5] දකිති; දගබ් දකරඬු කැරවූවෝ දකිති; හොජන ශාලා කැරවූවෝ දකිති; ළින් බිඳුවූවෝ[6] දකිති; පින් පැන් තිබුවෝ දකිති. බුදුසසුන් ඇතිකරවන්ට වහල් වූවෝ[7] දකිති; ධර්මාසන කැරවූවෝ දකිති; දණ්ඩාසන කබලි බණවසුන් පොත්වසුන් ලැව්වෝ[8] දකිති; බණ කියන ගෙයි වියන් බැන්දෝ දකිති. විය නෙහි මලොලඹු එල්වූවෝ දකිති; රන්මල් රිදීමල් ආදිය පිදූවෝ දකිති; සුවඳ මල් සුවඳසුනු[9] පිදූවෝ දකිති; සුවඳදුම් දුන්වෝ දකිති. බණ කියන ගෙයි පහන් දල්වූවෝ[10] දකිති; බණ අසන්ට හඬගෑවෝ දකිති; බණකියන කල සාධුකාර දුන්නෝ දකිති; ධර්ම කථිකයන් පය සේදූවෝ[11] දකිති; බණ කියන්නන්[12] ආචාර උපචාරයෙන් වඩාගෙනවුත් සකස්කොට බණ පැවැත්වූවෝ දකිති; විජිනිපත් දුන්නෝ දකිති; බණපොත් ලියවූවෝ දකිති; තමන් ලියවූ පොත අකුරු ගණනින් චක්‍රවර්ති සම්පත් ආදි වූ සැපත් ලදින් සුවපත්වූවෝ[13] මෙතේ බුදුන් දක්නාහු මය. තව ද ආමිසදන ධර්මදනාදියෙන් සංඝයා වහන්සේට සත්කාර කළාහු දකිත්මය. මවුපියන්ට උපස්ථාන කළෝ දකිති; කුල දෙටුවන්ට උපස්ථාන කළෝ දකිති; ලාබත්[14] පෝබත් අවටිබත් දුන්නෝ දකිති; දසපින්කිරියවත් පිරූවෝ දකිති; සංඝාරාම කරවූවෝ දකිති. පිළිම ගෙවල් කැරවූවෝ දකිති. පිළිම කරවා ඇස් පිහිටුවූවෝ[15] දකිති; ගිලනුන්ට අත්පාමෙහෙ කළෝ දකිති. තව ද ඒ මෛත්‍රී සර්වඥයන්වහන්සේ දකිම්ව යි[16] පතා යටත් පිරිසෙයින් එක මල්මිටක් එක පහනක්[17] එක බත්සරළුවක් පමණ දුන්නාහු ද ඒ මෛත්‍රී සර්වඥයන් වහන්සේ දකිත් මය; අනුන් කළ පින් තමා[18] සමසිතින් අනුමෝදන් වූවෝ දකිත් මය. මෙසේ පින් කළ සත්වයෝ එකල්හි ඒ මෛත්‍රී සර්වඥයන් වහන්සේ දැක බණ අසා මාර්‍ගඵලයට පැමිණ අමාමහ

1. අනුගා - ක.සි.ස.
2. කළාහු ද - BCNKL
සස් කළාහු ද - ADE
3. දක්ක නොහෙත් මය - B
තමන් - KL
5. කළෝ - BDEHKL
6. ළින් බිඳුවා ළින් පොකුණු කරවූවෝ - A
7. උත්සාහ කරන්නෝ - A
වහල් කැරවූවෝ - H
8. කරවූවෝ - B
9. සුවඳ සුනු ආදිය - A
10. ලැබූවෝ - KL
11. සේඩවූවෝ - පිටපත් හැම
12. බණ කියන්නන්ට - C
13. සුවවිළි - ABEHKL, ස.
14. ලහබත් - B
15. තිබ්බවූවෝ - B
16. දකුම්හ යි - KL
17. එක ම ලක්‍ෂණ පහනක් - A
18. පින්කම - ADEKL

Non-Commercial Distribution

නිවන් දකිති. එපරිද්දෙන් මාර්ග ඵල උපදවන්ට අසමර්ථ වූවාහු සදිව්‍යලොකය මිනිස්ලොව[1]ය යි යන සප්තවිධ කාමස්වර්ගයෙහි ම උපදිති; තිරිසන් යොනියෙහි උපන් අහෙතුක සත්වයෝ ද පවා හෙතුසම්පත් ලැබෙති. එසේ හෙයින් තමහට වැඩ කැමැති ශ්‍රද්ධාවන්ත සියලු සත්වයන් විසින් ම:

දානං සීලං භාවනා පත්තිදානං
වෙය්‍යාවච්චං දෙසනාචානුමොදෙ
දිට්ඨිජ්ජුකත්තං සංස්තුතිචාපචායො
ඤෙයෝ‍යා එවං පුඤ්ඤවත්ථුප්පභෙදෙ.

යනාදීන් දක්වන ලද දශප්‍රකාර කුශලධර්මයෙහි ආනිසංස විශෙෂය වෙන වෙන ම නුවණින් සලකා ආදිමධ්‍යාවසාන යන ත්‍රිවිධ චෙතනාව ශුද්ධ කොට අන්නපානාදිය දන්දීමය. පන්සිල් අටසිල් ආදිය රක්ෂාකිරීමය හිත අහිත මධ්‍යස්ථ සියලු සත්වයන් කෙරෙහි මෛත්‍රී පැතිරවීම් ආදි වූ භාවනාකිරීමය තමා කළ කුශලයෙහි සමාදන් කරවා අනුන්ට පින්දීමය අනුන් කළ කුසල් සමසිතින් ගැන්මය[2] මෙරමාහට බණ කීමය. අනුන් කියන බණ සාදර ව ඇසීමය වයසින් ගුණයෙන් වැඩිමහලු ශ්‍රමණ බ්‍රාහ්මණයන් හා ගිලනුන්ට උපස්ථාන කිරීමය. දානශීලාදියෙහි ඉෂ්ටවිපාක ඇතැ යි දන්නා සම්‍යක්දෘෂ්ටියෙන් චිත්තය සෘජු කිරීමය පූජාවට සුදුසු ගරුතර වැඩිමහල්ලන් දුටු ආදර දක්වා වැඳ පුද සාමීචි[3] වශයෙන් සත්කාර කිරීමය. යන මේ දශප්‍රකාර කුශලධර්මයන් පුරා තම තමා ශක්ති පමණින් අප්‍රමාද ව කරන ලද එම කුසලානුභාවයෙන් මතු ඒ කෙතුමතී නම් රාජධානියෙහි සියලු උපභොග පරිභොග සම්පත්තීන් සමෘද්ධ වූ ලොකපූජිත රජබමුණුකුලයෙන් අභිමත කුලයෙක ඉපද මෛත්‍රී බුදුන් දුටු බණ අසා සිව්පස දානයෙන් උපස්ථාන කොට අභිප්‍රාය වූ[4] පරිද්දෙන් දිව්‍ය මනුෂ්‍ය නිර්වාණ සඞ්ඛ්‍යාත ත්‍රිවිධ සම්පත්තිය ක්‍රමයෙන් හස්තගත කොට අමාමහ නිවන් දකින්නට උත්සාහ කළ මැනවි. දක්වන ලද මැයි:

ඉතො චිතිත්වා කුසලං මහාරහං
උපෙච්ච හො කෙතුමතිං මහාපුරං,
සමෙක්ඛ මෙත්තෙය්‍ය තථාගතං තද
කරොථ භන්තෙ තිවිධම්පි සම්පදං - යි.

මෙතෙකින් මෙහි පස්වන
මෛත්‍රෙය්‍ය වස්තුව
සැබෙවින්[5] දක්වන ලදී.

මෙසේ අතීතානාගත වර්තමාන සඞ්ඛ්‍යාත කාලත්‍රයවර්ති වූ සර්වධර්මයන් සර්වාකාරයෙන් ප්‍රකාශ කොට දක්වන අත්‍යන්තාද්භූත මහාප්‍රදීපයක් හා සමාන මේ සපර්යාප්තික නව ලොකොත්තර සද්ධර්මය ලාභසත්කාරයෙහි නිරපෙක්ෂ ව

1. මිනිස්ලොකය - B
2. 'දානං සීලං.... යනාදීන් යන කොටස වෙනුවට 'බුදුන් විසින්' - KL
2. පින් ගැන්මය - B
3. සාමීචියෙන් - A, ස
4. අභිප්‍රා වූ - පිටපත් හැම
5. සැබෙවින් - C

Non-Commercial Distribution

නිස්සරණධ්‍යාශයෙන් ප්‍රකාශ කොට අනුන්ට බණ කීම් වශයෙන් ධර්මදානය දීමය එසේ ම මාන මාත්සර්‍ය්‍ය විරහිත ව කර්මඵලසද්දහන[1] ශ්‍රද්ධාසම්පත්තියෙහි පිහිටා සාදරාවනත උත්තමාඞ්ගයෙන් යුක්ත ව අනන්‍යවිහිත නොව බන ඇසීමය යන මේ ද්විප්‍රකාර චාරිත්‍රය සියලු භවභොග සම්පත් සාධා කෙළවර අමාමහ නිවන් ගෙනහැර දීමට ඒකාන්තකාරණ හෙයින් ස්වාර්ථපරාර්ථ සංසිද්ධිය පිණිස ධර්මසංග්‍රහ වර්ගාදි වූ සුවිසි පරිච්ඡේදයකින් සංග්‍රහ කොට සංක්ෂේප කථාවන් හා සමග අමෘත රසධාරාවක් සේ සිටියාවූ එක්සිය සුසාලිසක්[2] පමණ වස්තුකථා සමූහයකින් සරහා මා විසින් මෙසේ සකල ජන සුබොධ කොට ස්වභාෂාවෙන් දක්වන ලද මේ සද්ධර්මාලඞ්කාර නම් වූ ධර්මව්‍යාඛ්‍යානය සකලජනානන්දය[3] කෙරෙමින් ලොක බහුමාන භාජන ව අනාගතයෙහිදු ලොකාර්ථසංසිද්ධිය[4] කෙරේවා. දක්වන ලද මැයි:

සද්ධම්මදාන සවනෙසු මහානිසංසං
සුත්වා පසන්නමනසා සපරත්ථමත්ථං,
භාසාය සීහලිකයා[5] කත ධම්මමෙතං
සාධෙතු සාධුජනපත්ථිත සබ්බමත්ථං - යි.

මෙතෙකින් සාධුජනයන්ගේ සිත් පහදවා
සගමොක් සැපත් සාධා දෙන පිණිස
හෙළුබසින් උපදවන ලද

මේ සද්ධර්මාලංකාරයෙහි
තිස්සනාග වර්ග නම් වූ

සුවිසිවන පරිච්ඡේදය නිමි.*

1. කම්පලසද්දහන - EH, බෙ.
2. එක්සිය පනසක් - ම.
3. සකල ජනනන්දනය - H
4. ලොකාර්ථසිද්ධිය - KL
5. සීහලම්හා - CDE, ක.සි.කු.ම.
* K සහ L පිටපත් මෙතෙකින් අවසන් වේ.

Non-Commercial Distribution

1 සග්ගා'පවග්ගපුරගාමී මහාපථං'ව[1]
ඒතං මයා රචයතා කුසලං චිතං යං,
තේජේන තස්ස භවනිස්සිත සබ්බජන්තූ
සන්තිං භජන්තු පති ජාති[2] භවේ භවම්පි[3].

2 පුඤ්ඤෙන'නේන යසතේජධනී සුරූපී
දීඝායු පඤ්ඤ කුල සීල බලී අරෝගී,
සද්ධොරුකාරු සුවචො සපරත්ථකාමී
හෙස්සාමි දනපති යාව ජිනො භවාමි.

3. භවගතමිව[4] සත්තා ධම්මමග්ගා'නපේතා
අගති ගති වියුත්තා ධූතපාපා ගුණඩ්ඪා,
අනය විරත චිත්තා මච්ඡරාරාකරොන්තා
සපරහිත විධානා[5] හොන්තු සබ්බෙ සමග්ගා

4. ලඞ්කා නිවාස භුවනෙක භුජෙ නරින්දෙ
චාරූරු සුන්දරගිරී පුරමාවසන්තෙ,
ආරක්ඛ සද්ධ පමුඛො පුටභත්තසෙල
පාරම්පරානුගතසුවිස්සුත වෙස්සවංසො[6]

5. සදෙස දෙසන්තර මම්බරෙකො
අනන්තරං[7] පත්ථට කිත්තිඝොසො,
යො ධම්මකිත්තීරිත නාමධෙය්‍යො
මහාදිසාමින්දු විරොචයිත්ථ.

6. සීහොරසො තස්ස'භිජාත භූතො
මහන්ත තෙජාමිත කිත්තිඝොසො,
දයාධනො නිච්ච'මනාථනාථො
ගණාදි[8] වාසන්තය[9] කෙතුභූතො.

7. සාධූපචාරෙ නිරතො නිරාසො
සදා ධනාදීහි සද සමිද්ධො,
තක්කාගමෙ[10] ව්‍යාකරණෙ පසත්ථො
මහාකවී සීහල දීප දීපො.

8 ගංගාසිරී චාරුපුරෙ සමිද්ධෙ
සිලාතලාදීහි සුදස්සනීයෙ,
ජායුදකා'වාසසරා'භිරාමෙ
අජ්ඣාවසං මාලතිමාල සෙලෙ.

---

1. මහාපථාව - ACDEH
2. පුරිජාසි - A
3. වහම්පි - E
4. භව ගමිත - E
භවගතමිත - ම.
5. විධාතා - ම.
6. වෙස්සවංසෙ - H
7. අනන්තරා - AB, බෙ.ස.
නිරන්තරං - ම.
8. ගණාදිකො - A
9. වාසන්වය - ම.
10. තක්කාගමො -A

Non-Commercial Distribution

9. ධම්මොදධිං සඤාණ සුමෙරුමන්ථා[1]
ආලොළයිත්වා සකලත්ථසාරං,
ආදය යො ධම්ම පදීප භූතං
ජනානුරාගං චරිතං අකාසි.

10. සදෙස දෙසම්හි විසෙසතො යො
යං යං කතං සබ්බධි සබ්බ පුඤ්ඤං,
අකාසි ගාථාය සමොදහිත්වා[2]
ජනෙතුකාමො[3] සුජනප්පසාදං.

11. සංසුද්ධ බුද්ධි සුවිසුද්ධ[4] ගුණාධිවාසො
යො සීලසංයමිසු[5] විස්සුත ථෙරි කාලෙ,
යං බොධිසත්ත චරිතබ්භුත 'මුත්තයුත්තං[6]
හාරං'ව පාරමී මහා සතකං අකාසි.

12. යො ධම්මකිත්තිසිරිත සඞ්ඝරාජො[7]
පදෙය දෙසෙපි බහු විහාරෙ,
නත්වා ගඩාලාදෙණි නාමධෙය්‍ය
මහාවිහාරෙ සුචිරං විහාසි.

13. තස්සා'නුජො සිස්සසුතො සුධීරො
තන්නාම තස්සාචය සඞ්ඝරාජො,[7]
අත්ථාය අත්තත්ථ පරත්ථ සිද්ධ්‍යා[8]
සද්ධම්මලඞ්කාර මකාසි'මෙතං.[9]

14. සද්ධම්මා'මත දත ධම්මසවනෙ ධම්මෙන ඤත්වා ඵලං
ධම්මෙ වත්තිත ධම්මකිත්තික මහා සඞ්ඝස්ස රාජා සද,
සාධෙතුං සහිතං[10] තථා පරහිතං ආබුද්ධභාවා මහා
සද්ධම්මාදිපදෙන යුත්ත රචයී ලඞ්කාරධම්මං ඉමං.

15. සයෙව සඞ්ඛෙප නිකාය[11] සඞ්ගහං
තථෙව බාලාද්‍යවතාර[12] සඤ්ඤකං,
ජිනාදිබොධාවලි නාම වන්දනං
අකාසි හාරාවලි සන්නිභං සුභං.

16. පුඤ්ඤදානෙන ගන්ත්වා තුසිතපුරම්හිතො පූරයිත්වා පුරං තං[13]
දිස්වා මෙත්තෙය්‍ය නාථං නමපි චිරතරං තම්හි සම්මා වසිත්වා,[14]
පත්වා තෙනෙවම්ධං[15] ධජවතී නගරං තස්ස බොධිං මහිත්වා
සුත්වා බුද්ධො භවෙය්‍යං[16] ඉති උදිත ගිරං තෙන බුද්ධො භවෙය්‍යං.

---

1. මහන්තමන්ථා - A
2. සමොදයිත්වා - A
3. ජනෙත්තුකාමො - H
   ජනෙත්තුකාමො - EH
4. සුවිසද්ධ - ක.සි.ඤ,ම.
5. සීලවංසමිසි - EH, ම.
6. චරිතබ්භුතමත්ථ - මුද්‍රිත හැම ස.
7. සඞ්ඝරාජො - ම.
8. පරත්ථසිද්ධිං - CEH
9. අකාසිමෙතං ජිම්බිහුතා - CEH
10. සකතං - A
11. නිහාත - A
12. බාලාවතාර -A
    බාලාඅවතාර -A
13. පරං තං -A
14. වසිත්වා - D. බෙ.ස.
15. තෙනෙව සද්ධිං -E ම.
    තෙනෙව සමිද්ධිං - AC
    තෙනෙසමිද්ධිං - ක.සි.ඤ.
16. සුත්වා සුබොධා'යං - බෙ.

Non-Commercial Distribution

17. සද්ධාසීලාදිපඤ්ඤා සිරිධිතිසතිමා චාගමෙත්තා දයාලු
සන්තො දන්තො සුවිනීතො කලහ විගමකො[1] දස්සනෙය්‍යාභිරූපො,
තෙජොනිධි ච[2] ජාතිස්සරමතිසුවචො සුස්සරොනන්තභොගො
සද්ධම්මොයෙව තාණො භවතු භව භවෙ පාපුණෙ යාව[3] බොධිං

18. ධම්මො පවත්තතු චිරාය මුනිස්සරස්ස
ධම්මෙ ඨිතා වසුමතී පතයො භවන්තු
කාලෙ පවස්සතු[4] ඝනො නිඛිලා පජා ච
අඤ්ඤොඤ්ඤ මෙත්ති පටිලාභ සුඛං ලභන්තු.

අනාගතවංශ දේශනාව නිමි.

ඉමං ලිඛිතපුඤ්ඤෙන මෙත්තෙය්‍යං උපසංකමිං[5]
පතිට්ඨහිත්වා සරණෙ සුප්පතිට්ඨාමි සාසනෙ.

සිද්ධිරස්තු. ශුභමස්තු. ආරොග්‍යමස්තු

1. සකලවිගමකො - E
2. තෙජානිධිච - AC, ක.සි.ස්‍යා.ස
තෙජානිදෙධාවා - ම.
තෙජොනිධිච - DH වෙ.
3. පාපුණෙය්‍යාව -ACDE
4. පවත්තතු - A.
5. උපසංකමෙ - ක.සි.ස්‍යා.ම.
උපසංකමො - ස.

Non-Commercial Distribution

ගැටපදය

අ

අංකුශ මාරණ(ය) - හෙණ්ඩුව භාවිත කරන ආකාරය පිළිබඳ ශාස්ත්‍රය; මෙය සූසැට කලාවන්ගෙන් එකකි.

අකුස්ස - හෙණ්ඩුව

අක්පල්ලෙන් - පතුල් කෙළවරින්; පාදග්‍රයෙන්

අක්‍ෂර(ය) - අක්‍ෂර ශාස්ත්‍රය; සූසැට කලා අතුරින් එකකි

අගරු - සුවඳ ලී වර්ගයක්; අගිල්

අග්නි ස්තම්භ(ය) - ගිනි සිසිල් කිරීමේ ශාස්ත්‍රය; සූසැට කලාවන්ගෙන් එකකි.

අග් බබුරු - අගින් කරකැවී ගියාවූ; වකුටු වූ අග් ඇති

අග්‍ර දක්ෂිණෙය්‍ය - උත්තම දක්ෂිණාව ලැබීමට යෝග්‍ය; අග්‍ර දනයට සුදුසු

අඩගදහරණ - අතෙහි වැලමිටෙන් ඉහළ කොටසෙහි පළඳින ආභරණ විශේෂයක්

අඟුරු මස - ගිනි අඟුරු මත තබා පුළුස්සා ගත් මස්

අට්ටාල - උස් කොට සෑදූ මුරගෙය

අතිරස - රස කැවිලි විශේෂයක්

අතීතංසඥානය - අතීත ජාතීන් දකීමේ නුවණ;පූර්වේ නිවාසානුස්මෘති ඥානය

අතෝර්මින් - වාදනය කරමින්

අදෘශ්‍යකරණ(ය) - අන්‍යයන්ට තමා නොපෙනී සිටීම; සූසැට කලාවන්ගෙන් එකකි.

අධන්මග - දීර්ඝ මාර්ගය

අනයව්‍යසනයට - හානි හා විපත්ති

අනන්‍යසාධාරණ - වෙනත් කෙනකු හා සමාන නොවූ

අන්න දනය - ආහාර දන් දීම

අන්තරට්ටාල - ප්‍රාකාරයක මුදුනේ අතරතුර වූ මුරගෙය; ප්‍රධාන අට්ටාල අතර පිහිටි කුඩා අට්ටාලය

අන්ධබධිරාදී - අඳ බිහිරි ආදී

අන්‍යවිහිත - වෙනත් කරුණකට යොමු වූ සිත් ඇති ව; වික්ෂිප්ත

අනාගතංසඥානය - අනාගත ජාතීන් දකීමේ නුවණ

Non-Commercial Distribution

අනාශ්‍රව	- ආශ්‍රව රහිත; කාම, භව දිට්ඨි අවිජ්ජා යන ආශ්‍රව සතරින් දුරු වූ; කෙලෙස් නැති
අනිෂ්ටාලම්බනීය	- අප්‍රිය වශයෙන් හෙවත් අශුභ වශයෙන්
අනිස	- අනේ! අහෝ! අනිච්චං
සඋපාදිණ්ණ	- තෘෂ්ණා දෘෂ්ටි දෙකින් ග්‍රහණය කරන ලද
අනුභොග	- පාවිච්චියට ගනු ලබන
අඳුන්තෙල්	- අඳුන් මිශ්‍ර තෙල්
අප්‍රතිපුද්ගල	- වඩා උසස් පුද්ගලයකු නැති; සම කළ හැකි පුද්ගලයකු නැති
අභිධර්මාමෘතප්‍රශව	- අභිධර්මය නමැති අමෘතය උපදවන්නාවූ
අභිසංස්කාරමාර	- කුශලාකුශල කර්ම නමැති මාරයා
අමුඛ්‍ය විපාකය	- අප්‍රධාන විපාකය
අර	- හරය; අරටුව
අරක්	- ආරක්ෂාව; රැකවල
අරණි මථනයෙන්	- ගින්නක් ඉපිදවීම සඳහා දඬු දෙකක් එකට ගැටීමෙන්
අරතර	- දැඩි, ස්ථිර
අර්ධ චන්ද්‍ර	- ආයුධ විශේෂයක්, අඩසඳ වැනි තලය ඇති ආයුධයක්
අලඞ්කාර(ය)	- සැරසීම; සූසැට කලාවන්ගෙන් එකකි.
අලමදන්	- නෙළුම් දඬු? (ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයේ මෙය 'අල හා මද' යනුවෙන් අර්ථ කියා ඇත).
අලුපෙලි	- වධ දීම පිණිස අණ්ඩයෙහි බඳින උපකර - ණයක්
අවබාල	- තරුණ
අවුල්හර	- පපුව මත පළඳින ආභරණ විශේෂයක්
අවුළු	- කැඳ සමඟ ගන්නා කැවිලි
අශ්වාරොහණ(ය)	- අසුන් පිට යාමේ ශාස්ත්‍රය; සූසැට කලාවන්-ගෙන් එකකි.
අශ්‍රැතපූර්ව	- නොඇසූ විරූ
අසණිපාතයක්	- අකුණු ගැසීමක්
අසමසම	- සමාන කෙනකු නැති
අසුරොද්දෙහි	- අගුල අදින ලනුවෙහි
අසූ අනුව්‍යඤ්ජන ලක්ෂණ	- බුදුන් වහන්සේගේ ශරීරයෙහි ඇති අසූවක් වූ අප්‍රධාන ශරීර ලක්ෂණ
අස්ඔබ්බවා	- මුද්‍රා තබවා
අස්මුන්දකින්	- හංස රූපය සහිත මුද්‍රාව

Non-Commercial Distribution

ආකර්ෂණ(ය) - මන්ත්‍ර ඖෂධ බලයෙන් අන්‍යයන් තමන්ට වසඟ කර ගැනීම; සූසැට කලාවන්ගෙන් එකකි.

ආකාශ ගමන(ය) - අහසෙහි ගමන් කිරීම; සූසැට කලාවන්ගෙන් එකකි.

ආඝාතන භූමිය - වධක භූමිය; වැරදි කරුවන්ට වධ පමුණුවන ස්ථානය

ආතතය - එක් මුහුණතක් ඇති බෙර; එකැස් බෙර; මෙය පංච තූර්ය භාණ්ඩයන්ගෙන් එකකි.

ආතෙමාද(ය) - තම තමාගේ අභිවෘද්ධිය ඇති කර ගැනීම පිළිබඳ ශාස්ත්‍රය; සූසැට කලාවන්ගෙන් එකකි.

ආලවණ්ණ - තත් සහිත තූර්ය භාණ්ඩ විශේෂයකි.

ආලොකන - ඉදිරිපස බැලීම

ආලොපයක් - පිඩක්

ආවේණික - 1. හිතවත්
"නුඹ වහන්සේගේ ආවේණික බිසොවුන් වැදූ තෙල පුතනුවන් වඩාගෙන.."
2. විශේෂ, වෙන් වූ 3. පරම්පරාවෙන් උරුම වූ

ආභරණ - අභරන

ඇකිල්ල - දම්වැල; මාංචුව

ඇණින් - රේක්කයෙන්; අටයි දණ්ඩකයෙන්

ඇණිය - 1. සමූහය (භට කණ්ඩායම) 2. දති පෝරුව 3. ජල යාත්‍රාවක ඉදිරි කොටස

ඇතිරියක් - ඇතිරිල්ලක්, පලස

ඇපයෙමි - පොරොන්දු ඉටු කරන බවට ගිවිස ගනිමි.

ඇඹිටි පූ - (බැඳපු නැති පිටිවලින් තනන ලද) කැවුම් විශේෂයක්

ඇව්දෙක් - ඉත්ත කුරක්

ඉ

ඉච්ඡානුරූප - කැමැත්තට අනුරූප වූ

ඉට්ටි - හෙල්ල විශේෂයක්

ඉඩංගිණි - සතුරන්ට පහර දීම සඳහා පවුර මත සවි කරන ලද උපකරණයක්

ඉණදසී - ලබා ගත් ණය ගෙවීම සඳහා ණය හිමියාට දාසකම් කරන ස්ත්‍රිය

Non-Commercial Distribution

ඉණ පරිභොගය	-	සිල්වත් භික්ෂුව විසින් ප්‍රත්‍යවේක්ෂා නොකොට සිව් පසය වැළඳීම
ඉතිහාස(ය)	-	එනම් ශාස්ත්‍රය; සූසැට කලාවන්ගෙන් එකකි.
ඉදෝළි	-	දෝලාව, පල්ලැක්කිය
ඉන්ද්‍රජාලයෙහි	-	ඇස් බැන්දුම, මායා කර්මය
ඉඹුරු	-	විශාල තෘණ විශේෂයක්
ඉලක්ක තබවා	-	වැටුප් දී
ඉලක්ක සිටුවා	-	වැටුප් දෙන්ට සලස්වා

උ

උච්චාටන(ය)	-	කෙනකු තමන්ගේ ස්ථානයෙන් පහ කිරීම; සූසැට කලාවන්ගෙන් එකකි.
උත්තමාඞ්ගයෙහි	-	හිසෙහි
උදයව්‍යය	-	සංස්කාරයන්ගේ ඇතිවීම හා නැතිවීම
උදර බන්ධන	-	උදරයෙහි බඳින ආභරණ විශේෂයකි. මෙය සූසැට ආභරණ අතුරින් එකකි.
උදවු	-	සම්පාදිත; සූදනම් කරන ලද
උදාවිය	-	සංස්කාරයන්ගේ ඇතිවීම හා නැතිවීම: උදයව්‍යය
උදිතොදිත ව	-	1. ඉතා උසස්; අති උදාර 2. අභිශයින් වැඩුණු 3. සමෘද්ධ වූ
උද්ගීරණය කොට	-	වමාරා, වමනය කොට
උද්දාලක	-	1. ගස් විශේෂයකි; එරහැන්ද 2. තාපසයකුගේ නාමය
උපච්ඡේද	-	සිඳීම; කඩ වීම
උපනිඃශ්‍රය	-	1. හේතු සම්පත්තිය; මාර්ග ඵල ලැබීමට ඇති හේතු වාසනාව 2. ආශ්‍රය
උපභොග (වස්තු)	-	කෑම බීම ආදී විඳීමට ගන්නා දේ
උපහත	-	ජරාවෙන් පීඩිත
උප්පතක්	-	බුලත් කොළයක්
උලක්කුව(ට)	-	1. ලක් තැබීමට; අලගු තැබීමට 2. මිනුම් විශේෂයක්; නැලියෙන් හතරෙන් පංගුව; පත
උළුසුණු	-	1. රතු මැටි 2. ගඩොල් කුඩු
ඌරුජාල	-	කලවයෙහි පළඳින ආභරණ විශේෂයක් :සූ සැට ආභරණවලින් එකකි.
ඌරුළිඳ	-	ඉතා ගැඹුරු ළිඳ; මැටි/දව වළලු ගිල්වා තනන ලද ළිඳ

Non-Commercial Distribution

එ

එකැස්බෙර - එක් මුහුණතක් ඇති බෙරය (පංච තූර්ය භාණ්ඩයන්ගෙන් එකකි.)
එකුරුකු - එකරොදට; එක කැටියට; එක මිටට (මෙය එකුකුරු යනුවෙන් ද යෙදී ඇත.)
එළවයි - පිරිනමයි; ඉදිරියට පමුණුවයි.
එකවජිද්‍ර - (එක් සිදුරක් ඇති) නළා විශේෂයක්
එකාවැල - තනි හුයකින් කරන ලද මාලයකි.
එකාසනිකඩගය - ඉරියව් වෙනස් නොකර එක ම අසුනක හිඳ ආහාර වැළඳීම් සංඛ්‍යාත ව්‍රතය (තෙලෙස් ධූතාංගයන් අතුරෙන් එකකි.)

ඔ

ඔක්කොල් සිනා - ශබ්ද නගා කරන සිනහව; කොක් හඬලා සිනාසීම
ඔඩමක් - සුරා පානය සඳහා ගන්නා බඳුනක්; චෂකයක්; විතක්
ඔත්තු - නළා විශේෂයක්
ඔරවසුන් - ළය පෙදෙස වැසෙන සේ පළඳින ස්ත්‍රී ආභරණයකි.
ඔලම්බක - එල්ලෙන

ක

කංසුතාලං - 'ඝන' වාද්‍ය ගණයට අයත්වන තූර්ය භාණ්ඩ විශේෂයකි.
කකුධඵල - කුඹුක් ගෙඩියේ ආකාරය ගන්නා මුතු විශේෂයක්
කකුධ භාණ්ඩ - රාජත්වය සංකේතවත් කරන භාණ්ඩ
කච්චිය - ඉන වට හැඳි වස්ත්‍රය
කටක - අතෙහි පළඳින ආභරණ විශේෂයක්; වළල්ල
කට බෙර - බෙර හඬට සමාන ව මුඛයෙන් නිකුත් කරන ශබ්දය
කටාක්ෂ - නෙත් කොණින් බලන බැල්ම
කටාරයක් - 1. විශාල කට ලොකු භාජන විශේෂයක් 2. ලෙණ තුළට වර්ෂා ජලය ගලා යාම වැළැක්වීම පිණිස ගලෙහි කොටන ගැට්ය

කටිසූත්‍ර - පිරිමින් ඉඟෙහි පළඳින ආභරණයකි.
කටුසැමිටි - කටු හෝ ගැට සහිත කසය
කවිටොඩං - ආභරණ විශේෂයක්: සූසැට ආභරණවලින් එකකි.
කඩපොල්ල - රෙදි කැබැල්ල; වස්ත්‍රය
කඩ පොට්ටනිය - රෙදි කඩක බඳින ලද පොදිය
කණ්ඩරණ(ය) - සූසැට කලාවන්ගෙන් එකකි. ඇතැම් තැනක මෙය කැටයම් කලා විශේෂයක් ලෙස ද තවත් තැනක ශරීරයෙන් විෂ ආදිය ඉවත් කිරීමේ ශාස්ත්‍රය ලෙස ද අර්ථ දක්වා ඇත.
කණිකාවෙන් - ඉතා කුඩා බිංදුවෙන්
කදෝපැණියන් - කණාමැදිරියන්
කනක - රත්රන්
කනක පරීක්‍ෂ(ය) - රත්රන්වල හොඳ - නරක පරීක්ෂා කිරීම; සූසැට කලාවන්ගෙන් එකකි.
කන්කුළින් - එක් කැණිමඬලක් යොදා සාදන ලද; කූටාගාරය, වටගෙය
කන්වයින් - හිස තබන කොට්ටය
කත්ථකඩක් - අණ්ඩ දමන ලද පරණ රෙදි කඩක්
කන්‍යාවාද(ය) - සූසැට කලාවන්ගෙන් එකකි. මෙය ඇතැම් තැනක කන්‍යාවන්ගේ ශුභාශුභ පරීක්ෂා කරන ශාස්ත්‍රය යනුවෙන් ද වෙනත් තැනක 'ඛන්‍යාවාදය' වශයෙන් ගෙන භූගත වස්තු පිළිබඳ දැන ගැනීම හා ඒවා ලබා ගැනීම පිළිබඳ ශාස්ත්‍රය වශයෙන් ද අර්ථ සපයා ඇත.
කඳුරැලියක් - බෑවුමක ගලා බසින කුඩා දිය පහර
කප්පිය භාණ්ඩ - භික්ෂූන් වහන්සේට ප්‍රයෝජන ගැනීමට යෝග්‍ය භාණ්ඩ
කප්රුක් - කැමති සම්පත් ලබා දෙන දිව්‍යමය වෘක්‍ෂය
කබලියක් - අඟුරු කබලක්; ගිනි කබලක්
කමඬලාවෙන් - කෙණ්ඩිය; තාපසවරුන් දිය ගෙන යාමට භාවිත කළ භාජන විශේෂයක්
කයිවාරු - පුරසාරම්
කරකතුරු - දළි පිහිය (අෂ්ට පරිෂ්කාරයන්ගෙන් එකකි.)
කරක් - මසුන් ඇල්ලීමට පාවිච්චි කරන උපකර - ණයක්
කරගෙහි - 1. හිසකේ කපන ගෙයිදී
2. හිසකේ කපා නිම වීමේදී

Non-Commercial Distribution

කරවාල	- ආයුධ විශේෂයක්; කෙටි කඩු විශේෂයක් සේ සැලකේ.
කර්පූර ශලාකාවක්	- ඇසෙහි අඳුන් ගාන කපුරු කූර
කර්ණචූලිකා	- 1. ඇතුන්ගේ කනෙහි බඳින ආභරණයක් 2. කන් පෙත්තෙහි උඩ කොටස
කර්ණාමෘත	- කනට මිහිරි වූ දෙය
කර්ණාවතංශක	- කනෙහි පළඳින ආභරණ විශේෂයක්: සූ සැට ආභරණවලින් එකකි.
කලන්දයක්	- විශාල සංඛ්‍යාවක්: අක්ෂෞහිණියෙන් 1/18 පංගුවකි. මෙය කලංක යනුවෙන් ද යෙදේ.
කල්පවෘක්ෂයක්	- සිතූ පැතූ දෙය ලබා දෙන දිව්‍යමය වෘක්ෂය
කල්පපාදප	- කල්ප වෘක්ෂය: සිතූ පැතූ දෙය ලබා දෙන දිව්‍යමය වෘක්ෂයකි.
කවාට	- 1. කවුළුව; ජනේලය 2. දොර
කසපැන්	- 1. කුරුම්බා ගෙඩිය; වැවර ගෙඩිය 2. කුරුම්බා වතුර; වැවර වතුර
කසල්ලක්	- කැදල්ලක්; කූඩුවක්
කස්	- කැසීම ඇති කරවන හොරි දද ආදී රෝග
කළල් පැදුරු	- පන් විශේෂයකින් හෝ කෙඳි විශේෂයකින් වියා ගන්නා ලද බිම අතුරන පැදුරු
කළවිටි	- කමත
කාඩිබත	- ඇඹුල් රසට පිස ගන්නා ලද බත
කාදුකාප්පු	- ආභරණ විශේෂයක්: සූසැට ආභරණවලින් එකක් සේ සැලකේ. (ඇතැම් තැනක මෙය ආභරණ දෙකක් වශයෙන් ද සලකා ඇත.)
කාබහන්	- ඉනේ බඳින පටිය: අටපිරිකර අතුරින් එකකි.
කාම ශාස්ත්‍ර(ය)	- සූසැට කලාවන්ගෙන් එකකි. 1. කම් සැප අනුභව කිරීම පිළිබඳ ශාස්ත්‍රය 2. කැමති වස්තු ඉපදවීමේ ශාස්ත්‍රය යනුවෙන් දෙආකාරයකින් අර්ථ පවසා ඇත.
කාරමින්	- උගුර පාදමින්
කාල්කොට	- කුරු ගසා
කාෂ්ඨ කර්ම(ය)	- වඩු කර්මාන්ත; ලී කලාව: සූසැට කලාවන්ගෙන් එකකි.
කැලම	- ඒකාන්තයෙන්; නිශ්චිත වශයෙන්
කැවිටිලියක්	- කෙවිට
කැවුටුවම්	- කෙවිටෙන් පහර දීම

Non-Commercial Distribution

කිංකිණිකජාල - 1. ආභරණයක් වශයෙන් පළඳිනු ලබන ගිගිරි වැල (සුසැට ආභරණයන්ගෙන් එකකි.)
2. සැරසිල්ලක් වශයෙන් දලක ආකාරයට අමුනා ගත් ගිගිරි සමූහය

කිඩින්ට - 1. නළඟනන්ට
2. කුඩා කෙල්ලන්ට

කිලිනන භොජනයක් - දිළිඳු භෝජනය (දුප්පතුන්ගේ පරිභෝගයට ගැනෙන ආහාරයකි.) (කිලින්න යන්නෙන් තෙත් යන අර්ථය ද ලැබේ.)

කිළිදිල්ලක් - දුව මතින කුඩා මිම්මක්; අඩපත

කිළිල් කඩක් - උණ ගොබ කැබැල්ලක්

කුට්ටම් - 1. භාජන විශේෂයක්
2. යුගලය

කුඩමස්සන් - නොගැඹුරු ජලයෙහි වසන කුඩා මත්ස්‍ය විශේෂයක්

කුණ්ඩලාභරණ - කනෙහි පළඳින ආභරණයක්

කුතු නටන - විකට රඟුම් දක්වන

කුන්තානි - පොළව කෙටීමට භාවිත කරනු ලබන උපකරණයක්

කුප්පායම් - යුද්ධයේදී ආරක්ෂාව සඳහා පළඳින සැට්ටයක් හෝ කබායක්

කුම්භාලඞ්කාර - ඇතුගේ කුම්භය සැරසීම සඳහා යොදන සැරසිල්ලක්

කුරරක - ගස් විශේෂයක්
1. කෙළිඳ 2. රතු කටු කරඬු 3. හෙළවරා 4. කරල් හැබ 5. ගිරිතිල්ල

කුරුඹිලි - කුඩා දොරටුව; රහස් දොරටුව

කුරුහුලා, කතින් - ඇඳි වස්ත්‍රයේ කොනින්

කුලාව - තෙල් ඉඳිකටු ආදිය බහාලීම සඳහා භාවිත කරන කුප්පිය හෝ කොපුව

කුසලාන් - 1. විහාර සන්තක කොට පූජා කරන ලද භූමි භාගය
2. භාජන විශේෂයක්

කූනම් - කුලීනයන් ගමන් යාමට යොද ගත් දෝලා හෝ පල්ලැක්කි විශේෂයක්

කූප ශාසත්‍ර(ය) - ළිං කැණීම පිළිබඳ ශාස්ත්‍රය; සූසැට කලාවන්ගෙන් එකක්

Non-Commercial Distribution

කෙණෙස්ස	-	හැන්ද
කෙමන්	-	ගලා බසින දිය පහරවල මසුන් ඇල්ලීම සඳහා භාවිත කරන කුඩු විශේෂයක්
කෙසුරුසළා	-	මල් රේණු සමූහය
කෙතක	-	වැටකෙයියා ආදී ගස් වර්ග අයත් වන ශාඛ පවුලේ නාමය
කෙයූරාභරණ	-	අතෙහි උඩ කොටසෙහි පළඳින වළල්ලක්; අඞගදාභරණය සූසැට ආභරණයන්ගෙන් එකක්
කෙපොට්ටු	-	ආභරණ විශේෂයක්: සූසැට ආභරණවලින් එකකි.
කොකවැල	-	ඇතුන්ට පළඳවන ආභරණ විශේෂයක්
කොටුගුලු	-	කෝෂ්ඨාගාරය; ගබඩා ගෙය
කොටුම්බර	-	තූර්ය භාණ්ඩ විශේෂයක් (කොටුඹර යනුවෙන් ද යෙදේ.)
කොදෙව්	-	කුඩා දිවයින්
කොතන	-	උල් ආයුධ විශේෂයක්
කොඳු පලස්	-	එළු ලොම්වලින් සාදන ලද පලස්
කොල්	-	ආයුධයක්; කුන්තායුධය
කොසුකඹා	-	ලිහිණි විශේෂයක්
කොමාලි	-	විකට නලුවා; කෝලමා, කෝනංගියා.
කෞචුමාර(ය)	-	සූසැට කලාවන්ගෙන් එකකි; ශරීර ශක්තිය ලබා දෙන ඖෂධ සංයෝග පිළිබඳ ශාස්ත්‍රය යනුවෙන් අර්ථ දක්වා ඇත.
කෞලඝර	-	නළා විශේෂයක්
ක්‍රමොන්නත	-	ක්‍රමයෙන් මහත් වූ; ක්‍රමයෙන් උස් ව ගිය
ක්ලේශකාලුෂ්‍ය	-	කෙලෙස් නමැති කිළුටු
කෙලශමාර	-	කෙලෙස් නමැති මාරයා. කෙලසමාර: අභිසංස්කාරමාර, මෘත්‍යුමාර, ස්කන්ධමාර, දෙව පුත්‍රමාර යනුවෙන් මාරයන් පංච විධ සේ සැලකේ.
ක්ෂුධාදුඃඛයෙන්	-	බඩගින්න නමැති පීඩාවෙන්
ඛජ්ජ	-	විකා අනුභව කළ යුතු ආහාර වර්ග; කැවිලි
ඛීලවාද(ය)	-	සූසැට කලාවන්ගෙන් එකකි. ස්ථානෝචිත ප්‍රඥාවෙන් ප්‍රතිවාදියා මෙල්ල කිරීමේ කලාව වශයෙන් ද වේද පාඨ ආශ්‍රය කොට තත්ත්ව නිර්ණය කිරීම සඳහා කරන වාද විශේෂය වශයෙන් ද අර්ථ පවසා ඇත.

Non-Commercial Distribution

ග

ගජාරෝහණ(ය)	-	ඇතුන් පිට යෑමේ ශාස්ත්‍රය; සූසැට කලාවන්ගෙන් එකක්.
ගඩපොල	-	ශරීරයේ හැදෙන විෂ ගෙඩි: විසප්පු
ගණසඞගණිකාවෙන්	-	සමූහ වශයෙන් එක් ව වාසය කිරීම.
ගණිත(ය)	-	ගණිත ශාස්ත්‍රය; සූසැට කලාවන්ගෙන් එකකි.
ගන්ධ යුක්ති(ය)	-	සුවඳ කැවීම; සුවඳ යෙදීම; සූසැට කලාවන්ගෙන් එකක්
ගඳකිළිය	-	ගන්ධ කුටිය; බුදු රජාණන්වහන්සේ වාසය කළ සුවඳින් පිරුණු කුටිය
ගම්කඳනයක්	-	ගමන් යාමට සූදානම් ව සිටින භික්ෂූන් වහන්සේට දෙන දානය
ගල මුතුමාලා	-	ගෙලෙහි පළඳින මුතුමාල විශේෂයෙක්; මෙහි භාවිත ව ඇත්තේ ඇතුන්ගේ ගෙලෙහි පළඳවන මුතුමාල විශේෂයක් වශයෙනි.
ගල් අතළ	-	ගල් තලාව
ගහට	-	හිරිහැර
ගාන්ධර්ව(ය)	-	සංගීත ශාස්ත්‍රය; සූසැට කලාවන්ගෙන් එකකි.
ගැටගන්වා	-	සිවුරෙහි ගණ්ඨිය ඊට නියමිත පුඩුවෙහි යොද බැඳ මනා කොට පෙරවීම
ගැටබෙර	-	බෙර විශේෂයක්
ගැටලනුවක්	-	ලනුවලින් වියා ඝනකස් කර ගන්නා ලද පැතලි භාජනයක්; තටුවක්
ගැටවටු ගන්වා	-	සිවුරෙහි ගැටය අමුණන පුඩුව ඊට නියමිත ගැටයෙහි යොද බැඳ මනා කොට පෙරවීම
ගිගිරිවළලු	-	1. අතෙහි පළඳින මිහිරි නාදයක් උපදවන වළලු විශේෂයක්: මෙය සූසැට ආභරණවලින් එකක් හැටියට සැලකේ. 2. ඇතුන්ගේ කකුල්වල පළඳවන වළලු විශේෂයකට ද මෙම නම භාවිත වේ.
ගිනි ගාගෙන	-	ගිනි උපදවාගෙන
ගිනි දඬු	-	ගිනි ඉපදවීමට ගන්නා ලී දඬු
ගුහ්‍ය ස්ථාන	-	(ශරීරයෙහි) සැඟවිය යුතු ස්ථානය; රහස් පෙදෙස
ගුථගන්ධයෙන්	-	අශූචිවල ගන්ධයෙන්
ගෘහච්ඡායා	-	ගෙයි සෙවන වැටෙන ප්‍රදේශය

Non-Commercial Distribution

ගෙඩි	- පහර; ගුටි
ගෙලමුතුමාලා	- ගෙලෙහි පළඳින මුතුමාල විශේෂයක්: මෙය සූසැට ආභරණවලින් එකකි.
ගොනටුනද	- මාර්ග අසල ගිමන් හැරීම සඳහා තනන ලද බංකුව හෝ ලැල්ල
ගොරද	- ගෝරෝචන
ගොපානසි	- වක් වූ පරාලය
ඝනතර තිමිරයක්	- දැඩි අන්ධකාරයක්
ඝන(ය)	- සීනු කයිතාලම් වැනි ගැටීමෙන් හඬ උපදවන සංගීත භාණ්ඩ විශේෂයකි; පංච තූර්ය භාණ්ඩයන්ගෙන් එකකි.

ච

චක්‍ර	- ආයුධ විශේෂයක්; රෝදයක් වැනි ආයුධයක්
චක්‍රවාලාන්තරයෙහි	- සක්වළ ඇතුළත
චතුරඩ්ගිනී සේනාව	- ඇත්, අස්, රිය, පාබල යන අංග සතරින් යුත් සේනාව
චම්පක	- සපු
චාතුර්වාද(ය)	- සූසැට කලාවන්ගෙන් එකකි. මෙයට අර්ථ පවසා ඇත්තේ චතුර්වේදය වශයෙනි. (එහෙත් මෙම අර්ථ කථනය අවිනිශ්චිතයි.)
චිත්‍ර කර්ම(ය)	- චිත්‍ර ඇඳීම; (රූප ඇඹීම හා නෙලීම ද මෙයට අයත් සේ සැලකේ.) සූසැට කලාවන්ගෙන් එකකි.
චොචපානය	- ඇට්කෙහෙල් ගෙඩි මිරිකා සකස් කර ගත් පානයක්; අෂ්ට විධ පාන වර්ගයන්ගෙන් එකකි.

ජ

ජදනයෙන්	- වහලෙන්
ඡන්දස්(ය)	- පද්‍ය බන්ධනය පිළිබඳ වූ ඡන්දස් ශාස්ත්‍රය; සූසැට කලාවන්ගෙන් එකකි.
ජායුදක	- ජායා + උදක- සෙවන සහ ජලය
ජිදුමණ්ඩලිකාවෙන්	- සිදුරු සමූහයෙන්
ජිනනාභිනන	- සිඳී බිඳී ගිය
ජඩ්ඝාවළලු	- කෙණ්ඩයෙහි පළඳින ආභරණයක්: සූසැට ආභරණවලින් එකකි.

ජන විවික්ත - ජනයාගෙන් තොර වීම නිසා විවේකී වූ
ජයසුමන - බඳුවද
ජරදු - සන්නාහ විශේෂයක් මෙය ඇතැම් සංස්කරණවල රජ්දු ලෙස ලියවී ඇත.
ජල ස්තම්භ(ය) - සූසැට කලාවන්ගෙන් එකකි.
1. ජල වේගය වැළැක්වීම: නැතහොත්
2. ජලය මතුපිට ගමන් කළ හැකි පරිදි ජලය දැඩි කිරීම යනුවෙන් අර්ථ පවසා ඇත.
ජල සාටිකාව - නාන කඩය; ජල සාටකය
ජාති සමරණ නුවණ - පූර්ව ජන්මයන් සිහිපත් කිරීමේ ඥානය
ජාම්බොනද කනකයෙන් - රත්රන් විශේෂයක්; දඹරන් (මෙය ජම්බු නම් නදිය ආශ්‍රයෙහි උපදින රත්රන් සේ සැලකේ.)
ජෝතිර්ඥාන(ය) - ජ්‍යොතිෂ් ශාස්ත්‍රය
ජ්වර රෝගයකින් - උණ රෝගයකින්
ජ්වාලාන්තයෙන් - ගිනිදැල්වලට ඇතුළත් වූ ප්‍රදේශය

ඪ

ඪබරාවකින් - තවුසන් භාවිත කරන පෙරහන් කඩක් සහිත භාජනයකින්
ඪවුර - බෙර විශේෂයක්
ඪැක්කි - බෙර විශේෂයක්

ත

තකුල් - සුවඳවත් ඖෂධීය ශාඛයක නාමය; පස්පලවතින් එකකි.
තඩි - මැද බර එල්වා දෙකෙළවරින් කර තබාගෙන යන ලී (මෙය 'තඩ' යනුවෙන් ද යෙදේ.)
තදපද - තද
තන්තිරි - තූර්ය භාණ්ඩ විශේෂයක් (මෙය නළා විශේෂයක් සේ සැලකිය හැකිය.)
තන්ත්‍ර(ය) - සූසැට කලාවන්ගෙන් එකකි. තන්ත්‍ර නම් ග්‍රන්ථ කොට්ඨාසය පිළිබඳ අධ්‍යයනය සේ සැලකිය හැකිය.
තන්ත්‍රිපට - තූර්ය භාණ්ඩ විශේෂයක්
තන්ත්‍රී - තූර්ය භාණ්ඩ විශේෂයක්. (මෙය තත් සහිත තූර්ය භාණ්ඩයක් විය හැකියි.)

Non-Commercial Distribution

තමලුලිය	-	ඖෂධීය වැල් වර්ගයක නාමයක් ; කොල්ලම් වැල්
තම්බතුඩගනබාදී	-	රත් පැහැති උස් වූ නියපොතු ආදී
තම්මැට	-	බෙර විශේෂයක්
තඹලවතින්	-	තඹ පැහැති තොල්වලින්
තඹවතුරු	-	බොර පැහැති ව ගලන ගං වතුර
තඹුරු	-	නෙළුම්
තර්ක(ය)	-	තර්ක ශාස්ත්‍රය; න්‍යාය ශාස්ත්‍රය; සූසැට කලාවන්ගෙන් එකකි.
තලප්පර	-	බෙර විශේෂයක්
තලු තැටියක්	-	පැතලි භාජනයක්
තල්කොලු	-	තල් පැළ
තල් වැට	-	තල් අත්තෙන් කළ අවාන; වටාපත
තාංඩංක	-	කනෙහි පළඳින ආභරණ විශේෂයක්
තාලි	-	පළල් මුවවිට සහිත විශාල භාජනයක්
තිමිර	-	අන්ධකාරය
තිමිරපටලොත්පාටනයෙහි	-	අන්ධකාරය නමැති පටලය ඉරා දැමීම
තිඹක්	-	ධාන්‍ය, ජලය ආදිය මනින මිනුම් ඒකකයක්; ලාස් සතරක ප්‍රමාණය
තිරිකුඩම්	-	මුදුන් තුනක් සහිත සැරසිල්ලක්; ('ත්‍රිකූටම්' යන සංස්කෘත වචනයෙන් ආවක් විය හැකිය.)
තිලි	-	1. ඇතිරිලි 2. මෙට්ට
තිලින්	-	මෙට්ටයෙන්
තිසරපට	-	හංස සලකුණින් යුත් මාල විශේෂයක්; සූ සැට ආභරණවලින් එකකි.
තිහිරිපිළි	-	පටරෙදි; කෞශෙය්‍ය පිළි
තීර්ථක	-	මිථ්‍යා ලබ්ධියක් ගත්තාවූ තැනැත්තා දෙසැට මිථ්‍යා දෘෂ්ටි අතුරින් කිසියම් දෘෂ්ටියක් ගෙන පැවිදි වූ තැනැත්තා
තීර්ථක මථනය	-	තීර්ථකයන් මැඩ පැවැත්වීම; පරාජය කිරීම
තුණ්ඩිබෙර	-	බෙර විශේෂයක්
තුනාදරු	-	රෙදි පිළි මැසීමේ නියුක්ත තරුණයා; සන්නාලි තරුණයා
තුන්සිත	-	යම් ක්‍රියාවක් කිරීමට පෙරත් කරන අතරතුරත් කළ පසුත් ඇති වන සිතුවිලි
තුන්සිවුරු	-	භික්ෂූන් වහන්සේට කැප සේ සකස් කරනු ලබන තනිපට සිවුර, දෙපට සිවුර සහ අඳනය යන සිවුරු තුන

Non-Commercial Distribution

තුඹ සුනු	-	ඊයම් කුඩු
තුලාම්	-	තලාදය; බාල්කය
තුලාසඞ්ඝාට	-	තුලා + සඞ්ඝාට ගෘහයක වහලෙහි කොටස්. තුලා යනු තලාදය හෝ බාල්කයයි. සඞ්ඝාට යනු කණු හෝ පේකඩ මතුයෙහි තබන යටලීයයි.
තුවටු	-	ගෙඩියක හෝ කොළයක නටු
තුෂ්ටිරාවයෙන්	-	සතුට ප්‍රකාශ කරන නාදය
තෙවළා	-	විනය සූත්‍ර අභිධර්ම යන තුන් පිටකය
තෙලිසම්	-	තෙල් ගල්වා සකස් කළ සමින් කරන ලද ආභරණ
තෙචීවරිකඞ්ගය	-	තුන් සිවුර පමණක් පරිභෝග කිරීමේ ධුතාංගය.
තෛලොජ්ජ්වලිත	-	තෛල+ උජ්වලිත තෙල්වලින් දල්වෙන
තෝ	-	දහයියා
තෝමර	-	දිගු මිටක් හා උලකින් යුත් ආයුධය; හෙල්ල
ත්‍රිභුවන චන්ද්‍ර	-	තුන් ලෝකයට චන්ද්‍රයෙකු වන්නාවූ
ත්‍රිභුවනෛශ්වර	-	තුන් ලෝකයට අධිපති
ත්‍රිමදගලිත	-	මද කිපුණු ඇතුන්ගෙන් පිළිවෙළින් අවස්ථා තුනක දී වැගිරෙන තුන් ආකාර වූ මදය; දෙකපෝලය හා කෝෂය යන තුන් තැනින් ද, ඒ තුන් තැන ඇතුළු ව දෙකන් දෙඇස් යන සත් තැනින් ද, ඒ සත් තැන ඇතුළු ව දෙනාසාපුටය හා ගුදය යන දස තැනින් ද වැහෙන ත්‍රිවිධ මදය
ත්‍රිවිධ චේතනාවන්	-	'තුන්සිත' යටතේ බලන්න.
ත්‍රිශූලායුධයක්	-	උල් තුනකින් යුත් ආයුධයක්
ත්‍රොටණ(ය)	-	සූසැට කලාවන්ගෙන් එකකි. ඇතැම් තැනක "විදමන" යනුවෙන් අර්ථ කියා ඇත.
ථවිකාවෙක	-	පසුම්බිය
ථාම	-	ශක්තිය
ථූල	-	මහත; තරබාරු.
ථෙය්‍යපරිභොගය	-	දුසිල් ව සිට සිවුපසය පරිභෝග කිරීම.
ථෙනක පරීක්ෂා(ය)	-	සොරකම් කළවුන් හඳුනා ගැනීමේ ශාස්ත්‍රය; සූසැට කලාවන්ගෙන් එකකි.

Non-Commercial Distribution

ද

දණ්ඩාසනයක් - පුස්කොළ පොත් තැබීම සඳහා භාවිත කරන කුඩා මේසයක් නැතහොත් ආධාරකයක්
දඬුඇණිය - ලීයක හෝ යකඩ කුරක අගට කොක්කක් මෙන් සවි කර සාදා ඇති උපකරණයක්
දඬුවැට - පහන් සවි කිරීම සඳහා ලීයෙන් තැනූ වැට
දවන - (ගොයම්) කපන
දවයෙන් - ජවයෙන්; වේගයෙන්
දශනඛසමොධානයෙන් - නිය දහය එකට සිටින සේ දත් එක් කිරීමෙන්
දහන්හු - පූන නූලː මෙය සුසැට ආභරණ අතුරින් එකක් සේ සඳහන් කොට ඇත.
දළදරා - නළා වර්ගයට අයත් තූර්ය භාණ්ඩ විශේෂයක්
දළහං - නළා වර්ගයට අයත් තූර්ය භාණ්ඩ විශේෂයක්
දගලෙක - ඇඹරුම් ගල
දයක පරිභොගයෙන් - තමන්ට පූජා කිරීම් වශයෙන් ලැබුණු සිව්පසය පරිභෝග කිරීම
දාරගල්ල - බිම දිග ඇඳී
දවුලු - 1. වස්ත්‍ර විශේෂයක් 2. රෙදි වැටි
දාරුසම්භාර - දව දඬු සමූහය
දදුරු බෙර - බෙර විශේෂයක්
දව - මහත; විශාල
දවතුලාම් - ලීයෙන් තැනූ හරස් බාල්කය; ලී තලාදය
දැකක් - දෙ + අකක් = අක් දෙකක් අක් යනු කහවණුවක බරින් 1/8 ක ප්‍රමාණයකි.
දැරහම්ණි - මැණික් විශේෂයක්; ජාතිරංග මාණික්‍ය; කැපීම් ආදියක් නැති ව ස්වභාවයෙන් ම බබලන මැණික්
දියත්ත - දිය ස්වල්පය
දිවමත් - ජීවමාන
දිවමිණි රසින් - දිව්‍යමය මාණික්‍ය රශ්මියෙන්
දිවස් හුල - මරණ දඬුවමට නියම කරනු ලැබූවන් තබන උල
දිවි බාවකු - දිවියකු
දීගෙඩියක් - දී කිරි භාජනයක්
දීප දනය - ආලෝක පූජාව

Non-Commercial Distribution

දීප ධූප - පහතින් නැගෙන සුවඳ දුම්
දුදුභු බෙර - බෙර විශේෂයක්
දුෂ්පරිභොගය - නුසුදුසු ලෙස පරිහරණය කිරීම
දූත(ය) - හසුන් පත් පණිවිඩ ආදිය ගෙන යෑම; සූ සැට කලාවන්ගෙන් එකක්
දූරගමන(ය) - දූර ගමන් කිරීම; දූර ධාවනය කිරීම; සූ සැට කලාවන්ගෙන් එකක්
දූර දර්ශන(ය) - දූර දකීම, සූසැට කලාවන්ගෙන් එකක්
දෙඉද්ද - පිනිද්ද, බෝලිද්ද යන ඉද්ද වර්ග දෙක
දෙණ්ඩිම - බෙර විශේෂයක්
දෙබිහින්නන් - 1. සහෝදරියන් දෙදෙන
2. සහෝදරයා සහ සහෝදරිය
දෙය්‍යධර්මයෙන් - දාන වස්තුවෙන්
දෙවපුත්‍රමාර - මාර දිව්‍ය පුත්‍රයා; වශවර්ති මාරයා පස් මරුන්ගෙන් එකෙකි.
දෙවාඩගය - මහාර්ඝ වස්ත්‍ර විශේෂයක්
දෙවාතිදෙව - දෙවියන්ටත් වඩා ශ්‍රේෂ්ඨ වූ දෙවියෙක්: මෙය බුදුන්වහන්සේ සඳහා යෙදෙන විශේෂණ පදයකි.
දෙවොපනීත - දේව + උපනීත දෙවියන් විසින් ඉදිරිපත් කරන ලද
දෝලි - දෝලා
දොණමුඛ - 1. ගම් හාරසියයකට ප්‍රධාන ග්‍රාමය
2. නැව් තොට
ධනුර්විකෘති - නොයෙකුත් ආකාරයේ දුනු වර්ග
ධම්මිල්ල කලාපයක් - කේශ කලාපයක්
ධවලාත පත්‍රයක් - ශේසතක්; සුදු කුඩයක්
ධාතුවාද(ය) - ආපෝ, තේජෝ ආදී ධාතුන් පිළිබඳ ශාස්ත්‍රය; සූසැට කලාවන්ගෙන් එකක්
ධූප - සුවඳ දුම් සඳහා දල්වනු ලබන ද්‍රව්‍ය
නඳුනුයන් - නන්දනෝද්‍යානය: ශක්‍ර භවනයෙහි පිහිටි ක්‍රීඩා උද්‍යානය
නපුංසක ලක්ෂණ(ය) - නපුංසක දේහ ලක්ෂණ ශාස්ත්‍රය; සූසැට කලාවන්ගෙන් එකක්
නරකාග්නියෙන් - අපායෙහි ගින්නෙන්
නරාවළෙක - 1. ඉතා ගැඹුරු අපිරිසිදු වළ
2. ගසක් දිරා යාම නිසා සෑදෙන වළ
නවමනවු - හොඳ නරක
නවාම් - නව කර්මාන්ත

Non-Commercial Distribution

නවෑමියන් - ලෝහ කර්මාන්තයෙහි නියුක්ත තැනැත්තා; කම්මල් කරු
නළල්පට - නළලෙහි පළඳින ආභරණ විශේෂයක් ; මෙය සූසැට ආභරණවලින් එකකි.
නාගවඩම් - ආභරණ විශේෂයක්; සූසැට ආභරණ යන්ගෙන් එකක්
නානාච්ඡන්දික - නොයෙක් අදහස් ඇති
නාරාචන - යකඩ කූරු; යකඩ ඉනි
නිඝණ්ටු(ය) - කෝෂ ග්‍රන්ථ පිළිබඳ ශාස්ත්‍රය; සූසැට කලාවන්ගෙන් එකක්
නිපතනයට - වැටීමට; පතිත වීමට
නිරුදක - ජලය නැති
නිර්මූලනය - සම්පූර්ණයෙන් විනාශ කිරීම
නිලකොට - නියම කර; පවරා
නිලීයන ස්ථාන - ආරක්ෂා ස්ථානය; අප්‍රකට ව සිටින ස්ථානය
නිශ්ශරණාධ්‍යාශයෙන් - සසරින් එතර වීමේ අදහසින්
නිසාන - බෙර විශේෂයක්
නීල මක්ෂිකාවෝ - නිල මැස්සෝ
නුවා - සිවුරෙහි වාටිය ශක්තිමත් කිරීමට අල්ලන රෙදි පටි
නූපුර - කාන්තාවන් පළඳින පාදාභරණ විශේෂයක්:
නෛය්‍යාඩම - විකට නැටුම
නෙත්‍රාභිරාම - නෙතට ප්‍රිය මනාප

ප

පංචලොහො බෙර - පස් ලෝවලින් සාදන ලද බෙර
පංසුකූලිකඩ්ගය - පංසුකූල සිවුරු පමණක් පරිභෝග කිරීමේ ධූතාංගය
පගලියෙන් - ඊතලයෙහි දුනුදිය මත පිහිටුවන කොටසින්
පඩක්තියෙන් - පෙළින්; ශ්‍රේණියෙන්; සමූහයෙන්
පඤ්චාපකෙලශයෙන් - චන්ද්‍රයාගේ හෝ සූර්යයාගේ ආලෝකය මුවා කරන කරුණු පහෙන්: (එනම් අභ්‍ර, මහිකා, ධූම, රජස් හා රාහු යන මේ පසයි.)
පඤ්චගවරසයෙන් - ගවයාගෙන් ලබා ගන්නා කිරි, දීකිරි, මෝරු ගිතෙල්, වෙඬරු යන ද්‍රව්‍ය පහෙන්; පස්ගෝ රසයෙන්
පඤ්චගොරසය - පඤ්ච ගව රසය

Non-Commercial Distribution

පඤ්චශිඛයා - දිව්‍ය ලෝකයෙහි ගාන්ධර්වයා; (කුඩා කොණ්ඩා පසක් ඇත්තා යනු මෙහි අරුතයි.)

පට සිරිවිලි - තූර්ය භාණ්ඩ විශේෂයක්

පටහ - බෙර විශේෂයක්

පට්ටකාර - ස්ත්‍රීන් ගෙලෙහි පළඳින ආභරණ විශේෂයක් කොඩි; පතාකා

පඩි - වැටුප්; කුලිය

පණව - බෙර විශේෂයක්

පණා බෙර - බෙර විශේෂයක්

පඩුරු පාක්කුඩම් - තෑගි බෝග

පත්කුඩයෙහි - තල අත්තකින් හෝ එවැනි වෙනත් පත්‍රයකින් සාදන ලද කුඩයෙහි

පත්තපිණ්ඩිකඞ්ගය - පාත්‍රයෙහි පමණක් ආහාර වැළඳීමේ ධූතාංගය

පත්තිරම් - ආයුධ විශේෂයක්; කුඩා කඩු

පතැස් - විශාල පොකුණු විශේෂයක්

පත්‍ර ඡේදන(ය) - 1. ගල් කැට විදීමෙන් කොළ සිදුරු කොට චිත්‍ර නිර්මාණය කිරීම; අතකුරු ගැසීම 2. 'පත්‍රලේඛා සිදීම හෝ ඇඳීම යනුවෙන් ශ්‍රී සුමංගල ශබ්ද කෝෂයේ අර්ථ දක්වා ඇත; ('පත්‍රලේඛා' යනු මුහුණ සැරසීම සඳහා කරන සැරසිලි විශේෂයකි.) සූසැට කලාවන්ගෙන් එකකි

පදනම් - අත්තිවාරම්; කය්යෝරු; අනුප්‍රාකාරය

පන්දුවට - ක්‍රීඩාවට ගන්නා බෝලය

පබළුමය - පබළුවලින් සැදුණු (පබළු යනු රත්න විශේෂයකි; ප්‍රවාල; කොරල්)

පමුතිලිංගම් - ස්ත්‍රී ආභරණ විශේෂයක්

පරක්කුවක් - සිත වෙනතක යොමු කිරීමක්; ප්‍රමාදයක්

පරකාය ප්‍රවේශන(ය) - මන්ත්‍රාදී බලයෙන් අනුන්ගේ ශරීරයට ආරූඪ වීම; සූසැට කලාවන්ගෙන් එකක්

පරදුඃඛදුඃඛිත - අනුන්ගේ දුකෙහිදී දුකට පත්වන (මෙය බුදුන්වහන්සේ සඳහා යෙදෙන නාමයකි.)

පරමප්‍රතිෂ්ඨාධාර - ඉහළම පිහිට; උතුම් ම ආධාරකය

පරහා - පෙරා

පරහිතකරණයෙහි - අනුන්ට යහපතක් කිරීමෙහි

පරහිත ඥාන(ය) - අනුන්ගේ සිතෙහි ඇති කරුණු දැන ගැනීමේ ශාස්ත්‍රය; (නිමිති ශාස්ත්‍රය ආදියෙහි මෙනි.) සූසැට කලාවන්ගෙන් එකකි.

Non-Commercial Distribution

පරිභොග - පරිහරණය කරනු ලබන; ප්‍රයෝජනයට ගනු ලබන

පර්වතස්ථායි - පර්වතයෙහි වාසය කරන

පල - වහලවල්

පලඟ - ආයුධ විශේෂයක්; පලිහ

පලිස - ආයුධ විශේෂයක්; පලිහ

පලලවයක් - දළුවක්

පසඟුල් - ඇඟිලි පස වැදුණු සලකුණු (මෙය සැරසිල්ලක් සේ භාවිත විය.)

පසාරණ - (අත පය ආදිය) දිග හැරීම

පස්පලවතින් - බුලත් විටට ගන්නා කපුරු, තකුල්, නාරං පොතු, කරාබු නැටි හා ඉඟුරු යන සුවඳ ද්‍රව්‍ය පහෙන්

පස්පෙරහර - පස් පොටක් ඇති මුතු වැල, මෙය සුසැට ආභරණවලින් එකක් සේ සැලකේ.

පස් මරුන් - කෙලෙශ මාර, අභිසංස්කාර මාර, ස්කන්ධ මාර, මෘත්‍යු මාර, දෙව පුත්‍ර මාර යන මාරයන් පස් දෙනා

පස්රු - ආභරණ විශේෂයක්; මෙය සුසැට ආභරණවලින් එකකි.

පස්සාවකුටි - මූත්‍ර කිරීම සඳහා තනන ලද කුටි; කැසිකිළි

පස්විකා - නුවණින් මෙනෙහි කොට; නුවණින් සලකා බලා

පහණවට - රවුම් ගල

පළස් - ලෝමයෙන් වියන ලද ඝන රෙදි; කම්බිලි

පළහා - පුළුස්සා

පළිරොධ - හිරිහැර; බාධක

පාඨගම්/පාඨගං - ස්ත්‍රීන් පයේ පළඳින ආභරණ විශේෂයක්; නූපුර

පාදජාල - පයෙහි පළඳින දැලක් වැනි ආභරණයක්

පාදත්‍ර වළලු - මෙය සුසැට ආභරණවලින් එකකි

පාදමක් - පය බඳින දම්වැලක්

පාදශරි - පයෙහි පළඳින ආභරණ විශේෂයක් (මෙය පාදසිරි යනුවෙන් ද යෙදේ.) සුසැට ආභරණ වලින් එකක් සේ සැලකේ

පාදසංබලා - පයෙහි පළඳින ආභරණයක්. මෙය සුසැට ආභරණවලින් එකකි.

පාදාංගුලි - පයෙහි ඇඟිලිවල පළඳින ආභරණ විශේෂයක්; සුසැට ආභරණවලින් එකකි.

Non-Commercial Distribution

පාදාහරණ - පයෙහි පළඳින ආභරණ විශේෂයක්; දසැට ආභරණවලින් එකකි.
පානදනය - පාන වර්ග දන් දීම
පානීය - බීමට යෝග්‍ය
පාමුදු - පයෙහි ඇඟිලිවල පළඳින මුදු
පාරිච්ඡත්තක - පරසතු (මෙය දිව්‍ය ලෝකයෙහි පමණක් ඇතැයි සැලකෙන වෘක්ෂයකි.)
පාරිජාත - පාරිච්ඡත්තක
පාරිමින් - කොමින්
පාසලඹ - පයෙහි ලන ගිගිරි සහිත වළලු විශේෂයක්
පැවි කොට - යටපත් කොට; සඟවා
පැනිත්තෙක් - පැන් ස්වල්පයක්
පැස - කුඩා පෙට්ටිය; කුඩය
පැසිබත් - ගිතෙල් දමා පිසන ලද බත්; ඇඹුල් බත්
පැස්සක් - 1. ව්‍යංජනයක්; අච්චාරුවක්
2. වට්ටියක්; කුඩයක්
පැසිමස් - ඇඹුල් ද්‍රව්‍යවල බහා පැසවන ලද මාංශ ආහාර
පිටබින්න - එක ම පියාට දව වෙන මවකගේ කුසින් උපන් තැනැත්තිය
පිටහවු - පුටු ආදී ගෘහ භාණ්ඩවල පිට තබන ඇන්ද
පිඩි(පිට) - නිතඹ පෙදෙස; තට්ටම ප්‍රදේශය
පිණ්ඩපාතිකඞ්ගය - තෙලෙස් ධුතාංගවලින් එකකි.
පෙරවීම, ඇතිරීම සඳහා ගනු ලබන පැරණි රෙදි වර්ගයක්
පිධානය - පියන; වැස්ම
පියවර පහණ - පය තබන ගල්ලෑල්ල; පියගැට පෙළෙහි ගල් පුවරුව
පියවිලි - පාවාඩ
පිරිවානා/පිරිවහන - සජ්ඣායනය කරන; කට පාඩමින් කියන
පිහිත - වැසුණු
පිළිදග - පිරිසිදු කොට
පිළිවහන - පළිඟු ගල්; ස්ඵටික පාෂාණ (මැණික් විශේෂයක්)
පිළියත් - වැසුණු; ආවරණය වූ
පිළිහිනි - පිළුණු වූ; නරක් වූ (පිළිහිණි)
පිළිතොරණ - රෙදිවලින් සාදන ලද තොරණ
පීඨයෙහි - ආසනයෙහි
පීරුණු දඬු - දිරා ගිය දඬු; සැහැල්ලු ලී
පුන්කලස - පිරුණු කලය

Non-Commercial Distribution

පුන්නාග	-	දොඹ
පුරමාට්ටු	-	විකට නැටුම්
පුරාණ(ය)	-	එනමින් හැඳින්වෙන ඉතිහාස ග්‍රන්ථ කොට්ඨාසය පිළිබඳ දැනීම; සූසැට කලාවන්ගෙන් එකකි.
පුරුෂ ලක්ෂණ(ය)	-	පුරුෂ දේහ ලක්ෂණ ශාස්ත්‍රය; සූසැට කලාවන්ගෙන් එකකි.
පුලිමුගම් / පුලිඩගම්	-	ප්‍රාසාද ආදිය අලංකාර කිරීමට යොදන ව්‍යාඝ්‍ර මුඛ සැරසිල්ල
පුලුබ්බදරා	-	කැවිලි විශේෂයක්; ආස්මි
පුවරු	-	1. පෝරු (සමතලා කිරීමේ උපකරණයක්) 2. ලෑලි
පූජනෙය්‍යාභිපූජනෙය්‍ය	-	පිදිය යුත්තන් අතුරෙහි වෙසෙසින් පිදිය යුතු
පූතිපාදප	-	දිරා ගිය ගස යන අර්ථය දෙන සංඥා නාමයකි.
පූනාවක්	-	කොතලයක් වැනි භාජනයක්
පූපාපූප	-	විවිධ රස කැවිලි වර්ග
පූර්වෝපචිත	-	(පූර්ව + උපචිත) ඉහත දී රැස් කරන ලද
පෙණමස	-	1. පිසින ලද මස් විශේෂයක් 2. සතකුගේ 'පප්ඵාස' නම් අවයවයෙහි මාංශය
පෙත (කුත්)	-	1. පොදක්: බිංදුවක්: ස්වල්පයක් 2. අඩිපාර; මාර්ගය
පෙය්‍ය	-	පානය කිරීමට ගන්නා දෙය
පේරැස් මුන්ද	-	රජුන්ගේ නම කෙටූ මුද්ද; රාජ මුද්‍රිකාව
පොපිදෙවා	-	කම්පිත කොට; වෙව්ලවා
පොලුගෙන	-	කපා
ප්‍රච්ඡන්න	-	වැසුණු; සැඟවුණු
ප්‍රතිමණ්ඩිත	-	සමන්විත; යුක්ත; අලංකෘත; ශොභාමත්
ප්‍රදාලනය	-	කඩා දැමීම; විනාශ කිරීම
ප්‍රධන්වියෑ	-	කෙලෙස් දවන වීර්යය
ප්‍රලය	-	අභිභවනය; පරාජය; විනාශය
ප්‍රසාද නේත්‍රයට	-	ප්‍රසාද නමැති ඇසට; ඇසින් බැලීමෙන් ඇති වන ප්‍රසාදයට
ඵලකායුධ	-	ආයුධ විශේෂයක්; පලිහ
ඵාරුෂක පානය	-	බොරලු දමනු නම් ගෙඩි වර්ගය මිරිකා සාද ගන්නා පානය (මෙය අෂ්ට විධ පානයන්ගෙන් එකකි.)

Non-Commercial Distribution

		('බොරලු දමනු' යනු 'උගුරැස්ස' යයි ඇතැම් තැනක අර්ථ කියා ඇත.)
බඩබින්න	-	එක ම මවකගේ කුසින් උපන් සහෝදරිය
බඩසාය	-	බඩගින්න
බඩහල්	-	භාණ්ඩ ශාලාව; ගබඩා ගෙය
බණවස්නක්	-	1. ධර්මාසනයෙහි හෝ එය ඉදිරිපිට මේසයෙහි එලන ඇතිරිල්ලක් 2. බණ පොත් දවටන වස්ත්‍රයක්
බත්ගම්	-	යැපීම පිණිස දුන් නින්දගම්
බත්සරළුවක්	-	බත් හැන්දක්
බඩාඤ්ජලි ව	-	ඇඳිලි බැඳගෙන; එකතු කළ දැත් ඇති ව
බඩපයර්ඞකයෙන්	-	අරමිණිය ගොතාගෙන
බන්ධුවර්ගයා	-	ඥාති සමූහයා
බමරවැල	-	මීමැසි පෙළ
බබුරන්	-	අශිෂ්ටයන්; ම්ලේච්ඡයන්; වනචාරීන්; බර්බර දේශ වාසීන්; කසල ශෝධකයන්
බහලාන්ධකාරයෙන්	-	දැඩි අඳුරින්
බාලපරායෙහි	-	බාල වයසෙහි; බාල අවස්ථාවෙහි
බාලභාස්කරයා	-	තරුණ සූර්යයා; උදයන සූර්යයා
බාලාර්ක මණ්ඩලය	-	තරුණ සූර්ය මණ්ඩලය
බාහුදණ්ඩ	-	බාහුවෙහි පළඳින ආභරණයක්; අඩගද හරණය; මෙය දූසැට ආභරණවලින් එකකි.
බෑබුන්	-	සහෝදර සහෝදරියන්
බිලයෙහි	-	සිදුරෙහි; කුහරයෙහි; බෙනයෙහි
බිසි	-	හිඳ ගැනීමට පාවිච්චි කරන කුඩා මෙට්ට
බුහුණනියන්	-	(වැඩිමහල්) සහෝදරිය
බොලු ආභරණ	-	බෙල්ලෙන් යොදා තැනූ ආභරණ
බොධිපර්‍යඞ්ක(ය)	-	බෝධි මූලයෙහි වූ වජ්‍රාසනය
බොධිසම්භාර	-	සර්වඥතා ඥානය ලැබීමට උපකාර වන පාරමිතා ධර්ම
ව්‍යාමප්‍රභා මණ්ඩලය	-	(බුදුරජාණන් වහන්සේගේ ශරීරය අවට) බඹයක් පමණ තැන් පැතිර පවත්නා රැස් වළල්ල
බ්‍රහ්මාතිබ්‍රහ්ම	-	බ්‍රහ්මයන් ඉක්මවා සිටි බ්‍රහ්මයා
භද්‍රඝටය(ක්)	-	සිතූ පැතූ සම්පත් ලබා දෙන දෙව්ලොව ඇතැයි සැලකෙන කළයක්
භද්‍රපීඨවල	-	උසස් ආසනවල; මහා ආසනවල
භද්‍රාව	-	යහපත් තැනැත්තිය; සොඳුරු; පිනැත්තිය (භාර්යාව සඳහා යෙදෙන ආමන්ත්‍රණ පදයකි.)

Non-Commercial Distribution

භරත(ය)	-	නාට්‍ය ශාස්ත්‍රය; සූසැට කලාවන්ගෙන් එකකි.
භාණ්ඩාරයෙන්	-	භාණ්ඩ හෝ මුදල් තැන්පත් කර තබන ගබඩා ගෙයින්; භාණ්ඩාගාරයෙන්
භික්ෂාව්‍රතයෙන්	-	පිඬුසිඟා වැළඳීමෙන් යැපීමේ ව්‍රතයෙන්
භූම්‍යඞ්ගනාවගේ	-	භූමි + අඞ්ගනාවගේ පෘථිවිය නමැති කාන්තාවගේ
භෙණ්ඩිවාල	-	සටන්වලදී පාවිච්චි කරන දමා ගසන ආයුධයක්
භෙණ්ඩුකයන්	-	සැරසිල්ලක් ලෙස භාවිත වූ නූල් ආදියෙන් තනන ලද පන්දු
භෙරීතලයක්	-	බෙර ඇසක්
භෙරීත්‍රොටණ(ය)	-	බෙර කඳ විද සකස් කිරීම යනුවෙන් අර්ථ කියා ඇත. සූසැට කලාවන්ගෙන් එකකි.
හොජ්ජ	-	අනුභව කිරීමට යෝග්‍ය

ම

මකරපට	-	මකරකුගේ රූ සටහනින් යුත් මාල විශේෂයක්; සූසැට ආභරණවලින් එකකි.
මඟුල් කොනතයෙහි	-	රාජකීය කොනතයෙහි
මච්ඡ	-	මාලු
මච්ඡමාංස විකෘති	-	විවිධාකාරයෙන් පිළියෙළ කරන ලද මාලු සහ මස්
මණිකවච	-	මැණික් ඔබ්බා කරන ලද සන්නාහය; මැණික් කංචුකය
මණිකෙවඩම්	-	අතෙහි පළඳින මැණික්වලින් සාදන ලද ආභරණයක්; සූසැට ආභරණවලින් එකක්
මණිපවී	-	මැණික් ඔබ්බා සාදන ලද නළා විශේෂයක්; මිණිමුවා වස් දණ්ඩ
මණ්ඩුක	-	මැඩියා
මථනය	-	1. පැරදවීම; මර්දනය 2. කැළඹීම; ඇලළීම
මද්දළ	-	බෙර විශේෂයක්
මධුපානය	-	1. මී පැණිවලින් සාද ගත් පානයක්; මෙය අෂ්ටවිධ පානවලින් එකකි. 2. මී බීම; මධ්‍ය පානය
මධුමද	-	මී බීමෙන් මත්වීම
මධුමදමුදිත	-	මී බීමෙන් මත් වී සතුටු වූ
මනොනුකුල	-	සිතට ගැළපෙන; චිත්තානුකූල

Non-Commercial Distribution

මනොප්‍රණිධානය	-	සිතින් කරන ප්‍රාර්ථනය; සිතෙහි ඇතිකර ගත්තාවූ අධිෂ්ඨානය
මනොරථය	-	චිත්තාභිලාසය
මන්ත්‍ර(ය)	-	මන්ත්‍ර ශාස්ත්‍රය; සූසැට කලාවන්ගෙන් එකක්
මන්‍දාර	-	මදාරා
මරීචියක්	-	රශ්මියක්; කාන්තියක්
මර්මස්ථානයෙක	-	මාරක ස්ථානයක; ප්‍රාණ දරන ස්ථානයක
මලෝලඹු	-	අලංකාරය පිණිස එල්වන ලද මල්දම්
මල්තොරණ	-	මල්වලින් තැනූ තොරණ
මහබෙර	-	බෙර විශේෂයක්
මහ සැළ	-	විශාල සැළිය
මහාසහශ්‍රී ලෝක ධාතුව	-	විශාල වූත් දහසින් ගණන් ගන්නා ලද්ද වූත් ලෝක ධාතුව; දහස් ගණන් සක්වළ එකතුවෙන් සමන්විත ලෝක ධාතුව
මාංස	-	මස්
මාරබලවිධමනයෙන්	-	මාරයාගේ බලය නැසීමෙන්; දුරු කිරීමෙන්; විනාශ කිරීමෙන්
මාරණ(ය)	-	සූසැට කලාවන්ගෙන් එකකි.
මාරුක් මලින්	-	පොල් මලින්
මාලති	-	මල් වර්ගයක්; ඉද්ද
මාලදානය	-	මල් මාලා දන් දීම
මාලා බන්ධ(ය)	-	මල් දම් ගෙතීමේ කලාව; සූසැට කලාවන්ගෙන් එකකි.
මැඩිල්ලක්	-	සිවුරේ කොටසක්
මිට්ටුරු / මිට්ටෙරු	-	දමා ගසන ආයුධ විශේෂයක්
මිණි අතලෙක	-	මාණික්‍යමය තලාවක
මිණි ඇස්	-	මණි අක්ෂික (එනම් නාරජ)
මිණිපලහක්	-	මැණික් ආසනයක්
මිණි වළලු	-	මාණික්‍යමය වළලු සූසැට ආභරණවලින් එකකි.
මිනිනඹු	-	චින්තඹු ඤත්‍රිය (මෙය චිනිතඹු යනුවෙන් ද යෙදේ.)
මිඩියට	-	දාසියට; සේවිකාවට
මියර	-	වේල්ල; සීමාව
මිරිවැඩි	-	පාවහන්
මිහිඟුබෙර	-	බෙර විශේෂයක්
මුකුණු	-	සොටු; නාසයෙන් වැගිරෙන දියර
මුඛවට්ටි	-	1. වහලෙහි වඩිම්බු ලෑලි 2. මුවවිටි

Non-Commercial Distribution

මුගුර	- (සතර රියනින් අඩු දිග ඇති) පොල්ල
මුතුපට	- මුතු අමුණා සාදන ලද මාලය; මුතුහර: මෙය සූසැට ආභරණවලින් එකකි.
මුද්දික පානය	- මිදි ගෙඩි මිරිකා සාද ගත් පානය; අෂ්ට විධ පානයන්ගෙන් එකකි.
මුව පිඩියක්	- මුවාගේ පස්සා ගාතයක්
මුවවිට	- (සැළියෙහි) කට
මුසන්	- සංගීත ශාස්ත්‍රයට අදාළ පාරිභාෂික ශබ්දයක්: සප්ත ස්වරය ආරෝහණ අවරෝහණ වශයෙන් පවත්නා ක්‍රමයක්; මූර්ජනා
මුසුන්	- කොහු (ගේ ඇමදීමට ගන්නා උපකරණ)
මුහුකුරා/ මුහුකුරුවා	- මෝරා; පරිපාකයට යවා
මුහුලු	- ගස් විශේෂයක්; මූනමල්
මුළු කරන ලද්දවූ	- එක් රැස් කරන ලද: දල්වන ලද
මුළු කොට	- එක් රැස් කොට දල්වා
මූල ප්‍රණිධියෙහි	- ආරම්භයේදී ම කරන ලද අධිෂ්ඨානය
මෘගසංවර්ෂාව	- කල්පාන්තයේදී ඇති වන භයානක වර්ෂාව (මෙම වර්ෂාවට තෙමුණු සත්වයෝ එකිනෙකාට මුවන් මෙන් පෙනී ඔවුනොවුන් නසා ගනිති.)
මෘත්‍යුමාරයා	- මරණය නමැති මාරයා: පස් මරුන්ගෙන් කෙනෙකි.
මෘදඞ්ග	- බෙර විශේෂයක්
මෙසමුඛයෙකින්	- වැසි වලාකුළක විවරයකින්
මොළ කම(ට)	- දරුණු කම; චණ්ඩ ක්‍රියාව
මොළ බාලයෝ	- ඉතා මෝඩ පුද්ගලයෝ
මොචපානය	- ඇට කෙසෙල්ගෙඩි මිරිකා සාද ගන්නා පානය; අෂ්ට විධ පානයන්ගෙන් එකකි.
මෝර පුටුවල	- මයුරාකාර පාද හෝ නැතහොත් මකරාකාර පාද ඇති හිඳ ගන්නා අසුන
මොහන(ය)	- වශීකරණ ශාස්ත්‍රය; සූසැට කලාවන්ගෙන් එකකි.
යකුළු	- යකඩින් තැනූ කුළුගෙඩි
යගදාවක්	- යකඩ පොල්ලක්
යථාධම්ම	- බුද්ධ ධර්මයෙහි පරමාර්ථ ධර්මය ඇතුළත් කොටස එනම්, අභිධර්ම පිටකය
යථානුලොම (ධම්ම)	- බුද්ධ ධර්මයෙහි සූත්‍ර පිටකය
යථාපරාධ (ධම්ම)	- බුද්ධ ධර්මයෙහි විනය පිටකය

Non-Commercial Distribution

යදඬු - යකඩ දඬු
යදොර - යකඩින් තැනූ දොර
යදොරබාව - යකඩින් තැනූ උළුවස්ස
යන්ත්‍ර(ය) - යන්ත්‍ර නමින් හැඳින්වෙන අභිචාර විධිය පිළිබඳ දැනීම; සූසැට කලාවන්ගෙන් එකකි
යමුගුරු - යකඩින් තැනූ පොලු
යවටක් - යකඩ බෝලයක්; යකඩ ගුලියක්
යහඬුවෙකින් - යකඩ අඬුවකින්
යහුල් - යකඩ උල්
යාගු - කැඳ
යාන දනය - යාන වාහන දන් දීම
යාළ - ධාන්‍ය මැනීමේ මිනුම් ඒකකයක්; අමුණු 20 ක ප්‍රමාණය
රජත කුම්භ - රිදී කළ
රජස් - දූවිලි
රණරභ ඝොෂා - තූර්ය භාණ්ඩයක්
රතිකර - ඇල්ම උපදවන
රත් කෙසුරු - රතු පැහැති මල් රේණු
රත්න පරීක්‍ෂා(ය) - මැණික් පරීක්ෂා කිරීම; සූසැට කලාවන් ගෙන් එකකි.
රත්පත් - විහාරයකට අයිති ගොඩනැගිලි විශේෂයක්
රනිබ්බන් - රන්මුවා ඉදිබුවන්
රන්ඇගෑ - රත්‍රනින් කළ පහන් ටැඹ
රනෝවිලි - රත්‍රන් උන්විල්ලා
රන් තොරණ - රත්‍රන් තොරණ
රන්දාරා - රනින් කළ නළාවර්ගයේ තූර්ය භාණ්ඩ විශේෂයක්
රන්පොරොඳු - රනින් කළ හස්ත්‍යලංකාර විශේෂයක්
රන්වැට - 1. රත්‍රනින් සාදන ලද පහන් ආධාරකය
2. රත්‍රනින් කළ පහන
රන් විසිරි - රන්මුවා විජිනිපත්
රන්සවඩි - ඉණේ බඳින රත්‍රන් දම්වැල
රන්සැන් - රනින් කළ හස්ත්‍යලංකාර විශේෂයක්; රනින් කළ කම්බලයි
රන් සින්නම් - රනින් කළ නළා වර්ගයේ තූර්ය භාණ්ඩ විශේෂයක්
රසන - ඉණේ පළඳින ආභරණයක්; මෙවුල්දම
රසාතලය(ට) - පොළවෙහි යට තිබෙතැයි සැලකෙන ලෝකය; පාතාලය

Non-Commercial Distribution

රාවුතයා	-	අශ්වාරෝහකයා
රිටිපුඹුළු	-	රිටි ගසෙහි පට්ටා; තවුසන් හා වනවාසීන් ඇඳීමට ගන්නා පට්ටා විශේෂය
රිදී ඇගෑ	-	රිදියෙන් කළ පහන් වැඹ
රිදී තොරණ	-	රිදීමය තොරණ
රිදීදාරා	-	රිදියෙන් කළ නළා වර්ගයේ තූර්ය භාණ්ඩ විශේෂයක්
රිදීවැට	-	1. රිදියෙන් සාදන ලද පහන් ආධාරකය 2. රිදියෙන් කළ පහන
රිදී සින්නම්	-	රිදියෙන් කළ නළා වර්ගයේ තූර්ය භාණ්ඩ විශේෂයක්
රුකයින්	-	'රුකයා' යන්නෙහි අනුක්ත බහුවචන රූපය 'රුකයා' යනු ගස්වල වසන සත්ව කොට්ඨාසයකි; ගස් බල්ලා
රුවන්වැල	-	1. පිරිමින් විසින් උඩුකයෙහි පළඳිනු ලබන ආභරණ විශේෂයක් 2. මැණික් අමුණා තනන ලද මාලයක්; සූසැට ආභරණවලින් එකකි.
රුවන් සින්නම්	-	මැණික් ඔබ්බා තනන ලද නළා වර්ගයේ තූර්ය භාණ්ඩ විශේෂයක්
රුවන්සොලු	-	මැණික් ඔබ්බා නිම කරන ලද නළල් පට; සූසැට ආභරණවලින් එකකි.
රේරකු	-	1. මත්ස්‍ය විශේෂයක්; ලූලකු 2. ජලචර පක්ෂි විශේෂයක්
රොදුබෙර	-	බෙර විශේෂයක්

ල

ලදපස්මල්	-	අබ, සුනුසහල්, සමන් කැකුළු, ඊතණ, විලඳ යන ශුභ සම්මත ද්‍රව්‍ය පස් වර්ගය
ලය	-	සංගීත ශාස්ත්‍රයෙහි පාරිභාෂික ශබ්දයකි; ගායන, වාදන, නර්තන ආදිය පවත්වනු ලබන වේග ප්‍රමාණය: මෙය තුන් වැදෑරුම් යේ සැලකේ.
ලවයක්	-	ඉතා ස්වල්පයක්
ලහබත් / ලහබද්	-	සලාක පත්‍රයක නම ලියූ දායකයා විසින් ඒ සලාක පත්‍රය ලැබූ භික්ෂූන් වහන්සේට පිරිනමනු ලබන ආහාර කොට්ඨාසය
ලිඛිත(ය)	-	ලිවීම ඉගැන්වීමේ ශාස්ත්‍රය සූසැට කලාවන්ගෙන් එකකි.

Non-Commercial Distribution

ලියවැට	-	1. ලතාවක ආකාරයට තනන ලද පහන් ආධාරකය 2. ලතාවක හැඩය ගත් පහන
ලෙය්‍ය	-	ලෙව කෑමෙන් අනුභව කළ යුතු ආහාර; මී පැණි වැනි ලේහ කටයුතු ආහාර
ලොහො බෙර	-	බෙර විශේෂයක්; ලෝහයෙන් තනන ලද මුවවිට ඇති බෙර වර්ගයක්
ලෝහං	-	නළා විශේෂයක්

ව

වංගි	-	නළා විශේෂයක්
වකුල	-	මුණමල්
වක්කාරියක්	-	ඝන රෙද්දක්
වග්ගිනි	-	ගිනි කබල්
වජ්‍රපඤ්ජර	-	දියමන්තියෙන් තනන ලද කුඩුවක් හෙවත් මැදිරියක්
වටබඳනය	-	ඉණ වටා බඳින පටිය
වටවෙට්ටම්	-	ප්‍රාකාර මත ඉදි කරන ලද තොරණ විශේෂයක්
වඩ්ඩි	-	ඔට්ටු; පරදු
වණ්ණු තෛලයෙන්	-	වැලි තෙලින්; වැලි මිරිකා ලබා ගත් තෙල්වලින්
වනස්පතී	-	1. විශාල ලෙස වැඩෙන ගස (වනයට ප්‍රධාන යනු වචනාර්ථයයි.) 2. නුග ගස
වන්බිඩි	-	වංගෙඩි
වන්‍දනෙය්‍යාභිවන්‍දනෙය්‍ය	-	වැඳුම් ලැබිය යුත්තන් අතර විශේෂයෙන් වැඳුම් ලැබිය යුතු තැනැත්තා
වරමත්දක්	-	සම්හ් ඇඹරු ලනුවක්
වරලියන්	-	උතුම් ස්ත්‍රීන්
වලය	-	1. අතේ පළඳින වළල්ල 2. වළලු වැනි මුතු වර්ගයක්
වලයාධාරයෙක	-	රවුම් හැඩය ගත් දරනුවක
වසල්ල	-	කොස් ආදී ගෙඩිවල මදුලු දරා සිටින කොටස
වස්කුලල්	-	පිඹින තූර්ය භාණ්ඩ විශේෂයක්; බටනළා
වස්දඬු	-	බටනළා
වස්ත්‍ර දානය	-	රෙදි පිළි දන් දීම

Non-Commercial Distribution

වත්තියක්	-	ගිත්තක්
වළත් වස්න	-	වළත් අඩුක්කුව
වාක් නිච්ඡාරණය	-	වචන පිට කිරීම
වාක්ප්‍රණිධානය	-	වචනයෙන් කරන ප්‍රාර්ථනය; බුදු වීමට නියත විවරණ ලැබීමට මත්තෙන් කරන ප්‍රාර්ථනය
වාසාභිරම්‍ය	-	වාසය කිරීමට වෙසෙයින් ප්‍රිය එළවන
වැටපහන්	-	පිත්තල පහන් යනුවෙන් අර්ථ කියා ඇත.
වැදෑපිය	-	ජාතක කළ පියා
වැදෑමෑණි	-	වැදූ මව
වැලය	-	ඉදුණු කොස්ගෙඩිය
වැසනයක්	-	ව්‍යසනයක්; උපද්‍රවයක්
වැකොඳ	-	කොඳ විශේෂයක්
විගමනයට	-	ඉවත් වීමට; දුරු වීමට
විඝාසාදයකු	-	ඉඳුල් කන තැනැත්තකු; යාචකයකු; දුගියකු
විජයවස්ත්‍ර	-	බිසෝ පළඳනා විශේෂයක්
විජයොත්මහපාය	-	ශක්‍රයාගේ වෛජයන්ත නම් මහා ප්‍රාසාදය
විජයොධ්වනි	-	නළා විශේෂයක්
විජිනිපත්‍රයක්	-	වටාපතක්; අවානක්.
විජ්ජතුන්	-	සංගීතකාරයන්; ගාන්ධර්වයන්
විඥබවට	-	කාරණා කාරණ දන්නා; හොඳ නොහොඳ දන්නා
විතතය	-	තල දෙකකින් යුත් බෙරය; පංචතූර්ය භාණ්ඩ අතුරින් එක් විශේෂයකි
විතතාතතය	-	හාත්පසින් සමින් වෙළන ලද බෙර විශේෂ යක්; පංච තූර්ය භාණ්ඩ අතුරින් එක් විශේෂයකි
විතාන	-	වියන්
විදුරසුන්	-	වජ්‍රාසනය; මහ බෝසතාණන්වහන්සේ බුද්ධත්වය ලැබීම සඳහා බෝමැඩ වැඩ හුන් ආසනය
විධමනය	-	දුරු කිරීම; ඉවත් කිරීම; පහ කිරීම
විධ්වංසනයට	-	විනාශ කිරීමට; දුරු කිරීමට
විනයනය	-	හික්මවීම
විනිනඹුවන්ට	-	විත්නඹු ස්ත්‍රීන්ට
විනෙයජනයන්	-	හික්මවීමට යෝග්‍ය පුද්ගලයන්
විභූෂිත	-	අලංකෘත වූ; සැරසී ගත්තාවූ
විලි	-	ප්‍රසව වේදනාව

Non-Commercial Distribution

විලෙපන දානය - ශරීරයෙහි ආලේප කිරීමට ගන්නා ද්‍රව්‍ය දන් දීම
විලොකන - බැලීම
විෂ හරණ(ය) - ශරීරගත විෂ ඉවත් කිරීම; සූසැට කලාවන්ගෙන් එකකි.
වියිරිපත් - විජිනිපත්; අවාන්
වීරනඳම් - බෙර විශේෂයක්
වේණු වීණා වාද්‍ය(ය) - වීණා ආදී සංගීත භාණ්ඩ වාදනය කිරීම; සූසැට කලාවන්ගෙන් එකකි.
වෙදිකා(ව) - 1. පිළ; ආලින්දය
2. බිත්ති අද්දර තිබෙන කයිරුව
වෙලාන්තය - වෙරළෙහි කෙළවර
වෙළු - බැඳීම; වෙළීම; වීණාවෙහි තත් බැඳීමට හා තද කිරීමට සවි කළ උපකරණයක් (මෙය වෙනත් ග්‍රන්ථවල 'වෙළුම්' යනුවෙන් යෙදී ඇති සෙයක් පෙනේ.)
වෛනෙයජනයන් - විනෙයජනයන්
වොටුනු - වොටුන්න; කිරීටය
මෙය සූසැට ආභරණවලින් එකක් සේ සැලකේ
ව්‍යාකරණ(ය) - ව්‍යාකරණ ශාස්ත්‍රය; සූසැට කලාවන්ගෙන් එකකි

ශ

ශක්‍රාතිශක්‍ර - 'ශක්‍රයාට ද වඩා ශ්‍රේෂ්ඨ ශක්‍රයෙක්
ශයන දානය - යහන් දන්දීම
ශරණාගත වජ්‍රපඤ්ජර - ශරණ පතා පැමිණියවුන්හට ආරක්ෂාව සලසන දියමන්ති කූඩුවක්
ශරාසනයක් - දුන්නක්
ශස්ත්‍ර කම්ම(ය) - ශල්‍ය කර්මය; සූසැට කලාවන්ගෙන් එකක්
ශස්ත්‍රක වාත - තියුණු ආයුධයකින් උදරය කපන කලක මෙන් පීඩා ගෙන දෙන වාත රෝගයක්
ශස්ත්‍ර වින්‍යාස(ය) - අවි සකස් කිරීම; සූසැට කලාවන්ගෙන් එකක්
ශාල ද්‍රැමයක් - සල් ගසක්
ශාලව්‍රීහි - ඇල් වී
ශාලිහොත්‍ර(ය) - අශ්ව රෝග චිකිත්සාව පිළිබඳ ශාස්ත්‍රය ; සූසැට කලාවන්ගෙන් එකක්

Non-Commercial Distribution

ශිරෝමාණික්‍ය	-	හිසෙහි පළඳින මැණික
ශිෂ්‍ය කර්මය	-	ශිෂ්‍ය අවස්ථාවෙහි පිළිපැදිය යුතු සිරිත් විරිත්; සූසැට කලාවන්ගෙන් එකක්
ශ්‍රැයාන(ය)	-	ශබ්ද තරංගයන්ගේ දේංකාරයෙන් අදහස් වටහා ගත් ක්‍රමයක්; රහස් යටි ක්‍රමයෙන් අදහස් වටහා ගැනීම; සූසැට කලාවන් ගෙන් එකක්
සංහාර තාණ්ඩවය	-	විනාශ කිරීමේ නර්තනය; කල්ප විනාශයේ දී ඊශ්වරයා විසින් පවත්වනු ලබන නර්තනය
සංවරණය	-	වසා ගැනීම; ආවරණය කිරීම
සඋපාදින්න	-	තෘෂ්ණා දෘෂ්ටි දෙකින් දැඩි සේ ග්‍රහණය කරන ලද
සකල ලොකානන්දකර	-	සියලු ලෝකයාට ප්‍රීතිය උපදවන (මෙය බුදුන්වහන්සේ උදෙසා යෙදෙන නාමයකි.)
සක්	-	තූර්ය භාණ්ඩ විශේෂයක්; හක්ගෙඩි
සකබරොදකය	-	හකුරු මිශ්‍ර කොට සාද ගනු ලබන මිහිරි පානය
සණ	-	ආයුධ මුවහත් තබන ගල
සත්කුල පව්	-	සපත කුල පර්වත; මහමෙර අවට ක්‍රමයෙන් උස් ව පිහිටා තිබෙතැයි සැලකෙන යුගන්ධර, ඊශධර, කරවීක, සුදර්ශන, නෙමින්ධර, විනතක, අශ්ව කර්ණ යන පර්වත හත
සත්දහතළා	-	හිමාලයේ ඇතැයි සැලකෙන විල් සත
සත්සයුරු	-	සාගර හත
සතති	-	අඩයටිය නම් ආයුධය
සදංගා	-	බිසෝ පළඳනාවක් හැටියට මෙම ග්‍රන්ථයෙහි යෙදී ඇත.
සධර්මගඞ්ගාප්‍රවාහ	-	සද්ධර්මය නමැති ගංගා ජල ධාරාව; සත් පුරුෂ ධර්මය නමැති ගංගා ප්‍රවාහය (මෙය බුදුන් වහන්සේ සඳහා යෙදෙන නාමයකි.)
සධර්මාභරණ විභූෂිත	-	සද්ධර්මය නමැති ආභරණයන්ගෙන් සැරසී ගත්; සත්පුරුෂ ධර්ම නමැති ආභරණය-න්ගෙන් සැරසී ගත් (මෙය බුදුන් වහන්සේ සඳහා යෙදෙන නාමයකි)
සනිකෝ	-	ඉක්මනින්
සපදනචාරිකඞ්ගය	-	නොවරදවා සෑම දිනකම ගෙපිළිවෙළින් පිඬුසිගා යාමේ ව්‍රතය (මෙය තෙලෙස් ධූතාංගයන්ගෙන් එකකි.)
සබලපෙති	-	වීවලින් සාද ගන්නා ආහාරයක්

Non-Commercial Distribution

සබ්‍රම්සරුන් - සමාන බ්‍රහ්මචර්යාව ඇති තැනැත්තන්; තමා හා එක් ව මහන දම් පුරන්නවුන්.
සමතිත්තික - ඉවුර දක්වා සම ව පිරී ගිය
සමධිගමයට - මනාව අවබෝධ කිරීමට
සමන්තභද්‍ර - සර්ව ප්‍රකාරයෙන් ම යහපත් වූ; සියල්ලෙන් ම ශ්‍රේෂ්ඨ වූ (මෙය බුදුන් වහන්සේ සඳහා යෙදෙන නාමයකි.)
සමස්තජනශෙඛර - සියලු ජනයාට මුදුන් මල් කඩක් වූ; සියලු ජනයාට උත්තම වූ
සමුත්තාලං - තූර්ය භාණ්ඩ විශේෂයක්; තාලම් විශේෂයක්
සමුදකරවා - රැස් කරවා
සමුද්‍රඝෝෂා - බෙර විශේෂයක්
සමොධානයෙන් - මැනවින් එකට ගැලපීමෙන්; මනා කොට එක් කිරීමෙන්; මනා කොට පිහිටුවීමෙන්
සම්බානක් - ජල යාත්‍රා විශේෂයක්; ඔරු දෙකක් එක් කොට සාදන ලද යාත්‍රාවක්
සම්මිඤ්ජන - (අත පය ආදිය) හැකිලීම
සරකක් - ගවයන්; ධනය උපයන මාර්ග
සරමෙහි - අභ්‍යාසයෙහි
සරළුවක් - හැන්දක්
සව්ඡාලි ඵුල්ලිත - මුල සිට අග දක්වා සෑම තැන ම මල් පිපුණු
සහශ්‍රකිරණයා - දහසක් රශ්මි ඇති තැනැත්තා, එනම් සූර්යයා
සළාවැටුම් - කරකැවී ගිය දිය සුළි
සාධු ක්‍රීඩා - පුණ්‍යෝත්සව; සැණකෙළි
සාමුදු පලා මාලුව - කලවම් පලා
සායණ්හකාලයෙහි - සවස් කාලයෙහි
සායනීය - රසවිඳිය යුතු; පස් වැදෑරුම් ආහාර වර්ග වලින් එකකි.
සාලුකපානය - ඕලු ඇට මිරිකා සාද ගත් පානය (අෂ්ට විධ පානයන්ගෙන් එකකි.)
සාලොහිතයෙක් - ලේ නෑකමක් ඇති තැනැත්තෙක්
සාල්ලෙක - පැසක; කුඩයක
සාළුවක් - හැන්දක්
සැඩි කොළෙෝ - අපිරිසිදු කළෝ
සැඳිකුළු - පක්ෂි විශේෂයක්
සැරයටි - හැරමිටි
සැළ - සැළිය; විශාල මැටි භාජනය

Non-Commercial Distribution

සැළිකුඩික්කියක්	- කුඩා සැළියක්
සිතුම්ණි රුවනක්	- චින්තාමාණික්‍ය රත්නයක්; සිතූ පැතූ සම්පත් දෙතැයි සැලකෙන මැණිකක්
සිදුහතු	- අබ
සිනිඳස	- ස්නේහය; ආදරය
සින්නම්	- තූර්ය භාණ්ඩ විශේෂයක්; හොරණෑව
සිරිවිලි	- තූර්ය භාණ්ඩ විශේෂයක්
සිලියෙකුත්	- සුලු මාමා කෙනෙකුත්
සිවිකාවකින්	- දෝලාවකින්
සිව්රඟ (වෙර)	- අංග සතරකින් යුත් වීර්යය; බෝසතුන් වහන්සේ බුද්ධත්වයට පත්වීම සඳහා වැඩ හුන් වේලෙහි කළ අධිෂ්ඨානය මෙයින් සමන්විත විය.
සිව්රඟ සෙනඟ / සිවුරඟ සෙන්	- ඇත්, අස්, රිය, පාබල යන චතුරංගිනී සේනාව
සීවෙය්‍ය වස්ත්‍රයෙන්	- සිවි රටේ වියන ලද අගනා රෙදි වර්ගයකින්
සීසත්	- සන්නාහ විශේෂයක්
සුධාභොජනය	- 1. දෙවියන්ගේ ආහාරය; අමෘතය 2. ඉතා මිහිරි ආහාරය
සුපිළිසත්	- මනාව වැසී ගත්; මැනවින් පෙරවූ
සුප්‍රතිෂ්ඨිතපාද	- මනාව පිහිටියාවූ පතුල්: බුදු රජාණන් වහන්සේගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ යන්ගෙන් එකකි.
සුබුක්ක	- කම්මුල
සුමන	- දසමන්; පිච්ච
සුමුහක්	- පෙට්ටියක්; කරඬුවක්
සුඹුළුවක්	- දරණුවක්
සුරහය	- පිහිය; කුඩා කඩුව
සුරභිධෙනුවක්	- දෙව්ලොව වෙසෙන සිතූ පැතූ සම්පත් දෙතැයි සැලකෙන ගව දෙන
සුසිර(ය)	- නළා වර්ගයේ තූර්ය භාණ්ඩ; පංච තූර්ය භාණ්ඩයන්ගෙන් එකකි.
සුළු ගෙය්යෙක්	- ස්වාමියාගේ සහෝදරයෙක්
සුළුවාගෙවල්	- කුඩා ප්‍රාසාද ගෘහ
සූප ශාස්ත්‍ර(ය)	- ඉහුම් පිහුම් පිළිබඳ ශාස්ත්‍රය; සූසැට කලාවන්ගෙන් එකකි.
සෙන්කෝල්	- සෞරළිය; රාජත්වය හඟවන සංකේතයක්
සෙමර	- සෙමර මුවාගේ වල්ගය; චාමරය (මෙය පවන් සැලීම සඳහා යොද ගැනේ.)

Non-Commercial Distribution

සෙල්බැවිල් - 1. පර්වත බෑවුම
2. පර්වත බෑවුමක සෑදුණු ගුහා

සේවාණෝ - සේවකයාණෝ

සේසත් - සුදු කුඩ

සොපාණ මාලාවෙන් - පියගැට පෙළ සමූහයෙන්

සෝවැති - නයි පෙණයෙහි ඇති ස්වස්තිකාකාර සටහන (මෙතැන්හි මෙය හස්ත්‍යාලංකාරයක් වශයෙන් දක්වා ඇත.)

ස්තම්භ - කුළුණු

ස්තම්භන(ය) - නොපෙල්වෙන බවට පත් කිරීම; දැඩි බවට පත් කිරීම; සූසැට කලාවන්ගෙන් එකකි.

ස්ත්‍රී ලක්ෂණ(ය) - 1. කාන්තා දේහ ලක්ෂණ ශාස්ත්‍රය; සූසැට කලාවන්ගෙන් එකකි.
2. නාරී සෞන්දර්යයේ අංග

ස්වර්ණකුම්භ - රතින් කළ කළගෙඩි

ස්වර්ණභිංකාරයෙන් - රන් කෙණ්ඩියෙන්

හ

හඩගීය - හඬ ගෑවේය.

හස්ති තලයක් - 1. අත්ලක්
2. ඇත් සොඬයක මතුපිටක්

හස්තමුද්‍රිකා - අතෙහි පළඳින මුද්‍ද; පේරුස් මුදු සූසැට ආභරණවලින් එකකි.

හස්තාංගුලි - අතෙහි ඇඟිලිවල පළඳින ආභරණ විශේෂයක්; මෙය සූසැට ආභරණවලින් එකකි.

හස්තෝදක කොට - අත පැන් වත් කොට

හිඟුල්සුනු - හිඟුල් නම් ද්‍රව්‍යයේ කුඩු; රත් සිරියල් කුඩු

හිමවුපියසට - හිමාල ප්‍රදේශයට

හිරි ඔතප් - පව් කිරීමෙහි ලජ්ජාව හා පව් කිරීමට ඇති භය

හිස්වරුකළහ - එක් රැස් කළහ.

හෙප් / හෙබ - කුඩා ජලාශය; ගලක පිහිටි දිය වල

හෙයක් - ඒදණ්ඩක්

හෙම කම්(ය) - ස්වර්ණ කර්මාන්තය; සූසැට කලාවන්ගෙන් එකකි.

හෝපලුපලලව - අශෝක වෘක්ෂයේ ළපටි දලු

www.sinhalaelibrary.com
Non-Commercial Distribution